# විසුද්ධි මග්ග මහා සන්නය

## ප්‍රථම භාගය

අත්ථකථා චාර්ය බුද්ධඝොෂ මහා ස්ථවිර ස්වාමිපාදයන්

විසින් විරචිත

ශ්‍රීමත් කලිකාලසාහිත්‍ය සර්වඥ පණ්ඩිතපරාක්‍රමබාහු
මහරජතුමානන් විසින් කරණලද විස්තරපදාර්ථ
ව්‍යාඛ්‍යානයෙන් හා අභිනව සංක්ෂෙප භාවසන්නයෙන්ද
යුත්තයි.

*“සබ්බ දානං ධම්ම දානං ජිනාති,*

*සබ්බරසං ධම්මරසො ජිනාති;*

*සබ්බරතිං ධම්මරති ජිනාති,*

*තණ්හක්ඛයො සබ්බදුක්ඛං ජිනාති”!.*

තිලොගුරු බුදුරජාණන්වහන්සේ විසින් සුභාෂිත ශ්‍රී සද්ධර්මය දැනඋගත් පඬිවරුන් කලින්කල ලොව පහලවී එම ධර්මය ග්‍රන්ථකරණය තුලින් හුදී ජනයාගේ ඤාණ ප්‍රයොජනය උදෙසා විවරකළවස් ඒතුලින් වටිනා ධර්ම ග්‍රන්ථ රැසක් ලොව පහලවිය.ඉන්බොහෝමයක් අද වනවිට අතුරුදහන්වී හමාරය.

අප විසින් මෙම ප්‍රයත්නයෙන් සිදුකළේ, අපහට සොයාගත හැකිවූ එබදු පැරණි ධර්ම ග්‍රන්ථ ධර්ම කාමීන්ගේ ප්‍රයෝජනය උදෙසා භාවිතයට ගත හැකිලෙස සකස්කිරීමයි.

අප ඉමහත් පරිශ්‍රමයකින් එම ග්‍රන්ථ ඡායාරූපගතකොට පරිගණක ආධාරයෙන් මෙසේ ප්‍රයොජනයට සුදුසු ආකාරයට සකස්කිරීම සිදුකළෙමු.එම උතුම් ධර්ම දානමය කුසලය කර්මයට නොයෙක් අයුරින් සහයවූ හිතවත් කල්‍යාණ මිත්‍රයන්වහන්සේලා සැමදෙනාටත්, එම ග්‍රන්ථවල මුල් කතෘන්වහන්සේලාටත්,ප්‍රථමයෙන් මුද්‍රණය කොට පළකරණලද සියලු පින්වතුනටත්මෙම කුසලය සසර සයුර තරණය කර නිවන් පරතෙරට පැමිණීමට උතුම් ධර්ම යාත්‍රාවක්ම වේවා.

තවද මෙයින් ප්‍රයෝජනය ලබන සියලු දෙනාටත් අප දෙමාපියන් ආචාර්යොපාධ්‍යායන්වහන්සේලා ඇතුළු කල්‍යාණමිත්‍රයන්වහන්සේලා සියලු දෙනාටත්, දෙව්ලෝව බඹලෝව වැසි සියලු දෙවියන් හා බ්‍රහ්මයන් ඇතුළු සියලු ලෝ සතනටත්මෙම උතුම් කුසලය අමාදම් සුවයෙන් සැනසීම පිණිසම උපකාරවේවා.

*“චිරං තිට්ඨතු ලොකස්මිං සම්මා සම්බුද්ධ සාසනං”!*

සාදු!.... සාදු!... සාදු!..

# සංඥාපනය.

"විශුද්ධිමාර්ග" යන්නේ අර්ථය නම්(කෙලෙසුන්කෙරෙන්) අතිශයින් පිරිසිදුවීමේ මාර්ගය යනුයි. ඒක්‍රමය ප්‍රකාශවන ග්‍රන්ථයද උපචාරයෙන් විශුද්ධිමාර්ගනම්—මෙහිවනාහි "අන්තොජටා බහිජටා ජටාය ජටිතා පජා තං තං ගොතම පුච්ඡාමි කො ඉමං විජටයෙ ජටං"යන ගාථාවෙන් එක්තරා දෙවපුත්‍රයෙකු විසින් කරණලද ප්‍රශ්නය තථාගතවූ සර්වඥයන්වහන්සේ විසින් "සීලෙ පතිට්ඨාය නරො සපඤ්ඤො" යනාදී ගාථාවෙන් විසඳා වදාල ධර්මය විස්තරකිරීමෙන් තුන්පිටකය අල්ලා සඞ්ග්‍රහ අර්ථකථාවශයෙන් කරණලද ග්‍රන්ථයයි-සමන්තපාසාදිකාවිනයාර්ථකථාදිය මෙන් මේ සිංහලාර්ථ කථාවන් පාලියට පිටපත්කරණලද අර්ථකථාවක්ද නොවේ. මේ වනාහි සිංහලාර්ථකථාවන් ශුද්ධමාගධීභාෂාවට නගා පාල්‍යර්ථකථා කල බුද්ධඝොෂාචාර්‍ය්‍යයන් වහන්සේ විසින් ලඞ්කාවට පැමිණ ප්‍රථමකොට කල පොතයි. එහි පිළිවෙල කථාව මෙසේයි-තථාගතවූ සර්වඥයන් වහන්සේ බුදුබව ලැබීමට පිටදී වදාල මහාබොධි වෘක්ෂය පිහිටි ගයාවෙහි බෝමැඩට නුදුරු ගමෙක්හි උපන් විද්‍යාශිල්පාදිය හා ඍග්යජුස්සාමසඞ්ඛ්‍යාත ත්‍රිවේදයේ පරතෙරට පැමිණි බ්‍රාහ්මණ මාණවකයෙක් තෙම මහාකොට දත් ආගම ධර්මඇත්තේ. සියලුවාදයන්හි නොපැකිලෙන දක්ෂභූමිඇත්තේ ප්‍රවාදීව දඹදිව සැරිසරණුයේ. එක් විහාරයකට අවුත් රාත්‍රිකාලයෙහි පතංජලීමතය පාඨොච්චාරණවශයෙන් සම්පූර්ණපද ව්‍යඤ්ජනයුක්තකොට හදරයි. එහි වසන්නාවූ රෙවතනම් ස්ථවිරතෙමෙක් මෙතෙම මහා ප්‍රාඥයෙක දමනය කටයුත්තේයයිසිතා කථාව උපදවනුපිණිස "කවරෙක් කොටලුහඬින් මහාශබ්ද කෙරේදැයි" කියනලද්දේ ඒ බ්‍රාහ්මණමාණවකතෙම කොටලුවන් හඬ අර්ථ දන්නෙහිදැයි කීසේක, මම දනිමියි කීකල්හි තමාගේ මත හෙලා ප්‍රශ්න කෙළේය. ඔහුවිසින් විචාරණලද හැම ප්‍රශ්නයන් ස්ථවිරයන්වහන්සේ විසඳ විරොධ පවා දක්වූසේක-එකල්හි ඒ බ්‍රාහ්මණ මාණවකයා විසින් තුඹවහන්සේද ස්වකීයමතය නගා මාපිළිවිසුවමැයි මෙසේ යනලද්දේ යමකප්‍රකරණයෙහි ආ අභිධර්මපාලියක් වදාළේය. හෙතෙම එහි අර්ථ නොදත මේ කවරෙකුගේ මන්ත්‍රයෙක්දැයි විචාරණලද්දේ බුද්ධමන්ත්‍රයයි වදාළේය- මටද මේ බුද්ධවේදය දෙවයි කීකල්හි පැවිදිව ගන්නුවයි කියනලද්දේ ඒ බ්‍රාහ්මණමාණවකතෙම බුද්ධමන්ත්‍රය උගන්නාපිණිස පැවිදිව ත්‍රිපිටකධර්මය මනාකොට උගත්තේ මෙය එකායනමාර්ගයයි පසුව ඒ ධර්මය පිළිගත්තේය, බුදුරජාණන්වහන්සේගේ ශබ්දය මෙන් ගැඹුරුහඬ ඇතිබැවින් බුද්ධඝොෂයයි උන්වහන්සේගේ නම ප්‍රකාශකලාහුය-උන්වහන්සේගේ කීර්ති ඝොෂාවද සර්වඥයන්වහන්සේගේ කීර්ති ඝොෂාව මෙන් පොළෝතෙලෙහි පතළවිය—එකල්හි හෙතෙමේ දඹදිවිහි "ඤාණොදය" නම්ප්‍රකරණය කොට ධම්මසඞ්ගණිනම් අභිධර්මයෙහි පළමුවෙනි ප්‍රකරණයට "අර්ථශාලිනී" නම් අටුවාව කළමෙස්ක් පිරිත්අටුවාව කරන්නට පටන්ගත්තේය-ඒදැක රේවතස්ථවිරතෙම වදාරණසේක්. මෙහි අටුවා නැත එසේම හෙදවූ ආචාර්‍ය්‍යවාදයෝ ද නැත්තාහ —සඞ්ගායනා තුණකට නගණලද බුද්ධවචන ද මහාකාශ්‍යපාදී මහතෙරුන්විසින් වදාරණලද අර්ථකථා මාර්ගයන්ද මනාකොට බලා ප්‍රාඥවූ මිහිදුමහතෙරුන්වහන්සේවිසින් සිංහලභාෂාවෙන් කරණලද

පූර්වී සිංහලාර්ථ කථාහොමෝ ලංකාද්වීපයෙහි සිංහලයන්කෙරෙහි එම භාෂාවෙන් පැවැත්තිය-එහි හෙයින් ඒ අර්ථකථා අසා මාගධීභාෂාවට පෙරළා අර්ථකථාකරව එය සියලු ලෝකයාහට වැඩදායක කොට රයි වදාළේයි-එසේ වදාළ කල්හි ඊට ප්‍රසන්නවූ බුද්ධඝොෂස්ථවිරතෙම දඹදිවින් නික්ම මෙම සිංහලද්වීපයෙහි අනුරාධපුරප්‍රවරයෙහි මහානාමරජකාලයෙහි බුදුන් පිරිනිවී නවසියපණස් තුන්වන්නෙහි මෙහි වැඩියේ මහාවිහාරයට පැමිණ මහාප්‍රධානවිහාරයේ සම්ප්‍රාප්තව එහි සඞ්ඝපාලස්ථවිරොත්තමයන් සමීපයෙහි සිංහලාර්ථකථා හා ස්ථවිරවාද ද අසා ධූන සම්‍යක්සම්බුද්ධයන්වහන්සේගේ මෙම අභිප්‍රායයි නිශ්චය කොට දූන එහි සඞ්ඝයා රැස්කරවා අටුවාකරණපිණිස අපට සියලුම පොත් දුනමැනවැයි යාච්ඤා කෙළේය. එකල්හි මහාභික්ෂු සඞ්ඝතෙම ඒ බුද්ධඝොෂාචාර්ය්‍යයන් විමසන පිණිස සංයුත්සඟියෙහි "අන්තො ජටා බහි ජටා" යනාදී ගාථා දෙක දී ආයුෂ්මත්හුගේ සමර්ථතාව මෙහි දක්වා පොතක් කළමැනව ඒ දූන සියලුම පොත් දෙම්හයි කීසේක. එහි අර්ථකථා සහිත පිටකත්‍රය සඞ්ක්ෂෙපයෙන් සඞ්ග්‍රහකොට විශුද්ධිමාර්ගය කෙළේය. ඉක්බිත්තෙන් බුද්ධධර්මයෙහි දක්ෂවූ සඞ්ඝයා මහබෝමළුවෙහි රැස්කොට එය කියවන්නට ආරම්භ කෙළේය. දෙවියෝ උන්වහන්සේගේ නිපුණත්වය මහජනයා මධ්‍යයෙහි ප්‍රකාශ කරණපිණිස පොත සැඟවූහ. තුන්වෙනි වර දක්වා ම උන්වහන්සේ පොත කෙළේය. තුන්වෙනිවර කරණලද පොත කියවන්නට ආරම්භ කළ කල්හි දෙවතාවෝ පූර්වවූ පොත් දෙක ද එහි එළවා තැබූහ. එකල භික්ෂූහු පොත්තුණ ම සංසන්දනයකොට කියවූහ ග්‍රන්ථවශයෙන් හෝ අර්ථවශයෙන් හෝ පූර්වාපරග්‍රන්ථවශයෙන් හෝ ස්ථවිරවාදවශයෙන් හෝ පාලිවශයෙන් හෝ පදව්‍යඤ්ජනවශයෙන් හෝ වෙනසක්නොව පොත් තුණම එකාකාරවිය. ඉක්බිත්තෙන් අවු පහටුවූ මහාසංඝ තෙමේ සාධුකාර පවත්වා ඒකාන්තයෙන් මේ මෛත්‍රෙය බොධිසත්වයෝවනැයි උද්ඝෝෂණයකොට සිංහලාර්ථකථා සහිත සියලු පිටකත්‍රයෙහි පොත් දුන්සේක. හෙතෙම මහාවිහාරබද "ධූරසඞ්කරග්‍රන්ථාකර" පිරිවෙණෙහි වෙසෙමින් සිංහල අටුවාවන් පාලිභාෂාවට නගා සමන්තපාසාදිකාදී අටුවාපොත් කළසේක.

මේ විශුද්ධිමාර්ගී අටුවාව වනාහි දීඝනිකායාදීයට සුමඞ්ගලවිලාසිනී ආදීයමෙන් අනන්තර අර්ථකථාවක් ද නොවේ—එසේම අභිධර්මාර්ථසඞ්ග්‍රහය අභිධර්මාවතාරාදියමෙන් ප්‍රකරණාන්තරයක් ද නොවේ—මේ වනාහි සමන්තපාසාදිකා සුමඞ්ගලවිලාසිනී ආදියෙන් ශේෂවූ සියලු ත්‍රිපිටකයට ම සාධාරණවූ සඞ්ග්‍රහාර්ථ කථාවෙකි—බුද්ධාගමේ සාරාංශයව ඇතුළත්වූ ශීල සමාධි භාවනා ස්කන්ධ ආයතන ධාතු ඉන්ද්‍රිය සත්‍ය ප්‍රතීත්‍යසමුත්පාදාදී ධර්ම සියල්ලම මෙහි විස්තර කොට ඒ ඒ අර්ථකථාවන්හි ඒ ඒ ධර්ම විස්තර කට යුතු තැන්හි විශුද්ධි මාර්ගයෙන් දතයුතුයයි සඳහන්කරණබැවින් මේ ප්‍රධාන සඞ්ග්‍රහ අටුවාව බව සැලකියයුතුයි—සියලු බුද්ධාගමේ තත්වය දැනගැණීම මේ විශුද්ධිමාර්ගයෙන් මෙන් වෙන එක පොතකින් කළ නොහැකිවේ. මෙම බුද්ධඝොෂාචාර්ය්‍යයන් වහන්සේට පෙදක් ලෑත කාලයක වැඩිසූ කුද්දගොත් සඟියෙහි පොත් තෙළෙසකට අටුවා හා සතරමහානිකායාර්ථකථාවන්ට පුරාණටීකාද නෙත්ති ප්‍රකරණඅටුවාව හා අභිධර්මානුටීකාවද යනාදී විශාල ප්‍රශස්ත ග්‍රන්ථයන්ගේ කර්තෘවරයාවන බදරතිත්ථවාසී ආචාර්ය්‍ය ධම්මපාල මහාස්ථවිරොත්තමයන් විසින් මෙම විශුද්ධිමාර්ගයට කරණලද "පරමත්ථමඤ්ජුසා" නම් ප්‍රශස්ත ටීකාවක් ඇත්තේවේ. එහි ග්‍රන්ථාරම්භයෙහි ගුණවදෙවතාශිංසනයට අනතුරුවමෙසේ ප්‍රතිඥකෙරේ.

විසුද්ධචරිතො නාථො, යං විසුද්ධිමනුත්තරං
පත්වා දෙසෙසි කරුණා, සමුස්සාහිතමානසො
තස්සා අධිගමූපායො, විසුද්ධාභිකඞ්ඛිනං
විසුද්ධිමග්ගො යො වුත්තො, සුවිසුද්ධපදක්කමො
සුවිසුද්ධං අසංකිණ්ණං, නිපුණත්ථවිනිච්ඡයං
මහාවිහාරවාසීනං, සමයං අවිලොමයං
තස්ස නිස්සාය පොරාණං, කථාමග්ගං අනාකුලං
තන්තිනයානුගං සුද්ධං, කරිස්සාමත්ථවණ්ණනං—

මේ විශුද්ධිමාර්ගයට ම පණ්ඩිතපරාක්‍රමබාහු මහරජාණන් විසින් සිංහල අර්ථ ව්‍යාඛ්‍යානය කරණලද්දේය — ඒ පරාක්‍රමබාහු මහරජතෙමේ මීට හවුරුදු 586 කට පමණ පූර්වකාලයෙහි ශ්‍රී ලඞ්කාද්වීපයෙහි ශත්‍රුමර්දනය කිරීමෙන් රාජ්‍යයකල රජතුමෙකි — ඒ නරේන්ද්‍රොත්තමයාහට එකල සඞ්ඝයාගෙන් "කලිකාලසාහිත්‍යසර්වඥපණ්ඩිත" යන නාමය පණ්ඩිතත්වයනිසා ලැබුනේය.—

මහාවංශයෙහි—

අච්චයෙ පිතුනො රාජා, පරක්කමභුජව්හයො
තිසීහලගතං සබ්බං, එකීකත්වා මහාජනං
අලඞ්කත්වා පුරං රම්මං, සුරරාජසමොවිය
පඨමං අභිසෙකං සො, කාරාපෙසි මහුස්සවං,
කලිකාලාදිසාහිච්ච, සබ්බඤ්ඤුපණ්ඩිතොති සො
පතීතං නාමධෙය්‍යම්පි, පණ්ඩිතත්තා සයංලභි—

මෙම විශුද්ධිමාර්ගව්‍යාඛ්‍යානයෙහි එම රජතුමාගේ පූර්වාරම්භයෙහි යොදනලද ගාථාතුණ මෙසේයි.

පාමොජ්ජත්ථාය යොගීනං, බුද්ධඝොසෙන ධීමතා
විසුද්ධිමග්ගො යො වුත්තො, විසුද්ධනයමණ්ඩිතො.
පරක්කමනරින්දෙන, සබ්බභූපාලකෙතුනා
ලඞ්කාදීපාධිපතිනා, සාසනොදයකාමිනා.
තස්ස සංවණ්ණනා එසා, සීහලානං නිරුත්තියා
යොගීනං මන්දබුද්ධීනං, හිතත්ථාය කතාති—

මෙහි භාවය — ප්‍රාඥවූ බුද්ධඝොෂාචාර්‍ය්‍යයන්වහන්සේ විසින් සමථවිදර්ශනා දෙක්හි යෙදෙන යොගීවූ කුලපුත්‍රයන්ගේ ප්‍රමොදනාව පිණිස පරිශුද්ධවූ නයින් සරසනලද යම් විශුද්ධිමාර්ගයක් වදාරණලද්දේද, සියලුමහීපාලයන්ට කොඩියක් වැනිවූ ශ්‍රීලඞ්කාධිපතිවූ බුද්ධශාසනාභ්‍යුදයකාමීවූ පරාක්‍රමබාහු මහරජාණන්විසින් ඒ විශුද්ධිමාර්ගයාගේ මේ අර්ථ වර්ණනාව නොමෝ සිංහලභාෂාවෙන් මන්දබුද්ධිවූ යොගීකුලපුත්‍රයන්ගේ හිතපිණිස කථනය කරණලැබේ යනුයි — මේ නරේන්ද්‍රතෙම එකල ලෝකයෙහි ඒ ඒ රටවල අධිපතිව රජකළ සියලු රජදරුවන් අතරෙන් අතිශයින් ම ශ්‍රේෂ්ඨ පණ්ඩිතවූ උගතෙක්වූ බැවින් සියලු පෘථිවීශ්වරයන්ට කොඩියක් වැනිවූ බව ගුනාපීඩවශයෙන් ස්වගාථාව්‍යාඛ්‍යානයක් බව සැලකියයුතුයි - මේ රජතුමාගේ පණ්ඩිතත්වය හැඟීමට මේ විශුද්ධිමාර්ග ව්‍යාඛ්‍යානය ද විනයවිනිශ්චයට කරණලද "ත්‍රිසංදෙහ" නම්වූ සන්නය ද "කව් සිළුමිණිකුසද" නම් සිංහලකාව්‍යයද ප්‍රමාණවේ - මේ මහාපණ්ඩිත රජතුමාවිසින් මේ අර්ථ ව්‍යාඛ්‍යානය නානාවිධ තර්කන්‍යායශබ්ද ශාස්ත්‍රඥානයකට පරවාදමර්දනයෙන් යුක්තකොට කරණලද්දේය ටීකාවෙහි "තස්ස නිස්සාය පොරාණං, කථාමග්ගං අනාකුලං" යනාදීන් අනාකුලවූ පුරාණ කථාමාර්ගයනිසා විශුද්

මාර්ගයාගේ අර්ථවර්ණනාව කරන්නෙමියන ප්‍රතිඥාවෙන් ද රජතුමාගේ අර්ථව්‍යාඛ්‍යානාරම්භයෙහි "සන්න ටීකා තුබූසේ ප්‍රසන්නවචනයෙන් සාර්ථප්‍රාය පදාර්ථ කියනුලැබේ" යන ප්‍රතිඥාවෙන් ද එහිම උදාහරණවශයෙන් දක්වා තිබෙන ඇතැම් සිංහලපාඨයන්ගෙන් ද මේ විශුද්ධිමාර්ගයට එතිමානකාලයෙහි විද්‍යමානටීකා සන්න දෙකටම පුරාණවූද මහපත්වූද භාවසන්නයක් තිබී දැනට ඒ සන්නය අභාවයටගොස් තිබෙනබැව් පෙනේ. එසේහෙයින් විශුද්ධි මාර්ගපාලිය හා පැරකුම්බාරජතුමාගේ ප්‍රශස්තසන්නයද හැකිපමණින් ඌනාධිකලිපිදෝෂාදිය පහකොට යලිදු ඒ සන්නයෙහි වාක්‍යයෝජනාව අතිශයින් ගම්භීරබැවින් ඒ පදාර්ථ ස්වභාවයෙන් අවබොධ නොකටහැකි මන්දබුද්ධිකජනයන්ට සුඛාවබෝධයපිණිස මෙහි සඞ්ක්‍ෂෙපභාවාර්ථ ව්‍යාඛ්‍යාවක් ද යොදා මුද්‍රණය කරණුලැබේ-එසේහෙයින් ශීල සමාධි ප්‍රඥාමුඛයෙන් ත්‍රිවිධ ශාසනය විස්තරකිරීමෙන් තෙවිසි පරිච්ඡේදයකින් උපලක්‍ෂිතකොට බුද්ධාගම පැහැදිලිකොට ප්‍රකාශකරණලද විශුද්ධිමාර්ගයාගේ භාෂාර්ථාවබොධයෙහි තත්පරවූවන් විසින් මෙය ආදරයෙන් කියවා බලා අවබොධ කටයුතුයි. මෙම පොත ශුද්ධකිරීමපිණිස පෙළපොත් සන්නපොත් කීපයක් ඒ ඒ පලාත්වලින් ලැබුනු නුමුත් වස්කඩුවේ සුභූති ස්ථවිරස්වාමීන් වහන්සේගෙන් ලැබුනාවූ විශුද්ධිමාර්ග පෙළපොත හා සෙංකඩගල නුවර රාජකීය පුස්තකාලයාධ්‍යක්‍ෂ සූරියගොඩ ස්ථවිරස්වාමීන්වහන්සේගෙන් ලැබුනාවූ සන්නපොත ද ගාල්ලේ මිනුවන්ගොඩ පරමානන්දවිහාරාධිවාසි කොග්ගල ශ්‍රී සංඝතිස්සස්ථවිරස්වාමීන් වහන්සේගෙන් ලැබුනාවූ සන්නපොත ද මෙකලට සපයාගත නොහැකි තරම් මාහැඟි පොත් වෙති. එයින් විශුද්ධිමාර්ග පෙළපොත භුවනෙකබාහු රජතුමාහට විසිඅටවන්නෙහි සෙම්බගප්පෙරුමාල් යන නමින් ප්‍රකටවූ සපුමල්කුමාරයා විසින් ලියවනලදපොතක්බව එහි අග තිබෙන වාක්‍යයෙන් ද පොතේ පරණ ස්වභාවයෙන් ද නිවරදි කමින්ද මනාසේ ඔප්පුවේ-සෙංකඩගලනුවර සන්නපොත සිංහලරජ කාලේදී ඒ ආණ්ඩුවට අයිති පොත් ගබඩාවකින් ලබාගත් නිවරදි පොතක් බව එම පොතෙන් ඔප්පුවේ-ගාල්ලේ පොත සිංහල කවිවර සාලිඇලේ තෙරුන්නාන්සේවිසින් භාවිතා කලපුරුදු පොතක්බව ද දැනගනිමු එබැවින් අපේ මේ ශුද්ධියට පරමොපකාරීවූ මේ දුර්ලභපොත් සපයාදුන් ස්ථවිරයන්වහන්සේලාට ද පොත මුද්‍රණයකිරීමේදී සිඩිපත්‍ර බලාදීමාදියෙන් උපකාරකල විද්‍යෝදයපිරිවෙණේ උපාචාර්යධුරය දරණ උගත් හෙය්යන්තුඩුවේ දේවමිත්තස්ථවිර ස්වාමීන්වහන්සේට ද රත්මලානේ පරමධම්මචෛත්‍ය පිරිවෙණේ ආචාර්යධුරය දරණ උගත් වලානේ ධම්මානන්දස්ථවිරස්වාමීන්වහන්සේට ද උගත් මහගොඩ ඤාණිස්සරස්වාමීන්වහන්සේට ද අවසාන සිඩිපත්‍ර බැලීමෙන් හා සියළුආකාරයෙන්ම ලොකශාසනොපකාරයෙ කටයුත්තට පරමෝපකාරීවූ ලඞ්කාභූමණ්ඩලමණ්ඩනායමාන විචක්ෂණකුලතිලකවූ ශ්‍රීපාද ස්ථානයඇතුළුවූ ගාළුපලාතේ නායකපදප්‍රාප්ත විද්‍යොදයපරිවෙණාධිපති හික්කඩුවෙ ආචාර්ය ශ්‍රී සුමඞ්ගලාභිධාන නායකස්ථවිරස්වාමීපාදයන්වහන්සේට ද අවනතව ස්තුතිකරමු.

මෙහි ඒ ඒ වාක්‍යාරම්භයෙහි(පා)මෙ ලකුණෙන් පෙළද-(ස)මෙලකුණෙන් සන්නයද-(භා) මේ ලකුණෙන් භාවය ද සලකුණු කරණුලැබි-එසේම ඒ ඒ ලකුණුසමග යොදාලද (*)මෙආදී එක එකාවර්ගයේ ලකුණුවලින් ඒ ඒ පාලිප්‍රදෙශයන්ගේ සන්නය ද භාවය ද අනාකුලකොට සුවසේ අවබොධ කටයුත්තේයි

M. Dharmaratne-
Editor "Lakminipahana"

# විශුද්ධිමාර්ගය

මා.ධ. ල.ක.

**අර්ථකථාචාර්ය්‍ය බුද්ධඝොෂ මහාස්ථවිර ස්වාමිපාදයන් විසින් විරචිතයි.**

ශ්‍රීමත් කලිකාලසාහිත්‍ය සර්වඥ පණ්ඩිතපරාක්‍රමබාහු

මහරජතුමාණන් විසින් කරණලද

විස්තාරපදාර්ථව්‍යාඛ්‍යානයෙන් හා අභිනවසංක්‍ෂෙපභාෂාසන්නයෙන්ද යුක්තයි

———*———

( ෴ * )

**නමො තස්ස භගවතො අරහතො**
**සම්මාසම්බුද්ධස්ස.**

සීලෙ පතිට්ඨාය නරො සපඤ්ඤො
චිත්තං පඤ්ඤඤ්ච භාවයං
ආතාපී නිපකො භික්ඛු
සො ඉමං විජටයෙ ජටන්ති. —

ඉති හිදං වුත්තං කස්මා පනෙතං වුත්තන්ති —

( ෂ * )

**නමො තස්ස භගවතො අරහතො**
**සම්මාසම්බුද්ධස්ස.**

පාමොජ්ජබහුලෙ යොගීනං
බුද්ධසාසනධීමතා
විසුද්ධිමග්ගො යො වුත්තො
විසුද්ධනයමණ්ඩිතො —
පරක්කමනරින්දෙන
සබ්බභූපාලකෙතුනා
ලඞ්කාදීපාධිපතිනා
සාසනොදයකාමිනා —
තස්ස සංවණ්ණනා එසා
සීහලානං නිරුත්තියා
යොගීනං මන්දබුද්ධිනං
හිතත්ථාය කරීයති. —

"සංඥාංනිමිත්තං කර්තාරං
පරිමාණං ප්‍රයොජනං
ප්‍රාගුක්ත්වා ගජීනතන්ත්‍රාණා
මත්ථම්බ්‍රූයාද් විචක්‍ෂණඃ"

යනු බැවින් පළමුකොට සංඥද්‍යර්ථ පඤ්චකය දක්වනුලැබේ.

ඉති සංඥ නම් ප්‍රස්තුත ග්‍රන්ථයෙහි නම්, නිමිත්ත නම් ඒ ගත්කිරීමට හෙතුයි, කර්තෘ නම්, ඒ ගත්කළ ආචාර්ය්‍යයෝයි, පරිමාණ නම්, ඒ ගත්හි ග්‍රන්ථ ප්‍රමාණයි, ප්‍රයොජන නම්, ඒ ගතින් සාධ්‍යඵලයයි, මෙකී සංඥකථා ව කර්තෘශ්‍රොතෘ ලොකයාගේ ව්‍යව හාර සෞකර්‍ය්‍යයයි සඳහා කීහුවයි.

ප්‍රෙක්‍ෂා පූර්වකාරී විචක්‍ෂණ සමූහාව නාව ග්‍රන්ථොත්පත්ති නිමිත්තපරී ඥාන මූලක වන්නෙන් තදුත්පාදය

සඳහා නිමිත්තකථා කථිතව්‍යයි-පුද්ගලප්‍රමාණ ලොකයා හට ග්‍රන්ථවිෂය ගෞරවය පුද්ගලධාරක වන්නෙන් තදුත්පාද සඳහා ගුණාඛ්‍යානාභිරාම කොට කථිතකථා කථිතව්‍යයි-ප්‍රස්තුතග්‍රන්ථයෙහි අධ්‍යයනශ්‍රවණාදී වශයෙන් පවත්නා ශිෂ්‍යලොකයාහට ප්‍රොත්සාහොත්පාදන සඳහා පරිමාණකථා කථිතව්‍යයි.

"සර්වස්‍යෙව හි ශාස්ත්‍රස්‍ය
කර්ම්මණොවාපි කස්‍යචිත්
යාවත් ප්‍රයොජනං නොක්තං
තාවත්වක්ත්‍රෙණ ගෘහ්‍යතෙ"යි
කීබැවින්.

ප්‍රයොජනාපෙක්‍ෂව පවත්නා ජනයන් පවත්වනුසඳහා ප්‍රයොජනකථා කථිතව්‍යයි, මෙසේ සමාසවිසින් සංඥාතථා සම්බන්ධ ව්‍යවහාරාර්ථ වෙයි, නිමිත්තකථිතා කථාවය ග්‍රන්ථ ගෞරවොත්පාදනාර්ථ වෙයි.

පරිමාණ ප්‍රයොජනකථාවය ශිෂ්‍යලොකප්‍රවෘත්ත්‍යඞ්ග වෙති දැක්වියයි, මෙසේ යථොක්ත ප්‍රකාරයෙන් සප්‍රයොජනවූ මේ සංඥාද්‍යර්ථපවක යෙහි ව්‍යාඛ්‍යෙයස්වභාවයෙන් ප්‍රස්තුතවූ මේ ග්‍රන්ථප්‍රබන්ධයට "විශුද්ධිමාර්ග"ය යනු අවයවාර්ථාව්‍යූත ගුණනිමිත්තකව සිඬවන බැවින් මෙහි මිථ්‍යානනාම වෙයි, මේ විශුද්ධිමාර්ගකරණයට නිමිත්තද ද්විප්‍රකාර වෙති අභ්‍යන්තරබාහ්‍යභෙදයෙන් ඒ දෙක්හි ප්‍රතිපද්‍යොගී ජනයන් අඥානදුර්ඥානමූලක අප්‍රතිපත්ති දුෂ්ප්‍රතිපත්ති හෙතුක සංසාරදුඃඛයෙන් මුදනුසඳ හා මේ විශුද්ධිමාර්ගය කළබැවින් යථොක්තප්‍රතිපද් ජනයන් කෙරෙහි සමුත්පන්න අනුකම්පාව අභ්‍යන්තර් නිමිත්තය.

"විභජ්ජවාදිසෙට්ඨානං
ථෙරියානං යසස්සිනං
මහාවිහාරවාසීනං
වංසජස්ස විභාවිනො—
භදන්තසඞ්ඝපාලස්ස
සුචි සල්ලෙඛවුත්තිනො
විනයාචාරයුත්තස්ස
යුත්තස්ස පටිපත්තියං—
ඛන්තිසොරච්චමෙත්තාදි
ගුණභූසිතචෙතසො
අජ්ඣෙසනං ගහෙත්වාන
කරොන්තෙන එවං මයා"—යි.

ආචාර්ය්‍යපාදයන් තමන් විසින් ච පර්‍ය්‍යන්තයෙහි ව්‍යක්ත්‍යමාණ බැවින් මේ විශුද්ධිමාර්ගකරණයෙහි බාහ්‍යද ර පරමවිශුද්ධාධ්‍යාශය සඞ්ඝපාලස්ථවිරපාදයෝ බාහ්‍යනිමිත්ත වෙත්, බුද්ධඝොෂාචාර්ය්‍යපාදයෝ මේ විශුද්ධිමාර්ගයට කර්තෘත්වයෙන් වෙදිතව්‍යයෝයි, එහෙයින්ම කීහ—"විපුලවිසුද්ධබුද්ධිනා බුද්ධඝොසොති ගරූහි ගහිතනාමධෙය්‍යෙන ථෙරෙන කතො විසුද්ධිමග්ගො"යි—මේ ආචාර්ය්‍යයෝ ජම්බුද්වීපවාසීව මහාස්ථවිරවරයන් විසින් සමාරාධිතව හෙළඅටුවා පෙරළා ස ජිනමූලභාෂායෙන් නොවලාවට අටුවා ලියනුසඳහා මේ ලඞ්කාද්වීපයට වැඩ මහාවිහාරයෙහි සඞ්ඝපාල මහාස්ථවිරයන් කෙරෙහි හෙළඅටුවා අසා සියලු ස්ථවිරවාද ඉගෙණ මහාසඞ්ඝයා රැස්කොට අටුවාලියන්නට පොත්දෙන්නේයයි ඉල්වූහ. සඞ්ඝයාද අර්ථකථාකරණුවට ශක්ති පරීක්‍ෂා සඳහා තොපගේ සාමර්ථ්‍ය මිහිදක්වව ඒ දැක පොත්දෙම්හයි මේ ගාථාදෙක දුන්හ, එසඳ තදභිවර්ණිණොනාචාරයෙන් එහි අටුවාසහිත පිටකත්‍රය සඞ්ග්‍රහකොට මේ විශුද්ධිමාර්ගය කළහ යනු පරම්පරාගත වාර්තායි.

( ක * )

මෙහි ග්‍රන්ථ ප්‍රමාණ තුදුස් දහස් දෙ බණවරෙකි. මෙහෙයින්ම කීහ.

විසුද්ධිමග්ගො එසො ච
අනන්තරායං විනා ඉධ
නිට්ඨිතො අට්ඨපඤ්ඤාස
භාණවාරාය පාලියා"ති

ප්‍රයොජන විවිධ වේ මුඛ්‍යානුෂඞ්ගික වශයෙන් එහි ප්‍රියශීල ප්‍රතිපත්ති ව සකල සුශික්ෂිත මුමුක්ෂිත යොගීජනයා හට ප්‍රීත්‍යුත්පාදනය මුඛ්‍යප්‍රයොජනය චතුපාරිශුද්ධි ශීලයෙහි සුප්‍රතිෂ්ඨිතව අධිශීල ශික්ෂා සිද්ධකොට ස්වචරිතානුකූල කර්මස්ථාන පරිග්‍රහාදි ක්‍රමයෙන් පැවැති භාවනාප්‍රාප්ති උපදීනානුජන්ම ස ලොකොත්තර ලෞකික අධිප්‍රඥ ශික්ෂායෙන් ස්වසන්තානප්‍රාප්තව පරම දක්ෂිණීය දක්ෂිණාශ්‍රය භාවයට සම්ප්‍රාප්ත ව සමාපත්ති සුඛානුභවයෙන් දවස් යවා නිරුපධිශෙෂ නිර්වාණධාතුවෙහි ... පද ප්‍රාප්තවනු මෙහි ආනුෂඞ්ගික ප්‍රයොජනයයි දතයුතුයි. මෙතෙක් සංක්ෂේපයෙන් කියනලද සංක්ෂෙපයෙන් ව්‍යාඛ්‍යානය විස්තරාර්ථින් විසින් වින නිස්සයෙව ලි "නිස්සන්දෙහ" නම් සන්නය බලා දතයුතු.

මේ විශුද්ධිමාර්ගය තෙමේ යම් සූත්‍ර පදයක් නිසා පවත්නේ නම් ලැබේද ඒ සූත්‍රපදය පළමුකොට නික්ෂේපකොට එයට නිදානාදි නිර්ධාරණ මුඛයෙන් නානා ප්‍රකාරයෙන් අර්ථ සංවර්ණන කරණු පිණිස "සීලෙපතිට්ඨාය" යනාදී ආරම්භකරණලදී.

ධර්ම සංවර්ණනා කරණ්නවුන් විසින් ආදිකොට වර්ණනීය ධර්මයට නිදාන කියයුතුය ප්‍රයොජනය පිණ්ඩාර්ථය පදාර්ථය සම්බන්ධය අභිප්‍රාය චොදනාය සොධනාය යනාමේ කියයුතුයි ආචාර්යයන් විසින් එසේහෙයින්ම කියනලදී—පෙර "භගවනතං ස්ථවිර" යනාදි දෙසනාවට නිදාන ප්‍රයොජන නිර්ධාරණය "විසුද්ධිමග්ගං භාසිස්සං" යනාදී පිණ්ඩාර්ථ නිර්ධාරණය "සීලෙපතිට්ඨාය" යනාදී පදාර්ථ සම්බන්ධාභිප්‍රාය විභාවනය "කිං සීලං" යනාදි චොදනාය එහින් මතු සොධනාති යනාදි ප්‍රභෙදකථාවෙහිද මෙම නයයි. විසර්ජනය පෘච්ඡාපූර්වඞ්ගමනුයි. පෘච්ඡාගාථාව පළමුකොට කියයුත්තෙන් පළමුකොට විසර්ජනගාථාව කුමක් හෙයින් කියනලදයත්? කදත් ය මඞ්ගල බැවිනි—ශාසනයාගේ ආදි කල්‍යාණාදි භාවය විභාවනය කරණ හෙයිනි. භයාදුපද්‍රව නිවාරණයෙන් අනන්තරාය සිද්ධිනය කරණ හෙයිනි. මතුයෙහි සංවර්ණනීය ධර්ම සංග්‍රහ බැව්නැයි දතයුතුයි ශාස්තෘ සතුනි ප්‍රශ්නපූර්වඞ්ගමකොට ආරම්භ නොකොට ව සතු නිර්දේශ පූර්වඞ්ගමකොට කුමක් හෙයින් කියනලද යත්? දීඝ නිකායාදීන්ට ප්‍රමඞ්ගල විලාසිනීයාදීන් මෙන් මෙනාම සංවර්ණනාවක් නොවන බැවිනුදු අභිධර්මාවතාර සූත්‍රනාවතාරාදීන් මෙන් ප්‍රකරණාන්තරයක් නොව හ බැවිනුදු සතුන් පූර්වඞ්ගමකොට නොදක්වනලදී. මේ වනාහි සුමඞ්ගල විලාසිනීයාදීන් මෙන්ම ශෙෂයයි දතයුතුයි. එසේ හෙයින්ම කීහ. "මජ්ඣෙ විසුද්ධිමග්ගො" යනාදී මෙහෙයින් මේ සතුන් පූර්වඞ්ගමය වනු පූර්වඞ්ගම නොවෙයි දතයුතුයි—කුමක් හෙයින් ද යත්? ශාස්තෲයෙහි වනු කීර්තන ය ලෝකයෙහි පෙනේ කෙවල නොව ශාස්තෘගුණ සම්පත්ති විභාවන වශයෙන් පවත්නා හෙයිනි—එහෙයින් ම වක්ෂ්‍යමාණය "තිස්සො සික්ඛා" ය නාදී—"සොතාපත්තාදි භාවස්ස කාරණං" යනුයෙහි ආදී ශබ්දයෙන් සකෘදාගාමී අනාගාමී භාවයන් අර්හත්‍යයෙන් ගැනීම් රහතුන්ම ගැනෙනෙ

බැවින් ත්‍රිවිධ බෝධිසත්වයන්ගේ නිෂේද භාගශීලාදීහු "සීලෙපතිට්ඨාය" යනාදීන් සංග්‍රහ වෙති. පශ්චිම භවයෙහි විශේෂයෙන් සංසාරභයේක්ෂණයද යථා ස්වකීය ශීලයෙහි පිහිටා සමථ විදර්ශනාබලයෙන් තෘෂ්ණා ජටා විජටන ප්‍රතිපත්තියද සමාන වෙති. එහෙයින් ශාසනයෙහි වස්තු කීර්තනය ශාස්තෘහුගේ අවිපරීත ධර්මදේශනා භාවප්‍රභාවනයෙන් ගුණ සම්පත්තිය හඟවමින්ම පවතිනුයි ස්තුති පූර්වාංගවයයි දතයුතුයි. නොහොත් "සො ඉමං විජටයෙජටං" යන සාධාරණ වචනයෙන් සාතිශය නිරතිශය තෘෂ්ණාජටා විජටනය ගෘහිත බැවින් සවාසන ප්‍රහාණබද්ධ සාතිශය තෘෂ්ණාජටා විජටනයෙන් ශාස්තෘහුගේ ප්‍රහාණ සම්පත්තියද තදවිනාභාව ඥානසම්පත්තියද තද්භවයෙන් නාන්තරීයක බැවින් ආනුභාව සම්පදද්දීහුද දක්වනලද්දහුයි මෙසේද ස්තුති පූර්වාංගවයයි දතයුතුයි. නොහොත් ප්‍රශ්නකල දිව්‍යපුත්‍රයාගේ අධ්‍යාශයානු රූපකොට ව්‍යාකරණ සමර්ථනා විභාවන වශයෙනුදු සංවර්ණිතාර්ථ ධර්මානු ගුණකොට සංවර්ණනා රම්භයෙහි ස්තුතිය ආචරිත බැවිනුදු ස්තුති පූර්වාංගවකොටම දක්වනුයේ කියනු ලබන ස්තුත්‍යාකාරයට කාරණ ධාරණය කරණු පිණිස පළමුකොට විසර්ජන ගාථාව නිඃශේෂකොට ඒ ගාථාවට නිදාන වෙදනා මුඛයෙන් පෘච්ඡා ගාථාව ස්වරූපයෙන් අඞ්ග මෙහෙසින් දක්වා ඒ පෘච්ඡාවට අවිපරීතව ව්‍යාකරණ සමර්ථනාව එළවනාවූ "සබ්බ ධම්මෙසු අප්පටිහතඤ්ඤාණචාරො" යනාදී ස්තුතිය පූර්වාංගවකොට ගාථාභිප්‍රාය වර්ණනාව කරණු පිණිස —

"සීලෙ පතිට්ඨාය නරො සපඤ්ඤො
චිත්තං පඤ්ඤඤ්ච භාවයං
ආතාපී නිපකො භික්ඛු
සො ඉමං විජටයෙ ජටං"යි කීහු.

මෙහින් මතු සත්‍ය ටීකා තුම්ලේ ප්‍රසන්න වචනයෙන් සාභිප්‍රාය පදයෝ වර්ණනා කරණු ලැබේ.

සපඤ්ඤො, පිළිසඳ නුවණින් නුවණ ඇතිවූ; ආතාපී, වීර්‍යය ඇතිවූ; නිපකො, පාරිහාරික නුවණින් නුවණ ඇතිවූ; භික්ඛු, සංසාර භය දක්නාවූ; නරො, යම් සත්ව කෙණෙක් ඇද්ද; සො, හෙතෙම; සීලෙ පතිට්ඨාය, ශීලයෙහි පිහිටා; චිත්තං, සමාධියද; පඤ්ඤඤ්ච, විදර්ශනාවද; භාවයං, වඩමින්; ඉමං ජටං, මේ තෘෂ්ණා නැමති අවුල; විජටයෙ, හපන්නේයි (හපන්නට පොහොසත් වන්නේයි යන අර්ථයි)

"ඉතිහිදං වුත්තං,, මිති ඉති ශබ්දය නිදර්ශනයෙහි වැටේ-එහෙයින්—ඉතිහි, මෙසේම; ඉදං, මේ සූත්‍රය; වුත්තං, දෙසනලද්දයි අර්ථ ගතයුතු. කස්මා, කුමක්හෙයින්; එතං, මේ සූත්‍රය; වුත්තං, දෙසනලදද (පන) යනු වචනාලඞ්කාරයි-ඉට "ඉදං"යි දක්වා මෙතන "එතං"යි කුමක් පිණිස දක්වූදයත්? බුදුන්විසින් දෙසිත ගාථාපදය අනන්තරාගත බැවින් අත්‍යන්ත සමීපවිසින් "ඉදං"යි දක්වූහු මෙතන සමීප විසින් "එතං"යි දක්වූහු. නොහොත් තමන්ගේ බුද්ධියෙහි වැටෙන බව ගෙණ "ඉදං"යි දක්වා නැවත භගවත්හු විසින් දෙසිතාකාර සඳහා "එතං"යි දක්වූහු.

( භා * )

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.**

විශුද්ධ බුද්ධීන් ප්‍රසිද්ධ බුද්ධඝොෂාචාර්‍ය මහා ස්වාමිපාදයෝ ජම්බුද්වීප

(භා *)

වාසී මහා ස්ථවිරයන් විසින් සම්රාධිතව මහා අටුවා සහ පෙරලා සිංහල මූල භාෂාවෙන් පොවලාවට අටුවා ලියනු සඳහා මේ ලංකාද්වීපයට වැඩ අනුරාධපුර මහා විහාරයෙහි සංඝපාල මහා ස්ථවිරයන් කෙරෙන් මෙහි අටුවා අසා සියළු ස්ථවිර වාද ගුණගණ මහාසංඝයා රැස්කොට අටුවා ලියන්නට පොත් දෙන්නේයයි ඉල්වූ සඞ්ඝයාද අර්ථනිශ්චාරණයට ශක්ති පරීක්ෂා සඳහා තොපගේ සාමර්ථ්‍ය බැලී මෙහි දක්වමු ඒ දැක පොත් දෙමුයයි මදවනුත සංයුක්තනිකායෙහි ආ මේ ගාථා දෙනා දුන්හ එසඳ තදර්ථ වර්ණනා වාරයෙන් එහි අටුවා සහිත පිටකත්‍රය සඞ්ග්‍රහකොට මේ විශුද්ධිමාර්ගය කළහ යනු පුරාණ ගාථා ප්‍රකාශිතයි —

මෙහි සංක්ෂෙපවූ පඤ්චකාදිය පරාක්‍රමබාහු විශුද්ධිමාර්ග සන්නයෙන් සංක්ෂෙප වශයෙන්ද එහා විනිශ්චය ලී "නිස්සන්දෙහ" නම් සන්නයෙන් විස්තර වශයෙන්ද දතයුතු. මේ විශුද්ධිමාර්ගය මෙමේ යම් සූත්‍රපදයක් නිසා පටන්ගත්තා ලැබේද ඒ සූත්‍ර පදය පළමුකොට නික්ෂෙපකොට එයට නිදානාදි නිර්ධාරණ මුඛයෙන් නානා ප්‍රකාරයෙන් අර්ථ සංවර්ණනා කරණු පිණිස "සීලෙ පතිට්ඨාය" යනාදී ගාථාව ආරම්භ කරණලදී

(ආලොභ අදොෂ අමොහය යන ත්‍රිහෙතු සම්ප්‍රයුක්ත සිතින් ගත්තාලද පිළිසඳ ඇති හෙයින් පිළිසඳ නුවණින් නුවණ ඇතිවූ කෙලෙස් තවන වීර්‍ය්‍යඇතිවූ පාරිහාරික නුවණින් නුවණැතිවූ සංසාර භය දක්නාවූ යම් සත්ව කෙනෙක් ඇත්තාහුවෙද්ද ඒ සත්වයෝතුමූ ශීලයෙහි පිහිටා සමාධියද විදර්ශනාවද වඩමින් මේ තෘෂ්ණා නැමැති අවුල කපන්නට පොහොසත් වන්නාහුය.) යනමේ සූත්‍ර ගාථාව දෙසනලද්දේය කුමක්හෙයින් දෙසනලද්දේදයත්?

(භා †)

භගවන්තං කිර සාවත්ථියං විහරන්තං රත්තිභාගෙ අඤ්ඤතරො දෙවපුත්තො උපසඞ්කමිත්වා අත්තනො සංසය සමුග්ඝාතත්ථං —

අන්තොජටා බහිජටා
ජටාය ජටිතා පජා
තං තං ගොතම පුච්ඡාමි
කො ඉමං විජටයෙ ජටන්ති
ඉමං පඤ්හං පුච්ඡි —

(ස †)

("භගවන්තංකිර" යන්නෙහි (කිර) ශබ්දය අනුශ්‍රවණයෙහි නිපාතය එහින් තමන් විසින් වක්ෂ්‍යමාණ අර්ථයාගේ පරම්පරායෙන් ශ්‍රූයමානතාව දක්වූහු) භගවන්තං කිර, භගවත්හු; සාවත්ථියං විහරන්තං, සැවැත්නුවර වසන්නහු කරා; රත්තිභාගෙ, මධ්‍යමරාත්‍රියෙහි; අඤ්ඤතරො දෙවපුත්තො, වෛශ්‍රවණාදීන්සේ ප්‍රකටවූ නාම නැති එක්තරා දිව්‍යපුත්‍රයෙක් ("දෙවො එව දෙවපුත්තො" යනුයෙ) උපසඞ්කමිත්වා, එළඹ; අත්තනො සංසයසමුග්ඝාතත්ථං, තමාගේ සංශය නැමැති ශල්‍යයාගේ සමුද්ධරණය පිණිස ("ඉමං පඤ්හං පුච්ඡි" යොදනු) අන්තොජටා, ඇතුළත්හිඳුඅවුල්වූය; බහිජටා, පිටත්හිඳු අවුල්වූය; පජා, සත්වසමූහ තොමෝ; ජටාය, ඇතුළත්හිඳු පිටත්හිඳු උපන්අවුලෙන්; ජටිතා, වෙළෙඳනාලද; තං, (තස්මා) එහෙයින්; ගොතම, ගෞතමය; තං, තා; පුච්ඡාමි, විචාරමි; ඉමංජටං, මේ තෘෂ්ණා අවුල; කො විජටයෙ? කවරෙක්කපන්නේදැයි; ඉමං පඤ්හං, මේ ප්‍රශ්නය; පුච්ඡි, විචාළේය;

( ගා † )

සැවැත්නුවර වසන්නාවූ භාග්‍යවතුන්වහන්සේ කරා මධ්‍යම රාත්‍රියෙහි වෛශ්‍රවණාදීන්ගේ ප්‍රකටවූ නාම නැති එක්තරා දිව්‍යපුත්‍රයෙක් එළඹ තමාගේ සැක නැමති හුල උදුරණු පිණිස මේ ප්‍රශ්නය විචාළසේක (ඇතුළත්හිදු අවුල්වය පිටත්හිදු අවුල්වය සත්ව සංඛ්‍යාත ප්‍රජාතොමෝ ඇතුළත්හිදු පිටත්හිදු උපන් මේ අවුලෙන් වෙළද නා ලද්දීය එහෙයින්ම ගෞතම ගෝත්‍රොද්භූත සර්වඥයන් වහන්ස ඔබ විචාරමි. මේ තෘෂ්ණා අවුල කවරෙක් කපන්නේද? යන මේ ප්‍රශ්නය විචාළේය.

( භා ‡ )

තස්සායං සඞ්ඛෙපත්ථො–"ජටා" ති තණ්හාය ජාලිනියා එතං අධිවචනං සා හි රූපාදිසු ආරම්මණෙසු හෙට්ඨුපරියවසෙන පුනප්පුන උප්පජ්ජනතො සංසිබ්බනට්ඨෙන වෙළුගුම්බාදීනං සාඛාජාලසංඛාතා ජටාවියාති ජටා-සාපනෙසා සකපරික්ඛාර පරපරික්ඛාරෙසු සකත්තභාව පරඅත්තභාවෙසු අජ්ඣත්තිකායතන බාහිරායතනෙසු ච උප්පජ්ජනතො අන්තොජටා බහිජටාති වුච්චති-තාය එවං උප්පජ්ජමානාය ජටාය ජටිතා පජා යථානාම වෙළුජටාදීහි වෙළුආදයො එවං තාය තණ්හාජටාය සබ්බාපි අයං සත්තසඞ්ඛාතා පජා ජටිතා විනද්ධා සංසිබ්බිතාති අත්ථො.

( ස ‡ )

තස්ස, ඒ ප්‍රශ්නයාගේ; අයං, මේ; සඞ්ඛෙපත්ථො, සංක්ෂෙපාර්ථයි; ජටාති, ජටායයි; ජාලිනියා තණ්හාය (අෂ්ටශත තෘෂ්ණා විචරිත ප්‍රභේද නැමැති ජාලා ඇති බැවින්) ජාලිනී නම්වූ තෘෂ්ණාවට; එතං අධිවචනං, මේ නාමෙකි ("අට්ඨසත තණ්හා විචරිතප්පභෙද අනන්තතො අවයව ගුණතො එව ජාලා එතිස්සා අත්ථීති ජාලිනී" යි හන්නේයි) සා හි, ඒ තෘෂ්ණා තොමෝ; රූපාදිසු ආරම්මණෙසු, රූපාදි ආරම්මණයන්හි; හෙට්ඨුපරියවසෙන, (කිසි කලෙක රූපාලම්බනයෙහි පවත් ධර්මාලම්බනය දක්වාද කිසිකලෙක්හි ධර්මාලම්බනයෙහි පවත් රූපාලම්බනය දක්වාද) උඩු යටිව; පුනප්පුන උප්පජ්ජනතො, නැවත නැවත උපදනා හෙයින්; සංසිබ්බනට්ඨෙන, සිවන අර්ථයෙන්; වෙළුගුම්බාදීනං, හුණ ලැහැප් ආදීන්ගේ; සාඛාජාල සඞ්ඛාතා, ශාඛාජාලයයි කියනලද; ජටාවියාති, අවුල වැනිහුයි; ජටා, අවුල් නම්වේ (යම්සේ වෙණුගුල්මාදියෙහි වෙණුශාඛා තොමෝ තමාගේ අවයවයෙන්ම වෙළදනාලද්දී ජටා නම් වේද යම්සේ කොශාදීහු තමන්ගේ අවයවයෙන්ම වෙළදනාලද්දාහු ජටා නම් වෙද්ද එසේම තෘෂ්ණාද ඒ ඒ ආරම්මණයෙහි උඩු යටිව උපන් විසින් තමාම තමාගිවනා බැවින් ජටා නම්වේයි දතයුතුයි–"සංසිබ්බනට්ඨෙන" යන පාඨය මුවහොත් කොෂකාර කාමියක්හු මෙන් තමා විසින්ම තමාගි වනලද බැවින යන අර්ථයි) සා පනෙසා තණ්හා, ඒ මේ තෘෂ්ණා තොමෝ; සකපරික්ඛාර පර පරික්ඛාරෙසු, තමාගේ පිරිකරය අනුන්ගේ පිරිකරය යන මොවුන් කෙරෙහිද; සකඅත්තභාව පරඅත්තභාවෙසු, තමාගේ ආත්ම භාවය අනුන්ගේ ආත්ම භාවය යන මොවුන් කෙරෙහිද; අජ්ඣත්තිකායතන බාහිරායතනෙසුච, අධ්‍යාත්මිකායතනය බාහ්‍යායතනය යන මොවුන් කෙරෙහිද; උප්පජ්ජනතො, උපදනා හෙයින්; අන්තොජටා බහිජටාති වුච්චති, අන්තොජටාය බහිජටායයි කි

යනුලැබේ ("සකපරික්ඛාර සකඅත්ත
භාව අජ්ඣත්තිකායතනෙසු උප්ප
ජ්ජනතො අනෙකාජටා පරපරික්ඛා
රපරඅත්තභාව බාහිරායතනෙසු උ
ප්පජ්ජනතො බහිජටා" යි යො
දනු—මෙහි සකපරික්ඛාර නම් ප්‍රව්‍රජි
තයන්ට පාත්‍රචීවරාදීහුය ගෘහස්ථය
න්ට හස්ත්‍යශ්වාදිහුයි, මෙහි තෘෂ්ණා
තොමෝ ස්වකීය පරිෂ්කාර යෙහිදු
ලොභවශයෙන් උපදීමය පරපරි
ෂ්කාරයෙහි එනාඞ තමහට වුවමැ
නවැයි අභිධ්‍යාවශයෙනුදු උපදීමැයි.
සකඅත්තභාව නම් තමාපස්කන්ධය ප
රඅත්තභාව නම්, අනුන් පස්කඳයි
මිහිදු තෘෂ්ණාතොමෝ මාගේ ආත්ම
භාවය සුන්දරයයි ලොභවශයෙන්
උපදීමය මාගේ ආත්මභාවය අසවල්
හුගේ ආත්මභාවයමෙන් වේවයි ලො
භවශයෙන් උපදීමැයි සකසන්තානි
පතිතපතිත චක්ඛුරාදීහු අජ්ඣත්තිකා
යතන නම් වෙති පරසන්තානපතිත
පතිත සියලු ආයතනයෝ බාහිරාය
තන නම්වෙත්—නොහොත් සකපරස
න්තානපතිතපතිත චක්ඛුරාදිහු අජ්ඣ
ත්තිකායතන නම්වෙති එසේම රූපා
දීහු බාහිරායතන නම්වෙත්-එහිදු තෘ
ෂ්ණාතොමෝ මාගේ චක්ඛුරාදීහු ම
නාපයි ලොභවශයෙන් උපදීමය
අනුන්ගේ චක්ඛුරාදීහු මනාපයි ලො
භවශයෙන් උපදීමැයි) නාය, ඒ; එවං
උප්පජ්ජමානාය, මෙසේ උපදනාවූ;
ජටාය, ජටාවෙන්; ජටිතා පජා, සත්ව
සංඛ්‍යාත ප්‍රජාතොමෝ වෙළඳනාලද;
යථානාම, යම්සේ; වෙළුජටාදීහි, ඒ
ශාඛාජාලාදි සංඛ්‍යාත වෙණුජටාදීන්;
වෙළුආදයො, හුණආදිහු වෙළඳනාලෑ
බේද්ද; එවං, එපරිද්දෙන්; තායත
ණ්හාජටාය, ඒ තෘෂ්ණා ජටාවෙන්; ස
බ්බාපි අයං සත්තසංඛාතාපජා, මේ සි
යලු සත්වසංඛ්‍යාත ප්‍රජාතොමෝ (ජටී
තායිසේයි) විනද්ධා, වෙළඳනාලද්දී;
සංසිබ්බිතාති අත්ථො, හිවනලදයත
අර්ථයි—

(භා ‡)

**ඒ ප්‍රශ්නයෙහි සඞ්ක්ෂෙපාර්ථ
මෙසේයි.**

"ජටා" යනු එක්සියඅටක්තෘෂ්ණා
ප්‍රභෙදනැමති ජාලඇති බැවින් ජා
ලිනී නම් වූ තෘෂ්ණාවට මේ නාමෙ
කි ඒ තෘෂ්ණාතොමෝ රූපාදි සාර
මුණෙහි කිසිකලෙක රූපාලම්බණ
යෙහි පටන් ධර්මාලම්බණය දක්වාද
කිසිකලෙක ධර්මාලම්බණයෙහි පට
න් රූපාලම්බනය දක්වාද උඩුයටිව
නැවත නැවත උපදනාහෙයින් හි
වන (මසන) අර්ථයෙන් හුණලෑහැ
ප් ආදීන්ගේ ශාඛාජාලයයි කියනලද
අවුල වැනිනුයි අවුල්නම් වේ—යම්
සේ හුණපඳුරු ආදියෙහි වෙණු ශා
ඛාතොමෝ තමාගේ අවයවයෙන්
ම වෙළඳනාලද්දී ජටානම් වේද—යම්
සේ කොසාදීහු තමන්ගේ අවයවයෙ
න්ම වෙළනලද්දාහු ජටානම් වෙද්ද
එසේම මේ තෘෂ්ණාද ඒ ඒ අරමුණෙ
හි උඩුයටිව උපන්හෙයින් තමාව ත
මාහිවනබැවින් ජටානම්වෙයි දතයු
තු—ඒ මේ තණ්හාතොමෝ තමාගේ
පිරිකරය අනුන්ගේ පිරිකරය යන
මොවුන් කෙරෙහිද තමාගේ ආත්ම
භාවය අනුන්ගේ ආත්මභාවය යන
මොවුන් කෙරෙහිද අධ්‍යාත්මිකාය
තනය බාහ්‍යායතනය යන මොවුන්
කෙරෙහිද උපදනාහෙයින් "අන්
තොජටා බහිජටා"යි කියනලැ
බේ—මෙහි සකපරික්ඛාර නම් ප්‍රව්‍රජි
තයන්ට පාත්‍රචීවරාදීහුය ගෘහස්ථ
යන්ට ඇත් අශ්ව ආදීහුයයි දතයුතු

මෙහි තෘෂ්ණාතොමෝ ස්වකීය පරිස්කාරයෙහිදු ලෝභවශයෙන් උපදීමය පරපරිස්කාරයෙහි එනාහි තව හට වූවමැණවයි අභිධ්‍යාවශයෙනුදු උපදීමැයි. "සකඅත්තභාව" නම් තමාපස්කන්දය " පරඅත්තභාව ,, නම් අනුන් පස්කන්දයි, මෙහිදු තෘෂ්ණාතොමෝ මාගේ ශරීරය යහපතැයි ලෝභවශයෙන් උපදීමය මාගේ ශරීරය අසවල්හුගේ ශරීරය මෙන් වේවයි ලෝභවශයෙන් උපදීමැයි- තමාසතන්හි චක්‍ෂුරාදීහු "අජ්ඣත්තිකායතන,, නම් වෙති අනුන්සතන්හි සියලු ආයතනයෝ බාහිරායතන නම් වෙති. නොහොත් ස්වපරසන්තානපර්‍යාපන්න චක්‍ෂුරාදීහු අජ්ඣත්තිකායතනනම් වෙති එසේම රූපාදීහු බාහිරායතන නම් වෙති- එහිද තෘෂ්ණාතොමෝ මාගේ චක්‍ෂුරාදිහු මනාහයි ලෝභවශයෙන් උපදීමය අනුන්ගේ චක්‍ෂුරාදිහු මනාහයි ලෝභවශයෙන් උපදීමැයි—මෙසේ උපදනාවූ ඒ ජටාවෙන් සත්වසංඛ්‍යාත ප්‍රජාතොමෝ වෙලදනා ලද්දීය -(කෙසේ වෙළදනා ලද්දීදයත්?) යම්සේ ඒ ශාඛාජාලාදි සංඛ්‍යාතවේණු ජටා ආදීන් හුණ ආදිහු වෙළදනා ලැබේද්ද එපරිද්දෙන්ම ඒ තෘෂ්ණා ජටාවෙන් මේ සියළු සත්වසංඛ්‍යාත ප්‍රජාතොමෝ අවුල්වන ලද්දීය. වෙළදනාලද්දීය. මැසෙනලද්දීය ~

( පා ¶ )

යස්මා ච එවං ජටිතා—තං තං ගොතම පුච්ඡාමි තස්මා තං පුච්ඡාමි ගොතමාති භගවන්තං ගොත්තෙන ආලපති "කො ඉමං විජටයෙ ජටන්ති?,, ඉමං එවං තෙධාතුකං ජටෙත්වාඨිතං ජටං කො විජටෙය්‍ය විජටෙතුං කො සමත්ථොති පුච්ඡි. ~

එවම්පුට්ඨො පනස්ස සබ්බධම්මෙසු අප්පටිහත ඤාණාචාරො දෙවදෙවො සක්කානං අතිසක්කො බ්‍රහ්මානං අතිබ්‍රහ්මා චතුවෙසාරජ්ජවිසාරදො දසබලධරො අනාවරණඤාණො සමන්තචක්ඛු භගවා තමත්ථං විස්සජ්ජෙන්තො "සීලෙපතිට්ඨාය නරො සපඤ්ඤො චිත්තංපඤ්ඤඤ්ච භාවයං—ආතාපීනිපකොභික්ඛු සො ඉමං විජටයෙ ජටං" ති ඉමං ගාථමාහ ~

( ශ ¶ )

යස්මා ච එවං ජටිතා, යම්හෙයකින් මෙසේ වෙලදනාලද ද; "තං තං ගොතම පුච්ඡාමි" යි, සේයි; තස්මා, ඒ හෙයින්; තං පුච්ඡාමි, තොපවිචාරමි; ගොතමා ති, ගෞතමයයි; භගවන්තං, භගවත්හට; ගොත්තෙන, ගොත්‍රයෙන්; ආලපති, ආමන්ත්‍රණය කෙරේ; කො ඉමං විජටයෙ ජටන්ති, කො ඉමං විජටයෙ ජටං යන් තෙහි; එවං, මෙසේ; තෙධාතුකං ජටෙත්වා ඨිතං, තුන්ලොව වෙලදගෙණ සිටියාවූ; ඉමං ජටං, මේ ජටාව; කො විජටෙය්‍ය, කවරෙක් කපන්නේද; විජටෙතුං කො සමත්ථොති, කපන්නට කවරෙක් සමර්ථ වේද්දයි; පුච්ඡි, විචාළේය,- ("එවංපුට්ඨොපනඅස්ස දෙවපුත්තස්ස ගාථමාහ" සම්බන්ධ කරණු) එවං, මෙසේ; අනෙනාජටා යනාදි ගයින්; පුට්ඨො, විචාරණලද; සබ්බධම්මෙසු, අතීතාදිභෙදභින්න සියලු ඥෙයධර්මයන්කෙරෙහි; අප්පටිහත ඤාණචාරෝ, නිරවශෙෂ ඥෙයාවරණ ප්‍රහාණයෙන් නිස්සඞ්ගචාර ඇතිබැවින් අපිහිත වූ ඥානවෘත්ති ඇතිවූ) නොපැකිළ පවත්නා නුවණඇතිවූය යන අර්ථයී- මෙසේ කාලත්‍රයෙහි අප්‍රතිහත ඥාන

( ස ¶ )

විභාවනයෙන්ම ආදියෙහි ආවෙණික ධර්මයන් තුන්දෙනාගේ ග්‍රහණයද, උන්ගේ ග්‍රහණයෙන්ම තදෙකලක්‍ෂණබැවිනුදු තදවිනාභාවී බැවිනුදු භගවත්හුගේසෙසු ආවෙණිකධර්මයන්ගේ ග්‍රහණය ද වෙදිතව්‍යයි) දෙවදෙවො, සම්මත්‍යුත්පත්තිවිශුද්ධි සඞ්ඛ්‍යාත සර්‍ව දෙවයන් විසින් පූජ්‍යතර දෙව බැවිනු දු සර්‍වඥගුණගණාභරණයෙන් විභූෂිතවූ විශුද්ධිදෙවභාවයට පැමිණි බැවිනු දු සෙසු දෙවියන්ට අතිශයදෙවවූ; සක්කානං අතිසක්කො, අපරිමාණ ලොකධාතුයෙහි අපරිමාණ ශක්‍රයන්ගේ ගුණාභිභවනය කොට සිටි හෙයින් අධිකවූ ශක්‍රනුයි අතිශක්‍රවූ; බ්‍රහ්මානං අතිබ්‍රහ්මා, කීනසින්ම බ්‍රහ්මයන්ට අතිබ්‍රහ්මවූ; චතුවෙසාරජ්ජවිසාරදො, (බුද්ධත්වාදී සතරතන්හි සදෙවකලොකයෙහි කිසිවක්හු විසින් නොසෙල්විය හැකි බැවිනුදු කිසිවෙකිනුදු උත්‍රාශයක් නැති බැවිනුදු) චතුර්විධ වෛශාරද්‍යයෙන් විශාරදවූ; දසබලධරො, ( ස්ථානාස්ථාන ඥානාදී දශවිධ ඥානබලයෙන් සමන්විත බැවින් දශබලධරවූ; අනාවරණඤාණො, ( සියලු ඥෙයධර්මයෙහි නොපැකිළ පවත්නා ඥානඇතිබැවින්ම ) අනාවරණඥාන ඇතිවූ; සමන්තචක්ඛු, (සියලු ඥෙය මණ්ඩලය හාත්පසින් සර්‍වාකාරයෙන් හස්තතලාමලකන්‍යායෙන් ප්‍රත්‍යක්‍ෂයෙන් දක්නට සමර්ථවූ ඤාණාලොචනයෙන් සමන්විතබැවින් ) සමන්තචක්ඛුනම්වූ; ( සර්‍වඥවූ යන අර්ථයි ) භගවා, භාග්‍යවත්ත්වාදී කාරණයෙන් භගවත්නමේ; අස්ස, මේ දිව්‍යපුත්‍රයාහට; තම්පඤ්හං විස්සජ්ජෙන්තො, ඒ අර්ථය විසඳන්නේ; සිලෙපතිට්ඨාය ... ඉමං ගාථමාහ, මේ ගාථාව කීහ( "සබ්බධම්මෙසු අප්පටිහතඤ

( ස ¶ )

ණාචාරො" යනුවෙන් භගවත්හුගේ අධිචිත්‍රයාරූඪප්‍රාවචනවත්ගේ ව්‍යාකරණයෙහි සමර්ථ බව දක්වූ කල්හි සිව දෙවියන්ගේ ප්‍රශ්න ව්‍යාකරණයෙහි දු සමර්ථවේද්ධහෝ යන ආශංකා නිවෘත්තියපිණිස "දෙවදෙවො"-යි දෙවාති දෙවවූ ශක්‍රදෙවෙන්ද්‍රතෙම දෙවියන්ගේ ප්‍රශ්න විසඳයි උහුගෙරත් මොවුන්ගේ වෙසෙස් කිම යන චින්තානිවෘත්තිය පිණිස "සක්කානං අතිසක්කො"යි කී—ශක්‍රයාවිසින් විචාළ ප්‍රශ්නද, සනත්කුමාරාදී බ්‍රහ්මයෝ විසඳති ඒ බ්‍රහ්මයන් කෙරෙන් මොවුන්ගේ වෙසෙස් කිම යන චින්තානිවෘත්තිය පිණිස "බ්‍රහ්මානං අතිබ්‍රහ්මා"යි කීහු. මේ විශෙෂය ද චතුර්වෛශාරද්‍ය දශබලඥානයෙන් ප්‍රකටවියයි දක්වනුපිණිස "චතුවෙසාරජ්ජවිසාරදො දසබලධරො"යි කී. චතුර්වෛශාරද්‍ය දශබලඥානයෝද මේ ඥානයන් දෙදෙනාගේ අධිගමය හා සමග සිද්ධවූහ යි දක්වනුපිණිස "අනාවරණඤාණො සමන්තචක්ඛු"යි කීහු- මේ දෙනුවණද පුණ්‍යඥානසම්භාරයන්ගේ උපචයින් සිද්ධවූ භග්නදෙශතාවෙන් සිද්ධවියයි දක්වනපිණිස "භගවා" යි කීහු—අනාවරණ ඥානය සර්‍වඥතාඥානය යන දෙනුවණ අර්ථ හෙයින් අභින්නවුව ද සඞ්ඛතාසඞ්ඛතසම්මුති භෙදභින්න සියලු ඥෙය ධර්මයන් විෂයකරණබැවින් සබ්බඤ්ඤුතඤාණනමුදු විය එම විෂයෙහි ආවරණයක් නැතිබැවින් නිස්සඞ්ගචාරය ගෙණ අනාවරණඤාණ නමුදු වියනී විෂයප්‍රවෘත්තිමුඛයෙන් විවිධ කොට කියනලද්දී දතයුතු-)

---

( භා ¶ )

යම්හෙයකින්(මේ සංවිධානයා ... සේ විළඳනාලද්දීද [illegible]

( භා ¶ )

වහන්සේ විචාරම්හි භාග්‍යවත්හට ගොතමයෙන් ආමන්ත්‍රණය කෙළේයි-මෙසේ මේ තුන්ලොව වැළඳගෙණ සිටිනා වූ මේ ජටාව කවරෙක් කපන්නේද? කපන්නට කවරෙක් සමර්ථවේදැයි? විචාළේය-

මෙසේ "අන්තොජටා" යනාදී ගයින් විචාරණලද අතීතාදීභෙදභින්න සියළු ඥෙයධර්මයන් කෙරෙහි නිරවශෙෂ ඥෙයාවරණප්‍රහාණයෙන් නිස්සඞ්ගචාර ඇති බැවින් නොපැකිල පවත්නා නුවණඇතිවූ සම්මුතිඋපපත්ති විශුද්ධි සංඛ්‍යාත සර්වදෙවයන් විසින් පූජ්‍යතර දෙවබැවිනුදු සර්වඥගුණාභරණයෙන් විභූෂිතවූ විශුද්ධිදෙවභාවයට පැමිණි බැවිනුදු සෙසු දෙවියන්ට අතිශය දෙවිවූ අපරිමාණ ලොකයෙහි අපරිමාණසත්ත්වයන්ගේ ගුණාභිභවනයකොට සිටිනහෙයින් අධිකවූ ශක්‍රතුයි අතිශක්‍රවූ කීනයීන්ම බ්‍රහ්මයන්ට අතිබ්‍රහ්මවූ බුද්ධත්වාදි සත රතන්හි දෙවියන්සහිත ලොකයෙහි කිසිවෙක්හු විසින් නොසෙල්විය හැකි වූ කිසිවෙකිනුදු උත්‍රාශයක් නැතිබැවින් චතුර්විධ වෛශාරද්‍යයෙන් විශාරදවූ ස්ථානාස්ථානඥානාදි දශවිධ ඥානබලයෙන් සමන්විත බැවින් දශබලධරවූ සියළු ඥෙයධර්මයෙහි නොපැකිල පවත්නා ඥානඇතිවූ සියලු ඥෙයමණ්ඩලය හාත්පසින් සර්වාකාරයෙන් හස්තතලාමලකන්‍යායෙන් ප්‍රත්‍යක්ෂයෙන් දක්නාට සමර්ථවූ ඥානාලොවනයෙන් සමන්විතබැවින් සර්වඥවූ භාග්‍යවත්ආදිකාරණයෙන් භගවත් නම්වූ තථාගතතෙමේ දිව්‍යපුත්‍රයාට ඒ අර්ථය විසඳන්නේ 'සීලෙ පතිට්ඨාය" යනාදි මේ ගාථාව වදාළසේක ~

( පා * )

ඉමිස්සාදානි ගාථාය
කථිතාය මහෙසිනා
වණ්ණයන්තො යථාභූතං
අත්ථං සීලාදිභෙදනං ~
සුදුල්ලභං ලභිත්වාන
පබ්බජ්ජං ජිනසාසනෙ
සීලාදිසඞ්ගහං ඛෙමං
උජුං මග්ගං විසුද්ධියා ~
යථාභූතං අජානන්තා
සුද්ධිකාමා පි යෙ ඉධ
විසුද්ධිං නාධිගච්ඡන්ති
වායමන්තාපි යොගිනො ~
තෙසං පාමොජ්ජකරණං
සුවිසුද්ධවිනිච්ඡයං
මහාවිහාරවාසීනං
දෙසනානයනිස්සිතං ~
විසුද්ධිමග්ගං භාසිස්සං
තං මෙ සක්කච්ච භාසතො
විසුද්ධිකාමා සබ්බෙපි
නිසාමයථ සාධවො ති ~

( ශ * )

ඉදානි, දැන්; මහෙසිනා, මහර්ෂීනුවිසින්; ("මහන්තෙ සීලක්ඛන්ධෙ එසිගවෙසීති මහෙසී භගවා" යි ගන්නේ) කථිතාය, දෙසනලද; ඉමිස්සා ගාථාය, මේ ගාථාවෙහි, සීලාදිභෙදනං, ශීලසමාධිප්‍රඥාභෙදඇති; යථාභූතං අත්ථං, අවිපරීතවූ අර්ථය; වණ්ණයන්තො, විස්තර කරන්නෙම්; ("විසුද්ධිමග්ගං භාසිස්සං" යි සම්බන්ධ කරණු) ජිනසාසනෙ, බුද්ධශාසනයෙහි; සුදුල්ලභං, අෂ්ටදුඃඛක්ෂණ වර්ජිත නවවන බුද්ධොත්පාදක්ෂණයෙහිම ලැබියයුතු බැවින් ඉතා ඉතාවම දුර්ලභවූ; පබ්බජ්ජං ලභිත්වාන, ප්‍රව්‍රජ්‍යාවලද්දන්; සීලාදිසඞ්ගහං, ශීලාදිස්කන්ධත්‍රයින් සඞ්ගෘහීතවූ, ("මග්ගං" යන්නට විශෙෂණයි) ආයතිම[illegible] සත්‍රුදෙශ බැවින්

( ස * )

ශීලාදිස්කන්ධත්‍රයින් සඞ්ගෘහීත වෙයි ස්කන්ධත්‍රය වනාහි නිෂ්ප්‍රදෙශ බැවින් ආර්‍ය්‍යමාර්ගයෙන් සඞ්ගෘහීත නොවේ "න ඛො ආවුසො විසාඛ අරියෙන අට්ඨඞ්ගිකෙන මග්ගෙන තයො ඛන්ධා සඞ්ගහිතා තීහි ච ඛො ආවුසො විසාඛ ඛන්ධෙහි අරියො අට්ඨඞ්ගිකො මග්ගො සඞ්ගහිතො" යනු පෙළි,) ඛෙමං (කෙලෙස් සොරුන් විසින් නොපැහැරිය යුතු බැවින්) ක්‍ෂෙමවූ; (නිර්භයවූ විසුද්ධියා, නිර්වාණයට අභිමුඛයට හෝ; උජුං මග්ගං, (අන්තද්වය වර්ජිතබැවිනු ද මායාශාඨ්‍යාදි කායවංකාදීන් පහවනබැවිනු ද) සෘජුවූ ආර්‍ය්‍යමාර්ගාඛ්‍ය ප්‍රතිපත්තිය; යථාභූතං අජානන්තා, ශීලාදිවිශුද්ධි පරම්පරායෙන් ප්‍රාප්තව්‍ය මෙබඳු ස්වරූප ඇත්තේය මෙබඳු කෘත්‍ය ඇත්තේය මෙබඳු ප්‍රයොජන ඇත්තේය යි ස්වරූප භෙදයෙන් නොදන්නාවූ; සුද්ධිකාමා පි, සියලු සංක්ලෙශයන් කෙරෙණුදු සංසාරයෙනු ද විමුක්තියකැමතිවූ; (මෙහි අපි ශබ්දය සම්භාවන යෙහිය එහෙයින් "න කෙවලං සීලමත්තෙන පරිතුට්ඨා, අථ ඛො විසුද්ධිකාමා 'පි සමානා"යි කීවෙත්) ඉධ, මේ ශාසනයෙහි; යෙ යොගිනො, යම් යොගිකෙනෙක්; වායමන්තාපි; විශුද්ධියපිණිස උත්සාහ කරන්නාහු දු; විසුද්ධිං නාධිගච්ඡන්ති, (උපාය අනධිගතබැවින්) විශුද්ධිය නොපැමිණෙද්ද; තෙසං පාමොජ්ජකරණං, ඒයොගීන්ට සතුටු කරවන්නාවූ; සුවිසුද්ධවිනිච්ඡයං, (නිකායාන්තරලබ්ධිහි අසම්මිශ්‍රබැවින්) මනාකොට පිරිසිදු විනිශ්චය ඇති; මහාවිහාරවාසිනං, මහාවිහාරවාසී තෙරවරුන්ගේ; දෙසනානයනිස්සිතං, අර්ථකථානය ආශ්‍රයකළාවූ; විසුද්ධිමග්ගං, විශුද්ධිමාර්ගය; භාසිස්සං, කියමි; සක්කච්චං, සකස්කොට; භාසතො,

( ස • )

කියන්නාවූ; මෙ, මාගේ; තං, ඒ විශුද්ධිමාර්ගය; විසුද්ධිකාමා, නිවන් කැමති; සබ්බෙපි සාධවො, සියලුසාධුජනයෙනි (සක්කච්චං, සකස්කොට) නිසාමයථ, අසව් (මෙහි "ඉමිස්සාදානි ගාථාය" යනුවෙන් විශුද්ධිමාර්ග කරණයට නිශ්‍රයදක්වූහ "කථිතාය මහෙසිනා" යනුවෙන් එහි නිශ්‍රය ප්‍රමාණබව දක්වූහ "යථාභූතං අත්ථං සීලාදිභෙදනං" යනුවෙන් අවිපරීතවූ පිණ්ඩාර්ථය දක්වූහ-"සුදුල්ලභං ..... පෙ ..... යොගිනො" යනුවෙන් නිමිත්ත දක්වූහ; "තෙසං පාමොජ්ජකරණං" යනුවෙන් ප්‍රයොජනය දක්වූහ "වණ්ණයන්තො අත්ථං සුවිසුද්ධවිනිච්ඡයං" යනුවෙන් ද "මහාවිහාරවාසීනං දෙසනානයනිස්සිතං" යනුවෙන් ද "සක්කච්චං" යනුවෙන් ද කරණප්‍රකාර දක්වූහ "විසුද්ධිකාමා සබ්බෙ පි නිසාමයථ සාධවො" යනුවෙන් සාධුජනයන් සත්කෘත්‍ය ශ්‍රවණයෙහියෙදූ-)

( හා * )

දැන් වනාහි මහත්වූ ශීලස්කන්ධයන් සොයන හෙයින් මහර්ෂිනම්වූ භගවත්හු විසින් දෙසනලද මේ ගාථාවෙහි ශීලසමාධිප්‍රඥාභෙද ඇති තත්ත්වාර්ථය විස්තරකරමින් විශුද්ධිමාර්ගය ප්‍රකාශ කරන්නෙමි – බුදු සස්නෙහි අෂ්ටදුෂ්ටක්‍ෂණ වර්ජිත නවවන බුද්ධොත්පාදක්‍ෂණයෙහි ම ලැබිය යුතු බැවින් අතිශයින් ම දුර්ලභවූ ප්‍රව්‍රජ්‍යාව ලදින් ශීලාදිස්කන්ධත්‍රයෙන් සංගෘහීතවූ කෙලෙස් සොරුන් විසින් නොපැහැරියයුතු බැවින් ක්‍ෂෙමවූ නිර්භයවූ නිර්වාණයට හෝ අභිමුඛයට අන්තද්වය වර්ජිතබැවිනු ද මායාශාඨ්‍යාදී කායවංකාදීන් පහවන බැවිනු ද සෘජුවූ ආර්‍ය්‍යමාර්ගාඛ්‍ය ප්‍රතිපත්තිය ශීලවිශුද්ධි පරම්පරායෙන් පැමිණියයුතුය මෙබඳු ස්වරූපඇත්තේය

( භා * )

මෙබඳුනානාත්වඇත්තේය මෙබඳු ප්‍රභේදයා ජන ඇත්තේයයි ස්වරූප හෙයින් නොදන්නාවූ සියලු කෙලෙසුන් නෙරෙනු දු සංසාරයෙනු දු මිදීම කැමති වූ මේ සාසනයෙහි යම් යෝගී කෙනෙක් විශුද්ධියපිණිස උත්සාහ කරන්නාහු දු උපාය නොදත් බැවින් විශුද්ධියට නොපැමිණෙද්ද. ඒ යෝගීන් සතුටුකරවනනාවූ අභයගිරි ජේතවනාදිනිකායාන්තර ලබ්ධීන්හා අසම්මිශ්‍ර බැවින් මනාකොට ම පිරිසිදු විනිශ්චය ඇති මහවෙහෙරවාසී තෙරවරුන්ගේ අර්ථකථානය ආශ්‍රයකළ විශුද්ධිමාර්ගය කථනයකරන්නෙම් එම්බා නිවන් කැමති සියලු සාධුජනයෙනි සකස්කොට කියන්නාවූ මාගේ ඒ විශුද්ධිමාර්ගය සකස්කොට ශ්‍රවණය කරව්.

( පා † )

තත්‍ථ "විසුද්ධී"ති සබ්බමලවිරහිතං අච්චන්තපරිසුද්ධං නිබ්බානං වෙදිතබ්බං තස්සා විසුද්ධියා මග්ගොති විසුද්ධිමග්ගො. "මග්ගො" ති අධිගමූපායො වුච්චති තං විසුද්ධිමග්ගං භාසිස්සාමී ති අත්‍ථො.

සො පනායං විසුද්ධිමග්ගො කත්‍ථචි විපස්සනාමත්තවසෙනෙව දෙසිතො යථාහ.

"සබ්බෙසඞ්ඛාරා අනිච්චා"ති
යදා පඤ්ඤාය පස්සති
අථ නිබ්බින්දතී දුක්ඛෙ
එස මග්ගො විසුද්ධියා"ති.

( ස † )

තත්‍ර "විසුද්ධිමග්ගං භාසිස්සං" යන මෙහි "විශුද්ධිමග්ගං" යනයම් වචනයෙක් ඇද්ද එහිය යන අර්ථයි; විසුද්ධි'ති, විසුද්ධියයි; සබ්බමල විරහිතං, සියලු රාගාදී මලයෙන් වෙන්වූ "අච්චන්තපරිසුද්ධං නිබ්බානං වෙදිතබ්බං, සර්වමල විරහිත බැවින් ම හැමකල ම අතිශයින් සර්වාකාරයෙන්ම පිරිසිදු

( ස † )

වූ නිර්වාණය දතයුතු; තස්සා විසුද්ධියා, ඒ විශුද්ධියට; මග්ගොති, මාර්ගයනුයි, විසුද්ධිමග්ගො, විශුද්ධිමාර්ගනම්; මග්ගොති, මාර්ගයයි; අධිගමූපායො වුච්චති, නිර්වාණප්‍රතිලාභයට උපාය කියනු ලැබේ, (විශුද්ධිමාර්ගයයි නිෂ්පර්යායයෙන් ලොකොත්තර මාර්ගයත් දතයුතුය තදුපායහෙයින් වනාහි පූර්වභාග මාර්ගය ද තන්නිශ්‍රය කථා ප්‍රබන්ධය ද විශුද්ධිමාර්ගයයි කියනුලැබේ) තං විසුද්ධිමග්ගං භාසිස්සාමීති අත්‍ථො, ඒ විශුද්ධිප්‍රතිලාභයට උපාය කියමි යන අර්ථයි; සො පනායං විසුද්ධිමග්ගො, ඒ මේ විශුද්ධිමාර්ගය වනාහි; කත්‍ථචි, කිසි සූත්‍රයක; විපස්සනාමත්තවසෙනෙව දෙසිතො, විදර්ශනාමාත්‍රවශයෙන් ම දෙසනලදී; (මෙහි එව යන අවධාරණයෙන් සමථය වළකනු, විශෙෂ නිවාතිය අර්ථකොට ඇති මාත්‍රශබ්දයෙන් විපස්සනායානිකයහට ද ක්ෂණිකසමාධියක් හැතිව විදර්ශනාව සම්භවනොවනබැවින් උපචාරපිණා භෙද ඇති සවිශෙෂ සමාධිය වළකනු) යථාහ, වදාළේමය-("යථාආහ තථා උපපාදයිස්සාම" යනු මිහිතාත්පර්යාර්ථයි, මත්තෙහි දු මෙම නයින්ම අර්ථගතයුතු) සබ්බෙසඞ්ඛාරා, සියලු ත්‍රෛභූමික සංස්කාරයෝ; (මෙහි ලොකොත්තරයන් සම්මර්ශනයෝග්‍ය නොවනබැවින් සබ්බෙසඞ්ඛාරයි කිවද ත්‍රෛභූමික සංස්කාරයෝම ගැණෙත්) අනිච්චාති, අනිත්‍යයහ. ක්ෂණභඞ්ගුරයහයි; යදා, යම් කලෙක; පඤ්ඤාය පස්සති, විදර්ශනා ප්‍රඥාවෙන් සම්මර්ශනය කෙරේද; අථ, පසුව; උදයව්‍යය ඥානාදීන්ගේ උත්පත්තියට

උපකාරකාලුයෙහි; දුක්ඛ, (එව අති තාපකාරයෙන් දැඩිවූ "සංඛතා සඞ්ඛාරා" යි කියනලද ත්‍රෛභූමික ලෞකික පඤ්ච සඞ්ඛ්‍යාගා) දුඃඛයෙහි; නිරෝධ ඥාන, නිරෝධද දෙනාය ප්‍රත්‍යක්ෂබිද; එසේ මෙහෙණි විසුද්ධිය, නිර්වේදානුපස්සනා සඞ්ඛ්‍යාත විරාගාකාරණාද්‍ය මේ මෙහි; නිර්වාණයාගේ අධිගමයට කාරණයයි.

( ගා † )

එහි "විසුද්ධි" නම් සියලු රාගාදි මලයන් පහවූ සර්වමල විරහිත බැවින් හැමකලම සර්වාකාරයෙන්ම පිරිසිදුවූ නිර්වාණය දතයුතු. ඒ විශුද්ධි සඞ්ඛ්‍යාත නිර්වාණයට මාර්ගබැවින් විශුද්ධිමාර්ග නම්වේ "මාර්ග" යනු නිර්වාණ ප්‍රතිලාභයට උපායයි. විශුද්ධිමාර්ගයයි නිෂ්පර්යායයෙන් ලෝකෝත්තර මාර්ගය දතයුතුය ඊට උපාය වනහෙයින් පූර්වභාගමාර්ගයද ඒ ආශ්‍රිත කථාප්‍රබන්ධයද විශුද්ධිමාර්ග යයි කියනලැබේ.

ඒ නිර්වාණ ප්‍රතිලාභයට උපායවූ විශුද්ධිමාර්ගය දෙසතැත්පවින් දක්වන් නාමි-ඒ මේ විශුද්ධිමාර්ගය වනාහි කිසියම් පෙදෙසෙක විදර්ශනාමාත්‍ර වශයෙන්ම දෙශනාකරනලද්දේය-විදර්ශනාලත් වැනෙති (සියලු ත්‍රෛභූමක සංස්කාරයෝ අනිත්‍ය නැතිවන්නාහු ක්ෂණයෙහි බිඳෙන්නාහයි යම් කලෙක විදර්ශනා ඥානයෙන් සලකාද, ඉක්බිති මෙපන් උදයව්‍යය ඥානාදීන්ගේ උත්පත්තියට මතුකාලයෙහි එව ආනිත්‍යාකාරයෙන් දක්නාලද ත්‍රෛභූමිකස්කන්ධ පඤ්චක සඞ්ඛ්‍යාත දුඃඛයෙහි නිර්වේද ඥානය ලැබේද. ඒ නිර්වේදානුපස්සනා සඞ්ඛ්‍යාත විරාගාකාරණාවූ මම්මොයම නිර්වාණාධිගමයට කාරණාවන්නේය.)—

( පා ‡ )

කොතැන්හි ධ්‍යානප්‍රඥාවශයෙන, යථාහ.

"යම්හි ඣානඤ්ච පඤ්ඤා ච
ස වෙ නිබ්බාණසන්තිකෙ"යි—

කොතැන්හි කර්මාදිවශයෙන, යථාහ.

"කම්මං විජ්ජා ච ධම්මො ච
සීලං ජීවිතමුත්තමං
එතෙන මච්චා සුජ්ඣන්ති
න ගොත්තෙන ධනෙන වා"යි—

කොතැන්හි සීලාදිවශයෙන, යථාහ.

"සබ්බදා සීලසම්පන්නො
පඤ්ඤවා සුසමාහිතො
ආරද්ධවිරියො පහිතත්තො
ඔඝං තරති දුත්තරං"යි—

කොතැන්හි සතිපට්ඨානාදිවශයෙන, යථාහ: "එකායනො අයං භික්ඛවෙ මග්ගො සත්තානං විසුද්ධියා—පෙ—නි බ්බානස්ස සච්ඡිකිරියාය යදිදං චත්තාරො සතිපට්ඨානා" සම්මප්පධානාදී සූත්‍ර වශයෙන් [illegible]

( ඝ ‡ )

කොතැන්හි, නිර්දේශයෙන; ධ්‍යාන ප්‍රඥාවශයෙන, සංක්ෂිප්තයෙන් [illegible]; යථාහ, දෙසනලද්දී; (මෙහි ධ්‍යාන [illegible] විදර්ශනාවට පාදකවූ ධ්‍යාන [illegible] ප්‍රඥාවයි.) යම්හි, යම් පුද්ගලයෙකු කෙරෙහි; ධ්‍යානවි, ධ්‍යානය ද; ප්‍රඥාව ද, ප්‍රඥාව ද (වේද) යම්පුද්ගලයෙකු ධ්‍යානය පාදකකොට විදර්ශනා [illegible] කොට ඒ ධ්‍යානද යන ඇතිකී [illegible] බබානසන්තිකෙ, හෙ, ඒ [illegible] තෙම; වේ, ඒකාන්තයෙන්, [illegible] සන්තිකෙ, නිවන් [illegible] (නිවනට පැමිණෙන්නේය [illegible] යි); කොතැන්හි, [illegible] යෙන යථාහ, [illegible] න් දෙසනලද්දී [illegible] නාව ද; ( [illegible] බැවින් සංඛ [illegible] චේතනාව, [illegible] මාර්ගය [illegible]

යොහුද; ජීවිතහේතුකත්වං, සම්මාආජීව යද; ධම්මො ච, සම්මාසඞ්කප්පය සම්මාසතිය සම්මාසමාධිය සම්මාවායාමය යන අවශිෂ්ට සතර ආර්‍ය්‍යමාර්ග ධර්මයෝ ද යන; එතෙන, මේ අෂ්ටාඞ්ගමාර්ගයෙන් (හොහොත් "කම්මං"යී යනුවෙන් සම්මා කම්මන්තයාගේ ග්‍රහණයවේ. "යා ච ඛෝසා විසාඛ සම්මාදිට්ඨි යො ච සම්මා සඞ්කප්පො ඉමෙ ධම්මා පඤ්ඤාක්ඛන්ධෙ සඞ්ගහිතා"යි කී බැවින් විජ්ජා යනුවෙන් සම්‍යග්දෘෂ්ටිය සම්‍යක්සඞ්කල්පය යනමොවුන්ගේ ග්‍රහණයවේ "එවං ධම්මා භගවන්තො අභෙසුං" යනුයෙහිමෙන් "ධම්මො"යි සමාධිය ගත්තාලැබෙයි තද්ග්‍රහණයෙන්ම "යො ච ආවුසො විසාඛ සම්මාවායාමො යා ච සම්මා සති යොච සම්මාසමාධි ඉමෙ ධම්මා සමාධික්ඛන්ධෙ සඞ්ගහිතා"යි කී බැවින් සම්මා වායාමය සම්මාසතිය යන මොවුන්ගේ ග්‍රහණයවෙයි. සීලං යනුවෙන් සම්මාවාචා සම්මාආජීව යනමොවුන්ගේ ග්‍රහණයවේ) යං ජීවිතමූතතං, යංකී මෙකී අෂ්ටාඞ්ගමාර්ගයෙන් සමන්විතද ඔව්හුගේ ජීවිතය උපතාවජීවිතනම් වෙයි යන අදහස-එතෙන, මේ ආර්‍යමාර්ගයෙන්; මච්චා සුජ්ඣන්ති, සත්වයො පිරිසිදුවෙති; න ගොත්තෙන ධනෙන වා, ගොත්‍රයෙන් වත් ධනයෙන්වත් පිරිසිදු නොවෙත්-කාළුව්, කිසිසූත්‍රයක, සීලාදිවසෙන යථාහ, ශීලසමාධිප්‍රඥාවිමුක්ති වශයෙන් දෙසනාලදී-සබ්බද, සමාදානයෙහි පවත් හැම කල්හි; සීලසම්පන්නො, චතුපාරිශුද්ධි ශීලයෙන් සමන්විතවූයේ; පඤ්ඤවා, ලෞකික ලෝකෝත්තර ප්‍රඥාවෙන් සමන්විතවූයේ; සුසමාහිතො, ප්‍රඥාසම්ප්‍රයුක්ත සමාධියෙන් මනාකොට ම සමාහිතවූයේ; ආරද්ධවීරියො, අකුශලධර්මයන්ගේ ප්‍රහාණයපිණිස කුශලධර්මයන්ගේ උත්පාදයපිණිස හුවනලද වීර්‍යඇතිවූයේ; පහිතත්තො, නිර්වාණය පිණිස මෙහෙයනලද සිත් ඇති බැවින් කාය ජීවිතයෙහි නිරපෙක්ෂවූ සිත්ඇතිවූයේ; දුත්තරං, අනුන් විසින් එතරවිය නොහැකි; ඔඝං, කාමොඝාදී චතුර්විධ ඔඝය (සංසාර ම ඔඝය); තරති, එතරවේ-කාළුව්, කිසිසූත්‍රයක; සතිපට්ඨානාදිවසෙන යථාහ, සතිපට්ඨානාදි වශයෙන් දෙසනලදී; භික්ඛවෙ, මහණෙනි; සත්තානං විසුද්ධියා, රාගාදි මලයෙනු දූ අභිධ්‍යා විසමලොභාදි උපක්ලේශයෙනු දූ සත්වයන්ගේ විශුද්ධිය පිණිස; නිබ්බානස්ස සච්ඡිකිරියාය, නිර්වාණය සාක්ෂාත් කිරිම පිණිස; ("අයං එකායනො මග්ගො" යනුයෙහි "අයන" ශබ්දය මාර්ගපර්‍යායය, එහෙයින් "එකමග්ගභූතො අයම්පි භික්ඛවෙ මග්ගො න ද්වෙධාපථභූතො" යනු අවුවා බැවින් එක මාර්ගවූ මාර්ගයවේ විවිධවූ මාර්ගයක් නොවේ යන අදහසි නොහොත් "එකංවා නිබ්බානං අයති ගච්ඡතීති එකායනො එකෙනවා ගණසඞ්ගණිකාපහාය විවෙකට්ඨෙන අයිතබ්බො පටිපජ්ජිතබ්බො'ති එකායනො, අයනති එතෙනා'ති වා අයනො, එකස්ස සෙට්ඨස්ස භගවතො අයනොති එකායනො තෙන උප්පාදිතත්තා එකස්මිංවා ඉමස්මිංධම්මවිනයෙ අයනො'ති එකායනො" යි ගත්තෙත් "යදිදං" යනු නිපාතය "සතිපට්ඨානා" යනු බලා 'යෙ ඉමෙ චත්තාරො සතිපට්ඨානා" යි යොදනු යම් මේ සතරවක සිවටන් කොටොක්ඇද්ද "අයං එකායනො මග්ගො"යි යොදනු—"සරණලක්ඛණෙන මග්ගෙට්ඨෙන මග්ගො'ති වුත්තස්සෙව කායාදි විසය භෙදෙන ච තුබ්බිධත්තා චත්තාරො සතිපට්ඨානා'ති වුත්තානි සෙදී

තබ්බං"] සම්මප්පධානාදිසුපි, සම්මප්පධානාදීයෙහිදු; එසෙවනානයා, මෙම නායයි (ආදි ශබ්දයෙන් අප්පමාදගිරති ආදීන්ගේ සංග්‍රහයදතයුතු අප්‍රමාද දී වශයෙනුදු කිසි සූත්‍රයක විශුද්ධි මාර්ගය දෙසනලදී. වදාළේමැනෝ – "අප්පමාදරතො භික්ඛු පමාදෙ භයදස්සිවා අභබ්බො පරිහාණාය නිබ්බානසෙව සන්තිකෙ"යි ]

( භා ‡ )

කිසි සූත්‍රයක සමථවිදර්ශනා වශයෙන් දෙශනාකරණලදි වදාළේමැනෝ. (යම් පුද්ගලයකු හෙරෙරහි ධ්‍යාන ප්‍රඥ දෙක ඇතිවේද යම් පුද්ගලයෙක් ධ්‍යානය පාදකකොට විදර්ශනාරම්භකොට ඒ විදර්ශනා වඩාද ඒ තෙමේ එකාන්තයෙන් නිවණට පැමිණෙන්නේයි) කිසි සූත්‍රයක කර්මාදි වශයෙන් දෙශනාකරණලද්දේය වදාළේමැනෝ-(සම්‍යක් කර්මාන්තය සම්‍යක් දෘෂ්ටිය සම්‍යග්වචනය සම්‍යක්සඞ්කල්පනාවය සම්‍යක්සතිය සම්‍යක් සමාධිය සම්‍යග්ව්‍යායාමය සම්‍යක් ආජීවය යනමේ ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගයෙන් යමෙක් යුක්තවේද ඔව්හුගේ ජීවිතය උත්තම ජීවිත නම්වේ මේ ආර්‍ය්‍ය මාර්ගයෙන් සත්වයෝ පිරිසිදුවෙති ගොත්‍රයෙන්වත් ධනයෙන්වත් පිරිසිදු නොවෙති) කිසි සූත්‍රයක ශීලසමාධි ප්‍රඥ වීර්‍ය්‍ය වශයෙන් දෙශනාකරණලදී වදාළේමැනෝ [සමාදානයෙහි පවත් හැමකල්හි චතුපාරිශුද්ධි ශීලයෙන් සම්පන්නවූ ප්‍රඥ සම්ප්‍රයුක්ත සමාධියෙන් මනාකොටම සංයුක්තවූ අකුශල ධර්මයන්ගේ ප්‍රහාණය පිණිසද කුශල ධර්මයන්ගේ උත්පාදය පිණිසද පවත්නාලද වීර්‍ය්‍ය ඇතිවූ නිර්වාණය පිණිස මෙහෙයනලද සිත් ඇයි බැවින් කායජීවිතයෙහි නිරපෙක්ෂවූ සිත් ඇත්තාවූ (පුද්ගල තෙම) අනුන් විසින් එතරවිය නොහැකි කාමෞඝාදි චතුර්විධ ඕඝය එතරකරන්නේයි.)

කිසි සූත්‍රයක සතිපට්ඨානාදීන්ගේ වශයෙන් දෙශනාකරණලදී වදාළේ මැනෝ - (මහණෙනි රාගාදී මලයෙනුදු අභිධ්‍යා විසම ලොභාදී උපක්ලේශයෙනුදු සත්වයන්ගේ විශුද්ධිය පිණිස නිර්වාණය සාක්ෂාත් කරණු පිණිස යම් මේ සතරමහා සතිපට්ඨාන කොතෙක් ඇද්ද මේ එකායනමාර්ගවූ මාර්ගය වෙයි විවිධවූ මාර්ගයක් නැත්තේය) සතර සම්‍යක් ප්‍රධානාදීයෙහිදු මෙම ක්‍රමය දතයුතුයි.

( භා ¶ )

ඉමස්මිං පන පඤ්හ ව්‍යාකරණෙ සීලාදිවසෙන දෙසිතො තත්‍රායං සංඛෙප වණ්ණනා "සීලෙ පතිට්ඨාය" ති සීලෙ ඨත්වා සීලං පරිපූරයමානො යෙව එවං සීලෙ පතිට්ඨිතොති වුච්චති තස්මා සීලපරිපූරණෙන සීලෙ පතිට්ඨහිත්වාති අයමෙත්ථ අත්ථො "නරො" ති සත්තො "සපඤ්ඤො" තිකම්මජාය ති හෙතුකපටිසන්ධිපඤ්ඤාය පඤ්ඤවා "චිත්තං පඤ්ඤඤ්ච භාවයං" ති සමාධිඤ්චෙව විපස්සනඤ්ච භාවයමානො චිත්තසීසෙන හෙත්ථ සමාධි නිද්දිට්ඨො පඤ්ඤනාමෙන ච විපස්සනාති. "ආතාපී" ති විරියවා විරියංහි කිලෙසානං ආතාපනපරිතාපනට්ඨෙන ආතාපොති වුච්චති තදස්ස අත්ථීති ආතාපී "නිපකො" ති නෙපක්කං වුච්චති පඤ්ඤා- තාය සමන්නාගතොති අත්ථො — ඉමිනා පන පදෙන පාරිහාරිය පඤ්ඤං දස්සෙති ඉමස්මිං හි පඤ්හාව්‍යාකරණෙ තික්ඛත්තුං පඤ්ඤා ආගතා — තත්ථ පඨමා ජාතිපඤ්ඤා දුතියා විපස්සනා පඤ්ඤා තතියා සබ්බකිච්ච පරිණායිකා පාරිහා

විපස්සනාපඤ්ඤා— සංසාරෙ භයං ඉක්ඛතීති භික්ඛු "සො ඉමං විජටයෙ ජටං" ති සො ඉමිනාච සීලෙන ඉමිනාච චිත්තසීසෙන නිද්දිට්ඨසමාධිනා ඉමායච තිවිධාය පඤ්ඤාය ඉමිනාච ආතාපෙනාති ඡබ්බිධෙන ධම්මෙන සමන්නාගතො භික්ඛු සෙය්‍යථාපි නාම පුරිසො පථවියා පතිට්ඨාය සුනිසිතං සත්ථං පග්ගහෙත්වා මහන්තං වෙළුගුම්බං විජටෙය්‍ය එවමෙවං සීලෙ පතිට්ඨාය සමාධිසිලාය නිසිතං විපස්සනාපඤ්ඤාසත්ථං විරියබලපග්ගහිතෙන පාරිහාරියපඤ්ඤාහත්ථෙන උක්ඛිපිත්වා සබ්බම්පි තං අත්තනො සන්තානෙ පතිතං තණ්හාජටං විජටෙය්‍ය සඤ්ඡින්දෙය්‍ය සම්පදාලෙය්‍ය මග්ගක්ඛණෙ පනෙස තං ජටං විජටෙති නාම ඵලක්ඛණෙ විජටිතජටො සදෙවකස්ස ලොකස්ස අග්ගදක්ඛිණෙය්‍යො හොති—

( ස ¶ )

ඉමස්මිං පන පඤ්හාවෙය්‍යාකරණෙ, මේ ප්‍රශ්න ව්‍යාකරණයෙහි; සීලාදිවසෙන දෙසිතො, ශීලසමාධි ප්‍රඥා වශයෙන් දෙසනලද්දී; තත්‍ර, ඒ ගාථායෙහි; අයං සංඛෙප වණ්ණනා, මේ සංක්ෂෙප වර්ණනායි; සීලෙ පතිට්ඨායා'ති යන්තෙහි; සීලෙ ඨත්වා, ශීලයෙහි සිට; සීලං පරිපූරයමානොයෙව, ශීලය පුරන්නේම; සම්භාගයෙන් සංවරණය කරන්නේම [ව්‍යතික්‍රම නොකරන්නේය යන අර්ථයි) එත්ථ, මෙහි; සීලෙ පතිට්ඨිතොති වුච්චති, ශීලයෙහි පිහිටියේයයි කියනු ලැබේ; තස්මා, එහෙයින්; සීල පරිපූරණවසෙන, ශීල පරිපූරණ වශයෙන්; සීලෙ පතිට්ඨහිත්වා'ති, ශීලයෙහි පිහිටාය යන; අයං, මේ; එත්ථ, "සීලෙ පතිට්ඨාය" යනමේ පෙදෙහි; අත්ථො, අර්ථයි; නරො 'ති, යි ශෙස්සි; සත්තො, සත්වයි ("නරො" යනු අවිභාගයෙන් පුද්ගල පර්‍යායය බැවින් "නරො 'ති සත්තො,"යි කීහු) සපඤ්ඤො'ති යන්තෙහි; කම්මජාය තිහෙතුක පටිසන්ධි පඤ්ඤාය පඤ්ඤවා, කර්මජවූ ත්‍රිහෙතුක ප්‍රතිසන්ධියෙහි ප්‍රඥාවෙන් ප්‍රඥා ඇති (ත්‍රිහෙතුක ප්‍රඥාවක් නැති බැවින් මෙහි "කම්මජාය තිහෙතුක පටිසන්ධි පඤ්ඤාය"යි ත්‍රිහෙතුක ශබ්දය ප්‍රතිසන්ධි ශබ්දය හා සම්බන්ධ කටයුතුයි. ප්‍රතිසන්ධියෙහි පවත්තෙන පවත්නා ප්‍රඥා තොමෝ භවාංගමූලික බැවින් ප්‍රතිසන්ධි ප්‍රඥායයි කියනලද්දී යි දතයුතුයි) "චිත්තං පඤ්ඤඤ්ච භාවයං" යන්තෙහි; සමාධිඤ්ච, සමාධියද; විපස්සනඤ්ච, විදර්ශනාවද; භාවයමානො, වඩන්නේ; එත්, මෙහි වනානි; චිත්තසීසෙන, චිත්ත ශීර්ෂයෙන් (චිත්ත මුඛයෙන් යන අර්ථයි) සමාධි නිද්දිට්ඨො, සමාධිය දක්වනලද්දී; (චිත්තාහි ආරම්මණං උපනිජ්ඣායතී'ති චිත්තං, සමාධි,යි නිර්වාජවම සමාධිගට චිත්ත පර්යාය ලැබෙතුදු චිත්ත ශබ්දය විඤ්ඤාණය කොරෙහි නිරූඪනු හි අප්‍රභායෙන් "චිත්තසීසෙන නිද්දිට්ඨො"යි කීහු) පඤ්ඤානාමෙනච විපස්සනා, ප්‍රඥා නාමයෙනුදු විදර්ශනා දක්වනලද්දී; "ආතාපී" යන්තෙහි; වීරියවා, වීර්‍ය ඇත්තේ; වීරියංහි, වීර්‍ය තොමෝ; කිලෙසානං ආතාපන පරිතාපනට්ඨෙන, කෙලෙසුන් තවන බැවිනුදු දනා තොව තවන බැවිනුද; ආතාපො'ති වුච්චති, ආතාපයයි කියනු ලැබේ; තං, ඒ වීර්‍යය; අස්ස අත්ථී'ති, මොහට ඇත්තුයි; ආතාපී, ආතාපී නම් [මෙහි ආතාපන ග්‍රහණයෙන් ආරම්භ ධාතුව දක්වනලද පරිතාපන ග්‍රහණයෙන් නික්කම ධාතු පරක්කම ධාතූහු දක්වන ලදහු) නිපකො යන්තෙහි; නෙප

නාමං වුච්චති පඤ්ඤා, නෙපක්කායයි ප්‍රඥා කියනු ලැබේ; තාය සමන්නාගතො 'ති අර්ථ, ඒ ප්‍රඥාවෙන් සමන්විතය යනු අර්ථයි ("නිපකචව විසෙසෙසති පටිපක්ඛං හනෙතොචා අපායාභාවංනිපාතනා පක්ඛන්තී නිපකො සම්පජාණතා" යි ග්‍රන්ථෙහි) ඉමිනා පදෙන, නිපකො යන මේ පදයෙන්; පාරිහාරිය පඤ්ඤං ද ගසයි, කර්මස්ථාන පරිහරණයෙහි නිපුණතා ප්‍රඥා දක්වා ("කම්මට්ඨානස්ස පරිහරණෙ නියුත්තා පාරිහාරිකා" යි ග්‍රන්ථෙහි) ඉමස්මිං පඤ්හ ව්‍යාකරණෙ, මේ ප්‍රශ්න ව්‍යාකරණයෙහි; තික්ඛත්තුං, තුන්වරක; පඤ්ඤා ආගතා, ප්‍රඥා තොමෝ අවු; තත්‍ර, ඒ තුන් ප්‍රඥා අතුරෙන් කොතෙරනි; පඨමා, ප්‍රථම ප්‍රඥා තොමෝ; ජාතිපඤ්ඤා, පිළිසඳ නුවණ බැවින් ජාතිප්‍රඥාය; දුතියා, දෙවන ප්‍රඥා තොමෝ; විපස්සනාපඤ්ඤා, විදර්ශනා ප්‍රඥාය; තතියා, තුන්වන ප්‍රඥා තොමෝ; සබ්බකිච්චපරිණායිකා, අභික්‍රමාදි සර්වකෘත්‍යයන් සාර්ථසම්ප්‍රජන්‍යාදි වශයෙන් පිරිසිඳ පවත්නාවූ; පාරිහාරිය පඤ්ඤා, පාරිහාරික ප්‍රඥායි. ("සබ්බකිච්චානි පරිච්ඡෙජ්ජ නෙති පරිච්ඡිජ්ජ නයිනි සබ්බකිච්ච පරිණායිකා" යි ග්‍රන්ථයෙහි) සංසාරෙ, සසරෙහි; භයං ඉක්ඛතීති භික්ඛු, භය දක්නුයි භික්ෂු නම්වේ ("සංසාරෙ භයං ඉක්ඛතීති භික්ඛු" යන සාධාරණ භික්ෂු ලක්ෂණ කථනයෙන් ප්‍රත්‍යක්ෂ වශයෙන්ම භික්ෂු භාවය දර්ශනයයි දැක්වූහයි. භින්නපටධරාදී භාවයෙන් භික්ෂු භාවය ගතනොහොත් පිඬුසිඟීම ආදී ක්‍රියාවැනි ගෘහස්ථයන් නොගැළපෙනා බැවින් නොහොත් "භින්දති පාපකෙ අකුසලෙ ධම්මෙ'ති භික්ඛු" යනුවේ.) "සො ඉමං විජටයෙ ජටං" යන්නෙහි "සො භික්ඛු" යි යෙදිය යුතුව

සීලෙන, මේ ගාථාවෙහි කී ශීලයෙන්ද; ඉමිනාච චිත්තසීසෙන නිද්දිට්ඨ සමාධිනා, මේ චිත්ත ශීර්ෂයෙන් දක්වනලද සමාධියෙන්ද; ඉමාය ච තිවිධාය පඤ්ඤාය, මේ ත්‍රිවිධ ප්‍රඥායෙන්ද; ඉමිනා ච ආතාපෙන, මේ වීර්යයෙන්දැයි; ඉති ධම්මෙහි සමන්නාගතො, මේ ෂඩ් ධර්මයෙන් සමන්විතවූ; සො භික්ඛු, ඒ භික්ෂු තෙමේ; සෙය්‍යථාපි නාම, යම්සේ; පුරිසො, පුරුෂයෙක්; පඨවියා පතිට්ඨාය, පෘථිවියෙහි පිහිටා; සුනිසිතං සත්ථං, මනාකොට මුවහත් තබනලද ශස්ත්‍රය; උක්ඛිපිත්වා, නගාගෙණ; මහන්තං වෙළුගුම්බං, මහත්වූ වෙළුගුම්බයක්; විජටෙය්‍ය, කපාද; එවමෙවං, එපරිද්දෙන්ම; සීලෙ පතිට්ඨාය, ශීලයෙහි පිහිටා; සමාධිසිලාය නිසිතං, සමාධි නැමැති සිලාවෙහි මුවහත් තබනලද; විපස්සනා පඤ්ඤාසත්ථං, විදර්ශනා ප්‍රඥා නැමැති ශස්ත්‍රය; විරියබල පග්ගහිතෙන, වීර්ය බලයෙන් ගන්නාලද; පාරිහාරිය පඤ්ඤාහත්ථෙන උක්ඛිපිත්වා, පාරිහාරික ප්‍රඥා නැමැති හස්තයෙන් නගාගෙණ; අත්තනො සන්තානෙ පතිතං, අනුසය වසින් තම සන්තන්හි හුණු; සබ්බම්පි තං තණ්හාජටං, ඒ සියලු තෘෂ්ණා අවුල; විජටෙය්‍ය, සිඳ හෙළයි; සඤ්ඡින්දෙය්‍ය, කපන්නේයි; සම්පදාලෙය්‍ය, සමුච්ඡෙද වශයෙන් ප්‍රහාණය කරන්නේය යනු අර්ථයි (උපමාවෙහි "සුනිසිතං සත්ථං" යන තැන සිලාය යනුද—"උක්ඛිපිත්වා" යන තැන "බාහුබලෙන" යනුද—අර්ථාක්ෂේපයෙන් නොව කීයෙහියින් උපමෙයයෙහි "සමාධි සිලාය නිසිතං" යනුද, "විරියබල පග්ගහිතෙන පඤ්ඤාහත්ථෙන උක්ඛිපිත්වා," යනුද කීයයි දතයුතු) [illegible]

නාම, කපන්නෝනම්වේ; ඵලක්ඛණෙ, ඵලක්ෂණයෙහි; විජටිතජටො, කපන ලද ජටා ඇත්තේ; සදෙවකස්ස ලොක ස්ස, සදෙවක ලෝකයාගේ; අග්ග ද ක්ඛිණෙය්‍යො හොති, අග්‍ර දක්ෂිණාවට ද හිවේ—

(ගා ෭)

මේ ප්‍රශ්න ව්‍යාකරණයෙහි වනාහි ශීලසමාධි ප්‍රඥා වශයෙන් (විශුද්ධිය) දෙ ශනාකරණලදී. ඒ ගාථායෙහි සංක්ෂෙ පාර්ථවර්ණනාව මෙසේ දතයුතු "සීලෙ පතිට්ඨාය" යන මෙහි ශීලයෙහි සිට ශීලය පරිපූර්ණකරන්නාවූ සබ්භාගයෙ න් සංවරණය කරන්නාවූම (පුද්ගල තෙමේ) මෙහි ශීලයෙහි පිහිටියේයයි කියනු ලැබේ එහෙයින් ශීලපරිපූරණ වශයෙන් ශීලයෙහි පිහිටාය යනමේ පෙදෙහි අර්ථ දතයුතුයි. "නරො සප ඤ්ඤො" යනමෙහි පූර්ව ජන්ම සිද්ධ කු ශල කර්මයෙන් හටගත් ත්‍රිහේතුක ප්‍රතිසන්ධියෙහි ප්‍රඥාවෙන් ප්‍රඥාවනතවූ සත්ව තෙමේය යන අර්ථයි "චිත්තං ප ඤ්ඤඤ්ච භාවයං" යනමෙහි සමාධියද විදර්ශනාවද වඩමින් යන අර්ථයි මෙහි චිත්ත මුඛයෙන් සමාධියද ප්‍රඥා නාම යෙන් විදර්ශනාවද දක්වනලදී "ආතා පී" යන්නෙහි අර්ථය වීර්‍ය්‍යඇති තැනැ ත්තේය යනුයි. වීර්‍ය්‍ය තෙමේ කෙලෙ සුන් තවන බැවිනුදු මනාකොට තව න බැවිනුද "ආතාප" යයි කියනු ලැ බේ ඒ වීර්‍ය්‍යය මොහට ඇතිහෙයින් "ආතාපී" නම්වේ "නිපකො" යන් නෙහි "නෙපක්ක" යයි ප්‍රඥාවට නම්. ඒ ප්‍රඥාවෙන් සමන්විතය යන අර්ථයි. "නිපකො," යනමේ පදයෙන් කර්ම ස්ථාන පරිහරණයෙහි නියුක්ත ප්‍රඥාව දක්වයි මේ ප්‍රශ්න ව්‍යාකරණයෙහි තුන්වරෙක ප්‍රඥාතොමෝ ආයේය.

ඒ තුන් ප්‍රඥාවන්කෙරෙහි ප්‍රථම ප්‍රඥා තොමෝ පිළිසිඳ නුවණ බැවින් ජාති ප්‍රඥාය දෙවන ප්‍රඥා තොමෝ විදර්ශනා ප්‍රඥාය තුන්වන ප්‍රඥා තොමෝ සාම ර්ම ආදී සියළු කෘත්‍යයන් සාර්ථ සම්ප්‍ර ජන්‍යාදී වශයෙන් පිරිසිඳ පවත්නාවූ පාරිහාරික ප්‍රඥානම්වේ "භික්ඛු" යනු සසරෙහි භය දක්නා අර්ථයෙන් භි ක්ෂු නම්වේ යන අර්ථයි මේ ගාථාවෙහි කී ශීලයෙන්ද මේ චිත්ත මුඛයෙන් ද ක්වනලද සමාධියෙන්ද මේ ත්‍රිවිධ ප්‍රඥාවෙන්ද මේ වීර්‍ය්‍යයෙන්දැයි යන ෂඩ්විධ ධර්මයෙන් සමන්විතවූ භික්ෂු තෙමේ යම්සේ පුරුෂයෙක් පොළෝ වියෙහි පිහිටා සිට මනාකොට මුවහත් තබනලද ශස්ත්‍රය නගාගෙණ මහත්වූ හුණපඳුරක් කපාද එපරිද්දෙන්ම ශීල යෙහි පිහිටා සමාධි නැමති කරගලෙහි මුවහත් තබනලද විදර්ශනා ප්‍රඥා නැ මති ශස්ත්‍රය වීර්‍ය්‍ය බලයෙන් ඔසවනා ලද පාරිහාරික ප්‍රඥා නැමති හස්තයෙ න් නගාගෙණ අනුසය වශයෙන් තමා සන්තානයෙහි පතළාවූ සියලු තෘෂ්ණා අවු ළු කපන්නේයි මුල් සිඳීම් වශයෙන් ප්‍රහාණය කරන්නේය යන අර්ථයි මේ තෙමේ මාර්ගක්ෂණයෙහි කපන්නේ මාර්ග ඥාන ප්‍රතිලාභ කාලයෙහි ඒ ජටාව කපන්නේ නම්වේ ඒ ලක්ෂණයෙහි ක පනලද ජටා ඇති (ඒ රහත් තෙමේ) දෙවියන් සහිත ලෝකයාගේ අග්‍රදක්ෂි ණාවට සුදුසුවේ මාර්ගක්ෂණය නම් මාර්ගචිත්ත වීථියෙහි ගොත්‍රභූ සිතට අ නතුරුව උපදනා එකම මාර්ගචිත්ත ක්ෂණයයි ඒ ලක්ෂණය නම් එම වීථි යෙහි ඉතිරි දෙවිසතක්ෂණය හා සක ඛ පරිනිර්වාණය දක්වා උපදවන ඵල චිත්තයෝයි—

(ගා ෮)

තෙනාහ භගවා—

"සීලෙ පතිට්ඨාය නරො සපඤ්ඤො
චිත්තං පඤ්ඤඤ්ච භාවයං
ආතාපී නිපකො භික්ඛු
සො ඉමං විජටයෙ ජටං"ති—

තත්‍රායං ඨාය පඤ්ඤාය සපඤ්ඤෝති වුත්තො තත්‍රස්ස කරණීයං නත්ථි පුරි

( පා * )

කම්මානුයොගවසෙනෙව තිස්සා සා සිද්ධා "ආතාපී නිපකො" ති එත්ථ වුත්තවිරියවසෙන පන එත්ථ සාතච්චකාරිනා පඤ්ඤාවසෙන ච සම්පජානකාරිනා හුත්වා සීලෙ පතිට්ඨාය චිත්තපඤ්ඤාවසෙන වුත්තා සමථවිපස්සනා භාවෙතබ්බාති. ඉමිනා භගවා සීලසමාධිපඤ්ඤාමුඛෙන විසුද්ධිමග්ගං දස්සෙසි එත්තාවතා හි තිස්සො සික්ඛා තිවිධකල්‍යාණං සාසනං තෙවිජ්ජතාදීනං උපනිස්සයො අන්තද්වයවජ්ජන මජ්ඣිමපටිපත්ති සෙවනානි අපායාදි සමතික්කමුපායො තීහාකාරෙහි කිලෙසප්පහාණං වීතික්කමාදීනං පටිපක්ඛො සංකිලෙසත්තය විසොධනං සොතාපන්නාදිභාවස්ස ච කාරණං පකාසිතං හොති කථං? එත්ථ හි සීලෙන අධිසීලසික්ඛා පකාසිතා හොති සමාධිනා අධිචිත්තසික්ඛා පඤ්ඤාය අධිපඤ්ඤාසික්ඛා සීලෙන ච සාසනස්ස ආදිකල්‍යාණතා පකාසිතා හොති "කො චාදි කුසලානං ධම්මානං සීලඤ්ච සුවිසුද්ධං" ති හි වචනතො "සබ්බපාපස්ස අකරණං" ති ආදිවචනතො ච සීලං සාසනස්ස ආදි තඤ්ච කල්‍යාණං අවිප්පටිසාරාදි ගුණාවහත්තා ~~~

( ස * )

තෙනාහ භගවා, එහෙයින් වදාළහ බුදුහු; සීලෙ ~~~ නෙ ~~~ ජටන්ති; තත්‍ර (තස්සං ගාථායං) ඒ ගාථාවෙහි; අයං, නරොති භික්ඛූති කියනලද මේ යොගාවචරතෙම; සාය පඤ්ඤාය සපඤ්ඤොති වුත්තො, යම් ප්‍රඥාවකින් සප්‍රඥයයි කියන ලදද; තත්‍ර, (තස්සං පඤ්ඤායං,) ඒ ප්‍රඥාවෙහි; අස්ස, මොහු විසින්; කරණීයං නත්ථි, කටයුතු නැති; ("අස්ස" යනු, සජ්ජනාකාරකයෙහි ෂෂ්ඨියි අනාන යනු අර්ථයි) සා, ඒ ප්‍රතිසන්ධි ප්‍රඥාතොමෝ; පුබ්බකම්මානුභාවෙන, පූර්ජන්මයෙහි සිදු කුසලකර්මානුභාවයෙන්; අස්ස, ඒ යොගීහට; සිද්ධා, සිද්ධයි; ආතාපී නිපකො ති එත්ථ, අතාපීනිපකො යන මෙහි; වුත්තවිරියවසෙන පන; කියනලද වීර්‍ය්‍යවශයෙන් වනාහී; තෙන, ඒ යොගීහු විසින්; සාතච්චකාරිනා හුත්වා, සතතප්‍රවෘත්ත වීර්‍ය්‍යඇත්තහු විසින්; පඤ්ඤාවසෙන පන, යථොක්ත නෛපක්‍ය සඞ්ඛ්‍යාත ප්‍රඥාවශයෙන්; සම්පජානකාරිනා හුත්වා, සියලු කර්තව්‍යයන් ඥානයෙන් කරන්නහු විසින්; නොහොත් ඒ ඒ කර්තව්‍යයෙහි ඥානය කරන්නහු විසින් නොහොත් ඥානය උපදවන්නහු විසින් ("යංකිඤ්චි කත්තබ්බං තස්ස සබ්බස්ස සම්පජානවසෙනෙව කරණසීලො, තස්ස වා සම්පජානකාරො එතස්ස අත්ථි සම්පජානස්ස වා අසම්මොහස්ස කාරකො උප්පාදකොති සම්පජානකාරී" යනු මෙතැන ටීකායි) සීලෙ පතිට්ඨාය, ශීලයෙහි පිහිටා; චිත්තපඤ්ඤාවසෙන වුත්තා සමථවිපස්සනා, චිත්තප්‍රඥාවශයෙන් උක්තවූ සමථ විදර්ශනාවෝ; භාවෙතබ්බා'ති; වැඩිය යුත්තාහයි "ඉමං විසුද්ධිමග්ගං" යී සම්බන්ධකරණු—අත්‍ර, මේ ගාථාවෙහි; භගවා, භාග්‍යවත් තෙමේ; සීලසමාධිපඤ්ඤාවසෙන, ශීලසමාධිප්‍රඥාවශයෙන්, ඉමං, විසුද්ධිමග්ගං දස්සෙති; මේ විශුද්ධිමාර්ගය දක්වී (වීර්‍ය්‍යශීලාදීන් ගේ සම්පාදනයට අඞ්ගවනබැවින් වෙනම නොගෙණ "සීලසමාධිපඤ්ඤාමුඛෙන" යුහු) එත්තාවතා, මෙපමණ දෙශනාවෙන්; තිස්සො සික්ඛා, තුන්ශික්ෂාවෝද; තිවිධකල්‍යාණං සාසනං, ත්‍රිවිධවූ කල්‍යාණඇති ප්‍රතිපත්ති ශාසනයද; තෙවිජ්ජතාදීනං උපනිස්සයො, ත්‍රෛවිද්‍ය

ඣානාදීන්ට උපනිශ්‍රයද; අනවජ්ජ ජ්ජානුයුත්ති ප්‍රතිපත්තිසෙවනානි, අනවද්‍යයට නොපැමිණ මධ්‍යම ප්‍රතිපත්ති සේවනයෝද (භාවනාවෝද යන අර්ථයි) අපායාදිසමතික්කමනූපායො, අපායාදීන්ගේ සමතික්‍රමණයට උපායද; තීනාකාරෙන කිලෙසප්පහාණං, තුන්ප්‍රකාරයකින් ක්ලේශයන්ගේ ප්‍රහාණයද; වීතික්කමාදිනං පටිපක්ඛො, ව්‍යතික්‍රමාදීන්ට ප්‍රතිපක්ෂද; සංකිලෙසත්තය විසොධනං, සංක්ලේශයන් තුන්දෙනාගේ විශෝධනයද; සොතාපන්නාදී භාවස්සකාරණං ච, ශ්‍රොතාපන්නාදී භාවයට කාරණාද; පකාසිතං හොති, ප්‍රකාශකරණලදනේ; කථං කෙසේ දයත්; එවං හි, ඒ ගාථාවෙහි. සීලෙන, ශීලයෙන්; අධිසීලසික්ඛා පකාසිතා, අධිශීල ශික්ෂා ප්‍රකාශකරණලදී; (ගාථාවෙහි "සීලෙ" යි සාමාන්‍යයෙන් කීවද තණ්හාජටාවිජටනයට පිහිට ශීලයම අභිමතනුයි "සීලෙන අධිසීලසික්ඛා පකාසිතා" යි කීහු-භවගාමිශීලය ශීලනම්වෙයි විභවගාමි ශීලය අධිශීලශික්ෂානම්වේ සෙසු ශික්ෂාවෙහි ද මෙමනයයි) සමාධිනා, සමාධින් "අධිචිත්තසික්ඛා පකාසිතා" යොදනු සමාධිනා අධිචිත්ත සික්ඛා, සමාධියෙන් අධිචිත්ත ශික්ෂාතොමෝ ප්‍රකාශකරණලදී; පඤ්ඤාය අධි පඤ්ඤාසික්ඛා, ප්‍රඥාවෙන් අධිප්‍රඥා ශික්ෂාතොමෝ ප්‍රකාශකරණලදී; සීලෙනච, අධිශික්ෂාවූ ශීලයෙන්; සාසනස්ස, ශාසනයාගේ; ආදිකල්‍යාණතා පකාසිතා හොති, ආදිකල්‍යාණභාවය ප්‍රකාශකරණලදී; කුසලානං ධම්මානං, මාර්ග කුශල ධර්මයන්ට; නොහොත් අනවද්‍ය ධර්මයන්ට (මේ අර්ථයෙහි ඵලධර්මයෝද සඞ්ග්‍රහවෙත්) කොවාදී, කවරෙක්ආදිද; සීලව සුවිසුද්ධන්ති ති වචනතො, සුවිශුද්ධ ශීලයයි වදාළබැවින්ද; සබ්බපාපස්ස අකරණනායි, සියලු සාවද්‍යයාගේ අක්‍රියාව (මෙම වචනයෙන් චාරිත්‍රවාරිත්‍ර භෙදඇති සියලු ශීලයම ගැනෙයි; "කතබ්බාකරණං වපි නිසාවජ්ජමෙව" යි කීබැවින්) ආදිවචනතො, "සබ්බපාපස්ස අකරණං" යනාදී ගාථාවෙහි කී සමාධිප්‍රඥාවන්ට ආදීයෙහි කී බැවින් ("ආදිමහි වචනතො" යි කීවෙන්-ආදිබවද උපකාරීකුශලධර්මයන් තන්මූලක බැවින් නොහොත් "ආදීනංයා වචනං ආදිවචනං" යි ගෙණ ආදිග්‍රහණින් "සීලංසමාධි පඤ්ඤාච විමුත්තිච අනුත්තරා" යනාදීන්ගේ සඞ්ග්‍රහය දතයුතු) සීලං සාසනස්ස ආදි, ශීලය ශාසනයට ආදියි; තඤ්ච, එද; කල්‍යාණං, කල්‍යාණයි; අවිප්පටිසාරාදි කල්‍යාණං, කල්‍යාණයි; අවිප්පටිසාරාදි ගුණාවහත්තා, ශීලයෙන් විප්‍රතිසාර නොහුන්ගේ දුර්භාවයෙන් අවිප්‍රතිසාරාදි ගුණඑළවන හෙයිනි-

( ගා * )

එසේහෙයින් "සීලෙපතිට්ඨාය" යනාදී ගාථාව බුදුහු වදාළහ ඒ ගාථාවෙන් කියනලද යොගාවචර පුද්ගලතෙම යම් ප්‍රඥාවකින් සප්‍රාඥයයි කියනලද්දේද එයින් මතු නොහොත් ඒ මාර්ග ඵල ලැබීමෙන් ඔබ්බෙහි ප්‍රඥාවෙහි මේ හු විසින් කටයුත්තක් නැත්තේය. ඒ ප්‍රතිසන්ධි ප්‍රඥාතොමෝ පූර්වජාතියෙහි රැස්කළ කුශලකර්මානුභාවයෙන් ඒ යොගීහට සිඩයි "ආතාපී නිපකො" යන මෙහි කියනලද වීර්‍යවශයෙන් වනාහි නිරතුරු පැවති වීර්‍යඇත්තාවූ යථොක්ත නෙපක්කසඞ්ඛ්‍යාත ප්‍රඥාවශයෙන් සියලු කාර්‍යයුතෙනති සම්ප්‍රජන්‍යය උපදවන්නාවූ ඒ යොගී විසින් ශීලයෙහි පිහිටා විදර්ශනාප්‍රඥාවශයෙන් කියනලද සමථවිදර්ශනාවෝ වැඩියයුත්තාහ. මේ ගාථාවෙහි භාගාවතුන්වහන්සේ ශීලසමාධි

( හා * )

ප්‍රඥාවශයෙන් මේ විශුද්ධිමාර්ගය දක්වන මේ පමණ දේශනාවෙන් තුන් ශික්ෂාවෝද ත්‍රිවිධවූ කල්‍යාණයෙන් යුක්තවූ ප්‍රතිපත්ති ශාසනයද ත්‍රිවිද්‍යාදීන්ට උපනිශ්‍රයද (කෙලෙස් නැසීම සඳහා) ශරීරය වෙහෙසකිරීමය කාමසෙවනාය යන අන්තවයට නොපැමිණ මධ්‍යම ප්‍රතිපත්තිසේවනයද අපායාදීන් ඉක්මවීමට කටයුතු උපායද තුන්ප්‍රකාරයකින් කෙලෙසුන්ගේ ප්‍රහාණයද පාපාචාරාදීන්ට ප්‍රතිපක්ෂධර්මයද කෙලෙසයන් තුන්දෙනාගේ විශෝධනයද සෝවාන් ආදි භාවයන්ගේ කාරණාද ප්‍රකාශකරණලද්දේනම්වෙයි.

ඒ කෙසේදයත් ?

ඒ ගාථාවෙහි ශීලයෙන් අධිශීලශික්ෂාවද සමාධියෙන් අධිචිත්තශික්ෂාවද අධිශික්ෂාඛ්‍ය ශීලයෙන් ශාසනයාගේ ආදි කල්‍යාණත්වය ද ප්‍රකාශකරණලදී ලෞගිකකුශලධර්මයන්ට නොහොත් අනවද්‍ය ධර්මයන්ට සාවරධර්මයක් මුල් වන්නේද යන මෙහි සුවිශුද්ධශීලය මුලැයි වදාළ බැවින්ද "සබ්බපාපස්ස අකරණං" යනාදි ගාථාවෙහි සියලු පාපයන්ගේ අක්‍රියා සඞ්ඛ්‍යාතවූ චරිත්‍ර වාරිත්‍රභේදඇති ශීලයම ආදියෙහි කීබැවින් ද ශීලය ශාසනයට මුල්වෙහි ශීලයෙන් නිපිළිසර නොවූවන්ගේ ද්‍රූරී තුනාභාවය කාරණහෙයින්ද අවිප්‍රතිසාරාදී ගුණ එලවන හෙයින් ද එම කල්‍යාණද වෙයි.

( පා † )

සමාධිනා මජ්ඣෙ කල්‍යාණතා පකාසිතා හොති "කුසලස්ස උපසම්පදා" ති ආදිවචනතො හි සමාධි සාසනස්ස මජ්ඣෙ සො ච කල්‍යාණො ඉද්ධිවිධාදි ගුණාවහනතො. පඤ්ඤාය පරියොසානකල්‍යාණතා පකාසිතා හොති "සචිත්ත පරියොදපනං එතං බුද්ධානසාසනං" ති වචනතො පඤ්ඤුත්තරතොච පඤ්ඤා සාසනස්ස පරියොසානං සා ච කල්‍යාණා ඉට්ඨානිට්ඨෙසු තාදිභාවාවහනතො.

( ස † )

සමාධිනා, අධිචිත්තශික්ෂාඛ්‍ය සමාධිය විසින්; මජ්ඣෙ කල්‍යාණතා, මධ්‍යයෙහි කල්‍යාණබව; පකාසිතා හොති, ප්‍රකාශකරණලදී; කුසලස්ස උපසම්පදා ති වචනතො, යම්හෙයකින් සමාධිය උපදවීමයයි කීබැවින් (සියලු ශාසනය සර්වඥයාගේ ප්‍රවෘත්ත ගාථාවෙහි ආදිපදයෙන් ආදියෙහි පිළිපැද්දයුතු ශීලයද තුන්වන පදයෙන් පර්‍යවසානයෙහි පිළිපැද්දයුතු ප්‍රඥාව ද ගෘහීත බැවින් පාරිශේෂ්‍යයෙන් මධ්‍යයෙහි පිළිපැදදයුතු සමාධිය දෙවන පදයෙන් ගෘහීතවන බැවින් "කුසලස්ස උපසම්පදා" ආදී වචනතොහි සමාධි සාසනස්ස මජ්ඣෙ" යි කීන කුසලශබ්දය සමාධිපර්‍යායයෙහියින් නොවෙයි දතයුතු) සොච, ඒ සමාධියද; කල්‍යාණො, කල්‍යාණය; ඉද්ධිවිධාදිගුණාවහනතො, සෘද්ධිවිධ දිව්‍යශ්‍රොත්‍රාදි ගුණඑලවන හෙයින් (සමාහිතනාදි අෂ්ටාංග සමන්නාගමනයෙන් සිත්හි අභිනිහාරක්ෂම කල කල පූර්වොපනිශ්‍රය ඇත්තාහට සමාධිය සෘද්ධිවිධාදී ගුණාවහබවවේ) පඤ්ඤාය, අධිප්‍රඥාශික්ෂාඛ්‍ය ප්‍රඥායෙන්; පරියොසානකල්‍යාණතා, පර්‍යවසාන කල්‍යාණ බව; පකාසිතා හොති; ප්‍රකාශ කරණලදී; සචිත්ත පරියොදපනං, තමා සිත හැම පරිද්දෙන් කෙලෙසුන් කෙරෙන් පිරිසිදුකිරීමය යන; එතං, මේ; බුද්ධානසාසනං, බුද්ධවරයන්ගේ අනුශාසනායයි; වචනතොති, වදාළ බැවින්ද; පඤ්ඤුත්තරතො, පඤ්ඤාව කෙළවරකොට ඇතිබැවින්ද; පඤ්ඤා

සාසනස්ස පරියොසානං, ප්‍රඥාතොමෙ ශාසනයාගේ පර්‍යවසානයයි (අග්‍රමාර්ග ප්‍රඥාව අධිගතකල්හි ප්‍රව්‍රජ්‍යාකෘත්‍ය පරිනිෂ්ඨිත වේනුයි ප්‍රඥා ශාසනයාගේ පර්‍යවසානනමු.

මෙම වදාළහ.

“සික්ඛානිසංසමිදං භික්ඛවෙ බ්‍රහ්ම චරියං වුස්සති සතාධිපතෙය්‍යං පඤ්ඤුත්තරං විමුත්තිසාරං” ති ප්‍රඥාකෘත්‍යය උත්තම ප්‍රයෝජනකල්හි මින්මත්තෙහි කාව පුත්‍රතන් නැතිබැවින් ශාස්තෘයාගේ ප්‍රඥෝත්තරතාව දතයුතු) සාව, ඒ ප්‍රඥා; කල්‍යාණං, කල්‍යාණයි; ඉට්ඨානි ට්ඨේසු තාදිභාවාවහනතො, ඉෂ්ටානිෂ්ටයෙහි තාදිබව (එක්වැනිබව අනුනය ප්‍රතිඝ නැතිබව) එළවනහෙයිනි

(මෙහු කීහ.

“යාදිසො ඉට්ඨෙසු ලාභාදි සුච අනුනයාභාවතො තාදිසො අනිට්ඨෙසු අලාභාදිසුව පටිඝාභාවතො තතො එවවා යාදිසො අනාපාථගතෙසු ඉට්ඨා නිට්ඨෙසු තාදිසො ආපාථගතෙසු පීති තාදී, තස්ස භාවො තාදිභාවො තස්ස ආවහනතො වා” ති)

(භා †)

තමා සතන්හි සමාධි උපදවීමයයි කී බැවින් අධිචිත්ත ශික්ෂාව සමාධිහු විසින් ශාසනයාගේ මධ්‍යයෙහි කල්‍යාණ බව ප්‍රකාශකරණලදී ඒ සමාධිය ද ඍද්ධිවිධාදිව්‍යශ්‍රෙෂ්ඨාදි ගුණ එළවන හෙයින් කල්‍යාණවෙයි අධිප්‍රඥා ශික්ෂාවූ ප්‍රඥාවෙන් ශාසනයාගේ කෙළවර යහපත්බව ප්‍රකාශකරණලදී තමා සිත හැමපරිද්දෙන් කෙලෙසුන්කෙරෙන් පිරිසිදු කිරීමය යන මේ වචනය මුදුන රජහුගේ අනුශාසනායයි වදාළ බැවින්ද ඤුණයම කෙළවරකොට ඇතිබැවින්ද ප්‍රඥාතොමෝ ශාසනයාගේ කෙළවරවන්නීය යහපත් අයහපත් අරමුණුදෙස්හි එක්වැනිබව හෙවත් ප්‍රීති පදවීම හාස්‍යදෙසා නැතිබව එළවන හෙයින් ඒ ප්‍රඥාවද කල්‍යාණබවෙයි.—

(භා ‡)

“සෙලො යථා එකඝනො
වාතෙන න සමීරති
එවං නින්දාපසංසාසු
න සමිඤ්ජන්ති පණ්ඩිතා” ති වුත්තත්තං

තථා සීලෙන තෙවිජ්ජතාය උපනිස්සයො පකාසිතො හොති සීලසම්පත්තිං හි නිස්සාය තිස්සො විජ්ජා පාපුණාති න තතො පරං—

සමාධිනා ඡළභිඤ්ඤතාය උපනිස්සයො පකාසිතො හොති සමාධිසම්පදං හි නිස්සාය ඡළභිඤ්ඤා පාපුණාති න තතො පරං— පඤ්ඤාය පටිසම්භිදාප්පභෙදස්ස උපනිස්සයො පකාසිතො හොති පඤ්ඤාසම්පත්තිං හි නිස්සාය චතස්සො පටිසම්භිදා පාපුණාති න අඤ්ඤෙන කාරණෙන-සීලෙන ච කාමසුඛානුයොග සඞ්ඛාතස්ස අන්තස්ස වජ්ජනං පකාසිතං හොති සමාධිනා අත්තකිලමථානුයොග සඞ්ඛාතස්ස පඤ්ඤාය මජ්ඣිමාය පටිපත්තියා සෙවනං පකාසිතං හොති— තථා සීලෙන අපායසමතික්කමනුපායො පකාසිතො හොති— සමාධිනා කාමධාතු සමතික්කමනුපායො— පඤ්ඤාය සබ්බභව සමතික්කමනුපායො—

(ස ‡)

යථා, යම්සේ; එකඝනොසෙලො, එක ඝනවූ ශෛලය; වාතෙන නසමීරති, වාතයෙන් නොසැලේද; එවං, මෙසේ; නින්දාපසංසාසු, නින්‍දා ප්‍රශංසාවෙහි; පණ්ඩිතා, පණ්ඩිතවරහු; (රහත්හු) න සමිඤ්ජන්ති, නොසැලෙතියි; වුත්

තාංති, වදාළේයැයි ("යථාසීලාදයො අ
භිඤ්ඤා සීලාදීනං පකාසකා තථා මෙ
විජ්ජාදීනං උපනිස්සයස්ස පකාස
කා" යි යුතු තථා ශබ්දයාගේ අර්ථයි )
සීලෙන මෙ විජ්ජාය උපනිස්සයො
පකාසිතො හොති, ශීලයෙන් මෙතු
විද්‍යාත්‍රයට උපනිශ්‍රය ප්‍රකාශකාරණලදී;
සීලසම්පත්තිං හි නිස්සාය, ශීල සම්ප
ත්තිය නිසා; තිස්සො විජ්ජා පාපුණා
ති. ත්‍රිවිද්‍යාවට පැමිණේ; නාතතොපරං,
ත්‍රිවිද්‍යාවන් මතු අභිඥා පටිසම්භිදා
වන්ට උපනිශ්‍රය නොවේ (සමාධි ප්‍රඥා
වන්ටමෙන් අභිඥාපටිසම්භිදාවන්ට
ශීලය සහායහෙයු නොවන බැවින්
ශීලසම්පත්තියෙන් විද්‍යාත්‍රය සම්පත්ති
ය කොසේ වේදයි යත්? යම්හෙයකින්
ශීලය පරිශුද්ධවන්නේ සහිසම්පජඤ්ඤ
බලයෙහුද්ද කම් සමහනා ඥනබලයෙය
හුද්ද සංක්ලේශ මලයෙන් විශුද්ධවෙයි.
පරිපූර්ණ වූයේද යෙයි එහෙයින් ශීල
සම්පත්ති සිද්ධවන්නී උපනිශ්‍රය සම්ප
ත්ති බැවින් සම්බල සඥණබල දෙදෙ
න වලවාහුයි සීලසම්පත්තියගේ විද්‍යා
ත්‍රයට උපනිශ්‍රය බව වෙද්නවයි.
සමාධි බලයෙයන් වනාති පූර්වෙනිවාසා
නුස්මෘති විද්‍යාවයි. සම්පජඤ්ඤ
යෙන් සියළු කායානුයෙගි සුද්ධයට කාරි
කා පරිච්ඡෙදයෙන් චුතූපපාත ඥනානු
බන්ධ දිව්‍යචක්ෂුර්ඥ සිද්ධවෙයි එහෙ
ක්‍රමාභාවයෙන් සංක්ලේශ ප්‍රහාණය
සම්භව වනහෙයින් එවෙනිපනිශ්‍රය
ක විශෙෂයෙන් වන අභිඥාය ශුද්ධත්
ආශ්‍රවක්‍ෂය විද්‍යාසිද්ධවෙයි පූර්වෝක්ත
සමාධි ප්‍රඥාවන්ගේ පාරිපූරියක් නැති
වම ශීලය ආශ්‍රවක්‍ෂය ඥනයට උපනි
ශ්‍රය වූ ශුෂ්ක විදර්ශක ක්ෂීණාශ්‍රවය
න් ඇසින් හැඟවියයුතු. මෙසේ සහාය
වෙසවු සම්ප්‍රදානයෙන් ශීලය ත්‍රිවිද්‍යාවට

උපනිශ්‍රයවෙයි දන්නේ) සමාධිනා, ස
මාධියෙන්; ඡළභිඥානාං උපනිස්ස
යො පකාසිතො හොති, ෂඩභිඥවට
උපනිශ්‍රය ප්‍රකාශකාරණලදී; සමාධි ස
ම්පදං නිස්සාය, සමාධිසම්පත්තිය
නිසා; ඡ අභිඤ්ඤා පාපුණාති, ෂට් අභි
ඥවන්ට පැමිණේ ("සමාහිතො යථා
භූතං පජානාති" යි කී බැවින් සමාධි
සම්පදව ෂඩභිඥවට උපනිශ්‍රයවේ)
න ආතතොපරං, ප්‍රඥයෙන් පටිසම්භිදා
වන්ට සමාධිනු සහාය හෙතු නොවන්
නොතත් අභිඥවෙන් මතු පටිසම්භිදා
නොවේ) පඤ්ඤාය පටිසම්භිදාපභෙද
ස්ස උපනිස්සයො පකාසිතො හොති,
ප්‍රඥවෙන් ප්‍රතිසම්භිද ප්‍රභෙදයට උපනි
ශ්‍රය ප්‍රකාශිතවේ; පඤ්ඤාසම්පත්තිං නි
ස්සාය, ප්‍රඥ සම්පත්තිය නිසා; චත
ස්සො පටිසම්භිදා පාපුණාති. සිව්ප්‍රති
සම්භිදාවට පැමිණේ; න අඤ්ඤේන කා
රණෙන, අන්‍ය කාරණයකින් නො
වේ ("යොගා වෙ ජායතෙ භූරි" යි කී
බැවින් පූර්වයොගය ගරුවාසය දෙශ
භාෂා කෞශල්‍යය උද්ග්‍රහය පරිප්‍ර
ශ්නය යනාදීන් පරිභාවිතවූ ප්‍රඥසම්
පත්ති නොමෙවී ප්‍රතිසම්භිදා හෙදයට
උපනිශ්‍රය හැයි ප්‍රභෙදයො බොධි සමය
ක් සමබොධියුද්ධ ප්‍රඥසම්පත්තිය නිසා
වන බැවින් ප්‍රඥවෙන් අනාධිගතාවන්
විශෙෂයක් නැති බැවින්ද ප්‍රඥවද ප
ටිසම්භිදා භෙදයට ඒකාන්ත කාරණ
බැවිනුදු යටමෙන් "න තතොපරං" යි
නොකීය. "න අඤ්ඤේන කාරණේ
නා" යි කීහ. "සීල සම්පත්තිං නිස්සා
ය" යි කී බැවින් සමාධි විජ්ජාගතාවූ
බැවින් නිරවශෙෂවූ ෂඩභිඥයෙන් යම
ක් කට සිද්ධ නොවෙද ඕනට උත්තා
නට පරිච්ඡෙද ලෙශයෙන් සමාධි සම්ප
ත්තිය හැත්තුයි ත්‍රිවිද්‍යාවන්ගේ දශ

ලෙසදක පදශභාවයක් ඇතද ශීලසම්පත්ති සමුදාගතවූ ත්‍රිවිද්‍යාවෝම මෙහිසි දක්වනලදහුයි කියේමැයි. "පඤ්ඤාස මාපත්ති සමුදාගතා චතස්සො පටිසම්භිදා උපනිස්සය සම්පන්නස්ස මග්ගෙනෙව ඉජ්ඣන්ති මග්ගක්ඛණෙ එව තාසං පටිලද්ධත්තා එවං සීලසම්පත්ති සමුදාගතා තිස්සො විජ්ජා, සමාධි සම්පත්ති සමුදාගතාච ඡ අභිඤ්ඤා උපනිස්සය සම්පන්නස්ස මග්ගෙනෙව ඉජ්ඣන්තීති මග්ගාධිගමෙනෙව තාසං අධිගමො වෙදිතබ්බො. පච්චෙක බුද්ධානං සම්මාසම්බුද්ධානඤ්ච පච්චෙකබොධි සම්මාසම්බොධි සමධිගමෙ සදිසානි ඉජ්ඣමානං අරියානං ඉමෙ විසෙසාධිගමා' යි විනය සූත්‍රාභිධර්මයෙහි සම්‍යක් ප්‍රතිපත්තීන් ත්‍රෛවිද්‍යතාදීන්ට උපනිශ්‍රතාවද යෙදුනාකාර විධිත්ව වෙදිතව්‍යයි)

සීලෙන ච කාමසුඛානුයොග සඞ්ඛාතස්ස අන්තස්ස වජ්ජනං, සමෙසනා ශීලය හට කාමසේවා නැති බැවින් ශීලයෙන් කාමසුඛයෙහි ඇලීමය යන අන්තයාගේ වර්ජනය පහළකරණලදී; සමාධිනා අත්තකිලමථානුයොග සඞ්ඛාතස්ස (ධ්‍යානසුඛලාභී හට ධ්‍යානයෙන් ලැබෙන් ප්‍රණීත රූපයෙන් පැතිරෙණලද කාය ඇති බැවින් කාය ක්ලාන්ත සම්භවයම නැත්තේය) සමාධියෙන් කායක්ලමථයෙහි යෙදීමය යන අන්තයාගේ වර්ජනය (පහළකරණලදී)

පඤ්ඤාය මජ්ඣිමාය පටිපත්තියා සෙවනං, ප්‍රඥාවෙන් මධ්‍යම ප්‍රතිපත්ති සෙවනය පහළකරණලදී (උක්තකාමව නිශ්‍රිතයෙන් එකාන්තයෙන් ආයති මාර්ගයම මධ්‍යම ප්‍රතිපත්ති නාමැයි "පඤ්ඤා" යනු මාර්ගප්‍රඥාවම ගතයුතුය. එතකුදුවුවත් ලෞකික ප්‍රඥා වශයෙනුදු අන්තවය වර්ජනය පහළ කරයුතු) සීලෙන අපායසමතික්කමනුපායො, සිල්පත්හු සුගතියෙහිම උපදනා බැවින් ශීලයෙන් අපාය ඉක්මීමට උපාය පහළකරණලදී (ශීලසමාධීන් අතික්‍රාන්තවූ කාමාදී භවයන් කාරණය අප්‍රහීණ හෙයින් අනතික්‍රාන්තම වෙයි; ප්‍රඥායෙන් වනාහි සුප්‍රහීණ හෙයින් අතික්‍රාන්ත නම් වේත්හුයි. "පඤ්ඤාය සබ්බභව සමතික්කමනුපායො" යි කීහු) සමාධිනා කාමධාතු සමතික්කමනුපායො, ධ්‍යානලාභීහු මහද්ගත භූමියෙහිම උපදනා බැවින් සමාධියෙන් කාමභව සමතික්‍රමයට උපාය පහළකරණලදී; පඤ්ඤාය සබ්බභව සමතික්කමනුපායො, ප්‍රඥාවෙන් කාමභවාදී භවභවයන්ගේ සමතික්‍රමණයට උපාය පහළකරණලදී —

( හා‡ )

යම්සේ මෛශල්‍යය උදීගය වාතයෙන් ගහාසැලේද මෙමසේම ත්‍රිවිද ප්‍රශංසාවෙහි .හත්හු පහසැලෙන්හි වදාළේමැයි. එසේම ශීලයෙන් ත්‍රිවිද්‍යා ලාභීභාවට උපනිශ්‍රය ප්‍රකාශකරණලද්දේය ශීල සම්පත්තිය නිසා ත්‍රිවිද්‍යාවට පැමිණෙත්තෝය ත්‍රිවිද්‍යාවෙන් මතු ඒ ශීලය අභිඥා ප්‍රතිසම්භිදාවන්ට උපනිශ්‍රය නොවන්නෝය සමාධියෙන් ෂඩභිඥාවට උපනිශ්‍රය ප්‍රකාශකරණලද්දේය සමාධි සම්පත්තිය නිසා ෂඩ් අභිඥාවට පැමිණෙන්නෝය අභිඥාවෙන් මතු ප්‍රතිසම්භිදා නොවන්නෝයි ප්‍රඥාවෙන් ප්‍රතිසම්භිදා ප්‍රභේදයට උපනිශ්‍රය ප්‍රකාශිතයි. ප්‍රඥාසම්පත්තිය නිසා සිව්පිළිසිඹියාවට පැමිණෙන්නෝය අන්‍ය කාරණයකින් නොවන්නෝයි ශීලවන්තයා හට කාමසේවා නැති බැවින් ශීලයෙන් කාමසැපයෙහි ඇලීමය යන

අනාගාමීන් දුරුකිරීම ප්‍රකාශකරණලද්දේය. ධ්‍යාන සුඛලාභී හට ධ්‍යානයෙන් උපන් ප්‍රණීත රූපයෙන් පැතිරෙණලද ශරීර ඇති බැවින් ශරීර විඛාධාවගේ හටගැන්ම නැති බැවින් සමාධියෙන් ශරීරය වෙහෙස කිරීමෙහි යෙදීමය යන අන්තයාගේ දුරුකිරීම ප්‍රකාශකරණලද්දේය. ප්‍රඥාවෙන් ම ධර්ම ප්‍රතිපත්ති සේවනය ප්‍රකාශකරණලද්දේය. සිල්වත්හු සුගතියෙහි උපදනා බැවින් ශීලයෙන් අපාය ඉක්මීමට උපාය ප්‍රකාශකරණලද්දේය. ධ්‍යාන ලාභීහු රූපාරූප භූමියෙහි උපදනා බැවින් සමාධියෙන් කාම භවය ඉක්මීමට උපාය ප්‍රකාශකරණලද්දේය. ප්‍රඥාවෙන් කාම භවාදි නව භවයන්ගේ ඉක්මීමට උපාය ප්‍රකාශකරණලද්දේය.

( පා ¶ )

සීලෙන ච තදඞ්ගප්පහාණවසෙන කිලෙසප්පහානං පකාසිතං හොති. සමාධිනා වික්ඛම්භනප්පහාණවසෙන, පඤ්ඤාය සමුච්ඡෙදප්පහාණවසෙන. තථා සීලෙන කිලෙසානං වීතික්කමපටිපක්ඛො පකාසිතො හොති, සමාධිනා පරියුට්ඨානපටිපක්ඛො, පඤ්ඤාය අනුසයපටිපක්ඛො. සීලෙන ච දුච්චරිතසංකිලෙසවිසොධනං පකාසිතං හොති. සමාධිනා තණ්හාසංකිලෙසවිසොධනං, පඤ්ඤාය දිට්ඨිසංකිලෙසවිසොධනං.

( ස ¶ )

සීලෙන ච, ශීලයෙන්ද; තදඞ්ගප්පහාණවසෙන, දීපාලෝකයෙන් අන්ධකාරයක්හු මෙන් පාණාතිපාත වෙරමණී ආදී ඒ ඒ කුශලාංගයෙන් පාණාතිපාතාදී ඒ ඒ අකුශලාංගයන්ගේ ප්‍රහාණ වසයෙන්; කිලෙසප්පහානං පකාසිතං හොති, ක්ලේශයන්ගේ ප්‍රහාණය ප්‍රකාශකරණලද්දී ("ආලොකෙනෙව තමස්ස පච්චනීකවසෙනෙව පහාතබ්බස්ස කුසලඞ්ගෙන තස්ස තස්ස අකුසලඞ්ගස්ස පහානං තදඞ්ගප්පහානං")යි. සමාධිනා වික්ඛම්භනප්පහාණවසෙන, උපචාරාර්පණා භේද සමාධීහු විසින් (ප්‍රවෘත්ති නිවාරණය කරණ බැවින් සෙවලප්‍රකාරයෙන් ජලපාලයෙහි ශෛවාලයන්මෙන්) ඒ ඒ නීවරණ ධර්මයන්ගේ විෂ්කම්භන ප්‍රහාණ වශයෙන් ක්ලේශ ප්‍රහාණය ප්‍රකාශිත වේ; පඤ්ඤාය සමුච්ඡෙදප්පහාණවසෙන, ආර්‍යමාර්ග ප්‍රඥාවෙන් සමුදයපාක්ෂික ක්ලේශ ගණයාගේ අත්‍යන්ත අප්‍රවෘත්ති සංඛ්‍යාත සමුච්ඡෙද ප්‍රහාණ වශයෙන් ක්ලේශ ප්‍රහාණය ප්‍රකාශිතවේ; තථා, එසේම; කිලෙසානං වීතික්කමපටිපක්ඛො, සංක්ලේශ ධර්මයන්ගේ කායිම් ක්ලේශයන්ගේ හෝ කායවාග් ද්වාරයෙහි ව්‍යතික්‍රම සංඛ්‍යාත අධ්‍යාචාරයට ප්‍රතිපක්ෂය; සීලෙන පකාසිතො හොති, ශීලය අව්‍යත් ක්‍රම ස්වභාව බැවින් ශීලයෙන් ප්‍රකාශිත වේ; සමාධිනා පරියුට්ඨානපටිපක්ඛො, (කුශලෝත්පත්තියට අවකාශ නොදී සිත්හි පැලඳගෙණ ක්ලේශයන්ගේ සිටීම පරියුට්ඨාන නම්වෙයි) ඒ පරියුට්ඨානයට ප්‍රතිපක්ෂය සමාධිනු පරියුට්ඨාන ප්‍රහායක බැවින් සමාධීන් ප්‍රකාශිතවේ; පඤ්ඤාය අනුසයපටිපක්ඛො, (අප්‍රහීණ භාවයෙන් සන්තානානුගතව අනුරූප කාරණ ලාභයෙහි උත්පත්තියට අභිමුඛ ස්ථාමගත කාමරාගාදි) සප්තානුශය ක්ලේශයන්ට ප්‍රතිපක්ෂය ප්‍රඥාවෙන් ප්‍රකාශවේ (ආර්‍ය මාර්ග ප්‍රඥාව අනුශය ප්‍රහායක බැවින්) දුච්චරිත සංකිලෙස විසොධනං, කාය දුශ්

චරිතාදි දුශ්චරිත සංක්ලේශයාගේ තදඞ්ගප්‍රහාණ සංඛ්‍යාත විශෝධනය; සීලේන පකාසිතං හොති, ශීලයෙන් ප්‍රකාශිතවේ (ශීලය ව්‍යතික්‍රම ප්‍රතිපක්ෂ බැවින්) ("දුච්චරිතවසෙන සත්තානං කිලෙසෙති විබාධෙති උපතාපෙති වාති සංකිලෙසො" යනුවේ) සමාධිනා තණ්හා සංකිලෙස විසොධනං, තෘෂ්ණා සංක්ලේශයන්ගේ විෂ්කම්භන ප්‍රහාණ සංඛ්‍යාත විශෝධනය සමාධින් ප්‍රකාශිතවේ (සමාධිය පර්‍යුත්ථාන ප්‍රතිපක්ෂ බැවින් තෘෂ්ණාවටද සමාධිය සෘජු ප්‍රතිපක්ෂ බැවිනි) පඤ්ඤාය දිට්ඨිසංකිලෙස විසොධනං, දෘෂ්ටි සංක්ලේශයාගේ සමුච්ඡේද ප්‍රහාණ සංඛ්‍යාත විශෝධනය ප්‍රඥාවෙන් ප්‍රකාශිතවේ (ප්‍රඥාව අනුශය ප්‍රතිපක්ෂ බැවින් අයථාවද් ග්‍රාහි දෘෂ්ටිගතයන්ට යථාවද් ග්‍රාහිණී ප්‍රඥාවද සෘජු ප්‍රතිපක්ෂ බැවිනි)

( හා ¶ )

ශීලයෙන් (ප්‍රදීපා ලෝකයෙන් අන්ධකාරය නසන්නාක් මෙන්) ප්‍රාණාතිපාත වෛරමණී ආදී ඒ ඒ කුශලාඞ්ගයෙන් ප්‍රාණාතිපාතාදී ඒ ඒ අකුසලාඞ්ගයන්ගේ ප්‍රහාණ වශයෙන් ක්ලේශ ප්‍රහාණය ප්‍රකාශ කරණලද්දේය. උපචාරාර්පණා සමාධිය විසින් පැවැත්ම වලක්වන බැවින් (කළය ගැසීමෙන් දිය මතුයෙහි සෙවෙල් පනම් යන්නාක් මෙන්) ඒ ඒ නිවරණ ධර්මයන්ගේ විෂ්කම්භන ප්‍රහාණ වශයෙන් ක්ලේශ ප්‍රහාණය ප්‍රකාශිතවේ ප්‍රඥාවෙන් තාණ්හා පක්ෂයෙහිවූ ක්ලේශ සමූහයාගේ අභිශයින් නොපැවැත්මයයි කියනලද සමුච්ඡේද ප්‍රහාණ වශයෙන් ක්ලේශ ප්‍රහාණය ප්‍රකාශිතවේ එසේම රාගාදී ක්ලේශ ධර්මයන්ගේ හෝ කම් ක්ලේශයන්ගේ හෝ ව්‍යතික්‍රම සංඛ්‍යාත අධ්‍යාචාරයට ප්‍රතිපක්ෂයා ශීලය අව්‍යතික්‍රම ස්වභාව බැවින් ශීලයෙන් ප්‍රකාශිතවේ කුශලෝත්පත්තියට අවකාශ නොදී සිත වැලඳගෙණ කෙලෙසුන්ගේ සිටීමයයි කියනලද පර්‍යුත්ථානයට ප්‍රතිපක්ෂයා සමාධිය සිත වැලඳගෙණ සිටිනා කෙලෙසුන්ගේ ප්‍රහාණය කරණ බැවින් සමාධියෙන් ප්‍රකාශිතවේ. අප්‍රහීණ භාවයෙන් සන්තානයෙහි පවත්නාවූ සුදුසු කාරණ ලැබීමෙහි ඉපදීමට සුදුසු ස්ථානගතවූ කාමරාගාදී සප්තානුශය ක්ලේශයන්ට ප්‍රතිපක්ෂයා ආර්‍ය්‍ය මාර්ගය අනුශය ප්‍රහායක බැවින් ප්‍රඥාවෙන් ප්‍රකාශිතවේ. ශීලය ශික්ෂාපදයන්ගේ ඉක්මීමට ප්‍රතිපක්ෂ බැවිනි. කායදුශ්චරිතාදීන්ගේ තදඞ්ග ප්‍රහාණ සංඛ්‍යාත විශෝධනය ශීලයෙන් ප්‍රකාශිතවේ. තෘෂ්ණාවට සමාධිය ඉදුරා ප්‍රතිපක්ෂ හෙයින් තෘෂ්ණා සංක්ලේශයන්ගේ විෂ්කම්භන ප්‍රහාණ සංඛ්‍යාත විශෝධනය සමාධියෙන් ප්‍රකාශිතවේ ප්‍රඥාව අනුශයයන්ටද මිථ්‍යාදෘෂ්ටියටද ඉදුරා ප්‍රතිපක්ෂ බැවින් මිථ්‍යාදෘෂ්ටි සංඛ්‍යාත ක්ලේශයාගේ සමුච්ඡේද ප්‍රහාණ සංඛ්‍යාත විශෝධනය ප්‍රඥාවෙන් ප්‍රකාශිතවේ.

( පා * )

තථා සීලෙන සොතාපන්න සකදාගාමිභාවස්ස කාරණං පකාසිතං හොති සමාධිනා අනාගාමිභාවස්ස පඤ්ඤාය අරහත්තස්ස සොතාපන්නො හි සීලෙසු පරිපූරකාරිති වුත්තො තථා සකදාගාමි අනාගාමි පන සමාධිස්මිං පරිපූරකාරි අරහා පන පඤ්ඤාය පරිපූරකාරීති.

එවං එත්තාවතා තිස්සො සික්ඛා තිවිධ කල්‍යාණං සාසනං තෙවිජ්ජතාදීනං උපනිස්සයො අන්තද්වය වජ්ජන මජ්ඣි

ම පටිපත්ති සෙවනානි අපායාදි සංගිකසානුපාතයා නිසාකාරෙන කිංල සපපහාණං විනිකසාවාදිනං පටිස කොබා සංකිලෙසතාය විසොධනං සොතාපනනාදි භාවසස ච කාරණ නති ඉමෙ තව අසෙඛකුව එවරූපා ගුණජාතිකා පකාසිතා භොනති —

( ස * )

සීලෙන, ශීලයෙන්; සොතාපනන සකදාගාමි භාවසස කාරණං, සෝවාන් සෙදගැමි බවට උපනිශ්‍රය ප්‍රත්‍යයාඛ්‍ය කාරණය ප්‍රකාශිතවේ; සමාධිනා, සමාධියෙන්; අනාගාමිභාවසස, අනාගාමි බවට කාරණය ප්‍රකාශිතවේ; සොතාපනනාති, සෝවාන් තෙමේ; සීලෙසු පරිපූරකාරී, මාර්ග බ්‍රහ්මචර්‍යයාවට ආදි හෙයින් ආදි බ්‍රහ්මචරියක නම්වූ පාරාජිකා සංඝාදිසෙස සංඛ්‍යාත මහාශීල ශික්‍ෂාපදයන්ගේ අවසානි ක්‍රමයෙන්ද ක්ෂුද්‍රානු ක්ෂුද්‍ර ශික්‍ෂාපදයන් ඉක්මීමෙන් ඇවැත් ආපත්තීන් වනා නැති හෙයින් ශීලයෙහි සමාප්තකාරී වේ; තථා අනාගාමී, අනාගාමීද එසේම ශීලයෙහි සමාප්තකාරීවේ (මේ ආයති යෝ දෙදෙන වනාහි සමාධි ප්‍රතිපක්‍ෂවූ කාමරාග ව්‍යාපාදයන්ද ප්‍රඥා ප්‍රතිපක්‍ෂවූ සත්‍යච්ඡාදක මෝහයද සම්කාරයෙන් නොපැහූ බැවින් සමාධි ප්‍රඥා දෙදෙනා වඩා නොහූ; සමාධි ප්‍රඥාවෙහි කාරිත්‍වයට පමණින් ප්‍රදේශ මාත්‍රයක් ම කාරණ බැවින් සමාධියෙහිත් ප්‍රඥාවෙහිද මාත්‍රකාරීව ශීලයෙහි පරිපූරකාරීහයි කියනු ලැබෙත්) අනාගාමීපන, අනාගාමී වනාහි; සමාධිසමිං පරිපූරකාරී, කාමරාග ව්‍යාපාදයන්ගේ සමුච්ඡින්න බැවින් සමාධියෙන් සමාප්තකාරීවේ; (සන්තානයෙහි ගුප්ත විදර්ශක යාද මරණ සමයෙහිද ... ධ්‍යාන ප්‍රතිලාභයට ... බැවින් අනාගාමී සමාධියෙහි පරිපූරකාරී හා වැයි කීහු) අරහාපඤ්ඤාය පරිපූරකාරී, රහත් තෙමේ සම්කාරයෙන් සමෙම්මා හය සමුච්ඡෙදය කල බැවින් ප්‍රඥාවෙහි පරිපූරකාරීවේ (එවං-යනාදී නිගමනයෙහි අර්ථ යටකී නයින් දතයුතු) ඉමෙනව, මේ ත්‍රිකයෝ නවදෙනාද; අසෙඛකුව එවරූපා ගුණජාතිකා, සෙසු වෙන්වූ (නයොපිවෙක තීණිකුසල මූලානි තීණිවිමොක්ඛමුඛානි, තීණි ඉන්ද්‍රියානි යනාදී) ගුණත්‍රිකයෝ; පකාසිතා හොනති, ප්‍රකාශිතවෙත් ("එත් තාවතා පකාසිතා හොනති" යි යොදනු "සීලෙන කායවිවෙකො පකාසිතො හොති සමාධිනා චිත්ත විවෙකො පඤ්ඤාය උපධිවිවෙකො" යනාදී ත්‍රිකයන් යෝජනාකරණු) —

( හා * )

එසේම ශීලයෙන් සෝවාන් සකෘදාගාමි බවට උපනිශ්‍රය කාරණය ප්‍රකාශිතවේ සමාධියෙන් අනාගාමි බවටද ප්‍රඥාවෙන් රහත් බවටද කාරණය ප්‍රකාශිතවේ සෝවාන් පුද්ගල තෙමේ මාර්ග බ්‍රහ්මචර්‍යයාට මුල්වූ හෙයින් ආදි බ්‍රහ්මචරියක නම්වූ පාරාජිකා සංඝාදිසෙස සංඛ්‍යාත මහාශීල ශික්‍ෂාපදයන්ගේ නොඉක්මීමෙන්ද ක්ෂුද්‍රානු ක්ෂුද්‍ර ශික්‍ෂාපදයන් ඉක්මීමෙන් පැමිණි ආපත්තීන්ගෙන් වනා නැති හෙයින්ද ශීලයෙහි සමාප්තකාරියයි කියනලද්දේය. සකෘදාගාමි පුද්ගල තෙමේද එසේම ශීලයෙහි සමාප්තකාරීවේ. අනාගාමි පුද්ගල තෙමේ වනාහි කාමරාග ව්‍යාපාදයන්ගේ මුල් සුන් කල බැවින් සමාධියෙහි සමාප්තකාරීවේ රහත් තෙමේ සම්කාරයෙන් මෝහය මුල් සුන්කල බැවින් ප්‍රඥාවෙන් පරිපූරකාරීවේ මෙසේ ත්‍රිවිධ ශික්‍ෂාය

ත්‍රිවිධ කල්‍යාණවූ ශාසනය ත්‍රිවිද්‍යාදීන්ට උපනිශ්‍රය ප්‍රත්‍යය උභයාන්තවර්ජිත මධ්‍යම ප්‍රතිපත්තිසේවනය අපායාදීන් ඉක්මවන උපාය තුන් ආකාරයකින් කෙලෙසුන් නැසීමය ශික්‍ෂාවන්ගේ ඉක්මවීමාදියට ප්‍රතිපක්‍ෂ ධර්මය කෙලෙසුන් තුන්දෙනාගේ විශෝධනය සෝවාන් ආදී භාවයට කාරණය යන මේ ත්‍රිකයෝ නවදෙනද සෙසු මෙබඳුවූ ත්‍රිවිධ විවේකය ත්‍රිවිධ කුශල මූලය ත්‍රිවිධ විමොක්‍ෂ මුඛය ත්‍රිවිධ ඉන්ද්‍රියාදි ගුණත්‍රිකයෝද මෙපමණකින් ප්‍රකාශකරණලද්දාහු නම් වෙති. ~

( පා † )

එවං අනෙකගුණ සඞ්ගාහකෙන සීලසමාධිපඤ්ඤාමුඛෙන දෙසිතොපි පනෙස විසුද්ධිමග්ගො අතිසඞ්ඛෙප දෙසිතත්තා නෙව හොති සබ්බෙසං උපකාරායාති විත්ථාරමස්ස දස්සෙතුං සීලං තාව ආරබ්භ ඉදං පඤ්හකම්මං හොති කිං සීලං? කෙනට්ඨෙන සීලං? කානස්ස ලක්ඛණරස පච්චුපට්ඨාන පදට්ඨානානි? කිමානිසංසං සීලං? කතිවිධඤ්චෙතං සීලං? කො චස්ස සංකිලෙසො? කිං වොදානන්ති? ~ තත්‍රිදං විසජ්ජනං ~

( ස † )

එවං, මේ උක්තප්‍රකාරයෙන්; අනෙකගුණ සඞ්ගාහකෙන, අධිශීල ශික්‍ෂා, ආදීවූද, සෙසුද අනෙක ගුණයෙන් සඞ්ග්‍රහකොට සිටි; සීලසමාධි පඤ්ඤාමුඛෙන, ("සබ්බෙ සඞ්ඛාරා අනිච්චා" යනාදීයෙහි මෙන් විදර්ශනා මාත්‍රාදි මුඛයෙන් සංක්‍ෂෙපයෙන් නොදෙසා) ශීලසමාධි ප්‍රඥා මුඛයෙන්; දෙසිතොපි පනෙස විසුද්ධිමග්ගො, දෙසිතවූද මේ විශුද්ධිමාර්ගය; අතිසංඛෙප දෙසිතත්තා, ස්වභාව විභාග විසින් නොදෙසු බැවින් අති සංක්‍ෂෙප දෙසිතාව හෙයිනුයි; සබ්බෙසං උපකාරාය නාලම්ති, සංක්‍ෂිප්තරුචි උද්ඝටිතඥයන් විනා නාති සංක්‍ෂිප්ත විස්තර රුචීන්ටද විපඤ්චිතඥයන්ටද උපකාරයට අසමර්ථයයි අස්ස විත්ථාරං දස්සෙතුං, මේ විශුද්ධිමාර්ගයාගේ විස්තරය දක්වනු පිණිස; සීලං තාව ආරබ්භ (සමාධි ප්‍රඥාවන් තබා) පළමුකොට ශීලය අරභයා; ඉදං පඤ්හකම්මං හොති, මේ ප්‍රශ්න කර්මය වේ; කිං සීලං, ස්වරූප විසින් සිල්නම් කිම; කෙනට්ඨෙන සීලං; කවරනම් අර්ථයෙන් සිල් නම්ද; අස්ස, මේ ශීලයාගේ; ලක්ඛණ රසපච්චුපට්ඨාන පදට්ඨානානි කානි, ස්වභාවය කෘත්‍යය වැටහෙන ආකාරය ආසන්න කාරණය යන මොහු කවරහ; සීලං, ශීලය; කිමානි සංසං, කුමක් අනුසස්කොට ඇත්තේද; එතං සීලං, මේ ශීලය; කතිවිධඤ්ච, කතිප්‍රකාරවේද, කො ච අස්ස සංකිලෙසො; මේ ශීලයට කිළුටු කිම; කිං වොදානං, පිරිසිදු කිමෙයන්?

තත්‍ර; ඒ ප්‍රශ්නකර්මයෙහි; ඉදං, මේ; විසජ්ජනං, විවරණයයි (මෙතැනත් තත්‍රයි සේයි "නස්ස පඤ්හස්ස" යන අර්ථයි)

( හා † )

මේ උක්තප්‍රකාරයෙන් නොයෙක් ගුණයෙන් සංග්‍රහකොට ඇති ශීලසමාධි ප්‍රඥාවාරයෙන් දෙශිතවූද මේ විශුද්ධිමාර්ගය ස්වභාව විභාග වශයෙන් නොදෙසූ බැවින් ඉතා සංක්‍ෂෙපයෙන් දෙසනලද්දේම වේයි එසේහෙයින් මෙ සංක්‍ෂිප්ත දෙශනාව උද්ඝටිතඥයන්ට මිස විස්තර රුචීන්ටද විපඤ්චිතඥයන්ටද උපකාරයට අසමර්ථ බැවින් මේ විශුද්ධි මාර්ගයාගේ

විස්තර දක්වනපිණිස සංඛ්‍යා ප්‍රශ්නවන් තබා පළමුකොට ශීලය අරභයා මේ ප්‍රශ්න කර්‍ණයවේ.

ස්වරූප වශයෙන් ශීලය නම් කුමක්ද? කවර අර්ථයකින් ශීලනම් වේද? මේ ශීලයාගේ ස්වභාවය සාමාන්‍යය දැක්වෙන ආකාරය ආසන්න කාරණය යන මේහු කවරහුද? ශීලය කුමක් අනුසස්කොට ඇත්තේද?

මේ ශීලය කී ප්‍රකාරයක්වේද? මේ සීලය කිළුටුවන්නේ කුමකින්ද? පිරිසිදුවන්නේ කුමකින්දයත්? ඒ ප්‍රශ්නයන්ගේ විසඳීම මෙසේ දතයුතු.

( පා ‡ )

කිං සීලන්ති? පාණාතිපාතාදීහි වා විරමන්තස්ස වත්තපටිපත්තිං වා පූරෙන්තස්ස චෙතනාදයො ධම්මා. වුත්තං හෙතං පටිසම්භිදායං. "කිං සීලන්ති චෙතනා සීලං චෙතසිකං සීලං සංවරො සීලං අවීතික්කමො සීලන්ති". තත්‍ර චෙතනා සීලං නාම— පාණාතිපාතාදීහි වා විරමන්තස්ස වත්තපටිපත්තිං වා පූරෙන්තස්ස චෙතනා. චෙතසිකං සීලං නාම පාණාතිපාතාදීහි විරමන්තස්ස විරති- අපිච චෙතනා සීලං නාම පාණාතිපාතාදීනි පජහන්තස්ස සත්ත කම්මපථ චෙතනා. චෙතසිකං සීලං නාම "අභිජ්ඣං පහාය විගතාභිජ්ඣෙන චෙතසා විහරතී"ති ආදිනා නයෙන වුත්තා අනභිජ්ඣා අබ්‍යාපාද සම්මාදිට්ඨි ධම්මා. සංවරො සීලන්ති එත්ථ පඤ්චවිධෙන සංවරො වෙදිතබ්බො. පාතිමොක්ඛසංවරො සතිසංවරො ඤාණසංවරො ඛන්තිසංවරො විරියසංවරොති. තත්ථ "ඉමිනා පාතිමොක්ඛසංවරෙන උපෙතො හොති සමුපෙතො"ති අයං පාතිමොක්ඛසංවරො. "රක්ඛති චක්ඛුන්ද්‍රියං චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජතී"ති අයං සතිසංවරො.

( ශ ‡ )

පාණාතිපාතාදීහි වා විරමන්තස්ස, ප්‍රාණවධාදී දශශීලය කර්මයෙන් හෝ සමාදානවිරති සම්ප්‍රාප්තවිරති වශයෙන් වළක්නාහුගේද; වත්තපටිපත්තිං වා පූරෙන්තස්ස, උපාධ්‍යායවත් ආදි වතැයි කියනලද පිළිවෙත් පුරන්නාහුගේ හෝ; චෙතනාදයො ධම්මා, චෙතනාදී ධර්මයෝයි—("චෙතනාදයො ධම්මා"යි සංක්ෂෙපයෙන් කියනලද අර්ථය පාලිවිසින් විභාගකොට දක්වනු පිණිස "වුත්තං හෙතං" යනාදී කියනලදී) පටිසම්භිදායං, පිළිසිඹියාවෙහි; එතං, මේ; වුත්තං, කියනලදී; කිං සීලන්ති, සිල්නම් කිමෙක්දයත්; චෙතනා සීලං, චෙතනා ශීලය; චෙතසිකං සීලං, චෛතසික ශීලය; සංවරො සීලං, සංවරශීලය; අවීතික්කමො සීලන්ති, අව්‍යතික්‍රම ශීලයයි-(මීනි චෙතනාවට චෛතසිකත්වය ඇතද "චෙතනා සීලං"යි වෙනගත්හෙයින් ශොබලිවර්දනයෙන් විරති අනභිධ්‍යාදී ශීලයම චෙතනාශීලනම්වෙයි දතයුතු) තත්‍ර, ඒ චතුර්විධ ශීලයෙහි; චෙතනා සීලං නාම, චෙතනා ශීලනම්; "පාණාතිපාතාදීහි විරමන්තස්ස චෙතනා"යි විරතියුක්ත ප්‍රධාන චෙතනාවකීය. "වත්තපටිපත්තිං පූරෙන්තස්ස චෙතනා"යි වත්පිළිවෙත් කරණ චෙතනාව කීහු—"චෙතසිකං සීලං නාම පාණාතිපාතාදීහි විරමන්තස්ස විරති"යි විරතියගේ ප්‍රධානබවෙන කීහු විරති නො උපදා සමාදන්වන්නාහු විසිනුදු කුඩා දරුවන්මෙන් කිසිවක් නොදන සිල්ගන්නාහු විසිනුදු අකුශල චෙතනාවට කුශල චෙතනාවම ප්‍රතිපක්ෂබැවින් චෙතනාව කීය; විරති ඇති හෙයු චෙතනා චෙතනාම සම්පබැවින් චෙතනාවම කීය—යනු සත්තයි යම් කාලෙක "[illegible]" එව කායකර්මපථ කුසල [illegible]

කාම්මං," යනාදී වශයෙන් බැවින් ප්‍රාණාතිපාතාදීන්ට ප්‍රතිපක්ෂවූ තද්විරති විශිෂ්ට චේතනාව ප්‍රධානභාවයෙන් ප්‍රාණාතිපාතාදීන් කෙරෙන් විරතිය සාධාද එකල තත්සම්ප්‍රයුක්තවිරති අනභිධ්‍යාදීහු චේතනාපාක්ෂික හෝ අව්‍යවහාරිකහෝ වෙත්හයි මේ අර්ථය සඳහා "චේතනා සීලං" යි කීහ—යම් කලෙක වනාහි ප්‍රාණාතිපාතාදීන් කෙරෙන් සඞ්කාවයට පැමිණෙන්නාහට එයින් විරමනාකාරයෙන් පවත්නාවූ චේතනාවිශිෂ්ටව විරතිද අනභිධ්‍යාදි ධර්මයෝද ඒ ඒ තැන්හි ප්‍රධාන බැවින් කෘත්‍යසාධකයෝ වෙද්ද එකල්හි චේතනාතොමෝ විරති ආදී පාක්ෂිකයෝ වෙති අව්‍යවහාරිකහෝ වෙතියි. යන මේ අර්ථය සඳහා "චෛතසිකංසීලං" යනු කීහ යනුවිකාතයයි—දැන් සූත්‍රයෙහි ආ නයින් දශකුශල කර්මපථ වශයෙන් චේතනා චෛතසික ශීලයන් විභාගකොට දක්වන පිණිස "අපිච" යනාදී කීහු)

අපිච, අනිකෙකුදු ඇති; පාණාතිපාතාදීනි පජහන්තස්ස (සමාදාන වශයෙනුදු සම්ප්‍රාප්ත වස්තුව අනධ්‍යාචරණවශයෙනුදු) ප්‍රාණවධාදීන් දුරු කරන්නාහුගේ; සත්තකම්මපථ චේතනා, පිළිවෙළින් සප්තවිධ කුශල කම්මපථ චේතනාවෝ "චේතනාසීලං නාම"යි යොදනු; අභිජ්ඣං පහාය, අභිධ්‍යාව දුරුකොට; විගතාභිජ්ඣෙන චේතසා, පහවූ අභිධ්‍යා ඇති චිත්තයෙන්; විහරති ආදිනා නයෙන, වෙසෙයි යනාදී නයින්; වුත්තා, කියනලද; අනභිජ්ඣා අව්‍යාපාද සම්මාදිට්ඨි ධම්මා, අනභිධ්‍යා අව්‍යාපාද සම්‍යග්දෘෂ්ටි ධර්මයෝයි (මේ අනභිධ්‍යාදීහු අභිධ්‍යාදීන්ට ප්‍රතිෂේධකබැවින් හෝ මිථ්‍යාචාරාදීන්ට ප්‍රතිෂේධක බැවින්හෝ ශීලනම්වේ—කිසේයයත්? අභිධ්‍යාවෙන් මිථ්‍යාචාරය වෙයි. ප්‍රාණීතක වස්තුයෙහි ව්‍යතික්‍රමවන බැවිනි-ව්‍යාපාදයෙන් ප්‍රාණාතිපාතය වෙයි. මියෙත්වයි පැවති සිත් ඇත්තහු අනුන් මරණබැවිනි—මිථ්‍යාදෘෂ්ටියෙන් මිථ්‍යාචාරයවෙයි පුත්‍රයා ලබය දූක ස්වර්ගයට යෙයිසි දෘෂ්ටින් මිථ්‍යාචාරචරණයට කාරණා ඇතිවනබැවිනි—මෙසේම සෙසු කම්මපථයෙහි යෙදෙන යෙදෙනසේ යොදනු—මෙසේ කීහ— "යථාහි අභිජ්ඣා ව්‍යාපාදවසෙන මිච්ඡාචාර පාණාතිපාතාදයො කරියන්ති එවං මිච්ඡාදිට්ඨිවසේනාපි තෙ පුත්තමුඛ දස්සනාදී අත්ථං කරියන්ති තෙසඤ්ච පජහනකා අනභිජ්ඣාදයො")යි. "සංවරො සීලං" යනුයෙහි පඤ්චවිධෙන සංවරො වෙදිතබ්බො, පඤ්චප්‍රකාරයෙකින් සංවරය දතයුතු; පාතිමොක්ඛ සංවරො, චාරිත්‍ර වාරිත්‍ර විභාග ඇති විනය පර්‍යාපන්න ශික්ෂාපද ශීල නමැති ප්‍රාතිමොක්ෂයම ප්‍රාතිමොක්ෂ සංවර ශීල නම; සතිසංවරො, මනස සවනුවූ ඉන්ද්‍රියයන්ගේ ආරක්ෂායයි කියනලද ඉන්ද්‍රිය සංවර පරනාමධෙය ඇති ස්මෘතියම සතිසංවර නම, ඤාණසංවරො, තණ්හාදිට්ඨි ආදීන් සමුච්ඡේද කරවන ඤාණයම ඤාණසංවර නම; ඛන්තිසංවරො, අධිවාසනා වශයෙන් පවත්නා අද්වේෂ ප්‍රධානස්කන්ධාඛ්‍යවූ අද්වේශාඛ්‍යම්වූහෝ ක්ෂාන්තියම ක්ෂාන්ති සංවර නම; විරිය සංවරො, කාමවිතර්කාදීන් දුරුකරණ වශයෙන් පවත්නා වීර්‍යයම විරිය සංවර නම්; තත්ථ, ඒ පඤ්චවිධ සංවරයෙහි; ඉමිනා පාතිමොක්ඛ සංවරෙන, මේ ප්‍රාතිමොක්ෂ සංවරයෙන්; උපෙතො හොති, යුක්තවේද ("සමුපෙතො හොති" යනු එයට පර්‍යායයි) රක්ඛති චක්ඛුන්ද්‍රියං, චක්ඛුන්ද්‍රිය රක්නේයි; චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජතීති,

චක්ඛුන්ද්‍රියෙහි සංවරයට පැමිණේය. සතු සති සංවර නමි.

( හා ‡ )

ශීලය නම් කුමක්ද යනමේ ප්‍රශ්නයෙහි ප්‍රාණවධාදී පාප කර්මයෙන් සමාදාන විරති සම්ප්‍රාප්ත විරති වශයෙන් වළකින්නාවූ පුද්ගලයාගේ හෝ උපාධ්‍යායවත් ආදී වත්පිළිවෙත් පුරන්නහුගේ හෝ චේතනාදී ධර්මයෝ ශීලනම් වන්නේය. පටිසම්භිදා මාර්ගයෙහිද මේ කාරණය මෙසේ වදාරණ ලද්දේය—(ශීල නම් කවරයත්? චේතනා ශීලය චෛතසික ශීලය සංවර ශීලය අව්‍යතික්‍රම ශීලයයි ශීලය සතර වැදෑරුම්වේ යනුයි) මෙහි චේතනාහි චේතනාව සාමාන්‍යයෙන් චෛතසික යන්ටම ඇතුළත් නමුදු චේතනාවය චෛතසිකයයි දෙකක්නොව ගත්හෙයින් ගොබලිවර්දයෝ ආවාහුයයි කීකල්හි ගො ශබ්දයෙන් සාමාන්‍ය ගව යන්ද බලිවර්ද ශබ්දයෙන් ප්‍රධාන වෘෂභයාද ගැණෙන්නාක්මෙන් චේතනා ශබ්දයෙන් සෙසු චෛතසික ධර්මයන් අරමුණෙහි පිහිටුවන කුශල චේතනාවද චෛතසික ශබ්දයෙන් විරති අනභිධ්‍යාදී එම කුශල චිත්තය පිළිබඳවූ සෙසු චෛතසික ධර්මයෝද දතයුතුයි. ඒ චතුර්විධ ශීලයන් අතුරෙහි චේතනා ශීලයනම් ප්‍රාණවධාදියෙන් වළක්නහුගේ හෝ වත්පිළිවෙත් පුරන්නහුගේ හෝ විරති යුක්තාවූ ප්‍රධාන චේතනාව චේතනා ශීල නම්. චෛතසික ශීලයනම් ප්‍රාණවධාදියෙන් වළක්නහුගේ ඒ කුශල චිත්ත වීථිය පිළිබඳවූ විරති අනභිධ්‍යාදී චෛතසිකයෝ චෛතසික ශීල නම් මේ ශීලදෙක එකම චිත්තවීථියෙහි ලැබියයුතුවේ—වැලිදු ප්‍රාණවධාදී අකුශල කර්මපථයන් සමාදාන විරති සම්ප්‍රාප්ත විරති වශයෙන් දුරුකරන්නහුගේ එකල උපදනා කුශල චිත්ත වීථියෙහි පිළිවෙළින් ජවන් සිත් සත හා සමග යුක්තාවූ සත්වැදෑරුම් කුශල කර්මපථ චේතනාවෝ චේතනාශීල නම්වේ(අභිධ්‍යාව දුරුකොට පහවූ අභිධ්‍යා ඇති සිතින් වාසයකෙරෙයි) යනාදීන් වදාරණලද ඒ පුද්ගලයාගේ සිත හා සමග පවත්නා අනභිධ්‍යා අව්‍යාපාද සම්‍යක්දෘෂ්ටි චෛතසික ධර්මයෝ චෛතසික ශීලනම්-ඒ කෙසේදයත්?

කැමතිවනලද වස්තුවෙහි ව්‍යතික්‍රමණය හෙවත් කැමතිවූ පරදාරවන් හරි ගමනය අභිධ්‍යාව මුල්වකරණබැවින් අභිධ්‍යාවෙන් මිථ්‍යාචාරය වේමය. අනුන් නසින්නෙයි යන සිත් ඇත්තාහු විසින් අනුන් මරණ බැවින් ව්‍යාපාදයෙන් ප්‍රාණාතිපාතය වේමය පුත්‍රයාගේ මුහුන දක සවර්ගයට යෙමියි යන විපරීත දෘෂ්ටියෙන්ද මිථ්‍යාචාරය හෙවත් කාමසේවනය කරණබැවින් මිථ්‍යාදෘෂ්ටියෙන් මිථ්‍යාචාරය වේමය මේ ආදීවූ ඒ ඒ අකුශල ධර්මයෙන් වෙන්වන්නහුගේ ඒ ඒ කුශල චිත්ත වීථි පිළිබඳව උපදනා අලෝභ අව්‍යාපාද සම්මාදිට්ඨි ආදීවූ චෛතසික ධර්මයෝ චෛතසික ශීලනම්වන්නේයි.

සංවරශීලය යන මෙහි සංවරය පඤ්චප්‍රකාරයකින් දතයුතු-හේ කෙසේදයත්? කටයුතු නොකටයුතු විභාග ඇති විනය දේශනාවට ඇතුලත්වූ ශික්ෂාපද ශීලය ප්‍රාතිමොක්ෂ සංවර ශීල නම් (චක්ෂුඃ ශ්‍රොත ඝ්‍රාණ ජිව්හා කාය මනඃ යන ෂඩින්ද්‍රියයන්ගේ ආරක්ෂාවයයි කියනලද ඉන්ද්‍රිය සංවරයයි කියනු අතික් නාමයක් ඇති ස්මෘති (සිහිය) සතිසංවර නම් (තෘෂ්ණා දෘෂ්ටි ආදී කෙලෙසුන් [illegible] නය) ඤාණ සංවර නම් ( [illegible] ශයෙන් පවත්නා [illegible]

ස ප්‍රධාන කොට ඇති ක්ෂාන්තිය) ඛන්තිසංවර නම — කාමවිතර්කාදීන් දුරු කිරීම් වශයෙන් පවත්නා සිත පිළිබද වියර්‍ය චෛතසිකය විරිය සංවර නම ඒ පඤ්චප්‍රකාර සංවරයන් අතුරෙහි "යමෙක්තෙම මේ ප්‍රාතිමෝක්ෂ සංවරයෙන් යුක්තවේද මනාකොටම යුක්තවේද" යනාදීන් වදාරණලද මේ සීලතෙමේ ප්‍රාතිමෝක්ෂ සංවර නම "චක්ඛුන්ද්‍රියය රක්නේද චක්ඛුන්ද්‍රියෙහි සංවරයට පැමිණෙන්නේය" යනාදීන් වදාරණලද මේ ශීලතෙම සතිසංවර නම—

( ගා ¶ )

"යානි සොතානි ලොකස්මිං
(අජිතාති භගවා)
සති තෙසං නිවාරණං
සොතානං සංවරං බ්‍රෑමි
පඤ්ඤාය යෙතෙ පිථීයරෙ"ති—

අයං ඤාණසංවරෝ — පච්චය පටිසෙවනම්පි එත්ථෙව සමොධානං ගච්ඡති — "යො පනායං ඛමො හොති සීතස්ස උණ්හස්සා"ති ආදිනා නයෙන ආගතො අයං ඛන්තිසංවරො නාම — "යො චායං උප්පන්නං කාමවිතක්කං නාධිවාසෙතී"ති ආදිනා නයෙන ආගතො අයං විරියසංවරො නාම — ආජීවපාරිසුද්ධි පි එත්ථෙව සමොධානං ගච්ඡති ඉති අයං පඤ්චවිධො පි සංවරො යාව පාපභීරුකානං කුලපුත්තානං සම්පත්තවත්ථුතො විරති සබ්බම්පෙතං සංවරසීලන්ති වෙදිතබ්බං — අවීතික්කමො සීලනති සමාදින්නසීලස්ස කායිකවාචසිකො අවීතික්කමො — ඉදං තාව කිං සීලන්ති පඤ්හස්ස විස්සජ්ජනං —

( ස ¶ )

("අජිත" යනු ආමන්ත්‍රණය "භගවා" යනු ප්‍රතිවචනයයි) ලොකස්මිං, ලොකයෙහි; යානි සොතානි, තෘෂ්ණා දෘෂ්ට්‍යාදී යම් ශ්‍රොතස්සෙතෙක් ඇද්ද; සති තෙසං නිවාරණං, විදර්ශනාසම්ප්‍රයුක්ත වූ සම්‍යක්ස්මෘතියතෙමේ තෘෂ්ණාදෘෂ්ට්‍යාදී ඒ ශ්‍රොතසුන්ට ආවරණයි; (රක්ෂාය යන අර්ථයි) සොතානං සංවරං බ්‍රෑමි, ශ්‍රොතසුන්ට එම සම්‍යක්ස්මෘතිය සංවරයයි කියමි; පඤ්ඤායෙතෙ පිථීයරෙ, රූපාදීන් කෙරෙහි අනිත්‍යාදිප්‍රතිවේධසාධකවූ මාර්ග ප්‍රඥාවෙන් ඒ ශ්‍රොතස්හු සර්වාකාරයෙන් පියනු ලැබෙත් (මෙම කීහ අටුවාවෙහිදු "සතිතෙසං නිවාරණන්ති විපස්සනා යුත්තා කුසලාකුසලානං ධම්මානං ගතියො සමන්නෙසමානා සති තෙසං සොතානං නිවාරණං, සොතානං සංවරං බ්‍රෑමීති තමෙව වාහං සතිං සොතානං සංවරං බ්‍රෑමී'ති අධිප්පායො පඤ්ඤායෙතෙ පිථීයරෙති රූපාදීසු පන අනිච්චාදි පටිවෙධසාධිකාය මග්ග පඤ්ඤාය එතෙ සොතා සබ්බසො පිථීයන්ති"යි. සන්නයෙහිදු "සොතානං සංවරං බ්‍රෑමි"යි—යට සති සංවර කීහ. "පඤ්ඤා යෙතෙ පිථීයරෙ"ය්-සමුච්ඡෙද කොලෙසුන් පහණ ප්‍රඥාවෙන් ක්ලෙශ්හු පියන ලැබෙතියි උතුම් ඤාණ සංවර කියතියි. ටීකාවෙහි වනාහි "සොතානං සංවරං බ්‍රෑමීති වත්වා පඤ්ඤායෙතෙ පිථීයරෙති වචනෙන සොතානං සංවරො පිදහනං සමුච්ඡෙදනං ඤාණන්ති විඤ්ඤායති"යි කීහු, මේ ඤාණ සංවරයි) පච්චය පටිසෙවනම්පි, ප්‍රත්‍යය සෙවුනා ශීලයද; එත්ථෙව සමොධානං ගච්ඡති (ප්‍රයොජනය සලකා නුවණින් ප්‍රත්‍යය සෙවුනා බැවින්) මේ ඤාණ සංවරයෙහිම සංග්‍රහයට යේ; යො පනායං, යම් මෙ සංවරයෙක්; ඛමො හොති සීතස්ස උණ්හස්සාති ආදිනා නයෙන ආගතො, හුණු සිහිල් අධිවාසනා කෙරෙති යනාදීනයින් ආයේ ඛන්ති

සංවර නම්; යොචායං, යම් මේ සංවරයෙක්; උප්පන්නානං කාමවිතක්කානං, ඒ ඒ අරමුණෙහි උපන් කාම ප්‍රතිසංයුක්ත විතර්කය; නාධිවාසෙති, නො ඉවසා (සිත්හි නොතබා යන අදහසි) ආදිනා නයෙන ආගතො, මෙ ආදි නයින් ආයේ වීර්ය සංවර නම්; ආජීවපාරිසුද්ධිපි, ආජීව පාරිශුද්ධිශීලයද; එතෙනෙව සමොධානං ගච්ඡති, මෙ වීර්ය සංවරයෙහිම සංග්‍රහයට යෙයි (ආජීව පාරිශුද්ධි ශීලය වීර්යයෙන් සිඬවන බැවිනි. මෙහි යම්සේ ඥානය තෘෂ්ණාදී ස්‍රොතසුන්ගේ ප්‍රවෘත්ති නිවාරණයෙන් පිදහනාර්ථයෙන් සංවර නම් වේද මතුයෙහි පවත්නා ගුණයන්ට ආධාරදීබැවින් ශීලනාර්ථයෙන් ශීල වේද එසේම ක්ෂාන්තියද අනධිවාසනයෙන් උපදනා කෙලශයන් අධිවාසනයෙන් සංවරණය කාරණහෙයින් සංවරයි; ක්ෂාන්ති හෙතුවෙන් උපදනා ගුණයන්ට ආධාරදීබැවින් ශීලනාර්ථයෙන් ශීලයි වීර්යය දුරුකටයුතුවූ පාපධර්මයන්ගේ දුරීකරණයෙන් සංවරණයකාරණහෙයින් සංවරයි පාපවිනොදන හෙතුවෙන් උපදනාවූ ගුණයන්ට ආධාරදීබැවින් ශීලනාර්ථයෙන් ශීලයයි දතයුතුයි) ඉති, මෙසේ; අයං පඤ්චවිධොපි සංවරො, මේ පඤ්චවිධ සංවරයද; පාප භීරුකානං කුලපුත්තානං, පාප භීරුකවූ කුලපුත්‍රයන්ගේ; සම්පත්තවත්ථුතො යාව විරති, සම්ප්‍රාප්ත වස්තුවෙන් ශීල සමාදානයක් නැතිවද මෙවැනි කර්ම නුසුදුසුයයි කාරණා යම් විරතියෙක් ඇද්ද; සබ්බොපෙතං සංවරසීලන්ති වෙදිතබ්බං, මේ සියල්ලම සංවරශීලයයි දතයුතු; අවීතික්කමො සීලන්ති, අවීතික්‍රම ශීල නම්; සමාදින්න සීලස්ස, සමාදන්වූ සිල් ඇත්තහුගේ; කායිකවාචසිකස්ස අවීතික්කමො, කායවාග්ද්වාරයෙහි අව්‍යතික්‍රමයයි (''පච්ඡිත්තකමෙති එතෙනා'ති අවිජ්ඣාසයො තථා පවත්තෙනා කුසලචිත්තුප්පාදො''යි ගන්නේ) නාව, පළමුකොට; කිං සීලන්ති පඤ්හස්ස, ''කිං සීලං'' යන ප්‍රශ්නයට; ඉදං විස්සජ්ජනං, මේ විසඳීමයි.

( ගා ¶ )

(එවිබා අජිත මාණවකය? ලොකයෙහි තෘෂ්ණා දෘෂ්ට්‍යාදී යම්යම් කෙලෙස් ඇතුල්වන්නාවූ සොරොව් ඇත්තාහුද විදර්ශනාවෙන් යුක්තවූ සිහිය ඒ සොරොව් ආවරණයයි (වැසීමයයි) කියමි රූපාදීන්ගේ අනිත්‍යතාව හඟවන්නාවූ මාර්ග ප්‍රඥාවෙන් ඒ සොරොව් සම්පූර්ණකාරයෙන් පියනු ලබන්නාහුයයි භාග්‍යවතුන්වහන්සේ පාරායන සූත්‍රයෙහි වදාළසේක) යන මේ ක්‍රමයෙන් ආයේ ඥානසංවර නම—ප්‍රයොජන සලකා නුවණින් සිව්පසය් සෙවනය කාරණබැවින් සිව්පසය සෙවනය කිරීමද මේ ඥාන සංවරයෙහිම සංග්‍රහබවට පැමිණෙන්නේයි.

(යම් මෙ සංවරයෙක් ශීතොෂ්ණයන්ගේ ඉවසීමකොටයි) යනාදී ක්‍රමයෙන් ආයේද මේ ශීලතෙමේ ඛන්ති සංවර නම-යම් මේ පුද්ගලයෙක්තෙම ඒ ඒ අරමුණෙහි උපන් කාමවිතර්කය සිත නොතබන්නේයයි) යනාදි ක්‍රමයෙන් ආයේද මේ ශීලතෙම වීර්ය සංවරනම ආජීව පාරිශුද්ධිශීලයද වීර්යයෙන් සිඬවනබැවින් මේ වීර්යසංවරයෙහිම සංග්‍රහවන්නේයි මෙසේ මේ පස්වැදෑරුම්වූ සංවරයද පාපභීරුකවූ කුලපුත්‍රයන්ගේ ශීලසමාදානයක් නැතිවත් මෙබඳු කර්ම අපවැත්නන්ට නුසුදුසුයයි සම්ප්‍රාප්ත වස්තුවෙන්කාරණා යම් විරතියෙක් ඇත්තේවේද මේ සිය

ලම සංවරශීලයයි දතයුතු. අවසන්හි ඥාන ශීලයනම් සිල්සමාදන්වූවාහුගේ කායචාර වාග්චාර දෙක්හී නොඉක් මීමෙවි. පළමුකොට මේ ශීලයනම් කුමක්ද? යන ප්‍රශ්නයෙහි විසඳීමයි—

( පා • )

අවසෙසෙසු කෙනට්ඨෙන සීලන්ති සීලනට්ඨෙන සීලං කිමිදං සීලනං නාම සමාධානං වා කායකම්මාදීනං සුසීල්‍යවසෙන අවිප්පකිණ්ණතාති අත්ථො උපධාරණං වා කුසලානං ධම්මානං පතිට්ඨාවසෙන ආධාරභාවොති අත්ථො—එතදෙව හි එත්ථ අත්ථද්වයං සද්ද ලක්ඛණවිදූ අනුජානන්ති අඤ්ඤෙ පන සිරට්ඨො සීතලට්ඨොති එවමාදිනා පි නයෙනෙවෙත්ථ අත්ථං වණ්ණයන්ති—

ඉදානි තස්ස ලක්ඛණ රසපච්චුපට්ඨාන පදට්ඨානානි වාති එත්ථ—

( ස * )

අවසෙසෙසු, සෙසු ප්‍රශ්නයන් කෙරෙහි "කෙනට්ඨෙන සීලං" යන්නෙහි; සීලනට්ඨෙන සීලං, ශීලනාර්ථයෙන් ශීල නම්; කිමිදං සීලනං නාම, ඒ ශීලනය නම් කිමයත්; සමාධානං වා, මනාකොට තිබීමහෝයි; කායකම්මාදීනං, කායකර්මාදීන්ගේ; සුසීල්‍ය වසෙන අවිප්පකිණ්ණතාති අත්ථො, සෞශීල්‍ය වශයෙන් අවිප්‍රකීර්ණ බවය යන අර්ථයි; (ශීල—සමාධෞ යන ධාතුහට රූවී. දෞශ්ශීල්‍යයෙන් පවත්නා කාය කර්මාදීහු දුනුදු මතුයෙහිදු අහිතදුඃඛ ඵලවනහෙයින් සම්මාඨපිත නම් නොවෙත්නුයි විසිර පවත්නානම් වෙති—සෞශීල්‍ය වශයෙන් වනාහී පවත්නා කායකර්මාදීහු තම්පයර්සයෙන් "ඔක්ඛිත්ත චක්ඛු න බාහුප්පචාලනාදී" විසින් සම්මාඨපිතයෝයුයි අවිප්‍රකීර්ණ නම්, නොවිසිර පවත්නා නම් වෙත් "අවිප්පකිණ්ණතා" යන මෙයින් සමාධිනු කෙරෙන් ශීලය වෙසෙසුනු—සමාධිහුගේ සමාධාන නම් සම්ප්‍රයුක්ත ධර්මයන්ගේ අවික්ෂෙප බවට හෙතු බවයි—මේ කාය කර්මාදීන් නොවිසිරියළි මනාකොට තිබීමයයි දතයුතු) උපධාරණංවා, දිඨරණානාබවහෝ ආද්‍යභාවය සිබැවින් මූල්බවහෝ; කුසලානං ධම්මානං පතිට්ඨාවසෙන (පූර්වභාග මහද්ගත ලොකොත්තර) කුශලධර්මයන්ට ප්‍රතිෂ්ඨා විසින්; ආධාරභාවො'ති අත්ථො, ආධාරබවය යන අර්ථයි; (ශීල—ප්‍රතිෂ්ඨායාම් යන ධාතු රූවි—"පතිට්ඨාවසෙන" යන මෙයින් පෘථිවීධාතු සාම්‍යයෙන් ශීලය වෙසෙසුනු—පෘථිවීධාතු සහ ජාන රූප ධර්මයන්ගේ සාධාරණ වශයෙන් පවත්නිය—මේ වනාහි අනවද්‍ය ධර්මයන්ට මූලාධිෂ්ඨානභාවයෙන් පවති) එතදෙව හි අත්ථද්වයං, මේ අර්ථදෙකම; සද්දලක්ඛණවිදූ, ශබ්ද ලක්ෂණ දන්නාහු; අනුජානන්ති, අනුඥා කෙරෙත්; අඤ්ඤෙ පන, (ශබ්දලක්ෂණඥයන් කෙරෙන් පිටත්) සෙසු ආචාර්යයෝ වනාහි ("වණ්ණයන්ති" යොදනු) සිරට්ඨො, උත්තමාඞ්ගය යන අර්ථය ශීලශබ්දයාගේ අර්ථයි; (යම්සේ හිස සුන් කල්හි සියලු ආත්මභාවය නසිද එසේම ශීලය භින්න කල්හි සියලු ගුණ ශරීරය නස්නේය එහෙයින් ගුණ ශරීරයාගේ උත්තමාඞ්ගාර්ථය ශීලාර්ථ නම යන අර්ථයි—තොරනොහා "සිරෙ සිසං"යි එක්නව්‍යයෙහි—"වර්ණාගමො වර්ණවිපර්යයශ්ච ද්වෞ චාපරෞ වර්ණවිකාර නාශෞ ධාතොස්තදර්ථාතිශයෙන යොගස් තදුච්‍යතෙ පඤ්චවිධං නිරුක්තම්" යන නෛරුක්තික විධින් සකාරයහට ලකාරකොට "සීලං"යි දක්වූහු) සීතලට්ඨො, පරිදාහ ව්‍යුපසමනා

ර්ථය ශීලාර්ථ නම (මේ අර්ථයෙහි "සී
තලං"යි වක්තව්‍යයෙහි නිරුක්ති න
යින්ම තකාරයගේ ලොප්කොට "සී
ලං"යි දැක්වූහු) එවමාදිනා නයෙන, මේ ආදිනයෙනුදු; එතං, මේ ශීල ශබ්දයෙහි; අත්ථං වණ්ණයන්ති, අර්ථය වර්ණනාකෙරෙත් (ආදී ශබ්දයෙන් "යස්මා අකුසලා එතස්මිං සති අප චිඩා හොන්තීති සීලං — සුපන්ති වා එතෙන විගතුස්සාහානි සබ්බ දුච්චරිතානීති සීලං" යනාදි ගතයුතු. †

( භා * )

සෙසු ප්‍රශ්නයන් අතුරෙන් කවර අර්ථයකින් ශීලනම්වේද යන මෙහි ශීලනාර්ථයෙන් ශීල නම — ඒ ශීල නයනම් කවරේදයත්? කාය කර්මාදීන්ගේ සුසිල්වත් භාව වශයෙන් නොවිසිර පවත්නා බවයයි කියනලද කාය කර්මාදීන් මනාකොට පිහිටුවීමහෝ- රූපාවචර අරූපාවචර ලොකොත්තර කුශල ධර්මයන්ට ප්‍රතිෂ්ඨා වශයෙන් ආධාරභාවයයි කියනලද අධිෂ්ඨාන බවහෝ ශීලන නම්වේ. යන අර්ථයි. මෙහි වනාහි මේ අර්ථවශම ශබ්දශාස්ත්‍රඥයෝ කැමතිවන්නාහුය. ශබ්ද ලක්ෂණඥයන් කෙරෙන් පිටත් සෙසු ආචාර්යයෝ වනාහි හිසය යන අර්ථ ශීල ශබ්දයාගේ අර්ථවත්තේයයිද පීඩා සන්සිඳුවන ශීතල අර්ථය ශීල ශබ්දයාගේ අර්ථයවන්නේයයි දැයි මේ ආදී ක්‍රමයෙනුදු මේ ශීල ශබ්දයෙහි අර්ථ වර්ණනාකරන්නාහු වෙති.

දැන් වනාහි මේ ශීලයාගේ ලක්ෂණය කෘත්‍යය එළඹ සිටිනා*ආකාරය ආසන්නකාරණය යන මොවුන් කවර හුදැයි? යනා මේ ප්‍රශ්නයන්ගේ අර්ථ විසඳීම (මින් මතු ක්‍රමයෙන් දක්වනු ලැබේ.)

( පා † )

සීලනං ලක්ඛණං තස්ස
භින්නස්සා'පි අනෙකධා
සනිදස්සනත්තං රූපස්ස
යථා භින්නස්ස නෙකධා ~

යථාහි නීලපීතාදි භෙදෙන අනෙකධා භින්නස්සා'පි රූපායතනස්ස සනිදස්සනත්තං ලක්ඛණං නීලාදි භෙදෙන භින්නස්සා'පි සනිදස්සනභාවානතික්කමනතො — තථා සීලස්ස චෙතනාදි භෙදෙන අනෙකධා භින්නස්සා'පි යදෙතං කායකම්මාදීනං සමාධානවසෙන කුසලානඤ්ච ධම්මානං පතිට්ඨානවසෙන වුත්තං සීලනං — තදෙව ලක්ඛණං — චෙතනාදිභෙදෙන භින්නස්සා'පි සමාධාන පතිට්ඨාන භාවා න තික්කමනතො — එවං ලක්ඛණස්ස පනස්ස ~

දුස්සීල්‍යවිද්ධංසනතා
අනවජ්ජ ගුණා තථා
කිච්චසම්පත්ති අත්ථෙන
රසො නාම පවුච්චති ~

තස්මා ඉදං සීලං නාම කිච්චට්ඨෙන රසෙන දුස්සීල්‍යවිද්ධංසනරසං සම්පත්ති අත්ථෙන රසෙන අනවජ්ජ රසන්ති වෙදිතබ්බං ~ ලක්ඛණාදිසුහි කිච්චමෙව සම්පත්ති වා රසොති වුච්චති ~

( ශ † )

අනෙකධා භින්නස්සාපි, (චෙතනාදි විසින්) අනෙකප්‍රකාරයෙන් භින්නවූවූ; තස්ස, ඒ ශීලයට; සීලනංලක්ඛණං, කායකර්මාදීන්ගේ අවිප්‍රකීර්ණ බවද කුශලධර්මයන්ට පිහිටබවද ලක්ෂණයයි ඇහාවයි; (අනෙකභෙදය සංග්‍රහබැවින් මේ විශෙෂ ලක්ෂණ නොවන්නේය — සාමාන්‍ය ලක්ෂණවන්නේය යන අ[illegible]

යෝගයට "සනිදස්සනත්තං රූපස්ස යථා භින්නස්සානෙකධා"යි—කීහු) අනෙකධා භින්නස්ස, නීලාදි විසින් අනෙකප්‍රකාරයෙන් භින්නවූ; රූපස්ස, වර්ණායතනයාගේ; සනිදස්සනත්තං යථා, සනිදර්ශනබවමෙනි; (යම්සේ නිලාදිවශයෙන් අනෙක භෙද භින්නදවූ රූපායතනයගේ තදන්‍ය ධර්මයන්ට අසාධාරණබැවින් සනිදර්ශනබව විශෙෂ ලක්‍ෂණවිද අනිත්‍යතාව එවන් රූපපතයමෙන් සාමාන්‍ය ලක්‍ෂණනම් නොවිද එසේම සිලයද තදන්‍ය ධර්මයන්ට අසාධාරණබැවින් චෙතනාදි භෙද භින්න ශීලයාට විශෙෂ ලක්‍ෂණයයි දැක්වියයුයි) යථාහි, යම්සේ; නීලපීතාදි භෙදෙන අනෙකධා භින්නස්සාපි, නීලපීතාදී භෙදයෙන් අනෙකප්‍රකාරයෙන් භින්නදවූ; රූපායතනස්ස, රූපායතනයහට; සනිදස්සනත්තං ලක්ඛණං, සනිදර්ශනබව තදන්‍ය ධර්මයන්ට අසාධාරණබැවින් විශෙෂලක්‍ෂණවිද; (කුම්හෙයිනයත්) නීලාදි භෙදෙන භින්නස්සාපි, නීලාදි භෙදයෙන් භින්නදවූ (රූපායතනයාගේ) සනිදස්සන භාවානතික්කමනතො, සනිදර්ශන භාවයාගේ නොඉක්මීම බැවිනි; තථා, එසේම; චෙතනාදි භෙදෙන අනෙකධා භින්නස්සාපි සිලස්ස, චෙතනාදි භෙදයෙන් අනෙක ප්‍රකාරයෙන් භින්නදවූ ශීලයට; කායකම්මාදීනං සමාධාන වසෙන, කායකර්මාදීන් නොවිසිරියදී මනාකොට තිබීම් වශයෙන්ද; කුසලානං ධම්මානං පතිට්ඨානවසෙන, කුශලධර්මයන්ට පිහිට විසින්ද; වුත්තං, කියනලද; යදෙතං සිලනං, යම් මේ ශීලනයෙක් ඇද්ද; තදෙව ලක්ඛණං, හේම ලක්‍ෂණයි; චෙතනාදි භෙදෙන භින්නස්සාපි, චෙතනාදි භෙදයෙන් භින්නයාගේද; සමාධානපතිට්ඨාන භාවානතික්කමනතො, කායකර්මාදීන්ගේ නොවිසිරෙනබව කුශල ධර්මයන්ට පිහිට බව නොඉක්මෙනහෙයිනි; එවං ලක්ඛණස්ස පනස්ස, මෙබඳු ලක්‍ෂණ ඇති (ශීලයාගේ) දුස්සිල්‍ය විධංසනතා, කායික අසංවරාදී භෙද ඇති දෞශ්ශීල්‍යයාගේ නැසීමද; තථා, එසේම; අනවජ්ජ ගුණා, නිරවද්‍ය කෘත්‍යයද; කිච්චසම්පත්ති අත්ථෙන, කෘත්‍යසහා සම්පත්තිය අර්ථකොට ඇති රසයෙන්; රසො නාම පවුච්චති, රස නැයි කියනුලැබේ ("යස්මා රසො නාම පවුච්චති තස්මා"යි හිඳෙවන්) ඉදං සීලං නාම, මේ ශීලයනම්; කිච්චට්ඨෙන රසෙන, කෘත්‍යාර්ථ රසයෙන්; දුස්සිල්‍ය විධංසන රසං, දෞශ්ශීල්‍යයාගේ නැසීම කෘත්‍යකොට ඇත්තේය; සම්පත්ති අත්ථෙන රසෙන, සම්පත්ත්‍යර්ථ රසයෙන්; අනවජ්ජ රසනානි, අනවද්‍යබව (අගහී බව) සම්පත් කොට ඇත්තේයයි; වෙදිතබ්බං, දතයුතුයි; ලක්ඛණාදිසුහි, ලක්‍ෂණ රසාදීන් කෙරෙහි; කිච්චමෙව සම්පත්තිවා රසොති වුච්චති, කෘත්‍යයමහෝ සම්පත්තියමහෝ රසයයි කියනු ලැබෙයි; (රසායතන රස රසාදීහු කියනු නො ලැබෙත් සත්තයෙහි "කිච්චමෙව" යන අවධාරණයෙන් කෘත්‍ය රසය බලවත් බව කීහයි හිහු. "කිච්චමෙව සම්පත්තිමෙවවා රසො" යන මේ අර්ථය අභිමතබැවින් ගේ ඔවුන්ගේ මති මාත්‍රයි)

( භා † )

චෙතනා සීලාදි වශයෙන් අනෙක ප්‍රකාරයෙන් ප්‍රභෙදවත්වූ ඒ ශීලයාගේ අනන්‍ය සාධාරණවූ ලක්‍ෂණය නම් කාය කර්මාදීන්ගේ නොවිසිර

( කා † )
පවත්නාබවද කුශල ධර්මයන්ට ප්‍රති
ෂ්ඨාවන බවද-ස්වභාව ලක්ෂණයයි.
(ඊට උපමා කවරේදයත්?) නීල පීතා
දි වශයෙන් අනෙක ප්‍රකාර භෙද ඇ
ත්තාවූ රූපායතනයාගේ සනිදර්ශන
භාවය හෙවත් දක්නට සතිය බව (අන
න්‍යසාධාරණ ලක්ෂණ වශයෙන්) කී
වාක් වේද-යම්සේ නීල පීතාදී භෙද
යෙන් අනෙක ප්‍රකාරයෙන් භින්නාවූද
රූපායතනයාගේ සනිදර්ශන භාවය
සෙසු ධර්මයන්ට අසාධාරණ බැවින්
විශෙෂ ලක්ෂණවීද කුමක් හෙයින්ද
යත්? නීලාදි භෙදයෙන් භින්නවූ රූපා
යතනයාගේ සනිදර්ශන භාවය නො
ඉක්මවන බැවිනැයි දතයුතු. එසේ
ම චෙතනා ශීලාදිවශයෙන් අනෙක
ප්‍රකාරයෙන් ප්‍රභෙදවූ ශීලයට කාය
කර්මාදින් නොවිසිරියද මනාකොට
පැවැත්වීම් වශයෙන්ද ලෞකික ලො
කොත්තර කුශල ධර්මයන්ට ප්‍රතිෂ්ඨා
වශයෙන්ද කියනලද යම් ශීලන
යෙක් ඇද්ද එම ලක්ෂණ වන්නේයි.
(කුමක් හෙයින්ද යත්?) චෙතනාදි
ප්‍රභෙද වශයෙන් භින්නාවූද ශීලයා
ගේ කායකර්මාදින් විසිරයානොදී පව
ත්වනබවද කුශලධර්මයන්ට පිහිට
වන බවද යන ලක්ෂණ දෙක නො
ඉක්මවන බැවිනැයි දතයුතුයි.

මෙබදු ලක්ෂණ ඇත්තාවූ ශීලයාගේ
කාය දුශ්චරිතාදි පාප ධර්මයන්ගේ
නැසීමද එසේම නිරවද්‍ය ගුණයෝද
යන මේවුන් කෘත්‍යය හා සම්පත්තිය
අර්ථකොට ඇති රසයෙන් රසනම්යයි
කියනලද්දේය. එහෙයින් මේ ශීල
යනම් කෘත්‍යය අර්ථකොට ඇති රස
යෙන් දුශ්ශීල බව නැතිකිරීම කෘත්‍ය
යකොට ඇත්තේය සම්පත්තිය අර්ථ
කොට ඇති රසයෙන් නිරවද්‍ය බව
හෙවත් නොගැරහියයුතු බව සම්ප
ත්කොට ඇත්තේයයි දතයුතුයි.
ලක්ෂණ රසාදීන් කෙරෙහි කෘත්‍යයම
හෝ සම්පත්තියම හෝ රසයයි කියන
ලද්දේයි.

( පා ‡ )

සොචෙය්‍ය පච්චුපට්ඨානං
තයිදං තස්ස විඤ්ඤූහි
ඔත්තප්පඤ්ච හිරිචෙව
පදට්ඨානන්ති වණ්ණිතං—

තං ඉදං සීලං "කායසොචෙය්‍යං වචී
සොචෙය්‍යං මනොසොචෙය්‍යං" ති
එවං වුත්ත සොචෙය්‍යපච්චුපට්ඨානං—
සොචෙය්‍යභාවෙන පච්චුපට්ඨාති ග
හණභාවං ගච්ඡති-හිරොත්තප්පඤ්ච
පන තස්ස විඤ්ඤූහි පදට්ඨානන්ති
වණ්ණිතං-ආසන්නකාරණන්ති අ
ත්ථො-හිරොත්තප්පෙ හි සති සීලං උ
ප්පජ්ජති චෙව තිට්ඨති ච අසති නෙව
උප්පජ්ජති න තිට්ඨතීති එවං සීලස්ස
ලක්ඛණරසපච්චුපට්ඨාන පදට්ඨානා
නි වෙදිතබ්බානි— කිමානිසංසන්ති
අවිප්පටිසාරාදි අනෙකගුණපටිලාභා
නිසංසං-වුත්තං හෙතං-අවිප්පටිසාර
ත්ථානි ඛො ආනන්ද කුසලානි සීලානි
අවිප්පටිසාරානිසංසානී" ති—

( ස ‡ )
සොචෙය්‍යපච්චුපට්ඨානං, කායාදී
න්ගේ ශුචි බව වැටහීම් කොට ඇත්
තේයි; තස්ස, ඒ ශීලයට; විඤ්ඤූහි,
නුවණැත්තන් විසින්; ඔත්තප්පඤ්ච, ඔ
ත්තප්පයද; හිරිචෙව, හිරිද; පදට්ඨා
නන්ති, ආසන්නකාරණයයි; වණ්ණිතං,
වර්ණනා කරනලදී; තං ඉදං සීලං,
ඒ මේ ශීලය; කායසොචෙය්‍යං, කාය
චාරශුචි බවය; වචීසොචෙය්‍යං, වාග්
චාරශුචි බවය; මනොසොචෙය්‍යන්ති,
මනොචාර ශුචිබවයයි; එවං වුත්ත
සොචෙය්‍ය පච්චුපට්ඨානං, මෙසේ කි
යනලද ශුචි බව වැටහීම්කොට ඇත්
තේයි; සොචෙය්‍යභාවෙන [illegible]

( ස ‡ )

ති, ශුචි බැවින් වැටහේ; ගහණභාවං ගච්ඡති, ගතයුතු බවට පැමිණේ (මෙහින් උපසථානාකාර සංඛ්‍යාත ප්‍රත්‍යුපසථානයයි කියනලද ඵල සීි හෙයින් වනාහි "අවිප්පටිසාර පච්චුපට්ඨානං සමාධිපච්චුපට්ඨානං වා" කියයුතු - ශීලය දක්නා අවිප්‍රතිසාරය ඵලවයි. පරම්පරායෙන් සමාධියද ඵලවා මේ ආනිසංස ඵලය ආනිසංස කථාවෙහි වක්ෂ්‍යමානයෙහිත් මෙහි නොකීහු— සන්තානයෙහි ඵලය අනීප්සිත බැවින් මෙහි නොගත්හයි කීහ - මෝ නොමැනවී ඵලය අනෙකත්ව බැවිනුදු ලෞකිකාදි ශීලය විභාග කටයුතු බැවිනුදු) හිරොත්තප්පපදට්ඨාන, හිරිඔතප් දෙක වනාහි; තසස, ඒ ශීලයට, විඤ්ඤූහි, නුවනැත්තන් විසින්; "පදට්ඨානන්ති වණ්ණිතා"යි, සෙයි; ආසන්නකාරණන්ති අත්ථො, ආසන්න කාරණය යන අර්ථයි (පෘථිවි ධාතු භව යම්සේ කර්මාදි දූර කාරණද සෙසු භූතත්‍රය ආසන්න කාරණද යම්සේ වසත්‍රයට තනනවාය තුරිය වෙම සලාකාදී දූර කාරණද තන්තුහු ආසන්න කාරණද එසේම ශීලයටද සද්ධර්ම ශ්‍රවණාදීහු දූරකාරණය හිරිඔතප් ආසන්න කාරණයයි දක්වනු පිණිස "හිරිඔත්තප්පෙසු" යනාදි කීහු "හිරිඔත්තප්පෙසු සති" යනාදීන් ආසන්න කාරණා බවම සාධන්) හිරිඔත්තප්පෙසු සති, හිරිඔතප් දෙදෙනා ඇතිකල්හි; සීලං, ශීලය; උප්පජ්ජති චෙව, සමාදන වශයෙන් උපදනේද වෙයි; තිට්ඨති ච, අව්‍යතික්‍රම වශයෙන් සිටුනේද වෙයි; අසති, හිරිඔතප් දෙක නැති කල්හි; නෙව උප්පජ්ජති න තිට්ඨති, නොම උපදනේය නොම සිටුනේයි; කිමානිසංසනායි, කුමක් අනුසස් කොට ඇත්තේදයත්? අවිප්පටිසාරාදි අනෙකගුණ පටිලාභානිසංසං, අවිප්‍රතිසාරාදී අනෙක ගුණ ප්‍රතිලාභය අනුසස්කොට ඇත්තේයි; (මෙහි අවිප්‍රතිසාර නම් විප්‍රතිසාර ප්‍රතිපක්ෂ කුශල චිත්තෝත්පාදයයි. මේ වනාහි වෙසෙසින් "ලාභා වත මෙ සුලද්ධං වත මෙ යසස මෙ සුපරිසුද්ධං සීලං" යනාදීන් තමාගේ ශීලය ප්‍රත්‍යවෙක්ෂාවශයෙන් ප්‍රවෘත්තයයි වෙදිතව්‍යයි=ආදි ශබ්දයෙන් ප්‍රමෝද්‍ය සොග සම්පත්ති කීර්ති ශබ්දාදීන් ගන්නු) වුත්තං හෙතං, වදාළේමය; ආනන්ද, ආනන්දය; කුසලානි සීලානි, අනවද්‍ය ශීලයෝ; අවිප්පටිසාරත්ථානි, අවිප්‍රතිසාරය ප්‍රයෝජනකොට ඇත්තාහුයි; අවිප්පටිසාරානි සංසානි, අවිප්‍රතිසාරය අනුසස්කොට ඇත්තාහුයි (මෙයින් අවිප්‍රතිසාරය ශීලයාගේ උදය මාත්‍රයයි සංවර්ධිත වෘක්ෂයෙහි ඡායා පුෂ්පසදෘශය-මෙයින් නිෂ්පාද්‍යවූයේ අනායම්වූ සමාධි ආදි ගුණයයිදක්වූහු)

( හා ‡ )

කායවාචීමනෝ යන වාරයන්ගේ පිරිසිදු බව වැටහීම්කොට ඇත්තේය පණ්ඩිතයන් විසින් පවට භය හා ලජ්ජාවද යන දෙක ඒ ශීලයාගේ ආසන්න කාරණායයි වර්ණනාකරණ ලද්දේය. ඒ මේ ශීලය කායවාරයෙහි පිරිසිදු බවය වාග්වාරයෙහි පිරිසිදු බවය මනොවාරයෙහි පිරිසිදු බවයයි මෙසේ කියනලද පිරිසිදු බව වැටහීම් කොට ඇත්තේය පිරිසිදු බැවින් වැටහීමට හෙවත් ගතයුතු බවට පැමිණෙන්නේය යන අර්ථයි. හිරි ඔතප් දෙක වනාහි නුවනැත්තන් විසින් ඒ ශීලයාට සමීප කාරණායයි වර්ණනාකරණ ලද්දේය-ඒ එසේමැයි හිරි ඔතප් දෙදෙනා ඇති කල්හි ශීලය සමාදන්වීම් වශයෙන් උපදනේද වෙයි. ශික්ෂාපද නොඉක්මවීම් වශ

යෙන් පිහිටා සිටීමෙන්ද වෙයි. එසේ ම හිරි ඔතප් දෙක නැති කල්හි ශීලය නොවූපදනේමය නොසිටින් මැයි-මෙසේ ශීලයාගේ ලක්‍ෂණය කෘත්‍යය වැටහෙන්නාවූ ආකාරය සම්ප්‍රදාරණය යන මොවුන් දතයුත්තාහුයි. ශීලය කුමක් අනුසස්කොට ඇත්තේද යත්? විපිළිසර නොවීම් ආදී නොයෙක් ගුණයන්ගේ ප්‍රතිලාභය අනුසස්කොට ඇත්තේයි. එහෙයින් වදළහ (එම්බා ආනන්දය නිරවද්‍යවූ ශීලයෝ විපිළිසර නොවීම ගෙපත් මාගේ ශීලය අතිශයින් සුපරිශුඩය මා විසින් ලබනලද්දේ මහත් ලාභයක යනාදින් පැවති ප්‍රමොදනාදිය ප්‍රයෝජනකොට ඇත්තාහ. එම විපිළිසර නොවන බව අනුසස්කොට ඇත්තාහ) යනාදියයි=

( ෲ ¶ )

අපරම්පි වුත්තං-"පඤ්චිමෙ ගහපතයො ආනිසංසා සීලවතො සීලසම්පදය, කතමෙපඤ්ච ඉධගහපතයො සීලවා සීලසම්පන්නො අප්පමාදධි කරණං මහන්තං භොගක්ඛන්ධං අධිගච්ඡති අයං පඨමො ආනිසංසො සීලවතො සීලසම්පදය—පුනච පරං ගහපතයො සීලවතො සීලසම්පන්නස්ස කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගච්ඡති අයං දුතියො ආනිසංසො සීලවතො සීලසම්පදය—පුන ච පරං ගහපතයො සීලවා සීලසම්පන්නො යං යදෙව පරිසං උපසඞ්කමති යදි ඛත්තිය පරිසං යදි බ්‍රාහමණ පරිසං යදි ගහපති පරිසං යදි සමණ පරිසං විසාරදෙ උපසඞ්කමති අමඞ්කුභූතො අයං තතියො ආනිසංසො සීලවතො සීලසම්පදය—පුනචපරං ගහපතයො සීලවා සීලසම්පන්නො අසම්මූළ්හො කාලඞ්කරොති අයං චතුත්ථො ආනිසංසො සීලවතො සීලසම්පදය—පුනච පරං ගහපතයො සීලවා සීලසම්පන්නො කායස්ස භෙද පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති අයං පඤ්චමො ආනිසංසො සීලවතො සීලසම්පදයා"ති—

( ඎ ¶ )

අපරම්පි වුත්තං, අතිරෙකඛුද්‍ද කියනලදී; ගහපතයො, ගෘහපතීනි; සීලවතො, පරිපූර්ණවූ සිල් ඇත්තාහුට; සීලසම්පදය, එම ශීල සම්පත්තියෙයහි; ඉමෙ පඤ්ච ආනිසංසා, මේ පස් අනුසස්හු වෙත්; කතමෙ පඤ්ච, කවර පස්දෙනෙක්ද යත්? ඉධ, මෙහි; ගහපතයො, ගෘහපතීනි; සීලවා, සිල්වත්වූ; සීලසම්පන්නො, සීලසම්පන්න තෙමේ; අප්පමාදධි කරණං, අප්‍රමාදකාරණයෙන්; මහන්තං භොගක්ඛන්ධං, මහත් භොග රාශියට; අධිගච්ඡති, පැමිණේ; අයං, මේ තෙමේ; සීලවතො සීලසම්පදය, සිල්වත්හුගේ ශීලසම්පත්තියෙහි; පඨමො ආනිසංසො, පළමුවන අනුසසයි; පුන ච පරං, නැවත අතික් අනුසස කුද්‍ද කියමි (මෙතු සතර වාරයෙහි කී තයින්ම අර්ථ දතහැකි බැවින් නොකී පෙදෙහිම අර්ථ ලියමු) කල්‍යාණො කිත්තිසද්දො, අබ්භුග්ගච්ඡති, මෙසේ සිල්වත් මෙසේ කල්‍යාණ ධර්මයයි සුන්දරවූ ස්තුති ඝොෂණය නැගේ [ලොව පැතිරේය යන අර්ථයි) යං යදෙව පරිසං උපසඞ්කමති, යම් යම් පිරිසකට එළඹිනම්; යදි ඛත්තියපරිසං, ඉදින් රජපිරිසකටවත්; යදි බ්‍රාහ්මණපරිසං, ඉදින් බමුණු පිරිසකටවත්; යදිගහපති පරිසං, ඉදින් ගෘහපති පිරිසකටවත්; යදි සමණ පරිසං, ඉදින් මහණ පිරිසකටවත් (එළෙඹීනම්) විසාරදෙ, තමා [illegible]

කිසි වරදක් නොදක්නේ විසාරදවූයේ නිර්භය වූයේ; අසම්මූළ්හො, මෝහල්වප නුවූයේ; උපසඞ්කමති, එළඹේ; අසම්මූළ්හො, මරණ සමයෙහි කුශල කර්මාදීන්ම වැටහෙන බැවින් මුළානොවූ ප්‍රසන්නවූ සිත් ඇතිව; කාලඞ්කරොති, කාලක්‍රියා කෙරේ; කායස්ස භෙද, උපාදිණ්ණස්කන්ධ සංඛ්‍යාත කායයාගේ පරිත්‍යාගයෙන් ජීවිතෙන්ද්‍රියයාගේ උපච්ඡේදයෙන්; පරම්මරණා, මරණින් මත්තෙහි; සුගතිං, සුන්දර ගති ඇති හෙයින් සුගති නම්වූ (මනුෂ්‍ය ගතියද සංග්‍රහවේ) සග්ගං ලොකං, දෙව්ගති සඞ්ඛ්‍යාත ලොකයෙහි; උපපජ්ජති, උපදියි (ගති තොමෝ ''රූපාදිහි විසයෙහි සුට්ඨු අග්ගොති සග්ගො''යි ''ලොකියති එත්ථ උළාරං පුඤ්ඤඵලන්ති ලොකො'' යිදු කියනු ලැබේ. ''අපරෙපි ආනිසංසා වුත්තා.''යි යොදනු )

( හා ¶ )

අනික් ආනිසංසයෙකුදු වදාරණලද්දේය (එම්බා ගෘහපතියෙනි සම්පූර්ණවූ සිල් ඇත්තා හට එම ශීල සම්පත්තියෙහි මේ අනුසස් පසෙක් ඇත්තාහ—ඒ කවර පසෙක්දයත්? එම්බා ගෘහපතීයෙනි! ශීලයෙන් පරිපූර්ණවූ සිල්වත් තෙමේ මෙ ලොකයෙහිදීම අප්‍රමාද නොවීමෙන් මහත්වූ භොග සම්පත් රාශියකට පැමිණෙන්නේය. මේ සිල් ඇත්තහුගේ ශීල සම්පත්තියෙහි පළමුවන ආනිසංසය නම්වේ. නැවත ද ගෘහපතියෙනි! ශීලයෙන් පරිපූර්ණවූ සිල්වත්හුගේ මෙබඳු සිල්වත්තාය මෙබඳු යහපත් ස්වභාව ඇත්තායයි යනාදීන් යහපත්වූ ස්තුති ඝොෂාව ලොකයෙහි උස්ව පැතිරී යන්නේය මේ සිල්වත්හුගේ ශීල සම්පත්තියෙහි දෙවන ආනිසංසය නම් වන්නේය—නැවතද ගෘහපතියෙනි, ශීලයෙන් පරිපූර්ණවූ සිල්වත් තෙමේ යම් යම් සභාවකට එළඹේද රාජ සභාවකට හෝ බ්‍රාහ්මණ සභාවකට හෝ ගෘහපති සභාවකට හෝ ශ්‍රමණ සභාවකට හෝ එළඹේද තැ, කෙරෙහි කිසි වරදක් නොදක්නා හෙයින් නිර්භයවම නොපිළිසරවම එළඹෙන්නේය මේ සිල්වත්හුගේ ශීල සම්පත්තියෙහි තුන්වන ආනිසංසය නම් වන්නේය—නැවතද ගෘහපතියෙනි, ශීලයෙන් පරිපූර්ණවූ සිල්වත් තෙමේ මරණ සමයෙහි මරණාසන්න ජවන චිත්ත වීථින්ට කුශල කර්මාදීන්ම අරමුණු වශයෙන් වැටහෙන බැවින් මුළානොවූ පහන්වූ සිත් ඇතිව කාලක්‍රියා කරන්නේය. මේ සිල්වත්හුගේ ශීල සම්පත්තියෙහි සතරවන ආනිසංසය නම් වන්නේය නැවතද ගෘහපතියෙනි, ශීලයෙන් පරිපූර්ණවූ සිල්වත් තෙමේ තෘෂ්ණාවෙන් ගන්නාලද ස්කන්ධ සංඛ්‍යාත කායයාගේ බිඳීමෙන් ජීවිතෙන්ද්‍රියයාගේ බිඳීමෙන් මරණින් මතුයෙහි සුන්දර ගති ඇත්තාවූ දිව්‍යලොකයෙහි උපදන්නේය මේ සිල්වත්හුගේ ශීල සම්පත්තියෙහි පස්වන ආනිසංසය නම් වන්නේය.) යනුයි.—

( හා * )

අපරෙපි-''ආකඞ්ඛෙය්‍ය චෙ භික්ඛවෙ භික්ඛු සබ්‍රහ්මචාරීනං පියො චස්සං මනාපො ගරු භාවනීයො චා''ති ''සීලෙ සෙවස්ස පරිපූරකාරී''ති ආදිනා නයෙන පියමනාපතාදයො ආසවක්ඛය පරියොසානා අනෙකෙ සීලානිසංසා වුත්තා—එවං අවිප්පටිසාරාදි අනෙකගුණානිසංසං සීලං—අපිච—

සාසනෙ කුලපුත්තානං
පතිට්ඨා නත්ථි යං විනා-
ආනිසංස පරිච්ඡෙදං
තස්ස සීලස්ස කො වදෙ෴
න ගඞ්ගා යමුනා චාපි
සරභූ වා සරස්සතී
නින්නගා වා චිරවතී
මහී චාපි මහා නදී෴
සක්කුණන්ති විසොධෙතුං
තං මලං ඉධ පාණිනං
විසොධයති සත්තානං
යං වෙ සීලජලං මලං෴
න තං සජලදා වාතා
න චාපි හරිචන්දනං
නෙව හාරා න මණයො
න චන්දකිරණඞ්කුරා෴
සමයන්තීධ සත්තානං
පරිළාහං සුරක්ඛිතං
යං සමෙති ඉදං අරියං
සීලං අච්චන්ත සීතලං෴
සීලගන්ධ සමො ගන්ධො
කුතො නාම භවිස්සති
යො සමං අනුවාතෙ ච
පටිවාතෙ ච වායති෴
සග්ගාරොහණ සොපානං
අඤ්ඤං සීලසමං කුතො
ද්වාරං වා පන නිබ්බාන
නගරස්ස පවෙසනෙ෴
සොභන්තෙවං න රාජානො
මුත්තාමණි විභූසිතා
යථා සොභන්ති යතිනො
සීලභූසන භූසිතා෴
අත්තානුවාදාදි භයං
විද්ධංසයති සබ්බසො
ජනෙති කිත්ති හාසඤ්ච
සීලං සීලවතං සදා෴
ගුණානං මූලභූතස්ස
දොසානං බලඝාතිනො
ඉති සීලස්ස විඤ්ඤෙය්‍යං
ආනිසංස කථා මුඛන්ති෴

( ස * )

භික්ඛවෙ, මහණෙනි; භික්ඛු, මහණ තෙමේ; සබ්‍රහ්මචාරීනං, සබ්‍රම් සරණට; පියොචස්ස, ප්‍රිය වෙම්වයි; (ප්‍රෙම කටයුතු වෙම්වයි යන අදහසි) මනාපොච, සබ්‍රම්සරුන් සිත් වඩම් වයි (මෙත් සිතින් පැහිරවිය යෙහෙම් වයි යන අදහසි) ගරුච, පහණ සත ක්හෙමන් ගුරුවෙම්වයි; භාවනීයොච, මේ ආයුෂ්මත් දතයුත්ත දන්නී දක්කයුත්ත දක්කිසී මෙසේ සම්භාව්‍ය වෙම් වයි; ආකඞ්ඛෙය්‍ය චෙ, ඉදින් කැමැත් තේ වීනම්; සීලෙසෙවස්ස පරිපූර කාරී, සතර පිරිසිදු සිල්හිම සම්පූර්ණකාරි වන්නේය යන; ආදිනා නයෙන, මේ ආදී නයින් (ආදි ග්‍රහණයෙන් "අජ්ඣත්තං චෙතො සමථමනුයුත්තො අනිරාකතජ්ඣානො විපස්සනාය සමන්නාගතො බ්‍රෑහෙතා සුඤ්ඤාගාරානං" යනාදීවූ ශීලසූත්‍රි සූත්‍රාගතවූ සතළොස් ශීලානිසංසයෝ සඞ්ගෘහීත වෙත් ) පියමනාපාදයො, ප්‍රියමනාපාදීවූ; ආසවක්ඛය පරියොසානා, ආශ්‍රවක්ෂය පර්යවසානවූ; අනෙකෙ සීලානිසංසා වුත්තා, නොයෙක් ශීලානිසංසයෝ කියනලදහු; එවං, මෙසේ; අවිප්පටිසාරාදි අනෙකගුණානිසංසං සීලං, අවිප්‍රතිසාරාදි අනෙක ගුණයන් අනුසස්කොට ඇත්තේයි ශීලය;-අපිච, අනිකක්දු (තවද ශීලානිසංසයෝ ඇත යන අදහසි.)

සාසනෙ,හි යනු, ලෞවී ලොවී තුරා ගුණ එලවන මේ ශාසනය ශාසනයෙහි; කුලපුත්තානං, ආචාර කුලපුත්‍රයන්ගේ; යං විනා පතිට්ඨා නත්ථි, යම් ශීලයක් විනා පිහිටක් නැද්ද; තස්ස සීලස්ස, මෙසේ අනුසස් ඇති ශීලයාගේ; ආනිසංස පරිච්ඡෙදං, අනුසස්හි පමණ; කො වදෙ; කවරෙක් කියන්නාව සමර්ථවේද; න ගඞ්ගා, ගඞ්ගා නම් නදීද; [illegible]

යමුනා නම් නදිද; සරභූවා, සරභූ නම් නදිද; සරස්සතී, සරස්වතී නම් නදිද; අචිරවතී නින්නගාවා, අචිරවතී නම් නදිද; මහිවාපි මහානදී, මහී නම් මහානදිද [ වා ශබ්දයෙන් අනුක්ත චන්ද්‍රභාගාදීහුද) යනාදී සියළු නදීහු; ("තම්මලං විසොධෙතුං න සක්කුණන්ති"යි යොදනු) ඉධ, මේ ලෝකයෙහි; පාණීනං සත්තානං, ප්‍රාණී සංඛ්‍යාත සත්වයන්ගේ; යම්මලං, යම් රාගද්වෙෂාදී මලයක්; වෙ, ඒකාන්තයෙන්; සීලජලං විසොධෙති, ශීල නැමති ජලය විශුද්ධ කෙරේද; තම්මලං, ඒ මලය; විසොධෙතුං, ශුද්ධකරන්නට; න සක්කුණන්ති, නොපොහොසත්හු; සුරක්ඛිතං, මනාකොට රක්‍ෂාකරණලද; අරියං, විශුද්ධවූ; අච්චන්ත සීතලං, අත්‍යන්තයෙන් සිහිල්වූ; ඉදං සීලං, මේ ශීලය තෙමේ; ඉධ, මේ ලෝකයෙහි; සත්තානං, ප්‍රාණී සංඛ්‍යාත සත්වයන්ගේ; යං පරිළාහං සමෙති, යම් පරිදාහයක් සන්හිඳුවාද, තං, ඒ පරිදාහය; සජලද වාතා, මේඝ මාරුතයෝද; න සමයන්ති, නොසන්හිඳුවත්; හරිචන්දනං, හරිචන්දනද; න චාපි සමයති, නොම සන්හිඳුවා; හාරා, මුක්තාහාරයෝද; නෙව සමයන්ති, නොම සන්හිඳුවත්; මණයො, වෛදූර්‍ය මණීහුද; නසමයන්ති, සන්නොසිඳුවත්; චන්දකිරණංකුරා, සඳරැස්හුද; න සමයන්ති, සන්නොසිඳුවත්; යො, යම් ශීලගන්ධයක් (ශීල සමුත්පිත කීර්ති ශබ්දය මනොහර බැවිනුදු දික්හි පැතිරෙණ බැවිනුදු "සීලගන්ධ" යයි කියනලදී;) සමං, සමව; අනුවාතෙ ච. යට සුළඟටද; පටිවාතෙච, උඩු සුළඟටද; වායති, හමාද; සීලගන්ධ සමො ගන්ධො, ඒ ශීලගන්ධය හා සම්වූ ගන්ධයෙක්; කුතො නාම භවිස්සති, කොහි නම්වේද; සග්ගාරොහණ, ස්වර්ගයට නැගෙන්නට; සීලසමං, ශීලය හා සමවූ; අඤ්ඤං සොපානං කුතො, අනික් හිනෙක් කොහිද; නිබ්බාන නගරස්ස, නිර්වාණ පුරයට; පවෙසනෙ, වදනා තැන්හි නොහොත් ප්‍රවේශ ක්‍රියායෙහි; වාරං වා පන අඤ්ඤං සීලසමං කුතො, අනික් ශීලය හා සමාන දොරක් කොහිද; සීලභූසන, ශීලාභරණයෙන්; භූසිතා, අලඞ්කෘතවූ; යතිනො, භික්ෂූහු; යථා සොභන්ති, යම්සේ හොබීද්ද; මුත්තාමණි විභූසිතා, මුතු මැණික් විභූෂිතවූ; රාජානො, රජදරුවෝද; එවං න සොභන්ති, එසේ නොහොබිත්; සීලං, ශීලය තෙමේ; සීලවතං, සිල්වත්නට; සදා, හැමකල්හි; අත්තානුවාදාදි භයං, තමාම තමාට නින්දා කිරීමෙහි උපදනා භය (ආදි ශබ්දයෙන් දණ්ඩභය දුර්ගති භය ගැණේ) සබ්බසො, සර්වාකාරයෙන්ම, විධංසයති, නසා; කිත්තිං, කීර්තිද; හාසඤ්ච, හර්ෂද; ජනෙති, උපදවා; ගුණානං මූලභූතස්ස, ගුණයන්ට මූලවූ; දොසානං බලඝාතිනො, දෝෂයන්ගේ බලයයි කියනලද පරාක්‍රම නසන්නාවූ (දොසානං බලං නාම වජ්ජපිබ්බාවාරො—තං තෙසං ඝාතුං අදෙන්තං සීලං දොසානං බලං ඝාතෙතීති වෙදිතබ්බං—

"සකලශාං කුරං න ප්‍රහනොති ශීලං
බීජාංකුරං කාල ඉවා'ති වෘත්තං
ශුමෙව හි ශීලෙ පුරුෂස්‍ය දෙෂා
මනස්‍ය ලජ්ජා ඉව ධ්වංසයන්ති"යි—

කීයේමැනෝ) සීලස්ස, ශීලයාගේ; ආනිසංස කථා මුඛං, ආනිසංස කථාවාරය (අනුසස් කීමට දොරය යන අර්ථයි) ඉති විශුද්ධෙය්‍යාං, මෙසේ දතයුතු.

(සා †)

අනිඝුදු ආනිසංසයන් වදරණ ලද්දේමැයි-(මහණෙනි මේ ශාසනයෙහි යම් මහණෙක් තෙම සමාන බ්‍රහ්මචාරීන්ට පූජා කටයුතු වෙම්වායි සමාන බ්‍රහ්මචාරීන් කෙරෙහි මෛත්‍රීසිත් පැතිරවීය හෙම්වයි පාෂාණ ඡත්‍රයක් මෙන් ගරු වෙම්වයි සම්භාවනීය වෙම්වයි ඉදින් කැමැත්තේවීනම් ඒ මහණ චතුපාරිශුද්ධි ශීලයෙහිම සම්පූර්ණකාරිවිය යුත්තේයි) යනාදීන් ශීලසූත්‍රයෙහි ආ ක්‍රමයෙන් ප්‍රියමනාපාදීවූ ආශ්‍රවක්ෂය කිරීම අවසන්කොට ඇත්තාවූ නොයෙක් ශීලානිසංසයෝ වදරණලද්දාහුය. මෙසේ මේ ශීලය අවිප්‍රතිසාරාදි නොයෙක් ගුණ අනුසස්කොට ඇත්තේය—කියන ලද්දේමැයි—ලෞකික ලෝකෝත්තර සැප ගෙණදෙන මේ සම්බුද්ධ ශාසනයෙහි ආචාර කුලපුත්‍රයන්ට යම් මේ ශීලය විනා අනික් පිහිටෙක් නැත්තේද ඒ ශීලයාගේ අනුසස් ප්‍රමාණ (මෙතෙකැයි) කවරෙක් කියන්නට පොහොසත් වේද—නොවන්නේමය. මේ ලෝකවාසී සත්වයන්ගේ යම් රාගාදි කෙලෙස් මලයක් ඒකාන්තයෙන් ශීල නැමැති ජලය විශේෂයෙන් පිරිසිදු කෙරේද ඒ මලය පිරිසිදුකරන්නට ගඞ්ගානම් නදිය යමුනානම් නදිය සරභූනම් නදිය සරස්වතීනම් නදිය අචිරවතීනම් නදිය මහීනම් නදිය චන්ද්‍රභාගාදී නදීහුය යන මේ සියලු නදිහුද පොහොසත් නොවෙත්මය මොනවට රක්ෂාකරණලද විශේෂයෙන් පිරිසිදුවූ අතිශයින් සිහිල්වූ මේ ශීලය තෙමේ මේ ලෝකයෙහි ප්‍රාණී සංඛ්‍යාත සත්වයන්ගේ යම් කෙලෙස් නැමැති දාහයක් සන්සිඳුවාද ඒ දාහය මේඝ මාරුතයෝද නොසන්සිඳුවන්මය රත්සඳුන්ද නොසන්සිඳුවාමය මුක්තාහාරයෝද නොසන්සිඳුවන්මය වෛඩූර්‍ය මාණික්‍ය රත්නයෝද නොසන්සිඳුවන්මය චන්ද්‍ර රශ්මීහුද නොසන්සිඳුවන්මය—ශීලයෙන් හවගතකාවූ (හෙවත් අසවලා මෙබඳු ශීලවන්තයෙකැ යනාදීන් පැණනැගාවූ) කීර්ති ශෝභාව මනොහර බැවින්ද දශ දිශාවන්හි පැතිරෙණ බැවින්ද සුගන්ධනම්වේ ඒ ශීල සුගන්ධ තෙමේ යටි සුලඟෙහිද උඩු සුලඟෙහිද ඒකාකාරව හමන්නේය. ඒ ශීල සුගන්ධය හා සමවූ සුගන්ධයෙක් අන් කොතැනක වේද? නොවන්නේමැයි—ස්වර්ගයට නැගීම පිණිස ශීලය හා සමවූ අනික් හිනිපෙතක් කොයින්ද? නැත්තේමය. නිවන්පුර වැදීමෙහි ශීලය හා සමාන දොරටුවෙක් වෙන කොයින්ද? නැත්තේමය ශීලනැමති ආභරණයෙන් සැරසුනාවූ භික්ෂූහු යම්සේ ශෝභනාහුද මුතු මැණික් ආදියෙන් සැරහුනාවූ රජදරුවෝ පවා එසේ නොශෝභනාහුය ශීලය තෙමේ සිල්වතුන්ට හැමකල්හිම තමා විසින් තමහට නින්දකිරීමෙහි උපදනා ආත්මානුවාද භය දඬ භය නරක භයාදිය සම්ප්‍රකාරයෙන්ම නසන්නේය කීර්ති ශෝභාවද ප්‍රීතියද උපදවන්නේය—ගුණයන්ට මුල් කාරණවූ රාග ද්වේෂ මෝහාදි කෙලෙසුන්ගේ බලයයි කියනලද පව්කිරීම නසන්නාවූ මේ ශීලයාගේ ආනිසංස මුඛ මාත්‍රය මෙසේ දතයුතුයි.

(පා †)

ඉදානි යං වුත්තං කතිවිධඤ්චේතං සීලන්ති-තත්‍රිදං විසජ්ජනං සබ්බමෙව තාව ඉදං සීලං අත්තනො සීලනලක්ඛණෙන එකවිධං.

චාරිත්තවාරිත්තවසෙන දුවිධං--තථා ආභිසමාචාරික ආදිබ්‍රහ්මචරියක

වසෙන - විරති අවිරතිවසෙන නිස්සිතා නිස්සිතවසෙන - කාලපරියන්තා ආපාණකොටික වසෙන - සපරියන්තා පරියන්ත වසෙන - ලොකිය ලොකුත්තරවසෙනච —

තිවිධං හීනමජ්ඣිම පණීතවසෙන - තථා අත්තාධිපතෙය්‍ය ලොකාධිපතෙය්‍ය ධම්මාධිපතෙය්‍ය වසෙන පරාමට්ඨාපරාමට්ඨ පටිප්පස්සද්ධි වසෙන විසුද්ධාවිසුද්ධවෙමතික වසෙන — සෙඛාසෙඛ නෙවසෙඛ නාසෙඛ වසෙනච — චතුබ්බිධං හානභාගිය ඨිතිභාගිය විසෙසභාගිය නිබ්බෙධ භාගියවසෙන — තථා භික්ඛු භික්ඛුනී අනුපසම්පන්න ගහට්ඨ සීලවසෙන — පකති අචාර ධම්මතා පුබ්බහෙතුක සීලවසෙන — පාතිමොක්ඛසංවර ඉන්ද්‍රිය සංවර ආජීවපාරිසුද්ධිපච්චය නිස්සිත සීලවසෙනච — පඤ්චවිධං පරියන්ත පාරිසුද්ධි සීලාදිවසෙන වුත්තම්පි චෙතං පටිසම්භිදායං "පඤ්චසීලානි පරියන්තපාරිසුද්ධිසීලං අපරියන්ත පාරිසුද්ධි සීලං පරිපුණ්ණපාරිසුද්ධිසීලං අපරාමට්ඨපාරිසුද්ධි සීලං පටිප්පස්සද්ධි පාරිසුද්ධි සීලං"ති තථා පහාණ වෙරමණි චෙතනා සංවරා වීතික්කම වසෙන —

---

(සං†)

("කතිවිධඤ්චෙතං සීලන්ති යං වුත්තං තත්‍ර ඉදං විසජ්ජනං"යි යොදනු) තාව, පළමුකොට; සබ්බමෙව ඉදං සීලං, සියළු මේ ශීලය ම; අත්තනො සීලන ලක්ඛණෙන, තමාගේ ශීලන සඞ්ඛ්‍යාත ස්වභාවයෙන්; එකවිධං, එක් ප්‍රකාරයේ; චාරිත්ත වාරිත්ත වසෙන, චාරිත්‍ර ශීල වාරිත්‍ර ශීල වශයෙන්; දුවිධං, දෙප්‍රකාරයේ; තථා, එසේම; ආභිසමාචාරික ආදි බ්‍රහ්මචරියක වසෙන, ආභිසමාචාරික ශීල ආදි බ්‍රහ්මචරියක ශීල වශයෙනුදු; විරති අවිරති වසෙන, විරතිශීල අවිරති ශීල වශයෙනුදු; නිස්සිතා නිස්සිත වසෙන, නිශ්‍රිත ශීල අනිශ්‍රිත ශීල වශයෙනුදු; කාලපරියන්ත සීල ආපාණකොටික සීලවසෙන, කාලපරියන්ත ශීල ආපාණකොටික ශීල වශයෙනුදු; සපරියන්තා පරියන්තවසෙන, සපරියන්ත ශීල අපරියන්ත ශීල වශයෙනුදු; ලොකිය ලොකුත්තර වසෙනච, ලෞකික ශීල ලෝකෝත්තර ශීල වශයෙනුදු (ද්විප්‍රකාර වේ) තිවිධං හීන මජ්ඣිම පණීත වසෙන, හීන ශීල මධ්‍යම ශීල ප්‍රණීත ශීල වශයෙන් ත්‍රිප්‍රකාර වේ-තථා, එසේම; අත්තාධිපතෙය්‍ය ලොකාධිපතෙය්‍ය ධම්මාධිපතෙය්‍ය වසෙන, ආත්මාධිපති ශීල ලෝකාධිපති ශීල ධර්මාධිපති ශීල වශයෙන්ද; පරාමට්ඨාපරාමට්ඨ පටිප්පස්සද්ධි වසෙන, පරාමෘෂ්ට ශීල අපරාමෘෂ්ට ශීල ප්‍රතිප්‍රශ්‍රබ්ධි ශීල වශයෙන්ද; විසුද්ධාවිසුද්ධ වෙමතික වසෙන, විශුද්ධ ශීල අවිශුද්ධශීල වෛමතික ශීල වශයෙන්ද; සෙඛාසෙඛ නෙවසෙඛ නාසෙඛ වසෙනච, ශෛක්ෂ ශීල අශෛක්ෂ ශීල නෛවශෛක්ෂ නාශෛක්ෂ ශීල වශයෙනුදු ත්‍රිප්‍රකාර වේ; චතුබ්බිධං හානභාගිය ඨිතිභාගිය විසෙසභාගිය නිබ්බෙධ භාගිය වසෙන, හානභාගිය ශීල ස්ථිතිභාගිය ශීල විශේෂභාගිය ශීල නිර්වේධභාගිය ශීල වශයෙන් චතුර්විධ වේ; තථා, එසේම; භික්ඛු භික්ඛුනී අනුපසම්පන්න ගහට්ඨ සීලවසෙන, භික්ෂු ශීල භික්ෂුණී ශීල අනුපසම්පන්න ශීල ගෘහස්ථ ශීල වශයෙනුදු; පකති ආචාර ධම්මතා පුබ්බහෙතුක සීලවසෙන, ප්‍රකෘති ශීල ආචාර ශීල ධර්මතා ශීල පූර්වහෙතුක ශීල වශයෙන්ද; පාතිමොක්ඛ සංවර ඉන්ද්‍රිය සංවර ආජීව පාරිසුද්ධි පච්චය නිස්සිත සීලවසෙ

තව, ප්‍රාතිමොක්ෂ සංවරශීල ඉන්ද්‍රිය සංවරශීල ආජීවපාරිශුද්ධිශීල ප්‍රත්‍යය සන්නිශ්‍රිතශීල වශයෙන්ද චතුර්විධ වේ; පඤ්චවිධං පරියන්ත පාරිසුද්ධි සීලාදී වසෙන, පර්‍ය්‍යන්ත පාරිශුද්ධිශීලාදී වශයෙන් පඤ්චවිධවේ; පඤ්චසීලානි, ශීලයෝ පස්දෙනෙකි; පරියන්ත පාරිසුද්ධිසීලං, පර්‍ය්‍යන්ත පාරිශුද්ධිශීලය; අපරියන්ත පාරිසුද්ධිසීලං, අපර්‍ය්‍යන්ත පාරිශුද්ධිශීලය; පරිපුණ්ණ පාරිසුද්ධිසීලං, පරිපූර්ණ පාරිශුද්ධිශීලය; අපරාමට්ඨ පාරිසුද්ධිසීලං, අපරාමෘෂ්ට පාරිශුද්ධිශීලය; පටිප්පස්සද්ධි පාරිසුද්ධිසීලන්ති, ප්‍රතිප්‍රශ්‍රබ්ධි පාරිශුද්ධිශීලයයි මෙසේ පඤ්චප්‍රකාරවේ; තථා පහාණ වෙරමණී චෙතනා සංවර අවීතික්කම වසෙන, ප්‍රහාණශීල වෛරමණීශීල චේතනාශීල සංවරශීල අව්‍යතික්‍රමශීල වශයෙන් එසේම පඤ්චවිධවේ.

( ගා † )

දැන් වනාහි ශීලය කී ප්‍රකාරයක්වේදැයි යන යම් ප්‍රශ්නයක් විචාරණලද්ද ඒ ප්‍රශ්නයෙහි මේ අර්ථ විවරණය දක්වනුලැබේ. පළමුකොට සියලු මේ ශීලය තමාගේ ශීලනයයි කියනලද සෙසු ගුණධර්මයන්ට ප්‍රතිෂ්ඨාධාර ස්වභාවයෙන් එක්වැදෑරුම්වන්නේය-චාරිත්‍ර වාරිත්‍ර ශීලවශයෙන් දෙවැදෑරුම්වන්නේය එසේම ආභිසමාචාරික ශීලය ආදි බ්‍රහ්මචරියක ශීලය යන දෙදෙනාගේ වශයෙනුදු විරතිශීලය අවිරතිශීලය යන දෙදෙනාගේ වශයෙනුදු නිශ්‍රිත ශීලය අනිශ්‍රිත ශීලය යන දෙදෙනාගේ වශයෙනුදු කාලපර්‍ය්‍යන්ත ශීලය ආප්‍රාණකොටික ශීලය යන දෙදෙනාගේ වශයෙනුදු සපර්‍ය්‍යන්ත ශීලය අපර්‍ය්‍යන්ත ශීලය යන දෙදෙනාගේ වශයෙනුදු ලෞකිකශීලය ලෝකොත්තරශීලය යන දෙදෙනාගේ වශයෙනුදු දෙවැදෑරුම්වන්නේයි-හීනශීලය මධ්‍යමශීලය ප්‍රණීතශීලය යන තුන්දෙනාගේ වශයෙන් තුන්වැදෑරුම්වන්නේය. එසේම ආත්මාධිපති ශීලය ලොකාධිපතිශීලය ධර්මාධිපති ශීලය යන තුන්දෙනාගේ වශයෙනුදු පරාමෘෂ්ටශීලය අපරාමෘෂ්ටශීලය ප්‍රතිප්‍රශ්‍රබ්ධිශීලය යන තුන්දෙනාගේ වශයෙනුදු විශුද්ධශීලය අවිශුද්ධශීලය වෛමතිකශීලය යන තුන්දෙනාගේ වශයෙනුදු ශෛක්ෂ්‍යශීලය අශෛක්ෂ්‍යශීලය නෛවශෛක්ෂ්‍ය නාශෛක්ෂ්‍යශීලය යන තුන්දෙනාගේ වශයෙනුදු තුන්වැදෑරුම්වන්නේය.

හානභාගියශීලය ස්ථිතිභාගියශීලය විශෙෂභාගියශීලය නිර්වේධභාගියශීලය යන මොවුන්ගේ වශයෙන් සතරවැදෑරුම්වන්නේය එසේම භික්ෂුශීලය භික්ෂුණීශීලය අනුපසම්පන්නශීලය ගෘහස්ථශීලයන්ගේ වශයෙනුදු ප්‍රකෘතිශීලය ආචාරශීලය ධර්මතාශීලය පූර්වහෙතුකශීලයන්ගේ වශයෙනුදු ප්‍රාතිමොක්ෂ සංවරශීලය ඉන්ද්‍රිය සංවරශීලය ආජීවපාරිශුද්ධිශීලය ප්‍රත්‍යය සන්නිශ්‍රිතශීලයන්ගේ වශයෙනුදු සතර සතරවැදෑරුම්වන්නේය.

පර්‍ය්‍යන්ත පාරිශුද්ධිශීලාදීන්ගේ වශයෙන් පස්වැදෑරුම්වන්නේය—ප්‍රතිසම්භිදා මාර්ගයෙහිද මෙම අර්ථය විචාරණලද්දේමැයි (කෙසේදයත්? ශීලයෝ පස්දෙනෙක්වෙති ඒ කවරයත්? පර්‍ය්‍යන්ත පාරිශුද්ධිශීලය අපර්‍ය්‍යන්ත පාරිශුද්ධිශීලය පරිපූර්ණ පාරිශුද්ධිශීලය අපරාමෘෂ්ට පාරිශුද්ධිශීලය ප්‍රතිප්‍රශ්‍රබ්ධි පාරිශුද්ධිශීලයයි මෙසේ පස්වැදෑරුම්වන්නේය) එසේම ප්‍රහාණශීලය වෛරමණීශීලය චේතනාශීලය සංවරශීලය අව්‍යතික්‍රමශීලය යන මොවුන්ගේ වශයෙනුදු පස් පස් ආකාරවන්නේති.

( පා ‡ )

තත්ථ එකවිධ කොට්ඨාසෙ අත්ථො වුත්තනයෙනෙව වෙදිතබ්බො දුවිධ කොට්ඨාසෙ යං භගවතා ඉදං කත්තබ්බන්ති පඤ්ඤත්තසික්ඛාපදපූරණං තං චාරිත්තං—ඉදං න කත්තබ්බන්ති පටික්ඛිත්තස්ස අකරණං තං වාරිත්තං—තත්‍රායං වචනත්ථො චරන්ති තස්මිං සීලෙ පරිපූරකාරිතාය පවත්තන්තීති චාරිත්තං—වාරිතං තායන්ති රක්ඛන්ති තෙනාති වාරිත්තං තත්ථ සද්ධා විරිය සාධනං චාරිත්තං සද්ධාසාධනං වාරිත්තං—එවං චාරිත්තවාරිත්ත වසෙන දුවිධං. දුතියදුකෙ අභිසමාචාරෙති උත්තම සමාචාරෙ අභිසමාචාරො ව ආභිසමාචාරිකං අභිසමාචාරං වා ආරබ්භ පඤ්ඤත්තං ආභිසමාචාරිකං ආජීවට්ඨමකතො අවසෙස සීලස්සෙතං අධිවචනං මග්ග බ්‍රහ්මචරියස්ස ආදිභාවභූතන්ති ආදි බ්‍රහ්මචරියකං ආජීවට්ඨමක සීලස්සෙතං අධිවචනං තං හි මග්ගස්ස ආදිභාවභූතං පුබ්බභාගෙ යෙව පරිසොධෙතබ්බතො තෙනාහ "පුබ්බෙව ඛො පනස්ස කායකම්මං වචීකම්මං ආජීවො සුපරිසුද්ධො හොතී"ති යානි වා සික්ඛාපදානි ඛුද්දානුඛුද්දකානීති වුත්තානි ඉදං ආභිසමාචාරිකං සීලං—සෙසං ආදි බ්‍රහ්මචරියකං උභතො විභඞ්ගපරියාපන්නං වා ආදි බ්‍රහ්මචරියකං—ඛන්ධකවත්තපරියාපන්නං අභිසමාචාරිකං තස්ස සම්පත්තියා ආදි බ්‍රහ්මචරියකං සම්පජ්ජති තෙනෙවාහ "සො ව භික්ඛවෙ භික්ඛු ආභිසමාචාරිකං ධම්මං අපරිපූරෙත්වා ආදී බ්‍රහ්මචරියකං ධම්මං පරිපූරෙස්සතීති—නෙතං ඨානං විජ්ජතී"ති එවං අභිසමාචාරික ආදි බ්‍රහ්මචරියකවසෙන දුවිධං.

( ස ‡ )

තත්ථ, එහි; එකවිධකොට්ඨාසෙ අත්ථො, එක්ප්‍රකාරකොට්ඨාසයෙහි අර්ථය; වුත්තනයෙනෙව, "සීලනට්ඨෙන සීලං" යනාදීන් යටකීනයින්; වෙදිතබ්බො, දතයුතුයි; දුවිධකොට්ඨාසෙ, විප්‍රකාර කොටස; භගවතා, භාගවත්හු විසින්; ඉදං කත්තබ්බන්ති, මේ ආභිසමාචාරිකය කටයුතුයි; යං පඤ්ඤත්තසික්ඛාපරිපූරණං, පණවනලද ශික්ෂාපද ශීලයාගේ යම්පිරිමක් ඇද්ද; තං චාරිත්තං, හේ චාරිත්‍රනම්; යං, යමෙක්; ඉදං න කත්තබ්බන්ති, මේ දුශ්චරිතය නොකටයුතුයයි; පටික්ඛිත්තං, ප්‍රතික්ෂෙපකරණලද්ද; තස්ස අකරණං, ඒ දුශ්චරිතයාගේ නොකිරීම; වාරිත්තං, වාරිත්‍රනම්; තත්‍ර, ඒ චාරිත්‍රවාරිත්‍ර ශබ්දදෙක්හි; අයං වචනත්ථො, මේ වචනාර්ථයි; තස්මිං සීලෙ, ඒ ශීලයෙහි; චරන්ති, හැසිරෙත්; පරිපූරකාරිතාය, සම්පූර්ණකාරීබැවින්; පවත්තන්තීති, පවතිත්නුයි; චාරිත්තං, චාරීත්‍රනම්; වාරිතං, මේ නොකටයුතුයයි වැළකූ ආකල්පය; තෙන, ඒ වාරිත්‍රය කරණකොට ගෙණ; "තායන්ති"යි සේයි; රක්ඛන්ති, රකිත්නුයි; වාරිත්තං, වාරීත්‍රනම්; තත්ථ, ඒ දෙක්හි; චාරිත්තං, චාරිත්‍රය; සද්ධාවිරිය සාධනං, ශ්‍රද්ධාරහිතයා ද කුසිතයා ද වත්පිළිවෙත් නුපුරණ බැවින් ශ්‍රද්ධාවෙන්හා වීර්‍ය්‍යයෙන් සැදියුතේයි; සද්ධාසාධනං වාරිත්තං, වාරීත්‍රශීලය ශ්‍රද්ධාවෙන් සැදියයුතු; අභිසමාචාරෙති, අභිසමාචාර නම්; උත්තම සමාචාරෙ, අධිශීල ශික්ෂා පර්‍ය්‍යාපන්නබැවින් උත්තම සමාචාරය යි; අභිසමාචාරො ව, අභිසමාචාරයම; ආභිසමාචාරිකං, ආභිසමාචාරිකනම් වේ (වෙණයිකො, යනුමෙන් ස්වාර්ථයෙහි "ණික" ප්‍රත්‍යය දතයුතුයි) අභිසමාචාරංවා ආරබ්භපඤ්ඤත්තං, උත්

කාණ්ට නිර්දෙශයෙන් මාර්ගශීල ඵල ශීලය අභිසමාචාර නම්; ඒ උදෙසා නත් ප්‍රයොජනකොට පණවනලද්දේ ආභිසමාචාරික නම්; ආජීවට්ඨමක නො, සුපරිශුද්ධ ත්‍රිවිධ කායකර්මයහා චතුර්විධ වාක්කර්මහා පරිශුද්ධ ආජීවය යනමේ ආජීවාෂ්ටමක ශීලය තෙරෙන්; අවසෙසසීලස්ස, අවශෙෂ ශීලයට; එතං අධිවචනං "ආභිසමාචාරිකා" යන මේ නමෙකි; මග්ග බ්‍රහ්මචරියස්ස (ශ්‍රේෂ්ඨබැවින් මාර්ගය මාර්ග බ්‍රහ්මචරියා නම ඒ) මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාට; ආදිභාවභූතනන්ති, ආදියෙහි ඉපදවිය යුතුනුයි; ආදි බ්‍රහ්මචරියකං, ආදි බ්‍රහ්මචරියක නම් ("මග්ග බ්‍රහ්මචරියස්ස ආදිම්හි භාවෙතබ්බත්තං නිප්ඵාදෙතබ්බත්තං පත්තානන්ති ආදි භාවභූතං" යනුවේ) ආජීවට්ඨමක සීලස්සෙතං අධිවචනං, ආජීවාෂ්ටමක ශීලයට මේ නමෙකි; තංහි, හෙතෙම; මග්ගස්ස ආදිභාවභූතං, මාර්ගයට ආදියෙහි ඉපදවිය යුතුවී (දෙශනා ක්‍රමයෙන් සම්‍යක් දෘෂ්ටි ආදීයයි—පටිපත්ති ක්‍රමයෙහි වනාහි ප්‍රාතිමොක්ෂ සංවරශීල නැති ශිහිවැස්සනුදු අවශ්‍යයෙන් පිරියයුතු බැවින් ආජීවය අටවනුකොට ඇති ශීලය ආදිබැවින්කීහ "ආදිභාවභූතං" යි) ආදිම්හි යෙව පරිසොධෙතබ්බතො, ආදියෙහිම පිරිසිදු කටයුතුහෙයිනි; තෙනාහ, එහෙයින්ම වදාළහ;- අස්ස, ඔහුගේ; පුබ්බෙව, පූර්වයෙහිම; කාය කම්මං, කායකර්මයද; වචීකම්මං, වාක්කර්මයද; ආජීවො, ආජීවයද; සුපරිසුද්ධො හොතී'ති' සුපරිශුද්ධවෙයි; යානිවා සික්ඛාපදානි, දෙශනාගාමිවූ දුෂ්කෘත දුර්භාෂිතවූ හෝ යම් ශික්ෂාපදකෙණෙක්; ඛුද්දානු ඛුද්දකානීති වුත්තානි, ක්ෂුද්‍රානුක්ෂුද්‍ර ශික්ෂාපදහයි කියනලදහුද; ඉදං ආභිසමාචාරිකං සීලං, මේ ආභිසමාචාරික ශීල නම්; සෙසං ආදි බ්‍රහ්මචරියකං, සෙස්ස ආදි බ්‍රහ්මචරියක ශීල නම්; උභතොවිභඞ්ග පරියාපන්නං වා, උභතොවිභඞ්ග පරියාපන්න ශීලය හෝ; ආදි බ්‍රහ්මචරියකං, ආදි බ්‍රහ්මචරියක නම්; ඛන්ධක වත්ත පරියාපන්නං, (අභිසමාචාරික) ස්කන්ධකවෘත්ත පර්‍ය්‍යාපන්න ශීලය; ආභි සමාචාරිකං, ආභිසමාචාරික නම්; තස්ස සම්පත්තියා, ආභිසමාචාරික ඒ ශීලයාගේ සම්පත්තින් (පිරිමෙන්) ආදි බ්‍රහ්මචරියකං සම්පජ්ජති, ආදි බ්‍රහ්මචරියකය පිරේ (යමෙක් ලහුකවූ අල්පසාවද්‍යයෙන් දුරුනොරේනම් හෙතෙම ගුරුවූ මහාසාවද්‍යයෙන් දුරුකෙරෙයි යනුයෙහි කියයුතුම නැත යන මේ අර්ථය ව්‍යතිරෙකවශයෙන් දක්වන්නේ "තෙනෙවාහ" යනාදී යි) භික්ඛවෙ, මහණෙනි; සො භික්ඛු, ඒ මහණ; ආභිසමාචාරිකං ධම්මං අපරිපූරෙත්වා, ආභිසමාචාරික ශීලය නොපුරා; ආදිබ්‍රහ්මචරියකං ධම්මං පරිපූරෙස්සතීති, ආදි බ්‍රහ්මචරියක ශීලය පුරන්නේයයි; නෙතං ඨානං විජ්ජතීති, මේ කාරණය නැතැයි (ක්ෂුද්‍රාපත්තිමඩනා සුලු ඉහි පරිචයෙන් මහත් ආපත්තිදු මඩනා බැවිනුදු ආභිසමාචාරික සිල්පුරතුදු ඒ සිල් සමාධි විපස්සනාවට පදස්ථාන නොවන්නේනුදු "නෙතං ඨානං විජ්ජති" යුනු) ළපි

( භා ‡ )

ඒ එකවිධාදි කොට්ඨාසයන් අතුරෙන් එක්ප්‍රකාර කොට්ඨාසයෙහි අර්ථය දැක්වී නයින් දතයුතුයි. ද්විප්‍රකාර කොට්ඨාසයෙහි වනාහි භාග්‍යවතුන් වහන්සේ විසින් පැවසූ මේයැයි පණවනලද ශික්ෂාපද ශීලයාගේ පිරීමෙක් ඇත්තේවද ඒ චාරිත්‍ර ශීල

නම්වන්නේය මේ දුශ්චරිතය නොකා
ටයුතුයයි යම්ක් ප්‍රතික්ෂේප කරණ
ලද්ද ඒ පාපධර්මය නොකිරීම වාරිත්‍ර
ශීල නම්වන්නේය ඒ චාරිත්‍ර වාරිත්‍ර
යන ශබ්ද දෙක්හි අර්ථ මෙසේ දත
යුතුයි (කෙසේදයත්) ඒ ශීලයෙහි ප
රිපූර්ණකාරීභාවයෙන් හැසිරෙන්නා
හුය පවත්වන්නාහුය යන අර්ථයෙන්
"චාරිත්‍ර" නම්වන්නේය මේ නොකටයු
තුයයි වලක්වනලද්ද ඒ වැලකීම කර
ණකොටගෙණ රක්නා අර්ථයෙන්
"වාරිත්‍ර" නම්වන්නේය ඒ චාරිත්‍රවාරි
ත්‍ර ශීලදෙදෙනා අතුරෙන් චාරිත්‍ර ශීල
ය අශ්‍රද්ධාවන්තයාද අලසයාද වත්පිළි
වෙත් නොපුරණබැවින් ශ්‍රද්ධා වීර්‍ය්‍ය
දෙකින් සිද්ධ කටයුත්තේයි වාරිත්‍ර ශී
ලය ශ්‍රද්ධාවෙන්ම සිද්ධ කටයුත්තේය-
අභිසමාචාරය නම් අධිශීල ශික්ෂාවන්ට
ඇතුළත්බැවින් උතුම්වූ හැසිරීමවෙ
යි ඒ අභිසමාචාරයම ස්වාර්ථයෙහි
"ණික" ප්‍රත්‍යයකොට "ආභි සමාචාරි
ක"යයි කියතුලැබේ නොහොත් "අභි
සමාචාර" යයි කියනලද මාර්ගඵල ශී
ලයන් උදෙසා පණවනලද්ද ආභිසමා
චාරිකනම්වන්නේය "ආභිසමාචාරි
කය" යනු සුපිරිසිදු ත්‍රිවිධ කාය කර්මය
චතුර්විධ වාක්කර්මය ආජීවය යනමේ
ආජීවාෂ්ටමක ශීලයෙන් ඉතිරිවූ සියලු
ශීලයට නම්වන්නේය ශ්‍රෙෂ්ඨවූ මාර්ග
බ්‍රහ්මචර්‍ය්‍යාවට මුලින් ඉපදවියයුතුබැ
වින් ආජීවය අටවනුකොට ඇති ශීල
ය "ආදි බ්‍රහ්මචරියක" නම්වන්නේය
මේ වනාහි ආජීවාෂ්ටමක ශීලයට
නම්වන්නේය ඒ ආජීවාෂ්ටමක ශීල
ය මුලින්ම පිරිසිදු කටයුතුහෙයින් මා
ර්ගාධිගමයට ආදියෙහි ඉපදවියයුතුයි
එහෙයින් වදාලහ—(පළමුකොටම ඒ
යෝගී පුද්ගලයාගේ කායකර්මයද
වාක් කර්මයද ආජීවයද සුපරිසිදුවන්
නේය) යනුයි—තවද ඇවැත් දෙසීම

පමණකින් පිරිසිදුවියහැකිවූ යම් ශි
ක්ෂාපදකෙනෙක් ක්ෂුද්‍රානුක්ෂුද්‍රයයි කි
යනලද්දාහුද මේ ආභිසමාචාරික ශීල
නම්වන්නේය සෙසු ශීලය ආදි බ්‍රහ්ම
චරියක ශීලනම්වන්නේය—තවද පා
රාජිකා පච්ඡන්නට ඇතුළත්ශීලය ආදි
බ්‍රහ්මචරියක නම සෙසු කඳුවන් ආදි
යට ඇතුළත් ශීලය ආභිසමාචාරික
ශීලනම්වන්නේය. ඒ ආභිසමාචාරික
ශීලය පිරීමෙන් ආදි බ්‍රහ්මචරියකනම්
වූ මහා ශීලය සම්පූර්ණවන්නේය—එ
හෙයින් වදාළහ (මහණෙනි ඒ මහ
ණතෙමේ එකාන්තයෙන් ආභිසමාචා
රික ශීලය නොපුරා ආදි බ්‍රහ්මචරියක
ශීලය පුරන්නේයයි යන මේ කාරණ
ය විද්‍යමාන නොවන්නේය" හෙවත්
සුලු ඇවැත් මධ්‍යාසුලු මහණතෙමේ
එහි අභ්‍යාසයෙන් ගරුකාපත්තින්ද ම
ඩනාබැවින් ක්‍ෂුද්‍ර ශික්ෂාපද රක්නා නු
මූත් ඒ රක්ෂාකිරීම ශීල සමාධි විදර්ශ
නාවන්ට කාරණා නොවනබැවින්
ආභිසමාචාරික ශීලය නොපුරන්නාවූ
මහණතෙම ආදි බ්‍රහ්මචරියක ශීලය
නොපුරන්නේයයි වදාළසේක) මෙ
සේ මේ ශීලය ආභිසමාචාරික ආදි
බ්‍රහ්මචරියකශීල වශයෙන් දෙවැද
රුම්වන්නේය.

( පා ¶ )

තතියදුකෙ පාණාතිපාතාදිහි වෙර
මණිමත්තං විරතිසීලං සෙසචෙතනාදි
අවිරතිසීලන්ති එවං විරති අවිරති
වසෙන දුවිධං. චතුත්ථදුකෙ නිස්ස
යොති වෙ නිස්සයො තණ්හානිස්ස
යො ච දිට්ඨිනිස්සයො ච තත්ථ යං ඉමි
නාහං සීලෙන දෙවො වා භවිස්සාමි
දෙවඤ්ඤතරොවාති එවං භවසම්ප
ත්තිං ආකඞ්ඛමානෙන පවත්තිතං,
ඉදං තණ්හානිස්සිතං යං සීලෙන සුද්ධි

ති එවං සුඛිදිට්ඨියා පවත්තිතං ඉදං දිට්ඨිනිස්සිතං යම්පන ලොකුත්තරං ලොකියස්ස තස්සෙව සම්භාරභූතං ඉදං අනිස්සිතන්ති එවං නිස්සිතා නිස්සිත වසෙන දුවිධං —— පඤ්චම දුකෙ කාල පරිච්ඡෙදං කත්වා සමාදින්නං සීලං කාලපරියන්තං යාවජීවං සමාදියිත්වා තථෙව පවත්තිතං ආපාණකොටිකන්ති එවං කාලපරියන්ත ආපාණකොටික වසෙන දුවිධං ——

( ෂ ¶ )

“පඨමදුකෙ” යන්හෙයි; පාණාතිපාතාදීහි වෙරමණි මත්තං, ප්‍රාණාතිපාතාදීන් කෙරෙන් විරමණමාත්‍රය; විරතිසීලං, විරතිශීලනම්; සෙස චෙතනාදි අවිරති සීලන්ති, සෙසු චෙතනාදීහු අවිරති ශීලනම්; “චතුත්ථ දුකෙ” යන්හෙයි; නිස්සයොති, නිශ්‍රයනම්; ද්වෙ නිස්සයා, නිශ්‍රයෝ දෙදෙනෙකි; තණ්හා නිස්සයො ච දිට්ඨිනිස්සයො ච, තෘෂ්ණා නිශ්‍රය දෘෂ්ටිනිශ්‍රයයි; තත්ථ, ඒ දෙක්හි; යං, යම් ශීලයෙක්; අහං ඉමිනා සීලෙන, මම මේ ශීලයෙන්; දෙවො වා, ශක්‍රසුයාමාදි දෙවියෙක්හෝ වෙමි; දෙවඤ්ඤතරො වා, සෙසු ශක්‍රාදීන් සේ නොව එක්තරා දෙවියෙක්හෝ වෙම්යි; එවං, මෙසේ; භවසම්පත්තිං ආකඞ්ඛමානෙන, භවසම්පත්ති කැමැත්තාවූ විසින්; පවත්තිතං, පවත්නා ලද්දේ; ඉදං, මේ තණ්හා නිස්සිතං, තෘෂ්ණා නිශ්‍රිත නම්; යං, යම් ශීල යෙක්; සීලෙන සුද්ධීති එවං සුද්ධිදිට්ඨියා පවත්තිතං, සීලින් සංසාර ශුද්ධියයි මෙසේ ශුද්ධි දෘෂ්ටින් පවත්වනලද්ද; ඉදං, මේ ශීලය; දිට්ඨි නිස්සිතං, දෘෂ්ටි නිශ්‍රිත ශීලනම්; යම්පන ලොකුත්තරං, යම් ලොකොත්තර ශීලයෙක් ඇද්ද; තස්සෙව සම්භාරභූතං, ඒ ලොකොත්තර ශීලයටම කාරණවූ; ලොකියං, යම් ලෞකික ශීලයෙක් ඇද්ද; ඉදං අනිස්සිතං, මේ අනිශ්‍රිත ශීල නම —— පෙ —— “පඤ්චම දුකෙ” යන් හෙයි “කාල පරිච්ඡෙදං කත්වා, “ඉමඤ්ච රත්තිං ඉමඤ්ච දිවසං” යනාදීන් කාල වශයෙන් පරිච්ඡේදකොට; සමාදින්නං සීලං, සමාදන්වනලද ශ්‍රයශ; කාල පරියන්තං, කාලපර්‍ය්‍යන්ත නම්; යාවජීවං සමාදියිත්වා, යාවජීවයෙන් සමාදන්ව; තථෙව පවත්තිතං, එසේම පවත්වනලද්දේ; ආපාණකොටිකං, ආපාණකොටික නම් ——

( ශා ¶ )

තුන්වන දුකයෙහි ප්‍රාණාතිපාතාදියෙන් වැළකීම් මාත්‍රයක් * (හෙවත් පණිවාගෙන් වළක්නාහුගේ ඒ වැළැක්ම පිළිබඳව උපදනා චිත්ත විථියෙහි යෙදුනාවූ විරති චෛතසිකය පමණක් විරති ශීලනම්වන්නේය. එම චිත්තය පිළිබඳව පවත්නා සෙසු චෙතනාදි චෛතසික ධර්‍මයෝ අවිරති ශීලනම්වන්නේය) මෙසේ විරති අවිරති වශයෙන් දෙවැදෑරුම්වන්නේය සතරවන දුකයෙහි නිශ්‍රයනම් තෘෂ්ණා නිශ්‍රය දෘෂ්ටිය නිශ්‍රයයි ද්විප්‍රකාර වන්නේය ඒ දෙදෙනා අතුරෙන් යම් ශීලයක් මම මේ ශීලය නිසාකොට ශක්‍ර සුයාම සන්තුෂිතාදි දෙවියෙක් හෝ වෙම්වායි සෙසු එක්තරා දෙවි

* භාව සන්නයෙහි ( ) මේ ලකුණුදෙකින් ඇතුළත්කාරණ මාත්‍ර පරණ සන්න ටීකා දෙකින් මුද්‍රණවූ අපොතින් සොදනලද අදහස් බව සැලකියයුතුයි. යට පිටුවල එබදුතැන් ද ඔහොසයෙන් දක්වන්නෙමු.

යෙක්හෝ වේද්දයි මෙසේ භවසම්පත් කැමැත්තෙන් රක්නාලද්දේවේද මේ ශීලය භව තෘෂ්ණාව ඇසුරුකොරණලදබැවින් තෘෂ්ණා නිශ්‍රිත නම්. ශීලයෙන් සංසාර ශුද්ධියවන්නේයයි මෙසේ ශුද්ධි දෘෂ්ටියෙන් යම් ශීලයක් රක්නේවේද මේ ශීලය දෘෂ්ටි නිශ්‍රිත ශීලනම්වන්නේය ලොකොත්තරවූ යම් ශීලයෙක්හෝ ඒ ලොකොත්තර ශීලයටම කාරණවූ යම් ලෞකික ශීලයෙක්හෝ ඇත්තේවේද මේ ශීලවයම තෘෂ්ණා දෘෂ්ටිදෙකින් ඇසුරුනොකරණලදබැවින් අනිශ්‍රිත ශීලනම්වන්නේය. මෙසේ නිශ්‍රිතශීල අනිශ්‍රිතශීල වශයෙන් දෙවැදෑරුම්වන්නේය.

පස්වන දුකයෙහි මේ රාත්‍රියද මේ දවාලද රකිම්යි යනාදියෙහිමෙන් කල් නියමකොටගෙණ සමාදන්වන ලද ශීලය කාලපර්‍යන්ත ශීල නම් දිවි ඇතිතෙක් සමාදන්ව එසේම පවත්නාලද ශීලය ආප්‍රාණකොටික ශීල නම මෙසේ කාලපර්‍යන්තශීල ආප්‍රාණකොටික ශීලවශයෙන් දෙවැදෑරුම් වන්නේය.

---

( පා * )

ඡට්ඨදුකෙ ලාභ යස ඤාති අඞ්ග ජීවිත වශයෙන දිට්ඨපරියන්තං සපරියන්තං නාම විපරීතං අපරියන්තං වුත්තම්පි චෙතං පටිසම්භිදායං "කතමන්තං සීලං සපරියන්තං අත්ථි සීලං ලාභ පරියන්තං අත්ථිසීලං යස පරියන්තං අත්ථිසීලං ඤාතිපරියන්තං අත්ථි සීලං අඞ්ග පරියන්තං අත්ථිසීලං ජීවිත පරියන්තං කතමන්තං සීලං ලාභ පරියන්තං ඉධෙකච්චො ලාභ හෙතු ලාභ පච්චයා ලාභකාරණා යථා සමාදින්න සික්ඛාපදං වීතික්කමති-ඉදං තං සීලං ලාභ පරියන්තං"ති එතෙ නෙව උපායෙන ඉතරානිපි විත්ථාරෙ තබ්බානි අපරියන්ත විස්සජ්ජනෙපි වුත්තං "කතමන්තං සීලං න ලාභපරියන්තං ඉධෙකච්චො ලාභහෙතු ලාභ පච්චයා ලාභකාරණා යථා සමාදින්න සික්ඛාපදං වීතික්කමාය චිත්තම්පි න උප්පාදෙති කිං සො වීතික්කමිස්සති ඉදං තං සීලං න ලාභපරියන්තං"ති එතෙ නෙව උපායෙන ඉතරානිපි විත්ථාරෙ තබ්බානි එවං සපරියන්තා පරියන්ත වසෙන දුවිධං.

---

( ස * )

ඡට්ඨදුකෙ, සවන දුකයෙහි; ලාභ යස ඤාති අඞ්ග ජීවිත වසෙන, කාල පරිච්ඡෙද නොකොට සමාදන්වන ශීලය අනතුරයෙහි විච්ඡින්නවූයේද සම්පන්න විරති වශයෙන් උපන්න වූත්ගේ රක්‍ෂණ වඩින වශයෙනුදු ඤාති අඞ්ග ජීවිතයන්ගේ අවිනාශ වශයෙනුදු; දිට්ඨපරියන්තං, දුෂ්ට පර්‍යන්තා ඇති ශීලය; සපරියන්තං, සපර්‍යන්ත ශීල නම්; විපරීතං අපරියන්තං, ලාභාදී විසින් අදෘෂ්ට පර්‍යවසාන ඇති ශීලය; අපරියන්තං, අපර්‍යන්තශීල නම් ... පෙ ... කතමන්තං සීලං සපරියන්තං, කවර යේ ශීලයෙක් සපර්‍යන්ත නම්ද; ලාභ පරියන්තං සීලං අත්ථි (යොදනු) ලාභ පර්‍යන්ත ශීලයෙකුදු ඇත (සෙසු පදයෙහිදු මෙසේම අර්ථ බණනු) කතමන්තං සීලං ලාභ පරියන්තං, කවර යේ ශීලයෙක් ලාභපර්‍යන්තවේද; ඉධ, මෙහි; එකච්චො, එකෙක්; ලාභහෙතු, ලාභ හෙතුවෙන්; ලාභ පච්චයා, ලාභ ප්‍රත්‍යයෙන්; ලාභකාරණා, ලාභ කාරණයෙන් (හෙතු ප්‍රත්‍යය දෙදෙනා වෙනත එකාර්ථ බව හඟවන පිණිස "ලාභකාරණා"යි කීහු) යථා සමාදින්න සික්ඛාපදං වීතික්කමති, මෙ

නෙක් දවස් රකිම්යි කාලපරිච්ඡෙද කොට්හෝ නොකොට්හෝ මෙතෙක් ශික්‍ෂාපද රකිම්යි ශික්‍ෂාපරිච්ඡෙදකොට්හෝ නොකොට්හෝ සමාදන්වන ලද ශික්‍ෂාපදය ඉක්මෙන්නේවීනම්; ඉදං සීලං ලාභ පරියන්තංනාම, මේ ශීලය ලාභපර්‍ය්‍යන්තයයි; එතෙනෙව උපායෙන, මෙම උපායෙන්; ඉතරානිපි (පදානි) විත්‍ථාරෙ තබ්බානි, සෙසු පදයෝද විස්තර කටයුතුනානුයි; අපරියන්ත විස්සජ්ජනෙපි, අපර්‍ය්‍යන්ත ශීල විසර්ජනයෙහිදු; වුත්තං, කියනලදී; කතමං තං සීලං න ලාභ පරියන්තං, කවර ශීලයෙක් ලාභපර්‍ය්‍යන්ත නොවේද; ඉධ, මෙහි; එකච්චො, එකෙක් ...පෙ... යථා සමාදින්නා සික්ඛාපදං, යම් පරිද්දෙකින් සමාදන්වනලද ශික්‍ෂාපදය; වීතික්කමාය චිත්තම්පි න උප්පාදෙති, ව්‍යතික්‍රමය පිණිස සිතද නොඋපදවන්නේය; කිං සො වීතික්කමිස්සති, හේ ව්‍යතික්‍රමය කෙරේයි යනු කිම (ව්‍යතික්‍රම නොකෙරේමය යන අදහසයි) ඉදං තං සීලං, මේ ශීලය; න ලාභ පරියන්තං නාම, ලාභ පර්‍ය්‍යන්ත නොවේ ...

( භා. * )

සමන්ත දූතයෙහි ලාභ කීර්ත්‍යාදීන් ඉපදවීම් උපන් ලාභ කීර්ත්‍යාදීන් රක්‍ෂා කිරීම් වඩනයකිරීම් වශයෙන්හෝ ඤාති අඞ්ග ජීවිතයන්ගේ අවිනාශ වශයෙන්හෝ දක්නාලද කෙළවර ඇති ශීලය සපර්‍ය්‍යන්ත ශීල නම. ඒ ලාභාදීන්ගේ වශයෙන් නොදක්නාලද කෙළවර ඇති ශීලය අපර්‍ය්‍යන්ත ශීල නාමවන්නේය එහෙයින් වදාළහ. ප්‍රශ්නනිර්දෙශ භාෂ්‍යයෙහි (කවර ශීලයෙක් සපර්‍ය්‍යන්තනාමවන්නේදයත්? ලාභය අවසන්කොට ඇති ශීලයෙකුදු ඇත්තේය කීර්තිය අවසන්කොට ඇති ශීලයකුදු ඇත්තේය නෑයන් අවසන් කොට ඇති ශීලයකුදු ඇත්තේය ශරීරය අවසන්කොට ඇති ශීලයකුදු ඇත්තේය ජීවිතය අවසන්කොට ඇති ශීලයකුදු ඇත්තේයි. හේ කවර ශීලයෙක් ලාභය අවසන්කොට ඇත්තේදයත්? මේ සස්නෙහි ඇතම් පුද්ගලයෙක් තෙමේ ලාභය හේතුකොට ගෙණ ලාභය ප්‍රත්‍යයකොටගෙණ ලාභය කාරණකොටගෙණ මෙතෙක් දවස් රක්නෙමියි කල් නියමකොටහෝ නොකොටහෝ මෙතෙක් ශික්‍ෂාපද රක්නෙමියි ශික්‍ෂාපද නියමකොටහෝ නොකොටහෝ සමාදන්වනලද ශික්‍ෂාපද ඒ ලාභාවසානයෙහි ඉක්මවන්නේවීනම් මේ ශීලය ලාභය අවසන් කොට ඇති ශීලනම්වන්නේය) මෙම ක්‍රමයෙන් සෙසු පදයෝද විස්තර කටයුතුයි. අපර්‍ය්‍යන්ත ශීල විසර්ජනයෙහිදු වදාරණ ලදුයේමැයි. (හේ කවර ශීලයෙක් ලාභය අවසන්කොට නොපවත්නේදයත්? මේ සස්නෙහි ඇතම් පුද්ගලයෙක්තෙම ලාභය හේතු කොටනොගෙණ ලාභය ප්‍රත්‍යයකොටනොගෙණ ලාභය කාරණකොට නොගෙණ කාල නියම ශික්‍ෂාපද නියමකොටහෝ නොකොටහෝ සමාදන් වනලද ශික්‍ෂාපද ඉක්මවන පිණිස සිතකුදු නොඋපදවන්නේය හේ නොම ඉක්මවයි යනුම කිම! මේ ශීලය ලාභය අවසන්කොට පවත්නේ නොවන්නේයි) සෙසු පදයන්ද මෙසේමෙන් විස්තර කටයුතුයි මෙසේ සපර්‍ය්‍යන්ත අපර්‍ය්‍යන්ත වශයෙන් දෙවැදෑරුම් වන්නේයි ...

සත්තමදුකෙ සබ්බම්පි සාසවං සීලං ලොකියං අනාසවං ලොකුත්තරං. තත්‍ථ ලොකියං භවවිසෙසාවහං හොති භවනිස්සරණස්ස ච සම්භාරො. යථාහ "විනයො සංවරත්‍ථාය—සංවරො අවිප්පටිසාරත්‍ථාය—අවිප්පටිසාරො පාමොජ්ජත්‍ථාය-පාමොජ්ජං පීතත්‍ථාය-පීති පස්සද්ධත්‍ථාය-පස්සද්ධි සුඛත්‍ථාය-සුඛං සමාධත්‍ථාය-සමාධි යථාභූත ඤාණ දස්සනත්‍ථාය-යථාභූත ඤාණ දස්සනං නිබ්බිදත්‍ථාය-නිබ්බිදා විරාගත්‍ථාය-විරාගො විමුත්තත්‍ථාය-විමුත්ති විමුත්ති ඤාණදස්සනත්‍ථාය-විමුත්ති ඤාණ දස්සනං අනුපාදා පරිනිබ්බානත්‍ථාය-එතදත්‍ථා කථා එතදත්‍ථා මන්තනා එතදත්‍ථා උපනිසා එතදත්‍ථං සොතාවධානං යදිදං අනුපාදා චිත්තස්ස විමොක්ඛො"ති ලොකුත්තරං භවනිස්සරණාවහං හොති පච්චවෙක්ඛණ ඤාණස්ස භූමිපි එවං ලොකිය ලොකුත්තරවසෙන දුවිධං.

( සන් )

සත්තම ) දුකෙ, සත්වන දුකයෙහි; සබ්බම්පි සාසවං සීලං, සියළු සාශ්‍රව ශීලයම; ලොකියං, ලෞකික නම (නාමා අරමුණුකරණ ආශ්‍රවයන් හා සමග පවත්නෙහ් ත්‍රෛභූමික ධර්මයෝ සාසව නම—තත් පයඹීපනනබැවින් ශීලයද සාසවනමැයි දත්යෙත්) අනාසවං, අනාශ්‍රව ශීලය; ලොකුත්තරං, ලෝකෝත්තර නම; තත්‍ර, ඒ දෙක්හි; ලොකියං, ලෞකික ශීලය; භවවිසෙසාවහං හොති, සුගතියෙහිම උපදවන බැවින් භව විශෙෂය එලවන්නේය; භවනිස්සරණස්ස සම්භාරො, නිවන් හි අද්‍යාසින් රක්නාහට විදර්ශනා පාදකවන බැවින් භව නිශ්මනයට ද ප්‍රත්‍යයවේ (නිර්වාණයටද උපනිශ්‍රය වේය යන අදහසි) යථාහ, වදාළේමය; විනයො, විනයතෙමේ; සංවරත්‍ථාය; සංවරය පිණිසවේ (සංවරයට උපනිශ්‍රයවේයි යන අදහසි. මෙහි විනය ශබ්දයෙන් ශීල ආ සිකපදයෙහි විනය නාමි.) සංවරො, සංවරයතෙමේ; අවිප්පටිසාරත්‍ථාය, අවිප්‍රතිසාරය පිණිසවේ; අවිප්පටිසාරො, අවිප්‍රතිසාරයතෙමේ; පාමොජ්ජත්‍ථාය, ප්‍රමොද්‍යය පිණිසවේ (තරුණ ප්‍රීතිය ප්‍රමොද්‍ය නම් බලවත් ප්‍රීතිය ප්‍රීති නම් ශීලයෙහි කලකිරීම නැතිබැවින් ඒ ශීලය ප්‍රත්‍යවේක්ෂාකරන්නාහු සිත පිනා නොවන්නෙත් "සංවරො පාමොජ්ජත්‍ථාය"යි කීහු) පාමොජ්ජං, ප්‍රමොද්‍යය; පීතත්‍ථාය, ප්‍රීතිය පිණිසවේ; පීති, ප්‍රීතිතෙමේ; පස්සද්ධත්‍ථාය, ප්‍රීතීන් පිරුණුබැවින් සන්හිඳීම පිණිසවේ; පස්සද්ධි, ප්‍රශ්‍රබ්ධිය; සුඛත්‍ථාය, සුව පිණිසවේ; සුඛං, සුවය; සමාධත්‍ථාය, සමාධිය පිණිසවේ (නාමරූප පරිග්‍රහයෙන් පෙරටු සෘණිග සමාධියද අර්පණා සමාධියද පිණිසවේය යන අදහසි.) සමාධි, සමාධිතෙමේ; යථාභූත ඤාණදස්සනත්‍ථාය, සප්‍රත්‍යය නාමරූප දර්ශනය පිණිස තදඞ්ගාන්තරුණ විදර්ශනාව පිණිසහෝවේ; යථාභූත ඤාණදස්සනං, යථාභූතඥාන දර්ශනය; නිබ්බිදත්‍ථාය, නිර්වේද ඥානය පිණිසවේ (මෙයින් බලවත් විදර්ශනා කීහු) නිබ්බිදා, නිර්වේදඥානය තොමේ; විරාගත්‍ථාය, මාර්ගය පිණිසවේ; විරාගො, විරාගතෙමේ; විමුත්තත්‍ථාය, අර්හත්ඵල විමුක්තිය පිණිසවේ; විමුත්ති, විමුක්ති තොමේ; විමුත්ති ඤාණදස්සනත්‍ථාය, ප්‍රත්‍යවේක්ෂා ඥානය පිණිසවේ; විමුත්ති ඤාණදස්සනං, විමුක්ති ඥාන දර්ශනය; අනුපාදා පරිනිබ්බානත්‍ථාය, අනුපාදා පරි

(ෂ †)

නිර්වාණය පිණිස වේ; යදිදං, යම් මේ; අනුපාදචිත්තස්ස විමොක්ඛො, අනුපාද චිත්තවිමොක්ෂයෙක් ඇද්ද; එතදත්ථා කථා, විනයකථාතොමෝ මේ අනුපාද විමොක්ෂය ම ප්‍රයෝජනකොට ඇත්තීයි; එතදත්ථා මන්තනා, කල්පාකල්පවිචාරණයෙන් විනය විචාරණද මෙම ප්‍රයෝජනකොට ඇත්තීයි; එතදත්ථා උපනිසා, විනයො සංවරත්ථාය, යනාදි යථොක්ත කාරණ පරම්පරාසංඛ්‍යාත උපනිශ්‍රය ද මෙම ප්‍රයෝජනකොට ඇත්තීයි; එතදත්ථං සොතාවධානං, කන් නතු කිරීම (ශ්‍රවණය යනු යන අර්ථයි) මේ ප්‍රයෝජනකොට ඇත්තේයි (මින් "අනුපාදචිත්තස්ස විමොක්ඛො" යනු මාර්ගය -- මාර්ගය සම්බන්ධ විමුක්තිය විමුක්තිඥානදර්ශනය අනුපාද පරිනිර්වාණය යන මේවුන් සිඩවන බැවින් "එතදත්ථාකථා" යනාදි ඒ අනුපාද විමොක්ෂය පිණිසයයි කීහු, එසේ උවහොත් "විරාගත්ථාය" යනුයෙහිම නොසැලකුව "විරාගො විමුත්තත්ථාය" යනාදි සූත්‍රව කියනත්; පරම්පරොපනිශ්‍රය නිෂ්ඨාවට පැමිණිතැන් දක්වනු පිණිස කීහු) ලොකුත්තරං, මාර්ග ඵල සම්ප්‍රයුක්ත ආජීවාෂ්ටමක ශීලය, භාවනිස්සරණාවහං හොති, භාවනිස්සරණය ඵලවියි; පච්චවෙක්ඛණඤාණස්ස ච භූමි හොති, ප්‍රත්‍යවෙක්ෂා ඥානයටද භූමිවේ; (මිනි මාර්ගශීලය භාවනිස්සරණයද කෙරෙයි ප්‍රත්‍යවෙක්ෂාවටද භූමිවෙයි—ඵල ශීලය ප්‍රත්‍යවෙක්ෂාවටම භූමිවෙයි.)

(හා †)

සත්වන දුකයෙහි ආශ්‍රව සහිතවූ හෙවත් කාමාදි චතුරාශ්‍රවයන්ගෙන් යුක්තාවූ පුද්ගලයාගේ ශීලය ලෞකිකශීල නම් චතුරාශ්‍රවයන්ගෙන් වියුක්තවූ ආර්‍යයන්ගේ ශීලය ලොකොත්තර ශීල නම් වන්නේය. ඒ දෙදෙනා අතුරෙන් ලෞකික ශීලය සුගතියෙහි ම උපදවන බැවින් භවවිශෙෂය ඵලවන්නේය නිවන් අදහසින් රක්නාහට විදර්ශනාවට පාදක වන බැවින් නිර්වාණයටද උපනිශ්‍රය වන්නේයි—වදලේ මැයි- විනයපිටකයෙහි ආ ශික්ෂාපදසංඛ්‍යාත විනය දෙශනාව සංවරයට උපනිශ්‍රය වන්නේය—සංවරය නොම විපිළිසර නොවීම පිණිස ද විපිළිසර නොවීම තරුණප්‍රීතිය පිණිසද තරුණප්‍රීතිය බලවත්ප්‍රීතිය පිණිසද බලවත්ප්‍රීතිය කෙලෙසුන් සන්සිදීම පිණිසද කෙලෙසුන් සන්සිදීම සැප පිණිසද සැපය අර්පණාසමාධිය පිණිසද සමාධිය ප්‍රත්‍යය සභානාවරූපයන් දක්නාට සමර්ථවූ යථාභූතඥානදර්ශනය පිණිසද යථා භූතඥානදර්ශනය භවයෙහි කළකිරීම් කරවන්නාවූ නිර්වේද ඥානය පිණිසද නිර්වේදඥානය ගිහින් මාර්ගඥානය පිණිසද අතින් මාර්ගඥානය අතින් ඵල සංඛ්‍යාත විමුක්තිය පිණිසද ඒ විමුක්තිය මාර්ගඵල ප්‍රත්‍යවෙක්ෂා කිරීමෙහි සමර්ථවූ ප්‍රත්‍යවෙක්ෂා ඥාන පිණිසද ඒ විමුක්ති ඥානදර්ශනය අනුපාදපරිනිර්වාණය හෙවත් [illegible] දානිය නොගෙණ [illegible] ණය පිණිස පවත්නේයි [illegible] දානිය නොගෙණ විනාතායෙන් [illegible] මිදෙනුත් ඇත්තේවීද—[illegible] යෙහි ආ විනය කථා [illegible] පාදවිමොක්ෂය ම ප්‍රයෝජන [illegible] ඇත්තේය කැප අකැප විනිශ්චය [illegible] ය නාගපරීක්ෂාද මෙම අනුපාදවිමො ක්ෂයම ප්‍රයෝජන කොට ඇත්තේ [illegible] විනයශික්ෂාවෙහි සංවරය [illegible] වන්නේයයි යනාදීන් වදාරණලද [illegible]

( හා † )

රජාණන්ගේ පරම්පරාව නිශ්‍රය හෙවත් එකෙකට උපකාර කාරණා වීම මෙම අනුපාදවිමොක්ෂය ප්‍රයෝජනකොට ඇත්තේය සත් කොමුක්තිරම යයි කියනලද ශ්‍රවණමයඥනයද මෙම අනුපාදවිමොක්ෂයම ප්‍රයෝජනකොට ඇත්තේයි —

[මාර්ගඵල චිත්තවීථි හා එක්ව යෙදුනාවූ ත්‍රිවිධකාය දුශ්චරිතය චතුර්විධ වාග්දුශ්චරිතය මිථ්‍යා ආජීවය යන මොවුන් අටදෙනාගෙන් වෙන්වීම් මාත්‍රයයි කියනලද විරති චෛතසික ධර්මයෝ ලොකොත්තර ශීල නම ආජීවාෂ්ටමක ශීලයයිද මිටම නම් වන්නේය. එයින් මාර්ගචිත්තය හා සමග යෙදුනාවූ විරති චෛතසික සංඛ්‍යාත ලොකොත්තර මාර්ගශීලය භවයෙන් නික්ම යාමට ද ප්‍රත්‍යවෙක්ෂා ඥනයට ද භූමිවන්නේය ඒ මාර්ගවීථියෙහි කෙළවර උපදනා ඵල චිත්තක්ෂණදෙක හා සමග යෙදුනාවූද ඊට අනතුරුව උපදනා ඵලචිත්තවීථිහා එක්ව යෙදුනාවූ ද විරති චෛතසිකසංඛ්‍යාත ලොකොත්තරඵලශීලය ප්‍රත්‍යවෙක්ෂාඥනයට පමණක් භූමි වන්නේයි] මෙසේ ලෞකික ලොකොත්තරශීලවශයෙන් දෙවැදෑරුම්වන්නේයි.

( පා ‡ )

තිකෙසු පඨමත්තිකෙ හීනෙන ඡන්දෙන චිත්තෙන විරියෙන වීමංසාය වා පවත්තිතං හීනං~මජ්ඣිමෙහි ඡන්දාදීහි පවත්තිතං මජ්ඣිමං පණීතෙහි පණීතං~යසකාමතාය වා සමාදින්නං හීනං පුඤ්ඤඵලකාමතාය මජ්ඣිමං~කත්තබ්බමෙවිදන්ති අරියභාවං නිස්සාය සමාදින්නං පණීතං~අහමස්මි සීලසම්පන්නො ඉමෙ පනඤ්ඤෙ භික්ඛූ දුස්සීලා පාපධම්මාති එවං අත්තුක්කංසනපරවම්භනාදි උපක්කිලිට්ඨං වා හීනං අනුපක්කිලිට්ඨං ලොකියං සීලං මජ්ඣිමං ලොකුත්තරං පණීතං තණ්හාවසෙන වා භවභොගත්ථාය පවත්තිතං හීනං අත්තනො විමොක්ඛත්ථාය පවත්තිතං මජ්ඣිමං සබ්බසත්තානං විමොක්ඛත්ථාය පවත්තිතං පාරමිතාසීලං පණීතන්ති එවං හීනමජ්ඣිම පණීත වසෙන තිවිධං~දුතියත්තිකෙ අත්තනො අනනුරූපං පජහිතුකාමෙන අත්තගරුනා අත්තනි ගාරවෙන පවත්තිතං අත්තාධිපතෙය්‍යං-ලොකාපවාදං පරිහරිතුකාමෙන ලොකගරුනා ලොකෙ ගාරවෙන පවත්තිතං ලොකාධිපතෙය්‍යං ධම්මමහත්තං පූජෙතුකාමෙන ධම්මගරුනා ධම්මෙ ගාරවෙන පවත්තිතං ධම්මාධිපතෙය්‍යන්ති එවං අත්තාධිපතෙය්‍යාදි වසෙන තිවිධං~තතියත්තිකෙ යං ද්වෙසු නිස්සිතන්ති වුත්තං තං තණ්හාදිට්ඨීහි පරාමට්ඨත්තා පරාමට්ඨං-පුථුජ්ජනකල්‍යාණකස්ස මග්ගසම්භාරභූතං සෙඛානඤ්ච මග්ගසම්පයුත්තං අපරාමට්ඨං~සෙඛාසෙඛානං ඵලසම්පයුත්තං පටිප්පස්සද්ධන්ති එවං පරාමට්ඨාදිවසෙන තිවිධං.

( ස ¶ )

තිකෙසු, ත්‍රිකයන් කෙරෙහි; පඨමත්තිකෙ, පළමුවන ත්‍රිකයෙහි; හීනෙන, හීනවූ; ඡන්දෙන, ඡන්දයෙන් හෝ; චිත්තෙන, සිතින් හෝ; විරියෙන, වීර්‍ය්‍යයෙන් හෝ; වීමංසායවා, ප්‍රඥාවෙන් හෝ; පවත්තිතං, පවත්වනලද්දේ; හීනං, හීන නම්; මජ්ඣිමෙහි ඡන්දාදීහි, මධ්‍යමවූ ඡන්දාදීන්; පවත්තිතං, පවත්වනලද්දේ; මජ්ඣිමං, මධ්‍යම නම; පණීතෙහි, ප්‍රණීතවූ ඡන්දාදීන්; පවත්තිතං, පවත්වනලද්දේ; පණීතං, ප්‍රණීත නම්; (මෙහි ඡන්දාදීන්ගේ හීන මධ්‍යම ප්‍රණීත

බව හීන මධ්‍යම ප්‍රණීත අධිමුක්ති වශයෙන් වෙයි — යම්සේ කර්මය ආයූහණ වශයෙන් හීනාදිභේද භින්නවේද එසේම ඡන්දාදීහුද ප්‍රවෘත්ත්‍යාකාර වශයෙන් හීනාද භේදයෙන් භින්නවෙයි ඒ ඒ ප්‍රවෘත්ත්‍යාකාරයද අධිමුක්ති භේදයෙහි නැති දතයුතුයි) යසකාමතාය වා සමාදින්නං හීනං, කීර්තියෙහි (ස්තුතියෙහි) අභිරතියෙන් සමාදන්වන ලද්දේ හීනනාම්; පුඤ්ඤඵලකාමතාය මජ්ඣිමං, පුණ්‍ය ඵලයෙහි අභිරතියෙන් සමාදන්වනලද්දේ මධ්‍යම නාම්; කත්තබ්බමෙවේදන්ති, මේ කටයුතුමය (එබඳුවෙක් මෙබඳුවක් කෙසේ නම් නොකෙරේදැයි] අරියභාවං නිස්සාය, ආර්‍ය්‍ය භාව ආශ්‍රයකොට; සමාදින්නං පණීතං, සමාදන්වන ලද ශීලය ප්‍රණීත නාම්; අහංසමී සිලසම්පන්නො, මම සීලසම්පන්න වෙමි; ඉමෙ පනා අඤ්ඤෙ භික්ඛූ, මේ සෙසු භික්ෂූහු; දුස්සීලා, දුස්සීලයහ; පාප ධම්මාති, පාප ධර්මයහයි; එවං, මෙසේ; අත්තුක්කංසන පරවම්භනානි, ආත්මෝත්කර්ෂණය පර පරිභවය යන මෙයින්; උපක්කිලිට්ඨං, කිළුටුවූයේ; හීනං, හීනනාම; අනුපක්කිලිට්ඨං, අත්තුක්කංසන පරවම්භනාවෙනුදු සෙසු උපක්ලේශයෙනුදු නොකිලිටුවූ; ලොකියං සීලං මජ්ඣිමං, ලෞකික ශීලය මධ්‍යම නාම; ලොකුත්තරං පණීතං, ලෝකොත්තර ශීලය ප්‍රණීත නාම්; තණ්හාවසෙනවා, තෘෂ්ණා වශයෙන් හෝ; භවභොගත්ථාය පවත්තිතං, භව සම්පත්තිය පිණිසද භොග සම්පත්තිය පිණිසද පවත්වන ලද්දේ; හීනං, හීන නාම්; අත්තනො විමොක්ඛත්ථාය පවත්තිතං මජ්ඣිමං, තමාගේ විමොක්ෂය පිණිස පවත්වන ලද්දේ මධ්‍යම නාම; සබ්බසත්තානං විමොක්ඛත්ථාය පවත්තිතං, සර්ව සත්වයන් සංසාර බන්ධනයෙන් මුදනු පිණිස පවත්වන ලද; පාරමිතා සීලං පණීතං, මහාබොධිසත්වයන්ගේ පාරමිතා ශීලය ප්‍රණීතනාමවේ; දුතියත්තිකෙ, ද්විතීය ත්‍රිකයෙහි; අත්තනො අනනුරූපං පජහිතුකාමෙන, තම හට නොසරුප් පෙදය දුරුකරණු කැමැත්තහු විසින්; අත්තගරුනා, තමාම ගුරුකොට ඇත්තහු විසින් (ලජ්ජාධිකයා විසින යන අදහසි) අත්තනි ගාරවෙන පවත්තිතං, තමා කෙරෙහි ගෞරවයෙන් පවත්වන ලද්දේ; අත්තාධිපතෙය්‍යං, ආත්මාධිපතෙය්‍ය නම්වේ ("අත්තා එව ගරු අධිපති එතස්සා'ති අත්තගරු- ලජ්ජාධිකො- අත්තාධිපතිතො ආගතං අත්තාධිපතෙය්‍යං" යනුවේ.) ලොකාපවාදං පරිහරිතුකාමෙන, ලොකාපවාදය දුරුකරණු කැමැත්තහු විසින්; ලොකගරුනා, ලොකය ගුරුකොට ඇත්තහු විසින්; ලොකෙ ගාරවෙන පවත්තිතං, ලෝකයා කෙරෙහි ගෞරවයෙන් පවත්වනලද්දේ; ලොකාධිපතෙය්‍යං, ලොකාධිපතෙය්‍ය නම් (ලොකො ගරු අධිපති එතස්සාති ලොකාධිපති—ඔත්තප්පාධිකො) ධම්ම මහත්තං පූජෙතුකාමෙන, ධර්ම මහත්වය පුදනු කැමැත්තහු විසින් (ධර්මය නම් මහානුභාව ඇත්තේය එකාන්ත නෛර්‍යාණිකය මේද ප්‍රතිපත්තීන් පිදිය යුතුය එහෙයින් ධර්මය ශීල සම්පත්තීන් පුදමිහි මෙසේ ධර්ම මහත්වය පුදනු කැමැත්තහු විසින් යන අදිසි) ධම්මගරුනා ධර්මය ගුරුකොට ඇත්තහු විසින්; ධම්මෙ ගාරවෙන පවත්තිතං, ධර්මයෙහි ගෞරවයෙන් පවත්වන ලද්දේ; ධම්මාධිපතෙය්‍යං, ධර්මාධිපතෙය්‍ය නම්; තතියත්තිකෙ, තෘතීය ත්‍රිකයෙහි; දුතොසු, [illegible] නිශ්‍රිතභාවි ප්‍රත්‍යං, [illegible]

ශ්‍රිතයයි කියන ලද්ද; තං, හේ; තෘෂ්ණාදිට්ඨීහි පරාමට්ඨත්තා, "ඉමිනාහං සීලෙන දෙවොවා භවිස්සාමි දෙවඤ්ඤතරොවා" යි තෘෂ්ණාවෙනුද "ඉමිනාමෙ සීලෙන සංසාර සුද්ධි භවිස්සති" යි දෘෂ්ටියෙනුද මාර්ගයට අනුපනිශ්‍රය භාවකාරණයෙන් පරාමාස වශයෙන් ආමෘෂ්ට බැවින්; පරාමට්ඨං, පරාමෘෂ්ට ශීල නම්. පුථුජ්ජනකල්‍යාණකස්ස, පුහුදුන් කෙරෙහි කල්‍යාණවූ ශීලාදි ගුණයෙන් සංයුක්තයාගේ; මග්ගසම්භාරභූතං, මාර්ගයට සම්භාරවූ ශීලයද; සෙඛානඤ්ච මග්ගසම්පයුත්තං, ශෛක්ෂයන්ගේ මාර්ග සම්ප්‍රයුක්ත ශීලයද; අපරාමට්ඨං, පරාමෘෂ්ට කෙලශයන් විෂ්කම්භිත බැවිනුදු ඔවුන් විසින් පරාමෘෂ්ට නොකළ බැවින් අපරාමෘෂ්ට ශීල නම්; සෙඛා සෙඛානං, ශෛක්ෂ අශෛක්ෂයන්ගේ; ඵලසම්පයුත්තං සීලං, ඵලසම්ප්‍රයුක්ත ශීලය; පටිප්පස්සද්ධත්ති, ඒ ඒ කෙලශදරථ සංසිඳුවන බැවින්; ප්‍රතිප්‍රශ්‍රබ්ධි ශීල නම්.

---

(භා ‡)

ත්‍රිකයන් අතුරෙන් පළමුවන ත්‍රිකයෙහි අර්ථ විවරණය මෙසේයි – ලාමකවූ ඡන්ද චෛතසිකය හෙවත් කරණු කැමැත්තය ලාමකවූ සිතය ලාමකවූ වීර්‍ය්‍යය හෙවත් වීර්‍ය්‍ය චෛතසිකය ලාමකවූ ප්‍රඥාවය යන සතර ධර්මයන්ගේ වශයෙන් පවත්වනලද ශීලය හීන නම් වන්නේය මධ්‍යමවූ ඡන්දාදියෙන් පවත්වනලද ශීලය මධ්‍යම නාම වන්නේය ප්‍රණීතවූ ඡන්දාදියෙන් පවත්වනලද ශීලය ප්‍රණීතනාම වන්නේය [මෙහි ඡන්දය වීර්‍ය්‍යය විමංසාය යන තුන්දෙනා සංස්කාරස්කන්ධ පර්‍ය්‍යාපන්න ධර්මයෝයි. ඡන්දය අරමුණු පිළිගැනීම් මාත්‍රයක් කරණු මිස ලොභය මෙන් අරමුණෙහි ඇලීමක් නොවේ. චිත්තය විඥානස්කන්ධයි සියළුම වීර්‍ය්‍ය චිත්තාදීහු මේ ධර්ම සතරෙන් යමක් අධිපතිකොට උපදවාහුය. මොවුන්ගේ ලාමකභාවාදිය අධිමොක්ෂ චෛතසිකයාගේ ලාමකභාවාදිය හෙතුකොටගෙණ වෙති. ලාමකවූ අධිමොක්ෂයෙන් යුත් චිත්ත වීර්‍ය්‍යයෙහි ශ්‍රද්ධාහුද ලාමක වන්නාහ. එම චිත්ත වීර්‍ය්‍යයෙහිම යෙදුනාවූ චේතනා විරති ආදී ධර්මයෝ ලාමක ශීල නාමයෙයි. සෙසු අර්ථ වශයෙහිද මෙසේම යෙදිය යුතු.) තවද කීර්ති ප්‍රසංශාවෙහි ඇල්මෙන් සමාදන්ව පවත්වනලද ශීලය හීන නාම. පුණ්‍ය ඵලයෙහි ආශාවෙන් (හෙවත් දෙව් මිනිස් සැප පිණිස) සමාදන්වනලද ශීලය මධ්‍යම නාම මේ ශීල සමාදනය මා විසින් කට යුතුමයයි සිතා ආර්‍ය්‍ය භාවය පිණිස සමාදන්වනලද ශීලය ප්‍රණීතනාම වන්නේය. තවද මම සිල්වතෙක් වෙමියි මේ සෙසු භික්ෂුහු දුස්සීලයෝය ලාමක ස්වභාව ඇත්තෝ යයි මෙසේ තමා උසස් තන්හිද අනුන් පහත් තන්හිද තැබීම් වශයෙන් ආත්මොත්කර්ෂණ පරවම්භනයෙන් කිලිටුවනලද ශීලය හීන නාම. ඒ ආත්මොත්කර්ෂණාදියෙන් හෝ සෙසු කෙලෙසුන්ගෙන් හෝ නොකිලිටුවූ ලෞකික ශීලය මධ්‍යම නාම. ලොකොත්තර ශීලය ප්‍රණීත නාම වන්නේය. තවද තෘෂ්ණාවශයෙන් හෝ භවභොග සම්පත් පිණිස හෝ පවත්වනලද ශීලය හීන නාම තමාගේ සංසාර මුක්තිය උදෙසා පවත්වනලද ශීලය මධ්‍යම නාම සියළු සතුන් සසරින් මුදවනු පිණිස පවත්වනලද බොධිසත්වයන්ගේ පාරමිතා ශීලය ප්‍රණීත නාම වන්නේය.

දෙවෙනි ත්‍රිකයෙහි තමහට නුසුදුසු පාප ධර්මය දුරුකරණු කැමැත්තහු විසින් තමාම ගුරුකොටගෙණ

තමා කෙරෙහි ගෞරවයෙන් පවත්වනලද ශීලය ආත්මාධිපති ශීල නම. ලෝකාපවාදය දුරුකරණු කැමැත්තහු විසින් ලෝකය ගුරුකොට ගෙණ ලෝකයා කෙරෙහි ගෞරවයෙන් පවත්වනලද ශීලය ලෝකාධිපති ශීල නම: නවලෝවුතුරා ධර්මයාගේ පූජාව පුදනු කැමැත්තහු විසින් ධර්මය ගුරුකොටගෙණ ධර්මයෙහි ගෞරවයෙන් පවත්වනලද ශීලය ධර්මාධිපති ශීල නම— මෙසේ ශීලය ආත්මාධිපත්‍යාදි වශයෙන් තුන් ආකාර වන්නේයි.

තුන්වන ත්‍රිකයෙහි [යටකී විභ විධයෙහි) යම් ශීලයක් තෘෂ්ණා දෘෂ්ටි දෙකින් ඇසුරු කරණලදැයි කියනලද්දේද ඒ ශීලය වනාහි මම මේ ශීලානිශංසයෙන් දෙවියෙක් හෝ වෙම්වයි යනාදීන් තෘෂ්ණාවෙන්ද මේ ශීලයෙන් මාගේ සංසාර ශුද්ධිය වන්නේයයි යන මිථ්‍යාදෘෂ්ටියෙන්ද අල්වාගන්නාලද බැවින් පරාමෘෂ්ට ශීල නම— ශීලාදි ගුණයෙන් සමන්විතවූ පෘථග්ජනයාගේ (අභින්මාර්ග ඝටනයට පාදකවූ ලෞකික ශීලයද සෝවාන් සකෘදාගාමි අනාගාමි අර්හත් යන මාර්ගස්ථ සතර ශෛක්ෂයන්ගේ හෙවත් විමුක්ති සඞ්ඛ්‍යාත අර්හත් ඵලය පිණිස නික්මෙන්නවුන්ගේ මාර්ග චිත්තවීථි සතර හා එක්ව යෙදුනාවූ ලෝකෝත්තර ශීලයයි කියනලද ත්‍රිවිධ විරති චේතනාදි ධර්මයෝ කෙලෙසුන් විසින් නොඅල්වනලද බැවින් අපරාමෘෂ්ට ශීල නම— සෝවාන්ඵලස්ථ සකෘදාගාමි ඵලස්ථ අනාගාමි ඵලස්ථ යන ශෛක්ෂයන් තුන්දෙනාගේද අශෛක්ෂවූ අර්හත්ඵලස්ථයාගේද ඒ ඒ ඵල චිත්ත වීථි හා එක්ව යෙදුනාවූ විරති ආදි චෛතසික ධර්ම සංඛ්‍යාත ශීලය ඒ ඒ කෙලෙස් පීඩා සංසිඳුවන බැවින් පටිප්පස්සද්ධි ශීල නම. මෙසේ පරාමෘෂ්ටාදි ශීල වශයෙන් තුන් ආකාර වන්නේයි

( පා ¶ )

චතුත්ථත්තිකෙ යං ආපත්තිං අනාපජ්ජිත්වා පූරිතං ආපජ්ජිත්වා වා පන කතපටිකම්මං තං විසුද්ධං. ආපත්තිං ආපන්නස්ස අකතපටිකම්මං අවිසුද්ධං. වත්ථුම්හි වා ආපත්තියා වා අජ්ඣාචාරෙ වා වෙමතිකස්ස සීලං වෙමතිකසීලං නාම. තත්ථ යොගිනා අවිසුද්ධං සීලං විසොධෙතබ්බං— වෙමතිකෙ වත්ථුජ්ඣාචාරං අකත්වා විමති පටිවිනොදෙතබ්බා ඉච්චස්ස ඵාසු භවිස්සතීති එවං විසුද්ධාදිවසෙන තිවිධං.

පඤ්චමත්තිකෙ චතූහි අරියමග්ගෙහි තීහි ච සාමඤ්ඤඵලෙහි සම්පයුත්තං සීලං සෙක්ඛං අරහත්තඵල සම්පයුත්තං අසෙක්ඛං සෙසං නෙවසෙක්ඛං නාසෙක්ඛන්ති එවං සෙක්ඛාදිවසෙන තිවිධං.

පටිසම්භිදායං පන යස්මා ලොකෙ තෙසං තෙසං සත්තානං පකතිපි සීලන්ති වුච්චති යං සන්ධාය අයං සුඛසීලො අයං දුක්ඛසීලො අයං කලහසීලො අයං මණ්ඩනසීලොති භණන්ති තස්මා තෙන පරියායෙන තීණි සීලානි කුසලං සීලං අකුසලං සීලං අබ්‍යාකතං සීලන්ති එවං කුසලාදිවසෙන පි තිවිධන්ති වුත්තං.

තත්ථ අකුසලං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතස්ස සීලස්ස ලක්ඛණාදීසු එකෙනාපි න සමෙතීති ඉධ න උපනීතං තස්මා වුත්තනයෙනෙවස්ස තිවිධතා වෙදිතබ්බා.

( ස ¶ )

චතුත්ථත්තිකෙ, සතරවන ත්‍රිකයෙහි; යං, යම් ශීලයෙක්; ආපත්තිං අනාප

ජ්ජෙනාන පූරිතං, ආපත්තියට නො
ම අවදනාහුන්සිත් පුරණලද්ද; ආපජ්ජි
ත්වා චාපන, ඇවද වනාහි; කතපටි
කම්මං, ව්‍යුත්ථාන දෙශනාවෙන් කර
ණලද පිළියම් ඇත්තේද; තං, ඒ;
විසුද්ධං, විශුද්ධ ශීල නම් වේ; ආපත්තිං
ආපන්නස්ස, ඇවැත් අවනාගුණේ; අ
කතපටිකම්මං, යථාධර්මයෙන් නො
කළ පිළියම් ඇත්තේද; අවිසුද්ධං, අ
විශුද්ධ ශීල නම්; වත්ථුම්හි වා (වලස් ම
ස් දෙහෝ හුරුමස් දෙහෝයි) ව
ස්තුවෙහි හෝ; ආපත්තියං වා, පාචි
ත්ති දෝහෝ දුක්කට දෝහෝයි ආ
පත්තියෙහි හෝ; අජ්ඣාචාරෙ වා,
(ව්‍යතික්‍රම කෙලෙම් දෝහෝ නො
කෙලෙම් දෝ හෝයි) අධ්‍යාචාරයෙ
හි හෝ; වෙමතිකස්ස, විමති ඇත්ත
හුගේ; සීලං, ශීලය; වෙමතික සීලං
නාම, වෙමතික ශීල නම්-නයි, එයි;
යෝගිනා, යෝගීහු විසින්; අවිසුද්ධං
සීලං විසෝධෙතබ්බං, අවිශුද්ධ ශීලය
විශුද්ධ කටයුතුය; වෙමතිකෙ, විමති
යට පැමිණිකල; වත්ථුජ්ඣාචාරං අක
ත්වා, වස්තු ව්‍යතික්‍රම නොකොට; වි
මති පටිවිනෙතබ්බා (තා වා නෝ
වස්තුව වචාරා විනයධරයන් කරා එ
ළඹ විචාරා හෝ) විමති දුරු කටයුතු
වේ (මෙසේ දුරුකරණලද සංසය
ඇත්තනු විසින් වනාහි නොකැප වී
නම් දුරු කටයුතු—එසින් කීහ "ඉච්ච
ස්ස ඵාසු භවිස්සන්ති") ඉති, එසේ ක
ල්හි; අස්ස, මේ යෝගී හට; ඵාසු භවි
ස්සති, සුවවේ—පසුව තැවීමක, පස්ව
න ත්‍රිකයෙහි; චතූහි අරිය මග්ගෙහි,
සතර ආර්‍ය මාර්ගයන් හාද; තීහිච
සාමඤ්ඤඵලෙහි, යට තුන් ශ්‍රාමණ්‍ය
ඵලයන් හාද; සම්පයුත්තං සීලං, සම්ප්‍ර
යුක්ත ශීලය; සෙඛං, සෙඛශීල නම;
අරහත්තඵලසම්පයුත්තං, අර්හත්ඵල
සම්ප්‍රයුක්ත ශීලය; අසෙඛං, අසෙඛ
ශීල නම; සෙසං, සෙසු ලෞකික ශීල
ය; නෙවසෙඛනාසෙඛං, නෙවසෙඛ
නාසෙඛ සීල නමි; පටිසම්භිදායම්පන,
පිළිසිඹියාහි වනාහි; යස්මා, යම්
හෙයකින්; ලොකෙ, ලෙව්හි; තෙ
සං තෙසං සත්තානං පකතිපි, ඒ ඒ ස
ත්ත්වයන්ගේ ස්වභාවයද; සීලනැයි වු
වහි, ශීලයයි කියනු ලැබේද; යං ස
න්ධාය, යම් ප්‍රකෘතියක් සඳහා; අයං
සුඛසීලො, මේ සුවෙන් වසන සුළුය;
අයං දුක්ඛසීලො, මේ දුකින් වසන
සුළුය; අයං කලහසීලො, මේ කල
හකාරණ සුළු ; අයං මණ්ඩනසීලො
ති, මේ මණ්ඩනයකරණ සුළුයයි; භ
ණන්ති, බෙණෙද්ද; තස්මා, එහෙයි
න්; තෙන පරියායෙන, ප්‍රකෘතියද
ශීලය යන ඒ පර්‍යායෙන් ( ශීල ශබ්ද
යා ප්‍රකෘත්‍යර්ථවාචක බැව්නැයන අර්ථ
යි) කුසලං සීලං, කුශල ශීලය; අකුස
ලං සීලං, අකුශල ශීලය; අව්‍යාකතං
සීලනැයි, අව්‍යාකෘත ශීලයයි; එවං,
මෙසේ; කුසලාදිවසෙනා'පි, කුශලාදි
වශයෙනුදු; තිවිධනති වුත්තං, ත්‍රිවිධ
යයි කියනලදී; තත්‍ර, ඒ ත්‍රිකයෙහි;
අකුසලං සීලං, අකුශල ශීලය; ඉම
ස්මිං අත්ථෙ අධිප්පෙතස්ස සීලස්ස, මේ
අර්ථයෙහි අභිමතවූ ශීලයාගේ; ල
ක්ඛණාදිසු, ලක්ෂණාදීන් කෙරෙහි;
එකෙනාපි න සමෙති ති, එකක් හා
ද සම නොවේනුයි, ඉධ, මෙහි; න
උපනීතං, කුශල ත්‍රික නොඑළවන
ලදී (මේ ත්‍රිකයෙහි අව්‍යාකෘත ශීලය
ගෙයසක ත්‍රිකයෙන් ගත් බැවින් මෙ
හි අභිප්‍රෙත ශීලයෙන් එක සංග්‍රහ
නුයි අකුශලයාගේම අයොජ්‍යමා
නනාව දක්වන පිණිස "තත්‍ර අකුස
ලං" යනාදී කීහු) තස්මා, එහෙයින්;
වුත්තනයෙනෙව, කියනලද නයින්
ම (කුශලත්‍රිකය නොගෙණ හීන ත්‍රි
කාදිවූ පඤ්චත්‍රිකයන්ගේ වශයෙන්ම

ය යන අර්ථයි) අසංඛ්‍ය විධතා වෙද්දී තබබා, ඒ ශීලයාගේ ත්‍රිවිධතාව ද තසුතුවේ.

( හා ¶ )

සතර වන ත්‍රිකයෙහි යම් ශීලයක් ඇවතකට නොපැමිණ පුරණලදද ඇවතට පැමිණ හෝ අභිභානයන් හෝ ඇවැත් දෙසීමෙන් හෝ කාරණලද පිළියම් ඇත්තේ වේද ඒ ශීලය විශුද්ධශීල නම ඇවැතට පැමිණියහුගේ එහායවිඩිවූ පරිද්දෙන් පිළියම් නොකරණලද ශීලය අවිශුද්ධශීල නම මස් පිළිගැණීමෙහි වලස් මස් දෙ හෝ හුරු මස් දෙ හෝයි වස්තුවෙහි සැකයෙන් හෝ මෙයින් පැමිණිය යුත්තේ පචිතියට දෙහෝ දුකුළාවට දෙ හෝයි ඇවතෙහි සැකයෙන් හෝ ඇවතට පැමිණියෙම්දෝ හෝ නොපැමිණියෙම්දෝ හෝයි අධ්‍යාචාරයෙහි සැකයෙන් හෝ යුක්ත පුද්ගලයාගේ ශීලය වෙමතිකශීල නම

එහි වනාහි යොගාවචරයා විසින් අපිරිසිදු ශීලය පිරිසිදු කටයුත්තේය— සැකළපත් ශික්ෂා පදයෙහි වස්තුව නොඉක්මවා තමාම පරීක්ෂාකොට හෝ විනයධරයන් කරා එළඹ විචාරා හෝ සැක හළ යුත්තේය මෙසේවූ කල්හි මේ යොගාවචරයාහට සැප වන්නේය —මෙසේ විශුද්ධාදී වශයෙන් ශීලය තුන්වැදෑරුම් වන්නේයි.

පස්වන ත්‍රිකයෙහි (සෝවාන් සකෘදාගාමි අනාගාමි අර්හත් යන සතර මාර්ගඥාන වීථි හා සමග ද සෝවාන් සකෘදාගාමි අනාගාමි යන ත්‍රිවිධඵල චිත්තවීථි හා සමග ද සම්ප්‍රයුක්තවූ ත්‍රිවිධ විරති චෛතසික සංඛ්‍යාත ශීලය අර්හත්ඵලය සඳහා නිශ්ශ්‍රිතයුක්තයන් බැවින්) ශෛක්ෂ ශීල නම (අර්හත්ඵල චිත්ත වීථිය හා සම්ප්‍රයුක්තවූ ඒ විරති ආදීගු ශික්ෂාබන්ධ නිශ්ශ්‍රිතයුක්තයන් නොවන බැවින්) අශෛක්ෂ ශීල නම-සෙසු ලෞකික ශීලය (හෙවත් කල්‍යාණ පෘථග්ජනයන්ගේ ශීල සමාදානයෙහි පහළවන කාමාවචර කුශල චිත්තවීථි හා සමග පවත්නාවූ ඒ විරති ආදී ශීලධර්මයෝ මාර්ගඵල ධර්මයන්ට කාරණා වන බව මුත් නියමයෙන් අර්හත් ඵලය පිණිස නිශ්ශ්‍රිතයුක්තයන් නොවන හෙයින් ද අර්හත් ඵලසම්පන්නයන් නොවන හෙයින් ද ) නෛවශෛක්ෂ නාශෛක්ෂ ශීල නම-මෙසේ ශෛක්ෂ අශෛක්ෂ වශයෙන් ශීලය තුන්වැදෑරුම්වන්නේයි—

ප්‍රතිසම්භිද මාර්ගපාලියෙහි වනාහි යම් හෙයකින් ලොකයෙහි ඒ ඒ සත්වයන්ගේ සවභාව ධර්මය ද ශීලයයි කියනුලැබේද ඒ එසේමැයි—යම් යම් සවභාවක් සඳහා (ලොකවාසීහු) මේ පුරුෂතෙම සැපසේ වසන සුලලය. මේතෙම දුකසේ වසන සුලලය මේ තෙම ඩබරකරණ සුලලය මේ තෙම සැරසෙන සුලලයයි කියන්නේද ? එසේහෙයින් ඒ ශීල ශබ්දය සවභාවය යන අර්ථය ද කියනබැවින් කුශල ශීලය අකුශල ශීලය අව්‍යාකෘත (කුශලාකුශල වශයෙන් නොකියනලද) ශීලයයි මෙසේ කුශලාදී වශයෙනුදු තුන්වැදෑරුම් වන්නේයයි කියනලද්දේය —ඒ ත්‍රිකයෙහි (ආචාවූ) අකුශල ශීලය වනාහි මේ ශීලන අර්ථයෙහි පවත්නා ශීලයාගේ ලක්ෂණාදීන් අතුරෙන් එකකට ද සමනොවන බැවින් මෙහි කුශලත්‍රිකය නොඑලවනලද්දේයි.

අව්‍යාකෘත ශීල නම් ශෛක්ෂ ත්‍රිකයෙහි ආ (සෝවාන්ඵල සකෘදාගාමිඵල අනාගාමිඵල අර්හත්ඵල චිත්තවීථි හා එක්ව යෙදුනාවූ විරති ආදී චෛ

නිශ්‍රාධර්මයෝ යි එසේම කාමාවචර සත්ත්වයන්ගේ ශීල සමාදානයෙහි උපදනා කුසලචිත්ත චිත්තයන් අවසාන තදාලම්බණාදි විපාකසිත් හා එක්ව යෙදුනාවූ විරති ආදීහුද අව්‍යාකෘත ශීලයයි ම සඞ්ග්‍රහ කටයුතුයි ශෛක්ෂත්‍රිකයෙන් එම ශීලය ද සඞ්ගෘහිත බැවින් මෙහි නොඑල්ලූහ. එසෙයින් කුශලත්‍රිකය නොගෙණ හීනත්‍රිකාදි පච්ත්‍රිකයන්ගේ වශයෙන්ම මේ ශීලයාගේ තුන්වැදෑරුම් බව දතයුතු.

---

(පා *)

චතුක්කෙසු පඨමචතුක්කෙ —
යො ධ සෙවති දුස්සීලෙ
සීලවන්තෙ න සෙවති
වත්ථුවීතික්කමෙ දොසං
න පස්සති අවිද්දසු —
මිච්ඡාසඞ්කප්පබහුලො
ඉන්ද්‍රියානි න රක්ඛති
එවරූපස්ස වෙ සීලං
ජායතෙ හානභාගියං —
යො පනත්තමනො හොති
සීලසම්පත්තියා ඉධ
කම්මට්ඨානානුයොගම්හි
න උප්පාදෙති මානසං —
තුට්ඨස්ස සීලමත්තෙන
අඝටන්තස්ස උත්තරිං
තස්ස තං ඨිතිභාගියං
සීලං භවති භික්ඛුනො —
සම්පන්නසීලො ඝටති
සමාධත්ථාය යො පන
විසෙසභාගියං සීලං
හොති එතස්ස භික්ඛුනො —
අතුට්ඨො සීලමත්තෙන
නිබ්බිදං යොනුයුඤ්ජති;
හොති නිබ්බෙධභාගියං
සීලමෙතස්ස භික්ඛුනොති —

එවං හානභාගියාදිවසෙන චතුබ්බිධං —

චතුක්කෙසු, චතුෂ්කයන් අතුරෙහි; පඨමචතුක්කෙ, ප්‍රථමචතුෂ්කයෙහි, ඉධ, මෙහි; යො අවිද්දසු, යම් අඥාන භික්ෂුවෙක්; දුස්සීලෙ සෙවති, දුශ්ශීලයන් සෙවීද; සීලවන්තෙ න සෙවති, සිල්වතුන් නොසෙවීද; වත්ථුවීතික්කමෙ, වස්තුව්‍යතික්‍රමයෙහි; දොසං න පස්සති, දොෂ නොදකීද; (දුස්සීලයන් සෙවුනාවූ සිල්වතුන් නොසෙවුනා බැවිනුදු ඔවුන්ගේ දිට්ඨානුගතියට පැමිණීමෙන් අධ්‍යාචාරයෙහි දොෂ නොදක්නේය යන අදහසි.) මිච්ඡාසඞ්කප්පබහුලො, කාමසඞ්කප්පාදි නව මහාවිතර්ක සඞ්ඛ්‍යාත මිථ්‍යාවිතර්ක බහුල වූයේ; ඉන්ද්‍රියානි න රක්ඛති, මිථ්‍යාසඞ්කල්ප බහුල බැවින්ම මනඃෂෂ්ඨ ඉන්ද්‍රියයන් නොරකීද; එවරූපස්ස සීලං, එබඳු භික්ෂුහුගේ ශීලය; වෙ, ඒකාන්තයෙන්ම; හානභාගියං ජායතෙ, හානභාගිය වන්නේයි (පරිහානිය සෙවුනේය යන අදහසි) ඉධ, මෙහි; යො පන, යම් මහණෙක්; අත්තමනො සීලසම්පත්තියා, තමාගේ චතුෂ්පාරිශුද්ධි ශීලයෙන්ම; අත්තමනො හොති, සතුටුවේද; කම්මට්ඨානානුයොගම්හි, කර්මස්ථානයෙහි යෙදීමෙහි; මානසං න උප්පාදෙති, සිත් නොඋපදවාද; තුට්ඨස්ස සීලමත්තෙන, ශීලමාත්‍රයෙන් තුෂ්ටවූ; උත්තරිං අඝටන්තස්ස, මතුයෙහි ධ්‍යාන සඞ්ඛ්‍යාත විශෙෂාධිගමයට ව්‍යායාම නොකරන්නාවූ; තස්ස භික්ඛුනො, ඒ භික්ෂුහුගේ; තං සීලං, ඒ සීලය තමෙම; ඨිතිභාගියං හොති ස්ථිතියම සෙවුනේයි; යො පන, යමෙක් වනාහි; සම්පන්නසීලො, සම්පූර්ණ වූ සිල් ඇත්තේ; සමාධත්ථාය, සමාධිය පිණිස; ඝටති, ව්‍යායාම කෙරේද; එතස්ස භික්ඛුනො, ඒ භික්ෂුහු

( ස * )

යේ; සීලං, ශීලය තෙමේ; විසෙසභාගියං හොති, ධ්‍යානවිශෙෂ සෙවියේයි; යො, යමෙක්; අතුට්ඨො සීලම්හි සෙතහ, ශීලමාත්‍රයෙන් අතුෂ්ටවූයේ; නිබ්බිදං අනුයුඤ්ජති, විදර්ශනාවෙහි යෙදේද (මෙයින් බලවත් විදර්ශනාව කීහු) එතස්ස භික්ඛුනො සීලං, මේ භික්ෂුහුගේ ශීලය; නිබ්බෙධභාගියං හොති, නිර්වේදය සෙවූයේයි (විදර්ශනාවෙහි යෙදුනු පමණකින්ද නිර්වේදභාග්වේ යන අර්ථයි)

( භා * )

චතුෂ්කයන් අතුරෙන් පළමුවන චතුෂ්කයෙහි (අර්ථ මෙසේ දතයුතු කෙසේදයත් ? ) මෙ ශාසනයෙහි යම් අඥාන මහණෙක්තෙමේ දුශ්ශීලයන් සෙවනයකෙරේද සිල්වතුන් සෙවනය නොකෙරේද ඒ කාරණකොට ගෙණ ඒ මහණතෙම ඔවුන්ගේ දෘෂ්ටානුගතියට යෑස් ශික්ෂාපද ඉක්මවීමෙහි දොස් නොදක්නේය කාමවිතර්කාදී නවමහා මිථ්‍යා කල්පනාම බහුලකොට ඇතතාවූ ඒ මහණතෙම මිථ්‍යා කල්පනා බහුලබැවින්ම චක්ෂුරාදී ෂඩින්ද්‍රියයන් නොරක්නේය මෙබඳු සවභාව ඇත්තාවූ භික්ෂුහුගේ ශීලය ඒකාන්තයෙන්ම පිරිහීම භජනය කරන්නේය.

මේ ශාසනයෙහි යම් මහණෙක් තෙම තමාගේ සිව් පිරිසිදු ශීලසම්පත්තියෙන්ම සතුටුවේද ඔබ්බෙහි නිවන් පිණිස කම්මට්ඨානානු යෝගයෙහි සිත් නුපදවාද ශීලමාත්‍රයෙන් සතුටුවූ මන්තෙහි ධ්‍යාන භාවනා සඛ්‍යාත විශෙෂාධිගමය පිණිස උත්සාහ නොවඩන්නාවූ ඒ භික්ෂුහුගේ ශීලය සඨිතිය නොහොත් මතු විශෙෂාධිගමයට නොපැමිණ නැවැත්ම භජනය කරන්නේයි මේ සස්නෙහි යම් මහණෙක් තෙම සම්පූර්ණවූ සිල් ඇත්තෙක්ව සමාධි භාවනා පිණිස උත්සාහ කෙරේද ඒ භික්ෂුහුගේ ශීලය විශෙෂාධිගමය භජනය කරන්නේය. යම් මහණෙක් තෙම ශීලමාත්‍රයකින් සතුටුනොවී හෙවත් ශීලයෙහිම නොනැවති විදර්ශනා වඩාද මේ භික්ෂුහුගේ ශීලය නිර්වේදය හෙවත් නිර්වාණ ප්‍රතිවෙධය භජනය කරන්නේයි මෙසේ ශීලය හානභාගීය සඨිතිභාගීය විශෙෂභාගීය නිර්වේදභාගීය වශයෙන් සතරවැදෑරුම් වන්නේයි—

( භා • )

( පා † )

දුතිය චතුක්කෙ භික්ඛූ ආරබ්භ පඤ්ඤත්තා සික්ඛාපදානි යානිච තෙසං භික්ඛූනීනං පඤ්ඤත්තතො රක්ඛිතබ්බානි ඉදං භික්ඛුසීලං—භික්ඛුනියො ආරබ්භ පඤ්ඤත්තා සික්ඛාපදානි යානි ච තාසං භික්ඛූනං පඤ්ඤත්තතො රක්ඛිතබ්බානි ඉදං භික්ඛුනී සීලං—සාමණේරසාමණේරීනං දසසීලානි ඉදං අනුපසම්පන්න සීලං උපාසක උපාසිකානං නිච්චසීලවසෙන පඤ්ච සික්ඛාපදානි සති වා උස්සාහෙ දස උපොසථඞ්ග වසෙන අට්ඨාති ඉදං ගහට්ඨසීලන්ති එවං භික්ඛුසීලාදිවසෙන චතුබ්බිධං—

තතියචතුක්කෙ උත්තරකුරුකානං මනුස්සානං අවීතික්කමො පකති සීලං—කුලදෙසපාසණ්ඩානං අත්තනො අත්තනො මරියාද චාරිත්තං ආචාරසීලං—"ධම්මතා එසා ආනන්ද යදා බොධිසත්තො මාතුකුච්ඡිං ඔක්කන්තො හොති න බොධිසත්තමාතු පුරිසෙසු මානසං උප්පජ්ජති කාමගුණූපසංහිතං" ති එවං වුත්තං බොධිසත්තමාතුසීලං ධම්මතා සීලං—මහා කස්සපාදීනං පන සුද්ධසත්තානං

( ෂා † )

තං බොධිසත්තස්ස ච තාසු තාසු ජාතිසු සීලං පුබ්බහෙතුකසීලන්ති එවං පකතිසීලාදි වසෙන චතුබ්බිධං —

( ෂ † )

දුතියචතුක්කෙ, දෙවන චතුෂ්කයෙහි; භික්ඛූ ආරබ්භ පඤ්ඤත්තසික්ඛාපදානි, භික්ෂූන් අරභයා පණවනලද ශික්ෂාපදයෝද; භික්ඛුනීනං පඤ්ඤත්තතො, භික්ෂුණීන්ට ප්‍රඥප්ත ශික්ෂාපදයෙන්; යානි ච තෙසං රක්ඛිතබ්බානි, යම් ශික්ෂාපදකෙනෙක් ඒ භික්ෂූන් විසින් රක්ක යුත්තාහුද; ඉදං භික්ඛුසීලං, මේ භික්ෂුශීල නම් වේ; භික්ඛුනීයො ආරබ්භ පඤ්ඤත්තසික්ඛාපදානි, භික්ෂුණීන් අරභයා ප්‍රඥප්ත ශික්ෂාපදයෝද; භික්ඛූනං පඤ්ඤත්තතො, භික්ෂූන්ට ප්‍රඥප්ත ශික්ෂාපදයෙන්; යානි ච තාසං රක්ඛිතබ්බානි, යම් ශික්ෂාපදකෙනෙක් ඒ භික්ෂුණීන් විසින් රක්කයුත්තාහුද; ඉදං, මේ; භික්ඛුනීසීල, භික්ෂුණී ශීල නම් වේ; සාමණෙර සාමණෙරීනං දසසීලානි, සාමණේර සාමණේරීන්ගේ දශශීලයෝ; අනුපසම්පන්නසීලං, අනුපසම්පන්නශීලනම්; උපාසක උපාසිකානං, උපාසක උපාසිකාවන්ගේ; නිච්චසීලවසෙන පඤ්ච සික්ඛාපදානි, නිත්‍යශීල වශයෙන් පඤ්චශික්ෂාපදයෝද; සති වා උස්සාහෙ දස, මෙතෙක් දශ ශීලයන් රක්ෂාකරන්නට උත්සාහයක් ඇතිකල්හි සවිකාරාදීන්ට මෙන් සාමණේරයන් විසින් රක්කයුතු එම දශ ශික්ෂාපදයෝද; උපොසථඞ්ගවසෙන අට්ඨාති, උපොසථාඞ්ග විසින් නච්චාදී මාලාදී වෙරමණීන් එක් අඟක්කොට අෂ්ට ශික්ෂාපදයෝද; ඉදං ගහට්ඨසීලං, මේ ගෘහස්ථශීල නම්.— තතියචතුක්කෙ, තුන්වන චතුෂ්කයෙහි; උත්තරකුරුකානං මනු

( ෂ † )

ස්සානං, උත්තරකුරු දිප වැසි මිනිසුන්ගේ; අවීතික්කමො, පචශීලයන්ගේ අව්‍යතික්‍රමය; පකති සීලං, ස්වභාව ශීලනම්; කුලදෙසපාසණ්ඩානං, ඒ ඒ කුලයන්ගේ ඒ ඒ දෙශ වාසීන්ගේ ඒ ඒ පාෂාණ්ඩයන්ගේ; අත්තනො අත්තනො මරියාදභත්තං චාරිත්තං, ඒ ඒ කුලාදියෙහි පූර්ව පුරුෂයන් විසින් ඒ ඒ වරද නොහිරීමෙහි හිමිකොට තබනලද චාරිත්‍රය; ආචාරසීලං, ආචාරශීලනම්; (බ්‍රාහ්මණාදීන්ගේ අමද්‍යපානාදී කුලධර්මය සම්භර ජනපදයෙක අහිංසනාදි දෙශ ධර්මය තිථිකයන්ගේ යමනියමාදි පාෂාණ්ඩ ධර්මයයි) අභාසද, ආභාසදන; එසා ධම්මතා, මේ ධර්මතායි (ස්වභාවයකි) යද, යම් කලෙක; බොධිසත්තො, බොධිසත්වතෙමේ, මාතුකුච්ඡිං ඔක්කන්තො හොති, මවුකුස උපන්නේ වේද; බොධිසත්ත මාතු මානසං, බොධිසත්වමාතෘචිත්තය; කාමගුණුපසංහිතං, කාම ගුණාස්වාදයෙහි ගිජුවූයේ; පුරිසෙසු න උප්පජ්ජති, නි, පුරුෂයන් කෙරෙහි නොඋපදනේයයි; එවං වුත්තං, මෙසේ කියනලද; බොධිසත්තමාතුසීලං, බොධිසත්වමාතෘශීලය; ධම්මතා සීලං, ධර්මතා ශීලනම ("පකතියා සීලවතී හොති" යි වදාළබැවින් බොධිසත්වයන් මවුන්ගේ පඤ්ච ශික්ෂාපදශීලය පරිපූර්ණම වේයි මේ වනාහි කුක්ෂිගත මහා බොධිසත්වයන්ගේ පිනානත් කෙරෙහි දු විඥානොත්පත්ති පමණෙකිනු දු අසංක්ලිෂ්ටවූ පරමෝත්කර්ෂය ව පැමිණි ශීලය ගුණානුභාවයෙන් සිද්ධවන බැවින් කාරණනියමයෙන් ආගතසීලය ධර්මතාශීලනමැයි දතයුතු) මහාකස්සපාදීනං පන සුද්ධසත්තානං, චිරකාලයක් සුපරිශුද්ධ ශීලව ආ බැවින් මහා කාශ්‍යපාදි ශුද්ධ සත්ව

යන්ගේ ශීලයද; බොධිසත්තස්ස ච, බොධිසත්වයන්ගේ ද; තාසු තාසු ජාතිසු සීලං "සීලවරජාතිංසරජාදි" ඒ ඒ ජාතියෙහි ශීලය; පුබ්බහෙතුකසීලං, පූර්වජාති සිද්ධ හෙතු ඇතිබැවින් පූර්ව හෙතුකශීලනම්.

(භා †)

දෙවන චතුෂ්කයෙහි භික්ෂූන් අරබයා වෙන්කොට පණවනලද ශික්ෂාපදයෝද භික්ෂුණීන් අරබයා පණවනලද ශික්ෂාපද අතුරෙන් භික්ෂූන් විසිනු ද රක්‍ෂායුතුවූ උභයසාධාරණ ශික්ෂාපදයෝ ද භික්ෂුශීල නම භික්ෂුණීන් අරබයා වෙන්කොට පණවනලද ශික්ෂාපදයෝ ද භික්ෂුණීන් අරබයා පණවනලද ශික්ෂාපද අතුරෙන් භික්ෂූන් විසිනු ද රක්ෂායුතුවූ උභයසාධාරණ ශික්ෂාපදයෝ ද භික්ෂුණීශීල නම මෙහෙණ මෙහෙණීන් අරබයා පණවනලද දශශීලයෝ අනුපසම්පන්නශීල නම උපාසක උපාසිකාවන් අරබයා නිත්‍යශීල වශයෙන් පණවනලද පඤ්ච ශික්ෂා පදයෝ ද මත්තෙහි ද උත්සාහඇත සපිකාරු දී දශශීල උපාසකයන්ට මෙන් මෙහෙණුන්විසින් රක්කයුතුවූ එව දශශික්ෂාවෝද උපෝසථාඞ්ගවශයෙන් එම දශශීලයෙහි ආ නච්චාදි මාලාදී ශික්ෂාපදදෙක එකත්කොට වදුරණලද අෂ්ට ශික්ෂාපදයෝද යන මෙතෙක් ප්‍රභෙද ඇත්තාවූ ශීලය ගෘහස්ථශීල නම මෙසේ භික්ෂුශීලාදි වශයෙන් ශීලය සතරවැදෑරුම් වන්නේයි. තුන්වන චතුෂ්කයෙහි උතුරුකුරු දිවයින් වැසි මිනිසුන්ගේ ස්වභාව ධර්මවශයෙන් පඤ්චශික්ෂාපද නොඉක්මවීම ස්වභාවශීල නම්. බ්‍රාහ්මණාදී ඒ ඒ කුලයන්ගේ රහමෙර නොපීම ආදිය පිණිස ආදිපුරුෂයන් විසින් ත

(භා †)

බනලද කුලසීමා චාරිත්‍ර ධර්මයෝ ද ඒ ඒ ජනපදයන්හි සත්වහිංසාව නොකටයුතුයයි යනාදීන් තබනලද දෙශචාරිත්‍ර ධර්මයෝද තීර්ථකාදීන්ගේ යමනියමාදි පාෂණ්ඩ චාරිත්‍රධර්මයෝද යන මෙතෙක් ධර්මයෝ ආචාරශීල නම (එම්බ: ආනන්දය යම් කලෙක මහබෝසත්හු මව්කුස පිළිසිඳගත්තේවේද එතැන්පටන් බොධිසත්ව මාතාවගේ සිත කම්සැපයෙහි ගිජුව පුරුෂයන්කෙරෙහි නොඋපදනේය මේ ස්වභාව ධර්මයෙකැයි) මෙසේ වදුරණලද බොධිසත්වමාතෘ ශීලය ධර්මතාශීල නම මහාකාශ්‍යපාදි පිරිසිදු සත්වයන්ගේද මහබොසතාණන් වහන්සේගේ ශීලවරජාදිව උපන් ඒ ඒ ජාතියෙහිද පූර්වහෙතු බලයෙන් සිද්ධවූ ශීලය පූර්වහෙතුක ශීලනම් මෙසේ ප්‍රකෘතිශීලාදිවශයෙන් ශීලය සතරවැදෑරුම්වන්නේයි.

(පා ‡)

චතුත්ථ චතුක්කෙ යං භගවතා "ඉධ භික්ඛු පාතිමොක්ඛසංවරසංවුතො විහරති ආචාරගොචරසම්පන්නො අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී සමාදාය සික්ඛති සික්ඛාපදෙසු" ති එවං වුත්තං සීලමිදං පාතිමොක්ඛසංවරසීලං නාම යම්පන "සො චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී යත්වාධිකරණමෙනං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣාදොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං තස්ස සංවරාය පටිපජ්ජති රක්ඛති චක්ඛුන්ද්‍රියං චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජති සොතෙන සද්දං සුත්වා ඝානෙන ගන්ධං ඝායිත්වා ජිව්හාය රසං සායිත්වා කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා මනසා ධම්මං විඤ්ඤා

( පා ‡ )

න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී ...පෙ... මනින්ද්‍රියෙ සංවරං ආපජ්ජතී"ති වුත්තං ඉදං ඉන්ද්‍රියසංවරසීලං. යා පන ආජීවහෙතු පඤ්ඤත්තානං ඡන්නං සික්ඛාපදානං වීතික්කමස්ස කුහනා ලපනා නෙමිත්තිකතා නිප්පෙසිකතා ලාභෙන ලාභං නිජිගීසනතාති එවමාදීනඤ්ච පාපධම්මානං වසෙන පවත්තා මිච්ඡාජීවා විරති ඉදං ආජීවපාරිසුද්ධිසීලං.

( ස ‡ )

චතුරෙක චතුෂ්කයෙහි; ("යං භගවතා එවං වුත්තං" යි යොදනු) භගවතා, භාග්‍යවත්හු විසින්; ඉධ, මේ ශාසනයෙහි; භික්ඛු, මහණ තෙමේ; පාතිමොක්ඛසංවරසංවුතො, ප්‍රාතිමොක්‍ෂසංවරයෙන් යුක්තවූයේ; විහරති, වාසය කෙරෙයි; ආචාරගොචරසම්පන්නො, වක්‍ෂ්‍යමාණ ආචාරයෙන් හා ගොචරයෙන් යුක්තවූයේ; අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී, අණුප්‍රමාණ වරදෙහිදු භයදක්නේ; සමාදාය, මනාකොට ගෙණ; සික්ඛාපදෙසු, සිකපදයෙහි; සික්ඛතී'ති, හික්මේන්නේයයි; එවං වුත්තං, මෙසේ කියනලද; යං සීලං, යම් ශීලයෙක් ඇද්ද; ඉදං, මේ; පාතිමොක්ඛසංවරසීලං නාම, ප්‍රාතිමොක්‍ෂ සංවරශීල නම් ("යං පන වුත්තං" යි යොදනු) සො, ඒ ප්‍රාතිමොක්‍ෂ සංවර ශීලයෙහි පිහිටි මහණ; චක්ඛුනා රූපං දිස්වා, චක්‍ෂුසින් රූපය දැක; න නිමිත්තග්ගාහී හොති, නිමිත්තග්‍රාහී නොවෙයි; නානුබ්‍යඤ්ජනග්ගාහී, අනුව්‍යඤ්ජනග්‍රාහී නොවෙයි; යත්වාධිකරණං, යම් අසංවරයක හෙතුවෙන්; එනං, ඒ පුද්ගලයා; චක්ඛුන්ද්‍රියං අසංවුතං, අපිහිත චක්‍ෂුරින්ද්‍රිය ඇතිව; විහරන්තං, වසන්නහු; අභිජ්ඣා, අභිධ්‍යාය; දෞර්මනස්සා, දෞර්මනස්‍යය යන; පාපකා, ලාමකවූ; අකුසලාධම්මා, අකුශලධර්මයෝ; අන්වාස්සවෙය්‍යුං, අනුබද්ධනාහුද; තස්ස, ඒ චක්‍ෂුරින්ද්‍රියයාගේ; සංවරාය පටිපජ්ජති, සංවරය පිණිස පිළිපදනේය; රක්ඛති චක්ඛුන්ද්‍රියං, චක්‍ෂුරින්ද්‍රිය රක්නේය; චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජති, චක්‍ෂුරින්ද්‍රියෙහි සංවරයට පැමිණෙන්නේය; සොතෙන සද්දං සුත්වා, ශ්‍රොත්‍රයෙන් ශබ්දයන් අසා; ඝානෙන ගන්ධං ඝායිත්වා, ඝ්‍රාණයෙන් ගන්ධය ආඝ්‍රාණය කොට; ජිව්හාය රසං සායිත්වා; ජිහ්වායෙන් රසය ආස්වාදය කොට; කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා, කයින් ස්ප්‍රෂ්ටව්‍යය ස්පර්ශකොට; මනසා ධම්මං විඤ්ඤාය, මනසින් ධර්මය දැන; න නිමිත්තග්ගාහී හොති, නිමිත්ත ග්‍රහණය නොකෙරෙයි; මනින්ද්‍රියෙ සංවරං ආපජ්ජති, මනින්ද්‍රියෙහි සංවරයට පැමිණේයයි; යං වුත්තං, යම් ශීලයෙක් කියනලදද; ඉදං, මේ; ඉන්ද්‍රියසංවරසීලං, ඉන්ද්‍රියසංවරශීල නම් ("යාපන විරති" යොදනු) ආජීවහෙතු පඤ්ඤත්තානං, ආජීවහෙතුවෙන් ප්‍රඥප්තවූ; ඡන්නං සික්ඛාපදානං, පාරාජිකාදී ශික්‍ෂාපදයන් සදෙනාගේ; වීතික්කමස්ස වසෙන පවත්තානං, ව්‍යතික්‍රමවශයෙන් ප්‍රවෘත්තවූද; කුහනා, ත්‍රිවිධ කුහන වස්තුවෙන් විස්මය කරවීම, ලපනා, තමාවන් ප්‍රත්‍යයදායකයාවන් උසස්කොට උහු කිසිවක් දෙන පරිද්දෙන් බිණීමය; නෙමිත්තිකතා, ප්‍රත්‍යයදානයෙහි සංඥා උපදවන කායවාක්කර්මාඛ්‍ය නිමිත්ත කරණ බවය; නිප්පෙසිකතා, ලාභපිණිස අනුන් ආක්‍රොශාදීන් පෙළනබවය; ලාභෙන ලාභං නිජිගීසනතා, තමා ලද ලාභයෙන් අනුන්ගේ ලාභ සෙවීමය යන; එවමාදීනංච පාපධම්මා

( ශා ‡ )

නං වසෙන, මේ ආදි පාප ධර්මයන්ගේ වශයෙනුදු ( ආදි ග්‍රහණින් "චාටුකම්‍යතා අනුප්පියභාණිතා" දීහු ගැණෙත් ) පවත්තා, ප්‍රවෘත්තවූ; යා මිච්ඡාජීවා විරති, යම් මිථ්‍යා ජීවයෙන් විරතියෙක්ඇද්ද; ඉදං, මේ; ආජීව පාරිසුද්ධි සීලං, ආජීව පරිශුද්ධි ශීලනම්.–

( ශා ‡ )

සහරවන චතුෂ්කයෙහි (මේ ශාසනයෙහි යම් මහණෙක් ප්‍රාතිමොක්ෂ සංවරයෙන් යෙදී වෙසේද යහපත්වූ චාරිත්‍රයෙන් හා ගොචරයෙන් යුක්තව ස්වල්ප මාත්‍රවූ වරදෙහි පවා භය දක්නා සුලුව බනාකොට සමාදන්ව ගෙණ ශික්ෂාපදයෙහි හික්මෙන්නේ යයි ) මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් වදරණලද යම් ශීලයෙක් ඇත්තේ වේද මේ ප්‍රාතිමොක්ෂ සංවර ශීල නම (ප්‍රාතිමොක්ෂ සංවර ශීලයෙහි පිහිටි හේ මහණ තෙමේ ඇසින් රූපාරමුණක් දැක ඒ අරමුණෙහි තනමස් ගඬු දැලි රවුල් ආදි ස්ත්‍රීපුරුෂ ලක්ෂණ ශුභ වසයෙන් සිතට නොගන්නේය. අත් පා ආදී අවයවයන් යහපතැයි කල්පනාකරන්නා හට එහි උපදනා කෙලෙස් ප්‍රකාටවන හෙයින් අණුව්‍යඤ්ජන නැයි කියනලද අවයවයන්ගේ ආකාර ශුභ වශයෙන් නොගන්නේය යම් චක්ෂුර්ද්වාරයෙහුගේ නොවැසීම කාරණකොටගෙණ විවෘතවූ චක්ෂුර්ද්වාර ඇතිව වසන ඒ පුද්ගලයා පසුපස්සෙහි විසම ලොභදෞර්මනස්‍ය සංඛ්‍යාතවූ ලාමක පාප ධර්මයෝ ලුහුබඳනානු; ඒ චක්ෂුර්ද්වාරය වැසීම පිණිස පිළිපදින්නේය. චක්ෂුර්ද්වාරය ආරක්ෂාකරන්නේය. චක්ෂුර්ද්වාරයෙහි සංවරයට පැමිණෙන්නේයි (සෙසු පෙදෙහි යට කී අර්ථයට සමාන පදයන්ගේ අර්ථ එසේම දතයුතුයි ) කණින් ශබ්දය

( ශා ‡ )

අඝාද නැහැයෙන් සුවඳ ආඝ්‍රාණයකොටද දිවින් රස විඳගෙණද ශරීරයෙන් පහස විඳගෙණද සිතින් ධර්මාලම්බනය දැනද ශුභ වශයෙන් ලක්ෂණ නොගන්නේය ශුභ වශයෙන් අවයවයන්ගේ ආකාර සිතට නොගන්නේය. මනින්ද්‍රියෙහි සංවරයට පැමිණෙන්නේයි. යනාදින් යම් ශීලයෙක් වදරණලද්දේ වේද මේ ඉන්ද්‍රිය සංවර ශීලනම් වන්නේය. දිවි පැවැත්ම කාරණකොටගෙණ පණවන ලද පාරාජිකාදී ශික්ෂාපද සදෙන ඉක්මවීම් වශයෙන් පැවැත්තාවූ හෝ රහස් බිණුම් ආදී තුන් වැදෑරුම්කොහොන්පියොවින් දායකයන් විස්මය පත්කාරවීමෙන් හෝ තමාද දායකයාද උසස්කොට ඔහු කිසිවක් දෙන පරිද්දෙන් බිණීමෙන් හෝ කයින් හෝ වචනයෙන් හෝ යම් කිසි ප්‍රත්‍යයක් දෙන පිණිස සලකුණු කිරීමෙන් හෝ ලාභ පිණිස ආක්‍රොශ වස්තුවෙන් මෙරමා පෙළීමෙන් හෝ තමාලද ලාභය අතිකෙකුට දී ඔහුගෙන් අනික් මහත් ලාභයක් සෙවීමෙන් හෝ යනමේ ආදී ලාමක ධර්මයන්ගේ වශයෙන් පවත්නා මිථ්‍යා ජීවයෙන් යම් වෙන්වීමෙක් ඇත්තේ වේද මේ ආජීව පරිශුද්ධි ශීලනම්.–

( පා ¶ )

"පටිසඞ්ඛා යොනිසො චීවරං පටිසෙවති යාවදෙව සීතස්ස පටිඝාතාය" ති ආදිනා පන නයෙන වුත්තො පටිසඞ්ඛාන පරිසුද්ධො චතුපච්චය පරිභොගො පච්චය සන්නිස්සිත සීලං නාම.–තත්‍රායං ආදිතො පට්ඨාය අනුපුබ්බ පදවණ්ණනාය සද්ධිං විනිච්ඡයකථා.–

"ඉධා"ති ඉමස්මිං සාසනෙ 'භික්ඛු'ති සංසාරෙ භයං ඉක්ඛණතාය

( පා ¶ )

**භින්නපටධරාදිතාය ච, එවං ලද්ධොකාසො තෙන පාතිමොක්ඛ සංවරෙන සංවුතො සද්ධාපබ්බජිතො කුලපුත්තො "පාතිමොක්ඛ සංවර සංවුතො" ති එත්ථ පාතිමොක්ඛන්ති සික්ඛාපද සීලං තඤ්හි යො නං පාතිරක්ඛති තං මොක්ඛෙති මොචෙති ආපායිකාදීහි දුක්ඛෙහි තස්මා පාතිමොක්ඛන්ති වුච්චති. සංවරණං සංවරො කායික වාචසිකස්ස අවීතික්කමස්සෙතං නාමං පාතිමොක්ඛමෙව සංවරො පාතිමොක්ඛ සංවරො තෙන පාතිමොක්ඛ සංවරෙන සංවුතො පාතිමොක්ඛ සංවර සංවුතො උපගතො සමන්නාගතො ති අත්ථො "විහරතී"ති ඉරියති "ආචාරගොචර සම්පන්නො" ති ආදීනං අත්ථො පාළියං ආගත නයෙනෙව වෙදිතබ්බො.**

( ස ¶ )

යොනිසො, නුවණින්; පටිසඞ්ඛාය, පරීක්ෂාකොට; චීවරං, සිවුරු; පටිසෙවති, වැළඳගන්නේය; යාවදෙව, යම්තාක්; සීතස්ස පටිඝාතාය, ශීත පීඩා නසන පිණිසය යනු; ආදිනා පන නයෙන, මේ ආදින යින්; වුත්තො, කියනලද; පටිසඞ්ඛාන පරිසුද්ධො, ප්‍රත්‍යවෙක්ෂාවෙන් පරිශුද්ධවූ; චතුපච්චය පරිභොගො, චතුෂ් ප්‍රත්‍යය පරිභොගය (තථා ප්‍රවෘත්ත අනවද්‍ය චෙතනාව) පච්චයසන්නිස්සිත සීලංනාම ප්‍රත්‍යය සන්නිශ්‍රිත ශීලනම්; තත්‍ර, ඒ ප්‍රාතිමොක්ෂ සංවරාදීන්ගෙහි; අයං, මේ තෙම; ආදිතො පට්ඨාය, ආදියෙහි පටන්; අනුපුබ්බපදවණ්ණනාය සද්ධිං, අනුපූර්ව පදවර්ණනාව හා සමග; විනිච්ඡය කථා, සංසය දුරුකරණ හෙයින් විනිශ්චය වූ කථායි; ඉධාති, ඉධ යන්නෙහි ඉමස්මිං සාසනෙ, මේ ශාසනයෙහි; භික්ඛූති, භික්ඛුනම්; සංසාරෙ භයං ඉක්ඛණතාය වා, සසරෙහි භය දක්නා බැවින් හෝ; භින්නපටධරාදිතාය වා, භින්නපටධාරාදි බැවින් හෝ; එවං ලද්ධොවාකාසො, භික්ෂුයයි ලද ව්‍යවහාර ඇති [පළමු අර්ථය සර්වසාධාරණ හෙයින් ප්‍රව්‍රජිතයන්ටම සාධාරණ පර්‍යාය දක්වන පිණිස "භින්නපටධරාදිතාය" යි කීහු.) තෙන පාතිමොක්ඛ සංවරෙන සංවුතො, ඒ ප්‍රාතිමොක්ෂ සංවරයෙන් යුක්තවූ; සද්ධාපබ්බජිතො, සැදැහැයෙන් පැවිදිවූ; කුලපුත්තො, ආචාර කුලපුත්‍ර හෝ ජාතිකුලපුත්‍ර හෝ; පාතිමොක්ඛ සංවර සංවුතො ති එත්ථ, පාතිමොක්ඛ සංවර සංවුතො' යනමෙහි; පාතිමොක්ඛන්ති, ප්‍රාතිමොක්ෂ නම්; සික්ඛාපද සීලං, චාරිත්‍ර වාරිත්‍ර භෙද ඇති ශික්ෂාපද වශයෙන් ප්‍රඥප්ත ශීලයයි [තඤ්හි පාතිමොක්ඛන්ති වුච්චති" යි යොදනු කියබදන යසමාදෘශ්‍යයි. "තස්මා" යනුහා සයදේ ) යො, යම්කිසි පුද්ගලයෙක්; නං, විනය පර්‍යාපන්න ශීලය; රක්ඛති, සඝකාරි කාරණ භාවයෙන් රකීද; තං, ඒ පුද්ගලයා; මොක්ඛෙති, මිදේයි; ආපායිකාදීහි දුක්ඛෙහි මොචෙති, ආපායිකාදි දුඃඛයෙන් මුදාද; තස්මා, එහෙයින්; පාතිමොක්ඛන්ති වුච්චති, ප්‍රාතිමොක්ෂයයි කියනුලැබේ ("අපායෙ පාචාති ආපායිකා ති" ආදි ග්‍රන්ථයෙන් හදන්‍ය සංසාර දුඃඛයගැනේ ) සංවරණං, කායවාග්ද්වාරයන්ගේ පිදහනය; සංවරො, සංවර නම් (ඒ සංවරයද ව්‍යතික්‍රම ප්‍රතිපක්ෂ බැවින් සප්තාපත්ති ස්කන්ධයන්ගේ අව්‍යතික්‍රමයෙන් නුසි "කායික වාචසිකස්ස අවීතික්කමස්සෙතං නාමං" යුහු, කායවාග්ද්වාරයෙහිවූ අව්‍යතික්‍රමයට නාමෙක යන අර්ථයි) පාතිමොක්ඛමෙව සංවරො, ප්‍රාතිමොක්ෂයම සංවරනුයි; පාතිමො

( ස ¶ )

කඛසංවරෙ, ප්‍රාතිමොක්‍ෂ සංවරනම්; තෙන පාතිමොක්ඛ සංවරෙන, ඒ ප්‍රාතිමොක්‍ෂ සංවරයෙන්; සංවුතො, පිහිත කාය වාග්වාරඇත්තේයි; පාතිමොක්ඛ සංවරසංවුතො, ප්‍රාතිමොක්‍ෂ සංවර සංවෘත නම්වේ [යම් හෙයකින් ප්‍රාතිමොක්‍ෂ සංවරයෙන් පිහිතවූ කායවාග්වාර ඇත්තේ එයට පැමිණියේ එයින් සමන්විතවූයේ නම් වේද එහෙයින් "උපගතො සමන්නාගතො'ති අත්‍ථො" යි කීහු ) "විහරති" යනුයෙහි; ඉරියති, ආත්මභාවය පවත්වන්නේයි; ආචාරගොචර සම්පන්නොති ආදීනං අත්‍ථො, ආචාර ගොචර සම්පන්නා යනාදීන්ගේ අර්ථය; පාලියං, ධ්‍යාන විභඞ්ගපාලියෙහි; ආගතනයෙනෙව වෙදිතබ්බො, ආ නයින්ම දතයුතු වේ—

( හා ¶ )

මේ සිවුරු පරිභොගකිරීම යම්තාක් ශීත පීඩා නසන පිණිසය යනාදීන් නුවණින් ප්‍රයෝජන සලකා සිවුරු වැලඳනන්නේයයි යනාදි ක්‍රමයෙන් විදුරණලද පස් විකීමෙන් පිරිසිදුවූ සිව්පසය පරිභොගකිරීම ප්‍රත්‍යය සන්නිශ්‍රිත ශීල නම (පරමාර්ථ වශයෙන් වනාහි සප්තාපත්තිස්කන්ධයට ඇතුළත්වූ ශික්‍ෂාවන් පුරන්නාවූ මහණහුගේ ඒ ඒ ඇවතට නොපැමිණීම පිළිබඳව උපදනා කාමාවචර කුශල චිත්තවීථි හා සම්ප්‍රයුක්තවූ චෙතනා චෛතසික ධර්මයෝම ප්‍රාතිමොක්‍ෂ සංවර ශීල නම චක්‍ෂුඃ ශ්‍රොත්‍ර ඝ්‍රාන ජිව්හා කාය මනඃ යන සදෙරින් රූප ශබ්ද ගන්ධ රස ස්පර්ශ ධර්මයන්ට ඇතුළත්විය නොදී ඒ සදොර රක්නාවූ පුද්ගලයා හට ඒ ඒ ආලම්බණයන් අනිත්‍යයහ දුඃඛයහ අනාත්මයහ යනාදීන් උපදනාවූ කුශල වි

( හා ¶ )

ත්තවීථි හා සම්ප්‍රයුක්තවූ චෙතනා චෛතසිකයෝ ඉන්ද්‍රිය සංවර ශීල නම පූර්වෝක්ත ඒ ඒ මිථ්‍යා ජීවයෙන් වැළකින්නාවූ පුද්ගලයා හට ඒ ඒ විරමණයෙහි උපදනා කුශල චිත්ත වීථි හා සම්ප්‍රයුක්තවූ විරති චෛතසික ධර්මයෝ ආජීව පාරිශුද්ධි ශීලනම. නුවණින් ප්‍රයෝජන සලකා චීවරාදි සිව්පසය පරිභොග කරන්නා හට ඒ ඒ ප්‍රත්‍යය පිළිබඳව උපදනා කුශල චිත්ත වීථිහා සම්ප්‍රයුක්තවූ චෙතනා ප්‍රධාන චෛතසික ධර්මයෝ ප්‍රත්‍යය සන්නිශ්‍රිත ශීල නම. ඒ ඒ පුද්ගලයන්ගේ සංසාරොත්පත්තියෙහි සටගිය ජාතියෙහි උපන් ඒ ඒ කුශලචිත්ත වීථි සම්ප්‍රයුක්තවූ චෙතනා චෛතසික සඞ්ඛ්‍යාත කර්ම නැමති බීජයම සුගති ප්‍රතිසන්ධි නැමති අඞ්කුරය උපදවන්නේයි. ප්‍රාතිමොක්‍ෂ සංවරය ඉන්ද්‍රිය සංවරය ප්‍රත්‍යය සන්නිශ්‍රිතය යන තුන්වැදෑරුම් කුශල චිත්ත වීථිහු චෙතනා ප්‍රධාන බැවින් මතු උත්පත්තියෙහි එම චෙතනාඛ්‍ය කර්මයම ප්‍රතිසන්ධි බීජය වෙයි. ආජීව පාරිශුද්ධි ශීල කුශලචිත්ත වීථියෙහි විරති චෛතසිකය ප්‍රධාන බැවින් ඒ විරතියම ශීලයයි දක්වූනුමුත් විරතිය ප්‍රතිසන්ධි බීජ නොවන්නෙන් කුශලාඛ්‍ය විරතිය හා සම්ප්‍රයුක්තවූ චෙතනා චෛතසිකය වනාහි සම්ප්‍රයුක්ත ධර්ම බලයෙන් කුසල් වන බැවින් ඕ තොමෝ මතු ජාතියෙහි ප්‍රතිසන්ධි බීජයවන්නේයි. මෙයින් සංස්කාරස්කන්ධ පර්යාපන්න විරති චෙතනාදී ධර්මයෝ දෙකක්ම සතර සංවර ශීලනම්වන බව දතයුතු සතර සංවර ශීලනම්වන්නේ යොනි පුද්ගලයාගේ අවිද්‍යාසක් රූපය දෙපණසක් චෛතසිකය එකුන් අනූවක් චිත්තය යන පස්සාදූන් අතුරෙන් කුමන ධර්මයක්ද? ඒ ශීලය සංසාරොත්ප

( හා ¶ )

තතියෙහි ප්‍රතිසඞ්ඛ විජය වන්නේ කො
සේද? යන විභාග නොදන්නවුන්
ගේ අවබොධය පිණිස මේ දක්වන ල
ද සඞ්ක්ෂෙප විභාගය සියලු තන්හිම
යොදා අර්ථ දතයුතු) ඒ ප්‍රාතිමොක්ෂාදී
සතර සංවර ශීලයෙහි මුල පටන් පිළි
වෙළ පද වර්ණනාව හා සමග සැක
දුරුකිරීම් වශයෙන් එලවනලද අර්ථ
විනිශ්චය කථාව මෙතැන් පටන් දක්
වනු ලැබේ.— මේ ශාසනයෙහි සසර භ
ය දක්නා අර්ථයෙන් හෝ සුන්බුන් ව
ස්ත්‍ර දැරීම් ආදී අර්ථයෙන් හෝ "භික්ෂු"
යයි ලබනලද නාම ව්‍යවහාර ඇත්තා
වූ ඒ ප්‍රාතිමොක්ෂ සංවර ශීලයෙන් යෙ
දුනාවූ සැදැහැයෙන් පැවිදිවූ ආචාර
කුලපුත්‍රයෙක් හෝ ජාතිකුලපුත්‍රයෙක්
හෝ ප්‍රාතිමොක්ෂ සංවර ශීලයෙන් යු
ක්තවූයේය යන මෙහි ප්‍රාතිමොක්ෂ
නම් චාරිත්‍ර වාරිත්‍ර ප්‍රභෙද ඇති ශික්ෂා
පද වශයෙන් පණවනලද ශීලයයි ඒ
එසේමැයි යම් පුද්ගලයෙක් තෙම ය
ම්හෙයකින් විනයට ඇතුළත්වූ ඒ
ප්‍රාතිමොක්ෂ සංවර ශීලය රක්නේවේ
ද ඒ පුද්ගලයා නරකාදී දුකින් මුදව
න්නේවේද එහෙයින් මේ ශීලය ප්‍රා
තිමොක්ෂයයි කියනු ලැබේ. සප්තාප
ත්ති ස්කන්ධයන්ගේ නොඉක්මවීමෙ
න් කාය වාග් ද්වාරයන්ගේ වැසීම
"සංවර" නම ඒ ප්‍රාතිමොක්ෂයම සං
වර වන හෙයින් ප්‍රාතිමොක්ෂ සංවර
නම. ඒ ප්‍රාතිමොක්ෂ සංවරයෙන් වස
නලද කායද්වාර වාග්ද්වාර ඇති පුද්ග
ල තෙමේ "ප්‍රාතිමොක්ෂ සංවර සංවෘ
ත" නම් වන්නේය.— යම් හෙය
කින් ඒ ප්‍රාති මොක්ෂ සංවරයෙන් වස
නලද කාය වාග්ද්වාර ඇති පුද්ගල
යා ඒ සංවරයට පැමිණි හෙයින්
එයින් සමන්විතවූ පැනැත්තේ නම්
වන්නේයි ඒ ප්‍රාතිමොක්ෂ සංවර ශීල

( හා ¶ )

යෙන් සමන්විතව ආත්මභාවය පවත්
වන්නේය හෙවත් සතර ඉරියව්වෙන්
දවස් යවන්නේය යනු භාවයි.

ආචාරගොචරයෙන් සම්පූර්ණවීමය
යනාදි පදයන්ගේ අර්ථ විභඞ්ගප්‍රකර
ණ පාලියෙහි ආනයින් දතයුතු.—

( ශා * )

වුත්තං හෙතං "ආචාරගොචර ස
ම්පන්නො ති අත්ථි ආචාරො අත්ථි අ
නාචාරො තත්ථ කතමො අනාචා
රො කායිකො වීතික්කමො වාචසි
කො වීතික්කමො කායික වාචසි
කො වීතික්කමො අයං වුච්චති අනා
චාරො සබ්බම්පි දුස්සිල්‍යං අනාචාරො
ඉධෙකච්චො වෙළුදානෙනවා පත්ත
දානෙන වා පුප්ඵඵලසිනානදන්ත
කට්ඨදානෙන වා චාටුකම්‍යතාය වා,
මුග්ගසූප්‍යතාය වා පාරිභට්ටතාය වා
ජඞ්ඝපෙසනිකෙන වා අඤ්ඤතරඤ්ඤ
තරෙන බුද්ධපටිකුට්ඨෙන මිච්ඡාජීවෙ
න ජීවිකං කප්පෙති අයංවුච්චති අනා
චාරො.— තත්ථ කතමො ආචාරො
කායිකො අවීතික්කමො වාචසිකො
අවීතික්කමො කායික වාචසිකො අ
වීතික්කමො අයං වුච්චති ආචාරො
සබ්බොපි සීල සංවරො ආචාරො ඉ
ධෙකච්චො න වෙළුදානෙන.— න ප
ත්ත-න පුප්ඵ-න ඵල-න සිනාන-න
දන්තකට්ඨදානෙන.— න චාටුකම්‍යතා
ය.— න මුග්ගසූප්‍යතාය.— න පාරිභට්ට
තාය.— න ජඞ්ඝපෙසනිකෙන.— න අ
ඤ්ඤතරඤ්ඤතරෙන බුද්ධපටිකුට්ඨෙ
න මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙති
අයං වුච්චති ආචාරො.—

( ස * )

වුත්තං හෙතං, මේ කියනලද වැ.හි.
(ධ්‍යාන විභඞ්ගයෙහි ශ්‍රමණාචාර ශ්‍රම
ණ ගොචර දක්වනු පිණිස "ආචාර

( ශ * )

ගොචර සම්පන්නො" යි කීයා යම්සේ මගකීයනුයේ' 'පාපං ඉව දක්ඛිණං ගණ්හ" යි වචීජනීය මග පළමුකීයා පසුව යාපුතුමග කියාද එසේම "අත්ථි ආචාරො අත්ථි අනාචාරො" යි උදෙස, අනාචාරය පළමුකොට විභාග කරණුවෝ "තත්ථ කතමො අනාචාරො" යනාදී කීහු) "ආචාර ගොචර සම්පන්නො" යනුයෙහි; අත්ථි ආචාරො, ආචාරද ඇති; අත්ථි අනාචාරො, අනාචාරද ඇති; තත්ථ, ඒ දෙක්හි; කතමො අනාචාරො, අනාචාර නම් කවරයත්; කායිකො වීතික්කමො; ත්‍රිවිධ කායදුශ්චරිත නැමැති කායචාරයෙහි ව්‍යතික්‍රමය; වාචසිකො වීතික්කමො, චතුර්විධ වාග්දුශ්චරිත නැමැති වාග්චාරයෙහි ව්‍යතික්‍රමය; කායිකවාචසිකො වීතික්කමො, කායචාර වාග්චාරයෙහි එව ව්‍යතික්‍රමය; අයං, මේතොම, අනාචාරො වුච්චති, අනාචාරයයි කියනුලැබේ (දුන් මෙයාසිකා අනාචාරය දක්වනු පිණිස "සබ්බම්පි දුස්සීල්‍යං අනාචාරො" යි කියා ඉති යවහරක් දක්වනු පිණිස "වෙළුදානෙන වා" යනාදී කීහු) සබ්බම්පි දුස්සීල්‍යං, සියලු දෞශ්ශීල්‍යයම; අනාචාරො, අනාචාර නම්; ඉධ, මෙහි; එකච්චො, එකෙක්; වෙළුදානෙන වා, ප්‍රත්‍යය උපදවනු පිණිස මිතිස්භාව ප්‍රයොජන එළුවන හුණදඬු දීමෙන් හෝ; පත්තදානෙන වා, තල්පත් හල්පත් ආදී පත්දීමෙන් හෝ; පුප්ඵදානෙන වා, සපුමල් නාගකේසර රුමල් ආදී මල්දීමෙන් හෝ; ඵල, පණස ඵලාදිඵල; සිනාන, ඓතරිසුණු ආදිනානසුණු; දන්තකට්ඨදානෙන වා; දැහැටි දඬුදීමෙන් හෝ; චාටුකම්‍යතා, යවා, තමා දෙසැසුමෙන් නිවාසකාමයෙ

හිතබා ප්‍රියකාමතාවෙන් අනුන් හුව බණන නෙපුල් ආදි ලාභ වශතනීන් හෝ; මුග්ගසුප්‍යතාය වා, මුද්ගසූපයක් වැනිවීමෙන් හෝ (යම්සේ මුද්ගසූපය පිසනකල බොහෝමුත් පැසිය යුතු ඇට කීපයක් ම නොපැසේද එසේම සත්‍යාලීකදෙකින් ජීවිකා කරන්නාහු කොටරකි බොහෝ අසත්‍ය වෙයි සත්‍යය මදක්වේ) පාරිභට්‍යතාය වා, අනුන් දරුවන් වඩීමෙන් හෝ; ජඞ්ඝපෙසනිකෙන වා, ගිහින්ට ග්‍රාමනගරදෙශාන්තරාදියෙහි ශාසන ප්‍රතිශාසන හරණ සඞ්ඛ්‍යාත කකුල් පමෙහෙවරකිරීමෙන් හෝ; අඤ්ඤතරඤ්ඤතරෙන බුද්ධපටිකුට්ඨෙන, වෙළුදානාදිය මෙ දගොඒම්භාණ්ඩාගාරිකකර්ම පිණ්ඩ ප්‍රතිපිණ්ඩාදි යම්කිසි බුදුන් විසින් ගරහණලද; මිච්ඡාජීවෙන, මිථ්‍යාජීවයකින්, ජීවිකං කප්පෙති, ජීවිකා කෙරේද; අයං, මේ තොම; අනාචාරො, අනාචාර නම්; තත්ථ, එහි; කතමො ආචාරො, ආචාරනම් කවරයත්; (ආචාර නිර්දෙශයෙහි අයි කීනයට ප්‍රතිපක්ෂනයින් දතයුතු —ගොචර නිර්දෙශයෙහි ද ප්‍රථම කොට ගොචරකථනයෙහි කාරණ යටකී නයින්ම දතයුතු.

( හා * )

මේ උදාහරණලද්දෙහි මැයි ධ්‍යාන විභඞ්ගපාලියෙහි ආචාරගොචරයෙන් සම්පූර්ණවූ තැනැත්තේය යනු මෙහි ආචාරයෙක්ද ඇත අනාචාරයෙක් ද ඇත ඒ දෙදෙනා අතුරෙන් අනාචාර නම් කවරේදයත්? කායචාරයෙන් ශික්ෂාපද ඉක්මවීම වාග්චාරයෙන් ශික්ෂාපද ඉක්මවීම කායචාර වාග් චාර දෙකින් ඉක්මවීමයි කියනලද මිථ්‍යා ආජීවය යන මේ අනාචාරය ද ශීලයාගේ ඉක්මවීම අනාචාරයයි කියනුලැබේ.

සියලුම දුශ්ශීලතාවය මානසික අනාචාරනම් ඒ කවරේදයත්? මේ සස්නෙහි ඇතැම් මහණෙක් ප්‍රත්‍යය උපදනු පිණිස මිනිසුන්ට ප්‍රයෝජනවත්වූ හුණදඬු දීමෙන් හෝ තල්පත් තලපත් ආදී පත්‍රදීමෙන් හෝ සපු කැණිරු දුනුකේ සමන් ආදී මල් දීමෙන් හෝ දෙල් කොස් පොල් පුවක් ආදී ඵල වර්ගය මහපිසුණු ආදී ඇඟ උලා නාන සුණුවර්ගය දැවිටිදඬුය යන මෙතෙක් දෑ දීමෙන් හෝ තමා මෙහෙකරුවෙකු මෙන් නිවසථානයෙහි ද දූතයා උපස්ථානහි ද තබා සිත්ගණු කැමැත්තෙන් කථාකිරීම් ආදී ලාමක පැවැත්මෙන් හෝ මුද්ගසූපය පිසන කල බොහෝ මුං පැසී ඇටකීප යක් නොපැසී හිඳින්නාක් මෙන් සැබෑ බොරු මිශ්‍රකොට කරණ කථාවෙන් හෝ ප්‍රත්‍යය දායකයන්ගේ දරුවන් වැඩීම සුරතල්කිරීම ආදියෙන් හෝ ගිහීන්ගේ පනිවුඩ කැඩපත් ආදිය අනික් ගමකට හෝ අනික් දෙශයකට හෝ ගෙණයාමය එතනින් දෙන පිළි කඩුත් ආදිය මෙහාබෙගෙණ ඊමය යනාදී පාමෙහෙකිරීමෙන් හෝ මේ වෛද්‍ය දූතාදි ගම් කිසිවකින් හෝ වෙදකම් නැකත් ගණිත මිනිත භාණ්ඩාගාරිකකම් පිණ්ඩප්‍රතිපිණ්ඩ කර්මාදී බුදුරජාණන් වහන්සේ විසින් නින්දාකරණලද එක් තරා මිථ්‍යා ආජීවයකින් දිවිපවත්වත් නේවේද මේ දිවි පැවැත්ම අනාචාර නම් වන්නේය.—

එක් ආචාරය නම් කවරේදයත් කයින් ත්‍රිවිධ දුශ්චරිතය නොකිරීමය වචනයෙන් චතුර්විධ දුශ්චරිතය නොකිරීමය කාය වාග්දුශ්චරිතසංඛ්‍යාතවූ මිථ්‍යා ආජීවයෙන් වැළකීමය යන මේ ආජීවාෂ්ටමකශීලය ආචාරයයි කියනුලැබේ. සියලුම ශීලසංවරය මානසික ආචාරනම් මේ සස්නෙහි ඇතැම් මහණෙක් ප්‍රත්‍යය උපදනු පිණිස උක්තප්‍රකාරවූ හුණදඬු ආදියදෙනාද මෙන් හෝ මල් පල නාහනසුණු දැහැටි දඬු ආදිය නොදීමෙන් හෝ චාටුකාම්‍යතා නොකිරීමෙන් හෝ මුද්ගසූප්‍යතා නොකිරීමෙන් හෝ දරුවන් වැඩීම ආදිය නොකිරීමෙන් හෝ පනිවුඩ කැඩපත් ආදිය ඔබ මොබ නොගෙණයාමෙන් හෝ බුදුරජාණන්වහන්සේ විසින් පිළිකුල්කොට හරණලද අන් කිසිවක් හෝ ආජීවය සඳහා නොකොට දිවිපවත්වන්නේ වේදමේ ආචාරයයි කියනුලැබේ.—

---

( පා† )

ගොචරොති අත්ථි ගොචරො අත්ථි අගොචරො තත්ථ කතමො අගොචරො ඉධෙකච්චො වෙසියගොචරො වා හොති විධවථුල්ලකුමාරිකපණ්ඩකභික්ඛුනීපානාගාරගොචරො වා හොති සංසට්ඨො විහරති රාජූහි රාජමහාමත්තෙහි තිත්ථියෙහි තිත්ථියසාවකෙහි අනනුලොමිකෙන සංසග්ගෙන යානි වා පන තානි කුලානි අසද්ධානි අප්පසන්නානි අක්කොසකපරිභාසකානි අනත්ථකාමානි අහිතකාමානි අඵාසුකාමානි අයොගක්ඛෙමකාමානි භික්ඛූනං භික්ඛුනීනං උපාසකානං උපාසිකානං තථාරූපානි කුලානි සෙවති භජති පයිරුපාසති අයං වුච්චති අගොචරො තත්ථ කතමො ගොචරො ඉධෙකච්චො නවෙසියගොචරොහොති —පෙ— න පානාගාර ගොචරො අසංසට්ඨො විහරති රාජූහි —පෙ— තිත්ථියසාවකෙහි අනනු

ලොමිකෙන සංසග්ගෙන යානි වාපන තානි කුලානි සද්ධානි පසන්නානි ඔපානභූතානි කාසාවපජ්ජොතානි ඉසිවාතපටිවාතානි අත්ථකාමානි...පෙ... යොගක්ඛෙමකාමානි භික්ඛූනං...පෙ... උපාසිකානං තථාරූපානි කුලානි සෙවති භජති පයිරුපාසති අයං වුච්චති ගොචරො — ඉති ඉමිනාච ආචාරෙන ඉමිනාච ගොචරෙන උපෙතො හොති සමුපෙතො උපගතො සමුපගතො උපපන්නො සමුපපන්නො සමන්නාගතො තෙන වුච්චති ආචාරගොචර සම්පන්නොති...

( ස † )

("අත්ථි ගොචරො අත්ථි අගොචරො" යනුවෙන් පිණ්ඩපාතාදීන් පිණිස එළඹෙන්නට සුදුසු තැන් ගොචර නම. නුසුදුසු තැන් අගොචර නම්) ඉධ, මෙහි; එකච්චො, එකෙක්; වෙසියාගොචරොපි හොති, වෙශ්‍යාවන් වසනතැන් ගොචරකොට යායුතු තැන් කොට ඇත්තේද (වෙශ්‍යාවෝ ඉතා හි ශ්‍රමණයාට අනාචාරයකාරණ බැවිනුද පරිශුද්ධාශය ඇත්තාහටද නින්දා ගෙනෙන බැවිනුද මිත්‍රසංස්තව විශෙෂනුද නොඑළඹිය යුත්තාහුයි) විධව, වැන්දඹුවන් (මලසැමියන් බැහැරගිය සැමියන් ඇත්තාවුන්ය යන අර්ථයි) ථුල්ලකුමාරි, මහලු අවිවාහිත කුමාරිකාවන් (යොවුන් කුලයාව නොගොස් ගෙහි සිඳ වැඩි මහලු කුමරියන් යන අර්ථයි) පණ්ඩක, නපුංසකයන් (උහු උත්සන්නවූ අවශ්‍යතාන ක්ලේශයන් ඇති බැවින් ලොකාමිශ නිශ්‍රිත කථා බහුලයෝ වූහයි නොඑළඹිය යුත්තාහුයි) භික්ඛුනී, භික්ෂුණීන් (මෙහෙණුන් උත්සන්න බ්‍රහ්මචර්‍ය්‍යා ඇති බැවින් මහණුද එසේම බැවින් සංස්තව මිසින් එළඹියෙන් බ්‍රහ්මචර්‍ය්‍යාන්තරායද වෙනුයි නොඑළඹිය යුත්තේ) පානාගාරගොචරොවා, රාගෙන් ගොචරකොට ඇත්තේවේද (රා සොඬුන් අවිචක්ෂ බැවින් බ්‍රහ්මචර්‍ය්‍යාන්තරාය කාරණ බැවින් රා ගෙයද නොඑළඹිය යුත්තේ) රාජූහි, රජ දරුවන්හාද; රාජමහාමත්තෙහි, රජ ඉසුරු වැනි මහත් ඉසුරෙන් යුක්ත රාජමහාමාත්‍යයන්හාද; තිත්ථියෙහි, තීර්ථකයන්හාද; තිත්ථිය සාවකෙහි, ඔවුන් කෙරෙහි දැඩි භක්ති ඇති ප්‍රත්‍යය දායකවූ ශ්‍රාවකයන්හාද; අනනුලොමිකෙන සංසග්ගෙන සංසට්ඨො, ත්‍රිවිධ ශික්ෂාවන්ට ප්‍රතිපක්ෂවූ සංසර්ගීයෙන් හැසී; විහරති, වෙසේද; යානි වාපන තානිකුලානි, යම් ඒ කුල කෙණෙක්; අසද්ධානි, බුද්ධාදීන් කෙරෙහි හැදහිලි නැති; අප්පසන්නානි, එහෙයින්ම අප්‍රසන්නවූ (නොහොත් කර්මඵල ශ්‍රද්ධා නැතහොත් අශ්‍රාද්ධවූ රත්නත්‍රයට ප්‍රසාද නැති බැවින් අප්‍රසන්නවූ යන අර්ථයි) අක්කොසකපරිභාසකානි, දශ ආක්‍රොශ වස්තූන්ගෙන් ආක්‍රොශ හා භය දක්වීමෙන් සන්තර්ජනය කෙරෙද්ද; අනත්ථකාමානි, අනර්ථම කැමතිවෙද්ද; අහිතකාමානි, අහිතම කැමතිවෙද්ද; අඵාසු කාමානි, නොපහසුව කැමතිවෙද්ද; අයොගක්ඛෙමකාමානි, භය කැමතිවෙද්ද; භික්ඛූනං, භික්ෂූන්ට (සාමණේරයන්ද ඇතුළුව ගැණෙන්) භික්ඛුනීනං, භික්ෂුණීන්ට (සික්ඛමාණ සාමණේරීනුද මෙහි ඇතුළත්) උපාසකානං, උපාසකයන්ටද; උපාසිකානං, උපාසිකාවන්ටද ("ඵාසුකාමානි" යනාදීන් හා සම්බන්ධකාරණු) තථාරූපානිකුලානි, එබඳු කුලයන්; සෙවති, සෙවීද (නිසා ජීවත්වේද යන අර්ථයි) භජති, උන්හට ළංවේද; පයිරුපාසති, නැවත නැවත යේද; අයං, මේ වෙශ්‍යාදි ගොචර...

ඩ කුලාදි ත්‍රිප්‍රකාරය; අගොචරො වුච්චති, අගොචරයයි කියනු ලැබේ (මිති පසදවතාම ගුණනිශ්‍රය බැවින් ශ්‍රමණ ධර්මයට අනුපනිශ්‍රය බැවින් වෙශ්‍යාදීද ලාභ සත්කාර සංඛ්‍යාත නැමැති අසනිපාතයට හේතුවන බැවින් රජ දරුවන් හා මහාමාත්‍යයෝද දෘෂ්ටි විපත්තියට හේතුවන බැවින් තීර්ථක ශ්‍රාවකයෝද ශ්‍රද්ධා හානිය විනාශ භේදය යන මොවුන් එළවන හෙයින් අශ්‍රාද්ධාදි කුලයෝද අගොචර නම්වෙති [ගොචර නිර්දේශයෙහි "න වෙසිය ගොචරො" යනාදීන්ගේ අර්ථ අගොචර නිර්දේශයෙහි කී නියායෙන් දතයුතුවේ) ඔපාන භූතානි, භික්ෂු භික්ෂුණී සඞ්ඝයා හට සතර මංසන්ධියෙහි . ලින් උදපානයක් වැනි වෙද්ද; කාසාව පජ්ජොතානි, භික්ෂු භික්ෂුණීන් හන් පෙරවි සිවුරෙහි ප්‍රභාවයෙන් එකාලෝක වෙද්ද; ඉසිවාත පටිවාතානි, ගෙට වද්නා නික්මෙන භික්ෂුභික්ෂුණීන් සංඝාටි සාමීන්ගේ චීවර වාතයෙනුද සම්මිඤ්ජන පසාරණයෙන් ජනිත ශරීර වාතයෙනුදු පරිවෘතවූ (ශබ්ද ලද නොහොත් නිර්ධූත කිල්විෂ ඇති හෝ ~ පෙ ~ ) ඉති, මෙසේ; ඉමිනාච ආචාරෙන, මේ ආචාරයෙන්ද; ඉමිනාච ගොචරෙන, මේ ගොචරයෙන්ද; උපෙතො හොති, යුක්තවේද ("උපෙතො" යනාදී "සම්පන්නො" යන්නට පර්යායයි)~

---

(හා †)

ගොචර නිර්දේශයෙහි පිණ්ඩපාතාදිය පිණිස එළඹියයුතු ගොචරස්ථානයන්ද ඇත නොඑළඹියයුතු අගොචරස්ථානයන්ද ඇත එහි පිණ්ඩපාතාදිය පිණිස නොඑළඹියයුතු අගොචරස්ථානයෝ නම් කවරේදයත්? මෙසස්ගෙහි ඇත්මී මහණෙක් වෙශ්‍යා ස්ත්‍රීන් වසන තැන් යායුතු ගොචරස්ථානකොට ඇත්තේද විලසැමියන් බැහැරගිය සැමියන් ඇතැයින් වසන තැන් ගොචරස්ථානකොට ඇත්තේද සැමි කුලයකට නොගොස් ගෙහිඳ වැඩිමැහැලිවූ කුමාරිකාවන් වසන තැන් ගොචරස්ථානකොට ඇත්තේවේද නපුංස න්හුන් කෙලෙස් ඇත්තාවූ පණ්ඩක නපුංසකයන් වසන තැන්ද උත්සන්නවූ බඹසරවස් ඇති හෙයින් බඹසරවස අනාචාරය වියතැකිවූ මෙහෙණින් වසන තැන්ද බුහුමවාස්ථාවට අනාචාරය කාරණවූ රාමසාඩුන් වසන සුරා සැල් ගොචරස්ථානකොට ඇත්තේ හෝ වේද රජුන් හා සමගද රජ කුමරු වැනි මහ කුසුරුමන් රාජමහාමාත්‍යයන් හා සමගද තීර්ථකයන් හා සමගද ඔවුන් කෙරෙහි දැඩි භක්ති ඇති ප්‍රත්‍යය දායකවූ ශ්‍රාවකයන් හා සමගද ත්‍රිවිධ ශික්ෂාවන්ට විරුද්ධවූ නුසුදුසු සංසර්ගයෙන් මිශ්‍රව වාසය කෙරේද තුණුරුවන් කෙරෙහි ඇදහිලි නැති බැවින් නොපහන්වූ දශ ආක්‍රොශ වස්තූන් ආක්‍රොශකිරීම හා පස්සැහැදීමියන්ට භය දක්වීමෙන් තර්ජනය කරන්නාවූ ඔවුන්ට අනර්ථයක්ම අවැඩක්ම අපහසුවක්ම භාගක්ම කැමැත්තාවූ යම් කුලයෙක් ඇත්තේවේද එබඳු කුලයන් නියා දිවිපැවැත්ම කෙරේද එබඳු කුලයන් කරා එළඹේද නැවත නැවත එළඹේද මේ වෙශ්‍යාස්ත්‍රීන් ආදීවූ රාජාදිවූ අශ්‍රාද්ධවූ කුලාදිවූ යම් තුන්වැදෑරුම් අය වසනතැන් අගමනීය ස්ථානවූ අගොචරයයි කියනු ලැබේ ඒ ත්‍රිවිධස්ථාන අගොචරනම් වන්නේ කුමක්හෙයිනයත්? වෙශ්‍යාදීන් පස්කාම ගුණයම ඇසුරුකරණ බැ

චින්ද ශ්‍රමණ ධර්මයට කාරණා නොවන බැවින්ද අගොචරස්ථාන නම් රාජ රාජ මහාමාත්‍යයන් ලඟ හසන්නාර කීර්ති ප්‍රශංසා නැමැති අසත්කාරයට හේතුවන බැවින් අගොචරස්ථාන නම සංඝයාගේ දෘෂ්ටි විපරීතයට කාරණා බැවින් තීර්ථකාදීහුද අගොචරස්ථාන නම් ශ්‍රද්ධා හානියද චිත්ත භේදයද වීමට කාරණා බැවින් අශ්‍රද්ධාවන් කුලද අගොචරස්ථාන නම් වන්නේයි ගොචර නිර්දේශයෙහි ගොචරස්ථාන නම් කවරයත්? මේ සස්නෙහි ඇතැම් මහණෙක් වේශ්‍යා ස්ත්‍රීන් වසන තැන් ගොචරස්ථාන නොකොට ඇත්තේවේද වැන්දඹුවන් වසන තැන්ද මැහැලි කුමාරිකාවන් වසන තැන්ද පණ්ඩකාදීන් වසන තැන්ද භික්ෂුණීන් වසන තැන්ද රා සොඬුන් වසන තැන්ද ගොචරස්ථාන නොකොට ඇත්තේවේද රාජරාජ මහාමාත්‍ය තීර්ථක තීර්ථක ශ්‍රාවකයන් හා ප්‍රසුද්සු සංසර්ගයෙන් නොහැනී වෙසේද යම් ඒ කුලයෙක් තුණුරුවන් කෙරෙහි ඇදහිලි ඇත්තේද පහන් සිත් ඇත්තේද භික්ෂු භික්ෂුණීන් සඳහා හම සතර මංසන්ධියෙහි කැණූ තොහ පැන් පොකුණක් වැනි වේද භික්ෂු භික්ෂුණීන්ගේ ගත් පෙරවි විහාරා ලොකයෙන් එකාලොක වීද නෙව වදනාවූද නික්මෙන්නාවූද භික්ෂු භික්ෂුණී සංඛ්‍යාත සංඝයාන්ගේ චීවර වාතයෙන් හා අත්පා දිගුකිරීම් ආදියෙන් හට ගත්තාවූ පවනින්ද හමනාලද නොමනාන් ගසා හරණලද පව ඇත්තේද භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකාදීන්ට අත්‍යන්තම සැප පහසු වන්නේම නිර්භයත්ම හැමැත්තේද එබඳු කුලයන් සෙවනා ගජනා පතිරූපාසනාය කෙරේද මේ පිණ්ඩපාතාදිය පිණිස එළඹියයුතු ගොචරස්ථානයයි කියා දැක්වී යෙසේ මේ ආචාරයෙන්ද මේ ගොචරයෙන්ද යම් මහණෙක් යුක්තවූයේද මනාකොට යුක්තවූයේද (මේ ආචාර ගොචරයට) එළඹියේවීද මනාකොට එළඹියේ වේද (මේ ආචාර ගොචරය) ඉපදවූයේද මනාකොටම ඉපදවූයේ වේද (මේ ආචාර ගොචරයෙන්) සමන්විතවූයේද එසේ හෙයින් ආචාරගොචරයෙන් සම්පූර්ණවූ (මහණසයි) කියා දැක්වී—

( ‡ )

අපිචෙත්ථ භූමිනාපි නයෙන ආචාර ගොචරා වෙදිතබ්බා— ඉධෙකච්චො අනාචාරො කායිකො වාචසිකො ච තත්ථ කතමො කායිකො අනාචාරො ඉධෙකච්චො සඞ්ඝගතොපි අචිත්තීකාරකතො ථෙරෙ භික්ඛූ ඝට්ටයන්තොපි තිට්ඨති ඝට්ටයන්තොපි නිසීදති පුරතොපි තිට්ඨති පුරතොපි නිසීදති උච්චෙපි ආසනෙ නිසීදති සසීසම්පි පාරුපිත්වා නිසීදති ඨිතකොපි භණති බාහාවික්ඛෙපකොපි භණති ථෙරානං භික්ඛූනං අනුපාහනානං චඞ්කමන්තානං සඋපාහනො චඞ්කමති නීචෙ චඞ්කමෙ චඞ්කමන්තානං උච්චෙ චඞ්කමෙ චඞ්කමති ඡමාය චඞ්කමන්තානං චඞ්කමෙ චඞ්කමති ථෙරෙ භික්ඛූ අනුපඛජ්ජාපි තිට්ඨති අනුපඛජ්ජාපි නිසීදති නවෙපි භික්ඛූ ආසනෙන පටිබාහති ජන්තාඝරෙපි ථෙරෙ භික්ඛූ අනාපුච්ඡා කට්ඨං පක්ඛිපති ද්වාරං පිදහති උදකතිත්ථෙපි ථෙරෙ භික්ඛූ ඝට්ටයන්තොපි ඔතරති පුරතොපි ඔතරති ඝට්ටයන්තොපි නහායති පුරතොපි නහායති ඝට්ටයන්තොපි උත්තරති පුරතොපි උත්තරති අන්තරඝරං පවිසන්තොපි ථෙරෙ භික්ඛූ ඝට්ටයන්තොපි ගච්ඡති පුරතොපි ගච්ඡති වොක්කම්ම ච

ථෙරානං භික්ඛූනං පුරතො ගච්ඡති යානිපි තානි හොන්ති කුලානං ඔවරකානි ගූළ්හානිච පටිච්ඡන්නානිච යත්ථ කුලිත්ථියො කුලකුමාරියො නිසීදන්ති තත්ථ සහසා පවිසති කුමාරකස්සපි සීසං පරාමසති අයං වුච්චති කායිකො අනාචාරො.

( ස ‡ )

[දුන් නිදෙස් තැබූ ආචාර ගෝචරයන් දක්වන පිණිස ''අපිචෙත්ථ'' යනාදිය ආරම්භකළේ) එහි, මේ ප්‍රාතිමොක්ෂ සංවර ශීලනිර්දේශයෙහි; ඉධ කා තෙයන, මේ ශාසනයෙහි; ආචාර ගෝචරා වෙදිතබ්බා, ආචාර ගෝචරයෝ දතයුත්තාහුයි; ද්වෙධා'ති අනාචාරො, අනාචාරය ද්විප්‍රකාරවේ; කායිකො වාචසිකොච, කායික අනාචාරය වාචසික අනාචාරයයි; තත්, ඒ දෙකහි; කතමො කායිකො අනාචාරො, කවරෙක් කායික අනාචාරවේද; එකච්චො, එකෙක්; සඞ්ඝගතො'පි, සංඝ සන්නිපාතයට පැමිණියේද; අචිත්තීකාරකතො, ගෞරවරහිතව ඇත්තේ; ථෙරෙ භික්ඛූ ඝට්ටයන්තො, ස්ථවිර භික්ෂූන් සිවුරෙන් හෝ ශරීරයෙන් හෝ ගටන්නේ; තිට්ඨති, සිටිනේද; නිසීදති, හිඳිනේද (''පුරතොපි තිට්ඨති අචිත්තීකාරකතො''යි සම්බන්ධයි මතුයෙහි සිටිනාක්හු මෙන් සිටීද) උච්චෙ ආසනෙපි, උස් අස්නෙහි හිඳී; සසීසං පාරුපිත්වා නිසීදති, හිස් වසා පොරවා හිඳීද; ඨිතකො'පි භණති, ආසනය නැත සිට බෙණේද; බාහාවික්ඛෙපකොපි, අත වනවනා; ථෙරානං භික්ඛූනං, ස්ථවිර භික්ෂූන්; අනුපාහනානං චඞ්කමන්තානං, වහන් නැතිව සක්මන් කරද්දී; සඋපාහනො චඞ්කමති, වහන් නැඟී සක්මන් කෙරේද; නීචෙ චඞ්කමෙ චඞ්කමන්තානං, මිටි සක්මනෙහි සක්මන් කරද්දී; උච්චෙ චඞ්කමෙ චඞ්කමති, උස් සක්මනෙහි සක්මන් කෙරේද; ඡමාය චඞ්කමන්තානං, බිම සක්මන් කරද්දී; චඞ්කමෙ චඞ්කමති, සක්මනෙහි සක්මන් කෙරේද; ථෙරෙ භික්ඛූ අනුපඛජ්ජාපි, ස්ථවිර භික්ෂූන් සිටිනා තැනට වැද ආසනාව සිටීද; නවෙ භික්ඛූ, නවක බාල භික්ෂූන්; ආසනෙන පටිබාහති, අස්නෙන් පිළිබහාද; ජන්තාඝරෙපි, ගිනිහල් ගෙහිද; ථෙරෙ භික්ඛූ අනාපුච්ඡා, ස්ථවිර භික්ෂූන් නොපිළිවිස; කට්ඨං පක්ඛිපති, අග්නි කුණ්ඩයෙහි දර බහාලාද; ද්වාරම්පිදහති, ගිනිහල් ගෙහි දොර පියාද; උදකතිත්ථෙපි, පැන්තොටද; ථෙරෙ භික්ඛූ, ස්ථවිර භික්ෂූන්; ඝට්ටයන්තොපි, ගටන්නේ; ඔතරති, බසීද; නහායති, නාහාද; පුරතො, පෙරව; උත්තරති, නැඟේද; අන්තරඝරං පවිසන්තො'පි, ගෝචර ග්‍රාමයට වදනේද (''අන්තරඝරෙ පවිසන්ති එත්ථ එතස්සාතිවා අන්තරඝරං ගෝචර ගාමො'යි ගත්තේ) පුරතො ගච්ඡති, ස්ථවිර භික්ෂූන් ඉක්ම පළමුව යේද; කුලානං, කුලවැසියන්ගේ; යානි පිතානි ඔවරකානි හොන්ති, යම් ඒ ගර්භ සංඛ්‍යාත අවරක ගෙණක් වේද; ගූළ්හානි, පියවින්ම මුවහවූ, පටිච්ඡන්නානි, කඩතුරා ආදියෙන් මුවහවූ; යත්ථ, යම් ගෙයක; කුලිත්ථියො, කුල ස්ත්‍රීහු; කුලකුමාරියො, කුලකුමාරිකාවෝ; නිසීදන්ති, හිඳිද්ද; තත්ථාපි, එහිද; සහසාපවිසති, වහා වදනේද; කුමාරකස්ස'පි සීසං පරාමසති, කුමරුන් හිස පිරිමදීද.

( හා ‡ )

නැවතද මේ ප්‍රාතිමෝක්ෂ සංවර ශීල නිර්දේශයෙහි මේ ක්‍රමයෙනුදු ආචාර ගෝචරයෝ දතයුත්තාහුයි,

ඒ කෙසේදයත් ? අනාචාරය කායික වාචසිකයයි දෙයාකාර වන්නේය. ඒ දෙයාකාරයන් අතුරෙන් කායික අනාචාරය නම් කවරයත් ? මේ සස්නෙහි ඇතැම් මහණෙක් සඞ්ඝ මධ්‍යගතව ඇතුළු ගෞරව නොකරන්නේවේද ස්ථවිර භික්ෂූන් සිවුරෙන් හෝ ශරීරයෙන් හෝ ඝට්ටනය කරමින් සිටිනේ හෝ වේද හිඳිනේ හෝ වේද ස්ථවිර භික්ෂූන්ට පෙරටුව අගෞරව වශයෙන් සිටිනේ හෝ වේද හිඳිනේ හෝ වේද උස් අසුන්හි හිඳිනේ හෝ වේද හිස් වසා පොරවා හිඳිනේ හෝ වේද ලඟ සිට කථා කෙරේද අත් වනවනා කථා කෙරේද ස්ථවිර භික්ෂූනු වහන් නැතුව සක්මන් කරණකල තෙමේ වහන් නැගී සක්මන් කෙරේද ස්ථවිර භික්ෂූන් මිටි සක්මන සක්මන් කරණ කල තෙමේ උස් සක්මන සක්මන් කෙරේද ස්ථවිර භික්ෂූනු බිම සක්මන් කරණකල තෙමේ සක්මන්මලුවෙහි සක්මන් කෙරේද ස්ථවිර භික්ෂූනු සිටි තැනට වැද ලංව සිටීද තමහට බාල භික්ෂූන් හුනස්නෙන් නැගුටුවාද ගිනිහල්ගෙහි ස්ථවිර භික්ෂූන් නොවිචාරා ලිපදර බහා ළන්නේවේද ගිනිහල්ගෙහි දොර වසාද නාහනා තොටෙහි ස්ථවිර භික්ෂූන් ඝට්ටනය කරමින් හෝ බසීද ඉදිරියෙහි හෝ බසීද ඝට්ටනය කරමින් නාහාද ඉදිරියෙන් නාහාද ඝට්ටනය කරමින් නැගීද ඉදිරියෙහි නැගීද ඇතුළු ගමට වදනාකල ස්ථවිර භික්ෂූන් ඝට්ටනය කරමින් හෝ යේද ස්ථවිර භික්ෂූන් ඉක්මවා පළමුකොට හෝ යේද ස්ථවිර භික්ෂූන්ට පෙරටුවයේද කුලවැසියන්ගෙ යම් සඟවාවෙයත් මුවහවු කඩතුරාදියෙන් වසනලද ඇතුල් ගබඩා ඇත්තේද යම් තැනක කුලස්ත්‍රීහුද කුලකුමාරිකාවෝද පළඟන්ව හිඳිද්ද එබඳු තැනට වහා ඇතුල්වන්නේවේද ප්‍රත්‍යය දායකයන්ගේ කුමරුන් හිස පිරිමදීද මේ කායික අනාචාරයයි කියනුලැබේ —

( පා ¶ )

තත්ථ කතමො වාචසිකො අනාචාරො ඉධෙකච්චො අචිත්තීකාරකතො ථෙර භික්ඛූ අනාපුච්ඡා ධම්මං භණති පඤ්හං විස්සජ්ජෙති පාතිමොක්ඛං උද්දිසති ඨිතකොපි භණති බාහාවික්ඛෙපකොපි භණති අන්තරඝරං පවිට්ඨො පි ඉත්ථිං වා කුමාරිං වා එවමාහ ඉත්ථන්නාමෙ ඉත්ථංගොත්තෙ කිං අත්ථි යාගු අත්ථි භත්තං අත්ථි ඛාදනීයං අත්ථි කිං පිවිස්සාම කිං ඛාදිස්සාම කිං භුඤ්ජිස්සාම කිං මෙ දස්සථාති විප්පලපති අයං වුච්චති වාචසිකො අනාචාරො. පටිපක්ඛවසෙන පනස්ස ආචාරො වෙදිතබ්බො — අපිච භික්ඛු සගාරවො සප්පතිස්සො හිරොත්තප්පසම්පන්නො සුනිවත්ථො සුපාරුතො පාසාදිකෙන අභික්කන්තෙන පටික්කන්තෙන ආලොකිතෙන විලොකිතෙන සමිඤ්ජිතෙන පසාරිතෙන ඔක්ඛිත්තචක්ඛු ඉරියාපථසම්පන්නො ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො භොජනෙ මත්තඤ්ඤූ ජාගරියානුයුත්තො සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො අප්පිච්ඡො සන්තුට්ඨො ආරද්ධවිරියො ආභිසමාචාරිකෙසු සක්කච්චකාරී ගරුචිත්තීකාර බහුලො විහරති අයං වුච්චති ආචාරො එවං තාව ආචාරො වෙදිතබ්බො —

( ශ ¶ )

ථෙර භික්ඛූ අනාපුච්ඡා, ස්ථවිර භික්ෂූන් නොවිචාරා; ධම්මං භණති, බණ කියාද; පඤ්හං විස්සජ්ජෙති, පැණ විසඳද; පාතිමොක්ඛං උද්දිසති, පාමොක්

වෙදයාද; ඨිතකොපි භණති, අප්පතා සිටි වනම සිට බෙණේද; බාහාවික්ඛෙපකො පි භණති, අත් වනා වනා බෙණේද; අන්තරඝරං පවිට්ඨො, ඇතුල් ගමට වත්නේද; ඉත්ථිං වා, ස්ත්‍රියකට වත්, කුමාරිකං වා, කුමාරියකට වත්; ඒවමාහ, මෙසේ කියාද; ඉත්ථන්නාමෙ, මෙනම් නෑනා තිය; ඉත්ථංගොත්තෙ, මෙනම් ගොත්‍ර ඇතිනිය; කිං අත්ථි, කුමක් ඇද්ද; යාගු අත්ථි, කැඳ ඇද්ද; භත්තං අත්ථි, බත් ඇද්ද; ඛාදනීයං අත්ථි, කැවුම ඇද්ද; කිං පිවිස්සාම, කුමක් බොමෝද; කිං ඛාදිස්සාම, කුමක් කමෝද; කිං භුඤ්ජිස්සාම, කුමක් වළඳමෝද; කිං වා මෙ දස්සථාති, කුමක් මට දේදැයි; විප්පලපති, දොඩාද; අයං, මේ මහණේ; වාචසිකො අනාචාරො වුච්චති, වාචසික අනාචාරයයි කියනුලැබේ; අස්ස, මේ අනාචාරයට; පටිපක්ඛවසෙන, ප්‍රතිපක්ෂ වීසින්; ආචාරො වෙදිතබ්බො, ආචාරය දතයුතු ("අපිච භික්ඛු" යනාදි තන්තිම භික්ෂු ගරු ආචාරදශීත වශයෙන් ප්‍රවෘත්ත අර්ථකථා වචනය නිර්දෙශ පාලි නොවේයි දතයුතු) අපිච, අතිකොකුදු; භික්ඛු, මහණ තෙමේ; සගාරවො, ශ්‍රද්ධාශ්‍රැත ත්‍යාගාදි ගුණ වහතුකොට ඇති ගෞරවයෙන් යුක්තවූයේ; සප්පතිස්සො, ගරුස්ථාන කෙරෙහි ගෞරව සාරද්‍රාදි වශයෙන් ප්‍රතිශ්‍රව සහිතවූයේ (නීචවෘත්ති ඇත්තේය යන අර්ථයි.) හිරොත්තප්පසම්පන්නො, හිරිඔතප් දෙකින් යුක්තවූයේ; සුනිවත්ථො, සෙඛිය ධර්මය පාරිපූරි වශයෙන් මනාකොට හැඳ; සුපාරුතො, මනාකොට පෙරවියේ; පාසාදිකෙන, ප්‍රසාදජනකවූ; අභික්කන්තෙන, ගමන් ඇතියේ (ඉත්ථම්භූත ලක්ෂණයෙහි කාරණ වචනයි. සෙසු පෙදෙහිදු මෙම නයයි) පටික්කන්තෙන, පෙරළා ඊම ඇතියේ, ආලොකිතෙන, ඉදිරියෙහි බැලුම් ඇතියේ; විලොකිතෙන, අනු දිග බැලුම් ඇතියේ; සම්මිඤ්ජිතෙන, හස්තපාදයන්ගේ හැකිළුම ඇතියේ; පසාරිතෙන, දික්කිරීම ඇතියේ; ඔක්ඛිත්තචක්ඛු. යුගමාත්‍ර දර්ශී බැවින් යට හෙළූ ඇස් ඇතියේ; ඉරියාපථසම්පන්නො ප්‍රසාදකර ඉරියව් ඇතිබැවින්ම සම්පන්න ඊර්යාපථ ඇතියේ; ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො, ෂඩින්ද්‍රියයන් කෙරෙහි සුසංවෘතවූ ආරක්ෂා ඇතියේ; භොජනෙ මත්තඤ්ඤූ, පරිභුඤ්ජිතව්‍ය බැවින් භොජන සංඛ්‍යාත චතුර්විධ ප්‍රත්‍යයෙහි පර්යේෂණ ප්‍රතිග්‍රහණ පරිභොගාදී විසින් සම්භාරයෙන් ප්‍රමාණ දන්නේ; ජාගරියානුයුත්තො, භාවනා මනස්කාර සඞ්ඛ්‍යාත ජාගරියෙහි යුක්ත ප්‍රයුක්තවූයේ ("සතිසම්පජඤ්ඤෙන" යනාදි යථොක්ත ආචාරයට සඞ්හාරදක්වනු පිණිස කීහු) සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො, සිහිනුවණ දෙකින් යුක්තවූ; අප්පිච්ඡො, ඉච්ඡා නැතියේ; සන්තුට්ඨො, යථාලාභාදි සන්තොෂයෙන් සන්තුෂ්ටවූයේ; ආරද්ධවීරියො, වැඩූවීර්‍ය්‍ය ඇත්තේ; ආභිසමාචාරිකෙසු, ආභිසමාචාරික ශීලයෙහි; සක්කච්චකාරී, සත්කාරය කාරීවූයේ (ආදර කරන්නේයි යන අර්ථයි) ගරුචිත්තීකාර බහුලො විහරති, ගරුස්ථානයෙහි ආදර බහුලවූයේ වෙසේද; අයං වුච්චති ආචාරො, මේ සගාරවාදිතෙමේ ආත්මභාවයෙන් සිත් ආචරිතව්‍ය බැවින් ආචාරයයි කියනුලැබේ ~

---

( ගා ¶ )

වාචසික අනාචාරය නම් කවරයත්? මේ සස්නෙහි ඇතැම් මහණෙක්

( ගා ¶ )

අනගෞරවකොට ස්ථවිරභික්ෂූන් නො විචාරා දහම්දෙසාද පැණ විසඳද පාමොක් දෙසාද ස්ථවිර භික්ෂූන් සමීපයෙහි නොපැමිණිව කය කෙරේද අත් වනවනා කථාකෙරේද ඇතුල් ගමට වැද ස්ත්‍රීයකුට හෝ කුමරියකුට හෝ මෙසේ කියාද අසවල් නම්ඇති තැනැත්තිය? අසවල් ගෝත්‍රඇති තැනැත්තිය? කුමක් ඇත්තෙහිද? කැඳ ඇද්ද? බත් ඇද්ද? කැවුම් ඇද්ද? කුමක්බොමුද? කුමක් කමුද? කුමක් වළඳමුද? මට කුමක් දෙන්නෙහිද්ද? මෙසේ දොඩාද මේ තම වාචසික අනාචාරයයි කියනු ලැබේ.

මේ අනාචාරයට ප්‍රතිපක්ෂවශයෙන් වනාහි ආචාරය දක්වනුයි අනික් කාරණයකු දු ඇත ඒ කවරයත්? මේ සස්නෙහි යම් ශ්‍රමණයෙක් තෙමේ ශ්‍රද්ධාශ්‍රුතත්‍යාගාදී ගුණධර්මයන්මහතු කොටඇති ගෞරවයෙන් යුක්තවූයේ ද යටහත් පැවතුම් ඇත්තේවේද හිරිඔතප් දෙකින් යුක්තවූයේ ද සෙඛියාධර්මයෙහි ආ නියායෙන් මනාකොට හැද මනාකොට පෙරවූයේවේද ප්‍රසාදවහවූ යාම් ඊම් ඇත්තේද ප්‍රසාදවහවූ ඉදිරිබැළුම් හා අනුදිසාබැළුම් ඇත්තේද ප්‍රසාදවහවූ හස්තපාදයන්ගේ හැකිලීම් හා දිගුකිරීම් ඇත්තේවේද වියදඬුපමණ දක්නාබැවින් යට හෙලූ ඇස් ඇත්තේවේද ප්‍රසාදවහවූ ඊර්යාපථයෙන් යුක්තවූයේවේද චක්ෂුරාදි ෂඩෙන්ද්‍රියයන්කෙරෙහි දොරවට කරණලද රක්ෂාවරණ ඇත්තේවේද චීවරාදි සිව්පසයෙහි පැවිදි පලිගැණීම් පරිභෝගකිරීම් ආදි වශයෙන් සම්භාරයෙන් පමණ දත්තේවේද නිද්‍රාවර්ජන කිරීමෙන් භාවනාවෙහි යෙදුනේවේද සිහිනුවණ දෙකින් යුක්තවූයේවේද ප්‍රත්‍යය

( භා ¶ )

ත්‍යමණාව ඇත්තේවේද ශීලාභසන්තොෂාදි චතුදශාකාරයෙන් සතුටුවූයේ වේද පටන්ගන්නා ලද කෙලෙස් නසනා වීර්‍ය්‍ය ඇත්තේ වේද ශව කියනලද ආභිසමාචාරිකසීලයෙහි ආදරකරන්නේවේද ගරුස්ථානයෙහි ආදර බහුලකොට වෙසේද මේ තෙමේ ආචාරයයි කියනුලැබේ. මෙසේ ආචාරය පළමුකොට දක්වනුයි—

( පා * )

ගොචරො පන තිවිධො උපනිස්සයගොචරො ආරක්ඛගොචරො උපනිබන්ධ ගොචරොති—

කතමො උපනිස්සයගොචරො දසකථාවත්ථු ගුණ සමන්නාගතො කල්‍යාණමිත්තො යං නිස්සාය අස්සුතං සුණාති සුතං පරියොදපෙති කඞ්ඛං විතරති දිට්ඨිං උජුංකරොති චිත්තං පසාදෙති යස්ස වා පන අනුසික්ඛමානො සද්ධාය වඩ්ඪති සීලෙන සුතෙන චාගෙන පඤ්ඤාය වඩ්ඪති අයං උපනිස්සයගොචරො— කතමො ආරක්ඛගොචරො ඉධ භික්ඛු අන්තරඝරං පවිට්ඨො වීථිං පටිපන්නො ඔක්ඛිත්තචක්ඛු යුගමත්තදස්සාවී සංවුතො ගච්ඡති න හත්ථිං ඔලොකෙන්තො න අස්සං න රථං න පත්තිං න ඉත්ථිං න පුරිසං ඔලොකෙන්තො න උද්ධං ඔලොකෙන්තො න අධො ඔලොකෙන්තො න දිසාවිදිසං පෙක්ඛමානො ගච්ඡති අයං ආරක්ඛගොචරො— කතමො උපනිබන්ධගොචරො චත්තාරො සතිපට්ඨානා යත්ථ චිත්තං උපනිබන්ධති වුත්තං හෙතං භගවතා කො ච භික්ඛවෙ භික්ඛුනො ගොචරො සකො පෙත්තිකො විසයො යදිදං චත්තාරො සතිපට්ඨානාති අයං උපනිබන්ධගොචරො— ඉති ඉමිනා ච

( පා * )

ආචාරෙන ඉමිනා ච ගොචරෙන උපෙතො සමන්නාගතො තෙන වුච්චති ආචාරගොචරසම්පන්නොති.

( ස * )

ගොචරො පන, ගොචරය වනාහි; තිවිධො, ත්‍රිවිධවේ; උපනිස්සයගොචරො, ශීලාදිගුණයන්ට උපනිශ්‍රයවූ ගොචරය; ආරක්ඛගොචරො, සමාධි සඞ්ඛ්‍යාතවූ සිත ආරක්‍ෂාකරණවූ ගොචරය; උපනිබන්ධ ගොචරො, කර්මස්ථාන සඞ්ඛ්‍යාතවූ සිත්හු උපනිබන්ධස්ථානවූ ගොචරය; කතමො උපනිස්සය ගොචරො, උපනිශ්‍රයගොචරනම් කවරේද? දසකථාවත්ථුගුණ සමන්නාගතො, අල්පේච්ඡකථාදිවූ දශකථාවස්තු ප්‍රතිසංයුක්තවූ ගුණයෙන් සමන්විතවූ; කල්‍යාණමිත්තො, කල්‍යාණමිත්‍රයා; යං නිස්සාය, යම් කල්‍යාණමිත්‍රයකු නිසා; අස්සුතං සුණාති; අශ්‍රුතයෙයාදී අසාද; සුතං, අසා ලද්ද; පරියොදපෙති, නැවත නැවත පරිපෘච්ඡාවෙන් විශුද්ධ කෙරේද; කඞ්ඛං විතරති, ශ්‍රුතස්ථානයෙහි සංශය දුරුකෙරේද; දිට්ඨිං උජුංකරොති, කර්මඵලයෙහිදු රත්නත්‍රයෙහිදු සම්‍යග්දෘෂ්ටිය ඍජුකෙරණවසයෙන් දෘෂ්ටිය ඍජුකෙරේද; චිත්තං පසාදෙති, එම කර්මඵලයෙහිදු රත්නත්‍රයෙහිදු ශ්‍රද්ධාවෙන් සිත පහදවාද; (මහණෝයම ශ්‍රුත ධර්මයන් පරිශුද්ධකොට එහි ආ රූපාරූපධර්මයන් පරිග්‍රහ කොට සප්‍රත්‍යය නාම රූපයන් බලනුයේ සබ්බය යන දෘෂ්ටිසංඛ්‍යාත චඤ්චලව්‍යවස්ථිතයෙන් දෘෂ්ටිය ඍජු කෙරේද ධර්මයන්ගේ ප්‍රත්‍යය ප්‍රත්‍යය සමුත්පන්නතාදිමාත්‍රදර්ශනයෙන් අධ්ව ත්‍රයෙහිම ශඞ්කා දුරුකෙරේද-එහින් මතුයෙහි උදයව්‍යයඥනාදී විපශ්‍යනාවඩා ආයසීනුම් ප්‍රාප්තව අවෙත්‍ය ප්‍රසාදයෙන් රත්නත්‍රයෙහි පහද

( ස * )

වා, සම්බඳවූයේ ඒ කල්‍යාණමිත්‍රයා අනුව සික්ඛන්නෙන් ශ්‍රද්ධාදිගුණයෙන් නොපිරිහෙයි එකාන්තයෙන් වැඩිම වෙයි-එහෙයින් කීහ "යස්සවා" යනාදී) යස්ස වා අනුසික්ඛමානො, යමෙක්හු අනුව හික්මෙන්නේ, සද්ධාය වඩ්ඪති, ශ්‍රද්ධාවෙන් වඩීද; සීලෙන, ශීලයෙන්; සුතෙන, ශ්‍රුතයෙන්; චාගෙන, ත්‍යාගයෙන්; පඤ්ඤාය, ප්‍රඥාවෙන්; වඩ්ඪති, වඩීද; අයං, මේ; උපනිස්සය ගොචරො, උපනිශ්‍රය ගොචරනම්; ඉධ, මෙහි; භික්ඛු, භික්‍ෂුයෙමේ; අන්තරඝරං පවිට්ඨො, ගොචරග්‍රාමයට වන්නේ; වීථිං පටිපන්නො, ඒ ඒ ගෙහි භික්‍ෂා පමණින්ම පිළිබඳ විථියට පැමිණියේ; ඔක්ඛිත්තචක්ඛු, යට හෙළු ඇස්ඇතියේ; යුගමත්තදස්සාවී, යුගමාත්‍රයක් බලන්නේ (කොටමණින් ඔක්ඛිත්තචක්ඛු නම්වේද යන ආශඞ්කාවෙහි "යුගමත්තදස්සාවී" කීහු) සංවුතො ගච්ඡති, සංයතව යයිද; (සංයතාකාරදක්වනපිණිස "න හත්ථිං ඔලොකෙන්තො" යනාදී කීහු) න හත්ථිං ඔලොකෙන්තො, ඇත්හු නොබලන්නේ; අස්සං, අසුන්; රථං; රථ; පත්තිං, පදතීන්; ඉත්ථිං; ස්ත්‍රීන්; පුරිසං, පුරුෂයන්; න ඔලොකෙන්තො; නොබලනුයේ (ඇතු වෙන වෙනම යොදනු) න උද්ධං ඔලොකෙන්තො, උඩ නො බලනුයේ; න අධො ඔලොකෙන්තො, කඳව බිඳනේ යට නොබලනුයේ; න දිසාවිදිසං පෙක්ඛමානො, දිශ් අනුදිශ් නොබලන්නේ; ගච්ඡති, යේද; අයං ආරක්ඛගොචරො, ඔබමොබ නොබැලීයෙදී අසංවරය රක්නා මේ සමාධියට ආරක්ඛ ගොචර නම්; කතමො, කවරේද; උපනිබන්ධගොචරො, උපනිබන්ධගොචර නම්ද; චත්තාරො සතිපට්ඨානා, සතර මහසිව

( ශ * )

ටන්නුයි; යථා විඤ්ඤාං උපනිබන්ධති, යම් සන්නිපට්ඨානමෙකග්ගතා භාවනා චිත්තය එලවා බඳිද (කියෙමැනු "යථා ථම්භෙ නිබන්ධෙය්‍ය-වච්ඡං දම්මං නරො-ඉධ බන්ධෙය්‍යවං සකං චිත්තං-සතියා රම්මණෙ දළ්හනති" ඒ සතරමහ සිවුවත්හු උපනිබන්ධ ගොචර නම් වෙයි යන අර්ථයි) වුත්තං හෙතං භගවතා, ඒ භගවත්හු විසින් වදාරණලද; භික්ඛවෙ, මහණෙනි; භික්ඛුනො, භික්ෂුහුගේ; ගොචරො, ගොචරය; කො, කවරේක්ද; සකො පෙත්තිකො විසයො, තමාගේ පියාවූ සම්‍යක් සම්බුද්ධයන් සන්තකවූ (ඔවුන් විසින් දක්වාවූ විෂයයි) යදිදං චත්තාරො සතිපට්ඨානා, යම් මේ සතර සතිපට්ඨාන කෙනෙක් ඇද්ද ("සකො සකො පෙත්තිකො විසයො" යි යොදනු) අයං උපනිබන්ධ ගොචරො, මේ උපනිබන්ධ ගොචර නම්---පෙ---

( භා * )

ගොචරය වනාහි ශීලාදි ගුණයන්ට කාරණවූ උපනිශ්‍රය ගොචරය සමාධි සඞ්ඛ්‍යාත සිතට ආරක්ෂකවූ ගොචරය කර්මස්ථාන සංඛ්‍යාතවූ සිත බඳනා ස්ථානයවූ උපනිබන්ධ ගොචරය යන මොවුන්ගේ වශයෙන් තුන්වැදෑරුම් වන්නේයි ඒ තුන්දෙනා අතුරෙන් ශීලාදි ගුණයන්ට කාරණවූ උපනිශ්‍රය ගොචර නම් කවරයත්? අපිස් සතොස් ආදි දශවිධ කථාවන්ට පිහිටවූ ගුණයන් යුක්තවූ කල්‍යාණ මිත්‍ර තෙමේ උපනිශ්‍රය ගොචර නම්--- ඒ එසේමැයි යම් කල්‍යාණ මිත්‍රයෙකු නිසා පෙර නොඇසූවිරූ සූත්‍රගෙයාදිය අසාද පෙර අසනලද්ද නැවත නැවත පිළිවිසීමෙන් පිරිසිදු කෙරේද ඇසූවිරූ තන්හි සැක දුරු

( භා • )

කෙරේද කර්ම ඵලයද රත්නත්‍රය ද ඇදහීම් වශයෙන් සම්‍යක් දෘෂ්ටිය ඇදහරී; එහිව ශ්‍රද්ධාවෙන් සිත පහදවාද ධර්මය පිරිසිදුකොට එහි ප්‍රකාශිතවූ නාමරූප ධර්මයන් තත්වාකාරයෙන් දක සත්ව ජීව යනාදී මිථ්‍යාදෘෂ්ටිසංඛ්‍යාත එක් දිගහැරීමෙන් සම්‍යක් දෘෂ්ටිය ඇද හරින්නේවේද නාමරූප ධර්මයන්ගේ කාරණයද ඒ කාරණයෙන් හටගත් ධර්ම මාත්‍රය ද තත්වාකාරයෙන් දැකීමෙන් අතීතානාගත වර්තමාන කාලත්‍රයෙහිව සැක දුරුකෙරේද ඉන් ඔබ්බෙහි උදයව්‍යය ඥානාදි වශයෙන් විදර්ශනාවඩා ආර්‍යභූමියට පැමිණ අචල ශ්‍රද්ධාවෙන් ආනුරූවන් කෙරෙහි සිත පහදවාද මෙබඳුවූ ලක්ෂණඇති ඒ කල්‍යාණමිත්‍රයාට අනුව හික්මෙන්නාවූ පුද්ගල තෙම එකාන්තයෙන් ශ්‍රද්ධාවෙන්ද ශීලයෙන්ද ශ්‍රුතයෙන්ද ත්‍යාගයෙන්ද ප්‍රඥාවෙන්ද නොපිරිහෙන්නේයි. මේ ගොචර තෙමේ උපනිශ්‍රය ගොචර නම් වන්නේයි.

ආරක්ෂ ගොචරය නම් කවරයත්? මේ සස්නෙහි යම් භික්ෂු කෙනෙක් ඇතුල්ගමට වැද පිඩු සිඟීම් පිණිස වීථි භාගීයට පිළිපන්නේ යට හෙළූ, ඇස් ඇතිව වියදඬු පමණ දුර බලන සුළුව චක්ෂුරාදි ෂඩින්ද්‍රියයන් මොනවට ආරක්ෂාකොටගෙණ යන්නේවේද; ඇතුන් අසුන් රථ පාබල සෙනා ස්ත්‍රී පුරුෂයන් දෙස නොබලමින් උඩ යට දිසානුදිසාවන් නොබලමින් යන්නේවේද මේ තෙමේ ආරක්ෂ ගොචරනම් වන්නේය. උපනිබන්ධ ගොචරනම් කවරයත්? යොගාවචර පුද්ගලයාගේ භාවනා චිත්තය ඔබ මොබ යා නොදී සතර සතිපට්ඨාන නැමැති ටැඹ කරා පමුණුවා එහි බඳනේද ඒ සතරසතිපට්ඨාන ධර්මයෝ උපනි

( හා * )

බද්ධගොචර නම්. භාග්‍යවතුන්වහන්සේ විසින්ද මේ වදාරණ ලද්දේයැයි මහණෙනි භික්ෂුහුගේ පිය සතුවූ හෙවත් සම්‍යක් සම්බුද්ධයන් විසින් දක්නාලද්දවූ ගොචරය කවරේදයත්? කායානුපස්සනාදී යම් සතර මහසිව්වටන් කෙණෙක් ඇත්තේ වේද ඒ තෙම තමන් පිය සතුවූ ගොචරය නම වේ උපනිබන්ධ ගොචරය නාම් වන්නේයි. (ඉතාමහත් පූජිත ලක්ෂණයෙන් යුක්තවූ කල්‍යාණ මිත්‍රයකුට අනුව සික්මෙන්නාහුගේ ඒ ඒ කාලට උපදනා කුශල චිත්තවිථි පිළිබඳවූ ශ්‍රද්ධා සමෘති ආදිවූ චෛතසික ධර්මයෝ උපනිශ්‍රය ගොචර නම. ඇතුල්ගමට පිඬු පිණිස පිළිපන් භික්ෂුතෙම ඇත් අස් ආදී නොයෙක් දේ නොබලා චක්ෂුරාදී ඉන්ද්‍රියයන් ආරක්ෂා කරණ කල්හි උපදනා චිත්තවිථි පිළිබඳවූ ස්මෘති චෛතසික ධර්මය ආරක්ෂගොචර නම. යොගාවචර භික්ෂුතෙම ඒ ඒ අත යා නොදී කායානුපස්සනාදි සතර තැන්හි සිත එල්බවා භාවනා වඩාද ඒ භාවනා චිත්තය පිළිබඳවූ එකාව ස්මෘති චෛතසික ධර්මය උපනිබන්ධ ගොචර නම.) යම් හෙයකින් භික්ෂු තෙම මේ ආචාරයෙන්ද මේ ගොචරයෙන්ද යුක්තවේද මනාකොටම යුක්තවේද එහෙයින් ආචාරගොචර සම්පන්නයයි කියනු ලැබේ.—

( පා † )

අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවීති අණුප්පමාණෙසු අසඤ්චිච්ච ආපන්නසෙඛියාකුසලචිත්තුප්පාදාදිභෙදෙසු වජ්ජෙසු භයදස්සනසීලො—සමාදාය සික්ඛති සික්ඛාපදෙසූති යංකිඤ්චි සික්ඛාපදෙසු සික්ඛිතබ්බං තං සබ්බං සම්මා ආදාය සික්ඛතීති එත්ථ පාතිමොක්ඛසංවරසංවුතොති

( පා † )

එත්තාවතා ච පුග්ගලාධිට්ඨානාය දෙසනාය පාතිමොක්ඛසංවරසීලං දස්සිතං, ආචාරගොචරසම්පන්නොති ආදි පන සබ්බං යථා පටිපන්නස්ස තං සීලං සම්පජ්ජති තං පටිපත්තිං දස්සෙතුං වුත්තන්ති වෙදිතබ්බං—යං පනෙතං තදනන්තරං සො චක්ඛුනා රූපං දිස්වාති ආදිනා නයෙන දස්සිතං ඉන්ද්‍රියසංවරසීලං, තත්ථ “සො”ති සො පාතිමොක්ඛසංවරසීලෙ ඨිතො භික්ඛු—චක්ඛුනා රූපං දිස්වාති කාරණවසෙන චක්ඛූති ලද්ධවොහාරෙන රූපදස්සනසමත්ථෙන චක්ඛුවිඤ්ඤාණෙන රූපං දිස්වා—පොරාණා පනාහු චක්ඛු රූපං න පස්සති අචිත්තකත්තා, චිත්තං න පස්සති අචක්ඛුකත්තා, ද්වාරාරම්මණසඞ්ඝට්ටෙ පන පසාදවත්ථුකෙන චිත්තෙන පස්සති ඊදිසී පනෙසා ධනුනා විජ්ඣතීති ආදීසු විය සසම්භාරකථා නාම හොති තස්මා චක්ඛුවිඤ්ඤාණෙන රූපං දිස්වාති අයමෙවෙත්ථ අත්ථොති—

( ස † )

“අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී” යන්නෙහි; අණුප්පමාණෙසු, පරමාණු ප්‍රමාණවූ ( “අසඤ්චිච්ච ආපන්නසෙඛියෙසු”යි අසඤ්චිච්ච ග්‍රහණය සෙඛිය විශෙෂණකොට “අකුසල චිත්තුප්පාදාදි භෙදෙසු”යි යොදනු) අසඤ්චිච්ච ආපන්නසෙඛිය, නොදැන වැරද අපරිමණ්ඩලකොට හැඳීම ආදින් අවන් සෙඛිය අකුශල චිත්තොත්පාදය යනාදි ප්‍රභෙද ඇති; වජ්ජෙසු, වරදෙහි (ආදිග්‍රහණයෙන් ප්‍රාතිමොක්ෂ සංවරශුද්ධිය පිණිස නොඉක්මිය යුතුවූ ආපත්තිය නොපැමිණිය යුතු දෝෂයන්ගේ ග්‍රහණය වේ-මිහි සෙඛිය ග්‍රහණයෙන් වෘත්තාසන්ධා

( ස † )

දියෙහි ආගත වාතාදීන්ගේදු ග්‍රහණය වේ ඔවුනුදු හික්මිය යුතු බැවින් තෙබිය නම් එන බැවින් මෙසේ කඳුවත් ආදීනුදු සෙඛියෙහිම සංග්‍රහවන බැවින්ම ගාථාතා වෙති පාරාජිකාදීන් මෙන් සෙඛියන්ගේ පරිච්ජේද නොදක්වනලදී අසඤ්චිච්ච ග්‍රහණයද ඔවුන්ට සෙඛිය බව ඇති කල්හිම සම්පීපිත වේ ගානාගත පන්සැතතා සෙඛියන් කෙරෙහි නො සඤ්ඤවිමොබවු කිසි සෙඛියක් නැති බැවින් අසඤ්චිච්ච ග්‍රහණයෙන්ම "අසතියා අජානන්තස්ස" යනුද ගැනේ ) භයදස්සන සීලො, පරමාණු මාත්‍ර වරදෙහිද මහ මෙර වැනි කොට භය දක්නා සුළු වේද (නොහොත් සචිලසුම් දුර්භාසිත පමණකුදු පාරාජිකාවක්සේ භය දක්නා සුළුවේද ) "සමාදය සික්ඛසි සික්ඛාපදෙසු" යන්නෙහි, යං කිඤ්චි සික්ඛාපදෙසු සික්ඛිතබ්බං, ශික්ෂා පදයෙහි මූල ප්‍රඥප්තිය අනු ප්‍රඥප්තිය සර්වත්‍ර ප්‍රඥප්තිය ප්‍රදෙශ ප්‍රඥප්තිය යනාදී භෙද ඇති යම් කිසිවෙක් හික්මිය යුතුද පිලිපැදිය යුතුද පිරිය යුතුද; තං සබ්බං, ඒ සියල්ල; සමාදාය, මනාකොට ගෙණ; සික්ඛති, හික්මෙන්නේද; එත්තාව, මිහි වනාහි; "පාතිමොක්ඛ සංවරසංවුතො" යි එත්තාවතා, "පාතිමොක්ඛ සංවර සංවුතො" යන මෙපමණකින්; පුග්ගලාධිට්ඨානාය දෙසනාය, පුද්ගලාධිෂ්ඨාන දෙශනාවෙන්; පාතිමොක්ඛ සංවර සීලං දස්සිතං, ප්‍රාතිමොක්ෂ සංවර ශීලය දක්වනලදී; ආචාරගොචර සම්පන්නතාහි ආදී පන සබ්බං, ආචාරගොචර සම්පන්නතා යනාදී සියල්ල වනාහි; යථා පටිපන්නස්ස තං සීලං සම්පජ්ජති, යම්සේ පිළිපන්නහුට ඒ ශීලය සමෘද්ධවේද; තං පටිපත්තිං දස්සෙතුං වුත්තන්ති වෙදිතබ්බං, ඒ ප්‍රතිපත්තිය දක්වන පිණිස කියන ලදැයි දතයුතු, තදනන්තරං, ඒ ප්‍රාතිමොක්ෂ සංවර ශීලයට අනන්තරයෙහි; සො චක්ඛුනා රූපං දිස්වාති ආදිනා නයෙන "සො චක්ඛුනා රූපං දිස්වා" යනාදි නයින්; යං පනෙතං ඉන්ද්‍රියසංවර සීලං දස්සිතං, යම් ඒ ඉන්ද්‍රියසංවර ශීලයෙක් දක්වන ලදද; තං, එනි; සොති, "සො" යි සො පාතිමොක්ඛ සංවරසීලෙ ඨිතො භික්ඛු, ඒ ප්‍රාතිමොක්ෂ සංවරශීලයෙහි සිටි මහණ; "චක්ඛුනා රූපං දිස්වා" යන්නෙහි; කාරණ වසෙන, ශාලාඞ්කුරය හෙරි යබද්ද යනු මෙන් අසාධාරණ කාරණ වශයෙන්; චක්ඛුනි ලද්ධ වොහාරෙන, චක්ඛුස් යයි ලබ්ධ ව්‍යවහාරඇති; රූපදස්සන සමත්ථෙන, රූප දර්ශනයට සමර්ථවූ; චක්ඛුවිඤ්ඤාණෙන රූපං දිස්වා, චක්ෂුර්විඥානයෙන් රූපය දැක; පොරාණා පන, පුරාතනයෝ වනාහි; ආහු, මෙසේ කීහු.

චක්ඛු, චක්ෂුස්තෙමේ; රූපං න පස්සති, රූපය නොදකී; අචිත්තකත්තා. නොසිත් නොවන හෙයිනි (ඉදින් චක්ෂුස රූපය දකීනම් අන්‍ය විඥාන සමන්විතයාගේද චක්ෂුස දක්නේයි මෙම කීහ. "යදි චක්ඛු රූපං පස්සෙය්‍ය අඤ්ඤවිඤ්ඤාණ සමඞ්ගිනොපි පස්සෙය්‍ය න චෙතං අත්ථි කස්මා අචෙතනත්තා චක්ඛුස්ස" යි ) චිත්තං න පස්සති, චිත්තයද රූපය නොදකී; අචක්ඛුකත්තා, තමා ඇස් නොවන හෙයිනි (ඉදින් විඥානය රූපය දකීනම් කුඩ්ඩාද්‍යන්තරිත රූපය දක්නේයි අප්‍රතිඝ බැවින් මෙම කීහ. "අථ විඤ්ඤාණං පස්සෙය්‍ය තිරොකුඩ්ඩාදිගතම්පි පස්සෙය්‍ය අප්පටිඝභාවතො ඉදම්පි නත්ථි සබ්බස්ස විඤ්ඤාණස්ස ද ස්සනාභාවතො ) ද්වාරාරම්මණ [illegible]

( ඝ † )

චෙව පන, චාරයාගේ අරක්ෂණ හා ගැටීම් ද ඇතිකල්හි (චක්‍ෂුසට රූපය හමුවූ කල්හි යනු භාවයි) පසාදවත්ථුකෙන චෙතෙන, චක්‍ෂුප් ප්‍රසාදය වස්තුකොට ඇති සිතින් (චක්‍ෂුරාශ්‍රිත චිත්තක්ෂණයෙද ආලොකයට විබන්ධකවූ කුඩ්‍යාදීන් ව්‍යවහිතයෙහි නොඋපදී ස්ඵටිකාභ්‍රපටලාදිවූ යමෙක විබන්ධ නැද්ද ඉඟි අනන්තරිතයෙහිදු උපදීමැයි මෙමැ කීහ "යස්‍ය චක්‍ෂුඃ පශ්‍යතීති දර්ශනං තස්‍යාතා සර්වං චක්‍ෂුඃ පශ්‍යති කිං තර්හි විඥානාධිෂ්ඨිතං යස්මාන්තු විඥානං පශ්‍යති දර්ශනං තස්‍ය 'පි න සර්වං විඥානං පශ්‍යති කිං තර්හි චක්‍ෂුරාශ්‍රිතං තච්චව්‍යවහිතෙන නොත්පාද්‍යතෙ යත්‍රා ලොකස්‍ය කුඩ්‍යාදෙඃ ප්‍රතිබන්ධං යත්‍රව ප්‍රතිබන්ධං ස්ඵටිකාභ්‍රපටලාදෙඃ තත්‍ර ව්‍යවහිතෙනා ව්‍යුත්පාද්‍යතෙ එව තස්මා තදාශ්‍රිතපතනාද ව්‍යවහිතෙනනන ව්‍යාවර්තපශ්‍යති විවක්ෂිතානානෙ යුක්තම් චක්‍ෂුර්විඥානං පශ්‍යතිති දර්ශනකාරණත්වංති චක්‍ෂුර්විඥානමිති" නොහොත් ආශ්‍රිතක්‍රියා ආශ්‍රයෙහි එව "චක්ඛුනා රූපං දිස්වා " යි කීහු. මේද කීහ. "අථවා ආශ්‍රිතකර්මාශ්‍රයෙ [illegible]සා ව්‍යතෙ" "යථාමඤ්චා උත්ක්‍රොශන්තීති") පසන්, දක්නේය (චක්‍ෂුඃප්‍රසාදසන්නිශ්‍රයවූ විඥානයා තමාගේ නිශ්‍රයගුණ ආලොකයාත් අනුගෘහීත කරණලද රූපාලම්බණයා පහළකරණ කල්හි ඒ විඥාන සමන්විත පුද්ගලතෙමේ රූපය බලන්නේයයි කියනු ලැබේ. ආලම්බණයාගේ යථාස්වභාවයෙන් විභාවනය ප්‍රත්‍යක්ෂ ග්‍රහණය අවභාසනනමැයි දතයුතු මෙම කීහ" - චක්ඛුප්පසාද සංනිස්සයස්ස විඤ්ඤාණස්ස ආලොකානුග්ගහිතං රූපාරම්මණං සන්නිස්සය ගුණෙන ඕභාසෙන්තස්ස තං සමඞ්ගි පුග්ගලො රූපං පස්සතීති වුච්චති ඔභාසනඤ්චෙත්ථ ආරම්මණස්ස යථාස

( ඝ † )

භාවතො විභාවනං යං පච්චක්ඛතො ගහණන්ති වුච්චති" ති) ධිතුනා ( [illegible] ආදිසු විය, ශරයෙන් ලක්‍ෂ්‍යවේධය කිවූ විතුදු ශරයට සම්භාරවූ දුන්නෙන් විදුමෙන් යනාදියෙහි මෙන්; ඊටිඹ පනොසා කථා, විඤ්ඤාණයෙන් රූප දර්ශනය සිඞ්ච තුදු "චක්ඛුනාරූපං පස්සති" යනාදි; සසම්භාර කථා නාම හොයි, සසම්භාරකථා නම්වී (දර්ශණ කාරණ ප්‍රසාදයා හා එක්කොට කී බැවින්) තස්මා, යමෙහෙයකින් නොවල චක්‍ෂුසින් හෝ කෙවල විඥානයෙන් හෝ දර්ශනය නොවේද එහෙයින්" චක්ඛුවිඤ්ඤාණෙන රූපං දිස්වා, 'යි' චක්‍ෂුර්විඥානයෙන් රූපය දැකය යනු; අයං, මේ නොමේ; එසො අයථා, මෙහි අදහසි——

---

( ශා † )

අණුප්‍රමාණවූ වරදෙහි භය දක්නා සුළුවීමය යනමෙහි නොදැන වරදවා පිරිමඬුලු නොහොට හැඳිම් පෙරඒම් ආදියෙන් පැමිණි සෙඛිය ශික්‍ෂාපදයන්ගේ ඉක්මවීමය අකුශල චිත්තයන්ගේ ඉපදීමය යනාදී ප්‍රභේදවත්වූ ස්වල්පමාත්‍ර වරදෙහි පවා මහමේරු වැනිකොට සිතා භය දක්නා සුළුවේද යනු භාවයි.

සමාදාන සෙණ ශික්ෂා පදයෙහි හික්ෂුවෙන්නේය යන මෙහි ශික්ෂාපදයෙහි ප්‍රථම ප්‍රඥප්තිය අනුප්‍රඥප්තිය සර්වත්‍ර ප්‍රඥප්තිය ප්‍රදෙශ ප්‍රඥප්තිය යනාදි ප්‍රභෙද වශයෙන් යම් කිසිවක් හික්මිය යුතුද පිළිපැදිය යුතුද පිරිය යුතුද ඒ සියල්ල මනාකොටගෙණ හික්මෙන්නේවේද යනු භාවයි. මෙහි වනානී ප්‍රාතිමොක්‍ෂ සංවරයෙන් වසනලද්දේය යන මෙ පවණයෙන් වදරණලද පුද්ගලාධිෂ්ඨාන දෙශනාවෙන් ප්‍රාතිමොක්‍ෂ සංවර ශීලය දක්

( ගා † )

වා විවරණ ලද්දේයි (හෙවත් ප්‍රාතිමොක්‍ෂයට ඇතුළත් ශික්‍ෂාපද රක්‍ෂාකර වනාහුයේ ඒ ඒ ශික්‍ෂාපද අරභයා උපදනා විඥප්තිපිලිබඳවූ චේතනා විරති ආදී චෛතසිකධර්මසංඛ්‍යාත ප්‍රාතිමොක්‍ෂසංවරශීලය දක්වා විවරණලදී] ආචාර ගොචරයෙන් සම්පූර්ණවූ තැනැත්තේය යනාදි සියල්ල වනාහි යම්සේ පිළිපන්නාහට ඒ ශීලය සම්පාදවේද ඒ ප්‍රතිපත්තිය දක්වනපිණිස කියනලද්දේයයි දතයුතු ඒ ප්‍රාතිමොක්‍ෂසංවරශීලයට අනතුරුව "හෙතෙම ඇසින් රූපය දක්නේය" යනාදී ක්‍රමයෙන් යම් බඳුවූ ඉන්ද්‍රිය සංවරශීලයෙක් විවරණලද්දේවේද (එහි විභාග මෙතැන් පටන් දක්වනුලැබේ) එහි "හෙතෙමේය" යන්නෙන් ඒ ප්‍රාතිමොක්‍ෂසංවරශීලයෙහි පිහිටි මහණ කියනුලැබේ "ඇසින් රූපය දැක" යනු කාරණෝපචාරවශයෙන් ඇසයයි ලබනලද ව්‍යවහාර ඇති රූපාරමුණු දක්මෙහි පොහොසත්වූ චක්‍ෂුර්විඥානයිසින් රූපය දක්නේය යනු භාවයි පුරාතනයෝ වනාහි මෙසේ කීවාහුය චක්‍ෂුස්තෙමේ සිත්තනොවනබැවින් රූපය නොදක්නේය සිතද ඇස් නොවනබැවින් රූපය නොදක්නේය වැලිකෙසේ දක්නේදයත්? චක්‍ෂුර්ද්වාරයාගේ රූපාරමුණයා ගැටීමක් ඇතිකල්හි හෙවත් ඇසට රූපය හමුවූකල්හි චක්‍ෂුස්ප්‍රසාදය වස්තු කොට ඇති හෙවත් ආධාරකොට පවත්නා සිතින් රූපය දක්නේය යම්සේ ඊයෙන් විදින්නේය විදීම කරන්නෙහි දුනු ඊයට ආධාරවූ දුන්නෙන් විදුනාහුයයි යනාදි ලෝකව්‍යවහාරය මෙන් සිතින් රූපයන්ගේ දක්ම සිද්ධවන්නේ නමුදු ඒ සිතට ආධාරවූ චක්‍ෂුස්ප්‍රසාදයාගේ නාමයෙන් ඇසින් රූප දක්නේය යනාදී මෙබඳුකථා

( ගා † )

හොමෙයි කාරණාසහිත කථා නම් වස්නීය යම්සේ හුදකලා චක්‍ෂුස්ප්‍රසාදයෙන් හෝ හුදකලා සිතින් හෝ රූපදර්ශනය නොවන්නේවේද එහෙයින් චක්‍ෂුස්ප්‍රසාදය ආධාරකොට පවත්නා සිතින් රූපයදක්නේය යන මේ කී අර්ථ දතයුතු——

---

( ගා ‡ )

න නිමිත්තග්ගාහීති ඉත්ථිපුරිසනිමිත්තං වා සුභනිමිත්තාදිකං වා කිලෙසවත්ථුභූතං නිමිත්තං න ගණ්හාති දිට්ඨමත්තෙයෙව සණ්ඨාති නානුබ්‍යඤ්ජනග්ගාහීති කිලෙසානං අනුබ්‍යඤ්ජනතො පාකටභාවකරණතො අනුබ්‍යඤ්ජනන්ති ලද්ධවොහාරං හත්ථපාදසිතහසිතකථිතවිලොකිතාදි භෙදං ආකාරං න ගණ්හාති යං තත්ථ භූතං තදෙව ගණ්හාති——චෙතියපබ්බතවාසී මහාතිස්සත්ථෙරො විය ථෙරං කිර චෙතියපබ්බතා අනුරාධපුරං පිණ්ඩචාරත්ථාය ගච්ඡන්තං අඤ්ඤතරා කුලසුණ්හා සාමිකෙන සද්ධිං භණ්ඩිත්වා, සුමණ්ඩිතපසාධිතා දෙවකඤ්ඤාවිය කාලස්සෙව අනුරාධපුරතො නික්ඛමිත්වා ඤාතිඝරං ගච්ඡන්තී අන්තරාමග්ගෙ ථෙරං දිස්වා විපල්ලත්ථචිත්තා මහාහසිතං හසි ථෙරො කිමෙතන්ති ඔලොකෙන්තො තස්සා දන්තට්ඨිකෙ අසුභසඤ්ඤං පටිලභිත්වා අරහත්තං පාපුණි——තෙන වුත්තං——

තස්සා දන්තට්ඨිකං දිස්වා
පුබ්බසඤ්ඤං අනුස්සරි
තත්ථෙව සො ඨිතො ථෙරො
අරහත්තං පාපුණී "ති——

සාමිකොපි ඛො පනස්සා අනුමග්ගං ගච්ඡන්තො ථෙරං දිස්වා කිඤ්චි භන්තෙ ඉත්ථිං පස්සථාති පුච්ඡි තං ථෙරො ආහ——

( සා ‡ )

නාභිජානාමි ඉත්ථී වා
පුරිසො වා ඉතො ගතො
අපි ච අට්ඨිසඞ්ඝාතො
ගච්ඡතෙ'ස මහාපථෙ 'ති.

( ස ‡ )

න නිමිත්තග්ගාහී 'ති' යන්නෙහි; ඉත්ථි පුරිස නිමිත්තං වා, ස්ත්‍රීපුරුෂ නිමිත්ත යනවූ සණ්ඨානමාත්‍රය වෙශද්‍රව්‍යාදී සනිමිත්තක්හෝ උක්තවිපර්‍ය්‍යාසයෙන් පුරුෂනිමිත්තක් හෝ; සුභනිමිත්තාදිකං වා, සුභනිමිත්තාදිවූ (රාගොත්පත්ති හෙතුවූ ඉෂ්ටාකාරය සුභනිමිත්ත නම ආදි ශබ්දයෙන් ද්වෙෂොත්පත්ති කාරණ සඞ්ඛ්‍යාත ප්‍රතිඝනිමිත්තද අඥානොපෙක්ෂාවට වස්තුවූ අරමුණු නැමැති උපෙක්ෂානිමිත්තද ගැණේ. මෙපල අභිධ්‍යා දෞර්මනස්‍යයන් ස්වරූපයෙන් අවද "මුට්ඨස්සච්චං වා අඤ්ඤාණං වා," යි වක්ෂ්‍යමාන බැවින් අසම්ප්‍රේක්ෂණයෙන් උපදනා මොහයද අසංවරම වේනුයි උපෙක්ෂානිමිත්තද සංග්‍රහ කරණලදී ) කිලෙසවත්ථු භූතං නිමිත්තං න ගණ්හාති, ලොභ ද්වෙෂ මොහ යන කෙලශයන්ට කාරණවූ නිමිත්තය නොගණී; දිට්ඨමත්තෙයෙව සණ්ඨාති, වර්ණායතනයෙහි චක්ෂුර්විඥානයා විසින්ද වීථිචිත්තයන් විසින්ද ගන්නාලද පමණෙහිම සිටීද්ද ( මතුයෙහු දු කිසි ශුභාදී ආකාරයක් කල්පනා නොකෙරේය යන අදහසි) 'නානුබ්‍යඤ්ජනග්ගාහී"යන්නෙහි; කිලෙසානං අනුබ්‍යඤ්ජනතො, කෙලෙසුන් මතුමතුයෙහි පහළකරණ බැවින්; පාකටභාවකරණතො; පරිව්‍යක්තකරණ බැවින්; අනුබ්‍යඤ්ජනන්ති ලද්ධවොහාරං, අනුබ්‍යඤ්ජනය යන ව්‍යවහාරලද; හත්ථ, හස්තය; පාද, පාදය, සිත, මඳසිනාය; හසිත, මහසිනය; කථිත, කිණීම; විලොකිත, බැලීමය; ආදි, මේආදී ප්‍රභෙදඇති; ආකාරං න ගණ්හාති, ආකාරග්‍රහණය නොකෙරේද; යං තත්ථ භූතං, ඒ ශරීරයෙහි විද්‍යමානවූ යම් බඳුවූ කෙශලොමාදියෙක් භූතොපාදාය පමණෙක් හෝ ඇද්ද; තංදෙව ගණ්හාති, එම යථාර්ථයෙන් ගණී; චෙතියපබ්බතවාසී; චෛත්‍යපර්වතයෙහි වසන; මහාතිස්සත්ථෙරො විය, මහාතිස්ස නම් තෙරුන්මෙන්; ථෙරං කිර, තෙරුන්; (කිරය නු අනුශ්‍රවණයෙහිය) චෙතියපබ්බතා, සෑගිරියෙන්; අනුරාධපුරං, අනුරාධපුරයට; පිණ්ඩචාරත්ථාය ගච්ඡන්තං, පිඬුසිඟාපිණිස යන්නාවූන්; අඤ්ඤතරා කුලසුණ්හා, එක්තරා කුලයෙක ලියක්; සාමිකෙන සද්ධිං භණ්ඩිත්වා, ස්වාමිහු හා සමග කලහකොට; සුමණ්ඩිතපසාධිතා, මනාකොට සැදීපැහැසී ත් ගන්නාලද්දීයි; (ආභරණාදී බාහිරෙපකරණයෙන් සැදීම මණ්ඩනනම උපලේපනාදී විසින් ශරීර පරිසංඛරණය පසාධන නැයි කියත්-වස්ත්‍රමාල්‍යාදීන් අලඞ්කරණය පසාධන නම උපනයස්ථාන පූරණය මණ්ඩන නාම) දෙවකඤ්ඤා විය, දෙවගණිකාවමෙන්; කාලස්සෙව, උදෑසනම; අනුරාධපුරතො නික්ඛමිත්වා, අනුරාධපුරයෙන් නික්ම; ඤාතිඝරං ගච්ඡන්ති, ඥාතිකුලගෘහට යන්නී; අන්තරාමග්ගෙ, අතරමග; ථෙරං දිස්වා, තෙරුන් දැක; විපල්ලත්ථචිත්තා, රාගවශයෙන් පෙරළි සිත්ඇත්තී; මහාහසිතං හසි, තම්බලවම්හිසි මහ සිනා කළා; ථෙරො, තෙරහු; කිමෙතන්ති ඔලොකෙන්තො, මනස්කාරයුක්තව යන්නාහු සම්භ්‍රමශබ්දශ්‍රවණයෙන් මේ කිමෙක් දෝහෝයි බලන්නාහු; තස්සා, ඇයගේ; දන්තට්ඨිකෙ, දත්ඇට; අසුභසඤ්ඤං පටිලභිත්වා අශුභසංඥාව පිළිලැබ; අරහත්තං පාපුණි, රහත්බවට

( ස ‡ )
අට්ඨික කම්මට්ඨානය මෙනෙහි කොරමින් යන්නා[ ] ඒ ස්ත්‍රිය පවත්වන මාගම්ගේ දළ අස්ථියෙහි පූර්වභාග නිමිත්තයද සාජ්ඣය උපචාරයද ලැබ එතනම සිට ප්‍රථම ධ්‍යානය ලදින් ඒ පාදකකොට විදර්ශනා වඩා මාර්ග පටිපාටියෙන් අර්හත්වයට පැමිණියෝ] මෙහ න වුත්තං, එහෙයින් කියනලදී.

තස්සා දන්තට්ඨිකං දිස්වා, ඒ මාගමගේ දත් ඇට දැක; පුබ්බසඤ්ඤං අනුස්සරි, තමන් මුල්කම්ස්ථානවූ අස්ථික සංඥාව සිහිකළේ; තත්ථෙව ඨිතො, එතැන්හිම සිට; සො ථෙරො, ඒ තෙරහු; අරහත්තං පාපුණි, අර්හත්වයට පැමිණියෝ.

අස්සා, ඒ මාගම්ගේ; සාමිකොපි, ස්වාමීද; අනුමග්ගං ගච්ඡන්තො, ඈ පසුපස්සේ යන්නේ; ථෙරං දිස්වා, තෙරුන් දැක; භන්තෙ, වහන්ස; කච්චි, කිම; ඉත්ථිං පස්සථානි, ස්ත්‍රියක දුටුදෑදැයි; පුච්ඡි, පිළිවිසී; තං, ඕහට; ථෙරො ආහ, තෙරහු මෙසේ කීවු; ඉතො ගතා, මෙහෙනින් ගියේ; ඉත්ථිවා පුරිසොවා, ස්ත්‍රියෙකැයි හෝ පුරුෂයෙකැයි හෝ; නාභිජානාමි, නොදනිමි; අපිච, එකෙක් ඇති; මහාපථෙ, මහමග; එස අට්ඨිසඞ්ඝාතො, මේ ඇටසැකිල්ලක්; ගච්ඡති, යන්නේයි (ඒ ස්ථවිරයන්ට භාවනාව පුහුණු බැවින් දන්තාස්ථි දැකීමෙන් සකල ශරීරය අස්ථිසඞ්ඝාතයක් සේ වැටහෙන හෙයින් ගැහැණියෙකැයි වත් පුරුෂයෙකැයි වත් නොහැඳින්මෙන් එහෙයින්කීහ "නාභිජානාමි" යනාදි)

( හා ‡ )
නිමිත්තග්‍රහණය නොකරන්නේය යන මෙහි තනමස්ගඩු ආදි ස්ත්‍රී ලක්ෂණ හෝ දැලිරැවුල් ආදි පුරුෂ ලක්ෂණ හෝ රාගෝත්පත්තියට කාරණවූ යහපත් ලක්ෂණයක් හෝ ද්වේෂෝත්පත්තියට කාරණවූ ප්‍රතිඝ නිමිත්තක් හෝ මෝහෝත්පත්තියට කාරණවූ උපෙක්ෂා නිමිත්තක් හෝ ලොභ ද්වේෂ මෝහාදී ක්ලේශයන්ට වස්තුවූ නිමිත්තක් හෝ නොගන්නේවේද දක්නාලද පමණෙක්හි සිටින්නේවේද මතුයෙහි කිසියම් ශුභාදි ආකාරයක් කල්පනා නොකෙරේද (මෙහෙවත් රූපයක් හමුවූ කල්හි උපදනා චක්ෂුර්විඥාන වීථින වීථියෙහි චක්ෂුර් විඥානය විසිනුදු එහි උපදනා ජවන්සිත්හු විසිනුදු ගත්තාලද පමණෙහිම සිටීද මතු මෙනෙහි ඒ අරමුණු ශුභය අශුභය යනාදීන් ඈලුම් වශයෙන් හෝ ද්වේෂ වශයෙන් හෝ සිත් නූපදවන්නේවේද යනු භාවයි) අනුව්‍යඤ්ජන නොගන්නේය යනු කෙලෙසුන් මතුමෙහෙති පහළකරණ බැවින් අනුව්‍යඤ්ජනැයි කියනලද අත්පා ආදියද මද සිනා හා මහ සිනාද කථාකිරීම හා බැල්මද යනාදී ආදි ප්‍රභේදඇති ආකාරයහපත් වශයෙන් කල්පනාකොට නොගන්නේද ඒ ශරීරයෙහි කෙස් ලොම් ආදියෙක්හෝ භූත රූප උපාදා රූප මාත්‍රයෙක් හෝ ඇත්තාහුද ඒ කෙශාදීහු යථාස්වභාවයෙන් කල්පනා කෙරේද මෙහෙවත් මේ කෙශාදීහු පෘථිව්‍යාදි සතරමහා භූතයන්ගෙන් හටගන්නාහුය. ආශ්‍රය අවකාශය සණ්ඨානය යනාදීන්ගෙන් වෙනසෙන් පිළිකුල් කටයුත්තාහුවෙය චක්ෂුරාදීහු ඒ මහාභූතයන් නිසා පවත්නාහුය යනාදීන් සෑගිරිපව්වෙහෙර වැසි මහාතිස්ස ස්ථවිරයන් මෙන් කල්පනා කෙරේද ඒ එසේමැයි. මහාතිස්ස ස්ථවිරයන්වහන්සේ සෑගිරියෙන් බැස අනුරාධපුරයට පිඬුසිගනපිණිස එන්නාහු එක්තරා කුලස්ත්‍රියක් [illegible]

ශාශාසමග ඩබරකොට හැදීපැහැදී දෙවඟනක්මෙන් උදුසනම අනුරාධපුරයෙන් නික්ම ස්වකීය මව්පියන්ගේ ගෙට යන්නී අතරමගදී මහාතිස්ස ස්ථවිරයන් දුක රාග වශයෙන් පෙරළුනා වූ සිත් ඇතිව තමා දෙස බලවමියි සිනා මහත් ශබ්ද නගා සිනාසිනී. මහතෙරුන්වහන්සේ යොනිසොමනස්කාරයෙන්යුක්තව වඩනාහු මහ සිනාහඬ අසා මේ කුමක්දෝහෝයි බලනුයේ සිනාසෙන්නීවූ ඒ ස්ත්‍රීගේ දත්ඇට දැක මහතෙරුන්වහන්සේ ප්‍රකෘතියෙන්ම අසුභ කර්මස්ථානය පුරුදුකරගණ ආ බැවින් පූර්වභාවිතා බලයෙන් එකෙණෙහිම කමටහන් වඩා ප්‍රතිභාග නිමිත්තද උපචාරනිමිත්තද ලැබ එතන්හිම සිට ප්‍රථමධ්‍යාන උපදවා ඒ ධ්‍යානය පාදකකොටගෙණ විදසුන් වඩා සෝවාන් සකෘදාගාමි අනාගාමි අර්හත් යන සතරමග සතරඵලයට පැමිණිසේක. එසේහෙයින් මේ ගාථාව කියනලදී "ඒ මාගමගේ දත්ඇට දැක තමන්ගේ මූලකර්මස්ථානවූ අසුභසංඥව මෙනෙහිකොට එතන්හිම සිට ඒ තිස්ස ස්ථවිරයන්වහන්සේ අර්හත්වයට පැමිණියාහ"

ඒ ස්ත්‍රීගේ ස්වාමිපුරුෂයාද ඈ පසුපස්සේ ලුහුබැඳයන්නාහු හැමට පළමු තෙරුන්වහන්සේ දැක කිමෙක්ද වහන්ස මේ මාර්ගයෙහි යන ස්ත්‍රියක දුටුදැයි විචාළේය. ඉක්බිති මහතෙරුන්වහන්සේ ඔහුට මේ ගාථාව වදාළේය. "පින්වත? මේ මගින් ගියේ ස්ත්‍රියෙකැයි හෝ පුරුෂයෙකැයි හෝ නොදනිමි. වැලිඑකෙක් ඇති මේ මහවත දුන් ඇටසැකිල්ලෙක් නම් ගියේයයි" වදාළේය.

---

( පා ¶ )

යස්සාධිකරණමේනන්ති ආදිම්හි යං කාරණා යස්ස චක්ඛුන්ද්‍රියාසංවරස්ස හෙතු එතං පුග්ගලං සතිකවාටෙන චක්ඛුන්ද්‍රියං අසංවුතං අපිහිත චක්ඛුද්වාරං හුත්වා විහරන්තං එතෙ අභිජ්ඣාදයො ධම්මා අන්වාස්සවෙය්‍යුං අනුපබන්ධෙය්‍යුං තස්ස සංවරාය පටිපජ්ජති තස්ස චක්ඛුන්ද්‍රියස්ස සතිකවාටෙන පිදහනත්ථාය පටිපජ්ජති එවංපටිපජ්ජන්තො යෙව රක්ඛති චක්ඛුන්ද්‍රියං චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජතීතිපි වුච්චති, තත්ථ කිඤ්චාපි චක්ඛුන්ද්‍රියෙ සංවරො වා අසංවරො වා නත්ථි නහි චක්ඛුප්පසාදං නිස්සාය සති වා මුට්ඨස්සච්චං වා උප්පජ්ජති අපිච යදා රූපාරම්මණං චක්ඛුස්ස ආපාථං ආගච්ඡති තදා භවඞ්ගෙ ද්වික්ඛත්තුං උප්පජ්ජිත්වා නිරුද්ධෙ කිරියාමනොධාතු ආවජ්ජනකිච්චං සාධයමානා උප්පජ්ජිත්වා නිරුජ්ඣති තතො චක්ඛුවිඤ්ඤාණං දස්සනකිච්චං තතො විපාකමනොධාතු සම්පටිච්ඡනකිච්චං තතො විපාකාහෙතුකමනොවිඤ්ඤාණධාතු සන්තීරණකිච්චං තතො කිරියාහෙතුකමනොවිඤ්ඤාණධාතු වොට්ඨපනකිච්චං සාධයමානා උප්පජ්ජිත්වා නිරුජ්ඣති තදනන්තරං ජවනං ජවති තත්‍රාපි නෙව භවඞ්ගසමයෙ න ආවජ්ජනාදීනං අඤ්ඤතරසමයෙ සංවරො වා අසංවරො වා අත්ථි ජවනක්ඛණෙ පන සචෙ දුස්සීල්‍යං වා මුට්ඨස්සච්චං වා අඤ්ඤාණං වා අක්ඛන්ති වා කොසජ්ජං වා උප්පජ්ජති අසංවරො හොති එවං හොන්තො පන සො චක්ඛුන්ද්‍රියෙ අසංවරොති වුච්චති කස්මා යස්මා තස්මිං සති ද්වාරම්පි අගුත්තං හොති භවඞ්ගම්පි ආවජ්ජනාදීනිපි වීථිචිත්තානි යථාකිං යථා නගරෙ චතූසු ද්වාරෙසු අසංවුතෙසු කිඤ්චාපි අන්තො

ඝරද්වාරකොට්ඨක ගබ්භාදයො සුසංවුතා තථාපි අන්තොනගරෙ සබ්බං භණ්ඩං අරක්ඛිතං අගොපිතමෙව හොති නගරද්වාරෙන හි පවිසිත්වා චොරා යදිච්ඡන්ති තං කරෙය්‍යුං එවමෙව ජවනෙ දුස්සීල්‍යාදිසු උප්පන්නෙසු තස්මිං අසංවරෙ සති ද්වාරම්පි අගුත්තං හොති භවඞ්ගම්පි ආවජ්ජනාදීනිපි වීථි චිත්තානි යථා කිං යථා නගරද්වාරෙසු සුසංවුතෙසු කිඤ්චාපි අන්තොඝරාදයො අසංවුතා හොන්ති තථාපි අන්තොනගරෙ සබ්බං භණ්ඩං සුරක්ඛිතං සුගොපිතමෙව හොති නගරද්වාරෙසු පිහිතෙසු චොරානං පවෙසො නත්ථි එවමෙව ජවනෙ සීලාදිසු උප්පන්නෙසු ද්වාරම්පි ගුත්තං හොති භවඞ්ගම්පි ආවජ්ජනාදීනි වීථිචිත්තානිපි තස්මා ජවනක්ඛණෙ උප්පජ්ජමානො චක්ඛුන්ද්‍රිය සංවරොති වුත්තො සොතෙන සද්ධං සුත්වාති ආදිසුපි එසෙව නයො ~~~

( ස ¶ )

"යත්වාධිකරණමෙනං" යනාදියෙහි; යං කාරණං, යම් කාරණයකින්; යස්ස චක්ඛුන්ද්‍රියා සංවරස්ස හෙතු, යම් චක්ෂුරින්ද්‍රියයක්හුගේ අසංවරය හේතු කොටගෙණ; එනං පුග්ගලං, ඒ පුහුලා ("යං කාරණං" යනු 'යත්වාධිකරණං' යනුයෙහි අර්ථයි "එනං පුග්ගලං" යනු 'එනං' යනුයෙහි අර්ථයි) සතිකවාටෙන, සිහි නැමැති දොරින්; චක්ඛුන්ද්‍රියං අසංවුතං, අසංවෘත චක්ෂුරින්ද්‍රිය ඇත්තාහු; අපිහිත චක්ඛුද්වාරං හුත්වා විහරන්තං, සිහිකවුළුවෙන් නොපියනලද චක්ෂුර්ද්වාර ඇතිව වසන්නාහුය; එතෙ අභිජ්ඣාදයො ධම්මා, මේ අභිධ්‍යාදි ධර්මයෝ ("අන්වාස්සවෙය්‍යුං"යි සේයි. අනුප්පබන්ධෙය්‍යුං, අනුබඳනාහුද (තස්ස සංවරාය පටිපජ්ජති"යි සේයි) තස්ස චක්ඛුන්ද්‍රියස්ස, ඒ චක්ඛුන්ද්‍රියයාගේ; සතිකවාටෙන පිදහනත්ථාය, සිහි නැමැති දොරින් පියන පිණිස; පටිපජ්ජති, පිළිපදී; එවං පටිපජ්ජන්තොයෙව, මෙසේ පිළිපදනේම; රක්ඛති චක්ඛුන්ද්‍රියං, චක්ෂුරින්ද්‍රියරක්නේයි; චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජති, චක්ෂුරින්ද්‍රියෙහි සංවරයට පැමිණෙන්නේයයි; වුච්චති, කියනුලැබේ ("යස්ස චක්ඛුන්ද්‍රියා සංවරස්ස හෙතු"යි කී බැවින් "තස්ස චක්ඛුන්ද්‍රියා සංවරස්ස" යි නොකියා "තස්ස චක්ඛුන්ද්‍රියස්ස සතිකවාටෙන පිදහනත්ථාය"යි කුමක්සඳහා කීහයත්? චක්ෂුරින්ද්‍රියයාගේ අසංවරයට හේතුවූ අභිධ්‍යාදීන්ගේ අන්වාශ්‍රවණය අසංවෘත චක්ෂුරින්ද්‍රිය හෙයිනැයි දක්වනු සඳහා කීහු) තත්, ඒ ද්වාරයෙහි ("කිඤ්චාපි චක්ඛුන්ද්‍රියෙ සංවරො වා අසංවරො වා නත්ථි ජවනක්ඛණෙ උප්පජ්ජමානො පි වුච්චතො"යි සම්බන්ධයි) කිඤ්චාපි, කිසිසේත්; චක්ඛුන්ද්‍රියෙ, චක්ෂුරින්ද්‍රියෙහි; සංවරො වා, සංවරයෙක් හෝ; අසංවරොවා, අසංවරයෙක්හෝ; නත්ථි, නැති; චක්ඛුප්පසාදං නිස්සාය, චක්ෂුඃප්‍රසාදය නිසා; සතිවා, සමෘතිය හෝ; මුට්ඨස්සච්චංවා, සිහිමුළාව හෝ; නඋප්පජ්ජති, නොඋපදී (කියනුලබන්නා සංවර බැවින් සෙසු සංවර තබා "සති වා මුට්ඨස්සච්චං වා" යනුවෙන් සතිසංවර අසංවර දෙක කීවෙත් "අපිච"යි සංවරා සංවර හැති සෙසු තැනුදු දක්වන පිණිස කීහු) යදා, යම් කලෙක; රූපාරම්මණං, රූපාලම්බනය; චක්ඛුස්ස, චක්ෂුසට; ආපාථං ආගච්ඡති, හමු බවට ඒද; තදා, එකල්හි; භවඞ්ග, භවාඞ්ගය; ද්වික්ඛත්තුං උප්පජ්ජිත්වා නිරුද්ධෙ, දෙවරෙක ඉපද නිරුද්ධවූ කල්හි; කිරියාමනොධාතු, කිරියාමනොධාතු තොමෝ; ආවජ්ජන කිච්

වං සාධයමානා, ආවජ්ජන කෘත්‍යය සාධමින්; උප්පජ්ජිත්වා නිරුජ්ඣති, ඉපිද නිරුද්ධවේ; තතො, ඉක්බිත්තෙන්; චක්ඛුවිඤ්ඤාණං, චක්ෂුර්විඥානය; දස්සන කිච්චං, දර්ශන කෘත්‍යයද; තතො, ඉක්බිත්තෙන්; විපාක මනොධාතු, විපාක මනොධාතුව; සම්පටිච්ඡන කිච්චං, සම්ප්‍රතීච්ඡන කෘත්‍යයද; තතො, ඉක්බිත්තෙන්; විපාකා අහෙතුක මනොවිඤ්ඤාණධාතු, විපාකවූ අහෙතුක මනොවිඥාන ධාතුව; සන්තීරණ කිච්චං, සන්තීරණ කෘත්‍යයද; තතො, ඉක්බිත්තෙන්; කිරියා අහෙතුක මනොවිඤ්ඤාණ ධාතු, ක්‍රියාඅහෙතුක මනොවිඥාන ධාතුව; වොට්ඨපන කිච්චං සාධයමානා, ව්‍යවස්ථාපන කෘත්‍යය සාධමින්; උප්පජ්ජිත්වා නිරුජ්ඣති, ඉපිද නිරුද්ධවේ; තදනන්තරං, එයට අනතුරෙහි; ජවනං, ජවන්හු; ජවති, දිවේ; තත්‍රාපි, මොවුන් කෙරෙහි, භවඞ්ග සමයෙ, භවාඞ්ගයෙහිදු ("භව අඞ්ග"යි කොදනු) ආවජ්ජනාදීනං, ආවජ්ජනාදීන් අතුරෙන්; අඤ්ඤතර සමයෙ, එක්තරා එකක්හු වන සමයෙහිද; සංවරොවා, සංවරයෙක් හෝ; අසංවරොවා, අසංවරයෙක් හෝ; නත්ථි අත්ථි, නොවඇති; ජවනක්ඛණෙ පන, ජවන ක්ෂණයෙහි වනාහි; සචෙ, ඉදින්; දුස්සීල්‍යංවා, දෞශ්ශීල්‍යය හෝ; මුට්ඨස්සච්චංවා, මුළාවූ සමෘතිය හෝ; අඤ්ඤාණංවා, අඥානය හෝ; අක්ඛන්තිවා, අක්ෂාන්තිය හෝ; කොසජ්ජංවා, කෞශීද්‍යය හෝ; උප්පජ්ජති, උපදීද; අසංවරො හොති, අසංවරයවේ) (මිනි "දුස්සීල්‍යංවා" යනාදී නැවත නොකී යනු පිණිස මේ දෙරම සියල්ල කී බැවින් ෂඩ්වාරයෙහි යථා සම්භවයෙන් දතයුතු කායවාග් දුශ්චරිත සඞ්ඛ්‍යාත දෞශ්ශීල්‍ය අසංවරය මනොවාර වශයෙන්ද සෙසු අසංවරයන් ෂඩ්වාර වශයෙන්ද යෙදියයුතු: මුට්ඨස්සච්චාදීන් සමෘති ප්‍රතිපක්ෂ අකුශල ධර්මයන් බැවින් උන්ගේ පස්දොර උපැන්වේ නමුදු පඤ්චද්වාරික ජවනයන් අවිඥප්ති ජනක බැවින් කායික වාචසික ව්‍යතික්‍රම වූ දෞශ්ශීල්‍යයාගේ පස්දොර උපැන් නොවෙයි දතයුතු. (දෞශ්ශීල්‍යාදී පන් අසංවරයෝ ශීලසංවරාදී පස්දෙන හට ප්‍රතිපක්ෂබැවින් කියනලදහු) එවං භොන්තො පන සො, මෙසේ ජවනක්ෂණයෙහි වන ඒ අසංවරය; චක්ඛුන්ද්‍රියෙ අසංවරො 'තිවුච්චති, චක්ෂුරින්ද්‍රියෙහි අසංවරයයි කියනුලැබේ; කස්මා, කුමක්හෙයිනයත්? යස්මා, යම්හෙයකින්; තස්මිං සති, ඒ අසංවරය ඇති කල්හි; ද්වාරම්පි අගුත්තං හොති, ද්වාරයද අගුප්තවෙයි; භවඞ්ගම්පි, භවාඞ්ගයද; ආවජ්ජනාදීනි වීථිචිත්තානි, ආවජ්ජනාදී වීථි චිත්තයෝද අගුප්තවෙත්; යථාකිං, කුමක්මෙනයත්; යථා, යම්සේ; නගරෙ, නුවරෙහි; චතූසුද්වාරෙසු අසංවුතෙසු, සතරදොර අපිහිතකල; කිඤ්චාපි, කිසිසේත් අන්තො, ඇතුළෙහි; ඝරද්වාරකොට්ඨක ගබ්භාදයො, ගෙදොර කොටුගේ ගබ්ආදිහු; සුසංවුතාපි, සුපිහිතවූවාහු නමුදු; තථාපි, එතකුදුවුවත්; අන්තොනගරෙ, ඇතුළු නුවර; සබ්බං භණ්ඩං, සියළු බඩු; අරක්ඛිතං අගොපිතමෙව හොති, අරක්ෂිත අගොපිතමවේ; නගරද්වාරෙන හි පවිසිත්වා, නුවර දොරින්වැද; චොරා, සොරහු; යදිච්ඡන්ති, යමක් කැමැත්තෝද; තං කරෙය්‍යුං, ඒ කරන්නාහුයි; එවමෙව, එපරිද්දෙන්ම; ජවනෙ, ජවනෙහි; දුස්සීල්‍යාදිසු උප්පන්නෙසු, දෞශ්ශීල්‍යාදීන් උපන් කල්හි; තස්මිං අසංවරෙ සති, ඒ ජවන්හි අසංවරය ඇති කල්හි; ද්වාරම්පි අගුත්තං හොති, දොරද අගුප්තවෙයි; භවඞ්ගම්පි,

භවාඞ්ගයද; ආවජ්ජනාදීනි වීථිචිත්තානිපි, ආවජ්ජනාදී වීථි චිත්තයෝද ගුප්තවෙත්; තස්මිං පන, ඒ ජවන්හි; සීලාදිසු උප්පන්නෙසු, ශීලාදීන් උපන් කල්හි; ද්වාරම්පි ගුත්තං හොති, දොරද ගුප්තවෙයි; භවඞ්ගම්පි, භවාඞ්ගයද; ආවජ්ජනාදීනි වීථි චිත්තානිපි, ආවජ්ජනාදි වීථි චිත්තයෝද ගුප්තවෙත්; යථාකිං, කුමක්මෙනයත්; යථා, යම්සේ; නගරද්වාරෙසු සුසංවුතෙසු, නුවර දොර සුපිහිත කල්හි; කිඤ්චාපි, කිසිසේත්; අන්තො, ඇතුළු නුවර; ඝරාදයො, ගේ ආදිහු; අසංවුතා හොන්ති, අපිහිතවූවාහු නමුදු; තථාපි, එතකුදුවූවත්; අන්තොනගරෙ, ඇතුළු නුවර; සබ්බං භණ්ඩං, සියලු බඩු; සුරක්ඛිතං සුගොපිතමෙව, සුරක්ෂිත සුගොපිත මවේ; නගරද්වාරෙසු පිහිතෙසු, නුවර දොර පිහිත කල්හි; චොරානං පවෙසො නත්ථි, සොරුන්ගේ ප්‍රවේශය නොවේ; එවමෙව, එසේම; ජවනෙ සීලාදිසු උප්පන්නෙසු, ජවන්හි සීල සංවර සතිසංවර ඥාණසංවර ඛන්ති සංවර විරියසංවරය උපන් කල්හි; ද්වාරම්පි ගුත්තං හොති, දොරද ගුප්ත වෙයි; භවඞ්ගම්පි, භවාඞ්ගයද; ආවජ්ජනාදීනි වීථිචිත්තානිපි, ආවජ්ජනාදි වීථිචිත්තයෝද ගුප්ත වෙත්; තස්මා, එහෙයින්; ජවනක්ඛණෙ උප්පජ්ජමානො, ජවනක්ෂණයෙහි උපදනේ; චක්ඛුන්ද්‍රිය සංවරොති වුච්චති, චක්ෂුරින්ද්‍රිය සංවරයයි කියනලදී (මෙහි "යථාකිං" යනාදීන් නුවරෙහි දොර අසංවෘත කල්හි තත් සම්බන්ධ ගෘහාදීන්ගේ අසංවෘත බවමෙන් ජවනයෙහි අසංවරය ඇති කල්හි තත් සම්බන්ධ ද්වාරාදීන්ගේද අසංවෘත බව වේනුයි මෙසේ අන්‍යසංවරයෙක්හි අන්‍යසංවෘතත්ව සාමාන්‍යයම නිදර්ශනකළහ පූර්වාපර සාමාන්‍යය හෝ අනතර් බහිඃසාමාන්‍යය හෝ නිදර්ශන නොකළහයිද දතයුතු. නොහොත් ද්වාරභවාඞ්ගාදීන් ඇති කල්හි පසුව උපදනා ජවනය බාහ්‍යාකාරයෙන්නොව නුවර දොර හා සමකළහ. සෙසු ද්වාර භවාඞ්ගය ඇතුළු නුවර හා සමකළෝ. ප්‍රත්‍ය බලයෙන් ප්‍රථමොත්පන්නවූ භවාඞ්ගාදි හෙයින් ජවනක්ෂණයෙහි අවිද්‍යමානවූයේද; චක්ෂුරාදීන්මෙන් ඵලනිෂ්පත්තිය පිණිස විද්‍යමාන නම්වෙයි දතයුතු බාහ්‍යයාමෙන් යනුදු පරමාර්ථ හෙයින් ජවන්හුගේ බාහිර බව හා ද්වාර භවාඞ්ගයන්ගේ අභ්‍යන්තර බව හැතද "පභස්සරමිදං භික්ඛවෙ චිත්තං තඤ්ච ඛො ආගන්තුකෙහි උපක්කිලෙසෙහි උපක්කිලිට්ඨං" යී වදාළ බැවින් ආගන්තුකවූ කිසිකලෙක උපදනාවූ ජවනයම බාහිරබවද තද්විධුර ස්වභාවවූ ද්වාරාදීන්ම අභ්‍යන්තර භාවයද එක්ලෙසක ලැබේනුයි කියනලදි මෙහි චක්ෂුර්ද්වාරයට රූපය හමුවූ කල්හි නියමිතාදි වශයෙන් කුශලාකුශල ජවනයන් සත්වරෙක ඉපැද භවාඞ්ගපාතවූකල තදනුරූපවූ මනොද්වාරික ජවනය එම අරමුණෙහි සත්වරෙක ඉපදී භවාඞ්ගපාතවූකල නැවත එම දොර එම අරමුණු නිසා සත්‍රිය පුරුෂය යනාදි වශයෙන් නියම කෙරෙමින් ප්‍රසාද රඤ්ජනාදි වශයෙන් සත්වරෙක ජවන් දිවෙයි මෙසේ පවත්නා ජවනය සඳහා "ජවනෙ දුස්සීල්‍යාදිසු උප්පන්නෙසු තස්මිං අසංවරෙ සති ද්වාරම්පි අගුත්තං" යනාදිය කියනලදි "සොතෙන සද්දං සුත්වා," යනාදියෙහිදු; එසෙව නයො, මෙම නයයි (ශබ්දාදීන්ද යථා යෝගයෙන් නිමිත්තානුව්‍යඤ්ජනයෝ දතයුත්තාහුයි. ශ්‍රොත්‍රයෙන් ශබ්දය අසා සත්‍රී ශබ්දය පුරුෂ ශබ්දයයි හෝ ඉෂ්ට නිෂ්ටාදිවූ හෝ

ශ වසනුවූ නිමිත්තය නොගන්නේය. ශ්‍රැතමාත්‍රයෙහිම සිටින්නේයි.

ගීත ශබ්දාදීයෙහිදු කෙලෙසයන් හා වත හැවත පහළකරණ හෙයින් අනුබ්‍යඤ්ජනයයි ලබ්ධ ව්‍යවහාර ඇති මන්දහාසාදි වශයෙන් ව්‍යවස්ථිත ශබ්දාදි භේදභින්න ආකාරයද නොගන්නේයි. මෙසේ ගන්ධාදීන්හිදු යථා යෝගයෙන් යෙදියයුතු. මනොද්වාරයෙහි වනාහි සාවර්ජන භවාඞ්ගය මනොද්වාර නම්වෙයි ඒ දෙර ධර්මාලම්බණය හමුවූකල හේ ජවනය මනසින්ම දූහ යනාදීන් යෙදියයුතු.

( භා ¶ )

“යත්‍වාධිකරණමෙනං” යනාදියෙහි යම් කාරණයෙකින් යම් චක්ෂුරින්ද්‍රියක්හුගේ නොවැසීම හේතුකොටගෙණ සිහි නැමැති දොර නොවසාහලද චක්ෂුරින්ද්‍රිය ඇත්තාවූ හෙවත් සිහි නැමැති කවුළුවෙන් නොපියහලද චක්ෂුර්ද්වාර ඇතිව වසන්නාවූ ඒ පුද්ගලයාගේ ආත්මභාව නැමැති ගෘහයට මේ විසම්ලොභාදි පාප ධර්මයෝ නැවත නැවතඇතුල්වන්නාහුද ඒචක්ෂුරින්ද්‍රියාගේ සිහි නැමැති දොර පියන පිණිස පිළිපදනේයි මෙසේ පිළිපදනාවූ ඒ පුද්ගල තෙමේ චක්ෂුරින්ද්‍රිය රක්නේය චක්ෂුරින්ද්‍රියෙහි සංවරයට පැමිණෙන්නේයයි කියනුලැබේ.

ඒ චක්ෂුර්ද්වාරයෙහි කිසියේත් සංවරයෙක් හෝ අසංවරයෙක් හෝ නැත්තේය චක්ෂුඃප්‍රසාදය නිසා සමෘතියක් හෝ මුළාවූ සිහි ඇති බවෙක් හෝ නොවූපදනේය වැලි කෙසේ සංවරාසංවරය වන්නේදයත්?

යම් කලෙක රූපාරම්මණ ඇසට හමුවේද එකල්හිභවාඞ්ගසිත දෙවරක් ඉපිද නිරුද්ධවූ ඉක්බිති ක්‍රියා මනොධාතු නම් චිත්තය ආවර්ජන කෘත්‍යය සිද්ධකරමින් එක්වරෙක් ඉපිද නිරුද්ධවේ. ඊට ඉක්බිති චක්ෂුර්විඥාන චිත්තය දර්ශන කෘත්‍යය සිද්ධකරමින් එක්වරෙක්ද ඉන් මතු විපාක මනොධාතු නම් චිත්තය අරමුණු පිළිගැණීම සිද්ධකරමින් එක්වරෙක්ද ඊට අනතුරුව විපාක හෙතුක මනොවිඥාණධාතු නම් චිත්තය අරමුණුතීරණය කරමින් එක්වරෙක්ද ඉක්බිත්තෙන් ක්‍රියාහෙතුක මනොවිඥාණ ධාතු නම් චිත්තය අරමුණු නියම කරගණිමින් එක්වරෙක්ද ඉපිද නිරුද්ධවේ. ඊට අනතුරුව සත් වරක් ජවන් වශයෙන් සිත ඉපිද නිරුද්ධවන්නේයි මෙතෙක් චිත්තයන් අතුරෙන් භවාඞ්ග සිත් උපදනා සමයෙහිදු ආවර්ජනාදි අන්‍යතර සිතක් උපදනා සමයෙහිදු සංවරයෙක් හෝ අසංවරයෙක් හෝ නොවන්නේය ඉදින් ජවන් සිත් උපදනාසමයෙහි අමනසිකාර හෙතුවෙන් ලොභමොහ අහිරිකා අනොත්තප්පාදී අකුශලපක්ෂයෙහිවූ පාපචෛතසිකධර්මයෝ ඒ ජවන් හා එක්ව යෙදෙද්ද ඒ යෙදීම හෙතුකොටගෙණ දුඃශීල බවෙක් හෝ සිහිමුළාවෙක් හෝ නොදැනීමෙක් හෝ උපදිද්ද හේ අසංවරනම් වන්නේයි මෙසේ ජවනචිත්තක්ෂණයෙහි වන්නාවූ අසංවරයම චක්ෂුරින්ද්‍රියෙහි නොවැසීමයයි කියනුලැබේ. කුමක්හෙයින්දයත්? ජවනක්ෂණයෙහි යොනිසො මනස්කාරයෙන් යෙදී සංවරය නොකෙලේනම් චක්ෂුරාදි ද්වාරයෝද භවාඞ්ගයෝද ආවර්ජනාදි වීථිචිත්තයෝද නොරක්නාලද්දාහු වන හෙයිනි ඊට උපමා කවරේදයත්? යම්සේ නුවර සතර වාසල් දොර නොවැසූ කල්හි කිසිසේත් ඇතුළු නුවර ගේදොර කොටු ගැප් ආදීහු වසනලද්දාහු නමුදු ඇතුල්නුවර සියළු බඩු නොරක්නා ලද්දා

හුමය ඒ එසේමැයි. නුවර දෙරින් වැ
ද සොරහු යම්සේ නොවැටියාම් ඒ නරත්
නාහුම්ය එපරිද්දෙන්ම ජවනක්‍ෂණ
යෙහි දුස්සීලතාදිය උපන් කල්හි එහෙ
යින්ම ඒ ජවන් සිත් සංවරයක් නැති
කල්හි චක්‍ෂුරාදි ද්වාරයෝද ආවර්ජනාදි
පෙරහු වීථි චිත්තයෝද නොරක්නාලද්
දාහුම්වෙති. ඒ ජවන චිත්තයෝ වනා
හි අයොනිසොමනසකාර හෙතුවෙන්
කුශල පක්‍ෂයෙහිවූ සමෘති ප්‍රඥ ක්‍ෂාන්
ති වීර්‍ය්‍ය සංඛ්‍යාත චෛතසික ධර්මයන්
හෙන් යෙදී උපන්නාහුද එකල්හි ච
ක්‍ෂුර්ද්වාරයද රක්නාලද්දේමය භවා
ඞ්ගයෝද ආවර්ජනාදි වීථිචිත්තයෝද
රක්නාලද්දාහුම්වෙති ඊට උපමා කව
රේදයත්? යම්සේ නුවර දෙර වසනල
ද්දේ වීනම් ඇතුල් නුවර
ගෘහාදිය නොවසනලද්දාහු නමුදු ඇ
තුල් නුවර සියළු බඩු සුරක්‍ෂිත වේද්ද
නුවර දොර වැසූ කල්හි සොරුන්ගේ
ඇතුල්වීමම නොවේද එපරිද්දෙන්ම
ජවනක්‍ෂණයෙහි ශීලසංවර සතිසංවර
ඥාණසංවර ඛන්තිසංවර විරියසංවර
යෝ උපන් කල්හි චක්‍ෂුරාදි ද්වාරයද
රක්නාලද්දේමය භවාඞ්ගයෝද ආවජ්
ජනාදි වීථි චිත්තයෝද රක්නාලද්දාහුම
වෙති. එසේහෙයින් ජවනක්‍ෂණයෙහි
උපදනා ශීලසංවරාදියම චක්‍ෂුරින්ද්‍රිය
ගේ සංවරයයි කියනුලැබේ. මෙහි ව
නාහි චක්‍ෂුර්ද්වාරයට රූපාරම්මණ හමු
වූ කල්හි දෙවරක් සිත භවාඞ්ග වශ
යෙන් ඉපිද ඊට අනතුරුව පඤ්චද්වාරා
වර්ජන සිත එක්වරක්ද චක්‍ෂුර්විඥාන
සිත එක්වරක්ද සම්ප්‍රතිච්ඡන්න සිත
එක්වරක්ද සන්තීරණ සිත එක්වරක්
ද ව්‍යවස්ථාපන සිත එක්වරක්ද පිළි
වෙළින් ඉපිද ඊට අනතුරුව යෝනි
සොමනස්කාරයෙන් යුක්තවීනම් කු

සල්වූද අයෝනි සොමනස්කාරයෙන්
යුක්තවීනම් අකුසල්වූද සත්වරක් ජ
වන් සිත් ඉපිද නැවත භවාඞ්ගපාතය
වෙයි. හෙවත් ඒ අරමුණ ලැබීමට ම
ත්තෙන් සිත එල්බගෙණ පැවැති ක
ර්‍යාදි අරමුණක්ම අරමුණුකරන්නේය
මෙසේ කීපවාරයක් භවාඞ්ග වශයෙ
න් ඉපිද නැවත එම අරමුණ එල්බ
ගෙණ භවාඞ්ග වශයෙන් දෙවරක්ද
මනොද්වාරාවර්ජන වශයෙන් එක්ව
රෙක්ද ජවන වශයෙන් සත්වරෙක්ද
මනොද්වාරයෙහි චිත්ත වීථිය උපදනේ
ය නැවතත් සිත කීපවාරයක් භවාඞ්ග
වී එම අරමුණම ගෙණ එම මනොද්වා
රයෙහිම දෙවනවර භවාඞ්ග වශයෙ
න් දෙවරක්ද මනොද්වාරාවර්ජන වශ
යෙන් එක්වරෙක්ද ජවන් වශයෙන්
සත්වරෙක්ද සිත උපදනේය. මේ තු
න්වන මනොද්වාරික චිත්ත වීථියෙහි
උපදනා ජවනයෝම මේ ස්ත්‍රිය මේ පු
රුෂයයි තත්වාකාරයෙන් හැඳිනීම
හෝ ඒ අරමුණ ශුභ වශයෙන් ගෙණ
පැහැදීම හෝ ඇලීම හෝ අශුභ වශ
යෙන් ගෙණ ද්වේෂවීම හෝ කරනා
හුවෙති. මෙහි ජවනක්‍ෂණයෙහි දුස්සී
ල බව හෝ සිහි මුළා බව හෝ වූ කල්
හි අසංවරය වෙයි යනු තුන්වන චිත්
ත වීථියෙහි ජවන් සඳහා කීහයි දතයු
තු ශ්‍රොත්‍රද්වාර ඝ්‍රාණද්වාර ජිව්හාද්වාර
කායද්වාරයන්හිද ශබ්ද ගන්ධ රස ස්ප
ර්‍ශ යන අරමුණු ගැටීමෙන් ඒ ඒ අර
මුණු නිසා උපදනා චිත්ත වීථිහුද සං
වරාසංවරය වන ක්‍රමයද මෙම අනුසා
රයෙන් දතයුතුයි. (මේ චිත්ත වීථි වි
භාගය පරමාර්ථධර්ම ස්වභාවය නුගත
න්ට අවිෂය බැවිනුදු පරමාර්ථ ධර්ම
යෙහි සියලු තන්ති වීථි චිත්තයන්
ගේ විභාගය පොදුන්ගෙන් මුළාවන
බැවිනුදු චක්‍ෂුරාදි සදෙර උපදනා

චිත්තවීථි ක්‍රමය සංක්ෂෙපයෙන් දක්වනු ලැබේ. මේ මනාව සිත්හි ලා දරිය යුතු. චක්ෂුර්ද්වාරය ශ්‍රොත්‍රද්වාරය ඝ්‍රාණද්වාරය ජිව්හාද්වාරය කායද්වාරය මනොද්වාරයයි චිත්තවීථීන්ගේ උත්පත්තියට ස්ථාන වූ ද්වාරයෝ සදෙනෙකි. චක්ෂුර්ද්වාරයෙහි වනාහි අතිමහන්තාරම්මණ වීථියෙක මහන්තාරම්මණ වීථි දෙකෙක පරිත්තාරම්මණ වීථි සයෙක අතිපරිත්තාරම්මණ වීථි සයෙකැයි ගණන වශයෙන් පසළොස් චිත්ත වීථියෙක් උපදනාහ. එසේම ශ්‍රොත්‍රද්වාරයෙහි පසළොසෙක ඝ්‍රාණද්වාරයෙහි පසළොසෙක ජිව්හාද්වාරයෙහි පසළොසෙක කායද්වාරයෙහි පසළොසෙකැයි පඤ්චද්වාරයෙහි සම්භාරයෙන් පන්සැත්තෑ චිත්තවීථි කෙණෙක් උපදනාහ. මනොද්වාරයෙහි වනාහි විභූතාරම්මණ වීථි පසෙක අවිභූතාරම්මණ වීථි දෙකෙකැයි සත්වැදෑරුම් චිත්තවීථි කෙණෙක් උපදනාහ.

එහිත් චක්ෂුර්ද්වාරයෙහි උපදනා අතිමහන්තාරම්මණ වීථිය කෙසේදයත්? භූමිජාති සම්ප්‍රයුක්ත ධර්ම සංස්කාර ආරම්මණයන්ගේ වශයෙන් තමාගේ ප්‍රතිසන්ධි චිත්තයට සදෘශවූ භවාඞ්ගස්‍රොතස හෙවත් භවාඞ්ග චිත්ත පරම්පරාව පවත්නා සමයෙහි යම් භවාඞ්ග චිත්තයක් හා සමග එකක්ෂණිකව උපන් රූපාරම්මණක් ඇත්තේවේ නම් ඒ අරමුණ මධ්‍යමායුෂ්කවූ චක්ෂුඃප්‍රසාදයට හමුව ගැටෙයි. සත්වයන්ගේ ප්‍රතිසන්ධි චිත්තය භවාඞ්ග චිත්තය චුති චිත්තය යන තුණ එක් භවයෙක නාමාවරුදී එකම ජාතියෙහිවූද එකම අරමුණක එල්බ සිටිනාවූද එකම චිත්තයෙක් වෙති. ඉතාත්මයෙහි විද පුරුදුවූ යම් අරමුණෙක් සිතට නොඑළඹිනම් ඒ කාලයෙහි සිත තමාගේ ප්‍රතිසන්ධිය ගෙණ දුන් පූර්ව ජාතිය පිළිබඳවූ කර්ම කර්මනිමිත්ත ගතිනිමිත්තයන්ගෙන් යමක් අරමුණුකොට පවත්නේය. එසේ පැවැත්ම භවාඞ්ගවර්මයයි කියනු ලැබේ.

අසංඥ තලයෙහි උපදනා කාලයෙහි පන්සියයක් කප් මුළුල්ලෙහි චිත්ත පරම්පරාවගේ උත්පත්තිය භාවනා බලයෙන් නවතනු විනා අනාදිමත්ව පවත්නා චිත්ත පරම්පරාව ස්කන්ධ පරිනිර්වාණය තිබිකොට එකවෙක අනන්තර ප්‍රත්‍යයවීමෙන් පවත්නේය. එසේ පවත්නා චිත්ත පරම්පරාවගේ පිළිවෙළ නොසිඳීම පිණිස භවයට හෙවත් සංසාරයට අඞ්ග වශයෙන් චිත්තයාගේ පැවැත්ම භවාඞ්ග නම. අරමුණු හා එකක්ෂණිකව ඉපිද වීථි සිත් ඉපදීමට මත්තෙන් ඉක්මගිය භවාඞ්ග අතීත භවාඞ්ග නාම. මෙසේ උපන් රූපාරම්මණ චක්ෂුඃප්‍රසාදය හා ගැටුනු කල්හි වීථි සිත් ඉපදීමට ආරම්භවූ බැවින් භවාඞ්ග ශ්‍රොතස චඤ්චල වීම් වශයෙන් වරක්ද භවාඞ්ග ශ්‍රොතස සිඳීම් වශයෙන් වරක්දැයි මෙසේ දෙවරක් භවාඞ්ග සිත ඉපිද නිරුද්ධ වෙයි. ඉක්බිති ඒ අරමුණ එල්බගෙණ පඤ්චද්වාරාවර්ජන සිත ආවර්ජන කෘත්‍යය සිද්ධකොරමින් එක්වරක්ද කුශලාකුශල විපාකවූ චක්ෂුර්විඥාන දෙදෙනා අතුරෙන් සුදුසු පරිද්දෙන් එක්තරා සිතක් දර්ශන කෘත්‍යය සිද්ධකරමින් එක්වරක්ද සම්ප්‍රත්‍යෙෂණ චිත්තයන් දෙදෙනා අතුරෙන් අනුරූපවූ සිතෙක් අරමුණු පිළිගැණීම සිද්ධකොරමින් එක්වරක්ද කුශල විපාක සන්තීරණ දෙකය අකුශල විපාක සන්තීරණය යන චිත්තයන් තුන්දෙන අතුරෙන් සුදුසු චිත්තයෙක් තීරණ කෘත්‍යය සිද්ධකොරමින් එක්වරක්ද

( ශා ¶ )

වොට්ඨපනචිත්තය ව්‍යවස්ථාපන කෘත්‍යය සිද්ධකරෙමින් එක්වරෙක් දක්ති මෙසේ පිළිවෙල නොවරදවා ඉපිද ඉපිද නිරුද්ධවන්නේයි. ඉක්බිති එම අරමුණම එල්බගෙණ යුහුසුළුවද්ද නාගැන්ම හෝ පැහැදීම හෝ ඇලීම හෝ දූෂ්‍යවීම හෝ මුළාවීම හෝ සිද්ධකොරෙමින් එකුන්තිස් කාමාවචර ජවනයන් අතුරෙන් එක්තරා චිත්තයක් ලබනලද සුදුසු ප්‍රත්‍යය ඇතිව සත්වරෙක් ජවනකෘත්‍යවශයෙන් ඉපිද නිරුද්ධවේ ඉක්බිති එම අරමුණම ගෙණ එකොළොස් තදාලම්බණසිත් අතුරෙන් එකක් තදාලම්බනකෘත්‍යවශයෙන් දෙවරක් ඉපිද නිරුද්ධවූ කල්හි ඒ උපන් රූපාලම්බනය සතළොස් චිත්තක්ෂණයකට ආයුෂ ඇතිව උපන් හෙයින් මේ දෙවන තදාලම්බනය හා සමග නිරුද්ධවූ ඉක්බිති පෙරමෙන්ම පූර්වජාතිකර්මාදියම එල්බගෙණ සිත භවාඞ්ගශ්‍රොතසට බස්නේය * මේ චක්ෂුර්ද්වාරයෙහි පවත්නා අතිමහත්තාරම්මණවීථියයි දතයුතු. යම් රූපාරමුණක් ඉපිද භවාඞ්ගසිත් දෙකක් ඉක්මගොස් හමුවීනම් තදාලම්බනවය ඉපදීමට අරමුණගේ ආයුෂ මදබැවින් සප්තජවනයන්ගේ අවසානයෙහි භවාඞ්ගවෙයි මේ පළමුවන මහත්තාරම්මණවීථි නම්. මෙහි අතීතභවාඞ්ගය හා සමග උපන් රූපාලම්බන චක්ෂුඃප්‍රසාදයෝ වනාහි චිත්තක්ෂණ සතළොසකට ම ආයුෂ ඇත්තාහු වීථි කෙළවර දෙන තදාලම්බනයාගේ භවඞ්ගය හා සමග බිඳෙනු ලබන්නාහුය, මේ වීථියෙහි පෙරපසු භවාඞ්ගයෝ පූර්වජාතිය පිළිබඳවූ කර්ම කර්මනිමිත්ත ගතිනිමිත්තයන් අතුරෙන් යමක් අරමුණුකොට පවත්නා දශවිධ කාමාවචර භවාඞ්ගයන් අතුරෙන් එක්තරා සිතක් ම වන්නේය පඤ්චද්වාරාවජ්ජනාදී තදාලම්බනය කෙළවරකොට ඇති සියලු වීථි චිත්තයෝ ඒ අතීතභවාඞ්ගය හා සමග උපන් රූපාලම්බනය අරමුණු කරන්නාහුය නිශ්‍රයවශයෙන් වනාහි චක්ෂුර්විඥානය මන්දායුක අමන්දායුක මධ්‍යමායුකවශයෙන් තුන්වැදෑරුම්වූ චක්ෂුර්වස්තුන් අතුරෙන් අන්තභවාඞ්ගය හා සමග උපන් මධ්‍යමායුකවූ චක්ෂුර්වස්තුව ම නිශ්‍රයකොට පවත්නේය සෙසු සියලු චිත්තයෝ පූර්වපූර්වවූ චිත්තයන් හා සමග උපන්නාවූ හෘදයවස්තුව ම නිශ්‍රයකොට පවත්නාහුය අතීතභවාඞ්ගය හා සමග උපන් රූපාදී පඤ්චාලම්බනයෝ එම භවාඞ්ගයන් හා එක්වඋපන් රූපාදි පඤ්චප්‍රසාදයන් හා සමග ගැටෙන්නාහුවෙති ඒ අතීත භවාඞ්ගය හා එක්ව උපන් ප්‍රසාදරූපයෝ මධ්‍යමායුක නම් ඊට පළමු පළමු චිත්තක්ෂණ හා එක්ව උපන් ප්‍රසාදරූපයෝ මන්දායුක නම් ඊටපසු චිත්තක්ෂණ හා එක්ව උපන් ප්‍රසාදරූපයෝ අමන්ද

* රූ෴ ෴ ෴ ෴......෴......෴......෴......෴-
අ-භ භ-ච භ-උ ප ච සම් සං වු-
෴......෴......෴......෴......෴......෴......෴......෴......෴-රූ-෴
ජ ජ ජ ජ ජ ජ ජ ත ත භ

මේ චක්ෂුර්ද්වාරයෙහි උපදනා අතිමහත්තාරම්මණ චිත්තවීථි වින්‍යාසයයි මේ නයින් සෙසුද යෙදෙන පරිද්දෙන් පඤ්චද්වාරයෙහි සෙසු සිව්සැත්තෑවක් වීථිහුද වින්‍යාසකටයුතු මෙහි එකාබද්ධවූ රේඛාත්‍රයෙන් උත්පාදස්ථිති භඞ්ග යන ක්ෂණත්‍රයෙන් යුත් සිතද යට අක්ෂරවලින් චිත්ත නාමයෝද දතයුතුයි මුල එක් අතීත භවාඞ්ගයක් දක්වූයේ රූපාරමුණ ඉපිද ඉක්ම ගිය භවාඞ්ගය පෙන්වීමසදහායි. කෙළවර භවාඞ්ගය දක්වූයේ වීථි අවසානයෙහි සිත භවාඞ්ග ශ්‍රොතසට වැටුනුබව හැඟවීමපිණිසවේ චිත්තක්ෂණ සතළොසගේ ආද්‍යන්තයෙහි රූකාරයෙන් රූපාරමුණ සතළොස් චිත්තක්ෂණයකට ආයු ඇතිබව හඟවයි. එකාබද්ධවූ චිත්තක්ෂණයෝතුමු එක් චිත්තවීථියක්බව දතයුතුයි.

ශුක නාම ඒ ඵුත්වැදූරුම් ප්‍රසාදයන් අතුරෙන් මජ්ඣිමායුක ප්‍රසාදයෝ ම අරමුණු හා සමග නැවෙත්නාහුය † මෙසේ ම යම් රූපාරමුණක් ඉපිද භවාඞ්ග තුනක් ඉක්මවා හමුවීනම් ඒ අරමුණ සත්වන ජවනක්‍ෂණය හා සමානායුෂ්කබැවින් සත්වනජවනයෙන් මතු භවාඞ්ග වන හෙයින් දෙවන මහන්තාරම්මණවීථි නම් වේ. යම් රූපාරමුණක් ඉපිද භවාඞ්ග සතරවාරයක් ඉක්මවා හමුවීනම් භවාඞ්ගචලන භවාඞ්ගොපච්ඡේද පඤ්චද්වාරාවර්ජන චක්‍ෂුර්විඥාන සම්ප්‍රතීච්ඡන සන්තීරණ යන එකෙකී චිත්තය බැගින් ඉපිද ව්‍යවස්ථාපනචිත්තය දාමණක් දෙවරක් ඉපිද අරමුණෙහි ආයුෂ මද බැවින් ජවනතදාලම්බනයන් නො ඉපද ම සිත භවාඞ්ගවෙයි ඒ පස්වන භවාඞ්ගයට රූපාරම්මණෙහි සතළොස් චිත්තක්‍ෂණය පිරෙණහෙයින් පස්වන භවාඞ්ගය හා සමග අරමුණ නිරුඬවෙයි මේ පළමුවන පරිත්තාරම්මණවීථි නම් මෙසේ ම රූපාරමුණ ඉපිද භවාඞ්ග සිත් පසක් ඉක්මවා හමුවීනම් එහිද ව්‍යවස්ථාපන දෙසිතක් ඉපිද සිත භවාඞ්ගවී සතරවන භවාඞ්ගය හා සමග ද භවාඞ්ග සයක් ඉක්මවා හමුවීනම් ව්‍යවස්ථාපන දෙසිත කෙළවර භවාඞ්ගවී තුන්වන භවාඞ්ගය හා සමග ද භවාඞ්ගසිත් සතක් ඉක්මවා හමුවීනම් ව්‍යවස්ථාපන දෙසිත කෙළවර භවාඞ්ගවී දෙවනභවාඞ්ගය හා සමග ද භවාඞ්ගසිත් අටක් ඉක්මවා හමුවීනම් ඒද දෙවන ව්‍යවස්ථාපනසිත කෙළවර උපදනා භවාඞ්ගය හා සමග ද භවාඞ්ග නවවරක් ඉක්මවා හමුවීනම් දෙවන ව්‍යවස්ථාපනසිත හා සමග ද ආයු කෙළවරවූ බැවින් රූපාරමුණ නිරුඬවන්නේයි. මේ චිත්තවීථිහු සදෙන සවල්පායුෂ්ක අරමුණෙහි උපදනා හෙයින් පරිත්තාරම්මණවීථිහු නම්වෙත්මැයි.

තවද රූපාරමුණ ඉපිද භවාඞ්ග දශවාරයක් හෝ එකොළොස්වාරයක් හෝ දොළොස්වාරයක් හෝ තෙළෙස්වාරයක් හෝ තුදුස්වාරයක් හෝ පසළොස්වාරයක් හෝ ඉක්මවා හමුවීනම් ඒ මොසවාරයෙහි ම ජවන තදාලම්බන නබා පචචාරාවර්ජනාදි ව්‍යවස්ථාපනසිත කෙළවරකොට ඇති එකම වීථිචිත්තයක්හුගේ ඉපදීමටපවා අරමුණ ආයු මදබැවින් එකම වීථිචිත්තයක්හුත් නොඉපද භවාඞ්ග චලන භවඞ්ගුපච්ඡේද යන දෙසිත පමණක් ඉපිද නැවතත් සිත භවාඞ්ගශ්‍රොතසටම බස්නේය ඒ අරමුණ පසළොස් චිත්තක්‍ෂණය පිරෙණතැන නිරුඬවෙයි මේ වීථිහු සදෙන චක්‍ෂුර්වාරයෙහි ඉතා සවල්පායුෂ්ක අරමුණෙහි උපදනා බැවින් අතිපරිත්තාරම්මණවීථිහු නම් වන්නාහුය මෙසේ චක්‍ෂුර්වාරයෙහි උපදනා එක් අතිමහන්තාරම්මණවීථියක මහන්තාරම්මණ දෙවීථියක පරිත්තාරම්මණවීථිහු සදෙනක අතිපරිත්තාරම්මණවීථිහු සදෙනකැයි යන පසළොස් ආකාර චිත්තවීථිහු දතයුත්තාහ.

අවශෙෂවූ ශ්‍රොත්‍රවාර ඝ්‍රාණවාර ජිහ්වාවාර කායවාර යන සතර දෙරෙහි ද ශබ්දාරම්මණාදිය එල්බගෙණ වීථිපසළොස බැගින් උපදනා බැවින් සර්වප්‍රකාරයෙන්ම පඤ්චවාරයෙහිපන් සැත්තෑවක් චිත්තවීථිහු දතයුත්තූයි. මනොවාරයෙහි වනාහි විභූතාරම්මණවීථි පසෙක අවිභූතාරම්මණ වීථිහු

† පචාරම්මණෙහි සහුප්පන්නානෙහි සට්ඨිනා පචප්පසාද මජ්ඣිමායුකා නාම තතො පුරිමුප්පන්නා මන්දායුකා නාම-තතො පච්ඡිමුප්පන්නා අමන්දායුකා නාම යන්නු (මණිසාර මඤ්ජූසාටීකායි)

දෙදෙනෙකු ඩිවිඤ්ඤාණවීථීන් දෙකක් වෙත් එහිදු බණ පච්චුප්පන්නකාලිකවූ විඥප්ති ලක්ෂණ රූප සඳෙනා හැර අවශේෂවූ ෂඩාලම්බන සංඛ්‍යාත දෙවිසි රූපයන්ගෙන් යමක් අරමුණුකොට ගෙණ මනොද්වාර වීථි පහළවේත්මය * සතළොස් චිත්තක්ෂණයකට ආයුෂ ඇත්තාවූ ෂඩාලම්බන ධර්මයන් අතුරෙන් යම්කිසි අරමුණක් ඉපිද එකම භවාඞ්ගයක් ඉක්මවා භවාඞ්ගචලන භවාඞ්ගුපච්ඡේද යන දෙසිත දෙවරක්ද මනොද්වාරාවර්ජන සිත ආවර්ජන කෘත්‍යයසිද්ධකෙරෙමින් එක්වරක්ද ඉක්බිති ඝවකී හයින් ජවනකෘත්‍ය වශයෙන් සත්වරක්ද තදාලම්බන කෘත්‍යවශයෙන් දෙවරක්ද ඉපිද සිත භවාඞ්ගවී සතරවන භවාඞ්ගය හා සමග අරමුණ නිරුද්ධවේ † මේ ක්‍රමයෙන් අවශෙෂ සතර වීථියෙහිද අතීත භවාඞ්ග දෙවරක් හා ද තුන්වරක් හා ද සතරවරක් හා ද පස්වරක් හා ද එක්ව උපදනා ආලම්බනයෝ වීථි කෙළවර තුන්වන දෙවන පළමුවන භවාඞ්ග හා ද දෙවන තදාලම්බනයාගේ භඞ්ගය හා ද සමාන කාලිකව නිරුද්ධ වෙත්මය. මේ වීථි පස මනොද්වාරයෙහි ප්‍රකටවූ අරමුණෙහිම උපදනා හෙයින් විභූතාරම්මණවීථීහු නම්වෙත් එසේම අවිභූතාරම්මණ වීථි දෙක්හි තදාලම්බන නොඉපද ජවනාහතාය හා සමගද ජවනයට අනතුරූ භවාඞ්ගය හා සමගද නිරුද්ධවන අරමුණු ඇති කල්හි අවිභූතාරම්මණ වීථීහුයයි කියනලදි. මෙසේ මනොද්වාරයෙහි උපදනා කාමාවචර සඤ්ඤාවීථීහු දනයුතුයි ~

මනොද්වාරයෙහි උපදනා රූපාරූප අභිඥමාර්ගඵල චිත්ත වීථීන්ගේ විභාගය ඉතා දීර්ඝ බැවින් ද මෙතන්හි ඔවුන් අප්‍රසඞ්ගවන හෙයින්ද විභාග නොදක්වම්හ. මේ චිත්තවීථි ක්‍රමය මෙසේ උපදනේ කවර හේතුවකින් දැයි නොදන්නාහු මෙහි සංසය උපදවනබැවින් ඔවුන්ගේ සංශය නිවාරණය පිණිස චෝදනා පරිහාරවශයෙන් ඒ වීථීන්ගේම ප්‍රකීර්ණක විස්තරයදක්වනු ලැබේ ~

චක්ෂුරාදී පස්දොරට රූපාදි අරමුණුපස හමුවනකල ඒ ඒ ප්‍රසාද රූප හා ආරම්මණයෝද සිටිවනම සිට හමුවන්නාහුද? නොහොත් ඔවුනොවුන් කරා එළඹ හමුවන්නාහුදයත්? ඔවුන් පස්දෙනා අතුරෙන් රූප ශබ්දාලම්බණයෝ වනාහි තම තමන්ගේ විෂයස්ථානවූ චක්ෂුඃශ්‍රොත්‍රයන්ට සිටිවනම සිට දුරදීම චන්ද්‍ර තාරකා රූප මෙඝගර්ජනාදි ශබ්දයන්මෙන් ගොචර බවට පැමිණෙන්නාහුය එසේ හෙයින් මෙහෙයිකළු පරිච්ඡෙදයන්ම රූප ශබ්දාලම්බනයෝ නොයෙක් කලාප ගතවූවාහු එක්රැස්ව එකම චක්ෂුඃශ්‍රොත්‍රයන්ට හමුබවට පැමිණෙන්නාහුය.(1

* චිත්ත චෛතසිකයෝ සතළොස් චිත්තක්ෂණායුක නොවන බැවින් පච්චුප්පන්නකාලිකව අරමුණු නොවෙත්මැයි නිර්වාණ ප්‍රඥප්තිධර්මයෝ වනාහි කාලවිමුක්තව අරමුණුවෙත්

† රූ ශ් ...... ශ් ...... ශ් ...... ශ් ...... ශ් ...... ශ් ...... ශ් ...... ශ් ...... ශ් ...... ශ් —
අ-භ භ-ච භ-උ ම ජ ජ ජ ජ ජ ජ —
ශ් ...... ශ් ...... ශ් ...... ශ් ...... ශ් ...... ශ් ...... ශ් ...... ශ්
ජ ත ත භ භ භ භ භ

මේ මනොද්වාරයෙහි උපදනා විභූතාරම්මණවීථි විභාගයයි මේ නයින්ම සෙසු වීථිහුද යෙදෙන යෙදෙනපරිද්දෙන් විභාග කටයුතුයි මේ වීථින්ගේ කෙළවර භවාඞ්ග සතරක් දක්වූයේ ඒ රූපාරමුණ මතුචිත්තක්ෂණ සතරකට ආයුෂ ඇතිබැවින් අරමුණ නිරුද්ධවන කාලය හැඟවීමපිණිසයි.

(1) රූපසද්දාලම්බනානි සකසකඨානෙ ඨත්වාව ගොචර භාවං ගච්ඡන්තීති ආ... සො යාසු රූපං අනෙක කලාපගතානිපි ආපාථමාගච්ඡන්තීති (විභාවිනී...

කෙසේ හමුවන්නාහුදයත්? නොයෙක් කලාපගතවූ රූපයන් එකට රැස්ව ඔවුනොවුන් සංඝාතය කළහැකි හෙයින් සිවිකොවහන න්‍යායෙන් හෙවත් බොහෝදෙන එකට රැස්වීමෙන් සිවිකාව හෙවත් පල්ලැක්කිය ඉසිලිය හැකිවන්නාක්මෙන් චක්ෂුර්විඥානයට ආලම්බන ප්‍රත්‍යයවන්නේය. එකක් හෝ දෙකක් හෝ රූපාලම්බනයෝම චක්ෂුර්විඥානයට ආලම්බන ප්‍රත්‍යය නොවන්නාහුය (2)

මෙම අර්ථය හඟවන පිණිස භාග්‍යවතුන්වහන්සේ විශුද්ධ විභඞ්ග ප්‍රකරණ පාලියෙහි ඇසද රූපයන්ද නිසා චක්ෂුර්විඥානය උපදනේයයි බහුවචන නිර්දේශයෙන්ම රූපය වදාරණලදී. (3)

මෙසේවූකල්හි චක්ෂුර්විඥානය සමූහයකු අරමුණු කරණ බවට පැමිණෙන්නේ නොවේදයත්? සමූහයක්ම නැති බැවින් එසේ නොවන්නේමය ඒ එසේමැයි පරමාර්ථ වශයෙන් යම්කිසි සමූහයෙක් නම් නැත්තේමය. යම් ප්‍රමාණ රූපාරමුණෙක චක්ෂුර්විඥානයට හමුවීමට සුදුසු තැනක පිහිටනලද ද ප්‍රත්‍යයාන්තරයන්ගේ යෙදීමක් ඇති කල්හි එපමණමවූ රූපාරමුණු එක් රැස්ව යටකී සිවිකොවහන න්‍යායෙන් චක්ෂුර්විඥානයට ආලම්බන ප්‍රත්‍යය වන්නේයි. (4)

මේ චක්ෂුඃශ්‍රොත්‍ර දෙදෙන කරා රූපශබ්දාලම්බනයෝ එළඹුනාහුම අරමුණු කරන්නාහුයයි ඇතැම් ආචාර්යවරයන්ගේ මත ඇති බැවින් ඒ මත නිරාකරණය පිණිස මේ ප්‍රශ්නයවෙයි. ඉදින් චක්ෂුඃශ්‍රොත්‍ර දෙදෙන තමන් කරා පැමිණියාවූම රූපශබ්දයෝ අරමුණු වශයෙන් ගන්නාහු නම් ඇසින්ම ඇස වර්ණයද බැම මුලද දක්කයුතු නොවේදයත්? ශබ්දය අසා පෙර දිගින් හෝ දකුණු දිගින් හෝ ඇසුනේයයි දික්දෙශ නියමය දැන විදින්නාවූ ශබ්දවෙධියාගේ ශරප්‍රහාරය ඔහුගේකන් තුලම ගියයුතු නොවේද? මේ දෙකම නොවන හෙයින් රූපශබ්දාලම්බනයෝ සිටි තැනම සිට චක්ෂුඃශ්‍රොත්‍රයන්ට ගොචරවන්නාහුමයයි දතයුතුයි. (5)

එතකුදුවුවත් දුර සිටියවුන් විසින් රජකාදීන්ගේ අපුළන ශබ්දය කලකින් අසන බැවින් ඒ කාලක්ෂෙපය වන්නේ ශබ්දය ශ්‍රොත්‍රය කරා පැමිණෙනු පිණිස නොවේදයත්? එසේ නොපැමිණෙන්නේමය. කුමක්හෙයින්දයත්? දුරස්ථාන සමීපස්ථානයන්හි සිටියවුන්ට ප්‍රකට අප්‍රකටවූ ශබ්දයෙහි ග්‍රහණ විශෙෂය ඇති බැවිනැයි දතයුතු. (6)

---

(2) අනෙක කලාපගතානි බහුනියෙව රූපායතනානි සමුදිතානි සංහච්චකාරිතාය සිවිකුබ්බාහන ඤායෙන චක්ඛුවිඤ්ඤාණස්ස ආරම්මණපච්චයො න එකකතිපයානිවාති දස්සෙතීති—(අනුටීකා) යි.

(3) චක්ඛුඤ්ච පටිච්ච රූපෙච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණංයි-(විභඞ්ගපාලියි)

(4) එවංසන්තෙ චක්ඛුවිඤ්ඤාණං සමුදායාරම්මණං ආපජ්ජතීති නාපජ්ජති සමුදායස්සෙව අභාවතො නහි පරමත්ථතො සමුදායො නාමකොචි අත්ථි වණ්ණායතන මෙවහි යත්තකං යොග්‍යදෙසෙ අවට්ඨිතං පච්චයන්තර සමායොගෙ සති තත්තකං යථාවුත්තෙන ඤායෙන චක්ඛුවිඤ්ඤාණස්ස ආරම්මණ පච්චයො හොතීයි -(අනුටීකා) යි.

(5) යදි පත්තං ද්වයං අත්ත-සමීපං යෙව ගණ්හති
අක්ඛිවණ්ණං තථා මූලං-පස්සෙය්‍ය භමුකස්සච
දිසා දෙස ව්වත්ථානං-සද්දස්ස නභවෙය්‍ය ච,
සියා ච සද්දවෙධිස්ස=සකණ්ණෙ සරපාතනං-,(විභාවිනී ටීකා)

(6) තනුච දූරෙ ඨිතෙහි රජකාදි සද්දෙ චිරෙන සුය්‍යන්තීති න දූරාසන්නානං යථා පාකටෙ සද්දෙ ගහණ විසෙසතො-(අනුටීකා) යි

සෙසු ගන්ධ රස ස්පර්ශයෝ වනාහි ඝ්‍රාණ ජිව්හා කායවස්තු සංඛ්‍යාත නිශ්‍රයන් කරා පැමිණ ඇලී ගැටුනාහුම විඤ්ඤාණයන්ගේ ඉපදීමට කාරණාවන්නාහ. එහෙයින් එකෙකි කලාපයෙහි පිහිටියාවූම ගන්ධ රස ස්පර්ශයෝද හමුබවට පැමිණෙන්මැයි. (8)

භවාඞ්ග චලනය යනු වාතාබාධීන් පවතින්සැලෙන්නාක්මෙන් වනනාවූ සැලීමක් නොව භවාඞ්ගසිතෙහි විසදෘශාකාරයෙන් හටගන්නා පැවැත්මක්වෙයි සැලෙන්නාවූ ඒ ආකාරයෙන්දෙවරක් පැවැත්ම කාරණකොට ගෙණ පෙරභවාඞ්ගසිත් හා සමනොවූ වීථිචිත්තයන්ගේ පැවැත්මට කාරණ බවවන්නේයි. (8)

රූපාදී අරමුණු චක්‍ෂුරාදි ද්වාරයන්ට හමුවූකල්හි වීථිචිත්තයන් උපදිනු සැමතිව භවාඞ්ගශ්‍රෝතස සිඳෙනනාහු වහා නොසිඳී කුමක් හෙයින් දෙවරක්ම භවාඞ්ග සිත් උපදනාහුද යත්? යම්සේ වේගයෙන් දිවන්නාවූ පුරුෂතෙම නවත්නා කැමැත්තේද එක් පියවරක් හෝ දෙපියවරක් හෝ පොළා පැණ ගොස්ම නවත්නේවේද එසේම භවාඞ්ග වේගය නොසිඳියහැකිව දෙවරදක්වා ඉපද සිඳෙන්නේයි. (9)

චක්‍ෂුර්විඥානයාගේ නිශ්‍රයවූ චක්‍ෂුස්ප්‍රසාදය හා රූපාරම්මණ ගැටුනුකල්හි අන්‍යවූ හෘදය වස්තු ආශ්‍රිතවූ භවාඞ්ග චිත්තයාගේ සැලීම කෙසේ වන්නේද යත්? හෘදය වස්තුවෙන් අන්‍යවූ චක්‍ෂුස්ප්‍රසාද වස්තුව හා රූපාරම්මණ ගැටුනු කල්හි අන්‍යවූ හෘදය වස්තු ආශ්‍රිතවූ භවාඞ්ග චිත්තයාගේ සැලීම රූපකලාපයන්ගේ එකාබද්ධව පිහිටීම් වශයෙන් වන්නේයි ඊට උපමා කවරේදයත්? එක් බෙරමූහුණක ඇළුනාවූ සකුරුකැටයක් මත්තෙහි මැස්සෙකු උන්කල අනික් බෙර මුහුණට කඩිප්පුආදියෙන් ගැසූකල්හි ඒ බෙර මුහුණ සැලීමෙන් එකා බද්ධවූ වරපට ආදිය සැලේද ඉක්බිති ඊට එකා බද්ධවූ ඒ බෙරමූහුණ සැලීමෙන් එහි තුබූ සකුරුකැටය සැලී මැස්සා ඉගිලයන්නාක්මෙන් රූපාරම්මණ හැපීමෙන් චක්‍ෂුස්ප්‍රසාදය සැලී ඊට එකාබද්ධවූ රූප කලාපයන් ක්‍රමයෙන් සැලෙමින් ගොස් හෘදයවස්තු රූපය සැලී ඒ ආශ්‍රයකොට පවත්නා භවාඞ්ගයාගේ සැලීම වන්නේයි. (10)

චිත්තවිභාගයෙහි වනාහි චක්‍ෂුර්විඥානයන් දෙදෙනෙක සම්ප්‍රතිච්ඡන්නයන් දෙදෙනෙක සන්තීරණයන් තුන්දෙනෙකැයි කියනලද බැවින් යම් වීථියක චක්‍ෂුර්විඥාන සම්ප්‍රතිච්ඡන්න සන්තීරණයෝ අසවල් සිත්හුයයි කෙසේ නියමකොට දැනගන්නාහුදයත්? යම් අකුශල චිත්තවීථියක් අනිෂ්ටාරම්මණයෙක්හි උපදනේනම් එකල උපදනා චක්‍ෂුර්විඥාන සම්ප්‍රතිච්ඡන්න සන්තීරණයෝද අකුශල විපාකම වන්නාහ යම් ශෝභන චිත්ත වීථියෝ ඉෂ්ටාලම්බනයෙක්හි උපදනේනම් එහි උපදනාවූ චක්‍ෂුර්විඥාන සම්ප්‍රතිච්ඡන්න

(7) සෙසානි පන ඝාණාදි නිස්සයෙසු අල්ලීනානෙව විඤ්ඤාණුප්පත්තියා කාරණං හොන්ති එකෙක කලාපගතානිපි ආපාථමාගච්ඡන්තියෙව-(විභාවනී ටීකා)

(8) භවඞ්ග චලනන්ති භවඞ්ග චිත්තස්ස පකම්පනං තථා විසභාගත්තං පවත්තියා විසදිසස්ස කාරණභාවූපගමණන්ති අත්ථො —(පරමත්ථ මඤ්ජුසා)

(9) යථාවෙගෙන ධාවන්තො ඨාතුකාමොපි පුරිසො එක ද්විපදවාරෙ අතික්කමිත්වා තිට්ඨති එවං ද්වික්ඛත්තුං උප්පජ්ජිත්වා වොච්ඡිජ්ජති—[විභාවනී ටීකා]

10 ඝට්ටිතෙ අඤ්ඤ වත්ථුම්හි, අඤ්ඤනිස්සිත කම්පනං,
එකාබද්ධෙන හොන්තීති, සක්ඛරොපමයා වදෙ—(සච්චසංඛෙපො)

සන්තීරණයෝ කුශල විපාකම වන්නාහුය. 11)

ජවන්සිත් ඉපදීමෙහි එකූන්තිස්කාමාවචර ජවනයන් අතුරෙන් එක්තරා ජවනයෙක් දිවෙති කියල්හි අසවල් ජවනයකී කෙසේ දතයුත්තේදයත්? ඒ කාලයෙහි යොනිසො මනසිකාරයෙන් යෙදුනේ වී නම් කුසල් ජවන්ද අයොනිසො මනස්කාරයෙන් යෙදුනේ වී නම් අකුසල් ජවන්ද රාගාදි අනුසයයන්ගෙන් මිදුනාවූ අර්හත් පුද්ගලයෙක් වී නම් ක්‍රියා ජවන්ද දිවන්නාහුය. මෙහි කුශලා කුශලජවන් රහතුන්වද ක්‍රියා ජවන් නොරහතුන්වද නූපදනා බව දතයුතුසී. (12)

අතිමහන්තාලම්බන වීථියෙහි මෙන් මහන්තාලම්බන වීථියෙහි ජවන් කෙළවර තදාලම්බන සිත් නූපදනේ කුමනහෙතුවකින්දයත්? තුදුස් චිත්තක්ෂණයකට ආයුෂ ඇත්තාවූ අරමුණෙහි පළමුකොට අරමුණනිරුද්ධවූ බැවින් තදාලම්බනයෝ නූපදින්මය පසළොස්චිත්තක්ෂණයකම ආයුෂඇත්තාවූ අරමුණෙහිද ජවනයන්ගේ ඉපදීමෙන් මතු එකම චිත්තක්ෂණයකුගේ ආයුෂ ඉතිරිව ඇති බැවින් තදාලම්බනයෝ නූපදනාහුය තදාලම්බන චිත්තයෝවනාහි යුගනන්ධ (සෙවන් යුගල වශයෙන් බැඳී පවත්නා) ධම්මයන් බැවින් දෙවරක්ම ඉපදීමට ආයුෂ මද අරමුණෙහි දෙවන තදාලම්බනයාගේ ඉපදීම නොවන්නෙන් පළමුවන සිතද නූපදනේමැයි හමද චිත්තවිභාගයෙහි තදාලම්බන සිත නොආබැවින් ඇතමෙක් හොත් ඒ කුමනසිතක්දෙයහොත්යි සංසය කෙරෙත්මිය කාමාවචර මහා විපාකසිත් අටය කුශලා කුශල විපාක සන්තීරණ තුණය යන එකොළොසින් අනුරූපවූ සිතක්ම තදාලම්බන වශයෙන් උපදනේය. ඒවනාහි ජවනයා විසින් ගත්කාලද අරමුණම ගන්නා බැවින් තදාලම්බනය යන පරනාමධෙයසින්ව්‍යවහාරකරනුලැබේ (13)

ඉදින් අරමුණ නිරුද්ධවූ හෙයින් තදාලම්බනය නොඋපදනේනම් ඒ ඉක්මගිය අරමුණ අතීත විශයෙන් එල්බගෙණ තදාලම්බනය නොඋපදනේද යත්? නූපදනේමය. ඒ එසේමැයි මාර්ග වීථි ඵලවීථින් හැර අන්කිසි චිත්තවීථියක ජවනාවර්ජන සිත් දෙකාටස කිසිසේත් නානාරම්මණික බව නොකැමතිවන්නේමය මාර්ගඵලචිත්තවීථියෙහි වනාහි ආවර්ජනසිත ත්‍රෛභූමික ධර්මයන් අරමුණුකරතුදු මාර්ගඵලචිත්තයෝ නිර්වාණයම අරමුණු කරන්නාහුමය එමෙන් අන්‍ය චිත්තයෝ එකම වීථියෙහි නානාරම්මණික නොවෙත් නුසී. මෙහි තදාලම්බනයන්ට අරමුණු නැති හෙයින් නූපදනාහුමය. (14)

පරිත්තාරම්මණ වීථියෙහි කුමක්

(11) සබ්බත්ථාපි පනෙත්ථ අනිට්ඨේ ආරම්මණෙ අකුසලවිපාකානෙව පඤ්චවිඤ්ඤාණ සම්පටිච්ඡන සන්තීරණ තදාලම්බනානි—(විභාවිනී ටීකා)යි.

(12) යොනිසොමනසිකාර අයොනිසොමනසිකාරතිරනුසය සන්තානාදීනං අනුරූපතො—(විභාවිනීටීකා)යි.

(13) චුද්දස චිත්තක්ඛණායුකෙතාව ආරම්මණස්ස නිරුද්ධත්තාව තදාරම්මණං අනුප්පජ්ජති පණ්ණරස චිත්තක්ඛණායුකෙපි ජවනුප්පත්තිතො පරං එකමෙව චිත්තක්ඛණං අවසිට්ඨන්ති ද්වික්ඛත්තුං තදාලම්බනුප්පත්තියා අප්පහොනකභාවතො නත්ථි දුතියතදාරම්මණස්ස උප්පත්තීති පඨමම්පි නුප්පජ්ජති—ති (විභාවිනී ටීකා)යි.

(14) මග්ගඵලවීථිතො අඤ්ඤත්ථ ජවනාවජ්ජනානං කත්ථචි නානාරම්මණතා අනභිමතා—(විභාවිනී ටීකා)යි.

හෙයින් ජවන්සිත් නුපදනාහුද යත්? ජවනයෝ වනාහි තුන්දෙනෙක් හෝ සතරදෙනෙක් හෝ නුපදනාහුදයත්? අතිපරිත්තාරම්මණවීථියෙහි ව්‍යවස්ථාපනචිත්තයාගේ ඉපදීමෙන් මතු චිත්තක්ෂණසයකට ආයුෂ ඉතිරිවූයේද අරමුණ අල්පානුභාවබැවින්ද හාත්පසින් දුබල බැවින්ද ජවනයාගේ ඉපදීමට කාරණානොවන්නේය ජවනයෝතුමූ උපදනාහු නියමවශයෙන් චිත්තක්ෂණ සතකට ආයුෂඇත්තාවූ අරමුණෙහිම උපදනාහුය ජවනයෝතුමූ යුගනද්ධ ධර්මමෙන් නියමයෙන් සත්දෙනෙක්ම උපදිනු විනා කීපයක් නොඋපදනා බැවින් චිත්තක්ෂණ සතකට ආයුෂමද අරමුණෙහි සම්භාරයෙන්ම ජවන් නුපදනාහුමය එනමුදුවූවත් මරණාසන්නකාලයෙහි ද මූර්ච්ඡාකාලයෙහිද ජවන්සයක් හෝ පසක්හෝ එසේම බුදුවරයන්ගේ යමක ප්‍රාතිහාර්‍යයෙහිද මහාශ්‍රාවකයන්ගේ එබඳු අත්‍යායික කෘත්‍යයෙහිද ජවන් සතරක් හෝ පසක් හෝ දිවන්නේසි. (15)

අතිපරිත්තාරම්මණ වීථියෙහි වනාහි පඤ්චද්වාරාවර්ජනාදී වීථිසිත්හු සම්භාරයෙන්ම නොඉපද භවාඞ්ග චලනයෙන් ම නවත්නේ කුමක්හෙයිනයත්? යටත්පිරිසෙයින් සප්ත චිත්තක්ෂණයකට ආයුෂ ඇත්තාවූ අරමුණගේද දෙවරක් ව්‍යවස්ථාපන චිත්තයාගේ ඉපදීමට ආයුෂ නොපොහොනා බැවින් වීථිචිත්තයන්ගේ ඉපදීම ම නැත්තේසි. (16)

මේ වීථිචිත්තවිභාගයෙහි පඤ්චද්වාරාවර්ජනය චක්ඛුවිඤ්ඤාණසම්පටිච්ඡනය සන්තීරණය ව්‍යවස්ථාපනය; ජවනය තදාලම්බනය යන චිත්ත පටිපාටිය ක්‍රමවා උත්පටිපාටියෙන් නූපදනාහුදයත්? නුපදනාහුමය ඒ එසේමැයි උතුබීජධම්මනියාමයන්ගේ නියමය මෙන් චිත්තනියාමයද පටිපාටියෙන් ම දතයුතුවෙයි ඒ චිත්තවීථිය ද අඹෝපමායෙන් හෙවත් අඹගස මුල හිස වැතැ පෙරවගෙණ නිද්‍රොපගතවූ පුරුෂයා ඵල පතන ශබ්දයෙන් ඇස හැර බලා පතිතවූ අඹ ඵලය දුක අතින් ගෙණ පිලිකුන් බව දැනගන්නාපිණිස හාත්පසින් අතින් පිරිමැද පිලිකුන් බව දැන සතුටු සිතින් අඹඵලය හා ඉක්බිති තල්වාදියෙහි ලග්නවූ රසය ශ්ලේෂ්මය හා සමග ආස්වාදයකොට ගිල නැවතත් නිද්‍රොපගතවන්නාක්මෙන් භවාඞ්ගසහිතවූ චිත්තවීථිය දතයුතුයි මෙහි නිද්‍රොපගතවූ පුරුෂයා හා භවාඞ්ගසිත ද ඵල පතනය හා අරමුණු ගැටීමද ඇසහිදි ගැටහැර නැගිටීම හා පඤ්චද්වාරාවර්ජනයද ඵලය දැකීම හා චක්ඛුර්විඤ්ඤාණයද ඵලය අතින් ගැණීම හා සම්පටිච්ඡන චිත්තයද ඵලය පිරිමැදීම හා සන්තීරණචිත්තය ද පිලිකුන්බවදැනීම හා ව්‍යවස්ථාපනචිත්තයද සතුටුසිතින් අනුභවකිරීම හා රූපාදීන් යුක්ත ජවන් ඉපදීමද පසුව තළු ආදියෙහි ඇළුනු රසාස්වාදය හා තදාලම්බනයන්ගේ ඉපදීමද නැවත එහිම ඒ පුරුෂයාගේ සැතපීම හා නැවත භවාඞ්ග ශ්‍රොතසට වැටීමද උපමෝපමේය සංසන්දන

(15) "වොට්ඨපනුප්පාදතො පරං ඡ චිත්තක්ඛණාවසිට්ඨායුකම්පි ආරම්මණං අප්පායුකතාය චෙව පරිදුබ්බලභාවතො ජවනුප්පත්තියා පච්චයො න හොති ජවනං හි උප්පජ්ජමානං නියමෙන සත්තචිත්තක්ඛණායුකෙයෙව උප්පජ්ජන්ති" (විභාවනීටීකා)

(16) "උපරිමකොටියා සත්තචිත්තක්ඛණායුකස්සපි චිත්තද්වයං වොට්ඨපනුප්පත්තියා අප්පහොනකභාවතො වීථිචිත්තානමුප්පාදො නත්ථී"ති (විභාවනීටීකා)

ය නොව අවබෝධකටයුතුයි (17)

මේ චිත්තවීථීන්ගේ පඤ්චද්වාරාවර්ජනාදිචිත්තයෝ භවාඞ්ගශ්‍රෝතසෙහි නැගනාහු ම ආගන්තුක වශයෙන් කොයෙන් අවුත් උපදනාහුදයත්? [illegible] දරය නිරුත්සාහය යන මොවුන්ගේ සමාගමය ඇති කල්හි පෙරනැතනාවූ ම අග්නිය යම්සේ උපදනේ ද එමෙන් ම වස්තු ආලම්බනයන්ගේ සමාගමය ඇතිකල්හි සිත්හු උපදනාහුමැයි. (18)

මෙසේ පඤ්චද්වාර චිත්තවීථීන්ගේ ප්‍රකීර්ණක විස්තරය දතයුතු-මනොද්වාරයෙහි වනාහි පඤ්චද්වාරාවර්ජන සිත නොඋපද මනොද්වාරාවර්ජන නම් සිත කවරහෙයකින් පහළවන්නේදයත්? මනොද්වාරයෙහි පහළවනනාවූ ඒ සිත මනොද්වාරාවර්ජන නමින්ද පඤ්චද්වාරයෙහි ව්‍යවස්ථාපනචිත්තය යන නමින් ද ව්‍යවහාර කරණ නුමුත් එක ම චිත්තය බවද ආවර්ජන යන නමින් මනොද්වාරයෙහි සිතක් පහළවන බැවින් ද පඤ්චද්වාරාවර්ජන සිත නොඋපදන්නේමය – තවද මනොද්වාරයෙහි පඤ්චවිඥානය සම්ප්‍රතීච්ඡනය සන්තීරණය යන මොවුන් කුමක්හෙයින් නූපදනාහුදයත්? වස්තුආලම්බනයන්ගේ ගැටීමක් නැතිහෙයින් පඤ්චවිඥානයෝ ද තම්හට අනන්තර ප්‍රත්‍යය විය හැකිවූ පඤ්චවිඥානයන්ගේ අභාවයෙන් සම්ප්‍රතීච්ඡන සන්තීරණයෝද නූපදනාහුයයි දතයුතු පඤ්චද්වාරයෙහි ව්‍යවස්ථාපන නමින් උපදනා චිත්තය මනොද්වාරයෙහි මනොද්වාරාවර්ජන නමින් උපදනා බැවින් ඒ හැතැයි නොකියයුතුමය. එසේම ඒ චිත්තයාගේ අනන්තර ප්‍රත්‍යය ලැබීමෙන් ජවන්සිත් උපදනාහුයයි දතයුතුයි.

මනොද්වාරයෙහිවනාහි පඤ්චද්වාරයන්හි මෙන් අතිමහන්තාලම්බන විභූතාදිවශයෙන් නොකියා විභූතාරම්මණාදිවශයෙන් ඒවිතියම කෙළේ කුමක්නිසාදයත්? මනොද්වාරයෙහි උපදනා චිත්තයන්ට අතීතානාගතවූ ද අරමුණු එල්බෙණ හෙයින් ඒ මනොද්වාරික චිත්තයන්ම අතිමහන්තාදිවශයෙන් අරමුණු නියම නොකළ හැක්කේය එසේහෙයින් විභූතාරම්මණාදිවශයෙන් නියමකළේයයි දතයුතුයි. මෙසේ මනොද්වාරයෙහි උපදනා චිත්තවීථීන්ගේ ප්‍රකීර්ණක විස්තර විභාගය දතයුතු (10)

( පා * )

එවම්දං සම්බන්ධතො රූපාදිසු කිලෙසානුබන්ධනිමිත්තාදිග්ගාහපරිවජ්ජන ලක්ඛණං ඉන්ද්‍රියසංවරසීලන්තිවෙදි

(17) "නියමො වීථිචිත්තස්ස, කම්මාදිනියමො විය
ඤෙය්‍යො අම්බොපමාදීහි, දස්සෙත්වා තං සුදීපයෙ" (සච්චසංඛෙප)
සුප්තස්‍යාම්‍රමූලෙ ඵලපතනරවාත් කශ්චිදුන්මීල්‍ය චක්ෂුර්
දෘෂ්ට්වාචාදාය චෛතත් ඵලමථ පරිතඃ පීඩයිත්වා කරෙණ,
ඥාත්වා පක්වස්වභාවං කිල පරිබුභුජෙ තද්ගිතොත්කෘෂ්ට චෙතඃ,
පශ්චාත්තාල්වාදිලග්නං රසමපිච සහශ්ලෙෂ්මනාස්වාද්‍යශිෂ්‍යන්(අභි-සනාථ)
18 "චක්ඛින්ධනාතපෙ අග්ගී, අසන්තොපි සමාගමෙ,
යථාහොති තථා චිත්තං, වත්ථාලම්බාදිසඞ්ගමෙ" (සච්චසංඛෙප)
(19) මනොද්වාරිකචිත්තානං අතීතානාගතම්පි ආරම්මණං හොතීති තෙසං අතිමහන්තාදිවසෙන විසයවවත්ථානං කාතුං නසක්කාති විභූතාවිභූතවසෙනෙව තං නියමෙතුං යදි විභූතාරම්මණන්ති ආදිවුත්තං –(විභාවනී ටීකා)

( පා * )

තබ්බං...... ඉදානි ඉන්ද්‍රියසංවරසීලානන්තරං වුත්තෙ ආජීවපාරිසුද්ධිසීලෙ ආජීවහෙතු පඤ්ඤත්තානං ඡන්නං සික්ඛාපදානන්ති යානි තානි ආජීවහෙතු ආජීවකාරණා පාපිච්ඡො ඉච්ඡාපකතො අසන්තං අභූතං උත්තරිමනුස්සධම්මං උල්ලපති ආපත්ති පාරාජිකස්ස...... ආජීවහෙතු ආජීවකාරණා සඤ්චරිත්තං සමාපජ්ජති ආපත්ති සඞ්ඝාදිසෙසස්ස...... ආජීවහෙතු ආජීවකාරණා යො තෙ විහාරෙ වසති සො භික්ඛු අරහාති භණති පටිවිජානන්තස්ස ආපත්ති ථුල්ලච්චයස්ස...... ආජීවහෙතු ආජීවකාරණා භික්ඛු පණීතභොජනානි අගිලානො අත්තනො අත්ථාය විඤ්ඤාපෙත්වා භුඤ්ජති ආපත්ති පාචිත්තියස්ස...... ආජීවහෙතු ආජීවකාරණා භික්ඛුනී පණීතභොජනානි අගිලානා අත්තනො අත්ථාය විඤ්ඤාපෙත්වා භුඤ්ජති ආපත්ති පාටිදෙසනීයස්ස...... ආජීවහෙතු ආජීවකාරණා සූපං වා ඔදනං වා අගිලානො අත්තනො අත්ථාය විඤ්ඤාපෙත්වා භුඤ්ජති ආපත්ති දුක්කටස්සාති...... එවං පඤ්ඤත්තානි ඡ සික්ඛාපදානි ඉමෙසං ඡන්නං සික්ඛාපදානං......

( ස * )

එවං, මෙසේ; ඉදං, මේ; සඞ්ඛෙපතො, සංක්ෂෙපයෙන්; රූපාදිසු, රූපාදි අරමුණුන් කෙරෙහි; කිලෙසානුබන්ධනිමිත්තාදිගාහපරිවජ්ජනලක්ඛණං, කෙලෙසුන්ගේ අනුබැඳීම් ඇති නිමිත්තානුබ්‍යඤ්ජන ග්‍රාහයන් දුරු කිරීම ලක්ෂණකොට ඇත්තේ; ඉන්ද්‍රියසංවරසීලන්ති වෙදිතබ්බං, ඉන්ද්‍රියසංවරශීලයයි දතයුතු.

ඉදානි, දැන්; ඉන්ද්‍රියසංවරසීලානන්තරං, ඉන්ද්‍රියසංවරශීලයට අනන්තරකොට; වුත්තෙ, යම් උද්දෙසවශයෙන් කියනලදද; ආජීවපාරිසුද්ධිසීලෙ, ආජීවපාරිසුද්ධිසීලයෙහි ("ආජීවහෙතු පඤ්ඤත්තානං ඡන්නං සික්ඛාපදානං යන්මෙහි "යානි තානි එවං පඤ්ඤත්තානි ඡ සික්ඛාපදානි" යි සම්බන්ධකරණු) ආජීවහෙතු, ජීවිකාහෙතුවෙන් (මෙසේකල ප්‍රත්‍යයෙන් අකලාත්තව ජීවත්වෙම්යි යන අභිප්‍රායෙනැයි සේයි-ආජීවකාරණා යනු එය ම පර්‍යායයි) පාපිච්ඡො, අසද්ගුණ සම්භාවනෙච්ඡායෙන් සමන්විතවූයේ; ඉච්ඡාපකතො, ඉච්ඡාවෙන් මඩනාලද්දේ; අසන්තං, තමා සතන්හි අවිද්‍යමානවූ; අභූතං අනුත්පන්නවූ; (අනුත්පන්නබැවින් නැත් නුයි පශ්චිමපදය පූර්වපදයට කාරණාවචන වේ) උත්තරිමනුස්සධම්මං, උත්කෘෂ්ට පුරුෂවූ ධ්‍යායීන් හා ආර්‍ය්‍යයන්ගේ ධර්මය (නොහොත් "මනුස්සධම්මතො උත්තරං උක්කට්ඨං" යි ගත්තේ) උල්ලපති, උද්ගතායුෂ්කව බෙණේද (ශීල නම් භික්ෂුහට ආයුෂය හෙතෙම තවාලපන සම්කාලයෙහි ම විගතවේ-එයින් කීහ "ආපත්තිපාරාජිකස්ස" යි "පාරාජිකසඞ්ඛාතං ආපත්ති අස්ස" යි යොදනු පාරාජිකා නම් ආපත්තිය වේ යනු අදහසි-නොහොත් පාරාජිකා සංඥ ව්‍යතික්‍රමයට ඇවැද්මේවී යන අදහසි --පෙ--) සඤ්චරිත්තං සමාපජ්ජති, සඤ්චරණභාවයට පැමිණේ (ස්ත්‍රියගේ මතිය පුරුෂයහට හෝ පුරුෂමතිය ස්ත්‍රියට හෝ කියාද යනු භාවයි) ආපත්ති සඞ්ඝාදිසෙසස්ස, සඞ්ඝාදිසෙස නම් ආපත්තියවේ -පෙ- යො, යමෙක්තෙ ව; තෙ විහාරෙ වසති, තාගේ වෙහෙර වෙසේද; සො, හෙතෙම; අරහාති, රහතැයි; පටිවිජානන්තස්ස භණති, පටිවිජානනසම්භාවනාකාරයෙහි ම කියයි

( ස * )

සී වාක්‍යයෙහි අභිප්‍රායක්හට කියා නම්; ආපත්ති ථුල්ලච්චයස්ස, ථුල්ලච්චාපත්තියට වේ; ඡත්තං, මහණ හා වම්; පණීත භොජනානි, ප්‍රණීතභෝජනයෝ; අගිලානො, නොගිලන්ව; අත්තනො අත්ථාය විඤ්ඤාපෙත්වා, තමා පිණිස විචාරා, භුඤ්ජති, වළඳයි; ආපත්ති පාචිත්තියස්ස, පාචිත්ති ආපත්ති වේ—පෙ—ආපත්ති පාටිදෙසනීයස්ස, පාටිදෙසනී ආපත්ති වේ; සූපං වා, සුපයක් හෝ; ඔදනං වා, බතක් හෝ:—පෙ—ආපත්ති දුක්කටස්ස, දුක්කටාපත්ති වේ; එවං, මෙසේ; පඤ්ඤත්තානි ඡ සික්ඛාපදානි, පණවනලද යම් ඒ ශික්ෂාපදයෝ සදෙනෙක් ඇද්ද, (“ඉමෙසං ඡන්නං සික්ඛාපදානං වීතික්කමස්ස වසෙන” යි සම්බන්ධ කරණු) මේ ශික්ෂාපදයන් සදෙනාගේද—

( හා * )

මෙසේ සංක්ෂෙප වශයෙන් රූපාදී ෂඩාලම්බනයෙහි ක්ලෙශයන්ගේ ලුහුබැඳීම් ඇති නිමිත්තානුබ්‍යඤ්ජන ග්‍රහණය දුරුකිරීම ලක්ෂණකොට ඇත්තේ ඉන්ද්‍රිය සංවරශීලයයි දතයුතු.

දැන් වනාහි ඉන්ද්‍රිය සංවරශීලයට අනතුරුව වදරණලද ආජීවපාරිශුද්ධිශීලයෙහි විභාග දක්වනුලැබේ මේ කෙසේදයත්? ආජීවය කාරණකොට ගෙණ පණවනලද ශික්ෂාපදසදෙනාගේය යනු මෙහි යම් භික්ෂුවකගේ ක් මෙසේ කෙලෙස්විනම් සිව්පසයෙන් කලාන්තනොවී ජීවත්විය හැකි වෙමිහි සිතා ජීවත්වීම හෙතුකොට ගෙණ නැතිගුණ පහළකරණු කැමතිව තෘෂ්ණාවෙන් මඩනාලදුව තමා සතන්හි නැත්තාවූ නූපන්නාවූ ධ්‍යානයක් හෝ මාර්ගඵලයක් හෝ ලද්දෙමියි කියාද ඒ භික්ෂුහට ඒකෙණෙහිව දෙලෙව පරදතා හෙයින් පාරාජිකානම්වූ ආපත්තිය පැමිණේය.

එසේම ජීවිකාව හෙතුකොටගෙණ අපාහා විචාහ එනු කැමති සංඝාරූඪස්ත්‍රියකගේ කාමැත්ත ඉබෙමොව ගෙණ ගොස් කියාද ඒ භික්ෂුහට ආද්‍යන්තයෙහි සඞ්ඝයා විසින් කටයුතු විනයකර්මයෙන් පිරිසිදුවියයුතු හෙයින් සඞ්ඝාදිශෙෂනම්වූ ආපත්තිය පැමිණේය. ජීවිකාව හෙතුකොටගෙණ තොපගේ විහාරයෙහි යම් භික්ෂුවකගේ ක් වෙසේද මහතෙම රහත්කෙනෙකැයි වචනයාගේ අර්ථ දන්නෙක්හට කියන්නේවීනම් ථුල්ලාත්‍යය සඞ්ඛ්‍යාතවූ මහත්වූ ඇවත වන්නේය.

යම් භික්ෂුකෙණෙක් ජීවිකාව හෙතුකොටගෙණ නොගිලන්ව සිටමගෙණ ප්‍රණීතවූ කිරි තෙල් මත්ස්‍ය මාංසාදී භොජනය තමා උදෙසා කනින් හෝ වචනයෙන් හෝ ඉල්වා වළඳා නම් පාචිත්ති ආපත්තිය වන්නේය. යම් භික්ෂුණීකෙණෙක් එසේම නොගිලන්ව ජීවිකාව හෙතුකොටගෙණ තමා උදෙසා ප්‍රණීතභොජන ඉල්වා වළඳානම් පාටිදෙසනීය නම් ඇවත වන්නේය. යම් භික්ෂුණීකෙණෙක් ජීවිකාව හෙතුකොටගෙණ නොගිලන්වම සුපයක් හෝ බතක් හෝ තමා උදෙසා ඉල්වා වළඳානම් දුෂ්කෘතාපත්තිය වන්නේයයි මෙසේ පණවනලද ශික්ෂාපද සදෙනාගේ ඉක්මවීම වශයෙන් ද (ආජීවපාරිශුද්ධිශීලයාගේ අසංවරය දතයුතු)

( ෂා † )

කුහනාති ආදිසු අයං පාළි—තත්ථ කතමා කුහනා ලාභසක්කාර සිලොකසන්නිස්සිතස්ස පාපිච්ඡස්ස ඉච්ඡාපකතස්ස යා පච්චයපටිසෙවන සඞ්ඛාතෙන වා සාමන්තජප්පිතෙන වා ඉරියාපථස්ස වා අට්ඨපනා ඨපනා

( පා † )

සණ්ඨපනා භාකුටිකා භාකුටියං කුහනා කුහායනා කුහිතත්තං අයං වුච්චති කුහනා — තත්ථ කතමා ලපනා ලාභසක්කාරසිලෝකසන්නිස්සිතස්ස පාපිච්ඡස්ස ඉච්ඡාපකතස්ස යා පරේසං ආලපනා ලපනා සල්ලපනා උල්ලපනා සමුල්ලපනා උන්නහනා සමුන්නහනා උක්කාචනා සමුක්කාචනා අනුප්පියභාණිතා චාටුකම්‍යතා මුග්ගසූප්‍යතා පාරිභට්‍යතා අයං වුච්චති ලපනා — තත්ථ කතමා නේමිත්තිකතා ලාභසක්කාරසිලෝකසන්නිස්සිතස්ස පාපිච්ඡස්ස ඉච්ඡාපකතස්ස යං පරේසං නිමිත්තං නිමිත්තකම්මං ඕභාසෝ ඕභාසකම්මං සාමන්තජප්පා පරිකථා අයං වුච්චති නේමිත්තිකතා — තත්ථ කතමා නිප්පේසිකතා ලාභසක්කාරසිලෝකසන්නිස්සිතස්ස පාපිච්ඡස්ස ඉච්ඡාපකතස්ස යා පරේසං අක්කෝසනා වම්භනා ගරහනා උක්ඛේපනා සමුක්ඛේපනා ඛිපනා සංඛිපනා පාපනා සම්පාපනා අවණ්ණහාරිකා පරපිට්ඨිමංසිකතා අයං වුච්චති නිප්පේසිකතා — තත්ථ කතමා ලාභේන ලාභං නිජිගිංසනතා ලාභසක්කාරසිලෝකසන්නිස්සිතෝ පාපිච්ඡෝ ඉච්ඡාපකතෝ ඉතෝ ලද්ධං ආමිසං අමුත්‍ර හරති අමුත්‍ර වා ලද්ධං ආමිසං ඉධාහරති යා එවරූපා ආමිසේන ආමිසස්ස එට්ඨි ගවෙට්ඨි පරියෙට්ඨි එසනා ගවෙසනා පරියෙසනා අයං වුච්චති ලාභේන ලාභං නිජිගිංසනතාති —

( ස † )

කුහනාති ආදිසු, කුහනා යනාදියෙහි; අයං පාලි, මේ විභඞ්ගයෙහි ආ නිර්දේශ පාලිය; තත්ථ, එහි; කතමා කුහනා, කුහනා නම් කවරක්ද? ලාභසක්කාරසිලෝකසන්නිස්සිතස්ස, චීවරාදි ප්‍රත්‍යය සඞ්ඛ්‍යාත ලාභය සකස්කොට ආදරයෙන් දෙන ලබන එම ප්‍රත්‍යය සඞ්ඛ්‍යාත සත්කාරය පතළගුණ [illegible] යශස ඇසුරුකළ, පාපිච්ඡස්ස, පවිටු අදහස් ඇති; ඉච්ඡාපකතස්ස, ඉච්ඡාවෙන් මඩනාලද්දහුගේ; පච්චයපටිසෙධනසඞ්ඛාතෙන වා, ප්‍රත්‍යය ප්‍රතිෂේධනයයි කියනලද කොනකොන්වහින් හෝ; සාමන්තජප්පිතෙන වා, සමීපකොට කියන තෙප්ලෙන් හෝ; ඉරියාපථස්ස වා, ඊර්ය්‍යාපථයාගේ හෝ; අට්ඨපනා, පළමුකොට ආදරයෙන් යම් තිබීමක්ද; ඨපනා, තබන ආකාරය; සණ්ඨපනා, සැදීම; භාකුටිකා, මුහුණු හකුළුවනබව; භාකුටියං, මුහුණු හකුළුවන ස්වභාව ඇතිබව; කුහනා, විස්මයකරවීම; කුහායනා, විස්මයපැවැත්වීම; කුහිතත්තං, කොහොන්බව; අයං වුච්චති කුහනා, මේ කුහනායයි කියනුලැබේ — පෙ — පරේසං පරාහට; ආලපනා, තමා පළමුකොට කිවීම; ලපනා, පසුවකීම; සල්ලපනා, මනාකොට කීම; උල්ලපනා, උසස්කොට කීම; සමුල්ලපනා, හැමපසින් උසස්කොට කීම; උන්නහනා, මතුමතුයෙහි බැඳීම; සමුන්නහනා, හැමපසින් නැවත නැවත බැඳීම; උක්කාචනා, උසස්කොට හැඟවීම; සමුක්කාචනා හැමපසින් නැවත නැවත උසස්කොට හැඟවීම; අනුප්පියභාණිතා නැවත නැවත ප්‍රිය තෙපුල් කීම; චාටුකම්‍යතා, යටත්ව පවත්නාබව; මුග්ගසූප්‍යතා මුද්ගසූපයක්වැනිබව; පාරිභට්‍යතා, දරුවඩනබව; අයං වුච්චති ලපනා, මේ ලපනායයි කියනුලැබේ — පෙ — නිමිත්තං, නිමිත්තකරණබව; නිමිත්තකම්මං, නිමිති කිරීම; ඕභාසො, පහළකිරීම; ඕභාසකම්මං, පහළකරණබව; සාමන්තජප්පා, සමීප

( ස † )

කොට කීම;පරිකථා, පරියාය කතා;අයං, මේ තොමෙ;නෙමිත්තිකතා, නෙමිත්තිකතාය යයි කියනු ලැබේ—පෙ—අසාදනා, ආක්‍රොශකිරීම; වම්භනා, පරිභවකොට කීම; ගරහනා, ගර්හාකොට කීම; උක්ඛෙපනා, උසස්කිරීම, සමුක්ඛෙපනා, හැමපසින් සංක්‍ෂෙපකොට නැගීම; ඛිපනා, සිනාකිරීම, සඞ්ඛිපනා, හැමපසින් සිනාකිරීම; පාපනා, පැමිණවීම; සම්පාපනා, හැමපසින් පැමිණවීම; අවණ්ණහාරිතා, නොගුණ ගෙණයාම; පරපිට්ඨිමංසිකතා, අනුන්පිට මස්කන සුලුබව (නොමැදෙහි අගුණ කියන සුලුබවය යන අදහසි) අයං වුච්චති නිප්පෙසිකතා, මේ නිප්පෙසිකතා යයි කියනුලැබේ—පෙ—ඉතො ලද්ධං ආමිසං, මෙහෙන් ලද ආමිසය; අමුත්‍ර හරති, එතැනට ගෙණයේ; අමුත්‍ර වා ලද්ධං ආමිසං, එතැනින් ලදආමිසය;ඉධ ආහරති, මෙතැනට ගෙණේ; එවරූපා, මෙබඳුවූ; ආමිසෙන ආමිසස්ස, ආමිෂයෙන් ආමිෂයාගේ; එට්ඨි, කැමතිවීම; ගවෙට්ඨි, සෙවීම; පරියෙට්ඨි, නැවත නැවත සෙවීම ("එසනා" යනාදිහු "එට්ඨි" ආදීන්ට පර්‍යාය වචනයෝයි) අයං, මේතෙම; ලාභෙන ලාභං නිජිගිංසනතාති වුච්චති, ලාභයෙන් ලාභ සොයන බවයයි කියනුලැබේ—

( හා † )

කුහනා යනාදීන්ගේ විභාගවිභඞ්ගය නිර්දෙශයෙහි ආ පාලියෙන් මෙසේ ගෙණහැර දක්වනුලැබේ එහි කුහනානම් කවරේදයත්? චීවරාදි සිව්පසලාභය සත්කාරය කීර්තිශොභාවය යන මොවුන් ආශ්‍රයකලාවූ ලාමක අදහස්ඇත්තාවූ තෘෂ්ණාවෙන් මඩනාලද්දාවූ ශ්‍රමණයෙකුගේ ප්‍රත්‍යය

( හා † )

නොඉවසා වැලකීම සඞ්ඛ්‍යාතකුහන වස්තුවෙන් හෝ ප්‍රත්‍යය දායකයන්ගේ සමණට කෙඳිරීමෙන් හෝ ඊර්‍ය්‍යාපථයාගේ පළමුකොට යම් තැබීමක් හෝ තබාකාරයක් හෝ සැදීමක් හෝ මුහුණ හකුළුවන භාවයක් හෝ මුහුණ හකුළුවන ස්වභාව ඇතිබවක් හෝ විස්මය පත්කර වීමක් හෝ විස්මය පැවැත්වීමක් හෝ කුහන ස්වභාවක් හෝ ඇත්තේවේද මේ කුහනායයි කියනුලැබේ. එහි ලපනා නාම් කවරයත්? ලාභසත්කාරකීර්ති ආශ්‍රය කලාවූ ලාමක අදහස් ඇත්තාවූ තෘෂ්ණාවෙන් මඩනාලද්දාවූ ශ්‍රමණයෙකුගේ යම් අනුන්ට පළමුකිණීමෙක් හෝ පසුව කිණීමෙක් හෝ මනාකොට කිණීමෙක් හෝ උසස් කොට කිණීමෙක් හෝ හාත්පසින් උසස් කොට කිණීමෙක් හෝ මතුමත්තෙහි බැඳීමක් හෝ හාත්පසින් නැවත නැවත බැඳීමක් හෝ උසස්කොට හැගවීමෙක් හෝ හාත්පසින් නැවත නැවත හැගවීමෙක් හෝ නැවත නැවත ප්‍රියතෙපුල් කිණීමෙක් හෝ සවත්ව පවත්නාබවෙක් හෝ මුද්ගසුපය වැනි බවක් හෝ දරුවන් වඩනබවක් හෝ ඇත්තේවේද මේ ලපනායයි කියනුලැබේ—

එහි නිමිත්තකරණ බවනම් කවරයත්? ලාභසත්කාරකීර්ති ආශ්‍රයකලාවූ ලාමක අදහස් ඇත්තාවූ තෘෂ්ණාවෙන් මඩනාලද්දාවූ ශ්‍රමණයෙකුගේ යම් නිමිත්ත කරණබවක් හෝ නිමිති කිරීමක් හෝ පහළකිරීමක් හෝ පහළකරණ ක්‍රියාවක් හෝ සම්පූර්ණකොට කිණීමක් හෝ පර්‍යාය තෙපුල් කිණීමක් හෝ ඇත්තේවේද මේ නොමේ නෙමිත්තිකතායයි කියනුලැබේ. එහි නිප්පෙසිකතා නාම කවරයත්? ලාභසත්කාරකීර්ති ඇසුරුකො

( භා † )

ලාභ ලාභ කාමී අදහස් ඇත්තාවූ තෘෂ්ණාවෙන් මඩනාලද්දවූ ශ්‍රමණයෙකුගේ පරනට යම් ආක්‍රොශ කිරීමෙක් හෝ නින්දාකොට කිවීමෙක් හෝ ගර්හාකොට කිවීමෙක් හෝ උසස් කිරීමෙක් හෝ හාත්පසින් උසස්කිරීමෙක් හෝ සිනාසීමෙක් හෝ හාත්පසින් සිනාසීමෙක් හෝ පැමිණවීමෙක් හෝ හාත්පසින් පැමිණවීමෙක් හෝ නොගුණ ගෙණයාමෙක් හෝ අනුන් පිට මස් කන්නාක් මෙන් පරාඞ්මුඛයෙහි නොගුණ කීමෙක් හෝ ඇත්තේවේද මේ නිප්පෙසිකතාවයයි කියනලැබේ * එහි ලාභයෙන් ලාභය සෙවීමනම් කවරේදයත්? ලාභසත්කාර කීර්ති ඇසුරුකළාවූ ලාමක අදහස් ඇත්තාවූ තෘෂ්ණාවෙන් මඩනාලද්දවූ ශ්‍රමණයෙක් මෙතෙම මේ තැනින් ලද ආමිෂයක් අධිකලාභය සඳහා ඒ ගෙට ගෙණ ගොස් දේද ඒ ගෙයින් ලද ආමිෂයක් මේ ගෙට ගෙණ අවුත් දෙත්තේ හෝ වේද මෙවැනිවූ යම් ආමිෂයෙන් ආමිෂය කැමතිවීමෙක් හෝ සෙවීමෙක් හෝ නැවත නැවත සෙවීමෙක් හෝ ඇත්තේවේද මේ ලාභයෙන් ලාභය සෙවීමයයි කියනලැබේ.

( පා ‡ )

ඉමිස්සා පන පාලියා එවමත්ථො වෙදිතබ්බො කුහනනිද්දෙසෙ තාව ලාභසක්කාරසිලොකසන්නිස්සිතස්සාති ලාභඤ්ච සක්කාරඤ්ච කිත්තිසද්දඤ්ච සන්නිස්සිතස්ස පත්ථයන්තස්සාති අත්ථො පාපිච්ඡස්සාති අසන්තගුණදීපනකාමස්ස ඉච්ඡාපකතස්සාති ඉච්ඡාය අපකතස්ස උපද්දුතස්සාති අත්ථො ඉතො පරං යස්මා පච්චයපටිසෙධන සාමන්තජප්පන ඉරියාපථසන්නිස්සිතවසෙන මහානිද්දෙසෙ තිවිධං කුහනවත්ථු ආගතං තස්මා තිවිධම්පෙතං දස්සෙතුං පච්චයපටිසෙධන සඞ්ඛාතෙන වාති එවමාදි ආරද්ධං තත්‍ථ චීවරාදීහි නිමන්තිතස්ස තදත්ථිකස්සෙව සතො පාපිච්ඡතං නිස්සාය පටික්ඛිපනෙන තෙ ච ගහපතිකෙ අත්තනි සුප්පතිට්ඨිතසද්ධෙ ඤත්වා පුන තෙසං අහො අය්‍යො අප්පිච්ඡො න කිඤ්චි පතිග්ගණ්හිතුං ඉච්ඡති සුලද්ධං වත නො අස්ස සචෙ අප්පමත්තකම්පි කිඤ්චි පතිග්ගණ්හෙය්‍යාති නානාවිධෙහි උපායෙහි පණීතානි චීවරාදීනි උපනෙන්තානං තදනුග්ගහකාමතංයෙව ආවිකත්වා පටිග්ගහණෙන ච තතොප්පභුති අපි සකටභාරෙහි උපනාමනහෙතුභූතං විම්හාපනං පච්චයපටිසෙධනසඞ්ඛාතං කුහනවත්ථූති වෙදිතබ්බං.

( ස ‡ )

ඉමිස්සා පන පාලියා, මේ පාලියෙහි; එවමත්ථො වෙදිතබ්බො, මෙසේ අර්ථ දතයුත්තේයි; කුහනනිද්දෙසෙ, කුහනනිර්දෙශයෙහි; ("තාව" යනු ක්‍රමයෙහියි) "ලාභසක්කාරසිලොකසන්නිස්සිතස්ස" යන්නෙහි; ලාභඤ්ච, චීවරාදි ප්‍රත්‍යයසඞ්ඛ්‍යාත ලාභයද; සක්කාරඤ්ච සත්කාරයද; (ගෞරවයෙන් දෙන ලබන ඒම ප්‍රත්‍යය සත්කාර නම්) කිත්තිසද්දඤ්ච, කීර්තිශබ්දයද; (පතලයසස් ඇතිබවය යන අර්ථයි) සන්නිස්සිතස්ස, තෘෂ්ණාවශයෙන් ආශ්‍රයකලහුගේ; පත්ථයන්තස්සාති අත්ථො, ප්‍රාර්ථනා කරණ්ණහුගේය යන අර්ථයි; "පාපිච්ඡස්ස" යන්නෙහි; අසන්තගුණදීපනකාමස්ස, තමාකෙරෙහි අවිද්‍යමානවූ ශුද්ධිගුණයන් පහළකරණු කැමැත්තහුගේ "ඉච්ඡාපකතස්ස" යන්නෙහි ඉච්ඡාය අපකතස්ස

* විශාලපමයෙන් නිප්පෙසකතායයිද කියත්.

( ස ‡ )

පවිට්ඨවඤ්ඤාව විසින් සම්‍යග්ජීවනය කෙරෙන් පහකරණලද්දාහුගේ (එබඳුව යේ ආජීවොපද්‍රවයෙන් උපද්‍රැතයෙව් හුයි කීහ ‘උපද්දුතස්සානි අයෙවා’’යි ආජීවොපද්‍රවයෙන් උපද්‍රැතයාගේය යන අර්ථයි) ඉතොපරං, මෙයින් මතු යෙහි; යස්මා, යම්හෙයකින්; පච්චයපටිසෙධන, ප්‍රත්‍යය ප්‍රතිෂෙධය; සාමන්තජප්පන, සාමන්තජල්පනය: ඉරියාපථසන්නිස්සිතවසෙන, ඊර්ය්‍යාපථ සන්නිශ්‍රය යන මොවුන්ගේ වශයෙන්; මහානිද්දෙසෙ, මහනිදෙස; තිවිධං කුහනවත්ථු ආගතං, ත්‍රිවිධවූ කොහොන්වත අයි: තස්මා, එහෙයින්; තිවිධමෙපතං, ත්‍රිවිධකුහනවස්තුව; දස්සෙතුං, පාලියෙන් දක්වනු පිණිස; පච්චයපටිසෙධනසඞ්ඛාතෙන වා 'ති එවමාදි ‘‘පච්චයපටිසෙධනසඞ්ඛාතෙන වා’’ යන මේ ආදී; ආරද්ධං, ආරම්භ කරණලදී; තත්‍ර, ඒ ආරබ්ධත්‍රිවිධකුහන වස්තූන් කෙරෙහි; චීවරාදිහි නිමන්තිතස්ස, චීවරාදී ප්‍රත්‍යයෙන් නිමන්ත්‍රණය කරණලද; තදත්ථිකස්සෙව සතො, ඒ චීවරාදීප්‍රත්‍යය කැමතිවූවහුගේම; පාපිච්ඡතං නිස්සාය, පාපිච්ඡබවනිසා (‘‘පටික්ඛිපනෙන පටිග්ගහණෙන ච විම්හාපනං’’යි සම්බන්ධයි) පටික්ඛිපනෙන, ප්‍රතික්ෂෙපයෙනුදු වෙන්ද; තෙ ච ගහපතිකෙ, ඒ ගෘහපතීන්ද, අත්තනි, තමාකෙරෙහි; සුප්පතිට්ඨිතසද්ධෙ, සුප්‍රතිෂ්ඨිත ශ්‍රද්ධා ඇත්තවුන්; ඤත්වා, දැන; පුන, නැවත; (‘‘තෙසං උපනෙන්තානං’’ යි යොදනු;) අහො, විස්මයෙ; අයෙසා අප්පිච්ඡො, ආර්ය්‍යතෙමෙම් අල්පෙච්ඡය; න කිඤ්චි පතිගණ්හිතුං ඉච්ඡති, කිසිවක් පිළිගණ්ණට නොකැමැත්තෙය; සචෙ, ඉදින්; අප්පමත්තකම්පි කිඤ්චි; ස්වල්පප්‍රමාණදවූ කිසිවක්; පතිගණ්හෙය්‍ය, පිළිගණ්නේවීනම්; සුලද්ධං වත

( ‡ ස )

නො අස්සානි, අපගේ ජීවිතය මිහිසත්බව හෝ මනාකොට ලදපෙයි; නානාවිධෙහි උපායෙහි, නානාප්‍රකාරඋපායෙන්, පණීතානි චීවරානි උපනෙන්තානං, ප්‍රණීතවූ චීවරාදීන් එළවන්නාවූ; තෙසං, ඒ ගෘහපතීන්ට; තදනුග්ගහකාමතං යෙව ආවිකත්වා, ඔවුන්ට අනුග්‍රහ කැමැත්තබව පහළකොට; පටිග්ගහණෙන ච, පිළිගැන්මෙන්ද; තතොප්පභූති, එතැන්පටන්; අපිසකටභාරෙහි උපනාමන හෙතුභූතං, සකට භාරයෙන් ගෙනඑළවීමට කාරණවූ; විම්හාපනං, විස්මය කරවීම; පච්චයපටිසෙධනසඞ්ඛාතං, ප්‍රත්‍යය ප්‍රතිෂෙධනයයි කියනලද; කුහනවත්ථු ති වෙදිතබ්බං, කොහොන්වතැයි දතයුතු.

( භා ‡ )

මේ පාලියෙහි අර්ථවිවරණය මේ මතු දක්වන පරිච්ඡෙදන් දතයුතුයි - එහිදු කුහන නිර්දෙශයෙහි පටන් පිළිවෙළින් අර්ථවිවරණය වන්නේයි. ලාභසත්කාරකීර්ති නිශ්‍රිතයාගේය යනු චීවරාදී ප්‍රත්‍යයසඞ්ඛ්‍යාත ලාභයද සත්කාර සඞ්ඛ්‍යාතවූ ගෞරවයෙන් දෙනු ලබන එම ප්‍රත්‍යයද පතළාවූ කීර්තියද යන මොවුන් තෘෂ්ණාවෙන් ප්‍රාර්ථනා කරණණහුගේය යනුභාවයි ලාභකාමි අදහස් ඇත්තාහුගේය යනු තමාකෙරෙහි නැති ශ්‍රද්ධාශීලාදී ගුණ ප්‍රකාශකරණු කැමැත්තාහුගේය. තෘෂ්ණාවෙන් මඩනාලද්දාහුගේය යනු ලාමක තෘෂ්ණාව විසින් යටපත්වූ ජීවිකාව කෙරෙන් පහකරණලද්දාහුගේය යනු භාවයි. මෙයින් මතු යම් හෙයකින් මහානිර්දෙශපාලියෙහි ප්‍රත්‍යය වැළැක්වීමය රහස් කිරීමය ඊර්ය්‍යාපථ නිශ්‍රිතබවය යන මොවුන්ගේ වශයෙන් තුන්වැදෑරුම්

( හා ‡ )

වූ කුහනවස්තුකෙණෙක් ආයේද එහෙයින් ඒ ත්‍රිවිධකුහනවස්තූන් පෙළින් දක්වනු පිණිස "පච්චය පටිසෙධන සඞ්ඛාතෙන වා" යනාදිය පටන්ගන්නාලද්දේය ඒ පටන්ගන්නාලද තුන්වැදෑරුම් කුහනවස්තූන් අතුරෙන් චීවර දී සිව්පසයෙන් නිමන්ත්‍රණය කරණලද ඒ ප්‍රත්‍යය කැමතිසුලුවම මහණහුගේ ලාමකවූ කල්පනාව නිසා ප්‍රතික්ෂෙපකිරීමෙන් හෝ පිළිගැණීමෙන් හෝ දායකයන් විස්මයපත් කෙරෙයි ඒ දායකයන් තමාකෙරෙහි මොහුවට පිහිට සැදූහැඇත්තවූන් බව දැන නැවත ඒ ප්‍රත්‍යය එළවන්නාවූ දායකයන්ට අහෝ අංශවයහිය අපගේ ආයසියන්වහන්සේ අල්පේච්ඡගුණ ඇත්තෙක කිසිවක් පිළිගන්ට නොකැමැත්තේය ඉදින් මෙබඳු සිල්වත් ගුණවත් ආර්යයෙක් ස්වල්පමාත්‍රවූ දෙයක්වත් පිළිගත්තේවීනම් ඒ පිළිගැණීම අපට ඒකාන්තයෙන් යහපත් ලාභයකැයි සිතවීම ආදි නොයෙක් ආකාර උපායෙන් ප්‍රණීතවූ චීවරාදි ප්‍රත්‍යය එළවනනාවූ ඒ දායකයන්ට අනුග්‍රහකරණු කැමතිබවම ප්‍රකාශනොකොට සිව්පසය පිළිගැණීමෙන් එතැන්පටන් නැල්පුරා සිව්පසය එළවීමට කාරණවූ විස්මයපත්කරවීම ප්‍රත්‍යය වැළක්වීමයයි කියනලද කුහනවස්තුවයයි දතයුතු.

( පා ¶ )

වුත්තම්පි චෙතං මහානිද්දෙසෙ — කතමං පච්චයපටිසෙධන සඞ්ඛාතං කුහනවත්ථු ඉධ ගහපතිකා භික්ඛුං නිමන්තෙන්ති චීවර පිණ්ඩපාත සෙනාසන ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරෙහි සො පාපිච්ඡො ඉච්ඡාපකතො අත්ථිකො චීවර ... පෙ ... පරික්ඛාරානං භිය්‍යො කම්‍යතං උපාදාය චීවරං පච්ච

( පා ¶ )

ක්ඛාති පිණ්ඩපාතං ... පෙ ... සෙනාසනං ගිලානපච්චය භෙසජ්ජපරික්ඛාරං පච්චක්ඛාති සො එවමාහ කිං සමණස්ස මහග්ඝෙන චීවරෙන එතං සාරුප්පං යං සමණො සුසානා වා සඞ්කාරකූටා වා පාපණිකා වා නන්තකානි උච්චිනිත්වා සඞ්ඝාටිං කත්වා ධාරෙය්‍ය ... කිං සමණස්ස මහග්ඝෙන පිණ්ඩපාතෙන එතං සාරුප්පං යං සමණො උඤ්ඡාචරියාය පිණ්ඩියාලොපෙන ජීවිකං කප්පෙය්‍ය කිං සමණස්ස මහග්ඝෙන සෙනාසනෙන එතං සාරුප්පං යං සමණො රුක්ඛමූලිකො වා අස්ස අබ්භොකාසිකො වා ... කිං සමණස්ස මහග්ඝෙන ගිලානපච්චය භෙසජ්ජපරික්ඛාරෙන එතං සාරුප්පං යං සමණො පූතිමුත්තෙන වා හරීටකඛණ්ඩෙන වා ඔසධං කරෙය්‍යාති තදුපාදාය ලූඛං චීවරං ධාරෙති ලූඛං පිණ්ඩපාතං පරිභුඤ්ජති ලූඛං සෙනාසනං පටිසෙවති ලූඛං ගිලානපච්චය භෙසජ්ජපරික්ඛාරං පටිසෙවති තමෙනං ගහපතිකා එවං ජානන්ති අයං සමණො අප්පිච්ඡො සන්තුට්ඨො පවිවිත්තො අසංසට්ඨො ආරද්ධවිරියො ධුතවාදොති භිය්‍යො භිය්‍යො නිමන්තෙන්ති චීවර ... පෙ ... පරික්ඛාරෙහි සො එවමාහ තිණ්ණං සම්මුඛීභාවා සද්ධො කුලපුත්තො බහුං පුඤ්ඤං පසවති සද්ධාය සම්මුඛීභාවා සද්ධො කුලපුත්තො බහුං පුඤ්ඤං පසවති දෙය්‍යධම්මස්ස ... පෙ ... දක්ඛිණෙය්‍යානං සම්මුඛීභාවා සද්ධො කුලපුත්තො බහුං පුඤ්ඤං පසවති තුම්හාකං චෙවායං සද්ධා අත්ථි දෙය්‍යධම්මො ච සංවිජ්ජති අහඤ්ච පටිග්ගාහකො සචාහං න පටිග්ගහෙස්සාමි එවං තුම්හෙ පුඤ්ඤෙන පරිබාහිරා භවිස්සන්ති න මය්හං ඉමිනා අත්ථො අපිච තු

( පා ¶ )

මිතානංයෙව අනුකම්පාය පතිගණ්හා මි ඉති තදුපාදාය - හුම්පි චීවරං පතිගණ්හාති බහුම්පි පිණ්ඩපාතං ---පෙ ---භෙසජ්ජපරික්ඛාරං පතිගණ්හාති ය්‍යා එවරූපා භාකුටිකා භාකුටියං කුහනා කුහායනා කුහිතත්තං ඉදං වුච්චති පච්චය පටිසෙධන සඞ්ඛාතං කුහනවත්ථු ---

( ස ¶ )

මහානිද්දෙසෙ, මහනිදෙස; එතං, මේ; වුත්තාමෙව, කියනලදි; කතමං පච්චයපටිසෙධන සඞ්ඛාතං කුහනවත්ථු, ප්‍රත්‍යය ප්‍රතිෂෙධ සඞ්ඛ්‍යාත කොහොන්වත් නම් කිම: ඉධ, මෙහි; ගහපතිකා, ගෘහපතීහු; භික්ඛුං නිමන්තෙන්ති, භික්ෂූන් නිමන්ත්‍රණය කෙරෙත්; චීවර පිණ්ඩපාත සෙනාසන ගිලානපච්චය භෙසජ්ජපරික්ඛාරෙහි, චීවරය පිණ්ඩපාතය සෙනාසනය ගිලන්පස බෙහෙත් පිරිකරය යන මෙයින්; පාපිච්ඡො, පවිටුවූ අදහස් ඇත්තේ; ඉච්ඡාපකතො, ඉච්ඡාවෙන් මඩනාලද්දේ; අත්ථිකො, අර්ථි වූයේ; චීවර, සිවුරු;—පෙ—පරික්ඛාරානං, පරිෂ්කාරයන්ගේ; භිය්‍යොකම්‍යතං උපාදාය, බොහෝ කැමැති වනබව නිසා; චීවරං චීවරය; පච්චක්ඛාති, ප්‍රතික්ෂෙප කෙරෙයි;—පෙ—සො, ඒහෙතෙම; එවමාහ, මෙසේකියා; කිං සමණස්ස මහග්ඝෙන චීවරෙන, ශ්‍රමණයාහට මහාඝවිවරෙන් කිම; එතං සාරුප්පං, මේ සරුපි ("යං"-යනු ක්‍රියාපරාමර්ශීනය එහෙයින් "ධාරෙය්‍යාති එතථ යංදතං සඞ්ඝාටිං ධාරණං එතං සමණස්ස සාරුප්පං" යී යොදනු) සුසානා වා, සොහොනින් හෝ; සඞ්කාරකූටා වා, කසලගොඩින් හෝ, පාපණිකා වා, අවුණුදොරින් හෝ; නන්තකානි උච්චිනිත්වා, කඩරෙදි කඩුළු ගෙණ; සඞ්ඝාටිං කත්වා ධාරෙ

( ස ¶ )

ය්‍යං, සඟළකොට දරද-පෙ උඤ්ඡාචරියාය, භික්ෂාසිඟීමෙන්; පිඬියාලොපෙන, පිණ්ඩපාත ලොපයෙන්; ජීවිකං කප්පෙය්‍යං, ජීවිකාව කෙරේද; රුක්ඛමූලිකො වා අස්ස, රුක්ඛමූලික හෝ වේද: අබ්භොකාසිකො වා හොති, අභ්‍යවකාසික හෝ වේද; පූතිමුත්තෙන වා, ගොමූත්‍රයෙන් හෝ; හරීතකඛණ්ඩෙන වා, අරලුකඩකින් හෝ; ඔසධං කරෙය්‍යං, බෙහෙත් කරන්නේයයි; තදුපාදාය, එතැන් පටන්; ලූඛං චීවරං ධාරෙය්‍ය, රැක්සිවුරු දරන්නේයි;-පෙ-තමෙනං, ඔහු; ගහපතිකා, ගෘහපතීහු; එවං ජානන්ති, මෙසේ දනිත්; අයංසමණො, මේ මහණතෙමේ; අප්පිච්ඡො, අපිස; සන්තුට්ඨො, සන්තුෂ්ටය; පවිවිත්තො; විවෙකයෙහි වෙසෙසි; අසංසට්ඨො, කුලෙහි ගෙණෙහි නොඇලුනේය; ආරද්ධවිරියො, වැඩූවිර්‍යය ඇත්තේය; ධුතවාදෙති, අනුනට ද ධුතාඞ්ගයෙහි ගුණ කියන්නේයයි; භිය්‍යො භිය්‍යො නිමන්තෙන්ති, නැවත නැවත නිමන්ත්‍රණය කෙරෙති—පෙ—සො, ඒ කුහකතෙමේ; එවමාහ, මෙසේ කියන්නේයි; තිණ්ණං සම්මුඛීභාවා, තුන්දෙනාකු සම්මුඛ බැවින්; සද්ධො කුලපුත්තො, සැදැහැ ඇති කුලපුත්‍රතෙමේ; බහුං පුඤ්ඤං පසවති, බොහෝපින් උපයයි (පිළිලැබේ යන අර්ථයි) සද්ධාය සම්මුඛී භාවා, ශ්‍රද්ධාවගේ සම්මුඛබැවින්; දෙය්‍යධම්මස්ස සම්මුඛී භාවා, දෙයවස්තුහුගේ සම්මුඛබැවින්, දක්ඛිණෙය්‍යානං සම්මුඛී භාවා, දක්ෂිණාර්හයන්ගේ සම්මුඛ බැවින්;—පෙ—තුම්හාකඤ්ච, තොපගේද; අයං සද්ධා අත්ථි, මේ ශ්‍රද්ධා ඇත; දෙය්‍යධම්මො ච සංවිජ්ජති, දෙයධර්මයද විද්‍යමානය; අහඤ්ච පටිග්ගා

( ඝ ¶ )

ගතො, මමද ප්‍රතිග්‍රාහක වෙමි; සචෙ, ඉදින්; අහං න පටිගණ්හෙස්සාමි, මම නොපිළිගනිමි නම්; එවං, එසේ ඇති කල්හි; තුම්හෙ, තෙපි; පුඤ්ඤෙන පරිබාහිරා භවිස්සථ, කුශලයෙන් පිරිහෙන්නාහු; න මය්හං ඉමිනා අත්ථො, මට මින් ප්‍රයොජන නැත; අපිච, එතකුදු වුවත්; තුම්හාකං යෙව අනුකම්පාය, තොපට ම අනුකම්පාපිණිස; පටිගණ්හාමීති, පිළිගණිමියි; පාදපාදය, එතැන් පටන්, බහුම්පි චීවරං පටිගණ්හාති, බොහෝද සිවුරු පිළිගණී

ඉප

( ඞ ¶ )

මේ කාරණය මහා නිද්දෙශයෙහිද වදාරණලදුයේ මැයි. ප්‍රත්‍යය ප්‍රතිෂෙධනායයි කියනලද කුහන වස්තුව නම් කවරයත්? මේ සස්නෙහි දැක ගෘහපතීහු චීවර පිණ්ඩපාත සෙනාසන ගිලන්පස බෙහෙත් පිරිකරය යන සිව්පසයෙන් භික්ෂූහු නිමන්ත්‍රණය කරණ්ණාහුය පවිත්‍ර අදහස් ඇත්තාවූ තෘෂ්ණාවෙන් මඩනාලද්දාවූ ඒ භික්ෂු තෙම සිව්පසය කැමැත්තවුයේද චීවර පිණ්ඩපාත සෙනාසන ගිලාන ප්‍රත්‍යයන් බොහෝ කැමති බව නිසා සිවුරුද ප්‍රතික්ෂෙප කරයි පිණ්ඩපාතයද ප්‍රතික්ෂෙපකරයි. සෙනසුන්ද ප්‍රතික්ෂෙප කරයි ගිලන්පස බෙහෙත් පිරිකරද ප්‍රතික්ෂෙප කරයි (මැලිදු ඒ භික්ෂුතෙම ප්‍රත්‍යයදායකයා හට) මෙසේ කියයි ශ්‍රමණයාහට මහැගි සිවුරෙන් කම් කිම්ද? යම්හෙයකින් ශ්‍රමණ තෙම සොහොනින් පලින් හෝ කසලගොඩින් හෝ සල්පිල් දොරින් හෝ කඩරෙදි අවුලා සඟළ සිවුරු කොට දරන්නේ වේද එම සරුප්වන්නේය ශ්‍රමණයාහට මහැගි පිණ්ඩපාතයෙන් කම්කිම? යම්හෙයකින් ශ්‍රමණ තෙම ගෙපිළිවෙළින් පිඩු සිඟීමෙන්ලද පිණ්ඩපාතාලොපයෙන් දිවිපවත්වාද ඒම සරුප් වන්නේය. ශ්‍රමණයාහට මහැගි සෙනාසනයෙන් කම්කිම? යම් හෙයකින් ශ්‍රමණ තෙම රුක්මුලෙහි සෙනසුන් කොට හෝ වෙසේද අභ්‍යවකාශයෙහි සෙනසුන් කොට හෝ වෙසේද ඒම සරුප්වන්නේය. ශ්‍රමණයාහට මහැගි ගිලන්පස බෙහෙත් පිරිකරින් කම්කිම? යම් හෙයකින් ශ්‍රමණ තෙම ගොමුත්‍රයෙන් හෝ අරළුකැබිල්ලෙන් හෝ බෙහෙත් කරන්නේ වේද ඒම සරුප් වන්නේයයි (ප්‍රත්‍යයදායකයාහට මෙසේ අනුශාසනා කරන්නේ වේද) එතැන්පටන් රූක්ෂවූ සිවුරු දරන්නේ වේද රූක්ෂවූ පිණ්ඩපාතය වළඳන්නේ වේද රූක්ෂවූ සෙනසුන් සෙවුනේ වේද රූක්ෂවූ ගිලන්පස බෙහෙත් පිරිකර සෙවුනේ වේද ඉක්බිති ප්‍රත්‍යය දායකයෝ ඒ භික්ෂුව මෙසේ දැන ගැනීගන්නාහුය. මේ මහණ තෙමේ අපිස් ගුණ ඇත්තා සන්තොස් ගුණ ඇත්තාක විවෙකානන්දී ඇති ගෝය කුලයා සහ ගණයා සො ... මහා ඇල්මෙන් යුක්තවූයේ ඇ... අනුත්පද ධුතාංගයෙහි යුක්ත ... නැවත නැවත චීවර පිණ්ඩපාත සෙනාසන ගිලාන ප්‍රත්‍යය බෙහෙත් පිරිකරින් නිමන්ත්‍රණය කරන්නාහුය නැවත ඒ ... මහණ තෙමේ මෙසේ ... ය. තුන් දෙනෙකුගේ ගැටීමෙන් ශ්‍රද්ධාසම්පන්න කුලපුත්‍රතෙමේ බොහෝ පින් ලබන්නේය. ඒ කවර තුන් දෙනාගේ දැයත්? ශ්‍රද්ධාව හමුවීමෙන්ද සැදැහැති කුලපුත්‍රතෙම බොහෝ පින් උපදයි දෙය්‍ය ධර්ම දානවස්තු හමුවීමෙන්ද සැදැහැති කුලපුත්‍රතෙම බොහෝ පින් උපදයි

දක්ෂිණාභියන් හමුවීමෙන්ද සැදැහැති කුලපුත්‍ර යම් බොහෝ පින් ඇපයසි නොපමන් මේ ශ්‍රද්ධාවද ඇත්තේය දියයුතු දනාවස්තුවද ඇත්තේය මමද ප්‍රතිග්‍රාහකයෙමි ඉදින් මම දනාවස්තුව පිළිනොගන්නෙම් නම් එසේ කල තෙපි කුශලයෙන් පිරිහෙන්නාහුය. මට මේ ප්‍රත්‍යයෙන් ප්‍රයෝජන නැත්තේ නමුදු තොපට අනුකම්පා පිණිස පිළිගණිමියි (යනාදි කුහක ප්‍රයෝග දක්වා) එතැන් පටන් ගෙනෙනාවූ චීවර පිණ්ඩපාත සේනාසන ගිලාන ප්‍රත්‍යය බෙහෙත් පිරිකර පිළිගණීමෙහි වේද මෙබඳු ආකාර ඇතනාවූ යම් මුහුණ හකුලුවන බවෙක් හෝ මුහුණ හකුලුවන සවභාව ඇති බවක් හෝ විස්මයපත් කරවීමක් හෝ විස්මය පැවැත්වීමක් හෝ කුහක බවක් හෝ ඇත්තේ වේද මේ ප්‍රත්‍ය වැලැක්වීම සඞ්ඛ්‍යාත කුහක වස්තුයයි දතයුතු—

( පා ¶ )

පාපිච්ඡස්සෙව පන සතො උත්තරිමනුස්ස ධම්මාධිගම පරිදීපනවාචාය තථා තථා විම්හාපනං සාමන්තජප්පන සංඛාතං කුහනවත්ථූති වෙදිතබ්බ — යථාහ — කතමං සාමන්තජප්පන සංඛාතං කුහනවත්ථු? ඉධෙකච්චො පාපිච්ඡො ඉච්ඡාපකතො සම්භාවනාධිප්පායො එවං මංජනො සම්භාවෙස්සතීති අරියධම්ම සන්නිස්සිතං වාචං භාසති යො එවරූපං චීවරං ධාරෙති සො සමණො මහෙසක්ඛොති භණති යො එවරූපං පත්තං ලොහථාලකං ධම කරකං පරිස්සාවනං කුඤ්චිකං කායබන්ධනං උපාහනං ධාරෙති සො සමණො මහෙසක්ඛොති භණති යස්ස එවරූපො, උපජ්ඣායො ආචරියො සමානුපජ්ඣායකො සමානාචරියකො මිත්තො සන්දිට්ඨො සම්භත්තො සහායො යො එවරූපෙ විහාරෙ වසති අඩ්ඪයොගෙ පාසාදෙ හම්මියෙ ගුහාය ලෙණෙ කුටියා කූටාගාරෙ අට්ටෙ මාළෙ උද්දණ්ඩෙ උපට්ඨාන සාලායං මණ්ඩපෙ රුක්ඛමූලෙ වසති සො සමණො මහෙසක්ඛොති අථවා කොරජිකකොරජිකො භාකුටිකභාකුටිකො කුහකකුහකො ලපකලපකො මුඛසම්භාවිතො අයං සමණො ඉමාසං එවරූපානං සන්තානං විහාරසමාපත්තීනං ලාභීති තාදිසං ගම්භීරං ගූළ්හං නිපුණං පටිච්ඡන්නං ලොකුත්තරං සුඤ්ඤතාපටිසංයුත්තකථං කථෙති යා එවරූපා භාකුටිකා භාකුටියං කුහනා කුහායනා කුහිතත්තං ඉදං වුච්චති සාමන්තජප්පනසංඛාතං කුහනවත්ථූති—

( ස * )

උත්තරිමනුස්ස ධම්මාධිගම පරිදීපන වාචාය, උත්තරිමනුෂ්‍ය ධර්මාධිගමය හඟවන තෙපුලෙන්; තථා තථා විම්හාපනං, මේ ධ්‍යානලාභිය ඵලලාභියයි එසේ එසේ විස්මයකරවීම; සාමන්තජප්පනසංඛාතං කුහනවත්ථූති වෙදිතබ්බං, තමා උත්තරිමනුෂ්‍ය ධර්මයට ආසන්නකොට බණනබැවින් සාමන්තජප්පනයයි කියනලද කොහොන්වතැයි දතයුතු; සම්භාවනාධිප්පායො, සම්භාවනාවෙහි අභිප්‍රාය ඇත්තේ; එවං, මෙසේ කල්හි; මං, මට; ජනො සම්භාවෙස්සති 'ති' ජනතෙම සම්භාවනා කරණේයයි; අරියධම්ම සන්නිස්සිතං, ආර්යධර්ම සන්නිශ්‍රිතවූ; වාචං භාසති, තෙපුල් බෙණේ ("යො එවරූපං චීවරං ධාරෙති" යනාදිය තාමාම සදහා කියන්) යො, යමෙක්; එව

( ස * )

රූපං චීවරං ධාරෙති, මෙබඳු සිවුරක්ද රැද; සො සම්පන්නො, ඒ මහණ; මහෙසක්ඛොහි, මහත් ආනුභාව ඇත්තේයයි (ලොකාධිපත්‍යභූත ධර්මාධිගමනයෙන්ය යන අභිප්‍රායයි) ඒවරූපං පත්තං, මෙබඳු පාත්‍රයක්; ලොහථාලකං, ලොහතල්ලක්; ධම්මකරකං, ධමකරණක්; පරිස්සාවනං, පෙරහනක්; කුඤ්චිකං, යතුරක්; කායබන්ධනං, කාබණක්; උපාහනං, වහන්; ධාරෙති, දරාද; සො සම්පන්නො, ඒ මහණ; මහෙසක්ඛොහි මහණහි, මහ ආනුභාව ඇත්තේයයි කියණෙයි; යස්ස, යමෙක්හුගේ; ඒවරූපා, මෙබඳුවූ; උපට්ඨාකා, උපස්ථායකයෝ; ආචරියා, ආචාර්යයෝ; සමානුපජ්ඣායකා, එක උපාධ්‍යායන් ඇත්තාහු; සමානාචරියකා, එක ආචාර්යයන් ඇත්තාහු; මිත්තා, මිත්‍රයෝ; සන්දිට්ඨා, දැකුම් මාත්‍ර මිත්‍රයෝ; සම්භත්තා, දැඩි භක්ති ඇත්තාහු; සහායා, සබඳෙක් ඇද්ද; සො, යමෙක්; ඒවරූපෙ විහාරෙ වසති, මෙබඳු වෙහෙර වෙසේද (ඒවරූපෙ යනු අඩ්ඪයොගාදී වැනි දූ යොදනු පාකාරපරිච්ඡින්න සියලු ආවාසය විහාර නම්වේ) අඩ්ඪයොගෙ, දීඝ ප්‍රාසාදයෙහි (ගරුඩපක්ෂ සංස්ථාන ප්‍රාසාදයයිද කියත්) පාසාදෙ, චතුරස්‍රප්‍රාසාදයෙහි; හම්මියෙ, සඳලුතලවා කළයෙහි; ගුහාය, දෙර කොඑ පමිත ගුහායෙහි; ලෙණෙ, දොරටු ගල්ලෙණ; කුටියා, කිළියෙහි, කූටාගාරෙ, කැණිමඬුළු ඇත්තාක් තාගා සාලයෙහි; අට්ටෙ (පටිරාජූනං පටිබාහණත්ථාය ... චතුපස්සවතුවෙසා පාසාදවිසෙසෙ සී) උසාත සමරූපවූ ගෘහ විශෙෂයෙහි; මාළෙ (එකකූට සඞ්ගහිතො අනෙකකොණෙ ලී) උසාත සමරූප ඇතිගෙහි; උද්දණ්ඩෙ,

ගර්භ නැති එක දෙරක් ඇති දීර්ඝ ශාලාවෙහි; උපට්ඨානසාලායං, හැම දෙනා රැස්වන ශෙහි; මණ්ඩපෙ, මණ්ඩපයෙහි; වසති, වෙසේද; සො සම්පන්නො, ඒ මහණ; මහෙසක්ඛොහි ‘හි ශ ණහි, මහත් ආනුභාව ඇත්තේයයි කියණේද; අථවා, නොහොත්; කොරජික කොරජිකො, ඉතාහැකිලෙන්නේ ("කුච්ඡිතං ජිගුච්ඡාය පාපිච්ඡතාය නිර ත්ථකං කාය චවිප්ඵන්දනිග්ගණ්හනං කොරජං තං එතස්ස අත්ථීති කො රජිකො කොකුච්චපකතිකො සංයතකා රො අතිවිය අතිණ්හංවා කොරජිකො කොරජිකො අතිවපරිසංකිතො" යනු ටීකායි) භාකුටික භාකුටි කො, ඉනා මූනුණ හකුළුවන සුළුවූ යේ (පරිසංකිතා වූයේ) කුහකුහකො, ඉතා විශ්මයකාරවන්නේ; ලපලපො, ඉතාම ප්‍රලාප තෙපුල් බණන්නේ; මුඛසම්භාවිතො, (කොරජික කොරජිකාදී ස්වභාවයෙන් ප්‍රකාශිත වූව නෙහුමෙවත්) තාමාගේ මුඛ මාත්‍රයෙන් අනුන් විසින් සම්භාවනා කරණලද්දේ (අයං සම්පන්නොති ආදීනි අනානාං පරං චිය කත්වා කථෙති) අයං සම්පන්නො, මේ මහණ තොමෝ, ඉමාසං, මේ; ඒවරූපානං, මෙබඳුවූ; සන්තානං විහාර සමාපත්තීනං ලාභීති, ශාන්තවූ විහාර සමාපත්තී ලාභියයි; තාදිසං, එබඳුවූ; ගම්භීරං, ගැඹුරුවූ (ප්‍රතිෂ්ඨා ලාභවූ යනු භාවයි) ගූළ්හං, ගූඪවූ (දුර්දශීවූ යන අර්ථයි) නිපුණං, සියුම්වූ; පටිච්ඡන්නං, මුවා කළ යුතුවූ; ලොකුත්තරං, ලොකොත්තරවූ; සුඤ්ඤතා පටිසංයුත්තං, නිර්වාණප්‍රතිසංයුක්තවූ; කථං කථෙති, කථා කෙබ ණ්ද.....

( කා. * )

මේ සස්නෙහි ලාමකවූ අදහස් ඇත්තාවූ ශ්‍රමණයකුගේ උත්තරි මනුෂ්‍ය ධර්මාධිගමය සඟවන්නාවූ වචනයෙන් මේ ධ්‍යානාදී ගුණ ඇත මේ මාර්ග ඵල ලාභියායි ඒ ඒ ආකාරයෙන් යම් විස්මයපත් කාරීම ඇත්තේවේ ද මේ සාමන්තජප්පන සංඛ්‍යාතවූ කුහනවස්තුයයි දත යුතු. එහෙයින් වදාළ සාමන්තජප්පන සංඛ්‍යාතවූ කුහනවස්තුව නම් කවරේදයත් ? මේ සස්නෙහි ඇතැම් ශ්‍රමණ කෙනෙක් ලාමකවූ අදහස් ඇත්තේ තෘෂ්ණාවෙන් මඩනාලද්දේ ගරු බුහුමන් ලැබීමෙහි අභිප්‍රාය ඇත්තේ මෙසේ ඇති කල්හි මනුෂ්‍යයෝ මට ගරු බුහුමන් කරන්නෝයයි සිතා ධ්‍යාන මාර්ගඵලාදී ආර්‍ය්‍ය ධර්ම නිශ්‍රිතවූ බස් බෙණේද යමෙක් මෙබඳු සිවුරක් දරාද ඒ ශ්‍රමණ තෙමේ මහානුභාව සම්පන්නයෙක ගෙහෙත් ධ්‍යාන මාර්ගඵල ලාභී යෙකැයි කියාද යමෙක් මෙබඳු පාත්‍රයක් හෝ මෙබඳු තඹ තැටියක් හෝ මෙබඳු ධම්කරුවක් හෝ මෙබඳු පෙරහන් කඩක් හෝ මෙබඳු කොස්සක් හෝ මෙබඳු කායබන්ධනක් හෝ මෙබඳු වහනක් හෝ දරාද ඒ ශ්‍රමණතෙම ධ්‍යානමාර්ගඵලලාභී මහානුභාව සම්පන්නයෙකැයි තමාම සඳහා කියාද යම් ශ්‍රමණයකුට මෙබඳු උපාධ්‍යායෙක් හෝ මෙබඳු ආචාර්‍යයෙක් හෝ මෙබඳු සමාන උපාධ්‍යායන් ඇත්තෙක් හෝ මෙබඳු සමාන ආචාර්‍යයන් ඇත්තෙක් හෝ මෙබඳු මිත්‍රයෙක් හෝ මෙබඳු දුටු පමණින් මිත්‍රයෙක් හෝ මෙබඳු දැක හක්ති ඇත්තෙක් හෝ මෙබඳු යහළුවෙක් හෝ ඇත්තේවේද යම් ශ්‍රමණයෙක් මෙබඳු ආකාර ඇති විහාරයක හෝ මෙබඳු දික් පහයක හෝ මෙබඳු සිව්රැස් පහයක හෝ මෙබඳු පියසි පාවාවා කළ ගේක හෝ මෙබඳු පවිත්‍ර ගුහාවෙක හෝ මෙබඳු ගල් ලෙණෙක හෝ මෙබඳු කුටි ගෘහයෙක හෝ මෙබඳු කර්ණිකා ඇති කොට තනා කළ ගේක හෝ මෙබඳු සතරමාල් පස්මාල් ගේක හෝ මෙබඳු ඒකාමුද්‍රගෙයි හා කොහොමයක් කොට ඇති ගේක හෝ මෙබඳු හැප් පැනි එක් දොරකින් යුත් දික් ශාලාවක හෝ මෙබඳු සත්ථාගාර ගෙයක හෝ මෙබඳු මණ්ඩප ගෙයක හෝ මෙබඳු රුක් මුලෙක හෝ වෙසේනම් ඒ ශ්‍රමණ තෙම ධ්‍යානමාර්ගඵලලාභී මහානුභාව ඇත්තෙකැයි තමා සඳහා කියාද මෙසේ කුහක ලෙසින් හටගත් නිසුණු දුඃඛතාවයෙන් අතිශයින් හැකිළෙමින් අතිශයින් මුහුණ හකුළුවමින් අතිශයින් විස්මයපත් කරවමින් අතිශයින් ප්‍රලාප බස් බෙණෙමින් තමාගේ වචන මාත්‍රයකින්ම අනුන් විසින් ගරු බුහුමන් කරණ ලද්ද මේ ශ්‍රමණ තෙම මෙබඳුවූ සන්සුන් ඉරියව් පැවැත්වීම හා ධ්‍යාන සම්පත්ති ඇත්තේයයි. තමාම අනුන්මෙන් කොට කියාද එබඳුවූ ගැඹුරුවූ දැක්ක නොහැකිකාවූ සියුම්වූ මුවහවූ ලෝකෝත්තරවූ නිර්වාණ ප්‍රතිසංයුක්තවූ කථා කෙරේද මෙබඳු ආකාර ඇත්තාවූ මුහුණ හකුළුවන බවෙක් හෝ මුහුණ හකුළුවන ස්වභාව ඇති බවෙක් හෝ විස්මයපත් කරවීමක් හෝ විස්මය පැවැත් වීමෙක් හෝ කුහනයෙහි පැවැත්මෙක් හෝ ඇත්තේවේද මේ සාමන්තජප්පන සංඛ්‍යාත කුහනවස්තුයයි කියනු ලැබේ.

( පා † )

පාපිච්ඡස්සෙව පන සතො සම්භාවනාධිප්පායස්ස ගමනාදිනා ඉරියාපථෙන විම්හාපනං ඉරියාපථසන්නිස්සිතං කුහනවත්ථූති වෙදිතබ්බං — යථාහ— කතමං ඉරියාපථසඞ්ඛාතං කුහනවත්ථු? ඉධෙකච්චො පාපිච්ඡො ඉච්ඡාපකතො සම්භාවනාධිප්පායො එවං මං ජනො සම්භාවෙස්සතීති ගමනං සණ්ඨපෙති සයනං සණ්ඨපෙති පණිධාය ගච්ඡති පණිධාය තිට්ඨති පණිධාය නිසීදති පණිධාය සෙය්‍යං කප්පෙති සමාහිතො විය ගච්ඡති සමාහිතො විය තිට්ඨති නිසීදති සෙය්‍යං කප්පෙති ආපාථකජ්ඣායීච හොති යා එවරූපා ඉරියාපථස්ස අට්ඨපනා ඨපනා සණ්ඨපනා භාකුටිකා භාකුටියං කුහනා කුහායනා කුහිතත්තං ඉදං ඉරියාපථ සඞ්ඛාතං කුහනවත්ථූති— තත්ථ පච්චය පටිසෙවන සඞ්ඛාතෙනාති පච්චය පටිසෙවනන්ති එවං සඞ්ඛාතෙන පච්චය පටිසෙවනෙනවා සඞ්ඛාතෙන— සාමන්තජප්පිතෙනාති සමීප භණිතෙන ඉරියාපථස්ස වාති චතුඉරියාපථස්ස අට්ඨපනාති ආදිට්ඨපනා ආදරෙනවා ඨපනා ඨපනාති ඨපනාකාරො සණ්ඨපනාති අභිසඞ්ඛරණං පාසාදික භාව කරණන්ති වුත්තං හොති— භාකුටිකාති පධානපුරිමට්ඨිත භාවදස්සනෙන භාකුටි කරණං මුඛසඞ්කොචොති වුත්තං හොති භාකුටි කරණං සීලමස්සාති භාකුටිකො භාකුටිකස්ස භාවො භාකුටියං— කුහනාති විම්හාපනා කුහස්ස ආයනා කුහායනා කුහිතස්ස භාවො කුහිතත්තන්ති—

( ස † )

සම්භාවනාධිප්පායකතෙන "කච්චානු ඛො මං ජනො අරියො'ති වා විසෙස ලාභීති වා ජානෙය්‍යාති'' යන අභිප්‍රායයෙන් කරණලද; ඉරියාපථෙන විම්හාපනං' ඊර්‍යාපථයෙන් විස්මයකරවීම; ඉරියාපථසන්නිස්සිතං කුහනවත්ථු 'ති වෙදිතබ්බං, ඊර්‍යාපථ සන්නිශ්‍රිත කුහන වස්තුයයි දතයුතු—පෙ—පණිධාය ගච්ඡති, රහතැයි මා දන්නායි සිතා පිහිටුවා පතා ගෙන යේද (සෙසු පෙළෙහිද මෙම අර්ථයි) සමාහිතොවිය ගච්ඡති, ධ්‍යාන සමාධින් සමාහිතයකු මෙන් යේද (සෙසු පෙළෙහිද මෙම න්‍යායි) ආපාථකජ්ඣායීව හොති, හමුයෙහි සිතත් මෙන් (පැමිණෙන තැන සමාපත්තියට සමවදින්නාහු මෙන් හිඳිනේද යන අර්ථයි)—පෙ—ඉරියාපථ සඞ්ඛාතං, ඉරියාපථසණ්ඨපනායයි කියනලද—පෙ—තාදී, ඒ පාලියෙහි; පච්චයපටිසෙවනනාති, අමයාතිසො උත්පාද ප්‍රත්‍යයන්ගේ ප්‍රතිෂෙධයයි; ඉච්චෙවං සඞ්ඛාතෙන, මෙසේ කියනලද ("පච්චය පටිසෙවන සඞ්ඛාතෙන තෙනාපි, පච්චය පටිසෙවනෙන සඞ්ඛා තෙගිහිතා සාථ තබ්බතා'' යන අර්ථයි) සමීපභණිතෙන, තමා අනිකෙකුහු මෙන් කොට තමහට සමීපකොට කිණීමෙන්; චතුරිරියාපථස්ස, චතුර්විධ ඊර්‍යාපථයාගේ; අට්ඨපනාහ, අට්ඨපනායම්; ආදිට්ඨපනා, ආදිකොට තිබීම; ආදරෙනවා ඨපනා, ආදරයෙන්හෝ තිබීම; අභිසඞ්ඛරණං, සැදීම; පාසාදිකභාවකරණං, ප්‍රසාද එළවන බව කිරීම—පෙ—පධාන පුරිමට්ඨිත භාවදස්සනෙන, ශ්‍රමණ ධර්ම කාරණයෙන් මිරිකුනු බව දැක්වීමෙන්; භාකුටිකරණං, මුහුණ හකුළුවා තබාපසී. එම කීහ "මුඛසඞ්කොචොති වුත්තං හොති''යි) භාකුටිකරණං, මුහුණ හැකිලිවීම; සීලං, සහ භාව වූයේ; අස්සාති, මෙහට වනුයි; භාකුටිකො, භාකුටිකතම; භාකුටිකස්ස භාවො, මුහුණ හකුළුවන සුලුවනුගේ භාවය; භාකුටි..., භා

කුටියනාම්; විම්හාපනා, විස්මය කරවීම (කුහනං කුහො තස්ස අයනා කුහායනා, විස්මය කරවීම කුහනනාම් ලාභුගේ ප්‍රවෘත්තිය කුහායන නාම්~,,තස්ස පුග්ගලස්ස අයනා ගති කිරියා කුහායනා-කුහො'ති කුහකනවා ඉතොනි කුහිතො කුහකො තස්ස භාවො කුහිතත්තං''ති ගණ්ඨිපද)

---

( හා † )

තවද ලාභය අදහස් ඇත්තාවූ යම් ශ්‍රමණයෙකුගේ තෙමේ රහතැයි හෝ ධ්‍යානලාභියයි හෝ මහජනයා දනීවයි යන අදහසින් කරණලද ඊර්‍යාපථයෙන් විස්මයපත් කරවීම ඊර්‍යාපථ නිශ්‍රිතවූ කුහන වස්තුයයි දතයුත්තේය එහෙයින් වදාළහ. ඊර්‍යාපථ සංඛ්‍යාතවූ කුහන වස්තු නම් කවරයත් ? මෙසේ සත්හි ඇතැම් මහණෙක් පවිටු අදහස් ඇත්තේ තෘෂ්ණාවෙන් මඩනාලද්දේ මෙසේ කල කල්හි මහජන තෙමේ මට සම්භාවනා කරන්නේයයි යන අභිප්‍රායයෙන් විශේෂලාභීන්ගේ ගමන් මෙන් ගමන සකස්කොට තබාද සයනය සකස්කොට තබාද මා රහතැයි දනීවයි සිතා යන්නේ හෝ වේද මා රහතැයි දනීවයි සිතා සිටින්නේ හෝ වේද මා රහතැයි දනීවයි සිතා හිඳින්නේ හෝ වේද මා රහතැයි දනීවයි සිතා සයනය කරන්නේ හෝ වේද ධ්‍යාන සමවතින් කොලෙසුන් නැසුවෙකු මෙන් යේද ධ්‍යාන සමවතින් කෙලෙසුන් නැසුවෙකු මෙන් සිටීද හිඳීද සයනය කෙරේද මහජනයාට පෙනෙන තැන සමවතට සමවන්නෙකු මෙන් හිඳීද මෙබඳු ආකාර ඇත්තාවූ ඊර්‍යාපථයාගේ යම් පලමුකොට තැබීමක් හෝ තබනාකාරයෙක් හෝ මනාකොට තැබීමක් හෝ මුහුණ හකුළුවන බවක් හෝ මුහුණ හකුළුවන ස්වභාව ඇති බවක් හෝ විස්මය පත්කාරවීමක් හෝ විස්මය පැවැත්වීමක් හෝ කුහන බවක් හෝ ඇත්තේවේද මේ ඊර්‍යාපථ සංඛ්‍යාතවූ කුහන වස්තුයයි දතයුතු. ඒ පාලියෙහි අර්ථ මෙසේ දතයුත්තේය කෙසේදයත්? ප්‍රත්‍යය වැලැක්වීම යයි කියනලද කුහනවස්තු නම් හුනුවණින් උපන් පසය පිළිගැණ්මයි කීම හෝ ඒ ප්‍රත්‍යය වැලැක්වීමයයි කියනලද කුහන වස්තුව හෝයි. සම්පකොට බිණීම නම් තමා අභිකාක්ෂාවෙන් කොට තම හට සමීපකොට බිණීම වෙයි ඊර්‍යාපථය නම් යාම් ඊම් හිඳීම් සිටීම් සංඛ්‍යාතවූ සතර ඉරියව්වයි. "අට්ඨපනා" නම් පලමුකොට තැබීම හෝ ආදරයෙන් තැබීම හෝයි "ඨපනා" නම් තබනාකාරයයි "සණ්ඨපනා" නම් පිළියෙල කිරීමයි පහන් ප්‍රසාද එලවන බව කිරීමයයි කියනලද්දේ වේ "භාකුටිකා" නම් මහණදම් පිරීමෙන් මිරිකුණු බව හැඟවීමෙන් භ්‍රැකුටි කිරීමයි මෙහෙවන් මුහුණ හකුළුවන බවයයි කියනලද්දේවේ මුහුණ හකුළුවන ස්වභාව මේහට ඇති හෙයින් "භාකුටික" නම් ඒ භාකුටිකයාගේ ස්වභාව "භාකුටිය" නම් වේ. "කුහනා" නම් මහජනයා විස්මයපත් කරවීමයි විස්මයපත් කරවනනාහුගේ පැවැත්ම "කුහායනා" නම් කුහිතයාගේ ස්වභාවය "කුහිතත්ත" නම්~

---

( පා ‡ )

ලපනා නිද්දෙසෙ ආලපනාති විහාරං ආගතෙ මනුස්සෙ දිස්වා කිමත්ථාය භොන්තො ආගතා කිං භික්ඛූ නිමන්තෙතුං යදි එවං ගච්ඡථ අහං පච්ඡතො ආගච්ඡාමීති එවං ආදිතො ලපනා අථවා අත්තානං උප

නෙත්වා අහං තිස්සො මයි රාජා පසන්නො මයි අසුකොච අසුකොච රාජමහාමත්තො පසන්නොති එවං අත්තූපනායිකා ලපනා ආලපනා—ලපනාති පුට්ඨස්ස සතො වුත්තප්පකාරමෙව ලපනා—සල්ලපනාති ගහපතිකානං උක්කණ්ඨනභීතස්ස ඔකාසං දත්වා දත්වා සුට්ඨුලපනා උල්ලපනාති මහාකුටුම්බිකො මහානාවිකො මහාදානපතීති එවං උද්ධං කත්වා ලපනා සමුල්ලපනාති සබ්බතො භාගෙන උද්ධං කත්වා ලපනා උන්නහනාති උපාසකා පුබ්බෙ ඊදිසෙ කාලෙ නව දානං දෙථ ඉදානි කිං න දෙථාති එවං යාව දස්සාම භන්තෙ ඔකාසං නලභාමාති ආදීනි වදන්ති තාව උද්ධං උද්ධං නහනා වෙඨනාති වුත්තං හොති—අථවා උච්ඡුහත්ථං දිස්වා කුතො ආභතං උපාසකාති පුච්ඡති උච්ඡුඛෙත්තතො භන්තෙති කිං තත්ථ උච්ඡු මධුරන්ති ඛාදිත්වා භන්තෙ ජානිතබ්බන්ති න උපාසකා භික්ඛුස්ස උච්ඡුං දෙථාති වත්තුං වට්ටතීතියා එවරූපා නිබ්බෙඨෙන්තස්සාපි නිබ්බෙඨනකථා සා උන්නහනා—සබ්බභාගෙන පුනප්පුනං නහනා සමුන්නහනා උක්කාචනාති එතං කුලං මං එවං ජානාති සචෙ එත්ථ දෙය්‍යධම්මො උප්පජ්ජති මය්හං එව දෙන්තීති එවං උක්ඛිපිත්වා කාචනා උක්කාචනා උද්දීපනාති වුත්තං හොති—තෙල කන්දරිකවත්ථු චෙත්ථ වත්තබ්බං සබ්බභාගෙන පන පුනප්පුනං උක්කාචනා සමුක්කාචනා—

( ස ‡ )

ආලපනා, ආලපනා නම්; විහාරං ආගතෙ මනුස්සෙ දිස්වා, විහාරයට ආ මිනිසුන් දැක; කිමත්ථාය භොන්තො ආගතා, භවත්හු කුමක් පිණිස අවුද; කිං, කිම; භික්ඛූ නිමන්තෙතුං, භික්ෂූන් නිමන්ත්‍රණය කරන්ට අවුද; යදි එවං ඉදින් එසේ වී නම්; ගච්ඡථ, යවපියව්; අහං, මම; පච්ඡතො ගහෙත්වා ආගච්ඡාමි, පසුපස්සෙ භික්ෂූන් ගෙණ එමියි; එවං ආදිතො ලපනා, මෙසේ පළමුකොට කීමයි; අථවා, නොහොත්; අත්තානං උපනෙත්වා, තමා එළවා; අහං තිස්සො, මම තිස්ස නමියි; මයි රාජා පසන්නො, මා කෙරෙහි රජ්ජුරු පහන්නාහය; මයි, මා කෙරෙහි; අසුකොච අසුකොච රාජමහාමත්තො පසන්නොති, අසවල් අසවල් රාජමහාමාත්‍යයෝ පහන්නාහයයි; එවං, මෙසේ; අත්තූපනායිකා ලපනා, තමා එළවා කීමයි; ලපනාති, ලපනා නම්; පුට්ඨස්ස සතො, ,,කො තිස්සො කො රාජපූජිතො''යි පිළිසඳන ලද්දහුගේ; වුත්තප්පකාරමෙව ලපනා, ''අහං තිස්සො මයි රාජා පසන්නො'' යනාදීන් කීමයි; ගහපතිකානං උක්කණ්ඨනභීතස්ස, ගෘහපතීන්ගේ එන්වාන් බිණීමෙන් උකටලීවීමෙහි භය ඇත්තහුගේ; ඔකාසං දත්වා දත්වා, අවකාශ දදී; සුට්ඨුලපනා, මනාකොට බිණීමයි; උල්ලපනා 'ති' උල්ලපනා නම්; මහාකුටුම්බිකො, මහ කෙළෙඹිය; මහානාවිකො, මහ නැවියා; මහා දානපතී 'ති' මහාදාන පතීයයි; එවං, මෙසේ; උද්ධං කත්වා, විභව සම්පත්ති ආදීන් උසස්කොට; ලපනා, බිණීමයි; සමුල්ලපනාති, සමුල්ලපනා නම්; සබ්බතො භාගෙන උද්ධං කත්වා ලපනා, සත්වනපරම්පරාව දක්වා මහ කෙළෙඹියාව යනාදීන් හැම පසින් උසස්කොට බිණීමයි; උන්නහනා නම්; උපාසකා, උපාසකවරුනි; පුබ්බෙ, පෙර; ඊදිසෙ කාලෙ, මෙබඳු කල; නවදානං දෙථ, අලුත් දානය දෙව්; ඉදානි කිං න දෙථ 'ති' දැන් කුමක්හෙයින් නොදෙව්දැයි; එවං, මෙසේ; යාව, යම්තාක්; දස්සාම භන්තෙ, වහන්ස දෙමුය; ඔකා

සංඝා ලපාමාති, අවකාශ නොලබ්මින සි; ආදිනි වදනානි, මේ ආදිය කියඅ; නාථ, ඒනාක්; උඩිං උඩිං, මතු මතුයෙ හි (නගනායි සේයි) වේඨනානි වුත්තං හොති, වෙළිමයයි කී නියාගි; උච්ඡු හද්ධං දිස්වා, ඉක්ෂුහස්ත පුරුෂයා දැක; කුතො ආභතං උපාසකා'ති පුච්ඡිති' කොයින් ගෙණෙයේද උපාසකයයි පිළි විසී; උච්ඡුඛෙත්තතො භන්තෙ'ති' ඉක්ෂුක්ෂෙත්‍රයෙන වහන්සැයි කී; කිං, කිම; තත්ථ උච්ඡුඃඛුරන්ති. ඉහි උක් මිතිරිද්දයි; ඛාදිත්වා ගච්ඡන්ත ජාතිතබ්බං, කා බිලා වහන්සෙ දතයුතු; උපාසකා, උපාසකවරිනි; භික්ඛුස්ස, භික්ෂුහට; උච්ඡුංදෙථාති වත්තුං නවට්ටන්ති, උක්දඬු දෙවයි කියන්නට නොවටනේ වේද්දයි; එවරූපා, මෙබඳුවූ; යා නිබ්බෙඨනස්ස විනිබ්බෙඨන කථා, ගැලවෙන් නමුදු නොගැලවිය දෙන යම් කථාවක් ඇද්ද; සා උන්නහනා, නෝ උන්නහනා නම්; සබ්බගාමෙගන, හැම පසින්ම; පුනප්පුන නහනා, නැවත නැවත බැදුම්; සමුන්නහනා, සමුන්නහනා නම්; එතං කුලං, මේ කුලය; මං එවං ජානාති, මා මෙසේ දනි; එත්ථ, මේ තැන්; සචෙ දෙය්‍යධම්මො උප්පජ්ජති, ඉදින් දෙය ධම්මයෙක් උපන්නේ; මය්හං එවදෙන්නි'ති' මටම දෙන්නාහයි; එවං, මෙසේ; උක්ඛිපිත් වානාවනා, උස්කොට තැගවීම උක්ඛාවනා නම් (එම කීහ "උද්දිපනා'ති වුත්තං හොති"යි) තෙලකන්දරිනවත්ථු තෙලකන්දරිකාවගේ වත; එත්ථ වත්තබ්බං, මෙතන කියයුතුයි (භික්ෂූනු දෙදෙනෙක් ගමකට වැද ආසන ශාලාවෙහි හිද එක් කුමාරියක කැඳවූහ ඈ ආකල එක් භික්ෂුවෙක් අනික් භික්ෂුහට වහන්ස මැ කාවරකගේ කුමාරිකාවක්දැයි පිළිවිසස මෙතෙම මේ අපගේ උපාසිකාවන් තෙල කන්දරිකාවගේ දුය මැගේ මව් මා හෙට එලඹී කාලන් හිතෙල් දෙනකල කළයෙකන්ට දෙන්නියි මේද මවමේන් කලයෙකන්ට දෙන්නීයයි උස්කොට තැනවී-මේ සඳහා කීහ "තෙල කන්දරික වත්ථුවෙත්ථ වත්තබ්බ"යි)

---

( ශා ‡ )

ලපනා නිර්දෙශයෙහි "ආලපනා" නාම විහාරයට ආ මිනිසුන් දැක මින්වහනි තොපි කුමක් පිණිස ආවාහුද? කුමක්ද භික්ෂූන් නිමන්ත්‍රණය කරන්නට ආවාහුද? ඉදින් භික්ෂූන් නිමන්ත්‍රණය කරන්නට ආවාහු විනම් තෙපි යව මම පසුපස්සේ භික්ෂූන් ගෙණ එන්නෙහිමියි මෙසේ පළමුකොට බිණීම නම්වේ. තොහොත් තුමා තිස්ස නාම් නවම්. මා කෙරෙහි රජ්ජු පුසන්නය අසැල් අසැල් රාජ මහාමාත්‍යයා ප්‍රසන්නයයි මෙසේ තමා උදෙසා බිණීමයි "ලපනා" නම්. සොභති තිස්ස නාම කව්ද? රාජ පූජිතව වසන්නේ කවුදැයි විචාරණලද්දෙකුට සව තිස නලද පකාරයෙන් තිස්ස කියන්නේ මමය රාජපූජිතව වසන්නේ මමයයි බිණීම වෙයි "සල්ලපනා" නම් ගෘහපතීන්ගේ එක්වන් බිණීමෙන් උසාලි වීමෙනි හස ඇතතුමෙස් අවිතද්දී මනාකොට බිණීමවෙයි "උල්ලපනා" නම් මිහ තොළෙගිල මිතාවගේ මහාදනපතියයි මෙමෙස් එවෝ... මපත් ආදියෙන් උසස්කොට ... දී බිණීම වෙයි "සමුල්ලපනා" ... තොපගේ සත්මුතු පරම්පරාව දක්... සියලුදෙනම මිහ කෙළෙසි... නාදීන් භාත්පසින් උසස්කොට බි... ම වෙයි "උන්නහනා" නම් උපාසා වරිනී පෙර තොපි මෙබඳු කාලයේ අග්‍ර සස්‍ය අග්‍රඵලාදි අලුත් දනයන් දෙන්නෝය දැන් කුමක් හෙයින් එබඳු දන නොදෙව්දැයි මෙසේ සවිසේ...

( හා ‡ )

එබඳු දන දුනුදු දෙමිහ අවකාශයෙහි ලබම්හයි යනාදිය කියනලාත් මතු මත්තෙහි බැඳීම හෙවත් එවනයෙන් පෙළීම "උන්නහනා" නම් වෙයි. නොහොත් උක්දඬු ගෙණ එන්නාවූ පුරුෂයෙක් දැක උපාසකය උක්දඬු කොයින් ගෙණෙ එව්දැයි විචාරයි උපාසකයාද ස්වාමීනි උක් කෙතින් නැති පිළිවදන් දෙයි උක් බීති භික්ෂූතෙම කිමෙක්ද උපාසකය එහි උක් මිහිරිදැයි විචාරයි එහෙත්හ හා බලා ම මිහිරිබව දතයුතුවෙයි උපාසකවරිනි භික්ෂුන්ට උක්දඬු දෙවයි කියන්නාට නැපෙනාවන් හෝ වේදැයි මෙසේ ගැළපෙන් නමුදු නොගැළපීම හැකිකොට කරණ යම්කථාවක් ඇත්තේවේද ඒ කථාව "උන්නහනා" නම්වේ. "සමුන්නහනා" නාම හාත්පසින් නැවත නැවත කථාවෙන් කරණ බැඳීමයි. "උක්කාචනා" නම් මේ කුලය මා මෙසේ හඳුනායි ඉදින් මෙ ගෙහි යම් දියයුතු දනවස්තුවක් උපන්නේවී නම් මටම දෙන්නේයයි මෙසේ උසස්කොට ගැනවීම "උක්කාචනා" නම්වේ. හෙවත් උසස්කොට ප්‍රකාශකිරීම යයි කියනලද්දේවේ, මෙතන්හි සාධකවශයෙන් තෙලකන්දරිකා නම් උපාසිකාවගේ වස්තුව දක්වයයුතුයි. එය කෙසේදයත් ? භික්ෂූහු දෙදෙනෙක් එක්ගමකට වැද ආසනශාලාවෙහි වැඩහිඳ එක් කුමාරිකාවක් කැඳවා ඇ ලඟට ආ කල එක්භික්ෂුවක් අනික් භික්ෂුවගෙන් වහන්ස මේතොමෝ කවරෙකුගේ කුමාරිකාවක් දැයි විචාළේය. ඒ භික්ෂුතෙම මේතොමෝ අපගේ තෙලකන්දරිකා නම් උපාසිකාවගේ දියණියෝය මෑගේ මව්තා ගෙවසින කල කිතෙල් දෙනනි කලයෙන්ම දෙයි මැද මව්මවත් කලයෙන් ම දෙන්නීයයි කියා හාත්පසින් නැවත නැවත උසස්කොට ප්‍රකාශකිරීම "සමුක්කාචනා" නම් වේ.–

( භා ¶ )

අනුප්පිය භාණිතාති සච්චානුරූපං ධම්මානුරූපං වා අනවලොකෙත්වා පුනප්පුන පියභණනං මෙව–චාටුකම්‍යතාති නීචවුත්තිතා අත්තානං හෙට්ඨතො හෙට්ඨතො ඨපෙත්වා පවත්තනං–මුග්ගසූප්‍යතාති මුග්ගසූපසදිසතා යථාහි මුග්ගෙසු පච්චමානෙසු කොචිදෙව න පච්චති අවසෙසා පච්චන්ති එවං යස්ස පුග්ගලස්ස වචනෙ කිඤ්චිදෙව සච්චං හොති සෙසං අලිකං අයං පුග්ගලො මුග්ගසූප්‍යො ති වුච්චති තස්ස භාවො මුග්ගසූප්‍යතා–පාරිභට්‍යතාති පාරිභට්‍යභාවො යො හි කුලදාරකෙ ධාතී විය අඞ්කෙන වා ඛන්ධෙන වා පරිහරති ධාරෙති හි අස්සා තස්ස පරිහාරස්ස කම්මං පාරිභට්‍යං පාරිභට්‍යස්ස භාවො පාරිභට්‍යතාති–නෙමිත්තිකතා නිද්දෙසෙ නිමිත්තන්ති කිඤ්චි පරෙසං පච්චයදානසඤ්ඤාජනකං කායවචීකම්මං–නිමිත්තකම්මන්ති ඛාදනීයං ගහෙත්වා ගච්ඡන්තෙ දිස්වා කිං ඛාදනීයං ලභිත්ථාති ආදිනා නයෙන නිමිත්තකරණං–ඔභාසොති පච්චයපටිසංයුත්තකථා–ඔභාසකම්මං වච්ඡපාලකෙ දිස්වා කිං ඉමෙ වච්ඡා ඛීරගොවච්ඡා තක්කගොවච්ඡාති පුච්ඡිත්වා ඛීරගොවච්ඡා භන්තෙති වුත්තෙ න ඛීරගො වච්ඡා, ඛීරගොවච්ඡා සියුං භික්ඛූපි ඛීරං ලභෙය්‍යුන්ති එවමාදිනා නයෙන තෙසං මාතාපිතූනං නිවෙදෙත්වා ඛීරදාපනාදිකං ඔභාසකරණං–

( ස ¶ )

සච්චානුරූපං, සත්‍යයට සුදුසුසේත්; ධම්මානුරූපංවා, මනාවාචනාවට සුදුසුසේත් හෝ ("වතනාවචනං ති ධම්මො 'යි වුච්චති'" යනු ටීකායි-නො හොත් සත්‍ය වචනයෙන් අනාකූ

සුභාෂිතවාචාව ධම්මයයි දතයුතුයි) අනුවලොකනචා, නොබලා; පුනප්පුන පියභණනමෙව, නැවත නැවත ප්‍රිය වචනයකිණිමම අනුප්පියභාණිතා නම්; නිච්චුත්තිතා, නිච්චෘත්තිඇතිබවයි; අත්තානං, තමා; හෙට්ඨතොහෙට්ඨතො ඨපෙත්වා පවත්තනං, යට යට කොට තබා පැවැත්මයි; මුග්ගසූපසදිසතා, මුද්ගසූපයක්වැනිබවයි; යථාහි, යම්සේ මුග්ගසූ පච්චමානෙසු, මුංපැසෙනකල්හි; කොචි දෙව න පච්චන්ති, කිසිඇටෙක්ම නොපැසේද; අවසෙසා පච්චන්ති, සෙසස පැසේද; එවං, එසේම; යස්ස පුග්ගලස්ස වචනෙ, යම් පුද්ගලයක්හුගේ වචනයෙහි; කිංචිදෙව සච්චං හොති, කිසිවෙක්ම සැබෑවේද; සෙසං අලිකං, සෙසස බොරුවේද; අයං පුග්ගලො, මේ පුද්ගලතෙමේ; මුග්ගසූපො'ති වුච්චති, මුද්ග සූපසදෘශකම ඇති බැවින් මුද්ගසූපයයි කියනුලැබේ; තස්සභාවො, ඒ මුද්ගසූපයාගේ භාවය; මුග්ගසූප්‍යතා, මුද්ගසූප්‍යතා නමිවී; පාරිභට්‍යභාවො, දරණනුගේ භාවය (දරුවඩන්නනුගේභාවය යනඅර්ථයි) යො හි, යමෙක්; කුලදාරකෙ, කුලදරුවන්; ධාති විය, කිරිමවකමෙන්; අඞ්කෙනපි වහති, ඇකයෙන් හෝ කරින් හෝ; පරිහරති, දරාද; ධාරෙති'ති අත්ථො, දරයි වඩයි යන අර්ථයි; තස්ස පරිහාසකම්මං, ඒ දරුවඩන්නහුගේ ක්‍රියාව පාරිභට්ටනම් (නොදව පාරිභට්ටතා) "නෙමිත්තිකතා" යන්නෙහි ("නිමිත්තෙන තන චරන්තො ජීවන්තොති නිමිත්තකාරකො නෙමිත්තිකො තස්ස භාවො නෙමිත්තිකතා" සිඟණයෙහි) යං කිඤ්චි, යම් කිසි; පරෙසං, පරයන්ට; පච්චයදාන සඤ්ඤජනකං, ප්‍රත්‍යයදානසංඥ උපදන; කායවචීකම්මං, කායවාක්කම්මයි; (බත්දෙනුපිණිස තමා සාබව දක්වමිසි තුස්පිරීමැදීම ආදිය කායකම්ම නම බතවද වැරිහ යනාදි වාක්කම්මනාම) ඛාදනීයං ගණ්හාථ ගච්ඡතාදිසව්‍යා, කැවුම් 'ගෙණයන්නවුන් දක; කිං, කිඃ; ඛාදනීයං ලභිස්සාමා'ති, කැවුමක් ලදදයන; ආදිකානානයෙන, මේආදීනයින්; නිමිත්තකරණනාති, නිමිත්කිරීමයි "ඔභාසො" යන්නෙනි තමාගේ ප්‍රත්‍යාව හැඟවීම ඔභාසනම්; පච්චයපටිසංයුත්තකථා "අජ්ජ භික්ඛූනං පච්චයා දුල්ලභා ජාතා" යනාදී ප්‍රත්‍යය ප්‍රතිසංයුක්තකථායි; ඔභාසකම්මනම්; වච්ඡපාලකෙ දිස්වා, වස්සන් රක්නාවුන් දක; කිං, කිම; ඉමෙ වච්ඡා, මේ වස්සෝ; ඛීරගොවච්ඡා, කිරිදෙනුන්වස්සෝද; තක්කගොවච්ඡා'ති, මෝරෝදෙනුන් වස්සෝද; එවමාදිනානයෙන, මේ ආදීනයින්; වුත්තං දරකානං, ඒ වස්සන් බලන දරුවන්ගේ; මාතාපිතූනනං නිවෙදෙත්වා, මවිපියන්ටකියා; ඛීරදපනාදිකාං, කිරිදෙවීම් ආදි; ඔභාසකරණං, ඔභාසකිරීමයි.

( භා ¶ )

"අනුප්පියභාණිතා" නම් සත්‍යයට සුදුස්සක් හෝ අසත්‍යවූ සුභාෂිත ධර්මවචනයට සුදුස්සක් හෝ නොබලා නැවත නැවත ප්‍රියතෙපුල්ම කිණිම වෙයි "චාටුකම්‍යතා" නම් යටත් පැවතුම් ඇතිබව හෝ නොහොත් ප්‍රත්‍යය දායකයා උසස්කොට තමා යට යට කොට තබා පැවැත්මවෙයි "මුග්ගසූප්‍යතා" නම් මුංඇට සූපයක්වැනි බවයි නොහොත් යම්සේ මුංපැසෙනා කල කිසි ඇටෙක්ම නොපැසේද සෙසු මුං පැසේද එමෙන්ම යම් පුද්ගලයෙකුගේ වචනයෙහි කිසි වචනයක්ම සැබෑවේද සෙස්ස බොරුවේද මේ පුද්ගලතෙමේ මුංඇට සූපයකට බඳු කම්ම ඇතිබැවින්

,මුගහසුප" යයි කියනු ලැබේ. ඒ පුද්ගලයාගේ ස්වභාවය මුගහසුපත්‍යතා නම් වන්නේයි "පාරිභට්ටතා" නම් දරුවඩන්නාහුගේ ස්වභාවයි යම් මනුෂ්‍යයෙක් කිරිදරුවන් වඩන්නාවූ කිරි මවක් මෙන් ඇකයෙන් හෝ කරින් හෝ ප්‍රත්‍යය දායකයන්ගේ දරුවන් වඩාද යනු භාවයි ඒ දරුවන් වඩන්නාහුගේ ක්‍රියාව පාරිභට්ට නම. ඒ ස්වභාවය පාරිභට්ටතා නම් වන්නේයි.

"නෙමිත්තිකතා" නිර්දේශයෙහි "නිමිත්ත" නම් ප්‍රත්‍යය දීමට සංඥා උපදවනු පිණිස අනුන්ට කයින් හෝ වචනයෙන් හෝ කරණ යම්කිසි ක්‍රියාවක් "නිමිත්තකර්ම" නම් කැවුම් ගෙණයන්නවුන් දැක කුමක්ද? කැවුම් ලබනාලද්දුනී යනාදීන් කීම "නිමිත්තකරණ" නම්වේ "ඔභාස" නම් අද භික්ෂූන්ට සිව්පසය දුර්ලභය යනාදීන් ප්‍රත්‍යය පිළිබඳ කථාවෙන් තමාගේ අදහස හැඟවීමයි "ඔභාසකර්ම" නම් වස්සන් රක්නාවුන් දැක කිමෙක්ද උපාසකවරිනි මේ වස්සෝ කිරිදෙනුන්ගේ වස්සෝද මෝරහාරදෙනුන්ගේ වස්සෝදැයි යනාදි ක්‍රමයෙන් විචාරා වහන්ස කිරිදෙනුන්ගේ වස්සෝයයි කී කල්හි කිරිදෙනුන්ගේ වස්සෝ නොවන්නාහුය ඉදින් කිරිදෙනුන්ගේ වස්සෝ වූවාහු නම් භික්ෂූන්ද කිරි ලබන්නාහු නොවෙද්දැයි මෙ ආදී ක්‍රමයෙන් ඒ වස්සන් බලන දරුවන්ගේ මව්පියන්ට දන්වා කිරි දන් දෙවීම කරවන කථාව "ඔභාසකරණ" නම් වන්නේයි.

---

(පා *)

සාමන්තජප්පාන් සම්පං කත්වා ජප්පනං කුලූපග භික්ඛු වත්ථුචෙත්ථ වත්තබ්බං කුලූපගො කිර භික්ඛු භුඤ්ජිතුකාමො ගෙහං පවිසිත්වා නිසීදි තං දිස්වා අදාතුකාමා ඝරණී තණ්ඩුලා නත්ථීති භණන්තී තණ්ඩුලෙ ආහරිතුකාමා විය පටිවිස්සකඝරං ගතා භික්ඛු අන්තොගබ්භං පවිසිත්වා ඔලොකෙන්තො කවාටකොණෙ උච්ඡුං භාජනෙ ගුළං පිටකෙ ලොණමච්ඡඵාලෙ කුම්භියං තණ්ඩුලෙ ඝටෙ ඝතං දිස්වා නික්ඛමිත්වා නිසීදි ඝරණී තණ්ඩුලෙ නාලත්ථන්ති ආගතා, භික්ඛු උපාසිකෙ අජ්ජ භික්ඛා න සම්පජ්ජිස්සතීති පටිගච්චෙව නිමිත්තං අද්දසන්ති ආහ? කිං භන්තෙති, කවාටකොණෙ නික්ඛිත්ත උච්ඡුං විය සප්පං අද්දසං තං පහරිස්සාමීති ඔලොකෙන්තො භාජනෙ ඨපිතගුළපිණ්ඩකෙ විය පාසාණලෙඩ්ඩුකෙන පහටෙන සප්පෙන කතං පිටකෙ නික්ඛිත්තලොණමච්ඡඵාල සදිසං ඵණං තස්ස තං ලෙඩ්ඩුං ඩසිතුකාමස්ස කුම්භියා තණ්ඩුලසදිසෙ දන්තෙ අථස්ස කුපිතස්ස ඝටෙ පක්ඛිත්තඝත සදිසං මුඛතො නික්ඛන්තං විසමිස්සකං ඛෙළන්ති, සා න සක්කා මුණ්ඩකං වඤ්චෙතුන්ති උච්ඡුං දත්වා ඔදනං පචිත්වා ඝතගුළමච්ඡෙහි සද්ධිං අදාසීති එවං සමීපං කත්වා ජප්පනං සාමන්තජප්පාති වෙදිතබ්බා...

---

(ස *)

("සාමන්තජප්පා" යනුයෙහි "ඉච්ඡිතවත්ථුස්ස සමීපෙ කථනං සාමන්තජප්පා"යි ගණිනේ) සමීපං කත්වා ජප්පනං, සමීපයෙහි ජල්පනයයි; කුලූපග භික්ඛු වත්ථුඤ්ච, කුලූපග භික්ෂූහුගේ වතද; එත්ථ, මෙහි; වත්තබ්බං, කියයුතුය; කුලූපගො කිර භික්ඛු, කුලූපග භික්ෂුවෙක්; භුඤ්ජිතුකාමො, වළඳනු කැමව; ගෙහං පවිසිත්වා නිසීදි, ගෙට වැදහුන්නේය; තං දිස්වා, ඒ භික්ෂූනු දැක; අදාතුකාමා, නොදීයවිඳු; ඝරණී, ගෘහිණී තොමෝ; තණ්ඩුලා නත්ථීති භ

ණ්ණාති, සහල් හැතැළි කියමින්; තණ්ඩුලෙ ආහරිතුකාමා විය, සහල් ගෙනයා ගෙනෙනු කැමැත්තියක් මෙන්; පවිට්ඨස්ස ඝරං ගතා, ඉක්බිති ගෙට ගියා; භික්ඛු, මහණ තෙමේ; අන්තො ගබ්භං පවිසිත්වා, ඇතුළු ගැබට වැද; ඔලොකෙන්තො, බලන්නේ; කවාටකොණෙ උච්ඡුං, දොර මුල්ලෙහි තිබූ උක්දඬු; භාජනෙ ඨපිතගුළං, බඳුනෙහි තුබූ සකුරු; පිටකෙ ඔලොණ්ඩච්ඡපාලං, පැස තුබූ ලුණු මස් පැලලි; කුම්භියං තණ්ඩුලෙ, සැලියෙහි සාල්; ඝටෙ ඝතං, කළයෙහි ගිතෙල්; දිස්වා, දැක; නික්ඛමිත්වා, ගෙන් නික්ම; නිසීදි, හුන්න; ඝරණී, ගෘහණී තොමෝ; තණ්ඩුලෙ නාලත්ථන්ති, සහල් නොලදිමියි කියා; ආගතා, අවු; භික්ඛු, මහණ තෙමේ; උපාසිකෙ, උපාසිකාව; අජ්ජ භික්ඛා න සම්පජ්ජිස්සතී'ති, අද භික්ෂාව නොසැපයෙයි; පටිකච්චෙව, පළමු කොටම; නිමිත්තං අද්දසාසි, නිමිත්තයක් දිටිමියි; ආහ, කී; කිං භන්තෙ, වහන්ස කිමෙක්දැයි කිවු; කවාටකොණෙ නික්ඛිත්ත උච්ඡුං විය, දොර මුල්ලෙහි තුබූ උක්දඬු වැනි; සප්පං අද්දසං, සර්පයකු දිටිමි; තං පහරිස්සාමී'ති, ඌ ගසමියි; ඔලොකෙන්තො, බලන්නේ; භාජනෙ ඨපිතගුළපිණ්ඩකෙ විය, බඳුනෙහි තුබූ සකුරු කැට වැනි; පාසාණලෙඩ්ඩුකෙ, පහණකැට දිටිමි; පහාරෙන සඤ්ඤාතෙ, ගසනලද සර්පයා විසින්; කතං, කරණලද; පිටකෙ ඨපිතඔලොණ්ඩච්ඡපාලසදිසං, පැස තුබූ ලුණු මස් පැලැලි වැනි; ඵණං, ඵණයද; තං ලෙඩ්ඩුං, ඒ කැට; ඩසිතුකාමස්ස තස්ස, ඩහනු කැමතිවූ ඒ සර්පයාගේ; කුම්භියා තණ්ඩුලසදිසෙ, සැලියෙහි සහල් වැනිවූ; දන්තෙ, දත් දිටිමියි; අථ, ඉක්බිතෙන්නේ; කුපිතස්ස අස්ස, කිපුනාවූ ඌහුගේ; මුඛතො පග්ඝරන්තං සදිසං, කළයෙහි වත්කොට තුබූ ගිතෙල් වැනිවූ; මුඛතො නික්ඛන්තං, මුඛයෙන් නික්මුනු; විසමිස්සකං ඛෙළං, විෂ මිශ්‍ර කෙල දිටිමියි කී; සා, ගෑ තොමෝ; නාසක්කා මුණ්ඩං වඤ්චෙතුන්ති, මුඩුනු වළහන්නට නොපිළිවනැයි; උච්ඡුං දත්වා, උක්දඬු දී; ඔදනං පචිත්වා, බත් පිස; ඝතගුළමච්ඡෙහි සද්ධිං, ගිතෙල් සකුරු මස් හා සමග; අදාසී'ති, දුනු; එවං, මෙසේ; සමීපං කත්වා ජප්පනං, සමීපකොට බිණීම; සාමන්තජප්පාති වෙදිතබ්බා, සාමන්තජප්පා නමැයි දතයුතුයි.

( ශා * )

''සාමන්තජප්පා'' නම් තමා කැමැතිවූ වස්තුව ආසන්නකොට දෙඩවීමයි මෙතන්හි කුලුපග භික්ෂුහුගේ කථා වස්තුව නිදසුන්කොට කියයුතුයි ඒ කෙසේදයත්? එක්තරා කුලුපග භික්ෂුවක් වළඳනු කැමතිව තමාගේ ප්‍රත්‍යය දායිකාවගේ ගෙට වැද වැඩහුන්නේය. ඒ දැක කිසිවක් නොදෙනු කැමතිවූ ප්‍රත්‍යයදායිකා තොමෝ සහල් හැතැයි කියමින් සහල් ගෙනයා ගෙනෙනු කැමැත්තියක්මෙන් සමීපගෙට ගියේය ඉක්බිති ඒ මහණ ඇතුල් ගබඩාවට වැද බලනුයේ දොර මුල්ලෙහි තුබූ උක්දඬුද බඳුනෙහි තුබූ සකුරු කැටද පැසෙහි තුබූ ලුණු මස් පැලැලිද සැලියෙහි තුබූ සහල්ද කළයෙහි තුබූ ගිතෙල්ද යන මේතෙක්දෑ දැක වහා ගෙන් නික්ම හුන් තැනම වැඩහුන්නේය ගෘහිණී ස්ත්‍රීද සහල් නොලද්දමියි කියා ආයේය ඒ මහණද එව්බා උපාසිකාව අද භික්ෂාව නොසැපයෙයි මම පළමුකොටම නිමිත්තක්

දුක්ලයාමයි ගිය වහන්සේ ඒ නාවර න්
ශිභාක්දුයි එවාල භාල්නි (එකො උපා
සිකාව මම අද පිහාරයෙන් සිටන්ව
එහ පෙරමග) දෙර මුල්ලෙහි තුබූ උ
ක්දඩ වැනි සර්පයෙකු දිටිමි ඒ සර්ප
යාට ගසමියි ඔබමොබ බලනුයේ තෙල
බිඳුමෙනන් තුබූ සකුරු කැටවැනි ගල්
කැට දිටිමි උඩින් ගසනලද සර්පයා වි
සින් කරණලද තෙල පැය තුබූ ලුණු
මිස්පෙයි වැනි පෙණයද ඒ ගල් කැට
ය ඩැහගණු කැමතිව නාට අයාගත්තා
වූ ඒ සර්පයාගේ මුඛය තුල තුබූ හෙයි
සැලිංගයකි සහල්වැනි දත්තාරත්ද දිටි
මි ඉක්බිති කිපුනාවූ ඒ සර්පයාගේ මු
ඛයෙන් නික්මුනාවූ තෙල ගෙයි බිඳු
ගෙහි තුබූ කිතෙල් වැනි විෂ මිශ්‍ර කෙ
ලද දිටිමියි කීයේය ඉක්බිති මෙගනීම්
සැට්ද මේ මුඩමගණා රවටන්නට නො
පිළිවනැයි උක්දඩු දීබත් පිස ගිතෙල්
සකුරු මස් හා සමග දුන්නිය මෙසේ
තමාගේ කැමැත්ත ආසන්නකොට කි
යීම "සාමන්තජප්පා" නමෙවි දතයුතු

( ෂා † )

පරිකථාහි යථා තං ලභති තථා ප
රිවත්තෙත්වා, පරිවත්තෙත්වා කථන
න්ති– නිප්පෙසිකතා නිප්පෙසෙ අ
ක්කොසනාති දසහි අක්කොසවත්ථූහි
අක්කොසනා උප්පණ්ඩනාති පරිහාසවචනා ක
ථනං ගරහණාති අස්සද්ධො අප්පස
න්නොති ආදිනා නයෙන දොසාරොප
ණා උක්ඛෙපනාහි මා එතං එත්ථ ක
ථෙථාති වාචාය උක්ඛිපනං සබ්බතො
භාගෙන සවත්ථුකං සහෙතුකං කත්වා
උක්ඛෙපනා සමුක්ඛෙපනා අථවා අදෙ
න්තං අහො දානපතීති එවං උක්ඛිප
නං උක්ඛෙපනා මහාදානපතීති එවං
සුට්ඨු උක්ඛෙපනා සමුක්ඛෙපනා ඛිප
නා හි කිං ඉමස්ස ජීවිතං බීජභොජී

නො හි එවං උප්පණ්ඩනා– සංඛිපනා
ති කිං ඉමං අදායකොති ගණ්ඨ යො
නිච්ච සබ්බෙසම්පි නත්ථීති වච
නං දෙතීති එවං සුට්ඨුතරං උප්පණ්ඩ
නා– පාපනාති අදායකත්තස්ස අව
ණ්ණස්ස වා පාපනා සමන්තතො පාපනා
පාපනා සම්පාපනා අවණ්ණහාරිකාති
එවං මෙ අවණ්ණභයාපි දස්සතීති ගෙ
හතො ගෙහං ගාමතො ගාමං ජනපද
තො ජනපදං අවණ්ණහරණං පරපි
ට්ඨිමංසිකතාති පුරතො මධුරං භණි
ත්වා පරම්මුඛෙ අවණ්ණභාසිතා එසාහි
අභිමුඛං ඔලොකෙතුං අසක්කොන්ත
ස්ස පරම්මුඛානං පිට්ඨිමංසඛාදනමිව
හොති තස්මා පරපිට්ඨිමංසිකතාති
වුත්තා අයං වුච්චති නිප්පෙසිකතාති
අයං යස්මා වෙළුපෙසිකාය විය අබ්භඞ්ගං
පරස්ස ගුණං නිප්පෙසෙති නිපුඤ්ඡ
ති යස්මා වා ගන්ධජාතං පිංසිත්වා ගන්ධ
මග්ගනා විය පරගුණෙ නිපිංසිත්වා විචු
ණ්ණෙත්වා එසා ලාභමග්ගනා හොති
තස්මා නිප්පෙසිකතාති වුච්චතීති–

( ෂ † )

"පරිකථානම" යථා තං ලභති, යම්
සේ ඒ ලැබේද; තථා, එසේ; පරිවත්
තෙත්වා පරිවත්තෙත්වා කථනාහි, "සා
මන්තජප්පා" යයි කී තෙපුල්ම නැවත
නැවත කීමයි; දසහි අක්කොස වත්ථූ
හි, දශ ආක්‍රොශ වස්තුවෙන්; අක්කොසනා
සනා, ආක්‍රොශ කයිනුදු දෙන්නෙන්යයි
සිතා ආක්‍රොශකිරීමයි (උම්හනාදිහුදු
එසේ යැයි] පරිහාසවචනං, උපහාස
කොට කීමයි; අස්සද්ධො, සැදැහැ නැ
ත්තේය; අප්පසන්නොති, පැහැදීමක්
නැත්ත යන; ආදිනා නයෙන, මේ ආදි
නයින්; දොසාරොපණා, දොෂාරොප
ණයකි; එත්ථ, මෙහිලු කෙරෙති; එතං
මා අවච'හි, ඒ නොකස් කියවයි; උක්ඛි

පනං, දායකාදීන් භාවයෙන් පහත්කිරීමයි;
සංවඩ්ඪනං, දෙවෙනි කමියක් කෙළෙනි
අනිකක් කියන්නට නොනිස්සෙනයි
එසේ සනිටුහන්කොට; සමනුකනං කත්වා,
මේ කාරණයෙහුදු අනිකක් කියන්න
ට නොනිස්සෙනයි සකාරණකොට; උ
ක්ඛෙපනා, දායකාදීන් භාවයෙන් දුරුකි
රීමය; අමද්දනං, නොමෙදන්නහුට;
අමහා දනාපන් නි, ඉනා දනාපනියයි;
උක්ඛිපනං, සිනා වශයෙන් දුරුකිරීම
යි; 'ඛිපනා' නම සොෂපවචනයි; කිං
ඉමස්ස ජීවිතං, මොහුගේ ජීවිතය කි
මෙක් නමද; බීජභොජිනො, බිජුවට
කන්නෝයයි; උප්පණ්ඩනා, අපහාශ කිරී
මයි (වපුළහොත් තම හට වියයුතු හසු
ලු නොබලා බිජුවට කන්නක්හුමෙන්
කුශල මූලයෙන් ලද සම්පත්තියට හෙ
තු නොවනුකොට වලදන හෙයින් බි
ජුවට කන්නෝ නම්හෙස් දතයුතු.)

කිං, කිම; ඉමං, මොහු; අදායකො
ති භණථ, අදායකයයි කියාද; යො,
යමෙක්; නිච්චකාලං, හැමකල්හි; ස
න්තිකෙපි, හැමදෙන ගටම; නත්ථීති
වචනං දෙන්නේ, නැත යන වචනය
දෙන්නෝය; එවං, මෙසේ; සුට්ඨුතරං,
මනාකොටම; උප්පණ්ඩනා, අපහාශකිරී
මයි; අදායකභාවස්ස, අදායක බවට
ගෝ; පාපනා, පැමිණවීමයි; සබ්බතො
භාගෙන, හැමපසින්ම; පාපනා, පැමි
ණවීම; සම්පාපනා, සම්පාපනා නම්;
එවං, මෙසේකල; මේ, මට; අවණ්ණභ
යා'පි දස්සති'ති, නොගුණෙහි බයිනුදු
දෙන්නේයයි; ගෙහතො ගෙහං, ගෙන්
ගෙට; ගාමතො ගාමං, ගමින් ගමට;
ජනපදතො ජනපදං, ජනපදයෙන්
ජනපදයට; අවණ්ණහරණං, නොගු
ණ ගෙණයාමයි "පරපිට්ඨිමංසිකතා"
නම්; පුරතො මධුරං භණිත්වා, මැද
ගෙහි මධුර වචන බැණ; පරම්මුඛෙ,
නොමැදෙහි; අවණ්ණං භාසිතා, නො
ගුණ කියන බවයි ("පරපිට්ඨිමංසික
තා" යනුවෙහි "පරෙසං පිට්ඨිමංසඛාද
න සීලො පරපිට්ඨිමංසිකො තස්සභා
වො පරපිට්ඨිමංසිකතා"යි ගණිතෙහි)
එසාහි, මේ වනාහි; අභිමුඛං ඔලො
කෙතුං අසක්කොන්තස්ස, අභිමුඛය බ
ලනනට නොපොහොසත්හුගේ; පර
ම්මුඛානං, පරාමුඛ වූවන්ගේ; පිට්ඨිමං
සඛාදනමිව හොති, පිටමස් කෑමක් වැ
නිවේ; තස්මා, එහෙයින්; පරපිට්ඨිමං
සිකතා'ති වුත්තා, පරපිට්ඨිමංසි කතා
යයි කියනලද; යස්මා, යම් හෙයකින්;
වෙළුපෙසිකාවිය අබ්භඞ්ගං, ශරීරයෙහි
අබ්‍යඞ්ග කළ දෙයක් පිස්නා හුණ
පොත්තක්මෙන්; පරස්ස ගුණං, අනු
න්ගේ ගුණ; නිප්පෙසියතිති-පෙස්සි-
නිපුඤ්ජති, පිස්නේද; යස්මා වා, යම්
හෙයකින් හෝ; ගන්ධජාතං පිංසිත්වා,
ගන්ධ ද්‍රව්‍යය අඹරා; ගන්ධමග්ගනාවිය,
ගඳ සෙවීමක් මෙන්; පරගුණෙ, අනු
න්ගේ ගුණ; නිපිංසිත්වා-පෙසී-චුණ්
ණෙත්වා, සුණුකොට; එසා ලාභමග්
ගනා හොති, මේ ලාභය සෙවීම වේද;
තස්මා, එහෙයින්; නිප්පෙසිකතා'ති,
නිප්පෙසි කතායයි; වුච්චති, කියනු ලැ
බේ (අනිපිංසිතෙ අලබ්භමානස්ස ග
න්ධස්ස නිපිංසනෙන ලාභො විය පර
ගුණෙ අනිපිංසිතෙ අලබ්භමානානං
පච්චයානං පිංසිතෙ ලාභො දට්ඨ
බ්බො.")

---

( හා † )

"පරිකථා," නම් යම්සේ ඒ ලාභය ලැ
බේද ඒ ආකාරයෙන් පෙරළ පෙර
ළා කී නොපුල්ම හැවයා නැවත කී
මයි. නිප්පෙසිකතා නිර්දෙශයෙහි ආ
ක්‍රොශයට හසිනුදු සිව්පසය දෙයයි

සිතා දශවිධ ආක්‍රොශ වස්තුවෙන් කිරීම "ආක්‍රොශ" නම්වේ.—

"වම්භනා" නම් ලාමකකොට කිරීමයි "ගරහණා" නම් නොයෙක් අශ්‍රද්ධයෙහිය නොපහන් තැනැත්තෙහිය යනාදීන් දෝෂාරෝපනය කොට කථා කිරීමයි "උක්ඛෙපනා" නම් මොහු කෙරෙහි කිසිවක් නොකියව්වයි කියා, උපාසකයන් දායකාදී භාවයෙන් පිටත දැමීමයි "සමුක්ඛෙපනා" නම් මේ දායකයා දෙවන නාමයක් නොලැබුය මොහුට අනිකක් නොකියයුත්තේයයි වස්තුසහිතකොට හෝ මේ මේ කාරණ සඳහා මොහුට අනිකක් නොකියයුත්තේයයි කාරණ සහිතකොට හෝ හාත්පසින් දායකභාවයෙන් දුරැකිරීම වේයි. නොහොත් දන් නොදෙන්නෙක් හට මොහු ඉතා දානපතියෙක යනාදීන් සිනාවශයෙන් දායකභාවයෙන් දුරැකිරීම "උක්ඛෙපනා" නම් වන්නේය එසේම දන් නොදෙන්නෙක් හට මොහු මහාදානපතියෙක යනාදීන් මෙසේ මහාකොට දුරැකිරීම "සමුක්ඛෙපනා" නම් වන්නේය "ඛිපනා" නම් මොහුගේ ජීවිතයෙන් කවර ප්‍රයෝජනද මෙතෙම බිජුවට කන්නේ යයි යනාදීන් අපහාස කිරීමයි "සඞ්ඛිපනා" නම් කුමක්හෙයින් මොහු නොදෙන සුලුලහයි කියව්ද? මේ තෙමේ හැමකල්හිම සියලුදෙනාටම නැතැයි යන වචනය දෙන්නේයයි මෙසේ මහාකොට අපහාස කිරීමයි "පාපනා" නම් ප්‍රත්‍යය දායකයා දන් නොදෙන්නෙක් බවට හෝ නුගුණයට හෝ පැමිණවීමයි "සම්පාපනා" නම් හාත්පසින්ම අදායකබවට හෝ නුගුණයට හෝ පැමිණවීමයි "අවණ්ණහාරිකා" නාම මොහුගේ නුගුණ කීකල ඊට භයින්වත් මොහු ප්‍රත්‍යය දේයයි සිතා ගෙසින් ගෙට ගමින් ගමට ජනපදයෙන් ජනපදයට නුගුණ ගෙණ ගොස් කීම නම්වේ.—

"පරපිට්ඨිමංසිකතා" නම් අභිමුඛයෙහි මිහිරිතෙපුල් කියා අනභිමුඛයෙහි නුගුණ කීමයි මේ පරපිට්ඨිමංසිකතාව වනාහි අභිමුඛය නොබැලියහැක්කහුගේ පිට මස් කෑමක් වැනි හෙයින් පරපිට්ඨිමංසිකතා නම් වන්නේ යයි කියනලද මෙ නිෂ්පේසිකතායයි කියනුලැබේ.—

මේ නිෂ්පේසිකතාව වනාහි යම් සේ ශරීරයෙහි ගැල්වූ දෙයක් පිස්නා හුණුදඬු පොත්තක් මෙන් අනුන්ගේ ගුණ පිස්නේද යම්සේ හයකින් සුගන්ධ ද්‍රව්‍යයක් අඹරා සුවඳ සොයාගන්නාක් මෙන් අනුන්ගේ ගුණ සුණුකොට මේ ලාභය සොයන්නේ වේද මේ ද එබඳුවූ හෙයින් නිෂ්පේසිකතා යයි කියනු ලැබේ.—

(පා ‡)

ලාභෙන ලාභං නිජිගීංසනතා නිද්දෙසෙ නිජිගීංසනතාති මග්ගනා ඉතො ලද්ධන්ති ඉමිස්මා ගෙහා ලද්ධං අමුත්‍රාති අමුකම්හි ගෙහෙ එට්ඨීති ඉච්ඡනා ගවෙට්ඨීති මග්ගනා පරියෙට්ඨීති පුනප්පුන මග්ගනා ආදිතො පට්ඨාය ලද්ධංලද්ධං භික්ඛං තත්‍ර තත්‍ර කුලදාරකානං දත්වා අන්තෙ ඛීරයාගුං ලභිත්වා ගතභික්ඛුවත්ථුචෙත්ථ කථෙතබ්බං.— එසනාදීනි එට්ඨිආදීනං වෙවචනානි තස්මා එට්ඨීති එසනා ගවෙට්ඨීති ගවෙසනා පරියෙට්ඨීති පරියෙසනා ඉච්චෙවමෙත්ථ යොජනා වෙදිතබ්බා අයං කුහනාදීනං අත්ථො.— ඉදානි එවමාදීනඤ්ච පාපධම්මානන්ති එත්ථ යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ

එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති සෙය්‍යථිදං අඞ්ගං නිමිත්තං උප්පාතං සුපිනං ලක්ඛණං මූසිකච්ඡින්නං අග්ගිහොමං දබ්බිහොමන්ති ආදිනා නයෙන බ්‍රහ්මජාලෙ වුත්තානං අනෙකෙසං පාපධම්මානං ගහණං වෙදිතබ්බං — ඉති ය්වායං ඉමෙසං ආජීවහෙතුපඤ්ඤත්තානං ඡන්නංසික්ඛාපදානං වීතික්කමවසෙන ඉමෙසඤ්ච කුහනා ලපනා නෙමිත්තිකතා නිප්පෙසිකතා ලාභෙන ලාභං නිජිගීංසනතාති එවමාදීනං පාපධම්මානං වසෙන පවත්තො මිච්ඡාජීවො, තස්මා සබ්බප්පකාරාපි මිච්ඡාජීවා යා විරති ඉදං ආජීවපාරිසුද්ධිසීලං — තත්‍රායං වචනත්ථො එතං ආගම්ම ජීවන්තීති ආජීවො කො සො පච්චයපරියෙසනවායාමො පාරිසුද්ධි පරිසුද්ධතා ආජීවස්ස පාරිසුද්ධි ආජීවපාරිසුද්ධි —

( ශ ‡ )

"නිජිගිංසනතා" යෙතනාති ("අප්පෙන ලාභෙන බහුකං වඤ්චනා, ගහෙතුං ඉච්ඡනං නිජිගීංසනං තස්ස භාවො, නිජිගිංසනතා තස්සෙව ඉච්ඡිතස්ස පවත්ති ආකාරො තං සහජාතං වා ගවෙසනකම්මං*) මගහනා, සෙවීම; ඉමිසමාගෙන ලද්ධං, මෙමගෙණලදදුය; අමුකම්හිගෙයෙහි, හරගෙන; ඉච්ඡනා, කැමැත්තෙවයි; ආදිනො පරියාය, ආදියෙහි පවත්; ලද්ධං ලද්ධං නික්ඛිපිං, ලද ලද නික්ෂෙප, තත්‍ර තත්‍ර කුලදරකානං දත්වා, ඒ ඒ ගෙහි කුලදරුවන්ටදී; අන්තෙ, කෙළවර; ඛීරයාගු ලභිත්වා, කිරිහුනු කැඳ ලදින්; ගනාභිසාලුවයු, කිය කිසුහුනුගේ වන; එහ, මෙහි; කාරෙතබ්බං, කියයුතු; එසනාආදිනි, එසනාආදී පදයෝ; එට්ඨිආදීනං, එට්ඨිආදීන්ට, වෙවචනානි, පරියායවචනයෝයි; අයං, මේ; කුහනාදීනං අයො, කුහනාදීන්ගේ අර්ථයි; ඉදනි, දූත්; "එවමාදීනාච පාපධම්මානං" යනුයෙහි; යථාවාපන, යම්සේ; ඇතැමෙනෙක් සමණබ්‍රාහ්මණා; පින්වත් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ; සද්ධාදෙය්‍යානි භොජනානි, කර්මඵලශ්‍රද්ධාවෙන් දෙනලද භෝජනයන්; භුඤ්ජිත්වා, වළඳා; එවරූපාය තිරච්ඡානවිජ්ජාය; මෙබඳුවූ තිරශ්චීන විද්‍යාවෙන්; මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති, මිථ්‍යාජීවයෙන් ජීවිකාව කෙරෙද්ද; සෙය්‍යථිදං, ඔහුන වනහ; අඞ්ගං, හස්තපාදාදී අඞ්ගයන් නිසා ප්‍රවෘත්ත අඞ්ගවිද්‍යාවයි; නිමිත්තං, ශකුනිරවාදී නිමිත්තකියන ශාස්ත්‍රයි; උප්පාතං, උල්කාපාතදිග්දාහ භූමිචාලාදි උත්පාතප්‍රතිබද්ධවිද්‍යායි; සුපිනං, ස්වප්න ශාස්ත්‍රයි; ලක්ඛණං, ස්ත්‍රීපුරුෂ ලක්ෂණදක්නා ශාස්ත්‍රයි; මූසිකච්ඡින්නං, වස්ත්‍රාදියෙහි දසවල්හාගයෙහි මීයන් කෑ ලප්හි මෙනම් ඵලයයි දක්නාශාස්ත්‍රයි; අග්ගිහොමං, පලාලාදිඅග්නීන් හොමරහි මෙනම් ගිනිහානක්හි හවනයකල කල්හි මෙනම් ඵලවෙහි අග්නි වශයෙන් හොමවිධානය; දබ්බිහොමං, මෙනම් දවියෙකින් හවනයකල කල්හි මෙනම් ඵලවෙහි දර්වී වශයෙන් හොමවිධානය; ආදිනා නයෙන, මේ ආදිනම් (ආදිග්‍රහණයෙන් ශුනකිහොමාදින්ගේද සෙසු මිථ්‍යාජීවයන්ගේද සඞ්ග්‍රහය දතයුතු) බ්‍රහ්මජාලෙ වුත්තානං, බ්‍රහ්මජාලසූත්‍රයෙහි කියනලද; අනෙකෙසං පාපකානං ධම්මානං, නොයෙක් පාපධර්මයන්ගේ; ගහණං, ග්‍රහණය; වෙදිතබ්බං, දතයුතු ("ය්වායං මිච්ඡාජීවො," යි යොදනු) තස්මා සබ්බප්පකාරාපි මිච්ඡාජීවා, ඒ සර්වප්‍රකාරමිථ්‍යාජීවයා කෙරෙන්; යා විරති, යම් විරතියක් ඇද්ද; ඉදං, මේ; ආජීවපාරිසුද්ධිසීලං, ආජීවපාරිසුද්ධි

( ෂ ‡ )
සීලනම්; තනු, එති; අයං, මේ; වචන
භෙදො, වචනාන්තරය; එතං ආගම්ම, මෙ
යට පැමිණ; ජීවනයි, ජීවත්වෙත්
නුයි; ආජීවො, ආජීවනම්; භො භො,
භෝ භික්ෂූන්ද; පච්චයපරිභෝගසන පා
යාමො, ප්‍රත්‍යය පසක්ඛණකරණ
වයායාමයි (ආජීවය පිණිසසාධනකැපින්
"පච්චය පරිභෝගත වායාමො" යුතු)
පාරිසුද්ධි'ති, පාරිසුද්ධිනම්; පරිසුද්ධතා,
පිරිසිදුබවයි; ආජීවස්ස පාරිසුද්ධි, ආජීව
යාගේ පාරිසුද්ධිය, ආජීවපාරිසුද්ධිනම්.

( කා ‡ )
ලාභයෙන් ලාභය සෙවීම සඞ්ඛ්‍යාත
නිර්දෙශයෙහි "නිජිගිංසනතා" නම්
සව පලාභයකින් වසඳවාගොව මෙ
කෝවූ ලාභයක් ලබන්නට සෙවීම
වෙයි "මෙයින්ලදද" නාම මෙ ගෙයින්
ලද වී ... ආදී යම් කිසි ප්‍රත්‍ය
යක්වූ "එහි මහණෙනු" නාම අරගෙ
ට මහණගොස්දීමෙයි "එට්ඨි" නාම
මද ලාභයකින් උභන්ලාභයක් කැ
ඹැන් වීමයි "ගවේට්ඨි" නාම සොල්පය
කින් හත් ලාභයක් සෙවීමයි "පරි
යෙට්ඨි" නාම නැවත නැවතත් ඒ ආ
කාරයෙන් සෙවීමයි මෙතන්හි එකා
ශී පඩුසිගීමට පටන්ගත් තැන්පටන්
ලද ලද භික්ෂාව ඒ ඒ ගෙහි කුලදරුව
න්වදී ගෙහලපරගෙයින් ලන් හිරෙන්
පිඩු කැද පළිගෙණ ගිය මහලුත්ගේ
කථාවස්තුව නියයුතු "එසනා" යනාදී
වචනයෝ යටකී "එට්ඨි" යනාදි වචන
යන්ට ම සමානාර්ථ වචනයෝයි එසේ
හෙයින් "එට්ඨි" යනු සෙවීමයි
"පරියෙට්ඨි" යනු කැදැත් වීමයි
"ගවේට්ඨි" යනු නැවත නැවත සෙවී
මයි මෙසේ මෙහි අර්ථයොජනාව දත
යුත්තේය් මේ ප්‍රකාශකරණලද්දේ කු
හනාදීන්ගේ අර්ථයොජනායි.

දූතන්ට ... 'මෙ ආදිවූ ලාමක අකු
ශලධර්මයන්ගේය" යනු ... (අර්ථ
විස්තරය පන්නෙන්ති) මෙසේ වනාති
ඇතාම් පින්වත් මහණ බමුණන් දායක
යන් සිහින් කම්පල ඇඳකිලන් දෙන
ලද ... සිවුපසය පරි
භෝගකොට ඒ මහණ බමුණන් මෙ
බඳුවූ නිරත්ථිකවූ ... සම්භාරවූ මි
ථ්‍යාආජීවයෙන් දිවි පවත්වන්නාහු
වෙද්ද ඒ මිථ්‍යාආජීවයෝ නම් කව
රහු ? ... ... ... ... ...
ලක්ෂණ බලා ... ... ...
... ... ... ...
... ... ... ...
... ... ... ...
බලා මෙබඳු ඵලා ඵල වෙයි කියා ...
න්පාතශාස්ත්‍රය මෙබඳු සඋප්පාතයන් ...
වූයේ නම් මෙබඳු විපාකවෙයි කිය
න ... ... ...
... ... ... ...
මෙබඳු ... ... ... ...
... ... ... ...
... ... ... ...
... ... ... ...
නාම ... ... ... ...
... ... ... ...
... ... ... ...
... ... ... ...
වෙයි කියන දර්විහොමශාස්ත්‍රය ය
නාදි කුමනෙත් ... ...
... ... ... ලාමක අකු
ශල ධර්මයන්ගේ ග්‍රහණය දතයුත්
තේයි

මෙසේ මේ ජීවිකාව කාරණකොට
ගෙණ පණවනලද ශික්ෂාපද සදෙ
නාගේද මේ කුහනාදි ලාමක ධර්ම
යන්ගේ ද වශයෙන් පැවැත්තාවූ
යම් මිථ්‍යාආජීවයෙක් වේද ඒ සම්
ප්‍රකාරවූ මිථ්‍යාආජීවයෙන් යම් වෙන්

වීමක් ඇත්තේ වේද ඒ මෙත්වීම (නොයෙක් උපකාරප්‍රකාර මිථ්‍යාආජීවයෙන් වළකින්නාහුව ඒ ඒ ලාමකජීවිකා, වන්නෙහි මෙත්විම පිළිබඳව පහළ වන්නාවූ කාමාවචර කුශලචිත්තවීපින්නෙහි ජවන් හා සමග යෙදුනාවූ ත්‍රිවිධවූ විරතිචෛතසික ධර්මයෝ) ආජීව පාරිසුද්ධිසීල නම් වන්නේයි. ඒ ආජීවපාරිශුද්ධිශීලය යන මේ වචනයාගේ අර්ථ මෙසේ දතයුතු. කෙසේ දයත්? මිට පැමිණ දිවි පවත්වන අ අර්ථයෙන් ආජීව” නම් ඒ කිමෙක්දයත් ? දුනැමින් සෙමින් ප්‍රත්‍යය සොය න උත්සාහයයි ඒ එසේමැයි මේ ආජීවපාරිශුද්ධිශීලය වීර්‍ය්‍යයෙන් ම සිද්ධකටයුතු බැවින් “ප්‍රත්‍යය පර්‍ය්‍යෙෂණ ව්‍යායාම” යයි කියනලද ඒ ආජීවයාගේ පිරිසිදු තාවය හෝ නිරවද්‍යබව ප්‍රඥසිහිව ආදියෙහි නොනැමැලි භික්ෂුව විසින් ම සිද්ධකටයුතුවෙයි අලස භික්ෂුතෙමේ ධාර්මිකන්‍යායෙන් සිවුපසය නොසෙවීය හැකිහෙයින් මිථ්‍යාආජීවය කරණකොටගේය යනු භාවයි “පාරිසුද්ධි” නම් පිරිසිදුබවයි ආජීවයාගේ පිරිසිදුබව හෝ නිරවද්‍යබව ආජීව පාරිශුද්ධිශීල නම් වන්නේයි ——

( පා ¶ )

යං පන තං තදනන්තරං පච්චය සන්නිස්සිත සීලං වුත්තං තත්ථ පටිස ඞ්ඛා යෝනිසෝ ති උපායේන පථේන පටිසඞ්ඛාය ඤත්වා පච්චවෙක්ඛිත්වා ති අත්ථෝ එත්ථ ච සීතස්ස පටිඝාතායාති ආදිනා නයේන වුත්තපච්චවෙක්ඛණමේව යෝනිසෝ පටිසඞ්ඛා ති වේදිතබ්බා තත්ථ චීවරන්ති අන්තරවාසකාදිසු යංකිඤ්චි පටිසෙවතීති පරිභුඤ්ජති නිවාසේති වා පාරුපති වා යාවදේවාති පයෝජනාවධි පරිච්ඡේද නියමවචනං එත්තකමේවහි යෝගිනෝ චීවරපටිසේවනේ පයෝජනං යදිදං සීතස්ස පටිඝාතායාති ආදි න තතෝ භීයෝ සීතස්සාති අජ්ඣත්ත ධාතුක්ඛෝභවසේන වා බහිද්ධා උතුපරිණාම වසේන වා උප්පන්නකස්ස යස්ස කස්සචි පටිඝාතායාති පටිහනනත්ථං යථා සරීරේ ආබාධං න උප්පාදේති එවං තස්ස විනෝදනත්ථං සීතබ්භාහතේ හි සරීරේ වික්ඛිත්තචිත්තෝ යෝනිසෝ පදහිතුං න සක්කෝති තස්මා සීතස්ස පටිඝාතාය චීවරං සේවිතබ්බන්ති භගවා අනුඤ්ඤාසි එසනයෝ සබ්බත්ථ —— කේවලං හෙත්ථ උණ්හස්සාති අග්ගිසන්තාපස්ස තස්ස පන වනදාහාදිසු සම්භවෝ වේදිතබ්බෝ ඩංසමකස වාතාතප සිරිංසප සම්ඵස්සානන්ති එත්ථ පන ඩංසාති ඩංසනමක්ඛිකා අන්ධමක්ඛිකාති පි වුච්චන්ති මකසා මකසා ඒව වාතාති සරජ අරජාදිභේදා ආතපෝති සුරියාතපෝ සිරිංසපාති යේ කේචි සරන්තා ගච්ඡන්ති දීඝජාතිකා සප්පාදයෝ තේසං දට්ඨසම්ඵස්සෝ ච ඵුට්ඨසම්ඵස්සෝ චාති දුවිධෝ සම්ඵස්සෝ සෝපි චීවරං පාරුපිත්වා නිසින්නං න බාධති තස්මා තාදිසේසු ඨානේසු තේසං පටිඝාතත්ථාය පටිසේවති —— යාවදේවාති පුන එතස්ස වචනං නියතපයෝජනාවධි පරිච්ඡේද දස්සනත්ථං හිරිකෝපීනප්පටිච්ඡාදනං හි නියතපයෝජනං ඉතරානි කදාචි කදාචි හොන්ති තත්ථ හිරිකෝපීනන්ති තං තං සම්බාධට්ඨානං යස්මිං යස්මිං හි අඞ්ගේ විවරියමානේ හිරිකුප්පති විනස්සති තං තං හිරිකෝපනතෝ හිරිකෝපීනන්ති වුච්චති තස්ස හිරිකෝපීනස්ස පටිච්ඡාදනත්ථන්ති හිරිකෝපීනපටිච්ඡාදනත්ථං හි රිකෝපීනං පටිච්ඡාදනත්ථන්ති පි පාඨෝ ——

( ෂ ¶ )

තදනන්තරං, ආජීව පාරිසුද්ධි සීලයට අනන්තරකොට; යං එතෙනං පච්චය සන්නිස්සිත සීලං වුත්තං, යම් මේ ප්‍රත්‍යය සන්නිශ්‍රිත ශීලයෙක් කියනලදද; තත්‍ර, එහි; පටිසඞ්ඛායොනිසො, ඤාණයෙන් පරීක්ෂාකොට ("සයං අභිඤ්ඤා" යනාදීයෙහිමෙන් යකාර ලොපයෙන් නිර්දෙශය දතයුතු) "උපායෙන" සි-සේසි-පථෙන, මාර්ගයෙන්; පටිසඞ්ඛායසි — සේසි-ඤත්වා, දැන; පච්චවෙක්ඛිත්වා ති අත්‍ථො, ප්‍රත්‍යවෙක්ෂාකොට යන අර්ථයි; එත්ථ, මෙහි වනාහි; සීතස්ස පටිඝාතායා'ති ආදිනානයෙන, "සීතස්සපටිඝාතාය" යනාදි නයින්; වුත්ත පච්චවෙක්ඛණමෙව, කියනලද ප්‍රත්‍යවෙක්ෂණයම; යොනිසො පටිසඞ්ඛායාති වෙදිතබ්බො, "යොනිසො පටිසඞ්ඛාය"යි දතයුතු; තත්‍ර, එහි; චීවරන්ති, සිවුරුනම්; අන්තරවාසකාදීසු යං කිඤ්චි, හඳනා ආදීන් කෙරෙහි යම්කිසිවෙක්; පටිසෙවති,සි — සේසි-පරිභුඤ්ජති, වැළඳගණී; නිවාසෙතිවා, හඳී හෝයි; පාරුපතිවා, පෙරව හෝයි ("වා" ශබ්දය පරිභොග විකල්පද දක්වානුයි සයන නිසිදන චීවර කුටිකරණාදී වශයෙන්ද පරිභොගයාගේ සංග්‍රහය දතයුතු) යාවදෙවාති, යාවදෙව යනු; පයොජනාවධි පරිච්ඡෙද නියමවචනං, ප්‍රයොජනයන්ගේ අවධි පරිච්ඡෙද වශයෙන් නියම වචනයි; යොගීනො, යොගීහුගේ; චීවරපටිසෙවනෙ පයොජනං, චීවර පරිභොගයෙහි ප්‍රයෝජනය; එත්තකමෙවාති, මෙපමණක්මැයි ("යදිදං සීතස්ස පටිඝාතායා'ති ආදි එත්තකමෙවා"යි යොදනු) න ඉතො භීයො, මෙයින් වැඩියෙක් නැත [මෙහි අවධාරණයෙන් ලීලා විභූෂා විලම්බනාඩම්බරාදී වශයෙන් වස්ත්‍ර පරිභොගය නිෂෙධ කෙරෙත් ලීලා වශයෙනුදු සම්භරු වස්ත්‍ර හඳිති පොරවති යෞවනමදති සිටි නාගරික පුරුෂයන්මෙන් සම්භරු විභූෂා වශයෙන් හඳින් වේශ්‍යාස්ත්‍රී ආදීන්මෙන් විලම්බන වශයෙන් විඩම්බනයෝද ආඩම්බර වශයෙන් භොජකාදීහුද හඳිත්) "සීතස්ස" යන්නෙහි; අජ්ඣත්ත ධාතුක්ඛොභවසෙනවා, ශීතඥ්වරාදී උත්පාදකවූ අධ්‍යාත්මික ධාතුක්ෂොභ වශයෙන්ද; බහිධා, පිටත; උතුපරිණාම වසෙනවා, ඍතු පරිණාම වශයෙන් විසභාග ශීතොෂ්ණ සෘතු සමුත්ථාන වශයෙන්හෝ [වා ශබ්දයෙන් හිමකාල් ආදියෙහි හිම පාතාදි වශයෙන් ප්‍රවෘත්තයාගේ සංග්‍රහය දතයුතු) උප්පන්නස්ස යස්ස කස්සචි, උපන් යම්කිසි ශීතයක්හුගේ; පටිඝාතායා'ති, සි — සේසි-පටිහනනත්ථං, නසන පිණිස; යථා, යම්සේ; සරීරෙ අබාධං න උප්පාදෙති, ශීතය තොමෝ ශරීරයෙහි පීඩා නොඋපදවාද; එවං, මෙසේ; තස්ස විනොදනත්ථං, ඒ ශීතයාගේ දුරුකිරීම පිණිස; සීතාභිභූතෙහි සරීරෙ, ශරීරය ශීතයෙන් පහරණලද කල්හි; වික්ඛිත්ත චිත්තො, වික්ෂිප්තවූ සිත් ඇත්තේ; යොනිසො පදහිතුං නසක්කොති, නුවණින් වීර්‍ය්‍යකරන්නට නොපොහොසත්වේ; තස්මා, එහෙයින්; සීතස්ස පටිඝාතාය චීවරං පටිසෙවිතබ්බං'ති, ශීතය නසන පිණිස චීවර සෙවිය යුතුයැයි; භගවා, අනුඤ්ඤාසි, භාගවත් අනුදනී; එසනයො සබ්බත්‍ථ, "උණ්හස්ස පටිඝාතාය" යනාදී සෙසු ප්‍රයොජනයෙහිදු මෙම නයයි. කෙවලං, හුදෙක් (අග්ගි මාත්‍රයක්ම සියම්නයි සේසි) එත්ථ, මෙහි (සූත්‍රයෙහි සන්තාපයද උෂ්ණවතුදු උග්‍ර ආතප ග්‍රහණයෙන් ගත් හෙයින් "උණ්හස්සා'ති අග්ගිසන්තාපො" යුතු) තස්ස, ඒ අග්

ති සන්තාපයාගේ (සමහර දවාග්නි සන්තාපයෙක් කය සිවුරෙන් වසා දුරු කරනාව පිළිවන්නුයි "තස්ස වන දාහාදිසු සම්භවො වෙදිතබ්බො" සුනු ~ පෙ ~) ඩංසානි, දංශයෝ නම්; (පිලුවන් මැස්සෝයි ලුහු ඩැහැන හෙයින් "ඩංසන මක්ඛිකා" ය මිවූහු) අන්ධමක්ඛිකා 'ති'ත් වුච්චනායි, කන මැස්සෝයයිද කියනු ලැබෙත්; මකසා, මකසයෝ නම්; මකසාමෙව, මදුරුවෝ මැයි; වාතා'ති, වාතයෝ නම්; සරජ අරජාදිභෙදා, රජස් ඇති නැති යනාදි භේද ඇති වාතයෝයි; ආතපො'ති, ආතපනම්; සුරියාතපො, සූර්ය සන්තාපයි "සිරිංසපා" යන්නෙහි; යෙකෙචි සරන්තා ගච්ඡන්තායි, යම් කිසි කෙනෙක් සමරණය කෙරෙමින් යෙද්ද; [ඕහුයි) දීඝජාතිකා, දිඝී ජාතිහුයි (ආදි ශබ්දයෙන් ශතපදාදිහු ගන්නා ලැබෙත්) තෙසං, ඔවුන්ගේද; දට්ඨසම්ඵස්සො, ඩැහැමෙන් වන ස්පර්ශය; ඵුට්ඨසම්ඵස්සොවාති, මෙවර පැහැරමෙන් වන ස්පර්ශයයි; දුවිධො සම්ඵස්සො, ස්පර්ශ විවිධවේ; සොපි, මෙද: චීවරං පාරුපිත්වා නිසින්නානං, සිවුරු පෙරවගෙණ හුන්නාහු; න බාධෙති, නොපෙළා; තස්මා, එහෙයින්; තාදිසෙසු ඨානෙසු, එබඳු තන්හි; තෙසං පටිඝාතත්ථාය, ඒ වාතාතපාදීන්ගේ නැසීම පිණිස; පටිසෙවති, වැලදගණී; යාවදෙවා'ති "යාවදෙව" යන; එතස්ස, මෙහුගේ; පුනවචනං, නැවත කීම; නියතපයොජනාවධිපරිච්ඡෙදදස්සනත්ථං. සකිකාලික ප්‍රයොජනයාගේ අවධි වශයෙන් පරිච්ඡෙදය දක්වන පිණිසයි; හිරිකොපීනපටිච්ඡාදනං හි, ලජ්ජාකොපනය කරණ අඞ්ග මුවහකිරීමම; නියතපයොජනං, නියත ප්‍රයෝජනයි; ඉතරානි, සෙසු ශීතපටිඝාතාදිහු; කදාචි කදාචි හොන්ති, කිසි කිසි කලෙක වෙත්; න පන, ඒ පාඨයෙහි; හිරිකොපීනනානි, හිරිකොපීන නාම්; තං තං සම්බාධට්ඨානං, ඒ ඒ සම්බාධ ප්‍රදෙශයි; යස්මිං යස්මිං අඞ්ගෙ විවරියමානෙ, යම් යම් අඞ්ගයක් විවරකරණු ලබන කල්හි; හිරි කුප්පති, ලජ්ජාව කිපේද; නස්සති, නසීද (හිරිලජ්ජාව වේද යන අර්ථයි) තං තං, ඒ ඒ අඞ්ගය; හිරිකොපනතො, ලජ්ජාව නසන හෙයින්; හිරිකොපීනන්ති, හිරිකොපීනයයි කියනු ලැබේ; තස්ස ච හිරිකොපීනස්ස, ඒ හිරිකොපීනයාගේ; පටිච්ඡාදනත්ථන්ති, මුවහකරණ පිණිසහුයි; හිරිකොපීනපටිච්ඡාදනත්ථං, හිරිකොපීන පටිච්ඡාදනය පිණිස නාම්වේ ("තස්ස ච" යනුයෙහි "ච" ශබ්දය පුර්වොක්ත ප්‍රයොජනයන් පිඩු කෙරේ] හිරිකොපීනං පටිච්ඡාදනත්ථන්ති'පි පාඨො, "හිරිකොපීනං පටිච්ඡාදනත්ථං" යනුදු පාඨයි ~

( හා ¶ )

මේ ආජීව පාරිශුද්ධි ශීලයට අනතුරුව යම් ප්‍රත්‍යය සන්නිශ්‍රිත ශීලයක් වදාරණලදද ඒ ශීලයාගේ විභාග මෙතැන් පටන් දක්වනු ලැබේ එහි "නුවණින් පරික්ෂාකොටය" යනු උපායෙන් හෝ මාර්ගයෙන් දැනය මෙහෙන් කල්පනා කොටය යන අර්ථයි මෙහි වනානි "ශීතවිනොදනය පිණිසය" යනාදි ක්‍රමයෙන් වදාරණලද ප්‍රත්‍යවෙක්ෂා කිරීමම නුවණින් ප්‍රත්‍යවෙක්ෂා කිරීමයයි දතයුතු එහි "සිවුරු" නම් අඳනය ආදී තුන් සිවුරු අතුරෙන් යම්කිසි චීවරයක් වේ "ප්‍රතිසෙවනය" නම් වැලඳගැණීම හෝ හැඳීම හෝ පෙරවීම හෝයි "යම්තාක්" ය යනු ප්‍රයොජන

විදිනා සීමාව නියමනොවූ හිමයි. ඒ එසේහැයි ඒ වචනයෙන් ශීත විනෝදනාය පිණිසය යනාදී යම් ප්‍රයෝජනයක් දක්වනලද්ද යෝගාවචරයාගේ සිවුරු පිළිසෙවීමෙහි ප්‍රයෝජන මෙපමණක්ම වන්නේය. මින් වැඩියක් නැතැයි දක්වයි. තවත් මේ සිවුරු පිළිසෙවීම නාගරවැසි යොවුන පුරුෂයන් මෙන් ලීලා පිණිසද නොවෙයි. අන්තඃපුර ස්ත්‍රීන් වෙශ්‍යා ස්ත්‍රීන් මෙන් අලංකාර පිණිසද නොවෙයි. ගුණමහොජකාදීන් මෙන් ආඩම්බර පිණිසද නොවේ. නෘත්‍යකාරයන් මෙන් විපුල පිණිසද නොවෙයි යන බව දක්වන්නේයි. “ශීතයාගේ”ය යනු ශීතස්පර්ශාදිය උපදීමට කාරණවූ ඇතුළත ධාතු කැලඹීම වශයෙන් හෝ පිටත්හි සෘතු පෙරළීම වශයෙන් හෝ උපන්නාවූ යම්කිසි ශීතයක්හුගේයි. “ප්‍රතිඝාතාය පිණිසය” යනු ඒ ශීත නසන පිණිසය යනුයි. නොහොත් යම්සේ ශරීරයෙහි ශීත පීඩා නොඋපදවාද එසේ ඒ ශීතයාගේ නැසීම පිණිසය යනුද වෙයි. ඒ එසේහැයි ශරීරය ශීත පීඩාවකින් පහරනලද කල්හි එකඟනොවූ සිත් ඇතිව ප්‍රධානයෙන් වීර්‍ය්‍යකරන්නට නොහැකි වෙයි එහෙයින් ශීත පීඩා නසන පිණිස සිවුරු වැළඳගත යුතුයයි භාග්‍යවතුන් වහන්සේ විසින් අනුඥා වදාළේය. “උෂ්ණ පීඩා නසන පිණිසය” යනාදී සියලු තන්හි මේ ක්‍රමයෙන් අර්ථ දතයුතුයි ඒ වචනයන්ගේද විස්තර හැර යුදෙක් වචනාර්ථ පමණක් දක්වන්නොමු මෙයි මහොස්දයන්?

මෙහි වනාහි “උෂ්ණයාගේ” ය යනු අග්නි සන්තාපයාගේය යනුයි. ඒ අග්නි සන්තාපය වනාහි ලැව්ගිණි ආදීන්හි සම්භවයයි දතයුතුයි. සඹහර ඒ ලැව්ගිණි ආදිය සිවුරෙන් සාග වසා වැළකිය හැකිවෙයි “ඩංසමසකසය වාතාය ආතපය සිරිංසපය සහ ෆොටුන්ගේ සංස්පර්ශය” යන මෙහි ඩංසයෝ නම් පිළුවන්නු මැසි මැලේ මෙයො හා මැස්සෝයි. සන මැස්සෝයයිද කියනු ලැබෙත් මකසයෝ නම් මදුරුවෝයයි වාතයෝ නම් රජස් ගැන්නාවූ වාතය නැත්නාවූ වාතය යනාදී නොයෙක් ප්‍රභේද ඇත්තාවූ වාතයෝයි. “ආතප” නම් සූර්‍ය්‍යතාපය හෙවත් සූර්‍ය්‍ය රශ්මියයි “සිරිංසපයෝ” නම් යම්කිසි දීර්ඝජාති සර්පාදි සත්ව කොටනෙක් සිහිනා වෙමින් යෙද්ද ඔවුහු වෙත් ඒ සර්පයන්ගේද දෂ්ටකිරීමෙන් වනාවූ ස්පර්ශය ඇඟ වැදගැන්මෙන් වනාවූ ස්පර්ශයයි ස්පර්ශය දෙවැදෑරුම් වන්නේයි ඒ දෙවැදෑරුම්වූ ස්පර්ශය සිවුරු පොරවාගෙණ හුන්නාහු නොපෙලයි එහෙයින් එබඳු තන්හි ඒ ඇවිසුලං සර්පාදීන්ගේ පීඩා නසනු පිණිස සිවුරු වැළඳගන්නේයි. නැවත කියනලද “යම්තාක්” යන මේ වචනය සැමකල්හිම ගතයුතු නියත ප්‍රයෝජනයාගේ සීමා පරිච්ඡේදය දක්වීම ප්‍රයෝජනකොට ඇත්තේයි ඒ එසේහැයි මේ සිවුරු වැළඳගැණීමෙහි ලජ්ජාව නසන ශරීරාඞ්ග මුවහකරී? නියත ප්‍රයෝජන නම් වෙයි මෙසේ ශීත පීඩා විනොදනාදීහු කිසි කිසි කලෙක වන්නාහුය ඒ පයයෙහි “හිරිකොපීන” නම් ඒ ඒ අඞ්ගජාතාදී සම්බාධස්ථානයි. යම් යම් ශරීරාවයවයන්හු විවෘතකල කල්හි ලජ්ජාව කිපේද විනාශවේද ඒ ඒ ශරීරාවයවය ලජ්ජාව නසන හෙයින් හිරිකොපීනයයි කියනු ලැබේ ඒ හිරිකොපීන නම්වූ ලජ්ජාස්ථාන මුවහකරණ පිණිස මේ සිවුරු වැළඳගැණීම පවත්නා හෙයින් හිරිකොපීනයාගේ ප්‍රතිච්ඡාදනය පිණිසවෙයි. යනු මෙහි සාරා

ඡිය. ''නිජ්ජොතිතං පටිච්ඡාදනත්‍ථං,, යි නිගෘහීතාගම වශයෙනුදු මේ පාඨය උච්චාරණය කරන්නේයී.

( පා * )

පිණ්ඩපාතන්ති යං කිඤ්චි ආහාරං. යො හි කොචි ආහාරො භික්ඛුනො පිණ්ඩොල්‍යෙන පත්තෙ පතිතත්තා පිණ්ඩපාතොති වුච්චති. පිණ්ඩානං වා පාතො පිණ්ඩපාතො තත්‍ථ තත්‍ථ ලද්ධානං භික්ඛානං සන්නිපාතො සමූහොති වුත්තං හොති. නෙව දවායාති න ගාමදාරකාදයො විය දවත්‍ථං කීළානිමිත්තන්ති වුත්තං හොති. න මදායාති න මුට්ඨිකමල්ලාදයො විය මදත්‍ථං බලමදනිමිත්තං පොරිසමදනිමිත්තඤ්චාති වුත්තං හොති. න මණ්ඩනායාති න අන්තෙපුරිකවෙසියාදයො විය මණ්ඩනත්‍ථං අඞ්ගපච්චඞ්ගානං පීණභාවනිමිත්තන්ති වුත්තං හොති. න විභූසනායාති න නටනච්චකාදයො විය විභූසනත්‍ථං පසන්නච්ඡවිවණ්ණතානිමිත්තන්ති වුත්තං හොති. එත්‍ථ ච නෙව දවායාති එතං මොහූපනිස්සයපහාණත්‍ථං වුත්තං. න මදායාති එතං දොසූපනිස්සයපහාණත්‍ථං. න මණ්ඩනාය න විභූසනායාති එතං රාගූපනිස්සයපහාණත්‍ථං. නෙව දවාය න මදායාති චෙතං අත්තනො සංයොජනුප්පත්තිපටිසෙධනත්‍ථං. න මණ්ඩනාය න විභූසනායාති එතං පරස්සපි සංයොජනුප්පත්තිපටිසෙධනත්‍ථං. චතූහිපි චෙතෙහි අයොනිසො පටිපත්තියා කාමසුඛල්ලිකානුයොගස්ස ච පහාණං වුත්තන්ති වෙදිතබ්බං. යාවදෙවාති වුත්තත්‍ථං මෙව. ඉමස්ස කායස්සාති එතස්ස චාතුමහාභූතිකස්ස රූපකායස්ස. ඨිතියාති පබන්ධට්ඨිතත්‍ථං. යාපනායාති පවත්තියා අවිච්ඡෙදත්‍ථං චිරකාලට්ඨිතත්‍ථං වා. ඝරූපත්ථම්භමිව හි ජිණ්ණඝරසාමිකො අක්ඛබ්භඤ්ජනමිව ච සාකටිකො කායස්ස ඨිතත්‍ථං යාපනත්‍ථමෙවෙස පිණ්ඩපාතං පටිසෙවති න දවමදමණ්ඩනවිභූසනත්‍ථං. අපිච ඨිතීති ජීවිතින්ද්‍රියස්සෙතං අධිවචනං. තස්මා ඉමස්ස කායස්ස ඨිතියා යාපනායාති එත්තාවතා එතස්ස කායස්ස ජීවිතින්ද්‍රියපවත්තාපනත්‍ථන්තිපි වුත්තං හොතීති වෙදිතබ්බං. විහිංසූපරතියාති විහිංසා නාම ජිඝච්ඡා ආබාධට්ඨෙන තස්සා උපරමත්‍ථම්පෙස පිණ්ඩපාතං පටිසෙවති වණාලෙපනමිව උණ්හසීතාදීසු තප්පටිකාරමිව. බ්‍රහ්මචරියානුග්ගහායාති සකලසාසනබ්‍රහ්මචරියස්ස මග්ගබ්‍රහ්මචරියස්ස ච අනුග්ගහත්‍ථං. අයඤ්හි පිණ්ඩපාතපටිසෙවනපච්චයා කායබලං නිස්සාය සික්ඛාත්තයානුයොගවසෙන භවකන්තාරනිත්ථරණත්‍ථං පටිපජ්ජන්තො බ්‍රහ්මචරියානුග්ගහාය පටිසෙවති කන්තාරනිත්ථරණත්ථිකා පුත්තමංසං විය නදිනිත්ථරණත්ථිකා කුල්ලං විය සමුද්දනිත්ථරණත්ථිකා නාවමිව.

( ස * )

පිණ්ඩපාතන්ති, පිණ්ඩපාතනම්; යං කිඤ්චි ආහාරං, ඛාද්‍යභොජ්‍යාදී වැලඳියයුතු යම්කිසි අහරෙකි; යො හොචි ආහාරො, යම් කිසි ආහාරයෙක්; භික්ඛුනො, භික්ෂුහුගේ; පිණ්ඩොල්‍යෙන, භික්ෂාචය්‍යාවෙන්; පත්තෙ පතිතත්තා, පාත්‍රයෙහි පැතීපා හෙයින්; පිණ්ඩපාතොති වුච්චති, පිණ්ඩපාතය යි කියනු ලැබේ (පිණ්ඩාය භික්ඛාය උලති'ති පිණ්ඩොලො තස්ස කම්මං පිණ්ඩොල්‍යං එතන පිණ්ඩොල්‍යෙන,, යි ගත් සේ) පිණ්ඩානං වා, ගෙන් ගෙන්ලද

ශිෂ්‍යාවන්ගේ; පාතෙ'ති, සන්නිපාතයෙක්හුයි; පිණ්ඩපාතො පිණ්ඩපාතනම් (එවකීය "තත්ථ තත්ථ ලද්ධානං භික්ඛානං සන්නිපාතො සමූහො 'ති වුත්තං හොති" යි) හා ගාමදාරකාදයො විය, නොද ගම්දරුවාදීන් මෙන්; දවත්ථං, කී-ළෙජ කීළානිමිත්තං 'ති වුත්තං හොති, ක්‍රීඩානිමිත්තකොට යයි කියනලද්දේ වෙයි; නා මුට්ඨික මල්ලාදයො විය, නොද මුෂ්ටියුද්ධකරණ මල්ලවයන් මෙන් (ආදිශබ්දයෙන් නිබ්බුද්ධ මල්ලවාදීන්ගේ ග්‍රහණයවේ) හා මදත්ථං, නොද මදපිණිස; බලමදනිමිත්තං, බලයනිසා උපදනා මදයපිණිස; පොරිසමදනිමිත්තංවා, මම පුරුෂයෙමියි උපදනා මානසඞ්ඛ්‍යාතමදයපිණිස නො (අසද්ධර්මසෙවනයෙහි සාමර්ථ්‍යය නිසා ප්‍රවෘත්ත මානරූපය පුරුෂමදයයි සඳහරු කියත්) "නමණ්ඩනාය" යනු, නා අන්තඃපුරිකාවෙසියාදයො විය, නොද අන්තඃපුරවාසී වෙශ්‍යාස්ත්‍රීන් මෙන්, මණ්ඩනත්ථං, මණ්ඩනයපිණිස; අඞ්ගපච්චඞ්ගානං පීණනභාවනිමිත්තං, අඞ්ගප්‍රත්‍යඞ්ගයන්ගේ ප්‍රීණනයපිණිස (පරිබෘංහණයපිණිසය යන අර්ථයි) නටනච්චකාදයො විය, නොද නටනච්චකාදීන්මෙන් (නටයෝනම් තුමූ නටන්නාහ නච්චකයෝනම් අනුන් නටවන්නෝයි-ටීකාවෙහි "නටා නාම රඞ්ගනටා නච්චකා ලඞ්ඝකාදයො" යි කීහු) භූසණත්ථං, භූෂණයපිණිස; පසන්නඡවිවණ්ණතා නිමිත්තං, ප්‍රසන්නඡවිවර්ණ හෙතුකොට; එත්ථ ච, මෙහි වනාහි; නෙව දවායා'ති එතං, නෙව දවාය යනමේ; මොහූපනිස්සයපහාණත්ථං වුත්තං, මෝහයට උපනිශ්‍රය නසනුපිණිස කියනලදී (ක්‍රීඩාවෝ මෝහයෙන් වනබැවිනුදු මෝහයවඩනා බැවිනුදු ක්‍රීඩාව නොකිරී මෙන් මෝහයාගේ අනුපනිශ්‍රය බවවේ) න මදාය 'ති එතං, න මදාය යන මේ, දෙසුපනිස්සයපහාණත්ථං, ද්වේෂයට උපනිශ්‍රය නසනුපිණිස කියනලදී (බලමද පුරුෂමද දෙක ද්වේෂහෙතුබැවින් ඒ දෙමදය නොවඩනනුව ද්වේෂයාගේ අනුපනිශ්‍රය බවවේ රාගමදවශයෙන් වනාහි—"රාගූපනිස්සයපහාණත්ථං" යි වකාන ව්‍යවේ) න මණ්ඩනාය න විභූසනායාති එතං, න මණ්ඩනාය න විභූසනාය යන මේ; රාගූපනිස්සයපහාණත්ථං, රාගොපනිශ්‍රය ප්‍රහාණයපිණිස කියනලදී (මණ්ඩනවිභූෂණ ප්‍රතිපක්ෂය මෙහුපනිශ්‍රය ප්‍රහාණයපිණිස වේ නමුදු රාගොපනිශ්‍රයනාවයට වනාහි සෘජු ප්‍රතිපක්ෂහුයි "රාගූපනිස්සයපහාණත්ථං" යි කීහු) නෙව දවාය න මදාය 'ති එතං, නෙව දවාය න මදාය යනමේ; අත්තනො සංයොජනුප්පත්ති පටිසෙධනත්ථං, තමා සන්තානයෙහි සංයොජනයන්ගේ උත්පත්ති ප්‍රතිෂෙධයපිණිසයි; න මණ්ඩනාය න විභූසණායාති එතං, න මණ්ඩනාය න විභූසණාය යන මේ; පරස්සපි සංයොජනුප්පත්තිපටිසෙධනත්ථං, අනුන්‍යද සංයොජනොත්පත්ති ප්‍රතිෂෙධය පිණිසයි (ඉදින් එකන්හුගේ දවමද හෙතුවෙන් පරයහට ප්‍රතිඝසංයොජනාදීන්ගේ උත්පත්තිය වේනමුදු මනොපදෙසිකදෙවාදීන්ට මෙන් තමාගේම දවමදයන් නිසා යමෙක්හට ස විශෙෂයෙන් රාග මෝහ මානාදි පාපධර්මයෝ උපදිද්ද ඔවුන් සඳහා "අත්තනො සංයොජනුප්පත්ති පටිසෙධනත්ථං" යි කියා මණ්ඩන විභූෂණයන් පිණිස පරයහට රාග මෝහාදිහුද පවතින්නුන් "පරස්සපි සංයොජනුප්පත්තිපටිසෙධනත්ථං" යි කීහු) චතුනි 'පිමෙවෙතනි, මෙ සතරින්ම; අයොනි

සො පටිපත්තියා, අනුපාය ප්‍රතිපත්ති න්ගේ; කාමසුඛල්ලිකානුයෝගස්ස ච, කාමසුඛල්ලිකානුයෝගයාගේද; පහාණං වුත්තං'ති වෙදිතබ්බං, ප්‍රහාණය කියනලද්දී දතයුතු ("අයෝනිසො පටිපත්තියා" යනු යෙහි කාමසුඛල්ලිකානුයෝගය හැර සියලුම මිථ්‍යා ප්‍රතිපත්තිය "අයෝනිසො පටිපත්ති" නම පළමු වෙදපදයෙන් අයෝනිසො පටිපත්තියගේද පශ්චිමපද දෙයෙන් කාමසුඛල්ලිකානුයෝගයාගේද ප්‍රහාණය උක්ත යයි කියනි "චතුහිපි පවත්තති"යි වනාහි කීහෙයින් සියලු පෙදෙන්ම දෙපදනාගේම ප්‍රහාණය උක්ත යි දතයුතු – කාමක්‍රීඩාවද ද්‍රව්‍යානුගතව වෙසි පුරුෂවදයද කාමසුඛල්ලිකානුයෝගයට ගෙතු වෙයි) යාවදෙව 'ති වුත්තත්ථාම ව, යාවදෙවයනු උක්කංසාවධි, චාතුමහාභූතිකස්ස, චාතුමහාභූතයෙන් නිෂ්පන්නවූ; රූපකායස්ස, චක්ෂුරාදි රූපසමූහයාගේ; පබන්ධට්ඨිතත්ථං, ප්‍රබන්ධස්ථිතිය පිණිස; පවත්තියා, ජීවිතෙන්ද්‍රිය ප්‍රවෘත්තිය පිණිස; අවිච්ඡේදනත්ථං, විච්ඡේදනය නොවනු පිණිස; (නොහොත් කායයේ යම්තාක් ආයුෂ්කල්පයද ඒ තාක් අවස්ථිතිය "යාපනා" යයි දක්වනු පිණිස "චිරකාලට්ඨිතත්ථං වා"ති කීහු) විහිංසූපරතියා මෙනා, ජිඝච්ඡාසරසවාමීහු; ශරූපපඵ මහම්ව, තත් නොහෙණපිණිස යෙනි දෙනාමූඩයක් වෙත්ද; සාසාර්වෙනා, ගැල්පද සාශු; අනභාහසුජ්නම්ව, සභ වශපවත්වනපිණිස අසුරනා දනා වද නාක්මෙන්ද; කායස්ස ඨිතත්ථං, කායයාගේ පිහිටීම පිණිස; යාපනත්ථාච, යැපෙනු පිණිසද; එසො, මේ යෝගී තෙමේ; පිණ්ඩපාතං පටිසෙවති, අහර වළඳත්තේයි; න දවමදමණ්ඩනත්ථං, දවමදමණ්ඩනත්ථාකාරණපිණිස නොවළඳන්නේයි (මෙයින් "යාවදෙව"යි අවධාරණයෙන් නිවෘත්ති තාත්පර්යය දක්වූහු) අපිච, අනිකෙකුඤ; ඨිති, ඨිතියයි; ජීවිතින්ද්‍රියස්ස, ජීවිතෙන්ද්‍රියට; එතං අධිවචනං, මේ නාමෙකි; තස්මා, එහෙයින්, ඉමස්ස කායස්ස, මේ කායප්‍රතිබද්ධවූ; ඨිතියා යාපනායාති, ජීවිතෙන්ද්‍රියාගේ ප්‍රවෘත්තියපිණිසය යනු; එත්තාවතා, මෙපමණකිනි; එතස්ස කායස්ස, මේ කායප්‍රතිබද්ධවූ; ජීවිතින්ද්‍රියස්ස වත්තාපනත්ථංහිපි, ජීවිතෙන්ද්‍රිය පවත්වනු පිණිසයයිද; වුත්තං හොතීති, කීවෙනියි; වෙදිතබ්බං, දතයුතු; විහිංසා නාම, විහිංසා නම්; ආබාධෙට්ඨෙන, විබාධාය කාරණහෙයින් නොහොත් රෝගකාරණහෙයින් ("ජිඝච්ඡා පරමා රෝගා"යි කීසේයැනු) ජිඝච්ඡා, ක්ෂුධාවයි; තස්සා උපරමත්ථම්පි, ඒ විහිංසාවගේ ව්‍යුපසමය පිණිසද; එසො, මේ තෙමේ; පිණ්ඩපාතංපටිසෙවති, අහර වළඳ; වණාලෙපනම්ව, වණඇත්තානුගේ වෙවෙණට ලන බෙහෙදක් මෙන්ද; උණ්හසීතාදිසු තපපතිකාරංවියව, උෂ්ණ ශීතාදීන් මඩනාකාල්හි තත්ප්‍රතිකාර ශීතොෂ්ණාදීන්මෙන්ද; ("පිණ්ඩපාතං පටිසෙවති"යි සම්බන්ධකරණු) සකලසාසනබ්‍රහ්මචරියස්ස, මාර්ගබ්‍රහ්මචර්යා නම්වූ සියලු ශික්ෂාත්‍රය සඞ්ඛ්‍යාත ශාසනාවචරිත අනුශාසනා සඞ්ඛ්‍යාත ශාසන බ්‍රහ්මචර්යායටද; මග්ගබ්‍රහ්මචරියස්ස, මාර්ගබ්‍රහ්මචර්යායටද; අනුග්ගහත්ථං, අනුග්‍රහපිණිස (සපයනුපිණිස) අයංහි, මේ යෝගීතෙමේ; පිණ්ඩපාතපටිසෙවනපච්චයා, ආහාරපරිභෝගය හෙතුකොටගෙණ; කායබලං නිස්සාය, යථාසමාරබ්ධගුණවිශෙෂ පාරිපූරියට හෙතුවූ කායයෙහි බලප්‍රාප්තිය නිසා; සික්ඛත්තයානුයොගමුඛෙන, ශික්ෂා

ත්‍රාණයකි අශුභරාගයෙන්; භවසා ගොචර නිවාරණයෙන්, භවකාන්තාරයාගේ නිස්තරණය පිණිස; පටිපදන් නෙනා, පිළිපදනෙන්; බ්‍රහ්මචරියානුග්‍රහය පිණිසවෙයි, බ්‍රහ්මචර්‍ය්‍යාව අනුග්‍රහපිණිස වළඳ; කාන්තාරනිස්තරණපිණිස පුත්‍රමාංසය මෙන්, කාන්තාරයෙන් එතරවනු කැමැති අඹුසැමි දෙදෙනා කන පුත්‍රමාංසය මෙන්ද; නදීනිස්තරණපිණිස කුල්ලය මෙන්, නදියෙන් එතරවනු කැමැත්තහු නැඟෙන පසුරක් මෙන්ද; සමුද්‍රනිස්තරණපිණිස නාවමෙන්, සමුද්‍රයෙන් එතරවනු කැමැත්තහු නඟින නැවක් මෙන්ද ("පටිසෙවති" යි යොදනු-යමිසේ මෙහි අගෘධව අමූර්ච්ඡිතව හුදෙක් ඒ ඒ ප්‍රයෝජනය අපේක්ෂාකොට පුත්‍රමාංසාදිය සෙවිද්ද එපරිද්දෙන් ම හුදෙක් භවකාන්තාර නිස්තරණය පිණිස අගෘධව අමූර්ච්ඡිතව පිණ්ඩපාතය සෙවෙන්නේයයි උපමාසංසන්දනයකරණු)

( හා * )

"පිඩපාත" නම් කණබොණද ආදි වශයෙන් වැලඳියයුතු යම් කිසි ආහාරයෙකි. යම් කිසි ආහාරයෙක් භික්ෂූහුගේ පිඩුසිඟීමෙන් පාත්‍රයෙහි බහාලනලද බැවින් පිඩපාතයයි කියනු ලැබේද ඒ ආහාරය පිඩපාත යයි දතයුතු නොහොත් භික්ෂූන්ගේ එකරැස්වීම පිණ්ඩපාත නම්නොහොත් ඒ ඒ ගෙයින් ලද භික්ෂාවන්ගේ එක් රැස්වූ සමූහයයි කියනලද්දේවේ "ක්‍රීඩාසෙල්ලම්පිණිස නොවේය" යනු ගම්දරු ආදීන් මෙන් කෙළිසෙල්ලම් පිණිස පිණ්ඩපාතය නොවළඳිමියි සේයි "මදපිණිස නොවේය" යනු මුෂ්ටියුද්ධකාරණ මල්ලාදීන්මෙන් මද පිණිස හෝවත් බලමදපුරුෂමද කාරණකොටගෙණ මේ පිණ්ඩපාතය නොවළඳිමැයි කියනලද්දේවේ "සැරසීමපිණිස නොවේය" යනු අන්තඃපුර ස්ත්‍රීන් වේශ්‍යාස්ත්‍රීන්මෙන් සැරසීමපිණිස නොවේය. නොහොත් අඟපසඟයන්ගේ ස්ථූලභාවය පිණිස මේ පිණ්ඩපාතය නොවළඳිමියි කියනලද්දේවෙයි "අලඞ්කාරපිණිස නොවේය" යනු නටන්නන් හෝ නටවන්නන් හෝ මෙන් අලඞ්කාර පිණිස නොවෙයි නොහොත් නෘත්‍යාකාරාදීන් මෙන් ප්‍රසන්නවූ ත්වච්වර්ණය පිණිස මේ පිණ්ඩපාතය නොවළඳිමියි කියනලද්දේවේ. මෙතන්හි වනාහි "නොකෙළිපිණිස නොවේය" යන මේ වචනය මෝහයට උපනිශ්‍රය කාරණය නසනපිණිස කියනලද්දේය" "මද පිණිස නොවේය" යන මේ වචනය ද්වේෂයට උපනිශ්‍රය කාරණය නසන පිණිස කියනලද්දේය "සැරසීමපිණිස අලඞ්කාරපිණිස නොවේය" යන මේ වචනය රාගයට උපනිශ්‍රයකාරණය නසන පිණිස කියනලද්දේය නොහොත් කෙළිපිණිස මදපිණිස නොවේය" යන මේ වචනය තමා සතන්හි උපදනා කෙලෙසසංයෝජනයන්ගේ උපදීම වැළැක්මපිණිස කියනලද්දේය. "සැරසීමපිණිස අලඞ්කාරපිණිස නොවේය" යන මේ වචනය අනුන් සතන්හි උපදනා කෙලෙසසංයෝජනයන්ගේ උපදීම වැළැක්මපිණිස කියනලද්දේය මේ වචන සතරින්ම නුනුවණින් ප්‍රතිපත්තිය ප්‍රහාණයද කාමසැපයෙහි ඇල්මෙහිද ප්‍රහාණය කියනලද්දේයයි දතයුතු "ඉමස්සක" යන වචනයාගේ අර්ථය කියනලද්දේයි 'මේ ශරීරයාගේ' ය යනු චාතුර්මහාභූතිකකායාගේ සතරමහාභූතයන් නිසා පවත්නාවූ මේ රූපසමූහයාගේයි. "සිටීමපිණිසය" යනු රූපසන්තති පරම්පරාවගේ සිටීම පිණිස වෙයි "යැ

පිං පිණිසය" යනු ජීවිතෙන්ද්‍රියාගේ පැවැත්මපිණිස හෝ නොසිඳීමපිණිස හෝ බොහෝ කල් සිටීම පිණිස හෝ යි යම්සේ දිරාගිය ගේඇති තැනැත්තේ ගේ නොවැටෙන පිණිස බලකරු මානාද සාත්තුකායක තෙමේ ගැල පවත්වන පිණිස අක්‍ෂයෙහි ( නාරාවෙහි ) තෙල්ගල්වාද එමෙන්ම මේ මහණතෙම ශරීරයාගේ සිටුවීමපිණිසද යැපීමපිණිසද අහර වලඳන්නේය කෙළිසෙල් ලම් මදමත්වීම් සැරසීම් අලඞ්කාර පිණිස නොවලඳන්නේයි. මෙහිඅර්ථ අනිත්ක්‍රමයෙහිද දතයුත්තේය "ඨිති යා" යනු මේ ජීවිතෙන්ද්‍රියට නාම වෙයි එසේහෙයින් මේ ශරීරය පිළිබඳවූ ජීවිතෙන්ද්‍රියාගේ පැවැත්ම පිණිසය යන තේපමණකින් මේ ශරීරය පිළිබඳවූ ජීවිතෙන්ද්‍රිය පවත්වන පිණිස යයි කියනලද්දේවෙයි දතයුතු "වෙහෙස සන්සිඳුවීමපිණිසය" යන මෙහි පිඬාකරණ අර්ථයෙන් බඩගාය "වෙහෙස" නම් වන්නේය මේ මහණද ඒ වෙහෙස සන්සිඳුවීම පිණිස ව්‍රණරොගඇත්තෙක් ව්‍රණයෙහි ගල්වන බෙහෙදක් මෙන්ද උෂ්ණාධික යෙක් සිහිල් දිය පානයකරණ්ණාක් මෙන්ද ශීතාධිකයෙක් ගිනිතපින්නාක් මෙන්ද පිණ්ඩපාතය වලඳයි "බඹස රවසට අනුග්‍රහපිණිසය" යනු සියලු ශාසන බ්‍රහ්මචර්‍ය්‍යාවටද මාර්ගබ්‍රහ්ම චර්‍ය්‍යාසඞ්ඛ්‍යාතවූ මාර්ගඵලයන්ටද අනුග්‍රහපිණිස හෙවත් ඒ බ්‍රහ්මචර්‍ය්‍යාස ම්පාදනය කරණු පිණිස මේ යොගා වචර භික්‍ෂුතෙමේ අහර වැළඳීම හෙතුකොටගෙණ පටන්ගණ්ණාලද ගුණවිශෙෂය සම්පූර්ණකිරීමට හෙතු වූ කායබලමාත්‍රය නිසා ත්‍රිවිධශික්‍ෂා යෙහි යෙදීම්වශයෙන් සසරකතරෙන් එතර කරණුපිණිස පිළිපදනේ යම්සේ මහාකාන්තාරය ගෙවා යන අඹු සැමිදෙදෙනා පුත්‍රයා මාර්ගකලාන්ත යෙන් මියගියකල ඔවුන්ට කෑයුතු ය මක් නැතිබැවින්ද ඒ මාංසය නො කා ගමන සිඬකරගතනොහැකි බැවින්ද හුදෙක් කාන්තාරමාර්ගය ගෙවා යාමම පරමකොට මාංසතෘෂ්ණා වෙන් නොගිජුව නොමුළාව ඒ පුත්‍ර මාංසය කන්නාහුද ගඟ එතරකර ණුකැමති පුරුෂයෙක් ඒ ගඟ එතරකි රීමම සලකා පසුරෙහි ආලයෙන් නොගිජුව නොමුළාව පසුර නැගේද මහසයුර එතර කරණුකැමති පුරු ෂයෙක් තෙමේ ඒ සාගරතරණයම පර මකොට නැවෙහි ආශාවෙන් නොගි ජුව නොමුළාව නැව් නැගේද එමෙ න්ම මේ යොගාවචරතෙමේ හුදෙක් බඹසරවසටම අනුග්‍රහ පිණිස තෘෂ්ණා වෙන් අහරෙහි නොගිජුව නොමු ළාව පිණ්ඩපාතය වලඳන්නේයි ~~

( පා † )

ඉති පුරාණඤ්ච වෙදනං පටිහඞ්ඛාමි නවඤ්ච වෙදනං න උප්පාදෙස්සාමි ති එවං ඉමිනා පිණ්ඩපාතපටිසෙවනෙන පුරාණඤ්ච ජිඝච්ඡා වෙදනං පටිහඞ්ඛාමි නවඤ්ච අපරිමිතභොජනපච්චයං ආහාරහත්ථක අලංසාටක තත්ථවට්ටක කාකමාසක භුත්තවම්මිතකබ්‍රාහ්මණානං අඤ්ඤතරො විය න උප්පාදෙස්සාමීති පටිසෙවති භෙසජ්ජමිව ගිලානො අථවා යා අබ්භුතා අසප්පායාපරිමිතභොජනං නිස්සාය පුරාණකම්මපච්චයා වසෙන උප්පජ්ජනතො පුරාණවෙදනාති වුච්චති සප්පායපරිමිතභොජනෙන තස්සා පච්චයං විනාසෙන්තො තං පුරාණඤ්ච වෙදනං පටිහඞ්ඛාමි ~~ යාවායං අධුනා කතඅයුත්තපරිභොගකම්මූපච්චයං නිස්සාය ආයතිං උප්පජ්ජනා

තො, නවවෙදනාහි වුච්චන්ති යුත්තපරිභොගපච්චයෙන තස්සා මූලං අතිබහු භොජනං, තං නවඤ්ච වෙදනං න උප්පාදෙස්සාමීති එවමෙතස්ස අපෙතා-දායිකෙනා — එතනාපනා යුත්තපරිභොගසඞ්ඛාතො අත්තකිලමථානුයොගප්පහාණං ධම්මිකා සුඛාපරිච්චාගො ච දීපිතො හොතීති වෙදිතබ්බො — යාත්‍රා ච මෙ භවිස්සතීති පරිමිතපරිභොගෙන ජීවිතින්ද්‍රියුපච්ඡෙදකස්ස ඉරියාපථභඤ්ජකස්ස වා පරිස්සයස්ස අභාවතො චිරකාලගමනසංඛාතා යාත්‍රා ච මෙ භවිස්සති ඉමස්ස පච්චයායත්තවුත්තිනො කායස්සාති පි පටිසෙවති යාප්‍යරොගී විය තප්පච්චයං අනවජ්ජතා ච ඵාසුවිහාරො චාති අයුත්තපරියෙසන පටිග්ගහණ පරිභොගපරිවජ්ජනෙන අනවජ්ජතා පරිමිතපරිභොගෙන ඵාසුවිහාරො අසප්පායා පරිමිතභොජනපච්චයා අරතිතන්දිවිජම්භිකා විඤ්ඤුගරහාදි දොසාභාවෙන වා අනවජ්ජතා සප්පාය පරිමිතභොජනපච්චයා කායබලසම්භවෙන ඵාසුවිහාරො යාවදත්ථ උදරාවදෙහක භොජනපරිවජ්ජනෙන වා සෙය්‍යසුඛ පස්සසුඛ මිද්ධසුඛ දීනං පහාණතො අනවජ්ජතා චතුපඤ්චාලොපමත්ත ඌනභොජනෙන චතුරිරියාපථයොග්‍යභාවපටිපාදනතො ඵාසුවිහාරො ච මෙ භවිස්සතීති පි පටිසෙවති — වුත්තම්පි හෙතං —

චත්තාරො පඤ්ච ආලොපෙ
අභුත්වා උදකම්පි වෙ
අලං ඵාසුවිහාරාය
පහිතත්තස්ස භික්ඛුනොති —

---

( ස † )

එව, මෙසේ; ඉමිනා පිණ්ඩපාත පටිසෙවනෙන, මේ පිණ්ඩපාත පරිභොගයෙන්; පුරාණඤ්ච ජිඝච්ඡාවෙදනං, භොජනයට පූර්වකාලික බැවින් පුරාතන වූ ක්ෂුද් වෙදනාව; පටිහංඛාමි, නසමි (නවඤ්ච වෙදනං න උප්පාදෙස්සාමී'ති පටිසෙවති" යි යොදනු) නවඤ්ච වෙදනං, නව වෙදනාවද [කොබඳුද යත්?) අපරිමිත භොජනපච්චයං, අග්නි ප්‍රමාණයට අධිකකොට වැළඳීම හේතුකොට ඇති; ආහාර හත්ථක, බොහෝකොට කා නැඟී සිටිය නොහී "ආහාර හත්ථං" යි කියන ආහාර හස්තක නම් බමුණුද; අලංසාටක, බොහෝකොට කා මහත්ව ගිය බඩ ඇති හෙයින් නැඟී සිට පිළී හැඳගත නොහී "අලං සාටකං" යි කියන බමුණුද; තත්ථාවට්ටක, බොහෝකොට කා නැඟී සිටියනොහී එහිම පෙරළෙන "තත්ථාවට්ටක" නම් බමුණුද; කාකාමාසක, බොහෝකොට කා යම්සේ කවුඩන් විසින් ආමෘශීතය කළ හැකිවේද එසේ මුඛවාරය දක්වා ආහාර බුදින යම් ඒ "කාකාමාසක" නම් බමුණුද; භුත්තවමිතක, බොහෝකොට කා මුඛයෙහි නොදැරිය හැකිව එතනම වමනය කරණ "භුත්තවමිතක" නම් බමුණුද; බ්‍රාහ්මණානං අඤ්ඤතරොවිය, මේ බමුණන් කෙරෙන් එක්තරා එකකු මෙන්; නඋප්පාදෙස්සාමි'ති පටිසෙවති, නොඋපදවමියි වළඳද; භෙසජ්ජමිව ගිලානො, බෙහෙතක් වළඳන ගිලනකු මෙන්; අථවා, නොහොත්; අධුනා, දැන්; අසප්පායා පරිමිතභොජනං නිස්සාය, සැපනොවන පමණ නොදන වැළඳීම නම් වූ ප්‍රයොග විපත්තියට පැමිණ; පුරාණකම්මපච්චයවසෙන, පූර්වජාති සිඩකර්මයාගේ ප්‍රත්‍යය වශයෙන්; උප්පජ්ජනතො උපදනා හෙයින්; යා පුරාණවෙදනාති වුච්චති, යමක් පුරාණ වෙදනායයි කියනු ලැබේද; සප්පාය පරිමිතභොජනෙන, සැප අනර්ඝ පමණ දන වැළඳීම නැමැති ප්‍රයොග

සම්පත්තියෙන්; තස්සා පච්චයං විනාසෙන්තො, ඒ පුරාණ වෙදනාවට ප්‍රත්‍යය නසන්නෙම්; තං පුරාණඤ්ච වෙදනං පටිහංඛාමි, ඒ පුරාණ වෙදනාව නසමි ("යාචායං නවවෙදනා'ති වුච්චති"යි යොදනු] යාචායං, යම් මේ වේදනාවක්; අබ්බුතා කතං, දූන් කරණලදද; අයුත්තපරිභොග කම්මුපචයං නිස්සාය "අයුත්තපරිභොගපච්චයෙ අපච්චවෙක්ඛිත්වා පරිභොගො"යි උක්ත සවරූප අයුක්ත පරිභොග නැමැති කර්මොපචිත කර්මෝපචය නිසා; ආයතිං උප්පජ්ජනතො, මතු උපදනා හෙයින්; නවවෙදනාති වුච්චති, නව වෙදනායයි කියනු ලැබේද; යුක්තපරිභොග වශෙන, ප්‍රත්‍යවෙක්ෂාකොට ප්‍රත්‍යය පරිභොග නැමැති යුක්ත පරිභොගයෙන්; තස්සා මූලං අනිබ්බත්තෙන්තො, ඒ නව වෙදනාවට මුල්වූ අයුක්ත පරිභොග කර්ම නොඋපදවන්නෙමි; තං නවඤ්ච වෙදනං න උප්පාදෙස්සාමිති, ඒ නව වේදනාව නොඋපදවම්යි; එවමපි, මෙසේද; එත්ථ අත්ථො දට්ඨබ්බො, මිහි අර්ථ දතයුතු.

එත්තාවතා "ඉති පුරාණඤ්ච" යනාදි පද වලයෙන් "විහිංසූපරතියා" යනාදි පද වනාත්ෂකයෙන් හෝ; යුක්තපරිභොග සඞ්ඛාතො, ප්‍රව්‍රජිතයන්ට අනුරූපවූ ප්‍රත්‍යය පරිභොගය කී බැවින් යුක්ත පරිභොගයෙන් සංග්‍රහයද; අත්ත කිලමථානුයොගප්පහාණං, සමුද් දුඃඛාද් දුඃඛ ප්‍රතිෂ්ඨානය කී බැවින් අත්තකිලමථානුයොග ප්‍රහාණයද; ධම්මික සුඛාපරිච්චාගො ච, ධ්‍යාන සුඛාදීන්ට ප්‍රත්‍යයවූ කාය සුඛය නොහල බැවින් ධාර්මිකසුඛයාගේ අපරිත්‍යාගයද; දීපිතො හොතීති වෙදිතබ්බො, දක්වනු ලැබේයයි දතයුතු; නිත්‍යමිත පරිභොගෙන, සැප අහර පමණින් වැළදී

මෙන්, ජීවිතින්ද්‍රිය උපච්ඡෙදකස්ස, ජීවිතෙන්ද්‍රිය පැවැත්ත නොදී සිඳුනාවූ හෝ; ඉරියාපථභඤ්ජකස්සවා, ඊර්‍යාපථයන් බිඳුනාවූ හෝ; පරිස්සයස්ස අභාවතො, උපද්‍රව නොවන බැවින්; චිරකාලාගමණ සංඛ්‍යාතා, චිරකාල ප්‍රවෘත්තියයි කියනලද; මෙ, මාගේ; ඉමස්ස පච්චයායත්ත වුත්තිනො කායස්ස, ප්‍රත්‍යය ප්‍රතිබද්ධ වෘත්ති ඇති මේ ශරීරයාගේ; යාත්‍රාච භවිස්සති, යැපීමද වන්නේයයි; පටිසෙවති, වළඳා; යාප්‍යරොගීව්‍ය, සාධ්‍යද අසාධ්‍යද නොවන යාප්‍ය රොග ඇත්තානු; තප්පච්චයංවිය, දවස දවස වළඳන බෙහෙදක්මෙනි. (යම්සේ යාප්‍ය රොගී තෙමේ දවස දවස බෙහෙද වළඳා ශරීරය පවත්වාද මේද එසේම වේ ප්‍රත්‍යයායත්ත ශරීරයාගේ යාපනය පිණිස වළඳයි යන අර්ථයි. යට 'යාපනාය'යි ජීවිතෙන්ද්‍රිය යාපනාව අභිමතය මෙතන වනාහි සතර ඉරියාපථයන්ගේ අවිච්ඡෙද සංඛ්‍යාත යාපනාව 'යාත්‍රා' යයි අභිමතයි) අයුක්ත පරියෙසන පටිග්ගහණ පරිභොග පරිවජ්ජනෙන, බුද්ධනින්දිත මිථ්‍යා ජීවයෙන් ප්‍රත්‍යය පර්‍යෙෂණය පමණ නොදන පිළිගැන්ම විනිපාතනය පිණිස හෝ පිළිගැන්ම අප්‍රත්‍ය වෙක්ෂා පරිභොගය යනමේ අයුක්ත පර්‍යෙෂණ ප්‍රතිග්‍රහණ පරිභොගය යන මොවුන් දුරුකිරීමෙන් ධර්මයෙන් පර්‍යෙෂණයකොට ධර්මයෙන් පිළිගෙණ ප්‍රත්‍යවෙක්ෂාකොට වැලදීම; අනවජ්ජතා, නිරවද්‍ය බව නම්; පරිමිත පරිභොගෙන, පමණ දැන වැලදීමෙන්ම; ඵාසුවිහාරො, ඵාසු විහාරයවේ; අසප්පායාපරිමිත භොජනපච්චයා, අසත්ප්‍රාය අපරිමිත භොජන ප්‍රත්‍යයෙන්; අරති, ප්‍රාන්තසයනාසනයෙහිද අධිකුශල ධර්මයෙහිද අනභිරතිය; තන්දි, මද නි

ද්‍රාය; විස්මිතිතා, සන්‍යාසාමිඩ විශෙෂ න් හැඹිම; වීසද්ධෘ හරහාදි මදසාහා මවනාවා, විඥයන් වසින් කාරණ ගනී යනාදි නම මදෂයන්ගේ අභාවයෙන් සහ; අනවජ්ජතා, නිවරද බවය; සප්පායපරිමිත භොජනපපවමයා, සැප අහාර පමණ දැන වැලඳීමෙම් සත්‍යුවෙන්; කායබල සම්භාවනා, කායබල සම්භාව වන හෙයින්; ඵාසු විහාරො, ඵාසු විහාරයෙවී; යාවදත්‍ථං උදරාවදෙහක භොජන පරිවජ්ජනෙනතව, යම්තාක් කුස් පුරාකන අහර දුරුකිරිමෙන් සහ; සෙය්‍යසුඛං, ශයනාවෙන් වන සුවය; එස්සසුඛං, දෙඇලයෙන් පෙරළි පෙරළි සෝනාහව වන සුවය; මිඩ්ඩසුඛාදීනං, නිද්‍රා වශයෙන් උපදනා සුවය යනාදීන්ගේ; පහාණතො, ප්‍රහාණයෙන්; අනවජ්ජතා, නිවරද බවද; චතුපඤ්චාලොපමතතා ඌනහොජනෙන, සතර පස් ආලොපයක් පමණ ඌනකොට වැලඳීමෙන්; චතුරිරියාපථයානය භාව පටිපාදනතො, සතර ඉරියව්වන්ගේ යොග්‍ය බව සපයන හැවින්; ඵාසුවිහාරෝච මෙම භාවස්සතීති, මට ඵාසුවිහාරයද වන්නේයයි; පටිසඞ්ඛාති, වලදා; වුත්තමපි මෙතං, මේ කීයේවැනු –

චත්තාරො පඤ්ච ආලොපෙ අභුත්වා, සතර පස් ආලොපයක් නොවලදා; උදකම්පිවෙ, පැන් බොන්නේය; පහිතත්තස්ස භික්ඛුනො, නිවනට මෙහෙයනලද සිත් ඇති භික්ෂු හට; ඵාසුවිහාරාය, ඵාසුවිහාර පිණිස; අලං, පමණි.

---

( හා † )

“මමෙස් පුරාණ වෙදනාවන්ද නසමි. අලුත් වෙදනාවන්ද නො උපදෑම්සි” යනා මෙකී මමෙස් මේ පිණ්ඩපාතාහාරය වැලඳීමෙන් ඊට මත්තෙන් පැවැති පරණවූ ක්ෂුධා වෙදනාවන්ද නසන්නෙමි. අලුත් වෙදනාවන්ද නො උපදවන්නෙමියි සලකා පිණ්ඩපාතය වලඳමියි යනු භාවයි ඒ අලුත් වෙදනා කෙසේ නූපදවාද්‍යන්? යමෙක් බඩගිනි පමණ නොබලා වැඩි කොට වැලඳීම සත් ආනොට්ටෙහණ බොහෝකොට කා නැගී සිටිය නොහැකිවූ ආහාරහත්‍ථක නාම බමුණාද බඩ හෝකොට කා පරිනීය බඩ ඇති බැවින් නැගී සිටියේ නමුදු පිළි හැඳගත නොහැකිවූ අලංසාටක නාම බමුණාද බොහෝ කාට කා නැගී සිටින්නට අසමර්ථව එතන්හිම පෙරළෙන්නාවූ තත්‍රවට්ටක නාම බමුණාද කවුඩන්නක් කා යම්සේ ඒ කෑ අහර කවුඩන් විසින් මුඛයෙන් ඇද ඇද කාද එබඳුවූ කාකමාසක නාම බමුණාද බොහෝකොට කා මුඛයෙහි නොදැරිය හැකිව එහිම වමනය කරන්නාවූ භුත්තවමිතක නාම් බමුණාද යන මේ බමුණන් අතුරෙන් එක්තරා එකෙකු මෙන් අලුත් වේදනාවන් නොඋපදවම්යි සලකා මෙහෙදක් වලඳන ගිලනක්හු මෙන් පිණ්ඩපාතය වලඳමියි යනු භාවයි. නොහොත් මේ ජාතියෙහි නොසැපවූ ප්‍රමාණයට වැඩිවූ අහර වැලඳීම නැමැති ප්‍රයොග විපත්තියට පැමිණ පූර්ව ජන්මයෙහි කරණලද අනිෂ්ට කර්මයාගේ විපාක වශයෙන් උපදනා බැවින් යම් වේදනාවක් පුරාණ වෙදනායයි කියනු ලැබේද සැපවූ පමණ දැන වලඳනා අහර නමැති ප්‍රයොග සම්පත්තියෙන් පුරාණ වෙදනාවගේ ප්‍රත්‍යයද නසමින් ඒ පුරාණ වෙදනාව නසමියි යනු භාවයි යම් වෙදනාවක් නොමෙර දැන් කරණලද පස් නොවිකා ප්‍රත්‍යය පරිභොගගිරියයයි කියනලද අයුක්ත පරිභොග නැමැති අකුශල කර්මවිපාකය නිසා මතු උපදනා හෙයින් අලුත් වෙදනා

යයි කියනු ලැබේද පස් විකා පසය වැලඳීම නැමැති යුක්ත පරිභොගයෙන් ඒ අළුත් වේදනාවට මූල්වූ පස් නොවිකා පසය වැලඳීම් සංඛ්‍යාත අකුශල කර්මයද නොඋපදවමින් ඒ අලුත් වෙදනාවද නොඋපදවමියි මෙසේද මෙහි අර්ථ දතයුතු මෙපක්ෂණකින් වනාහි ප්‍රව්‍රජිතයන්ට සුදුසුවූ පස් විකා සිවුපසය පරිභොගකිරීම කී බැවින් යුක්ත පරිභොග සංග්‍රහයද සුඛා දුඃඛාදී දුක් නැසීම කී බැවින් ආත්ම කලමථුවගේ ප්‍රහාණයද ධ්‍යාන සුඛාදීන්ට කාරණ වූ ශරිර සැපය අත්නොහැරීය බැවින් ධාර්මික සැපයාගේ අපරිත්‍යාගය (අත්නොහැරිම] ද දක්වන ලද්දේයයි දතයුතු.

"මාගේ යාත්‍රාව වන්නේය" යන මෙහි සැප අහර පමණදැන වැලඳීමෙන් දිවි නසන්නාවූහෝ ඉරියව් බිඳින්නාවූ හෝ උපද්‍රව නොවන බැවින් බොහෝකල් පැවැත්වයයි කියනලද මාගේ මේ ප්‍රත්‍යයන් පිළිබඳව පවත්නාවූ ශරිරයාගේ යැපීම වන්නේයයි සිතා සාධ්‍යද අසාධ්‍යද නොවන්නාවූ යාප්‍යවූ රෝගයක් ඇත්තාවූ රෝගාතුරයෙක් ඒ බෙහෙද නිසා අනවද්‍ය බවද සැප විහරණයද වන්නේයයි සිතා දවස දවස වලඳන බෙහෙදක්මෙන් සිවුපසය සෙවනයකරයි නොහොත්. භිදුන් විසින් ගර්හාකරණලද මිථ්‍යා ආජීවයෙන් පසය සෙවීමය පමණ නොදැන බොහෝකොට පිළිගැන්මය පස් නොවිකා පසය පරිභොගකිරීමය යන මෙවුන් දුරුකිරීමෙන් දැහැමින් සොයා පමණ දැන පිළිගත් පස් විකා වැලඳීම නිවරද බවවෙයි පමණ දැන වැලඳීමෙන් සැපවූ විහරණයවෙයි නොසැපවූ අහර පමණ නොදැන වැලඳීම හේතුකොටගෙණ ආරණ්‍යසෙනාසනයෙහිද ධ්‍යාන භාවනානුයෝගද නොඇලීමය නිද්‍රමතය ඇඟමැලිහැරීමය නුවණැත්තන් විසින් ගර්හා කටයුතු බවට පැමිණීමය යනමේ දෝෂයන් නැති හෙයින් නිවරද බවවෙයි සැපවූ පමණ දැන වලඳන්නාවූ භොජනය හේතුකොටගෙණ කායබල හටගන්නා බැවින් සැපවිහරණය වන්නේය කුස් පිරෙණතාක් අනුභවකරණ ආහාරය දුරුකිරීමෙන් හෝ සයනයකිරීමෙන් ලැබෙන සැපය දෙඇලමෙයන් පෙරළී පෙරළී හෝනා තැනැත්තා හට ලැබේන සැපය නිදගැන්මෙන් ලැබෙන සැපය යන මෙවුන්ගේ දුරුකිරීමෙන් හෝ නිවරද බවවෙයි සතර පස් පිඩක් පමණ අඩුකොට වැලඳීමෙන් සතර ඉරියව්වන්ගේ සුදුසු බව සපයන බැවින් මට සැප විහරණයද වන්නේයයි සලකා සිවුපසය පරිභොග කරන්නේයි මේ වදාරණලදුයේමැයි නිවන් පිණිස මෙහෙයනලද සිත් ඇති භික්ෂු තෙම සතර පස් පිඩක් පමණ නොවලදා (නොහොත් සතර පස් පිඩකට ඝාසස්ථිය අවකාශ තබාපියා) පැන් බොන්නේ වීනම් ඒ වැලඳීම නිවන් පිණිස මෙහෙයනලද සිත් ඇති භික්ෂු හට සැපවිහරණය පිණිස ප්‍රමාණ වන්නේයි

---

( පා ‡ )

එත්තාවතාව පයෝජන පරිග්ගහො මජ්ඣිමාව පටිපදා දීපිතා හොතීති වෙදිතබ්බා — සෙනාසනානි සයනඤ්ච ආසනඤ්ච යත්ථ යත්ථ සෙති විහාරෙ වා අඩ්ඪයොගාදිම්හිවා තං සයනං යත්ථ යත්ථ ආසති නිසීදති තං ආසනං තං එකතො කත්වා සෙනාසනන්ති වුච්චති — උතුපරිස්සය විනොදන පටිසල්ලානාරාමත්ථන්ති පරිසහනට්ඨෙන උතුයෙව උතුපරිස්ස

යො උතුපරිස්සයවිනොදනත්‍ථං පටිසල්ලාණාරාමත්‍ථඤ්ච යො සරීරාබාධචිත්තවික්ඛෙපකරො අසප්පායො උතු සෙනාසනෙ පටිසෙවියමානො විනොදෙතබ්බො හොති තස්ස විනොදනත්‍ථං එකීභාවසුඛත්‍ථඤ්චාති වුත්තං හොති කාමඤ්ච සීතස්ස පටිඝාතාදිනාව උතුපරිස්සයවිනොදනං වුත්තමෙව යථාපන චීවරපටිසෙවනෙ හිරිකොපීනපටිච්ඡාදනං නියතපයොජනං ඉතරානි කදාචි කදාචි භවන්තීති වුත්තං එවමිධාපි නියතං උතුපරිස්සයවිනොදනං සන්ධාය ඉදං වුත්තන්ති වෙදිතබ්බං—අථවා අයං වුත්තප්පකාරො උතු උතුයෙව පරිස්සයො පන දුවිධො පාකටපරිස්සයො ච සීහබ්‍යග්ඝාදයො පටිච්ඡන්නපරිස්සයො රාගදොසාදයො තෙ යත්‍ථ අපරිගුත්තියා ච අසප්පායරූපදස්සනාදිනා ච ආබාධං න කරොන්ති තං සෙනාසනං එවං ජානිත්වා පච්චවෙක්ඛිත්වා පටිසෙවන්තො භික්ඛු පටිසඞ්ඛා යොනිසො සෙනාසනං—පෙ—උතුපරිස්සයවිනොදනත්‍ථං පටිසෙවතීති වෙදිතබ්බො—

( ෂ ‡ )

එතනාවතාව, "යාත්‍රා" යනාදීන් උක්තපදත්‍රයින්; ප්‍රයොජන පරිග්‍රහො "යාත්‍රා ච මෙ භවිස්සති" යනු යෙන් ප්‍රයොජනපරිග්‍රහයද; "මජ්ඣිමා ච පටිපදා "අනවජ්ජතා ච ඵාසුවිහාරො" යනුයෙන් ධාර්මිකසුඛයාගේ අපරිත්‍යාගය හෙතුකොට ඇති ඵාසු විහාර සංඛ්‍යාත මධ්‍යම ප්‍රතිපත්තියද; දීපිතා හොන්තී'ති වෙදිතබ්බ, දක්වනලදැයි දතයුතු; මෙහි "යාවදෙව ඉමස්ස කායස්ස ඨිතියා" යනුඑක් අඟෙක "යාපනාය" යනු එක් අඟෙක "විහිංසූපරතියා" යනු එක් අඟෙක "බ්‍රහ්මචරියානුග්ගහාය" යනු එක් අඟෙක "ඉති පුරාණඤ්ච වෙදනං පටිහඞ්ඛාමි" යනු එක්අඟෙක "නවඤ්ච වෙදනං න උප්පාදෙස්සාමි" යනු එක් අඟෙක "යාත්‍රා ච මෙ භවිස්සති" යනු එක් අඟෙක "අනවජ්ජතා" යනු එක් අඟෙක "ඵාසුවිහාරො" යනු භොජනානිසංසයි—මෙසේ අෂ්ටාඞ්ගයෙන් යුක්ත වූ ආහාර වළඳන්නේනම්වේ දතයුතු.

"සෙනාසනං" යනෙනත්; සයනව, ශයනද; ආසනව, ආසනයද ("යත්‍ථ යත්‍ථ විහාරෙ වා අඩ්ඪයොගාදිම්හි වා"ති යොදනු) යම් යම් විහාරයක හෝ අඩ්ඪයොගාදියක හෝ; සයනි, හොවීද; තං සෙනං, ඒ සයන නම්—(ආදිශබ්දයෙන් ප්‍රාසාදාදීන් ද මචාදීන් ද සඞ්ග්‍රහකෙරෙත් "යත්‍ථ විහාරෙ වා අඩ්ඪයොගාදිම්හි වා ආසති" යොදනු) නිසීදනි, හිඳීද; තං ආසනං, ඒ අසුන් නම් (ම්හිආදි ශබ්දයෙන් පීඨසන්ථතාදීන්ගේ ග්‍රහණයවේ) තං එකතො කත්වා, ඒ දෙකා එක්කොට, සෙනාසනනායි වුවමනි, "සෙනාසනං" යි කියනුලැබේ—පරිසහනාවෙඨන, අභිභව නායීයෙන් (පෙළනාහෙයින යන අර්ථයි) උතුයෙව, ශීතොෂ්ණාදී සෘතුවම; උතුපරිස්සයො, උතුපරිස්සය නම්; උතුපරිස්සය විනොදනත්‍ථච, සෘතුපීඩාව නසනපිණිස (අනුත්පන්නයාගේ අනුත්පාදනයද උත්පන්නයාගේ ව්‍යුපසමයද පිණිසය යන අර්ථයි) පටිසල්ලාණාරාමත්‍ථච, එකී භාවයෙන් වන සුවය පිණිසද ("නානාරම්මණතො පටිසංහරිත්වා කම්මට්ඨානභූතෙ එකස්මිං යෙව ආරම්මණෙ චිත්තස්ස සම්මදෙව ලයනං පටිසල්ලාණං තත්‍ථ ආරාමො අභිරති පටිසල්ලාණාරාමො තදත්‍ථං" යි ගන්නේ-කී අර්ථයම භගවනපිණිස "යො" යනාදී කිවූ) සරීරාබාධ චිත්තවික්ඛෙපකාරො, ශරීරපීඩා

ය විනානවිනෝදනාය යන මොවුන් කාරණාවූ; යො අසප්පායො උතු, නොසැපවූ යම් ඍතුවෙක්; සෙනාසනපටිසෙවනෙන විනොදෙතබ්බො හොති, සෙනසුන් වැලදගැන්මෙන් දුරුකටයුතු වේද; තස්ස විනොදනත්ථාය, ඒ නොසැප ඍතුව දුරුකරණ පිණිසද; එකීභාවසුඛත්ථාය, එකීභාවහෙතුවෙන් වන සුවය පිණිසද; වුත්තං හොති, කියනලැබේ; කාමව සදුව, කිසිසේත්; සීතපටිඝාතාදිනාව, "සීතස්ස පටිඝාතාය" යනාදීයෙන්ම; උතුපරිස්සයවිනොදනං, ශීතොෂ්ණව්‍යතිරික්ත ඍතුවක් නැතිබැවින් ඍතුපීඩාදුරුකිරීම; වුත්තමෙව, කියනලදමය; යථාපන, යම්සේ වනාහි; චීවරපටිසෙවනෙ, සිවුරු වැලදගැන්මෙහි; හිරිකොපීනපටිච්ඡාදනං නියතපයොජනං, හිරිකොපීනපටිච්ඡාදනය නියතප්‍රයොජනය; ඉතරානි කදාචි කදාචි භවන්තී 'ති, සෙසු සීතපටිඝාතාදිහු කිසි කිසි කලෙක වෙත්නු; වුත්තා, කියනලද්දාහු; එවං, එපරිද්දෙන්ම; ඉධාපි, මෙහිදු; නියතං උතුපරිස්සයවිනොදනං සන්ධාය, සඳහාවි බැවින් නියත උතුපරිස්සයවිනොදනය සඳහා; ඉදං වුත්තං 'ති, මේ කියනලදැයි; වෙදිතබ්බං, දතයුතු — අථවා, නොහොත්; වුත්තප්පකාරො උතු, සීතාදිවූද අසප්පායවූදැයි උක්තප්‍රකාර ඍතුව; උතුයෙව, ඍතුවනම්වෙයි; පරිස්සයොපන, පරිස්සය වනාහි; දුවිධො, ද්විප්‍රකාරවේ; සීහව්‍යග්ඝාදයො, සිංහව්‍යාඝ්‍රාදිවූ; පාකටපරිස්සයො ච, ප්‍රකට උපද්‍රවද; රාගදොසාදයො, රාගද්වේෂාදිවූ; පටිච්ඡන්නපරිස්සයො, ප්‍රතිච්ඡන්න උපද්‍රවද්දැයි; තෙ, ඒ උපද්‍රවයෝද දෙන; යත්ථ, යම් සෙනාසනයක, අපරිගුත්තියා ච, අසංවෘතද්වාරාදි බැවින්ද; අසප්පායරූපදස්සනාදිනා ච, අසන් ප්‍රායරූපදර්ශනාදීන්ද; ආබාධං න කරොන්ති, පීඩා නොකෙරෙද්ද (විවෘතාඞ්ගන වෘක්ෂමූලාදියෙහි හුන්නහුව සිංහාදි බාහිරොපද්‍රවයෝද සග්‍රාප දර්ශනාදීන් රාගාදි ක්ලෙශොපද්‍රවයෝද පෙළන්නාහු සෙනසුන් වැද හුන්නාහුව උපද්‍රවයෝ දෙදෙනාම නොපෙළන්නාහුයි) තං තං සෙනාසනං, ඒ ඒ සෙනසුන්, එවං ජානිත්වා, ප්‍රකටාප්‍රකට උපද්‍රවදෙක නැත්තේයයි දැන; පච්චවෙක්ඛිත්වා, ප[illegible], සෙවමානො භික්ඛු, සෙවනා මහණ තෙමේ "පටිසෙවන්නො භික්ඛු ච දිතබ්බො" යි සම්බන්ධකරණු)

( භා. ‡ )

මෙපමණකින් හෙවත් මේ "යාත්‍රා" "අනවජ්ජතා", "ඵාසුවිහාරො" යන පදත්‍රයෙන් ප්‍රයොජනපරිග්‍රහයද ධාර්මික සැපයාගේ අන්තනොහැරිම මෙහු කොට ඇති සැපවිහරණසංඛ්‍යාත මධ්‍යමප්‍රතිපදාවද දක්වනලද්දේයයි දතයුතු "සෙනාසනං" යන මෙහි යහන්ද අසුන්ද සෙනසුන් නම් ඒ එසේමැයි යම් යම් විහාරයෙක හෝ අඩ්ඪයොගාදි ප්‍රාසාදාදියෙක හෝ ගෑසීආදියෙක හෝ නොහෙත්වීනම් ඒ හෝනාතැන් යහන් නම් යම් යම් විහාරාදි තැණක හෝ පුටු ආදියක හෝ හිඳින්නේවීනම් ඒ හිඳිනාතැන් අසුන් නම් ඒ හෝනා හිඳිනා තැන් එක්කොට සෙනාසුන් යයි කියනලද්දේයි.

"ඍතුපීඩා නසනපිණිසය නැම සථානාරම්භණෙහි සිත ඇලවීම පිණිසය" යන මෙහි පීඩාකාරණ අර්ථයෙන් හුනු සිනිල් බවය කියනලද ඍතුවම ඍතුපීඩාව නම් වන්නේය නුපන්නාවූ ඍතුපීඩාවන් නුපදනා පිණිසද උපන්නාවූ ඍතුපීඩාවන් සන්සිඳුවන පිණිසද කම්මට්ඨානාරම්භනෙහි

සිත අලුවන පිණිසද (සෙනසුන්සෙවනය කෙරෙයි) මෙවත් ශරීර පීඩා විනොදනාර්ථාදයක කරවනාවූ නොසැපවූ ශම් ස්පර්ශයක් සැපවූ සෙනසුන් සෙවීමෙන් දුරු කටයුතුවේද ඒ නොසැපවූ ස්පර්ශ දුරු කරන්නට පිණිසද විවෙකසැපය පිණිසද (සෙනසුන් සෙවනය කරණයෙන්යැයි කියනලද්දේ වේ) කිසියම් ශීත නැසීම් ආදියෙන් ම ස්පර්ශය, නැසීමද කියනලද්දේවේද යම්සේ සිවුරු වැලඳ ගැන්මෙහි ලජ්ජාසථාන මුවහකිරීම නියතප්‍රයෝජනවේද සෙසු ශීත වැළැක්වීම් ආදී ප්‍රයෝජනයෝ කිසි කිසි කලෙක වෙතියි කියනලද්දේවේද එපරිද්දෙන්ම මෙහි ද ස්පර්ශපීඩා නැසීම නියතප්‍රයොජනවෙයි යන බව දක්වනු සඳහා මෙ කියනලදයි දතයුතු.

නොහොත් යට කියනලද ප්‍රකාර ඇතනාවූ ශීතොෂ්ණාදි ස්පර්ශම ස්පර්ශනම පීඩාව වනාහි සිංහව්‍යාඝ්‍රාදි ප්‍රකට උපද්‍රවය රාගවෙෂාදී අප්‍රකට උපද්‍රවයයි දෙවැද්දෑරුම්වෙයි ඒ උපද්‍රවයෝ දෙදෙන යම් සෙනසුනෙක දොර නොවැසීම් ආදී ආරක්ෂා නොකිරීමෙන්ද නොසැපවූ රූප දැකීම් ආදීයෙන්ද පීඩා නොකෙරෙද්ද ඒ ඒ සෙනසුන් මෙසේ ප්‍රකට අප්‍රකට උපද්‍රව නැත්තේයයි දැන පසවිකා සෙවනය කරණ මහණතෙමේ නුවණින් ප්‍රයෝජන සලකා ස්පර්ශපීඩා නසන පිණිස සෙනසුන් ප්‍රයෝජන ගණ්ණේයයි දතයුතු —

( පා ෆ )

ගිලානප්පච්චයභෙසජ්ජපරික්ඛාරන්ති එත්ථ රොගස්ස පති අයනට්ඨෙන පච්චයො පච්චනීකගමනට්ඨෙනාති අත්ථො, යස්ස කස්සචි සප්පායස්සෙතං අධිවචනං භිසක්කස්ස කම්මං තෙන අනුඤ්ඤාතත්තාති භෙසජ්ජං ගිලානපච්චයොව භෙසජ්ජං ගිලානපච්චයභෙසජ්ජං යංකිඤ්චි ගිලානස්ස සප්පායං භිසක්කකම්මං තෙලමධුඵාණිතාදීති වුත්තං හොති පරික්ඛාරොති පන සත්තහි නගරපරික්ඛාරෙහි සුපරික්ඛිත්තං හොතීති ආදීසු පරිවාරො වුච්චති —. රථො සීලපරික්ඛාරො ඣානක්ඛො චක්කවීරියොති ආදීසු අලඞ්කාරො —. යෙ ච ඛො ඉමෙ පබ්බජිතෙන ජීවිතපරික්ඛාරා සමුදානෙතබ්බාති ආදීසු සම්භාරො —. ඉධ පන සම්භාරොපි පරිවාරොපි වට්ටති තං හි ගිලානපච්චයභෙසජ්ජං ජීවිතස්ස පරිවාරොපි හොති ජීවිතනාසකාබාධුප්පත්තියා අන්තරං අදත්වා රක්ඛණතො සම්භාරොපි යථා චිරං පවත්තති එවමස්ස කාරණභාවතො තස්මා පරික්ඛාරොති වුච්චති —. එවං ගිලානපච්චයභෙසජ්ජඤ්ච තං පරික්ඛාරො චාති ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරො තං ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං ගිලානස්ස යංකිඤ්චි සප්පායං භිසක්කානුඤ්ඤාතං තෙලමධුඵාණිතාදිජීවිතපරික්ඛාරන්ති වුත්තං හොති —. උප්පන්නානන්ති ජාතානං භූතානං නිබ්බත්තානං වෙය්‍යාබාධිකානන්ති එත්ථ ව්‍යාබාධොති ධාතුක්ඛොභො තං සමුට්ඨානා ච කුට්ඨගණ්ඩපීළකාදයො ව්‍යාබාධතො උප්පන්නත්තා වෙය්‍යාබාධිකා වෙදනානන්ති දුක්ඛවෙදනා අකුසලවිපාකවෙදනා තාසං වෙය්‍යාබාධිකානං වෙදනානං අබ්‍යාපජ්ජපරමතායාති නිද්දුක්ඛපරමතාය යාව තං දුක්ඛං සබ්බං පහීනං හොති තාවාති අත්ථො —. එව මිදං සඞ්ඛෙපතො පටිසඞ්ඛා යොනිසො පච්චය පරිභොගලක්ඛණං පච්චයසන්නිස්සිතං සීලං වෙදිතබ්බං —.

( ස ¶ )

රොගස්ස පති අයනාෙටඨෙන, ධාතුක්ෂොභලක්ෂණවූ තඬේතුක දුඃඛයෙව දනා ලක්ෂණවූ ඝොර රෝගයට ප්‍රතිපක්ෂබැවින්; පච්චයො, ප්‍රත්‍යයනම්වේ (එසේහෙයින් "පච්චනීකගමනට්ඨෙන" හී "වූපසමනට්ඨෙන" යන අර්ථයි) යස්ස කස්සචි, සර්පිෂාදීන්කෙරෙහි යම් කිසි; සප්පායස්ස, පථ්‍යයකට; එතං අධිවචනං, ප්‍රත්‍යය යන මේ නාමෙකි; භිසක්කස්ස කම්මං, භිසක්හුගේ කර්මය; තෙන අනුඤ්ඤාතත්තා 'ති' උහුවිසින් අනුඤ්ඤාතහෙයින්; භෙසජ්ජං, බෙහෙත් නම් වේ—ගිලානපච්චයභාවි භෙසජ්ජං, ගිලානප්‍රත්‍යයම බෙහෙත්වූයේ; ගිලානපච්චයභෙසජ්ජං, ගිලානප්‍රත්‍යය භෛෂජ්‍යනම්; යං කිඤ්චි ගිලානස්ස සප්පායං, යම් කිසි ගිලන්හට සැපවූ; භිසක්ක කම්මං, භිසක්කර්මයි; තෙලමධුඵාණිතාදි ති වුත්තං හොති, තෙල් මීපැණි ආදිය යන අර්ථයි; පරික්ඛාරො 'ති පන, පරිෂ්කාරනම් වනාහි; සත්තහි නගරපරික්ඛාරෙහි "කවාටපරිඛෙපො පරිඛා උද්දපො පාකාරො එසිකා පලිඝො පාකාරපත්ථණ්ඩිලං"ති කියනලද සප්තනගර පරිෂ්කාරයෙන් (නගරං පරිවාරෙත්වා, රක්ඛණකෙහි යන අර්ථයි) සුපරික්ඛිත්තං හොතීති ආදිසු, මනාකොට පිරිවරණලද යනාදියෙහි; පරිවාරො වුච්චති; පරිවාර කියනලැබේ —

සීලපරික්ඛාරො, සුවිශුද්ධ ශීලාලඞ්කාරඇති; ඣානක්ඛො, ධ්‍යාන නැමැති අකුරක්ඇති; චක්කවිරියො, වීර්‍ය්‍ය නැමැති සක්ඇති; රථො, අෂ්ටාඞ්ගමාර්ගනැමැති රථය; ආදිසු, මේ ආදියෙහි; අලඞ්කාරො, අලඞ්කාරය කියනලැබේ; පබ්බජිතෙන, පැවිදිවූවහු විසින්; යෙවිමෙ ජීවිතපරික්ඛාරා, යම් මේ ජීවිතප්‍රවෘත්තියට කාරණාංගකෙණෙක්; සමුදානෙතබ්බා, මනාකොට මතු මතුයෙහි එලවියයුත්තාහුද යන; ආදිසු, මේ ආදියෙහි; සම්භාරො, කාරණය කියනලැබේ; ඉධ පන, මෙතනවනාහි; සම්භාරොපි, සම්භාරාර්ථයද; පරිවාරොපි, පරිවාරාර්ථයද; වට්ටති, වෙයි; තං හි ගිලානපච්චයභෙසජ්ජං, ඒ ගිලානප්‍රත්‍යය භෛෂජ්‍යය; ජීවිතස්ස, ජීවිතයට; පරිවාරො'පි' හොති, පරිවාරදවේ; ජීවිතනාසකාබාධුප්පත්තියා, ජීවිතනාසකවූ ආබාධොත්පත්තියට; අන්තරං අදත්වා, අතුරු නොදී; රක්ඛණතො, රක්නාහෙයින්; සම්භාරොපි, සම්භාරද වේ; යථාචිරම්පි පවත්ති, යම්සේ චිරකාලයක් පවතීද; එවමස්ස කාරණභාවතො, එසේ ජීවිතයට කාරණවනහෙයිනි, ("රසායනභූතං හි භෙසජ්ජං සුචිරම්පි කාලං ජීවිතං පවත්තෙතී"ති) තස්මා, එහෙයින්; පරික්ඛාරොති වුච්චති, පරිෂ්කාරයයි කියනලැබේ—පෙ—(අනුත්පන්නවූ දුඃඛවෙදනාවම බෙහෙත් වැලඳීමෙන් වලක්නීය උපන්වෙදනා නොවලක්කියි නමා ස්වරසයෙන්ම බිඳෙන බැවින් "සා එවනිහතිරී තානිවෙවඩ සධානි" යනුයෙහිමෙන්වනාහි තත්ස දෘශයෙහි තද්ව්‍යවහාරයෙන් උත්පන්නසදෘශ වෙදනාවෝ "උප්පන්නානං"යි කියනලදහු එහෙයින්සීඝ "උප්පන්නානන්ති, ජාතානං භූතානං නිබ්බත්තානං"යි) ව්‍යාබාධො'ති' ව්‍යාබාධනම්; ධාතුක්ඛොභො, ධාතුක්ෂොභයද; තං සමුට්ඨානකුව, දෙශ සඞ්ඛයෙහි පාන් ඒ ධාතුක්ෂොභය හෙතුකොටඇති" කුට්ඨපිළිකාදයො, කුෂ්ඨ පිළිකා ආදීහු ("සච්ඡතො පටිසාය සො ධාතුක්ඛොභො සමුට්ඨානං එතෙසන්තිතංසමුට්ඨානං" යී ගණිමෙණි) ව්‍යාබාධෙනා උප්පන්නත්තා, ධාතුක්ෂොභලක්ෂණ කුෂ්ඨපිලකාදී ලක්ෂ

ණ හෝ ව්‍යාබාධයා කෙරෙන් උත්පන්න හෙයින්; වෙය්‍යාබාධිකා වෙදනා, වෙය්‍යාබාධිකා වේදනා නම්වේ ("දුක්ඛාවෙදනා" යි කීයාද හෝ තොමෝ අකුශල සවභාවද වේ නුයි. එයින් මෙසේසතු පිණිස "අකුසල විපාක වෙදනා" යි කීහු) තාසං වෙය්‍යාබාධිකානං වෙදනානං, උක්ත ලක්‍ෂණ ව්‍යාබාධයෙන් උපන් වේදනාවන්ගේ (ව්‍යාබාධනමෙටඨ්ත ව්‍යාබාධො ව්‍යාපජ්ජං දුක්ඛනති අතෙථා තස්මි එතථ බ්‍යාපජ්ජං අබ්‍යාපජ්ජං නිද්දුක්ඛතා තෙනාහ අබ්‍යාපජ්ජ පරමතායා'ති නිද්දුක්ඛ පරමතායාති") යාව, යම්තාක්; තං දුක්ඛං, ඒ රෝග නිමිත්ත දුඃඛය; සබ්බං පහීණං හොති, සියල්ල ප්‍රහීණවේද; තාවානි අතෙථා, ඒතාක්ය යන අර්ථයි; එවං, මෙසේ ("ඉදං සීලං"යි යොදනු) සඞ්ඛෙපතො, සඞ්ක්‍ෂෙපයෙන්; පටිසඞ්ඛායොනිසො, නුවණින් ප්‍රත්‍යවෙක්‍ෂාකොට; පච්චය පරිභොග ලක්ඛණං, ප්‍රත්‍යය පරිභොග ලක්‍ෂණකොට ඇති; පච්චසන්නිස්සිතසීලං, ප්‍රත්‍යය සන්නිශ්‍රිත ශීලය; වෙදිතබ්බං, දතයුතු.

( භා ¶ )

"ගිලන්පස බෙහෙත් පිරිකරය" යන මෙහි ධාතු කැලඹීම ලක්‍ෂණකොට ඇත්තාවූ හෝ එම හේතුවෙන් උපදනා දුක් වේදනාව ලක්‍ෂණකොට ඇත්තාවූ හෝ රෝගයට විපක්‍ෂව යන අර්ථයෙන් හෙවත් රෝගය සංසිඳුවන අර්ථයෙන් ගිලන්පස නම. ගිතෙල් ආදීවූ යම්කිසි පථ්‍යයකට මේ නම් වන්නේයි. වෙදෙක් විසින් අනුදත්තාලද බැවින් වෙදෙක්හුගේ කර්මය බෙහෙද නම ගිලන්හුගේ පසයම බෙහෙත්වූ හෙයින් ගිලාණ ප්‍රත්‍යය භෛෂජ්‍ය නම ගිලණුන්ට සැපවූ යම්කිසි බෙහෙත් කිරීමක් වේ. හෙවත් තලතෙල් මීපැණිආදියයි කියන ලද්දේවේ "පරිෂ්කාර" නම් නුවර පිරිවරා රක්නාලද සප්තනගර පරිෂ්කාරයෙන් මනාකොට පිරිවරණලද්දේය යනාදියෙහි පරිෂ්කාර ශබ්දයෙන් පිරිවර කියනලද්දේය. සුපරිශුඞ ශීල නැමැති අලඞකාර ඇති ධ්‍යාන නැමැති බොස්ගෙඩි ඇති වීය්‍යී නැමැති රථ රෝද ඇති අෂටාඞගික මාර්ග නැමැති රථය යනාදි තන්හි පරිෂ්කාර ශබ්දයෙන් අලඞකාරය කියනලද්දේය පැවිදි වූවහු වසින් දිවි පැවැත්මට සුදුසුවූ යම් මේ කාරණා කෙණෙක් ෂතුමත්තෙහිදු මනාකොට එලවියයුත්තාහුද යනාදි තන්හි කාරණය පරිෂ්කාර ශබ්දයෙන් කියනලද්දේය. එමෙන්ම මෙතන්හි වනාහි කාරණාර්ථයද පරිවාරාර්ථයද සුදුසු වන්නේයි. ඒ එසේමැයි ඒ ගිලන්පස බෙහෙත් පිරිකර දිවි නසනනාවූ රෝගාබාධයන්ගේ ඉපදීමට අවකාශ නොදී රක්‍ෂාකරණ හෙයින් දිවි පැවැත්මට පිරිවරද වේමය යම්සේ ආත්මය බොහෝකල් පවත්වාද ජීවිතයාගේ එසේ පැවැත්මට කාරණාවන හෙයින් කාරණද වේමය ඒ එසේමැයි රසායනාවූ බෙහෙද ඉතා බොහෝකල් ජීවිතය පවත්වන්නේයි. එසේ හෙයින් ප්‍රත්‍යය ජීවිතයට පරිෂ්කාරය හෙවත් පිරිවරයයි කියනු ලැබේ. "උපන්නවුන්ගේ" ය යනු උපන්නාවූ හෙවත් හටගත්තාවූ පහළවූනාවූ රෝගයන්ගේයි "වෙය්‍යාබාධිකාවන්ගේ" යන මෙහි ව්‍යාබාධනම් ධාතූන්ගේ කැලඹීම හා එයින් හටගත්තාවූ කුෂට ගඩ පිළකාදීහුද ධාතූන්ගේ කැලඹීමෙන් උපන් හෙයින් වෙය්‍යාබාධිකා නම්වෙති "වෙදනා" නම් අකුශල විපාක වේදනාවූ දුක් වේදනායි ඒ උක්තප්‍රකාර ලක්‍ෂණ ඇත්තාවූ ව්‍යාබාධයෙන් උපන් වේදනාවන්ගේය ය

නු ගාථායි "අබ්‍යාපජ්ජපරමතාය පිණිසං" යනු නිදුක් බව උතුම්කොට ඇතිබවයි. භාගවත් යම්තාක් ඒ රෝගය කාරණකොට ඇති සියළු දුක් ප්‍රහීණ වේද්ද ඒතාක් කල්ය යනාර්ථයි. මෙසේ සංක්‍ෂෙප වශයෙන් නුවණින් පස්විකා සිව්පසය ප්‍රයෝජන ගැණීම ලක්‍ෂණකොට ඇති ප්‍රත්‍යය සන්නිශ්‍රිත ශීලය දතයුතු.

( ඵා * )

වචනත්ථො පනෙත්ථ චීවරාදයො හි යස්මා තෙ පච්චනිස්සාය පරිභුඤ්ජමානා පාණිනො අයන්ති ගච්ඡන්ති පවත්තන්ති තස්මා පච්චයාති වුච්චන්ති තෙ පච්චයෙ සන්නිස්සිතන්ති පච්චයසන්නිස්සිතං. එවමෙතස්මිං චතුබ්බිධෙ සීලෙ සද්ධාය පාතිමොක්ඛ සංවරො සම්පාදෙතබ්බො. සද්ධාසාධනො හි සො සාවකවිසයාතීතත්තා සික්ඛාපද පඤ්ඤත්තියා. එවන පටික්ඛෙපො චෙත්ථ නිදස්සනං. තස්මා යථා පඤ්ඤත්තං සික්ඛාපදං අනවසෙසං සද්ධාය සමාදියිත්වා ජීවිතෙපි අපෙක්ඛං අකරොන්තෙන සාධුකං සම්පාදෙතබ්බං. වුත්තම්පිහෙතං.

කිකීව අණ්ඩං චමරීව වාලධිං
පියංව පුත්තං නයනංව එකකං
තථෙව සීලං අනුරක්ඛමානකා
සුපෙසලා හොථ සදා සගාරවාති.

අපරම්පි වුත්තං එවමෙව ඛො මහාරාජ යං මයා සාවකානං සික්ඛාපදං පඤ්ඤත්තං තං මම සාවකා ජීවිතහෙතුපි නාතික්කමන්තීති ඉමස්මිඤ්ච පනෙත්ථ අටවියං චොරෙහි බද්ධථෙරානං වත්ථූනි වෙදිතබ්බානි. මහාවත්තනි අටවියං කිර ථෙරං චොරා කාළවල්ලීහි බන්ධිත්වා නිපජ්ජාපෙසුං. ථෙරො යථා නිපන්නොව සත්තදිවසානි විපස්සනං වඩ්ඪෙත්වා අනාගාමිඵලං පාපුණිත්වා තත්ථෙව කාලං කත්වා බ්‍රහ්මලොකෙ නිබ්බත්ති. අපරම්පි ථෙරං තම්බපණ්ණිදීපෙ පූතිලතාය බන්ධිත්වා නිපජ්ජාපෙසුං. සො දවග්ගිම්හි ආගච්ඡන්තෙ වල්ලිං අච්ඡින්දිත්වාව විපස්සනං පට්ඨපෙත්වා සමසීසී හුත්වා පරිනිබ්බායි. දීඝභාණක අභයත්ථෙරො පඤ්චහි භික්ඛුසතෙහි සද්ධිං ගච්ඡන්තො දිස්වා ථෙරස්ස සරීරං ඣාපෙත්වා චෙතියං කාරාපෙසි. තස්මා අඤ්ඤොපි සද්ධො කුලපුත්තො.

පාතිමොක්ඛං විසොධෙන්තො
අප්පෙව ජීවිතං ජහෙ
පඤ්ඤත්තං ලොකනාථෙන
න භින්දෙ සීලසංවරං.

( ඝ * )

වචනත්ථො පනෙත්ථ, මෙහි වචනාර්ථය වනාහි ("චීවරාදයො හි පච්චයා ති වුච්චන්ති" යි යොදනු) යස්මා, යම් හෙයකින්; තෙ, ඒ චීවරාදී ප්‍රත්‍යයන්; පටිච්ච, යි සේයි; නිස්සාය, නිසා; පරිභුඤ්ජමානා, වළඳන්නාවූ; පාණිනො, සත්වයෝ; අයන්ති, යි සේයි; ගච්ඡන්ති, යෙද්ද; පවත්තන්ති, පවත්නේද්ද; තස්මා, එහෙයින්; පච්චයාති වුච්චන්ති, ප්‍රත්‍යයහයි කියනු ලැබෙත් ( ප්‍රත්‍යය සන්නිශ්‍රය කිරීම නම් අර්ථෙහයින් පරිභොගයමයයි දක්වන පිණිස "තෙ පටිච්ච නිස්සාය"යි කියාද "පරිභුඤ්ජමානා"යි කීහු ) තෙ පච්චයෙ සන්නිස්සිතන්ති, ඒ ප්‍රත්‍යය සන්නිශ්‍රිතහුයි; පච්චය සන්නිස්සිතං, ප්‍රත්‍යය සන්නිශ්‍රිත නම්; එවං, මෙසේ; චතුබ්බිධෙ සීලෙ, චතුර්විධවූ ශීලයෙහි; සද්ධාය, සැදැහැයෙන්; පාතිමොක්ඛ සංවරො, ප්‍රාතිමොක්‍ෂ සංවරය; සම්පාදෙතබ්බො, සැපයියයුත්තේයි; සද්ධාසාධනො හි සො, ඒ ප්‍රාතිමොක්‍ෂ සංවරය ශ්‍රද්ධාව සාධනකොට ඇත්තේයි; ("සාධීයති සම්පාදීයති එතෙනාති

සාධනං සඞ්ඝසාධනං එතස්සා'ති සද්ධාසාධනො" යි නන්දෙන්-චිය්‍යසමාති ප්‍රඥාවෙන් මිනාද පාතිමොක්ඛ සංවරය සිද්ධ නොවන්නාවූ ශ්‍රද්ධාවගේ විශෙෂ ප්‍රත්‍යය බව සඳහා ශ්‍රද්ධාසාධන බව කීයතලුදුනී දක්වනුවෝ "සාවකා විසයාතීතා යා සික්ඛාපද පඤ්ඤත්තියා" යි කීහු-ශික්ෂාපද ප්‍රඥප්තිය ශ්‍රාවකවිෂය නුත්වසිව් නෙහින යනාඅර්ථයි) සික්ඛාපදපඤ්ඤත්තියා එවිතාපටනොඛනො ච, ශික්ෂාපදප්‍රඥප්තිපතිණිත සැරියුත් මහතෙරුන්කල යාවසැවට කළ පුන්නෙසෝ පයද; එවං, ඒ ශ්‍රාවකවිෂයාතීත භාවයෙහි; නිදස්සිතං, නිදශිතයි (කීහුම්හු "ආගමෙහි ත්වං සාරිපුත්ත තථාගතොව තත්ථ කාලං ජානිස්සති" යි—සමූවච්චාර්‍ය්‍යාවශබ්දයෙන් "අපඤ්ඤත්තං නපඤ්ඤපෙම පඤ්ඤත්තං න සමුච්ඡින්දාම යථාපඤ්ඤත්තෙසු සික්ඛාපදෙසු සමාදාය වත්තාම" යනාදීන්ගේ සංග්‍රහය දතයුතු.) තස්මා, එහෙයින්; යථාපඤ්ඤත්තං සික්ඛාපදං, පණවනලද සියලු ශික්ෂාපදය; අනවසෙසං, නිරවශෙෂකොට; සද්ධාය සමාදියිත්වා, බුදුන් කෙරෙහි ධර්මයෙහිද ශ්‍රද්ධාවෙන් සමාදන්ව; ජීවිතම්පි, ජීවිතයෙහිද (අපි ශබ්දය සම්භාවනාර්ථයෙහිය "පගෙව ජීවිත පරික්ඛාරෙ" යි කීයෙන් ) අපෙක්ඛං අනපෙක්ඛන්, අපෙක්ෂා නොකරන්නාහු විසින්; සාධුකං, මනාකොට; සම්පාදෙතබ්බං, සැපයියයුතු; එතං, මේ; වුත්තම්පිච, කීයනලදමැයි.—

කිකීව අණ්ඩං, තමා දිවි පියාද බිජුවට රක්නා කිරළක් යම්සේද; චමරීව වාලධිං, දිවිපියා කණ්වගාගුල්මාදියෙහි ලග්නවූ නාමා වාලධිය රක්නා චමරීමෘගී යම්සේද; පියං එකකං පුත්තංව"යි යොදනු; ප්‍රියවූ එකපුත්‍රකු රක්නා කෙලඹියක් යම්සේද; තායතංච එකකං, එකැස් පුරුෂයෙක් තමා ඇස යම්සේද; තථෙව, එසේම; සීලං අනුරක්ඛමානකා, ශීලය රක්ෂාකරන්නාවූ; සදා, හැමකල්හි (නොමඩාම සර්වකාලයි) සගාරවා, බුද්ධාදීන් කෙරෙහි ගෞරව ඇතිව; සුපෙසලා හොථ, මනාකොට ප්‍රියශීලීව; අපරම්පි වුත්තං, අනිකක්හුද කීයනලදී; එවමෙවඛො, (යම්සේ මහාසාගරය වෙලාව නොඉක්මේද) එපරිද්දෙන්ම; මහාරාජ, මහරජ; මම, මාගේ; සාවකානං, සව්වකාට; යං සික්ඛාපදං පඤ්ඤත්තං, යම් සිකාපදයක් පණවනලදද; තං, ඒ; මම සාවකා, මාගේ සව්වෝ; ජීවිතහෙතු'පි, ජීවිතය හෙතුකොටද; නාතික්කමන්ති, නොයික්මෙති; ඉමසම්සඳව පනත්ථෙ, මේ අර්ථයෙහි (ජීවිත හෙතුවෙහුදු සිකපද නොයික්මවීමෙහිය යනු අර්ථයි) අටවියං, අරණ්‍යයෙහි; චොරෙහි, සොරුන් විසින්; බද්ධානං, බඳනාලද; ථෙරානං, තෙරවරුන්ගේ; වත්ථූනි, වස්තූහු; වෙදිතබ්බානි, දතයුත්තාහුයි; මහාවත්තනි අටවියං, මහා අටවියෙහි (හිමවත් සමීපයෙහි අටවියෙක යෙන්ම) ථෙරං, එක් තෙර කෙනෙකුන්; චොරා, සොරහු; කාලවල්ලීහි, කළුවැලින්; බන්ධිත්වා නිපජ්ජාපෙසුං (ගොසින් කිසිවක් හට නොකියපයි) බැඳ හෙවූහු; ථෙරො, තෙරහු; යථා නිපන්නොව, ඕන්වනම හෙව; සත්තදිවසානි, සත් දවසක්; විපස්සනං වඩ්ඪෙත්වා, විදශීනා වඩා; අනාගාමිඵලං පාපුණිත්වා, අනාගාමි ඵලයට පැමිණ; තත්ථෙව, එතැන්හිම; කාලං කත්වා, කාලක්‍රියාකොට; බ්‍රහ්මලොකෙ නිබ්බත්ති, බඹලොව නිපන්හු.—

අපරම්පි ථෙරං, අනික් තෙර කෙණෙකුදු; තම්බපණ්ණිදීපෙ, මේ හෙළදිවදී; පූතිලතාය, කිඳිවැලකින්; බන්ධිත්වා නිපජ්ජාපෙසුං, බැඳ හෙවූහු; සො, ඒ තෙරනු; දවඩාහෙ ආගච්ඡ

නො, ලැව්ගිනි එන කල්හි; වල්ලං අවජ්ජිත්වාව (ආපත්තියෙකින් හයින්) වැල නොසිඳම; විපස්සනං පට්ඨපෙත්වා, විදර්ශනාව ආරම්භකොට; සමසීසී හුත්වා පරිනිබ්බායි, ජීවිත සමසීසීව පිරිනිවියේ (යමක් හට කෙලෙසුන්ට ඉස්වූ අවිද්‍යාව මාර්ග පටිපාටියෙන් ගොස් රහත් මග තෙමේ ක්ෂය කෙරේද ඉක්බිති එකුන් විසිවන ප්‍රත්‍යවෙක්ෂා ඥානයෙහි පිහිටා භවාංගාවතරණයවූකල ප්‍රවෘත්තියට ඉස්වූ ජීවිතෙන්ද්‍රියයා චුති චිත්තය තෙමේ ක්ෂය කෙරේද මෙතෙම මේ වාර සමත්වයෙන් ජීවිත සමසීසී නමැයි කියනු ලැබේ) දීඝභාණක අභයත්ථෙරො, දීඝභාණක නම් අභය මහතෙරනු; පඤ්චහි භික්ඛුසතෙහි සද්ධිං, පන්සියයක් භික්ෂූන් හා සමග, ගච්ඡන්තො, යන්නාහු; දිස්වා, දැක; ථෙරස්ස සරීරං ඣාපෙත්වා, සප්විරයන්ගේ ශරීරය දවා; චෙතියං කාරාපෙසි, චෛත්‍යයක් කැරවූ; තස්මා, එහෙයින්; අඤ්ඤෙපි සද්ධා කුලපුත්තා, අනික් සැදැහැසපන් කුලපුත්‍රකුද; පාතිමොක්ඛං, ප්‍රාතිමොක්ෂ සංවර ශීලය; විසොධෙන්තා, පිරිසිදුකරන්නේ; ජීවිතං පජෙය, තමාගේ ජීවිතය හළයේ වී නමි; අපෙපපව, යැගෙක; ලොකනාථෙන, ලොකනාථයා විසින්; පඤ්ඤත්තං, පණවනලද; සීලසංවරං, සංවර ශීලය; නභින්දෙ, නොබිඳින්නේයි (නොසීක් මෙන්නේයි)

( භා * )

මෙහි චවනාජ්ජී වනාහි යම් හෙයකින් ඒ චීවරාදිය නිසා ඒ පරිභොගකරන්නාවූ සත්වයෝ ජීවත්වන්නාහු වෙද්ද. එසේහෙයින් ඒ චීවරාදීහු ප්‍රත්‍යයෝයයි කියනු ලැබෙත්. ඒ ප්‍රත්‍යයන් ඇසුරුකරණලද ශීලය ප්‍රත්‍යය සන්නිශ්‍රිත ශීල නම්වෙයි. මෙසේ සතර වැදෑරුම්වූ ශීලයෙහි ප්‍රාතිමොක්ෂ සංවර ශීලය සැදැහැයෙන් සැපවිය යුත්තේය ඒ එසේමැයි. ශික්ෂාපද පැණවීම ශ්‍රාවක විෂය ඉක්මවා සිටිබැවින් ප්‍රාතිමොක්ෂ සංවර ශීලය බුදුන් කෙරෙහිද ධර්මය කෙරෙහිද ශ්‍රද්ධාව කරණකොටගෙණ සැදිය යුත්තේයි. මේ ශික්ෂාපද පැණවීම ශ්‍රාවක විෂය ඉක්මවා සිටි බවට සැරියුත් මහතෙරුන් විසින් ශික්ෂාපද පැණවීම පිණිස කළ යාච්ඤා ප්‍රතික්ෂේපය නිදසුන් වෙයි.

එහෙයින් සර්වඥයන්වහන්සේ විසින් පණවනලද තාක් ශික්ෂාපද ඉතුරු නොකොට සැදැහැයෙන් සමාදන්ව ජීවිතයෙහිද ජීවත්වීමට සුදුසු උපකරණයෙහිද ආසාවෙන් තොරවූවාහු විසින් මනාකොට සීලය සැපවිය යුත්තේයි. මේ වදාරණ ලදුයේ මැයි. තමාගේ ජීවිතාලය අත්හැර බිජුවට රක්නා කිරලක් මෙන්ද කවුලැහැප් ආදියෙහි පැටළුනාවූ තමාගේ වල්ගය ජීවිතාලය හැරපියා රක්නා සෙමර මුවැත්තියක් මෙන්ද ප්‍රියවූ එකම පුත්‍රයා රක්නා කෙළඹියක් මෙන්ද එක ඇසක් ඇති පුරුෂයෙක් රක්නාවූ එක ඇස මෙන්ද සතරසංවරශීලය රක්නාවූ මහණ තෙමේ තවක වයසය මධ්‍යම වයසය ස්ථවිර වයසය යන සැම කල්හි ම බුද්ධාදීන් කෙරෙහි ගෞරව ඇතිව මනාකොට ප්‍රියශීලීව වාසය කරව යනාජ්ජයි. අනිකෙකුදු කියන ලදුයේ මැයි. මහරජ යම්සේ මහාසාගරය වෙරල නොඉක්මවාද එපරිද්දෙන්ම මා විසින් ශ්‍රාවක සඞ්ඝයාට යම් ශික්ෂාපද කොණෙක් පණවනලද්ද ඒ ශික්ෂාපදයෝ මාගේ ශ්‍රාවකයෝ ජීවිත විනාශයට හේතුවක් ඇති කල්හිද නොඉක්මවන්ය යනුයි මේ ජීවිත විනාශ කාරණයක් පැමිණි කල්හිදු ශික්ෂාපද නොඉක්මවීමෙහි නිදසුන් වශයෙන් අරණ්‍යයෙහි සොරුන් විසින්

බැඳපියනලද තෙරුන්ගේ කථා
වස්තුව දතයුත්තාහුය. ඒ කෙසේදය
ත්? දඹදිව හිමාලයවනයට නුදුරුවූ
විඣ්‍යාටවී නම් මහා අරණ්‍යයෙහි මහණ
දම් පිරූ එක්තරා ස්ථවිර කෙනෙක්
සොරුන් විසින් කලවැලින් බැඳ එප
වත් මිනිස් පියසප ගොස් කිසිවෙක්
හට නොකියවයි කියා වැදහොවා පූ
හ. තෙරුන්වහන්සේද භූතගාමපා
තව්‍යතාපත්තියට භයින් ප්‍රාණවත්වූ
වැලනොකඩාම වැදහොත්සැටිම හි
ද සත්දවසක්මුලුල්ලෙහි විදසුන්වඩා
අනාගාමිඵලයට පැමිණ එහිම කලුරි
යකොට බඹලොව උපන්නාහ තවද
මෙම සිංහල ද්වීපයෙහිම අනික් තෙ
රකෙනෙකුන් යට කී නියායෙන් ම
සොරුන් විසින් රසකිඳවැලකින් බැ
ඳ වැදහොවාපූහ. ඒ තෙරුන්වහන්
සේද වනයෙහි ස්වභාවයෙන් හටග
ණ්ණා ලැව්ගින්නක් නැගී එනකල
ද ප්‍රාණවත්වූ රසකිඳවැල සිඳ දැමුයේ
වී නම් භූතගාම පාතව්‍යතාපත්තියට
පැමිණෙන්නෙම්වේදැයි යන භයින්
වැලනොසිඳම භාවනාකොට විදසුන්
වඩා ජීවිතසමශීෂීව හෙවත් කෙලෙ
සුන්ට හිසක් බඳුවූ අවිද්‍යාව මාර්ගපටි
පාටියෙන් ගොස් අග්‍රමාර්ගයෙන්
ක්‍ෂයකල ඉක්බිති එකුන්විසිවන ප්‍ර
ත්‍යවේක්‍ෂාඥානයෙහි පිහිටා භවාඞ්ග
පාතවූකල ආත්මයාගේ පැවැත්මට
හිසක් බඳුවූ ජීවිතෙන්ද්‍රිය චුතිචිත්ත
ය විසින් ක්‍ෂයකරණලැබ පිරිනිවන්
පෑවෝය. නොහොත් කෙලශශීර්ෂවූ
මෝහයමත් ආත්මශීර්ෂවූ ජීවිතයත්
එකවරම නිරුද්ධවූවාහුය ඉක්බිති දීඝ
භාණක අභය නම් මහතෙරුන්ව
හන්සේ පිරිවර පන්සියයක් භික්‍ෂූන්
සමග මාර්ගයෙහි එඩෙත් තෙරුන්
වහන්සේගේ මෘතශරිරය දැක එහි
නැවති ආදහනකෘත්‍යය කරවා අස්ථි
ධාතූගෙණ දාගැබක් කරවා වැඩියාහ
එසේහෙයින් අනුකූල මෙබඳු ශ්‍රද්ධාස
මපන්නකුලපුත්‍රයෙක් ඇත්තේවී නම්
ගේශතමේ ප්‍රාතිමොක්‍ෂ සංවරශීලය
පිරිසිදුකරමින් තමාගේ ජීවිතයහළේ
ව්නම් ඒ යහපත ලෝකස්වාමිවූභාග්‍ය
වතුන්වහන්සේ විසින් පණවාවදාරණ
ලද සංවරශීලය නොබිඳිය යුත්තේය
හෙවත් ජීවිතහානියක්වූවත් ශීලය
නොබිඳිය යුත්තේය යනුභාවයි. ~

(පා †)

යථාච පාතිමොක්ඛසංවරො සද්ධාය
එවං සතියා ඉන්ද්‍රියසංවරො සම්පාදෙ
තබ්බො සතිසාධනො හි සො සති
යා අධිට්ඨිතානං ඉන්ද්‍රියානං අභිජ්ඣාදී
හි අනන්වාස්සවනීයතො තස්මා වරං
භික්ඛවෙ තත්තාය අයොසලාකාය
ආදිත්තාය සම්පජ්ජලිතාය සජොති
භූතාය චක්ඛුන්ද්‍රියං සම්පලිමට්ඨං න
ත්වෙව චක්ඛුවිඤ්ඤෙය්‍යෙසු රූපෙසු
අනුව්‍යඤ්ජනසො නිමිත්තග්ගාහො
ති ආදිනා නයෙන ආදිත්තපරියායං
සමනුස්සරිත්වා රූපාදිසු විසයෙසු චක්ඛු
වාරාදිප්පවත්තස්ස විඤ්ඤාණස්ස අභි
ජ්ඣාදීහි අන්වාස්සවනීයං නිමිත්තා
දිග්ගාහං අසම්මුට්ඨාය සතියා නිසෙ
ධෙන්තෙන එස සාධුකං සම්පාදෙ
තබ්බො ~ එවං අසම්පාදිතෙ හි එ
තස්මිං පාතිමොක්ඛසීලම්පි අනවට්ඨි
තං හොති අචිරට්ඨිතිකං අසංවිහිතසා
ඛාපරිවාරමිව සස්සං හරන්ති නං
කිලෙසචොරා විවටද්වාරො විය ගා
මො පරස්සහාරීහි විත්තඤ්චස්ස රා
ගො සමතිවිජ්ඣති දුච්ඡන්නමගාරං
වුට්ඨිවිය ~ වුත්තම්පි හෙතං ~

රූපෙසු සද්දෙසු අථො රසෙසු
ගන්ධෙසු ඵස්සෙසු ච රක්ඛ ඉන්ද්‍රියං
එතෙ හි ද්වාරා විවටා අරක්ඛිතා
හනන්ති ගාමංව පරස්ස හාරිනො ~

(ශ †)

ගත්වා, යම්සේ; පාතිමොක්ඛසංවරං, ප්‍රාතිමෝක්ෂසංවරය; සද්ධාය, ශ්‍රද්ධාවෙන් (සැපවියයුතුද) එවං, එපරිද්දෙන්; සතියා, සමෘතියෙන්; ඉන්ද්‍රියසංවරො, ඉන්ද්‍රියසංවරය; සම්පාදෙතබ්බො, සැපයියයුතු; සො, ඒ ඉන්ද්‍රියසංවරය; සතිසාධනො හි, සමෘතිසාධනකොට ඇත්තේයි; සතියා අධිට්ඨිතානං ඉන්ද්‍රියානං, පළමුකොට එළවනලද සමෘතිය විසින් ආරක්ෂාවශයෙන් අධිෂ්ඨිතවූ ඉන්ද්‍රියයන්ගේ; අභිජ්ඣාදීහි, අභිධ්‍යාදි පාපධර්මයන් විසින්; අනන්වාස්සවනීයතො, අනුනොවියයුතු හෙයින් (අනුබන්ධනාය නොකටයුතුබැවින්) තස්මා, එහෙයින්; තත්තාය, හුණුවූ; ආදිත්තාය, ආදීපයෙහි පටන් හැමතැනම ඇවිළිගිනිඇති; සම්පජ්ජලිතාය, හාත්පසින් දිලියෙන; සජොතිභූතාය, එකජ්වාලාවූ; අයොසලාකාය, යලහාවෙන්; චක්ඛුන්ද්‍රියං, චක්ෂුරින්ද්‍රියතෙම; සම්පලිමට්ඨං, පිරිමදිනාලද්දේ; වරං, උතුම්ය; චක්ඛුවිඤ්ඤෙය්‍යෙසු, ඇසින් දක්කයුතුදවූ; රූපෙසු, රූඅරමුණන් කෙරෙහි; අනුබ්‍යඤ්ජනසො නිමිත්තග්ගාහො, කෙලෙසුන් පහළවනසේ සුභාදි නිමිත්තග්‍රහණය (නොහොත් හස්තපාදදී අනුබ්‍යඤ්ජනවශයෙන් ස්ත්‍රී පුරුෂාදීන් කෙරෙහි සුභාදි නිමිත්තග්‍රහණය) නාමෙච්ච වරතාහි, නොම උතුම්යන, ආදිත්තානයෙන, මේ ආදී නයින් දෙසිතවූ; ආදිත්තපරියායං, ආදිත්තපරියායසූත්‍රය; සමනුස්සරිත්වා, සිහිකොට; රූපාදීසු විසයෙසු, රූපශබ්දාදී විෂයෙහි; චක්ඛුද්වාරාදිප්පවත්තස්ස, චක්ෂුර්ද්වාරාදීන් කෙරෙහි ප්‍රවෘත්තවූ; විඤ්ඤාණස්ස, ජවන විඥානයාගේ; අභිජ්ඣාදීහි, අභිධ්‍යාදී පාපධර්මයන් විසින්; අන්වාස්සවනීයං, අනුවියයුතුවූ; නිමිත්තග්ගාහං, නිමිත්තානුබ්‍යඤ්ජනග්‍රහණය; නිසෙධෙන්තෙන, වළක්වනු විසින්; අපමුට්ඨාය සතියා, අනෂ්ටස්මෘතියෙන්; එසො, මේ ඉන්ද්‍රියසංවරයතෙමේ; සාධුකං, මනාකොට; සම්පාදෙතබ්බො, සැපයියයුත්තේයි; එවං, මෙසේ; එතස්මිං, මේ ඉන්ද්‍රියසංවරශීලය; අසම්පාදිතෙ, නොසපයනලද් කල්හි; පාතිමොක්ඛසීලම්පි, ප්‍රාතිමෝක්ෂසංවරශීලයද; අනද්ධනියං හොති, අධ්වසහ නොවේ; අචිරට්ඨිතිකං, චිරස්ථිතිකනොවේ (බොහෝ දවසක් නොසිටී කුමක් මෙහදයන්) අසංවිහිතසාඛාපරිවාරං, නොකරණලද වැටැති; සස්සං ඉව, ගොයමක් මෙනි; අයං, මේ ප්‍රාතිමෝක්ෂසංවරතෙමේ; කිලෙසචොරෙහි; කෙලෙස් සොරුන් විසින්; හඤ්ඤතෙව, පහරණුලැබෙයි (කුමක් මෙනයත්?) විවටද්වාරො විය ගාමො පරස්සහාරීහි, විවෘතවූ දොර ඇති ගමක් සොරුන් විසින් මෙනි; අස්ස, මෙ භික්ෂුගේ; චිත්තං, චිත්තය ද; රාගො; රාගයතෙමේ; සමතිජ්ඣති, හාත්පසින් විදී; දුච්ඡන්නාගාරං, නොපුරුකොට සෙවූ ගෙයක්; වුට්ඨිවිය, වැස්සක් මෙන්. එතං, මේ; වුත්තම්පිහි, කීයේමැනෝ-රූපෙසු, රූපයෙහුවෙත්ද (නිමිත්තාපේක්ෂායෙහි සප්තම්යි) සද්දෙසු, ශබ්දයෙහුවෙන් ද; අථෝ, නැවත; රසෙසු, රසයෙහුවෙන්ද; ගන්ධෙසු, ගන්ධයෙහුවෙන් ද ඵස්සෙසු ච, ස්පර්ශයෙහුවෙන් ද; (උප්පජ්ජනක කිලෙසෙසු යනු යෙෂයි—උපදනා කෙලෙසුන්කෙරෙහ්) රක්ඛ ඉන්ද්‍රියං, චක්ෂුරාද ඉන්ද්‍රියයන් රක්ෂාකර; එතෙ ද්වාරා, මේ ද්වාරයෝ (චක්ෂුරාදී ද්වාරයෙහි ප්‍රවෘත්තකෙලශයෝ යුතුවූ කාරණාපචාරයෙන් වනාහි ද්වාරයෙහි ප්‍රවෘත්තකෙලශයෝ ද්වාරශබ්දයෙන් ගෘහිතයෝයි) අසංවුතා, ගුප්ති

කවුළුවෙන් නොපියනලද්දහු; අරක්ෂිතා, එහෙයින් ම අරක්ෂිතවූවාහු; ගෘහං පරසන්තාරිකා ඉව, ගෙයක් පහරණ සොරුන් මෙන්; සතානි, හසත් (අපිහිතද්වාරයෙන් යුත් පුහුලානාසති යුතැති නොනොත් ඒ කෙලෙසුන්ට අරමුණුවූ මේ රූපාදීහු) විවෘත, විවෘතවූ, අරක්ෂිතා, අරක්ෂිතවූ; චාරා, චක්ෂුරාදිද්වාරයන් සොහුකොටගෙණ; හයානි, විවෘතද්වාරයෙන් සමන්විතයා (එනම් ද්වාර යනු ගෙහිජීවයෙහි පවම් යි — මේ පක්ෂයෙහි දුකෙලෙසුන් කලම්නා භාෂාය රූපාදීන් කෙරෙහි එළවා කිබැවින් කාරණෝපචාරමැයි)

( හා † )

යමෙක් සැදැහැයෙන් ප්‍රාතිමෝක්ෂ සංවරශීලය සැපයිය යුත්තේද එපරිද්දෙන්ම සිහියෙන් ඉන්ද්‍රියසංවරශීලය සැපයියයුතුවෙයි ඒ එසේමැයි ඉන්ද්‍රියසංවරශීලය සිහියෙන්ම සෑදිය යුත්තේය කුමක්හෙයින්දයත්? පළමුකොට ඒ ඒ ඉදුරන් ආරක්ෂාකිරීම පිණිස ඒ ඒ ඉන්ද්‍රියෙහි නවතා සිටුවන ලද ආරක්ෂාභාවයක් බඳුවූ සිහියෙන් ආරක්ෂාකරණලද චක්ෂුරාදි ඉන්ද්‍රියයන් ගේ පසුපස්සෙහි විෂමලොභාදිපාප ධර්මයෝ ලුහුබැඳ නොයනහෙයිනි එසේහෙයින් හුනුවූ භාත්පසින් ගිනි ගෙණ දිලියෙන එකම ගිනිදලින් යුක්තවූ අයොමය නාරාසනයකින් ඇස පිරිසිඳිනා ලද්දේවී නම් ඒ උතුම වන්නේය ඇසින් දක්කයුතුවූ රූපාලම්බනයන් කෙරෙහි කෙලෙසුන් ගේ ඉපදීමට සුදුසු ආකාරයෙන් අත් පා ආදිවූ අනුව්‍යඤ්ජන වශයෙන් ස්ත්‍රීපුරුෂාදීන් කෙරෙහි සුභාදි නිමිත්ත ග්‍රහණය උතුම් නොවන්නේය යනාදී ක්‍රමයෙන් දෙශනාකර වදාරණලද්දාවූ ආදිත්තපරියායසූත්‍රදෙශනාව සිහිකොට රූපාදී අරමුණු සැපයෙහි චක්ෂුරාදි ද්වාරයන් දශයෙන් පැවැසනාවූ ප්‍රතිපිහිතයාගේ විෂම ලොභාදි පාපධර්මයන් විසින් ලුහුබැඳියයුතුවූ නිමිත්තානුබ්‍යඤ්ජනග්‍රහණ වලක්වන්නාවූ විෂය මූලානාවූ සිහියෙන් මේ ඉන්ද්‍රිය සංවරශීලය මනාකොට සැපයිය යුත්තේයි. මේ ඉන්ද්‍රිය සංවරශීලය වනාහි මෙසේ සකසාකොට නොසපයනලදකල ප්‍රාතිමෝක්ෂ සංවරශීලයද කල් නොපැවැතියහැක්කේයි, කුමක්මෙන්ද යත්? ඉතාමෙන් නොනිඳිනාලද වැට ඇති ගෙයක යවකේ කෙත සිව්පාවුන් විසින් විනාශකරණුලැබීද හැර දමනලද දොර ඇති ගෙයක මසේ සොරුන් විසින් පැහැරගණුලැබේද එපරිද්දෙන්ම ඉන්ද්‍රිය සංවර නැමැති දොර නොවසනලද කල්හි මේ ප්‍රාතිමෝක්ෂසංවරශීල නැමැති ධනය රාගද්වේෂ මෝහාදි කෙලෙස් නැමැති සොරුන් විසින් පැහැරගණු ලබන්නේය එසේම මොහුගේ සිතද නපුරුකොට සෙවිලිකරණලද ගෙයක් භාත්පසින් තෙමනනාවූ වර්ෂාවක් මෙන් රාග නැමැති වැස්සෙන් තෙමන්නේයි. කියනලදුයේයැයි. රූප ශබ්ද ගන්ධ රස ස්පර්ශ යන පඤ්චකාම සම්පත්තීන් කාරණකොටගෙණ උපදනා රාගනැමැති කෙලෙසයන්ගෙන් චක්ෂුඃශ්‍රොත්‍රඝ්‍රාණ ජිහ්වා කායසඞ්ඛ්‍යාත පඤ්චද්වාරයන් රක්ෂාකරව මේ චක්ෂුරාදිද්වාරයන් සිත් නැමැති කවුළුවෙන් නොවසනලද නොරක්නාලද පුද්ගලයා ගෙයක් පසරිණු සොරුන් මෙන් කෙලෙසුන් විසින් විනාශකරණු ලබන්නේයි.

( පා ‡ )

යථාගාරං දුච්ඡන්නං
වුට්ඨි සමතිවිජ්ඣති
එවං අභාවිතං චිත්තං
රාගො සමතිවිජ්ඣති

සම්පාදිතෙ පන තස්මිං පාතිමොක්ඛසංවරසීලම්පි අද්ධනියං හොති චිරට්ඨිතිකං සුසංවිහිතසාඛාපරිවාරමිව සස්සං න ගය්හතෙව යං කිලෙසචොරෙහි සුසංවුතවාරො විය ගාමො පරස්සහාරීහි න චස්ස චිත්තං රාගො සමතිවිජ්ඣති සුච්ඡන්නමගාරං වුට්ඨි විය. වුත්තම්පි හෙතං.

රූපෙසු සද්දෙසු අථො රසෙසු
ගන්ධෙසු ඵස්සෙසු ච රක්ඛ ඉන්ද්‍රියං
එතෙ හි ද්වාරා පිහිතා සුසංවුතා
න හන්ති ගාමංව පරස්සහාරිනො.

යථාගාරං සුච්ඡන්නං
වුට්ඨී න සමතිවිජ්ඣති
එවං සුභාවිතං චිත්තං
රාගො න සමතිවිජ්ඣතීති.

අයම්පන උක්කණ්ඨදෙසනා චිත්තං නාමෙතං ලහුපරිවත්ති තස්මා උප්පන්නං රාගං අසුභමනසිකාරෙන විනොදෙත්වා ඉන්ද්‍රියසංවරො සම්පාදෙතබ්බො. අධුනා පබ්බජිතෙන වගීසත්ථෙරෙන විය. ථෙරස්ස කිර අධුනා පබ්බජිතස්ස පිණ්ඩාය චරතො එකං ඉත්ථිං දිස්වා රාගො උප්පජ්ජි. තතො ආනන්දත්ථෙරං ආහ.

කාමරාගෙන ඩය්හාමි
චිත්තං මෙ පරිඩය්හති
සාධු නිබ්බාපනං බ්‍රූහි
අනුකම්පාය ගොතමා ති.

ථෙරො ආහ.

සඤ්ඤාය විපරියෙසා
චිත්තං තෙ පරිඩය්හති
නිමිත්තං පරිවජ්ජෙහි
සුභං රාගූපසංහිතං.
අසුභාය චිත්තං භාවෙහි
එකග්ගං සුසමාහිතං
සඞ්ඛාරෙ පරතො පස්ස
දුක්ඛතො නො ච අත්තතො
නිබ්බාපෙහි මහාරාගං
මා ඩය්හිත්ථො පුනප්පුනන්ති.

ථෙරො රාගං විනොදෙත්වා පිණ්ඩාය චරි.

---

( ස ‡ )

යථා, යම්සේ; ද්‍රුච්ඡන්නං, මනාකොට නොසොයන ලද; අගාරං, ගෙය; වුට්ඨී, වැසිවිය; සමතිවිජ්ඣති (සං අතිවිජ්ඣති) හැමසැයින් විදීද (හැමපරිද්දෙන් නොමාද යන අර්ථයි) එවං, එපරිද්දෙන්ම, අභාවිතං චිත්තං, ලොකොත්තරභාවනාරහිත චිත්තය; රාගො, රාගය; සමතිවිජ්ඣති, මනාකොටම විදී; එතස්මිං, මේ ඉන්ද්‍රියසංවරශීලය; සම්පාදිතෙ, සපයුකල්හි; පාතිමොක්ඛසීලම්පි, ප්‍රාතිමොක්ෂශීලයද; අද්ධනියං හොති, අද්ධවක්ෂමෙවි; චිරට්ඨිතිකං හොති, චිරස්ථිතික වේ (බොහෝකලක් පවතී) සුසංවිහිත, මනාකොට කරණලද; සාඛාපරිවාරං, වැටඇති; සස්සං ඉව, ගොයක්මෙනි; කිලෙසචොරෙහි, කෙලෙස්සොරුන් විසින්; අයං, මේ ප්‍රාතිමොක්ෂසංවරශීලය; නගය්හතෙ ච; නොපැහැරණලැබීමැයි; පරස්සහාරීහි, සොරුන් විසින්; සුසංවුතවාරො විය ගාමො, පියනලද දොරඇති ගමක් මෙනි; අස්ස, මොහුගේ; චිත්තං, චිත්තය; රාගො, රාගයතෙම; න සමතිවිජ්ඣති, හැමසැයින්ම නොවිදුනේයි, සුච්ඡන්නමගාරං, මනාකොට සොයනලද ගෙයක්; වුට්ඨි විය, වැස්සක්මෙනි; එතං, මේ; වුත්තම්පිච, කියනලදමැයි (රූපෙසු යනාදී දෙගයෙහි අර්ථ කීනයට ප්‍රතිපක්ෂනයින් ගතයුතු) අයම්පන, සම්භාරයෙන් කෙලශයන්ගෙන් මේ අනුත්පාදය; අති උක්කණ්ඨදෙසනා, ඉතා උත්කණ්ඨදෙසනාය; චිත්තං නාමෙතං, මේ සිත නම්; ලහුපරිවත්ති, ලඝුපරිවෘත්ති ඇත්තේයි; තස්මා, එහෙයින්; උප්පන්නං රාගං, උපන්රාගය; අසුභමනසි

සාරෙන, අසුභ මනස්කාර වශයෙන්; විනොදෙත්වා, දුරු කොට; ඉන්ද්‍රිය සංවරෙන, ඉන්ද්‍රිය සංවරය; සමපාදෙතබ්බා, සැපයියයුතු; අචිරා පබ්බජිතෙයානා, අළුත මහණවූ; වඞ්ගීසත්ථෙරෙනවිය, වඞ්ගීස තෙරුන්මෙනි; අචිරා පබ්බජිතස්ස, අලුත මහණවූ; පිණ්ඩාය චරතො, පිඬු පිණිස හැසිරෙන්නාවූ; ථෙරස්ස, තෙරුන්ට; එකං ඉත්ථිං දිස්වා, එක් මාගමක් දැක; රාගො උප්පජ්ජි, රාගය උපනි; තතො, ඉන්බිත්තෙන්; ආනන්දත්ථෙරං, ආනන්ද ස්ථවිරයන්ට; ආහ, මෙසේ කී; කාමරාගෙන, කාම රාග සංඛ්‍යාත ගිනියෙන්; ඩය්හාමි, දැවෙමි; මෙ, මාගේ; චිත්තං, චිත්තය තෙමේ; පරිඩය්හති, හාත්පසින් දවනු ලැබෙයි; සාධු, ආරාධනා කෙරෙමි; ගොතම, ගෞතමය; අනුකම්පාය, අනුකම්පා පිණිස (ඒ රාගාග්නි) නිබ්බාපනං, නිවීපනයට උපායක්; බ්‍රෑහි, කියා; ථෙරො, අනඳමහතෙරහු; ආහ, මෙසේ කීහු; සඤ්ඤාය විපරියෙසා, අශුභයෙහි ශුභයයි ප්‍රවෘත්ත සංඥාවිපර්‍යාසය හේතුවෙන්; තෙ චිත්තං, තාගේ සිත; පරිඩය්හති, දැයි; රාගූප සංහිතං, රාගොත්පත්තියට හේතුවූ; සුභනිමිත්තං, ශුභ නිමිත්තය; පරිවජ්ජෙහි, දුරුකර (මෙතෙක් නොකර) අසුභාය, අශුභ භාවනාවෙහි (අසුභාලම්බණයෙහිය යන අර්ථයි) එකග්ගං, වික්ෂෙපාභාවයෙන් එකාග්‍ර කොට; සුසමාහිතං, මනාකොට අර්පිත භාවයෙන් සුසමාහිත කොට; චිත්තං, තාගේ සිත; භාවෙහි, වඩ; සංඛාරෙ, සියළු සංස්කාරයන්; පරතො පස්ස, අවිධෙය හෙයින් (පර හෙයින්) බල; දුක්ඛතො (අනිත්‍ය බැවිනුදු උදයව්‍යය දෙකින් පෙළෙන බැවිනුදු) දුක් හෙයින් බල; නොව අත්තතො (අනාත්ම ස්වභාව හෙයින්ද ආත්ම විරහිත හෙයින්ද] අනාත්ම හෙයින බල; මහාරාගං, තුන් ලොව මැඩපවත්නා හෙයින් මහාවේග ඇති බැවින් මහාරාගය; නිබ්බාපෙහි, මග පිළිවෙළින් ගොස් රහත් මගින් නිවාපිය; පුනප්පුනං, දත්මෙන් නැවත නැවත; මාඩය්හිත්ථො, නාහමක් දනු ලැබ; ථෙරො, වඞ්ගීස තෙරහු; රාගං විනොදෙත්වා, රාගය දුරුකොට; පිණ්ඩාය චරි, පිඬු පිණිස ගියෝ

( භා ‡ )

තවද යම්සේ මනාකොට සෙවිලි නොකරණලද ගෙය වැසි නොහමේ හාත්පසින් තෙමාද එපරිද්දෙන්ම ලොකොත්තර භාවනා නැමැති සෙවිල්ල නැතතාවූ චිත්තය රාග නැමැති වැසි නොහමේ හාත්පසින්ම තෙමෙන්නේයි මේ ඉන්ද්‍රිය සංවර ශීලය මනාකොට සැපයූ කල්හි ප්‍රාතිමොක්ෂ සංවර ශීලයද අධවක්ෂවෙයි එබඳුයෝ කල් පැවැතියයුතුවෙයි කුමක්මෙන්දයත්? යම්සේ මනාකොට බඳිනාලද වැට ඇති ගොයම ගවාදී සිව්පාවුන් විසින් විනාශ නොකළයුතුවේද යම්සේ මනාකොට දොර කවුළු වසනලද ගම සොරුන් විසින් පැහැරගතයුතු නොවේද එපරිද්දෙන්ම මේ ආත්මභාව නැමැති ගෘහයෙහි ප්‍රාතිමොක්ෂ සංවර නැමැති ධනය කෙලෙස් නැමැති සොරුන් විසින් පැහැරගණු නොලබන්නේයි. මේ යොගාවචර පුද්ගලයාගේ සිතද රාග නමේ හාත්පසින් නොවිදිනෙයි කුමක්මෙන්දයත්? මනාකොට සෙවිලිකරලද ගෙය යම්සේ වැසි නොහමේ හාත්පසින් නොවිදීද නොතෙමාද එමෙනි මේද වදුරණලදුමෙල්වැයි රූප ශබ්ද ගන්ධ රස ස්පර්ශ යන පඤ්චකාම ගුණත්තීන් කාරණකොටගෙන උපදනා රාග නැමැති කෙලෙසයන්ගෙන් චක්ෂුඃ ශ්‍රොත්‍ර ඝ්‍රාණ ජිහ්වා කාය සංඛ්‍යාත පඤ්චද්වාරයන් රක්ෂාකරව. මේ වස්තුවද්

වාරයන් සිහි නැමැති කවිළුවෙන් වසනලද රක්නාලද පුද්ගලයා මනාකොට වසනලද දොර කවුළු ඇති ගම් සොරුන් විසින් පැහැර නොගන්නාක් මෙන් කෙලෙස් නැමැති සොරුන් විසින් පැහැරගණු නොලබන්නේයි. තවද යම්සේ මනාකොට සෙවිලි කරණලද ගෙය වැසි නොතෙමේ නාත්පසින් නොතෙමාද එපරිද්දෙන්ම ලෝකොත්තර භාවනාවෙන් පුරුදුකරණලද චිත්තය රාග නොතෙමේ නාත්පසින් නොතෙමන්නේයි සර්වප්‍රකාරයෙන්ම රාගාදී කෙලෙසුන්ගේ නොඉපදීම ඉතා උත්කෘෂ්ටවූ දෙශනාවෙවෙයි. මේ සිත වනාහි වහා පෙරළෙන සුළුබැවින් යම් අරමුණෙක්හි උපන් ඇල්ම අසුභ මනසිකාරයෙන් දුරුකොට ඉන්ද්‍රිය සංවර ශීලය මනාකොට සම්පාදනය කටයුත්තේයි කෙසේ සම්පාදනය කටයුතුදයත්? අළුත පැවිදිවූ වඞ්ගීස ස්ථවිරයන්මෙන් සම්පාදනය කටයුතුයි. අලුත පැවිදිව පිඬු සිඟීම පිණිස ගියාවූ වඞ්ගීස ස්ථවිරයන්වහන්සේ එක්තරා ස්ත්‍රියක් දැක ඒ ස්ත්‍රියකෙරෙහි උන්වහන්සේගේ සිත පිළිබඳවීය ඉක්බිත්තෙන් වඞ්ගීස ස්ථවිරයන්වහන්සේ එක්ව පිඬු සිඟීමට ගිය ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්වහන්සේට මෙසේ සැලකළාහ ගෞතම ගොත්‍ර ඇත්තාවූ ආනන්ද ස්ථවිරය කාමරාග නැමැති ගින්නෙන් මා දනු ලබමි මාගේ සිත නාත්පසින්ම දවනු ලබයි එහෙයින් මට අනුකම්පා පිණිස ඒ රාග ගින්න නිවීමට සුදුසු උපායක් කියවයි ආරාධනා කෙළේය. ආනන්ද ස්ථවිරයන්වහන්සේද ගාථාවකින් මෙසේ වදාළේය. ඇවැත්නි අයහපත් අරමුණෙහි යහපතැයි පැවැති තොපගේ විපරීත සංඥාව හේතුකොටගෙණ තොපගේ සිත රාග නැමැති ගින්නෙන් දවයි එහෙයින් රාගය ඉපදීමට කාරණවූ යහපතැයි සිතා ගන්නාලද ඒ අරමුණ මෙනෙහි නොකිරීමෙන් දුරුකරව ඒ ස්ත්‍රී රූපය අශුභ වශයෙන් සලකා අශුභාරම්මණයෙහි එකගවූ සිත මනාකොට පිහිටුවා තොපගේ සිත භාවනාවෙන් වඩව සියලු සංස්කාර ධර්මයන් අනිත්‍ය වශයෙන්ද ඉපදීමෙන් හා බිඳීමෙන් පෙළෙන හෙයින් දුක් වශයෙන්ද අනාත්ම වශයෙන්ද බලව තුන් ලොවම මැඩපවත්වා සිටිනාවූ මහත්වූ තෘෂ්ණා නැමැති ගින්න සෝවාන් සකෘදාගාමී අනාගාමී අර්හත් යන සතරමග සතරඵල නැමැති ජලයෙන් පිළිවෙළින් ගොස් නිවව දූන් තොප රාගාග්නියෙන් දැවෙන්මෙන් නැවත නැවතත් නොදවයි වදාළහ.

වඞ්ගීස ස්ථවිරයන්වහන්සේද මේ අනන්දමහ තෙරුන්වහන්සේගේ ධර්මකථාව අසා රාගය දුරුකොටම පිඬු පිණිස හැසුරුණුසේක.

( පා ¶ )

අපිච ඉන්ද්‍රියසංවර පූරකෙන භික්ඛුනා කුරණ්ඩක මහාලෙණවාසී චිත්තගුත්තත්ථෙරෙන විය චොරක මහාවිහාරවාසී මහාමිත්තත්ථෙරෙන වියච භවිතබ්බං කුරණ්ඩකලෙණෙ කිර සත්තන්නං බුද්ධානං අභිනික්ඛමණ චිත්තකම්මං මනොරමං අහොසි සම්බහුලා භික්ඛු සෙනාසනචාරිකං ආහිණ්ඩන්තා චිත්තකම්මං දිස්වා මනොරමං භන්තෙ චිත්තකම්මන්ති ආහංසු ථෙරො ආහ අතිරෙක සට්ඨිවස්සා ආවුසො, වස්සානි ලෙණෙ වසන්තස්ස චිත්තකම්මං අත්ථිතිපි න ජානාමි අජ්ජදානි චක්ඛුමන්තෙ නිස්සාය ඤාතන්ති ථෙරෙන කිර එත්තකං අද්ධානං වසන්තෙන චක්ඛුං උම්මීලෙත්වා ලෙණං න උල්ලො

ඛිත පුබ්බං ලෙණද්වාරෙ චස්ස මහානා ගරුක්ඛොපි අහොසි සොපි ථෙරොඋප රිං න උල්ලොකිත පුබ්බො අනුසංව ච්ඡරං භූමියං කෙසර නිපාතං දිස්වා තස්ස පුප්ඵිත භාවං ජානාති රාජා ථෙරස්ස ගුණසම්පත්තිං සුත්වා වන්දිතු කාමො තික්ඛත්තුං පෙසෙත්වා අනාග ච්ඡන්තෙ ථෙරෙ තස්මිං ගාමෙ තරුණ පුත්තානං ඉත්ථීනං ථනෙ බන්ධාපෙත්වා ලඤ්ඡාපෙසි තාව දාරකා ථඤ්ඤං මා ලභිංසු යාව ථෙරො ආගච්ඡතීති ථෙ රො දාරකානං අනුකම්පාය මහාගාමං අගමාසි රාජා සුත්වා ගච්ඡථ භණෙ ථෙරං පවෙසෙථ සීලානි ගණ්හිස්සාමීති අන්තොපුරං අභිහරාපෙත්වා වන්දිත්වා භොජෙත්වා අජ්ජ භන්තෙ ඔකාසො නත්ථි ස්වෙව සීලානි ගණ්හිස්සාමීති ථෙර ස්ස පත්තං ගහෙත්වා ථොකං අනුග න්ත්වා දෙවියා සද්ධිං වන්දිත්වා නිවත්ති ථෙරො රාජාවා වන්දතු දෙවීවා සුඛී හොතු මහාරාජාති වදති එවං සත්ත දිවසා ගතා භික්ඛූ ආහංසු කිං භන්තෙ තුම්හෙ රඤ්ඤෙපි වන්දමානෙ දෙවියා පි වන්දමානාය සුඛීහොතු මහාරාජාති එවමෙව වදථාති ථෙරො නාහං ආවුසො රාජාතිවා දෙවීතිවා වවත්ථානං කරො මීති වත්වා සත්තාහාතික්කමෙ ථෙරස්ස ඉධවාසො දුක්ඛොති රඤ්ඤා විස්සජ්ජි තො කුරණ්ඩක මහාලෙණං ගන්ත්වා රත්තිභාගෙ චඞ්කමං අභිරුහි නාග රුක්ඛෙ අධිවත්ථා දෙවතා දණ්ඩදීපි කං ගහෙත්වා අට්ඨාසි අථස්ස කම්මට්ඨා නං අති පරිසුද්ධං පාකටං අහොසි ථෙ රො කිංනුමෙ අජ්ජ කම්මට්ඨානං අතිවිය පකාසතීති අත්තමනො මජ්ඣි මයාම සමනන්තරං සකල පබ්බතං උ න්නාදයමානො අරහත්තං පාපුණි— තස්මා අඤ්ඤොපි අත්තකාමො කුල පුත්තො—

මක්කටොව අරඤ්ඤම්හි
වනෙ භන්තමිගො විය
බාලො විය ච උත්‍රස්තො
න භවෙ ලොලලොචනො—
අධො ඛිපෙය්‍ය චක්ඛූනි
යුගමත්තදසො සියා
වනමක්කට ලොලස්ස
න චිත්තස්ස වසං වජෙ—

( සං )

දුටිව, අනිකෙකුදු; ඉන්ද්‍රිය සංවර පරි පූරකයා භික්ෂූන්, ඉන්ද්‍රිය සංවර පූරණ මහණුනු වසින්; කුරණ්ඩක මහා ලෙණවාසී, කරඬු මහලෙණ වසන; චිත්තගුත්ත ථෙර විය, චිත්තගුත් නම් තෙරුන්මෙන්; චොරක මහා විහාරවාසී, චොරකනම් මහ වෙහෙර වසන; මහාමිත්ත ථෙර විය ච, මහාමිත්ත නම් තෙරුන් මෙන්ද; භවිතබ්බං, විය යුතු; කුරණ්ඩක ලෙණෙ කිර, කරඬු ලෙණ; සත්තන්නං බුද්ධානං, විපස්සිය සිඛීය වෙස්සභූය කකුසඳය කොණාගමනය කස්සපය ගෞතමය යන සප්තබුද්ධයන්ගේ; අභිනික්ඛමණ චිත්තකම්මං, මහබිනික්මන් සිතියම; මනොහරං අහොසි, මනහර වී; සම්බහුලා භික්ඛූ, බොහෝ භික්ෂූහු; සෙනාසනචාරිකං ආහිණ්ඩන්තා, සයනාසන චාරිකාව කරන්නාහු (සෙනස් ගෙන් සෙනස්නට යමින් වසිතුරු බලා ඇවිදිනාහු) චිත්තකම්මං දිස්වා, සිතියම් දැක; භන්තෙ, වහන්ස; චිත්තකම්මං, සිතියම; මනොහරන්ති ආහංසු, මනහරයයි කීවු; ථෙරො, තෙරහු; ආහ, මෙසේ කීවු; ආවුසො, ඇවැත්නි; ලෙණෙ, මේ ලෙණ; වසන්තස්සමෙ, වසන්නාවූ මට; අතිරෙක සට්ඨිවස්සානි, සැට අවුරුද්දකට වැඩි කෙනෙ; චිත්තකම්මං අත්ථීතිපි නජානාමි, විසිතුරු සිතියම් ඇතැයිද නොදනිමි; අජ්ජ දානි, දැන් අද; චක්ඛුමන්තෙ

තෙ නිස්සාය, ඇස් ඇත්තවුන් නිසා;
ලද්ධතායි, දත්තාලද්දයි; ථෙරෙනකිර,
තෙරුන් විසින්; එත්තකං අද්ධානං ව
සන්තෙන, මෙතෙක් කල් වසනුවන්
විසින්; චක්ඛුං උම්මීලෙත්වා නාලොලො
කිත පුබ්බං, හැම තැනම යුගමාත්‍ර දර්
ශී බැවින් ඇස දල්වා උඩ නොබලන
ලද විරී; අස්ස, ඒ තෙරුන්ගේ; ලෙ
ණවාරෙ, ලෙණදෙර; මහානාගරු
ක්ඛොපි අහොසි, මහ නාරුකෙක්ද වී,
සොපි, ඒ නා රුකද; ථෙරෙන, තෙරු
න් විසින්; උද්ධං, උඩ; න උල්ලොකිත
පුබ්බං, ඇස දල්වා නොබලනලද විරී;
අනුසංවච්ඡරං, හවුරුදුපතා; භූමියං,
බිම; කෙසරනිපාතං දිස්වාව, වගුල
කෙසරු දැක ම; එතස්ස, ඒ රුක; පුප්
ඵිත භාවං, පිපුණු බව; ජානාති, දනි
න්; රාජා, මාගම වසන රජතෙම; ථෙ
රස්ස, තෙරුන්ගේ; ගුණසම්පත්තිං
සුත්වා, ගුණ සම්පත්තිය අසා; වන්දිතු
කාමො, වඳිනු කැමතිවූයේ; තික්ඛත්
තුං පෙසෙත්වා, තුන්වරෙක යවා; අ
නාගච්ඡන්තෙ ථෙරෙ, තෙරුන් නොඑ
න කල්හි; තස්මිං ගාමෙ, එම මහගමෙ;
තරුණ පුත්තානං, කිරි බොණ දරුව
න් ඇති; ඉත්ථීනං, ගැණුන්ගේ; ථනෙ
බන්ධාපෙත්වා, තනපටින් බඳවා; ලඤ්
ඡාපෙසි, රජ මුද්‍රිකාවෙන් හස් එබවී
(කුම් පිණියයන්?) යාව ථෙරො ආග
ච්ඡති, යම්තාක් තෙරනු එද්ද; තාව,
ඒතාක්; දාරකා, දරුවෝ; ථඤ්ඤං මා
ලභිංසූති, කිරි නොලබත්වායි කියායි;
ථෙරො, තෙරනු; දාරකානං අනුකම්පා
ය, දරුවන්ට අනුකම්පා පිණිස; මහා
ගාමං අගමාසි, මහගමට ගියෝය; රා
ජා, රජ තෙමේ; තං සුත්වා, තෙරුන් වැ
ඩි බව අසා; භණෙ, කොල; ගච්ඡථ,
යව; ථෙරං, තෙරුන්; පවෙසෙථ, වඩා
එව; සීලානි ගණ්හිස්සාමි, තෙරුන්
කෙරෙහි සිල් ගණිමියි; අන්තොපු

රං, රජගෙට; අභිහරාපෙත්වා, වඩා
ගෙන්වා; වන්දිත්වා, වැඳ; භොජෙත්වා,
වළඳවා; අජ්ජ, අද; භන්තෙ, වහන්
ස; ඛණො නත්ථි, අවකාශ නැත,
සෙව සීලානි ගණ්හිස්සාමීති (නැවත
දක්කැවිව) සෙට සිල්ගණිමියි; ථෙ
රස්ස, තෙරුන්ගේ; පත්තං ගහෙත්වා,
පාත්‍රය ගෙණ; ථොකං, මදක්; අනුග
න්ත්වා, පසු ගමන්කොට; දෙවියා සද්ධිං
වන්දිත්වා, දෙවින් හා සමග වැඳ; නිව
ත්තති, වළකී; ථෙරො, තෙරනු; රාජා,
වන්දතු, රජ වඳීවයි; දෙවී වන්දතු,
දෙවී වඳීවයි; මහාරාජ, මහරජ; සුඛී
හොතු, සුවපත් වේවයි; වදති, කියත්;
එවං, මෙසේ; සත්තදිවසා, සත්දවසස්
හු; ගතා, ඉක්මුණාහ; කිංකු, කිසනු;
ආහංසු (තෙරුන්ට මෙසේ) කීහු; භ
න්තෙ, වහන්ස; තුම්හෙ, තෙපි; ර
ඤ්ඤෙපි වන්දමානෙ, රජනු වඳනා ක
ල්හිද; දෙවියාපි වන්දමානාය, දෙවින්
වඳනා කල්හිද; සුඛී හොතු මහාරාජාති
ඉවෙවව, මහරජ සුවපත්වේවයිම;
කිං වදථාති, කුමක්හෙයින්ම කියාද
යි; ථෙරො, තෙරනු; ආවුසො, ඇවැත්
නි; අහං, මම; රාජාතිපි, රජයයිද;
දෙවීතිවා, දෙවියයිද; වවත්ථානං න
කරොමීති, නියම නොකරමියි; වත්වා,
කියා; සත්තාහාතික්කමෙ, සත්දවස
ක් ඉක්මුණු කල්හි; ථෙරස්ස, තෙරු
න්ට; ඉධ වාසො දුක්ඛොති, මිනි මි
හිසිම දුකැයි; රඤ්ඤා විස්සජ්ජිතො, ර
ජහු විසින් හරණලද්දේද; කුරුණ්ඩක
ලෙනමෙව ගන්ත්වා, කුරුඬු ලෙනම
ට ගොස්; රත්තිභාගෙ, රාත්‍රි භාග
යෙහි; චඞ්කමං අභිරුහි, සක්මනට
නැගී; නාගරුක්ඛෙ අධිවත්ථා, දෙව
තා, නා රුක වසන දෙවතා තොමෝ;
දණ්ඩදීපිකං ගහෙත්වා, තෙරුන්ගේ
සීලය සුපරිසුද්ධයේ දැක දඬුවැට පහ
ණක් ගෙණ; අට්ඨාසි, සිටියා; අථ, ඉ
ක්බිත්තෙන්; අස්ස, ඒ තෙරුන්ට;

කාමච්ඡන්දං, කාමච්ඡන්දය; අභිපරිපු ණ්ණං, පූර්ණ පිරිපුණුව; පාසාදං අභිරුහි, ප්‍රා සාද වී; වේරං, වෛරය; අජ්ජ, අද; මං, මට; කාමච්ඡන්දං, කාමච්ඡන්දය; අ භිවිය, අභිබවා; පකාසති, ප්‍රකා ශවෙයි; භින්නූ ඉති, බිඳුණේයි; අ නන්තරෙන, සතුටුව; මජ්ඣිමයාමස මනන්තරං, මධ්‍යමයාමයාගේ අනතුරෙහි; සකලපබ්බතං, සියලු පර්වතය; උ න්නාදයමානො, පෑවිවිනාමිපාපයෙන් නාදකරවමින් (එහි වසන දෙවිය න්ගේ සාධුකාරශබ්දයෙන්ම) අරහ ත්තං පාපුණි, රහත්ඵලයට පැමිණි යෙ; තස්මා, එහෙයින්; අත්තකාමො, තමහට වැඩකැමැති; අනෙකෙසුපි කුල පුත්තො, අනිත් කුලපුත්‍රයකුදු "ලොල ලොලවන්තො හසමෙ"යි සොයදනු) අර ඤ්ඤෙ, වල්හි; මක්කටොව, වානර යෙකුමෙන්ද; ඉතෙ, වනයෙහි හන්තමිගො විය, භ්‍රාන්තමෘගයෙක්හු මෙන්ද; බාලොවියව උත්‍රස්තො, සඳ තිවිකොගගෙන් සත්‍රාසනාවූ තරුණ දරකයකුමෙන්ද; ලොලලොලවන්තො, ලොල්වූ නෙත් ඇත්තේ; නභවෙ, නොවන්නේයි; එකබුති, තෙන්‍රයන්; අබො, යට; ඛිපෙය්‍ය, හෙලන්නේය; යුගමත්තදස්සා සියා, වියදඬු පමණ ක්ම බලන්නේයි; වනමක්කටලොල සස, වනමකුළුවෙකුමෙන් ලොල්වූ; චිත්තස්ස, චිත්තයාගේ; වසං, වසගයට, නාවජෙ, නොපැමිණෙන්නේයි;

( හා ¶ )

තවද මෙහි අනිත් කාරණයකුද ඇත්තේය ඉන්ද්‍රියසංවරශීලය පූර ණවූ මහණවිසින් කරඹුමහලෙ න්වැසි චිත්තගුත්තමහාස්ථවිරයන්ව හන්සේමෙන්ද චොරකනාම මහවෙහෙ ර වැසි මහාමිත්තනාම මහතෙරුන්ව හන්සේමෙන්ද වියයුතුය. හේ කෙ සේදයත්? මෙම ලක්දිව කරඹුමහා ලෙණ තුළ ප්‍රියස්සෙහි විපස්සිය සිඛිය වෙස්සභූය කකුසන්ධය කොණාගමනය කාශ්‍යපය ගෞතමය යන සත්බුදු වරයන් වහන්සේලා මහාභිනික්මන් කළ ආකාරයට කරණලද සිතුයම් දුටුවන් සිත් පැහැරගන්නාසේ විසිතු රුවෙයි.

එක්කාලෙක බොහෝ භික්ෂූහු තෙ රුන්වහන්සේ සොයන්නට ගොසින් විසිතුරුබලමින් ඇවිදිනාහු මේ ක රඹුමහලෙණට පැමිණ එහි තුබූ සිතුයම් කදිම්නාන දැක වහන්ස මේ සිතුයම සිත්කළුයයි කීවාහුය. මහ තෙරුන්වහන්සේ මෙසේ කීසේය. ඇවැත්නි මේ ගල්ලෙණ වසන්නාවූ මට සැට හවුරුද්දකට වැඩිකල් ඉක් මගියේය එනමුදුවුවත් මේනාක්කල් මෙබදු විසිතුරු සිතුයම් ඇතැයි යන බවකුදු නොදනුම්හ දූන් අද ඇස් ඇ ත්තාවූනොප නිසා සිතුයම් ඇතිබව ද න්නාලදුම්හයි කීසේය. මේ ගල්ලෙ ණ මෙතෙක් දීර්ඝකාලයක් වසනානාවූ තෙරුන්වහන්සේ විසින් හැමතැන ම වියදඬුපමණ දුර බලන බැලුම් ඇ තිබැවින් කිසිකලෙක ඇස දල්වා උ ඩ නොබලන ලද්දේය ඒ තෙරුන් වහන්සේගේ ගල්ලෙන්දොරකඩ ම හත්වූ නාරුකෙක්ද ඇත. ඒ නාරුක ද තෙරුන්වහන්සේ විසින් කිසිකලෙ ක උඩ නොබලන ලද්දේමය. හවුරු දුපතා මල් පිපෙන සමයෙහි බිම හෙන නාමල් රොන් සලා දැකීමෙන්ම ඒරුක මල් පිපී ගියහයි දනගන්නාහ එසමයෙහි මාගම්නුවර රජකරණ රජතෙමේ මහතෙරුන්වහන්සේගේ ශීලාදිගුණසම්පත්තිය අසා වඳිනු කැ මතිව තුන්වරක් රාජදූතයන් යවා තෙරුන්වහන්සේ නොවඩිනාකල ඒ මාගම්නුවර කිරි බොනලදරු වන් ඇතිගැහැණුන්ගේ පයොධරයන් පටියෙන් බඳවා රාජමුද්‍රිකාවෙන්

මුද්‍රණය කරවූයේය. කුමක්සඳහාදයත්? යම්තාක් මහතෙරුන්වහන්සේ නුවරට එබෙන්ද ඒතාක් කල් දරුවෝ කිරි නොලබත්වායි කීයාය. මහතෙරුන්වහන්සේ එපවත් අසා ඒ තෙරුන්වහන්සේගේ නොයාමෙන් කිරි නොලබනාවූ ළදරුවන්ට අනුකම්පාපිණිස මාගම්නුවරට වැඩියාහ. රජතෙමේ මහතෙරුන්වහන්සේ සැඩියහයි අසා රාජපුරුෂයන් බණවා යව සහය මහතෙරුන්වහන්සේ රජගෙට වැඩම්වාගෙණ එට තෙරුන්වහන්සේ සම්පයෙහිදී සිල්ගණ්ණම්හයි කියා යවා තෙරුන්වහන්සේ රජගෙට වඩා ගෙන්වා පනහපිහිටුවා වැද දන්වලදවා ඉක්බිති සවාමීන්වහන්ස අද අපට අවකාශ නැත්තේය සෙටදවස සිල් ගණ්ණම්හයි නැවතත් තෙරුන්වහන්සේ දකිණු කැමැතිව තෙරුන්වහන්සේගේ පාත්‍රය ගෙණ ඉදක් දුර පසුගමන් කොට රාජදේවිය හා සමග සිට වැද නැවැත්තාහ මහතෙරුන්වහන්සේද රජු වඳිවයි හෝ රාජදේවී වඳිමයි හෝ මහරජ සුවපත් වේවායි කියන්නේය. මෙසේ තෙරුන්වහන්සේ දවස දවස රාජප්‍රතිඥ මුදවන පිණිස රජගෙට වඩනාහු රජ්ජුද සවාමිනි සෙට සෙටයයි කියමින් සත්දවසක් ඉක්මගියාහුය. තෙරුන්වහන්සේට පශ්චාත් ශ්‍රමණව එබනාවූ සෙසුභික්ෂූනු සවාමින්වහන්ස නුඹවහන්සේ රජගෙට වැඩියවේලනි රජනු වඳිනාකල්හිද දේවිය වඳිනාකල්හිද වෙනසක් නැතුව මහරජ සුවපත්වේවායි යන මෙපමණක්ම කුමක් නිසා කියන්නේදැයි විචාළහ මහතෙරුන්වහන්සේ ඇවැත්නි මම රජ්ජුයයි කියා හෝ දේවියයි කියා හෝ නියම නොකරම් හෙවත් විශෙෂලක්ෂණ දැක නොහදුනම්හයි කීයේය. මෙසේ සත්දවසක් ඉක්මුණුකල තෙරුන්වහන්සේට මේ ඇතුල්නුවර විසීම දුක්වන්නේයයි සිතා රජ්ජුවිසින්ම පිටත්කර හරණලදුව තමන්වහන්සේ වැඩහුන් කරඹුවහලෙණටම වැඩ එදවස රාත්‍රිභාගයෙහි භාවනාකිරීමපිණිස සක්මණට නැගාහ. එබව දුටු භාරුක අධිගෘහීතවූ දේවතාදෙනාමෙක් තෙරුන්වහන්සේගේ සීලය සුපරිශුද්ධවදන දඹුවැටපහණක් ගෙණ ආලෝකකරමින් සිටියාහ ඉක්බිත්තෙන් තෙරුන් වහන්සේට කර්මස්ථානාරම්මණ සෙසුදවසටවඩා ඉතා පිරිසිදුව පහලවූයේය තෙරුන්වහන්සේ අද දවස් මට කර්මස්ථානාරම්මණ ඉතා පිරිසිදුව ප්‍රකාශවෙයි කුමක් හේදෝහෝයි සතුටුව භාවනාවෙහි යෙදී මැදුම්යම්දක්වා කොළවර සියලු පර්වතය පෑපිට කම්පාවෙන් නාදකරවමින් ඒ පඨිනවායි දෙවියන්ගේ සාධුනාදපූජා ලබමින් සෝවාන් ආදී මාර්ගපිළිවෙළින් කෙළෙස් උදුරා අර්හත්ඵලයට පැමිණියේක ඵබැවින් තමහට වැඩකැමැති අනික් කුලපුත්‍රයෙකුදු ඇත්තේවීනම් මහතෙමේද වල්ගි වසන නොයෙක්දිග බලනා වඳුරෙකු මෙන්ද වනයෙහි සිංහාදී සිව්පාවුන්ට භයින් ත්‍රාසනවූ මුවෙකු මෙන්ද මව්පියාදීන්ගෙන් වෙන්වීමෙන් භයටපත්වී ඔබ මොබ බලන ළදරුවෙකු මෙන්ද මවිලවූ නෙවත් වට බලනා ඇස් ඇත්තෙක් නොවියයුත්තේය. එහෙයින්ම නෙත්‍රයන් යට හෙළියයුත්තේය වියදඬුපමණ දුර බලයා බැලුම් ඇති වියයුත්තේය වල් වඳුරෙකුමෙන් චවලවූ චිත්තයාගේ වශයට නොයායුත්තේයි ―

( පා * )

මහාමිත්තත්ථෙරස්සාපි මාතු විසගඩරෝගො උප්පජ්ජි ධීතාපිස්සා භික්ඛු

භික්ඛු පබ්බජිතා හොති සා තං ආග ආග
ච්ඡි ආගන්ත්වා භාතු සන්තිකං ගන්ත්වා, මම
අඵාසුකාවං ආරොචෙත්වා, භෙසජ්ජං
ආහරාහි සා ගන්ත්වා ආරොචෙසි ථෙ
රො තාසං මූලභෙසජ්ජාදීනි සංහරි
ත්වා, භෙසජ්ජං පචිතුං ජානාමි අපිච
ඛො භෙසජ්ජං ආචික්ඛිස්සං අහං හි
සෙතා පබ්බජිතො න මයා ලොභසහ
ගතෙන චිත්තෙන ඉන්ද්‍රියානි භින්දිත්වා
විසභාගරූපං ඔලොකිතපුබ්බං ඉමිනා
සච්චවචනෙන මාතුයා මෙ ඵාසුහොතු
ගච්ඡ ඉදං වත්වා උපාසිකාය සරීරං
පරිමජ්ජාහි සා ගන්ත්වා ඉමමත්ථං ආ
රොචෙත්වා තථා අකාසි උපාසිකාය
තං ඛණංයෙව ගණ්ඩො ඵෙණපිණ්
ඩො විය විලීයිත්වා අන්තරධායි සා උට්ඨා
හිත්වා සචෙ සම්මාසම්බුද්ධො ධරෙය්‍ය
කාසම්මා ... මම පුත්තසදිසස්ස භික්ඛුනො
ජාලවිච්ඡෙදනත්ථ ... සීසං තාපරා
මසෙය්‍යාති අත්තමනා වාචං නිච්ඡාරෙ
සි.....තාසම්බා.....

ඛුල්ලපුත්තමාහං අඤ්ඤාසිං
පබ්බජිත්වාන සාසනෙ
මිත්තාමච්චෙ ච නිවෙසිය
චරෙ ඉන්ද්‍රියසංවරෙ.....

( ස * )

මහාමිත්තා ථෙරස්සාපි, මහාමිත්තා නම් ස්ථවිරයන්ගේද; මාතුලුපාසිකාය මවු උපාසිකාවන්වද; විසකණ්ඩරොගො, පාදි, පාලිඳෙරැගගෙඩක්වී; තස්සා, ඒ උපාසිකාවන්ගේ; ධීතාපි, දුව නියෝද; භික්ඛුනීසු, මෙහෙණින්නා න්ෂකරෙන්; පබ්බජිතා හොති, මහණ වූ; සා, ඒ උපාසිකාවගෙන්; තං, ඒ මෙ හෙණව; ආහ, මෙසෙ කිවු; අය්‍යෙ, ආර්‍ය්‍යාව; ආගච්ඡ, මෙසේ එව; භාතු සන්තිකං ගන්ත්වා, තොප බෑණන් සමීපයට ගොස්; මම අඵාසුකාවං, මා රෝගීබව; ආරොචෙත්වා, කියා; භෙසජ්ජං ආහරාහි, බෙහෙත් ගෙනෙ

වසි; සා, ඒ මෙහෙණ; ගන්ත්වා, ගොසි න්; ආරොචෙසි, බෑණන්ට කීවු; ථෙ රො, තෙරනු; අසං, මෂ; මූලභෙස ජ්ජාදීනි, මුල්බෙහෙත් ආදිය, සංහ රිත්වා, රැස්කොට; භෙසජ්ජංපචිතුං, බෙහෙත් පිසනුයේ; නජානාමි, නොහ දනිමි; අපිච, එහෙත්ද්දුවුවත්; ඛො, නි ච; භෙසජ්ජං, බෙහෙදක්; ආචික්ඛි ස්සං කියමි; අහං, මම; යතො පබ්බජිතො (තොතො පබ්බජිය සෙදනු) යම් තැනෙක පටන් පැවි දිවීම්ද එතැන්පටන්; මයා, මාවිසින්; ලොභසහගතෙන චිත්තෙන, ලොභ සහගතවූ සිතින්; ඉන්ද්‍රියානි භින්දි ත්වා, ඉන්ද්‍රියසංවරශීලය බිඳ (ඉන්ද්‍රිය සංවරශීලය බිඳහල්ලයි ඉන්ද්‍රියයෙ න් ආරක්ෂාභාවයෙන් ගිලානාවේ ලෙ ත් තොතොත් නිමිත්තානුබ්‍යඤ්ජන ග්‍රාහයව වාරවූ ඉන්ද්‍රියයෝම භින්න වෙත්) විසභාගරූපං, නොබල තලදවිරි; ඉමිනා සච්චවචනෙන, මේ සත්‍යවචනයෙන්; මෙ, මාගේ; මා තුයා, මවු උපාසිකාවන්ට; ඵාසු හො තු, ඵාසුවේවා; ගච්ඡ, යා; ඉදං වත්වා, මේ කියා; උපාසිකාය සරීරං, උපාසි කාවන් සිරුරු; පරිමජ්ජාහි, පිරිමදනිය; සා, ඒ මෙහෙණ; ගන්ත්වා, ගොස්; ඉම මත්ථං ආරොචෙත්වා, මේ පවත් කියා; තථා අකාසි, එසේම කළාය; උපාසිකා ය, උපාසිකාවන්ගේ; තං ඛණං යෙව, එකෙණෙහිම; ගණ්ඩො, ගඩ; ඵෙණපි ණ්ඩො විය, පෙණපිඩක්මෙන්; විලීයි ත්වා, වීරී; අන්තරධායි, අතුරුදන්වී - සා උපාසිකා උට්ඨහිත්වා, ඒ උපාසිකා වනැගීසිට; සචෙ, ඉදින්; සම්මාසම්බු ද්ධො, සම්‍යක්සම්බුද්ධතෙම; ධරෙය්‍ය, ජීවත්වේනම්; කාසම්, කුමක් හෙයින්; මමපුත්තසදිසස්ස භික්ඛුනො, මපුතු න්වැනි භික්ෂූන්ගේ; සීසං, හිස; ජාල විච්ඡෙදනත්ථ හසෙත්ථං, ජාලලක්ෂණ

යෙන් එච්ඡුහසතායෙන්; නාපරාමසෙ ය්‍යාති, නොපිරිමදනේදැයි; අත්තමන වාචං, සතුටුනොවූ; නිච්ඡාරෙසි, නික්මවූ; තස්මා, එහෙයින්; කුලපුත්තමානී, කුලපුත්‍රයෙම් යන මත්ඇති; අ ඤ්ඤොපි, අනිකෙකුදු; සාසනෙ, සස් නෙහි; පබ්බජිත්වාන, පැවිදිව; මිත්ත ත්ථෙරොව, මිත්තනම් තෙරුන්මෙන්; වරෙ, උතුම්වූ; ඉන්ද්‍රියසංවරෙ, ඉන්ද්‍රිය සංවරයෙහි, තිට්ඨෙය්‍යාති; සිටුනේයි

( ගා * )

මහාමිත්තසථවිරයන්වහන්සේගේ මව් උපාසිකාවන්ටවනාහී වනගඩපො ළක්විය ඒ උපාසිකාවන්ගේ දියනියද මෙහෙණිසස්නෙහි මහණව වෙසෙයි උපාසිකාවෝ ඒ මෙහෙණින්නට මෙ සේ කීහු ආයෙණිය මෙසේ එව නුඹ වහන්සේගේ බෑණන්වහන්සේ කරා ගොස් මා ගිලන්බව දන්වා බෙහෙ දක් ගෙණ එවයි කියා යැවීය ඒ මෙහෙණිනාමෝ මහා මිත්ත සථවිර යන්වහන්සේ කරා ගොස් එපවත් සැලකළාය. එකල තෙරුන්වහන්සේ කියනසේක් අපිවනාහි බෙහෙත්මුල් ආදිය රැස්කොට බෙහෙත් පිසන්නට නොදන්නම්හ එනකුදුවූවත්මම නිවඑක් බෙහෙදක් කියමි මම මහණව යම් කල ක පැවිද්වීම්ද එතැන් පටන් මේතාක් මාවිසින් ලොභසහගතවූ සිතින් ඉන්ද්‍රිය සංවරශීලය බිඳගෙණ විසභාග රූප යක් නොබලනලදවිරූය මේ සත්‍යවච නය කාරණකොටගෙණ මාගේ මව් උපාසිකාවන්ට පාසුවේවයි මෙපමණ කින් සත්‍යක්‍රියාකොට යව මාගේ මේ සත්‍යවචනය කියා උපාසිකාවන්ගේ සිරුර පිරිමදුවයි කීයේය. ඒ මෙහෙ ණිගොස් මව් උපාසිකාවන්ට මෙපවත් කියා ඒ කී සැනිම කළාය උපාසිකා වන්ගේ වනගඩපොළද එකෙණෙහිම පෙණපිඩක්මෙන් විරීගොස් අතුරු දන්වූයේය උපාසිකාවෝ නැගිසිට ඉදින් සම්මාසම්බුද්ධරජානන්වහන්සේ අද්ජීවමානව වැඩසිටියේනම් කුම ක් හෙයින් මපුත්‍රනුවන්වහන්සේවැනි භික්ෂූන්ගේ හිස උන්වහන්සේගේජාල ලක්ෂණයෙන් විසිතුරුවූ ශ්‍රීහස්තයෙ න් නොපිරිමදනේදැයි යනාදීන් ප්‍රීති වාක්‍ය පැවැත්වූහ. එහෙයින් මෙ ජාති ආචාර කුලපුත්‍රයෙක්ම් යන මා නය ඇති අනිකෙකුදු ඇත්නම් ඒහ තෙමේද මේ සර්වඥශාසනයෙහි පැවිදි ව මහාමිත්ත සථවිරයන්වහන්සේ මෙ න් උතුම්වූ ඉන්ද්‍රිය සංවර ශීලයෙහි පිහි ටියයුත්තේයි.

( ගා † )

යථා පන ඉන්ද්‍රිය සංවරො සතියා තථා විරියෙන ආජීවපාරිසුද්ධි සම්පා දෙතබ්බා, විරියසාධනා හි සා සම්මා ආරද්ධවිරියස්ස මිච්ඡාජීවප්පහාණ සම් භවතො. තස්මා අනෙසනං අප්පති රූපං පහාය විරියෙන පිණ්ඩපාතචරි යාදීහි සම්මාඑසනාහි එසා සම්පාදෙ තබ්බා පරිසුද්ධුප්පාදෙ යෙව පච්චයෙ පටිසෙවමානෙන අපරිසුද්ධුප්පාදෙ ආසීවිසෙ විය පරිවජ්ජයතා. තත්ථ අපරි ගහිතධුතඞ්ගස්ස සඞ්ඝතො ගණ තො ධම්මදෙසනාදීහි වස්ස ගුණෙහි පසන්නානං ගිහීනං සන්තිකා උප්ප න්නා පච්චයා පරිසුද්ධුප්පාදානාම පිණ්ඩ පාතචරියාදීහි පන අතිපරිසුද්ධුප්පාද යෙව පරිගහිත ධුතඞ්ගස්ස පිණ්ඩ පාතචරියාදීහි ධුතඞ්ගගුණෙ වස්ස පසන්නානං සන්තිකා ධුතඞ්ගනිය මානුලොමෙන උප්පන්නා පරිසුද්ධු ප්පාදා එකබ්‍යාධිවූපසමත්ථඤ්චස්ස පූති හරීටක චතුමධුරෙසු උප්පන්නෙසු ච තුම්බුරං අනෙසකම්පි සබ්‍රහ්මචාරිනො පරිභුඤ්ජිස්සන්තීති චිනෙතත්වා පරි

වසා බණ්ඩමෙව පරිභුඤ්ජමානස්ස ධුතඞ්ගසමාදානං පයිරූපං නොත්ති එසස් උලාම අරියවංසිකො භික්ඛුති වුච්චති.—යෙ පනෙතෙ චීවරාදයො පච්චයෙ තෙසු යස්ස කස්සචි භික්ඛුනො ආජීවං පරිසොධෙන්තස්ස චීවරෙ පිණ්ඩපාතෙච නිමිත්තොභාසපරිකථා විඤ්ඤත්තියො නවට්ටන්ති.—සෙනාසනෙ පන අපරිග්ගහිතධුතඞ්ගස්ස නිමිත්තොභාසපරිකථා වට්ටන්ති.—තත්‍ර නිමිත්තං නාම සෙනාසනත්ථං භූමිපරිකම්මාදීනි කරොන්තස්ස කිං භන්තෙ කයිරති කො කාරාපෙතීති ගිහීහි වුත්තෙ න කොචීති පටිවචනං යං වා පනඤ්ඤම්පි එවරූපං නිමිත්තකම්මං. ඔභාසො නාම උපාසකා තුම්හෙ කුහිං වසථාති පාසාදෙ භන්තෙති භික්ඛූනං පන උපාසකා පාසාදො නවට්ටතීති වචනං යං වා පනඤ්ඤම්පි එවරූපං ඔභාසකම්මං පරිකථා නාම භික්ඛුසඞ්ඝස්ස සෙනාසනං සම්බාධන්ති වචනං යං වා පනඤ්ඤම්පි එවරූපා පරියායකථා. භෙසජ්ජෙ සබ්බම්පි වට්ටති තථා උප්පන්නං පන භෙසජ්ජං රොගෙ වූපසන්තෙ පරිභුඤ්ජිතුං න වට්ටති තත්‍ර විනයධරා භගවතා ද්වාරං දින්නං තස්මා වට්ටතීති වදන්ති සුත්තන්තිකා පන කිඤ්චාපි ආපත්ති න හොති ආජීවම්පන කොපෙතීති තස්මා න වට්ටතීත්වෙව වදන්ති.—

( ස* )

යථා, යම්සේ; ඉන්ද්‍රියසංවරො, ඉන්ද්‍රිය සංවර තෙමේ; සද්ධාය සම්පාදෙතබ්බො, සමාන්ගයෙන් සැදියයුතු වේද; තථා, එසේම; ආජීවපාරිසුද්ධි, ආජීවපාරිශුද්ධි තොමෝ; වීරියෙන සම්පාදෙතබ්බා, වීර්‍යයෙන් සැපයියයුතුයි; සා, ඒ තොමෝ; විරියායත්තා, වීර්‍ය සාධනකොට ඇත්තීයි; සම්මා ආරද්ධවිරියස්ස, මනාකොට ආරබ්ධවූ වීර්‍ය ඇත්තහුට; මිච්ඡාජීවප්පහානං සම්භවතො, මිථ්‍යාජීවප්‍රහාණය සම්භව වන හෙයිනි; තස්මා, එහෙයින්; අප්පතිරූපං, ශාසනාශාසනයට නොසුදුසුවූ; අනෙසනං, අයුක්ත ගවෙෂණය; පහාය, දුරුකොට (නොහොත්) අනෙසනං, අයුක්ත ගවේෂණයද; අප්පතිරූපං, සංලේඛ විනොදනයකරණ ප්‍රතිපත්තිද; පහාය, දුරුකොට (''අනෙසනඤ්ච අප්පතිරූපඤ්ච පහාය'' යන අර්ථයි) විරියෙන, වීර්‍යයෙන්; පිණ්ඩපාතචරියාදීහි, පිඬු සිඟීම් ආදීවූ; සම්මා, එසනාහි, සම්‍යක් පර්‍යේෂණයෙන්; එසා, මේ ආජීව පාරිසුද්ධි තොමෝ; සම්පාදෙතබ්බා, සැපයිය යුත්තී (ආදිගුණයෙන් මිත්‍රසුගාත්පාංශුකූලචරියාද්‍යන්ගේ සඞ්ග්‍රහය දතයුතු) පරිසුද්ධුප්පාදෙයෙව පච්චයෙ, පරිසුද්ධෝත්පත්ති ඇති ප්‍රත්‍යයන්; පටිසෙවමානෙන, සෙවනාවූ විසින්; අපරිසුද්ධුප්පාදෙ, අපරිසුද්ධොත්පත්ති ඇති ප්‍රත්‍යයන්; ආසීවිසෙ විය, අශිවිෂයන් මෙන්; පරිවජ්ජයතා, දුරුකරන්නාහු විසින් (එසා සම්පාදෙතබ්බා'' යි යොදනු) තත්‍ර, එහි; අපරිග්ගහිත ධුතඞ්ගස්ස, ධුතාඞ්ග සමාදන් නොවූ මහණ හට; සඞ්ඝතො, සඞ්ඝයා කෙරෙන්; ගණතො, සෙත්‍රාපාතිකාදී ගණයා කෙරෙන්ද; අස්ස, මොහුගේ; ධම්මදෙසනාදීහි ගුණෙහිව, ධර්ම දෙශනාදීවූ ගුණයෙන්; පසන්නානං ගිහීනං, ප්‍රසන්නවූ ගෘහීන්ගේ; සන්තිකා උප්පන්න පච්චයා, සමීපයෙන් උපන් ප්‍රත්‍යයෝ; පරිසුද්ධුප්පාදා නාම, පිරිසිදුව උපැන් ඇත්තාහු නම් වෙත්; පිණ්ඩපාතචරියාදීහි පන, පිණ්ඩපාතචර්‍යාදීන්ගෙන් වනාහි; අතිපරිසුද්ධුප්පාදයෙව, අතිපරිසුද්ධව උපැන් ඇත්තාහුමැයි; පරිග්ගහිත ධුතඞ්ගස්ස, සමාදන් වතලද ධුතාඞ්ග ඇත්තා හට; පිණ්ඩපාත චරියාදීහි, පිණ්ඩපාතචර්‍යාදී

යෙන්ද; අයස, මොහුගේ; ධුතගුණපසත්ථානං, ධුතගුණයෙහි ප්‍රසන්නවූවන්ගේ; සභාගිනා, සම්පයෙන්; ධුතඞ්ගනියමානුලොමෙන, ධුතාඞ්ග නියමයට අනුලොම පක්‍ෂයෙන්; උප්පන්නා, උපන් පසයෝ; පරිසුද්ධුප්පාද, පිරිසිදුවූ උපැන් ඇත්තාහම්වෙත්; එකබ්‍යාධිවූපසමත්ථං, එක් ව්‍යාධියක් සන්හිඳුවන පිණිස; අයස, මෝහට; පූතිහරීටක, පූතිමූත්‍රපරිභාවිතවූ. තොමෙහොත් පූතිභාවයට ගත් හරණලද අරළුහා; චතුමධුරෙසු උප්පන්නෙනාසු, චතුමධුර උපන් කල්හි; චතුමධුරං, චතුමධුරය; අඤ්ඤම්පි සබ්බත්ථවාරිතො, සෙසු සබ්බම් සාධුද; පරිභුඤ්ජිස්සතීති, අනුභව කෙරෙතියි; විතෙත්තබ්බා, සිතා; හරීටකඛණ්ඩමෙව පරිභුඤ්ජමානස්ස, අරළු කඩම වළඳන්නහුට; ධුතඞ්ගසමාදානං, ධුතාඞ්ග සමාදන්වීම; පතිරූපං හොති, සුදුසුවෙයි; එසහි, මෙතෙම වනාහි; උත්තම අරියවංසිකො භික්ඛුති, උතුම් ආර්‍ය්‍යවංශ ඇති මහණයයි; වුච්චති, කියනු ලැබේ; යථාපනෙත, යම්සේ; චීවරාදයොපච්චයා, චීවරාදී ප්‍රත්‍යය කොටස්ස් ඇද්ද; එතෙසු, ඔවුන් කෙරෙහි; ආජීවං පරිසොධෙන්තස්ස, ආජීවය පිරිසිදු කරන්නාවූ; යස්සකස්සචිභික්ඛුනො, ධුතාඞ්ග ඇති නැති යම් කිසිවර මහණක් හට; චීවරෙච, සිවුරෙහිද; පිණ්ඩපාතෙච, පිණ්ඩපාතයෙහිද; නිමිත්තොභාසපරිකථා විඤ්ඤත්තියො, නිමිත්තය අවභාසය පරිකථාය විඥප්තිය යනමොහු; නවට්ටන්ති, නොවටින්; තත්‍ථ, එහි; නිමිත්තංනාම, නිමිත්තනම්; සෙනාසනත්ථං, සෙනසුන් පිණිස; භූමිපරිකම්මාදීනි කරොන්තස්ස, භූමිපරිකර්මාදීන් කරන්නාහුට; කිං භන්තෙ කරීයති, වහන්ස කුමක්කරනු ලැබෙද; කොකාරාපෙතීති, කවරෙක් කරවාදයි; ගිහීහිවුත්තෙ, ගෘහීන් විසින් කීකල; නකොචීති, කිසිවෙක් නොවෙයි කීමවෙයි; යංවාපනඤ්ඤම්පි එවරූපං නිමිත්තකම්මං, යම් අනික් මෙබඳු නිමිත්ත කර්මයක් ඇද්ද (මේ නිමිත්ත කර්මනම්) ඔභාසංනාම, අවභාසනම්; උපාසකා, උපාසකවරිනි; කුහිං වසථාති, කොහි වසාද; පාසාදෙ, භන්තෙති, වහන්ස ප්‍රාසාදයෙහි වසමු; භික්ඛූනං පන උපාසකා පාසාදො නවට්ටතීති, උපාසකවරිනි භික්‍ෂූන්ට පහසුනොවටිදුයි; යංවාපනඤ්ඤම්පි එවරූපං ඔභාසකම්මං, යම් අනික් මෙබඳුවූ අවභාෂ කර්මයක් ඇද්ද (මේ ඔභාසනම්) පරිකථානාම, පරිකථානම්; භික්ඛුසඞ්ඝස්ස සෙනාසනං සම්බාධන්ති වචනං, භික්‍ෂුසඞ්ඝයාහට සෙනසුන් ගැහැටයයි කීමයි; යංවාපනඤ්ඤම්පි එවරූපා පරියායකථා, යම් අනික් මෙබඳු පර්‍ය්‍යායකථාවක් ඇද්ද (මේ පරියාය කථා නාම) සෙනාසනෙපන, සෙනාස්නෙහි වනාහි; අපරිග්ගහිතධුතාඞ්ගස්ස, ධුතාඞ්ග නොගත් මහණහට; නිමිත්තොභාසපරිකථා වට්ටන්ති, නිමිත්තය ඔභාසය පරිකථාය යනමොහු වටින්; භෙසජ්ජෙ, බෙහෙත් පසයෙහි; සබ්බම්පි වට්ටති, සියල්ලම වටී; තථා උප්පන්නම්පන භෙසජ්ජං, මෙසේ නිමිත්ත ඔභාසාදීන් උපන් බෙහෙත් වනාහි; රොගෙ වූපසන්තෙ, රොගය සන්හුන් කල්හි; පරිභුඤ්ජිතුං නවට්ටති, වළඳන්නට නොවටී; තත්‍ථ, එහි; විනයධරා, විනයධරයෝ; භගවතා, භගවත්හු විසින්; ද්වාරං දින්නං, රොග ගිෂ්යෙන් වළඳන්නට දොර දෙනලද; තස්මා, එහෙයින්; වට්ටතීති වදන්ති, (රොග නැතිකල්හිදු වළඳන්නට) වටීයයි යෙත්; සුත්තන්තිකාපන, සෞත්‍රාන්තිකයෝ වනාහි; කිඤ්චාපි, කිසිසෙත්; ආපත්තිනහොති, ඇවැත් නො

නෙ සි; ආජීවපසන්නෙනාපෙති, ආජීවය වනානි නොවා (සංල් පිළිවෙත්හි සිව්ය නාව සංළු පැවැතුම් නොවයි යන අභිප්‍රායි) නසවා, එනෙයිත්; නාවවින් ත්‍රෙළුව වදනානි, නොවප්‍රිය නයන් ("ආජීවපසන නොපෙති" යනුයෙන් ම නෙනාසුන් පිළිගැදී ධුතාඞ්ගධරය හට නිමිත්තාදීනු නොවපිනියි යෙන්. සමහරු සෙසු ධුතාඞ්ග ධරයනවද නොවපින් පව යෙන්) ~

( නා * )

යම්සේ මේ ඉන්ද්‍රිය සංවරය සිහියෙන් සැපයිය යුත්තේද එසේම ආජීව පාරිශුද්ධිය වීර්යයෙන් සැපයිය යුත්ය ඒ ආජීව පාරිශුද්ධිය වනාහි වීර්යයෙන්ම සාධනය කටයුතු වන්නීය. කුමක්හෙයිනයත්? මනාකොට පටන්ගත් නාලද වීර්ය ඇත්තාහට මිථ්‍යා ආජීවයෙන් දුරුවීම සම්භාවනා වෙයින. එසේ හෙයින් ශාස්තෘ ශාසනයට නුසුදුසුවූ යුතු ප්‍රත්‍යය සෙවීම දුරුකොට වීර්යකාරණතාවගෙණ පිඬු සිඟීම් ආදීවූ මනාවූ ප්‍රත්‍යය සෙවීමෙන් මේ ආජීව පාරිශුද්ධිය සැපයිය යුත්තීය පිරිසිදුව උපන්නාවූ සිව්පසය පරිභෝග කරන්නානු විසින්ද අපිරිසිදුව උපන් සිව්පසය විෂසොර සර්පයන්මෙන් දුරුකරන්නානු විසින්ද මේ ආජීව පාරිශුද්ධි සැපයිය යුත්තීය. ප්‍රත්‍යය සෙවීමෙහිද ධුතාඞ්ග සමාදන් නොවූ මහණනට සඞ්ඝයාගෙන් හෝ ගණයාගෙන් හෝ ධර්මදේශනා ආදියෙහි ප්‍රසන්නාවූ දායකයන්ගෙන් හෝ ලබනාලද සිව්පසය පිරිසිදුව උපන් පසය නම පිණ්ඩපාතාදියෙන් ලබනාලද පසය වනාහි ඉතා පිරිසිදුව උපන් ප්‍රත්‍යයනම වන්නේයි ධුතාඞ්ග සමාදන්වූ භික්ෂුහට පිඬු සිඟීම් ආදියෙන් හෝ උහුගේ ධුතාඞ්ග ගුණයෙහි ප්‍රසන්නාවූ දායකාදීන්ගෙන් හෝ ධුතාඞ්ග නියමයට අනුලෝම වශයෙන් උපන් ප්‍රත්‍යයෝ පිරිසිදුව උපන්නාහු නම්වෙත්.

යම් බඳුවූ එක්ලෙඩක් සන්හිඳුවනු පිණිස ගොමුයෙන් හා විතාකාරණලද අරළු හා ඵන මී නලතෙල් ගිතෙල් යන චතුමධුරය ද ලැබුනුකල්හි ප්‍රණීතවූ චතුමධුරය සෙසු සබ්‍රහ්මචරිනු වළඳන්නයි සිතා ඉතුරුකොට නබාගෙන ගොමුත්‍ර රූක්‍ෂවූ ගොමුයෙන් හාවිතාකාරණලද අරළුකැබලි වළඳනා සුලුවේද එබඳු මහණ හට්ම ධුතාඞ්ග සමාදානය සුදුසුවන්නේය මෙබඳු මහණ තෙමේ උත්තම ආර්යවංශයැයි මහණයයි කියනු ලැද්දේයි යම් මේ චීවර පිණ්ඩපාත සෙනාසන ගිලානප්‍රත්‍යය යන සිව්පසයෙහි ආජීවය පිරිසිදුකරන්නාවූ ධුතාඞ්ග සමාදන්වූ හෝ නුවූ හෝ යමක්සි භික්ෂුවක් හට සිව්රෙනිද අහරෙනිද (යට කියනලද ලක්ෂණ ඇත්තාවූ) නිමිත්තය අවභාසය පරියායකථාය විඥප්තිය යන මොහු නොවපිනානාහුය හෙවත් නිමිත්තාදිය කිරීමෙන් ලබනලද චීවර පිණ්ඩපාතයෝ නැප නොවන්නාහුය ධුතාඞ්ගධරනොවූ භික්ෂුහට සෙනසුනෙහි පමණක් නිමිත්තාවභාස පරියායකථාවෝ වටනාහ හෙවත් නිමිත්තාදිය කිරීමෙන් සපයාගත්තාලද සෙනසුන නැපවන්නේයි එහි "නිමිත්ත කිරීම" නම් සෙනසුන්පිණිස බිම සමතලා කිරීම් ආදි පිරියම්කරණ මහණසුව සිටින් එසින් ස්වාමිනි කුමක් කරන්නෙහිද කවරෙක් මෙපිහාරය කරවන්නේදැයි කීකල්හි ගිහිපිහාර කාරකය කෙනෙක් නැතැයි පිළිවදන් දීම හෝ අනිකුද මෙබඳුවූ යම් නිමිත්තකර්මයක් කිරීම හෝ නම්නිකිරීම නාම "ඕභාස" නම් උපාසකවරිනි තොපි කොහි වෙසෙව්දැයි ත්වාරයි උපාසක තෙමේ ස්වාමිනි අපි ප්‍රාසාදයෙහි වසම්හයි පිළිවදන් දුන්කල්හි උපාසකවරිනි භික්ෂුන්ටත් ප්‍රාසාද නොකැපදැයි කීම හෝ

අතිසුදු වෙබදුවූ නම ඔභාසකම්ම ස්ථිවත්හෝ ඔභාසකාමී නාව "පරියායකථා'' නම් ප්‍රත්‍යය දායකයන් සම්පයෙහි භික්ෂූන්ගේ ආහාර පෙනසුන ගැහැට ය තොපෙනෙනෙත්යයි කියා හෝ අතිසුදු වෙබදුවූ ඉතිවතාවේය හාගවිත වෙතැ එවත කීවයහෝ පයෑය කථනම් එන්නේයි. රෝගාතුරවූ කල්හි බේහෙත් පසය සෙවීමෙහි වතානි යන කී නිමිත්ත කම්මය ඔභාසකම්ය පයෑයකථාය විඥප්තිය යන සතර ආකාරයම කැපවන්නේයි. රෝගාතුරවූ කල්හි මෙසේ නිමිත්ත කම්‍රිදිය කිරීමෙන් උපයකාලද බේහෙත් පසය වතානි ඒ රෝගය සංසිඳුන්කල නොකැපවන්නේය නොවැලදිය යුත්තේයි ඒ කාරණයෙනි විනයධර භික්ෂූහු භාගවතුන්හු විසින් රොගශිමියෙන් වලදන්නාව අවසර දෙනලද්දේය. එහෙයින් වවන්නේයිද සූත්‍රාන්තික භික්ෂූහු ශීලත් සමෙයහි නිමිත්තාදියෙන් සපයනලද බෙහෙත් පසය වැලදීමෙන් කීසිසෙස්ත් ඇවැත් නොවේද වැලි එහෙත් ඇත. ඒ ඉතුරු බෙහෙත් පසය නිරෙහි සමෙයහි වැලදීම සැහැල්ලු පැවැතුම් ඇති මහණහුගේ ආජීව පාරිශුද්ධි ශීලය විනාශකරන්නේය එසේහෙයින් නොවවනේය නොවැලදිය යුත්තේයයිද කියන්නාහුය.

( ෂා † )

සො පන භගවතා අනුඤ්ඤාතාපි නිමිත්තොභාස පරිකථා, විඤ්ඤත්තියො අකාරොන්තො, අප්පිච්ඡතාදි ගුණෙමෙයව නිස්සාය ජීවිතක්ඛයෙපි පච්චුපට්ඨිතෙ අඤ්ඤත්‍ර ඔභාසාදීහි උප්පන්නෙ පච්චයෙ පටික්ඛිපන්තො එස පරම සල්ලෙඛවුත්තීති වුච්චති සෙය්‍යථාපි ථෙරො සාරිපුත්තො. සො කිර ආයස්මා එකස්මිං සමයෙ පවිවෙකං බ්‍රූහයමානො මහාමොග්ගල්ලානත්ථෙරෙන සද්ධිං අඤ්ඤතරස්මිං අරඤ්ඤෙ විහරති අථස්ස එකස්මිං දිවසෙ උදර වාතාබාධො, උප්පජ්ජිත්වා අතිදුක්ඛං ජනෙසි මහා මොග්ගල්ලානත්ථෙරො සායණ්හසමයෙ තස්සායස්මතො උපට්ඨානං ගතො ථෙරං නිපන්නං දිස්වා තං පවත්තිං පුච්ඡිත්වා පුබ්බෙ තෙ ආවුසො කෙන ඵාසු හොතීති පුච්ඡි ථෙරො ගිහිකාලෙ මෙ ආවුසො මාතා සප්පිමධු සක්කරාදීහි යොජෙත්වා අසම්භින්න ඛීරපායාසං අදාසි තෙන මෙ ඵාසු අහොසීති, සොපි ආයස්මා හොතු ආවුසො සචෙ මය්හං වා තුය්හං වා පුඤ්ඤං අත්ථි අප්පෙවනාම සෙව ලභිස්සාමාති ආහ ඉමං පන නෙසං කථාසල්ලාපං චඞ්කමනකොටියං රුක්ඛෙ අධිවත්ථා දෙවතා සුත්වා සෙව අය්‍යස්ස පායාසං උප්පාදෙස්සාමීති තාවදෙව ථෙරස්ස උපට්ඨාකකුලං ගන්ත්වා ජෙට්ඨපුත්තස්ස සරීරං ආවිසිත්වා පීළං ජනෙසි, අථස්ස තිකිච්ඡා නිමිත්තං සන්නිපතිතෙ ඤාතකෙ ආහ සචෙ ථෙරස්ස එවරූපං නාම පායාසං පටියාදෙථ මුඤ්චිස්සාමීති තෙ තයා අවුත්තෙපි මයං ථෙරානං නිබද්ධං භික්ඛං දෙමාති වත්වා දුතිය දිවසෙ තථාරූපං පායාසං පටියාදිංසු මහාමොග්ගල්ලානත්ථෙරො පාතොව ආගන්ත්වා ආවුසො යාවාහං පිණ්ඩාය චරිත්වා ආගච්ඡාමි තාව ඉධෙව හොහීති වත්වා ගාමං පාවිසි තෙ මනුස්සා පච්චුග්ගන්ත්වා ථෙරස්ස පත්තං ගහෙත්වා වුත්තප්පකාරස්ස පායාසස්ස පූරෙත්වා අදංසු ථෙරො ගමනාකාරං දස්සෙසි භුඤ්ජථ භන්තෙ තුම්හෙ අපරම්පි දස්සාමාති ථෙරං භොජෙත්වා පුන පත්තපූරං අදංසු ථෙරො ගන්ත්වා හන්දාවුසො සාරිපුත්ත පරිභුඤ්ජාති උපනාමෙසි ථෙරොපි තං දිස්වා අති

ම්හාමෙපා පායාමසා කාරත්තුචො උ
ප්පන්නානි විමානානි තස්ස උ
ප්පත්තිමූලං දිස්වා හරාම්හෙසා මහා
ග්ගල්ලාන අපරිභොගෙන පිණ්ඩපා
තෙනාති ආහ කොපායසමා මාදිසෙන
නාම ආචාමං පිණ්ඩපාතං නපරිභුඤ්ජ
න්තියා විනාසම්පි අනුසොචෙය්‍ය, එතාව
වශ හානෙනව පතානං මුඛාදවිටියං ගමෙන
ත්වා එකමන්තං නිසීදෙය්‍යාසි පායා
සස්ස සහ භූමියං පතිට්ඨිතාං ථෙර
ස්ස ආබාධො අන්තරධායි, තතො ප
ට්ඨාය පඤ්ඤවත්තාසාල්ලපසාති නපුන
උප්පජ්ජි තමෙනා මහාමොග්ගල්ලානා
ථෙරං ආහ ආවුසො වචිච්ඡන්දතාති
නිස්සාය උප්පන්නා පායාසෙ අනෙතා
සු නික්ඛමිත්වා, භූමියං චරන්තාසුපි
පරිභුඤ්ජිතුං අයුත්තාරූපාති ඉමම
උදානං උදානෙසි —

වචිච්ඡන්දතාති ඡප්ජාරා
උප්පන්නාං ෂඩ්ඩායාසං
සචෙ භුඤ්ජෙය්‍යාං භවෙය්‍යාං
සාජීවො ගරහිතො මම —

යදිපි මෙ අනාතගුණං
නික්ඛමිත්වා බහි චරෙ
නෙව භින්දෙය්‍ය ආජීවං
චජමානොපි ජීවිතං —

ආරාධෙමි සකං චිත්තං
විවජ්ජෙමි අනෙසනං
නාහං බුද්ධප්පටිකුට්ඨං
කාහාමිච අනෙසනං නාති —

විපරකුඹකවාසි අඹබාදක මහාති
සසමොත්ථරවුඤ්චිපි මෙවං කථෙතබ්බං
එවං සබ්බංපි —

අනෙසනාය චිත්තම්පි
අජනෙත්වා විචක්ඛණො
ආජීවං පරිසොධෙය්‍ය
සද්ධා පබ්බජිතො යතීති —

—o—

( ස † )

යොපන, යමෙක් වනාහි; භගවතා
අනුඤ්ඤාතාපි, භගවත්හු විසින් අනුද
න්නවූද; නිම්මිත්තොභාසපරිකථාවිඤ්ඤ
ත්තියො, නිමිත්තාවභාසපරිකථාවිඥප්
තීන්; අනොරොහන්තො, නොබට අනුද
පාවිෂයෙහිදු නොහැරණේ; අපච්ච
නාදි ගුණෙෙයවනිස්සාය, අපිස්ආදියු
ණයන්වනිසා; ජීවිතක්ඛයෙ පච්චා
ට්ඨිතෙපි, ජීවිතාවිනාශයකුදු ලඟසිටියා
ල්ති; අඤ්ඤෙතුව ඔභාසාදීනි, ඔභාසා
දීන්තබා; උප්පන්න පච්චයෙ පටිසෙ
වති, උපන් ප්‍රත්‍යය අනුභවකෙරේද;
එසො, මෙතෙමේ; පරමසල්ලෙඛවු
ත්තීති වුච්චති, පරමසල්ලෙඛවෘත්ති
ඇත්තේයයි කියනු ලැබේ; සෙයථාපි,
පි ථෙරො සාරිපුත්තො, සැරියුත්මහ
තෙරුන් මෙනි; සො හිරායස්මා, ඒ ආ
වත්; එකස්මිං සමයෙ, එක්සමයෙක්
හි; පවිවෙකං බ්‍රෑහයමානො, විවෙ
කය වඩනුයේ (රහත්පල සමවතින්
වසනුයේ) මහාමොග්ගල්ලානත්ථෙ
රෙන සද්ධිං, මුගලන් මහතෙරුන් හා
සමග; අඤ්ඤතරස්මිං අරඤ්ඤෙ විහ
රති, එක්තරා අරණ්‍යයෙක්හි වාසය
කෙරේ; අථ, ඉක්බිත්තෙන්; අස්සං
ඒ තෙරහට; එකස්මිං දිවසෙ, එක්දව
සෙක්හි; උදරවාතාබාධො උප්පජ්ජි
ත්වා, බඩවාතරොගයෙක් ඇතිව (රැ
ජාවෙක් ඇතිවීයයි සේයි) අතිදුක්ඛං
ජනෙතසි, අධිකදුක්තෙලේ; මහාමො
ග්ගල්ලානත්ථෙරො, මහමුගලන් තෙ
රනු; සායණ්හසමයෙ, සවස්වේලෙ
හි; තස්සායස්මතො, ඒ ආවත්හට;
උපට්ඨානං ගතො, උපස්ථානයම
ගියේ; ථෙරං, තෙරුන්; නිපන්නං
දිස්වා, හොත්තාවුන් දැක; තං පව
ත්තිං පුච්ඡිත්වා, හොත්පවත් පිළිවි
ස; ආවුසො, ඇවත; පුබ්බෙ, පෙර;
තෙ, තොපට; කෙන ඵාසුකොහොති;

ක්ඛමන්ත් ඵාසුවෙද්දයි; පුච්ශ්, පිළිවිස් සි; ථෙරො, තෙරනු; ආහ, මෙසේ කීවු; ආවුසො, ඇවැත; ගිහිකාලෙ, ගිහිවැ සිටි කල; මාතා, මා මෑණියෝ; සප්පිමධුඵාණිතාදියෝජිතා, සර්පි මධු ශර්කරාවෙන් යොදූ; අභිසංඛත ඛීරපායාසං, දියනොමුසු කිරිබත; අදාසි, දුන්න; තෙන, එහෙයින්; ඵාසුකං අහොසී'ති, ඵාසුවීයයි; සොපි ආය සමා, ඒ ආවත්හුද; ආවුසො, ඇවත; සොකු, මැනවි; සචෙ, ඉදින්; මය්හං වා තුය්හං වා පුඤ්ඤං අත්ථි, නොපෙ ගේවත් අපගේවත් පින් ඇත්තම්; සොව ලභිස්සාම, සෙට ලදමෝ තම්; අප්පටිතාම ඉති, මෙසේ කැයි; ආහ, කීනු; තෙසං, ඒ දෙදෙනාගේ; ඉමං එත කථාසල්ලාපං, මේ කථාස ල්ලාපය; චඞ්කමනකොටියං, සක්ම න් කෙළවරසිටි; රුක්ඛෙ අධිවත්ථා දෙවතා, රුක්හි වසනා දෙවතාතො මෝ; සුත්වා, අසා; සෙව, සෙට; අය්‍යස්ස, ආර්‍ය්‍යන්ට; පායාසං උප්පාදෙස්සාමිති, පායාසය උපදවම්හි සිතා; තාවදෙව; එවේලෙහිම; ථෙරස්ස උපට්ඨාක කුලංගන්ත්වා, තෙරුන්ගේ උපස්ථායක කුලයට ගොස්; ජෙට්ඨ පුත්තස්ස සරීරං ආවිසිත්වා, ජ්‍යෙෂ්ඨ පුත්‍රයාගේ ශරීරයෙහි ආවිශවව; පීළං ජනෙසි, පීඩාකළා; අථ, ඉක්බිත්තෙත්; අස්ස, ඔහට; තිකිච්ඡානිමිත්තං, චිකිත් සාවකාරණෙකාට; සන්නිපතිතෙ ඤාතකෙ, නෑයන් රැස්වුවන්ට; ආහ, මෙසේකීවු; සචෙ, ඉදින්; සෙව, සෙට; ථෙරස්ස, මුගලන් මහතෙරහට; එවරූපං නාම පායාසං, මෙබඳු පායාසයක්; පටියාදෙථ, සපයානම්; මුඤ්චිස්සාමි 'ති, හරිමිස් කී; තෙ, ඒ නෑයෝ; තයා අවුත්තෙපි, තිවිසින් නොකියනලදකල්හිදු; මයං, අපි; ථෙරානං, තෙරවරනට; නිබද්ධං භික්ඛං දෙමාති, නිබද්ධයෙන් අහාර දෙම්හයි; ව

ත්වා, කියා; දුතියදිවසෙ, දෙවනදව ස්; තථාරූපං පායාසං, එබඳු පායාස යක්; පටියාදයිංසු, සැපවූ, මහාමොග්ගල්ලානත්ථෙරො, මුගලන් මහතෙ රනු, පාතොව, උදයසනින්ම; ආගතා, අවුත්, අවුසො, ඇවත; යාව ගං පිණ්ඩාය චරිත්වා ආගච්ඡාමි, යම්තාක් කල් මාපිඬුපිණිසගොස් එම්ද; තාව, ඒ තාක්, ඉධෙව හොහි 'ති' මෙසි ම වසවයි; වත්වා, කියා; ගාමං පාවිසි; ගමවැදුන්හු; තෙ මනුස්සා, ඒ මිනිස්හු, අබ්භුග්ගන්ත්වා, අභිමුඛව දිවගොස්; ථෙරස්ස, තෙරුන්ගේ; පත්තං ගහෙත්වා, පාත්‍රය ගෙණ; දුතානුපපායාසස්ස පූරෙත්වා, උක්තප්‍රකාරපායාසයෙන් පුරා; අදංසු, දුන්හු; ථෙරො, යත්වාගතෙ; ගමනාකාරං දස්සෙසි, ගමනාකාරය දක්වූහු, තෙ ඒ මිනිස්සු; භුඤ්ජථ භන්තෙ, වහන්සෙ වළඳනු; අපරම්පි දස්සාමා 'ති' අනිත් පිණ්ඩපාතයක්ද දෙම්හයි; ථෙරං භොජෙත්වා, තෙරුන් වළඳවා, පුන පත්තපූරම්පි අදංසු, නැවත පාත්‍රය පුරා දුන්හු; ථෙරො, තෙරනු; ගන්ත්වා, ගොස්; ආවුසො සාරිපුත්ත, ඇවැත්නි සාරිපුත්‍රයෙනි; හන්ද පරිභුඤ්ජථාති, වළඳවයි; උපනාමෙසි, එළවූ; ථෙරො 'පි සැරියුත් මහතෙරහුදු; තං දිස්වා, ඒ දැක; පායාසො, ක්ෂීරබත; අතිමනාපො, ඉතාමැනවි; කථන්නුඛො උප්පන්නොති, කෙසේ උපන්නේ දෝ හෝයි, චින්තෙත්වා, සිතා; තස්ස, ඒ පායාසයාගේ; උප්පත්තිමූලං දිස්වා, උත්පත්තිහේතුවද්දුත (ගිහිකල මා මෑනියෝ සර්පිමධුශර්කරාවෙන් යොදූ අසම්භින්නක්ෂීරපායාසය දුන්හ එහින් ඵාසුවීයයි තා පෙළ මිසින් කාරණලද වාගේහද සබ්බනාකාරණයයි තේ සී) ආවුසො මොග්ගල්ලාන, ඇවැත්නි මොග්ගල්ලානය; හර, හැරපියව; අපරිභොගාරහො පිණ්ඩපාතොති, පිණ්ඩ

පාපාය පරිණාමාය යොගනෙත්‍රතාවෙයි; ආම, ඔව්; තස්ස පි ආයස්මා, ඒ ආයුෂ්මත් හුදු; මාදිසස්ස නාම ආහාරං පිණ්ඩපාතං, මබඳුවන් විසින් කෙසේ නම් ලද පිණ්ඩපාතය; නපරිභුඤ්ජන්ති නි, නොවළඳත්තේයයි; විතක්කම්පි හා උප්පදෙත්වා, සිතකුදු නොඋපදවා; එකාවව කෙතෙනව, එකකොපුලෙත්ම; පත්තං; පාත්‍රය; ලුඤ්චිත්වා ගණ්හාති, මුවවිකස්ගෙණ; එකමන්තෙ, එකත්පස්හි, නිසීදෙජ්ජයි, මුහුන්නත් නමයි; පායාසස්ස, පායාසයාගේ; සකලභූමියං පතිට්ඨාන, භූමියෙහි පිහිටිම හා සෑග; ඓරසස නොවැන්නේ; ආබාධො, ව්‍යාධිය; අනාරද්ධායි, අනුරුද්දන්වී; තතො පට්ඨාය, එතැන්පටන්ගෙණ; පච්චන්තාලිඞ්ගස්සානි, පන්සාලිස් හවුරුද්දක්; පුන හා උප්පජ්ජි, නැවත නුපනි; තතො, ඉක්බිතෙතාන්; මහාමොග්ගල්ලානං, මහාමොග්ගල්ලානයන්ට; ආහ, මෙසේකී; ආවුසො, ඇවැත; විවිච්ඡදනහිං නිස්සාය, වාග්විඥප්තියනිසා; උප්පන්නො පායාසො, උපන් පායාසය; අභොතනු, අනුණු; නනකම්මිත්වා, නික්ම; භූමියං චරතෙනසුයි, භූමියෙහි හැසිරෙතුදු; පරිභුඤ්ජිතුං අයුතතරුපෙ'නි, වළඳන්නට නුසුදුසුයයි; ඉදම් උදනං උදනේසි, මේ උදන්ද ඇනි —

විචිවිඤ්ඤත්තිවිජ්ජාරා, වාග්විඥප්තිප්‍රවෘත්ති හෙතුකොවත්; උප්පන්නං, උපන්; මධුපායාසං, සම්‍රපායාසය; සචෙ, ඉදින්; අහං, මම; භුත්තො භවෙය්‍යං, කැළෙම්වීන්නම්; මම, මාගේ; ආජීවො, ආජීවය, ගරහිතො අස්ස, ගර්හිතවන්නේයි(''භවෙය්‍යාහං සාජීවො'' යනුයෙහි ''භවෙය්‍යං අහං අස්ස ආජීවො'' යි පදබිද ''එවංසතෙ'' යනු මෙත් සම්බන්ධාරිය කටයුතු) යදිපි, ඉදින්; මෙ අන්තගුණං, මාගේඅතුණ (අන්තගුණනම් ''අන්තමෙවමෙහෙළ අන්තගුණතානි නිද්දේසං වා අනොජාතා හො ධීයා තෙසු තෙසු ගොනෙච්ඡාතො බද්ධං'' යනු මෙතැන චිකායි,) නිකාම්මනවා, නික්ම; බහිචරෙ, බාහිර හෝ යාපිංත ඇඳෙද් නමුදු; ජීවිතං, ජීවිතය; චජ්ජාතොපි, හරණේනමුදු; ආජීවං, ආජීවය; නෙවහිතෙස්සං, නොනසිඳු නෙම්; සතං චිත්තං, සච්ඡිත්තවිත්තය; ආරාධෙමි, වසඟකොටෙමි; අනෙසනං, අයුක්තවූ ත්‍රෙවෂණය; විවජ්ජෙමි; දුරුකෙරෙමි; අහං, මම; බුද්ධපතිකුට්ඨං, බුදුන් විසින් ගර්හිතවූ; අනෙසනං, අයුක්තවූත්‍රෙවෂණය; නකාහාමි, නොකෙරෙමි; චිරරගුම්බිතවායි, චිරරගුම්බිකනම් නැත වනය; අම්බිලාදකම් හාපාසස්සමුවරවත් මිපි ච, අම්බිලාදක නිසා කම් පොරුවාගේ පතද; එවං, මෙනත; කාලිතබ්බං, කියයුතු; එවං, මෙසේ; සබ්බථාපි, සම්ප්‍රකාරයෙන්; විච්ඡිත්ව, විච්ඡින්නකොට; අනෙසනාය; අයුක්තවූ ත්‍රෙවෂණයෙහි; විත්තම්පි අජනෙත්වා, සිත්ම නොඋපදවා; සඩාපටිච්ඡන්නෙතා යන්, සැදැහැයෙන් මහණවූ තපස්වීයාමේ; ආජීවං පරිසොධෙය, ආජීවය පරිශුද්ධකරණේයයි —

---

( ගා † )

(මේ උභයපක්ෂයෙහි පැවැති වාද විනිශ්චය මෙසේ දතයුතු) මේ සස්නෙහි යම් මහණෙක් ශිලන්සම්භයෙහි නම් කාකම්මදියෙන් හෝ මෙබඳුන් ප්‍රත්‍යයෙවියයුතුයයි සච්චිතරණව තෙනොවගෙණ භගවත්හු විසින් අනුදතපදලේ නමුදු නිම්පොතා හාස පරියායකථාවිඥප්තින් තොතර මින් අලෙපචඡකාදි ගුණයන්ම නියා තමාගේ ජීවිතහානියන් එලම් සිටින ල්හිද ඔහු මහාමිමාදිය තොතොව දුකැමින් මෙමින් උපන් පසයම අනුභවකෙරේද මෙබඳු මහණතෙම සැරි

පුත් මහතෙරුන් මෙන් උතුම්වූ සැහැල්ලු පැවැතුම් ඇත්තෝයයි කියනු ලැබේ. ඒ ආයුෂ්මත්වූ ශාරිපුත්‍ර ස්ථවිරයන්වහන්සේ වනාහි එක් කාලයක අර්හත්ඵල සමාපත්තියට සමවැද විවෙක සැපවිඳිනුයේ මුගලන් මහතෙරුන්වහන්සේ හා සමග එක්තරා අරණ්‍යයෙක වැඩවාසය කෙළේය. ඉක්බිති එක්දිනක් සැරියුත්මහතෙරුන්වහන්සේට බඩරුජාවක් ඉපද මහත් දුක්වෙදනාවූයේය මුගලන් මහතෙරුන්වහන්සේ සවස්භාගයෙහි තෙරුන්වහන්සේට උපස්ථානයට ගියේ තෙරුන්වහන්සේ වැදහොත් බව දැක එපවත් විචාරා ඇවැත්නි පෙර නුබවහන්සේට මේ අඑාසුව කවර බෙහෙදකින් සුවවේදැයි විචාළේය සැරියුත් මහතෙරුන්වහන්සේ එබසට ඇවැත්නි ගිහිගෙයි වසනකල මේ අඑාසුවට අපගේ මෑණියෝ ගිතෙල් මීසකුරුයොදා දියනොමුසු කිරිබතක් පිස දුන්හ එයින් සුවවූයේයයි වදාළේය. ඒ ආයුෂ්මත් මුගලන්මහතෙරුන්වහන්සේද යහපත ඇවැත්නි ඉදින් තොපගේවත් අපගේවත් පින් ඇත්තේවීනම් සෙටදවස දිය නොමුසු කිරිබතක් ලදුමෝ නම් යෙහෙකැයි කීයෙය මේ දෙදෙනාවහන්සේගේ කථාසල්ලාපය එම විහාර සක්මන් කෙළවර පිහිටි වෘක්ෂයෙහි අධිගෘහීතවූ දෙවිදු අසා සෙටදවස ආර්ය්‍යයන්වහන්සේට පැන් නොමුසු කිරිබතක් සලස්වමියි සිතා එකෙණෙහිම තෙරුන්වහන්සේගේ උපස්ථායක කුලයට ගොස් ඒ ගෙහි වැඩිමහල්පුත්‍රයාගේ ශරීරයෙහි ආවෙශවී දුක් ඉපදවූයේය ඉක්බිති ඔහුට පිළියම්කරණුපිණිස නෑයන් රැස්වූකල්හි ඔවුන්ගේ මධ්‍යයෙහි මෙසේ කීහ. ඉදින් සෙටදවස මේ ගෙට පිඩුපිණිස වඩනාවූ මුගලන් මහතෙරුන්වහන්සේට ගිතෙල් මීසකුරුයොදාලද පැන්නොමුසු කිරිබතක් සපයා පිළිගන්වනාහු නම් මොහු මුරගා අන්හරින්නෙමි යනුයි එබස රැස්වූ නෑයෝ තිව්සින් නොකියනලද්දේ නමුදු අපිවනාහී මහතෙරුන්ට නිබද්ධපිණ්ඩපාතය දෙන්නෝ නොවෙමුදැයි කියා දෙවෙනි දවස්හි එබඳු කිරිබතක් සම්පාදනය කළෝයි. මුගලන් මහතෙරුන්වහන්සේද උදෑසනම සැරියුත් මහතෙරුන්වහන්සේකරා ගොස් ඇවැත්නි මා පිඩුපිණිසගොස් එනතාක් මෙහිම වැඩහිඳුවයි කියා පාසිවුරු ධරමින් ගමට වන්නාහ ඒ මනුෂ්‍යයෝද තෙරුන්වහන්සේගේ ඉදිරියට දිවගොස් පාත්‍රය ගෙණ ඒ පැන්නොමුසු කිරිබතින් පාත්‍රය පුරා පිළිගැන්වූහ තෙරුන්වහන්සේ වඩිනු කැමැති ආකාර දක්වූහ ඉක්බිති ඒ මනුෂ්‍යයෝ ස්වාමීනි මේ කිරිබත වැලඳූමැනව නැවත් පිණ්ඩපාතයක්ද දෙමහයි කියා තෙරුන්වහන්සේ වළඳවා නැවතද පාත්‍රය පුරා කිරිබත් පිළිගැන්වූවෝය උන්වහන්සේ කිරිබත්පාත්‍රය ගෙණ විහාරයට අවුත් ඇවැත්නි ශාරිපුත්‍රස්ථවිරයෙනි මෙය වළඳනුයි පාත්‍රය එළවූහ ශාරිපුත්‍ර ස්ථවිරයන්වහන්සේද ඒ දුක කිරිබත ඉතාමැනව කෙසේ උපන්නේද්දෝයි දිවැසින් බලනුයේ ඒ කිරිබත උපන් හෙතුවදක නොහොබ ඊයේදවස මා ගිහිකල මාගේ මෑණියෝ සපයාදුන් පැන්නොමුසුකිරිබතින් බඩරුජාව සුවවීයයි මුගලන් මහතෙරුන්සමග කළකථාව විහාර සක්මන් කෙළවර රුක්හි වසනා දෙවිදු අසා අපගේ වාග්විඥප්තියෙන් උපස්ථායකකුලය පෙළහසා උපදවාලන් කිරිබතකැයි දැක ඇවැත මෞද්ගල්‍යායනය මේ කිරිබත ඉවත දමා පියව පරිභොගයට නුසුදුසු වන්නේ

යයි කියේය. ඒ ආයුෂ්මත් මුගලන් මහතෙරුන්වහන්සේද නැවැත අග ශ්‍රාවකයෙකු වසින් මහණෙකළද පණ්ඩුසාවාය පවා අනායාසයට නොපෑලදන් ගේ මව්දනී යනා සිනාසුදු හුපදවා සැරියුත් මහතෙරුන්ගේ එක කුසන් නිරිවත් පාසුග මුවටින් නෙණගොස් එකත් පසෙක සිටිත් පාවාහින ඒ කිරිබත් කිස වැටී බාසන මහතෙරුන් වහන්සේගේ පාතාවාධය අතුරුදන් වූයේය. එතැන් පටන් පනස් හවුරුද්දක් මුළුල්ලෙහි * නැවැත ඒ ආබාධය පහළ නූනේය. ඉක්බිති මුගලන් මහතෙරුන්ට මෙසේ කීහ. ඇවැත්නි වාග්විඥප්තියෙන් උපන් කිරිබත මා බඩවැල පිටතට නික්ම අහර නොයා කීව හැසිරේ නමුත් නොවැලැඳියයුතු වන්නේයයි මෙතෙහිද මේ ප්‍රීතිවාක්‍යය පැවැත්වූයේය.

මාගේ වචනයෙන් දූත් වීම හේතු කොටගෙණ උපන් මිමුසු කිරිබත ඉදින් මම අනුභව නොකෙළෙම්නම් මාගේ දිවපැවැත්ම පණ්ඩායන් වසින් ගනීා නම්යුතු වන්නේය ඉඳින් මාගේ බඩ වැල පිටතට නික්ම නොයා ඇවිද්දේද නමුදු දිවි ගියේ නමුදු ආජීව පාරිශුද්ධිශීලය නොබිඳිම් සවකීය ජීවිතය පසගෙනාමි අයුතුවූ ප්‍රත්‍යය සෙවීම දුරුකරමි මම එනාති හා නැවතුත් වහන්සේ විසින් නිංදනොකොට වදාරණලද අයුතුවූ ප්‍රත්‍යය සෙවීම නොකෙරෙමි යනු භාවයි

මෙයානාව සාධක වශයෙන්ම චිව රඟුඹනාගම් විහාරවාසීවූ අඹබාදක මහාතිස්ස ස්ථවිරයන්වහන්සේගේ කථා වස්තුවද කියයුත්තේය ඒ වනාති ඉතා පහලවන්නේයි මෙසේ සම්‍ප්‍රකාරයෙන්ම පණ්ඩිතවූ සැදැහැයෙන් පැවිදිවූ භික්ෂු නොමේ අයුතු පසය සෙවීමෙන් සිත්සුදු හුපදවා ආජීව පාරිශුද්ධි ශීලය පිරිසිදු කරන්නේයි —

( පා. ‡ )

යථාවුත්තවිධිනා ආජීවපාරිසුද්ධි තථා පච්චයසන්නිස්සිතං සීලං පඤ්ඤාය සම්පාදෙතබ්බං. පඤ්ඤාධිකාති තා පඤ්ඤවතො පච්චයෙසු ආදීනවානිසංසදස්සනසමත්ථතාය පහාය පච්චයගෙධං ධම්මෙන සමෙන උප්පන්නෙ පච්චයෙ යථාවුත්තෙන විධිනා පඤ්ඤාය පච්චවෙක්ඛිත්වා පරිභුඤ්ජනතො තං සම්පාදෙතබ්බං — තත්ථ දුවිධං පච්චවෙක්ඛණං පච්චයානං පටිලාභකාලෙච පරිභොගකාලෙ ච පටිලාභකාලෙපි ධාතුවසෙනවා පටිකූලවසෙනවා පච්චවෙක්ඛිත්වා ඨපිතානි චීවරාදීනි තතො උත්තරිං පරිභුඤ්ජන්තස්ස අනවජ්ජොව පරිභොගො පරිභොගකාලෙපි තත්‍රායං සන්නිට්ඨානකරො විනිච්ඡයො චත්තාරො හි පරිභොගා ථෙය්‍යපරිභොගො ඉණපරිභොගො දායජ්ජපරිභොගො සාමිපරිභොගොති — තත්‍ර සඞ්ඝමජ්ඣෙ නිසීදිත්වාපි පරිභුඤ්ජන්තස්ස දුස්සීලස්ස පරිභොගො ථෙය්‍යපරිභොගො නාම — සීලවතො අපච්චවෙක්ඛිත්වා පරිභොගො ඉණපරිභොගො නාම — තස්මා චීවරං පරිභොගෙ පරිභොගෙ පච්චවෙක්ඛිතබ්බං — පිණ්ඩපාතො ආලොපෙ ආලොපෙ තථා අසක්කොන්තෙන පුරෙභත්තපච්ඡාභත්තපුරිමයාමමජ්ඣිමයාමපච්ඡිමයාමෙසු සචස්ස අපච්චවෙක්ඛතොව අරුණං උග්ගච්ඡති ඉණපරිභොගට්ඨානෙ තිට්ඨති — සෙනාසනම්පි පරිභොගෙ පරිභොගෙ පච්චවෙක්ඛිතබ්බං — භෙසජ්ජස්ස පටිග්ගහණෙපි පරිභොගෙපි සතිපච්චයතාව වට්ටති එවං සන්තෙපි පටිග්ගහණෙ සතිං කත්වා පරිභොගෙ අකරොන්තස්සෙව ආපත්ති — පටිග්ගහණෙ පන සතිං අකත්වා, පරිභොගෙ කරොන්තස්ස අනාපත්ති —

* පාලියෙහිද සන්නයෙහිද "පඤ්චවස්සසහස්‍රස වස්සානි" යි කියාතිබෙතනමුත් බුදුව වැඩසිටියේ පන්සාළිස් වසක් බැවින්ද සැරියුත් මහතෙරුන් බුදුන් දෙවෙනි අවුරුද්දේ පැවිදිව බුදුන්ට මත්තෙන් පිරිනිවී බැවින්ද "පඤ්ච" යන්න වැඩි පාඨයකැයි සිතමු පාලි සන්න දෙකින් "පඤ්ච" යන්න අත්හැර ගොදුගතයුතුයි සියලු පොත්වලම ලියූ බැවින් වෙනස් නොකෙළෙමු (ශෝධක)

( ස ‡ )

යථා, යම්සේ; ආජීවපාරිසුද්ධි, ආජීව පාරිශුද්ධිතොමෙ; පරියෙසනා, විචාරන් සැපයියයුතුද; තථා, එසේම; පච්චයසන්නිස්සිතසීලං, ප්‍රත්‍යයසන්නිශ්‍රිතශීලයද; පඤ්ඤාය සම්පාදෙතබ්බං, ප්‍රඥාවෙන් සැපයියයුතුවේ; තං, මේ ප්‍රත්‍යයසන්නිශ්‍රිත ශීලය; පඤ්ඤාසාධනංහි, ප්‍රඥාව සාධනකොට ඇත්තේමැයි (කාරණා දක්වති "පඤ්ඤවතො...පෙ...සම්භවතො'' යි) පඤ්ඤවතො, ප්‍රඥා ඇත්තාහුගේ; පච්චයෙසු, චතුර්විධ ප්‍රත්‍යයන් කෙරෙහි; ආදීනවානිසංස දස්සනසමත්ථභාවතො, දොස් දැකීමෙහි ආදීනව හා පස්විසීමෙහි ආනිසංස දක්නාසට සමර්ථ බව හෙයිනි; තස්මා, එහෙයින්; පච්චයගෙධං, ප්‍රත්‍යයන් කෙරෙහි ලොභය; පහාය, දුරුකොට (ශෙධ ග්‍රහණයෙන්ම සගෞරව බැව්හුදු උපනිශ්‍රය බැව්හුදු මොහයද ගන්නාලැයි) ධම්මෙන සමෙන උපපන්නෙ පච්චයෙ, දැහැමෙන් සෙමෙන් උපන් ප්‍රත්‍යයන්; යථාවුත්තෙන විධිනා, යථොක්ත ක්‍රමයෙන්; පඤ්ඤාය, නුවණින්; පච්චවෙක්ඛිත්වා, පසවිසා; පරිභුඤ්ජමානෙන, වළඳන්නාහු විසින්; තං, ඒ ප්‍රත්‍යයසන්නිශ්‍රිත ශීලය; සම්පාදෙතබ්බං, සැපයියයුතු; තත්ථ, එහි; පච්චවෙක්ඛණං, ප්‍රත්‍යවෙක්ෂාව; දුවිධං, දෙවැදෑරුම්වේ; පච්චයානං, ප්‍රත්‍යයන්ගේ; පටිලාභකාලෙච, ප්‍රතිලාභ කාලයෙහිද; පරිභොගකාලෙච, අනුභව කාලයෙහිදැයි; පටිලාභකාලෙ'පිහි, ප්‍රතිලාභ කාලයෙහිදු; ධාතුවසෙනවා (ස්වකීය ප්‍රත්‍යයෙන් පවත්නා ධාතු මාත්‍රයෙකැයි) ධාතුවශයෙන් හෝ; පටික්කූලවසෙනවා [පූතිකායට පැමිණ පිළිකුල්වන්නාහයි) ප්‍රතිකූල වශයෙන් හෝ; පච්චවෙක්ඛිත්වා ඨපිතානි, ප්‍රත්‍යවෙක්ෂාකොට තබනලදද; චීවරාදීනි, චීවරාදී ප්‍රත්‍යයන්; තතො උත්තරිං, ප්‍රතිලාභ කාලයෙන් මතුයෙහි; පරිභුඤ්ජන්තස්ස, එයට කියනලද ප්‍රත්‍යවෙක්ෂාවෙන් පස්විසා අනුභවකරන්නාහුගේ; පරිභොගො, පරිභොගය; අනවජ්ජොව, නිරවද්‍යමවේ ("පටිලාභ...පෙ...පරිභොගො'' යනමේ පවනය පරිභොග කාලයෙහි ප්‍රත්‍යවේක්ෂාව ප්‍රතිෂෙපකාරණ පිණිස නොවෙයි ප්‍රත්‍යවෙක්ෂාවගේ ආදි ශුද්ධිය දක්වන පිණිස කියනලදී එහෙයින්ම "පරිභොග කාලෙ'පි'' යුහු පරිභොග කාලයෙහිදු පස්විසා පරිභොගකරන්නාහුගේ පරිභොගය නිවරද වේවයි යන අදහසි) තත්‍ර, ඒ පරිභොග කාලයෙහි කාරණ ප්‍රත්‍යවෙක්ෂාවෙහි; අයං, මේ; සන්නිට්ඨානකරො, සන්නිෂ්ඨාන කරන්නාවූ; විනිච්ඡයො, විනිශ්චයයයි; පරිභොගා, පරිභොගයෝ; චත්තාරො, සතරදෙනායි; ථෙය්‍යපරිභොගො, ථෙය්‍යපරිභොගය; ඉණපරිභොගො, ඍණපරිභොගය; දායජ්ජපරිභොගො, දායාද පරිභොගය; සාමිපරිභොගොති, ස්වාමිපරිභොගයයි; සඞ්ඝමජ්ඣෙපි නිසින්නො, සඟ මැදදු හිඳ; පරිභුඤ්ජන්තස්ස, වළඳන්නාවූ; දුස්සීලස්ස පරිභොගො, දුශ්ශීලයාගේ පරිභොගය; ථෙය්‍යපරිභොගො, ථෙය්‍ය පරිභොග නාම් (බුදුන් විසින් සිල්වත්හට අනුදත් බැවිනුදු දායකනුදු සිල්වත් හට දෙම්හයි දෙන බැවිනුදු සිල්වතුන් අතින් පසක දුශ්ශීලයා සඟමැද හිඳ වළඳතුදු උහුගේ පරිභොගය ථෙය්‍යපරිභොග නම්) සීලවතො, සිල්වත්හුගේ; අපච්චවෙක්ඛිත පරිභොගො, නොපස්විසා පසයු වැළඳීම; ඉණපරිභොගොනාම, ඍණපරිභොගනම් (ප්‍රතිග්‍රාහකයා කෙරෙන් දක්ෂිණාවිශුද්ධිය නොවනබැවින්

නොපස්වනා වැලදීම නයගෙණ වැල
දීමය යන අර්ථයි) ගසමා, එනෙහිත්;
චීවරං, සිවුර; පරිභොගෙ පරිභොගෙ,
හැඳීම් පෙරෙවීම හඳනා පොරෝණා
සඳ; පච්චවෙක්ඛිතබ්බං, පස්විකියයු
තු; පිණ්ඩපාතො, පිණ්ඩපාතය; ආ
ලොපෙ ආලොපෙ, ආලොපයක් ආ
ලොපයකි පස්වෙක්ෂායයුතු; තථා, අස
ක්කොන්තෙන, එසේ පස්විකාණුවට
නොපොහොසත්වූ විසින්; පුරෙභ
ත්තං, පෙර බතය; පච්ඡාභත්තං, පස්
බතය; පුරිමයාමං, පෙරයමෙහි; මජ්ඣිම
යාම, මැදුම්යාමය; පච්ඡිමයාමෙසු, පැ
සුම්යාමය යනාමෙහි; පච්චවෙක්ඛිතබ්
බං, පස්විකියයුතු; සචෙ, ඉදින්; අසො,
ඒ මහණහු; අපච්චවෙක්ඛිතොව,
නොපස්විකාත්තාම හැව (පස් නොවි
කා කන්ම) අරුණං උග්ගමෙති, අ
රුණු නැගිනම්; ඉණපරිභොගට්ඨා
නෙ තිට්ඨති, ඎණපරිභොගස්ථානයෙ
හි සිටී; සෙනාසනම්පි, සෙනසුනුදු; ප
රිභොගෙ පරිභොගෙ, පරිභොගයෙහි
පරිභොගයෙහි; පච්චවෙක්ඛිතබ්බං,
පස්විකියයුතු; භෙසජ්ජස්ස, බෙහෙත
ට; පටිග්ගහණෙපි, පිළිගන්නෙහිද;
පරිභොගෙපි, පරිභොගයෙහිද; සතිප
ච්චයතා වට්ටති, සමෘතියගේ ප්‍රත්‍යය
භාවය වදී (පිළිගන්නෙහිද පරිභොග
යෙහිද ප්‍රත්‍යවෙක්ෂා සමෘතියගේ ප්‍රත්‍ය
ය බව වදීන පස්විකාම පිළිගතයුතුය
පරිභොගද කායුතුය යන අර්ථයි)
එවං සන්තෙ'පි, එසේ කල්හිදු; පටි
ග්ගහණෙ සතිං කත්වා, පිළිගන්නෙහි
ප්‍රත්‍යවෙක්ෂා සමෘතියකොට; පරිභො
ගෙ අකරොන්තස්සෙව, පරිභොගයෙහි
නොකරණුව හට්ම; ආපත්ති, ඇවැත්
වෙයි; පටිග්ගහණෙ පන සතිං අක
ත්වා'පි, පිළිගැණිම්හි වනාහී සතිය
නොකොටද; පරිභොගෙ කරොන්ත
ස්ස, පරිභොගයෙහි සිහිකරණුව හට;
අනාපත්ති, ඇවැත් නොවේම.

( හා ‡ )

යම්සේ ආජීවය පිරිසිදුයෙන් සැප
යියයුතු වන්නේද එසේම ප්‍රත්‍යය ස
න්නිශ්‍රිත ශීලය ප්‍රඥාවෙන් සැපයියයු
තු වෙයි ඒ ප්‍රත්‍යය සන්නිශ්‍රිත ශීලය
වනාහි ප්‍රඥාව කාරණකොට ඇත්තේ
වැනි කුමක් හෙයින්දයත්? නුවණැත්
තා හට සිව්පසය නොපස්විනා පරි
භොගකිරීමෙහි ආදීනව හා පස්විනා
පරිභොග කිරීමෙහි අනුසස් දක්මට
පොහොසත් බව ඇති හෙයිනි. එසේ
හෙයින් සිව්පසයෙහි ගිජුබව දුරුකො
ට ධර්මයෙන් සෙමෙන් උපන් ප්‍රත්‍යය
න් යවිකී ක්‍රමයෙන් නුවණින් පස්වි
කා වළඳනා මහණ විසින් ඒ ප්‍රත්‍යය
සන්නිශ්‍රිත ශීලය සැපයිය යුත්තේයි.

ඒ ප්‍රත්‍යවෙක්ෂාකිරීම වනාහි දෙ
වැදෑරුම් වන්නේය ඒ කවරේදයත්?
චීවරාදි ප්‍රත්‍යයන් ලබනා කල්හිද පරි
භොගකරණ කල්හිද යන දෙතන්හි
කාරණ ප්‍රත්‍යවෙක්ෂාවයි ප්‍රත්‍යයන් ල
බනා කල්හිද ඒ ප්‍රත්‍යයෝ තමතමන්
ගේ හේතු වශයෙන් පවත්නා ඉකාහු
ත මාත්‍රයෙක නනාදීනා ධාතු වශයෙ
න් හෝ මේ යහපත්වූ ප්‍රණීතවූ චීවර
පිණ්ඩපාතාදී ප්‍රත්‍යයෝ දෙතිස් කුණ
පයෙන් පිරිතිබෙනනාවූ ශරීරයට පැ
මිණ පිළිකුල් වනනාහුයයි යනාදීන්
පිළිකුල් වශයෙන් හෝ ප්‍රත්‍යවෙක්ෂා
කොට තබනලද චීවරාදි ප්‍රත්‍යයන්
ඉන්මතු පරිභොගකාලද නියායෙන් පස්
විකා අනුභවකරනානුගේ පරිභොග
ය නිවරද දෙන්නේමය ඒ පරිභොග කා
ලයෙහි කාරණ ප්‍රත්‍යවෙක්ෂාවෙහි මේ
තොමුලා බව හරත්නාවූ විනිශ්චයයි.
ඒ කෙසේදයත්? පරිභොගය වනාහි
ථෙය්‍ය පරිභොගය ඉණපරිභොගය
දායාද පරිභොගය ස්වාමිපරිභොගයයි

සතරවැදෑරුම් වන්නේය ඒ සිව්වැදෑරුම් පරිභොගයන් අතුරෙන් සඟමැද සඞ්ඝයාට ඇතුළත්ව හිඳ වළඳන්නාවූ දුස්සීල භික්ෂූණයාගේ පරිභොගය ථෙය්‍යපරිභොග නම. සිල්වතුන්ගේද නොපස්විකාහලද ප්‍රත්‍යය පරිභොගය ඉණපරිභොග නම එහෙයින් සිවුර කයින් ඉවත්කොට හඳනා පොරොණා ක්ෂණයක් පාසා පස්විකාම හැකිය යුතුය පෙරවිය යුතුය පිණ්ඩපාතය වලඳනාකල්හිද පිඩක් පිඩක් පාසා පස්විකා වැලඳිය යුතුය එසේ නොහැකි මහණ එසින් පෙර බත් කාලය පසු බත් කාලය පෙරයම් දස පැයය මැදුමයම් දසපැයය පැසුම්යම් දසපැයය යනාමේ කාලයන් අතුරෙන් යම්කිසි කාලෙක පස් විකියයුතුය ඉදින් නොකින් එක්තරා කාලෙකත් පස්නොවිකා අරුණ නැගේවී නම් ඒ මහණහුගේ ප්‍රත්‍යය පරිභොගය ඉණපරිභොගයට පාතනයකි සිවිසී හෙවත් ඒ පරිභොගය ට නයගැතියෙක්වෙයි සෙනසුන්ද පරිභොගකරණ ක්ෂණයක් පාසා පස්විකිය යුතුය ගිලන්පස බෙහෙත් පිරිකර පිළිගන්නා කල්හිද වළඳනා කල්හිද පස්විකාම පිළිගතයුතුය වැළඳිය යුතුය එසේ ඇත්තෙනහිදු පිළිගන්නාකල පස්විකුම් සිහිනොකොට වළඳනාකල පස්විකුම් සිහිනොකරන්නා හටම ඇවැත්වෙයි පිළිගන්නාකල පස්විකුම් සිහිනොකොටද වළඳනාකල පස්විකා වළඳන්නා හට ඇවත් නොවන්නේයි.

(පා ¶)

චතුබ්බිධානි සුද්ධි දෙසනාසුද්ධි සංවර සුද්ධි පරියෙට්ඨි සුද්ධි පච්චවෙක්ඛණ සුද්ධීති තත්‍ථ දෙසනා සුද්ධි නාම පාතිමොක්ඛ සංවරසීලං තංහි දෙසනාය සුජ්ඣනතො දෙසනා සුද්ධීති වුච්චති— සංවර සුද්ධි නාම ඉන්‍ද්‍රිය සංවර සීලං තංහි න පුන එවං කරිස්සාමීති චිත්තාධිට්ඨානෙන සංවරෙන සුජ්ඣනතො සංවර සුද්ධීති වුච්චති— පරියෙට්ඨිසුද්ධි නාම ආජීව පාරිසුද්ධි සීලං තංහි අනෙසනං පහාය ධම්මෙන සමෙන පච්චයෙ උප්පාදෙන්තස්ස පරියෙසනාය සුද්ධත්තා පරියෙට්ඨි සුද්ධීති වුච්චති— පච්චවෙක්ඛණ සුද්ධි නාම පච්චයසන්නිස්සිත සීලං තංහි වුත්තප්පකාරෙන පච්චවෙක්ඛණෙන සුජ්ඣනතො පච්චවෙක්ඛණ සුද්ධීති වුච්චති— තෙන වුත්තං පටිග්ගහණෙ පන සතිං අකත්වා පරිභොගෙ කරොන්තස්ස අනාපත්තීති —

(ස ¶)

චතුබ්බිධාහි සුද්ධි, ශුද්ධි තොමෝ චතුර්විධවේ; දෙසනා සුද්ධි, දෙශනා ශුද්ධිය; සංවරසුද්ධි, සංවර ශුද්ධිය; පරියෙට්ඨිසුද්ධි, පර්‍යෙෂණ ශුද්ධිය; පච්චවෙක්ඛණ සුද්ධී'ති, ප්‍රත්‍යවෙක්ෂා ශුද්ධියයි; තත්‍ථ, එහි; දෙසනාසුද්ධි නාම, දේශනාශුද්ධි නම්; පාතිමොක්ඛ සංවර සීලං, ප්‍රාතිමොක්ෂ සංවර ශීලයයි; තංහි, එහෙයින්; දෙසනාය සුජ්ඣනතො, දේශනාවෙන් ශුද්ධවන හෙයින්; දෙසනා සුද්ධීති වුච්චති, දේශනා ශුද්ධියයි කියනලදී; සංවරසුද්ධි නාම, සංවරශුද්ධි නම්; ඉන්‍ද්‍රිය සංවරසීලං, ඉන්‍ද්‍රියසංවර ශීලයයි; තංහි, එහෙයිනි; න පුන එවං කරිස්සාමීති, නැවත මෙසේ නොකරම් යන; චිත්තාධිට්ඨාන සංවරෙනෙව, සිත්ළවන සංවරයෙන්ම; සුජ්ඣනතො, ශුද්ධවන හෙයින්; සංවරසුද්ධීති වුච්චති, සංවර ශුද්ධියයි කියනලදී; පරියෙට්ඨිසුද්ධි නාම, පර්‍යෙෂණශුද්ධි නම්; ආජීවපාරිසුද්ධිසීලං, ආජීව පාරිශුද්ධිශීලයයි; තංහි, එහෙයින්; අනෙසනං පහාය, අයුක්තාන්වෙෂණය දුරුකොට; ධම්මෙන සමෙන, දැහැමින් සෙමින්; පච්චයෙ උ

උප්පාදනස්ස, ප්‍රත්‍යයන් උපදවන්නාහට; පරියෙසනාය සුද්ධතා, පර්යේෂණයෙන් ශුද්ධවන හෙයින්; පරියෙට්ඨිසුද්ධි 'හි වුච්චති, පර්යේෂණ ශුද්ධියයි කියනුලැබේ; පච්චවෙක්ඛණසුද්ධි නාම, ප්‍රත්‍යවේක්ෂණශුද්ධි නම්; පච්චයසන්නිස්සිතසීලං, ප්‍රත්‍යය පරිභොගසන්නිශ්‍රිත ශීලයයි; හිංහි, කහෙහෙමි; වුත්තප්පකාරෙන පච්චවෙක්ඛණෙන, උක්ත ප්‍රකාර ප්‍රත්‍යවේක්ෂණයෙන්; සුජ්ඣනෙන, ශුද්ධවන හෙයින්; පච්චවෙක්ඛණසුද්ධි හි වුච්චති, ප්‍රත්‍යවේක්ෂණශුද්ධියයි කියනුලැබේ; තෙන වුත්තං, එහෙයින් කියනලදී; පටිලාභකෙණ පන, පිළිගණ්නා කල වනාහි, සතිං අකත්වා, පස්විකුම් සිහිනොකොට; පරිභොගෙ කරොන්තස්ස, පරිභොගකාලයෙහි කරණ්නාහට; අනාපත්ති 'හි, නිරවතැයි.

( භා ¶ )

පිරිසිදුබව වනාහි දෙශනාශුද්ධිය සංවරශුද්ධිය පර්යේෂණ ශුද්ධිය ප්‍රත්‍යවෙක්ෂාශුද්ධියයි සතරවැදෑරුම්වේ ඔවුන්අතුරෙන් දෙශනාශුද්ධි නම් ප්‍රාතිමොක්ෂ සංවරශීලයයි ඒ එසේයැයි ප්‍රාතිමොක්ෂ සංවරශීලය පාමොක් දෙසීමෙන් පිරිසිදුවන හෙයින් දෙශනාශුද්ධියයි කියනුලැබේ සංවරශුද්ධි නම් ඉන්ද්‍රියසංවරශීලයයි ඒ වනාහි නැවත මෙබන්දක් නොකරමණ්නම්යි සිතින් ඉටාගණ්ණ, සංවරයෙන්ම පිරිසිදුවනහෙයින් සංවරශුද්ධියයි කියනුලැබේ පර්යේෂණ ශුද්ධි නම් ආජීවපාරිශුද්ධිශීලයයි ඒ ශීලය වනාහි එක්විසි අයුතුප්‍රත්‍යය සෙවීම දුරුකොට දැහැමෙන් සෙමෙන් සිව්පසය උපදවනනාහට යහපත්සෙවීමෙන්ම පිරිසිදුවනහෙයින් පර්යේෂණශුද්ධියයි කියනුලැබේ ප්‍රත්‍යවෙක්ෂාශුද්ධිනම් ප්‍රත්‍යයපරිභොගනිශ්‍රිතවූ ශීලයයි. ඒ වනාහි යට කියනලද නයින් පස්විකා පසය පරිභොගකිරීමෙන් පිරිසිදුවනහෙයින් ප්‍රත්‍යවෙක්ෂා ශුද්ධියයි කියනුලැබේ. එහෙයින් සිව්පසය පිළිගණ්නාකල පස්විකුම් සිහිනොකොටද පරිභොගකාලයෙහි සිහිකරණ්නාහට ඇවැත්නොවන්නේයයි යන මේ වචනය කියනලද්දේයි. ~

( පා * )

සත්තන්නං සෙඛානං පච්චයපරිභොගො දායජ්ජපරිභොගො නාම තෙහි භගවතො පුත්තා තස්මා පිතුසන්තකානං පච්චයානං දායාදා හුත්වා තෙ පච්චයෙ පරිභුඤ්ජන්ති කිං පන තෙ භගවතො පච්චයෙ පරිභුඤ්ජන්ති ගිහීනං පච්චයෙ පරිභුඤ්ජන්තීති ගිහීහි දින්නාපි භගවතා අනුඤ්ඤාතත්තා භගවතො සන්තකා හොන්ති තස්මා භගවතො පච්චයෙ පරිභුඤ්ජන්තීති වෙදිතබ්බා ධම්මදායාද සුත්තඤ්චෙත්ථ සාධකං ~ ඛීණාසවානං පරිභොගො සාමිපරිභොගො නාම තෙහි තණ්හාදාසව්‍යං අතීතත්තා සාමිනො හුත්වා පරිභුඤ්ජන්ති ~ ඉමෙසු පරිභොගෙසු සාමිපරිභොගො ච දායජ්ජපරිභොගො ච සබ්බෙසං වට්ටති ඉණපරිභොගො න වට්ටති ථෙය්‍යපරිභොගෙ කථා, නෙව නත්ථි ~ යො. පනායං සීලවතො පච්චවෙක්ඛිත පරිභොගො ඉණපරිභොගස්ස පච්චනීකත්තා ආනණ්‍යපරිභොගො වා හොති දායජ්ජපරිභොගෙ වා සඞ්ගහං ගච්ඡති සීලවාපි හි ඉමාය සික්ඛාය සමන්නාගතත්තා සෙඛොත්වෙව වුච්චති ඉමෙසු පන පරිභොගෙසු යස්මා සාමිපරිභොගො අග්ගො, තස්මා තං පත්ථයමානෙන භික්ඛුනා වුත්තප්පකාරාය පච්චවෙක්ඛණාය පච්චවෙක්ඛිත්වා පරිභුඤ්ජන්තෙන

තා පච්චයසන්නිස්සිතසීලං සම්පාදෙතබ්බං එවං කරොන්තො හි කිච්චකාරී හොති—

( ස* )

සත්තන්නං සෙඛානං, සප්තවිධ ශෛක්ෂයන්ගේ; පච්චය පරිභොගො, ප්‍රත්‍යයපරිභොගය; දායජ්ජපරිභොගො නාම, දායාද පරිභොගනම්; හොති, ඒ; සෙඛා හි; භගවතො පුත්තා, භගවත්හුගේ පුත්‍රයහ; තස්මා, එහෙයින්; පිතු සන්තකානං පච්චයානං, පිතෘසන්තකවූ ප්‍රත්‍යයන්ට; දායාදා හුත්වා, හිමිව; තෙ, ඒ සෙඛයෝ; පච්චයෙ පරිභුඤ්ජන්ති, ප්‍රත්‍යයන් අනුභවකෙරෙත්; කිං පන, කිම; තෙ, ඒ සෙඛයෝ; භගවතො පච්චයෙ පරිභුඤ්ජන්ති, භගවත්හුගේ ප්‍රත්‍යය අනුභවකෙරෙද්ද; ගිහීනං පච්චයෙ පරිභුඤ්ජන්ති නී, ගිහියන්ගේ ප්‍රත්‍යය අනුභවකෙරෙද්ද; ගිහීහි දින්නා 'පි, ගිහියන් විසින් දෙනලද්දාහුද; භගවතා අනුඤ්ඤාතත්තා, භගවත්හු විසින් අනුඥාතහෙයින්; භගවතො සන්තකා හොන්ති, භගවත්හු සතුහිමිවෙත්; තස්මා, එහෙයින්; භගවතො පච්චයෙ පරිභුඤ්ජන්ති 'ති, භගවත්හුගේ ප්‍රත්‍යය වලඳතියි; වෙදිතබ්බා, දතයුත්තාහුයි; එතථ ඒ ගිහියන් දුන් දෙයද භගවත්හු සන්තකය යනු මේ අදහසයි; ධම්මදායාදසුත්තඤ්ච සාධකං, "ධම්මදායාද මෙ භික්ඛවෙ භවථ මා ආමිසදායාද" යනාදි ධර්මදායාදසූත්‍රයද සාධකයි; ඛීණාසවානං පරිභොගො, රහතුන්ගේ පරිභොගය; සාමිපරිභොගො නාම, ස්වාමිපරිභොගනම්වේ; තෙහි, ඒ රහත්හු; තණ්හාදාසබ්‍යං අතීතත්තා, තෘෂ්ණා දස්බව ඉක්මූ හෙයින්; සාමිනො හුත්වා, ස්වාමිව; පච්චයෙ පරිභුඤ්ජන්ති, ප්‍රත්‍යය පරිභොගකෙරෙත් (අවීතරාගයන්ට වනාහි තෘෂ්ණා පරවශ බැවින් ප්‍රත්‍යය පරිභොගයෙහි ස්වාමිබවෙක් නැති වීතරාගයන්ට එහි ස්වාමිභාවය රුචිවූපරිදෙන් ප්‍රත්‍යය පරිභොග සද්භාවයෙනැයි දතයුතු එහෙයින් ඔහු ප්‍රතිකූලය අප්‍රතිකූලාකාරයෙන්ද අප්‍රතිකූලය ප්‍රතිකූලාකාරයෙන්ද එය දෙක හැර උපෙක්ෂාකාරයෙනුද ප්‍රත්‍යයපරිභොගය කෙරෙත් නුයි දතයුතු) ඉමෙසු පරිභොගෙසු, මේ සතරවැදෑරුම් පරිභොගයන් කෙරෙහි; සාමිපරිභොගො ච, ස්වාමිපරිභොගයද; දායජ්ජපරිභොගො ච, දායාද පරිභොගයද; සබ්බෙසං, ආර්‍යයන්ටද පුහුදුනන්ටද; වට්ටති, වේ (ස්වාමිපරිභොග දායාද පරිභොගයෝ? පුහුදුනන්ට කෙසේ සම්භවෙද්ද? යෙත් උපචාර වශයෙන් සම්භවෙති දතයුතු—කල්‍යාණපෘථග්ජනයෙහි පිහිටි පුහුදුන්හුගේ ප්‍රත්‍යයගෘද්ධ දුරුකොට එහි අනුපලිප්තචිත්තයෙන් පරිභොගය ස්වාමිපරිභොගයක් බඳු සිල්වත්හු පස්වකාරණ පරිභොගය දායාද පරිභොගයක් මෙනි එහෙයින් 'දායාදපරිභොගයෙව වා සඞ්ගහං ගච්ඡති" යුහු) ඉණපරිභොගො, ප්‍රත්‍යවෙක්ෂා නොකිරීමෙන් වන ඍණපරිභොගය; න වට්ටති, හැමදෙනාටම නොවේ; ථෙය්‍ය පරිභොගෙ, දුශ්ශීලවකරණ ථෙය්‍යපරිභොගයෙහි; කථා එව නත්ථි (නොවටී යනුයෙහි) කථාමනැති; යො පනායං, මේ යමක්තෙලේ; සීලවතො, සිල්වතුන්ගේ; පච්චවෙක්ඛිත පරිභොගො, පස්වකාකාරණ පරිභොගයෙක්ද; සො, හෙතෙම; ඉණපරිභොගස්ස පච්චනීකත්තා, ඍණපරිභොගයට ප්‍රතිපක්ෂහෙයින්; ආනණ්‍යපරිභොගො වා හොති, අනෘණපරිභොගනම් වෙයි; දායාද පරිභොගෙයෙව, දායජ්ජ පරිභොගයෙහිම හෝ;

සඞ්ඛ්‍යං ගච්ඡති, සංඛ්‍යායට යේ; සීලවාපි, සිල්වත්ද; ඉමාය සික්ඛාය සමන්නාගතත්තා, මේ ශික්ෂාවෙන් සමන්විතබැවින්; සෙඛොත්වෙව, සෙඛය යිම්; වුච්චති, කියනුලැබේ. ඉමෙසු පන පරිභොගෙසු, මේපරිභොගයන් කෙරෙහි; යස්මා, යම්හෙයකින්; සාමිපාරිභොගො අග්ගො, ස්වාමිපරිභොගය අග්‍රද; තස්මා, එහෙයින්; තං, ඒ; පච්චයඤ්ඤාතෙන, පතන්නාවූ; භික්ඛුනා, මහණහු විසින්; වුත්තප්පකාරාය පච්චවෙක්ඛණාය; උක්තප්‍රකාර ඇති ප්‍රත්‍යවෙක්ෂණයෙන්; පච්චවෙක්ඛිත්වා, පස්විකා; පරිභුඤ්ජනෙතන, වලඳන්නහු විසින්; පච්චයසන්නිස්සිතසීලං, ප්‍රත්‍යයසන්නිශ්‍රිතශීලය නෙමේ; සම්පාදෙතබ්බං, සැපවියයුතු; එවං කරොනෙතා, මෙසේ පස්විකා පරිභොගකරන්නේ; කිච්චකාරී හොති, කෘත්‍යකාරීවේ (යුක්තප්‍රාප්තකාරීවේ යුතැති)

( ඝා * )

සප්තශෛක්ෂ්‍යපුද්ගලයන්ගේ ප්‍රත්‍යය පරිභොගය දායාදපරිභොග නම ඒ ශෛක්ෂ්‍යපුද්ගලයෝ වනාහි භාග්‍යවතුන් වහන්සේගේ ඖරස පුත්‍රයෝයි. එහෙයින් පියසතු පසයට උරුමවූ ඒ ශෛක්ෂ්‍යපුද්ගලයෝ සිව්පසය පරිභොග කෙරෙත්මැයි ( ශෛක්ෂ්‍යයෝනම් සෝවාන් මාර්ගස්ථ සෝවාන්ඵලස්ථ සකෘදාගාමි මාර්ගස්ථ ස කෘ දා ගා මි ඵ ල ස්ථ අ නා ගා මි මා ර්ග ස්ථ අ නා ගා මි ඵ ල ස්ථ අර්හත්මාර්ගස්ථ යන සත්දෙනායි මෙතන්හි ලභ්‍යමානනයවශයෙන් සප්ත ශෛක්ෂ්‍යයෝම නිරවශෙෂකොට කියෙහිදු සෝවාන්මාර්ගස්ථ සකෘදාගාමිමාර්ගස්ථ අනාගාමි මාර්ගස්ථ අර්හත්මාර්ගස්ථ යනසතරශෛක්ෂ්‍යයෝ පුද්ගල

වශයෙන් දුකයේ ලැබියයුතුය. කුමක්හෙයින්දයත්? ත්‍රිහෙතුක ප්‍රතිසන්ධිඇතතාවූ කාමභූමි නිශ්‍රිතවූ හෝ රූපභූමිනිශ්‍රිතවූ හෝ යම් කිසි යොගාවචර පුද්ගලයෙක් ත්‍රෛභූමික සංස්කාර ධර්මයන් අතුරෙන් යම්කිසිවක් අරමුණුකොටගෙණ "සබ්බෙ සඞ්ඛාරා අනිච්චා" කියා හෝ "සබ්බෙ සඞ්ඛාරා දුක්ඛා" කියා හෝ "සබ්බෙ ධම්මා අනත්තා" කියා හෝ භාවනාවඩා මාර්ගචිත්තවීපිය උපදනා සමයෙහි මනොවාරාවර්ජනසිත එක්වරක් ඉපිද සොම්නස්සහගතඥාණසම්ප්‍රයුක්ත පළමුවන දෙවන කාමාවචර කුශලචිත්තයන් දෙදෙනා අතුරෙන් යම්කිසි චිත්තයෙක් මන්දප්‍රාඥයාහට පරිකර්ම උපචාර අනුලොම වශයෙන් තුන්වරෙක්ද තික්ෂ්ණප්‍රඥයාහට උපචාර අනුලොම වශයෙන් දෙවරෙක්ද ත්‍රෛභූමික ධර්මයන්ම අරමුණුකොටගෙණ ඉපද සතරවැනිව හෝ තුන්වැනිව පෘථග්ජනගොත්‍රය මැඩ පවත්වමින් ගොත්‍රභූචිත්තය නිවන් අරමුණුකොටගෙණ ව්‍යුත්ථානගාමිනිර්වේදගාමීනා ජවනකෘත්‍යවශයෙන් එක්වරක් ඉපිද නිරුද්ධවේ ඉක්බිති නිවන් අරමුණුකොටගෙණ තීක්ෂ්ණප්‍රඥයාහට සතරවැනිවද මන්දප්‍රාඥයාහට පස්වැනිවද ධ්‍යානලාභියෙක්වීනම් ධ්‍යානාඞ්ග පඤ්චකයෙන් යුත් ප්‍රථමධ්‍යාන මාර්ගචිත්තය හෝ ධ්‍යානාඞ්ගසතරකින් හෝ තුණකින් හෝ දෙකකින් හෝ යුක්තවූ ද්විතීයධ්‍යාන තෘතීයධ්‍යාන චතුර්ථධ්‍යාන මාර්ගචිත්තය හෝ ඉදින් ගොත්‍රභූ චිත්තය උපෙක්ෂාසහගත කාමාවචර කුසල්සිතක් වීනම් උපෙක්ෂාඑකාග්‍රතා යන අඞ්ගවයෙන් යුක්තවූ පඤ්චමධ්‍යානමාර්ගචිත්තයහෝ පාදකධ්‍යාන සන්මර්ශිතධ්‍යාන පුද්ගලාධ්‍යාශයධ්‍යාන යන මෙයින් එක්

ආකාරයකින් ධ්‍යානනියම විදර්ශනා නියමයන්ගේ වශයෙන් දුඃඛසත්‍යය පිරිසිඳ දැනගැන්මය සමුදය සත්‍යය නැතිකිරීමය නිරොධසත්‍යය ප්‍රත්‍යක්ෂකිරීමය මාර්ගසත්‍යය වැඩීමයයි කියනලද කෘත්‍යසතරම එකවර සිඩකෙරෙමින් ඒ ඒ මාර්ගයෙන් සිඳියයුතු කෙලෙස් නමැති වෘක්ෂයන්ට ගසනලද අකුණුපහරක්මෙන් එකම මාර්ගචිත්තක්ෂණය කෙලශමූලොත්පාටනය කරමින් එක්වරක්ම ඉපිද නිරුඩවූ ඉක්බිති එම නිවන් අරමුණු කොටගෙණ ඒ මාර්ගචිත්තය හා සම්ප්‍රයුක්තවූ චෙතනාව විසින් උපදවනලද ඵලචිත්තය සප්තජවනවීථිය සම්පූර්ණවනතාක් මන්දප්‍රාඥයානට දෙවරක් හා තීක්ෂප්‍රාඥයානට තුන්වරක්ද ජවනකෘත්‍ය වශයෙන් ඉපිද නිරුඩවේ * ඉක්බිති ඒ ආර්‍ය්‍යපුද්ගල තෙමේ තමාලත් මාර්ගධර්මය ප්‍රත්‍යවෙක්ෂාකරණු කැමැතිකල්හිද ඵලධර්මය ප්‍රත්‍යවෙක්ෂාකරණු කැමැතිකල්හිද නිවන් ප්‍රත්‍යවෙක්ෂාකරණු කැමතිකල්හිද ඒ මාර්ගයෙන් නුත් කෙලෙසුන් ප්‍රත්‍යවෙක්ෂාකරණු කැමතිකල්හිද ඒ මාර්ගයෙන් නොනුත් ඉතිරි කෙලෙසුන් ප්‍රත්‍යවෙක්ෂාකරණු කැමතිකල්හිද එම මාර්ගයෙන් ලත් ඵලයට සමවදිනු කැමති කල්හිද යන මේතෙක් තන්හි හැඟිනිපරිද්දෙන් මාර්ගවිත්තවීථියෙහි කී නියායෙන් කාමාවචර ත්‍රිහේතුක මහාකුශලචිත්ත වීථියක්ම ඒ ඒ ක්‍රියා නිෂ්පත්තිය කෙරෙමින් ජවනකෘත්‍ය වශයෙන් උපදනේයි ධ්‍යානලාභීයෙක් ධ්‍යානය නොලබා හෝ ධ්‍යාන නැත්තාවූ ශුෂ්කවිදර්ශකයෙක් හෝ මාර්ගය උපදවනකල ධර්මස්වභාව පරිදෙදන් ධ්‍යානාඞ්ගපඤ්චකින් යුත් මාර්ගවිථිය පහළවේ යයි කියනලද එසාම මාර්ගචිත්තක්ෂණය වනාහි නැවත ඕහට නූපදනේයි කුමක් හෙයිනයත් මාර්ගචිත්තයාගේ කෘත්‍යය කෙලෙස්සිඳීම බැවින් නැවත ඒ සිත ඉපිද කටයුතු කෘත්‍යයක් නැති බැවින් එකම පුද්ගලයෙකුට එකම මාර්ගචිත්ත එක්වරක්ම මුත් දෙවරක් නූපදනේයි.

මෙසේ මාර්ගක්ෂණය එකම චිත්තක්ෂණයක්වූ නිමේෂොන් මෙෂාදිවශයෙන් උපමාරහිතවූ සූක්ෂ්මතර කාලයක් බැවින් මාර්ගස්ථ පුද්ගලයා හට ඒ මාර්ගක්ෂණයෙහි යම් කිසි ප්‍රත්‍යයක් දීමහෝ පිළිගැන්ම දුෂ්කරය සප්තශෛක්ෂ්‍යයන් අතුරෙන් පුද්ගලවශයෙන් සෝවාන් සකෘදාගාමි අනාගාමි යන ත්‍රිවිධ ඵලස්ථපුද්ගලයන්ම බොහෙවින් ලැබියයුතුහෙයිනැයි දතයුතු කුමක්ද ඒ ශෛක්ෂ්‍යයෝ

* සං-ශ් ... ශ් ... ශ් ... ශ් ... නිශ් ... ශ් ... ශ්...ශ්...ශ්-සෝවාන්මාර්ග වීථිය
මනො පරි උප අනු ගොත්‍ර මාර්ග ඵල ඵල භව
සං-ශ් ... ශ් ... ශ් · ශ් ... නිශ් ...ශ්...ශ්...ශ්...ශ්-සකෘදාගාමිමාර්ග වීථිය
මනො පරි උප අනු ගොත්‍ර මාර්ග ඵල ඵල භව
සං-ශ් .. ශ් ... ශ් ... ශ් ... ශ් ... ශ් ... ශ්...ශ්...ශ්-අනාගාමි මාර්ග වීථිය
මනො පරි උප අනු ගොත්‍ර මාර්ග ඵල ඵල භව
සං-ශ් ... ශ් ... ශ් ... ශ් ... ශ් ... ශ් ... ශ්...ශ්...ශ්-අර්හත් මාර්ග වීථිය
මනො පරි උප අනු ගොත්‍ර මාර්ග ඵල ඵල භව

මේ දක්වූයේ මන්දප්‍රාඥයාහට උපදනා මාර්ග වීථිහුයි. තීක්ෂප්‍රාඥයාහට පරිකර්ම සිතහැර උපදනාබැවින් ඵලසිත් තුනක්ම වෙත්.

මනොද්වාරාවර්ජනය පටන් ත්‍රෛභූමික සංස්කාරයන්ද ගොත්‍රභූ පටන් නිර්වාණයද අරමුණු කරත්.

භාග්‍යවතුන් වහන්සේගේ පසය අනුභව කරන්නාහුද ගිහියන්ගේ පසය අනුභව කරන්නාහුද යත්? සිව්පසය වනාහි ගිහින් විසින් දෙනු ලබන්නාහුද භාග්‍යවතුන් වහන්සේ විසින් අනුදැන වදාරණලද බැවින් භාග්‍යවතුන්වහන්සේ සන්තකනම් වෙත්මය. එහෙයින් භාග්‍යවතුන්වහන්සේගේ පසය වළඳන්නාහුයයි දත යුත්තාහුය. මේ ගිහින් විසින් දුන් පසය භාග්‍යවතුන්වහන්සේ සතුයයි යන කාරණය හැඟවීමට මැදුම්සඟියෙහි ආ ධම්මදායාදනම් සූත්‍රය නිදර්ශනයකටයුතුයි අගින් ඵලයෙහි පිහිටි බැවින් අශෛක්ෂ්‍යවූ රහතුන්වහන්සේගේ සිව්පස පරිභොගය ස්වාමිපරිභොග නම්වෙයි. ඒ එසේමැයි රහතුන්වහන්සේ වනාහි තෘෂ්ණාව හල් බව ඉක්ම සිටි හෙයින් අග්‍ර දක්ෂිණාවට සුදුසුව ගැදූහවතුන්ගේ සිව්පසයට ස්වාමිව පසය පරිභොග කෙරෙත්මැයි මේ සතර පරිභොගයන් අතුරෙන් ස්වාමි පරිභොගය දායාද පරිභොගය යන දෙයාකාරය සියළු ආර්‍ය්‍යයන්ටද පෘථජනයන්ටද සුදුසු වන්නේය. රහතුන්විසින්ලැබියයුතුවූ ස්වාමි පරිභොගය හා සප්තශෛක්ෂ්‍යයන් විසින් ලැබිය යුතුවූ දායාදපරිභොගයද පෘථග්ජනයන් විසින් කෙසේලැබිය යුත්තාහුදයත්? සැහැල්ලු පැවතුම් ඇති පෘථග්ජනයන්ගේ ප්‍රත්‍යයාශාව දුරුකොට ප්‍රත්‍යයෙහි නොඇලුනු සිතින් පරිභොගකිරීම ස්වාමි පරිභොගයක් වැනිහෙයින්ද සිල්වත් පෘථග්ජන මහණ පස්විකුම්සිහිකොට පසය පරිභොගකිරීම දායාද පරිභොගයක් වැනී බැවින්ද පෘථග්ජනයන්ගේ ඒ දෙයාකාර පරිභොගයද ස්වාමි දායාද පරිභොගයන්වම ඇතුලත් වෙත්මැයි. ප්‍රත්‍යවෙක්ෂා නොකොට කරණලද ඉණපරිභොගය කිසිවෙකුටත් නොසුදුසු වන්නේය දුස්සීලව සිවෘගණ කරණ ථෙය්‍ය පරිභොගයයි කියයුත්තක්ම නැත්තේය. සිල්වත් මහණහුගේ ඒ මේ පස්විකීමෙන් කරණලද ප්‍රත්‍යය පරිභොගය ඉණපරිභොගයට දුරු ප්‍රතිපක්‍ෂ බැවින් ණයගැතිනොවූ පරිභොගනම. නොහොත් දායාද පරිභොගයෙහි හෝ ඇතුලත්වෙයි. ඒ එසේමැයි සිල්වත් මහණද එක් ආකාරයකින් මේ ශික්‍ෂාවෙන් යුක්ත බැවින් ශෛක්ෂ්‍යම යයි කියනු ලැබේ. මේ සතර වැදෑරුම් පරිභොගයන් අතුරෙන් යම් හෙයකින් ස්වාමිපරිභොගයම අග්‍රවේද එහෙයින් ඒ ස්වාමි පරිභොගයම පතන්නාවූ යට කියනලද ප්‍රකාර පස්විකුම් සිහිකොට පසය පරිභොග කරන්නාවූ මහණ විසින් ප්‍රත්‍යය සන්නිශ්‍රිත ශීලය සැපයිය යුත්තේයි මෙසේ පරිභොග කරන්නාවූ මහණ තෙමේ සුදුසු සැපිද පැමිණි කල්ද දන් මහණයයි කියනු ලැබේ.

---

( පා † )

වුත්තම්පි චෙතං.

පිණ්ඩං විහාරං සයනාසනඤ්ච
ආපඤ්ච සඞ්ඝාටි රජූපවාහනං
සුත්වාන ධම්මං සුගතෙන දෙසිතං
සංඛාය සෙවෙ වරපඤ්ඤ—
—සාවකො.

තස්මා හි පිණ්ඩෙ සයනාසනෙච
ආපෙච සඞ්ඝාටිරජූපවාහනෙ
එතෙසු ධම්මෙසු අනූපලිත්තො
භික්ඛු යථා පොක්ඛරෙ වාරිබින්දු.
කාලෙන ලද්ධා පරතො අනුග්ගහා
ඛජ්ජෙසු භොජ්ජෙසු සායනෙසු
මත්තංසොජඤ්ඤාසතතං උපට්ඨිතො
වණස්ස ආලෙපනරූහනෙ යථා.
කන්තාරෙ පුත්තමංසංව
අක්ඛස්සබ්භඤ්ජනං යථා
එවං ආහරි ආහාරං
යාපනත්ථාය මුච්ඡිතොති.

( ස † )

ධූතනලපි වෙතං, මේ කියනලදී; පිණ්ඩං, පිණ්ඩපාතයද; විහාරං, සෙයද; සයනාසනඤ්ච, හැඳපුටුද ( දෙකින්ම සෙනසුන් පස කීහු ) සංඝාටිරජූපවාහනං, සිවුරෙහි රජස් දුරුකරන්නාවූ; ආපඤ්ච, ජලයද; සුගතෙන දෙසිතං, "පටිසංඛායොනිසො චීවරං පටිසෙවති" යනාදීන් සුගත්හුවිසින් දෙසිතවූ; ධම්මං සුත්වාන, ධර්මය අසා; වරපඤ්ඤසාවකො, තථාගත ශ්‍රාවක තෙමේ; සංඛාය, "යාවදෙව ඉමස්ස කායස්ස ඨිතියා යාපනාය" යනාදී නයින් ප්‍රත්‍යවෙක්ෂාකොට; සෙවෙ(පිණ්ඩ ශබ්දයෙන් කියනලද පිණ්ඩපාත ප්‍රත්‍යයද "විහාරං සයනාසනං" යනුයෙන් කියනලද සෙනාසන ප්‍රත්‍යයද පිපාසාහෙගලඤ්ඤාය සංඛ්‍යාතවන හෙයින් පැණද ගිලාන ප්‍රත්‍ය යනුයි ආපඤ්ච යෙන් කියනලද ගිලාන ප්‍රත්‍යයද සංඝාටි ශබ්දයෙන් කියනලද චීවර ප්‍රත්‍යයද යන චතුර්විධප්‍රත්‍යයන් සෙවුයේයි සෙවුනට සම්බන්ධ වන්නේය යන අදහසයි) තස්මා, එහෙයින් (යම් හෙයකින් තථාගත ශ්‍රාවක තෙමේ ප්‍රත්‍යවෙක්ෂාකොට සෙවුයේද එහෙයින් යන අදහසයි)පිණ්ඩෙ,පිණ්ඩපාත පසයෙහිද; සයනාසනෙ ච, සෙනසුන් පසයෙහිද; ආපෙච සංඝාටිරජූපවාහනෙ, සිවුරෙහි රජස් සෝදන ජලයෙහිද (සිවුරු පසයෙහි හා ගිලන්පසයෙහිද යන අදහසයි) එතෙසු ධම්මෙසු, මේ සිව්පසයනැමති ධර්මයන් කෙරෙහි; භික්ඛු, මහණ තෙමේ; අනුපලිත්තොනොහොති, නොඇලෙන්නේයි (කුමක්මෙන්දැන්? ) පොක්ඛරෙවාරිබින්දුයථා, පොකුරුපත ජලබින්දුමෙනි) පොකුරුපත ජලබින්දු යම්සේ නොඇලේද එසේම පස්විසා සිව්පස සෙවුන මහණ තෙමේ ඒ සිව්පසයෙහි නොඇලෙන්නේයි) කාලෙන, ආයති යන්ගේ භොජන කාලයෙහි; අනුග්ගහා, තමාකෙරෙහි අනුකම්පායෙන්; පරතො, දායකයා කෙරෙන්; ලද්ධා, ලදින්, ඛජ්ජෙසු, අපූපාදීයෙහිදු; භොජ්ජෙසු, අන්නාදීයෙහිදු; සායනෙසු, ඵාණිතාදීයෙහිදු; සො, ඒ මහණ; සතතං, හැමවේලෙහිම; උපට්ඨිතො, එළඹසිටි සිහිඇත්තේ; ආලෙපන, බෙහෙත් ආලෙපනයෙන්; වණස්ස රූහණෙයථා, වණරොපනයෙහි මෙන්; මත්තංජඤ්ඤ, පමණදන්නේයි (යම්සේ වෙදෙක් බෙහෙද ආලෙපකරණයේ පමණදැන ආලෙප කෙරේද එසේම පමණ දැන අහර වළඳන්නේයි යුතැති) කන්තාරෙ, කාන්තාරයෙහි; පුත්තමංසංව, පුත්‍ර මාංසය යම්සේද; අක්ඛස්සබ්භඤ්ජනායථා, අකුරක්හි දන වදනය යම්සේද; එවං, එපරිද්දෙන්ම; යාපනත්ථාය, ශරීරයැපෙන පිණිස; අමුච්ඡිතො, තෘෂ්ණාවෙන් මූර්ජිත නොවූයේ; ආහාරං, අහර; ආහරී, වළඳන්නේයි ( ආහරි—යන්නෙහි "ආහරෙය්‍ය" යනඅදහසයි. ආහරෙය්‍යාහාරං—යනු පාඨය යෙත්ම)...

( හා † )

මේ වදාරණ ලද්දෙයමැයි මේ සස්නෙහි තථාගත ශ්‍රාවක තෙමේ භාග්‍යවතුන් විසින් නුවණින් පස් විසා පසය පරිභොග කටයුතුය. යනාදී නයින් වදාළ ධර්මය අසා දැන මේ ශරීරයාගේ යැපීම පිණිසය යනාදී යටකී නයින් පස් විසා පිණ්ඩපාතයද හැඳ පුටු සහිතවූ විහාරයේද සිවුරුද රජස් දුරුකරන්නාවූ ජල සඞ්ඛ්‍යාතවූ ගිලන්පසද යන මේ සිව්පසය සෙවනය කරන්නේයි. යම්සේ ඒ තථාගත ශ්‍රාවක තෙමේ පස්විසා සිව්පසය සෙවනය කෙරේද එහෙයින් පිණ්ඩපාතයෙහිද සෙනාසනයෙහිද චීවරයෙහිද ගිලන්

පසයෙහිද යනමේ සිව්පසයෙහි නොලුම්පත නොඇලෙන දිය බිඳුව ක්මෙන් පස් විකා පසය පරිභොගකරණ මහණ තෙමේ නොඇලෙන්නේසි. තවද ආයුෂ්මතුන්ගේ භොජන කාලයෙහි හෙවත් පිණ්ඩපාතය කාලයෙහිද ගිලන්පස විකාලයෙහිද තමාගේ ආත්ම භාවය කෙරෙහි අනුකම්පායෙන් දයකයා කෙරෙන් ලබනලද කඩාකෑයුතු පූ ආදියෙහිදු වැලඳියයුතු ආහාරාදියෙහිදු ලෙවියයුතු පැණි ආදියෙහිදු ඒ මහණ තෙම සියලු කල්හිව එළඹ සිටි සිහි ඇත්තෙක්ව යම්සේ ව්‍රණයකි බෙහෙත් ගල්වන තැනැත්තේ පමණදැන ගල්වාද එමෙන්ම ශරිරයාපනායට සුදුසු අහර පමණ දැනව ලඳන්නේසි තවද වාලුකා කාන්තාරාදියෙහි මල පුත්‍රයාගේ මාංසය යම්සේ මාංස තෘෂ්ණාවෙන් නොගිජුව නොමුලාව හුදෙක් කාන්තාරය එතර කිරීමම සලකා අනුභව කෙරේද යම්සේ ගැල පෙරළීම සලකා අක්ෂයෙහි තෙල් ගල්වාද එපරිද්දෙන්ම තෘෂ්ණාවෙන් නොමුලාව හුදෙක් ප්‍රතිපත්ති ධර්ම පූරණයට කාරණවූ ශරීරයාගේ යැපීම හෝ බොහෝ කල් පැවැත්ම පිණිස අහර වලඳන්නේසි.——

( පා ‡ )

ඉමස්සච පච්චය සන්නිස්සිත සීලස්ස පරිපූරකාරිතාය භාගිනෙය්‍ය සඞ්ඝරක්ඛිත සාමණෙරස්ස වත්‍ථුං කථෙතබ්බං සොහි සම්මාපච්චවෙක්ඛිත්වා පරිභුඤ්ජ යථාහ——

උපජ්ඣායො මංභුඤ්ජමානං
සාලිකූරං සුනිබ්බුතං
මාහෙවත්වං සාමණෙර
ජිව්හං ඩාහෙසි අසඤ්ඤතො——
උපජ්ඣායස්ස වචො සුත්වා
සංවෙගමලභිං තදා
එකාසනෙ නිසීදිත්වා
අරහත්තං අපාපුණිං——
සොහං පරිපුණ්ණ සඞ්කප්පො
වස්සෙ පණ්ණරසො යථා
සබ්බාසව පරික්ඛීණො
නත්ථිදානි පුනබ්භවො ති——
තස්මා අඤ්ඤොපි දුක්ඛස්ස
පත්‍ථයන්තො පරික්ඛයං
යොනිසො පච්චවෙක්ඛිත්වා
පටිසෙවෙථ පච්චයෙ ති——

එවං පාතිමොක්ඛ සංවරසීලාදි වසෙන චතුබ්බිධං——

( ස ‡ )

ඉමස්ස පච්චය සන්නිස්සිත සීලස්ස, මේ ප්‍රත්‍යය සන්නිශ්‍රිත ශීලයාගේ; පරිපූරකාරිතාය, සම්පූර්ණකාරී බැවිනි; භාගිනෙය්‍ය සඞ්ඝරක්ඛිත සාමණෙරස්ස, භාගිනෙය්‍ය සඞ්ඝරක්ඛිත නම් හෙරණුන්ගේ; වත්‍ථුං කථෙතබ්බං, වතද කියයුතු; සොහි, ඒ හෙරණතෙමේ; සම්මා, මනාකොට; පච්චවෙක්ඛිත්වා, පස්විකා, පරිභුඤ්ජ, වැලඳී; යථාහ, කීසේමැනු; උපජ්ඣායො, මාගේ උපාධ්‍යාය තෙරහු; සුනිබ්බුතං, ඉතා නිවුනු ( ඇල්වූ ) සාලිකූරං, හැල්බත, භුඤ්ජමානං, වලඳනනාවූ; මං, මට; සාමණෙර, හෙරණ; ත්වං, තෝ; අසඤ්ඤතො, අසංයතවූයෙහි (නොපස්විකන්නෙහි) ජිව්හං, දිව; මාඩාහෙසි; නහමක්දවසි කියා ('අවච' යන්නක් අධ්‍යාහාරකරණු) උපජ්ඣායස්ස, උපාධ්‍යාය තෙරුන්ගේ; වචො සුත්වා, ඒ නෙපුල් අසා; තදා, ඒ වේලෙහි; සංවෙගමලභිං, සංවේගයට පැමිණියෙමි; එකාසනෙ නිසීදිත්වා, එක ආශනයෙහිද, අරහත්තං අපාපුණිං, රහත්බවට පැමිණියෙමි; සො අහං, ඒ මම; පණ්ණරසො වස්සෙ යථා පුණුරුසි පොහෝදවස් සඳමෙන්; පරිපුණ්ණ සඞ්කප්පො, පරිපූර්ණ සඞ්කල්ප ඇතියෙමි; සබ්බාසවපරික්ඛීණො, ක්ෂීණවූ සියලු ආශ්‍රවයන් ඇත්තෙම්; ඉදානි, දැන්;

පුනබ්භවො නත්‍ථි, පුනර්භවය නැති; තාසමා, එහෙයින්; අජ්ජෙදපි, අනිතෙ ඛුද්දං; දුක්ඛස්ස, දුක්ඛයාගේ; පරික්ඛයං, පරික්ෂය; පච්චයෙහාතා, පතත්තෙන්; යොනිසො, නුවණින්; පච්චවෙක්ඛිත්වා, පස් විකා; පච්චයෙ, සතර පසයන්; පටිසෙවෙථ, සෙවුනේයි; එවං, මෙසේ; පාතිමොක්ඛසංවරාදි වසෙන, ප්‍රාතිමොක්ෂ සංවරාදීන් විසින්; චතුබ්බිධං, චතුර්විධ වේ~

( ගා ‡ )

මේ ප්‍රත්‍යය සන්නිශ්‍රිත ශීලය සම්පූර්ණකිරීමෙහි සාධක වශයෙන් භාගිනෙය්‍ය සංඝරක්ඛිත නම් හෙරණුන් දූගේ කථා වස්තුවද කියයුතුයි ඒ භාගිනෙය්‍ය සංඝරක්ඛිතනම් සාමණේරයන්වහන්සේ මනාකොට පස් විකා පසය පරිභොග කෙළේයි මෑත භාගයෙහි එව හෙතුවෙන්ම රහත්ඵලයට පැමිණ මේ ගාථාවන්ගෙන් තමා ප්‍රකාශ කෙළේයි. කීයේමෑ නෝ~ මාගේ උපාධ්‍යායවූ ස්ථවිරයන්වහන්සේ ඉතා සිහිල්වූ හැල්බත වලඳන්නාවූ කට එම්බා සාමණේරය තෝ අසංයතකාරීව නොහොත් පස් නොවිකා වලදා දිව නොදවවයි කීසේක. උපාධ්‍යාය ස්ථවිරයන්වහන්සේගේ ඒ තෙපුල් අසා මම එකෙණෙහිව සංවේගයට පැමිණියෙමි. එම අ අස්නෙහිම හිඳ සියලු කෙලෙසුන් නසා රහත්ඵලයටද පැමිණියෙමි ඒ රහත්වූ මම පූර්ණපොහෝ දවස සොළොස් කලාවෙන් පරිපූර්ණ චන්ද්‍රමණ්ඩලය මෙන් පරිපූර්ණ කල්පනා ඇත්තෙක්ද වීමි කාමාදි සියලු ආශ්‍රවයන් හාත්පසින්ම අවසන් කෙළෙමි. එහෙයින් මාගේ නැවත භවයෙහි ඉපදීමෙක්ද නැත්තේයි. මා මෙන් අනිත්‍ය ඛුද්‍ද දුක් අවසන් කිරීමෙන් ලැබියයුතුවූ නිර්වාණ ධර්මය පතන්නේ වීනම් හෙතෙමේද නුවණින් පස් විකා චීවරාදි සිව්පසය සෙවනය කරන්නේයි මෙසේ මේ ශීලය ප්‍රාතිමොක්ෂ සංවරය ඉන්ද්‍රිය සංවරය ආජීව පාරිශුද්ධිය ප්‍රත්‍යය සන්නිශ්‍රිතය යන මොවුන්ගේ වශයෙන් සතරුකාර වන්නේයි ~

( පා ¶ )

පඤ්චවිධ කොට්ඨාසස්ස පඨමපඤ්චකෙ අනුපසම්පන්නාන සීලාදිවසෙන අත්‍ථො වෙදිතබ්බො ~ වුත්තං හෙතං පටිසම්භිදායං ~ කතමං පරියන්ත පාරිසුද්ධි සීලං අනුපසම්පන්නානං පරියන්තසික්ඛාපදානං ඉදං පරියන්ත පාරිසුද්ධි සීලං ~ කතමං අපරියන්ත පාරිසුද්ධි සීලං උපසම්පන්නානං අපරියන්ත සික්ඛාපදානං ඉදං අපරියන්ත පාරිසුද්ධිසීලං ~ කතමං පරිපුණ්ණ පාරිසුද්ධි සීලං පුථුජ්ජන කල්‍යාණකානං කුසල ධම්මෙ යුත්තානං සෙක්ඛපරියන්තෙ පරිපූරකාරීනං කායෙ ච ජීවිතෙ ච අනපෙක්ඛානං පරිච්චත්තජීවිතානං ඉදං පරිපුණ්ණ පාරිසුද්ධි සීලං ~ කතමං අපරාමට්ඨ පාරිසුද්ධි සීලං සත්තන්නං සෙඛානං ඉදං අපරාමට්ඨ පාරිසුද්ධිසීලං ~ කතමං පටිප්පස්සද්ධි පාරිසුද්ධිසීලං තථාගතසාවකානං ඛීණාසවානං පච්චෙක බුද්ධානං තථාගතානං අරහන්තානං සම්මාසම්බුද්ධානං ඉදං පටිප්පස්සද්ධි පාරිසුද්ධි සීලන්ති ~ තත්‍ථ අනුපසම්පන්නානං සීලං ගණනවසෙන සපරියන්තත්තා පරියන්ත පාරිසුද්ධීති වෙදිතබ්බං ~

( ඝ ¶ )

පඤ්චවිධකොට්ඨාසස්ස, පඤ්චවිධ කොට්ඨාසයාගේ; පඨමපඤ්චකෙ, පළමුවන පඤ්චකයෙහි; අනුපසම්පන්නසීලාදිවසෙන, අනුපසම්පන්න සීලාදි විසින්; අත්‍ථො වෙදිතබ්බො, අර්ථ දතයුතු; කතමං පරියන්ත පාරිසුද්ධිසීලං, පර්‍ය්‍යන්ත පාරිශුද්ධි ශීලනම් කවරයත්? අනුපසම්පන්නානං, උපසම්පන්න නොවූ; පරියන්ත සික්ඛාපදානං, පර්‍ය්‍යන්ත

ඇති ශික්ෂාපද ඇත්තාවූන්ගේ (පරියන්තා එතෙසං අත්ථීති පරියන්තානි සික්ඛාපදානි තානි යෙසං හොන්ති පරියන්තසික්ඛාපදානි තෙසං පරියන්තසික්ඛාපදානං" යි ගන්නේ ගණන් වශයෙන් පර්‍ය්‍යන්තඇති ශික්ෂාපද ඇත්තාහු පරියන්තසික්ඛාපදනම්වෙති ඒ පර්‍ය්‍යන්තශික්ෂාපදයන්ගේ) ඉදං, මේසීලය; පරියන්තපාරිසුද්ධිසීලං, පර්‍ය්‍යන්තපාරිශුද්ධිශීලනම්; උපසම්පන්නානං (කල්‍යාණපුථුජ්ජන සෙක්ඛාසෙක්ඛයන් නොවූවන් හැර) සෙසු උපසම්පන්නයන්ගේ; අපරියන්තසික්ඛාපදානං, අපර්‍ය්‍යන්ත ශික්ෂාපද ඇත්තාවූන්ගේ; පුථුජ්ජනකල්‍යාණකානං, පෘථග්ජනකල්‍යාණකයන්ගේ; කුසලධම්මෙ යුත්තානං, විදර්ශනාචාරයෙහි යුක්තප්‍රයුක්තවූ; සෙක්ඛපරියන්තෙ, ශෛක්‍ෂ්‍යධර්මය න් පර්‍ය්‍යන්තකොටඇති ධර්මයන් කෙරෙහි ("සෙක්ඛධම්මා පරියන්තො පරමොමරියාදෙ එතෙසන්ති සෙක්ඛපරියන්තො,, නාමරූප පරිච්ඡේදයෙහි පටන් කුශලධර්ම සමාදානයෙහි සෝ පටන් ගොත්‍රභූවදක්වා ප්‍රවෘත්තකුසලධර්මප්‍රබන්ධය ශෛක්‍ෂ්‍යධර්මයෙහි පැහැරසිටිහෙයින් සෙඛපරියන්තනම් හොහොත් ශෛක්‍ෂ්‍යධර්මයන් පශ්චිමන්තකොටඇතිවූ ශෛක්‍ෂ්‍යකල්පවූ ලෞකික ත්‍රිවිධ ශික්ෂාවෝ සෙඛපරියන්තනම්වෙත්)ඒ සෙඛපරියන්තයෙහි; පරිපූරකාරීනං, කිසි ශික්ෂා වකුදු නොහැරපුරණ්ණාවූ; කායෙ ච ජීවිතෙ ච අනපෙක්ඛානං, මතුයෙහි විශේෂාධිගමයපිණිස කායෙහිදු ජීවිතයෙහිදු නිරපෙක්ෂවූ; පරිච්චත්තජීවිතානං, එහෙයින්ම සීලපූරණයපිණිස පරිත්‍යක්තවූ ජීවිතය ඇත්තාවූන්ගේ; ඉදං, මේ; පරිපුණ්ණපාරිසුද්ධිසීලං, පරිපූර්ණපාරිශුද්ධිශීලනම්; සත්තන්නං සෙක්ඛානං, සප්තවිධශෛක්‍ෂ්‍යයන්ගේ; ඉදං සීලං, මේ ශීලය; අපරාමට්ඨත්තා, දෘෂ්ටිසංකෙලශයෙන් අපරාමෘෂ්ටබැවින්; අපරාමට්ඨපාරිසුද්ධිසීලං, අපරාමෘෂ්ටපාරිශුද්ධිශීලනම්; තථාගතසාවකානං ඛීණාසවානං, තථාගතශ්‍රාවකවූ ක්ෂීණාශ්‍රවයන්ගේද; පච්චෙකබුද්ධානං, ප්‍රත්‍යෙකබුද්ධයන්ගේද, තථාගතානං අරහන්තානං සම්මාසම්බුද්ධානං, තථාගතවූ අර්හත්වූ සම්‍යක්සම්බුද්ධයන්ගේද; ඉදං, මේ සීලයතෙමේ; පටිප්පස්සද්ධිපාරිසුද්ධිසීලං, කෙලශයන් සම්භාරයෙන් සන්හිඳීමෙන් පිරිසිදුබැවින් පටිප්පස්සද්ධිපාරිශුද්ධිශීලනම්; තත්‍ර, ඒපාලියෙහි (අනුපසම්පන්නාදවූ අසෙක්ඛ සෙක්ඛ කල්‍යාණ පුථුජ්ජනයන්ගේ ශීලය මහානුභාවහෙයින් ආනුභාවවශයෙන් අපර්‍ය්‍යන්තනම්වේනුයි "ගණනවසෙන අපරියන්තතා" යි කීහු)

(භා ¶)

පස්වැදෑරුම් කොට්ඨාසයෙහි පළමුවන පක්‍ෂයෙහි අනුපසම්පන්න සීලාදීන්ගේ වශයෙන් අඩ දතයුතු මේ කියනලදුයේමැයි ප්‍රතිසම්භිදාමාර්ගපාලියෙහි පර්‍ය්‍යන්තපාරිශුද්ධිශීල නම් කවරයත් ? මේතෙක් ශික්ෂාපදයයි ගණන්වශයෙන් කෙලවරක් ඇති ශික්ෂාපද ඇත්තාවූ අනුපසම්පන්නයන්ගේ ශීලය පර්‍ය්‍යන්තපාරිශුද්ධිශීල නම අපර්‍ය්‍යන්තපාරිශුද්ධිශීල නම් කවරයත්? කෙලවරක්නැති ශික්ෂාපදඇතිකල්‍යාණපෘථග්ජනශෛක්‍ෂ්‍යඅශෛක්‍ෂ්‍යයන්හැර සෙසු උපසම්පන්නභික්‍ෂූන්ගේ ශීලය අපර්‍ය්‍යන්තපාරිශුද්ධිශීල නම පරිපූර්ණපාරිශුද්ධිශීල නම් කවරයත්? කල්‍යාණ පෘථග්ජනයන්ගේ නාමරූප ව්‍යවස්ථානයෙහිපටන් ගොත්‍රභූසිතදක්වා පැවැති කුශලධර්මයෙහි හෙවත් විදර්ශනාවෙහි යෙදුනාවූ ශෛක්‍ෂ්‍යධර්මසඞ්ඛ්‍යාතවූ මාර්ගඵල ධර්මයන් අවසන්කොටඇති ලෞකික ත්‍රිවිධශීලයෙහි සම්පූර්ණකාරිවූ මතු

මත්තෙහි මාර්ගඵලාධිගමය සඳහා ශරීරයෙහිද ජීවිතයෙහිද අපේක්ෂාවක් නැත්තාවූ එහෙයින්ම සිල්රක්ෂාකිරීම පිණිස ජීවිතයපවා අත්හරින්නාවූ කල්‍යාණපෘථග්ජනයන්ගේ මේ ශීලය පරිපූර්ණ පාරිශුද්ධිශීල නම. අපරාමෘෂ්ට පාරිශුද්ධිශීල නම් කවරයත්? සෝවාන්මාර්ගස්ථයා පටන් අර්හත්මාර්ගස්ථයා අවසන්කොට ඇති සප්තශෛක්ෂ්‍ය පුද්ගලයන්ගේ මේ ශීලයවනාහි ශීලයෙන් සංසාරශුද්ධිය වේයි යන දෘෂ්ටියෙන් අල්වා නොගන්නාලද බැවින් අපරාමෘෂ්ට පාරිශුද්ධිශීල නම. ප්‍රතිප්‍රශ්‍රබ්ධිපාරිශුද්ධිශීල නම් කවරයත්? තථාගත ශ්‍රාවකවූ ක්ෂීණාශ්‍රව මහරහතුන්ගේද පසේබුදුවරයන්ගේද අර්හත් සම්‍යක්සම්බුද්ධවූ තථාගතයන් වහන්සේගේද මේ ශීලය සියලු කෙලෙසුන් සර්වප්‍රකාරයෙන්ම සන්සිඳීමෙන් පිරිසිදුවූහෙයින් ප්‍රතිප්‍රශ්‍රබ්ධිපාරිශුද්ධිශීල නම් වන්නේය.

ඒ පාලියෙහි අනුපසම්පන්නයන්ගේ ශීලය ගණන්වශයෙන් කෙළවරඇතිබැවින් පර්‍යන්තපාරිශුද්ධිශීලය යි දතයුතුයි.෴

( පා * )

උපසම්පන්නානං෴
නවකොටි සහස්සානි
අසීතිං සතකොටියො
පඤ්ඤාසං සතසහස්සානි
ඡත්තිංසා ච පුනාපරෙ෴
එතෙ සංවර විනයා
සම්බුද්ධෙන පකාසිතා
පෙය්‍යාලමුඛෙන නිද්දිට්ඨා
සික්ඛා විනයසංවරෙ ති෴

එවං ගණනවසෙන සපරියන්තම්පි අනවසෙසවසෙන සමාදානභාවං ලාභයසඤාති අඞ්ගජීවිතවසෙන අදිට්ඨපරියන්තභාවඤ්ච සන්ධාය අපරියන්තපාරිසුද්ධි ති වෙදිතබ්බං෴ චිරගුම්බකවාසි අම්බඛාදක මහාතිස්සත්ථෙරස්ස සීලම්ව෴ තථාහි සො ආයස්මා෴

ධනං චජෙ යො පන අඞ්ගහෙතු
අඞ්ගං චජෙ ජීවිතං රක්ඛමානො
අඞ්ගං ධනං ජීවිතං චාපි සබ්බං
චජෙ නරො ධම්ම මනුස්ස—
—රන්තො ති෴

ඉදං සප්පුරිසානුස්සතිං අවිජහන්තො ජීවිතසංසයෙපි සික්ඛාපදං අවීතික්කම්ම තෙනෙව අපරියන්තපාරිසුද්ධිසීලං නිස්සාය උපාසකස්ස පිට්ඨිගතො ච අරහත්තං පාපුණි෴ යථාහ෴

න පිතා න පිතෙ මාතා
න ඤාති න පි බන්ධවා
කරොතෙතාදිසං කිච්චං
සීලවන්තස්ස කාරණා෴
සංවෙගං ජනයිත්වාන
සම්මසිත්වාන යොනිසො
තස්ස පිට්ඨිගතො සන්තො
අරහත්තං අපාපුණි ති෴

( ස * )

උපසම්පන්නානං, උපසම්පන්නයන්ගේ; නවකොටිසහස්සානි, නවකෙළදහසෙක්ද; අසීතිං සතකොටියො, එක්සියකෙළක් හා අසූකෙළක්ද; පඤ්ඤාසං සතසහස්සානි, පණස්ලක්ෂයෙක්ද; ඡත්තිංසා ච පුනාපරෙ, නැවත අනික්සතිසෙක්ද; විනයසංවරෙ, විනයපිටකයෙහි; පෙය්‍යාලමුඛෙන නිද්දිට්ඨා, ඒ ඒ තැන විස්තරවාරයෙන් දක්වනලද; එතෙ සංවරවිනයා, කායවාක් දෙදෙනා සංවරණයකරණහෙයින්ද විනයනය කරණහෙයින්ද සංවරවිනයනම්වූ; සික්ඛා, ශීලසඞ්ඛ්‍යාත ශික්ෂාවෝ; සම්බුද්ධෙන, සර්වඥයන් වහන්සේ විසින්, පකාසිතා, පහලකරණලදහු; එවං, මෙසේ; ගණනවසෙන පරි

යථානාමපි, ගණෙන් පිහිත් පර්යාගතා
ඇත්තේද; අනවසෙසවසෙන, උපස
ම්පන්නයා විසින් හික්මියයුතු වූ සියලු
ශීලය කිරාවිරහණ ශෙයෙන්; සමාදාන
භාවං, සමාදානසද්භාවයද; (ලාභ යස
ඤාති අනපෙක්ඛිතවසෙන, ලාභය යශස්ය
නෑයෝය අඞ්ගය ජීවිතය යනමොවුන්
ගේ හෙතුවෙන්ද, අදිට්ඨපරියන්තභා
වං, නොදක්නාලද කෙළවරඇති බ
වද; සන්ධාය, සඳහා; අපරියන්තපාරිසු
ද්ධි වෙදිතබ්බං, අපර්යන්තපාරිශුද්ධි
යයි දතයුතු; චිරරක්ඛිතවාසී, එනම
තැංපවසනා; අම්බඛාදකමහාතිස්සත්ථෙ
රස්ස, අම්බඛාදකමහාතිස්සනම් තෙ
රුන්ගේ; සීලම්පි, ශීලයමෙති—තථා
හි, එසේමැනු—සෝ ආයස්මා, ඒ ආ
යුෂ්මතෙමේ; ධනංචජෙ අඞ්ගහෙතු, (පා
රිපන්ථික සොරාදීන්විසින් උපදැන
වූයේ) අඞ්ගයහෙතුකොට ධනය දෙන්
නේය; අඞ්ගංචජෙ ජීවිතං රක්ඛමානො,
(සර්පදෂ්ටාදි කාලයෙහි) දිවිරක්නේ
අඞ්ගයහරණිය (දක්ෂිණාපාහ කපාහ
රණිය යන අර්ථයි) අඞ්ගං, කරචර
ණාදි අඞ්ගයද; ධනං, ධනයද; ජීවිතං,
ජීවිතයද යන; සබ්බං, සියල්ල; ධම්ම
මනුස්සරමානො නරො (සුතසෝම මහා
බොධිසත්වාදීන්මෙන) ධර්මානුස්මරණ
යකාරණ සිහිකෙරෙමි, චජෙ, හරණෙ
ය යන; ඉමං සප්පුරිසානුගතිං, මේ
මහාපුරුෂයන්ගේ පිළිපැව; අවිජහ
න්තො, නොහරණේ; ජීවිතසංසයෙපි
(ක්ෂුධාපරිශ්‍රමයෙන්) ජීවිතසංශය ඇ
ති කල්හිදු; සික්ඛාපදං අවීතික්කමම්
(අණාචිකාවූ අඹපත් සම්පයෙහි ගසින්
වැගිරතුබුවද ප්‍රතිග්‍රාහකයකුනැති
බැවින් නො වළඳන්නහු) ප්‍රතිග්‍රහණ
ශික්ෂාපදය නොඉක්ම; තදෙව අපරි
යන්තපාරිසුද්ධිසීලං තිස්සස්ස, එම අප
ර්යන්තපාරිශුද්ධිශීලය තිස්සය; උපාසක
ස්ස පිට්ඨියංසෙයානො, උපාසකයාපිට හිඳ
ම; අරහත්තං පාපුණි, රහත්බවට
පැමිණියේය; යථාහ, කියේමැයි—ථෙ
තාගේ; නපිපිතා, පියෙක්නොදෙනෙයි;
නමාතා, මවෙක්නොදෙනෙයි; නඤාති,
නෑඑකෙක් නොදෙවෙයි; නබන්ධවො,
සබඳුවෙක් ඇත්තෝනොදෙයි; එ
තාදිසං කිච්චං, මෙබඳු කෘත්‍යය (එහ
වත් පිට හිඳුවාගෙණයාම) සීලවන්තා
සස කාරණා, සිල්වත්බවහෙයින්;
තාදිසං කිච්චං, දසරුවෙන් ඉසිලීම්
ආදී කෘත්‍යය; කරොති, කරන්නේයි;
සංවෙගං ජනයිත්වාන, මෙසේ සංවෙ
ග උපදවා; යොනිසො, නුවණින්; ස
ම්මසිත්වාන, සන්මර්ශනයකොට; ත
ස්ස, ඒ උපාසකයාගේ; පිට්ඨියංතො
සන්තො, පිටහුන්නේම; අරහත්තං
අපාපුණි, රහත්බවට පැමිණියේය.

( හා * )

උපසම්පන්න භික්ෂූන්ගේ කාය
වාක්දෙක හික්මවන හෙයින්ද කාය
වාග්වාරදෙකින් පාපධර්මයන්ට ඇතු
ළුත්වියනොදී ආවරණයකරණහෙ
යින්ද සංවරවිනය නාමවූ ශික්ෂාපද
විනයපිටකයෙහි ඒඒතැන විස්තර
කිරීමෙහි දෙදරවූවයයි කියයුතුවූ
පෙයාලයන්ගෙන් සංක්ෂේපකොට
සර්වඥසම්බුද්ධයන් වහන්සේ විසින්
දෙශනාකර වදාරණලද්දාවූ පෙයා
ලාධිරණයකොට විස්තරවශයෙන්
දක්වනලද්දහුනම් මේ සංවරයේ නා
වනලදහස් එක්සිය අසූකොටි ප
ණස්ලක්ෂ සතිසක් වෙත්මෙය පාරාජි
කා පොතේ ආ උත්තරි මනුෂ්‍ය ධර්ම
පෙයාලය නීලපෙයාලය සඤ්චරි
ත්‍ර පෙයාලය යන ආදී විස්තර
කිරීමෙන්ම නොයෙක් දහස්ගණන්
සංවරයෝ ලැබෙත්මය මෙසේ මේ
උපසම්පන්න ශීලය ගණන් වශ
යෙන් කෙලවර ඇත්තෙහිදු උපස
ම්පන්නයා විසින් හික්මියයුතුවූ සියලු
ශීලය ඉතුරුනොකොට සමාදන්වන
බවද ලාභය කීර්තිය නෑයෝය ශරී
රය ජීවිතය යනමොවුන්ගේ හෙතු
වෙන් නොදක්නාලද කෙළවර ඇති
බවද සඳහා අපර්යන්ත පාරිශුද්ධිශීල

නම් වෙයි දතයුතු. චීවරගුම්බක නම් වෙහෙර විසූ අඹඛාදක මහාතිස්ස නම් තෙරුන්වහන්සේගේ සීලය මෙහි උදාහරණ කටයුතුයි. ඒ එසේ වැයි ආයුෂ්මත්වූ ඒ මහාතිස්සස්ථවිරයන්වහන්සේ දුර්භික්ෂකාලයෙහි දීර්ඝමාර්ගයෙහි වඩනෝ සා පිපාසයෙන් පීඩිත කලාන්තව එක්තරා අඹගසක්මුල සැතපුණේය. උන්වහන්සේ සා පිපාසයෙන් දිවියනතුරම දුකට පත්වූ කල්හිද තමන්වහන්සේ වැදහොත්තැනම අඹ ගසින් වැගිරතුබූ අස්වාමිකවූ බොහෝ පිලිකුන් අඹපලන් දක පිළිගන්වන්නෙකු නැතිහැවින් නොවළඳ ප්‍රතිග්‍රහණ ශික්ෂාපදය නොඉක්මවා මෙසේ සිතූයේය - මේ ලෝකයෙහි සබ්බකීය ශරීරය රක්නාකැමැති පුරුෂතෙම මංපහරණ සොරුන් ආදීන්ගෙන් පෙළෙනු ලබන කල්හි ශරීරය හේතු කොටගෙණ තමාසතු දේසතුව සොරුන්ට දී ශරීරය රක්නේය ශරීරාවයවයන් සර්පාදීන් විසින් දෂ්ටකළකල්හි ද ජීවිතරක්නාපිණිස දෂ්ටකළ අවයව කපාහැරපියා දිවිරක්නේය සුතසෝම මහා බෝධිසත්වාදීන්මෙන් ධර්මය සිහිකරණ සත්වතෙම මේ හස්තපාදාදි අවයවයන්ද හිරණ්‍යසුවර්ණාදි ධනයද ජීවිතයද යන සියල්ලම අත්හැරපියා ශීලාදි ගුණධර්මයම රක්නේයයි යන මේ මහාපුරුෂයන්ගේ සිත්විල්ල නොහරිමින් ජීවිතයට පවා සැක කටයුතු සා පිපාසා දුක් පැමිණි කල්හිද ප්‍රතිග්‍රහණ ශික්ෂාපදය නොඉක්මවාම වැඩහුන්නේය.

ඉක්බිති එක්තරා මහලු උපාසක යෙක් පිපාසයෙන් ගිලන්ව කලාන්තව වැටීනුත් ඒ මහාතිස්සස්ථවිරයන් වහන්සේ දක විඩාවූබව දන අඹරස පිරිනා පොවා නොයාහැකි බව දැන අනුකම්පා උපදවා තෙරුන්වහන්සේ තමපිටමත් තබා හිඳුවාගෙණ ගියේය. උන්වහන්සේද එම අපස්සේනපාරිශුද්ධ ශීලය හේතුකොටගෙණ උපාසකයාගේ පිට හිඳගණිමි තෙමේ තමහට අවවාදකරණුයේ මෙසේ සිතූයේය - එම්බා තිස්සය තා මේ උපාසකයාගේ පියෙක්ද නොවෙයි මවෙක්ද නොවෙයි නෑයෙක්ද නොවෙයි බන්ධුවෙක්ද නොවෙයි එතකුදුවුවත් තාගේ සිල්වත්බව හේතුකොටගෙණ මේ දුන් පිට හිඳුවාගෙණයාම්‍යාදී එතාවත්කාරන් නෝයයි මෙසේ සංවේග උපදවා නුවණින් ත්‍රෛභූමික සංස්කාර ධර්මයන් සන්මර්ශණයකොට ඒ උපාසකයාගේ පිට හිඳගෙණම අර්හත්ඵලයට පැමිණියේක. එතැන් පටන් උන්වහන්සේ අඹඛාදක තිස්සයයි ප්‍රසිද්ධයය —

( පා + )

පුථුජ්ජනකල්‍යාණකානං සීලං උපසම්පදතො පට්ඨාය සුධොතජාතිමණි විය සුපරිකම්මකත සුවණ්ණං විය ච අතිපරිසුද්ධත්තා චිත්තුප්පාදමත්තකෙනාපි මලෙන විරහිතං අරහත්තස්සෙව පදට්ඨානං හොති තස්මා පරිපුණ්ණපාරිසුද්ධීති වුච්චති — මහාසඞ්ඝරක්ඛිත භාගිණෙය්‍ය සඞ්ඝරක්ඛිත ථෙරානං විය — මහාසඞ්ඝරක්ඛිතත්ථෙරං කිර අතික්කන්තසට්ඨිවස්සං මරණමඤ්චෙ නිපන්නං භික්ඛුසඞ්ඝො ලොකුත්තරාධිගමං පුච්ඡි ථෙරො නත්ථි මෙ ලොකුත්තරධම්මොති ආහ — අථස්ස උපට්ඨාකො දහරභික්ඛු ආහ භන්තෙ තුම්හෙ පරිනිබ්බුතොති සමන්තා ද්වාදසයොජනා මනුස්සා සන්නිපතිතා තුම්හාකං පුථුජ්ජනකාලකිරියාය මහාජනස්ස විප්පටිසාරො භවිස්සතීති — ආවුසො අහං මෙත්තෙය්‍යං භගවන්තං පස්සිස්සාමීති විපස්සනං න පට්ඨපෙසිං තෙන හි මං නිසීදාපෙත්වා ඔකාසං කරොහීති සො ථෙරං නිසීදාපෙත්වා බහි

නික්ඛමන්තො ථෙරො තස්ස සහගනි
නික්ඛමණාව අරහත්තං පත්වා, අච්ඡරි
කාය සඤ්ඤං අදාසි සඞ්ඝො සන්නිප
තිත්වා ආහ එවරූපෙ මරණකාලෙ
ලොකුත්තරධම්මං නිබ්බත්තෙන්තා දු
ක්කරං කරිත්ථාති නාවුසො එතං දු
ක්කරං අපිච වො දුක්කරං ආචික්ඛි
ස්සාමි අහං ආවුසො පබ්බජිත කාල
තො පට්ඨාය අසතියා අඤ්ඤාණපක
තං කම්මං නාම න සරාමීති භාගිනෙ
ය්‍යොපිස්ස පඤ්ඤාසවස්සකාලෙ එවමෙ
ව අරහත්තං පාපුණීති ...

( ෂ † )

උපසම්පදතො පට්ඨාය, උපසම්පන්නවූ
සේක් පටන්; සුධොතජාතිමණිවිය,
මනාකොට දෘහැලිකළ දාරඟ මිණිරුව
න්ක්මෙන්; සුපරිකම්මකතසුවණ්ණං
විය ච, මනාකොට පරිකර්මකරණලද
සුවර්ණයක්මෙන්ද; අතිපරිසුද්ධතා,
ඉතා පිරිසිදුහෙයින්; චිත්තුප්පාදමත්ත
කෙනාපි මලෙන, අකුශල චිත්තොත්
පාදමාත්‍ර මලයෙකිනුදු; විරහිතං, වියු
ක්තවූයේ; අරහත්තස්සෙව පදට්ඨානං
හොති, අර්හත්වයටම කාරණාවේද;
තස්මා, එහෙයින්; පරිපුණ්ණපාරිසුද්ධි
නිවුච්චති, පරිපූර්ණපාරිසුද්ධයයි කිය
නුලැබේ; මහාසඞ්ඝරක්ඛිතභාගිනෙ
ය්‍ය සඞ්ඝරක්ඛිතත්ථෙරානංවිය, මහා ස
ඞ්ඝරක්ෂිතස්ථවිරයන්හා උන්ගේ බෑණ
නෙයින් භාගිනෙය්‍ය සඞ්ඝරක්ෂිතනම්
වූ ස්ථවිරයන්හා දෙදෙනාගේ ශීලයමෙ
නි; මහාසඞ්ඝරක්ඛිතත්ථෙරංකිර, මහා
සඞ්ඝරක්ෂිත ස්ථවිරයන්; අභිඤ්ඤාත
සට්ඨිවස්සං, ඉක්මුණු සැට වයස් ඇත්
තවුන්; මරණමඤ්චෙ නිපන්නං, මර
ණමංචකයෙහි හොත්තවුන්; භික්ඛු
සඞ්ඝො ලොකුත්තරාධිගමං පුච්ඡි,
භික්ෂුසඞ්ඝයා ලොකොත්තරධර්මප්‍රතිලා
භයපිළිවිසෑ; ථෙරො, තෙරහු; තුණ්හී

මෙ ලොකුත්තර ධම්මොනත්ථි ආහ, මට
ලොකුත්තර ධර්මයෙක් නැතැයි කීහු;
අථ, ඉක්බිතෙන්; අස්ස, ඒ තෙරුන්
ගේ; උපට්ඨාකො භික්ඛු, උපස්ථාන
කරණ භික්ෂුතෙම; ආහ, මෙසේ කී;
භන්තෙ, වහන්ස; තුම්හෙ පරිනිබ්බු
තොති, නුඹ පිරිනිවියහයි; සමන්තා,
හාත්පසින්; ද්වාදසයොජනා මනුස්සා,
දොළොස්යොදුනෙක මිනිස්සු; ස
න්නිපතිතා, රැස්වූහු; තුම්හාකං පුථු
ජ්ජනකාලකිරියාය, නුඹගේ පෘථග්ජ
න කාලක්‍රියාවෙන්; මහා විප්පටිසාරො
භවිස්සති, රහත්යයි නිෂ්කාරණයෙහි
ආම්නසි මහත් විප්‍රතිසාරවන්නේයි;
ආවුසො, ඇවැත; අහං, මම; මෙත්තෙ
ය්‍යං භගවන්තං පස්සිස්සාමීති, මෛ
ත්‍රෙය භගවත්හු දක්මියි; විපස්සනං
න පට්ඨපෙසිං, විදර්ශනාව පටන් නො
ගත්මියි; තෙනහි, එසේකැවින්; මං
නිසීදාපෙථ, මා හිඳුවාලා; ඔකාසං ක
රොථාති, අවකාශකරයි; සො, හෙතෙ
ම; ථෙරං නිසීදාපෙත්වා, තෙරුන් හිඳු
වා; බහිනික්ඛන්තො, පිටතට නික්ම
ණි, ථෙරො, තෙරහු; තස්ස, ඔහුගේ;
සහනික්ඛමණාව, නික්මම හා එක්වම;
අරහත්තං පත්වා, රහත්බවට පැමිණ;
අච්ඡරිකාය, අසුරුපැහැර; සඤ්ඤං
අදාසි, එඩපිණිස සංඥාකළේ; ස
ඞ්ඝො, සඞ්ඝතෙමේ; සන්නිපතිත්වා,
රැස්ව; ආහ, මෙසේ කී; භන්තෙ, ව
හන්ස; එවරූපෙ මරණකාලෙ, මෙබඳු
මරණ සමයෙහි; ලොකුත්තරධම්මං
නිබ්බත්තෙන්තො, ලොකුත්තර ධර්මය
නිපදවන්නාහු; දුක්කරං කරිත්ථාති
දුෂ්කරයක් කළහයි; නාවුසො එතං
දුක්කරං, ඇවැත්නි මෙ දුෂ්කර නො
වෙයි; අපිච, එකෙක් ඇති; වො දුක්ක
රං ආචික්ඛිස්සාමි, තොපට දුෂ්කරයක්
කියමි; ආවුසො, ඇවැත්නි; අහං, මම;

පබ්බජිතකාලතො පට්ඨාය, පැවිදිවූ කල්පටන්ගෙණ; අසතියා, සිහිනැති ව; අකුසලුප්පාදනකං කම්මං නාම, නොදුන්නකල කර්මයක්නම්; න සරාමි, සිහිනොකෙරෙමි, අස්ස, එ තෙරුන්ගේ; භාගිනෙය්‍යොපි, බෑණ තෙරහුද; පඤ්ඤාසවස්සකාලෙ, පණස් හැවිරිදි සම්වූයෙහි; එවමෙව අකාසි, එ සේමකලෝ......

( පා † )

කල්‍යාණ පෘථග්ජනයන්ගේ ශීලය උපසම්පදාවෙහි පටන් නිර්මල ජාතිරත්න මාණික්‍ය රත්නයක් මෙන්ද මොනවට ඔප්නාගන්නාලද ස්වර්ණයක් මෙන්ද ඉතා පිරිසිදුහෙයින් අකුශල චිත්තෝත්පාදයක් පමණකුදු මලයකින් අපවිත්‍රනොවූ ශීලය රහත්පලයටම පසුවෙද එහෙයින් පරිපූර්ණ පාරිශුද්ධිශීලනම් කියනලැබේ. මහා සංඝරක්ෂිත ස්ථවිරයන්වහන්සේගේ හා උන් බෑණනුවූ භාගිනෙය්‍ය සංඝරක්ෂිත ස්ථවිරයන්වහන්සේගේද පරිපූර්ණ පාරිශුද්ධිශීලය මෙතනට සාධකවශයෙන් දක්වියයුතු ගේ කෙසේදයත්? මහාසංඝරක්ෂිත ස්ථවිරයන්වහන්සේ වනාහි සැටවයස් පිරී මරණමංචකයෙහි වැදහොත් කල්හි භික්ෂුසංඝයා රුන් තුඹවහන්සේ කවර මාර්ගඵලාධිගමයක් ලැබුසේකැයිදැයි විචාලෝය මහා සංඝරක්ෂිත ස්ථවිරයන්වහන්සේ ඇවැත්නි මට ලොකොත්තරධර්මයක් නැතැයි කීයේය ඉක්බිත්තෙන් ඒ මහතෙරුන්වහන්සේගේ උපස්ථායක භික්ෂූනු මෙසේ කීහ ස්වාමීනි තුඹවහන්සේ සකාඩ පරිනිර්වාණයෙන් පිරිනිවන් පානසේකැයි සිතා තුඹවහන්සේ පුදනපිණිස හාත්පසින් දොළොස් යොජනක තැන් වසන මනුෂ්‍යයෝ රැස්වූවෝය ඉදින් තුඹවහන්සේගේ පෘථග්ජනකාලක්‍රියාවවූයේනම් මහජනයාහට විපිළිසර වන්නේය, තුඹවහන්සේ රහත්යයි සිතා කිසිකාරණයකින් ආවාහයි ඔවුන් කැළඹිම පැමිණෙනනාහුයයි කීයේය ඉක්බිති මහතෙරුන් වහන්සේ කියනසේක් ඇවැත්නි මා මෛත්‍රී බුදුන් දක්නෙමියි සිතා විදර්ශනාවට පටන්නොගත්තෙමි එබැවින් මා නැගා සිටුවා අවකාශ දෙවයි කීහ ඒ භික්ෂූහු තෙරුන්වහන්සේ නගා වඩා හිඳුවා පිටතට නික්මුණෝය තෙරුන් වහන්සේ ඒ භික්ෂූහු ගේ පිටතට නික්ම හා සමගම සියලු කෙලෙසුන් හා සමග අර්හත්වයට පැමිණ අසුරුගසා නැවත ඒ භික්ෂූනට එනුපිණිස සංඥාකළේය ඉක්බිති සංඝයාවහන්සේ රැස්ව අවුත් ස්වාමීන්වහන්ස මෙබඳු මරණාසන්නයෙහි ලොකොත්තර ධර්මාධිගමය උපදවනනාවූ තුඹවහන්සේ ඉතා දුෂ්කරයක් කළසේකැයි කීය. හා එසමයෙහි මහතෙරුන්වහන්සේ කියනසේක් ඇවැත්නි මම දුෂ්කරයක් නොකෙළෙමි වැලි එකක් ඇති දුෂ්කරවූ කාරණයක් මම තොපට ප්‍රකාශකරන්නෙමි ඇවැත්නි මා පැවිදිවූතැන් පටන් මෙ දක්වා නොසිහියෙන් කරනලද කාර්‍ය්‍යයක් නම් සිහිනොකරමි කීයේය උන්වහන්සේගේ බෑණනුවූ භාගිනෙය්‍ය සංඝරක්ෂිත ස්ථවිරයන්වහන්සේද පණස් හැවිරිදි වයස් කල ඒ මහා සංඝරක්ෂිත ස්ථවිරයන් මෙන්ම අර්හත්වයට පැමිණි සේක......

( පා ‡ )

අප්පස්සුතොපි චෙ හොති
සීලෙසු අසමාහිතො
උභයෙන නං ගරහන්ති
සීලතො ච සුතෙන ච......
අප්පස්සුතොපි චෙ හොති
සීලෙසු සුසමාහිතො
සීලතො නං පසංසන්ති
තස්ස සම්පජ්ජතෙ සුතං......

බහුස්සුතොපි චෙ හොති
සීලෙසු අසමාහිතො
සීලතො නං ගරහන්ති
නාස්ස සම්පජ්ජතෙ සුතං—
බහුස්සුතො පි චෙ හොති
සීලෙසු සුසමාහිතො
උභයෙන නං පසංසන්ති
සීලතො ච සුතෙන ච—
බහුස්සුතං ධම්මධරං
සප්පඤ්ඤං බුද්ධසාවකං
නෙක්ඛං ජම්බොනදස්සෙව
කො තං නින්දිතුමරහති
දෙවාපි නං පසංසන්ති
බ්‍රහ්මුනාපි පසංසිතො ති—

( ස ‡ )

අප්පස්සුතොපි චෙ හොති, සූත්‍රගෙයාදිවූ ඇසූතැනක් ඉදින් නැත්තේවීනම්; සීලෙසු අසමාහිතො, ප්‍රාතිමොක්ෂ සංවරාදි ශීලයෙහිද මනාකොට නොපිහිටියේවීනම්; සීලතොච, ශීලයෙන්ද; සුතෙන ච, ශ්‍රැතයෙන්ද යන; උභයෙනච, දෙකින්ම; නං, ඔහු, ගරහන්ති, ගර්හා කෙරෙත්; අප්පස්සුතො'පි චෙ හොති, ඉදින් ඇසූතැනක් නැත්තේවීනමුදු; සීලෙසු සුසමාහිතො, ශීලයෙහි මනාකොට පිහිටියේවීනම්; නාස්ස සම්පජ්ජතෙ සුතං, ඒහට ඇසූතැන් නැතිහෙයින් ශ්‍රැතයෙන් ප්‍රශංසාවෙක් නොවේනමුදු; සීලතො නං පසංසන්ති, උහුට ශීලයෙන් ප්‍රශංසා කෙරෙත්; බහුස්සුතො, බහුශ්‍රැතනමේ ("චෙ" යනු නිපාත පමණෙකි) සීලෙසු අසමාහිතො හොති, ශීලයෙහි නොපිහිටා නම්; නං, උහු; සීලෙන ගරහන්ති, ශීලයෙන් ගර්හා කෙරෙති; අස්ස, ඔහුගේ; සුතං, ශ්‍රැතය තෙමේ; නසම්පජ්ජතෙ, තමහටද අනුන්වද සම්පත්ති නොඑළවා (දුශ්ශීලබැවින් තමහටද දුශ්ශීල පුද්ගලයයි සිල්වතුන් නොඑළඹෙනබැවින් අනුන්වද සම්පත් නොඑළවාය යන අදහසි) බහුස්සුතො'පි චෙ හොති, ඉදින් බහුශ්‍රැතවීනම්; සීලෙසු සුසමාහිතො, ශීලයෙහි මනාකොට පිහිටියේවීනම්; සීලතො ච, ශීලයෙන්ද; සුතෙන ච, ශ්‍රැතයෙන්ද යන; උභයෙන, දෙකින්ම; නං, උහු; පසංසන්ති ප්‍රශංසා කෙරෙත්; බහුස්සුතං, බොහෝ ඇසූතැන් ඇති; ධම්මධරං, ඇසූ ධර්මය දරා; සප්පඤ්ඤං, ප්‍රඥා සම්පන්නවූ; තං බුද්ධසාවකං, ඒ බුද්ධ ශ්‍රාවකයා; නෙක්ඛංජම්බොනදස්සෙව, ජම්බුනදනම් රන්නික්කමෙන්; කො නින්දිතුං අරහති, කවරෙක් නින්දා කරන්නට සුදුසුද; දෙවා'පි, දෙවියෝද; නං පසංසන්ති, ඕහට ප්‍රශංසා කෙරෙති; බ්‍රහ්මුනාපි, බ්‍රහ්මයා විසිනුදු; පසංසිතො, ප්‍රශංසිත නම් වේ—.

( හා ‡ )

කියනලද්දේමැයි. යම් මහණෙක් සූත්‍රගෙයාදියෙහි ඇසූපිරූතැන් නැත්තේවීනම් ප්‍රාතිමොක්ෂ සංවරාදී ශීලයෙහිදු මනාකොට නොපිහිටියේවී නම් ඒ මහණහට ශීලයෙන්ද බහුශ්‍රැතබවයෙන්ද යන දෙකින්ම ගර්හා කෙරෙත්මැයි. ඉදින් ඇසූපිරූ තැනක් නැත්තේවීනමුදු ශීලයෙහි මනාකොට පිහිටියේවීනම් ඒහට බහුශ්‍රැතබවයෙන් ප්‍රශංසාවෙක් නොවේ එතකුදු වුවත් ශීලයෙන් ඔහුට ප්‍රශංසා කෙරෙත්මැයි. යම් මහණෙක් බොහෝ ඇසූපිරූතැන් ඇත්තේවේද ශීලයෙහි මනාකොට නොපිහිටියේවේද ඔහුට ශීලයෙන් ගර්හා කෙරෙත්මය. ඔහුගේ බහුශ්‍රැතබවය තමා දුශ්ශීලබැවින් තමහටද දුශ්ශීලයායි සිල්වතුන් නොඑළඹෙනබැවින් අනුන්ටද සමගිමොක්ෂ සම්පත් නොඑළවන්නේයි. යම් මහණෙක් බොහෝ ඇසූපිරූතැන්ද

ඇත්තේවේද ශීලයෙහිද මහාකොට පිහිටියේවේද ඒ මහණ ශීලයෙන්ද බහුශ්‍රුතභාවයෙන්ද යන දෙකින්ම ප්‍රශංසා කෙරෙත්මැයි බොහෝ ඇසූ පිරූතැන් ඇත්තාවූ ඒ ඇසූ ධර්මය සිත්හිලා දරන්නාවූ ප්‍රඥා සම්පන්නවූ ජම්බුනදියෙන් උපන් රණින් කළ නික්ඛයක්වැනිවූ ඒ බුද්ධශ්‍රාවක මහණහට නින්දාකරන්නට කවරෙක් සුදුසුවේද නොවේමැයි ඕහට දෙවියෝද ප්‍රශංසා කෙරෙත්මය මහතෙව මහා බ්‍රහ්මයා විසිනුදු ප්‍රශංසාකරණලද්දේයි ——

( පා ¶ )

සේඛානං පන සීලං දිට්ඨිවසෙන අපරාමට්ඨත්තා පුථුජ්ජනානං වා පන භවවසෙන අපරාමට්ඨසීලං අපරාමට්ඨපාරිසුද්ධීති වෙදිතබ්බං. කුටුම්බියපුත්තතිස්සත්ථෙරස්ස සීලං විය සො හි ආයස්මා තථාරූපං සීලං නිස්සාය අරහත්තෙ පතිට්ඨාතුකාමො වෙරිකෙ ආහ ——

උභොපාදානි භින්දිත්වා
සංයමිස්සාමි වො අහං
අට්ටියාමි හරායාමි
සරාගමරණං අහන්ති ——

අඤ්ඤතරොපි මහාථෙරො බාළ්හගිලානො සහත්ථා ආහාරං පරිභුඤ්ජිතුං අසක්කොන්තො සකෙ මුත්තකරීසෙ පලිපන්නො සම්පරිවත්තති තං දිස්වා අඤ්ඤතරො දහරො අහො දුක්ඛා ජීවිතසඞ්ඛාරාති ආහ —— තමෙනං මහාථෙරො ආහ ආවුසො ඉදානි මීයමානො සග්ගසම්පත්තිං ලභිස්සාමි නත්ථි මෙ එත්ථ සංසයො, ඉමං පන සීලං භින්දිත්වා ලද්ධසම්පත්ති නාම සික්ඛං පච්චක්ඛාය ලද්ධගිහිභාවසදිසීති වත්වා සීලෙනෙව සද්ධිං මරිස්සාමීති තත්ථෙව නිපන්නො තමෙව රොගං සම්මසන්තො අරහත්තං පත්වා භික්ඛුසඞ්ඝස්ස ඉමාහි ගාථාහි ව්‍යාකාසි ——

පුට්ඨස්ස මෙ අඤ්ඤතරෙන ව්‍යාධිනා රොගෙනබාළ්හං දුක්ඛිතස්ස රුප්පතො පරිසුස්සති ඛිප්පමිදං කළෙබරං පුප්ඵං යථා පංසුනි ආතපෙ කතං ——

අජඤ්ඤං ජඤ්ඤසඞ්ඛාතං
අසුචිං සුචිසම්මතං
නානාකුණපපරිපූරං
ජච්චරූපං අපස්සතො ——
ධිරත්ථුමං ආතුරං පූතිකායං
දුග්ගන්ධියං අසුචිං ව්‍යාධිධම්මං
යත්ථප්පමත්තා අධිමුච්ඡිතා පජා
හාපෙන්ති මග්ගං සුගතූපපත්තියාති ——

අරහන්තාදීනං පන සීලං සබ්බදරථපටිප්පස්සද්ධියා පරිසුද්ධත්තා පටිප්පස්සද්ධිපාරිසුද්ධීති වෙදිතබ්බං —— එවං පරියන්තපාරිසුද්ධිවසෙන පඤ්චවිධං ——

( ස ¶ )

සේඛානං පන සීලං, ශෛක්ෂයන්ගේ ශීලය; දිට්ඨිවසෙන අපරාමට්ඨත්තා, දෘෂ්ටිවශයෙන් අපරාමෘෂ්ටබැවින්, පුථුජ්ජනානං වා පන, පෘථග්ජනයන්ගේ හෝ වනාහි; භව වසෙන අපරාමට්ඨසීලං, භවතෘෂ්ණායෙන් අපරාමෘෂ්ට ශීලය ("භව වසෙන" යනුයෙන් තෘෂ්ණා පරාමර්ශ නැතිබව කීහු) අපරාමට්ඨපාරිසුද්ධීති, අපරාමෘෂ්ට පාරිශුද්ධියයි; වෙදිතබ්බා, දතයුතු; කුටුම්බිය පුත්තතිස්සත්ථෙරස්ස, කුටුම්බිය පුත්‍ර තිස්ස නම් තෙරුන්ගේ; සීලංවිය, ශීලයමෙනි; සො හි ආයස්මා, ඒ ආයුෂ්මත් තෙමේ; තථාරූපං සීලං නිස්සාය, භවතෘෂ්ණාවෙන් අපරාමෘෂ්ටශීලය නිසා; අරහත්තෙ පතිට්ඨාතුකාමො, අර්හත්හි පිහිටනු කැමැත්තේ; වෙරිකෙ ආහ, වෛරීන්ට මෙසේකී; උභොපාදානි භින්දිත්වා, දෙපයබිඳ; අහං

මම; සංවෙජිස්සාමි, මැඩවිනසත් මිා හර
ණෙව හිමිස්වමි; අහං. මම, සරණගමර
ණං, සරණගමරණය; දේටිසාමි, දුගුප්
සාකෙරෙමි; හරායාමි, ලජ්ජාකෙරෙමි;
අඤ්ඤතරො'පි මහාථෙරො, එක්තරා
මහ තෙරකෙනෙකුද; බාලගිලා
ණො, ඉතා ගිලන්වූවාහු; සයංපා ආ
හාරං පරිභුඤ්ජිතුං අසක්කොන්තො,
සවහස්තයෙන් අහර කෑ නොහෙත්
නාහු; සකෙමුත්තකරීසෙ පළිප
න්නො, තමන්ගේ මූත්‍රකරීෂයෙහි
ගැලුනාහු; සම්පරිවත්තන්තෙ, ඇලලෙසන්
ඇලසව පෙරලෙන්නේසි; තං දිස්වා;
ඔහුත් දුක; අඤ්ඤතරො දහරො,
එක්තරා ලදරු භික්ෂුවෙක්; අහො,
මෙබඳය; ජීවිතසඞ්ඛාරා දුක්ඛා'ති, ආ
යු සංස්කාරයෝ දුඃඛයහයි; ආහ, කී;
තමෙමතං, ඕහට; මහාථෙරො, මහාස්ථ
විරයෝ; ආහ, මෙසේ කීවූ දුඃඛජීවිත
යහැර සුඛජීවිතයක් ලැබියහැකිවූවද
එ නොහැමැතිබව දක්වන්නෝ "ආවු
සො" යනාදී කීහු) ආවුසො, ඇවැත;
අහං, මම; ඉදානි මියමානො, දැන්
මියන්නෙම්නම්; සග්ගසම්පත්තිං ලභි
ස්සාමි, ස්වර්ගසම්පත්ති ලැබෙමි; හෙසි
මම එත්ථ සංසයො, මෙහි මට සංශයෙක්
නැත; ඉමං පන සීලං භින්දිත්වා ලද්ධසම්ප
ත්ති නාම, මෙශීලයබිඳ ලබනලද සම්ප
ත්තිනමි; සික්ඛං පච්චක්ඛාය පටිලද්ධ ගි
හිභාව සදිසා'ති, සික පිළිකෙව කොට
ලබනලද ගිහිබවක් වැන්නීයයි; වත්වා,
කියා; සීලෙනෙව සද්ධිං මරිස්සාමී'ති, ශී
ලය හොනසා ශීලයහා සමග මියෙමි
(තිසිකාලෙකද ශීලය නොහරිමියි හ
වාදනයක් ඇති කල්හි ශීලයෙන්
ඒසා ගෙවීනම් ඒ හවග්‍රහණයම නො
කෙරෙමි යන අභිප්‍රායයි) තත්ථෙව නිප
න්නො, එසේම වැදහොත්තේ; තමෙව
රොගං සම්මසන්තො, එම රොගය
ඛ්‍යාත වෙදනාවද (වෙදනාමුඛයෙන්
සියලු රූපාරූප ධර්මයන්ගේද පරිග්‍ර
හයකොට) සත්මෙශීනයනරන්නෝ;
අරහත්තං පත්වා, රහත්බවට පැමිණ;
භික්ඛුසඞ්ඝස්ස, භික්ෂුසඞ්ඝයාහට; ඉමා
ගාථායො අභාසි, මේ ගාථාවෙන් අ
භිත්තිය ප්‍රකාශකෙළේ; අඤ්ඤතරෙන
ව්‍යාධිනා, එක්තරා ව්‍යාධියකින්; ඵු
ට්ඨස්ස, පහරණලද; රොගෙන, වෙද
නාවෙන්; බාළ්හං, අත්‍යර්ථයෙන්;
දුක්ඛිතස්ස, දුඃඛිතවූ; රුප්පතො, විකා
රයට පමුණුවනලද ශරීර ඇති; මෙ,
මාගේ; ඉදං කලෙබරං, මේ කලෙබර
ය; පරිසුස්සති, හාත්පසින් වියළේ;
ආතපෙ පංසුනි. හිරුරැසින් සන්තා
පනවූ පාංශුමෙනි; කතං, තබනලද;
පුප්ඵං යථා, මිහරිආදී මල්මෙනි; අජ
ඤ්ඤං, අමනොඥවූ; ජඤ්ඤසම්මතං,
අඥනයන් විසින් මනොඥයයි සිතන
ලද; අසුචිං, සුචිනොවූ; සුචිසම්මතං,
සුචියයි අභිමතවූ; නානාකුණපපරි
පූරං, නොයෙක් කුණින් පිරුණාවූ;
අපස්සතො, ප්‍රඥචක්ෂුසින් නොබලන්
නාහුට; ජඤ්ඤරූපං, මනොඥ රූප
යක් බඳුවූ ("ධි අත්‍ථු ඉමං"යි බිඳුමෙන්)
ආතුරං, දුක්පත්වූ; දුග්ගන්ධියං, දුගී
න්ධඇති; අසුචිං, සුචි නොවන; ව්‍යාධි
ධම්මං, ව්‍යාධි ස්වභාවවූ; ඉමංකායං,
මේ ශරීරයට; ධිරත්ථු, නිඤ්දවේවා;
යත්ථ, යම් පූතිකායෙක; පමත්තා, රා
ගවශයෙන් ප්‍රමාදයට පැමිණ; අධි
මුච්ඡිතා, ඉතා මූර්ඡිතවූ; පජා, සත්ව
යෝ; සුගතූපපත්තියා මග්ගං, සුගති
යෙහි උත්පත්තියට මාර්ගයවූ (ශීලය
හාපෙන්ති, පිරිහෙළති; (ධ්‍යානාදියෙ
හි කියනු කිම යන අභිප්‍රායයි)

---

( හා ¶ )

සප්ත ශෛක්ෂයන්ගේ ශීලය මිථ්‍යා
දෘෂ්ටිවශයෙන් නොඅල්වා ගන්නාලද
බැවින්ද පෘථග්ජනයන්ගේ හෝ
භව තෘෂ්ණාවශයෙන් නොඅල්වාගත්
තාලද ශීලයද අපරාමෘෂ්ට පාරිශුද්ධි

යයි දතයුතු. ඒ අපරාමෘෂ්ට පාරිශුද්ධි ශීලයට සාධකවශයෙන් කුටුම්බියපුත්‍ර තිස්සස්ථවිරයන්ගේ ශීලය දක්වියයුතු. කෙසේදයත්? ඒ ආයුෂ්මත් කොලඹිපුත් තිස්සස්ථවිරයන්වහන්සේ එබඳුවූ අපරාමෘෂ්ට ශීලය නිසා අර්හත්වයෙහි පිහිටනු කැමැත්තේ (අරණ්‍යයෙහි මහණදම් පිරූයේය එකල්හි උන්වහන්සේගේ ගිහිවැසි කාලෙ සතුරෝ අවුත් උවලා අල්වාගෙණ මරන්නට තැත්කළෝය) ඉක්බිති ඒ සතුරන්ට මෙසේ කීයේය පින්වත්නි මා මෙතනින් පලා නොයමි ඉදින් නොඅදහව්නම් මාගේ දෙකකුල් බිඳ දමා පියා මද ඇසිල්ලකට මා අත හරිනලෙස ගිවිස්වමි කුමක්හෙයින යත්? මාගේ රාගාදී කෙලෙස් සහිත මරණය මම පිළිකුල්කෙරෙමි ලජ්ජා කෙරෙමි එබැවින් මා මරන්නට පළමුවෙන් කෙලෙස් නසා රහත්පලයට පැමිණෙමියි කීයේක......

අනිකුදු එක්තරා මහතෙරකෙණෙක් ඉතා ගිලන්ව සියතින් අහර නොවැලඳියහැකිව තමාගේ මලමුත්‍රයෙහි ඇලයෙන් ඇලයට පෙරළෙන්නනු දක එක්තරා ලදරු භික්ෂුනකෙණෙක් අහෝ ජෙදනක ආයුසංස්කාරයෝ දුකැයි කීයේය ඒ ලදරු භික්ෂුහට මහතෙරුන්වහන්සේ මෙසේ කීසේක ඇවැත්නි දැන් මියන්නේවීනම් ස්වර්ගසම්පත් ලබන්නෙමි මා මියගිය කල ස්වර්ගසම්පත් ලැබෙනි සැකයෙක්නම් නැත්තේය එතකුදුවුවත් මේ ශීලය බිඳ ලබනලද ස්වර්ගසම්පත්තිනම් ශික්ෂාප්‍රත්‍යාඛ්‍යානයකොට නොවත් උපසම්පදශීලය ප්‍රතික්ෂෙපකොට ලබනලද ගිහිබවක් හැතියයි කියා සිල් නොබිඳ සිලය හා සමගම මියෙන්නෙමියි සිතා වැදහොත්වනම තිද එව රාග සංඛ්‍යාත වේදනාවෙ දනා ඉවසීමෙන් සෙසු භාවනාව වඩායන්ද සන්ලශීඝ්‍රකරන්නේ පිළිවෙළින්ගොස් අර්හත්ඵලයට පැමිණ රැස්වූ භික්ෂු සංඝයාහට මේ ගාථාවෙන් අර්හත්භාවය ප්‍රකාශකෙළේය. එක්තරා ව්‍යාධියකින් පහරණලද දුක්ඛ වේදනාවෙන් අභිශප්ත දුක්ඛපත්වූ විකාරයට පමුණුවනලද ශරීරඇත්තාවූ මාගේ මේ ශරීරය හිරුරැසින් රත්වූ වැලිතලාවෙක්හි බහා ලනලද මහරී ආදී මල් පරිදෙදන් හාත්පසින් මියලියන්නේය අඥබාලයන් විසින් සිත්කාඑයයි සම්මතකරණලද නුමුත් සිත්කාඑනොවූ එසේම පවිත්‍රයයි සම්මතකරණලදනුමුත් අපවිත්‍රවූ නොයෙක් කුණපයෙන් පිරුණාවූ නවණ්‍ණ නැමති ඇසින් නොබලුන්නානව සිත්කාඑසේ වැඩහෙන්නාවූ දුප්පත්වූ දුර්ගන්ධවහනයවන්නාවූ අපවිත්‍රවූ ස්වභාව ඇත්තාවූ මේ ශරීරයට නිත්‍ය වේවා මේ කුණු ශරීරයෙහි රාගඇල්මෙන් ප්‍රමාදවූ මෝහයෙන් මුළාවූ සත්වයෝ සුගතියෙහි ඉපදීමට භාගිවූ ශීලය පිරිහෙළත්මැ...

රහතුන් පසේබුදුන් සම්මාසම්බුදුවරයන්ගේ ශීලය සියලු කෙලෙස් විෂ්කම්භනයෙන් පිරිසිදුවූහෙයින් ප්‍රතිප්‍රශ්‍රබ්ධි පාරිශුද්ධිශීලයයි දතයුතු. මෙසේ මේ ශීලය පර්‍ය්‍යන්තපාරිශුද්ධිශීලාදීන්ගේ වශයෙන් පස්වැදෑරුම්වන්නේයි......

( ඝ )

දුතිය පඤ්චකෙ පාණාතිපාතාදීනං පහානාදි වසෙන අත්ථො වෙදිතබ්බො......වුත්තං හෙතං පටිසම්භිදායං පඤ්චසීලානි පාණාතිපාතස්ස පහානං සීලං වෙරමණී සීලං චෙතනා සීලං සංවරො සීලං අවීතික්කමො සීලං......අදින්නාදානා කාමෙසු......මුසාවාදා......පිසුණා වාචා ද යස

පිසුණවාචාය ~ ඵරුසවාචාය ~
සම්ඵප්පලාපස්ස ~ අභිජ්ඣාය ~
ව්‍යාපාදස්ස ~ මිච්ඡාදිට්ඨියා ~ නෙ
ක්ඛම්මෙන කාමච්ඡන්දස්ස ~ අව්‍යා
පාදෙන ව්‍යාපාදස්ස ~ ආලොකස
ඤ්ඤාය ථිනමිද්ධස්ස ~ අවික්ඛෙපෙන
උද්ධච්චස්ස ~ ධම්මවවත්ථානෙන විචි
කිච්ඡාය ~ ඤාණෙන අවිජ්ජාය ~
පාමොජ්ජෙන අරතියා ~ පඨමෙන ඣා
නෙන නීවරණානං ~ දුතියෙන ඣා
නෙන විතක්කවිචාරානං ~ තතියෙ
න ඣානෙන පීතියා ~ චතුත්ථෙන
ඣානෙන සුඛදුක්ඛානං ~ ආකාසා
නඤ්චායතනසමාපත්තියා රූපස
ඤ්ඤාය පටිඝසඤ්ඤාය නානත්තසඤ්ඤා
ය ~ විඤ්ඤාණඤ්චායතනසමාපත්
තියා ආකාසානඤ්චායතනසඤ්ඤාය ~
ආකිඤ්චඤ්ඤායතනසමාපත්තියා විඤ්
ඤාණඤ්චායතනසඤ්ඤාය ~ නෙවස
ඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තියා
ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤාය ~ අනි
ච්චානුපස්සනාය නිච්චසඤ්ඤාය ~
දුක්ඛානුපස්සනාය සුඛසඤ්ඤාය ~
අනත්තානුපස්සනාය අත්තසඤ්ඤාය
~ නිබ්බිදානුපස්සනාය නන්දියා ~
විරාගානුපස්සනාය රාගස්ස ~ නිරො
ධානුපස්සනාය සමුදයස්ස ~ පටිනි
ස්සග්ගානුපස්සනාය ආදානස්ස ~
ඛයානුපස්සනාය ඝනසඤ්ඤායවයානු
පස්සනාය ආයූහනස්ස ~ විපරි
ණාමානුපස්සනාය ධුවසඤ්ඤාය ~ අ
නිමිත්තානුපස්සනාය නිමිත්තස්ස ~
අප්පණිහිතානුපස්සනාය පණිධියා ~
සුඤ්ඤතානුපස්සනාය අභිනිවෙසස්ස
අධිපඤ්ඤාධම්මවිපස්සනාය සාරාදානා
භිනිවෙසස්ස ~ යථාභූතඤාණදස්ස
නෙන සම්මොහාභිනිවෙසස්ස ~ ආ
දීනවානුපස්සනාය ආලයාභිනිවෙස
ස්ස ~ පටිසඞ්ඛානුපස්සනාය
අප්පටිසඞ්ඛාය ~ විවට්ටානුපස්සනාය
සංයොගාභිනිවෙසස්ස ~ සොතාප
ත්තිමග්ගෙන දිට්ඨෙකට්ඨානං කිලෙසා
නං ~ සකදාගාමිමග්ගෙන ඔළාරිකා
නං කිලෙසානං ~ අනාගාමිමග්ගෙන
අනුසහගතානං කිලෙසානං ~ අර
හත්තමග්ගෙන සබ්බකිලෙසානං පහා
ණං සීලං වෙරමණී ~ පෙ ~ චෙත
නා සංවරො අවීතික්කමො සීලං එව
රූපානි සීලානි චිත්තස්ස අවිප්පටිසා
රාය සංවත්තන්ති පාමුජ්ජාය සංවත්ත
න්ති පීතියා සංවත්තන්ති පස්සද්ධියා
සංවත්තන්ති සොමනස්සාය සංවත්ත
න්ති ආසෙවනාය සංවත්තන්ති භාව
නාය සංවත්තන්ති බහුලීකම්මාය
සංවත්තන්ති අලඞ්කාරාය සංව
ත්තන්ති පරික්ඛාරාය සංවත්තන්ති පරි
වාරාය සංවත්තන්ති පාරිපූරියා සංව
ත්තන්ති එකන්තනිබ්බිදාය විරාගාය
නිරොධාය උපසමාය අභිඤ්ඤාය සම්
බොධාය නිබ්බානාය සංවත්තන්තීති. ~

(¶) අරහත්තාදීනං පහා සීලං, රහ
තන්ආදීන්ගේ ශීලය (ආදි ග්‍රහණින්
පසේබුදුන් සම්මාසම්බුදුන් ගන්නු)
සබ්බදරථ පටිප්පස්සද්ධියා පරිසුද්ධත්
තා, සියලු කෙලෙස් විඩා සන්හිඳී
මෙන් පරිශුද්ධවන බැවින්; පටිප්පස්ස
ද්ධි පාරිශුද්ධි 'ශීලවේදිතබ්බා, ප්‍රතිප්‍රශ්‍රබ්ධි
පාරිශුද්ධියයි දතයුතු; එවං, මෙසේ; පරි
යන්තපාරිසුද්ධිවසෙන පඤ්චවිධං, පර්‍ය්‍ය
න්තපාරිශුද්ධිශීලාදි විසින් පඤ්චවිධවේ.

( ඝ * )

( "පාණාතිපාතාදීනං පහාණාදිව

(¶)] යම් ප්‍රමාදයකින් මේ තන පටන් පේලි 10 ක් 187 වෙනි පිටේ දෙවෙනි තීරයට නොගැළපී තිබේ. එබැවින් මේ පේලි 10 ය එම පිටේ එම තීරය හා සම්බන්ධකොට තේරුම් ගතයුතුයි

නෙහ” යනුයෙහි පාණාතිපාතාදීනං යන ආදිග්‍රහණයෙන් රහත්මගින් වධ්‍ය කෙලශයන් කෙළවරකොට ඇති අදිත්තාදානාදීන්ගේ සඞ්ග්‍රහයද “පහාණාදි” යන ආදිග්‍රහණයෙන් වෙරමණි ආදී සතරදෙනාගේ සඞ්ග්‍රහයද දතයුතු ගිරිඔ්‍යානපපාකරුණා අලොභාදී ප්‍රධානවූ යම් කුශලචිත්තොත්පාදයකින් ප්‍රාණඝාතය ප්‍රහීණකරණලැබේද ඒ ප්‍රාණඝාතයාගේ ප්‍රහාණය ශීලනාමීයෙන් ප්‍රහාණශීලනම එසේම ප්‍රාණඝාතයෙන් වැළැක්ම විරමණශීලනම් වේ—ප්‍රාණඝාතයට ප්‍රතිපක්‍ෂවූ චෙතනාව චෙතනාශීලනම—“පාණාතිපාතස්ස පහාණං සීලං පාණාතිපාතස්ස වෙරමණිසීලං හති” යි මෙසේ චෙතනාවෙනම ශෙදියයුතු) පාණාතිපාතස්ස සංවරණං සීලං, ප්‍රාණාතිපාතයාගේ සංවරණය (ප්‍රවේශවාරපිධානය) සංවරශීලනම්; අවීතික්කමොසීලං, ප්‍රාණඝාතයාගේ අව්‍යතික්‍රමණය අව්‍යතික්‍රමශීලනම (“අදින්නාදානස්ස” යනාදීයෙහිදු මෙමනයයි - අභිධ්‍යාදීන්ගේ වනාහි අනභිධ්‍යාදිවශයෙන් ප්‍රහාණය දතයුතු) අදින්නාදානස්ස, අදත්තාදානයාගේ; කාමෙසු මිච්ඡාචාරස්ස, කාමමිථ්‍යාචාරයාගේ; මුසාවාදස්ස, මුසාවාදයාගේ; පිසුණ වාචාය, පිශුණවචනයාගේ; ඵරුස වාචාය, පරුෂවචනයාගේ; සම්ඵප්පලාපස්ස, සම්ප්‍රලාපයාගේ; අභිජ්ඣාය, අභිධ්‍යාවගේ; ව්‍යාපාදස්ස, ව්‍යාපාදයාගේ; මිච්ඡාදිට්ඨියා; මිථ්‍යාදෘෂ්ටියගේ (“පහාණං සීලං,, යනාදීන් හා යොදනු —මෙසේ දශකුශලකර්මපථවශයෙන් ශීලාදීන් දක්වා දැන් සඋපායවූ-අෂ්ටසමාපත්තීන්ගේද අෂ්ටාදශමහාවිදර්ශනාදීන්ගේද ආර්‍ය්‍යමාර්ගයන්ගේද වශයෙන් ප්‍රහාණාදිශීලයන් දක්වනුපිණිස “නෙක්ඛම්මෙන” යනාදි ආරම්භකළේ) නෙක්ඛම්මෙන, අලොභ ප්‍රධාන කුශල චිත්තොත්පාදයෙන්; කාමච්ඡන්දස්ස, කාමච්ඡන්දයාගේ; අව්‍යාපාදෙන, අව්‍යාපාදයෙන් (මෛත්‍රියෙන්) ව්‍යාපාදස්ස, ව්‍යාපාදයාගේ; ආලොකසඤ්ඤාය විනීවරණසඤ්ඤා (විශුද්ධකොට මෙනෙහිකිරීමෙන් උපස්ථිතවූ) ආලොකසංඥාවෙන් ස්ත්‍යානමිද්ධයාගේ; අවික්ඛෙපෙන උද්ධච්චස්ස, සමාධීන් ඖද්ධත්‍යයාගේ; ධම්මවවත්ථානෙන විචිකිච්ඡාය, කුශලාදිධර්මයන්ගේ යථාවනිශ්චයෙන් (සප්‍රත්‍යය නාමරූප ව්‍යවස්ථානයෙනැයිදුවෙත්) විචිකිත්සාවගේ (මෙසේ කාමච්ඡන්දාදි නීවරණප්‍රහාණවශයෙන් “අභිජ්ඣාදොමනස්සං” යනාදීන් කියනලද ප්‍රථමධ්‍යානාදීන්ගේ අධිගමයට උපායවූ පූර්වභාග ප්‍රතිපත්ති වශයෙන් ප්‍රහාණශීලාදීන් දක්වා දැන් සඋපායවූ අෂ්ටසමාපත්තිආදීන්ගේවශයෙන් දක්වන පිණිස “ඤාණෙන” යනාදි කියනලදී-නාමරූපපරිග්‍රහසාධනාවීතරණයන්ට විබන්ධකවූ මොහයාගේ දූරීකරණයෙන් ඥාතපරිඥාවෙහි පිහිටුවා අනිත්‍යසංඥාදීහු සිඩවෙති යි එසේම ධ්‍යානසමාපත්තියෙහිම අභිරතිනිමිත්තවූ ප්‍රමොද්‍යයෙන් ඉති අනභිරතිය දුරුකළකල්හි ධ්‍යානාදීන්ගේ සම්බිගමයවේනුයි සමාපත්ති විදර්ශනාවයහා මොවුන්ට අරතිවිනොදන අවිද්‍යාප්‍රදලනයෝ උපායනුයි “ඤාණෙන අවිජ්ජාය පාමොජ්ජෙන අරතියා” යි කීහු - උත්පටිපාටිනිර්දෙශය වනාහි නීවරණ සභාව අවිද්‍යානීවරණයන් කෙරෙහිදු සඞ්ග්‍රහබව දක්වනුපිණිසැයි දතයුතු) පඨමෙනඣානෙන නීවරණානං, ප්‍රථමධ්‍යානයෙන් නීවරණයන්ගේ; දුතියෙන ඣානෙන විතක්කවිචාරානං, ද්විතියධ්‍යානයෙන් විතර්කවිචාරයන්ගේ; තතියෙන ඣානෙන පීතියා, තෘතීයධ්‍යානීන් ප්‍රී

හීයෙන්; චතුත්ථජ්ඣානෙන සුඛ දුක්ඛානං, චතුර්ථධ්‍යානයෙන් සුඛ දුඃඛයන්ගේ; ආකාසානඤ්චායතන සමාපත්තියා, ආකාශානන්ත්‍යායතන සමවතින්; රූපසඤ්ඤාය, රූපසංඥාවගේ; පටිඝසඤ්ඤාය, ප්‍රතිඝ සංඥාවගේ; නානත්තසඤ්ඤාය, නානත්ව සංඥාවගේ; විඤ්ඤාණඤ්චායතන සමාපත්තියා, විඥානානන්ත්‍යායතන සමවතින්; ආකාසානඤ්චායතනසඤ්ඤාය, ආකාශානන්ත්‍යායතන සංඥාවගේ; ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියා, ආකිඤ්චන්‍යායතන සමවතින්; විඤ්ඤාණඤ්චායතන සඤ්ඤාය, විඥානානන්ත්‍යායතන සංඥාවගේ; නෙවසඤ්ඤා නාසඤ්ඤායතන සමාපත්තියා, නෛවසංඥා නාසංඥායතන සමවතින්; ආකිඤ්චඤ්ඤායතන සඤ්ඤාය, ආකිඤ්චන්‍යායතන සංඥාවගේ ("පහානං සීලං" යි යොදනු. සුවිශුද්ධ කායකර්මාදි ඇත්තක් ගිහිම විනා සම්බාධ වශයෙන් ධ්‍යානයන් පවත්නා බැවින් මොවුන්ට ශීලභාවය හා එහි විරතීන්ගේ සම්භවය කෙසේ දැයත්? මේ ධ්‍යාන ධර්මයෝ පටිපක්‍ෂ කුසලයන්ගෙන් කායකර්මාදිය විශෝධනය කිරීම් වශයෙන්ද මාර්ගඵල ධර්මයන්මෙන් දුශ්චරිත දුරාජීවයන් පටිපස්සම්භන වශයෙන්ද පවත්නාහු නොවෙත් මේ සැබැවින මහද්ගත ධර්මයෙහි නිෂ්පන්නයන් ශීලභාවයෙක් නැත. විරමණාදීයන් කොයිත්ද? මෙහි එනාහි නිෂ්පන්නයන් විරමණයක් නැතද පන්නයන් ලැබේ ඒ කෙසේදයත්? මහද්ගත කුශල ධර්මයෝ සම්පයුත්ත ධර්ම ප්‍රතිපක්ෂ ධර්මයන් පහකෙරෙද්ද එපමණකින් ප්‍රතිපක්ෂ ධර්මයන් කෙරෙන් විරමණයද කෙරෙත් යම්සේ ප්‍රතිපක්ෂ ධර්මයෝ සිතට නොනැගෙද්ද එසේ සංවරද වෙත් මනොද්වාරයෙහි පර්‍යුත්ථාන සංඛ්‍යාත ව්‍යතික්‍රමයද නොකෙරෙත් මෙතෙකි වනාහි තත්සම්ප්‍රයුක්තතාවෙවති මෙසේ පහීණයන් ශීලභාවය දතයුතු)

අනිච්චානු පස්සනාය, ත්‍රෛභූමික ධර්මයන්ගේ අනිත්‍යතාව ගෙණ පවත්නාවූ අනිත්‍යානු දර්ශනාවෙන්; නිච්චසඤ්ඤාය, නිත්‍යය යන සංඥාවගේ; දුක්ඛානුපස්සනාය, දුඃඛානු දර්ශනාවෙන්; සුඛසඤ්ඤාය, සුඛසංඥාවගේ; නිබ්බිදානු පස්සනාය, නිර්වේදානු දර්ශනාවෙන්; නන්දියා, සප්‍රීතික තෘෂ්ණාවගේ; විරාගානුපස්සනාය, විරජ්ජනාකාරයෙන් පවත්නා අනුපස්සනාවෙන්; රාගස්ස, සංස්කාර විෂය රාගයාගේ; නිරොධානුපස්සනාය, සංස්කාරයන්ගේ නිරොධ බලන අනුපස්සනාවෙන්; සමුදයස්ස, තෘෂ්ණාවගේ; පටිනිස්සග්ගානු පස්සනාය, සංස්කාරයන් හරණාකාරයෙන් පවත්නා අනුපස්සනාවෙන්; ආදානස්ස, නිත්‍යාදී විසින් ග්‍රහණයාගේ; ඛයානුපස්සනාය, ක්‍ෂයානු දර්ශනාවෙන්; ඝනසඤ්ඤාය, සන්තති සමූහ කෘත්‍යාලම්බන වශයෙන් එකත්ව ග්‍රහණ සංඛ්‍යාත ඝනසංඥාවගේ; වයානුපස්සනාය, ව්‍යයානු දර්ශනාවෙන්; ආයූහනස්ස, අභිසංස්කරණයාගේ; විපරිණාමානුපස්සනාය, අවස්ථාවිශෙෂාපත්ති සංඛ්‍යාත විපරිණාමයාගේ අනු දර්ශනාවෙන්; ධුවසඤ්ඤාය, ස්ථිරභාව ග්‍රහණ සංඛ්‍යාත ධ්‍රැවසංඥාවගේ; අනිමිත්තානු පස්සනාය, අනිමිත්තානු දර්ශනාවෙන්; නිමිත්තස්ස, සමූහාදී ඝන වශයෙනුදු සකෘත්‍ය පරිච්ඡෙදයෙනුදු සංස්කාරයන්ගේ සවිග්‍රහතා සංඛ්‍යාත නිමිත්තයාගේ; අප්පණිහිතානුපස්සනාය, අප්‍රණිහිතානු දර්ශනාවෙන්; පණිධියා, සංස්කාරයන් කෙරෙහි නිමන තෘෂ්ණා ප්‍රණිධියගේ; සුඤ්ඤතා

නු පස්සනාය, ශූන්‍යතානු දර්ශනාවෙන්; අභිනිවෙසස්ස, ආත්ම දෘෂ්ටි සංඛ්‍යාත අභිනිවේශයාගේ; අධිපඤ්ඤා ධම්මවිපස්සනාය, අනිත්‍යාදි වශයෙන් සියලු ත්‍රෛභූමක ධර්මතීරණයකාරණ අධිප්‍රඥා ධර්මානු දර්ශනාවෙන්; සාරාදානාභිනිවෙසස්ස, අසාරයෙහි සාරග්‍රහණ විපර්‍ය්‍යාසයාගේ; යථාභූත ඤාණදස්සනෙන, ස්ථිරභාවප්‍රාප්ත අනිත්‍යානු දර්ශනා සංඛ්‍යාත යථාභූත ඥානදර්ශනාවෙන් (සන්තානයෙහි සප්‍රත්‍යය නාමරූපදර්ශනය යථාභූත ඥාන නමැයි කීහ සමහරු උදයව්‍යය ඥානය යෙත්) සම්මෝහාභිනිවෙසස්ස, "ඉස්සරකතනාදිවසෙන ලොකො සමුප්පන්නො"යි කාරණඅභිනිවේශය සම්මෝහාභිනිවේශ නම්. උහුගේ යන අදහසි (සන්තානයෙහි ශාශ්වත උච්ඡේද අභිනිවේශයයි කීහු සමහරු "අහොසිං නුඛො අහං අතීතමද්ධානං" යනාදීන් ප්‍රවෘත්ත සංශයාපත්තිය සම්මෝහාභිනිවේශයයෙන්) ආදීනවානුපස්සනාය ආලයාභිනිවෙසස්ස, ආදීනවානු දර්ශනාවෙන් සංස්කාරයන් කෙරෙහි ත්‍රාණලෙණ භාවග්‍රහණ සංඛ්‍යාත ආලයාභිනිවේශයාගේ; පටිසංඛා ධම්මානුපස්සනාය "එවං හි තෙ සංඛාරා පටිනිස්සජ්ජන්ති'ති පවත්තං ඤාණං"යි උක්ත ස්වරූප ප්‍රතිසංඛ්‍යා ධර්මානු දර්ශනාවෙන්; අප්පටිසංඛාය, ප්‍රතිසංඛ්‍යාවට ප්‍රතිපක්ෂවූ මෝහප්‍රධාන අකුශල ධර්ම සංඛ්‍යාත අප්‍රතිසංඛ්‍යාවගේ; විවට්ටානුපස්සනාය, නිර්වාණ සංඛ්‍යාත විවට්ටයෙහි නිම්න බවය යන විවට්ටානුපස්සනාවෙන් (සංස්කාරෝපෙක්ෂාවෙන් හෝ අනුලෝම ඥානයෙන් යන අදහසි) සංයොගාභිනිවෙසස්ස, සංස්කාරයන් කෙරෙහි සංයොග විසින් අභිනිවේශයාගේ; සොතාපත්ති මග්ගෙන, ශ්‍රොතාපත්ති මාර්ගයෙන්; දිට්ඨෙකට්ඨානං, දෘෂ්ටිය හා සහජ වශයෙන් එක්ව සිටියාවූ ක්ලේශයන්ගේ; සකදාගාමි මග්ගෙන, සකෘදාගාමි මාර්ගයෙන්; ඔළාරිකානං කිලෙසානං, ඖදාරික ක්ලේශයන්ගේ; අනාගාමි මග්ගෙන අනුසහගතානං කිලෙසානං, අනාගාමි මාර්ගයෙන් අණුවූ සහගත ක්ලේශයන්ගේ; අරහත්ත මග්ගෙන, අර්හත් මාර්ගයෙන්; සබ්බකිලෙසානං, අවශිෂ්ට සමස්ත ක්ලේශයන්ගේ; පහානං සීලං, ප්‍රහාණ ශීලය; ...එවරූපානි සීලානි, මෙබඳු ශීලයෝ; විසුද්ධස්ස, විශුද්ධයාගේ; අවිප්පටිසාරාය සංවත්තන්ති "සංවරො අවිප්පටිසාරත්ථාය"යි කී බැවින් සිත්හුගේ අවිප්‍රතිසාරය පිණිස වෙති; පාමොජ්ජාය සංවත්තන්ති "යොනිසො මනසි කරොතො පාමොජ්ජං ජායති"යි කීහෙයින් අවිප්‍රතිසාරය ප්‍රමොදය පිණිස වෙති; පීතියා සංවත්තන්ති, "පමුදිතස්ස පීති ජායති"යි කීහෙයින් ප්‍රමොදය ප්‍රීතිය පිණිස වෙති; පස්සද්ධියා සංවත්තන්ති "පීතිමනස්ස කායො පස්සම්භති"යි කීහෙයින් ප්‍රීතිය සන්සිඳීම පිණිස වෙති; සොමනස්සාය සංවත්තන්ති "පස්සද්ධකායො සුඛං වෙදෙති"යි කීහෙයින් සන්සිඳීම සොමනස් වේදනාව පිණිස වෙති; ආසෙවනාය "සුඛිනො චිත්තං සමාධියති"යි කී බැවින් සමාධියාගේ ආසෙවනාය පිණිස වෙති (නිරාමිෂ සුඛය සිද්ධ කල්හි "සුඛිනො චිත්තං සමාධියති"යි කීබැවින් සමාධිය සිද්ධවෙයි. එහෙයින් සමාධියාගේ ආසෙවනාය පිණිස ප්‍රගුණබලව භාවය පිණිසවේ යන අදහසි) භාවනාය, ඒ සමාධියාගේම වෘද්ධිය පිණිස; බහුලීකම්මාය, නැවත නැවත වඩනා පිණිස; අලඞ්කාරාය, එම සමාධියට ප්‍රසාධනවූ ශ්‍රද්ධෙන්ද්‍රියාදීන්ගේ නිෂ්පත්තිය පිණිස; පරික්ඛාරාය, අවිප්‍රතිසාරාදිවූ සමාධිසම්භාරයාගේ සිද්ධිය පිණිස (සම්භාරනාම් ප්‍රත්‍යයයි දතයුතු)

පරිවාරය, සමාධිය හට පරිවාරවූ සමාහිචිත්තාදී ධර්ම විශේෂයන් මූලකාරණව සාධනබැවින් පරිවාර සම්පත්තිය පිණිසවේ; පාරිපූරියා සංවත්තන්ති, චිත්තාවයට පැමිණවීමෙන්ද විදර්ශනාවට කාරණභාවාපාදනයෙන් පරිපූර්ණ බව සාධන බැවින්ද සමාධියගේ පාරිපූරිය පිණිසවේ (මෙසේ සුපරිශුද්ධ ශීලමූලක සම්භාර පරිපූර්ණ සමාධිය දක්වා දැන් ශීලමූලක සමාධිපදස්ථාන ප්‍රයොජනයන් දක්වනු පිණිස "එකන්ත නිබ්බිදාය" යනාදී කීහු) එකාන්ත නිබ්බිදාය, එකාන්ත නිර්වේදය පිණිස ("විරාගාය අභිඤ්ඤාය සම්බොධාය" යනු මාර්ගය පිණිසය "නිරොධාය උපසමාය නිබ්බානාය" යනු නිවන් පිණිසය යනු සහතයි).

( හා * )

දෙවන පඤ්චකයෙහි ප්‍රාණඝාතාදී පාපධර්මයන්ගේ ප්‍රහීණකිරීම් ආදී වශයෙන් අර්ථ දතයුතු. මේ කියනලද්දේ මැයි. ප්‍රතිසම්භිදා මාර්ග පාලියෙහි ශීලයෝ පස්දෙනෙක්වෙත්මැයි ඒ කවර හුදයත්? ප්‍රාණඝාතයාගේ දුරුකිරීම ප්‍රහාණ ශීලනාම ප්‍රාණඝාතයාගේ විරමණය වෙරමණී ශීලනාම. ප්‍රාණඝාතයට විපක්ෂවූ චෙතනාව චෙතනා ශීලනාම. ප්‍රාණඝාත පාපය ඇතුල්වන්නාවූ කායද්වාරය වැසීම සංවර ශීලනාම. ප්‍රාණඝාතය නොකිරීම අව්‍යතික්‍රම ශීලනාම. (විස්තර වශයෙන් වනාහි මේ ශීලයෝ පන්දෙනම එකෙකී කර්මපථයක් පාසා පහළවන එකෙකී චිත්ත වීථියෙහි ලැබෙන නියාව අන්‍ය විහිත නොව අසා සිත්හි ලා දැරියයුතු. කෙසේදයත්? ප්‍රාණඝාතයෙන් වළකින්නාවූ පුද්ගලයා හට ඒ පිළිබඳව අටමහා කාමාවචර කුශල චිත්තවීථි අතුරෙන් සුදුසු චිත්ත වීථියක් පහළවේයි. ඒ චිත්ත වීථියෙහි පවත්නා ලජ්ජාවීම ස්වභාවකොට ඇති හ්‍රී චෛතසිකය පවට භයවීම ස්වභාවකොට ඇති ඕත්තප්ප චෛතසිකය අනුන් දුකින් මුදවීම ලක්ෂණකොට ඇති කරුණා චෛතසිකය කාමයෙහි නොඇල්ම ලක්ෂණකොට ඇති අලොභ චෛතසිකය යන මොවුන් ප්‍රමුඛකොට ඇත්තාවූ සතිස පටන් අවතිස දක්වා චෛතසික ධර්මයෝ සුදුසු පරිදි පහළවෙත්මය. ඔවුන් අතුරෙන් සම්‍යක් කර්මාන්ත විරති චෛතසිකය චෙතනා චෛතසිකය සමාහිත ආදි යෙදී සංවර ධර්මපඤ්චකය යන ධර්මයෝ තුන්දෙනා හැර සෙසු හිරිඔත්තප්පාදී චෛතසික ධර්මය සම්ප්‍රයුක්තවූ චිත්ත වීථිය ප්‍රාණඝාත පාපකර්මය නැසූ හෙයින් ප්‍රහාණ ශීලනාම සම්‍යක් කර්මාන්ත විරති චෛතසිකය කාරණකොටගෙණ ඒ පාපයෙන් වෙන්වූ හෙයින් වෙරමණී ශීලනාම. ඒ පාපයට ඉඳුරා විපක්ෂවූ චෙතනා චෛතසිකය චෙතනා ශීලනාම සමාහිත චෛතසිකය ආදි ධර්ම පඤ්චකය එම පාප ධර්මයට ඇතුළුවීය නොදී කායද්වාරය අවුරාගෙණ සිටිමහෙයින් සංවර ශීලනාම. ඒ චිත්ත වීථිය කාරණකොටගෙණ ප්‍රාණඝාත පාපය නොඉක්මවා සිටි හෙයින් ඒ චිත්ත වීථිය අව්‍යතික්‍රම ශීලනාම අන්සතු සම්පත් පැහැර ගැන්මෙන් දුරුවන කල්හිද ඒ සම්බන්ධව උපදනා කුශල චිත්ත වීථිය හා සමඟ පහළවන අලොභාදී චෛතසික ධර්මයෝද ප්‍රාණඝාතයට කී නියායෙන්ම ප්‍රහාණ ශීලය වෙරමණී ශීලය චෙතනා ශීලය සංවරශීලය අව්‍යතික්‍රම ශීල යන පස්වැදෑරුම් වෙත්මය.

කාමමිථ්‍යාචාරයෙන් වළක්නා සමයෙහිද බොරු කීමෙන් වළක්නා සමයෙහිද කේලාම් කීමෙන් වළක්නා සමයෙහිද පරුෂවස් කීමෙන් වළක්නා සමයෙහිද සම්ඵප්‍රලාප කීමෙන් වළක්

නා සමයෙහිද අනුන්ගේ සම්පතට ආශාකිරීමෙන් වළක්නා සමයෙහිද අනුන් නසින්වයි යනාදීන් සිතන ව්‍යාපාදයෙන් වළක්නා සමයෙහිද කර්මනැත කර්මඵල නැත යනාදී දශවස්තුවකින් ගන්නාලද මිථ්‍යාදෘෂ්ටියෙන් වළක්නා සමයෙහිද ප්‍රාණඝාතයට කී නියායෙන් එකෙසී කාමාවචර කුශල චිත්ත වීථිය පහළවෙයි ඒ ඒ වීථියෙහි පහළවන්නාවූ අලෝභාදී චෛතසික ධර්මයෝද යටකී නියායෙන් ප්‍රහාණ ශීල වේරමණී ශීල චේතනා ශීල සංවර ශීල අව්‍යතික්‍රම ශීලයෝ නම්වෙත්. මෙසේ දශකුශල කර්මපථයන්ගේ වශයෙන් සම්පණසක් ශීලයෝ වෙත්වය.

තවද පස්කම් සැපත අත්හැරපියා ගිහිගෙන් නික්මෙන්නා හට ඒ නික්මීම පිළිබඳව පහළවන්නාවූ අලෝභප්‍රධාන කාමාවචර කුශල චිත්ත වීථිය ප්‍රහාණ ශීල නම්. එහි යෙදුනාවූ විරතිය වේරමණී ශීල නම් චේතනාව චේතනා ශීල නම්. සමෘති ආදිය සංවර ශීල නම්. නැවත ඒ ශීලය නොඉක්මවීම අව්‍යතික්‍රම ශීල නම්. මෛත්‍රිය කාරණකොටගෙණ ව්‍යාපාදය දුරුකරන්නා හට පහළවන මෛත්‍රී චෛතසිකය ප්‍රධානකොට ඇති චිත්ත වීථියෙහිද ප්‍රකටකොට මෙනෙහිකිරීමෙන් උපන් ආලෝක සංඥාවයයි කියනලද ප්‍රතිභාග නිමිත්ත කාරණකොටගෙණ ථිනමිද්ධ නීවරණය දුරුකරන්නා හට පහළවන මනසිකාර ප්‍රධාන චිත්ත වීථියෙහිද සිත එකඟකොට අරමුණෙහි පිහිටුවීමෙන් උදහස් දුරුකරන්නා හට පහළවන ඒකාග්‍රතා චෛතසික ප්‍රධාන කුශල චිත්ත වීථියෙහිද ප්‍රත්‍යය සහිතවූ නාමරූප ධර්ම මේ මේයයි නියමකර දැනගැන්මෙන් විචිකිත්සාව දුරුකරන්නා හට පහළවන සම්‍යග් දෘෂ්ටි ප්‍රධාන කාමාවචර කුශල චිත්ත වීථියෙහිද යටකී නියායෙන් එකොසී නිවරණ ධර්මය පිළිබඳව ප්‍රහාණශීල වේරමණී ශීල චේතනාශීල සංවරශීල අව්‍යතික්‍රම ශීලයන් ලැබෙන බව දත යුතු. මෙසේ පඤ්චනිවරණ ධර්මයන් දුරුකරන්නා හට පහළවන්නාවූ චිත්ත පඤ්චකයාගේ වශයෙන් පස්විසි ශීලකොණක් වෙත්මැයි. තවද නුවණින් නාමරූප ධර්මයන් බලන්නා හට උපදනා ප්‍රඥාප්‍රධාන කාමාවචර කුශල චිත්ත වීථියෙහිද ධ්‍යාන සමාපත්තියෙහි ඇල්මෙන් එහි නොඇලීම් දුරුකරන්නා හට උපදනා ප්‍රීති ප්‍රධාන කුශල චිත්ත වීථියෙහිද ප්‍රථම ධ්‍යානය හේතුකොටගෙණ පඤ්චනීවරණයන් පහකරන්නා හට උපදනා ප්‍රථමධ්‍යාන රූපාවචර කුශල චිත්ත වීථියෙහිද විතීය ධ්‍යානයෙන් විතර්ක විචාරයන් දුරුකරනනා හට උපදනා විතීයධ්‍යාන රූපාවචර කුශල චිත්තවීථියෙහිද තෘතීයධ්‍යානයෙන් ප්‍රීතිය දුරුකරන්නා හට උපදනා තෘතීයධ්‍යාන රූපාවචර කුශල චිත්තවීථියෙහිද චතුර්ථධ්‍යානයෙන් සැපදුක් දුරුකරනනා හට උපදනා චතුර්ථධ්‍යාන රූපාවචර කුශල චිත්ත වීථියෙහිද ආකාසානඤ්චායතන පළමුවන අරූපාවචර ධ්‍යානයෙන් රූපසංඥා ප්‍රතිඝසංඥා නානත්ව සංඥාවන් දුරුකරනනා හට උපදනා පළමුවන අරූපාවචර කුශල චිත්ත වීථියෙහිද විඤ්ඤාණඤ්චායතන දෙවන අරූපාවචර ධ්‍යානයෙන් ආකාසානඤ්චායතන සංඥාව දුරුකරන්නා හට උපදනා දෙවන අරූපාවචර කුශල චිත්ත වීථියෙහිද ආකිඤ්චඤ්ඤායතන තුන්වන අරූපාවචර

ධ්‍යානයෙන් විඤ්ඤාණඤ්චායතන සංඥාව දුරුකරන්නාහට උපදනා තුන්වන අරූපාවචර කුශලවිපාකවීථියෙහිද නෙවසඤ්ඤානාසඤ්ඤායතන සතරවන අරූපාවචරධ්‍යානයෙන් ආකිඤ්චඤ්ඤායතනසංඥාව දුරුකරන්නාහට උපදනා සතරවන අරූපාවචරකුශලවිපාකවීථියෙහිද යනමේ අරහිමිතනාදන අවිද්‍යාප්‍රදලන සඞ්ඛ්‍යාත උපායඇගිය අෂ්ටසමාපත්ති වීථියෙහි ඒ ඒ ධ්‍යානාදීන්ට විරුද්ධ ධර්මයන් පහකරණහෙයින් ප්‍රහාණශීලයද එම විරුද්ධ ධර්මයන්ගෙන් වැලැක්මෙන හෙයින් වෙරමණීශීලයද එම ධර්මයන් නැවත සිතට නොඑලඹෙන පරිද්දෙන් මුවහකරණහෙයින් සංවරශීලයද එම ධර්මයන් මනොද්වාරයෙහි නොපහලවනහෙයින් අව්‍යතික්‍රම ශීලයද යන සතරප්‍රකාර වශයෙන්ද ස්වභාවයෙන් ඒ ඒ වීථියෙහි යෙදී පවත්නා චේතනා ශීලයද යනමේ ශීලපඤ්චකය ලැබෙන්නේයි. මෙසේ උපායවීථිදෙසාය සමාපත්තිවීථිඅටය යන දසවීථියෙහි ලැබිය යුතු සමපණස් ශීලයෝ දතයුතු තවද තෙභූමික සියලු සංස්කාරයන් අනිත්‍යහයි දක්නා අනිච්චානුපස්සනාවෙන් සංස්කාරධර්මයන් නිත්‍යය යන සංඥාව දුරුකරන්නාහට උපදනා කුශලවිපාකවීථියෙහි එම ධර්මයන් දුකැයි දක්නා දුක්ඛානුපස්සනාවෙන් සැපය යන සංඥාව දුරුකරණ්ණාහට උපදනා කුශලවිපාකවීථියෙහිද අනාත්මයයි දක්නා අනත්තානුපස්සනාවෙන් මමය මාගේය යන සංඥාව දුරුකරන්නාහට උපදනා කුශලවිපාකවීථියෙහිද සංස්කාරධර්මයෙහි කලකිරීමවශයෙන් පවත්නා නිබ්බිදානුපස්සනාවෙන් ප්‍රීතිසහගත තෘෂ්ණාව දුරුකරන්නාහට උපදනා කුශලවිපාකවීථියෙහිද එම ධර්මයෙහි නොඇලීම වශයෙන් පවත්නා විරාගානුපස්සනාවෙන් කාමසැප නොදුරුකොට පවත්නාරාගය දුරුකරන්නාහට උපදනා කුශලවිපාකවීථියෙහිද එම ධර්මයන්ගේ නිරුද්ධය දැකීමවශයෙන් පවත්නා නිරොධානුපස්සනාවෙන් තෘෂ්ණාව දුරුකරන්නාහට උපදනා කුශලවිපාකවීථියෙහිද එම ධර්මයන් අත්හරණ ආකාරයෙන් පවත්නා පටිනිස්සග්ගානුපස්සනාවෙන් නිත්‍යාදිවශයෙන් ගන්නාලද ග්‍රහණය දුරුකරන්නාහට උපදනා කුශලවිපාකවීථියෙහිද එම ධර්මයන්ගේ ක්ෂයවීම දැකීමවශයෙන් පවත්නා ඛයානුපස්සනාවෙන් සංස්කාරයන් එකම පරම්පරාවය එකමසමූහය යනාදින් එකක්කොට සිතාගන්නා ඝණසංඥාව දුරුකරන්නාහට උපදනා කුශලවිපාකවීථියෙහිද එම ධර්මයන්ගේ විනාශය දැකීමවශයෙන් පවත්නා වයානුපස්සනාවෙන් කර්මයන්ගේ රැස්කිරීම දුරුකරන්නාහට උපදනා කුශලවිපාකවීථියෙහිද එම ධර්මයන් නොයෙක් ආකාරයට පැමිණීම දැකීමවශයෙන් පවත්නා විපරිණාමානුපස්සනාවෙන් සංස්කාරයන් ස්ථිරවශයෙන් සිතාගන්නාලද ධ්‍රැවසංඥාව දුරුකරන්නාහට උපදනා කුශලවිපාකවීථියෙහිද අනිමිත්තානු පස්සනාවෙන් එම සංස්කාරධර්මයන්ගේ සමූහාදි ඝනවශයෙන් හෝ තමතමන්ගේ කටයුතු පිරිසිඳීමවශයෙන් හෝ ශරීරබවක් ඇතැයි පවත්නා නිමිත්ත සංඥාව දුරුකරන්නාහට උපදනා කුශලවිපාකවීථියෙහිද අප්පණිහිතානුපස්සනාවෙන් එම සංස්කාර ධර්මයෙහි නැමුනාවූ රාගප්‍රාර්ථනාව දුරුකරන්නාහට උපදනා කුශලවිපාකවීථියෙහිද සුඤ්ඤතානුපස්සනාවෙන් මමය මාගේය යන දෘෂ්ටිය දුරුකරන්නාහට උපදනා කු

ශලචිත්තවීථියෙහිද එම සංස්කාර ධර්මයන් අනිත්‍යදුක්ඛ අනාත්ම වශයෙන් තීරණයකරන්නාවූ අධිප්‍රඥා ධම්මානුපස්සනාවෙන් අසාරයෙහි සාරයයි සිතාගන්නාලද විපර්‍ය්‍යාසග්‍රහණය දුරුකරන්නාහට උපදනා කුශලචිත්තවීථියෙහිද නැත්පත් විදර්ශනාව යයි කියනලද යථාභූතඥානදර්ශනයෙන් ලෝකය ඊශ්වරාදීන් විසින් නිර්මිතකරණලදැයි යනාදින්පවත්නා මෝහමූලාව දුරුකරන්නාහට උපදනා කුශලචිත්තවීථියෙහිද ජරාමරණාදි ආදීනව දැකීම්වශයෙන් පවත්නා ආදීනවානුපස්සනාවෙන් සංස්කාරධර්මයන් රක්ෂාස්ථානය ආධාරස්ථානය යනාදීන් ගන්නාලද ඇල්ම දුරුකරන්නාහට උපදනා කුශලචිත්තවීථියෙහිද මෙසේ සිටිකල සංස්කාරයෝ අත්හරණාහුයයි පැවැති පටිසඞ්ඛාධම්මානුපස්සනාවෙන් මෝහප්‍රධාන අකුශලධර්මයන් දුරුකරන්නාහට උපදනා කුශලචිත්තවීථියෙහිද නිර්වාණධර්මයෙහි නැමීමේ වශයෙන් පවත්නා විවට්ටානුපස්සනාවෙන් සංස්කාරධර්මයෙහි යෙදීම දුරුකරන්නාහට උපදනා කුශල්චිත්තවීථියෙහිද සෝවාන්මාර්ගඥානයෙන් දෘෂ්ටිසඞ්ගත විචිකිත්සා සහගත අකුශලචිත්තයන් දුරුකරණාහට උපදනා සෝවාන් මාර්ග චිත්තවීථියෙහිද සකෘදාගාමි මාර්ගඥානයෙන් ඖලාරිකවූ රාගද්වේෂමෝහයන්ගේ තුනීබවකරන්නාහටඋපදනා සකෘදාගාමි මාර්ගචිත්තවීථියෙහිද අනාගාමි මාර්ගඥානයෙන් යට මාර්ගයෙන් තුනීකොට අවශේෂවතුබූ සූක්ෂ්ම කෙලෙසුන් නසනනාහට උපදනා අනාගාමිමාර්ග කුශලචිත්තවීථියෙහිද අර්හත්මාර්ගඥානයෙන් ඉතිරි සියලු කෙලෙසුන් නසනනාහට උපදනා අර්හත් මාර්ග කුශලචිත්තවීථියෙහිද යනමේ අවලොස් මහාවිදර්ශනා චිත්තවීථීහුය සතරආර්‍ය්‍යමාර්ගවීථීහුය යන දෙපසිතන්හි ද ප්‍රහාණශීල වේරමණිශීල චේතනාශීල සංවරශීල අව්‍යතික්‍රම ශීලයන් ලැබෙනපරිදි දතයුතු.

මෙසේ අවලොස් මහාවිදර්ශනාඥාන වීථි සතරආර්‍ය්‍යමාර්ගඥානවීථියෙහි ලැබෙනනාවූ එක්සියදශයක් ශීලයෝ දතයුත්තාහුයි. මෙපමණකින් දශඅකුශලධර්මයන්ගෙන් වැලකීම්වශයෙන් සමපණසක් ශීලයෝද පඤ්චනිවරණ ධර්මයන් දුරුකිරීම්වශයෙන් පස්විස්සක් ශීලයෝද උපායදෙකකින් යුක්තවූ අෂ්ටසමාපත්තීන්ගේ වශයෙන් සමපණසක් ශීලයෝද අවලොස් මහාවිදර්ශනාඥාන; සතරආර්‍ය්‍යමාර්ගඥානයන්ගේ වශයෙන් එක්සියදශයක් ශීලයෝද යන දෙසියපන්තිස් ශීලයෝ දතයුත්තාහුය.]

මෙබඳුවූ ශීලයෝ (සංවරය පිළිසරණවීමපිණිස පවත්නේයයි වදාලබැවින්) සිත නොකලකිරීමපිණිස පවත්නාහුය (නුවණින් මෙනෙහිකරන්නාහට ප්‍රමෝදය උපදනේයයි වදාලබැවින්) එ නොකලකිරීම ප්‍රමෝදය පිණිස පවත්නේය ප්‍රමෝදඇත්තාහට ප්‍රීතිය උපදනේයයි වදාලබැවින්) ඒ ප්‍රමෝදය ප්‍රීතියපිණිස පවත්නේය (ප්‍රීතිසිත් ඇත්තාහුගේ වෙදනාදි ස්කන්ධසඞ්ඛ්‍යාත කය සංසිඳේන්නේයයි වදාලබැවින්) ඒ ප්‍රීතිය සංසිඳීම පිණිස පවත්නේය (සංසිඳුනු කය ඇත්තේ සැපවිඳීනේයයි වදාලබැවින්) ඒ සංසිඳීම සොම්නස් සහගත සැපවේදනාව පිණිස පවත්නේය (සුඛිත පුද්ගලයාගේසිත එකගවන්නේයයි වදාලබැවින්) ඒ සැපවේදනාව සමාධියගේ බලවත්බව පිණිසද වැඩීමපිණිසද නැවත නැවත

වැඩීම පිණිස ද සඞ්ඛ්‍යාදීන්ගෙන් අලඞ්කාරකරණ පිණිසද සොභාකල්‍ර කිරීම් ආදී උපකාර පිණිසද සමාහිතීයඃාදිධර්මවිශේෂයන්ගෙන් පිරිවරණු පිණිස ද විදර්ශනාවට කාරණවූ සමාධිය සම්පූර්ණකිරීම පිණිස ද සියලු සංස්කාරධර්මයෙහි එකාන්තයෙන් නාලකිරීම්පිණිස ද රාගය නැනාවූ සෝවාන්ආදි මාර්ගධර්මයන් අවබෝධකිරීම්පිණිස ද සියලුදුක් නිරුද්ධකිරීමෙන් හා සියලුකෙලෙස් සන්සිඳුවීමෙන් ද ලැබියයුතු අර්හත්මහානිර්වාණසම්පත්තිප්‍රතිලාභය පිණිස ද පවත්නේයි.

( ෴ † )

එවඤ්ච පහානන්ති කොචි ධම්මො නාම නත්ථි අඤ්ඤත්‍ර වුත්තප්පකාරානං පාණාතිපාතාදීනං අනුප්පාදමත්තතො. යස්මා පන තං තං පහානං තස්ස තස්ස කුසලස්ස ධම්මස්ස පතිට්ඨානට්ඨෙන උපධාරණං හොති විකම්පාභාවකරණෙන ච සමාධානං තස්මා පුබ්බෙ වුත්තෙනෙව උපධාරණසමාධානසඞ්ඛාතෙන සීලනට්ඨෙන සීලන්ති වුත්තං. ඉතරෙ චත්තාරො ධම්මා තතො තතො වෙරමණිවසෙන තස්ස තස්ස සංවරවසෙන තදුභයසම්පයුත්තචෙතනාවසෙන තං තං අවීතික්කමන්තස්ස අවීතික්කමවසෙන ච චෙතසො පවත්තිං සන්ධාය වුත්තා — සීලට්ඨො පන තෙසං පුබ්බෙ පකාසිතොයෙවාති එවං පහානසීලාදිවසෙන පඤ්චවිධං — එත්තාවතා ච කිං සීලං කෙනට්ඨෙන සීලං කානස්ස ලක්ඛණරසපච්චුපට්ඨානපදට්ඨානානි කතිවිධං සීලන්ති ඉමෙසං පඤ්හානං විස්සජ්ජනං නිට්ඨිතං —

( ස † )

එවඤ්ච, මෙසේවනාහි; පහානන්ති, ප්‍රහාණයනම්; කොචි ධම්මො නාම නත්ථි, කිසි ධර්මයෙක් නම් නැත. (“පජහනං අනුප්පාදනිරොධො පහානං” යි පහාණශබ්දයාගේ භාවසාධන බැවින් ප්‍රහාණ නම් කිසි ධර්මයෙක්නැත යන අදහසි) වුත්තප්පකාරානං, කියනලදප්‍රකාර ඇති; පාණාතිපාතාදීනං, ප්‍රාණඝාතාදීන්ගේ; අනුප්පාදමත්තතො අඤ්ඤත්‍ර, අනුප්පාදමාත්‍රය තබා (‘කොචි ධම්මො නත්ථි” යොදනු) යස්මා පන, යම්හෙයකින්; තං තං පහානං (“පාණාතිපාතස්ස පහානං අදින්නාදානස්ස පහානං” යි කියනලද) ඒ ඒ ප්‍රහාණය; තස්ස තස්ස කුසලස්ස ධම්මස්ස, (ප්‍රාණඝාතයාගේ ප්‍රහාණය මෛත්‍ර්‍යාදි කුශලධර්මයන්ට පිහිටයයිද අදත්තාදාන ප්‍රහාණය ත්‍යාගාදිකුශලධර්මයන්ට පිහිටයයිද මෙසේ) ඒ ඒ කුශලධර්මයන්ට; පතිට්ඨානට්ඨෙන, ප්‍රතිෂ්ඨාවනබැවින්; උපධාරණං හොති, උපධාරණයවේ (පිහිටවේ යන අදහසි) විකම්පාභාවකරණෙන ච, ප්‍රාණාතිපාතාදීහු තමන් උපන් සන්තානයාගේ විකම්පනයට හෙතුනුයි තත්ප්‍රහාණය විකම්පාභාවය කරණහෙයින්; සමාධානං, සමාධාන නාම් වේ; තස්මා, එහෙයින්; පුබ්බෙ වුත්තෙනෙව, පූර්වයෙහිම උක්තවූ; උපධාරණසමාධානසඞ්ඛාතෙන, උපධාරණසමාධානය යන; සීලනට්ඨෙන, ශීලනාර්ථයෙන්; සීලන්ති වුත්තං, ශීලයයි කියනලදී, ඉතරෙ චත්තාරො ධම්මා, වෙරමණිආදිවූ සෙසු සතරධර්මයෝ; තතො තතො වෙරමණිවසෙන, ඒ ඒ පාණාතිපාතාදීන් කෙරෙන් විරමණවශයෙන්ද; තස්ස තස්ස සංවරවසෙන, ඒ ඒ පාණාතිපාතාදීන්ගේ සංවරණවශයෙන්ද (ඒ ඒ සංවරයන්ගේ වශයෙන් හෝ) තදුභය

සම්පයුත්ත චේතනාවසෙන, වෙරමණීනං හා ද සංවරධර්මයන් හා ද සම්ප්‍රයුක්ත චේතනාවශයෙන්ද; තං තං ඉවීතික්කමන්තස්ස අවීතික්කමවසෙන ච, ඒ ඒ නොඉක්මෙන්නහුගේ අව්‍යතික්‍රමවශයෙන්ද; චෙතසො පවත්තිසබ්භාවං සන්ධාය, සිත්හුගේ ප්‍රවෘත්තිසද්භාවය සඳහා; වුත්තං, කියනලදු (එහෙයින් එකක්‍ෂණයෙහිදු සම්භවයෙහි යනු මෙහි අභිප්‍රායයි) සෙසං, ඒ වෙරමණී ආදීන්ගේ; සීලට්ඨො පන, ශීලාර්ථය; පුබ්බෙ පකාසිතො යෙවාති, පළමු ප්‍රකාශකරණලදමැයි ... පෙ ...

( හා † )

මේ පඤ්චප්‍රකාරශීලයන් අතුරෙන් යටකියනලද පරිද්දෙන් ප්‍රාණඝාතාදීන් නොඉපදවීම හැර ප්‍රහාණශීලයයි යන අන්කිසි ශීලයෙක් නම් නැත්තේය යම්පරිද්දෙකින් ඒ ඒ අකුශලධර්මයන්ගේ ප්‍රහාණය ඒ ඒ කුශලධර්මයන්ට පිහිටවේද හෙවත් ප්‍රාණාතිපාත ප්‍රහාණය මෛත්‍රිආදී කුශල ධර්මයන්ටත් අදත්තාදානයාගේ ප්‍රහාණය ත්‍යාගාදී කුශලධර්මයන්ටත් පිහිටවේද මෙසේ ඒ ඒ කුශලධර්මයන්ට ආධාරවන බැවින් පිහිටවෙයි එසේම ප්‍රාණඝාතාදී පාපධර්ම උපදනා චිත්තසන්තානයක චඤ්චලවීමට හෙතුවන බැවින් ඒ පාපධර්මයන්ගේ ප්‍රහාණය සිත නොසැලීමට කාරණවන හෙයින් පාපධර්මයන්ගේ ප්‍රහාණය සිත මනාකොට පිහිටුවීමවෙයි එහෙයින් යට කියනලද ආධාරබවය මනාකොට පිහිටුවනබවය යන විප්‍රකාර ශීලනාර්ථයෙන් ප්‍රහාණය ශීලයයි කියනලද්දේයි සෙසුශීලයෝ සතරදෙන වනාහි ප්‍රහාණශීලය මෙන් ව්‍යවහාරමාත්‍රයෙක් නොව ස්වභාවධර්මයෝ මැයි. හේ කෙසේදයත්? ඒ ඒ පාපයෙන් වළක්නාහුගේ චිත්තය ප්‍රතිබද්ධවූ විරති චෛතසිකයෝ ම විරතිශීලනාම ඒ ඒ චිත්තසම්ප්‍රයුක්ත සමෘතිප්‍රඥක්‍ෂාන්තිආදී සංවරධර්මයෝ ම සංවරශීල නම් ඒ ඒ චිත්තප්‍රතිබද්ධචේතනාවෝ චේතනාශීල නම් ඒ ඒ පාපධර්මය නොකිරීම්වශයෙන් පැවති චිත්තචෛතසික ධර්මයන්ගේ මනාවූ ස්වභාව අව්‍යතික්‍රමශීල නම් එහෙයින් මේ පඤ්චප්‍රකාරශීලයෝ එකම චිත්තක්‍ෂණයෙහි උපදනාහුය. ඒ විරතිආදී ධර්මයන්ගේ ශීලාර්ථය යට කියනලද්දේමැයි මෙසේ මේ ශීලය ප්‍රහාණශීලාදීවශයෙන් පස්වැදෑරුම් වන්නේයි.

මෙතෙකින් ශීලය නම් කුමක්ද? කවරඅර්ථයෙකින් ශීලනම් වන්නේද? ඒ ශීලයාගේ ලක්‍ෂණය කෘත්‍යය ඵල ඔසිටින කාරණය ආසන්නකාරණය යන මොහු කවරහුද? ශීලය කුමක් අනුසස්කොට ඇත්තේද? මේ ශීලය කී ප්‍රකාරයක් අත්තේදැයි? යට දක්වනලද ප්‍රශ්නයන්ගේ විසඳීම කියා නිමවනලද්දේයි. ...

( පා ‡ )

යංපන වුත්තං කො චස්ස සඞ්කිලෙසො කිං වොදානන්ති තත්‍ර වදම ... ඛණ්ඩාදිභාවො සීලස්ස සඞ්කිලෙසො අඛණ්ඩාදිභාවො වොදානං සො පන ඛණ්ඩාදිභාවො ලාභයසාදිහෙතුකෙන හෙදෙන ච සත්තවිධමෙථුනසංයොගෙන ච සඞ්ගහිතො. තථාහි යස්ස සත්තසු ආපත්තික්ඛන්ධෙසු ආදිම්හි වා අන්තෙ වා සික්ඛාපදං භින්නං හොති තස්ස සීලං පරියන්තෙ ඡින්නසාටකො විය ඛණ්ඩන්නාම හොති ... යස්ස පන වෙමජ්ඣෙ භින්නං තස්ස මජ්ඣෙ ඡිද්දසාටකො විය ඡිද්දන්නාම හොති ... යස්ස පටිපාටියා ද්වෙ තීණි භින්නානි තස්ස

පිට්ඨියා වා කුච්ඡියා වා උට්ඨිතෙන විසභාග වණ්ණෙන කාළරත්තාදීනං අඤ්ඤතර සරීරවණ්ණා ගාවී විය සබලං නාම හොති— යස්ස අන්තරන්තරා භින්නානි තස්ස අන්තරන්තරා විසභාග වණ්ණබින්දු විචිත්‍රගාවී විය කම්මාසන්නාම හොති— එවං තාව ලාභාදි හෙතුකෙන භෙදෙන ඛණ්ඩාදි භාවො හොති—

( ෂ ‡ )

(''කො චස්ස සඞ්කිලෙසො කිං වොදානන්ති යං පන වුත්තං තත්‍ර වදාම'' යනාදිනු) අස්ස, මේ චතුර්විධ ශීලයාගේ; සඞ්කිලෙසො, සකිලිටු බව; කොපන, කවර; වොදානං, පිරිසිදු බව; භින්නි, කවරයත්? ඛණ්ඩාදිභාවො, ඛණ්ඩසබලාදි භාවය; සීලස්ස, සීලයාගේ; සඞ්කිලෙසො, සකිලිටු බව නම් වේ; අඛණ්ඩාදිභාවො, අඛණ්ඩ අච්ඡිද්‍රාදි භාවය; වොදානං, පිරිසිදු බව නම් වේ; සො පන ඛණ්ඩාදිභාවො, ඒ ඛණ්ඩාදි භාවය වනාහි; ලාභයසාදි හෙතුකෙන, ලාභයස ආදීන් හෙතු කොට ඇති; භෙදෙන, භෙදයෙන්ද; සත්තවිධ මෙථුන සංයොගෙන ච, සත්වැදෑරුම් මෛථුන සංයොගයෙන්ද; සඞ්ගහිතො, සංග්‍රහකරණලදී; තථාහි, එසේමැයි; යස්ස, යමෙක්හුගේ; සත්තසු ආපත්තික්ඛන්ධෙසු, සත් ඇවැත් කඳුන් කෙරෙහි; ආදිම්හි වා, ආදියෙහි හෝ; අන්තෙ වා, කෙළවරහෝ; සික්ඛාපදං භින්නංහොති, සික පදයෙක් බිඳෙනලද්දේවේද; තස්ස සීලං, උහුගේ ශීලය; පරියන්තෙ ඡින්නසාටකො විය, දකත්වත් කුරුගුලාකත්වත් සිඳුනාලද වස්ත්‍රයක් මෙන්; ඛණ්ඩන්නාම හොති, කඩකරණලද්දේ නම්වේ; යස්ස පන, යමෙක්හුගේ වනාහි (ශීලය) වෙ මජ්ඣෙ භින්නං, මධ්‍යයෙහි ශික්ෂාපදයක් භින්නවීනම්; තස්ස, ඔහුගේ (ශීලය) මජ්ඣෙ ඡිද්දසාටකො විය, මධ්‍යයෙන් සිදුරු පිළියක් මෙන්; ඡිද්දං නාම හොති, සිදුරු නම්වේ; යස්ස, යමෙකුගේ (ශීලය) පටිපාටියා, පිළිවෙළින්; ද්වෙ තීණි, දෙතුන් ශික්ෂාපද කොණක්; භින්නානි, බිඳෙනලද්දාහුවේද; තස්ස, ඔහුගේ [ශීලය) පිට්ඨියා වා, පිටවත්; කුච්ඡියා වා, කුසවත්; උට්ඨිතෙන, නැංගාවූ; විසභාගවණ්ණෙන, නොසමවූ වර්ණයෙන් යුත්; කාළරත්තාදීනං, කාලරක්තාදි වර්ණයන් අතුරෙන්; අඤ්ඤතර සරීරවණ්ණා, එක්තරා ශරිර වර්ණයක් ඇති; ගාවී විය, දෙනකමෙන් (කබර දෙනකමෙන්) සබලං නාම, සබරනම් (කබරයුතැති) යස්ස, යමෙක්හුගේ; අන්තරන්තරා, අතරතුරෙහි; භින්නානි, සිකපදයෝ බිදෙනලද්දාහු වෙද්ද; තස්ස, ඔහුගේ (ශීලය) අන්තරන්තරා, අතරතුරෙහි; විසභාගවණ්ණබින්දු, නොසම පැහැති බින්දුවෙන්; විචිත්‍රගාවී විය, විසිතුරු දෙනකමෙන් [තිත්දෙනකමෙන්) කම්මාසං නාමහොති, කල්මාෂ නම්වේ (තිත් නම්වේ) එවං, මෙසේ; තාව, පළමුකොට; ලාභාදිහෙතුකෙන භෙදෙන; ලාභාදීන් හෙතුකොට ඇති භෙදයෙන්; ඛණ්ඩාදිභාවො, ඛණ්ඩාදි භාවය; වෙදිතබ්බො, දතයුතුවේ—

(භා ‡)

මෙතැන්පටන් මේ සිව්වැදෑරුම් ශීලයාගේ කිළුටු කවරේද? පිරිසිදු බව කවරේදැයි යන ප්‍රශ්න වෙයෙහි විසර්ජනාව දක්වම්හ. යේ කෙසේදයත්? ශීලයෙහි ඛණ්ඩ සබලාදි ස්වභාවය ශීලයාගේ කිලුටු බවයයි කියාද අඛණ්ඩ අච්ඡිද්‍රාදි ස්වභාවය පිරිසිදුබවයයි කියාද දතයුතු ශීලයාගේ යම් ඛණ්ඩාදි ස්වභාවක් ඇත්තේවේද ඒ ස්වභාවය ලාභකීර්ති ආදී ශරිර ජීවිතයන්

යන් වශයෙන්ද සත්වැදෑරුම් මෙවුන් දම් සෙවීම් වශයෙන්ද සංග්‍රහකරණ ලද්දේයි. ඒ එසේමැයි. මේ සස්නෙහි යම් මහණෙකුගේ සප්තාපත්තිස්කන්ධයන් අතුරෙන් මුල හෝ අග හෝ යම් ශික්ෂාපදයක් බිඳුනේ වේද ඔහුගේ ශීලය කොණ් සිදුනාලද වස්ත්‍රයක්මෙන් කඩකරණලද්දේ වෙයි. යම් මහණෙකුගේ ශීලය මධ්‍යයෙහි ශික්ෂාපදයක් බිඳුනාලද්දේද විනම් ඔහුගේ ශීලය මැදින් සිදුරුකළ වස්ත්‍රයක්මෙන් සිදුරුකරණලද්දේ වෙයි. යම් මහණෙකුගේ ශීලය පිළිවෙළින් දෙතුන් ශික්ෂාපද කොටණක් බිඳෙනලද්දැහු වේද ඔහුගේ ශීලය පිට හෝ බඩ හෝ පැංගාවූ නොසමවූ වර්ණයෙන් යුත් කාල රක්තාදී වර්ණයන් අතුරෙන් එක්තරා ශරීර වර්ණයක් ඇත්තාවූ කබර දෙනක්මෙන් සබලනම්වෙයි. යම් මහණෙකුගේ ශීලය අතරතුරෙහි ශික්ෂාපදයෝ බිඳෙනලද්දාහුද ඔහුගේ ශීලය අතරතුරෙහි නොසමවන් පැහැති බින්දුවෙන් එසිතුරු තිත්දෙනක්මෙන් තිත් සහිත නම් වන්නේයි මෙසේ පල මුළුකොට ලාභ යශ සඳහා අඩග ජීවිත විශයෙන් ශීලයාගේ ඛණ්ඩඡිද්‍ර සබල කල්මාෂ භාවය වන පරිදි දතයුත්තේයි.

( පා ෟ )

එවං සත්තවිධමෙථුන සංයොග වසෙන—වුත්තං. හෙතං භගවතා ඉධ බ්‍රාහමණ එකච්චො සමණො වා බ්‍රාහමණො වා සම්මා බ්‍රහමචාරී පටිජානමානො නහෙවඛො මාතුගාමෙන සද්ධිං ද්වයං ද්වය සමාපත්තිං සමාපජ්ජති අපිච ඛො මාතුගාමස්ස උච්ඡාදනං නහාපනං සම්බාහනං සාදියති සො තදස්සාදෙති තං නිකාමෙති තෙන ච විත්තිං ආපජ්ජති ඉදම්පිඛො බ්‍රාහමණ බ්‍රහමචරියස්ස ඛණ්ඩම්පි ඡිද්දම්පි සබලම්පි කම්මාසම්පි අයං වුච්චති බ්‍රාහමණ අපරිසුද්ධං බ්‍රහමචරියං චරති සංයුත්තො මෙථුනෙන සංයොගෙන නපරිමුච්චති ජාතියා ජරාය මරණෙන —පෙ— නපරිමුච්චති දුක්ඛස්මාති වදාමි —පුනච පරං බ්‍රාහමණ ඉධෙකච්චො, සමණො වා —පෙ— පටිජානමානො න හෙව ඛො මාතුගාමෙන සද්ධිං ද්වයං ද්වය සමාපත්තිං සමාපජ්ජති න පි මාතුගාමස්ස උච්ඡාදනං —පෙ— සාදියති අපිච ඛො මාතුගාමෙන සද්ධිං සඤ්ජග්ඝති සංකීළති සංකෙලායති සො තදස්සාදෙති —පෙ— දුක්ඛස්මාති වදාමි —පුනච පරං බ්‍රාහමණ ඉධෙකච්චො, සමණො වා බ්‍රාහ්මණො වා —පෙ— නහෙව ඛො මාතුගාමෙන සද්ධිං ද්වයං ද්වය සමාපත්තිං සමාපජ්ජති න පි මාතුගාමස්ස උච්ඡාදනං —පෙ— සාදියති නපි මාතුගාමෙන සද්ධිං සඤ්ජග්ඝති සංකීළති සංකෙලායති අපිච ඛො මාතුගාමස්ස චක්ඛුනා චක්ඛුං උපනිජ්ඣායති පෙක්ඛති සො තදස්සාදෙති —පෙ— දුක්ඛස්මාති වදාමි —පුනචපරං බ්‍රාහමණ ඉධෙකච්චො, සමණො වා බ්‍රාහමණො වා —පෙ— න හෙව ඛො මාතුගාමෙන —පෙ— න පි මාතුගාමස්ස —පෙ— න පි මාතුගාමෙන —පෙ— නපි මාතුගාමස්ස —පෙ— පෙක්ඛති අපිච ඛො මාතුගාමස්ස සද්දං සුණාති තිරොකුඩ්ඩා වා තිරොපාකාරා වා හසන්තියා වා භණන්තියා වා ගායන්තියා වා රොදන්තියා වා සො තදස්සාදෙති —පෙ— දුක්ඛස්මාති වදාමි —පුනචපරං බ්‍රාහමණ ඉධෙකච්චො සමණො වා බ්‍රාහ්මණො වා —පෙ— න හෙව ඛො මාතුගාමෙ

න — නාපි මාතුගාමස්ස — නාපි මාතුගාමෙන — න පි මාතුගාමස්ස සරාදසානීයා වා — අපිච ඛො යානිස්ස තානි පුබ්බෙ මාතුගාමෙන සද්ධිං හසිත ලපිත කීළිතානි තානි අනුස්සරති සො තදස්සාදෙති — පෙ — දුක්ඛස්මාති වදාමි — පුනචපරං බ්‍රාහ්මණ ඉධෙකච්චො සමණො වා බ්‍රාහ්මණො වා — පෙ — න හෙව ඛො මාතුගාමෙන — පෙ — නාපි මාතුගාමස්ස — පෙ — නාපි යානිස්ස තානි පුබ්බෙ මාතුගාමෙන සද්ධිං හසිත ලපිත කීළිතානි තානි අනුස්සරති — අපිච ඛො පස්සති ගහපතිං වා ගහපති පුත්තං වා පඤ්චහි කාම ගුණෙහි සමප්පිතං සමඞ්ගීභූතං පරිචාරයමානං සො තදස්සාදෙති — පෙ — දුක්ඛස්මාති වදාමි — පුනචපරං බ්‍රාහ්මණ ඉධෙකච්චො සමණො වා — පෙ — න හෙව ඛො මාතුගාමෙන — න පස්සති ගහපතිං වා ගහපතිපුත්තං වා පරිචාරය මානං — අපිච ඛො අඤ්ඤතරං දෙවනිකායං පණිධාය බ්‍රහ්මචරියං චරති ඉමිනාහං සීලෙන වා වතෙන වා තපෙන වා බ්‍රහ්මචරියෙන වා දෙවො වා භවිස්සාමි දෙවඤ්ඤතරො වාති සො තදස්සාදෙති තන්නිකාමෙති තෙන ච විත්තිං ආපජ්ජති ඉදම්පි බ්‍රාහ්මණ බ්‍රහ්මචරියස්ස ඛණ්ඩම්පි ඡිද්දම්පි සබලම්පි කම්මාසම්පීති — එවං ලාභාදි හෙතුකෙන භෙදනච සත්තවිධ මෙථුන සංයොගතච ඛණ්ඩාදි භාවො සඞ්ගහීතොති වෙදිතබ්බා —

( ස ¶ )

එවං, මෙසේ; සත්තවිධ මෙථුන සංයොගවසෙන (මෙම) සප්ත ප්‍රකාර මෛථුන සංයොග වශයෙනුදු (ඛණ්ඩාදි භාවය දතයුතු) වුත්තං හි භගවතා, භගවත්හු විසින් කීයේමැනු; බ්‍රාහ්මණ, බමුණ; ඉධ, මේ ලෝකයෙහි; එකච්චො, එකෙක්; සමණො වා, ද්‍රව්‍යජ්‍යාමාත්‍රයෙන් ශ්‍රමණයෙක් හෝ; බ්‍රාහ්මණො වා, ජාති මාත්‍රයෙන් බමුණෙක් හෝ; බ්‍රහ්මචාරි පටිජානමානො, බ්‍රහ්මචර්‍ය්‍යාව වෙසෙමිහි ප්‍රතිඥකරන්නේ; මාතුගාමෙන සද්ධිං, මාගම හා සමග; ද්වයංද්වය සමාපත්තිං (දෙදෙනා විසින් සමවැද්ද යුතු බැවින් ද්වයංද්වය සමාපත්ති නම් වූ) මෛථුන ධර්මය; නහෙව ඛො සමාපජ්ජති, නොම සම්වදනේයි; අපිච ඛො, එකෙක් ඇති; මාතුගාමස්ස, මාගමගේ; උච්ඡාදනං, ඇඟ ඉලීම; නහාපනං, නැවීම; සම්බාහනං, අතපය හැඹීම; සාදියති, ඉවසාද; සො, හෙතෙම; තදස්සාදෙති, ඒ උච්ඡාදනාදියෙහි ඇලේද; තං, එය; නිකාමෙති, කැමැතිවේද; තෙනච විත්තිං ආපජ්ජති, එයින් තුෂ්ටියට පැමිණේද; බ්‍රාහ්මණ, බමුණ; ඉදම්පි ඛො, මේද ( ඉදං යනු යථොක්ත සාදියනාදීන් ඛණ්ඩභාවාදි වශයෙන් එකත්වයෙන් ගෙණ කීහ. පි ශබ්දය වක්ෂ්‍යමාන සමුච්චයාර්‍ථය ඛො යනු අවධාරණාර්‍ථයි) බ්‍රහ්මචරියස්ස, බ්‍රහ්මචර්‍ය්‍යාගේ; ඛණ්ඩම්පි, එකාන්තයෙන් ඛඩදවෙයි; ඡිද්දම්පි, ඡිද්‍රදවෙයි; සබලම්පි, සබලද වෙයි; කම්මාසම්පි, කල්මාෂද වේ; බ්‍රාහ්මණ, බමුණ; අයං, මේ තෙම; අපරිසුද්ධං බ්‍රහ්මචරියං චරති, අපරිශුද්ධ බ්‍රහ්මචරියද පුරයි; මෙථුනෙන සංයොගෙන, මෛථුන සංයොගයෙන්; සංයුත්තො විහරති, යෙදී වෙසේ; ජාතියා, ජාතියෙනුදු; ජරාය, ජරාවෙන්ද; මරණෙන, මරණින්ද; නපරිමුච්චති, නොමිදේ; දුක්ඛස්මා, දුකින්; න පරිමුච්චතීති වදාමි, නොමිදෙයි කියමි — පෙ — සඤ්ජග්ඝති, කොලශ වශයෙන් මහසිනාසේද; සඞ්කීළති, කාය සංසග්ග වශයෙන් කෙළීද; සඞ්කෙලායති, සම්ඛාරයෙන් මාගම

කෙරෙහි මමත්වය කෙරේද...පෙ...චක්ඛුනා චක්ඛුං, තමාගේ ඇසින් මාගමගේ ඇස; උපනිජ්ඣායති, බලාද ('පෙක්ඛති' යනු 'ඔලොකෙති' යන අර්ථයි)

තිරොකුඩ්ඩා වා, මැටි භිත්තියෙහි එපිටින් හෝ; තිරොපාකාරා වා, උළු පවුරෙහි එපිටින් හෝ; මාතුගාමස්ස, මාගමගේ; හසන්තියා වා, හසන්නියගේ හෝ; භණන්තියා වා, බණන්නියගේ හෝ; ගායන්තියා වා, ගී කියන්නියගේ හෝ; රොදන්තියා වා, හඬන්නියගේ හෝ; සද්දං සුණාති, ශබ්දය අසාද; අස්ස, ඒ බ්‍රහ්මචාරී ප්‍රතිඥයාගේ; පුබ්බේ, ව්‍රත සමාදානයට පූර්වයෙහි; මාතුගාමෙන සද්ධිං, මාගම හා සමග (කල) යානි තානි හසිතලපිත කීළිතානි, යම් ඒ සිනාවෙන් කථාවෙන් කෙළියෙන් ඇද්ද; තානි, ඔවුන්; අනුස්සරති, සිහිකෙරේද; අපිචඛො, අනිකෙකුදු ඇත; ගහපතිං වා, ගෘහපතියෙක් හෝ; ගහපති පුත්තං වා, ගෘහපති පුත්‍රයෙකු හෝ; පඤ්චහි කාමගුණෙහි, පස්කම් කොටසින්; සමප්පිතං, සහිතවූවහු; සමඞ්ගිභූතං, සමන්විතවූවහු; පරිචාරයමානං, කෙළනහු (උපස්ථානකරණු ලබන්නහු හෝ) අඤ්ඤතරං දෙව නිකායං පණිධාය, එක්තරා දිව්‍ය නිකායක් ප්‍රාර්ථනාකොට; බ්‍රහ්මචරියං චරති, බ්‍රහ්මචරිය කෙරේද; අහං, මම; ඉමිනා සීලෙන වා, මේ ශීලයෙන් හෝ; වතෙන වා, ව්‍රතයෙන් හෝ; බ්‍රහ්මචරියෙන වා, බ්‍රහ්මචරියයෙන් හෝ ("සීලෙන" යනාදියෙහි යම නියමාදි සමාදානය සීලයයි අව්‍යති ක්‍රමය ව්‍රතයි නොහොත් ඒ දෙකම සීලයයි දුෂ්කරචර්‍යා වශයෙන් පවත්වනලද්දේ ව්‍රතයි. තත් තත් අසාත්‍ය සම්බන්ධයෙන් නිවෘත්ති ලක්ෂණ ශීලය සමාදන් වූවහුගේ වෙස භොජන කෘත්‍යාචරණාදි විශෙෂ ප්‍රතිපත්තිය ව්‍රතයි. හැමතැන ම දුෂ්කරචර්‍යාව තපසයි මෛථුන විරතිය බ්‍රහ්මචර්‍යායි.) ("දෙවො වා භවිස්සාමි"යි, ශක්‍ර සුයාමාදි ප්‍රකට දෙවියන්කීහ "දෙවඤ්ඤතරො"යි, අප්‍රසිද්ධයන්කීහු) එවං, මෙසේ; ලාභාදි හෙතුකෙන ච භෙදෙන, ලාභාදි හෙතුභෙදයෙන්ද; සත්තවිධ මෙථුන සංයොගෙන ච, සප්තවිධ මෛථුන සංයොගයෙන්ද; ඛණ්ඩාදිභාවො, ඛණ්ඩාදි භාවය; සඞ්ගහිතානි, සඞ්ග්‍රහකරණලද්දේයයි; වෙදිතබ්බා, දතයුත්තේ වේ (සප්තවිධ මෛථුන සංයොගය වූවහොත් ඡිද්‍ර නම්වේ පිළිවෙළින් මෛථුන සංයොගයක් වූවහොත් සබල නම්වේ. අනතුරෙහි වූවහොත් කම්මාස නම්වෙයි නොහොත් ආදියෙහි සිකපද ඉක්මීමට ප්‍රත්‍යය වීයයුතු මෛථුන සංයොගය වූවහොත් සිල්කඩ නම්වෙයි මේ නියායෙනුදු යොදනු)

(භා ¶)

සත්වැදෑරුම් මෛථුන්දම්හි යෙදීම වශයෙන් ඛණ්ඩාදි භාවය වනසැටිද මෙසේම දතයුතු. භාග්‍යවතුන්වහන්සේ විසින්ද වදාරණ ලදුයේමැයි. බ්‍රාහ්මණය මේ ලෝකයෙහි මනාකොට බඹසරවස රකිමියි හඟවන්නාවූ ඇතම් මහණෙක් හෝ බමුණෙක් හෝ මාගම හා සමග මෛථුන්දම් නොම සෙවුනේද වැළඳෙනකෙක් ඇත. මාගමවිසින් කරණලද ඇඟ ඉලීම් නැහැවීම් අතපය මැඩීම යනාදි කායික වතාවත් ඉවසාද හෙතෙමේ ඒ ඇඟ ඉලීම් ආදියෙහි ඇලේද කැමැතිවේද එයින් සතුටුවේද එම්බා බ්‍රාහ්මණය මේ මාගම විසින් කරණලද ඇඟ ඉලීම් ආදිය ඉවසීම බඹසරවස කඩවීමය සිදුරුවීමය කබර සහිත වීමය තිත් සහිත වීමයයි කියනු ලැබේ. එම්බා බ්‍රාහමණය මේ මාගම විසින් කරණලද ඇඟ ඉලිම් ආදිය ඉවසන මහණ බමුණු තෙමේ අපිරිසිදු බඹසරවස පුරන්නේ නම්වෙයි. මෛථුන්දම්හි යෙ

දීමෙන් යුක්තව වසන්නේනම් මෙසේ හෙතෙම මේ ජාතිදුකින්ද ජරාදුකින්ද මරණදුක් ආදියෙන්ද අපායදුකින්ද නොමිදෙන්නේයයි කියමි.

නැවතද බ්‍රාහ්මණය මේ ලොකයෙහි මනාකොට බඹසරවස රක්මියි හඟවන්නාවූ ඇතැම් මහණෙක් හෝ බමුණෙක් හෝ මාගම්හා සමග මෙවුන්දම් නොමසෙවුනේද මාගම විසින් කරණලද ඇඟලීම් නැහැවීම් අතපයමැඩීම් නොමඉවසන්නේද වැලිඑකෙක් ඇත මාගම්හා සමග කෙලෙස්වශයෙන් සිනාසෙන්නේ හෝ වේද කායසංසග්ගවශයෙන් සෙල්ලම් හෝ කෙරේද සම්භාරයෙන් මාගමකෙරෙහි මමත්වය කෙරේද හෙතෙමේ ඒ සිනාසීම් ආදියෙහි ඇලෙන්නේවේද ඒ කැමැතිවේද එයින් සතුටුවේද එම්බා බ්‍රාහ්මණය මේ මාගම හා සමග කෙලෙස්වශයෙන් සිනාසීම් ආදිය බඹසරවස කඩවීමය සිදුරුවීමය කබරසහිතවීමය තිත්සහිතවීමයයි කියනුලැබේ. එම්බා බ්‍රාහ්මණය මේ මාගම හා සමග කෙලෙස්වශයෙන් සිනාසෙන මහණ බමුණුතෙමේ අපිරිසිදු බඹසරවස පුරන්නේනමිවෙයි. මෙවුන්දම්හි යෙදෙන්නේනම් වෙයි. හෙතෙමේ ජාතිජරාමරණාදී දුකින් නොමිදෙන්නේයයි කියමි

නැවතද බ්‍රාහ්මණය මේ ලොකයෙහි මනාකොට බඹසරවසරකිමියි හඟවන්නාවූ ඇතැම් මහණෙක් හෝ බමුණෙක් හෝ මාගම හා සමග මෙවුන්දම් නොමසෙවුනේද මාගමවිසින් කරණලද ඇඟලීම් ආදිය නොම ඉවසන්නේද මාගම හා සමග කෙලෙස්වශයෙන් සිනාසීම් ආදිය නොකරන්නේවේද. වැලි එකෙක් ඇත තමාගේ ඇසින් මාගමගේ ඇස රාගසිතින් බලන්නේවේද යත දශීතරාගවාරයෙහිද බිත්තිය එපිටින් හෝ ප්‍රාකාරය එපිටින් හෝ සිට සිනාසෙන්නීවූ හෝ කථාකරන්නීවූ හෝ ගීකියන්නීවූ හෝ හඬන්නීවූ හෝ මාගමගේ ශබ්දය රාගසිතින් අසාද යත ශ්‍රවණරාගවාරයෙහිද ශීලසමාදානයට පෙර මාගම හා සමග කලවිරූ සිනාසීම් කථාකිරීම් සෙල්ලම්කිරීම් ආදිය නැවත නැවත සිහිකෙරේද යත අනුස්මරණරාගවාරයෙහිද රූපාදි පස්කම් ගුණයෙහි පිහිටියාවූ ඒ පස්කම්ගුණයෙන් යුක්තවූ ඒ පස්කම්ගුණයෙන් උපස්ථානකරණලබන්නාවූ ගෘහපතියෙකු හෝ ගෘහපතිපුත්‍රයෙකු හෝ දැක ඒ සම්පතහි ඇලේද යනාදී කාමරාගවාරයෙහිද මම මේ ශීලයෙන් හෝ ව්‍රතයෙන් හෝ තපස්කිරීමෙන් හෝ බඹසරවසරැකීමෙන් හෝ ඉන්ද්‍රාදි ප්‍රසිද්ධ දෙවියෙක්වෙම්වයි කියා හෝ අප්‍රසිද්ධ එක්තරා දෙවියෙක් වෙම්වයි කියා හෝ එක්තරා දිව්‍යසමාගමක් ප්‍රාර්ථනාකොට සීලාදිය රක්නේද යත තෘෂ්ණාපරිභාෂවාරයෙහිද යනමේ සතරවාරයෙහි යටකී නියායෙන් බඹසරවස ඛණ්ඩච්ඡිද්‍රසබලකල්මාෂවනපරිදි දතයුතු.

මෙසේ ලාභාදිය හේතුකොටඇති ප්‍රභෙදයෙන්ද සත්වැදෑරුම් මෙවුන් දම්හි යෙදීම්වශයෙන්ද ඛණ්ඩච්ඡිද්‍රසබලකල්මාෂභාවය සංග්‍රහකරණලද්දේයයි දතයුතු.

( පා * )

අඛණ්ඩාදිභාවො පන සබ්බසො සික්ඛාපදානං අභෙදෙන භින්නානඤ්ච සප්පටිකම්මානං පටිකම්මකරණෙන ච සත්තවිධමෙථුනසංයොගාභාවෙන අපරාය ච කොධූපනාහමක්ඛපලාසඉස්සාමච්ඡරියමායාසාඨෙය්‍යථම්භසාරම්භමානාතිමානමදපමාදෙහි

ආදීනං පාපධම්මානං අනුප්පත්තියා අප්පිච්ඡතා සන්තුට්ඨිතා සල්ලෙඛතා දීන ච ගුණානං උප්පත්තියා සඞ්ගහී තො යානිහි සීලානි ලාභාදිනම්පි අත්ථාය අභිහනානි පමාදදොසෙන වා භින්නානි පි පටිකම්මකතානි මෙථුනසංයොගෙහි ච කොධුපනාහාදීහි ච පාපධම්මෙහි අනුපහතානි සබ්බසො අඛණ්ඩානි අච්ඡිද්දානි අසබලානි අකම්මාසානීති වුච්චන්ති තානියෙව භුජිස්සභාවකරණතො ච භුජිස්සානි විඤ්ඤුප්පසත්ථතා විඤ්ඤුප්පසත්ථානි තණ්හාදිට්ඨීහි අපරාමට්ඨතා අපරාමට්ඨානි උපචාරසමාධිං අප්පනාසමාධිං වා සංවත්තයන්තීති සමාධිසංවත්තනිකානි ච හොන්ති තස්මා තෙසං එස අඛණ්ඩාදිභාවො වොදානන්ති වෙදිතබ්බො ––

( ඝ * )

අඛණ්ඩාදිභාවොපන, අඛණ්ඩාදිභාවය වනාහි ("සඞ්ගහිතො" යනු හා සම්බන්ධකරණු) සබ්බසො සික්ඛාපදානං අභෙදන, සර්වාකාරයෙන් සිකපද නොබිඳීමෙන්ද (නොහොත් සියලුසිකපද නොබිඳීමෙන්ද) භින්නානව, බින්නාදවූ; සප්පටිකම්මානං, පිළියම්සහිත (සිකපදයන්ට) පටිකම්මකරණෙනච, පිළියම්කිරීමෙන්ද; සත්තවිධ මෙථුනසංයොගානා මවන, සත්වැදෑරුම්වූ මෛථුනසංයොගයාගේ අභාවයෙන්ද ("අපරාය ච අනුප්පත්තියා" යනු හා යොදනු) අපරාය, අනික්; කොධො, කිපනලකුණු පලමු උපදනා චෙතසික; උපනාහො, නැවත නැවත බලවත්ව වෛරිබඳිමින් උපදනා චෛතසිකය; මක්ඛො, අනුන්ගේ ගුණ මකන චෛතසිකය; පලාසො, අනුන්ගේ ගුණ හැදුරුකිරිමක් මෙන් අනුන්ගේගුණ හා සමගුණ ඇති වියසනාසහම් යන දෘෂ්ටිතාස් සහ ගිය චිත්තොත්පාදය; ඉස්සා, පරසැපත් නැසෙට්මින් උපදනා ඊර්ෂ්‍යා; මච්ඡරියං, තමාහැපත් සඟවන මසුරුබව; මායා, ඇතිදොස් මුවහකරණලොභාකාරඇති චිත්තොත්පාදය; සාඨෙය්‍යං, නැතිගුණ පහලකරණුකැමැති ලොභාකාරඇති චිත්තොත්පාදය; ථම්භො, තන්තකරින් දැඩිවූ චිත්තොත්පාදය; සාරම්භො, අනුන්ගුණ ඉකුත්විය නොදෙනුකැමති දෘෂ්ටිතාස් සහ ගිය චිත්තොත්පාදය; මානො, ජාතිආදීන් තමාහුවන ලකුණුඇති මානය; අතිමානො, අනිකෙකින් හැම නුවනලකුණුඇති මානය; මදො, ජාතිආදියකින් සතුටුවෙමින් උපදනා මත්නැමැත් මදය; පමාදො, පස්කම්ගුණෙහි උපදනා චිත්තොත්පාදය යන; ආදීනං, මේ ආදිවූ; පාපධම්මානං, පාපධර්මයන්ගේ; අනුප්පත්තියා, නොඋපදීමෙන්ද; අප්පිච්ඡතා, අල්පේච්ඡතාස් ඇතිබවද; සන්තුට්ඨිතා, ඉතරිතරප්‍රත්‍යයෙන් සතුටුබව; සල්ලෙඛතා, මනාකොට කෙලෙසුන් ලියන බවය යන; ආදීනං, මේආදිවූ. ගුණානං උප්පත්තියා ච, ගුණයන්ගේ උපැත්මෙන්ද; සඞ්ගහිතො, සඞ්ග්‍රහකරණලද; යානි හි සීලානි, යම් සිල්කෙණෙක්; ලාභාදීනම්පි අත්ථාය අභින්නානි, ලාභාදීන්පිණිස අභින්නයෝද; පමාදදොසෙන වා භින්නානිපි, ප්‍රමාදදෝෂයෙන් බින්නාහුද; පටිකම්මකතානි, පිළියම්කරණලද්දාහුද. මෙථුනසංයොගෙහි ච, (සත්වැදෑරුම්) මෛථුනසංයොගයන්ද; කොධුපනාහාදීහි ච පාපධම්මෙහි, ක්‍රොධය උපනාහය යනාදිවූ පාපධර්මයෙන්ද; අනුපහතානි, නොපහරණලද්දාහුද (නොනැසුවාහුද) සබ්බසො, සර්වාකා

රණයන්; අඛණ්ඩානි, නොකඩහ; අච්ඡිද්‍රානි, නොසිදුරහ; අසබලානි, නොකබරහ; අකම්මාසානි, නොතිත්හයි; චුච්චභාගී, ගිහැහු ලැබෙද්ද; භානිමයො, ඔහුම; භුජිස්සභාවකරණතො, තෘෂ්ණාදාසත්වයෙන් මුදන බැවින්; භුජිස්සානි, භුජිස්ස නම්වෙත්; විඤ්ඤුපසත්ථානි, නුවණැතියන් විසින්; පසත්ථතා, ප්‍රශස්ත බැවින්; විඤ්ඤූප්පසත්ථානි, විඤ්ඤූප්පසත්ථ නම්වෙත්; තණ්හාදිට්ඨිහි, තෘෂ්ණාදෘෂ්ටි දෙදෙන විසින්; අපරාමට්ඨතතා, නොපිරිමට බැවින්; අපරාමට්ඨානි, අපරාමට්ඨ නම්වෙත්; උපචාර සමාධිං, උපචාර සමාධිය හෝ; අප්පනාසමාධිංවා, අර්පණා සමාධිය හෝ; සංවත්තයන්තීති, පවත්වන්නුයි; සමාධිසංවත්තනිකාව හොන්ති, සමාධිසංවත්තනිකා නමුදුවෙත්; තස්මා, එහෙයින්; එතං, ඒ ශීලයන්ගේ; එසො අඛණ්ඩාදිභාවො, මේ නොකඩ ආදිබව; වොදානනති, පිරිසිදුබවුනමැයි; වෙදිතබ්බො, දතයුතුයි.

(භා*)

තවද ශීලයාගේ අඛණ්ඩඅච්ඡිද්‍ර අසබල අකල්මාෂ භාවය වනාහි සර්වාකාරයෙන් ශික්ෂාපද නොබිඳීමෙන්ද බිඳුනාවූද පිළියම් සහිතවූ හෙවත් වුට්ඨානගාමිණී දේශනාගාමිණී ශික්ෂාපදයන්ට වත්මානත් අබ්භානකම් කිරීමෙන් ප්‍රකෘතිකිරීමෙන්ද සත්වැදෑරුම් මෙවුන්දම්හි නොවැදීම් වශයෙන්ද අතිකුදු කිපෙන ලක්ෂණ ඇතතාවූ පළමු උපදනා ද්වෙෂ සහගත සිතය නැවත බලවත් වෛර බඳිමින් උපදනා ද්වෙෂ සහගත සිතය අනුන්ගේ ගුණමකන ද්වෙෂසහගත සිතය අනුන්ගේ ගුණ හා සමගුණ ඇතිවිය නොහෙම් යන දොම්නස් සහගත සිතය යනාදී ද්වෙෂ ය මුල්ව උපදනා අකුශල චිත්තයෝ පරසම්පත්තීයෙහි ගැටෙමින් උපදනා ඊර්ෂ්‍යා සහගත සිතය තම සැපත් සඟවනා සුළුවූ මසුරු බව මුල්ව උපදනා අකුශල සිතය ඇති දොස් මුවහකරණ ලොභාකාර ඇති සිතය තමා කෙරෙහි නැති ගුණ පහළකරණු කැමති ලොභ විකාර සිතය යනාදී ලොභමූලික අකුශල චිත්තයන්ගේ විපාක විකාරයෙන් දූෂිත අකුශල චිත්ත : අනුන්ගේ ගුණ ඉතුම්ය නොදනු කැමැති දොම්නස් සහගත සිතය ජාති ආදීයෙන් තමා උසස්කරණු කැමැති මානසහගත අකුශල චිත්තය අතිශයින් සර්වප්‍රකාරයෙන් තමා උසස්කරණු කැමැති අතිමාන සහගත අකුශල චිත්තය ජාතිමදාදි වශයෙන් සතුටුවෙමින් උපදනා මානසහගත අකුශල චිත්තය පස්කම් සැපයෙහි ප්‍රමාදවීම් වශයෙන් උපදනා ලොභ සහගත චිත්තය යන ද්වෙෂ මූලික ලොභමූලික අකුශල චිත්තයෝය යනාදී ආදී පාප ධර්මයන් නොඉපදවීමෙන්ද අලොභ අදහස් ඇතිබවය ලද දෙයකින් සතුටුවන බවය මනාකොට කෙලෙස් ලියන බවය යනාදී ආදිගුණයන් ඉපදවීම් වශයෙන්ද සඞ්ග්‍රහකරණලද්දේයි යම් ශීලයෙක් ලාභාදිය පිණිස හෝ නොබිඳිනලද්දනුද ප්‍රමාද දොෂයකින් බිඳුනාහුදු නැවත පිළියම්කොට පිරිසිදුකරණලද්දනුද සත්වැදෑරුම් මෙවුන්දම්යෙන් හෝ ක්‍රොධ උපනාහාදි පාප ධර්මයන්ගෙන් හෝ නොපහරණලද්දනුද ඒ ශීලය සර්වාකාරයෙන් නොකඩවූ නොසිදුරුවූ නොකබරවූ නොතිත්වූ ශීලයයි කියනු ලැබේ එම ශීලයෝම තෘෂ්ණාදාසත්වයෙන් මුදා රහත් බව එලවන හෙයින් භුජිස්ස නම්ද වෙත්මය නුවණැත්තන් විසින් පසස්නාලද බැවින් විඤ්ඤූප්පසත්ථ නම්ද වෙත්මය තෘෂ්ණාදෘෂ්ටි දෙකින් නොඅල්වාගන්නාලද

බැවින් අපරාමෘෂ්ට නම්ද වෙත්මය උපචාර සමාධිය හෝ අර්පණා සමාධිය හෝ පවත්වන හෙයින් සමාධි සංවත්තනික නමුදු වෙත්මය එහෙයින් ඒ ශීලයන්ගේ මේ අඛණ්ඩාදි භාවයම ශීලයාගේ පිරිසිදු බව නම්වෙයි දත යුතු—

( ෂා † )

තම්පනෙතං වොදානං විභාකාරෙහි සම්පජ්ජති සීලවිපත්තියා ආදිනව දස්සනෙන සීලසම්පත්තියාච ආනිසංස දස්සනෙන— තත්ථ පඤ්චිමෙ භික්ඛවෙ ආදීනවා දුස්සීලස්ස සීලවිපත්තියාති එවමාදි සුත්තනයෙන සීලවිපත්තියා ආදීනවො දට්ඨබ්බො— අපිච දුස්සීලො පුග්ගලො දුස්සීල්‍යහෙතු අමනාපො හොති දෙවමනුස්සානං අනනුසාසනීයො සබ්‍රහ්මචාරීනං දුක්ඛිතො දුස්සීලගරහාසු විප්පටිසාරී සීලවතං පසංසාසු තාය ච පන දුස්සීල්‍යතාය සාණසාටකො විය දුබ්බණ්ණො හොති යෙඛො පනස්ස දිට්ඨානුගතිං ආපජ්ජන්ති තෙසං දීඝරත්තං අපාය දුක්ඛාවහනතො දුක්ඛසම්ඵස්සො යෙසං දෙය්‍යධම්මං පතිගණ්හාති තෙසං න මහප්ඵලකරණතො අප්පග්ඝො අනෙකවස්සගණික ගූථකූපොවිය දුබ්බිසොධො ඡවාලාතමිව උභතො පරිබාහිරො භික්ඛුභාවං පටිජානන්තොපි අභික්ඛු යෙව ගොගණං අනුබන්ධගද්‍රභො විය සතතුබ්බිග්ගො සබ්බ වෙරිපුරිසො විය අසංවාසාරහො මතකළෙබරං විය— සුතාදි ගුණයුත්තොපි සබ්‍රහ්මචාරීනං අපූජාරහො සුසානග්ගි විය බ්‍රාහ්මණානං— අභබ්බො විසෙසාධිගමෙ අන්ධොව රූපදස්සනෙ නිරාසො සද්ධම්මෙ චණ්ඩාලකුමාරකො විය රජ්ජෙ සුඛිතොස්මීති මඤ්ඤමානොපි දුක්ඛිතො අග්ගික්ඛන්ධ පරියායෙ වුත්ත දුක්ඛභාගිතාය දුස්සීලානං හි පඤ්චකාමගුණ පරිභොග වන්දනමානනාදි සුඛස්සාදගථිත චිත්තානං තප්පච්චයං අනුස්සරණ මත්තෙනාපි හදයසන්තාපං ජනයිත්වා උණ්හලොහිතුග්ගාරප්පවත්තනසමත්ථං අතිකටුකං දුක්ඛං දස්සෙන්තො සබ්බාකාරෙන පච්චක්ඛකම්මවිපාකො භගවා ආහ පස්සථ නො තුම්හෙ භික්ඛවෙ අමුං මහන්තං අග්ගික්ඛන්ධං ආදිත්තං සම්පජ්ජලිතං සජොතිභූතන්ති, එවම්භන්තෙ තං කිං මඤ්ඤථ භික්ඛවෙ කතමන්නුඛො වරං යං අමුං මහන්තං අග්ගික්ඛන්ධං ආදිත්තං සම්පජ්ජලිතං සජොතිභූතං ආලිංගිත්වා උපනිසීදෙය්‍යවා උපනිපජ්ජෙය්‍යවා, යංවා ඛත්තියකඤ්ඤං වා බ්‍රාහ්මණකඤ්ඤං වා ගහපතිකඤ්ඤංවා මුදුතලුණහත්ථපාදිං ආලිංගිත්වා උපනිසීදෙය්‍ය වා උපනිපජ්ජෙය්‍යවාති— එතදෙව භන්තෙ වරං යං ඛත්තියකඤ්ඤංවා— පෙ— උපනිපජ්ජෙය්‍යවා— දුක්ඛංහෙතං භන්තෙ යං අමුං මහන්තං අග්ගික්ඛන්ධං— පෙ— උපනිපජ්ජෙය්‍යවාති—

( ෂ † )

තං පනෙතං වොදානං, ඒ වොදානය; විභාකාරෙහි, දෙයාකාරයකින්; සම්පජ්ජති, සිඩවෙයි; සීලවිපත්තියා ආදිනව දස්සනෙන, ශීල විපත්තියෙහි ආදිනව දුටුමෙන්; සීලසම්පත්තියා ආනිසංස දස්සනෙන, ශීලසම්පත්තියෙහි අනුසස් දක්මෙනි; තත්ථ, ඒ දෙක්හි; භික්ඛවෙ, මහණෙනි; දුස්සීලස්ස සීලවිපත්තියා, දුශ්ශීලය හට ශීල විපත්තියෙහි; ඉමෙ පඤ්ච ආදීනවා ඉති, මේ පස් ආදීනවයෙන යන; එවමාදිසුත්තනයෙන, මේ ආදි සූත්‍රනයෙන්; සීලවිපත්තියා, ශීලවිපත්තියෙහි; ආදීන

පො දට්ඨබ්බො, ආදීනව දතයුතුයි;
අපිච, අනිකෙකුදු; දුස්සීලො පුග්ග
ලො, දුශ්ශීල පුද්ගල තෙමේ; දුස්සීල්‍ය
හෙතු, දුශ්ශීල බව හේතුකොටගෙණ;
දෙවමනුස්සානං, දෙව්මිනිසුන්ට; අම
නාපො හොති, අමනාපවේ; සබ්‍රහ්ම
චාරීනං, සබ්‍රම්සරුන්ට; අනනුසාසනි
යො (පිළිකුල් බැවින්) අනුශාසනා ක
ටයුතු නොවේ; දුස්සීලගරහාසු, දුශ්ශී
ලයන්ට ගර්හාකරණකල්හි; දුක්ඛිතො,
තෙමේ දුක්ඛිතවේ; සීලවතං පසංසා
සු, සිල්වතුන්ට ප්‍රශංසාකරණ කල්හි;
විප්පටිසාරී, කලකිරේ ("අභතං වත
මෙ කල්‍යාණං" යනාදීන් පශ්චාත්තා
පී වෙයි සේයි) තාය පන දුස්සීල්‍ය
තාය, එම දුශ්ශීල භාවයෙන්; සාණ
සාටකො විය, සණවාකඩක්මෙන්; දු
බ්බණ්ණො හොති, ගුණවර්ණයෙන්හා
ශරීර වර්ණයෙන් රහිතවේ; යෙ බො
පන, යම් කෙනෙක් වනාහි; අස්ස,
ඒ දුශ්ශීලයාගේ; දිට්ඨානුගතිං ආප
ජ්ජන්ති, ලබ්ධි අනුබවට පැමිණේද;
තෙසං, ඔවුන්ට; දීඝරත්තං, බොහෝ
කලක්; අපායදුක්ඛාවහනතො, අපා
ය දුක් එලවන හෙයින්; දුක්ඛස්සෙ
ශසො, දුඃඛ ස්පර්ශ ඇත්තේයි; යෙසං
දෙය්‍යධම්මං පටිගණ්හාති, යම් කෙ
ණෙකුන්ගේ දෙයධර්මය පිළිගණීද;
තෙසං, ඔවුන්ට; න මහප්ඵල කරණ
තො, මහත්ඵල නොකරණ බැවින්;
අප්පග්ඝො, මදක් අගනේයි; අනෙකව
ස්සගණික, අනෙක වර්ෂ සමූහයෙහි ස
ඤ්චිතවූ; ගූථකූපොවිය, අශුචිවළක්මෙ
න්; දුබ්බිසොධො, ශුද්ධකට නොපිළිව
න් වන්නේයි; ඡවාලාතම්ව, සොහො
න් පෙනහෙල්ලක්මෙන්; උභතො
පරිබාහිරො, ශ්‍රාමණ්‍යයෙන්ද ගෘහි භා
වයෙන්ද යන දෙකින්ම පිටත්වන්
නේයි; භික්ඛුභාවං පටිජානනොපි,
භික්ෂුභාවය ප්‍රතිඥාකරන්නේද; අභික්ඛු
යෙව, අභික්ෂුමවේ; ගොගණං අනුබන්ධ
ගද්‍රභො විය, ගොගණයක් අනුබඳනා
වූ කොටලුවෙකුමෙනි; සතතුබ්බිග්
ගො, සතතයෙන්ම උද්විග්න වන්නේ
ය (තැලගිරෙයි) සබ්බවෙරි පුරිසොවි
ය, හැමදෙන හටම වෛරීපුරුෂයෙකු
මෙනි; අසංවාසාරහො, සංවාසයට සු
දුසු නොවේ; මතකලෙබරං විය, සැව
ශරීරයක්මෙනි; සුතාදිගුණයුත්තොපි,
බහුශ්‍රැතාදී ගුණයෙන් යුක්තවූයේද;
සබ්‍රහ්මචාරීනං, සබ්‍රම්සරුන්ගේ; අපූ
ජාරහො, පූජාවට අර්හ නොවේ; බ්‍රා
හ්මණානං, බමුණන්ට; සුසානග්ගිවිය,
සොහොන් ගින්නක්මෙනි; අභබ්බො
විසෙසාධිගමෙ, විශෙෂාධිගමයෙහි අභ
ව්‍යවේ; රූපදස්සනෙ අන්ධොව, රූ දැ
ක්මෙහි අන්ධයක්හුමෙනි; සද්ධම්මෙ,
ප්‍රතිපත්ති ප්‍රතිවෙධ සද්ධර්මයෙහි; නිරා
සො, ආශා නැත්තේයි; චණ්ඩාලකුමා
රොවිය රජ්ජෙ, රජයෙහි සැඩොල් කු
මරුවක්හුමෙනි; සුඛිතොස්මීති මඤ්ඤ
මානොපි, සුවපත්වෙමියි සිතන්නේද;
දුක්ඛිතො, දුක් ඇත්තේමවේ; අග්ගි
ක්ඛන්ධපරියායෙ වුත්තදුක්ඛභාගිතාය,
අග්නිස්කන්ධ පර්‍ය්‍යාය සූත්‍රයෙහි කී දු
කට හිමිව සිටි හෙයිනි; පඤ්චකාමගු
ණ පරිභොගවන්දනමානනාදි සුඛස්සා
ද ගධිත චිත්තානං, පස්කම්ගුණ වැල
ඳීමෙහි වන සුඛයෙහිද අනුන් විසින්
කරණ වන්දනමානනාදියෙන් වන සු
ඛයෙහිද ආස්වාදයෙහි ගිජුවූ සිත් ඇ
ති; දුස්සීලානං, දුශ්ශීලයන්ට; තප්ප
ච්චයං, යථොක්තවූ සුඛාස්වාදයන් ප්‍ර
ත්‍යයකොට ඇති ("දුක්ඛං" යනු හා
සම්බන්ධයි) අනුස්සරණමත්තෙනාපි,
අනුස්මරණ මාත්‍රයෙනුදු; හදයසන්තා
පං ජනයිත්වා, හෘදය සන්තාපය කර
වා; උණ්හලොහිතුග්ගාරප්පවත්තන ස

මලං, හුණුලේ හන්වාපියන්නාට සම
ළුවූ; අභිසටුකං, ඉතා දරුණුවූ; දු
ක්ඛං, දුක; දුස්සහනෙතා, දක්වන්නා
වූ; සබ්බාකාරෙන, සර්වාකාරයෙන්; ප
ච්චක්ඛකම්ම විපාකො, ප්‍රත්‍යක්‍ෂකර්ම වි
පාක ඇත්තාවූ; භගවා, භාග්‍යවත්
තෙමේ; භික්ඛවෙ, මහණෙනි; තුම්හෙ,
තෙපි; අමුං මහන්තං අග්ගික්ඛන්ධං,
තෙල මහත් ගිනිකඳ; ආදිත්තං, ගිනි
ගත්; සම්පජ්ජලිතං, හාත්පසින් නැ
ගෙණ ගිනිසිලින් ගැවසීගෙණ (එකප්‍ර
භා සමූහවූවා) නොපස්සථ, නොදක්නුදු
සි; ආහ, කී; එවම්භන්තෙ, වහන්ස එ
සේයසි ප්‍රතිවචන දුන්හුහු; භික්ඛවෙ,
මහණෙනි; තං කිං මඤ්ඤථ, තෙ සුම
කැයි හැඟුද; කතමන්නු ඛො වරං, ක
වරක් උතුම්ද; ආදිත්තං, ගිනිගත්;
සම්පජ්ජලිතං, හාත්පසින් දිලියෙන;
සජොතිභූතං, ගිනිසිලින් දිලියෙන
(එකප්‍රභාවූ) අමුං මහන්තං අග්ගික්ඛ
න්ධං, තෙල මහත් ගිනිකඳ; ආලිඞ්ගි
ත්වා, වැලඳගෙණ; උපනිසීදෙය්‍යවා, හි
ඳුනේහෝ වේද; උපනිපජ්ජෙය්‍යවා,
හෝනේ හෝ වේද යන; යං, යමෙක්
ඇද්ද; ඛත්තියකඤ්ඤංවා, රජ දූවක
හෝ; බ්‍රාහ්මණකඤ්ඤංවා, බමුණු දුව
ක හෝ; ගහපතිකඤ්ඤං වා, ගැහැවි දු
වක හෝ; මුදුතලුනහත්ථපාදිං, මෘදුවූ
සිවිමැලිවූ හස්තපාදදී අවයව ඇත්ති
ය; ආලිඞ්ගිත්වා, වැලඳගෙණ; උපනිසී
දෙය්‍යවා, හිඳුනේ හෝ වේද; උපනිප
ජ්ජෙය්‍යවා, හෝනේ හෝ වේද යන;
යං වා, යමෙක් ඇද්ද (මේ දෙකින්;
("කතමන්නුඛො වරං" යි යොදනු)
භන්තෙ, වහන්ස; එතදෙව, මෙම; ව
රං, උතුම්; ඛත්තියකඤ්ඤංවා, රජ දුව
ක හෝ ...... පෙ ...... උපනිපජ්ජෙය්‍ය
වා, වැලඳගෙණ හිඳිනේය යන; යං,
යමෙක් ඇද්ද ("එතදෙව වරං" යි
යොදනු—ඒ උතුම් බව් හෙතු දක්ව
ති "දුක්ඛං හෙතං භන්තෙ"යි) අමුං
මහන්තං අග්ගික්ඛන්ධං, තෙල මහත්
ගිනිකඳ; උපනිපජ්ජෙය්‍යවා, වැලඳ
ගෙණ හෝනේද යන; යං, යමෙක්
ඇද්ද; එතං, මේ; දුක්ඛං ති, දුක්වැයි
කීහු ......

( භා † )

ඒ මේ පිරිසිදු බව විනා ශීල විප
ත්තියෙහි දෙස් දක්වමය ශීල සම්පත්ති
යෙහි අනුසස් දක්වමය යන දෙයාකා
රයකින් සිඩවන්නේසී ඒ දෙයාකාරය
න් අතුරෙන් මහණෙනි දුස්සීලයා හ
ට ශීල විපත්තියෙහි මේ ආදීනවයෝ
පස්දෙනෙකැයි යනාදී ආදී සූත්‍ර දෙ
ශනා ක්‍රමයෙන් ශීල විපත්තියෙහි ආදී
නව දතයුතුයි තවද දුශ්ශීල පුද්ගල
තෙමේ දුශ්ශීල බව හෙතුකොටගෙණ
දෙවි මිනිසුන්ට අමනොඥ වන්නේය
සබ්‍රම්සරුන්ට පිළිකුල් බැවින් අනුශා
සනා කටයුතු නොවන්නේය දුශ්ශීල
යන්ට ගර්හාකරණ කල්හි තෙමේ
දුක්ඛිතවන්නේය සිල්වතුන්ට ප්‍රශංසා
කරණ කල්හි මාවිසින් යහපතක්
නොකරණලදැයිසිත පශ්චාත්තාප ව
න්නේය ඒ දුශ්ශීල බව හෙතුකොට
ගෙණ හණරෙදිකඩක් මෙන් ගුණ ව
ර්ණ ශරීර වර්ණ දෙකින්ම පිරිහෙන්
නේය යම් කෙණෙක් විනාහි ඒ දුශ්ශී
ලයාගේ ලබ්ධිය පසුපස්සේ යනානු
නම් ඔවුන්ට බොහෝ කලක් අපාය
දුක්ඵලවිපාකහෙයින් දුක්වූ යහස් ඇත්
න්නේසි යම් කෙනෙකුන්ගේ දානවස්
තුව පිළිගන්නේවීනම් ඒ දායකයන්ට
මහත්ඵල මහානිසංස නොකරණ බැ
වින් අල්පාර්ඝ වන්නේය නොයෙක්
අවුරුදු සමූහයෙක්හි රැස්වූ අශුචි වළ
ක්මෙන් පිරිසිදු නොකළහැකි වන්
නේසී සොහොන් පෙනෙල්ලක්මෙන්
ශ්‍රමණ භාවයෙන්ද ගිහි භාවයෙන්ද

යහා දෙසින්ම පිවත්වත්නේයි ගව
රලත් පසුපස්සේ යන දෙකාවිච්චෙක්
මෙන් සඟ මැද හිඳ භික්ෂු භාවය අඟ
වන්නේ තමුදු අභිභූව වන්නේය.
හැමදෙන ගවම සතුරු පුරුෂයකු
මෙන් නිරන්තරයෙන් කලකිරීමෙන්
පසු වන්නේය මිනිසුන් හා එක්ව විසී
මට නුසුදුසු මල මිනියක්මෙන් ප්‍රත්‍ය
ති භික්ෂූන් හා එක්ව විසීමට නුසුදුසු
වන්නේය බමුණන්ගේ ගිනිදෙවියා පි
දීමට නුසුදුසු ගොහොත් ගිනහක්මෙ
න් ඒ දුස්සීල තෙමේ බහුශ්‍රැතාදි ගුණ
යෙන් යුක්තවූයේද සබ්‍රම්සරුන්ගේ
පූජාවට සුදුසු නොවන්නේය අන්ධයෙ
ක් නිල පීතාදි රූපදර්‍ශනයෙහි අසම
ර්‍ථවන්නාක්මෙන් මාර්‍ගඵලාධිගමයෙ
හි සමර්‍ථ නොවන්නේය රජ සැපතෙ
හි ආශා නැතතාවූ සැඬොල් දරුවෙ
කුමෙන් ප්‍රතිපත්ති ප්‍රතිවේධ සඞ්ඛ්‍යාත
සද්ධර්‍මයෙහි ආශා නැත්තේයි පස්කම්
ගුණ ලැබීමෙන් සුවපත්විම්යි සිතන්
නේ තමුදු අග්ගික්ඛන්ධ පරියාය සූත්‍ර
යෙහි දක්වනලද දුකට භාජනව සිටි
හෙයින් දුක් ඇත්තේම වන්නේය ප
ස්කම් ගුණ වැලඳීමෙන් වන සැපයෙ
හිද අනුන් විසින් කරණ වැඳුම් පිදුම්
ආදීයෙන් වන සැපයෙහිද ආස්වාද
යෙන් ගිජුවූ සිත් ඇති දුශ්ශීලයන්ට
ඒ සුඛාස්වාදය කාරණාකොට ඇති දු
ක් රාශිය සිහිකළ පමණකිනුදු ළය
රත්කරවා උණු ලේ වමනය කරවන්
නට සමර්‍ථවූ ඉතා දරුණුවූ දුක් දක්
වමින් සම්භාරයෙන් ප්‍රත්‍යක්ෂ වශ
යෙන් දක්නාලද කර්ම විපාක ඇති භා
ග්‍යවතුන් වහන්සේ මහණෙනි ආදි
යෙහි පවත් ගිනිගත් හාත්පසින් දිලි
සෙන එකප්‍රභාවූ ජෙල මහත් ගිනික
ද නොපි නොදක්නාහුදැයි වදළේය
භික්ෂූහු එසේය ස්වාමීන්වහන්සැයි ප්‍ර
තිවචන දුන්නාහුය. මහණෙනි නොපි
ඒ කුමකැයි සිතනනාහුද? ආදියෙහි ප
වත් ගිනිගත් හාත්පසින් දිලිසෙන එ
කප්‍රභාවූ ජෙල මහත් ගිනිකඳ වැලඳ
ගෙණ හිඳීමෙන් හෝ හෝනේ හෝ
වේද යන යම් කාරණයක් ඇද්ද මො
ළකැහි සිවුමැලි අත්පා ඇති රජ දුව
ක් හෝ බමුණු දුවක් හෝ ගැහැවි දු
වක් හෝ වැලඳගෙණ හිඳීමෙන් හෝ
හෝනේ හෝ වේද යන යම් කාරණ
යක් ඇද්ද මේ දෙකින් කවර කාරණ
යක් උතුමැයි සිතව්දැයි විචාරා වදාළේ
ය එවිට භික්ෂූහු ස්වාමීන්වහන්ස මො
ළකැහි සිවුමැලි අත්පා ඇති රජ දුව
ක් හෝ බමුණු දුවක් හෝ ගැහැවි දුව
ක් හෝ වැලඳගෙණ හිඳීමෙන් හෝ
හෝනේ හෝවේද යනමේ කාරණයම
උතුම් වන්නේය වහන්ස ආදියෙහි
පවත් ගිනිගත් හාත්පසින් දිලිසෙන
එකප්‍රභාවූ ජෙල මහත් ගිනිකඳ වැල
ඳගෙණ හිඳීමෙන් හෝ හෝනේ හෝ
වේද යනමේ කාරණය දුක්වන්නේම
යයි සැලකළාහුය...

( පා ‡ )

ආශරුච්ශාමිවො භික්ඛවෙ පටිවෙද
යාමි වො භික්ඛවෙ යථා එතදෙව ත
ස්ස වරං දුස්සීලස්ස පාපධම්මස්ස අසුචි
සඞ්කස්සර සමාචාරස්ස පටිච්ඡන්න ක
ම්මන්තස්ස අස්සමණස්ස සමණ පටි
ඤ්ඤස්ස අබ්‍රහ්මචාරිස්ස බ්‍රහ්මචාරි පටි
ඤ්ඤස්ස අන්තොපූතිකස්ස අවස්සුතස්
ස කසම්බුජාතස්ස යං අමුං මහන්තං අ
ග්ගික්ඛන්ධං...පෙ...උපනිපජ්ජෙය්‍ය වා
තං කිස්ස හෙතු තතො නිදානං හිසො
භික්ඛවෙ මරණංවා නිගච්ඡෙය්‍ය මර
ණමත්තංවා දුක්ඛං තතො ච ඛො පච්ච
යා කායස්ස භෙද නිරයං උපපජ්ජෙය්‍ය
යංච ඛො සො භික්ඛවෙ දුස්සීලො
...පෙ...කසම්බුජාතො ඛත්තිය

සාකඤ්ඤංවා –පෙ– උපනිපජ්ජෙය්‍ය වා. තඤ්හි තස්ස භික්ඛවෙ හොති දීඝරත්තං අහිතාය දුක්ඛාය කායස්ස භෙදා නිරයං උපපජ්ජති–

( ඝ ‡ )

භික්ඛවෙ, මහණෙනි; වො, තොපට; ආරොචයාමි, කියමි; භික්ඛවෙ, මහණෙනි; වො, තොපට; පටිවෙදයාමි, හඟවමි ("තස්ස දුස්සීලස්ස යථා එත දෙව වරං තථා පටිවෙදයාමි" යොදනු) දුස්සීලස්ස, දුශ්ශීලවූ; පාපධම්මස්ස, ලාමක ස්වභාව ඇති; අසුචිසංකස්සර සමාචාරස්ස, නොපිරිසුදු කායකර්මාදි ඇති බැවින් ශුචිනොවූ සංකාවෙන් සමරණීයවූ ප්‍රවෘත්ති ඇති; පටිච්ඡන්න කම්මන්තස්ස, සැඟවියයුතු ක්‍රියා ඇති (අනුන් දුටහොත් ලජ්ජා කටයුතු බැවින් සැඟවියයුතු කායවාක්කර්ම ඇතියයි සේයි) අස්සමණස්ස, මහණ නොවූ; සමණපටිඤ්ඤස්ස, ලහගේ ආදියෙහි ශ්‍රමණයෙමි යන මිථ්‍යා ප්‍රතිඥාවෙන් ශ්‍රමණ ප්‍රතිඥාව ඇති; අබ්‍රහ්මචාරිස්ස, බ්‍රහ්මචාරි නොවූ; බ්‍රහ්මචාරි පටිඤ්ඤස්ස, උපොසථාදියෙහි බ්‍රහ්මචාරිමියි යන මිථ්‍යා ප්‍රතිඥායෙන් බ්‍රහ්මචාරි ප්‍රතිඥා ඇති; අන්තොපූතිකස්ස, දුශ්ශීල බැවින්ම ඇතුලෙන් කුණුවූ; අවස්සුතස්ස, සදොරින් වැහෙන කෙලෙසුන් විසින් තෙත්වූ; කසම්බුජාතස්ස, සඤ්ජාතවූ රාගාදි කසළ ඇති (නොහොත් සිල්වතුන් විසින් දුරුකටයුතු බැවින් කචවර ස්වභාව ඇති) තස්ස, ඔහට ("අමුං මහන්තං අග්ගික්ඛන්ධං –පෙ– උපනිපජ්ජෙය්‍ය වා ඉති යං එතදෙව වරං"යි යොදනු) තං කිස්ස හෙතු, එයට හෙතු කිම; භික්ඛවෙ, මහණෙනි; හතො නිදානංහි, ඒ ගිනිකඳ වැලඳගෙණ හිඳීම හෙතු කොටගෙණම; සො, ඒ මහණතෙමේ; මරණංවා නිගච්ඡෙය්‍ය, මරණයටහෝ පැමිණෙයි; මරණමත්තංවා දුක්ඛං, මරණ පමණ දුකටහෝ පැමිණේ; තප්පච්චයා, ඒ ගිනිකඳ වැලඳගෙණ හිඳීම හෙතුකොටගෙණ; කායස්ස භෙදා, කාය භෙදයෙන් මතුයෙහි; නිරයං, නරකයෙහි; නතෙව උපපජ්ජෙය්‍ය, නොම උපදනේයි; භික්ඛවෙ, මහණෙනි; සො දුස්සීලො, ඒ දුශ්ශීලතෙමේ; කසම්බුජාතො, කසළව බඳු ස්වභාව ඇත්තේ; ඛත්තිය කඤ්ඤංවා, රජ දුවක හෝ–පෙ–උපනිපජ්ජෙය්‍ය වා, ආලිඞ්ගනයකොට හිඳුනේහෝ වේද යන; යඤ්ච, යමෙක් ඇද්ද; තං හි, හෙතෙමේ; භික්ඛවෙ, මහණෙනි; තස්ස, ඒ දුශ්ශීලයා හට; දීඝරත්තං, බොහෝ කලක්; අහිතාය, අහිත පිණිස; දුක්ඛාය, දුක්ඛය පිණිස; හොති, වේ; කායස්ස භෙදා, කායභෙදයෙන් මතුයෙහි; නිරයං උපපජ්ජති, නරකයෙහි උපදී–

( හා ‡ )

මහණෙනි ඒ දුශ්ශීල මහණ හට යම්සේ ඒ මහත් ගිනිකඳ වැලඳනැත්මම උතුම්වන්නේද ඒ ආකාරයෙන් තොපට කියන්නෙමි භගවත්තෙමි මහණෙනි මේ ශාසනයෙහි දුෂ්ටවූ සිල් ඇති ලාමක ස්වභාව ඇත්තාවූ අපිරිසිදු කායකර්මාදිය ඇති බැවින් අපවිත්‍රවූ සැකයෙන් සිහි කටයුතු පැවැතුම් ඇති බැවින් සංකස්සර සමාචාර නම්වූ අනුන් දුටහොත් ලජ්ජා කටයුතු බැවින් සැඟවියයුතු කායවාක්කර්ම ඇත්තාවූ ශ්‍රමණ නොවම සංඝ ලාභාදියෙහි මම ශ්‍රමණයෙමියි බොරුවෙන් අඟවන්නාවූ බඹසරවස් නොරැකම පොහෝකිරීම් ආදියෙහි මම බ්‍රහ්මචාරියෙමියි බොරුවෙන් අඟවන්නාවූ දුශ්ශීලබැවින් ඇතුලත කුණුවූ චක්ෂුස් ශ්‍රොත්‍ර ඝ්‍රාණ ජිව්හා කාය මනඃ යන

සංදෙරින් නිරතුරු වැගෙහෙන රාග දෙවෂ මෝහ මූලික පාප ධර්ම නැමැති සුණුදියෙන් තෙත්වූ සිල්වතුන් විසින් දුරුකාටයුතු බැවින් කසල ගොඩකට බඳුවූ ඒ මහණ හට මහත්වූ ගිනිකඳ වැලඳගෙණ හිඳීමෙන් හෝ හෝවීමෙන් හෝ වේද යනමේ කාරණයම උතුම් වන්නේයි.

ඊට කාරණා කවරේදයත්? මහණෙනි ඒ මහත්වූ ගිනිකඳ වැලඳගෙණ හිඳීම හෙතුකොටගෙණ ඒ මහණතෙම මරණයට හෝ මරණ සමාන දුකට පැමිණෙන්නේය ඒ ගිනිකඳ වැලඳගෙණ හිඳීම හෙතුකොටගෙණ කාය භෙදයෙන් මරණින් මත්තෙහි නරකයෙහි නොඋපදනේමැයි මහණෙනි ඒ කසලගොඩකට උපමා ඇති දුශ්ශිල මහණතෙමේ රජ දුවක් හෝ බමුණු දුවක් හෝ ගැහැවි දුවක් හෝ වැලඳගෙණ හිඳීමෙන් හෝ හෝවීමෙන් හෝ වේද යන යම් කාරණයක් ඇත්තේ වේද මහණෙනි ඒ කාරණය වනාහි ඒ දුශ්ශිල මහණ හට බොහෝ කලක් අවැඩ පිණිසද දුක් පිණිසද පවත්නේය කායභෙදයෙන් මරණින් මත්තෙහි නරකයෙහි උපදනේයි—

( පා ¶ )

එවං අග්ගික්ඛන්ධූපමාය ඉත්ථි පටිබද්ධපඤ්චකාමගුණ පරිභොගපච්චයං දුක්ඛං දස්සෙත්වා එතෙනෙව උපායෙන තං කිං මඤ්ඤථ භික්ඛවෙ කතමං නුඛො වරං යං බලවා පුරිසො දළ්හාය වාලරජ්ජුයා උභොජඞ්ඝා වෙඨෙත්වා ඝංසෙය්‍ය සා ඡවිං ඡින්දෙය්‍ය ඡවිං ඡෙත්වා චම්මං ඡින්දෙය්‍ය චම්මං ඡෙත්වා මංසං ඡින්දෙය්‍ය මංසං ඡෙත්වා නහාරුං ඡින්දෙය්‍ය නහාරුං ඡෙත්වා අට්ඨිං ඡින්දෙය්‍ය අට්ඨිං ඡෙත්වා අට්ඨිමිඤ්ජං ආහච්ච තිට්ඨෙය්‍ය යංවා ඛත්තිය මහාසාලානං වා බ්‍රාහ්මණ මහාසාලානං වා ගහපති මහාසාලානං වා අභිවාදනං සාදියෙය්‍යාති ව— තං කිං මඤ්ඤථ භික්ඛවෙ කතමං නුඛො වරං යං බලවා පුරිසො තිණ්හාය සත්තියා තෙලධොතාය පච්චොරස්මිං පහරෙය්‍ය යං ඛත්තිය මහාසාලානං වා බ්‍රාහ්මණ මහාසාලානං වා ගහපති මහාසාලානං වා අඤ්ජලිකම්මං සාදියෙය්‍යාති ව— තං කිං මඤ්ඤථ භික්ඛවෙ කතමං නුඛො වරං යං බලවා පුරිසො තත්තෙන අයොපට්ටෙන ආදිත්තෙන සම්පජ්ජලිතෙන සජොතිභූතෙන කායං සම්පලිවෙඨෙය්‍ය යංච ඛත්තිය බ්‍රාහ්මණ ගහපති මහාසාලානං වා සද්ධාදෙය්‍යං චීවරං පරිභුඤ්ජෙය්‍යාති ව— තං කිං මඤ්ඤථ භික්ඛවෙ කතමං නුඛො වරං යං බලවා පුරිසො අයොසංකුනා ආදිත්තෙන සම්පජ්ජලිතෙන සජොතිභූතෙන මුඛං විවරිත්වා තත්තං ලොහගුළං සජොතිභූතං මුඛෙ පක්ඛිපෙය්‍ය තං තස්ස ඔට්ඨම්පි ඩහෙය්‍ය මුඛම්පි ජිව්හම්පි කණ්ඨම්පි උරම්පි ඩහෙය්‍ය අන්තම්පි අන්තගුණම්පි ආදාය අධොභාගං නික්ඛමෙය්‍ය යංවා ඛත්තිය බ්‍රාහ්මණ ගහපති මහාසාලානං වා සද්ධාදෙය්‍යං පිණ්ඩපාතං පරිභුඤ්ජෙය්‍යාති ව— තං කිං මඤ්ඤථ භික්ඛවෙ කතමං නුඛො වරං යං බලවා පුරිසො සීසෙ වා ගහෙත්වා ඛන්ධෙ වා ගහෙත්වා තත්තං අයොමඤ්චං වා අයොපීඨං වා ආදිත්තං සම්පජ්ජලිතං සජොතිභූතං අභිනිසීදාපෙය්‍ය වා අභිනිපජ්ජාපෙය්‍ය වා යං වා ඛත්තිය බ්‍රාහ්මණ ගහපති මහාසාලානං වා සද්ධාදෙය්‍යං මඤ්චපීඨං පරිභුඤ්ජෙය්‍යාති ව— තං කිං මඤ්ඤථ භික්ඛවෙ කතමං නුඛො වරං යං බල

වා පුරිසො උද්ධපාදං අධොසිරං ගහෙත්වා තත්තාය ලොහකුම්භියා පක්ඛිපෙය්‍ය ආදිත්තාය සම්පජ්ජලිතාය සජොතිභූතාය සො තත්ථ ඵෙණුද්දෙහකං පච්චමානො සකිම්පි උද්ධං ගච්ඡෙය්‍ය සකිම්පි අධො ගච්ඡෙය්‍ය සකිම්පි තිරියං ගච්ඡෙය්‍ය යං වා ඛත්තිය බ්‍රාහ්මණ ගහපති මහාසාලානං වා සද්ධාදෙය්‍යං විහාරං පරිභුඤ්ජෙය්‍යාතිවාති ....

( ස ¶ )

එවං, මෙසේ; [අග්ගික්ඛන්ධූපමාය, ගිනිකඳ උපමාවෙන්; ඉච්ඡිපටිබද්ධ, මාගම් පිළිබැඳිවූ; පඤ්චකාමගුණ පරිභොගපච්චයං දුක්ඛං දස්සෙත්වා, පස්කම් ගුණ පරිභොගය හේතුකොට ඇති දුක් දක්වා (මතුයෙහි "දුක්ඛං දස්සෙසි" යනු හා සබඳ) එතෙහෙව උපායෙන, මෙම උපායෙන් ("තං කිම්මඤ්ඤථ" යනාදී යමකී පෙදෙහි අඤ්ඤකී නියෙන්ම දතයුතු] බලවා පුරිසො, බලවත් පුරුෂයෙක්; දළ්හාය, දෘඪවූ; වාලරජ්ජුයා, වලින් කරණලද රජ්ජුයෙන්; උභො ජඞ්ඝා වෙඨෙත්වා, ජඞ්ඝා දෙක වෙළා; සංඝංසෙය්‍ය, ඝර්ෂණය කොට ඡේද (බව රැහැණමෙන් අදිද යන අර්ථයි) සා, ඒ රජ්ජු තොමෝ; ඡවිං ඡින්දෙය්‍ය, ඡවිය සිඳින්නේය; ඡවිං ඡෙත්වා, ඡවිය සිඳ; චම්මං ඡින්දෙය්‍ය, සම සිඳී; චම්මං ඡෙත්වා, සම සිඳ; මංසං ඡින්දෙය්‍ය, මස් සිඳී; මංසං ඡෙත්වා, මස් සිඳ; නහාරුං ඡින්දෙය්‍ය, නහර සිඳී; නහාරුං ඡෙත්වා, නහර සිඳ; අට්ඨිං ඡින්දෙය්‍ය, ඇට සිඳී; අට්ඨිං ඡෙත්වා, ඇට සිඳ; අට්ඨිමිඤ්ජං ආහච්ච තිට්ඨෙය්‍ය, ඇට මිදුලෙහි පැහැර සිටුනේය යනු; යං, යමෙක් ඇද්ද; ඛත්තිය මහාසාලානං වා, ක්ෂත්‍රිය මහාසාරයන්ගේ හෝ; බ්‍රාහ්මණ මහාසාලානං වා, බ්‍රාහ්මණ මහාසාරයන්ගේ හෝ; ගහපති මහාසාලානං වා, ගෘහපති මහාසාරයන්ගේ හෝ; අභිවාදනං සාදියෙය්‍ය, වැඳීම ඉවසන්නේය යනු; යං, යමෙක් ඇද්ද (ඒ දෙක්හි) ("කතමං නුඛො වරං" යි යොදනු මතුයෙහිදු මෙම නියායි) තිණ්හාය, තියුණුවූ; තෙලධොතාය, තෙල්සණලූ; සත්තියා, අඬයටියෙන්; පච්චොරස්මිං, ළමැද; පහරෙය්‍ය, පහරන්නේද .... පෙ .... අඤ්ජලිකම්මං, අඤ්ජලී කර්මය (ඇඳිලි බැඳීම) .... පෙ .... තත්තෙන, රත්කරණලද; අයොපට්ටෙන, යපටින්; කායං, ශරීරය; සම්පලිවෙඨෙය්‍ය, ගාත්පසින් වෙෂ්ටනය කරන්නේය .... පෙ .... සද්ධාදෙය්‍යං චීවරං, සැදැහැයෙන් දෙනලද සිවුර; පරිභුඤ්ජෙය්‍යාති, වැළඳගන්නේද .... පෙ .... අයොසංකුනා, යකඩුවෙන්; මුඛං විවරිත්වා, මුඛය විවර කොට; සම්පජ්ජලිතං, දිලියෙන්නාවූ; ලොහගුළං, යවට; මුඛෙ පක්ඛිපෙය්‍ය, මුඛයෙහි බහාලාද; තං, ඒ යවට; ඔට්ඨම්පි ඩහෙය්‍ය, තොලද දවන්නේය; මුඛම්පි, මුඛයද; ජිව්හම්පි, දිවද; කණ්ඨම්පි, ගෙලද; උදරම්පි, ළයද; ඩහෙය්‍ය, දවන්නේය; අන්තම්පි, අතුණුද; අන්තගුණම්පි, අතුණු බහන්ද; ආදාය, ගෙණ; අධොභාගං, අධොභාගයට; නික්ඛමෙය්‍ය, නික්මෙන්නේයි.

සද්ධාදෙය්‍යං පිණ්ඩපාතං, සැදැහැයෙන් දෙනලද අහර; පරිභුඤ්ජෙය්‍ය, වළඳන්නේද; සීසෙ වා ගහෙත්වා, හිස හෝ ගෙණ; ඛන්ධෙ වා, කඳට හෝ ගෙණ; අයොමඤ්චං වා, යහැදක හෝ; අයොපීඨංවා, යපුටුවක වත්; අභිනිසීදාපෙය්‍ය, හිඳුවන්නේ හෝ වේද; අභිනිපජ්ජාපෙය්‍ය වා, හොවන්නේ හෝ වේද; උද්ධපාදං, දෙපය උඩුකුරුකොට; අධොසිරං ගහෙත්වා, ඉස යටිකොට ගෙණ; තත්තාය, තැවියෙන්නාවූ; ලොහකුම්භියා, ලොහොකුඹු තරකයෙහි; පක්ඛිපෙය්‍ය, බහාලන්නේද; සො, හෙ

(උනං; පච්චුපෙද්දනානං, පෙළේ නාගනගා; පවිවිත්තනො, පැපෙසනෝපිනේද; සකිමෙයි, එක්පසපිසා; උඩ්ඩියි යපෙරිණයා, උඩ්ඩි හැපෙනත්තෝ; සකිමෙයි, එක්පපෙසා; අපධානපෙරිණයා, යට බස්සෙන්ති; සකිමෙයි, එක්මපෙසා; තිරියංහපෙරිණයා, සරසවියන් ගෙහිම පපාවිහාරං, පසන්සුත්, පරිගුපජය, විලෙදනන් ගෙත්යයි; ලූහිව, පබ්පේද; ("ලූමාකිට පමාණිසී" යොදනු)

( හා ¶ )

මෙසේ නිතිකදු උපමාවෙන් මාගමූන් පිළිබඳවූ පස්නම් ගුණ පරිභොගය හෙතුකොට ඇති දුක් දක්වා මින් මතුද මේ නියායෙන් දුක් දක්වා වදරණසේක්.

මහණෙනි ඒ කුමකැයි සිතන්නාහුද? යම් වියඹිවත්වූ පුරුෂයෙක් කකීශවූ ලොමින් අභිරණලද රැහැණකින් දෙකෙන්ඩා වෙළා ලියනකදක රැහැණක් මෙන් දෙකොන් අල්වා අදිද ඒ රැහැණ සිවිය සිඳිනේය සිවිය සිඳ සම සිඳිනේය සම සිඳ මස් සිඳිනේය මස් සිඳ නහර සිඳිනේය නහර සිඳ ඇට සිඳිනේය ඇටසිඳ ඇටමිදුලෙහි හැපී සිටිනේය යන යම් කාරණයක් ඇද්ද, යම් මහණෙක් ක්ෂත්‍රිය මහාසාරයන්ගේ හෝ බ්‍රාහ්මණමහාසාරයන්ගේ හෝ ගෘහපති මහාසාරයන්ගේ හෝ වැඳුම් ඉවසීමය යන යම් කාරණයෙක් ඇද්ද යන මේ දෙකින් කවරක් උතුම්දැයි යන අභිවාදනසාදියන වාරයෙහිද යම් බලවත් පුරුෂයෙක් තෙල්නාන ගා මුවහත් තබනලද තියුණු අඩයටියකින් ළමැද පහරණේද යන යම් කාරණයෙක් ඇද්ද ක්ෂත්‍රියබ්‍රාහ්මණ ගෘහපති මහාසාරයන්ගේ ඇඳිලිබැඳීම ඉවසන්නේද යන යම් කාරණයක් ඇද්ද යන මේ දෙකින් කවරක් උතුම්දැයි යන අඤ්ජලිකම්මසාදියන වාරයෙහිද යම් බලවත් පුරුෂයෙක් ගිනිගෙණ දිලියෙන ගිනිදැල් සහිතවූ රත්කරණලද යපටින් ශරීරය හාත්පසින් වෙළාද යන යම් කාරණයක් ඇද්ද ක්ෂත්‍රිය බ්‍රාහ්මණ ගෘහපති මහාසාරයන් විසින් සැදැහැයෙන් දෙනලද සිවුරු වැලඳගන්නේය යන යම් කාරණයක් ඇද්ද යන මේ දෙකින් කවරක් උතුම්වන්නේද යන චීවර පරිභොග වාරයෙහිද යම් බලවත් පුරුෂයෙක් රත්වූ යකඩුවකින් මුඛය විවෘත කොට ගිනිගෙණ දිලියෙන ලොහොගුලියක් මුඛයෙහි බහාලන්නේවේද ඒ ලොහොගුලිය තොලද දවන්නේය මුඛයද දිවද උගුරද දවන්නේය බඩවැල් අතුණු අතුණු බහණුත් දවාගෙණ යට භාගයට බස්නේය යන යම් කාරණයක් ඇද්ද ක්ෂත්‍රිය බ්‍රාහ්මණ ගෘහපති මහාසාරයන් විසින් සැදැහැයෙන් දෙනලද පිණ්ඩපාත ආහරය වලඳන්නේද යන යම් කාරණයක් ඇද්ද යන මේ දෙකින් කවරක් උතුම්වන්නේද යන පිණ්ඩපාත පරිභොග වාරයෙහිද යම් බලවත් පුරුෂයෙක් හිසත් කදටත් අල්වාගෙණ රත්වූ හාත්පසින් ගිනිගෙණ දිලියෙන ගිනිදැල් සහිතවූ යකැඳක හෝ යපුටුවක හෝ හිඳුවන්නේ හෝ වේද හොවන්නේ හෝ වේද යන යම් කාරණයක් ඇද්ද ක්ෂත්‍රිය බ්‍රාහ්මණ ගෘහපති මහාසාරයන් විසින් සැදැහැයෙන් දෙනලද ඇඳපුටු පරිභොග කරන්නේද යන යම් කාරණයක් ඇද්ද යන මේ දෙකින් කවරක් උතුම්වන්නේදැයි යන සෙනාසන පරිභොග වාරයෙහිද යම් බලවත් පුරුෂයෙක් දෙපය උඩුකොට හිස යටකොට අල්වාගෙණ කකියන්නාවූ ගිනිගෙණ දිලියෙන ලොහොකුඹු නරකයෙහි බහාලන්

න්නේවිද ඒ සම්මතව එහි පෙණෙ භාග තගා පැසෙමින් වරක් උඩ ම තුවන්නේය වරක් යට බස්නේය වරක් සරස යන්නේය යන යම් කා රණයක් ඇද්ද ක්ෂත්‍රිය බ්‍රාහ්මණ ගෘ හපති මහාසාරයන් විසින් සැදැහැ යෙන් කරවා පිළිගන්වනලද විහාරු රුව පරිභොග කරන්නේවිද යන ය ම් කාරණයක් ඇද්ද යන මේ දෙකි න් කවරක් උතුම්වන්නේද යන වි හාරපරිභොග වාරයෙහිද යන මෙ තෙක් වාරයන්හිද යට කී නියාමෙය න් අර්ථ දතයුතු –

( පා * )

ඉමාහි වාලරජ්ජු තිණ්හසත්ති අයොප ට්ට අයොගුළ අයොමඤ්ච අයොපීඨ අයොකුම්භි උපමාහි අභිවාදන අ ඤ්ජලිකම්මචීවර පිණ්ඩපාත මඤ්චපීඨ විහාර පරිභොගපච්චයං දුක්ඛං ද ස්සෙසි – තස්මා –

අග්ගික්ඛන්ධාලිඞ්ගන-
දුක්ඛාධිදුක්ඛකටුකඵලං,
අවිජහතො කාමසුඛං
සුඛං කුතො භින්නසීලස්ස –
අභිවාදනසාදියනෙ
කිංනාම සුඛං විපන්නසීලස්ස,
දළ්හවාලරජ්ජුඝංස-
දුක්ඛාධිදුක්ඛභාගිස්ස –
සද්ධානමඤ්ජලිකම්ම-
සාදියනෙ කිං සුඛං අසීලස්ස,
සත්තිප්පහාරදුක්ඛා-
ධිමත්තදුක්ඛස්ස යං හෙතු –
චීවරපරිභොගසුඛං
කිංනාම අසඤ්ඤතස්ස –
(යෙන චිරං,
අනුභවිතබ්බා නිරයෙ
ජලිතඅයොපට්ටසම්ඵස්සා –
මධුරොපි පිණ්ඩපාතො
හලාහලවිසූපමො අසීලස්ස,
ආදිත්තා ගිලිතබ්බා
අයොගුළා යෙන චිරරත්තං –
සුඛසම්මතොපි දුක්ඛො,
අසීලිනො මඤ්චපීඨපරිභොගො,
යං බාධිස්සන්ති චිරං
ජලිතඅයොමඤ්චපීඨානි –
දුස්සීලස්ස විහාරෙ
සද්ධාදෙය්‍යම්හි කා නිවාසරති,
ජලිතෙසු නිවසිතබ්බා
යෙන අයොකුම්භිමජ්ඣෙසු –
සඞ්කස්සරසමාචාරො
කසම්බුජාතො අවස්සුතො පාපො,
අන්තොපූතීති ච යං
නින්දන්තො ආහ ලොකගරු –
ධිජ්ජීවිතං අසඤ්ඤතස්ස
තස්සච සමණජනවෙසධාරිස්ස,
අස්සමණස්ස උපහතං
ඛතමත්තානං වහන්තස්ස –
ගූථං විය කුණපං විය
මණ්ඩනකාමා විවජ්ජයන්තීධ,
යංනාම සීලවන්තො
සන්තො කිං ජීවිතං තස්ස –
සබ්බභයෙහි අමුත්තො
මුත්තො සබ්බෙහි අධිගමසුඛෙහි,
සුපිහිතසග්ගද්වාරො
අපායමග්ගං සමාරූළ්හො –
කාරුණ්ණාය වත්ථුභූතො
කාරුණිකජනස්ස නාම එසො –
(අසඞ්ඛ්‍යා,
දුස්සීලස්සෙවං දුස්සී-
ලතාය ඉති බහුවිධා දොසාති –

( ශ * )

ඉමාහි, මේ; වාලරජ්ජු, වලින්ක ළ රැහැ; තිණ්හසත්ති, තියුණුවූ අඩ යටිය; අයොපට්ට, යපට; අයොමඤ්ච, යහැද; අයොපීඨ, යපුටුය; අයොකු ම්භි, ලොහකුඹුය යන; උපමාහි, උපමාවෙන්; අභිවාදන, වැඳීම; අඤ්ජ ලිකම්ම, ඇඳිලිබැඳීම; චීවර, සිවුරු; පිඩපාත, අහර; මචපීඨ, හැඳපුටුය, වි හාර; සෙනසුන (යන මොවුන්ගේ)

පරිභොගපච්චයං, පරිභොගය ප්‍රත්‍යයකොට ඇති; දුක්ඛං දුක්ඛසි, දුක් දුක්වේ; තස්මා, එහෙයින් (බුදුන් වෙස් වදළ බැවිනැසි-යු ශේෂි)

අග්ගික්ඛන්ධාලිඞ්ගන දුක්ඛා, ගිනිකඳ වැලඳගැන්මෙන් වන දුකට වඩා; අති දුක්ඛංකටුකංඵලං, ඉතා දුක්වූ තීක්ෂ්ණ විපාකඇති; කාමසුඛං, කාමසුඛය; අච්ජගතො, නොහැරණොවූ; භින්නසීලස්ස, දුස්සීලය හට; සුඛා කුතො, සුවනොකි (සුවෙක්නම් නැත යන අභිප්‍රායයි) දළ්හවාලරජ්ජුඝංස, තරවූ වාලයෙන් අඹරණලද රජ්ජුඝර්ෂණයෙන් වන; දුක්ඛාහි දුක්ඛතාතියස්ස, දුකට වඩා අධික දුඃඛයට හේතු කාරණවූ; අභිවාදනාසාදියනෙ, වැඳුම් ඉවිසීමෙහි; විපන්නසීලස්ස, දුස්සීලයහට; කිංනාම සුඛං, කවරනම් සුවයෙක් වේද; සත්තිප්පහරණ දුක්ඛා, තියුණු අඩයටියෙන් පහරණ දුකට වඩා; අධිමත්ත දුක්ඛස්ස, අධිමාත්‍රවූ දුකට; යං හෙතු, යමක් කාරණවේද; අසීලස්ස (ඒ) සිල් නැත්තහුට; සද්ධානං, සැදැහැ ඇත්තවුන්ගේ; අඤ්ජලිකම්මසාදියනං, අඤ්ජලිකර්ම ඉවසීමෙහි; කිං සුඛං. කවර සුවයෙක්ද; යෙන, යමක්හු විසින්; නිරයෙ, නිරයෙහි; ජලිත අයොපට්ටසමඵුස්සා, දිලියෙන යපට පහස්හු; චිරං, බොහෝකලක්; අනුභවිතබ්බා, අනුභව කටයුත්තාහුද; අසංවුතස්ස (ඒ අසංවෘත මහණහට; චීවරපරිභොග සුඛං කිංනාම, සිවුරු පරිභොගයෙන් වන සුවයෙක් කිමෙක් නම්ද (සුව නැත යුතුයි) යෙන, යමක්හු විසින්; චිරරත්තං, බොහෝකලක්; ආදිත්තා, ආදීප්තවූ; අයොගුළා, යවටහු; ගිලිතබ්බා, ගිලියයුත්තාහුද; අසීලස්ස (ඒ) නිස්සීලය හට; මධුරපිණ්ඩපාතො, මධුරදවූ පිණ්ඩපාතය; හලාහලවිසුපමො, හලාහලවිෂ වැන්නේය; යං යමක්හු; ජලිත අයොමඤ්ච දුක්ඛානි, දිලියෙන අයොමඤ්ච දුඃඛයෝ; චිරං. බොහෝකලක්; බාධිස්සන්ති, පෙළද්ද; අසීලිනො (ඒ) නිස්සීලය හට; සුඛසම්මතොපි, සුවයයි සම්මතදවූ; මඤ්චපීඨ පරිභොගො, ඇඳපුටු පරිභොගය; දුක්ඛො, දුක්මවේ; යෙන, යමක්හු විසින්; ජලිතෙසු අයොකුම්භිමජ්ඣෙසු, දිලියෙන ලොහකුඹු මැද; නිවසිතබ්බං, විසිය යුතුද; දුස්සීලස්ස (ඒ) දුස්සීලයා හට; සද්ධාදෙය්‍යම්හි විහාරෙ, ශ්‍රද්ධා දෙය්‍යවූ විහාරයෙහි; කා නිවාසරති, කවර නම් නිවාසරතියෙක්ද; සඞ්කස්සරසමාචාරො, සඞ්කාවෙන් සිහිකටයුතුවූ ප්‍රවෘත්ති ඇතියේය (හෙතෙම සිල්වතුන් විසින් දුරුකටයුතු බැවින් සවර (ඥාතාදි වූයේය) අවස්සුතො, සදෙරින්ම වැගෙන කෙලෙසුන් විසින් තෙත්ය; පාපො, ලාමකය; අන්තොපූති, ඇතුළෙන් කුණුවූ; යං, යමක්හට; නිස්සතො, නින්දකාරණ; ලොකගරු, ලෝකයට ගුරුතෙම; ආහ, කීද; අඛණ්ඩස්ස, අඛණ්ඩවූ; (සිඳුන් නැත්තාවූ) සමණජන මොක්ඛාරිස්ස, මහණජනයාගෙන් වෙන්දුරු; අස්සමණස්ස, මහණනොවූ; උපහත, ශීල විනාශයෙන් නටුවාවූ; හතමත්තානං වහන්තස්ස, හානලද කුසල් මුල් ඇති ගුණශරීරය උසුලත්තාවූ; තස්ස, උහුගේ; ජීවිතං, ජීවිතයට; ධි (අහෝ) නින්දවේවා; මණ්ඩනකාමා, ශරීර මණ්ඩනය කැමැත්තවුන්; ගූථං විය, ගූථයක්මෙන්ද; කුණපංවිය, කුණපයක්මෙන්ද (යම්සේ ශරීර මණ්ඩනය කැමැත්තාහු ගූථය කුණපය දුරුකෙරෙද්ද එසේමය යන අදහසි) සුධම්මි ශාසනෙයති; සීලවන්තා සන්තො, සිල්වත් සත්පුරුෂයෝ; යං නාම විවජ්ජයන්ති, යමක්හු හම් දුරුකෙරෙද්ද; තස්ස ජීවිතං කිංනාම, ඔහුගේ ජීවිතය කිමෙක් නම්ද? සබ්බභයෙහි, ආත්මානුවාදදී සියළු භයින්; අමුත්තො, මූකානොවූ; සබ්බෙහි අධිගම සුඛෙහි, උපචාරදීවූ සියළු අධිගම සුඛයෙන්; මූළ්හො, මුළාවූ (දුරුවූ) සුපිහිත, මනාකොට පියනලද; සග්ගද්වාරො, ස්වර්ගද්වාර ඇති; අපායමග්ගං,

අපායමගට; සමාරූළෙහා, නැංගාවූ; කාරුණිකජනස්ස, කරුණා ඇති ජනයාගේ; කරුණාය වත්ථුභූතො, කරුණාවට වස්තුවූ (භාජනවූ) දුස්සීල සමො, දුස්සීලයාහා සදෘශවූ; අඤ්ඤො, අනිකෙක්; කො නාම, කවරෙක් නම් ද; දුස්සීලතාය, දුස්සීල බැවිනි; ඉති, මෙසේ; දොසා, දොෂයෝ; බහුවිධා, අනෙකප්‍රකාරයෝයි.

( කා * )

මෙසේ මේ වාලරොදදය තියුණු අඩයටිය යපටය ලොහොගුළිය යහැදය යපුටුය ලොහොකුඹුය යන උපමාවන්ගේ පිළිවෙළින් දුස්සීලයන් විසින් වැඳුම් ඉවසීමය ඇඳිලිබැඳීම් ඉවසීමය සිවුරුවැලඳගැන් මය පිණ්ඩපාතය වැළඳීමය හැඳපුටු පරිභොගය විහාර පරිභොගය යන මොවුන් නිසා උපදනා දුක් දක්වා වදාලසේකි එහෙයින් කීයේමැයි.

ගිනිකඳක් වැළඳගෙණ හිඳිමෙන් උපදනා දුකටත් වඩා අතිශයින් දුක් වූ තියුණු විපාක ඇති පස්කම්සැප අනුභවය අත්නොහරණ බුන්සිල් ඇති මහණහට සැපයක්නම් කොයින් ද? නැත්තේමැයි.

කර්කශ වාලරොමයෙන් අඹරණලද රොදදකින් ගැටීමෙන් වන දුකටත් වඩා අධික දුක් ගෙණදීමට හේතුවූ දුස්සීලයාගේ සැදැහැවතුන් විසින් කරණලද වැඳුම් ඉවසීමෙහි කවරනම් සැපයක්ද නැත්තේමය.

තියුණු අඩයටියෙන් පැහැරීමෙන් උපදනා දුකටත් වඩා අතිශය දුක් ඵලවීමට කාරණවූ සැදැහැවතුන්ගේ අඤ්ජලිකම් ඉවසීමෙහි සිල් නැත්තා හට කවරනම් සැපයක්වේද නොවන්නේමය.

යම් දුස්සීල මහණෙකු විසින් නරකයෙහි බොහෝ කාලයක් මුළුල්ලෙහි ගිනිගෙණ දිල්නෙයන යපටින් වෙළීමෙන් හටගන්නා මහත් දුක් වේදනා විඳියයුත්තානුද කාය වාක් සංවරනැති ඒ මහණහට සිවුරු වැලඳගැන්මෙන් සැපයක්නම් කොයින්ද? නැත්තේමය.

යම් දුස්සීල මහණෙකු විසින් බොහෝ කලක් මුළුල්ලේ ගිනිගෙණ දිලියෙන ලොහොගුළි ගිලියයුත්තානුද ඔහුට මධුර පිණ්ඩපාතය හලාහල විෂයක් සමානවෙයි.

ගිනිගෙණ දිලියෙන යහැද යපුටු ආදියෙහි සයනනිශද්‍යාදිය කිරීමෙන් හටගන්නා දුක් වේදනාවෝ බොහෝ කාලයක් මුළුල්ලේ යම් දුස්සීලයෙකු පෙළාද එබඳු දුස්සීලයා හට සැපයයි සම්මතකරණලද ඇඳ පුටු පරිභොගය දුක්ම වන්නේය.

යම් දුස්සීලයෙකු විසින් ගිනිගෙණ දිලියෙන ලොහොකුඹු නරක මධ්‍යයෙහි විසිය යුතුවේද එබඳු දුස්සීලයා හට සැදැහැවතුන් විසින් කරවන ලද විහාරාරාමයෙහි විසීමට ඇල්මක්නම් කොයින්ද නැත්තේමය.

දුස්සීලයන්ට නින්දා කොට වදාරන්නාවූ සර්වඥයන්වහන්සේ විසින් යම් මහණෙක් සැකයෙන් සිහිකටයුතු පැවැතුම් ඇත්තේයයිද සිල්වතුන් විසින් දුරුකටයුතු බැවින් කසලගොඩකට බඳුයයිද චක්ෂුඃ ශ්‍රොත්‍ර ඝ්‍රාණ ජිව්හා කාය මනඃ යන සදොරින් වැහෙන රාගාදි කෙලෙසුන්ගෙන් තෙත්වූයේයයිද ලාමකයයිද ඇතුළෙන් කුණුවූයේයයිදැයි වදාලසේක්ද ශ්‍රමණ නොවම ශ්‍රමණවෙස් දරනනාවූ කාලකන්නිවූ ශීල විනාශයෙන් නටුවාවූ උදුරණලද කුසල් මුල් ඇති ගුණ ශරීරයක් උසුලන්නාවූ ඒ දුස්සීලයාගේ ජීවිතයට නින්දාවේවා.

යම්සේ සැරසෙනු කැමති පුරුෂයෝ අශුචි හා කුණපයන් දුරුකෙරෙද්ද එසේම මේ ශාසනයෙහි සිල්වත්වූ සත්පුරුෂයෝ යම් දුශ්ශීලයෙක් සඞ්ඝයාගෙන් දුරුකෙරෙද්ද එබඳු දුස්සීලයාගේ ජීවිතයෙන් ප්‍රයෝජන කවරේද නැත්තේමය.

දුස්සීලයා හා සමාන ආත්මානුවාදදී සියලු භයින් නොමිදුනු උපචාර සමාධි ආදි සියළු අධිගම සැපයෙන් මිදුනාවූ දෙව්ලෝ දොරටුව අතිශයින් වැසූ අපාය මගට නැංගාවූ කරුණාව කාතයන්ගේ කරුණාවට භාජනවූ අනිකෙක් නම් කොයිත්ද? නැත්තේමය.

එහෙයින් දුස්සීලතාවෙහි මෙබඳු දෝෂයෝ අනේකප්‍රකාරව නතානුය.

---

( පා † )

එවමාදිනා පච්චවෙක්ඛණෙන සීලවිපත්තියං ආදීනව දස්සනං වුත්තප්පකාර විපරීතතො සීලසම්පත්තියං ආනිසංස දස්සනඤ්ච වෙදිතබ්බං. අපිච.

තස්ස පාසාදිකං හොති
පත්තචීවර ධාරණං
පබ්බජ්ජා සඵලා තස්ස
යස්ස සීලං සුනිම්මලං.

අත්තානුවාදදි භයං
සුද්ධසීලස්ස භික්ඛුනො
අන්ධකාරං විය රවිං
හදයං නාවගාහති.

සීලසම්පත්තියා භික්ඛු
සොභමානො තපොවනෙ
පභාසම්පත්තියා චන්ද්‍ර
ගගනෙ විය සොභති.

කායගන්ධොපි පාමොජ්ජං
සීලවන්තස්ස භික්ඛුනො
කරොති අපි දෙවානං
සීලගන්ධෙ කථාවකා.

සබ්බෙසං ගන්ධජාතානං
සම්පත්තිං අභිභුය්‍යති
අවිඝාති දසදිසා
සීලගන්ධො පවායති.

අප්පකම්පි කතා කාරා
සීලවන්තෙ මහප්ඵලා
හොන්තීති සීලවා හොති
පූජාසක්කාර භාජනං.

සීලවන්තං නබාධෙන්ති
ආසවා දිට්ඨධම්මිකා
සම්පරායික දුක්ඛානං
මූලං ඛණති සීලවා.

යා මනුස්සෙසු සම්පත්ති
යා ච දෙවෙසු සම්පදා
න සා සම්පන්න සීලස්ස
ඉච්ඡතො හොති දුල්ලභා.

අච්චන්තසන්තා පන යා
අයං නිබ්බානසම්පදා
සම්පන්න සීලස්ස මනො
තමෙව අනුධාවති.

සබ්බසම්පත්ති මූලම්හි
සීලම්හි ඉති පණ්ඩිතො
අනෙකාකාර වොකාරං
ආනිසංසං විභාවයෙති.

එවං හි විභාවයතො සීලවිපත්තිතො උබ්බිජ්ජිත්වා සීලසම්පත්ති නින්නං මානසං හොති තස්මා යථා වුත්තං ඉමං සීලවිපත්තියා ආදීනවං ඉමඤ්ච සීල සම්පත්තියා ආනිසංසං දිස්වා සබ්බාදරෙන සීලං වොදාපෙතබ්බන්ති. එත්තාවතාච "සීලෙ පතිට්ඨාය නරො සපඤ්ඤො"ති ඉමිස්සා ගාථාය සීල සමාධිපඤ්ඤාමුඛෙන දෙසිතෙ විසුද්ධිමග්ගෙ සීලං තාව පරිදීපිතං හොති.

**ඉති සාධුජන පාමොජ්ජත්ථාය**
**කතෙ විසුද්ධිමග්ගෙ**
**සීලනිද්දෙසො**
**නාම පඨමො පරිච්ඡෙදො.**

---

( ස † )

**එවමාදිනා**, මේ ආදීවූ; පච්චවෙක්ඛ
ණෙන, ප්‍රත්‍යවෙක්ෂණයෙන්; සීලවි
පත්තියං ආදීනව දස්සනං, ශීල විප
ත්තියෙහි ආදීනව දැක්මද; වුත්තප්ප
කාර විපරීතතො (ශීල විපත්තියෙහි)
උක්තප්‍රකාරයට ප්‍රතිපක්ෂ හෙයින්; සී
ල සම්පත්ති යං, ශීලසම්පත්තියෙහි;
ආනිසංස දස්සනං, ආනිසංස දර්ශනය
ද; වෙදිතබ්බං, දතයුතු.

අපිච, අනිකෙකුදු (සෙසු ශීලානි
සංසයෙද් ඇත යන අර්ථයි) යස්ස, ය
මෙක්හුගේ; සීලං, ශීලය තෙමේ; සුනි
ම්මලං, මනාකොටම නිර්මලද; ත
ස්ස, ඔහුගේ; පත්තචීවරධාරණං, පා
ත්‍ර චීවරධාරණය; පාසාදිකං හොති,
ප්‍රසාදකර වේ; තස්ස, ඔහුගේ; පබ්බ
ජ්ජා, ප්‍රව්‍රජ්‍යාව; සඵලා, සඵලවේ; සු
ද්ධසීලස්ස, පිරිසිදු සිල් ඇති; භික්ඛු
නො, භික්ෂූහුගේ; හදයං, ළයවු; අ
ත්තානුවාදදිභයං, ආත්මානුවාදදි භ
ය; නාවක්කමති, නොබසී (කුමක්මෙ
න්දයත්?) රවිං අන්ධකාරං විය, හිරු
කාරා අඳුරු නොබස්නා සෙයිනි; ත
පොවනෙන, තපොවනයෙහි; සීලසම්ප
ත්තියා සොභමානො භික්ඛු, ශීල ස
ම්පත්තින් හොබනාවූ මහණ තෙමේ;
සොභති, හොබී (කෙසේදයත්?) පභා
සම්පත්තියා, ප්‍රභා සම්පත්තීන් හො
බනාවූ; ගගනෙ චන්දිමාවිය, ආකාශ
යෙහි සඳුමෙනි; සීලවන්තස්ස භික්ඛු
නො, සිල්වත් භික්ෂූහුගේ; කායග
න්ධොපි, ශරීර ගන්ධයද; අපි දෙවා
නං, දෙවියන්ට පවා; පාමොජ්ජං ක
රොති, ප්‍රීතිය කෙරෙයි; සීලගන්ධො, ශී
ල ගන්ධයෙහි; කථාවකා, කථාව කිම?
සබ්බසං ගන්ධජාතානං, තගරම
ල්ලිකාදි සියලු ගන්ධ ජාතීන්ගේ;
සම්පත්තියං අභිභුය්‍ය, සම්පත්ති මැ
ඩ; දසදිසා, දශ දිශාහි; අවිඝාති,
අප්‍රතිඝාතිව ( පැකිල්මක් නැතිව )
සීලගන්ධො, ශීලගන්ධය; පවායති,
භවා; සීලවන්තෙ, සිල්වත්හු කෙරෙ
හි; කතා, කරණලද; අප්පකම්පිකාරා,
මඳවූද ක්‍රියා කෙරෙණක්; මහප්ඵලා
හොන්ති, මහත්ඵල වෙත්නුයි; සීල
වා, සිල්වත් තෙමේ; පූජාසක්කාර භා
ජනං හොති, පූජා සත්කාරයට භාජ
නවේ; දිට්ඨධම්මිකා, මෙම ආත්මභා
වයෙහි වන; ආසවා, වධ බන්ධනාදි
උපද්‍රවයෝ; සීලවන්තං, සිල්වත්හු;
නාබාධන්ති, නොපෙළත්; සීලවා,
සිල්වත් තෙමේ; සම්පරායික දුක්ඛා
නං, පරලොවෙහි වන දුඃඛයන්ගේ; මූ
ලං, දෙශශිල්‍ය සංඛ්‍යාතමූලය; ඛණ
ති, කණී; මනුස්සසු, මිනිසුන් කෙරෙ
හි; යා සම්පත්ති, යම් සම්පත්තියක් ඇ
ද්ද; යාචදෙවෙසු සම්පදා, දෙවියන්
කෙරෙහි යම් සම්පත්තියක් ඇද්ද; සා,
ඒ සම්පත්ති තොමෝ; ඉච්ඡතො (ඒ
සැපත්) කැමති; සම්පන්නසීලස්ස, ශී
ල සම්පන්නය හට; න දුල්ලභා හොති,
දුර්ලභ නොවේ; අච්චන්තසන්තා, අ
ත්‍යන්තයෙන් ශාන්තවූ (හැම දවස්ම
ශාන්තවූ) යා අයං නිබ්බානසම්පදා,
යම් මේ නිර්වාණ සම්පත්තියක් ඇද්
ද; සම්පන්න සීලස්ස, සම්පන්න ශීල
යාගේ; මනො, සිත; තමෙව, ඒ නි
ර්වාණ සම්පදාවම; අනුධාවති, අනුව
දීවේ; සබ්බසම්පත්ති මූලම්හි, සියළු සැ
පතට මුල්වූ; සීලම්හි, ශීලයෙහි; ඉති,
මෙසේ; පණ්ඩිතො, නුවණැත්තේ; අ
නෙකාකාර වොකාරං, අනෙකාකාර
යෙන් විස්තරවූ; ආනිසංසං, අනුසස්;
විභාවයෙ, පහළකරන්නේයි; එවං
හි විභාවයතො, මෙසේ විභාවනා
කරණ්නාහුගේ; සීලවිපත්තිතො උබ්බි
ජ්ජිත්වා, ශීල විපත්තීන් උත්‍රස්තව;
සීලසම්පත්ති නින්නං, ශීල සම්පත්ති
යෙහි නිම්නවූ; මානසං හොති, මාන
ස වන්නේයි; තස්මා, එහෙයින්; යථා
වුත්තං, කීයනලද; ඉමං සීලවිපත්ති
යා ආදීනවං, මේ ශීල විපත්තියෙ

හි ආදීනවද; ඉමං සීලසම්පත්තියා ආනිසංසං, මේ ශීලසම්පත්තියෙහි ආනිසංසද; දිස්වා, දැක; සබ්බාදරේන, සියලුආදරයෙන්; සීලං, ශීලය; සොධෙතබ්බං, පිරිසිදුකටයුතු; එතාවතා, මෙපමණෙකින්ද "සීලෙ පතිට්ඨාය නරො සපඤ්ඤො" යි ඉමිස්සා ගාථාය, "සීලෙ පතිට්ඨාය" යනාදී මේ ගාථාවෙහි; සීලසමාධිපඤ්ඤාමුඛෙන දෙසිතෙ, ශීලසමාධිප්‍රඥාමුඛයෙන් දෙසනලද; විසුද්ධිමග්ගෙ, විශුද්ධිමාර්ගයෙහි; සීලං තාව පරිදීපිතං හොති පළමුකොට ශීලය දක්වනලදී.

## සීලනිද්දෙසො.

( හා † )

මේ ආදික්‍රමයෙන් පස්විසීමෙන් ශීලවිපත්තියෙහි දෝෂ දැක්මද ශීලවිපත්තියෙහි කී නියාවට ප්‍රතිපක්‍ෂනයින් ශීලසම්පත්තියෙහි ආනිසංස දැක්මද දතයුත්තේයි;

අනිකුදු ශීලානිසංසයෝ ඇත්තාහුය හේ කවරහුදයත්? යම් භික්‍ෂුවක්හුගේ ශීලය මනාකොට නිර්මලවේද ඒ භික්‍ෂූහුගේ පාසිවුරු දැරීමද දුටුවන් පහදවන්නේයි ඔහුගේ ප්‍රව්‍රජ්‍යාවද සඵලවන්නීය.

යම්සේ සූර්‍ය්‍යකිරණ අන්ධකාරය නොබස්නේද එමෙන්ම සුපිරිසිදු සිල් ඇති මහණහුගේ සිතට ආත්මානුවාදාදි භය නොබස්නේයි. යම්සේ ආලොකසම්පත්තියෙන් හොබනාවූ පූර්ණචන්ද්‍රයා අහස්හිද බබලාද එමෙන්ම ශීලසම්පත්තියෙන් හොබනාවූ භික්‍ෂුතෙම තපොවනයෙහි බබලන්නේයි.

සිල්වත් මහණහුගේ කායගන්ධය දෙවියන්ට පවා ප්‍රීතිකෙරෙයි එබඳු සිල්වතුන්ගේ ශීලගන්ධයෙහි කියනුම කවරේද?

සිල්වතුන්ගේ ශීලසුගන්ධය වනාහි තුවරලා දසමන්ආදී සියලු සුගන්ධවර්ගයන්ගේ සුවඳ මැඩපවත්වා කිසිතැනෙක පැකිළීමක් නැතුව සියලුදිශාභාගයෙහි හමන්නේය. සිල්වතුන්කෙරෙහි කරණලද ස්වල්පවූද පූජාසත්කාරයෝ මහත්ඵල මහානිසංසවන්නාහුය. එහෙයින් සිල්වත්තෙමේ පූජාසත්කාරයට භාජනවන්නේයි. සිල්වත්හු ඉහාත්මභාවයෙහි වන්නාවූ වධබන්ධනාදි උපද්‍රවයෝද නොපෙළෙත්මය පරලොවෙහි වනනරකාදි දුඃඛයන්ට මුල්වූ රාග දෙෂ මොහයෝද උපුටාහරින්නෙමැයි

මනුෂ්‍යලොකයෙහි යම් සම්පත්තියක් ඇත්තේවේද දිව්‍යලොකයෙහි යම් සම්පත්තියක් ඇත්තේවේද ඒ විප්‍රකාරවූ සම්පත්තියම ඉදින් සිල්වත්හු කැමතිනම් දුලීභ නොවෙයි අත්‍යන්තයෙන් ශාශ්වත් සියලුකල්හිම ශාන්තවූ යම් නිර්වාණසම්පත්තියක් ඇත්තේවේද, සම්පූර්ණවූ සිල් ඇති පුද්ගලයාගේ සිත එම නිර්වාණධාතුවටම අභිමුඛව දිවන්නේයි මෙසේ සියලු සැපතට මුල්වූ ශීලසම්පත්තියෙන් නුවණැති තෙමේ නොයෙක්ප්‍රකාර විස්තරවූ ආනිසංසයන් ප්‍රකාශකරන්නේයි. මෙසේ වඩන්නහුගේ සිත ශීලවිපත්තියෙහි කලකිරී ශීලසම්පත්තියෙහි නැමුනේ වෙයි. එහෙයින් උක්තප්‍රකාර මේ සීලසම්පත්තියෙහි ආදීනව හා ආනිසංසද දැන සර්වාදරයෙන් ශීලය පිරිසිදුකටයුත්තේයි මෙපමණෙකින් "සීලෙපතිට්ඨාය නරොසපඤ්ඤො" යනාදි මේ ගාථාවෙහි ශීලසමාධි ප්‍රඥමුඛයෙන් දේශනාකර වදාරණලද විශුද්ධිමාර්ගයෙහි පළමුකොට ශීලය දක්වනලද්දේයි.

**මෙතෙකින් සාධුජන ප්‍රමොදය පිණිස කරණලද විශුද්ධිමාර්ගයෙහි**

**සීලනිද්දෙස**

**නම් පළමුවෙනි පරිච්ඡෙදය කිශා නිමවනලදී.**

( පා ‡ )

ඉති යෙහි අප්පිච්ඡතාසන්තුට්ඨිතාදීහි ගුණෙහි වුත්තප්පකාරස්ස සීලස්ස වොදානං හොති තෙ ගුණෙ සම්පාදෙතුං යස්මා සමාදින්නසීලෙන යොගිනා ධුතඞ්ගසමාදානං කාතබ්බං, එවං හිස්ස අප්පිච්ඡතා සන්තුට්ඨිතා සල්ලෙඛ-පවිවෙක-අපචය-විරියාරම්භ-සුභරතාදිගුණසලිල වික්ඛාලිතමලං සීලඤ්චෙව සුපරිසුද්ධං භවිස්සති වතානි ච සම්පජ්ජිස්සන්ති ඉති අනවජ්ජ සීලබ්බතගුණ පරිසුද්ධ සමාචාරො පොරාණෙ අරියවංසත්තයෙ පතිට්ඨාය චතුත්ථස්ස භාවනාරාමතා සඞ්ඛාතස්ස අරියවංසස්ස අධිගමාරහො භවිස්සති තස්මා ධුතඞ්ගකථං ආරභිස්සාම — භගවතා හි පරිච්චත්ත ලොකාමිසානං කායෙ ච ජීවිතෙ ච අනපෙක්ඛානං අනුලොමපටිපදංයෙව ආරාධෙතුකාමානං කුලපුත්තානං තෙරසධුතඞ්ගානි අනුඤ්ඤාතානි — සෙය්‍යථිදං — පංසුකූලිකඞ්ගං — තෙචීවරිකඞ්ගං — පිණ්ඩපාතිකඞ්ගං — සපදානචාරිකඞ්ගං — එකාසනිකඞ්ගං — පත්තපිණ්ඩිකඞ්ගං — ඛලුපච්ඡාභත්තිකඞ්ගං — ආරඤ්ඤිකඞ්ගං — රුක්ඛමූලිකඞ්ගං — අබ්භොකාසිකඞ්ගං — සොසානිකඞ්ගං — යථාසන්ථතිකඞ්ගං — නෙසජ්ජිකඞ්ගන්ති — තත්ථ —

අත්ථතො ලක්ඛණාදීහි
සමාදානවිධානතො
පභෙදතො භෙදතො ච
තස්ස තස්සානිසංසතො —
කුසලත්තිකතො චෙව
ධුතාදීනං විභාගතො
සමාසව්‍යාසතො චාපි
විඤ්ඤාතබ්බො විනිච්ඡයො —

( ස ‡ )

ඉති, මෙසේ; අප්පිච්ඡතා, අල්පේච්ඡ බවය (අල්ප අදහස් ඇතිබවය යුතැයි) සන්තුට්ඨිතාදීහි, ඉතරීතර ප්‍රත්‍යයෙන් සතුටුවීම යනාදිවූ; යෙහිගුණෙහි, යම්ගුණයකින්; වුත්තප්පකාරස්ස සීලස්ස, කියනලද ප්‍රකාර ඇති ශීලයාගේ; වොදානං හොති, පිරිසිදුබව වේද; තෙගුණෙ, ඒ ගුණයන්; සම්පාදෙතුං, සපයනු පිණිස; යස්මා, යම් හෙයකින්; සමාදින්නසීලෙන, සමාදන්වූ සිල් ඇති; යොගිනා, යොගි හුවිසින්; ධුතඞ්ගසමාදානං කාතබ්බං, ධුතාඞ්ගසමාදන් වීම කටයුතු; එවං හි, එසේකල්හි; අස්ස, ඒ යොගීහුගේ; අප්පිච්ඡතා, අල්පේච්ඡබව; සන්තුට්ඨිතා; ලදපසයෙහි සතුටුවීම; සල්ලෙඛ, මනාකොට කෙලෙසුන් ලිහීම (සිඳීම තුනීකිරීමයයි සේයි) පවිවෙක, සිත් විවේකයට කරුණුවූ කායවිවේකය; අපචය, කෙලෙසුන්ගේ විදුසීම (කෙලශාපගමයයි සේයි) විරියාරම්භ, ආරබ්ධවීර්‍ය්‍ය ඇතිබව; සුභරතා, සුපොෂ බවය (ආදිශබ්දයෙන් අප්පකිච්චතා සල්ලහුකවුත්ති යනාදීන් ගන්හු) ගුණසලිල, ගුණනැමති ජලයෙන්; වික්ඛාලිතමල, ප්‍රක්ෂාලිතවූ මල ඇති; සීලඤ්චෙව, ශීලයද; සුපරිසුද්ධං භවිස්සති, ප්‍රතිපක්ෂ දමුත් දුරුවීමෙන් සුපරිසුද්ධවන්නේයි; වතානි ච, ධුතධර්මයෝද; සම්පජ්ජිස්සන්ති, සම්පන්නවෙත් (අල්පාදි ගුණවඩුන්ම ධුතගුණද පරිපූර්ණව නිපදිතියි-යුසේයි) ඉති, මෙසේ; අනවජ්ජ, නිර්දෝෂවූ; සීලබ්බතගුණ, සිල් හා ධුතගුණයන්; පරිසුද්ධසමාචාරො, පිරිසිදු සියලු ප්‍රයොග ඇතියේ; පොරාණෙ, පෞරාණවූ බුද්ධාදි ආර්‍ය්‍යයන්ගේ ප්‍රවේණිබැවින් පෞරාණවූ) අරියවංසත්තයෙ, ඉතරීතර චීවරපිණ්ඩපාත සෙනාසන

යනාදි විසින් සඞ්ඛ්‍යාත ආයස්මංගප්‍රමෙයකි;
ගණිඨාගත, පිණ්ඩා; චතුපස්සස, සගාර
වතුපුප; භාවනාරාමතාසඞ්ඛාතස්ස, ස
ප්පභාවනා විපස්සනාභාවනාමයෙහි
ප්‍රකාශනබවයයි කියනලද; අරියවං
සස්ස, අරියවංශයන්ගේ; අධිගමාර
ම්භාභාවිස්සති, අධිගමයට සුදුසුවූ;
නයමා, එමෙයිසින් ("යෙසමා අධිගමාර
මහා භවිස්සති නයමා" යි යොදනු) ධු
තඞ්ගකථං ආරභිස්සාම, ධුතාඞ්ගකථා
ව ආරම්භකරමු. භගවතා, භගවත්හු
විසින් ("අනුසාසනානි" යනු සබඳ)
පරිච්චත්ත ලොකාමිසානං, දුරුකරණ
ලද ලොකාමිෂ ඇති (තෘෂ්ණාවෙන් පිරි
මැදියයුතුබැවින්ද ලොකපරියාපන්න
බැවින්ද ලාභසත්කාරාදිනු ලොකා
මිෂ නම් වෙත්) කායෙ ච ජීවිතෙ
ච අනපෙක්ඛානං, කයෙහිද ජීවිත
යෙහිද නිරපෙක්ෂවූ; අනුලොම පටි
පදං කයව, නිර්වාණාධිගමයට අනු
ලොම්වූ විපස්සනාභාවනා සඞ්ඛ්‍යාත
පිළිපෙවත්ම; ආරාධෙතු කාමානං, සිද්ධ
කරණුකැමැතිවූ; කුලපුත්තානං, ආචා
රකුලපුත්නට, තෙරසධුතඞ්ගානි, තෙ
ළෙස්ධුතාඞ්ගයෝ; අනුසාසනානි, අ
නුදන්නාලදනු; සමයාපිදං, ඔහුකාව
රහ; තාවු, ඒ තෙළෙස්ධුතාඞ්ගයන්
තෙකෙරහි ("විනිච්ඡයො විඤ්ඤූත
ම්බා" ඊ යොදනු) අට්ඨතො (පංසුකු
ලාදි ඒ ඒ ශබ්දාර්ථයෙන්) අර්ථවශයෙ
න්ද; ලක්ඛණාදිනි, ලක්ෂණරසාදිවිසි
න්ද; සමාදානවිධානතො, සමාදා
න විසින්ද විධානවිසින්ද; පභෙද
තො, විභාගවිසින්ද; භෙදතො, බිඳීම්
විසින්ද; තස්ස තස්සානිසංසතො, ඒ
ඒ ධුතාඞ්ගයාගේ අනුසස් විසින්ද; කු
සලත්තිකාතො චෙව, කුශලත්‍රිකයන්
විසින්ද; ධුතාදීනං විභාගතො, ධුතය
ධුතවාදය ධුතධර්මය ධුතාඞ්ගය යන
මොවුන්ගේ විභාග විසින්ද; සමා
සබ්‍යාසතොචාපි, සංක්ෂෙප හා විස්තර
විසින්ද; විනිච්ඡයො විඤ්ඤූතබ්බො,
විනිශ්චය දතයුත්තේයි —

( භා ‡ )

දූත්වතාහි අපිච්ඡතාන් ආදි යම්
ගුණසමූහයකින් යට දූන්වූ ශීලය පි
රිසිදුවන්නේද ඒ ගුණ සපයනුපිණිස
යම්පරිද්දෙකින් සමාදන්වන සිල්
ඇති යොගාවචර මහණ විසින් ධුතා
ඞ්ග සමාදන්වියයුතුවේද. මෙසේසමා
දන්වූකල ඒ මහණහුගේ මැඩින් ස
තුටුවීමයයි කියනලද අපිච්ඡගුණය ල
දෙදයකින් සතුටුවීමයයි කියනලද
සන්තොස්ගුණය කෙළෙස් තුනීකිරීම
යයි කියනලද සල්ලේඛගුණය විනාවි
වෙකයට කාරණවූ කායවිවෙකයයි
කියනලද කය සන්සිඳුවාගැන්මය
කෙලෙස් පහකිරීමයයි කියනලද අ
පචයගුණය භාවනාවෙහි වඩනලද
වීර්‍යඇති බවයයි කියනද විරියා
රම්භ ගුණය සැපසේ පොෂ්‍යය
කළහැකිබවයයි කියනලද සුභර
තාගුණය ස්වල්ප කටයුතු ඇතිබවය
සැහැල්ලු පැවැතුම් ඇතිබවය යනාදි
ශ්‍රාමණ්‍යගුණ නැමැති ජලයෙන්
කෙලෙස්මල දෙවූ ශීලය ඒ ශීලයට
විරුඬ ධර්මයන් දුරුවීමෙන් අතිපරි
සුඬවන්නේය ඒ ධුතාඞ්ගධර්මයෝද
සම්පූර්ණවන්නාහුයයි මෙසේ නිර්
දෝෂ ශීලව්‍රත ගුණයෙන් සුපිරිසිදු
හැසිරීම් ඇති බුඬාදී ආර්‍යයන්ගේ
පරම්පරාගත බැවින් පුරාතනවූ අපිස්
බව ලදදෙයකින් සතුටුවන බවය
කෙළෙස් තුනීකරණ බවය යන ආ
ර්‍යවංශත්‍රයෙහි පිහිටා සිව්වනුවූ භා
වනාරාමතා සඞ්ඛ්‍යාත ආර්‍යවං
ශයට පැමිණීමට යොග්‍යවේද එහෙ
යින් ධුතාඞ්ගකථාව කියන්නට පට
න්ගණුමහ.

තෘෂ්ණාවෙන් පිරිමැදියයුතු බැවින්
හා ලොකයෙහි ඇතුළත් බැවින්ද
භාග්‍යවතුන්වහන්සේ විසින් ලෞකි

කාමයෙහි තිරහලද ලාභසත්කාරාදිය අත්හැරියාවූ ශරීරයෙහිවත් ජීවිතයෙහිත් ආශා නැත්තාවූ නිවන් ලැබීමට අනුලෝමවූ විදර්ශනාභාවනා සඞ්ඛ්‍යාත පිළිවෙත්ම සිදුකරණු කැමැති ආචාර කුලපුත්‍රයන්ට තෙළෙස්ධුතාඞ්ග ධර්මයෝ අනුදැන වදාරණලද්දාහුය.

ඒ කවරහුදයත්? පාංශුකූලිකාඞ්ගය තෛචීවරිකාඞ්ගය පිණ්ඩපාතිකාඞ්ගය සපදානචාරිකාඞ්ගය ඒකාශනිකාඞ්ගය පත්තපිඬිකාඞ්ගය ඛලුපච්ඡාභත්තිකාඞ්ගය ආරඤ්ඤකාඞ්ගය රුක්ඛමූලිකාඞ්ගය අබ්භොකාසිකාඞ්ගය සොසානිකාඞ්ගය යථාසන්ථතිකාඞ්ගය නෛසජ්ජිකාඞ්ගය යන මේ තෙළෙස්දෙන ධුතාඞ්ග ධර්මයෝ නම්වෙති. —

ඒ තෙළෙස් ධුතාඞ්ගධර්මයෙහි පංසුකූලිකාදි ඒ ඒ ශබ්දයන්ගේ අර්ථවශයෙන්ද ලක්ෂණය කෘත්‍ය එළඹ සිටිනා කාරණය ආසන්නකාරණය යන මොවුන්ගේ වශයෙන්ද සමාදන්වන ආකාර වශයෙන්ද විධානවශයෙන්ද විභාගවශයෙන්ද භේදවශයෙන්ද ඒ ඒ ධුතාඞ්ගයාගේ ආනිසංස වශයෙන්ද කුශලත්‍රික වශයෙන්ද ධුතය ධුතවාදය ධුතධර්මය ධුතාඞ්ගය යන මොවුන්ගේ භේදවශයෙන්ද සඞ්ක්ෂෙපවශයෙන්ද විස්තරවශයෙන්ද විනිශ්චය දතයුත්තේයි. —

---

( පා ¶ )

අත්ථතො තාව රථිකා සුසාන සඞ්කාරකූටාදීනං යත්ථ කත්ථචි පංසූනං උපරිඨිතත්තා අබ්භුග්ගතට්ඨෙන තෙසු පංසුසු කූලමිවාති පංසුකූලං — අථවා පංසු විය කුච්ඡිතභාවං උලතීති පංසුකූලං කුච්ඡිතභාවං ගච්ඡතීති වුත්තං හොති එවං ලද්ධනිබ්බචනස්ස පංසුකූලස්ස ධාරණං පංසුකූලං පංසුකූලං සීලමස්සාති පංසුකූලිකො පංසුකූලිකස්ස අඞ්ගං පංසුකූලිකඞ්ගං අඞ්ගන්ති කාරණං වුච්චති තස්මා යෙන සමාදානෙන සො පංසුකූලිකො හොති තස්සෙතං අධිවචනන්ති වෙදිතබ්බං — එතෙනෙව නයෙන සඞ්ඝාටි උත්තරාසඞ්ග අන්තරවාසක සඞ්ඛාතං තිචීවරං සීලමස්සාති තෙචීවරිකො තෙචීවරිකස්ස අඞ්ගං තෙචීවරිකඞ්ගං — භික්ඛා සඞ්ඛාතානං පන ආමිසපිණ්ඩානං පාතො පිණ්ඩපාතො පරෙහි දින්නානං පිණ්ඩානං පත්තෙ නිපතනන්ති වුත්තං හොති. තං පිණ්ඩපාතං උඤ්ඡති තං තං කුලං උපසඞ්කමන්තො ගවෙසතීති පිණ්ඩපාතිකො පිණ්ඩාය වා පතිතුං වතමෙතස්සාති පිණ්ඩපාතී පතිතුන්ති චරිතුං පිණ්ඩපාතී එව පිණ්ඩපාතිකො පිණ්ඩපාතිකස්ස අඞ්ගං පිණ්ඩපාතිකඞ්ගං — දානං වුච්චති අවඛණ්ඩනං අපෙතං දානතො අපදානං අනවඛණ්ඩනන්ති අත්ථො සහ අපදානෙන සපදානං අවඛණ්ඩනරහිතං අනුඝරන්ති වුත්තං හොති — සපදානං චරති ඉදමස්ස සීලන්ති සපදානචාරී සපදානචාරී එව සපදානචාරිකො තස්ස අඞ්ගං සපදානචාරිකඞ්ගං — එකාසනෙ භොජනං එකාසනං තං සීලමස්සාති එකාසනිකො තස්ස අඞ්ගං එකාසනිකඞ්ගං — දුතියභාජනස්ස පටික්ඛිත්තත්තා කෙවලං එකස්මිංයෙව පත්තෙ පිණ්ඩො පත්තපිණ්ඩො ඉදානි පත්තපිණ්ඩගහණෙ පත්තපිණ්ඩසඤ්ඤං කත්වා පත්තපිණ්ඩො සීලමස්සාති පත්තපිණ්ඩිකො තස්ස අඞ්ගං පත්තපිණ්ඩිකඞ්ගං — ඛලූති පටිසෙධනත්ථෙ නිපාතො පවාරිතෙන සතා පච්ඡාලද්ධං භත්තං පච්ඡාභත්තං නාම තස්ස පච්ඡාභත්තස්ස භොජනං පච්ඡාභත්තභොජනං තස්මිං පච්ඡාභත්ත භොජ

ජනං පච්ඡාභත්ත සඤ්ඤං කත්වා පච්ඡා භත්තං සීලමස්සාති පච්ඡාභත්තිකො න පච්ඡාභත්තිකො ඛලුපච්ඡාභත්තිකො. සමාදානවසෙන පටික්ඛිත්තාතිරිත්තභොජනස්සෙතං නාමං~අට්ඨකථායං පන වුත්තං ඛලූති එකො සකුණො සො මුඛෙන ඵලං ගහෙත්වා තස්මිං පතිතෙ පුන අඤ්ඤං නඛාදති තාදිසො අයන්ති ඛලුපච්ඡාභත්තිකො තස්ස අඞ්ගං ඛලුපච්ඡාභත්තිකඞ්ගං~අරඤ්ඤෙ නිවාසො අස්සාති ආරඤ්ඤිකො තස්ස අඞ්ගං ආරඤ්ඤිකඞ්ගං~රුක්ඛමූලෙ නිවාසො රුක්ඛමූලං තං සීලමස්සාති රුක්ඛමූලිකො රුක්ඛමූලිකස්ස අඞ්ගං රුක්ඛමූලිකඞ්ගං~අබ්භොකාසික සොසානිකඞ්ගෙසුපි එසෙව නයො~යදෙව සන්ථතං යථාසන්ථතං ඉදං තුය්හං පාපුණාතීති එවං පඨමං උද්දිට්ඨසෙනාසනස්සෙතං අධිවචනං~තස්මිං යථා සන්ථතෙ විහරිතුං සීලමස්සාති යථා සන්ථතිකො තස්ස අඞ්ගං යථා සන්ථතිකඞ්ගං~සයනං පටික්ඛිපිත්වා නිසජ්ජාය විහරිතුං සීලමස්සාති නෙ සජ්ජිකො තස්ස අඞ්ගං නෙසජ්ජිකඞ්ගං~

( ශ ¶ )

තාව, පලඹුකොට; අපවිතෙහා, වචනාඨ යෙහින්; රථිකාසුසාන සඞ්කාරකූටාදීනං, වීථිය සොහොනය කසල ගොඩය යනාදීන් කෙරෙහි; යත්‍ර තත්‍රව, යම්කිසි තැනෙක්හි; පංසුතං උපරිසිතතාතා, පාංශුව ඉස්තානයෙහි සිටීහෙයින්; අබ්භුග්ගතට්ඨෙන, උස්ව සිටිනා හෙයින්; පොසු පංසුසු කුලම්වාත්, ඒ පාංශුවෙහි ඉදුර, බඳුනුයි; පංසුකූලං, පංසුකුලනම් ("නදීයා කූලං" යනාදියෙහිමෙන් මිනි "කූල" ශබ්දය සමූහයාඨිනුයි "පංසුකූලම්පාති පංසුකූලං"යි කීහු) අථවා, වාගෙහොන්; පංසුං විය, පාංශුවක්මෙන්; කුච්ඡිතභාවං, කුත්සිත බවට; උලතීති, යේවූයි; පංසුකුලං, පංසුකුල නම් (මිනි "කු" ශබ්දය කුත්සාවෙහි "උල" ශබ්දය ගත්‍යර්ථයෙහි වැටෙනුයි කීහ. "කුච්ඡිතභාවං ගච්ඡතීති වුත්තං හොති"යි) එවං ලද්ධනිබ්බචනස්ස, මෙසේ ලබනා ලද නිර්වචන ඇති (අක්ෂරාර්ථ ඇති යහා අර්ථයි) පංසුකුලස්ස ධාරණං, පංසුකුලනාගේ දැරීම; පංසුකුලං [උත්තරපද ලොපයෙන්] පංසුකුල නම්වේ. ("අප්‍රපබොධනාම ප්‍රපං නත් ශීලමසෙය තාප්‍රපිකඃ" යනුයෙහි මෙන් "පංසුකුල ධාරණං" යනුයෙහි ධාරණ ශබ්දය ලොප්කොට පංසුකුලං යනුවේ යහ අර්ථයි) පංසුකුලං සීලමස්සාති, පංසුකුලය දැරීම ප්‍රකෘතිවූයේ මෙහ්හට තුයි; පංසුකුලිකො, පංසුකුලික නම්වේ; පංසුකුලිකස්ස, පංසුකුලිකයාගේ; අඞ්ගං, සමාදාන චෙතනා සංඛ්‍යාත ධර්මය; පංසුකුලිකඞ්ගං, පංසුකුලිකඞ්ග නම්වේ; අඞ්ගනති කාරණං වුච්චති, අඞ්ගයයි කාරණය කියනු ලැබේ; තස්මා, එහෙයින්; යෙන සමාදානෙන (චෙතනා ලක්ෂණ) යම් සමාදානයක් හේතුකොටගෙණ; සො, ඒ පංසුකුලය දරණ භික්ෂු තෙමේ; පංසුකුලිකොති වුච්චති, පංසුකුලිකයයි කියනු ලැබේද; තස්ස, ඒ සමාදාන චෙතනා ලක්ෂණයට; එතං අධිවචනං, මේ අඞ්ගයයි කියන නමෙකි ('සමාදීයති එතෙනාති සමාදානං චෙතනා සා අඞ්ගනති අනන්තරා ඵලම්පති ගහනභාවං ගච්ඡතීති අඞ්ගං කාරණං යෙන පුග්ගලො පංසුකුලිකොති වුච්චතීති"යි කී බැවින් යම් සමාදාන චෙතනාවක් කාරණකොටගෙණ භික්ෂු තෙමේ පංසුකුලික නම්වේද ඒ සමාදාන චෙතනාව ලබුනේ පංසුකුලිකභාවට කාරණ බැවින් පංසුකුලික නම්වෙයි දතයුතු) "එතෙනෙව නයෙන" මෙම නයින් ("පංසුකුලිකඞ්ගං"

යනුයෙහි "පංසුකූලධාරණං පංසුකූලං පං සීලො පංසුකූලිකො, තස්ස අඞ්ගං සඞ්ඛාදනා චෙයතා පංසුකූලිකඞ්ගං" යනු යම්සේද එසේම "තෙචීවරධාරණං තිචීවරං නා සීලො තෙචීවරිකො තස්ස අඞ්ගං තෙචීවරිකඞ්ගං" යි ගතාශ්‍රුතය යන අර්ථයි. "සඞ්ඝාටි උත්තරාසඞ්ග අන්තරවාසක සංඛාතං" යනුයෙන් සඟළ සිවුරැය පොරෝණය හඳනාවය යන තුන්සිවුරෙහිම; ත්‍රිචීවර සංඥාය සංඥාපච්ඡාදි උපසිකාඝාටකාදීන් කෙරෙහි නොවෙයි දක්වත්) තිචීවරං, තුන්සිවුරු දරීම; සීලමස්සාති, ප්‍රකෘති වූයේ මෝහටනුයි; තෙචීවරිකො, තෙචීවරික නම්; තෙචීවරිකස්ස අඞ්ගං, තෙචීවරිකයාගේ අඞ්ගය; තෙචීවරිකඞ්ගං, තෙචීවරිකඞ්ග නම්; භික්ඛාසංඛාතානං, භික්ෂා සංඛ්‍යාතවූ; ආමිසපිණ්ඩානං, ආමිෂ පිණ්ඩයන්ගේ; පාතො, හිඳ; පිණ්ඩපාතො, පිණ්ඩපාත නම්; පරෙහි, පරයාවිසින්; දින්නානං පිණ්ඩානං, දෙනලද පිණ්ඩයන්ගේ; පත්තෙ, පාත්‍රයෙහි; නිපතනන්ති වුත්තං හොති, හිඳයයි කියනලද්දේවෙයි; තං පිණ්ඩපාතං, අනුන් විසින් දෙනලද පිණ්ඩයන්ගේ පාත්‍රයෙහි පතනය; උඤ්ඡති, හමුලා; තංතංකුලං උපසඞ්කමන්තො, ඒ ඒ කුලයට එළඹෙන්නේ; ගවෙසතීති, සොයානුයි; පිණ්ඩපාතිකො (බාදරික සාමාණිකයන්මෙන්) පිණ්ඩපාතික නම්වේ; පිණ්ඩායවා, පිඬු පිණිස හෝ; පතිතුං, ඇවිද්නට; වතං, ව්‍රතය; එතස්සාති, මොහට නුයි; පිණ්ඩපාතී, පිණ්ඩපාතී නම්වේ; පතිතුනන්ති චරිතුං, 'පතිතුං යි සේයි චරිතුං යන අර්ථයි; පිණ්ඩපාතී එව, පිණ්ඩපාතීම; පිණ්ඩපාතිකො ("භද්දො එව භද්දකො" යනුමෙන්) පිණ්ඩපාතික නම්වේ; පිඬපාතිකස්ස අඞ්ගං, පිඬපාත පයෙෂ්ෂණයට කාරණය (පිඬපාත පයෙෂ්ෂණ වූත ඇතිවීමට කාරණය හෝ) පිඬපාතිකඞ්ගං, පිඬපාතිකඞ්ග නම්වේ; දානං, දානය; අවඛණ්ඩනං වුච්චති, විච්ඡේදය (කඩකිරීමය) කියනු ලැබේ; අපෙතාදානතො, විච්ඡේද සංඛ්‍යාත දානයා කෙරෙන් අපෙතවූයේ; අපදානං, අපදාන නම්වේ; අනවඛණ්ඩනන්ති අත්ථො, කඩනොකිරීමය යන අර්ථයි; සහඅපදානෙන, කඩනොකිරීම හාසම්ඥ පවතීනුයි; සපදානං, සපදාන නම්වේ; අවඛණ්ඩනරහිතං, විච්ඡේදයක් නොකොට; අනුඝරන්ති වුත්තං හොති, ගෙපිළිවෙළින යුයේයි; සපදානං, ගෙපිළිවෙළින්; චරති, හැසිරේනුයි; ඉදං, මේ සපදානචරණය; අස්ස සීලන්ති, මොහට ප්‍රකෘතිනුයි; සපදානචාරී, සපදානචාරී නම්වේ; සපදානචාරීඑව, සපදානචාරීම; සපදානචාරිකො, සපදානචාරික නම්වේ; තස්ස, උහුගේ; අඞ්ගං, ගෙපිළිවෙළින් ඇවිදීම ප්‍රකෘතිවන්නාව කාරණය (හෙවත් සපදානචාරීවීමට කාරණය) සපදානචාරිකඞ්ගං, සපදානචාරිකඞ්ග නම්; එකාසනෙ භොජනං, ඊර්යාපථාන්තරයෙහි අනන්තරිතවූ එකම නිෂද්‍යාවෙහි භොජනය; එකාසනං (උත්තරපද ලොපයෙන්) එකාසන නාම්; තං, ඒ එකාසනභොජනය; සීලමස්සාති, ප්‍රකෘතිවූයේ මෝහටනුයි; එකාසනිකො, එකාසනික නම්; තස්ස, ඔහුගේ; අඞ්ගං, එක හස්නෙහි හිඳ වැළඳීම ප්‍රකෘතිවීමට කාරණය (හෙවත් එකාසනිකවීමට කාරණය) එකාසනිකඞ්ගං, එකාසනිකඞ්ග නම්; දුතියභොජනස්ස පටික්ඛිත්තත්තා, විතීයභොජනය ප්‍රතික්ෂෙපකළ බැවින්; පත්තෙලා, හුදෙක්; එකස්මිං යෙවපත්තෙ, ඒකාම පාත්‍රයෙහි; පිණ්ඩො, පිඬය; පත්තපිණ්ඩො, පත්තපිඬනම්; ඉදානි, දැන්; පත්තපිණ්ඩගහණෙ, පාත්‍රපිඬගහණයෙහි; පත්තපිණ්ඩසඤ්ඤංජනෙත්වා (උත්තරපද ලොපයෙන්)

පත්තපිණ්ඩය යන සංඥාකොට; පත්තපිණ්ඩො සීලමස්සාති, එකම පාත්‍රයෙහි පිඩුග්‍රහණය ශීලවූයේ මොහට වනුයි; පත්තපිණ්ඩිකො, පත්තපිණ්ඩික නම්වේ; තස්ස, ඔහුගේ; අඞ්ගං, එකම පාත්‍රයෙහි පිඩුග්‍රහණය ප්‍රකෘතිවීමට කාරණය; පත්තපිණ්ඩිකඞ්ගං, පත්තපිණ්ඩිකඞ්ග නම්වේ; ඛලූති, ඛලු යනු; පටිසෙධනෙ නිපාතො, ප්‍රතිෂෙධාර්ථයෙහි නිපාතයෙකි; පවාරිතෙන සතා, පැවැරී අවසානහු විසින්; පච්ඡාලද්ධං භත්තං, පසුව ලද බත; පච්ඡාභත්තං නාම, පශ්චාද් භක්ත නම්; තස්ස පච්ඡාභත්තස්ස භොජනං, ඒ පශ්චාද් භක්තයාගේ භොජනය; පච්ඡාභත්ත භොජනං, පච්ඡාභත්ත භොජන නම්; තස්මිං පච්ඡාභත්තභොජනෙ, ඒ පශ්චාද් භක්ත භොජනයෙහි; පච්ඡාභත්ත සද්දං කත්වා (උත්තරපද ලොපයෙන්) පච්ඡාභත්තය යන නාමකොට; පච්ඡාභත්තං, පශ්චාද් භක්ත භොජනය; සීලමස්සාති, ප්‍රකෘතිවූයේ මොහට වනුයි; පච්ඡාභත්තිකො, පච්ඡාභත්තික නම්වෙයි; න පච්ඡාභත්තිකො, පච්ඡාභත්ත භොජනය නොකරණ සුළුවූයේ; ඛලු පච්ඡාභත්තිකො, ඛලුපච්ඡාභත්තික නම් (ඛලු ශබ්දය ප්‍රතිෂෙධාර්ථ බැවින් එහු හා සමානාර්ථවූ නකාරයෙන "නපච්ඡාභත්තිකො" යුහු) සමාදානවසෙන පටික්ඛිත්ත, සමාදාන වශයෙන් ප්‍රතික්ෂිප්තවූ; අතිරිත්ත භොජනස්ස, (ශික්ෂාපද වශය ශික්ෂාපදයෙන් ප්‍රතික්ෂෙපකළ බැවින්) අතිරික්ත කර්මකළ භොජනයට; එතං අධිවචනං, පච්ඡාභත්තය යනමේ නාමයක; අට්ඨකථායං පන, අටුවාවෙහි වනාහි; වුත්තං, කියනලදී; ඛලූති, ඛලු නම; එකො සකුණිකො, එක්සකුණියෙක; සො, වනාහි; මුඛෙන ඵලං ගහෙත්වා, මුඛයෙන් ඵලයක් ගෙණ; තස්මිං පතිතෙ, ඒ ඵලය හුනු කල්හි; පුන අඤ්ඤං න ඛාදති, නැවැත අනික්ක් නොකාන්නේය; අයං, මේ තෙමේ; තාදිසො, එබඳුයයි; ඛලුපච්ඡාභත්තිකො, ඛලුපච්ඡාභත්තික නම්...පෙ...අරඤ්ඤෙ නිවාසො අස්සාති, අරණ්‍ය නිවාසය මොහට වනුයි; ආරඤ්ඤිකො, ආරණ්‍යක නම්; රුක්ඛමූලෙ නිවාසො රුක්ඛමූලං, රුක්මුල විසීම රුක්ඛමූල නම්; තං, ඒ වෘක්ෂමූල නිවාසය; සීලමස්සාති, ප්‍රකෘතිවූයේ මොහට වනුයි; රුක්ඛමූලිකො, රුක්ඛමූලික නම්වෙයි; අබ්භොකාසික සොසානිකඞ්ගෙසුපි, අබ්භොකාසික සොසානික දෙඅඞ්ගයෙහිදු; එසෙව නයො, මෙම නයයි ("අබ්භොකාසෙ නිවාසො අබ්භොකාසං සුසානෙ නිවාසො සුසානං තං සීලමස්ස" යනාදී සියල්ල "එසෙවනයො" යනුවෙන් අතිදෙශකළේ) සන්දෙව සන්ථතං, යමෙක්ම පණවනලදද; යථාසන්ථතං, යේම යථාසන්ථත නම්; ඉදං තුය්හං පාපුණාතීති, මේ තට පැමිණෙන්නේයයි; එවං, මෙසේ පැමිණි; පඨමං උද්දිට්ඨසෙනාසනස්ස, පළමුකොට උදෙසනලද සෙනාසනයට; එතං අධිවචනං, මේ නාමෙකි; තස්මිං යථාසන්ථතෙ, ඒ යථාසන්ථතයෙහි; විහරිතුං, විසීම; සීලං, ප්‍රකෘතිවූයේ; අස්සාති, මොහට වනුයි; යථාසන්ථිකො, යථාසන්ථතික නම්; සයනං පටික්ඛිපිත්වා, බැසහෙවීම ප්‍රතික්ෂෙපකොට; නිසජ්ජාය, හිඳීමෙන්; විහරිතුං, විසීම; සීලමස්සාති, ප්‍රකෘතිවූයේ මොහට වනුයි; නෙසජ්ජිකො, නෙසජ්ජික නම්; තස්ස, ඔහුගේ; අඞ්ගං, අඞ්ගය; නෙසජ්ජිකඞ්ගං, නෛෂද්‍යකාඞ්ග නම් ~

---

( භා ? )

එහි පළමුකොට අංගී වශයෙන් විනිශ්චය දක්නා පුළුවේ ... ශ්කොසේද ... ?

වීථිකා හෝ අමුසොහොනක හෝ සකලගොඩක හෝ එබඳු වෙනයම් කිසි තැනක හෝ තුබූ වස්ත්‍රය පස් මතෙහි සිටි බැවින් උස්ව සිටි ඉවුරක් වැනි නුයී පංසුකූලනාම් වන්නේයි නොහොත් ඒ වස්ත්‍රය කුණපයෙන් ගැවසීගත් ශරීරයෙහි වැලඳගැත්තේමෙන් පස්පිඩක් මෙන් පිළිකුල් බවට පැමිණෙන අයුරු යෙන්ද පංසුකූල නම්වන්නේයි මෙසේ ලබනලද අර්ථ ඇති පංසුකූලය හෙවත් වීථි ආදියෙන් අවුලාගන්නාලද හඬපිළියෙන් කරණලද සිවුරු දැරීම පංසුකූල නම් වන්නේයි. ඒ පංසුකූල දැරීම ස්වභාවකොට ඇති මහණ පංසුකූලිකයයි කියනු ලැබේ ඒ පංසුකූලික මහණහුගේ සමාදන චේතනා ධර්මය පංසුකූලිකාඞ්ග නම මෙතන්හි අඞ්ග නම් කාරණයයි එහෙයින් පංසුකූලිකාඞ්ගය සමාදන්වන මහණ හට ඒ පිළිබඳව උපදනා කුශල චිත්ත චිත්ත සම්ප්‍රයුක්ත චේතනා ලක්ෂණවූ යම් සමාදන්වීමක් හේතුකොටගෙණ ඒ මහණ පංසුකූලිකයයි කියනුලැබේද එහෙයින් ඒ සමාදන චේතනාවට අඞ්ගය යන මේ නම් වන්නේයයි දතයුතු.

මේ ක්‍රමයෙන්ම සඟළසිවුරය පොරෝණය අඳනය යන තුන්සිවුරු පමණක් දැරීම ස්වභාවකොට ඇති මහණ තෙචීවරික නම යව පෙදෙකි කී නියායෙන් ඔහුගේ සමාදන චේතනාව තෙචීවරිකාඞ්ග නම.

අනුන්විසින් දෙනලද භික්ෂා සංඛ්‍යාත අහර පිඩු පාත්‍රයෙහි වැටීම පිණ්ඩපාතනම ඒ අනුන් විසින් දෙන ලදුව පාත්‍රයෙහි වැටෙන අහරපිඩු අවුලා ගන්නා හෙයින්ද ඒ ඒ කුලයගට එළඹීමෙන් අහරපිඩු සොයන හෙයින්ද පිණ්ඩපාතික නම් වන්නේයි පිඩු සොයන පිණිස හැසිරීම ව්‍රතයක්කොට ඇති මහණද පිණ්ඩපාතික නම ඒ පිඩු සොයන ව්‍රත ඇතිවීමට කාරණවූ සමාදන චේතනාව පිණ්ඩපාතිකාඞ්ග නම් වන්නේයි.

අතරතුරෙහි නොකඩකොට ගෙපිළිවෙළින් පිඩු සිඟීම සපදන නම. ඒ ගෙපිළිවෙළින් පිඩු සිඟීම ස්වභාවකොට ඇති මහණ සපදනචාරික නම. ඒ මහණහුගේ සපදනචාරිකවීමට හේතුවූ සමාදන චේතනාව සපදනචාරිකාඞ්ග නම.

ඊර්යාපථාන්තරයකින් නොවෙනස්වූ එකම අස්නෙහි හිඳ වැළඳීම එකාසන නම ඒ එකාසන භොජනය ස්වභාවකොට ඇති මහණ එකාසනික නාම. ඒ මහණහුගේ එකාසනිකවීමට කාරණවූ සමාදන චේතනාව එකාසනිකාඞ්ග නම්වේ.

දෙවෙනි භාජනය ප්‍රතික්ෂෙපකළ බැවින් එකම පාත්‍රයෙහි පිඩුගැන්ම පත්තපිණ්ඩ නාම දත් ඒ පාත්‍ර පිණ්ඩ ග්‍රහණයයි පත්තපිණ්ඩ යන සංඥව කොට එකම පාත්‍රයෙහි පිඩුගැන්ම ස්වභාවකොට ඇති මහණ පත්තපිණ්ඩික නාම. ඔහුගේ ඒ පත්තපිණ්ඩිකවීමට හේතුවූ සමාදන චේතනාව පත්තපිණ්ඩිකාඞ්ගයයි කියනුලැබේ.

ආහාරප්‍රවාරණ කරන්නාහු විසින් විහායනයින් පසුව ලබනලද ආහාරය පසු බත නාම. ඒ පසුබත වැළඳීම පච්ඡාභත්ත භොජන නාම. ඒ පච්ඡාභත්ත භොජනයෙහි පච්ඡාභත්තය යන සංඥාවකොට "ඛලු" යන නිපාතය වැලැක්මද අර්ථකොට ඇති හෙයින් ඒ පසු බත නොවළදන සුලු මහණ ඛලුපච්ඡාභත්තික නාම. අතිරික්ත භොජන ශික්ෂාපදයෙහි ආ ක්‍රමයෙන් ප්‍රතික්ෂෙපකොට නැවත විහාය නයින් කැපකොට ගන්නාලද අතිරික්ත භොජනය නොවැළදීම මෙහි අඞ්ගනාම් වන්නේයි. අවුවා යෙහිවනාහි ඛලුනාම් එක්යරු පක්ෂි

ලෙයන් ඇත ඒ පක්ෂිතොම හුඩින් ගත් ගෙඩි කිසි ඵලයක් වැටුණේනම් හැ එන අනික් ඵලයක් නොකන්නේය යම් මහණෙක්ද ඒ පක්ෂියාමෙන් විනය නයින් කැපවූද අතිරික්තභොජන සඞ්ඛ්‍යාත පසුබත අංගවශයෙන් නො වළඳනසේක්ද බලුපක්ෂියානම් වැනි හුයි බලුපච්ඡාභත්තික නම් වෙයි කි යත් වැඩි ඒ බලුපච්ඡාභත්තිකවීමට හෙ තුවූ සමාදානචේතනාව බලුපච්ඡාභ ත්තිකාංග නම් වන්නේයි ~

ග්‍රාමාන්තයපටන් දුනුපන්සියයක් දුරවූ අරණ්‍යලක්ෂණයෙන් යුත් වන යෙහි විසීම ස්වභාවකොටඇති මහ ණ ආරඤ්ඤකනම ඒ ආරඤ්ඤකවීමට කාරණවූ සමාදාන චේතනාව ආර ඤ්ඤකාංගනාම් වන්නේයි ~

වෘක්ෂමූලයෙහි විසීම ස්වභාවකොට ඇති මහණ රුක්ඛමූලිකනාම ඒ රුක්ඛ මූලික වීමට හෙතුවූ සමාදානචේත නාව රුක්ඛමූලිකාංගනාම් වන්නේයි

සෙවනිරහිත අභ්‍යවකාශයෙහි විසීම ස්වභාවකොට ඇති මහණ අබ්භොකාසික නම ඒ අබ්භොකාසි කවීමට හෙතුවූ සමාදාන චේතනාව අබ්භොකාසිකාංග නාම් වන්නේයි ~

සොහොනෙහි විසීම ස්වභාවකොට ඇති මහණ සොසානිකනම ඒ සොසා නිකවීමට හෙතුවූ සමාදාන චේතනාව සොසානිකාංග නම් වන්නේයි ~

මේ සෙනසුන තොපටදෙසා වන් නේයයි පළමුකොට පණවාලද සෙ නාසනය යථාසන්ථත සෙනාසන නම් ඒ යථාසන්ථත සෙනාස්නෙහි විසීම ස්වභාවකොට ඇති මහණ යථා සන්ථතිකනම ඔහුගේ ඒ යථාසන්ථ තිකවීමට හෙතුවූ සමාදානචේතනාව යථාසන්ථතිකාංගනම්වන්නේයි ~

කය හෙලා වැදහෙවීම දුරුකොට නිශද්‍යයෙන් හෙවත් හිඳීම සිටීම ගමන යන තුන්ඉරියව්වෙන් විසීම ස්වභාවකොටඇති මහණ නෙසජ්ජිකනම ඒ නෙසජ්ජිකවීමට හෙතුවූ සමාදාන චේතනාව නෙසජ්ජිකාංග නම් වන්නේයි ~

මෙසේ මේ තෙළෙස්පදයන් අතු රෙන් පංසුකූලයාගේ දරීමය තුන් සිවුරු දරීමය පිණ්ඩපාතය සෙවීමය එකඅස්නෙහිද වැළඳීමය පාත්‍රයෙන් පිඩුගැන්මය පසුබත නොවැළඳීමය අරණ්‍යයෙහි විසීමය වෘක්ෂමූලයෙහි විසීමය අභ්‍යවකාශයෙහි විසීමය සොහොනෙහි විසීමය පළමු උදෙ සාලද සෙනාස්නෙහි විසීමය නිෂද්‍යර්යාපථයෙන් විසීමය යන දෙ ළොස්පෙදෙහි උත්තරපදලොපයෙන් හෙවත් දරීමය සෙවීමය වැළඳීමය ගැන්මය නොවැළඳීමය යනාදි උ ත්තරපද නිරුක්තිනයින් නසාද සප දානචාරිකපදය උත්තරපදය නොන සාද අජී දතයුතු ~

( පා * )

සබ්බානෙව පනෙතානි තෙන තෙ න සමාදානෙන ධුතකිලෙසත්තා ධුත ස්ස භික්ඛුනො අංගානි කිලෙස ධු නනතො වා ධුතන්ති ලද්ධ වොහාරං ඤාණං අංගං එතෙසන්ති ධුතංගානි අථවා ධුතානි ච තානි පටිපක්ඛනිද්ධු නනතො අංගානි ච පටිපත්තියාති පි ධුතංගානි එවං තාවෙත්ථ අත්ථතො විඤ්ඤාතබ්බො විනිච්ඡයො ~ සබ්බා නෙව චෙතානි සමාදාන චෙතනා ලක්ඛණානි වුත්තම්පි චෙතං අට්ඨ කථායං යො සමාදියති සො පුග්ග ලො යෙන සමාදියති චිත්තචෙතසි කා එතෙ ධම්මා සමාදාන චෙතනා තං ධුතංගං යං පටික්ඛිපති තං වත්ථු න්ති ~ සබ්බානෙව ච ලොලුප්පවිද්ධං සනරසානි නිල්ලොලුප්පභාවපච්චුප ට්ඨානානි අප්පිච්ඡතාදි අරියධම්මප

දළ්හානි එව යෙහි ලක්ඛණාදීහි වෙදිතබ්බා විනිච්ඡයො — සමාදානවිධානභෙදාදී ආදිසු පන පචනු සබ්බානෙව ධුතංගානි ධරමානෙ භගවති භගවතොව සන්තිකෙ සමාදාතබ්බානි පරිනිබ්බුතෙ මහාසාවකස්ස සන්තිකෙ තස්මිං අසති ඛීණාසවස්ස — අනාගාමිස්ස — සකදාගාමිස්ස — සොතාපන්නස්ස — තිපිටකස්ස — ද්විපිටකස්ස — එකපිටකස්ස — එකසඞ්ගීතිකස්ස — අට්ඨකථාචරියස්ස — තස්මිං අසති ධුතංගධරස්ස තස්මිම්පි අසති චෙතියංගනං සම්මජ්ජිත්වා උක්කුටිකං නිසීදිත්වා සම්මාසම්බුද්ධස්ස සන්තිකෙ වදන්තෙන විය සමාදාතබ්බානි — අපිච සයම්පි සමාදාතුං වට්ටති එව එත්ථ චෙතියපබ්බතෙ ද්වෙභාතිකත්ථෙරානං ජෙට්ඨභාතු ධුතංගප්පිච්ඡතාය වත්ථු කථෙතබ්බං — අයං තාව සාධාරණකථා —

( ස* )

සබ්බානෙව පනෙතානි, මේ සියලු ධුතාඞ්ගයෝම; පෙත පෙතන සමාදානෙන, ඒ ඒ පාංශුකූලාදි අඞ්ගයන්ගේ සමාදානයෙන්; ධුතකිලෙසතා, නසනලද කෙලෙශයන් ඇතිහෙයින් ( තදංගවශයෙන් ප්‍රහීණ තෘෂ්ණොත්පාදාදි පාපධර්මයන් ඇතිහෙයින් යන අදහසි) ධුතස්ස භික්ඛුනො, පලවූ කෙලෙසුන් ඇති භික්ෂුහුගේ; අංගානි, අංගයෝ නුයි (''ධුතංගානි''යි යොදනු -යම් සමාදානයකින් ඒ කෙලශධූනනය වේද ඒ සමාදානයෝම ඒ ධුතාංග භික්ෂුහුගේ අංගය හයි අභිප්‍රායයි යම් අප්‍රත්ක්සිකෙණෙක් හොවෙත් — එය කීහ — ''ධුතකිසඞ්කිලෙසධූනනං නාතිවෙච ඉධ ධුතස්ස භික්ඛුනො අංගානි 'ති අධිප්පෙතානි න අඤ්ඤානි යානි කානිචි''යි) කිලෙසධූනනතො වා, කෙලෙසුන් නසනහෙයින් හෝ; ධූතනාමිලද්ධවොහාරංලද්ධං, ධූතයයි ලද ව්‍යවහාරඇති නුවණ; අංගං එතෙසන්ති, අංගවූයේ මේ සමාදානයිවනුයි; ධුතංගානි, ඒ සමාදානයෝ ධුතාංගනම්වෙත් (මෙයින් ඒ පාංශුකූලිකාදීන්ගේ සමාදානය ඥානපූර්වකබව කීවෙත් — මෙම කීහ - ''ඤාණං අංගං එතෙසන්ති ඉමිනා ඤාණපුබ්බකත්තං තෙසං සමාදානස්ස විභාවෙති'') අථවා, නොහොත්; ධූතානි ච තානි, ධූතවූවාහු ඔහුවය; පටිපක්ඛ නිද්ධූනනතො, ප්‍රතිපක්ෂයන් නසනහෙයින්; පටිපත්තියා, ශීලාදිසංඛ්‍යාත ප්‍රතිපත්තියට, අංගානිච තානි; අංගවූවාහු ඔහුමනුයි; ධූතංගානි, ධූතංග නම්වෙත්; එවං, මෙසේ; තාව, පළමුකොට; එත්ථ, මේ ධුතාංගයෙහි; අත්ථතො, අර්ථහෙයින්; විඤ්ඤාතබ්බො විනිච්ඡයො, විනිශ්චය දතයුතු; සබ්බානෙව වෙතානි, මේ සියලු ධුතාංගයෝම; සමාදානචෙතනාලක්ඛණානි, සමාදාන චෙතනාව ස්වභාවකොට ඇත්තාහුයි (පරිහරණ චෙතනාවද ධුතාංගමයයි දතයුතු — ''සමාදියති එතෙනා ති සමාදානං සමාදානචෙතනා පවත්තා චෙතනා තං ලක්ඛණං එතෙසන්ති සමාදානචෙතනාලක්ඛණානි'') වුත්තංහි චෙතං අට්ඨකථායං, අට්ඨකථාවෙහි මෙසේ යන ලදුයේමැයි; යො සමාදියති, යමෙක් සමාදන්වේද; සො පුග්ගලො, හේ පුද්ගලයි; යෙන සමාදියති, යමෙක් කාරණකොටගෙණ සමාදන්වේද; චිත්තචෙතසිකා එතෙ ධම්මා, උහු චිත්ත චෙතසිකධර්මයෝයි (මිහි සමාදානක්‍රියාවට සාධකතම බැවින් සමාදානචෙතනා සම්ප්‍රයුක්තධර්මයෝ ''යෙන''යි කාරණභාවයෙන් දක්වනලදහු එසේකල්හි ''යා සමාදානචෙතනා තං ධුතංගං''යි සමාදානචෙතනාග්‍රහණය සුදුසු

පිණ්සාය යත්? චීවරාමූලකහෙයි නැසි දනුයුතු) යා සමාදානචේතනා, යම් සමාදානචේතනාවෙක් ඇද්ද; තං ධුතඞ්ගං, එත් ධුතඞ්ගනම්; යං පටික්ඛිපති, ගෘහපතිදානචීවරාදිය යමක් ප්‍රතික්ෂේප කෙරේද; තං පජහති, ඒ හරනුයෙයි; සබ්බානෙව, සියලු ධුතාඞ්ගයෝම; ලොලුප්පවිද්ධංසනරසානි, තෘෂ්ණාචාර සඞ්ඛ්‍යාත ලොලුප්පවිද්ධංසනය කෘත්‍යකොට ඇත්තාහුයි ("කුසලචණ්ඩස්ස භුසං විලුම්පනට්ඨෙන ලොලුප්පං තණ්හාචාරො තස්ස විධංසනාභිවට්ටනා ලොලුප්පවිධංසනරසානි" යනු ටීකායි) නිල්ලොලුප්පභාවපච්චුපට්ඨානානි, තෘෂ්ණාචාරසඞ්ඛ්‍යාත ලොලුප්පභාවයක් නැතිබව එළවනිම්කොට ඇත්තාහුය; අප්පිච්ඡතාදි, අල්පෙච්ඡතාවාදිවූ; අරියධම්මපදට්ඨානානි, පරිශුද්ධශීලාදි ආර්‍ය්‍යධර්මයන් ආසන්නකාරණකොට ඇත්තාහුය; එවං, මෙසේ; එත්ථ, මෙහි; ලක්ඛණාදීහි, ලක්ෂණාදි වශයෙන්; විනිච්ඡයො වෙදිතබ්බො, විනිශ්චය දතයුතු ("සමාදානවිධානතො ති ආදිසු පන පදෙසුපි එවං විනිච්ඡයො වෙදිතබ්බො" යි කීවෙත්) පංසුකූලිකඞ්ගං, පාංශුකූලිකාඞ්ගය — පෙ — නෙසජ්ජිකඞ්ගං, නෛෂද්‍යිකාඞ්ගය (යන මොහුයි) සබ්බානෙව පනෙතානි ධුතඞ්ගානි, මේ සියලුධුතාඞ්ගයෝම; ධරමානෙ භගවති, භාග්‍යවත්හු ධරමානකල්හි; භගවතො යෙව සන්තිකෙ, භාග්‍යවත්හු සමීපයෙහිම; සමාදාතබ්බානි, සමාදන්විය යුත්තාහුය; පරිනිබ්බුතෙ (භගවත්හු) පිරිනිවිකල්හි; මහාසාවකස්ස සන්තිකෙ, මහාසව්වක්හු සමීපයෙහි ("සමාදාතබ්බානි" යොදනු-මතුයෙහිදු මෙම නියාය) තස්මිං අසති, ඒ මහාසව්වක්හු නැතිකල්හි; ඛීණාසවස්ස, රහත්මහණක්හු ('සන්තිකෙ' යි යොදනු මෙහු පෙදෙහිදු මෙම නියාය "තස්මිං අසති" යනු "අනාගාමිස්ස" යනාදි මෙ පෙදෙහිදු යොදනු) අනාගාමිස්ස, අනාගැමියකුහු; සකදාගාමිස්ස, සෙදගැමියකුහු; සොතාපන්නස්ස, සෝවාන්හු; තෙපිටකස්ස, තුන්පිටකය දන්නාකුහු; ද්වෙපිටකස්ස, දෙපිටකය දන්නාකුහු; එකපිටකස්ස, එක්පිටකයක් දන්නාකුහු; එකසඞ්ගීතිකස්ස, එක් සඞ්ගීතියක් දන්නාකුහු; අට්ඨකථාචරියස්ස, අටුවාඇදුරකුහු (මෙසේ ත් අටුවාචාර්‍ය්‍යම පුහුණුවක්නුවය යනාදුයි) තස්මිම්පි අසති, අටුවාඇදුරකුහු නැතිකල්හි; ධුතඞ්ගධරස්ස, ධුතාඞ්ගධරයකුහු; තස්මිම්පි අසති, ඔහුද නැතිකල්හි; චෙතියඞ්ගනං සම්මජ්ජිත්වා, දාගැබ්අඟන හැමද; උක්කුටිකං නිසීදිත්වා, උක්කුටිකයෙන්හිඳ (එලිල්ලෙන් හිඳ යන අර්ථයි) සම්මාසම්බුද්ධස්ස සන්තිකෙ, බුදුන් සම්පයෙහි; වදන්තෙන විය, කියනුවක්හු මෙන්; සමාදාතබ්බානි, සමාදන්විය යුත්තාහුයි; අපිච, අනිකක්දු; සයම්පි, තමාද; සමාදාතුං, සමාදන්වන්නට; වට්ටතියෙව, වටීමැයි; එත්ථ, මෙ තමා සමාදන්වීමෙහි; ද්වෙභාතිකථෙරානං, දෙබෑතෙරුන් කෙරෙන්; ජෙට්ඨභාතු, වැඩිමහල්තෙරුන්ගේ; ධුතඞ්ගප්පිච්ඡතාය, ධුතාඞ්ගයෙහි අපිස්බැවිනි; වත්ථු කථෙතබ්බං, වත්කියයුතු (ඒ මහතෙරුන්ගේ නෛසජ්ජික බව කිසිවෙක් නොදන්නාහ එක් දවසක් යහන්හි මැදුම්යම පලඟබැඳහුන් හවුන් විදුලිය අලුවෙන් දුක මල්තෙරහු වහන්ස නෛසජ්ජිකයෙක්දැයි පුළුවුන්හු තෙරහු තමන් ධුතඞ්ග අපිස්බැවින් එවිටම වැදහෙව පසුව තුමු සමාදන්වූහ) අයං තාව, මෙ වනාහි; සාධාරණකථා, සියලු ධුතාඞ්ගයන්ට සාධාරණකථායි —

(හා •)

ඒ ධුතාඞ්ගයෝ සියල්ලෙදනම ඒ ඒ ධුතාඞ්ග සමාදන්වන මහණහුගේ තෘෂ්ණාදී පාපධර්මයන් ප්‍රහීණකාරණ අර්ථයෙන් හෝ කෙලෙස් කම්පාකල මහණහුන්ගේ අඞ්ගබැවින් හෝ ධුතාඞ්ග නම් වෙයියි කියනලද්දේයි

මෙහැත්පටන් මෙ මේ දේ කෙරෙමියි නොකෙරෙමියි හෝ ගුවාගෙණ ඒ ඒ අඞ්ග සමාදන්වන මහණහට උපදනා කුශලවිඥානවීථියෙහි සම්ප්‍රයුක්ත චෙතනාවන්ම කෙලෙස් නැසීමට කාරණාවනබැවින් ඒ චෙතනාවෝම මෙහි ධුතාඞ්ගනම් වෙත්වැයි නැවද ඒ ඒ අඞ්ග සමාදන්වන මහණහුගේ ඒ ඒ ව්‍රතය පිළිබඳව පහළවන විඥානවීථිසම්ප්‍රයුක්තවූ ප්‍රඥාචෛතසිකයෝම රාගාදීකෙලෙසුන් නැසීමට කාරණවන බැවින් ඒ ප්‍රඥාචෛතසිකයෝ හෝ ධුතාඞ්ග නම් වෙත්වැයි නොහොත් රාගාදිප්‍රතිපක්ෂධර්ම නසන හෙයින්ද ශීලාදි සම්‍යක් ප්‍රතිපදාවන්ට කාරණවනබැවින්ද ඒ පාංශුකූලධාරණාදිය ධුතාඞ්ග නම් වෙත්මැයි. මෙසේ පළමුකොට තෙළෙස් ධුතාඞ්ගධර්මයෙහි අරුත් විසින් විනිශ්චය දතයුත්තේයි.

මේ සියලු ධුතාඞ්ගයෝම සමාදාන චෙතනාව හෝ පරිහරණචෙතනාව හෙවත් ධුතාඞ්ගසමාදන්ව රක්ෂාකරණතාක් ඒ අරමුණෙහි උපදනා විඥානවීථි පිළිබඳ චෙතනාවන් ලක්ෂණ කොට ඇත්තාහුය මේ කියනලදුයේ වැයි අටුවාවෙහි - යමෙක් ධුතාඞ්ග සමාදන්වේද ඒ පුද්ගලනම යමක් කරණකොටගෙණ සමාදන්වේද ඔහුව විඥානචෛතසිකධර්මනම යම් සමාදාන චෙතනා කෙනෙක්වේද මෙතම ධුතාඞ්ගනම ධුතාඞ්ග සමාදන්වූ පුද්ගල තෙමේ යමක් ප්‍රතිපක්ෂකොටේද එක් වස්තු නම හෙවත් යම්කිසි පුද්ගලයෙක් ධුතාඞ්ග සමාදන්වේනම් මෙතෙම ධුතාඞ්ගධරපුද්ගල නම ඒ සමාදානකාලයෙහි උපදනා විඥානවීථිප්‍රතිබද්ධවූ චෙතනාව පියා සෙසු විඥාන චෛතසිකධර්මයෝ ඒ ධුතාඞ්ගයට හෙතුකාරණා නම, ඒ විඥානවීථිසම්ප්‍රයුක්තවූ චෙතනාචෛතසිකය ධුතාඞ්ග නම ඒ ධුතාඞ්ගධරයා විසින් දුරුකරණලද ගෘහපතිදත්ත චීවරාදිය ධුතාඞ්ග වස්තු නම් වන්නේයි. මේ සියලුධුතාඞ්ගයෝම කුසල්බඩු පැහැරගන්නා තෘෂ්ණාවනැති සොරුන් නැසීම කෘත්‍ය කොට ඇත්තාහුය: එම තෘෂ්ණාවනැමිති සොරුන් නසනබව වැටහීම හෙවත් ඵලකොට ඇත්තාහුය මදකින් සතුටුවීම් ආදී පිරිසිදු ආර්‍ය්‍ය ගුණධර්ම ආසන්නකාරණකොට ඇත්තාහුය මෙසේ ධුතාඞ්ගනිර්දෙශයෙහි ලක්ෂණ රස ප්‍රත්‍යුපස්ථාන පදස්ථාන වශයෙන් විනිශ්චය දතයුතු--

සමාදානවිධානාදිවූ පඤ්චප්‍රකාර විනිශ්චයෙහි අර්ථ මෙසේ දතයුතු කෙසේදයත්? මේ තෙළෙස්ධුතාඞ්ගයෝම සර්වඥයන්වහන්සේ ජීවමානකල්හි උන්වහන්සේ හමුයෙහිම සමාදන් වියයුත්තාහුය භාග්‍යවතුන්වහන්සේ පිරිනිවිකල්හි අසූමහාශ්‍රාවකයන්වහන්සේ අතුරෙන් යම්කිසි මහාශ්‍රාවකයන්වහන්සේකෙනෙකුන් හමුයෙහිද මහාශ්‍රාවකකෙනෙකුදු නැතිකල්හි ක්ෂීණාශ්‍රවමහරහතුන්ගේ හමුයෙහිද ක්ෂීණාශ්‍රවයකුදු නැතිකල්හි අනාගාමී ශ්‍රාවකයෙක් හමුයෙහිද අනාගාමී ශ්‍රාවකයෙකුදු නැතිකල්හි සකෘදාගාමී ශ්‍රාවකයෙකු හමුයෙහිද සකෘදාගාමීකුදු නැතිකල්හි සෝවාන් ශ්‍රාවකයෙක් හමුයෙහිද සෝවානුදු

නැති කල්හි ත්‍රිපිටකධාරි භික්ෂුවක් හමුයෙහිද ත්‍රිපිටකධාරීහුද නැති කල්හි ද්විපිටකධාරි භික්ෂුවක් හමුයෙහිද ද්විපිටකධාරීහුද නැතිකල්හි එක් පිටකයක් දරණ භික්ෂුවක් හමුයෙහිද එක් පිටකයක් දරන්නෝහුද නැති කල්හි එක් සඟීයක් දරණ භික්ෂුවක් හමුයෙහිද එක් සඟීයක් දරණ භික්ෂුව හුද නැති කල්හි අටුවා පෙළම පුහුණුවූ අට්ඨකථාචාර්යයෙකු හමුයෙහිද අට්ඨකථාචාර්යයන්හුද නැති කල්හි ධුතාඞ්ගධර භික්ෂුවක් හමුයෙහිද ධුතාඞ්ගධර භික්ෂුවකුද නැතිකල්හි දාගැබ් මලුව හැමද පෙමි නයේ හමුයෙහි උත්කුටිකාසනයෙන් හිද සම්‍යක් සම්බුදුන්ගේ හමුයෙහි කියා සමාදන්වන්නෙකු මෙන් අඞ්ග සමාදාන කටයුතු බවද ආචාර්යයන්හු නැත්කල්හි තුමූම සමාදන්වන් නටද වටනේමැයි ඒ තුමූ සමාදන්වීමෙහි චෙහානික තෙරුන් අතුරෙන් වැඩිමහල් තෙරුන්ගේ ධුතාඞ්ගාල්පෙච්ඡතාවෙහි කථාවෘත්තාන්තය උදාහරණ කටයුතු. ඒ කෙසේදයත්? මේ ලක්දිව සෑගිරියෙහි එක්තරා ගල්ගුහාවක ඒ දෙබෑතෙරුන් වැඩවසන්නාමෙන් වැඩිමහල් තෙරුන්වහන්සේ නොසජ්ජිකාඞ්ගය රක්ෂාකරන්නාහු කිසිවෙක් නොදන්නාසේක එක් දවසක් මධ්‍යම යාමයෙහි මහතෙරුන්වහන්සේ ආසනයෙහි ඍජුපර්යඞ්කයෙන් වැඩහුන් බව එළුල්ය එලියෙන් දුටු කුල්බෑ තෙරුන්වහන්සේ කිමෙක්ද ස්වාමිනි නුඹවහන්සේ නොසජ්ජිකාඞ්ගය පුරන්නෙහිදැයි ඒවෙලෙහි මහතෙරුන්වහන්සේ තමන් ධුතාඞ්ගයෙහි අල්පෙච්ඡ බැවින් නොයැහැවටීය එකෙණෙහිම වැදහෙව පසුව තුමූ සමාදන්වූහ මේ කථාව සතුව වනානි සියළු ධුතාඞ්ගයන්ටම සාධාරණවන්නේයි මෙවත් ඇදුරෙකු නැතිකල්හි සියළු ධුතාඞ්ගයෝම තමන් විසින් සමාදන්විය යුතුනාහුයි ..

( පා † )

ඉදානි එකෙකස්ස සමාදාන විධාන ප්පභේද භේදානිසංසෙ වණ්ණයිස්සාම පංසුකූලිකඞ්ගං තාව ගහපතිදාන චීවරං පටික්ඛිපාමි පංසුකූලිකඞ්ගං සමාදියාමීති ... ඉමෙසු ද්වීසු වචනෙසු අඤ්ඤතරෙන සමාදින්නං හොති ඉදං තාවෙත්ථ සමාදානං ... එවං සමාදින්න ධුතඞ්ගෙන පන තෙන සොසානිකං පාපණිකං රථියචොලං සඞ්කාරචොලං සොත්ථියං න්හානචොලං තිත්ථචොලං ගතපච්චාගතං අග්ගිදඩ්ඪං ගොඛායිතං උපචිකඛායිතං උන්දූරඛායිතං අන්තච්ඡින්නං දසච්ඡින්නං ධජාහටං ථූපචීවරං සමණචීවරං ආභිසෙකිකං ඉද්ධිමයං පන්ථිකං වාතාහටං දෙවදත්තියං සාමුද්දියන්ති ... එතෙසු අඤ්ඤතරං චීවරං ගහෙත්වා ඵාලෙත්වා දුබ්බලට්ඨානං පහාය ථිරට්ඨානානි ධොවිත්වා චීවරං කත්වා පොරාණ ගහපති චීවරං අපනෙත්වා පරිභුඤ්ජිතබ්බං ...

( ස † )

ඉදානි, දැන්; එකෙකස්ස, එකී එකී ධුතඞ්ගයාගේ; සමාදාන, සමාදන් වීමය; විධාන, විධානය (විධානනු ධුතඞ්ගයෙහි පිළිපදනා විධියි] පභෙද, භින්නාදි ප්‍රභෙදය; භෙද, ධුතඞ්ග බිඳීමය; ආනිසංසෙ, අනුසස්ය යන මොවුන්; වණ්ණයිස්සාම, වර්ණනාකරමු ("පංසුකූලිකඞ්ගං තාව සමාදින්නං හොති" යනු සම්බන්ධයි) ගහපතිදාන චීවරං, ගෘහපතීන් දෙන සිවුරු; පටික්ඛිපාමි, ප්‍රතික්ෂෙප කෙරෙමි; පංසුකූලිකඞ්ගං, පංසුකූලික සිවුරු අඞ්ගය; සමාදියාමීති, සමාදන් වෙමි යන; ඉමෙසු ද්වීසු වචනෙසු, මේ දෙවචනයන් කෙරෙහි; අඤ්ඤතරෙන, එක්තරා වචනයකින්; සමාදින්නං හොති, සමාදන්වන ලද්දේවේ ("ගහ

පතිදත්ත චීවරං" යනුයෙහි දායක බැවින් මහණහුදු උපාසකව ගෘහපති පක්ෂයෙහිම ඇතුළත්වෙත් දව්‍යජීතයෝ ගණින්. හි තබනලද සිවුර ගහපති සිවුර නම්වෙයි ගෘහපතියන් දුන් සිවුර නම් නොවෙයිහුයි එබඳු සිවුර වලන්නට දත ශබ්දය ප්‍රයෝගකලහයි දතයුතු) එවං, මෙසේ; ඉදං, මේ; සමාදානං, සමාදන්වීමයි; එවං, මෙසේ; සමාදින්නධුතඞ්ගෙන, සමාදන්වනලද ධූතාඞ්ග ඇති ඔහු විසින් ("පරිභුඤ්ජිතබ්බං" යනු හා සම්බන්ධ) සොසානිකං, සොහොනෙහි දමූ පිළිය; පාපණිකං, අවුණුදොර දමූ පිළිය; රථියචොළං, අතර වීථියෙහි දමූ පිළිය; සඞ්කාරචොළං, කසළගොඩ දමූ පිළිය; සොත්ථියං, දරු ලදසද ගර්භමල පිසදමූ පිළිය; නහානචොළං, යකැදුරන් යකුන් හුනුවන් නහවා පියාහළ පිළිය; තිත්ථචොළං, නහනතොට දමූ පිළිය; ගතපච්චාගතං, සොහොන් ගියන් නිසුත් නැවත අවුත් නැහැසද පිළිය; අග්ගිදඩ්ඪං, ගින්නෙහි ප්‍රදේශයක් දා පිළිය; ගොඛායිතං, ගෙරින්මුවන් කෑ පිළිය; උපචිකාඛායිතං, වේයන් කෑ පිළිය; උන්දූරඛායිතං, මීයන් කෑ පිළිය; අන්තච්ඡින්නං, අන්තයෙන් සුන් පිළිය; දසච්ඡින්නං, දසායෙන් සුන් පිළිය; ධජාහටං, නැව් නැගෙන වෙළෙඳුන් බැඳි පිළිධ්වජය (යුද්ධ භූමියෙහි බැඳි ධ්වජ හෝ) ථූපචීවරං, බිලිකම් පිණිස තුඹස පිහාල පිළිය; සමණචීවරං, පැවිද්දන් දුන් පිළි සිවුරු; ආභිසෙකිකං, රජුන් අභිෂේක මඩුයෙහි පියාතා පිළිය; ඉද්ධිමයං, එහි භික්ෂු පැවිද්දෙ උපන් සිවුරු; පන්ථිකං, මගහුණු පිළිය; වාතාහතං, වාතයෙන් ගෙණගොස් දුරගොඑයේ; දෙවදත්තියං, දෙවියන් විසින් දෙන සිවුරු; සාමුද්දියන්ති, මුහුදු රළින් දමා ගොඩ පියූ පිළිය යන; එතෙසු, මෙවුන් කෙරෙහි; අඤ්ඤතරං චීවරං ගහෙත්වා, එක්තරා සිවුරක් ගෙන; ඵාලෙත්වා, පලා; දුබ්බලට්ඨානං පහාය, දුර්වල තැන් හැර; ථිරට්ඨානානි, තරතැන්; ධොවිත්වා, සෙදා; චීවරං කත්වා, සිවුරු කොට; පොරාණං ගහපතිචීවරං, පරණ ගෘහපති චීවරය; අපනෙත්වා, හැර; පරිභුඤ්ජිතබ්බං, වැළඳ යුතු.

(භා.‡)

දැන් මතුහි එසේ කී ධූතාඞ්ගයන් හුගේ සමාදන්වීමය පිළිපදනා විධිය හීනාදි ප්‍රභේදය ධූතාඞ්ග බිඳීමය ධූතාඞ්ග ආනිසංසය යන මෙවුන් වෙන් වෙන් වශයෙන් වර්ණනා කරමු. ඔවුන් අතුරෙන් පළමුකොට පංසුකූලිකාඞ්ගය මෙසේ සමාදන් විය යුතු. කෙසේදයත්? ඒ ධූතාඞ්ග සමාදන්වන්නහු විසින් පටකී නියායෙන් සලී ඥාත්වහන්සේ ආදී කොට ඇති මෙවැනි වාහය සොඳුරකොට ඇති යම් තැනකට එළඹ උත්සුටකයෙන් හිඳ "ගහපතිදාන චීවරං පටික්ඛිපාමි පංසුකූලිකඞ්ගං සමාදියාමි" යි ගෘහපතින් විසින් දෙවන් යමක්ස්වෙක් විසින් පිළිගන්වනලද සිවුරු ප්‍රතික්ෂේප කෙරෙමි පංසුකූලික සිවුරු දරණ අඞ්ගය සමාදන් වෙමියි යන මේ වචන වශයෙන් එක්තරා වචනයකින් හෝ වචන වශයෙන්ව හෝ සමාදන්වනලද්දේවෙයි මේ මෙහි සමාදන්වීමයි මෙසේ සමාදන්වනලද ධූතාඞ්ග ඇති ඒ මහණ විසින් සොහොනෙහි නිරුලයට හැරදමූ වස්ත්‍රය සල්පිල් දොරකඩදමූ වස්ත්‍රය ඇතුල් වීථියෙහි දමූ වස්ත්‍රය කසළගොඩ දමූ වස්ත්‍රය ප්‍රසූතිකාවන්ගේ ගැබ්මල පිස දමූ වස්ත්‍රය යකැදුරන් විසින් යකා

වෙගඬුවන් නහවා හැරදමූ වස්ත්‍රය න
හනතොට දමූ වස්ත්‍රය සොසොනට
ගියවුන් ගෙට අවුත් ඉස් සෝද නහා
දමූ ගලිටි වස්ත්‍රය ගින්නෙන් කොන්
දැගිය බැවින් හැරදමූ වස්ත්‍රය ගව මුව
ආදීන් විසින් එක් පෙදෙසක් කෑ බැ
වින් හැරදමූ වස්ත්‍රය වේයන් විසින්
එක් පෙදෙසක් කෑ බැවින් හැරදමූ
වස්ත්‍රය මීයන් විසින් එක් පෙදෙසක්
කෑ බැවින් හැරදමූ වස්ත්‍රය තෙලවර
සුන් බැවින් හැරදමූ වස්ත්‍රය දවළ
සුන් බැවින් හැරදමූ වස්ත්‍රය නැව්
නැගෙණ වෙලදුන් නැව් නගිනකල
මුහුදුවෙරළ තබා තොපෙණෙනා තැ
න හැරදමා යන ධවජ වස්ත්‍රය හෝ
හොත් යුඬභූමියෙහි තබා දෙසෙනග
හැරදමා ගිය ධවජ වස්ත්‍රය බලි පිණි
ස තුඹස වටකොට බැඳ හැරදමූ තිර
වස්ත්‍රය මහණුන් දුන් වස්ත්‍රය රජුන්
ගේ අභිෂෙක මණ්ඩපයෙහි හැරදමූ
වස්ත්‍රය එහි භික්ෂු භාවයෙන් මහණ
වන්න හව සාඬියෙ පහළවන වස්ත්‍ර
ය මාර්ගයෙහි වැටීතුබූ වස්ත්‍රය සුළඟි
න් ගෙණගොස් දුරලූ හිමියන් නැති
වස්ත්‍රය දෙවියන් විසින් දෙනලද වස්
ත්‍රය මුහුදු රළින් ගොඩදමූ වස්ත්‍රය
යනමේ තෙවිස වස්ත්‍රයන් අතුරෙන්
එක්තරා වස්ත්‍රයක් ගෙණ දවිලව දිරා
ගිය තැන් හැරදමා තර වස්ත්‍ර හැබලි
දෙවා සිව්රුකොට කප්බිඳු තැබීම
ආදී සියලු පුජිකානය නිමවා වැලඳ
ගෙණ ඇඹූ පරණ ගෘහපති චීවරය
මුදා මේ පංසුකූල චීවරය දරිය යුත්
තේයි.

(පා ¶)

තත්‍ථ සොසානිකාති සුසානෙ ප
තිතකං — පාපණිකාති ආපණද්වා
රෙ පතිතකං — රථියචොළනති පුඤ්ඤ
ත්‍ථිකෙහි වාතපානෙන රථිකාය
ඡඩ්ඩිතචොළකං — සඞ්කාර චොළනති
සඞ්කාරට්ඨානෙ ඡඩ්ඩිත චොළකං —
සොත්ථියනති ගබ්භමලං පුඤ්ඡිත්වා
ඡඩ්ඩිතවත්ථං — තිස්සාමච්චමාතාකිර ස
තග්ඝනකෙන වත්ථෙන ගබ්භමලං
පුඤ්ඡාපෙත්වා පංසුකූලිකා ගණ්හිස්ස
න්තීති තාලවෙලිමග්ගෙ ඡඩ්ඩාපෙසි
භික්ඛූ ජිණ්ණකට්ඨානත්ථමෙව ගණ්හ
න්ති — න්හානචොළනති යං භූතවෙ
ජ්ජෙහි සසීසං නහාපිතා කාලකණ්ණිචොළනති
ඡඩ්ඩෙත්වා ගච්ඡන්ති — තිත්ථ
චොළනති සිනානතිත්ථෙ ඡඩ්ඩිතපි
ලොතිකං — ගතපච්චාගතනති යං මනු
ස්සා සුසානං ගන්ත්වා පච්චාගතා න
හාත්වා ඡඩ්ඩෙන්ති — අග්ගිදඩ්ඪනති අග්
ගිනා දඩ්ඪපදෙසං තාදිසඤ්හි මනුස්සා
ඡඩ්ඩෙන්ති — ගොඛායිතාදීනි පාකට
ත්තා දීසානි පිහි මනුස්සා ඡඩ්ඩෙ
න්ති — ධජාහටනති නාවං ආරුහන්තා
ධජං බන්ධිත්වා ආරුහන්ති තං තෙසං
දස්සනාතික්කමෙ ගහෙතුං වට්ටති —
යම්පි යුඬභූමියං ධජං බන්ධිත්වා ඨපිතං
තං ද්වින්නම්පි සෙනානං ගතකාලෙ
වට්ටති — ථූපචීවරනති වම්මිකං පරික්ඛි
පිත්වා බලිකම්මකතං — සමණචීවරනති
භික්ඛු සන්තකං — ආභිසෙකිකනති ර
ඤ්ඤො අභිසෙකට්ඨානෙ ඡඩ්ඩිත චීව
රං — ඉද්ධිමයනති එහිභික්ඛු චීවරං —
පන්ථිකනති අන්තරාමග්ගෙ පතිතකං
යං පන සාමිකානං සතිසම්මොසෙන
පතිතං ථොකං රක්ඛිත්වා ගහෙතබ්බං
වාතාහටනති වාතෙන හරිත්වා දූරෙ
පාතිතං තං පන සාමිකෙ අපස්සන්තෙන
ගහෙතුං වට්ටති — දෙවදත්තියනති
යං අනුරුද්ධත්ථෙරස්ස විය දෙවතාහි
දින්නකං — සාමුද්දියනති සමුද්දවීචිහි
ථලෙ උස්සාදිතං —

( ස ¶ )

නන්ත, එනි; සොසානිකන්ති, සොසානික නම්; සුසානෙන, සොසොනාන්හි; පතිතකං, කිසිවෙකුහු විසින් පියුසෙස්සි; පාපණිකන්ති, පාපණික නම්; ආපණවාසෙර, අවුණු දෙර; පතිතකං, කිසිවකුහු විසින් පියුසෙස්සි; පුඤ්ඤත්ථිකෙහි, පින් කැමැත්තවුන් විසින්; වාතපානවාසෙරන, කවුළුදෙරින්; රථිකාය, අතුරුවෙහි (වීථියයි සෙස්සි) ඡඩ්ඩිතචොළං, දමන ලද කඩයි; සඞ්කාරධානෙන, කසළගොඩ; ගබ්භමලං, ගර්භමලය; පුඤ්ඡනිකා, පිස; නහානමච්චනිකා, නහන ඇමෑහානාමවූ; සනඅඞ්ගහාසෙකන වණෙළිත, සියක් අඟනා වස්ත්‍රයෙන්; ගබ්භමලං පුඤ්ඡිත්වා, ගර්භමලය පිසවා; පංසුකූලිකා ගණ්හිස්සන්තීති, පංසුකූලිකයෝ ගණිත්වයි; තාලවේලිමගෙහ (මහගම) තාලවේලි නම් වීථියෙහි (අනුරාධපුරෙහි වීය යෙන්ම) ඡඩ්ඩිතා සෙපසි, දමවාපු; භික්ඛූ, භික්ෂූහු; ජිණ්ණකට්ඨානත්ථමෙව (නමන් අපිස් බැව්හ්) ජීර්ණස්ථාන පිණිසම; ගණ්හන්ති, ගණිත්; භූතවෙජ්ජේහි, යකැදුරන් විසින්; සසීසං නහාපිතා, ඉසින් නහවන ලද්දහු; කාලකණ්ණිචොළන්ති, කාලකණ්ණි චොළයයි (නිසිරිකඩ යුතුනී) යං, යමක්; ඡඩ්ඩෙත්වා, හැර; ගච්ඡන්ති, යෙද්ද ("තං නහානචොළං නාම" යි යොදනු) සිනානතිත්ථෙ, නහනනතොට; ඡඩ්ඩිත පිලොතිකං, හළ කඩරෙද්ද; මනුස්සා, මිනිස්සු; සුසානං ගන්ත්වා, සොහොනාට ගොස්; පච්චාගතා, නැවත ආවාහු; නහාත්වා, නහාපියා; යං ඡඩ්ඩෙන්ති, යමක් දමාපියද්ද (තං ගතපච්චාගතං නාම" යි යොදනු) අග්ගිනා, ගින්නෙන්; දඩ්ඪපදෙසං, දන ලද ප්‍රදෙශයක් ඇත්තේයි; තං, එය; මනුස්සා, මිනිස්සු; ඡඩ්ඩෙන්ති, පියත්; ගොබායිතාදීනි, ගොබායිත යනාදීහු; පාකටාමෙනව, ප්‍රකටවෙයෙමැයි; තාදිසානිහි, එබඳුවූ චීවරයන්; මනුස්සා, මිනිස්හු; ඡඩ්ඩෙන්ති, පියත්; නාවං, නැවට; ආරුහන්තා, නැගෙන්නාහු; ධජං බන්ධිත්වා, ධ්වජය බැද; ආරුහන්ති, නැගෙත්; තං, එය; තෙසං, ඒ වෙළඳුන්ගේ; දස්සනාතික්කන්තමෙ, දර්ශනය ඉක්මුණු කල්හි; ගහෙතුං වට්ටති, ගන්නට වටී; යුද්ධභූමියං, රණබිමෙහි; යං, යමක්, ධජං බන්ධිත්වා ඨපිතං, ධ්වජය බැද තබන ලද්ද; තං, එය; විහාරම්පි සෙනාසනං, දෙසෙනාවම; ගතකාලෙ, ගිය කල්හි; වට්ටති, ගන්නට වටී; වම්මිකං, තුඹස; පරික්ඛිපිත්වා, සිසාරා; බලිකම්මකතං, බිලියම් කරණලද්දෙද්ද; භික්ඛු සන්තකං, මහණුන් සතුයෙයි; රථෙසු, රජහුගේ; අභිසෙකට්ඨානෙ, අභිෂිකත ස්ථානයෙහි; ඡඩ්ඩිතචීවරං, පියනලද චීවරය; එහි භික්ඛූ චීවරං, එහි භික්ෂු ප්‍රව්‍රජ්‍යාවෙන් ආ සිවුරුය; අන්තරාමග්ගෙ, අතුරුමග; පතිතකං, පියනලද්දේය (ඒ බොහෝ දවස් ඉක්මුණ ගතයුතු වේ සමහරු දෙතුන් දවසක් ඉක්මුණ ගතයුතුය යෙත්) යං පන, යමක් වනාහි; සාමිකානං, ස්වාමීන්ගේ; සතිසම්මොසෙන, සිහි නැතිවීමෙන්; පතිතං, හුනුයේද; ථොකං, මඳකලක්; රක්ඛිත්වා, රැකගිද; ගහෙතබ්බං, ගතයුතුයි; වාතෙන හරිත්වා, වාතවේගයෙන් ගෙණගොස්; දූරෙ පාතිතං, දූර හෙලන ලද්දේයි; තං පන, එය වනාහි; සාමිකෙ අපස්සන්තෙන (සිහි මූලාව හුනුවා වැනිතුයි) ස්වාමිහු නොපෙනෙන කල්හි; ගහෙතුං වට්ටති; ගතයුතුවේ; අනුරුද්ධත්ථෙරස්ස විය, අනුරුද්ධ තෙරනට (දෙව්දුව දුන් වස්ත්‍රය) මෙන්; දෙවතා දින්නකං, දෙවියන් විසින් දෙනලද්දයි; සමුද්දවීචි

ති, මුහුදුරළින්; එළෙ, ගෙඩ; උසභා දිනං, නොගණෙලද්දෙදයි—

( ගා ¶ )

ඒ තෙවිසිවසනු අතුරෙරන් සොසාන්කනාම් සොහොනෙහි කිසිවෙකු විසින් හැරපියනලද වස්ත්‍රයි පාපණිකනාම් සල්පිල් දොරකඩ කිසිවෙකු විසින් දමාපියනලද වස්ත්‍රයි. රථියචොළනාම් පින්කැමැත්තන් විසින් යමෙක් ගණ්වයි සිතා ජනෙල්කවුළුවෙන් වීථියට දමාපියනලද වස්ත්‍රයි. සඞ්කාරචොළනාම් නිරාලයව කසළගොඩ දමූවස්ත්‍රයි සොත්ථියනාම් ප්‍රසූතිකාවන්ගේ ගැබ්මල පිසදමූ වස්ත්‍රයි ඒ එසේ වැසි මානම් නුවර තාලවෙළිගෙවන් හාල්වෙළල නාම් වීථියෙහි විසූ තිස්සමාත්‍යායාගේ මව සියයක් අගනා වස්ත්‍රයෙන් ගැබ්මල පිස පියා පංසුකූලිකාඞ්ගධර භික්ෂූහු ගණිත්වයි සිතා තාලවෙලි නාම් වීථියට දමාපිය භික්ෂූහුද ඒ වස්ත්‍ර පාංශුකූලසංඥවෙන් අවුලාගෙණ අපිස්ගුණයෙහි ඇලුනුබැවින් පුරාණ පංසුකූල චීවරයන්ගේ දිරාගියතැන් මඩුලු මැසීමට කඩ කඩගොට ගත්තාහුය කුමක්හෙසිතාය්න්? ඒ මාහැඟි වස්ත්‍රයෙන් සිවුරක්කෙළේ විනම් එහි උපදනා ආශාව මහත් වන බැවිනැයි දතයුතු. නානාචොළනාම් අභ්‍යුදරන් විසින් යසාවෙලවුවන්ට යම් වස්ත්‍රයක් හඳවා මිතෝත්‍රාදකයෙන් හිසපටන් නහවා කාලකානි වස්ත්‍රයයි හැරපියායෙද්ද ඒ වස්ත්‍රයි තාපත්වොළ නාම් නානතොට දමාපාලද වස්ත්‍රයි ගතපච්චාගත නාම් මිනුෂ්‍යයෝ සොහොනානට ගොස් පෙරළා ගෙට ආවාහු ඉස්සෝද නහා යම් වස්ත්‍රයක් හිලිවයයි හැරපියද්ද ඒ වස්ත්‍රයි අග්ගිදඩ්ඪනාම් එක්ප්‍රදේශයක් ගිනෙනන් දූකල මනුෂ්‍යයෝ පරිභෝග නොකොට හැරපියද්ද ඒ වස්ත්‍රයි. ගෙඛායිතාදි නාම් ගෙරින් මුවන්විසින් හෝ මීයන්විසින් හෝ වේයන් විසින් හෝ ප්‍රදේශයක් කෑකල මනුෂ්‍යයන් පරිභෝගයට නුසුදුසුයයි හැරපියන වස්ත්‍රයි. ධජාහට නාම් නැව්නගිනා වෙළෙඳුන් විසින් ඉව්රෙහි නංවා ජෙනගොස් ගොස් හැරදමාපියන ධ්වජවස්ත්‍රහා යුදබිම නගණ කොඩිවස්ත්‍රයි. එන් වනාහි වෙළෙඳුන්ගේ දර්ශනපථය ඉක්මගියකල්හිද යුධභූමියෙහි භාංවනලද ධ්වජය දෙසෙනාග නික්මගියකල්හිද ගනනාට වටගෙන්ය ථූපචීවර නාම් තුඹසවට සිසාර, බිලිකම්කරණපිණිස අදිනලද වස්ත්‍රයි සමණචීවර නාම් භික්ෂූන් සනතක වස්ත්‍රයි ආභිසෙකික නාම් රජහුගේ අභිෂෙක මණ්ඩපයෙහි හැර දමාපියන වස්ත්‍රයි. ඉද්ධිමය නාම් කෘතාධිකාරඇති භික්ෂූන්ගේ රහත්බැව්ලැබිමෙහිදී අහසින් අවුත් වැලෙදගන්නා සිවුරැයි පන්ථික නාම් අතරමග හැර දමාපියනලද වස්ත්‍රයි. ඒ වනාහි බොහෝදවස් ඉක්මව, ගතයුතුය යම් වස්ත්‍රයක් වස්ත්‍රහිමියන්ගේ සිහිමුළාවෙන් අතරමග හුණුයේද ඒ වස්ත්‍රද දෙක්රුකාසිට ගිමියන් නැගත්තේවීනම් ගතයුතුය වාතාහත නාම් සුළං වේගයෙන් ගෙණගොස් දුර දමාපියනලද වස්ත්‍රයි ඒ වස්ත්‍ර වනාහි ස්වාමිහු නොපෙණෙනකල්හිම ගතයුතුයි. දෙවදත්තියනම් අනුරුඩ ස්ථවිරයන්ට දෙව්දූ දුන්වස්ත්‍රයවැනි දෙවතාවන් විසින් දෙනලද වස්ත්‍රයි සාමුද්දියනාම් මුහුදුරළින් ගොඩනගා පියනලද වස්ත්‍රයි—

( ගා ෴ )

යං පන සඞ්ඝස්ස දෙමාති දිනානං චොළක භික්ඛායචා චරමානෙනහි ලද්ධං තානං පංසුකූලං හිසාබුදනේ යම්පි යං චස්සගෙහා ගාහාපෙත්වාදීයනගිසෙ

කාසාය චීවරං වා හොති න තං පංසු
කූලං හොති ගාහෙත්වා දින්නමෙව පං
සුකූලං තත්‍රාපි යං දායකෙහි භික්ඛු
ස්ස පාදමූලෙ නික්ඛිත්තකං තෙන පන
භික්ඛුනා පංසුකූලිකස්ස හත්ථෙ ඨපෙ
ත්වා දින්නං තං එකතො සුද්ධිකං නාම
යං භික්ඛුනො හත්ථෙ ඨපෙත්වා දින්නං
තෙන පන පාදමූලෙ ඨපිතං තම්පි
එකතො සුද්ධිකං යං භික්ඛුනොපි පාද
මූලෙ ඨපිතං තෙනාපි තථෙව දින්නං
තං උභතො සුද්ධිකං යං හත්ථෙ යෙව ඨ
පිතං තං අනුක්කට්ඨචීවරං නාම ඉති
ඉමං පංසුකූල භෙදං ඤත්වා පංසුකූලි
කෙන චීවරං පරිභුඤ්ජිතබ්බන්ති ඉද
මෙත්ථ විධානං — අයං පන පභෙද
තො තයො පංසුකූලිකා උක්කට්ඨො මජ්ඣි
මො මුදූති තත්ථ සොසානිකංයෙ
ව ගණ්හන්තො උක්කට්ඨො හොති
පබ්බජිතා ගණ්හිස්සන්තීති ඨපිතකං
ගණ්හන්තො මජ්ඣිමො පාදමූලෙ
ඨපෙත්වා දින්නකං ගණ්හන්තො මුදු
ති — තෙසු යස්සකස්සචි අත්තනො
රුචියා ගහිතාය ගිහිහිදින්නකං සාදි
තක්ඛණෙ ධුතඞ්ගං භිජ්ජති — අය
මෙත්ථ භෙදො —

( ශ * )

යමසා, යමක්වනාහි; සඞ්ඝස්ස දෙ
මාතිදින්නං, සඟහට දෙන්නයි දෙනල
දද; චොළභික්ඛාය, සාඩිගිමිපිණ්ඩිස;
චරනාතෙක් වා, ඇවිදිනවුන් විසින්
හෝ, ලද්ධං, ලද්දේද; න තං පංසුකු
ලං, ඒ පංසුකුල නම් නොවේ; භික්ඛු
දත්තියමෙව, භික්ෂුදත්තිය චීවරයද; යං,
යමක්; එයස්සයහා ගාහාපෙත්වා වා
දීයන්නී, සඟහට හෝ ගණයට හෝ
දෙන්නවුන් විසින් වසහින් පමුණුවා
දෙනුලැබේද; කෙතාසභාචීවරං වා
හොති, කොනසුන් කරවූවන් විසින්
කෙතාත්හෙිහි වසනුවන්ව වැලදග

නමැත්වැයි දෙනලද කොනසුන් සිවු
රෙක් හෝ වේද; න තං පංසුකූලං,
ඒ පංසුකූල නම් නොවේ; ගාහා
පෙත්වා දින්නමෙව, වසහින් පොප
මුණුවා දෙනලද්දේම; පංසුකූලං, පං
සුකුල නම් වේ; තත්‍රාපි, තොපමු
ණුවා දෙනලද භික්ඛුදත්තියෙහිදු;
යං, යම් සිවුරක්; දායකෙහි, දායකය
න් විසින්; භික්ඛුස්ස, භික්ෂුහුගේ; පාද
මූලෙ නික්ඛිත්තකං, පාමුලෙහි තබ
නලදද; තෙන පන භික්ඛුනා, ඒ මහ
ණහු විසින් වනාහි; පංසුකූලිකස්ස,
පංසුකූලික හට; හත්ථෙ ඨපෙත්වා දි
න්නං, අත්හිතබා දෙනලදද; තං, ඒ
සිවුරය; එකතො සුද්ධිකං නාම, දායක
යා විසින් පාමුල්හි තබා දුන් බැවින්
එකතොසුද්ධික නම් වේ; යං, යමක්,
භික්ඛුනො, භික්ෂුහුගේ; හත්ථෙ ඨපෙ
ත්වා දින්නං, අත්හිතබා දෙනලද්දේද;
තෙන පන භික්ඛුනා, ඒ භික්ෂුව විසින්
වනාහි; පාදමූලෙ ඨපිතං, පාමුල්හි ත
බනලදද; තම්පි, එහෙද; එකතො සුද්ධි
කං, එකතොසුද්ධික නම්වේ; යං, යම
ක්; භික්ඛුනො, භික්ෂුහුගේ; පාදමූලෙ
ඨපෙත්වා දින්නං, පාමුල්හි තබා දෙ
නලදද; තෙනාපි; ඒ භික්ෂුහු විසිනුද;
තථෙව දින්නං, එසේම පාමුල්හි තබා
දෙනලදද; තං උභතො සුද්ධිකං,
(දායකයහි ද දනාගෙන් ද පාමුල්හි ත
බූ බැවින්) උභතො සුද්ධික නම්වේ;
යං, යමක් හත්ථෙ ඨපෙත්වා ලද්ධං;
අත්හි තබා ලබනලද්දේද; හත්ථෙයෙව
ඨපිතං, දෙනකල අත්හිම තබනලද්
දේද; තං, එය; අනුක්කට්ඨචීවරං නා
ම, අනුත්කෘෂ්ටචීවර නම්වේ; ඉති, මෙ
සේ; ඉමං, මේ; පංසුකූල භෙදඤ්ඤ
ත්වා, පාංශුකූලික භෙදය දැන; පංසු
කූලිකෙන, පාංශුකූලිකයා විසින්; චී
වරං, සිවුරු; පරිභුඤ්ජිතබ්බන්ති, වැල
ඳගතයුත්තේයි; ඉදං, මේ; එත්ථ, මෙ
හි; විධානං, පිළිපදනා විධියි; අයං

පන, මේ වනාහි; පභෙදො, විභාගයි; තයො පංසුකූලිකා, පංසුකූලිකයෝ තුන්දෙනෙකි; උක්කට්ඨො, උත්කෘෂ්ටය; මජ්ඣිමො, මැදුමය; මුදුකොහි, මෘදුකයයි; තත්‍ර; ඒ තුන්දෙනාකෙරෙහි; සොසානං යෙව ගණ්හන්තො, සොහොනෙහි පිය්‍ය කඩව ගන්නේ; උක්කට්ඨො නාම හොති, උත්කෘෂ්ට නම්වේ; පබ්බජිතා ගණ්හිස්සන්තීති ඨපිතං ගණ්හන්තො, පැවිද්දෝ ගණ්නෝයි තබා තිබෙලද්ද ගන්නේ; මජ්ඣිමො, මැදුම් නම් වේ ("පබ්බජිතා ගණ්හිස්සන්තීති ඨපිතකං යෙව ගණ්හන්තො මජ්ඣිමො"යි කී බැවින් සොහොනෙහි සෙසු තන්හිදු නොඋදෙසා තිබූවා ගන්නේ උකට්ඨ වේ යැයු සිඩ්සි "සොසානිකං යෙව ගණ්හන්තො" යන මේ වනාහි අති උත්කෘෂ්ට විසින් කියනලදයෙන්) පාදමූලෙ ඨපෙත්වා දින්නකං, මහණක්හු විසින් පාමුල්හි තබාදෙනලද දෙය; ගණ්හන්තො, ගන්නේ; මුදුකො හි, මෘදුක නාම්වේ; තෙසු, ඔවුන් කෙරෙහි; යස්ස කස්සචි, උත්කෘෂ්ටින් කෙරෙහි යම් කිසිවක්හටම; අත්තනො රුචියා බහතියා, තමහට කැමති වීමෙන්; ගිහිනිද්දානකං, ගෘහීන් විසින් දුන්නා, සාදිතබ්බෙණ, ඉවසු කෙණිනිම; ධුතඞ්ගං භිජ්ජති, දුහඟ බිඳේ (මෙහි ය අත්තට දෙමියි ගණුත් දෙඹ නැතැයි කීමෙන්) අයමෙත්ථ භෙදො, මේමෙහි භෙදයි—

---

( ගා * )

යම් වස්ත්‍රයක් වනාහි සොඛ්‍යාගම මදෙ මිහයි සංගෘහකොට හෝ දේද වස්ත්‍ර සිඟීමයින් ඇවිදින්නන් විසින් හෝ ලබනලද්දේද ඒ වස්ත්‍ර පංසුකූල නම් නොවන්නේයි භික්ෂුදානීය විවරයද යම් වස්ත්‍රයක් සඞ්ඝයාහට හෝ ගණයාහට හෝ දෙන්නවුන් විසින් වසයින් පමුණුවා දෙනු ලැබේද එසේම සෙනසුන් කරවූ දායකයන් විසින් ඒ සෙනස්න වසන භික්ෂූන්ට වන්නේයයි කියා දෙනලද්ද ඒ විප්‍රකාර වස්ත්‍රව පංසුකූල නොවන්නේය ඒ භික්ෂූදාන විවරයෙහි හිදූ යම් සිවුරක් දායකයා විසින් භික්ෂූන්ගේ පාමුල්හි තබනලද්ද ඒ මහණ විසින් එම වස්ත්‍රය පංසුකූලිකමහණක්හුගේ අතතබා දෙනලද්ද ඒ විවරය දායකයා විසින් පාමුලතබා දුන් බැවින් එක්පාර්ශවයකින් පිරිසිදුවූ පංසුකූල නම් යම් වස්ත්‍රයක් භික්ෂුහුගේ පාමුල තබා දෙනලද්ද ඒ භික්ෂුව විසිනුදු එම වස්ත්‍රය පංසුකූල මහණක්හුගේ පාමුල තබා දෙනලද්ද එම වස්ත්‍රය ලබන කලද දෙනකල පාමුලම තුබූ බැවින් දෙපාර්ශවයෙන්ම පිරිසිදුවූ පංසුකූල නම් වන්නේයි යම් වස්ත්‍රයක් ලබන කල්හිද දෙනකල්හිද අත්හිම තබා දෙනලද්ද ඒ වස්ත්‍රය අනුත්කෘෂ්ට චීවරනම් වන්නේයි මෙසේ මේපංසුකූලප්‍රභෙද දැන පංසුකූලිකයා විසින් සිවුරැ වැලඳගත යුත්තේයි. මේ මෙහි පිළිපදනා විධියි. මෙතැන්පටන් දක්වනුලබන්නේ ඒපංසුකූලිකාඞ්ගවිභාගයයි කෙසේදයත්? උත්කෘෂ්ටයාය මධ්‍යමයාය මෘදුකයායයි පංසුකූලිකයෝ තුන්දෙනෙක් වෙත්මැයි ඒ තුන්දෙනා අතුරෙන් සොහොනෙහි හැරදමනලද කඩරෙද්ම සොයා සිවුරැකොට වැලඳ ගන්නා මහණ අතිඋත්කෘෂ්ට නම් සෙසු තන්හිද නොඋදෙසා තබනලද වස්ත්‍ර ගන්නා මහණ උත්කෘෂ්ට නම ප්‍රව්‍රජිතයෝ ගණිත්වයි යම්තැනෙක භික්ෂූන් උදෙසා තබනලද වස්ත්‍ර පංසුකූල සංඥාවෙන් ගන්නා මහණ මධ්‍යමනාම යම් භික්ෂුවක් විසින් පාමුල තබා දෙනලද වස්ත්‍රගන්නා මහණ මෘදුක නාම මොවුන් තුන්දෙනා අතුරෙන්

යම් කිසි ධුතාඞ්ගධරයෙක් හට තෙමේ කැමැත්තෙන් තමාපිණිසම ගිහින් විසින් දෙනලද වස්ත්‍රයක් ඉවසූ කල්හිම ධුතාඞ්ගය බිඳෙන්නේයි. මේ මෙහි විභාගයි.

(ආ †)

අයං පන ආනිසංසො පංසුකූල චීවරං නිස්සාය පබ්බජ්ජාති වචනතො නිස්සයානුරූප පටිපත්ති සබ්භාවො පඨමෙ අරියවංසෙ පතිට්ඨානං ආරක්ඛදුක්ඛාභාවො අපරායත්ත වුත්තිතා චොරභයෙන අභයතා පරිභොගතණ්හාය අභාවො සමණසාරුප්පපරික්ඛාරතා අප්පානි චෙව සුලභානි ච තානි ච අනවජ්ජානීති භගවතා සංවණ්ණිතපච්චයතා පාසාදිකතා අප්පිච්ඡතාදීනං ඵලනිප්ඵත්ති සම්මාපටිපත්තියා අනුබ්‍රූහණං පච්ඡිමාය ජනතාය දිට්ඨානුගතිං ආපාදනන්ති.

මාරසෙනවිඝාතාය
පංසුකූලධරො යති
සන්නද්ධකවචො යුද්ධෙ
ඛත්තියො විය සොභති.

පහාය කාසිකාදීනි
වරවත්ථානි ධාරිතං
යං ලොකගරුනා කො තං
පංසුකූලං න ධාරයෙ.

තස්මා හි අත්තනො භික්ඛු
පටිඤ්ඤං සමනුස්සරං
යොගාචාරානුකූලම්හි
පංසුකූලෙ රතො සියාති.

අයං තාව පංසුකූලිකඞ්ගෙ සමාදාන විධානප්පභෙද භෙදානිසංස වණ්ණනා.

——o——

(ස †)

අයං පනානිසංසො, මේ වනාහි අනුසසි; පංසුකූල චීවරං නිස්සාය, පංසුකූලික චීවරය නිසා; පබ්බජ්ජාති වචනතො, පැවිදියයි වදාළ බැවින්; නිස්සයානුරූප පටිපත්ති සබ්භාවො; නිශ්‍රයට නිසිවූ පිළිවෙත් ඇතිබවය (මහණුවම් මිලුයෙහි ආචාර්යයන් විසින් ක්‍රියනලද සතරනිශ්‍රයෙහි තමාම පිළිනකල දෙවනනිශ්‍රයට සුදුසු පිළිවෙත්බව යුතැනි) පඨමෙ අරියවංසෙ, පළමුවන ඉතරීතර අරියවංශයි; පතිට්ඨානං, පිහිටීමය; ආරක්ඛදුක්ඛාභාවො; පංසුකූල චීවරය අලොභනීය බැවින් සිවුරු රක්ෂාවෙහි දුක් නැතිබවය; අපරායත්ත වුත්තිතා, අනුන් අයත් වෘත්ති නැතිබවය; චොර භයෙන, සොරබියෙන්; අභයතා, භය නැතිබවය; පරිභොගතණ්හාය අභාවො, පවසසින්ව එබ බැවින් පරිභොගයෙහි තණ්හා නැති බවය; සමණ සාරුප්පපරික්ඛාරතා, මහණුන්ට සුදුසු පිරිකරබවය; අප්පානිචෙව, මහාර්ඝ නොවන බැවින් අල්පයහ; සුලභානිච, එකතැනකින්ට නොලැබියහැකි බැවින් සුලභයහ; තානිච, ඔහුද; අනවජ්ජානීති, නිරවද්‍යයහයි; භගවතා, භාග්‍යවතුන් විසින්; සංවණ්ණිත, "වණ්ණනාකරණලද; පච්චයතා, පසයක් බවය; පාසාදිකතා, අනුන්ට ප්‍රසාද එළවනබවය; අප්පිච්ඡතාදීනං ඵලනිප්ඵත්ති, අල්පෙච්ඡ භාවාදි හෙතු වෙන් දුහන පරිහරණය නිෂ්පන්නවනබැවින් අල්පෙච්ඡභාවාදීන්ගේ ඵලනිෂ්පත්තියෙක; සම්මාපටිපත්තියා අනුබ්‍රූහණං, දුහන රැක්ම මනා පිළිවෙතින් උපයනු පිණිසනුයි ඔහුයෙහි වන සම්‍යක්පිළිවෙත වඩන්නේය; පච්ඡිමාය ජනතාය, පශ්චිම ජනතායාගේ; දිට්ඨානුගතිං ආපාදනන්ති, මෙම දෘෂ්ටිය අනුවීමට පැමිණවීමයි—

මාරසෙනවිඝාතාය, මරහු හා මාරසෙනාව හසනුපිණිස; පංසුකූලධරො යති, පවුල්සිවුරුදරු තපස්වීතෙමේ; යුද්ධෙ, සංග්‍රාමයෙහි; සන්නද්ධකවචො

බඳනාලද සඝාතාග ඇති; බන්ධනයෙන්
ය, රජෙජකුමෙන්; සොහොන්, සොබෙන්
හි; කාසිකාදීනි, කසිසළු ආදිවූ; චරව
ජ්ජානි පහාය, උතුම් වස්ත්‍ර හැර; ලෝ
කගරුනා යං පංසුකූලං ධාරිතං, ත්‍රි
ලෝක ගුරුහුම්සින් යම් පවුල් සිවුර
ක් දරණ ලදද; තං, ඒ; සො න ධා
රෙය, කවරෙක් නම් නොදරාද (නො
හොත් "යං" යනු යස්මාදර්ථකොට
"යස්මා ලෝකගරුනා පංසුකූලං ධාරි
තං තස්මා සො තං න ධාරයෙ"යි
යොදනු=යෙන් තත් ශබ්දයන් නිත්‍ය සම්
බන්ධ බැවින්) තස්මා, එසේහෙයින්ම (ලෝ
ක ගුරුහුම්සින් දරූ බැවින්ම යුතැති)
භික්ඛු, මහණහොමේ; අපනාමෙනා, තමා
ගේ; පටිඤ්ඤං සම්භුස්සරං (මහණුවමම
ලු වෙමි "ආමගන්ධ"යි ඇජර තෙරු
න් ප්‍රධානකොටඇති සගවැද කළපිළි
න සිහිකරණුයේ; යොගාචාරානු කූල
ෙනි, යොගාවචරයන්ට අනුලෝම්වූ;
පංසුකූලෙ, පවුල් සිවුරෙහි; රමෙතාසි
යා, ඇලෙන් නේයි—

අයං, මේ; පංසුකූලිකාඞ්ග, පාංශුකූ
ලිකාඞ්ගයෙහි; සමාදානවිධානප්පභෙද
හෙදනිසංස වණ්ණනා, සමාදානය
විධානය ප්‍රභෙදය බිඳීමය ආනිසංසය
යන මෙවුන්ගේ සංවණ්ණනායි—

( ගා † )

මින් මතුදක්වනලබන්නේ ඒධුතාඞ්ග
යාගේ ආනිසංසයි ප්‍රව්‍රජ්‍යාභූමියෙහි ආ
චාර්ය උපාධ්‍යායයන් විසින් ඇවැත්නි
තොපගේ ප්‍රව්‍රජ්‍යාව පංසුකූල චීවරය
නිසාව වන්නේයයි අනුශාසනාකළ
බැවින් තමාගේ ආශ්‍රයට සුදුසුවූ ප්‍රති
පත්ති ස්වභාව ඇතිබවය ඉතාරෙනාර
ප්‍රත්‍යයෙන් සතුටුවීමයයි කියනලද ප
ළමුවන ආර්ය වංශයෙහි පිහිටනා බව
ය පංසුකූල චීවරය ලොභ නොකවයු
තු බැවින් සිවුරු රැකීමයයි දුක්
නැති බවය අනුන් අයත් පැවැතුම්
නැති බවය සොරබියෙන් නිර්භය බව
ය විශෙෂයෙන්ම රූක්ෂබැවින් පරිභො
ග තෘෂ්ණා නැති බවය මහණුන්ට සුදු
සු පිරිකරක්වන බවය මදක් අගනා
බැවින් සවල්පයහ එකතැනකින්ම
නොලැබියහැකි බැවින් සුලභයයිනි
රවද්‍යයහයි යනාදීන් භාග්‍යවතුන් වි
සින් වර්ණනාකරණලද ප්‍රත්‍යයක් බව
ය දුටුවන් පහදවන බවය අල්පෙච්ඡ
තාවාදීන්ගේ ඵල නිපදවන බවය මතු
මතුහාගී උපදනා මනා ප්‍රතිපත්තීන් ව
ඩන බවය පශ්චිම ජනතාමුහයා තමා
ගේ ඒ දෘෂ්ටියට අනුව යන බවය යන
මෙතෙක් ආනිසංස ඇත්තාහුය තවද
සෙනා සහිත මරහු නැසීම පිණිස
පංසුකූල චීවරය දරූ මහණ යුධ භූමි
යෙහි බඳනාලද සන්නාහ ඇති ක්ෂත්‍රි
ය රජෙකුමෙන් සොබනේය තුන්
ලෝකාචාර්යවූ භාග්‍යවතුන්වහන්සේ
විසිනුදු උතුම කසීසළු ආදිය අත්හැර
යම් පංසුකූල චීවරයක් දරණලද්දේ
වීනම් ඒ මාහැඟි පංසුකූලය කවරෙක්
නම් නොදරන්නේද දරන්නේමැ
යි. එහෙයින් මේ සසුන්වන් මහණ
තොමේ ප්‍රව්‍රජ්‍යා භූමියේදී ආචාර්ය උපා
ධ්‍යායයන් ප්‍රමුඛකොට ඇති සඞ්ඝ ස
භාව විසින් ඇවැත්නි තොපගේ මේ
ප්‍රව්‍රජ්‍යාව පංසුකූල චීවරය පිණිස ව
න්නේයයි අනුශාසනාකරණකල එ
සේය සවාමිනියි දුන් ප්‍රතිඥාව සිහිකර
මින් යොගාවචරයන්ට අනුලෝම්වූ
පංසුකූල චීවරයෙහි ඇලෙන්නේයි—
මේ පළමුවන පංසුකූලිකාඞ්ගයෙහි ස
මාදන්වීමය පිළිපදනා විධිය ප්‍රභෙදය
බිඳීමය ආනිසංසය යනාදී වර්ණනාක්‍රමය
යි වර්ණනායි—

( පා ‡ )

තදනන්තරං පන තෙචීවරිකඞ්ගං චතුත්ථක චීවරං පටික්ඛිපාමි තෙචීවරිකඞ්ගං සමාදියාමීති ඉමෙසං අඤ්ඤතර වචනෙන සමාදින්නං හොති තෙන පන තෙචීවරිකෙන චීවරදුස්සං ලභිත්වා යාව අඵාසුභාවෙන කාතුං වා න සක්කොති විචාරකං වා න ලභති සූචිආදීසු වාස්ස කිඤ්චි න සම්පජ්ජති තාව නික්ඛිපිතබ්බං නික්ඛිත්තපච්චයා දොසො නත්ථි රජිතකාලතො පන පට්ඨාය නික්ඛිපිතුං න වට්ටති ධුතඞ්ගචොරො නාම හොති ඉදමස්ස විධානං පභෙදතො පන අයම්පි තිවිධො හොති තත්ථ උක්කට්ඨෙන රජනකාලෙ පඨමං අන්තරවාසකං වා උත්තරාසඞ්ගං වා රජිත්වා තං නිවාසෙත්වා ඉතරං රජිතබ්බං තං පාරුපිත්වා සඞ්ඝාටි රජිතබ්බා සඞ්ඝාටිං පන නිවාසෙතුං න වට්ටති ඉදමස්ස ගාමන්ත සෙනාසනෙ වත්තං ආරඤ්ඤකෙ පන ද්වෙ එකතො ධොවිත්වා රජිතුං වට්ටති යථා පන කිඤ්චි දිස්වා සක්කොති කාසාවං ආකඩ්ඪිත්වා උපරි කාතුං එවං ආසන්නෙ ඨානෙ නිසීදිතබ්බං මජ්ඣිමස්ස රජනසාලායං රජනකාසාවං නාම හොති තං නිවාසෙත්වා වා පාරුපිත්වා වා රජනකම්මං කාතුං වට්ටති මුදුකස්ස සභාගභික්ඛූනං චීවරානි නිවාසෙත්වා පාරුපිත්වා වා රජනකම්මං කාතුං වට්ටති — තත්‍රට්ඨක පච්චත්ථරණම්පි තස්ස වට්ටති පරිහරිතුං පන න වට්ටති සභාගභික්ඛූනං චීවරම්පි අන්තරන්තරා පරිභුඤ්ජිතුං වට්ටති තෙචීවරිකස්ස පන චතුත්ථං වට්ටමානං අංසකාසාවමෙව වට්ටති තඤ්ච ඛො විත්ථාරතො විදත්ථි දීඝතො තිහත්ථමෙව වට්ටති ඉමෙසං පන තිණ්ණම්පි චතුත්ථක චීවරං සාදියනක්ඛණෙයෙව ධුතඞ්ගං භිජ්ජති අයමෙත්ථ භෙදො —

( ස ‡ )

තදනන්තරං පන, ඉන්පසු ඉක්බිතිව; තෙචීවරිකඞ්ගං, තෙචීවරිකාඞ්ගය; චතුත්ථක චීවරං, සතරවන සිවුරු (මිහි ගදනට පොරෝණව ඇඳසුවුයේ සතරවන සිවුර නම්වේද දත්කඩ නොහැරියයුතු බැවිනි] පටික්ඛිපාමි, ප්‍රතික්ෂෙප කෙරෙමි; තෙචීවරිකඞ්ගං, තෙචීවරිකාඞ්ගය; සමාදියාමීති, සමාදන් වෙමි යන; ඉමෙසං, මොවුන් අතුරෙන්; අඤ්ඤතර වචනෙන, එක්තරා වචනයකින්; සමාදින්නං හොති, සමාදන්වන ලද්දේවේ; තෙන පන තෙචීවරිකෙන, ඒ තෙචීවරිකයා විසින්; චීවර දුස්සං ලභිත්වා, සිවුරු පිළී ලදින්; යාව, යම්තාක්; අඵාසුභාවෙනවා, අපහසු බැවින් හෝ; කාතුං න සක්කොති, කරන්නට නොපොහොසත්වේද ("යාව විචාරකං වා න ලභති"යි යෙදූ-සිවුරු විචාරන්නක්හු හෝ කරණයේ දන්නක්හු යුතැන්) නලභති, නොලැබේද; සූචිආදීසු වා, ඉදිකටු ආදියෙහි හෝ; කිඤ්චි, කිසිවෙක්; අස්ස, මෝහට; න සම්පජ්ජති, නොසැපයේද; තාව, ඒතාක්; නික්ඛිපිතබ්බං, තිබියයුතු; නික්ඛිත්තපච්චයා දොසො නත්ථි, වස්ත්‍ර සන්නිධිපසයෙන් දොස් නැති (වස්ත්‍ර සන්නිධිද නොවෙයි ධුතඞ්ගද නොබිඳෙයි යුතැනි) රජිතකාලතො පන පට්ඨාය, රඳුකල වනාහි පටන්ගෙණ; නික්ඛිපිතුං නවට්ටති, තබන්නට නොවටී; ධුතඞ්ගචොරො නාමහොති (පරණ සිවුරු හැර මේ සිවුරු වැලඳගණිමියි තබන්නාහුව ධුතඞ්ග නොබිඳෙ තුදු) ධුතඞ්ගසොර නම්වේ; ඉදං, මේ තෙම; අස්ස, මේ තෙචීවරිකාඞ්ගයාගේ; විධානං, විධියි; පභෙදතොපන, ප්‍රභෙද ලෙසින් වනාහි; අයම්පි, මේද; තිවිධො හොති, තුන්වැදෑරුම්වේ; තත්ථ, එහි; උක්කට්ඨෙන, උකටහු විසින්;

රජනකාලෙ, රදනා කල්හි; පඨමං, පළමුකොට; අන්තරවාසකං වා, හඳනා සිවුර හෝ; උත්තරාසඞ්ගං වා, පොරොණා සිවුර හෝ; රජිත්වා, රදා; ඉතරං, අනික් සිවුර; රජිතබ්බං, රැදියයුතු; තං පාරුපිත්වා, ඒ පෙරව; සඞ්ඝාටි රජිතබ්බා, සඟළ රැදියයුතු; සංඝාටිං පන නිවාසෙතුං නවට්ටති, සඟළ වනාහි හඳනාට නොවටී; ඉදං, මේ; අස්ස, මේ තිචීවරිකයාගේ; ගාමන්තසෙනාසනෙ, ගමත් සෙනස්නෙහි; වත්තං, වතයි; ආරඤ්ඤකෙ පන, වල්හි වසන තෙචීවරිකයා විසින් වනාහි; ද්වෙ එකතොධොවිත්වා, දෙසිවුර එක්කොට දෙවා; රජිතුං වට්ටති, රදන්නට වටනාහුය; යථා පන, යම්සේ; කඤ්චි දිස්වා, කිසිවෙක්හු දැක; කාසාවං ආකඩ්ඪිත්වා, සිවුර ඇද; උපරිකාතුං සක්කොති, මතුයෙහි කරන්නට පොහොසත්වේද; එවං, එසේ; ආසන්නෙ, සිවුරට ආසන්න තැන්හි; නිසීදිතබ්බං, හින්දයුතු; රජනසාලායං, රදනා හල්හි; රජනකාසාවං නාමහොති, රදනා සිවුර නම්වෙයි; තං, ඒ; නිවාසෙත්වා, හැඳද; පාරුපිත්වා, පෙරවද; රජනකම්මං කාතුං වට්ටති, රදනකම් කරන්නට වටී; ඛුද්දකස්ස, මාද්දකය හව; සභාග භික්ඛූනං චීවරානි, සභාග මහණුන්ගේ සිවුරු; නිවාසෙත්වා, හැඳ හෝ; පාරුපිත්වා, පෙරව හෝ; රජනකම්මං කාතුං වට්ටති, රදනකම් කරන්නට වටී; තත්‍රට්ඨක පච්චත්ථරණං, තමාසතු නොතමාසතු හෝ හඳනා පොරෝණා පිණිස නොබූවා සෙනාසනයෙහි පසපාරණකොට ඉටනලද සිවුරද; තස්ස, ඕහට; වට්ටති, වටී; පරිහරිතුංපන නවට්ටති (රදනා කලටම අනුදන් බැවින් නිත්‍ය පරිභොග වසින්) පරිභොග කරන්නට නොවටී.

දන්කඩ එපාන් පරිකාරසොළොස්හිමෙසේ පසතරණය දන්කඩය යන දෙසිවුර අතිරෙක සිවුරු තන්හි සිටියාහුදු දූගග නොබිඳිනිඕ අවුවාමෙයහි කීහයිදනායුතු) සභාග භික්ඛූනං චීවරම්පි, සභාග මහණුන්ගේ සිවුරුදු; අනන්තරෙ, අතුරෙහි; පරිභුඤ්ජිතුං, වැළඳගන්නට; වට්ටති, වටී; තෙචීවරිකස්ස පන, තෙසිවුරි හව වනාහි; චතුත්ථං වට්ටමානං, සතරවන සිවුර වටනේ; අංසකාසාවමෙව වට්ටති, දන්කඩම වටී; තඤ්ච ඛො, එද; විත්ථාරතො, පළලින්; විදත්ථි, වියතෙක්ම; දීඝතො, දිගින්; තිහත්ථමෙව, තුන්රියන්වූයේම; වට්ටති, වටී; ඉමෙසං පන තිණ්ණම්පි, මේ තුන්දෙන හට්ම; චතුත්ථ චීවරං සාදියන්තානමෙව, පෙරගත් ආදී බාහිර පිරිකර මිස නමා හඳනා පොරෝණා වස් සතරවන සිවුර ඉවසූ කෙණෙහිම; ධුතඞ්ගම්භිජ්ජති, දුහග බිඳේ; අයමෙත්ථ භෙදො, මේ මෙහි භෙදයි.

( හා ‡ )

පාංශුකූලිකාඞ්ගයට අනතුරුව තෙචීවරිකාඞ්ගයයි හේ කෙසේදයත්? යටකී නයින්ම අඞ්ග සමාදන්වන මහණ විසින් "චතුත්ථක චීවරං පටික්ඛිපාමි තෙචීවරිකඞ්ගං සමාදියාමි" යි අංගකඩ අත්හැර අඳිනට පොරොණට පොහෝනා තුන්සිවුරෙන් වැඩිවූ සතරවන සිවුර ප්‍රතික්ෂෙපකෙරෙම් තෙචීවරිකාඞ්ගය සමාදන්වෙමියි යන මේ වචනයන් අතුරෙන් එක්තරා වචනයකින් හෝ වචන වශයෙන්ම හෝ සමාදන් වනලද්දේවෙයි. ඒ තෙචීවරිකාඞ්ගධර මහණ විසින් සිවුරු පිළියක් ලැබ තමාගේ අපහසුපනින් හෝ සිවුරු කරණ සේ දන් නොහෙණසු නොලැබීමෙන් හෝ හිදිකටු තුල් ආදී උපකරණයෙන් යමක් තැනට අසලපූගීනණ බැවින්

හෝ යම්තාක්කල් වස්ත්‍ර තබාද ඒතාක්කල් දශාභාගි ක්‍රමණයෙන් වන වස්ත්‍ර සන්නිධි ඇවත හෝ ධූතාඞ්ග බිඳීම හෝ නොවන්නේයි. සිවුරුකම් නිමවා රැදූකල පරිභොග නොකොට බහා තබන්නට නොවටනේය. ඉදින් පරණ සිවුර මුදුපියා මේ සිවුර නැවත වැලඳගණිමියි සිතා බහා තබන්නේ වීනම් ඒ මහණහුගේ ධූතාඞ්ගය නොබිඳේනනමුදු ධූතාඞ්ගචෞරනම් වන්නේයි මේ තෙචීවරිකාඞ්ගය සමාදන්වන විධියයි.

ප්‍රභෙද වශයෙන් වනාහි මේ ධූතඞ්ග උත්කෘෂ්ට මධ්‍යම මෘදුක වශයෙන් තුන්වැදෑරුම් වන්නේයි ඒ තුන්දෙනා අතුරෙන් උත්කෘෂ්ට ධූතාඞ්ගධරයා විසින් සිවුරු රඳනකල පළමුකොට අඳනය හෝ පොරෝණය හෝ රඳා එ හැඳගෙණ අනික් සිවුර රැඳියයුතුය ඒ පෙරවගෙණ සඟළ සිවුර රැඳීය යුතුය සඟල සිවුර වනාහි අඳනයමෙන් අඳිනට නොවටනේය මේ තෙචීවරිකාඞ්ගය රක්නා මහණ විසින් ග්‍රාමාන්ත සෙනාසනයෙහි කටයුතු වත් ක්‍රමය වන්නේයි.

වනාගෝශී වසන තෙචීවරිකයා විසින් පොරෝණය සඟලය යන දෙසිවුර එකවිට දෙවා රැඳියයුත්තේය. එනමුදු වුවත් ඒ සිවුරු රඳ රැඟැණෙහි දවා පෙහෙ සිදෙනහාක් යම්සේ කිසිවෙක් දුටුකල වහා සිවුරු ඇඳ ශරීරය වත්තෙහි දමාගත හැකි වේද එසේ ලංව් තුඳුරු නැනක හිඳිය යුත්තේය මධ්‍යම ධූතාඞ්ගධරයා හට සිවුරු රඳනහල සිවුරු රඳන භික්ෂුන්ට තාවකාලිකවශයෙන්හැඳීම පෙරවීම පිණිස සැදූහැවතුන් විසින් තබනලද සිවුරු හැඳ පෙරවගෙණද සිවුරු රඳනට වටනේය මෘදුක ධූතාඞ්ගධරයාහට සභාග යහලු භික්ෂුන්ගේ සිවුරු ඉල්වා හැඳ පෙරවගෙණ සිවුරු රඳනටද වටනේය නමාසතුවූ යෝ නුවූ හෝ හැඳනා පොරෝණා පිණිස නොඉටා සෙනස්නෙහි පසතුරුණු වශයෙන් ඉටනලද සිවුරුද ඒ මෘදුකයා හට වටනේය එනමුදු වුවත් සිවුරු රඳනාකල මුන් සෙසු නෑනා ගෙණයාම් ආදියෙන් පරිභොග නොකටයුත්තේයි. සභාග යහලු භික්ෂුන්ගේ සිවුරුද අනරතුරෙහි ප්‍රත්‍යයක් ඇතිකල වැලඳගන්නාට වටනේයි මේ තෙචීවරිකාඞ්ගධර මහණහට තුන්සිවුරෙන් වැඩිවූ සතරවන සිවුරක් වශයෙන් අංශකාඩ මුත් සෙසු අඳනයආදී තුන්සිවුරු අතුරෙන් යමක් නොවටනේමැයි ඒ අංශකාඩ පුළුලින් වියතක්හා දිගින් තුන්රියනක්ද වටනේයි මේ උත්කෘෂ්ට මධ්‍යම මෘදුක වශයෙන් තුන්වැදෑරුම්වූ ධූතාඞ්ගධරයෝම සතරවන සිවුරක් නමා පිණිස ඉවසු කෙණෙහි ධූතාඞ්ගය බිඳේත්නේවෙයි මේ මෙහි ප්‍රභෙද වන්නේයි.

---

( පා ළි )

අයං පන ආනිසංසො තෙචීවරිකො භික්ඛු සන්තුට්ඨො හොති කායපරිහාරිකෙන චීවරෙන තෙනස්ස පක්ඛිනො විය සමාදායෙව ගමනං අප්පසමාරම්භතා වත්ථසන්නිධි පරිවජ්ජනං සල්ලහුකවුත්තිතා අතිරෙක චීවරලොලුප්පප්පහානං කප්පියෙපි මත්තකාරිතා සල්ලෙඛවුත්තිතා අප්පිච්ඡතාදීනං ඵලනිප්ඵත්තීති එවමාදයො ගුණා සම්පජ්ජන්ති.

අතිරෙක වත්ථ තණ්හං
පහාය සන්නිධි විවජ්ජිතො ධීරො
සන්තොස සුඛරසඤ්ඤූ
තිචීවරධරො භවති යොගී

තස්මා සපත්තචාරවතො
පක්ඛිව සචීවරෙ ච යොගිවරෙ
සුඛමනුච්චරිතුකාමො
චීවරනියමෙ රතිං කයිරාති.

අයං තෙචීවරියඞ්ග සමාදාන විධානප්පභෙද භෙදානිසංසවණ්ණනා.

---

( ස ¶ )

අයමෙත්ථ, මේ වනාහි; ආනිසංසො, අනුසසී; තෙචීවරිකො භික්ඛු, තෙසිවුරිදහණහෙම; කායපරිහාරිකෙන, වාතාතපයෙන් කායපරිහරණයකරණ චීවරෙන, සිවුරෙන්; සන්තුට්ඨො හොති, සතුටුවේ; තෙන, එහෙයින්; අස්ස, උහුගේ; පක්ඛිනොවිය, පක්ෂියකුහු මෙන්; සමාදාය එව, ගෙණම; ගමනං, යාමය; අප්පසමාරම්භතා, මදකිස ඇතිබවය; වත්ථසන්නිධි පරිවජ්ජනං, වස්ත්‍රසන්නිධිය දුරුකිරීමය; සල්ලහුකවුත්තිතා, ලුහුවූ ප්‍රවෘත්තිඇතිබවය; අතිරෙකචීවර ලොලුප්පප්පහාණං, තුන්සිවුරෙන් වැඩි චීවරයෙහි ලොල්බව පැහීමය; කප්පියෙපි මත්තකාරිතා නිසිදනාදී අනුදන් බොහෝ සිවුරු ඇතද තුන්සිවුරුපමණෙහි සිටිබැවින් කැපයෙහිදු මාත්‍රකාරිබවය; සල්ලෙඛවුත්තිතා, සලෙල් පැවතුම්ඇති බවය; අප්පිච්ඡතාදීනං, අල්පෙච්ඡාවාදීන්ගේ; ඵලනිප්ඵත්ති, ඵලනිෂ්පත්තිය යන; එවමාදයො ගුණා, මේ ආදීගුණයෝ; සම්පජ්ජන්ති, නිෂ්පන්නවෙත්.

අතිරෙකවත්ථතණ්හං පහාය, තුන් සිවුරෙන් වැඩි සිවුරෙහි තෘෂ්ණාව දුරුකොට; සන්නිධිපරිවජ්ජිතො, වස්ත්‍ර සන්නිධින්වර්ජිතවූ; ධීරො යොගී, ධීරවූ යොගීහෙම; සන්තොසසුඛ රසඤ්ඤූ, සන්තොසසුඛයෙහි රසදන්නේ, තිචීවරධරො; තුන්සිවුරුදරවේ;

තස්මා, එහෙයින්; සපත්තචාරවතො, පතුරවනසන්හාවූ (සපක්ෂයුතානී) පක්ඛිව, පක්ෂියකුමෙන්; සචීවරොව, තුන්සිවුරු සහිතවූම; යොගිවරො, යොගීවරයහෙම; සුඛං, සුවසේ; අනුච්චරිතුකාමො, ඇවිදිනාකැමැත්තේ; චීවරනියමෙ රතිං කයිරා, සිවුරු නියමයෙහි (තුන්සිවුරෙහිය යුතුනී) ඇලුම් කරන්නේයි.

---

( භා ¶ )

මේ මතුදක්වන්නේ ආනිසංසයි. කෙසේදයත්? තෙචීවරිකාඞ්ගධර මහණහෙම් කය වැළඳගෙණ හැසිරෙණ තුන්සිවුරෙන්ම සතුටුවෙයි එහෙයින් පක්ෂියෙක් යනකල ඔහුගේ පියාපත් ශරීරයෙහිම වැළඳගෙණ යන්නාක්මෙන් මේ මහණහෙද සැහැල්ලු ගමන් ඇතිබවය සවල්ප කටයුතු ඇතිබවය වස්ත්‍රසන්නිධියෙන් එන ඇවැත් දුරුකිරීමය ලුහුවූ පැවැතුම් ඇතිබවය තුන්සිවුරෙන් වැඩිසිවුරෙහි තෘෂ්ණාව නැතිකිරීමය භික්ෂූන්ට කැපවූ නිසිදනාදී නොයෙක් සිවුරුඇතත් ඒ කැපයෙහි පවා අපිස්ගුණ හපයනුපිණිස පමණ දැන පරිභොග කරණබවය සැහැල්ලු පැවතුම් ඇතිබවය අල්පෙච්ඡාවාදීන්ගේ ඵල නිෂ්පත්තිය යන මේ ආදිගුණයෝ සම්පූර්ණවෙත්මැයි.

තුන්සිවුරෙන් වැඩිසිවුරෙහි තෘෂ්ණාව හැර වස්ත්‍රසන්නිධියෙන් දුරුවූ ධෛර්‍ය්‍යවත්වූ සන්තොෂසුඛයාවයයි කියනලද මදයින් සතුටුවන සැපයෙහි රස දන්නාවූ යොගාවචර මහණහෙම් තෙචීවරිකාඞ්ගධර වන්නේයි.

ඒහෙයින් පියාපත් පමණකින් යුක්තව යන්නාවූ පක්ෂියකුමෙන් සැපසේ හැසිරෙණු කැමැත්තාවූ තුන්

සිවුරු පමණක් දරණ යොගාවචරම ගණ්ගෙතමේ තෙචීවරිකාඞ්ගයෙහි ඇලුම්කරන්නේයි. මේ තෙචීවරිකාඞ්ගයෙහි සමාදන්වීමය පිළිපදනා විධිය විභාගය භෙදය ආනිසංසය යන පඤ්චයන්ගේ වර්ණනායි.

—— ෦ ——

( පා * )

පිණ්ඩපාතිකඞ්ගම්පි අතිරෙකලාභං පටික්ඛිපාමි පිණ්ඩපාතිකඞ්ගං සමාදියාමීති. ඉමෙසං අඤ්ඤතරවචනෙන සමාදින්නං හොති තෙන පන පිණ්ඩපාතිකෙන. සඞ්ඝභත්තං උද්දෙසභත්තං නිමන්තනං සලාකභත්තං පක්ඛිකං උපොසථිකං පාටිපදිකං ආගන්තුකභත්තං ගමිකභත්තං ගිලානභත්තං ගිලානුපට්ඨාකභත්තං විහාරභත්තං ධුරභත්තං වාරභත්තන්ති එතානි චුද්දස භත්තානි න සාදිතබ්බානි. සචෙ පන සඞ්ඝභත්තං ගණ්හථාති ආදිනා නාමෙන අවත්වා අම්හාකං ගෙහෙ සඞ්ඝෙ භික්ඛං ගණ්හති තුම්හෙපි භික්ඛං ගණ්හථාති වත්වා දින්නානි හොන්ති තානි සාදිතුං වට්ටන්ති සඞ්ඝතො නිරාමිස සලාකාපි විහාරෙ පක්කභත්තම්පි වට්ටති යෙවාති. ඉදමස්ස විධානං. පභෙදතො පන අයම්පි තිවිධො හොති තත්ථ උක්කට්ඨො පුරතොපි පච්ඡතොපි ආහට භික්ඛං ගණ්හාති පත්තද්වාරෙ ඨත්වා පත්තං ගණ්හන්තානම්පි දෙති පටික්කමනං ආහරිත්වා දින්න භික්ඛම්පි ගණ්හාති තං දිවසං පන න නිසීදිත්වා භික්ඛං ගණ්හාති මජ්ඣිමො තං දිවසං නිසීදිත්වාපි ගණ්හාති ස්වාතනාය පන නාධිවාසෙති මුදුකො ස්වාතනායපි පුන දිවසායපි භික්ඛං අධිවාසෙති තෙ උභොපි සෙරිවිහාරසුඛං න ලභන්ති උක්කට්ඨො පන ලභති එකස්මිං කිරගාමෙ අරිය

වංසො හොති උක්කට්ඨො ඉතරෙ ආහ ආයාමාවුසො ධම්මසවණායාති තෙසු එකො එකෙනම්හි භන්තෙ මනුස්සෙන නිසීදාපිතොති ආහ. අපරො මයා භන්තෙ ස්වාතනාය එකස්ස භික්ඛා අධිවාසිතාති එවං තෙන උභොපි පරිහීණා ඉතරො පාතොව පිණ්ඩාය චරිත්වා ගන්ත්වා ධම්මරසං පටිසංවෙදෙසි. ඉමෙසං තිණ්ණම්පි සඞ්ඝභත්තාදිකං අතිරෙකලාභං සාදිතක්ඛණෙ එව ධුතඞ්ගං භිජ්ජති අයමෙත්ථ භෙදො.

( ස * )

පිණ්ඩපාතිකඞ්ගම්පි, පිණ්ඩපාතිකාඞ්ගය ද; (අතිරෙකලාභං, පිණ්ඩපාතලොප භොජනයෙන් වැඩිලාභය (සඞ්ඝභත්තාදිය යුතැනි)පටික්ඛිපාමි, පිළිකෙව් කෙරෙමි; පිණ්ඩපාතිකඞ්ගං සමාදියාමි; පිඩපාතිකාඞ්ගය සමාදන්වෙමි; ඉමෙසං අඤ්ඤතර වචනෙන, මොවුන්ගෙ කෙරෙන් එක්තරාවචනයකින්; සමාදින්නං හොති, සමාදන්වනලද්දෙවේ; තෙනපන පිඩපාතිකෙන, ඒ පිඩපාතිකයා විසින් (සමාදනතබ්බානි යනු හා සබඳ) සඞ්ඝභත්තං, සියලු සඟනට දියයුතු බතය; උද්දෙසභත්තං භික්ෂූන් ස්පදෙනෙකු උදෙසා දියයුතු බතය; නිමන්තනං, සඟනටවත් පුහුලනටවත් නිමන්ත්‍රණයකොට දෙන බතය; සලකාභත්තං, ලඟ බතය; පක්ඛිකං, එක්පක්‍ෂයක එක්දවසක් දියයුතු බතය; උපොසථිකං, පොහොය පොහොයෙහි දියයුතු බතය; පාටිපදිකං, පෑලවිය දියයුතු බතය; ආගන්තුකභත්තං, ආගන්තුක භික්ෂූන්ට දියයුතු බතය; ගමිකභත්තං, ගමන් යනවුන්ට දියයුතු බතය; ගිලානභත්තං, ගිලනුන්ට දියයුතු බතය; ගිලානුපට්ඨාකභත්තං, ගිලනුන්ට උපස්ථානකරණුවන්ට දෙන බතය;

විහාරගතානං, වෙහෙර උදෙසා දෙද නාබතය ( නොහො කාරමු සඟසතු අව සාන මිසන්හැවුන්ට දෙන කුටිහතානා යද මෙනිම ඇතුළත් වේයත් ) ධුරගතානං, සඟනාවන් ප්‍රමුඛලනවූන් ධුරබත් දෙමිසී නිත්‍යනෙත්දෙනා බතය ( ජනයාගැණනලඟගති තබා සඟනට දෙන බත්යෙන්මය යනුද තන්තසී-ටිකාවෙහි වනාහි "ධුරගෙහෙ එව ඨපෙතබ්බ, දෘතබ්බං භතානං ධුරභතානං" යි කීහු) වාරභතානං, ගම්වැසි ආදීන් වාරයෙන්දෙන බතය යන; එතානිමුද්ද සගනානාති, මේ තුදුස් බත්හු; නකාදි තබ්බානි, නොඑවසිය යුතුතාහු; ස චෙපන, ඉදින්; සඞ්ඝභතානං ගණික ඨානි ආදිනානාහයෙන, සඞ්ඝභතානං ග ණිතඨ-යනාදි නයින්; අවත්වා, නො කියා; අම්හාකං නෙනෙන, අපගේගෙනි; සඞ්ඝා භික්ඛංගණ්හාති, සඟහිඤාව ගන්නේය; තුම්හෙපි, තෙපිද; භික්ඛං ගණ්හථාති වත්වා, භික්ෂාව ගණුවසි කියා; දීනකාති හොන්ති, දෙනලඥහු වේද; තානි, ඔවුන්; කාදිතුං, ඉවස නනාව; වට්ටති (භික්ෂාතාෂයෙන් කී හෙයින්) වේ; සඞ්ඝතො, සඟහුගෙන රෙන්; නිරාමිසසලාකා, ආමිසකැලිමිස සෙසු තුන්කැලිම්වූ ලහාද; විහාරෙ පකාගතානම්පි, වෙහෙරද්ම පිසවා දෙන බතද; වට්ටති චෙවාති, වට නේමයයි; ඉදං, මේ; අසස, මේහු ගේ; විධානං, විධිය; පභෙද තොපන, ප්‍රභෙදයෙහින් වනාහි; අයම්පි, මේද, නිච්චෙධා හොන්ති, ත්‍රිවිධවේ; කථං, කුමන්කාරෙන්; උක්කට්ඨො, උත්කට; පුරතොපි, පෙරටින්ද; පච්ඡතොපි, පස්සෙන්ද; ආහටභික්ඛං ගණ්හාති, ගෙණා භික්ෂාවගණී; පත්තද්වාරෙ ඨත්වා, හමුවූ දොරසිට; පත්තං ගණ්හන්තාන ම්පි, පාත්‍රය ගන්නාවුන්ටද; දෙති, දේ; පටික්කමනං, බේ‍රුත්හල්; ආහරිත්වා

දිනානාභිකාඛම්පි (පයගෙණගොස් බත් ඇවිස) ගෙණඅවුත් දුන් භික්ෂාවද; ගණ්හාති, ගණී; තංදිවසංපන නිසී දිත්වා භික්ඛං න ගණ්හාති, එහෙත්සේ ජ්ඩුපණ්ස හොවැඩියමැතව මෙහෙ රටම අහරගෙනණීගහීයනා උපාසක යන්ගේ බස් ඉවසා එදවස් හිඳ නො ගණී; මජ්ඣිමො, මැදුම්; තං දිවසං, එදවස්; නිසීදිත්වාපි ගණ්හාති, හිදදය ණී; සවාතනාය පන, සෙට පිණිස ව නාති; නාධිවාසෙති, නොඉවසා; මු දුකො, මෘදුකෙනමේ; සවාතනායපි, සෙටදවස පිණිසද; පුනදිවසායපි, අ නික්දවස පිණිසද; භික්ඛං, භික්ෂාව; අධිවාසෙති, ඉවසා; තෙ උභොපි, තිද නියාව ගන්නේද සෙවයට අන්ත්ද වසට ඉවසන්නේද යන දෙදෙනම; සෙරිවිහාරසුඛං නලභන්ති, සෙරිවි හාරසුඛය නොලබත් (අනුන් අයත් නොව වසන බවය යන සුව නො ලබත් යුතැනි) උක්කට්ඨොව, උත්කට; ලභති, ලබා; එකස්මිං කිර ගාමෙ, එක්තරා ගමෙක්හි; අරියවංසො හොති ආර්යවංශ සූත්‍ර ප්‍රතිසංයුක්ත ධර්මකථාවෙක් වේ; උක්කට්ඨො, උත්කටයෙම්; ඉතරෙ, සෙස්සන්ට (මජ්ඣිම මුදුක දෙදෙනාහට යුතැනි) ආහ, කීයේ; ධම්මසවණාය, බණ අසනුපිණිස; ආයාමාවුසොති, ඇවැ ත්නි යම්හයි; තෙසු, ඔවුන්කෙරෙ න්; එකො, එක්මහණෙක්; භන්තෙ, වහන්ස; එකෙන මනුස්සෙන, එක් මිනිසෙකු විසින්; නිසීදපිතොම්හි, හි ඳුවනලදෙම්යි; ආහ, කී;අපරො, අනි කා; භන්තෙ, වහන්ස; මය්හං, මාවිසින්; සවාතනාය, සෙටදවස පිණිස; එක සස, එකෙක්හුගේ; භික්ඛා, භික්ෂාතො මේ; අධිවාසිතානි, ඉවසනලදුයි කී; එවං, මෙසේ; තෙ උභො, ඔහු දෙදෙ නම; පරිහීණා, දහම්දෙරෙසන් පිරිහු

ණාහ; ඉතරො, අනික්උකාට; පාතො ච, උදෙසන්හිම; පිණ්ඩාය චරිත්වා, පිඬු පිණිස ගොස්; ගන්ත්වා, බණ අසනපිණිස ගොස්; ධම්මරසං පටිසංවෙදෙසි, ධර්මයුක්තවූ ප්‍රමොද්‍යාදිරසය අනුභවකෙළේයි; ඉමෙසම්පාන තිණ්ණම්පි, මේ තුන්දෙනාහටම; සඞ්ඝභත්තාදි අතිරෙකලාභං, සඞ්ඝභත්තාදිවූ අතිරෙකලාභය; සාදිතබ්බමෙව, ඉවසුකොටෙණහිම; ධුතඞ්ගං භිජ්ජති, ධුතඟ බිඳේ; අයමෙත්ථ භෙදො, මේ මෙහි භෙදයි.

( හා * )

තෙචීවරිකාඞ්ගයට අනතුරුව පිණ්ඩපාතිකාඞ්ග යයි ඒ අඞ්ගය සමාදන්වන මහණු විසින් විධිවූ පරිද්දෙන් "අතිරෙකලාභං පටික්ඛිපාමි පිණ්ඩපාතිකඞ්ගං සමාදියාමි" යි පිණ්ඩපාතිකඅඞ්ගය සමාදන් වෙමි අතිරෙක ලාභ ප්‍රතික්ෂෙප කෙරෙමි යන මේ වචන අතුරෙන් එක්තරා වචනයකින් හෝ වචනවලයෙන්ම හෝ සමාදන්වනලද්දේවෙයි. ඒ පිඩපාතිකාඞ්ගධර මහණු විසින් නො ඉවසිය යුතුබත්නම් සඟසතුකොට දෙන බතය භික්ෂූන් කීපදෙනෙක් උදෙසා දෙන බතය සඞ්ඝයාට හෝ භික්ෂූන් කීපදෙනෙකුට හෝ ආරාධනාකොට දෙන බතය කැඩපත්දමා ලබාගත් නාලහබතය පක්ෂයකට එක්දිනක් පාසා දෙන බතය පොහොයක් පාසා දෙන බතය පැලවියක් පාසා දෙන බතය ආගන්තුක භික්ෂූන්ට දෙන බතය ගමන්යනවුන්ට දෙන බතය ගිලනුන්ට දෙන බතය ගිලන් උවටැන්කරණුවන්ට දෙන බතය විහාරය උදෙසා නෙවත් තමාකරවූ සඟරමෙහි වසනුවන්ට වේවයි දෙන බතය සඞ්ඝයාට හෝ පුද්ගලයාට හෝ නිත්‍යයෙන් දෙන ධුරබතය ගම්වැසියන් විසින් වාරවශයෙන් දෙන ධුරබතය යන මේ තුදුස්බත් නො ඉවසියයුත්තාහුය. ඉදින් දායකයන් විසින් සඟසතුබත් පිළිගණුවයි යනාදින් නොකියා සවාමිනි අපගේ ගෙහි සඞ්ඝයා භික්ෂාව ගන්නේය නුඹවහන්සේද අවුත් භික්ෂාව පිළිගණුවයි කියාදෙනලද්දනුද ඒ බත භික්ෂානාමයෙන් කී බැවින් පිළිගන්නට වටනේය සඞ්ඝයාකෙරෙන් ලබනලද බෙහෙත්බඩු ආදියෙන් යුක්තවූ යාමකාලික සත්තාහකාලික යාවජීවික යන ත්‍රිවිධකාලික සලාකයෝද දායකයන් අවුත් විහාරයේදීම පිසවාදෙන බතද මේ පිණ්ඩපාතිකාඞ්ගධර මහණහට පිළිගන්නාටවටනේ මැයි— මේ පිණ්ඩපාතිකාඞ්ගයාගේ විධානයි.

ප්‍රභෙදවශයෙන් වනාහි මේ ධුතාඞ්ගයද උත්කෘෂ්ට මධ්‍යම මෘදුක වශයෙන් තුන්වැදෑරුම් වන්නේයි ඔවුන්අතුරෙන් උත්කෘෂ්ට ධුතාඞ්ගධර තෙමේ පෙරටුවෙන් හෝ පසුභාගයෙන් හෝ ගෙණනලද භික්ෂාව පිළිගන්නේය ඉදිරියට හමුවූ දොරටුවෙහි සිට පාත්‍රය ගන්නවුන්ටද පාත්‍රය දෙන්නේය පාත්‍රය බොජුන් හලට ගෙණගොස් ගෙණවුත් දෙන භික්ෂාවද පිළිගන්නේය දායකයන් විසින් සවාමිනි අද පිඬුපිණිස නොවැඩිය මැනව මෙහෙරටම භික්ෂාව ගෙනෙම්හයි කියනලදුවවනය ඉවසා එදවස් විහාරයෙහිද භික්ෂාව පිළිනොගන්නේය.

මධ්‍යම ධුතාඞ්ගධර මහණතෙමේ දායකයන් විසින් කරණලද එබඳු ආරාධනාවක් ඉවසා එදවස පමණක් විහාරයෙහිද භික්ෂාව පිළිගන්නේය එනමුදුවූවත් සෙටදවස පිණිසත් එන්නම පිළිගණුවයි කරණ ආරාධනාව නොඉවසන්නේය මෘදුක ධුතාඞ්ගධර තෙමේ සෙටදවසද අනිද්දදවසද යන දෙදවසම දායකයන්ගේ ආරාධනා ඉවසන්නේය මොවුන් අතු

ගෙරන් ඒ දවසට පමණක් ආරාධනා ඉවසන මධ්‍යමයාද පසට අනිද්ද දෙදවසට ආරාධනා ඉවසන මෘදුකයාද යන මේදෙදනම අනුන් අයත් නොවූ පැවැත්මෙන් ලැබියයුතු සැපය නොලබන්නේය උත්කෘෂ්ටයා වනාහි ඒ පෙරිවිහාර සැපය ලබන්නේහි. ඊට උදාහරණ කවරේදයත්? එක් සමයෙක්හි එක්තරා ගමෙක ආර්‍ය්‍යවංශ සූත්‍ර ප්‍රතිසංයුක්ත ධර්මදේශනාවක් වීය. එසමයෙහි උත්කෘෂ්ට පිණ්ඩපාතිකාඞ්ගධර තෙරුන්වහන්සේ මධ්‍යම මෘදුක ධූතාඞ්ගධර තෙරුන්වහන්සේලා දෙදෙනා හට ඇවැත්නි බණ අසන්ට යමුහයි කැඳවූයේය ඉක්බිති ඒ දෙදෙනාවහන්සේ අතුරෙන් මධ්‍යම ධූතාඞ්ගධර තෙරුන්වහන්සේ කියනසේක් ස්වාමිනි එක් මිනිසෙකු විසින් අද දවස මම විහාරයෙහි හිඳුවනලද්දෙමියි කීයේය අනික් මෘදුක ධූතාඞ්ගධර තෙරුන්වහන්සේද ස්වාමිනි මාවිසින් සෙට දවස පිණිස එක් දායකයෙකුගේ භික්ෂාව ඉවසනලද්දේයයි කීයේය. මෙසේ ඒ තෙරුන්වහන්සේලා දෙදෙනම දහම්රස විඳගැන්මෙන් පිරිහුණාහුය උත්කෘෂ්ට ධූතාඞ්ගධර තෙරුන්වහන්සේ වනාහි උදෑසනම පිඬු පිණිස වැද ආහාර කෘත්‍ය නිමවා ධර්මශ්‍රවණයට ගොස් දහම්රස විඳගත්තේයි මේ උත්කෘෂ්ට මධ්‍යම මෘදුක යන තුන්වැදෑරුම ධූතාඞ්ගධරයන්ටම යම්කිසි සඟසලු බත් ආදී තුදුස් අතිරේක ලාභයන් අතුරෙන් යම්කිසි ලාභයක් ඉවසූ කෙණෙහිම ධූතාඞ්ගය බිඳෙන්නේයි. මේ මෙහි භේදයි —

( පා. † )

අයම්පන ආනිසංසො — පිණ්ඩියාලොප භොජනං නිස්සාය පබ්බජ්ජාති වචනතො නිස්සයානුරූප පටිපත්තිසබ්භාවො දුතියෙ අරියවංසෙ පතිට්ඨානං අපරායත්ත වුත්තිතා අප්පානිච්ච සුලභානිච තානිච අනවජ්ජානීති භගවතා සංවණ්ණිත පච්චයතා කොසජ්ජනිම්මද්දනතා පරිසුද්ධා ජීවිතා සෙඛියපටිපත්ති පූරණං අපරපොසිතා පරානුග්ගහකිරියා මානප්පහාණං රසතණ්හා නිවාරණං ගණභොජන පරම්පර භොජන චාරිත්තසික්ඛාපදෙහි අනාපත්තිතා අප්පිච්ඡතාදීනං අනුලොම වුත්තිතා සම්මාපටිපත්ති බ්‍රූහණං පච්ඡිමජනතානුකම්පනන්ති —

පිණ්ඩියාලොප සන්තුට්ඨො
අපරායත්ත ජීවිකො
පහීනාහාර ලොලුප්පො
හොති චාතුද්දිසො යති —
විනොදයති කොසජ්ජං
ආජීවස්ස විසුජ්ඣති
තස්මා හි නාතිමඤ්ඤෙය්‍ය
භික්ඛාචරියං සුමෙධසො —

එවරූපස්සහි —

පිණ්ඩපාතිකස්ස භික්ඛුනො
අත්තභරස්ස අනඤ්ඤපොසිනො
දෙවාපිහයන්ති තාදිනො
නොචෙ ලාභසිලොක නිස්සිතො —

අයං පිණ්ඩපාතිකඞ්ග සමාදාන විධානප්පභෙද භෙදානිසංස වණ්ණනා —

( ස † )

අයම්පන, මේ වනාහි; ආනිසංසො, අනුසස්; පිණ්ඩියාලොප භොජනං නිස්සාය, පිණ්ඩියාලොප භොජනය නිසා; පබ්බජ්ජාති වචනතො, පැවිදියයි වදාළ බැවින්; නිස්සයානුරූප පටිපත්ති සබ්භාවො, නිශ්‍රයට අනුරූපවූ පිළිවෙත් ඇති බවය; දුතියෙ අරියවංසෙ පතිට්ඨානං, දෙවනුවූ පිණ්ඩපාත ආර්‍ය්‍යවංශයෙහි පිහිටීමය; අපරාය

තත වුත්තිතා, අනුන් අයත් නොවන පැවැතුම් ඇති බවය; අප්පානිචෙව, අල්පයහ; සුලභානිච, සුලභයහ; තානිච, ඔහුද; අනවජ්ජානිනි, නිරවද්‍යයහයි; භගවතා සංවණ්ණිත පච්චයතා, භාගවත්හු විසින් සංවණ්ණිත ප්‍රත්‍යය බවය; කොසජ්ජ නිම්මථනතා (ජඞ්ඝාබල නිසා පිඩු සිඟන බැවින්) කුසීත භාවයාගේ මැඩීමත් බවය; පරිසුද්ධාජීවිතා, පිරිසිදුවූ ආජීව ඇති බවය; සෙඛිය පටිපත්ති පූරණං [අනාහාර සරයට වදනා හෙයින්) සුප්පටිච්ඡන්නතා ගමනාදී සෙඛිය ධර්මයන්ගේ පිරීමය; අපරපොසිතා, පමණ්ඩූන පිළිගැන්මෙන්ද අනුන් හා හැනී නොවසන බැවින්ද පරපොෂණයක් නැති බවය; පරානුග්ගහකිරියා, ගෙන්ගෙන් මදින් මදින්ම පිළිගැන්මෙන් අනුන්ට අනුග්‍රහකිරීමය; මානප්පහානං, අන්තිම ජීවිකායෙහි පිහිටිබැවින් මානයාගේ පැහීමය ("අන්තමිදං භික්ඛවෙ ජීවිකානං යදිදං පිණ්ඩොල්‍යං" යනු පෙලි) රසතණ්හා නිවාරණං, මුසු අහරින් යැපෙන බැවින් රසතණ්හා වැළකීමය; ගණභොජන පරම්පරභොජන චාරිත්ත සික්ඛාපදෙහි (නිමන්ත්‍රණ නොඉවසන බැවින්) ගණභොජන සික්ඛාපදය පරම්පරභොජන සික්ඛාපදය චාරිත්ත සික්ඛාපදය යන මෙයින්; අනොපත්තිතා, නිරාවැත් බවය; අප්පිච්ඡතාදීනං, අල්පේච්ඡ භාවාදීන්ට; අනුලොම වුත්තිතා, අනුලොම පැවැතුම ඇති බවය; සම්මාපටිපත්ති බ්‍රෑහණං, මනා පිළිවෙත් වැඩීමය; පච්ඡිම ජනතානුකම්පනතා, පශ්චිම ජනයන්ට අනුකම්පායයි ~

පිණ්ඩියාලොප සන්තුට්ඨො, පිඬු සිඟීමෙන් ලද ආලොපයෙන් සතුටුවූ; අපරායත්ත ජීවිකො, අනුන් අයත් නොවන ජීවිකා ඇති; පහීණාහාර ලොලුප්පො, පහකරණලද ආහාරෙහි ලොල්බව ඇති; යති, මහණතෙමේ; චාතුද්දිසො (නොපැකිළෙන පැවැතුම් ඇතිබැවින්) සතරදිගටම හිතවූයේ; හොති, වන්නේයි; කොසජ්ජං කුසීත බව; විනොදයති, දුරුකරන්නේයි; අස්ස, මොහුගේ; ආජීවො, ආජීවය; විසුජ්ඣති, පිරිසිදුවේ; තස්මා හි, එහෙයින්; සුමෙධසො, මනා නුවණැත්තේ; භික්ඛාචරියං, භික්සිඟීම; නාතිමඤ්ඤෙය්‍ය, නොඉක්මවන්නේයි; එවරූපස්ස, මෙබඳුවූ [කියනලද ගුණයන් යුක්තවූ යුතැති) අත්තභරස්ස, තමාම රක්නාවූ; අනඤ්ඤපොසිනො, එහෙසින්ම අනුන් පොෂණය නොකරණ; තාදිනො, එබඳුවූ; පිණ්ඩපාතිකස්ස භික්ඛුනො, පිණ්ඩපාතික භික්ෂු හට; නොචෙ, ඉදින්; ලාභසිලොක නිස්සිතො නාහොති, ලාභය යසසයන මොවුන් ඇසුරු නොකෙළේ වීනම්; දෙවාපිහයන්ති, දෙවියෝ පතත් (ඔහුගේ සිල් ආදි ගුණයෙහි බහුමන් කරනනාහු ආදර කෙරෙහි යුතැති) ~

( හා † )

මේ මතු දක්වන්නේ ආනිසංසයි. ප්‍රව්‍රජ්‍යාව පිණ්ඩපාතාලොප භොජනය නිසා වන්නේයයි භාග්‍යවතුන් විසින් වදළ බැවින් තමාගේ නිශ්‍රයට සුදුසුවූ ප්‍රතිපත්ති ඇතිබවය දෙවන ආයසිපංශ සඞ්ඛ්‍යාත පිණ්ඩපාත ධුතාඞ්ගයෙහි පිහිටන බවය අනුන් අයත්නුවූ පැවැතුම් ඇතිබවය අල්පයහ සුලභයහ නිර්දොෂයහයි යනාදීන් භාග්‍යවතුන් විසින් වර්ණනාකරණලද ප්‍රත්‍යය බවය කුසීතබව නැසීමය පිරිසිදුජීවිකා ඇති බවය පිඬුපිණීස යන්නෙන්සුපිළිවෙන්ව හැඳීම් පෙරවීම් ආදිය කටයුතු බැවින් සෙඛියා වත් පූරණ බවය පමණ දන පිළිගන්නා බැවින් තමා විසින් අනුන්

පොෂණය නොකටයුතු බවය මෙයෙක් පාසා ගෙයක් මදක් මදක් පිළිගතයුතු බැවින් අප්‍රාණ්ව අනුග්‍රහකරණ බවය අනාශ්‍රිත ජීවිකාවෙන් යැපි බැවින් මානය දුරුකාරණ බවය මිශ්‍ර ආහාරයෙන් නොඇලෙන බැවින් රසතෘෂ්ණාව නිවාරණ බවය ආරාධනා නොකළසන බැවින් ගණභෝජනය පරම්පර භෝජනය චාරිත්‍ර සික්ඛාපද යනාදීන්ගෙන් ඇවැත් නොවන බවය අපිච්ඡ බැව් ආදියට අනුලෝම පැවැතුම් ඇතිබවය මනා ප්‍රතිපත්ති ඇති බවය පශ්චිම ජනයාට අනුකම්පා ඇති බවය යන මොහු පිණ්ඩපාතිකාඞ්ගයාගේ අනුසස් වෙත් වැයි දතයුතු කියේවැවෙත්—

පිඩු සිඟීමෙන් ලද පිණ්ඩයාලොප භෝජනයෙන් සතුටුවූ එහෙයින්ම අනුන් අයත්වූ දිවි පැවැතුම් ඇති ආහාර ලොලය දුරුකළාවූ මේ පිණ්ඩපාතිකාඞ්ගධර මහණ තෙමේ සියලු නැත්ති නොපැකිලෙන බැවින් සතර දිශාවටම සුදුසු වන්නේයි යම් හෙයකින් මේ පිණ්ඩපාතික ධුතාඞ්ගය මේ මහණහුගේ සැසින බව දුරුකෙරේද දිව පැවැත්ම පිරිසිදු කෙරේද එහෙයින් පණ්ඩිත මහණ තෙම මේ පිඩුසිඟීම සොයාසිත්ම වන්නේයි මෙබඳු ගුණ සමූහයෙන් යුක්තවූ නමාව පොෂ්‍යය කාරණ හෙයින් අනුන් පෝෂ්‍යය නොකරන්නාවූ පිණ්ඩපාතිකාඞ්ගධර මහණ තෙමේ ඉද්දන් ලාභසීත්ති දූශංසාදිය ඇසුරු නොකොට නිස්සරණාධ්‍යාශයෙන් අඞ්ග රක්ෂාකරන්නේ වීනම් දෙවියෝ පවා ඔහුගේ ශීලාදි ගුණයෙහි ආදරබහුමාන කරන්නාහුමැයි මේ පිණ්ඩපාතිකාඞ්ගයෙහි සමාදන්වීමය පිළිපදනා විධිය විභාගය බිඳීමය අනුසස්ය යන මොවුන්ගේ වර්ණනාතී—

( පා ‡ )

සපදානචාරිකාඞ්ගම්පි ලොළුප්පචාරං පටික්ඛිපාමි සපදානචාරිකඞ්ගං සමාදියාමීති— ඉමෙසං අඤ්ඤතරවචනෙන සමාදින්නං හොති. තෙන සපදානචාරිකෙන ගාමද්වාරෙ ඨත්වා පරිස්සයාභාවො සල්ලක්ඛෙතබ්බො— යස්සා රච්ඡාය වා ගාමෙ වා පරිස්සයො හොති තං පහාය අඤ්ඤත්‍ථ චරිතුං වට්ටති. යස්මිං ඝරද්වාරෙ වා රච්ඡාය වා ගාමෙ වා කිඤ්චි න ලභති අගාමසඤ්ඤං කත්වා ගන්තබ්බං යත්‍ථ කිඤ්චි ලබ්භති තං පහාය ගන්තුං න වට්ටති ඉමිනාච භික්ඛුනා කාලතරං පවිසිතබ්බං එවං අඵාසුකට්ඨානං පහාය අඤ්ඤත්‍ථ ගන්තුං සක්ඛිස්සති. සචෙපනස්ස විහාරෙ දානං දෙන්තා අන්තරාමග්ගෙ වා ආගච්ඡන්තා මනුස්සා පත්තං ගණ්හිත්වා පිණ්ඩපාතං දෙන්ති වට්ටති ඉමිනාච මග්ගං ගච්ඡන්තෙනාපි භික්ඛාචාරවෙලායං සම්පත්තගාමං අනතික්කමිත්වා චරිතබ්බමෙව තත්‍ථ අලභිත්වා වා ථොකං ලභිත්වා වා ගාමපටිපාටියා චරිතබ්බන්ති ඉදමස්ස විධානං පභෙදතො පන අයම්පි තිවිධො හොති තත්‍ථ උක්කට්ඨො පුරතො ආහට භික්ඛං පච්ඡතො ආහට භික්ඛම්පි පටික්කමනං ආහරිත්වා දියමානම්පි නගණ්හාති පත්තද්වාරෙ පන පත්තං විස්සජ්ජෙති ඉමස්මිං හි ධුතඞ්ගෙ මහාකස්සපත්‍ථෙරෙන සදිසො නාම නත්‍ථි තස්සාපි පත්තං විස්සට්ඨට්ඨානං පඤ්ඤායති— මජ්ඣිමො පුරතො වා පච්ඡතො වා ආහටම්පි පටික්කමනං ආහටම්පි ගණ්හාති පත්තද්වාරෙපි පත්තං විස්සජ්ජෙති න පන භික්ඛං ආගමයමානො නිසීදති එවං සො උක්කට්ඨපිණ්ඩපාතිකස්ස අනුලොමෙති— මුදුකො තං දිවසං නිසී

දිස්වා ආගෙනවත්ථු ඉමෙසං පන තිණ්ණමපි ලොලුප්පචාරෙ උප්පන්නමත්තෙ ධුතඞ්ගං භිජ්ජති අයමෙත්ථ භෙදො.

අයං පන ආනිසංසො – කුලෙසු නිච්චනවකතා චන්දූපමතා කුලමච්ඡරප්පහානං සමානුකම්පිතා කුලූපකාදීනවාභාවො අව්හානානභිනන්දනා අභිහාරෙන අනත්ථිකතා අප්පිච්ඡතාදීනං අනුලොමවුත්තිතාති.

චන්දූපමො නිච්චනවො කුලෙසු
අමච්ඡරී සබ්බසමානුකම්පො
කුලූපකාදීනවවිප්පමුත්තො
හොතීධ භික්ඛු සපදානචාරී.

ලොලුප්පචාරඤ්ච පහාය තස්මා
ඔක්ඛිත්තචක්ඛු යුගමත්තදස්සී
ආකඞ්ඛමානො භුවි සෙරිචාරං
චරෙය්‍ය ධීරො සපදානචාරන්ති.

අයං සපදානචාරිකඞ්ගෙ සමාදානවිධානප්පභෙදභෙදානිසංසවණ්ණනා.

---

( ෂ ‡ )

සපදානචාරිකඞ්ගම්පි, සපදානචාරිකාඞ්ගයද; ලොලුප්පචාරං පටික්ඛිපාමි, ලොලු භාවයෙන් ගෙපිළිවෙළ ඉක්ම හැසිරීම; පටික්ඛිපාමි, ප්‍රත්‍යක්ෂෙප කෙරෙමි; සපදානචාරිකඞ්ගං සමාදියාමිති, සපදානචාරිකාඞ්ගය සමාදන්වෙමියි යන; ඉමෙසං, මෙ වූන් කෙරෙන්; අඤ්ඤතර වචනෙන, එක්තරා වචනයකින්; සමාදින්නං හොති, සමාදන්වන ලද්දේවේ; එතෙන සපදානචාරිකෙන, ඒ සපදානචාරිකයා විසින්; ගාමද්වාරෙ ඨත්වා, ගම්දොර සිට; පරිස්සයභාවො, උපද්‍රව නැතිබව; සල්ලක්ඛෙතබ්බො, සැලකියයුතු; යස්සාරච්ඡාය වා, යම් වීථියකවත්; ගාමෙ වා, ගමෙකවත්; පරිස්සයො හොති, උපද්‍රව ඇත්තම්; තම්පහාය, ඒ හැර; අඤ්ඤත්ථ, සෙසු තැනට(?) ගොසු පත්හි; චරිතුං, සිඟන්නට; වට්ටති, වටී; යස්මිං ද්වාරෙ, යම් ගෙදොරෙක හෝ; රච්ඡාය වා, වීථියෙක හෝ; ගාමෙ වා, ගමෙක හෝ; කිඤ්චි නලබ්භති (තුන් දවසක් සිඟා) කිසිවක් නොලැබේද; අගාමසදිසං කත්වා, නොගම් සංඥකොට; ගන්තබ්බං, යායුතු; යත්ථ, යම්තැනෙක; කිඤ්චිලබ්භති, කිසිවක් ලැබේද; තම්පහාය, ඒ හැර; ගන්තුං න වට්ටති, යන්නට නොවටී; ඉමිනාච භික්ඛුනා, මේ සපදානචාරික මහණහු විසින්; කාලතරං පවිසිතබ්බං, උදෑසන්හිම වැද්දයුතු; එවං, මෙසේ කල්හි; අඵාසුකට්ඨානං පහාය, නොවැද්දයුතු තැන් හැර; අඤ්ඤත්ථ, සෙසු තැනට; ගන්තුං, යන්නට; සක්ඛිස්සති, පොහොසත්වේ; සචෙපන, ඉදින්; විහාරෙ, වෙහෙර; දානං දෙන්තා, දන් දෙන්නාවූ හෝ; අන්තරාමග්ගෙ, අතරමග; ආගච්ඡන්තාවා, එන්නාවූ හෝ; මනුස්සා, මිනිස්හු; අස්ස, මොහුගේ; පත්තං ගහෙත්වා, පාත්‍රය ගෙණ; පිණ්ඩපාතං දෙන්ති, අහර දෙත්නම්; වට්ටති, වටී; මග්ගං ගච්ඡන්තෙන, මග යන්නාවූ; ඉමිනාච, මොහු විසින්ද; භික්ඛාචාරවෙලායං, පිඬු සිඟන වේලෙහි; සම්පත්තගාමං අනතික්කමිත්වා, සම්ප්‍රාප්ත ග්‍රාමය නොඉක්මවා; චරිතබ්බමෙව, සිඟියයුතුමැයි, තත්ථ, එහි; නලභිත්වා වා, නොලද්දින් හෝ; ථොකං ලභිත්වා වා, මදක් ලදින් හෝ; ගාමපටිපාටියා චරිතබ්බන්ති, ගම් පිළිවෙළින් සිඟිය යුතුයයි; ඉදං, මේ; අස්ස, මොහුගේ; විධානං, විධානයි; පභෙදතො පන, ප්‍රභෙද හෙයින් වනාහි; අයම්පි, මේද; තිවිධො හොති, තුන්වැදෑරුම්වේ; තත්ථ, ඒ තුන්දෙනා කෙරෙහි; උක්කට්ඨො, උත්කෘෂ්ට තෙමේ; පුරතො ආගතභික්ඛම්පි, පෙරටින් ගෙණා අහරද; පච්ඡ

නො ආගාමිකබවෙහි, පත්තෙන් ගෙ
ණා අහරද; පටිකඩාමතං, බොජුන්ග
ල; ආහරිත්වා දීඝභානකම්පි, ගෙණහැර
ගෙනලද අහරද; නගණ්හාති, නො
ගණී; පච්ඡාවාරෙ පන, හමුවූ ගෙදර ව
නාහි; පත්තං විස්සජ්ජෙති, පා විසඳු;
ඉමසමිං ධුතඞ්ගෙ, මේ දුහගෙහි; මහා
කස්සපත්ථෙරෙන සදිසො නාම, මහ
සුප්තෙරණුවන් හා සදෘශයෝ නැත;
කස්සාපි, ඔවුන්ගේද; පත්තවිස්සට්ඨ
ට්ඨානං (පෙහෙරවීපියෙහි පෙහෙර
වෙස්සගණ්ඩි සක් දෙව් රජහුගේ
ගෙදර) පා විහිදිනැත්; පසාදඤ්ඤත
එව, පැමිණිකැයි; භිකඛං ආගමයමා
නො පන, භික්ෂාව බලාවනාහි; නනි
සීදති, නොහිඳී; එවං, මෙසේ ඒ මෘදු
මෙනමේ; උක්කට්ඨ පිණ්ඩපාතිකස්ස,
උකටපිණ්ඩපාතිකයාහට; අනුලොමෙ
ති, උනුදලා නොහිඳිනාබැවින් අනු
ලොමවේ; මුදුකො, මෘදුකනෙමේ;
තං දිවසං, එදවස්; නිසීදිතබ්බ, හිඳ;
ආගමෙති, බලා; ඉමෙසම්පන ති
ණ්ණම්පි, මේ තුන්දෙනාහටම; ලොලු
ප්පචාරෙ උප්පන්නමත්තෙ, ලොලුප්
බැවින් ගෙපිළිවෙළ ඉක්ම හැසිරීම
උත්පන්නමාත්‍රයෙහිම; ධුතඞ්ගං භි
ජ්ජති, ධුතඞ්ග බිඳේ; අයං, මේතෙම;
එත්ථ, මෙහි; භෙදො, භෙදයයි.~

අයම්පන, මේ වනාහි; ආනිසං
සො, අනුසස්; කුලෙසු නිච්චනව
කතා (කිසිකුලෙක්හි නිබදයෙන්
නොඑලඹෙන බැවින්) කුලෙහි දුම
දවස්හිම අලුත්බවය, චන්දූපමතා,
හැමතැන්හිම අලග්නමනස් ඇත්තැවි
නුදු සෞම්‍යබැවිනුදු චන්ද්‍රොපමබව
ය; කුලමච්ඡෙරප්පහාණං, පරිග්‍රහවි
තතාභාවයෙන් කුලෙහි මසුරුබව පැ
හිමය; සමානුකම්පිතා, අපභාගයෙන්
හිත පසස්තෙන් සමවූ අනුනුගඇති
බවය; කුලුපකාදී නාවාකාවො, කුලයට
එළඹෙමන්වන සඞ්ගණහා න සංසට්ඨා
දී ආදීනව නැතිබවය; අව්හාණානා
භිනන්දනා, නිමන්ත්‍රණයෙන් නොතුටු
ස්වවය; අභිහාරෙන, භික්ෂාව ඇර
එළවීමෙන්; අනපෙක්ඛනා, ප්‍රයෙජන
නැති බවය; අපේච්ඡතාදීනං, අල්පෙච
ඡතා දීන්ට; අනුලොමවුත්තිතාති,
අනුලොම පැවතුම ඇතිබවයි.~

ඉධ, මේ සස්නෙහි; සපදානචාරී
භික්ඛු, සපදානචාරික වහන්සේ; කු
ලෙසු, කුලයෙහි; චන්දූපමො, සඳහුනෑ
නිවූයේ; නිච්චනවො, හැමදවස්ම අලු
ත්වූයේ; කුලෙසු අමච්ඡරී, කුලයෙහි
මසුරුබවක් නැත්තේ; සබ්බසමානුක
ම්පො, සමීජනයාකෙරෙහි සමවූ
අනුකම්පා ඇත්තේ; කුලුපකාදීනව වි
ප්පමුත්තො, කුලයට එළඹෙමන් වන
ආදීනවයෙන් වියුක්තවූයේ; හොති,
වන්නේයි; තස්මා, එහෙයින්; ලොලු
ප්පචාරං පහාය, ලොල්බැවින් ගෙප
ළිවෙළ ඉක්ම සිඟීම හැර; ඔක්ඛිත්ත
චක්ඛු, යටහෙළූ ඇස්ඇත්තේ, යුගම
ත්තදස්සී, එහෙයින්ම යුගයමණක් බ
ලන්නේ; භූව, පොළොනෙලෙහි; සෙ
රිවාරං ආකඞ්ඛමානො, සෙසවරිච්ඡා
රයකැමැත්තේ; ධීරො, ධීරතෙමේ;
සපදානචාරං චරෙය්‍ය, සපදානචාරික
ධුතඞ්ග පුරන්නේයි.~

—o—

( භා ‡ )

පිණ්ඩපාතිකාඞ්ගයට අනතුරුව සපද
න චාරිකාඞ්ගයයි ඒ සමාදන්වන මග
ණ වසින් යෙදී නියායෙන් “ලොලු
ප්පචාරං පටික්ඛිපාමි සපදානචාරිකඞ්ගං
සමාදියාමි” යි ප්‍රත්‍යයාසාවෙන් ගෙප
ළිවෙළ ඉක්මවා පිඬුසිඟීම ප්‍රතික්ෂෙප
කරමි සපදානචාරිකාඞ්ගය සමාදන්
වෙමියි යන වචනයෙන්ම හෝ එක්
තරාවචනයකින් හෝ සමාදන්වන
ලද්දේවෙයි ඒ සපදානචාරිකාඞ්ග ධ
ර මහණවිසින් පිඬුපිණිස හැසිරෙට

මත්තෙහෙත් ගම්දොර සිට උපද්‍රව නැතිබව සැලක්ෂයුත්තේය. තමාපිඩුසිඟන්නාට යන යම් වීථියක හෝ ගමක හෝ උපද්‍රව ඇත්තේවී නම් එබඳු වීථිගම් අත්හැර සෙසු තැන සිඟිය යුතුය. පිඩුසිඟනා යම් ගෙදොරක හෝ වීථියක හෝ ගමක හෝ තුන්දිනක් පිළිවෙළින් සිඟා කිසිවක් නොලදුයේ නම් එබඳු තැන් ගම් නොවෙසි යන සංඥවකොට හැර යායුතුය. එනකුදුවූවන් යම් තැනකින් ස්වල්පමාත්‍රවූද කිසිවක් ලැබේනම් එබඳුතැන් හැර නොයායුතුය. මේ සපදානචාරික මහණ විසින් උදෑසන පිඩුසිඟීම පිණිස ගම්වැදිය යුතුය. මෙසේ උදෑසන පිඩුපිණිස ගියකල නොවැද්ද යුතුතැන් සලකා හැර සෙසුතැනට යා හැකිවන්නේය. ඉදින් විහාරයෙහි දන් දෙන්නාවූ හෝ අතරමග එනනාවූ හෝ මනුෂ්‍යයෝ මේ සපදානචාරික භික්ෂූහුගේ පාත්‍රය ගෙණ පිණ්ඩපාතය දෙන්නාහු නම් ඒ පිළිගන්නාවද වටනේය. මග යන්නාවූ මේ සපදානචාරික භික්ෂුවසිතුදු පිඩුසිඟනා වේලෙහි ඉදිරියට හමුවූ ග්‍රාමය නොඉක්මවා පිඩුසිඟිය යුතුමය. ඒ සම්ප්‍රාප්ත ග්‍රාමයෙහි පිණ්ඩපාතය නොලැබුනේ හෝ වේද යැපෙන පමණ නොලැබුනේ හෝ වේද එසේකල ගම්පිළිවෙළින් යැපෙනතෙක් පිඩුසිඟිය යුතුය යනු මෙහි පිළිපදනා විධියි.

ප්‍රභේදවශයෙන් වනාහි මේ සපදානචාරිකාඞ්ගයද උත්කෘෂ්ට මධ්‍යම මෘදුකවශයෙන් තුන් වැදෑරුම්වන්නේයි. ඒ තුන්දෙනා අතුරෙන් උත්කෘෂ්ට සපදානචාරික ධූතාඞ්ගධර මහණ ඉදිරියෙන් හෝ පස්සෙන් හෝ ගෙණෙනලද අහරද බොජුන් හලට ගෙණවුත් දෙන අහරද පිළිනොගන්නේය. ඉදිරියට හමුවූ දොරකඩ පාත්‍රය දෙයි. මේ උත්කෘෂ්ට ධූතාඞ්ගයෙහි මහසුප් තෙරුන්වහන්සේ වැනි ධූතාඞ්ගධරයෙක් මේ සන්තෙනි නැත්තේයි. උන්වහන්සේගේ පාත්‍රයද පෙසකාරවීථියෙහි පෙහෙරවෙස්ගෙණ සිටි සක්දෙව්රජහුගේ ගෙදොර විනිදවූ බවද පෙනෙන්නේමැයි. මේ උත්කෘෂ්ටය භික්ෂාව ගෙණෙන්නේද හෝයි බල බලා බොහෝ වේලා නොනිඳින්නේයි. මධ්‍ය ධූතාඞ්ගධර තෙමේ ඉදිරියෙන් හෝ පස්සෙන් හෝ එලවූහලද භික්ෂාවද බොජුන්හලටගෙණෙනලද භික්ෂාවද පිළිගන්නේය. හමුවූ දොරකඩ පාත්‍රයද විනිදුවයි. භික්ෂාව ගෙණෙන්නේද හෝයි මඟබල බලා නොනිඳින්නේය. මෙසේ ඒ මධ්‍යම සපදානචාරිකාඞ්ගධර තෙමේ උත්කෘෂ්ට පිණ්ඩපාතිකාඞ්ගධරයා හට අනුලෝමවන්නේයි. මෘදු සාධූතාඞ්ගධර තෙමේ එක්දවසක්ම භික්ෂාව ගෙණෙද්දෝයි බලානිඳින්නේයි. මේ තුන්දෙනාහටම ලොලුපපචාරයයි කියනලද ගෙපිළිවෙළ අත්හැර පිඩුසිඟීම ඇතිකල ධූතාඞ්ගය බිඳීම වන්නේයි. මේ මෙහි බිඳීමයි. මේ මතුදක්වන්නේ ආනිසංසයි මෙ කවරහුදයත්? මේ සපදානචාරික මහණතෙමේ කිසිකුලයක් කරා නිරන්තරයෙන් නොඑළඹෙනබැවින් කුලෙහි හැමදවස්ම අලුත්බව ද කිසිකුලයෙක්හි නොඇලෙන සිත්ඇතිබැවින් හා සෙමපාත්‍රගුණ ඇතිබැවින්ද චන්ද්‍රයාට බඳුබවය අන්භික්ෂුවක් නමගේ ප්‍රත්‍යය දායකයන්ගෙන් ප්‍රත්‍යය නොගණිවයි සිතිමය යන කුලයාන් ශායීය දුරුවීමය සියලුදෙනාකෙරෙහි සමාන අනුකම්පා ඇතිබවය කුලයාට සංග්‍රහකිරීම මිශ්‍රවීම යනාදි ආදීනව නැතිබවය ආරාධනා ඉවසීමෙන් සතුටුනොවන බවය අහර එලවා

දීමෙන් ප්‍රයෝජන නැතිබවද අපිස් සංතොස් ආදි ගුණයන්ට අනුලෝම් පැවතුම් ඇතිබවද යන මෙතෙක් අනුසස් ඇත්තේයි.

එහෙයින් කියනලදී. මේ සද්දෙහි සපදානචාරිකාඞ්ගය පුරා මිහණ මේ කුලයාකෙරෙහි චන්ද්‍රොපම ප්‍රතිපද ඇතිවන්නේය හැම දවසේම අලුත්වන්නේය කුලවිහාසංකිස් නැතිවන්නේය නියමදෙනා කෙරෙහි සංවූ අනුකම්පා ඇතිවන්නේය නිතරකුලයාකෙරෙහි එල්ලීමෙන් විනා ආදී නව දෝසයන් මිදෙන්නේයි එහෙයින් ප්‍රත්‍යය ලොභ යන් නොපිළිවෙල ඉක්මවා හැසිරීම දුරුකොට යම් සෙලු ඇස් ඇතිව විය දුම්පමණ දුර බලන්නාවූ බොධිසත්වයන් මේ ලෝකයෙහි අනුන් අයත් නොවූ පැවැත්මයයි කියනලද මෙම පිරිවරණය කැමැත්තේවීනම් සපදානචාරිකාඞ්ගය පුරන්නේයි.

මේ සපදානචාරිකාඞ්ගයාගේ සමාදන්වීමය පිළිපදනාවිධිය ප්‍රභෙදය බිඳීමය ආනිසංසය යන අර්ථවර්ණනා මෙන් අර්ථවර්ණනායි. —

( කා ෆ )

එකාසනිකඞ්ගම්පි නානාසනභොජනං පටික්ඛිපාමි එකාසනිකඞ්ගං සමාදියාමීති — ඉමෙසං අඤ්ඤතර වචනෙන සමාදින්නං හොති තෙන පන එකාසනිකෙන ආසනසාලාය නිසීදන්තෙන ථෙරාසනෙ අනිසීදිත්වා ඉදං මය්හං පාපුණිස්සතීති පතිරූපං ආසනං සල්ලක්ඛෙත්වා නිසීදිතබ්බං — සචස්ස විප්පකතෙ භොජනෙ ආචරියො වා උපජ්ඣායො වා ආගච්ඡති උට්ඨාය වත්තං කාතුං වට්ටති — තිපිටක චූළාභයත්ථෙරො පනාහ ආසනං වා රක්ඛෙය්‍ය භොජනං වා අයඤ්ච විප්පකතභොජනො තස්මා වත්තං කරොතු භොජනම්පන මා භුඤ්ජතූති ඉදමස්ස විධානං — පභෙදතො පන අයම්පි තිවිධො හොති — තත්ථ උක්කට්ඨො අප්පං වා හොතු බහුං වා යම්හි භොජනෙ හත්ථං ඔතාරෙති තතො අඤ්ඤං ගණ්හිතුං න ලභති සචෙපි මනුස්සා ථෙරෙන න කිඤ්චි භුත්තන්ති සප්පිආදීනි ආහරන්ති භෙසජ්ජත්ථමෙව වට්ටන්ති න ආහාරත්ථං මජ්ඣිමො යාව පත්තෙ භත්තං න ඛීයති තාව අඤ්ඤං ගණ්හිතුං ලභති අයංහි භොජනපරියන්තිකො නාම හොති — මුදුකො යාව ආසනා න වුට්ඨාති තාව භුඤ්ජිතුං ලභති සොහි උදකපරියන්තිකො වා හොති යාව පත්තධොවනං න ගණ්හාති තාව භුඤ්ජනතො — ආසනපරියන්තිකො වා යාව න වුට්ඨාති තාව භුඤ්ජනතො ඉමෙසං පන තිණ්ණම්පි නානාසනභොජනං භුත්තක්ඛණෙ ධුතඞ්ගං භිජ්ජති — අයමෙත්ථ භෙදො — අයං පනානිසංසො — අප්පාබාධතා අප්පාතඞ්කතා ලහුට්ඨානං බලං ඵාසුවිහාරො අනතිරිත්තපච්චයා අනාපත්ති රසතණ්හා විනොදනං අප්පිච්ඡතාදීනං අනුලොමවුත්තිතාති —

එකාසනභොජනෙ රතං
න යතිං භොජනපච්චයා රුජා
විසහන්ති රසෙ අලොලුපො
පරිහාපෙති න කම්මමත්තනො —

ඉති ඵාසුවිහාරකාරණෙ
සුචිසල්ලෙඛරතූපසෙවිතෙ
ජනයෙථ විසුද්ධමානසො
රතිමෙකාසනභොජනෙ යති —

අයං එකාසනිකඞ්ගෙ සමාදාන විධාන පභෙදභෙදානිසංසවණ්ණනා —

( ෂ ¶ )

එකාසනිකඞ්ගම්පි, එකාසනිකා
ඞ්ගයද; නානාසනභොජනං, වෙන
වෙන අස්නෙහි හිඳ කරණ ආහාර
පරිභොගය; පටික්ඛිපාමි, ප්‍රතික්‍ෂෙප
කෙරෙමි; එකාසනිකඞ්ගං සමාදියා
මි, එකාස නිකාඞ්ගය සමාදන්වෙමි
යනු; ඉමෙසං, මොවුන්කෙරෙන්;
අඤ්ඤතරවචනෙනාපි, එක්තරා වචනය
කින්; සමාදින්නං හොති, සමාදන්වන
ලද්දේවේ; තෙන පන එකාසනිකෙන,
ඒ එකාසනිකයා විසින්; ආසනසාලා
ය, අසුන්හල්හි; නිසීදන්තෙන, හිඳි
නහු විසින්; ථෙරාසනෙ අනිසීදිත්වා,
ථෙරාසනයෙහි නොහිඳ; ඉදංමය්හං
පාපුණිස්සතීති, මේ අස්න මට පැමි
ණෙන්නේයයි; පතිරූපං ආසනං
සල්ලක්ඛෙත්වා, සුදුසු අස්නක් සලකා
(නාගතො සිටියයුතු අස්න සලකාය
යුතැනි) නිසීදිතබ්බං, හින්දයුතු;
සචෙ, ඉදින්; අස්ස, මොහුගේ; භොජ
නෙ විප්පකතෙ, භොජනය අඩාලවූ
කල්හි; ආචරියො වා, ඇජරතෙරහු
වත්; උපජ්ඣායො වා, උපාධ්‍යාය තෙ
රහුවත්; ආගච්ඡති, අවුනම්, උට්ඨාය,
නැගිසිට; වත්තං කාතුං වට්ටති, වත්
කරන්නට වටී (ඒ වටිනාබවම තරක
රණුපිණිස මතුයෙහි ථෙරවාදයකිනු)
තිපිටක චූලාභයත්ථෙරොපන, තිපිට
චූලාභයනම් තෙරහු වනාහි; ආසන,
මෙසකිවු; ආසනං වා රක්ඛෙය්‍ය,
එකාසනික භික්‍ෂුහු වලදන්නාහු ධුතා
ඞ්ගභෙදයෙන් හුන් හස්න හෝ රක්
නේය (භොජන පරියොසානය වන
තෙක් නැගිනොසිටිය යුතුය යුතැනි)
භොජනංවා රක්ඛෙය්‍ය, වලදන්නාහු
ධුතාඞ්ගභෙදයෙන් භොජනය හෝ
රක්නේය (යම්තාක් වලදන්නව පට
න්නොගද්ද ඒතාක් නැගිසිටිය යු
තුය යන අදහසි. යම්හෙයකින් ඒ
දෙකම මිඩිනැග්ගේද එහෙයින් නැගී
සිට වත් කිරීම දුෂක නොරක්නේය
යන අභිප්‍රායයි=අයඤ්ච යනාදී එහෙ
යින් කියන්) අයඤ්ච, මේද; විප්පකත
භොජනො, අඩාලකල බොජුන් ඇත්
තේය; තස්මා, එහෙයින්; වත්තං
කරොතු, වත්කෙරේවයි; භොජනම්ප
න භොජනය වනාහි; මාගුඤ්ජතු, නාග
මස් වලදුවා; ඉදං, මේ; අස්ස, මොහු
ගේ; විධානං, විධියි; පභෙදතොපන,
ප්‍රභෙදහෙයින් වනාහි; අයම්පි, මේද;
තිවිධො හොති, තුන්වැදෑරුම්වේ;
තත්, එහි; උක්කට්ඨො, උතුම්; අප්පං
වා හොතු, මදවේවයි; බහුං වා, බො
හෝවේවයි; යම්හි භොජනෙ, යම්
භොජනයෙක්හි; හත්ථං ඔතාරෙති,
අතඑරවා ද; තතො, එයින්, අඤ්ඤං
ගණ්හිතුං, අනිකක් ගන්නට; නල
භති, නොලබා; සචෙ, ඉදින්; මනුස්සා
මිනිස්හු; ථෙරෙන, තෙරුන් විසින්;
න කිඤ්චි භුත්තන්ති; කිසිවක් නොව
ලඳනාලදුයි; සප්පිආදීනි ආහරන්ති,
සර්පිආදීන් එලවත්නම්; භෙසජ්ජත්ථ
මෙව වට්ටන්ති (වලඳනුවට අහරෙති
අත්එරවූතැන පහරවා) බෙහෙත්
පිණිසම වටිති; න ආහාරත්ථං, අහර
පිණිස නොවටීත්; මජ්ඣිමො, මැදුම්;
යාව, යම්තාක්; පත්තෙ භත්තං න
ඛීයති, පාහි බත් ක්‍ෂය නොවේද; තාව,
ඒතාක්; අඤ්ඤං ගණ්හිතුං ලභති,
අනිකක්ගන්නට ලබා; අයං හි, මේ
තෙමේ; භොජනපරියන්තිකො නාම
හොති (පාහි බොජුන් නිමනතෙක්
ඇවිසි යමක් වලඳනබැවින්) භොජ
නය කෙළවරකොට ඇත්තේනම්වේ;
මුදුකො, මෘදුකතෙමේ; යාව ආසනා
න වුට්ඨාති, යම්තාක් අස්නෙන් නො
නැගේද; තාව, ඒතාක්; භුඤ්ජිතුං
ලභති, වලඳන්නට ලබා; සො, හෙ
තෙම; උදකපරියන්තිකො වාහොති,
උදකය කෙළවරකොට ඇත්තේහෝ

වේ; යාවපත්තමේධාවනං නගණ්හාති,
යම්තාක් පාත්‍රය නොගණිද; තාව
භුඤ්ජනතො, ඒතාක් වළඳනබැවිනි;
ආසනපරියන්තිකො වා, භුක්තස්ස
කෙලවරගොාට ඇත්තේ හෝ වේ; යා
වනාවුට්ඨාති, යම්තාක් අස්නෙන් නො
නැගේද; තාව, ඒතාක්; භුඤ්ජනතො,
වළඳනතෙයිනි; ඉමෙසම්පන තිණ්ණ
ම්පි, මේ තුන්දෙනාහටම; නානාසන
භොජනං භුත්තකඛණෙ, නන්අස්
නෙහි හිඳ යව්කැලිබොජුනක් වැළඳූ
කෙණෙහිම; ධුතඞ්ගං භිජ්ජති, ධූතඞ්ග
බිඳේ; අයමෙත්ථ, මේ මෙහි; භෙදො,
බෙදය; අයම්පන, මේ වනාහි; ආනි
සංසො, අනුසස.

අප්පාබාධතා, නිරෝගීබවය; අප්
පාතඞ්කතා, සිරුරුදුක් නැතිබවය;
ලහුට්ඨානං, ලඝුව පවත්නාබවය;
බලං, සිරුරුබලය; ඵාසුවිහාරො, සුව
විහාරය; අනතිරිත්තපච්චයා, කැප
නොකළ බොජුන් පසයෙන්; අනාප
ත්ති, නිරුවැත (නන්අස්නෙහි වළඳනු
වනට කැපනොකළ බොජුන් වැළඳි
මෙන් වන ඇවැත් එකාසනිකයනට
නොවේයි යුතැති)

රසතණ්හා විනොදනං, රසතණ්
හා දුරුකිරීමය; අප්පිච්ඡතාදීනං අනු
ලොම්වුත්තිතාති, අපිස්බැව් ආදීන්ට
අනුලොම් පැවතුම් ඇතිබවය;

එකාසනභොජනෙ, එකාසන
භොජනයෙහි; රතං, ඇලුනාවූ; යතිං,
මහණහු; භොජනපච්චයා, ආහාරප්‍ර
ත්‍යයෙන් වන; රුජා, රොගයෝ; න
විසහන්ති, නොමඩීත්; රසෙ, රසයෙහි;
අලොලුපො, ලොල්නොවූයේ; අත්ත
නො කම්මං, තමාගේ (සමථ විපස්ස
නා) කර්ම; න පරිහාපෙති, නොපිරි
හෙලා (බොජුන් පිරීයස්නා පියෝ
මනාබැව්නුදු නිරොගී වන බැවිනුදු
තමා කල් නොපිරිහෙලා යුතැති)
ඉති, මෙසේ; ඵාසුවිහාර කාරණො
සුඛවිහරණයට කාරණාවූ; සුචිසල්ලෙ
ඛරතුපසෙවිතො, පිරිසිදුවූ සල්ලේඛගුණෙ
හි ඇලුනන්විසින් සෙවුනාලද; එකා
සන භොජනෙ, එකාසන භොජන
යෙහි, විසුද්ධමානසො, පිරිසිදු සිත්
ඇත්තේ; රතිං ජනයෙථ, ඇළුම් කර
න්නේයි

---

( හා ¶ )

සපදානචාරිකාඞ්ගයට අනතුරුව
එකාශනිකාඞ්ගයයි ඒ සමාදන්වන
මහණ විසින් විධිවූ පරිද්දෙන් "නා
නාසනභොජනං පටික්ඛිපාමි එකාස
නිකඞ්ගං සමාදියාමි" යි. වෙන වෙන
අසුන්හි හිඳ කරණ ආහාරපරිභො
ගය ප්‍රතික්ෂෙපකරමි එකාශනිකාඞ්ගය
සමාදන්වෙමි යන වචනවලයෙන්ම
හෝ එක්තරා වචනයකින් හෝ සමා
දන්වනලද්දේවෙයි. ඒ එකාශ නිකා
ඞ්ගධර මහණ විසින් ආසනශාලා
වෙහි වැඩහුන්නාකල ස්ථවිරශන
යෙහි නොහිඳ මේ අස්න පිළිවෙළින්
අවුත් මට ලැබෙන්නේයයි සුදුසු අස්
නක් සලකා ඔහින් නැගුවුවයි නොකි
යයුතු අස්නෙකම හිඳියයුතුය එතකු
දුවුවත් තමාගේ ආචාර්ය උපාධ්‍යාය
තෙරහු භොජනකෘත්‍යය අවසානව
න්නට මත්තෙන් අසුන්හලට ආවාහු
නම් අස්නෙන් නැගිට වතාවත් කළ
යුත්තේය මෙහි වනාහි ත්‍රිපිටක චූලා
භය ස්ථවිරයන්වහන්සේ මෙසේ කී
යේය කෙසේදයත් ? එකාශ නිකාඞ්ග
ධර මහණහුගේ භොජන කාලයෙහි
ආචාර්ය උපාධ්‍යායතෙරහු ආවාහුනම්
ධුතාඞ්ගභෙදයට භයින් භොජනා
වසානයදක්වා නොනැගීසිට ආස
නය හෝ රක්නේය වළඳමින්සිටි
අස්නෙන් නැගිට ගොස් නැවත
වැළඳුයේවීනම් ධුතාඞ්ගය බිඳෙන

හෙයින් නැගිට ගොස් නැවත නො වැලඳීමෙන් භොජනය හෝ රක්නේය. ඉඳින් වළඳන්නට පටන්නො ගත්තේ වීනම් නැගිට එනාවත් කට යුතුයි. එහෙයින් අඛාලකල භොජන ඇති මේ ධුතාඞ්ගධර මහණ වලඳ මින් හුන් අස්නෙන් නැගිට විනාවත් හෝ කෙරේවායි නැවත වැලඳීමහෝ නොකරණ්නේක්වායි යනු මෙහි පිළිප දනාවිධියි මේ ධුතාඞ්ගයද උත්කෘෂ්ට මධ්‍යම මෘදුකවශයෙන් තුන්වැදෑරුම් වන්නේයි. ඔවුන් අතුරෙන් උත්කෘෂ්ට ධුතාඞ්ගධරතෙමේ ස්වල්පයක් වේවයි බොහෝ වේවයි යම් ආහරයෙක අතබහාළුයේනම් ඉන් පිටත් ආහර යක් පිළිගන්නට නොවටනේයි ඉදි ත් මනුෂ්‍යයෝ මේ තෙරුන්වහන්සේ කිසිවක් නොවැලඳූයේයයි ගිතෙල් මී සර්කරාදිය එලවන්නම් ඒ ගිතෙල් ආදියබෙහෙන් පිණිසමුත් අහරපිණිස පිළිගන්නට නොවටනේය මධ්‍යමධු තාඞ්ගධරතෙමේවළඳන අතුරෙහි යම් තාක් පාත්‍රයෙහි අහරනොනිමියේද ඒතාක් කැවත නැවත පිළිගන්වන ලද අහරද පිළිගන්නට වටනේය ඒ එසේමැයි. මේ මධ්‍යම එකාශනිකා ඞ්ගය පූරණ මහණ භොජනපරියන් තික නම්වෙයි මෘදුක ධුතාඞ්ගධර මහණ යම්තාක් ඒ අස්නෙන් නො නැගියේද ඒතාක් ලැබෙන අහර පිළිගන්නට වටහෝය ඒ එසේමැයි ඒ මෘදුක ධුතාඞ්ගධර මහණ යම්තාක් පාත්‍රය ශෝනා ජලය නොගත්තේද ඒතාක් වලඳන හෙයින් උදක පරි යන්තික නම් හෝ වන්නේය යම් තාක් හුනස්නෙන් නොනැගේද ඒ තාක් වලඳනහෙයින් ආසනපරියන් තික නම් හෝ වන්නේයි මේ උත්කෘ ෂ්ට මධ්‍යම මෘදුක යන තුන් ධුතාඞ්ග ධරයන් හටම නොයෙක් අසූත්ති හිද යාවකාලික භොජන සඞ්ඛ්‍යාත අහරක් වැලඳූයෙනෙණෙහිම ධුතාඞ්ගය බිඳෙන්නේයි. මේ මෙහි බිඳීමයි.

මතුදක්වන්නේ ආනිසංසයි නි රොගීබව ඇතිවීමය ශරීරදුක් නැති කරණ බවය සැහැල්ලුව පවත්නා බවය ශරීරබල ලැබීමය සැපවිහරණ ඇතිවීමය කැපනොකල බොජුන් වැලඳීම හෙතුකොටගෙණ පැමිණිය යුතු ඇවැතින් මිදීමය රසතෘෂ්ණාව දුරැකිරීමය අල්පෙච්ඡතාදි ගුණයන්ට අනුලොම්වූ පැවැතුම් ඇතිබවය යන මෙතෙක් අනුසස් ඇතානුයි. කී සේමැනෝ.

එක් අස්නේහිද වැලඳීමෙහි ඇළු නාවූ මහණහු අහර නිසා වනරොග යෝ නොඋපදින්මය රසයෙහි ලොල් නුවූ ඒ මහණ තමාගේ සමථවිදර්ශනා භාවනාව නොපිරිහෙළන්නේයි මෙ සේ කෙලෙස් තුනීකිරීමයයි කියනලද පවිත්‍රවූ සල්ගුණයෙහි ඇළුනාවූ පිරි සිදු සිතැති භික්ෂූහොමේ යොගීන් විසින් සෙවුනාලද සැපවිහරණයට කාරණවූ එකාශන භොජනයෙහි නිරන්තරයෙන් ඇලුම් කරන්නේයි.

මේ එකාශනිකාඞ්ගයෙහි සමාදන් වීමය පිළිපදනාවිධිය ප්‍රභෙදය බිඳීමය ආනිසංසය යන අයී පස්වකයාගේ වර්ණනායි.

( පා * )

පත්තපිණ්ඩිකඞ්ගම්පි දුන්නක භාජ නං පටික්ඛිපාමි පත්තපිණ්ඩිකඞ්ගං සමාදියාමීති ඉමෙසං අඤ්ඤතර වචනෙන සමාදින්නං හොති තෙන පත්තපිණ්ඩිකෙන යාගු පානකාලෙ භාජනෙ ඨපෙත්වා ව්‍යඤ්ජනෙ ලද්ධෙ ව්‍යඤ්ජනං වා පඨමං ඛාදිතබ්බං යාගු වා පාතබ්බා සචෙ පන යාගුයං පක්ඛිපති පූතිමච්ඡකාදිම්හි ව්‍යඤ්ජනෙ

පක්ඛිත්තා යාගු පටික්කූලා හොති අප්පටික්කූලමෙව ච කත්වා භුඤ්ජිතුං වට්ටති තස්මා තථාරූපං ව්‍යඤ්ජනං සන්ධාය ඉදං වුත්තං. යං පන මධුසක්කරාදිකං අප්පටික්කූලං හොති තං පක්ඛිපිතබ්බං. ගණ්හන්තෙන ච පමාණයුත්තමෙව ගණ්හිතබ්බං. ආමකසාකං හත්ථෙන ගහෙත්වා ඛාදිතුං වට්ටති. තථා පන අකත්වා පත්තෙයෙව පක්ඛිපිතබ්බං. දුතියකභාජනස්ස පන පටික්ඛිත්තත්තා අඤ්ඤං රුක්ඛපණ්ණම්පි න වට්ටතීති ඉදමස්ස විධානං. පභෙදතො පන අයම්පි තිවිධො හොති. තත්ථ උක්කට්ඨස්ස අඤ්ඤත්‍ර උච්ඡුඛාදනකාලා කචවරම්පි ඡඩ්ඩෙතුං න වට්ටති. ඔදනපිණ්ඩමච්ඡමංසපූවෙපි භින්දිත්වා ඛාදිතුං න වට්ටති. මජ්ඣිමස්ස එකෙන හත්ථෙන භින්දිත්වා ඛාදිතුං වට්ටති. හත්ථයොගී නාමෙස. මුදුකො පන පත්තයොගී නාම හොති. තස්ස යං සක්කා හොති පත්තෙ පක්ඛිපිතුං සබ්බං හත්ථෙන වා දන්තෙහි වා භින්දිත්වා ඛාදිතුං වට්ටති. ඉමෙසං පන තිණ්ණම්පි දුතියකභාජනං සාදිතක්ඛණෙ ධුතඞ්ගං භිජ්ජති. අයමෙත්ථ භෙදො. අයං පනානිසංසො. නානාරසතණ්හාවිනොදනං අත්‍රිච්ඡතාය පහාණං ආහාරෙ පයොජනමත්තදස්සිතා ථාලකාදිපරිහරණඛෙදාභාවො අවික්ඛිත්තභොජිතා අප්පිච්ඡතාදීනං අනුලොමවුත්තිතාති.

නානාභාජනවික්ඛෙපං
හිත්වා ඔක්ඛිත්තලොචනො
ඛණන්තො විය මූලානි
රසතණ්හාය සුබ්බතො.

සරූපං විය සන්තුට්ඨිං
ධාරයන්තො සුමානසො
පරිභුඤ්ජෙය්‍ය ආහාරං
කො අඤ්ඤො පත්තපිණ්ඩිකොති.

අයං පත්තපිණ්ඩිකඞ්ගෙ සමාදාන විධානප්පභෙද භෙදානිසංසවණ්ණනා.

( ස* )

පත්තපිණ්ඩිකඞ්ගම්පි, පත්තපිණ්ඩිකාඞ්ගයද; දුතියකභාජනං පටික්ඛිපාමි, දෙවන භාජනය පිළිකෙව් කෙරෙමි; පත්තපිණ්ඩිකඞ්ගං සමාදියාමීති, පත්තපිණ්ඩිකාඞ්ගය සමාදන්වෙමි යන; ඉමෙසං, මොවුන් අතුරෙන්; අඤ්ඤතරවචනෙන, එක්තරා වචනයකින්; සමාදින්නං හොති, සමාදන්වනලද්දේවේ; තෙන පත්තපිණ්ඩිකෙන, ඒ පත්තපිණ්ඩික මහණහු විසින්; යාගුපානකාලෙ, කැඳවළඳනකල; භාජනෙ ඨපෙත්වා බ්‍යඤ්ජනෙ ලද්ධෙ, භාජනයෙහි තබා අවුළු ලදකල; පඨමං ඛාදිතබ්බං (හබුහෙවා පිළිගෙණ) පළමුකොට අවුළුකෑයුතු; යාගුවා පාතබ්බා (අවුළුඔත් බජුත් හෝ පිළිගෙණ) හබුයෙහි පළමුකොට පියයුතු; සචෙ පන, ඉදින්; යාගුයං පක්ඛිපති, අවුළු හබුයෙහිම බහාලත්නම්; පූතිමච්ඡකාදිම්හි බ්‍යඤ්ජනෙ පක්ඛිත්තෙ, කුනුමස් ආදී අවුළු බහාලූකල්හි; යාගුපටික්කූලා හොති, හබු පිළිකුල්වේ නම්; අප්පටික්කූලං කත්වා, නොපිළිකුල්කොට; භුඤ්ජිතුං වට්ටති, වළඳත්හට වටී (පිළිකුල්දූය වැළඳුකල බඩහොසිට නැඟීද යන්නේය එහෙයින් පිළිකුල්නොවනසේ වෙන වෙන වැළඳියයුතුය යුතැනි) තස්මා, එහෙයින්; තථාරූප බ්‍යඤ්ජනං සන්ධාය, මෙබඳු බ්‍යඤ්ජනය සඳහා; ඉදං වුත්තං, මේ කියනලද (කුමක්කීනියාදයත්; යම් බ්‍යඤ්ජනයක් හබුයෙහි ලා බොණකල්හි පිළිකුල්වේද එවැනි බ්‍යඤ්ජනය සඳහා "බ්‍යඤ්ජනංවා පඨමං ඛාදිතබ්බං යාගුවා පාතබ්බා"

යන මේ කියනලද යුතැති) මධුසක්ඛරාදිකං, මධුසර්කරාදිවූ; යම්පන අපටිකූලං හොති, යම්අවුලෙක් පිළිකුල් නොවේද; තං, එය; පක්ඛිපිතබ්බං, හුඹුයෙහිම බහාලියයුතු; ගණ්හන්තෙන ච, පිළිගන්නහු විසිනුදු; පමාණ යුත්තමෙව ගණ්හිතබ්බං, පමණ යුක්ත කොටම ගතයුතු (එකභාජනයෙහිම ගණිම්සි බොහෝකොටගෙණ නොදුම්ය යුතුය යුතැනී) ආමකසාකං (මිරිස අතු ඈ) අමුඅතු; හත්ථේන ගහෙත්වා, අතින්ගෙණ; ඛාදිතුං වට්ටති, කන්නට වටනේය; තථාපන අකත්වා, එසේනොකොට; පත්තෙයෙව පක්ඛිපිතබ්බං, පාත්‍රම එවියයුතු (අතද දෙවන භාජනයක්වැනි බැවින් සරුප්පිණිස පාත්‍රම එවියයුතුය යුතැති) දුතියක භාජනස්ස පටික්ඛිත්තත්තා, දෙවනභාජනය පිළිකෙව්කල බැවින්; අඤ්ඤං රුක්ඛපණ්ණම්පි න වට්ටති, අනික්රුක්පතෙකුදු නොවටිසී; ඉදං; මේ; අස්ස, මොහුගේ; විධානං, විධිසී; පභෙදතොපන, ප්‍රභෙදහෙයින් වනාහි; අයම්පි, මේද; තිවිධොහොති, තුන් වැදෑරුම්වේ.

තත්ථ; ඔවුන්කෙරෙහි; උක්කට්ඨස්ස, උත්කට හට; අඤ්ඤත්‍ර උච්ඡුඛාදනකාලා; සපදූමිය යුතුබැවින් උක් දඩුකනකලින් පිටත්ව; කචවරම්පි, කසළකුදු; ඡඩ්ඩෙතුං, හරණට; න වට්ටති, නොවටී; ඔදනපිණ්ඩ, බත් කැටී; මච්ඡමංස පූවෙපි, මත්ස්‍ය මාංසය අපූපය යනමේ; භින්දිත්වා, දතින් බිඳ; ඛාදිතුං න වට්ටති, කන්නට නොවටී; මජ්ඣිමස්ස, මැදුමහට; එකෙන හත්ථේන භින්දිත්වා, එක්අතෙකින් බිඳ; ඛාදිතුං වට්ටති, කන්නට වටී; එසො, මේතෙම; හත්ථයොගී නාම, අතින් කරණ ප්‍රයොග ඇති බැවින් හත්ථයොගී නම් වේ, මුදුකො පන, මෘදුහු වනාහි; පත්තයොගී නාම, පත්තයොගී නම් වේ; තස්ස, ඒ පත්තයොගීහට; යං සක්කා හොති පත්තෙ පක්ඛිපිතුං, යමෙක් පාත්‍ර බහාලනුවට පිළිවන්ද; සබ්බං, සියල්ල; හත්ථෙන වා. අතින්හෝ; දන්තෙන වා, දතින්හෝ; භින්දිත්වා ඛාදිතුං වට්ටති, බිඳ කන්නට වටී; ඉමෙසම්පන තිණ්ණම්පි, මේ තුන්දෙනාහටම; දුතියකභාජනං සාදියනක්ඛණෙ, දෙවනභාජනය ඉවසුමෙහාණෙහි; ධුතඞ්ගං භිජ්ජති, ධුතඞ්ගය බිඳේ; අයං, මේ; එත්ථ, මෙහි; භෙදො, භෙදයි; අයම්පන, මේ වනාහි; ආනිසංසො, අනුසසි; නානාරසතණ්හාවිනොදනං, නානාරස වැලඳීමෙහි තණ්හා දුරුකිරීමය; අත්‍රිච්ඡතාය පහාණං, නානාභාජනගත රසෙහි ඉච්ඡාදුරුකිරීමය; ආහාරෙ, අහරෙහි; පයොජනමත්තදස්සිතා, ප්‍රයොජන මාත්‍රදක්මය (තුමූසුරසෙහි ගිජුනොව එක්කොට වලඳන බැවින් අහරෙහි බුදුන් විසින් අනුදත් ජීවිතෙන්ද්‍රිය පවත්වන මතුප්‍රයොජනය දක්නාබව යුතැති) ථාලකාදි පරිහරණ ඛෙදාභාවො, සක්තලුආදීන්ගේ පරිහරණයෙහි ඛෙදනැතිබවය; අවික්ඛිත්තභොජිතා, නානාභාජනගත වූ ව්‍යඤ්ජනයෙහි එක භාජනගත සංඥා ඇති බැවින් අවික්ෂිප්තවූ භොජනඇතිබවය (තත්තද්භාජනගත සංඥ ඇතිබව වැළකීම යුතැති) අප්පිච්ඡතාදීනං අනුලොම වුත්තිතාති, අපිස් බැවූ ආදීන්ට අනුලොම්වූ පැවතුම් ඇතිබවයි.

නානාභාජන වික්ඛෙපං, නානාභාජනගත වික්ෂෙපය; හිත්වා. හැර; ඔක්ඛිත්තලොචනො, පත්තසංඥයෙන් යටහෙලූ ඇස්ඇතිව; රසතණ්හාය, රසතණ්හායෙහි; මූලානි ඛණන්තොවිය, මුල්කණින්නක්හු මෙන්; සුබ්බතො, සුන්දරවූ ව්‍රත ඇතිව;

සරූපං සන්තුට්ඨිං ධාරයන්තා විය, සිරුරුඇති තුෂ්ටිය දරන්නෙකු බඳුවූ (මූර්තිමත් තුෂ්ටිය දරන්නෙකු වැනිය යුතැති) සුමානසො, සුන්දරවූ මනස් ඇතිව; පත්තපිණ්ඩිකා අහෙසුං, පත්ත පිණ්ඩිකයාම්සඅන්කවරෙක්; ආහාරං පරිභුඤ්ජෙය්‍ය, අහරවළඳන්නට සමර්ථවන්නේද (නානාභාජනයෙහි වික්ෂෙප දුරුකොට පාහිහුණුඇස් ඇතිව රසතණ්හාව මුලින් උදුරන්නක්හුමෙන් සුන්දරවූ ව්‍රතඇතිව සිරුරුමත් සන්තුෂ්ටිය දරන්නක්හුමෙන් සුන්දරවූ මනස්ඇතිව පත්තපිණ්ඩිකයා අතර වළඳනුවට සමර්ථවෙයි යුතැති)—

( හා * )

ඒකාසනිකාඞ්ගයට අනතුරුව පත්තපිණ්ඩිකාඞ්ගයයි ඒ සමාදන්වන මහණ විසින් ප්‍රත්‍යෝක්ත නියායෙන් "දුතියකභාජනං පටික්ඛිපාමි පත්තපිණ්ඩිකාඞ්ගං සමාදියාමි"යි පාත්‍රයට දෙවන භාජනය ප්‍රතික්ෂෙපකෙරෙමි පත්තපිණ්ඩිකාඞ්ගය සමාදන්වෙමි යන වචන අතුරෙන් එක්තරා වචනයකින් හෝ වචනවලයෙන්ම හෝ සමාදන්වන ලද්දේවෙයි. ඒ පත්තපිණ්ඩිකාඞ්ගය පූරණ මහණ විසින් කැඳඅවුළු වළඳනකල බඳුනෙහි තබා අවුළු ලද්දේවීනම් ඒ අවුළු පාත්‍රයෙන් පිළිගෙණ පළමුකොට වැළඳියයුතුය කැඳ හෝ පාත්‍රයෙන් පිළිගෙණ පළමුව පියයුතුය කුමක් හෙයිනයත්? ඉදින් අවුළු කැදෙහි බහාලූයේනම් කුණුමස් ආදි අවුළු බහාලීමෙන් කැඳ පිළිකුල් වන්නේය පිළිකුල්වීමෙන් වමනය වන්නේය එහෙයින් පිළිකුල් නොවන පරිද්දෙන් වෙන වෙනම පරිභොගකළයුතුයි. එහෙයින් එබඳු පිළිකුල් උපදනා ආහාර සඞ්ඛාරය වළකණු සඳහා කැඳහෝ අවුළු හෝ පළමුව වැළඳියයුතුයයි යන මෙ වචනය කියනලද්දයි දතයුතුයි,

මිසකුරුආදීවූ පිළිකුල්නොවූ යමක් ලැබුනේවීනම් ඒ පාත්‍රයෙහිම බහාලියයුත්තේය. අහර පිළිගන්නහු විසිතුදු හඹහට යැපෙනපමණ සූකාත කොට පිළිගතයුතුයි මිරිස් අතුආදි අමුඅතු අතින්ගෙණ වැළඳියයුතුවූවද අනත් දෙවන පාත්‍රයක් වැතිබැවින් එසේ නොකොට පාත්‍රයෙහිම බහාලියයුතුයි දෙවනභාජනය ප්‍රතික්ෂෙපකළ බැවින් අතික් කොළපත්ආදියක්ද නොවටනේය යනු මේ පත්තපිඩිකාඞ්ගය පිළිපදනාවිධියි. ප්‍රභෙදවශයෙන් මේ ධුතාඞ්ගයද උත්කෘෂ්ට මධ්‍යම මෘදුකවශයෙන් තුන්වැදෑරුම්වෙයි ඒ තුන්දෙනා අතුරෙන් උත්කෘෂ්ට ධුතාඞ්ගධරයාහට සප දමියයුතුබැවින් උග්ගස්මිස සෙසු අහරක් වළඳනකල ඒ අහරෙහි තුඹු කැලිකසළකුදු ඉවත නොදැමියයුතු වෙයි එසේම බත් කැටි මත්ස්‍යමාංශ පූපාදිය දතින් බිඳ වළඳන්නටද නොවටින් මැයි මධ්‍යම ධුතාඞ්ගධරයාහට එකඅතකින් බිඳ වළඳන්නට වටනේය. එහෙයින්ම මේතෙම හත්ථයොගීනම් වෙයි. මෘදුකයාහට යමක් පාත්‍රයෙහි බහාලියහැකිවේද ඒ සියල්ල අතින් හෝ දතින් හෝ බිඳ වළඳන්නට වටනේය එහෙයින්ම මේතෙම පත්තයොගිනම්වේ.

මේ තුන්දෙනහටම දෙවන භාජනයක් ඉවසූකෙණෙහිම ධුතාඞ්ගය බිඳෙන්නේය යනු මෙහි බිඳුමයි. මේ මතු දත්වන්නේ ආනිසංසයි. නොයෙක් රස වැළඳීමෙහි ආසාව දුරුකිරීමය නොයෙක් භාජනයන්ට බෙදූ නොයෙක් රසයන්කෙරෙහි උපදනා ආසාව දුරුකිරීමය තුඹුසුරසයෙහි ගිජුනොව එක්කොට වළඳනා බැවින් ආහාරයෙහි බුද්ධන් විසින් අනු

දන්නාලද ජීවිතෙන්ද්‍රිය පැවැත්වීමයයි කියනලද ප්‍රයෝජනමාත්‍රයක් දක්නා බවය, ගලුහැපීආදිය පරිහරණය කිරීමෙහි විධානැතිබවය, නොයෙක් භාජනයන්ට බෙදූ ව්‍යඤ්ජනයෙහි එකබඳුනට බෙදූ සංඥා ඇතිබැවින් අවික්ෂිප්ත භෝජන ඇතිබවය, අල්පේච්ඡතාදී ආර්‍යගුණයන්ට අනුලෝම් පැවතුම් ඇතිබවය යනමේතෙක් ආනිසංස ඇත්තාහුයි.

එහෙයින් කීයේමැයි. නොයෙක් භාජනගතවූ විත්තවික්ෂේපය හැර පාත්‍රසංඥාවෙන් යව හෙලූ ඇස්ඇතිව රසතෘෂ්ණාවෙහි මුල් උදුරන්නෙකු මෙන් මනාවූත ඇත්තාවූ මූර්තිමත් සන්තෝෂය උසුලන්නෙකු මෙන් නොසිත් ඇත්තාවූ පත්තපිණ්ඩිකාඞ්ගධර මහණ හැර අන්කවරෙක් අහර වලඳන්නට සමර්ථවන්නේද නොවන්නේමැයි.

මේ පත්තපිණ්ඩිකාඞ්ගයෙහි සමාදන්වීමය, පිළිපදනා විධිය, විභාගය, බිඳීමය, ආනිසංසය යන අර්ථපඤ්චකයාගේ වර්ණනායි—

( ෂා † )

ඛළුපච්ඡාභත්තිකඞ්ගම්පි අතිරිත්ත භොජනං පටික්ඛිපාමි ඛලුපච්ඡාභත්තිකඞ්ගං සමාදියාමීති— ඉමෙසං අඤ්ඤතර වචනෙන සමාදින්නං හොති— තෙන ඛලුපච්ඡාභත්තිකෙන පවාරෙත්වා පුන භොජනං කප්පියං කාරෙත්වා න භුඤ්ජිතබ්බං ඉදමස්ස විධානං— පභෙදතො පන අයම්පි තිවිධො හොති— තත්‍ථ උක්කට්ඨො යස්මා පඨමපිණ්ඩෙ පවාරණා නාම න හොති තස්මිං පන අජ්ඣොහරියමානෙ අඤ්ඤං පටික්ඛිපතො හොති තස්මා එවං පවාරිතො පඨමපිණ්ඩං අජ්ඣොහරිත්වා දුතියපිණ්ඩං න භුඤ්ජති— මජ්ඣිමො යස්මිං භොජනෙ පවාරිතො තදෙව භුඤ්ජති— මුදුකො යාව ආසනා න වුට්ඨාති තාව භුඤ්ජති— ඉමෙසං පන තිණ්ණම්පි පවාරිතානං කප්පියං කාරෙත්වා භුත්තක්ඛණෙ ධුතඞ්ගං භිජ්ජති අයමෙත්ථ භෙදො— අයං පනානිසංසො— අනතිරිත්ත භොජනාපත්තියා දූරභාවො, ඔදරිකත්තස්ස අභාවො, නිරාමිසසන්නිධිතා පුන පරියෙසනාය අභාවො, අප්පිච්ඡතාදීනං අනුලොම වුත්තිතාති—

පරියෙසනාය ඛෙදං
නයාති නකරොති සන්නිධිංධීරො
ඔදරිකත්තං පජහති
ඛළුපච්ඡාභත්තිකො යොගී—
තස්මා සුගතපසත්ථං
සන්තොසගුණාදිවුද්ධි සඤ්ජනනං
දොසෙ විධුනිතු කාමො
භජෙය්‍ය යොගී ධුතඞ්ගමිදන්ති—

අයං ඛළුපච්ඡාභත්තිකඞ්ගෙ සමාදාන විධානප්පභෙද භෙදානිසංස වණ්ණනා—

( ෂ † )

ඛලුපච්ඡාභත්තිකඞ්ගම්පි, ඛලුපච්ඡාභත්තිකාඞ්ගයද; අතිරිත්තභොජනං පටික්ඛිපාමි, පැවරීඇවැඳකල පළමු කොට වැළඳියයුතු භෝජනය පිළිකෙව් කෙරෙමි; ඛලුපච්ඡාභත්තිකඞ්ගං සමාදියාමිති, ඛලුපච්ඡභත්තිකාඞ්ගය සමාදන්වෙමියියන; ඉමෙසං, මොවුන්කෙරෙන්; අඤ්ඤතරවචනෙන, එක්තරාවචනයෙකින්; සමාදින්නං හොති, සමාදන්වනලද්දේ වේ; තෙන ඛලුපච්ඡාභත්තිකෙන, ඒ ඛලුපච්ඡාභත්තිකයා විසින්, පවාරෙත්වා, පැවරීඇවැද; කප්පියං කාරාපෙත්වා, කැපකරවා; පුනනභුඤ්ජිතබ්බං, නැවත නොවැළඳියයුතු; ඉදං, මේ; අස්ස, ඔහුගේ; විධානං, විධාන යයි. පභෙදතො පන, ප්‍රභෙදයෙහිත් වනාහි; අයම්පි, මේද; තිවිධො හොති,

ආන්මැදූරැම්වේ; තාථ, එහි; උපාත
රිත්තා. උපාව; සයා, සම්භෙගකින්;
පයම පිණ්ඩ පවාරණා නාම නැති, ප
ළමුවන පිඬපැවිරීනම් නැද්ද; තසමිං,
ඒ ප්‍රථම පිණ්ඩය; අපෙකඛාහරිසම
ංතා, වළඳනු ලැබෙමින් සිටිකල්හි;
අපරං පටිකඛිපතො, අන්බොජ්
හන් පිළිකෙව්කරන්නාහට; හොති,
පැවිරීවේ; තසමා, එහෙයින්; එවං
පවාරිතො, මෙසේ පැවිරී අවන්තේ;
පඨමපිණ්ඩං අපෙකඛාහරිතිබා, පළමු
වන වළඳනුදු නිසම්ණ්ඩං න අභුඤ්ජති, දෙ
වන පිඬ නොවළඳ; පිණ්ඩිකමො, මිදූ
ළ; සාධිං භොජනෙන පවාරිතො, සම්
භොජනයක් පැවරී ඇවැද්ද; තදෙ
ව භුඤ්ජති, ඒ ව වළඳ; මූදුකො, මෘදු
ගසා; සාව ආසනා න උට්ඨාති, සම්
හාත් අස්නෙන් නොනැගේද; තාව
භුඤ්ජති, ඒතාක් වළඳ; පවාරිතානං,
පැවිරිඅැවුන්; ඉමෙසම්පන තිණ්ණම්පි,
මේ තුන්දෙන හට; කාපටි කාගෙර
ඩා, කැපකරවා; භූතාහාරං, වැල
දුකෙණෙනි; ධුතඞ්ගං භිජ්ජති, ධුතඟ
බිඳේ; අයං මෙත්ථ භෙදො, මේ මෙහි
හෙදයි; අයං ආනිසංසො, මේ ආනි
සංසයි, අනුසසි; අනතිරිත්තභොජ
නාපත්තියා දූරිහාවො, නැපනොකළ
වැලඳීමෙන් වන ඇවැතින් දුරුවීමය;
ඔදරිකත්තාභාවො, එක පිඬකින්ද
යැපෙනබැවින් කුස පුරන්නැවි නැති
බවය; නිරාමිස සන්නිධිතා, කැපකර
වා වළඳීම්සි ගබන ආමිෂයක් නැති
බවය; පුනපරියෙසනාය අභාවො,
නැවත අහර සෙවීමක් නැතිබවය;
අපපිච්ඡතාදීනං අනුලොමවුත්තිතාති,
අපිස්බැව් ආදීන්ට අනුලොම්වූ පැව
තුම්ඇතිබවයි. ඔහු, ඔහුවූ; ඛලුපච්ඡා
භත්තිකො යොගී, ඛලුපච්ඡා භත්තික
යොගීතෙමේ; පරිෙයසනාය ඛෙද
නාකායානි, පැවිරිඇවැද නොබොජ්නා

බැවින් සෙවීමෙන්වන ශ්‍රමයට නො
පැමිණේ; සන්නිධිං න කරොති, ආමි
ෂ සන්නිධියද නොකෙරෙයි; ඔදරි
කත්තං පජහති, කුස්පුරණ සුලුවැව්
දුරු කෙරෙයි; තසමා, එහෙයින්; සුග
තපසත්ථං, සුගතන්හු විසින් පසස්නා
ලද; සන්තොස ගුණාදිවුඩ්ඪිසඤ්ජනනං,
සන්තොසගුණාදීන්ගේ වෘද්ධිය ක
රන්නාවූ; ඉදං ධුතඞ්ගං, මේ ධුතාඞ්ග
ය; දෙසෙවිතුං අරහතෙව, දොෂ නැත්
තසනු නැමති; යොගී, යොගීතෙමේ;
හජෙය්‍ය, සෙවුනේයි.

——— ooo ———

( හා † )

ඛලුපච්ඡාභත්තිකාඞ්ගයට අනතුරුව
ඛලුපච්ඡාභත්තිකාඞ්ගයයි. ඒ සම්දන්
වන්නනු විසින් පූර්වාකානිසාවෙන්
අනතිරිත්තභොජනං පටික්ඛිපාමි ඛලු
පච්ඡාභත්තිකඞ්ගං සමාදියාමි"යි ආ
හාර පවාරණයකොට නැවත කැප
කොට ගන්නාලද භොජනය ප්‍රති
ක්ෂෙපකරමි ඛලුපච්ඡාභත්තිකාඞ්ගය
සමාදන්වෙමි යනාමේ දෙවනවගයෙන්ම
හෝ එක්තරා වචනයකින් හෝ සමා
දන්වනලද්දේවෙයි. ඒ ඛලුපච්ඡාභ
ත්තිකාඞ්ගධර තෙමේ විසින් පවාරණ
කරන්ලද ආහාරය කැපකරවාගෙණ
නැවත නොවැලඳියයුතුය යනු මෙහි
පිළිපදනා විධියි. ප්‍රභෙද වශයෙන් ව
නාහි මේ අඞ්ගයද උත්කෘෂ්ට මධ්‍යම
මෘදුක වශයෙන් ත්‍රන්වැදෑරුම් වන්
නේයි. ඔවුන් තුන්දෙනා කෙරෙන්
උත්කෘෂ්ට ධුතාඞ්ගධර මහණ යම්හෙ
යින් පළමුවන පිඬෙහි පවාරණයක්
නම් නැත්තේවේද එහෙයින් ඒ පළ
මුවන පිඬ වළඳමින් සිටිනා කල අන්
පසට ගෙණ යම් ආහාරයක් ප්‍රතික්ෂෙප
කරන්නාහට පවාරණය වන්නෙ
යේ ඒ පළමුවන පිඬ වළඳ දෙවන

පිඩ නොවලදන්නේයි. මධ්‍යම ධුතාඞ්ගධර මහණ යම් භොජනයක් පවාරණ කෙළේද එම භොජනය කැප කරවා වලදයි අනික් භොජනයක් නොවලදන්නේයි. මෘදුක ධුතාඞ්ගධර මහණ යම්තාක් අස්නෙන් නොනැගේද ඒතාක් වලදන්නේයි මේ තුන් දෙන හදිම පවාරණකරණලද අහරක් කැපකරවා වැලදූ කෙණෙහිම ධුතාඞ්ගය බිඳෙන්නේය යනු මෙහි බිඳීමයි.—

මේ මතු දක්වන්නේ ආනිසංසයි. කැපනොකළ වැළඳීමෙන්වන ඇවිතින් දුරුවීමය එක පිණ්ඩකි නුදු යැපෙනබැවින් කුසපිරෙණබැවි නැතිබවය කැපකරවා වළඳම්යි තබන ආමිෂ නැතිබවය නැවත අහර සෙවීමක් නැතිබවය අල්පේච්ඡතාදි ගුණයන්ට අනුලොම් පැවතුම් ඇතිබවය යන මෙතෙක් අනුසස් ඇත්තාහුයි. එහෙයින් කීයේමැයි.—

ධෛර්‍ය්‍යවත්වූ මේ බලුපච්ඡාභත්තිකාඞ්ගධර මහණ පවරා නැවත නොවලදනබැවින් අහර සෙවීමෙන් විඩාවට නොපැමිණෙයි ආමිෂසන්නිධිය නොකරන්නේයි. කුස්පුරා අහර බුදිනබව දුරුකරන්නේයි එහෙයින් සුගන්හු වසින් පසස්නාලද ලදදෙයකින් සතුටුවීම් ආදී ගුණයන් උපදනය කරන්නාවූ මේ බලුපච්ඡාභත්තිකාඞ්ගයරණාදි දොෂ නසනු කැමැති යොගාවචර මහණ තෙමේ සෙවනය කරන්නේයි.—

මේ බලුපච්ඡාභත්තිකාඞ්ගයෙහි සමාදන්වීමය පිළිපැදීමය විභාගය බිඳීමය අනුසස්ය යන අඩී පඤ්චකයාගේ වර්ණනායි.—

——ooo——

( පා ‡ )

ආරඤ්ඤකඞ්ගම්පි ගාමන්තසෙනාසනං පටික්ඛිපාමි ආරඤ්ඤකඞ්ගං සමාදියාමීති ඉමෙසං අඤ්ඤතර වචනෙන සමාදින්නං හොති.— තෙන පන ආරඤ්ඤකෙන ගාමන්තසෙනාසනං පහාය අරඤ්ඤෙ අරුණං උට්ඨාපෙතබ්බං තත්ථ සද්ධිං උපචාරෙන ගාමො යෙව ගාමන්තසෙනාසනං.— ගාමො නාම යො කොචි එක කුටිකො වා අනෙකකුටිකො වා සපරික්ඛිත්තො වා අපරික්ඛිත්තො වා සමනුස්සො වා අමනුස්සො වා අන්තමසො අතිරෙක චාතුමාසනිවිට්ඨො යො කොචි සත්ථොපි ගාමූපචාරො නාම පරික්ඛිත්තස්ස අනුරාධපුරස්සෙව වෙ ඉන්දඛීලා හොන්ති අබ්භන්තරිමෙ ඉන්දඛීලෙ ඨිතස්ස ථාම මජ්ඣිමස්ස ලෙඩ්ඩුපාතො තස්ස ලක්ඛණං යථා තරුණ මනුස්සා අත්තනො බලං දස්සෙත්වා බාහං පසාරෙත්වා ලෙඩ්ඩුං ඛිපන්ති එවං ඛිත්තස්ස ලෙඩ්ඩුස්ස පතනට්ඨානබ්භන්තරන්ති විනය ධරා. සුත්තන්තිකා පන කාකනිවාරණ නියාමෙන ඔක්ඛිත්තස්සාපි වදන්ති.— අපරික්ඛිත්තගාමෙ යං සබ්බපරියන්තිමස්ස ඝරස්ස ද්වාරෙ ඨිතො මාතුගාමො භාජනෙන උදකං ඡඩ්ඩෙති තස්ස පතනට්ඨානං ඝරූපචාරො තතො වුත්තනයෙන එකො ලෙඩ්ඩුපාතො ගාමො දුතියො ගාමූපචාරො අරඤ්ඤං පන විනයපරියායෙන තාව ඨපෙත්වා ගාමඤ්ච ගාමූපචාරඤ්ච සබ්බමෙතං අරඤ්ඤන්ති වුත්තං.— අභිධම්මපරියායෙන නික්ඛමිත්වා බහි ඉන්දඛීලා සබ්බමෙතං අරඤ්ඤන්ති වුත්තං.— ඉමස්මිං පන සුත්තන්තිකපරියායෙන ආරඤ්ඤකං පන සෙනාසනං පඤ්චධනු සතිකං පච්ඡිමන්ති ඉදං ලක්ඛණං.— තං ආරොපිතෙන ආචරියධනුනා පරික්ඛිත්තස්ස ගාමස්ස ඉන්දඛීලතො අපරික්ඛිත්තස්ස පඨමලෙඩ්ඩුපාතතො පට්ඨාය යාව විහාරපරික්ඛෙපා මිනිත්වා වවත්ථපෙතබ්බං සචෙ

පන තං විහාරෙ අපරික්ඛිත්තත්තා හොති යං සබ්බපඨමං සෙනාසනං වා භත්තසාලා වා ධුවසන්නිපාතට්ඨානං වා බොධි වා චෙතියං වා දූරෙ චෙපි සෙනාසනතො හොති තං පරිච්ඡෙදං කත්වා මිනිතබ්බන්ති අට්ඨකථාසු වුත්තං, මජ්ඣිමට්ඨකථායං පන විහාරස්සාපි ගාමස්සෙව උපචාරං නීහරිත්වා උභින්නං ලෙඩ්ඩුපාතානං අන්තරා මිනිතබ්බන්ති වුත්තං ඉදමෙත්ථ පමාණං — සචෙපි ආසන්නෙ ගාමො හොති විහාරෙ ඨිතෙහි මානුසකානං සද්දො සුය්‍යති පබ්බතනදීහි පන අන්තරිතත්තා න සක්කා උජුං ගන්තුං යො තස්ස පකතිමග්ගො හොති සචෙපි නාවාය සඤ්චරිතබ්බො තෙන මග්ගෙන පඤ්චධනුසතිකං ගහෙතබ්බං යො පන ආසන්නගාමස්ස අඞ්ගසම්පාදනත්ථං තතො තතො මග්ගං පිදහති අයං ධුතඞ්ගචොරො හොති සචෙ පන ආරඤ්ඤිකස්ස භික්ඛුනො උපජ්ඣායො වා ආචරියො වා ගිලානො හොති තෙන අරඤ්ඤෙ සප්පායං අලභන්තෙන ගාමන්තසෙනාසනං නෙත්වා උපට්ඨාතබ්බො කාලස්සෙව පන නික්ඛමිත්වා අඞ්ගයුත්තට්ඨානෙ අරුණං උට්ඨාපෙතබ්බං. සචෙ අරුණුට්ඨානවෙලායං තෙසං ආබාධො වඩ්ඪති තෙසංයෙව කිච්චං කාතබ්බං න ධුතඞ්ගසුද්ධිකෙන භවිතබ්බන්ති ඉදමෙත්ථ විධානං පභෙදතො පන අයම්පි තිවිධො හොති තත්ථ උක්කට්ඨෙන සබ්බකාලං අරඤ්ඤෙ අරුණං උට්ඨාපෙතබ්බං — මජ්ඣිමො චත්තාරො වස්සිකෙ මාසෙ ගාමන්තෙ වසිතුං ලභති — මුදුකො හෙමන්තිකෙපි — ඉමෙසං පන තිණ්ණම්පි යථාපරිච්ඡින්නෙ කාලෙ අරඤ්ඤතො ආගන්ත්වා ගාමන්තසෙනාසනෙ ධම්මං සුණන්තානං අරුණෙ උට්ඨිතෙපි ධුතඞ්ගං න භිජ්ජති සුත්වා ගච්ඡන්තානං අන්තරාමග්ගෙ උට්ඨිතෙපි න භිජ්ජති සචෙ පන උට්ඨිතෙපි ධම්මකථිකෙ මුහුත්තං නිපජ්ජිත්වා ගමිස්සාමාති නිද්දායන්තානං අරුණං උට්ඨහති අත්තනො වා රුචියා ගාමන්තසෙනාසනෙ අරුණං උට්ඨාපෙන්ති ධුතඞ්ගං භිජ්ජතීති අයමෙත්ථ භෙදො —

අයං පනානිසංසො අරඤ්ඤසඤ්ඤං මනසිකරොන්තො භබ්බො අලද්ධං වා සමාධිං පටිලද්ධුං ලද්ධං වා රක්ඛිතුං සත්ථාපිස්ස අත්තමනො හොති යථාහ තෙනාහං නාගිතස්ස භික්ඛුනො අත්තමනො හොමි අරඤ්ඤවිහාරෙනාති — පන්තසෙනාසනවාසිනො චස්ස අසප්පාය රූපාදයො චිත්තං න වික්ඛිපන්ති විගතසන්තාසො හොති ජීවිතනිකන්තිං ජහාති පවිවෙකසුඛරසං අස්සාදෙති පංසුකූලාදිභාවො චස්ස පතිරූපො හොතීති —

පවිවිත්තො අසංසට්ඨො
පන්තසෙනාසනෙ රතො
ආරාධයන්තො නාථස්ස
වනවාසෙන මානසං —

එකො අරඤ්ඤෙ නිවසං
යං සුඛං ලභතෙ යති
රසං තස්ස න වින්දන්ති
අපි දෙවා සඉන්දකා —

පංසුකූලඤ්ච එසො ච
කවචං විය ධාරයං
අරඤ්ඤසඞ්ගාමගතො
අවසෙසධුතායුධො —

සමත්ථො න චිරස්සෙව
ජෙතුං මාරං සවාහිනිං
තස්මා අරඤ්ඤවාසම්හි
රතිං කයිරාථ පණ්ඩිතොති —

අයං ආරඤ්ඤිකඞ්ගෙ සමාදානවිධානප්පභෙදභෙදානිසංසවණ්ණනා —

——oOo——

( ස ‡ )

ආරඤ්ඤකඞ්ගම්පි, ආරණ්‍යකාඞ්ගද; ගාමන්තසෙනාසනං පටික්ඛිපාමි, ග්‍රාමාන්ත සෙනසුන පිළිකෙව්කෙරෙමි; ආරඤ්ඤකඞ්ගං සමාදියාමීති, ආරණ්‍යකාඞ්ගය සමාදන්වෙමි යන; ඉමෙසං අඤ්ඤතර වචනෙන, මොවුන්කෙරෙහි එක්තරා වචනයෙකින්; සමාදින්නං හොති, සමාදන් වන ලද්දේවේ; තෙන ආරඤ්ඤිකෙන, ඒ ආරණ්‍යකයා විසින්; ගාමන්ත සෙනාසනං පහාය, ග්‍රාමාන්ත සෙනසුන හැර; අරඤ්ඤෙ අරුණං උට්ඨපෙතබ්බං, අරණ්‍යයෙහි අරුණ නැඟවිය යුතු; තත්‍ර, එහි; සද්ධිං උපචාරෙන, උපචාරයහා සමග; ගාමොයෙව ගාමන්තසෙනාසනං, ග්‍රාමයම ග්‍රාමාන්ත සෙනසුන නම්වේ (ගමත් සෙනස්න ගම්හි ඇතුළත්බැවින් ගමත් සෙනසුන්නම් යුතැති "යො චකොචි සත්ථොපි ගාමො නාම" යි සබඳ) යොකොචි, යම්කිසි; එකකුටිකොවා, එකකුටියක් ඇතිවූද; අනෙකකුටිකොවා, බොහෝ කුටි ඇතිවූද; සපරික්ඛෙපොවා, වැට පවුරු ආදීන් පරික්ෂෙප සහිතවූද; අපරික්ඛෙපොවා, පරික්ෂෙප නැත්තාවූද; සමනුස්සොවා, මිනිසුන් ඇතිවූද; අමනුස්සොවා (නැවත එම්හ යන උත්සාහ විනිද ගිය) මිනිසුන් නැතිවූද; අන්තමසො, යටත් පිරිසෙයින්; චාතුමාසනිවිට්ඨො, සාර සත් වසනලද; යො කොචි සත්ථොපි, ජඞ්ඝසත්ථය සකටසත්ථය යන යම්කිසි සාර්ථයකුදු; ගාමො නාම, ගම්නම්වේ—

ගාමූපචාරොනාම, ග්‍රාමොපචාරය නම්; පරික්ඛිත්තස්ස ගාමස්ස, පරික්ෂෙප ඇති ග්‍රාමයාගේ; සචෙ, ඉදින්; අනුරාධපුරස්සෙව, අනුරාධපුරයාගේමෙන්; ද්වෙ ඉන්දඛීලා හොන්ති, එලිපත්හු දෙදෙනෙක් වෙත් නම්; අබ්භන්තරිමෙ ඉන්දඛීලෙ ඨිතස්ස, ඇතුළු එලිපත්හි සිටිනාවූ; ථාම මජ්ඣිමස්ස පුරිසස්ස, බල මැදුම් පුරුෂයාහු; ලෙඩ්ඩුපාතො, ලෙඩ්ඩුපාතයෙකි (තස්ස ලෙඩ්ඩුපාතං විදහාන්ති-සබඳ) ඒ ලෙඩ්ඩුපාතයාගේ ලක්ෂණය; යථා, යම්සේ; තරුණ මනුස්සා, ලදරු මිනිස්හු; අත්තනො බලං දස්සෙන්තා, තමන්ගේ බල දක්වන්නාහු; බාහං පසාරෙත්වා, අතත් දිගුකොට; ලෙඩ්ඩුං ඛිපන්ති, කැටක් ගසද්ද එවෙ ඛිත්තස්ස ලෙඩ්ඩුස්ස පතනට්ඨානබ්භන්තරං, එසේ ගැසූ කැට හුනු තැනින් ඇතුළසී; විනයධරා වදන්ති, විනයධරයෝ කියති; සුත්තන්තිකා පන, සූත්‍රාන්තිකයෝ වනාහි; කාකනිවාරණ නියාමෙන ඛිත්තස්සාති වදන්ති, කවුඩුවන් නෙරණ නියමින් ගැසූ කැට හුණු තැනින් ඇතුළසයෙන්, අපරික්ඛිත්තගාමෙ, පරික්ෂෙප නැති ගම්හි; සබ්බපච්ඡිමස්ස, හැමගෙයින් කෙළවරවූ; ඝරස්ස, ගෙහි; ද්වාරෙ ඨිතො, දොර සිටි මාතුගාමො, ගෑසිවි මාගම; භාජනෙන, බඳුනෙන්; යං උදකං ඡඩ්ඩෙති, යම් දියක් දමාද; තස්ස පතනට්ඨානං, ඒ දිය හුණු තැන්; ඝරූපචාරො, ගෙළ උපචාරනම්වේ; තතො, එයින්; වුත්තනයෙන එකො ලෙඩ්ඩුපාතො, කී නියායෙන් එක් ලෙඩ්ඩුපාතයෙක්; ගාමො, ගම්නම්වේ; දුතියො, දෙවන ලෙඩ්ඩුපාතය; ගාමූපචාරො, ග්‍රාමොපචාරනම්වේ; අරඤ්ඤං පන, අරණ්‍යය වනාහි ("විනය පරියායෙන තාව" යි යොදනු-විනය දෙසනාවෙහි අභිනාදත් පරිජ්ජෙයහි) තාව, පළමු කොට; ඨපෙත්වා ගාමඤ්ච ගාමූපචාරඤ්ච, ගමද ගම්උපවසරදතබා; සබ්බං, සියල්ල; අරඤ්ඤන්ති වුත්තං, අරණ්‍ය යයි කියනලදී; අභිධම්ම පරියායෙන, අභිධර්ම දෙසනාවෙහි; පච්ඡිමං අරඤ්ඤනාම සෙනාසනං, පශ්චිම අරණ්‍ය සෙනසුනනම්; පඤ්චධනුසතිකං, පන්සියයක් දුනු පමණ ඇත්තේයයි;

ඉදං (ලෙඩ්ඩු)පාතං, මේ ලකුණි (තං වච
චං ඨපෙතබ්බං සි යොදනු) තං, ඒ ල
කුණ; ආරොපිතෙන, නගණලද;
ආරොපියඩනුනා, තැබියන් ඇජ යුත්
ගෙනත්; පරික්ඛිත්තස්ස ගාමස්ස, පරි
ක්ෂෙප ඇති ගම්; ඉන්දඛීලතො, එලිප
තාපටන්; අපරික්ඛිත්තස්ස, පරික්ෂෙප
නැති ගම්; පඨම ලෙඩ්ඩුපාතතො ප
ට්ඨාය, ප්‍රථම ලෙඩ්ඩුපාතයෙහි පටන්
(මෙතන "ගාමෙවාගෙව ගාමූපචාරො"යි
ගෙන්) යාව විහාර පරික්ඛෙපා, යම්
තාක් විහාර පරික්ෂෙපය දක්වා; මිනි
තබ්බං, මැන; ඨපෙතබ්බං, තියාය
යුතු; සචෙපන, ඉදින්; විහාරෙ,
වෙහෙර; අපරික්ඛිත්තො හොති, පරි
ක්ෂෙප නැත්තේවීනම්; සබ්බ පඨමං,
සියල්ලට පළමු; යං සෙනාසනං වා,
යම් සෙනසුනක් හෝ; භත්තසාලාව,
බත්හලක් හෝ; ධුව සන්නිපාතට්ඨා
නං වා, නිති රැස්වෙනතැනක් හෝ;
බොධි වා, බොධියක් හෝ; චෙතියං වා,
චෛත්‍යය හෝ; දූරෙපි සෙනාසන
තො හොති, සෙනසුනෙන් දුරවී
නම්; තං පරිච්ඡෙදං කත්වා, ඒ සීමා
කොට; මිනිතබ්බන්ති, මිනියයුතුයයි;
විනයවිනිච්ඡයෙසු වුත්තං, විනය අටුවා
යෙහි කීයනලද; මජ්ඣිමට්ඨකථාය
ම්පන, මැදුම් සංගී අටුවායෙහි; විහා
රස්සාපි, විහාරයාගේද; ගාමස්සෙව,
ග්‍රාමයාගේමෙන්; උපචාරං නීහරිත්වා,
උපචාරය එළවා; උභින්නං ලෙඩ්ඩු
පාතානං අන්තරා, උභය ලෙඩ්ඩුපාත
යන්ගේ අතුර; මිනිතබ්බන්ති, මිනිය
යුතුයයි; වුත්තං, කීයනලදී; ඉදමෙ
ත්ථපමාණං (මේද සූත්‍රාගත වණ්ණිත
නුයි) මෙහිමේපමණයි; සචෙ, ඉදින්; ආ
සන්නො ගාමො හොති, ආසන්නයෙහි
ගමෙක්වීනම්; විහාරෙ ඨිතෙහි, වෙ
හෙර සිටියවුන් විසින්; සද්දෝ සූයති,
ශබ්දය අසනුලැබේනම්; පබ්බත නදී

ආදීහි පන, පර්වත නදී ආදීන් චනති;
අන්තරිකා හොති; අන්තරිත වෙහයින්; න
සක්කා උජුං ගන්තුං, සෘජුවයන්නට
නොපිළිවන්ද; තස්ස, ඒ වෙහෙරට;
යොපකති මග්ගො, යම්ප්‍රකෘති මගෙක්
වීද; සචෙ, ඉදින්; නාවාය සඤ්චරි
තබ්බො, ඒ මග නැවින් යායුතුවීනම්;
තෙන මග්ගෙන, ඒ මගින්, පඤ්ච
ධනුසතිකා, පන්සියයක් දුනුපමණ;
ගහෙතබ්බං, ගතයුතු; යොපන, යම
මෙක් වනාහි; ආසන්නගාමස්ස, ආ
සන්න ග්‍රාමයාගේ: අඞ්ගසම්පාදනත්ථං,
අඞ්ගය සපයා දුනු පන්සියයක් සපය
නුපිණිස; තතො තතො මග්ගංපිදහ
ති, ඒඒ තැන්හි කුඩා මං හසුවාද;
අයං, මේතෙම; ධුතඞ්ගචොරොනාම
හි, දූතඟ චෞරනම් වේ; සචෙ පන,
ඉදින් වනාහි; ආරඤ්ඤිකස්ස භික්ඛු
නො, ආරණ්‍යක භික්ෂුහුගේ; ආචරි
යො වා, ආචාර්යෙ හෝ; උපජ්ඣායො
වා, උපාධ්‍යායෙ හෝ; ගිලානො හොති,
ගිලන්වූ හොත්; තෙන, ඒ ආරණ්‍යකයා
විසින්; අරඤ්ඤෙ සප්පායං අලභ
න්තෙන, අරණ්‍යයෙහි සැපනොල
බන්නානු විසින්; ගාමන්තසෙනාසනං
නෙත්වා, ග්‍රාමාන්ත සෙනස්නට ගෙණ
ගොස්; උපට්ඨාතබ්බො, උපස්ථාන
කටයුතු; කාලෙයෙව පන නික්ඛමි
ත්වා, කාලයෙහිම නික්ම; අඞ්ගයු
ත්තෙ ඨානෙ, අඞ්ගයුක්ත ස්ථානයෙ
හි; අරුණං උට්ඨාපෙතබ්බං, අරුණු
නැගියයුතු; සචෙ, ඉදින්; අරුණුට්ඨා
නවෙලායං, අරුණුනැගෙන වේලෙ
හි; තෙසං ආබාධො වඩ්ඪති, ආචාර්ය
උපාධ්‍යායයන්ගේ ආබාධය වඩීනම්;
තෙසංයෙව කිච්චං කාතබ්බං, ඔවුන්
ගේම කෘත්‍ය කටයුතු; න ධුතඞ්ග සුද්ධි
කෙන භවිතබ්බං, දූතඟ පිරිසිදුකිරී
මෙහි යුක්තාවූවන් විසින් නොවියයුතු;
ඉදං විධානං, මේ මෙහි විධානයයි;
පභෙදතො පන, ප්‍රභෙදයෙන් වනා

හි; අයමපි, මෙද; තිවිධොහොති, තුන්
වැදෑරුම්වේ; තත්‍ථ, එහි; උක්කට්ඨෙන
න, උත්තමවූ විසින්; සබ්බකාලං, හැම
කල්හිම; අරඤ්ඤෙ, අරණ්‍යයෙහි;
අරුණං උට්ඨාපෙතබ්බං, අරුණු නැගී
යයුතු; මජ්ඣිමස්ස, මැදෑමු; චත්තාරො
වස්සිකෙ මාසෙ, සතර වර්‍ෂා මාසයෙ
හි; ගාමන්තෙ වසිතුං ලභති, ග්‍රාම
න්තයෙහි වසන්නට ලැබේ; මුදුකො,
මෘදුකයා; හෙමන්තිකෙපි, හිම සාර
මසද (ගිම්හි වසන්නට ලැබේ) ඉමෙ
සංපන තිණ්ණම්පි, මේ තුන්දෙනාව
ම; යථා පරිච්ඡින්නෙ කාලෙ, තමන්ට
පිරිසුත් කල්හි (උක්කට්ඨට තුන් සෘතු
වෙහිම මැදුමහට සෘතුවෙහිම මුදු
කයහට එක සෘතුයෙහිමය දූනැති)
අරඤ්ඤතො ආගන්ත්වා, අරණ්‍ය
යෙන් අවුත්; ගාමන්තසෙනාසනෙ
ධම්මං සුණන්තානං, ගමත් සෙනස්නෙහි
බණ අසන්නාහු; අරුණං උට්ඨිතෙපි,
දූන අරුණු නැගද; ධුතඩ්ගං න භි
ජ්ජති, සොත්සාහිබැවින් දුහඟ නො
බිදේ; සුත්වාන ගච්ඡන්තානං පන, බ
ණ අසා යන්නවුන්ට; අන්තරාමග්ගෙ,
අතුරු මග; උට්ඨිතෙපි, අරුණු නැඟ
ද; න භිජ්ජති, දුහඟ නොබිදේ; සචෙ
පන, ඉදින් වනාහී; උට්ඨිතෙපි ධම්ම
කථිකෙ, බණ කථිකයා අස්නෙත් නැ
ගි කල් හිඳු; මුහුත්තං නිපජ්ජිත්වා ගමි
ස්සාමීති, මොහොතක්හෙව සැතපී
යම්හයි, නිද්දායන්තානං, නිදනනත්
ට; අරුණං උට්ඨහති, ඇරුණු නැඟී
නම්; ධුතඩ්ගං භිජ්ජති (සිත් ලිහිල්කල
බැවින්) දුහඟ බිදේ; අත්තනොවා රු
චියා, තමන්ගේ රුචියෙන් හෝ; ගා
මන්ත සෙනාසනෙ, ගමාත් සෙනස්
නෙහි; අරුණං උට්ඨාපෙන්තස්ස, අරුණු
නඟන්නාම්; ධුතඩ්ගං භිජ්ජති, දුහඟ
බිදේ; අයමෙත්‍ථභෙදො, මේ මෙහි භෙ
දයි;
අයං පන, මේ වනාහි; ආනිසංසො,
අනුසස

ආරඤ්ඤකො භික්ඛු, ආරණ්‍යක භික්ෂු
තෙමේ; අරඤ්ඤසඤ්ඤං මනසිකරො
න්තො (මම විවෙකයෙහි වෙසෙමියි
හෝ ලද්කායවිවෙකය සාර්‍ථක කට
යුතුයයිහෝ) මෙසේ අරණ්‍ය සංඥ
මෙනෙහිකරන්නේ; අලද්ධං වා සමාධිං,
නොලද සමාධිහෝ; පටිලභුං, ලබන්
නට; ලද්ධං, ලත් සමාධිය; රක්ඛිතුං වා,
රක්‍ෂාකරණුවටහෝ; භබ්බො, පො
හොසත්වේ; සත්ථාපිස්ස අත්තමනො
හොති, ශාස්තෘද මෝහට සතුටුවේ; ය
ථාහ, කීසේද්මැනු; අහං මම; නාගිතස්ස
භික්ඛුනො, නාගිතනම් මහණහට; තෙ
න අරඤ්ඤවිහාරෙන, ඒ අරණ්‍යවාස
යෙන්; අත්තමනො හොමි, සතුටුවන්
නෙම්; පන්තසෙනාසනවාසිනොව
ස්ස, ප්‍රාන්ත සෙනාසනයෙහි වසන්
නාවූ ඕහට; අසප්පාය රූපාදයො,
අසරුප් රූ අරමුණු ආදීහු; චිත්තං
න වික්ඛිපන්ති, සිත්වික්‍ෂෙප නොකෙ
රෙත්; විගත සන්තාසොහොති, විවෙ
කයෙහි පරිචය ඇතිබැවින් පහවූ ත්‍රා
ස ඇත්තේවේ; ජීවිත නිකන්තිං ජ
හාති, බොහෝ පරිපන්‍ථ ඇති අරණ්‍ය
යෙහි විසීමෙන් මරණභය දුරුවන
බැවින් ජීවිතයෙහි ආලය දුරුකෙරේ;
විවෙක සුඛරසං අස්සාදෙති, ජනසං
සග්ග නැතිබැවින් විවෙක සුව රසය
අනුභවකෙරේ; පවිවෙකතා, කායවි
වෙක ඇත්තේ; අසංසට්ඨො, කිසිවක්
හු හා සංසර්ගයක් නැත්තේ; වන
වාසෙන, අරණ්‍ය වාසයෙන්; නාථස්ස
මානසං, නාථයාගේ මානස; ආරාධ
යන්තො, මනා පිළිවෙතින් සතුටුක
රන්නේ: එකො, අසහායවූ: යති, ය
තීතෙමේ; අරඤ්ඤනිවාසෙ, අරණ්‍යයෙ
හි වසන්නේ; යං සුඛං ලභතෙ, යම්
සුවයක් ලබාද; තස්ස, ඒ සුඛයා
ගේ; රසං, රසය; සඉන්දා, ඉන්ද්‍ර ස
හිතවූ; දෙවාඅපි, දෙවියෝ පවා; න
වින්දන්ති, නොලබත්; එසො, මෙසෙ

ම; පංසුකූලං, පසුල්සිවුර; කාවචංචිය, කාවචඤ්ඤෙන්; ධාරයං, දරන්නේ; අවසෙසධුතාඞ්ගෙධා, අවශිෂ්ට ධුත ධර්මනැමැති ආයුධ ඇත්තේ; අරඤ්ඤ සඞ්ගාමගතො, අරණ්‍යෙහි කෙලෙස් සඞ්ග්‍රාමයට ගියේ; සවාහිණිං, වාහිණී සහිතවූ; මාරං, මරනු; යේතුං, දිනන්නට; නචිරසෙසව සමයො, නොබෝ කලකින්ම සමර්ථවේ; තසමා, එහෙයින්; අරඤ්ඤවාසමහි, අරණ්‍ය වාසයෙහි; පණ්ඩිතො, නුවනැත්තේ; රතිං කයිරථ, ආලයකරන්නේයි.

---ooo---

( හා. ‡ )

බහුපච්ඡාභත්තිකාඞ්ගයට අනතුරුව ආරණ්‍යකාඞ්ගයයි. ඒ සමාදන්වන මහණ විසින් කියවූ පරිද්දෙන් "ගාමන්ත සෙනාසනං පටික්ඛිපාමි ආරඤ්ඤකඞ්ගං සමාදියාමි"යි ගම්හි සෙනස්න ප්‍රතික්ෂෙපකරමි ආරණ්‍යකාඞ්ගය සමාදන්වෙමි යන වචනවශයෙන්ම හෝ එක්තරා වචනයකින් හෝ සමාදන්වනලද්දේ වෙයි. ඒ ආරණ්‍යකාඞ්ගධර මහණ විසින් ගමින් සෙනස්න හැර අරණ්‍යයෙහිම අරුණු නැඟවියයුතුවෙයි එහි ගමින් සෙනස්න නම් කුමක්දයත්? උපචාරය සහිත ග්‍රාමය ග්‍රාමාන්ත සෙනාසන නම් ග්‍රාමයනම් යම්කිසි එක්ගෙයක් ඇත්තාවූද බොහෝ ගෙවල් ඇත්තාවූද වැට පවුරු ආදියෙන් වටකරණ ලද්දාවූ හෝ නුවූහෝ මිනිසුන් ඇත්තාවූද නැවත එව්හයි යන අදහසින් අන් හැර තියෙහසින් මිනිසුන් නැත්තාවූද යවන්පිරිසෙයින් සාරමසකට වැඩි කලක් යම්කිසි ගැල්සාත්තුනායකයෙක් වසනලද්දාවූ හෝ ස්ථානය ග්‍රාමනම් වන්නේයි. ග්‍රාමොපචාරනම් යම් වැට පවුරු සහිතගමක් ඉදින් අනුරාධපුර යමෙන් එලිපත් දෙකක් ඇත්තෙව නම් ඇතුළු එලිපත සිටි මධ්‍යම බලති පුරුෂයෙකු විසින් ගසනලද කැට හුණු තැන ඒ ගාමූපචාරයාගේ ලක්ෂණයයි කීයත්. මේතන්හි විනයධර තෙරහු යම්සේ තරුණ පුරුෂයෝ තමාගේ කායබල දක්වා අත දිගුකොට කැට ගසද්ද එසේ ගසනලද කැට හුණුතැනින් ඇතුලත ග්‍රාමොපචාරයයි කීයත් සූත්‍රාන්තික තෙරහු වනාහි කවුඩන් තෙරපන ක්‍රමයෙන් ගසනලද කැට හුණුතැනින් ඇතුලත ග්‍රාමොපචාරයයි කියත් පරික්ෂෙප නොකරණලද ගමෙහි සියල්ලට අන්තිමගෙහි දොරකඩ සිටි මාගමක් විසින් භාජනයකින් දමනලද ජලය හුණුතැන ඝරූපචාරනම ඒ ඝරූපචාරයෙහි පටන් එක්තැටක් හුණුතැන ග්‍රාමනම් වන්නේය එතැන්සිට ගසනලද දෙවන කැට හුණුතැන ග්‍රාමොපචාරනම් වන්නේයි. මෙම අරණ්‍යය විනයෙහි අදත්තාදාන පාරාජිකා විභාගයෙහි පළමුකොට ග්‍රාමයද ග්‍රාමොපචාරයදහැර සෙසු සියලුතැන් අරණ්‍යයයි කියනලද්දේයි. අභිධර්මදෙශනාවෙහි නුවර ඉන්ද්‍රඛීලනම් එලිපතපටන් මේ සියල්ල අරණ්‍යයයි කියනලද්දේයි මේ ආරණ්‍යක ධුතාඞ්ගයෙහි වනාහි සූත්‍රාන්ත දෙශනාවෙහි ආ නියාමයෙන් අරණ්‍ය සෙනාසනය ගතයුත්තේයි එහෙයින් ගම් කෙළවර පටන් ධනුපන්සියයක් දුරවූ ස්ථානය පශ්චිම ආරණ්‍ය සෙනාසනනම්වෙයි යනු මේ ලක්ෂණයි ඒ අරණ්‍ය සෙනාසනයද තිතලය තගතලද නාවච්චයත් ආචාර්‍ය දුන්නෙන් වැට පවුරු සහිත ගම්දොර එලිපත පටන්ද අපරික්ෂිපත ගම පළමු ගැසූ කැට හුණු තැන් පටන්ද විහාර ප්‍රාකාරය දක්වා දුනු පන්සියය මැන නියම කටයුතුයි ඉදින් විහාරය පරික්ෂෙපනොකරණලද්දේනම් සියල්ලට පළමුවූ සෙ සෙනස්නක් හෝ බත්හලක්

හෝ නිරතුරු රැස්වෙන්නාවූ තැනක්හෝ බොධියක්හෝ චෛත්‍යයක්හෝ සෙනාසනයට දුරුවීනම් ඒ දුරස්ථානය හිමිකොට මැනියයුතුයයි විනයඅටුවාවෙහි කියනලද්දේය මැදුම්සඟි අටුවාවෙහි විහාරයාගේද ග්‍රාමයගේ මෙන් උපචාරය එලවා ඒ විහාරොපචාර ග්‍රාමොපචාරදෙක නියමකල ලෙඩ්ඩුපාතදෙක අතරතුර මිනියයුතුය ඒ දෙඅතුර දුනු පන්සියයක් වියයුතුයයි කියනලද්දේයි. මේ ආරණ්‍ය සෙනාසනයාගේ ප්‍රමාණයි.

ඉදින් ආරණ්‍ය සෙනාසනය සමීපයෙහි යම් ගමෙක්වීද විහාරයෙහි සිටියවුන් විසින් ගම්වැසි මිනිසුන්ගේ ශබ්දය අසනුලැබේද එතැනදුවුවත් පර්වත ගඞ්ගා ආදීයෙන් ඇතුලත්කරණලදබැවින් ඍජුව විහාරයට නොයාහැකිවේද ඒ විහාරයට යන ප්‍රකෘති මාර්ගය නැව් ආදියකින් හෝ යායුතුවේද ඒ මාර්ගයෙන් හෝ දුනු පන්සියය ඇත විහාරය සීමාවෙන් වෙන් කටයුත්තේය යම් භික්ෂුවකෙනෙක් වනාහි ගමට නුදුරුවූ විහාරය අරණ්‍යකාඞ්ගය සම්පාදනයකරණු පිණිස එඒ තැනින් කුඩා මං අවුරාද මේ තෙමේ ධුතාඞ්ගවෛර නම්කරන්නේයි. ඉදින් ආරණ්‍යකාඞ්ගධර භික්ෂූහුගේ ආචාර්ය උපාධ්‍යායයෝ ගිලන්හුවාහුනම් ඒ ආරණ්‍යකාඞ්ගධර භික්ෂූහු විසින් ඒ ගිලනුන්ට වනයෙ නොලැබේනම් ග්‍රාමාන්ත සෙනාසනයට ගෙණගොස් උපස්ථානකටයුතුය එසේ ග්‍රාමාන්තයෙහි වසනාහු විසින් අරුණට පළමුව ආරණ්‍යකාඞ්ගයට නිලක්ෂණයුත් වනයටගොස් එහි අරුණුනැඟවියයුතුය ඉදින් ඒ රොගාතුර භික්ෂූන්ගේ ආබාධය අරුණු නැගෙණ වේලෙහිම උත්සන්නවේනම් ධුතාඞ්ග පාරිශුද්ධිය පිණිස රොගාතුරයා හැරදමා නොගොස් උපස්ථාන කටයුතුවන්නේය යනු මේ ආරණ්‍යකාඞ්ගයෙ විධි සදහා විධියයි.

ප්‍රභෙදවශයෙන් වනාහි මේද උත්කෘෂ්ට මධ්‍යම මෘදුක වශයෙන් තුන්ප්‍රකාරවන්නේයි ඒ තුන්දෙනා කෙරෙන් උත්කෘෂ්ට ධුතාඞ්ගධරයා විසින් හැමකලම අඞ්ගලක්ෂණ සම්පූර්ණ අරණ්‍යයෙහිම අරුණු නැගවියයුත්තේය මධ්‍යම ධුතාඞ්ගධරයාහට වැසි සාරමාසහි ග්‍රාමාන්ත සෙනාසනයෙහි වසන්නට ලැබේමැයි. මෘදුක ධුතාඞ්ගධරයාහට වැසිසාරමාස්හිද හිමසාරමාස්හිද ග්‍රාමාන්ත සෙනාසනයෙහි වසන්නට ලැබේමැයි. මේ තුන්දෙනම තමතමන්ට නියමවූ ප්‍රමාණකාලයතුල අරණ්‍යයෙන් අවුත් ග්‍රාමාන්ත සෙනාසනයෙහි බණ අසන්නාහු දුනුදුන අරුණ නගාද ධුතාඞ්ගය නොබිදෙයි බණ අසා අරණ්‍යයට යන අතරමගදී අරුණනැගේද ධුතාඞ්ගය නොබිදෙයි ඉදින් බණ අසන්නාහු ධර්මකථිකයා ධර්මාසනයෙන් බැස ගිය පසු මොහොතක් සැතපී ගිද යන්නෙම්වේදැයි සිතා නිදන්නාහට අරුණු නැගේවීනම් යන්නෙම් වේදැයි සිත් ලිහිල්කලබැවින් ධුතාඞ්ගය බිඳෙන්නේමැයි. එසේම තමන්ගේ කැමැත්තෙන් ගමින් සෙනාසනයෙහි අරුණු නගන්නාම එයිනුදු ධුතාඞ්ගය බිඳෙන්නේයි යනු මේහි බිඳීමයි.

මේ මතු දක්වන්නේ ආනිසංසයි ආරණ්‍යකාඞ්ගධර මහණතෙමේ අරණ්‍ය සංඥාව මෙනෙහිකරමින් මම කායවිවෙක ලද්දෙමියි හෝ ඒ කායවිවෙකය සාධිත කටයුතුයයි කියා හෝ නොලද්දාවූ සමාධිය ලබන්නේද ලද්දාවූ සමාධිය රැකගන්නේද හොසන්වන්නේය. එසේම ශාස්තෘවූ භාග්‍යවතුන්වහන්සේද මේ ආරණ්‍ය

ත ධුතාඞ්ගධර මහණහට සතුටුවෙයි, එසින් වදාළේමැයි. මම වනාහි අරණ්‍ය වාසය සෙනසුන් කොටගෙණ තාභික නාම ශ්‍රේෂ්ඨව සතුටුවූයෙමියි යන දිනන් භාෂිතනම් තෙරුන්ගේ ආර ණ්‍යකාඞ්ගය සඳහා වදාරණලද්දේය අරණ්‍ය සෙනාසනයෙහි වසන්නාවූ මේ මහණහුගේ සිත නොසැපවූ රූපාදී අරමුණු ආදීනු විශෙෂප නොකෙරෙන්මය විවෙකයෙහි පුරුදුවූබැවින් පහවූ භයඇතිවෙයි නොයෙක් සතුරු භයඇති වන යති පිසිමෙන් මරණ භය දුරුවනබැවින් ජීවිතාශාවද දුරුකෙරෙයි මහජනයා හා එක්ව වාසයක් නැතිබැවින් විවෙක සැප යෙහි රස අනුභව කෙරෙයි මේ ආර ණ්‍යකාඞ්ගය පුරණ මහණහට පංසුකූලිකාදි සෙසු ධුතාඞ්ග පිරීමද සුදුසු වන්නේයි—කියන්නේමැ යි.

කායවිවෙක ඇතිව කිසිවෙකු හා මිශ්‍රනොවී වනයෙහි පිසිමෙන් අනා ථනාථවූ භගවන්හුගේ සිත් සතුටු කරවන්නාවූ අරණ්‍ය සෙනාසනයෙ හි ඇලුනාවූ හුදකලාව වනයෙහි වස න මහණතෙම යම් සැපයක් ලබන්නේද ඒ සැපයෙහි රසය ශක්‍රයද බ්‍රහ්මයා සහිත දෙවියෝ පවා නොලබත්මැයි තවද මේ ධුතාඞ්ගධර මහණ නැමැති සඞ්ග්‍රාම ද ක්‍ෂයොධහටතෙමේ පාංශුකූලචීවර නැමැති සන්නාහය පෙරවගෙණ අවශෙෂ ධුතාඞ්ග නැමැති යුධායුධයන් සැරසී කෙලෙශ යුධ භූමි නැමැති වනයට දුව් එවූයේනම් නොබෝ කලකින්ම සෙනා සහිතවූ රූප වෙෂ මොහ නැමැති කෙලෙශ මාරයා ජයගන්නට පොහොසත් වන්නේයි එහෙයින් අරණ්‍යවාසයෙහි ඇලුණැති මහණතෙම ඇලුම්කරන් නේයි.

මේ අරණ්‍යකාඞ්ගයෙහි සමාදන් වීමය පිළිපැදීමය ප්‍රභෙදය බිඳීමය අනුසස්ය යන අඞ්ග පඤ්චකයාගේ වර්ණනාවයි.

—— oo ——

( ෴ ¶ )

රුක්ඛමූලිකඞ්ගම්පි ඡදනං පටික්ඛිපාමි රුක්ඛමූලිකඞ්ගං සමාදියාමීති ඉමෙසං අඤ්ඤතර වචනෙන සමාදින්නං හොති තෙන පන රුක්ඛමූලිකෙන සීමන්තරික රුක්ඛං චෙතිය රුක්ඛං නියයාසරුක්ඛං ඵලරුක්ඛං වග්ගුලිරුක්ඛං සුසිරරුක්ඛං විහාරම ජ්ඣෙ ඨිතරුක්ඛන්ති ඉමෙ රුක්ඛෙ විවජ්ජෙත්වා විහාරපච්චන්තෙ ඨිත රුක්ඛො ගහෙතබ්බොති ඉදමස්ස විධානං—පභෙදතො පන අයම්පි තිවිධො හොති—තත්ථ උක්කට්ඨො ය ථාරුචිතං රුක්ඛං ගහෙත්වා පටිජග්ගා පෙතුං න ලභති පාදෙන පණ්ණසටං අපනෙත්වා වසිතබ්බං—මජ්ඣිමො තං ඨානං සම්පත්තෙහි යෙව ජග්ගා පෙතුං ලභති—මුදුකෙන ආරාමික සමණුද්දෙසෙ පක්කොසිත්වා වාලිකං ඔකිරාපෙත්වා පාකාර පරික්ඛෙපං කා රාපෙත්වා ද්වාරං යොජාපෙත්වා වසිත බ්බං—මහදිවසෙ පන රුක්ඛමූලිකෙන තත්ථ අනිසීදිත්වා අඤ්ඤත්ථ ප ටිච්ඡන්නෙ ඨානෙ නිසීදිතබ්බං ඉමෙ සං පන තිණ්ණම්පි ඡදනෙ වාසං කප්පිතක්ඛණෙ ධුතඞ්ගං භිජ්ජති ජා නිත්වා ඡදනෙ අරුණං උට්ඨාපිත මත්තෙති අඞ්ගුත්තරභාණකා—අය මෙත්ථ භෙදො අයං පනානිසංසො— රුක්ඛමූල සෙනාසනං නිස්සාය පබ්බ ජ්ජාති වචනතො නිස්සයානුරූපපටි පත්ති සබ්භාවො අප්පානි චෙව සුල භානි ච තානි ච අනවජ්ජානීති භගව තා සංවණ්ණිතපච්චයතා අභිණ්හං තරුපණ්ණ විකාරදස්සනෙන අනිච්ච සඤ්ඤා සමුට්ඨාපනතා සෙනාසන

මච්ඡෙර කම්මාරාමතානං අභාවො දෙවතාහි සහවාසිතා අප්පිච්ඡතාදීනං අනුලොමවුත්තිතාති—

වණ්ණිතො බුද්ධසෙට්ඨෙන
නිස්සයොති ච භාසිතො
නිවාසො පවිවිත්තස්ස
රුක්ඛමූලසමො කුතො—

ආවාසමච්ඡෙරහරෙ
දෙවතාපරිපාලිතෙ
පවිවිත්තෙ වසන්තො හි
රුක්ඛමූලම්හි සුබ්බතො—

අභිරත්තානි නීලානි
පණ්ඩූනි පතිතානි ච
පස්සන්තො තරුපණ්ණානි
නිච්චසඤ්ඤං පනූදති—

තස්මා හි බුද්ධදායජ්ජං
භාවනාභිරතාලයං
විවිත්තං නාතිමඤ්ඤෙය්‍ය
රුක්ඛමූලං විචක්ඛණොති—

අයං රුක්ඛමූලිකඞ්ග සමාදාන විධානප්පභෙදභෙදානිසංසවණ්ණනා—

—oo—

( ෂ ¶ )

රුක්ඛමූලිකඞ්ගම්පි, වෘක්ෂමූලිකාඞ්ග සද; ඡන්නං, වෘක්ෂිකාජ්දනාදීන් විසින් යොයනලද ෂ්නානය (ආවසථය සිත්සි) පටික්ඛිපාමි, පිළිකෙව් කෙරෙමි; රුක්ඛමූලිකඞ්ගං වෘක්ෂමූලිකාඞ්ගය; සමාදියාමීති, සමාදන්වෙමි යන; ඉමෙසං, මොවුන්කොරෙන්; අඤ්ඤතරවචනෙන, එක්තරා වචනයකින්; සමාදින්නංහොති, සමාදන්වන ලද්දේවේ; තෙන පන රුක්ඛමූලිකෙන, ඒ රුක්ඛමූලිකයා විසින්; සීමන්තරික රුක්ඛං, රාජ්‍ය සීමාවෙහි සිටි රුක; චෙතියරුක්ඛං, දෙවියන් වෙසෙනසි මිනිසුන්විසින් පිදියයුතු රුක; නියාස රුක්ඛං, ලහටුගන්නා රුක; ඵල රුක්ඛං, පලගන්නා රුක; වග්ගුලි රුක්ඛං, වව්ලන් වසන්නාවූ රුක; සුසිර රුක්ඛං, සිදුරු ඇති රුක; විහාර මජ්ඣෙ ඨිත රුක්ඛම්පි, වෙහෙර මැද සිටි රුකැයි; ඉමෙ රුක්ඛෙ විවජ්ජෙත්වා, මේ රුක් දුරුකොට; විහාර පච්චන්තෙ ඨිතරුක්ඛො ගහෙතබ්බොති, විහාර කෙළවරසිටි රුකෙක් ගතයුතුයයි; ඉදං, මේ; අස්ස, යොගීහට; විධානං, විධානයයි; පභෙදතො පන අයම්පි තිවිධො හොති, ප්‍රභෙදයෙන් වනාහි මේද තුන්වැදෑරුම්වේ; තත්‍ර, එහි; උක්කට්ඨො, උත්කෘෂ්ටයා; යථාරුචිතං රුක්ඛං ගහෙත්වා, රිසියෙන යම් රුකක්ගෙණ; පටිජග්ගාපෙතුං, පිළිදැගවන්නට; න ලභති, නොලැබේ; පාදෙන, පයින්; පණ්ණසටං, වගුළු පඬරල්, අපනෙත්වා, පහකොට; වසිතබ්බං, වියයුතු; මජ්ඣිමො, මැදුම; තං ඨානං, එතනට; සම්පත්තෙහියෙව, පැමිණියවුන් ලවාම; ජග්ගාපෙතුං, දගවන්නට; ලභති, ලැබේ; මුදුකෙන, මෘදුකයා විසින්; ආරාමික සමණුද්දෙසෙ, ආරාමික සාමණේරයන්; පක්කොසාපෙත්වා, ගෙන්වාගෙණ, සොධාපෙත්වා, පිරිසිදුකරවා; සමං කාරාපෙත්වා, සමකරවා; වාලිකං ඔකිරාපෙත්වා, වැලිඔබවා; පාකාර පරික්ඛෙපං කාරාපෙත්වා, ප්‍රාකාර පරික්ෂෙපකරවා; ද්වාරං යොජාපෙත්වා, දොර යොදවා; වසිතබ්බං, විසියයුතු; මහදිවසෙ පන, පුද දවස වනාහි; රුක්ඛමූලිකෙන, රුක්ඛමූලිකයා විසින්; තත්‍ථ අනිසීදිත්වා, ඒ රුක්මුලනොහිඳ; අඤ්ඤත්‍ථ, අනික්තෙනක; පටිච්ඡන්නෙ ඨානෙ, රුක්ඛමූලිකබව සඟවාපිණිස මුවහ වූතෙනක; නිසීදිතබ්බං, හින්දයුතු; ඉමෙසං පන තිණ්ණම්පි, මේ තුන්දෙනහටම; ඡන්නෙ වාසං කප්පිතක්ඛණෙ, වසනපිණිස වැද ජනාශ්‍රයෙහි වාසයකළ කෙණෙහිම; ධුත

ඞ්ගං භිජ්ජති, දුහඟබිඳේ; ජනිබ්බාජනෙහා අරුණං උට්ඨාපිතමත්තෙතාති අඞ්ගුත්තරභාණකා (බණ අසනුපිණිස එන්නහු ඒ කරුණුම්සද මෙහි වෙසෙම්සි සැලකූහොතුදු) දූත දූත අරුණු නැගී මතුයෙහි දුහඟබිඳෙයි අඞ්ගුත්තරභාණකයෝ කියති යන අර්ථයි (පළමුකී ඇජර මතයෙහි නිකරුණෙහි වැදවිසූවහට විසීමෙන්ම දුහඟබිඳෙනසේ කීහ දෙවනමතයෙහි බණ අසනු ආදී කම්හි වැද වසන්නහුව දූත දූත අරුණුනැගූ සඳ දුහඟ බිඳෙනසේ කීහු එබැවින් දෙමතයම නැම නිවනලැබේ) අයමෙත්ථභෙදො, මේ මෙහි භෙදයි.

අයම්පන, මේ වනාහි; ආනිසංසො, අනුසස්; රුක්ඛමූල සෙනාසනං නිස්සාය පබ්බජ්ජාති වචනතො, රුක්මුල් සෙනසුන් නිසා පැවිදිඅයි වදාළ බැවින්; නිස්සයානුරූප පටිපත්ති සබ්භාවො, නිශ්‍රයට අනුරූප ප්‍රතිපත්ති ඇතිබවය; අප්පානිචෙව, අල්පයහ; සුලභානි, සුලභයහයි; තානිච, ඔහුද; අනවජ්ජානිති, නිවරද්‍යදයහයි; භගවා, භගවත්හුවිසින්; සංවණ්ණිතපච්චයතා, වණ්නලද පසයක් බවය; අභිණ්හං, එක්වන්; තරුපණ්ණවිකාරදස්සනෙන, වෘක්ෂපර්ණයන්ගේ විකාර දක්මෙන්ද, අනිච්චසඤ්ඤ, අනිත්‍ය සංඥවන්; සමුට්ඨාපනතා, උපදවනබවය; සෙනාසනමච්ඡෙර කම්මාරාමතානං අභාවො, ආවාසමාත්සර්‍ය නවකර්මයෙහි ඇලුනුබවය යන මොවුන්ගේ අභාවය; දෙවතාහි සහවාසිතා, රුක්නිසා සිටි විමන්හි වසන බැවින් රුක්දෙවියන් හා සමග වසනබවය; අප්පිච්ඡතාදීනං, අපිඡබැව් ආදීන්ට; අනුලොම වුත්තිතානි, අනුලොම්වූ පැවතුම් ඇත්බවයි.

බුද්ධසෙට්ඨෙන, බුද්ධශ්‍රෙෂ්ඨයා විසින්; වණ්ණිතො "අප්පානි චෙව සුලභානි" යනාදීන් පසස්නාලද; නිස්සයොතිච භාසිතො "රුක්ඛමූල සෙනාසනං නිස්සාය පබ්බජ්ජා"යි මෙසේ නිශ්‍රයයිද කියනලද; පවිවිත්තස්ස, විවෙකීහට; රුක්ඛමූලසමො, වෘක්ෂමූලයහා සමවූ; නිවාසොකුතො, නිවෙස්නෙක් කොහිද; ආවාසමච්ඡෙරහරෙ, ආවාසමාත්සර්‍ය දුරුකරන්නාවූ; දෙවතාපරිපාලිතෙ, දෙවියන් විසින් රක්ෂාකරණලද; පවිවිත්තෙ, විවෙකවූ; රුක්ඛමූලම්හි, රුක්මුල්හි; වසන්තො, වසන්නාවූ; සුබ්බතො, සුන්දරවූ ව්‍රත ඇත්තේ; අභිරත්තානි (රතුණකල) ඉතාරත්වූද; නීලානි, මදනිල්වූද; පණ්ඩූනි (මුහුකළකල) පඬුවන්වූද; පතිතානිච, බිමවගුලාවූද; තරුපණ්ණානි, වෘක්ෂපර්ණයන්; පස්සන්තො, දක්නේ; නිච්චසඤ්ඤං, නිත්‍ය යන සංඥව; පනුදති, දුරුකෙරේ; තස්මාහි, එහෙයින්; බුද්ධදායජ්ජං, බුදුන්හිමිවූ; (යම්හෙයකින් ජාතිය බොධිය ධම්මචක්කප්පවත්තනය පරිනිර්වාණය යන මොහු රුක්මුල්හිමවූද එහෙයින් රුක්ඛමූලය දායදනම්වෙයි දතයුතු) භාවනාභිරතාලයං, භාවනායෙහි අභිරති ඇත්තහට ආලයවූ; විවිත්තං, විවෙකීවූ; රුක්ඛමූලං, රුක්මුල; විචක්ඛණො, නුවණැත්තේ; නාතිමඤ්ඤෙය්‍ය, ඉක්මෙම්යි නොසිතන්නේයි.

——oo——

( ශා ¶ )

ආරණ්‍යකාඞ්ගයට අනතුරුව රුක්ඛමූලිකාඞ්ගයයි ඒ සමාදන්වන මහණ විසින් පූර්වොක්ත න්‍යායෙන් "ඡන්නං පටික්ඛිපාමි රුක්ඛමූලිකඞ්ගං සමාදියාමි"යි උඒආදියෙන් පසම්ලිකරණද ගෘහය ප්‍රතික්ෂෙපකොටෙම් රුක්ඛමූලිකාඞ්ගය සමාදන්වෙමි යනාමෙ වචනයන් අතුරෙන් එක්තරා වචනය

කින් හෝ වච්ඡතච්ඡයෙන්ම හෝ සමාදන්වනලද්දේ වෙයි ඒ රුක්ඛමූලිකාඞ්ගධර මහණහුවිසින් හළයුතු වෘක්ෂයෝ නම් දෙරජුන්ගේ රාජ්‍ය සීමාව දූනගැණීමට නියම්කොටගිබෙන රුකය දෙවියන් විසින් අධිගෘහීතයයි මිනිසුන්විසින් සම්මතකොට පිදවිලිදෙන රුකය ලහටු ගන්නා රුකය ඵල නෙලාගන්නා රුකය වවුලන් වසන රුකය සිදුරැති රුකය වෙහෙරමැද සිටි රුකය යන මේ වෘක්ෂයන් උපද්‍රව සහිතබැවින් දුරුකොට විහාරකෙළවරපිහිටි රුක්මුලට තෝරා ගතයුත්තේය යනු මෙහි පිළිපදනා විධියයි. ප්‍රභෙද වශයෙන් වනාහි මේද උත්කෘෂ්ට මධ්‍යම මෘදුක වශයෙන් තුන් ප්‍රකාර වන්නේය ඔවුන් අතුරෙන් උත්කෘෂ්ටතෙම තමනවකැමැති යම්කිසි රුකක්තෝරාගෙණ පිළිදූගුම් කරන්නට නොලැබෙන්නේය එකෙණෙහිම පැමිණී රුක්මුල වගුළ පරඬලාපත් ආදිය පයින් ඉවත්කොට විසියයුතුය මධ්‍යමතෙමේ එහිපැමිණියවුන් ලවා පිළිදූගුම් කරවන්නට ලැබෙන්නේය මෘදුකයා විසින් ඉදිගේ කැමැතිව තම ආරාමික සාමණේරාදීන් කැඳවා ගෙණගොස් සැස පිරිසිදුකරවා සමකරවා වැලිවිසුරුවා පවුරු පිරිකෙව් දෙවා දොරකුදුයොදවා විසියයුත්තේය එනි අවුත් මිනිසුන් පුදපොළකරකාරණ දවස්හි එහි නොහිඳ රුක්ඛමූලිකාඞ්ගධරයාව නොහඟවන පිණිස පිළිසන්වූ අන්නැනක හිඳිය යුත්තේය මේ තුන් දෙනහටම බුද්ධොපස්ථාන ආචාර්ය උපස්ථාන ධර්මදෙශනා ධර්මශ්‍රවණාදිය පිණිසවුත් වසනු පිණිස ඇතුල්වී යම්කිසි සෙවෙනි සහිතගෘහාදියෙක විසූකෙණෙහිම ධුතාඞ්ගය බිඳෙන්නේයි මෙතන්හි අඞ්ගුත්තර භාණකතාවූ අභයරු සහිය දාවොද්ගතකොට දරන්නාවූ තෙරහු වනාහිබණ අසනු පිණිස සෙවෙනි තුළට වන් ධුතාඞ්ගධරයා බණ අවසන්වූ පසු මෙහි මදක් වසම්හි සිතා ප්‍රමාදවැන්නාහට දූන දූන අරුණු නැගිනම් ධුතාඞ්ගය බිඳෙන්නේයයි කියන් මේ දෙමතයම යථාපන්වන්නේය. ගනු ලැහි බිදීම වන්නේයි.

මේ මතු දක්වනුලබන්නේ ආනිසංසයි. උපසම්පදාමැලෙහිදීම ආචාර්‍ය්‍ය උපාධ්‍යායයන් විසින් ඇවැත් නොපමේ ප්‍රව්‍රජ්‍යාව රුක්ඛමූල සෙනාසනය සඳහායයි අනුශාසනාකළබැවින් නිශ්‍රයට සුදුසුවූ පිළිවෙත්ඇතිබවය අල්පයහා සුලභයහ එවුනුදු නිරවද්‍යයහයි භගවතයන් විසින් වර්ණිත ප්‍රත්‍යයන් බවය නිරන්තරයෙන් වෘක්ෂපත්‍රයන්ගේ විකාර දක්වෙන් අනිත්‍යසංඥා උපදවන බවය ආවාසමාත්සර්‍ය්‍ය නවකර්මාන්තයෙහි ඇලීමය යනමෙතෙක් දෙෂ නැතිබවය වෘක්ෂදෙවතාවන් හා සමග වසනබවය අල්පේච්ඡතාවාදීන්ට අනුලොම් පැවතුම් ඇත්බවය යන මෙතෙක් අනුසස් ඇත්තේයි-කියනලදුයේමැයි—

ශ්‍රෙෂ්ඨවූ සම්‍යක්සම්බුද්ධයන් වහන්සේ විසින් අල්පයහ සුලභයහ නිශ්‍රයට සුදුසු සෙනාසනයහයි යම් වෘක්ෂමූල සෙනාසනයක් වර්ණනාකරණලද්දේද එහෙයින් විවෙක කැමැතිවූ මහණහට වෘක්ෂමූලය හා සමවූ අනික් සෙනාසනයක් නම් කොයින්ද නැත්තේය. තවද ආවාසමාත්සර්‍ය්‍ය දුරුකරන්නාවූ දෙවියන් විසින් ආරක්ෂාකරණලද්දාවූ විවෙකාවූ වෘක්ෂමූල සෙනාසනයෙහි වසන ඉතා ව්‍රතඇති මහණතෙමේ ලපටි කල ඉතා රක්තවර්ණවූදමද නිල්වූද මූකල කල පඬුවන්වූද බිම වගුළාවූද වෘක්ෂපත්‍රයන් දකිමින් සංස්කාර ධර්මයන්ගේ නිත්‍යය යන සංඥාව දුරුකරන්නේයි එහෙයින්

විවෘණ විහණිතෙමේ යම්සේ සර්වඥයන්වහන්සේගේ උපතින් නික්මීමය බුද්ධත්වය පැමිණීමය දම්සක් පැවැත්වීමය පිරිනිවන්පෑමය යන ප්‍රධාන මඟුල්කාර්‍ය්‍ය සතර රුක්මුල්හිම කළබැවින් වෘක්ෂමූල සෙනාශනය බුදුන් අයත්වේද එහෙයින් ඒ බුද්ධායතනවූ භාවනාවෙහි ඇලුනවුන්ට ශාසනයන් බඳුවූ විශේෂකාරී වෘක්ෂමූල සෙනාශනය නොයිත් යැ එන්නේයි.

මේ වෘක්ෂමූලිකාඞ්ගයෙහි සමාදන් වීමය විධිය ප්‍රභේදය බිඳීමය අනුසස්ය යන අර්ථ පඤ්චකයාගේ වර්ණනායි —

—— oo ——

( පා * )

අබ්භොකාසිකඞ්ගම්පි ඡන්නඤ්ච රුක්ඛමූලඤ්ච පටික්ඛිපාමි අබ්භොකාසිකඞ්ගං සමාදියාමීති ඉමෙසං අඤ්ඤතර වචනෙන සමාදින්නං හොති — තස්ස පන අබ්භොකාසිකස්ස ධම්මස්සවනාය වා උපොසථත්ථාය වා උපොසථාගාරං පවිසිතුං වට්ටති — සචෙ පවිට්ඨස්ස දෙවො වස්සති වස්සමානෙ අනික්ඛමිත්වා වස්සූපරමෙ නික්ඛමිතබ්බං. භොජනසාලං වා අග්ගිසාලං වා පවිසිත්වා වත්තං කාතුං භොජනසාලාය ථෙරෙ භික්ඛූ භත්තෙන ආපුච්ඡිතුං උද්දිසන්තෙන වා උද්දිසාපෙන්තෙන වා ඡන්නං පවිසිතුං බහිදුන්නික්ඛිත්තානි මඤ්චපීඨාදීනි අන්තො පවෙසෙතුං වට්ටති — සචෙ මග්ගං ගච්ඡන්තෙන වුඩ්ඪතරානං පරික්ඛාරො ගහිතො හොති දෙවෙ වස්සන්තෙ මග්ගමජ්ඣෙ ඨිතං සාලං පවිසිතුං වට්ටති සචෙ න කිඤ්චි ගහිතං හොති සාලාය ඨස්සාමීති වෙගෙන ගන්තුං න වට්ටති පකතිගතියා ගන්ත්වා පවිට්ඨෙන පන යාව වස්සූපරමා ඨත්වා ගන්තබ්බන්ති ඉදමස්ස විධානං — රුක්ඛමූලිකස්සාපි එසෙව නයො — පභෙදතො පන අයම්පි තිවිධො හොති තත්ථ උක්කට්ඨස්ස රුක්ඛං වා පබ්බතං වා ගෙහං වා උපනිස්සාය වසිතුං න වට්ටති අබ්භොකාසෙයෙව චීවරකුටිං කත්වා වසිතබ්බං — මජ්ඣිමස්ස රුක්ඛපබ්බතගෙහානි උපනිස්සාය අන්තො අප්පවිසිත්වා වසිතුං වට්ටති — මුදුකස්ස අච්ඡන්නමරියාදං පබ්භාරම්පි සාඛාමණ්ඩපොපි පිට්ඨපටොපි ඛෙත්තරක්ඛකාදීහි ඡඩ්ඩිතා තත්තිකාපි වට්ටති ඉමෙසං පන තිණ්ණම්පි වාසත්ථාය ඡන්නං වා රුක්ඛමූලං වා පවිට්ඨක්ඛණෙ ධුතඞ්ගං භිජ්ජති ජානිත්වා තත්ථ අරුණං උට්ඨාපිතමත්තෙනාති අඞ්ගුත්තරභාණකා. අයමෙත්ථ භෙදො — අයං පනානිසංසො — ආවාසපලිබොධුපච්ඡෙදො ථිනමිද්ධපනූදනං "මිගා විය අසඞ්ගචාරිනො අනිකෙතා විහරන්ති භික්ඛවො" ති පසංසාය අනුරූපතා නිස්සඞ්ගතා චාතුද්දිසතා අප්පිච්ඡතාදීනං අනුලොමවුත්තිතාති —

අනගාරියභාවස්ස
අනුරූපෙ අදුල්ලභෙ
තාරාමණිවිතානම්හි
චන්දදීපප්පභාසිතෙ —

අබ්භොකාසෙවසං භික්ඛු
මිගභූතෙන චෙතසා
ථිනමිද්ධං විනොදෙත්වා
භාවනාරාමතං සිතො —

පවිවෙකරසස්සාදං
න චිරස්සෙව වින්දති
යස්මා තස්මා හි සප්පඤ්ඤො
අබ්භොකාසෙ රතො සියාති —

අයං අබ්භොකාසිකඞ්ගෙ සමාදානවිධානප්පභෙදභෙදානිසංසවණ්ණනා —

—— oo ——

( ශ * )

අබ්භොකාසිකඞ්ගම්පි, අබ්භොකාසිකාඞ්ගයද; ඡන්නඤ්ච, ඡන්නයද; රුක්ඛමූලඤ්ච, රුක්මුලද; පටික්ඛිපාමි, පිළිකෙව් කෙරෙමි; අබ්භොකාසිකඞ්ග, අබ්භොකාසිකාඞ්ගය; සමාදියාමීති, සමාදන්වෙමියි යන; ඉමෙසං, මොවුන්කෙරෙන්; අඤ්ඤතරවචනෙන, එක්තරා වචනයෙකින්; සමාදින්නං හොති, සමාදන්වනලද්දේ වේ (ධුතාඞ්ග සමාදානය හැමපරිද්දෙන්ම ප්‍රතියොග ප්‍රතික්ෂෙපයෙන් සිද්ධවන බැවින් "ඡන්නඤ්ච රුක්ඛමූලඤ්ච පටික්ඛිපාමි"යි යුහු "ඡන්නඤ්ච රුක්ඛමූලඤ්ච පටික්ඛිපාමි"යි—අබ්භොකාසිකාඞ්ගය සමාදන්වූවාහට "රුක්ඛමූලිකඞ්ගං පටික්ඛිපාමි"යි නොකියා "රුක්ඛමූලං පටික්ඛිපාමි"යි කීබැවින් රුක්ඛමූලිකාඞ්ගය පිරෙන්නේවේ) තස්ස පන අබ්භොකාසිකස්ස, ඒ අබ්භොකාසිකයාහට; ධම්මස්සවණාය වා, දහම් අසනුපිණිස හෝ; උපොසථත්ථාය වා, පොහෝකරණු පිණිස හෝ; උපොසථාගාරං, පෙහෝ ගෙට; පවිසිතුං වට්ටති, වදනට වටී (ධම්මසවණාය යනුයෙන්ම දෙසන්නහු විසිනුදු පොහොදවස් ආදියෙහි අසන්නවුන් සිත් රක්නා සඳහා ඔවුන් විසින් යාචිතව ඡන්නයට වදුත් වටි බණකියාවනාහි අබවසටම ඉයයුතු-රුක්ඛමූලිකයාහටද මෙමනයයි) සචෙ, ඉදින්; පවිට්ඨස්ස, උපොසථාගාරයට වන්නාහට; දෙවො වස්සති, වැසි වසීනම්; වස්සමානෙ, වසිමින්සිටි කල්හි; අනික්ඛමිත්වා, නොනික්ම; වස්සූපරමෙ, වැසි වැලකි කල්හි; නික්ඛමිතබ්බං, නික්මියයුතු; භොජනසාලං වා අග්ගිසාලං වා පවිසිත්වා, බොජුන්හලටද ගිනිහලට ද වැද; වත්තං කාතුං, වත්කරන්නට ද; භොජනසාලායං, බොජුන්හල්හි; ථෙරෙ භික්ඛූ, ස්ථවිරභික්ෂූන්; භත්තෙන ආපුච්ඡිතුං, බතින් පිළිවිස්නවද; උද්දිසන්තෙන වා, අනුන්ට කියාවාදෙන්නහු විසිනුදු; උද්දිසාපෙන්තෙන වා, කියවාගන්නහු විසිනුදු; ඡන්නං පවිසිතුං, ඡන්නයට වදනටද; බහි, පිටත්හි; දුන්නික්ඛිත්තානි, නොමනාසේ තබනලද; මඤ්චපීඨාදීනි, ඇඳ පුටුආදීන්; අගොපායෙසුං, ආතුළෙහි ලන්නටද; වට්ටති, වටී; සචෙ, ඉදින්; මග්ගං ගච්ඡන්තෙන, මගයන්නහු විසින්; වුඩ්ඪතරානං, මහල්ලන්ගේ; පරික්ඛාරො ගහිතො හොති, පිරිකර ගන්නාලද්දේවී නම් ("වුඩ්ඪතරානං" යනු සරුප්පිණිස කීහ සමණුන්ගේ පිරිකරද ගත වටීවයයෙන්) දෙවෙ වස්සන්තෙ, වැසිවස්නා කල්හි; මග්ගමජ්ඣට්ඨිතං සාලං, මංමැද සිටි සාලාවට; පවිසිතුං වට්ටති, වදනට වටී (මංමැද සිටි හල් නම් හෙලදිව මෙන් මගින් පහනොව ඉදිවම වැද්ද යුතු හලයි "මග්ගමජ්ඣෙ සාලං සිතං"යි කීවද "මඤ්චපීඨාදිනං අගොපායෙසුං වට්ටති" කී බැවිනුදු "වෙගෙන ගන්තුං න වට්ටති" යන තන්හි අනුන්ගේ පිරිකර ගත්තෙනාත් වෙගයෙන් යායුතුය යනු කීවනබැවිනුදු මගමැද නොසිටි හලටද අනුන් පිරිකරගත්තහු විසින් වැද්දයුතුයයි කීවෙත්) සචෙ, ඉදින්; න කිඤ්චිගහිතං හොති, කිසිවෙක් නොගත්තාලද නම්; සාලායං ඨස්සාමීති, හල්හි සිටිමියි; වෙගෙන ගන්තුං න වට්ටති, නොසරුප්බැවින් වෙගයෙන් යන්නට නොවටී; පකතිගතියා ගන්ත්වා පවිට්ඨෙන පන, පියවි ගමනින් ගොස් වන්නහු විසින් වනාහි; යාව වස්සූපරමා, වැසි වලක්නාතෙක් සිට; ගන්තබ්බන්ති, යායුතුයයි; ඉදං, මේ; අස්ස, මොහුගේ; විධානං, විධානයි; රුක්ඛමූලිකස්සාපි, රුක්මුල්හි වස

නුවිනාවද; එංසවතයො, මෙම්තයයි; පභෙදතො පන අයම්පි තිවිධො හොති, ප්‍රභෙදයෙහින් වනාහි මේද ත්‍රිවිධ වේ; තජ්, එනි; උක්කට්ඨස්ස, උකටහට; රුක්ඛං වා, රුකක් හෝ; පබ්බතං වා, පර්වතයක් හෝ; ගෙහං වා, ගෙයක් හෝ; උපනිස්සාය, නිසා; වසිතුං න වට්ටති, වසන්නට නොවටී; අබ්භොකාසෙ යෙව, අබ්භවසම; චීවරකුටිං කත්වා, සිවුරුකුටියක් කොට; වසිතබ්බං, විසියයුතු; මජ්ඣිමස්ස, මැදුමහට; රුක්ඛපබ්බතගෙහානි උපනිස්සාය, රුක පර්වත ගෙය යන මේ තුන් නිසා; අනොවස්සකා (වැස්ස යෙනි පර්වතයෙහි හිරමුදුනෙහි සඳ ජායාව පැනිරෙණනැනට ගෙහි දිය ගෙලවෙන්) ඇතුළ නොවැද, වසිතුං වට්ටති, වසන්නට වටී; මුදුකස්ස, මෘදුකයාහට; අච්ඡන්නමරියාදං පබ්භාරං, දියවදනාබැවින් අබවස්ම බඳු දියහාවාර නොපුන් ලෙණද; සාඛාමණ්ඩපොපි, තුනුහොට සෙවූ කොලම්ඩුවද; පීඨපණ්ණොපි, තලප ගැනූ පවයද; චෙතාරක්ඛකාදීහි ඡඩ්ඩිතා, ක්ෂෙත්‍රපාලාදීන් විසින් හරණලද; තත්‍රට්ඨකකුටිකාපි, එතැන්හිම සිටිකුටිකාද; වට්ටති, වටනේයි; ඉමෙසං පන තිණ්ණම්පි, මේ තුන්දෙනාහටම; වාසත්ථාය, වසනු පිණිස; ගච්ඡතො වා, ගනනසව හෝ; රුක්ඛමූලං වා, රුක්මුලව හෝ; පවිට්ඨක්ඛණෙ, වන් කෙණෙහිම; ධුතඞ්ගං භිජ්ජති, දුහඟ බිඳේ; ජානිත්වා තජ් අරුණං උට්ඨාපිතමත්තෙ ති, දම්සවුන් ආදී පිණිස ගනනාසව හෝ රුක්මුලට හෝ වැද හුනානු දුන් අරුණු නැගෙසි දන දන අරුණු නැගූ මතුයෙහි දුහඟ බිඳෙයි; අඞ්ගුත්තරභාණකා, අඞ්ගුත්තරභාණකයෝ (කියත්) අයං, මේ එජ්, මෙහි; භෙදො, භෙදයි; අයං පන, මේ වනාහි; ආනිසංසො; අනුසසි; ආවාසපළිබොධුපච්ඡෙදෙ, ආවාස පළිබොධයාගේ උපච්ඡෙදය (කිසි රුක්ලෙන් ගිඳු නිවාස ඡාසුබව ඇතිනුයි එහි අසඞ්ග පූර්වූ ආවාස පළිබොධය වන්නේය අබ්භස්ති වනාහි නැත්මනුයි මෙහිම ආවාස පළිබොධුපච්ඡෙදය අනුසස්යයි කියකලද්දයි දතයුතු) ථිනමිද්ධපනුදනං, ථිනමිද්ධ දෙදෙනාගේ දුරුකිරීමය; අභිනොකාතා, ශෝනැතිවූ; ශිකාවො,උහණෙනු; මිගකාවිය, මෘගයන්මෙන්; අසඞ්ගවාරිතො, සඞ්ගයක් නැතිව හැසිරෙන්නාහු; විහරතී, වෙසෙන්යයි කියනලද; පසංසාය, ප්‍රශංසාබවට; අනුරූපතා, නිරාලයභාවයෙන් සුදුසු බවය; නිස්සඞ්ගතා, ආවාස පරිග්‍රහයක් නැත්තෙත්ම එහි සඞ්ගයක් නැතිබවය; චාතුද්දිසතා (එක් දිගෙක වසනනැත්නැත ඒ දිගට කෙසේ යම්නසී යහ ඊනාකියක් නැතිබැවින්) සතරදිගට සුදුසු බවය; අපිවජ්ජිතාදීනං, අපිස්බැව් ආදීන්ට; අනුලොමවුත්තිතානි, අනුලෝමවූ පැවතුම් ඇතිබවයි.

අනගාරියභාවස්ස, අගාරික නොවන බවට; අනුරූපෙ, සුදුසුවූ; අදුලලෙහෙ, දුලිග නොවන; තාරාමණිවිතානම්හි, තුරු නැමැති මුබුලු ඇති අහස්තලම වියන්ඇත්; චන්දදීපපභාසිතෙ, චන්ද්‍ර නැමති ප්‍රදීපයෙන් ආලොක කරණ; අබ්භොකාසෙ, අබවස්හි; මිගභූතෙන චෙතසා, පරිග්‍රහ නැතිබැවින් මෘගයන්ට බඳුවූ සිතින්; වසං භික්ඛු, වසන මහණතෙමේ; ථිනමිද්ධං විනොදෙත්වා, ථිනමිද්ධ දෙක දුරුකොට; භාවනාරාමතා, බවුත්හි ඇලුනුබැවින්; සීඝතො, ආශ්‍රයකෙලේශ; යජ්ඣා, යම්භෙදකින්; පවිවෙකරසස්සාදං, පවිවෙක රසාස්වාදය; න චිරස්සෙව, නොබෝකලකින්ම; විඤ්ඤති,

ලැබේද; තායමාහි, එහෙයින්; සපප සොදසු, නුවණැත්තේ; අබ්භොකාසෙ, අබපස; රතො, ඇලුනේ; සියා, වන්නේයි ––

( ඝා * )

වෘක්ෂමූලිකාඞ්ගයට අනතුරුව අබ්භොකාසිකාඞ්ගයවෙයි. ඒ සමාදන්වන මහණහුවිසින් "ඡන්නාඥව රුක්ඛමූලඤ්ච පටික්ඛිපාමි අබ්භොකාසිකාඞ්ගං සමාදියාමි"යි උළු ආදියෙන් සෙවිලිකරණලද ගෘහාදියද වෘක්ෂමූලයද ප්‍රතික්ෂෙප කෙරෙමි අබ්භොකාසිකාඞ්ගය සමාදන්වෙමි යන මොවුන් අතුරෙන් එක්තරා වචනයකින් හෝ වචනවයෙන්ම හෝ සමාදන්වනලද්දේවෙයි මෙතන්හි වනාහි වෘක්ෂමූලිකාඞ්ගය ප්‍රතික්ෂෙප නොකරෙමියි හුදෙක් වෘක්ෂමූලයම ප්‍රතික්ෂෙප කෙරෙමයි කීබැවින් වෘක්ෂමූලිකාඞ්ගයද නොබිඳෙන්නේයි. මේ අබ්භොකාසිකාඞ්ගය සමාදන්වූවාහට බණ අසනු පිණිස හෝ බණ දෙසනු පිණිස හෝ පොහොපවුරුණු කිරීම පිණිස හෝ උපොසථාගාරාදියට ඇතුල්වන්නට වටනේය එතකුදුවූවත් ඒ බණ ඇසීම් ආදිය අවසන්වූ පසු අබ්භොකාසයටම ගියයුතුවන්නේය ඉදින් පොහෝගේ ආදියට ඇතුල්වූ පසු වැසි වසින්නට පටන්ගත්තේවීනම් ඒ වැසි වස්නාකල්හි නොනික්මයිට වැසි දැලකිකල්හිව නික්ම යායුතුවන්නේය තවද භොජනශාලාවට හෝ ගිනිහලට හෝ ඇතුල්ව වත්පිළිවෙත් කරන්නටද භොජන ශාලාවෙහි ස්ථවිර භික්ෂූන් බත්ත් පිළිවිසින්නටද අනුන්ට වනපොත් කරවන්නට හෝ තමන් වනපොත් කරවාගන්නට හෝ සෙවෙනියුතු ගෘහාදියට ඇතුල්වන්නටද වටනේය ගෙන් පිටත්හි නපුරුකොට තබනලද සඟසතු හැඳපුටු ආදිය ඇතුළෙහි තබනුපිණිසද ගෙට ඇතුල්වන්නට වටනේය ඉදින් මග යනකල්හි මැඩිමහල්ලන්ගේ හෝ යකලහිකුන්ගේ හෝ පාසිවුරු ආදී පිරිකර ගෙණයන්නේවීනම් වැසි වස්නාකල්හි පිරිකර නොතෙමෙන පිණිස මාවත මැද පිහිටි ශාලාවකට ඇතුල්වෙන්නටද වටනේය එතකුවූවත් කිසි පිරිකරක් නොගත්තේවීනම් සිටමියි සිනා වෙගයෙන් යන්නට නොවටනේය ස්වභාව ගමනින්ගොස් වැසි වලක්නාතෙක් ශාලාවෙහි සිට යායුතුවන්නේයි. මේ මෙහි පිළිපදනා විධියයි. මේ පිළිපදනා විධිය වෘක්ෂමූලිකාඞ්ගධරයාහටද සමානවන්නේයි. ප්‍රභෙදවශයෙන් වනාහි මේද උත්කෘෂ්ට මධ්‍යම මෘදුක වශයෙන් තුන්වැදෑරුම්වන්නේයි ඔවුන්අතුරෙන් උත්කෘෂ්ටයාහට ගසක් හෝ පර්වතයක් හෝ ගෙයක් හෝ නිසා හෙවත් ළඟ ආශ්‍රකොට ගෙණ වසන්නටද නොවටනේය අබ්භාවකාශයෙහිම සිවුරුකිළියක්කොටගෙණ විසියයුත්තේය මධ්‍යමයාහට වෘක්ෂ පර්වත ගෘහයන් නිසා ඇතුළට නොවැද හෙවත් වෘක්ෂ පර්වතයන්ගේ හිරම්ඬුන්වේලෙහි සෙවනැල්ල පැතිරෙණ පමණ තැනටද ගෙහි සෙවෙනිදිය වැටෙන පමණ තැනටද ඇතුල්නොවී ළඟ වසන්නට වටනේමය මෘදුකයාහට විර්ෂාජලය ඇතුළට වැදගත නැකිවූ මහොතහි සෙවෙනි නොකරණලද ගල්ලෙණටද තුනීකොට කොල අතුවලින්සෙවෙනි කරණලද කෙළ මඩුවටද ඉටිරෙදි කුඩාරමටද කුඹුරු රක්නාවුන්විසින් හරණලද එහි පිහිටි පැල්කුටියටද ඇතුල්වන්නට වටනේය මේ තුන්දෙනාහටම විසීම පිණිස සෙවනකට හෝ රුක්මුලකට හෝ වැද අරුණු නැගෙයි යනබව දැන දැන හුන්නාහු අරුණු

නැඟුකල්හිම ධුතාඞ්ගය බිඳෙන්නේ
යයි අඞ්ගුත්තර භාණක තෙරහු කි
යත්මැයි. මේ මෙහි බිඳීමයි මේ මතු
දක්වන්නේ ආනිසංසයි රුක්ඛමූලිකා
ඞ්ගධර මහණහට ආවාසපලිබොධ
නැති බවය ථිනමිද්ධ දෙදෙනා දුරුකි
රීමය ගේ නැත්තාවූ මේ භික්ෂූහු මෘ
ගයන්මෙන් කිසිතැනක නොඇලී
හැසිරෙමින් වෙසෙත්යයි යන ලො
කයාගේ ප්‍රශංසාවට සුදුසු බවය ආවා
සසම්බන්ධයක් නැති බැවින් එහි ඇළුම්
නැති බවය. අසවල් දිශාවෙහි වසන
තැන් නැත ඒ දිගට කෙසේ යම්හයි
යන විතර්කයක් නැති බැවින් සතර
දිගටම සුදුසුබවය අල්පෙච්ඡභාවාදි
න්ට අනුලෝම් පැවතුම් ඇති බවය.
යන මෙතෙක් අනුසස් ඇත්තේයි–
මේකියනලදුයේමැයි.

ප්‍රව්‍රජ්‍යාභාවයට සුදුසු සියළු තත්
හිම ලැබියැහැකිහෙයින් දුලීභ නො
වන්නාවූ තාරකා නැමැති මැණික් බුබු
ලුවලින් සැරසුනු අහස් නැමැති
වියන්ඇති චන්ද්‍රාලොකනැමැති පහ
න් ආලොකයෙන් හෙබියාවූ අභ්‍ය
වකාශයෙහි කිසිතැනක ඇලුම් නැති
බැවින් මුවන්ට බදු සිතින් යුක්තව
වසන්නාවූ මහණතෙමේ ථිනමිද්ධය දු
රුකොට භාවනාරාමතාවෙහි ඇලුනු
බැවින් යම්හෙයකින් විවේකරසා සවා
දය නොබිඳ කලකින්ව විඳගණිද එ
හෙයින් පණ්ඩිතමහණතෙමේ අබ්භෝ
කාසිකාඞ්ගයෙහි ඇළෙන්නේයි.

මේ අබ්භොකාසිකාඞ්ගයෙහි සමා
දන්වීමය පිළිපැදීමය ප්‍රභෙදය බිඳී
මය අනුසස්ය යන මොවුන්ගේ ව
ර්ණනායි —

— 0 —

( ෆා † )

සොසානිකඞ්ගම්පි නසුසානං පටි
ක්ඛිපාමි සොසානිකඞ්ගං සමාදියා
මීති ඉමෙසං අඤ්ඤතර වචනෙන ස
මාදින්නං හොති — තෙන පන
සොසානිකෙන මනුස්සා ගාමං නිවෙ
සන්තා ඉදං සුසානන්ති යං වවත්ථපෙ
න්ති න තත්ථ වසිතබ්බං න හි තෙන සරීරෙ
අජ්ඣාපිතෙ තං සුසානං නාම හො
ති ඣාපිතකාලතො පන පට්ඨාය ස
චෙපි ද්වාදසවස්සානි ඡඩ්ඩිතං සුසාන
මෙව තස්මිං පන වසන්තෙන චඞ්ක
මමණ්ඩපාදීනි කාරෙත්වා මඤ්චපීඨං
පඤ්ඤපෙත්වා පානීයං උපට්ඨපෙත්වා
ධම්මං වාචෙන්තෙන න වසිතබ්බං ග
රුකං හි ඉදං ධුතඞ්ගං තස්මා උප්ප
න්න පරිස්සය විඝාතත්ථාය සඞ්ඝ
ත්ථෙරං වා රාජයුත්තකං වා ජානාපෙ
ත්වා අප්පමත්තෙන වසිතබ්බං —
චඞ්කමන්තෙන අඩ්ඪක්ඛිකෙන ආළා
හනං ඔලොකෙන්තෙන චඞ්කමිත
බ්බං — සුසානං ගච්ඡන්තෙනාපි ම
හාපථා ඔක්කම්ම උප්පථෙන ගන්ත
බ්බං දිවායෙව ආරම්මණං වවත්ථ
පෙතබ්බං — එවං හිස්ස තං රත්තිං
භයානකං න භවිස්සති අමනුස්සා ර
ත්තිං විරවිත්වා විරවිත්වා ආහිණ්ඩන්තා
පි න කෙනචි පහරිතබ්බා එකදිව
සම්පි සුසානං අගන්තුං න වට්ටති
මජ්ඣිමයාමං සුසානෙ ඛෙපෙත්වා ප
ච්ඡිමයාමෙ පටික්කමිතුං වට්ට
තීති අඞ්ගුත්තරභාණකා — අමනු
ස්සපියං තිලපිට්ඨමාසභත්තම
ච්ඡමංස ඛීරතෙලගුළාදි ඛජ්ජ භො
ජ්ජං න සෙවිතබ්බං — කුලගෙහං න
පවිසිතබ්බන්ති ඉදමස්ස විධානං —
පභෙදතො පන අයම්පි තිවිධො
හොති — තත්ථ උක්කට්ඨස්ස යත්ථ
ධුවඩාහ ධුවකුණප ධුවරොදනානි අත්ථි
තත්ථෙව වසිතබ්බං — මජ්ඣිමස්ස
තීසු එකස්මිම්පි සතිපි වට්ටති —
මුදුකස්ස වුත්තනයෙන සුසානල
ක්ඛණං පත්තමත්තෙ වට්ටති — ඉ

ඉමස්ස පන භින්නම්පි නසුසානාභිමුඛි
වාසං කප්පනෙන ධුතඞ්ගං භිජ්ජ
ති සුසානං අගත දිවසෙහි අඞ්ගු
ත්තරභාණකා. අයමෙත්ථ භෙදො.
අයං පනානිසංසො. මරණස්සතිප
ටිලාභො අප්පමාදවිහාරිතා අසුභ
නිමිත්තාධිගමො කාමරාගවිනොද
නං අභිණ්හං කායසභාවදස්සනං
සංවෙගබහුලතා ආරොග්‍යමදප්ප
හානං භයභෙරවසහනතා අමනු
ස්සානං ගරුභාවනීයතා අප්පිච්ඡතා
දීනං අනුලොමවුත්තිතාති.

සොසානිකඤ්හි මරණානුස්සතිප්පභාවා
නිද්දාගතම්පි න ඵුසන්ති පමාද දොසා
සම්පස්සතොව කුණපානි බහූනි තස්ස
කාමානුරාග වසගම්පි න හොති-
(චිත්තං.
සංවෙගමෙති විපුලං නමදං උපෙති
සම්මා අථො ඝටති නිබ්බුති මෙස-
(මානො
සොසානිකඞ්ග මිතිනෙක ගුණා
(වහත්තා
නිබ්බාන නින්නහදයෙන නිසෙවි
(තබ්බන්ති.
අයං සොසානිකඞ්ගෙ සමාදානවිධා
නප්පභෙදභෙදානිසංස වණ්ණනා.

( ස † )

සොසානිකඞ්ගම්පි, සොසානිකා ඞ්ගයද; න සුසානං පටික්ඛිපාමි, සොහොන් පිළිකෙව් කෙරෙමි (සොහොන් ලකුණු නැති උසන තැන්යයි සේයි) සොසානිකඞ්ගං සමාදියාමිති, සොසානිකාඞ්ගය සමාදන්වෙමියි යන; ඉමෙසං අඤ්ඤතර වචනෙන, මොවුන් කෙරෙන් එක්තරාවචනයෙකින්; සමාදිනානං හොති, සමාදන්වනලද්දේවේ; තෙන පන සොසානිකෙන, ඒ සොසානිකයා විසින් වනානි; මනුස්සා, මිනිස්සු; ගාමං නිවෙසෙන්වා, ගම පිහිටුවා (කරවා) ඉදං සුසානන්ති, මේ තැන සොහොනැයි; යං වවත්ථපෙන්ති, යම් තැනක් නියම කෙරෙද්ද; තත්ථ, ඒ සොහොනැයි නියම් කළ තැන්හි, න වසිතබ්බං, නොවැසියයුතු; සෙතසරිරෙ, සැදෙ ශරීරය; අජ්ඣාපිතෙ, නොදවනලද කල්හි; තං, ඒ තැන; සුසානං නාම නාහි හොති, සොහොනක් නොමවේ; ඣාපිතකාලතො පන පට්ඨාය, දවූ කල පටන්ගෙණ; සචෙපි, ද්වාදින්; වාදසවස්සානි, දොළොස් අවුරුද්දක්; ඡඩ්ඩිතං, නොදවාහරණලද්දේ නමුදු; සුසානමෙව, සොහොන් නම්මවේ; තස්මිං පන වසන්තෙන, එහි වසන්නහු විසින්; චඞ්කමමණ්ඩපාදීනි කාරෙත්වා, සක්මන්මඩු ආදිය කරවා, මඤ්චපීඨං පඤ්ඤපෙත්වා, හැඳපුටු පණවා, පානීයං උපට්ඨපෙත්වා, පැන්එළවා තබවා; ධම්මංවාචෙන්තෙන, බණ කියන්නහු විසින්; නවසිතබ්බං, නොවිසියයුතු; ගරුකංහි ඉදං ධුතඞ්ගං, මේ ධුතඞ්ගය ගුරුයි (දුකසේ පරිහරණය කටයුතුයයි සේයි) තස්මා, එහෙයින්; උප්පන්නපරිස්සයවිඝාතත්ථාය, උපන් උපද්‍රවයන් නසනු සඳහා; සඞ්ඝත්ථෙරං වා, වසන වෙහෙර ගණ තෙරුන් හෝ; රාජයුත්තකං වා, ගොචරග්‍රාමයෙහි රජුන් විසින් යුක්තවූ පුරුෂයා හෝ; ජානාපෙත්වා, නාමා සොහොන්හි වසනබව දන්වා; අප්පමත්තෙන, නොපමාවූවහු විසින්; වසිතබ්බං, විසියයුතු; චඞ්කමන්තෙන, සක්මන්කරන්නහු විසින්; අඩ්ඪක්ඛිකෙන ආළාහනං ඔලොකෙන්තෙන චඞ්කමිතබ්බං, හමුවූ සඳ සංවෙග උපයනු පිණිස සක්මන්හි එන යන ඇස් කෙළින් සොහොන බලමින් සක්මන් කටයුතු; සුසානං ගච්ඡන්තෙනාපි, සොහොනට යන්නහු විසිනුදු; මහාපථා ඔක්කම්ම,

මග වසින් පහව; උපපථ මග්ගෙන ගන්තබ්බං, තමාගේ සොසානික බව නොහඟවන පිණිස කුඩු මගින් යායුතු; දිවාසෙය්‍යං, දහවල්හි; ආරම්මණං වවත්ථපෙතබ්බං (මේ තුඹසය මේ රූකය යනාදීන්) අරමුණු නියම කටයුතුය; එවංහි, එසේ කල්හි; අස්ස, මේ හට; තං, ඒ අරමුණ; රත්තිං, රෑ; භයානකං න භවිස්සති, භය ජනක නොවෙයි; අමනුස්සා, යක්හු; රත්තිං, රෑ; විරවිත්වා විරවිත්වා ආහිණ්ඩන්තා, හඬ හඬා ඇවිදිනාහු; නංසොතාවි පලරිතබ්බා, කැටපහණ ආදි කිසිවෙකින් ලඟ ඇවිදින්නාහයි නොපැහැරිය යුත්තේය; එකදිවසම්පි, එක දවසකුදු; සුසානං අගන්තුං නවට්ටති, සොහොන නොයන්නට නොවටී; මජ්ඣිමයාමං සුසානෙ ඛෙපෙත්වා, මැදුම්යම සොහොන්හි යවා; පච්ඡිමයාමෙ පටික්කමිතුං වට්ටතීති, පැසුම් යම්හි නවත්නට වටියි; අංගුත්තරභාණකා, අංගුත්තරභාණකයෝ (කියත්) අමනුස්සානං පියං, අමනුෂ්‍යයන්ට ප්‍රියවූ; තිලපිට්ඨං, තලසුනු (තලමුරුවම හෝ තල හා පිටිම හෝ) මාසභත්තං, උඳුබත්; මංසඛිර තෙලගුලාදි බජ්ජ භොජ්ජං, මස කිරි තෙල සකුරුය යනාදී කැවුම් බිම්; න සෙවිතබ්බං, නොසෙවිය යුතු; කුලගෙහං න පවිසිතබ්බන්ති (සොහොන් දුටු නිවාසිත බැවිනුදු සොහොන් ගඳින්ම පිශාචයන් විසින් අනුබද්ධනාලද හෙයින්ද) කුලගෙට නොවැද්ද යුතුයයි; ඉදං, මේ; අස්ස, මොහුගේ; විධානං, විධානයි; පභෙද තො පන, ප්‍රභෙද හෙයින් වනාහි; අයම්පි, මේද; තිවිධො හොති, තුන්වැදෑරුම්වේ; තත්ථ, එහි; උක්කට්ඨෙන, උක්කට්ඨහු විසින්; යත්ථ, යම් සොහොනෙක; ධුවඩාහ, දවස දවස මිනී දැවීම්; ධුවකුණප, දවස දවස කුණප; ධුවරොදනානි, දවස දවස හැඬීම්හු; අත්ථි, ඇත්තාහුද; තත්ථෙව, එහිම; වසිතබ්බං, විසියයුතු; මජ්ඣිමස්ස, මැදුම හට; තීසු, ධුවඩාහාදී තුන්දෙනා කෙරෙහි; එකස්මිම්පි සන්තෙ, එකක්ද ඇති කල්හිදු; වට්ටති, වටී; මුදුකස්ස, මෘදුකයා හට; වුත්තනයෙන, යටකී නියෙන්ම; සුසානලක්ඛණං පත්තමත්තෙ, සොහොන් ලකුණු පැමිණි මතුයෙහි; වට්ටති, වටී; ඉමෙසං පන තිණ්ණම්පි, මේ තුන්දෙනා හටම; න සුසානම්හි වාසං කප්පෙන්ත ධුතඞ්ගං භිජ්ජති, නොසොහොන්හි වාසය කිරීමෙන් ධුතඞ්ග බිඳේ; සුසානං අගතදිවසෙති, (දහවළුදු වීනම්) සොහොනට නොගිය දවස් බිඳෙයි; අංගුත්තරභාණකා, අංගුත්තරභාණකයෝ (කියත්) අයමෙත්ථ භෙදො, මේ මෙහි භෙදයි.

අයම්පන, මේ වනාහි; ආනිසංසො, අනුසස්; මරණසතිපටිලාභො, සොහොන්හි නිති සැමශරීර දුක්මෙන් මරණ සිහි පිළි ලැබීමය; අප්පමාද විහාරිතා, එහෙයින්ම නොපමා බවය; අසුභ නිමිත්තාධිගමො, සැම ශරීර දර්ශනයෙන් අසුබු නිමිත් පිළි ලැබීමය; කාමරාග විනොදනං, එහෙයින්ම කාමරාගයාගේ දුරුකිරීමය; අභිණ්හං කාය සභාව දස්සනං (බොහෝසේ සිරුරු පිළිකුල් දුගඳ බව සැලකීමෙන්) එක්වත් කාය ස්වභාව දක්මය; සංවෙග බහුලතා (කාය සවභාව දුක්මෙන්ද මරණසති පිළි ලැබීමෙන්ද) සංවෙග බහුල බවය; ආරොග්‍ය මදප්පහාණං (ව්‍යාධිතවූද ජරාජීර්ණවූද මළසිරුරු ඉති පැමිණෙන බැවින්ද) ආරොග්‍ය යොබ්බන ජීවිත මදයන්ගේ පැහීමය; භයභෙරව සහනතා, කුඩා මහත් භය සහන බවය (නොයෙක් භය හා භය එළවන අරමුණු සහනා බවය) අමනුස්සානං ගරු භාවනීයතා [සංවෙගගට පැ

මිණියේ නුවණින් ව්‍යායාම කෙරෙයි) අමනුෂ්‍යයන් විසින් ගරුකොට සම්භාව්‍යකරණලද බවය; අප්පිච්ඡතාදීනං අනුලොම වුත්තිතාති, අපිස්බැව් ආදීන්ට අනුලොම් පැවතුම් ඇති බවයි.

සොසානිකඞ්ගී, සොසානික මහණනු; මරණානුස්සතිප්පභාවා, මරණානුස්මෘතියෙහි ආනුභාවයෙන්; නිද්දාගතම්පි, නිද්‍රාගතහුදු (සිහිනෙහුදු) පමාද දෙසා, ප්‍රමාද දෙෂයෝ න ඵුසන්ති, ස්පර්ශ නොකෙරෙත්; බහුනි කුණපානි, බොහෝ කුණපයන්; පස්සතො, දක්නාවූ; තස්ස, ඔහුගේ; චිත්තඤ්ච, මනසද; කාමානුරාගවසගම්පි නහොති, කාමරාග වශගද නොවේ; විපුලං, මහත්වූ; සංවෙගමෙති, සංවෙගයට පැමිණෙයි; න මදං උපෙති, ආරෝග්‍යාදී මදයට නොපැමිණෙයි; අත්ථො, නැවත; නිබ්බුතිං, නිවන්; එසමානො, සොයනුයේ; සම්මා, මනාකොට; ඝටති, ව්‍යායාම කෙරේ; ඉති, මෙසේ; අනෙකගුණාවහත්තා නොයෙක් ගුණ එළවන හෙයින්; සොසානිකඞ්ගං, සොසානිකාඞ්ගය තෙමේ; නිබ්බානනින්නහදයෙන, නිවන්හි නැමුනාවූ සිතැත්තහු විසින්; නිසෙවිතබ්බං, සෙවියයුතු ෴

---

( ගා † )

අබ්භොකාසිකාඞ්ගයට අනතුරුව සොසානිකාඞ්ගයයි ඒ සමාදන්වන මහණ විසින් "අසුසානං පටික්ඛිපාමි සොසානිකඞ්ගං සමාදියාමි"යි සුසාන ලක්ෂණ නැත්තාවූ වාසස්ථාන ප්‍රතික්ෂෙපකරමි සොසානිකාඞ්ගය සමාදන්වෙමි යනමේ වචන අතුරෙන් එක්තරා වචනයකින් හෝ වචන මෙයන්ම හෝ සමාදන්වන ලද්දේවෙයි. ඒ සොසානිකාඞ්ගධර මහණ විසින් වනාහි මනුෂ්‍යයෝ පළමුකොට යම් ගමක් පිහිටුවා ඒ ගමට මෙතන සොහොනයයි යම් තැනක් නියම කළාහුද ඒ නියමකළ ස්ථානය මිනි නොදවනහෙන් සොහොන් නම් නොවන බැවින් එහි නොවිසිය යුත්තේය. මිනී දැවූ කාලය පටන් ඉදින් දෙළොස් අවුරුද්දක් මුලුල්ලෙහි මිනි නොදවා අත්හරණ ලද්දේවී නමුදු සොහොන් නම්මවේමැයි. ඒ සොහොන්හි වසන්නහු විසිනුදු සක්මන්මළු මණ්ඩපාදිය කරවා හැඳපුටු පණවා පැන් එළවා තබා බණ දෙසමින් නොවිසියයුතු මේ සොසානිකාඞ්ගය වනාහි දුෂ්කරව පරිහරණය කටයුතුයි. එහෙයින් උපන් උපද්‍රවයන් නසනු පිණිස තමා වසන වෙහෙර සඟ තෙරුන්ට හෝ එගම්හි රජුන් විසින් අනුයුක්තවූ ගම් මුදලියාට හෝ තමා සොහොන්හි වසන බව දන්වා අප්‍රමාදවූවහු විසින් විසියයුත්තේය. ඒ එසේමැයි සොහොන් නම් මනුෂ්‍යයන්ගේ රහසට සුදුසු තැනයයි සිතා සොරු ඒ ඒ තැනින් වස්තු පැහැරගෙණ සොහොනට එන්නාහුය. වස්තු ස්වාමීහු සොරුන් එනුබැඳ එන්නාහු සොහොන්හි දමාපියා දිවන්නාහුය ඉක්බිති හිමිහු සොරුයයි අල්වාගන්නාහුය එහෙයින් ඒ උපද්‍රව වළක්වන පිණිස සඟතෙර හෝ රාජ පුරුෂයන් හෝ අනුදන්වා සොහොන්හි විසිය යුත්තේමැයි.

සක්මන්කරන්නහු විසිනුදු හමු නොවූකල සංවෙග උපදවනු පිණිස සක්මන්හි එමින් යමින් ඇස් කෙළවරින් සොහොන දෙස බල බලා සක්මන් කටයුතුය සොහොනට යනකල්හිද මහා මාර්ගයෙන් නොගොස් තමා සොසානිකාඞ්ගය පූරණ බව මිනිසුන්ට නොහඟවන පිණිස කුඩා මාර්ගයකින් යායුතුවන්නේය ඒ තමා යන සොහොනෙහි ඇත්තාවූ තුඹස් ගල්

මූල් ව්‍යාඝ්‍රාදී අරමුණු දහවල් දවස
ගොස් නියම දුහහැඳින ගතයුත්තේ
ය. එසේ කල්හි මේ භික්ෂු හට රෑ දව
ස ඒ අරමුණු අමනුෂ්‍යයෝයයි භය
නුපදවන්නේයි. තවද සොහොන්හි
රෑ දවස අඬ අඬා ඇවිදිනාවූ අමනුෂ්‍ය
යන්ට ලඟ ඇවිදිනාහයි කැට මුගුරු
ආදියෙන් නොපහළ යුත්තේය. සො
සානිකාඞ්ගය පුරණ මහණ විසින්
එක දවසකුදු සොහොණට නොගො
ස් විහාරයෙහි නොවිසිය යුත්තේය.
මෙහි වනාහි අඞ්ගුත්තරභාණක තෙර
හු මධ්‍යමයාමය සොහොනෙහි ගෙවා
පශ්චිමයාමයෙහි හවන්නට වටනේය
යි කියත්. තවද සොහොනට යන ම
හණ විසින් අමනුෂ්‍යයන්ට ප්‍රියවූ තල
සුණු තලමුරුවට උඳුබත් මස් කිරි
තෙල් සකුරු ආදි කණ බොණදු නො
වැලඳිය යුතුය සොහොන් දූමින් ශරී
රය දුගඳව තිබෙන හෙයිනුදු සොහො
න් ගඳින් ප්‍රේත පිශාචාදීන් විසින් අ
නුබද්නා හෙයිනුදු කුලගෙට නොවැ
දද යුතුය යනු මෙහි පිළිපදනා විධියි.
ප්‍රභේද වශයෙන් වනාහි මේද උත්කෘ
ෂ්ට මධ්‍යම මෘදුක වශයෙන් තුන් ප්‍ර
කාර වන්නේයි. ඔවුන් අතුරෙන් උත්
කෘෂ්ටයා විසින් යම් සොහොනක නි
තර මිනී දැවීමය නිතර මිනීකුණු පැ
මිණීමය නිතර හැඬීමය යන මොවුන්
ඇතනාහුනම් එබඳු සොහොනෙක්හි
විසිය යුතුය. මධ්‍යමයා හට මේ තුණි
න් එකකුදු ඇත්තේ වීනම් වටනේය.
මෘදුකයා හට යටකී නියායෙන් සො
හොනයයි සම්මතකරණලද තැනක
යටත්පිරිසෙයින් මිනී දැවූ දෙළොස්
අවුරුද්දක් ඇතුළත වටනේය. මේ
තුන්දෙනා හටම සුසාන ලක්ෂණයෙ
න් තොරවූ යම් තැනක වාසයකිරී
මෙන් ධුතාඞ්ගය බිඳෙන්නේයි. මෙහි
වනාහි අංගුත්තරභාණක තෙරහු දහ
වල් නුමුත් සොහොනට නොගිය දව
ස්හිම ධුතාඞ්ගය බිඳෙන්නේයයි කිය
ත්. මේ මෙහි බිඳීමයි.

මේ මතු දක්වන්නේ ආනිසංසයි.
සොහොන්හි නිරන්තර වාසයෙන් මෘ
තශරීර දක්මෙන් මරණානුස්මෘතිය
ලැබීමය මරණානුස්මෘති ප්‍රතිලාභය
හේතුකොටගෙණ ශ්‍රමණ ධර්මයෙහි
අප්‍රමාදවන බවය මෘතශරීර දක්මෙන්
අශුභ නිමිත් ලැබීමය අශුභ ලක්ෂණ
වැටහීම හේතුකොටගෙණ කාමරාග
ය දුරුවීමය නිරතුරු ශරීරයාගේ පිළි
කුල් බව හා දුගඳ බව සැලකීමෙන්
එකාන්තයෙන් ශරීර ස්වභාව දැකීමය
කාය ස්වභාව දක්මෙන් හා මරණානු
ස්මෘති ප්‍රතිලාභයෙන්ද සංවේග බහුලවී
මය සොහොන්හි රෝගාතුරවූද ජරාජී
ර්ණවූද මෘතශරීර නිරතුරු දක්මෙන්
ආරෝග්‍යමද යෞවනමද ජීවිත මදය
න් දුරුකිරීමය කුද්‍රමහත් භය හා භය
එලවන අරමුණු ඉවසන බවය සංවෙ
ගයට පැමිණි මේ මහණ නුවණින්
ව්‍යායාම කෙරෙයි සිතා අමනුෂ්‍යයන්
විසින් ගරුකොට සලකනලද බවය
අල්පේච්ඡතාදී ගුණයන්ට අනුලෝම
පැවතුම් ඇති බවය යන මෙතෙක් අ
නුසස් ඇතනාහුයි කීයේමැයෝ.

සොසානිකාඞ්ගධර මහණහු වනාහි
මරණානුස්මෘති භාවනානු භාවයෙන්
සිහිනොනුදු ප්‍රමාද දෝෂයෝ ස්පර්ශ
නොකෙරෙත්මය බොහෝවූ මෘත
ශරීරයන් දක්නා ඔහුගේ සිතද කාම
රාගයට වශග නොවන්නේය. මහ
ත්වූ සංවේගයටද පැමිණෙයි. ආරෝ
ග්‍යමදාදී මදයටද නොපැමිණෙයි. එ
සේ නොපැමිණ නිර්වාණ ධර්මය
නොයම්ත් ව්‍යායාමද කෙරෙයි. මෙ

ස් නොයෙක් ගුණ එලවන හෙයින් සොසානිකාඞ්ගය නිර්වාණය කෙරෙහි නැමුනු සිතැති යෝගාවචරයා විසින් සෙවනාය කටයුත්තේයි —.

මේ සොසානිකාඞ්ගයාගේ සමාදන්වීමය පිළිපැදීමය ප්‍රභේදය බිඳීමය අනුසස්ය යන අඞ්ග පඤ්චකයාගේ වර්ණනායි — —

( පා. ‡ )

යථාසන්ථතිකඞ්ගම්පි සේනාසන ලොලුප්පං පටික්ඛිපාමි යථාසන්ථතිකඞ්ගං සමාදියාමීති ඉමෙසං අඤ්ඤතර වචනෙන සමාදින්නං හොති තෙන පන යථාසන්ථතිකෙන යදස්ස සේනාසනං ඉදං තුය්හං පාපුණාතීති ගාහිතං හොති තෙනෙව තුට්ඨබ්බං න අඤ්ඤො උට්ඨාපෙතබ්බො ඉදමස්ස විධානං පභෙදතො පන අයම්පි තිවිධො හොති — තත්ථ උක්කට්ඨො අත්තනො පත්තසේනාසනං දූරෙති වා අච්චාසන්නෙති වා අමනුස්ස දීඝජාතිකාදීහි උපද්දුතන්ති වා උණ්හන්ති වා සීතන්ති වා පුච්ඡිතුං න ලභති මජ්ඣිමො පුච්ඡිතුං ලභති ගන්ත්වා පන ඔලොකෙතුං න ලභති මුදුකො ගන්ත්වා ඔලොකෙත්වා සචස්ස තං න රුච්චති අඤ්ඤං ගහෙතුං ලභති — ඉමෙසං පන තිණ්ණම්පි සේනාසනලොලුප්පෙ උප්පන්නමත්තෙ ධුතඞ්ගං භිජ්ජතීති අයමෙත්ථ භෙදො — අයං පනානිසංසො — යං ලද්ධං තෙන සන්තුට්ඨබ්බන්ති වුත්තොවාදකරණං සබ්‍රහ්මචාරීනං හිතෙසිතා හීනපණීතවිකප්ප පරිච්චාගො අනුරොධ විරොධප්පහානං අත්‍රිච්ඡතාය ද්වාරපිදහනං අප්පිච්ඡතාදීනං අනුලොම වුත්තිතාති —

"යං ලද්ධං තෙන සන්තුට්ඨො
යථා සන්ථතිකො යති
නිබ්බිකප්පො සුඛං සෙති
තිණ සන්ථරණෙසුපි —
න සො රජ්ජති සෙට්ඨම්හි
හීනං ලද්ධා න කුප්පති
සබ්‍රහ්මචාරී නවකෙ
හිතෙන අනුකම්පති —
තස්මා අරියසතාචිණ්ණං
මුනිපුඞ්ගව වණ්ණිතං
අනුයුඤ්ජෙථ මෙධාවී
යථා සන්ථතාරාමතන්ති —

අයං යථා සන්ථතිකඞ්ගෙ සමාදාන විධානප්පභෙද භෙදානිසංස වණ්ණනා —

( ෂ ‡ )

යථාසන්ථති කඞ්ගම්පි, යථාසන්ථති කාඞ්ගයද; සේනාසනලොලුප්පං පටික්ඛිපාමි, සෙනස්හි ලොල් බව පිළිකෙව් කෙරෙමි; යථාසන්ථතිකඞ්ගං සමාදියාමීති, යථාසන්ථතිකාඞ්ගය සමාදන්වෙමි යන; ඉමෙසං අඤ්ඤතර වචනෙන, මොවුන් කෙරෙන් එක්තරා වචනයෙකින්; සමාදින්නං හොති, සමාදන්වනලද්දේ වේ; තෙන පන යථාසන්ථතිකෙන, ඒ යථාසන්ථතිකයා විසින්; යං සේනාසනං, යම් සෙනස්නෙක්; ඉදං තුය්හං පාපුණාතීති, මේ තොපට පැමිණෙයි; අස්ස (අනෙන) ගාහිතං හොති, මොහු විසින් ගන්වනු ලැබේද; තෙනෙව තුට්ඨබ්බං, එයින්ම සතුටු වියයුතු; න අඤ්ඤො උට්ඨාපෙතබ්බො, අනිකෙක් නොනැගිට වියයුතු; ඉදමස්ස විධානං, මේ මෙහි විධානයි; පභෙදතො පන, ප්‍රභෙද හෙයින් වනාහි; අයම්පි, මේද; තිවිධො හොති, තුන් වැදෑරුම්වේ; තත්‍ර, එහි; උක්කට්ඨො, උකට තෙමේ; අත්තනො පත්ත සේනාසනං, තමා හට පැමිණි සෙනස්නා; දූරෙති වා, දුරු කෙළවරයයි

ගියාද; අවචාසනෙනානි වා, බොහෝ දෙනා රැස්වන ලහයකී ගියාද; අමනුෂ්‍යාදීසජාතිකාදීහි; යක්දිස්දූආදීන් විසින්; උපද්දුතනානිවා, උපද්‍රව ඇත්තේයයි කියාද; උණ්හනානි වා, හුණු යයි කියාද; සීතනානි වා, සිහිල් යයි කියාද; පුච්ඡිතුං, විළිව්සිනට; නා ලහති, නොලැබේ (විළිව්ස් මෙනුදු දුහග කෙලෙසෙන බැවිනි) මැඩිමෙ, මැදුම් තෙමේ; පුච්ඡිතුං ලහති, විළිවිස්නාව ලැබේ; ගනාවා පන ඔලොකෙතුං න ලහති [මනාවූවගණිමිහි නොමනාවුව නොගණිම්යි සිතා) ගොස් බලන්නට නොලැබේ; මුදුකො, මැදුකය; ගනාවා, ගොස්; ඔලොකෙත්වා, බලා; සචෙ, ඉදින්; අසස, ඕහට; තං, ඒ; නරුච්චති, අප්‍රිය බැවින් නොරිසිනම්; අසදිසං ගහෙතුං ලහති, අනික් සෙනසුනක් ගන්නට ලැබේ; ඉමමසං පන නිණ්ණම්පි, මේ තුන්දෙනාහටම; සෙනාසනලොලුප්ප උපපනනාම නොවා (නමහට පැමිණි සෙනාසන නොගෙණ අසුවල් දහර මහණහු වසන සෙනස්න දෙවසිද අසුවල් සෙනස්න දෙවසිද විසඳුනානියට පමුණුවා) සෙනසුන් ලොල් බැවූ උපන් කෙණෙහිම, බුනඩිගං හිජ්ජාහිනි, දුහග බිඳෙයි; අයං, මේ; එත්ථහෙදො, මෙහි හෙදයි; අයං පනානිසංසො, මේ වනානි අනුසසි; සං ලඞ්ං තෙනසන්තුට්ඨනානි වූතොනාවාදකරණං, යමක් ලබනලදද එයින් සතුටුවිය යුතුයයි කියනලද අවවාද කිරීමය; සබ්‍රහමචාරීනං හිතෙසිතා (නැණියගුණනාවූද නොනැහෙනා බැවින්) සබ්‍ර සරණට හිත පහස්නා බවය (එයින් කාරුණා විහාරයව අනුකූල බවය) නිහපපණිතවිතපපපරිච්චාගො, සුන්දරා සුන්දර විභාගය නොකරණ බැවින් හීනප්‍රණීත විකල්පය දුරුකිරීමය (එයින් නාදිගුණයට අනුකූල බවය) අනුරොධ විරොධප්පහාණං, එහෙයින් අනුරොධ විරොධයන් පැහීමය; අග්‍රිවජ්ජනාය චාරපිදහනා, අග්‍රිවජ්භාවයට අවකාශ දෙනයෙන් දෙරපිමය; අප්පිච්ඡතාදීනං අනුලොම වුත්තිතාති, අල්පේච්ඡ ආදීන්ට අනුලොම්වූ පැවතුම් ඇතිබවයි.

යං ලඞ්ං, යමෙක් ලබනලදද; තෙන සන්තුට්ඨා, එයින් සතුටුවූ; යථාසන්ථිකොයනි, යථාසන්ථිත මහණ; නිබ්බිකප්පො, විකල්පයක් නැතුව; නිණසන්ථරකෙසුපි, තණ ඇතිරියෙහිදු; සුඛං සෙති, සුවසේ හොවී; සෙට්ඨ්මිනි, උතුම් සෙනස්නෙහි; සො, හෙතෙමේ; නරජ්ජති, රාගනොකරේ; හීනං ලඞ්වා න කුප්පනි, නපුරු සෙනසුන් ලදින් නොකිපේ; සබ්‍රහමචාරිනවකෙ හිතෙන අනුකමපති, දහර මහණුන් නොනගණ බැවින් නවක සබ්‍රම් සරණට හිත පසස්නා බැවින් අනුකම්පාකෙරෙයි; තසමා, එහෙයින්; අරියසනාවිණ්ණං, නොයෙක් අරියන්විසින් පුරුදුකාරණලද; මුනිපුඞගව වණ්ණිතං, තථාගතයන් විසින් පසස්නාලද; මෙධාවී, නුවනැත්තේ; යථාසන්ථතාරාමතං, යථාසන්ථතයෙහි ඇලුනු බැවිනි; අනුයුඤ්ජෙය්ය, යෙදෙන්නේයි.

( ශා ‡ )

සොසානිකාඞ්ගයට අනතුරුව යථාසන්ථිකාඞ්ගයයි ඒ සමාදන්වන මහණ විසින් "සෙනාසනලොලුප්පං පටික්ඛිපාමි යථාසන්ථිකාඞ්ගං සමාදියාමි"යි සෙනස්නෙහි ලොල් බව දුරුකරමි යථාසන්ථිකාඞ්ගය සමාදන්වෙමි යන මෙවුන් අතුරෙන් එක්තරා වචනයකින් හෝ වචන වයෙන්ම හෝ සමාදන් වනලද්දේ වෙයි ඒ යථාසන්ථිකාඞ්ගධර මහණ විසින් යම් සෙනස්නක් මේ තොපට

වන්නේයයි සේනාසන ගාහාපකයා විසින් භාරගන්වනු ලැබේද ඒ සෙනස්නෙන්ම සතුටුවියයුතු වන්නේයි. මේ යහපත මේ අයහපත යනාදීන් විමසමින් අනිකෙකුන් සෙනස්නෙන් නොනැගිට වියයුත්තේය යන මෙපමණක්ම මෙහි පිළිපදනා විධානයි. ප්‍රභෙදවශයෙන් මේද උත්කෘෂ්ට මධ්‍යම මෘදුක වශයෙන් තුන් ප්‍රකාරවන්නේයි. ඔවුන් අතුරෙන් උත්කෘෂ්ට ධුතාඞ්ගධරතෙමේ තමහට පැමිණි සෙනස්න දුරුවූ විහාර කෙලවරදැයි? කියා හෝ බොහෝදෙනා රැස්වන විහාරාභිමුඛවූ ලඟදැයි? කියා හෝ අමනුෂ්‍ය සර්පාදීන්ගෙන් පීඩිතදැයි? කියාහෝ හුණුදැයි? සිහිල්දැයි? කියාහෝ විචාරන්නට නොලබන්නේයි කුමක්නිසාදයත්? එසේ පිළිවිසීමෙන්ද ධුතාඞ්ගය කෙලෙසෙන බැවිනැයි දතයුතු. මධ්‍යම ධුතාඞ්ගධර තෙමේ යටකී නියායෙන් සෙනාසනයෙහි යහපත් නපුරු බව විචාරන්නට ලබන්නේයි එතකුදු වුවත් සෙනස්න මනා වුවහොත් ගණිමි නපුරු වුවහොත් නොගණිමි සිතා ගොස් බලන්නට නොවටනේයි මෘදුකයා හට සෙනසුන් විචාරන්නටද ගොස් බලන්නටද ඉදින් ඒ සෙනස්න තමහට අඵාසු බැවින් නොරුස්නේනම් අනික් සෙනස්නක් ගන්නටද ලබන්නේයි මේ තුන් දෙනහටම තමහට පැමිණි සෙනස්න යහපත් නොවන්නේය. අසවල් බාල භික්ෂුව වසන සෙනස්න හෝ අසවල් සෙනස්න හෝ දෙවයි විඤ්ඤත්තියට පමුණුවා සෙනාසන ලොලුප්පය උපන් කෙණෙහිම ධුතාඞ්ගය බිඳෙන්නේය යනු මෙහි බිඳීමයි මේ මතුදක්වන්නේ ආනිසංසයි. යමක් ලබන ලද්දේද් වීනම් එයින් සතුටුවියයුතුයයි භාග්‍යවතුන් විසින් වදාරණලද අවවාද පිළිපදනා බවය නැගුටුවිය යුතු බාලභික්ෂූන් පවා නොනැගුටුවන බැවින් සබ්‍රම්සරුන්ට හිත පසස්නා බවය එහෙයින් මබ්‍රහ්මවිහාරයට අනුකූලවන බවය යහපත අයහපත යන විභාග නොකරණ බැවින් හීන ප්‍රණීත විකල්පය දුරුකිරීමය එහෙයින් තාදි ගුණයට අනුකූල වීමය අනුරෝධ විරෝධයයි කියනලද රාග ද්වෙෂ දෙක දුරුකිරීමය අනිච්ඡා සඞ්ඛ්‍යාත ආශාවට වැද්නොදී දෙර වසන බවය අල්පේච්ඡතාදීන්ට අනුලොම්වූ පැවතුම් ඇති බවය යන මෙතෙක් අනුසස් ඇත්තේයි.

කියනලදුයේ මැයි-යම් සෙනසුනක් ලබනලද්දේද් වීනම් එයින් සතුටුවූ යථාසන්ථතිකාඞ්ගධර මහණ යහපත අයහපත යනාදි විතර්ක නැතිව තණකොල ඇතිරියෙහිද සුවසේ හෝනේ වෙයි නවද මේ යථාසන්ථතිකාඞ්ගධර මහණ යහපත් සෙනස්නෙහිද නොඇලෙන්නේය නපුරු සෙනසුන් ලදද නොකිපෙන්නේය බාලභික්ෂූන් පවා අස්නෙන් නොනැගුටුවන බැවින් සබ්‍රම්සරුන්ට හිතවැඩ එලවන්නේය එහෙයින් නොයෙක් සියගණන් ආය[illegible]න් විසින් පුරුදුකරණල[illegible] තථාගත[illegible]න් විසින් ප්‍රශංසනීයවූ යථාසන්ථතිකාඞ්ගරාමතාවෙහි පණ්ඩිත මහණ තෙමේ නැවත නැවත යෙදෙන්නේයි ~

මේ යථාසන්ථතිකාඞ්ගයෙහි සමාදන්වීමය පිළිපදනා විධිය ප්‍රභෙදය බිඳීමය ආනිසංසය යන අඞ්ග පඤ්චකයාගේ වර්ණනායි. ~

( පා * )

නෙසජ්ජිකඞ්ගම්පි සෙය්‍යං පටික්ඛිපාමි නෙසජ්ජිකඞ්ගං සමාදියාමීති ඉමෙසං අඤ්ඤතර වචනෙන සමාදින්නං හොති...... තෙන පන නෙසජ්ජිකෙන රත්තියා තීසු යාමෙසු එකං යාමං උට්ඨාය චඞ්කමිතබ්බං ඉරියාපථෙසු හි නිපජ්ජිතුමෙව න වට්ටති ඉදමස්ස විධානං පභෙදතො පන අයම්පි තිවිධො හොති...... තත්ථ උක්කට්ඨස්ස නෙව අපස්සෙනං න දුස්සපල්ලත්ථිකා න අයොගපට්ටො වට්ටති මජ්ඣිමස්ස ඉමෙසු තීසු යංකිඤ්චි වට්ටති...... මුදුකස්ස අපස්සෙනම්පි දුස්සපල්ලත්ථිකාපි අයොග පට්ටොපි බිම්බොහනම්පි පඤ්චඞ්ගොපි සත්තඞ්ගොපි වට්ටති පඤ්චඞ්ගො නාම පිට්ඨිඅපස්සයෙන සද්ධිං කතො සත්තඞ්ගො නාම පිට්ඨිඅපස්සයෙන ච උභතො පස්සෙසු අපස්සයෙහි ච සද්ධිං කතො තං කිර පීළාභයත්ථෙරස්ස අකංසු ථෙරො අනාගාමී හුත්වා පරිනිබ්බායි. ඉමෙසං පන තිණ්ණම්පි සෙය්‍යං කප්පිතමත්තෙව ධුතඞ්ගං භිජ්ජති අයමෙත්ථ භෙදො අයං පනානිසංසො ...... සෙය්‍යසුඛං මිද්ධසුඛං පස්සසුඛං අනුයුත්තො විහරතීති වුත්තස්ස චෙතසො විනිබන්ධස්ස උපච්ඡෙදනං සබ්බකම්මට්ඨානානුයොගසප්පායතා පාසාදික ඉරියාපථතා විරියාරම්භානුකූලතා සම්මාපටිපත්තියා අනුබ්‍රූහණන්ති......

ආභුජිත්වාන පල්ලඞ්කං
පණිධාය උජුං තනුං
නිසීදන්තො විකම්පෙති
මාරස්ස හදයං යති......

සෙය්‍යසුඛං මිද්ධසුඛං
හිත්වා ආරද්ධවීරියො
නිසජ්ජාභිරතො භික්ඛු
සොභයන්තො තපොවනං......

නිරාමිසං පීතිසුඛං
යස්මා සමධිගච්ඡති
තස්මා සමනුයුඤ්ජෙය්‍ය
ධීරො නෙසජ්ජිකං වතන්ති......

අයං පන නෙසජ්ජිකඞ්ග සමාදාන විධානප්පභෙදභෙදානිසංසවණ්ණනා.

—— ooo ——

( ස ‡ )

නෙසජ්ජිකඞ්ගම්පි, නෙසජ්ජිකාඞ්ගය ද; සෙය්‍යං පටික්ඛිපාමි, ශය්‍යා පථ ලක්‍ෂණවූ ශය්‍යාව පිළිකෙව්කෙරෙමි (ශය්‍යාපථ ශය්‍යාව පිළිකෙව්කිරීමෙන්ම නැඟීවූ මාඤ්චය හිසිය ය හාදිවූ ශය්‍යාවෝද පිළිකෙව්කරණ ලදහුවෝම වෙත්) නෙසජ්ජිකඞ්ගං සමාදියාමීති, නෙසජ්ජිකාඞ්ගය සමාදන් වෙමි යන; ඉමෙසං අඤ්ඤතරවච නෙන, මොවුන් කෙරෙන් එක්තරා වචනයෙකින්; සමාදින්නං හොති, සමාදන්වනලද්දේවේ; තෙන පන නෙසජ්ජිකෙන, ඒ නෙසජ්ජිකයා විසින්; රත්තියා තීසු යාමෙසු, රාත්‍රියෙහි තුන්යාමයෙහි; එකං යාමං, එක්යමක්; උට්ඨාය චඞ්කමිතබ්බං, නැගිසිට සක්මන් කටයුතු (නෙසජ්ජිකයෙම් සියලු රෑ නොහින්දයුතු) ඉරියාපථෙසු හි, ඊර්යාපථයන් කෙරෙහි; නිපජ්ජිතුමෙව න වට්ටති, සෝනාවම නොවටී; ඉදං, මේ; අස්ස, මොහුගේ; විධානං, විධාන යි; පභෙදතො පන, ප්‍රභෙදයෙහින් වනාහි; අයම්පි තිවිධො හොති, මේද තුන්වැදෑරුම්වේ; තත්ථ, එහි; උක්කට්ඨස්ස, උකටුහට; නෙව අපස්සෙනං වට්ටති, පිට වුව නොදවටී; න දුස්ස පල්ලත්ථිකා, සිවුරෙන් අකට්වූ නොද වටී; න අයොගපට්ටො වට්ටති, අයොගපටිය නොදවටී; මජ්ඣිමස්ස පන, මැදුම්හට වනාහි; ඉමෙසු තීසු, මේ තුන්දෙනා කෙරෙහි; යං කිඤ්චි වට

ති, යම් සිතකින් වේ: මුදුකායස්ස, මෘදුකායභාව: අපසෝසනාදිපි, පිවාටුවද; දුස්සපල්ලත්ථිකාපි, සිවුරෙන් අකෑවුද; අයොගපට්ටාපි, අයොගපට්ටියද; බිම්බොහනාපි, බිම්බොහනයද (කන් මෙහිනුදු) පඤ්චඞ්ගාපි, පඤ්චාඞ්ගයද; සත්තඞ්ගාපි, සත්තාඞ්ගයද; වට්ටති, වේ: පඤ්චඞ්ගා නාම, පඤ්චාඞ්ගය නම්; පිට්ඨි අපස්සයෙන සහිතා කතනා, පිට අපස්සයත් සමග කෙළේයි (මෙහි ය සතරපයින්හා පිටහි අපස්සයෙන්හා යුක්තබැවින් පඤ්චාඞ්ගනාම් වී) සත්තඞ්ගා නාම, සත්තාඞ්ගය නම්; පිට්ඨි අපස්සයෙන ච, පිට්ඨි අපස්සයින්ද: උභතො පස්සෙසු අපස්සයෙහි ච කතනා, දෙපසෙහි අපස්සය දෙකය සහමෙයින් කෙළේයි (මේ සතරපයින්හා අපස්සය තුණින්හා යුක්තහෙයින් සත්තාඞ්ග නාම්වේ – දෙස් හිද පිටින්ද සුවසේ වැතිර හිඳිනා නෙසජ්ජිකයාහා අනෙසජ්ජිකයාගේ වෙනස්කම යනු වණ්ට "තං කිර පිළුභාහයතෙට රස්ස අකංසු" යනු ගේ සත්තාඞ්ගය පිළුභාහය තෙරැන්ට කළහ; රෙරු අනාගාමි හුවා පරිනිබ්බායි, තෙරහු ඉති හිද අනාගැමිව පිරිනිවියෝ; ඉමෙසං පන තිණ්ණම්පි, මේ තුන් දෙනාහටම්; සෙයනං කපෙටිනමෙනො, ශය්‍යාව කළ මතුයෙහි; ධුතඞ්ගං භිජ්ජති, ධුතඞ්ගබිදේ; අයමෙත්ථ භෙදො, මේ මේහි හෙදයි; අයම්පන, මේ වනාහි; ආනිසංසො, අනුසසි; සෙය්‍යසුඛං, තෙව්මෙන් වන සුවෙහි; පස්සසුඛං, ඇලමෙන් ඇලෑට පෙරළී පෙරළී නිදන් තහුටවන පාර්ශව සුඛයෙහි; මිද්ධසුඛං, මිද්ධ සුවෙහි; අනුයුතොනා විහරන්ති, යෙදී වෙසෙන; වුත්තස්ස, කියනලද; චෙතසො විනිබන්ධස්ස, චෙතොවිනිබන්ධයාගේ; උපච්ඡෙදනං, උපච්ඡෙදනය කරන්නේය, සබ්බකම්මට්ඨානානුයොගසප්පායතා, නිෂද්‍යාව අලින අනුයොගපායිකා බැවින් සියලු කම්ටහන් යෙදීමට සැප බවය; පාසාදික ඉරියාපථතා, ලෙහයින්ම ප්‍රසාදකර ඉරියව්වක් බැවින්; විරියාරම්භානුකූලතා, වීර්‍යාරම්භ යොගයට සුදුසුබැවින් වීර්‍යාරම්භයට අනුකූල බවය; සම්මාපටිපත්තියා සංපබ්‍රූහණානි, එහෙයින්ම සම්‍යක් ප්‍රතිපත්තියගේ වැඩීමකැයි —

පල්ලඞ්කං ආභුජිත්වාන, පලඟ බැඳ; තනුං, සිරුර; උජුං පණිධාය, සෘජු කොට පිහිටුවා; නිසීදනෙනා, හිඳුනාවූ; යති, මහණතෙමේ; මාරස්ස හදයං, මරහුගේ හෘදය; කම්පෙති, කම්ප කෙරේ (මරහුගේ ඉච්ඡාවිඝාතය කෙරේ) නිසජ්ජාභිරතො, නිෂද්‍යාවෙහි ඇලුනාවූ; භික්ඛු, මහණතෙමේ; සෙය්‍යසුඛං, ශය්‍යා සුවය; මිද්ධසුඛං, මිද්ධ සුවය; හිත්වා, හැර; ආරද්ධවීරියො, ආරබ්ධවීර්‍ය ඇත්තේ; තපොවනෙ සොභයන්තො, තපොවනය හොබවමින්; යස්මා, යම්හෙයකින්; නිරාමිසං, ලොකාමිස රහිතවූ; පීතිසුඛං, ප්‍රීති සුවයට; සමධිගච්ඡති, පැමිණේද; තස්මා, එහෙයින්; ධීරො, නුවණැත්තෝ; නෙසජ්ජිකං වතං, නෙසජ්ජික ධුතඞ්ග; සමනුයුඤ්ජෙය්‍ය, මනාකොට යෙදෙන්නේයි —

අයං, මේ; නෙසජ්ජිකඞ්ග සමාදානවිධානප්පභෙදභෙදානිසංස වර්ණනා, නෙසජ්ජිකාඞ්ගයෙහි සමාදාන විධානය ප්‍රභෙදය ආනිසංසය යන මොවුන්ගේ වර්ණනායි —

———

( හා. ९ )

යථාසන්ථතිකාඞ්ගයට අනන්තර නෙසජ්ජිකාඞ්ගයයි ඒ සමාදන්වන මහණ එයින් "සෙනාසනං පටික්ඛිපාමි නෙසජ්ජිකාඞ්ගං සමාදියාමි" යි ඇද ඇතිරිලි හිස් බිම්බොහනාදී ශයන

සනිතවූ සයනා ඉරියව්ව ප්‍රතික්ෂේප කාරී නෙසජ්ජිකාඞ්ගය සමාදන්වෙමි යන මේ වචනාදියෙන්ගෙන් එක්තරා වචනයකින් හෝ සමාදන්වනලද්දේ වේයි. ඒ නෙසජ්ජිකාඞ්ගධර මහණ විසින් ඉම නෙසජ්ජිකයෙහි තිනා මුලු රාත්‍රියම නොනිද තුන්යාමයෙන් එක් ය මෙක් නැගිට සක්මන් කටයුතුයි ඉදිරි ඉයෑ සිටීම ය ගමන ය සයනය යන සතර ඉරියව්වෙන් සයන ඉරියව්ව නෙසජ්ජිකාඞ්ගධරයාහට නොවටනේ සි මේ සන සි පිළිපැදීමයි. ප්‍රභේදවශයෙන් මේද උත්කෘෂ්ට මධ්‍යම මෘදුක වශයෙන් ත්‍රිප්‍රකාරවන්නේයි. ඒ වින් උත්කෘෂ්ටයාහට පිටා වටයයි කියනලද පිටඇන්දයද සිවුරැ අකට්ටුවයයි කියනලද සිවුරෙන් පලඟතැද්දද අපයාශ්‍රයටයයි කියන ලද ඒලි සපිනා ප්‍රවරණඩද නොවට නේය මධ්‍යමයාහට මේ තුනින් යම් කිසි එකක් වටනේය මෘදුකයාහට පිටාපුටද සිවුරැ අකට්ටුවද අපාශ්‍රයටයද නොවටයද පංචාඞ්ගයෙන් යුත් අස්නද සප්තාඞ්ගයෙන්යුත් අස්නද වටනේය පංචාඞ්ගයෙන්යුත් අස්න නම් පිටාටුවය සතරපාදය යන අවයව පසක් ඇති දඬුවැඩි පුටු ආදියයි සප්තාඞ්ගයෙන්යුත් අස්න නම් පිටාටුවය දෑලයෙහි අත් පඩි දෙකය සතරපාදය යන ආයව සතකින්යුත් දඬුවැඩි පුටු ආදියයි මෙහි එනාති පංචාඞ්ග සප්තාඞ්ගයෙන්යුත් පුටු වැනි ආදියෙහි සුවසේ වැතිර සිටිනා නෙසජ්ජිකාඞ්ගධරයාහට අනෙස ජ්ජිකයෙන්ද කවර වෙනසක් ඇත් තේදයත්? පිළිනාග තෙරුන්වහන් සේට වනාති නෙසජ්ජිකාඞ්ගය පුරණු පිණිස ඒ සප්තාඞ්ගයෙන්යුත් ආසන යක් කරවූහ. තෙරුන්වහන්සේ එක් සිද නෙසජ්ජිකාඞ්ගය පුරා නොබෝ දවසකින් අනාගාමී ඵලයට පැමිණ පිරිනිවන් පෑසේක. මේ තුන්දෙනාහ ටම සයනයකළ කල්හිම ධුතාඞ්ගය බිඳෙන්නේය යනු මෙහි භේදයි. මේ මතු දක්වන්නෝ ආනිසංසයි වැදහෙ විඳිමන්වන සුවය ඇලයෙන් ඇලයට පෙරළි පෙරළි නිදන්නහුටවන පාර් ශ්ව සුවය පංචඤ්චාදියන්ගේ මිඩංගලි තවිතෙන් උපදනා නිද්‍රාසුවය යන මේ ත්‍රිවිධ සුවයෙහි යෙදී වසන්නේ යයි කියනලද චිත්තබන්ධනය සිඳින් නේය නිෂද්‍යාස්ථාපනය නොකම්මැලි නිවෘත්තිනා නොලඬහුබවට පසා බැවින් සියලු කම්ටහන් භාවනාවෙහි යෙදීමට සැපයමිය දුටුවන් පහදවන ඉරි යව් බවය විශිෂ්ටාරම්භයට අනුකූල බවය එහෙයින්ම මනා ප්‍රතිපත්ති ධර්ම යන් වඩනා බවය යන මෙතෙක් අනු සස් ඇත්තේයි—කියේමැනෝ.—

පලක්බැඳ වැඩහිඳ ශරීරය ඍජු කොට පිහිටුවා හිඳිනාවූ තපස්වීතෙ මේ මාරයාගේ ලය කම්පිතකෙරෙයි හෙමත් බලවත් ආසාව සුන්කරන් නේයි. තවද නිෂද්‍යාප්‍රස්ථහෙහි ඇලුනාවූ භික්ෂුතෙම සයනසුව නිද්‍රා සුවයන් හැර වැඩුවීර්‍ය ඇතිව තපෝ වනය හොබවමින් යම්හෙයකින් ලොකාමිෂ සංස්ථානවූ පස්කම්සැප යෙන් වෙන්වූ ප්‍රීති සැපයට පැමිණේ ද එහෙයින් පණ්ඩිත මහණතෙම නෙසජ්ජිකාඞ්ගය සෙවනේ නොකටයුතුයි.—

මේ නෙසජ්ජිකාඞ්ගයාගේ සමා දානවිධිය පිළිපැදීම විධානය භේදය අනුසස් යන අප්‍රකාශිතයාගේ ව ණ්නායි.—

— ... —

( පා * )

කුසලත්තිකතො චෙව
ධුතාදීනං විභාගතො
සමාසව්‍යාසතො චාපි
විඤ්ඤාතබ්බො විනිච්ඡයො.

ඉමිස්සා ගාථාය වසෙන වණ්ණනා හොති තත්‍ථ කුසලත්තිකතොති සබ්බානෙව හි ධුතඞ්ගානි සෙඛපුථුජ්ජනඛීණාසවානං වසෙන ... සියා කුසලානි ... සියා අබ්‍යාකතානි ... නත්‍ථි ධුතඞ්ගං අකුසලන්ති ... යො පන වදෙය්‍ය "පාපිච්ඡො ඉච්ඡාපකතො ආරඤ්ඤකො හොති"ති ආදිවචනතො අකුසලම්පි ධුතඞ්ගන්ති සො වත්තබ්බො න මයං අකුසලචිත්තෙන අරඤ්ඤෙ න වසතීති වදාම යස්ස හි අරඤ්ඤෙ නිවාසො සො ආරඤ්ඤකො සො ච පාපිච්ඡො වා භවෙය්‍ය අප්පිච්ඡො වා ඉමානි පන තෙන තෙන සමාදානෙන ධුතකිලෙසත්තා ධුතස්ස භික්ඛුනො අඞ්ගානි කිලෙසධුනනතො වා ධුතන්ති ලද්ධවොහාරං ඤාණං අඞ්ගමෙතෙසන්ති ධුතඞ්ගානි අථවා ධුතානිච තානි පටිපක්ඛනිද්ධුනනතො අඞ්ගානි ච පටිපත්තියාතිපි ධුතඞ්ගානීති වුත්තං න අකුසලෙන කොචි ධුතො නාම හොති යස්සෙතානි අඞ්ගානි භවෙය්‍යුං න ච අකුසලං කිඤ්චි ධුනාති යෙසං තං අඞ්ගන්ති කත්වා ධුතඞ්ගානීති වුච්චෙය්‍යුං නාපි අකුසලං චීවරලොලුප්පාදීනි චෙව ධුනාති පටිපත්තියා ච අඞ්ගං හොති තස්මා සුවුත්තමිදං නත්‍ථි අකුසලං ධුතඞ්ගන්ති යෙසම්පි කුසලත්තිකවිනිමුත්තං ධුතඞ්ගං තෙසං අත්‍ථතො ධුතඞ්ගමෙව නත්‍ථි අසන්තං කස්ස ධුනනතො ධුතඞ්ගං නාම භවිස්සති ධුතගුණෙ සමාදාය වත්තන්තීති වචනවිරොධොපි ච නෙසං ආපජ්ජති තස්මා තං න ගහෙතබ්බන්ති අයං තාව කුසලත්තිකතො වණ්ණනා ...

( ස * )

ඉදූති, දූත්; කුසලත්තිකතො ... පෙ ... විඤ්ඤාතබ්බො විනිච්ඡයො ... පෙ ... ඉමිස්සා ගාථාය වසෙන, මේ ගාථාවගේ වශයෙන්; වණ්ණනා හොති, වර්ණනාවෙයි; තත්‍ථ, ඒ ගාථාවෙහි; කුසලත්තිකතො, ඇත්දෙනෙ; සබ්බානෙව ධුතඞ්ගානි, සියලු ධුතාඞ්ගයෝම; සෙඛපුථුජ්ජනඛීණාසවානං වසෙන, සෛක්ෂ්‍ය පෘථග්ජන ක්ෂීණාශ්‍රවයන්ගේ වශයෙන්; සියා කුසලානි, කුසල්වූවෝනි; සියා අබ්‍යාකතානි, අව්‍යාකෘතවූවෝත් ...

("සෙඛපුථුජ්ජනානං වසෙන සියා කුසලානි ඛීණාසවානං වසෙන සියා අබ්‍යාකතානි" යි යොදනු — ශෛක්ෂ්‍ය පෘථග්ජනයෝ පුණ්‍යපාගී පුරණු පිණිසද ක්ෂීණාශ්‍රවයෝ සුඛවිහාර පිණිසද ධුතාඞ්ග පරිහරණය කෙරෙත්) නත්‍ථි ධුතඞ්ගං අකුසලන්ති, අකුසල ධුතාඞ්ගයෙක් නැතැයි; යො පන වදෙය්‍ය, යමෙක් වනාහි මෙසේ කියා නම්; පාපිච්ඡො ඉච්ඡාපකතො ආරඤ්ඤකො හොතීති ආදිවචනතො, පවිටු ඉච්ඡා ඇත්තේ ඉච්ඡාවෙන් මඩනා ලද්දේ ආරණ්‍යක වේයි යනාදීන් කීබැවින්; අකුසලම්පි ධුතඞ්ගන්ති, අකුසලවූ ධුතාඞ්ගයෙක් ඇතැයි (අකුසල චිත්තයෙනුදු ධුතාඞ්ගසෙවනා ඇත යන අභිප්‍රායයි) සො වත්තබ්බො, හේ මෙසේ කියයුතුවේ; මයං, අපි; අකුසලචිත්තෙන, අකුසල් සිතින්; අරඤ්ඤෙ න වසතීති, අරණ්‍යයෙහි නොවෙසෙයි; න වදාම, නොකියමු; යස්ස හි, යමෙක්හට; අරඤ්ඤෙ නිවාසො, අරණ්‍යයෙහි විසීම වේද; සො, හේ; ආරඤ්ඤකො, ඒ ආරණ්‍යකය; සො ච, හේ;; පාපිච්ඡො වා භවෙය්‍ය, පාපෙච්ඡයෙක් වේ; අප්පිච්ඡො වා, අල්පෙච්ඡ

හෝ වේ ("ඉමානි පන ධුතඞ්ගානි"
යොදනු "තෙන තෙන" යනාදියෙහි
අර්ථ වචනාර්ථ නිර්දේශයෙහි කී නයින්
දතයුතු) වුත්තං, යෙකී වචනාර්ථ
නිර්දේශයෙහි කීනකලද යන අර්ථයි;
අකුසලෙන, අකුශලයෙන්; කොචි,
කිසි භික්ෂුවෙක්; ධුතො නාම නව
හොති, කෙලශධුනනය කාරණහෙ
යින් ධුත නම් නොවේද; යස්ස, යම්
භික්ෂුවෙක්හට; එතානි, මේ අකුශල
සමාදානයෝ; අඞ්ගානි භවෙය්‍යුං,
අඞ්ගවෙද්ද (අකුශලයෙන් සමන්විත
පුහුලා ධුතය යන නම නොලබනබැ
වින් "ධුතස්ස භික්ඛුනො අඞ්ගානි"ති
පූර්ව විග්‍රහයෙනුදු අකුශල ධුතාඞ්ග
නම් නොවෙයි යනු අභිප්‍රායයි) අකු
සලං, අකුශලයතෙමේ; කිඤ්චි පාපං,
කිසි පාපයක් (අප්‍රතිපක්‍ෂබැවින්) න
ධුනාති, නොනසාද; යෙසං, යම් ස
මාදානකොණක්නට; තං, හේ අකුශ
ලය; අඞ්ගනාම් කාඬා, අඞ්ගයයි කියා;
ධුතඞ්ගානීතිවුච්චෙය්‍යුං, ධුතාඞ්ගයයි
ඒ අකුශලයෝ කියනු ලැබෙද්ද (සමා
දානයන්ට අඞ්ගවන අකුශලය ධුතය
යන නම් නොලබනබැවින් "ධුතානි
ලඞ්වොහාරං" යන දෙවන විග්‍රහ
යෙනුදු අකුශල ධුතාඞ්ග නම් නො
වේ යන අභිප්‍රායයි) අකුසලං, අකුශ
ලයතෙමේ, චීවරලොලුප්පාදීනි චෙව,
චීවර තෘෂ්ණාදීන්ද; නාපි ධුනාති,
නොද නසයි; පටිපත්තියා ච, ප්‍රතිප
ත්තියෙහිද; නාපි අඞ්ගං හොති, නොද
අඞ්ගවේ (මෙයින් "අථ වා ධුතානි ච
තානි යනාදි තුන්වන විග්‍රහයෙනුදු
අකුශලය ධුතාඞ්ග නොවන බව දක්
වූහු) තස්මා, එහෙයින්; නාපි අකුස
ලං ධුතඞ්ගානි, අකුශල ධුතාඞ්ග
යක් නැත යන; ඉදං, මේ; සුවුත්තං,
මනාකොට කියනලදී; යෙසම්පි, යම්
අභයගිරි වැසි කෙනෙක්හට; ධුත
ඞ්ගං, ධුතාඞ්ගයතෙමේ; කුසලත්තික
විනිමුත්තං, කුශලත්‍රික විනිර්මුක්ත
වේද (අභයගිරිනිවාසීහු වනාහි ධු
තාඞ්ග නම් ප්‍රඥප්තියි යෙත්) තෙසං,
ඒ අභයගිරිවැස්සනට; අත්ථතො ධුත
ඞ්ගං නාම නත්ථි, පරමාර්ථයෙන් අවි
ද්‍යමානබැවින් ධුතාඞ්ග නම් නැත්;
අසන්තං, තෙමේ අවිද්‍යමානවූයේ;
කස්ස ධුනනතො, කවර කෙලෙසක්
හු නසනබැවින්; ධුතඞ්ගං නාම භවි
ස්සති, ධුතාඞ්ග නම් වේද; ධුතගුණෙ
සමාදය වත්තතීති, ධුතගුණයන් ස
මාදන්ව වෙසෙයි යන; වචන විරො
ධොපි ච, මේ වචනයට විරොධයද;
තෙසං ආපජ්ජති, ඒ අභයගිරිවැස්ස
නට පැමිණේ (ධම්මවශයෙන් අවිද්‍ය
මානයා ගුණනම් නොවනබැවින්ය
යනු අභිප්‍රායයි) තස්මා, යම්හෙයකින්
(ප්‍රඥප්ති පක්‍ෂයෙහි මෙකී දෝෂයෝ
දුර්නිවාරයෝද එහෙයින්) තං න
ගහෙතබ්බං, ඔවුන්ගේ වචනය නො
ගතයුතුය (උක්තනයින් චෙතනා ප
ක්‍ෂයම ගතයුතුය යන අර්ථයි) අයං
තාව, මේතෙමේම; කුසලත්තිකතො
වණ්ණනා, කුශලත්‍රිකහෙයින් වණ්
නායි.——

( ගා. )

දැන් වනාහි මේතැන්පටන් "කුශල
ත්‍රික වශයෙන්ද ධුතධර්මාදීන්ගේ වි
භාගවශයෙන්ද සංක්ෂෙපවශයෙන්ද
විස්තාරවශයෙන්ද විනිශ්චය දතයුත්
තේය" යන මේ ගාථාවගේ වශයෙන්
යෙවත් මේ ගාථාවෙහි ආපිළිවෙළින්
වණ්ණනාව වන්නේසි ඔවුන් අතුරෙන්
කුශලත්‍රික වශයෙන් වණ්ණනාව තෙ
ජේදයත්? මේ සියලු ධුතඞ්ගයෝම
ශෛක්‍ෂපෘථග්ජනක්ෂීණාශ්‍රවයන්ගේ
වශයෙන් කුසලද්ද අබ්‍යාකෘතද වෙති
(මෙහිවින් සෝවාන්මාර්ගස්ථයාදි අර්
හත්මාර්ගස්ථයා අවසන්කොට ඇති සප්ත

පෙශලභාවයෝහෝ පෘථග්ජනයෝද මතු මාර්ගඵලාධිගමය සඳහා ප්‍රතිපත්ති පූරණු පිණිස මෙව ධුතාඞ්ග රක්‍ෂාකරණකාල්හි ඔවුන්ට කුසල්වෙති ක්‍ෂීණාශ්‍රව රහතුන් සැපවිහරණය පිණිස ධුතාඞ්ග පරිහරිණයකරණකල්හි අනුසය රහිත සන්තානබැවින් ඒ ධුතාඞ්ග පිළිබඳව පහළවන විධානයෝ කාමාවචරක්‍රියා අව්‍යාකෘතනම වෙත් මැයි] තවද අකුශල පක්‍ෂයට අයත්වූ ධුතාඞ්ගයක් නැත්තේමැයි එනකුදු වුවත් මේ සස්නෙහි ඇතැම් මහණෙක් ලාමක අදහස් ඇතිව තෘෂ්ණාවෙන් මඩනාලදුව ආරණ්‍යකවෙයි යනාදීන් වදලබැවින් ඒ පාපභික්‍ෂූන්ගේ අකුසල චේතනාවෙනුදු ධුතාඞ්ග සේවන ඇතිබැවින් අකුශලවූ ධුතාඞ්ගයෙකුදු ඇතැයි යම් වාදියෙක් කියත්නේවේද ඔහට මෙසේ කියයුතු වන්නේයි කෙසේදයත්? අකුසල් සිතින් කිසියම් මහණෙක් අරණ්‍යයෙහි නොවසන්නේයයි අපිදු නොකියම්හ එනකුදුවුවත් යමෙකුට අරණ්‍යවාස ඇත්තේවේනම් හෙතෙම ආරණ්‍යක නම් වන්නේය ඒ පුද්ගලතෙම ලාමක අදහස් ඇත්තේහෝ වේවයි අල්පෙච්ඡහෝ වේවයි ආරණ්‍යකවන පමණවූයේ ආරණ්‍යක ධුතාඞ්ගධර නොවන්නේය. මේ ධුතාඞ්ගයෝ වනාහි ඒ ඒ අඞ්ගසමාදානයෙන් කම්පාකරණලද කෙලෙස් ඇතිබැවින් ධුත නම්වූ භික්‍ෂූහුගේ අඞ්ගයෝනුයි කියාහෝ කෙලෙස් කම්පාකරණ අර්ථයෙන් ධුතයයි ලබනලද නම් ඇති ඥාන නැමැති අඞ්ගය ඇතිබැවින්හෝ ධුතාඞ්ගනම් වෙත්මය නොහොත් තමතමන්ට විරුඬ ධර්ම නසන අර්ථයෙන් ධුත නම්වූද ප්‍රතිපත්තියට කාරණබැවින් අඞ්ග නම්වූද ධර්මයෝ ධුතාඞ්ගනම් වෙතියි යටකී වචනාර්ථනිර්දේශයෙහි දක්වනලද්දේයි. මේ සස්නෙහි කිසි භික්‍ෂුවක් අකුසලයෙන් කෙලෙස් කම්පා නොකරණහෙයින් ඒ අර්ථයෙකුදු පවිටු මහණහුගේ චේතනාදීහු ධුත නම්ද නොවන්නාහුය යම් භික්‍ෂුවක්හට මේ අකුසල සමාදානයෙන් අඞ්ගවේද්ද ඒ අකුසලය කිසි පාපයක් නොම්සොලවනබැවින් ඒ අඞ්ග සමාදානයන්ට අඞ්ගවන අකුසලය ධුතනාමය නොලබනබැවින්ද අකුසල් ධුතාඞ්ගනම් නොවන්නාහුය අකුසලය චීවර ලොලත්වාදියද නොනසයි ප්‍රතිපත්තියටද අඞ්ග නොවේයි එහෙයින් අකුසල්වූ ධුතාඞ්ගයෙක් නැතැයි යන මේ වචනය මනාකොටම කියනලදී. තවද අභයගිරිවිහාරවාසීහු ධුතාඞ්ගනම් කුශලත්‍රිකයෙන්ම මිදුනාවූ ප්‍රඥප්තිමාත්‍රයෙකැයි කියත් එසේ ඇති කල්හි ඒ අභයගිරිවිහාරවාසීන්ට පරමාර්ථවශයෙන් ධුත ධර්මයන් අවිද්‍යමානහෙයින්ද ධුත ධර්මයෙන් වෙන්වූ කෙලෙස් නැසීමක් නැතිබැවින් කෙලෙසුන් කම්පාකිරීමක්ද නැතිවන්නේය තෙමේම නැත්නාවූ ධර්මයක්නම් කවරකුශලයක් නසනහෙයින් ධුතාඞ්ගනම් වන්නේද? ධර්මවශයෙන් අවිද්‍යමාන සම්භාර ගුණද නොවනබැවින් ධුතගුණයන් සමාදන්වෙතැයි වන්නේය යන දෙශනාපලද ඔවුන්ට විරුඬවන්නේය යම්හෙයකින් ධුතාඞ්ගය ප්‍රඥප්තිමාත්‍රයෙකැයි කියන අභයගිරි පක්ෂයට පැමිණෙන මේ දෝෂයෝ වලකාලියනොහැක්ක එහෙයින් ඔවුන්ගේ මතය පිළිනොගෙණ යට කියනලද චේතනාවම ධුතාඞ්ගයයි යන මතය පිළිගතයුත්තේයි | නොවත් පංසුකූලිකාදි ධුතාඞ්ග පුරන්නාහට සමාදානකාලයෙහිද පරිහරණකාලයෙහිද ඒ පිළිබඳව පහළවන චිත්තවීථි හා සම්ප්‍රයුක්තවූ චෛතසික ධර්ම අනුසාරයෙන් අලොභාදියට පුරෝවරුබව ගෙනදෙනාවූ චේතනා ප්‍රඥා යන චෛතසික ධර්ම

යෝච ධුතාඞ්ගනම්මන්තාහුයි ඒද
දෙශෙක්හ පෘථග්ජනයන්ට නම් ඉතු
විශෙෂාධිගමයන්ට ප්‍රත්‍යය වනහෙ
යින් කුසල්ද රහතුන්ටනම් ඉතු වි
ශෙෂාධිගමයක් නැතිබැවින්ද තෘ
ෂ්ණාව නැසූබැවින්ද අව්‍යාකෘතම
වෙත්වැයි. එසේහෙයින් මේ ධුතාඞ්ග
ධර්මයෝ කුසලුන්වන්නෝය අව්‍යාකෘ
තද වන්නෝනුයි අන්ධර්ම මාතෘකාග
ත පළමුවන කුසලත්‍රිකයාගේ පළමු
වන තුන්වන දෙපදයෙහි සඞ්ග්‍රහකර
ණලද්දේයි. මෙසේම වෙදනාත්‍රිකාදි
සියලු ත්‍රික මාතෘකායෙහිද සංකිලෙ
ස දුකාදී සියලු නික්ඛෙපකායෙහිද
ඇතුලත්කොට සුදුසු පරිද්දෙන් ව
ර්ණනා කටයුතුයි] මේ පළමුතොට කු
ශලත්‍රික වශයෙන් වර්ණනායි —

( ශා † )

ධුතාදීනං විභාගතොති ධුතො වෙදි
තබ්බො ධුතවාදො වෙදිතබ්බො ධුත
ධම්මා වෙදිතබ්බා ධුතඞ්ගානි වෙදි
තබ්බානි කස්ස ධුතඞ්ගසෙවනා සප්පා
යාති වෙදිතබ්බා — තත්‍ථ ධුතොති
ධුතකිලෙසො වා පුග්ගලො කිලෙස
ධුනනො වා ධම්මො ධුතවාදොති එ
ත්‍ථ පන අත්‍ථි ධුතො න ධුතවාදො අ
ත්‍ථි න ධුතො ධුතවාදො නෙව අත්‍ථි
ධුතො න ධුතවාදො අත්‍ථි ධුතො චෙව
ධුතවාදො ච තත්‍ථ යො ධුතඞ්ගෙන
අත්තනො කිලෙසෙ ධුනි පරං පන
ධුතඞ්ගෙන න ඔවදති නානුසාසති
බාකුලත්ථෙරො විය අයං ධුතො න ධු
තවාදො යථාහ තයිදං ආයස්මා බාකු
ලො ධුතො න ධුතවාදොති — යො
පන ධුතඞ්ගෙන න අත්තනො කිලෙ
සෙ ධුනි කෙවලං අඤ්ඤෙ ධුතඞ්ගෙන
ඔවදති අනුසාසති උපනන්දත්ථෙරො
විය අයං න ධුතො ධුතවාදො යථාහ
තයිදං ආයස්මා උපනන්දො සක්‍යපු
ත්තො න ධුතො ධුතවාදොති —

යො උභයවිපන්නො ලාළුදායි විය
අයං නෙව ධුතො න ධුතවාදො යථා
හ තයිදං ආයස්මා ලාළුදායි නෙව
ධුතො න ධුතවාදොති — යො පන
උභයසම්පන්නො ධම්මසෙනාපති විය
අයං ධුතො චෙව ධුතවාදො ච යථාහ
තයිදං ආයස්මා සාරිපුත්තො ධුතො
චෙව ධුතවාදො චාති — ධුතධම්මා
වෙදිතබ්බාති — අප්පිච්ඡතා සන්තු
ට්ඨිතා සල්ලෙඛතා පවිවෙකතා ඉද
මට්ඨිතාති ඉමෙ ධුතඞ්ගචෙතනාය
පරිවාරකා පඤ්ච ධම්මා අප්පිච්ඡං යෙව
නිස්සායාති ආදිවචනතො ධුතධම්මා
නාම — තත්‍ථ අප්පිච්ඡතා ච සන්තු
ට්ඨිතා ච අලොභෙ සල්ලෙඛතා පවි
වෙකතා ච ද්වීසු ධම්මෙසු අනුපතන්ති
අලොභෙ ච අමොහෙ ච — ඉදමට්ඨි
තා ඤාණමෙව — තත්‍ථ අලොභෙන
පටික්ඛෙපවත්ථූසු ලොභං අමොහෙන
තෙසුයෙව ආදීනවපටිච්ඡාදකං මො
හං ධුනාති — අලොභෙන ච අනු
ඤ්ඤාතානං පටිසෙවනමුඛෙන පව
ත්තං කාමසුඛානුයොගං අමොහෙන
ධුතඞ්ගෙසු අතිසල්ලෙඛමුඛෙන පව
ත්තං අත්තකිලමථානුයොගං ධුනාති
— තස්මා ඉමෙ ධම්මා ධුතධම්මාති
වෙදිතබ්බා — ධුතඞ්ගානි වෙදිතබ්බා
නීති තෙරස ධුතඞ්ගානි වෙදිතබ්බා
නි — පංසුකූලිකඞ්ගං — පෙ —
නෙසජ්ජිකඞ්ගන්ති තානි අත්ථතො
ලක්ඛණාදීහි ච වුත්තානෙව — කස්ස
ධුතඞ්ගසෙවනා සප්පායාති — රාග
චරිතස්ස චෙව මොහචරිතස්ස ච ක
ස්මා ධුතඞ්ගසෙවනාහි දුක්ඛා පටිපදා
චෙව සල්ලෙඛවිහාරො ච දුක්ඛා පටි
පදඤ්ච නිස්සාය රාගො වූපසම්මති
සල්ලෙඛං නිස්සාය අප්පමත්තස්ස
මොහො පහීයතීති — ආරඤ්ඤික
ඞ්ග රුක්ඛමූලිකඞ්ග පටිසෙවනා වා
එත්ථ දොසචරිතස්සාපි සප්පායා තත්ථ

තිස්ස අසංසට්ඨවිහාරිතාය විහරතො දොසො පි වූපසමෙතීති අයං ධුතාදීනං විභාගතො වණ්ණනා.

( ස † )

"ධුතාදීනං විභාගතො" යනාදියෙහි--ධුතො වෙදිතබ්බො, ධුත නම් මෙසේ දතයුතුය; ධුතධම්මා වෙදිතබ්බා, ධුතධර්මයෝ දතයුත්තාහ; ධුතඞ්ගානි වෙදිතබ්බානි, ධුතාඞ්ගයෝ දතයුත්තාහ; කස්ස ධුතඞ්ගසෙවනා සප්පායාති, කාහට ධුතාඞ්ගසේවනාවෝ සැපයේද්දයි; වෙදිතබ්බා, දතයුතුයි; තත්‍ථ, එහි; ධුතොති, ධුත නම්; ධුතකිලෙසො වා පුග්ගලො, නසන ලද කෙලෙසුන් ඇති පුද්ගලී (මෙහි සියලු රහතුන්ම ධුතකෙලශවූවද මෙතන වනාහි ධුතාඞ්ගසේවනා මුඛයෙන් කෙලෙසුන් නසාසිටි ක්ෂිණාශ්‍රව ධුතකෙලශ පුද්ගලයයි අභිමතයි "කාමං සබ්බොපි අරහා ධුතකිලෙසො ඉධ පන ධුතඞ්ගසෙවනා මුඛෙන කිලෙසෙ විධුනිත්වා ඨිතො ඛීණාසවො ධුතකිලෙසො පුග්ගලොති අධිප්පෙතො" යනු ටීකායි) කිලෙස ධුනනො වා ධම්මො, කෙලෙසුන් නසන ධර්මය හෝ (කෙලශධුනන ධර්මයයි නිෂ්පර්‍යායයෙන් සියලු ආර්‍ය්‍යමාර්ගයම දතයුතුය විශෙෂයෙන් අග්‍රමාර්ගය දතයුතු පර්‍ය්‍යායයෙන් වනාහි විදර්ශනාඥානයද යම්පිරිසෙකින් ධුතාඞ්ග චෙතනා සම්ප්‍රයුක්තඥානයද දතයුතු—"තත්‍ථ සබ්බොපි අරියමග්ගො නිප්පරියායෙන කිලෙස ධුනනො ධම්මො විසෙසතො අග්ගමග්ගො පරියායෙන පන විපස්සනාඤාණානි හෙට්ඨිමපරිච්ඡෙදෙන ධුතඞ්ගචෙතනා සම්පයුත්තඤාණං දට්ඨබ්බං" යනු මෙතැන ටීකායි) ධුතවාදෙති එත්‍ථ පන, ධුතවාදෙ යනාමෙහි; අත්‍ථි ධුතො න ධුතවාදො, ධුතාඞ්ගයෙන් අනුන්ට අවවාද නොකරන එකෙක් ඇති යන අර්‍ථයි (මෙසු පෙළෙහිද මෙම ක්‍රමයෙන් අර්‍ථ බිණියයුතු) එත්‍ථ, ඒ චතුෂ්කයෙහි; යො, යමෙක්; ධුතඞ්ගෙන අත්තනො කිලෙසෙ ධුනි, ධුතාඞ්ගයෙන් තමාගේ කෙලෙසුන් නැසීද; පරං පන ධුතඞ්ගෙන න ඔවදති, අනුන්ට වනාහි ධුතාඞ්ගයෙන් අවවාද නොකෙරේද; නානුසාසති, අනුශාසනා නොකෙරේද; බාකුලත්ථෙරො විය, බාකුල තෙරුන්මෙන්; අයං, මේතෙමේ; ධුතො, ධුත නම් වේයි; න ධුතවාදො, ධුතවාද නම් නොවේ; යථාහ, අටුවාවෙහි කීයේමැනෝ ("තයිදං" යනු නිපාතසෙහි ය "සො අයං" යන අර්ථයි) තයිදං ආයස්මා බාකුලො, හේ මේ ආයුෂ්මත් බාකුලතෙමේ; ධුතො න ධුතවාදොති, ධුතො න ධුතවාදෙයි (සෙසු පෙළෙහි මෙම අර්ථ බණිනු) යො, යමෙක්; උභයවිපන්නො, උභයවිපන්නද (තෙමේ ධුතනොවෙයි අනුන්ට ධුතාඞ්ගයෙන් අවවාද නොකෙරේද යන අර්ථයි) ලාළුදායි විය, ලාළුදායි නම් භික්ෂුහු මෙන්; යො ච පන, යමෙක් වනාහි; උභයසම්පන්නො, දෙකින්ම සම්පන්නද (තෙමේ ධුතව අනුන්ට ධුතාඞ්ගයෙන් අවවාද කෙරේද යන අර්ථයි ("අප්පිච්ඡතා" යනාදී පෙළෙහි අර්ථයට කී නියායෙන් දතයුතු "ඉමෙහි අකුසලධම්මෙහි අත්තං ඉදම්පටියිතො හොති ඉදම්පටියිතා" යනු වේ--ඥානුවණකින් ප්‍රව්‍රජිතයක්හු විසින් නම් පාංශුකූලිකාදි ධුතාඞ්ගයෙහි පිහිටිය යුතුයයි කියනලද්ද ධුත ගුණයක් සමාදන්ව පරිහරණය කෙරේද හෙද "ඉදම්පටියිතා" නම්—එහෙයින් ම කීහ "ඉදම්පටියිතා ධුතඞ්ගෙව" යි—"ඉමෙ පඤ්ච ධම්මා ධුත ධම්මා නාම" යි යොදනු) ධුතඞ්ගචෙතනා

පරිවාරතා, ධුතඞ්ගචේතනාවට පර්
ච්‍යාවූ; ඉමෙ පඤ්ච ධම්මා, අප්පිච්ඡතා
දී මේ ධර්මයෝ පස්දෙන; අප්පිච්ඡං
යෙව නිස්සායාති ආදිවචනතො, අ
ප්පිච්ඡං යෙව නිස්සාය යනාදී කීබැ
වින්; ධුතධම්මා නාම, ධුතධර්මයෝ
නම් වෙත්; තත්‍ථ, ඒ ධුතධර්මයන්කෙ
රෙහි; අප්පිච්ඡතා ච සන්තුට්ඨිතා ච,
අප්පිච්ඡතාවද සන්තුට්ඨිතාවද යන
දෙදෙන; අලොභෙ අනුපතන්ති, අස
ම්ප්‍රාප්ත සම්ප්‍රාප්ත වස්තුවෙහි අලුබ්ධ
ආකාරයෙන් පවත්නාහෙයින් අලො
භයෙහි හෙන් (තිත්හෙති යන අර්ථයි)
සල්ලෙඛතා ච පවිවෙකතා ච, සල්ලෙ
ඛතාවද පවිවෙකතාවද යන දෙදෙ
න; ඒසු ධම්මෙසු අනුපතන්ති අලො
භෙ ච අමොහෙ ච, අලොභය අමො
හය යන ධර්මයන් දෙදෙනා කෙරෙහි
හෙති (හෙවත් ප්‍රභාය හෙයින් හෙ
තුකොට ඇති ලොලභාවාදි සඞ්කල
යෙන් මනාකොට ලියනහෙයින්ද
ගණසඞ්ගණිකාදි භෙද සංසර්ගයෙන්
විනායා වෙන්කාරණහෙයින් අලොභ
අමොහ සඞ්ඛ්‍යාත සල්ලෙඛ පවිවෙක
දෙදෙන අලොභය අමොහය යන ධර්
යන් දෙදෙනා කෙරෙහිය යන අර්
යි) ඉදම්පටිඨිතා, ඉදම්පටිඨිතානම්; ඤණ
මෙව, ඤණයම්හයි; තත්‍ථ, එහි; අලො
භෙන, අලොභයෙන්; පටික්ඛිත්තපවත්
සු, ගැහපති චීවරාදි ඒඒ ධුතාඞ්ග
යන් ප්‍රතික්ෂෙප කටයුතු වස්තුවෙහි;
ලොභං, ලොභයද; අමොහෙන, අ
මොහයෙන්; ආදීනවං, ඒ ප්‍රතික්ෂෙ
ප්‍යවස්තූවෙහි; ආදීනව පටිච්ඡාදෙන්තං,
ආරක්ෂා දුඃඛය පරාධීන භාවාදිය වෙ
ර ගයය යන ආදීනවයන් මුවහන
රණ මොහයද; ධුනාති, නසා; අලො
භෙනච, අලොභයෙන්ද; අනුඤ්ඤා
තානං, භගවත්නු විසින් අනුඥාරාත
පරිභොගවශයෙන් අනුඥාතවූ සුඛසා
ශී ඇති ආස්තරණ ප්‍රාවරණාදීන්ගේ;
පටිසෙවනමුඛෙන, ප්‍රතිසෙවනවාර
යෙන් (අනුභවංලෙසයෙන යන අර්
යි) පවත්තං, ප්‍රවෘත්තාවූ; කාමසුඛානු
යොගං, අනුඥත චීවරාදී ප්‍රත්‍යයන්
ඇලී අනුභවකිරීමහෝ (මෙවැනි සැශී
සම්පන්න ආස්තරණාදීන් වැළඳගත්
තාලැබෙන් උපාදිනහ එස්සය වනාහි
කුමට නොවළඳනා ලැබේදැයි මෙම
දෙරින් ප්‍රවෘත්තවූ කාමසුඛල්ලිකානු
යොගය හෝ) අමොහෙන, අමොහ
යෙන්; අතිසල්ලෙඛවුත්තෙන පවත්තං,
අතිසල්ලෙඛ ප්‍රතිපත්ති මුඛයෙන් ප්‍ර
වෘත්තවූ උත්කෘෂ්ටයනව වචනාදද
ප්‍රතික්ෂෙප කිරීම් වශයෙන් යන අර්
ථ) අත්තකිලමථානුයොගං, ආත්මක්ලම
ථයෙහි යෙදීමද; ධුනාති, නසා; ත
ස්මා, එහෙයින්; ඉමෙ ධම්මා, මේ ධර්
මයෝ; ධුතධම්මාති වෙදිතබ්බා, ධුත
ධර්මයහයි දතයුතුනාහුයි ~පෙ~
නාති, ඒ ධුතාඞ්ගයෝ; අත්ථතො, අර්
ථයින්ද; ලක්ඛණාදීහි ච, ලක්ෂණාදී
විසින්ද; වුත්තාතෙව, කියනලදහුමැ
ති "සබ්බෙ ධුතඞ්ගචෙතනා සප්පායා"
යන්තෙනි; රාගචරිතස්ස, රාගචරිතය
හටද; මොහචරිතස්ස, මොහචරිතය
හටද, සප්පායා, සැපයෝයි; කස්මා,
කුමක්හෙයිනයන්; ධුතඞ්ගසෙවනාහි,
ධුතාඞ්ගසේවනා තොමෝ; දුක්ඛාපටි
පදා චෙව, දුඃඛ ප්‍රතිපත්තිද වේති; ස
ල්ලෙඛ විහාරෝච, සල්ලෙඛ විහාරද
වේ; දුක්ඛාපටිපදං නිස්සාය, දුඃඛ ප්‍රති
පත්තියද නිසා; රාගො වූපසම්මති, රා
ගය සන්හිඳේ (සුඛොපකරණ සනාහි
ත්‍යය රාගයා දුඃඛ ප්‍රතිපත්තියෙහි පිහිට
නොලබනබැවින් රාගය සන්සිඳේය
යන අර්ථයි) සල්ලෙඛං නිස්සාය, ස
ල්ලෙඛය නිසා; අප්පමත්තස්ස, අප්‍ර

මනායතනයි; මොහො පහියති, මොහය පහනුලැබේ; (සල්ලෙඛයනම් සම්ප්‍රජන්‍යයම වෙයි සම්ප්‍රජන්‍යය ඇතිකල්හි අප්‍රමාදය සම්භාව වනබැවින් මොහය අප්‍රතිෂ්ඨිතවේ යන අදහසයි) එසේ, මේ ධුතාඞ්ගයන් තොපරති; ආරඤ්ඤකඞ්ග රුක්ඛමූලිකඞ්ග පටිසෙවනා වා, ආරණ්‍යකාඞ්ග වෘක්ෂමූලිකාඞ්ග සෙවනාවෝ; දොසචරිතස්සපි සප්පායා, ද්වෙෂ චරිතයහටද සැපයෝයි; තත්ථ හි, ඒ අරණ්‍යයෙහි වෘක්ෂමූලයෙහි; අසඞ්ඝට්ටමානස්ස, සඞ්ඝට්ටනයක් කරණු නොලදින්; විහරතො, වසන්නාවූ; අස්ස, ඒ යොගීහට; දොසොපි වූපසමම්ගච්ඡති, ද්වෙෂයද සන්හිඳෙන්නේයි; අයං, මේතෙම; ධුතාදීනං විභාගතො වණ්ණනා, ධුතාදීන්ගේ විභාගහෙයින් වණ්ණනායි.

( භා † )

ධුතාදීන්ගේ විභාගවශයෙන් වර්ණනාව කෙසේදයත්? ධුතනම් මේය ධුතධර්මයෝනම් මොහුය ධුතාඞ්ගයෝනම් මොහුය ධුතාඞ්ගසෙවනය කවරෙක්හට සැපවේදැයි යන මේ කාරණා සතර දතයුතුවන්නේයි ඔවුන් අතුරෙන් නසනලද කෙලෙස් ඇති පුද්ගලනාම ධුතනම් වන්නේයි එකාන්තයෙන් සියලු රහතුන්ම කෙලෙස් නැසූහෙයින් ධුතනම්වූවද මෙහි වනාහි ධුතාඞ්ගසෙවනයෙන් කෙලෙසුන් නසා සිටි ක්ෂීණාශ්‍රව පුද්ගලයා ධුතනම් වෙයි කියනලද්දේයි තවද කෙලෙස් නසන ධර්මයෝ ධුතධර්ම නම් එහිදු නිෂ්පර්‍යායවශයෙන් සෝවාන් ආදී සතර ආර්‍ය මාර්ග ධර්මයෝද විශෙෂවශයෙන් අර්හත්මාර්ගයද පර්‍යාය වශයෙන් විදර්ශනාඥානයද අභාගීය පරිච්ඡේදයෙන් ධුතාඞ්ග රක්ෂාකරණ පුද්ගලයාහට උපදනා චිත්තප්‍රතිබද්ධවූ චෙතනාව හා එක්ව යෙදුනාවූ ඥානයද ධුතධර්ම නමැයි දතයුතුයි. ධුතවාදීනම් කවරයත්? මෙහි වනාහි ධුතාඞ්ගයෙන් අනුන්ට අවවාද නොකරණ ධුතාඞ්ගධරයෙක්ද ඇත්තේය තමා ධුතාඞ්ගධර නොව අනුන්ට ධුතාඞ්ගයෙන් අවවාදකරන්නෙකුද ඇත්තේය තමාද ධුතාඞ්ගධරනොවී අනුන්ටද ධුතාඞ්ගයෙන් අවවාද නොකරන්නෙකුද ඇත්තේය තමාද ධුතාඞ්ගධරව අනුන්ටද ධුතාඞ්ගයෙන් අවවාද කරන්නෙකුද ඇත්තේයි ඒ සතරදෙනා අතුරෙන් යම් මහණෙක් ධුතාඞ්ගසෙවනයෙන් තමන්ගේ කෙලෙසුන් නැසූයේද ආයුෂ්මත් බාකුලස්ථවිරයන්මෙන් ධුතාඞ්ගයෙන් අනුන්ට අවවාදානුශාසනා නොකෙළේද මේතෙම ධුතාඞ්ගයෙන් අනුන්ට අවවාද නොකරණ ධුතාඞ්ගධර පුද්ගලනාමිවී. එහෙයින් කීහ ඒ ආයුෂ්මත් බාකුලස්ථවිරතෙමේ ධුතාඞ්ගයෙන් අනුන්ට අවවාද නොකරණ ධුතාඞ්ගධරනම්වන්නේයි. යම් මහණෙක් ධුතාඞ්ග සෙවනයෙන් තමාගේ කෙලෙස් නොනැසූයේද ආයුෂ්මත් උපනන්දස්ථවිරයන්මෙන් හුදෙක් අනුන්ට ධුතාඞ්ගයෙන් අනුවාදශාසනා කරන්නේවේද හෙතෙම තමා ධුතාඞ්ගධර නොවීම අනුන්ට ධුතාඞ්ගයෙන් අවවාද කරන්නේනම් වන්නේයි එහෙයින් කීහ ඒ ආයුෂ්මත්වූ උපනන්ද සාක්‍යපුත්‍රතෙමේ තමා ධුතාඞ්ගධර නොවී අනුන්ට ධුතාඞ්ගයෙන් අවවාද කරන්නේනම්වේ යම් භික්ෂුකෙනෙක්තෙමේද ධුතාඞ්ගධර නො

අනුත්විද බුතාඩිගයෙන් අවවාද නො කරණබැවින් ලාලුදායි ස්ථවිරයන් මෙන් ලාභ පක්ෂයෙහි පිහිටුනේ වේද මෙසේ නම් කෙසේද බුතාඩිගධර නොව අනුත්විද බුතාඩිගයෙන් අවවාද නො කරන්නේ නම් වේයි එසෙයින් කීහ ඒ ආයුෂ්මත් ලාලුදායිස්ථවිරයනට නම් කෙසේද බුතාඩිගධර නොවී අනුත්විද බුතාඩිගයෙන් අවවාද නොකරන්නේ නම් වේයි. යම් භික්ෂුවකගේ දම් සෙනවි සැරියුත් මහතෙරුන් මෙන් තොමේද බුතාඩිග පූරන්නේ වේද අනුත්විද බුත ඩිගයෙන් අනුශාසනා කරන්නේ වේද මෙසේ නම් බුතවාද ඇති බුතාඩිගධර නම්වන්නේයි එසෙයින් කීහ ඒ ආයුෂ්මත් මහා ශාරිපුත්‍ර ස්ථවිරයනට බුතවාද ඇති බුතාඩිගධර නම්වන්නේය......

බුත ධර්මයෝ දනායුතාහුයි යන මෙහි බුත ධර්මයෝ නම් කවරයන්? පංසුකූලිකාදී බුතාඩිග සමාදන්වීමෙන් පරිහරණය කරණ භික්ෂුව ඒ පිළිබඳව පහළවන කුසල චිත්තයන් හා එක්ව යෙදුනාවූ ලද නොලද පසයෙහි නොඇලෙනාකාරයෙන් පවත්නා අපච්ඡතායයි කියනලද අලෝභ චෛතසිකයද ලදදේකින් සතුටුව අනිකක් නොපැතීම වශයෙන් පවත්නා අනුපාකාරවූ අලෝභ චෛතසිකයද එම ලෝභාදී කෙලෙසුන් මනා කොට ලිහීම වශයෙන් පවත්නා සල්ලේඛතායයි කියනලද ප්‍රඥා චෛතසිකයද ගණසංගණිකාරාමතාදියෙහි ඇලීමෙන් සිත වෙන්කිරීම වශයෙන් පවත්නා පවිවේකතායයි කියනලද අනුපාකාරවූ අලෝභ චෛතසිකයද සනාමේබඳු ගුණධර්මයන් ... ප්‍රවර්තනයන්ට පංසුකූලිකාදී බුතාඩිගයෙහි පිහිටිය යුතුයයි සිත. බුත ගුණයන් සමාදන්ව පරිහරණය කිරීම වශයෙන් පවත්නා ඉදම්වඩිතායයි කියනලද ප්‍රඥා චෛතසිකය යන මේ ධර්මයෝ පස්දෙන කෙලෙස් නැසීම් වශයෙන් පවත්නාහෙයින්ද බුත නම්වූ චෙතනා චෛතසිකයට උපකාරව පවත්නාහෙයින්ද බුත ධර්මනම්වන්මැයි. ඒ පඤ්චප්‍රකාර බුත ධර්මයන් අතුරෙන් අපිස්බව්ය ලද දේකින් සතුටුව බවය යන ධර්මයෝ දෙදෙන අලෝභයෙහිද ඇතුළත්කොට කෙලෙස් ලියනබවය ගණ සංගණිකාරාමතාදියෙන් සිත වෙන් කරණබවය යන ධර්මයෝදෙදෙන ක්‍රමයෙන් අමෝහ අලෝභ යන ධර් දෙදෙනාකෙරෙහිද ඇතුළත්වැටෙත්මැයි. ඉදම්වඩිතා නම් ප්‍රඥ නායනයම වන්නේයි. ඔවුන් අතුරෙන් අලෝභය කරණකොටගෙණ ගෘහපතිදන චීවරාදි ඒ ඒ බුතාඩිගයෙන් ප්‍රතික්ෂේප කටයුතු වස්තූන්හි ඇලීමද අලෝභය කරණකොටගෙණ එම වස්තූන්හි ආරක්ෂාකිරීමෙන් වන දොසය අනුන් අයත් පැවතුම් ඇතිබවය ස්ථාරබියා යනාදි දෙෂ මුලව හරණ මොහයද නසන්නේයි. තවද අලෝභය කරණකොටගෙණ බුදුන් විසින් නොඇලී පරිභොග කටයුතුයයි අනුදන වදාල සාප පහස් ඇති ඇඳ ඇතිරි ආදියෙහි චීවරාදි ප්‍රත්‍යයෙහි ඇලී අනුභවකිරීම් වශයෙන් පවත්නා කාම සැපයෙහි යොගයෙදුන්නේය අමොහය කරණකොටගෙණ අතිශයින් කෙලෙස් ලිහීම් වශයෙන් පැවැති උත්තාපවසාගා සුද්ධදේ මධ්‍යමාදීන් විසින් දුරැකිරීම් වශයෙන් ආත්මය ක්ලමථා නොකරන්නේය එහෙයින් මේ අලෝභාදි ධර්මයෝ බුත ධර්මනම්වූයි දනයුතාහුයි......

බුතාඩිගයෝ දනයුතාහුය යන

මෙහි ධුතාඞ්ගයෝනම් පාංශුකූලිකාඞ්ගය ආදිකොට ඇති නෙසජ්ජිකාඞ්ගය අවසන්කොට ඇති තෙළෙස් ධුතාඞ්ග ධර්මයෝයි. ඒ ධුතාඞ්ගයෝ අර්ථ වශයෙන්ද ලක්ෂණාදී වශයෙන්ද යට කියනලද්දාහු මැයි. ධුතාඞ්ගසේවනය කවරෙක්හට සැපවන්නේදැයි යත මෙහි රාගචරිතයාහටද මෝහ චරිතයාහටද ධුතාඞ්ග සේවනය සැප වන්නේමැයි. කුමක්හෙයින්දයත්? ධුතාඞ්ගසේවනය දුක්වූ ප්‍රතිපදාත්ද වෙයි සල්ලේඛ විහාරයද වෙයි. සැපපහස්ඇති උපකාරණ ආශ්‍රයකොට පවත්නා රාගය දුක්වූ ප්‍රතිපදාවෙන් පිහිට නොලබනහෙයින් දුක්වූ ප්‍රතිපදාව නිසා රාගය සන්සිඳෙන්නේයි. ප්‍රඥාව ඇතිසල්ලේඛ අප්‍රමාදය ලැබෙන හෙයින් අප්‍රමාදවූ හැනැත්තාහට කෙලෙස් ලිහීම නිසා මෝහය ප්‍රහීණ වන්නේයි. මේ තෙළෙස් ධුතාඞ්ග ං තුරෙන් ආරණ්‍යකාඞ්ග වෘක්ෂමූලිකාඞ්ග දෙක සේවනයකිරීම වෙෂ චරිත ඇත්තාහටද සැපවන්නේය ඒ එසේ මැයි ආරණ්‍ය වෘක්ෂමූලයෙහි නොගැටී වසන්නාවූ ඒ යෝගාවචර තෙමේ වෙෂය සන්සිඳෙන්නේය යනු මේ ධුතධර්මාදීන්ගේ විභාග වශයෙන් වර්ණනාව වන්නේයි.

( පා ‡ )

සමාසබ්‍යාසතොති ඉමානි පන ධුතඞ්ගානි සමාසතො තීණි සීසඞ්ගානි පඤ්ච අසම්භින්නඞ්ගානීති අට්ඨෙව හොන්ති. තත්‍ර සපදානචාරිකඞ්ගං එකාසනිකඞ්ගං අබ්භොකාසිකඞ්ගන්ති ඉමානි තීණි සීසඞ්ගානි. සපදානචාරිකඞ්ගං හි රක්ඛන්තො පිණ්ඩපාතිකඞ්ගම්පි රක්ඛිස්සති. එකාසනිකඞ්ගඤ්ච රක්ඛතො පත්තපිණ්ඩිකඞ්ගඛලුපච්ඡාභත්තිකඞ්ගානිපි සුරක්ඛානි භවිස්සන්ති. අබ්භොකාසිකඞ්ගං රක්ඛන්තස්ස කිං අත්ථි රුක්ඛමූලිකඞ්ගයථාසන්ථතිකඞ්ගෙසු රක්ඛිතබ්බං නාම. ඉති ඉමානි තීණි සීසඞ්ගානි. ආරඤ්ඤිකඞ්ගං පංසුකූලිකඞ්ගං තෙචීවරිකඞ්ගං නෙසජ්ජිකඞ්ගං සොසානිකඞ්ගන්ති ඉමානි පඤ්ච අසම්භින්නඞ්ගානීති අට්ඨෙව හොන්ති. පුන ද්වෙ චීවරපටිසංයුත්තානි පඤ්ච පිණ්ඩපාතපටිසංයුත්තානි පඤ්ච සෙනාසනපටිසංයුත්තානි එකං විරියපටිසංයුත්තන්ති එවං චත්තාරෙව හොන්ති. තත්ථ නෙසජ්ජිකඞ්ගං විරියපටිසංයුත්තං. ඉතරානි පාකටානෙව. පුන සබ්බානෙව නිස්සයවසෙන ද්වෙ හොන්ති පච්චයසන්නිස්සිතානි ද්වාදස විරියසන්නිස්සිතං එකන්ති. සෙවිතබ්බාසෙවිතබ්බවසෙනාපි ද්වෙයෙව හොන්ති. යස්ස හි ධුතඞ්ගං සෙවන්තස්ස කම්මට්ඨානං වඩ්ඪති තෙන සෙවිතබ්බානි. යස්ස සෙවතො හායති තෙන න සෙවිතබ්බානි. යස්ස පන සෙවතොපි අසෙවතොපි වඩ්ඪතෙව න හායති තෙනාපි පච්ඡිමං ජනතං අනුකම්පන්තෙන සෙවිතබ්බානි. යස්සාපි සෙවතොපි අසෙවතොපි න වඩ්ඪති තෙනාපි සෙවිතබ්බානියෙව ආයතිං වාසනත්ථාය. එවං සෙවිතබ්බාසෙවිතබ්බවසෙන දුවිධානිපි සබ්බානෙව චෙතනාවසෙන එකවිධානි හොන්ති. එකමෙව හි ධුතඞ්ගසමාදානචෙතනාති. අට්ඨකථායම්පි වුත්තං යා චෙතනා තං ධුතඞ්ගන්ති වදන්තීති. බ්‍යාසතො පන භික්ඛූනං තෙරස භික්ඛුනීනං අට්ඨ සාමණෙරානං ද්වාදස සික්ඛමානසාමණෙරීනං සත්ත උපාසකඋපාසිකානං ද්වෙති ද්වාචත්තාලීස හොන්ති. සචෙ හි අබ්භොකාසෙ ආරඤ්ඤිකඞ්ගසම්පන්නං සුසානං හොති එකොපි භික්ඛු එකප්පහාරෙන සබ්බධුතඞ්ගානි පරි

භුඤ්ජිතුං සක්කොන්ති භික්ඛුනීනං පන ආරඤ්ඤිකඞ්ගං ඛලුපච්ඡාභත්තිකඞ්ගඤ්ච සික්ඛාපදෙනෙව පටික්ඛිත්තානි.—අබ්භොකාසිකඞ්ගං රුක්ඛමූලිකඞ්ගං සොසානිකඞ්ගන්ති ඉමානි තීණි දුප්පරිහාරානි භික්ඛුනියා හි දුතියිකං විනා වසිතුං න වට්ටති එවරූපෙ ච ඨානෙ සමානච්ඡන්දා දුතියිකා දුල්ලභා සචෙපි ලභෙය්‍ය සංසට්ඨවිහාරතො න මුච්චෙය්‍ය එවං සති යස්සත්ථාය ධුතඞ්ගං සෙවෙය්‍ය ස්වෙවස්සා අත්ථො න සම්පජ්ජෙය්‍ය එවං පරිහරිතුං අසක්කුණෙය්‍යතාය පඤ්ච හාපෙත්වා භික්ඛුනීනං අට්ඨෙව හොන්තීති වෙදිතබ්බානි යථා වුත්තෙසු පන ඨපෙත්වා තෙචීවරිකඞ්ගං සෙසානි ද්වාදස සාමණෙරානං සත්ත සික්ඛමානසාමණෙරීනං වෙදිතබ්බානි උපාසකඋපාසිකානං පන එකාසනිකඞ්ගං පත්තපිණ්ඩිකඞ්ගම්පි ඉමානෙව පතිරූපානි චෙව සක්කා ච පරිහරිතුන්ති ද්වෙ ධුතඞ්ගානීති.—එවං බ්‍යාසතො ද්වාචත්තාලීස හොන්තීති අයං සමාසබ්‍යාසතො වණ්ණනා.—එත්තාවතා ච.—සීලෙ පතිට්ඨාය නරෙ සපඤ්ඤොති ඉමිස්සා ගාථාය සීලසමාධිපඤ්ඤාමුඛෙන දෙසිතෙ විසුද්ධිමග්ගෙ යෙහි අප්පිච්ඡතා සන්තුට්ඨිතාදීහි ගුණෙහි වුත්තප්පකාරස්ස සීලස්ස වොදානං හොති තෙසං සම්පාදනත්ථං සමාදාතබ්බ ධුතඞ්ග කථා කථිතා හොති.—

**ඉති සාධුජනපාමොජ්ජත්ථාය කතෙ**
**විසුද්ධිමග්ගෙ**

# ධුතඞ්ගනිද්දෙසො

**නාම දුතියො පරිච්ඡෙදො.**

——೦——

( ස ‡ )

"සමාසබ්‍යාසතො." යන්නෙහි; ඉමානි පන ධුතඞ්ගානි, මේ සියලු ධුතඟනු: සමාසයෙන්, සැකෙවින් (අවෙරිච හොතත් සබඳ) තිණි සීසඞ්ගානි (තිසිකෙණෙකුන් විනා නොපවත්නාහෙයින්ද සුවසේ රැකෙනබැවින්ද සෙසු ධුතඟනුදු සඟහනබැවින් (උත්තමාඞ්ගයෝ තුන්දෙනෙක; පසළුව අසමින්ගාඞ්ගානිති, හොමුසු අඟහු පස්දෙනෙකැයි; අවෙරිච හොන්නී, අටදෙනෙක්ම වෙත්; තව, එහි; සපදානචාරිකාඞ්ගං, සපදානචාරිකාඞ්ගය; එකාසනිකාඞ්ගං, එකාසනිකාඞ්ගය; අබ්භොකාසිකඞ්ගනති, අබ්භොකාසිකාඞ්ගයයි; ඉමානි තීණි, මොහු තුන්දෙන; සීසඞ්ගානි, උත්තමාඞ්ගයෝයි; සපදානචාරිකඞ්ගං හි රක්ඛන්තො, සපදානචාරික අඟ රක්නේ; පිණ්ඩපාතිකඞ්ගම්පි, පිඬුපා අඟද; රක්ඛිස්සති, රකී; එකාසනිකඞ්ගඤ්ච රක්ඛතො, එක් අසුන් අඟ රක්නවුට; පත්තපිණ්ඩිකඞ්ග ඛලුපච්ඡාභත්තිකඞ්ගානිපි, පාත්පිඩු අඟහා ඛලුපච්ඡා භත්තික අඟය යන මොහු; සුරක්ඛියානි භවිස්සන්ති, සුවසේ රැක්ෂාහැකිවන්නාහුයි (ඉහි එක් අසුන් අඟින් මේ පත්පිඩු අඟ නොරැකෙතුදු එකාසනිකාඞ්ගය එක ඉරියවුවෙන් සුවසේරක්නහැකිබැවින් කීහු) අබ්භොකාසිකඞ්ගං රක්ඛන්තස්ස, අබවස් අඟ රක්නවුට; රුක්ඛමූලිකඞ්ග සොසානිකඞ්ගෙසු, රුක්මුල් අඟ සොසැනික අඟෙහි; රක්ඛිතබ්බං නාම කිං අත්ථි, රැක්කයුතුනම් කිමෙක් ඇද්ද (නැත යන අදහසි) ඉති, මෙසේ; ඉමානි ත්‍රීණි, මොහු තුන්දෙන; සීසඞ්ගානි, උතුම් අඟහුයි; ආරඤ්ඤිකඞ්ගං, ආරණ්‍යකාඞ්ගය; පංසුකූලිකඞ්ගං, පාංශුකූලිකාඞ්ගය; තෙචීවරිකඞ්ගං, තෙචීවරි

කාඞ්ගය; තෙසජ්ජිකඞ්ගං, නෙසජ්ජි
ක අඞ්ගය; සොසානිකඞ්ගනාති, සො
සානික අඞ්ගය යයි; ඉතංති පසදුව,
මෙහු පස්දෙන; අසම්භිනනඞ්ගානි
වාති, නොමුසු අඟයයි; අසඞ්ඛ්‍ය නො
නාති, දූහගහු අඞ්දෙනෙක්මවෙත්;
පුන, තැවත; චෙ චීවරපටිසංයුත්තා
නි, චීවර ප්‍රතිසංයුක්තවූ (සිවුරු පිළි
බැඳිවූ) දෙදෙනෙක; පඤ්ච පිණ්ඩපා
ත පටිසංයුත්තානි, පිණ්ඩපාත ප්‍රතිසං
යුක්තවූවෝ පස්දෙනෙකි; පඤ්ච සෙ
නාසන පටිසංයුත්තානි, සයනාසන
ප්‍රතිසංයුක්තවූවෝ පස්දෙනෙකි; එ
කං විරිය පටිසංයුත්තං, එකෙක් වීර්‍ය්‍ය
ප්‍රතිසංයුක්තවෙයි; එවං වත්තාරෙව
හොන්ති, මෙසේ සතරදෙනෙක්ම
වෙත්; තත්‍ථ, එහි; නෙසජ්ජිකඞ්ගං,
නෛෂද්‍යකාඞ්ගය; විරියපටිසංයුත්තං,
වීර්‍ය්‍ය ප්‍රතිසංයුක්තය; සෙසානි, සෙ
සෝ, පාකටානෙව, ප්‍රකටයෝමැයි;
පුන, තැවත, සබ්බානෙව, හැමදෙන
ම; නිස්සයවසෙන චෙ හොන්ති, නි
ශ්‍රය විසින් දෙදෙනෙක් වෙත්; පච්ච
යසන්නිස්සිතානි චාදස, ප්‍රත්‍යය ස
න්නිශ්‍රිතයෝ දොළොසෙක; විරියනි
ස්සිතං එකං, වීර්‍ය්‍ය නිශ්‍රිතවූයේ එකෙ
කි; සෙවිතබ්බා සෙවිතබ්බවසෙනපි
චෙ හොන්ති, සෙවියයුතු නො
සෙවියයුතු බැවිනුදු දෙදෙනෙක්ම
වෙත්; යස්ස හි, යමෙක්හට; ධුතඞ්ගං
සෙවන්තස්ස, දූහඟසෙවුනාහට; ක
ම්මට්ඨානං වඩ්ඪති, කමටහන් වඩිද
(සවභාර දූහගන් සෙවීනාවූ රාගචරිත
යාහට හෝ මොහචරිතයාහට හෝ
වෙෂචරිතයාහට හෝ කමටහන් වඩිද
යන අභිප්‍රායයි) තෙන, ඔහු විසින්;
සෙවිතබ්බානි, සෙවියයුත්තාහුයි; ය
ස්ස, යමෙක්හට; සෙවතො, දූහඟසෙ
වුනාහට; හායති (කමටහන් සිවුමැලි
තැබීන් රූකපිළිවෙත්තෝ හොසගත්

නාහට) පිරිහේද; තෙන න සෙවිත
බ්බානි, ඔහු විසින් හෝ නොසෙවිය
යුතුවහු; යස්ස පන, යමෙක්හට වනා,
හි; සෙවතොපි, දූහඟ සෙවුනාහටද;
අසෙවතොපි, නොසෙවුනාහටද; ව
ඩ්ඪතෙයෙව, මහා පුරුෂජාතිකයෙකින්
වැඩීමම වේද; න හායති, නොපිරි
හේද; තෙනාපි, ඔහු විසිනුදු; පච්ඡිමං
ජනතං අනුකම්පමානෙන, පශ්චිම ජ
නයහට අනුකම්පාකරණුවනු විසින්;
සෙවිතබ්බානි, සෙවියයුත්තාහුයි; ය
ස්සාපි, යමෙක්හට; සෙවතොපි අසෙව
තොපි න වඩ්ඪති, උපනිශ්‍රය නැති
බැවින් සෙවුනාහටද නොසෙවුනා
හටද නොවඩිද; තෙනාපි, ඔහු විසි
නුදු; ආයතිං වාසනත්ථාය, ආයති වාස
නා පිණිස; සෙවිතබ්බානෙව, සෙවිය
යුත්තාහුමැයි; එවං, මෙසේ; සෙවිත
බ්බා සෙවිතබ්බ වසෙන දුවිධානිපි,
සෙවියයුතු නොසෙවියයුතු විසින් දෙ
වැදෑරුම්වූද; සබ්බානෙව, සියලු දූහඟ
හුම්; චෙතනා වසෙන එකවිධානි
හොන්ති, චෙතනා වශයෙන් එකවිධ
වෙත්; එකෙකවිධ ධුතඞ්ගං, චෙතනා
සවභාවයෙහෙයින් දූහඟ එකක්මය (එ
හෙයින්ම කියා "සමාදාන චෙතනා"ය
දූහඟනම් "සමාදාන චෙතනා" හුයි
චෙතනා සවභාවයෙහෙයින් දූහඟ එක්
වැදෑරුම්වෙසි යුතැති) අට්ඨකථාසම්
ප්‍රදානං, අටුවාවෙහිදු කියනලදී; යා
චෙතනා, යම් චෙතනාවනාවක් ඇද්ද;
තං, හේ; ධුතඞ්ගං වදන්ති, දූහඟ
නමැයි කියත්; බ්‍යාසතො පන, විස්ත
රයෙහෙයින් වනාහි, භික්ඛූනං තෙරස,
සමණතට තෙළෙසෙක; භික්ඛුණීනා
අට්ඨ, මෙහෙණනට අටෙක; සාමණේ
රානං චාදස, හෙරණනට දොළොසෙක;
සික්ඛමානා සාමණෙරීනං සත්ත, සික
මණනා හෙරණියනට සතක; (...

සක උපාසිකානං වෙහි, උපාසක උපාසිකාවන්ම දෙකොකැයි; වෙ වචනාලිඞ්ග හොනානි, දෙසාලිසක් වෙත්; සමෙ, ඉදින්; අබ්භොකාසෙ, අබවසඃ ආරඤ්ඤකඞ්ග සමාදානා, ආරණ්‍යකාඞ්ගයෙන් යුක්තවූ; සුඤ්ඤං හොති, සොභාහෙනත්වේද; එකොපි භික්ඛු, එකව මහණ, එකප්පහාරෙන, එක පැහැර; සබ්බ ධුතඞ්ගානි, සියලු දුහගුන්; පරිභුඤ්ජිතුං සමෙනාහි, වලදන්නට සමර්ථවේ; භික්ඛුනීනං පන, මෙහෙණීන්ට වනාහි; ආරඤ්ඤකඞ්ගං ච, ආරණ්‍යකාඞ්ගයද; ඛලුපච්ඡාභත්තිකඞ්ගං, ඛලුපච්ඡාභත්තිකාඞ්ගයද යන, මෙවි, දෙදෙනම; සික්ඛාපදෙනෙව පටික්ඛිත්තානි, ශික්ෂාපදයෙන්ම ප්‍රතික්ෂිප්තයහ (ආරණ්‍යකාඞ්ගය "ගණමහා ඔබි යන" ශික්ෂාපදයෙන් ප්‍රතික්ෂිප්තය ඛලුපච්ඡාභත්තිකාඞ්ගය අතතිරික්ත භොජන ශික්ෂාපදයෙන්ම ප්‍රතික්ෂිප්තයි) අබ්භොකාසිකඞ්ගං, අබ්භොකාසිකාඞ්ගයද; රුක්ඛමූලිකඞ්ගං, රුක්ඛමූලිකාඞ්ගයද; සොසානිකඞ්ගනානි, සොසානිකාඞ්ගය යන; ඉමානි තීණි, මොහු තුන්දෙන; දුප්පරිහාරානි, දුපැහැරයෙන් (දුපැහැර බවම "භික්ඛුනියා" යනාදින් පහළකෙරෙන්) භික්ඛුනියානි, මෙහෙණියට; දුතියිකාං විනා, විතියිකාවක් නැතිව; වසිතුං න වට්ටති, වසන්නට නොවටී; එවරූපෙපව ඨානෙ, මෙබඳුතැන්හිද; සමානච්ඡන්දා දුතියිකා, සමාන අදහස් ඇති දුතියිකාවක්; දුල්ලභා, දුලභය; සචෙපි ලභෙය්‍ය, ඉදින් ලැබුනාමුද; සංසට්ඨ විහාරතො න මුච්චෙය්‍ය, සංසර්ග විහාරයෙන් නොමිදෙන්නේය; එවංසති, එසේකල්හි; යස්සත්ථාය, යමෙක් පිණිස (යම් විවෙකයක් පිණිස යන අර්ථයි) ධුතඞ්ගං සෙවෙය්‍ය, දුහගනසෙවීද; සො එව අත්ථො, එ අර්ථය; අස්ස න සම්පජ්ජෙය්‍ය, ඇට නොසැපයෙන්නේයි; එවං, මෙසේ; පරිභුඤ්ජිතුං අසක්කුණෙය්‍යතාය, වලඳන්නට නොපිළිවන් හෙයින්; පඤ්ච හාපෙත්වා, පසක් පිරිහෙළා; භික්ඛුනීනං, මෙහෙණනට; අට්ඨෙව හොන්තිහි, අට්ඨක්ම වෙත්නුයි; වෙදිතබ්බානි, දතයුතුහුයි; යථාවුත්තෙසු, යථොක්තවූ දුහඟුන් කෙරෙහි (භික්ෂූන්ට කියනලද තෙළෙසෙහිය මෙහෙණටකී අටෙහියයි යුතැති) ඨපෙත්වා තෙචීවරිකාඞ්ගං, තෙචීවරකාඞ්ගය තබා; සෙසානි වාදස, සෙසු දොළස; සාමණෙරානං වෙදිතබ්බානි, හෙරණට දතයුත්තාහ; සසාන, සත; සික්ඛමාණසාමණෙරීනං, සිකමණුන්හා හෙරණිනට; වෙදිතබ්බානි, දතයුතුහුයි; උපාසක උපාසිකානම් පන, උපාසක උපාසිකාවන්ට වනාහි; එකාසනිකඞ්ග පත්තපිණ්ඩිකඞ්ගනානි, එක් අසුන් අහය පත්පිඩු අහයයි යන; ඉමානෙව, මොහුම; පතිරූපානි චෙව, සුදුසුද වෙති; සක්කාව පරිභුඤ්ජිතුනානි, වලඳන්නටද පිළිවන්හුනුයි; වෙ ධුතඞ්ගානීති, දුහඟුනු දෙදෙනකැයි; එවං, මෙසේ; බ්‍යාසතො, විස්තරවිසින්; වෙ වචනාලිඞ්ග හොනානි, දෙසාලිසෙක්වෙත්; එත්තාවතා, මෙපමණෙකින් ("ධුතඞ්ග කථා කථිතා හොති" යනු සබඳ) අදිබිතාව, ආදියෙනිද; සීලානි විසොධෙත්වායි එථ, සීලානි විසොධෙත්වා යන මේ මාතෘකා පදයෙනි; වුත්තප්පකාරස්ස සීලස්ස, කියනලද ප්‍රකාර ඇති ශීලයාගේ; යෙහි, යම්; අප්පිච්ඡතා සන්තුට්ඨිතාදිහි, අල්පේච්ඡබැව් සතුටුබැව් යනාදීවූ; ගුණෙහි, ගුණයෙන්; වොදානං හොති, පිරිසිදුබව වේද; තෙසං සම්පාදනත්ථං, ඒ අල්පස් ආදි ගුණයන් සපයනු පිණිස; සමාදාතබ්බ ධුතඞ්ග කථා, සමාදන්විය යුතු දුහඟ කථ

නොමෙයි; භාවනායොනි, කියනලද් දිවෙ—

# ධුතාඞ්ග නිද්දෙසො ද්විතීයො.

—— ෦෦෦ ——

( ගා. ‡ )

සංක්ෂෙප විස්තාර වශයෙන් වර්ණනාව කෙසේදයත්? මේ සියලු ධුතාඞ්ගයෝම සංක්ෂෙප වශයෙන් සිඛි ධුතාඞ්ගයකින් වෙන්ව නොපවත්නා බැවින්ද සුවසේ රැකෙනබැවින්හා සෙසු ධුතාඞ්ගයනුදු සඞ්ග්‍රහකාරණ හෙයින්ද ශීර්ෂාඞ්ගයෝ තුන්දෙනෙක අමිශ්‍ර අඞ්ගයෝ පස්දෙනෙකැයි යන මොවුන්ගේ වශයෙන් අටදෙනෙක් වෙති ඔවුන් අතුරෙන් සපදානචාරිකාඞ්ගය ඒකාසනිකාඞ්ගය අබ්භොකාසිකාඞ්ගය යන මේ තුන්දෙන ශීර්ෂාඞ්ගයෝ නම්වෙත් ඒ එසේමැයි. සපදානචාරිකාඞ්ගය රක්නා මහණ පිණ්ඩපාතිකාඞ්ගයද රක්නේය ඒකාසනිකාඞ්ගය රක්නහුට පත්තපිණ්ඩිකාඞ්ගය ඛලුපච්ඡාභත්තිකාඞ්ගය යන දෙවුන්ද සැපසේ පිරියහැකිවන්නාහුය අබ්භොකාසිකාඞ්ගය රක්නහුට රුක්ඛමූලිකාඞ්ගය යථාසන්ථතිකාඞ්ගය යන අඞ්ගවය නොපිරියහැකිවන්නේමය මෙසේ මේ අඞ්ගයෝ තුන්දෙන ප්‍රධානමාත්‍රයෙන් ශීර්ෂාඞ්ගයෝයි ආරණ්‍යකාඞ්ගය පාංශුකූලිකාඞ්ගය තෙචීවරිකාඞ්ගය නෙසජ්ජිකාඞ්ගය සොසානිකාඞ්ගය යන මේ පස්දෙන අමිශ්‍ර අඞ්ගයෝයි යන මේ දෙසාකාරයන්ගේ වශයෙන් ධුතාඞ්ගයෝ අටදෙනෙක් වෙත්මැයි තැවතද මේ තෙලෙස් ධුතාඞ්ග අතුරෙන් දෙදෙනෙක් සිවුරු පිළිබඳ වන්නේය පසෙක් පිණ්ඩපාතය පිළිබඳ වන්නේය පසෙක් සෙනාසුන් පිළිබඳවන්නේය එකෙක් වීර්‍ය්‍ය පිළිබඳ වන්නේයයි මෙසේ සතරාකාරවන්නේයි ඔවුන් අතුරෙන් නෙසජ්ජිකාඞ්ගය වීර්‍ය්‍යයෙන් පිරියයුතුබැවින් වීර්‍ය්‍ය පිළිබඳවන්නේය සෙසු තුන් ආකාරය යටකී නයින්ම ප්‍රකටවන්නේයි. තැවතද මේ සියලු ධුතාඞ්ගයෝම නිශ්‍රය වශයෙන් දෙයාකාරවන්නේය ඒ කෙසේදයත්? ප්‍රත්‍යය නිශ්‍රිත අඞ්ගයෝ දොළොසෙක වීර්‍ය්‍ය නිශ්‍රිත එකෙකැයි කියාවෙත් එසේම මේ සියලු ධුතාඞ්ගයෝ සෙවනය කටයුතුය නොකටයුතුය යන දෙදෙනාගේ වශයෙන්ද දෙයාකාරවෙත්මැයි. ඒ එසේමැයි යම් මහණෙක්හට යම් ධුතාඞ්ගයක් සෙවනය කිරීමෙන් කමටහනය වැඩේද ඒ මහණ විසින් තමන්ගේ චරිතයට සුදුසුවූ ඒ ධුතාඞ්ගය සෙවනය කටයුත්තේයි. යම් මහණෙක්හට යම් ධුතාඞ්ගයක් සෙවනය කිරීමෙන් කමටහනය පිරිහේද ඒ මහණ විසින් තමන්ගේ චරිතයටහෝ සිවුමැලිබවට හෝ නුසුදුසු ඒ ධුතාඞ්ගය සෙවනය නොකටයුත්තේයි. යම් මහණෙක්හට ධුතාඞ්ගසෙවනය කිරීමෙනුදු නොකිරීමෙනුදු මහාපුරුෂ පශ්චිමභවිකාදීන් වන්මෙන් කමටහන් වැඩීමමේද පිරිහීමක්නොවේද ඔහුවිසිනුදු අනාගත පසු පශ්චිම ජනතාවට අනුකම්පාපිණිස ධුතාඞ්ග සෙවනය කටයුත්තේය යම් මහණෙක්හට ධුතාඞ්ග සෙවනය කිරීමෙන් හෝ නොකිරීමෙන් හෝ කමටහන නොවැඩේද ඔහු විසිනුදු මතු අභ්‍යාශය සඳහා ධුතාඞ්ග සෙවනය කටයුත්තේමැයි. මෙසේ සෙවියයුතුය නොසෙවියයුතුය යන මොවුන්ගේ වශයෙන් දෙවැදෑරුම් වූද මේ සියලු ධුතාඞ්ගයෝම චේතනා වශයෙන් එක්වැදෑරුම් වන්නේයි ඒ එසේමැයි. මේ සියලු ධුතා

ඞ්ගයෝම චේතනාව සවභාවකොටඇතිසෙයින් හෙවත් ඒ ඒ ධුතාඞ්ගයන් සමාදන්වගෙණ රක්‍ෂාකරන්නහුව පහළවන චිත්තාචිපි පිළිබඳවූ චෙතනාවම ධුතාඞ්ගයයි කියනහෙයින් ධුතාඞ්ගය එකොක්ම වන්නේය එහෙයින් අටුවාවෙහිදු ධුතාඞ්ග සමාදන්වන මහණහුගේ චිත්තය පිළිබඳවූ යම් චෙතනාවක්වේද ඒ ධුතාඞ්ගනම්වෙයි කියනලද්දේයි. එයකාරණෙහෙයින් හේ වනාහි භික්‍ෂූන්ට තෙලෙසක භික්‍ෂුණීන්ට අටෙක සාමණේරයන්ට දොළොසෙක සාමණේරීන්ට හා ශික්‍ෂමානයන්ට සතෙක උපාසක උපාසිකාවන්ට දෙදෙකකැයි දෙසාලිසක්වෙත් මය ඉදින් අභ්‍යවකාසයෙහි ආරණ්‍යකාඞ්ගයට යුතු ලක්‍ෂණයෙන් යුත් සොහොනක් ඇත්තේවීනම් එකව මහණෙක් එකපැහැර සියලු ධුතාඞ්ගයන්ම රක්නට පොහොසත් වන්නේයි. භික්‍ෂුණීන්ට වනාහි භික්‍ෂුණී ගණයාකෙරෙන් පහනොවියයුතු ශික්‍ෂාපදයෙන් ආරණ්‍යකාඞ්ගයද අතිරිත්ත භොජන ශික්‍ෂාපදයෙන් ඛලුපච්ඡාභත්තිකාඞ්ගයද නහනම්කොට වදලහෙයින් මේ අඞ්ගයෝ දෙදෙන නොපිරියහැක්කාහුය අබ්භොකාසික රුක්ඛමූලික සොසානික යන අඞ්ගයෝ තුන්දෙන භික්‍ෂුණීන්ට පරිහරණයකරන්ට දුෂ්කරවන්නාහුය ඒ එසේමැයි භික්‍ෂුණීයකුට අනික් දෙවෙනි භික්‍ෂුණියක් නැතිව වසන්නට නොවටනේය ඊබදු රූපසෙනසුන්හි විසීමට සමානාඡන්දශය ඇති භික්‍ෂුණියකුදු නොලැබියහැකිවන්නේය ඉදින් ලැබියේනමුදු අනිකෙක් සමඟ වසන තැනැත්තී සංසග්ග විහාරයෙන්නොමිදෙන්නීය එසේකල යම් විවෙක සුවයක් සඳහා ධුතාඞ්ග පුරන්නේවීනම් ඒ විවෙකය ඇට නොලැබෙන්නේය මෙසේ නොපිරියහැකි බැවින් පසක් පිරිහෙළා භික්‍ෂුණීන්ට ධුතාඞ්ග අටෙක්ම වෙතියි දතයුත්තාහුයි. තවද භික්‍ෂූන් අයත්වූ තෙලෙස් ධුතාඞ්ග අතුරෙන් තෙචීවරිකාඞ්ගය හැර සෙසු දොළොස සාමණේරයන්ටද භික්‍ෂුණීන් අයත් අෂ්ට ධුතාඞ්ගයන් අතුරෙන් තෙචීවරිකාඞ්ගය හැර සෙසු ධුතාඞ්ග සත ශික්‍ෂමානයන්ට හා සාමණේරීන්ටද රක්කහැකිවන්නාහුය උපාසක උපාසිකාවන්ට එකාසනිකාඞ්ගය පත්තපිණ්ඩිකාඞ්ගය යන මේ දෙඅඞ්ග සුදුසුවන්නාහුය රක්‍ෂාකරන්නටදහැකිවන්නාහුය මෙසේ විස්තරවශයෙන් ධුතාඞ්ගයෝ දෙසාලිස්දෙනෙක් වෙත්මැයි මේ මෙහි සංක්‍ෂෙප විස්තරවශයෙන් වර්ණනාවවන්නේයි. මෙපමණෙකින් "සීලෙ පතිට්ඨාය නරො සපඤ්ඤො" යන මේ ගාථාවෙහි ශීල සමාධි ප්‍රඥාමුඛයෙන් දෙශනාකරණලද විශුද්ධිමාර්ගයෙහි අපිස්බැව් ලදදේකින් සපුරුවනබැව් ආදී යම් ගුණයකින් කියනලද ප්‍රකාර ඇති ශීලය පිරිසිදු වන්නේද ඒ අපිස්බැව් ආදි ගුණ සපයනු පිණිස සමාදන්වියයුතු ධුතාඞ්ගකථාව සර්වප්‍රකාරයෙන්ම කියනලද්දේයි.

මෙසේ සාධුජන ප්‍රමොදය පිණිස කරණලද විශුද්ධිමාර්ගයෙහි

## ධුතාඞ්ගනිර්දේශ

නම්වූ දෙවෙනි පරිච්ඡේදය නිමවනලද්දේය.

——oo——

( පා ¶ )

ඉදානි යස්මා එවං ධුතඞ්ග පරිහරණ සම්පාදිතෙහි අප්පිච්ඡතාදීහි ගු

ගුණෙහි පරියොදාතෙ ඉමස්මිං සීලෙ පතිට්ඨිතෙන සීලෙ පතිට්ඨාය නරො සපඤ්ඤො චිත්තං පඤ්ඤඤ්ච භාවයන්ති වචනතො චිත්තසීසෙන නිද්දිට්ඨො සමාධි භාවෙතබ්බො. සො ච අතිසංඛෙපදෙසිතත්තා විඤ්ඤාතුම්පි තාව න සුකරො පගෙව භාවෙතුං, තස්මා තස්ස විත්ථාරඤ්ච භාවනානයඤ්ච දස්සෙතුං ඉදං පඤ්හාකම්මං හොති— කො සමාධි— කෙනට්ඨෙන සමාධි— කානස්ස ලක්ඛණරසපච්චුපට්ඨානපදට්ඨානානි— කතිවිධො සමාධි— කො චස්ස සංකිලෙසො— කිං වොදානං— කථං භාවෙතබ්බො— සමාධි භාවනාය කො ආනිසංසොති— තත්‍රිදං විස්සජ්ජනං කො සමාධීති— සමාධි බහුවිධො නානප්පකාරකො තං සබ්බං විභාවයිතුං ආරබ්භමානං විස්සජ්ජනං අධිප්පෙතඤ්චෙව අත්ථං න සාධෙය්‍ය උත්තරිඤ්ච වික්ඛෙපාය සංවත්තෙය්‍ය තස්මා ඉධාධිප්පෙතමෙව සන්ධාය වදාම—

( ස ¶ )

ඉදානි, දැන්; යස්මා, යම්හෙයකින්; එවං, මෙසේ; ධුතඞ්ගපරිහරණසම්පාදිතෙහි, ධුතාඞ්ග පරිහරණයෙන් සපනලද; අප්පිච්ඡතාදීහි ගුණෙහි, අල්පෙච්ඡතාවාදී ගුණයෙන්; පරියොදාතෙ, පරිශුද්ධවූ (නිරුපක්ලෙශවූ) ඉමස්මිං සීලෙ පතිට්ඨිතෙන, යථොක්ත චතුපාරිශුද්ධිශීලයෙහි පිහිටියහු විසින්; සීලෙ— පෙ— වචනතො "සීලෙ පතිට්ඨාය නරො සපඤ්ඤො චිත්තං පඤ්ඤඤ්ච භාවයං"යි වදාළබැවින්; චිත්තසීසෙන නිද්දිට්ඨො සමාධි, චිත්තශීර්ෂයෙන් දක්වනලද සමාධි තෙමේ; භාවෙතබ්බො, වැඩියයුතුය; සො ච, හේද; අතිසංඛෙප දෙසිතත්තා "චිත්තං භාවයං"යි අති සංක්ෂෙපකොට දෙසූබැවින්; විඤ්ඤාතුම්පි තාව න සුකරො, දන්නට පොළ සුව නොවෙයි; පගෙව භාවෙතුං, භාවනා කරන්නට කොහිමද; තස්මා, එහෙයින්; තස්ස, ඒ සමාධිහුගේ; විත්ථාරඤ්ච, ප්‍රභෙදවිසින් විස්තරයද; භාවනානයඤ්ච, එසේ විස්තරකරණලද සමාධිහුගේ භාවනානයද; දස්සෙතුං, දක්වනපිණිස; ඉදං පඤ්හාකම්මං හොති, මේ ප්‍රශ්නකර්මනම්වේ; කො සමාධි, සමාධිනම් කිමෙක්ද; කෙනට්ඨෙන සමාධි, කවර අර්ථයෙන් සමාධිනම් කියනුලැබේද ("සමාධි" යයි යන පදය කවර අභිධෙයයක් නිසා පවතීද යන අදහසි) අස්ස, ඒ සමාධිහුගේ; ලක්ඛණ රස පච්චුපට්ඨාන පදට්ඨානානි, ලක්ෂණය රසය ප්‍රත්‍යුපස්ථානය පදස්ථානය යන මොහු; කානි, කවරහු; කතිවිධො සමාධි, සමාධිය කතිප්‍රකාරවේද; අස්ස, ඒ සමාධිහුගේ; සංකිලෙසො කො, සකිලිටුබව කිමෙක්ද; කිං වොදානං, පිරිසිදුබව කිමෙක්ද; කථං භාවෙතබ්බො, කෙසේ වැඩියයුතුද; සමාධිභාවනාය කො ආනිසංසො, සමාධිභාවනාවෙහි අනුසස් කිමෙක්ද; තත්‍ර, ඒ ප්‍රශ්නකර්මයෙහි; ඉදං විස්සජ්ජනං, මේ විසඳීමයි "කො සමාධි" යනෙනානි; සමාධි, සමාධිතෙමේ; බහුවිධො, කුශලාදී විසින් අනෙකප්‍රකාරවේ; නානප්පකාරකො (ආලම්බනය මනස්කාරය ඡන්දය ප්‍රණිධිය අධිමොක්ෂය අභිනීහාරය ප්‍රඥාව යනමොවුන්ගේ නානත්වයෙන්) නානාප්‍රකාරවේ.

තං සබ්බං, ඒ සියලු ප්‍රකාරය; විභාවෙතුං, පහළකරන්නට; ආරබ්භමානං විස්සජ්ජනං, ආරම්භකරණු ලබන විසජ්ජනයතෙමේ; අධිප්පෙතමෙව අත්ථං සාධෙය්‍ය, ලෞකිකභාවනා සඞ්ඛ්‍යාත අභිප්‍රෙතාර්ථය නොසාදන්

යන්ය (ධ්‍යාන විමොක්ෂාදියෙහි සමා
ධීනු උද්ධරණකොට ඔහුගේ ලභ්‍ය
මාන විභාග වශයෙන් විසර්ජනයකර
ණු ලබන කල්හි ධ්‍යාන විභඞ්ගාදීයෙ
හි ආගත සියලු සමාධි ප්‍රභෙදය විස
ඳියයුතුවෙයි එසේකල්හි අභිමත ලෞ
කික සමාධි භාවනා විධිහුගේ විසඳී
මට අවසරම නොවන්නේය යන අ
ර්‍ථයි) උත්තරිච, මතුයෙහිදු; විස්තා
රාය සංවතනාය, වික්ෂෙප පිණිස
වන්නේයි (සමාධිහුගේ ත්‍රික චතුෂ්ක
ධ්‍යානිකවූ හීනාදිවූ භෙදභින්නවූ යම්
ප්‍රවෘත්තිවිභාගයකින් බ්‍රහ්මපාරිශුද්ධි
නාවවිධවූ යම් භවප්‍රභෙදයෙක් නි
ෂ්පන්නවේද පංචමධ්‍යානිකවූ යම්
ප්‍රවෘත්ති විභාගයකින් වෘහත්ඵලාදී
පිසින් දශවිධවූ එකාදශවිධවූහෝ යම්
භව ප්‍රභෙදයෙක් නිෂ්පන්නවේද ඒ
සියලු විභාගය වෙන වෙන නිර්ධාරණ
යකොට කියනු ලබන්නේ වික්ෂෙපක
රණවී යන අර්‍ථයි) නසමා, එහෙයින්;
ඉධාධිපෙපතමෙව සඞ්ඛාය වදාම, මෙ
තන අභිමතවූම සමාධිහු සඳහාම
කියමු.

( ගා ¶ )

දූන් වනාහි යම්සේ ධුතාඞ්ග පරිහ
රණයෙන් සම්පාදනයකරණලද අ
ල්පෙච්ඡතාදි ගුණයෙන් පිරිසිදුකර
ණලද උක්තප්‍රකාර චතුෂ්පාරිශුද්ධිශීල
යෙහි පිහිටියහු විසින් "සීලෙ පතිට්ඨා
ය" යනාදී ගාථාවෙහි "චිත්තං පඤ්ඤ
ඤ්ච භාවයං" යනු වදාළබැවින් සිත ප්‍ර
ධානකොට දක්වනලද සමාධිය වැඩි
යයුත්තේය ඒ සමාධියද ඉතා සැකෙ
වින් වදාළබැවින් දූනගන්නට පවා
දුෂ්කරවෙයි භාවනාකිරීමට කෙසේ
හැකිවන්නේද නොවන්නේමැයි. එ
හෙයින් ඒ සමාධිහුගේ ප්‍රභෙද වශ
යෙන් විස්තරද භාවනාක්‍රමයද දක්
වනු පිණිස මේ ප්‍රශ්න කර්ම්මය වන්
නේයි. සමාධිනම් කුමක්ද? කවර අ
ර්‍ථයකින් සමාධිනම් වන්නේද? ඒ
සමාධිහුගේ ලක්ෂණය කෘත්‍යය එලග
ආසන්නකාරණය යනමොහු කවර
හුද? ඒ සමාධිය කී ප්‍රකාරයක්වේද?
ඒ සමාධිහුගේ කිලුටුබව කිමෙක්ද?
පිරිසිදුබව කිමෙක්ද? සමාධිය කෙසේ
වැඩියයුතුද? සමාධිභාවනාවෙහි අනු
සස් කවරේදයත්? මේ මතු දක්වන්
නේ ඒ ප්‍රශ්නකර්ම්මයෙහි විසඳීම වන්
නේයි. සමාධිනම්කුමක්ද යනමෙහි කු
ශලාදීන්ගේ වශයෙන් සමාධිය අනෙ
කප්‍රකාරවන්නේය ඒ සියලු ප්‍රකාර
යන් ප්‍රකාශකරන්හොත් ධ්‍යාන විභ
ඞ්ගාදීයෙහි ආ සියලු සමාධි ප්‍රභෙදය
විසඳියයුතුවෙයි එසේකල මෙතන්හි
අභිමතවූ ලෞකික සමාධිභාවනා විධි
ය විසඳීමට අවකාශ නොලබන්නේය
මෙතනහිද සමාධිහුගේ ත්‍රික චතුෂ්ක
ධ්‍යානාදිවූද හීනප්‍රණීතාදීවූද නො
යෙක් භෙදභින්නවූ පැවැත්මෙන්ගා
බ්‍රහ්මපාරිශුද්ධි වශයෙන් නවවැදෑ
රුම්වූ හෝ පංචමධ්‍යානික වෙහප්ඵලා
දි වශයෙන් දශවැදෑරුම්වූහෝ එකො
ළොස්වැදෑරුම්වූ හෝ භවය නිපදවන්
නේය යනාදීන් ඒ සියලු විභාග වෙන
වෙන විස්තරකොට කියන්හොත්
සිත් විපිළිසරබවටද කාරණාවන්නේ
ය එහෙයින් මෙහි අභිමතවූ සමාධිය
සඳහාම වර්ණනාවකරම්හ.

( සා * )

කුසලචිත්තෙකග්ගතා සමාධි. කො
නට්ඨෙන සමාධීති. සමාධානට්ඨෙන
සමාධිකිම්දං සමාධානංනාම. එකා
රම්මණෙ චිත්තචෙතසිකානං සමං ස
ම්මා ච ආධානං ඨපනන්ති වුත්තං හොති
තස්මා යස්ස ධම්මස්සානුභාවෙන එකා
රම්මණෙ චිත්තචෙතසිකා සමං සම්මා

ච අවික්ඛිප්පමානා අවිප්පකිණ්ණා ච හුත්වා තිට්ඨන්ති ඉදං සමාධානන්ති වෙදිතබ්බං — තස්ස ලක්ඛණ රස පච්චුපට්ඨානපදට්ඨානානි එත්ථ පන අවික්ඛෙපලක්ඛණො සමාධි වික්ඛෙප විද්ධංසනරසො අවිකම්පන පච්චුපට්ඨානො සුඛිනො චිත්තං සමාධියතීති වචනතො පන සුඛමස්ස පදට්ඨානං — කතිවිධො සමාධීති අවික්ඛෙපලක්ඛණෙන තාව එකවිධො උපචාර අප්පනාවසෙන දුවිධො — තථා ලොකිය ලොකුත්තරවසෙන සප්පීතික නිප්පීතිකවසෙන සුඛසහගත උපෙක්ඛාසහගතවසෙන ච — තිවිධො හීන මජ්ඣිම පණීත වසෙන තථා සවිතක්ක සවිචාරාදි වසෙන පීතිසහගතාදි වසෙන පරිත්තමහග්ගතප්පමාණ වසෙන ච — චතුබ්බිධො දුක්ඛාපටිපදා දන්ධාභිඤ්ඤාදි වසෙන තථා පරිත්ත පරිත්තාරම්මණාදි වසෙන චතුජ්ඣානඞ්ග වසෙන හානභාගියාදි වසෙන කාමාවචරාදි වසෙන අධිපති වසෙන ච — පඤ්චවිධො පඤ්චකනයෙ පඤ්චඣානඞ්ග වසෙනාති —

( ස * )

කුසලචිත්තෙකග්ගතා සමාධි, අනවද්‍යසුඛවිපාකලක්‍ෂණවූ කුශල චිත්තෙහි ඒකාග්‍රතාතොමෝ සමාධිනම්වේ ("සම්මා ආධානං" යනුවෙ) කිමිදං සමාධානං නාම, මේ සමාධාන නම් කිමෙක්ද; එකාරම්මණෙ, එක අරමුණෙහි; චිත්තචේතසිකානං, චිත්තචෛතසිකයන්ගේ; සමං, නොවිසිර (පිඬුව) ආධානං, පිහිටුවීම; සම්මාච, නානාලම්බණයෙහි අවික්‍ෂෙප වශයෙන්; ආධානං, පිහිටවීම; ඨපනන්ති වුත්තං හොති, තිබීමයයි කී නියායි; තස්මා, එහෙයින්; යස්ස ධම්මස්සානුභාවෙන, යම් ධර්මයක්හුගේ බලයෙන්; එකාරම්මණෙ, එක අරමුණෙහි; චිත්තචෙතසිකා, චිත්තචෛතසිකයෝ; සමං, සමව; සම්මා ච, මනාව; අවික්ඛිප්පමානා, නොදවිසිරෙණලදුව (වුපසම්මානා යන අර්ථයි) අවිප්පකිණ්ණාච හුත්වා, නොදවිසිර ("අවික්ඛිප්පමානා" යනුයෙන් සමාධිනු විපක්‍ෂ ප්‍රත්‍යනීකබව දක්වූහු "අවිප්පකිණ්ණා" යනුයෙන් අවිසාර ලක්‍ෂණ බව දක්වූහු) තිට්ඨන්ති, සිටිද්ද; ඉදං, මේ; සමාධානන්ති වෙදිතබ්බං, සමාධානයයි දතයුතු "තස්ස ලක්ඛණ රස පච්චුපට්ඨාන පදට්ඨානානි" යන; එත්ථ පන, මෙහි වනාහි; අවික්ඛෙප ලක්ඛණො, නානාලම්බණයෙහි නොවිසිරෙණබව ලක්‍ෂණකොට ඇත්තේ; සමාධි, සමාධිනම්වේ ("තංසම්පයුත්තානං වා න වික්ඛිපතීති එතෙනායං අවික්ඛෙපො සො ලක්ඛණං එතස්සාති අවික්ඛෙපලක්ඛණො" යි ගන්නේ) වික්ඛෙප විද්ධංසනරසො, වික්‍ෂෙපය නැසීම කෘත්‍යකොට ඇත්තේයි (නොහොත් වික්‍ෂෙප විධ්වංසනය සම්පත්කොට ඇත්තේයි "වික්ඛෙපං විද්ධංසෙති තථා වා සම්පජ්ජතීති වික්ඛෙපවිද්ධංසනරසො" යනු ටීකායි) අවිකම්පන පච්චුපට්ඨානො, උද්ධච්චහෙතුවෙන් කම්පාවක් නැති බව වැටහීම්කොට ඇත්තේයි (සම්ප්‍රයුක්තයන්ට හෝ අවිකම්පනය එළවීම වැටහීම්කොට ඇත්තේයි "උද්ධච්චෙන අවිකම්පනවසෙන පච්චුපතිට්ඨති සම්පයුත්තානං වා තං පච්චුපට්ඨපෙතීති අවිකම්පන පච්චුපට්ඨානො" යනු ටීකායි) සුඛිනො චිත්තං සමාධියතීති වචනතො "සුඛිනො චිත්තං සමාධියතී"යි කීබැවින්; සුඛං, නිරාමිෂ සුඛය තෙමේ; අස්ස පදට්ඨානං, මොහට ආසන්න කාරණාවේ; "කතිවිධො

"සමාධි" යන්නෙහි අවික්ඛෙපලක්ඛණතා, අවික්ෂෙපලක්ෂණයෙන්; එකවිධො, එකප්‍රකාරයෙවි; උපචාරප්පනාවසෙන, උපචාර සමාධි අර්පණාසමාධි වශයෙන්; දුවිධො, විප්‍රකාරයෙවි; තථා, එසේම; ලොකිය ලොකුත්තරවසෙන, ලෞකික සමාධි ලොකොත්තර සමාධි විසින්ද; සප්පීතික නිප්පීතික වසෙන, සප්‍රීතික සමාධි නිෂ්ප්‍රීතික සමාධි විසින්ද; සුඛසහගත උපෙක්ඛාසහගත වසෙන ච, සුඛසහගත සමාධි උපෙක්ෂාසහගත සමාධි විසින්ද (විප්‍රකාරයෙවි) හීනමජ්ඣිමපණීත වසෙන, හීන සමාධි මධ්‍යම සමාධි ප්‍රණීත සමාධි විසින්; තිවිධො, ත්‍රිප්‍රකාරවේ, තථා; එසේම; සවිතක්ක සවිචාරාදිවසෙන, සවිතර්ක සවිචාර සමාධිය අවිතර්ක විචාරමාත්‍ර සමාධිය යනාදි විසින්ද; පීතිසහගතාදිවසෙන, ප්‍රීති සහගත සමාධිය සුඛ සහගත සමාධිය යනාදි විසින්ද; පරිත්තමහග්ගතාප්පමාණ වසෙනච, පරිත්ත සමාධිය මහග්ගත සමාධිය යනාදීන් විසින්ද (ත්‍රිවිධවේ) දුක්ඛාපටිපදා දන්ධාභිඤ්ඤාදිවසෙනච, දුක්ඛාපටිපදා දන්ධාභිඤ්ඤය දුක්ඛාපටිපදා ඛිප්පාභිඤ්ඤය යනාදී විසින්ද; පරිත්තපරිත්තාරම්මණාදි වසෙන ච, පරිත්ත පරිත්තාරම්මණ සමාධිය පරිත්ත අප්පමාණාරම්මණ සමාධිය යනාදී විසින්ද; චතුරඞ්ගනාඞ්ග වසෙන, සතරධ්‍යානයට අඞ්ගවන සමාධි විසින්ද (චතුෂ්කනයයෙහෙයින් සිනු) හානභාගියාදිවසෙන, හානභාගිය සමාධිය ඨිතිභාගිය සමාධිය යනාදී විසින්ද; කාමාවචරාදිවසෙන, කාමාවචර සමාධිය රූපාවචර සමාධිය යනාදී විසින්ද; අධිපතිවසෙනච, ඡන්ද සමාධිය විරිය සමාධිය යනාදී අධිපති විසින්ද (චතුෂ්ප්‍රකාරයෙවි) පඤ්චකනයෙ, පඤ්චකනයෙහි; පඤ්චජ්ඣානඞ්ගවසෙන, පඤ්චධ්‍යානයට අඞ්ග විසින්; පඤ්චවිධො, පඤ්චප්‍රකාරවේ.

——ooo——

( ගා * )

නිරවද්‍ය සුඛවිපාක ලක්ෂණවූ කුශල චිත්ත සම්ප්‍රයුක්තවූ චිත්තෛකාග්‍රතාව හෙවත් චිත්ත චෛතසිකයන් අරමුණෙහි මනාකොට පිහිටුවීම සමාධි නම්වේ.

කවර අර්ථයකින් සමාධිනම්වේද? යනමෙහි පිඩුකිරීම වශයෙන් හෝ මනාකොට හෝ පිහිටුවන අර්ථයෙන් සමාධි නම වේ මනාකොට පිටුවීමනම් කවරේදයත්? චිත්තචෛතසික ධර්මයන් විසිරයානොදී එක් අරමුණෙක්හි පිඩුකොට පිහිටුවීම හෝ නොයෙක් අරමුණෙහි නොබහාලීමෙන් එක් අරමුණෙක්හිම තැබීමයයි කියනලද්දේ වෙයි එහෙයින් යම් ධර්මයක්හුගේ බලයෙන් එක අරමුණෙහි චිත්තචෛතසිකයෝ මනාකොට නොවිසිර නොයෙක් අරමුණෙහි නොවැටී සිටින්නාහුද මේ සමාධානය හෙවත් මනාකොට පිහිටුවීමයයි දතයුතුයි. ඒ සමාධිහුගේ ලක්ෂණය කෘත්‍යය ඵලය ආසන්න කාරණය යන මොවුන් කවරහුද? යනමෙහි සමාධිය නොයෙක් අරමුණෙහි චිත්තචෛතසිකයන් නොවිසුරුවන බව ලක්ෂණකොට ඇත්තේය වික්ෂෙප සඞ්ඛ්‍යාතවූ නොයෙක් අරමුණෙහි චිත්තචෛතසිකයන් ගෙණගොස් බහාලනබැවි නැසීම කෘත්‍ය හෝ සම්පත්කොට ඇත්තේය උඩුවෙන් චිත්තචෛතසිකයන් නොසැලෙන බව ඵලකොට ඇත්තේය සර්වඥයන්වහන්සේ විසින් සුඛිත පුද්ගල තෙමේ සිත එකඟකරන්නේයයි වදළ බැවින් පත්කම් සැපයයන් පෙන්වූ නිරාමිෂ සුවය මේ සමාධියට ආසන්න කාරණාවන්නේයි සමාධිය කී ප්‍රකාරයක් වන්නේද යනමෙහි නොයෙක් අරමුණෙහි චිත්තචෛතසිකයන් නොබහාලීම් සඞ්ඛ්‍යාත ලක්ෂණ

යෙන් එක්ප්‍රකාර වන්නේය. තමා හා සම්ප්‍රයුක්තාවූ චිත්තචෛතසික ධර්මයන්. විතර්කය නිසා අරමුණු කරා පමුණුවන්නාක්මෙන් පවත්වන හෙයින් විතර්ක ප්‍රධාන අර්පණානම් සමාධිය ඒ විතර්කය හුපදනා උපචාර සමාධිය යන දෙදෙනාගේ වශයෙන්ද ලුජ්ජන පලුජ්ජනාර්ථයෙන් ලොක නම්වූ භවය නිශ්‍රිත සමාධිය ඒ ලොකයෙන් එතරවනිය අර්ථයෙන් ලොකොත්තරනම්වූ මාර්ගඵල නිශ්‍රිත සමාධිය යන දෙදෙනාගේ වශයෙන්ද ප්‍රීතිය හා එක්ව යෙදුනාවූ සමාධිය නොයෙදුනාවූ සමාධිය යන දෙදෙනාගේ වශයෙන්ද සුඛවේදනාව හා එක්ව යෙදුනාවූ සමාධිය උපෙක්‍ෂා වේදනාව හා එක්ව යෙදුනාවූ සමාධිය යන දෙදෙනාගේ වශයෙන්ද ද්විප්‍රකාරවන්නේයි. ස්වභාව වශයෙන්හෝ ප්‍රත්‍යයවශයෙන්හෝ ඵලවශයෙන්හෝ හීනවූ සමාධිය මධ්‍යමවූ සමාධිය ප්‍රණීතවූ සමාධිය යන තුන්දෙනා වශයෙන් තුන්ප්‍රකාරවන්නේය එසේම සවිතර්ක සවිචාර සමාධිය අවිතර්ක විචාරමාත්‍ර සමාධිය අවිතර්ක අවිචාරසමාධිය යන තුන්දෙනාගේ වශයෙන්ද ප්‍රීති සහගත සමාධිය සුඛසහගත සමාධිය උපෙක්‍ෂා සහගත සමාධිය යන තුන්දෙනාගේ වශයෙන්ද පරිත්ත සමාධිය මහග්ගත සමාධිය අප්පමාණ සමාධිය යන තුන්දෙනාගේ වශයෙන්ද තුන්ප්‍රකාරවන්නේයි තවද දුක්ඛා පටිපදා දන්ධාභිඤ්ඤාදි වශයෙන්ද පරිත්ත පරිත්තාරම්මණාදි වශයෙන්ද චතුර්ධ්‍යානාඞ්ග වශයෙන්ද හානභාගියාදිවශයෙන්ද කාමාවචරාදිවශයෙන්ද අධිපති ධර්මවශයෙන්ද සිව්වැදෑරුම්වන්නේයි. පඤ්චක ක්‍රමයෙහිලා පඤ්චධ්‍යානාඞ්ගයන්ගේ වශයෙන් පස්වැදෑරුම්වන්නේයි.—

( පා † )

තාව එකවිධකොට්ඨාසෙ උත්තානොයෙව. දුවිධකොට්ඨාසෙ ඡන්නං අනුස්සතිට්ඨානානං මරණස්සතියා උපසමානුස්සතියා ආහාරෙ පටිකූලසඤ්ඤාය චතුධාතුවවත්ථානස්සාති ඉමෙසං වසෙන ලද්ධචිත්තෙකග්ගතා යාච අප්පනාසමාධීනං පුබ්බභාගෙ එකග්ගතා අයං උපචාර සමාධි.—පඨමස්ස ඣානස්ස පරිකම්මං පඨමස්ස ඣානස්ස අනන්තරපච්චයෙන පච්චයොති ආදිවචනතො පන යා පරිකම්මානන්තරා එකග්ගතා අයං අප්පනා සමාධීති එවං උපචාරප්පනාවසෙන දුවිධො.—දුතියදුකෙ තීසු භූමීසු කුසලචිත්තෙකග්ගතා ලොකියො සමාධි අරියමග්ගසම්පයුත්තා එකග්ගතා ලොකුත්තරො සමාධීති එවං ලොකිය ලොකුත්තර වසෙන දුවිධො.—තතියදුකෙ චතුක්කනයෙ ද්වීසු පඤ්චකනයෙ තීසු ඣානෙසු එකග්ගතා සප්පීතිකො සමාධි අවසෙසෙසු ද්වීසු ඣානෙසු එකග්ගතා නිප්පීතිකො සමාධි උපචාර සමාධි පන සියා සප්පීතිකො සියා නිප්පීතිකොති එවං සප්පීතික නිප්පීතික වසෙන දුවිධො.—චතුත්ථදුකෙ චතුක්කනයෙ තීසු පඤ්චකනයෙ චතූසු ඣානෙසු එකග්ගතා සුඛසහගතො සමාධි අවසෙසස්මිං උපෙක්ඛාසහගතො උපචාරසමාධි පන සියා සුඛසහගතො සියා උපෙක්ඛාසහගතොති එවං සුඛසහගත උපෙක්ඛාසහගත වසෙන දුවිධො.—තිකෙසු පඨමත්තිකෙ පටිලද්ධමත්තො හීනො නාතිසුභාවිතො මජ්ඣිමො සුභාවිතො වසිප්පත්තො පණීතොති එවං හීනමජ්ඣිම පණීතවසෙන තිවිධො.—දුතියත්තිකෙ පඨමජ්ඣානසමාධි සද්ධිං උපචාරසමාධිනා සවිතක්ක සවිචාරො පඤ්ච

පඤ්චකනයෙ දුතියජ්ඣානසමාධි අවිතක්ක විචාරමත්තො යො හි විතක්කමත්තෙ යෙව ආදීනවං දිස්වා විචාරෙ අදිස්වා කෙවලං විතක්කප්පහානමත්තං ආකංඛමානො පඨමජ්ඣානං අතික්කමති සො අවිතක්ක විචාරමත්තං සමාධිං පටිලභති තං සන්ධාය චෙතං වුත්තං.

( ස † )

හැඳ, ඒ එකවිධාදීනයෙහි; එකවිධ කොට්ඨාසො, එකප්‍රකාරය යන කොටස; උපනානමෙවා යෙව, අගම්භීරවූ ඇති ඇත්තේ වැයි; දුවිධකොට්ඨාසෙ, ද්විප්‍රකාරවේ යි යන කොටස; ඡණ්ණං අනුස්සතිට්ඨානානං, බුද්ධානුස්සති ආදිවූ අනුස්සති කම්මට්ඨානයන් සදෙනාගේ; මරණසතියා, මරණානුස්සතියගේ; උපසමානුස්සතියා, උපසමානුස්සතියගේ; ආහාරෙ පටිකූලසඤ්ඤාය, ආහාරයෙහි ප්‍රතිකූලසංඥාවගේ; චතුධාතුවවත්ථානස්සාති, චතුධාතුව්‍යවස්ථානයාගේ යන; ඉමෙසං වසෙන, මේ දශකර්මස්ථානයන්ගේ වශයෙන්; ලද්ධචිත්තෙකග්ගතා, ලද චිත්තෛකාග්‍රතාවද; අප්පනාසමාධීනං පුබ්බභාගෙ, අර්පණාසමාධීන්ට පූර්වභාගයෙහි; යාච එකග්ගතා, යම් එකාග්‍රතාවක්ද (මෙයින් අර්පණාවට උපකාරකවූ නානාවර්ජනොපචාරයාගේද සංග්‍රහය දතයුතු–එකාවර්ජනොපචාරයාගේ මතුනොවෙයි හගලන්) අයං, මේ; උපචාරසමාධි, උපචාරසමාධිනම්වේ; පඨමස්ස ඣානස්ස, ප්‍රථමධ්‍යානයාගේ; පරිකම්මං, ගොත්‍රභූ සඞ්ඛ්‍යාත පරිකර්මය; පඨමස්ස ඣානස්ස, ප්‍රථමධ්‍යානයට; අනන්තර පච්චයෙන පච්චයොහි ආදිවචනතො පන, අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙයි සනාදි වචනයෙන් වනාහි; යා පරිකම්මානන්තරඑකග්ගතා, ගොත්‍රභූ සඞ්ඛ්‍යාත පරිකර්මයට අනන්තරවූ යම් එකාග්‍රතාවක් ඇද්ද; අයං, මේ තොමෝ; අප්පනාසමාධීති, අර්පණා සමාධියයි; එවං උපචාරප්පනාවසෙන, මෙසේ උපචාර සමාධි අර්පණා සමාධි විසින්; දුවිධො, ද්විප්‍රකාරවේ; දුතියදුකෙ, විතීයදුකයෙහි; තීසු භූමීසු චිත්තෙකග්ගතා, කාමභූමි රූපභූමි අරූපභූමි යන තුන්බිමෙහි කුශල චිත්තෛකාග්‍රතාතොමෝ; ලොකියො සමාධි, ලෞකික සමාධිනම්වේ; අරිය මග්ගසම්පයුත්තා එකග්ගතා, ආර්ය මාර්ග සම්ප්‍රයුක්තවූ එකාග්‍රතාතොමෝ (මෙතැන කුශල සමාධියම කියනබැවින් "අරියමග්ග සම්පයුත්තා" යි කීහු) ලොකුත්තරො සමාධීති, ලොකොත්තර සමාධියයි ~ පෙ ~ චතුක්කනයෙ, චතුෂ්කනයෙහි; ද්වීසු, ප්‍රථම ද්විතීයධ්‍යානදෙක්හිද; පඤ්චකනයෙ, පඤ්චකනයෙහි; තීසු ඣානෙසු, ප්‍රථම ද්විතීය තෘතීයධ්‍යාන තුනෙහිද; එකග්ගතා, එකාග්‍රතාතොමෝ; සප්පීතිකො සමාධි, සප්‍රීතික සමාධි නම්; අවසෙසු ද්වීසු ඣානෙසු, චතුෂ්කනයෙහි තුන්වනු සතරවනුවූ පඤ්චකනයෙහි සතරවනු පස්වනුවූ සෙසු ධ්‍යානදෙක්හි; එකග්ගතා නිප්පීතිකො සමාධි, එකාග්‍රතාතොමෝ නිෂ්ප්‍රීතික සමාධි නමි; උපචාර සමාධි පන, උපචාර සමාධි වනාහි; සියා සප්පීතිකො සියා නිප්පීතිකො, සප්‍රීතිකද වෙයි නිෂ්ප්‍රීතිකද වෙයි (සියලු ධ්‍යානයන්ගේම නානාවර්ජන වීථියෙහි උපචාර සමාධිය සප්‍රීතිකද වෙයි නිෂ්ප්‍රීතිකද වෙයි එකාවර්ජන වීථියෙහි වනාහි පෙරදනා පරිච්ඡින්න නැති බැවින් ආදියෙහි චතුෂ්ක ධ්‍යානයන්ගේ උපචාරසමාධිය සප්‍රීතිකම වෙයි සෙසු තෘතීය චතුර්ථ පඤ්චමධ්‍යානයෙහිද උපචාර සමාධිය නිෂ්ප්‍රීතිකම වෙයි) චතුත්

දුකෙ, චතුක්කදුකයෙහි; චතුක්කනයෙ හි පු, චතුෂ්කනයෙහි ආදියෙහි තුන් දුකැත්තිද; පංචකනයෙ චතුසු ඣානෙසු, පංචකනයෙහි ආදියෙහි සතර දුකැත්තිද; එකග්ගතා, ඒකාග්‍රතා නොහැර; සුඛසහගතො සමාධි, සුඛ සහගත සමාධිනම්වේ; අවසෙසෙසුං, චතුෂ්කනයෙහි චතුර්ථ දුකැත්තිද පංචකනයෙහි පංචම දුකැත්තිද ඒකාග්‍රතානොහැර; උපෙක්ඛාසහගතො සමාධි, උපෙක්ෂා සහගත සමාධි නම්; උපචාර සමාධි පන, උපචාර සමාධි වනාහි; සියා සුඛ සහගතො සියා උපෙක්ඛා සහගතො, සප්‍රීතික දුකෙහි ගී හා සීන්ම සුඛ සහගතදවේයි උපෙක්ෂා සහගතදවේයි; තිකෙසු, ත්‍රිකයන්හෙරෙහි; පඨමත්තිකෙ, ප්‍රථමත්‍රිකයෙහි; පටිලද්ධමත්තො, ප්‍රතිලබ්ධමාත්‍රවූයේ (අනාසෙවිතවූයේ යන අදහසි) හීණො, පරිදුර්වලබැවින් හීනනම්වේ; නාතිසුභාවිතො, අතිශය ප්‍රගුණබවට නොපමුණුවනලද්දේ; මජ්ඣිමො, මධ්‍යමනම්වේ; සුභාවිතො, මනාකොටම ප්‍රගුණකරණලද්දේ; වසිප්පත්තො, වසිතාවට පමුණුවනලද්දේ; පණීතො, ප්‍රණීතනම්; දුතියත්තිකෙ, ද්විතීයත්‍රිකයෙහි; පඨමජ්ඣාන සමාධි, ප්‍රථමධ්‍යාන සමාධිය; සද්ධිං උපචාර සමාධිනා, උපචාර සමාධිය හා සමග; සවිතක්ක සවිචාරො, සවිතර්ක සවිචාර සමාධිනම්වේ; පංචකනයෙ, පංචකනයෙහි; දුතියජ්ඣාන සමාධි, ද්විතීයධ්‍යාන සමාධිය; අවිතක්ක විචාරමත්තො, අවිතර්ක විචාරමාත්‍රනම්; යොහි, යමෙක් වනාහි; විතක්කමත්තෙව ආදීනවං දිස්වා, විතර්කමාත්‍රයෙහිම (විතර්කසොභනරයහි) ආදීනව දැක; විචාරෙ අදිස්වා, විචාරයෙහි ආදීනව නොදැක (විචාරයසාන්තහෙයින් දැකයයි සේයි) කෙවලං, හුදෙක්; විතක්කප්පහාණමත්තං ආකඩ්ඛමානො, විතර්ක ප්‍රහාණමාත්‍රය කැමැත්තේ; පඨමජ්ඣානං අතික්කමති, ප්‍රථමධ්‍යානය ඉක්මවීද; සො, හෙතෙමේ; අවිතක්ක විචාරමත්තං සමාධිං පටිලභති, අවිතර්ක විචාරමාත්‍රධ්‍යානයලැබේ; තං සන්ධාය, මෙසේ ලද සමාධිය සඳහා; එතං වුත්තං, "අවිතක්ක විචාරමත්තො සමාධි" යන දෙවන පදය කියනලදී.

( භා † )

ඒ එකවිධාදි ක්‍රමයෙහි එක්වැදෑරුම් කොටස නොහැඹුරු අසීඅැත්තේයි දෙවැදෑරුම් කොටසයෙහි වුධානුස්සති ආදිවූ අනුස්සති කම්මට්ඨාන සංඥාය මරණානුස්සති කම්ඨානය උපසමානුස්සති කම්ඨානය ආහාරයෙහි ප්‍රතිකූල සංඥා කම්ඨානය චතුධාතු ව්‍යවස්ථාන කම්ඨානය යන මේ දශ කම්ඨාන භාවනා කිරීම් වශයෙන් ලබනලද සිත එකඟබවද අර්පණා සමාධියට පෙරටුව උපදනා සිත එකඟබවද යනමේ දෙවැදෑරුම් සමාධිය උපචාර සමාධි නම්වේ. ප්‍රථමධ්‍යාන විපිනුගේ පරිකම්විතානය ප්‍රථමධ්‍යාන සිතට අනන්තර ප්‍රත්‍යයෙන් උපකාරවන්නේයයි පට්ඨාන මහා ප්‍රකරණයෙහි වදාළබැවින් එගාත්‍රභූ සඞ්ඛ්‍යාත පරිකර්මසිතට අනතුරුවැඋපදනා ප්‍රථමධ්‍යාන සිතහා සමග පවත්නා එකග්‍රතා චෛතසිකය අර්පණා සමාධිනම්වේ (ප්‍රථමධ්‍යාන උපදවනුකැමති යොගාවචර පුද්ගලයා කම්ඨාන භාවනාකරණ කල ධ්‍යානය උපදනා කැමති කල්හි මනොද්වාරාවර්ජනයට අනතුරුව ජවන් පසක්හෝ සත් චිත්තවීථිය උපදනේය එයින් පළමුවන සිත පරිකර්ම නම දෙවන සිත උපචාර නම තුන්වන සිත අනුලොම නම සතරවන සිත ගොත්‍රභූ

නම. පස්වන සිත ධ්‍යාන නම් ඉන් මතු තදාලම්බන නොඋපදි භවාඞ්ගයට යි මෙහි ජවන් පස අතුරෙන් දෙවන උපචාරනම්වූ විතර්කාදීන් සහ එක්ව යෙදුනාවූ එකාග්‍රතා චෛතසිකය උපචාර සමාධි නම. සතරවන ගොත්‍රභූ සිතට අනතුරුව උපදනා ධ්‍යාන විතර්කාදීන් හා සම්ප්‍රයුක්තවූ එකාග්‍රතා චෛතසිකය අර්පණා සමාධිනම් පට්ඨානප්‍රකරණයෙහි වදාළ ප්‍රථමධ්‍යානයට අනන්තර ප්‍රත්‍යයෙන් උපකාරවන සිත ධ්‍යානයට පිරිකම් වනබැවින් පරිකම් නාමයෙන් වදාළ නුමුත් ඒ සිත කාමාවචර ගොත්‍රය මැඩපැවැත්වීමට හේතුභූතව උපදනාහෙයින් ගොත්‍රභූයයිද ව්‍යවහාර කරන්නේයි*] ධ්‍යානය ළඟ හැසිරෙන අර්ථයෙන් උපචාර සමාධියයිද කෙලෙස් විෂ්කම්භන සඞ්ඛ්‍යාත කෙලෙස් මඩාගැනීමට පමුණුවන අර්ථයෙන් අර්පණා සමාධියයිද යන දෙදෙනාගේ වශයෙන් මේ සමාධිය දෙවැදෑරුම් වන්නේයි.

දෙවන දුකයෙහි සප්තකාම සුගතියෙහිද සොළොස් රූපභූමියෙහිද සතර අරූපභූමියෙහිද යන තුන්තැන වසනා සත්ත්වයන් විසින් උපදවනලද ධ්‍යාන කුශලචිත්ත වීථි සම්ප්‍රයුක්තවූ එකාග්‍රතා චෛතසිකයෝ ලෞකික සමාධිනම්වූ එම භූමිකනාවූම සත්ත්වයෝ ධ්‍යානලාභීව එ ධ්‍යානය පාදකකොට හෝ සවිතර්කධ්‍යානය පාදකකොට හෝ සෝවාන් ආදී සතර ආර්යමාර්ගයන් උපදවන කල ඒ ධ්‍යානමාර්ග සිත පිළිබඳවූ එකාග්‍රතා චෛතසිකය ලෝකෝත්තර සමාධි නම යන මොවුන්ගේ වශයෙන්ද දෙවැදෑරුම් වන්නේයි.

තුන්වන දුකයෙහි චතුෂ්ක නයවශයෙන් ධ්‍යානය සතරකට ප්‍රභේදවීමෙහි පළමුවන දෙවන ධ්‍යාන චිත්තවීථියෙහිද පඤ්චක නය වශයෙන් ධ්‍යානය පසකට ප්‍රභේදවීමෙහි පළමුවන දෙවන තුන්වන ධ්‍යාන චිත්තවීථියෙහිද එක්ව යෙදුනාවූ එකාග්‍රතා චෛතසිකයන් ප්‍රීති චෛතසිකය හා සමඟ යෙදුනුබැවින් සප්‍රීතික සමාධි නම් සෙසු චතුෂ්ක ක්‍රමයෙහිලා තුන්වනු සතරවනුවූද පඤ්චක ක්‍රමයෙහිලා සතරවනු පස්වනුවූද ධ්‍යාන චිත්තවීථිහා සම්ප්‍රයුක්තවූ එකාග්‍රතාවෝ සහජාතවූ ප්‍රීති චෛතසිකයක් නැතිබැවින් නිෂ්ප්‍රීතික සමාධිනම්ය එනමුදුවූවත් සියලු සප්‍රීතිකහෝ නිෂ්ප්‍රීතිකයෝ ධ්‍යානයන්ගේ උපචාර සමාධිය කාමාවචර වීථියෙහි සප්‍රීතිකද නිෂ්ප්‍රීතිකදවියහැකි වන්හෙයින් එකාවර්ජන වීථියෙහි සප්ත ජවනයන්ගේ වේදනා චෛතසිකය නොපෙරළෙනබැවින් ප්‍රථම ද්විතීය ධ්‍යානයන්ගේ උපචාර සමාධිය සප්‍රීතිකවේයි. සෙසු තෘතීය චතුර්ථ පඤ්චමධ්‍යානයන්ගේ උපචාර සමාධිය නිෂ්

* භ...න...භ...ච—ම...උ...ම...පරි...උප. අනු...ගොත්‍ර...ධ්‍යාන..භ...භ
ස්...ස්...ස්...ස් ස්...ස්...ස්... ස්... ස්... ස්... ස් ... ස් .. ස් ස්
මේ මන්දප්‍රඥයාහට උපදනා ධ්‍යානවීථියයි. තීක්ෂ්ණප්‍රඥයාහට පරිකම් සිත හැර උපචාර අනුලෝම ගොත්‍රභූ සිත් ඉපද සතරවන සිත ධ්‍යානයවේයි.

ඉන්පසු ඒ ධ්‍යානයෙහි යෙදුනාවූ විතර්කාදී අඞ්ගයන් පස්විසිම් වශයෙන් කාමාවචර කුශල චිත්ත වීථි පසක් උපදින් ඉන්බිනි ඒ ධ්‍යානයට සමවදිනුකැම තිකල පහළවන වීථියෙහි ධ්‍යානසිත් අනන්ත අප්‍රමාණව උපදිත්. මේ ප්‍රථම ධ්‍යානයමෙන් සෙසු ධ්‍යාන වීථීන් සැලකියයුතු. තවද නාම ජවනයන්මෙන් සත්වරක් නොඉපද සතරපස්වරක් ජවන් ඉපදීමද නාදජවනයන්ගේ අවසානයෙහිමෙන් තදාලම්බන සිත් නොඉපදීමද ධ්‍යාන වීථීන්ගේ සැහාවක් බව දතයුතුයි.

ප්‍රීතිකාමවන්නේයි සතරවන දුකයෙහි චතුෂ්කධ්‍යාන ක්‍රමයෙහිලා ප්‍රථම ද්විතීය තෘතීය ධ්‍යානවීථියෙහිද පඤ්චක ධ්‍යාන ක්‍රමයෙහිලා ප්‍රථම ද්විතීය තෘතීය චතුර්ථ යන සතර ධ්‍යාන වීථියෙහිද සම්ප්‍රයුක්තවූ ඒකාග්‍රතා චෛතසික සුඛවේදනාව හා එක්වයෙදුනුබැවින් සුඛසහගත සමාධිනම් සෙසු චතුෂ්ක ක්‍රමයෙහිලා චතුර්ථධ්‍යානයෙහිද පඤ්චක ක්‍රමයෙහිලා පඤ්චමධ්‍යාන වීථියෙහිද සම්ප්‍රයුක්තවූ ඒකාග්‍රතා චෛතසිකය උපේක්ෂා වේදනාව හා එක්ව යෙදුනුබැවින් උපේක්ෂා සහගත සමාධිනම එහිම උපචාර සමාධිය සවසී නියාමයෙන් සුඛවේදනා සහගතද වෙයි උපේක්ෂා වේදනා සහගතද වෙයි—

ත්‍රිකයන් අතුරෙන් පළමුවන ත්‍රිකයෙහිලා ලබනලද මාත්‍රයක් වැඩූනාවූ හෙවත් පළමුකොට ලබනලද සමාධිය හාත්පසින් දුර්වලබැවින් හීන නම අනිශයින් භාවිතානොකරනලද සමාධිය මධ්‍යම නම් මනාකොට ප්‍රගුණකරනලද වශගතවූ පළඹුවනලද සමාධිය ප්‍රණීතනම්වන්නේයි. දෙවනදුකයෙහි උපචාර සමාධියහා ප්‍රථමධ්‍යාන සමාධියද විතර්ක විචාරයන්හා සමග යෙදී පවත්නාහෙයින් සවිතර්ක සවිචාර සමාධිනම පඤ්චක නයෙහිලා ද්විතීයධ්‍යාන සමාධිය විතර්කනැත්තාවූ විචාරය පමණක් ඇත්තාවූ සමාධිනම. යම් යොගාවචර පුද්ගලයෙක්තෙමේ විතර්කයෙහි පමණක් දෝෂ් දක විචාරයෙහි දෝෂ්නොදක හුදෙක් විතර්ක ප්‍රහාණය පමණක් කැමතිවෙමින් ප්‍රථම ධ්‍යානය ඉක්මවාද හෙතෙම අවිතර්ක විචාරමාත්‍ර සමාධිය ලබන්නේයි. ඒ සමාධිය සඳහා අවිතර්ක විචාරමාත්‍ර සමාධිය යන මේ දෙවන පදය දක්වනලද්දේය—

( පා ‡ )

චතුක්කනයෙ පන දුතියාදීසු පඤ්චකනයෙච තතියාදීසු ඣානෙසු එකග්ගතා අවිතක්කාවිචාරො සමාධි එවං සවිතක්ක සවිචාරාදිවසෙන තිවිධො—තතියත්තිකෙ චතුක්කනයෙ ආදිතො තීසු පඤ්චකනයෙච තීසු ඣානෙසු එකග්ගතා පීතිසහගතො සමාධි—තෙසුව තතියෙ චතුත්ථෙච ඣානෙ එකග්ගතා සුඛසහගතො සමාධි අවසානෙ උපෙක්ඛා සහගතො උපචාර සමාධි පන පීතිසුඛ සහගතො වා හොති උපෙක්ඛා සහගතො වාති එවං පීතිසහගතාදිවසෙන තිවිධො—චතුත්ථත්තිකෙ උපචාරභූමියං එකග්ගතා පරිත්තො සමාධි රූපාවචර අරූපාවචර කුසලෙ එකග්ගතා මහග්ගතො සමාධි අරියමග්ග සම්පයුත්තා එකග්ගතා අප්පමාණො සමාධීති එවං පරිත්ත මහග්ගත අප්පමාණවසෙන තිවිධො—චතුක්කෙසු පඨම චතුක්කෙ අත්ථි සමාධි දුක්ඛාපටිපදො දන්ධාභිඤ්ඤෝ අත්ථි දුක්ඛාපටිපදො ඛිප්පාභිඤ්ඤෝ අත්ථි සුඛාපටිපදො දන්ධාභිඤ්ඤෝ අත්ථි සුඛාපටිපදො ඛිප්පාභිඤ්ඤෝ තත්ථ පඨමසමන්නාහාරතො පට්ඨාය යාව තස්ස තස්ස ඣානස්ස උපචාරං උප්පජ්ජති තාව පවත්තා සමාධිභාවනා පටිපදාති වුච්චති උපචාරතො පන පට්ඨාය යාව අප්පනා තාව පවත්තා පඤ්ඤා අභිඤ්ඤාති වුච්චති සා පනෙසා පටිපදා එකච්චස්ස දුක්ඛා හොති නීවරණාදි පච්චනීකධම්ම සමුදාචාරගහණතාය කිච්ඡා අසුඛසෙවනාති අත්ථො එකච්චස්ස තදභාවෙන සුඛා අභිඤ්ඤාපි එකච්චස්ස දන්ධා හොති මන්දා අසීඝප්පවත්තිනී එකච්චස්ස ඛිප්පා අමන්දා සීඝප්පවත්තිනී තත්ථ යානි පරතො සප්පායා

සප්පායානිච පලිබොධුපච්ඡෙදාදීනි පු
බ්බකිච්චානිච අප්පනා කොසල්ලානිච
වණ්ණිතානියෙව තෙසු යො අසප්පාය
සෙවී හොති තස්ස දුක්ඛා පටිපදා
දන්ධාච අභිඤ්ඤා හොති සප්පාය සෙවි
නො සුඛා පටිපදා ඛිප්පාච අභිඤ්ඤා
යො පන පුබ්බභාගෙ අසප්පායං සෙ
විත්වා අපරභාගෙ සප්පාය සෙවී හො
ති පුබ්බභාගෙවා සප්පායං සෙවිත්වා අ
පරභාගෙ අසප්පාය සෙවී තස්ස වො
මිස්සතා වෙදිතබ්බා තථා පලිබොධු
පච්ඡෙදාදිකං පුබ්බකිච්චං අසම්පාදෙ
ත්වා භාවනමනුයුත්තස්ස දුක්ඛා පටිප
දා හොති විපරියායෙන සුඛා —

( ස ‡ )

චතුක්කනයෙ පන, චතුෂ්කනයෙහි
වනාහි ("දුතියාදිසු තීසු ඣානෙසු" යි.
යොදනු) ද්විතීයාදිසු, මිතීයාදි තුන්
ධ්‍යානයෙහිද; පඤ්චකනයෙච, පඤ්ච
කනයෙහිදු; තතියාදිසු තීසු ඣානෙ
සු, තෘතීයාදී තුන්ධ්‍යානයෙහිද; එක
ග්ගතා, එකාග්‍රතාතොමෝ; අවිතක්කා
විචාරො සමාධීති, අවිතර්කාවිචාර සමා
ධියයි; තතියතිකෙ, තෘතීයත්‍රිකයෙ
හි; චතුක්කනයෙ, චතුෂ්කනයෙහි;
ආදිතොතීසු, ආදියෙහි ධ්‍යානදෙක්
හිද; පඤ්චකනයෙ, පඤ්චකනයෙහි;
තීසු ඣානෙසු, ආදියෙහි තුන් ධ්‍යාන
යෙක්හිද; එකග්ගතා, එකාග්‍රතා තො
මෝ; පීතිසහගතො සමාධි, ප්‍රීති සහ
ගත සමාධිනම්වේ; තෙසුයෙව, එම
චතුෂ්ක පඤ්චකනයෙහි; තතියෙ ච
තුත්ථෙ ච ඣානෙ එකග්ගතා, චතුෂ්
කනයෙහි තෘතීයධ්‍යානයෙහි පඤ්ච
කනයෙහි චතුර්ථධ්‍යානයෙහි එකාග්‍ර
තාතොමෝ; සුඛ සහගතො සමාධි,
සුඛ සහගත සමාධි නම්වේ; අවසා
නෙ, දෙනයෙහිම පර්‍යවසානවූ සත
රවන පඤ්චම ධ්‍යානයෙහි එකාග්‍රතා
තොමෝ; උපෙක්ඛා සහගතො, උපෙ
ක්ෂාසහගත සමාධිනම්වේ; උපචාර
සමාධි පන, උපචාර සමාධිය වනාහි;
පීති සුඛ සහගතො වා හොති, ප්‍රීති
සුඛ දෙකින්ම සහගියාහෝ වේනී;
උපෙක්ඛා සහගතො වා, උපෙක්ෂා ස
හගියාහෝ වේ; චතුත්ථතිකෙ, සතර
වන ත්‍රිකයෙහි; උපචාරභූමියං එකග්ග
තා, උපචාර ධ්‍යාන සම්ප්‍රයුක්ත චිත්
තොත්පාදයෙහි එකාග්‍රතා තොමෝ
(හේ වනාහි සහගත ධර්මයන්ට උත්ප
ත්තිස්ථානබැවින් භූමියයි කියනලැ
බේ) පරිත්තො සමාධි, කාමාවචර ස
මාධිබැවින් පරීත්ත සමාධි නම්වේ; රූ
පාවචර රූපාවචර කුසලෙ එකග්ගතා,
රූපාවචර අරූපාවචර කුශලයෙහි
එකාග්‍රතාතොමෝ; මහග්ගතො සමා
ධි, මහද්ගත සමාධිනම්වේ; අරියමග්ග
සම්පයුත්තා එකග්ගතා, ආර්‍යමාර්ගී
සම්ප්‍රයුක්තවූ එකාග්‍රතාතොමෝ; අ
ප්පමාණො සමාධිති, අප්‍රමාණ සමාධි
නම් වෙයි — පෙ — චතුක්කෙසු, ච
තුෂ්කයන් කෙරෙහි; පඨමචතුක්කෙ,
ප්‍රථම චතුෂ්කයෙහි; දුක්ඛාපටිපදො,
දුඃඛවූ ප්‍රතිපදාති ඇති; දන්ධාභිඤ්ඤො,
ලස්වූ ඥාණ ඇති; සමාධි ඇති, සමාධි
යෙක් ඇති; දුක්ඛාපටිපදො, දුඃඛවූ
ප්‍රතිපදාති ඇති; ඛිප්පාභිඤ්ඤො, තීක්ෂ
ණවූ ඥාණ ඇති; සමාධි ඇති, සමාධි
යෙක් ඇති; සුඛා පටිපදො, සුඛ ප්‍රති
පදාති ඇති; දන්ධාභිඤ්ඤො, ලස්වූ ඥා
ණ ඇති; සමාධි ඇති, සමාධියෙක්
ඇති; සුඛා පටිපදො, සුඛ ප්‍රතිපදාති
ඇති; ඛිප්පාභිඤ්ඤො, තීක්ෂණවූ ඥාණ
ඇති; සමාධි ඇති, සමාධියෙක් ඇති;
තතො, ඒ චතුෂ්කයෙහි; පඨම සම
න්නාහාරතො පට්ඨාය (භාවනාරම්භය
කරන්නහුගේ "පඨවි පඨවි" යනා
දීන් කරණ කර්මස්ථානයෙහි) ප්‍රථ[illegible]

**නිවෙසෙයි** පවත්; යාව, යම්තාක්;
**තස්ස තස්ස ඣානස්ස උපචාරං උප්ප
ජ්ජති,** ඒ ඒ ධ්‍යානයාගේ උපචාරය උ
පදීද; තාව, ඒතාක්; පවත්තා සමාධි
භාවනා (ඒ උපචාරයට පූර්වයෙහි) ප්‍ර
වෘත්තවූ සමාධිභාවනාතොමෝ; පටි
පදාති වුච්චති, පටිපදා නමැයි කියනු
ලැබේ; උපචාරතො පන පට්ඨාය, උ
පචාරයෙහි පටන් ගෙනම; යාව අප්ප
නා, යම්තාක් අර්පණාව උපදීද; තාව,
ඒතාක්; පවත්තාපඤ්ඤා, (ඒ අර්පණා
වට පූර්වයෙහි) උපන්නාවූ ප්‍රඥාතො
මෝ; අභිඤ්ඤා, අභිඥා නම් (පූර්වභාග
ප්‍රඥාවටම අභිඥාභාවය කිමද අර්පණා
ප්‍රඥාවද අභිඥානම්වේ "යදග්ගෙනහි
පුබ්බභාග පඤ්ඤාය දන්ධ සිඝතා තද
ග්ගෙන අප්පනා පඤ්ඤාය" යනු ටීකා
බැවින්) සා පනෙසා පටිපදා, ඒ මේ
ප්‍රතිපත්තිතොමෝ; එකච්චස්ස, එකෙක්
හට; දුක්ඛාහොති, දුක්වේ; නීවරණා
දි පච්චනීක ධම්ම, නීවරණ විතර්ක
විචාරාදි ප්‍රතිපක්ෂ ධර්මයන්ගේ; සමුද
චාර ගහණතාය, සමුදාචාරය ගහණ
බැවින් (ප්‍රවෘත්ති බහුලබැවින යන
අර්ථයි) කිච්ඡා, කෘච්ඡ්‍රය; අසුඛසෙව
නාති අත්ථෝ, නොසුවවූ භාවනා ඇත්
තිය යන අර්ථයි; එකච්චස්ස, සමහ
රෙක් හට; තදභාවෙන, ඒ ප්‍රත්‍යනීක ධ
ර්ම සමුදාචාර ගහණ නොවනබැවින්;
සුඛා, සුවවේ; අභිඤ්ඤාපි, අභිඥද; එ
කච්චස්ස, එකෙක් හට; දන්ධාහොති, ලස්
වෙයි; මන්දා, මන්දවෙයි; අසීඝප්පවත්ති,
ශීඝ්‍රව නොපවතී; එකච්චස්ස, එකෙක්
හට; ඛිප්පා, ක්ෂිප්‍රවෙයි; අමන්දා, මඳ
නොවෙයි; සීඝප්පවත්තිනී, ශීඝ්‍රව පවතී;
තත්‍ර, ඒ ප්‍රතිපදාභිඥාවන් කෙරෙහි;
යානි, යම්; පරතො, මතුයෙහි; සප්පා
යා සප්පායානිච, සැප නොසැප කො
රෙත්ද; පලිබොධුපච්ඡෙදාදීනි, පලි
බොධුපච්ඡේද භාවනා විධානයාගේ අ
පරිහානිය යනාදී; පුබ්බකිච්චානිච, පූ
ර්ව කෘත්‍යයන්ද; අප්පනා කොසල්ලානි
ච වණ්ණයිස්සාම, අර්පණා කෞශල්‍ය
යන්ද වර්ණනාකරමෝද; තෙසු, ඔ
වුන් කෙරෙහි; යො අසප්පාය සෙවිනො
ති, සමෙක් ආවාසාදි සත්වණක් නො
සැප සෙවීද; තස්ස, ඔහට; දුක්ඛා පටි
පදා, දුක්වූ ප්‍රතිපත්තිය වෙයි; දන්ධාච
අභිඤ්ඤාහොති, ලස්වූ අභිඥද වෙ
යි; සප්පාය සෙවිනො, උක්තප්‍රකාර
යෙන් සැපසෙවුනාහට; සුඛා පටිපදා,
සුවවූ ප්‍රතිපත්ති ඇතිවෙයි; පුබ්බභා
ගෙවා අසප්පායං සෙවිත්වා, පූර්වභාග
යෙහිමෙහෝ නොසැපසෙව; අපරභාගෙ
සප්පායසෙවී, අපරභාගයෙහි සැපසෙ
වුනේද; තස්ස, ඔහට; වොමිස්සකා (ප
ළමුකොට නොසැප සෙව පසුව සැප
සෙවියහුට දුක්ඛාපටිපදා ඛිප්පාභිඤ්ඤා
වෙයි පළමුකොට සැපසෙව පසුව
නොසැප සෙවියහට සුඛා පටිපදා
දන්ධාභිඤ්ඤා වෙයි මෙසේ ප්‍රථම චතු
ර්ථයන්හා විතීය තෘතීයයන්ගේ) මිශ්‍ර
බව; වෙදිතබ්බා, දතයුතුයි; තථා,
එසේම; පලිබොධුපච්ඡේදාදිකං පුබ්බ
කිච්චං, පලිබොධ සිඳීම් ආදී පූර්ව
කෘත්‍යය; අසම්පාදෙත්වා, නොසපයා;
භාවනං අනුයුඤ්ජන්තස්ස, භාවනායෙහි
යෙදුනාහට; දුක්ඛාපටිපදාහොති, පරි
පන්ථයන් ඇතිබැවින් දුක්වූ ප්‍රතිපත්ති
වේ; විපරියායෙන, පලිබොධ සිඳීම්
ආදිවූ පූර්වකෘත්‍යය සැපවූවාහට පරි
පන්ථ නැතිබැවින්; සුඛා, සුවවේ......

---

( භා ‡ )

චතුෂ්ක ක්‍රමයෙහිලා විතීයධ්‍යාන
තෘතීයධ්‍යාන චතුර්ථධ්‍යාන යන තු
නෙහිද පඤ්චක ක්‍රමයෙහිලා තෘතී

යධ්‍යාන චතුර්ථධ්‍යාන පඤ්චමධ්‍යාන යන තුනෙහිද සම්ප්‍රයුක්තවූ ඒකාග්‍රතා චෛතසිකය විතර්ක විචාර නැති බැවින් අවිතර්ක අවිචාර සමාධි නම් වේයි. මෙසේ සවිතර්ක සවිචාරාදි වශයෙන් සමාධිය තුන්ප්‍රකාරවන්නේයි. තුන්වන ත්‍රිකයෙහි චතුෂ්ක ක්‍රමයෙහිලා ප්‍රථමධ්‍යාන ද්විතීයධ්‍යාන දෙක්හිද පඤ්චකක්‍රමයෙහිලා ප්‍රථමධ්‍යාන ද්විතීයධ්‍යාන තෘතීයධ්‍යාන තුනෙහිද සම්ප්‍රයුක්තවූ ඒකාග්‍රතා චෛතසිකය ප්‍රීති සහගත සමාධිනම් එම චතුෂ්ක පඤ්චක ක්‍රමයෙහිලා තෘතීයධ්‍යාන චතුර්ථධ්‍යාන සම්ප්‍රයුක්තවූ ඒකාග්‍රතාව සුඛවේදනාව හා යුක්තබැවින් සුඛ සහගත සමාධි නම් මේ දෙනයෙහිම කෙළවර සතරවන පස්වන ධ්‍යානයන්හා සම්ප්‍රයුක්තවූ ඒකාග්‍රතා චෛතසිකය උපෙක්ෂාවේදනාව හා එක්ව සෙවුනුබැවින් උපෙක්ෂා සහගත සමාධිනම්. මේ දෙතන්හිම උපචාර සමාධිය ප්‍රීති සුඛ දෙකින්මහෝ යුක්තවෙති උපෙක්ෂා සහගතහෝ වේයි. මෙසේ ප්‍රීති සහගතාදි වශයෙන් සමාධිය තුන්ප්‍රකාරවන්නේයි. සතරවන ත්‍රිකයෙහි උපචාරධ්‍යාන සම්ප්‍රයුක්තවූ චිත්තයෙහි ඒකාග්‍රතාව කාමාවචරබැවින් පරීත්ත සමාධි නම් රූපාවචර කුශල චිත්තයන්හා සම්ප්‍රයුක්තවූ ඒකාග්‍රතාව මහද්ගත සමාධි නම් ආර්‍යමාර්ගයන්හා සම්ප්‍රයුක්තවූ ඒකාග්‍රතාව අප්‍රමාණ සමාධි නම් මෙසේ පරීත්ත මහද්ගත අප්‍රමාණ වශයෙන් සමාධිය තුන්ප්‍රකාර වන්නේයි.

චතුෂ්කයන් අතුරෙන් පළමුවන චතුෂ්කයෙහිලා දුක්වූ ප්‍රතිපදාහා අප්‍රකට නුවණ ඇත්තාවූ සමාධියෙක්ද ඇත්තේය. දුක්වූ ප්‍රතිපදාහා තියුණු නුවණ ඇත්තාවූ සමාධියෙක්ද ඇත්තේය. සුවවූ ප්‍රතිපදාහා අප්‍රකටව නුවණ ඇත්තාවූ සමාධියෙක්ද ඇත්තේය සුවවූ ප්‍රතිපදාහා තියුණු නුවණ ඇත්තාවූ සමාධියෙක්ද ඇත්තේයි ඔවුන් අතුරෙන් ප්‍රතිපදානම් කුමක්ද අභිඥානම් කුමක්දයත්? ධ්‍යාන භාවනාකරන්නහුගේ පඨවි කසිණාදියෙන් කරණ පළමුවන භාවනාව පටන් ඒ ඒ ධ්‍යානයාගේ උපචාරසිත දක්වා පැවැති සමාධි භාවනාව ප්‍රතිපදා නම් ඒ උපචාර චිත්තක්ෂණය පටන් අර්පණා චිත්තක්ෂණය දක්වා මේ අතුරෙහි උපන්නාක් ප්‍රඥාවෝද අර්පණා චිත්ත සම්ප්‍රයුක්තවූ ප්‍රඥාවද අභිඥානම් වේයි.

ඒ මේ ප්‍රතිපදාවට නීවරණ විතර්ක විචාරාදි විරුද්ධ ධර්මයන්ගේ පැවැත්ම බහුලබැවින් ඇතම් යෝගාවචරයන්ට දුක්විඳින්නීය හෙවත් දුෂ්කරවූ භාවනා ඇත්තීය ඇතම් යෝගාවචරයන්ට විරුද්ධ ධර්මයන්ගේ බහුලත්වයක් නැතිබැවින් සුවවිඳින්නීය අභිඥාවද ඇතැම් යෝගාවචරයෙක්හට අප්‍රකටවෙයි හෙවත් මඳවෙයි ලුහුසුලු නොවූ පැවැතුම් ඇතිවෙයි ඇතම් යෝගාවචරයෙක්හට තියුණුවෙයි හෙවත් නොමඳවෙයි ලුහුසුලු පැවැතුම් ඇතිවෙයි. ඒ ප්‍රතිපදා අභිඥාවන් අතුරෙන් යම් සැප නොසැප සෙනසුන් ආදීන්ද පළිබෝධයන්ගේ සිඳීම් ආදියද භාවනාවිධානයාගේ නොපිරිහීම් ආදි පූර්ව කෘත්‍යයන්ද අර්පණා කෞශල්‍යයන්ද මතු වර්ණනාකරන්නෙමෝද ඔවුන් අතුරෙන් යමෙක් නොසැපවූ ආවාසාදිය සේවනයකෙරේද ඔහට දුක්වූ ප්‍රතිපදාවන්නීය. අප්‍රකටවූ අභිඥාවද වන්නීය සැපවූ ආවාසාදිය සේවනයකරන්නහුට සුවවූ ප්‍රතිපත්තිද වන්නීය තියුණුවූ අභිඥාද වන්නීය යමෙක් තෙමේ පළමුකොට සැප ආවාසාදිය සේවනයකොට පසුව නොසැප ආවාසාදිය සේවනයකෙරේද

ඛිහට සුවවූ ප්‍රතිපත්තිවන්නිය අප්‍රකටවූ අභිඥදවන්නීය පළමුකොට නොසැප ආචාරාදිය සෙවනයකොට පසුව සැප ආචාරාදිය සෙවනයකරන්නහුව දුක්වූ ප්‍රතිපත්තිවන්නිය තියුණුවූ අභිඥද වන්නිය මෙසේ ප්‍රථම චතුෂ්ට ක්‍රමයන්හා විතීය තෘතීය ක්‍රමයන්ගේ මිශ්‍රබව දතයුතුයි. තවද පළිබොධ පසිඳීම් ආදී පූර්ව කෘත්‍ය නොසපයා භාවනාවෙහි යෙදුනාහටද සතුරන්ඇතිබැවින් දුක්වූ ප්‍රතිපත්තිවන්නිය පළිබොධ පසිඳීම් ආදී පූර්ව කෘත්‍ය සපයා භාවනාවෙහි යෙදෙන්නාහට සතුරන් නැතිබැවින් සුවවූ ප්‍රතිපත්ති වන්නීය.

( ෂා ¶ )

**අප්පනා කොසල්ලන්ති පන අසම්පාදෙන්තස්ස දන්ධාභිඤ්ඤා හොති සම්පාදෙන්තස්ස ඛිප්පා අපිච තණ්හාඅවිජ්ජා වසෙන සමථ විපස්සනාධිකාරවසෙන චාපි එතාසං පභෙදො වෙදිතබ්බො තණ්හාභිභූතස්සහි දුක්ඛාපටිපදා හොති අනභිභූතස්ස සුඛා අවිජ්ජාභිභූතස්ස හි දන්ධාභිඤ්ඤා හොති අනභිභූතස්ස ඛිප්පා යොච සමථෙ අකතාධිකාරො තස්ස දුක්ඛා පටිපදා හොති කතාධිකාරස්ස සුඛා යොපන විපස්සනාය අකතාධිකාරො හොති තස්ස දන්ධාභිඤ්ඤා හොති කතාධිකාරස්ස ඛිප්පා කිලෙසින්ද්‍රිය වසෙනචාපි එතාසං පභෙදො වෙදිතබ්බො තිබ්බකිලෙසස්සහි මුදින්ද්‍රියස්ස දුක්ඛා පටිපදා හොති දන්ධාච අභිඤ්ඤා තික්ඛින්ද්‍රියස්ස පන ඛිප්පාභිඤ්ඤා මන්දකිලෙසස්සච මුදින්ද්‍රියස්ස සුඛා පටිපදා හොති දන්ධාච අභිඤ්ඤා තික්ඛින්ද්‍රියස්ස ඛිප්පා අභිඤ්ඤාති ඉති ඉමාසු පටිපදාභිඤ්ඤාසු යොපුග්ගලො දුක්ඛාය පටිපදාය දන්ධායච අභිඤ්ඤාය සමාධිං පාපුණාති තස්ස සො සමාධි දුක්ඛා පටිපදො දන්ධාභිඤ්ඤොති වුච්චති එසනයො සෙසත්තයෙපි එවං දුක්ඛා පටිපදා දන්ධාභිඤ්ඤාදිවසෙන චතුබ්බිධො. දුතිය චතුක්කෙ අත්ථි සමාධි පරිත්තො පරිත්තාරම්මණො අත්ථි පරිත්තො අප්පමාණාරම්මණො අත්ථි අප්පමාණො පරිත්තාරම්මණො අත්ථි අප්පමාණො අප්පමාණාරම්මණොති තත්‍ථ යො සමාධි අප්පගුණො උපරිඣානස්ස පච්චයො භවිතුං නසක්කොති අයං පරිත්තො යො පන අවඩ්ඪිතෙ ආරම්මණෙ පවත්තො අයං පරිත්තාරම්මණො යො පගුණො සුභාවිතො උපරි ඣානස්ස පච්චයො භවිතුං සක්කොති අයං අප්පමාණො යොච වඩ්ඪිතෙ ආරම්මණෙ පවත්තො, අයං අප්පමාණාරම්මණො වුත්තලක්ඛණවොමිස්සතා පන වොමිස්සකනයො වෙදිතබ්බොති එවං පරිත්ත පරිත්තාරම්මණාදි වසෙන චතුබ්බිධො.**

( ෂ ¶ )

අප්පනාකොසල්ලන්ති පන අසම්පාදෙන්තස්ස, දශවිධ අර්පණා කෞශල්‍යයන් නොසපයන්නාහට; දන්ධාභිඤ්ඤ හොති, ඤාණයාගේ අවිසදබැවින් ලස්වූ අභිඥවේ; සම්පාදෙන්තස්ස, ඒ දශවිධ අර්පණා කෞශල්‍යයන් සපයන්නාහට; ඛිප්පාභිඤ්ඤ, ඤාණය විසදවනහෙයින් ක්ෂිප්‍රවූ අභිඥවේ; අපිච, අනිකක්හුදු ඇත්; තණ්හාවිජ්ජාවසෙන, තෘෂ්ණා අවිද්‍යා දෙදෙනාගේ අභිභවන අනභිභවන වශයෙන්; සමථ විපස්සනාධිකාර වසෙනවාපි, සමථ විදර්ශනාවෙහි අභියොග වශයෙන්ද; එතාසං, මොවුන්ගේ; පභෙදො, වෙදිතබ්බො, ප්‍රභෙදය දතයුත්තේයි. තණ්හාභිභූතස්ස, වැඩිසිටි තෘෂ්ණා ඇත්තාහුට (තෘෂ්ණාධිකයහට යයි සේයි) දුක්ඛාපටිපදාහොති, තෘෂ්ණාව සමාධි

යට සෘජුප්‍රතිපක්‍ෂබැවින්) දුක්වූ ප්‍රතිපදාහිවේ; අනභිභූතස්ස, මැඩිසිට තෘෂ්ණාතැතනාහාබැවි; සුඛා, සුවවේ; අවිජ්ජාභිභූතස්ස, මැඩිසිටි අවිද්‍යා ඇත්තාහට; දන්ධාභිඤ්ඤාහොති (අවිද්‍යාව ප්‍රඥාවට සෘජුප්‍රතිපක්‍ෂබැවින්) ලස්වූ අභිඥාවෙයි; අනභිභූතස්ස, මැඩිසිටි අවිද්‍යානැත්තාහට; ඛිප්පා, සැණිනුවූ අභිඥාවෙයි; යොච, යමෙක් වනාහි; සමථෙ අකතාධිකාරො, සමථයෙහි(භාවනාතාරයෙහි) නොකරණලද පරිචයඇත්තේද (සත්තයෙහි ඉක්බිති ජනියෙහි නොකළ අභියොග ඇත්තේදයි කීනු) තස්ස, ඔහුට; දුක්ඛා පටිපදාහොති, දුඃඛ ප්‍රතිපදාහිවේ; කතාධිකාරස්ස (භාවනාතාරයෙහි) කරණලද පරිචය ඇත්තාහට; සුඛා, සුවවේ; යො පන, යමෙක් වනාහි; විපස්සනාය අකතාධිකාරොහොති, විදර්ශනාවෙහි (භාවනාතාරයෙහි) නොකරණලද පරිචය ඇත්තේවීනම්; තස්ස, ඔහුට; දන්ධාභිඤ්ඤාහොති, ලස්වූ අභිඥාවේ; කතාධිකාරස්ස, කරණලද පරිචය ඇත්තාහට; ඛිප්පා, සැණිනුවූ අභිඥාවේ; කිලෙසින්ද්‍රියවසෙන චාපි (තික්ෂ්ණා තීක්ෂ්ණ) කෙලශයන්හා ඉන්ද්‍රියයන්ගේ වශයෙන්ද; එතාසං, මේ ප්‍රතිපදාභිඥාවන්ගේ; භෙදො වෙදිතබ්බො, භෙදය දතයුත්තේයි; තිබ්බකිලෙසස්ස හි, තිව්‍රවූ තෘෂ්ණාදි කෙලෙශයන් ඇති; මුදින්ද්‍රියස්ස, මෘදුවූ ශ්‍රද්ධාදි ඉන්ද්‍රියයන් ඇත්තාහට; දුක්ඛා පටිපදාහොති, දුඃඛවූ ප්‍රතිපදාහිවේ; දන්ධාච අභිඤ්ඤා, ලස්වූ අභිඥාදවේ; තික්ඛින්ද්‍රියස්ස පන, තීක්ෂ්ණවූ ඉන්ද්‍රියයන් ඇත්තාහට වනාහි; ඛිප්පාභිඤ්ඤා, සැණිනුවූ අභිඥාවේ; මන්දකිලෙසස්ස මුදින්ද්‍රියස්සච, මඳවූ කෙලෙසුන් ඇති මෘදුවූ ඉඳුරන් ඇත්තාහටද; සුඛා පටිපදාහොති, සුවවූ ප්‍රතිපදාවෙයි; දන්ධා ච අභිඤ්ඤා, ලස්වූ අභිඥාදවේ; තික්ඛින්ද්‍රියස්ස පන, තීක්ෂ්ණවූ ඉන්ද්‍රියයන්ඇත්තාහට වනාහි; ඛිප්පාභිඤ්ඤා, සැණිනුවූ අභිඥාවෙයි; ඉති, මෙසේ; ඉමාසු පටිපදාභිඤ්ඤාසු, මේ ප්‍රතිපදාභිඥාවන්කෙරෙහි; යො පුග්ගලො, යම්පුද්ගලයෙක්තෙමේ; දුක්ඛාය පටිපදාය, දුඃඛ ප්‍රතිපත්තියෙන්ද; දන්ධායච අභිඤ්ඤාය, ලස්වූ අභිඥාවෙන්ද; සමාධිං පාපුණාති, සමාධියට පැමිණේද; තස්ස, ඔහුගේ; සො සමාධි, ඒ සමාධිය; දුක්ඛාපටිපදො, දුක්වූ පිළිවෙත් ඇත්තේය; දන්ධාභිඤ්ඤොති, ලස්වූ අභිඥා ඇත්තේයයි; වුච්චති, කියනුලැබේයි; එසනයො සෙසත්තයෙපිති, දුක්ඛාපටිපදො ඛිප්පාභිඤ්ඤො යනාදි සෙසුතුනෙහිදු මෙම නයයි; එවං, මෙසේ; දුක්ඛා පටිපදා දන්ධාභිඤ්ඤාදිවසෙන, දුක්ඛාපටිපදා දන්ධාභිඤ්ඤාදි වශයෙන්; චතුබ්බිධො, සතර ප්‍රකාරවේ.

දුතිය චතුක්කො, දෙවන චතුෂ්කයෙහි; පරිත්තො, අප්‍රගුණවූ; පරිත්තාරම්මණො, නොවැඩූ අරමුණු ඇති (“සමාධි අඞ්ග” යොදනු-සමාධියෙක් ඇත යන අර්ථයි මතුයෙහිදු මෙම නයයි) අප්පමාණො, මහත්වූ (සුභාවිතවූ යන අර්ථයි) අප්පමාණාරම්මණො, වැඩූ අරමුණු ඇති ... පෙ ... තාව්, ඒ චතුෂ්කයෙහි; යො සමාධි, යම් සමාධියෙක්; අප්පගුණො, මනාකොට නොවඩනලද්දේ (මනාකොට නොපුරුදුවනලද්දේයයි සේයි) උපරිඣානස්ස පච්චයො භවිතුං න සක්කොති, මතුයෙහි ධ්‍යානයකට ප්‍රත්‍යයවන්නට නොපොහොසද්ද; අයං මේ සමාධි තෙමේ; පරිත්තො, අල්පානුභාව බැවින් පරිත්තනමිවේ; අවඩ්ඪිත (අඞ්ගුලක් දෙඅඟුලක් පමණද) නොවඩනලද පිළිණු අරමුණෙහි (අඟුලක් දෙඅඟුලකුදු වැඩි අරමුණෙහි අප්‍රමාණයයිම යෙන් “පගුණො සුභාවිතො”යි කියා නැවත “උපරිඣානස්ස පච්චයො භවි

ණං හොතී"යි යන මෙයින් ප්‍රගුණවූද සමාධිතෙමේ මත්තෙහි ධ්‍යානයට ප්‍රත්‍යයවන්නට අසමර්ථවූයේ පරීත්තනම්වේද අප්‍රමාණනම්නොවේද එසේම ගුණාභ්‍යාසයෙහිනු එක අස්නෙතීම හිද මතුයෙහි ධ්‍යානයන් උපදවන කල්හි නාහි සුභාවිතවූ සමාධිතෙමේ මතුයෙහි ධ්‍යානයට ප්‍රත්‍යයභාවසඞ්ඛ්‍යාත සුභාවිත භාවය සිද්ධියෙන් අප්‍රමාණයයිම කියනුලැබේ සමහරු වනාහි ඉදින් සුභාවිතවීනම් මතුයෙහි ධ්‍යානයට ප්‍රත්‍යය නොවන්නේද ප්‍රමාණකර රාගාදීන්ට අභිදූර බැවින් අප්‍රමාණනම්වෙයි සේයි) යො, යම් සමාධියක්තෙමෙ; පගුණො, ප්‍රගුණද; සුභාවිතො, මනාකොට බවනලදද; උපරිඣානස්ස පච්චයො භවිතුං සක්කොති, මතුයෙහි ධ්‍යානයට ප්‍රත්‍යයවන්නට පොහොසද්ද; අයං, මේ සමාධිය; අප්පමාණො, අප්‍රමාණ නම; ඉයාව, යමෙක් වනාහි; වඩ්ඪිතෙ ආරම්මණෙ පවත්තො, වැඩූ ආරම්මණෙහි ප්‍රවෘත්තද; අයං, මේ සමාධිය; අප්පමාණාරම්මණො, අප්‍රමාණාරම්මණ නම්; වුත්තලක්ඛණවොමිස්සතාය පන, ප්‍රථම චතුෂ්ට සමාධීන්ට කියනලද ලක්ෂණයන්ගේ ව්‍යාමිශ්‍ර නයින් වනාහි; වොමිස්සකනයො වෙදිතබ්බො, විතීය තෘතීය සමාධි සඞ්ග්‍රාහකවූ ව්‍යාමිශ්‍රනය දතයුතු; එවං, මෙසේ; පරිත්ත පරිත්තාරම්මණාදි වසෙන, පරිත්ත පරිත්තාරම්මණාදී වශයෙන්; චතුක්කො, චතුර්විධවේ.

( භා ¶ )

තවද දශවිධ අපිණා කෞසල්‍යයන් නොසපයා භාවනාකරන්නාහටද අප්‍රකටවූ අභිඥවන්නිය ඒ දශවිධ අපිණා කෞශල්‍යයන් සපයන්නාහට නිපුණවූ අභිඥවන්නිය තවද තෘෂ්ණා අවිද්‍යා දෙදෙනාගේ මැඩපැවැත්වීමය උත්සන්නභාවය යන දෙයාකාරයෙන්ද සමථ විදර්ශනායෙහි පූර්වාභිවාසනා වශයෙන්ද මොවුන්ගේ ප්‍රභෙදද දතයුත්තේය. ඒ කෙසේදයත්? තෘෂ්ණාධිකයාහට තෘෂ්ණාව සමාධියට විරුද්ධබැවින් දුක්වූ ප්‍රතිපත්තිවන්නීය මැඩපැවැත්වූ තෘෂ්ණා ඇත්තාහට සුවවූ ප්‍රතිපත්තිවන්නිය අවිද්‍යාධිකයාහට අවිද්‍යාව ප්‍රඥවට විරුද්ධහෙයින් අප්‍රකටවූ අභිඥවන්නීය මැඩපැවැත්වූ අවිද්‍යා ඇත්තාහට නිපුණවූ අභිඥවන්නීය යම් යොගාවචරයෙක් තෙම පෙර ජාතියෙහි සමථභාවනා පුරුදුනොකෙළේවේද ඔහට දුක්වූ ප්‍රතිපත්තිවන්නීය පෙරජාතියෙහි කරණලද පරිචය ඇත්තාහට සුවවූ ප්‍රතිපත්තිවන්නීය යමෙක් වනාහි පෙරජාතියෙහි විදර්ශනාභාවනාව පුරුදුනොකෙළේද ඔහට අප්‍රකටවූ අභිඥවන්නීය කරණලද පරිචය ඇත්තාහට නිපුණවූ අභිඥවන්නීය ක්ලේශයන්ගේද ඉන්ද්‍රියයන්ගේද වශයෙනුත් මොවුන්ගේ ප්‍රභෙද දතයුතුයි.

ඒ කෙසේදයත්? තියුණුවූ රාගාදී ක්ලේශභා ඇතිවූ ශ්‍රද්ධාදී ඉන්ද්‍රියයන් ඇත්තාහටද දුක්වූ ප්‍රතිපත්තිවන්නීය අප්‍රකටවූ අභිඥද වන්නීය එම ඉන්ද්‍රියයන් තියුණුවූවාහට නිපුණවූ අභිඥවන්නීය මඳවූ ක්ලේශයා මෘදුවූ ඉන්ද්‍රියන් ඇත්තාහටද සුවවූ ප්‍රතිපත්තිවන්නීය අප්‍රකටවූ අභිඥවන්නීය තීක්ෂණවූ එම ඉන්ද්‍රියන් ඇත්තාහට නිපුණවූ අභිඥවන්නීය මෙසේ මේ ප්‍රතිපත්ති අභිඥවන් අතුරෙන් යම් පුද්ගලයෙක්තෙමේ දුක්වූ ප්‍රතිපත්තියෙන්ද අප්‍රකටවූ අභිඥවෙන්ද සමාධියට පැමිණියේවේද ඔහුගේ ඒ සමාධිය දුක්වූ පිළිවෙත්හා අප්‍රකටවූ අභිඥද ඇත්තේයයි කියනුලැබේ සෙසු තුන් තන්හිද මේම ක්‍රමය දතයුතුයි.

මෙසේ දුක්ඛාපටිපදා දන්ධාභිඤ්ඤාදි වශයෙන් සමාධිය සතරාකාර වන්නේයි.

දෙවනචතුෂ්කයෙහිලා නුපුරුදුවූ නොවැඩූ අරමුණුඇති සමාධියෙක්ද ඇත්තේය පුරුදුවූ වැඩූ අරමුණුඇති සමාධියෙක්ද ඇත්තේය මහාතොව පුරුදුකරණලද නොවැඩූ අරමුණු ඇති සමාධියෙක්ද ඇත්තේය මහාතොව පුරුදුකරණලද වැඩූ අරමුණු ඇති සමාධියෙක්ද ඇත්තේයි. ඒ චතුෂ්කයෙහි යම් සමාධියෙක් වසඟබවට නොපමුණුවනලද්දේද එද මතු ධ්‍යානයන්ට උපකාරවන්නට අසමර්ථවේද මේසමාධිය අල්පානුභාව ඇති හෙයින් පරිත්තනම්. යම් සමාධියෙක් මහාතොව නොවැඩූ අරමුණෙහි පැවැත්තේද ඒ සමාධිය පරිත්තාරම්මණ සමාධිනම් යම් සමාධියෙක් මහාතොව පුරුදුකරණලද්දේද එද මතු ධ්‍යානයන්ට උපකාරවීමට සමර්ථවේද [illegible] යම් සමාධියෙක් මහාතොව වැඩූ අරමුණෙහි පැවැත්තේද මේ සමාධිය අප්‍රමාණාරම්මණසමාධිනම්. එසේම පළමුවන සතරවන සමාධින්ට කීලක්ෂණයන්ගේ මිශ්‍රවීමෙන් ව්‍යාමිශ්‍රනයද දතයුතුයි. මෙසේ පරිත්තපරිත්තාරම්මණාදිවශයෙන් සමාධිය සතරාකාර වන්නේයි —

( ග * )

තතියචතුක්කෙ වික්ඛම්භිතනීවරණානං විතක්කවිචාර පීතිසුඛසමාධීනං වසෙන පඤ්චඞ්ගිකං පඨමං ඣානං තතො වූපසන්තවිතක්කවිචාරං චතුරඞ්ගිකං දුතියං — තතො විරත්තපීතිකං දුවඞ්ගිකං තතියං — තතො පහීණ සුඛ උපෙක්ඛාවෙදනාසහිතස්ස සමාධිනො වසෙන දුවඞ්ගිකං චතුත්ථං ඉති ඉමෙසං චතුන්නං ඣානානං අඞ්ගභූතා චත්තාරො සමාධී හොන්ති එවං චතුක්කජ්ඣානඞ්ගවසෙන චතුබ්බිධො — චතුත්ථචතුක්කෙ අත්ථි සමාධි හානභාගියො අත්ථි ඨිතිභාගියො අත්ථි විසෙසභාගියො අත්ථි නිබ්බෙධභාගියො — තත්ථ පච්චනීකසමුදාචාරවසෙන හානභාගියතා තදනුධම්මාය සතියා සණ්ඨානවසෙන ඨිතිභාගියතා උපරි විසෙසාධිගමවසෙන විසෙසභාගියතා — නිබ්බිදාසහගතසඤ්ඤාමනසිකාරසමුදාචාරවසෙන නිබ්බෙධභාගියතා ච වෙදිතබ්බා — යථාහ පඨමස්ස ඣානස්ස ලාභිනො කාමසහගතසඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති හානභාගිනී පඤ්ඤා — තදනුධම්මතා සති සන්තිට්ඨති ඨිතිභාගිනී පඤ්ඤා අවිතක්කසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති විසෙසභාගිනී පඤ්ඤා — නිබ්බිදාසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති විරාගූපසංහිතා නිබ්බෙධභාගිනී පඤ්ඤාති තාය පන පඤ්ඤාය සම්පයුත්තා සමාධීපි චත්තාරො හොන්තීති — එවං හානභාගියාදිවසෙන චතුබ්බිධො —

( ඝ * )

තතියචතුක්කෙ, තෘතියචතුෂ්කයෙහි; වික්ඛම්භිතනීවරණානං, විෂ්කම්භනයකරණලද නීවරණයන්ඇති; විතක්කවිචාරපීතිසුඛසමාධීනං වසෙන, විතර්ක විචාර ප්‍රීතිසුඛසමාධීන්ගේ වශයෙන්; පඤ්චඞ්ගිකං, පංචාඞ්ගයක්ඇති; පඨමංඣානං, ප්‍රථමධ්‍යානය; තතො, ඒ ප්‍රථමධ්‍යානයෙන් ඉක්බිතිවූ, වූපසන්තවිතක්කවිචාරං, සන්හුන්නාවූ විතර්කවිචාරයන්ඇති; චතුරඞ්ගිකං, සතරඅඟක්ඇති; දුතියං; ද්විතීයධ්‍යානයයි; තතො, ඉන්බින්තෙන්; විරත්තපීතිකං, විරක්තවූ (අතික්‍රාන්තවූ) ප්‍රීතිඇති; දුව

ඩගිකං, දෙයගක් ඇති; තතියං, තුන්වන ධ්‍යානය; භවෙතා, එසින්; පහීණසුඛ, ප්‍රහීණවූ සුඛවේදනා ඇති; උපෙක්ඛාවෙදනා සහිතස්ස සමාධිනොවශෙන, උපෙක්ෂාවේදනාසහිතවූ සමාධිහුගේ වශයෙන්; දුවඩගිකං චතුත්ථං, දෙයගක් ඇති සතරවන ධ්‍යානය යි; ඉති, මෙසේ; ඉමෙසං චතුන්නං ඣානානං අඩගභූතා (සෙනාඩගාය රථාඩගය යනුමෙන්) සතරධ්‍යානයන්ට අඩගවූ; චත්තාරො සමාධි හොන්ති, සතරසමාධිහුවෙත්; එවං, මෙසේ; චතුක්කඣානඩගවසෙන, සතරධ්‍යානයට අඩගවශයෙන්; චතුබ්බිධො, චතුර්විධවේ; හානභාගියො, පරිහාණිය සෙවිනාවූ; ඨිතිභාගියො, ස්ථිතියසෙවිනාවූ; විසෙසභාගියො, විශෙෂය සෙවිනාවූ; නිබ්බෙධභාගියො, නිර්වේධයසෙවිනාවූ; තත්‍ථ, ඒ චතුර්විධනයෙහි; පච්චනීක සමුදාචාරවසෙන, ඒ ඒ ධ්‍යානයට ප්‍රතිපක්ෂවූ නීවරණවිතර්කවිචාරාදීන්ගේ ප්‍රවෘත්ති වශයෙන්; හානභාගියතා, හානභාගියබව ("වෙදිතබ්බා"යි යොදනු) තදනුධම්මතාය සතියා, තදනුරූපවූ ස්මෘතියගේ; සණ්ඨානවසෙන, පිහිටීම් වශයෙන්; ඨිතිභාගියතා, ස්ථිතිභාගියබව (ස්මෘතිනම් ඒ ඒ ධ්‍යානයට නිසිවූ ධ්‍යානනිකාන්ති තෘෂ්ණා වෙයි "තදනුධම්ම සම්පයුත්තකඛන්ධ සහිතා මිච්ඡාසති" යනු විභඞ්ගඅටුවායි ටීකාචාර්යයෝ ලද්ධ්‍යානයෙහි සාපෙක්ෂයා මතුයෙහි විශෙෂාධිගමයට නොපෝසත්වනබැවින් අභිනතවූනිකාන්ති ඇති තද්තද් ධ්‍යානපරිහරණයකරණ ස්මෘතියම සතියයි දක්වියත්වේ එහෙයින්ම "සතියාවා," "නිකන්තියාවා" යන විකල්පවචනයද යුක්තවෙයි යෙන්) උපරිවිසෙසාධිගමවසෙන, මතුයෙහි (විශෙෂාධිගමයට ප්‍රත්‍යය භාවවශයෙන් (විශෙෂභාගියබව නොහොත් "විසෙසං වා අධිගච්ඡන්ති එතෙනාති විසෙසාධිගමො තස්ස වසෙන"යි ගන්නේ) නිබ්බිදාසහගත සඤ්ඤාමනසිකාර වසෙන; ආදීනවදර්ශනය පෙරදැරිකොට ඇති නිර්වේදයුතසම්ප්‍රයුක්ත සංඥාමනස්කාරයන්ගේ ප්‍රවෘත්තිවශයෙන් (සංඥාවශයෙන් ජවන්සිත්ගත් මනසිකාරයනුයෙන් ජවනයටපෙර අවජ්ජන්සිත්ගත්හු) නිබ්බෙධභාගියතා ච වෙදිතබ්බා, නිර්වේධභාගියබවද දතයුතු (සත්‍යනිර්වේධයහෙවත් ප්‍රතිවේධය කරණ විදර්ශනාවට කාරණහෙයින් නිර්වේධභාගී බව දතයුතුයයි යෙස් යි )

යථාහ, වදාළේමැනු; පඨමස්ස ඣානස්ස ලාභිනො, ප්‍රථමධ්‍යානලාභීහට; කාමසහගතසඤ්ඤා මනසිකාරා සමුදාචරන්ති, කාමඡන්දයෙන් කාමාලම්බණවූ සංඥාමනස්කාරයෝ පවතිත් නම්; හානභාගිනීපඤ්ඤා, පරිහානිය සෙවුනා ප්‍රඥාවේ; තදනුධම්මතා සති සන්තිට්ඨති, තදනුරූපවූ ස්මෘතිය සිටී නම්; ඨිතිභාගිනීපඤ්ඤා, ස්ථිතිය සෙවුනා ප්‍රඥාවේ, අවිතක්කාසහගතා සඤ්ඤා මනසිකාරා සමුදාචරන්ති (විතර්කසහගත ධ්‍යානය නොසේවෙදෙ හෝ සිමව සේ) අවිතර්කාලම්බණවූ සංඥමනස්කාරයෝ පවතිත් නම්, විසෙසභාගිනීපඤ්ඤා හොති, මතුයෙහි විශෙෂය සෙවුනාවූ ප්‍රඥාවේ; නිබ්බිදා සහගතා, නිර්වේදසහගතවූ; සඤ්ඤා මනසිකාරා, සංඥා මනස්කාරයෝ, විරාගූපසංහිතා, බලවත් විදර්ශනාව හා යුක්තවූවාහු; සමුදාචරන්ති, පවතිත් නම්; නිබ්බෙධභාගිනී පඤ්ඤාහි, නිර්වේධයසෙවුනා ප්‍රඥාවේ; තාය පඤ්ඤාය සම්පයුත්තා, ඒ ප්‍රඥාව හා සැපියුතුවූ; සමාධි පි, සමාධීහු; චත්තාරො, සතරදෙනෙක්ම වෙත් —

( හා * )

ඉන්වන චතුෂ්කයෙහි නවත්වහලද පචනීවරණධර්‍ම ඇත්තාවූ විතර්‍කය විචාරය ප්‍රීතිය සුඛය සමාධිය යන අඞ්ගපසක්ඇති ප්‍රථමධ්‍යානය ඊට ඉක්බිතිව සංහුන් විතර්‍කවිචාරඇත්තාවූ අඞ්ගතුණක්ඇති විතීයධ්‍යානය ඊට ඉක්බිතිව ඉක්මුනාවූ ප්‍රීතිඇති අඞ්ගව යන්ඇති තුන්වනධ්‍යානය ඉන්මතු ප්‍රහීණවූ සුඛවෙදනාඇති උපෙක්‍ෂාවෙදනායුක්ත සමාධිහුගේ වශයෙන්දෙයගක් ඇති සතරවන ධ්‍යානය මෙසේ මේ සතරධ්‍යානයන්ට අඞ්ගවූ සමාධිහු සතරදෙනෙක් වෙත් මෙසේ සතරධ්‍යානාඞ්ගයන්ගේ වශයෙන් සතරකාර වන්නේසි. සතරවන චතුෂ්කයෙහි පිරිහීම සෙවුනාවූ සමාධියෙක්ද ඇත්තේය සිටීම හෝ නැවත්ම සෙවුනාවූ සමාධියෙක්ද ඇත්තේය විශෙෂභාගියක් සෙවුනාවූ සමාධියෙක්ද ඇත්තේය නිබ්බිදනුපස්සනාව සෙවුනාවූ සමාධියෙක්ද ඇත්තේය ඒ සතරදෙනා අතුරෙන් ඒ ඒ ධ්‍යානයට විරුද්ධවූ නීවරණ විතර්‍ක විචාරාදීන්ගේ පැවැත්ම වශයෙන් සමාධිහුගේ විනාශය සෙවුනාබව දතයුතුයි. ඒ ඒ ධ්‍යානයට සුදුසුවූ සමාධිය පිහිටුවීම් වශයෙන් සිටීම සෙවුනාබව දතයුතුයි. ඒ ධ්‍යානයෙන් මත්තෙහි මාර්‍ගඵලාධිගමලාභීම්වශයෙන් විශෙෂ සෙවුනාබව දතයුතුයි නිබ්බිදනුපස්සනාඥාණයද එක්ව යෙදුනාවූ සංඥමනසකාරදෙදෙනාගේ වශයෙන් නොහොත් එම්වීථියෙහි ජවන්සිත් හා ආවර්ජන චිත්තයාගේ වශයෙන් නිර්වේධය හෙවත් නිර්‍වාණාවබොධය සෙවුනාබවද දතයුතුයි. එහෙයින් වදාළේමැයි.

ප්‍රථමධ්‍යානලාභීහට කාමාස්වාදයෙන් කාමය අරමුණුකොටඇති සංඥමනසකාරයෝ හෙවත් ජවනාවර්ජනයෝ පවතිත්නම් ඒ ධ්‍යානප්‍රඥව පිරිහීම සෙවුනානම් වේ. ඒ ප්‍රථමධ්‍යානලාභියාහට ඒ ධ්‍යානයට සුදුසුවූ ස්මෘතිය පිහිටුවානම් ඒ ධ්‍යානප්‍රඥව සිටීම සෙවුනානම්වේ අවිතර්‍කවූ විතීයධ්‍යානය කෙසේ උපදවන්නෙම්දෝ හෝයි අවිතර්‍කාලම්බණවූ සංඥමනස්කාරයෝ හෙවත් ජවනාවර්ජනයෝ පවතිත්නම් ඒ ධ්‍යානප්‍රඥව මතුධ්‍යානාධිගමයට ආසන්නකාරණා වනබැවින් විශෙෂ සෙවුනානම්වේ එම ප්‍රථමධ්‍යානලාභිහුගේ සහාය ප්‍රතිවෙධ සහ ගියාවූ සංඥමනසකාරයෝ බලවත් විදර්ශනාවහා යුක්තවූවාහුනම් ඒ ධ්‍යානප්‍රඥව නිර්වේධය සෙවුනා නම් වේනුයි ඒ ප්‍රඥව හා සම්ප්‍රයුක්තවූ සමාධියද සතරකාර වන්නේසි. මෙසේ මේ සමාධිය හානභාගියාදිවශයෙන් සතරකාර වන්නේසි —

( පා † )

පඤ්චමචතුක්කෙ කාමාවචරො සමාධි — රූපාවචරො — අරූපාවචරො — අපරියාපන්නොති එවං චත්තාරො සමාධි — තත්‍ථ සබ්බාපි උපචාරෙකග්ගතා කාමාවචරසමාධි රූපාවචරාදි කුසලචිත්තෙකග්ගතා ඉතරෙ තයොති — එවං කාමාවචරාදිවසෙන චතුබ්බිධො — ඡන්දචතුක්කෙ ඡන්දඤ්චෙ භික්ඛු අධිපතිංකරිත්වා ලභති සමාධිං ලභති චිත්තස්ස එකග්ගතං අයං වුච්චති ඡන්දසමාධි — විරියඤ්චෙ භික්ඛු — පෙ — චිත්තඤ්චෙ භික්ඛු — වීමංසඤ්චෙ භික්ඛු අධිපතිං කරිත්වා ලභති සමාධිං ලභති චිත්තස්ස එකග්ගතං අයං වුච්චති වීමංසා සමාධීති එවං අධිපතිවසෙන චතුබ්බිධො — පඤ්චකෙ යං චතුක්කභෙදෙ වුත්තං දුතියජ්ඣානං තං විතක්කමත්තාතික්කමෙන දුතියං විතක්කවිචාරාතික්කමෙන තතියං කත්වා

එවං විධා භින්දිත්වා පඤ්චජ්ඣානානි වෙදිතබ්බානි තෙසං අඞ්ගභූතා පඤ්චසමාධිති එවං පඤ්චජ්ඣානඞ්ගවසෙන පඤ්චවිධතා වෙදිතබ්බා.

( ස † )

කාමාවචරො සමාධි, කාමාවචර සමාධිය; රූපාවචරො, රූපාවචරසමාධිය; අරූපාවචරො, අරූපාවචරසමාධිය; අපරියාපන්නොති, ලොකොත්තරසමාධියයි; එවං මෙසේ; චතුක්කෙරුසමාධි, සතරසමාධිකොට්ඨාසක්වෙත්, තත්ථ, එහි; සබ්බා පි උපචාරෙකග්ගතා, සියලු උපචාරධ්‍යානයෙහි එකාග්‍රතාතොමෝ; කාමාවචරො සමාධි, කාමාවචර සමාධිනමි (සෙසු කාමාවචරසමාධිඅදහදයෝ මෙහි භාවනාමය සමාධීහු අභිමතබැවින් "උපචාරෙකග්ගතා කාමාවචරො සමාධි"කීහු) රූපාවචරාදි කුසල චිත්තෙකග්ගතා, රූපාවචරාදිවූ කුශල චිත්තෙකාග්‍රතා තොමෝ; ඉතරෙ තයොති, රූපාවචර අරූපාවචර අපරියාපන්න සමාධිහු තුන්දෙනයයි; කාමාවචරාදි වසෙන චතුබ්බිධො, කාමාවචරාදි විසින් සතර ප්‍රකාරවේ; භික්ඛු, මහණ තෙමේ, චෙ, ඉදින්; ඡන්දං, ඡන්දය; අධිපතිං කරිත්වා, ඡන්දවත්හට සමාධිචේතනව මටම වත්තේයයි ඡන්දය ජ්‍යෙෂ්ඨකොට; සමාධිං පටිලභති, සමාධිය ලැබේනම්; ලභති චිත්තස්සෙකග්ගතං, චිත්තෙකාග්‍රතාවලැබේනම්; අයං, මේ තෙමේ; ඡන්දසමාධීති වුච්චති; ඡන්දාධිපතිසමාධියයිකියනු ලැබේ...පෙ...වීමංසං, ප්‍රඥාව...පෙ...චතුක්කභෙදෙ, චතුෂ්කවශයෙන් සමාධිප්‍රභෙද නිර්දේශයෙහි; යං දුතියජ්ඣානං වුත්තං, යම් දෙවනධ්‍යානයෙක් කියනලදද; තං, ඒ; විතක්කමත්තාතික්කමෙන, විතර්කමාත්‍රයාගේ ඉක්මීමෙන්; දුතියං, විතීය නම් වෙයි; විතක්කවිචාරාතික්කමෙන තතියං, විතර්කවිචාරයෝ ඉක්මීමෙන් තෘතීයනම් වෙයි; එවං, මෙසේ; විධා භින්දිත්වා, දෙකක්කොට බිඳ; පඤ්චජ්ඣානානි වෙදිතබ්බානි, පඤ්චධ්‍යානයෝ දත යුත්තාහුයි (සෙසුතැන්හි සම්ප්‍රයොගවශයෙන් විචාරය හා සමග පවත්නාවූ විතර්කය පඤ්චකනයෙහි ද්විතීයධ්‍යානයෙහි වෙන්කරණලදුයේ ද සුට්ඨුවිභෙජිත නොවේනුයි ඔහු හා සමගම විචාරසමතික්‍රමනය දක්වනපිණිස "තතිය විචාරාතික්කමෙන" කීහයි දත්තෝ) තෙසං අඞ්ගභූතා පඤ්චසමාධීහිව, පඤ්චධ්‍යානයන්ට අඞ්ගවූ පස සමාධිහයි; එවං, මෙසේ පඤ්චධ්‍යානයන්ට අඞ්ගභාවවසයෙන්; පඤ්චවිධතා, සමාධිහුගේ පඤ්චවිධ බව; වෙදිතබ්බා, දතයුතු.

( හා † )

පස්වෙනි චතුෂ්කයෙහිලා කාමාවචරසමාධිය රූපාවචර සමාධිය අරූපාවචරසමාධිය ලොකොත්තරසමාධියයි සතරකාරවන්නේයි ඒ සතර දෙනාඅතුරෙන් සියලුඋපචාරධ්‍යාන චිත්තය හා සම්ප්‍රයුක්තවූ එකාග්‍රතාචෛතසිකය කාමාවචරසමාධි නම් රූපාවචරධ්‍යාන සිත හා යුක්තවූ එකාග්‍රතාව රූපාවචර සමාධිනම් අරූපාවචරධ්‍යානසිත හා සම්ප්‍රයුක්තවූ එකාග්‍රතාව අරූපාවචරසමාධි නම් ලොකොත්තරධ්‍යානසිත හා යුක්තවූ එකාග්‍රතාව ලොකොත්තරසමාධි නම් මෙසේ සමාධිය කාමාවචරාදිවශයෙන් සතරකාරවන්නේයි. ඡන්දචතුෂ්කයෙහිලා ඉදින් යම්මහණෙක් ඡන්දය අධිපතිකොටගෙණ යම්සමාධියක් සිත්එකඟබවක් ලබාද මේ ඡන්දසමාධියයි කියනුලැබේ. ඉදින් යම්මහ

හණෙක් වීය්‍ර්‍යය අධිපති කොට ගෙණ යම් සමාධියක් සිත්එකඟ බවක් ලබා ද මේ වීය්‍ර්‍යසමාධිය කියනුලැබේ යම් මහණෙක් සිත අධිපති කොට ගෙණ යම් සමාධියක් සිතඑකඟ බවක් ලබා ද මේ චිත්තසමාධිය කියනු ලැබේ යම්මහණෙක් ප්‍රඥාව අධිපති කොට ගෙණ යම් සමාධියක් සිත්එකඟ බවක් ලබා ද මෙ වීමංසාසමාධිය කියනුලැබේ මෙසේ සමාධිය අධිපති ධර්‍මවශයෙන් සතරාකාර වන්නේයි. පඤ්චකක්‍රමයෙහිලා චතුෂ්ක වශයෙන් දක්වූ ප්‍රභෙදයෙහි යම් ද්විතීයධ්‍යාන යක් කීයනලදද ඒ ධ්‍යානය විතර්ක මාත්‍රයක් ඉක්මීම්වශයෙන් ද්විතීයධ්‍යා නනාමී වෙයි විතර්කවිචාර දෙකෙදනාගේ ඉක්මීමෙන් තෘතීයධ්‍යාන නම් වෙයි මෙසේ දෙකක් කොට බිඳ පඤ්චධ්‍යාන යෝ දතයුත්තානුයි ඒ පඤ්චධ්‍යානය න්ට අභිනවූ විතර්කාදි පඤ්චකය සමාධි නාම වෙන්නුයි මෙසේ පඤ්චධ්‍යානාඞ්ග යන්ගේ වශයෙන් පඤ්චවිධප්‍රකාරබව දතයුත්තානුයි.~

( පා † )

කොචස්ස සංකිලෙසො කිං වොදානන්ති එත්ථ පන විස්සජ්ජනං විභඞ්ගෙ වුත්තමෙව වුත්තංහි තත්ථ සංකිලෙසන්ති හාණභාගියො ධම්මො ~වොදානන්ති විසෙසභාගියො ධම්මොති~තත්ථ පඨමස්ස ඣානස්ස ලාභිං කාමසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති හාණභාගිනී පඤ්ඤාති ඉමිනා නයෙන හාණභාගියො ධම්මො වෙදිතබ්බො~අවිතක්කසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති විසෙසභාගියො ධම්මොති වෙදිතබ්බො~ඨානං භාවෙතබ්බොති එත්ථ පන යො තාව අයං ලොකියලොකුත්තරවසෙන දුවිධොති ආදිසු අරියමග්ගසම්පයුත්තතා සමාධි වුත්තො තස්ස භාවනානයො පඤ්ඤාභාවනානයෙනෙව සඞ්ගහිතො පඤ්ඤාය භාවිතාය සො භාවිතො හොති පන්තස්මා තං සන්ධාය එවං භාවෙතබ්බොති නකිඤ්චි විසුංවදාම යො පන ලොකියො සො වුත්තනයෙන සීලානි විසොධෙත්වා සුපරිසුද්ධෙ සීලෙ පතිට්ඨිතෙන යවාස්ස දසසු පලිබොධෙසු පලිබොධො අත්ථි තං උපච්ඡින්දිත්වා කම්මට්ඨානදායකං කල්‍යාණමිත්තං උපසඞ්කමිත්වා අත්තනො චරියානුකූලං චත්තාලීසාය කම්මට්ඨානෙසු අඤ්ඤතරං කම්මට්ඨානං ගහෙත්වා සමාධිභාවනාය අනනුරූපං විහාරං පහාය අනුරූපෙ විහාරෙ විහරන්තෙන ඛුද්දකපලිබොධුපච්ඡෙදං කත්වා සබ්බං භාවනාවිධානං අපරිහාපෙන්තෙන භාවෙතබ්බොති~අයමෙත්ථ සඞ්ඛෙපො~අයං පන විත්ථාරො~

( ස † )

“කොචස්ස සංකිලෙසො කිං වොදානං” යනාමෙහි; විස්සජ්ජනං, විසඳීම; විභඞ්ග, ඣානවිභඞ්ගයෙහි ( “ඣාන සමාධිසමාපත්තිනං සංකිලෙසං වොදානං” යනැතැ ) වුත්තමෙව, කියනලදමැයි; තත්‍ර, ඒ විභඞ්ගයෙහි; වුත්තංහි, කීසේදැනු; සංකිලෙසන්ති, සංකිලෙස නම්; හාණභාගියො ධම්මො, අප්‍රගුණවූ ප්‍රථමධ්‍යානාදීන් හැගිකල්හි කාමාදිවිෂය සංඥමනස්කාරසඞ්ඛ්‍යාත හාණභාගිය ධර්‍මයි; වොදානන්ති, වොදානනම්; විසෙසභාගියොධම්මොති, ප්‍රගුණවූ ප්‍රථමධ්‍යානාදීන් හැගිකල්හි විතීයධ්‍යානාදි විෂයසංඥ මනස්කාර සඞ්ඛ්‍යාත විශෙෂභාගිය ධර්‍මයි ( එහෙයින්ම කීහ; පඨමස්ස ඣානස්ස ලාභිං” යනාදී) තත්ථ, එහි; පඨමස්සඣානස්සලාභිං, අප්‍ර

ගුණවූ ප්‍රථමධ්‍යානලාභීහු; කාමසහගත, අලම්බනවශයෙන් කාමසහගතවූ; සඤ්ඤාමනසිකාරා, සංඥමනස්කාර යන මොහු; සමුදාචරන්ති; චොදනාකෙරෙද්ද (ධ්‍යානයෙන් නැඟිගහු පෙළත්ද යන අර්ථයි (හානභාගිනී පඤ්ඤාහි (කාමියෙහි පවත්නා සංඥමනස්කාරයන්ගේ වශයෙන් (ප්‍රථමධ්‍යාන සංඥතොමේ පිරිහෙන්නිය යි; ඉමිනා නයෙන, මේකාමසහගත සංඥය යනාදී මේ ප්‍රථමධ්‍යානයෙහි කී විධියෙන්; හානභාගියො ධම්මො වෙදිතබ්බො, හානභාගීයධර්මය දත යුතු; අවිතක්කසහගතා, අවිතර්කවූ විතීයධ්‍යාන ආලම්බන වශයෙන් අවිතර්ක සහගතවූ; සඤ්ඤාමනසිකාරා, සංඥමනස්කාරයෝ; සමුදාචරන්ති, ප්‍රගුණවූ ප්‍රථමධ්‍යානයෙන් නැඟිගහු විතීයධ්‍යානාධිගමය පිණිස චොදනා කෙරෙද් ද (පෙළද්ද) විසෙසභාගිනී පඤ්ඤා, විතියධ්‍යානයෙහි පවත්නා සංඥ මනස්කාර වශයෙන් ප්‍රථමධ්‍යාන ප්‍රඥතොමෝ විශෙෂවූ විතීයධ්‍යාන තත්පත්තියට පදස්ථාන බැවින් විශෙෂභාගිනී නම්වේ; ඉමිනා නයෙන, මේ අවිතක්කසහගතා යනාදී ප්‍රථමධ්‍යානයේ කී විධියෙන්; විසෙසභාගියොධම්මො වෙදිතබ්බො, විසෙසභාගීයධර්මය දතයුතු (මෙතන වනාහි සමාධිය අභිප්‍රෙතයයි දතයුතු) සා ඵං භාවෙතබ්බා ති එත්ථ පන, සාඵං භාවෙතබ්බා යන මෙහි වනාහි "ලොකියලොකුත්තරවසෙන දුවිධො" යනාදියෙහි; අරියමග්ගසම්පයුත්තො, ලොකොත්තර අප්‍රමාණ අපරියාපන්න ග්‍රහණයෙන් ලෞකිකයන්හා අසාධාරණ වශයෙන් සප්‍රීතිකාදි ග්‍රහණයෙහි සාධාරණ වශයෙන් "යො අයං අරියමග්ගසම්පයුත්තො සමාධි වුත්තො" යි යොදනු; යම් මේ ආර්‍ය්‍යමාර්‍ගසම්ප්‍රයුක්ත සමාධියෙක් කියනලදද; තස්ස, ඔහුගේ; භාවනානයො, භාවනාවිධිය; පඤ්ඤාභාවනානයෙනෙව සඞ්ගහිතො, පඤ්ඤාභාවනා නයින්ම සඞ්ග්‍රහකරණලද; පඤ්ඤාය භාවිතාය, ප්‍රඥාවබවනලද කල්හි; සො, හේ සමාධිය තෙමේ; භාවිතොව හොති, ප්‍රතිසම්ප්‍රයුක්ත හෙයින් බවන ලද්දේම වේ; තස්මා. එහෙයින්; තං සන්ධාය, ඒ ආර්‍ය්‍යමාර්‍ගී සමාධියසඳහා; එවං භාවෙතබ්බොති, මෙසේ බැවියයුතුයයි; කිඤ්චි, කිසිවක්;විසුං, ප්‍රඥාභාවනායෙන් වෙන්කොට, නොවදම, නොකියමු; යොපනායං ලොකියො, යම් ලෞකිකසමාධියෙක් ඇත්ද; සො, හෙතෙම; වුත්තනයෙන, යටකී නයින්; සීලානි විසොධෙත්වා, සීලයන් පිරිසිදුකොට;

සුපරිසුද්ධෙ සීලෙ පතිට්ඨිතෙන, පිරිසුදුසිල්හි පිහිටියහු විසින් "භාවෙතබ්බො" යි යොදනු; අස්ස, මේයෝගීහුගේ; දසසු පලිබොධෙසු, දශපලිබොධයන් කෙරෙහි; යො අත්ථි, යමෙක් ඇද්ද;තං, හේ; උපච්ඡින්දිත්වා, පසිඳ; කම්මට්ඨානදායකං, කමටහන් දෙන්නාවූ; කල්‍යාණමිත්තං, කල්‍යාණමිත්‍රයාකරා; උපසඞ්කමිත්වා, එළඹ; අත්තනො චරියානුකූලං, තමාගේ චරිතයට අනුකූලවූ; චත්තාලීසාය කම්මට්ඨානෙසු, සතළිස්කමටහනුන් කෙරෙහි; අඤ්ඤතරං කම්මට්ඨානං, එක්තරා කමටහනක්; ගහෙත්වා, ගෙණ; සමාධිභාවනාය, සමාධිභාවනාවට; අනනුරූපං විහාරං පහාය, නොසුදුසු අවලොස්වෙහෙර හැර; අනුරූපෙ විහාරෙ විහරන්තෙන, සුදුසු පසඟින්යුත් වෙහෙර වසන්නහු විසින්: ඛුද්දකපලිබොධුපච්ඡෙදං කත්වා, දික්කෙස් නිය ආදිවූ ක්‍ෂුද්‍රපලිබොධයන් පසිඳ; සබ්බං භාවනාවිධානං

සියලුභාවනාවිධිය; අපරිහාපෙන්තෙ
න, නොපිරිහෙළන්නාහු විසින්; භා
වෙතබ්බානි, වැඩියයුතුයුය යන; අයං
මේ; එසො, මෙහි; සඞ්ඛෙපො, සඞ්
ක්ෂෙපය; අයං පන, මේවනාහි; විත්ථා
රො, විස්තරයි—

( භා • )

ඒ සමාධිහුගේ කෙලසීම කුම
ක්ද පිරිසිදුබව කුමක්ද යන මේ ප්‍රශ්
නාවයෙහි විසඳීම විභඞ්ගප්‍රකරණ
යෙහි ආ ඤාණවිභඞ්ගයෙහි කියනලද්
දේමය එහෙයින් වදාළහ. විභඞ්ග
යෙහි සමාධිහුගේ කෙලසීම නම්
නුපුරුදුවූ ප්‍රථමධ්‍යානාදියෙන් නැගී
කාමසැප පිළිබඳ සංඥාමනස්කාර සහ
වන් ජවනාවිජ්නයන්ගේපැවැත්මයයි
කියනලද ධ්‍යානයෙන් පිරිහීම සෙවු
නාවූ ධර්මයි, සමාධිහුගේ පිරිසිදුබව
නම් පුරුදුවූ ප්‍රථමධ්‍යානාදියෙන් නැගී
විතර්කධ්‍යානාදිහු කෙසේ උපදවන්
නෙම් දෝහෝයි යන සංඥාමනස්කා
රයන්ගේ සහවන් ජවනාවිජ්නයන්
ගේ පැවැත්මයයි කියනලද මතු විශේ
ෂාධිගමයට හේතුවූධර්මයෝයි. එහි අප්‍ර
ගුණවූප්‍රථමධ්‍යානයෙන් නැගීසිටි පුද්
ගලයා කාමඅරමුණු පිළිබඳ සංඥාම
නස්කාරයෝ පෙළත්ද ඔහුගේ ධ්‍යා
නප්‍රඥාව පිරිහීම සෙවුනා නම් වෙයි
මේ ආදික්‍රමයෙන් සියලුධ්‍යානයෙහි
ම පිරිහීම සෙවුනාවූධර්මයෝදතයුතුයි
ප්‍රගුණවූප්‍රථමධ්‍යානයෙන්නැගීසිටි පුද්
ගලයා අවිතර්කසමාධිසහගතවූ සංඥා
මනස්කාරයෝ පෙළත්ද ඒ ප්‍රථමධ්‍යා
නප්‍රඥාව විශෙෂවූ විතර්කධ්‍යානාදීන්
ඉපදවීමට ආසන්නකාරණ වන බැවි
න් විශෙෂ සෙවුනා නම් වෙයි මේ ප්‍ර
ථමධ්‍යානයෙහි කී නියායෙන් සෙසු
ධ්‍යානයෙහිද විශෙෂභාගිය ධර්මයෝයි
දතයුතු. සමාධිය කෙසේ වැඩිය යුතුද?
යන මෙහි පළමුකොට යම් මේ සමාධි
යෙක් ලෞකික ලොකොත්තර වශයෙ
න් විප්‍රකාරවන්නේයයි යනාදියෙහි
යම් ආර්‍ය්‍යමාර්ගී සම්ප්‍රයුක්ත සමාධි
යෙක් කියනලද්ද ඒ ආර්‍ය්‍යමාර්ගීසමා
ධිය වඩනා ක්‍රමය ප්‍රඥාභාවනා ක්‍රම
යෙන්ම සඞ්ග්‍රහකරණ ලද්දේය ප්‍රඥා
ව වැඩූකල්හි ඒ සමාධිය ප්‍රඥාසම්ප්‍රයු
ක්තහෙයින් වඩනාලද්දේම වෙයි එ
හෙයින් ඒ ආර්‍ය්‍යමාර්ගීගය සඳහා මෙ
සේ භාවනාකටයුතුයයි ප්‍රඥාභාවනා
වෙන් වෙන්කොට නොකීයම්හ යම්
ලෞකික සමාධියෙක් වේද ඒ සමාධි
ය යට ශීලනිර්දෙශයෙහි ආ නයින්
සිල් පිරිසිදුකොට සුපිරිසිදු ශීලයෙහි
පිහිටියහු විසින් තමහට දශපළිබො
ධයන් අතුරෙන් යමක් ඇත්තේවීන
ම් ඒ පළිබොධය පසිඳ කම්ටහන්
දෙන කල්‍යාණමිත්‍ර ආචාර්‍ය්‍යවරයෙකු
කරා එළඹ තමාගේ චරිතයට සුදුසුවූ
සතළිස්කමටහන් අතුරෙන් එක්ත
රා කමටහනක් ගෙණ සමාධිභාවනා
වට නොසුදුසුවූ අටලොස්විහාරයන්
අත්හැර පඤ්චාඞ්ගයෙන් යුත් සුදුසු
වෙහෙරක වසමින් දික්වූ නියපොතු
නියපොතු ආදී කුඩා පළිබොධයන්ද
නසා සියලු භාවනාක්‍රමය නොපිරි
හෙළා භාවනා කටයුතුයෝය මේ
මෙහි සඞ්ක්ෂෙපයි මේ මතු දක්වන්
නේ විස්තර වන්නේය මේ කෙසේ
දැයත්? —

( පා ¶ )

යං පනෙතං වුත්තං දසසු ප
ළිබොධෙසු පළිබොධො අත්ථි තං උ
පච්ඡින්දිත්වාති එත්ථ—

ආවාසො ච කුලං ලාභො
ගණො කම්මඤ්ච පඤ්චමං
අද්ධානං ඤාති ආබාධො
ගන්ථො ඉද්ධීති තෙ දසාති—
ඉමෙ දසපළිබොධා නාම—

තාව ආවාසො යෙව ආවාසපලිබොධො. එසනයො කුලාදීසු — තත්‍ථ ආවාසොති එකොපි ඔවරකො වුච්චති එකම්පි පරිවෙණං සකලොපි සඞ්ඝාරාමො. ස්වායං න සබ්බෙසංයෙව පලිබොධො හොති — යො පනෙත්‍ථ නවකම්මාදීසු උස්සුක්කං වා ආපජ්ජති බහුභණ්ඩසන්නිචයො වා හොති යෙන කෙනචි වා කාරණෙන අපෙක්ඛවා පටිබද්ධචිත්තො තස්සෙව පලිබොධො හොති න ඉතරස්ස. තත්‍රිදං වත්‍ථු — ද්වෙ කිර කුලපුත්තා අනුරාධපුරා නික්ඛමිත්වා ථූපාරාමෙ පබ්බජිංසු. තෙසං එකො ද්වෙමාතිකා පගුණං කත්වා පඤ්චවස්සිකො හුත්වා පවාරෙත්වා පාචීනඛණ්ඩරාජිං නාම ගතො. එකො තත්‍ථෙව වසි. පාචීනඛණ්ඩරාජිං ගතො තත්‍ථ චිරං වසිත්වා ථෙරො හුත්වා චින්තෙසි පටිසල්ලානසාරුප්පමිදං ඨානං හන්ද නං සහායකස්සාපි ආරොචෙමීති. තතො නික්ඛමිත්වා අනුපුබ්බෙන ථූපාරාමං පාවිසි. පවිසන්තංයෙව ච නං දිස්වා සමානවස්සිකත්‍ථෙරො පච්චුග්ගන්ත්වා පත්තචීවරං පටිග්ගහෙත්වා වත්තං අකාසි. ආගන්තුකත්‍ථෙරො සෙනාසනං පවිසිත්වා චින්තෙසි ඉදානි මෙ සහායො සප්පිං වා ඵාණිතං වා පානකං වා පෙසෙස්සති. අයම්පි ඉමස්මිං නගරෙ චිරනිවාසීති. සො රත්තිං අලද්ධා පාතො චින්තෙසි ඉදානි උපට්ඨාකෙහි පහිතයාගුඛජ්ජකං පෙසෙස්සතීති. තම්පි අදිස්වා පහිණන්තා නත්‍ථි පවිට්ඨස්ස මඤ්ඤෙ දස්සන්තීති පාතොව තෙන සද්ධිං ගාමං පාවිසි. තෙ එකවීථිං චරිත්වා උළුඞ්කමත්තං යාගුං ලභිත්වා ආසනසාලායං නිසීදිත්වා පිවිංසු. තතො ආගන්තුකො චින්තෙසි නිබද්ධයාගු මඤ්ඤෙ නත්‍ථි භත්තකාලෙ ඉදානි මනුස්සා පණීතං භත්තං දස්සන්තීති. තතො භත්තකාලෙ පිණ්ඩාය චරිත්වා ලද්ධමෙව භුඤ්ජිත්වා ආහ කිං භන්තෙ සබ්බකාලං එවං යාපෙථාති. ආම ආවුසොති. භන්තෙ පාචීනඛණ්ඩරාජි ඵාසුකා තත්‍ථ ගච්ඡාමාති. ථෙරො නගරතො දක්ඛිණද්වාරෙන නික්ඛමන්තො කුම්භකාරගාමමග්ගං පටිපජ්ජි. ඉතරො ආහ කිං භන්තෙ ඉමං මග්ගං පටිපන්නත්‍ථාති. නනු ත්වං ආවුසො පාචීනඛණ්ඩරාජියා වණ්ණං අභාසීති. කිං පන භන්තෙ තුම්හාකං එත්තකං කාලං වසිතට්ඨානෙ කොචි අතිරෙකපරික්ඛාරො නත්‍ථීති. ආම ආවුසො මඤ්චපීඨං සඞ්ඝිකං තං පටිසාමිතමෙව අඤ්ඤං කිඤ්චි නත්‍ථීති. මය්හං පන භන්තෙ කත්තරදණ්ඩො තෙලනාළි උපාහනත්‍ථවිකා ච තත්‍ථෙව ඨපිතාති. තයා ආවුසො එකදිවසං වසිත්වා එත්තකං ඨපිතන්ති. ආම භන්තෙති. සො පසන්නචිත්තො ථෙරං වන්දිත්වා තුම්හාදිසානං භන්තෙ සබ්බත්‍ථ අරඤ්ඤවාසොයෙව. ථූපාරාමො චතුන්නං බුද්ධානං ධාතුනිධානට්ඨානං ලොහපාසාදෙ සප්පායං ධම්මස්සවනං මහාචෙතියදස්සනං ථෙරදස්සනඤ්ච ලබ්භති බුද්ධකාලො විය පවත්තති ඉධෙව තුම්හෙ වසථාති. දුතියදිවසෙ පත්තචීවරං ගහෙත්වා සයමෙව අගමාසි — ඊදිසස්ස ආවාසො න පලිබොධො හොති —

---

( ස ¶ )

යං තාව වුත්තං, යමෙක් පලමුකොට කියනලදද; ඉදිනි, දුන් (“ ඉමෙ දසපලිබොධා වෙදිතබ්බා” යනු සබද “ අස්ස යොගිනො දසසු පලිබොධෙසු යො පලිබොධො අත්ථි තං උපච්ඡින්දිත්වා යි යං වුත්තං එහි ” යි යොදනු ) සවස්සනාවාහි යං වුත්තං, යම් වචනයෙක් මෙසේ ආදීයෙහි කියනලදද; එහි, මෙහි ( පලිබොධනම් කවරයත් යත

අඞ්ගි) ආවාසසාව, අවස්ද; කුලං, කු
හි කුලාදී කුලයද; ලාභො, ප්‍රත්‍යය
සඞ්ඛ්‍යාත ලාභයද; ගණො, ගණයද;
කම්මං, පස්විනුවූ, නවකර්ම්මය, නාම
කර්ම්මයද; අද්ධානං, මග ගමන්ද; ඤාති,
ආචාර්ය්‍යොපාධ්‍යායාදී නෑයෝද; ආබා
ධො, සමහරවිට රෝගයෙක්ද; ගන්ථො,
පර්‍ය්‍යාප්ති ග්‍රන්ථයද; ඉද්ධි, පෘථග්ජන
ඍද්ධිද යන; මෙදසාති, ඒ පළිබොධ
යෝ දශදෙනානෑයි කියනලද; තත්ථ
දස පළිබොධා නාම, මේ දශ පළිබො
ධයෝ නම්වෙත්; තත්ථ, ඒ දශ පළි
බොධයන් අතුරෙහි; ආවාසොයෙව, අ
වාසය; ආවාස පළිබොධො, ආවාස ප
ළිබොධනමි; කුලාදිසු, කුලාදීන් කෙ
රෙහි; එසෙවනයො, මෙම නයයි;
එත්ථ, මෙහි; ආවාසොති, ආවාසය
නම්; එකොපි ඕවරකො, එකද ගෑ
බෙක්; එකම්පි පරිවෙණං, එකද පිරි
වෙණක්; සකලොපි සඞ්ඝාරාමො,
මුළු සඞ්ඝාරාමද; වුච්චති, කියනලදී;
සොචෙ, එසේම ආවාසය; න සබ්බෙසං
ව පළිබොධො හොති, සියල්ලන්ට ප
ළිබොධ නොවේ; යො පන, යමෙක්
වනාහි; එත්ථ, එ අවස්ථි; නවකම්මා
දීසු උස්සුක්කං වා ආපජ්ජති, නව ක
ර්ම්මාදියෙහි උත්සාහය හෝ පැමිණෙ
ද; බහු භණ්ඩ සන්නිචයො වා, බොහො
බඩු සමූහවත් ඇත්තේහෝ
වේද; යෙන කෙනචිවා කාරණෙන
(සිත්ද් [illegible] ඇත්තේය [illegible]
ඇත්තේය යනාදී [illegible]
[illegible]; අපෙක්ඛවා, අපෙක්ඛා ඇත්
තේද; [illegible], [illegible]
[illegible] පළිබොධො හොති
ති, [illegible] පළිබොධ වේමයි; න [illegible]
සස, [illegible] නොවේ; තත්‍ර, ඒ ප
[illegible]; [illegible]
නොම් (සිට [illegible]

පාහසි) මෙ කුලපුත්තා, කුලපුත්‍ර
දෙදෙනෙක්; අනුරාධපුර නික්ඛමිත්වා,
අනුරාධපුරයෙන් නික්ම; ථූපාරාමෙ
පබ්බජිංසු, ථූපාරාමයෙහි පැවිදිවූහ; තෙ
සං, ඒ දෙදෙනාකෙරෙන්; එකො, එ
කෙක්; මෙ මාතිකා පගුණං කත්වා,
දෙමාතෘකා පුහුණුකොට; පඤ්චවස්සිකො
හුත්වා, පසවස් ඇතිව; පවාරෙත්වා,
පවරා, පාචින ඛණ්ඩරාජිනාමක ග
යෙනා, පාචීන ඛණ්ඩරාජිනම් තැනට
ගියේ (පූර්වදිග පවීන ඛණ්ඩයක් අතු
රෙහි වනරාජියෙක් ඇතිතැනයෙක්)
එකො, එකෙක්; තත්ථෙව වසයි, එහි
ම වෙසෙසි; පාචින ඛණ්ඩරාජීගතො,
පාචින ඛණ්ඩරාජියට ගියතෙම; ත
ත්ථ, එහි; චිරං වසිත්වා, බොහෝ කලක්
වැස; ථෙරො හුත්වා, තෙරව; චින්තෙ
සි, මෙසේ සිතී; ඉදං ඨානං, මේ තැන;
පටිසල්ලාණ සාරුප්පං, විවේකයට
සුදුසුය; හන්ද, එබැවින්; සහායස්ස
සාපි, මාගේ සබඳහටද; ආරොචෙම
මිති, කියමිසි; තතො නික්ඛමිත්වා, ඒ
පාචින ඛණ්ඩරාජියෙන් නික්ම; අනු
පුබ්බෙන, අනුක්‍රමයෙන්; ථූපාරාමං
පාවිසි, ථූපාරාමයට වන; පවිසන්තං
යෙව තං දිස්වා, පිවිසෙනම දුටු; ස
[illegible] විසනිකානුබන්ධ, සමවස් ඇති
තෙරනු: පච්චුග්ගන්ත්වා, පෙරගමන්
කොට; පත්තචීවරං පටිග්ගහෙත්වා, පා
සිවුරු පිළිගෙන; වත්තං අකාසි, වත්
[illegible]; [illegible]; [illegible] දවිය [illegible], සෙනාස
[illegible]; [illegible], [illegible] මෙ සනා
[illegible]; [illegible], දුන්;
[illegible] වා, [illegible] වා,
[illegible]; [illegible] වා, [illegible]
[illegible]; [illegible], [illegible]; අසංති,
[illegible] වනාහි; [illegible] හාතො,

* † මේ ලකුණු දෙක ඇදිපිටාකතම සියළු ගන්ථ පොතවලම වනඩිනව
තිබී ඉපවිසත් [illegible] "පාහතෑවී" යන පදයද ඇතම
පොළ පොත්වල දක්නාලැබේ සුදුසුනම් පෙළම වීද යෙදිය යුතුති.

ගේ නුවර; චිරනිවාසිනි, බොහෝ
කල් වසන්නෙකැයි † සො, ඒ අමුතු
තෙමේ; රතනිං අලද්ධා, රැ නොල
දින්; පාතො විභොහසි, උදෑසන්හි සි
ති; ඉදෑති, දුන්; උපට්ඨාකෙහි පහිතං,
උපස්ථායකයන් විසින් එළවනලද;
යාගුඛජ්ජකං, කැඳහා කැවුන්; පෙසෙ
සනීග්‍ර, එවන්නේයැ; නම්පි අදිසවා,
තෙද නොදැක; පහිතනනා නම්, එ
වන්නහු නැත; පච්ඡිට්ඨස්ස මසෙදසද
දසසනාතීනි, ගමට වන්නහුට දෙන
වන්හසි; පාතොව, උදෑසන්හිම; සෙ
න සඞිං ගාමං පාවිසි, ඒ ගම්වැසි තෙ
රුන්නා සමඟ ගමටවන්හු; තෙ, ඒ
දෙදෙන; එකං විථිං චරිත්වා, එක් වීථි
යක සිහා; උලුඞිකාමත්තං යාගුං ලබි
ත්වා, සරළුවක් පමණ කැඳලදින්; ආස
නසාලායං නිසීදිත්වා, ආසනසාලාවෙ
හි හිඳ; පිවිංසු, වැලදූහු; තතො, ඉක්
බින්නෙන්; ආගන්තුකො, අමුතු තෙ
රනු; චින්තෙසි, මෙසේ සිතූ; නිබඩ යා
ගුං මසෙදසද නම්පි, නිබද කැඳවක්
නැහිවන; හත්තකාලෙ ඉදෑති, දුන්
බත්වේලෙහි; මනුස්සා, මිනිස්සු, ප
ණීතං භත්තං දස්සන්තීනි, ප්‍රණීත
බත් දෙන්නාහයි; තතො, ඉක්බින්
තෙන්; භත්තකාලෙ පිණ්ඩාය චරිත්වා
ලඞමෙව භුඤ්ජිත්වා, බත්වේලෙහිදු පි
ඩුසිගාලද දූගම වලඳ; ආහ, මෙසේකී;
කිං හන්තෙ, වහන්ස කිම; සබ්බකා
ලං එවං යාපෙථාති, හැමකල්හිම මෙ
සේ යැපේද්දයි; ආමාවුසොති, එසේය
ඇවතැයි ගම්වැසි තෙරනු කීහු; භ
න්තෙ, වහන්ස; පාචීන ඛණ්ඩරාජී,
පාචීන ඛණ්ඩරාජීතොමේ; ඵාසුකා,
ඵාසුය; තත්ථ ගච්ඡාමාති, එතට යම්
හයි; ථෙරො, ගම්වැසි තෙරහු; නගර
තො, නුවරින්; දක්ඛිණද්වාරෙන නික්ඛ
මන්තො, දකුණුදොරින් නික්මෙනනා
හු; කුම්භකාරගාම මග්ගං පටිපජ්ජි, කු

ඹල්හලට යන මග පිළිපන්හු (නික්මු
නනු යුතැනී) ඉතරො ආහ, අනික් අ
මුතු තෙරහු මෙසේ කීවු; කිං භන්තෙ,
වහන්ස කිම; ඉමං මග්ගං පටිපන්න
ත්ථාති, මේ මග නික්මුණුයේත්තැයි;
ආවුසො, ඇවත; නනු, නොම; පාචීන
ඛණ්ඩරාජියා, පාචීන ඛණ්ඩරාජිනම් තැන;
වණ්ණං අභාසි තනුති, ගුණ කීයෙහි
නොවේදුයි; කිම්පන, කිමෙක්ද; භ
න්තෙ, වහන්ස; තුම්හාකං එත්තකං
කාලං වසිතට්ඨානෙ, තොපගේ මෙ
තෙක්කල් විසුතැන්හි; කොචි අති
රෙක පරික්ඛාරෙන අත්ථිති, කිසි ඉති
රි පිරිකරෙක් නැද්දයි; ආම ආවුසො,
ඇවත එසේය; මඤ්චපීඨං සඞ්ඝිකං,
වැලඳගන්නා හැඳපුටු සඟසතුය; තං,
ගේ; පටිසාමිතමෙව, නගා තබනලද
මය; අඤ්ඤං කිඤ්චි නත්ථීති, අනික් කි
සිවෙක් නැතැයි; භන්තෙ, වහන්ස;
මය්හං පන, මාගේ වනාහි; කත්තර
දණ්ඩො, කතුරු යටද; තෙලනාළි,
තෙල්තළද, උපාහනත්ථවිකාසදම, ව
හන් පසියද; තත්ථෙවාති, එහිමැයි;
ආවුසො, ඇවත; තයා, තාවිසින්; එක
දිවසං වසිත්වා, එක් දවසක් වැස; එ
ත්තකං ඨපිතනායි, මෙතෙක් තබන
ලද්දයි; ආම භන්තෙ, වහන්ස එසේ
යි; සො, තෙතෙම; පසන්නචිත්තො,
ප්‍රසන්න සිත් ඇත්තේ; ථෙරං වන්දි
ත්වා, තෙරුන් වැඳ; තුම්හාදිසානං භ
න්තෙ සබ්බත්ථ අරඤ්ඤවාසො ෙව, ව
හන්ස නුඹවැන්නවුන්ට හැමතැනම
අරණ්‍යවාසමය; ථූපාරාමො, තුබරො
ඹ; චතුන්නං බුද්ධානං, මෙකප කකුසඳ
කොණාගම කාශ්‍යප ගෞතමය යන
සතර බුදුන්ගේ; ධාතුනිධානට්ඨානං,
ධාතුනිධානය ඛම්රාය තහන සථය අනුද
ලයන පරිභොගධාතු ශරීරධාතූන්
ගේ නිධානස්ථානය; ලොහපාසාදෙ ස
ප්පායං ධම්මසවණං, ලෝවාමහපායෙ

හි සැපවූ දනම් ඇසීමද; මහාවෙහෙරද සනං, මහාචෛත්‍යය දකිනයද; ථෙර දස්සනයෙව, සංඝිරයන් දක්මද; ලබන නි, ලැබෙයි; බුද්ධකාලොචිය වනාහි, බුදුන් කලක්මෙන් පවති; ඉමෙව, මෙ හිම; භූමිහ වසථානී, තෙපි වසවසී භියා; දුතිය දිවසෙ, දෙවන දවස්; පතාවිවරං ගහෙත්වා, පාසිවරුගෙණ; සයමෙව අගමාසිනි, තුමූම ගියෝ; ඊදි සසස, මේ තෙරුන්ගෙ අලන්නවූ සිතැත්තාහ; ආවාසො පලිබොධො හ ණොති, ආවාසය පලිබොධයෙ වේ.

( ගා. [illegible] )

පලමුකොට ඒ දසාකාරවරයා හට දශපලිබොධයන් අතුරෙන් යම් පලිබොධයක් ඇත්තේවිනම් ඒ පලිබොධය පසිඳිය යුතුය යන යම් වචනයක් කියනලද්දේවේද එහි පලිබොධ නම් කවරයන්? ආවාසය කුලී ආදී කුලය ප්‍රත්‍යලාභය නවකර්මාන්තය මාර්ග ගමනය ආවාසී උපාධ්‍යායාදී ඥාතීන්ය රෝගාබාධය පර්‍යාප්ති ග්‍රහණය පුහුදුන් සෘද්ධිය යන මේ දශය පලිබොධයෝයම් වෙත් ඒ දශ පලිබොධයන් අතුරෙන් ආවාසය ආවාස පලිබොධනම් මෙසේ කුල පලිබොධාදීයන් මෙම ක්‍රමයෙන් දතයුතු. එහි ආවාසනම් එක් ගැබක් ඇති ගෙයක් හෝ එක් පිරිවෙණක් හෝ මුලු සඞ්ඝාරාමය හෝ ආවාසයයි කියනු ලැබේ ඒමේ ආවාසය සියල්ලන්ටම පලිබොධ නොවන්නේය වැලි කවරෙකුට පලිබොධවන්නේදයත්? යම් භික්ෂු කෙනෙක් ඒ ආවාසයෙහි නව කර්මාන්තාදිය හෝ කරවීමට උත්සාහ වඩන්නේවේද බොහෝ ලහුගරු බඩු රැස්කිරීමෙන් හෝ ඇත්තේවේද මෙ විහාරය සිතිල් සෙවන ඇත්තේය මිහිරි පැන් ඇත්තේය යනාදී යම් කිසි කාරණයක් හෙතුකොටගෙණ ඒ විහාරයෙහිම ඇලුනේවේද ඒ විහාරයෙහි පිළිබඳ සිත් ඇත්තේහෝ වේද එබඳු මහණහට ම විහාරය පලිබොධවන්නේය සෙස්සහට පලිබොධ නොවන්නේය මේ උදාහරණ වශයෙන් මේ කථාවස්තුව දතයුතු. කෙසේදයත්?

දෙව ලත්ත්‍රීම අනුරාධපුරයෙහි වැසි යහලු කුලපුත්‍රයෝ දෙදෙනෙක් අනුරාධපුරයෙන් නික්මී ථූපාරාම විහාරයෙහි පැවිදිවූහුය ඒ දෙදෙනා අතුරෙන් එක් භික්ෂුකෙනෙක් භික්ෂුභික්ෂුණී ප්‍රාතිමොක්ෂය පුහුණුකොට පස්වස් ඇතිව පෙහෙත් නිසසාධන සපුණී කොට නිසමුසානකවී වස් පවරා අනුරාධපුරයට පැදුන්දිග කඳුරැලි අතුරෙනි පිහිටි විහාරෙදට ගියේය අනික් භික්ෂුතෙම ඒ ථූපාරාමයෙහිම විසුයේය පැදුන්දිග කඳුරැලි අතුරෙහි විහාරෙදට ගිය යහලු භික්ෂූන්වහන්සේ එහි කලක් වැස සංවිරසාවයට පැමිණ මෙසේ සිතූය මේ ස්ථානය විවෙක කැමැත්තන්ට සුදුසුවන්නේය එබැවින් මාගේ යහලු භික්ෂූනටද එපවත් දන්වා කැඳවාගෙණ එන්නෙමියි සිතා පැදුන්දිග කඳුරැලි අතුරෙහි විහාරෙදින් පිටත්ව ක්‍රමයෙන් මගයෙවා අවුත් ථූපාරාම විහාරයට පැමිණියේක විහාරයට ඇතුල්වන ඒ තෙරහු දුටු සමවස් ඇති යහලු භික්ෂුහු පෙරමගට ගොස් පාසිවුරු පිළිගෙණ වත්පිළිවෙත් කලේය්ය ආගන්තුක යහලු තෙරහු සෙනසුනට වැද මෙසේ සිතූහ මාගේ මේ යහලු තෙරහු මේ දැවර බොහෝකල් විශුද්ධ ප්‍රත්‍යයෙහිද බොහෝ ඇතිම්ප්‍රායකාහුය දුන් මාගේ යාලුතෙම ගිතෙල්හෝ පැණි හෝ පානවර්ගයෙක් හෝ එවන්නේවේදැයි සිතූයේද රාත්‍රියෙහි සිටියක් නො,

ලදින් උදෑසනින් මෙසේ සිතූහ. දැන් මාගේ සහලු තෙරහුගේ උපස්ථායක දායකයන් විසින් ගෙණෙනලද කැඳ අවුළු ඇත. එයින් එවන්නෝවේදැයි සිතූහ. ඒද නොදුක උදෑසන කැඳ අවුළු එවන්නාව මනුෂ්‍යයෝ සා.නිවන ගමට ගියවුන්ටම දෙන්නාහුවනැයි සිතා උදෑසනම ඒ ගම්වැසි සහලු තෙරහා සමග පිඩුපිණිස ගමට වන්නාහුය. ඔවුන් දෙදෙන එක් වීථියක පිඩුපිණිස හැසිර සරළුවක් පමණ කැඳ දින්නක් ලදින් විහාරයට නොගොස් නුවර අසුන්සලම වැඩහිඳ පැලදුවාහුය. ඉක්බිති ආගන්තුක තෙරහු මෙසේ සිතූහ මේ කැඳ තිබද දෙනා කා දෙන් නොවෙයි බත්කාලයෙහි මනුෂ්‍යයෝ ප්‍රණීතවූ රසමසවුළුත් යුත් අහර දෙන්නාහුවනැයි සිතා ඉන්බින්තෙන් බත්වේලෙහිද පිඩුසිනා ගොස් ලදදෙයක්ම වළඳා කිමෙක්ද වහන්ස හැම කල්හිම මෙසේ යැපෙන්නෝදැයි විචාළහ. ගම්වැසි තෙරහුද එසේය ඇවැත්නියි පිළිවදත් දුන්නෝය එබසට ආගන්තුකතෙර කියනසේක් සව. චිනී පැදුන්දිග කදුරලි අතුරෙහි වනරෙද ඉනා ඵාසුවන්නේ. එහි යම්හයි කැඳවූහ. ගම්වැසි තෙරහුද ඇනවැයි කියා නැවත විහාරයට නොපිවිස පාසිවුරු පමණක් ගෙණ පිඩුපිණිස ගමට වන් සැටිම නුවර දකුණු දෙරටුවෙන් නික්ම කුඹල්ගම මගට පිළිපන්හ. ආගන්තුක තෙරහු කිමෙක්ද වහන්ස මේ මගට පිළිපන්නෝ කොහි වඩින්නාවූදැයි විචාළේය. ගම්වැසි තෙරුන්වහන්සේ ඇවැත්නි තෙපි දූන් පැදුන්දිග කදුරලි අතුරෙහි වනරෙද ඵාසුවන්නේයයි ගුණවණිනාකළේ නොවේද? එහි යන්නට මේ මගට පිළිපන්නෙම් වේදැයි කීහ.

ඉක්බිති ආගන්තුක තෙරුන්වහන්සේ කිමෙක්ද නුඹවහන්සේ මෙතෙක් කල් විසූතෙන කාසින් පරිහරණය කටයුතු පාසිවුරු හැර යම්කිසි [illegible] පිරිකරෙක් නැත්තෙහිදැයි [illegible] ගම්වැසි තෙරහු එසේය ඇවැත්නි අපවිසින් පරිභොගකළ හැඳපලු ආදී පරිෂ්කාර සහසනය ඒ පිරිකර [illegible] රු සුදුසු පරිභෝගුන් සහසනොව [illegible] නාලදුවය මාසතු අත්තිසි පිරිකරක් නැතැයි කීහ. ඉක්බිති ආගන්තුක තෙර කියනසේ වහන්ස මා සැල සවිය පසනල්වත තෙල්කුලාව බහන් පසිය යන පිරිකර කුළුණක් තිබේ [illegible] විසූ ඒ වෙහෙර තබාගලද්දෙය [illegible] මගේ යාලූතුසඳිගිත එබසා [illegible] තෙරුහු ඇවැත්නි එතරුයන් [illegible] නොප එයින් මෙගෙන් පිරිකර [illegible] කලදදූයි විචාළහ එසේය වහන්සැයි පිළිවදන්දී ආගන්තුක තෙරහු පසන් සිත් ඇතිව තෙරුන්වැද වහන්ස නුඹවහන්සේ හැමතැනම [illegible] ඇත්තෙන්මය මේ ශ්‍රීපාරම විහාරය මෙකාප බුදුවූ කකුසඳ කොණාගමන කාශ්‍යප ගෞතම යන සතර බුදුවරයන්ගේ පරිභෝගධාතුය [illegible], නාකඩස ශ්‍රීධාතූන් සහ පාරිභෝගික ශාරීරික ධාතූන් නිදහන්කරණලද උතුම් ස්ථානය වන්නේය ලොහප්‍රාසාදයෙහි සැපවූ ධර්මශ්‍රවණයද මහසෑ දැකීමද මහතෙරුන් දැකීමද මෙහි විසීමෙන් නිරතුරු ලැබෙන්නේය මචකල මෙන් දිවමන් බුදුන් දකිනමැන්න නුඹවහන්සේ මෙහිම වසනසේක්වයි කියා පසුවද උදෑසනම පාසිවුරු ගෙණ ආගන්තුක තෙරහු උදකලාවම පෙරවිසූ ප්‍රදෙසයටම ගියෝයි මේ තෙරුන්මෙන් බහුභාණ්ඩ රැස්කිරීමෙහි නොඇලුනු සිතැති මහණහට ආවාස පළිබොධ නොවන්නේයි.

( පා * )

කුලන්ති ඤාතිකුලං වා උපට්ඨාක
කුලං වා එකච්චස්ස හි උපට්ඨාකකුලං
ම්පි සුඛිතෙ සුඛිතොති ආදිනා නයෙන
න සංසට්ඨස්ස විහරතො පලිබොධො
හොති සො කුලමනුස්සෙහි විනා
ධම්මසවණාය සාමන්තවිහාරම්පි න ග
ච්ඡති එකච්චස්ස මාතාපිතරොපි පලි
බොධා න හොන්ති කොරණ්ඩක
විහාරවාසිථෙරස්ස භාගිනෙය්‍යදහර
භික්ඛුනො විය සො කිර උද්දෙසත්ථං
රොහණං අගමාසි ථෙරභගිනීපි උපා
සිකා සදා ථෙරං තස්ස පවත්තිං පුච්ඡ
ති ථෙරො එකදිවසං දහරං ආනෙ
ස්සාමීති රොහණාභිමුඛො පායාසි දහ
රොපි චිරං මෙ ඉධ වුත්ථං උපජ්ඣාය
ම්පි පයිරුපාසිත්වා උපාසිකායච පවත්තිං
ජානිත්වා ආගමිස්සාමීති රොහණතො
නික්ඛමි තෙ උභොපි ගඞ්ගාතීරෙ
සමාගච්ඡිංසු සො අඤ්ඤතරස්මිං රු
ක්ඛමූලෙ ථෙරස්ස වත්තං කත්වා කුහිං
යාසීති පුච්ඡිතො තං පවත්තිං ආරොචෙසි
ථෙරො සුට්ඨු තෙ කතං උපාසිකාපි
සදා පුච්ඡති අහම්පි එතදත්ථමෙව ආග
තො ගච්ඡ ත්වං අහං පන ඉධෙව ඉමං
වස්සං වසිස්සාමීති තං උය්‍යොජෙසි
සො වස්සූපනායිකදිවසෙයෙව තං
විහාරං පත්තො සෙනාසනම්පිස්ස පි
තරා කාරිතමෙව පත්තං අථස්ස පිතා
දුතියදිවසෙ ආගන්ත්වා කස්ස භන්තෙ
අම්හාකං සෙනාසනං පත්තන්ති පුච්ඡ
න්තො ආගන්තුකදහරස්සාති සුත්වා
තං උපසඞ්කමිත්වා වන්දිත්වා ආහ භ
න්තෙ අම්හාකං සෙනාසනෙ වස්සං
උපගතස්ස වත්තං අත්ථීති කිං උපාස
කාති තෙමාසං අම්හාකං යෙව ඝරෙ
භික්ඛං ගහෙත්වා පවාරෙත්වා ගමන
කාලෙ ආපුච්ඡිතබ්බන්ති සො තුණ්හී
භාවෙන අධිවාසෙසි උපාසකොපි ඝරං
ගන්ත්වා අම්හාකං ආවාසෙ එකො ආග
න්තුකො අය්‍යො උපගතො සක්කච්චං
උපට්ඨාතබ්බොති ආහ උපාසිකා සාධූ
ති සම්පටිච්ඡිත්වා පණීතං ඛාදනීයං
භොජනීයං පටියාදෙසි දහරොපි භ
ත්තකාලෙ ඤාතිඝරං අගමාසි න නං
කොචි සඤ්ජානි සො තෙමාසම්පි තත්
ථ පිණ්ඩපාතං පරිභුඤ්ජිත්වා වස්සං
වුත්ථො අහං ගච්ඡාමීති ආපුච්ඡි අථස්ස ඤාතකා
ස්වෙ භන්තෙ ගච්ඡථාති දුතියදිව
සෙ ඝරෙයෙව භොජෙත්වා තෙලනා
ළිං පූරෙත්වා එකං ගුළපිණ්ඩං නවහ
ත්ථඤ්ච සාටකං දත්වා ගච්ඡථ භන්තෙ
ති ආහංසු සො අනුමොදනං කත්වා
රොහණාභිමුඛො පායාසි උපජ්ඣායො
පිස්ස පවාරෙත්වා පටිපථං ආගච්ඡ
න්තො පුබ්බෙ දිට්ඨට්ඨානෙයෙව තං
අද්දස සො අඤ්ඤතරස්මිං රුක්ඛමූ
ලෙ ථෙරස්ස වත්තං අකාසි අථ නං
ථෙරො පුච්ඡි කිං භද්දමුඛ දිට්ඨා තෙ
උපාසිකාති ආම භන්තෙති සබ්බං පව
ත්තිං ආරොචෙත්වා තෙන තෙලෙන
ථෙරස්ස පාදෙ මක්ඛෙත්වා ගුළෙන පා
නකං කත්වා පායෙත්වා තම්පි සාටකං
ථෙරස්සෙව දත්වා ථෙරං වන්දිත්වා ම
ය්හං භන්තෙ රොහණංයෙව සප්පා
යන්ති අගමාසි ථෙරොපි විහාරං ආග
න්ත්වා දුතියදිවසෙ කොරණ්ඩකගාමං
පාවිසි උපාසිකාපි මය්හං භාතා මම
පුත්තං ගහෙත්වා ඉදානි ආගච්ඡති ඉදා
නි ආගච්ඡතීති සදා මග්ගං ඔලොකය
මානාව තිට්ඨති සා තං එකකමෙව
ආගච්ඡන්තං දිස්වා මඤ්ඤෙ මෙ මතො
මම පුත්තො අයං ථෙරො එකකොව ආ
ගච්ඡතීති ථෙරස්ස පාදමූලෙ පතිත්වා
පරිදෙවමානා පරොදි ථෙරො නූන ද
හරො අප්පිච්ඡතාය අත්තානං අජානා
පෙත්වාව ගතොති තං සමස්සාසෙත්වා
සබ්බං තං පවත්තිං ආරොචෙත්වා පත්ත
ත්ථවිකතො තං සාටකං නීහරිත්වා ද
ස්සෙසි උපාසිකා පසීදිත්වා පුත්තස්ස

ගඞ්ගාභිමුඛො උරෙන නිපජ්ජිත්වා නමස්සමානො ආහ මය්හං පුත්තෙන සද්ධිං වස මඤ්ඤෙ භික්ඛුං කායසක්ඛිං කත්වා භගවා රථවිනීතපටිපදං නාලකපටිපදං තුවට්ටකපටිපදං චතුපච්චයසන්තොසභාවනාරාමතාදීපකං මහාඅරියවංසපටිපදඤ්ච දෙසෙසි විජාතමාතුයා නාමගෙහෙ නෙමාසං භුඤ්ජමානො අහං පුත්තො ත්වං මාතාති න වක්ඛති අහො අච්ඡරිය මනුස්සොති එවරූපස්ස මාතාපිතරොපි පලිබොධා නහොන්ති පගෙව අඤ්ඤං උපට්ඨාකකුලන්ති —

---

( ස * )

කුලන්ති, කුලනම්; ඤාතිකුලං වා, නෑ කුලයගෙහෝය; උපට්ඨාකකුලං වා, උපස්ථායක කුලයගෙහෝයි; එකච්චස්සහි, සමහරක්හට; උපට්ඨාකකුලම්පි, උපස්ථායක කුලයද; සුඛිතෙ, කුලය සුඛිත කල්හි; සුඛිතොති ආදිනා නයෙන, තොමෙද සුඛිතවෙහි යනාදී නයින්; සංසට්ඨස්ස විහරතො, හැනී වසන්නහුට; පලිබොධො හොති, පලිබොධවේ; සො, හෙතෙම; කුලමානුසකෙහි විනා, කුලමිනිසුන්හැර; ධම්මසවණාය, බණ අසනුපිණිස; සාමන්තවිහාරම්පි න ගච්ඡති, ආසන්න විහාරයටද නොයෙයි; එකච්චස්ස, සමහරක්හට; මාතාපිතරොපි, මවුපියෝ පවා; පලිබොධා න හොන්ති, පලිබොධ නොවෙත්; කොරණ්ඩකවිහාරවාසිථෙරස්ස භාගිනෙය්‍ය දහර භික්ඛුනො විය, කොරණ්ඩක නම් වූ වෙහෙර වසන තෙරුන්ගේ බෑණ ලදරු මහණහු මෙනි; සො කිර, ඒ දහර මහණතෙමේ; උද්දෙසත්ථං, උද්දෙසයපිණිස (පෙලකියවාගෙණ පුහුණුකරණුපිණිස යුතැනී) රොහණං අගමාසි, රුහුණු දනව්වට ගියෝ; ථෙරභගිනිපි උපාසිකා, තෙරුන්ගේ නංඋපාසිකාද; සදා, හැම දවස්ම; ථෙරස්ස පවත්තිං පුච්ඡති, තෙරුන් පුතනුවන්ගේ පවත් පිළිවිසි; ථෙරො, තෙරහු; එකදිවසං, එක් දවසක්; දහරං ආනෙස්සාමීති, දහරයා ගෙනෙමියි; රොහණාභිමුඛො පායාසි, රුහුණට අභිමුඛව ගියෝ; දහරොපි, දහරද; චිරං මෙ ඉධ වුත්ථං, බොහෝ කලක් මාවිසින් මෙහි වසනලද; උපජ්ඣායං දානි පස්සිත්වා, දැන් උපාධ්‍යායයන් බලා; උපාසිකායච පවත්තිං ඤත්වා, උපාසිකාවන්ගේද පවත් දැන; ආගමිස්සාමීති, එමියි; රොහණතො නික්ඛමි, රුහුණින් නික්මීනී; තෙ උභොපි, තෙරහුද දහර මහණද දෙදෙනා; ගඞ්ගාතීරෙ සමාගච්ඡිංසු, මහවැලි ගංතෙර එක්වූහ; සො, ඒ දහරතෙම; අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ, එක්තරා රුක්මුලෙක්දී; ථෙරස්ස වත්තං කත්වා, තෙරුන්ට වත්කොට; කුහිං වසිසීති පුච්ඡිතො, කොයිසෙහිදැයි විචාරණලද්දේ; තමත්ථං ආරොචෙසි, එපවත්කී; ථෙරො, තෙරහු; සුට්ඨු තෙනහි, තාවිසින් මැනවෙක් කරණලද; උපාසිකාපි, උපාසිකාද; සදා පුච්ඡති, දවස දවස විචාරයි; අහම්පි, මමද; එතදත්ථාය මෙව ආගතො, මෙපිණිසම ආමි; ගච්ඡ ත්වං, තෝ යා; අහං පන ඉධෙව ඉමං වස්සං වසිස්සාමීති, මම මෙහිම මේ වස් වෙසෙමියි; තං උය්‍යොජෙසි, ඒ දහරයා නංගායවූ; සො, හෙතෙම, වස්සූපනායිකා දිවසෙයෙව, වස්එළඹෙන දවස්ම; තං විහාරං පත්තො, ඒ වෙහෙරට පැමිණියේ; සෙනාසනම්පි, සෙනස්නද; අස්ස, ඔහට; පිතරා කාරිතමෙව. පියාණන්විසින්ම කරවනලද්දේ; පත්තං, පැමිණියා; අථ, ඉක්බිත්තෙන්; අස්ස, ඒ මහණහුගේ; පිතා, පියාතෙම; දුතියදිවසෙ ආගන්ත්වා, දෙවන දවස් අවුත්; කස්ස භන්තෙ අම්හාකං සෙනා

සත්තං පහාතානි, වහන්ස තවුරුන්ට
අපගේ සෙනාස්න පත්දුසි; පුච්ඡ
මානා, විචාරන්නේ; අගනතුක දහ
රයසානි සුත්වා, ආගන්තුක දහරයෙ
නෙක්හටය යනු අසා; තං උපසඞ්ක
මිත්වා, ඒ දහරයන් කරා එළඹ; වන්දි
ත්වා, වැඳ; ආහ, මෙසේ කී; භන්තෙ,
වහන්ස; අම්හාකං සෙනාසනෙ වසනං
උපාසකස්ස, අපගේ සෙනස්නෙහි වස්
එලඹියහව; වාතාං අථ්ථි, වනෙහක්
ඇතැයි; කිං උපාසකානි, කිමෙක්ද
උපාසකයකී කිවු; තෙමාසං, තුන්මස;
අම්හාකං ඝරෙයෙව භික්ඛං ගහෙත්වා,
අපගේ ගෙහිම අහරගෙණ; පවාරෙ
ත්වා ගමනකාලෙ, පවරා යනකල; ආ
පුච්ඡිතබ්බො, පිළිවිසයුතු (අපට කියා
වැඩියයුතුය යුතැනි) සො, තෙතෙම;
තුණ්හීභාවෙන අධිවාසෙසි, තුෂ්ණීම්
භාවයෙන් ඉවසී; උපාසකොපි, උපා
සකද; ඝරං ගන්ත්වා, ගෙට ගොස්; අ
ම්හාකං ආවාසෙ, අපගේ සෙනස්නෙ
හි; එකො ආගන්තුකො අයෙයා, එක්
ආගන්තුක ආය්‍යීයෙකෙණක්; උපග
තො, වසෙලඹියෙහ; සක්කච්චං උපට්ඨා
තබ්බොති ආහ, සකස්කොට උපස්ථා
න කටයුත්තේයයී කී; උපාසිකාපි,
උපාසිකාවෝද; සාධූති සම්පටිච්ඡිත්වා,
යහපතැයි ගිවිස; පණීතං ඛාදනීයං
භොජනීයං පටියාදෙසි, මධුරවූ ඛාද්‍ය
භොජ්‍යය සැපයූ; දහරොපි, දහරද;
ගමනකාලෙ, ඒලදනා වේලෙහි; ඤාති
කුලං ආගමාසි, ඥාතීන් කුලයට එ
ළඹිය; තං, ඔවුන්; කොචි න සඤ්ජා
නි, කිසිවෙක් නොහැඳිනි; සො, තෙ
තෙම; තෙමාසම්පි තෙමස් පිණ්ඩපාතං
පරිභුඤ්ජිත්වා, තුන්මසම එහි අහර
වළඳා; අහං ගච්ඡාමීති ආපුච්ඡි, මම
යෙමියි පිළිවිස්සී; අථ, ඉක්බිත්තෙන්;
අස්ස, ඔහුගේ; ඤාතකා, නෑයෝ;
ස්ව ගමෙනා ගච්ඡිස්සථාති, වහන්ස
සෙට පඬගෙන්යෑයි කියා; දුතිය දිවසෙ,
දෙවන දවස්; ඝරෙයෙව භොජෙත්වා,
ගෙහිම වළඳවා; තෙලනාළිං පූරෙත්වා,
තෙල් නැළ පුරවා; එකං ගුළපිණ්ඩං,
එක් සකුරු පිඩක්ද; නවහත්ථඤ්ච සා
ටකං දත්වා, නවරියන් පිළියක්දදී;
ගච්ඡථභන්තෙති ආහංසු, වහන්ස වැ
ඩියැනවැයි කීහු; සො, තෙතෙම;
අනුමොදනං කත්වා, අනුමෙවුනිකො
ට; රොහණාභිමුඛො, රුහුණට අභිමු
ඛව; පායාසි, ගියේය.

උපජ්ඣායොපිස්ස, ඔහුගේ උපාධ්‍යා
යයෝද; පවාරෙත්වා, පවරා; පටිපථං,
ආගච්ඡන්තො, පෙරමග එන්නාහු;
පුබ්බෙ දිට්ඨට්ඨානෙයෙව, පෙර දුටු
තැන්හිම; තං ඔහු; අද්දස, දිටී; සො,
තෙතෙම; අඤ්ඤතරස්මිං රුක්ඛමූ
ලෙ, එක්තරා රුක්මුලෙක; ථෙරං,
තෙරුන්ට; වත්තං අකාසි, වත්තෙ
ළේ; අථ, ඉක්බින්තෙන්; ථෙරො පු
ච්ඡි, තෙරහු පිළිවිස්සෙසේ; කිං, කිම;
භද්දමුඛ, භද්‍රමුඛය; තෙ, තාවිසින්; උ
පාසිකා දිට්ඨානි, උපාසිකාව දක්නාල
ද්දයි; සො, තෙතෙම; ආම භන්තෙ
ති, වහන්ස එසේයයී; සබ්බං පවත්තිං
ආරොචෙත්වා, සියලු පවත් කියා;
තෙන තෙලෙන, ඒ තෙලින්; ථෙර
ස්ස පාදෙ මක්ඛෙත්වා, තෙරුන් පාද
යන්මැඩ; ගුළෙන, සකුරෙන්; පාන
කං කත්වා, පානයක්කොට; පායෙත්වා,
වළඳවා; තම්පි සාටකං ථෙරස්සෙව ද
ත්වා, ඒ පිළියද තෙරුන්ටමදී; ථෙරං
වන්දිත්වා, තෙරුන් වැඳ; මය්හං භ
න්තෙ රොහණං යෙව සප්පායනානී,
මට වහන්ස රුහුණම සැපයයි; අග
මාසි, ගියෝයී; ථෙරොපි, තෙරහුදු; වි
හාරං අගන්ත්වා, වෙහෙරට අවුත්; දු
තිය දිවසෙ, දෙවනදවස්; කොරන්ත
කගාමං පාවිසි, කොරතක නම් ග
මට වන්හු; උපාසිකාපි, උපාසිකා
වෝද; මය්හං භාතා, මබෑණෝ; එම

පුච්ඡං ගහෙත්වා, මාගේ පුතනුවන්
ගෙණ; ඉදානි ආගච්ඡති ඉදානි ආග
ච්ඡන්ති, දැන් එති දැන් එතියි; සදා ම
ග්ගං ඔලොකයමානාව හිටියනි, පැ
වරූ දවස් හිමිගනාට හැමවේලෙහිම
මග බල බලාම සිටී; සො, හෝතෙම
වෙී; තං, ඒ තෙරුන්; එකාකාලෙව,
හුදකලාවම; ආගච්ඡන්තං දිස්වා,
එන්නාවූන් දැක; මතො මෙ මඤ්ඤෙ
පුත්තො, මාගේ පුතනුවෝ මළ වන්
හයි; ඉති, යම් කාරණෙකින්; ථෙරෙ,
තෙරහු; එකකො ආගච්ඡන්ති, හුද
කලාවම එන්නාහයි; ථෙරස්ස පාදමූ
ලෙ පතිත්වා, තෙරුන් පාමුල්හි;
පරිදෙවමානා, හඬන්නී; පරොදි, වැ
ලැපීහු; ථෙරො, තෙරහු; තුන්හි, එසැ
තියෙන්; දහරො, දහරගෙමෙ; අපවි
ච්ඡතාය, අපිස්බැවින්; අත්තානං අජා
නාපෙත්වා, තමා නොහඟවා; ග
තොහි, ගියේයයි; තං උපාසිකං, ඒ
උපාසිකාව; සමස්සාසෙත්වා, අස්වසා;
සබ්බං පවත්තිං ආරොචෙත්වා, සියලු
පවත් කියා; පත්තත්ථවිකතො, පාත්‍ර
පසිමෙන්; තං වත්ථං නීහරිත්වා, ඒ
පිළිය හැරගෙණ; දස්සෙසි, දැක්වී; උ
පාසිකා, උපාසිකාවෝ; පසීදිත්වා, පැ
හැද; පුත්තෙන ගතදිසාභිමුඛා, පුත
නුවන් විසින් ගිය දිගට අභිමුඛව;
උරෙන නිපජ්ජිත්වා, ළෙන්බැස ගෙව;
නමස්සමානා, වඳිනී, ආහ, මෙමෙස කි
වූ; වත, එකාන්තයෙන්; මෙ පුත්තො ස
දිසං, මාගේ පුතනුවන් වැනිවූ; භික්ඛුං,
භික්ෂුවන්හු; කායසක්ඛිං කත්වා, කාය
සාක්ෂිකොට (සම්මුඛයේ ප්‍රතිග්‍රාහක
කොටය සුතැනී) භගවා, භගවත්
තෙමේ; රථවිනීත පටිපදං, දශ කථා
වස්තු පරිදීපන පූර්වභාගවූ රථවිනීතප
මාවෙන් විභාගිකවූ රථවිනීත සූත්‍ර
යෙහි ආ සප්තවිශුද්ධි පිළිවෙත්ද; නාල
ක පටිපදං "මොනෙය්‍යං තෙ උ
පඤ්ඤිස්සං" යනාදීන් බුදුන් විසින්
නාලකනම් තෙරුන්ට කී පිළිවෙත්ද;
තුවට්ටක පටිපදං "මූලං පපඤ්චසඞ්ඛා
ය"ති යනාදින් දෙසූ පිළිවෙත්ද;
චතුපච්චය සන්තොස භාවනාරාමතා
දීපකං, චීවරාදී සතරපසයෙහි සන්
තොෂය භාවනාරාමතාවද ප්‍රකාශවූ;
මහා අරියවංසපටිපදඤ්ච, මහා ආර්ය
වංශ ප්‍රතිපත්තියද; දෙසෙසි වදාළසේක,
දෙසූහයි සිතමි; විජාතමාතුයාතාව
ගෙහෙ, වැදූ මවකගේ ගෙහිහි;
තෙමාසං භුඤ්ජමානො, තුන් මසක්
වළඳන්නේ; අහං පුත්තො, මම පුත්
මි; ඉති මාතාපි, තෙපි මෑනියව; න
වක්ඛති, නොකියන්නේය; අහො,
විම්හය; අච්ඡරිය මනුස්සොති, ආශ්චර්ය
යවූ මනුෂ්‍යයෙකැයි ("පුත්තෙන ගත
දිසාභිමුඛා උරෙන නිපජ්ජිත්වා නම
ස්සමානා ආහ"යි යොදනු) එවරූප
ස්ස, මෙබඳුවූ මහණහට; මාතාපිත
රොපි පලිබොධා න හොන්ති,
මවුපියෝද පළිබෝධනම් නොවෙත්;
පගෙව අඤ්ඤං උපට්ඨාකකුලං, අන්‍ය
වූ උපස්ථායක කුලයෙක් පළිබොධ
නොවන බව කැලමැයි—

( හා • )

කුලයනම් ඤාති කුලයයෝ උපස්ථා
යක කුලයහොයි ඇතැම් මහණෙක්
හට උපස්ථායක කුලයි ලැබෙන්නාල
තෙමේ සුවපත්වන්නේයයි සිතා කු
ලයානා මිශ්‍රව විසීමෙන් කුලය පළි
බොධවන්නේය ඒ මහණ කුල මිනි
සුන්හැර බණ අසන්නට පිණිස ළඟ වෙ
හෙරට පවා නොයන්නේය කොරණ්ඩ
ක වෙහෙරවාසී මහතෙරුන් බෑණාවූ
ළදරු භික්ෂුහුවැනි ඇතැම් මහණෙකු
ට මවුපියෝපවා පළිබොධ නොවෙත්
මය හේ කෙසේදයත්? අනුරාධපුර
ය බඳ කොරඬක විහාරවාසී මහ

තෙරුන් බැනවූ ලදරු භික්ෂුහු පෙල කියවාගෙණ පුහුණුකරණුපිණිස රුහුණුදනව්වට ගියෝය මහතෙරුන් තැගත් උපාසිකාවෝද ඇම දවස්ම පුතු භික්ෂුහුගේ සුවදුක් පවත් මහතෙරුන් විචාරති මහතෙරහුද එක් දවසක් ලදරු භික්ෂුව කැඳවාගෙණ එමයි සිනා රුහුණුරට බලා වැඩියෝය ලදරු භික්ෂුහුද මෙහි වසන මට බොහෝකල් ඉක්මගියේය. දූත් වනාහි මාගේ උපාධ්‍යාය තෙරුන් දූත මවු උපාසිකාවගේද පවත් දූත එන්නෙමියි සිතා රුහුණින් නික්ම අනුරාධපුරය බලා එන්නේය උන්වහන්සේලා දෙදෙන මහවැලිගංතොටදී එක්වූවෝය ඒ ලදරු මහණ එක්තරා රුක් මුලෙක්හි මහතෙරුන්ට වතාවත් කොට එතැන්පස්ව සිටියේය ඉක්බිති මහතෙරුන් විසින් තෙපි කොහිසේදූයි විචාරණලද්දී එපවත් සැලකළාහ මහතෙරහුද තොපවිසින් කළනිසා යනපන උපාසිකාවෝද ඇම දවස් තොප පවත් විචාරයි මවද තොප කැඳවාගෙණ රටට ගියා ආදී දූත් වනාහි තොප සව් උපාසිකාව දක්නාට යව මම මෙහිම වස් එළඹෙමියි ලදරු භික්ෂුව පිටත්කොළේයි ඔහුද වස් එළඹෙන දවස්ම ඒ කොරතත වෙහෙරට පැමිණියේය පුතු භික්ෂුව උදෙසා ඔහුගේ පිය උපාසකතෙම පිහිටුවාම කරවාලද සෙනස්න ඒ භික්ෂුහට පැමිණියේය ඉක්බිති දෙවෙනි දවස් ඔහුගේ පිය උපාසකතෙම විහාරයට අවුත් වහන්ස අපේ සෙනස්න කවරෙකුට පැමිණියේදැයි විචාරන්නේ ආගන්තුක ලදරු භික්ෂුවකුටයයි අසා ඒ භික්ෂු කරා එළඹ වැඳ වහන්ස අපේ සෙනස්න වස් එළඹි භික්ෂුහට වතක් ඇත්තේයයි සැලකළාහ එවිට ලදරු භික්ෂුහුද ඒ කුමක්ද විචාළේද උපාසක යෙහියි විචාළහ වහන්ස වස් තුන් මස මුළුල්ලෙහි අපගේ ගෙහිම භික්ෂා වගෙණ වස් පවරා යන කල අපට දන්වා වැඩියයුතු වතෙක් ඇත්තේයයි සැලකළාහ ලදරු මහණද මුවෙන් නොබැණ ආරාධනාව ඉවසූයේය උපාසකයාද ගෙටගොස් උපාසිකාව බණවා එම්බල සොඳුර අපගේ සෙනස්නෙහි එක්තරා ආගන්තුක ආර්‍ය්‍යකෙනෙක් වස් එළඹියේය උන්වහන්සේට සකස්කොට උවටැන් කටයුත්තේයයි කීහ. උපාසිකාවෝද යහතැයි කියා මිහිරි කැඳබොජුන්ද සැපසූහ ලදරු මහණද වළඳනවේලෙහි මව්පියන්ගේ ගෙට වැඩියාහ ඒ ලදරු මහණ මව්පිය ආදී කිසි නෑකෙනෙක් නොහැඳින්නාහුය තුන් මසක් මුළුල්ලෙහි මව්පියන්ගේ ගෙහිම පිණ්ඩපාතය වළඳා වස් පවරා මුල් පුනිඳුවමෙන් මම යන්නෙමියි පිළිවිස්සාහ ඉක්බිති ඔහුගේ මව්පියෝ වහන්ස සෙටදවස වඩිනේමැනවයි කියා දෙවනදවස ගෙහිම වළඳවා ඉක්බිති තෙල්කුලාව පුරා පයනල්වන තෙලුත්දී එක් සකුරු මුඩුවක්ද නව රියන් සිවුරුපියළියක්ද දී වහන්ස ඉන්නා වැඩියමැනවැයි කීවාහුය ලදරු මහණද අනුමෙවෙනිකොට නැඟී රුහුණුරට බලා වැඩියාහ ඔහුගේ උපාධ්‍යාය මහතෙරහුද වස් පවරා පෙරගව එන්නාහු පළමු වඩනා දවස් දුටු තැනදීම ඔවුනොවුන් දූක එක්තරා රුක්මුලෙක්හි මහතෙරුන්ට වතාවත්කොට එතන්පසෙක සිටියාහ මහතෙරහුද කිමෙක්ද භද්‍රමුඛය තොපගේ මව් උපාසිකාව දක්නාලදදූයි විචාළේය ලදරු මහණද එසේය ස්වාමීනියි සියලු පවත් සැලකොට ඒ තෙලින් මහතෙරුන්ගේ පය මැඩ සකුරෙන් පානයක් තනා වළඳවා

පිළිසඳ මහතෙරුන්වම පුදා වැද ගො
මිනි මට රුහුණම සැපවන්නේයයි
අවසරගෙණ නැගිගියේය මහතෙර
හුද විහාරයට පැමිණ දෙවනදවස
කොරනක ගමට වන්නාහ උපාසිකා
තෝද මාගේ බෑණන්වහන්සේ ඉපු
තනුවන් කැඳවාගෙණ දූන් එති දූන්
එතියි මහතෙරුන් ගියදවස් පටන්
නිරන්තරයෙන් මග බලබලා සිටින්
නීය උපාසිකාවෝද මහතෙරුන්
උදකල්‍රාවම එනනා දූක එකාන්ත
යෙන්- මහතෙරුන්වහන්සේ උදක
ල්‍රාව ෟ එන්නේ මපුතනුවෝ මල
ස්ත්වනැයි සිතා ඉදිරියටගොස් මහ
තෙරුන්ගේ පාමුල වැටී මහ හඬින්
හඬමින් වැලපුනාහ මහතෙරහුද එ
කාන්තයෙන් ලදරු මහණ අපිස්බැ
වින් කුලයාකෙරෙනි නොඇලී තමා
නොහඳුන්වා ගියසේක්වනැයි සිතා
නැගනි උපාසිකාව අස්වසා වස් තුන්
මස මුලුල්ලේ ඔවුන්ගේ සෙනසුන්හි
වස් වැස ඔවුන්ගේ ගෙදොර නිබඳ
භික්‍ෂාව ගත් ලදරු මහණ ඔවුන්ගේ
පුත්‍රයාය යනාදී සියලු පවත් දන්වා
පා පසුම්බියෙන් ඔවුන්ම දුන් නව
රියන් වස්ත්‍රය මෑත්කොටගෙණ දූන්
වූහ උපාසිකාවෝද සෝදුක් තුනී
කොට අනිශයින් පැහැද එකාන්ත
යෙන් සර්වඥයන්වහන්සේ මපුතනු
වන්වැනි භික්‍ෂුවක්හු ඉදිරියෙහි ධර්‍ම
ප්‍රතිග්‍රාහකකොට දශකථාවස්තු ප්‍රකා
ශවන්නාවූ රථවිනීතසූත්‍රයෙහි සප්ත
විශුද්ධි ක්‍රමයද නාලකනම් තෙරුන්ට
වදාළ මොනෙය්‍ය ප්‍රතිපදාවද තුවටක
ප්‍රතිපදාවද සිව්පසයෙහි සන්තොෂයද
භාවනායෙහි ඇලීමද ප්‍රකාශවනනාවූ
මහා අරියවංස ප්‍රතිපදාවද දෙසනා
කෙළේයයි සිතම්හ තවද වැදූ මවගේ
ගෙනි තුන්මසක් වලඳන තැනැත්තේ
මා පුත්‍රසමි තෙපි මැතියව යන පම
ණකුදු නොකීයේය අහෝ ආශ්චර්‍ය්‍ය
මනුෂ්‍යයෙකැයි යනාදින් පුත්‍රයාගේ
ගුණ කියමින් පුතනුවන් ගියදිග බලා
ලෙන් බැසහෙව වඳිමින් ප්‍රීතිවාක්‍ය
පැවැත්තුවාහ මෙබඳු මහණහට මව්
පියෝ පවා පළිබොධ නොවෙත්නම්
අන් උපස්ථායක කුලයෙක් කෙසේ
පළිබොධ වන්නේද නොවන්නේ
මැයි.—

---

( ලා † )

ලාභොති චත්තාරො පච්චයා තෙ ත
ථං පළිබොධා හොන්ති පුඤ්ඤවන්තා
සඞ්ගි භික්ඛුනො ගතගතට්ඨානෙ මනු
ස්සා මහාපරිවාරෙ පච්චයෙ දෙන්ති
සො තෙසං අනුමොදෙන්තො ධම්මං
දෙසෙන්තො සමණධම්මං කාතුං ඔ
කාසං න ලභති අරුණුග්ගමනතො
යාව පඨමයාමො තාව මනුස්ස සංස
ග්ගො න උපච්ඡිජ්ජති පුන බලව
පච්චූසෙයෙව බාහුලික පිණ්ඩපාතිකා
ආගන්ත්වා භන්තෙ අසුකො උපාස
කො උපාසිකා අමච්චො අමච්චධීතා
තුම්හං දස්සනකාමාති වදන්ති
සො ගණ්හාහි ආවුසො පත්තචීවරන්ති ග
මනසජ්ජොව හොති නිච්චබ්‍යාවටො
තස්සෙවං තෙ පච්චයා පළිබොධා හො
න්ති තෙන ගණං පහාය යත්ථ නං න
ජානන්ති තත්ථ එකකෙන චරිතබ්බං
එවං සො පළිබොධො උපච්ඡිජ්ජති.—
ගණොති සුත්තන්තික ගණො වා ආභි
ධම්මිකගණො වා යො තස්ස උද්දෙසං
වා පරිපුච්ඡං වා දෙන්තො සමණධ
ම්මස්ස ඔකාසං න ලභති තස්ස ගණො
පළිබොධො හොති තෙන සො එවං
උපච්ඡින්දිතබ්බො සචෙ තෙසං භික්ඛූ
නං බහුගතං හොති අප්පං අවසිට්ඨං
තං නිට්ඨපෙත්වා අරඤ්ඤං පවිසිතබ්බං
සචෙ අප්පං ගතං බහු අවසිට්ඨං යො
ජනතො පරං අගන්ත්වා අන්තො යො

ජන පරිච්ඡෙදෙ අඤ්ඤං ගණ්ඨාවචනං උපසඞ්කමිත්වා ඉමම් ආයසම්ා උදෙදු සාදිහි සඞ්ගණ්හිතුනි වාතාබ්බං එවම් අලභමානෙන මයහං ආවුසො එකං තිවචනං අපි තුවෙහි යථා ඵාසු නපියනානි ගච්ඡථාති ගණ්ඨිපනාය අභාවිතා කම්මං කාතබ්බං—

( ස † )

ලාභොති, ලාභ නම්; චතාරෙ පච්චයා, සතරපසයෝයි; තෙ තාථං පළිබොධා හොනති, ඔහු කෙසෙ පළිබොධ වෙද්ද; ප්‍රඥාවනතාසස හි භිකඛුනො, විණැයි භිකුහට; ගහනහාවසාහෙ මනුසසා, ගියගියතැන මිනිස්සු; මහා පරිවාරෙ පච්චයෙ දෙනති (දෙනදෙන පසය පිරිකර සහිතකොට දෙන බැවින්) විපුල පරිවාර ඇති ප්‍රත්‍ය සන්දෙන් (බුඩපූජා පාසිවුරු ආදින් පිරිවරකොට ඇති අහර දන් පිණ්ඩපාතාදින් පරිවාරකොට සිවුරු දන් ආදී දෙති යන අදහසි) සො, හෙතෙම්; තෙසං, ඒ මිනිස්නට; අනුමොදෙනතො, අනුමෙවුහිකරන්නේ; ධම්මං දෙසෙනතො, දහම්දෙසන්නේ; සම ණධම්මං කාතුං ඔකාසං න ලභති, ම හණදම් පුරන්නට අවකාශ නොලැබේ; අරුණුගගමනතො, අරුණුනැගෙණනතෙකාපටන්; යාව පඨමයාමො, යම්තාක් ප්‍රථමයාමයද, තාව, ඒතාක්; මනුසස සංසගො, මිනිසුන්ගේ සසග; න උපච්ඡිජ්ජති, නොසිඳේ; පුන, නැවත; බලවපච්චුසෙ යෙව, අලුයම්වේලෙහිම; බාහුලික පිණ්ඩපාතිකා ආගනත්වා, ප්‍රත්‍යය බාහුලික පිණ්ඩපාතිකයෝ අවුත්; භනෙත, වහන්ස; අසුකො උපාසකො, අසුවල් උපාසකයෙමෙ) උපාසිකා, උපාසිකා තොමෝ; අමචෙවා, ඇමතිහෙමෙ; අමච්චධීතා, ඇමති දූතොමෝ; තුම්හාකං දසසනකාමාති වදනති, තෙප දක්නා කැමැත්තාහයි කියත්; සො, හෙතෙම, ගණ්හාවුසො පතතචීවර නති, ඇවත පාසිවුරුගණුයි; ගමනසජ්ජොව හොති, ගමනට සැරහුනේ වේ; නිච්චබ්‍යාවටො (උපාසක ආදීන් සැගැත්හෙි) හැමවේලෙහිම ව්‍යාවෘතවේ (පුකාරෙයි යුතැයි) තසස, ඔහට; එවං, මෙසේ; තෙ පච්චයා පළිබොධා හොනති, ඒ පසයෝ පළිබොධවෙත්; තෙන, එහෙයින්; ගණ පලිබාය, ගණයාහැර; යපට, යම් තැනක; තං, ඔහු; න ජානනති, නොහඳුනද්ද; තාථ, එහි; එකකො චරිතබ්බං, අසහායවූවනු විසින් හැසිරිය යුතු; එවං, එසේකල්හි; සො පළිබොධො, ඒ ලාභ පළිබොධය; උපච්ඡිජ්ජති, සිඳේ—

ගණොති, ගණපළිබොධ නම්; සුතනතිකගණො වා, සෞත්‍රාන්තික ගණය හෝය; ආභිධම්මිකගණො වා, ආභිධර්මික ගණය හෝයි; යො, යමෙක්; තසස, ඒ ගණයහට; උද්දෙසං වා, උද්දෙසය හෝ; පරිපුච්ඡං වා, පරිපුච්ඡා හෝ; දෙනෙතා, දෙන්නේ (උද්දෙස නම් පෙල කියවාදීමයි පරිපුච්ඡා නම් අර්ථ ඉගැන්වීමයි) සමණධම්මසස, ශ්‍රමණ ධර්මයට; ඔකාසං න ලභති, අවකාශ නොලැබේද; තසස, ඔහට; ගණො, ගණයතෙමේ; පළිබොධො හොති, පිලිබුඳුවේ; තෙන, එහෙයින්; සො, හෙතෙම; එවං, මෙසේ; උපච්ඡින්දිතබ්බො, පසිඳයුතු; සචෙ, ඉදින්; තෙසං භිකඛූනං, ඒ භික්ෂූන්ට; බහුං ගතං, බොහෝනිෂ්ටිතවීනම්; අපපං අවසිට්ඨං, මඳෙක් අවසිටියේ වීනම්; තං නිට්ඨපෙත්වා, ඒ නිමවා; අරඤ්ඤං පවිසි තබ්බං, වලට වැද්ද යුතු; සචෙ, ඉදින්; අපපං ගතං, මදෙක් නිෂ්ටිතවීනම්, බහුං අවසිට්ඨං, අවසිටියේ බොහෝවීනම්; ජොජනතො

පරං අගන්ත්වා, යොදනකින් මත්තට
නොගොස්; අන්තො යොජන පරි
ච්ඡෙදෙ, යොදනක් පමණින් ඇතු
ළෙහි; අඤ්ඤං ගණවාචකං උපසඞ්ක
මිත්වා, අතික් ගණවාචකයක්හු කරා
එළඹ; ආයස්මා, ආවත්තෙමෙ; උද්දෙ
සාදීහි, උද්දෙශ පරිපෘච්ඡාදීන්; ඉමෙ
සඞ්ගණ්හතූති, මොවුන්ට සඞ්ග්‍රහකෙ
රේවායි; වත්තබ්බං, කියයුතු; එවම්පි,
මෙසේද; අලභමානෙන, නොලබන්
නහු විසින්; මය්හං ආවුසො එකං
කිච්චං අත්ථි, ඇවැත්නි මාගේ එක්
කටයුත්තක් ඇති; තුම්හෙ, තෙපි;
යථා ඵාසුකට්ඨානානි ගච්ඡථාති, ඵාසු
තැනකට යෙත්වයි; ගණම්පහාය,
ගණයාහැර; අත්තනො කම්මං කාත
බ්බං, තමාගේ මහණදම් කටයුතු.

( හා † )

ලාභනම් චිවරාදී සිව්පසයෝයි ඒ
පසයෝ කෙසේ පළිබොධවේද්ද
යත්? පිණැති භික්ෂුහට ගියගියතෙන
මනුෂ්‍යයෝ සිවුරුආදී බොහෝ පිරි
කර පිරිවරකොටඇති මහදන් දෙන්
නෝය ඒ භික්ෂුහුද මිනිසුන්ට අනුමෙ
වෙනිකරමින් දහම් දෙසන්නහු මහ
ණදම් පිරීමට අවකාශ නොලබන්
නේය එබඳු පිණැති භික්ෂූන්ට අරු
ණු නැගුණුනැත්පටන් රාත්‍රි පෙරයම
දක්වා මිනිසුන්ගේ ආකීර්ණභාවය
නොසිඳෙන්නේය නැවත ඉතා අලු
යම්වේලෙහි ප්‍රත්‍යය බාහුලික පිණ්ඩපා
තිකයෝ අවුත් වහන්ස අසවල් උපා
සකයා අසවල් උපාසිකාව අසවල්
අමාත්‍යයා අසවල් ඇමති දූ නුඹවන්
සේ දක්නා කැමැත්තාවිහයි කියති ඒ
පිණැති භික්ෂුහුද ඇවත පාසිවුරු ග
ණුවයිකියා නිතර ගමනට සැරසෙන්
නෝය නිරතුරු උපාසකාදීන්ට ස
ඞ්ග්‍රහකිරීමෙහි නියුක්තව වසන්නේ
ය මෙසේ ඒ ප්‍රත්‍යයලාභී පිණැති
භික්ෂූන්ට ප්‍රත්‍යයෝ පළිබොධවෙත්
මය එහෙයින් එබඳු භික්ෂුහු විසින්
ගණයා අත්හැර යම්තෙනක මනු
නොහඳුනද්ද එබදු තෙනක උදක
ලාව හැසිරියයුතුය එසේ කල ඒ ලා
භයෙන්වන පළිබොධය දුරුවන්නේ
ය. ගණපළිබොධයනම් සෞත්‍රාන්තික
ගණයාහෝ ආභිධර්මික ගණයාහෝ
වෙයි. යම් භික්ෂුකෙණෙක් ඒ සූත්‍රය
හෝ අභිධර්මයහෝ ඉගෙණගන්නා
ගණයාහට පෙල කීමවාදීමහෝ අර්ථ
උගැන්වීමහෝ කරන්නේවීනම් ඔහ
ට මහණදම් පිරීමට අවසර නොලැ
බෙන්නේයි. ඔහට ගණය පළිබොධ
වන්නේය එහෙයින් සමාධි වඩන්නා
වූ භික්ෂුහු විසින් මෙසේ ගණ පළිබො
ධය සිඳියයුතුය. ඉදින් ඒ භික්ෂූන්ට
උගන්වන පාලිය හෝ අර්ථය හෝ
බොහෝ ඉක්මගොස් මදක් අවශෙෂ
වීනම් ඒ නිමවා වනට වැද්දයුතුය
ඉදින් මදක් ඉක්ම බොහෝ අවශෙ
ෂව ඇත්තේනම් බොහෝ කාලාන්
තරයක් නොවනපිණිස යොදනකින්
මත්තෙහි නොගොස් යොදනකින්
ඇතුළත අතික් ගණවාචකයක්හු
ඇත්තේනම් ඔහු කරා එළඹ ආයුෂ්
මත්නි උද්දෙස පරිපෘච්ඡාදියෙන් මො
වුන්ට සඞ්ග්‍රහකෙරේවායි කියයුතුය.
මෙසේද නොලබන්නහු විසින් ඇ
වැත්නි මාගේ එක් කටයුත්තෙක්
ඇත තෙපි ඵාසුතැනකට යෙත්වයි
කියා ගණයා හැර වනට වැද තමා
ගේ මහණදම් පිරියයුතුයි.

( සා ‡ )

කම්මන්ති නවකම්මං කරොන්තෙන
වඩ්ඪකී ආදීහි ලද්ධාලද්ධං ජානිතබ්බං
කතා කතෙ උස්සුක්කං ආපජ්ජිතබ්බ
න්ති සබ්බථාපි පළිබොධො හොති
සොපි එවං උපච්ඡින්දිතබ්බො සචෙ

අප්පං අවසිට්ඨං හොති නිට්ඨාපෙත
බ්බං සචෙ බහුං සංඝිකඤ්චෙ නවක
ම්මං සඞ්ඝස්ස වා භාරහාරක භික්ඛූ
නං වා නිය්‍යාදෙතබ්බං අත්තනො
සන්තකඤ්චෙ අත්තනො භාරහාර
කානං නිය්‍යාදෙතබ්බං තාදිසෙ අල
භන්තෙන සඞ්ඝස්ස පරිච්චජිත්වා ග
න්තබ්බං.–අද්ධානන්ති මග්ගගමනං
යස්ස කත්ථචි පබ්බජ්ජාපෙක්ඛො වා
හොති පච්චයජාතං වා කිඤ්චි ලද්ධබ්බං
හොති සචෙ තං අලභන්තො න ස
ක්කොති අධිවාසෙතුං අරඤ්ඤං පවි
සිත්වා සමණධම්මං කරොන්තස්සාපි
ගමිකචිත්තං නාම දුප්පටිවිනොදයං
හොති තස්මා ගන්ත්වා තං කිච්චං තී
රෙත්වා ව සමණධම්මෙ උස්සුක්කං කා
තබ්බං.–ඤාතීති විහාරෙ ආචරියු
පජ්ඣාය සද්ධිවිහාරික අන්තෙවාසික ස
මානුපජ්ඣායක සමානාචරියකා.–
ඝරෙ මාතා පිතා භාතාති එවමාදි
කා තෙ ගිලානා ඉමස්ස පලිබොධා
හොන්ති තස්මා සො පලිබොධො උ
පට්ඨහිත්වා තෙසං පාකතිකකරණෙන
උපච්ඡින්දිතබ්බො.–තත්ථ උපජ්ඣා
යො තාව ගිලානො සචෙ ලහුං න වු
ට්ඨාති යාවජීවම්පි පටිජග්ගිතබ්බො.–
තථා පබ්බජ්ජාචරියො උපසම්පදාචරි
යො සද්ධිවිහාරිකො උපසම්පාදිත
පබ්බාජිත අන්තෙවාසික සමානු
පජ්ඣායකා ච.–නිස්සයාචරිය උද්දෙ
සාචරිය නිස්සයන්තෙවාසික උද්දෙස
න්තෙවාසික සමානාචරියකා පන
යාව නිස්සය උද්දෙසා අනුපච්ඡින්නා
තාව පටිජග්ගිතබ්බා පහොන්තෙන
තතො උද්ධම්පි පටිජග්ගිතබ්බා එව.–
මාතාපිතූසු උපජ්ඣායෙ විය පටිපජ්ජි
තබ්බං.–සචෙපි හි තෙ රජ්ජෙ ඨිතා
හොන්ති පුත්තතො ච උපට්ඨානං
පච්චාසිංසන්ති කාතබ්බමෙව අථ තෙ
සං භෙසජ්ජං නත්ථි අත්තනො සන්ත
කං දාතබ්බං.–අසති භික්ඛාචරියාය
පරියෙසිත්වාපි දාතබ්බමෙව භාතුභගි
නීනං පන තෙසං සන්තකමෙව යො
ජෙත්වා දාතබ්බං සචෙ නත්ථි අත්ත
නො සන්තකං තාවකාලිකං දත්වා
පච්ඡා ලභන්තෙන ගණ්හිතබ්බං අල
භන්තෙන න චොදෙතබ්බා අඤ්ඤාත
කස්ස භගිනියා සාමිකස්ස භෙසජ්ජං
නෙව කාතුං න දාතුං වට්ටති තුය්හං
සාමිකස්ස දෙහීති වත්වා පන භගිනියා
දාතබ්බං භාතුජායායපි එසෙව නයො
තෙසං පන පුත්තා ඉමස්ස ඤාතකා
යෙවාති තෙසං කාතුං වට්ටති.–

( ස ‡ )

කම්මනායි, කර්මනම්; නවකම්මං, නවකර්මාන්තයි; තං, ඒ නවකර්මා
න්තය; කරොන්තෙන, කරන්නහු වි
සින්; වඩ්ඪකිආදීහි, වඩුආදීන් විසින්;
ලද්ධාලද්ධං ජානිතබ්බ, ලදනොලද
දෙය දතයුතු, කතාකතෙ උස්සුක්කං
ආපජ්ජිතබ්බන්ති, කළනොකළ කර්
යෙහි උත්සාහයට පැමිණියයුතුයයි;
සබ්බථාපි, හැම්පරිද්දෙන්ම; පලිබො
ධො හොති, පලිබොධයක්වේ (මේ කො
ලේය මේ නෙ කොලේයයි දුක්මුමු සි
තා කනයෙහි උත්සුකතානම් නො
හොත් "කතාකතෙ අප්පෙස මය
සොතව"යි ප්‍රනැති 'එලාඑලෙ" යනු
යෙහිදෙවිනි)සොවි, හෙද; එවං, මෙසේ;
උපච්ඡින්දිතබ්බො, පසිඳයුතු; සචෙ, ඉ
දීත්; අප්පං අවසිට්ඨං හොති, ඉදත් අ
වශිෂ්ටවීනම්; නිට්ඨාපෙතබ්බං, නිමවිය
යුතු ("සචෙබහුං අවසිට්ඨං"යි සබ්දන
රණු)ඉදිත් බොහෝ අවසිටියේවීනම්;
සචෙ සංඝිකංමෙව නවකම්මං, ඉදින්;
සංඝික නවකර්මයෙක්වීනම්; සඞ්ඝස්ස
වා භාරහාරක භික්ඛූනං නිය්‍යාදෙ

තබ්බං, සඞ්ඝයාගේ බර උසුලන භික්ෂූන්ටහෝ පාවාදියයුතු; අත්තනො සභාගකසෙව, ඉදින් තමා සතුවී නම්; අත්තනො භාරභාරකානං නිය්‍යාදෙතබ්බං, තමාගේ බර උසුලනට පාවාදියයුතු; තාදිසෙ අලභන්තෙන, එබඳු භාරහාරකයන් නොලබන්නහු විසින්; සඞ්ඝස්ස පරිච්චජිත්වා, සඞ්ඝයාටහැර; ගන්තබ්බං, යායුතු.

අධිගතානි, අධිගතනම්; මග්ග ගමනං, මගයාමයි; යස්සති, යමක්හුගේ; කාචි, කිසිතැනක; පබ්බජ්ජාපෙක්ඛාවාහොති, පැවිද්දෙහි අපෙක්ෂා ඇත්තේවීනම්හෝ; පච්චයජාතං වා, කිඤ්චිලද්ධබ්බං හොති, කිසි ප්‍රත්‍යයෙක් හෝ ලැබියයුතුවීනම්; සචෙ, ඉදින්; තං අලභන්තො න සක්කොති අධිවාසෙතුං, ඒ නොලබන්නේනේ ඉවසියනොහේද (ඉදින් නොලබන්නේද ඉවසියනෝනම් වළටවැද මහණදම් කට යුතුය යන අභිප්‍රායයි) අරඤ්ඤං පවිසිත්වා, අරණ්‍යයට වැද; සමණධම්මං කරොන්තස්සාපි, මහණදම්කරන්නහුවද; ගමිකචිත්තං නාම දුප්පටිවිනොදයං හොති, ගමන්යනු කැමැත්තහු සිත නොවැලක්වියහැකි; තස්මා, එහෙයින්; ගන්ත්වා, ගොස්; තං කිච්චං තීරෙත්වා, ඒ කටයුත්ත නිමවා; සමණධම්මෙ උස්සුක්කං කාතබ්බං, මහණදම්හි උත්සාහකටයුතු; ඤාතීති, නෑයෝනම්; විහාරෙ, විහාරයෙහි; ආචරිය, ආචාර්‍ය්‍යහ; උපජ්ඣාය, උපාධ්‍යායයහ; සද්ධිවිහාරික, සද්ධිවිහාරිකයහ; අන්තෙවාසික, අතවැස්සහ; සමානුපජ්ඣායක, සමානවූ උපාධ්‍යායයන් ඇත්තහ; සමානාචරියකා, සමානවූ ආචාර්‍ය්‍යයන් ඇත්තහ (එක උපාධ්‍යායයන් එක ආචාර්‍ය්‍යයන් ඇත්තාහ යුතැනී) ඝරෙ, ගෙයි; මාතා, මවුය; පිතා, පියාය; භාතානී, බෑය යන; එවමාදිකා, මේ ආදීහුයි; තෙ, ඔහු; ගිලානා, ගිලන්වූවාහු; ඉමස්ස, මේහට; පලිබොධා හොන්ති, පලිබොධවෙත්; තස්මා, එහෙයින්; සො පලිබොධො, ඒ පලිබොධය; උපට්ඨහිත්වා, උපස්ථානකොට; තෙසං, ඔවුන්ට; පාකතිකෙන කරණෙන, පියවයි කිරීමෙන් (නීරොගකාලමෙන් කිරීමෙනැයි යුතැනී) උපච්ඡින්දිතබ්බො, පසිඳියයුතු; තත්ථ, ඔවුන්කෙරෙහි; උපජ්ඣායො, උපාධ්‍යායයෝ; ගිලානොහොති, ගිලන්වූවාහු; සචෙ, ඉදින්; ලහුං න උට්ඨහති, වහා නොනැගෙත්නම්; යාවජීවම්පි, සාවජීවයෙනුදු; පටිජග්ගිතබ්බො, පිළිදුගනයුත්තෝ; පබ්බජ්ජාචරියො, පැවිදිකළ ඇජරෝද; උපසම්පදාචරියො, උපසම්පදාදුන් ඇජරෝද; සද්ධිවිහාරිකො, සද්ධිවිහාරිකද; උපසම්පාදිත, කාම්වදන් කියවා තමා විසින් උපසම්පන්නකරවනලද අතවැසිද; පබ්බාජිත අන්තෙවාසික, පැවිදිකරවනලද අතවැසිද; සමානුපජ්ඣායකාච, එක උපාධ්‍යායයන් ඇත්තේද යන මොහුද; තථා, එසේමැයි (ගිලන්වූවාහු උපස්ථානකටයුතු යුතැනී) නිස්සයාචරිය, නිස දුන් ඇජරෝය; උද්දෙසාචරිය, උදෙස දුන් ඇජරෝය; නිස්සයන්තෙවාසික, නිසා වසන අතවැසිය; උද්දෙසන්තෙවාසික, උදෙසගන්නා අතවැසිය; සමානාචරියකා පන, එක ඇජරන් නිසා වසන්නේද යන මොහු වනාහි; යාව, යම්තාක්; නිස්සය උද්දෙසා අනුපච්ඡින්නා, නිශ්‍රය උදෙසය යන මොහු නොසිඳ පවත්නාහුද; තාව පටිජග්ගිතබ්බා, ඒතාක් පිළිදුගනයුතුනුයී; පහොන්තෙන, පොහොසත්හු විසින්; තතො උද්ධම්පි, එයින් මත්තෙහිද; පටිජග්ගිතබ්බා එව, පිළිදුගනයුත්තාහුමැයි; මාතාපිතුසු, මව්පියන්කෙරෙහි; උපජ්ඣායෙ විය, උපාධ්‍යායන් කෙරෙහිමෙන්; පටිපජ්ජි

නානං, පිළිපැද්දයුතු; සචෙපි හි, ඉ
දින්; තෙ, ඒ ඉවුපිසෝ; රජෙජපි ඨි
තා හොනහි, රජයෙහි සිටියාහුවූ
නමුද; දූතන්තොව උපට්ඨානං පච්චා
සිංසනහි, පුනනුවන්කෙරෙන් වනා
හි උපසථානකැමැතිවුහම්; නාතබ්බ
මෙව, කටයුතුමැයි; අථ, ඉදින්; තෙ
සං හෙසජ්ජං නත්ථි, ඔවුන්ට බෙ
හෙත් නැත්නම්; අත්තනො සන්ත
කං දාතබ්බං, තමාසතු බෙහෙත් දිය
යුතු; අසති, තමා සතු බෙහෙදක්
නැත්නම්; භික්ඛාචරියාය පරියෙසි
ත්වා, භික්ෂාචාරයෙන් පයෙෂීෂණය
කොට; දාතබ්බමෙව, දියයුතුමැයි;
මාතුභගිනිභාගිනෙය, මාතුභගිනීන්ට
වනාහි (හාතුනම් තමහට බාල වැඩි
මහලු කුසහොත්තෝය හගිනීනම්
බාල වැඩිමහලු කුසහොත්තියි) තෙ
සං සන්තකමෙව, ඔවුන් සතු බෙ
හෙත්ම; යොජෙත්වා දාතබ්බං, යොද
දියයුතු; සචෙ නත්ථි, ඉදින් නැත්
නම්; අත්තනො සන්තකං, තමාසතු
බෙහෙත්; තාවකාලිකං දත්වා, තාවු
කාලිකොටදී; පච්ඡා, පසුව; ලභන්
තෙන ගණ්හිතබ්බං, ලබන්නාහු විසින්
ගතයුතු; අලභන්තෙන, නොලබන්
නාහු විසින්; න චොදෙතබ්බා, නො
ඉල්වියයුත්තාහුයි; භගිනියා, කුස
හොත්නියගේ; අඤ්ඤාතිකස්ස සාමි
කස්ස, නොනෑසැමියහට; භෙසජ්ජං
නෙව කාතුං න දාතුං වට්ටති, බෙ
හෙත්කරන්නටද නොවටී දෙන්න
ටද නොදවටී; තුය්හං සාමිකස්ස දෙ
හිති, තීගේ සැමියහටදෙයි; වත්වා,
කියා; භගිනියා දාතබ්බං, කුසහොත්නි
යට දියයුතු; භාතුජායාය පි, කුස
හොත්තාහුගේ අඹුවටද; එසෙවන
යො, මේම නයයි; තෙසං පන පුත්තා,
ඔවුන්ගේ පුත්‍රයෝ වනාහි; ඉමස්ස
ඤාතකායෙව, මේ භික්ෂුහට නෑයෝ මැ
යි; තෙසං කාතුං වට්ටති, ඔවුන්ට
බෙහෙත්කරන්නට වටී.

( නා. ‡ )

කම්මං ති විහාරකම්මාදි නවක
ම්මයි ඒ නවකම්කරනනාහු විසිනුදු වඩු
ආදීන් විසින් අසවල් දුවදඬු ආදී උ
පකරණ ලබනලද්දේය අසවල් උප
කරණ නොලබනලද්දේයයි දතගත
යුතුවෙයි මේ කම්මාන්තය කෙළේය
මේ කම්මාන්තය නොකෙළේයයි දත
නොහිමි කම්මාන්තයෙහි උත්සාහ ක
වයුතුය මෙසේ සර්වප්‍රකාරයෙන්ම න
වකම්මාන්තය පළිබොධවන්නේය ඒ
පළිබොධයද මෙසේ පසිඳියයුතුය
ඉදින් මදක් අවශෙෂවීනම් නිමවිය
යුතුය බොහෝ අවශෙෂන්වීනම් නව
කම්මාන්තයන් සඟසතුවීනම් සඞ්ඝයා
ගේ බරඋසුලන යම් භික්ෂූනම්කටහෝ
පාවාදියයුතුවෙයි ඉදින් නවකම්මාන්ත
ය තමාසතුවීනම් තමාගේ බර උසුල
නොහැකුවහෝ පාවාදියයුතුවෙයි එ
බඳුක් නොලබනනාහු විසින් තමා
සතු කම්මාන්තය සඟසතුකොටදී වල
ට යායුතුයි.

අද්ධාන නම් මාර්ගයෙහි යාමයි සිංහ
ලද්වීපයෙහි ප්‍රව්‍රජ්‍යාව ආවාහ විවාහ
මඞ්ගල්‍යමෙන් දීත තියනකොටකර
ණබැවින් යමෙක්හුගේ යම්කිසි තැ
නෙක ප්‍රව්‍රජ්‍යායෙහි නැමැත්තක්
ඇත්තේවීනම්හෝ කිසිතැනෙක යම්
කිසි ප්‍රත්‍යයෙක්හෝ ලැබියයුතුවීනම්
ඉදින් ඒ ප්‍රත්‍යය නොලැබීමෙන් නො
ඉවසියහැකිවේද එබඳු අන්‍ය විහිත
යක් ඇති කල වලට වැද මහණදම්
කරන්නාහටද ඒ ගමන්යනුකැමැති
සිත වලකාලිය නොහෙහී එහෙයින්
ඒ ගමන් ගොස් කටයුතු නිමවාම

මහණදම් පිරීමෙහි උත්සාහ කටයුතු ඉදින් ඒ ප්‍රත්‍යය නොලැබීම ඉවසිය හැකිවේනම් ඒ ගමන් නොගොස්ම වළට වැද මහණදම් පිරියයුතු වන්නේයි.

නෑයෝනම් විහාරයෙහි ආචාර්‍ය්‍යයෝය උපාධ්‍යායයෝය සමග වසන භික්‍ෂූහුය අතවැස්සාය එක උපාධ්‍යායයන් ඇති තැනැත්තේය එක ආචාර්‍ය්‍යයන් ඇති තැනැත්තේය යන මෙතෙක්දෙනාහා ඇතුළුගම මෑනියෝය පියානෝය සහෝදරයෝය යන මේ ආදීහුයි. මොවුන් ගිලන්වූවාහුනම් මේ භික්‍ෂුහට පළිබෝධවන්නාහුය එසේ ඇති කල ඔවුන්ට උපස්ථානකොට නිරෝගීකරවීමෙන් ඒ පළිබෝධය පසිඳියයුත්තේය ඒ නෑයන් අතුරෙනුදු ඉදින් උපාධ්‍යායයෝ ගිලන්වූවාහු වහා ලෙඩින් නොනගින්නම් දිවිහිම්යෙනුදු උපස්ථාන කටයුත්තෝය තමා පැවිදිකල ආචාර්‍ය්‍යයෝය උපසම්පදාකල ආචාර්‍ය්‍යයෝය සමගවසන මහණය තමාවිසින් කර්‍මවාචානුශ්‍රාවණයකොට උපසම්පදාකරවනලද අතවැස්සාය තමාවිසින් පැවිදිකරණලද අතවැස්සාය එක උපාධ්‍යායයන් ඇතිතැනැත්තේය යන මොහු ගිලන්වූව හු උපාධ්‍යායයන්ට මෙන් උපස්ථාන කටයුත්තාහුය නිසදුන් ආචාර්‍ය්‍යයෝය පෙළ කියවාදුන් ආචාර්‍ය්‍යයෝය තමන්ගෙන් නිසගෙණ වසන අතවැස්සාය තමන්ගෙන් පෙළ කියවාගන්නා අතවැස්සාය එක ආචාර්‍ය්‍යයන් ලඟ නිසගෙණහෝ පෙළ කියවාගෙණහෝ වසන තැනැත්තේය යනමොහු වනාහි ඒ නිසදීමහෝ පෙළ කියවාගැණීමහෝ නොකඩව පවත්නාතාක් පිළිදුගුම් කටයුත්තාහුය ඉන්මත්තෙහිද හැකිවීනම් පිළිදුගුම් කටයුත්තාහුමය මවුපියන් කෙරෙහි වනාහි උපාධ්‍යායයන්කෙරෙහිමෙන් දිවිහිම්යෙන්ම පිළිපැද්ද යුතුයි. ඉදින් ඒ මවුපියෝ රජසැපතෙහි පිහිටිය·හුනුමුත් පුතනුවන්ගෙන්ම උපස්ථාන ලබනු කැමැත්තාහුනම් කටයුතුම්වන්නේය ඉදින් ඒ මවුපියන්ට බෙහෙත්පස නැත්තේවීනම තමාසතු බෙහෙත් දියයුතුය තමාසතු බෙහෙදකුත් නැත්තේවීනම් භික්ෂිගිමෙන්හෝ සොයා දියයුතුවන්නේමැයි එකකුසහොත් බාල වැඩිමහලු සහොදර සහොදරීන් ගිලන්වූවාහුනම් ඔවුන් සතු බෙහෙත්ම සොඳ දියයුතුයි ඔවුන් සතු බෙහෙදෙක් නැත්තේවීනම් තමාසතු බෙහෙත් තාවකාලිකකොටදී පසුව ඔවුන්ගෙන් ලැබුනේවීනම් ගතයුතුවන්නේය ඉදින් නොලැබුනේවීනම් දෙවයි නොඉල්වියයුත්තාහුය එකකුදුවූවත් එකකුසහොත් බුහුණනියගේ නොනෑ සවාමිපුරුෂයාහට බෙහෙත් කරන්නටද බෙහෙත් දෙන්නටද නොවටනේය නිගේ සැමියාහට දෙවයි කියා එකකුසහොත් බුහුණනියන් අතට තමාසතු බෙහෙත් දියයුතුය. එකකුසහොත් මල්බෑයන්ගේ නොනෑ අඹුවටද මෙසේම වන්නේයි එත අදුවුවත් නොනෑ සුහුරගේද නොනෑ බුහුණනියන්ගේද දරුවෝ මේ භික්‍ෂුහට නෑවනබැවින් ඔවුන්ට බෙහෙත්කරන්නටද දෙන්නටද වටනේමැයි.

( පා ¶ )

අ·බාධොති යොකොචි රොගො සො බාධයමානො පළිබොධො හොති තස්මා හෙසජ්ජකරණෙන උපච්ඡින්දිතබ්බො සචෙ පන කතිපාහං හෙසජ්ජං කරොන්තස්සාපි න වූපසමෙති

නාහං තුය්හං දොසො නහනකො තං සෙවිතිං පොසෙහොනා අනමතග්ගෙ සංසාරවට්ටෙ දුක්ඛපපෙතානි, අනාත භාවි ගරහිත්වා සමණධම්මං කාත බ්බා—ගහෙසානි පරිහානි පරිහ රණං තං සප්පායාදීනි නිච්චච්චනාවට් ටස්ස පළිබොධොහොති න ගුනර ස්ස තාන්ති වත්ථු—මණ්ඩිකෙහා ණකාලදවිලෙත්ගෙන ගිර මිලසවාසි ලෙ විසෙට්ඨස්ස සමාගිකං ගහෙත්වා නාමිවි ධිහා සාමි ලෙලෙන කිඳිසොයි ආවු සො පරිසකාගිසනානි මජ්ඣිමෙ වෙ ගසෙනා පතුලෙණානි ආවුසො මජ්ඣි මෙ හාසෙස දුපපජ්ජාතෙන මිලපණ්ණා සං සජ්ඣායනතස්ස මජ්ඣිමපණ්ණාස ණො ආගච්ඡති තං සජ්ඣායනාස්ස උපරිපණ්ණාසො සුතො තුය්හං කම්මට්ඨානානි ගහෙනා තුම්හාකං සමාගිකෙන කම්මට්ඨානං උත්තා පුන තා මිලාතකාසාමිති කම්මට්ඨානං ග හෙත්වා එකුනවීසති වස්සානි සජ්ඣා යං අකත්වා වීසතිමෙ වස්සෙ අරහත්ත පත්වා සජ්ඣායත්ථාය ආගතානං භි ක්ඛූනං වීසති මෙ ආවුසො වස්සානි පරියත්ති අනොලොකෙන්තස්ස අපි ච ඛො කතපරිචයො අහං එත්ථ ආරභ ථාති වත්වා ආදිතො පට්ඨාය යාව ප රියොසානා එකබ්‍යඤ්ජනෙපි කඞ්ඛා නාහොසි—කාරලිය තිස්සත්ථෙර ස්සාපි අට්ඨාරසවස්සා නි පරිසානි ජහිත්වා හිත්ඛූනා පාපුරානී උද්දිසි තෙසං ගාමවාසිකත්ථෙරෙ සද්ධිං සාසනපච්චනිකා එකපදෙසොපි උපප විතාවිතා ආගෙතා නාහොසි—

( ඝ )

ආබාධෙබාධෙහි, ආබාධිනම්; යො කොචි රොගො, ඉල්ලූසෝ අනුගිද්ධියෝ යම්කිසි රොගයකිඃ සො, ඒරොගය; බාධයමානො, පෙළන්නේ; පළිබො

ධො හොති, පළිබොධවේ; තසමා, එහෙයින්; සො, ඒ ආබාධ පළිබොධ ය; භෙසජ්ජකරණෙන උපච්ඡින්දිත බ්බො, බෙහෙත් කිරීමෙන් පසිඳුනු; සචෙපන, ඉදින්; කතිපාහංභෙසජ්ජං කරොන්තස්සාපි. කීප දවසක් වෙ දෙන්කරන් නාහටද; න උපසම්මති නොසන්හිදේනම්; නාහං තුය්හං ද සො, මම තාගේ දසිනම් නොදවෙමි; න භනකො, බැලසනීම් නොදෙවෙමි; තං සෙවි පොසෙනා, තාම පොෂ ණය කරන්නෙමි; අනමතගෙග සං සාරවට්ටෙ, අනුව නොදන්නාලද ස සරවට (අනාදිමත් සසරය සුනැති) දුක්ඛපපෙනානිති, දුකට පැමිණි යෙම්චිමියි; අනාතභාවං ගරහිත්වා, ආත්මභාවයට නින්දාකොට; සමණධ ම්මං කාතබ්බො, මහණදම් කටයුතු.

ගහෙසානි, ගුළනම්; පරිසනානි පරි හරණං, පසනානි පරිහරණයයි; තං, ඒ; සප්පායාදීනි, සප්පායසහ ධාර ණය පරිවාසය පරිපුච්ඡාය සහාදින්; නිච්චච්චනාවට්ටස්සව, නිත්‍යයෙන් නි පුත්තයනාවම; පළිබොධොහොති, ප ළිබොධවේ; න ගුනරස්ස, අපිනාවිටය භව නොවේ (ගුණපූරය හැරද සිවිය නට ගුණය පවතිනම් ඕහට පළිබොධ නොවෙයි දක්විනපිණිස "නගුනා" යනාදී කීහු) නනු, එයි (අපිනාවිටියහ ට පළිබොධ නොවීමෙහිය සුනැති) ඉම්හා වත්ථු ති, මේ වස්තුහුයි; මජ්ඣිම භාණක දෙවත්ථෙරෙන කිර, මධ්‍යම භාණක දෙවනම් තෙරනු මිලසවාසි, ම ලය වෙසනසෙනි විසන (මල්විල විසන සුනැති) දෙවත්ථෙරස්ස සමාගිකං ග හෙත්වා, දෙව නම් තෙරුන්වහන්සේ ස මීපයට එලඹ; කම්මට්ඨානං යාචි, කා මටහන් ඉල්වූහු; ථෙරො, තෙරහු; ආවුසො, ඇවැත; පරියත්තියං කී

දිඝසායි, පයිඤ්ඤපතියෙහි කොබන්දෙනි
දූසි; පුච්ඡි, විචාළේයි; මජ්ඣිමො මෙ
භන්තෙ පගුණො, වහන්ස මධ්‍යම
නිකාය මට පුහුණුයයි කීහු; ආවුසො,
ඇවත; එසො මජ්ඣිමො නාම දුප්පරි
හාරො, මේ මධ්‍යම නිකායනම් දුකින්
පරිහරණය කටයුත්තේය; මූලපණ්
ණාසං සජ්ඣායන්තස්ස, මුල් පණස
ස්වාධ්‍යායනය කරන්නාහට (පිරිවහන්
නාහට) මජ්ඣිමපණ්ණාසකො ආග
ච්ඡති (සූත්‍ර ප්‍රදෙශයන්ද වාරයන්ද
සදෘශබැවින්) මැදි පණස එන්නේය;
තං සජ්ඣායන්තස්ස, ඒ මැදි පණස
ස්වාධ්‍යායනය කරන්නාහට; උපරිපණ්
ණාසකො, උපරිපණස එන්නේය; කු
තො තුය්හං කම්මට්ඨානගහණං, තොප
ට කමටහන් කොයිද්දයි; භන්තෙ, ව
හන්ස; තුම්හාකං සන්තිකෙ, තොප
සමීපයෙහි; කම්මට්ඨානං ලභිත්වා, ක
මටහන් ලදින්; පුන න ඔලොකෙ
ස්සාමීති, නැවත නොබලම්යි; කම්ම
ට්ඨානං ගහෙත්වා, කමටහන් ගෙණ;
එකූනවීසතිවස්සානි, එකුන්විසි අවු
රුද්දක්; සජ්ඣායං අකත්වා, නොපිරි
වහා; වීසතිමෙ වස්සෙ අරහත්තම්ප
ත්වා, විසිවන හවුරුදු රහත් බවට පැ
මිණ; සජ්ඣායත්ථාය ආගතානං භික්ඛූ
නං, ස්වාධ්‍යායනය පිණිස ආ භික්ෂූන්ට;
ආවුසො, ඇවැත්නි; පරියත්තිං අ
නොලොකෙන්තස්සමෙ, පරියත්තිය
නොබලන්නාවූ මට; වීසති වස්සානි,
විසි හවුරුද්දෙක් ඇත; අපිච ඛො, එ
තකුදුවුවත්; අහං, මම; එත්ථ, මෙහි;
කතපරිචයො, කරණලද පරිචය ඇ
තෙනම්; ආරභථාති වත්වා ආරම්භක
රවයි කියා; ආදිතො පට්ඨාය යාව ප
රියොසානා, ආදියෙහිපටන් කෙළවර
දක්වා; එකබ්‍යඤ්ජනෙපි, එක්ව්‍යඤ්ජ
නයෙකද; කඞ්ඛා නා හොසි, සැක
යෙක් නොවී.

කාරලියගිරි වාසී නාගත්ථෙරොපි,
කාරලිගිරි නාම් තැන වසන නාග
නාම් තෙරහුද; අට්ඨාරසවස්සානි පරි
යත්තිං ඡඩ්ඩෙත්වා, අටළොස් හවුරුදු
දෙක් පයඤ්ඤපතිය හැර; භික්ඛූනං,
භික්ෂූන්ට; ධාතුකථං උද්දිසි, ධාතු ක
ථාව උදෙසූහු; ගාමවාසිකත්ථෙරෙහි
සද්ධිං, අනුරාධපුරවැසි තෙරුන්හා සම
ග; සංසන්දන්තානං තෙසං, සංසන්ද
නය කරණ ඒ භික්ෂූන්ගේ; එක ප
ඤ්හොපි උප්පටිපාටියා ආගතො නා
හොසි, එකද ප්‍රශ්නයෙකුදු උත්පටි
පාටින් ආයේ නොවී.

( හා· ¶ )

ආබාධනම් යම්කිසි රෝගයෙක්වන්
නේයි. ඒ රෝගයෙන් පෙළනු ලබන්
නේනම් පළිබොධ වෙයි, එහෙයින්
ඒ රෝග පළිබොධය බෙහෙත් කිරී
මෙන් පසිඳිය යුතුවෙයි. ඉදින් කිහිප
දිනක් බෙහෙත් කරණුවනටද රෝග
ය නොසන්සිඳේනම් තමාගේ ආත්ම
භාවය බණවා එම්බල මම නාගේ
දාසයෙකුදු නොවෙමි නට බැළමෙ
හෙකරන්නෙකුදු නොවෙමි මම ව
නාහි නෝම පොෂනයකරමින් අනා
දිමත් සසර අනාදිමත් කාලයක්
මුලුල්ලේ සැරිසරමින් දුකට පැමිණි
යෙමියි යනාදීන් ආත්මභාවයට ගර
හා රෝගාබාධය අපෙක්ෂානොකොට
කොස් මහණදම් පිරියයුතුය. ග්‍රන්ථ
නම් ත්‍රිපිටක පයඤ්ඤපතිධර්ම පරිහර
ණය කිරීමවෙයි. ඒ පයඤ්ඤපති ධර්ම
ඉගෙණීම දැරීම් පුරුදුකිරීම් පිළිවිසීම්
ආදියෙහි නිරන්තරයෙන් නියුක්තයා
හට පළිබොධවන්නේය. එනකුදු
වුවත් ග්‍රන්ථධුරය හැර සිටියහුටද ඒ
ග්‍රන්ථය නොනැසී පවතීනම් එබඳු
මහණහට පළිබොධ නොවන්නේමය
ඒ ග්‍රන්ථධුරයෙහි නියුක්ත නොවූවා
හට පළිබොධ නොවීමෙහි මේ කතු
දක්වන කථාවස්තුහු දතයුත්තාහුයි.

එක් සමයෙක්හි මධ්‍යම විහාරණික දෙව:ස්ථිරයෝ මලය ජනපදවාසී මහා දෙවස්ථවිරයන්හට එලම්බ සඟාසි උපදවුනු පිණිස කම්ටහන් ඉල්වූහ. තෙරුන්වහන්සේ ඇවැත්නි තෙපි පයඹ්‍යාපතිය කෙනෙක් දුරව පුහුණුකල හුදුයි විචාළේය. වහන්ස මට මැදුම්සඟිය පුහුණයයි කීහ ඇවැත්නි මැදුම්සඟිය දුකාසේ පරිහරිණය කවියුතු උත්තෙයි මුල් සූත්‍ර පණස පිරිවහත්හානට බොහෝසෙයින් සූත්‍ර ප්‍රදෙශවාරවශයෙන් සමානබැවින් මැදි පණස එන්තෙන් මැදිපණස පිරිවහත්නාහට උපරිපණස එයි එහෙයින් නොපව සූමණ කම්ටහනෙක්දැයි කීයේය ඉක්බිති මධ්‍යම භාණක දෙවස්ථිරයෝ වහන්ස නුඹවහන්සේ ලඟ කම්ටහන්ගෙණ නැවත ඒ මැදුම්සඟිය නොබලමියි කියා කම්ටහන්ගෙණ වලට වැද භාවනා එඩා එකුන්විසි අවුරුද්දක් මුලුමෙලෙනි නොපිරිවහාසිට විසිවෙනි අවුරුද්දෙහි රහත්බවට පැමිණ පිරිවාණාපිණිස පැමිණි භික්ෂූන්ට කියන්නාහු ඇවැත්නි පයඹ්ජ්‍යහිය නොබලන්නාවූ මට විසි අවුරුද්දක් ඉක්මුනේය එහෙයුදුවුවත් මම මෙහි පුරුදුකරණලද්දෙමි. තෙපි සවධ්‍යානාවව පටන්ගණුවයි කියා මුලපටන් කෙළවර දක්වා හදරවත්නාහට එක් බ්‍යඤ්ජනයෙක්හිදු සැකයෙක් නොවූයේය.

තවද කැරලිගිරිනම් වෙහෙර වසන නාග නම් තෙරුන්වහන්සේද අටළොස් අවුරුද්දක් මුලුමෙලෙනි පයාපතිය නොපිරිවා ඇරසිට භික්ෂූන්ට ධාතුකථාප්‍රකරණ පාලිය කියවා ඇසී ඉගැන්වූහ ඒ භික්ෂූහු අනුරාධපුරවාසී භික්ෂූන් හා සමග සංසන්දනය කරත්නාහු එකද ප්‍රශනයකුදු පිළිවෙළ ඉක්මවා නො ආයේයි.......

( පා * )

මහාවිහාරෙ තිපිටක චූලාභයත්ථේරෝ නාම අට්ඨකථා අනුගගහෙත්වාව පඤ්චනිකායමණ්ඩලෙ තීණි පිටකානි පරිවත්තෙස්සාමීති සුවණ්ණභෙරිං පහාරාපෙසි භික්ඛුසඞ්ඝො කතමාචරියානං උග්ගහො අත්තනො ආචරියුග්ගහං යෙව වදතු ඉතරථා වත්තුං නදෙම්මාති ආහ උපජ්ඣායොපි නං අත්තනො උපට්ඨානං ආගතං පුච්ඡි ත්වං ආවුසො භෙරිං පහාරාපෙසීති, ආම භන්තෙ කිං කාරණාති පරියත්තිං භන්තෙ පරිවත්තෙස්සාමීති ආවුසො අභය ආචරියා ඉමං පදං කථං වදන්තීති එවං වදන්ති භන්තෙති ථෙරො හුංති පටිබාහි පුන සො අඤ්ඤෙන අඤ්ඤෙන පරියායෙන එවං වදන්ති භන්තෙති තික්ඛත්තුං ආහ ථෙරො සබ්බං හුංති පටිබාහිත්වා ආවුසො තයා පඨමං කථිතො යෙව ආචරිය මග්ගො ආචරිය මුඛතො පන අනුග්ගහිතත්තා එවං ආචරියා වදන්තීති සණ්ඨාතුං නාසක්ඛි ගච්ඡ අත්තනො ආචරියානං සන්තිකෙ සුණාහීති කුහිං භන්තෙ ගච්ඡාමීති ගඞ්ගාය පරතො රොහණජනපදෙ තුලාධාර පබ්බත විහාරෙ සබ්බපරියත්තිකො ධම්මරක්ඛිතත්ථෙරො නාම වසති තස්ස සන්තිකං ගච්ඡාති සාධු භන්තෙති ථෙරං වන්දිත්වා පඤ්චහි භික්ඛුසතෙහි සද්ධිං ථෙරස්ස සන්තිකං ගන්ත්වා වන්දිත්වා නිසීදි ථෙරො කස්මා ආගතොසීති පුච්ඡි ධම්මං සොතුං භන්තෙති ආවුසො අභය දීඝමජ්ඣිමෙසු මං කාලෙන කාලං පුච්ඡන්ති අවසෙසම්පන මෙ තිංසමත්තානි වස්සානි න ඔලොකිතපුබ්බං අපිච ත්වං රත්තිං මම සන්තිකෙ පරිවත්තෙහි අහං තෙ දිවා කථයිස්සාමීති සො සාධු භන්තෙති තථා අකාසි පරිවෙණද්වාරෙ මහා මණ්ඩපං කාරෙත්වා ගාමවාසිනො දිවසෙ දිවසෙ

ධම්මසවණාය ආගච්ඡන්ති ථෙරො රත්තිං පරිවත්තිතං දිවා කථයන්තො අනුපුබ්බෙන දෙසනං නිට්ඨපෙත්වා අභයත්ථෙරස්ස සන්තිකෙ තට්ටිකාය නිසීදිත්වා ආවුසො මය්හං කම්මට්ඨානං කථෙහීති ආහ භන්තෙ කිං භණ ථ නනු මයං තුම්හාකමෙව සන්තිකෙ සුතං කිමහං තුම්හෙහි අඤ්ඤාතං කථෙස්සාමීති තතො තං ථෙරො අඤ්ඤො එස ආවුසො අධිගතස්ස මග්ගො නාමාති ආහ අභයත්ථෙරො කිර තදා සොතාපන්නො හොති අථස්ස සො කම්මට්ඨානං දත්වා ආගන්ත්වා ලොහපාසාදෙ ධම්මං පරිවත්තෙන්තො ථෙරො පරිනිබ්බුතොති අස්සොසි සුත්වා ආහරථාවුසො පත්තචීවරන්ති චීවරං පාරුපිත්වා අනුච්ඡවිකො ආවුසො අම්හාකං ආචරියස්ස අරහත්තමග්ගො ආචරියො නො ආවුසො උජු ආජානීයො අත්තනො ධම්මන්තෙවාසිකස්ස සන්තිකෙ තට්ටිකාය නිසීදිත්වා මය්හං කම්මට්ඨානං කථෙහීති ආහ අනුච්ඡවිකො ආවුසො ථෙරස්ස අරහත්තමග්ගොති එවරූපානං ගන්ථො පලිබොධො න හොති—

( ශ * )

මහාවිහාරෙපි, මහ වෙහෙරෙහිදු; තිපිටක චූලාභයත්ථෙරො නාම, ත්‍රිපිටක චූලාභය නම් තෙරකෙනෙක්; අට්ඨකථා අනුග්ගහෙත්වා, අටුවා නො ඉගෙනම; පඤ්චනිකායමණ්ඩලෙ, දීඝනිකායාදී පස්නිකායෙහි භික්ෂූන් පිරිසට; තීණි පිටකානි පරිවත්තෙස්සාමීති, තුන්පිටකය වර්ණනා කෙරෙමියි; සුවණ්ණභෙරිං පහාරාපෙසි, ශ්‍රෙෂ්ඨ භෙරිය පැහැරවූ; භික්ඛුසඞ්ඝො, භික්ෂුසඟහු; කතමාචරියානං උග්ගහො, වර්ණනාකරණු ලබන්නේ කවර ආචාර්‍ය්‍යයන්ගේ උද්ග්‍රහයද; අත්තනො ආචරියුග්ගහංයෙව වදතු, තමාගේ ආචාර්‍ය්‍යයන් ඉගැන්වූවාම කියවයි; ඉතරථා වත්තුං න දෙමාති, නො එසේ කියනොදෙම්හයි; ආහ, කීහ; උපජ්ඣායොපි, උපාධ්‍යායයෝද; අත්තනො උපට්ඨානමාගතං තං පුච්ඡි, තමනට උපස්ථානයට ආ ඒ තෙර පුළුවුත්හු; ත්වං ආවුසො භෙරිං පහාරාපෙසීති, ඇවැත තෝ බෙරපැහැරවීදැයි; ආම භන්තෙ, වහන්ස එසේමයයි; කිං කාරණානි, කවර හෙතුව කින්ද; පරියත්තිං භන්තෙ පරිවත්තෙස්සාමීති, වහන්ස පර්‍ය්‍යාප්තිය වර්ණනා කෙරෙමියි කී; ආවුසො අභය, ඇවැත්වූ අභයතුමැනනි; ආචරියා ඉමං පදං කථං වදන්තීති, ආචාර්‍ය්‍යවරහු මේ පදය කෙසේකියද්ද; එවං වදන්ති භන්තෙති, වහන්ස මෙසේ කියති කී (එක් ඇජරකෙණෙකුන් තෙරෙනි නොඇසුවද අනුස්සව විසින් "එවං වදන්ති"යි-කීහයි දතයුතු) * ථෙරො, තෙරහු; හුන්ති පටිබාහි, හුංකාරයෙන් පිළිබැහු; පුන, නැවත; සො, තෙතෙම; අඤ්ඤෙනඤ්ඤෙන පරියායෙන, අතින් අතින් ක්‍රමයකින්; එවං වදන්ති භන්තෙති, වහන්ස මෙසේ කියතියි; තික්ඛත්තුං ආහ, තුන් වරෙක් කීහු; ථෙරො, තෙරහු; සබ්බං, සියල්ලම; හුන්ති පටිබාහිත්වා, හුංකාරයෙන් පිළිබහා; ආවුසො, ඇවැත; තයා, තා විසින්; පඨමං කථිතොයෙව

* අපවිසින් සපයානත්තාලද උගතුන් විසින් ඇසුරුකරණලද පුරාණ සන්න හතඅටෙව මෙතනට අමුතු සන්න කැබෙල්ලක් වැටී අතිසයින් ආකූල වී තිබුනේය. එය උත්සාහයෙන් ශුද්ධකරණලදී. එබැවින් අන් පොත්වල මෙබඳු ආකූල තැන්වලදී විමසියයුතුයි – (කර්තෘ)

ආචරියමුඛෙන, පලම්බිකොට කියෝම ආචාර්යයන්ගේ කථාමාර්ගය; ආචරිය මුඛතො පන අනුගහනිතත්තා, ආචරිය මුඛයෙන් වනාහි නොඋගත්හෙයින්; එවං ආචරියා වදන්තීති, ආචාර්යයෝ මෙසේ කියනිති; සණ්ඨානං නාසක්ඛි, පිහිටනට නොපොහොසත් වී; ගච්ඡ, යා; අත්තනො ආචරියස්සනං සන්තිකෙ සුණාහීති, තව ශියන්හට සුදුසු ඇජරන් සමීපයෙහි අසාසි කීවු; කුහිං භන්තෙ ගච්ඡාමීති, වහන්ස කොහියෙමිද; ගඞ්ගාය පරතො, ගඟින් එත; රොහණ ජනපදෙ, රුහුණු දනව්වෙහි; තුලාධාර පබ්බත විහාරෙ, තරහල් පවුවෙහෙර; සබ්බපරියත්තිකො, සියලු ත්‍රිපිටක පයණිප්ජනිධරවූ; ධම්මරක්ඛිතත්ථෙරො නාම වසති, ධර්මරක්ෂිතනම් තෙරකෙනෙක් වෙසෙති; තස්ස සන්තිකං ගච්ඡාහීති, ඔවුන් සමීපයට යායි කීහු; සාධු භන්තෙති, වහන්ස යහපතැයි; වන්දිත්වා, තෙරුන් වැඳ; පඤ්චහි භික්ඛුසතෙහි සද්ධිං, පන්සියයක් භික්ෂූන්හා සමග; ථෙරස්ස සන්තිකං ගන්ත්වා, තෙරුන් සමීපයටගොස්; වන්දිත්වා, වැඳ; නිසිදි, හුන්හු; ථෙරො, තෙරහු; කස්මා ආගතොසීති පුච්ඡි, කුමක් පිණිස ආදුසි විචාළෝ; ධම්මං සොතුං භන්තෙති, වහන්ස දහම් අසනුපිණිස ආමියි කී; ආවුසො අභය, ඇවැත්වූ අභාතෂෑ තනම; දීඝමජ්ඣිමෙසු මං කාලෙනකාලං පුච්ඡනානි, දීඝ මධ්‍යම දෙනිකායෙහි මා කලින් කල විචාරනි; අවසෙසම්පන, සෙස්ස වනාහි; තෙ, මාවිසින්; තිංසවත්තනානි වස්සානි, තිස්හවුරුද්දක්හට; න ඔලොකිතපුබ්බං, නොබලනලද පිරිස; අපිච, එහෙත් ඇති; ඡ්ඡං, තෝ; රත්තිං මම සන්තිකෙ පරිවත්තෙනාහි, රෑ මා සමීපයෙහි පිරිවහා; අහං, මම; තෙ දිවා භාථයිස්සාමි, තට දහවල් කියමි; සො, හෙතෙම; සාධු භන්තෙති, වහන්ස යහපතැයි; තථා අකාසි, එසේකෙළේ; පරිවෙණවාරෙ මහා මණ්ඩපං කාරාපෙත්වා, පිරිවෙන් දොර මහත් මඩුවක්කරවා; ගාමවාසිනො, ගම්වැස්සෝ; දිවසෙ දිවසෙ ධම්මසවණාය ආගච්ඡනාති, දවස දවස දහම් අසනු පිණිස එත්; ථෙරො, තෙරහු; රත්තිං පරිවත්තිතං දිවා කථයන්තො, රෑ පිරිවැහුනැන් දහවල් කියන්නාහු; අනුපුබ්බෙන දෙසනං නිට්ඨපෙත්වා, අනුක්‍රමයෙන් දෙසුන් නිමවා; අභයත්ථෙරස්ස සන්තිකෙ තට්ටිකාය නිසීදිත්වා, පීඨිකායෙන් බැස අභය තෙරුන් සමීපයෙහි පත්කඩ හිඳ; ආවුසො මය්හං කම්මට්ඨානං කථෙහීති ආහ, ඇවැත මට කමටහන් කියවයි කීවු; භන්තෙ කිං භණථ, වහන්ස කුමක් කියනසේක්ද; මයා, මාවිසින්; තුම්හාකමෙව සන්තිකෙ සුතං නනු, නුඹ සමීපයෙහිම අසනලද්දේ නොවේද; අහංහි තුම්හෙහි අසුසදුතං කිං කථෙස්සාමීති, මම වනාහි නුඹසින් නොදන්නාලද කුමක් කියම්ද; තතො, ඉක්බිත්තෙන්; ථෙරො, තෙරහු; ආවුසො, ඇවැත; එස අධිගතමග්ගො නාම අඤ්ඤො, මේ අධිගම මාර්ගනම් අනිකෙක්යයි; ආහ, කීවු; අභයත්ථෙරො කිර තදා සොතාපන්නො හොති, අභයතෙරහු එසමයෙහි සෝවාන්වෙත්; අථ, ඉක්බිත්තෙන්; සො, ඒ අභය තෙරහු; අස්ස කම්මට්ඨානං දත්වා, ඔවුන්ට කමටහන්දී; ආගන්ත්වා, අවුත්; ලොහපාසාදෙ ධම්මං පරිවත්තෙන්තො, ලෝවාමහපායෙහි ධර්මය කියන්නාහු; ථෙරො පරිනිබ්බුතොති අස්සොසි, තෙරහු පිරිනිවියහ යනු ඇසූ; සුත්වා, අසා; ආහරථාවුසො චීවරනායී, ඇවැත්නි සිවුරු ගෙනෙණවයි; චීවරං

පාරුපිත්වා (තෙරුන්කෙරෙහි ගෞරවයෙන් සිවුරු පරිමණ්ඩලකොට පෙරවා; ආවුසො, ඇවැත්නි; අම්හාකං ආචරියස්ස, අපගේ ආචාරීන්ගේ; අරහත්තමග්ගො අනුච්ඡවිකො, රහත් මඟ සුදුසුය; ආවුසො, ඇවැත්නි; ආචරියො, අපගේ ආචාර්යයෝ; උජ්ජ ආජානියො, ඉඳුරුම කාරණාකාරණා දන්නාහයි; සො, ඔහු; අත්තනො ධම්මන්තෙවාසිකස්ස සන්තිකෙ, තමන්ගේ ධර්මාන්තෙවාසිකයා සමීපයෙහි; තට්ටිකාය නිසීදිත්වා, පත්කඩගිඳ; මය්හං කම්මට්ඨානං කථෙහීති ආහ, මට කමටහන් කියවයිසීහ; ආවුසො, ඇවැත්නි; අනුච්ඡවිකො ථෙරස්ස අරහත්තමග්ගොති, තෙරුන්ගේ රහත් මඟ අනුච්ඡවිකයයි කීවු; එවරූපානං, මෙබඳුවනට; ගන්ථො පලිබොධො න හොති, ග්‍රන්ථය පලිබොධ නොවේ.—

( හා • )

එක් සමයෙක්හි අනුරාධපුරයෙහි මහාවිහාරවාසී ත්‍රිපිටක චූල්ලාභය නම් තෙරුන්වහන්සේ අටුවා නොඋගෙණම දික්සඟිය ආදී පස්මහ සඟිය උගෙණගත් පිරිසට තුන්පිටකය වර්ණනාකරමියි රන්බෙරය පැහැරවූහ භික්ෂු සඞ්ඝයාද ඔහු විසින් වර්ණනා කරණු ලබන්නේ කවර ආචාර්යයන්ගේ උගැන්වීමක්ද තමන්ගේ ආචාර්යයන්ගේ උගැන්වීමම කියනසේක්වායි අන් ප්‍රකාරයකින් කියන්නට නොදෙමහයි කීයේය.

උපාධ්‍යාය මහතෙරහුද තමන්ට උපස්ථාන පිණිස ආ ඒ චූල්ලාභය තෙරුන් ඇවැත තෙපි බෙරය පැහැරවූයේදැයි විචාළහ. අභයතෙරහුද එසේය වහන්සැයි ප්‍රතිවචන දුන්නේය ඇවැත්නි තෙපි කුමණ කාරණයක් අරබයා බෙරය පැහැරවූයේදැයි විචාළාහු වහන්ස පර්‍ය්‍යාප්තිය වර්ණනාකරණ පිණිසයයි කීහ. ඇවැත්වූ අභය මේ පදය ආචාර්‍ය්‍යවරයෝ කෙසේ අර්ථ වර්ණනාකරන්නාහුදැයි එක් පදයක් විචාළහ ඉක්බිති අභය තෙරහු එක් ඇදුරෙකුගෙන් නොඇසුවත් පරම්පරාගත ශ්‍රවණ වශයෙන් ස්වාමිනි මෙසේ කියතියි පිළිවදන් දුන්හ. ඒ දුන් ප්‍රතිවචනය උපාධ්‍යාය මහතෙරහු නොපිළිගැන්ම හඟවන හුංකාර ශබ්දයෙන් ප්‍රතිබාහනය කළාහුය. නැවත අභයතෙරහු අනික් අනික් ක්‍රමයෙකින් වහන්ස මෙසේ මෙසේ කියන්නාහුයයි තුන්යලක් කීයේය. මහතෙරහු ඒ සියල්ලම පෙරමෙන් හුංකාර ශබ්දයෙන් ප්‍රතිබාහනයකොට ඇවැත්නි තාපිසින් පළමුකොටම කියනලද්දේ ආචාර්යයන්ගේ අර්ථකථා මාර්ගයමය එතකුදුවුවත් ආචාර්‍ය මුඛයෙන් නොඋගත්බැවින් ආචාර්යයෝ මෙසේ කියතියි ඒ මතයෙහි පිහිටන්නට නොපොහොසත්විය එහෙයින් තෙපි යව ඇවැත්නි තොපට කියන්නට සුදුසු ආචාර්යයන්හු සමීපයෙහි අසවයි කීයේය ඉක්බිති අභයතෙරහු ස්වාමිනි කොහි යෙම්දැයි විචාළාහු ඇවැත්නි මහවැලිගඟින් එගොඩ ඇත රුහුණුදනව්වෙහි තරහල්පව්වෙහෙර සියලු ත්‍රිපිටක පර්‍ය්‍යාප්තිය දරන්නාවූ ධර්මරක්ෂිතනම් මහතෙරකෙනෙක් වෙසෙති ඔවුන් ලඟට යවයි කීහ. අභය තෙරහුද යහපත වහන්සැයි කියා මහතෙරුන්වැද පන්සියයක් භික්ෂූන් හා සමග රුහුණුදනව්වෙහි ධර්මරක්ෂිතස්ථවිරයන් කරා එළඹ වැද එකත්පසෙක හුන්නේය මහතෙරහුද කුමක්පිණිස අවුදැයි විචාළාහු වහන්ස දහම් අසනු පිණිස ආමිහයි කීයේය. ඉක්බිති ධර්මරක්ෂිත ස්ථවිරයන් වහන්සේ ඇවැත්වූ අභය දික්සඟි මැදුම්සඟි යන දෙනිකායෙහි කලින් කල

මා විචාරව සෙසු පර්‍ය්‍යාප්තිය මාවිසින් තිස් අවුරුද්දකින් නොබලනලද විපීය එතකුදුවුවත් තොප රාත්‍රිභාගයෙහි මා ලඟ සජ්ඣායනාකරව මම තොපට දහවල් දවස එහි අණී වණ්නාව කියමියි කීය. අභයතෙරහුද යහපත වහන්සැයි ගිවිස එසේම කෙළේය. රුහුණු දනව්වැස්සෝ පිරිවෙන් දෙරටුවෙහි මහත්වූ මඩපයක් තනවා දවස දවස බණ අසනුපිණිස පැමිණෙන්නාහුය. ධම්මරක්ඛිතාචාර්‍යයෝද අභයතෙරහු රෑ පිරිවැහු පෙල දහවල් අණී කියන්නාහු පිළිවෙළින් දෙශනාව නිමවා පුටුවෙන් බැස තමන් අතවැසිවූ ඒ අභයතෙරුන් ලඟ පන්කඩ හිඳ ඇවැත්නි මට කම්ටහන් දෙවයි කීයේය ඉක්බිති අභය තෙරුන්වහන්සේ ස්වාමිනි කුමක් කියනසේක්ද මාවිසින් අණී අස්වනලද්දේ නුඹවහන්සේ සම්පෘයති නොවේද? මම වනාහි නුඹවහන්සේ විසින් නොදන්නාලද කුමක් කියන්නෙම්දැයි කීයේය. ඉක්බිති මහතෙරුන්වහන්සේ ඇවැත්නි පර්‍ය්‍යාප්තිය අතිශකක මේ අධිගම මාර්‍ගීය අනිකෙකැයි කීයේය එසමයෙහි වනාහි අභය තෙරුන්වහන්සේ සෝවාන්වී සිටියේය කම්ස්ථාන දෙන්නාවූ ආචාර්‍ය්‍යයෝනම් සර්‍වඥයන්ගේ පටන් ක්‍රමයෙන් අවුත් සෝවාන් පුද්ගලයෙක් හෝ උනුත් නැත්නම් යටත් පිරිසෙයින් පෘථග්ජනවූ එක්සඟියක් දරන්නෙකුහෝ වියයුතුහෙයින් මේ ධම්රක්ඛිතස්ථවිරතෙමේද තමන්ගේ ධම්නෙතවාසිකවූ සෝවාන් අභය තෙරුන්ගෙන් කමටහන් ඉල්වූහයි දතයුතු. ඉක්බිති අභයතෙරුන්වහන්සේ මහතෙරුන්වහන්සේට කමටහන්දී අවුත් ලෝවාමහපායෙහි දහම් දෙසන්නාහු ධම්මරක්ඛිත තෙරහු පිරිනිවියහයි අසා ඇවැත්නි පාසිවුරු ගෙනෙවයි කියා මහතෙරුන් කෙරෙහි ගෞරව පිණිස සිවුරු පිරිමඩුලුකොට පොරවා ඇවැත්නි අපගේ ආචාර්‍ය්‍යයන්වහන්සේගේ අර්හද්මාර්ගීය සුදුසු වන්නේය ඇවැත්නි අපගේ ආචාර්‍ය්‍ය තෙමේ ඉදුරම කාරණා කාරණා දන්නාසේක උන්වහන්සේ තමන්ගේ ධම්මාන්තෙවාසිකයා සමීපයෙහි පත්කඩහිඳ මට කමටහන් කීයවයි කියා කමටහන් ගන්හ. ඇවැත්නි තෙරුන්වහන්සේගේ අර්හද්මාර්ගීය සුදුසු වන්නෝයයි කීයේය. මෙබඳුවූවන්ට ග්‍රන්ථය පළිබොධ නොවන්නේයි —

---

( පා † )

ඉද්ධීති පොථුජ්ජනිකා ඉද්ධි සාහි උත්තානසෙය්‍යක දාරකො විය තරුණසස්සංවියච දුප්පරිහාරාහොති අප්පමත්තකෙන ච භිජ්ජති සා පන විපස්සනාය පළිබොධොහොති නසමාධිස්ස සමාධිමාගම්ම පත්තබ්බතො තස්මා විපස්සනත්ථිකෙන ඉද්ධි පළිබොධො උපච්ඡින්දිතබ්බො — ඉතරෙන අවසෙසානි — අයන්තාව පළිබොධකථාය විත්ථාරො —

කම්මට්ඨාන දායකං කල්‍යාණමිත්තං උපසඞ්කමිත්වාති එත්ථ පන දුවිධං කම්මට්ඨානං සබ්බත්ථක කම්මට්ඨානං පාරිහාරිය කම්මට්ඨානඤ්ච — තත්ථ සබ්බත්ථක කම්මට්ඨානං නාම භික්ඛුසඞ්ඝාදිසු මෙත්තා මරණස්සති ච අසුභසඤ්ඤාතිපි එකෙ — කම්මට්ඨානි කෙනාහි භික්ඛුනා පඨමං තාව පරිච්ඡින්දිත්වා සීමට්ඨක භික්ඛු සඞ්ඝෙ සුඛිතා භවන්තු අබ්‍යාපජ්ජාති මෙත්තා භාවෙතබ්බා තතො සීමට්ඨක දෙවතාසු තතො ගොචරගාමම්හි ඉස්සර ජනෙ තතො තත්ථ මනුස්ස උපාදාය සබ්බ

සන්තෙසු සො භික්ඛු සඞ්ඝෙ මෙත්තා
ය සහවාසීනං මුදුකත චිත්ත තාල්ප්
හොති අථස්ස තෙ සුඛසංවාසා හො
න්ති සීමට්ඨකදෙවතාසු මෙත්තාය මු
දුකත චිත්තාහි දෙවතාහි ධම්මිකාය
රක්ඛාය සුසංවිහිතා රක්ඛාහොති
ගාමගොචරගාමම්හි ඉස්සරජනෙ මෙත්තාය
මුදුකතචිත්තසන්තානෙහි ඉස්සරෙහි
ධම්මිකාය රක්ඛාය සුරක්ඛිත පරික්ඛා
රොහොති තත්ථ මනුස්සෙසු මෙත්තාය
පසාදිත චිත්තෙහි තෙහි අපරිභූතො
හුත්වා විචරති සබ්බසත්තෙසු මෙත්තා
ය සබ්බත්ථ අප්පටිහතචාරො හොති
මරණස්සතියා පන අවස්සං මරිතබ්බ
න්ති අනෙසනං පහාය උපරූපරි ව
ඩ්ඪමාන සංවෙගො අනොලීන වුත්ති
කො හොති අසුභසඤ්ඤා පරිචිතචිත්ත
ස්ස පනස්ස දිබ්බානිපි ආරම්මණානි
ලොභවසෙන චිත්තං න පරියාදියන්ති
එවං බහූපකාරත්තා සබ්බත්ථ අත්ථයි
තබ්බා ඉච්ඡිතබ්බාති ච අධිප්පෙත
ස්ස යොගානුයොග කම්මස්ස ඨාන
න්ති චාති සබ්බත්ථක කම්මට්ඨානන්ති
වුච්චති චත්තාලීසාය පන කම්මට්ඨා
නෙසු යං යස්ස චරිතානුකූලං තං
තස්ස නිච්චං පරිහරිතබ්බත්තා උපරි
මස්ස ච උපරිමස්ස භාවනාකම්මස්ස
පදට්ඨානත්තා පාරිහාරිය කම්මට්ඨා
නන්ති වුච්චති ඉති ඉමං දුවිධම්පි ක
ම්මට්ඨානං යො දෙති අයං කම්මට්ඨා
න දායකො නාම තං කම්මට්ඨාන දා
යකං කල්‍යාණමිත්තන්ති---

( ස † )

ඉද්ධිති, සෘද්ධිනම්; පොථුජ්ජනිකා
ඉද්ධි, පුහුදුන්ගේ සෘද්ධියි; යා හි, යම්
සෘද්ධියක්තොමෝ; උත්තානසෙය්‍යක
දාරකාංචිය, උඩුබැලිහෝනා බාල දරු
කෙණෙක්මෙන්ද; තරුණසස්සං විය
ච, ළැලගොයමක්මෙන්ද; දුප්පරිහාරා
හොති (බොහෝ උපද්‍රව ඇතිබැවින්)
දුකසේ පරිහරණය කටයුතුවෙයි; අ
ප්පමත්තකෙන ච භිජ්ජති, මඳකිනුදු
බිඳේ; සා පන, හෝ වනාහි; විපස්ස
නාය පළිබොධොහොති, විදර්ශනාව
පළිබොධවේ; න සමාධිස්ස, සමාධියට
පළිබොධ නොවේ; සමාධිං පත්වා, ස
මාධියට පැමිණ; පත්තබ්බතො, පැමි
ණියයුතුහෙයිනි; තස්මා විපස්සනාත්ථි
කෙන, එහෙයින් විදර්ශනාභාවනාක
රණු කැමැත්තහු විසින්; ඉද්ධි පළි
බොධො උපච්ඡින්දිතබ්බො, සෘද්ධි පළි
බොධය සිඳියයුතු; ඉතරෙන, සෙසු
සමාධිභාවනාකරණු කැමැත්තහු වි
සින්; අවසෙසා නව පළිබොධා උප
ච්ඡින්දිතබ්බා (සිඳියයුතු) සෙසු නව
පළිබොධයෝ සිඳියයුත්තාහුයි---

---පළිබොධකථා---

කම්මට්ඨාන---පෙ---එත්ථ පන,
කම්මට්ඨානදායකං කල්‍යාණමිත්තං උ
පසඞ්කමිත්වා යනමෙහි චාතානි; දුවිධං
කම්මට්ඨානං, කර්මස්ථානය දෙවැදෑරුම්
වේ; සබ්බත්ථක කම්මට්ඨානං, තැම
තන්හි කැමැතිවියයුතු කර්මස්ථාන; පා
රිහාරිය කම්මට්ඨානන්ති, පරිහරණය
කටයුතු කර්මස්ථානයයි (කම්මට්ඨානං
දුවිධං හොතියී -යොදනු) තත්ථ, එ
දෙක්හි; සබ්බත්ථක කම්මට්ඨානං නාම,
සබ්බත්ථක කර්මස්ථානනම්; භික්ඛු සඞ්ඝ
දිසු මෙත්තා, භික්ෂුසඞ්ඝ ආදීන් කෙරේ
හි මෛත්‍රීද; මරණස්සතිච, මරණසිහිය
ද (යනමෙයි) එකෙ, සමහරු; අසුභ ස
ඤ්ඤංපි, අශුභසංඥද (සබ්බත්ථක ක
ර්මස්ථාන කියත්) කම්මට්ඨානිකෙ
න භික්ඛුනා, කර්මස්ථාන් සෙදෙන ම
හණහු විසින්; පඨමතාව, පළමුකො
ට; පරිච්ඡින්දිත්වා (ඉමස්මිං විහාරෙ ස
බ්බෙ භික්ඛු සඞ්ඝොසි) පිරිසිඳ; සීමට්ඨ
ක භික්ඛුසඞ්ඝ, සීම්හි වසන භික්ෂු ස
ඞ්ඝයා කෙරෙහි; සුඛිතා භවන්තු, සුව

පත්ථෙන්තීති; අව්‍යාපජ්ජා හොන්තූති,
නිදුක් වේවායි; මෙත්තා භාවේතබ්බ
ා, මෙත් තොමෝ වැඩියයුතුයි; තා
ථෙරා, ඉක්බිත්තෙහනත්; සීමට්ඨකදෙව
තාසු, සීමා වසන දෙවියන් කෙරෙහි
ද; තතො, ඉක්බිත්තෙහනත්; ගොචරගා
මෙ ඉස්සරජනෙ, ගොදුරුගම්හි ඉසු
රුජනයා කෙරෙහිද; තතො, ඉක්බි
ත්තෙන්; තත්ථ මනුස්සෙසු උපාදය, ඒ
ගොදුරුගම්හි මිනිසුන් පරිදී; සබ්බ
සත්තෙසු, සියලු සතුන් කෙරෙහිද
(''මෙත්තා භාවෙතබ්බා''යි යොදනු)
සොහි, හෙතෙම වනාහි; භික්ඛුසංඝෙ මෙත්
තාය, භික්ෂුසංඝයා කෙරෙහි මෙහින්;
සහවාසීනං, සමග වසන්නාවූන්ගේ;
මුදුචිත්තතං ජනෙති, තමා කෙරෙහි
මෘදු සිත් ඇතිබව කෙරෙයි; අථ, එසේ
කල්හි; අස්ස, මොහු විසින්; තෙ, ඒ
සහවාසිනු; සුඛසංවාසා හොන්ති, සුව
සේ සමග විසියයුතුවෙත්; සීමට්ඨක
දෙවතාසු මෙත්තාය, සීමා වසන දෙ
වියන් කෙරෙහි මෙහින්; මුදුකත චි
ත්තාහි දෙවතාහි, මෘදුලොත්කාරණල
ද සිත් ඇති දෙවියන් විසින්; ධම්මිකා
ය රක්ඛාය, ධාර්මික්වූ රක්ෂාවෙන්;
සුසංවිහිතාරක්ඛො හොති, යහපත
පරිපාටියෙන් මූදුම් කොට විහිත
වූ ආරක්ෂා ඇතියේවී; ගොචරගාමම්හි
ඉස්සරජනෙ මෙත්තාය, ගොදුරුගම්හි
ඉසුරුජනයන් කෙරෙහි මෙහින්; මුදු
කතචිත්ත සන්තානෙහි ඉස්සරෙහි,
මෘදුලොත්කාරණලද සිත් සතන් ඇති
ඉසුරන් විසින්; ධම්මිකාය රක්ඛාය,
ධර්මයෙන් යුතුවූ රක්ෂාවෙන්; සුරක්ඛි
තපරික්ඛාරො හොති, මනාකොට ප
රික්ෂාකරණලද පරිෂ්කාර ඇතියේවී;
තත්ථ මනුස්සෙසු මෙත්තාය, ඒ ගොදු
රුගම්හි මිනිසුන් කෙරෙහි මෙහින්;
පසාදිත චිත්තෙහි තෙහි, පහදවනලද
සිත්ඇති ඔවුන් විසින්; අපරිභූතො හු
ත්වා විචරති, අපරිභූතව (අනිඳිතව)
හැසිරේ; සබ්බසත්තෙසු මෙත්තාය,
සියලු සතුන් කෙරෙහි මෙහින් (සව
සතුන් කෙරෙහි මෙහි කොට වන බැවින්) සබ්බ
ත්ථ, හැමතැන; අප්පටිහතචාරො හො
ති, නොහැපෙනුවූ පැවතුම් ඇතියේවී;
මරණස්සතියා, මරණ සිහියෙන්; අව
ස්සං මරිතබ්බන්ති, අවශ්‍යයෙන් මළයු
තුයයි; අනෙසනං පහාය, නොමැස් සා
රණ අනෙසුන් හැර; උපරූපරි සංවඩ්
ඪමාන සංවෙගො, මතුමතුයෙහි වඩ
නාලද සංවෙග ඇත්තේ; අනොලී
නවුත්තිකො හොති, මහා පිළිවෙත
පසුනොබස්නා පැවතුම් ඇතියේවී; අසු
භසඤ්ඤාපරිචිතචිත්තස්ස, අශුභසංඥ
යෙන් පුරුදුකරණලද සිත්ඇති; අස්
ස, ඔහුගේ; විගතං, සිත; දිබ්බානිපි
ආරම්මණානි, දිව්‍ය අරමුණෝද; ලොභ
වසෙන, ලොභ වශයෙන්; න පරියා
දියන්ති, ග්‍රහණය නොකෙරෙත් (දිව්‍ය අර
මුණු පවා ඔහු සිත ලොප් උපනව රූ
නොවේ යන අභිප්‍රායයි) එවං, මෙසේ;
බහූපකාරත්තා, බොහෝ උපකාර ඇ
ති බැවින්; සබ්බත්ථ, සියලු කම්ස්ථාන
නු යොගයෙහි; අත්ථයිතබ්බංයි යෙසිං.
(පූර්වෙසේ මාවිසින්) ඉච්ඡිතබ්බන්ති, කැ
මතිවියයුතුයුයි කියාද; අභිප්පෙතස්
ස, අභිමතවූ; යොගානුයොග කම්ම
ස්ස, භාවනා සංඛ්‍යාත යොගයෙහි අ
නුයුක්තව ක්‍රියාවට; ඨානත්ති, කාර
ණවූයි කියාද; සබ්බත්ථක කම්මට්ඨා
නන්ති වුච්චති, සබ්බත්ථක කම්ස්ථාන
යයි කියනුලැබේ (''සබ්බත්ථ කත්තබ්බං
කම්මට්ඨානන්ති සබ්බත්ථක කම්මට්ඨා
නං''යි සේවත්) චත්තාළීසාය පන කම්ම
ට්ඨානෙසු, සතළිස් කමටහනුන් කෙරෙ
හි; යං යස්ස චරියානුකූලං, යමෙක් ය
මෙක්හුගේ චරිතයට අනුකූලද; තං,
ඒ කමටහන; අස්ස, ඔහු විසින්; නි
ච්චං, හැමවේලේම; පරිහරිතබ්බත්තා,
පරිහරණය කටයුතු බැවින්ද; උපරිම
ස්සච උපරිමස්ස භාවනාකම්මස්ස,
මතුමතුවන භාවනා කර්මයටද; පදට්ඨා
නත්තා, පිහිටවනබැවින්ද; පාරිහාරිය
කම්මට්ඨානන්තිපි වුච්චති, පාරිහාර්‍ය කම්
ස්ථානයයි කියනුලැබේ; ඉති, මෙසේ;

ඉමං දුවිධම්පි කම්මට්ඨානං, මේ දෙවැද්දෑරුම් කමටහන; යො දෙති, යමෙක් දේද; අයං කම්මට්ඨාන දායකො, මේ කම්සථාන දායකනම් ("තං කම්මට්ඨාන දායකං" යනු "කල්‍යාණ මිත්තං" යන්නට විශේෂණයි )

( හා † )

ඍද්ධි නම් පෘථග්ජනයන් විසින් උපදවාගන්නාලද ලෞකික ඍද්ධීහ. පෘථග්ජනයන්ගේ ඒ ඍද්ධිය වනාහි උඩුබැලිහෝනා ලදරුවෙකු මෙන්ද පැලපත ගොයමක් මෙන්ද උපදවා වැඩීමෙහි දුකසේ පරිහරණය කටයුතුවෙයි ස්වල්ප මාත්‍රයෙකින්ද බිඳෙයි. ඒ පුහුදුන්ගේ ඍද්ධියද විදර්ශනාවට පලිබොධ වන්නේය එනසුදුවුවත් සමාධියට පලිබොධ නොවන්නේය කුමක් හෙයිනයත්? සමාධියට පැමිණ නැවත ඍද්ධියට පැමිණියයුතු හෙයිනි. එහෙයින් විදර්ශනාභාවනා කරණු කැමැත්තහු විසින් ඍද්ධිපලිබොධය පසිඳියයුතුයි.

සෙසු සමාධිභාවනා කරණු කැමැත්තහු විසින් ඍද්ධිපලිබොධය හැර අවශේෂ නවපලිබොධයන් පසිඳියයුතුයි මේ මෙහි පළමුකොට පලිබොධ කථාවගේ විස්තරවන්නේයි.

කර්මස්ථාන දෙන්නාවූ කල්‍යාණ මිත්‍රයෙකු කරා එළඹිය යන මෙහි වනාහි හැමතන්හි කැමැතිවියයුතු හෙයින් සබ්බත්ථකකම්මට්ඨාන නිරතුරු පරිහරණය කටයුතු හෙයින් පාරිහාරියනම් කමටහනැයි කියා කමටහන දෙවැද්දෑරුම් වන්නේයි ඒ කමටහන් දෙදෙනා අතුරෙන් භික්ෂු සඞ්ඝයා ආදීන් කෙරෙහි මෛත්‍රී වැඩීමද මරණානුස්මෘති භාවනාවද සබ්බත්ථක කමටහන් නම. ඇතැම් ආචාර්‍ය්‍යකෙනෙක් අශුභ සංඥාවද සබ්බත්ථක කමටහනැයි කියත්මැයි කමටහන් භාවනාකරණ මහණ විසින් පළමුව වෙන්කොට මේ වෙහෙර වසන භික්ෂු සඞ්ඝයා සුවපත්වේවායි නිදුක්වේවායි යනාදීන් සීමා තුළ වසන සඞ්ඝයා කෙරෙහි මෛත්‍රී වැඩියයුතුයි. ඉක්බිත් සීමාභ්‍යන්තරයෙහි වසන දෙවියන් කෙරෙහිද ඊට ඉක්බිති ගොදුරුගම වසන ප්‍රධාන ජනයා කෙරෙහිද ඊට ඉක්බිති ගොදුරුගම වසන අවශේෂ මනුෂ්‍යයන් පටන් සියලු සතුන් කෙරෙහිද මෛත්‍රී වැඩියයුතුයි. ඒ මහණ භික්ෂුසඞ්ඝයා කෙරෙහි මෛත්‍රියෙන් තමා හා එක්ව වසන්නවුන්ගේ මොළොක් සිත් ඇති බව කරන්නේයි එසේ කල්හි ඔහු හා සමග වසන්නාහු සැපසේ එක්ව විසියයුතු වෙත් සීමාභ්‍යන්තරයෙහි වසන දෙවියන් කෙරෙහි මෛත්‍රී වැඩීමෙන් මොළොක් සිතැති දෙවියන් විසින් දැහැමින් යුත් ආරක්ෂාවෙන් සංරක්ෂිත ප්‍රේත පිශාචාදී උපද්‍රවයෙන් මුදා මනාකොට කරණලද ආරක්ෂා ඇතිවෙයි. ගොදුරුගම ප්‍රධාන ජනයා කෙරෙහි මෛත්‍රී වැඩීමෙන් මොළොක් සිතැති ප්‍රභූජනයා විසින් ධාර්මිකාරක්ෂාවෙන් සංරක්ෂිතවූ හෙයින් මුදා මනාකොට ආරක්ෂාකරණලද පරිෂ්කාර ඇත්තේවෙයි ගොදුරුගම වසන අවශේෂ මනුෂ්‍යයන් කෙරෙහි මෛත්‍රී වැඩීමෙන් නින්දා ගර්හා නොලැබ සිත්සේ ගමන් හැසිරෙන්නේවෙයි සියලු සතුන් කෙරෙහි මෛත්‍රී වැඩීමෙන් සියලු සත්වයන් මොළොක් සිත් ඇති වන බැවින් හැමතන්හිම නොගැටුනු පැවැතුම් ඇත්තේවෙයි. මරණානුස්මෘති භාවනා වැඩීමෙන් එකාන්තයෙන් නොමම්ත් මලයුතුයයි සිතා නොසරුප් ප්‍රත්‍යය සෙවීම් අත්හැර මතුමතුයෙහි වඩනාලද සංවේග ඇතිව මනා ප්‍රතිපත්තියෙහි නොපසුබට පැවැතුම් ඇත්

තේ වූ අශුභසංඥා භාවනාවෙන් පුරුදු කරණලද සිත් ඇති මහණහුගේ සිත දිව්‍යලෝකයෙහි දිව්‍යමය වූ රූපශබ්දාදි අරමුණු පවා ලෝභ වශයෙන් පැහැර නොගණින්නේය. මෙසේ බොහෝ උපකාර ඇති බැවින් සියළු කම්වහන් භාවනාවන් ති යෙදීමෙහිදී පළමු කොට තමා විසින් නැමති වශයෙන්හුසි කියා බෝ අභිප්‍රාය භාවනා සංඛ්‍යාත යෝගයෙහි නැවත නැවත යෙදීමට කාරණාවෙනුයි කියාහෝ මෙත්‍රීය මරණානුස්මෘතිය අශුභසංඥාව යන සැමවහන් තුණ සබ්බත්ථක කම්වහන නැසී ගියනුලැබේ සතළිස් කම්ස්ථාන යන් අතුරෙන් යම් කම්වහනක් යමෙකුගේ චරිතයට අනුකූලවේනම් ඒ කම්වහණ ඔහු විසින් නැමතලම පරිහරණය කළයුතුබැවින්ද මතුමතු භාවනා කර්මයට පිහිටවනබැවින්ද පාරිහාරිය කම්වහනැයි කියනුලැබේ. මෙසේ මේ දෙවැදෑරුම් කම්ස්ථානය මෙසක් සද්ධාම් මේ මෙම කම්ස්ථාන දයක හ මවු කල්‍යාණමිත්‍රවන්නේනී.

( ගාථා )

"පියො ගරු භාවනීයො
වත්තා ච වචනක්ඛමො,
ගම්භීරඤ්ච කථං කත්තා
නොචට්ඨානෙ නියොජයෙති".

එවමාදිගුණ සමන්නාගතං එකන්තෙන හිතෙසිං වුද්ධිපක්ඛෙ ඨිතං කල්‍යාණමිත්තං. වුත්තංහි ආගම්ම කල්‍යාණමිත්තං ආගම්ම ජාතිධම්මා සත්තා ජාතියා පරිමුච්චන්තීති ආදිවචනතො පන සම්මාසම්බුද්ධො, සො ච සබ්බාකාර සම්පන්නො කල්‍යාණමිත්තො තස්මිං සති තස්සෙව භගවතො සන්තිකෙ ගහිතං කම්මට්ඨානං සුගහිතං හොති පරිනිබ්බුතෙ පන තස්මිං අසීතියා මහාසාවකෙසු යො ධරති තස්ස සන්තිකෙ ගහෙතුං වට්ටති තස්මිං අසති යං කම්මට්ඨානං ගහෙතුකාමො හොති තස්සෙව වසෙන චතුක්ක පඤ්චකජ්ඣාන පදට්ඨානං විපස්සනං වඩ්ඪෙත්වා ආසවක්ඛයං පත්තස්ස ඛීණාසවස්ස සන්තිකෙ ගහෙතබ්බං. කිංපන ඛීණාසවො අහං ඛීණාසවොති අත්තානං පකාසෙතීති. කිං වත්තබ්බං කාරකභාවංහි ජානිත්වා පකාසෙති. නනු අස්සගුත්තත්ථෙරො ආරද්ධං කම්මට්ඨානස්ස භික්ඛුනො කම්මට්ඨානං කාරකො අයන්ති ජානිත්වා ආකාසෙ චම්මඛණ්ඩං පඤ්ඤපෙත්වා තත්ථ පල්ලඞ්කෙන නිසින්නො කම්මට්ඨානං කථෙසීති. තස්මා සචෙ ඛීණාසවං ලභති ඉච්චෙතං කුසලං නො චෙ ලභති අනාගාමි සකදාගාමි සොතාපන්න ඣානලාභී පුථුජ්ජන තිපිටකධර ද්වි පිටකධර එකපිටකධරෙසු පුරිමස්ස පුරිමස්ස සන්තිකෙ එකපිටකධරොපි අසති යස්ස එකසඞ්ගීති අට්ඨකථාය සද්ධිං පගුණාසයඤ්ච ලජ්ජී හොති තස්ස සන්තිකෙ ගහෙතබ්බං. එවරූපොහි තන්තිධරො වංසානුරක්ඛකො පවෙණිපාලකො ආචරියො ආචරියමතිකොව හොති න අත්තනොමතිකො තෙනෙව පොරාණකත්ථෙරා ලජ්ජී රක්ඛිස්සති ලජ්ජී රක්ඛිස්සතීති ආහංසු.

පුබ්බෙ වුත්තඛීණාසවාදයො චෙත්ථ අත්තනො අධිගතමග්ගමෙව ආචික්ඛන්ති බහුස්සුතො පන තං තං ආචරියං උපසඞ්කමිත්වා, උග්ගහ පරිපුච්ඡානං විසොධිතත්තා ඉතො චිතො ච සුත්තඤ්ච කාරණඤ්ච සල්ලක්ඛෙත්වා සප්පායාසප්පායං යොජෙත්වා, ගහනට්ඨානෙ ගච්ඡන්තො මහාහත්ථීවිය මහාමග්ගං දස්සෙන්තො කම්මට්ඨානං කථෙස්සති තස්මා එවරූපං කම්මට්ඨාන දායකං කල්‍යාණමිත්තං උපසඞ්කමිත්වා තස්ස වත්තපටිපත්තිං කත්වා කම්මට්ඨානං ගහෙතබ්බං.

( සෑ ‡ )

කල්‍යාණමිත්තන්ති, කල්‍යාණමි ත්තං යනුයෙහි; පියො, තමාගේ ශීල සම්පත්තියෙන් ප්‍රියය (එහෙයින්ම) ගරු, පහණසක්මෙන් ගරුය; භාව නීයො, ගුණ විසින් සම්භාවනා කටයු තුය; වත්තාච, අවවාද විසින් කියන සුලුය; වචනක්ඛමො, චොදනා විසින් පි ළිවිසි තෙපුල් ඉවසනසුළුය; ගම්භීරඤ් ච කථං කත්තා, සස්පිළිස්සුපාදෑ පිළි සයුත් ගැඹුරු තෙපුල් කියනසුළුය; නොචට්ඨානෙ නියොජයෙති, නොතැ න් නොයෙදෙන්නේය යන; එවමාදි ගුණ සමන්නාගතං, මේ ආදි ගුණ යෙන් සමන්විතවූ ("කල්‍යාණමිත්තො හි සද්ධාසම්පන්නො හොති සීලසම්පන් නො සුතසම්පන්නො චාගසම්පන්නො විරියසම්පන්නො සතිසම්පන්නො ස මාධිසම්පන්නො පඤ්ඤාසම්පන්නො"ති කියනලද ගුණයෙන් සම්පන්නවූ යුතැ නි) එකන්ත හිතෙසිං, එකාන්තයෙන් හි ත පසස්නාවූ; වුඩ්ඪිපක්ඛෙ ඨිතං, අත වැසියන්ට අභිවෘද්ධි පක්ෂයෙහි පිහිටි; කල්‍යාණමිත්තං, කල්‍යාණමිත්‍රවූ; ආන න්ද, අනද; මමං කල්‍යාණමිත්තං ආග මම, කල්‍යාණමිත්‍රවූ මාකරා පැමිණ; ජාතිධම්මා සත්තා, ජාතිධර්ම සත්වයෝ; ජාතියා පරිමුච්චන්තීති, ජාතියෙන් මිදෙ න්නාහ යන; ආදිවචනතො, මේආදි වදාළ බැවින්; සම්මාසම්බුද්ධොයෙව, සම්මාසම්බුදුහුම; සබ්බාකාර සම්පන් නො කල්‍යාණමිත්තො, සර්වාකාරයෙ න් සම්පන්නවූ කල්‍යාණමිත්‍රයි; තස් මා, එහෙයින්; තස්මිංසති, ඒ බුදුන් ඇති කල්හි; තස්සෙව භගවතො සන් තිකෙ, ඒ භගවත්හුගේ සමීපයෙහිම; ගහිතං කම්මට්ඨානං සුගහිතං, ගන්නා ලද කමටහන සුගහිතනම්වේ; පරිනි බ්බුතෙපන තස්මිං, ඒභගවත්හු පිරිනි වී කල්හි; අසීතියා මහාසාවකෙසු යො ධරති, අසූමහ සව්වන් නොමරහි යමෙක් ඇද්ද; තස්ස සන්තිකෙ ගහෙ තුං වට්ටති, ඔහු සමීපයෙහි ගන්නට වටී; තස්මිම්පි අසති, උන්දු නැති කල් හි; යං කම්මට්ඨානං ගහෙතුකාමො හො ති, යම් කමටහනක් ගන්නා කැමැති වේද; තෙනෙව වංසෙන, ඒ කමටහන් හුගේ වශයෙන්; චතුක්කපඤ්චකජ්ඣා නං නිබ්බත්තෙත්වා, චතුෂ්කපඤ්චක ධ්‍යානයන් නිපදවා; ඣානපදට්ඨා නං විපස්සනං වඩ්ඪෙත්වා, ධ්‍යාන පිහි ටකොට ඇති විදසුන් වඩා; ආසවක්ඛ යං පත්තස්ස, රහත් ඵලයට පැමිණි; ඛීණාසවස්ස සන්තිකෙ ගහෙතබ්බං, රහතන්හු සමීපයෙහි ගතයුතු; කිං ප න, කිමෙ; ඛීණාසවො, ක්ෂීණාශ්‍රව තෙ මේ; අහං ඛීණාසවොති, මම ක්ෂීණාශ්‍ර වයෙමියි; අත්තානං පකාසෙතීති, ත මා පහළ කෙරේද? කිං වත්තබ්බං, අප විසින් කියනුම කිම? කාරකභා වංහි, කාරකභාවය බැවි; ජානිත්වා, දැන; පකාසෙති, හෙතෙම් පහළ කෙරේ ද මැනෝ (දැහැන් කරුන් යුවුකල ර හතුන් තමන් රහත්බැව් පහළකරණ බවම දක්වනු පිණිස "ගන්නු" යනාදී කී "කාරෙසි නාතු"ති යොදනු) අස්සගු ත්තත්ථෙරො, අස්සගුත්ත නම් තෙරනු; ඉමස්ස භික්ඛුනො, මේ භික්ෂූහු විසින් (තෘහියාර්ථයෙහි ෂෂ්ටීසි) ආරද්ධං, ක ම්මට්ඨානං ආරම්භකරණලද; කාරකො අයන්ති ජානිත්වා, මෙ කරුයයි දැන; ආකාසෙ චම්මඛණ්ඩං පසාරෙත්වා, අ හස සම්කඩ පණවා; තත්ථ, එහි; පල්ල ඞ්කෙන නිසීදිත්වා, පලඟින් හුන්නා හු; කම්මට්ඨානං කථෙසි නාතු, කමටහ න් කීහේ නොවෙති; තස්මා සචෙ ඛී ණාසවංලභති, එහෙයින් ඉදින් ක්ෂීණා ශ්‍රවයන්හු ලබානම්; ඉච්චෙතං කුසලං, ඒ ක්ෂීණාශ්‍රවයා ලැබීම කුශලය (යෙහෙ කා යුතැ නි) නොවලහනී, නොලද න

මි; අනාගාමී, අනාගාමියෙ; සකදාගාමී, සෙදාගාමියෙ; සොතාපන්නො, සෝවාන; කාහලානි, දුහැන්ලද්දේය; පුථුජ්ජන තිපිටකධර, පුහුදුන් තුන්පිටක ධරය; ද්විපිටකධර, දෙපිටකධරය; එකපිටක ධරෙසු, එක්පිටක ධරය සත තෙවුවත් කෙරෙහි; පුරිමස්ස සන්තිකෙ, පලමුවු වනු සම්පයෙහි (කම්මට්ඨානං ගහෙතබ්බං" යනු සබඳ) එකපිටකධරෙපි අස ති, එක්පිටකයක් දූරුවන්හුද නැති කල්හි; යස්ස, යමක්හට; එකසඞ්ගීති පි, එක් සඟියක්හුද; අට්ඨකථා සඞ්ගී පගුණා, අටුවා යමක පුහුණුද; සොයෙක්ම ලජ්ජී හොති, තෙමේද ලජ්ජීවේද; තස්ස සන්තිකෙ ගහෙතබ්බං, උහු සමීපයෙහි ගතයුතු; එවරූපො හි තන්තිධරො, මෙබඳු ලජ්ජීසූත්‍රධර තෙමේ; වංසානුරක්ඛකො, බුද්ධානුබුද්ධයන් වංශය අනුරක්ෂණය කරන්නාවූ; පවෙණීපාලකො, ආචාර්‍යපරපුරෙහි පැමිණි ප්‍රවෙණිය රක්ෂාකරන්නාවූ; ආචරියො, ආචාර්‍ය තෙමේ; ආචරියමතිකොව හොති, ආචාර්‍යමතිය නොඉක්මවන බැවින් ආචාර්‍ය මතයෙහිම සිටියේයි (මේ පක්ෂයෙහි 'ආචරියමතිං කායති කථෙති ආචරිය මතිං නිස්සෙතා ආචරියමතිකො"යි ගන්නේ "ආචරියමතිං කායති කථෙතීති ආචරියමතිකො"යි ගත ආචාර්‍ය මතයම කියන්නේය යනු අර්ථයි) න අත්තනොමතිකො, තම මතිය කියන්නේ නොවේ; එතතෙනාව, එහෙයින්ම; පොරාණකත්ථෙරා, පුරාතන තෙරවරුහු; ලජ්ජී රක්ඛිස්සති ලජ්ජී රක්ඛිස්සතීති ආහංසු, ලජ්ජී රක්ෂී ලජ්ජී රක්ෂිති කිවු; එවූව, මොවුන් කෙරෙහිදු; පුබ්බවුත්තඛීණාසවාදයො, පළමු කී රහත් ආදීහු; අනන්තා අධිගතමග්ගමෙව ආචික්ඛන්ති, තමන් විසින් අධිගතමාර්ග කියති; බහුස්සුතො පන, බහුශ්‍රැත වනාහි; තංතං ආචරියං උපසඞ්කමිත්වා, ඒ ඒ ආචාර්‍යන් කරා එළඹ; උග්ගහ පරිපුච්ඡාහං විසොධිතත්තා, කථනයහට උපකාර වූ පෙළ අටුවා ශුද්ධකළබැවින්; ඉතො චිතො, පස්නිකායෙහි ඔබින් ඔබින්; සුත්තඤ්ච කාරණඤ්ච සල්ලක්ඛෙත්වා, ඒ ඒ කම්මට්ඨානට සුදුසු සූත්‍ර පදද සූත්‍රානුගතවූ කාරණාද සලකා; සප්පායාසප්පායං යොජෙත්වා, සැපඅසැප යොද; ගහනට්ඨානෙ ගච්ඡන්තො, ගහන තැන යන්නාවූ; මහාහත්ථිපිය මහ ඇතක්හු මෙන්; මහාමග්ගං දස්සෙන්තො, කම්ටහන් විධිය මහමඟකොට දක්වමින්; කම්මට්ඨානං කථෙස්සති, කම්ටහන් කියන්නේයි; තස්මා, එහෙයින්; එවරූපං කම්මට්ඨානදායකං, එබඳුවූ කම්ටහන් දෙනයක්හු කරා; උපසඞ්කමිත්වා, එළඹ; තස්ස, ඔහට; වත්තපටිවත්තං කත්වා, වත්පිළිවෙත් කොට; කම්මට්ඨානං ගහෙතබ්බං, කම්ටහන් ගතයුතු ~

---

( කා ‡ )

කල්‍යාණමිත්‍රනම් යමෙක් තමාගේ සීලසම්පත්තීන් ප්‍රියවේද එහෙයින්ම පාෂාණඡත්‍රයක්මෙන් ගරුවන්නේද ගුණ වශයෙන් ගරුබුහුමන් කටයුතුවේද අවවාද වශයෙන් කියනසුලුවේද චොදනා වශයෙන් පිළිවිසි තෙපුල් ඉවසනසුලුවේද චතුරාර්‍යසත්‍ය ප්‍රතීත්‍යසමුත්පාදාදී ප්‍රතිසංයුක්ත ගැඹුරු ධර්මකථා කියනසුළුවේද නොමනා තන්හි නොයොදන්නේවේද ශ්‍රද්ධාශීලශ්‍රැත ත්‍යාග වීර්‍ය ස්මෘති සමාධි ප්‍රඥා යනාදි ගුණයෙන් සමන්විතවූයේද එකාන්තයෙන් හිත වැඩම සොයන්නේවේද අනවැසියන්ට අභිවෘද්ධි පක්ෂයෙහි සිටියේවේද මෙබඳු තැනැත්තේ කල්‍යාණමිත්‍රනම් වන්නේයි හඟවන්

පු විසින් ආනන්දය කල්‍යාණමිත්‍රවූ මා කරා පැමිණ ඉපදීම් ස්වභාවකොට ඇති සත්වයෝ ජාතියෙන් මිදෙත්නාහු යයි යනා මේ ආදිය වදාළබැවින් සම්‍යක් සම්බුද්ධහුම සර්වාකාර පරිපූර්ණවූ පරම කල්‍යාණමිත්‍රනම: එහෙයින් බුද්ධ ජීවමාන කල්හි ඒ භාග්‍යවත්හු සමීපයෙහිම ගත්තාලද කමටහන මනාකොට ගත්තාලද නම් වෙයි භගවත්හු පිරිනිවීපසු අසූමහාශ්‍රාවකයන් අතුරෙන් යමෙක් ධරමානවීනම් ඔහු සමීපයෙහි කමටහන් ගතයුතුය ඔහුද නැතිකල යම් කමටහනක් ගණු කැමැත්තේවීනම් ඒ කමටහන වඩා චතුෂ්ක පඤ්චකධ්‍යානයන් උපදවා ඒ ධ්‍යානය පිහිටකොටගෙණ විදර්ශනා වඩා රහත්ඵලයට පැමිණි රහත් කෙණෙක් සමීපයෙහි ගතයුතුයි කිමෙක්ද ක්ෂීණාශ්‍රව රහත් කෙණෙක් මම ක්ෂීණාශ්‍රවයෙමියි තමා පහළ කෙරේද යත්? අප විසින් ක්ෂීණාශ්‍රවයා තව කුමක් කියයුතුද? යමෙක් භාවනාකරණ බැව් දැන තමාගේ රහත්බව පහළ කලේනම් මැනව ඒ එසේමැයි අස්සගුත්ත නම් තෙරුන්වහන්සේ උත්තරා භික්ෂු කෙණෙක් කමටහන් භාවනාකරන්නා දැක මේ භික්ෂුහු විසින් කමටහන් වැඩීමට පටන්ගත්තාලද්දේය. මෙතෙම භාවනාකරන්නෙකැයි දැන අහස පත්කඩ අතුරා එහි පළක්බැඳ වැඩහිද කමටහන්දුන්න එහෙයින් ක්ෂීණාශ්‍රවයෝ ධ්‍යානාඩම්භවුත් දුටුකල තමා රහත්බව අඟවා කමටහන් දෙත්තේය එහි උත්තරි මනුෂ්‍ය ධර්මාරෝචනය නොවන්නේ වැයි එබදු ක්ෂීණාශ්‍රවයෙකු ලදනම් ඒ ක්ෂීණාශ්‍රවයාගේ ලැබීමනම් හොත ක්ෂීණාශ්‍රවයෙකු නොලදනම් අනාගාමියෙක්ද ඔහුත් නොලදනම් සෝවාහන්හුද ඔහුත් නොලදනම් ධ්‍යානලාභියෙක්ද ඔහුත් නොලදනම් පෘථග්ජන ත්‍රිපිටකධරයෙක් හෝ ද්විපිටකධරයෙක් හෝ ඒකපිටකධරයෙක් හෝ යන මොවුන් අතුරෙන් පළමු පළමු වූවහු සමීපයෙහි කමටහන් ගතයුත්තේය. ඒකපිටකධරයෙකුද නැතිකල යමෙකුට අටුවා හා සමග එක්සඟියක් පුහුණුද හෙතෙම් ලජ්ජීවූද එබඳක්හු සමීපයෙහි කමටහන් ගතයුත්තේය මෙබඳුවූ ලජ්ජී සූත්‍රධර තෙමේ බුද්ධානුබුද්ධයන්ගේ ශාසන වංශය රක්නාවූ ආචාර්ය්‍ය පරම්පරාගත ආචාර්ය්‍යමාර්ගය නැමති ප්‍රවේණිය පාලනයකරන්නාවූ ආචාර්ය්‍ය මතයෙහි පිහිටි තමා මතය නොගනිත සුලුවූ ආචාර්ය්‍ය නම්වෙයි එහෙයින්ම පුරාණත මහතෙරවරහු ශාසනය අනාගතයෙහි ලජ්ජී රකියි ලජ්ජී රකියි කීහ මෙවුන් අතුරෙන් වනාහි පළමු කියනලද රහත් ආදීහු තමන් විසින් අධිගතමාර්ගය කියන්නාහුය බහුශ්‍රැත තෙම ඒ ඒ ආචාර්ය්‍යයන් කරා එළඹ කමටහනට උපකාරවූ පෙල අටුවා සුඩකල බැවින් පස්නිකායෙහි ඔබිනොබින් ඒ ඒ කමටහනට සුදුසුවූ සූත්‍රපද හා සූත්‍රානුගතවූ කාරණාද සලකා ඒ ඒ චරිතයට සැපෙන සැපෙන සේද මහත්වූ වනගහණයෙක ගමන්කරණ මග ඇතෙකු මෙන් කමටහන් විධිය මනාකොට දක්වමින් කමටහන් කියන්නේයි එහෙයින් එබඳුවූ කල්‍යාණමිත්‍ර කම්ස්ථාන දායකයෙකු කරා එළඹ ඕහට වත් පිළිවෙත්කොට කමටහන් ගතයුත්තේයි

( පා ¶ )

සමෙවනං තං එකවිහාරෙයෙව ලභති ඉච්චෙවතං කුසලං නොචෙ ලභති යත්ථ සො වසති තත්ථ ගන්තබ්බං ගච්ඡන්තෙනච නෙව ධොතමක්ඛිතෙහි පාදෙහි උපාහනා ආරුහිත්වා ඡත්තං ගහෙත්වා තෙලනාළිමධුඵාණිතාදීනි ගාහාපෙත්වා අන්තෙවාසිකපරිවුතෙන ගන්තබ්බං ගමිකවත්තං පූරෙත්වා අත්තනො පත්තචීවරං සයමෙව ගහෙ

ත්වා අන්තරාමග්ගෙ යං යං විහාරං ප
විසති සබ්බත්ථ වත්තපටිවත්තං කුරු
මානො සල්ලහුක පරික්ඛාරෙන පර
ම සල්ලෙඛ වුත්තිනා හුත්වා ගන්තබ්බං
තං විහාරං පවිසන්තෙන අන්තරාමෙයෙ
ව දන්තකට්ඨං කප්පියං කාරාපෙත්වා
ගහෙත්වා පවිසිතබ්බං න ච මුහුත්තං
විස්සමිත්වා පාදධොවන මක්ඛනාදීනි
කත්වා ආචරිය සන්තිකං ගමිස්සාමීති
අනුසන්ධං පරිවෙණං පවිසිතබ්බං කස්මා
සචෙ හිස්ස තත්‍ර ආචරියස්ස විසභාගා
භික්ඛූ භවෙය්‍යුං තෙ ආගමන කාරණං
පුච්ඡිත්වා ආචරියස්ස අවණ්ණං වත්වා
සෙත්වා නාසෙස්සසි සචෙ තස්ස සන්තිකං
ආගමෙස්සසි විප්පටිසාරං උප්පාදෙය්‍යුං
යෙන තතොව පටිනිවත්තෙය්‍ය තස්මා
ආචරියස්ස වසනට්ඨානං පුච්ඡිත්වා උජු
කං තත්ථෙව ගන්තබ්බං සචෙ ආචරි
යො දහරතරො හොති පත්තචීවරප
ටිග්ගහණාදීනි කාතබ්බානි සචෙ
බ්‍යත්තතරො හොති ආචරියං වන්දිත්වා
ඨාතබ්බං නික්ඛිපාවුසො පත්තචීවර
න්ති වුත්තෙයෙව නික්ඛිපිතබ්බං — පානී
යං පිවාහීති වුත්තෙ සචෙ ඉච්ඡති පා
තබ්බං පාදෙ ධොවාහීති වුත්තෙපි න තාව
ධොවිතබ්බා සචෙ හි ආචරියෙන ආ
භතමුදකං භවෙය්‍ය න සාරුප්පං සියා
ධොවාවුසො න මයා ආහතං අඤ්ඤෙහි
ආහතන්ති වුත්තෙපන යත්ථ ආචරි
යො න පස්සති එවරූපෙ පටිච්ඡන්නෙ
වා ඔකාසෙ අබ්භොකාසෙ විහාරස්සාපි
වා එකමන්තෙ නිසීදිත්වා පාදා ධොවි
තබ්බා. සචෙ ආචරියො තෙලනාළිං
ආහරති උට්ඨහිත්වා උභොහි හත්ථෙහි
සක්කච්චං ගහෙතබ්බා සචෙ හි නො
ගණ්හෙය්‍ය අයං භික්ඛු ඉතො එව පට්ඨා
ය සම්භොගං කොපෙතීති ආචරියස්ස
භවෙය්‍ය ගහෙත්වා පන න ආදිතොව
පාදා මක්ඛෙතබ්බා — සචෙ හි තං ආ
චරියස්ස ගත්තාභිඤ්ජනතෙලං භවෙ
ය්‍ය න සාරුප්පං සියා තස්මා පඨමං
සීසං මක්ඛෙත්වා ඛන්ධාදීනි මක්ඛෙත
බ්බානි සබ්බපාරිහාරියතෙලමිදං ආවු
සො පාදෙපි මක්ඛෙහීති වුත්තෙ තාපන
පාදෙ මක්ඛෙත්වා ඉමං තෙලනාළිං
ඨපෙමි භන්තෙති වත්වා ආචරියෙ ග
ණ්හන්තෙ දාතබ්බා ගතදිවසතො පට්ඨා
ය කම්මට්ඨානං මෙ භන්තෙ කථෙථ
තු එවං න වත්තබ්බං දුතියදිවසතො
පන පට්ඨාය සචෙ ආචරියස්ස පකති
උපට්ඨාකො අත්ථි තං යාචිත්වා වත්තං
කාතබ්බං සචෙ යාචිතොපි න දෙති
ඔකාසෙ ලද්ධෙයෙව කාතබ්බං — ක
රොන්තෙන ච ඛුද්දකමජ්ඣිමමහන්
තානි තීණි දන්තකට්ඨානි උපනාමෙ
තබ්බානි සීතං උණ්හන්ති දුවිධං මුඛ
ධොවන උදකඤ්ච නහානොදකඤ්ච
පටියාදෙතබ්බං තතො යං ආචරියො
තීණි දිවසානි පරිභුඤ්ජති තාදිසමෙව
නිච්චං උපට්ඨාපෙතබ්බං — නියමං
අකත්වා යං වා තං වා පරිභුඤ්ජන්තස්ස
යථාලද්ධං උපනාමෙතබ්බං කිං බහු
නා වුත්තෙන යං භගවතා අන්තෙ
වාසිකෙන භික්ඛවෙ ආචරියම්හි සම්මා
වත්තිතබ්බං තත්‍රායං සම්මාවත්තනා
කාලස්සෙව වුට්ඨාය උපාහනා ඔමුඤ්චි
ත්වා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා
දන්තකට්ඨං දාතබ්බං මුඛොදකං දාත
බ්බං ආසනං පඤ්ඤපෙතබ්බං සචෙ
යාගු හොති භාජනං ධොවිත්වා යාගු
උපනාමෙතබ්බාති ආදිකං ඛන්ධකෙ
සම්මා වත්තං පඤ්ඤත්තං තං සබ්බම්පි
කාතබ්බං — එවං වත්තසම්පත්තියා ග
රුං ආරාධයමානෙන සායං වන්දිත්වා
යාහීති විස්සජ්ජිතෙන ගන්තබ්බං යදා
සො භික්ඛුස්ස ආගතොසීති පුච්ඡති තදා
ආගමන කාරණං කථෙතබ්බං සචෙ
සො නෙව පුච්ඡති වත්තං පන සාදිය

ති දස්සෙත්වා පක්කමිත්වා විහිවිතොනා එකදිවසං විසජ්ජිතෙනාපි ආගන්ත්වා ඔකාසං කාරෙත්වා ආගමනකාරණං ආරොචෙතබ්බං. අකාලෙ වා ගන්ත්වා කිමත්ථං ආගතොසීති පුට්ඨෙන ආරොචෙතබ්බං. සචෙ සො පාතොව ආගච්ඡාහීති වදති පාතොව ගන්තබ්බං. සචෙ පනස්ස තායං වෙලායං පිත්තාබාධෙන වා කුච්ඡි පරිඩය්හති අග්ගිමන්දතාය වා භත්තං න ජීරති අඤ්ඤො වා කොචි රොගො බාධති තං යථාභූතං ආවිකත්වා අත්තනො සප්පායවෙලං ආරොචෙත්වා තාය වෙලාය උපසඞ්කමිතබ්බං. අසප්පායවෙලායං හි වුච්චමානං කම්මට්ඨානං න සක්කා හොති මනසි කාතුන්ති අයං කම්මට්ඨානදායකං කල්‍යාණමිත්තං උපසඞ්කමිත්වාති එත්ථ විත්ථාරො.

( ස ¶ )

සචෙ, ඉදින්; තං, ඔහු; එකවිහාරෙයෙව ලභති, එක වෙහෙරම ලැබීනම්; ඉච්චෙතං කුසලං, මේ මැනව; නොචෙ ලභති, ඉදින් නොලැබේනම්; යත්ථ සො වසති, යම් තැනෙක හෙතෙම වෙසේද; තත්ථ ගන්තබ්බං, එහි යායුතු; ගච්ඡන්තෙන ච, යන්නහු විසිනුදු; ධොතමක්ඛිතපාදෙහි; සෙද වූ තෙල් ගැල්වූ පයින්; උපාහනා ආරුහිත්වා, වහන් නැගී; ඡත්තං ගහෙත්වා, සත් ගෙණ; තෙලනාළි මධුඵාණිතාදීනි ගාහාපෙත්වා, තෙල් නළ මී සකුරු ආදීන් ගෙන්වාගෙණ; අන්තෙවාසික පරිවුතෙන, අතවැසියන් විසින් පිරිවරණ ලදින්; න ගන්තබ්බං, නොයායුතු; ගමිකවත්තං පන පූරෙත්වා, ගමික්වත් පුරා; අත්තනො පත්ත චීවරං සයමෙව ගහෙත්වා, තමාගේ පාසිවුරු තමාම ගෙණ; අන්තරාමග්ගෙ යං යං විහාරං පවිසති, අතුරු මග යම් යම් වෙහෙරකට වදීද; සබ්බත්ථ, ඒ සියළු තන්හි; වත්තපටිපත්තිං කුරුමානෙන, වදනහු විසින් ආගන්තුකවත් නිත්මෙන්නහු විසින් ගමිකවත් කරන්නහු විසින්; සල්ලහුක පරික්ඛාරෙන, සැහැල්ලු පිරිකර ඇත්තහු විසින්; පරමසල්ලෙඛ වුත්තිනා හුත්වා ගන්තබ්බං, උසස් සැලේ පැවැතුම් ඇතිව යායුතු; තං විහාරං පවිසන්තෙන, ඒ ඇදුරන් උසන වෙහෙර වදනහු විසින්; අන්තරාමග්ගෙව දන්තකට්ඨං කප්පියං කාරෙත්වා, අතුරුමගදීම දැහැටිදඬු කැප කරවා; ගහෙත්වා, ගෙණ; පවිසිතබ්බං, වැද්දයුතු; මුහුත්තං, මොහොතක්; විස්සමිත්වා, සැතපී; පාදධොවනමක්ඛනාදීනි කත්වා, පාදෙවීම් තෙල් ගැල්වීම් ආදිකොට; ආචරියස්ස සන්තිකං ගමිස්සාමීති, ඇදුරන් සමීපයට යෙමියි; අඤ්ඤං පරිවෙණං, අනික් පරිවෙණකට; න පවිසිතබ්බං, නොවැද්දයුතු; කස්මා, කුමක්හෙයිනයත්? සචෙ හි, ඉදින්; තත්‍ර, ඒ වෙහෙර; ආචරියස්ස විසභාගා භික්ඛූ භවෙය්‍යුං, ආචාර්‍ය්‍යයන්ට විසභාග භික්ෂූහු ඇත්නම්; තෙ ආගමන කාරණං පුච්ඡිත්වා, ඔව්හු ආ කරුණු විචාරා; ආචරියස්ස, ආචාරීන්ගේ; අවණ්ණං පකාසෙත්වා, නොගුණ ප්‍රකාශ කොට; සචෙ, ඉදින්; තස්ස සන්තිකං ආගතො, ඔහු සමීපයට ආගියෙහිමි; නට්ඨො අසි, නට්ඨයෙහිවේදැයි; ("අස්ස විප්පටිසාරං උප්පාදෙය්‍යුං" යී සබ්බදකරණු) ඕහට විපිළිසර උපදවන්නාහුයි; යෙන, යම් විපිළිසරකින්; තතොව, එතනම සිට; නිවත්තෙය්‍ය, හාවනීද (එසේ විපිළිසර උපදවන්නාහුය යුතැනී) තස්මා, එහෙයින්; ආචරියස්ස වසනට්ඨානං පුච්ඡිත්වා, ආචාරීන් වසන තැන පිළිවිස; උජුකං, ඉදිරුම; තත්ථෙව, එතැනටම; ගන්තබ්බං,

යාපුතු; සචෙ, ඉදින්; ආචරියො දන
රතරෙරා හොති, ආචාරීනු ලදරු වූනම්;
පතාවිවරපටිගහණාදීනි හා සාදි
තබ්බානි, පාසිවුරු පිළිගැනීම ආදි
කොටුවසියයුතු; සචෙ, බුඩ්ඪනරො
හොති, ඉදින් වැඩිමහලුවනී; ග
හෙබ්බා, ගොස්; ආචරියං වඤ්ඣිබා ඨා
තබ්බං, ආචාරීන්වැඳසිටියයුතු; නිසාබ
පාවුරෙසා පතාවිවරතානි වුතොනන,
ඇවැත පාසිවරුතබ්බයි කියනලද්දහු
විසින්; නිසාබිපිතබ්බං, තිබියයුතු; පා
නීයංපිවාන් වුතොනන, පැන්බොවයි
කියනලද්දහු විසින්; සචෙ ඉච්ඡති පා
තබ්බං, ඉදින් කැමතිනම් පියයුතුයා;
පාදෙ ධොවානි වුතොනන, පාදයන්
දොයි කියනලද්දහු විසින්; න තාව
ධොවිතබ්බා, තව නොසෙදියයුතුහා;
සචෙති, ඉදින්; ආචරියෙන ආගතව මුද
තාහොවෙයා, ආචාරීන්විසින් ගෙණා
පැන්වීනම්; තසාරුප්පංසියා, සරුප්
නොවන්නේයි; ධොවාවුසො, ඇවැත
දෙ; න මයා ආගතං, මාවිසින් ගෙ
ණෙනලද්දේනොවෙයි; අසෙසැඤති ආ
හතනති, අනුන් විසින් ගෙණෙන ල
දූයි; වුතොනන පන, කියනලද්දහු
විසින් වනාහි; යස්ස ආචරියො න ප
සසති, යම් තැනෙක්හි ආචාය්‍යීයෝ
නොදක්දද; එවරූපෙ, එබඳුවූ; පටි
ච්ඡන්නෙ වා ඔකාසෙ, ප්‍රතිච්ඡන්නවූ
අවකාසයෙකහෝ; අජ්ඣොකාසෙ විහා
රසාමි, අභ්‍යවකාශ විහාරයාගේද;
එකාමන්තෙ නා වා නිසිදිතබ්බා, ආචාරීන්ට
ඉදිරිව හමුයෙහි නොහිඳ විවිතස
නොපෙනෙණතනෙක ලොත් හිඳ; පාද,
ධොවිතබ්බා, පාදෙවිසයුතුකාහුයි; ස
චෙ, ඉදින්; ආචරියො, ආචාරීනු;
තෙලනාළිං ආහරති, තෙල්නාළ ගෙ
ණාවුනම්; උට්ඨහිත්වා, නැගිට; උ
බොහි හත්ථෙහි, දෙඅතින්; සක්ක
ච්චං ගහෙතබ්බා, සකස්කොට ගත
යුතුයි; සචෙ න ගණ්හෙය්‍ය, ඉදින්
නොගන්නේවීනම්; අසංගිතවූ, මේ
වහණ; ඉතො එවපට්ඨාය, මෙතැනම
පටන්ගෙණ; සභාගං කොපෙතීති,
සභාගයභාවත්තේයයි (නොක
රන්නේය යුතුනී) ආචරියස්ස හමෙ
යා, ආචාරීන්ටවන්නේය (සිතන්
නේය යුතුනී) ගහෙතබ්බා පන, තෙල්
නළගෙණ වනායි; ආදිතොව පාදෙ න
මක්ඛෙතබ්බා, ආදිකොටම පාදයෝ
ගැතියයුත්තාහු නොවෙත්; සචෙහි,
ඉදින්; ආචරියස්ස ගත්තාබ්භඤ්ජනතෙ
ලං හවෙය්‍ය, ආචාරීන් ශරීරයෙහි ග
ගත තෙලක්වීනම්; න සාරුප්පංසියා,
සරුප්නොවන්නේයි; තසමා, එහෙ
හීන්; පඨමං, පළමුකොට; සීසං ම
ක්ඛෙතබ්බං, හිසගනා; ඛන්ධාදීනි මක්ඛෙ
තබ්බානි, පිටිකර ආදීහු ගැතියයුතු;
ආවුසො, ඇවැත; ඉදං, මේ; සබ්බ
පාරිහාරියතෙලං, සියලු ඇඟ පසනට
හෝ සියලු මහණවිහෝ පිණිස පරි
හරණය කටයුතු තෙල; ආවුසො,
ඇවැත; පාදෙපි මක්ඛෙථිනි වුත්තාන
පන, පයදගනයි කියනලද්දහු විසින්;
පාදෙ මක්ඛෙතබ්බා, පයගනහා; ඉම්
තෙල නාළිං ඨපෙමි හගොනති වත්වා,
මේ තෙල්නළ තබමි වහන්සැයිකියා;
ආචරියෙ ගණ්හන්තෙ දාතබ්බා, ආචා
රීන් ගණුන් කොන් දියයුතුය; ගත
දිවසතො පට්ඨාය, ගියදවස් පටන්
ගෙණ; සචෙ, ඉදින්; ආචරියස්ස ප
තාහි උපට්ඨාකො අත්ථි, ආචාරීන්ගේ
පියවී උපස්ථායකයෙක් ඇත්තම්;
තං යාචිතබ්බා, උහු ඉල්වාගෙණ; වත්තං
කාතබ්බං, වත් කටයුතුය; සචෙ,
ඉදින්; යාචිතොපි නාදෙති, වත් ඉල්
වනලද්දේද නොදේනම්; ඔකාසෙ
ලද්ධෙයෙව කාතබ්බං, අවකාශලද
විටම කටයුතු; කරොන්තෙන ච, ක
රන්නාහු විසිනුදු; ඛුද්දක මජ්ඣිම ම
හාපාතානි තීණි දාතබ්බානි, කුඩා
මැදුම් මහත්වූ දෑවටි දඹුවෝ තුන්

දෙනොක්; උපනාමෙතබ්බානි, එළ
විය යුත්තාහුයි; සීතං උණ්හනායි දුවි
ධං, හැල්දිය හුණුදිය යන දෙවැද
රුම්වූ; මුඛධොවන උදකඤ්ච, මුව
දෝනා දියද; නහානොදකඤ්ච, නාහ
න දියද; පටියාදෙතබ්බං, සැපයියයු
තු; තතො, එයින්; ආචරියො, ඇජ
රෝ; තිණි දිවසානි, තුන්දවසක්;
යං පරිභුඤ්ජති, යමක් වැළඳගණීත්
නම්; තාදිසමෙව නිච්චං උපට්ඨපෙ
තබ්බං, එබඳුම්වූවා නිතියෙන් එළඹිය
යුතු; නියමං අකත්වා, නියමනොකො
ට; යං වා තං වා පරිභුඤ්ජනස්ස, යම්
තම්දෙයක් වැළඳගන්නාහට; යථා ල
ද්ධං උපනාමෙතබ්බං, ලදදූයක්ම එළඹි
යයුතු; කිං බහුනා වුත්තෙන, බොහෝ
කොට කිමෙක් කිම ("යං තං භගවතා
පඤ්ඤත්තං"යි සබඳ) භගවතා, භග
වත්හු විසින්; ඛන්ධකෙ, මහණෙනි,
අන්තෙවාසිකෙන, අතවැස්සහු විසින්;
ආචරියම්හි, ආචාරීන්හුකෙරෙහි; සම්මා
වත්තිතබ්බං, මනාකොට පැවැත්තයු
තු; තත්‍ර, එහි; අයං, මේ; සම්මාවත්ත
නා, මනාකොට පැවතුම්; කාලස්සෙ
ව උට්ඨාය, උදසන්හිම නැගී; උපා
හනා ඔමුඤ්චිත්වා, වහන් ගලවා; එකං
සං උත්තරාසඞ්ගං කරිත්වා, උත්තරා
සඞ්ගය එකස්කොට පෙරව; දන්ත
කට්ඨං දාතබ්බං, දැහැටිදඬු දියයුතු; මු
ඛොදකං දාතබ්බං, මුවදෝනාදිය දිය
යුතු; ආසනං පඤ්ඤපෙතබ්බං, අසුන්
පැණවියයුතු; සචෙ යාගු හොති, ඉ
දින් හබුඇත්නම්; භාජනං ධොවිත්වා,
භාජනදෙව; යාගු උපනාමෙතබ්බාති,
හබු එළවියයුත්තියයි; ආදිකං, මේ
ආදිවූ; ඛන්ධකෙ, වත්කඳෙහි; යං තං
වත්තං, යම් ඒ වතෙක්; පඤ්ඤත්තං,
පණවනලදද; තං සබ්බම්පි කාත
බ්බං, ඒ සියල්ලම කටයුතු; එවං,
මෙසේ; වත්තසම්පත්තියා ගරුං ආරා
ධයමානෙන, වත්සම්පත්තියෙන් ගු
රුහු සිත්ගන්නාහු විසින්; සායං, සව
ස; වන්දිත්වා, වැඳ; යාහීති, යායි; විස්ස
ජ්ජිතෙන, හරණලද්දහු විසින්; ගන්ත
බ්බං, යායුතු; යදා, යම්වේලෙක; සො,
ඒ ඇජරතෙමේ; කස්මා ආගතොසීති
පුච්ඡති, කුමක්පිණිස අයිදූයි විචා
රද; තදා, එකල්හි; ආගමනකාරණං
කථෙතබ්බං, ආකාරණ කියයුතු; ස
චෙ, ඉදින්; සො, ඒ ඇජරතෙමේ; නෙ
ව පුච්ඡති, නොවිචාරානම්; වත්තං
පන සාදියති, වත්වතානි ඉවසානම්;
දසාහංවා, දසදවසක්හෝ; පක්ඛංවා,
පක්ෂයක්හෝ; වීතිවත්තෙත්වා, ඉක්මුවා
කල; එකදිවසං, එක් දවසක්; විස්සජ්ජි
තෙනාපි, යායි සමුදෙනලදහු විසිනුදු;
අගන්ත්වා, නොගොස්; ඔකාසං කාරෙ
ත්වා, අවකාශකරවා; ආගමනකාරණං
ආරොචෙතබ්බං, ආකාරණ කියයුතු;
අකාලෙ වා ගන්ත්වා, නොකල්හිහෝ
එළඹ; කිමත්ථං ආගතොසීති පුට්ඨෙ
න, කුමක්පිණිස ආදූයි විචාරණලද්ද
හු විසින්; ආරොචෙතබ්බං, කියයුතු;
සචෙ, ඉදින්; සො, ඒ ඇජර; පාතො
ව ආගච්ඡාති වදති, උදසන්හිම එව
යි කියානම්; පාතොව ගන්තබ්බං, උද
සන්හිම යායුතු; සචෙ පන, ඉදින්
වනාහි; අස්ස, ඔහුගේ; තාය වේලාය,
ඒ වේලෙහි; පිත්තාබාධෙන වා කුච්ඡි
පරිඩය්හති, පිත්තරොගයෙන් කුසගිය
දනම්හෝ; අග්ගිමන්දතාය වා භත්තං
න ජීරති, අග්නිමන්දබැවින් හෝ බත
නොදිරානම්; අඤ්ඤොවා කොචි රො
ගො බාධති, අනික් කිසි රෝගයෙක්
හෝ පෙළානම්; තං, ඒ රෝගය; යථා
භූතං ආවිකත්වා, වූපරිද්දෙන් පහළ
කොට; අත්තනො සප්පායවෙලං ආ
රොචෙත්වා, තමහට සැපවේලාවක්
කියා; තාය වෙලාය උපසඞ්කමිත
බ්බං, එවේලෙහි එළඹියයුතු; අසප්පා
යවෙලායං හි, නොසැපවේලෙහි; වූපව

මානවපි කම්මට්ඨානං, සිඛනුලබන
ලද්දු කම්මට්ඨාණං; න සක්කාහොති ම
නසිකාතුං, මෙනෙහිකරන්නට නො
පිළිවන්වේ; අයං, මෙතෙම; කම්මට්ඨා
නදායකං කල්‍යාණමිත්තං උපසඞ්ක
මිත්වා'ති එළඹ, කම්මට්ඨාන...උප...ත්වා
යනමෙහි; විත්ථාරො, විස්තරයි.

( හා ¶ )

ඉදින් එබඳු කමටහන් දෙන ක
ල්‍යාණ මිත්‍රයෙක් තමා වසන වෙහෙ
රම ලැබේනම් හෝ මැනව ඉදින්
නොලැබේනම් වසනතෙනකට යායු
තුවන්නේය. එසේ යන්නහු විසිනුදු
දෙවහලදුවූහෝ තෙල් ගල්වනලදු
වූහෝ පයින් නොයායුතුය වහන්
නැගී කුඩගෙණ තෙල්කුලා මී සකුරු
ආදී යම් කිසිවක් ගෙන්වාගෙණ අත
වැසියන් විසින් පිරිවරණලදුව හෝ
නොයායුතුය වසනවෙහෙර ගමික
වත්පුරා තමාගේ පාසිවුරු තමාම
ගෙණ අතරමග යම්යම් විහාරයකට
වදිනම් ඒ සියලුතන්හි ආගන්තුක
වත් ගමිකවත් කරමින් සැහැල්ලු පිරි
කරඇතිව උත්කෘෂ්ටවූ කෙලෙස් ලිය
නපැවතුම් ඇතිව ගියයුත්තේය ඒ
ආචාර්‍ය්‍යයන් වසන වෙහෙරට වදන
හු විසින් අතුරෙහිම දැවිදඬු කැපක
රවාගෙණ වැද්දයුතුය මොහොතක්
සැතපිහිඳ පාදෙවීම් තෙල්ගැල්වීම්
ආදියකොට ආචාර්‍ය්‍යයන් සමීපයට
යෙමියි සිතා අන් පිරිවෙණකට නො
වැද්දයුතුය කුමක්හෙයිනයත්? ඉදින්
ඒ විහාරයෙහි ආචාර්‍ය්‍යයන්ට විසභා
ග භික්ෂූහු ඇත්නම් ඔවුන් තමා ආගා
රුණු විචාරා අසවල් ආචාර්‍ය්‍යයන් ලඟ
කමටහන් ගන්නවයයි දැන ඒ ආචා
ර්‍ය්‍යයන්ගේ නොගුණ ප්‍රකාශකොට
ඉදින් තොප ඔහු සමීපයට ආයේනම්
නටුයෙය්වේදැයි යනාදීන් කියා ඔහට
එතනම්සිට ආචාර්‍ය්‍යයන් කරා යාම
නමනොහැරියයුතුවූ විපිළිසර සිත් උප
දවන්නාහුය එහෙයින් පළමුකොට
ආචාර්‍ය්‍යයන් වසනතෙනම විචාරා
ඉදුරා එතනටම වැද්දයුතුය ඉදින්
ආචාර්‍ය්‍යයා වයසින් බාලවීනම් තමා
ගේ පාසිවුරු පිළිගැනීම් ආදිවශ
යෙන් කටයුතු වත්පිළිවෙත් නොඉව
සියයුතුය ඉදින් ආචාර්‍ය්‍යයන් වැඩිමහ
ලුනම් ලඟට ගොස් වැඳ සිටියයුතුවන්
නේය එසේ සිටිඇතව ඇවැත්නි පාසි
වුරු තබවයි කී කල්හිම තැබියයුත්
තේය පැන් බොවයි කී කල්හිම කැමැ
තිවීනම් පියයුත්තේය පාදෙවයි කී
කල්හි පළමුකොටම නොදෙවියයුත්
තේය කුමක්හෙයිනයත්? ඉදින් ආ
චාර්‍ය්‍යයන් විසින් ගෙණෙනලද පැන්
වීනම් නොසරුප්වනහෙයිනි ඉදින්
ආචාර්‍ය්‍යතෙම ඇවැත්නි මා විසින්
ගෙණෙනලද පැන්නොවෙයි අනුන්
විසින් ගෙණෙනලදැයි කී කල්හි යම්
තැනෙක ආචාර්‍ය්‍යයන්ට නොපැණේ
නම් එබඳු පිළිසන් තැනෙක හෝ
අභ්‍යවකාශ විහාරයෙහි ආචාර්‍ය්‍යයන්
ඉදිරියේ හොහිඳ පිටිපස නොපැණෙ
නයෙනතෙක හෝ හිඳ පාදෙවියයුත්තා
හුය. ඉදින් ආචාර්‍ය්‍යයෝ තෙල්කුලාව
ගෙණාහුනම් හුනස්නෙන් නැගිසිට
දෙඅතින් සකස්කොට පිළිගතයුතුනීය
ඉදින් නොගත්තේවීනම් මේ මහණ
මෙතැන්පටන්ගෙණ සම්භොග නො
කරන්නේයයි ආචාර්‍ය්‍යතෙම සිතන්
නේය එහෙයින් තෙල්කුලාවගෙණ
පළමුකොටම පා නොගැල්වියයුත්
තේය. කුමක්හෙයිනයත්? ඉදින් ආ
චාර්‍ය්‍යයන් ශරීරයෙහි ගල්වන තෙලක්
වීනම් නොසරුප්වනහෙයිනි එහෙ
යින් පළමුකොට තෙල් ගෙණ හිස
ගල්වා පිටිකර ආදි තැන් ගැල්විය
යුත්තාහුය ඉදින් ආචාර්‍ය්‍යතෙම ඇ
වැත්නි මේ තෙල සියලු අඞ්ගප්‍රත්‍යඞ්ග

යට හෝ සිදලු මහණුන්ට හෝ පරිහරණය කටයුතු තෙලය ඇවැත්නි පයද ගල්වයි කී කල්හිම පය ගල්වා මේ තෙල් තල තබමි වහන්සැයි කියා තැබිය යුත්තේය. ඉදින් ආචාර්යයෝ ගණු කැමැත්තීනම් ආචාර්යයන්ට දියයුත්තේය. විහාරයට ගිය දවසපටන් වහන්ස මට කමටහන් දුනමැනවැයි නොකියයුත්තේය. දෙවෙනි දවස පටන් ඉදින් ආචාර්යයන්ගේ ප්‍රකෘති උපස්ථායකයෙක් ඇත්තේවීනම් ඔහු යාච්ඤාකොටත් නොදේනම් අවකාශ ලද විටකම කටයුතුවන්නේය. එත් පිළිවෙත්කරන්නහු විසිනුදු පළමු දවස්හි කුඩා මහත් මැදුම් යන තුන් ප්‍රමාණයක දැහැටි දඬු තුණක් එළවියයුත්තාහුය. ඇල්පැන් හුණුපැන් යන දෙයාකාරයක මුවදෙනා ජලයහා නහන ජලයද එළවියයුත්තේය. එසින් ආචාර්යයෝ තුන්දිනක්ම යම් ප්‍රමාණයක දැහැටි දඬුහා යම් පැනක් පරිභෝගකෙලේවීනම් නිරන්තරයෙන් එබඳු දැහැටි හා පැන් එළවියයුත්තාහුය.) නියමනොකොට යම්තම්දෙයක් වැලඳගන්නාහට ලදදෙයක්ම එළවියයුත්තේය. බොහෝකොට කීමෙන් කවර ප්‍රයෝජනද? භාග්‍යවත්හුවිසින් මහණෙනි අතවැස්සාවිසින් ආචාර්යයාකෙරෙහි මනාකොට පැවැතියයුතුයි මේ මතුදක්වන්නේ එහි මනාකොට පැවැත්මවෙයි. අතවැස්සා විසින් උදැසන්හිම නැගීසිට පය වහන් ගලවා පොරොනා සිවුර එකාංශකොට පෙරවා ආචාර්යයන්ට දැහැටිදඬු දියයුත්තේය මුවදෙනා පැන් දියයුත්තේය අසුන් පැණවියයුත්තේය ඉදින් කැඳ ඇත්තේවීනම් තලියතැටිය දෙව කැඳ එළවියයුත්තේය යනාදීන් මහවග්ගවත්ත ස්කන්ධකයෙහි යම් වතෙක් පණවා වදාරණ ලදද ඒ සියල්ලම කටයුතු වන්නේයි. මෙසේ වත්පිළිවෙත් සැප සිටෙමින් ගුරුන් සිත් ගන්නහු විසින් සවස ගුරුන් වැඳ යවයි කිවත්කල්හි නලදුවම ගමනේ සෙනස්නට යායුතුවන්නේයි. යම් විටක ඒ ආචාර්‍යතෙම කුමක් පිණිස ආයේදැයි විචාරද එකල්හි තමා ආ කාරණා කියයුත්තේය ඉදින් ආචාර්‍යතෙම නොවිචාරනම් වත්පිළිවෙත් ඉවසන්නේනම් දශදිනක් හෝ පසළොස්දිනක් හෝ ඉක්මුණුකල එක්දිනක වත්පිළිවෙත් කොට යවයි සමුදෙනලදුවත් නොගොස් අවසර රැගෙණ තමා ආ කරුණු දැන්වියයුත්තේය වත්පිළිවෙත් ආදිය නොකටයුතු අවේලාවක හෝ ගොස් කුමක්පිණිස ආයේදැයි විචාරණලදුව කියයුත්තේය. ඉදින් ඒ ආචාර්යතෙමේ උදැසන්හිම එවයි කියා නම් උදැසන්හි යායුතුය ආචාර්යයන් විසින් නියමකරණලද වේලෙහි පිත් රෝගයකින් කුස්දැවිල්ලක් හෝ කුස් ගිනි මදබැවින් අහර නොදිරීමෙන් හෝ අන්කිසි රෝගයකින් පෙළීමක් හෝ ඇත්තේවීනම් ඒ රෝගය තත්වූ පරිද්දෙන් ප්‍රකාශකොට කියා තමහට සැප පහසු වේලාවක් දන්වා එ වේලෙහිම එළඹිය යුතුවන්නේය. කුමක්හෙයිනයත්? නොසැපවේලෙහි කියනලද කමටහණ මෙනෙහි කරන්නට නොපිළිවන්වනහෙයිනැයි දත යුතු. මේ වනාහි කමටහන් දෙන කල්‍යාණ මිත්‍රයෙකු කරා එළඹිය යන වාක්‍යයෙහි විස්තරවන්නේයි.

( ෂා * )

ඉදැනි අාතනො චරියානුකූලනයි එත්ථ චරියානි ඡ චරියා රාග චරියා දෙස චරියා මොහ චරියා සධා චරිය

බුද්ධිචරියා විතක්කචරියාති කෙචි පන රාගාදීනං සංසග්ගසන්නිපාතවසෙන අපරාපි චතස්සො—තථා සද්ධාදීනන්ති ඉමාහි අට්ඨහි සද්ධිං චුද්දස ඉච්ඡන්ති—එවම්පන භෙදෙ වුච්චමානෙ රාගාදීනං සද්ධාදීහිපි සංසග්ගං කත්වා අනෙකා චරියා හොන්ති තස්මා සඞ්ඛෙපෙන ඡළෙව චරියා වෙදිතබ්බා—චරියා පකති උස්සන්නතාති අත්ථතො එකං තාසං වසෙන ඡළෙව පුග්ගලා හොන්ති—රාගචරිතො දොසචරිතො මොහචරිතො සද්ධාචරිතො බුද්ධිචරිතො විතක්කචරිතොති—තත්ථ යස්මා රාගචරිතස්ස කුසලප්පවත්තිසමයෙ සද්ධා බලවතී හොති රාගස්ස ආසන්නගුණත්තා යථාහි අකුසලපක්ඛෙ රාගො සිනිද්ධො නාතිලූඛො එවං කුසලපක්ඛෙ සද්ධා යථා රාගො වත්ථුකාමෙ පරියෙසති එවං සද්ධා සීලාදිගුණෙ යථා රාගො අහිතං න පරිච්චජති එවං සද්ධා හිතං න පරිච්චජති තස්මා රාගචරිතස්ස සද්ධාචරිතො සභාගො යස්මා පන දොසචරිතස්ස කුසලප්පවත්තිසමයෙ පඤ්ඤා බලවතී හොති දොසස්ස ආසන්නගුණත්තා යථාහි අකුසලපක්ඛෙ දොසො නිස්සිනෙහො ආරම්මණං අල්ලීයති එවං කුසලපක්ඛෙ පඤ්ඤා යථාච දොසො අභූතම්පි දොසමෙව පරියෙසති එවං පඤ්ඤා භූතං දොසමෙව පරියෙසති යථා දොසො සත්තපරිවජ්ජනාකාරෙන පවත්තති එවං පඤ්ඤා සඞ්ඛාරපරිවජ්ජනාකාරෙන තස්මා දොසචරිතස්ස බුද්ධිචරිතො සභාගො—යස්මා පන මොහචරිතස්ස අනුප්පන්නානං කුසලානං උප්පාදාය වායමමානස්ස යෙභුය්යෙන අන්තරායකරා විතක්කා උප්පජ්ජන්ති මොහස්ස ආසන්නලක්ඛණත්තා යථාහි මොහො පරිබ්‍යාකුලතාය අනවට්ඨිතො එවං විතක්කො නානප්පකාරවිතක්කනතාය යථාච මොහො අපරියොගාහනතාය චඤ්චලො තථා විතක්කො ලහුපරිකප්පනතාය තස්මා මොහචරිතස්ස විතක්කචරිතො සභාගොති—අපරෙ තණ්හා මාන දිට්ඨි වසෙන අපරාපි තිස්සො චරියා වදන්ති තත්ථ තණ්හා රාගොයෙව මානොච තංසම්පයුත්තොති තදුභයං රාගචරියං නාතිවත්තති මොහනිදානත්තාච දිට්ඨියා දිට්ඨිචරියා මොහචරියමෙව අනුපතති—

---

( සං )

ඉදනි, දැන්; අත්ථතො චරියානුකූලතාති එබැවි, අත්ථතො චරියානුකූලං යනමෙහි; චරියාති, චරියානම්; ඡචරිය, චරියාවෝ සදෙනායි; රාගචරියා, රාගයාගේ සන්තන්හි උත්සන්නභාව චරණය (ප්‍රවෘත්තිය) රාග චරියානම් (සෙස්සෙහිදු මෙසේනයි) දෙසචරියා, ද්වෙෂචරියාය; මොහචරියා, මොහචරියාය; සද්ධාචරියා, ශ්‍රද්ධාචර්යාය; බුද්ධිචරියා, බුද්ධිචර්යාය; විතක්කචරියා, විතර්කචර්යායයි (සදෙනෙක්වෙතියි යොදනු) කෙචිපන, සමහරකෙනෙක් වනාහි (''ඉච්ඡන්ති''යි යොදනු) රාගාදීනං, රාගාදි තුන්දෙනාගේ; සංසග්ගසන්නිපාතවසෙන, සංසර්ගසන්නිපාත වශයෙන් (මිශ්‍රවශයෙන් රාශිවශයෙන්) අපරාපිචතස්සො, අනික් සතරදෙනෙක; තථා සද්ධාදීනම්පි, එසේම ශ්‍රද්ධාදීන්ගේද (සංසර්ගසන්නිපාත වශයෙන් සතරදෙනෙකැයි) අට්ඨහි සද්ධිං, අටදෙනෙකුහා සමග; චුද්දස ඉච්ඡන්ති, තුදුස්චරිතයෙක ණෙන් පසසිත් (මෙහි රාගද්වෙෂචරිතය රාගමොහචරිතය ද්වෙෂමොහචරිත යයි දෙදෙනා එක්කිරීම සංසර්ගනම් වෙයි රාග ද්වෙෂ මොහචරිතයයි තුන්දෙනා එක්කිරීම සන්නිපාතනම්වෙයි

මොවුන්හැමසඳහා "අපරාපිචතසෙසා" යි කීහු ශ්‍රද්ධාදී ත්‍රිකයෙහිදු මෙමනයයි) එවමෙත, මෙසේ සංසග්ගසන්නිපාත වශයෙන්; භෙදෙ වුච්චමානෙ, භෙදය කියනුලබන කල්හි; රාගාදීනං සද්ධාදීහිපි සංසග්ගං කත්වා, රාගාදීන්ගේ ශ්‍රද්ධාදීන්හාද සංසර්ගකොට (රාගසද්ධා චරියා—යනාදීන් මිශ්‍රකොට) අනෙක චරියාහොන්ති, නොඑක් චරිතයෝ වෙත් (නොසෑවෙක්ද අධිකයෙක්ද වෙති යනු අදහසයි-ඔහු අසමෙමාසාන නාතරධාන සූත්‍ර ටීකාවෙහි කී නියෙන් දතයුත්තාහුයි) තස්මා, එහෙයින්; සඞ්ඛෙපෙන, සංක්ෂෙපයෙන්; ඡළෙව චරියා වෙදිතබ්බා, චරියාවෝ සදෙනෙක්ම දතයුත්තාහුයි; චරියා, චරියාය; පකති, ප්‍රකෘතිය; උස්සන්නතාති, උත්සන්නබවය යනු; අත්ථතො එකං, අර්ථයෙන් එකෙකි (රාගාදීහුම සන්තානයෙහි උත්සන්නභාවයෙන් පවත්නාහෙයින් චරියානමුදුවෙති ප්‍රතිපක්ෂභාවනාවක් නැතිකල්හි ඒ ඒ සතන්හි ස්වභාවහෙයින් ප්‍රකෘතිනමුදු වෙති අන්‍ය ධර්මයන්ට ද්‍රව්‍ය අධික විසින් උත්සන්නතා නමුදුවෙත්) තාසං වසෙන, ඒ මූලචරියාවන්ගේ වශයෙන්; ඡළෙව පුග්ගලාහොන්ති, පුද්ගලයෝ සදෙනෙක්මවෙත්; රාගචරිතො, රාගචරිතය; දොසචරිතො, ද්වේෂචරිතය; මොහචරිතො, මොහචරිතය; සද්ධාචරිතො, ශ්‍රද්ධාචරිතය; බුද්ධිචරිතො, බුද්ධිචරිතය; විතක්කචරිතො, විතර්කචරිතයයි; තත්ථ, එහි; යස්මා, යම්හෙයකින්; රාගචරිතස්ස, රාගචරිතයහට; කුසලප්පවත්තිසමයෙ, කුශලචිත්තයාගේ ප්‍රවෘත්තිකාලයෙහි; සද්ධා බලවතීහොති (රාගොත්සන්න සන්තානයෙහි තදනුගුණ ධර්මයාගේ එකාන්තයෙන් අධිකබව ස්වභාව වනබැවින්) ශ්‍රද්ධා බලවත්වේත් (එහෙයින්ම කීහ "රාගස්ස ආසන්නගුණත්තා"යි-සෙනහය පර්යේෂණය අපරිත්‍යාගය යනමෙයින් සභාග ධර්මහෙයින් යන අදහසයි-එම "සාධයති යථාහි" යනාදී) යථා, යම්සේ; අකුසලපක්ඛෙ, අකුශලපක්ෂයෙහි; රාගො සිනිද්ධො, රාගය ස්නිග්ධවේද; නාතිලූඛො, රූක්ෂභාවයෙන් පවත්නෙන් අතිශයින්ම රූක්ෂනොවේද; එවං කුසලපක්ඛෙ සද්ධා, කුශලපක්ෂයෙහි ශ්‍රද්ධා එසේයයි (ප්‍රසාද වශයෙන් පවත්නෙන් සිනිදුව අරූක්ෂව පවතී යන අදහසයි) යථාහි, යම්සේ; රාගො, රාගයතෙම; වත්ථුකාමෙ පරියෙසති, වස්තුකාමයන් පර්යේෂණය කෙරේද (තෘෂ්ණාවශයෙන් තන්නිමිත්තව පවතිද්ද යන අදහසයි) එවං සද්ධා සීලාදිගුණෙ, ශ්‍රද්ධාවද සීලාදි ගුණයන් එසේ සොයයි (අධිමුක්ත වශයෙන් තන්නිමිත්තව පවතී යන අදහසයි) යථාහි, යම්සේ; රාගො, රාගයතෙමේ; අහිතං නපරිච්චජති, අභිසඞ්ග විසින් වැද පවත්නෙන් අහිතය දුරුනොකෙරේද; එවං සද්ධා හිතං නපරිච්චජති, එසේම ශ්‍රද්ධාවද අවකල්පනභාවයෙන් සෙනහ වශයෙන් වැද පවත්නෙන් හිතය දුරුනොකෙරේද; තස්මා, එහෙයින්; රාගචරිතස්ස, රාගචරිතයහට; සද්ධාචරිතො සභාගො, ශ්‍රද්ධා චරිතයා සභාගවේ; යස්මා පන, යම්හෙයකින් වනාහි; දොසචරිතස්ස, ද්වේෂචරිතයහට; කුසලප්පවත්තිසමයෙ, කුශලයාගේ ප්‍රවෘත්තිකාලයෙහි; පඤ්ඤා බලවතී හොති (ද්වේෂොත්සන්න සන්තානයෙහි තදනුකූල ධර්මයාගේ එකාන්තයෙන් අධිකබව ස්වභාව වනහෙයින්) ප්‍රඥාබලවත්වේ (එහෙයින්ම කීහ "දොසස්ස ආසන්න ගුණත්තා"යි-නොඇලීමය පර්යේෂණය පරිවර්ජනය යනමෙයින් සභාග ධර්මහෙයින යන අදහසයි) යථාහි, යම්සේ; අකුසලපක්ඛෙ, අකුශල පක්ෂයෙහි; දොසො

නීයයිහෙනො, වෙෂය (ව්‍යාපාද වශයෙන් විසංසෘෂ්ටව පවත්නෙන්) නිසෙනාගවේද; ආරම්මණං හා අල්ලීයති, අරමුණෙහි නොඇලේද; එවං කුසලපක්ඛෙ පඤ්ඤා, කුශලපක්‍ෂයෙහි ප්‍රඥද එසේමැයි (රාගයන්ගේ යථා ලෙහා වාවබොධ විසින් පවත්නෙන් අරමුණෙහි විසංසෘෂ්ටව පවත්නේය යන අදහසි) යථාච, යම්සේ; දොසො, වෙෂය; අභූතම්පි දොසමෙව පරියෙසති, අවිද්‍යමානවූ දෙෂයක්ම සොයාද (කැපීවද) එවං පඤ්ඤා භූතමෙව දොසං පරියෙසති, එසේම ප්‍රඥාවද විද්‍යමානවූ දෙෂයක්ම සොයා (විචාරණයකෙරේය යන අදහසි) යථා, යම්සේ; දොසො, වෙෂය; සත්තපරිවජ්ජනාකාරෙන පවත්තති, සත්ත්වයන් දුරුකරණ ආකාරයෙන් පවතීද (යම්සේ තමහට අහිතවේද ඒ ආකාරයෙන් දුරුකෙරේද යන අදහසි) එවං පඤ්ඤා සඞ්ඛාරපරිවජ්ජනාකාරෙන, එසේම ප්‍රඥතොමෝ (නිර්විඥනාදි වශයෙන් පවත්නෙන්) සංස්කාරයන් දුරුකරණ ආකාරයෙන් පවතී; තස්මා, එහෙයින්; දොසචරිතස්ස, වෙෂ චරිතයාහට; බුද්ධිචරිතො සභාගො, බුද්ධිචරිතයා සභාගවේ; යස්මා පන, යම්හෙයකින් වනාහි; මොහචරිතස්ස, මොහචරිතයහට; අනුප්පන්නානං කුසලානං ධම්මානං, අනුත්පන්න කුශල ධර්මයන්ගේ; උප්පාදය වායමමානස්ස, උත්පාදය පිණිස ව්‍යායාමකරණ්නවහට; යෙභුය්‍යෙන, බොහෝසේම; අනන්තරායකරා විතක්කා උප්පජ්ජන්ති (මොහොත් සහිත සන්තානයෙහි තදනුගුණ ධර්මයන්ගේ බොහෝසේ ප්‍රාදුර්භාවයෙන් හෙයින්) අනන්තරායකර මිථ්‍යා විතර්කයෝ උපදනාහුයි (එහෙයින් කීහ "මොහස්ස ආසන්නලක්ඛණත්තා"යි- අනවස්ථාන චඤ්චලභාවයෙන් සභාගලක්ෂණහෙයින යන අදහසි-මොහයද විතර්කයද අකුසලමබැවින් "ආසන්නගුණත්තා"යි නොකියා "ආසන්නලක්ඛණත්තා"යි කීහු) යථාච, යම්සේ; මොහො, මොහයතෙම; පරිබ්‍යාකුලතාය, අරමුණෙහි සම්මොහවසයෙන් ව්‍යාකුලව පවත්නෙන්; අනවට්ඨිතො, නොසන්සිටුනේව පවතීද; එවං, එපරිද්දෙන්ම; විතක්කො, විතර්කයතෙමේ; නානප්පකාරවිතක්කනතාය, නානාප්‍රකාර අරමුණු විතර්කණයකොට සවිස්ථාරබැවින් නොසන්සිටුනේව පවතී; යථාච, යම්සේ; මොහො, මොහය; අපරියොගාහනතාය, සබ්භාවාවබොධ විසින් අරමුණෙහි නොබැස පවත්නාබැවින්; චචලො, චචලව පවතීද; තථා, එසේම; විතක්කො, විතර්කයද; ලහුපරිකප්පනතාය, ලඝුවූ කල්පනා ඇතිබැවින් චචලව පවතී; තස්මා, එහෙයින්; මොහ චරිතස්ස, මොහචරිතයහට, විතක්කචරිතො සභාගොති, විතර්ක චරිතයා සභාගවේ; අපරෙ, සමහරු; තණ්හාමානදිට්ඨිවසෙන, තණ්හා චරියාය මානචරියාය දිට්ඨිචරියාය යන මොවුන්ගේ වශයෙන්; අපරාපි තිස්සොචරියා වදන්ති, අනික් තුන්චරිතකෙණෙකුදු කියත්; තත්‍ථ, ඔවුන්කෙරෙහි; තණ්හාරාගොයෙව, තෘෂ්ණානම් රාගයමය; මානො ච, මානයද; තං සම්පයුත්තොති, එ රාගයාහාම සම්ප්‍රයුක්තනුයි; තදුභයං, තෘෂ්ණාමානවූ; රාගචරියං නාතිවත්තති, ස්වභාවහෙයිනුදු සම්ප්‍රයොගයෙහිනුදු රාගචරියාව ඉක්මනොපවතී (තෘෂ්ණාවනම් ස්වභාවහෙයින් රාගයමය එහෙයින් රාගචරියාවෙන් භින්න තෘෂ්ණා චරියාවෙක් නැත මානයද වෙෂාදීන්මෙන් ලොභයා විප්‍රයුක්තව නොලැබේනුයි තෘෂ්ණා මාන දෙකම රාගචරියාවෙහිම සඞ්ග්‍රහවෙයි යන අභිප්‍රායයි-යම්සේ රාග වෙෂයන්

හා සම්ප්‍රයොග වශයෙන් සමග පවත්නාවූ මොහය උත්සදහෙයින් වෙනම චරියා භාවයද එසේම රාගයහා සම්ප්‍රයොග ඇතද වෙනම මානයාගේ චරියා භාවය යුක්තවන්නේය එත කුදුවුවත් රාග පටිඝ දිට්ඨි විචිකිච්ඡා අවිජ්ජාවන්ගේ අනුසයාභිධයමෙන් මේ රාගාදීන්ට වෙනස්වූ ව්‍යාධියෙක් ඇත්තුයි මානයහට ව්‍යාධිය නැතැයි දතයුතු දෘෂ්ටියගේද වෙනම චරියා නොවනබව මෙසේ දතයුතු සත්‍යයෙහි මානය බහුල පුද්ගලයාහට ඊර්ෂ්‍යාපථාදිවිසින් විභාගයක් නැතිබැවින් රාගචරිතයාකෙරෙහිම සඞ්ග්‍රහකරණ පිණිස "මානො ච තං පටිපත්‍යුතොනාච" (හි සිනු) දිට්ඨියා, දෘෂ්ටියගේ; මොහනිදනතාය, මොහනිදනතොට ඇති බව හෙයිනුදු (සමුච්චයින් සම්ප්‍රයුක්තහෙයිනුදු යන අර්ථයි) මොහචරියමෙව අනුපතති, මොහචරියාමෙවිව ගේ (ඇතුලත්වේ යන අර්ථයි)—

( හා * )

දැන් වනාහි තමන්ගේ චරිතයට අනුකූලවූ යහ වාක්‍යයෙහි විස්තර ප්‍රකාශවන්නේය ඇ කෙසේදත්? මෙහි වනාහි ව්‍යාධිවෝනම් සිත්සතන්හි නිරතුරු රාගයාගේ උත්සන්න පැවැත්මයයි කියනලද රාගව්‍යාධිය එමෙන්ම ද්වෙෂව්‍යාධිය මොහව්‍යාධිය ශ්‍රද්ධාව්‍යාධිය බුද්ධිව්‍යාධිය විතර්කව්‍යාධියයි සදෙනෙක්වෙත් තවද රාග ද්වෙෂ මොහ තුන්දෙනාගේ මිශ්‍රවීමෙන් හා රාශිවීමෙන් අනික් සතර ව්‍යාධිකෙණෙක්ද ශ්‍රද්ධා බුද්ධි විතර්ක තුන්දෙනාගේ මිශ්‍රවීමෙන් හා රාශිවීමෙන් තවත් සතර ව්‍යාධිකෙණෙක්දැයි යනමොවුන් අටදෙනාගේ වශයෙන්ද තුදුස් ව්‍යාධිකෙණෙක් වෙතියි ඇතම් ආචාර්යවරහු කියත්මැයි. මෙසේ චරිත ප්‍රභෙදය කියනු ලබන කල්හි රාගාදීන්ගේ ශ්‍රද්ධාදීන්හා මිශ්‍රකිරීමෙන් තෙසැටක් චරිතයෝ වෙත්මැයි. එහෙයින් සංක්‍ෂෙපයෙන් චරිතයෝ සදෙනෙක්ම වෙතියි දතයුතුයි.

රාගාදි කෙලශයෝ සිත්සතන්හි උත්සන්නභාවයෙන් පවත්නාහෙයින් ව්‍යාධිතමූදුවෙහි ඒ රාගාදීන් මැඩපැවැත්මට සුදුසු භාවනාවක් නැති කල්හි ඒඒ සන්තානයෙහි පවත්නා සවභාවහෙයින් ප්‍රකෘතිනමූදුවෙයි සෙසු චෛතසික ධර්මයන්ට වඩා ඒ රාගාදීහු අධිකවශයෙන් පවත්නාහෙයින් උත්සන්නතා නමුදුවෙයි එහෙයින් චරිතය ප්‍රකෘතිය උත්සන්නතාවය යනමොහු අර්ථ වශයෙන් එකක්ම වන්නේයි. ඒ මූල ව්‍යාධිවන්ගේ වශයෙන් පුද්ගලයෝ සදෙනෙක් වෙත්මැයි. ගේ කවරහුදයත්? රාගචරිතය ද්වෙෂචරිතය මොහචරිතය ශ්‍රද්ධාචරිතය බුද්ධිචරිතය විතර්ක චරිතය යනමොහුයි. ඒ සදෙනා අතුරෙන් යම්හෙයකින් රාගචරිත පුද්ගලයාහට කුසල්සිත් පවත්නා කල්හි ශ්‍රද්ධාව තමා යෙනහය සෙවීමය අන්නොහැරීමය යන ගුණයෙන් රාගයට ආසන්නවූ ගුණ ඇතිහෙයින් ශ්‍රද්ධාව බලවත් වන්නේයි. ඒ එසේමැයි. යම්සේ අකුශලපක්‍ෂයෙහි රාගය සිනිදුවේද ඇලුම්වශයෙන් පවත්නාබැවින් ගුනා රූක්‍ෂනොවේද එමෙන්ම කුශල පක්‍ෂයෙහි ශ්‍රද්ධාවද පැහැදීම් වශයෙන් පවත්නාහෙයින් සිනිදුද වෙයි ගුනා රළුද නොවෙයි. යම්සේ රාගය තෙමේ වස්තුකාමයන් සොයන්නේවේද එමෙන්ම ශ්‍රද්ධාතොමෝද සීලාදි ගුණයන්ම සොයන්නේවෙයි. යම්සේ රාගය ඇලුම් වශයෙන් අහිතයන් අත්නොහරීද එමෙන්ම ශ්‍රද්ධාතොමෝද හිතයන් අත්නොහරීමැයි. එහෙයින් රාගචරිතයාහට ශ්‍රද්ධා චරිතයා

සභාග වන්නේයි යම් හෙයකින් ශ්‍රද්ධාචරිතයාහට කුසල්සින් පවත්නාකල්හි නොඇලීමය සෙවීමය දුරුකිරීමය යන මෙකී ගුණයන් ප්‍රඥාව ප්‍රවෂ්ඨව ආසන්න ගුණ ඇති බැවින් ප්‍රඥාව බලවත්වන්නීය ඒ එසේමැයි යම්සේ අකුශලපක්ෂයෙහි ද්වේෂය ව්‍යාපාදවශයෙන් අනුන්හා අමිශ්‍රව පවත්නා බැවින් සිනිඳු නොවේද අරමුණෙහි නොඇලේද එමෙන්ම කුශලපක්ෂයෙහි ප්‍රඥාවද රාගාදීන්ගේ තත්වූ පරිදි අවබෝධ කිරීම් වශයෙන් පවත්නා බැවින් අරමුණෙහි මිශ්‍රනොව පවත්නේය යම්සේ ද්වේෂය නැත්තාවූම දොසක් සොයන්නේද සත්වයන් දුරුකරණ ආකාරයෙන් පවත්නේද එමෙන්ම ප්‍රඥාවද කලකිරීම් ආදි වශයෙන් පවත්නා හෙයින් සංස්කාරයන් දුරුකරණ ආකාරයෙන් පවත්නේය එහෙයින් ද්වේෂචරිතයාහට බුද්ධිචරිතයා සභාගවන්නේයි, යම් හෙයකින් නූපන් කුශලධර්මයන් උපදවනු පිණිස උත්සාහවඩන් නාවූ මෝහචරිතයා හට විතර්කයා තමා මෝහයට ආසන්නලක්ෂණ ඇතිබැවින් නො නෙසෙසින් අන්තරායකරවූ මිථ්‍යාවිතර්කයෝ උපදනාහුද යම්සේ මෝහය අරමුණෙහි මුලාවී විවශයෙන් වියවුල්ව පවත්නා හෙයින් සනිටුහන් නොව පවත්නේද එමෙන්ම විතර්කයාද නොයෙක් ප්‍රකාර අරමුණු කල්පනාකිරීමෙන් පැහිරෙණ හෙයින් සනිටුහන්නොව පවත්නේය යම්සේ මෝහය ධර්මයන්ගේ ස්වභාවාවබෝධවශයෙන් අරමුණෙහි නොබැස පවත්නා බැවින් චඤ්චලව පවත්නේද එපරිද්දෙන්ම විතර්කයද සංකල්පනා ඇතිබැවින් චඤ්චලව පවත්නේය එහෙයින් මෝහචරිතයාහට විතර්කචරිතයා සභාගවන්නේයි, සමහර ආචාර්ය්‍යවරයෙක් තෘෂ්ණාචරිතය මානචරිතය දෘෂ්ටිචරිතය යන මොවුන්ගේ වශයෙන් අනිකුත් චරිත තුනකුදු කියත්, ඒ තුන්දෙනා අතුරෙන් තෘෂ්ණා නම් රාගයමැයි මානයද ඒ රාගය හා සම්ප්‍රයුක්තවෙයි හෙවත් ලෝභමූලිකවූ අකුශලචිත්තයන් අටදෙනා අතුරෙන් සතරෙක දෘෂ්ටියද සතරෙක මානයද සම්ප්‍රයුක්තව පවතින්මැයි එහෙයින් තෘෂ්ණා මානදෙදෙන රාගචරිතය ඉක්ම නොපවත්නාහුය මෙහි වනාහි මෝහය තෘෂ්ණාවහා සම්ප්‍රයෝගව ඇත්තේනම්දු කෙසේකොට චරිතවශයෙන් උද්ධරණයකළාක්මෙන් මානයද වෙන්කොට චරිතවශයෙන් උද්ධරණය කටයුතු නොවේදයත්? ඒ එසේමැයි. අනිකුදු පාපධර්ම ඇතත් රාග ප්‍රතිඝ දෘෂ්ටි විචිකිත්සා අවිද්‍යාවන්ම අනුශයධර්මවශයෙන් උද්ධරණය කළාක්මෙන් මේ චරිතාවිය රාගාදීන්ටමුත් මානයට නැතිබැවින්ද මක්ෂද එන ඊර්ෂ්‍යාප්‍රදාසාදීන්ගේ වෙනස මානයට නොලැබෙනහෙයින්ද මානචරිතය නැත්තේයයි දතයුතු. එමෙන්ම දෘෂ්ටියද මෝහය නිදානකොට ඇති බැවින් හෙවත් මෝහයෙන් දෘෂ්ටියද ගැණෙන හෙයින් දෘෂ්ටිචරිතයද මෝහචරිතයෙහිම ඇතුලත්වනබව දතයුත්තේයි ~

( භා † )

තාපසතතා චරියා සිංහිකතා කථඤ්ච ජානිතබ්බා අසං රාගචරිතා අසා දොසාදීසු අඤ්ඤතරචරිතො කිං චරිතස්සච පුග්ගලස්ස කිං සප්පායන්ති ~ තත්‍ර පුරිමා, තාව තිස්සො චරියා ද්‍රබ්බ විකණ නිදානා ධාතුදොසනිදානාචාති එකෙච වදන්ති පුබ්බෙ කිර ඉට්ඨප්පයොග සුභකම්මබහුලො රාගචරිතො හොති සග්ගා වා චවිත්වා ඉධූපපන්නො පුබ්බෙපේ

දන වධබන්ධන වෙරකම්මබහුලො
දොසචරිතො හොති නිරයනාගයො
නීහි වා චවිත්වා ඉධූපපන්නො - පු
බ්බෙ මජ්ජපානබහුලො සුතපරිපුච්ඡා
විහීනො ච මොහචරිතො හොති තිර
ච්ඡානයොනියා වා චවිත්වා ඉධූපප
න්නොති එවං පුබ්බාචිණ්ණනිදානාති
වදන්ති, ද්වින්නං ධාතූනං උස්ස
න්නත්තා පුග්ගලො මොහචරිතො
හොති පඨවීධාතුයා ආපොධාතුයා ච
- ඉතරාසං ද්වින්නං උස්සන්නත්තා
දොසචරිතො සබ්බාසං සමත්තා රාග
චරිතොති දොසෙසු ච සෙම්හාධිකො
රාගචරිතො හොති වාතාධිකො මො
හචරිතො සෙම්හාධිකො වා මොහ
චරිතො වාතාධිකො වා රාගචරිතොති
එවං ධාතුදොසනිදානාති වදන්ති තත්
යස්මා පුබ්බෙ ඉට්ඨප්පයොගසුභකම්ම
බහුලාපි සග්ගා චවිත්වා ඉධූපපන්නාපි ච
න සබ්බෙ රාගචරිතා යෙව හොන්ති
ඉතරෙ වා දොසමොහචරිතා එවංධාතු
නඤ්ච යථාවුත්තෙනාකාරෙන
උස්සදනියමො නාම නත්ථි දොසනියමෙ
ච රාගමොහද්වයමෙව වුත්තං තඤ්ච
පුබ්බාපරවිරුද්ධමෙව සද්ධාචරියාදීසු ච
එකිස්සාපි නිදානං න වුත්තමෙව තස්මා
සබ්බමෙතං අපරිච්ඡින්නවචනං අය
මෙත්ථ අට්ඨකථාචරියානං මතානු
සාරෙන විනිච්ඡයො, වුත්තං හෙතං
උස්සදකිත්තනෙ ඉමෙ සත්තා පුබ්බ
හෙතුනියාමෙන ලොභුස්සදා දොසුස්ස
දා මොහුස්සදා අලොභුස්සදා අදොසු
ස්සදා අමොහුස්සදා ච හොන්ති -

( ස † )

නා පනෙතා චරියා, ඒ මේ චරිතයෝ;
කිංනිදානා, කුමක් නිදානකොට ඇත්
තාහුද; අයං පුග්ගලො රාගචරිතො,
මේ පුද්ගල රාගචරිතය; අයං, මෙතෙ
ම; දොසාදිසු, ද්වේෂාදීන් කෙරෙහි; අ
සදෘසතර චරිතෝ, එක්තරා චරිතයෙ
කු; කිං චරිතස්ස පුග්ගලස්ස, කවරචරි
තපුද්ගලව, කිං සප්පායං හොති, කිමෙක්සෑ
පදූයි; කථංජානිතබ්බං (යි යොදනු)
කෙසේ දතයුතුද; තත්‍ර, එහි; පුරිමා,
තාව තිස්සොචරියා, පළමුරාගාදි චරි
යාවෝ තුන්දෙන; පුබ්බාචිණ්ණ නිදා
නා, පූර්වජාතියෙහි පුරුදුකරණලද
දෙය කාරණාකොට ඇත්තාහ; ධාතු
දොසනිදානාචාති, පෘථිවීධාතු ආදීන්
හා ශ්ලෙෂ්මාදිදොෂයන් කාරණාකොට
ඇත්තාහයි; එකච්චෙ, සමහරෙක
නෙක්; වදන්ති, කියත්(එකච්ච-යනු
උපතිෂ්‍යස්ථවිරයන් සඳහා කීහු ඔවු
න් විසින් තමන්ගේ විමුක්තිමාර්ග
යෙහි එසේ කියනලදී) පුබ්බෙ, පූර්ව
ජාතියෙහි (කිරශබ්දය ඔවුන් කියනු
යෙහි අරුචිසූචකයි) ඉට්ඨප්ප
යොග, ඉෂ්ටක්‍රියාහා; සුභකම්මබහුලො;
සුභක්‍රියා බොහෝකොට ඇත්තේ;
රාගචරිතො; රාගචරිතයෙයි; සග්ගාවා
චවිත්වා ඉධූපපන්නො, දෙව්ලෝකයෙන්
හෝ චුතව මිනිළුපන්නේද රාගචරි
තවේ; පුබ්බෙ, පූර්වජාතියෙහි; ඡේදන
වධබන්ධන වෙරකම්ම බහුලො, අත්
පා ආදි සිඳීම මැරීම අත්දූ බන්ධනාදීන්
බැඳීම වෛරක්‍රියාය යන මොවුන්
බහුලකොට ඇත්තේ; දොසචරිතො
හොති, ද්වේෂචරිතවෙයි; නිරයනාග
යොනිහි වා චවිත්වා ඉධූපපන්නො, නිර
යනාගයොනීන් යන මෙයින් චුතව
මිහිඋපන්නේ හෝ ද්වේෂචරිතවෙයි;
පුබ්බෙ මජ්ජපානබහුලො, පූර්වයෙහි
මද්‍යපානය බොහෝකොට ඇතියේ;
සුතපරිපුච්ඡා විහීනො ච, ශ්‍රුතපරිපෘ
ච්ඡාරහිතයාද; මොහචරිතො හොති,
මොහචරිත වේ (මිහිශ්‍රුතනම් ඇසූ
තැන පරිපෘච්ඡා නම් ග්‍රන්ථපද අර්ථ
විචාරණයයි) තිරච්ඡානයොනියා
වා චවිත්වා, තිරිසන්යොනියෙන් හෝ

වුත්තං; ඉධූපපන්නො, මෙහි උපන්නේ; මොහචරිතො. මෝහචරිතවෙයි; එවං, මෙසේ; පුබ්බාචිණ්ණ නිදානාති වදන්ති, පෙර පුරුදුකළද්දය නිදානකොට ඇත්තාහයි කියත්; විතානමපන ධාතූනං උස්සන්නත්තා, ධාතූන් දෙදෙනා උත්සන්න බැවින්; පුග්ගලො මොහචරිතො හොති, පුද්ගල මොහචරිතවේ (කවර දෙදෙනාගේදැයත්?) පඨවිධාතුයාචෙව, පෘථිවි ධාතුවගේ හා; ආපොධාතුයාච, ආපොධාතුවගේයි(ධාතූන් දෙදෙනා ගුරු බැවින් ඔවුන් අධික පුග්ගල්හු නොනගනා බැවින් අරමුණු බරව වැටෙනහ මොහචරිතවේ) ඉතරාසං ද්වින්නං උස්සන්නත්තා, තෙජොධාතු වායොධාතු දෙදෙනා අධික බැවින්; දොසචරිතො හොති, වෙෂචරිතවේ (ධාතූන් දෙදෙනා තීක්ෂ්ණ බැවින් ඔවුන් අධික පුද්ගල තෙම තීක්ෂ්ණවූ වෙෂචරිතයෙක් යයි කියත්) සබ්බාසං සමත්තා රාගචරිතො, සියළු ධාතූන් ගේ සම බැවින් රාගචරිතවේ; දොසෙසු, දොෂයන් කෙරෙහි; සෙම්හාධිකො රාගචරිතො හොති, සෙම්හ ශුක්‍රප්‍රාබල්‍යවත හෙයින් ශ්ලෙෂ්මාධිකයා රාගචරිතවෙයි; වාතාධිකො මොහචරිතො, වාතය චියවුත්ව පවත්නා බැවින් වාතාධිකයා මොහචරිතවේ; සෙම්හාධිකොවා මොහචරිතො, ශ්ලෙෂ්මාව වාතයෙහි පිටිනා හෙයින් ශ්ලෙෂ්මාධිකයා හෝ මොහචරිතවේ; වාතාධිකො රාගචරිතොති, වාතයා සෙල්ව නා බැවින් වාතාධිකයා රාගචරිතවේ යි යැත්; එවං, මෙසේ; ධාතුදොස නිදානාති වදන්ති, ධාතූන් හා දොෂයන් නිදානකොට ඇත්තාහයි කියත්; යස්මා, යම්හෙයකින්; පුබ්බෙ, පූර්ව ජාතියෙහි; ඉට්ඨප්පයොගො සුභකම්ම බහුලොපි, ඉෂ්ට ක්‍රියා හා සුභක්‍රියා බහුලයෙක් ද;සග්ගාචිණ්ණ ඉධූපපන්නොපිච, ස්වර්ගයෙන් චුතව මෙහි උපන්නේද; හ

සමෙක්හ රාගචරිතොවේ හොතායි (අරාගචරිතය සමද පූර්වයෙහි ඉෂ්ට ප්‍රයොග ශුභකර්ම බහුල බව සම්භාවිතා මෙහ ඔහුදු ස්වර්ගයෙන් චුතව මිහි උත්පත් තිය සම්භාවිත හෙයිනුදු) හැම දෙනාම රාගචරිත නොවෙත්; ඉතරෙවා, ජේදන වධබන්ධන වෛර කර්මබහුලයෙක්ද නිරය නාගයොනීන් චුතව මෙහි උපන්නාවූ කෙනෙක්ද; තසංඛ්ඛ දෙස මොහචරිතා(යි යොදනු) හැමදෙනාම වෙෂ මොහචරිතයෝ නොවෙති; තථා, එසේම; ධාතූනං, ධාතූන්ගේද; යථාවුත්ත නෙවනයෙන, විතානමපන ධාතූනං උස්සන්නත්තා– යනාදි ප්‍රකාරවූ නයින්; උස්සදනියමො නාම නත්ථි, උත්සද නියමයෙක් නැති (අසුචල් අසුචල් ධාතූහු අධික බැවින් අසුචල් අසුචල් චරිතයෙකී යන නියමයෙක් නැත යන අර්ථයි) දොස නියමෙච, දොෂ නියමයෙහිදු; රාගමොහවයමෙව වුත්තං, රාගමොහ දෙකම කියනලදී; තම්පිච, එය දෙවස යෙන් නියම වචනයද; පුබ්බාපර විරුද්ධමෙව, පූර්වාපරවිරුද්ධමැයි ("සෙම්හාධිකො රාගචරිතො."යිකියා නැවත "සෙම්හාධිකොමොහචරිතොයි"ද "වාතාධිකො මොහචරිතො"යිකියා නැවත "රාගාධිකො මොහචරිතො"යිද කීබැවින් පූර්වාපර විරුද්ධය යන අර්ථයි) සද්ධාචරිතාදිසුච, ශ්‍රද්ධාචරිතාදීන් කෙරෙහිදු; එකිස්සාපි, එකවක්තාවකාදද; නිදානං නවුත්තමෙව, නිදාන නොකියනලද මැයි; තස්මා, එහෙයින්; සබ්බමෙතං, මේ සියල්ල; අපරිච්ඡින්නා වචනං, නුවණින් පිරිසිද නොකළ වචනයෙක් නොවේ (පරීක්ෂානොකොට කී වචන මයක යන අර්ථයි) අනුමපන, මේ චනාති; එහි, මෙහි; අට්ඨකථාචරියානං, අර්ථකථාචාර්යයන්ගේ; මතානුසාරේන විනිච්ඡයො, ලබ්ධි අනුව යාමෙන්

කරණ විනිශ්චයයි; වුත්තං හෙතං උස්සද කිත්තනෙ (විපාකකථාවෙහි) උස්සද කිත්තනයෙහි කියේමැයි; ඉමෙසං තෙසං, මමසත්තු; පුබ්බහෙතු නියාමෙන, පූර්වයෙහි ප්‍රවෘත්ත මොහාදී හෙතු නියමයෙන් (ඒ ලොභාදීන්ට ප්‍රතිනියත ලුබ්භනාදි ස්වභාවයෙන යන අර්ථයි) ලොභුස්සද, ලොභොත්සද වෙති ("ලොභොස්සදෙ එතෙසන්ති ලොභුස්සදා" යිගත් කොත් සෙස්සෙහිදු මෙම නයයි-උත්සන්න ලොභය හෙ ලොභාධිකයන යන අර්ථයි) දොසුස්සද, දොසොත්සද වෙති; මොහුස්සද, මොහොත්සද වෙති; අලොභුස්සද, අලොභොත්සදවෙති; අදොසුස්සද, අදොසොත්සදවෙති; අමොහුස්සදව හොන්ති, අමොහොත්සදද වෙත් (සම්පිණ්ඩනාර්ථ වූ ශබ්දයෙන් ලොභාදීන්ගේ ව්‍යතිමිශ්‍ර වශයෙන් සම්භවවන චතුර්දශ ප්‍රභෙදයන් නිශ්ශෙෂයෙන් සම්පිණ්ඩනය කෙරෙත්)

( හා† )

ඒ සවැදෑරුම්වූ චරිතයෝ කුමක් නිදානකොට ඇත්තාහුද? මොහු රාගචරිතයාය මොහු ද්වෙෂචරිතාදීන් කෙරෙන් එක්තරා චරිත ඇත්තෙකැයි කෙසේ දතයුතුද? සවර චරිතයක් ඇති පුද්ගලයෙකුට භාවරක් සැපවත් හෝදයි යන විභාගය කෙසේ දතයුත්තේදයත්? ඒ චරිතයන් අතුරෙන් පළමුවන් රාගද්වෙෂමොහ චරිතයෝ තුන්දෙන පූර්වජාතියෙහිපුරුදුකරණලද විරුඬස්වභාවයන් කාරණාකොට ඇත්තාහුයයි කිහන් ආයුෂ්මත් උපතිෂ්‍ය ස්ථවිරයන්වහන්සේවනාහි විමුක්ති මාර්ගයෙහි පෘථිවි ආදි සතර ධාතූන් හා ශ්ලෙෂ්මාදි දෝෂත්‍රයද කාරණාකොට ඇත්තාහයි කියයි. හේ කෙසේදයත්? පූර්වජාතියෙහි ඉෂ්ටප්‍රයොග කුශල කර්ම බොහෝකොට පුරුදුකලවිරූතැනැත්තේද දෙව්ලොවින් සැව මේ මිනිස්ලොව උපන් තැනැත්තේද රාගචරිත ඇතිවත්තේය පූර්ව ජාතියෙහි අත්පා ආදිය සිඳීමය මැරීමය සිරගෙයි ආදියෙහි බැඳීමය වෛරකර්මය යනමොවුන් බහුලකොටඇතිතැනැත්තේද නරකයෙන් සැව මිනිස්ලොව උපන් තැනැත්තේද ද්වෙෂචරිත ඇත්තෝවෙයි පූර්වජාතියෙහි රහමෙර පිව බහුලකොට ඇති තැනැත්තේද ඇසූපිරූතැන් නැති තැනැත්තේද තිරිසන් යොනියෙන් සැව මේ මිනිස්ලොව උපන් තැනැත්තේද මොහචරිත ඇත්තේවෙයි. මෙසේ පූර්වජාතියෙහි පුරුදුකරණලද විරූ ස්වභාව ධර්මයන් නිදානකොට ඇත්තාහයි කීය. ධාතු වශයෙන් චරිත ප්‍රභෙදය කෙසේදයත්? පෘථිවිධාතු ආපොධාතු දෙදෙනා බර බැවින් ඔවුන් අධික පුද්ගලයා හට අරමුණු බරව වැටහෙන බැවින් මේ ධාතූන් දෙදෙනාගේ උත්සන්නතාව ඇති පුද්ගල තෙමේ මොහචරිත ඇත්තේවෙයි. තෙජොධාතු වායොධාතු දෙදෙන තියුණු බැවින් ඔවුන් දෙදෙනාගේ අධිකත්වයෙන් ද්වෙෂචරිත ඇත්තේවෙයි. ඒ සතරධාතූන්ගේ අනූනාධිකවූ සමවූ පැවැත්මෙන් රාගචරිත ඇත්තේවෙයි තුන් දෙසුන් අතුරෙන් ශ්ලෙෂ්මාව කාරණකොටගෙණ ශුක්‍රධාතුව බහුලවන හෙයින් ශ්ලෙෂ්මාධිකයා රාගචරිත ඇත්තේවෙයි පිත්තය විපුල්ව පවත්නා බැවින් පිත්තාධිකයා ද්වෙෂචරිත ඇත්තේවෙයි හෙවත් ශ්ලෙෂ්මාව වසාගෙණ සිටින බැවින් ශ්ලෙෂ්මාධිකයාද මොහචරිතඇත්තේවෙයි වාතය චංචලකරවන බැවින් වාතාධිකයාද රාගචරිත ඇත්තේවෙයි මෙසේ චරිතයෝ සතරමහාභූතයන් හා තුන්දෙස් කාරණකොට ඇත්තාහයි කියත් ඔවුන්

අතුරෙන් යම්කෙනෙකුන් පූර්වජාතියෙහි යහපත් ක්‍රියා හා කුශලකර්ම බහුලකොට ඇත්තාවූ සත්ත්වයෝද දෙව්ලොවින් සැව මෙහි උපන්නාවූ සත්ත්වයෝද යන සියල්ලෝම රාගචරිත ඇත්තාහුම නොවෙත්මැයි. කුමක්හෙයිනැයි නම්? රාගචරිත තැනැත්තාහටද පූර්ව ජාතියෙහි යහපත් ක්‍රියා කුශලකර්ම බහුල වන බැවින්ද දෙව්ලොවින් සැව මෙහි උත්පත්තිය ලැබෙන හෙයින්දැයි ද නයුතුයි එපරිද්දෙන්ම ගියජාතියෙහි අත්පා සිඳීම් මැරීම් සිරගේ ආදියෙහි බැඳීම් වෛරකිරීම් බහුලකොට ඇත්තාවූ සත්ත්වයෝද නිරය නාගයොනින් සැව මිනිස්ලොව උපන් සත්ත්වයෝද යන සියල්ලෝම ද්වේෂ මෝහචරිත ඇත්තාහුම නොවෙත්මැයි එමෙන්ම සතරමහාභූතයන්ගේද යම්කිසි කලද ආකාරයෙන් අසවල් ධාතුහුගේ අධිකත්වයෙන් අසවල් චරිත ඇත්තේ වෙයි යන නියමයෙක්ද නැත්තේමැයි.

ද්වේෂ නියමයෙහිද රාගමෝහ දෙක පමණක් කියන බැවින් ඒ ද්වේෂ වශයෙන් චරිත නියමයද පෙරපසු නොගැලපෙන්නේයි. ශ්‍රද්ධාචරිතාදීන් කෙරෙහිදු එකවයක්හාවකාවත් නිදන නොකියනලද්දේමැයි එහෙයින් මේ සියල්ල නුවණින් පරීක්ෂාකොට කියනලද්දේ නොවෙයි. මේ මිථ්‍යා දක්වන්නෙන් මෙහි අචාර්යවාදීන්ගේ ලබ්ධියම අනුවාදයෙන් කාරණලද විනිශ්චයයි කියනලද්දේමැයි. විපාක කථාවෙහි උත්සන්න පාපධර්මයන් ප්‍රකාශකිරීමෙහි මේ සත්ත්වයෝ යම්කිසි ජාතියෙහි පැවැති ලෝභාදි හේතු නියමයෙන් මේ ජාතියෙහි ලෝභාධිකද වෙයි ද්වේෂාධිකද වෙයි මෝහාධිකද වෙයි අලෝභාධිකද වෙයි අද්වේෂාධිකද වෙයි අමෝහාධිකද වෙයියි දතයුත්තාහුය. ~

( පා ‡ )

යස්ස හි කම්මායූහනක්ඛණෙ ලොභො බලවා හොති අලොභො මන්දො, අදොසාමොහා බලවන්තො දොසමොහා මන්දා, තස්ස මන්දො අලොභො ලොභං පරියාදාතුං න සක්කොති, අදොසාමොහා පන බලවන්තො දොසමොහෙ පරියාදාතුං සක්කොන්ති, තස්මා සො තෙන කම්මෙන දින්නපටිසන්ධිවසෙන නිබ්බත්තො ලුද්ධො හොති සුඛසීලො අක්කොධනො පඤ්ඤවා වජිරූපමඤාණො ච. යස්ස පන කම්මායූහනක්ඛණෙ ලොභදොසා බලවන්තො හොන්ති අලොභාදොසා මන්දා අමොහො බලවා මොහො මන්දො, සො පුරිමනයෙනෙව ලුද්ධො චෙව හොති දුට්ඨො ච පඤ්ඤවා පන හොති වජිරූපමඤාණො දත්තාභයත්ථෙරො විය ~ යස්ස කම්මායූහනක්ඛණෙ ලොභඅදොසමොහා බලවන්තො හොන්ති ඉතරෙ මන්දා සො පුරිමනයෙනෙව ලුද්ධො චෙව හොති දන්ධො ච සීලකො පන හොති අක්කොධනො ~ තථා යස්ස කම්මායූහනක්ඛණෙ තයොපි ලොභදොසමොහා බලවන්තො හොන්ති අලොභාදයො මන්දා සො පුරිමනයෙනෙව ලුද්ධො චෙව හොති දුට්ඨො ච මූළ්හො ච ~ යස්ස පන කම්මායූහනක්ඛණෙ අලොභදොසමොහා බලවන්තො හොන්ති ඉතරෙ මන්දා සො පුරිමනයෙනෙව අප්පකිලෙසො හොති දිබ්බාරම්මණම්පි දිස්වා නිච්චලො දුට්ඨො පන හොති දන්ධපඤ්ඤො වාති ~ යස්ස කම්මායූහනක්ඛණෙ අලොභාදොසමොහා බලවන්තො හොන්ති ඉතරෙ මන්දා සො පුරිමනයෙනෙව අලුද්ධො චෙව හොති සීලකො ච දන්ධො පන හොති ~ තථා යස්ස කම්මායූහනක්ඛණෙ අලොභදොසමොහා බලව

න්තො හොන්ති ඉතරෙ මන්දා පුරිමනයෙනෙව අලුද්ධො චෙව හොති පඤ්ඤවා ච දුට්ඨො පන හොති කොධනො— යස්සපන කම්මායූහනක්ඛණෙ තයොපි අලොභාදයො බලවන්තො හොන්ති ලොභාදයො මන්දා සො මහා සඞ්ඝරක්ඛිතත්ථෙරොවිය අලුද්ධො අදුට්ඨො පඤ්ඤවා ච හොති— එත්ථ ච ලුද්ධොති වුත්තො අයං රාගචරිතො දුට්ඨදන්ධා දොසමොහචරිතා පඤ්ඤවා බුද්ධිචරිතො අලුද්ධා දුට්ඨා පඤ්ඤාපකතිකා සද්ධාචරිතා— යථාවා අමොහපරිවාරෙන කම්මනා නිබ්බත්තො බුද්ධිචරිතො එවං බලව සද්ධාපරිවාරෙන කම්මනා නිබ්බත්තො සද්ධාචරිතො කාමවිතක්කාදි පරිවාරෙන කම්මනා නිබ්බත්තො විතක්කචරිතො ලොභාදීසු වොමිස්ස පරිවාරෙන කම්මනා නිබ්බත්තො වොමිස්සචරිතොති එවං ලොභාදීසු අඤ්ඤතරඤ්ඤතර පරිවාරං පටිසන්ධිජනකං කම්මං චරියානං නිදානන්ති වෙදිතබ්බං—

---

( [illegible] )

යස්සනි, යමෙක් හට; කම්මායූහනක්ඛණෙ, කර්මකරණ කාලයෙහි; ලොභො බලවා හොති (තදනුරූප ප්‍රත්‍යය සාමග්‍රී බලයෙන්) ලොභය අධික වෙයි; අලොභො මන්දො, තත්ප්‍රතිපක්ෂ වූ අලොභය දුර්වල වේ (ලොභාලොභයන් එකක්ෂණයෙහි නොපවත්නා බැවින් නිකාන්තික්ෂණය ආයූහන පාක්ෂික කොට "කම්මායූහනක්ඛණෙ ලොභො බලවා හොති අලොභො මන්දො" යි කීහයි දතයුතු. සෙසු පදෙහිදු මෙම නයයි) අදොසාමොහා බලවන්තො, අද්වේෂ අමෝහ දෙදෙන බලවත්වෙද්ද; දොසමොහා මන්දා, ද්වේෂ මෝහ දෙදෙන දුර්වලවෙද්ද; තස්ස, ඔහට; මන්දො අලොභො, දුර්වලවූ අලොභය; ලොභං පරියාදාතුං න සක්කොති, ලොභය මඩනට අසමර්ථවේ (ඒ අලොභය තෙමේ මෙසේ සුන්දරවූ මෙසේ විපුලවූ මෙසේ මහඇගිවූ වස්තු කොතෙක් දෙම්ද යනාදීන් ප්‍රවෘත්තවූ අමුක්ත ත්‍යාගතාදී වශයෙන් පවත්නාවූ චේතනා හා සම්ප්‍රයුක්තවූයේ මනාකොට ලොභය මැඩපැවැත්විය නොහැකිය යන අදහසයි) අදොසා මොහා පන බලවන්තො, අද්වේෂ අමෝහයන් අනුත්පන්නිත්ද එබඳු ප්‍රත්‍යය ලාභයෙන් බලවත් වූ අද්වේෂ අමෝහ දෙදෙනා, දොසමොහෙ පරියාදාතුං සක්කොන්ති, ද්වේෂ මෝහයන් මඩනට පොහොසත් වෙත්; තස්මා, එහෙයින් (ලොභ අද්වේෂ අමෝහයන් බලවත් බැවින් අලොභ ද්වේෂ මෝහයන් දුර්වල බැවින්ද යන අදහසයි) සො, ඒ කැමිත් සමන්විත පුද්ගල තෙමේ; තෙන කම්මෙන දින්නපටිසන්ධිවසෙන, මොහාදී උපනිශ්‍රය ඇති කුශල කර්මයෙන් දෙනලද පිළිසඳ විසින්; නිබ්බත්තො, උපන්නේ; ලුද්ධො චෙව හොති, ලුබ්ධද වේ; සුඛසීලො, අරුක්ෂ ප්‍රකෘති ඇතිවේ; අක්කොධනො, නොකිපෙන සුලුවේ; පඤ්ඤවා, නුවණැතිවේ; වජිරූපම ඤාණොහිව, වජ්‍රෝපම ඥාන ඇතිවේ; යස්සපන, යමෙක්හුගේ වනාහි; කම්මායූහනක්ඛණෙ, කර්මකරණ වේලාවෙහි; ලොභාදොසා බලවන්තො හොන්ති, ලොභ ද්වේෂයෝ බලවත් වෙද්ද; අලොභාදොසා මන්දා, අලොභ අද්වේෂ දෙදෙනා දුර්වලවෙද්ද; අමොහො බලවා, අමෝහය බලවත් වේද; මොහො මන්දො, මෝහය මඳවේද; සො, ඒ කැමිත් සමන්විත පුද්ගල තෙමේ; පුරිමනයෙනෙව, පෙරකී න්‍යායානුසාරයෙන් (පුරිමනයෙන — යන මෙයින් "මන්දා අලොභාදොසා ලොභ

මන්දා ඤාණපරියාපුණං නසක්කොන්ති (අමොහොපන බලවා මොහං පරියාදාය සක්කොති" යනු අභිධර්මකෝෂ-ව්‍යාඛ්‍යානයෙහිද මෙම නයයි) ලුද්ධො චෙව හොති; ලුබ්ධද වෙයි; දුට්ඨො ච, කුඩද වෙයි; පඤ්ඤවා ච හොති, නුවණැත්තේ වේ; වජිරූපමඤාණො ච, වජ්‍රෝපම වූ නුවණ ඇතියේ වේ; දත්තාභයත්ථෙරො විය, දත්තාභය නම් ස්ථවිරයන් මෙනි; යස්ස යමක්හට; කම්මායූහනක්ඛණෙ, කර්මකරණ වේලෙහි; ලොභ අදොසාමොහා බලවන්තො, ලොභය අදොසය අමොහය යන මොහු බලවත් වෙද්ද; ඉතරෙ මන්දා, අලොභය ද්වෙෂය මොහය යන මොහු දුබල වෙද්ද; පුරිමනයෙනෙව, පෙරකී නයින්ම; ලුද්ධො චෙව හොති, ලුබ්ධද වෙයි; දන්ධො ච, නුවණ මඳද වෙයි; සීලකො ච, සිල්වතාහි වේ (සුවලොල්පියවී ඇයිබව යන අර්ථයි) අක්කොධනො, කිපෙන සුලු නොවේ; තථා, එසේම; යස්ස, යමක්හට; කම්මායූහනක්ඛණෙ, කර්මකරණ වේලෙහි; තයොපි ලොභදොසමොහා ලොභය ද්වේෂය මොහය යන තුන්දෙන; බලවන්තො හොන්ති, බලවත් වෙද්ද; අලොභාදයො මන්දා, අලොභාදිහු දුබල වෙද්ද, සො, හෙතෙම; පුරිමනයෙනෙව, පෙරකීනයින්ම; ලුද්ධො චෙව හොති, ලුබ්ධද වෙයි; දුට්ඨො ච, කුඩද වෙයි; මූළ්හො, මූඪද වේ; යස්ස පන, යමක්හට වනාහි; කම්මායූහනක්ඛණෙ, කර්මකරණ වේලෙහි, අලොභාදොසාමොහා බලවන්තො හොන්ති, අලොභය අද්වේෂය අමොහය යන මොහු බලවද්ද; ඉතරෙ මන්දා, ලොභය ද්වේෂය මොහය යන මොහු දුබල වෙද්ද; සො, හෙතෙම; පුරිමනයෙනෙව, පෙරකීනයින්ම; අප්පකිලෙසො හොති, මඳවූ ක්ලේශයන් ඇතියේවී; දිබ්බාරම්මණම්පි දිස්වා නිච්චලො හොති, දිව්‍යාලම්බණයක්දුටුද්ද නිශ්චලවෙයි; දුට්ඨො පන හොති, කිපෙන සුලු වේ; දන්ධපඤ්ඤො ච, නුවණ මඳවේ, යස්සපන, යමක්හට; කම්මායූහනක්ඛණෙ, කර්මකරණ කාලයෙහි; අලොභාදොසා මොහා බලවන්තො හොන්ති, අලොභය අද්වේෂය අමොහය යන මොහු බලවත්වෙද්ද; ඉතරෙ මන්දා, ලොභාදි තුන්දෙන දුබලවෙද්ද; සො, හෙතෙම; පුරිමනයෙනෙව, පරසේම; අලුද්ධො චෙව හොති, අලොභිද වෙයි; සීලකො ච, සීලද වෙයි; දන්ධො පන හොති, නුවණ මඳ වේ; තථා, එසේම; යස්සකම්මායූහනක්ඛණෙ, යමක්හට කර්මකරණවේලෙහි; අලොභ දොසාමොහා බලවන්තො හොන්ති, අලොභය ද්වේෂය අමොහය යන මොහු බලවත්වෙද්ද; ඉතරෙ මන්දා, ලොභාදීහු දුබලවෙද්ද; සො, හෙතෙම; පුරිමනයෙනෙව, පෙරකීනයින්ම; අලුද්ධො චෙව හොති, අලොභිද වෙයි; පඤ්ඤවා ච හොති, නුවණැතිද වෙයි; දුට්ඨො පන හොති, කිපෙනසුලුවේ; කොධනො, කිපෙනසුලුවේ; යස්ස, යමක්හට; කම්මායූහනක්ඛණෙ, කර්මකරණවේලෙහි; තයොපි අලොභාදයො බලවන්තො, අලොභාදී තුන්දෙනම බලවත්වෙද්ද; ලොභාදයො මන්දා, ලොභාදීහු දුබලවෙද්ද; සො, හෙතෙම, මහාසඞ්ඝරක්ඛිතත්ථෙරො විය; මහාසඞ්ඝරක්ඛිත ස්ථවිරයන් මෙන්; අලුද්ධො ච, අලොභිද වෙයි; අදුට්ඨො ච, ද්වෙෂිද නොවෙයි; පඤ්ඤවා, නුවණැතිද වෙයි (මෙහි ලොභ-දොස-මොහ ලොභ දොස-ලොභ මොහ-දොස මොහ ලොභ දොස මොහ-යන මොවුන්ගේ වශයෙන් එකකයෝ තුන්දෙනෙක දුකයෝ තුන්දෙනෙක එකාන්තකයෙකැයි ලොභාදීන්ගේම උත්සදයෙන් අකුශල පක්ෂයෙහිම සත්වාරයෙක

කුශලපක්‍ෂයෙහිදු එසේම අලෝභාදී න්ගේ උත්සදවශයෙන් සන්‍යොජනය කැයි වාරයෙක් තුදුසෙක් වෙති. එහි "අලෝභදොසාමොහා අලෝභාදොසා මොහා අලෝභදොසමොහා බලවන් තො"යි යන කුශලපක්‍ෂයෙහි තෘතීය ද්විතීය ප්‍රථමවාරයෙහි අදොසුස්සදමො හුස්සද අදොසමොහුස්සද වාරයෙහි ගත් තාලද්දහුම්වෙත් එසේම අකුශල පක්‍ෂයෙහිදු "ලොභ දොස මොහා ලොභ දොසා මොහා ලොභාදොසා මොහා බලවන්තො"යි යන තෘතීය ද්විතීයප්‍රථම වාරයෙහි අදොසුස්සද අමොහුස්සද අදොස මොහුස්සදවාරයෝම ගෘහිතවෙ ත්නුයි, අකුශල කුශලපක්‍ෂයෙහි තුන් තුන් වාරයෙන් ඇතුළත්කොට අට වාරයෝ දක්වනලදනැයි දතයුතු) එ පස්ව, මෙහි වනාහි; ලුබ්ධායි වුත්තො (උස්සදකිත්තනයෙන්) ලුබ්ධයයි කියනලද්ද, අයං, මෙතෙම; රාගචරිතො, චාත්‍රියාවිචාරයෙහි රාගචරිතයයි දතයුතුවේ; දුට්ඨදන්ධා, දුෂ්ටයා දන්ධයයි කියනලද දෙදෙන; දොසමොහචරිතා, දොෂමොහචරිතවෙත්; පඤ්ඤවා, අභිසය ලඥහඇත්තේයයි කියනලද්දේද; බුද්ධිච රිතො, බුද්ධිචරිතවේ; අලුද්ධාදුට්ඨා, අලු බ්ධ අදුෂ්ටයයි කියනලද දෙදෙනා; පසන්නපකතිතාය, ප්‍රසන්නස්වභාව හෙයින්; සද්ධාචරිතා, ශ්‍රද්ධාචරිතවෙත් (අලොභ අද්වෙෂදෙදෙනාගේ බලවත් බව ශ්‍රද්ධාවගේ උපනිශ්‍රයවන්නේවිනා නොවන්නෙහෙන් අලුබ්ධ අදුෂ්ට දෙදෙ හා ප්‍රසන්න ස්වභාවඇතිහෙයිනි ශ්‍රද්ධා චරිතවෙතියි කීනු අමිශ්‍රවූ ප්‍රවීණහතු නිසාමයෙන්ම බුද්ධිචරිතා දිනුදු දක්ව න පිණිස "යථා වා" යනාදි කියනලදී) වා, හොහොත්; යථා, යම්සේ; අමො හපරිවාරෙන කම්මනා නිබ්බත්තො, උපනිශ්‍රයවශයෙනු ප්‍රඥාපරිවාරනොව ඇති කර්මයෙන් උපන්නේ; බුද්ධි චරිතො, බුද්ධිචරිතවේද; එවං, එසේ; බලවසද්ධාපරිවාරෙන කම්ම නා නිබ්බත්තො, බලවත් ශ්‍රද්ධාව පිරිවරකොටඇති කර්මයෙන් උප න්නේ; සද්ධාචරිතො, ශ්‍රද්ධාචරිතවේ; කාමවිතක්කපරිවාරෙන කම්මනා නිබ්බත්තො, කාමවිතර්කාදීන් පිරිව රණකොට ඇති කර්මයෙන් උපන්නේ, විතක්කචරිතො, විතර්කචරිතවේ; වොමි ස්සපරිවාරෙන කම්මනා නිබ්බත්තො, ලොභමොහාදි වශයෙන් ඔවුනොවුන් හා අවිරුද්ධ මිශ්‍රකයන් පිරිවරකොට ඇතිකර්මයෙන් උපන්නේ; වොමිස්සචරි තො, මිශ්‍රචරිතවේ (මිහිලොභ මොහ යෙන් ඔවුනොවුන් හා අවිරුද්ධ මිශ්‍ර පරිවාරයගේ යතානේයි. අවිරොධයද භින්න ස්වභාවවූ ශ්‍රද්ධා ප්‍රඥාදි ධර්මානු සාරිතොත්‍රයන්ගෙන් ශුභනුනා විශයෙ න් අප්‍රවෘත්තිනැයි දතයුතු - ප්‍රවීණහතු නියමයෝම විශේෂයව න බැවින් එහාතනයෙන් මිශ්‍රවයෙ වෙ පැහැ සපුන්තාහයි. උත්සද කිර් තනයද එසේම ප්‍රවෘත්තියයි දතයුතු) එවං, මෙසේ; ලොභාදිසු, ලොභාදීන් කෙරෙහි; අඤ්ඤතරඤ්ඤතර පරිවා රං, එක්තරා එක්තරා එකක්හු පිරිව රකොටඇති, පටිසන්ධිජනකං කම්මං ප්‍රතිසන්ධිජනක කර්මය; චරියානං නි දානන්ති වෙදිතබ්බං, චර්‍ය්‍යාවන්ට නිදා නයයි දතයුතු.

(භා ‡)

ඒ එසේයැයි. යම්සේක්නට යම්හිය ජාතියෙහි කර්මකරණසමයෙහි ඊට සුදුසු කාරණයන්ගේ එක්වීම හෙ තුකොටගෙණ ලොභය අධිකවේද ඊට විරුද්ධවූ අලොභය දුර්වලවේද අද්වෙෂ අමොහ දෙදෙනා බලව ත්වූවාහුද ද්වෙෂමොහ දෙදෙනා

වන්නේය. ද්වේෂමෝහයන් නො ඉපදී මෙන්ද එබඳු ශෝභනප්‍රත්‍යයන් ලැබ මෙන්ද බලවත්වූ අද්වේෂ අමෝහයෝ ද්වේෂමෝහයන් මැඩපවත්නාහුවාව පොහොසත් වෙත්මැයි. එහෙයින් ඒ කර්මයෙන් යුක්තවූ පුද්ගලතෙම ඒ කුශලකර්මයෙන් දෙනලද ප්‍රතිසන්ධි වශයෙන් උපන්නේනම් තෙතෙම ලෝභීද රජෙහොවූ ස්වභාව ඇත්තේද නොකිපෙන ස්වභාව ඇත්තේද ප්‍රඥ ඇත්තේද වජ්‍රෝපම නුවණ ඇත්තේද වන්නේයි. යමෙක්හට පූර්වජාතියෙහි කර්මකරණ සමයෙහි ලෝභද්වේෂයෝ බලවත්වූවාහුද අලෝභඅද්වේෂයෝ දුර්වලවූවාහුද අමෝහය බලවත්විද මෝහය දුර්වලවීද ඒ කර්මයෙන් යුක්තවූ පුද්ගලතෙම ඒ කුශලකර්මයෙන් දෙනලද ප්‍රතිසන්ධිවශයෙන් උපන්නේනම් තෙතෙම පෙරකීනයින්ම ලෝභීද ක්‍රෝධයින් ඇත්තේද දත්තාභයනම් ස්ථවිරයන් මෙන් වජ්‍රෝපම නුවණැත්තේද වන්නේය. යමෙක්හට පූර්වජාතියෙහි කර්මකරණ සමයෙහි ලෝභය අද්වේෂය මෝහය යන තුන්දෙන බලවත්වූවාහුද අලෝභ ද්වේෂ අමෝහයෝ දුර්වලවූවාහුද තෙතෙම පෙරකීනයින්ම ලෝභීවෙයි නුවණමඳවෙයි මොළොක් ස්වභාව ඇත්තේවෙයි නොකිපෙන සුලුවෙයි එපරිද්දෙන්ම යමෙක්හට කර්මකරණ සමයෙහි ලෝභද්වේෂමෝහයෝ බලවත්වූවාහුද අලෝභ අද්වේෂ අමෝහයෝ දුර්වලවූවාහුද තෙතෙම පෙරකීනයින්ම ලෝභීවෙයි ක්‍රෝධ සිතැත්තේවෙයි මුළාවූයේවෙයි යමෙක්හට වනාහි කර්මකරණ සමයෙහි අලෝභ ද්වේෂමෝහයෝ බලවත්වූවාහුද ලෝභ අද්වේෂ අමෝහයෝ දුර්වලවූවාහුද තෙතෙම කීහියාගේත් මඳවූ කෙලෙස් ඇත්තේවෙයි දිව්‍යමය අරමුණුපවා දක ලෝභවශයෙන් නොසෙල්වෙයි කිපෙනසුවභාව ඇත්තේවෙයි මඳනුවණ ඇත්තේවේයි. යමෙක්වනාහි කර්මකරණසමයෙහි අලෝභ අද්වේෂ අමෝහයෝ දුර්වල වූවාහුද තෙතෙම පෙරකීනයින්ම අලෝභිවෙයි. මොළොක් ස්වභාව ඇත්තේවෙයි නුවණමඳවෙයි එපරිද්දෙන්ම යමෙක්හට කර්මකරණසමයෙහි අලෝභ ද්වේෂමෝහයෝ බලවත්වූවාහුද ලෝභ අද්වේෂ අමෝහයෝ දුර්වල වූවාහුද තෙතෙම පෙරකී නයින්ම අලෝභි වෙයි නුවණැත්තේවෙයි මෘදු සිතැත්තේ වෙයි කිපෙන සුලුවෙයි යමෙක්හට වනාහි කර්මකරණසමයෙහි අලෝභ අද්වේෂ අමෝහයෝ තුන්දෙනාම බලවත් වූවාහුද ලෝභ ද්වේෂ මෝහයෝ තුන්දෙන දුර්වලවූවාහුද තෙතෙම මහාසංඝ රක්ෂිත ස්ථවිරයන් මෙන් අලෝභි වෙයි අද්වේෂි වෙයි ප්‍රඥාවන්තවෙයි(මෙහ වත් මේ තෙම ත්‍රිහේතුක කර්මයෙන් දෙනලද ප්‍රතිසන්ධි ඇත්තේයයි කියත් එහෙයින් බුද්ධ ප්‍රත්‍යෙකබුද්ධ අග්‍රශ්‍රාවක මහාශ්‍රාවකාදී උත්තමයන්ගේ ප්‍රතිසන්ධිය එම ත්‍රිහේතුක සිතින් ගන්නා ලද්දේයි) මේ රාගාදීන්ගේ උත්සන්නභාවය ප්‍රකාශකිරීමෙහි යමෙක් ලෝභීයයි කියනලදද හෙතෙම රාගචරිත ඇත්තේයයි දතයුතුය යම්කෙනෙක් දුෂ්ටය දඩයයි කියනලද්දාහුද ඔව්හු ද්වේෂචරිත මෝහචරිත ඇත්තාහයි දතයුතුය යමෙක් නුවණැත්තේයයි කියනලදදහෙතෙම බුද්ධිචරිතඇත්තේ වෙයි යම්කෙනෙක් අලෝභීය අද්වේෂීයයි කියනලද්දාහුද ඔව්හු ප්‍රසන්න ස්වභාව ඇතියෙහයින් ශ්‍රද්ධාචරිත ඇත්තාහයි දතයුතු තවද යම්සේ ප්‍රඥාවපිරිවරකොට ඇතිකර්මයෙන් උපන් තැනැ

තෙම බුද්ධිචරිත ඇතිවේද එපරිද්දෙන්ම බලවත් ශ්‍රද්ධාව පිරිවරකොට ඇති කර්මයෙන් උපන් සත්වතෙම ශ්‍රද්ධාචරිත ඇතිවන්නේය කාමවිතර්කාදීන් පිරිවරකොට ඇති කර්මයෙන් උපන් සත්වතෙම විතර්කචරිත ඇතිවන්නේය ලොභ මොහාදිවශයෙන් මිශ්‍රවූත් හා අවිරුද්ධ මිශ්‍රධර්මයන් පිරිවරකොට ඇති කර්මයෙන් උපන්සත්වතෙම මිශ්‍රචරිත ඇතිවන්නේය මෙසේ ලොභාදීන් අතුරෙන් එක් එක්තරා එකක්ම පිරිවරකොට ඇති ප්‍රතිසන්ධිය ගෙණදුන් කර්මය චරිතයන්ගේ නිදානයයි දතයුතුයි.

( පා ¶ )

යම්පන වුත්තං කථඤ්ච ජානිතබ්බං අයං පුග්ගලො රාගචරිතොති ආදිතත්‍රායං නයො.

ඉරියාපථතො කිච්චා
භොජනා දස්සනාදිතො
ධම්මප්පවත්තිතො චෙව
චරියායො විභාවයෙ.

තත්ථ ඉරියාපථතොති රාගචරිතො හි පකතිගමනෙන ගච්ඡන්තො චාතුරියෙන ගච්ඡති සණිකං පදං නික්ඛිපති සමං නික්ඛිපති සමං උද්ධරති උක්කුටිකඤ්චස්ස පදං හොති දොසචරිතො පාදග්ගෙහි ඛණන්තො විය ගච්ඡති සහසා පදං නික්ඛිපති සහසා උද්ධරති අනුකඩ්ඪිතඤ්චස්ස පදං හොති මොහචරිතො පරිබ්‍යාකුලාය ගතියා ගච්ඡති ඡම්භිතො විය පදං නික්ඛිපති ඡම්භිතො විය උද්ධරති සහසානුපීළිතඤ්චස්ස පදං හොති වුත්තම්පි චෙතං මාගන්දියසුත්තුප්පත්තියං.

රත්තස්ස හි උක්කුටිකං පදං භවෙ
දුට්ඨස්ස හොති අනුකඩ්ඪිතං පදං
මූළ්හස්ස හොති සහසානුපීළිතං
විවත්තච්ඡදස්ස ඉදමීදිසං පදන්ති

ඨානම්පි රාගචරිතස්ස පාසාදිකං හොති මධුරාකාරං දොසචරිතස්ස ථද්ධාකාරං මොහචරිතස්ස ආකුලාකාරං නිසජ්ජායපි එසෙව නයො රාගචරිතො ච අතරමානො සමං සයනං පඤ්ඤපෙත්වා සණිකං නිපජ්ජිත්වා අඞ්ගපච්චඞ්ගානි සමොධාය පාසාදිකෙන ආකාරෙන සයති වුට්ඨාපියමානො ච සීඝං අවුට්ඨාය සඞ්කිතො විය සණිකං පටිවචනං දෙති දොසචරිතො තරමානො යථා වා තථා වා සයනං පඤ්ඤපෙත්වා පක්ඛිත්තකායො භාකුටිං කත්වා සයති වුට්ඨාපියමානො ච සීඝං වුට්ඨාය කුපිතො විය පටිවචනං දෙති මොහචරිතො දුස්සණ්ඨානං සයනං පඤ්ඤපෙත්වා වික්ඛිත්තකායො බහුලං අධොමුඛො සයති වුට්ඨාපියමානො ච හුංකාරං කරොන්තො දන්ධං වුට්ඨාති සද්ධාචරිතාදයො පන යස්මා රාගචරිතාදීනං සභාගා තස්මා තෙසම්පි තාදිසොව ඉරියාපථො හොතීති එවන්තාව ඉරියාපථතො චරියායො විභාවයෙ.

( ස ¶ )

යම්පන වුත්තං, යමක්වදාරනලද්ද; කථංජානිතබ්බං අයං පුග්ගලො රාගචරිතොති ආදි, මේ පුද්ගල රාගචරිතවේද යනාදිය කෙසේ දතයුතුද ? තත්‍ර, ඒ පුච්ඡාවචනයෙහි; අයං නයො, මේ නයයි.

ඉරියාපථතො, ඊර්යාපථයෙහිද; කිච්චා, කෘත්‍යයෙහින්ද; භොජනා, භොජනයෙහින්ද; දස්සනාදිතො, දර්ශනාදියෙහින්ද; ධම්මප්පවත්තිතො චෙව, ධර්මයන්ගේ ප්‍රවෘත්තියෙහිද; චරියායො, චර්‍ය්‍යාවන්; විභාවයෙ, පහළකරන්නේයි.

නාථ, එති, ඉරියාපථතොති, ඉරියාපථතො; යන්නෙනති; රාගචරිතොති, රාගචරිතතෙම; පකතිගමනෙන ගච්ඡ නෙහා, පියවිගමනින් යන්නේ; චාතුරියෙන ගච්ඡති, චතුරභාවයෙන්ගේ (ලීලායෙන් ගෙයි යෙයි) සනිකං පදං නික්ඛිපති, සෙමෙන් පය තබයි; සමං නික්ඛිපති, සම කොට තබයි; සමං උද්ධරති, සම කොට උදුරයි; අස්ස, මොහුගේ; පාදඤ්ච, පාදය වනාහි; උක්කුටිකං හොති, උක්කුටිකවේ (පය සම කොට නොගලයිදු පියවර වනාති විළුම්න් හා අක්පසින් ගැනෙල් වැද නොගැලෙන්නේය යුතැති) දොසචරිතො, ද්වෙෂ චරිත තෙමේ; පාදග්ගෙහි, පතුල් අගින්; ඛණන්තො විය ගච්ඡති, බිම කණන්නාක්හුමෙන් යේ; සහසා පදං නික්ඛිපති, වහාම බිම පයහෙලයි; සහසා, වහාම; උද්ධරති, උදුරා; අනුකඩ්ඪිතපදං හොති (පාදනිඃශෙෂ ප සමකෙනි අදනාක්හුමෙන් පය තබා යුති) මොහුගේ පය අදනාලද්දේවේ; මොහචරිතො, මොහචරිත තෙමේ; පරිබ්‍යාකුලාය ගතියා, හාත්පසින් හැලුනු ගමනින්; ගච්ඡති, යයි; ඡම්භිතො විය, තැතිගත්තාක්හුමෙන් (සැක ඇත්තාක්හුමෙන් හය ඇත්තාක්හුමෙන් යුතැති) පදං නික්ඛිපති, පය තබයි; ඡම්භිතො විය, තැතිගත්තාක්හුමෙන්; උද්ධරති, උදුරයි; අස්සපදඤ්ච, මොහුගේ පිය වනාහි; සහසානුපීළිතං, විලුමින් හා අක්පල්ලෙන් වහාම එකෙපෙයි; මාගන්දිය සුත්තුප්පත්තියං, මාගන්දිය සූත්‍රොත්පත්තියෙහි; එතං, මේ; වුත්තමෙව, කියනලදී; රත්තස්ස, රාගීහුගේ; පදං, පියය; උක්කුටිකං භවෙ, විළුමින් හා අක්පල්ලෙන් ගැනෙල් (වැද නොගැළුනේවේයි යනු අදහසි) දුට්ඨස්ස, ද්වේෂීහුගේ; පදං, පියය; අනුකඩ්ඪිතං හොති, පස්සෙන් අදනාලද්දේවේයි; මූළ්හස්ස, මොහීහුගේ (පියය) සහසානුපීළිතං, විලුමින් හා අක්පල් ලෙනුත් වහාම එබෙයි (පූර්ව පසට අලෝ කොළ ගලදී වෙයි යනු සහයයි.) විවට්ටච්ඡදස්ස, විදහාහලද කෙලෙස් සෙවෙනි ඇත්තාහුගේ (ප්‍රහීණ කෙලෙස ඇත්තාහුගේයයි සෙයි) ඉදමීදිසං පදං, මෙබඳුවූ පියයවේ.

ඨානම්පි, සිටීමද; රාගචරිතස්ස, රාගචරිතයාගේ; පාසාදිකං හොති, ප්‍රසාදවත්වේ; මධුරාකාරං, මිහිරු ආකාර ඇත්තේයි (ඉමුවූ ආකාර ඇති යේය යුතැති රුවැති වේ යනු සහයයි) දොසචරිතස්ස, ද්වේෂ චරිතයාගේ; ථද්ධාකාරං, දැඩිවූ ආකාර ඇත්තේයි; මොහචරිතස්ස, මොහචරිතයාගේ; ආකුලාකාරං, ආකුලවූ ආකාර ඇත්තේයි; නිසජ්ජායපි, හිඳීමෙහිද; එසෙව නයො, මේම නයයි; රාගචරිතො, රාගචරිතද; අතරමානො, යුහුනොවූ (නොවෙහා යුතැති) සමං සයනං පඤ්ඤපෙත්වා, සම කොට යහන පණවා; සනිකං නිපජ්ජිත්වා, සෙමෙන් වැදහෙ; අඞ්ගපච්චඞ්ගානි සමොධාය, අඞ්ග ප්‍රත්‍යඞ්ගයන් මනාකොට කොට්සිර පිහිටුවා; පාසාදිකෙන ආකාරෙන, ප්‍රසාද කරවූ ආකාරයෙන්; නිපජ්ජිත්වා, හොව; සයති, නිදා; වුට්ඨාපියමානො ච, නැගිටුවනු ලබන්නේද; සීඝං උට්ඨාය, වහා නැගිට; සඞ්කිතො විය, සඞ්කා ඇත්තාහු මෙන්; සනිකං, සෙමෙන්; පටිවචනං දෙති, ප්‍රතිවචන දේ; දොසචරිතො, ද්වේෂ චරිත තෙමේ; තරමානො, යුහුව; යං වා තං වා, යම්කිසි සයනං පප්ඵොටෙත්වා, යම්තම් දෙයකින් යහන පණවා; නික්ඛිත්තකායො, අවසඟ යන්හුමෙන් ඉහා එළුවනලද සිරුරු ඇතියාව; භාකුටිං කත්වා, මුහුනු හකුළුවා කෙණෙහෙව; සයති, නිදා; වුට්ඨාපියමානො ච, නැගිටුවනු ලබන්නේද; සීඝං උට්ඨාය, වහා නැගිට; කුපිතො විය, කිපියක්හුමෙන්; පටිවචනං

දෙති, ප්‍රතිවචන දේ; මොහචරිතො, මොහචරිත තෙමේ; දුස්සණ්ඨානං සෙයනං පඤ්ඤපෙත්වා, නපුරුවූ සවහන් කොට යහන පණවා; වික්ඛිත්තකායො, ඒ ඒ පස හෙළනලද අඞ්ගප්‍රත්‍යඞ්ග ඇතියාව; බහුලං, බොහෝසේ; අධොමුඛො සයති, මුහුණින් හෙව නිද; වුට්ඨාපියමානො ච, නගා සිටුවනු ලබන්නේද; හුංකාරං කරොන්තො, හුංකාර කෙරෙමින්; දන්ධං වුට්ඨාති, ලස්ව නැගීසිටී; සද්ධාචරිතාදයොපන, ශ්‍රද්ධාචරිතාදීහු වනාහි; යස්මා, යම්හෙයකින්; රාගචරිතාදීනං සභාගා, රාගචරිතාදීන්ට සභාගයෝද; තස්මා, එහෙයින්; තෙසම්පි, ඒ ශ්‍රද්ධාචරිතාදීන්ගේද; තාදිසොව ඉරියාපථො හොති, එබඳුවූම ඉරියවු වේ; එවං, මෙසේ; තාව, පළමුකොට; ඉරියාපථතො, ඉරියවු හෙයින්; චරියායො විභාවයෙ, චර්‍යාවන් පහළකරන්නේයි.

( භා ¶ )

මේ පුද්ගල තෙම රාගචරිතවෙයි යනාදිය කෙසේ දතයුතුද යන යම් වචනයක් කියනලදද ඒ වචනයෙහි මේ විස්තරවන්නේයි

ඉරියවු වශයෙන්ද කෘත්‍ය වශයෙන්ද භොජන වශයෙන්ද දර්ශනාදි වශයෙන්ද ධර්මයන්ගේ පැවැත්ම වශයෙන්ද චරිතයන් ප්‍රකාශකරන්නේයි. ඔවුන් අතුරෙන් ඉරියවු වශයෙන් චරිතය කෙසේ ප්‍රකාශකරන්නේදයත්? රාගචරිත ඇති පුද්ගල තෙම දුටුවන් පහදවන සවභාව ගමන් ඇත්තේවෙයි සෙමෙන් පා තබයි සමකොට තබයි සමකොට උදුරයි මොහචරිත ඇත්තා හට විළුම්න් හා අක්පතුලෙන් වැදගන්නා පියවර ඇතිවෙයි ද්වෙෂ චරිත පුද්ගලතෙම අක්පතුලෙන් බිම කණින්නාක්හුමෙන් වහා පියවර තෙලයි වහා උදුරයි මොහුගේ පියවර පසයත් අදනාලද්දේවෙයි මොහචරිත ඇති පුද්ගලතෙම භාත්පසින් ඇලෙනු සවභාව ගමනින් යෙයි තැතිගත් කෙනෙකුමෙන් පියවර තබයි තැතිගත් කෙනෙකුමෙන් පියවර උදුරයි මොහුගේ පියවරද විළුම්න් හා අක්පලෙලෙන් සහාව බිම ඊබී යන්නේවෙයි කියනලදදේයැයි කුද්දකානුසන්ධියේ මාගන්දිය සූත්‍රොත්පත්තියෙහි රාගචරිතයාගේ පියවර විළුම්න් හා අක්පලෙලෙන් බිම නැමෙන්නේවෙයි ද්වෙෂ චරිතයාගේ පියවර පස්සෙන් අදනාලද්දේවෙයි. මොහචරිතයාගේ පියවර විළුම්න් හා අක්පලෙලින් වහාම බිම එබෙන්නේවෙයි භගවත්හුගේ පියවර සවහන දැක ප්‍රතික්ෂෙපකරනලද කෙලෙස් ඇත්තාහුගේ මෙබඳුවූ පියවර ඇත්තේවෙයි කීහ.

තවද රාගචරිතයාගේ සිටීමද ප්‍රාසාද එළවයි යහපත් ආකාර ඇතිවෙයි ද්වෙෂචරිතයාගේ සිටීම දැඩිවූ ආකාර ඇතිවෙයි මොහචරිතයාගේ සිටීම ආකුලවූ ආකාර ඇතිවෙයි හිඳීමෙහිද මෙසේම තුන්ආකාර ඇති බව දතයුතුයි රාගචරිත තෙමේ සෙමිසෙමින් සමකොට අසුන් පණවා සෙමිසෙමින් බැසගෙන අඞ්ගප්‍රත්‍යඞ්ගයන් මනාකොට නොවිසිර පිහිටුවා දුටුවන් පහදවන ආකාරයෙන් උඩුහෙව සයනය කෙරෙයි නැගිසිටිනු ලබන්නාහුද වහා නැගීසිට සැක ඇත්තෙකුමෙන් සෙමින් පිළිවදන් දෙයි ද්වෙෂචරිත පුද්ගල තෙමේ වහවහා යම්තම් දෙයකින් යහන් පණවා වහා හෙළනලද ශරීර ඇතිව හෙවත් අවසඟ එකෙකුමෙන් යහනෙහි වහා වැටී මුහුණහකුළුවාගෙණ සයනයකෙරෙයි නැගී සිටිනු ලබන්නාහුද වහා නැගීසිට කිපියක්හුමෙන් පිළිවදන්දෙයි මොහචරිත පුද්ගල තෙමේ දුටුවන් නොපහදිනා නපුරු සවහන් ඇති අසුන් පණවා ඒ අන්නෙහි ඒ ඒ තැන හෙළනලද අවයව ඇතිව බොහෝසෙයින් මුනින්

පාදයෙහි නිදසියා නැඟී සිටිනු ලබන්නාහුද හුංකාර ශබ්ද පවත්වමින් කම්මැලි ස්වභාවයෙන් සෙමින් නැඟිසිටින්නේය ශ්‍රද්ධාදි ඉතුරු තුන් චරිතයෝ යම්සෙයකින් රාගචරිතාදීන්ට සභාග වන්නාහුද එහෙයින්ම ශ්‍රද්ධා චරිතාදීන්ගේද එබඳුවූ ඉරියව් ඇතිවන්නාහුයි මෙසේ පළමුකොට ඉරියව් වශයෙන් චරියාවන් ප්‍රකාශකරන්නේයි.

( පා )

කිච්චාති සම්මජ්ජනාදීසුච කිච්චෙසු රාගචරිතො සාධුකං සම්මජ්ජනිං ගහෙත්වා අතරමානො වාලිකං අවිප්පකිරන්තො සින්දුවාර කුසුමසන්ථරමිව සන්ථරන්තො සුද්ධං සමං සම්මජ්ජති දොසචරිතො ගාළ්හං සම්මජ්ජනිං ගහෙත්වා තරමානරූපො උභතො වාලිකං උස්සාරෙන්තො ඛරෙන සද්දෙන අසුද්ධං විසමං සම්මජ්ජති මොහචරිතො සිථිලං සම්මජ්ජනිං ගහෙත්වා සම්පරිවත්තකං ආලොළයමානො අසුද්ධං විසමං සම්මජ්ජති යථාච සම්මජ්ජනෙ එවං චීවරධොවනරජනාදීසුපි සබ්බකිච්චෙසු නිපුණමධුරසමසක්කච්චකාරී රාගචරිතො ගාළ්හථද්ධවිසමකාරී දොසචරිතො අනිපුණපරිව්‍යාකුල විසමාපරිච්ඡින්නකාරී මොහචරිතො චීවරධාරණම්පිච රාගචරිතස්ස නාතිගාළ්හං නාතිසිථිලං හොති පාසාදිකං පරිමණ්ඩලං දොසචරිතස්ස අතිගාළ්හං අපරිමණ්ඩලං මොහචරිතස්ස සිථිලං පරිව්‍යාකුලං සද්ධාචරිතාදයො පනෙතෙසං යෙවානුසාරෙන වෙදිතබ්බා තං සභාගත්තාති එවං කිච්චතො චරියායො විභාවයෙ.

( ස )

කිච්චාති, කිච්චා යන්නෙහි; සම්මජ්ජනාදීසුච කිච්චෙසු, හැමදීම් ආදී කිසයෙහිද; රාගචරිතො, රාගචරිත තෙමේ; සාධුකං, මොනවට මොනමොළොක්කොට; සම්මජ්ජනිං ගහෙත්වා, මුස්නය ගෙණ; අතරමානො, යුහුනොව; වාලිකං අවිප්පකිරන්තො, වැලි නොවිසුරුවන්නේ; සින්දුවාර කුසුමසන්ථරං, නිකමල් ඇතිරියක්; සන්ථරන්තොඉව, අතුරන්නක්හු මෙන්; සුද්ධං, ශුද්ධකොට; සමං, සම්කොට; සම්මජ්ජති, හමදී; දොසචරිතො, ද්වෙෂචරිත තෙමේ; ගාළ්හං සම්මජ්ජනිං ගහෙත්වා, තරකොට මුස්නගෙණ; තරමානො, යුහුව; උභතො, දෙපස්හි; වාලිකං උස්සාරෙන්තො, වැලි නගන්නේ; ඛරෙන සද්දෙන, ඛර ස්වරයෙන් (රූක්ෂ හඬ ඇතිකොට යන අභිප්‍රායයි) සුද්ධං, ශුද්ධනොකොට; විසමං, නොසමකොට; සම්මජ්ජති, හමදී; මොහචරිතො, මොහචරිත තෙමේ; සිථිලං, සිථිලකොට; සම්මජ්ජනිං ගහෙත්වා, මුස්නගෙණ; සම්පරිවත්තකං (වැලි) පෙරළ පෙරළා; ආලොළයමානො (වැලිකසළ) අලලමින් (ආකුල කෙරෙමින් යුතැති) අසුද්ධං, අශුද්ධකොට; විසමං සම්මජ්ජති නොසමකොට හමදී; යථාච සම්මජ්ජනෙ, යම්සේ හැමදීමෙහිද; චීවරධොවනරජනාදීසු, සිවුරු සේදීම රැදීම යනාදීවූ; සබ්බකිච්චෙසුච, සියළු කෘත්‍යයෙහිද; එවං, මෙසේමැයි; නිපුණ, දක්‍ෂව; මධුර, මනාකොට, සමං, සමකොට; සක්කච්චකාරි, සකස්කොට කරණසුළුවූයේ; රාගචරිතො, රාගචරිතවේ; ගාළ්හ, සපිරකොට; ථද්ධ, අසිථිලකොට; විසමකාරී, විසමකොට කරන්නේ; දොසචරිතො, ද්වෙෂචරිතවේ; අනිපුණ, අදක්‍ෂව; පරිව්‍යාකුල, වියවුල්කොට; විසම, සමනොකොට; අපරිච්ඡින්නකාරී, නොපිරිසිඳ කරණසුළුවූ

යේ; මොහචරිතො, මොහචරිතයෙව්; විවරධාරණෙයපිව, සිවුරු දැරීමද; රාගචරිතස්ස, රාගචරිතයාගේ; සාහිකාළසං, ඉතා දැඩිනොවූයේ; සාහි සිපිලං, ඉතා මොළොක් නොවූයේ; හෙති, වේ; පාසාදිකං, ප්‍රසාද එළවන්නේ; පරිමණ්ඩලං, හාත්පසින් මණ්ඩලවේ (හැම අඟින් වටවේ යුතැති) දොසචරිතස්ස, ද්වෙෂ චරිතයාගේ (චීවරධාරණය) අහිකාළසං, ඉතා දැඩිවේ; අපරිමණ්ඩලං, පරිමණ්ඩල නොවේ; මොහචරිතස්ස, මොහචරිතයාගේ (චීවරධාරණය) සිථිලං, සිථිලවේ; පරිවත්තකුලං, හාත්පසින් ආකුලවේ; සද්ධාචරිතාදයො, ශ්‍රද්ධාචරිතාදීහු; තං සභාගත්තා, ඔවුන් හා සභාග හෙයින්; තෙසං යෙවානුසාරෙන වෙදිතබ්බා, ඔවුන්ගේම අනුසාරයෙන් දතයුත්තාහුයි; එවං, මෙසේ; කිච්චතො, කෘත්‍ය වශයෙන්; චරියායො විභාවයෙ, චර්‍යාවන් ප්‍රකාශකරන්නේයි.

( භා * )

කෘත්‍යවශයෙන් චර්‍යාවන්ගේ විභාගය කෙසේදයත්? රාග චරිත පුද්ගල තෙම හැමදුන් ආදි කටයුතුකරණකාලෙ නොදැඩි නොමොළොක්කොට මුස්න අල්වාගෙණ යුහුසුළු නොවී වැලි නොවිසුරුවමින් නිකමල් ඇතිරියක් අතුරන්නෙ හකුමෙන් පිරිසිදුව සමව හමදින්නේය ද්වෙෂචරිත පුද්ගල තෙම තරයේ මුස්න අල්වාගෙණ යුහුසුළුව දෙපාශ්වයෙන් වැලිඋඩ නගනනා රළු හඬ ඇතිකොට පිරිසිදුව නොසමකොට හමදින්නේය මොහචරිත පුද්ගල තෙමේ ලිහිල්කොට මුස්න අල්වාගෙණ වැලි පෙරළ පෙරළා වැලි හා කැලි කසළ ආකුල කෙරෙමින් අපිරිසිදුව විසමකොට හමදින්නේය. හැමදීමෙහි යම්සේද එපරිදෙන් සිවුරු රැදීම දෙවීම ආදි සියළු කුදු මහත් කටයුතුකතානිද ඒ ඒ චරිතයන්ගේ විභාග දතයුතු. තෙවන් දක්ෂවූද මොහොවූද සමවූද සහස්වූද කටයුතු කරණ යුළුවිනම රාග චරිත ඇත්තේයයිද සපිරවූද දැඩිවූද විසමවූද කටයුතු කරණ යුළුවිනම ද්වෙෂ චරිත ඇත්තේයයිද අදක්ෂවූද හාත්පසින් විසුරුල්වූද විසමවූද නොපිරිසුන්වූද කටයුතුකරණ යුළුවිනම් මොහචරිත ඇත්තේයයිද දතයුතු. තවද රාග චරිතයාගේ සිවුරු දැරීමද ඉතා දැඩිනොවෙයි ඉතා ලිහිල් නොවෙයි පිරිමඬුල්වෙයි ද්වෙෂ චරිතයාගේ සිවුරු දැරීම ඉතා දැඩිවෙයි හාත්පසින් වටනොවෙයි මොහචරිතයාගේ සිවුරු දැරීම ලිහිල්වෙයි හාත්පසින් විසුරුල්වෙයි ශ්‍රද්ධාදී තුන් චරිතයන්ද ඒ රාග චරිතාදීන්ට සභාග හෙයින් ඔවුන්ගේම අනුසාරයෙන් දතයුත්තාහුය. මෙසේ කෘත්‍ය වශයෙන් චර්‍යාවන් ප්‍රකාශකරන්නේයි.

( භා † )

භොජනන්ති රාගචරිතො සිනිද්ධ මධුර භොජනප්පියො හොති භුඤ්ජමානො ච නාතිමහන්තං පරිමණ්ඩලං ආලොපං කත්වා රසපටිසංවෙදී අතරමානො භුඤ්ජති කිඤ්චිදෙව සාදුං ලභිත්වා සොමනස්සං ආපජ්ජති දොසචරිතො ලූඛ අම්බිල භොජනප්පියො හොති භුඤ්ජමානො ච මුඛපූරකං ආලොපං කත්වා අරසපටිසංවෙදී තරමානො භුඤ්ජති කිඤ්චිදෙව අසාදුං ලභිත්වා දොමනස්සං ආපජ්ජති මොහචරිතො අනියතරුචිකො හොති භුඤ්ජමානො ච අපරිමණ්ඩලං පරිත්තමාලොපං කත්වා භාජනෙ ඡඩ්ඩෙන්තො මුඛං මක්ඛෙ

මනානා විසඞ්ඛතවිතතා තං තං විත
ගොමනානා භුඤ්ජති සද්ධාචරිතාද
යොපි එතෙසං යෙවානුසාරෙන වෙදි
තබ්බා තං සභාගතතා හි එවං භොජ
නතො චරියායො විභාවයෙ.——

( ඝ † )

භොජනානි, භොජන යන්නෙ
හි; රාගචරිතො, රාගචරිත තෙමේ,
සිනිද්ධ මධුර භොජනප්පියො හොති,
සිනිඳුවූ මධුරවූ බොජුන් ප්‍රියකොට
ඇති වේ; භුඤ්ජමානො ච; වළඳන්
නේද; නාතිමහන්තං, ඉතා මහත්
නොවූ, පරිමණ්ඩලං ආලොපංකත්වා,
ආලොපය වටකොට, රසපටිසංවෙදී.
රසවිඳ, අතරමානො, යුහුනොව, භුඤ්
ජති, වළඳ; කිඤ්චිදෙව සාදුං ලභිත්වා,
කිසිමධුරයක් ලදින්, සොමනස්සං ආ
පජ්ජති, සොම්නසට පැමිණේ; දොස
චරිතො, ද්වෙෂචරිත තෙමේ; ලූඛ අම්බි
ලභොජනප්පියො හොති, රූක්‍ෂවූ ඇ
ඹුල්වූ භොජනය ප්‍රියකොට ඇත්තේ
වේ; භුඤ්ජමානො ච, වළඳන්නේද;
මුඛපූරකං ආලොපංකත්වා, මුඛය පුර
න්නාවූ මහත්වූ ආලොපයකොට; අර
සපටිසංවෙදී, රසනොවිඳ; තරමානො
යුහුව; භුඤ්ජති, වළඳ; කිඤ්චිදෙව
අසාදුං ලභිත්වා, කිසි නොමිහිරක්
ලදින්; දොමනස්සං ආපජ්ජති, දොම්
නසට පැමිණේ; මොහචරිතො,
මොහචරිත තෙමේ; අනියතරුචි
කො හොති, අනියතවූ රුචි ඇත්
තේවේ (රාගද්වේෂචරිතයන් දෙදෙනා
එකෙක නියතවූ රුචිඇත්තේ නො
වෙති යුතැනි) භුඤ්ජමානො ච; වළඳ
න්නේද; අපරිමණ්ඩලං පරිත්තමාලො
පං කත්වා, වටනොවූ කුඩා ආලොපය
කොට, භාජනෙ ඡඩ්ඩෙන්තො, වළ
දන බඳුනෙහි හුළු හෙළමින්, මුඛං මක්
ඛෙන්තො, මුහුණ ගාමින්, වික්ඛිත්ත
චිත්තො, විසුරුනුසිත් ඇත්තේ (එක
ගනොවූයේ යුතැනි) තං තං විතක්කෙ
න්තො, ඒ ඒ විතර්කය කෙරෙමින්
(ඒ ඒ සිතමින් යුතැනි) භුඤ්ජති, වළ
ඳ; සද්ධාචරිතාදයොපි, ශ්‍රද්ධාචරිතාදි
හුද; එතං සභාගත්තා, ඔවුන් හා සභා
ගබැවින්; එතෙසං යෙවානුසාරෙන
වෙදිතබ්බා, ඔවුන් ගේ අනුසාරයෙන්
දතයුත්තාහු; එවං, මෙසේ, භොජන
තො, භොජනයෙහිසින්; චරියායො
විභාවයෙ, චර්‍ය්‍යාවන් පහළකරන්
නේය.——

( ගා † )

භොජනසමයෙහි චර්‍ය්‍යාවන්ගේ
විභාගය කෙසේදයත්? රාගචරිත පුද්
ගලතෙම සිනිඳු මිහිරිබොජුන් ප්‍රිය
කොට ඇත්තේවෙයි. වළඳන්නාහු
ඉතා මහත්නොවූ වටකුරු බත්පිඩු
කොට රසවිඳ විඳ සෙමි සෙමින් වළ
දයි. යම්කිසි මිහිරිබොජුනක් ලදින්
සොම්නසට පැමිණේයි. ද්වේෂචරිත ඇ
ති පුද්ගලතෙම රළුවූහෝ ඇඹුල්වූ
හෝ බොජුන් ප්‍රියවෙයි. වළඳනාහු
මුඛය පිරෙණතරම් මහත් මහත්පිඬු
කොට රසනොවිඳ යුහුයුහුව වළඳයි.
යම්කිසි නොමිහිරි බොජුනක් ලදින්
දොම්නසට පැමිණේයි. මෝහචරිතඇ
ති පුද්ගලතෙම නියමයක්‍ෂයෙන් එකෙ
ක්ම කැමති නොවෙයි. වළඳන්නාහු
වටකුරුවූ කුඩා කුඩා පිඩුකොට වළඳ
න බඳුනෙහි හුළු ඉසිමින් මුහුණගාමි
න් එකඟනොවූ සිත්ඇතිව නොයෙ
ක් සිහිවිලිසිතමින් වළඳයි. ශ්‍රද්ධාදී ච
ර්‍යාවන්ද ඊට සභාග බැවින් ඒ
අනුසාරයෙන්ම දතයුත්තාහුයි. මෙ
සේ භොජන විෂයෙහි චර්‍ය්‍යාවන්
ප්‍රකාශකරන්නේයි.——

( ඞා ‡ )

දස්සනාදීසු තාව රාගචරිතො ඊසක
මපි මනොරමං රූපාදිසවා විම්හය ජා

තො විය චිරං ඔලොකෙති පරිත්තෙපි ගුණෙ සජ්ජති භූතම්පි දොසං න ගණ්හාති පක්කමන්තොපි අමුඤ්චිතුකාමොව හුත්වා සාපෙක්ඛො පක්කමති දොසචරිතො ඊසකම්පි අමනොරමං දිස්වා කිලන්තරූපො විය න චිරං ඔලොකෙති පරිත්තෙපි දොසෙ පටිහඤ්ඤති භූතම්පි ගුණං න ගණ්හාති පක්කමන්තොපි මුඤ්චිතුකාමොව හුත්වා අනපෙක්ඛො පක්කමති මොහචරිතො යංකිඤ්චි රූපං දිස්වා පරපච්චයිකො හොති පරං නින්දන්තං සුත්වා නින්දති පසංසන්තං සුත්වා පසංසති සයං පන අඤ්ඤාණුපෙක්ඛාය උපෙක්ඛකොව හොති එස නයො සද්දසවණාදීසුපි සද්ධාචරිතාදයො පන තෙසං යෙවානුසාරෙන වෙදිතබ්බා තංසභාගත්තාති එවං දස්සනාදිතොපි චරියායො විභාවයෙ.

( ස ‡ )

දස්සනාදිතොති "දස්සනාදිතො" යන්හෙති; රාගචරිතො, රාගචරිත තෙමේ; ඊසකම්පි මනොරමං රූපං දිස්වා, මඳකුදු සිත්කළු රුවක් දැක; විම්හයජාතොවිය, විස්මය ඇතියකු මෙන්; චිරං, බොහො කලක්; ඔලොකෙති, බලා; පරිත්තෙපි ගුණෙ සජ්ජති, මඳවූද ගුණයෙහි ඇලේ; භූතම්පි දොසං න ගණ්හාති, විද්‍යමානවූද දොෂයක් නොගණී; පක්කමන්තොපි, යන්නේද; අමුඤ්චිතුකාමොව හුත්වා, මුදනු නොකැමැතිවම; සාපෙක්ඛො, අපෙක්ෂා ඇතිවම; පක්කමති, යේ; දොසචරිතො, ද්වෙෂචරිතතෙමේ; ඊසකම්පි අමනොරමං දිස්වා, මඳකුදු නොමනාවක් දැක; කිලන්තරූපො විය, (ඒ අසහනයෙන්) ඛෙදයට පැමිණියකු මෙන්; චිරං, බොහෝ කලක්; න ඔලොකෙති, නොබලා; පරිත්තෙපි දොසෙ, මඳද දොෂයෙහි; පටිහඤ්ඤති, ගැටේ; භූතම්පි ගුණං, විද්‍යමානවූද ගුණයක්; න ගණ්හාති, නොගනී; පක්කමන්තොපි, යන්නේද; මුඤ්චිතුකාමොව හුත්වා, මිදියැ ඊවම; අනපෙක්ඛො, නිරපෙක්ෂව යේ; මොහචරිතො, මොහචරිතතෙමේ; යංකිඤ්චි රූපං දිස්වා, මනාමනාප යම්කිසි රුවක් දැක; පරපච්චයිකො හොති, පරප්‍රත්‍යය ඇත්තේවේ; පරං නින්දන්තං සුත්වා, පරයා නින්දකරන්නහු අසා; නින්දති, තෙමේ නින්ද කෙරෙයි; පසංසන්තං සුත්වා, ප්‍රශංසාකරන්නහු අසා, පසංසති, ප්‍රශංසාකෙරේ; සයං, තෙමේ; අඤ්ඤාණුපෙක්ඛාය, අඥානව උපෙක්ෂායෙන්; උපෙක්ඛකො, උපෙක්ෂාකෙරේ; එස නයො සද්දසවණාදීසුපි, ශබ්දශ්‍රවණාදියෙහිද මේ නයයි; සද්ධාචරිතාදයො, ශ්‍රද්ධාචරිතාදීහු වනාහි; තංසභාගත්තා, ඔවුන් හා සභාගහෙයින්; තෙසං යෙවානුසාරෙන වෙදිතබ්බා, ඔවුන්ගේ අනුසාරයෙන්ම දතයුත්තාහුයි; එවං, මෙසේ; දස්සනාදිතො; දර්ශනාදී විසින්; චරියායො විභාවයෙ, චර්‍යාවන් පහළකරන්නේ.

( හා ‡ )

දර්ශනාදි වශයෙන් චර්‍යාවිභාගය කෙසේද යත්? රාගචරිත පුද්ගලතෙම මඳක් සිත්කළු රූපයක් දැක විස්මයට පත්වූවකු මෙන් බොහෝවේලා බලා සිටින්නේය මඳවූ ගුණයෙහිද ඇලෙන්නේය ඇත්තාවූද දොෂය නොගන්නේය හැරයන්නාහු නොමුදනු කැමැතිව අපෙක්ෂාසහිතව යන්නේය ද්වෙෂචරිත පුද්ගලතෙම මඳකුදු නොමනාපයක් දැක ඒ නොඉවසීමෙන් කලකිරුණක්හු මෙන් බොහෝවේලා නොබලයි ස්වල්පවූවරදෙහිපවා ගැටෙන්නේ

වෙයි විද්‍යමානවූද ගුණය නොහානත්
තේය හැරයත්නාහු මිළදුනුකැමති
ව නිරපෙක්‍ෂකව යත්නේවෙයි ද්වේ
ෂචරිත පුද්ගලතෙම මනාවූ හෝ
නොමනාවූ හෝ යම් රූපයක් දුක
අනුන්කාරණාකොටගෙණ යතුගී නි
න්‍දාකරන්නේ වෙයි හෙවත් අනුන් නි
න්‍දාකරනනාහුඅසා ගෙනමින් නින්‍දාකෙ
රෙයි අනුන් ප්‍රසංශාකරන්නාහු අසා
ගෙනමින් ප්‍රසංශා නොකෙරෙයි මෙමෙන්
අඳුනවූ උපෙක්‍ෂාවෙන් ලංකොට
දක්නේ වෙයි ශබ්ද ශ්‍රවණාදීයෙහිද
මෙමනයින් දතයුතු. ශ්‍රද්ධාචරිතාදී
තුන්දෙනා මේ තුන්චරිතයන්ට ස
භාග බැවින් ඒ අනුසාරයෙන්ම දත
යුතුනාහුයි. මෙසේ දශීනාදි වශ
යෙන් වශ්‍යවිභාගය ප්‍රකාශ කරන්
නේයි.—

( තා ¶ )

ධම්මප්පවත්තිතො චෙවාති රාග
චරිතස්සච මායා සාඨෙය්‍යං මානො
පාපිච්ඡතා මහිච්ඡතා අසන්තුට්ඨි
තා සිඞ්ගං චාපල්‍යන්ති එවමාදයො
ධම්මා බහුලං පවත්තන්ති දොසචරි
තස්ස කොධො උපනාහො මක්ඛො
පළාසො ඉස්සා මච්ඡරියන්ති එවමා
දයො — මොහචරිතස්ස ථිනං මි
ද්ධං උද්ධච්චං කුක්කුච්චං විචිකිච්ඡා ආ
ධානගාහිතා දුප්පටිනිස්සග්ගිතා
ති එවමාදයො — සද්ධාචරිතස්ස
මුත්තචාගතා අරියානං දස්සනකා
මතා සද්ධම්මං සොතුකාමතා පා
මොජ්ජබහුලතා අසඨතා අමායා
විතා පසාදනීයෙසු ඨානෙසු පසා
දොති එවමාදයො — බුද්ධිචරිතස්ස
සොවචස්සතා කල්‍යාණමිත්තතා
භොජනෙ මත්තඤ්ඤුතා සතිසම්ප
ජඤ්ඤං ජාගරියානුයොගො සංවෙ
ජනීයෙසු ඨානෙසු සංවෙගො සංවි
ග්ගස්සච යොනිසො පධානන්ති එව
මාදයො — විතක්කචරිතස්ස භස්ස
බහුලතා ගණාරාමතා කුසලානුයො
ගෙ අරති අනවට්ඨිතකිච්චතා රත්ති
ධූමායනා දිවා පජ්ජලනා හුරාහුරං ධා
වනාති එවමාදයො ධම්මා බහුලං ප
වත්තන්තීති එවං ධම්මප්පවත්තිතො
චරියායො විභාවයෙ—

( ස ¶ )

ධම්මප්පවත්තිතො චෙවා ති
"ධම්මප්පවත්තිතො චෙව" යනෙන
හි; රාගචරිතස්ස, රාගචරිතයහට; මා
යා, ඇතිදොස් මුවාකරණ ලකුණු
මායාව; සාඨෙය්‍යං, නැතිගුණ පහළ
කරණ ලකුණු සාඨෙය්‍යය; මානො,
උඩඟුලකුණු මානය; මහිච්ඡතා, නැ
තිගුණ පහලකිරීම් මුඛයෙන් පිළිග
හණෙති පමණ නොදන්නා ලකුණු
මහිච්ඡතාය; අසන්තුට්ඨිතා, තම ලා
භයෙන් සතුටුනොවන ලකුණු අස
න්තුට්ඨිතාය; සිඞ්ගං, ශෘඞ්ගබව (නා
ගරිකභාවයයි කියාහලද කෙලෙශ ශෘ
ඞ්ගය) චාපල්‍යං; තමා සිරුරද චිවරාදි
පිරිකරද නොබවන විසින් පවත්නා
ලොලුප්පනැමති චාපල්‍යයයි; එවමා
දයො, මේආදිවූ ධම්මයෝ; බහුලං,
බොහෝසේ, පවත්තන්ති, පවතින්;
(ආදිශබ්දයෙන් අහිරික අනොත්තප්ප
ප්පමාදදිහු ගතනාලැබෙත්)
දොසචරිතස්ස, ද්වෙෂ චරිතයහට;
කොධො, කිපෙනලකුණු ක්‍රොධය;
උපනාහො, අනුන්ගේ අපරාධබද්
නා ලකුණු උපනාහය; මක්ඛො, අ
නුන්ගුණ මකන ලකුණු මක්ඛය; ප
ළාසො, අනුන්ගේ ගුණඛැහැ පහක
රන්නක්හු මෙන් යුගග්‍රාහ ලකුණුවූ
පලාසය; ඉස්සා, පරසැපත උසුසා
ලකුණු ඉස්සාය, මච්ඡරියං, තමා
සැපත් සඟවනලකුණු මච්ඡරියය ය;
එවමාදයො, මේආදිහුයි (ආදිශබ්ද
යෙන් දොවචස්සතා පාපමිත්තතා

දින්ගේ සඞ්ග්‍රහය වේ ) මෝහචරිත
ස්‍ස, මෝහචරිතයහට; පීනං, නිරු
ත්සාහව සිත්හු නාවබවය යන පීනය;
මිඞං, සිත්හුගේ ශක්තිනැතිව නටබව්
ය යන මිඞයද; උඞච්චං, සිත්හු නොසන්
හ්සුන්බවයයත උඞච්චය; කුක්කුච්චං,
විපිළිසරබවයයි කියනලද කුක්කුච්ච
ය; විචිකිච්ඡා, සංසයලක්‍ෂණ විචිකිත්
සාය; ආධානග්ගාහිතා, අභෝනිවෙස,
දෘඪග්‍රහණය යන ආධානගාහිතාය,
දුප්පටිනිස්සග්ගිතා, ගතනාලද මිථ්‍යා
ග්‍රහණය වෙන්කොටපියා නොහැකි
බවය යන දුප්පටිනිස්සග්ගිතාය යු
න; එවමාදයො, මේ ආදිහුයි (ආදි
ශබ්දයෙන් මුට්ඨස්සච්චය අසම්පජඤ්ඤ
ය යනාදින්ගේ සඞ්ග්‍රහය වේ ) සද්ධා
චරිතස්ස, ශ්‍රද්ධාචරිතයහට; මුත්තචා
ගතා, නිස්සඞ්ගත්‍යාගය; අරියානං,
ආර්‍ය්‍යයන්ගේ; දස්සනකාමතා; දක්
ම කැමති බවය; සද්ධම්මං සොතුකා
මතා, සදහම්අසනු කැමතිබවය; පා
මොජ්ජබහුලතා, ප්‍රීතිබහුලබවය; අ
සාඨෙය්‍යතා, රජඇමති ආදින්හා හැ
නි නොවසනබවය; අමායාවිතා, මා
යාවී නොවනබවය (ඇතිදෙස් මුවහ
නොකරණබවය යුතැති ) පසාදනී
යෙසු ඨානෙසු, ප්‍රසාදකටයුතුවූ තැණු
රුවන්හි; පසාදො, ප්‍රසාදය යන;
එවමාදයො, මෙආදිහුයි; බුද්ධිචරිත
ස්ස, බුද්ධිචරිතයහට; සොවචස්සතා,
සුවචබවය; කල්‍යාණමිත්තතා, කල්‍යා
ණමිත්‍රයන් ඇතිබවය; භොජනෙ ම
ත්තඤ්ඤුතා, භොජනයේ පමණ ද
න්නාබවය; සතිසම්පජඤ්ඤං, සිහිනු
වණ දෙකය; ජාගරියානුයොගො, අ
ප්‍රමාදභාවයෙහි යෙදීමය; සංවෙජ
නීයෙසු, ජාත්‍යාදි උවෙග කටයුතු
තැන්හි; සංවෙගො, උවෙගය; සංවි
ග්ගස්සච, උවෙගකළහුගේද; යො
නිසො, නුවණින්; පධානනානි, වීර්‍ය්‍ය
කිරීමයයි; එවමාදයො, මේආදිහුයි; වි
තක්කචරිතස්ස, විතර්කචරිතයහට;
භස්සබහුලතා, කථාබහුලබවය ( බදු
බමලුබවය යුතැති) ගණාරාමතා, ගෙ
ණෙහි ඇලුනුබවය; කුසලානුයො
ගෙ, කුශලධර්මභාවනාවෙහි; අරති,
අනභිරතිය; අනවට්ඨිත කිච්චතා,
අනවස්ථිතවූ සිත්ඇති බවය; රත්තිං
ධූමායනා, මෙසේ ද මෙසේ ද කෙ
රෙමියි රාත්‍රිභාගයෙහි ඒ ඒ කෘත්‍ය
යන්ගේ පරිවිතර්කිත නැමති විත
ර්ක ධූමයෙන් දූමන බවය; දිවා ප
ජ්ජලනා, විතර්කිතවූ ඒ ඒ කෘත්‍යය
න්ගේ දිවසභාගයෙහි අනුෂ්ඨාන නැ
මති දහවල් දිලීමය; හුරාහුරං ධාව
නානි, අරමුණින් අරමුණට දිවීය
යන; එවමාදයො ධම්මා, මේආදි ධ
ර්මයෝ; බහුලං, බොහෝසේ; පව
ත්තනානි, පවතිත්; එවං, මෙසේ; ධ
ම්මප්පවත්තිතො, ධර්මයන්ගේ ප්‍රවෘ
ත්තීන්; චරියායො විභාවයෙ, චර්‍ය්‍යා
වන් පහළකරන්නේ.

( ගා 1 )

ධර්මප්‍රවෘත්ති වශයෙන් චර්‍ය්‍යා
විභාගය කෙසේදයත්? රාගචරිතපු
ද්ගලයාහට ඇති දෙස් මුවහකිරීම
ලක්‍ෂණකොටඇති මායාවය නැති
ගුණ පහළකිරීම ලක්‍ෂණකොට ඇති
සාඨ්‍යබවය උඞගුබව ලක්‍ෂණකොට ඇ
ති මානය නැතිගුණ පහළකිරීම් වශ
යෙන් පසය පිළිගැන්මෙහි පමණ
නොදැනීම ලක්‍ෂණකොට ඇති මහේ
ච්ඡතාවය ස්වකීය ලාභයෙන් සතුටු
නොවීම ලක්‍ෂණකොටඇති අසන්තු
ට්ඨිතාවය නගරවැසියන්ගේ ස්වභාව
යයිකියනලද කෙලෙශනැමිති ශෘඞ්ග
ය ස්වකීය ශරීරයාගේද චීවරාදිප්‍රත්‍ය
යන්ගේද සැරසීම් වශයෙන් පවත්
නා ලොලුප්පාං සඞ්ඛ්‍යාත චපල බ
වය යනමේආදි පාපධර්මයන් බො
හෝසේ පවත්නාහුයයි දතයුත්තේයි.

ද්වේෂචරිත ඇත්තාහට කිපීම ලක්ෂණකොට ඇති ක්‍රොධය අනුන්ගේ අපරාධ බැඳීම ලක්ෂණකොටඇති උපනාහය අනුන් ගුණමැකීම ලක්ෂණකොටඇති මක්ඛගුණය අනුන්ගුණඩැහැ පහකරන්නාක්මෙන් පවත්නා යුගග්‍රාහය ලක්ෂණකොට ඇති පළාසය අනුන් සැපත නොඉවසීම ලක්ෂණකොට ඇති ඊර්ෂ්‍යාවය තමාසැපත සඟවනු ලක්ෂණකොට ඇති මාත්සර්‍ය්‍යය යනාදි පාපධර්මයන්ගේ බහුලවශයෙන් පැවැත්මද මෝහචරිත ඇත්තාහට නිරුත්සාහිව සිත්නැවීමයයි කියනලද ථිනය ශක්තිහැනිව සිත්නටබවයයි කියනලද මිද්ධය සිත්නොසන්හුන්බව ලක්ෂණකොටඇති උද්ධච්චය විප්‍රිසරබව ලක්ෂණකොට ඇති විචිකිත්සාය නුනුවණින් නොමඟ දැඩිකොටගැන්ම ලක්ෂණකොටඇති ආධානග්‍රාහිතාවය නුනුවණින් තරයේ ගන්නාලද මිථ්‍යාග්‍රාහය මවත්කල නොහැකිබව ලක්ෂණකොටඇති දුප්පටිනිස්සග්ගිතාවය යනාදි ධර්මයන්ගේ බොහෝසෙයින් පැවැත්මදවන්නේයි.

ශ්‍රද්ධාචරිතඇත්තාහට නිරාලයභාවයෙන්වස්තුපරිත්‍යාගකිරීම ලක්ෂණකොටඇති මුක්තත්‍යාගීබවයආර්‍ය්‍යයන් දක්නාකැමතිබවය බණඅසනු කැමතිබවය ප්‍රීතිබහුලබවය රජඅැමතිආදීන්සමග නොහැනී වසනබවය ඇතිදෙය් මුවහගොනකාරණබවය පැහැදීමට කාරණාවූ තුණුරුවන් කෙරෙහි පැහැදීමය යන මේආදී ධර්මයන්ගේ පැවැත්මබොහෝසෙයින් වන්නේය. බුද්ධිචරිතඇත්තාහට සුවචබවය කල්‍යාණමිත්‍රයන් ඇතිබවය භොජනයෙහි පමණදන්නාබවය සිහිනුවණ දෙකින් යුක්තබවය අප්‍රමාදභාවයෙහි යෙදීමය ජනිදුක් ආදි කළකිරියයුතුතන්හි කළකිරීමය එසේ කළකිරුණාහුගේ නුවණින් උත්සාහ වැඩීමය යන මේආදිවූ කුශලධර්මයන්ගේ බොහෝසේ පැවැත්මවන්නේයි.

විතර්කචරිත ඇත්තාහට දෙඩමලුබවය ගණයාකෙරෙහි ඇලුනුබවය කුශලධර්ම වැඩීමෙහි නොඇලීමය එකඅරමුණෙක නොපිහිටි සිත්ඇතිබවය රාත්‍රිභාගයෙහි එක්වන්ම සිදු සෙව මෙසේ මෙසේ කරනෙමියි ඒඒකාර්‍ය්‍යයුතු කල්පනාකිරීම් හැමෙහි දුම්න් දුමනබවය දහවල්ද වස කල්පනාකරණලද ඒ ඒ කාර්‍ය්‍යයෙහි උත්සාහකිරීම් හැමෙහි ගින්නෙහ් දිලීහීමය අරමුණින් අරමුණට සිතදිවීමය යන මේආදිධර්මයන් බොහෝසෙයින් පවත්නාහුය මෙසේ ධර්මයන්ගේ පැවැත්ම වශයෙන් චර්‍ය්‍යාවන් ප්‍රකාශකරන්නේයි.

( පා * )

යස්මා පනඉදං චරියා විභාවන විධානං සබ්බාකාරෙන නෙව පාළියං න අට්ඨකථායං ආගතං කෙවලං ආචරියමතානුසාරෙන වුත්තං තස්මා නසාරතො පච්චෙතබ්බං රාගචරිතස්ස හි වුත්තානි ඉරියාපථාදීනි දොසචරිතාදයොපි අප්පමාදවිහාරිනො කාතුං සක්කොන්ති සංසට්ඨචරිතස්ස ච පුග්ගලස්ස එකස්සෙව භින්නලක්ඛණා ඉරියාපථාදයො නඋප්පජ්ජන්ති යං පනෙතං අට්ඨකථාසු චරියා විභාවනා විධානං වුත්තං තදෙව සාරතො පච්චෙතබ්බං වුත්තඤ්හෙතං චෙතොපරියඤාණස්ස ලාභී ආචරියො චරියං ඤත්වා කම්මට්ඨානං කථෙස්සති ඉතරෙන අන්තෙවාසිකො පුච්ඡිතබ්බොති යස්මා චෙතොපරියඤාණෙන වා තං වා පුග්ගලං පුච්ඡිත්වා ජානි

තබ්බං අයං පුගගලො රාගචරිතො අ
යං දොසාදීසු අඤඤතරචරිතො හි.

( ස * )

යස්මා පන, යම්හෙයකින් වනා
හි; ඉදං, මේ; චරියාවිභාවනා විධා
නං, චයඝීාචන්ගේ පහළකරණ විධි
ය; සබ්බකාරෙන, සියලුආකාරයෙ
න්; පාලියං නෙව ආගතං, පාලියෙ
හි නොම ආයේය; නාට්ඨකථායං,
අටුවායෙහි නොද ආයේයි (" සබ්බා
කාරෙන" යනුයෙන් මදමද දෙ
යක් ආයේකිවූ සුවෙත්) කෙවලං, හු
දෙක්; ආචරියමතානුසාරෙන, ඇජර
මත අනුසාරයෙන්; වුත්තං, කියන
ලද්ද; තස්මා, එහෙයින්; න සාරතො
පච්චෙතබ්බං, සාරහෙයින් හැදහිය
යුතුනොවේ ("රාගචරිතස්සහි" යනා
දීන් කාරණා දක්වති ) රාගචරිතස්ස
හි වුත්තානි, රාගචරිතයහට කියන
ලද; ඉරියාපථාදීනි, ඊයඝීාපථාදීන්;
අප්පමාදවිහාරිනො, අප්‍රමාද විහාරි
වූ; දොසචරිතාදයොපි, දොෂචරිතා
දීහුදු; කාතුං සක්කොනති, කරන්න
ට පොහොසත් වෙත්; සංසට්ඨචරිත
ස්ස ච, මුසුවූචරිත ඇති; එකස්සෙව
පුගගලස්ස, එකම පුඟුලහටද; භින්න
ලක්ඛණා(චාතුරියගමනය අචාතුරිය
ගමනය සනිකගමනය සහසාගමන
ය යනාදි) භින්නලක්ෂණවූ; ඉරියාප
ථාදයො, ඉරියවූආදීහු; න උපපජ්ජ
නති, නොයෙදෙත්; අට්ඨකථාසු, අ
ටුවායෙහි; යමපනෙතං චරියා විභා
වනා විධානං, යම් යේ චරියා
යන්ගේ විභාවනා විධියෙක්; වු
ත්තං, කියනලද්ද, තදෙව, හේම;
සාරතො, සාර හෙයින්; පච්චෙත
බ්බං, හැදහියයුතු; එතං, මේ; වුත්තං
හි, අටුවායෙහි කියනලදමැනු; චෙ
තොපරියඤාණස්සලාභිආචරීයො, ප
රසිත් පිරිසිඳදන්නා නුවණලදඇජර
තෙමේ; චරියඤඤතවා, චරිතදැන; ක
මටඨානං කථෙස්සති, කමටහන් කි
යන්නේය; ඉතරෙන, සෙස්සඟුවි ඛ
න්; අනොතවාසිකො, අතවැසිතෙ
මේ; පුච්ඡිතබ්බො, විචාරියයුතුයි; ත
ස්මා, එහෙයින්; චෙතො පරියඤ
ණෙනවා; පරසිත්දන්නා නුවණින්
හෝ; තං පුගගලං, ඒඅතවැසිපුඟුලා;
පුච්ඡිත්වා, පිළිවිසහෝ; අයං පුගග
ලො රාගචරිතො, මේපුඟුල්රාගචරි
තය; අයං,මේතෙම; දොසාදීසුඅඤඤ
තරචරිතොති, ද්වෙෂාදීන්කෙරෙහි එ
ක්තරා චරිතයෙකැයි; ජානිතබ්බං,
දතයුතුයි.

( හා * )

යම් හෙයකින් මේ චයඝීාප්‍රකාශ
කාරණවිධිය මදක්මදක්මුත් සියලුආ
කාරයෙන් සියල්ලම පෙළෙහිවත් අටු
වායෙහිවත් නොම ආයේද හුදෙක්
ආචායඝීමතානුසාරයෙන්ම කියනල
දද එහෙයින් සාරවශයෙන් හැදහිය
යුතු නොවන්නේයි ඊට කාරණා කව
රේදයත්? රාගචරිත ඇත්තවුන්ට කි
යනලද ඊයඝීාපථාදීහු අප්‍රමාද විහා
රිවූ ද්වෙෂචරිතාදීන්ද කරනනට පො
හොසත් වෙති මිශ්‍රචරිත ඇති එක
ම පුද්ගලයෙක්හටද දක්ෂගමනය
අදක්ෂගමනය සෙමින්ගමනය වහා
ගමනය යනාදි භින්නලක්ෂණ ඊයඝීා
පථාදීහු නොයෙදෙත්මැයි හෙවත් ඒ
ඉරියවුආදියෙන් චරිතය නොහැඳිනි
යහැකි වන්නේය එහෙයින් අටුවා
යෙහි යම් චයඝීාප්‍රකාශකාරණ ක්‍රමය
ක් කියනලදද ඒ ක්‍රමයම සාරවශයෙ
න් හැදහියයුත්තේයි එහෙයින් කිය
න ලදුයේමැයි අටුවායෙහි පරසිත්
පිරිසිඳදන්නා නුවණලද ආචායඝීතෙ
ම චරිතදැන කමටහන් කියන්නේය
සෙස්සන් විසින් අතවැසියා විචාළ යු
ත්තේය එහෙයින් පරසිත් දන්නා

නුවණින් දුන හෝ ඒ අනවැස්සා වි
චාරා හෝ මේ තෙම රාගචරිතඇත්
තේය මෙතෙම වෙෂාදින් අනුරෙ
න් එක්තරා චරිතඇත්තෙකැයි දත
යුත්තේයි

( පා † )

කිං චරිතස්ස පුග්ගලස්ස කිං
සප්පායන්ති එත්ථ පන සෙනාසනං
තාව රාගචරිතස්ස අධොතවෙදිකා
භූම්මට්ඨකා අකටපබ්භාරතිණකුටිප
ණ්ණසාලාදීනං අඤ්ඤතරං රජොකි
ණ්ණං ජතුකා භරිතං ඔලුග්ග විලු
ග්ගං අතිඋච්චං වා අතිනීචං වා උජ්ජ
ඞ්ගල සාසඞ්කං අසුචිවිසමමග්ගං යත්ථ
මඤ්චපීඨම්පි මඞ්කුණභරිතං දුරූපං
දුබ්බණ්ණං යං ඔලොකෙන්තස්සෙව
ජිගුච්ඡා උප්පජ්ජති තාදිසං සප්පායං
නිවාසන පාරුපණං අන්තච්ඡින්නං ඔ
ලම්බවිලම්බසුත්තකා කිණ්ණං ජාලපූ
වසදිසං සාණිමිව ඛරසම්ඵස්සං කිලි
ට්ඨං භාරිකං කිච්ඡපරිහරණං සප්පා
යං පත්තොපි දුබ්බණ්ණො මත්තිකා
පත්තො වා ආණිගණ්ඨිකාහතො අ
යොපත්තො වා ගරුකො දුස්සණ්ඨා
නොසීසකපාලමිව ජෙගුච්ඡො වට්ට
ති භික්ඛාචාරමග්ගොපි අමනාපො අ
නාසන්නගාමො විසමො වට්ටති භි
ක්ඛාචාරගාමොපි යත්ථ මනුස්සා අප
ස්සන්තාවිය විචරන්ති යත්ථ එකකු
ලෙපි භික්ඛං අලභිත්වා නික්ඛමන්තං
එහි භන්තෙති ආසනසාලං පවෙසෙ
ත්වා යාගුභත්තං දත්වා ගච්ඡන්තා ගා
වී විය වජෙ පවෙසෙත්වා අනපලො
කෙන්තා ගච්ඡන්ති තාදිසො වට්ටති
පරිවිසකමනුස්සාපි දාසාවා කම්මක
රාවා දුබ්බණ්ණා දුද්දසිකා කිලිට්ඨවස
නා දුග්ගන්ධා ජෙගුච්ඡා යෙ අචිත්තී
කාරෙන යාගුභත්තං ඡඩ්ඩෙන්තා
විය පරිවිසන්ති තාදිසා සප්පායා යා
ගුභත්ත ඛජ්ජකම්පි ලූඛං දුබ්බණ්ණං
සාමාක කුද්රූසක කණාජකාදිමයං
පූතිතක්කංබිලඞ්ගං ජිණ්ණසාකසූපෙ
ය්‍යං යංකිඤ්චිදෙව කෙවලං උදරපූර
මත්තං වට්ටති ඉරියාපථොපිස්ස ඨා
නං වා චඞ්කමො වා වට්ටති ආරම්ම
ණං නීලාදීසු වණ්ණකසිණෙසු යං
කිඤ්චි අපරිසුද්ධවණ්ණන්ති ඉදං රාග
චරිතස්ස සප්පායං

( ස † )

කිං චරිතස්ස ච පුග්ගලස්ස, කව
රචරිතයක් ඇති පුඟුලක් හට, කිංස
ප්පායං, කිමෙක්සැපදයත; එත්ථ;මෙ
හි; සෙනාසනංතාව, සෙනාසනතෙ
මේ; රාගචරිතස්ස, රාගචරිතයහට;
අධොතවෙදිකා, නොපිරිසුදුපරිසොෂ
පවෙදිකාපරිබා ඇති; භූම්මට්ඨකා,
බිම්හිනැගුයේ හෝ(මතුමහල් නැති
යේය යන අභිප්‍රායයි) අකටපබ්භාර,
නොකරණලද තිසානිභූමිපරිකම්ඇ
ති (නැමිසිටිපවිතයාගේ යටභාගය
හෝ) තිණකුටි, තණකිලිය;පණ්ණසා
ල,පත්සැල්යයන;ආදීනං,මේආදීන්
ගේ; අඤ්ඤතරා, එක්තරා එකෙක්
හෝ, රජොකිණ්ණං, රජසින්ගැවසි
ගත්; ජතුකාභරිතං,දුවන්විසින්පිරැ
ණේ; ඔලුග්ගවිලුග්ගං, සිදුනුබිඳුනේ;
අතිඋච්චං වා, ඉතාඋස්වූයේහෝ, අ
තිනීචං වා, ඉතාමිටිවූයේහෝ; උජ්ජ
ඞ්ගලං,රළුවූ රජස්නැගෙණ (ජායුදක
රහිතවූයයුතැති) සාසඞ්කං,සිංහව්‍යා
ඝ්‍රාදීහසින්සාශඞ්කවූ; අසුචි, සුචිනො
වන; විසමමග්ගං, නොසමවූ මං ඇ
තිවූයේ (සප්පායං යනුසබඳ) යං, ය
මිසෙනස්නෙක; මඤ්චපීඨම්පි, හැඳ
පුටුද; මඞ්කුණභරිතං, මකුණන්පිරැ
ණේ;දුරූපං, විරූපවූයේ;දුබ්බණ්ණං,
නපුරුවූ පැහැඇතියේ(නපුරු සටහ
න්ඇතියේහෝවේද) යං, යම්හැඳපුටු
වක්: ඔලොකෙන්තස්සෙව ජිගුච්ඡා උ
ප්පජ්ජති,බලත්නහුටම පිළිකුලඋපදී

ද; තාදිසං, එබඳුවූ සෙනසුන; සප්පා
යං, සැපවේ; නිවාසනපාපූරණං, ග
ඳනා පොරෝණා සිවුරුද; අනතවශි
තානං, දසින්සුන්නේ; ඔලම්බවිලම්බ
සුත්තකාකිණ්ණං, ඔලම්බ විලම්බවූසු
ත්‍රයෙන්ආකිණ්වූයේ ( ඔලම්බනම් ම
දක් එලෙනහුය-විලම්බ නම්දික්වඑ
ලෙනහුය) ජාලපූවසදිසං, ජාලපූපය
ක්වැනිවූ(ඉඩිපුබඳුයයනුසන්‍යසිජාලා
කාරයෙන්කරණලදඅපූපජාතියෙක
යෙන්) සාණිවිය බරසම්ඵස්සං, සණ
පොහොරුවක්මෙන් දුක්පහස් ඇති
යේ (නොහොත්තනිසමක්මෙන්දුක්
පහස්ඇතියේ ) කිලිට්ඨං,කිලිටුවූයේ;
භාරිකං, බරවූයේ, කිච්ඡපරිහරණං,
බරබැවිනුදු අතුරතුරේ හිදියම්කිරී
මෙනුදු දුකසේ පරිහරණය කටයු
තුවූයේ; සප්පායං, සැපයී; පහොතා
පි, පාත්‍රයද; දුබ්බණ්ණො, නපුරුවූ ව
ණීඇති; මත්තිකාපතෙතා වා, මැටි
පයහෝ; ආණිගණ්ඨිකාහතො,ඇණි
න්හා පෙතින් නසනලද ශොභාඇ
ති(ඇණනම් සිදුරුතැන ගසනඇණ
ය ගණ්ඨි නම්එහි හෙළනපෙතියි)අ
යොපතෙතා වා, යපයහෝ;ගරුකො,
බරවූයේ; දුස්සණ්ඨා නො, නපුරුසට
හන් ඇත්තේ; සීසකපාලම්ව ජේගු
ච්ඡො, හිස්කබලක්මෙන් පිළිකුල්වූ
යේ; වට්ටති, වටී; භික්ඛාචාරමග්ගො
පි, සිඟා යන මඟද; අමනාපො, සි
ත් කළුනොවූයේ;අනාසන්නගාමො,
දුරුවූ ගම් ඇතියේ;විසමො,සමනො
වූයේ; වට්ටති, වටී;භික්ඛාචාරගාමො
පි, සිඟායනගමද; යත්‍ථමනුස්සා, යම්
ගමෙක මිනිස්සු;අපස්සන්තාවිය චිව
රනති, නොදක්නවුන්මෙන්ඇවිදිත්
ද; යත්‍ථ, යම් ගමෙක; එකකුලෙපි, එ
ක්කුලෙක්හිදු; භික්ඛං අලභිත්‍වා, භි
ක්ෂාව නොලදින්; නික්ඛමන්තං, ගම්
න් නික්මෙනනහු; එහිභන්තෙති, ව
හන්ස එන්නේයයි;ආසනසාලංපවෙ
සෙත්‍වා, ආසනසාලාවට වදවා ;යාගුභ
තානං දත්‍වා ගච්ඡන්තා, හඹුබත්දීය
නානාහු; ගාවිං, දෙනක; වජෙ පවෙ
සෙත්‍වා විය,ගොවුදෙහිලා යනනවුන්
මෙන්; අනපලොකෙත්‍වා ගච්ඡන්ති,
නොබැණම යෙදද; තාදිසො, එබඳු
වූ ගොචරග්‍රාමය; වට්ටති, වටී; පරිවි
සකාමනුස්සාපි, වළඳවනම්නිස්හුද;
දසාචා, දස්හු වෙත්වයි; කම්මකරා
වා, මෙහෙකරුවෝ වෙත්වයි; දුබ්බ
ණ්ණා, නපුරුවූ පැහැඇත්තාහු; දුද්දු
සිකා, අගපසභවිසින් නපුරුවූ දසුන්
ඇත්තාහු; කිලිට්ඨවසනා, කිලිටුව
ස්ත්‍රඇත්තාහු; දුග්ගන්ධා, දුගඳවූවාහු;
ජෙගුච්ඡා, පිළිකුල්වූවාහුවෙත්ද; සෙ,
යම්කොණෙක්; අචිත්තීකාරෙන, අ
ගෞරවයෙන්; යාගුභත්තං, හඹුබත්;
ඡඩ්ඩෙන්තා විය, දමනනවුන් මෙන්;
පරිවිසන්ති ච, වළඳවත්ද; තාදිසා,එ
බඳුවූවෝ; සප්පායා,සැපයෝයී; යාගු
භත්තබ්‍යඤ්ජනකම්පි; හඹුබත්කැවිලිද,ගි
ලං, රුක්ෂවූයේ; දුබ්බණ්ණං, දුර්වණ්වූ
යේ; සාමාක, බොඩහමු; කුද්‍රුසක;
සෙසුක්ෂුද්‍රධාන්‍ය; කණාජකාදිමයං;
නිමුඩු සහල් ආදීන්කරණලද;පූතිත
ක්ක,කුනුමොහොර; බිලඩ්ග, කාඩි;
ජිණ්ණසාකසූපෙය්‍යං,මුහුකළපලාමා
එඇති;යංකිඤ්චිදෙව, යම්කිසිවක්ම;
කොචලං, හුදෙක්; උදරපූරමත්තම්පි;
කුස්පිරෙණපමණක්; වට්ටති, වටී; ඉ
රියාපථොපි,ඉරියවුද; අස්ස,මෝහට;
ඨානං වා චඞ්කමො වා වට්ටති; සිටී
මහෝ සක්මනහෝ වටී(ප්‍රණීතඉරිය
වූවෙහි රාගොත් පත්තිවනහෙයිනය
නඅභිප්‍රායි) ආරම්මණං, අරමුණ; නී
ලාදිසු වණ්ණකසිණෙසු;නීලාදීවූවණ
කිසුණෙහි; යංකිඤ්චි, යම්කිසිවෙක්;
අපරිසුද්ධවණ්ණන්ති, නොපිරිසිදුව
ණීඇතියේ (සැපයි) ඉදං, මේ;රාගච
රිතස්සසප්පායං, රාගචරිතයහටසැප
යි ( මෙසේකලකෙලෙස් උපැත්නො
වේයන අභිප්‍රායි)

නුවණින් දැන හෝ ඒ අනවැසසා වි
චාරා හෝ මේ තෙම රාගචරිතඇත්
තේය මෙතෙම වෙෂාදින් අතුරෙ
න් එක්තරා චරිතඇත්තෙකැයි දත
යුත්තේයි ———

( පා † )

කිං චරිතසස පුගගලසස කිං
සපපායනති එතථ පන සෙනාසනං
තාව රාගචරිතසස අධොතවෙදිකා
භුමමටඨකා අකටපබහාරතිණකුටිප
ණණසාලාදීනං අඤඤතරං රජොකි
ණණං ජතුකා භරිතං ඔලුගග විලු
ගගං අතිඋච්චං වා අතිනීචං වා උජජ
ඩගල සාසඩකංඅසුචිවිසමමගගං යතථ
මඤචපීඨමපි මඞකුණ භරිතං දුරූපං
දුබබණණං යං ඔලොකෙනතසෙසව
ජිගුචඡා උපපජජති තාදිසං සපපායං
නිවාසන පාපුරණං අනතච්ඡිනනං ඔ
ලමබවිලමබසුතතකා කිණණං ජාලපූ
වසදිසං සාණිවිය බරසම්ඵසසං කිලි
ට්ඨං භාරිකං කිච්ඡපරිහරණං සපපා
යං පතෙතාපි දුබබණෙණා මතතිකා
පතෙතා වා ආණිගණ්ඨිකාහතො අ
යොපතෙතා වා ගරුකො දුසසණ්ඨා
නොසිසකපාලමිව ජෙගුච්ඡො වට්ට
ති භිකඛාචාරමගෙගා පි අමනාපො අ
නාසනනගාමො විසමො වට්ටති භි
කඛාචාරගාමොපි යතථ මනුසසා අප
සසනතාවිය විචරනති යතථ එකකු
ලෙපි භිකඛං අලභිතවා නිකඛමනතං
එහි භනෙතති ආසනසාලං පවෙසෙ
තවා යාගුභතතං දතවා ගච්ඡනතා ගා
වි විය වජෙ පවෙසෙතවා අනපලො
කෙනතා ගච්ඡනති තාදිසො වට්ටති
පරිවිසකමනුසසාපි දාසාවා කම්මක
රාවා දුබබණණා දුදදසිකා කිලිට්ඨවස
නා දුගගනධා ජෙගුච්ඡා යෙ අචිතති
කාරෙන යාගුභතතං ඡඩෙඩනතා
විය පරිවිසනති තාදිසා සපපායා යා
ගුභතත ඛජජකමපි ලූඛං දුබබණණං
සාමාක කුදුසක කණාජකාදිමයං
පූතිතකකංබිලඩගං ජිණණසාකසූපෙ
යනං යංකිඤ්චිදෙව කෙවලං උදරපූර
මතතං වට්ටති ඉරියාපථොපිසස ඨා
නං වා චඞකමො වා වට්ටති ආරමම
ණං නීලාදීසු වණණකසිණෙසු යං
කිඤචි අපරිසුඩවණණනති ඉදං රාග
චරිතසස සපපායං ———

( ස † )

කිං චරිතසස ච පුගගලසස, කාව
රචරිතයක් ඇති පුඟුලක් හට, කිංස
පපායං, කිමෙක්සැපදයන; එතථ;මෙ
හි; සෙනාසනංතාව, සෙනාසනතෙ
මේ; රාගචරිතසස, රාගචරිතයහට;
අධොතවෙදිකා, නොපිරිසුදුපරිසොෂ
පවෙදිකාපරිබා ඇති; භුමමටඨකා,
බිම්හිනැගුයේ හෝ (මතුමහල් නැති
යේය යන අභිප්‍රායයි) අකටපබහාර,
නොකරණලද භිත්තිභූමිපරිකර්මඇ
ති (නැමිසිටිපඊතයාගේ යටහාගය
හෝ) තිණකුටි, තණකිළිය;පණණසා
ල,පන්සැල්යයන;ආදීනං,මෙආදීන්
ගේ; අඤඤතරා, එක්තරා එකෙක්
හෝ, රජොකිණණං, රජසින්ගැවසි
ගත්; ජතුකාභරිතං,දුවන්විසින්පිරු
ණේ; ඔලුගගවිලුගගං, සිදුනුබිදුනේ;
අතිඋච්චං වා, ඉතාඋස්වූයේහෝ, අ
තිනීචං වා, ඉතාමිටිවූයේහෝ; උජජ
ඩගලං,රළුවූ රජස්නැගෙණ (ඡායුදක
රහිතවූයයුතැනි) සාසඩකං,සිංහව්‍යා
ඝ්‍රාදිභයින්සාශඩකාවූ; අසුචි, සුචිනො
වන; විසමමගගං, නොසමවූ මං ඇ
තිවූයේ (සපපායං යනුසබඳ) යං, ය
ම්සෙනස්නෙක; මඤචපීඨමපි, හැඳ
පුටුද; මඞකුණභරිතං, මකුණන්පිරු
ණේ;දුරූපං, විරූපවූයේ;දුබබණණං,
නපුරුවූ පැහැඇතියේ(නපුරු සටහ
න්ඇතියේහෝවේද) යං, යම්හැඳපුටු
වක්; ඔලොකෙනතසෙසවජිගුච්ඡා උ
පපජජති,බලන්නහුටම පිළිකුල්උපදී

ගන්ධං යං දස්සනමත්තෙනෙව පීති
පාමොජ්ජං ජනයති එවරූපං සප්පායං
තස්ස පන සෙනාසනස්ස මග්ගොපි
සබ්බපරිස්සය විමුත්තො සුචිසමත
ලො අලඞ්කතපටියත්තො ච වට්ටති
සෙනාසනපරික්ඛාරො පෙත්ථ කීට
මඞ්කුණදීඝජාතිමූසිකාදීනං නිස්සය
පරිච්ඡින්නත්තං නාති බහුකො එක
මඤ්ච පීඨමත්තමෙව වට්ටති නිවා
සන පාපුරණම්පි සස්සචීන පට්ටසො
මාරපට්ට කොසෙය්‍ය කප්පාසිකසුඛු
ම ඛොමසුඛුමාදීනං යං යං පණීතං
තෙන තෙන එකපට්ටං වා දුපට්ටං
වා සල්ලහුකං සමණසාරුප්පෙන සු
රත්තං සුපරිසුද්ධවණ්ණං වට්ටති ප
ත්තො උදකබුබ්බුළම්ව සුසණ්ඨානො
මණි විය සුමට්ඨො නිම්මලො සම
ණසාරුප්පෙන සුපරිසුද්ධවණ්ණො
අයොමයො වට්ටති භික්ඛාචාර ම
ග්ගො පරිස්සයවිමුත්තො සමො මනා
පො නාතිදූරනාච්චාසන්නගාමො ව
ට්ටති භික්ඛාචාරගාමොපි යත්ථ මනු
ස්සා ඉදානි අය්‍යො ආගමිස්සතීති සි
ත්තසම්මට්ඨෙ පදෙසෙ ආසනං ප
ඤ්ඤපෙත්වා පච්චුග්ගන්ත්වා පත්තං ආ
දාය ඝරං පවෙසෙත්වා පඤ්ඤත්තාස
නෙ නිසීදාපෙත්වා සක්කච්චං සහත්ථා
පරිවිසන්ති තාදිසො වට්ටති පරිවෙස
කාපනස්ස යෙ හොන්ති අභිරූපා පා
සාදිකා සුන්හාතා සුවිලිත්තා ධූප
වාසකුසුමගන්ධසුරභිනො නානා වි
රාගසුවිමත්තදුස්ස වත්ථාභරණ පතිම
ණ්ඩිතා සක්කච්චකාරිනො තාදිසා
සප්පායා යාගු භත්ත ඛජ්ජකම්පිව
ණ්ණගන්ධරස සම්පන්නං ඔජවන්තං
මනොරමං සබ්බකාරපණීතං යාව
දත්ථං වට්ටති ~ ඉරියාපථෙපිස්ස
සෙය්‍යාවා නිසජ්ජාවා වට්ටති ආරම්ම
ණං නීලාදීසු වණ්ණකසිණෙසු යංකි
ඤ්චිසුපරිසුද්ධවණ්ණන්ති ඉදං දොසචරි
තස්ස සප්පායං ~

( ස ‡ )

දොසචරිතස්ස, ද්වෙෂචරිතයහට;
සෙනාසනං,සෙනස්න;නාති උච්චං;
ඉතාඋස්නොවූයේ;නාති නීචං, ඉතා
මිටිනොවූයේ; ඡායූදක සම්පන්නං,
ඡායාඋදකයෙන් සමන්විතවූයේ; සු
විභත්තං, මනාකොට විභාගකරණල
ද; භිත්තිත්ථම්භසොපානං, බිත්හා
ටැම්හා හිණීඇතියේ;සුපරිනිට්ඨිත,ම
නාකොටනිමවනලද; මාලාකම්මල
තාකම්මං, මල්කම් ලියකම්ඇතියේ;
නානාවිධ චිත්තකම්මසමුජ්ජලං,නන්
ප්‍රකාර විත්‍රකර්මයෙන් උජ්වලවූයේ;
සමසිනිද්ධමුදු භූමිතලං,සමවූ ස්නිග්ධ
වූ මෘදුවූ බිම්තල ඇතියේ; බ්‍රහ්මවි
මානම්ව,බඹවිමණක්මෙන්; කුසුමදා
මවිචිත්තවණ්ණ,මල්දමින් විසිතුරුවූ
වණ්ඇති; චෙළවිතාන සමලඞ්කතං,
පිළිවියනින්සැදනලද්දේ;සුපඤ්ඤත්ත,
මනාකොටපණවනලද; සුචිමනො
රමත්ථරණමඤ්චපීඨං, සුචිවූමනො
රම්‍යවූ පසතරණ ඇති හැදපටු ඇති
යේ;තත්ථතත්ථ,ඒ ඒතාන්හි;වාසත්ථාය
නික්ඛිත්තං,සුවඳගඳ්වන පිණිස තබ
නලද; කුසුමවාසගන්ධ සුගන්ධං, මල්
හා වත්සුන්නෙහි ගන්ධයෙන් සුග
න්ධවූයේ (සප්පායංයනුසබද) යං, යම්
සෙනස්නෙක්; දස්සනමත්තෙනෙව
පීතිපාමොජ්ජං ජනයති, දශීණමාත්‍ර
යෙන්ම ප්‍රීතිප්‍රමොද්‍යයඋපදවාද;එව
රූපං; මෙබඳුවූයේ; සප්පායං, සැපයි;
තස්සපනසෙනාසනස්ස මග්ගොපි, ඒ
සෙනස්නටයනමගද; සබ්බපරිස්සය
විමුත්තො,සියලුපරිපන්ථයෙන් විනිර්
මුක්තවූයේ; සුචි, පිරිසිදුවූයේ; සමත
ලො,සමවූ තලඇත්තේ; අලඞ්කතප
ටියත්තොච වට්ටති,සදානිමවනලද්දේ
මවටී ( සජීසැජ්ජවූයේමවටීයුතැති)
එත්ථ, මෙහි; සෙනාසනපරික්ඛාරො
පි; සෙනසුන්පිරිකරද; කීටමඞ්කුණ

ණ දීසයන්ති මූසිකාදීනං, පණු මකුණු
දිග්දූමිති ආදීන්ගේ; නිස්සයපරිච්ඡේද
නාපං, ආශ්‍රය පසිඳිනාපිණිස; එකං
මඤ්චපීඨං පාතශෙව වට්ටති, එකම හැ
ඳක්හෝ පුටුවක් පමණවට; නාතිබහු
කො, ඉතාවැඩියක් (නොවටි) නිවාස
නපාපූරණමපි, හඳනා පොරෝණා සි
වුරැද; අසස, ඔහට; එකපටට, එක
දේශයෙහි පටය; සොෘාරපටට, සො
ඕාර දේශයෙහි පටය; කොසෙයන, නී
කිරි පිළිය; කප්පාසිකසුඛුම, සිහින් ක
පුපිළිය; ඛොමසුඛුම, සිහින් කොමු පි
ළිය (එනම් දෙසැක පිළිය යෙත් කො
මුනම් එකජාතියෙක යෙන්මැයි) ආදී
නං, මේ ආදීන්ගේ; යා යං පඤ්ඤත්තං,
යමෙක් යමෙක් ප්‍රඥප්තද; තෙත තෙ
න, ඒ එයින්, එකපට්ටංවා ද්‍රපට්ටංවා,
එක්පටහෝ දෙපටවූයේ; සලලහුකං,
සැහැල්ලුවූයේ; සමණසාරුප්පෙපත සු
රතතං, ශ්‍රමණසාරුප්‍යයෙන් මනා
කොටම රඳනාලද්දේ; සුපරිසුද්ධව
ණ්ණං, ඉතා පිරිසිදු පැහැ ඇත්තේ;
වට්ටති, වටී; පතෙතා, පාත්‍රය; උදක
බුබ්බුලමිව සුසණ්ඨානො, දියබුබුලක්
මෙන් මනාවූ සටහන් ඇත්තේ; මණි
විය සුමටෙටා, මැණිකක්මෙන් ඉතා
මටවූයේ; නිම්මලො, නිර්මලවූයේ; සම
ණසාරුප්පෙපත, ශ්‍රමණ සාරුප්‍ය වර්ණ
යෙන්; සුපරිසුද්ධවණෙණා, සුපිරිසිදු
වර්ණ ඇතියේ; අයොමයො, යකඩින්
කරණලද්දේ; වට්ටති, වටී; නිකඛාචා
ර මගෙගා, එබු සිඟා යන මඟද; පරි
සසය විමුතෙතා, උපද්‍රවයෙන් මිදුනේ;
සමො, සමවූයේ; මනාපො, මනාවඩත්
තේ (වටී) නාති දූරනාච්චාසනනගා
මො වට්ටති, ඉතා දුරුනොවූ ඉතා
ළංනොවූ ගම් ඇත්තේ වටී; නිකඛා
චාරගාමොපි; සිඟා යන ගමද; යතථ
මනුසසා, යම් ගමෙක මිනිස්හු; ඉදානි
අයෙයා ආගමිසසනතීති, දැන් ආර්‍ය්‍යයෝ
එන්නාහයි; සිතවා සම්මටඨ පදෙසෙ,
දියඉස හමදනාලද පෙදෙස්හි; ආස
නං පඤ්ඤාපෙතවා, හසුන් පණවා;
පච්චුගගනතවා, පෙරමගට ගොස්; ප

තතං ආදාය, පාත්‍රයගෙණ; ඝරං පවෙ
සෙතවා; ගෙට වඩා; පඤ්ඤතතාසනෙ
නිසීදපෙතවා, පැණවූ ආසනයෙහි හි
ඳුවා; සකකචචං, සකස්කොට; සහ
ත්ථා පරිවිසනායි, තමන් අතින් වළඳ
වද්ද; තාදිසො වට්ටති, එබඳුවූයේ
වටී; පරිවෙසකා පන, වළඳවනම්නිස්
සු වනාහි; අසස, ඕහට; යෙ, යම්කෙ
ණෙක්; අභිරූපා, සුන්දරවූ රූප ඇ
තතාහු; පාසාදිකා, ප්‍රසාද එළවන්නා
හු; සුනහාතා, මනාකොට නැහැවාහු;
සුවිලිත්තා, මනාකොට විලෙවුත් ග
තතාහු; ධූමවාස සුගනධ, දුම වත්සුණු
සුවඳය යන මෙහි ගන්ධයෙන්; සුගන්ධි
තො, සුවඳවූවාහු; නානාවිරාග, නන්
පැහැ ඇති; සුවිමනුඤ්ඤවත්ථාභරණ
පතිමණ්ඩිතා, යුතුවූ මනොඥ වස්ත්‍රාභ
රණයෙන් සැදූහාහු; සකකච්චකාරි
නො, සකස්කොටකරණ සුලුහු;
හොනති, වෙද්ද; තාදිසා සපපායා, එ
බඳුවූවුහු සැපයෝයි; යාගුභත්තඛජ්ජ
කමපි, හඹුබත් කැවුම්ද; වණ්ණගන්ධ
රස සමපනනං, වර්ණගන්ධ රස යන
මෙයින් සමන්විතවූයේ; ඔජවනතං,
ඔජස් ඇත්තේ; මනොරමං, මනහර
වූයේ; සබ්බාකාරපඤ්ඤත්තං, සර්වාකාර
යෙන් මධුරවූයේ; යාවදතථං, කැමැති
පමණවූයේ; වට්ටති, වටී; ඉරියාපථො
පි, ඉරියව්වද; අසස, ඔහට; සෙයයා
වා, හෙවීමහෝ; නිසජ්ජාවා, හිඳීම
හෝ; වට්ටති, වටී; ආරම්මණං, අරමු
ණු; නීලාදිසු වණ්ණකසිණෙසු, නීලා
දී වර්ණකසිණයන්කෙරෙහි; යංකිඤ්චි,
යම්කිසිවෙක්; සුපරිසුද්ධවණ්ණං, ඉ
තා පිරිසිදු පැහැ ඇත්තේ; වට්ටති,
වටී; ඉදං, මේ; දොසචරිතසස සපපා
යං, ද්වේෂචරිතයහට සැපයි.

( හා ‡ )

ද්වේෂචරිත පුද්ගලයාහට ඉතා උස්
නොවූද ඉතා මිටි නොවූද ඡායාවෙන්
හා ජලයෙන් යුක්තවූද මනාකොට
බෙදනලද බිත්ති දැම් ඉණීම ඇ
තතාවූද මොනවට නිමවනලද මාලා

කම් ලතාකම් ඇත්තාවූද නොයෙක් ප්‍රකාර විසිතුරු කම්මාන්තයෙන් උස්ව බබලන්නාවූද සමසතිඹ මැදුහුම්තල ඇත්තාවූද බ්‍රහ්මවිමානයක්මෙන් මල් දම්වලින් විසිතුරු වණී ඇත්තාවූ පිළිවියනින් සරසනලද්දාවූද මොනවට පණවනලද සිත්කලු පිරිසිදු පසතුරුනු ශයන්යුත් හැඳපුටු ඇත්තාවූද තන්තන්හි සුවඳ ගන්වන පිණිස තබනලද සුවඳ මල් සුවඳසුණු ආදින් එක සුගන්ධවූද යම් සෙනස්නක් දුටු පමණින් ප්‍රීතිප්‍රමොද්‍ය උපදවාද මෙබඳු සෙනස්නක්ම සැපවන්නේයි, ඒ සෙනස්නට යන මාර්ගයද සියලු උපද්‍රවයෙන් මිදුනාවූද පවිත්‍රවූද සමතලවූද සර්වාලඞ්කාරයෙන් සද නිමවනලද්දේම වට්නේය මෙහි සෙනාසන පරිෂ්කාරයෝද පණුමකුණු සර්පාදීන්ගේ ආශ්‍රය වලක්වනු පිණිස එකම හැඳක්හා පුටුවක් පමණක්ම වට්නේය ඉතා වැඩියක් නොවටී ඕහට හඳනා පොරෝණා සිවුරුද චීනදෙශයෙහි හටගත් පටපිළිය සොමාරදෙශයෙහි හටගත් පටපිළිය තිතිරිපිළිය සිහින් කපු පිළිය සිහින් කොමුපිළිය යනමේ ආදීන්ගෙන් යම්යම්ඳක් ප්‍රණීතද ඒ ඒ දත් එක්පටහෝ දෙපටහෝ ඇති සැහැල්ලුවූ ශ්‍රමණසාරූප්‍ය වණීයෙන් මනාකොටම රඳනාලද ඉතා පිරිසිදු පැහැඇත්තේම වට්නේය පාත්‍රයද දියබුබුලක්මෙන් මනා සටහන් ඇති මැණිකක්මෙන් ඉතා මටවූ නිම්ලවූ ශ්‍රමණ සාරූප්‍ය වණීයෙන් සුපරිසිදු වණී ඇත්තාවූ යකඩ පාත්‍රයක්ම වට්නේය පිඬුසිගා යන මාර්ගයද සියලු උපද්‍රවයෙන් මිදුනාවූ සමවූ මනාපවූ ඉතා දුරුනොවූ ඉතා ලංනොවූ ගම් ඇත්තේම වට්නේය පිඬුසිගා යන ගමද යම් ගමක මනුෂ්‍යයෝ දැන් ආර්යයෝ වඩිනැයි දියැත්ස හමදනාලද පෙදෙසෙක අසුන් පණවා පෙරමගට ගොස් පාත්‍රයගෙණ ගෙට වඩා පැණවූ අසුන් මතෙහි වඩාහිඳුවා සකස් කොට සියඅතින්ම වලඳවද්ද එබඳුවූම ගමක් වට්නේය ඕහට වලඳවන මනුෂ්‍යයෝද යම් කෙණෙක් සොඳුරු රූප ඇත්තාහුද ප්‍රසාද එලවන්නාහුද මනාකොට නානලද්දාහුද මනාකොට විලවුන් ගන්නාලද්දාහුද සුවඳ දුම් සුවඳ සුණු සුවඳමල් යන මොවුන්ගේ සුවඳින් සුගන්ධවූවාහුද නානා වණී ඇති පිරිසිදු සිත්කලු වස්ත්‍රාභරණයෙන් සැරසුනාහුද සකස්කොට වතාවත් කරණ සුළුලෝමෙද්ද එබඳු වූවෝම සැපවන්නාහුය කැඳබත්හා කැවුම්ද වණී ගන්ධ රසයෙන් සම්පූණීවූ ඕජස් ඇත්තාවූ සිත්කලුවූ සර්වාකාරයෙන් මධුරවූවාක්ම කැමති පමණක් වලඳන්නට වට්නේය ඕහට ඉරියව්ද සයනයකිරීමහෝ හිඳීම වට්නේය අරමුණුද නීලකසිණාදී වණීකසිණයන් අතුරෙන් ඉතා පිරිසිදු වණී ඇත්තාවූ යම්කිසිවක්ම වට්නේය මේ වෙෂචරිත ඇත්තාහට සැපවූ සෙනසුන් ආදිය වන්නේයි.

( පා ¶ )

මොහචරිතස්ස සෙනාසනං දිසාමුඛං අසම්බාධං වට්ටති යත්ථ නිසින්නස්ස විවටා දිසා පඤ්ඤායන්ති ඉරියාපථෙසු චඞ්කමො වට්ටති. ආරම්මණං පනස්ස පරිත්තං සුප්පමත්තං සරාවමත්තං වා ඛුද්දකං න වට්ටති සම්බාධස්මිං හි ඔකාසෙ චිත්තං භියොයා සම්මොහමාපජ්ජති තස්මා විපුලං මහාකසිණං වට්ටති සෙසං දොසචරිතස්ස වුත්ත සදිසමෙවාති ඉදං මොහචරිතස්ස සප්පායං සද්ධාචරිතස්ස සබ්බම්පි දොසචරිතම්හි වුත්තවිධානං සප්පායං ආරම්මණෙසු චස්ස අනුස්සතිට්ඨානම්පි වට්ටති බුද්ධිචරිතස්ස සෙනාසනාදීසු ඉදං නාම අසප්පායන්ති නත්ථි. විතක්කචරිතස්ස සෙනාසනං විවටං දිසාමුඛං යත්ථ නිසින්නස්ස ආරාමවනපොක්ඛරණීරාමණෙය්‍යකානි ගාමනිගමජනපදපටිපාටියො නීලො

භාසා පබ්බතාච පඤ්ඤායන්ති තං න වට්ටති තංහි විතක්ක විධාවනස්සෙව පච්චයො හොති තස්මා ගම්භීරෙ දරීමුඛෙ වනපටිච්ඡන්නෙ හත්ථිකුච්ඡිපබ්භාර මහින්දගුහා සදිසෙ සෙනාසනෙ වසිතබ්බං ආරම්මණම්පි විපුලං න වට්ටති තාදිසං හි විතක්කවසෙන සන්ධාවනාය පච්චයො හොති පරිත්තං පන වට්ටති සෙසං රාගචරිතස්ස වුත්තසදිසමෙවාති ඉදං විතක්කචරිතස්ස සප්පායං අයං එත්ථ චරියානුකූලන්ති එවං ආගතානං චරියානං පභෙද නිදාන විභාවන සප්පාය පරිච්ඡෙදතො විත්ථාරො.

( ස ¶ )

මොහචරිතස්ස සෙනාසනං, මොහචරිතයහට සෙනසුන; දිසාමුඛං, දිගට අභිමුඛවූයේ (අහසවකාශයට අභිමුඛවූයේය යන අභිප්‍රායයි) අසම්බාධ වට්ටති, හකුළුනොවූයේ වේ; යත්ථ, යම් සෙනසුනෙක; නිසින්නස්ස, හුන්නහුට; විවටාදිසා පඤ්ඤායන්ති, විවෘතවූ දික්හු පැණෙද් (කිසිවෙකින් මුවහ නොවූ දික්හු යුගැනී) ඉරියාපථෙසු, ඉරියව්වෙහි; චඞ්කමො වට්ටති, සක්මන වේ; ආරම්මණං පන, අරමුණු වනාහි; අස්ස, මොහුට; පරිත්තං, සවල්පවූයේ; සුප්පමත්තං, සුලු කුළු පමණවූයේ; සරාවමත්තං, මලාවක් පමණවූයේ; ඛුද්දකං, කුඩා අරමුණු; නවට්ටති, නොවේ; සම්බාධස්මිං ඔකාසෙ, හකුළුවූ අවකාශයෙහි; චිත්තං, සිත තෙමේ; භිය්‍යො, බොහෝසේ; සම්මොහමාපජ්ජති, මුළාබවට පැමිණේ; තස්මා, එහෙයින්; විපුල වට්ටති, මහත් කසිණුවේ (ශූර්පසරුව ප්‍රමාණයට සතර පස් අඟලක් උඩාකාරණ කිසුණු මඬුළු වේ යන අදහසි) සෙසං, සෙස්ස; දොසචරිතස්ස වුත්තසදිසමෙව, දෙෂචරිතයහට කියනලද්දහාව සදෘශවේ (සෙනසුන් ආදියෙහි යමෙක් මොහචරිතයහට වනාවශ්‍යවේද හේ දෙෂචරිතයහට කියනලද සැපහා සදෘශවේ යුතැනී) ඉදං, මේ; මොහචරිතස්ස සප්පායං, මොහචරිතයහට සැපයි; සද්ධාචරිතස්ස, ශ්‍රද්ධාචරිතයහට; දොසචරිතම්හි, දෙෂචරිතයාකෙරෙහි; වුත්තවිධානං සබ්බම්පි, කියනලද විධාන ඇති සියල්ලම; සප්පායං, සැපයි; ආරම්මණෙසු ච, අරමුණුන් කෙරෙහිද; අස්ස, මොහුට; අනුස්සතිට්ඨානම්පි, අනුස්මෘතිස්ථානයද (බුද්ධානුස්මෘති ආදිවූ සදෙනද යන අදහසි) බුද්ධිචරිතස්ස, බුද්ධිචරිතයහට; සෙනාසනාදිසු, සෙනාසනාදීන් කෙරෙහි; ඉදං නාම අසප්පායන්ති නත්ථි, මෙනම්දුයෙක් අසප්පායයනුනැති; විතක්කචරිතස්ස, විතර්කචරිතයහට; සෙනාසනං, සෙනසුන; විවටං, විවෘතවූයේ; දිසාමුඛං, දිගට අභිමුඛවූයේ (වට්ටන්ගනු සබඳ) යත්ථ නිසින්නස්ස, යම්තැනක උන්නාහට; ආරාමවනපොක්ඛරණි රමණීයානි, අරම් වන පොකුණු රමණීහුද; ගාමනිගම ජනපද පටිපාටියො, ගම් නියම්ගම් දනව් පිළිවෙළහුද; නීලොභාසාච පබ්බතා, නීලප්‍රභා ඇති පර්වතයෝද; පඤ්ඤායන්ති, පැණෙද්ද; තං න වට්ටති, ඒ නොවේ; තං හි, හේ වනාහි; විතක්කසන්ධාවනස්ස පච්චයො හොති, විතර්කයාගේ සන්ධාවනයට (දිවීමට) ප්‍රත්‍යයවේ; තස්මා, එහෙයින්; ගම්භීරෙ, ගැඹුරුවූ; දරීමුඛෙ, පර්වතවිවරයෙහි; වනපටිච්ඡන්නෙ, වෙනෙන් මුවහවූ; හත්ථිකුච්ඡිපබ්භාර මහින්දගුහා සදිසෙ, හස්තිකුක්ෂිප්‍රාග්භාරය මහින්දගුහාය යන මෙවුන් වැනිවූ (මිහිඳුගුහානම් සෑගිරිය මිහිඳුමහසෙන රහත් විසූ ගුහාය) සෙනාසනෙ වසිතබ්බං, සෙනාසනයෙහි විසියයුතු; ආරම්මණම්පි, අරමුණුද; අස්ස, මොහුට; විපුලං, මහත්වූයේ; න වට්ටති, නො

වටී; තාදිසංහි, එබඳුවූයේ; විතක්ක ධාවනාය, විතර්ක වශයෙන් දිවීමට; පච්චයොහොති, ප්‍රත්‍යයවේ; පරිත්තං පන, පරිත්ත කසිණ වනාහි (සුප්පමත්ත සරාවමත්තාවූයේ යුසේයි) වට්ටති, වටී; සෙසං, සෙසය; රාගචරිතස්ස වුත්තසදිසමෙවාති, රාගචරිතයහට කියනලද සැපයහා සමවූයේම වටී; ඉදං, මේ; විතක්කචරිතස්ස සප්පායං, විතර්කචරිතයහට සැපයි; අයං, මේ; අනන්තරො චරියානුකූලභාව එත්ථ, අනන්තරො චරියානුකූලං-යන මෙහි; ආගතචරියානං, ආචාවූ චර්යාවන්ගේ; පභෙද විධාන විභාවන සප්පාය පරිච්ඡෙදතො, ප්‍රභෙද පරිච්ඡෙදය විධාන පරිච්ඡේදය විභාවන පරිච්ඡේදය සප්පාය පරිච්ඡේදය යන මොවුන්ගේ; විත්ථාරෙන, විස්තරයි (මේ රාගචරිතය යනාදීන් ජනනායම විභාවනා නම්වෙයි හගිනු.)

( භා ¶ )

මෝහචරිත ඇත්තාහට අභ්‍යවකාශයට අභිමුඛවූ හෙවත් සතරදිගා පැණෙන ගැහැට නැත්තාවූ සෙනසුන්ම වටනේය යම් සෙනස්නෙක උන්නාහට කිසිවකින් මුවහනොවූ සතරදිසාවන් පැණේද එබඳුමවූ සෙනස්නා සැපවන්නේය ඉරියවු අතුරෙන් සක්මන්කිරීමම වටනේය මේ මොහචරිත ඇත්තාහට අරමුණුද සුලුකුළු පමණවූහෝ මිලාවක් පමණවූහෝ කුඩා අරමුණු නොවටනේය කුමක්හෙයිනයත්? ගැහැටවූ අවකාශයෙහි සිත බොහෝසෙයින් මූළාවනනෙයිනි එහෙයින් සුලුකුළු මිලාවන්ගේ ප්‍රමාණයට සතරඟුල් අගලක් මහත්කොට කරණලද කසිණමණ්ඩලයම වටනේය සෙසු සියල්ල වෙෂචරිතයාහට කියනලද නයින් දතයුතු මේ මෝහචරිත ඇත්තාහට සැපවූ සෙනසුන් ආදියවන්නේයි. ශ්‍රද්ධාචර්‍ය්‍යා ඇත්තාහටද වෙෂචරිතයාහට කියනලද විධාන සියල්ලම සැපවන්නේයි. අරමුණු අතුරෙන් මෛත්‍රී බුද්ධානුස්සති ආදී සදෙන සැපවන්නේයි. බුද්ධිචරිතයාහට සැපවූ සෙනසුන් ආදීන් අතුරෙන් මෙනම්දෙයක් නො සැපයයි නැත්තේය හෙයින් සියල්ලම සැපවන්නේයි. විතර්කචරිත ඇත්තාහට විවෘතකරණලද දිශාවන්ට අභිමුඛවූ හෙවත් සතරදිගට පැණෙන සෙනස්නක්ම වටනේය විතර්කචරිත ඇත්තාහට යම් සෙනස්නෙක උන්නාහු සිත්කලු උයන්වනු වන පොකුණුහෝ ගම්නියම්ගම් දනව් පිළිවෙළහෝ නිල්පැහැති කඳු පෙළ් ආදියහෝ පැණේනූ එබඳුවූ මුවහනොකරණලද දශදිශාවන් ඇති සෙනසුන් නොවටනේය කුමක්හෙයිනයත්? එබඳු සෙනසුන් ඒ ඒ අත විතර්කයාගේ දිවීමට කාරණාවන්නේය එහෙයින් ගැඹුරුවූ පබ්බත විවරසෙනාහෝ වනයෙන් මුවහවූ හත්ථිකුච්ඡි පබ්භාරය සෑගිරියෙහි මිහිඳුමහතෙරුන් විසූ ගුහාය යනාදී හැන් වැනි සෙනස්නෙකහෝ විසියයුත්තේය මේ විතර්කචරිත ඇත්තාහට මහත්වූ කසුණු අරමුණුද විතර්කයාගේ ඒ ඒ අත දිවීමට කාරණාවනහෙයින් නොවටනේය එහෙයින් මොහට සුලුකුළු මිලාවන් බඳුවූ සල්ප කසුණු අරමුණක්ම වටනේය සෙසු සියල්ල රාගචරිතයාහට කියනලද ක්‍රමයහා සමානවන්නේයි. මේ විතර්කචරිතයාහට සැපවූ සෙනසුන් ආදියවන්නේයි. මේ වනාහි තමන්ගේ චර්‍ය්‍යාවන්ට අනුකූලවූ යන මෙහි ආචාවූ චර්‍ය්‍යාවන්ගේ ප්‍රභෙද පරිච්ඡෙදය විධාන පරිච්ඡෙදය විභාව

හා පරිච්ඡේදය සප්පාය පරිච්ඡේදය යන මොවුන්ගේ විස්තරවර්ණනය —

( ෂා * )

නච තාව චරියානුකූලං කම්මට්ඨානං සබ්බාකාරෙන ආවිකතං තං හි අනන්තරස්ස මාතිකා පදස්ස විත්ථාරෙ සයමෙව ආවිභවිස්සති තස්මා යං වුත්තං චත්තාලීසාය කම්මට්ඨානෙසු අඤ්ඤතරං කම්මට්ඨානං ගහෙත්වාති එත්ථ සඞ්ඛාත නිද්දෙසතො උපචාරප්පනාවහතො ඣානප්පභෙදතො සමතික්කමතො වඩ්ඪනාවඩ්ඪනතො ආරම්මණතො භූමිතො ගහණතො පච්චයතො චරියානුකූලතොති ඉමෙහි තාව දසහි ආකාරෙහි කම්මට්ඨාන විනිච්ඡයො වෙදිතබ්බො — තත්ථ සඞ්ඛාත නිද්දෙසතොති චත්තාලීසාය කම්මට්ඨානෙසු ඉතිහි වුත්තං තත්‍රිමානි චත්තාලීස කම්මට්ඨානානි දසකසිණා දස අසුභා දස අනුස්සතියො චත්තාරො බ්‍රහ්මවිහාරා චත්තාරො ආරුප්පා එකා සඤ්ඤා එකං වවත්ථානන්ති — තත්ථ පඨවි කසිණං ආපොකසිණං තෙජොකසිණං වායොකසිණං නීලකසිණං පීතකසිණං ලොහිතකසිණං ඔදාතකසිණං ආලොකකසිණං පරිච්ඡින්නාකාසකසිණන්ති ඉමෙ දස කසිණා — උද්ධුමාතකං විනීලකං විපුබ්බකං විච්ඡිද්දකං වික්ඛායිතකං වික්ඛිත්තකං හතවික්ඛිත්තකං ලොහිතකං පුළුවකං අට්ඨිකන්ති ඉමෙ දස අසුභා — බුද්ධානුස්සති ධම්ම සඞ්ඝ සීල චාග දෙවතානුස්සති මරණස්සති කායගතාසති ආනාපානස්සති උපසමානුස්සතීති ඉමා දස අනුස්සතියො — මෙත්තා කරුණා මුදිතා උපෙක්ඛාති ඉමෙ චත්තාරො බ්‍රහ්මවිහාරා ආකාසානඤ්චායතනං විඤ්ඤාණඤ්චායතනං ආකිඤ්චඤ්ඤායතනං නෙවසඤ්ඤානාසඤ්ඤායතනන්ති ඉමෙ චත්තාරො ආරුප්පා — ආහාරෙ පටිකූලසඤ්ඤා එකා සඤ්ඤා චතුධාතු වවත්ථානං එකං වවත්ථානන්ති එවං සඞ්ඛාතනිද්දෙසතො විනිච්ඡයො වෙදිතබ්බො —

( ෂ * )

චරියානුකූලං කම්මට්ඨානං, චරියානුකූලවූ කමටහන; සබ්බාකාරෙන, හැම ආකාරයෙන්; නචතාව ආවිකතං, තව පහළනොකරණලදී (සමහර කසිණානුස්සතිට්ඨාන කෙණෙකුන් සත්ප්‍රාය ප්‍රසඞ්ගහෙයින් නචතාව චරියානුකූලං යනාදී කීහයි හඟනේ) තං හි, ඒ චරියානුකූලයහා කමටහන; අනන්තරස්ස මාතිකාපදස්ස විත්ථාරෙ, අනතුරෙහි කියනලද මාතෘකා පදයාගේ විස්තරයෙහි; සයමෙව ආවිභවිස්සති, තෙමෙම පහළවේ; තස්මා, එහෙයින්; චත්තාලීසාය කම්මට්ඨානෙසු, සතලිස් කමටහනුන්කෙරෙහි; අඤ්ඤතරං කම්මට්ඨානං ගහෙත්වාති, එක්තරා කමටහනක් ගෙණයයි; යංවුත්තං (යි යොදනු) යමක් කියනලදද; එත්ථ, මෙහි; සඞ්ඛාතනිද්දෙසතො, සතළිසෙකැයි සඞ්ඛ්‍යා වශයෙන් ගැනීමයන්ගේ නිර්දේශහෙයින්ද; උපචාරප්පනාවහතො, (මෙතෙක්දෙන උපචාරධ්‍යාන එළවති මෙතෙක්දෙන අර්පණාධ්‍යාන එළවතියි) මෙසේ උපචාරාර්පණා වහබැවින්ද; ඣානප්පභෙදතො (මෙතෙක්දෙන එකධ්‍යානිකයහ මෙතෙක්දෙන ත්‍රිකධ්‍යානිකයහ මෙතෙක්දෙන සකලධ්‍යානිකයහයි මෙසේ) ධ්‍යානප්‍රභෙදහෙයින්ද; සමතික්කමතො (මේ කමටහනුන්කෙරෙහි අඞ්ග සමතික්‍රමය මොවුන්කෙරෙහි ආලම්බන සමතික්‍රමයයි මෙසේ) සමතික්‍රමහෙයින්ද; වඩ්ඪනාවඩ්ඪනතො (මෙතෙක්දෙන වැඩියයුත්තාහ මෙතෙක්දෙන නොවැඩියයුත්තාහයි මෙ

ත් වැඩියයුතු නොවැඩියයුතුහෙයින්ද; ආරම්මණතො (ස්වභාව ධර්මාලම්බනය නිමිත්තාලම්බනය නවත්තව්‍යාලම්බනය චලිතාලම්බනය අචලිතාලම්බනය යනාමොවුන්ගේ වශයෙන්) ආලම්බන විභාගහෙයින්ද; භූමිතො, කාමාවචරාදි භූමිවිභාගහෙයින්ද; ගහණතො (මොහු දෘෂ්ටයෙන් ගතයුත්තාහ මොහු ස්පෘෂ්ටව්‍යයෙන් ගතයුත්තාහයි යනාදීන්) ග්‍රහණහෙයින්ද; පච්චයතො, ආරුප්පාදීන්ට යථාහියෙන් ප්‍රත්‍යයභාවයෙන්ද; චරියානුකූලතො, චරිතාදීන්ට අනුකූලහෙයින්ද; ඉමෙහි තාව දසහි ආකාරෙහි, මේ දශආකාරයෙන්; කම්මට්ඨාන විනිච්ඡයො වෙදිතබ්බො, කමටහන් විනිශ්චය දතයුතුයි; තත්‍ර, ඒ දශප්‍රකාරයෙහි (සඞ්ඛාත නිද්දෙසතොයනෙනනි) චත්තාළීසාය කම්මට්ඨානෙසු ඉතිහි වුත්තං, සතළිස් කමටහනුන්කෙරෙහියයි මෙසේ කියනලදද; තත්‍ර, එහි; ඉමානි, මොහු; චත්තාළීස කම්මට්ඨානානි, සතළිස් කමටහන්හුයි; දසකසිණා, දසකසිණයෝ; දස අසුභා, දශ අශුභයෝ; දසානුස්සතියො, දසානුස්මෘතීහු; චත්තාරො බ්‍රහ්මවිහාරා, සතර බ්‍රහ්මවිහාරයෝ; චත්තාරො ආරුප්පා, සතර ආරුප්‍යයෝ; එකාසඤ්ඤා, එකම සංඥාවෙක; එකං චවත්ථානන්ති, එකම ව්‍යවස්ථානයෙකැයි= තත්‍ථ, එහි; පඨවි කසිණං, පඨවි කසිණ—පෙ—පරිච්ඡින්නාකාස කසිණන්ති, පිරිසුත් අහස් කසිණය යනමොහු; දසකසිණා, දසකසිණයෝ නම්වෙත්; උද්ධුමාතකං, උද්ධුමාතක අසුභය—පෙ—අට්ඨිකන්ති, ඇටීක අශුභයයි; ඉමෙ,මොහු; දස අසුභා, දශ අශුභයෝනම්වන්නාහුයි; බුද්ධානුස්සති, බුද්ධානුස්මෘතිය—පෙ—උපසමානුස්සතීති, උපසමානුස්මෘතියයි; ඉමා, මොහු; දස අනුස්සතියො, දශානුස්මෘති නම්වෙත්; මෙත්තා, මෛත්‍රිය; කරුණා, කරුණාය; මුදිතා, මුදිතාය, උපෙක්ඛා, උපෙක්ෂාය යන; ඉමෙ චත්තාරො බ්‍රහ්මවිහාරා නාම, මොහු සතර බ්‍රහ්මවිහාරයෝ නම්වෙත්; ආකාසානඤ්චායතනං, ආකාසානඤ්චායතනය; විඤ්ඤාණඤ්චායතනං, විඤ්ඤාණඤ්චායතනය; ආකිඤ්චඤ්ඤායතනං, ආකිඤ්චඤ්ඤායතනය; නෙවසඤ්ඤානාසඤ්ඤායතනන්ති, නෙවසඤ්ඤානාසඤ්ඤායතනයයි; ඉමෙ, මොහු; චත්තාරො ආරුප්පා, සතර ආරූප්‍යයෝ නම්වෙත්; ආහාරෙ පටික්කූල සඤ්ඤා, ආහර පිළිකුල් සංඥතොමෝ; එකා සඤ්ඤා නාම, එක් සංඥ නම්වෙයි; චතුධාතුවවත්ථානං, සතරධාතූන්ගේ ව්‍යවස්ථාව; එකං වවත්ථානන්ති, එක් ව්‍යවස්ථාන නමැයි; එවං, මෙසේ; සඞ්ඛාත නිද්දෙසතො විනිච්ඡයො වෙදිතබ්බො, සඞ්ඛ්‍යාත නිර්දේශහෙයින් විනිශ්චය දතයුතු—

( භා* )

තවද චයනීවන්ට සුදුසුවූ කර්මස්ථානය මේතාක් සර්වප්‍රකාරයෙන් ප්‍රකාශ නොකරණලද්දේය ඒ කමටහණ වනාහි අනතුරුව කියනලද මාත්‍රාපදයාගේ විස්තරයෙහි නොමෙම ප්‍රකාශවන්නේය එහෙයින් සතළිස් කර්මස්ථානයන් අතුරෙන් එක්තරා කමටහණක් ගෙණයයි යන යමක් කියනලදද මෙතැන් පටන් ඒ චයනීයෙහි සතළිසකැයි ගණන්වශයෙන් ගන්නාලදුවූන්ගේ නිර්දේශවශයෙන්ද මෙතෙක් කර්මස්ථානයෝ උපචාරධ්‍යාන එළවන් මෙතෙක් කර්මස්ථානයෝ අර්පණාධ්‍යාන එළවනියි මෙසේ උපචාරාර්පණාධ්‍යාන එළවීම් වශයෙන්ද මෙතෙක් කර්මස්ථානයෝ ප්‍රථමධ්‍යානිකය මෙතෙක් කර්මස්ථානයෝ ත්‍රිකධ්‍යානි

කායක චෙමතෙක්දෙන සහලබ්ධ්‍යානිකය හයි මෙසේ ධ්‍යාන ප්‍රභෙද වශයෙන්ද මෙතෙක් කම්ස්ථානයන් අතුරෙහි අඞ්ගසමතික්‍රමනයඇත්තේය මේතෙක් කම්ස්ථානයන් කෙරෙහි ආලම්බන සමතික්‍රමනය ඇත්තේයයි මෙසේ සමතික්‍රමන වශයෙන්ද මෙතෙක්දෙන වැඩියයුත්තාහ මෙතෙක්දෙන නොවැඩියයුත්තාහයි මෙසේ වැඩියයුතු නොවැඩියයුතු වශයෙන්ද මොහු සභාව ධර්මාලම්බනය නිමිත්තාලම්බනය නවත්තව්‍යාලම්බනය චලිතාලම්බනය අචලිතාලම්බනය යන ආලම්බනයන්ගේ විභාග වශයෙන්ද මොහු කාමාවචර භූමිවන්නෝය මොහු රූපාවචර භූමිවන්නෝය යනාදී භූමි විභාග වශයෙන්ද මොහු දක්නාලද්දහුගේ වශයෙන් ගතයුත්තාහ මොහු ස්පෘෂ්ටව්‍ය වශයෙන් ගතයුත්තාහයි යනාදී ගැණීම් වශයෙන්ද ආරූප්‍යාදීන්ට සුදුසු ප්‍රත්‍යය භාවයෙන්ද චරිතාදීන්ට අනුකූලහෙයින්දයි යනමේ දශාකාරයෙන් කමටහන් විනිශ්චය දතයුතු වන්නේයි ඒ දශප්‍රකාර විනිශ්චයන් අතුරෙන් සතළිසෙකැයි ගණන් වශයෙන් ගන්නාලද්දවුන්ගේ නිර්දේශ වශයෙන් විනිශ්චය කවරයත්? සතළිස් කමටහන් අතුරෙහියයි යම් වචනයක් කියනලදද එහි මේ දතු දක්වන්නේ සතළිස් කම්ස්ථානයෝයි දශ කසිණය දශ අශුභය දශ අනුස්මෘතිය සතර බ්‍රහ්මවිහාරය සතර ආරූප්‍යය එකම සංඥාවය එකම ව්‍යවස්ථානය යනමෙ සමසතළිස කම්ස්ථාන නම් වන්නේයි ඔවුන් අතුරෙන් පඨවී කසිණය ආපො කසිණය තෙජෝ කසිණය වායො කසිණය නීල කසිණය පීත කසිණය ලොහිත කසිණය ඔදාත කසිණය ආලොක කසිණය පරිච්ඡින්නාකාශ කසිණය යනමේ දශය කසිණනම් වෙත් උද්ධුමාතක අසුභය විනීලක අසුභය විපුබ්බක අසුභය විච්ඡිද්දක අසුභය වික්ඛායිතක අසුභය වික්ඛිත්තක අසුභය හතවික්ඛිත්තක අසුභය ලොහිතක අසුභය පුළුවක අසුභය අට්ඨික අසුභය යනමේ දශය අසුභනම්වෙත් බුද්ධානුස්මෘතිය ධර්මානුස්මෘතිය සඞ්ඝානුස්මෘතිය ශීලානුස්මෘතිය ත්‍යාගානුස්මෘතිය දෙවතානුස්මෘතිය මරණානුස්මෘතිය කායගතානුස්මෘතිය ආනාපානානුස්මෘතිය උපසමානුස්මෘතිය යනමේ දශය අනුස්මෘති නම් වෙත්. මෛත්‍රිය කරුණාය මුදිතාය උපෙක්ෂාය යනමේ සතර බ්‍රහ්මවිහාරනම්වෙත් ආකාශානඤ්චායතනය විඤ්ඤාණඤ්චායතනය ආකිඤ්චඤ්ඤායතනය නෙවසඤ්ඤානාසඤ්ඤායතනය යනමෙ සතර ආරූප්‍යනම් වෙත් ආහාරයෙහි ප්‍රතිකූල සංඥාව එකම සංඥා නම සතරධාතුන්ගේ ව්‍යවස්ථානය එකම ව්‍යවස්ථාන නම වේ මේ සතළිසෙකැයි ගණන් වශයෙන් ගන්නාලද්දවුන්ගේ නිර්දේශහෙයින් විනිශ්චය දතයුත්තේයි —

( පා † )

උපචාරප්පනාවහතොති ඨපෙත්වා කායගතාසතිඤ්ච ආනාපානසතිඤ්ච අවසෙසා අට්ඨ අනුස්සතියො ආහාරෙ පටික්කූලසඤ්ඤා චතුධාතුවවත්ථානන්ති ඉමානෙව හි දසකම්මට්ඨානානි උපචාරාවහානි සෙසානි අප්පනාවහානීති එවං උපචාරප්පනාවහතො — ඣානප්පභෙදතොති අප්පනාවහෙසු චෙත්ථ ආනාපානසතියා සද්ධිං දසකසිණා චතුක්කජ්ඣානිකා හොන්ති කායගතාසතියා සද්ධිං දස අසුභා පඨමජ්ඣානිකා පුරිමා තයො බ්‍රහ්මවිහාරා තිකජ්ඣානිකා — චතුත්ථබ්‍රහ්මවිහාරො චත්තාරො ච ආරුප්පා චතුක්කජ්ඣානිකාති එවං ඣානප්ප

භෙදතො — සමතික්කමතොති ද්වෙ
සමතික්කමා අඞ්ගසමතික්කමො ච ආර
ම්මණසමතික්කමො ච තත්‍ථ සබ්බෙසුපි
තික චතුක්කජ්ඣානිකෙසු කම්මට්ඨා
නෙසු අඞ්ගසමතික්කමො හොති විත
ක්ක විචාරාදීනි ඣානඞ්ගානි සමතික්ක
මිත්වා තෙසෙවාරම්මණෙසු දුතිය
ජ්ඣානාදීනං පත්තබ්බතො තථා චතු
ත්‍ථ බ්‍රහ්මවිහාරෙ — සොපිහි මෙත්තා
දීනං යෙව ආරම්මණෙ සොමනස්සං
සමතික්කමිත්වා පත්තබ්බොති චතුසු
පන ආරුප්පෙසු ආරම්මණ සමතික්ක
මො හොති පුරිමෙසු හි නවසු කසිණෙ
සු අඤ්ඤතරං සමතික්කමිත්වා ආකාස
ානඤ්චායතනං පත්තබ්බං ආකාසාදී
නි සමතික්කමිත්වා විඤ්ඤාණඤ්චායත
නාදීනි සෙසෙසු සමතික්කමො නත්‍ථි
ති එවං සමතික්කමතො —

---

( ස † )

"උපචාරප්පනාවහතො" යන්නෙ
හි; කායගතාසතිඤ්ච, කායගතානුස්මෘ
තියද; ආනාපානසතිඤ්ච, ආනාපානා
නුස්මෘතියද; ඨපෙත්වා, තබා; අවසෙ
සට්ඨ අනුස්සතියො, අවශෙෂ අට අ
නුස්මෘතිහුද; ආහාරෙ පටික්කූල ස
ඤ්ඤඤ්ච, ආහාරයෙහි පිළිකුල් සංඥව
ද; චතුධාතු වවත්ථානන්ති, චතුර්ධාතු
ව්‍යවස්ථාවද යන; එත්‍ථ, මේ කමටහ
ණුන්කෙරෙහි; ඉමානෙව හි දස ක
ම්මට්ඨානානි, මේ දශ කමටහන්හුම;
උපචාරාවහානි, උපචාරධ්‍යාන එළ
වන්නාහුය; සෙසානි, සෙසෙසෝ; අප්ප
නාවහානීති, අර්පණා එළවන්නාහයි;
එවං උපචාරප්පනාවහතො, මෙසේ
උපචාරාර්පණාවහ බැවින් — පෙ —
"ඣානප්පභෙදතො" යනෙනහි, අප්ප
නාවහෙසුවෙත්‍ථ, අර්පණාවහවූ මේ කම
ටහණුන්කෙරෙහිදු; ආනාපානසතියා
සද්ධිං, ආනාපානානුස්මෘතියහා සමග;
දසකසිණා, දසකසිණුහු; චතුක්ක
ජ්ඣානිකානිහොන්ති, සතර රූපාවච
රධ්‍යානයන් ඇත්තාහුවෙත් (මේ ච
තුෂ්කනයෙහෙයින් කීහු) කායගතාස
තියා සද්ධිං, කායගතාසතියහා සමග;
දස අසුභා, දශ අශුභයෝ; පඨමජ්ඣා
නිකා, ප්‍රථමධ්‍යාන ඇත්තාහුවෙත්;
පුරිමා තයො බ්‍රහ්මවිහාරා, පළමු තුන්
බ්‍රහ්මවිහාරයෝ; තිකජ්ඣානිකා, ආදි
යෙහි කී ධ්‍යානයන් තුන්දෙනා ඇත්
තාහුයි; චතුත්‍ථ බ්‍රහ්මවිහාරෙ, සතර
වන බ්‍රහ්මවිහාරයද; චත්තාරෙව ආ
රූප්පා, සතර ආරූප්‍යයෝද; චතුක්ක
ජ්ඣානිකා, සතරධ්‍යාන ඇත්තාහු
වෙත් — පෙ — "සමතික්කමොති"
යන; එත්‍ථ, මෙහි; ද්වෙ සමතික්කමා,
සමතික්‍රමනයෝ දෙදෙනෙකි; අඞ්ග
සමතික්කමො ච, අඞ්ගයන්ගේ ඉක්මී
මද; ආරම්මණ සමතික්කමො ච, ආල
ම්බනයන්ගේ ඉක්මීමද්දැයි ("ද්වෙ සමති
ක්කමා" යි යොදනු) තත්‍ථ, ඒ දෙක්
හි; සබ්බෙසුපි, සියලුම; තිකචතුක්ක
ජ්ඣානිකෙසු කම්මට්ඨානෙසු, ත්‍රික
ධ්‍යානිකවූ පූර්ව බ්‍රහ්මවිහාරත්‍රයෙහිද
චතුෂ්කධ්‍යානිකවූ ආනාපාන දසකසි
ණ යන කමටහණුන්කෙරෙහිද; අ
ඞ්ග සමතික්කමො හොති, අඞ්ගයන්
ගේ ඉක්මීමවේ; විතක්කවිචාරාදීනි
ඣානඞ්ගානි සමතික්කමිත්වා, විතර්ක
විචාරාදී ධ්‍යානාඞ්ගයන් ඉක්ම; තෙ
සෙවාරම්මණෙසු, ඒ අරමුණෙහිම;
දුතියජ්ඣානාදීනං, ද්විතීයධ්‍යානාදීන්ගේ;
පත්තබ්බතො, පැමිණියයුතුහෙයිනි;
තථා චතුත්‍ථ බ්‍රහ්මවිහාරෙ, සතරවන
බ්‍රහ්මවිහාරයෙහිදු එසේමැයි; සොපිහි,
ඒ සතරවන බ්‍රහ්මවිහාරයද; මෙත්තා
දීනංයෙව ආරම්මණෙ, මෛත්‍රීආදීන්
ගේ අරමුණෙහිම; සොමනස්සං සම
තික්කමිත්වා, සොමනස්සය ඉක්ම; ප
ත්තබ්බො, පැමිණියයුතු; චතුසු පන

ආරුප්පෙසු, සතර ආරූප්‍යයන් කෙරෙති; ආරම්මණසමතික්කමෝ හොති, ආලම්බනසමතික්‍රමයෙක් වේ; පුරිමේසු හි අට්ඨ කසිණේසු (අහස් කිසුණ හැර) පළමු නවකිසුණෙහි (සෙසුනැහ අහ් කිසුණෙහියසිද ඔදාත කිසුණසෙයින්ම ආලෝක කිසුණ උගුළුවා අරූප සමාපත්ති උපදවනබැවින් එහි ඇතුළුකොට "නව කසිණේසු"යි කීහු) අඤ්ඤතරං සමතික්කමිත්වා, එක්තර කිසුණක් ඉක්ම; ආකාසානඤ්චායතනං පත්තබ්බං, ආකාසානඤ්චායතන ධ්‍යානය පැමිණියයුතු; ආකාසාදීනි ච සමතික්කමිත්වා, ආකාශාදීන් ඉක්ම; විඤ්ඤාණඤ්චායතනාදීනි, විඤ්ඤාණඤ්චායතනාදීහු පැමිණියයුත්තෝයි; සෙසේසු, සෙස්සන්කෙරෙහි; සමතික්කමෝ නත්ථි, සමතික්‍රමය නැති.

( හා † )

උපචාරධ්‍යාන අර්පණාධ්‍යාන එළවීම් වශයෙන් විභාග කවරයත්? කායගතා ස්මෘතිය ආනාපාන ස්මෘතිය යන දෙදෙනා හැර අවශෙෂ අනුස්මෘති අටදෙනාද අහරෙහි පිළිකුල් සංඥාවද චතුර්ධාතු ව්‍යවස්ථානද යන මේ දශකර්මස්ථානයෝ උපචාරධ්‍යාන එළවන්නාහුය යන මොවුන්ගේ වශයෙන් උපචාර අර්පණාධ්‍යාන එළවීම් වශයෙන් විභාග දතයුතුයි.

ධ්‍යාන ප්‍රභෙද වශයෙන් විභාග කවරයත්? අර්පණාධ්‍යාන එළවන්නාවූ මේ කර්මස්ථාන අතුරෙහිදු ආනාපාන ස්මෘතියහා සමග දශ කසිණයෝ සතර රූපාවචරධ්‍යාන ඇත්තාහුය. කායගතාස්මෘතියහා සමග දශ අශුභයෝ ප්‍රථමධ්‍යාන ඇත්තාහුය මෛත්‍රී කරුණාමුදිතා යන තුන් බ්‍රහ්මවිහාරයෝ මූලකී ධ්‍යානයන් තුන්දෙන ඇත්තාහුය සතරවන බ්‍රහ්මවිහාරය සතර ආරූප්‍යයෝය යන මොහු චතුෂ්ක ධ්‍යාන ඇත්තාහුයයි මෙසේ ධ්‍යාන ප්‍රභෙදහෙයින් විභාග දතයුතු.

සමතික්‍රම වශයෙන් විභාග කෙසේ දයත්? අඞ්ගසමතික්‍රමය ආරම්මණ සමතික්‍රමයයි යන දෙදෙනාගේ වශයෙන් සමතික්‍රමය දෙයාකාරවන්නේයි ඒ දෙයාකාරයන් අතුරෙන් ත්‍රිකධ්‍යානිකවූ පළමුවන බ්‍රහ්මවිහාරත්‍රයෙහිද චතුෂ්කධ්‍යානිකවූ ආනාපාන ස්මෘතිය දශ කසිණය යන කර්මස්ථාන සෙහිද අඞ්ගයන්ගේ ඉක්මීම වන්නේය කුමක්හෙයින්දයත්? විතර්ක විචාරධ්‍යානයන් ඉක්ම එම් අරමුණෙහි විතීයධ්‍යානාදීන් උපදවනහෙයිනැයි දතයුතුයි—සතරවන බ්‍රහ්මවිහාරයද එසේමැයි ඒ සතරවන බ්‍රහ්මවිහාරයද මෛත්‍රී ආදීන්ගේ අරමුණෙහි සෞම්නස ඉක්ම පැමිණියයුත්තේයි සතර ආරූප්‍යයෙහි ආලම්බනයන්ගේ ඉක්මීමවන්නේය ආකාශ කසිණය හැර පළමුවන අවශෙෂ නවකසිණයන් අතුරෙන් එක්තර කසිණයක් ඉක්ම ආකාසානඤ්චායතනධ්‍යානයට පැමිණියයුත්තේය ඒ ආකාසානඤ්චායතනාදීන් ඉක්ම විඤ්ඤාණඤ්චායතනාදීන්ට පැමිණිය යුත්තේයි සෙස්සන්කෙරෙහි ඉක්මීමක් නැත්තේනුයි මෙසේ සමතික්‍රම වශයෙන් විභාග දතයුත්තේයි.

( සා ‡ )

වඩ්ඪනාවඩ්ඪනතොති ඉමේසු චත්තාළීසාය කම්මට්ඨානෙසු දස කසිණානෙව වඩ්ඪෙතබ්බානි යත්තකං ඔකාසං කසිණෙන ඵරති තදබ්භන්තරෙ දිබ්බාය සොතධාතුයා සද්දං සොතුං දිබ්බෙන චක්ඛුනා රූපානි පස්සිතුං පරසත්තානඤ්ච චෙතසා චිත්ත

මඤ්ඤාතුං සමත්ථො හොති— කායගතාසති පන අසුභානි ච නවඩ්ඪෙතබ්බානි කස්මා ඔකාසෙන පරිච්ඡින්නත්තා ආනිසංසාභාවාච සාච එතෙසං ඔකාසෙන පරිච්ඡින්නතා භාවනානයෙ ආවි භවිස්සති තෙසු පන වඩ්ඪිතෙසු කුණපරාසියෙව වඩ්ඪති න කොචි ආනිසංසො අත්ථි වුත්තම්පි චෙතං සොපාක පඤ්හබ්‍යාකරණෙ විභූතා භගවා රූපසඤ්ඤා අවිභූතා අට්ඨිකසඤ්ඤාති තත්‍රහි නිමිත්තවඩ්ඪනවසෙන රූපසඤ්ඤා විභූතාති වුත්තා අට්ඨිකසඤ්ඤා අවඩ්ඪනවසෙන අවිභූතාති යං පනෙතං කෙවලං අට්ඨිකසඤ්ඤාය අඵරිං පඨවිං ඉමන්ති වුත්තං තං ලාභිස්ස සතො උපට්ඨානාකාරවසෙන වුත්තං යථෙව හි ධම්මාසොකකාලෙ කරවීකසකුණො සමන්තා ආදාසභිත්තීසු අත්තනො ඡායං දිස්වා සබ්බදිසාසු කරවීකසඤ්ඤී හුත්වා මධුරස්සරං නිච්ඡාරෙසි එවං ථෙරොපි අට්ඨිකසඤ්ඤාය ලාභිතාය සබ්බදිසාසු උපට්ඨිතං නිමිත්තං පස්සන්තො කෙවලාපි පඨවි අට්ඨිකපරිතාති චින්තෙසීති යදි එවං යා අසුභජ්ඣානානං අප්පමාණාරම්මණතා වුත්තා සා විරුජ්ඣතීති? සාච නවිරුජ්ඣති එකො හි උද්ධුමාතකෙවා අට්ඨිකෙවා මහන්තෙ නිමිත්තං ගණ්හාති එකෙච්චො අප්පකෙ ඉමිනා පරියායෙන එකච්චස්ස පරිත්තාරම්මණං ඣානං හොති එකච්චස්ස අප්පමාණාරම්මණන්ති යොවා එතං වඩ්ඪනෙ ආදීනවං අපස්සන්තො වඩ්ඪෙති තං සන්ධාය අප්පමාණාරම්මණන්ති වුත්තං ආනිසංසාභාවාපන නවඩ්ඪෙතබ්බානීති— යථාච එතානි එවං සෙසානිපි නවඩ්ඪෙතබ්බානි කස්මා තෙසුහි ආනාපාන නිමිත්තං තාව වඩ්ඪයතො වාතරාසියෙව වඩ්ඪති ඔකාසෙන ච පරිච්ඡින්නං ඉති සාදීනවත්තා ඔකාසෙන ච පරිච්ඡින්නත්තා නවඩ්ඪෙතබ්බං බ්‍රහ්මවිහාරා සත්තාරම්මණා තෙසං නිමිත්තං වඩ්ඪයතො සත්තරාසියෙව වඩ්ඪෙය්‍ය නච තෙන අත්ථො අත්ථි තස්මා තම්පි නවඩ්ඪෙතබ්බං යං පන වුත්තං මෙත්තා සහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වාති ආදි තං පරිග්ගහවසෙන වුත්තං එකආවාස ද්වි ආවාසාදිනාහි අනුක්කමෙන එකිස්සා දිසාය සත්තෙ පරිග්ගහෙත්වා භාවෙන්තො එකං දිසං ඵරිත්වාති වුත්තො න නිමිත්තං වඩ්ඪෙන්තො— පටිභාග නිමිත්තමෙව චෙත්ථ නත්ථි යදයං වඩ්ඪෙය්‍ය පරිත්ත අප්පමාණාරම්මණතාපෙත්ථ පරිග්ගහවසෙනෙව වෙදිතබ්බා— ආරුප්පාරම්මණෙසුපි ආකාසං තාව කසිණුග්ඝාටිමත්තත්තා තං කසිණාපගමවසෙනෙව මනසිකාතබ්බං තතොපරං වඩ්ඪයතොපි න කිඤ්චිහොති විඤ්ඤාණං සභාවධම්මත්තා නසක්කා සභාව ධම්මං වඩ්ඪෙතුං විඤ්ඤාණාපගමො විඤ්ඤාණස්ස අභාවමත්තත්තා නෙවසඤ්ඤානාසඤ්ඤායතනාරම්මණං සභාවධම්මත්තායෙව නවඩ්ඪෙතබ්බං සෙසානි අනිමිත්තත්තා පටිභාගනිමිත්තංහි වඩ්ඪෙතබ්බං නාම භවෙය්‍ය බුද්ධානුස්සති ආදීනඤ්ච නෙව පටිභාග නිමිත්තං ආරම්මණං හොති තස්මා තං නවඩ්ඪෙතබ්බන්ති එවං වඩ්ඪනාවඩ්ඪනතො—

---

( ස ‡ )

ඉමෙසු චත්තාලීසාය කම්මට්ඨානෙසු, මෙ සතළිස් කමටහන් කෙරෙහි; දසකසිණානෙව, දසකසිණයෝම; වඩ්ඪෙතබ්බානි, වැඩියයුත්තාහුයි; යත්තකං ඔකාසං, යම් පමණ අවකා

ශලයක්; හයිමෙණන, කිසුණෙන්; ඵර ශි, ස්ඵරණයකොළේද (කිසුණ පතුරු වාද යන අර්ථයි) හදබිහ හනරෙ, ඒ ද තුරෙහි; දිබ්බාය සොතධාතුයා සද්දං සොතුං, දිව්‍යශ්‍රොත්‍රධාතුවෙන් ශබ්දය අසන්නටද (මෙයින් කිසුණු පැහිරි තැනැමමුත් සෙසු තැන අර් නොව අසයි කීවෙත්) දිබ්බෙන චක්ඛුනා, දිව්‍යනෙත්‍රයෙන්; රූපානි පස්සිතුං, රූප බලනුවටද; පරසත්තානං, පරසත්වයන්ගේද; චෙතසා, සිත; චෙතසා අඤ්ඤත්තයෙව, සිතින් දත්නටද; සමත්ථොහොන්ති, සමර්ථවේ (දිව්‍ය සිත් දක්නාලද හෘදයරූපයැති සත්වයාගේ චිත්තය ආදිකම්මිකතෙනෙහි චෙතොපරිය නුවණින් පිරිසිඳිනට සමර්ථවෙයි අනිකෙකුට නොවේ කිසුණු පැහිරීම චෙතොපරිය ඥාණයටද ප්‍රත්‍යයවේ හුයි "පරසත්තානං......පෙ......"සමත්ථොහොන්ති"යි කියූ) කායගතාසති පන, කායගතාසතියද; අසුභානිච, අශුභයෝද; න වඩ්ඪිතබ්බානි, නොවැඩියයුත්තාහුයි; කස්මා, කුමක්හෙයිනයත්? ඔකාසෙන පරිච්ඡින්නත්තා, අවකාශයෙන් පිරිසුන්හෙයිනි (කායගි ණයි සභාගපරිච්ඡෙදවශයෙන්ද අසුභය හාත්පස්හි පාෂාණ නිමිත්තාදීන් පිරිසුන්හෙයින්ද යන අර්ථයි) ආනිසංසාභාවාච, අනුසස්සුන්ද නැතිහෙයිනි; තෙසං, ඒ කායගතාසති අශුභයන්ගේ; සාව ඔකාසෙන පරිච්ඡින්නතා, ඒ අවකාශයෙන් පිරිසුන් බවද; භාවනාභමෙස ආවිභවිස්සති, භාවනානයෙහි පහළවේ; තෙසු පන වඩ්ඪිතෙසු, ඒ කායගතාසති අශුභයන් වැඩූ කලම; කුණප රාසියෙව වඩ්ඪති, කුණප රාශියම වඩනේයි; න කොචි ආනිසංසො අත්ථි (ඔවුන් වැඩූ කල්හි කුණප රාශියම වඩනාබැවින් නොවැඩුවද කාම රාග විෂ්කම්භනයවනබැවින්) කිසි අනුසසෙක් නැති; ඒතං, මේ වැඩීමෙහි ප්‍රයොජනයක් නැති බව; සොපාක පඤ්හ ව්‍යාකරණෙ, සොපාක ප්‍රශ්න ව්‍යාකරණයෙහි; වුත්තමෙව, වදාරණලදී; භගවා, භගවත්හි; රූපසඤ්ඤා, රූප සංඥතොමෝ; විභූතා, මහත්ව වඩනාලදද (අප්‍රමාණාලම්බනයෙහි පවත්නෙන් පරිච්ඡෙදය යන අර්ථයි) අවිභූතා අට්ඨිකසඤ්ඤා, අස්ථික සංඥතොමෝ අපරිච්ඡින්නයි; තත්‍ර, එහි; නිමිත්තවඩ්ඪනවසෙන, නිමිත්ත වඩන විසින්; රූපසඤ්ඤා, රූපසංඥතොමෝ; විභූතාති වුත්තා, විභූතයයි කියනලදී; අට්ඨිකසඤ්ඤා, අස්ථිකසංඥතොමෝ; අවඩ්ඪනවසෙන, නොවඩන විසින්; අවිභූතානි, අවිභූතයයි කියනලදු; කෙවලං, සියලු; ඉමං පඨවිං, මේ පෘථිවිය; අට්ඨිකසඤ්ඤාය ඵරිත්වා, අස්ථිකසංඥාවෙන් ස්ඵරණය කොළෙමිසි; යං වුත්තංයි (යොදනු) යම් වචනයක් කියනලදද; තං, ඒ වචනය; ලාභිස්ස සතො, ලාභීවූවහුට; උපට්ඨානාකාරවසෙන වුත්තං (බැලු බැලූ අත පෙනෙණබැවින්) වැටහෙන ආකාර වශයෙන් කියනලද (නිමිත්ත වඩ්ඪනවශයෙන් නොපැණේ යන අභිප්‍රායයි) යථෙවනි, යම්සේ; ධම්මාසොකකාලෙ, ධර්මාශොක රජහු කාලයෙහි; කරවීකසකුණො, කරවීකසකුණයෙක්; සමන්තා, හාත්පසින්; ආදාසභිත්තිසු, ආදර්ශ භිත්තියෙහි; අත්තනො ඡායං දිස්වා, තමාගේ ඡායාව දැක; සබ්බදිසාසු, සියලුදිශාහි; කරවීක සඤ්ඤීහුත්වා, කරවීකය යන සංඥ ඇතිව; මධුරං ගිරං නිච්ඡාරෙසි, මධුර ශබ්දය පැවැත්වීය; එවං, එපරිද්දෙන්ම; ථෙරා

පි, නොරගුද; අට්ඨිකසඤ්ඤය ලාභී නතා, අස්ථික සංඥාවසානිශයලද බව හෙයින් (උත්කෘෂ්ට වශීභාව ඇතිහෙයින යන අර්ථයි) සබ්බදිසාසු, සියලු දිගු; උපට්ඨිතං නිමිත්තං පස්සතො, වැටහුණු නිමිත්ත බලන්නේ; නෙව ලාපි පඨවී, සියලු පොළොවතොවේ; අට්ඨිකපරිපූරිනාහි විත්තෙතයි, ඇටින් පිරුණහයි සිතුයු (තෙරහු උත්කෘෂ්ට භාවයට පැමිණිහෙයින් අශුභමණ්ඩලයෙහි අශුභයෙහු මෙහෙයන්නෙකු මෙන් හුන්තැන සිටිතැන ධ්‍යානයට සමවදනාහ එහෙයින්ම තෙරුන්ට නිමිත්තය වඩනාලද්දසේ වැටහිනි) යදි එවං, ඉදින් එසේවිනම් (අසුභ නිමිත්තය නොවඩිනම් යනුභාවයි) අසුභජ්ඣානානං, අශුභධ්‍යානයන්ගේ; යා අප්පමාණාරම්මණතා, යම් අප්‍රමාණාරම්මණබවක්; වුත්තා (දම්සඟුණෙහි) කියනලද්ද; සා විරුජ්ඣතීති, හෝ විරොධවෙසියත්? සා වනවිරුජ්ඣති, හෝද විරුධනොවේ; එකච්චාහි, සමහරකෙණෙක්; මහතෙත, මහත්වූ; උද්ධුමාතකෙවා, උද්ධුමාතක අසුභයෙහිවත්; අට්ඨිකෙවා, ඇටෙකවත්; නිමිත්තංගණ්හාති, නිමිත්තගනී (සියලු සිරුරෙහිහෝ නිමිත්ත ගන්ය යන අර්ථයි) එකච්චො, එකෙක්; අප්පකෙ (ශරීරයෙහි) එකදෙශයෙක (කුඩාරක ශරීරයෙහි හෝ නිමිත්තය ගනී) ඉමිනා පරියායෙන, මේ පර්‍යායෙන්; එකච්චස්ස, එකෙක්හුගේ; පරිත්තාරම්මණං ඣානං හොති, පරිත්තාලම්බනධ්‍යානයවෙයි; එකච්චස්ස, එකෙක්හුගේ; අප්පමාණාරම්මණනි, අප්‍රමාණාලම්බනධ්‍යානයවෙයි; යොවා, යමෙක්හෝ; එතං, මේ අසුභ නිමිත්තය; වඩ්ඪෙත්‍වා ආදීනවං අපස්සන්තො, (අසුභරාසියෙව වඩ්ඪන්ති න කොචි ආනිසංසොති-කියනලද) ආදීනව නොදක්නේ; වඩ්ඪෙති, වඩාද; තං සන්ධාය, උපු සඳහා; අප්පමාණාරම්මණනාහි වුත්තං, අප්‍රමාණාලම්බණයයි කියනලදී; ආනිසංසාභාවා පන, ආනිසංසයක් නැතිහෙයින්; නවඩ්ඪෙතබ්බානීති, නොවැඩියයුත්තාහුයි; යථා ච එතානි, යම්හෙයකින් කායගතාසති දස අසුභ යන මොහු නොවැඩිය යුත්තාහුද; එවං, එපරිද්දෙන්ම; සෙසානිපි, සෙස්සෝද; නවඩ්ඪෙතබ්බානි, නොවැඩියයුත්තාහුයි; කස්මා, කුමක් හෙයිනයත්? තෙසුහි, ඔවුන් කෙරෙන්; ආනාපාන නිමිත්තං, ආනාපාන නිමිත්තය; වඩ්ඪයතො, වඩනුවහට; වාතරාසියෙව වඩ්ඪන්ති, වාතරාශියම වඩී (පිඩු පිණ්ඩාදි වශයෙන් වැටහෙන්නාවූ නිමිත්තය වාත සඞ්ඛාත සන්නිශ්‍රය නුයි "වාතරාසියෙව වඩ්ඪන්ති"යි කීහු) ඔකාසෙනච පරිච්ඡින්නං, නාශිකාග්‍රය උත්තරෝෂ්ඨය යන අවකාශයෙන් පිරිසිදුනාලදී; ඉති, මෙසේ; සාදීනවත්තා, ආදිනව ඇති බැවින්ද; ඔකාසෙන ච පරිච්ඡින්නත්තා, අවකාශයෙන් පරිච්ඡින්නහෙයින්ද; නවඩ්ඪෙතබ්බං, නොවැඩියයුතු; බ්‍රහ්මවිහාරා, සතර බ්‍රහ්මවිහාරයෝ; සත්තාරම්මණා, සත්ත්වයන් අරමුණුකොට ඇත්තාහ; තෙසං, ඒ බ්‍රහ්මයන්ගේ; නිමිත්තං වඩ්ඪයතො, අරමුණු වඩනුවහට; සත්තරාසියෙව වඩ්ඪෙය්‍ය, සත්ත්වරාශියම වැඩෙන්නේය; න ච තෙන අත්ථො අත්ථි, ඒ සත්ත්වරාශිය වැඩීමෙන් (පෘථිවි කසුණු ආදිය වැඩීමෙකිමෙන්) කිසි ප්‍රයොජනයෙක් නැති; තස්මා, එහෙයින්; තම්පි, ඒ සත්ත්වාලම්බනයද; න වඩ්ඪෙතබ්බං, නොවැඩියයුතු; මෙත්තා සහගතෙන චෙතසා, මෛත්‍රීන්යුක්ත චිත්තයෙන්; එකං දිසං ඵරිත්වාහි ආදී, එක් දිගක් පතුරුවාය යනාදී; යං පන වුත්තං (සී යොදනු) යමෙක් වනාහි කියනලද්ද; තං, හේ; පරිග්ගහ

වසෙන වුත්තං, අපරිග්ගහිතභාවතො විහාරයාගේ පරිග්‍රහ වශයෙන් කියන ලදී; එක ආවාස වි ආවාසාදීනාති, එක් අවසෙක හෝ අවසෙක යනාදින්; අනුක්කමෙන, පිළිවෙළින්; එකිස්සා දිසාය ඵරෙන්තා පරිග්ගහනවා, එක් දිශක සතුන් පරිග්‍රහකොට; භාවෙන්තා, වඩන්නේ; එකං දිසං ඵරිත්වා නිවුතෙන්තා, එක් දිශක් ස්ඵරණය කොටයයි කියනලද; න නිමිත්තං වඩ්ඪෙන්තො, නිමිත්තය වඩනුවේ නොවේ; එතු, මේ බ්‍රහ්මවිහාරභාවනා වෙති; පටිභාග නිමිත්තමෙව නත්ථි, ප්‍රතිභාග නිමිත්තයම නැති; යදයං වඩ්ඪෙය්‍ය, යම් ප්‍රතිභාග නිමිත්තයක් මේ යොගී වඩාද (තං පටිභාග නිමිත්තමෙව නත්ථීති යොදනු) එතු, මෙහි; පරිත්ත අප්පමාණාරම්මණතාපි, පරිත්තාලම්බන අප්‍රමාණාලම්බන බවද; පරිග්ගහවසෙනෙව. අල්පානල්ප පරිග්‍රහ වශයෙන්ම; වෙදිතබ්බා, දතයුතු (කතිපය සත්ත්වයන්ගේ පරිග්‍රහ වශයෙන් ප්‍රවෘත්තවූයේ පරිත්තාරම්මණවෙයි බොහෝ සත්ත්වයන්ගේ පරිග්‍රහ වශයෙන් ප්‍රවෘත්තවූයේ අප්‍රමාණාලම්බනවෙයි යන අදහසි) ආරුප්පාරම්මණෙසුපි, අරූප්‍යාලම්බනයන් කෙරෙහිදු; ආකාසං, ආකාශය; කසිණුග්ඝාටිමත්තත්තා, කසුණු ඉගිලිවූතැනබැවින් (නවඩ්ඪෙතබ්බංසි යොදනු) තංහි, ඒ ආකාශය; කසිණාපගම වසෙනෙව, කසිණයාගේ අපගම වශයෙන්ම; මනසිකාතබ්බං (පරිච්ඡෙදාකාස කසිණය පරිච්ඡෙද වශයෙන්) මෙනෙහිකරණු ලැබෙයි (කසුණ ඉගුළු අහස අහස්සෙයින්ම මෙනෙහිකරණු ලැබෙයි මෙසේබැවින් "කසිණාපගමවසෙන" යී කීහු) තතො පරං, එයින් මත්තෙහි; වඩ්ඪයතොපි, වඩනුවහට; න කිඤ්චි හොති, කිසිවෙක් නොවේ (වැඩෙත් නොවේයි යන අදහසි) විඤ්ඤාණං, විඤ්ඤාණය; සභාව ධම්මත්තා, සවභාව ධර්මහෙයින් (නොවැඩියයුතු) න හි සක්කා සභාව ධම්මං වඩ්ඪෙතුං, පරිකල්පිතඅරමුණම වඩන්නට පිළිවන්බැවින් සවභාව ධර්ම වඩනුවට නොමපිළිවනි; විඤ්ඤාණාපගමො, විඤ්ඤාණයාගේ අපගමය; විඤ්ඤාණස්ස අභාවමත්තත්තා, විඤ්ඤාණයාගේ අභාවමාත්‍රයක්හෙයින් (නොවැඩියයුතු) නෙවසඤ්ඤානාසඤ්ඤායතනාරම්මණං, නෙවසඤ්ඤානාසඤ්ඤායතනාලම්බනය; සභාවධම්මත්තායෙව, සවභාව ධර්මහෙයින්ම; න වඩ්ඪෙතබ්බං, නොවැඩියයුතු (ආරූප්‍යයන්ගේ පරිත්තාරම්මණ අප්‍රමාණාලම්බනතාව පරිත්ත කසුණු ඉගුළු අහස්හිද විපුල කසුණු ඉගිලිවූ අහස්හිද ප්‍රවෘත්තින් දතයුතු) සෙසානි, සෙසු බුද්ධානුස්සති ආදීවූ දස කම්මට්ඨානන්හු; අනිමිත්තත්තා, ප්‍රතිභාග නිමිත්ත නැති බැවින් ("නවඩ්ඪෙතබ්බානි"යි යොදනු) පටිභාග නිමිත්තං හි, ප්‍රතිභාග නිමිත්තය; වඩ්ඪෙතබ්බං නාම භවෙය්‍ය, වැඩියයුතු නම්වන්නේයි (කියනු යසමාදණිවී) බුද්ධානුස්සති අදීහඤ්ච, බුද්ධානුස්සති ආදීන්ට වනාහි; නෙව පටිභාග නිමිත්තං ආරම්මණං හොති, පටිභාගනිමිත්තය නොම අරමුණුවේ; තස්මා, එහෙයින්; තං, ඒ බුද්ධානුස්සති ආදි කම්මට්ඨාන; න වඩ්ඪෙතබ්බං, නොවැඩියයුතු.

( හා ‡ )

වැඩීම් නොවැඩීම් වශයෙන් විභාග කවරේදයත්? මේ සමසාළිස් කම්ටහණුන් අතුරෙන් දශ කසිණයෝම වැඩියයුත්තාහුය යම් පමණ අවකාශයෙක කසිණය පතුරුවාද ඒ අතුරෙහි දිව්‍ය කණින් ශබ්ද අසන්නාවද දිව ඇසින් රූප දක්නාවද අන් සත්ත්වයන්ගේ සිත තමාගේ සිතින් පිරිසිඳ දැනගන්

නවද පොහොසත්වන්නේයි කායග
තාසමෘතියද දශ අශුභයෝද නොවැ
ඩියයුත්තාහුය කුමක්හෙයිනයත්? අ
වකාශයෙන් වෙන්කළහෙයින්ද අනු
සස් නැතිහෙයින්දැයි දතයුතු ඒ කාය
ගතාසති අශුභයන්ගේ අවකාශයෙන්
පිරිසුන්බව මතු භාවනා ක්‍රමයෙහි ප්‍ර
කාශවන්නේයි ඒ කායගතාසති අශු
භයන් වැඩූ කල්හි කුණප රාශියම
වඩනාහෙයින්ද නොවැඩූවත් කාම
රාග විෂ්කම්භනයට හෙයින්ද කිසි
අනුසසෙක් නැත්තේය මේ කායගතා
සති අශුභයන් වැඩීමෙන් ප්‍රයෝජන
යක් නැතිබව සොපාක ප්‍රශ්න ව්‍යාක
රණයෙහි වදාරණලද්දේමය හේ කෙ
සේදයත්? භාගයවත්හි රූපසඤ්ඤාව
අප්‍රමාණාලම්බනයෙහි පවත්නාහෙයින්
අතිශයින් ප්‍රකටවන්නේය අශුභ සං
ඥාව අප්‍රකටවන්නේයි එහි නිමිත්ත
වැඩීම් වශයෙන් රූපසංඥාව විභූතය
යිදු අශුභ සංඥාව නොවැඩීම වශ
යෙන් අවිභූතයයිදු කියනලද්දේවැයි
මේ සියලු පෘථිවිතලය අශුභ සංඥා
වෙන් පතුරුවනලද්දෙමියි යම් වචන
යක් කියනලද්දේද ඒ වචනය අශුභ
ක සංඥා ලාභීහට බැලුබැලූ අත පැ
ණෙනබැවින් වැටහෙන ආකාර වශ
යෙන් කියනලද්දේමය නම්සේ ධර්මා
ශෝක රජකාලයෙහි එම රජුගේ රා
ජ මන්දිරයෙහි එක්තරා කුරවී කොවු
ලෙක් ගාන්පතින් කැඩපත් භිත්ති
යෙහි තමාගේ සෙවනැල්ල දැක සි
යලු දිග තොවූලෝය සහ සංඥා ඇති
ව මිහිරි ශබ්ද පැවැත්වූයේද එපරිද්
දෙන්ම සොපාකස්ථවිරයෝද අශුභ
සංඥාව අතිශයින් විශනකළබැවින්
සියලු දිශාභාගයෙහි වැටහුනු නිමිත්
ත බලමින් සියලු පෘථිවිය ඇටයෙන්
ම පිරුණාහයි සිතාසේක ඉදින් අශුභ
නිමිත්තය නොවඩිනම් අශුභධ්‍යාන
යන්ගේ යම් අප්‍රමාණාරම්මණ බවක්
ධම්මසඞ්ගනි පාලියෙහි වදාරණලදද
එයට විරෝධවන්නේ නොවේදැයත්?
ඒද විරුද්ධනොවන්නේය කුමක්හෙ
යිනයත්? ඇතැම්කෙණෙක් මහත්වූ
උද්ධුමාතක අශුභයෙකවත් ඇතැම්ක
වන් නිමිත්තග්‍රහණය කරන්නේය
ඇතැම්කෙණෙක් ශරීරයෙහි එක්
ප්‍රදේශයෙකහෝ කුඩා දරුවෙකුගේ
ශරීරයෙහි හෝ නිමිත්තග්‍රහණය ක
රන්නේය මෙ ක්‍රමයෙන් එකම ධ්‍යා
නය එකෙක්හට සවල්ප අරමුණෙහි
උපදනේය එකෙක්හට අප්‍රමාණාලම්
බනයෙහි උපදනේයි යමෙක්තෙමේ
අශුභනිමිත්තය වැඩීමෙහි දෙස් නො
දැක අශුභ නිමිත්තයම වඩාද ඔහු සඳ
හා අප්‍රමාණාලම්බනයයි වදාරණලද්
දේය. හේ වනාහි අනුසස් නැතිබැ
වින් නොවැඩියයුතුනාහුය යමෙහෙය
කින් කායගතාසමෘති දශ අශුභයෝ
නොවැඩියයුත්තාහුද එපරිද්දෙන්ම
සෙස්සෝද නොවැඩියයුත්තාහුය කු
මක්හෙයිනයත්? ඔවුන් අතුරෙන්
පළමුකොට ආනාපාන නිමිත්තය ව
ඩන්නාහට වාතරාශියම වඩනේය නා
ශිකාවය උඩුතොලය යන අවකාශ
යෙන් වෙන්කරණලද්දේය යනාදී
ආදීනව සහිතබැවින්ද අවකාශයෙන්
වෙන්කරණලදබැවින්ද නොවැඩිය
යුත්තෝය සතර බ්‍රහ්මවිහාරයෝ සත්ව
යන් අරමුණුකොට ඇත්තාහ ඒ බ්‍රහ්ම
යන්ගේ අරමුණුවඩන්නාහට සත්වරා
ශියම වැඩෙන්නේය ඒ සත්වරාශිය වැ
ඩීමෙහි පෘථිවි කසිණාදිය වැඩීමෙහි
මෙන් ප්‍රයෝජන නොවැත්තේය එ
හෙයින් ඒ සත්වාලම්බනයද නොවැඩිය
යුත්තේය මෛත්‍රී සහගත සිතින් එක්
දිශාවක් පතුරුවන්නේය යනාදී ය
මක් වදාරණලදද හේ වනාහි නො
ගත්හාලද භාවනා විෂයාගේ ගැණී
ම වශයෙන් කියනලද්දේයි එයි ආවා

සංයක දෙ ආවාසයක යනාදී පිළිවෙළින් එක් දිශාභාගයෙක සත්වයන් ගෙණ භාවනාවඩන්නාහු එක් දිශාභාගයක් පතුරුවන්නේනම් වෙයි කියනලද්දේය එනකුදුවුවත් නිමිත්තය වඩන්නේනොවෙයි මේ බ්‍රහ්මවිහාර භාවනාවෙහි යොගාවචරතෙම යම් ප්‍රතිභාග නිමිත්තක් උඩාද ඒ ප්‍රතිභාග නිමිත්තම නැත්තේය මේ බ්‍රහ්මවිහාර භාවනාවෙහි පරිත්තාලම්බන අප්‍රමාණාලම්බන බවද යොගාවචරයාගේ ස්වල්ප වශයෙන්හා බොහෝ වශයෙන් ගැන්මෙන්ම හෙවත් සත්වයන් කීපදෙනෙකුගේ ගැන්මි වශයෙන් පැවැත්තේනම් පරිත්තාලම්බනද බොහෝ සත්වයන්ගේ ගැන්මි වශයෙන් පැවැත්තේනම් අප්‍රමාණාලම්බනද වන්නේයයි දතයුතුයි. අරූපතාලම්බනයන් කෙරෙහිදු ආකාශය කිසුණු ඉගුළුනැනබැවින් නොවැඩියයුත්තේයම් ආකාශය කසිණයාගේ පහවීම් වශයෙන් පරිච්ඡෙදාකාශය පරිච්ඡෙද වශයෙන්ද කිසුණු ඉගුළු අහස අහසසෙයින්ද මෙනෙහි කටයුත්තේය ඉන් මත්තෙහි වඩන්නාහටද කිසිවක් නොවඩනේයි විඥානය ස්වභාව ධර්මබැවින් නොවැඩියයුත්තේය යම්සින් පිළිවෙළකරණලද අරමුණම වඩන්නට පිළිවන්බැවින් ස්භාව ධර්මය නොවැඩියහැක්කේමය විඥාණයාගේ පහවීම විඥානයාගේම අභාවමාත්‍රයක්බැවින් නොවැඩියයුත්තේය නෙවසඤ්ඤා නාසඤ්ඤායතනාලම්බන ස්භාව ධර්මහෙයින්ම නොවැඩියයුත්තේය අවශෙෂවූ බුද්ධානුස්මෘති ආදි දශ කර්මස්ථානයෝ ප්‍රතිභාග නිමිත්ත නැතිබැවින් නොවැඩියයුත්තාහුය සියලුතන්හිම ප්‍රතිභාග නිමිත්ත වැඩියයුතුනොවන්නේය බුද්ධානුස්මෘති ආදීන්ට ප්‍රතිභාගනිමිත්ත අරමුණු නොවනහෙයින් බුද්ධානුස්මෘති ආදී කර්මස්ථාන නොවැඩියයුත්තේයි මෙසේ වැඩීම් නොවැඩීම් වශයෙන් විභාග දතයුතු.

( පා )

ආරම්මණතොති ඉමෙසුච චත්තාලීසාය කම්මට්ඨානෙසු දසකසිණා දස අසුභා ආනාපානස්සති කායගතාසතීති ඉමානි ද්වාවීසති පටිභාගනිමිත්තාරම්මණානි සෙසානි න පටිභාගනිමිත්තාරම්මණානි තථා දසසු අනුස්සතීසු ඨපෙත්වා ආනාපානස්සතිඤ්ච කායගතාසතිඤ්ච අවසෙසා අට්ඨ අනුස්සතියො ආහාරෙ පටික්කූලසඤ්ඤා චතුධාතුවවත්ථානං විඤ්ඤාණඤ්චායතනං නෙවසඤ්ඤානාසඤ්ඤායතනන්ති ඉමානි ද්වාදස සභාවධම්මාරම්මණානි දස කසිණා දස අසුභා ආනාපානස්සති කායගතාසතීති ඉමානි ද්වාවීසති නිමිත්තාරම්මණානි සෙසානි ඡ නවත්තබ්බාරම්මණානීති තථා විපුබ්බකං ලොහිතකං පුළවකං ආනාපානස්සති ආපොකසිණං තෙජොකසිණං වායොකසිණං යංච ආලොකකසිණෙසු සූරියාදීනං ඔභාසමණ්ඩලාරම්මණං ඉමානි අට්ඨචලිතාරම්මණානි තානිච ඛො පුබ්බභාගෙ පටිභාගම්පන සන්නිසින්නමෙව හොති සෙසානි නචලිතාරම්මණානීති එවං ආරම්මණතො.

භූමිතොති එත්ථ දස අසුභා කායගතාසති ආහාරෙ පටික්කූලසඤ්ඤාති ඉමානි ද්වාදස දෙවෙසු නප්පවත්තන්ති තානි ද්වාදස ආනාපානස්සතිචාති ඉමානි තෙරස බ්‍රහ්මලොකෙ නප්පවත්තන්ති අරූපභවෙ පන ඨපෙත්වා චත්තාරො ආරුප්පෙ අඤ්ඤං නප්පවත්තති මනුස්සෙසු සබ්බානිපි පවත්තන්ති එවං භූමිතො.

( ඡ ¶ )

ඉමෙසු චත්තාළීසාය කම්මට්ඨානෙසු, මේ සතළිස් කමටහන්හු කෙරෙහි; දසකසිණා, දසකසිණයහ; දස අසුභා, දස අසුභයහ; ආනාපානසති, ආනාපානසමෘතිය; කායගතාසතීති, කායගතාසමෘතියයි; ඉමානි චාවීසති, මොහු දෙවිස්න; පටිභාගනිමිත්තාරම්මණානි, ප්‍රතිභාග නිමිත්තවූ අරමුණෝයි; සෙසානි, සෙසු අටළොස * න පටිභාග නිමිත්තාරම්මණානි, ප්‍රතිභාග නිමිත්ත නොවූ අරමුණෝයි; තථා, එසේම; දසසු අනුස්සතිසු, දශානුස්මෘතීන්කෙරෙහි; ආනාපානසතිච, ආනාපාන සමෘතියද; කායගතාසතිඤ්ච, කායගතා සමෘතියද; ඨපෙත්වා, තබා; අවසෙසා අට්ඨ අනුස්සතියො, සෙසු අට අනුස්මෘතීහුද; ආහාරෙ පටිකූලසඤ්ඤා, අහර පිළිකුල් සංඥවද; චතුධාතු වවත්ථානං, චතුධාතු ව්‍යවස්ථානයද; විඤ්ඤාණඤ්චායතනං, විඤ්ඤාණඤ්චායතනයද; නෙවසඤ්ඤානාසඤ්ඤායතනන්ති, නෙවසඤ්ඤානාසඤ්ඤායතනයද යන; ඉමානි චාදස, මොහු දොළොස්දෙන; සභාව ධම්මාරම්මණානි, ස්වභාව ධර්මවූ අරමුණහ; දසකසිණා, දස කසුණහ; දස අසුභා, දස අසුභයහ; ආනාපානසති, ආනාපාන සමෘතිය; කායගතාසතීති, කාය ගතා සමෘතියයි; ඉමානි චාවීසති, මොහු දෙවිස්ස; නිමිත්තාරම්මණානි, ප්‍රතිභාග නිමිත්තවූ අරමුණෝයි; සෙසානිච, සතර බ්‍රහ්මවිහාරයහ ආකාශානඤ්චායතනය විඤ්ඤාණඤ්චායතනය යන මේ සදෙන; නවත්තබ්බාරම්මණානි, ප්‍රඥප්තිවූ අරමුණෝයි; තථා, එසේම; විපුබ්බකං, පුයාදිවැහෙන අසුභය; ලොහිතකං, ලෙහලේ ඇති අසුභය; පුළවකං, කෘමීන්වැහෙන අසුභය; ආනාපානසති, ආනාපානසමෘතිය; ආපොකසිණං, ආපොකසුණුය; තෙජොකසිණං, තෙජොකසුණුය; වායොකසිණං, වායො කසුණුය; ආලොකකසිණෙසු, ආලොක කසිණයන්කෙරෙහි; සුරියාදීනං, සූර්‍ය්‍යාදීන්ගේ; යංච ඔභාසමණ්ඩලාරම්මණං, යම් අවභාසමණ්ඩල සංඛ්‍යාතවූ අරමුණෙක් ඇද්ද; ඉමානි අට්ඨ, මොහු අටදෙන; චලිතාරම්මණානි, සැලෙන අරමුණෝයි (එහි වැහෙන පූයා ඇතිවනබැවින් විපුබ්බකයද වැහෙන ලෙහෙ ඇතිහෙයින් ලොහිතකයද කෘමීන් සැලෙනහෙයින් පුළවකයද චලිතාලම්බනයයි කියනලදහ—වාත පාණච්ඡිද්‍රාදීන් අතතෘ ප්‍රවිෂ්ට සූර්‍ය්‍යාලොකාදීහුගේ චලනාකාරය පැණෙනහෙයින්-අවභාෂමණ්ඩලාලම්බනය චලිතාලම්බනයයි කියනලදි සෙස්ස වූත්තෙ[illegible] ලිත බව ප්‍රකටමැයි) තානිච, ඔහු [illegible]පුබ්බභාගෙ, ප්‍රතිභාග නිමිත්තොත්පත්තියට පූර්වභාගයෙහිම චලිතාලම්බනනම්වෙයි; පටිභාගම්පන, ප්‍රතිභාගය වනාහි; සන්නිසින්නමෙව හොති, සන්හුන්නේමවේ (නිශ්චලවේ යන අර්ථයි) සෙසානි, සෙසෝ; අචලිතාරම්මණානි, අචලිතාලම්බන වෙත්; දස අසුභා, දස අසුභයහ; කාය

* “නොහොත් සතර බ්‍රහ්මවිහාරයහ ආකාශානඤ්චායතනය ආකිඤ්චඤ්ඤායතනය යන සදෙන” යන වාක්‍යගම සියලු සන්නවලම මෙහි දක්නා ලැබෙන නමුත් චේතනට නොගැළපේ මෙසේවීමට හේතුව එම ටීකාවේ “සෙසානීති අට්ඨාරස සෙසානිපි නවත්තබ්බාරෙ බ්‍රහ්මවිහාරා ආකාසානඤ්චායතනං ආකිඤ්චඤ්ඤායතනන්ති ඉමානි සෙසානිපි” යන වාක්‍යගම බලා[illegible]ණයයි සිතමිහ. මේ විස්තරකාළේ “සෙසානි න පටිභාග නිමිත්තාරම්මණානි” යන තැනත් “සෙසානිපි නවත්තබ්බාරම්මණානි” යන තැනත් ආ ‘සෙස’ ශබ්ද දෙකම්[illegible]. මැතදී කවුදෝ මුලින්ම ‘සෙස’ ශබ්දයේ අර්ථමයයි සිතා අවුල්කර තිබේ. විමසා ගතයුතුයි

ගතාසති, කායගතාසමෘතිය; ආහාරෙ පටිකූලසඤ්ඤති, අහර පිළිකුල් සංඥාව යන; ඉමානි වාදස, මොහු දෙලොස්දෙන; දෙවෙසු, කාමාවචරදෙව්ලොව; නප්පවත්තනාහි (අසුභ සහද ප්‍රතිකූලාහාරයද ඉහිනැතිබැවින්) නොපවතිත්; තානි වාදස, මොහු දොළසද; අනාපානසතිචානි (බඹලොව ආශ්වාසප්‍රාශ්වාස නැතිබැවින්) ආනාපානසතිය යන; ඉමානි තෙරස, මොහු තෙළෙස්දෙන; බ්‍රහ්මලොකෙනප්පවත්තනාත්, බඹලොව නොපවතිත්; අරූපභවෙ පන, අරූපභවයෙහි වනාහි; ඨපෙත්වා චත්තාරො ආරුප්පෙ, සතර ආරූප්‍යයන් තබා; අඤ්ඤං නප්පවත්තති, අනිකෙක් නොපවතී; මනුස්සෙසු, මිනිස්ලොව; සබ්බානි පවත්තන්තීති, සැමදෙනම පවත්නාහුයි.

( හා ¶ )

අරමුණු වශයෙන් විභාග කෙසේද යත්? මේ සමසාළිස් කම්ටහණුන් අතුරෙන් දස කසිණය දශ අශුභය ආනාපානසමෘතිය කායගතාසමෘතිය යනමේ දෙවෙසි කම්ස්ථානයෝ ප්‍රතිභාග නිමිත්ත අරමුණුකොට ඇත්තාහුය අවශෙෂවූ කම්ටහන්හු ප්‍රතිභාග නොවූ නිමිත්ත අරමුණුකොට ඇත්තාහුය එසේම දශ අනුස්මෘතීන් අතුරෙන් ආනාපාන සමෘතිය කායගතා සමෘතිය යන දෙදෙන හැර සෙසු අටදෙනාය අහර පිළිකුල් සංඥාවය චතුධාතු ව්‍යවස්ථානය විඤ්ඤාණඤ්චායතනය නෙවසඤ්ඤා නාසඤ්ඤායතනය යන මොහු දෙළොස්දෙන ස්වභාව ධර්ම යන් අරමුණුකොට ඇත්තාහුය දශ කසිණය දශ අශුභය ආනාපාන සමෘතිය කායගතාසමෘතිය යන දෙදෙනහැර සෙසු අට අනුස්මෘතිය යන මෙ දෙවිස්ස නිමිත්තය අරමුණුකොට ඇත්තාහුය. අවශෙෂවූ සතර බ්‍රහ්මවිහාරය ආකාශානඤ්චායතනය විඤ්ඤාණඤ්චායතනය යන සදෙන ප්‍රඥප්තිය අරමුණුකොට ඇත්තාහුය එපරිද්දෙන්ම පුළා වැහෙන අශුභය ලේ වැහෙන අශුභය පණුවන් වැහෙන අශුභය ආනාපානසමෘතිය ආපොකසිණය තෙජොකසිණය වායොකසිණය ආලොක කසිණයෙහි සූර්‍ය්‍යාදීන්ගේ අවභාසමණ්ඩල සඞ්ඛ්‍යාතවූ අරමුණය යන මොහු අටදෙන සැලෙන අරමුණු ඇත්තාහුය ඔව්හුද ප්‍රතිභාග නිමිත්ත ඉපදීමට පූර්වභාගයෙහිම චලිතාලම්බන නම් වන්නාහුය ප්‍රතිභාග නිමිත්ත වනාහි නිශ්චලම වන්නේයි මෙහි නොකී අවශෙෂාලම්බනයෝ අචලිතාලම්බනනම් වෙත්මැයි මෙසේ අරමුණු වශයෙන් විභාග දතයුතුයි.

භූමිවශයෙන් විභාග කෙසේදයත්? මෙහි වනාහි දශ අශුභය කායගතාසමෘතිය අහර පිළිකුල් සංඥාවය යන මොහු දෙළොස්දෙන අශුභයනුදු පිළිකුල් අහරද කාමාවචර දිව්‍යලොකයෙහි නොලැබෙනහෙයින් එහි නොපවත්නාහුය එම දෙළසහා බ්‍රහ්මලොකයෙහි ආශ්වාස ප්‍රාශ්වාස නැතිහෙයින් ආනාපානසමෘතියද යනමේ තෙළෙස්දෙන බඹලොව නොපවත්නාහුය අරූපල සතරෙහි සතර ආරූප්‍යයන්හැර අනිකෙක් නොපවත්තේය මනුෂ්‍යලොකයෙහි සම්සාළිස් කම්ස්ථානයෝම අනූනව පවත්නාහුය මෙසේ භූමි වශයෙන් විභාග දතයුතු.

( පා ¶ )

ගහණතොති දිට්ඨසුතගහණතොපෙත්ථ විනිච්ඡයො වෙදිතබ්බො. තත්‍ර ඨපෙත්වා වායො කසිණං

සෙසා නවකසිණා දස අසුභානි ඉමානි එකවීසති දිට්ඨෙන ගහෙතබ්බානි පුබ්බභාගෙ චක්ඛුනා ඔලොකෙත්වා ඔලොකෙත්වා නිමිත්තං නෙසං ගහෙතබ්බන්ති අත්ථො — කායගතාසතියං තචපඤ්චකං දිට්ඨෙන සෙසං සුතෙනාති එවං තස්සාරම්මණං දිට්ඨසුතෙන ගහෙතබ්බං — ආනාපානසති ඵුට්ඨෙන වායොකසිණං දිට්ඨඵුට්ඨෙන සෙසානි අට්ඨාරස සුතෙන ගහෙතබ්බානි උපෙක්ඛා බ්‍රහ්මවිහාරො චත්තාරො ආරුප්පාති ඉමානි චෙත්ථ න ආදිකම්මිකෙන ගහෙතබ්බානි සෙසානි පඤ්චතිංස ගහෙතබ්බානීති එවං ගහණතො — පච්චයතොති ඉමෙසු පන කම්මට්ඨානෙසු ඨපෙත්වා ආකාසකසිණං සෙසා නවකසිණා ආරුප්පානං පච්චයා හොන්ති දසාපි කසිණා අභිඤ්ඤානං තයො බ්‍රහ්මවිහාරා චතුත්ථබ්‍රහ්මවිහාරස්ස හෙට්ඨිමං හෙට්ඨිමං ආරුප්පං උපරිමස්ස උපරිමස්ස නෙවසඤ්ඤානාසඤ්ඤායතනං නිරොධසමාපත්තියා සබ්බානිපි සුඛවිහාරවිපස්සනා භවසම්පත්තීනන්ති එවං පච්චයතො — චරියානුකූලතොති චරියානං අනුකූලතොපෙත්ථ විනිච්ඡයො වෙදිතබ්බො — සෙය්‍යථීදං රාගචරිතස්ස තාවෙත්ථ දස අසුභා කායගතාසතීති එකාදස කම්මට්ඨානානි අනුකූලානි දොසචරිතස්ස චත්තාරො බ්‍රහ්මවිහාරා චත්තාරි වණ්ණකසිණානීති අට්ඨ මොහචරිතස්ස විතක්කචරිතස්ස ච එකං ආනාපානසති කම්මට්ඨානමෙව සද්ධාචරිතස්ස පුරිමා ඡ අනුස්සතියො බුද්ධිචරිතස්ස මරණසති උපසමානුස්සති චතුධාතුවවත්ථානං ආහාරෙ පටිකූලසඤ්ඤාති චත්තාරි සෙසකසිණානි චත්තාරො ච ආරුප්පා සබ්බචරිතානං අනුකූලානි කසිණෙසු ච යංකිඤ්චි පරිත්තං විතක්කචරිතස්ස අප්පමාණං මොහචරිතස්සාති එවමෙත්ථ චරියානුකූලතො විනිච්ඡයො වෙදිතබ්බොති —

( ස ¶ )

"ගහණතො" යන්නෙහි; දිට්ඨඵුට්ඨසුතගහණතොපි, දෘෂ්ටව්‍යයෙන් ස්පෘෂ්ටව්‍යයෙන් ශ්‍රුතයෙන් ගැණුම්හෙයිනුදු; එත්, මෙහි; විනිච්ඡයො වෙදිතබ්බො, විනිශ්චය දතයුතු; තත්‍ර, එහි; ඨපෙත්වා වායොකසිණං, වායුකිසුණ හැර; සෙසා නවකසිණා, සෙසු නවකසිණයෝද; දස අසුභානි, දස අසුභයෝදැයි යන; ඉමානි එකූනවීසති, මේනු එකුන් විසිදෙන; දිට්ඨෙන ගහෙතබ්බානි, දෘෂ්ටවූ චක්ෂුව කරණකොටගෙණ උගතයුතුහුයි (උද්ග්‍රහනිමිත්තයෝ ඉපදවියයුත්තාහ යන අර්ථයි) පුබ්බභාගෙ, පූර්වභාගයෙහි; චක්ඛුනා ඔලොකෙත්වා ඔලොකෙත්වා, ඇසින් බලබලා; නෙසං, ඒ කිසුණු ආදීන්ගේ; නිමිත්තං, උද්ග්‍රහනිමිත්ත; ගහෙතබ්බනාහි අත්ථො, ගතයුතුහයි යන අර්ථයි; කායගතාසතියං, කායගතාසතියෙහි; තචපඤ්චකං, තචක්පඤ්චකය; දිට්ඨෙන, දෘෂ්ට චක්ෂුවෙන්ද; සෙසං, සෙස; සුතෙනාති, ශ්‍රාවණවස්තුවෙන්දැයි; එවං, මෙසේ; තස්සාරම්මණං, ඒ කායගතාසති අරමුණ; දිට්ඨසුතෙන ගහෙතබ්බං, දෘෂ්ටශ්‍රාත දෙයින් ගතයුතු; ආනාපානසති, ආනාපානසති කම්ටහන; ඵුට්ඨෙන, පහලතැන්විසින්; වායොකසිණං, වායුකිසුණ; දිට්ඨඵුට්ඨෙන, (ඉක්ෂුසශස්‍යාදීන්ගේ පත්‍රයෙහි චලමානවණ්ණොද්ග්‍රහණ මුඛයෙහි වාතග්‍රාහ්‍යබැවින් දිට්ඨඵුට්ඨෙන යුතු) සෙසානි අට්ඨාරස, සෙසු අටළොස;

ප්‍රජනනගතෙනබ්බානි, ගාතයෙන් ගතයුත්තාහුයි; උපෙක්ඛා බ්‍රහ්මවිහාරෙහි, උපෙක්ෂා බ්‍රහ්මවිහාරයෙද; චත්තාරො ආරුප්පානි, සතර ආරූප්‍යයෝද යන; ඉමානි, මෙහු: එළඹ, මෙකම්මට්ඨාන ශ්‍රුත්කෙනෙරෙනි; ආදිකම්මිකෙන භාග ගෙහතබ්බානි (යට දැක් බ්‍රහ්මවිහාරය වද ක්ෂුණේණි රූපාවචර චතුර්ථධ්‍යාන යවද නොපැමිණ නොඉපදවියහැකි හෙයින් ආදිකර්මිකයා විසින් භාවනාරම්භයෙහි ගණ්නාහා යු නො වෙත්; සෙසානි පනඩිහිංස, සෙසු පන්හිස; ගහෙතබ්බානි, ගතයුත්තාහුයි—"පච්චාගතො" යන්නෙනි; ඉමෙසු පන කම්මට්ඨානෙසු, මේ කමටහ න්හිත්කෙනෙරෙහි (කාමීවට්ඨාන ශබ්දයෙන් යටිහියෙන් ආලම්බණයනුදු ධ්‍යානයනුදු ගතයුතු) ජපෙපෝ ආනා ස ...ණං, නොකුසි ... වියහැකිවැ විත් අභාවිතසුණ භනා; සෙසානවනකිණා, සෙසු නවකිසුණයෝ; ආරුප්පානං ප ච්චයාහොන්ති, ආරූප්‍යයන්ට ප්‍රත්‍යය වෙත්; දසකසිණා, දසකසුණෝම; අභිඤ්ඤානං, අභිඥාවන්ට ප්‍රත්‍යයයෝ වෙත්; තයොපි බ්‍රහ්මවිහාරා, පළමු තුන් බ්‍රහ්මවිහාරයෝ; චතුත්ථ බ්‍රහ්ම විහාරස්ස, සතරවන බ්‍රහ්මවිහාරයට (ප්‍රත්‍යයවෙත්) හෙට්ඨිමං හෙට්ඨිමං ආරුප්පං, යට යට අරූපාවචරය; උපරිම ස්ස උපරිමස්ස, මතුමතු අරූපාවචර යට (ප්‍රත්‍යයවේ) නෙවසඤ්ඤානාසඤ්ඤා යතනං, නෙවසඤ්ඤා නාසඤ්ඤායත නය; නිරොධ සමාපත්තියා, නිරොධ සමාපත්තියට (ප්‍රත්‍යයවේ) සබ්බානිපි, සියල්ලම; සුඛවිහාරා, දෘෂ්ටධර්ම සුඛවිහාර යෝ; නිස්සරණා, නිස්සරණය; භවසම්ප ත්තීනං, භවසම්පත්තීන්ට සහසම්පත්තීන්ට (ප්‍රත්‍යයවෙති) එවං, මෙසේ; පච්චය තො, ප්‍රත්‍යයවශයෙන් (විභාගය දතයුතු) "චරියානුකූලතො" යන්නෙනි, චරියාන අනුකූලතොපි, චරිතයන්ට

අනුකූලතොපිනුදු; එත්ථ, මේ කාර්‍ය්‍යව ශ්‍යයෙහි; විනිච්ඡයො වෙදිත බ්බො, විනිශ්චය දතයුත්තේයි; සෙය්‍යථීදං, සෙය්‍යථීදං; එත්ථ, ඒ රාගාදි චරි තයන්ට යෙදෙන; රාගචරිතස්ස, රාග චරිතයාට; දස අසුභා, දසඅසුභයෝ; කායගතාසතීති, කායගතා සතිය ය න; එකාදස කම්මට්ඨානානි, එකො ළොස් කමටහන්හු; අනුකූලානි (රාග විෂ්කම්භනයට උපායබැවින්) අනුකූ ලයෝයි; දෙසචරිතස්ස, ද්වේෂචරිතය ට; චත්තාරො බ්‍රහ්මවිහාරා, සතර බ්‍රහ්මවිහාරයන; චත්තාරි වණ්ණකසි ණානි, සතරවණී කසුණයන යන; අට්ඨ, අටදෙන (අනුකූලානියි යොද නු) මොහචරිතස්ස, මොහ චරිතයාට ද; විතක්කචරිතස්සච, විතර්කචරිතය ටද; එකං, එකම; ආනාපානසති ක ම්මට්ඨානමෙව, ආනාපානසති කමට හණම (අනුකූලංයි යොදනු) සද්ධා චරිතස්ස, ශ්‍රද්ධාචරිතයාහට; පුරිමාඡ අනුස්සතියො, පළමුවූ බුද්ධානුස්සති ධම්ම සඞ්ඝ සීල චාග දෙවතානුස්සති ය යන අනුස්මෘතීහු සදෙන (අනුකූලා නියි යොදනු—මතු යනිදු මෙමනියේ අනුකූලයෝයි) බුද්ධිචරිතස්ස, බුද්ධි චරි තයාහට; මරණසති, මරණසිහිය; උප සමානුස්සති, උපසම සිහිය; චතුධාතු වවත්ථානං, සතරධාතුන්ගේ ව්‍යවස්ථා නය; ආහාරෙපටික්කූලසඤ්ඤා, අහ රෙහි පිළිකුල් සංඥාය යන; චත්තාරි, සත රදෙන (අනුකූලයෝයි) සෙසකසිණා, වර්ණකසුණු හැර සෙසු කසුණයෝ; ච ත්තාරො ආරුප්පා, සතර ආරූප්‍ය යහ යන මොහු; සබ්බචරිතානං අනු කූලානි, සියලු චරියාවන්ට අනුකූල යෝයි; තං සණ්ඨාපි, කසුණයන්හි පරිත්තං "සුප්පමත්තං සරාවමත්තං" යි කිහනලද යන්නැවි, කවි ... විතක්කචරිතස්ස, විතර්කචරිතයාහට

(අනුකූලය) අප්පමාණං, එයින් වැඩි පමණ ඇත්තේ; මොහචරිතස්සාහි, මොහචරියහට සැපයි; එවං, මෙසේ; එත්ථ, මෙහි; චරියානුකූලතො විනිච්ඡයො වෙදිතබ්බො, චරියානුකූලහෙයින් විනිශ්චය දතයුතු.—

( ගා * )

ග්‍රහණවශයෙන් විභාග කෙසේද යත්? දක්නාලද්දහුගේ වශයෙන්ද ස්පර්ශකරණලද්දහුගේ වශයෙන්ද අසනලද්දහුගේ වශයෙන්ද මෙහි විනිශ්චය දතයුත්තේය එහි වනාහි වායො කසිණයහැර සෙසු නව කසිණයෝය දශ අශුභයෝය යන එකුන්විසිදෙන දක්නාලද වස්තුව කාරණකොටගෙණ උද්ග්‍රහනිමිත්ත ඉපදවිය යුත්තාහුය ඒ එසේමැයි පූර්වභාගයෙහි ඇසින් බලබලා ඒ කසිණාදීන්ගේ උද්ග්‍රහනිමිත්ත ගතයුත්තේය කායගතාසමෘතියෙහි කෙස් ලොම් නිය දත් සම් යන තච්පඤ්චකය දක්නාලද වස්තුවෙන්ද සෙස්ස අසනලද වස්තුවෙන්දැයි මෙසේ ඒ කායගතාසමෘති අරමුණ දෘෂ්ට ශ්‍රැත දෙකින් ගතයුත්තේය ආනාපානසමෘතිය පැහැරගත්නාලද තැන් වශයෙන් ගතයුත්තේය වායො කසිණය උක්ගස් ගොසම්ගස් ආදියේ සැලෙන පත්‍රයන්ගේ වර්ණය ගැණීම්වශයෙන්ද නිමිත්තග්‍රහණය කටයුතුබැවින් දක්නාලද පැහැරගත්නාලද වස්තූන්ගේ වශයෙන් ගතයුත්තේය සෙසු අටළොස් කර්මස්ථානයෝ අසනලද වස්තූන්ගේ වශයෙන්ම ගතයුත්තාහුය උපෙක්ෂා බ්‍රහ්මවිහාරය සතර ආරූප්‍යයෝය යන පස්දෙන යට තුන් බ්‍රහ්මවිහාරයටද රූපාවචර චතුර්ථධ්‍යානයටද නොපැමිණ නොඉපදවියහැකිබැවින් ආදිකර්මික යොගාවචරයා විසින් නොගතයුත්තාහුය සෙසු පන්තිස් කර්මස්ථානයෝම ගතයුත්තාහුමය මෙසේ ග්‍රහණ වශයෙන් විභාග දතයුත්තේයි.—

ප්‍රත්‍යය වශයෙන් විභාග කෙසේද යත්? මේ කර්මස්ථානයන් අතුරෙන් උගුළුවිය නොහැකිබැවින් ආකාශ කසිණයහැර සෙසු නව කසිණයෝ ආරූප්‍යයන්ට ප්‍රත්‍යය වන්නාහුය දශ කසිණයෝම අභිඥාවන්ට ප්‍රත්‍යය වන්නාහුය යට තුන් බ්‍රහ්මවිහාරයෝ සතරවන බ්‍රහ්මවිහාරයට ප්‍රත්‍යයවන්නාහුය යටයට අරූපාවචරය මතුමත්තෙහි අරූපාවචරයටද නෛවසඤ්ඤානාසඤ්ඤායතනය නිරෝධ සමාපත්තියටද සියල්ලම දෘෂ්ටධර්ම සුඛවිහරණයෝ විදර්ශනාවටත් භව සම්පත්තියටද ප්‍රත්‍යයවන්නාහුමය මෙසේ ප්‍රත්‍යයහෙයින් විනිශ්චය දතයුත්තේයි.—

චරිතයන්ට අනුකූල වශයෙන් විනිශ්චය කවරයත්? මෙහි වනාහි චරිතයන්ට සුදුසු පරිද්දෙද යුදු විනිශ්චය දතයුත්තේයි ඒ කෙසේදයත්? යට කියනලද රාගචරිතාදී සදෙනා අතුරෙන් රාගචරිතයාහට දශ අශුභය කායගතාසමෘතිය යන එකොළොස් දෙන රාගවිෂ්කම්භනයට උපායවන බැවින් අනුකූලයෝය සතර බ්‍රහ්මවිහාරය සතර වර්ණ කසිණය යන අටදෙන ද්වේෂචරිතයාහට අනුකූලයෝය එකම ආනාපානසමෘති කර්මස්ථානය මොහචරිත විතර්ක චරිත දෙදෙනාහට අනුකූලවන්නේය බුද්ධානුස්මෘති ධර්මානුස්මෘති සංඝානුස්මෘති ශීලානුස්මෘති ත්‍යාගානුස්මෘති දෙවතානුස්මෘති යන සදෙන ශ්‍රද්ධා චරිතයාහට අනුකූලයෝයි.—

බුද්ධිචරිත ඇත්තාහට මරණානුස්මෘතිය උපසමානුස්මෘතිය චතුර්ධාතු ව්‍යවස්ථානය ආහාරෙපටිකූල සංඥාව යන

සතර කසිණයන්හු අනුකූලවන්නාහු ය වර්ණකසිණය හැර සෙසු කසිණ යෝය සතර ආරූප්‍යයෝය යනමොහු සියලු චරිත ඇත්තවුන්ටම අනුකූලවන්නාහුය කසිණයන් අතුරෙහිද සුලුකුළුඵලාවන්බඳුවූ යම්කිසි ස්වල්ප මාත්‍රවූ කසිණාරම්මණක්ම විතර්කචරිත ඇත්තාහට අනුකූලවන්නේය ඉන් වැඩි ප්‍රමාණ ඇති කිසුණු විපුලූ මෝහ චරිත ඇත්තාහට සැපයෙයි මෙසේ මෙහි චරිතයන්ට අනුකූල වශයෙන් විනිශ්චය දතයුත්තේයි.—

( පා † )

සබ්බඤ්චෙතං උජුවිපච්චනීකවසෙන ච අතිසප්පායවසෙන ච වුත්තං රාගාදීනං පන අවික්ඛම්භකා සද්ධාදීනං වා අනුපකාරා කුසලභාවනා නාම නත්ථි වුත්තම්පිචෙතං මෙඝියසුත්තෙ චත්තාරො ධම්මා උත්තරි භාවෙතබ්බා රාගස්ස පහානාය මෙත්තා භාවෙතබ්බා ව්‍යාපාදස්ස පහානාය ආනාපානස්සති භාවෙතබ්බා විතක්කුපච්ඡෙදාය අනිච්චසඤ්ඤා භාවෙතබ්බා අස්මිමානස මුග්ඝාතායාති—රාහුලසුත්තෙපි මෙත්තං රාහුල භාවනං භාවෙහීති ආදිනා නයෙන එකස්සෙව සත්ත කම්මට්ඨානානි වුත්තානි තස්මා වචනමත්තෙ අභිනිවෙසං අකත්වා සබ්බත්ථ අධිප්පායො පරියෙසිතබ්බොති—අයං කම්මට්ඨානං ගහෙත්වාති එත්ථ කම්මට්ඨාන කථා විනිච්ඡයො.—

ගහෙත්වාති ඉමස්ස පන පදස්ස අයං අත්ථපරිදීපනා තෙන යොගිනා කම්මට්ඨාන දායකං කල්‍යාණමිත්තං උපසඞ්කමිත්වාති එත්ථ වුත්ත නයෙන වුත්තප්පකාරං කල්‍යාණමිත්තං උපසඞ්කමිත්වා බුද්ධස්ස වා භගවතො ආචරියස්ස වා අත්තානං නිය්‍යාතෙත්වා සම්පන්නජ්ඣාසයෙන සම්පන්නාධිමුත්තිනා ච හුත්වා කම්මට්ඨානං යාචිතබ්බං—තත්ථ ඉමාහං භගවා අත්තභාවං තුම්හාකං පරිච්චජාමීති එවං බුද්ධස්ස භගවතො අත්තා නිය්‍යාතෙතබ්බො—එවඤ්හි අනිය්‍යාතෙත්වා පන්තෙසු සෙනාසනෙසු විහරන්තො භෙරවාරම්මණෙ ආපාථමාගතෙ සන්ථම්භිතුං අසක්කොන්තො ගාමන්තං ඔසරිත්වා ගිහීහි සංසට්ඨො හුත්වා අනෙසනං ආපජ්ජිත්වා අනයබ්‍යසනං පාපුණෙය්‍යාපි නිය්‍යාතිතත්තභාවස්ස පනස්ස භෙරවාරම්මණෙ ආපාථමාගතෙපි භයං න උප්පජ්ජති නනු තයා පණ්ඩිත පුරිමමෙව අත්තා බුද්ධානං නිය්‍යාතිතොති පච්චවෙක්ඛතො පනස්ස සොමනස්සමෙව උප්පජ්ජති යථාහි පුරිසස්ස උත්තමං කාසිකං වත්ථං භවෙය්‍ය තස්ස තං මූසිකාය වා කීටෙහි වා ඛාදිතෙ උප්පජ්ජෙය්‍ය දොමනස්සං සචෙ පන තං අචීවරිකස්ස භික්ඛුනො දදෙය්‍ය අථස්ස තං තෙන භික්ඛුනා ඛණ්ඩාඛණ්ඩං කයිරමානං දිස්වාපි සොමනස්සමෙව උප්පජ්ජෙය්‍ය එවං සම්පදමිදං වෙදිතබ්බං—

( ස † )

සබ්බඤ්චෙතං, මේ සියල්ල; උජුවිපච්චනීකවසෙන ච, ඍජු ප්‍රත්‍යනීකබැව්හේද (ඉදිරිව පිළිවක් විසින යුතැති) අතිසප්පායවසෙන ච, ඉතා සැපවිසින් ද; වුත්තං, කියනලදී (රාගචරිතාදීන්ට අසුභ කම්මට්ඨාන ආදීහු පිළිවක් විසින් කියනලදන සද්ධාචරිත ආදීනට බුද්ධානුස්සති ආදිය සැපවිසින් කියනලදූයි යනු අදහසි) රාගාදීනම්පන අවික්ඛම්භකා, රාගාදිකෙලෙසුන් විෂ්කම්භ නොකරණ (නොමඩිනාවූ) සද්ධාදීනං, ශ්‍රද්ධාදීන්ට; අනුපකාරා, අනුපකාරවූ; කුසලභාවනා නාම නත්ථි, කුසල භාවනානම් දෑයෙක්නැති; මෙඝිය

සුත්තෙ, මෙඝියසූත්‍රයෙහි; එතං වුත්තං එව, මේ කියන ලදී; චත්තාරො ධම්මා, මෙතෙක් කටයුතුවූ සතර ධර්මයෝ; උත්තරි, මතුයෙහි (සීලසම්පත්තිය කල්‍යාණමිත්‍රතාව සත්‍ප්‍රාය ධර්මශ්‍රවණය වීර්‍ය්‍යය ප්‍රඥාව යනමේ පසුව ධර්මයෙහි පිහිටීමෙන් මත්තෙහි යන අර්ථයි) භාවෙතබ්බා, වැඩියයුත්තාහුයි; අසුභා, (එකොළොස් අසුභ කම්මස්ථානයන්) අසුභ භාවනාතොමෝ; රාගස්ස පහාණාය, රාගප්‍රහාණය පිණිස; භාවෙතබ්බා, වැඩියයුතු; මෙත්තා, (ඔධිසො අනොධිසො විසින් පවත්නා) මෛත්‍රීතොමෝ; ව්‍යාපාදස්ස පහාණාය, ව්‍යාපාද ප්‍රහාණය පිණිස; භාවෙතබ්බා, වැඩියයුතු; ආනාපානසති, ෂොඩශ වස්තුකවූ ආනාපානස්මෘතිතොමෝ; විතක්කුපච්ඡෙදාය, මිථ්‍යා විතර්කයන්ගේ උපච්ඡෙදය පිණිස; භාවෙතබ්බා, වැඩියයුතු; අනිච්චසඤ්ඤා, (සර්වසංස්කාරයෝ අනිත්‍යයයි ප්‍රවෘත්ත) අනිත්‍යානුදර්ශනාතොමෝ; අස්මිමාන සමුග්ඝාතාය, (අස්මියි උපන්නාවූ) නවවිධ මානයාගේ සමුච්ඡෙදය පිණිස; භාවෙතබ්බා, වැඩියයුතු (මෙසේ එකක්හු සතර චරිත නොවතුදු එකක්හටම සතරකම්මස්ථාන වැඩියයුත්තාහයි කියනලදහ එහෙයින් සියලු කම්මස්ථානයන් සියලු කෙලෙසුන් විෂ්කම්භනයහ සියලු කුසලයන් වඩනාහයි යනුභාවයි) රාහුලසුත්තෙපි, රාහුලසූත්‍රයෙහිද; මෙත්තං රාහුලභාවනං භාවෙහීති, රාහුලය මෛත්‍රීභාවනාවඩයි; ආදිනානයෙන මේ ආදී නයෙන්; එකස්සෙව, එකම්පුද්ගලයෙක්හට; සත්තකම්මට්ඨානානි වුත්තානි, සතර බ්‍රහ්මවිහාරය අසුභය කායගතාසතිය ආනාපානසතිය යන සත් කම්මස්ථානයන් කියනලදහ (තෙරහුදු සර්වචරිත නොවෙති යන අභිප්‍රායි) තස්මා, එහෙයින්; වචනමත්තෙ, (අසුවල් කම්මස්ථාන අසුවල් චරිතයහට අනුකූලයයි) වචනමාත්‍රයෙහි; අභිනිවෙසං අකත්වා, අභිනිවේශය නොකොට; සබ්බත්ථ, හැමතැනම; අධිප්පායො පරියෙසිතබ්බො, (මේ චරිතයහට මේ කම්මස්ථානය අනුකූලයයි කීයේහි) අභිප්‍රාය සෙවියයුතු (සේවනානී "සබ්බෙසුවතං" යනාදින් කපිතමැයි) අයං, මේ; කම්මට්ඨානග්ගහෙණානි එත්ථ "කම්මට්ඨානං ගණ්හති" යනමෙහි; කම්මට්ඨාන කථාවිනිච්ඡයො, කම්ස්ථාන කථාවිනිශ්චයයි – ගහෙත්වාති ඉමස්ස පන පදස්ස, ගහෙත්වා, යනමේ පදයාගේ; අයං, මේ; අත්ථදීපනා, අර්ථදීපනායි; තෙන යොගිනා, ඒ යොගීහු විසින්; කම්මට්ඨානං ගහෙතබ්බන්ති එත්ථ වුත්තනයෙන, මෙහි කී නයින්; වුත්තප්පකාරං කල්‍යාණමිත්තං, පියොගරු භාවනීයො යනාදීන් කියනලද ප්‍රකාර ඇති කලණමිතුන් කරා; උපසඞ්කමිත්වා, "අත්තානො පරිච්චජ සයමෙව ගහෙත්වා" යනාදීන් කී නියෙන් එළඹ; බුද්ධස්ස භගවතො, භගවත් බුදුන්වහන්සේ; ආචරියස්ස වා, ආචාරීන්වහන්සේ; අත්තානං නිය්‍යාතෙත්වා, තමා පවාදී (උන් වසඟකොට පුදා) සම්පන්නජ්ඣාසයෙන, සම්පන්නවූ අධ්‍යාසය ඇත්තාහුවිසින්; සම්පන්නාධිමුත්තිනා හුත්වා, සම්පන්නවූ අධිමුක්ති ඇතියහු වූයේද; කම්මට්ඨානං යාචිතබ්බං, කමටහන් ඉල්වියයුතු; තත්‍ර, එහි, භගවා, භගවත්; අහං, මම; ඉමං අත්තභාවං, මේ ආත්මභාවය; තුම්හාකං, තොපට; පරිච්චජාමිති, පරිත්‍යාග කොරම්යි; එවං, මෙසේ; බුද්ධස්ස භගවතො, භගවත් බුද්ධයාහට; අත්තානිය්‍යාතෙතබ්බො, ආත්මය නිර්‍ය්‍යාතය කටයුතු; එවංහි අනිය්‍යාතෙත්වා, මෙසේ නිර්‍ය්‍යාතනය නොකොට; පන්තෙසු සෙනාසනෙසු විහරන්තො; ගැඹුරු උල්සෙනාසනයන්හි වසන්නේ,

හෙරවාරම්මණෙ ආපාථමාගතෙ, භයානක අරමුණු නමුවූකල; සම්මගිතුං අසක්කොන්තො, හැල්වියනොහෙන්නේ (සමීපවිය නොහෙන්නේය යුතැනී) ගාමන්තං ඔසරිත්වා, ග්‍රාමාන්තයට බැස; ගිහිහි සංසට්ඨො හුත්වා, ගිහින් හා හැණී; අනෙසනං ආපජ්ජිත්වා, අයුක්තාන්වේෂණයට පැමිණ; අනයව්‍යසනං පාපුණෙය්‍ය, අනයව්‍යසනයට පැමිණෙන්නේය; නිය්‍යානිකතානභාවස්ස පනස්ස, පරිත්‍යක්තවූ ආත්මභාවඇති ඕහට වනාහි; භෙරවාරම්මණෙ ආපාථමාගතෙ, භයානක අරමුණු හමුවූ කල; භයං න උප්පජ්ජති, භය නොඋපදී; පණ්ඩිත, නුවණැත්තව; තය, තාවිසින්; පුරිමදිවසමෙව, පළමු දවසම; අහතා බුද්ධානං නිය්‍යානිතො තනු, ආත්මය බුදුන්ට පාවාදෙනලද්දේ නොවේදැයි; පච්චවෙක්ඛතො පන, ප්‍රත්‍යවෙක්ෂාකරන්නාවූ; අස්ස, ඕහට; සොමනස්සමෙව උප්පජ්ජති (මෙසේ බොහෝ උපද්‍රව ඇති ආත්මභාවයසථානයෙහි දෙනලදැයි සිතන්නහුට) සොම්නස්ම උපදී; සෙය්‍යථාපි, යම්සේ; පුරිසස්ස, පුරුෂයාගේ; උත්තමං, උතුම්වූ; කාසිකං වත්ථං භවෙය්‍ය, කාසිවස්ත්‍රයක්වන්නේද; තස්ස, ඒ පුරුෂයහට; තස්මිං, ඒ කාසිවත; මූසිකායවා, මීයකු විසින්හෝ; කීටෙනවා, පණුවන් විසින්හෝ; ඛායිතෙ, කණලදකල්හි; උප්පජ්ජෙය්‍ය දොමනස්සං, දොම්නස් උපදනේය; සචෙ පන, ඉදින් වනාහි; තං, තේ වස්ත්‍රය; අම්බරිකස්ස භික්ඛුනො දදෙය්‍ය, සිවුරැනැති මහණෙකුහට දුන්නේවීනම්; අථ, ඉක්බිත්තෙන්; තං, ඒ වස්ත්‍රය; තෙන භික්ඛුනා, ඒ මහණහු විසින්; [illegible] කාපිරඤ්ජනං දාපාපි, කැකඩකොට රඳුලබන්නා දකද; සොමනස්සමෙව උප්පජ්ජෙය්‍ය, සොම්නස්ම උපදනේනී; ඉදං, මේද; ඒවං සම්පදං, මෙම වැන්නැයි; වෙදිතබ්බං, දතයුතු —

---

( භා † )

මේ සියලු චරිතානුකූල කර්මස්ථාන නියමය ඒ ඒ චරිතයන්ට ඉදුරා විපක්ෂ වශයෙන්ද ඒ ඒ චරිතයන්ට ඉතා සැප වශයෙන්ද හෙවත් රාගචරිතාදීන්ට අශුභ කර්මස්ථානාදීහු ප්‍රතිපක්ෂහෙයින්ද ශ්‍රද්ධාචරිතාදීන්ට බුද්ධානුස්මෘති ආදීහු සැපහෙයින්ද සිංහලද්දේයි රාගාදීන් මැඩනොපවත්නාවූහෝ ශ්‍රද්ධාදීන්ට උපකාරනුවූහෝ කුශලභාවනාවෙක්නම් නැත්තේය මේ කාරණය මේඝිය සූත්‍රයෙහිද වදරණලදුයේමැයි හේ කෙසේදයත්? සීලසම්පන්නිය කල්‍යාණමිත්‍රසේවනය සැපවූ ධර්මශ්‍රවණය වීර්‍ය්‍යය ප්‍රඥාය යන පඤ්ච ධර්මයෙහි පිහිටිමෙන් මතු හෙවත් මේ ධර්ම පඤ්චකයෙහි පිහිටියහුවිසින් සතර ධර්මකෙණෙක් වැඩියයුතුනාහයෝ කවරනුදයත්? රාගප්‍රහාණීය පිණිස එකොළොස් අශුභ කර්මස්ථානයෙහි අශුභ භාවනාව වැඩියයුතුනීය ව්‍යාපාදප්‍රහාණීය පිණිස හිඳිනොහිමි වශයෙන් පවත්නා මෛත්‍රීභාවනාව වැඩියයුත්තීය මිත්‍යා කල්පනාවින්ගේ සිඳීම පිණිස ෂොඩශ වස්තුකවූ ආනාපානස්මෘති භාවනාව වැඩියයුත්තීය නවවිධමානය සිඳීම පිණිස සියලු සංස්කාර ධර්මයන් අනිත්‍යහයි පැවති අනිච්චානුපස්සනා භාවනාව වැඩියයුත්තීය මෙසේ එකොළොස්හට සතර ධර්මකෙණෙක් වැඩියයුතුබව කීසෙතිදු චරිත සතරක් එකොළොව නැත්තේයි එකොළොවම සතර කර්මස්ථානය වැඩියයුත්තේයයි කියනලදහෙයින් සියලු නමවනන්හු සියලු කෙලෙසුන්ම මැඩපවත්නානුය සියලු කුශලයන්ම වඩන්නාහුයයි දතයුතු රාහුලසූත්‍රයෙහිද රාහුලය මෛත්‍රීභාවනාව වඩම

යනාදී නයින් එකම රාහුල ස්ථවිර
යන්ට සතර බ්‍රහ්මවිහාරය අශුභය
කායගතාස්මෘතිය ආනාපානස්මෘතිය
යන සපත කර්මස්ථානයක් වදාරණලද්
දේය එනකුදුවුවත් ස්ථවිරහෙම සිය
ලු චර්‍ය්‍යා ඇත්තේද නොවන්නේය
එහෙයින් අසවල් චරිතයාහට අසවල්
කමටහණ සැපවන්නේයයි කී වචන
මාත්‍රයෙහිම නොනැවත හැමතන්හිම
ම චරිතයාට මේ කමටහණ අනුකූල
යයි කී නියමයෙහි අභිප්‍රායාර්ථය
සෙවියයුත්තේය මෙසේ කමටහන්
ගෙණය යනමෙහි කර්මස්ථාන කථා
විනිශ්චය දතයුත්තේයි.

මින්මතු කමටහන් ගෙණය යනමේ
පදයාගේ අර්ථප්‍රකාශකිරීම් වන්නේය
හේකෙසේදයත්? ඒ යොගාවචර පුද්
ගලයාවිසින් කමටහන්දෙන කල්‍යාණ
මිත්‍රයෙකුකරා එළඹය යනමෙහි කිය
නලද ලක්ෂණ සම්පන්න කල්‍යාණ මි
ත්‍රයෙකුකරා එළඹ භාග්‍යවත් බුදුන්ට
හෝ තමාගේ ආචාර්‍ය්‍යයාටහෝ ආත්
මය පාවාදී ඔවුන් වසඟකොටගෙණ
සම්පූර්ණ අදහස් ඇතියෙක්ව සම්පූර්ණ
හැදහිලි ඇතියෙක්ව කර්මස්ථාන ඉල්
වියයුත්තේය ඒ කමටහන්ගැන්මෙහි
පළමුකොට ස්වාමිනි භාග්‍යවතුන් ව
හන්ස මම මේ ආත්මභාවය නුඹව
හන්සේට පරිත්‍යාගකෙරෙමියි මෙ
සේ භාග්‍යවත් බුදුන්ට ආත්මය පාවා
දියයුතුවන්නේය මෙසේ පාවානොදී
ගැඹුරුවල්සෙනසුන්හි වසන්නාහු
භයානක අරමුණු හමුවූ කල නොසැ
ලී නොසිටියහැක්කාහු ග්‍රාමාන්තයට
බැස ගිහින්හා මිශ්‍රව අයුතු ප්‍රත්‍යය
සෙවීමට පැමිණ මහත් විනාසට පැමි
ණෙන්නේයි. බුදුන්ට පාවාදෙන ආත්
මභාව ඇති ඔහට භයානක අරමුණු
හමුවූකලද භය නොඋපදනේය එඹා
නුවහැන්තව තොපවිසින් පළමු ද
වස්හිම ආත්මය බුදුන්ටපාවාදෙනලද්
දේ නොවේදැයි පස්විකන්නාවූ ඔහට
සේබදු නොයෙක් උවදුරු ඇත්නාවූ
මාගේ අත්බව පාවාදියයුතුනෙනවම්
පාවාදුනිමියි සොම්නස් උපදනේය
තවද යම්සේ යම් පුරුෂයෙකුගේ උ
තුම්වූ කසී සළුවක් මියන්හෝ පණු
වන්හෝ කෑකල ඒ පුරුෂයාට දොම්
නස් උපදනේද ඉදින් ඒ වස්ත්‍රය සිවු
රුනැති මහණෙක්හට පරිත්‍යාගකො
ළේවීනම් ඒ මහණ විසින් ඒ වස්ත්‍රය
කඩකඩකොට කපනලබනහා දුටද
සොම්නස්ම උපදනේද මේද මේ උප
මාව වැනියයි දතයුත්තේයි.

( ශා ‡ )

ආචරියස්ස නිය්‍යාතෙන්තෙනාපි
ඉමාහං භන්තෙ අත්තභාවං තුම්හාකං
පරිච්චජාමීති වත්තබ්බං. එවං අනි
ය්‍යාතිතත්තභාවො හි අතජ්ජනියො
වාහොති දුබ්බචොවා අනොවාදක
රො යෙන කාමංගමො වා ආචරියං
අනා පුච්ඡාව යත්ථිච්ඡති තත්ථ ගන්තා
තමෙනං ආචරියො ආමිසෙනවා ධ
ම්මෙනවා නසඞ්ගණ්හාති ගුළ්හං ගන්ථං
න සික්ඛාපෙති සො ඉදං දුවිධං සඞ්ග
හං අලභන්තො සාසනෙ පතිට්ඨං න
ලභති නචිරස්සෙව දුස්සීල්‍යංවා ගිහි
භාවංවා පාපුණාති නිය්‍යාතිතත්තභා
වො පන සෙව අතජ්ජනියො හො
ති නයෙන කාමංගමො සුවචො ආ
චරියායත්තවුත්තියෙව හොති සො
ආචරියතො දුවිධං සඞ්ගහං ලභ
න්තො සාසනෙ වුඩ්ඪිං විරූළ්හිං වෙ
පුල්ලං පාපුණාති චූළපිණ්ඩපාතික
තිස්සත්ථෙරස්ස අන්තෙවාසිකා විය ථෙ
රස්සකිර සන්තිකං තයො භික්ඛූ ආ
ගමංසු තෙසු එකො අහං භන්තෙ

තුම්හාකං අජ්ඣාසයානි වුත්තෙන සත්තපො
රිසෙස පපාතෙ පතිතුං උස්සහෙය්‍යු
න්ති ආහ–දුතියො අහං භන්තෙ
තුම්හාකං අජ්ඣාසානි වුත්තෙන ඉමං
අත්තභාවං පණ්හිතො පට්ඨාය පාසා
ණපිට්ඨෙ සංසෙදෙන්තො නිරවසෙසං
ඛෙපෙතුං උස්සහෙය්‍යන්ති ආහ–
තතියො අහම්භන්තෙ තුම්හාකං අජ්ඣා
සානි වුත්තෙන අස්සාස පස්සාසෙ උප
රුන්ධිත්වා කාලකිරියං කාතුං උස්සහෙ
ය්‍යන්ති ආහ–ථෙරො භබ්බා වති
මෙ භික්ඛූති කම්මට්ඨානං කථෙසි තෙ
තස්ස ඔවාදෙ ඨත්වා තයොපි අරහත්තං
පාපුණිංසූති අයමෙත්ථ සංඛෙපො අත්තනි
ය්‍යාතනෙ–තෙනාවුත්තං බුද්ධස්සවා
භගවතො ආචරියස්සවා අත්තානං
නිය්‍යාතෙත්වාති–සම්පන්නජ්ඣාස
යෙන සම්පන්නාධිමුත්තිනාච හුත්වාති
එත්ථ පන තෙන යොගිනා අලොභාදී
නං වසෙන ඡන්නාකාරෙහි සම්පන්න
ජ්ඣාසයෙන භවිතබ්බං එවං සම්පන්න
ජ්ඣාසයොහි තිණ්ණන්නං බොධීනං
අඤ්ඤතරං පාපුණාති–යථාහ ඡ
අජ්ඣාසයාච බොධිසත්තා බොධිපරි
පාකාය සංවත්තන්ති අලොභජ්ඣාස
යාච බොධිසත්තා ලොභෙ දොස දස්සා
විනො අදොසජ්ඣාසයාච බොධිසත්තා
දොසෙ දොසදස්සාවිනො අමොහජ්ඣා
සයා ච බොධිසත්තා මොහෙ දොස ද
ස්සාවිනො නෙක්ඛම්මජ්ඣාසයා ච බො
ධිසත්තා ඝරාවාසෙ දොසදස්සාවිනො
පවිවෙකජ්ඣාසයා ච බොධිසත්තා ග
ණසඞ්ගණිකාය දොස දස්සාවිනො නි
ස්සරණජ්ඣාසයා ච බොධිසත්තා ස
බ්බභවගතිසු දොස දස්සාවිනොති යෙ
හි කෙචි අතීතානාගත පච්චුප්පන්නා
සොතාපන්නා සකදාගාමි අනාගාමි
ඛීණාසව පච්චෙකබුද්ධ සම්මාසම්බුද්ධා
සබ්බෙ තෙ ඉමෙහි ඡහි ආකාරෙහි
අපත්තා අත්තනා පත්තබ්බං විසෙසං
පත්තා තස්මා ඉමෙහි ඡහි ආකාරෙහි
සම්පන්නජ්ඣාසයෙන භවිතබ්බං–
තදධිමුත්තතායාති පන අධිමුත්තිසම්ප
න්නෙන භවිතබ්බං සමාධාධිමුත්තෙන
ච සමාධි ගරුකෙන සමාධි පබ්භාරෙ
න නිබ්බානාධිමුත්තෙන නිබ්බාන ග
රුකෙන නිබ්බාන පබ්භාරෙන ච භ
විතබ්බන්ති අත්ථො–එවං සම්ප
න්නජ්ඣාසයාධිමුත්තිනො පනස්ස ක
ම්මට්ඨානං යාචතො චෙතො පරිය
ඤ්ඤාණලාභිනා ආචරියෙන චිත්තාචාරං
ඔලොකෙත්වා චරියා ජානිතබ්බා ඉත
රෙන කිං චරිතොසි කෙවා තෙ ධම්මා
බහුලං සමුදාචරන්ති කිංවා තෙ මන
සිකරොතො ඵාසුහොති කතරස්මිං
වා තෙ කම්මට්ඨානෙ චිත්තං නමතීති
ච එවමාදීහි නයෙහි පුච්ඡිත්වා ජානිත
බ්බා එවං ඤත්වා චරියානුකූලං කම්ම
ට්ඨානං කථෙතබ්බං කථෙන්තෙන ච
තිවිධෙන කථෙතබ්බං පකතියා උග්ග
හිත කම්මට්ඨානස්ස එක ද්වෙ නිසජ්ජා
සජ්ඣායං කාරෙත්වා දාතබ්බං සන්ති
කෙ වසන්තස්ස ආගතාගතක්ඛණෙ
කථෙතබ්බං–උග්ගහෙත්වා අඤ්ඤ
ත්‍ර ගන්තුකාමස්ස නාතිසංඛිත්තං නා
තිවිත්ථාරිකං කත්වා කථෙතබ්බං–
තත්‍ර පඨවීකසිණං තාව කථෙන්තෙ
න චත්තාරො කසිණ දොසා කසිණ
කරණං කතස්ස භාවනානයො දුවිධං
නිමිත්තං දුවිධො සමාධි සත්තවිධං
සප්පායාසප්පායං දසවිධං අප්පනා
කොසල්ලං විරියසමතා අප්පනාවිධා
නන්ති ඉමෙ නව ආකාරා කථෙතබ්බා
සෙසකම්මට්ඨානෙසුපි තස්ස තස්ස අ
නුරූපං කථෙතබ්බං තං සබ්බං තෙ
සං භාවනාවිධානෙ ආවිභවිස්සති එවං
නියමියමානෙ පන කම්මට්ඨානෙ තෙන
යොගිනා නිමිත්තං ගහෙත්වා සොතා

ඛබං නිමිත්තං ගහෙත්වාති ඉදං හෙට්ඨි මපදං ඉදං උපරිමපදං අයමස්ස අත්ථො අයමධිප්පායො ඉදං ඕපම්මන්ති එවං තං තං ආකාරං උපනිබන්ධිත්වාති අත්ථො ... එවං නිමිත්තං ගහෙත්වා සජ්ඣායච්චං සුණන්තෙනාති කම්මට්ඨානං සුගහිතං හොති අථස්ස තං නිස්සාය විසෙසාධිගමො සම්පජ්ජති න ඉතරස්සාති අයං ගහෙත්වාති ඉමස්ස පදස්ස අත්ථපරිදීපනා එත්තාවතා කල්‍යාණමිත්තං උපසඞ්කමිත්වා අත්තනො චරියානුකූලං චත්තාලීසාය කම්මට්ඨානෙසු අඤ්ඤතරං කම්මට්ඨානං ගහෙත්වාති ඉමානි පදානි සබ්බාකාරෙන විත්ථාරිතානි හොන්තීති ...

**ඉති සාධුජන පාමොජ්ජත්ථාය කතෙ**
**විසුද්ධිමග්ගෙ සමාධිභාවනාධිකාරෙ**

# කම්මට්ඨානග්ගහණ නිද්දෙසො

**නාම තතියො පරිච්ඡෙදො.**

—000—

( ස ‡ )

ආචරියස්ස නිය්‍යාතිතත්තභාවොපි, ආචාය්‍යීයන්ට නිය්‍යාතිතත ශකාරණුවනු විසිනුදු; භන්තෙ, වහන්ස; ඉමං අත්තභාවං, මේ ආත්මභාවය; අහං, මම; තුම්හාකං, තොපට; පරිච්චජාමීති, පරිත්‍යාගකෙරෙමියි; වත්තබ්බං, කියයුතු; එවං, මෙසේ; අනිය්‍යාතිතත්තභාවො, අපරිත්‍යක්තවූ ආත්මභාව ඇත්තේ; අතජ්ජනීයොහොති, තර්ජනය කටයුතු නොවෙයි; දුබ්බචොවා, නොකීකරුහෝවේ; අනොවාදකරො, අවවාදනොකෙරේ (අනොවාදකරො-යනු දුබ්බචො-යනුයෙහිම අර්ථපහලකරණු පිණිස කීහ) යෙන කාමංගමො වා, කැමති අතකයේහෝයි; ආචරියං අනාපුච්ඡිත්වා, ආචාය්‍යීයන්නොවිළිවිස; යත්ථිච්ඡති, යම්තැනකට යනු කැමතිද; තත්ථගන්තා, එයට යන්නේවේ; තං එනං, ඒ මේ මහණහට; ආචරියො, ආචාය්‍යීතෙමේ; ආමිසෙනවා, ආමිෂයෙන්හෝ; ධම්මෙනවා, අවවාද අනුශාසනා ධර්මයෙන්හෝ; න සඞ්ගණ්හාති, සඞ්ග්‍රහනොකෙරේ; ගුළ්හං ගන්ථං (කර්මස්ථාන සත්‍ය ප්‍රතීත්‍ය සමුත්පාදදිවූ) ගැඹුරු ගුහ්‍යතා ප්‍රතිසංයුක්ත ධර්මයන්; නසික්ඛාපෙති, නොහික්මවා (අර්ථ පහලකොට නොදක්වා) සො, හෙතෙම; ඉදං දුවිධං සඞ්ගහං අලභන්තො, මේ ධර්මාමිෂ දෙකින් දෙවැදෑරුම් සඞ්ග්‍රහ නොලබන්නේ; සාසනෙ පතිට්ඨං නලභති, සස්නෙහි පිහිට නොලැබේ; නචිරස්සෙව, නොබොහෝ කලකින්ම; දුස්සීල්‍යං වා ගිහිභාවං වා පාපුණාති, දුශ්ශීල බවටහෝ ගිහි බවට පැමිණේ; නිය්‍යාතිතත්තභාවො පන, පරිත්‍යක්තවූ ආත්මභාව ඇත්තේ වනාහි; නෙව අතජ්ජනීයො හොති, තර්ජනය නොකටයුතු නොදවේයි; න යෙන කාමංගමො, කැමති අත යන්නේද නොවේ; සුවචොවා, කීකරුවේ; ආචරියායත්තවුත්තිරෙව හොති, ආචාය්‍යීයන් පිළිබඳ පැවතුම්ම ඇතිවේ; සො, හෙතෙම, ආචරියතො දුවිධං සඞ්ගහං ලභන්තො, ආචාය්‍යීයන්කෙරෙන් දෙවැදෑරුම් සඞ්ග්‍රහ ලැබන්නේ; සාසනෙ, සස්නෙහි; වුඩ්ඪිං විරූළ්හිං වෙපුල්ලං පාපුණාති, ශීලයෙන්වෘද්ධියට සමාධීන් විරූඪියට ප්‍රඥවෙන් විපුලබවට පැමිණේ; චූළපිණ්ඩපාතික තිස්සත්ථෙරස්ස, මූලපිණ්ඩපාතික තිස්ස නම් තෙරුන්ගේ; අන්තෙවාසිකා විය, අතවැසියන්මෙනි; ථෙරස්සසිර සන්තිකං, තෙරුන් සමීපයට; තයො භික්ඛූ අගමංසු, භික්ෂූ

හු තුන්දෙනෙක් ගියෝ; තෙසු, ඔ
වුන් කෙරෙහි; එකො, එකෙක්; භ
න්තෙ, වහන්ස; අහං, මම; තුම්හාකං
අත්ථාය නිවුත්තො, තොපට වැඩෙකැ
යි කී කල්හි; සතපොරිසෙ පපාතෙ,
සියක් පුරුෂ ප්‍රමාණ ඇති ප්‍රපාත
යෙහි; පතිතුං උස්සහෙය්‍යාසීති ආහ,
පහන්නාව උත්සාහකෙරෙම්දැයි කී;
දුතියො, දෙවන අනවැසි; අහං, මම;
භන්තෙ, වහන්ස; තුම්හාකං අත්ථාය
නිවුත්තො, තොපට (මනුෂ්‍ය කල්හි
යෙන්) ප්‍රයොජනයෙකැයි කී කල්හි;
ඉමං අත්තභාවං, මේ ආත්මභාවය;
පණ්හිතො පට්ඨාය, පිලිව පටන්ගෙ
ණ; පාසාණපිට්ඨෙ සංසෙදෙන්තො, ග
ල්පිට ගටන්නෙමි; නිරවසෙසං බෙ
පෙතුං, නිරවශෙෂයෙන් සුණුකරන්
නට; උස්සහෙය්‍යාසීති ආහ, උත්සාහ
ඇත්තෙම්දැයි කී; තතියො, තුන්වන
අනවැසි; අහං, මම; භන්තෙ, වහන්
ස; තුම්හාකං අත්ථාය නිවුත්තො (ආ
ශ්වාස ප්‍රශ්වාස නිරොධයෙන්) තොප
ට කිසි ප්‍රයොජනයෙකැයි කී කල්හි;
අස්සාස පස්සාසෙ උපරුන්ධිත්වා, ආශ්වා
ස ප්‍රශ්වාස නිරොධකොට; කාලකිරියං
කාතුං උස්සහෙය්‍යාසීති ආහ, කාලක්‍රි
යාකරන්නට උත්සාහකෙරෙම්දැයි කී;
ථෙරො, තෙරහු; භබ්බාවනිමෙ භික්ඛූ
ති, මේ මහණහු එකාන්තයෙන් භව්‍යය
හයි; කම්මට්ඨානං කථෙසි, කමටහන්
කීහු; තෙ, ඒ මහණහු; තස්ස ඔවාදෙ
ඨත්වා, ඒ තෙරුන්ගේ අවවාදයෙහි
සිට; තයොපි අරහත්තං පාපුණිංසූති,
තුන්දෙනම රහත්බවට පැමිණියෝ
යි; අයං, මේ; අනන්තරානිසංසො ආනි
සංසො, ආනන්තරිකත්වයෙහි අනු
සස; වෙනනවුත්තං, එහෙයින් කියන
ලදී ("බුද්ධස්ස ...පෙ... නියාතෙ
ත්වා"සි මේ තුන්දෙනා විසින්ම ආචා
රීන් කෙරෙහි භක්ති ගැහවීමෙන් ත
මන්ගේ විශ්වාසයම හඟවනලද්දී
දහසුඛ) සම්පන්න ...පෙ... එළ

පන, මෙහි වනාහි; තෙන යොගිනා,
ඒ යොගීන් විසින්; අලොභාදීනං ව
සෙන, අලොභාදීන් විසින්; ජහාකා
රෙහි (අලුබ්භනාදී) ස්වාකාරයෙකින්;
සම්පන්නජ්ඣාසයෙන, සම්පූර්ණවූ අද
හස් ඇත්තාහු විසින්; භවිතබ්බං, විය
යුතු (පූර්වභාගයෙහි ශීල සම්පදාදීන්
සාධන වශයෙන්ද ලොකොත්තර කු
සලයන්ට උපනිශ්‍රය වශයෙන්ද සම්ප
න්නවූ අදහස් ඇත්තාහු විසින් වියයු
තුය යුතැනි) එවං, මෙසේ; සම්පන්න
ජ්ඣාසයො හි, සම්පන්නවූ අදහස් ඇත්
තේ; තිස්සන්නං බොධීනං, ත්‍රිවිධ බො
ධීන් කෙරෙන්; අඤ්ඤතරං පාපුණාති,
එක්තරා බොධියකට පැමිණේ; යථා
හ, වදාළේමැණු; ඡ අජ්ඣාසයාව බො
ධිසත්තා, ස අදහස් ඇති බෝසත්හු;
බොධිපරිපාකාය, බොධිඥානය මුහුකු
රුවනු පිණිස; සංවත්තන්ති, පවතිත්;
ලොභෙ දොස දස්සාවිනො (ලුබ්භන
ලකුණු) ලොභයෙහි අයුණු දක්නාවූ;
බොධිසත්තා, බෝසත්හු; අලොභජ්ඣා
සයා (අලොභිනම් කෙසේවමෝඅද්‍ය
භෝයි) අලොභ අදහස් ඇතිවෙත්
(හැමතැනම හැම දවසම කෙසේනම්
අලුබ්ධවමෝඅද්‍යභෝයි සිතා ආදියෙ
හිද ලොභ නොකිරීමෙන් මැදද ලො
භ නොකිරීමෙන් පසුවද පවත්නා අ
ලොභ අදහස් ඇත්තහු යුතැනි—
සෙසු පෙදෙහිදු මෙම නයයි) දොසෙ
(දූෂන ලකුණු) වෙෂයෙහි; දොස
දස්සාවිනො, අයුණු දක්නාවූ; බොධි
සත්තා, බෝසත්හු; අදොසජ්ඣාසයා
(අවෙෂිනම් කෙසේවමෝඅද්‍යභෝයි)
අවෙෂයෙහි අදහස් ඇතිවෙත්; මො
හෙ (මූඪන ලකුණු) මොහයෙහි;
දොසදස්සාවිනො, අයුණු දක්නාවූ;
බොධිසත්තා, බෝසත්හු; අමොහජ්ඣා
සයා (අමොහිනාම් කෙසේවමෝඅද්‍ය
භෝයි) අමොහ අදහස් ඇතිවෙත්;

ඝරාවාසෙ දොසදස්සාවිනො, ගිහිගෙයි විසීමෙහි අයුණු දක්නාවූ; බොධිසත්තා, බෝසත්හු; නෙක්ඛම්මජ්ඣාසයා (කෙසේනම් පැවිදිවමෝද්‍යෙහෝයි) ප්‍රව්‍රජ්‍යාවෙහි අදහස් ඇතිවෙත්; ගණසඞ්ගණිකාය දොසදස්සාවිනො, ගණසඞ්ගණිකාවෙහි අයුණු දක්නාවූ; බොධිසත්තා, බෝසත්හු; පවිවෙකජ්ඣාසයා (කෙසේනම් විවේකීවමෝද්‍යෙහෝයි) තදඞ්ගාදි විවෙකයෙහි අදහස් ඇතිවෙත්; සබ්බභවගතිසු දොසදස්සාවිනො, සියලු භවගතියෙහි අයුණු දක්නාවූ; බෝධිසත්තා, බෝසත්හු; නිස්සරණජ්ඣාසයා (නිවන්නම් කෙසේ ලබම්දැයි) නිවන්හි අදහස්ඇතිවෙත්; අතීතානාගතපච්චුප්පන්නා, අතීතානාගත වර්තමාන කාලිකවූ; යෙහිකෙචි, යම්කිසි; සොතාපන්නා, සෝවාන්හු; සකදාගාමී, සෙදගැමියහු; අනාගාමී, අනාගැමියහු; අරහන්තා, රහත්හු; පච්චෙකබුද්ධා, පසේබුදුහුය; සම්මාසම්බුද්ධා, සම්‍යක්සම්බුද්ධයහ යන යම්කෙණෙක්ද; සබ්බෙතෙ, ඔහු හැමදෙනම; ඉමෙහෙව ඡහි ආකාරෙහි, මෙම සආකාරයෙන්; අත්තනා අත්තනා පත්තබ්බං විසෙසං, තමතමන් විසින් පැමිණියයුතු විශේෂයට; පත්තා, පැමිණියහ; තස්මා, එහෙයින්; ඉමෙහි ඡහි ආකාරෙහි, මේ සආකාරයෙන්; සම්පන්නජ්ඣාසයෙන භවිතබ්බං, සම්පන්නවූ අදහස් ඇත්තහු විසින් වියයුතු; තදධිමුත්තතාය පන, එහිම අධිමුක්ති ඇතිබැවින් වනාහි (යමක් පිණිස භාවනානුයොගයකෙරේද යමක් පිණිස ප්‍රව්‍රජ්‍යාවවේද එහිම අධිමුක්ති ඇත්තහු විසින්ය යුතැනි) අධිමුත්ති සම්පන්නෙන භවිතබ්බං, අධිමුක්ති සම්පන්නහු විසින් වියයුතු; සමාධාධිමුත්තෙන, සමාධියෙහි අධිමුක්ති ඇත්තහු විසින්; සමාධිගරුකෙන, සමාධිය ගුරුකොට ඇත්තහු විසින්; සමාධිපබ්භාරෙන, සමාධියෙහිම නැමුනහු විසින්; නිබ්බානාධිමුත්තෙන, නිවන්හි අධිමුක්ති ඇත්තහු විසින්; නිබ්බානගරුකෙන, නිවන්ම ගුරුකොට ඇත්තහු විසින්; නිබ්බානපබ්භාරෙන, නිවන්හි නැමුනහු විසින්; භවිතබ්බන්ති අත්ථො, වියයුතුය යනු අර්ථයි; එවං, මෙසේ; සම්පන්නජ්ඣාසයාධිමුත්තිනො පන, සම්පන්නවූ අදහස් අධිමුක්ති ඇතිව; කම්මට්ඨානං යාචතො, කමටහන් ඉල්වන්නාවූ; අස්ස, මොහුට; චෙතොපරියඤාණලාභිනා ආචරියෙන, පරසිත් පිරිසිඳ දන්නා නුවණලද ඇදුරු විසින්; චිත්තාචාරං ඔලොකෙත්වා, සිත් හැසිර බලා; චරියා ජානිතබ්බා, චරියාවෝ දතයුත්තාහුයි; ඉතරෙන, ඒ නුවණ නොලද්දහු විසින්; කිං චරිතොසි, කවර චරිතයෙහිදැයි (පුච්ඡිත්වා ජානිතබ්බා යනු-සම්බන්ධ-මෙසේ විචාරණ ලද්දේ නොදනිම්යි කියාතම් "කෙවා තෙ ධම්මා" යනාදීන් විචාරියයුතු-) තෙ, තට; කෙවා ධම්මා බහුලං සමුදාචරන්ති, කවර ධර්මයෝ බොහෝකොට හැසිරෙද්ද; කිං වා මනසිකරොතො (අසුභාදීන්කෙරෙහි) කුමක් මෙනෙහිකරන්නාවූ; තෙ, තට; ඵාසු හොති, ඵාසුවේද (සිත් එකඟව සුවසේ වේද යුතැනි) කතරස්මිං වා කම්මට්ඨානෙ, කවර කමටහනෙක්හි; තෙ චිත්තං නමති, සියසිත් නාගිත නැමේදැයි; එවමාදීහි නයෙහි, මේ ආදී නයින්; පුච්ඡිත්වා, විචාරා; ජානිතබ්බා, දතයුත්තාහුයි (ආදී ග්‍රහණින් ඉරියාපථාදීන්ගේ සඞ්ග්‍රහ දතයුතු)- එවඤ්ච, මෙසේ දැන; චරියානුකූලං කම්මට්ඨානං, චරිතයට අනුකූලවූ කමටහනක්; කථෙතබ්බං, කියයුතු; කථෙන්තෙන ච, කියන්නහු විසිනුදු; තිවිධෙන කථෙතබ්බං, තුන් පරිද්දෙකින් කියයුතු; පකතියා උග්ගහිතකම්මට්ඨානස්ස, පියවින් උගත් කමටහන් ඇත්තහුට (සජ්ඣායනා කාලයෙහි හෝ මනසිකාර විසින්හෝ පුරුදුකර

ණලද කමටහන් ඇත්තාහටය යුතැ
හි) එකදෙවතිසජ්ජා සජ්ඣායං කාරෙ
ත්වා දාතබ්බං, එක් දෙතස්නක් පුහුණු
ගන්වා දියයුතු; සන්තිකෙ වසන්තා
ස්ස, සමීපයෙහි වසනුවහට; ආගතා
ගතක්ඛණෙ කථෙතබ්බං, ආආ කෙ
ණෙහි පවත් අස අසා කියයුතු; උ
ග්ගහෙත්වා අඤ්ඤත්‍ර ගන්තුකාමස්ස,
උගෙණ අනික් තැනකට යනු කැ
මැත්තාහට; නාතිසංඛිත්තං, ඉතා
සංක්ෂෙප නොකොට; නාතිවිත්ථාරිකං
කත්වා, ඉතා විස්තර නොකොට; ක
ථෙතබ්බං, කීයයුතු; තත්‍ර, ඒ කමට
හන්හි; නාව, පලමුකොට; පඨවිකසි
ණං කථෙන්තස්ස, පඨවිකසුණු කමට
හණ කියනුවහු විසින්; චත්තාරො ක
සිණදොසා, සතර කසුණු දොස්හුය;
කසිණකරණං, කසුණුකරණතියාය;
කතස්ස භාවනානයො, කරණලද ක
සිණයාගේ භාවනානයය; දුවිධං නිමි
ත්තං, දෙවැදෑරුම් නිමිත්තය; දුවිධො
සමාධි, දෙවැදෑරුම් සමාධිය; සත්තවි
ධං සප්පායාසප්පායං, සත්වැදෑරුම් සැ
ප නොසැපය; දසවිධං අප්පනා කො
සල්ලං, දසවැදෑරුම් අර්පණා කෞශ
ල්‍යය; විරියසමතා, වීර්‍ය්‍ය සමත්වය;
අප්පනාවිධානානි, අර්පණාවිධානය
යි; ඉමෙ නව ආකාරා, මේ නවප්‍රකාර
යෝ; කථෙතබ්බා, කියයුත්තාහුයි;
සෙස කම්මට්ඨානෙසුපි, සෙසු කමට
හණෙහිදු; තස්ස තස්ස අනුරූපං, ඒඒ
කමටහණට සුදුසුකොට; කථෙතබ්බං,
කියයුතු; තං සබ්බං, ඒ සියල්ල; තෙ
සං භාවනාවිධානෙ ආවිභවිස්සති, ඒ
ඒ කමටහණුන්ගේ භාවනාවිධි කිය
නතැන පහළවේ; එවං කථියමානෙ
පන කම්මට්ඨානෙ, මෙසේ කමටහන්
කියනලබන කල්හි; තෙන යොගිනා,
ඒ යොගීහු විසින්; නිමිත්තං ගහෙත්වා
සොතබ්බං, නිමිත්තගෙණ ඇසියයුතු;
නිමිත්තං ගහෙත්වාති ඉදං, නිමිත්තං
ගහෙත්වා යනමේ; ඉදං හෙට්ඨිමපදං,
මේ යට පදය; ඉදං උපරිමපදං, මේ
මතු පදය; අයමස්ස අත්ථො, මෙම පද
යාගේ අර්ථමේය; අයමධිප්පායො, මේ
අභිප්‍රායය; ඉදං ඔපම්මන්ති, මේ උප
මායයි; එවං, මෙසේ; තංතං ආකාරං,
ඒඒ ආකාරය; උපනිබන්ධිත්වාති අ
ත්ථො, සිත්හිබැඳය යන අර්ථයි; එවං,
මෙසේ; නිමිත්තං ගහෙත්වා, නිමිත්ත
ගෙණ; සක්කච්චං සුණන්තෙනහි, ස
කස්කොට අසන්නාහු විසින්; කම්ම
ට්ඨානං සුගහිතං හොති, කමටහන ම
ණාකොට ගන්නාලැබේ; අථ, ඉක්
බිත්තෙන්; තං නිස්සාය, ඒනිසා; වි
සෙසාධිගමො සම්පජ්ජති, විශෙෂාධි
ගමය සිඩවෙයි; න ඉතරස්සාති, සෙ
ස්සහට සිඩනොවේ; අයං, මේ; ගහෙ
ත්වාති ඉමස්ස පදස්ස, ගහෙත්වා යන
මේ පදයාගේ; අත්ථ පරිදීපනා, අර්ථ
දීපනයයි; එත්තාවතා, මෙපමණ
කින්; කල්‍යාණ——පෙ——ගහෙත්වා
ති, ගෙණය යන, ඉමානි පදානි, මේ
පදයෝ; සබ්බාකාරෙන, සියලු ප්‍රකාර
යෙන්; විත්ථාරිතානි හොන්ති, විස්තර
කරණලද්දාහුවෙත්——

# කම්මට්ඨාන ගහණ නිද්දෙසො.

——ooo——

( භා ‡ )

ආචාර්‍ය්‍යයන්ට ආත්මභාවය පාවා
දෙනානු විසිනුදු වහන්ස මේ ආත්ම
භාවය නුඹවහන්සේට පරිත්‍යාග කො
රෙමියි කියයුත්තේය මෙසේ පාවා
දෙන ආත්මභාව ඇත්තාහු ආචාර්‍ය්‍යය
යන් විසින් තර්ජනය කළයුතු නොවන්
නේය මෙබඳු මහණ නොකීකරුහෝ
වන්නේය අවවාදයෙහි පිළිනො
ගන්නේය යම්තෙනකට යනුකැමැත්

තේවිනම් එතනට යන්නේහෝවෙයි ආචාර්‍ය්‍යයන් නොවිචාරා යම්ගැනෙක යනු කැමැත්තේවීනම් එතැන්හි යන්නේහෝවෙයි එබදු නොකීකරු මහණහට ආචාර්‍ය්‍යයෝ ආමිෂයෙන් හෝ ධර්‍මයෙන්හෝ අනුග්‍රහනොකරන්නේය කර්‍මස්ථාන චතුරාර්‍ය්‍යසත්‍ය ප්‍රතීත්‍යසමුත්පාදාදි ගැඹුරු ධර්‍ම නොඋගන්වයි හෙවත් අර්‍ත්‍ථ ප්‍රකාශකොට නොදක්වන්නේයි මෙසේ ධර්‍මාමිෂ සංඛ්‍යාත ද්විප්‍රකාර සංග්‍රහයම නොලබනාවූ ඒ නොකීකරු මහණ මේ නෛර්‍ය්‍යාණික ශාසනයෙහි පිහිටනොලබන්නේය නොබෝ කලකින්ම දුස්සීලබවටහෝ ගිහිබවටහෝ පැමිණෙන්නේය ආචාර්‍ය්‍යයන්ට පාවාදෙනලද ආත්මභාව ඇති මහණ වරදදුටුතැන ආචාර්‍ය්‍යයන් විසින් තර්ජනය කටයුතුවන්නේය යම්තෙනකට යනු කැමැත්තේවීනම් එතනටද නොයාහැකිවන්නේය කීකරුදවෙයි ආචාර්‍ය්‍යයන් පිළිබඳ පැවතුම් ඇත්තේද වන්නේයි ඒ කීකරු මහණ ආචාර්‍ය්‍යයන්ගෙන් ධර්‍මාමිෂ සංග්‍රහ ලබන්නාහු චූලපිණ්ඩපාතික තිස්සතෙරුන්ගේ අතවැසත්මෙන් මේ සස්නෙහි සීලයෙන් වෘද්ධියටද සමාධියෙන් විරූඪියටද ප්‍රඥවෙන් විපුලබවටද පැමිණෙන්නේයි හේ කෙසේදයත්? චූලපිණ්ඩපාතික තිස්සස්ථවිරයන් සමීපයට භික්ෂූන් තුන්දෙනෙකු ආවාහුය ඔවුන් අතුරෙන් එක් භික්ෂුකෙනෙක් ස්වාමිනි නුඹවහන්සේට යම්කිසි වැඩෙක්වෙයි කියාතම් මම සියක් පුරුෂප්‍රමාණ ප්‍රපාතයක හිඹට උත්සාහ ඇත්තෙමියි කීහ දෙවෙනි භික්ෂුතෙම ස්වාමිනි නුඹවහන්සේට මනුෂ්‍යමාංශ කල්කයෙන් යම්කිසි වැඩෙක්වෙයි කියාතම් මම මේ ආත්මභාවය විලුම්පමන්ගෙණ ගලක්පිට ගටා ඉතුරු නොකොට ගෙවන්නටතරම් උත්සාහ ඇත්තෙමියි කීහ තුන්වන භික්ෂුතෙම ස්වාමිනි නුඹවහන්සේට මාගේ ආශ්වාස ප්‍රාශ්වාස වැලකීමෙන් යම්කිසි රෝග ව්‍යුපසමනාදී ප්‍රයෝජනයක් ඇතැයි කියාතම් මම මාගේ ආශ්වාස ප්‍රාශ්වාස වලක්වා කාලක්‍රියා කරන්නට උත්සාහ ඇත්තෙමි කීහ මහ තෙරුන්වහන්සේද එකාන්තයෙන් මේ භික්ෂූහු භව්‍යයෝයයි සිතා කමටහන් දුන්හ ඒ භික්ෂූහුද තෙරුන්ගේ අවවාදයෙහි පිහිටා කමටහන් වඩා තුන්දෙනම සියලු කෙලෙසුන් නසා රහත්ඵලයට පැමිණියෝය මේ ආත්මභාවය පාවාදීමෙහි අනුසස්වන්නේයි. එහෙයින් භාග්‍යවත් බුදුන්වහෝ ආචාර්‍ය්‍යයන්වහෝ ආත්මභාවය පාවාදියයුතුයයි කියනලද්දේය මේ භික්ෂූන් තුන්දෙනා විසින්ම ආචාර්‍ය්‍යයන් කෙරෙහි ආදරය හැඟවීමෙන් තමන්ගේ වීර්‍ය්‍යාරම්භය හඟවනලද්දේයයි දතයුතු.

සම්පූර්ණවූ අධ්‍යාශය ඇත්තාහුවිසින් සම්පූර්ණ අධිමුක්තයි ඇත්තාහු විසිනයනමෙහි වනාහි ඒ යෝගාවචර පුද්ගලයා විසින් අලෝභාදී වශයෙන් සයාකාරයකින් සම්පන්නාධ්‍යාශය ඇතියවියයුත්තේය හෙවත් මුවන්ගේ සයනස්ථානයක්මෙන් විපනයාගේ සයනස්ථානය අධ්‍යාශයනම ඒ අධ්‍යාශයද විපන්නය සම්පන්නයයි දෙවැදෑරුම්වෙයි ඔවුන් අතුරෙන් ශාශ්වතාදි මිථ්‍යාදෘෂ්ටි නිශ්‍රිතවීනම් විපන්නාධ්‍යාශය නම සම්පන්නාධ්‍යාශය ද භවනිශ්‍රිතය විභවනිශ්‍රිතයයි දෙවැදෑරුම්වෙයි එහිදු විභවනිශ්‍රිත සම්පන්නාධ්‍යාශය ඇති පුද්ගලතෙම මෙතන්හි දතයුත්තෝයි මෙසේ සම්පූර්ණ අදහස් ඇති යෝගාවචරතෙම සම්‍යක්සම්බෝධිය ප්‍රත්‍යෙකබෝධිය ශ්‍රාවකබෝධිය යනමොවුන් අතුරෙන් එක්තරා බෝධිඥානයක් මුහුකුරුවනු පිණිස පොහොසත්වන්නේය හේ කෙසේදයත්? ඇලීම ලක්ෂණකොට ප

වන්නා ලෝභයෙහි දෝෂ දක්නා සුලුවූ බොධිසත්වයෝ අලෝභිනම් නොසේවමෝදෙහෝයි අලෝභ අදහස් ඇත්තාහුවෙති දූෂ්‍යවීම ලක්‍ෂණකොට පවත්නා ද්වේෂයෙහි ආදීනව දක්නා සුලුවූ බොධිසත්වයෝ අද්වේෂිනම් නොසේවමුදෙහෝයි අද්වේෂ අදහස් ඇත්තාහුවෙති මුළාවීම ලක්‍ෂණකොට පවත්නා මෝහයෙහි ආදීනව දක්නා සුලුවූ බොධිසත්වයෝ අමෝහිනම් නොසේවවෝදෙහෝයි අමෝහ අදහස් ඇත්තාහුවෙති ගිහිගෙහි විසීමෙහි දෝස් දක්නා සුලුවූ බොධිසත්වයෝ පැවිදිනම් නොසේවමෝදෙහෝයි ප්‍රව්‍රජ්‍යායෙහි අදහස් ඇත්තාහුවෙති ගණයාකෙරෙහි ඇලීමෙහි දෝස් දක්නා සුලුවූ බොධිසත්වයෝ විවෙකීනම් නොසේවමෝදෙහෝයි විවෙක අදහස් ඇත්තාහුවෙති සියලු භවගතියෙහි දෝස් දක්නා සුලුවූ බොධිසත්වයෝ භවනිස්සරණයට කාරණාවූ නිර්වාණයෙහි නැමුනු අදහස් ඇත්තාහුවෙත් මැයි යම්කිසි අතීතානාගත වර්තමානවූ සෝවාන් සකෘදාගාමි අනාගාමි අර්හත් ප්‍රත්‍යෙකබුද්ධ සම්‍යක්සම්බුද්ධ කෙනෙක්වූවාහුද ඔවුන් හැම්දෙනම මෙම සයාකාරයෙන් තමතමන් විසින් පැමිණියයුතු අධිගම විශෙෂයන්ට පැමිණියාහුය එහෙයින් මේ සයාකාරයෙන් සම්පූර්ණ අදහස් ඇතිවියයුත්තේය.

ඒ එසේමැයි අලොභය මාත්සර්‍ය්‍යයටද අද්වේෂය දුශ්ශීල මලයටද අමෝහය කුශල ධර්මයෙහි ප්‍රමාදවීම් සඞ්ඛ්‍යාත නොවැඩීමටද ප්‍රතිපක්‍ෂවන්නේයි තවද අලෝභය ත්‍යාගයටද අද්වේෂය ශීලයටද අමෝහය කුශලධර්මයන්ගේ වැඩීමටද කාරණාවන්නේයි. ලුබ්ධයා බොහෝකොට ගන්නාබැවින් අලෝභය කාරණකොටගෙණ මදකොට ගන්නේවෙයි දුෂ්ටයා ඌනකොට ගන්නාබැවින් අද්වේෂය කාරණකොටගෙණ අනූනකොට ගන්නේවෙයි මූඪයා විපරීත වශයෙන් ගන්නාහෙයින් අමෝහය කාරණකොටගෙණ අවිපරීතකොට ගන්නේවෙයි තවද අලෝභය කාරණකොටගෙණ විද්‍යමාන දෝෂය දෝස් නිදෝස් වශයෙන් සිරා දෝෂයෙහිම පවත්නේය ලෝභී තෙම දෝෂය මුවහකරයි අද්වේෂය කාරණකොටගෙණ විද්‍යමාන ගුණය ගුණාගුණ වශයෙන් සිරා ගුණයෙහිම පවත්නේය දුෂ්ටතෙම ගුණ මකන්නේයි අමෝහය කාරණකොටගෙණ තත්වූ පරිදි තත්වූ පරිද්දෙන් සිරා තත්වභාවයෙහිම පවත්නේය මූඪතෙම අසත්‍යය සත්‍යවශයෙන්ද සත්‍යය අසත්‍යවශයෙන්ද ගන්නේයි තවද ලුබ්ධයාහට ප්‍රිය සවභාව ඇත්තෙහෙයින්ද ප්‍රියවිප්‍රයොග දුක නොඉවසනහෙයින්ද අලෝභය කාරණකොටගෙණ ප්‍රියවිප්‍රයොග දුක නොවන්නේය දුෂ්ටයාහට අප්‍රිය සවභාව ඇතිහෙයින්ද අප්‍රිය සම්ප්‍රයොග දුක නොඉවසනහෙයින්ද අද්වේෂය කාරණකොටගෙණ අප්‍රිය සම්ප්‍රයොග දුක නොවන්නේය අමෝහී පුද්ගලතෙම ආදීනව සලකනහෙයින් අමෝහය කාරණකොටගෙණ කැමති වස්තූහුගේ නොලැබීමෙන්වන දුක නොවන්නේයි තවද අලෝභයට තෘෂ්ණාව ප්‍රතිපක්‍ෂහෙයින්ද ජාතිදුඃඛයට තෘෂ්ණාව මුල්වනහෙයින්ද අලෝභය කාරණකොටගෙණ ජාතිදුක නොවන්නේය තියුණු ද්වේෂ ඇත්තාහට වහාම ජරාව සම්භවනහෙයින් අද්වේෂය කාරණකොටගෙණ ජරාදුක නොවන්නේය අමෝහී පුද්ගලයාහට දුක්වූ සම්මෝහ මරණ දුක නොවනබැවින් අමෝහය කාරණකොටගෙණ මරණ දුක නොවන්නේය අලෝභයෙන් ගෘහස්ථයන්

ගේද අමොහයෙන් ප්‍රව්‍රජිතයන්ගේද අද්වේෂයෙන් සියලුදෙනාගේද සැපවූ සමගවාසයවන්නේය විශෙෂ වශයෙන් අලොභය කාරණකොටගෙණ ප්‍රේතලොකොත්පත්තිය නොවන්නේය ඒ එසේමැයි බොහෝසෙයින් සත්වයෝ තෘෂ්ණාව කාරණකොටගෙණ ප්‍රේතලොකයෙහි උපදිත්මැයි ඒ තෘෂ්ණාවටද මේ අලොභය ප්‍රතිපක්‍ෂවන්නේමැයි ද්වෙෂය කාරණකොටගෙණ නරකොත්පත්තියවනහෙයින් තත් ප්‍රතිපක්‍ෂවූ අද්වේෂය කාරණකොටගෙණ නරකොත්පත්තිය නොවන්නේය අමොහය කාරණකොටගෙණ තිරිසන්යොනියෙහි නොඋපදනේය ඒ එසේමැයි මොහය කාරණකොටගෙණ නිත්‍ය සම්මූඪවූ තිරිසන්යොනියෙහි උපදනේයි තවද අලොභය රාග වශයෙන් එලඹීමද අද්වේෂය ද්වේෂ වශයෙන් එලඹීමද අමොහය අමධ්‍යස්ත භාවයෙන් එලඹීමද වලක්වන්නේය එපරිද්දෙන්ම මේ අලොභ අද්වෙෂ අමොහ තුණින් පිළිවෙළින් නෙක්ඛම්මසඤ්ඤා අව්‍යාපාදසඤ්ඤා අවිහිංස සඤ්ඤා යන ත්‍රිවිධ සංඥාවද අශුභ සංඥා අප්‍රමාණ සංඥා ධාතු සංඥා යන තුනද උපදනාහුය තවද අලොභයෙන් කාමසුඛල්ලිකානුයොග නැමති අන්තයාගේ දුරුකිරීමද අද්වේෂයෙන් අත්තකිලමථානුයොග නැමති අන්තයාගේ දුරුකිරීමද අමොහයෙන් මධ්‍යම ප්‍රතිපදාවට පිළිපැදීමද වන්නේයි එපරිද්දෙන්ම අලොභයෙන් අභිධ්‍යා කාය ග්‍රන්ථයාගේ බිඳීමද අද්වේෂයෙන් ව්‍යාපාද කාය ග්‍රන්ථයාගේ බිඳීමද අමොහයෙන් සීලබ්බතපරාමාස ඉදං සච්චාභිනිවෙස යන කාය ග්‍රන්ථයන් දෙදෙනාගේ බිඳීමදවන්නේමැයි තවද පළමුවන දෙවන සතිපට්ඨානයෝ දෙදෙන අලොභ අද්වෙෂ දෙදෙනාගේ ආනුභාවයෙන්ද තුන්වන සතරවන සතිපට්ඨානයෝ දෙදෙන අමොහයාගේ ආනුභාවයෙන්ද සම්පාදිතවන්නේය මොවුන් අතුරෙන් අලොභය නිරොගිබවට ප්‍රත්‍යයවන්නේය ඒ එසේමැයි අලොභීතෙම ලොභ කටයුතුවූද නොසැපවූ ප්‍රත්‍යය පරිභොග නොකරණහෙයින් නිරොගීවන්නේය අද්වෙෂීතෙම ඇග රැලිවැටීම් හිසකේ පැසීම් ආදීය වන එලවන්නාවූ ද්වෙෂ නැමති ගින්නෙන් නොදවනු ලබනහෙයින් බොහෝ කාලක් යෞවනයෙහි සිටිනහෙයින්ද අද්වේෂය යෞවනයට ප්‍රත්‍යයවන්නේය අමොහී පුද්ගලතෙම හිත අහිත දැන අහිත දුරුකොට හිත සෙවනයකොට බොහෝ දීඝායුෂ ලබනහෙයින් අමොහය දීඝායුෂයට ප්‍රත්‍යයවන්නේය ත්‍යාගයෙන් භොගසම්පත්ති ප්‍රතිලාභයවනහෙයින් අලොභය භොගසම්පත්තියට ප්‍රත්‍යයවන්නේය මෛත්‍රියෙන් මිත්‍ර ප්‍රතිලාභයද නොපිරිහීද්වනහෙයින් අද්වේෂය මිත්‍ර සම්පත්යට ප්‍රත්‍යයවන්නේය අමොහීතෙම තමහට වැඩක්මකරණහෙයින් අමොහය ආත්ම සම්පත්තියට ප්‍රත්‍යයවන්නේය තවද අලොභය දිව්‍ය විහාරයටද අද්වේෂය බ්‍රහ්මවිහාරයටද අමොහය ආර්ය විහාරයටද කාරණාවන්නේය අලොභීහට ස්වකීය ජනයාගේ විනාශයෙහි ඇලීම හෙතුකොට උපදනා දුක් නොවනබැවින් අලොභයෙන් ස්වකීය පක්‍ෂයෙහි සත්ව සංස්කාරයන්කෙරෙහි නිවුනේවෙයි අද්වෙෂීහට පර පක්‍ෂයෙහි ජනයාගේ විනාශයෙහි සතුටුවියයුතු නොවනහෙයින්ද වෛරීන් කෙරෙහිදු වෛරී සංඥා නැතිබැවින්ද අද්වෙෂය කාරණකොටගෙණ පර පක්‍ෂයෙහි සත්ව සංස්කාරයන්කෙරෙහි නිවුනේවෙයි අමොහීහට සියලුතැන සඞ්ඛාතැතිබැ

බැවින් අපේක්ෂාහය මිහු අම්හු උදස හා ත්‍රිවිධ පක්ෂයෙහි සර්වසංස්කාරය න් එසමෙරනිම නිඳුලත් ඉඳිසි ලො භිනු උපෙක්ෂාක තෘෂ්ණාව කරණ කොටගෙන අනිත්‍යවූ සංස්කාරයන් නිත්‍යවශයෙන් දක්නා බැවින් අලෝභය කරණකොටගෙන අනිත්‍යදර්ශන යද අපේක්ෂා දුරුකරණලද තෙවිධ ආකාරවූ පරිග්‍රහ ඇති බැවින්ද සංස්කාරයන් දුක්වශයෙන් දක්නා බැවින්ද අපේක්ෂාකාරණකොටගෙන දුඃඛදර්ශනයද අපේක්ෂානිකන්තමේ නාත්වූපරි ද්දේදන් ධ්‍යානගැට්ටෙමෙහි දක්ෂබැවින් හා අපරිණායකවූ සතත්ව පරද්‍රව්‍යය සපරි ණ යතාවමයන් දක්නාගන්නා බැවින්ද අමොහය කාරණකොටගෙන අනා ත්මදර්ශනයද වන්නේයි. යම්සේ මේ අලෝභ අද්වේෂ අමොහයන් කාරණ කොටගෙන අනිත්‍ය දුඃඛ අනාත්ම දර්ශනයෝ වෙද්ද එපරිද්දෙන්ම අනිත්‍ය දර්ශනාදීන්ගේ අලෝභාදීහුද වෙත්දැයි කෙසේද අනිත්‍යදර්ශනයෙන් අලෝභ යද දුඃඛ දර්ශනයෙන් අද්වේෂයද අනා ත්මදර්ශනයෙන් අමොහයද වෙත්හි දක්නායාහුහි කවරෙක් නම් මේ සං ස්කාරධර්මයන් අනිත්‍යයයි මනා කොට දැන ඒ සංස්කාරයන්ගේ ප්‍රති ලාභය පිණිස තෘෂ්ණාව උපදවාද නොඋපදවාදැයි කවරෙක්නම් සංස් කාරයන් දුකයයි දැන අතීක්ෂ්ණවූ අති ශය තීක්ෂ්ණවූ ක්‍රොධය උපදවාද නො උපදවාදැයි කවරෙක්නම් ආත්මයෙ න් ශූන්‍යයයි අවබෝධකොට නැවත මුළාවට පැමිණේද නොපැමිණේදැයි

යමක් පිණිස භාවනාවෙහි යෙදේද උවමනාව රක්නේද ඒ අභිය සිංඛිරිමෙහි කැමැත්ත ඇතිවියයුත් තේය සමාධියෙහි කැමැත්ත ඇතිවිය යුත්තේය සමාධිය ගුරුකොට විසිය යුත්තේය සමාධියෙහි නිමිනව විසිය යුත්තේය නිර්වාණයෙහි කැමැත්ත ඇ තිවියයුත්තේය නිර්වාණය ගුරුකොට විසියයුත්තේය නිර්වාණයෙහි නිමිනව විසියයුත්තේය යන අර්ථයි. මෙසේ සම්පූර්ණ අදහස් ඇතිව සම්පූර්ණ කැමැත්ත ඇතිව කමටහන් ඉල්ලන් නාවූ මේ යෝගාවචරයාගේ චරිතය පරසින් පිරිසිඳදන්නා හුවහලද ආචා ර්යයා විසින් සිත්හසර බලා දතයුත් තේය පරසින්දන්නා හුවණ නොලත් ආචාර්යයා විසින් තොපි කවර චරිත ඇත්තාහිදැයි විචාරා දතයුත්තේය එසේත් නොදනුම්හයි කීයේනම් තො පගේ සනාතනයෙහි කවර ධර්මයෙක් බොහෝකොට හැසිරේදද අනු භාදින් ගෙන් කවර කමටහනක් මෙ නෙහිකාරනාවූ තොපගේ සිත එක ගව සුවසේ වෙසේද කවර කමටහනෙහි කා තොපගේ සිත ප්‍රසාදියෙයන් නැ ඹිඳියි යනා මේ ආදිහසින් විචාරා දත යුත්තේය මෙසේ දැන චරිතයට අනු කූලවූ කමටහනක්ම කියයුත්තේය ඒ කමටහන කියනානු එසිනුදු තුන් පරිච්ඡේදයකින් කියයුත්තේය කෙසේ කෙ සේදයත් ? ස්වභාවයෙන් උගත් කමටහනක් ඇත්තාහට හෙවත් ස්වාධ්‍යා යන වශයෙන් කන් මෙම්නාහිනිරීක්ෂව ශනයෝ හෝ පුරුදු උගුණුකරණලද කමටහන් ඇති යෝගාවචරයාහට එක අස්නක් දෙඅස්නක් හෝ සරවාදීනයුත් තේය කමසමීපයෙහි වසනාහට ආ ආ කල පුරාණයි අස අසා කියයුත් තේය කමටහන් උගෙණ අන්තැන කට යනු කැමැත්තාහට ඉතා සංක්ෂෙ ප නොකොට ඉතා විස්තර නො කොට කියයුත්තේය ඒ කමටහන් යන යන් අනුමෙරන් පළමුකොට පාලිකස

ණ කර්මස්ථානය කියනනාහු විසින් සතරකසිණදෙසමයෝය කසිණකරණ ක්‍රමය කරණලද කසිණය භාවනාකරණ විධිය දෙවැදෑරුම් නිමිත්තය දෙවැදෑරුම් සමාධිය සත්වැදෑරුම් සෑපෙනාසැපවිධිය දසවැදෑරුම් අර්පණා කුශලත්වය වීර්‍ය්‍යසමාභාවය අර්පණාවිධානය යන මේ නවආකාරයෝ කියයුත්තාහුයි අවශෙෂවූ එකුන්සාලිස් කර්මස්ථානයෙහිදු ඒ ඒ කමටහනට සුදුසු සුදුසු පරිච්ඡෙදයන් කිය යුත්තෝයි එ සියල්ල ඒ කර්මස්ථාන භාවනා විධි දක්වනයන්හි ප්‍රකාශවන්නෝයි මෙසේ කමටහන් කියනකල්හි ඒ යොගාවචරයා විසින් නිමිත්ත ග්‍රහණය කොට ඇසියයුත්තේය නිමිත්තග්‍රහණයකොට ආචාර්‍ය්‍යයා විසින් කියනලද කර්මස්ථානයාගේ මේ යටපදය මේ මතුපදය අර්ථය මේය අභිප්‍රාය මේය උපමා මේයයි මෙසේ ඒ ඒ ආකාරය සිත්හි බැඳගෙණ ඇසිමවන්නේය මෙසේ නිමිත්තග්‍රහණයකොට සකස්ව අසන්නාහු විසින් කර්මස්ථානය මනාකොට ගන්නාලද්දේනම් වන්නේයි ඉක්බිත්තෙන් ඒ කර්මස්ථානය භාවනාවඩනනාහට ඒ කමටහණ කාරණකොටගෙණ අභිඥ සමාපත්ති මාර්ග ඵලසඞ්ඛ්‍යාත විශෙෂාධිගමය සිද්ධවන්නේය කමටහන් නොවඩනනාවූ අනිකෙක්හට සිද්ධනොවන්නේමැයි. මේ දක්වනලද්දේ කමටහන් ගෙණය යන මේපදයාගෙ අර්ථවිවරණයවන්නේයි. මෙතෙකින්කල්‍යාණමිත්‍රවූ ආචාර්‍ය්‍යයෙකු කරා එළඹ තමන්ගේ චරිතයට සුදුසුවූ සතලිස් කමටහනුන් අතුරෙන් එක්තරා කමටහණක් ගෙණ යන මේ සියලු පදයෝ සර්වප්‍රකාරයෙන්ම විස්තරකරණලද්දනුමවන්නෑයි.—

මෙතෙකින් සාධුජනප්‍රමොදය පිණිස කරණලද විශුද්ධිමාර්ගයෙහි සමාධි භාවනාධිකාරයෙහි

## කර්මස්ථානග්‍රහණ නිර්දේශනම්වූ

### තුන්වනපරිච්ඡෙදය කියා නිමවනලදී.

—0—

( පා ¶ )

ඉදානි යං වුත්තං සමාධිභාවනාය අනනුරූපං විහාරං පහාය අනුරූපෙ විහරන්තෙනාති එත්ථ යස්ස තාව ආචරියෙන සද්ධිං එකවිහාරෙ වසතො ඵාසු හොති තෙන තත්ථෙව කම්මට්ඨානං පරිසොධෙන්තෙන වසිතබ්බං සචෙ තත්ථ ඵාසු න හොති යො අඤ්ඤො ගාවුතෙ වා අඩ්ඪයොජනෙ වා යොජනමත්තෙපි සප්පායො විහාරො හොති තත්ථ වසිතබ්බං එවං හි සති කම්මට්ඨානස්ස කිස්මිඤ්චි දෙව ඨානෙ සන්දෙහෙ වා සතිසම්මොසෙ වා ජාතෙ කාලස්සෙව විහාරෙ වත්තං කත්වා අන්තරාමග්ගෙ පිණ්ඩාය චරිත්වා භත්තකිච්චපරියොසානෙ ආචරියස්ස වසනට්ඨානං ගන්ත්වා තං දිවසං ආචරියස්ස සන්තිකෙ කම්මට්ඨානං සොධෙත්වා දුතියදිවසෙ ආචරියං වන්දිත්වා නික්ඛමිත්වා අන්තරාමග්ගෙ පිණ්ඩාය චරිත්වා අකිලමන්තොයෙව අත්තනො වසනට්ඨානං ආගන්තුං සක්ඛිස්සති යො පන යොජනප්පමාණෙපි ඵාසුට්ඨානං න ලභති තෙන කම්මට්ඨානෙ සබ්බං ගණ්ඨිට්ඨානං ඡින්දිත්වා සුවිසුද්ධං ආවජ්ජනපටිබද්ධං කම්මට්ඨානං කත්වා දූරම්පි ගන්ත්වා සමාධිභාවනාය අනනුරූපං විහාරං පහාය අනුරූපෙ විහාතබ්බං තත්ථ අනනුරූපො නාම අට්ඨාර

සන්නං දොසානං අඤ්ඤතරෙන සමන්නාගතො. තත්‍රිමෙ අට්ඨාරසදොසා — මහන්තත්තං නවත්තං ජිණ්ණත්තං පන්ථනිස්සිතත්තං සොණ්ඩිං පණ්ණං පුප්ඵං ඵලං පත්ථනීයතා නගරසන්නිස්සිතතා දාරුසන්නිස්සිතතා ඛෙත්තසන්නිස්සිතතා විසභාගානං පුග්ගලානං අත්ථිතා පට්ටනසන්නිස්සිතතා පච්චන්තසන්නිස්සිතතා රජ්ජසීමසන්නිස්සිතතා අසප්පායතා කල්‍යාණමිත්තානං අලාභොති ඉමෙසං අට්ඨාරසන්නං අඤ්ඤතරෙන දොසෙන සමන්නාගතො අනනුරූපො නාම න තත්ථ විහාතබ්බං — කස්මා — මහාවිහාරෙ තාව බහූ නානාච්ඡන්දා සන්නිපතන්ති තෙ අඤ්ඤමඤ්ඤං පටිවිරුද්ධතාය වත්තං න කරොන්ති බොධිඅඞ්ගනාදීනි අසම්මට්ඨානෙව හොන්ති අනුපට්ඨාපිතං පානීයං පරිභොජනීයං තත්‍රායං ගොචරගාමෙ පිණ්ඩාය චරිස්සාමීති පත්තචීවරමාදාය නික්ඛන්තො සචෙ පස්සති වත්තං වා අකතං පානීයඝටං වා රිත්තං අථානෙන වත්තං කාතබ්බං හොති පානීයං උපට්ඨාපෙතබ්බං අකරොන්තො වත්තභෙදෙ දුක්කටං ආපජ්ජති කරොන්තස්ස කාලො අතික්කමති අතිදිවා පවිට්ඨො නිට්ඨිතාය භික්ඛාය කිඤ්චි න ලභති පටිසල්ලානගතොපි සාමණෙරදහරභික්ඛූනං උච්චාසද්දෙන සඞ්ඝකම්මෙහි ච වික්ඛිපති යත්ථ පන සබ්බං වත්තං කතමෙව හොති අවසෙසා ච සඞ්ඝට්ටනා නත්ථි එවරූපෙ මහාවිහාරෙපි විහාතබ්බං — නවවිහාරෙ බහුං නවකම්මං හොති අකරොන්තං උජ්ඣායන්ති යත්ථ පන භික්ඛූ එවං වදන්ති ආයස්මා යථාසුඛං සමණධම්මං කරොතු මයං නවකම්මං කරිස්සාමාති එවරූපෙ විහාතබ්බං — ජිණ්ණවිහාරෙ පන බහු පටිජග්ගිතබ්බං හොති අන්තමසො අත්තනො සෙනාසනමත්තම්පි අප්පටිජග්ගන්තං උජ්ඣායන්ති පටිජග්ගන්තස්ස කම්මට්ඨානං පරිහායති — පන්ථනිස්සිතෙ මහාපථවිහාරෙ රත්තින්දිවං ආගන්තුකා සන්නිපතන්ති විකාලෙ ආගතානං අත්තනො සෙනාසනං දත්වා රුක්ඛමූලෙ වා පාසාණපිට්ඨෙ වා වසිතබ්බං හොති පුනදිවසෙපි එවමෙවාති කම්මට්ඨානස්ස ඔකාසො න හොති — යත්ථපන සොණ්ඩී නාම පාසාණපොක්ඛරණී හොති තත්ථ පානීයත්ථං මහාජනො සමොතරති නගරවාසීනං රාජකුලූපකත්ථෙරානං අන්තෙවාසිකා රජනකම්මත්ථාය ආගච්ඡන්ති තෙසං භාජනදාරුදොණිකාදීනි පුච්ඡන්තානං අසුකෙ ච අසුකෙ ච ඨානෙති දස්සෙතබ්බානි හොන්ති එවං සබ්බකාලම්පි නිච්චබ්‍යාවටා හොන්ති — යත්ථ නානාවිධං සාකපණ්ණං හොති තත්ථස්ස කම්මට්ඨානං ගහෙත්වා දිවාවිහාරං නිසින්නස්සාපි සන්තිකෙ සාකහාරිකා ගායමානා පණ්ණං උච්චිනන්තියො විසභාගසද්දසඞ්ඝට්ටනෙන කම්මට්ඨානන්තරායං කරොන්ති — යත්ථ පන නානාවිධා මාලාගච්ඡා සුපුප්ඵිතා හොන්ති තත්‍රාපි තාදිසො යෙව උපද්දවො — යත්ථ නානාවිධං අම්බජම්බුපනසාදිඵලං හොති තත්ථ ඵලත්ථිකා ආගන්ත්වා යාචන්ති අදෙන්තස්ස කුජ්ඣන්ති බලක්කාරෙන වා ගණ්හන්ති සායන්හසමයෙ විහාරමජ්ඣෙ චඞ්කමන්තෙන තෙ දිස්වා කිං උපාසකා එවං කරොථාති වුත්තා යථාරුචි අක්කොසන්ති අවාසාය පිස්ස පරක්කමන්ති — පත්ථනීයෙ පන ලොකසම්මතෙ දක්ඛිණගිරි හත්ථිකුච්ඡි චෙතියගිරි චිත්තලපබ්බත සදිසෙ විහාරෙ විහරන්තං අයං අරහාති සම්භාවෙත්වා වන්දිතුකාමා මනුස්සා සමන්තා ඔසරන්ති තෙනස්ස න ඵාසු හො

හි යස්සපන තං සප්පායං හොති තෙන දිවා අඤ්ඤත්ථ ගන්ත්වා රත්තිං වසිතබ්බං — නගරසන්නිස්සිතෙ විසභාගාරම්මණානි ආපාථං ආගච්ඡන්ති සුවිහදයිතබ්බාපි සමෙන්ති නිසංසනාගිතා ගච්ඡන්ති ඔතාරමිත්වා මිගං න දෙන්ති ඉස්සරම්භුස්සාපි විහාරම්හි ජෙට්ඨසානිං පරික්ඛිපිත්වා නිසීදන්ති — දූරෙ සන්නිස්සයෙ පන යස්ස සඤ්චාරිම දුබ්බුපසාරණෙ රුක්ඛාච සන්ති තත්ථ කට්ඨහාරිකා පුබ්බෙව බුදහාසාහස පුප්ඵහාරිකාවිය අඵාසුං කරොන්ති විහාරෙ රුක්ඛා සන්ති තෙපි ඡින්දිත්වා ඝරානි කරියමානි මනුස්සා ආගන්ත්වා ඡින්දන්ති සචෙ සායණ්හසමයං පධානඝරා නික්ඛමිත්වා විහාරමජ්ඣෙ චඞ්කමන්තා නෙ දිස්වා කිං උපාසකා එවං කරොථාති වදති යථාරුචිං අක්කොසන්ති සන්ති අවාසාය පිස්ස පරක්කමන්ති — යො පන ඛෙත්තසන්නිස්සිතො හොති සමන්තා ඛෙත්තානි පරිවාරිතො තත්ථ මනුස්සා විහාරමජ්ඣෙයෙව ඛලං කත්වා ධඤ්ඤං මද්දන්ති පමුඛෙ සුපන්ති අඤ්ඤම්පි බහුං අඵාසුං කරොන්ති යත්ථාපි මහාසඞ්ඝභොගො හොති ආරාමිකා කුලානං ගාවො රුන්ධන්ති උදකවාරං පටිසෙධෙන්ති මනුස්සා වීහිසීසං ගහෙත්වා පස්සථ තුම්හාකං ආරාමිකකුලානං කම්මන්ති සඞ්ඝස්ස දස්සෙන්ති තෙන තෙන කාරණෙන රාජරාජමහාමත්තානං ඝරද්වාරං ගන්තබ්බං හොති අයම්පි ඛෙත්තසන්නිස්සිතෙනෙව සඞ්ගහිතො — විසභාගානං පුග්ගලානං අත්ථිතාති යත්ථ අඤ්ඤමඤ්ඤං විසභාගා වෙරි භික්ඛූ විහරන්ති යෙ කලහං කරොන්තා මා භන්තෙ එවං කරොථාති වාරියමානා එතස්ස පංසුකූලිකස්ස ආගතකාලතො පට්ඨාය නට්ඨම්හාති වත්තාරො හොන්ති — යොපි උදකපට්ටනං වා ථලපට්ටනං වා නිස්සිතො හොති තත්ථ අභිණ්හං නාවාහි චෙව සත්ථෙහි ච ආගතමනුස්සා ඔකාසං දෙථ පානීයං දෙථ ලොණං දෙථාති සඞ්ඝට්ටෙන්තා අඵාසුං කරොන්ති පච්චන්තනිස්සිතෙ පන මනුස්සා බුද්ධාදීසු අප්පසන්නා හොන්ති — රජ්ජසීමනිස්සිතෙ රාජභයං හොති තඤ්හි පදෙසං එකො රාජා න මය්හං වසෙ වත්තතීති පහරති ඉතරොපි න මය්හං වසෙ වත්තතීති තත්‍රායං භික්ඛු කදාචි ඉමස්ස රඤ්ඤො විජිතෙ විචරති කදාචි එතස්ස අථ නං චරපුරිසොති මඤ්ඤමානා අනයබ්‍යසනං පාපෙන්ති — අසප්පායතාති විසභාගරූපාදි ආරම්මණසමොසරණෙන වා අමනුස්සපරිග්ගහිතතාය වා අසප්පායතා තත්‍රිදං වත්ථු — එකො කිර ථෙරො අරඤ්ඤෙ වසති අථස්ස එකා යක්ඛිනී පණ්ණසාලද්වාරෙ ඨත්වා ගායි සො නික්ඛමිත්වා ද්වාරෙ අට්ඨාසි සා ගන්ත්වා චඞ්කමනසීසෙ ගායි ථෙරො චඞ්කමනසීසං අගමාසි සා සතපොරිසෙ පපාතෙ ඨත්වා ගායි ථෙරො පටිනිවත්ති අථ නං සා වෙගෙනාගන්ත්වා ගහෙත්වා භන්තෙ මයා එවරූපා එවරූපා තුම්හාදිසා ඛාදිතාති ආහ — කල්‍යාණමිත්තානං අලාභොති යත්ථ න සක්කා හොති ආචරියං වා ආචරියමත්තං වා උපජ්ඣායං වා උපජ්ඣායමත්තං වා කල්‍යාණමිත්තං වා ලද්ධුං තත්ථ සො කල්‍යාණමිත්තානං අලාභො මහාදොසොයෙවාති ඉමෙසං අට්ඨාරසන්නං දොසානං අඤ්ඤතරෙන සමන්නාගතො අනනුරූපොති වෙදිතබ්බො — වුත්තම්පි චෙතං අට්ඨකථාසු —

මහාවාසං නවාවාසං
ජරාවාසඤ්ච පන්ථනිං
සොණ්ඩිං පණ්ණඤ්ච පුප්ඵඤ්ච
ඵලං පත්ථිතමෙව ච —

හාරං දූරතො වෙහන්තං
විසාහශෙන පට්ටනං
පච්චන්ත සීමා සප්පායං
යත්ථ මිච්ඡතා න ලබ්භති
අට්ඨාරසෙතානි ඨානානි
ඉති විඤ්ඤාය පණ්ඩිතො
ආරකා පරිවජ්ජෙය්‍ය
මග්ගං පටිභයං යථාති

( ස ¶ )

ඉදානි, දැන්; යං වුත්තං, යමෙක් කී සේහාලදද; සමාධි—පෙ—එළිපත, මෙති වනාහි; ආචරියෙන සහිං, ආචාරීන් හා සමග; එකවිහාරෙ වසන්තො, එක වෙහෙර විසන්නාවූ; යස්ස, යමෙක් හට; ඵාසු හොති [ආචාරීසප්පායාදී ලාභයෙන්ම මහාසත්කාරයට) සුවවේද; තෙන, ඔහු විසින්; තත්ථෙව, එහිම; කම්මට්ඨානං පරිසොධෙන්තෙන (ගැට පද සිඳ) කමටහන් පිරිසිදුකරන්නාහු විසින්; වසිතබ්බං, විසියයුතු; සචෙ, ඉදින්; තත්ථ, එහි; ඵාසු න හොති, ඵාසු නොවේනම්; යො අඤ්ඤො, යම් අනික් (විහාරෙ රාහොති" යනු සබඳ) ගාවුතෙ වා, ගවුවෙක හෝ; අඩ්ඪයොජනෙ වා, අඩ යොදුනෙක හෝ; යොජනමත්තෙ වා, යොදුනක් පමණ තැන හෝ; සප්පායො විහාරො හොති, සැප වෙහෙරක්වේද; තත්ථ වසිතබ්බං, එහි විසියයුතු; සචෙ, ඉදින්; තත්ථ, එහි; ඵාසුක හොති, ඵාසු නොවේනම්; එවං සති, එසේ කල්හි: කම්මට්ඨානස්ස, කමී ස්ථානයාගේ; කිඤ්චිදෙව දෙමට්ඨානෙ, කිසි හැමෙනක; සන්දෙහෙවානසති, සන්දෙහයක් හෝ ඇති කල්හි; සංසයෙවා ජාතෙ, සැක මූලාව ගිය කල්හි හෝ; කාලස්සෙව, උදෑසනම්; විහාරෙ වත්තං කත්වා, වසන වෙහෙරවත්කොට; අන්තරාමග්ගෙ පිණ්ඩාය චරිත්වා, අතුරුමඟ පිඩුසිඟා; භත්තකිච්ච පරියොසානෙ සෙව, බත්කිස කෙළවරම; ආචරියස්ස වසනට්ඨානං ගන්ත්වා, ආචාර්යයන් වසන තැනට එළඹ; තං දිවසං, එදවස්; ආචරියස්ස සන්තිකෙ, ආචාර්යයා සමීපයෙහි; කම්මට්ඨානං සොධෙත්වා, කමටහන් පිරිසිදුකොට; දුතියදිවසෙ, දෙවන දවස්; ආචරියං වන්දිත්වා, ආචාර්යයන් වැඳ; නික්ඛමිත්වා, නික්ම; අන්තරාමග්ගෙ පිණ්ඩාය චරිත්වා, අතුරුමඟ පිඩුසිඟා, අකිලන්තොයෙව, අක්ලාන්තකාය ඇතිවම; වසනට්ඨානං ආගන්තුං සක්ඛිස්සති, වසන තැනට එන්නට සමර්ථවේ; යො පන, යමෙක් වනාහි; යොජනප්පමාණෙපි ඵාසුකං නලභති, යොදුනක් පමණ තැනද ඵාසු තැනෙක් නොලැබේනම්; තෙන, ඔහු විසින්; කම්මට්ඨානෙ, කමටහණ; සබ්බං ගණ්ඨිට්ඨානං, සියලු ගැට තැන්; ඡින්දිත්වා (ඇති පත ළස්රිමෙන්) සිඳ; කම්මට්ඨානං, කමටහණ; සුවිසුද්ධං, පරිශුද්ධකොට; ආවජ්ජන පටිබද්ධං කත්වා, ආවර්ජන ප්‍රතිබද්ධකොට; දූරම්පි ගන්ත්වා, දුරවද ගොස්; සමාධිභාවනාය අනනුරූපං විහාරං, සමාධි භාවනාවට නුසුදුසු වෙහෙර; පහාය, හැර; අනුරූපෙ විහාරෙ වසිතබ්බං, සුදුසු වෙහෙර විසියයුතු; තත්ථ, එහි; අනුරූපො නාම, සුදුසු වෙහෙරනම්; අට්ඨාරසන්නං දොසානං, අටළොස් දෝෂයන් කෙරෙන්; අඤ්ඤතරෙන සමන්නාගතො, එක්තරා දෝෂයකින් සමන්විතවූයේ; තත්ථ, එහි; ඉමෙ අට්ඨාරස දොසා, මේ අටළොස් දෝෂයෝයි; මහත්තං, මහත් බවය; නවත්තං, අළුත් බවය; ජිණ්ණත්තං, ජීර්ණ බවය; පන්ථනිස්සිතත්තං, මඟක් ඇසුරුකළ බවය; සොණ්ඩිං, පැන්පොකුණු ඇත්තේය; පණ්ණං, පත්‍ර ඇත්තේය; පුප්ඵං, මල් ඇත්තේය; ඵලං, පල ඇත්තේය; පත්ථනීයතා, ප්‍රාර්ථනීය බවය; නගරසන්නිස්සිතතා, නුවර ඇසුරුකළ

ළ බවය; දාරුසන්නිස්සිතතා, දාරුසන්නිශ්‍රිත තැන් ඇසුරුකළ බවය; ඛෙත්තසන්නිස්සිතතා, කෙත්‍රසීමා ඇසුරුකළබවය; විසභාගානං පුග්ගලානං අත්ථිතා, විසභාග පුද්ගලයන් ඇතිබවය; පට්ටනසන්නිස්සිතතා, සමුද්‍රතීරය ඇසිරුකළබවය; පච්චන්ත සන්නිස්සිතතා, ප්‍රත්‍යන්තය ඇසිරු කළබවය; රජ්ජසීම සන්නිස්සිතතා, රාජ්‍ය සීමා ඇසිරුකළ බවය; අසප්පායතා, නොසැප බවය; කල්‍යාණමිත්තානං අලාභො, කල්‍යාණමිත්‍රයන්ගේ අලාභයයි; ඉමෙසං අට්ඨාරසන්නං, මේ අටළොස් දෝෂයන් අතුරෙන්; අඤ්ඤතරෙන දොසෙන සමන්නාගතො, එක්කරා දෝෂයෙකින් සමන්විතවූයේ; අනනුරූපො නාම, නොසුදුසු වෙහෙර නම්වේ; තත්‍ර, එහි; න විහාතබ්බං, නොවිසියයුතු; කස්මා, කුමක්හෙයින යත්? මහාවිහාරෙ, මහවෙහෙර; බහූ නානාඡන්දා සන්නිපතන්ති, බොහෝ නොඑක් අදහස් ඇත්තාහු රැස්වෙත්; තෙ, ඔව්හු; අඤ්ඤමඤ්ඤං පටිවිරුද්ධතාය, ඔවුනොවුන් ප්‍රතිවිරුද්ධ බැවින්; වත්තං න කරොන්ති, වත් නොකෙරෙති; බොධියඞ්ගණාදීනි, මහබෝ අඟන ආදීහු; අසම්මට්ඨානෙව හොන්ති, නොහමදනා ලදහුමවෙත්; පානීයං, බොන පැන්; පරිභොජනීයං, නහන පැන්; අනුපට්ඨපිතං, නොඑළවනලද්දේවේ; තත්‍ර, එහි; අයං, මේ මහණ තෙමේ; ගොචරගාමෙ පිණ්ඩාය චරිස්සාමීති, ගොචර ග්‍රාමයෙහි පිඬු සිඟමියි; පත්තචීවරමාදාය, පාසිවුරු ගෙණ; ගච්ඡන්තො, යන්නේ; සචෙ, ඉදින්; වත්තංවා අකතං පස්සති (මහබෝ අඟන ආදීතැන) වතක් හෝ නොකරණලදහු දකීද; පානීයඝටංවා රිත්තං (හැමදෙනා පැන් එළවියයුතුතැන) සිස්කළ හෝ දකීද; අථ, ඉක්බින්තෙන්; වත්තං කාතබ්බං හොති, වත් කටයුතුවෙයි; පානීයං උපට්ඨපෙතබ්බං, පැන් එළවියයුතුවේ; අකරොන්තො, නොකරන්නේ; වත්තභෙදෙ දුක්කටං ආපජ්ජති, වත් භෙදයෙන් දුකුළාවට අවදී; කරොන්තස්ස, වත් කරන්නාහට; කාලො අතික්කමති, කල් ඉක්මේ; අතිදිවා පවිට්ඨො, ඉතා දහවල් ගම්වදනේයේ; නිට්ඨිතාය භික්ඛාය, භික්ෂාව පළමුව වත් ඉහණනට දී නිමිකල; කිඤ්චි න ලභති, කිසිවක් නොලැබේ; පටිසල්ලානගතොපි, විවේකයට ගියේද; සාමණෙරදහර භික්ඛූනං, සාමණේරදහර මහණුන්ගේ; උච්චසද්දෙන, උස් හඬින්ද; සඞ්ඝකම්මෙහි ච, සඞ්ඝ කර්මයෙන්ද; වික්ඛිපති, වික්ෂෙපයමවේ; යත්ථ පන, යම් වෙහෙරක වනාහි; සබ්බං වත්තං කතමෙව හොති, සියළු වත් කරණලද්දේමවේද; අවසෙසාපිච ඝට්ටනා නත්ථි, සෙසු ගැහැට්ද නැද්ද; එවරූපෙ, එබඳුවූ; මහාවිහාරෙපි, මහ වෙහෙරද; විහාතබ්බං, විසියයුතු; නවවිහාරෙ, අලුත් වෙහෙර; බහු නවකම්මං හොති, බොහෝ නවකම් ඇතිවේ; අකරොන්තං, නොකරන්නහු; උජ්ඣායන්ති, නිපෙත්; යත්ථපන, යම්තැනක වනාහි; භික්ඛූ, මහණහු; එවං වදන්ති, මෙසේ කියද්ද; ආයස්මා, ආයුෂ්මත්; යථා සුඛං, සුවසේ; සමණධම්මං කරොතු, මහණදම් කෙරේවා; මයං, අපි; නවකම්මං කරිස්සාමාති, නවකම් කරම්හයි; එවරූපෙ විහාරෙ, මෙබඳු වෙහෙර; විහාතබ්බං, විසියයුතු —

ජිණ්ණවිහාරෙපන, ජරාවෙහෙර වනාහි; බහුං පටිජග්ගිතබ්බං හොති, බොහෝ පිළිදුගතයුතුවේ; අන්තමසො, කෙළවරපිරිසෙයින්; අත්තනො සෙනාසනමත්තම්පි, තමාගේ සෙ

කාසුන් පමණකුදු; අප්පටිජග්ගනතං,
නොපිළිදගනනාව; උස්සිතානානි, සී
පත්; පටිජග්ගනතස්ස, පිළිදගන
හව; කම්මට්ඨානං පරිහායති, කමට
හන් පිරිහේ —

පත්ථනිස්සිතෙ (පත්ථනිස්සිතෙසි-
යේසි) මහාපථවිහාරෙ, මහවන් සමීප
යෙහි මවෙහෙර; රත්තින්දිවං, රෑදහවල්;
ආගන්තුකා සන්නිපතන්ති, ආගන්තු
කයෝ රැස්වෙත්; විකාලෙ ආගතානං,
නොකල්හි ආවාහට; අපාතමෙපා සෙ
නාසනං දත්වා, තමාගේ සෙනස්නද;
රුක්ඛමූලෙවා, රුක්මුල හෝ; පාසාණ
පිට්ඨේ වා වසිතබ්බං, පනමෝපිට කාහෝ
විසියයුතු; සුත දවසෙ පි, දෙවනදව
සුදු; එවමෙවාන්, මෙමෙස්ම්නු සි; කම්ම
ට්ඨානස්ස ඕකාසො න හොති: කමට
හණට අවකාශ නොමවි —

යස්ස පන, යම් වෙහෙරක, සො
ණ්ඩිතාම පාසාණපොක්ඛරණී හොති,
නෙම හාවූ ගල්පොකුණු වේද; තත්
පානීයත්ථං, එනි පැන්පිණිස; මහාජ
නො, මහජනතෙම; සමොසරති,
රැස්වෙයි; නගරවාසිතං, නුවර වසන්
නාවූ; රාජකුලූපකථෙරානං, රජකුල
යට එළඹියා තෙරවරුන්ගේ; අන්
තෙවාසිකා, අතවැසියෝ; රජන කම්ම
ත්ථාය ආගච්ඡන්ති, රදනකම්පිණිස
එති; තෙසං, ඔවුන්ට; භාජනදාරු
දෙණිනාදිනි, රජන්කම්බන විලඳය
දරය රජන්පිසනනැනග යනාදීගත්
හු) පුච්ඡන්තානං, විචාරන්නාහට;
අසුකෙ ච අසුකෙ ච ඨානෙ අත්ථි, අසුව
ල් අසුවල්තැනයයි; දස්සෙතබ්බානි
හොන්ති, දක්වයයුතුවෙත්; එවං, මෙ
සේ; සබ්බකාලම්පි නි, හැමදවස්හිම;
නිච්චබ්‍යාවටොහොති, නිත්‍යමෙයන් මෙ
හිම යුක්තවේ—

යත්ථ, යම් වෙහෙරක; නානාවි
ධං, නොඑක් ප්‍රකාරවූ; සාකපණ්ණං
හොති, පලාවේද; තත්ථ, ඒ වෙහෙර;
අස්ස, මොහු; කම්මට්ඨානං ගහෙත්වා,
කමටහන් ගෙණ; දිවාවිහාරං නිසින්
නස්සාපි සන්තිකෙ, දිවාවිහාරයේ
හුන්නාහු සමීපයෙහි; සාකහාරිකා,
පලාගෙණ යන මාගමීහු, ගායමානා
පණ්ණං උච්චිනන්තියො, ගී කියමින්
පලාබිඳිනාහු; විසභාගසද්ද සඞ්ඝට්ට
නෙන, විසභාගශබ්දයන්ගේ ඝට්ටන
යෙන්; කම්මට්ඨානන්තරායං කරො
න්ති, කමටහණට අන්තරාය කෙරෙත්
(කාමගුණූපසංහිත ගීතශබ්ද විසභාග
ශබ්දයෙනි. මෙහිල ස්ත්‍රී ශබ්දයද විස
භාගශබ්දයයිම දතයුතු) යත්ථ පන,
යම් වෙහෙරක; නානාවිධා මාලාග
ච්ඡා, නොඑක්වැදෑරුම් මල්රුක්හු;
සුපුප්ඵිතා හොන්ති; පිපිසිටිනාහු වේද;
තත්‍රාපි, ඒ වෙහෙරද; තාදිසොයෙව
උපද්දවො; එබඳුවූම උපද්‍රවයේ; යත්ථ,
යම් වෙහෙරක, නානාවිධං, නො
එක්වැදෑරුම්වූ; අම්බජම්බුපනසාදි
ඵලං හොති, අඹ දඹ කොස්ය ය
නාදී පලවේද; තත්ථ, ඒ වෙහෙරට;
ඵලත්ථිකා ආගන්ත්වා, පලකැමැත්තාහු
අවුදින්; යාචන්ති, ඉල්ලති; අදෙන්තස්
ස, නොදෙන්නහට; කුජ්ඣන්ති, කිපෙති;
බලක්කාරෙන වා ගණ්හන්ති,
බලාත්කාරයෙන් හෝ ගණිති; සාය
ණ්හ සමයෙ, සවස්වේලෙහි; විහාරම
ජ්ඣෙ චඞ්කමන්තෙන, වෙහෙර මැද ස
ක්මන්කරණ මහණහු විසින්; දිස්වා,
දක; උපාසකා, උපාසකවරිනි; කිං එවං
කරොථාති වුත්තා, තුම්සේ මෙ
සේ කරුදැයි කියනලද්දාහු; යථාරුචිං
අක්කොසන්ති; රිසිසේ ආක්‍රොශ කෙ
රෙත්; අස්ස, ඒ මහණහුට; අවාස
යම්පි පරයාසාමනාහි; නොඑසීම පිණි
සද උත්සාහ කෙරෙත්; පත්ථනීයෙ
පන, ප්‍රාර්ථනීයවූ; ලොකසම්මතෙ,
ලෝවැසියන් විසින් සම්භාවනා කළ

සුතුවූ; දක්ඛිණාගිරි, දක්ෂිණගිරි වෙහෙරය (මගධරට දක්ෂිණගිරියෙහි) සංඝිතුවයි. ඇත්කුස් ලෙණෙහි; චෙතියගිරි, සෑගිරියෙහි; චිත්තලපබ්බත, සිතුල්පවුවය යන වෙහෙරින් හා; සද්දෙස, සඳගමු (වැනිවු) විහාරෙ විහරන්තො, වෙහෙරවසන්නාහු; අයං අයසාන්, මෙ රහතෑණ; තම්බා එපඬා, සම්බා උපාසකො ව; වන්දිතුකාමා මනුසසා, වඳනා කැමැති මිනිස්හු; ගමනා, හාත්පසින්; ඔසරනයි, රැස්වෙත්; තෙන, එහෙයින්; අසස, ඕහට; නඵාසු හොති, පහසු නොවේ; යසස පන තං සපපායං හොති, යමෙක්හට ඒ වෙහෙර සැපවී නම්; තෙන, ඔහු විසින්; දිවා අඤ්ඤත්‍ර ගනතබ්බා, දහවල් අනික්තැනකට යොස්; රත්තිං වසිතබ්බං, රෑවිසියයුතු-

නගරසන්නිසසිතෙ, නුවර සමීපයෙහි වෙහෙර; විසභාගාරම්මණානි, ඉටු අනිටු විසභාග අරමුණෙණ්; ආපාථං ආගච්ඡන්ති, හමුබවට එත්; කුම්භ දාසියොපි, කළදෑස්හුද; ඝටෙහි නිඝංසන්තියො, කළයෙන් ගටමින්, ගච්ඡන්ති; යෙත්; ඔක්කමිත්වා, පහව, මග් ගං න දෙන්ති, මං නොදෙත්; ඉසසර මනුසසාපි, ඉසුරු මිනිස්හුද; විහාරමජ්ඣෙ, වෙහෙර මැද; සාණිං පරික්ඛිපිත්වා; කඩරෙදි පරික්ෂෙප කොට; නිසීදන්ති, හිඳිත් —

දූරසන්නිසසිතෙ පන, දුරඇසිරැ වෙහෙර වනාහි; යත්‍ර, යම් වෙහෙරෙක; කට්ඨානි ච, දරද; දබ්බුපකරණ රුක්ඛා ච සන්ති, දුවඋපකරණයට නිසිවූ රුක්හු ද ඇද්ද; තත්‍ර, ඒ වෙහෙර; කට්ඨහාරිකා, දර ගෙනයන මානිහු; පුබ්බෙබුද්ධිතා, පලමුකී, සාකපුප්ඵහාරිකාවිය, සාකහාරිකා පුප්ඵහාරිකා වත්මෙන්; අඵාසුං කරොන්ති, අඵාසු කෙරෙති; විහාරෙ රුක්ඛාසන්ති, වෙහෙරවෘක්ෂයෝවෙත්; තෙපි ඡින්දිත්වා, ඒ රුක්ඛපාපෙ; සරාති හරියස්වා එ, ගෙන් කරම්හයි; මනුසසා ආගන්ත්වා, මිනිස්හු අවුත්; ඡින්දන්ති, කපති; සෙන, ඉදින්; සායණ්හසමයං, සවස්වේලෙහි; පධානඝරා නික්ඛමිත්වා, ප්‍රධානාගාරයෙන් නික්ම; විහාරමජ්ඣෙ චඞ්කමනතා, වෙහෙරමැද සක්මන්කරණ්නහුගේ; ඉත දිසවා, ඒ මිනිසුන් දැක; උපාසකා, උපාසකවරිනි; කිං එවං කරොථාති වදති, කුමක්පිණිස මෙසේ කරව්දැයි කියන්නේය; යථාරුචිං අකොසනති, රිසිසේ ආක්‍රොශ කෙරෙත්; අසස, ඒ මහණහුගේ අවාසාය පි, නුතිමෙනාවිසිම පිණිසද; පරක්කමනති, උත්සාහ කෙරෙත් —

යො පන, යම් වෙහෙරෙක්; ඛෙත්තසන්නිසසිතො හොති, කෙත් ඇසුරුකොටෙල් වේද; සමන්තා, හාත්පසින්; කෙදාරෙහි පරිවාරිතො, අකෂෙත්‍රයෙන් පිරිවරණලද්ද; තත්‍ර, ඒ වෙහෙර; මනුසසා, මිනිස්හු; විහාරමජ්ඣෙයෙව, වෙහෙර මැදම; ඛලං කත්වා, කළවිටිකොට; ධඤ්ඤං මද්දන්ති, වී මඩනාහ; පමුඛෙ, නිසැමින් තෙන්; සුසසනති, වී වියලන්නාහ, බහුම්පි, බොහෝවූ; අඵාසුං කරොන්ති, අනිත් අඵාසුද කරන්නාහුයි; යත්‍රාපි, යම් වෙහෙරක; මහාසඞ්ඝිකො හොති; මහත් සඞ්ඝසතක ඇද්ද; ආරාමිකකුලානං ගාවො රුන්ධන්ති; ආරාමිකකුලයන්ගේ ගොයම් කෑහයි ගෙරිබැද සිටුවති; උදකවාරං පටිසෙධෙන්ති, ගොයමට දිය සුතු දියමුර වලකති; මනුසසා, මිනිස්හු; වීහිසීසං ගහෙත්වා, වීකරල් කඩාගෙණ; පසසථ, බලව; තුම්හාකං, තොපගේ; ආරාමිකකුලානං කම්මන්ති, ආරාමිකකුලයන්ගේ ක්‍රියායයි; සඞ්ඝසස දසෙසන්ති, සඞ්ඝයාහට දක්වති; තෙන තෙන කාරණෙන, ඒ ඒ කාරණයෙන්; රාජරාජමහාමත්තානං ඝරද්වාරං

නානබද්ධං හොති, රජරජ මහාමැතියන්ගේ ගෙව යාසුතුවෙයි; අයම්පි, මේද; බොධානසන්නිස්සිතෙහෙව සඞ්ගහිතො, ක්ෂෙත්‍රසන්නිශ්‍රිතයෙන්ම සඞ්ග්‍රහකරණලදී—

“විසභාගානං පුග්ගලානං අපි තා” යනුවෙති; යත්, යම් වෙසෙහරෙහ; අසදෘශ්මසදෘශ විසභාගා, ඔබු නොවූත්ට සභාගනොවූ; වෙරිභික්ඛු විහරනයි, වෛරීභික්ෂූහු වෙසෙද්ද; යෙ, යම්භික්ෂුන්නමණෙක්; කලහං කරොනතා, කලහකරත්තාහු; මාභන්තෙ එවං නකරොථා ති, මහණෙනි එසේ නොකරත්නෝයි; වාරියමානා වළකනුලබත්තාහු; එතස්ස පංසුකූලිකස්ස ආගතකාලතො පට්ඨාය, මේ පාංශුකූලිකයා ආතැත්පටන්ගෙණ; නට්ඨම්හා ති, නටුම්හයි; වත්තාරො ගච්ඡන්ති, කියන්නාහුවෙත්—

යොපි, යම් මෙමහරෙක්; උදකපට්ටනං, දියඇසිරුකළපටුන (මුහුදු ඇසුකළපටුන නදීඇසුරුකළපටුන යනාදිය දිය ඇසුරුකළපටුන්හම්වේ) ථලපට්ටනං, අම්විමුඛාදීන් ඇසිරුකල ගොඩපටුන්ද; සන්නිස්සිතො හොති, ආශ්‍රයකොලේවේද; තත්ථ, එහි; අභිණ්හං, එක්වන්; නාවාභිව, නැව්හන්ද; සත්ථෙ ච; සත්ථයෙන්ද; ආගතමනුස්සා, ආමිනිස්හු; ඔකාසං දෙථ, අවකාශදෙව; පානීයං දෙථ, පැන්දෙව; ලොණං දෙථා ති, ලුණුදෙවයි; සට්ටයන්තා, ගැහැට කරත්තාහු; අඵාසුං කරොන්ති, අපහසුකෙරෙද්ද—

පච්චන්ත නිස්සිතෙසු පන, ප්‍රත්‍යන්ත නිශ්‍රිතයෙනි වනාහි; මනුස්සා, මිනිස්හු; බුද්ධාදීසු අප්පසන්නා හොන්ති, බුද්ධාදීන්කෙරෙහි අප්‍රසන්නාවෙත්; රජසීමසන්නිස්සිතෙ, රාජසීමානිශ්‍රිතවෙහෙර; රාජභයං හොති, රාජභයවේ; තංහි පදෙසං, ඒප්‍රදෙශය; එකො රාජා, එක්රජෙක්; මය්හං වසෙ නවත්තතී ති, මාවසඟයෙහි නොපවත්නේයයි; පහරති, පහරන්නේය; ඉතරො පි, අනික්රජද; න මය්හං වසෙවත්තතී ති, මාවසඟයෙහි නොපවත්නේයයි; පහරති, පහරන්නේය; තත්‍ර, ඒ වෙහෙර; අයංභික්ඛු, මේමහණ; කදාචි, කිසිකලෙක, ඉමස්ස රඤ්ඤො විජිතෙ විචරති, මේ රජහුගේ විජිතයෙහිහැසිරෙයි, කදාචි, කිසිකලෙක; එතස්ස, ඒරජහුගේ (විජිතයෙහි හැසිරේ) අථ, එසේකල්හි; තං, ඒ මහණහු; චරපුරිසො අයං හොති, මේ චරපුරුෂයෙකැයි; මඤ්ඤමානා, සිතන්නාහු; අනයව්‍යසනං පාපෙන්ති, අනයව්‍යසනයට පමුණුවත්( අනයනම් නොවැඩ ව්‍යසනනම් පීඩායි )

අසප්පායතා ති, නොසැපබව නම්; විසභාගරූපාදි ආරම්මණ සමොසරණෙන වා, සභාගනොවන රූපාදි අරමුණන්ගේ එකින් ඔබ හැසිරීමෙන් හෝ; අමනුස්ස පරිග්ගහිතතාය වා, යක්ෂයන්විසින් පරිග්‍රහිතබැවින් හෝ; අසප්පායතා, නොසැපබවයි; තත්‍ර, ඒඅසැපබැව්හි; ඉදං වත්ථුං, මේ වස්තුකි; එකො කිර ථෙරො, එක් තෙරකෙණෙක්; අරඤ්ඤෙ වසති, අරණ්‍යයෙහි වෙසෙයි; අථ, එකල්හි; අස්ස, ඒතෙරුන්ගේ; පණ්ණසාලද්වාරෙ ඨත්වා, පන්සල්දොරසිට; එකා යක්ඛිණී, එක්යක්ෂිණියක්; ගායි, ගීයක් කීවු; සො, ඒතෙරහු; නික්ඛමිත්වා, පන්සලින් නික්ම; ද්වාරෙ අට්ඨාසි, දොරටුවෙහි සිටියහ, සා, ඒයක්ෂිණී, ගන්ත්වා, ගොස්; චඞ්කමනසීසෙ ඨත්වා, සක්මන්භූසෙව; ගායි; ගීයක් කීවු; ථෙරො, තෙරහු; චඞ්කමනසීසං අගමාසි, සක්මන්භූසට ගියහ; සා, ඒයක්ෂණී; සතපොරිසෙ පපාතෙ ඨත්වා, ගායි (ගීතසංඥායෙන් ආවිඳු ප්‍රපාතයෙහි හෙලාගෙණ නාමඩ)සියක්පුරුෂප්‍රමාණ ප්‍රපාතයෙහි සිටගීය කීවු; ථෙරො; තෙරහු; පටිනි

විනන්, වැළැක්තහ; අථ, ඉක්බිත්තෙන්; සා, ඒයකිණි; තං, ඵතෙරුන්කරා; වෙගෙනාගනාවා, වේගයෙන්අවුත්; ගහෙත්වා (ගොසියෙගිද්ධි) ගෙණ; හත්‍ථා, වහන්ස; මයා, මාවිසින්; තුම්හාදිසා, තොපවැන්නෝ; බාදිතා, කනලද්දහු; න එතෙමෙව, එකෙක් දෙන්නෙක් නොවෙතියි; ආහ; කීවු ය.

"කල්‍යාණමිත්තානංවා අලාභෙ" යන්නෙහි, යත්‍ථ, යම් වෙහෙරක (වෙහෙර සමීපයෙහිහෝ) ආචරියංවා, ආචාර්‍ය්‍යයන්හෝ; ආචරියසමංවා, ආචාර්‍ය්‍යයන්හා සමවූහෝ; උපජ්ඣායංවා, උපාධ්‍යායයන් හෝ; උපජ්ඣායසමංවා, උපාධ්‍යායයන් හා සමවූහෝ; කල්‍යාණමිත්තංලද්ධුං, කල්‍යාණමිත්‍රයක් හුහෝ ලබන්නට ("න සක්කොන්ති" යි යොදනු) පිළිවන් නොවේද; තත්‍ථ, එහි; සො කල්‍යාණමිත්තානං අලාභො, ඒකල්‍යාණමිත්‍රයන්ගේඅලාභය; මහාදොසො යෙවාති, මහාදොෂයයි; ඉමෙසං අට්ඨාරසන්නං දොසානං අඤ්ඤතරෙන, මේඅටළොස්දොෂයන් අතුරෙන් එක්තරා එකෙකින්; සමන්නාගතො, සමන්විතවූයේ, න අනුරූපොති, අනුරූපවිහාර නම් නොවෙයි; වෙදිතබ්බො, දතයුතු; අට්ඨකථාසු, අටුවාකථායෙහි; වුත්තම්පි ච, කියනලදී; මහාවාසං, මහවෙහෙර; නවාවාසං, නවවෙහෙර; ජරාවාසං, ජරාවාසවෙහෙර; පන්ථනිං, මහමඟඇසිරුකළවෙහෙර; සොණ්ඩිං, පැන්තොම්ඇතිවෙහෙර; පණ්ණං, පත්‍රඇතිවෙහෙර; පුප්ඵං, මල්ඇතිවෙහෙර; ඵලං, ඵලඇතිවෙහෙර; පත්‍ථිතමෙව, පැතියයුතුවෙහෙර; නගරං, නුවරඇසිරුකළවෙහෙර; දාරුනා, දරුඇති වෙහෙරහා සමය; ඛෙත්තං, කෙත්ඇසිරුකළවෙහෙර; විසභාගනං, විසභාගයන් ඇසිරුකළවෙහෙරහා සමග; පච්චන්තං, පටුන්ගම්ඇසුරුකළවෙහෙර; පච්චන්තං, ප්‍රත්‍යන්තඇසිරුකළවෙහෙර; සීමං, රජසීම්ඇසිරුකළවෙහෙර; අසප්පායං, නොසැපවෙහෙර, යත්‍ථ, යම්වෙහෙරක; කල්‍යාණමිත්තො න ලබ්භති, කල්‍යාණමිත්‍රයකු නොලැබේද යන; එතානි අට්ඨාරස ඨානානි, මේ අටළොස්ස්ථානයන්; පණ්ඩිතො, නුවණැත්තේ; ඉතිවිඤ්ඤාය, මෙසේ දැන; පරිභයං මග්ගං යථා, භයඇති මඟක් මෙන්; ආරකා, දුරින්ම; පරිවජ්ජයෙ, දුරුකරන්නේයි ය.

( ගා ¶ )

දූත්වනාහි මිටඅනතුරුව සමාධිභාවනාවට නුසුදුසුවිහාරය හැර සුදුසුවිහාරයෙක වසනනුවිසිනැයි යමක් කියනලදද මෙහි විස්තර මෙතැන්පටන් ප්‍රකාශවන්නේය කෙසේදයත්? පළමුකොට ආචාර්‍ය්‍යයන්හා සමග එකවෙහෙර වසනනාවූ යොගාවචරයා හට සැපවූ ආවාසාදිය ලැබීමෙන් යොනිසො මනසිකාරයට සැපෙවීද ඒයොගාවචරයාවිසින් එමකම්මට්ඨානය ගැටපෙද විචාරා පිරිසිදු කරමින් එහිම විසියයුත්තේය ඉදින් ඒආචාර්‍ය්‍යයන් වසන වෙහෙර ඵාසුනැත්තේවී නම් එනතින් ගවුවක්හෝ අඩයොදුනක් හෝ යොදුනක්හෝ පමණනන්හි අනික් සැපවූ විහාරයෙක් ඇත්තේවීනම් ඒ වෙහෙර විසියයුත්තේයි දුරුවූවිහාරයෙක හිද මෙසේකම්ටහන්භාවනා වඩනකල්හි කම්මට්ඨානයාගේ යම්කිසිතැනෙක සැකයෙක් ඇතිවුකල හෝ සිහිමුලාවගියකල හෝ උදසන්හිම තමාවසන වෙහෙරවත්සපයා වෙහෙරින්නික්ම අතර මග පිඩුසිගා බත්කිසකෙළවරම් ආචාර්‍ය්‍යයන්වසන තෙනට එළඹ එදවස් ආචාර්‍ය්‍යයන් ලඟ කම්මටහන් පිරිසිදු කොට දෙවෙනිදවස ආචාර්‍ය්‍යයන් වැද එයින් නික්ම අතරමඟ පිඩුසිගා

නොහැකිරිසුණු ශරීරඇතිවම තමාවසනහනෙහට එන්නට පොහොසත්වේද එබඳුතෙනක විසියයුත්තේය යමයොගාවචරයෙක් යොදුනක්පමණ දුරුවූ සෙනස්නෙහින් එපුසුහොලබන්නේනම් ඒයොගාවචරයාවිසින් කම්මස්ථානයෙහි සියලුගැටපදයන් අර්ථප්‍රකාශකිරීමෙන් සිඳ කම්ටහන් පිරිසිදුව ආවර්ජනප්‍රතිබද්ධකොට දුරවහෝගොස් සමාධිභාවනාවට නුසුදුසු විහාර හැර සුදුසුවිහාරයෙහම විසියයුත්තේයි එහි නුසුදුසු විහාරයනම් අටලොස් විහාරදෙෂයන්ගෙන් එක්තරාදොෂයකින් සමන්විතවූ විහාරයවන්නේයි එහි අටලොස් දෙෂයෝනම් කවරහයත්? මහත්බවය අලුත්බවය දිරාගියබවය මාර්ගඇසුරුකළබවය පැන්පොකුණඇතිබවය මල්ඇතිබවය පලාඇතිබවය ඵලාඵලඇතිබවය ප්‍රාර්ථනීයබවය නුවරක්ඇසුරුකළබවය දරදඬුවදඬු ඇසුරුකළබවය කෙත් ඇසුරුකළබවය විසභාගපුද්ගලයන් ඇතිබවය සුංකස්ථානසඩබයාත පටුනුඇසුරුකළබවය පසල්දනවු ඇසුරුකළබවය රාජ්‍යසීමා ඇසුරුකළබවය නොසැපබවය කල්‍යාණමිත්‍රයන් නොලැබීමය යන මේ අටලොස් දෙෂයන්කෙරෙන් එක්තරා දෙෂයකින් යුක්තවීනම් ඒවිහාරය නුසුදුසුවිහාරනම් වන්නේයි එබඳු වෙහෙර කම්ටහන්වඩන යොගාවචරයාහට නොවිසියයුතු විහාරනම් වන්නේයි කුමක්හෙයිනයත්?

පළමුකොට මහවෙහෙර නොයෙක්අදහස්ඇත්තාවූ බොහෝදෙන රැස්වන්නාහුය ඔවුන් අන්‍යොන්‍යවිරුද්ධබැවින් වත්පිළිවෙත් නොපුරන්නාහුවෙති මහබෝමළුආදිය නොහමුදින ලද්දාහුමවෙති බොණපැන් දෙවනපැන් නොඑළවති එබඳුමහවෙහෙරවසන මේයොගාවචර මහණහොදුරුගම පිඬුසිඟම්සිනා පාත්‍රවුරුගෙණයන්නාහු ඉදින් මහබෝමළුආදියෙහි කටයුතු වත්පිළිවෙත් නොකරණලද බවහෝ සිස්කළහෝ දක්නේවීද එකල්හි ඒපිඬුසිඟායනා ගමන්‍ලක්වා වත්පිළිවෙත්හෝ කටයුතුවෙයි පැන්හෝ එළවිය යුතුවෙයි වත්පිළිවෙත් නොකරන්නාහු වතාභෙදයෙන් දුකුලාඇවැතට පැමිණෙන්නේයි වත්කරන්නාහට බොහෝකල් ඉක්මුනහෙයින් ඉතාදහවල් පිඬුපිණිසවන්නාහු පළමු පළමු ආනිසුන්ට පිණ්ඩපාතයදී නිමාගියබැවින්කිසිවක් නොලැබෙන්නේයි එබඳු මහවෙහෙර විවෙකස්ථානයට ගියේද හෙරණලදරුමහණුන්ගේ උස්හඬින්ද සඝකර්මයෙන්ද චිත්තවික්ෂෙපයට පැමිණෙති මහවෙහෙරක වූවත් කටයුතු සියලුවත්පිළිවෙත් කරණලද්දේවේද සෙසුනැතැත් හැරතාහුද එබඳුවූ මහවෙහෙර විසියයුත්තේය.

අලුත්වෙහෙර බොහෝ නවකර්මාන්ත ඇත්තේය ඒනවකර්මාන්තනොකරන්නාහට සෙස්සෝ කිපෙන්නාහුය යම්වෙහෙරක වසන සෙසුභික්ෂුහු ආයුෂ්මත්නි පොපි සැපසේ මහණදම් කරවයි අපි නවකර්මාන්ත කරමහයි කියත්නම් මෙබඳු පළිබොධතැති අලුත්වෙහෙර විසියයුත්තේයි.

දිරාගියවෙහෙර වනානි පිළිදුගුම් කටයුත්තේය. යටත්පිරිසෙයින් තමාගේ සෙනසුන් පමණකුදු පිළිදුගුම් නොකරන්නාහට සෙසෝ කිපෙන්නාහුය පිළිදුගුම්කරන්නාහට කම්ටහන පිරිහෙන්නේයි.

මාර්ගනිශ්‍රිතවිහාරනම් මහාමාර්ගසමීපයෙහි පිහිටි විහාරයයි එබඳුවෙහෙරම රෑදහවල් ආගන්තුකභික්ෂූහු රැස්වන්නාහු විකාලයෙහි පැමිණි

භික්ෂූන්ට තමාගේ සෙනාසනදී රුක් මුලකහෝ ගල්පෙර්රුවක්පිටහෝ විසියයුත්තේය දෙවසාදවස්හිද මෙසේම විවෙක නොලැබෙනහෙයින් කම්ස්ථාන භාවනාවට අවකාශ නොලැබෙන්නේයි.

යම්වෙහෙරක කොමිතම්වූ ගල්පොකුණු ඇත්තේවේද එහි පැන්පිණිස නිරතුරු මහජනයා රැස්වෙයි නුවර වසන්නාවූ රාජකුලූපගතෙරුන්ගේ අතවැස්සෝද සිවුරුරැදීමපිණිස පැමිණෙන්නාහුය රදනබඳුන් කොහිද? දරකොහිද? රදනඔරුකොහිද? රදන් පිසනපැන් කොහිදැයි? විචාරන්නවුන්ට අසවල් අසවල් තැනයයි දක්වියයුත්තේය මෙසේ හැමදවස්හිම නිරතුරුකටයුත්තෙහි නියුක්තවන්නේ හී. යම්විහාරයෙක නන්වැදෑරුම් පලාකොල ඇත්තාහුද ඒ විහාරයෙහි කම්ටහන්ගෙණ දිවාවිහාරයෙහි උන්නාවූ මෙහිභික්ෂුවලග පලාගෙණයන මාගම්වූ ගීකියමින් පලාතෙලන්නාහු කාමගුණ නිශ්‍රිත විසභාග ශබ්දයන්ගේ ගැටීමෙන් කම්ටහණට අනතරාය කරන්නාහු වෙති.

යම් වෙහෙරක නන්වැදෑරුම්මල්රුක් පිපීයන්නාහු වෙද්ද ඒ විහාරයෙහිද එබඳුවූ උපද්‍රවයෝ ඇත්තාහුවෙති.

යම් වෙහෙරක නන්වැදෑරුම අඹ දඹ කොස්ආදි ඵලාඵලඇත්තාහුද එබඳු වෙහෙරට ඵලාඵලකැමැත්තාහු අවුත් ඉල්වන්නාහුය එසේ ඉල්වූකල නොදෙන්නාවූ භික්ෂූහට කිපෙන්නාහුය බලාත්කාරයෙන්හෝ හැරගණිති සවස්වේලෙහි වෙහෙරමැද සක්මන්කරණ මහණ මෙසේපැහැර ගන්නා දක ඇයි උපාශකවරිනි කුමක්පිණිස මේසේකරන්නාහුදැයි විචාලාහු ඔවුන් කැමතිපරිද්දෙන් ආක්‍රොශ පරිභවකරන්නාහු වෙති ඒ මහණහට ඒ විහාරයෙහි නොවිසීම පිණිස හෙවත් මවෙහෙරින් නෙරණ පිණිස උත්සාහකරන්නාහු වෙති.

ප්‍රාර්ථනීයවූ ලෝවැසාවිසින් බහුමන්කරණලද මගධරට දක්ෂිණගිරි විහාරය ඇත්කුස් ලෙණය ලක්දිව සැගිරිය සිතුල්පවුවය යනාදෙවූත් හා සදෘශවූ උතුම් විහාරයෙහි වසන්නාහු මේ රහත්කෙණෙකැයි සිතා බුහුමන්කොට වඳිනුකැමති මනුෂ්‍යයෝ හාත්පසින් අවුත් රැස්වනනාහුය එහෙයින් ඒ මහණහට විවෙක ඵාසු නොවන්නේය එතකුදුවුවත් යමෙක්හට ඒ විහාරයම සැපවේ නම් ඔහුවිසින් දහවල් දවස අතික්තැනෙක ගොස් දිවාවිහරණය කොට අවුත් රෑ විසියයුත්තේය.

නුවරසම්පයෙහි පිහිටි විහාරයෙහි ඉෂටානිෂටවිසභාගඅරමුණු නිතර හමුබවට පැමිණෙන්නාහුය කුම්භදාශිකාවෝද කළයෙන් ගටමින් යන්නාහුය මාගීගයෙන් ඉවත්ව මාර්ගයද නොදෙන්නාහුය අධිපති මනුෂ්‍යයෝ ද අවුත් විහාරමධ්‍යයෙහි සාලුරා වටකොට ඇද හිඳිනාහුය.

දරුනිශ්‍රිතවිහාරයෙහි වනාහි යම් වෙහෙරක දරහෝ දාවඋපකරණය ට සුදුසු වෘක්ෂයෝ ඇත්තාහුද ඒ විහාරයෙහි දරගෙණයන මාගම්වූ පලමුකී පලාකොල මල්ආදිය ගෙණයන මාගමුන්මෙන් අඵාසු කරන්නාහුමය දාවඋපකරණයට සුදුසු වෘක්ෂ විහාරයෙහි ඇත්තාහුවී නම් ඒ රුක්සිඳ ගේකරම්හයි මනුෂ්‍යයෝ අවුත් රුක් සිඳිනාහුය ඉදින් සවස්වේලෙහි භාවනායුක්තයෙන් නික්ම විහාරමධ්‍යයෙහි සක්මන්කරන්නාහු ඒමිනිසුන් දක ඇයි උපාශකවරිනි කුමක්නිසා මෙසේ කරන්නාදැයි පිලිවිස්නාහු ඔවුන් කැමත් පරිද්දෙන් ආක්‍රොශපරිභව බෙණන්මය ඒමහණහට එහි නො

දසිමපිළිසඳ උපන්සාහ කරනනාහුය.

යම් චෛතෙරක් කෙත් සමීපයෙහි හෝ වීනම් ගාන්පසින් කෙයින් පිරිවරණලද්දේ හෝ වීනම් මනුෂ්‍යයෝ ඒ විහාර මධ්‍යයෙහි සාලවිටිකොට විමසනාහ විහාරමිදුලෙහි ඒ වියල නනාහ අතිසුදු බොහෝ අප්‍රාසු කරන්නාහ යම් විහාරයක මහත්වූ සඞ්ඝයාහා ඇත්තේවීනම් ඒ විහාරයෙහි ආරාමිකකුලයන්ගේ ගොයම් කැපයි ගෙරින්බැඳ සිටුවති කොයම්ට දීගසුතු දීයමුර වලක්වති මනුෂ්‍යයෝ විකාරල් කඩාගෙණ මෙසේ බලව නොපගේ ආරාමිකයන්ගේ ක්‍රියායයි සඞ්ඝයාව දක්වති ඒ ඒ කාරණෙන් රාජ රාජ මහාමාත්‍යයන්ගේ ගෙවියා පුතුවෙති මෙබඳු විහාරද කෙත් ඇසුරුකරණලද විහාරයෙහිම ඇතුළත්කරණලද්දේ වෙයි.

විසභාගපුද්ගලයන් ඇතිබවනම් යම් චෛත්‍යරක ඔවුනොවුන්ට සභාගනොවූ සතුරුභික්ෂූහු වෙසෙද්ද යම් භික්ෂූකෙනෙක් ඛාරකරනනාහු වහන්ස එසේනොකරන්වයි වළකනනාහු මේ පාංසුකූලකයා ආතැන් පටන් වනාශවූමහයි කියනනාහුවෙද්ද එබඳු චෛත්‍යරෙ විසභාග පුද්ගලයන්ඇත් චෛත්‍යරයයි දතයුතු.

යම් විහාරයක් සමුද්‍රසුංකසථානයක් හෝ නදීසුංකසථානයක් හෝ මහවනඅදෙරටුආදී ගොඩසුංකසථානයක්හෝ ඇසුරුකොල්වේද එබඳු විහාරයෙහි නිරතුරු නැවින් හා ගැලින්ද ආ ආ මනුෂ්‍යයෝ අවකාශදෙව පැත්දෙව ලුණුදෙවයි නොදීන් නැහැවකරනනාහු අප්‍රාසු කෙරෙත්මැයි.

පසල්දනව් ඇසුරුකල විහාරයවනානි එහිවැසි මනුෂ්‍යයෝ බුද්ධාදි රත්නත්‍රයෙහි අප්‍රසන්නහෙයින් අශ්‍රද්ධස වැයි.

රාජ්‍යසීමා ඇසුරුකළවිහාරය රාජහය පැමිණෙන හෙයින් සුදුසු නොවන්නේය ඒ රාජ්‍යසීමා ඇසුරුකල ප්‍රදේශය එක්රජෙක් මා වශගයෙහි නොපවත්නේයයි පහරදෙන්නේය අනික්රජුද මාවශගයෙහි නොපවත්නේයයි පහරදෙන්නේය ඒ මෙනෙරවසන මහණ කිසිකලෙක මේරජුගේ විජිතයෙහි හැසිරෙයි කිසිකලෙක ඒ රජුගේ විජිතයෙහි හැසිරෙයි එසේකල ඒමහණ චරපුරුෂයෙකැයි සිතනනාහු අනයව්‍යසනයට පමුණුවනනාහුය.

නොසැපබව නම් සභාග නොවූ රූපාදීඅරමුණු ඔබ්බොබ හැසිරෙවුන් හෝ යක්ෂාධිගෘහිත බැවින් හෝ නොසැප බවයි ඒ නොසැපබව හැගවීමට මේ කථාවස්තුව උදහරණකට යුතුයි ඒ කෙසේදයත්? එක් තෙරකෙනෙකුන් වහන්සේ අරණ්‍යයෙහි වාසයකරනනාහු පන්සල්දෙරටුවේ සිට එක්තරා යක්ෂණියක් ගීයක් කීයේය තෙරුන්වහන්සේ පන්සලින් නික්ම විහාරදොරටුවේ සිටියේය ඉක්බිති ඒ යක්ෂණී නොසක්මන් ඉස සිට ගායනා කෙළේය තෙරහුද සක්මන්හිසට ගියේය ඉක්බිති ඒයක්ෂණී ගිනිකාශබ්දයට ලොල්වආ මහණහු ප්‍රපාතයෙහි හෙළා අල්වාගෙණ කන්නෙමිසිතාසියක්පුරුෂ ප්‍රමාණ ගැඹුරු ප්‍රපාතයෙක සිට ගායනා කෙළේය එතකුදුවුවත් තෙරුන්වහන්සේ ඉනොබීබි නොගොස් සක්මන්හිසම රඳුනාහ ඉක්බිති ඒයක්ෂණී තෙරුන්කරා ඡවගයෙන් දිවඇවුත් කොහි යයිද්දයි අල්වාගෙණ වහන්ස මාවිසින් කතලද නොපවැත්තෝ එකෙක්දෙන්නෙක් නොවෙති ඉතා බොහෝවෙතියි කීයේය.

කල්‍යාණමිත්‍රයන්ගේ නොලැබීම නම් යම්චෛත්‍යරකවත් විහාරයකිපු

යෙකිවත් ආචාර්‍ය්‍යවූයෙහෝ ආචාර්‍ය්‍යසමානවූයෙහෝ උපාධ්‍යායවූයෙහෝ උපාධ්‍යායසමානවූයෙහෝ කල්‍යාණමිත්‍රයෙක් ලබන්නට නොහැකි වේද අවලොස් දෙෂයන් අතුරෙන් ඒ කල්‍යාණමිත්‍රයෙකුගේ නොලැබීම මහාදෙෂනම් වන්නේයි මේ අටලොස් දෙෂයන් අතුරෙන් එක්තරා දෙෂයකින් සමන්විතවූ විහාරය නුසුදුසුවිහාර නම් වෙයි දතයුත්තේයි අටුවායෙහිද මේ කියනලද මැයි. මහ වෙහෙරය අලුත් වෙහෙරය ජරාවාසවෙහෙරය මහමං ඇසුරුකල වෙහෙරය පැන්කොම්ඇති වෙහෙරය පලාකොලඇති වෙහෙරය මල්ඇති වෙහෙරය ඵලාඵලඇති වෙහෙරය ප්‍රාර්ථනීය වෙහෙරය නුවර ඇසුරුකල වෙහෙරය දර දුව දඬුඇති වෙහෙරය කෙත් ඇසුරුකල වෙහෙරය විසභාග භික්ෂූන්ඇති වෙහෙරය පටුන්ගම් හෙවත් සුංකස්ථාන ඇසුරුකල වෙහෙරය පසල්දනව්වූ ඇසුරුකල වෙහෙරය රාජ්‍යසීමා ඇසුරුකල වෙහෙරය නොසැප වෙහෙරය කල්‍යාණමිත්‍රයන් නොලැබියහැකි වෙහෙරය යන මේ අවලොස් ස්ථානයන් නුවණැතිපණ්ඩිතයෙම මෙසේ දූත හයස හිත මාර්ගයන් මෙන් දුරින්ම දුරුකරන්නේයි—

( පා * )

සෝපන ගොචරගාමතො නාතිදූරනාච්චාසන්නතාදීහි පඤ්චහි අඞ්ගෙහි සමන්නාගතො අයමනුරූපො නාම වුත්තංහෙතං භගවතා— කථඤ්ච භික්ඛවෙ සෙනාසනං පඤ්චඞ්ගසමන්නාගතං හොති— ඉධ භික්ඛවෙ සෙනාසනං නාතිදූරං හොති නාච්චාසන්නං ගමනාගමනසම්පන්නං දිවා අප්පකිණ්ණං රත්තිං අප්පසද්දං අප්පනිග්ඝොසං අප්පඩංසමකසවාතාතප සිරිංසප සම්ඵස්සං ඛොපන හොති— තස්මිං ඛොපන සෙනාසනෙ විහරන්තස්ස අප්පකසිරෙනෙව උප්පජ්ජන්ති චීවරපිණ්ඩපාත සෙනාසනගිලාන පච්චය භෙසජ්ජ පරික්ඛාරා— තස්මිං ඛොපන සෙනාසනෙ ථෙරා භික්ඛූ විහරන්ති බහුස්සුතා ආගතාගමා ධම්මධරා විනයධරා මාතිකාධරා තෙ කාලෙන කාලං උපසඞ්කමිත්වා පරිපුච්ඡති පරිපඤ්හති ඉදං භන්තෙ කථං ඉමස්ස කො අත්ථොති— තස්ස තෙ ආයස්මන්තො අවිවටඤ්චෙව විවරන්ති අනුත්තානීකතඤ්ච උත්තානීකරොන්ති අනෙකවිහිතෙසු ච කඞ්ඛාට්ඨානීයෙසු ධම්මෙසු කඞ්ඛං පටිවිනොදෙන්ති— එවං ඛො භික්ඛවෙ සෙනාසනං පඤ්චඞ්ගසමන්නාගතං හොතීති— අයං සමාධිභාවනාය අනනුරූපං විහාරං පහාය අනුරූපෙ විහරන්තෙනාති එත්ථ විත්ථාරො—

( ස * )

සෝපන, යම්වෙහෙරෙක්; ගොචරගාමතො, ගොචරග්‍රාමයෙන්; නාතිදූරනාච්චාසන්නතාදීහි, ඉතාදුරු නොවනබවය ඉතාආසන්න නොවනබවය යනාදිවූ; පඤ්චහි අඞ්ගෙහි සමන්නාගතො; පස්අඞ්ගින් සමන්විතද; අයං, මේවෙහෙර; අනුරූපො නාම, අනුරූපනම්වේ; භගවතා, භගවත්බුදුහිමියන්; වුත්තමෙතංහි, මේවදාළේමැයි; භික්ඛවෙ, මහණෙනි; සෙනාසනං, සෙනස්න; කථං පඤ්චඞ්ගසමන්නාගතං හොති, කෙසේපඤ්චාඞ්ගයෙන් සමන්විතවේද; භික්ඛවෙ, මහණෙනි; ඉධ, මෙහි; සෙනාසනං, සෙනස්න; නාතිදූරං හොති (අඞ්ගවූවෙකින් නොදුරුබැවින්) ඉතාදුරු නොවේද; නාච්චාසන්නං (යමන්පිරී සෙයින් දුනුපන්සියයකට අඩු නොව

නාබැවින්) ඉතා ආසන්නනොවේද; ගමනාගමන සම්පන්නං (ඉතාදුර ඉතාලං නොවනබැවිනුදු නිරුපද්‍රව සැපමං ඇතිබැවිනුදු) ගමනයටද ආගමනයටද සුවවේද; දිවා අප්පාකිණ්ණං, දිවාභාගයෙහි මහජනයාවිසින් සංකීර්ණනොවේද; රත්තිං අප්පසද්දං(රාද්‍රවසජනයාගේ ශබ්දනගනැතිබැවින්) රාත්‍රියෙහි ශබ්දනැත්තේද, අප්පනිග්ඝොසං (හැමවේලෙහිම ජනසන්නිපාතයෙන්වන නිර්ඝොෂ නැතිබැවින්)ගිගුරුම් හඬනැත්තේද; අප්පඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සං ඛොපන හොති, ඇසිමදුරුවාතආතපදීඝජාතිය යනමොවුන්ගේ ඩැහැමෙන් (වෙරපැහැරීමෙන්) වනස්පර්ශ නැත්තේවේද; තස්මිං ඛො පන සෙනාසනෙ, ඒ සෙනස්නෙහි; විහරන්තස්ස, වසන්නාහට, චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරා, සිවුරුය පිණ්ඩපාතය සෙනාසනය ගිලන්පසය බෙහෙත්පිරිකරය යනමොහු; අප්පකසිරෙනෙව උප්පජ්ජන්ති, නොදුකින්මඋපදනාහුද; තස්මිං ඛො පන සෙනාසනෙ, ඒසෙනස්නෙහි; ථෙරා භික්ඛූ නිවසන්ති, ස්ථවිරභික්ෂූහු වෙසෙත්; බහුස්සුතා, සූත්‍රගෙයාදී බොහෝ ඇසුතැත් ඇති; ආගතාගමා (වාචුග්ගතකරණයෙන්ද ගුරුන්කෙරෙහි මනාකොට උගත්බැවින්ද දන්නාලදපය්‍යාප්ති ධර්මඇතිබැවින්ද)විඥාතවූ ආගම ඇති, ධම්මධරා, සූත්‍රාභිධර්ම සඞ්ඛ්‍යාතධර්මයදරුබැවින් ධර්මධරවූ; විනයධරා, විනයධරවූ; මාතිකාධරා, විනයාභිධර්මමාතෘකා දරුබැවින් මාතෘකාධරවූ; (“ථෙරා භික්ඛූනිවසන්ති” යි සම්බන්ධකරණු)තෙ, ඒතෙරවරුන්හට; කාලෙන කාලං උපසඞ්කමිත්වා, කලින්කලඑළඹ; පරිපුච්ඡති, පෙළදම්හිසැකපිළිවිසිද; පරිපඤ්හති, අර්ථවිචාරණයකොරේද; භන්තෙ, වහන්ස; ඉදං කථං, මේ පදයකෙසේද; ඉමස්ස කො අත්ථොති, මේපදයාගේ අර්ථකවරේදැයි කියා (“පරිපුච්ඡති පරිපඤ්හති-යි යොදනු)තස්ස, ඕහට; තෙආයස්මන්තො, ඒආයුෂ්මත්හු; අවිවටඤ්චෙව විවරන්ති (ප්‍රදෙශාන්තර පාලිදර්ශනයෙන්) ආගමවශයෙන් පාඨාර්ථය ප්‍රකාශද කෙරෙති; අනුත්තානීකතඤ්ච උත්තානීකරොන්ති, අප්‍රකටවූ (ගැඹුරුවූ) අර්ථය (යුක්තිදීපනවශයෙන්)උත්තාන කෙරෙති; අනෙකවිහිතෙසු, අනෙකවිධවූ; කඞ්ඛට්ඨානීයෙසු ධම්මෙසු, සැකයුත්පත්ති කාරණවූ බැවින්ග්‍රන්ථිස්ථානවූ පාලිප්‍රදෙශයෙහි; කඞ්ඛං පටිවිනොදෙන්ති (යාථාර්ථයෙන් විනිශ්චයදීමෙන්) කාංක්ෂාව දුරුකෙරෙත්; එවං, මෙසේ; භික්ඛවෙ, මහණෙනි; සෙනාසනං පඤ්චඞ්ගසමන්නාගතං හොතීති, සෙනාසනය පඤ්චාඞ්ගයෙන් යුක්තවෙයි(“වුත්තං චෙතං භගවතා” යි යොදනු-මෙහි නාතිදූරං හොති නාච්චාසන්නං ගමනාගමනසම්පන්නං-යනු එක් අඞ්ගයි-දිවාඅප්පාකිණ්ණං රත්තිං අප්පසද්දං අප්පනිග්ඝොසං-යනු එකොඞ්ගයි-අප්ප ඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සං ඛො පන හොති-යි යනු එකොඞ්ගයි-තස්මිං ඛො පන සෙනාසනෙ විහරන්තස්ස...පෙ...පරික්ඛාරා යනු එකොඞ්ගයි-තස්මිං ඛො පන සෙනාසනෙ ථෙරා...පෙ...කඞ්ඛං පටිවිනොදෙන්ති...යනු එකොඞ්ගයි) අයං, මේ ...පෙ...එවද්විචාරා මෙහි විස්තරයි...

( භා * )

යම්සෙනසෙක් ගොදුරුගමින් ඉතාදුරුනොවනබවය ඉතාලංනොවනබවය යනාදි පඤ්චාඞ්ගයෙන් සමන්විතවූයේද මෙබඳු වෙහෙර සුදුසු විහාරනම් වන්නේයි භාග්‍යවත් බුදු

න් විසිනුදු මේ එදුරණලදයේමැයි මහණෙනි සෙනාසනය පඤ්චාඞ්ගයෙන් සොමස්සමන්විතවේද යත්? මහණෙනි සම්සෙනාස්නක් නිස්පීයෙන් අධික වූවකින් නොදුරුබැවින් දුරුනොවේද යවත්පිරිසෙකින් දුනුපනේසියයකට අඩුනොවන බැවින් ඉතා ලංනොවේද ඉතාමනාදුරු නොලංබැවිනුදු තිරුපදුව සැපමාඇතිබැවිනුදු යාමජ්ජට සැපවේද දහවල්දවස මහජනයාගෙන් සංකීර්ණනොවේද රාත්‍රිභාගයෙහි මහජනයාගේ කථාශබ්දනැති බැවින් ශබ්දනැත්තේද හැමවේලෙහිම ජනසන්නිපාතයෙන් වන ඝෝෂාරු මහඬ නැත්තේද මැසි මදුරු වාතාතප දිර්ඝජාති සර්පයන්ගේ වෙරපැහැරගැන්මෙන් වනනාවූ ස්පර්ශනැත්තේවේද ඒ සෙනස්නෙහි වසන මහණහට චීවරපිණ්ඩපාත සෙනාසන ගිලාන ප්‍රත්‍යය බෙහෙත් පිරිකරනොදුකින් උපදනාහුද ඒ සෙනස්නෙහි සූත්‍රගෙයාදී බොහෝ ඇසූතැන්ඇත්තාවූ පාඩම්කිරීමෙන්ද ගුරුන්ලඟ මහාකොට උගත්බැවින්ද දත්හාලදපයම්පත්ධර්මඇතිබැවින්ද විශෙෂයෙන් දන්නාලද සුගතාගමඇති සූත්‍රාභිධර්මසඞ්ඛ්‍යාතවූධර්මය දූරුබැවින් ධර්මධරවූ අභිධර්මවිනය මාතෘකා දූරුබැවින් මාතෘකාධරවූ ස්ථවිරභික්ෂුහු වෙසෙද්ද ඒ මහණතෙරුන්ඝාරා කාලින්කල එළඹ වහන්ස මේපදයකෙසේද? මේපදයාගේ අර්ථ කවරේදැයි පාලිධර්මයෙහි සැකපිළිවිසිද්ද අර්ථවිචාරණයකෙරේද ඒ මහණහට ඒ ආයුෂ්මත්හුද නොයෙක් පාලිප්‍රදෙශයන් දක්වමින් පාලයර්ථ ප්‍රකාශකෙරද්ද ඔනෑතිනොවූ ගැඹුරු වූ අර්ථයන් යුක්ති දක්විමෙන් ඔහැති කොරේද? නොයෙක් වැදූරුම් සැකඉපදීමට කාරණ බැවින් ග්‍රන්ථිස්ථානවූ පාලිප්‍රදෙශයෙහි තත්වූපරිදෙදන් විනිශ්චය දීමෙන් සැකදුරලන්නාහුද මහණෙනි සෙනාසනය මෙසේ පඤ්චාඞ්ගයෙන් යුක්තවන්නේයි. සමාධිභාවනාවට නුසුදුසු විහාරයසාර සුදුසු විහාරයෙහි වසන මහණ විසින් යන තැනෙහි මේ විස්තර කථාමාර්ගය වන්නේයයි දතයුතු —

( පා † )

බුද්දකපලිබොධුපච්ඡෙදං කත්වාති එවං පතිරූපෙ විහාරෙ විහරන්තෙන යෙපිස්ස තෙ හොන්ති බුද්දකා පලිබොධා තෙපි උපච්ඡින්දිතබ්බා — සෙය්‍යථිදං — දීඝානි කෙසනඛලොමානි ඡින්දිතබ්බානි ජිණ්ණචීවරෙසු දළ්හීකම්මං වා තුන්නකම්මං වා කාතබ්බං කිලිට්ඨානි වා රජිතබ්බානි සචෙ පත්තෙ මලං හොති පත්තො පචිතබ්බො — මඤ්චපීඨාදීනි සොධෙතබ්බානීති අයං බුද්දකපලිබොධුපච්ඡෙදං කත්වාති එත්ථ විත්ථාරො ඉදානි සබ්බං භාවනාවිධානං අපරිහාපෙන්තෙන භාවෙතබ්බන්ති එත්ථ අයං පඨවීකසිණං ආදිං කත්වා සබ්බකම්මට්ඨානවසෙන විත්ථාරකථා හොති — එවං උපච්ඡින්නබුද්දකපලිබොධෙන හි භික්ඛුනා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තෙන භත්තසම්මදං පටිවිනොදෙත්වා පවිවිත්තෙ ඔකාසෙ සුඛනිසින්නෙන කතාය වා අකතාය වා පඨවියා නිමිත්තං ගණ්හිතබ්බං. වුත්තං හෙතං පඨවීකසිණං උග්ගණ්හන්තො පඨවියා නිමිත්තං ගණ්හාති කතෙ වා අකතෙ වා සාන්තකෙ නො අනන්තකෙ සකොටියෙ නො අකොටියෙ සවට්ටුමෙ නො අවට්ටුමෙ සපරියන්තෙ නො අපරියන්තෙ සුප්පමත්තෙ වා සරාවමත්තෙ වා සො තං නිමිත්තං සුග්ගහිතං කරොති සූපධාරිතං උපධාරෙති සුවවත්ථිතං වවත්ථපෙති සො තං නිමි

තතං දුග්ගහිතං කත්වා සුප්පධාරිතං උපධාරෙත්වා සුට්ඨු සඤ්ඤිතං වවත්ථපෙත්වා ආනිසංස දස්සාවී රතනසඤ්ඤී හුත්වා චිත්තීකාරං උපට්ඨපෙත්වා සම්පියායමානො තස්මිං ආරම්මණෙ චිත්තං උපනිබන්ධති අද්ධා ඉමාය පටිපත්තියා ජරාමරණම්හා මුච්චිස්සාමීති සො විවිච්චෙව කාමෙහි ...පෙ... පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරතීති ....

( ෂ † )

ඛුද්දක ...පෙ... කත්වාති "ඛුද්දක පළිබොධු පච්ඡෙදං කත්වා" යන මෙහි; එවං, මෙසේ; පතිරූපෙ සෙනාසනෙ විහරන්තෙන, සුදුසු සෙනසුනෙහි වසන්නහු විසින්; අස්ස, ඔහුගේ; යෙපි තෙ හොන්ති ඛුද්දක පළිබොධා, යම් ඒ ක්ෂුද්‍ර පළිරොධ කෙනෙක් ඇද්ද; තෙපි උපච්ඡින්දිතබ්බා, උන්ද පසිඳුයු [තු* කෙසපිදං, ඔහු කවරහුදයත්? දීඝානි කෙසනඛලොමානි, දික්වූ කෙස් නිය ලොම්; ඡින්දිතබ්බානි, සිඳියයුත්තාහුය; ජිණ්ණචීවරෙසු, දිරාගිය සිවුරෙහි; දළ්හිකම්මං වා, දැඩිකම් හෝ; තුන්නකම්මං වා, ගෙත්තම් හෝ; කාතබ්බං, කටයුතුයි; කිලිට්ඨානි වා, කිලිටි සිවුරු හෝ; රජිතබ්බානි, රැඳියයුත්තාහුය; සචෙ, ඉදින්; පත්තෙ මලං හොති, පාත්‍රයෙහි මල ඇත්තේවීනම්; පත්තො පචිතබ්බො, පය පිසියයුතු; මඤ්චපීඨාදීනි, මැසි පුටු ආදිය; සොධෙතබ්බානීති, පිරිසිදු කටයුත්තාහුය යනු; අයං, මේ; ඛුද්දක පළිබොධු පච්ඡෙදං කත්වාති එහි, සුඩා පිළිබුදු පසිඳීම කොටවය යනයි; විත්ථාරො, විස්තරයි; ඉදානි, දැන්; සබ්බං භාවනා විධානං, සියළු භාවනා විධිය; අපරිහාපෙන්තෙන, නොපිරිහෙළන්නහු විසින්; භාවෙතබ්බොති එහි, වැඩියයුතු ය යනමෙහි; පථවීකසිණං ආදිං කත්වා, පෘථිවිකිසුණ මුල්කොට; සබ්බකම්මට්ඨාන වසෙන, අනුක්‍රමයෙන් දක්වන සතලිස් ආකාරවූ සියළු කමටහණුන්ගේ වශයෙන්; අයං විත්ථාරකථා හොති, මේ විස්තර කථාවවේ; එවං උපච්ඡින්නඛුද්දකපළිබොධෙනාති; මෙසේ පසිඳිනාලද සුඩා පිළිබුදු ඇති; පිණ්ඩපාත පටික්කන්තෙන, පිණ්ඩපාත පරිභොගයෙන් පෙරළා ආවාවූ; භික්ඛුනා, මහණ විසින්; පච්ඡාභත්තං, බතට පසුකාලයෙහි; භත්තසම්මදං පටිවිනොදෙත්වා, භොජන නිමිත්තයෙන් උපදනා විඩා සන්සිඳුවා (ආහාරය ආහාරාසන්න පිළිසිකල ආහාරයාගේ ආගන්තුක බැවින් බොහෝසෙයින් ශරීර විඩා උපදන්නේය ඒ ව්‍යුපශමිතයනු වූ කල ශරීරඛෙදයෙන් විචෙතනකාග්‍රතාව නොලබන හෙයින් ඒ විඩා සන්සිඳුවාය සුභැනී) පවිවිත්තෙ ඔකාසෙ, ජනවිවික්ත ස්ථානයෙහි; සුඛ නිසින්නෙන, පලක් බැඳ ශරීරය සෘජුව තබා සැපසේ හුන්නහු) විසින්; කතාවා අකතාය වා, කරණලද හෝ නොකරණලද හෝ; පථවියං, පෘථිවියෙහි; නිමිත්තං ගණ්හිතබ්බං, නිමිත්ත ගතයුතු; වුත්තං හෙතං (පරණ අටුවායෙහි) කියේමැනු; පථවීකසිණං උග්ගණ්හන්තො, උද්ග්‍රහ නිමිත්තභාවයෙන් පෘථිවිකිසුණ උගන්නේ; පථවියං, (සංස්ථාන විශෙෂ ඇති) පෘථිවි මණ්ඩලයෙහි; නිමිත්තං ගණ්හාති (ආදශීතලයෙහි මුඛ නිමිත්තය ඇසින්ගන්නාක්හුමෙන් භාවනා ඥානයෙන් සංස්ථාන විශෙෂඇති) පෘථිවි නිමිත්තය ගණී ("පථවියං"යි කියද මණ්ඩලාපෙක්ෂාවෙන් නපුංසක නිර්දෙශ කළේ.)

* [ ] මේ ලකුණු දෙක අතර සන්නය සියලු පොත්වල ම ඛණ්ඩිතව තිබී අප විසින් යොදනලදි.

කතෙ වා, වක්ෂ්‍යමාණ විධීන් කරණලද හෝ; අකතෙ වා, නොකරණලද [බලමණ්ඩලාදී) පෘථිවී මණ්ඩලයෙහි හෝ; සාන්තකෙ, අන්තසහිතමවූ ("සපරිච්ඡෙදවූ යන අර්ථයි) හෝ අනන්තකෙ, අන්ත නැතිවූ ("සකොටිකෙ" යනාදීහු "සාන්තකෙ" යනාදීන්හා සමානාර්ථයෝයි) සුප්පමත්තෙ වා, සුළුකුලු පමණවූ හෝ; සරාවමත්තෙ වා, මලාවක් පමණවූ හෝ (මිහි සුප්ප සරාව දෙදෙනා සම ප්‍රමාණවූවාහු පසස්නා ලද්හු) සො, ඒ යෝගාවචර තෙමේ; තං නිමිත්තං, ඒ පඨවි මණ්ඩලය; සුග්ගහිතං කරොති, මනාකොට ගන්නාලද්දක් කෙරේ (යම් කලෙක උන්මීලිත කාලයෙහිමෙන් නිමීලිත කාලයෙහි වැටහේද එකල්හි මනාකොට ගන්නාලද්ද නම්වේ) සූපධාරිතං උපධාරෙති, මනාකොට සලකණලදුකොට සලකා (සමාහිත එළවා අවහිතවූ සිතින් නැවත නැවත සලකන්නේ මනාකොට සලකණලදුකොට සලකන්නේ නම්වේ) සුවවත්ථිතං, මනාකොට නියමකරණලදුකොට; වවත්ථපෙති, නියම කෙරේ; සො, ඒ යොගී තෙම; තං නිමිත්තං, ඒ පඨවි මණ්ඩලය; සුග්ගහිතං කත්වා, මනාකොට ගන්නාලදුකොට; සූපධාරිතං උපධාරෙත්වා, මනාකොට සලකණලදුකොට සලකා; සුවවත්ථිතං වවත්ථපෙත්වා, මනාකොට නියමකරණලදුකොට නියමකොට; ආනිසංස දස්සාවී, අනුසස් දක්නේ; රතනසඤ්ඤී හුත්වා, රත්නසංඥා ඇතිව; චිත්තීකාරං උපට්ඨපෙත්වා, ගෞරව එළවා; සම්පියායමානො, සොම්නස්වෙමින්; තස්මිං ආරම්මණෙ, සුග්ගහිතකරණාදීන් මනාව වැටහුනු පඨවිකසිණ අරමුණෙහි; චිත්තං උපනිබන්ධති, තමාගේ සිත උපචාර ධ්‍යානයට පමුණුවා බඳී. (අන්‍යාලම්බණයෙන් වළකා) අද්ධා, එකාන්තයෙන්; ඉමාය පටිපත්තියා, මේ පිළිවෙතින්; ජරාමරණම්හා මුච්චිස්සාමිති, ජරාමරණයෙන් මිදෙමියි (අධ්‍යයනාදීන් අනුසස දැකී බව දක්වූහු) සො, ඒ යොගී තෙම; විවිච්චෙව කාමෙහි, කාමයන් කෙරෙන් වෙන්ව; විවිච්ච අකුසලෙහි ධම්මෙහි, අකුශල ධර්මයන් කෙරෙන් වෙන්ව; පඨමජ්ඣානං උපසම්පජ්ජ, ප්‍රථම ධ්‍යානය උපදවා; විහරති, වෙසේ ~

( හා † )

ඛුද්‍ර පලිබොධපසිඳුය යනමෙහි උක්තප්‍රකාර සුදුසු සෙනසුනෙහි වසන්නහු විසින් ඉඟට යම් යම් ඛුද්‍ර පලිබොධයෙක් ඇද්ද ඒ පලිබොධ යනුදු පසිඳිය යුත්තාහුය කෝ කවර ඛුද්‍ර පලිබොධයෙක්දයත්? දික්වූ කෙස් නිය ලොම් සිඳියයුත්තාහුය දිරාගිය සිවුරෙහි ඩුලු දැම්මෙන් දැඩිකම හෝ තිදිකම හෝ කටයුතුය කිලිටුවූ සිවුරු රැඳියයුත්තාහුය ඉදින් පාත්‍රයෙහි මල ඇත්නම් පාත්‍රය පිසියයුත්තේය මැසිපුටු ආදිය සුඩකටයුත්තාහුය ඛුද්‍ර පලිබොධ පසිඳය යනමෙහි මේ විස්තර වන්නේයි දත් වනාහි සියළු භාවනා විධිය නොපිරිහෙළන්නහු විසින් භාවනා කටයුතුය යනමෙහි මේ පෘථිවී කසිණය ආදිකොට ඇති මහු දන්වනලද සතළිසක් ප්‍රභෙදවූ සියලු කර්මස්ථානයන්ගේ වශයෙන් විස්තර කථාව වන්නේයි මෙසේ පසිඳිනාලද ඛුද්‍ර පලිබොධ ඇති මහණ විසින් පිණ්ඩපාතයෙන් පෙරළා අවුත් බත්හි උපන් විඩා සන්සිඳුවා පසුබත් කාලයෙහි විවෙක ස්ථානයෙක පලක් බැඳ ශරීරය සෘජුව තබා සැපසේ හිඳ කිසුණුමඬුළු කරණලද පෘථිවියෙහි හෝ කිසුණුමඬුළු නොකරණලද කලවිටි ආදි ප්‍රකෘති පෘථිවියෙහි හෝ නිමිත්ත ගතයුත්තේය. පුරාණ අටුවාවෙහිදු මේ කිය

තලඳුයේවැයි උද්ග්‍රහනිමිත්ත වශයෙන් පෘථිවිකසිණය ගත්තාහු මතු දක්වන නයින් කරණලද කිසුණුබිම් හෝ නොකරණලද කලවිටි ආදි බිම හෝ සුළුකුලුමලාවන් පමණවූ කසිණ මණ්ඩලයෙක කැටිපනෙක මූවනිමිත්තය ඇසින් බලන්නොහොත් භාවනාමය නුවණින් ඒ පෘථිවි කසිණ නිමිත්තය ගත්තේය ඒ කසිණ නිමිත්තයද පිරිසිඳිනලද්දනුව කොත් ඇත්තාහුම මාගී සනිතවූම කොළවර ඇත්තාවූම වූයේය නොපිරිසිඳිනලද කොන් හැත්තාවූ මාගී නැත්තාවූ කොලවර නැත්තාවූ කසිණමණ්ඩලය නොවූයේය ඒ යොගාවචර තෙම ඒ පෘථිවි කසිණමණ්ඩලය මහාකොට ඉගෙණනන්නාලද්දේවෙයි මහාකොට සලකණලද්දේවෙයි මහාකොට නියමකරණ ලද්දේවෙයි ඒ යොගාවචරතෙම කසිණ නිමිත්තය උන්මිලිත කාලයෙහිමෙන් නිමිලිත කාලයෙහින් සිතව වැටෙනසේ මහාකොට ඉගෙණ නැවත නැවත මහාකොට සලකා මහාකොට සිතින් නියමකොටගෙණ අනුසස් දක්නා සුළුව මහගු රත්නයක් ලැබුයේය යන සංඥ ඇතිව ගෞරව එළවා සොම්නස් වෙමින් ඒකාන්තයෙන් මම පිළිවෙතින් ජරාමරණයෙන් මිදෙමියි සිතා මහාකොට වැඩුහුයු ඒ කසිණාරම්මණති තමාගේ සිත අනාලම්බණයන්ගෙන් වළකා උපාචාර ධ්‍යානයට පමුණුවා බඳිනේය ඒ යොගාවචර තෙම වස්තුකාම කෙලශකාමයන්ගෙන් හා අකුසල ධර්මයන්ගෙන් වෙන්ව විතර්ක විචාර සහිතවූ ප්‍රථම ධ්‍යානය උපදවා වාසයකරන්නේය.

( ෆ, ‡ )

යෙන පන අන්නභවෙපි සාසනෙ වා ඉසිපබ්බජ්ජාය වා පබ්බජිත්වා පඨවිකසිණෙ චතුක්කපඤ්චකජ්ඣානානි නිබ්බත්තිතපුබ්බානි එවරූපස්ස පුඤ්ඤවතො උපනිස්සය සම්පන්නස්ස අකතාය පඨවියා කසිතට්ඨානෙ වා ඛලමණ්ඩලෙ වා නිමිත්තං උප්පජ්ජති මල්ලකත්ථෙරස්ස විය. තස්ස කිරායස්මතො කසිතට්ඨානං ඔලොකෙන්තස්ස තඞ්ඨානප්පමාණමෙව නිමිත්තං උදපාදි සො තං වඩ්ඪෙත්වා පඤ්චකජ්ඣානානි නිබ්බත්තෙත්වා ඣානපදට්ඨානං විපස්සනං පට්ඨපෙත්වා අරහත්තං පාපුණි යො පන එවං අකතාධිකාරො තෙනාපි ආචරියසන්තිකෙ උග්ගහිතං කම්මට්ඨාන විධානං අවිරාධෙත්වා චත්තාරො කසිණදොසෙ පරිහරන්තෙන කසිණං කාතබ්බං. නීලපීතලොහිතොදාත සම්භෙදවසෙන හි චත්තාරො පඨවිකසිණදොසා තස්මා නීලාදිවණ්ණං මත්තිකං අග්ගහෙත්වා ගඞ්ගාවහෙ මත්තිකාසදිසාය අරුණවණ්ණාය මත්තිකාය වුත්තං කසිණං කාතබ්බං තඤ්ච ඛො විහාරමජ්ඣෙ සාමණෙරාදීනං සඤ්චරණට්ඨානෙ න කාතබ්බං. විහාරපච්චන්තෙ පන පටිච්ඡන්නට්ඨානෙ පබ්භාරෙ වා පණ්ණසාලාය වා සංහාරිමං වා තත්‍රට්ඨකං වා කාතබ්බං තත්‍ර සංහාරිමං චතුසු දණ්ඩකෙසු පිලොතිකං වා චම්මං වා කටසාරකං වා බන්ධිත්වා තත්‍ර අපනීතතිණමූලසක්ඛරකඨලිකාය සුමද්දිතාය මත්තිකාය වුත්තප්පමාණං වට්ටං ලිම්පිත්වා කාතබ්බං තං පරිකම්මකාලෙපි භූමියං අත්ථරිත්වා ඔලොකෙතබ්බං. තත්‍රට්ඨකං භූමියං පදුමකණ්ණිකාකාරෙන ඛාණුකෙ ආකොටෙත්වා වල්ලිහි විනන්ධිත්වා කාතබ්බං යදි සා මත්තිකා නප්පහොති අධො අඤ්ඤං පක්ඛිපිත්වා උපරිභාගෙ සුපරිසොධිතාය අරුණවණ්ණාය මත්තිකාය විදත්ථි චතුරඞ්ගුල වි

ත්වාරං වට්ටං කාතබ්බං. එතදෙව හි පමාණං සන්ධාය සුප්පමත්තං වා සරාවමත්තං වාති වුත්තං. සාන්තකෙ නො අනන්තකෙති ආදීපනස්ස පරිච්ඡෙදත්ථාය වුත්තං. තස්මා එවං වුත්තප්පමාණං පරිච්ඡෙදං කත්වා රුක්ඛපාණිකා විසභාග වණ්ණං සමුට්ඨාපෙති තස්මා තං අගහෙත්වා පාසාණපාණිකාය ඝංසිත්වා සමං භෙරීතල සදිසං කත්වා තංඨානං සම්මජ්ජිත්වා නහාත්වා ආගන්ත්වා කසිණමණ්ඩලතො අඩ්ඪතෙය්‍ය හත්ථන්තරෙ පදෙසෙ පඤ්ඤත්තෙ විදත්ථිචතුරංගුලපාදකෙසු අත්ථතෙ පීඨෙ නිසීදිත්වා තතො දූරතරෙ නිසින්නස්ස හි කසිණං න උපට්ඨාති ආසන්නතරෙ කසිණදොසා පඤ්ඤායන්ති උච්චතරෙ නිසින්නෙන ගීවං ඔනාමෙත්වා ඔලොකෙතබ්බං හොති නීචතරෙ ජණ්ණුකානි රුජන්ති තස්මා වුත්තනයෙනෙව නිසීදිත්වා අප්පස්සාදා කාමාති ආදිනා නයෙන කාමෙසු ආදීනවං පච්චවෙක්ඛිත්වා කාමනිස්සරණෙ සබ්බදුක්ඛ සමතික්කමස්ස උපායභූතෙ නෙක්ඛම්මෙ ජාතාභිලාසෙන බුද්ධ ධම්ම සඞ්ඝ ගුණානුස්සරණෙන පීතිපාමොජ්ජං ජනයිත්වා අයං හි සා සබ්බ බුද්ධ පච්චෙක බුද්ධ අරියසාවකෙහි පටිපන්නා නෙක්ඛම්ම පටිපදාති පටිපත්තියා සඤ්ජාතගාරවෙන අද්ධා ඉමාය පටිපත්තියා පවිවෙක සුඛරසස්ස භාගී භවිස්සාමීති උස්සාහං ජනයිත්වා සමෙන ආකාරෙන චක්ඛූනි උම්මීලෙත්වා නිමිත්තං ගණ්හන්තෙන භාවෙතබ්බං අති උම්මීලයතො හි චක්ඛුං කිලමති මණ්ඩලඤ්ච අතිවිභූතං හොති තෙනස්ස නිමිත්තං නුප්පජ්ජති අතිමන්දං උම්මීලයතො මණ්ඩලං අවිභූතං හොති චිත්තඤ්ච ලීනං හොති එවම්පි නිමිත්තං නුප්පජ්ජති තස්මා ආදාසතලෙ මුඛනිමිත්ත දස්සිනා විය සමෙන ආකාරෙන චක්ඛූනි උම්මීලෙත්වා නිමිත්තං ගණ්හන්තෙන භාවෙතබ්බං.— න වණ්ණො පච්චවෙක්ඛිතබ්බො. න ලක්ඛණං මනසිකාතබ්බං. අපිච වණ්ණං අමුඤ්චිත්වා නිස්සයසවණ්ණං කත්වා උස්සදවසෙන පණ්ණත්ති ධම්මෙ චිත්තං ඨපෙත්වා මනසිකාතබ්බං. පඨවී මහී මෙදිනී භූමි වසුධා වසුන්ධරාති ආදීසු පඨවී නාමෙසු යං ඉච්ඡති යදස්ස සඤ්ඤානුකූලං හොති තං වත්තබ්බං.—

---

( ස ‡ )

(දුන් දක්වනලද අටුවා පාඨයාගේ අර්ථ ප්‍රකාශකිරීම හා සමග භාවනා විධිය පහළකරණුවෝ—"තත්ථ" යනාදී කීහු) තත්ථ, ඒ දෙක්හි; යෙන, යමක්හු විසින්; අතීතභවෙපි, අතීත බෙංචනිදු; සාසනෙ වා, බුදුසස්නෙහි හෝ; ඉසිපබ්බජ්ජාය වා, සෘෂි ප්‍රව්‍රජ්‍යාවෙහි හෝ; පබ්බජිත්වා, පැවිදිව; පඨවීකසිණෙ, පඨවි කිසුණෙහි; චතුක්කපඤ්චකජ්ඣානානි, චතුෂ්ක පඤ්චක ධ්‍යානයෝ; නිබ්බත්තිතපුබ්බානි, නිපදවනලද විරූද; එවරූපස්ස, එබඳුවූ; පුඤ්ඤවතො, භාවනාමය පිණැතිය හට; උපනිස්සය සම්පන්නස්ස, එබඳුව උපනිශ්‍රයෙන් සමන්විතය හට; අකතාය පඨවියා, නොකරණලද පෘථිවියෙහි; කසිතට්ඨානෙ වා, සාවතැන හෝ; ඛලමණ්ඩලෙ වා, කලවිටි මඩුල්ලෙහි හෝ; නිමිත්තං උප්පජ්ජති, ප්‍රතිභාග නිමිත්ත උපදී; මල්ලකත්ථෙරස්ස විය, මල්ලකනම් තෙරුන්ටමෙනි; තස්ස කිරායස්මතො, ඒ ආවත්හු; කසිතට්ඨානෙ ඔලොකෙන්තස්ස, සාවතැන් බලන්නාහුට; තංඨානප්පමාණමෙව, ඒ බැළුතැන් පමණමම; නිමිත්තං උදපාදි, ප්‍රතිභාග නිමිත්ත උපනි; සො, ඒ තෙරහු; තං වඩ්ඪෙත්වා, ඒ නිමිත්ත වඩා; පඤ්චකජ්ඣානානි නිබ්බ

ජනෙත්වා, පස්ඨ්‍යාන් උපදවා; ඣානපදට්ඨානං විපස්සනං පට්ඨපෙත්වා, ධ්‍යාන පාදක කොට විදර්ශනාවට පටන්ගෙණ; අරහත්තං පාපුණි, රහත්බවට පැමිණියෝ; යො පන, යමෙක් වනාහි; එවං අකතාධිකාරො, මෙසේ කෘතාධිකාර නොවේ නම්; තෙන, උහු විසින්; ආචරියසන්තිකෙ, ආචාර්‍ය්‍යයන් සමීපයෙහි; උග්ගහිතං කම්මට්ඨාන විධානං, උගත් කමටහන් විධිය; අවිරාධෙත්වා, නොවරදවා; චත්තාරො කසිණදොසෙ පරිහරන්තෙන, සතර කිසුණු දොසුන් දුරුකරන්නහු විසින්; කසිණං කාතබ්බං, කිසුණ කටයුතු; නීල පීත ලොහිත ඔදාතසම්භෙදවසෙන, නීල්වන් රත්වන් රත්වන් සුදු පැහැ ඇති මැටි මුසුවීම් විසින්; චත්තාරො පඨවි කසිණදොසා, පඨවි කිසුණු දොස්හු සතර දෙනෙකි; තස්මා, එහෙයින්; නීලාදිවණ්ණං මත්තිකං අගහෙත්වා, නීලාදි වර්ණ ඇති මැටි නොගෙණ; ගඞ්ගාවහෙ මත්තිකා සදිසාය, රවුලු ගංසැඩ පහරින් පහළ හිත්තියෙහි මැටි වැනිවූ § අරුණවණ්ණාය මත්තිකාය, අරුණුවන් මැටියෙන්; වුත්තං කසිණං කාතබ්බං, කීයන ලද පඨවිකිසුණ කටයුතු; තඤ්ච බො, හේ කිසුණද; විහාරමජ්ඣෙ, වෙහෙර මැද; සාමණෙරාදීනං සඤ්චරණට්ඨානෙ, සෙරණ ආදීන්ගේ සඤ්චරණ ස්ථානයෙහි; න කාතබ්බං, නොකටයුතු; විහාරපච්චන්තෙ පන, විහාර පර්‍ය්‍යන්තයෙහි වනාහි; පටිච්ඡන්නට්ඨානෙ, මුවහනැන; පබ්භාරෙවා, නැමී සිටි ගල්යමෙක හෝ; පණ්ණසාලායවා, පන්සලෙක හෝ; සංහාරිමංවා, ගෙණයා ඇකිකොට හෝ; තත්‍රවට්ටකංවා, ඉහිම සිටිනාකොට හෝ; කාතබ්බං, කටයුතු; තත්‍ර, ඒ දෙක්හි; සංහාරිමං, සංහාරිම කිසුණ; චතුසු දණ්ඩකෙසු, දඬු සතරෙක; පිලොතිකංවා, රෙදිකඩක් හෝ; චම්මංවා, සමක් හෝ; කටසාරකංවා, කලාල් කඩක් හෝ (හුණු පපිරි එව් යනු සන්නයි) බන්ධිත්වා, බැඳ; තත්, එහි; අපනීත, පහකරණලද; තිණමූලසක්ඛරවාලිකාය, තණමුල් හකුරු වැලි ඇති; සුමද්දිතාය, මනා කොට මඩනාලද; මත්තිකාය, මැටියෙන්; විදත්ථි චතුරඞ්ගුලප්පමාණං, එක් වියත් සතරඟුල් පමණකොට; වට්ටං, වටකොට; ලිම්පිත්වා කාතබ්බං, ලෙප කර කටයුතු; පරිකම්මකාලෙපි, නිමිත්ත ග්‍රහණයෙන් භාවනාකරණ කාලයෙහිද; භූමියං අත්ථරිත්වා, භූමියෙහි අතුට (බිම තබාය යන අර්ථයි) ඔලොකෙතබ්බං, බැලියයුතු; තත්‍රවට්ටකං, තත්‍රවට්ටක කිසුණ; භූමියං, බිම; පදුම කණ්ණිකාකාරෙන, පියුම්කෙමි ආකාරයෙන්; ඛාණුකෙ ආකොටෙත්වා, කණු ගසා; වල්ලිහි විනන්ධිත්වා, වැලින් බැඳ; කාතබ්බං, කටයුතු; යදි, ඉදින්; සාමත්තිකා නප්පහොති, ඒ අරුණුවන් මැටි නොසෑහේ නම්; අධො අඤ්ඤං පක්ඛිපිත්වා, යට අනික් මැටියක් බහාලා, උපරිභාගෙ, මතුපිට; සුප

§ මෙතන සන්නයෙහි "රවුළුපහ හිත්තියෙහි" යයි ලියා තිබේ. නුමුත් ටීකාවෙහි "ගඞ්ගාවහෙති, ගඞ්ගාසොතෙ, සීහලදීපෙ කිර රාවණගඞ්ගා නාම නදී, තස්සා සොතෙන, භින්නතටට්ඨානෙ; මත්තිකා අරුණවණ්ණා, තං සන්ධාය වුත්තං ගඞ්ගාවහෙ, මත්තිකාසදිසාය, අරුණ වණ්ණායාති" යනු දක්නාලබේ "රවුළු (ගං සැඩපහරින්) පහ (ළ) හිත්තියෙහි" යයි පුරාණ සන්න කර්තෘගේ ලියවිල්ල ඛණ්ඩිතව මෙසේ වීයයි හඟිමු. අපට ලැබුනු සන්න හතඅටකම මෙසේම තිබේ. සිංහල යනු බොහෝසෙයින් තුන්භාගං උපදින අත් රටකි. "සීහ අස්මිං විජ්ජතීති සීහලා" යන නිර්වචන ක්‍රමයෙන් ඒ සිංහල ජනපදයත් "සීහංලූනාති සීහලා තබ්බංසාතාවා සීහලො" යන නිර්වචනයෙන් මෙම හෙලදිවත් ගන්නා ලැබේ. (ශොධක කර්තෘ.)

රිසොධිතාය, තණමුල් ආදීන් පහකොට පිරිසිදුකරණලද; අරුණවණ්ණාය මත්තිකාය, අරුණුවන් මැටියෙන්; විදත්ථි චතුරංගුල විත්ථාරං, එක්වියත් සතරඟුලක් පළල්කොට; වට්ටං කාතබ්බං, වටකොට කටයුතු; එතදෙවකි පමාණං සන්ධාය "විදත්ථි චතුරංගුලං"යි කියනලද පමණම සඳහා; සුප්පමත්තං සරාවමත්තං වාති වුත්තං "සුප්පමත්තං සරාවමත්තංවා"යි කියනලදී. (එකී කුල්ලද ඉතා මහත් නොවූයේ මලාවද මහත් සැලක් පියාලනලද පමණම සම ප්‍රමාණවූයේවේ) "සාන්තකෙ වා අනන්තකෙ" යනාදී වනාහි; අස්ස, ඒ කසිණයාගේ; පරිච්ඡේදත්ථාය වුත්තං, පරිච්ඡේදය පිණිස කියනලදී; තස්මා, එහෙයින්; එවං වුත්තප්පමාණ පරිච්ඡේදං කත්වා, එක්වියත් සතරඟුලක් පළල පරිච්ඡේදකොට (නොහොත් එක්වියත් සතරඟුලක් පමණ කිසුණ විසභාග වණ්ණයකින් පරිච්ඡේදකොට) රුක්ඛපාණිකා, කසඳුන් ආදී දඬුපෙණය; විසභාග වණ්ණං සමුට්ඨාපෙති, අරුණුවන් පැහැයට විසභාග වණ්ණය උපදවයි; තස්මා, එහෙයින් තං අගහෙත්වා, ඒ දඬුපෙණය නොගෙණ (පියවි රුක් පෙණය ගල් පෙණෙයහිම ඇතුළත්වෙයි හගෙන්) පාසාණ පාණිකාය ඝංසිත්වා, ගල්පෙණින් ගගා; සමං, සමකොට; හෙරිතලසදිසං කත්වා, බෙර මුහුණක් වැනිකොට; තූරයාතං සම්මජ්ජිත්වා, එහැන හැමද; නහාත්වා ආගන්ත්වා, නහා අවුත්; කසිණමණ්ඩලතො, කිසුණු මඬුල්ලෙන්; අඩ්ඪතෙය්‍ය හත්ථන්තර පදෙසෙ, දෙරියන් වියතක් පමණ අතුර ඇති ප්‍රදෙශයෙහි (මඬුල්ල හා හිඳිනා පුටුව හා මැද දෙරියන් වියතක් තබායයි සේයි) පඤ්ඤත්තෙ, පණවනලද; විදත්ථි චතුරංගුල පාදකෙ, එක්වියත් සතරඟුල් පා ඇති; සුඅත්ථතෙ පීඨෙ, මෙලොක්කොට අතුළ පුටුවෙයහි; නිසීදිත්වා, හිඳ ("නිමිත්තං ගණ්හෙන්තෙන භාවේතබ්බං යනු හා යොදනු) තතො දූරතරෙ නිසීනස්ස, මඬුල්ලෙන් දෙරියන් වියතකින් දුරුවහුන්හා හට; කසිණං න උපට්ඨාති, කිසුණ නොවැටහේ; ආසන්නතරෙ, දෙරියන් වියතකින් ලංව හුන්හා හට; කසිණදෙසො පඤ්ඤායති, කිසුණු දොස් පැනේ; උච්චතරෙ නිසින්නෙන, කී පමණින් උස් තැන්හි හුන්නහු විසින්; ගීවං ඔනාමෙත්වා ඔලොකෙතබ්බං හොති, කරහාමා නැමුරුව ගෙණ බැලියයුතුවේ; නීචතරෙ, මිටිවෙහි හුන්නහුගේ; ජණ්ණුකානි රුජන්ති, දෙදණ මඬුලුරෙදෙයි ("ජණ්ණුකානි රුජන්ති" යනු පය එල්වා හිඳිනා හෙයින් කීහයි හඟණේ) යස්මා, එහෙයින්; වුත්තනයෙනෙව නිසීදිත්වා, කී නයෙන්ම හිඳ; අප්පස්සාදා කාමා හි ආදිනා නයෙන, කාමයෝ අල්පාස්වාදයහ යනාදි නයින්; කාමෙසු ආදීනවං පච්චවෙක්ඛිත්වා, කාමයෙහි ආදීනව ප්‍රත්‍යවෙක්ෂාකොට; කාමනිස්සරණෙ, කාමයන්ට නිස්සරණවූ (කාමයන් කෙරෙන් නික්මනවූ ගෝ) සබ්බදුක්ඛ සමතික්කමස්සව උපායභූතෙ (රහත් මගට පාදක බැවින්) සියළු දුක් ඉක්මීමට උපායවූ; නෙක්ඛම්මෙ ජනාභිලාසෙන, ධ්‍යාන ප්‍රතිලාභයෙහි උපන් අභිලාෂා ඇත්තහු විසින්; බුද්ධධම්ම සඞ්ඝගුණානුස්සරණෙන ("සම්මා සම්බුද්ධො වත භගවා අවිපරීත ධම්මදෙසනත්තා" යනාදීන්) බුද්ධරත්නයාගේද ("ස්වාක්ඛාතො ධම්මො එකන්ත නීය්‍යානිකත්තා" යනාදීන්) ධම්මරත්නයාගේද ("සුප්පටිපන්නො සඞ්ඝො යථානුසිට්ඨං පටිපජ්ජනතො" යනාදීන්) සඞ්ඝරත්නයාගේද ගුණ සිහිකිරීමෙන්; පීතිපාමොජ්ජං ජනයිත්වා, රත්නත්‍රයවිෂය ප්‍රීතිප්‍රමොද්‍ය උප

දුවා; සබ්බබුද්ධ පච්චෙක බුද්ධඅරියසා
වකානං, සියළු බුදු පසේබුදු අරිහතුව
න් විසින්; පටිපන්නා, පිළිපදනාලද;
("අයං දුතිසා පොක්ඛමම පටිපදා"යි
යොදනු) අයං දුති, මේ දුත්; සා පො
ක්ඛමම පටිපදානි, ඒ නෛෂ්ක්‍රම්‍ය ප්‍රති
පත්තියයි (කාමාවචර ධ්‍යානය විදර්ශ
නාය මාර්ගය නිර්වාණය යන මොවුන්
ගේ අධිගමයට කාරණායයි සන අර්ථ
යි) පටිපන්නියා, පිළිවෙත්හි; සඥ්ජා
තගාරවෙන, උපන් ගෞරව ඇත්තාහු
විසින්; අධා, ඒකාන්තයෙන්; ඉමාය
පටිපත්තියා, මේ පිළිවෙතින්; පවිවේ
ක සුඛරසස්ස, විවේකාදි ප්‍රවිවේ
කයෙන්වූ සුඛරසයට; භාගී භවිස්සාමි
නි, හිමිවෙමි යි; උස්සාහං ජනයිත්වා,
උත්සාහ උපදවා; සමෙන ආකාරෙන,
සමවූ ආකාරයෙන්; චක්ඛූනි උම්මීලෙ
ත්වා, ඇස් දල්වා; නිමිත්තං ගණ්හා
තෙන, නිමිත්ත ගත්තාහු විසින්;
භාවෙතබ්බං, බැවියයුතු; අතිඋම්මීල
යන්තා, ඉතා ඇස දල්වන්නාහුගේ;
චක්ඛුං කිලමති (ඉතා සියුම් රූපක්
හෝ ඉතා භාස්වර රූපක් හෝ බලන්
නක් හට මෙන්) ඇස කලකිරේ; ම
ණ්ඩලඤ්ච, මඬුල්ලද; අතිවිභූතං හො
ති, ඉතා පහළවේ (ලක්ෂණ වශයෙන්
හෝ වර්ණ වශයෙන් හෝ වැටහේ)
තස්මා, එහෙයින්; අස්ස, ඔහට; නිමි
ත්තං නුප්පජ්ජති, නිමිත් නොඋපදී;
අතිමන්දං උම්මීලයතො, ඉතා මඳකො
ට බලන්නාහුට; මණ්ඩලං, මඬුල්ල; න
විභූතං හොති, පහළ නොවේ (ගප නි
මිලනයෙන් බලන්නහුට අරමුණක්
මෙන් පහළ නොවේ යුතැනි) චිත්තඤ්ච
ලීනං හොති (දර්ශනයෙහි මඳ ව්‍යාපා
ර බැවින් කෞසීද්‍ය පක්ෂයෙහි හිමෙ
න්) සිතද ලීනවේ; එවම්පි, මෙසේ ත
ලද; නිමිත්තං නුප්පජ්ජති, නිමිත්තය
නොඋපදී; තස්මා, එහෙයින්; ආදාස

තලෙ මුඛනිමිත්තං දස්සිතාවිය, කැඩප
ත් පෙලෙහි මුහුණු පිළිබිඹු බලනුව
හුමෙන් (උන්මීලනයද අති නිමීලන
යද නොකොට කැඩපත් පෙලෙහි ව
ර්ණය පස්නොවිකා ඉතිලකුණු මෙනෙ
හි නොකොට සම ආකාරයෙන්ම න
මා මුහුණු නිමිත් බලනුවනු මෙන යු
තැනි) සමෙන ආකාරෙන චක්ඛූනි
උම්මීලෙත්වා, සම ආකාරයෙන් ඇස්
දල්වා; නිමිත්තං ගණ්හන්තෙන, නිමි
ත් ගන්නාහු විසින්; භාවෙතබ්බං, බැ
වියයුතු; න වණ්ණො පච්චවෙක්ඛිත
බ්බො, ඉති අරුණ වර්ණය නොපස් වි
කියයුතුය (නොසිතියයුතුය යුතැනි)
න ච ලක්ඛණං මනසිකාතබ්බං (ඉති
පෘථිවී ධාතුමෙහි) තද ලකුණු මෙනෙ
හි නොකටයුතු; අපිච, එකාන්ත් ඇති;
වණ්ණං අමුඤ්චිත්වා (බල බලා බැවිය
යුතු බැවින්) වර්ණය නොහැර; නිස්ස
ය සවණ්ණං කත්වා, වර්ණය තම හට
ආශ්‍රයවූ පෘථිවී ධාතුව හා සමාන ගන්
නාකොට (එක්වන්කොට වර්ණය හා
එක්කොට මෙනෙහි කටයුතුය යුතැ
නි) උස්සදවසෙන පණ්ණත්තිධම්මෙ,
පෘථිවී ධාතුවගේ උත්සන්න භාවයෙ
න් (ශක්ති හෙයින් අධික බැවින් සස
ම්භාර පෘථිවියෙහි පඨවියයි යම් ලෝ
ක ව්‍යවහාරයෙක්ද) ඒ ප්‍රඥප්ති ධම
යෙහි; චිත්තං ඨපෙත්වා, සිත පිහිටුවා;
මනසිකාතබ්බං, මෙනෙහි කටයුතු;
පඨවි, පෘථිවිය; මහි, මහිය; මෙදිනී,
මෙදිනීය; භූමි, භූමිය; වසුධා, වසුධා
ය; වසුන්ධරානි, වසුන්ධරාය යනමේ ආ
දිවූ; පඨවි නාමෙසු, පෘථිවී නාමයන්
කෙරෙහි; යං ඉච්ඡති, යම් නාමයක්
කැමතිද; යං, යමෙක් තෙමේ; අස්ස,
මොහුගේ; සඤ්ඤානුකූලං හොති, පූර්ව
යෙහි ගෘහිත සංඥා වශයෙන් අනුකූ

ලමෙව්ද; තං වත්තබ්බං, ඒ නම කියයුත්තේය ("වත්තබ්බං" යනමෙහි ප්‍රථම සම්භාරාහාරයෙහි කිසිවක් නට වාග් භෙදදමෙයි කීමෙවත් ආචාරීන් විසින් කියයුතු බව සඳහා හෝ කියනලදු.—

( ගා1 ‡ )

ඒ කල නොකල කසිණ භූමින් අතුරෙන් යමෙක් විසින් යටගිය ජාතියෙහි බුදුසස්නෙහි හෝ සෘෂි ප්‍රව්‍රජ්‍යාවෙහි හෝ පැවිදිව පෘථිවීකසිණ ලම්බණයෙහි චතුෂ්ක පඤ්චක ධ්‍යානයන් නිපදවනලද විරූද මෙබඳු භාවනාවය පිණැති උපනිශ්‍රය සම්පන් ඇත්තා හට කිසුණුම්බුලු නොකරණලද සීසෑ කෙතෙක හෝ කලවිටි මඩුල්ලෙක හෝ අරමුණු ගැණීමෙන් ප්‍රතිභාග නිමිත්ත උපදනේය. ඒ එසේයැයි ආයුෂ්මත්වූ මල්ලක ස්ථවිරයන්වහන්සේ සීසෑ තැන බලන්නාහු ඒ බැළුතැන් පමණවූ ප්‍රතිභාග නිමිත්ත උපන්නේය. ඒ ස්ථවිරයන්වහන්සේ ඒ උපන් ප්‍රතිභාග නිමිත්ත වඩා පඤ්චක ධ්‍යානයන් උපදවා ධ්‍යාන පාදකකොට විදසුන් වඩා රහත් බවට පැමිණිසේක. යම් කෙනෙක් මෙසේ පෙර භාවනාමය කුසල් නොකලවිරූනම් ඔහු විසින් ආචාර්යයන් සමීපයෙහි ඉගෙණගත් කමටහන් විධිය නොවරදවා සතර කසිණ දෙෂයන් දුරුකරමින් කසිණ මණ්ඩලය කටයුත්තේය. ඒ සතර දෙෂයෝ නම් නිල්වන් මැටිය රන්වන් මැටිය රතුවන් මැටිය සුදුවන් මැටිය යනමේ සිවුවන් මැටි මිශ්‍රවීමෙන් පෘථිවීකසිණ දෙෂයෝ සතරදෙනෙක් වන්නාහුය. එහෙයින් ඒ නිල් ආදි පැහැ ඇති මැටි නොගෙණ හෙලදිව රාවණා ගඞ්ගාවෙහි සැඩපහරින් බිඳී ගිය ඉවුරෙහි මැටි වැනි අරුණුවන් මැටියෙන් කියනලද කසිණමණ්ඩලය කටයුත්තේය ඒ කසිණමණ්ඩලයද වෙහෙර මැද මහරණ ආදීන් හැසිරෙණ තැන නොකටයුත්තේය විහාර කෙලවර මුවහවූ තැනෙක හෝ නැමී සිටි ගලක් යට හෝ කොලම්බුවක හෝ ගෙණයා හැකිකොට හෝ එහිම පිහිටා සිටිනසේ හෝ කටයුත්තේය. ඒ දෙයාකාර කිසුණුමඬුලු අතුරෙන් ගෙණයා හැකිකොට කරණලද කිසුණුමඬුල්ල කණු සතරෙක රෙදි කඩක් හෝ සම්කඩක් හෝ කලාල්කඩක් හෝ බැද ඊමත්තෙහි තණමුල් අකුරු වැලිකැට ඉවත්කොට මනාකොට ගනලද මැටියෙන් එක්වියත් සතරඟුල් පමණ වටකොට ලෙපනය කටයුත්තේය ඒ ගෙණයාහැකිකොට කරණලද කසිණමණ්ඩලය නිමිත්තග්‍රහණය කොට භාවනාකරණකල බිම අතුට බැලියයුත්තේය එහි පිහිටා සිටින ආකාරයෙන් කරණලද කිසුණුමඬුල්ල භූමියෙහි පියුම්කෙමි ආකාරයෙන් කණු සිටුවා වැලින් වෙලා වට බැඳ සිවුපා ආදීන් විසින් විනාශ නොකලහැකි පරිද්දෙන් කටයුතුය ඉදින් එ කිසුණුමඬුල්ල අලෙව්දෙන අරුණුවන් මැටි නොපොහොනේ නම් යටිභාගයෙහි යම්කිසි අනික් මැටියක් බහා ඊට උඩුපිට තණමුල් ආදිය පහකොට පිරිසිදුකරණලද අරුණුවන් මැටියෙන් එක්වියත් සතරඟුල් විෂ්කම්භය පුළුල්කොට වට ආකාරයෙන් කටයුත්තේය මෙම එක්වියත් සතරඟුල් ප්‍රමාණයම සඳහා සුළුකුලු මලාවන් පමණයයි යව දක්වනලද්දේය පරිච්ඡෙද සහිතවූ කසිණ මණ්ඩලයෙහිම භාවනා කටයුතුය නොපිරිසිඳිනාලද කසිණ මණ්ඩලයෙහි නොකටයුතු යනාදිය වෙන්කොට පිරිසිඳීම පිණිසම කියනලද්දේය එහෙයින් එක්වියත් සතරඟුල් පමණ විෂ්කම්භය පුළුල්වූ කිසුණුමඬුල්ල හාත්පස විස

භාසවර්ණාලෙපනයකින් වෙන්කොට අරුණුවන්පැහැයෙන් අලෙවිදුන් කිසුණුමඬුල්ල රන්කිනිරිආදී දඹුඅල්ලෙන් ගැවීමෙන් අරුණුවන් පැහැය විවර්ණවනහෙයින් ඒ දඹුඅල්ල නොගෙණ ගල්අල්ලෙන් ගවා බෙරැ ඇසක්මෙන් සම්කොට ඒ යථාභය හැමද ජලස්තානයනොව අවුන් කිසුණු මඬුල්ලට හා කිඳිනා පුටුවටින් අතුර දෙරියන් සමාරක් හැර පණවනලද එක්වියත් සතරඟුල් පාඇති මෙහෙලාස් ඇතිරි අතුළ පුටුවෙක සිද නිමිත්ත ග්‍රහණය කිරීමෙන් භාවනාකටයුත්තේය ඒ කිසුණුමඬුල්ලෙන් දෙරියන් සමාරකින් දුරුව උත්තමව කසිණලම්බණය නොවැවහෙත් තේය දෙරියන් සමාරනට වඩා ලංව උන්නානව කිසුණු මඬුලෙලහි පෙණ පහර ආදී දෝෂ පෙනෙණන්නේය එක්වියත් සතරඟුලට වඩා උස්පාපුටුවෙක උන්නහු විසින් කරහැඹුරුකොට කසිණ මඬලය බැලියයුතුවෙයි. එක්වියත් සතරඟුලට වඩා මිටිපා පුටුවෙක හිඳ කසිණමඬලය බලන්නහුගේ දෙදණමඬුලු රිදෙන්නාහුය එහෙයින් කී ප්‍රකාරයෙන් හිඳ මේ පඤ්චකාම සම්පත්තිහු නාම් නිරාස්වාදාර්ථයෙන් ඇටසැකිල්ලක් වැන්න නැවත නැවත දවන අර්ථයෙන් තණසුලක් වැන්න අගියසින් තවන අර්ථයෙන් ගිනිහඟුරු වලක්වැන්න වහා හැඟි වියහැකි අර්ථයෙන් ස්වප්නයක්වැන්න තාවකාලිකාර්ථයෙන් නාසටවුල්වාගත්දෙයක්වැන්න සියලු අඞ්ගප්‍රත්‍යඞ්ගයන් බිඳීනඅර්ථයෙන් වෘක්ෂඵලයක්වැන්න විශෙෂයෙන් නොවන අර්ථයෙන් මස්ලොඹුවක්වැන්න හිනිවිදයනඅර්ථයෙන් අඩයටියක් වැන්න ගසළුලනාඅර්ථයෙන් සර්පිහිසක් වැන්න යනාදීවශයෙන්ද මේ කාමසම්පත්තිහු අල්පාස්වාද ඇත්තාහ බොහොදුක් ඇත්තාහ බොහෝ උපායාස ඇත්තාහ යනාදියෙන්ද මේ පස්කාමසැපතාම් බොහෝ උපද්‍රව සහිතය බොහෝ භයසහිතය හාත්පසින් කිලිටුය අශුචිපරිභොගයක් වැන්න ලාමකය ගම්වැසියන්ගේ ස්වභාවධර්මයක පුහුදුන්ගේ ධර්මයක අනාර්යය අනර්ථසහිතය යනාදීන් කාමයෙහි ආදීනව සලකා කාමයට පිහිටනොවු හෙවත් කාමයෙන් නික්මුනාවුද රහත්මගට පාදක බැවින් සියලුදුක් ඉක්මීමට උපායවුද ධ්‍යාන ප්‍රතිලාභයෙහි උපන් අභිලාෂා ඇත්තෙක්ව ඊට ඉක්බිතිව නොපෙරලෙන දහම්දෙසන බැවින් ඒ භාග්‍යවතුන්වහන්සේ එකාන්තයෙන් සම්‍යක් සම්බුද්ධම වන්නේය එකාන්තයෙන් භවයෙන් නික්ම යාම ඵලවත් ධර්මය මනාකොටම දෙසනලද්දේය අනුශාසනා පරිච්ඡෙදන් පිළිපන්නෙහෙයින් සඞ්ඝතෙමේද එකාන්තයෙන් සුපිළිපන්නම වන්නේයයි යනාදීන් රත්නත්‍රයෙහි ගුණ සිහිකරමින් රත්නත්‍රයෙහි ප්‍රීතිප්‍රමොදය උපදවා මේ ධ්‍යාන සඞ්ඛ්‍යාත නෛෂ්ක්‍රම්‍ය ප්‍රතිපත්තිය සියලු බුදුපසේබුදු අරිසව්වන් විසින් පිළිපදනාලද උතුම් ප්‍රතිපදාවක් වන්නේය. උපචාරධ්‍යානය විදර්ශනාය මාර්ගය නිර්වාණය යන මොවුන්ගේ අධිගමයට කාරණා වන්නේයයි යනාදීන් ප්‍රතිපත්තියෙහි ගෞරව උපදවීමෙන් එකාන්තයෙන් මේ පිළිවෙතින් විතනම්වෙනාදි විවෙකයෙන් හටගත් සුවරසයට හිමියෙමියි උත්සාහ උපදවා සමවූ ආකාරයෙන් ඇස්දල්වා නිමිත්තග්‍රහණය කිරීමෙන් භාවනාකටයුතුය ඇස ඉතා දල්වා බලන්නාහට ඉතාසියුම් රූපයක් නොව ඉතා බබලන රූපයක් හෝ බලන් නොකුටමෙන් ඇස් කලාන්තවෙහි. කිසුණුමඬුල්ලද අභිභයින් ප්‍රකටව

පෙණෙනහෙයින් ලක්ෂණවශයෙන් හෝ වර්ණවශයෙන් හෝ වැටහෙයි එසේකළ ඔහට නිමිත්ත නූපදනේමැයි ඉතා මදකොට දල්වා හස්ගිනිමිලනයෙන් බලන්නහුට අරමුණෙක් ඉමන් ප්‍රකට නොවන්නේය. බැලීමෙහි මඳොත්සාහ ඇතිබැවින් කුසිතපක්ෂයෙහි හිමෙන් සිත හෝ සැඟවෙයි මෙසේවූකලද නිමිත්ත නොඋපදනේය යම්සේ කැටපතෙහි මුඛනිමිත්තය බලන්නාහු කැටපතෙහි ලක්ෂණ මෙනෙහි නොකොට සමආකාරයෙන් හුදෙක් තමාගේ මුඛනිමිත්තම බලන්නේද එපරිද්දෙන්ම උන්මිලනයද අතිනිමිලනයද නොකොට සමආකාරයෙන් ඇස් දල්වා නිමිත්තග්‍රහණය කිරීමෙන් භාවනාකටයුත්තේය එසේ භාවනාකරන්නාහු විසින් ඒ කිසුණුමඩුල්ලෙහි අරුණුවන් පැහැය නොසිතියයුතුය එහි පෘථිවිධාතුවෙහි තදලකුණු මෙනෙහි නොකටයුත්තේය එනකුදුවූවත් බලබලා භාවනාකටයුතුහෙයින් වර්ණයද වර්ණයට ආශ්‍රය ස්ථානවූ පෘථිවිධාතුව හා එක්කොට හෙවත් වර්ණයන් පෘථිවිධාතුවමැයි මෙනෙහි කටයුත්තේය. පෘථිවිධාතුව් අධික බැවින් හෙවත් ශක්තියෙන් අධික බැවින් සසම්භාරපෘථිවියෙහි පඨවියයි යම් ලොකසම්මතයක්වේද ඒ ප්‍රඥප්ති ධර්මයෙහි සිත පිහිටුවා මෙනෙහි කටයුත්තේය පඨවිය මහිය මෙදිනිය භූමියට වසුධාය වසුන්ධරාය යනමේ ආදිවූ පෘථිවිනාමයන් අතුරෙන් යම් නාමයක් ප්‍රියවේද යම් භාවයක් ඒ යොගාවචරයාගේ සංඥාවට අනුකූලවේද ඒ නාමයම කියයුත්තේයි.

( පා ¶ )

අපිච පඨවීති එතදෙව නාමං පාකටං තස්මා පාකටවසෙනෙව පඨවී පඨවීති භාවෙතබ්බං කාලෙන උම්මිලෙත්වා කාලෙන නිමිලෙත්වා ආවජ්ජිතබ්බං යාව උග්ගහනිමිත්තං නුප්පජ්ජති තාව කාලසතම්පි කාලසහස්සම්පි තෙනෙවාභියොගෙනාපි එතෙනෙව නයෙන භාවෙතබ්බං තස්සෙවං භාවයතො යදා නිමීලෙත්වා ආවජ්ජන්තස්ස උම්මිලිතකාලෙ විය ආපාථං ආගච්ඡති තදා උග්ගහනිමිත්තං ජාතං නාම හොති තස්ස ජාතකාලතො පට්ඨාය න තස්මිං ඨානෙ නිසීදිතබ්බං අත්තනො වසනට්ඨානං පවිසිත්වා තත්ථ නිසින්නෙන භාවෙතබ්බං පාදධොවනපපඤ්චපරිහාරත්ථං පනස්ස එකපටලිකුපාහනා ච කත්තරදණ්ඩො ච ඉච්ඡිතබ්බා අථානෙන සචෙ තරුණො සමාධි කෙනචිදෙව අසප්පාය කාරණෙන නස්සති උපාහනා ආරුය්හ කත්තරදණ්ඩං ගහෙත්වා තං ඨානං ගන්ත්වා නිමිත්තං ආදාය ආගන්ත්වා සුඛනිසින්නෙන භාවෙතබ්බං පුනප්පුනං සමන්නාහරිතබ්බං තක්කාහතං විතක්කාහතං කාතබ්බං තස්ස එවං කරොන්තස්ස අනුක්කමෙන නීවරණානි වික්ඛම්භන්ති කිලෙසා සන්නිසීදන්ති උපචාරසමාධිනා චිත්තං සමාධියති පටිභාගනිමිත්තං උප්පජ්ජති තත්‍රායං පුරිමස්ස ච උග්ගහනිමිත්තස්ස ඉමස්ස ච විසෙසො උග්ගහනිමිත්තෙ කසිණදොසො පඤ්ඤායති පටිභාගනිමිත්තං ථවිකතො නීහටාදාසමණ්ඩලං විය සුධොතසඞ්ඛථාලං විය වලාහකන්තරා නික්ඛන්තචන්දමණ්ඩලං විය මෙඝමුඛෙ බලාකා විය උග්ගහනිමිත්තං පදාලෙත්වා නික්ඛන්තමිව තතො සතගුණං සහස්සගුණං සුපරිසුද්ධං හුත්වා උපට්ඨාති තඤ්ච ඛො නෙව වණ්ණවන්තං න සණ්ඨානවන්තං යදි හි තං එදිසං භවෙය්‍ය චක්ඛුවිඤ්ඤෙය්‍යං සියා ඔළාරිකං සම්මසනූපගං තිලක්ඛණබ්භා

ණාහතං න පනෙතං තාදිසං කෙවලංහි සමාධිලාභිනො උපට්ඨානාකාරමත්තං සඤ්ඤජමෙතන්ති උප්පන්නකාලතො ච පනස්ස පට්ඨාය නීවරණානි වික්ඛම්භිතානෙව හොන්ති කිලෙසා සන්නිසින්නාව උපචාරසමාධිනා චිත්තං සමාහිතමෙවාති දුවිධොහි සමාධි උපචාරසමාධි ච අප්පනාසමාධි ච ද්වීහාකාරෙහි චිත්තං සමාධියති උපචාරභූමියං වා පටිලාභභූමියං වා තත්ථ උපචාරභූමියං නීවරණප්පහානෙන චිත්තං සමාහිතං හොති පටිලාභභූමියං අඞ්ගපාතුභාවෙන ද්වින්නං පන සමාධීනං ඉදං නානාකරණං උපචාරෙ අඞ්ගානි න ථාමජාතානි හොන්ති අඞ්ගානං අථාමජාතත්තා යථා නාම දහරො කුමාරකො උක්ඛිපිත්වා ඨපියමානො පුනප්පුනං භූමියං පතති — එවමෙව උපචාරෙ උප්පන්නෙ චිත්තං කාලෙන නිමිත්තං ආරම්මණං කරොති කාලෙන භවඞ්ගං ඔතරති අප්පනාය පන අඞ්ගානි ථාමජාතානි හොන්ති තෙසං ථාමජාතත්තා යථා නාම බලවා පුරිසො ආසනා වුට්ඨාය දිවසම්පි තිට්ඨෙය්‍ය එවමෙව අප්පනාසමාධිම්හි උප්පන්නෙ චිත්තං සකිං භවඞ්ගවාරං ඡින්දිත්වා කෙවලම්පි රත්තිං කෙවලම්පි දිවසං තිට්ඨති කුසලජවනපටිපාටිවසෙනෙව පවත්තතීති —

( ස ¶ )

අපිච, අනිකෙකුද; පඨවීති එතෙද ව නාමං පාකටං, පඨවි යනමේ නාම ප්‍රකටය; තස්මා, එහෙයින්; පාකටවසෙනෙව, ප්‍රකට වශයෙන්ම; පඨවි පඨවීති භාවෙතබ්බං, පඨවි පඨවි කියා බැඹියයුතු; කාලෙන උම්මීලෙත්වා, කලෙක්හි ඇස්දල්වා (නිමිත්ත ග්‍රහණ වශයෙන් මණ්ඩලය බලා) කාලෙන නිමීලෙත්වා, කලෙක ඇසපියා; ආවජ්ජි

තබ්බං (යම් ආකාරයෙකින් ඇස දල්වා බලාගත්තාලදද ඒ ආකාරයෙන්) ආභොග කටයුතු; යාව උග්ගහනිමිත්තං නුප්පජ්ජති, යම්තාක් උද්ග්‍රහ නිමිත්ත නොඋපදීද; තාව, එතාක්; කාලෙන සතම්පි, කාල සතයකදු; කාලසහස්සම්පි, කාලසහස්‍රයකදු; තතො භිය්‍යොපි, එයින් වැඩියකදු; එතෙනෙවාකාරෙන, මෙම ආකාරයෙන්; භාවෙතබ්බං, වැඩියයුතු; තස්සෙවං භාවයතො, මෙසේ භාවනාකරන්නාවූ ඔහට; යදා, යම් වේලෙක; නිමීලෙත්වා ආවජ්ජන්තස්ස, ඇසපියා ආවර්ජනාකරන්නා හට; උම්මීලිතකාලෙවිය, ඇසදල්වූ කාලයෙහි මෙන්; ආපාථං ආගච්ඡති (මනොද්වාර ජවනට) හමු බවට ඒද; තදා, එකල්හි; උග්ගහනිමිත්තං ජාතංනාමහොති, උද්ග්‍රහ නිමිත්ත උපන්නා නම්වේ; තස්ස, ඒ උද්ග්‍රහ නිමිත්හුගේ; ජාතකාලතොපට්ඨාය, උපන්නැත් පටන්ගෙණ; න තස්මිං ඨානෙ නිසීදිතබ්බං, එතැන්හි නොහින්දයුතු (ඉදින් උද්ග්‍රහ නිමිත් උපදවන සඳද පඨවි මණ්ඩලය බලබලා බවානම් ප්‍රතිභාග නිමිත් උපැන් නොවිත්තේය සමීපයෙහි හුන්නහු විසිනුද නොබලනුවව නොපිළිවනැයි "න තස්මිං ඨානෙ නිසීදිතබ්බං" යුහු) අත්තනො වසනට්ඨානං පවිසිත්වා, තමා වසන තැනට වැද; තත්ථ නිසීදන්තෙන, එහි හුන්නාහු විසින්; භාවෙතබ්බං, වැඩියයුතු; පාදධොවන පපඤ්චපරිහාරත්ථං, පා දෙවීමෙන්වන ලස හරණ පිණිස; අසස, මේ යාගිනු එසින්; එකපටලිකුපාහනාච (නියෑබද භාවය පිණිස) එක්පට වහන්ද; කත්තරදණ්ඩොච (පරිපන්ථ දූරිකරණය පිණිස) කත්‍රුරැයටෙකුද; ඉච්ඡිතබ්බා, පැසැසියුතුත; සචෙ, ඉදින්, තරුණො සමාධි, තරුණවූ සමාධිය; කෙනචිදෙව අසප්පාය කාරණෙන, කිසි අසත්ප්‍රාය කාරණයෙකින්; න

ඝසත්, කවුලයේ එහාම්; උපාහනා ආරු
ළ්හ, වහන් නැඟි; කත්තරදණ්ඩං ග
හෙත්වා, කතුරු යටගෙණ; තංඨානං
ගන්ත්වා, එතනට ගොස්; නිමිත්තං ආ
දය, උද්ග්‍රහ නිමිත්තෙණ; ආගන්ත්වා,
අවුත්; අථාමෙන හ සුඛනිසින්නෙන්ත හා
චෙතබ්බං (යි යොදනු) පසුව ඒ යොගී
හු විසින් සුවෙන් හුන්නහු විසින් බ,
වියයුතු; පුනප්පුනං සමන්නාහරිතබ්
බං, නැවත නැවත නිමිත් ආවර්ජනා
කටයුතු; තක්කාහතං විතක්කාහතං
කාතබ්බං, තර්කයෙන් පහරණලද බල
වත් විතර්කයෙන් පහරණලද කටයුතු
(බලවත් විතර්ක මිනස්කාර බොහෝ
කොට පැවැත්වියයුතුය යුතැති) එවං
කරොන්තස්ස, මෙසේ කරන්නාවූ;
තස්ස, ඒ යොගීහට; අනුක්කමෙන
(බවුන්) අනුක්‍රමයෙන්; නීවරණානි
වික්ඛම්භනානි, නීවරණයෝ එබෙන්
(සඩාදි ඉදුරන් නිම්ලව නිහිඹව පැ
වැත්මෙන් අසඥියාදීන්ගේ දුරුවීමෙ
න් සාභිශය බලද්ධාතාදීන් විසින් උප
සනම්භලද විතර්කාදිකමව සැරිදූහැන්
අගහු බොහෝකොට පහලවෙහි එමෙහ
සින් ඔවුන්ට ඉදිවම පිළියළිවූ කාමඡ
න්ද ආදීහු නදෙකසථ පාප ධර්මයන්හා
සමග දුරුවෙති උගැහැ නිමිනි හා ස
මග ඒ පිළිබා නිමිත් අරමුණුකොට උ
වසර දූහැන් උපදී එයින් කිහ "නිව
රණානි වික්ඛම්භනානි"යි) කිලෙසා ස
න්නිසීදනති, කෙලෙස්හු මනාවම ස
න්හිඳෙති; උපචාරසමාධිනා, උවසර
සමාධින්; චිත්තං සමාධියති, සිත සමා
හිතවේ; පටිභාග නිමිත්තං උප්පජ්ජති,
පිළිබා නිමිත් උපදී; තත්‍ර, ඒ දෙක්හි;
පුරිමස්ස ච, පළමුවූ; උග්ගහ නිමිත්ත
ස්ස, උගැහැ නිමිත්හුගේද; ඉමස්ස ච,
මේ පිළිබා නිමිත්හුගේද; අයං විසෙ
සො, මේ වෙසෙසයි; උග්ගහ නිමිත්තෙ,

උද්ග්‍රහ නිමිත්හි; කසිණදොසො ප
ඤ්ඤායති (ඉපණ පහර ආදී) කිසුණු
දෙස් පැමෙණයි; පටිභාග නිමිත්තං, පි
ළිබා නිමිත්; ථවිකතොනීහට, පසිමෙය
න් හයනලද; ආදාස මණ්ඩලංවිය, කෑ
ටපතක්මෙන්ද; සුධොත, මනාකොට
දෙවි; සඞ්ඛථාලංවිය, සක් තලලක්
මෙන්ද; වලාහකන්තරා නික්ඛන්ත,
වලාහ අතුරෙන් නික්මුනු; චන්දමණ්ඩ
ලංවිය, සඳමඩලක්මෙන්ද; මෙඝමුඛෙ
බලාකාවිය, මෙඝමුඛයෙහි බලාකාවක්
මෙන්ද; උග්ගහ නිමිත්තං පදාලයිත්වා
නික්ඛන්තමිව, උගැහැ නිමිත් පලා
ගෙණ නික්මුණක්හුමෙන්; තතො, ඒ
උගැහැ නිමිත්තාට වඩා; සතගුණං ස
හස්සගුණං සුපරිසුද්ධං හුත්වා (නිසුණු
දෙස් නැතිව] සියක්ගුණ දහසක්ගුණ
පිරිසිදුව; උපට්ඨාති, වැටහේ; තඤ්ච
ඛො, ඒ පිළිබා නිමිත්ද; නෙව වණ්ණ
වන්තං (තමා පරමාර්ථයෙන් අවිද්‍ය
මාන බැවින්) නොදවණිති ඇත්තේ
නොයි; න සණ්ඨානවන්තං, නොද සට
හන් ඇත්තේදනොවෙයි; යදිහි, ඉදින්;
තං, ඒ පිළිබා නිමිත්; එදිසංභවෙය්‍ය,
වණීණ ඇත්තේ සටහන් ඇත්තේවී
නම්; චක්ඛු විඤ්ඤෙය්‍යං සියා, චක්ෂුර්
විඥෙය වන්නේයි; ඔළාරිකං, ඔදෙරි
කාවන්නේය; සම්මසනූපගං, සම්මශීන
යට සුදුසුවන්නේයි; තිලක්ඛණබ්භා
හතං (උත්පාදාදි) තුන්ලකුණෙන් අ
නුවිඩ වන්නේය (අනිත්‍යාදි ලක්ෂණ
ත්‍රයින් හෝ අංකිතවන්නේයි) ඒතංප
න, මේ වනාහි; තාතාදිසං, එබදු නො
වේ; කෙවලං, හුදෙක්; සමාධිලාභි
නො, සමාධිලාභී හට; එතං, මේ; උප
ට්ඨානාකාරමත්තං, වැටහෙන ආකාර
මාත්‍රයෙක; සඤ්ඤජං, භාවනා සංඥ
වෙන් වූයේයි (භාවනා සංඥවෙන් හ
ටුනත පමණෙකි ඇවභාව ධර්මයක්හු
ගේ කිසිවෙකින් උපැත් නැති බැවින

යනා අර්ථයි) හසා, ඒ පිළිබඳ නිමිත්තු ගේ; උප්පන්නකාලතො පට්ඨාය, උපන් කල් පටන්ගෙණ; නීවරණානි, නීවරණයෝ; වික්ඛම්භිතානෙව හොන්ති, මඩනාලද්දහුමවෙත්; කිලෙසා, කෙලෙස්හු; සන්නිසින්නා, සන්හිඳෙනලද්දහුමවෙත්; උපචාර සමාධිනා, උපචාර සමාධියෙන්; චිත්තං, සිත; සමාහිතමෙව, සමාහිතවූයේමවේ; දුවිධොහි සමාධි, සමාධිය දෙවැදෑරුම්වේ; උපචාර සමාධි, උපචාර සමාධියද; අප්පනා සමාධිච, අර්පණා සමාධියද්දයි; ද්වීහාකාරෙහි චිත්තං සමාධීයති (ධ්‍යාන ධර්මයන්ට ප්‍රතිපක්ෂයන්ගේ දූරිභාවයෙන් ස්ථිරභාව ප්‍රාප්තියෙනැයි) දෙආකාරයෙන් සිත සමාහිතවේ (දුග් ඒ කාරණයන් අවසථා ඉබ්ඛෙයන් දක්වන්නේ "උපචාර භූමියංවා" යනාදිනී) උපචාර භූමියංවා, උපචාර අවස්ථාවෙහිහෝ (සමාහිතවෙයි) පටිලාභ භූමියංවා, ප්‍රතිලාභ අවස්ථාවෙහි හෝ (සමාහිතවෙයි) තත්‍ර, ඒ දෙක්හි; උපචාර භූමියං, උපචාරාවස්ථාවෙහි; නීවරණප්පහාණෙන චිත්තංසමාහිතංහොති, නීවරණයන්ගේ පැහීමෙන් සිත සමාහිතවේ; පටිලාභභූමියං, ධ්‍යානයාගේ ප්‍රතිලාභාවස්ථාවෙහි; අඞ්ගපාතුභාවෙන, අඞ්ග ප්‍රාදුර්භාවයෙන් (සමාහිතවෙයි) චිත්තං සමාධීනං, සමාධීන් දෙදෙනාගේ; ඉදං නානාකරණං, මේ නානත්වයයි; උපචාරෙ, උපචාරාවස්ථාවෙහි; අඞ්ගානි, ධ්‍යානාඞ්ගයෝ; ථාමජාතානි න හොන්ති, උපන්නාවූ ශක්ති ඇත්තාහු නොවෙත් (භාවනා බලප්‍රාප්තයෝ නොවෙති යනා අර්ථයි) අඞ්ගානං ථාමජාතත්තා, අඞ්ගයන් බලප්‍රාප්ත නොවන බැවින්; යථානාම, යම්සේ; දහර කුමාරයො, බාල කුමරුතෙමේ; උක්ඛිපිත්වා ඨපියමානො, නගා සිටුවනලද්දේ; පුනප්පුනං භූමියං පතති, නැවත නැවත භූමියෙහි හෙන්නේද; එවමේව, එපරිද්දෙන්ම; උපචාරෙ උප්පන්නෙ, උපචාර ධ්‍යානය උපන්කල; චිත්තං, ධ්‍යාන සිත; කාලෙන, කාලෙක්හි; නිමිත්තං ආරම්මණං කරොති, පිළිබඳ නිමිත් අරමුණු කෙරෙයි; කාලෙන, කාලෙක්හි; භවඞ්ගං ඔතරති, භවාඞ්ගයට බේ; අප්පනාය පන, අර්පණාවෙහි වනාහි; අඞ්ගානි, අඞ්ගයෝ; ථාමජාතානි හොන්ති, බල ඇතිවෙත්; තෙසං, ඒ අඞ්ගයන්; ථාමජාතත්තා, බල ඇති බැවින්; යථානාම, යම්සේ; බලවාපුරිසො, බලවත් පුරුෂයෙක්; ආසනාවුට්ඨාය, අස්නෙන් නැගී; දිවසම්පි තිට්ඨෙය්‍ය, දවසමුළු සිටින්නේද; එවමෙව, එපරිද්දෙන්ම; අප්පනාසමාධිම්හි උප්පන්නෙ, අර්පණා සමාධිය උපන් කල්හි; චිත්තං, සිත; සකිං, එක්වරක්; භවඞ්ගවාරං ඡින්දිත්වා, භවාඞ්ග වාරය සිඳගෙණ; කෙවලම්පි රත්තිං, සියළු රාත්‍රියෙහිද; කෙවලම්පි දිවසං, සියළු දවස්හිද; තිට්ඨති, සිටුනේයි (ප්‍රථමාර්පණය එක චිත්තක්ෂණවතුදු ඒ අර්පණා සමාපත්තියෙන් සමාපත්ති කාලය සඳහා "කෙවලම්පි රත්තිං" යනු කීහයි සලකණු) කුසලජවන පටිපාටිවසෙනෙව, කුසල් ජවන් පිළිවෙළ වශයෙන්ම; පවත්තති, පවත්නේයි.

(භා ¶ )

තවද පෘථිවියට ව්‍යවහාරකරන්නාවූ අතීත් නාම් ඇතද පඨවිනාමය අතිශයින් ප්‍රකටය එහෙයින් ප්‍රකට වශයෙන් පඨවි පඨවි කියා භාවනාකටයුතේයි එසේ භාවනාකරන්නාහු කාලෙක ඇස දල්වා නිමිත්තග්‍රහණ වශයෙන් මණ්ඩලය බලා කාලෙක ඇස පියා යම් ආකාරයකින් ඇසදල්වා බලා නිමිත්ත ගත්කාලදද ඒ ආකාරයෙන් ආවර්ජනා නවයුත්තේය යම්තාක්කාල් උද්ග්‍රහ නිමිත්ත නූපදීද ඒතාක්කා

ල් සියක්වරකුදු දහස්වරකුදු ඉන් වැඩියකුදු මෙව නයින්ම භාවනා කටයුත්තේයි මෙසේ භාවනා කරන්නාවූ ඒ යෝගාවචරයා හට යම් වේලෙක ඇස පියා ආවර්ජනා කරන්නාහුදු ඇස දැල්වූ කලක් මෙන් මනොද්වාර ජවන විෂයතාවට හමු බවට පැමිණේද එකල්හි උද්ග්‍රහ නිමිත්ත උපන්නා නම් වේ. මෙසේ නොවත් කිසුණු මඬුල්ල අත්හැර බැලූ කලත් එම නිමිත්ත පෙණේ නම් එකල උද්ග්‍රහ නිමිත්ත උපන්නා නම් වන්නේයි ඒ උද්ග්‍රහ නිමිත්ත උපන් තැන් පටන් එහි නොහිඳිය යුත්තේය කුමක්හෙයිනයත්? උද්ග්‍රහ නිමිත්ත උපන්කල නැවතත් කිසුණු මඬුල්ල බල බලා භාවනා කරන්නේ නම් ප්‍රතිභාග නිමිත්ත නූපදනේය කිසුණු මඬුල්ල ලඟ උන්නේනම් නොබලන්නටද නොහැක්කේය එහෙයින් එහි නොහිඳ තමා වසන තෙනට වැද එහි හිඳ භාවනා කටයුත්තේය ඒ යෝගාවචරයාවිසින් පාදෙවීමෙන් වන ප්‍රමාදය වළක්වනු පිණිසද නිශ්ශබ්දව යාම ඊම් පිණිසද එක්සවපටවහන්ද උපද්‍රව දුරුකරණු පිණිස සැරයටියක්ද කැමැතිවියයුත්තේය ඉදින් ඒ නිමිත්තයෙන් උපදවාගන්නාලද තරුණ සභාගීය යම්කිසි නොසැප කාරණයකින් නටුයේ නම් වහන් නැගී සැරයටියගෙණ වහාම කිසුණු මඬුල්ල කරා ගොස් පළමු සෙයින් උද්ග්‍රහ නිමිත්ත උපදවාගෙණ අවුත් නැවත පාදෙවීම් නොකොටම අප්‍රමාදව තමා භාවනා කරණ අස්නේ සැපසේ හිඳ භාවනා කටයුතුවන්නේය ඒ උපන් නිමිත්ත නැවත නැවත අවජුන් කටයුත්තේය කල්පනාකරණ අර්ථයෙන්ද විශෙෂයෙන් කල්පනාකරණ අර්ථයෙන්ද තර්කය විතර්කයයි ලබනලද නම් ඇති භාවනා විචාර සම්ප්‍රයුක්ත සමයක්කල්පනාවෙන් ඔබිනොබ පැවැත්වීමෙන් පහරණලද්දක් මෙන් කටයුත්තේය මෙහෙවන් ලෙවන් මනස්කාර බොහෝකොට පැවැත්විය යුත්තේයි මෙසේ භාවනා කරන්නාවූ ඒ යෝගාවචරයා හට භාවනා පිළිවෙළින් නිවරණයෝ එබී යන්නාහුය රාගාදි කෙලශයෝ යට බස්නාහුය ශ්‍රද්ධාදි ඉන්ද්‍රියයන් තියුණු වීමෙන් හා අශ්‍රද්ධාදීන් දුරුවීමෙන්ද අතිශයින් බලවත්වූ ශ්‍රද්ධාදී සප්ත බලයෙන් ලබනලද උපස්තම්භ ඇති විතර්කාදි කාමාවචර ධ්‍යානාංගයෝ බොහෝ වශයෙන් පහළවන්නාහුය. එහෙයින් ඔවුන්ට විරුද්ධවූ කාමච්ඡන්දාදි පාප ධර්මයෝ දුරුවන්නාහුය. ඉක්බිති උපචාරසමාධියෙන් සිත එකඟ වන්නේයි ඒ උද්ග්‍රහ නිමිත්ත අරමුණුකොටගෙණ එබඳුවූ ප්‍රතිභාග නිමිත්ත උපදනේයි ඒ උද්ග්‍රහ ප්‍රතිභාග නිමිත්තයන් ගෙරන් පළමුවූ උද්ග්‍රහ නිමිත්තගේද දෙවනුවූ ප්‍රතිභාග නිමිත්තගේද වෙනස කවරයත්? උද්ග්‍රහ නිමිත්තෙහි කිසුණු මඬුල්ල ගාවා සමකල පෙණපහර ආදි කසිණ දොෂයන් පෙණෙන්නේය ප්‍රතිභාග නිමිත්ත වනාහි පසුම්බියකින් මෑත්කොට ගන්නාලද කැටපතක් මෙන්ද මනාකොට සෝදාලද සක් තල්ලක් මෙන්ද වලා ගැබකින් නික්මුණු සඳමඬලක් මෙන්ද වැසි පටලයක් ඉදිරියෙහි පියාඹන කොකෙක් මෙන්ද උද්ග්‍රහ නිමිත්ත පලාගෙණ නික්මුනාක්මෙන් කිසුණු දෙස් නැතිව ඒ උද්ග්‍රහ නිමිත්තට වඩා සියක් ගුණයෙන් දහසක් ගුණයෙන් පිරිසිදුව වැටහෙන්නේය ප්‍රතිභාග නිමිත්තද තමා පරමාර්ථ වශයෙන් අවිද්‍යමාන බැවින් වර්ණ ඇත්තේද නොවෙයි සටහන් ඇත්තේද නොවෙයි. කුමක්හෙයිනයත්? ඉදින්

පූර්වභාගනිමිත්ත එබඳු වර්ණ ඇත්තේ හෝ සටහන් ඇත්තේ හෝ වී නම් ඇසින් දක්නායුත්තේය මලරික වන්නේය සම්මශීනායට සුදුසුවන්නේය, උත්පාදස්ථිතිභඞ්ග යන ලක්‍ෂණයෙන් හෝ අනිත්‍යදුක්ඛ අනාත්ම යන ලක්‍ෂණත්‍රයෙන් හෝ සලක්‍ෂණභාවයුක්තවන්නේය. මේ ප්‍රතිභාගනිමිත්ත වනාහි එබඳු ආකාර නොවන්නේය හුදෙක් සමාධිලාභීහට මෑවෙන ආකාරමාත්‍රයක්ම වන්නේය භාවනාසංඥාවෙන් හඳුනනමාත්‍රයක්ම වන්නේය ඒ ප්‍රතිභාගනිමිත්ත උපන් තැන් පටන් පඤ්චනීවරණයෝ ඔබනලද්දාහුමය රාගාදි ක්ලේශයෝ සංසිඳෙන ලද්දාහුමය උපචාර සමාධියෙන් සිත මනාකොට පිහිටුවන ලද්දේමය මේ සමාධිය වනාහි උපචාරසමාධි අර්පණාසමාධි යන දෙදෙනාගේ වශයෙන් දෙයාකාරවන්නේය ධ්‍යානයන්ට විරුද්ධවූ නීවරණයන්ගේ දුරුකිරීමය සිත තැන්පත්කිරීමය යන දෙයාකාරයෙන් උපචාරකාලයෙහි හෝ ධ්‍යානලාභකාලයෙහි හෝ සිත එකඟකරන්නේය ඒ දෙදෙනාඅතුරෙන් උපචාරාවස්ථාවෙහි නීවරණයන්ගේ දුරුකිරීමෙන් සිත එකඟවන්නේය ධ්‍යානලාභ අවස්ථාවෙහි විතර්කාදි ධ්‍යානාඞ්ගයන්ගේ පහලවීමෙන් සිත එකඟවන්නේයි. මේ සමාධි දෙදෙනාගේ වෙනස මින්මතු දක්වනුලැබේ. කෙසේදයත් ? උපචාරසමාධිකාලයෙහි ධ්‍යානාඞ්ගයෝ භාවනාබලයෙන් ශක්ති ඇත්තාහු නොවෙති යම්සේ ලදරු කුමරුවන්නු නැගීසිටුවන ලද්දේද නැවත නැවත බිමහෝද ඒපරිද්දෙන්ම ධ්‍යානාඞ්ගශක්තීන් නැතිබැවින් උපචාර ධ්‍යානය උපන්කල ධ්‍යානචිත්තය කිසිකලෙක නිම්නගා පිළිගණිමින් අරමුණුහාරන්නේය කිසිකලෙක භවාඞ්ගශ්‍රොතසට බස්නේය අර්පණා සමාධියෙහි ධ්‍යානාඞ්ගයෝ ශක්තිඇත්තාහුය යම්සේ බලවත් තරුණපුරුෂයෙක් හුනස්නෙන් නැගී දවසමුළු සිටියේන් සිටීනේද ඒපරිද්දෙන්ම ධ්‍යානාඞ්ගශක්තිය ඇතිබැවින් අර්පණාසමාධිය උපන්කල ධ්‍යාන චිත්තය එකවටක් භවාඞ්ගපාතය සිඳගෙණ සියලු රාත්‍රියෙහිද සියලු දවසෙහිද ධ්‍යානසමාපත්තිවශයෙන් සිටින්නේය මෙවවත් භාවනාවර්ජනාදි සෙසුසිත් සර්වප්‍රකාරයෙන්ම නොඉපද කුසලජවනයන්ගේ පිළිවෙළින්ම පවත්නේය ⁓

( පා * )

තත්‍ර යදෙතං උපචාරසමාධිනා සහ පටිභාගනිමිත්තං උප්පන්නං තස්ස උප්පාදනං නාම අතිදුක්කරං තස්මා සචෙ තෙනෙව පල්ලඞ්කෙන තං නිමිත්තං වඩ්ඪෙත්වා අප්පනං අධිගන්තුං සක්කොති සුන්දරං නොචෙ සක්කොති අථානෙන තං නිමිත්තං අප්පමත්තෙන චක්කවත්තිගබ්භො විය රක්ඛිතබ්බං එවං හි⁓

නිමිත්තංරක්ඛතො ලද්ධ
පරිහානි නවිජ්ජති
ආරක්ඛම්හි අසන්තම්හි
ලද්ධංලද්ධං විනස්සති⁓

තත්‍රායං රක්ඛනාවිධි⁓

ආවාසො ගොචරො භස්සං
පුග්ගලො භොජනං උතු
ඉරියාපථොති සත්තෙතෙ
අසප්පායෙ විවජ්ජයෙ⁓

සප්පායෙ සත්ත සෙවෙථ
එවංහි පටිපජ්ජතො
නචිරෙනෙව කාලෙන
හොයි කස්සචි අප්පනා⁓

( ස * )

තත්‍ර, ඒ සමාධිදෙක්හි; උපචාර සමාධිනාසඞ්ගං, උපචාරසමාධිය හා සමග; සද්ධිං පටිභාග නිමිත්තං උප්පන්නං, යම් මේ ප්‍රතිභාගනිමිත්තයෙක් උපන්නේද; තස්ස උප්පාදනං නාම අතිදුක්කරං, ඒ පිළිබිඹුනිමිත්හුගේ ඉපදීම නම් ඉතා දුෂ්කරය (ඉපාදුකින් කටයුතුය යුතැති) තස්මා, එහෙයින්; සචෙ, ඉදින්; තෙනෙව පල්ලඞ්කෙන, එමපලඟින්; තං නිමිත්තං වඩ්ඪෙත්වා, ඒ නිමිත්තය වඩා; අප්පනං අධිගන්තුං අපිණාවට පැමිණෙන්නට; සක්කොති, පොහොසත්නම්; සුන්දරං, සොඳුරැයි; නොචෙ සක්කොති, ඉදින් නොපොහොසත්වීනම්; අථ, එසේ කල්හි; අනෙන, මොහු විසින්; තං නිමිත්තං, ඒ නිමිත්; අප්පමත්තෙන, නොපමාවූවහු විසින්; චක්කවත්ති ගබ්භොවිය, සක්විතිගැබක්මෙන්; රක්ඛිතබ්බං, රැකියයුතු; එවංහි, එසේ කල්හි; නිමිත්තං රක්ඛතො, පිළිබිඹු නිමිත් රක්නාහුට; ලද්ධපරිහානි න විජ්ජති, ලද උපචාරධ්‍යානයාගේ පරිහානියක් නොවේ (නිමිත්තය නොනටකල්හි තදලම්බන ධ්‍යානය නොපිරිහෙන්නේමවේ) ආරක්ඛම්හි අසන්තම්හි, නිමිත්හි ආරක්ෂාවක් නැතිකල්හි; ලද්ධං ලද්ධං විනස්සති, ලදලදධ්‍යානයද නසියි (ධ්‍යානහු නිමිත්තායත්තව පවත්නා බැවිනි) තත්‍රායං රක්ඛනාවිධි, ඒ පිළිබිඹු නිමිත්හුගේ මේ රක්ෂණාවිධියි; ආවාසො, අවස්ය; ගොචරො, ගොචර ග්‍රාමය, භස්සං, කථාය; පුග්ගලො, පුද්ගල, භොජනං, භොජනය; උතු, සෘතුය; ඉරියාපථො ති, ඉරියව්වය යන; එතෙ සත්ත, මොහු සත්දෙන; අසප්පායෙ, නොසැපවූවන්; විවජ්ජෙය්‍ය, දුරුකරන්නේය; සප්පායෙ සත්ත, සැපවූ සත්දෙන; සෙවෙථ, සෙවුනේය; එවං හි පටිපජ්ජතො, මෙසේ පිළිපදනාහු; කස්සචි, කිසිවෙක්හට; නචිරෙනෙව කාලෙන, නොබෝ කලෙකින්ම; අප්පනා හොති, අපුන්වේ.

---

( භා * )

ඒ සමාධි දෙදෙනා අතුරෙන් උපචාර සමාධිය හා සමග යම් ප්‍රතිභාග නිමිත්තක් උපන්නේවේද ඒ ප්‍රතිභාග නිමිත්ත ඉපදවීම ඉතා දුෂ්කරසේ කටයුතුවන්නේය එහෙයින් ඒ පලඟින්ම හිඳ ඒ නිමිත්ත වඩා අර්පණාසමාධියට පැමිණෙන්නට පොහොසත්වූයේ නම් හේ මැනව ඉදින් නොපොහොසත්වී නම් මින්තෙහිද අප්‍රමාදවූ යෝගාවචරයා විසින් සක්විති රජයට පිණැති කුමරෙකු පිළිසිඳගත් ගර්භයක් මෙන් මනාකොට රැකියයුත්තේයි එසේකල ප්‍රතිභාගනිමිත්ත රක්නාහු විසින් ලබනලද ධ්‍යානය විනාශ නොවන්නේය හෙවත් නිමිත්ත නොනටකල ඒ අරමුණුකොට පවත්නා ධ්‍යානයද නොපිරිහෙන්නේමැයි. නිමිත්තයෙහි ආරක්ෂාවක් නැතිකල ධ්‍යානවිනාශය තමා නිමිත්ත පිළිසරණකොට පවත්නා බැවින් ලද ලද ධ්‍යානයද නස්නේයැයි එහෙයින් මින්මතු ඒ ප්‍රතිභාගනිමිත්ත රක්නා විධිය දක්වනුලැබේ හේ කෙසේදයත්? නොසැප සෙනාසනය නොසැප ගොදුරුගමය නොසැපකථාය නොසැප පුද්ගලයාය නොසැපභොජනය නොසැප සෘතුවය නොසැප ඉරියව්පැවැත්මය යන මොහු සත්දෙන දුරුකටයුත්තෝය. ඉක්බිති සැපවූසෙනාසනය සැපවූ ගොදුරුගමය සැපවූකථාය සැපවූ පුද්ගලයාය සැපවූ භොජනය සැපවූසෘතුවය සැපවූඉරියව්වයයන මොහු සත්දෙන සෙවනය කටයුත්තෝය

මෙසේ පිළිපදනාවූ ඇතැම් යොගාවචරයන්හට නොබෝ කලකින්ම අර්පණා සමාධිය උපදනේය......

( පා † )

තත්‍රස්ස යස්මිං ආවාසෙ වසන්තස්ස අනුප්පන්නං වා නිමිත්තං නුප්පජ්ජති උප්පන්නං වා විනස්සති අනුපට්ඨිතා ච සති න උපට්ඨාති අසමාහිතඤ්ච චිත්තං න සමාධියති අයං අසප්පායො යත්ථ නිමිත්තං උප්පජ්ජති චෙව ථාවරඤ්ච හොති සති උපට්ඨාති චිත්තං සමාධියති නාගපබ්බතවාසී පධානියතිස්සත්ථෙරස්ස විය අයං සප්පායො තස්මා යස්මිං විහාරෙ බහූ ආවාසා හොන්ති තත්ථ එකමෙකස්මිං තීණි තීණි දිවසානි වසිත්වා යත්ථස්ස චිත්තං එකග්ගං හොති තත්ථ වසිතබ්බං ආවාසසප්පායතාය හි තම්බපණ්ණිදීපම්හි චූළනාගලෙණෙ තත්ථෙව කම්මට්ඨානං ගහෙත්වා පඤ්චසතා භික්ඛූ අරහත්තං පාපුණිංසු සොතාපන්නාදීනං පන අඤ්ඤත්ථ අරියභූමිං පත්වා තත්ථ අරහත්තප්පත්තානඤ්ච ගණනා නත්ථි එවං අඤ්ඤෙසුපි චිත්තලපබ්බතවිහාරාදීසු ගොචරගාමො පන යො සෙනාසනතො උත්තරෙන වා දක්ඛිණෙන වා නාතිදූරෙ දියඩ්ඪකොසබ්භන්තරෙ හොති සුලභසම්පන්නභික්ඛො සො සප්පායො විපරීතො අසප්පායො......

භස්සන්ති ද්වත්තිංස තිරච්ඡානකථාපරියාපන්නං අසප්පායං තං හිස්ස නිමිත්තන්තරධානාය සංවත්තති දසකථාවත්ථුනිස්සිතං සප්පායං තම්පි මත්තාය භාසිතබ්බං...... පුග්ගලොපි අතිරච්ඡානකථිකො සීලාදිගුණසම්පන්නො යං නිස්සාය අසමාහිතං වා චිත්තං සමාධියති සමාහිතං වා චිත්තං ථිරතරං හොති එවරූපො සප්පායො කායදළ්හිබහුලො පන තිරච්ඡානකථිකො අසප්පායො සො හි තං කද්දමොදකමිව අච්ඡං උදකං මලිනමෙව කරොති තාදිසඤ්ච ආගම්ම කොටපබ්බතවාසී දහරස්සෙව සමාපත්තිපි නස්සති පගෙව නිමිත්තං...... භොජනං පන කස්සචි මධුරං කස්සචි අම්බිලං සප්පායං හොති උතුපි කස්සචි සීතො කස්සචි උණ්හො සප්පායො හොති තස්මා යං භොජනං වා උතුං වා සෙවමානස්ස ඵාසු හොති අසමාහිතං වා චිත්තං සමාධියති සමාහිතං වා චිත්තං ථිරතරං හොති තං භොජනං සො ච උතු සප්පායො ඉතරං භොජනං ඉතරො ච උතු අසප්පායො ඉරියාපථෙසුපි කස්සචි චඞ්කමො සප්පායො හොති කස්සචි සයනට්ඨානනිසජ්ජානං අඤ්ඤතරො තස්මා තං ආවාසං විය තීණි දිවසානි උපපරික්ඛිත්වා යස්මිං ඉරියාපථෙ අසමාහිතං වා චිත්තං සමාධියති සමාහිතං වා චිත්තං ථිරතරං හොති සො සප්පායො ඉතරො අසප්පායොති වෙදිතබ්බො ඉති ඉමං සත්තවිධං අසප්පායං වජ්ජෙත්වා සප්පායං සෙවිතබ්බං එවං පටිපන්නස්ස හි නිමිත්තාසෙවනබහුලස්ස න චිරෙනෙව කාලෙන හොති කස්සචි අප්පනා යස්ස පන එවම්පි පටිපජ්ජතො න හොති තෙන දසවිධං අප්පනාකොසල්ලං සම්පාදෙතබ්බං......

( ස † )

තත්‍ර, එහි; යස්මිං ආවාසෙ, යම් ආවාසයෙක; වසන්තස්ස අස්ස, වසන්නාවූ මොහට; අනුප්පන්නං වා නිමිත්තං, නො උපන්නෝ නිමිත්ත; නුප්පජ්ජති, නො උපදීද; උප්පන්නං වා නිමිත්තං විනස්සති, උපන්නෝ නිමිත් නසීද; අනුපට්ඨිතා ච සති, නො එළඹසිටි සිහිතොමෝ; න උපට්ඨාති,

නොඑලඹේද; අසමාහිතඤ්ච චිත්තං, සමාහිතනොවූ සිතද; න සමාධියති, සමාහිත නොවේද; අයං, මේ ආවාසය; අසප්පායො, අසැපනම්වේ; යත්ථ, යම් අවසෙක (වසන්නහුට) නිමිත්තං උප්පජ්ජතිචෙව (නූපන් නිමිත්) උපදීද; ථාවරඤ්ච හොති (උපන් නිමිත්) නරවේද; සති උපට්ඨාති, සිහි එළඹ සිටීද; චිත්තංසමාධියති, සිත සමාහිත වේද; නාගපබ්බතවාසී, නාපව්නම් තැන වසන; පධානියතිස්සත්ථෙරස්ස විය, පධානීයතිස්සනම් තෙරුන්ට මෙන්; අයං, මේ; ආවාස සප්පායො, අවස සැපනම්වේ; තස්මා, එහෙයින්; යස්මිං විහාරෙ, යම් වෙහෙරෙක; බහූ ආවාසා, බොහෝ ආවාසයෝවෙද්ද; තත්ථ, එහි; එකමෙකස්මිං, එකිඑකී අවස; තීණිතීණි දිවසානිවසිත්වා, තුන්තුන් දවස වැස; යත්ථ, යම් අවසෙක; අස්ස චිත්තං එකග්ගංහොති, මොහුගේසිත එකාග්‍රවේද; තත්ථ, ඒ අවස; වසිතබ්බං, විසියයුතු; ආවාස සප්පායතායහි, ආවාස සප්පායබැවින්; තම්බපණ්ණිදීපම්හි, මෙම හෙළදිව; චූළලනාගලෙණෙ. සුලුනාගලෙණ; තත්ථෙව කම්මට්ඨානං ගහෙත්වා, එහිම කමටහන ගෙණ; පඤ්චසතා භික්ඛු අරහත්තං පාපුණිංසු, පන්සියයක් මහණහු රහත්බවට පැමිණියෝ; සොතාපන්නාදීනං පන, සෝවාන් ආදීන්ගේද වනාහි; අඤ්ඤත්ථ අරියභූමිං පත්වා, සෙසුතැන්හි අරියභූමියට පැමිණ; තත්ථ, එහිදී; අරහත්තං පත්තානඤ්ච, රහත්බවට පැමිණියවුන්ගේද; ගණනානත්ථි, ගණන් නැති; අඤ්ඤෙසු, සෙසු; චිත්තලපබ්බතවිහාරාදිසුපි, සිතුල්පවුවෙහෙර ආදියෙහිද; එවං, එසේමැයි.

ගොචරගාමො පන, ගොචරග්‍රාමය වනාහි; යො, යමෙක්; සෙනාසනතො, සෙනස්නෙන්; උත්තරෙන වා දක්ඛිණෙන වා (ගමනාගමනයෙහි නිරමුහුණ නොකරණ පිණිස) දකුණු දිගහෝ උතුරුදිගහෝ වේද; නාතිදූරෙ, ඉතා නොදුර; දියඩ්ඪකොසබ්භන්තරෙහොති, තුන්දහස් දුනු පමණින් ඇතුළේවේද; සුලභ සම්පන්න භික්ඛා, සුලභවූ සම්පන්නවූ භික්‍ෂා ඇත්තේද; සො, හෙතෙම; සප්පායො, සැපය; විපරීතො, විපරීතවූයේ; අසප්පායො, නොසැපවේ; භස්සම්පි, භස්සයද; ද්වත්තිංස තිරච්ඡාන කථා පරියාපන්නං, දෙතිස් තිරශ්චීන් කථාවෙහි ඇතුළත්වූයේ; අසප්පායං, නොසැපයි; තංහි, හේතෙමේ; අස්ස, මොහුගේ; නිමිත්තන්තරධානාය සංවත්තති, ලදනිමිත්හුගේ අතුරුදන්වීම පිණිසවේ; දසකථාවත්ථුනිස්සිතං, දසකථාවස්තු සන්නිශ්‍රිතවූයේ; සප්පායං, සැපවේ; තම්පි, හේද; මත්තාය, පමණින්; භාසිතබ්බං, බිණියයුතු; පුග්ගලො, පුගුලාද; අතිරච්ඡාන කථිකො, තිරශ්චීනකථා නොබණනුයේ (තිරශ්චීනකථාවට විදූරවූ ධර්මයුක්ත කර්මස්ථාන ප්‍රතිසංයුක්ත කථාකරන්නේය යන අභිප්‍රායයි) සීලාදිගුණසම්පන්නො, සීලාදිගුණයෙන් යුක්තවූයේ; යං නිස්සාය, යමක්හු නිසා, අසමාහිතං වා චිත්තං සමාධියති, අසමාහිතවූ සිත සමාහිත හෝවේද; සමාහිතං වා චිත්තං ථිරං හොති, සමාහිත චිත්තය ස්ථිරහෝවේද; එවරූපො, මෙබඳු පුගුලා; සප්පායො, සැපවෙයි (යමෙක් සමාධි කැමතිද සමාධි කමටහන්හි කෙළපැමිණියේද හේ සැපවෙයි හඟනේ) කායදළ්හී බහුලො පන, ශරීර වඩනයෙහි තැත්කරණුයේ (කායයාගේ සන්තර්පණ පොෂණයෙහි නියුක්තවූයේ) තිරච්ඡාන කථිකො, තිරච්ඡාන කථාකරන්නේ; අසප්පායො, සැපනොවේ; සො, හෙතෙම; තං, ඒ යොගීහු; කද්දු

මොදකම්ව අවජ්ඣං උදකං, පහන්දිය කිලුටුකාරණ මඩදියක්මෙන්; මලින මෙව කරෙති, මලිනක්කෙරේ; තාදි සංසෑව ආනමම, එබඳු පුහුලා කරා පැමිණ; කොට්පබ්බතවාසි දහරස්සෙව, කොළපව්වෙහි වසන දහරයාගේ මෙන්; සමාපත්තිපි නස්සති, සමවතුදු නස්නේය; පගෙව නිමිත්තං, නිමිත්ත පළමුවම—

භොජනම්පන, භොජනය වනාහි; කස්සචි මධුරං, කිසිවක්හට මධුරවූයේ; කස්සචි අම්බිලං, කිසිවක්හට ඇඹුල්වූයේ; සප්පායංහොති, සැපවේ (භොජනය බොහෝසේ සත්වයන්ට උපයොගයටයේනුයි "කස්සචි මධුරං කස්සචි අම්බිලං සප්පායං" යුහු—කටුකාදී රසයෝ වනාහි සංස්කාරයෙන් වන්නාහයි දතයුතු) උතුපි, සෘතුද; කස්සචි, කිසිවක්හට; සීතො, ශීතවූයේ; කස්සචි උණ්හො, කිසිවක්හට හුණුවූයේ; සප්පායො හොති, සැපවේ; තස්මා, එහෙයින්; යං භොජනං වා උතුං වා සෙවන්තස්ස, යම් භොජනයක්වත් සෘතුවක්වත් සෙවුනාහට; ඵාසුහොති, ඵාසුවේද; අස්මා ……පෙ…… නං භොජනං, ඒ බොජුනද; සොච උතු, ඒ සෘතුවද; සප්පායො, සැපය; ඉතරං භොජනං, සෙසු බොජුනද; ඉතරොච උතු, සෙසු සෘතුවද; අසප්පායො, නොසැපයි; ඉරියාපථෙසුපි, ඊර්යාපථයෙහිද; කස්සචි, කිසිවක්හට; චඞ්කමො සප්පායොහොති, සක්මන සැපවෙයි; කස්සචි, කිසිවක්හට; සයනට්ඨාන නිසජ්ජානං අඤ්ඤතරො, සයනය සිටීම නිසදීම යනමොවුන් කෙරෙන් එක්තරා එකෙක් සැපවේ; තස්මා, එහෙයින්; තං, ගේ; ආවාසං විය, ආවාසයමෙන්; තීණි දිවසානි උපපරික්ඛිත්වා, තුන්දවසක් පරීක්ෂාකොට; යස්මිං ඉරියාපථෙ, යම් ඉරියව්වූවෙක; අස්ස ……පෙ…… පිරතරංහොති, වෙසෙසින් ස්ථිරවේද; සො සප්පායො, ඒ ඉරියව්ව සැපය; ඉතරො අසප්පායො, අනික් ඉරියව්ව අසත්ප්‍රායයි; වෙදිතබ්බො, දතයුතු; ඉති, මෙසේ; ඉමං සත්තවිධං අසප්පායං, ඈම් සප්තවිධවූ අසැපයන්; වජ්ජෙත්වා, දුරුකොට; සප්පායං, සැප; සෙවිතබ්බං, සෙවියයුතු; එවං පටිපන්නස්ස, මෙසේ සැප සෙවුනාවිසින් පිළිපන්නාවූ; නිමිත්තාසෙවන බහුලස්ස කස්සචි, නිමිත්ත ආසෙවනා බහුලවූ කිසිවක්හට (පිළිබානිමිත්හි භාවනා මනස්කාරය බහුලකොට ආසෙවනයකරණ කිසිවෙක්හට) නචිරෙනෙව කාලෙන, නොබොහෝ කලකින්ම; අප්පනා හොති, අපුන්වේ; යස්ස පන, යමෙක්හටවනාහි; එවම්පි පටිපජ්ජතො න හොති, මෙසේ පිළිපදනහුටද අර්පණා නොවේනම්; තෙන, ඔහු විසින්; දස විධ අප්පනා කොසල්ලං, දශවිධවූ අර්පණා කෞශල්‍යය (යම් විධියකින් අර්පණාවෙහි කුසලවේද ඒ දශවිධ විධිය උපයන ගුණයහෝ අර්පණාකෞශල්‍යනම්වෙයි දන්නේ) සම්පාදෙතබ්බං, සැපවියයුතු……

( හා † )

ඒසත්දෙනා අතුරෙන් යම් සෙනස්නෙක වසන්නාවූ මේ යොගාවචරයාහට නූපන්නාවූ ප්‍රතිභාග නිමිත්ත නූපදනේද පෙර උපන් නිමිත්තහෝ නස්නේද නොඑලඹ සිටි සිහිය නොඑලඹෙන්නේද එකඟනොවූ සිත එකඟ නොවේද මෙබඳු ලක්ෂණයුත් සෙනස්න නොසැප සෙනස්නනම්වන්නේය යම් සෙනස්නෙක වසන්නාහට භාග පමිණවාසි යෝගාවචර තිස්සස්ථවිරයන්ටමෙන් නූපන් ප්‍රතිභාග නිමිත්ත උපදීද පෙර උපන් නිමිත්ත නනවුරුවේද සිහිය එළඹ සිටීද සිත

එකඟවේද මෙබඳු ආවාසය සැපවූ ආ
වාසනාමවන්නේයි. එහෙයින් යම් වෙ
හෙරෙක බොහෝ සෙනසුන් ඇත්තා
හුවිනම් එබඳු වෙහෙර එකෙකී සෙ
නසුන තුන්තුන් දවස වැස ඒ යෝ
ගාවචරයාගේ සිත යම් සෙනසුනෙක
එකඟවේනම් ඒ සෙනසුනෙහි විසිය
යුත්තේය සැපවූ ආවාස පහසුව කාර
ණාරණනොවිගෙණ මෙම සිංහලවිප
යෙහි සුලුන්නාලෙන් වැසි පන්සිය
යක් භික්ෂූහු එහිම කම්ටහන්ගෙණ
රහත්පලයට පැමිණියෝය සෙසුනත්
හි සෝවාන් ආදී ආර්‍ය භූමියට පැමි
ණී මේ සුලුන්නාලෙණට අවුත් රහත්
පලයට පැමිණි සෝවාන් ආදී ආර්‍ය
පුද්ගලයන්ගේ මෙතෙකැයි සඞ්ඛ්‍යා
වෙක් නැත්තේය සෙසු සිතුල්පව්වෙ
හෙර මිහිඳුපව්වෙහෙර ආදී විහාරයෙ
හිදු මෙසේම ආර්‍ය භූමියට පැමිණිය
වුන්ගේ ගණන් නැත්තේමය යම් නො
දුරුගමක් සෙනසුනෙහිට පිඩුසිහා යන
කල හෝ පෙරළා එන කල හෝ හිරු
රැස් මුහුනට නොවදනාසේ උතුරෙන්
හෝ දකුණෙන් හෝ පිහිටියේවේද ගම
භාගම්නායට පහසුපරිද්දෙන්දුනුතුන්
දහසකින් ඇතුළත තනා නුදුරුතනක්
හිවේද සුලභවූ සම්පූර්ණ භික්ෂාව ඇත්
තේවේද එබඳු නොදුරුගම සැපවූ
ගොදුරුගම්නම්වන්නේය එයින් විප
රීතවීනම් නොසැපවන්නේයි. කථා
වද රජකථාදී දෙතිස් තිරශ්චීන ක
ථාවන්ට ඇතුළත්වූ හෙවත් ස්වර්ගමො
ක්ෂයන්ට බාධකවූ කථාවක්වීනම්
නොසැපවන්නේය එබඳු කථාව මේ
යෝගාවචරයාගේ උද්ග්‍රහ ප්‍රතිභාග
නිමිත්තයන් අතුරුදන්වීමට කාරණා
වන්නේය ඒ දෙතිස් කථාවන්ගෙන්
වෙන්වූ අල්පේච්ඡතාදී දශකථාවස්තු
නිශ්‍රිත කථාවම සැපවන්නේයි එතකු
දුවුවන් ඒ සැපවූ කථාවද පමණ දත
යුත්තේයි පුද්ගලයාද තිරශ්චීන
කථාවන්ට ප්‍රතිපක්ෂවූ ධර්මප්‍රතිසංයු
ක්ත කථාකාරණ සුලුවේද ශීලාදි ගුණ
යෙන් යුක්තවීද ඔහුනිසා එකඟනොවූ
සිත එකඟවේද එකඟවූ සිත තහවුරු
හෝවේද මෙබඳු පුද්ගලතෙම ඇසුරු
කිරීමට යෝග්‍යවූ සැපවූ පුද්ගලනම්
වන්නේය ඊට විරුඬවූ ශරීර සනා
ණ පොෂණයෙහිම නියුක්තවූ තිරශ්චී
න කථාකාරණ සුලු පුද්ගලතෙම නො
සැප පුද්ගලනම්වන්නේයි කුමක්
හෙයිනයත්? එබඳු පුද්ගලතෙම පැ
හැදි ජලය කිලුටුකාරණ මඩදියක්
මෙන් ඒ යෝගාවචර පුද්ගලයා කිලු
ටුකරන්නේය එබඳු පුද්ගලයා කරා
එළඹ කොළපව්වෙහෙර වැසි බාල
භික්ෂූහුමෙන් සමාපත්තියද නස්නේ
මය උපදවානත් ප්‍රතිභාග නිමිත්ත
නැස්ම කියනුම කවරේද?. භොජනය
වනාහි කිසිවෙකුට මිහිරිවූද කිසිවෙ
කුට ඇඹුල්වූද සැපවන්නේය ඍතු
වද කිසිවෙකුට සිහිල්වූද කිසිවෙකුට
උෂ්ණවූද සැපවන්නේය එහෙයින්
යම් බොජුනෙක්හෝ යම් හුණු සිහිල්
ඍතුවක්හෝ සෙවුනාහට පහසුවේද
එකඟනොවූ සිත එකඟවේද එකඟවූ
සිත තහවුරුහෝවේද එබඳු බොජුනද
එබඳු ඍතුවද සැපවන්නේයි. අනික්
බොජුන්හා අනික්ඍතුදනොසැපවන්
නේයි. ඉරියව් පැවැත්මෙහිද කිසිවෙ
කුට සක්මන්කිරීම සැපවන්නේය කි
සිවෙකුට සයනයකිරීමය සිටීමය හිඳීම
ය යන ඉරියව් අතුරෙන් යම්කිසි ඉරි
යව්වක් සැපවන්නේය එහෙයින් සෙ
නාසනයට කී නියායෙන් තුන්දිනක්
පරීක්ෂාකොට යම් ඉරියව්වෙක පවත්
නහුගේ එකඟනොවූ සිත එකඟවේද
එකඟවූ සිත තහවුරුවේද එබඳු ඉරි
යව්වම සැපවන්නේයි. අනික් ඉරියව්
නොසැපවන්නේයයි දතයුත්තේයි.
මෙසේ සත්වැදෑරුම් නොසැපයන්

දුරුකොට සත්වැදෑරුම් සැපයන් සෙවියයුත්තේයි. මෙසේ පිළිපන්නාවූ ප්‍රතිභාග නිමිත්තයෙහි භාවනානුයොගය බහුලකොට සෙවනයකරණ ඇතැම් යොගාවචරයෙක්හට නොබෝ කාලයකින්ම අර්පණා සමාධිය උපදනේය~

මෙසේ පිළිපදනාවූ යමෙක්හටත් අර්පණා සමාධිය නූපදනේවී නම් ඔහු විසින් දසවැදෑරුම්වූ අර්පණා කෞශල්‍යය සැපවියයුත්තේයි~

---

( ෂා ‡ )

තත්‍රායං නයො දසහාකාරෙහි අප්පනාකොසල්ලං ඉච්ඡිතබ්බං වත්ථුවිසදකිරියතො~ඉන්ද්‍රිය සමත්තපටිපාදනතො~නිමිත්තකුසලතො~යස්මිං සමයෙ චිත්තං පග්ගහෙතබ්බං තස්මිං සමයෙ චිත්තං පග්ගණ්හාති~යස්මිං සමයෙ චිත්තං නිග්ගහෙතබ්බං තස්මිං සමයෙ චිත්තං නිග්ගණ්හාති~යස්මිං සමයෙ චිත්තං සම්පහංසිතබ්බං තස්මිං සමයෙ චිත්තං සම්පහංසෙති~යස්මිං සමයෙ චිත්තං අජ්ඣුපෙක්ඛිතබ්බං තස්මිං සමයෙ චිත්තං අජ්ඣුපෙක්ඛති~අසමාහිත පුග්ගල පරිවජ්ජනතො~සමාහිත පුග්ගල සෙවනතො~තදධි මුත්තතොති~ තත්ථ වත්ථු විසදකිරියා නාම අජ්ඣත්තික බාහිරානං වත්ථූනං විසදභාවකරණං යදාහි ස්ස කෙසනඛලොමානි දීඝානි හොන්ති සරීරං වා සෙදමලග්ගහිතං තදා අජ්ඣත්තිකං වත්ථු අවිසදං හොති අපරිසුද්ධං යදා පන චීවරං ජිණ්ණං කිලිට්ඨං දුග්ගන්ධං හොති සෙනාසනං වා උක්ලාපං තදා බාහිරං වත්ථු අවිසදං හොති අපරිසුද්ධං, අජ්ඣත්තිකෙ බාහිරෙච වත්ථුම්හි අවිසදෙ උප්පන්නෙසු චිත්තචෙතසිකෙසු ඤාණම්පි අපරිසුද්ධං හොති අපරිසුද්ධානි දීපකපල්ලිකවට්ටිතෙලානි නිස්සාය උප්පන්නදීපසිඛාය ඔභාසො විය අපරිසුද්ධෙන ච ඤාණෙන සඞ්ඛාරෙ සම්මසතො සඞ්ඛාරාපි අවිභූතා හොන්ති කම්මට්ඨානමනුයුඤ්ජතො කම්මට්ඨානම්පි වුඩ්ඪිං විරූළ්හිං වෙපුල්ලං න ගච්ඡති විසදෙ පන අජ්ඣත්තික බාහිරෙ වත්ථුම්හි උප්පන්නෙසු චිත්තචෙතසිකෙසු ඤාණම්පි විසදං හොති පරිසුද්ධානි දීපකපල්ලික වට්ටිතෙලානි නිස්සාය උප්පන්නදීපසිඛාය ඔභාසො විය පරිසුද්ධෙන ච ඤාණෙන සඞ්ඛාරෙ සම්මසතො සඞ්ඛාරාපි විභූතා හොන්ති කම්මට්ඨානමනුයුඤ්ජතො කම්මට්ඨානම්පි වුඩ්ඪිං විරූළ්හිං වෙපුල්ලං ගච්ඡති~

---

( ෂ ‡ )

තත්‍ර, එහි; අයංනයො, මේ ක්‍රමය වේ; දසහාකාරෙහි, දස ආකාරයෙකින්; අප්පනාකොසල්ලං ඉච්ඡිතබ්බං, අර්පණා කෞශල්‍යය කැමතිවියයුතු; වත්ථුවිසදකිරියතො, වස්තූන්ගේ නිර්මලබව කිරීමෙන්ද ("අප්පනාකොසල්ලං ඉච්ඡිතබ්බං"යි යොදනු—සිත් පවත්නාතැන්හෙයින් සිරුරුද සිරුරු පිළිබැඳි සිවුරු ආදීහුද වස්තූනම්වෙයි යම්සේ සිතට සුවඑළවාද එසේකිරීම ඔවුන්ගේ විසදකාරණයයි දතයුතු—සෙසු පෙදෙහිදු මෙම නිය) ඉන්ද්‍රිය සමත්ත පටිපාදනතො, ඉන්ද්‍රියයන්ගේ සම බව කිරීමෙන්ද; නිමිත්තකුසලතො, පඨවි කසිණාදි නිමිත්තයෙහි කුසලබැවින්ද; යස්මිං සමයෙ, යම් සමයෙක්හි; චිත්තං, සිත; පග්ගහෙතබ්බං, බැඳියයුතුද; තස්මිං සමයෙ පග්ගණ්හාති, එසමයෙහි සිතහුවවත්නේද; යස්මිං සමයෙ, යම් සමයෙක; චිත්තං, සිත: නිග්ගහෙතබ්බං, නිග්‍රහ කළයුතුද; තස්මිං සමයෙ, එසමයෙහි; චිත්තං නිග්ගණ්හාති, සිත නිග්‍රහ කෙරේද; යස්මිං සමයෙ, යම් සමයෙක; චිත්තං,

සිත; සම්පයුත්තකානං, සතුටු සමියුතු ද; තස්මිං සමයෙ, එසමයෙහි; විඤාණං සම්පහංසෙති, සිත සතුටුකෙරේද; යස්මිං සමයෙ, යම් සමයෙක; විඤාණං, සිත; අජ්ඣුපෙක්ඛිතබ්බං, උපෙක්ෂා කටයුතුද; තස්මිං සමයෙ, එසමයෙහි; විඤාණං, සිත; අජ්ඣුපෙක්ඛති, උපෙක්ෂා කෙරේද; අසමාහිත පුග්ගල පරිවජ්ජනතො, අසමාහිත පුහුලන්ගේ දුරුකිරීමෙන්ද; සමාහිත පුග්ගලසෙවනතො, සමාහිත පුහුල් සෙවීමෙන්ද; තදධිමුත්තතොති, සමාධියෙහි අධිමුක්තියෙන්දැයි; තත්‍ථ, එහි; වත්‍ථු විසද කිරියානාම, වස්තු විසද ක්‍රියානම්; අජ්ඣත්තිකබාහිරානං, අධ්‍යාත්මබාහ්‍ය වස්තූන්ගේ; විසදභාව කරණං, විසදබව කිරීමයි; යදාති, යම්කලෙක; අස්ස, මොහුගේ; කෙස නඛ ලොමානි, කෙස් නිය ලොම්හු; දීඝානි හොන්ති, දික්වෙද්ද; සරීරං වා සෙදමලග්ගහිතං, සිරුරතෝ සෙද මලගත් තාලදද; තදා, එසමයෙහි; අජ්ඣත්තිකං වත්‍ථුං අවිසදං හොති, අධ්‍යාත්ම වස්තුව (අදහැතිවත්) අවිසදවේ; අපරිසුද්ධං, නොපිරිසුදුවේ; යදා පන, යම් කලෙක; චීවරං ජිණ්ණං, චීවරය ජිණිවූයේ; කිලිට්ඨං, කිලුටුවූයේ; දුග්ගන්ධං හොති, දුගඳවූයේවේද; සෙනාසනං වා උක්ලාපං, සෙනස්නහෝ කසල ඇත්තේවේද (වා ශබ්දයෙන් පාත්‍ර ආදීන්ගේද සඞ්ග්‍රහ දතයුතු) තදා බාහිරං වත්‍ථුං අවිසදං හොති, එකල්හි බාහිර වස්තුව අවිසදවේ; අපරිසුද්ධං, නොපිරිසිදුවේ; අජ්ඣත්තික බාහිර වත්‍ථුම්හි අවිසදෙ, අජ්ඣත්තික බාහිර වස්තූන් අවිසදකල්හි; උප්පන්නෙසු චිත්තචෙතසිකෙසු (නිශ්‍රයාදි ප්‍රත්‍යය වශයෙන්) උපන් චිත්ත චෛතසිකයන්කෙරෙහි; ඤාණම්පි අපරිසුද්ධං හොති, නුවනද අපරිශුද්ධවෙ; අපරිසුද්ධානි, පිරිසුදුනොවූ; දීපකපල්ලිකා වට්ටිතෙලානි නිස්සාය, පාත්කබල් පියළිතෙල්නිසා; උප්පන්නාදීපසිඛාය, උපන් දීප ශිඛාවෙහි; ඔභාසොවිය, ආලොකයමෙනි; අපරිසුද්ධෙන ච ඤාණෙන, නොපිරිසුදුවූ ඤාණයෙන්; සඞ්ඛාරෙ සම්මසතො, සංස්කාරයන් සම්මර්ශනයකරන්නාහට; සඞ්ඛාරාපි අවිභූතා හොන්ති, සංස්කාරයෝද; (සකරනුදු) පහළනොවෙත්; කම්මට්ඨානං මනුයුඤ්ජතො, කම්ටහන් යෙදන්නහුට; කම්මට්ඨානම්පි, කම්ටහන්ද; වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං න ගච්ඡති, වෘද්ධියට විරූඪියට විපුලබවට නොයේ; විසදෙ පන අජ්ඣත්තිකබාහිරෙ වත්‍ථුම්හි, අජ්ඣත්තික බාහිර වස්තූන් විසද කල්හි වනාහි; උප්පන්නෙසු චිත්තචෙතසිකෙසු, උපන් චිත්තචෛතසික දමුන්කෙරෙහි; ඤාණම්පි විසදං හොති, ඤාණයද විසදවේ; පරිසුද්ධානි, පිරිසිදුවූ; දීපකපල්ලිකවට්ටිතෙලානි නිස්සාය, පාත්කබල් පියළි තෙලනිසා; උප්පන්නාදීපසිඛාය ඔභාසොවිය, උපන් දීපශිඛාවෙහි ආලොකයමෙනි; පරිසුද්ධෙන ඤාණෙන, පිරිසිදුවූ නුවණින්; සඞ්ඛාරෙ සම්මසතො, සංස්කාරයන් සම්මර්ශනයකරන්නාහට; සඞ්ඛාරාපි විභූතාහොන්ති, සංස්කාරයෝද විභූතවෙති; කම්මට්ඨානම්පි, සමථ කමටහණද; වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ගච්ඡති (අඞ්ගප්‍රාදුර්භාවයෙන්) වෘද්ධියට (ප්‍රගුණභාවයෙන්) විරූඪියට (සර්වප්‍රකාර වශීභාවයෙන්) වෛපුල්‍යය වද යේ.

( ගා ‡ )

මේ මතු දක්වන්නේ ඒ ක්‍රමයයි. දස ආකාරයකින් අපීණා කුශලත්වය කැඳැවියයුත්තේය හේ කවර දශ ආකාරයක්දයත්? වස්තූන්ගේ නිර්මල

බව කිරීමෙන්ද අපීණා කෞශල්‍යය කැමතිවියයුත්තේය මෙහි චිත්තචෛතසිකයන්ගේ පැවැත්මට ස්ථානවූ විත් ශරීරයද ඒ ශරීර ප්‍රතිබද්ධව පවත්නා සිවුරුපිරිකරාදියද වස්තුයයි ව්‍යවහාරවන්නේය යම්සේ සිත සැපඑළඹන්නේද එසේකිරීම වස්තු නිර්මලබවකිරීම නම්වන්නේ සිඉන්ද්‍රියයන්ගේ සමබව කිරීමෙන්ද අපීණා කෞශල්‍යය සැපවියයුත්තේය පෘථිවි කසිණාදි නිමිත්තග්‍රහණයෙහි දක්‍ෂබැවින්ද අපීණා කෞශල්‍යය කැමතිවියයුත්තේය යම් කාලෙක සිත වැඩියයුතුද එකල සිත වඩන්නේවේද යම් කාලෙක සිත නිග්‍රහ කටයුතුද එකල සිත නිග්‍රහකරන්නේවේද යම් කාලෙක සිත සතුටුකළයුතුද එකල සිත සතුටුකෙරේද යම් කාලෙක සිත මැදහත්කොට පැවැත්වියයුතුද එකල සිත මැදහත්කොට පවත්වාද යන සතරාකාරයෙන්ද නොසන්හුන් පුද්ගලයන් දුරුකිරීමෙන්ද සන්හුන් පුද්ගලයන් සෙවනයකිරීමෙන්ද සමාධි ඉපදවීමෙහි කැමැත්තෙන්ද යනමේ දශ ආකාරයෙන් අපීණා දක්‍ෂබව සැපවියයුත්තේයි ඒ දශ ආකාර අපීණා කෞශල්‍යයන් අතුරෙන් වස්තුන්ගේ නිර්මලබවකිරීම නම් අධ්‍යාත්මික බාහිර වස්තුන්ගේ නිර්මලබවකිරීම වේයි ඒ එසේමැයි යම්කාලෙක යෝගාවචරයාගේ කෙස් නිය ලොම් දික්වෙද්ද ශරීරය ඩහදිය මල ගන්නාලද්දේහෝවේද එකල අධ්‍යාත්මික වස්තුසඞ්ඛ්‍යාත හෘදයවස්තුවද අපිරිසිදුවන්නේය යම්කාලෙක සිවුරු දිරාගියේද කිලිටිවූයේද දුගඳවූයේද සේනාසනය හෝ කුණු කසළින් ගැවසිගත්තේද එකල අධ්‍යාත්මික වස්තු සඞ්ඛ්‍යාතවූ හෘදය වස්තුවද නොපිරිසිදුවන්නේමය මෙසේ අධ්‍යාත්මික බාහිර වස්තුන් අපිරිසිදුවූ කල ඔවුන් ආශ්‍රයකොටගෙණ උපදනා චිත්තචෛතසිකයන් පිළිබඳව පවත්නා නුවණද අපිරිසිදුවන්නේමය යම්සේ නොපිරිසිදු ප්‍රදීපාධාරය නොපිරිසිදු පහන්වැටිය නොපිරිසිදු තෙලය යන මොවුන් නිසා දල්වූ පහන්සිළෙහි ආලෝකය නොපිරිසිදුම්වේද එපරිද්දෙන්ම නොපිරිසිදු නුවනින් සංස්කාර ධර්මයන් සම්මර්ශනයකරනාහාහට සංස්කාරයෝද පහළනොවෙත්මය කමටහන් භාවනාවෙහි යෙදෙනාහුගේ කමටහණ වැඩීමටද භවනැඟීමටද මහත්බවටද නොපැමිණෙන්නේය අධ්‍යාත්මික බාහිර වස්තූන් නිර්මල කල්හි උපදනා චිත්තචෛතසිකයන් පිළිබඳව පවත්නා ඤාණයද නිර්මලවන්නේය ඊට උපමා කවරේදයත්? යම්සේ පිරිසිදු ප්‍රදීපාධාරය පහන්වැටිය පහන්තෙලය යනමොවුන්නිසා දල්වනලද පහන්සිලෙහි ආලෝකය නිර්මලවේද එපරිද්දෙන්ම පිරිසිදුවූ නුවනින් සංස්කාරයන් සම්මර්ශනයකරන්නාහට සංස්කාරයෝද ප්‍රකටව පහළවෙත්මය කමටහන් භාවනාවෙහි යෙදෙන්නාහුගේ කමටහණ අභිවෘද්ධියටද ප්‍රගුණවීමටද මහත්බවටද පැමිණෙන්නේයි.—

( ෂ ¶ )

ඉන්ද්‍රිය සමත්තපටිපාදනං නාම සද්ධාදීනං ඉන්ද්‍රියානං සමභාවකරණං සචෙහිස්ස සද්ධින්ද්‍රියං බලවං හොති ඉතරානි මන්දානි තතො විරියින්ද්‍රියං පග්ගහකිච්චං සතින්ද්‍රියං උපට්ඨානකිච්චං සමාධින්ද්‍රියං අවික්ඛෙපකිච්චං පඤ්ඤින්ද්‍රියං දස්සනකිච්චං කාතුං න සක්කොන්ති තස්මා තං ධම්මසභාවපච්චවෙක්ඛණෙන වා යථා වා මනසිකරොතො බලවං ජාතං තථා අමනසිකාරෙන හාපෙතබ්බං — වක්කලිත්ථෙර වත්ථු චෙත්ථ නිදස්සනං — සචෙ පන විරි

ඤ්ඤින්ද්‍රියං බලවං හොති අථනෙව සද්ධින්ද්‍රියං අධිමොක්ඛකිච්චං කාතුං සක්කොති න ඉතරානි ඉතරකිච්චභෙදං තස්මා තං පස්සද්ධාදි භාවනාය හාපෙතබ්බං තත්‍රාපි සොණත්ථෙරස්ස වත්ථුං කාතබ්බං එවං සෙසෙසුපි එකස්ස බලවභාවෙ සති ඉතරෙසං අත්තනො කිච්චෙසු අසමත්ථතා වෙදිතබ්බා —

( සන්න )

ඉන්ද්‍රියසමත්තපටිපාදනං නාම, ඉන්ද්‍රියයන්ගේ සමබව්‍ය පැමිණිවීම නම්; සද්ධාදීනං ඉන්ද්‍රියානං, ශ්‍රද්ධාදි ඉන්ද්‍රියයන්ගේ; සමභාවකරණං, සමබවකිරීමයි (ප්‍රත්‍යයෙහෙයින් අනූනානධික බව කිරීමයි) සචෙ හි, ඉදින්; අස්ස, ඒ යොගිහට; සද්ධින්ද්‍රියං බලවං හොති, ශ්‍රද්ධෙන්ද්‍රිය බලවත්වේද; ඉතරානි මන්දානි, ඉතරයෝ මඳවෙද්ද; තතො, එහෙයින් (ශ්‍රද්ධෙන්ද්‍රිය බලවත්බැවින් ඉතරයන් මඳබැවින් යන අර්ථයි) විරියින්ද්‍රියං පග්ගහකිච්චං, වීර්‍ය්‍යෙන්ද්‍රියතෙමේ (සම්ප්‍රයුක්ත ධර්මයන්ට අනුබලදීමෙන්) හුවනා කෘත්‍යය ("කාතුං න සක්කොන්ති"යි සම්බන්ධකරණු-සෙසු පෙදෙහිදු මෙම නියා) සතින්ද්‍රියං, සිහි ඉඳුරු; උපට්ඨානකිච්චං, අරමුණෙහි එළඹසිටිනාකිස (අරමුණු නොහරණා කිසයෝ) සමාධින්ද්‍රියං, සමාධි ඉඳුරු, අවික්ඛෙපකිච්චං, නොවිසිරියයුතු දමුන් නොවිසිරිසදෙන කිස; පඤ්ඤින්ද්‍රියං, පැණ ඉඳුරු; දස්සනකිච්චං, (රූව අරමුණක් ඇසින්මෙන්) යථාවත්වයෙන් විෂයස්වභාව දක්නා කෘත්‍යය; කාතුං, කරන්නට; න සක්කොන්ති, නොපොහොසති; තස්මා, එහෙයින්; තං (ඒ බලවත් ශ්‍රද්ධෙන්ද්‍රියයෙන් මඩනාලද හෙයින්) ඉඳුරු ධර්මස්වභාව; පච්චවෙක්ඛණෙන වා (යම් හැදගියයැකි වස්තුවක්හුගේ උදාරතාදි ගුණයෙහි අධිමුච්චනයාගේ සාතිශයව පැවැත්මෙන් ශ්‍රද්ධෙන්ද්‍රිය බලවත්වේද; ඒ වස්තූනුගේ ප්‍රත්‍යය සමුත්පන්නාදී විභාගය වෙන් වෙන්කොට මෙනෙහිකිරීමෙන්හෝ යන අර්ථයි මෙසේ ධර්මානය ස්වභාව ස්වරසවශයෙන් පරිග්‍රහ කරණකල්හි මේ මේ දහමුන්ගේ ස්වභාවය යන ප්‍රඥව්‍යාපාරය බලවත්බැවින් අධිමොක්ෂ සවිස්ථාරවීය නොහේ-බුරිය දහමුන්කෙරෙහි වනාහි යම්සේ ශ්‍රද්ධාවගේ බලවතාවයෙහි ප්‍රඥාවගේ මන්දතාවයද එසේම ප්‍රඥාවගේ බලවතාවයෙහි ශ්‍රද්ධාවගේ මන්දතාවය වෙයි දන්නේ එයින්කීහ "ධම්ම සභාව පච්චවෙක්ඛණෙන හාපෙතබ්බං"යි) යථාවා මනසිකරොතො, යම් ආකාරයකින් යෝ මෙනෙහිකරණුවහට; බලවං ජාතං (ශ්‍රද්ධෙන්ද්‍රිය) බලවත්වීද; තථා අමනසිකාරෙන, එසේ නොමෙනෙහි නොකිරීමෙන්; හාපෙතබ්බං, හෙළුවියයුතු (වීර්යාදීන්ගේ පටුකෘත්‍යභාවාවනවූ මනසිකාරයෙන් ඔවුන්හා ශ්‍රද්ධෙන්ද්‍රිය සමරසකරන්නාහු එයින් පිරිහෙළියයුතුය යන අර්ථයි-සෙසු ඉඳුරන්කෙරෙහිදු හාපනවිධි මෙයින් දතයුතු) එත්ථ ච, මෙහි වනාහි; වක්කලිත්ථෙරවත්ථු, වක්කලිනම් තෙරුන්ගේ වත; නිදස්සනං, දෘෂ්ටාන්තයි; සචෙ පන, ඉදින්; විරියින්ද්‍රියං බලවං හොති, වීර්යෙන්ද්‍රිය බලවත්වීනම්; අථ, එසේකල්හි; සද්ධින්ද්‍රියං ශ්‍රද්ධෙන්ද්‍රිය; අධිමොක්ඛකිච්චං කාතුං, අධිමොක්ෂ කෘත්‍යකරණුවට; නෙව සක්කොති නොපොහොසත්වේ; ඉතරානි, සෙසු ඉඳුරෝ; ඉතරකිච්චභෙදං, සෙසු උපට්ඨානාදී කෘත්‍යභෙදය ("නෙව කාතුං සක්කොන්ති"යි යොදනු) තස්මා, එහෙයින්; තං, ඒ වීර්යෙන්ද්‍රිය; පස්සද්ධාදිභාවනාය හාපෙතබ්බං, පස්සද්ධි සමාධි උපෙක්ඛා යනමොවුන්ගේ භාවනායෙන් හෙළියයුතු, තත්‍රා

ති, එනිදු; තොණවේරස්ස වත්‍ථු, තො
ණොම තෙරුන්ගේ වත; දකෙස්සන
බවං, දක්ව්ඡයුතු; සොකෙස්සුති, සති
සමාධි පඤ්ඤින්‍ද්‍රියයන් කෙනෙරති දූ;
එවං, මෙවස්මැයි; එකස්ස බලවත්වෙව
යැයි, එකක්හුගේ බලවත්බව ඇතිහ
ල්හි, ඉතරෙසං, සෙස්සවුන්ගේ; අහා
පො හිතෙව්වසු අසමත්‍ථා, හාම තොම
තේ කෘත්‍යයෙහි අසමර්ථබව; වෙදිත
බබා, දතයුත්තේයි—

( ගා ¶ )

ඉදුරන්ගේ සමබවට පැමිණවීම්
හම් ශ්‍රද්ධාදී ඉන්‍ද්‍රියයන්ගේ අන්‍යෝන්‍ය අන
තික්‍රමණයන් සමබවනිරිමෙවයි ඉදින්
ඒ යොගාවචරයාහට ශ්‍රද්ධෙන්‍ද්‍රිය බලව
ත්වීද සෙසු ඉන්‍ද්‍රියයෝ දුර්වලවූවාහුද
එසේකල වීර්‍ය්‍යෙන්‍ද්‍රිය තමා හා එක්ව
යෙදුනාවූ අවශෙෂ ධර්මයන්ට අනු
බලදීමෙන් උත්සාහ නොකටහැකි
වෙයි සමාධීන්‍ද්‍රිය අරමුණට එළඹ
සිටිනාවූ හෝ අරමුණ නොහරණාවූ
හෝ කෘත්‍යය නොකටහැකිවෙයි සමා
ධීන්‍ද්‍රිය තමාහා එක්ව යෙදුනාවූ
ධර්මයන් නොවිසිරියෑදි කැටිකරණ
කෘත්‍යය නොකටහැකිවෙයි ප්‍රඥෙන්‍ද්‍රිය
රූපාලම්බනය ඇසින් දක්නාක්මෙන්
ප්‍රඥාචක්ෂුසින් තත්වූපරිද්දෙන් අරමුණු
දක්නාවූ කෘත්‍යය නොකටහැකි
වේය ඒ බලවත් ශ්‍රද්ධෙන්‍ද්‍රියයන් ඉඩ
කාලද තෙහසින් ධර්මයන්ගේ තත්වාකා
රය මෙනෙහිකිරීමෙන් හෝ යම් ආකා
රයකින් මෙනෙහිකරන්නාහට ශ්‍රද්ධ
න්‍ද්‍රිය බලවත්වීද ඒ ආකාරයෙන් මෙ
නෙහි නොකිරීමෙන් හෝ ශ්‍රද්ධෙන්‍ද්‍රිය
පිරිහෙලිය යුත්තේය මෙහිලා වක්ක
ලිස්ථවිරයන්ගේ කථාවස්තුව නිදසු
න කටයුත්තේයි ඒ වක්කලිස්ථවිර
යෝ ශ්‍රද්ධාධිමුක්තිකයන් පෙර කාරණ
ලද පිණ්ඩියව ශාස්තෘන්වහන්සේගේ
රූපකායසම්පත්තිය දක්මෙනිම නියුක්
තව වසනුයේ එක්දවසක් ශාස්තෘන්
වහන්සේ වදරණසේක් එම්බා වක්ක
ලිය මේ කුණුශරීරය දක්මෙන් කවර
ප්‍රයෝජනද ? යමෙක් ධර්මය දකීනම්
හෙතෙම මා දුටුයේනම්වෙයි යනාදීන්
අවවාදකොට කමටහන්දුන්සේක යෙදුනේද
කමටහන් නොවඩා සර්වඥයන්වහන්
සේ තමාහට කරුණාසේනැයි සිතා දුක්වැද
ප්‍රපාතයක පැන දිවිහානිකරමි සිතා
ගල්මුදුනකට නැංගේය බුදුකෙනෙකුන්
සර්වඥයන්වහන්සේ එබව දිවැසින් දැක
වදාරා ඔබනුත්තැනමසිට ආලොක
යක් පතුරුවා තමන්වහන්සේගේ
රූපකාය දක්වා බුද්ධයසුන්හි පතන්වූ
ප්‍රමොද බහුලකොට විසූහ මහණ
සංස්කාරයන් ව්‍යුපශමනයකළාවූ පරම
ශාන්තසුඛවූ නිර්වාණපදයට පැමිණෙ
න්නේයයි යනා මේ ගාථා වදාරා මෙමස්
එව වක්කලියයි අභිනාවදුළේය වක්ක
ලි ස්ථවිර තෙමේ ඒ වචනයෙන්ම
අත්‍යන්තප්‍රීතියක ලදද සතුමෙන් කුටුපත
දුව විදශීනාවට පටන්ගත්ත ඒ තෙරු
න්ගේ ශ්‍රද්ධා බලව හාවය හෙතුකොට
ගෙණ විදශීනා වීථියට නොබැස්සේය
භාගාවතුන්වහන්සේ එබව දැනවදාරා
ඉදුරන්ගේ සමකව පිළිගෙළකරමින්
කම්ටහන දිරිසිදුකොට දුන්සේක ව
ක්කලිස්ථවිරයෝද ශාස්තෘන්වහ
න්සේ විසින් දෙනලද නියායෙන් විද
සුන් වඩා ගොවා ආදී මාර්ගපිළිවෙ
ළින් රහත්ඵලයට පැමිණිසේක ඉදින්
වීර්‍ය්‍යෙන්‍ද්‍රිය බලවත්විනම් එකල ශ්‍රද්ධ
න්‍ද්‍රිය අධිමොක්‍ෂකෘත්‍යය කරණුවට
වනාහොයොනහ්වෙයි සෙසු ඉන්‍ද්‍රිය
යෝද සෙසු අරමුණු එළඹසිටීම ආදී
කෘත්‍යභෙදයන්ද කරණුවට නො
හොයාසන් ... ... ...

වීර්‍යේන්ද්‍රිය පස්සද්ධි සමාධි උපෙක්ඛා යන බොධ්‍යඞ්ගයන් වැඩීමෙන් පිරිහෙළිය යුත්තේයි. එහිදු සුකුමාරසොණ ස්ථවිරයන්ගේ කථාවස්තුව දක්විය යුත්තේය. ඒ ආයුෂ්මත් සුකුමාර සොණස්ථවිරයන්වහන්සේ කාමටහන් ගෙණ සීතවනයෙහි වසනුයේ මාගේ ශරීරය ඉතා සිවුමැලිය සුවවිඳීමෙන් සුවයට පැමිණිය නොහැක්කේමය ඉදින් සුවහැලැවහිනම් ශරීරය කලානා නොවිමසා ණදමකාටියුතුමයයි සිතා සිරිමි සක්මන් කිරීම් පමණක් ඉවාගෙණ වීර්‍යාරම්භයේ යම්තාක් පතුල් තෙලෙහි පොළු නැගේද ඒතාක් වෙදනාව නොබලාම දැඩිතර වීර්‍යාරම්භයේ අධික වීර්‍යයෙහිත් විශෙෂාධිගමයට නොපැමිණියේය ශාස්තෲන්වහන්සේ එබව දැනවදාරා එහි වැඩ අවවාදයෙකාට වීර්‍ය සමතාවයයොදනආකාර දක්වමින් කාමටහන් ශුද්ධකොටදී ගිජුකුළුපව්වට වැඩියේක තෙරැන්වහන්සේ ද ශාස්තෲන්වහන්සේ විසින් දෙනලද නියායෙන් වීර්‍යසමතාව යොදමින් විදසුන් වඩා රහත්පලයට පැමිණියේය.—

මෙසේම සෙසු ශ්‍රද්ධෙන්ද්‍රියාදී ඉන්ද්‍රියයන් කෙරෙහිද එකමඉන්ද්‍රියෙක් බලවත්වීනම් සෙසු ඉන්ද්‍රියයන් තමතමන්ගේ කෘත්‍යයෙහි අපොහොසත්වන බව දතයුත්තේයි—

( පා: )

විසෙසතො පනෙත්ථ සද්ධාපඤ්ඤානං සමාධිවීරියානඤ්ච සමතං පසංසන්ති බලව සද්ධො හි මන්දපඤ්ඤො මුධප්පසන්නො හොති අවත්ථුස්මිං පසීදති බලවපඤ්ඤො මන්දසද්ධො කෙරාටිකපක්ඛං භජති භෙසජ්ජසමුට්ඨිතො විය රොගො අතෙකිච්ඡො හොති උභින්නං සමත්තා වත්ථුස්මිංයෙව පසීදති බලවසමාධිං පන මන්දවීරියං සමාධිස්ස කොසජ්ජපක්ඛත්තා කොසජ්ජං අභිභවති බලව වීරියං මන්දසමාධිං වීරියස්ස උද්ධච්චපක්ඛත්තා උද්ධච්චං අභිභවති සමාධිපන වීරියෙන සංයොජිතො කොසජ්ජෙ පතිතුං නලභති වීරියං සමාධිනා සංයොජිතං උද්ධච්චෙ පතිතුං නලභති තස්මා තදුභයං සමංකාතබ්බං උභයසමතාය හි අප්පනා හොති අපිච සමාධිකම්මිකස්ස බලවතීපි සද්ධා වට්ටති එවං සද්දහන්තො ඔකප්පෙන්තො අප්පනං පාපුණිස්සති සමාධිපඤ්ඤාසු පන සමාධිකම්මිකස්ස එකග්ගතා බලවතී වට්ටති එවං හි සො අප්පනං පාපුණාති විපස්සනාකම්මිකස්ස පඤ්ඤා බලවතී වට්ටති එවං හි සො ලක්ඛණ පටිවෙධං පාපුණාති උභින්නං පන සමත්තාපි අප්පනා හොතියෙව සතිපන සබ්බත්ථ බලවතී වට්ටති සතිහි චිත්තං උද්ධච්චපක්ඛිකානං සද්ධා වීරිය පඤ්ඤානං වසෙන උද්ධච්චපාතතො කොසජ්ජපක්ඛෙන ච සමාධිනා කොසජ්ජපාතතො රක්ඛති තස්මා සා ලොණධූපනංවිය සබ්බබ්‍යඤ්ජනෙසු සබ්බකම්මික අමච්චොවියච සබ්බරාජකිච්චෙසු සබ්බත්ථ ඉච්ඡිතබ්බා තෙනාහ— සතිපන සබ්බත්ථිකා වුත්තා භගවතා කිං කාරණා චිත්තං හි සතිපටිසරණං ආරක්ඛ පච්චුපට්ඨානාච සතිනාවිනා සතියා චිත්තස්ස පග්ගහ නිග්ගහො හොතී ති—

( ස: )

එහි, මේ පඤ්චෙන්ද්‍රියයන් කෙරෙහි; විසෙසතො පන, විශෙෂයෙන් වනාහි; සද්ධාපඤ්ඤානං, ශ්‍රද්ධාප්‍රඥාවන්ගේද, සමාධිවීරියානඤ්ච, සමාධි වීර්‍යයන්ගේද; සමතං පසංසන්ති, සමබව පසසිත්; බලවසද්ධො හි, බලවත් ශ්‍රද්ධා ඇති; මන්දපඤ්ඤො, මඳනුවණ ඇත්තේ; මුධප්පසන්නො හොති, නොදැන පහද

ගොචෙව්; අවසම්පසම්, පසිදති (ශ්‍රද්ධා
ප්‍රසන්නාබැවින් නිශ්චිතයන්ගෙයි) අව
සානුගෙහි පහදනේනී; බලව පසෙනුද,
බලවත්ප්‍රසාදඇත්තෙන්; මන්ද සංඝා,
මදවූ සැදහැඇත්තෙන්; ගොරාවික
පකාශං භජති (සිත් උපන් පමණින්ම
කුසල්ගේ සී දන්ආදි දීමෙන් කටයුතු
නිමැයි) ගෝරාවිකාපසාදය ගෙවූයෙන්
වෙ; ගොසප්පසම්ප්‍රසිතො විශෙරාගෙන,
ගොමහදින් උපන්ගෙරාගයන්ගෙන්;
අගොනතිවෙශි, ගොනි, පිලිසමිකටයුතු
ගොවෙ (ගෙබදුවූයේ වහාති ඇත්ත
පාශීඝයන් පිලිමපවාත සිත්ඇත්තෙන්
හුවණැත්තාවූත් ගොපුල් ගොගිරිස්
ගෝයයි යන අදහසි) උභින්නං සම
තාය, ශ්‍රද්ධාප්‍රඥ දෙදෙනාගේ සමබව
යෙන්; පඤ්ඤුසම්භ යෙව පසිදති, එත්
තිව පහදගෙන්ස; බලව සමාධිං පන,
බලවත්සමාධිඇතිවූ; මන්දවිරියං, මන්ද
වීර්‍යඇත්තානු; සමාධිස්ස කොසජ්ජ
පක්ඛත්තා, සමාධිනු කොසීද පක්ෂ
යනයින්; කොසජ්ජං අභිභවති, කොස
සීදූය මැඩපවති (එහෙයින් අර්පණා
වට ගොපැමිණේ යන අදහසි—"උද්ධ
ච්චං අභිභවති" යනු ගසනී ද මෙමනි
යේ) බලවවීරියං, බලවත්වීර්‍ය ඇත්
තාවූ, මන්දසමාධි, මදසමාධි ඇත්තාහු;
විරියස්ස උද්ධච්චපක්ඛත්තා, වීර්‍ය
ඖද්ධත්‍යපක්ෂයෙයින්; උද්ධච්චං අභිභ
වති, උද්ධච්චය මැඩපවති; සමාධි පන,
සමාධියවනාති; විරියෙන සංයොජි
තො, වීර්‍යයා යොදනලද්දේ; කොස
ජ්ජෙ පතිතුං න ලභති, කොසීදය
යෙහි ගොහෙළුවිගොලැබේ; විරියං,
වීර්‍ය; සමාධිනා සංයොජිතං, සමා
ධිය හා යොදනලද්දේ; උද්ධච්චෙ පති
තුං න ලභති, උද්ධච්චයෙහි ගොහෙළුව
ගොලැබේ (ඖද්ධත්‍යපක්ෂයට ගොපැයේ)
තස්මා, එහෙයින්; තදුභයං, ඒ ශ්‍රද්ධා
ප්‍රඥ දෙක හා සමාධිවීර්‍යදෙකද; සම
භාවම, සමකටයුතු; උභය සම

තාය හි, දෙදෙනාගේ සමබැවින්; අප්
පනාගෙනා, අර්පණාවෙ; අපිච, අනි
කොකූද; සමාධිකම්මිකස්ස, සමාධිකර්
මිකයාට; බලවතිපි සද්ධාවට්ටති, බල
වත්වූද සැදහැවෙයි; එවං, එසේකල්හි
(මද්ක් ශ්‍රද්ධාව බලවත්කල "පඨවි පඨ
වී"යි කියමිණකින් ධ්‍යානනම් කෙසේ
වේද්දැයි ගොසලකා එකාන්තයෙන්
බුදුන් විසින් කියනලද මෙ විධිය සිඛ
වන්ගෙන්මයයි) සද්දහන්තො, හදහන්
ගෙන්, ඔකපෙපන්තො, විදහදහන්නේ;
අප්පනං පාපුණිස්සති, අර්පණාවට පැමි
ණේ; සමාධිපඤ්ඤාසු පන, සමාධිප්‍රඥ
දෙදෙනාකෙරෙහි වනාහි; සමාධිය
ම්මිකස්ස, සමාධිකර්මිකයහට; එකග්ග
තා බලවති වට්ටති (ධ්‍යානය සමාධි
ප්‍රධානබැවින්) එකාග්‍රතාවම බල
වත්වීවෙයි; එවංහි, එසේකල්හි (මද්ක්
එකාග්‍රතාව බලවත්කල්හි) සො, හෙ
තෙම; අප්පනං පාපුණාති, අර්පණාවට
පැමිණේ; විපස්සනාකම්මිකස්ස, විද
ර්ශනාකර්මිකයහට; පඤ්ඤාබලවයි වට්ට
තෙයි, ප්‍රඥතොමෙ බලවත්වීවෙයි; එවං
හි, එසේකල්හි; සො, හෙතෙමේ; ලක්ඛ
ණපටිවෙධං පාපුණාති, ලක්ෂණ ප්‍රති
වෙධයට පැමිණේ; උභින්නං පන සම
තාය පි, සමාධිප්‍රඥ දෙදෙනාගේ සම
බැවිනුද, අප්පනා හොති යෙව, අර්පණා
වේමැයි (සමාධිකර්මිකයහට සමාධි
බලවත්වව කැමතිවීයයුතු යනු ගතවනා
පිණිස "සමතාය"ට් කීනු "අප්පනා"
යසිදු සමාධි නැතුවූ-එහෙයින්ම සා
සඛාව "හොතියෙව"යි යනු-ලෙවු
වුරා අර්පණාවවනා නි ඔවුන්ගේ සබැ
වින් කැමතිවනුලැබේ-එහෙයින් කීහ
"සමථවිපස්සනා යුගනද්ධා හොන්ති"
යි) සති පන, සිහි වනාහි; සබ්බත්ථ, සි
යල්තැන්හි ... උභයපක්ෂයෙහිම පසුවිසි යෙන්
ගොහෙරනිම; බලවතී වට්ටති; බලවත්

විටවී; සති, සිහිතොමේ; චිත්තං; සිත්හු; උද්ධච්චපක්ඛියානං, ඖද්ධත්‍යපක්ෂයෙහි සිටියාවූ; සද්ධාවීරියපඤ්ඤානං වශෙන, ශ්‍රද්ධාවීර්‍ය්‍ය ප්‍රඥාවන්ගේ වශයෙන්; උද්ධච්චපාතතො, ඖද්ධත්‍යයෙහි හිමෙන්ද; කොසජ්ජපක්ඛෙන සමාධිනා, කෞසීද්‍යපක්ෂවූ සමාධිහු විසින්; කොසජ්ජපාතතො, කෞසීද්‍යයෙහි හිමෙන්ද; රක්ඛති, රකී; තස්මා, එහෙයින්; සා, ඒ සිහිතොමේ; ලොණධූපනං විය සබ්බබ්‍යඤ්ජනෙසු, සියලුව්‍යඤ්ජනයෙහි ලුණු හා තෙල්ඉසීම්ද; සබ්බකම්මික අමච්චො විය සබ්බරාජකිච්චෙසු, සියලු රාජකෘත්‍යයෙහි සියලු කාර්‍ය්‍යයන්හි නියුක්ත ඇමැතියා මෙන්ද; සබ්බත්ථ, හැමතැනම; ඉච්ඡිතබ්බා, පැතැස්සයුතුයි; තෙනාහ, එහෙයින් කීහ; සති පන, සිහිවනාහි; සබ්බත්ථිකා වුත්තා භගවතා, භගවත්හු විසින් හැමතැනම කැමතිවියයුතුයයි කියනලද; කිං කාරණා, කවර කාරුණයෙන්? චිත්තං හි, කුසල් සිත තෙමේ; සතිපටිසරණං, සිහියම පිළිසරණකොට ඇත්තේයි (අප්‍රාප්තයාගේ ප්‍රාප්තියෙහිද අනධිගතයාගේ අධිගමයෙහිද සිහියම පිළිසරණය යනු ඇතියි) සති, සිහිතොමේ; ආරක්ඛපච්චුපට්ඨානා, ආරක්‍ෂාබව වැටහීම් කොට ඇත්තීයි; සතියා විනා, සිහියනැතිව; චිත්තස්ස, චිත්තයාගේ; පග්ගහනිග්ගහො න හොතීති, ප්‍රග්‍රහනිග්‍රහයෙක් නොවන්නේයි.

( ගා * )

මේ පඤ්චින්ද්‍රියයන් අතුරෙන් විශෙෂයෙන් ශ්‍රද්ධා ප්‍රඥා දෙදෙනාගේ හා සමාධි වීර්‍ය්‍ය දෙදෙනාගේද සමබව පැවැත්ම ඇතැයි ප්‍රශංසා කොරෙත් කුමක් හෙයින්දයත්? බලවත් ශ්‍රද්ධාව ඇත්තේම මඳප්‍රඥා ඇත්තේවී කාම් ගෙනෙන් කාරණා නොදැන පහ දීමෙන්ම වෙති මුග්ධප්‍රසන්නබැවින් නිරර්ථකයන්හිද පහදින්නේ වෙයි බලවත් ප්‍රඥාව ඇති මන්ද ශ්‍රද්ධා ඇත්තේවී නම් කුසල්සිත් උපන් පමණින්ම කුසල් වෙයි දැන දානාදි කටයුතු නොකිරීමෙන් කපටප්‍රයෝජනාදී සිතා නොකරාපිය පක්ෂය වෙයි වනැයි කොතෙරයි ඒ පුද්ගලතෙම බෙහෙදින් උපන් රොගයක්මෙන් පිළිය ම් කටයුතුද නොවෙයි මෙබඳු පුද්ගල තෙම අසාධ්‍යයි සිත් නයින් උද්ධතවූ සිත්ඇතිව ආවර්ණයනවූ නො පුල් නොශිඛිස්සේය ශ්‍රද්ධාප්‍රඥා දෙදෙනාගේ සමබව කාරණ කොට ගෙණ පැහැදියයුතු වස්තු කෙරෙහි පහදින්නේය බලවත් සමාධි ඇති පුද්ගලතෙමේ වීර්‍ය්‍යදුබලයේනම් සමාධිය කුශීතපා ක්ෂික ධර්මයක් බැවින් කුශීතබව මැඩ පවත්වනහෙයින් අපිණ වට නොපැ මිණෙන්නේය බලවත් වීර්‍ය්‍යවනා තෙම මඳවූ සමාධි ඇත්තේවීනම් වී ර්‍ය්‍යය උද්ධතවූ පක්‍ෂබැවින් උද්ධච්චය මැඩපවත්වයි සමාධිය වීර්‍ය්‍යය හා යොදනලද්දේ වීනම් කුශීතබවෙහි වැටෙ න්නට නොදෙයි වීර්‍ය්‍යය සමාධිය හා යොදනලද්දේ වීනම් ඖද්ධත්‍යයෙහි වැටෙනනට නොදෙයි එහෙයින් ඒ ශ්‍රද්ධා ප්‍රඥා දෙදෙනා හා සමාධි වීර්‍ය්‍ය දෙදෙනාද සමකටයුතුය ඒ යුගලවය සමකල්හි අර්පණාසමාධිය වන්නේයි. තවද සමාධිකර්මික යොගාවචරයාහට ශ්‍රද්ධාව බලවත්වූත් වටනේය කුමක් හෙයිනයත්? බලවත් ශ්‍රද්ධාව ඇතිකල්හි පඨවිපක්ඛයයි කී පඨවිකසිණ නොවෙ ධ්‍යානය උපදින්නේදැයි නොසලකා ඒකාන්තයෙන් භාවනාවන්හු විසින් වැඩුරණලද ශ්‍රද්ධාව සිඩවත්නෙන් මැයි අදහනුයේ අර්පණාවද අදහනුයේ අර්පණාසමාධියට පැමිණෙන්නේයි සමාධිප්‍රඥා දෙදෙනා අතුරෙන් සමාධිය

උපදවන්නා හට එකාග්‍රතාව බලව
ත් නල්ති අපිණාවට පැමිණෙණනෙහයි
න් එකාග්‍රතාව බලවත්වූත් වවෙත්ය
විදගිනා වඩන්නා හට ප්‍රඥව බලවත්
නල්ති මෙහෙතම ලක්ෂණ ප්‍රතිවෙධයට
පැමිණෙණනාබැවින් ප්‍රඥව බලවත්වූත්
වවෙත්ය මෙසමාධි ප්‍රඥ දෙදෙනාගේ
සම බැවිහුද අපිණා සමාධිය වන්
මෙහේය සමාධිය හැකුලුනාවූ මෙහි ච
ඥවලවූහෝ සියළුපෙක්ෂාපක්ෂයන් කො
රෙතිම බලවත්වූත් වවෙත්ය ඒ එසේ
මැයි සමාධිය උඩහ පක්ෂයෙයි සිටියා
වූ ශ්‍රද්ධා වීය්‍ර්‍ය ප්‍රඥවන්ගේ වශයෙන්
සිත උඩවව්වෙයි කිංවෙද්ද කුසිතයට
පක්ෂවූ සමාධිය එයින් කුසිතයෙහි හි
මෙන්ද රක්නේය එහෙයින් ස්ය
බ්‍රෑාද්ධනාහයෙහි යෙදියයුතු ලුණු හා
මෙහෙල් ඊමෙන්ද සියළු රාජ කාර්‍ය්‍යයෙ
හි නියුක්ත අමාත්‍යයා මෙන්ද සමාධිය
හැමතැනම කැමතිවිය යුත්තේය එහෙ
යින් කීසේමැනෙනි අටුවාවෙයි භගව
තුනු විසිනුදු සමාධිය හැමතැනම ඇ
විය යුත්තැයි වදරණලද්දීය කාව
ර හෙයකින්දයත්? කුසල චිත්තය
තමා සමාධිය පිහිටකොට ඇත්තේය
ඍනාපැමිණෙණලද විශෙෂාධිගමයට
පැමිණීමද සමාධියම පිහිටකොට ඇ
ත්තේමැයි සමාධිය සෙසු කුසල ධම්
යන් ආරක්ෂාකිරීම උදවකිමකොට ඇ
ත්තේය සමාධියෙන් මේ ගට චිත්තයා
ගේ සංග්‍රහයද නිග්‍රහයද කොටවත්
තේමැයි—

---

( ෂා † )

නිමිත්ත කොසල්ලං නාම පඨවි
කසිණාදිකස්ස චිත්තෙකග්ගතා නිමි
ත්තස්ස අකතස්ස කරණ කොසල්ලං
කතස්ස භාවනා කොසල්ලං භාවනා
ය ලද්ධස්ස රක්ඛණ කොසල්ලඤ්ච තං
ඉධ අධිප්පෙතං — කථඤ්ච යස්මිං
සමයෙ චිත්තං පග්ගහෙතබ්බං තස්මිං
සමයෙ චිත්තං පග්ගණ්හාති යදාස්ස
අතිසිථිල විරියතාදීහි ලීනං චිත්තං
හොති තදා පස්සද්ධි සම්බොජ්ඣඞ්ගාද
යො තයො අභාවෙත්වා ධම්මවිචය සම්
බොජ්ඣඞ්ගාදයො තයො භාවෙති වු
ත්තං හෙතං භගවතා — සෙය්‍යථාපි
භික්ඛවෙ පුරිසො පරිත්තං අග්ගිං
උජ්ජාලෙතුකාමො අස්ස සො තත්‍ර අල්
ලානි චෙව තිණානි පක්ඛිපෙය්‍ය අල්
ලානි ච ගොමයානි පක්ඛිපෙය්‍ය අල්ලා
නි ච කට්ඨානි පක්ඛිපෙය්‍ය උදක වාත
ඤ්ච දදෙය්‍ය පංසුකෙන ච ඔකිරෙ
ය්‍ය භබ්බො නු ඛො සො භික්ඛවෙ පුරි
සො තං පරිත්තං අග්ගිං උජ්ජාලෙතු
න්ති නො හෙතං භන්තෙ එවමෙව
ඛො භික්ඛවෙ යස්මිං සමයෙ ලීනං
චිත්තං හොති අකාලො තස්මිං සම
යෙ පස්සද්ධි සම්බොජ්ඣඞ්ගස්ස භාවනා
ය අකාලො සමාධි — පෙ — අකා
ලො උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගස්ස භා
වනාය තං කිස්ස හෙතු ලීනං භික්ඛ
වෙ චිත්තං තං එතෙහි ධම්මෙහි දුස්ස
මුට්ඨාපයං හොති යස්මිඤ්ච ඛො
භික්ඛවෙ සමයෙ ලීනං චිත්තං හොති
කාලො තස්මිං සමයෙ ධම්මවිචය සම්
බොජ්ඣඞ්ගස්ස භාවනාය කාලො
— පෙ — විරිය — පෙ — කාලො පී
තිසම්බොජ්ඣඞ්ගස්ස භාවනාය තං
කිස්ස හෙතු ලීනං භික්ඛවෙ චිත්තං
තං එතෙහි ධම්මෙහි සුසමුට්ඨාපයං
හොති — සෙය්‍යථාපි භික්ඛවෙ පුරිසො
පරිත්තං අග්ගිං උජ්ජාලෙතුකාමො අ
ස්ස සො තත්‍ර සුක්ඛානි චෙව තිණානි
පක්ඛිපෙය්‍ය සුක්ඛානි ච ගොමයානි ප
ක්ඛිපෙය්‍ය සුක්ඛානි ච කට්ඨානි පක්ඛි
පෙය්‍ය මුඛවාතඤ්ච දදෙය්‍ය න ච පංසු
කෙන ඔකිරෙය්‍ය භබ්බො නු ඛො සො
භික්ඛවෙ පුරිසො තං පරිත්තං අග්ගිං
උජ්ජාලෙතුන්ති එවං භන්තෙති—

( ස † )

නිමිත්ත කොසල්ලං නාම, නිමිත්ත කෞශල්‍ය නම්, පඨවිකසිණාදිකස්ස, පෘථිවි කසුණු ආදිවූ; චිත්තෙකග්ගතා නිමිත්තස්ස, සිත් එකග බවට කාරණවූ කසුණු නිමිත්හු; අකතස්ස, නොඋපදවන ලද්දහුගේ; කාරණ කොසල්ලං, ඉපදවීමෙහි දක්ෂ බව; කතස්ස, උපදවනලද්දහුගේ; භාවනා කොසල්ලං, භාවනාවෙහි දක්ෂ බව; භාවනාය ලද්ධස්ස, භාවනාවෙන් ලද්දහුගේ; රක්ඛණකොසල්ලඤ්ච, රක්ෂණයෙහි දක්ෂ බවති; තං, ඒ රක්ෂණ කෞශල්‍යය; ඉධ, මේ අප්පණා කෞශල්‍ය කථාවෙහි; අධිප්පෙතං (නිමිත්ත කෞශල්‍යයයි) අභිමතයි (සිත්හුගේ සමාහිත ආකාරය සලකා සමථ නිමිත් රක්නාහුම කසුණු නිමිත් රක්නා බැවින් "පඨවිකසිණාදිකස්ස" යන තැන ආදි ශබ්දයෙන් කෙවල ප්‍රතිභාග නිමිත්තාම නොව සමථ නිමිත්හුගේ ග්‍රහණයද දතයුතු: මේ අර්ථයෙහි "චිත්තෙකග්ගතා නිමිත්තස්ස" යන තැන "චිත්තෙකග්ගතා සඞ්ඛාතස්ස නිමිත්තස්ස"යි අර්ථ ගතයුතු) කථඤ්ච ~පෙ~ යද, කිම්කලෙක; අස්ස, මේ යෝගීහුගේ; චිත්තං, භාවනා සිත තෙමේ; අතිසිථිල වීරියතාදීහි, අතිසිථිල වීර්‍ය්‍ය ඇති බව යනාදීන්; ලීනං හොති, හැකිළෙන්නේවේද (ආදි ශබ්දයෙන් සධ්‍යාපන විනිශ්‍රි බැව ගණින් යතු මෙහෙත සත්නාසී ටීකාචාරීන් මේ "පමොදනා සංවෙදනා විපරියෙස සංගණ්හාති"යි කීහු) තද, එවිලෙහි; පස්සද්ධි සම්බොජ්ඣඞ්ගාදයො තයො, පස්සද්ධි සම්බොජ්ඣඞ්ගාදී තුන්දෙන; අභාවෙතබ්බා, නොවඩා; ධම්මවිචය සම්බොජ්ඣඞ්ගාදයො තයො භාවෙති, ධම්මවිචය සම්බොජ්ඣඞ්ගාදී තුන්දෙන වඩන්නේයි; භගවතා, භගවත්හු විසින්; එතං, මේ; වුත්තංහි, වදාළේමය; භික්ඛවෙ, මහණෙනි; පුරිසො, පුරුෂ තෙමේ; සෙය්‍යථාපි, යම්සේ; පරිත්තං අග්ගිං, මදවූ ගින්න; උජ්ජාලෙතුකාමො අස්ස, දල්වනු කැමතිවේද; සො, තෙතෙමේ; තත්‍ර, ඒ මදගින්නෙහි; අල්ලානි චෙව තිණානි පක්ඛිපෙය්‍ය, අලුත් තණ බහාලන්නේද; අල්ලානි චෙව ගොමයානි පක්ඛිපෙය්‍ය, අළුත් ගොම බහාලන්නේද; අල්ලානි චෙව කට්ඨානි පක්ඛිපෙය්‍ය, අලුත් දර බහාලන්නේද; උදකවාතඤ්ච දදෙය්‍ය, දියමුසු වාතය දෙන්නේද; පංසුකෙනච ඔකිරෙය්‍ය, පස් ඕන්නේද; භික්ඛවෙ, මහණෙනි; සො පුරිසො, ඒ පුරුෂ තෙමේ; තං පරිත්තං අග්ගිං, ඒ මදගින්න; උජ්ජාලෙතුං, දල්වන්නට; භබ්බො නුඛොති, පොහොසද්දනු (ප්‍රබලවින්හු) නො හෙතං භන්තෙ, වහන්ස නොපොහොසතැයි (ප්‍රතිවචන දුන්හු) භික්ඛවෙ, මහණෙනි; එවමෙවඛො, එපරිද්දෙන්මි; යස්මිං සමයෙ ලීනං චිත්තං හොති, යම් සමයෙක්හි සිත හැකුළෙන්නේවේද; තස්මිං සමයෙ, එසමයෙහි; පස්සද්ධි සම්බොජ්ඣඞ්ගස්ස, ප්‍රශ්‍රබ්ධි සම්බොධ්‍යඞ්ගයාගේ; භාවනාය, වැඩීමට; අකාලො, නොකල; අකාලො ~පෙ~ තා සිස්සතොතු, එයට කාරණ කිම? භික්ඛවෙ, මහණෙනි; චිත්තං, සිත; ලීනං, හැකුළුණේද; තං, එය; එතෙහි ධම්මෙහි, ප්‍රශ්‍රබ්ධි සමාධි උපෙක්ෂා සම්බොධ්‍යඞ්ග යන මේ ධර්මයන්; දුස්සමුට්ඨාපයං හොති, නැගන්නට නොපිළිවන්වේ; භික්ඛවෙ, මහණෙනි; යස්මිං සමයෙ, යම් සමයෙක; චිත්තං, සිත; ලීනං හොති, ලීනවේද තස්මිං සමයෙ, එසමයෙහි; ධම්මවිචය සම්බොජ්ඣඞ්ගස්ස, ධර්මවිචය සම්බොධ්‍යඞ්ගයාගේ; භාවනාය, වැඩීමට;

සාහලා, හල; විරිය...පෙ...එතෙහි
ධම්මෙහි, මේ ධර්මවිචය ප්‍රීති වීර්‍ය්‍ය සම්
බොජ්ඣඞ්ග ධර්මයෙන්; සුසමුට්ඨාපයං
හොන්ති, සුපිසේ නැගුටුවිය හැකිවේ;
සෙය්‍යථාපි...පෙ...සුක්ඛානි චෙව ති
ණානි පක්ඛිපෙය්‍ය, වියලි තණ බහාල
න්නේද; සුක්ඛානි චෙව ගොමයානි ප
ක්ඛිපෙය්‍ය, වියලි ගොම බහාලන්නේ
ද; සුක්ඛානිචෙව කට්ඨානි පක්ඛිපෙ
ය්‍ය, වියලි දර බහාලන්නේද; මුඛවා
තඤ්ච දදෙය්‍ය, මුවෙන් සුලං ඕනේ
ද; නච පංසුකේන ඔකිරෙය්‍ය, නොද
පස් ඔනේද; භික්ඛවෙ, මහණෙනි;
සො පුරිසො, ඒ පුරුෂ තෙමේ; තං
පරිත්තං අග්ගිං උජ්ජාලෙතුං, ඒ මද
ගිනි දල්වන්නට; භබ්බොනුඛො,
හැක්කේද කීනු; එවම්භන්තෙති, වහන්ස
එසේයයි (ප්‍රතිවචන දුන්හු)...

( හා † )

නිමිත්ත කෞශල්‍යය නම් පොට්
පදවනලද පැමිරි සාසිණාදිවූ සින් එ
කග බවට කාරණවූ කසිණ නිමිත්තය
න් නූපදවීමෙහි දක්ෂ බවය උපදවනල
ද කසිණ නිමිත්තයන් වැඩීමෙහි දක්ෂ
බවය භාවනා වශයෙන් ලද නිමිත්ත
ආරක්ෂාකිරීමෙහි දක්ෂ බවය යනමේ
ත්‍රිවිධාකාර දක්ෂ බවයි මේ අර්ථ
කොසල්ලන් කථාවෙහි වතාහි ඒ රක්ෂ
ණ කෞශල්‍යයම නිමිත්ත කෞශල්‍ය
වශයෙන් කැමතිවියයුත්තේයි. තේ
කොතේදයත්? යස්මිංසමයෙ සිත භාව
නා වශයෙන් වැඩිය යුතුද එසමයෙ
හි සිත පසින්නෙන්ය යස්මිංසමයෙ මේ
මනාගාවචරයාගේ භාවනා සිත ඉතා
ලිහිල් වීර්‍ය්‍යාදියෙන් හැකිලෙන්නේ
වේද එකල ප්‍රශ්‍රබ්ධි ආදී බොධ්‍යඞ්ග
යන් නූපදවා පොවැඩ ධම්ම්විචයාදී
බොධ්‍යඞ්ගයෙ නූපදවා වැඩියයුත්
සොසී භාගවතුන්ගු විසිනුද මේ වදාර
ණ ලදුයේ මහණෙනි යම් පුරුෂ
යෙක් තෙමේ යම්සේ ස්වල්පවූ ගින්නක්
දල්වනු කැමැත්තේද ඒ පුරුෂ තෙ
මේ ඒ මද ගිනෙහිහි අමුත් තණපත්
බහාලන්නේද අමුත් ගොම බහාලන්
නේද අමුත් දර බහාලන්නේද දියමු
සු වාතය දෙන්නේද පස් ඉසින්නේ
වේද මහණෙනි ඒ පුරුෂතෙම ඒ මද
ගින්න දල්වන්නට පොහොසත්වේ
දැයි එවිට වදාල්ල භික්ෂුහුද ස්වාමීන්
වහන්ස පොහොසත් නොවන්නේයයි
ප්‍රතිවචන දුන්නාහුය මහණෙනි එප
රිද්දෙන්ම යම් සමයෙක්හි සිත හැකු
ළුනේවේද එසමයෙහි ප්‍රශ්‍රබ්ධි සම්බෝ
ධ්‍යඞ්ගයද සමාධි සම්බොධ්‍යඞ්ගයද උ
පෙක්ෂා සම්බොධ්‍යඞ්ගයද වැඩීමට සුදුසු
කල් නොවන්නේය ඊට කාරණා කව
රයත්? මහණෙනි එසමයෙහි සිත හැ
කුළුනේවේයි ඒ හැකුළුනාවූ සිත මේ
ප්‍රශ්‍රබ්ධි සමාධි උපෙක්ෂා යන සම්බො
ධ්‍යඞ්ගයන්කරණකොටගෙණ නඟා සි
ටුවාලිය නොහැකි වන්නේයයි වදාළ
සේක...

( පා ‡ )

එත්ථ යථාසකං ආහාරවසෙන ධම්ම
විචය සම්බොජ්ඣඞ්ගාදීනං භාවනා
වෙදිතබ්බා වුත්තං හෙතං...අත්ථි භි
ක්ඛවෙ කුසලාකුසලා ධම්මා සාවජ්ජා
නවජ්ජා ධම්මා හීනප්පණීතා ධම්මා
කණ්හසුක්කසප්පටිභාගා ධම්මා තත්ථ
යොනිසොමනසිකාර බහුලීකාරො
අයමාහාරො අනුප්පන්නස්සවා ධම්ම
විචය සම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය
උප්පන්නස්සවා ධම්මවිචය සම්බො
ජ්ඣඞ්ගස්ස භීය්‍යොභාවාය වෙපුල්ලා
ය භාවනාය පාරිපූරියා සංවත්තතීති
...තථා අත්ථි භික්ඛවෙ ආරම්භධාතු
නික්කමධාතු පරක්කමධාතු තත්ථ
යොනිසොමනසිකාර බහුලීකාරො අ
යමාහාරො අනුප්පන්නස්සවා විරිය ස
ම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය උප්පන්නස්ස

ස්ස වා විරියසම්බොජ්ඣඞ්ගස්ස භිය්‍යො
භාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූ
රියා සංවත්තතී'ති—තථා අත්ථි
භික්ඛවෙ පීතිසම්බොජ්ඣඞ්ගට්ඨානියා
ධම්මා තත්ථ යොනිසොමනසිකාර බහු
ලීකාරො අයමාහාරො අනුප්පන්නස්ස
වා පීතිසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය
උප්පන්නස්ස වා පීතිසම්බොජ්ඣඞ්ගස්ස
භිය්‍යොභාවාය වෙපුල්ලාය භාවනාය
පාරිපූරියා සංවත්තතී'ති—තත්ථ ස
භාව සාමඤ්ඤලක්ඛණ පටිවෙධවසෙ
න පවත්තමනසිකාරො කුසලාදීසු
යොනිසොමනසිකාරො නාම ආරම්භ
ධාතු ආදීනං උප්පාදන වසෙන පව
ත්තමනසිකාරො ආරම්භධාතු ආදීසු
යොනිසොමනසිකාරො නාම තත්ථ
ආරම්භධාතූති පඨමවීරියං වුච්චති
නික්කමධාතූති කොසජ්ජතො නික්ඛ
න්තත්තා තතො බලවතරං පරම්ප
රංඨානං අක්කමනතො තතොපි
බලවතරං—පීතිසම්බොජ්ඣඞ්ගට්ඨා
නියා ධම්මාති පන පීතියා එවෙතං
නාමං තස්සාපි උප්පාදකමනසිකාරො
යොනිසොමනසිකාරො නාම—

---

( ස ‡ )

එහිදු, මෙහිදු; යථාසකං ආහාර
වසෙන, තම තමන්ගේ ප්‍රත්‍යයවශ
යෙන්; ධම්මවිචය සම්බොජ්ඣඞ්ගා
දීනං භාවනා, ධර්මවිචය සම්බොධ්‍ය
ඞ්ගාදීන්ගේ (උත්පාදවෘද්ධි සඞ්ඛ්‍යාත)
භාවනා තොමෝ; වෙදිතබ්බා, දතයු
තානිසි; වුත්තං හෙතං, වදාළේමැයි;
භික්ඛවෙ, මහණෙනි; කුසලා කුසලා
ධම්මා, කුශලාකුශල ධර්මයෝ; සාවජ්ජා
නවජ්ජා ධම්මා, සාවද්‍යානවද්‍ය ධර්ම
යෝ; හීනප්පණීතා ධම්මා, හීනප්‍රණී
තධර්මයෝ; කණ්හසුක්ක සප්පටිභාගා
ධම්මා, කෘෂ්ණශුක්ල සප්‍රතිභාග ධර්ම
යෝ; අත්ථි, ඇති (මෙහි කොශලාස ම්

ඥාතාර්ථයෙන් කුශලයෝයි—කුශල
හුක ප්‍රතිපක්ෂහෙයින් අකුශලයෝයි
උක්තලක්ෂණ අකුශලයෝම සාවද්‍
යහ කුසලයෝ අනවද්‍යයෝයි එසේ
අකුසලයෝ හීනයෝයි කුසලයෝ
ප්‍රණීතයෝයි නොහොත් කුසලයෝ
හීනච්ඡන්දාදීන් ප්‍රවෘත්ත ආරබ්ධයෝ
හීනයහ සෙසෙයෝ ප්‍රණීතයෝයි—
අන්‍යෝන්‍ය ප්‍රතිපක්ෂ කුශලා කුශල
ධර්මයෝ කෘෂ්ණ ශුක්ල සප්‍රතිභාග
ර්මනම් එසේ නොහොත් "කණ්හා
සුක්කාච සප්පටිභාගා ච කණ්හසුක්කා
සප්පටිභාගා" යි—කෘෂ්ණශුක්ලධර්
යන් වෙන්නොවගෙණ සුඛවේදන
දුක්ඛවේදනාවට ප්‍රතිපක්ෂහෙයින්
සප්‍රතිභාගය දුඃඛවේදනා සුඛවේ
නාවට පිළිපක්හෙයින් සප්‍රතිභාගය
අණිගතයුතු.)

තත්‍ර, ඒ ධර්මයන් කෙරෙහි; යො
සොමනසිකාර බහුලීකාරො, යො
සොමනස්කාරයාගේ යම් බොහො
කිරීමෙක් ඇද්ද; අයමාහාරො, මේ
ආහාරයතෙම්; අනුප්පන්නස්ස
ධම්මවිචය සම්බොජ්ඣඞ්ගස්ස, නූ
උපන්නෙහෝ ධර්මවිචය සම්බොධ්‍ය
ඞ්ගයාගේ; උප්පාදාය, උත්පාදන
පිණිස; උප්පන්නස්ස වා ධම්මවිච
සම්බොජ්ඣඞ්ගස්ස, උපන්නෙහෝ ධ
විචය සම්බොධ්‍යඞ්ගයාගේ, භිය්‍යො
භාවාය, නැවත නැවත වීමපිණි
වෙපුල්ලාය, විපුලබවපිණිස; භාව
ය, වැඩියපිණිස; පාරිපූරියා, පරිපූර්ණ
වන පිණිස, සංවත්තති, පවතී; තථ
එසේම; ආරම්භධාතු, ආරම්භ
ප්‍රවෘත්තවීර්‍ය්‍යය; නික්කමධාතු, කො
ද්‍යයෙන් නික්මුණු බලවත්වීර්‍ය්‍යය;
රක්කමධාතු, මත්තාලයන ඉතා බ
ත්වීර්‍ය්‍යය; තත්‍ර, ඒ ආරම්භධාතු
යෙහි; පීතිසම්බොජ්ඣඞ්ගට්ඨානි
ධම්මා, ප්‍රීතිසම්බොධ්‍යඞ්ගස්ථානීය
ර්මයෝ (සෙසුපදෙහි අර්ථ ප්‍ර

රයෙහි කීනයින් දත යුතු) තවද "අජ්ඣ
ණිතබ්බමෙව" යනාදින් දක්වනලද පාඨ
යෙහි; සභාවසාමඤ්ඤලක්ඛණ පටි
වේධවසෙන (කුසලාදීන්ගේ අනවජ්ජ
සුඛ විපාකාදිය ස්පර්ශාදීන්ගේ ප්‍රස
නාදිය යන)සවභාව ලක්ෂණයාගේ හා
අනිත්‍යාදි සාමාන්‍ය ලක්ෂණයාගේද
ප්‍රතිවේධවශයෙන්; පවත්ත මනසිකා
රෙ, ප්‍රවෘත්ත මනසකාරය තෙමේ
(කුසලාදීන්ගේ ඒ ඒ සවභාවලක්ෂණා
දීන්ගේ තත්‍වාවබෝධවශයෙන් උපන්
ජවන චිත්තොත්පාදම අවිපරිතමන
සකාරබැවින් යොනිසොමනසකාර
යයි කියනලදී) කුසලාදීහු යෝනි
සොමනසිකාරෙ නාම, කුසලාදීන්
කෙරෙහි යොනිසොමනසකාරනම;
ආරම්භධාතු ආදීනං, ආරබ්ධධාතුආදි
න්ගේ; උප්පාදවසෙන පවත්තමන
සිකාරෙ, උප්පාදවශයෙන් ප්‍රවෘත්ත
මනසකාරය, ආරම්භධාතු ආදීසු
යොනිසොමනසිකාරො නාම, ආර
බ්ධධාන්වාදීන්කෙරෙහි යොනි සොම
නසකාරනම; තවද, ඒ ආරබ්ධධාන්
වාදීන්කෙරෙහි; ආරම්භධාතුති, ආර
ම්භධාතුනාම; පඨමවිරියං වුච්චති, ප්‍රථ
මවීය්‍ය්‍ය කියනලදී (කුශලක්‍රියාවෙහි
ආරම්භවශයෙන් ප්‍රවෘත්තවීය්‍ය්‍ය
ධෘතිස්වභාව බැවින් ධාතුනම වෙයි
"ආරම්භධාතුති පඨමවිරියං වුච්චති" යි
කීහු) නික්කමධාතුති, නික්කමධාතු
යයි; කොසජ්ජතො නික්ඛන්තතා,
කෞසීද්‍යයෙන් නික්මුන බැවින්; ත
තොබලවතරං, ආරබ්ධධාතුවට වඩා
අතිශයින් බලවත්වූ වීය්‍ය්‍ය ("වුච්චති"
යි සම්බන්ධකරණු) පරක්කමධාතුති
පරක්කමධාතුයයි, පරම්පරට්ඨානං
අක්කමනතො, මතුමත්තට යනහෙ
යින්; තතොපි බලවතරං, නික්කම
ධාතුවටද වඩා අතිශයින්ම බලවත
වූවීය්‍ය්‍ය කියනලදී; පීතිසම්බො
ජ්ඣඞ්ගට්ඨානියා ධම්මාති, ප්‍රීති
සම්බොධ්‍යඞ්ගස්ථානීය ධර්‍මය හා
පීතියා එවෙතං නාමං, ප්‍රීතියටම නම
("ගිට්ඨිපවත්තති ඵස්සාහි ඨානියා
පීතිසම්බොජ්ඣඞ්ගස්ස ඨානියා පීති
සම්බොජ්ඣඞ්ගට්ඨානියා"— ඨාතබ්බා
වා ඨානියො, පීතිසම්බොජ්ඣඞ්ගො
ඨානියො එතෙසූති පීතිසම්බොජ්ඣ
ඞ්ගට්ඨානියා අපරාපරං පවත්තමානා
පීතිසම්බොජ්ඣඞ්ගසම්පයුත්තා ධම්මා
යස්මා පන තෙසු පීතියෙව පීතිසම්
බොජ්ඣඞ්ගස්ස විසෙසකාරණං තස්මා
වුත්තං පීතියා එවෙතං නාමන්ති)
තස්සාපි, ඒ ප්‍රීතියගේද; උප්පාදක මන
සිකාරෙ, උපදවන මනසකාරය (යම්
සේ මෙනෙහිකරණුවහට නොඋපන්
ප්‍රීතිසම්බොධ්‍යඞ්ගය උපදීද උපන්නේ
වඩීද එසේ පවත්නා මනසකාරය යන
අර්ථයි) යොනිසො මනසිකාරො නාම,
යොනිසොමනසකාරනම—

( හා ‡ )

තවද මහණෙනි යම්කලෙක සිත
හැකුළුනේවේද එසමයෙහි ධර්‍මවිචය
සම්බොධ්‍යඞ්ගය ප්‍රීතිසම්බොධ්‍යඞ්ගය
වීය්‍ය්‍යසම්බොධ්‍යඞ්ගය යන මොවුන්
වැඩීමට කල්‍යන්නේය ඊට කාරණා
කවරේදයත් ? මහණෙනි හැකුළුනාවූ
සිත මේ ධර්‍මවිචය ප්‍රීතිවීය්‍ය්‍ය බොධ්‍යඞ්ග
යන් කරණකොටගෙණ සුවසේ ප්‍රබො
ධකොට නගා සිටුවාලියහැක්කේය
මහණෙනි යම්සේ යම් පුරුෂයෙක්
සවල්පවූ ගින්නක් මහත්කොට දල්වනු
කැමතිවී නම් ඒ පුරුෂතෙම සවල්පවූ
ගින්නෙහි වියලිතණ බහාලන්නේද
වියලිගොම බහාලන්නේද වියලිදර
බහාලන්නේද මුඛයෙන් සුලං පිඹි
නේද පස්නොවිසුරුවාද මහණෙනි
ඒ පුරුෂතෙම ඒ මදගින්න මහත්
කොට දල්වීමෙහි පොහොසත්වන්නේ

දූසි විචාළහ ඒ භික්ෂූහු එසේය වහන්සැයි ප්‍රතිවචන දුන්නාහුය.

මෙහිදු තම තමන්ගේ ප්‍රත්‍යය වශයෙන් ධර්මවිචයසම්බොධ්‍යඞ්ගාදීන්ගේ ඉපදවීම් වැඩීම් ඩීනය කිරීම සඞ්ඛ්‍යාතවූ භාවනා විශෙෂයම දතයුතුයි. භාග්‍යවත්හු විසිනුදු මේ වදාරණ ලදුයේමැයි. මහණෙනි දක්ෂබව උපදවන අර්ථයෙන් කුසල් නම්වූද ඒ කුසලහෙතුන්ට විරුද්ධ හෙයින් අකුසල් නම්වූද එහෙයින්ම සාවද්‍ය අනවද්‍යවූද හීනප්‍රණීතවූද දුක්විපාක හා සැපවිපාක දෙන අර්ථයෙන් කෘෂ්ණ ශුක්ලවූද ඔවුනොවුන්ට විරුද්ධවූද යම් ධර්මකෙණෙක් ඇත්තාහුද ඒ ධර්මයන් අතුරෙන් කුශල සඞ්ඛ්‍යාතවූ නූපන්නාවූ ධර්මවිචය සම්බොධ්‍යඞ්ගය ඉපදවීමපිණිස හෝ උපන් ධර්මවිචය සම්බොධ්‍යඞ්ගය නැවත නැවත හටගැණීම පිණිස හෝ මහත්බව පිණිස හෝ වැඩීමපිණිස හෝ සම්පූර්ණවීම පිණිස හෝ යොනිසො මනසකාරය බහුලකිරීම ප්‍රත්‍යයවශයෙන් පවත්නේය එසේම මහණෙනි කුශලක්‍රියාවෙහි පළමු පටන්ගැණීම්වශයෙන් පැවැති වීර්‍ය්‍යසඞ්ඛ්‍යාත ආරම්භ ධාතු නම්වූ යම් ප්‍රථමවීර්‍ය්‍යයෙක් ඇත්තේවේද එයින් ලබනලද ආසෙවන ප්‍රත්‍යය ඇතිව බලප්‍රාප්තව විරුද්ධධර්මයන් නසමින් කුසීතබවෙන් නික්මෙන අර්ථයෙන් නික්කමධාතුයයි කියනලද යම් මධ්‍යමවීර්‍ය්‍යයෙක් ඇත්තේවේද අනික් අනික් තැනකට පැමිණ ප්‍රතිපක්ෂධර්මයන් නසන අර්ථයෙන් පරක්කමධාතුයයි කියනලද යම් අධිකවීර්‍ය්‍යයෙක් ඇත්තේවේද මහණෙනි ඒ ත්‍රිවිධවීර්‍ය්‍යසඞ්ඛ්‍යාතවූ නූපන්නාවූ වීර්‍ය්‍යසම්බොධ්‍යඞ්ගය ඉපදවීම පිණිස හෝ උපන්නාවූ වීර්‍ය්‍යසම්බොධ්‍යඞ්ගය නැවත නැවත හටගැණීම පිණිස හෝ මහත්බව පිණිස හෝ වැඩීමපිණිස හෝ සම්පූර්ණවීම පිණිස හෝ යොනිසොමනසකාර බහුලකිරීම ප්‍රත්‍යයවශයෙන් පවත්නේය එසේම මහණෙනි ප්‍රීතිසම්බොධ්‍යඞ්ගස්ථානිකවූ යම් ධර්මකෙණෙක් ඇත්තාහුවේද්ද ඒ ධර්මඅතුරෙන් නූපන්නාවූ ප්‍රීතිසම්බොධ්‍යඞ්ගය ඉපදවීම පිණිස හෝ උපන්නාවූ ප්‍රීතිසම්බොධ්‍යඞ්ගය නැවත නැවත හටගැණීමපිණිස හෝ මහත්බව පිණිස හෝ වැඩීම පිණිස හෝ සම්පූර්ණබව පිණිස හෝ යොනිසොමනසකාරය බහුලකිරීම ප්‍රත්‍යයවශයෙන් පවත්නේය. ඒ දක්වන ලද දෙශනාපාලියෙහි කුසලාදීන්ගේ අනවද්‍ය සුඛවිපාකාදිවශයෙන් හෝ ස්පර්ශ චෛතසිකාදීන්ගේ අරමුණට වැදගැනීම් ආදිවශයෙන් හෝ පැවති ස්වභාවලක්ෂණ හා ඒ සියලු ධර්මයන්ගේ අනිත්‍ය දුඃඛ අනාත්ම වශයෙන් පැවති සාමාන්‍යලක්ෂණයද ප්‍රතිවෙධ කිරීම්වශයෙන් උපන් ජවන චිත්තොත්පාදයම කුසලාදියෙහි පැවති යොනිසොමනසකාරනාම ආරම්භධාතු ආදීන් ඉපදීම්වශයෙන් පැවැති මනසකාරය ආරම්භධාතු ආදියෙහි පැවති යොනිසොමනසකාරනාම ඒ ආරම්භධාතු ආදීන් කෙසෙරන් කුශලක්‍රියාවෙහි පළමු පටන්ගැණීම්වශයෙන් පැවැති වීර්‍ය්‍යය ධෛර්‍ය්‍යවත් ස්වභාව ඇතිබැවින් ආරම්භධාතුනම ඒ ආරම්භධාතුවට වඩා අතිශයින් බලවත්වූ වීර්‍ය්‍ය කම්මැලිස්වභාවෙන් නික්මුණු බැවින් නික්කමධාතු නම ඒ නික්කමධාතුවටද වඩා අතිශයින් බලවත්වූ වීර්‍ය්‍යය මතුමතුයෙහි අනික් අනික් තැනකට යනහෙයින් පරක්කමධාතු නම ප්‍රීති නම ප්‍රීති සම්බොධ්‍යඞ්ගස්ථානිය ධර්ම නම යම්සේ මෙනෙහිකරන්නාහට නූපන් ප්‍රීතිසම්බොධ්‍යඞ්ගය උපදීද උපන් ප්‍රීතිසම්බොධ්‍යඞ්ගය වඩීද

එසේ මෙනෙහිකිරීම හෙවත් ප්‍රීතිය උපදවන මනසිකාරයම යොනිසොමනසිකාරනම්වන්නේයි ~

( 4 පා ¶ )

අපිච සත්තධම්මා ධම්මවිචය සම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය සංවත්තන්ති පරිපුච්ඡකතා වත්ථුවිසදකිරියතා ඉන්ද්‍රිය සමත්ත පටිපාදනා දුප්පඤ්ඤපුග්ගලපරිවජ්ජනා පඤ්ඤවන්ත පුග්ගල සෙවනා ගම්භීරඤාණචරියපච්චවෙක්ඛණා තදධිමුත්තතාති ~ එකාදස ධම්මා විරියසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය සංවත්තන්ති අපායාදි භයපච්චවෙක්ඛණතා විරියායත්තලොකිය ලොකුත්තර විසෙසාධිගමානිසංස දස්සිතා බුද්ධ පච්චෙකබුද්ධමහාසාවකෙහි ගතමග්ගො මයා ගන්තබ්බො සොපි න සක්කා කුසීතෙන ගන්තුන්ති එවං ගමන වීථිපච්චවෙක්ඛණතා දායකානං මහප්ඵලකාරතාය පිණ්ඩාපචායනතා විරියාරම්භස්ස වණ්ණවාදී මෙ සත්ථා සො ච අනතික්කමනීයසාසනො අම්හාකඤ්ච බහූපකාරො පටිපත්තියා ච පූජියමානො පූජිතො හොති න ඉතරථාති එවං සත්ථුමහත්ත පච්චවෙක්ඛණතා සද්ධම්මසඞ්ඛාතං මෙ මහාදායජ්ජං ගහෙතබ්බං න ච සක්කා කුසීතෙන ගහෙතුන්ති එවං දායජ්ජමහත්තපච්චවෙක්ඛණතා ආලොකසඤ්ඤා මනසිකාර ඉරියාපථපරිවත්තන අබ්භොකාස සෙවනාදීහි ථිනමිද්ධවිනොදනතා කුසීතපුග්ගල පරිවජ්ජනතා ආරද්ධවිරියපුග්ගලසෙවනතා සම්මප්පධානපච්චවෙක්ඛණතා තදධිමුත්තතාති ~ එකාදස ධම්මා පීති සම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය සංවත්තන්ති ~ බුද්ධානුස්සති ධම්මසඞ්ඝසීලචාගදෙවතානුස්සති උපසමානුස්සති ලූඛපුග්ගල පරිවජ්ජනතා සිනිද්ධපුග්ගල සෙවනතා පසාදනීය සුත්තන්තපච්චවෙක්ඛණතා තදධිමුත්තතාති ~ ඉති ඉමෙහි ආකාරෙහි එතෙ ධම්මෙ උප්පාදෙන්තො ධම්මවිචය සම්බොජ්ඣඞ්ගාදයො භාවෙති නාම එවං යස්මිං සමයෙ චිත්තං පග්ගහෙතබ්බං තස්මිං සමයෙ චිත්තං පග්ගණ්හාති ~

( ස ¶ )

[ * අපිච, වැලි එකෙක් ඇත; ධම්මවිචය සම්බොජ්ඣඞ්ගස්ස, ධර්මවිචයසම්බොධ්‍යඞ්ගයාගේ; උප්පාදාය, ඉපදවීම පිණිස; සත්තධම්මා, ධර්මයෝ සත්දෙනෙක්; සංවත්තන්ති; පවතිත්, පරිපුච්ඡකතා, හාත්පසින්බැස විචාරණබවය (පස්මහසඟිය ඉගෙණද ආචාර්‍යයන් සෙවනයකොට ඒ ඒ පදයාගේ අර්ථය විචාරන්නහුටද අට්ඨවාසතින පකරණිකාය හෝ ඉගෙණ යම් යම් ග්‍රන්ථිස්ථාන ඇත්නම් ඒ ඒ ස්ථාන වහන්ස මේ පදය කෙසේද? මේ පදයාගේ අර්ථකවරේදැයි? විචාරන්නාහටද ධර්මවිචය සම්බොධ්‍යඞ්ගය උපදී යනාර්ථයි) වත්ථුවිසදකිරියතා, අධ්‍යාත්මික බාහ්‍යවස්තූන්ගේ නිර්මල බව කිරීමය; ඉන්ද්‍රිය සමත්තපටිපාදනා, ඉඳුරන්ගේ සමබව පිළියෙළකිරීමය; දුප්පඤ්ඤපුග්ගල පරිවජ්ජනා, දුෂ්ප්‍රාඥපුග්ගලන් දුරුකිරීමය (බන්දම තලද කවුඩන් මස්දමනලද සුනඛයන්මෙන් මොහයෙන්මුළාවූ සත්වයන් දුරින් දුරුකිරීම දුෂ්ප්‍රාඥයන් දුරුකිරීමනම්වේ) පඤ්ඤවන්තපුග්ගලසෙවනා, පැණවත් පුග්ගලන්සෙවීමය (ප්‍රඥාපිණිය කෘපාධිකාරඇති සත්‍ය ප්‍රතීත්‍ය සමුත්පාදදිශයෙහි දක්ෂ ආචාර්‍ය

* [ ] මේ ලකුණුදෙකට ඇතුලත්වූ සන්නය සිංහලූපාත්තිව බඩිතවුනිති අප විසින් යොදනලදී.

යන්නෙහි විදසුන් භාවනාකරන්නාවූ මහාප්‍රාඥයන් හෝ කලින්කල සෙවනය කිරීමයි) ගම්භීරඤාණචරියපච්චවෙක්ඛණා, ගැඹුරු නුවණැත්තන් විසින් අවබෝධකටයුතුවූ ස්කන්ධධාතු ආයතන සත්‍ය ප්‍රතීත්‍ය සමුත්පාදාදිය ප්‍රකාශවන්නාවූ හෝ ශූන්‍යතා ප්‍රතිසංයුක්තවූහෝ සූත්‍රාන්තයන් පස්විකීමය; තදධිමුත්තතා, ප්‍රඥයෙහි නිම්න ප්‍රවණබවයි; විරියසම්බොජ්ඣඞ්ගස්ස, වීර්‍ය්‍ය සම්බොධ්‍යඞ්ගයාගේ; උප්පාදය, ඉපදවීමපිණිස; එකාදසධම්මා, එකොළොස් ධර්මකෙණෙක්; සංවත්තන්ති, පවතිත්; අපායාදිභය පච්චවෙක්ඛණතා, අපායාදි භය පස්විකණබවය (ආදිශබ්දයෙන් ජාත්‍යාදී දුකය අනාගතයෙහි වෘත්තමූලකදුකය ප්‍රත්‍යුත්පන්නයෙහි ආහාරපරියෙසන මූලක දුකය යන මොවුන් සඞ්ග්‍රහකෙරේ) විරියායත්තලොකියලොකුත්තරවිසෙසාධිගමානිසංස දස්සාවිතා, වීර්‍ය්‍යායත්තවූ ලෞකික්‍ය ලොකොත්තර ගුණ විශෙෂාධිගමයන්ගේ අනුසස් දක්නා සුලුබවය; බුද්ධපච්චෙකබුද්ධ මහාසාවකෙහි, බුදුපසේබුදු මහසව්වන් විසින්; ගතමග්ගො, අධිගතවූ මාර්ගය; මයාගන්තබ්බො, මා විසින් යායුතුය; සොපි, හේද; කුසීතෙන ගන්තුං නසක්කාති, කුසීතවූ වහු විසින් යන්නට නොහැකිවෙයි; එවං ගමනවීථි පච්චවෙක්ඛණතා, මෙසේ ගමන් මාර්ගය පස්විකණබවය; දායකානං මහප්ඵලකාරකරණෙන, ප්‍රත්‍යය දායකයන්ගේ සත්කාරයද තමාගේ මනා ප්‍රතිපත්තියද මහත් ඵලබව කිරීමෙන්; පිණ්ඩාපචායනතා, පිඩපාතයාගේ ප්‍රතිපූජනභාවය; මෙසේවා, මාගේ ශාස්තෘන්වහන්සේ; විරියාරම්භස්සවණ්ණවාදී, වීර්‍ය්‍යාරම්භයෙහි ගුණකීයනසුලුය; සොච, සේතෙමේද; අනතික්කමනීයසාසනො, නොඉක්මියහැකි අනුශාසනා ඇත්තේය; අම්හාකං බහුපකාරො, අපටද බොහෝ උපකාර ඇත්තේය; පටිපත්තියාව පූජියමානො, ප්‍රතිපත්තිපූජාවෙන් පුදනු ලබනුයේ, පූජිතොහොති, පුදන ලද්දේවෙයි; න ඉතරථාති, අන්පරිද්දෙකින් නොවේයයි; එවං, මෙසේ; සත්ථුමහත්තපච්චවෙක්ඛණතා, ශාස්තෘහුගේ මහත්බව පස්විකීම; තථා, එසේම; සද්ධම්මසඞ්ඛාතං මහාදායජ්ජං, සද්ධර්මසංඛ්‍යාත මහාදායාදය; ගහෙතබ්බං, ගතයුතු; තඤ්ච, හේද; න සක්කා කුසීතෙන ගහෙතුන්ති, කුසීතහු විසින් ගන්නට නොපිළිවනැයි; එවං, මෙසේ; දායජ්ජමහත්තපච්චවෙක්ඛණතා, දායාදයාගේ මහත්බව පස්විකණබවය; ආලොකසඤ්ඤා මනසිකාර, ආලොකසංඥ මෙනෙහිකිරීමය, ඉරියාපථ පරිවත්තන, ඉරියව් පෙරළීමය, අබ්භොකාස සෙවනාදීහි, අභ්‍යවකාශසෙවීම් ආදීන්; ථිනමිද්ධවිනොදනතා, ස්ත්‍යානමිද්ධදුරුකරණබවය; කුසීතපුග්ගලපරිවජ්ජනතා, අලසවූ (භාවනාවෙහි නම් පමණකුදු නොදන්නා කායදඩ්ඪිබහුලවූ ගෙය්‍යසුඛාදියෙහි යෙදෙන තිර්ය්‍යක්කථාවෙහි නිරත) පුගුලන් දුරුකරණබවය; ආරද්ධවිරියපුග්ගලසෙවනතා (දිවාවඩ්ඩකමෙහෙනීසජ්ජාය යනාදීන් භාවනාරම්භවශයෙන්) ආරබ්ධවූ (දැඩිවූ වීර්‍ය්‍යඇතිය යුතුනි) පුගුල් කලින්කල සෙවීනාබවය; සම්මප්පධානපච්චවෙක්ඛණතා, සතරවැදෑරුම් සම්මප්පධානයාගේ ආනුභාව පස්විකීමය; තදධිමුත්තතා, ඒ වීර්‍ය්‍ය සම්බොධ්‍යඞ්ගයෙහි සර්වේර්‍ය්‍යාපථයෙහිම නිම්න ප්‍රවණබවයි; එකාදසධම්මා, එකොළොස් ධර්මකෙණෙක්; පීතිසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදය සංවත්තන්ති, ප්‍රීතිසම්බොධ්‍යඞ්ගයාගේ ඉපදවීමපිණිසපවතිත්; බුද්ධානුස්සති...

ඵැඩපුග්ගලපරිවජ්ජනතා (බුද්ධරුවන් ආදියෙහි ප්‍රසාද ස්නේහ නැති බැවින්) ධූසරවූ හෘදය ඇති පුහුලන් දුරුකරණබවය; සිනිඩපුග්ගලසෙවනතා (බුද්ධරුවන් ආදියෙහි ප්‍රසාද සෙනහ) ස්නිග්ධ ලයැති පුහුලන් සෙවනාබවය; පසාදනීයාදී සුත්තන්ත පච්චවෙක්ඛණතා, බුද්ධරුවන් ආදීන්ගේ ගුණභගවතා සම්ප්‍රසාදනීයාදි සූත්‍රාන්තයන් පස්විකණබවය; තදධිමුත්තතා, ප්‍රීතිසම්බොධ්‍යඞ්ගයාගේ උත්පාදනයෙහි නිම්න ප්‍රවණබවයයි; ඉති, මෙසේ; ඉමෙහි ආකාරෙහි, යථොක්ත කුශලාදී ධර්මයන්ගේ සවභාව සාමාන්‍ය ලක්ෂණප්‍රතිවෙධාකාරයෙන්ද පරිපුච්ඡකතාදි ආකාරයෙන්ද; එතෙ ධම්මෙ, කුසලාදින්නොමරති යොනි නොමනසිකාරාදින්ද ධර්මද්‍රන්මය අධර්මද්‍රන්මය යනාදි ධර්මයන්ද; උප්පාදෙන්තො, උපදවන්නේ; ධම්මවිචය සම්බොජ්ඣඞ්ගාදයො, ධර්මවිචය සම්බොධ්‍යඞ්ගාදීන්; භාවෙති නාම, වඩන්නේ නම්වේ; එවං, මෙසේ—පෙ—

( භා ¶ )

තවද ධර්මවිචය සම්බොධ්‍යඞ්ගය ඉපදවීමපිණිස ධර්මයෝ සත්දෙනෙක් පවත්නාහුය හේ කවරහුදයත්? සියලු පස්මහතිකායයන් අවුවා සහිත කොට ඉගෙණද ආචාර්යයන් කරා එළඹ සැසනැන් පිළිවිත්නා බවය අධ්‍යාත්මික බාහ්‍ය වස්තූන් නිර්මලකරණබවය ඉන්ද්‍රියන්ගේ සමබව කිරීමය බත්දමනලද කාවුඩන් මස්දමනලද සුනඛයන් මෙන් මොහයෙන් මුලාවූ ඓඩුබුද්ධික පුද්ගලයන් දුරින් දුරුකරණ බවය ප්‍රඥාවපිණිස කරණලද පින් ඇතිනාවූ සත්‍ය ප්‍රතීත්‍යසමුත්පාදාදියෙහි දක්ෂවූ ආචාර්යයන් හෝ විද්‍යුත් වඩන්නාවූ මහ පැණැත්තන් හෝ සාලින්කල සෙවනයකරණබවය ගැඹුරු පැණැත්තන් විසින් දතයුතුවූ ස්කන්ධායතනධාතු සත්‍ය ප්‍රතීත්‍යසමුත්පාදදීන් ප්‍රකාශවන්නාවූ හෝ ශූන්‍ය හා ප්‍රතිසංයුක්තවූ හෝ සූත්‍රාන්තයන් පස්විකණබවය ප්‍රඥාවෙහි නැමුනු බවය යනා මේ සත්වැදෑරුම් ධර්මයෝ ධර්මවිචයසම්බොධ්‍යඞ්ගයාගේ ඉපදවීම පිණිස පවත්නාහුය—

තවද අපායදුකාය ජාත්‍යාදි අනාගත සංසාරදුකය වර්තමානකාලයෙහි ආහාරපර්යේෂණ මූලක දුකය යන මොවුන් පස්විකීමය වීර්යයට ඇතුලත්වූ ලෞකික ලොකොත්තර ගුණ විශෙෂාධිගමයාගේ අනුසස් දක්නා සුලුබවය බුද්ධප්‍රත්‍යෙකබුද්ධ මහාශ්‍රාවකයන් විසින් අධිගතවූ නිර්වාණමාර්ගය මා විසිනුදු පැමිණියයුත්තේය ඒ පැමිණිමද කුසීතයා විසින් නොපැමිණිය හැක්කේයයි මෙසේ ගමනවීථිපස්විකණ බවය ප්‍රත්‍යය දායකයන්ගේ සිවුපසයද තමාගේ සම්‍යක් ප්‍රතිපත්තියද මහත්ඵලකිරීමෙන් භික්ෂා ප්‍රතිපූජාකරණබවය මාගේ ශාස්තෘන්වහන්සේ වීර්යාරම්භයාගේ ගුණ කියන සුලුය උන්වහන්සේද නොඉක්මිය හැකි අනුශාසනා ඇත්තේය අපමද ඒ ප්‍රතිපත්තිය බොහෝ උපකාරවන්නේය ප්‍රතිපත්තියෙන් පුදනුලැබුයේ වීනම් ඒ සර්වඥයන්වහන්සේ පුදනලද්දේ වෙයි ආමිසපූජාවෙන් පුදනුලැබුයේ පුදනලද්දේ නොවෙයි මෙසේ ශාස්තෘන්වහන්සේගේ මහත්බව පස්විකීමය මාවිසින් සධර්ම සඛ්‍යාතවූ මහා දායාදය ගතයුතුවන්නේය හේද කුසීතයා විසින් නොගතහැක්කේයයි මෙසේ දායාද මහත්බව පස්විකීමය ආලොක සංඥාව මෙනෙහිකිරීම ඉරියවු පෙරළිම් අභ්‍යවකාශය සෙවීම් යන මේ ආදියෙන් ථිනමිද්ධය දුරුකරණ බවය අලසවූ භාවනාවෙහි නම්පමණ

කුද්‍ර වනාදත් හාවූ ශරීර පොෂණයෙහි ගෙවත් කායදඩ්ඪිකිරීම් සංඛ්‍යාත මස්වැඩීමෙහි නියුක්තවූ සෙය්‍යසුඛාදියෙහි ඇලුනාවූ තිරිසන්කථාවෙහි නියුක්ත පුද්ගලයන් දුරුකරණබවය භාවනාරම්භ වශයෙන් පටන්ගත්තාලද වීර්‍ය්‍යඇති පුද්ගලයන් සෙවනාබවය සතර සම්‍යක් ප්‍රධානවීර්‍ය්‍යයන්ගේ ආනුභාව පස්විකීමය ඒ වීර්‍ය්‍යසම්බොධ්‍යඞ්ගයෙහි නිරතුරු නැමී පවත්නාබවය යන මේ එකොළොස්වැදෑරුම්වූ ධර්‍මයෝ වීර්‍ය්‍යසම්බොධ්‍යඞ්ගය ඉපදවීම පිණිස පවත්නාහුය තවද බුද්ධානුස්මෘතිය ධර්‍මානුස්මෘතිය සඞ්ඝානුස්මෘතිය ශීලානුස්මෘතිය ත්‍යාගානුස්මෘතිය දෙවතානුස්මෘතිය උපශමානුස්මෘතිය යන සප්තානුස්මෘති භාවනාකිරීමය බුද්ධාදීන් කෙරෙහි ප්‍රසාද නැමති තෙලය නැති බැවින් විශලිගිය ළයැති පුද්ගලයන් දුරුකරණබවය එම රත්නත්‍රයෙහි පැහැදීම නැමති තෙලයෙන් සිනිඳුවූ ළයැති පුද්ගලයන් සෙවනය කරණබවය බුද්ධාදි රත්නත්‍රයෙහි ගුණ පහළවන සම්ප්‍රසාදනීය සූත්‍රාන්තවැනි ධර්‍මයන් පස්සිකාණබවය ඒ ප්‍රීති සම්බොධ්‍යඞ්ගයෙහි නැමී පවත්නාබවය යන මේ එකොළොස් ධර්‍මයෝ ප්‍රීතිසම්බොධ්‍යඞ්ගය ඉපදවීම පිණිස පවත්නාහුය මෙසේ මේ කුශලාදි ධර්‍මයන්ගේ ස්වභාවලක්ෂණ සාමාන්‍යලක්ෂණ ප්‍රතිවෙධාදී ආකාරයෙන් මේ ධර්‍මයන් උපදවන්නාහු ධර්‍මවිචය සම්බොධ්‍යඞ්ගාදි ධර්‍මයන් වඩන්නෝ නම් වන්නෝයි මෙසේ යම් සමයෙක්හි සිත වැඩිය යුතු වීනම් එසමයෙහි සිත වඩන්නේයි ——

( පා ° )

කථං යස්මිං සමයෙ චිත්තං නිග්ගහෙතබ්බං තස්මිං සමයෙ චිත්තං නිග්ගණ්හාති යදාස්ස අච්චාරද්ධ විරියතාදිහි උද්ධතං චිත්තං හොති තද ධම්මවිචය සම්බොජ්ඣඞ්ගාදයො නාමෙය්‍ය අභාවෙත්වා පස්සද්ධිසම්බොජ්ඣඞ්ගාද යො භාවෙති වුත්තං හෙතං භගවතා —— සෙය්‍යථාපි භික්ඛවෙ පුරිසො මහන්තං අග්ගික්ඛන්ධං නිබ්බාපෙතුකාමො අස්ස සො තත්‍ර සුක්ඛානි චෙව තිණානි පක්ඛිපෙය්‍ය —පෙ— න ච පංසුකෙන ඔකිරෙය්‍ය භබ්බොනුඛො සො පුරිසො මහන්තං අග්ගික්ඛන්ධං නිබ්බාපෙතුන්ති නොහෙතං භන්තෙ එවමෙවඛො භික්ඛවෙ යස්මිං සමයෙ උද්ධතං චිත්තං හොති අකාලො තස්මිං සමයෙ ධම්මවිචය සම්බොජ්ඣඞ්ගස්ස භාවනාය අකාලො —— විරිය —— පෙ —— අකාලො පීතිසම්බොජ්ඣඞ්ගස්ස භාවනාය තංකිස්ස හෙතු උද්ධතං භික්ඛවෙ චිත්තං තං එතෙහි ධම්මෙහි දුවූපසමයං හොති යස්මිඤ්ච ඛො භික්ඛවෙ සමයෙ උද්ධතං චිත්තං හොති කාලො තස්මිං සමයෙ පස්සද්ධිසම්බොජ්ඣඞ්ගස්ස භාවනාය කාලො සමාධි —— පෙ —— කාලො උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගස්ස භාවනාය තංකිස්ස හෙතු උද්ධතං භික්ඛවෙ චිත්තං තං එතෙහි ධම්මෙහි සුවූපසමයං හොති සෙය්‍යථාපි භික්ඛවෙ පුරිසො මහන්තං අග්ගික්ඛන්ධං නිබ්බාපෙතුකාමො අස්ස සො තත්‍ර අල්ලානි චෙව තිණානි පක්ඛිපෙය්‍ය —— පෙ —— පංසුකෙන ච ඔකිරෙය්‍ය භබ්බොනුඛො සො පුරිසො මහන්තං අග්ගික්ඛන්ධං නිබ්බාපෙතුන්ති එවං භන්තෙති —— එත්ථාපි යථාසකං ආහාරවසෙන පස්සද්ධිසම්බොජ්ඣඞ්ගාදීනං භාවනා වෙදිතබ්බා —— වුත්තං හෙතං භගවතා ——

( ස ° )

යස්මිං —පෙ— යදාස්ස අච්චාරද්ධ විරියතාදීහි, යම්කලෙක මොහුගේ අතිශයින් වූ හෙවත් වීර්‍ය්‍යඇතිබවය යනා

දින්; චිත්තං උද්ධතං හොති, සිත උද්ධතවේද (සමාධිආදීන් යොමිනා බැවින් නොසන්හුන්නේවේද – තද යනාදී යෙහි පදයට කී නයට ප්‍රතිපක්‍ෂනයින් දතයුතු බැවින් අතරතුරෙහි නොකී බසට අර්ථකියනුලැබේ) මහන්තං අග්ගික්ඛන්ධං, මහත් ගිනිරැසක්; නිබ්බාපෙතුකාමො, නිවනුකැමැත්තේ; සුක්ඛානි, වියළුනු; දුප්පසමයං හොති, සන්සිඳුවන්නට නොපිළිවන්වේ; යථා සකං ආහාරවසෙන, තමා තමන්ගේ ප්‍රත්‍යයවශයෙන්; පස්සද්ධි සම්බොජ්ඣඞ්ගාදීනං, ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ගාදීන් ගේ; භාවනා වෙදිතබ්බා, වැඩීම දතයුත්තීයි — පෙ —

( භා )

යම්සමයෙක සිත නිග්‍රහකටයුතු වීනම් එසමයෙහි සිත කෙසේ නිග්‍රහ කරන්නේදයත්? යම් කලෙක මේ යොගාවචරයාගේ සිත අතිශයින් පටන්ගන්නාලද වීර්‍ය්‍යඇති බැවින් ආදී යෙන් උද්ධතවේද නොහොත් සමාධි ආදී යෙන් නොසන්හුන්නේවේද එකල්හි ධම්මවිචය සම්බොධ්‍යඞ්ගාදී තුන්දෙන නොවඩා ප්‍රශ්‍රබ්ධි සම්බොධ්‍යඞ්ගාදී තුන්දෙන වඩන්නේනම් භාග්‍යවතුන් වහන්සේ විසිනුදු මේ වදාරණලදුයේ වැයි මහණෙනි යම්සේ යම් පුරුෂ යෙක් මහත්වූ ගිනිකඳක් නිවනුකැමැ තිවේද ඒ පුරුෂතෙම ඒ මහත්ගින් නෙහි වියළි දරහා තණපත් ගොම බහාලන්නේවේද පස් නොදමන්නේද මහණෙනි ඒ පුරුෂතෙම ඒ මහත්වූ ගිනිකඳ නිවන්නට පොහොසත්වන් නේදැයි විචාළහ භික්ෂූහු වහන්ස ඒ පුරුෂතෙම ඒ ගිනිකඳ නිවන්නට පොහොසත් නොවන්නේයයි ප්‍රතිවචන දුන්නාහුය එපරිද්දෙන්ම මහ ණෙනි යම් කලෙක සිත උද්ධතවී නම් එකල්හි ධම්මවිචය වීර්‍ය්‍ය ප්‍රීතිස ම්බොධ්‍යඞ්ගයන් වැඩීමට සුදුසුකල් නොවන්නේය ඊට කාරණා කවරය ත්? මහණෙනි එකල්හි සිත උද්ධතවූයේ ය ඒ උද්ධතවූසිත මේ ධම්මවිචය වීර්‍ය්‍ය ප්‍රීති සම්බොධ්‍යඞ්ගයන් කාරණකොට මෙගණ සන්සිඳුවා ලියනොහැක්කේය මහණෙනි යම්කලෙක සිත උද්ධතවී නම් ඒ කාලයෙහි ප්‍රශ්‍රබ්ධි සමාධි උපෙක්ෂා යන සම්බොධ්‍යඞ්ගයන් වැඩීමට සුදුසුකල්වන්නේය. ඊට කාරණා කවරේදයත්? මහණෙනි එ කාලයෙහි සිත උද්ධතවූයේය ඒ උද්ධතවූසිත මේ ප්‍රශ්‍රබ්ධි සමාධි උපෙක්ෂා යන සම්බොධ්‍යඞ්ගයන් කාරණකොට මෙගණ සන් සිඳුවා ලියහැකිවන්නේය මහණෙනි යම්සේ යම් පුරුෂයෙක් මහත්වූ ගිනිකඳක් නිවනුකැමතිවේද ඒ පුරුෂ තෙම ඒ මහත්ගින්නෙහි අලුත් තණ පත් දර ගොම බහාලන්නේවේද පස්වීසුරුවන්නේවේද මහණෙනි ඒ පුරුෂතෙම ඒ මහත් ගිනිකඳ නිවා ලීමෙහි පොහොසත්වන්නේදැයි? විචා ළහ. භික්ෂූහුද එසේය ස්වාමීන්වහන්ස ඒ ප්‍රතිවචන දුන්නාහුය මෙහිද තම තමන්ගේ ප්‍රත්‍යයවශයෙන් ප්‍රශ්‍රබ්ධි සම්බොධ්‍යඞ්ගාදීන්ගේ වැඩීම දතයුතුයි. භාග්‍යවතුන් විසිනුදු මේ වදාරණලදුයේයැයි —

( භා )

අජ්ඣත්තිකවෙ කායපස්සද්ධි චිත්තපස්සද්ධි තත්ථ යොනිසොමනසිකාර බහුලීකාරො අයමාහාරො අනුප්පන්නාස්සවා පස්සද්ධිසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය උප්පන්නස්සවා පස්සද්ධිසම්බොජ්ඣඞ්ගස්ස භීය්‍යොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා සංවත්තති — තථා අත්ථි භික්ඛවෙ සමථ නිමිත්තං අබ්‍යග්ගනිමිත්තං තත්ථ යොනිසොමනසිකාර බහුලීකාරො අයමාහාරො

අනුප්පන්නස්ස වා සමාධිසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය උප්පන්නස්ස වා සමාධි සම්බොජ්ඣඞ්ගස්ස භීය්‍යොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා සංවත්තතීති. තථා අත්ථි භික්ඛවෙ උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගට්ඨානීයා ධම්මා තත්ථ යොනිසොමනසිකාර බහුලීකාරො අයමාහාරො අනුප්පන්නස්සවා උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය උප්පන්නස්සවා උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගස්ස භීය්‍යොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා සංවත්තතීති. තත්ථ යථාස්ස පස්සද්ධිආදයො උප්පන්නපුබ්බා තං තං ආකාරං සල්ලක්ඛෙත්වා තෙසං උප්පාදකවසෙන පවත්තිතමනසිකාරොව තීසුපි පදෙසු යොනිසොමනසිකාරො නාම සමථනිමිත්තන්තිච සමථස්සෙවතං අධිවචනං අවික්ඛෙපට්ඨෙන ච තස්සෙව අබ්‍යග්ග නිමිත්තන්ති.

( ස † )

සමථ නිමිත්තං (මතුයෙහි සමාධියට කාරණාවන බැවින්) සමාධියම සමථනිමිත්ත නම්වේ; අබ්‍යග්ග නිමිත්තං (අවික්ෂෙප කාරණයෙන්) හේම අබ්‍යග්ගනිමිත්ත නම (තුන්වාරයෙහිම සෙසුපෙදෙහි අර්ථයට කීනයින් දත යුතු) තත්ථ "අත්ථි භික්ඛවෙ" යනාදීන් දක්වූ පාඨයෙහි; යථා, යම්සේ; අස්ස, ඒ යොගීහට; පස්සද්ධිආදයො උප්පන්න පුබ්බා, ප්‍රශ්‍රබ්ධි සමාධි උපෙක්ෂා යන මොහු ඒ ඒ කාරණයෙහි උපන්විරුද; තං තං ආකාරං සල්ලක්ඛෙත්වා, ඒ පස්සද්ධාකාරයද සමාහිතාකාරයද අජ්ඣුපෙක්ඛනාකාරයද සලකා (පරිඥාකොට) තෙසං උප්පාදකවසෙන, ඒ පස්සද්ධිආදීන්ගේ උත්පාදකවශයෙන්; පවත්තිතමනසිකාරොව, පවත්වනලද මනසිකාරයම; තීසුපි පදෙසු "අත්ථි භික්ඛවෙ කායපස්සද්ධි" යනාදීන් ආ තුන්වාරයෙහි (එයින් ප්‍රකාශිතවූ තුන්දහම්කොටස හෝ) යොනිසොමනසිකාරො නාම, යොනිසොමනසිකාරනම්වේ; සමථ නිමිත්තන්තිච, සමථනිමිත්තං යනුද; සමථස්සෙව, ඒ සමථයටම (අධිවචනං" යි යොදනු "නානාරම්මණෙ පරිබ්භමනෙන විවිධං අග්ගං එතස්සාති බ්‍යග්ගො වික්ඛෙපො-එකග්ගතා භාවෙන බ්‍යග්ගපටිපක්ඛොති අබ්‍යග්ගො සමාධි යථාහි නානාකාරං සල්ලක්ඛෙත්වා ගය්හමානො සොඑව නිමිත්තන්ති අබ්‍යග්ගනිමිත්තං" යි ගන්නේ)

( භා † )

මහණෙනි කායපස්සද්ධි චිත්තපස්සද්ධි සඞ්ඛ්‍යාතවූ යම් චිත්තචෛතසික ධර්මයන්ගේ සන්සිඳීමක් ඇත්තේවේද එහි යොනිසොමනස්කාරයාගේ යම් බොහෝ කිරීමක්වේද මේ බොහෝකිරීමයයි කියනලද ප්‍රත්‍යය නූපන්නාවූ ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ගය ඉපදවීම පිණිස ද උපන්නාවූ ප්‍රශ්‍රබ්ධි සම්බොධ්‍යඞ්ගය බොහෝ බව පිණිසද මහත්බව පිණිසද වැඩීම පිණිසද සම්පූර්ණබව පිණිසද පවත්නේය. එපරිද්දෙන්ම මහණෙනි ඒ පිළිසරබවට කාරණා නොවන බැවින් අබ්‍යග්ගනිමිත්ත නම්වූ මතුමත්තෙහි උපදවනලද සමාධියට කාරණවූ යම් සමථනිමිත්තක් ඇත්තේවේද ඒ නිමිත්තයෙහි යොනිසොමනස්කාරය බොහෝකිරීමයයි කියනලද මේ ප්‍රත්‍යය නූපන්නාවූ සමාධිසම්බොධ්‍යඞ්ගය ඉපදවීම පිණිසද උපන්නාවූ සමාධිසම්බොධ්‍යඞ්ගය බොහෝබව පිණිසද මහත් බව පිණිසද වැඩීම පිණිසද සම්පූර්ණබව පිණිසද පවත්නේය එපරිද්දෙන්ම

මහතෙණති උපෙක්ෂා සම්බොධ්‍යඞ්ග සංඛ්‍යාත වූ යම් ධර්මයකගේ ඇත්තාහු වේද ඒ ධර්මයෙහි නොයෙක්සාමහස් කාරය බොහෝ කිරීමයයි කියනලද. මේ කාරණය නූපන්නාවූ උපෙක්ෂා සම්බොධ්‍යඞ්ගයාගේ ඉපදීම පිණිසද උපන්නාවූ උපෙක්ෂා සම්බොධ්‍යඞ්ගයාගේ බොහෝ බව පිණිසද මහත් බව පිණිසද වැඩීම පිණිසද සම්පූර්ණ බව පිණිසද පවත්නේයි. ඒ දක්වූ දෙශනා පාලි ප්‍රදේශයෙහි ඒ යොගාවචරයා හට යම් පරිච්ඡෙදකින් ප්‍රශ්‍රබ්ධි සමාධි උපෙක්ෂා යන බොධ්‍යඞ්ගයෝ ඒ ඒ කාරණයෙකින් උපත්විරෑද ඒ සන්සිඳුව නාආකාරයද එකඟවූ ආකාරයද මැදහත්ව දක්නාආකාරයද පරීක්ෂාකොට ඒ ප්‍රශ්‍රබ්ධි සම්බොධ්‍යඞ්ගාදීන්ගේ ඉපදවීම් වශයෙන් පවත්වනලද මනස්කාරය ඒ තුන්වාරයෙහිම යොනිසොමනස්කාරනම් වන්නේයි. සමථ නිමිත්ත යනුද සමථයටම නම් වන්නේය ඒ සමථයම විසිරීසර නොවන අර්ථයෙන් අව්‍යග්‍ර නිමිත්තයයිද කියනලද්දේයි ——

(පා ‡)

අපිච —— සත්තධම්මා පස්සද්ධිසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය සංවත්තන්ති පණීතභොජනසෙවනතා උතුසුඛසෙවනතා ඉරියාපථසුඛසෙවනතා මජ්ඣත්තපයොගතා සාරද්ධපුග්ගලපරිවජ්ජනතා පස්සද්ධකායපුග්ගලසෙවනතා තදධිමුත්තතාති —— එකාදස ධම්මා සමාධිසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය සංවත්තන්ති වත්ථුවිසදතා නිමිත්තකුසලතා ඉන්ද්‍රියසමත්තපටිපාදනතා සමයෙ චිත්තස්ස නිග්ගණ්හනතා සමයෙ චිත්තස්ස පග්ගණ්හනතා නිරස්සාදස්ස චිත්තස්ස සද්ධාසංවෙගවසෙන සම්පහංසනතා සම්මාපවත්තස්ස අජ්ඣුපෙක්ඛනතා අසමාහිතපුග්ගලපරිවජ්ජනතා සමාහිතපුග්ගලසෙවනතා ඣානවිමොක්ඛපච්චවෙක්ඛණතා තදධිමුත්තතාති —— පඤ්ච ධම්මා උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය සංවත්තන්ති සත්තමජ්ඣත්තතා සඞ්ඛාරමජ්ඣත්තතා සත්තසඞ්ඛාරකෙලායනපුග්ගලපරිවජ්ජනතා සත්තසඞ්ඛාරමජ්ඣත්තපුග්ගලසෙවනතා තදධිමුත්තතාති —— ඉති ඉමෙහි ආකාරෙහි එතෙ ධම්මෙ උප්පාදෙන්තො පස්සද්ධිසම්බොජ්ඣඞ්ගාදයො භාවෙති නාම එවං යස්මිං සමයෙ චිත්තං නිග්ගහෙතබ්බං තස්මිං සමයෙ චිත්තං නිග්ගණ්හාති ——

(ස ‡)

පණීතභොජන සෙවනතා, ප්‍රණීත භොජුන් සෙවීනා බවය; උතුසුඛ සෙවනතා, සැප සෘතු සෙවීනා බවය; ඉරියාපථ සුඛසෙවනතා, සුවඉරියව් සෙවුනා බවය; මජ්ඣත්තපයොගතා, සමවූ කායචිත්ත ප්‍රයොග ඇති බවය; සාරද්ධපුග්ගල පරිවජ්ජනතා, කෙලශ පරිදාහ ඇති නොසන්හුන් පුද්ගලන් දුරුකරණ බවය; පස්සද්ධකාය පුග්ගලසෙවනතා, කෙලශ පරිදාහ නැති බැවින් සන්හුන් කාය ඇති පුද්ගලන් සෙවුනා බවය; තදධිමුත්තතාති, ප්‍රශ්‍රබ්ධි සම්බොධ්‍යඞ්ගයෙහි නිමිහ ප්‍රවණ බවයි; එකාදස ධම්මා, එකොළොස් ධර්ම කොටසෙක්; සමාධි සම්බොජ්ඣඞ්ගස්ස, සමාධිසම්බොධ්‍යඞ්ගයාගේ; උප්පාදාය සංවත්තන්ති, උත්පාදය පිණිස පවත්නාහුයි; වත්ථුවිසදතා, අධ්‍යාත්මික බාහ්‍ය වස්තූන් පිරිසිදු බවය; නිමිත්තකුසලතා, පඨවිකසිණාදි නිමිත්ත ග්‍රහණයෙහි දක්ෂ බවය; ඉන්ද්‍රියසමත්තපටිපාදනතා, ඉන්ද්‍රියන්ගේ සමබව කිරීමය (සමාධින්ද්‍රිය හා වීර්‍ය්‍යෙන්ද්‍රිය සමබව කීයෙහි ශ්‍රද්ධා ස

න්නයි) සමයෙහි චිත්තස්ස නිග්ගණ්හනතා, සුදුසු සමයෙහි සිත්හු නිගන්හා බවය; සමයෙහි චිත්තස්ස පග්ගණ්හනතා, සුදුසු සමයෙහි සිත්හු හුවහා බවය; නිරස්සාදස්ස චිත්තස්ස, භාවනාස්වාද රහිත සිත්හුගේ; සද්ධාසංවෙගවසෙන, ශ්‍රද්ධාවෙන් නිපන් සංවේගවශයෙන්; සම්පහංසනතා, සංවේග පූර්වවූ ප්‍රසාදෝත්පාදනයෙන් සිත් සතුටු කිරීමය; සමප්පවත්තස්ස (ලීනුද්ධච්ච විරහයෙන්ද සමථ වීථියට පිළිපැදීමෙන්ද සමව සවිශෙෂව පැවැත්මෙන්) මනාකොටම ප්‍රවෘත්ත භාවනා සිත්හුගේ; අජ්ඣුපෙක්ඛණතා (පග්ගහ නිග්ගහ සම්පහංසනයෙහි ව්‍යාපාරයක් නැතිව) උපෙක්ෂාකරණ බවය; අසමාහිත පුග්ගල පරිවජ්ජනතා, වික්ෂිප්ත හෘදය ඇති පුද්ගලන් දුරුකරණ බවය; සමාහිත පුග්ගලසෙවනතා, සමාහිත පුද්ගලන් සෙවුනා බවය; ඣානවිමොක්ඛ පච්චවෙක්ඛණතා, ප්‍රථමාදී ධ්‍යානයන්ට ප්‍රතිපක්ෂ දමුන් කෙරෙන් මනාකොටම පහවූ බැවින් විමොක්ෂ නම්වූ ඒ විමොක්ෂ ධ්‍යානයන්ද මෙසේ බැවිය යුතු ය මෙසේ සමවැදිය යුතුයයි පස්විකණ බවය; තදධිමුත්තතා, සමාධි සම්බොධ්‍යඞ්ගයෙහි නිම්නප්‍රවණ බවයි; පස්සද්ධි ධම්මා, ධර්මයෝ පස්දෙනෙක්; උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගස්ස, උපෙක්ෂා සම්බොධ්‍යඞ්ගයාගේ; උප්පාදාය සංවත්තන්ති, උත්පාදය පිණිස වෙත්; සත්තමජ්ඣත්තතා, ප්‍රිය සත්වයන් කෙරෙහිදු මැදහත් බවය; සඞ්ඛාර මජ්ඣත්තතා, චක්ෂුරාදී යෙහිදු පාසිවුරු ආදියෙහිදු මැදහත් බවය; සත්තසඞ්ඛාර කෙලායන පුග්ගල පරිවජ්ජනතා, සත්ව සංස්කාරයන් කෙරෙහි මමත්වය කරණ පුද්ගලන් දුරුකරණ බවය; සත්තසංඛාර මජ්ඣත්ත පුග්ගල සෙවනතා, සත්ව සංස්කාරයන් කෙරෙහි මැදහත්ව පවත්නා පුද්ගලන් සෙවුනා බවය; තදධිමුත්තතා, උපෙක්ෂා සම්බොධ්‍යඞ්ගයෙහි නිම්නප්‍රවණ බවයි; ඉති, මෙසේ; ඉමෙහි ආකාරෙහි, කියනලද කායචිත්තයන්ගේ පස්සද්ධාකාර සැලකීම් ආකාරයෙන්ද සප්පායාහාර සෙවීම් ආදිවූ ආකාරයෙන්ද; එතෙ ධම්මා, මේ පස්සද්ධි ආදී ධර්මයන්; උප්පාදෙන්තො, උපදවන්නේ; පස්සද්ධි සම්බොජ්ඣඞ්ගාදයො භාවෙති නාම, පස්සද්ධි සම්බොජ්ඣඞ්ගාදීන් වඩන්නා නම්වේ; එවං, මෙසේ ~~ පෙ ~~

---

( භා ‡ )

තවද ප්‍රණීත ආහාරසෙවනයකිරීමය සැප සෘතු සෙවනයකිරීමය සැප ඉරියව් සෙවනයකිරීමය සමවූ කායවාදි මනඃ ප්‍රයොග ඇති බවය කෙලෙස් විඩාවෙන් නොසන්හුන් පුද්ගලයන් දුරුකරණ බවය කෙලෙස්විඩා නැති බැවින් සන්හුන් පුද්ගලයන් සෙවනයකරණ බවය ඒ ප්‍රශ්‍රබ්ධි සම්බොධ්‍යඞ්ගයෙහි නැමී පවත්නා බවය යන මේ සත්වැදෑරුම් ධර්මයෝ ප්‍රශ්‍රබ්ධි සම්බොධ්‍යඞ්ගය ඉපදීමපිණිස පවත්නාහුය. තවද අධ්‍යාත්මික බාහ්‍ය වස්තූන් නිර්මලකිරීමය පෘථිවීකසිණාදි නිමිත්තයෙහි දක්ෂ බවය ඉදුරන්ගේ සමබව පිළියෙළකිරීමය සුදුසු කල්හි සිතට නිග්‍රහකරණ බවය සුදුසු කල්හි සිතට අනුග්‍රහකරණ බවය භාවනාස්වාද රහිත චිත්තය ශ්‍රද්ධා වශයෙන් හා සංවේග වශයෙන් සතුටුකරණ බවය හැකිලීම් උඩඟුවීම් ආදියකට නොපැමිණ සමව පවත්නා භාවනා චිත්තය මැදහත්ව බැලීමය නොසන්හුන් පුද්ගලයන් දුරුකරණ බවය සන්හුන් පුද්ගලයන් සෙවනයකිරීමය ප්‍රථමාදි ධ්‍යානයන් හා ත්‍රිවිධ විමොක්ෂ ධ්‍යානයන් පස්විකීමය ඒ සමාධිසම්බොධ්‍යඞ්ගයෙහි නැමී පවත්නා බවය යනමේ

එසේමලාස් වැදෑරුම් ධර්මයෝ සමාධි
සම්බොධ්‍යඞ්ගය ඉපදීම පිණිස පවත්
නාහුය. ප්‍රිය සත්ත්වයන් කෙරෙහිදු මැද
හත් බවය චක්ෂුරාදි ඉන්ද්‍රියයෙහිද පා
සිවුරු ආදී පරිෂ්කාරයෙහිද මමත්වය
නොකිරීමෙන් මැදහත් බවය සත්ත්ව
සංස්කාරයන් කෙරෙහි මමත්වය කර
ණ පුද්ගලයන් දුරුකරණ බවය සත්ත්ව
සංස්කාරයන් කෙරෙහි මැදහත්ව ප
වත්නා පුද්ගලයන් සෙවනයකරණ
බවය ඒ උපෙක්ෂා සම්බොධ්‍යඞ්ගයෙහි
නැමී පවත්නා බවය යනමේ පස්වැදෑ
රුම් ධර්මයෝ උපෙක්ෂා සම්බොධ්‍යඞ්ග
ය ඉපදීම පිණිස පවත්නාහු වෙත්මැ
යි මෙසේ උක්තප්‍රකාරයෙන් ප්‍රශ්‍රබ්ධි
ආදී සම්බොධ්‍යඞ්ගයන් උපදවන්නා
හු ප්‍රශ්‍රබ්ධි සම්බොධ්‍යඞ්ගාදීන් වඩන්
නේ නම් වන්නේයි මෙසේ යම් සම
යෙක සිතට නිග්‍රහකටයුතු වීනම් එස
මයෙහි සිතට නිග්‍රහ කරන්නේයි.―

( ජ ¶ )

කථං යස්මිං සමයෙ චිත්තං සම්පහං
සිතබ්බං තස්මිං සමයෙ චිත්තං සම්ප
හංසෙති යදස්ස පඤ්ඤාපයොග මන්ද
තායවා උපසමසුඛානධිගමෙනවා නිර
ස්සාදං චිත්තං හොති තදනං අට්ඨසං
වෙග වත්ථුපච්චවෙක්ඛණෙන සංවෙ
ජෙති අට්ඨසංවෙග වත්ථූනි නාම ජාති
ජරා ව්‍යාධි මරණානි චත්තාරි අපාය
දුක්ඛං පඤ්චමං අතීතෙ වට්ටමූලකං
දුක්ඛං අනාගතෙ වට්ටමූලකං දුක්ඛං
පච්චුප්පන්නෙ ආහාර පරියෙට්ඨි මූල
කං දුක්ඛනති බුද්ධ ධම්ම සඞ්ඝගුණා
නුස්සරණෙන චස්සපසාදං ජනෙති
එවං යස්මිං සමයෙ චිත්තං සම්පහංසි
තබ්බං තස්මිං සමයෙ චිත්තං සම්පහං
සෙති―කථං යස්මිං සමයෙ චිත්තං අ
ජ්ඣුපෙක්ඛිතබ්බං තස්මිං සමයෙ චිත්
තං අජ්ඣුපෙක්ඛති යදස්ස එවං පටිප
ජ්ජතො අලීනං අනුද්ධතං අනිරස්සාදං
ආරම්මණෙ සමප්පවත්තං සමථවීථි පටි
පන්නං චිත්තං හොති තදනස්ස පග්ග
හනිග්ගහ සම්පහංසනෙසු නව්‍යාපා
රං ආපජ්ජති සාරථිවිය සමප්පවත්තෙ
සු අස්සෙසු එවං යස්මිං සමයෙ චිත්තං
අජ්ඣුපෙක්ඛිතබ්බං තස්මිං සමයෙ
චිත්තං අජ්ඣුපෙක්ඛති―

( ඣ ¶ )

යස්මිං―පෙ―යද, යම්කලෙ
ක; අස්ස, ඒ යොගීහිගේ; පඤ්ඤාප
යොගමන්දතායවා, ප්‍රඥාප්‍රයොග මඳ
බැවින් හෝ; උපසමසුඛානධිගමෙන
වා, එකාග්‍රතා සුඛය නොලදහෙයින්
හෝ; නිරස්සාදං චිත්තං හොති, චිත්
තය නිරාස්වාද වේද (යම් වේලෙක ප්‍ර
ඥා ප්‍රයොග මඳවේද එවේලෙහි නොස
කස් අහරක් පුරුෂයා හට රුචි නො
එලවන්නාක්මෙන් භාවනා තොමෝ
සිතට අභිරුචි නොඑලවයි. එහෙයි
න් නිරාස්වාදවේයි යම් වේලෙක භාව
නා තොමෝ මනාකොට වීථි ප්‍රතිපන්
න නොවන බැවින් මතුමත්තෙහි වි
ශේෂාවහ නොවේද එසමයෙහි එකා
ග්‍රතා සුඛයාගේ අලාභයෙන් චිත්තය
නිරාස්වාදවේ යන අර්ථයි) තද, එවේ
ලෙහි; නං, ඒ චිත්තය; අට්ඨසංවෙග
වත්ථු පච්චවෙක්ඛණෙන සංවෙජෙති,
අෂ්ටසංවෙග වස්තූන්ගේ ප්‍රත්‍යවේක්ෂා
වෙන් සංවෙගකරවා; අට්ඨසංවෙග ව
ත්ථූනිනාම, අෂ්ටසංවෙග වස්තුනම්; ජා
ති ජරා ව්‍යාධි මරණානි, ජාතිය ජරා
ය ව්‍යාධිය මරණය යන; චත්තාරි, ස
තරදෙනය; අපාය දුක්ඛංපඤ්චමං,
පඤ්චවිධ බන්ධනාදී ක්ෂුද්පිපාසාදි අ
නෙකාකාර විබාධනාදී හේතුකොට ඇ
ති පස්වනුවූ අපාය දුක්ඛයද; අතීතෙ
වට්ටමූලකං දුක්ඛං, ඉකුත් කල්හි වට
මුල්කොට ඇති දුක්ද; අනාගතෙ වට්
ටමූලකං දුක්ඛං, අනාගතයෙහි වඩමු

ල්කොට ඇති දුක්ද; පච්චුප්පන්නන, වර්තමාන කාලයෙහි; ආහාරපරියෙට්ඨිමූලකං දුක්ඛන්ති, ආහාරපර්යේෂණය මුල්කොට ඇති දුක්ද (යනමේයි) බුද්ධ ධම්ම සඞ්ඝ ගුණානුස්සරණෙන, බුද්ධ ධම්ම සඞ්ඝ යන තුන්රුවන්හි ගුණ සිහිකිරීමෙන්; අස්ස, ඒ චිත්තය ට; පසාදං ජනෙති, ප්‍රසාද එළවා; එවං, මෙසේ—පෙ—යද, යම්කාලෙක්හි; එවං පටිපජ්ජතො, මෙසේ පිළිපද නාවූ; අස්ස, ඒ යොගීහිගේ; චිත්තං, සිත් තෙමේ; අලීනං (කෞසීද්‍යපාක්ෂික ධර්මයන් විලීන නොවන බැවින්) නොහැකුළුණේ; අනුද්ධතං (ඖද්ධත්‍යපාක්ෂික ධර්මයන් විලීන නොවන බැවින්) උද්ධතනොවූයේ; අනිරස්සාදං (ප්‍රඥා ප්‍රයොග සම්පත්තියෙනුදු ව්‍යුපශම සුඛ ලාභයෙනුදු) නිරාස්වාදනොවූයේ; ආරම්මණ සමප්පවත්තං, එහෙයින්ම අරමුණු සමව පවත්නේ; සමථවීථිපටිපන්නං, සමාධි වීථියට පිළිපන්නේ; හොති, වේද; තදා, එවේලෙහි; තස්ස, ඒ සිත්හු; පග්ගහ නිග්ගහ සම්පහංසනෙසු, ලීන නොවන බැවින් හුවන බව්ය උද්ධත නොවන බැවින් නිගැන්මය නිරාස්වාද නොවන බැවින් සතුටුකැරවීමය යනමෙහි; ව්‍යාපාරං නාපජ්ජති, ප්‍රයොගයට නොපැමිණේ; සමප්පවත්තොහු අස්සසු, සමව පවත්නා අශ්වයන් කෙරෙහි; සාරථිවිය, සාරථිහුමෙනි; එවං, මෙසේ—පෙ—

( ශා ¶ )

තවද යම් කාලෙක සිත සතුටුකළයුතු වීනම් එකල කෙසේ සතුටුකරන්නේදයත්? යම්කාලෙක ඒ යොගාවචරයාගේ ප්‍රඥා ප්‍රයොග මද බැවින් හෝ සිත් එකඟකිරීමෙන් ලැබියයුතු සැපය නොලද බැවින් හෝ චිත්තය ආස්වාද රහිතවේද එකල අටමහා සංවෙග වස්තු පස්විකීමෙන් සිත සංවෙගයට පමුණුවන්නේය සංවෙග වස්තු අට නම් ජාති දුඃඛය ජරා දුඃඛය ව්‍යාධි දුඃඛය මරණ දුඃඛය යන සතර හා පඤ්චවිධ බන්ධනාදි පස්වන අපාය දුඃඛද අතීත භවයෙහි සංසාර දුඃඛය අනාගතයෙහි සංසාර දුඃඛය වර්තමාන කාලයෙයි අහර සෙවීම මුල්කොට ඇති දුඃඛය යනමේ අටවැදෑරුම් දුඃඛ වන්නේයි බුද්ධ ධර්ම සඞ්ඝ යන රත්නත්‍රයෙහි ගුණ මෙනෙහිකිරීමෙන් ඒ සිත පහදවන්නේයි මෙසේ යම් සමයෙක සිත සතුටුකළයුතු වීනම් එසමයෙහි සතුටුකරන්නේයි.

යම් සමයෙක සිත මැදහත්ව බැලියයුතුවීනම් එසමයෙහි සිත කෙසේ මැදහත්ව බැලියයුතුදයත්? යම්කාලෙක මෙසේ පිළිපදනා ඒ යොගාවචරයාගේ සිත කුසීතයෙහි පැහිරීමෙන් නොහැකුළුනේ හෝ වේද? ඖද්ධත්‍යයෙහි ගිමෙන් උද්ධතනුවූයේ හෝ වේද ප්‍රඥා ප්‍රයොග සම්පත් ආදියෙන් නිරාස්වාද නුවූයේවේද අරමුණෙහි සමව පවත්නේද සමාධි වීථියට පැමිණියේවේද එකල්හි ඒ සිත වැඩීමය නිග්‍රහකිරීමය සතුටුකරවීමය යනමෙහි උත්සාහයට නොපැමිණෙන්නේය කුමක්මෙන්දයත්? රථයෙහි යොදනලද අසුන් සමව පවත්නා කල්හි සම්මැට්ටයෙන් නොතළා නොමෙහෙයා මැදහත්ව බලන්නාවූ රථාචාර්යයාමෙනි මෙසේ යම් සමයෙක සිත මැදහත්ව බැලියයුතුවීනම් එසමයෙහි මැදහත්ව බලන්නේයි—

( ෂා • )

අසමාහිත පුග්ගල පරිවජ්ජනා නාම නෙක්ඛම්ම පටිපදං අනාරූළ්හ පුබ්බානං අනෙකකිච්චපසුතානං වික්ඛිත්ත හදයානං පුග්ගලානං ආරකා පරිවජ්ජනා—සමාහිත පුග්ගල සෙවනා

නාම නෙක්ඛම්ම පටිපදං පටිපන්නානං සමාධිලාභීනං පුග්ගලානං කාලෙන කාලං උපසඞ්කමනං෴ තදධිමුත්තතා නාම සමාධි අධිමුත්තතා සමාධි ගරු සමාධිනින්න සමාධිපොණ සමාධි පබ්භාරතාති අත්ථො එවමෙතං දසවිධං අප්පනාකොසල්ලං සම්පාදෙතබ්බං෴

එවං හි සම්පාදයතො
අප්පනා කොසල්ලං ඉමං
පටිලද්ධෙ නිමිත්තස්මිං
අප්පනා සම්පවත්තති෴
එවම්පි පටිපන්නස්ස
සචෙ සා නප්පවත්තති
තථාපි න ජහෙ යොගං
වායමෙථෙව පණ්ඩිතො෴
හිත්වා හි සම්මාවායාමං
විසෙසං නාම මාණවො
අධිගච්ඡෙ පරිත්තම්පි
ඨානමෙතං න විජ්ජති෴
චිත්තප්පවත්ති ආකාරං
තස්මා සල්ලක්ඛයං බුධො
සමතං විරියස්සෙව
යොජයෙථ පුනප්පුනං෴
ඊසකම්පි ලයං යන්තං
පග්ගණ්හෙථෙව මානසං
අච්චාරද්ධං නිසෙධෙත්වා
සමමෙව පවත්තයෙ෴
රෙණුම්හි උප්පලදලෙ
සුත්තෙ නාවාය නාළියා
යථා මධුකරාදීනං
පවත්ති සම්ම වණ්ණිතා෴
ලීන උද්ධතභාවෙහි
මොචයිත්වාන සබ්බසො
එවං නිමිත්තාභිමුඛං
මානසං පටිපාදයෙ෴

---

( සං )

අසමාහිත පුග්ගල පරිවජ්ජනා නාම, අසමාහිත පුගුලන් දුරලීම නම්, නෙක්ඛම්මපටිපදං අනාරූළ්හ පුබ්බානං, ධ්‍යාන ප්‍රතිපත්තියට නොනැඟී විරූ (නොපිළිපන් විරූ සුනැති) නොක කිච්චපසුතානං, අනෙක කෘත්‍යයෙහි නියුක්තවූ; වික්ඛිත්තහදයානං පුග්ගලානං, වික්ෂිප්තවූ හෘදය ඇති පුගුලන්; ආරකාපරිවජ්ජනෙන, දුරින්ම දුරුකිරීමය; සමාහිත පුග්ගලසෙවනා නාම, සමාහිත පුගුලන් සෙවීමනම්; නෙක්ඛම්මපටිපදං පටිපන්නානං, ධ්‍යාන පිළිවෙතට පිළිපන්; සමාධිලාභීනං පුග්ගලානං, සමාධිලද පුගුලන් කරා; කාලෙනකාලං උපසංකමනං, කලින්කල එළඹීමය; තදධිමුත්තතා නාම, තදධිමුත්තතා නම්; සමාධි අධිමුත්තතා, සමාධියෙහි අධිමුක්ත බවය; සමාධිගරු, සමාධිය ගුරුකොට ඇති බවය; සමාධිනින්න, සමාධියෙහි නිම්න බවය; සමාධිපොණ, සමාධියෙහි ප්‍රවණබවය; සමාධිපබ්භාරතාති අත්ථො, සමාධියෙහි ප්‍රාග්භාර බවය යන අර්ථයි; එවං, මෙසේ; එතං, මේ; දසවිධං අප්පනා කොසල්ලං, දශවිධවූ අර්පණාකෞශල්‍යය; සම්පාදෙතබ්බං, සැපයියයුතු.

පටිලද්ධෙ නිමිත්තස්මිං, පිළිලද නිමිත්හි; එවං, මෙසේ; ඉමං අප්පනාකොසල්ලං, මේ දසවැදෑරුම්වූ අර්පණාකෞශල්‍යය; සම්පාදයතො, සපයන්නහුට; අප්පනාසම්පවත්තති, අර්පණා පවතී; එවම්පි පටිපන්නස්ස, මෙසේද පිළිපද නුවහට; සචෙ, ඉදින්; සා, ඒ අර්පණා තොමෝ; නප්පවත්තති, නොපවත්නේ නම්; තථාපි, එතකුදුවුවත්; න ජහෙ යොගං, භාවනා යොගය නොහරන්නේය; පණ්ඩිතො, නුවණැත්තේ; වායමෙථෙව, ව්‍යායාම කරන්නේමැයි. ("හිත්වාහි" යනැනහි ශබ්දය හෙතු ප්‍රයොජනය එහෙයින් "යස්මා ඨානමෙතං න විජ්ජති තස්මා," යි යොදනු) සම්මාවායාමං, සම්‍යග්ව්‍යායාමය; හිත්වා, හැර; පරිත්තම්පි විසෙසං නාම, මදද විශෙෂයකාටනම්; මාණවො, සත්ත්ව තො

මේ; අධිගචෙඡ, පැමිණෙන්නේය යන; එතංඨානං, මේ කාරණය; න විජ්ජති, යම්හෙයකින් නැද්ද; තසමා, එහෙයින්; විනාතපපවතානි ආකාරං, භාවනා සිත්හු ලීනුඩවම පිසින් පවත්නා ආකාරය; සල්ලකඛයං, සලකන්නාවූ; බුධො, නුවණැති යොගී තෙමේ; පුනපපුනං, නැවත නැවත; විරියසස සමතංයෙව, වීර්‍ය්‍යාගේ සමබවම; යොජයෙ, යොදන්නේය; ඊසකම්පි, මඳකුදු; ලයං යනතං, ලීන බවට යන්නාවූ; මානසං, සිත; පගගණෙහඑව, හුවන්නේමය; අච්චාරඬං, ඉතා උඩඟුවූසිත; නිසෙධෙතවා, වළකා; සමමෙව, සමකොටම; පවතතයෙ, පවත්වන්නේය; රෙණුමහි, මල්රොන්හිද; උප්පලදලෙ, මහනෙල් පෙත්තෙහිද; සුතෙත, මකුළුහුයද; නාවාය, නැවද; නාළියා, තෙල් නළද; මධුකරාදීනං, මීමැසි සලඹෙවද්‍ය ආදීන්ගේ; පවතති, ප්‍රවෘත්ති තොමෝ; යථා, යම්සේ; සමපවණණිතා (උපමා භාවයෙන් අටුවාසෙහි) වණිනාකරණලදද; එවං, එපරිද්දෙන්ම; ලීන උඩතභාවෙහි, ලීන බැවින් උඩත බැවින්; සබබසො මොචයිතවා, සංසකාරයන් සර්වාකාරයෙන් මුදා; නිමිතතාභිමුඛං, ප්‍රතිභාග නිමිත් අභිමුඛකොට; මානසං, සිත; පටිපාදයෙ, මෙහෙයනනා—

(භා *)

නොසත්හුන් පුද්ගලයන් දුරුකිරීමනම් ධ්‍යාන ප්‍රතිපත්තියට නොපිළිපන්නාවූ නොයෙක් කටයුතුතෙහි නියුක්තවූ විපිළිසර සිතැති පුද්ගලයන් දුරින්ම දුරිකිරීමයි. සත්හුන් පුද්ගලයන් සෙවීමනම් ධ්‍යාන ප්‍රතිපත්තියට පිළිපන්නාවූ සමාධිලාභී පුද්ගලයන් කරු කලින්කල එළඹීමයි. තදධිමුක්තතානම් සමාධි උපදවනු කැමති බවයි හෙවත් සමාධියම ගරුකොට ගැන්ම හෝ සමාධීයෙහිම නැමී පවත්නා බව හෝ සමාධියම පිරිසිදු සථානකොට ඇති බව හෝ සමාධියට අභිමුඛව පවත්නා බව හෝයි. මෙසේ මේ දශ ප්‍රකාරවූ අර්පණා කෞශල්‍යය සැපයිය යුත්තේයි. ලබනලද ප්‍රතිභාග නිමිත්තයෙහි මෙසේ මේ දශවැදෑරුම් අර්පණා කෞශල්‍යය සපයන යොගාවචරයාහට අර්පණා සමාධිය උපදනේයි ඉදින් මෙසේද පිළිපදනාවූ යොගාවචරයාහට ඒ අර්පණා සමාධිය නොඋපදීනම එපමණකින් භාවනාවෙහි යෙදීම අත්නොහරණේය නුවණැති යොගාවචර තෙම මතුමතුයෙහි උත්සාහ වඩන්නේයි. යම්හෙයකින් සත්ව තෙමේ සම්‍යග් ව්‍යායාමය හැර සවල්ප මාත්‍රවූද විශෙෂයකට පැමිණෙන්නේය යනමේ කාරණය ලොකයෙහි අවිද්‍යමානවේද එහෙයින් භාවනා චිත්තය හැකිළීම් උඩඟුවීම් ආදි වශයෙන් පවත්නා ආකාරය සලකන්නාවූ යොගාවචර තෙම නැවත නැවත වීර්‍ය්‍ය සමතවයම යොදන්නේයි. එසේම සවල්ප මාත්‍රවූ හැකිළීමකට පැමිණෙන්නාවූ සිත එසේ හැකිළිය නොදී උත්සාහවත් කරන්නේමය එපරිද්දෙන් ඉතා උඩගුවූ සිත ඖද්ධත්‍යයෙන් වළකා සමකොට පවත්වන්නේයි

භාවද මල්රොන්ය මහනෙල් මල් පෙතිය මකුළුහුය නැවය තෙල් නළය යනමෙහි මීමැස්සාය සල්ලඹෙවද්‍ය ශිෂ්‍යයාය මකුළුහුයගන්නා පුරුෂයාය නැව පදින්නාය තෙල් වත්කරණ ශිෂ්‍යයාය යන මොවුන්ගේ පැවැත්ම අටුවායෙහි යම්සේ උපමා භාවයෙන් වණිතාකරණලදද එපරිද්දෙන්ම හැකිළෙන බවය උඩගුවන බවය යන මෙයින් සර්වප්‍රකාරයෙන් මුදා නිමිත්තට අභිමුඛකොට සිත මෙහෙයන්නේයි—

( පා † )

තත්‍රායං අත්ථදීපනා —

යථාහි අතිඡේකො මධුකරො අමුකස්මිං රුක්ඛෙ පුප්ඵං පුප්ඵිතන්ති සුත්වා තික්ඛෙන වෙගෙන පක්ඛන්තො තං අතික්කමිත්වා පටිනිවත්තන්තො ඛීණෙ රෙණුම්හි සම්පාපුණාති — අපරො අඡෙකො මන්දෙන ජවෙන පක්ඛන්තො ඛීණෙයෙව සම්පාපුණාති — ඡෙකොපන සමෙන ජවෙන පක්ඛන්තො සුඛෙන පුප්ඵරාසිං සම්පත්වා යාවදිච්ඡකං රෙණුං ආදාය මධුං සම්පාදෙත්වා මධුරසං අනුභවති — යථාච සල්ලකත්ත අන්තෙවාසිකෙසු උදකථාලගතෙ උප්පලපත්තෙ සත්ථකම්මං සික්ඛන්තෙසු එකො අතිඡෙකො වෙගෙන සත්ථං පාතෙන්තො උප්පලපත්තං ද්විධා ඡින්දති උදකෙවා පවෙසෙති — අපරො අඡෙකො ඡිජ්ජනපවෙසනභයා සත්ථකෙන ඵුසිතුම්පි නවිසහති — ඡෙකොපන සමෙන පයොගෙන තත්ථ සත්ථපදං දස්සෙත්වා පරියොදාත සිප්පො හුත්වා තථාරූපෙසු ඨානෙසු කම්මං කත්වා ලාභං ලභති — යථාච යො චතුබ්‍යාමප්පමාණං මක්කටසුත්තං ආහරති සො චත්තාරි සහස්සානි ලභතීති රඤ්ඤා වුත්තෙ එකො අතිඡෙකො පුරිසො වෙගෙන මක්කටසුත්තං ආකඩ්ඪන්තො තහිං තහිං ඡින්දතියෙව අපරො අඡෙකො ඡෙදනභයා හත්ථෙන ඵුසිතුම්පි නවිසහති — ඡෙකොපන කොටිතො පට්ඨාය සමෙන පයොගෙන දණ්ඩකෙ වෙඨෙත්වා ආහරිත්වා ලාභං ලභති — යථාච අතිඡෙකො නියාමකො බලවවාතෙ ලංකාරං පූරෙන්තො නාවං විදෙසං පක්ඛන්දාපෙති අපරො අඡෙකො මන්දවාතෙ ලංකාරං ඔරොපෙන්තො නාවං තත්ථෙව ඨපෙති — ඡෙකොපන මන්දවාතෙ පූරෙන්තො බලවවාතෙ අඩ්ඪලංකාරං කත්වා සොත්ථිනා ඉච්ඡිතට්ඨානං පාපුණාති — යථාච යො තෙලං අඡඩ්ඩෙන්තො නාළිං පූරෙති සො ලාභං ලභතීති ආචරියෙන අන්තෙවාසිකානං වුත්තෙ එකො අතිඡෙකො ලොභපකතො වෙගෙන පූරෙන්තො තෙලං ඡඩ්ඩෙති — අපරො අඡෙකො තෙලඡඩ්ඩනභයා ආසිඤ්චිතුම්පි නවිසහති — ඡෙකොපන සමෙන පයොගෙන පූරෙත්වා ලාභං ලභති —

( ස † )

තත්‍ර, මේ ගාථා දෙක්හි; අයං, මේ; අත්ථදීපනා, උපමෝපමෙය්‍යාර්ථ හැඟවීමයි; යථා, යම්සේ; අතිඡෙකො මධුකරො, ඉතා දක්‍ෂවූ මධුකර තෙමේ; අමුකස්මිං රුක්ඛෙ, අසුවල් රුක; පුප්ඵං පුප්ඵිතන්ති සුත්වා, මල්පිපිනැයි දැන; තික්ඛෙන වෙගෙන පක්ඛන්තො, තීක්‍ෂණවූ වේගයෙන් දිවන්නේ; තං අතික්කමිත්වා, ඒ රුක ඉක්මැ; පටිනිවත්තෙන්තො, නැවත එන්නේ; ඛීණෙ රෙණුම්හි සම්පාපුණාති, රේණුව ක්‍ෂීණවූ කල්හි පැමිණෙන්නේද (යම් හෙයකින් පිපි කෙණෙහි මල්රොන් සුරසේද පසුව වාතාදියෙන් විගුළේ හෝ විරසවේද එහෙයින් "ඛීණෙ රෙණුම්හි සම්පාපුණාති"යි කීහු) අපරො, අනික්; අඡෙකො, දක්‍ෂනොවූ; මධුකරයෙක්; මන්දෙන ජවෙන පක්ඛන්තො, මඳවූ ජවයෙන් දිවන්නේ; ඛීණෙයෙව සම්පාපුණාති, ක්‍ෂීණ කල්හිම පැමිණෙන්නේද; ඡෙකො පන, දක්‍ෂවූ මධුකර තෙමේ; සමෙන ජවෙන පක්ඛන්තො, සමවූ ජවයෙන් දිවන්නේ; සුඛෙන, සුවයෙන්ම; පුප්ඵරාසිං පත්වා, වෘක්‍ෂ ශාඛායෙහි නිචිත මල් රැසට පැමිණ; මධුං සම්පාදෙත්වා,

මධුව සම්පාදනය කොට; මධුරසං අනුභවති, මධු රසය විඳී; යථාච, යම්සේ; සල්ලකත්ත අන්තෙවාසිකෙසු, ශල්‍යකර්මය දන්නා ඇදුරන්ගේ අතවැසියන්; උදකථාලගතෙ උප්පලපත්තෙ, දියතලියෙහි ලූ මහනෙල්මල් පෙත්තෙහි; සත්ථකම්මං සික්ඛන්තෙසු, සිරවේධාදී ශස්ත්‍රකර්මය හික්මෙන්නවුන් කෙරෙහි; එකො, එකෙක්; අතිඡෙකො, ඉතා දක්‍ෂවූයේ; වෙගෙන සත්ථං පාතෙන්තො, වේගයෙන් ශස්ත්‍රය හෙළන්නේ; උප්පලපත්තං, මහනෙල් පෙත්ත; විභාජිතැති, දෙකක් කොට හෝ සිඳීනේද; උදකෙවා පවේසෙති, දියෙහි හෝ ප්‍රවේශ කෙරේද; අපරො, අනික්; අඡෙකො, දක්‍ෂනුවූ අතවැසි; ඡින්නප්පවේසන භයා, පෙත්ත කැපියේද්දෝ හෝ දියෙහි ගැලියේද්දෝ හෝ යන භයින්; සත්ථෙන ඵුසිතුම්පි න විසහති, සැතින් පහරවන්නටවද නොපොහොසත්වේද; ඡෙකො පන, දක්‍ෂවූ අතවැසි වනාහි; සමෙන පයොගෙන, සම්ප්‍රයොගයෙන්; තත්ථ, උප්පල පත්‍රයෙහි; සත්ථපදං දසෙසත්වා, සැත්පද දක්වා; පරියොදාතසිප්පො හුත්වා, පිරිසිදුවූ ශිල්ප ඇත්තේ; තථාරූපෙසු ඨානෙසු, එබඳු සැත්කම් කටයුතු තැන්හි; කම්මං කත්වා, ශස්ත්‍රකර්ම කොට; ලාභං ලභති, ලාභය ලැබේද; යථාච, යම්සේ; යො, යමෙක්; චතුව්‍යාමප්පමාණං මක්කටසුත්තං, සතරබඹ පමණ මකුළුහුයක්; ආහරති, ගෙණේද; සො චත්තාරි සහස්සානි ලභතීති, හේ සාරදහසක් ලැබෙයි; රසැඳු වූහොත, රජහු කී හල්හි; අතිඡෙකො පුරිසො, ඉතා දක්‍ෂවූ පුරුෂයෙක්; වෙගෙන මක්කටසුත්තං ආකඩ්ඪෙන්තො, වේගයෙන් මකුළුහුය හයන්නේ; තහිං තහිං ඡිජ්ජති යෙව, ඒ ඒ තන්හි සිඳියන්මවේද; අපරො, අනික්; අඡෙකො, නොදක්‍ෂවූ පුරුෂයෙක්; ඡෙදන භයා, කැඩෙයි යන භයින්; හත්ථෙන ඵුසිතුම්පි න විසහති, අතින් පහරණට නොද පොහොසත්වේද; ඡෙකො පන, දක්‍ෂ පුරුෂ වනාහි; කොටියෙහා පට්ඨාය, කෙළවර පටන්ගෙණ; සමෙන පයොගෙන, සමවූ ප්‍රයොගයෙන්; දණ්ඩකෙ වෙඨෙත්වා, මකුළුහුය දණ්ඩෙක වෙළාගෙණ; ආහරිත්වා, ගෙණඇර; ලාභං ලභති, ලාභ ලැබේද; යථාච, යම්සේ; අතිඡෙකො නියාමකො, ඉතා දක්‍ෂවූ නියමුවා; බලවවාතෙ, බලවත් වාතයෙහි; ලකාරං පූරෙන්තො, රුවල පුරා පවන් ගන්වන්නේ; නාවං, නැව; විදෙසං පක්ඛන්දාපෙති, නොදෙසට පමුණුවන්නේද; අපරො, අනික්; අඡෙකො, අදක්‍ෂවූ නියමුවෙක්; මන්දවාතෙ, මදවාතයෙහි; ලකාරං ඔරොපෙන්තො, රුවල බහන්නේ; නාවං තත්ථෙව ඨපෙති, නැව එතනම සිටුවාද; ඡෙකො පන, දක්‍ෂ නැවැත්තේ වනාහි; මන්දවාතෙ, මදවාතයෙහි; පූරෙන්තො, රුවල පුරන්නේ; බලව වාතෙ, බලවත් වාතයෙහි; අඩ්ඪලකාරං කත්වා, අඩලකාරකොට; සොත්ථිනා, සුවෙන්; ඉච්ඡිතං ඨානං පාපුණාති, කැමති තැනට පැමිණෙන්නේද; යථාච, යම්සේ; යො, යමෙක්; තෙලං අඡඩ්ඩෙන්තො, තෙල් නොඉස්නේ; නාළිං පූරෙති, නළ පිරැවීනම්; සො, හෙතෙම; ලාභං ලභතීති, ලාභ ලැබෙයි; ආචරියෙන අන්තෙවාසිකානං වුත්තෙ, ආචාරීන් විසින් අතවැසියන්ට කීකල; එකො, එකෙක්; අතිඡෙකො, ඉතා දක්‍ෂවූයේ; වෙගෙන පූරෙන්තො, වහා පුරන්නේ; තෙලං ඡඩ්ඩෙති, තෙල් ඉස්නේද; අපරො, අනික්; අඡෙකො, අදක්‍ෂයෙක්; තෙලඡඩ්ඩන භ

යා, තෙල් ඉසේද්දෝහෝ යන හයින්; ආසිඤ්චිතුම්පි නවිසහති, වත්කොට ලන්නවද නොපොහොසද්ද; ඡෙකො පන, දක්‍ෂතම වනාහි; සම්මාපයොගෙන පූරෙත්වා, සම්ම ප්‍රයොගයෙන් පුරාලා; ලාභං ලභති, ලාභ ලැබේද—

( ගා । )

ඒ ගාථා දෙක්හි උපමා උපමෙය අර්ථ හැඟවීම් වශයෙන් මෙතැන් පටන් අර්ථය ප්‍රකාශකරණු ලැබේ. කෙසේදයත්? යම්සේ අතිදක්‍ෂවූ මීමැසෙක් අසවල් රුක මල් පිපිනැයි දැන තියුණු වේගයෙන් දිවන්නාහු ඒ රුක ඉක්මනොස් නැවත හැරී ආපසු එන්නාහු සුලං ආදියෙන් මල් රෙණු ක්‍ෂයව ගියකලම පැමිණෙන්නේය. අනික් අදක්‍ෂවූ මීමැස්සෙක් වේගයෙන් දිවන්නාහු කල් ඉක්මීමෙන් මල් රෙණු ක්‍ෂයව ගිය කල්හිම පැමිණෙන්නේය දක්‍ෂවූ මීමැසිවනාහි තියුණුනොවූද නොමදවූද සමජව වේගයෙන් දිවන්නාහු සැපසේම වෘක්‍ෂ ශාඛාවන්හි පිපියාවූ මල් රුසට පැමිණ කැමති පමණ මල්රොන් ගෙණම මී බැඳ මධු රස අනුභවකරන්නේය යම්සේ ශල්‍යකාර්‍ය දන්නා වෛද්‍යාචාරීන් ලඟ දිය හැටියෙහි තුබූ මහනෙල් පතෙහි නහර විදුම් ආදී ශස්ත්‍ර කර්‍මයෙහි හික්මෙන්නාවූ අතවැස්සන් අතුරෙන් එක්තරා අති දක්‍ෂවූ අතවැස්සෙක් තියුණු වේගයෙන් ශස්ත්‍රය එලන්නේ මහනෙල්පත දෙබෑකොට පලන්නේ හෝ වෙයි දියෙහි ගැලෙන්නේ හෝ වෙයි අනික් අදක්‍ෂවූ අතවැසියෙක් මහනෙල් පත කැපියේද්දෝහෝ ගිලියේදෝ හෝයි යන හයින් ශස්ත්‍රය ලංකරන්නවද නොපොහොසත් වන්නේය. දක්‍ෂවූ අතවැසි වනාහි තියුණුනොවූද නොමදවූද සමවූප්‍රයොගයෙන් ඒ මහනෙල් පතෙහි ශස්ත්‍ර පද දක්වා පිරිසිදු ශිල්ප ගුණයෙන් එබඳු සැත්කම් කටයුතු තන්හි ශස්ත්‍රකම් කොට ලාභ ලබන්නේය. තවද යම්සේ යම්කිසිවෙක් සතර බඹ ප්‍රමාණ මකුළුහුයක් ගෙණෙන්නේනම් හෙතෙම සාරදහසක් වස්තුලබන්නේයයි රජවිසින් අණබෙර ලැවූකල්හි අතිදක්‍ෂවූ යම්පුරුෂයෙක් තියුණු වේගයෙන් මකුළුහුය අදනාහු ඒ ඒ තැන සිඳීගොස්මවෙයි අනික් අදක්‍ෂවූ පුරුෂයෙක් සිඳෙයි යන හයින් අතින් අල්වන්නවද නොපොහොසත්වෙයි දක්‍ෂවූ පුරුෂයා වනාහි තියුණුනොවූද නොමදවූද සමවූප්‍රයොගයෙන් කෙළවරපටන් අල්වා දණ්ඩෙහි වෙළා මකුළුහුය ගෙණගැරදී ලාභ ලබන්නේයි. තවද යම්සේ අතිදක්‍ෂවූ නැව් පදින්නෙක් බලවත් සුලඟෙහි රුවල පුරා සුලං ගන්වන්නේ නැව විදෙශයට පමුණුවාලන්නේවෙයි අනික් අදක්‍ෂවූ නැව් පදින්නෙක් මඳ සුලඟෙහි රුවල තගන්නේ නැව එතනම සිටින්නේවෙයි දක්‍ෂවූ නැව පදින්නා වනාහි මඳ සුලඟෙහි රුවල පවනින් පුරවන්නේ තද සුලඟෙහි අඩ රුවල හසන්නේ සැපසේ කැමති තොටට පැමිණෙන්නේවෙයි. තවද යම්සේ යමෙක් තෙල් නොවිසුරුවා තෙල් නල පුරාඑයේ විනම් හෙතෙම මෙතෙක් ලාභ ලබන්නේයයි ආචාර්‍ය්‍යයා විසින් අතවැස්සන්ට කීකල අතිදක්‍ෂවූ එක්තරා ශිෂ්‍යයෙක් තියුණු වේගයෙන් තෙල් නල පුරාලන්නේ තෙල් විසුරුවන්නේයි අනික් අදක්‍ෂවූ අතවැස්සෙක් තෙල් විසිරේද්දෝහෝයි යන හයින් තෙල් වත්කරන්නවද නොපොහොසත්වෙයි දක්‍ෂවූ අතවැසියා වනාහි තියුණුනොවූද නොමදවූද සමවූ ප්‍රයොගයෙන් තෙල්නලපුරා වත්කොට දී ලාභ ලබන්නේවෙයි—

( පා ‡ )

එවමෙවංඛො භික්ඛු උප්පන්නෙ නිමිත්තෙ සීඝමෙව අප්පනං පාපුණිස්සාමීති ගාළ්හං විරියං කරොති තස්ස චිත්තං අච්චාරද්ධ විරියත්තා උද්ධච්චෙ පතති න සක්කොති අප්පනං පාපුණිතුං එකො අච්චාරද්ධ විරියතාය දොසං දිස්වා කිංදානි මෙ අප්පනායාති විරියං හාපෙති තස්ස චිත්තං අතිලීන විරියත්තා කොසජ්ජෙ පතති සොපි න සක්කොති අප්පනං පාපුණිතුං යො පන ඊසකම්පි ලීනං ලීනභාවතො උද්ධතං උද්ධච්චතො මොචෙත්වා සමෙන පයොගෙන නිමිත්තාභිමුඛං පවත්තෙති සො අප්පනං පාපුණාති තාදිසෙන භවිතබ්බං ඉමමත්ථං සන්ධායෙතං වුත්තං–

රේණුම්හි උප්පලදලෙ
සුත්තෙ නාවාය නාළියා
යථා මධුකරාදීනං
පවත්ති සම්පවණ්ණිතා–
ලීන උද්ධතභාවෙහි
මොචයිත්වාන සබ්බසො
එවං නිමිත්තාභිමුඛං
මානසං පටිපාදයෙ'ති–

---

( ස ‡ )

එවමෙව, එපරිද්දෙන්ම; එකො භික්ඛු, එක් මහණෙක්; උප්පන්නෙ නිමිත්තෙ, පිළිබිඹු නිමිත් උපන් කල්හි; සීඝමෙව අප්පනං පාපුණිස්සාමීති, වහාම අපුන් පැමිණෙමියි; ගාළ්හං විරියං කරොති, වීර්යතර කෙරෙයි; තස්ස චිත්තං, ඔහුගේ සිත; අච්චාරද්ධ විරියත්තා, ඉතා වඩනලද වීර්ය ඇති බැවින්; උද්ධච්චෙ පතති, උද්ධත බැව්හි හෙයි; න සක්කොති අප්පනං පාපුණිතුං, එහෙයින්ම අර්පණාවට පැමිණෙනුවට නොපොහොසත්වෙයි; එකො, එකෙක්; අච්චාරද්ධ විරියතාය, ඉතා වඩනලද වීර්ය ඇති බැවිනි; දොසං දිස්වා, දොස් දැක; කිංදානි මෙ අප්පනායාති (ලද්දවු රක්ෂාකොරම්යි) දැන් මට අර්පණාවෙන් කිමෙක්දැයි; විරියං හාපෙති, වීර්ය පිරිහෙළාද; තස්ස චිත්තං, ඔහුගේ සිත; අතිලීන විරියත්තා, හැකුළුණු වීර්ය ඇති බැවින්; කොසජ්ජෙ පතති, කුසීත බව හෙයි; සොපි, හේද; න සක්කොති අප්පනං පාපුණිතුං, අර්පණාවට පැමිණෙනුවට නොපොහොසත්වෙයි; යො පන, යමෙක් වනාහි; ඊසකම්පි, මඳකුදු; ලීනං, ලීන වූ සිත; ලීන භාවතො, ලීන බැවින්ද; උද්ධතං, උද්ධත සිත; උද්ධච්චතො, උද්ධත බැවින්ද; මොචෙත්වා, මුදා; සමෙන පයොගෙන, සමවූප්‍රයොගයෙන්; නිමිත්තාභිමුඛං පවත්තෙති, පිළිබිඹු නිමිත්තට අභිමුඛකොට පවත්වාද; සො, හෙතෙම; අප්පනං පාපුණාති, අපුන් පැමිණෙයි; තාදිසෙන භවිතබ්බං, එබඳු වහු විසින් වියයුතු; ඉමමත්ථං සන්ධායෙතං වුත්තං, මේ අර්ථය සඳහා මේ කියනලදී–පෙ–

---

( භා ‡ )

එපරිද්දෙන්ම එක් යොගාවචර මහණෙක් ප්‍රතිභාග නිමිත්ත උපන් කල්හි වහාම අර්පණා සමාධියට පැමිණෙමියි සිතා දැඩිතර වීර්ය කෙරේද ඒ යොගාවචරයාගේ සිත දැඩිතර වීර්යය කාරණකොටගෙණ උද්ධත බැව්හි වැටීමෙන් අර්පණාවට නොපැමිණිය හැකි වන්නේය ඇතැම් යොගාවචරයෙක් දැඩිතර වීර්යකිරීමෙහි දොස් දැක අර්පණා සමාධියෙන් මට කවර ප්‍රයොජනද මේ ලබනලද ප්‍රතිභාග නිමිත්තම රක්නෙමියි වීර්ය පිරිහෙළා නම් ඒ යොගීහුගේ සිත හැකුළුනු වීර්ය ඇති බැවින් කුසීත බැව්හි වැටෙන්නේයි.

එබැවින් ඒ යෝගාවචරයාද අර්පණා සමාධියට නොපැමිණියහැකි වන්නේය යම් යෝගාවචරයෙක් තෙමේ මදකුදු හැකුළුනාවූ සිත ඒ හැකිළීමෙන්ද උඩගුවූ සිත ඒ උඩගු බැවින්ද මුදා සම ප්‍රයෝගයෙන් ප්‍රතිභාග නිමිත්තට අභිමුඛකොට මෙහෙයානම් ඒ යෝගාවචරයාව අර්පණාසමාධියට පැමිණෙන්නේයි. එහෙයින් යථොක්තාකාරයෙන් හැකිළීමෙන්හා උඩගු බැවින් සිත මුදා භාවනා කටයුත්තේයි මේ අර්ථය සඳහා මල්රොන්ය මහතෙල්පත්‍රය යනාදීන්ගේ පැවැත්ම අටුවාවෙහි උපමා වශයෙන් වර්ණනාකරණලද පරිද්දෙන් භාවනා සිත හැකිළීමය උඩගු බවය යනාදියෙන් සර්වප්‍රකාරයෙන් මුදා ප්‍රතිභාග නිමිත්තට අභිමුඛව සිත මෙහෙයන්නේය යනුවම් ගාථා යුග්මය කියනලදැයි දතයුත්තේයි.—

( ෂා ¶ )

එවං නිමිත්තාභිමුඛං මානසං පටිපාදයතො පනස්ස ඉදානි අප්පනා ඉජ්ඣිස්සතීති භවඞ්ගං උපච්ඡින්දිත්වා පඨවී පඨවීති අනුයෝගවසෙන උපට්ඨිතං තදෙව පඨවීකසිණං ආරම්මණං කත්වා මනොද්වාරාවජ්ජනං උප්පජ්ජති තතො තස්මිං යෙවාරම්මණෙ චත්තාරි පඤ්චවා ජවනානි ජවන්ති තෙසු අවසානෙ එකං රූපාවචරං සෙසානි කාමාවචරානි පකති චිත්තෙහි බලවතර විතක්ක විචාරපීතිසුඛ චිත්තෙකග්ගතානි යානි අප්පනාය පරිකම්මත්තා පරිකම්මානීතිපි යථාගාමාදීනං ආසන්නප්පදෙසො ගාමූපචාරො නගරූපචාරොති වුච්චති එවං අප්පනාය ආසන්නත්තා සමීපචාරිත්තාවා උපචාරානීතිපි ඉතො පුබ්බෙ පරිකම්මානං උපරි අප්පනායච අනුලොමතො අනුලොමානීතිපි වුච්චන්ති යඤ්චෙත්ථ සබ්බන්තිමං තං පරිත්තගොත්තාභිභවනතො මහග්ගත ගොත්ත භාවනතො ච ගොත්‍රභූතිපි වුච්චති අගහිත ගහණෙනපි පනෙත්ථ පඨමං පරිකම්මං දුතියං උපචාරං තතියං අනුලොමං චතුත්ථං ගොත්‍රභු පඨමංවා උපචාරං දුතියං අනුලොමං තතියං ගොත්‍රභු චතුත්ථං පඤ්චමංවා අප්පනා චිත්තං චතුත්ථමෙවහි පඤ්චමංවා අප්පෙති තඤ්ච ඛො ඛිප්පාභිඤ්ඤ දන්ධාභිඤ්ඤ වසෙන තතොපරං ජවනං පතති භවඞ්ගස්ස වාරො හොති— ආභිධම්මික ගොදත්තත්ථෙරො පන "පුරිමා පුරිමා කුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං කුසලානං ධම්මානං ආසෙවන පච්චයෙන පච්චයො"ති ඉමං සුත්තං වත්වා ආසෙවන පච්චයෙන පච්ඡිමො පච්ඡිමො ධම්මො බලවා හොති තස්මා ඡට්ඨෙපි සත්තමෙපි අප්පනා හොතීති ආහ තං අට්ඨකථාසු අත්තනො මතිමත්තං ථෙරස්සෙතන්ති වත්වා පටික්ඛිත්තං චතුත්ථ පඤ්චමෙසු යෙව පන අප්පනා හොති පරතො ජවනං පතිතං නාම හොති භවඞ්ගස්ස ආසන්නත්තාති වුත්තං එවං විචාරෙත්වා වුත්තත්තා නසක්කා පටික්ඛිපිතුං යථාහි පුරිසො ඡින්නතටාභිමුඛො ධාවන්තො ඨාතුකාමොපි පරියන්ත පාදං කත්වා ඨාතුං නසක්කොති පපාතෙ එව පතති එවං ඡට්ඨෙවා සත්තමෙවා අප්පෙතුං නසක්කොති භවඞ්ගස්ස ආසන්නත්තා තස්මා චතුත්ථ පඤ්චමෙසු යෙව අප්පනා හොතීති වෙදිතබ්බා.—

( ෂ ¶ )

එවං, මෙසේ කී නියෙන්; නිමිත්තාභි මුඛං, නිමිත්තට අභිමුඛකොට; මානසං පටිපාදයතො පන, සිත පිළිපදනාවූ; අස්ස, ඒ යෝගීහට (වීරියසමතා

යොජනා වශයෙන් වීථි පිළිපන් භා
වනාවනස පිළිබා නිමිත්ති භිබිම් වශ
යෙන් නිමිත්තාභිමුඛකොට පිළිපන්
නාවූ යොගි භවය යන අර්ථයි) ඉදනි,
දූන්; අප්පනා ඉජ්ඣිස්සතීති, අපීනා
ව සිඩවෙයි කීහද; භවඞ්ගං උපච්ඡිජ්ජි
ත්වා, භවාඞ්ග සිඳගෙණ ("මනොවාරා
වජ්ජන මුප්පජ්ජති" යනුහා යොදනු)
පඨවි පඨවීති අනුයොගවසෙන උප
ට්ඨිතං, පඨවි පඨවි යන භාවනානු
යොග වශයෙන් වැටහුනු; තදෙව ප
ඨවි කසිණං, එම පඨවි කිසුණ; ආර
ම්මණං කත්වා, එම පිළිබා නිමිත් අරමු
ණුකොට; මනොවාරාවජ්ජනං උප්ප
ජ්ජති, මුනිදෙර අවජුන් සිත උපද්දී;
තතො, ඉක්බින්තෙන්; තස්මිං යෙවා
රම්මණෙ, එම පිළිබා නිමිත් අරමුණෙ
හි; චත්තාරි පඤ්චවා ජවනානි ජව
නානි, ජවන්හු සතරදෙනෙක් හෝ
පස්දෙනෙක් හෝ දිවෙත්; තෙසු, ඔවු
න් කෙරෙහි; අවසානෙ, කෙළවර;
එකං, එකම ජවන් සිත; රූපාවචරං,
රූපාවචරවෙයි; සෙසානි, සෙස්සෝ;
කාමාවචරානි, කම්වැජරිවෙත්; පකති
චිත්තෙහි, පියවිකම්වැජරි සිතුන්ට ව
ඩා; බලවතර, ඉතා බලවත්වූ; විත
ක්කවිචාරපීති සුඛචිත්තෙකග්ගතානි,
විතක්ක විචාර ප්‍රීතිය සුඛය චිත්තෙක
ග්‍රතාය යන මොවුන් ඇත්තාහුවෙ
න්; යානි, යම් ජවන කෙණෙක්; අප්ප
නාය පරිකම්මත්තා, අපීණාවට පරික
ම් බැවින් (පටිසඞ්ඛාරක වන බැවින්
යන අර්ථයි) පරිකම්මානීතිපි, පරිකම්හ
යි කියා; යථා, යම්සේ; ගාමාදීනං ආ
සන්නදෙසො, ග්‍රාමාදීන්ට ආසන්න
දෙශය; ගාමූපචාරො නගරූපචාරො
ති වුච්චති, ග්‍රාමොපචාරය නගරොප
චාරයයි කියනු ලැබේද; එවං, එපරිද්
දෙන්; අප්පනාය ආසන්නත්තා, අපී
ණාවට ආසන්න බැවින්; සමීපචාරි
ත්තාවා, සමීපයෙහි හැසිරෙණ හෙයි

න් හෝ; උපචාරානීතිපි, උපචාරහයි
කියාද (ආසන්න හෙයින් උපචාර බව
වේනම් ගොත්‍රභූ හ?ම උපචාර සංඥ
වන්නේයයි "සමීපචාරිත්තාවා" යුහු-
අත්‍යාසන්න නුවූයේද ඉතා දුරුනො
වත්තේ සමීපාචාරි නම්වේ "අප්පනං
උපෙච්ච උපචාරානි චරන්තීති උපචා
රා" යනුවේ) ඉතො පුබ්බෙ පරිකම්මා
නං, මෙයින් පෙරටු නාභාවජ්ජන වීථි
පරිකර්ම්යන්ටද; උපරි අප්පනායච, ම
තුයෙහි අපීණාවටද; අනුලොමත්ත
තො, අනුලොම් වන බැවින්; අනුලො
මානීතිපි, අනුලොමයහයි කියාද; වුච්ච
න්ති, කියනු ලැබේද්ද; එහි, මේ පරි
කම් උපචාර අනුලොමනම් ජවනයන්
කෙරෙහි; යඤ්චසබ්බන්තිමං, යමෙක් ස
ර්වාන්තිමද; තං, හේ; පරිත්තගොත්තා
භි භවනතො, පරිත්ත ගොත්‍රය මඩනා
හෙයින්ද; මහග්ගත ගොත්ත භාවන
තො, මහග්ගත ගොත්‍රය උපදවනා හෙ
යින්ද; ගොත්‍රභූති වුච්චති, ගොත්‍රභූය
යි කියනුලැබේ (මෙහි "පරිත්තය" ය
න නාමද බුද්ධියද පරීත්ත ගොත්‍ර නම ම
හග්ගත ගොත්‍රයෙහිද මෙම නයයි.
මෙම කීහ—"ගන්තායතීති ගොත්තං ප
රිත්තන්ති පවත්තමානං අභිධාන බුද්ධි
ච එකංසිකං විය තායති රක්ඛතීති ප
රිත්ත ගොත්තං යථාති වුච්චති ආරම්ම
ණ භූතෙන ගොත්තෙන විනා න වත්
තති එවං අභිධානං අභිධෙය්‍යභූතෙ
න තස්මා සොතානි තායති රක්ඛතීති
වුච්චති තං පන මහග්ගතානුත්තර වි
ධුරං කාමතණ්හාය ගොචරභූතං කා
මාවචර ධම්මානං ආවෙණිකං රූපං
දට්ඨබ්බං මහග්ගත ගොත්තෙපි ඉමිනා
ව නයෙන අත්ථො වෙදිතබ්බො"යි. ස
න්තානයෙහි වනාහි පරිත්ත ගොත්තාභි
භවනතො, කාම්වැජරිනම් මඩනා බැ
වින්; මහග්ගත ගොත්ත භාවනතො

ච, රූපාවචරිනම් උපයන බැවිනැයි
කීහු. (එහෙයින් පරිත්තය යන නමද
බුඬියද මඬනා හෙයිනුදු මහග්ගතය
යන නමද බුඬියද උපදවන හෙයිනුදු
ගොත්‍රභූ නමැයි දතයුතු) අගහීත ගහ
ණෙනපි පන, අගෘහීතග්‍රහණයෙනුදු
චනාහි (අවිශෙෂයෙන් සියල්ලමව ප
රිකර්මාදි සංඥනුයි. ප්‍රථමහය ගෘහීත
ග්‍රහණ බැවින් "අගහිත ගහණෙනපි
පන"යි කීහු) එළු, මෙහි; පඨමං පරි
කම්මං, පළමුවන ජවනය පරිකර්ම න
ම්වෙයි; දුතියං උපචාරං, දෙවන ජව
නය උපචාර නම්වෙයි; තතියං, තුන්
වන ජවනය; අනුලොමං, අනුලොම
නම්වෙයි; චතුත්ථං ගොත්‍රභූ, සතරව
න ජවනය ගොත්‍රභූ නම්වේ (නානාව
ජ්ජන පරිකර්මයම පරිකර්මවන බැවින්
"පඤ්චමංවා" යනාදී කීහු) චතුත්ථං
අප්පනා චිත්තං, සතරවන සිත අර්
ණාසිතවේ; පඤ්චමංවා අප්පනා චිත්
තං (ඉදින් යටකී නයින් සතරවනුව
ගොත්‍රභූනම්) පස්වන සිත හෝ අර්
ණාවේ (යන අදහසයි) චතුත්ථමෙව, සත
රවන සිත හෝ; පඤ්චමංවා, පස්වන
සිත හෝ; අප්පෙති, අර්පණාවේ; තඤ්
චඛො, හෙද; ඛිප්පාභිඤ්ඤ දන්ධාභි
ඤ්ඤ වසෙන, ක්ෂිප්‍රාභිඥය දන්ධාභිඥය
යන ලැබුවුන්ගේ වශයෙනි (ක්ෂිප්‍රාභි
ඥය හට සතරවනුවවෙයි දන්ධාභිඥය
හට පස්වනුවවෙයි යන අදහසයි) ත
තො පරං, පඤ්චම ජවනයා ගෙ
රෙන් මත්තෙහි (සවන සත්වන ජව
නය) පතති, හේ; භවඞ්ගස්සවාරො
හොති, භවාඞ්ගයාගේ වාරයවේ (භවා
ඞ්ගාසන්න බැවින්ම පරික්ෂීණ ජවන
හෙයින් හෙත්නක්හුමෙන් වෙයි සේ
යි) ආභිධම්මික ගොදත්තත්ථෙරො ප
න, ආභිධර්මික ගොදත්ත නම් තෙර
හු; පුරිමපුරිමා කුසලාධම්මා, පළමු ප
ළමු කුශල ධර්මයෝ; පච්ඡිමානං පච්ඡි
මානං කුසලානං ධම්මානං, පසුපසු
කුශල ධර්මයන්ට; ආසෙවන පච්චයෙ
න පච්චයොති, ආසෙවන ප්‍රත්‍යයෙන්
ප්‍රත්‍යයවෙයි යන; ඉමං සුත්තං වත්වා,
මේ සූත්‍රය කියා; ආසෙවන පච්චයෙන,
ආසෙවන ප්‍රත්‍යය බලයෙන්; පච්ඡිමො
පච්ඡිමො ධම්මො බලවාහොති, පශ්චිම
පශ්චිම ධර්මය බලවත්වෙයි; තස්මා, එ
හෙයින්; ඡට්ඨෙපි සත්තමෙපි අප්ප
නාහොතීති ආහ, සවන්හෙහිදු සත්
වන්හෙහිදු අර්පණාවෙයි කීහු (යම්සේ
ආසෙවන නොලද ප්‍රථම ජවනය දුර්ව
ල බැවින් ගොත්‍රභූව ඉපදවිය නොහේ
ද ආසෙවනලද දෙවන තුන්වන ජව
නය බලවත් බැවින් තුන්වන සතරව
න ගොත්‍රභූව ඉපදවියහේද ආසෙවන
ලදින් බලවත් බැවින් සවන සත්වන
ජවනය අර්පණාවෙයි යනු තෙරුන්
ගේ අභිප්‍රායයි) තං, ඒ තෙරුන්ගේ ව
චනය ("පටික්ඛිත්තං"යි යොදනු. මතු
යෙහි "වුත්තං" යනු "අට්ඨකථාසු" ය
නු හා යොදනු) අත්තනොමතිමත්තං
ථෙරස්සතනාති (සූත්‍ර සූත්‍රානුලොම
ආචාර්‍යවාද යන මෙයින් අනුපස්තම්
භිත බැවින්) ස්ථවිරයන්ගේ අත්ත
නොමති පමණකැයි; පටික්ඛිත්තං,
ප්‍රතික්ෂෙපකරණලදී (ආසෙවන නො
ලද ප්‍රථම චෙතනාව දෘෂ්ටධර්මවෙදනීය
වන බැවිනුදු ආසෙවනලද දෙවන
චෙතනාවෙහි පටන් සවන චෙතනාව
දක්වා අපරාපරිය වෙදනීයවන බැවි
නුදු ආසෙවන ප්‍රත්‍යය ලාභයාගේ බල
ව භාවයෙහි අනෙකාන්තිකවන බැවි
න් "පුරිමා පුරිමා කුසලාධම්මා" යන
සූත්‍ර පදයද අකාරණවේ) චතුත්ථ
~~~පෙ~~~ වුත්තං, යටකියනලදම
අර්ථ යුක්ති දක්වන මුඛයෙන් නිගමන
ය පිණිස කීහු; තං, ඒ වචනය; එවං
විචාරෙත්වා, මෙසේ පරීක්ෂාකොට; වුත්
තත්තා, කීහෙයින්; තස්සායා පටික්ඛි
ත්තං, ප්‍රතික්ෂෙපකරන්නට නොපිළිව
නි (ඉදින් සවන සත්වන ජවන පරි
~~~

ක්ෂීණජව ඇති හෙයින් පතිතවේගවූ සත්වන ජවන චේතනාව කෙසේ උපපද්‍යවේදනීයද ආනන්තරිකද වේදයත්? මේ විශේෂය අනන්තර ප්‍රත්‍යය ලද්දින්වූ බලවත් බැවින් නොවෙයි. වැලි කිමෙක්දයත්? ක්‍රියාවස්ථා විශේෂ හෙයිනි ක්‍රියාවස්ථාවනාහි ආරම්භ මධ්‍ය පර්‍යවසාන වශයෙන් ත්‍රිවිධවෙයි. එහි පර්‍යවසානාවස්ථාව සන්නිෂ්ඨාපක චේතනා බැවින් උපපද්‍ය වේදනීයද ආනන්තරිකද වෙයි බලවත් බැවින් නොවෙයි දතයුතු ප්‍රතිසන්ධියට ප්‍රත්‍යයවන විපාක සන්තානයෙහි සත්වන චේතනාව අනන්තර ප්‍රත්‍යය භාවයෙන් වාසිතව ගිය බැවිනුදු යෙත් මෙම කීහ. "පටිසන්ධියා අනන්තර පච්චය භාවිතො විපාකසන්තානස්ස අනන්තරප්පච්චය භාවෙන තථා අභිසඞ්ඛටත්තාති වදන්ති"යි එහෙයින් සත්වන ජවනයෝ ප්‍රපාතාභිමුඛව පරික්ෂීණ ජව ඇති බැවින් චලනානුවට නොපිළිවන් වෙත්. එහෙයින් කීහ. ("යථාභිතස්සාදී") යථා, යම්සේ; පුරිසො, පුරුෂ තෙමේ; ඡින්නතටාභිමුඛො, ඡින්නවූ කුලපාශ්වයට අභිමුඛව; ධාවන්තො, දිවන්නේ; ඨාතුකාමොපි, සිටිනා කැමතිවූයේද; පරියන්තපාදං කාණ්ඩාඨාතුං න සක්කොති, පර්‍යන්තයෙහි (කෙලවර) පය තබා සිටිනට නොපොහොසත්වේද; පපාතෙ ච්පතති, ප්‍රපාතයෙහිම හෝද; එවං, එපරිද්දෙන්ම; ඡට්ඨෙවා සත්තමෙවා, සවන්නෙහි හෝ සත්වන්නෙහිහෝ; අප්පෙතුං නසක්කොති, අර්පණාවන්නට නොපොහොසති; භවඞ්ගස්ස ආසන්නත්තා, භවාඞ්ගයට ආසන්නහෙයින —පෙ—

( භා¶ )

මෙසේ කී නියායෙන් ප්‍රතිභාග නිමිත්තට අභිමුඛකොට භාවනා සිත මෙහෙයන්නාවූ ඒ යෝගාවචරයා හට දැන් අර්පණාසමාධිය උපදීයයි කියයුතු කල හෙවත් අර්පණාසමාධිය උපදනා සමයෙහි භවාඞ්ගශ්‍රොතස සිඳ පඨවි පඨවි යන භාවනානුයොග වශයෙන් වැටහුනු එම පෘථිවීකසිණයෙන් උපදවාගන්නාලද ප්‍රතිභාග නිමිත්ත අරමුණුකොටගෙණ මනොද්වාරාවර්ජන සිත උපදනේය. ඉක්බිති එම ප්‍රතිභාග නිමිත්තාරම්මණයෙහිම ජවනයෝ සතරදෙනෙක් හෝ පස්දෙනෙක් හෝ දිවන්නාහුය ඔවුන් අතුරෙන් කෙලවර එකම ජවන චිත්තය රූපාවචර ධ්‍යානනම. සෙසු ජවන චිත්තයෝ කාමාවචරයෝම්මැයි. එතකුදුවුවත් ඒ කාමාවචර ජවනයෝ ප්‍රකෘති කාමාවචර ජවනයන්ට වඩා බලවත්වූ විතර්ක විචාර ප්‍රීති සුඛ ඒකාග්‍රතා යන මොවුන්ගෙන් යුක්තවූවාහුවෙති. ඒ ජවනයන් අතුරෙන් පලමුවන සිත අර්පණා සිත පිළියෙලකරණ බැවින් පරිකර්ම යයි කියාද දෙවන සිත ගාමාදීන්ගේ ආසන්නය ග්‍රාමොපචාරය නගරොපචාරය යනාදීන් ව්‍යවහාරකරන්නාක් මෙන් අර්පණා සිතට ලංවූ බැවින්හෝ අර්පණා සිත ලඟ හැසිරෙන බැවින් හෝ උපචාරයයි කියාද තුන්වන සිත මෙයින් පෙරටු අනික් අනික් ආවර්ජනා වීථින්ගේ පරිකර්ම සිතකටද මතුයෙහි අර්පණාවටද අනුලෝමවන බැවින් අනුලෝමයයි කියාද ව්‍යවහාරකරණලද්දේයි. තවද මේ පරිකර්මාදී සිත් අතුරෙන් හැමටම කෙලවරවූ යම් සිතක් වේද ඒ සිත කාමාවචර ගොත්‍රය මැඩපවත්වන හෙයින්ද මහද්ගත ගොත්‍රය උපදවන බැවින්ද ගොත්‍රභූයයි කියනලද්දේයි තවද අගෘහීත ග්‍රහණ න්‍යායයෙනුදු මේ සිත් අතුරෙන් පල

පළමුවන ජවනය පරිකර්මනම් දෙවන ජවනය උපචාර නම් තුන්වන ජවනය අනුලෝමනම් සතරවන ජවනය ගොත්‍රභූනම් එසේම නානාවර්ජන පරිකර්මය හෙවත් පූර්වවූ ධ්‍යාන වීථියෙක පරිකර්ම සිත පසුවූ ධ්‍යාන වීථියකට පරිකර්ම විය හැකි බැවින් පෙර ධ්‍යාන උපදවනලද විරූ සොභාවචරයෙක් හට පරිකර්ම සිත නූපදනා ධ්‍යාන වීථියෙහි පළමුවන සිත උපචාර නම්. දෙවන සිත අනුලෝම නම්. තුන්වන සිත ගෝත්‍රභූ නම් සතරවන සිත අර්පනා නම් වන්නේයි. ඉදින් මෙබඳු නියාමයෙන් සතරවන සිත ගොත්‍රභූවීනම් පස්වන සිත අර්පණා නම් වන්නේයි මෙහි වනාහි සතරවන ජවනය හෝ පස්වන ජවනය හෝ අර්පණාවේමය හේද ක්ෂිප්‍රාභිඥයා හට සතරවන සිතද දන්ධාභිඥයා හට පස්වන සිතද අර්පනා වෙයි ඉන් මතුනි භවාඞ්ගාසන්න බැවින් ජවනය වැටෙන්නාක්මෙන් පවත්නේයි. මෙහි වනාහි ආභිධර්මික නොදතත් සර්වඥයන්වහන්සේ පෙරවූ පෙරවූව උපදනා කුශල ධර්මයෝ පසු පසුව උපදනා කුශල ධර්මයන්ට ආසෙවන ප්‍රත්‍යය වශයෙන් උපකාරවෙතැයි යන පට්ඨාන මහාප්‍රකරණගත පාලි ප්‍රදේශය උදාහරණකොට එළවා ආසේවන ප්‍රත්‍යයෙන් පසුපසුව උපදනා ධර්මය බලවත්වන බැවින් සවන සිත හෝ සත්වන සිත හෝ අර්පණාවෙයි කීහ. යම්සේ ආසෙවන ප්‍රත්‍යය නොලත් ප්‍රථම ජවන චෙතනාව දෘෂ්ටධර්ම වේදනීය වශයෙනුද සවන චෙතනාව දක්වා අපරාපරිය වේදනීය වශයෙනුද විපාක දෙද්ද එහෙයින් ආසෙවන ප්‍රත්‍යය ජවනයන් බලවත්වීමට ඒකාන්ත හේතු නොවන්නේය ඒ මතය ඒ ගොදතත සර්වඥයන්ගේම කල්පනා මාත්‍රයෙකැයි අටුවාහි ප්‍රතික්ෂෙප කරණලද්දේය. එහෙයින්, සතරවන සිත හෝ පස්වන සිත හෝ අර්පණා වෙයි ඉන් මතුනී භවාඞ්ගයට ලංවූ බැවින් ජවනය වැටෙන්නේනම්වෙයි කියනලද්දේයි ඒ වචනය මෙසේ පරික්ෂාකොට කියනලද බැවින් ප්‍රතික්ෂෙප කරන්නාව නොහැක්කේය යම්සේ බිඳිගිය ඉවුරු ඇති වලක් ඉදිරියට දිවන්නාවූ පුරුෂ තෙම නවතිනු කැමැත්තේද බිඳිගිය ඉවුරු කෙලවර පය තබා නොනැවතිය හැකිවේද ප්‍රපාතයට ලංවූ බැවින් ඒ ප්‍රපාතයෙහිම වැටේද එපරිද්දෙන්ම භවාඞ්ගයට ලංවූ බැවින් සවනුව හෝ සත්වනුවහෝ අර්පණා වශයෙන් සිත පිහිටුවාලිය නොහැක්කේය එහෙයින් සතරවන සිත හෝ පස්වන සිත හෝ අර්පණා වන්නේයයි දතයුත්තේයි.

( පා* )

සාච පන එක චිත්තක්ඛණිකායෙව සත්තසු ඨානෙසු අද්ධාන පරිච්ඡෙදො නාම නත්ථි පඨමකප්පනායං ලොකියාභිඤ්ඤාසු චතූසු මග්ගෙසු මග්ගානන්තරඵලෙ රූපාරූපභවෙසු භවඞ්ගජ්ඣානෙ නිරොධස්ස පච්චයෙ නෙවසඤ්ඤානාසඤ්ඤායතනෙ නිරොධාවුට්ඨහන්තස්ස ඵලසමාපත්තියනායි එත්ථ මග්ගානන්තරං ඵලං තිණ්ණං උපරි නහොති නිරොධස්ස පච්චයො නෙවසඤ්ඤානාසඤ්ඤායතනං චිත්තං උපරි නහොති රූපාරූප භවෙසු භවඞ්ගස්ස පරිමාණං නත්ථි සෙසට්ඨානෙසු එකමෙව චිත්තං හොති ඉති එකචිත්තක්ඛණිකායෙව අප්පනා නතො භවඞ්ගපාතො අථ භවඞ්ගං වොච්ඡින්දිත්වා ඣානං පච්චවෙක්ඛණත්ථාය ආවජ්ජනං නතො ඣානපච්චවෙක්ඛණානි ... චතාපගෙහස චිච්ඡෙදචච කාමෙහි විවිච්චෙව

අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති එවමෙතෙන පඤ්චඞ්ගවිප්පහීනං පඤ්චඞ්ගසමන්නාගතං තිවිධකල්‍යාණං දසලක්ඛණසම්පන්නං පඨමජ්ඣානං අධිගතං හොති පඨවිකසිණං.

( ස* )

තාව පන, ඒ අර්පණාද; එකචිත්තක්ඛණිකායෙව, එක චිත්තක්ෂණිකම වේ; සත්තසුහිඨානෙසු, සත් තැනෙක; අද්ධානපරිච්ඡෙදෙ නත්ථි, කාලපරිච්ඡේදයෙක් නැති (එකවර සත් තැන වද යෙන්) පඨමකප්පනායං, පළමුව හා අර්පණාවෙහි ය; ලොකියාභිඤ්ඤාසු, ලෞකික අභිඥාවන් කෙරෙහි ය; චතූසු මග්ගෙසු, සතර මාර්ගයෙහි ය; මග්ගානන්තරඵලෙ, මාර්ගානන්තර ඵලයෙහි ය; රූපාරූපභවෙසු භවඞ්ගජ්ඣානෙ, රූපාරූප භවයෙහි භවාඞ්ග සඞ්ඛ්‍යාත ධ්‍යානයෙහි ය; නිරොධස්ස පච්චයෙ, නිරොධ සමාපත්තියට ප්‍රත්‍යයවූ; නෙවසඤ්ඤානාසඤ්ඤායතනෙ, නෙවසංඥානාසංඥායතනයෙහි ය; නිරොධාවුට්ඨහන්තස්ස, නිරොධයෙන් නැගෙන්නහුගේ; ඵලසමාපත්තියං, ඵලසමාපත්තියෙහි ය යන මේ සත් තැන්හි (“සත්තසු ඨානෙසු” යනු භාවනාධිකාර බැවින් සෙසු ධර්ම නොකියා භාවනා බලයෙන් වන මහද්ගත ධර්ම හා ලොකොත්තර ධර්ම පිණිස කීහු) එත්ථ, මෙහි; මග්ගානන්තරං ඵලං, මාර්ගානන්තර ඵලය; තිණ්ණං උපරි න හොති, තුන් දෙනකු කෙරෙන් මත්තෙහි නොවේ; නිරොධස්ස පච්චයො නෙවසඤ්ඤානාසඤ්ඤායතනං, නිරොධයට ප්‍රත්‍යයවූ නෙවසංඥානාසංඥායතනය; චිත්තං උපරි න හොති, දෙදෙනකු කෙරෙන් මත්තෙහි නොවේ; රූපාරූපභවෙසු, රූපාරූප දෙක්හි; භවඞ්ගස්ස පරිමාණං නත්ථි, භවාඞ්ගයෙහි පමණ නැති; සෙසට්ඨානෙසු, ප්‍රථමාර්පණාය ලෞකික අභිඥාය මාර්ගක්ෂණය නිරොධයෙන් නැගෙන්නහුගේ ඵලක්ෂණය යන මේ සතර තැන්හි; එකමෙව චිත්තං හොති, එකම චිත්තයෙක් වේ; ඉති, මෙසේ; එකචිත්තක්ඛණිකායෙව අප්පනා, අර්පණා තොමෝ එක චිත්තක්ෂණිකාමවේ (මෙහි රූපාරූප භවයෙහි සෙසු අරමුණු සිත් නොපවත්නා සඳ භවාඞ්ග සිත් මෙතෙක්ම දවස් පවත්නේයයි කාල පරිමාණයක් නැති බැවින් අද්ධාන පරිච්ඡේදය නැතැයි කීහ. සෙසු තැන්හි කාලපර්යන්ත බැවින් අද්ධාන පරිච්ඡේද ඇතැයි කීහු) තතො, ඒ අර්පණාවට ඉක්බිතිව; භවඞ්ගපාතො, භවාඞ්ගපාතයවේ; අථ, ඉක්බිතෙන්; භවඞ්ගං වොච්ඡින්දිත්වා, භවාඞ්ගය සිඳගෙණ; ඣානපච්චවෙක්ඛණත්ථාය, ධ්‍යාන ප්‍රත්‍යවෙක්ෂාකරණ පිණිස; ආවජ්ජනං, මනොද්වාරාවර්ජනයවේ; තතො, ඉක්බිතෙන්; ඣානං පච්චවෙක්ඛති, ධ්‍යානප්‍රත්‍යවෙක්ෂාවන්නේයි; එත්තාවතා, මෙපමණ භාවනා ක්‍රමයකින්; එස, මේ යොගීතෙමේ; විවිච්චෙව කාමෙහි, කාමයන් කෙරෙන් වෙන්වම; විවිච්ච අකුසලෙහි ධම්මෙහි, අකුශල ධර්මයන් කෙරෙන් වෙන්වම; සවිතක්කං, විතර්ක සහිතවූ; සවිචාරං, විචාර සහිතවූ; විවෙකජං, විවෙකයෙහි උපන්; පීතිසුඛං, ප්‍රීතිසුඛඇති; පඨමජ්ඣානං, ප්‍රථම ධ්‍යානය; උපසම්පජ්ජ, උපදවා; විහරති, වෙසේ; අනෙන, මේ ප්‍රථම ධ්‍යානය උපදවා වසන්නහු විසින් (“තෙනෙව පඨමජ්ඣානං අධිගතං හොති පඨවිකසිණං”ති සම්බන්ධකරණු) පඤ්චඞ්ගවිප්පහීණං, ප්‍රහීණවූ

කාමච්ඡන්දාදි පඤ්චාඞ්ගයන් ඇරි; පඤ්චාඞ්ග සමන්නාගතං, විතර්කාදි පඤ්චාඞ්ගයෙන් සමන්විතවූ; ත්‍රිවිධ කල්‍යාණං (ආදි කල්‍යාණාදි) ත්‍රිවිධ කල්‍යාණයන් ඇති; දසලක්ඛණ සම්පන්නං, (ආදිමධ්‍ය පර්‍ය්‍යවසානයන්ගේ ලක්ෂණ වශයෙන්) දශලක්ෂණයෙන් යුක්තවූ; පඨවිකසිණං, පෘථිවි කසිණවූ; පඨමජ්ඣානං, ප්‍රථමධ්‍යානය; අධිගතං හොති, පැමිණෙනලද්දේවී.

( හා † )

ඒ අර්පණාසංඛ්‍යාත චිත්තය චනාහි එකක්ෂණිකවම්වන්නේය ඒ එසේමැයි සප්තජවනවීථි සඞ්ඛ්‍යාතවූ කාලනියමය කිසිතැනෙක අප්‍රමාණචිත්තක්ෂණ උපදනාබැවින්ද කිසිතැනෙක ලුනා [illegible] ලේපවශයෙන් උපදනාබැවින් ද සත්තැනෙක නොලැබෙන්නේය ඒ කවර සත්තැනෙක්දයත්? පළමුවන අර්පණාවය ලෞකික අභිඥාවෝය සතරමාර්ග චිත්තයෝය මාර්ගයට අනන්තරව උපදනා ඵලචිත්තය රූපාරූප භවයෙහි භවාඞ්ග සඞ්ඛ්‍යාත ධ්‍යාන චිත්තය නිරෝධ සමාපත්තියට ප්‍රත්‍යයවූ නෙවසඤ්ඤානාසඤ්ඤායතනධ්‍යාන චිත්තය නිරෝධ සමාපත්තියෙන් නැගෙන්නහුගේ ඵලසමාපත්ති චිත්තය යනමේ සත්තැන ජවනවීථීන්ගේ කාලනියමය නැත්තේයයි දතයුතු. කවද [illegible] සිත්ප්‍රවෘත්ති [illegible] චිත්තය ජ [illegible] නන්නේ කා ල පරිච්ඡේදය නොන්නේද මේ භාව නාසිතාර්ථයකි [illegible] නො නොව භාවනා නිලය [illegible] මාර්ගය හා ලෞකික [illegible] නිර්වානුයම් කියැවි ච සත්තැනෙහිතැයි කියයි දතයුතු. මේ සත්තැන් අනුලෝමිඥ මාර්ග [illegible] යට අනන්තරව උපදනා ඵල ජවනය තුන්වරයක් වැඩිවද නිරෝධ සමාපත්තියට කාරණවූ නෙවසඤ්ඤානා සඤ්ඤායතන ධ්‍යාන ජවනය දෙවර කින් වැඩිවද නොවන්නේය රූපාරූප භවයෙහි භවාඞ්ගසඞ්ඛ්‍යාත ධ්‍යාන චිත්තයන්ගේ ප්‍රමාණයක් නැත්තේය පළමුවන අර්පණා ජවනය ලෞකික අභිඥ ජවනය මාර්ග ජවනය නිරෝධ යෙන් නැගෙන්නහුගේ ඵල ජවනය යන මේ සතර තැන්හි එකම ජවන චිත්තක්ෂණයක්වන්නේයි. මෙසේ අර්පණා සංඛ්‍යාත චිත්තය එකක්ෂණිකව වන්නේයයි දතයුතු. මෙසේ මේ අර්පණාචිත්තය එක්වරක් ඉපිද නිරුද්ධවූ ඉක්බිති සිත භවාඞ්ගයට වැටෙන්නේය ඊට අනතුරුව ඒ භවාඞ්ගය ඉක්ම නස සිඳගෙණ ධ්‍යාන ප්‍රත්‍යවෙක්ෂාවිෂ ණිස මනොද්වාරාවර්ජන සිත ඉපිද නි රුද්ධවීමට අනතුරුව එකෙකී ධ්‍යානා ඞ්ගයක් ප්‍රත්‍යවේක්ෂාකිරීම් වශයෙන් ප්‍රත්‍යවේක්ෂා ජවනවිථි පසක් උපදනා හුය මෙසේ මේ යොගාවචර මහණ මෙපමණ භාවනා ක්‍රමයකින් රූපාදි පඤ්චකාමයෙන් වෙන්වීමෙන්හා වි තර්ක විචාර යනාදිවූ විවේකයෙන්ද උපන් ප්‍රීති සැප ඇතිවූ ප්‍රථමධ්‍යා නය උපදවා වාසයකරන්නේයි. මෙ සේ මේ ප්‍රථමධ්‍යානය උපදවා වසන් නහු විසින් කාමච්ඡන්දාදි පඤ්චාඞ්ග යන් ප්‍රහීණකරණලද විතර්කාදි පඤ්චා ඞ්ගයෙන් සමන්විතවූ ආදිකල්‍යාණාදි ත්‍රිවිධ කල්‍යාණයෙන්හා ආදි මධ්‍ය පර්‍ය්‍යවසානාදි දශලක්ෂණයෙන් ද යු ක්තවූ පෘථිවි කසිණය අරමුණුකොට ඇති ප්‍රථමධ්‍යානය ලබනලද්දේනම් වන්නේයි.

( හා ‡ )

තවද විවිච්චෙව කාමෙහි කාමෙහි විවිච්චව, විනාභූත්වා, අපක්කමිත්වා යො පනායමෙත්ථ එවකාරො සො නියමත්ථොති වෙදිතබ්බො, යස්මාච නියමත්ථො තස්මා තස්මිං පඨමජ්ඣා

නං උපසම්පජ්ජවිහරණසමයෙ අවිජ්ජමානානම්පි කාමානං තස්ස පඨමජ්ඣානස්ස පටිපක්ඛභාවං කාමපරිච්චාගෙනෙව චස්ස අධිගමං දීපෙති. කථං විවිච්චෙව කාමෙහීති එවංහි නියමෙ කයිරමානෙ ඉදං පඤ්ඤායති නූනමිමස්ස ඣානස්ස කාමා පටිපක්ඛභූතා යෙසු සති ඉදං නප්පවත්තති අන්ධකාරෙ සති දීපොභාසොවිය තෙසං පරිච්චාගෙනෙව චස්ස අධිගමො හොති ඔරිමතීර පරිච්චාගෙන පාරිමතීරස්සෙව තස්මා නියමං කරොතීති.

( ශ ‡ )

තත්, ඒ ධ්‍යානපූර්වභාගයෙහි; විවිච්චෙව කාමෙහි, යන්නෙහි (විවිච්චිත්වාසී-සේහි) විනාභූත්වා, වෙන්ව; අපක්කමිත්වා, ප්‍රහාණවශයෙන් පහව; එත්, විවිච්චෙව යනමෙහි; යො පනායං එවකාරො, යම් එවකාරයෙක් ඇද්ද; සො, හෙතෙම; නියමත්ථොති වෙදිතබ්බො, නියමයාර්ථයයි (අවධාරණාර්ථයයි) දතයුතු; යස්මා චනියමත්ථො, යම්හෙයකින් නියමාර්ථද; තස්මා, එහෙයින්; තස්මිං පඨමජ්ඣානං උපසම්පජ්ජවිහරණසමයෙ, ඒ ප්‍රථමධ්‍යානයට පැමිණවසන සමයෙහි; අවිජ්ජමානානම්පි කාමානං, අවිද්‍යමානවූද කාමයන්ගේ; තස්ස පඨමජ්ඣානස්ස පටිපක්ඛභාවං, ඒ ප්‍රථමධ්‍යානයට ප්‍රතිපක්ෂබවද; කාමපරිච්චාගෙනෙව, කාමයාගේ පරිත්‍යාගයෙන්ම; අස්ස අධිගමඤ්ච, ඒ ධ්‍යානයාගේ අධිගමයද; දීපෙති, හඟවා; කථං, කෙසේදයත්? විවිච්චෙව කාමෙහීති, කාමයන්කෙරෙන් වෙන්වමයයි; එවං නියමෙ කයිරමානෙ, මෙසේ නියමකරණුලබන කල්හි; ඉදං පඤ්ඤායති, මේ පැණේ; නූන, එකාන්තයෙන්; ඉමස්ස ඣානස්ස, මේ ධ්‍යානයට; කාමා පටිපක්ඛභූතා, කාමයෝ ප්‍රතිපක්ෂයෝයි; යෙසු සති, යම් කාමකෙනෙකුන් ඇතිකල්හි; ඉදං නප්පවත්තති, මේ ධ්‍යානය නොපවතීද; අන්ධකාරෙ සති දීපොභාසොවිය, අන්ධකාරය ඇතිකල්හි ප්‍රදීපාලොකයමෙනි (අන්ධකාරෙසති—යනු ඇදිරිහයි අලු සංගම නොවැටෙන බැවින් කීහ යනු සතනයි "අන්ධකාරෙ සති දීපොභාසොවියාති එතෙන යථා පදීපොභාසාභාවෙන රත්තියං අන්ධකාරාභිභවො එවං ඣානාභාවෙන සන්තානස්ස කාමාභිභවොති දස්සෙති" යනු ටීකායි) තෙසං පරිච්චාගෙනෙව, ඒ කාමයන්ගේ පරිත්‍යාගයෙන්ම; අස්ස අධිගමො හොති, මේ ධ්‍යානයාගේ අධිගමයදවේ; ඔරිමතීර පරිච්චාගෙන, අවරිමතීරයාගේ පරිත්‍යාගයෙන්; පාරිමතීරස්සෙව, පාරිමතීරයාගේ අධිගමයමෙනි; තස්මා, එහෙයින්; නියමං කරොතීති ඉදං පඤ්ඤායතීති-(යොදනු) නියමකරන්නේයි.

( භා ‡ )

ඒ ප්‍රථමධ්‍යානයෙහි පඤ්චකාම සම්පත්තීන්ගෙන් වෙන්වමය යනමෙහි ඒ කාමයන්ගෙන් පහව හෙවත් ප්‍රහාණ වශයෙන් දුරුව ප්‍රථමධ්‍යානය උපදවන්නේයයි දතයුතුයි. මෙහි වනාහි යම් එවකාරයෙක් ඇත්තේවේද ඒ එවකාරය නියමයාර්ථයෙහි වැටෙන්නේයයි දතයුත්තේය යම්හෙයකින් නියමාර්ථයෙහි වැටේද එහෙයින් ප්‍රථමධ්‍යානයට පැමිණවසන සමයෙහි අවිද්‍යමානවූ කාමච්ඡන්දාදී නීවරණයන් ප්‍රථමධ්‍යානයට ප්‍රතිපක්ෂබවද ඒ කාමයන්ගේ ප්‍රහාණවීමෙන්ම ප්‍රථමධ්‍යානයට පැමිණීමද හඟවන්නේයි. ඒ කෙසේදයත්? කාමයන්කෙරෙන් වෙන්වමයයි මෙසේ නියමකරණුලබන කල්හි එකා

කාමයන් මේ ධ්‍යානයට කාමයෝ ප්‍රතිපක්ෂයෝය රාත්‍රියෙහි ප්‍රදීපාලෝකය නැතිබැවින් අන්ධකාරය පැනිරෙන්නාක්මෙන් ඒ කාමයන් ඇති කල්හි මේ ධ්‍යානය නොපවත්නේය ගඞ්ගාවක මෙතෙර අත්හැරීමෙන් එතෙර ලැබෙන්නාක්මෙන් ඒ කාමයන් නොහැරීමෙන් ධ්‍යානය ලබන්නේ නොවෙයි එහෙයින් එවකාරයෙන් නියමකරන්නේය ගන්මේ අර්ථය ප්‍රකාශවන්නේයි—

---

( වා ෆ )

තත්‍ථ සියා කස්මා පනෙස පුබ්බපදෙයෙව වුත්තො න උත්තරපදෙ කිං අකුසලෙහි ධම්මෙහි අවිවිච්චාපි ඣානං උපසම්පජ්ජ විහරෙය්‍යාති න ඛො පනෙතං එවං දට්ඨබ්බං තන්නිස්සරණතොහි පුබ්බපදෙ එසො වුත්තො කාමධාතුසමතික්කමනතොහි කාමරාගපටිපක්ඛතොච ඉදං ඣානං කාමානමෙව නිස්සරණං—යථාහ කාමානමෙතං නිස්සරණං යදිදං නෙක්ඛම්මන්ති උත්තරපදෙපි පන යථා ඉධෙව භික්ඛවෙ සමණො ඉධ දුතියො සමණොති එත්‍ථ එවකාරො ආනෙත්වා වුච්චති එවං වත්තබ්බො නහිසක්කා ඉතො අඤ්ඤෙහිපි නීවරණසඞ්ඛාතෙහි අකුසලෙහි ධම්මෙහි අවිවිච්ච ඣානං උපසම්පජ්ජ විහරිතුං තස්මා විවිච්චෙව කාමෙහි විවිච්චෙව අකුසලෙහි ධම්මෙහීති එවං පදද්වයෙපි එස දට්ඨබ්බො පදද්වයෙපිච කිඤ්චාපි විවිච්චාති ඉමිනා සාධාරණවචනෙන තදඞ්ගවිවෙකාදයො විත්තවිවෙකාදයොච සබ්බෙපි විවෙකා සඞ්ගහං ගච්ඡන්ති තථාපි කායවිවෙකො චිත්තවිවෙකො වික්ඛම්භනවිවෙකොති තයො එව ඉධ දට්ඨබ්බා—කාමෙහීති ඉමිනා පන පදෙන යෙච නිද්දෙසෙ කතමෙ වත්‍ථු කාමා මනාපියා රූපාති ආදිනා නයෙන වත්‍ථුකාමා වුත්තා—යෙච තත්‍ථෙව විභඞ්ගෙච ඡන්දො කාමො රාගො කාමො ඡන්දරාගො කාමො සඞ්කප්පො කාමො රාගො කාමො සඞ්කප්පරාගො කාමොති ආදිනා—එවං කිලෙසකාමා වුත්තා තෙ සබ්බෙපි සඞ්ගහිතා ඉච්චෙව දට්ඨබ්බා එවංහිසති විවිච්චෙව කාමෙහීති වත්‍ථුකාමෙහිපි විවිච්චෙවාති අත්‍ථො යුජ්ජති තෙන කායවිවෙකො වුත්තො හොති විවිච්ච අකුසලෙහි ධම්මෙහීති කිලෙසකාමෙහි සබ්බාකුසලෙහිවා විවිච්චාති අත්‍ථො යුජ්ජති තෙනෙව චිත්තවිවෙකො වුත්තො හොති පුරිමෙනචෙත්‍ථ වත්‍ථුකාමෙහි විවෙකවචනතොඑව කාමසුඛපරිච්චාගො දුතියෙන කිලෙසකාමෙහි විවෙකවචනතො නෙක්ඛම්මසුඛපරිග්ගහො විභාවිතො හොති එවං වත්‍ථුකාම කිලෙසකාම විවෙකවචනතො යෙව එතෙසං පඨමෙන සංකිලෙසවත්‍ථුප්පහානං දුතියෙන සංකිලෙසප්පහානං පඨමෙන ලොලභාවස්ස හෙතුපරිච්චාගො දුතියෙන බාලභාවස්ස පඨමෙනච පයොගසුද්ධි දුතියෙන ආසයපොසනං විභාවිතං හොතීතිපි ඤාතබ්බං එස තාවනයො කාමෙහීති එත්‍ථ වුත්තකාමෙසු වත්‍ථුකාමපක්ඛෙ, කිලෙසකාමපක්ඛෙ පන ඡන්දොති ච රාගොතිච එවමාදීහි අනෙකභෙද කාමච්ඡන්දොයෙව කාමොති අධිප්පෙතො සොච අකුසලපරියාපන්නොපි සමානො තත්‍ථ කතමො කාමො ඡන්දො කාමොති ආදිනා නයෙන විභඞ්ගෙ ඣානපටිපක්ඛතො විසුං වුත්තො කිලෙසකාමත්තාවා පුරිමපදෙ වුත්තො අකුසලපරියාපන්නත්තා දුතියපදෙ අනෙකභෙදතොචස්ස කාමතොති අවත්වා කාමෙහීති වුත්තං අඤ්ඤෙසම්පිච ධම්මානං අකු

සලභාවෙව විජ්ජමානෙ තත්‍ථ කතමෙ අකුසලා ධම්මා කාමච්ඡන්දොති ආදිනා නයෙන විභඞ්ගෙ උපරිඣානඞ්ගපච්චනීක පටිපක්ඛභාවදස්සනතො නීවරණානෙව වුත්තානි නීවරණානිහි ඣානඞ්ගපච්චනීකානි තෙසං ඣානඞ්ගානෙව පටිපක්ඛානි විද්ධංසකානි විඝාතකානීති වුත්තං හොති තථාහි සමාධි කාමච්ඡන්දස්ස පටිපක්ඛො පීති ව්‍යාපාදස්ස විතක්කො ථිනමිද්ධස්ස සුඛං උද්ධච්චකුක්කුච්චස්ස විචාරො විචිකිච්ඡායාති පෙටකෙ වුත්තං.

( ස ¶ )

තත්‍ර, ඒ "විවිච්චෙව කාමෙහී" යන පදයෙහි; කියා, චොදකයෙක් වන්නේ සි; කස්මා පන, කුමක් හෙයින්; එස, මේ එවශබ්දය තොමෝ; පුබ්බපදෙයෙව පූර්වපදයෙහිම කියනලද්දේ ද; න උත්තරපදෙ, උත්තරපදයෙහි නොකියනලදද; කිං, කිම; අකුසලෙහි ධම්මෙහි අවිවිච්චාපි, අකුශලධර්මයන්කෙරෙන් වෙන් නොවද; ඣානං උපසම්පජ්ජ විහරෙය්‍යාති, ධ්‍යානය උපදවා වෙසේද යත්? එතං, මේ (පූර්වපදයෙහිම) අවධාරණ වචනය; න බොපන එවං දට්ඨබ්බං, එසේ දතයුතු නොවේ; තන්නිස්සරණතො, ඒ කාම නිස්සරණ හෙයින් (කාමයෙන් පහවීමක් කාමයාගේ අපවත්කිරීමක් බැවින් නැයි යන අර්ථයි) පුබ්බපදෙ, පූර්වපදයෙහි; එස, මේ එවශබ්දය; වුත්තො, කියනලදී; කාමධාතුසමතික්කමනතො, සියලු කාමභවයාගේ සමතික්‍රමනයට ප්‍රතිපක්ෂ බැවින්ද (මෙයින් කාමයාගේ කාමපරිඥාභාවය කීහු) කාමරාගපටිපක්ඛතො, වක්ෂ්‍යමාණ විභාග ඇති කෙලෙසකාමයට ප්‍රතිපක්ෂ බැවින්ද (මෙයින් ව්‍යාපාදයට ප්‍රතිපක්ෂ මෛත්‍රිය මෙන්ද විහිංසාවට ප්‍රතිපක්ෂ කරුණාව මෙන්ද ධ්‍යානය කාම රාගයට සෘජුප්‍රතිපක්ෂයයි දක්වා) ඉදං ඣානං, මේ ධ්‍යානය; කාමානමෙව නිස්සරණං, කාමයන්ගේම නිස්සරණයි "නිස්සරනති නිග්ගච්ඡනති එතෙන එතස්මාති නිස්සරණං යො හි තෙසං කාමානං නිස්සරණං පහාණං තන්නිස්සරණං-තතො"යි ගන්නේ-මෙසේ ධ්‍යානය කාමයාගේ ප්‍රවෘත්තීන්ද විපාකප්‍රවෘත්තීන්ද කාමරාගයෙනුත් කාමධාතුවෙනුත් එතිරෙහිසවභාවනුයි විශේෂයෙන් කාමයන්ගේම නිස්සරණයි) යථාහ, වදාළේමැයි; යදිදං නෙක්ඛම්මං, යම් මේ ධ්‍යානයෙක් ඇද්ද; එතං, මේ ධ්‍යානය; කාමනිස්සරණං, කාමයන්ගේ නිස්සරණ නුයි; උත්තරපදෙපි පන, උත්තර පදයෙහිදු ("විච්චෙව"යි යොදනු) යථා, යම්සේ; ඉධෙව භික්ඛවෙ සමණො ඉධ දුතියො සමණොති එත්, ඉධෙව භික්ඛවෙ සමණො ඉධ දුතියො සමණො- යන මෙහි; එවකාරෙ අනෙනො වුච්චති, එවකාරය දෙවනපදයට ගෙණ අවුත් කියනුලැබේද; එවං වත්තබ්බො, එසේම කියයුතුයි (ඉධෙව භික්ඛවෙ යනාදියෙහි) භික්ඛවෙ, මහණෙනි; සමණො (සෝවාන්) මහණද; ඉධෙව, මේ ශාසනයෙහිමය; දුතියො සමණො, දෙවන (සෙදගැමි අනාගැමි) මහණද; ඉධ, මේ ශාසනයෙහිමයයි (පදයම් දතයුතු) ඉතො, මේ කාමච්ඡන්දයෙන්; අඤ්ඤෙහිපි, අනෙ‍යවූ; නීවරණ සඞ්ඛාතෙහි අකුසලෙහි ධම්මෙහි, නීවරණ සඞ්ඛ්‍යාත අකුශල ධර්මයන් කෙරෙනුදු; අවිවිච්ච, වෙන් නොවී; ඣානං උපසම්පජ්ජ විහරිතුං, ධ්‍යානය උපදවා වසන්නට; න සක්කාති (යි යොදනු) නොපිළිවනි; තස්මා, එහෙයින්; විවිච්චෙව කාමෙහි, කාමයන් කෙරෙන් වෙන්වමැ; එවං, මෙසේ;

පදවිසෙයි, දෙපදයෙහි; එස, ඉමි නියමය; ද්විධෙවඛා, දනයුතු; පදවිසෙයිව, දෙපදයෙහිම; කිඤ්චාපි, කිසිසේත්; විවෙචවාති ඉමිනා සාධාරණවචනෙනා, විවිච්ච යන අවිශෙෂ වචනයෙන්; තදඞ්ගවිවෙකාදයො ච, තදඞ්ග විවෙකය විෂ්කම්භන විවෙකය සමුච්ඡෙද විවෙකය ප්‍රතිප්‍රශ්‍රබ්ධිවිවෙකය නිස්සරණ විවෙකය යන පඤ්චවිවෙකයෝද; චිත්තවිවෙකාදයො, චිත්ත විවෙකය කායවිවෙකය උපධි විවෙකය යන ත්‍රිවිධ විවෙකයෝදැයි; සබ්බෙ විවෙකා, සියලු විවෙකයෝ; සඞ්ගහංගච්ඡන්ති, සඞ්ග්‍රහයට යෙති; තථාපි, එසේ කුදුවූවත්; කායවිවෙකො, කායවිවෙකය; චිත්තවිවෙකො, චිත්තවිවෙකය; විකඛම්භනවිවෙකොති, විෂ්කම්භන විවෙකයයි; තයොඑව (සමුච්ඡෙද විවෙකාදීන් අසම්භව වන හෙයින්) මේ තුන්දෙනම; ඉධ, මේ ධ්‍යාන කථාවෙහි; දට්ඨබ්බා, දතයුත්තාහුයි; කාමෙහීති ඉමිනා පන පදෙන, කාමෙහි යනමේ පදෙන්; නිද්දෙසෙ, මහනිද්දෙස; කතමෙ වත්ථුකාමා, වස්තුකාමයෝ නම් කවරහ? මනාපියා රූපානි ආදිනානයෙන, මනාපියා රූපායතනාදී නයින්; යෙ වත්ථුකාමා වුත්තා, යම් වස්තුකාම කෙනෙකුන් කියනලදහුද; තෙසම්පි, එම නිද්දෙස්හිම; විභඞ්ගෙච, ධ්‍යාන විභඞ්ගයෙහිද; (යෙච කිලෙසකාමා වුත්තා-යි යොදනු "ඡන්දොකාමො" යනාදියෙහි අර්ථ මෙසේ දතයුතු-ප්‍රාර්ථනාකාරයෙන් ප්‍රවෘත්තවූ දුර්වලලොභය ඡන්දනාර්ථයෙන් ඡන්දනම්වූයේ කැමතිවනහෙයින් කාමනම්වේ-සෙස්සෙහිදු මෙම නයයි. එයට වඩා බලවත් ලොභය රඤ්ජනාර්ථයෙන් රාගනම්වේ එයට වඩා බලවත් බහලරාගය ඡන්දරාග නම්වේ නිමිත්තානුව්‍යඤ්ජනයන්ගේ සඞ්කල්පයට හෙතුවූ ලොභය සඞ්කල්පනම "නිමිත්තානුව්‍යඤ්ජනානි සඞ්කප්පෙති එතෙනාති සඞ්කප්පො තථා පවත්තො ලොභො" එයට වඩා බලවත්වූයේ රඤ්ජනාර්ථයෙන් රාගනම්වේ. සඞ්කල්පවශයෙන් ප්‍රවෘත්තවූ වෙසෙසින් බලවත්වූ ලොභය සඞ්කල්පරාගනම්වේ) ඉමෙ කිලෙසකාමාති වුච්චන්ති, මේ කෙලශකාමයහයි කියනුලැබෙත්; එවං කිලෙසකාමා වුත්තා, මෙසේ කෙලශකාමයෝ කියනලදහුද; තෙ සබ්බෙපි, වස්තුකාමය කෙලශකාමය යන හැමදෙනම, සඞ්ගහිතා ඉච්චෙව, සඞ්ග්‍රහකරණලදහයි; දට්ඨබ්බා, දතයුතුතාහුයි (මෙහි වස්තුකාමය කෙලශකාමයා විසින් කැමතිවනුලබානුයි "කාමියන්ති කාමා" යනුවෙයි. කෙලශකාමයා වස්තුකාමය කැමතිවේනුයි "කාමෙන්ති කාමා" යනුවේ) එවංහිසති, මෙසේ (කාමයන් දෙකාගේ සඞ්ග්‍රහයක්) ඇතිකල්හි; විවිච්චෙව කාමෙහීති, විවිච්චෙව කාමෙහි යන මෙහි; වත්ථුකාමෙහි විවිච්චෙවාති අත්ථො යුජ්ජති, වස්තුකාමයෙන් වෙන්වම යන අර්ථය යෙදේ; තෙන, ඒ වස්තුකාමයෙන්; කායවිවෙකො වුත්තොහොති (පුත්‍රදාරාදි පරිග්‍රහවිවෙකය හඟවනබැවින්) කායවිවේකය කියනලදවේ; විවිච්ච අකුසලෙහි ධම්මෙහීති, විවිච්ච අකුසලෙහි ධම්මෙහි යනුයෙහි; කිලෙසකාමෙහි, කෙලශකාමයන්ගෙන්; සබ්බාකුසලෙහි වා, සියලු අකුසලයන්ගෙන්හෝ; විවෙචාති, වෙන්වයයි; අත්ථොයුජ්ජති, අර්ථයෙදේ; තෙන. ඒ කෙලශකාම විවෙකයෙන්; චිත්තවිවෙකො වුත්තොහොති, චිත්තවිවේකය කියනලදවේ; එහි 'විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි" යන පදවියෙහි (මෙයින් නිර්ධාරිත විවේකද්වයෙහිහෝ) පුර්මෙන, කායවිවෙකයෙන්; වත්ථුකා

මෙහි විවේක වචනයෙනා එව, වස්තුකාමයෙන් විවේකය කියෙහයින්ම; කාම සුඛපරිච්චාගො, කාමසුඛයාගේ පරිත්‍යාගය (විභාවිතොහොතී යි යොදනු) දක්වයෙන, විත්තවිවේකයෙන්; ක්ලේශකාමෙහි විවේක වචනයෙනා, ක්ලේශකාමයෙන් විවේකය කියෙහයින්; නෙක්ඛම්ම සුඛපරිග්ගහො, ධ්‍යාන සුඛපරිග්‍රහය; විභාවිතොහොති, පහලකරණලද්දේවේ (අකුශල ශබ්දයෙන් ඉදිත් ක්ලේශකාමයගෙහෝ සියලු අකුසලධර්මයගෙහෝ ගෘහිතවූහමුදු හැමපරිද්දෙන්ම ක්ලේශකාමයෙන් විවේකය උපනාවේනු-යි "දුතියෙන ක්ලේශකාමෙහි විවේක වචනතො"යි කීහයි දතයුතු) එවං; මෙසේ; වත්ථු කාම ක්ලේශකාම විවේක වචනතො යෙව, වස්තුකාම ක්ලේශකාම විවේක වචනයෙන්ම; එතෙසං, යථොක්ත පදයන් දෙදෙනා අතුරෙන් (නිර්ධාරණයෙහි ෂෂ්ඨී යි) පඨමෙන, කායවිවේකයෙන්; සඞ්කිලෙස වත්ථුප්පහාණං, තෘෂ්ණාදි සංක්ලේශයන්ගේ උත්පත්තියට කාරණවූ වස්තූන්ගේ ප්‍රහාණය (විභාවිතංහොතියි- යොදනු) දුතියෙන, චිත්තවිවේකයෙන් (මතුයෙහිද "පඨමෙන දුතියෙන" යන්නෙහි කීනියෙන්ම අර්ථ යොදනු) සඞ්කිලෙසප්පහාණං, සංක්ලේශයාගේ ප්‍රහාණය; ලොලභාවස්ස හෙතුපරිච්චාගො, ඒ ඒ විෂයෙහි තෘෂ්ණොත්පාදසඞ්ඛ්‍යාත ලොලභාවයට හෙතුහුගේ පරිත්‍යාගය (වස්තුකාමයාගේ පරිත්‍යාගය යන අර්ථයි "බාලභාවස්ස හෙතුපරිච්චාගො"ය් යොදනු මෙහි බාලභාවනම් අවිජ්ජායි "දුච්චින්තිතචින්තී හොති" යනාදි හෝයි එයට අයොනිසොමනසිකාරයගෙහෝ සියලු අකුශලධර්මයෝගෙහෝ හෙතුනම්වෙනියි දතයුතු) පයොග සුද්ධි (කමටුණ ධර්මයට හෙතුවූ ප්‍රාණ වධාදීන් අකුශල ප්‍රයොගවනබැවින් තච්විවේකයෙන්) ප්‍රයොග ශුද්ධිය (විභාවිතවේ යන අර්ථයි) ආසයපොසනං, (තෘෂ්ණාසංක්ලේශ විශොධනයෙන්ද විවට්ටූපනිශ්‍රය ධ්‍යාන සංවර්ධනයෙන්දවන) අධ්‍යාසය විශොධනය; විභාවිතංහොති, විභාවිතවේයි; ඤාතබ්බං, දතයුතු; එසනාමනයො, මේ නයතෙමේ; කාමෙසුහි එත්වූතන, කාමෙහි යන මේ පෙදෙහි කියනලද; කාමෙසු, කාමයන්කෙරෙහි; වත්ථුකාමපක්ඛෙ, වස්තුකාම පක්ෂයෙහිය; සඞ්කිලෙස කාමපක්ඛෙපන, ක්ලේශ කාම පක්ෂයෙහි වනාහි; ඡන්දොතිච, ඡන්දයයිදු; රාගොතිච, රාගයයිදු; එවමාදීනි, මේ ආදී නයින්; අනෙකභෙදො (කාමාසව කාමරාග සංයොජනාදි වශයෙන්ද රූපතෘෂ්ණාදි වශයෙන්ද) අනෙකප්‍රභෙද ඇති; කාමච්ඡන්දොමෙව, කාමච්ඡන්දම්වූ ඡන්දය; කාමොති අධිප්පෙතො, කාමයයි අභිමතයි; සො ච, හෙද; අකුසල පරියාපන්නොපි සමානො, අකුශලයන්කෙරෙහි ඇතුළත්වූයේද; තත්ථ ... පෙ ... කතමො කාමච්ඡන්දො කාමොති" යනාදී නයින්; විභඞ්ගෙ, ධ්‍යාන විභඞ්ගයෙහි; ඣානපටිපක්ඛතොවා, ධ්‍යානයට ප්‍රතිපක්ෂබවහෙයින්හෝ; විසුං වුත්තො (අකුශල සාමාන්‍යයෙන් තොරණ) වෙන්කොට ස්වරූපයෙන් ගත්තාලදි; කිලෙස කාමතොවා, ක්ලේශකාමහෙයින්හෝ; පුරිමපදෙ වුත්තො, පූර්වපදයෙහි කියනලද; අකුසල පරියාපන්නත්තා දුතිය පදෙ, අකුසලයන්කෙරෙහි ඇතුළත්බැවින් දෙවනපෙදෙහි කියනලදී; අනෙකභෙදත්තාවස්ස, ඒ කාමයාගේ අනෙක භෙද ඇතිහෙයින්; කාමතොයි අවත්වා, කාමතොයි (එකවචනයෙන්) නොකියා; කාමෙහිති වුත්තං "කාමෙ

ති"යි බහුවචනයෙන් කියනලදී; අඤ්ඤසම්පි ධම්මානං, දෘෂ්ටිමානාදී අන්‍ය ධර්මයන්ගේද තත් සම්ප්‍රයුක්ත ස්පර්ශාදීන්ගේද; අකුසලභාවෙ විජ්ජමානෙ, අකුසලබව ඇති කල්හි; තථා ―පෙ― කාමච්ඡන්දොති ආදීනා නයෙන, යනාදී නයින්; විභඞ්ග, විභඞ්ගයෙහි; උපරිඣානඞ්ග, මතුයෙහි කියනලද ධ්‍යානාඞ්ගයන්; පච්චනීක, තමන්ට ප්‍රත්‍යනීක නීවරණ ධර්මයන්ද; පටිපක්ඛභාවදස්සනතො ප්‍රතිපක්ෂභාවය දක්වනහෙයින් (ධ්‍යානාඞ්ගයන් තමන්ට ප්‍රතිපක්ෂවූ නීවරණ ධර්මයන්ට ධ්‍යානාඞ්ග ධර්මයන්ගේ ප්‍රතිපක්ෂභාවය දක්වනහෙයින යන අර්ථයි) නීවරණානෙව වුත්තානි, ධ්‍යානාඞ්ග ප්‍රතිපක්ෂවූ නීවරණයෝම කියනලදහු; නීවරණානීති, නීවරණයෝ වනාහි; ඣානඞ්ගපච්චනීකානි, ධ්‍යානාඞ්ගයන්ගේ ප්‍රත්‍යනීක නීවාරණයකරණහෙයින් ඔවුන්ට ප්‍රත්‍යනීකයෝයි; තෙසං, ඒ නීවරණයන්ට; ඣානඞ්ගානෙව පටිපක්ඛානි, ධ්‍යානාඞ්ගයෝම ප්‍රතිපක්ෂයෝයි; විද්ධංසකානි, විනාශකයෝයි; විඝාතකානීති, විහිංසකයහයි; වුත්තංහොති, කියනලදවේ; තථාහි, එසේමැයි; සමාධි කාමච්ඡන්දස්ස පටිපක්ඛො (රාගප්‍රණිධියට සෘජු ප්‍රතිපක්ෂබැවින්ද නානාලම්බනයෙන් පොළඹවනලද්දාවූ පරිභ්‍රමනය කරණ චිත්තයා සමාහිතකරණබැවින්ද) සමාධිය කාමච්ඡන්දයට ප්‍රතිපක්ෂයි; පීතිව්‍යාපාදස්ස (ව්‍යාපාදයෙන් ගැවෙන සිත්හු පිණවනුව තමා ප්‍රමොදහා සමාන යොගක්ෂම ඇති බැවින්) ප්‍රීතිය ව්‍යාපාදයට ප්‍රතිපක්ෂයි; විතක්කො ථිනමිද්ධස්ස, (යොනිසො සඞ්කල්පනවශයෙන් සවප්ඵාරකව පවත්නෙන්) විතර්කය ථීනමිද්ධයට ප්‍රතිපක්ෂවේ; සුඛං, වූපශාන්ත සීතල ස්වභාව ඇති සුවය, උද්ධච්චකුක්කුච්චස්ස (අවූපශම අනුතාප ස්වභාව ඇති) උද්ධච්චකුක්කුච්චයට ප්‍රතිපක්ෂවේ; විචාරො විචිකිච්ඡායාති (අරමුණෙහි අනුමර්ජනවශයෙන් ප්‍රඥා ප්‍රතිරූප ස්වභාව ඇතිහෙයින්) විචාරය විචිකිත්සාවට ප්‍රතිපක්ෂවේයයි; පෙටකෙවුත්තං, පෙටකයෙහි කියනලදී―

( හා ¶ )

තවද ඒ කාමයන්කෙරෙන් වෙන්වමය යන පෙදෙහි ආ මේ එවශබ්දය පශ්චිම පදයෙහි නොකියා කුමක්හෙයින් පූර්වපදයෙහි පමණක් කියනලද්දේදයත්? කිමෙක්ද කාමයන්ගෙන් මුත් අකුශල ධර්මයන්ගෙන් වෙන් නොවී ධ්‍යාන උපදවා වාසයකරත් හේදයත්? මෙහන්හි වනාහි මේ අවධාරණාර්ථවූ එවකාරය පූර්වපදයෙහිම යෙදෙත්තේයයි නොදතයුත්තේය ඒ ධ්‍යානය කාමයෙන් පහවීමක්බැවින් පූර්වපදයෙහිම මේ එවකාරය වදාරණලද්දේයි ඒ එසේමැයි සිතලූකාමභවය ඉක්මීමට ප්‍රතිපතතිබැවින්ද කෙලශකාමයට විරුඬබැවින්ද මේ ධ්‍යානය කාමයන්ගේම ඉක්මීමයයි දතයුතුයි. එහෙයින් භාගෑවත්හු විසිනුදු නෙෂ්ක්‍රම්‍ය සඞ්ඛ්‍යාතවූ යම් මේ ධ්‍යානයෙක් ඇත්තේවේද ඒ මේ ධ්‍යානය කාමයෙන් නික්මීමයයි වදාරණලද්දේයි. යම්සේ "ඉධෙව භික්ඛවෙ සමණො ඉධ දුතියො සමණො" යන දෙශනා පෙළෙහි එවකාරය දෙවන පෙදෙහිදු එලවා කියනුලැබේද එපරිද්දෙන්ම "විවෙකාමෙහි විවිච්චෙච්ච කාමෙහි විවිච්ච අකුසලෙහි" යන මේ පාලියෙහිදු එවකාරය දෙවන පදයෙහිද එලවා අර්ථ ගිණියයුත්තේයි. කුමක්හෙයිනයත්? මේ කාමච්ඡන්ද නීවරණයෙන් අන්‍යවූ නීවරණ සඞ්ඛ්‍යාත අකුශල ධර්මයෙන්ද වෙන්නොවීම

ධ්‍යාන උපදවා වසන්නට නොපිළිවන්නෙහිනැයි දතයුතුයි. එහෙයින් කාමයන්කෙරෙන් වෙන්වම අකුශල ධර්‍මයන්කෙරෙන් වෙන්වමැයි මෙසේ මේ දෙපදෙහිම එවකාරය දතයුතුයි. එනකුදුවූවත් ඒ දෙපදෙහිම අවිශෙෂයෙන් ආවාවූ වෙන්වීමය යනමේ වචනයෙන් තදඞ්ග විවෙකය ප්‍රහාණ විවෙකය වික්ඛම්භන විවෙකය ප්‍රශ්‍රබ්ධි විවෙකය නිස්සරණ විවෙකය යන පඤ්ච විවෙකයෝද චිත්ත විවෙකය කාය විවෙකය උපධි විවෙකය යන සියලු විවෙකයෝද සඞ්ග්‍රහ බවටගෙත්මය. මේ ධ්‍යාන සාථාවෙහි වනාහි මාගීාධිගමයෙහිමෙන් සමුච්ඡේද විවෙකාදිහු නොලැබෙනහෙයින් කාය විවෙකය චිත්ත විවෙකය උපධි විවෙකයයි කියනලද තුන්දෙන පමණක් දතයුත්තාහුයි කාමයෙන් වෙන්ව යනමෙහි මහා නිද්දේශ පාලියෙහි වස්තුකාමයෝනම් කවරහුද්‍යයි යන පෘච්ඡාව පෙරටුකොටගෙණ මනාප වන්නාවූ රූපයෝය යනාදිනයින් යම් වස්තුකාමකෙනෙක් කියනලද්දාහුද එම නිද්දේශයෙහිම ධ්‍යාන විභඞ්ගයෙහි ප්‍රාර්ථනාකිරීම්වශයෙන් පැවැති දුර්වල ලොභ සඞ්ඛ්‍යාතවූ ඡන්දකාමය ඒ ප්‍රාර්ථිත වස්තුයෙහි ඇලීම් වශයෙන් පැවැති ඊටවැඩා බලවත් ලොභ සඞ්ඛ්‍යාතවූ රාග කාමය ඒ දෙදෙනාට වැඩා බලවත් ලොභ සඞ්ඛ්‍යාතවූ ඡන්දරාගකාමය සාදුමනාත් නිමිත්ත යන් සැලකීමට හෙතුවූ ලොභ සඞ්ඛ්‍යාතවූ සඞ්කල්පකාමය එම නිමිත්තයෙහි ඇලීම් වශයෙන් පැවැති ලොභ සඞ්ඛ්‍යාතවූ රාගකාමය ඒ දෙදෙනාටම වැඩා බලවත් ලොභ සඞ්ඛ්‍යාතවූ සඞ්කල්පරාගකාමය යනමේ කෙලශ ධර්‍මයෝ කෙලශකාමයෝයයි මෙසේ යම් කෙලශකාම කෙනෙක් කියනලද්දාහුද ඒ සියලු වස්තුකාම කෙලශකාමයෝම කාමයන්කෙරෙන් යන මේ පෙදින් සඞ්ග්‍රහකරණලදහයි දතයුත්තාහුයි. මෙසේ කාමයන් දෙදෙනාගේම සඞ්ග්‍රහය ඇති කල්හි කාමයෙන් වෙන්ව යන මේ පෙදින් කෙලශකාමයෙන් පමණක්නොව රූපාදි වස්තුකාමයෙන් ද වෙන්ව යයි යන අර්ත්‍ථය යෙදෙත්තේමැයි. ඒ වස්තුකාමයෙන් වෙන්වීමෙන් අඹුදරුආදින් තමාසතු නොව තබව හඟවනබැවින් එම පෙදින් කාය විවෙකය කියනලද්දේයි. අකුශල ධර්‍මයන් කෙරෙන් වෙන්වය යනමෙයින් කෙලශකාමයෙන්හෝ සියලු අකුශලයන්ගෙන් වෙන්වය යන අර්ත්‍ථය යෙදෙන්නේයි. ඒ කෙලශ කාමයෙන් වෙන්වීමෙන් චිත්තවිවෙකය කියනලද්දේයි. තවද මේ වස්තුකාම කෙලශකාමයන්ගෙන් වෙන්වය අකුශලධර්‍මයන්ගෙන් වෙන්වය යන දෙපදෙහිහෝ ඒ දෙපදින් ගැණෙන කායවිවෙක චිත්තවිවෙක දෙක්හිහෝ පළමුවන කාය විවෙකයෙන් වස්තුකාමයෙන් වෙන්වීම කීබැවින් කාමසැපය දුරුකිරීම ප්‍රකාශකරණලද්දේය දෙවන චිත්තවිවෙකයෙන් කෙලශකාමයෙන් වෙන්වීම කීහෙයින් ධ්‍යාන සුවය ආත්පත්කරගැණීම ප්‍රකාශකරණලද්දේය මෙසේ වස්තුකාම කෙලශකාමයෙන් වෙන්වීම කීහෙයින් ඒ පදයන් දෙදෙනා අතුරෙන් පළමුවන පදයෙන් කී කාය විවෙකයෙන් තෘෂ්ණා මානාදී කෙලෙසුන් ඉපදීමට කාරණවූ වස්තුකාමයාගේ ප්‍රහාණය ප්‍රකාශකරණලද්දේය දෙවන පෙදින් කී චිත්තවිවෙකයෙන් එම තෘෂ්ණාමානාදී කෙලෙසුන්ගේ ප්‍රහාණය ප්‍රකාශකරණලද්දේයි. තවද එම කාය විවෙකයෙන් ලොල් බවට හෙතුවූ වස්තු කාමයෙ හැරීමද වි

නතාවිවේකයෙන් අවිද්‍යාවට හෙතුවූ
සියලුපාපධර්මයන්ගේ ප්‍රහාණයද එ
සේම පලමුවනපෙදින් කී කායවි
වෙකයෙන් ප්‍රාණවධාදීයෙන් වෙන්
වීමෙන් වන ප්‍රයෝගශුඩියද දෙවන
පෙදින් කී චිත්තවිවේකයෙන් තෘ
ෂ්ණාදිකෙලෙසුන්ගේ පිරිසිදුකිරීමෙ
න් වන අධ්‍යාසයශුඩියද ප්‍රකාශකර
ණලද්දේයයි දතයුතුයි. මේවනාහි
කාමයන්කෙරෙන්ය යනමේ පෙදෙ
හි කියනලද විප්‍රකාර කාමයන්අතු
රෙන් වස්තුකාමපක්ෂයෙහි ක්‍රමය ව
න්නේයි. ක්ලේශකාමපක්ෂයෙහි ව
නාහි ඡන්දය රාගය යනමේ ආදීක්‍රම
යෙන්ද කාමාශ්‍රවය කාමරාගය කාම
සංයොජනය යනාදිවශයෙන්ද රූප
තෘෂ්ණා ශබ්දතෘෂ්ණාදිවශයෙන්ද අ
නෙකප්‍රභෙදද ඇතිකැමැතිවන ස්වභා
වැන්නාවූ ඡන්දයම කාමයයි අභිම
තකරණලද්දේය. ඒ කාමච්ඡන්දය අ
කුසලයන්කෙරෙහි ඇතුල්විවූයේද
ධ්‍යානවිභඞ්ගයෙහි කාමච්ඡන්දනම්
කවරේදයි යන පාලිවපෙරටුකො
ට කාමය රාගය කාමරාගය යනාදී ක්‍ර
මයෙන් ධ්‍යානයට ප්‍රතිපක්ෂභාවයෙ
න්ම අකුශලසාමාන්‍යයෙන් නොගෙ
න වෙන්කොට ස්වරූපවශයෙන් කි
යන ලද්දේය. ක්ලේශකාම හෙයි
න් පූර්වපදයෙහිද අකුශලයන්ට
ඇතුලත්බැවින් දෙවනපෙදෙහිද කි
යනලද්දේය. නවද ඒකාමය අනෙ
කප්‍රකාර ප්‍රභෙදහෙයින් කාමයෙනැ
යි එකවචනයෙන් නොකියා කාමය
න්ගෙනැයි බහුවචනයෙන්ම කියන
ලද්දේය. ඒ සින්හා එක්වයෙදුනාවූ
අනිකුදු දෘෂ්ටිමානාදිවූද ස්පර්ශාදිවූද
ධර්මයන්ගේ අකුශලස්වභාව ඇත්
තෙහිද ධ්‍යානවිභඞ්ගයෙහි මතුයෙහි
කියන ධ්‍යානාඞ්ගයන් තමන්ට ප්‍රතිවි
රුඩවූ නීවරණ ධර්මයන්ට ධ්‍යානාඞ්ග
ධර්මයන්ගේ ප්‍රතිපක්ෂභාවය දක්ව
නහෙයින් ධ්‍යානයන්ට ප්‍රතිපක්ෂවශ
යෙන් පඤ්චනීවරණධර්මයෝම කිය
නලද්දැහුය. ඒ එසේමැයි. ඒ පඤ්චනී
වරණධර්මයෝ ධ්‍යානාඞ්ගයන්ගේ
පැවත්ම වලක්වනහෙයින් ඒ ධ්‍යා
නාඞ්ගයන්ට පසමිතුරුවන්නාහුය ඒ
නීවරණධර්මයන්ගේ පැවැත්ම වැ
ලැක්වීමටද ධ්‍යානාඞ්ගයෝම පසමි
තුරුවන්නාහුය හෙවත් නීවරණධ
ර්මයන් විනාශකරන්නාහුය මෙසේ
සකරන්නාහුයයි දතයුතුයි. ඒ එසේ
මැයි. සමාධිසඞ්ඛ්‍යාතවූ චිත්තෛකාග්‍ර
තාව තමා රාගනිශ්‍රිතප්‍රාණිනාටට ඉඳු
රාවිරුඩබැවින්ද නොයෙක් අරමුණු
ලැබ ඒ ඒ තන්හි හැසිරෙණ චිත්තය
එකඅරමුණක පිහිටුවන බැවින්ද කා
මච්ඡන්දනීවරණයට ප්‍රතිපක්ෂවන්නේ
ය ප්‍රීතිය තමා ව්‍යාපාදයට දුරාවිරුඩ
වූ ප්‍රමොද්‍යයහා සමාන යොගක්ෂම
ඇතිබැවින් ව්‍යාපාද නීවරණයට විරු
ඩවන්නේය විතර්කය තමා නුවණි
න් කල්පනාකිරීම් වශයෙන් සිත පැ
තිරපවත්නා බැවින් ථීනමිද්ධනීවරණ
යට විරුඩවන්නේය සැපවෙදනාව
තමා සන්සුන් ශීතල ස්වභාව ඇති
බැවින් නොසන්හුන් පසුතැවීම් ස්ව
භාවකොටඇති උඩච්ච කුක්කුච්ච නී
වරණයට විරුඩ වන්නේය විචාරය
තමා අරමුණ පිරිමැදීම්වශයෙන් ප්‍ර
ඥාවට සුදුසු ස්වභාව ඇතිබැවින් වි
චිකිච්ඡානීවරණයට විරුඩවන්නේය
යි යන මේ අර්ථය ( ආයුෂ්මත් මහාකා
ත්‍යායන ස්ථවිරයන්වහන්සේ විසින්
දෙශනා කරණ ලද ත්‍රිපිටක අර්ථව
ර්ණනාවූ ) පෙටක පාලියෙහි දක්ව
නලද්දේයි.

( පා * )

එවමෙත්ථ විවිච්චෙවකාමෙහීති ඉමි
නා කාමච්ඡන්දස්ස වික්ඛම්භනවිවෙ
කො වුත්තො හොති විවිච්ච අකුස

ලෙහි ධම්මෙහීති ඉමිනා පඤ්චන්න
මපි නීවරණානං අගහිතග්ගහණෙන
පන පඨමෙන කාමච්ඡන්දස්ස දුති
යෙන සෙසනීවරණානං තථා පඨ
මෙන තීසු අකුසලමූලෙසු පඤ්චකා
මගුණභෙදවිසයස්ස ලොභස්ස දුති
යෙන ආඝාතවත්ථුභෙදාදි විසයානං
දොසමොහානං ඔඝාදීසු වා ධම්මෙසු
පඨමෙන කාමොඝකාමයොගකාමා
සව කාමුපාදාන අභිජ්ඣාකායගන්ථ
කාමරාග සංයොජනානං දුතියෙන
අවසෙස ඔඝයොගාසව උපාදාන ග
න්ථසංයොජනානං පඨමෙන තණ්හා
ය තංසම්පයුත්තකානං ච දුතියෙන අ
විජ්ජාය තංසම්පයුත්තකානං ච..අපි
ච පඨමෙන ලොභසම්පයුත්තඅට්ඨචි
ත්තුප්පාදානං දුතියෙන සෙසානං ච
තුන්නං අකුසලචිත්තුප්පාදානං වික්ඛ
ම්භන විවෙකො වුත්තො හොතීති
වෙදිතබ්බං..අයං තාව විවිච්චෙව
ච කාමෙහි විවිච්ච අකුසලෙහි ධ
ම්මෙහීති එත්ථ අත්ථප්පකාසනා..එ
ත්තාවතා පඨමස්ස ඣානස්ස පහා
ණඞ්ගං දස්සෙත්වා ඉදානි සම්පයොග
ඞ්ගං දස්සෙතුං සවිතක්කං සවිචාර
න්ති ආදිවුත්තං..

( ස * )

එවං, මෙසේ; එත්ථ, මෙපදවයෙහි;
විවි..පෙ..ඉමිනා "විවිච්චෙව කාමෙහි"
යනාමෙයින්; කාමච්ඡන්දස්ස, කාමච්ඡ
න්දයාගේ; වික්ඛම්භනවිවෙකො වු
ත්තො හොති, විෂ්කම්භනවිවේකය
කියනලද්දේවේ; විවි..පෙ..'අකුසලෙ
හි ධම්මෙහි" යනමෙයින්; පඤ්චන්න
මපි නීවරණානං, පඤ්චනීවරණයන්
ගේ; අගහිතගහණෙනපන, නොගත්
තගුණගැණීමෙන්වනාහි; පඨමෙන,
පළමුපෙදෙන්; කාමච්ඡන්දස්ස, කාම
ච්ඡන්දයාගේ ("විෂ්කම්භනවිවේකො
වුත්තො හොති" යි යොදනු-සෙසු

පෙදෙහිදුමෙමතැයි) දුතියෙන, දෙ
වනපෙදෙන්; සෙසනීවරණානං, සෙ
සුනීවරණයන්ගේ; තථා, එසේම; තී
සු අකුසලමූලෙසු, තුන්අකුසලමූලය
න් කෙරෙහි; පඤ්චකාමගුණභෙදවි
සයස්ස, රූපාදී පඤ්චකාමගුණවිශෙ
ෂ විෂයවූ; ලොභස්ස, ලොභයාගේද;
"ආඝාතවත්ථුභෙදාදි විසයානං දොස
මොහානං" යන්නෙහි (ව්‍යාපාද වි
වෙකවචනයෙන් "අනත්ථං මෙඅචරි"
යනාදීවූ ආඝාතවස්තු භෙදාදි විෂයවූ
ද්වෙෂයාගේ (ථිනමිද්ධාදී විවේකවච
නයෙන් ප්‍රච්ඡාදන වශයෙන් දුඃඛාදි
පූර්‍වාන්තාදී භෙදවිෂයවූ) තමදක
සථ මොහයාගේද (විෂ්කම්භන වි
වෙක උක්තයයි ඇති දතයුතු) ඔඝා
දිසු වා ධම්මෙසු, ඔඝාදි ධර්මයන්
කෙරෙහිහෝ; පඨමෙන, ප්‍රථමව
චනයෙන්, කාමොඝ, කාමොඝය..
පෙ..කාමරාගසංයොජනානං, කාමරා
ගසංයෝජනය යන මොවුන්ගේ;
දුතියෙන, දෙවනවචනයෙන්, අව
සෙසඔඝයොගාසව උපාදාන ගන්ථ
සංයොජනානං, කාමොඝාදීන් කෙ
රෙන් පිටත් ඔඝයොගාසවය උ
පාදානය ගන්ථය යනමොවුන්ගේ;
තණ්හාය, තෘෂ්ණාවගේද; තංසම්ප
යුත්තකානං ච, ඒ තෘෂ්ණාසම්ප්‍රයුක්ත
යන්ගේද; අවිජ්ජාය, අවිද්‍යාවගේද;
තංසම්පයුත්තකානං ච, ඒ අවිද්‍යාස
ම්ප්‍රයුක්තයන්ගේද; අපිච, අනිකෙ
කුද; පඨමෙන, පළමුපෙදෙන්; ලො
භ සම්පයුත්ත අට්ඨචිත්තුප්පාදානං,
ලොභසම්ප්‍රයුක්ත අෂ්ටචිත්තොත්පා
දයන්ගේද; දුතියෙන, දෙවනවච
නයෙන්; සෙසානං චතුන්නං අකුසල
චිත්තුප්පාදානං (ද්වෙෂසම්ප්‍රයුක්ත දෙ
සිතය මොහමූලදෙසිතය යන ) සෙ
සු සතර අකුසල චිත්තොත්පාදයන්
ගේ; වික්ඛම්භන විවෙකො වුත්තො
හොන්ති, විෂ්කම්භනවිවේකය උක්ත

වෙසි, වෙදිතබ්බා, දහසු සු; අ යං–පෙ–වටට අප්පකාසනා. මෙ මෙහිඅඞ්ගප්‍රහාණතායි; එගතාවතා, මෙ පමණකින්; පඨමස්සඣානස්ස, පඨම ඣානයාගේ; පහාණඞ්ගං දසසනවා, ප්‍රහාණාඞ්ගයන් දක්වා; දැනි, දූන්; ස මප යොගඞ්ගං දසසතුං, සම්ප්‍රයොගා ඞ්ගයන් දක්වනුපිණිස; සවිතක්කං සවිචාරනති ආදි වුත්තං "සවිතක්කං සවිචාරං" යනාදි කියනලදී.

(හ)

මෙසේ මේ දෙපදයන් අතුරෙ න් කාමයන්ගෙන් වෙන්වය යනමේ මූලපෙදින් කාමයාගේ විෂ්කම්භන විවෙකය කියනලද්දේවෙසි. අකුස ල ධර්මයන්ගෙන් වෙන්වය යන මෙ දෙවනපෙදින් පඤ්චනිවරණ ධර්මයන් ගේ විෂ්කම්භනවිවෙකය කියනලද් දේය එසේම නොහොතහුගේ ගැන් මැයි කියනලද අගෘහිතග්‍රහණතා යවශයෙන් මුලපෙදින් කාමච්ඡන්ද නි වරණයාගේද දෙවනපෙදින් සෙසු නිවරණ ධර්මයන්ගේද විෂ්කම්භනවි වෙකය හෙවත් ඒ නිවරණයන් ඔබා ගැණීමෙන් ලබනලද විතාතවිවෙක ය කියනලද්දේය. එපරිද්දෙන්ම මු ලපෙදින් ත්‍රිවිධ අකුශල මූලයන් අතු රෙන්පඤ්චකාමය කොදූරුකොට පව ත්නා තෘෂ්ණාවගේද දෙවනපෙදින් මෝහු මට පෙර අනර්ථයක්කෙලේ යයි යනාදි නවාකාර ආඝාතවස්තූන් ගොදූරුකොටපවත්නා ද්වේෂයාගේ ද පිනම්ඩාදීන්ගෙන් වෙන් වීම කී හෙයින් ඒ පිනම්ඩයන්හා එක්ව පැ වැති මෝහයාගේද වෙන්වීම කිය නලද්දේයි. ඌසාදී ධර්මයන් අතුරෙ න් නෝ පළමුවනපෙදින් කාමෝඝය කාම යෝගය කාමාශ්‍රවය කාමූපාදා නය අභිධ්‍යාකායග්‍රන්ථය කාමරාගසං යෝජනය යන එකාන්ත තෘෂ්ණාවෙන් ප්‍රභෙදවත්හාවූ මෙතෙක් ධර්මයන් ගේද දෙවනපෙදින් භවය දෘෂ්ටිය අවිද්‍යාවය යන තුණින් පෙරකීනයි න් ප්‍රභෙදවත්හාවූ ඔඝ යොග ආශ්‍රව උපාදාන ග්‍රන්ථ සංයෝජනයන්ගේද එපරිද්දෙන්ම මූලපෙදින් තෘෂ්ණාව ගේද ඒතෘෂ්ණාසම්ප්‍රයුක්ත අවශෙෂ ධර්මයන්ගේද දෙවනපෙදින් අවිද්‍යාව ගේද ඒ අවිද්‍යා සම්ප්‍රයුක්ත අවශෙෂ ධර්මයන්ගේද වෙන්වීම දක් වනලද් දේය. තවද පළමුවනපෙදින් ලෝභ මූලිකවූ සොමනස් සහගතවූ දෘෂ්ටිග ත සම්ප්‍රයුක්තාදි චිත්තොත්පාද අටදෙ නාගේද දෙවනපෙදින් සෙසු වෙෂ සම්ප්‍රයුක්ත මොහසම්ප්‍රයුක්ත සතරචි ත්තොත්පාදයන්ගේද ඔබාගැණීමෙ න් ලබනලද විතාතවිවෙකය දක්ව නලද්දේයයි. දනයුත්තේයි මේවනා හි පළමුකොට කාමයන්කෙරෙන් වෙන්වය අකුශලධර්මයන්කෙරෙන් වෙන්වය යන මේ දෙපෙදෙහි අර්ථ ප්‍රකාශකිරීමවන්නේයි. මෙතෙකින් ප්‍රථම ධ්‍යානයාගේ දුරුකටයුතු අඞ්ග යන් දක්වා දුන් ප්‍රථමධ්‍යානයහාඑක් ව යෙදුනාවූ අඞ්ගයන් දක්වනු පිණි ස විතර්ක සහිතවූ විචාරසහිතවූ ය නාදිය පවත්ගත්තා ලද්දේය.

(හා †)

තත්ථ විතක්කනං විතක්කො ඌහ නන්ති වුත්තං හොති සවායං ආරම්ම ණෙ චිත්තස්ස අභිනිරොපනලක්ඛ ණො ආහනනපරියාහනනරසො ත ථාහි තෙන යොගාවචරො ආරම්මණං විතක්කාහතං විතක්ක පරියාහතං කරොතීති වුච්චති ආරම්මණෙ චිත්ත ස්ස ආනයනපච්චුපට්ඨානො ... විචර ණං විචාරො අනුසඤ්චරණන්ති වුත්තං හොති සවායං ආරම්මණානුමජ්ජනල ක්ඛණො තත්ථ සහජාතානුයොජනර සො චිත්තස්ස අනුප්පබන්ධනපච්චුප

ට්ඨානතො. සන්තෙපි ච තෙසං කත්ථචි අවිප්පයොගෙ ඔළාරිකට්ඨෙන පුබ්බඞ්ගමට්ඨෙන ච ඝණ්ටාභිඝාතොවිය චෙතසො පඨමාභිනිපාතො විතක්කො සුඛුමට්ඨෙන අනුමජ්ජනසභාවෙන ච ඝණ්ටානුරවොවිය අනුප්පබන්ධො විචාරො — විප්ඵාරවා චෙත්ථ විතක්කො පඨමුප්පත්තිකාලෙ පරිප්ඵන්දනභූතො චිත්තස්ස ආකාසෙ උප්පතිතුකාමස්ස පක්ඛිනො පක්ඛවික්ඛෙපො විය පදුමාභිමුඛපාතො විය ච ගන්ධානුබන්ධචෙතසො භමරස්ස. සන්තවුත්ති විචාරො නාතිපරිප්ඵන්දනභාවො චිත්තස්ස ආකාසෙ උප්පතිතස්ස පක්ඛිනො පක්ඛප්පසාරණං විය පරිබ්භමණං විය ච පදුමාභිමුඛපතිතස්ස භමරස්ස පදුමස්ස උපරිභාගෙ. දුකනිපාතට්ඨකථායං පන ආකාසෙ ගච්ඡතො මහාසකුණස්ස උභොහි පක්ඛෙහි වාතං ගහෙත්වා පක්ඛෙ සන්නිසීදාපෙත්වා ගමනං විය ආරම්මණෙ චෙතසො අභිනිරොපනභාවෙන පවත්තො විතක්කො, වාතග්ගහණත්ථං පක්ඛෙ ඵන්දාපයමානස්ස ගමනං විය අනුමජ්ජනභාවෙන පවත්තො විචාරොති වුත්තං. තං අනුප්පබන්ධෙන පවත්තියං යුජ්ජති. සො පන නෙසං විසෙසො පඨමදුතියජ්ඣානෙසු පාකටො හොති. අපි ච මලග්ගහිතං කංසභාජනං එකෙන හත්ථෙන දළ්හං ගහෙත්වා ඉතරෙන හත්ථෙන චුණ්ණතෙලවාලණ්ඩුපකෙන පරිමජ්ජන්තස්ස දළ්හංගහණහත්ථොවිය විතක්කො පරිමජ්ජනහත්ථොවිය විචාරො. තථා කුම්භකාරස්ස දණ්ඩප්පහාරෙන චක්කං භමයිත්වා භාජනං කරොන්තස්ස උප්පීළනහත්ථොවිය විතක්කො ඉතොචිතොච සඤ්චරණහත්ථොවිය විචාරො. තථා මණ්ඩලං කරොන්තස්ස මජ්ඣෙ සන්නිරුම්භිත්වා ඨිතකණ්ටකොවිය අභිනිරොපනො විතක්කො බහිපරිබ්භමණකකණ්ටකොවිය අනුමජ්ජනො විචාරො. ඉති ඉමිනා ච විතක්කෙන ඉමිනා ච විචාරෙන සහ වත්තති රුක්ඛොවිය පුප්ඵෙන ඵලෙනචාති ඉදං ඣානං සවිතක්කං සවිචාරන්ති වුච්චති — විභඞ්ගෙ පන ඉමිනා ච විතක්කෙන ඉමිනා ච විචාරෙන උපෙතො හොති සමුපෙතොති ආදිනා නයෙන පුග්ගලාධිට්ඨානා දෙසනා කතා. අත්ථො පන තත්‍රාපි එවමෙව දට්ඨබ්බො —

( ස † )

තතු, එහි; විතක්කනං, විතර්කය, විතක්කො, විතර්කනම්; ඌහනන්ති වුත්තං හොති, සිත්හු අරමුණෙහි එලවීමයයි කීතියායි (ටීකායෙහි "ඊදිසම්දන්ති ආරම්මණස්ස පරිකප්පනං"යි කීහු) සවායං; ඒ විතර්කය තෙමේ; ආරම්මණෙ චිත්තස්ස අභිනිරොපනලක්ඛණො, අරමුණෙහි සිත්හු නමාගෙන් ආනුභාවයෙන් නගනා බැවින් ආරොපනය සවභාවකොට ඇත්තේයි (විතර්කයනැති දෙපස්වි නැණුත්හා විතීයධ්‍යාන් ආදීහු කෙසේ අරමුණට නැගෙද්දයත්? දෙපස්වි නැණහු විතර්කයනැත්හොතුදු ච ක්ඛාලම්බණයන්ගේ සඞ්ඝට්ටනය බලවත්හෙයින් නැගෙයි. විතීයධ්‍යාන ආදීහු යටයට භාවනාබලයෙන් නගත් හොහොත් පරිචයබලයෙන් අවිතර්කයවද අරමුණට නැගෙත් යෙත් මෙමකීහ ටීකායෙහි "විතක්කස්ස නිස්සන්දෙන අභිණ්හං පවත්තස්ස ච තෙසං චිත්තස්ස ආරම්මණාභිරුහණං චිරපරිචිතං තෙන තං තදවිතක්කෙන චිත්තාපි තත්ථ පවත්තතෙව යථා තංඤාණසහිතං හුත්වා සම්මසනවසෙන චිරපරිචිතං තදුත් ඤාණරහිතම්පි සම්මසනවසෙන පවත්තති

යථාවා කිලෙස සහිතංනුසුම්වා පදීපානං
සබ්බසො කිලෙසපරිළාහම්පි පරිච්චජෙ
න කිලෙසවූපසන්තාවිසෙසා පටිපත්ති
එවං සම්පදමිදං දට්ඨබ්බං"යි) ආහන
න පරියාහනනකරණයා, අරමුණෙහි
පහරණ වෙළඹයින් පහරණ කෘත්‍ය
ඇත්තේයි, තථාහි, එසේමැයි ;තෙන,
ඒ පරියාහනනයෙන්; යොගාවචරො,
යොගාවචරතෙමේ; ආරම්මණං, අර
මුණ; විතක්කාහතං, විතර්කයෙන්
පහරණලද්ද; විතක්කපරියාහතං, වි
තර්කයෙන් විශේෂකොට පහරණ
ලද්ද; කරොතීති, කෙරෙයි; වුච්චති,
කියනුලැබේ; ආරම්මණෙ චිත්තස්ස
ආනයන පච්චුපට්ඨානො, සිත්හු අර
මුණෙහි එළවනුසුබභාව විසින් වැ
ටහීම් ඇත්තේයි; විචරණං, හැසිරීම;
විචාරො, විචාරනම්; අනුසඤ්චරණ
න්ති වුත්තං හොති, අනුවහැසිරීමයයි
කීනියායි; සවායං, ඒ මේ විචාරය
තෙමේ; ආරම්මණානු මජ්ජනලක්ඛ
ණො, අරමුණුපිරිමදින සවභාව ඇත්
තේයි; තත්, ඒ අරමුණෙහි; සහජා
තානුයොජනරසො, සහජාතධර්ම
යන්ගේ (අනුවිචරණවශයෙන්) යෙ
දීම කෘත්‍යකොට ඇත්තේයි; චිත්ත
ස්ස අනුප්පබන්ධන පච්චුපට්ඨානො,
අරමුණෙහි සිත්හුගේ නොසිඳීමක්
මෙන් ප්‍රවෘත්තිය වැටහීම්කොට ඇත්
තේයි; තෙසං, ඒ විතක්කවිචාර දෙ
දෙනාගේ; කත්ථචි, සවිතක්ක සවිචා
ර චිත්තොත්පාදයෙහි; අවිප්පයො
ගෙ සන්තෙපි, නොවියෝව පැවැත්
මක් ඇතිකල්හිදු; ඔළාරිකට්ඨෙන,
(විචාරයටවඩා) ප්‍රකටබැවිනුදු; පුබ්බ
ඞ්ගමට්ඨෙන ච (තමා බෙලෙන් සිත්
හු අරමුණට නැගෙනුකොට විචාර
යහට) පූර්වඞ්ගම හෙයිනුදු, ඝණ්ටා
භිඝාතොවිය, ඝණ්ටාභි ඝාත ශබ්ද
යක් මෙයි; චෙතසො පඨමාභිනිපා
තො, සිත්හු පළමුකොට අරමුණෙ
හි හීම; විතක්කො, විතර්කනම් (වි
තර්කයා ඝණ්ට ප්‍රකට නැත්තෙ
ණ කිහු-යම්සේ ඝණ්ටාභිඝාතශබ්දය
ප්‍රථමාභිනිපාත වේද එසේම අරමු
ණෙහි අභිනිරොපනය කරණයෙ
හින් විතක්කයසිත්හු ප්‍රථමාභිනිපාත
වේ "අභිඝාතගහණෙන චෙත්ථ අභි
ඝාතජෝසද්දෙගහිතො" යනුටීකායි)
සුඛුමට්ඨෙන, සූක්ෂමහෙයින්ද, අනු
මජ්ජනසභාවෙන, ඒ අනුසඤ්චරණ
සවභාවහෙයින්ද; ඝණ්ටානුරාවෝ වි
ය, ඝණ්ටාවෙහි අනුරාවය මෙන්ද;
අනුප්පබන්ධො විචාරො, අනුවැ
වැත්තේ විචාරනම (විචාරයා ප්‍රකට
නැත්තෙණ කිහු) එස්, මේ දෙදෙ
නාතෙරෙහි; විප්ඵාරවා, චලනවත්වූ
යේ(පැහිරීම්ඇතියේ යනු සන්නයි)
පඨමුප්පත්තිකාලෙ පරිප්ඵන්දභූතො
චිත්තස්ස, චිත්තයාගේ ප්‍රථමොත්පත්
තිකාලයෙහි පොපිඇති බදුවූයේ; වි
තක්කො, විතර්කනම්; ආකාසෙ උ
ප්පතිතුකාමස්ස පක්ඛිනො, ආකාශ
යෙහි නැගෙනු කැමති පක්ෂීහු
ගේ;පක්ඛවික්ඛෙපොවිය, පියාත්පපැ
හැරමෙන්ද, ගන්ධානුබන්ධ චෙතසො
භමරස්ස, ගන්ධයෙහි අනුබද්ධවූ සිත්
ඇති බමරහුගේ; පදුමාභිමුඛපාතො
විය ච, පියුමටඅභිමුඛව හීමමෙන්ද;
("විප්ඵාරවා පඨමුප්පත්තිකාලෙ පරි
ප්ඵන්දභූතො චිත්තස්ස විතක්කො"යි
යොදනු) සන්තවුත්ති, ශාන්තවෘත්ති
ඇත්තේ; නාතිපරිප්ඵන්දභාවො චිත්ත
ස්ස, සිත්හුගේ අතිශයෙන්ම පොපි
නැතිබව; විචාරො, විචාරනම; ආකා
සෙ, අහස, උප්පතිතස්ස පක්ඛි
නො, නැගිපක්ෂීහුගේ; පක්ඛප්පසාර
ණංවිය,පියාපත්පැහැරමෙන්ද; පදුමා
භිමුඛපතිතස්ස, පද්මයට අභිමුඛවනු
නු; භමරස්ස, බමරහුගේ; පදුමස්ස
උපරිභාගෙ, පියුමෙහි මතුභාගයෙ
හි; පරිබ්භමණං විය, පරිභ්‍රමණයක්

මෙන්ද ("සන්තවුත්තිතා නාතිපරිප්ඵන්දනභාවො චිත්තස්ස විචාරො" යි යොදනු) දුකනිපාතට්ඨකථායම්පන, දුකනිපාත අටුවාහෙහි වනාහි; ආකාසෙ ගච්ඡතො, අහස යන්නාවූ; මහාසකුණස්ස, ගිජුලිහිණියාගේ; උභොහිපක්ඛෙහි, දෙපියාපෙන්; වාතං ගහෙත්වා, වාතය ගෙන්වා; පක්ඛෙ සන්නිසීදාපෙත්වා, දෙපියාපත් සන්හිඳුවාගෙණ; ගමනං විය, ගමන යමෙන්; ආරම්මණෙ චෙතසො අභිනිරොපනභාවෙන පවත්තො විතක්කො, සිත්හු අරමුණෙහි නඟනබැවින් ප්‍රවෘත්තවූයේ විතර්කයයි; වාත ගහණත්ථං, වාතයගන්නා පිණිස; පක්ඛෙ ඵන්දාපයමානස්ස ගමනං විය, පියාපත්දෙක සොලවන්නාහුගේගමන යමෙන්; අනුමජ්ජනභාවෙන පවත්තො විචාරොති, අරමුණු පිරිමදිනා බැවින් ප්‍රවෘත්තවූයේ විචාරයයි; වුත්තං, කියනලදී (කුඩා ලිහිණියාගේ පියාපත්පෙළීමබඳුයයි පොපිඇතිසෙයින් විතර්ක ඖදරිකබව කීහු— මහ ලිහිණියාගේපියාපත් සන්හිඳුවාගෙනගමන වැන්නැයි වේගඇතිබැවින් විතර්ක ඖදරිකයෙස් කීහු— කුඩාලිහිණියාගේ පියාපැහැරම බඳුයයි මදවේග ඇතිසෙයින් විචාරය ශාන්තයෙස්ම කීහු— මහ ලිහිණියාගේ පියාපත්පොළමින් යනගමනමෙනැයි මද පොපිඇතිසෙයින් විචාරයාගේ ශාන්තභාවයෙස්ම කීහු) තං, එය මහාසකුණ දෘෂ්ටාන්තය; අනුප්පබන්ධෙනපවත්තියං (උපචාරයෙහිවත් අර්පණායෙහිවත්) සන්තාන වශයෙන් පවත්නා කල්හි; යුජ්ජති, යෙදේ (එහි විතර්කයෙහි ශ්වලව අරමුණට වදනාක්මෙන් පවතියි ප්‍රථමාභිනිපාත යෙහි එසේ නොවෙයි දතයුතු) සො පන විසෙසො; ඒ විශෙෂය වනාහි, පඨමදුතියජ්ඣානෙසු පාකටො හොති; ප්‍රථම ද්වි

තීය ධ්‍යානයෙහි ප්‍රකටවේ (විතර්කයාගේ අභිනිරොපනාකාර සඞ්ඛ්‍යාත විශෙෂය ප්‍රථමධ්‍යානයෙහි ප්‍රකටවෙයි විතර්කයාගේ අභාවයෙන් පඤ්චක නයෙහි ද්විතීයධ්‍යානයෙහි විචාරයාගේ අනුමජ්ජනාකාර විශෙෂය ප්‍රකටවේ) අපිච, අනිකකුදු; මලග්ගහිතං කංසභාජනං, මලහුත් ලොහොවළඳ; එකෙන හත්ථෙන දළ්හං ගහෙත්වා, එක්අතකින් තරවාගෙණ, ඉතරෙන හත්ථෙන, අනික්අතින්; චුණ්ණතෙලවාලණ්ඩුපකෙන, සුණුතෙල්යුත් එළුලොම්ආදීන් කළලොම් සුබුළුවෙන්; පරිමජ්ජන්තස්ස, මදනහුගේ; දළ්හං ගහණහත්ථො විය, තරවාගත් අතබඳුවූයේ; විතක්කො, විතර්කයයි; පරිමජ්ජනහත්ථො විය, පිරිමදනාඅතබඳුවූයේ; විචාරො, විචාරයයි; තථා, එසේම; කුම්භකාරස්ස, කුඹල්හු; දණ්ඩප්පහාරෙන චක්කං භමයිත්වා, දඬුපහරින් සකබමවා; භාජනං කරොන්තස්ස, භාජනය කරණහුගේ; උප්පීළනහත්ථො විය විතක්කො, මැටිපිඩ පෙළාගත් අතබඳුවූයේ විතර්කයයි; සංචරණහත්ථො විය විචාරො, මැටිපිඩ ඔබිනොබ යන අතබඳුවූයේ විචාරයයි; තථා, එසේම; මණ්ඩලං කරොන්තස්ස (කංසභාජනාදියෙහි) වටරෙඛා ගෙලන්නහුගේ (සැත්හි මැඬිලි ගෙලනුවායනු සිලිස ත්කයි) මජ්ඣෙ, මැද; සන්නිරුම්භිත්වා ඨිතකණ්ටකො විය, ඔබාගෙණ සිටිකටුව බඳුවූයේ; අභිනිරොපනො විතක්කො, අභිනිරොපන ලක්ෂණය විතර්කයයි; බහිපරිබ්භමණක කණ්ටකො විය, පිටත්හි කව හයන කටුවබඳුවූයේ; අනුමජ්ජනො විචාරො, අනුමජ්ජනලක්ෂණවිචාරයයි, ඉති, මෙසේ; ඉමිනා ච විතක්කෙන, මේ උක්තලක්ෂණ විතර්කයෙනු; ඉමිනා ච විචාරෙන, මේවිචාරයෙනුද; සහ පව

ත්තානි, සම්පයුත්තානි; රුක්ඛා විය පුප්ඵෙන ඵලෙන චාති, පුෂ්පහා ඵල හා සමග පවත්නා වෘක්ෂයමෙන්නැයි; ඉදං ඣානං, මේ ධ්‍යානය; සවිතක්කං සවිචාරන්ති, සවිතර්කය සවිචාරය යි කියනුලැබේ (යම්සේ පුෂ්පශාඛාදි අවයවයෙන් විනිර්මුක්තවූද අවිද්‍යමානවූද වෘක්ෂය "සපුෂ්පඵල"යයි කියනුලැබේද එමෙන්ම විතර්කාදී අඞ්ග විනිර්මුක්තව අවිද්‍යමානවූද ධ්‍යානය සවිතර්කය සවිචාරය යි ව්‍යවහාර කරණුලැබේයි හඟවනපිණිස "රුක්ඛා විය" යනාදී කීයේයයි දතයුතු) විභඞ්ගෙ පන, විභඞ්ගයෙහි වනාහි; ඉමිනා...පෙ...නයෙන, මෙආදී නයින්; පුග්ගලාධිට්ඨානා දෙසනා කතා, (ධ්‍යානභාවනා පුද්ගලවශයෙන් දෙසියයුතුබැවින්) පුද්ගලාධිෂ්ඨාන කොට දෙසනාකරණ ලදු; අත්ථො පන, අර්ථය වනාහි; තත්‍රාපි, ඒ විභඞ්ගයෙහිදු; එවමෙව දට්ඨබ්බො (යම්සේ "ඉමිනා ච විතක්කෙන ඉමිනා ච විචාරෙන" යනාදී ධර්මවශයෙන් කියන ලද්ද) මෙසේම දතයුතු (පරමාර්ථයෙන් පුද්ගලයකු නැත්බැවින යන අභිප්‍රායයි—නනාහොත් ධ්‍යානසමඞ්ගීහයාගේ විතර්කවිචාරය සමන්වීතබව දක්වීමෙන් ධ්‍යානයාගේම සවිතර්කසවිචාරබව උක්ත හෙයිනැයි මෙසේහෝ අර්ථ දතයුතු)

( ශාං+ )

එහි අරමුණු කල්පනාකිරීම්දෝ හෝ නොහොත් සිත අරමුණෙහි එළවීම හෝ මේඅරමුණ මෙබඳුයයි කල්පනාකිරීම හෝ විතර්කනම් වන්නේයි ඒ මේ විතර්කයා තමාගේ ආනුභාවබලයෙන් සිතඅරමුණටනංවාපියනබැවින් නැන්වීම ස්වභාවකොට ඇත්තේය අරමුණෙහි ගැටීම හෝ හාත්පසින්ගැටීම කෘත්‍යකොට ඇත්තේය ඒ එසේමැයි. ඒ අරමුණෙහි ගැටීම් හාත්පසින් ගැටීම්වශයෙන් යොගාවචර මහණ අරමුණ විතර්කයෙන් පහරණලද්දක්මෙන්ද විශේෂයෙන් පහරණලද්දක්මෙන්ද කෙරේයයි පෙළෙහි වදරණ ලද්දේය. මේ විතර්කය අරමුණට සිත එළවීම ඵලය කොට ඇත්තේයි. අරමුණෙහි සිත හැසිරවීම හෙවත් නැවත නැවත හැසිරවීම විචාරනම ඒ මෙ විචාරය අරමුණු පිරිමදිනා ස්වභාව ලක්ෂණ කොට ඇත්තේය සිතහා සමග උපන් ධර්මයන් ඒ අරමුණෙහි සිතට අනුවයෙදවීම කෘත්‍යකොට ඇත්තේය අරමුණෙහි පවත්නා චිත්තචෛතසිකයන් එවින් නොකිරීමක් මෙන් පැවැත්ම ඵලකොට ඇත්තේය ඒ විතර්ක විචාර දෙදෙන ප්‍රථමධ්‍යානසඞ්ඛ්‍යාතවූ ඇතම් සිතෙක නොවෙන්ව පවත්නේනමුදු විචාරයටවඩා ප්‍රකටබැවිනුදු තමාගේ බලයෙන් සිත අරමුණට පහතකල්හි විචාරයට පෙරටුව යන අර්ථයෙනුදු ඝණ්ටාවක පළමුවෙන් පහළ ශබ්දයක්මෙන් පළමුකොට සිත අරමුණෙහි වැටීම විතර්කනම් වන්නේය ඒ විතර්කයට වඩා සියුම් අර්ථයෙන්ද අරමුණ පිරිමදනා ස්වභාවඇතිහෙයින්ද ඝණ්ටාව පහළශබ්දයාගේ නැගී අනුරාවශබ්දය මෙන් පසු පසුව අරමුණෙහි වැටීම විචාරනම් වන්නේය තවද මේ විතර්ක විචාර දෙදෙනාඅතුරෙන් අහසට නගිනු කැමැති පක්ෂියකුගේ පියාපත් පැහැරීමක් මෙන්ද සුවඳෙහි අනුබද්ධ සිතැති බඹරෙකුගේ පියුමට අභිමුඛව වැටීමක් මෙන්ද ප්‍රථමෝත්පත්ති කාලයෙහි සිත පොපියන්නාක් මෙන්පැතිරීම් ඇතිබව විතර්කනම් වන්නේය අහසට නැගී පක්ෂිහු පියාපත් දිගහැර නොසොල්වා යන්නාක්මෙන්ද පියුමට

අභිමුඛව වැටුනු බමරුගේ පියාවි ම නොනගී බැම්මෙන් මෙන්ද අභිශයින් නොපොපිනා සිත සන්සුන්ව පැවැත්ම විචාරනම් වන්නේයි.

දුකනිපාතඅටුවාවෙහි වනාහි අහසයෙහිනාවූ ගිජුලිහිණියකුගේ දෙපියාපතින් පවන්ගෙනැ පියාපත් සන්හිඳුවාගෙණ යන්නාක්මෙන් සිත අරමුණට නැංවීමවශයෙන් පැවැත්ම විතර්කනම් සුලංගන්වනපිණිස පියාපත්දෙක සොල්වමින් යන්නාක්මෙන් සිත අරමුණ පිරිමැදීමවශයෙන් පැවත්ම විචාරනමැයි කියනලද්දේයි ඒ මහාසකුණදෘෂ්ටාන්තය උපචාරයෙහිහෝ අර්පණාවෙහිහෝ පරම්පරාවශයෙන් පවත්නාකල්හිම යෙදෙන්නේයි ඒ විශේෂය ප්‍රථමධ්‍යානයෙහි විතර්කයාගේ අරමුණට නැගීම්වශයෙන්ද විප්ඵාරඥානයෙහි විචාරයාගේ අරමුණ පිරිමැදීම්වශයෙන්ද ප්‍රකාශවන්නේය තවද මල බදිනාලද ලෝහලියක් එක්අතකින් තරකොටඅල්වාගෙණ අනික්අතින් ලොම්සවුසුණුතෙල්සහිත පුඹුළුවෙන් හෙවත් කොස්සෙන් මදිනහුගේ තරකොටඅල්වාගත්අතමෙන් විතර්කයද මදිනාඅතමෙන් විචාරයද දතයුතුයි එසේම දණ්ඩන්ගසා කුඹල්සක බමවානැලිවලන්ආදී බඳුන් ඉදිකරනනාවූකුඹල්හුගේ මැටිපඬම්කරණ අතමෙන් විතර්කයද මැටිපිඬබිබොනාබවන අතමෙන් විචාරයද දතයුතුයි එපරිද්දෙන්ම ලෝබඳුන්ආදියෙහි කවරේඛා හෙලනනහු සවකටුවෙහිමැද ඔබාගෙණසිටි කටුවමෙන් අරමුණට සිතනගනනාවූ විතර්කයද පිටතකවරේඛාගෙලන කටුවමෙන් අරමුණ පිරිමදිනනාවූවිචාරයද දතයුත්තේයි යම්සේ පුෂ්පඵල නිසාව පුෂ්පඵලජාති වෘක්ෂයද ශාඛාදි අවයව නැත්තාවූ මල්ගන්නා පලගන්නා සවභාවඇති බැවින් මල්රුකය පලරුකයයි ව්‍යවහාරකරන්නේවේද එසේම විතර්කාදීන්නැත්තාවූ ධ්‍යානයද සවිතර්ක සවිචාර ධ්‍යානයයි නම්කරණලද්දේයි ධ්‍යානවිභඞ්ගයෙහි වනාහි මේ විතර්කයෙන්ද මේවිචාරයෙන්ද යුක්තවූයේය මනාකොටම යුක්තවූයේයයි යනාදික්‍රමයෙන් ධ්‍යානභාවනාව පුද්ගලයෙකුවිසින්ම කටයුතු අර්ථවශයෙන් දේශනාකටයුතුබැවින් පුද්ගලාධිෂ්ඨානකොට හෙවත් ඒ ධ්‍යානයට ආධාරවූ පුද්ගලයාගෙණ දේශනාකරණලද්දේයි ඒ විභඞ්ගයෙහිද පරමාර්ථවශයෙන් පුද්ගලයෙකු නැතිබැවින් මේ විතර්කවිචාරයන්ගෙන් යුක්තාවූ ධ්‍යානයයනාදින් කියනලද ධර්මාධිෂ්ඨානවශයෙන්ම අර්ථ දතයුත්තේයි.

( පා † )

විවෙකජන්ති එත්ථ විත්ති විවෙකො නීවරණවිගමොති අත්ථො විත්තොතිවා විවෙකො නීවරණවිවිත්තො ඣානසම්පයුත්තධම්මරාසීති අත්ථො ~ තස්මා විවෙකා තස්මිංවා විවෙකෙ ජාතන්ති විවෙකජං ~ පීතිසුඛන්ති පිණයතීති පීති සා සම්පියායනලක්ඛණා කායචිත්තපීණනරසා ඵරණරසාවා ඔදග්‍යපච්චුපට්ඨානා සාපනෙසා ඛුද්දිකාපීති ඛණිකාපීති ඔක්කන්තිකාපීති උබ්බෙගාපීති ඵරණාපීතීති පඤ්චවිධා හොති තත්ථ ඛුද්දිකාපීති සරීරෙ ලොමහංසමත්තමෙව කාතුං සක්කොති ඛණිකාපීති ඛණෙ ඛණෙ විජ්ජුප්පාතසදිසා හොති සමුද්දතීරං වීචිවිය කායං ඔක්කමිත්වා ඔක්කමිත්වා භිජ්ජති ~ උබ්බෙගාපීති බලවතී හොති කායං උද්ධග්ගං කත්වා ආකාසෙ ලඞ්ඝාපනප්පමාණප්පත්තා හොති පුණ්ණවල්ලිකවාසී මහාතිස්සත්ථෙරො පුණ්ණමදිවසෙ සායං චෙතියඞ්ගණං

ගහෙත්වා චන්දලොකං දිස්වා මහාචෙතියාභිමුඛො හුත්වා ඉමාය වත වෙලාය චතස්සො පරිසා මහාචෙතියං වන්දන්තීති පකතියා දිට්ඨාරම්මණවසෙන බුද්ධාරම්මණං උබ්බෙගපීතිං උප්පාදෙත්වා සුධාතලෙ පහට චිත්තගෙණ්ඩුකො විය ආකාසෙ උප්පතිත්වා මහාචෙතියඞ්ගණෙ යෙව පතිට්ඨාසි— තථා ගිරිකණ්ඩක මහාවිහාරස්ස උපනිස්සයෙ වත්තකාලකගාමෙ එකා කුලධීතාපි බලව බුද්ධාරම්මණාය උබ්බෙගපීතියා ආකාසෙ ලඞ්ඝෙසි තස්සා කිර මාතාපිතරො සායං ධම්මස්සවණත්ථාය විහාරං ගච්ඡන්තා අම්ම ත්වං ගරුභාරා අකාලෙ විචරිතුං න සක්කොසි මයං තුය්හං පත්තිං කත්වා ධම්මං සොස්සාමාති අගමංසු සා ගන්තුකාමාපි තෙසං වචනං පටිබාහිතුං අසක්කොන්තී ඝරෙ ඔහියිත්වා ඝරාජිරෙ ඨත්වා චන්දාලොකෙන ගිරිකණ්ඩකෙ ආකාසචෙතියඞ්ගණං ඔලොකෙන්තී චෙතියස්ස දීපපූජං අද්දස චතස්සො ච පරිසා මාලාගන්ධාදීහි චෙතියපූජං කත්වා පදක්ඛිණං කරොන්තියො භික්ඛු සඞ්ඝස්ස ච ගණසජ්ඣායසද්දං අස්සොසි අථස්සා ධඤ්ඤාවතිමෙ යෙ විහාරං ගන්ත්වා එවරූපෙ චෙතියඞ්ගණෙ අනුසඤ්චරිතුං එවරූපඤ්ච මධුරං ධම්මකථං සොතුං ලභන්තී මුත්තාරාසි සදිස චෙතියං පස්සන්තියා එව උබ්බෙගාපීති උදපාදි සා ආකාසෙ ලඞ්ඝිත්වා මාතාපිතූනං පුරිමතරං යෙව ආකාසචෙතියඞ්ගණෙ ඔරුය්හ චෙතියං වන්දිත්වා ධම්මං සුණමානා අට්ඨාසි අථ නං මාතා පිතරො ආගන්ත්වා අම්ම ත්වං කතරෙන මග්ගෙන ආගතාසි පුච්ඡිංසු සා ආකාසෙන ආගතම්හි න මග්ගෙනාති වත්වා අම්ම ආකාසෙන නාම ඛීණාසවා සඤ්චරන්ති ත්වං කථං ආගතාසි වුත්තා ආහ මය්හං චන්දාලොකෙන චෙතියං ඔලොකෙන්තියා ඨිතාය බුද්ධාරම්මණා බලවපීති උප්පජ්ජි අථාහං නෙව අත්තනො ඨිතභාවං න නිසින්නභාවං අද්දසං ගහිත නිමිත්තෙනෙව පන ආකාසෙ ලඞ්ඝිත්වා චෙතියඞ්ගණෙ පතිට්ඨිතම්හීති එවං උබ්බෙගාපීති ආකාසෙ ලඞ්ඝාපනප්පමාණා හොති—

( ස ‡ )

විවෙකජන්ති එහි "විවෙකජං" යන මෙහි; විවිත්ති, වෙන්වීම; විවෙකො, විවෙක නම්; නීවරණ විගමොති අර්ථ, නීවරණ ධර්මයන්ගේ පහවීම යන අර්ථයි; විවිත්තොවා විවෙකො, පහවීනුයි හෝ විවෙක නම්; නීවරණවිවිත්තො, නීවරණ ධර්මයන් කෙරෙන් පහවූ; ඣානසම්පයුත්ත ධර්මරාසීති අර්ථ, ධ්‍යානය හා සම්ප්‍රයුක්ත ධර්මරාශිය යන අර්ථයි; තස්මා විවෙකා (නීවරණ විගත සංඛ්‍යාත) ඒ විවෙකය හේතුකොටගෙණ; තස්මිං විවෙකෙ (නීවරණයන් කෙරෙන් පහවූ ධර්මරාශි සංඛ්‍යාත) ඒ විවේකයෙහි හෝ; ජාතන්ති, උපන්නුයි; විවෙකජං, විවෙකජ නම්වේ; "පීතිසුඛං" යනුයෙහි; පීණයතීති (කාය චිත්තය) පිණවානුයි; පීති, ප්‍රීති නම්වේ; සා, හෝ තොමෙ; සම්පියායන ලක්ඛණා, අරමුණු කැමිමකොට දක්නා ස්වභාව ඇත්තීයි; කායචිත්ත පිණනරසා, කායචිත්ත දෙදෙනා පිණවන කෘත්‍ය ඇත්තීයි; ඵරණරසාවා, පැතිරෙණ කෘත්‍ය ඇත්තීහෝයි (උපන් තැනින් කොසගත් පමණතැන් ඉඩක්‍රමණයක් නැද්ද ආත්ම පරිපතිරීමෙන් තෙමේද පැතිරෙණ තම්වී] ඔදග්‍යපච්චුපට්ඨානා, උද්ග්‍රභාව එළඹිසිටිම්කොට ඇත්තීයි; සාපනෙසා, ඒ ප්‍රීති තොමෝ; සරීරෙ ලොමහංසනමත්තමෙව කාතුං සක්කොති, ශරීරයෙහි රෝමහර්ෂ මාත්‍රයක්ම කරන්නට පොහොසත්

වේ; ඛණිකා පීති, ක්ෂණික ප්‍රීති තොමෝ; ඛණේ ඛණේ, ක්ෂණ ක්ෂණයෙහි; විජ්ජුප්පාත සදිසා හොති, විද්‍යුත්පාත සදෘශව (ක්‍ෂුද්‍ර ප්‍රීතියට වඩා බලවත්ව] උපදී; ඔක්කන්තිකා පීති, අවක්‍රාන්තික ප්‍රීති තොමෝ; සමුද්දතීරං වීචි විය, මුහුදුවෙරල පැහිරෙණ මුහුදුරළ සෙයින්; කායං ඔක්කමිත්වා ඔක්කමිත්වා භිජ්ජති, ශරීරය පිණවමින් පැහිර බිඳේ (හෝ ක්ෂුද්‍ර ප්‍රීතියට වඩා බලවත්වේ) උබ්බේගා පීති, උද්වේග ප්‍රීති තොමෝ; බලවතී හොති, බලවත්වේ; කායං, ශරීරය; උද්ධග්ගං කත්වා, උස්වාගුකොට; ආකාසෙ, අහස; ලඞ්ඝාපනප්පමාණපත්තා, නගාපියන පමණට පැමිණීමෙසි; තථාහි, එසේමැනු; පුණ්ණගල්ලකවාසී මහාතිස්සත්ථෙරො, පණ්ගල්වැසි මහාතිස්ස නම් තෙරහු; පුණ්ණමදිවසෙ, මැදිපොහෝ දවස්; සායං, සවස් වේලෙහි; චෙතියඞ්ගණං ගන්ත්වා (පණ්ගල් වෙහෙර) දාගැබ අඟණට එළඹ; චන්දාලොකං දිස්වා, සඳපහණ දැක, මහාචෙතියාභිමුඛො හුත්වා, මහසෑයට අභිමුඛව; ඉමාය වත වෙලාය, මේ වේලෙහි; චතස්සො පරිසා, සිවුපිරිස්; මහාචෙතියං වන්දන්තීති, මහා චෛත්‍යය වඳනාහුයි; පකතියා දිට්ඨාරම්මණවසෙන, පූර්වයෙහි මුහා චෛත්‍යයෙහි දුටු අරමුණු විසින් (මහා චෛත්‍යයෙහි පූජා දුටු පිරුමෙහයිනැයි සේයි) බුද්ධාරම්මණං, බුදුන් අරමුණුකොට ඇති; උබ්බේගපීතිං උප්පාදෙත්වා, උත්ප්‍රේක්ෂිකා ප්‍රීතිය උපදවා; සුධාතලෙ පහටචිත්‍රභෙණ්ඩකො විය, සුණුබිම පහළ චිත්‍රාකාරයෙන් කළකත් දූකයක්මෙන් (පෙඳක්මෙන්) ආකාසෙ උප්පතිත්වා, අහසට නැගී; මහාචෙතියඞ්ගණෙයෙව පතිට්ඨාසි, මහසෑ අඟණෙහිම පිහිටිවිය (යෙම්ය යන සිත් හැනද ප්‍රීති බලයෙන්ම අරමුණුකාල හැතා පිහිටිවිය) පථා, එසේම; ගිරිකණ්ඩක මහා විහාරස්ස, ගිරිහඬු වෙහෙරට; උපනිස්සයෙ, සමීපයෙහි (නොහොත් ඒ වෙහෙරට නිශ්‍රයවූ ගොචරස්ථානවූය යන අර්ථයි) වත්තකාලකගාමෙ, එනම් ගමෙහි; එකාකුලධීතාපි, එක් කුලදුවකුදු; බලව බුද්ධාරම්මණාය උබ්බේගපීතියා, බලවත්වූ බුද්ධාලම්බණවූ උද්වේග ප්‍රීතියෙන්; ආකාසෙ ලඞ්ඝෙසි, අහසනැඟ; තස්සා කිර, ඇයගේ; මාතාපිතරො, මවුපිය දෙදෙන; සායං, සවස; ධම්මසවණත්ථාය, බණ අසනු පිණිස; විහාරං ගච්ඡන්තා, වෙහෙරට යන්නාහු; අම්ම ත්වං ගරුභාරා, අම් තොපි ගුරුවූ බර ඇත්තව (දරු ඇත්තවයි සේයි) අකාලෙ චරිතුං න සක්කොසි, නොවේලෙහි යන්නට නොපොහොසතුව; මයං, අපි; තුය්හං පත්තිං කත්වා, තිටද පෙන්සොට; ධම්මං සොස්සාමාති, බණ අසම්හයි; අගමංසු, ගියහ; සා, හෝ තොමෝ; ගන්තුකාමාපි, යනු කැමැති විද; තෙසං වචනං පටිබාහිතුං අසක්කොන්තී, ඔවුන්ගේ තෙපුල් පිළිබන්නට නොපොහොසත්වී; ඝරෙ ඨත්ත්වා, ගෙහිම වැළකා; ඝරාජිරෙ ඨත්වා, ගෘහාඞ්ගණයෙහි සිට; චන්දාලොකෙන, චන්ද්‍රාලොකයෙන්; ගිරිකණ්ඩකෙ, ගිරිහඬුයෙහි; ආකාසචෙතියඞ්ගණං ඔලොකෙන්තී (පර්වත ශිඛරයෙහි) ආකාශ දාගැප් අඟණබලත්නී; චෙතියස්ස, චෛත්‍යයෙහි; දීපපූජං අද්දස, පානේ පූජා දුට; චතස්සො ච පරිසා, සිවුවණක් පිරිස්; මාලාගන්ධාදීහි චෙතියපූජං කත්වා, මල්ගඳ ආදීන් චෛත්‍යයට පූජාකොට; පදක්ඛිණං කරොන්තියො, පැදකුණුකරන්නවුන් ("අද්දස"යි සම්බන්ධකරණු) භික්ඛු සඞ්ඝස්ස ච, භික්ෂු සඞ්ඝයාගේද; ගණසජ්ඣාය

සද්දං අස්සොසි, ශබ්ද (දහම්) පිරිවහ
ණ හඬ ඇසූ; අථ, ඉක්බිත්තෙන්;
අස්සා, ඈට; ධම්මසද්දවති මෙ, මු ඉතා
පිණැත්තග; යෙ, යම් කෙණෙක්; වි
හාරං ගන්ත්වා, වෙහෙරට එළඹ; එව
රූපෙ චේතියඞ්ගණෙ, මෙබඳුවූ දාගැප්
අඟණෙහි; අනුසඤ්චරිත්වා, ඇවිදිනව;
එවරූපස්ස මධුරං ධම්මකථං සො
තු, මෙබඳු මිහිරි ධර්මකථා අසනුවට
ද; ලභන්තී, ලැබෙද්දැයි; මුත්තාරා
සි සදිසචේතියං, මුතු රැසක් වැනිවූ
චෛත්‍යය; පස්සන්තියා එව, බලමින්
සිටියා හටම; උබ්බෙගාපීති උදපාදි, උ
ත්පෙඞ්ඛිකා ප්‍රීති උපනු; සා, සෝ තො
මෝ; ආකාසෙ ලංඝිත්වා, අහසනැගී;
මාතා පිතූනං පුරිමතරං යෙව, මවු
පියන්ට පළමුකොටම; ආකාසචෙති
යඞ්ගණෙ ඔරුය්හ, ආකාස චෛත්‍ය
ඞ්ගණයෙහි බැස; චේතියං වන්දිත්වා,
චෛත්‍යය වැද; ධම්මං සුණමානා, ද
හම් අසන්නී; අට්ඨාසි, සිටී; අථ, ඉක්
බිත්තෙන්; තං, ඇ; මාතාපිතරො, ම
වුපියෝ; ආගන්ත්වා, අවුත්; අම්ම, අම;
ත්වං, තෝ; කතරෙන මග්ගෙන ආග
තාසි පුච්ඡිංසු, කවර මඟකින් අවුදැයි
පිළිවිස්සෝ; සා, සෝ තොමෝ; ආකා
සෙන ආගතම්හි, අහසින් අයිමි; න
මග්ගෙනාති ආහ, මඟින් නොආයෙමි
කියා; අම්ම, අම; ආකාසෙන නාම, අ
හසින්නම්; ඛීණාසවා සඤ්චරන්ති,
ඛීණාශ්‍රවයෝ ඇවිදිති; ත්වං කථං ආ
ගතාසි වුත්තෙ, තෝ කෙසේ ආදැයි කි
යනලද්දී; ආහ, මෙසේ කීවූ; මය්හං
චන්දාලොකෙන චේතියං ඔළොකෙන්
තියා ඨිතාය, මා චන්ද්‍රාලොකයෙන්
චෛත්‍යය බලමින් සිටියාව; බුද්ධාරම්
මණා බලවපීති උප්පජ්ජි, බුද්ධාලම්බන
බලවත් ප්‍රීති උපනු; අථ, ඉක්බිත්තෙ
න්; අහං, මම; තස්ස අනන්තරෙන ඨිත
භාවං න ජානාමි ආකාසෙ ලඞ්ඝිං, න
මා තොදසිටි බව නොදනුත් බව දනි
මි; නගින නිමිත්තෙන (චෛත්‍ය වන්
දනාද ධර්මශ්‍රවණයද උදෙසා "ධම්මසද්දං
වන්දෙමි" යනාදීන්) ගත්තාලද කුසල
නිමිත්ත හෙතුවෙන්ම; ආකාසෙ ලංඝි
ත්වා, අහස නැගී; චෙතියඞ්ගණෙ පති
ට්ඨිතම්හිති, දාගැප් අඟණෙහි පිහිටි
යෙමි; එවං, මෙසේ; උබ්බෙගා පීති,
උද්වෙග ප්‍රීති තොමෝ; ආකාසෙ ලඞ්ඝා
පනප්පමාණා හොති, අහස නැංවෙන
පමණවේ —

---

(ගා ‡)

විවෙකයෙන් හටගත් ධර්මය යනමෙ
හි නීවරණයන්ගෙන් පහවීමයෝ වෙ
න්වීම විවෙකනම. නිවරණ ධර්මයන්
කෙරෙන් පහවූ ධ්‍යානසම්ප්‍රයුක්ත ධ
ර්ම සමූහය හෝ විවෙක නම් වන්නේ
ය. ඒ නිවරණයන්ගෙන් පහවීමයයි
කියනලද විවෙකය හේතුකොටගෙ
ණ හෝ නිවරණයන් කෙරෙන් පහවූ
ධර්මරාශි සංඛ්‍යාත විවේකයෙහි හෝ
හටගන්නාවූ ධර්මය විවේකයෙන් හට
ගත් ධර්ම නම්වේ ප්‍රීතිසුඛය යනමෙහි
නාමකාය සංඛ්‍යාත වෙදනාදිස්කන්ධත්‍ර
ය හා සිතද පිණවන අර්ථයෙන් ප්‍රීති
නම. ඒ ප්‍රීතිය අරමුණු ප්‍රියාකාරයෙ
න් දක්නා ස්වභාව ලක්ෂණකොට ඇ
ත්තීය පූර්වාකාශ කායචිත්ත දෙදෙන
පිණවීම හෝ පැහිරීම් කෘත්‍යකොට
ඇතිනිය ඔදවැඩීම ඵලකොට ඇත්තී
ය ඒ ප්‍රීතිය වනාහි ක්ෂුද්‍රකප්‍රීතිය ක්ෂණි
ක ප්‍රීතිය අවක්‍රාන්තික ප්‍රීතිය උත්පෙ
ඞ්ඛිකා ප්‍රීතිය ස්ඵුරණ ප්‍රීතියයි පස්වැදෑ
රුම් වන්නීය ඔවුන් අතුරෙන් ක්ෂුද්‍ර
ක ප්‍රීතිය ශරීරයෙහි ලොමු දැහැගැණු
ම පමණක් කරන්නාව සමර්ථ වන්නීය
ක්ෂණිකප්‍රීතිය ක්ෂුද්‍රකප්‍රීතියට වඩා බල
වත්ව ඉපිද ක්ෂණ ක්ෂණයෙහි විදුලිය
ගැසීමක්මෙන් වන්නීය. අවක්‍රාන්තික

ප්‍රීතිය මහා සමුද්‍රයෙහි නැඟි රළ වේගය වෙරළ දක්වා අවුත් පැතිරෙනනාක්මෙන් සියළු ශරීරය පිණපිණා පැතිරෙන්නීය උත්ප්‍රෙක්‍ෂිකා ප්‍රීතිය බලවත් වීනම් ශරීරය උඩුකුරුකොට අහසට නඟාපියන පමණට පැමිණෙන්නීය ඒ එසේමැයි මෙම ලක්දිව පුණ්ණගල්ලක විහාරවාසී මහාතිස්ස ස්ථවිරයෝ පසළොස්වක් පොහෝ දවස සවස් භාගයෙහි පණගල් වෙහෙර දාගැබ් මළුවට එළඹ සඳපාන දුටුරුවන්වැලි මහසෑයට අභිමුඛව ඒකානායෙන් මේ වේලෙහි සිවුපිරිස් රැස්ව මහසෑය වඳනාහයි පූර්වයෙහි මහසෑයෙහි දුටුවිරූ අරමුණු වශයෙන් සලකා බුදුන් අරමුණුකොට ඇති උත්ප්‍රෙක්‍ෂිකා ප්‍රීතිය උපයා සුණු පිරියම් කොට ඔප් නැගූ බිම පහළ වියතුරු පන්දුවක්මෙන් අහසට නැඟී සිහින් අරමුණුකළ මහසෑ මළුවෙහි ප්‍රීති බලයෙන්ම අහසින් ගොස් පිහිටියාය ඒ පරිද්දෙන්ම ගිරිභණ්ඩ වෙහෙරට ගොදුරුගම්වූ වත්තකාලනම් ගම්වැසි එක් තරා කුලදුවක්ද බුදුන් අරමුණුකොට උපදවාගත් උත්ප්‍රෙක්‍ෂිකා ප්‍රීතිය කරණකොටගෙණ අහස් නැංගාය කෙසේදයත්? ඇගේ මවුපිය දෙදෙනා එක්දිනක් සවස් වේලෙහි බණ අසනපිණිස වෙහෙරට යන්නාහු දියණියන් ගැබ්ගෙණ සිටි බැවින් අම්ම තී දුරිඇත්තියව නොකල්හි ඒ ඒ තැන හැසිරෙන්නට නොපොහොසත් වන්නිය අපි වෙහෙරට ගොස් තිට පින්පෙත්කොට බණ අසම්හයි නැංගියෝය ඈ වනාහි බණ අසනු කැමැත්තීද මවුපියන් නෙපුල් පැහැර හරින්නට නොපොහොසත්ව ගෙහිම රැඳින. ඉක්බිති මවුපියෝ වෙහෙරට නික්ම ගියාහු ගෙහිරැඳු දියණියෝ ගෙමිදුළට බැස සිට සඳපානින් බලන්නී ගිරිභණ්ඩ විහාරයෙහි ගල් පර්වතය මුදුනත පිහිටි අහස්දාගැබ් මළුවෙහි පහන් පූජාව හා සිවුවණක් පිරිස් රැස්ව මල් සුවඳ ආදීයෙන් සෑය පුද වැඳ පැදකුණුකරනනාවුන්ද දුටුය. භික්‍ෂු සඞ්ඝයා ධර්ම පිරිවහණා ශබ්දයද ඇසීය ඉක්බිතෙන් ඈට මෙබඳු සිතක් පහළවිය ඉදින් යම්කෙනෙක් වෙහෙරට එළඹ මෙබඳු දාගැබ් මලුවෙහි ඇවිදින්නටද මෙබඳු මිහිරි බණ කථා අසන්නටද ලැබෙත්නම් ඔව්හු ඉතාපිණැත්තෝයයි සිතමින් මුතු රැසක් වැනිවූ චෛත්‍යය බලමින් සිටියාවූ ඈට උත්ප්‍රෙක්‍ෂිකා ප්‍රීතිය උපන ඈ ඒ ප්‍රීතිවේගයෙන් අහසට නැගී මවුපියන්ට පෙරාතුව ආකාශ චෛත්‍ය මළුවෙහි බැස චෛත්‍යයබැද බණඅසම්හයි සිටියාහ. ඉක්බිතෙන් ඈගේ මවුපියෝ අවුත් ඈ දැක අම්ම තී අපට පෙරාතුව කොයි මඟින් ආදූයි පිළිවිසෙයෝය ඈද වහන්ස මඟකින් නොආයෙමි අහසින් ආම්හයි කීය අම්ම අහසින් නම් ක්‍ෂීණාශ්‍රවයෝම ඇවිදිනාහ තී කෙසේ අහසින් අවුදුයි විචාරණලද්දී වහන්ස සඳපහන් එළියෙන් චෛත්‍යය බලමින් සිටියාවූ මට බුදුන් අරමුණුකොට ඇති බලවත් ප්‍රීතිය උපන්නීය ඉක්බිතෙන් මාගේ ශරීරය සිටිය බවක්වත් හුන් බවක්වත් මම නොදැනිමි චෛත්‍ය වඳනාවද ධර්මශ්‍රවණයද අරමුණුකොට ප්‍රීතිය උපන් කල්හි ගන්නාලද කුශල නිමිත්ත හේතුකොටගෙණ අහසට නැගී මේ දාගැබ මලුවෙහි පිහිටියෙමියි කීහ. මෙසේ උත්ප්‍රෙක්‍ෂිකා ප්‍රීතිය ශරීරය අහසට නංවන ප්‍රමාණ වන්නීය යි දතයුතු.

( පා ¶ )

ඵරණපීතියා පන උප්පන්නාය සකල සරීරං ධමිත්වා පූරිතවත්ථි විය මහතා

උදකොඝෙන පක්ඛන්ත පබ්බත කුච්ඡි විය ච අනුපරිප්ඵුටං හොති. සා පනෙසා පඤ්චවිධා පීති ගබ්භං ගණ්හන්තී පරිපාකං ගච්ඡන්තී දුවිධං පස්සද්ධිං පරිපූරෙති කායපස්සද්ධිං චිත්තපස්සද්ධිඤ්ච. පස්සද්ධි ගබ්භං ගණ්හන්තී පරිපාකං ගච්ඡන්තී දුවිධම්පි සුඛං පරිපූරෙති කායිකඤ්ච චෙතසිකඤ්ච. සුඛං ගබ්භං ගණ්හන්තං පරිපාකං ගච්ඡන්තං තිවිධං සමාධිං පරිපූරෙති ඛණිකසමාධිං උපචාරසමාධිං අප්පනාසමාධින්ති. තෙසු යා අප්පනාසමාධිස්ස මූලං හුත්වා වඩ්ඪමානා සමාධිසම්පයොගං ගතා ඵරණාපීති අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා පීතීති. ඉතරම්පන සුඛනං සුඛං, සුට්ඨු වා ඛාදති ඛණති ච කායචිත්තාබාධන්ති සුඛං. තං සාතලක්ඛණං සම්පයුත්තානං උපබ්‍රූහනරසං අනුග්ගහපච්චුපට්ඨානං. සතිපි ච නෙසං කත්ථචි අවිප්පයොගෙ ඉට්ඨාරම්මණපටිලාභතුට්ඨි පීති. පටිලද්ධරසානුභවනං සුඛං. යත්ථ පීති තත්ථ සුඛං. යත්ථ සුඛං තත්ථ න නියමතො පීති. සඞ්ඛාරක්ඛන්ධසඞ්ගහිතා පීති. වෙදනාක්ඛන්ධසඞ්ගහිතං සුඛං. කන්තාරඛින්නස්ස වනන්තුදකදස්සනසවනෙසු විය පීති. වනච්ඡායාප්පවෙසනඋදකපරිභොගෙසු විය සුඛං. තස්මිං තස්මිං සමයෙ පාකටභාවතො චෙතං වුත්තන්ති වෙදිතබ්බං. ඉති අයඤ්ච පීති ඉදඤ්ච සුඛං අස්ස ඣානස්ස අත්ථි ඣානෙ අත්ථීති ඉදං ඣානං පීතිසුඛන්ති වුච්චති. අථ වා පීති ච සුඛඤ්ච පීතිසුඛං ධම්මවිනයාදයො විය. විවෙකජං පීතිසුඛමස්ස ඣානස්ස අත්ථි ඣානෙ අත්ථීති එවම්පි විවෙකජං පීතිසුඛං. යථෙව හි ඣානං එවං පීතිසුඛම්පෙත්ථ විවෙකජමෙව හොති. තඤ්චස්ස අත්ථි තස්මා එකපදෙනෙව විවෙකජං පීතිසුඛන්තිපි වත්තුං යුජ්ජති විභඞ්ගෙ පන ඉදං සුඛං

ඉමස්ස පීතිසා සහගතහානි ආදිනා නයෙන වුත්තං අථවා පන තාවාපි එවමෙව දට්ඨබ්බා.

( ස )

ඵරණපීතියා පන උප්පන්නාය, ඵරණ ප්‍රීතිය උපන් කල්හි; සකල සරීරං, සියලු ශරීරය; ධමිත්වා පූරිතවත්ථිවිය, පිඹ පිරූ විතක් මෙන්ද; මහතා උදකොඝෙන පක්ඛන්තා. මහ දියපතුරෙකින් වදනාලද; පබ්බත කුච්ඡිවිය, පර්වත කුක්ෂියක් මෙන්ද; අනුපරිප්ඵුටං හොති, හැමපසින්ම ස්පර්ශීකරණ ලද්දේවේයි; සා පනෙසා පඤ්චවිධා පීති, ඒ මේ පස්විධ ප්‍රීති තොමෝ; ගබ්භං ගණ්හන්ති (ප්‍රශ්‍රබ්ධියට නිමිත්ත වැවත්) ගැබ් ගන්නී; පරිපාකං ගච්ඡන්තී, මිහිකරන්නී; දුවිධම්පි පස්සද්ධිං පරිපූරෙති, දෙවැදෑරුම් ප්‍රශ්‍රබ්ධිය පුරයි (කවර දුවිධ ප්‍රශ්‍රබ්ධියක්දයත්?) කායපස්සද්ධිඤ්ච, කායප්‍රශ්‍රබ්ධියද; චිත්තපස්සද්ධිඤ්ච, චිත්ත ප්‍රශ්‍රබ්ධියද යන විවිධ ප්‍රශ්‍රබ්ධියයි; පස්සද්ධි ගබ්භං ගණ්හන්තී, ප්‍රශ්‍රබ්ධිය ගැබගන්නී; පරිපාකං ගච්ඡන්තී, මිහිකරන්නී; දුවිධම්පි සුඛං පරිපූරෙති, දෙවැදෑරුම් සුවය පුරයි (කවර දෙසුවයදයත්?) කායිකඤ්ච චෙතසිකඤ්ච, කායික සුවය චෛතසික සුවය යන මේ දෙසුවයයි; සුඛං ගබ්භං ගණ්හන්තං, සුවය ගැබගන්නේ; පරිපාකං ගච්ඡන්තං, මුහුකරන්නේ; තිවිධං සමාධිං පරිපූරෙති, ත්‍රිවිධ සමාධිය පුරයි: ඛණිකසමාධිං (උපචාරහු මියට නොපැමිණි) ක්ෂණික සමාධිය; උපචාර සමාධිං, උපචාර සමාධිය; අප්පනාසමාධින්ති, අර්පණා සමාධියයි (මේ තුන පුරා අර්පණා සමාධි සම්ප්‍රයුක්ත ප්‍රීතිය අර්පණා සමාධියම පුරයි. ක්ෂණිකසමාධි පුරණ ප්‍රීතියද උපචාර සමාධි පුරණ ප්‍රීතියද අර්පණා සමාධියට දුරැබුසි ඒ දෙක මෙහි නොඅල්වා "තෙසු යා අප්පනා සමාධිස්ස" යනාදී

සීහු) නොසු, ඒ භූත්සමාධිත් හෙරෙහි; අප්පනාසමාධිස්ස මූලං හුත්වා, අර්පණා සමාධියට මුල්ව; වඩ්ඪමානා (පූර්වයෙහි උපචාර සමාධිහුහා සම්ප්‍රයුක්තව) අනුක්‍රමයෙන් වඩන්නී; සමාධිසම්පයොගංගතා, අර්පණාසමාධිහු හා සම්ප්‍රයොගයට පැමිණි ("යා ඵරණාපීති" යි යොදනු) යම් ස්ඵුරණ ප්‍රීතියක් ඇද්ද; අයං, මේ තොමෝ; ඉමස්මිං අත්ථෙ "පීතිසුඛං" යන තැන; අධිප්පෙතා පීති, අභිමත ප්‍රීතියි (අර්පණා ප්‍රීතියම ස්ඵුරණ ප්‍රීති නම්වේ "පඤ්චවිධා පීති ගබ්භං ගණ්හන්ති" යි කුමක් පිණිස කීහ යත්? ප්‍රථම ධ්‍යානයෙහි අර්පණා ප්‍රීතියද මතු මත්තෙහි ධ්‍යානයෙහි ප්‍රීතියට ප්‍රත්‍යය වන බැවින් යථාලාභ වශයෙන් සප්‍රීතික ධ්‍යානයට ප්‍රත්‍යය වන ප්‍රීතීන් එක්කොට සාමාන්‍ය විසින් "පඤ්චවිධාපීති" යි කී වෙත්) ඉතර මපන, අනික් සුඛය වනාහි; සුඛනං සුඛං, සුඛකිරීම සුව නම්. ("සුඛදුක්ඛ ත ක්‍රියායං" යන ධාතුයි) වා, නොහොත්; සුට්ඨු, මනාකොට; කායචිත්තාබාධං, කායචිත්ත පීඩාව; ඛාදති, කානුයි ("ඛාදභක්ඛණෙ" යන ධාතුයි) ඛණතිච, කණීනුයිද ("ඛණුඛණනෙ" යන ධාතුයි) සුඛං, සුවය නම් වේ; තං, ඒ සුඛය; සාතලක්ඛණං, සීතල මධුර ස්වභාව ඇත්තේයි; සම්පයුත්තානං උපබ්‍රූහණරසං, සම්ප්‍රයුක්ත ධර්මයන්ගේ වැඩීම කෘත්‍යකොට ඇත්තේයි; අනුග්ගහ පච්චුපට්ඨානං, සම්ප්‍රයුක්තයන්ට අනුග්‍රහකිරීම (උපකාරී බව) වැටහීම් කොට ඇත්තේයි; කත්ථචි, ප්‍රථම ධ්‍යානාදීන්හි; සතිපිච නෙසං අවිප්පයොගෙ, ප්‍රීතිසුඛ දෙදෙනාගේ අවිප්‍රයොගයක් ඇතිකල්හිදු; ඉට්ඨාරම්මණ පටිලාභතුට්ඨි පීති, ඉෂ්ටාලම්බන ප්‍රතිලාභ වශයෙන් උපදනා තුෂ්ටිය ප්‍රීති නම්; පටිලද්ධ රසානුභවනං සුඛං, ප්‍රතිලබ්ධවූ ආලම්බන රස අනුභවය කිරීම සුඛ නම්; යත්ථපීති, යම් සිතෙක ප්‍රීතිය ඇද්ද; තත්ථ, ඒ සිත; සුඛං, සුඛය වේ (මෙයින් විතර්කයාගේ විචාරය හා සම්ප්‍රයොගය මෙන් ප්‍රීති සුඛයන්ගේ අත්‍යන්ත සංයොගය කීහු। යත්ථ සුඛං, යම් සිතෙක සුවයද; තත්ථ, ඒ සිත; නානියමතො පීති (සුඛ සහගත කාය විඤ්ඤාණයෙහි හා පඤ්චක නයෙහි චතුර්ථධ්‍යානයෙහි ප්‍රීතිය නොවන්නේ) නියමයෙන් ප්‍රීතිය නොවේ (මෙයින් විචාරයාගේ විතර්කය හා සම්ප්‍රයොගය මෙන් සුඛයාගේ ප්‍රීතිය හා අත්‍යන්ත සංයොගය කීහු) සඞ්ඛාරක්ඛන්ධසඞ්ගහිතාපීති, සංස්කාරස්කන්ධයෙහි සංග්‍රහකරණලද්දී ප්‍රීතියයි; වෙදනාක්ඛන්ධසඞ්ගහිතං සුඛං, වෙදනාස්කන්ධයෙහි සංග්‍රහකරණලද්දේ සුඛයයි; කන්තාරඛින්නස්ස, පැන් නැති දීර්ඝ මාර්ගයෙහි දුක්ඛයට පැමිණියහුගේ ("කාන්තාරනායි එරාති කාන්තාරං නිරුදකමරුට්ඨානං") වනන්තුදකා දස්සන සවණෙසුවිය පීති, වන දර්ශන උදක දර්ශන ශ්‍රවණයෙහි මෙන් ප්‍රීතිය දතයුතුයි ("වනමෙව වනන්තං" යනු වේ) වනච්ඡායප්පවෙස උදකපරිභොගෙසුවිය සුඛං, වනච්ඡායාවට වැදීමෙහි හා උදක පරිභොග කාලයෙහි මෙන් සුඛය දතයුතු; තස්මිං තස්මිං සමයෙ, ඉෂ්ටාලම්බනයාගේ ප්‍රතිලාභ සමයෙහිද ප්‍රතිලබ්ධයාගේ රසානුභවන සමයෙහිද। වනච්ඡායාදීන්ගේ දර්ශන ශ්‍රවණ සමයෙහිද පරිභොග සමයෙහිද) පාකටභාවතො ච, ප්‍රීති සුඛ දෙදෙනාගේ ප්‍රතිලබ්ධ හෙයින්ද (ඉෂ්ටාලම්බන ප්‍රතිලාභ කාලයෙහිදු වනාන්ත උදක දර්ශන ශ්‍රවණ කාලයෙහිදු සුවය ඇතදහොත් එය වඩා ප්‍රකට ප්‍රත්‍යය ඇති ප්‍රීතිය බලවත් හෙයින් ඉෂ්ටාලම්බන රසය අනුභවකරණ කා

ල්හිද ඡායා ජල වැලඳගත්තා කල්හිද ප්‍රීතිය ඇතැදහොත් එයට වඩා සුවය බලවත්වන බැවින්ද යනු අදහසි) එතං වුත්තන්ති වෙදිතබ්බං, මේ කියනලදූයි දතයුතුයි; ඉති, මෙසේ; අයඤ්ච පීති, මේ ප්‍රීතිද; ඉදඤ්ච සුඛං, මේ සුඛයද; අස්ස ඣානස්ස, මේ ධ්‍යානය හට ඇත්තුයි කියාද; අස්මිං වා ඣානෙ අත්ථි, මේ ධ්‍යානයෙහි ඇත්තුයි කියාද; ඉදං ඣානං, මේ ධ්‍යානය; පීතිසුඛන්ති වුච්චති, ප්‍රීති සුඛයයි කියනු ලැබේ (මේ අර්ථ විකල්පයෙහි "විවෙකජං"යි ධ්‍යානයම කියනලදී) අථවා, නොහොත්; පීතිඤ්ච සුඛඤ්ච, ප්‍රීතියද සුඛයද (ප්‍රීති සුඛ දෙකම) ධම්මවිනයාදයො විය ("ධම්මො ච විනයො ච" ධම්මවිනයා යනාදීමෙන් (යනු අදහසි) විවෙකජං යෑඑවනි ඣානං, තම්සේ ධ්‍යානය විවෙකජද; එවං, මෙසේම; එත්ථ, මේ ධ්‍යානයෙහි; පීතිසුඛම්පි, විවෙකජමෙව හොති, ප්‍රීතිසුඛයම විවෙකජවේ; තඤ්ච, ඒ ප්‍රීතිසුඛයද; අස්ස අත්ථි, මේ ධ්‍යානයට ඇති; තස්මා, එහෙයින්; එකපදෙනෙව (අලුප්ත සමාස බැවින්) එකපදයෙන්ම; විවෙකජං පීතිසුඛන්ති වත්තුං යුජ්ජති "විවෙකජං පීතිසුඛං"යි කියන්නට යෙදේ; විභඞ්ගෙපන, විභඞ්ගයෙහි වනාහි; ඉදං සුඛං, මේ සුඛය; ඉමාය පීතියා සහගතන්ති ආදිනා නයෙන, මේ ප්‍රීතිය හා සහගතය යනාදි නයින්; වුත්තං, කියනලදී; අත්ථොපි, අර්ථයද; තත්ථ, ඒ විභඞ්ගයෙහිදු; එවමෙව දට්ඨබ්බො, මෙසේම දතයුත්තේයි.

( හා ¶ )

ස්ඵුරණ ප්‍රීතිය උපන් කල්හි සියළු ශරීරය සුලං පිඹි පිරූ පිඟාන් කෙත්ද මහ දියවතුරක් ඇතුළට වන් ගල්ගුහා කුක්ෂියක් මෙන්ද හාත්පසින් සියළු ශරීරය ස්පර්ශකරණලද්දේ වෙයි. ඒ මේ පඤ්චප්‍රකාර ප්‍රීතිය කෙලෙස් සන් සිඳුවීමට කාරණාවශයෙන් ගැබ් ගත් වන්නී මුහුරුවන්නී කායික සුවය චෛතසික සුවය යන දෙයාකාර සුවය ගැබ්ගත්වූවත් මුහුරුවමින් ක්ෂණික සමාධිය උපචාර සමාධිය අර්පණා සමාධිය යන තුන් ආකාර සමාධිය පුරන්නේයි ඒ ත්‍රිවිධ සමාධීන් අතුරෙන් අර්පණා සමාධියට මුල්වූ පූර්වභාගයෙහි උපන් උපචාර සමාධිය හා සම්ප්‍රයුක්තව අනුක්‍රමයෙන් වඩනා අර්පණා සමාධිය හා එක්වන් බවට ගියාවූ යම් ස්ඵුරණ ප්‍රීතියක් ඇත්තීවිද ඒ මේ ප්‍රීතිය මේ අර්ථයෙහි ප්‍රීතියයි දතයුත්තේය මෙයින් අන්‍යවූ සුවය කෙසේදයත්? සුවපත් කිරීම සුවනම් නොහොත් නාමකාය චිත්තකාය දෙදෙන සම්බන්ධ පීඩාව මනාකොට භක්ෂණයකරණ දැයියෙන් හෝ කණන අදියෙන් හෝ සුවනම් වන්නේය ඒ සුවය ශීතල මධුර ස්වභාව ලක්ෂණකොට ඇත්තේය තමා හා සම්ප්‍රයුක්තවූ සෙසු චිත්ත චෛතසිකයන් වැඩීම කෘත්‍යකොට ඇත්තේය එම සම්ප්‍රයුක්ත ධර්මයන්ට උපකාරවීම එලකොට ඇත්තේය ප්‍රථම ධ්‍යානාදි ඇතම් සිතෙක මේ ප්‍රීති සුඛ දෙදෙන වෙන්කොට පවත්නෙහිදු තමා කැමති අරමුණු ලැබීම් වශයෙන් උපදනා සතුට ප්‍රීති නම ලබහලද ඒ අරමුණු රස විඳගැණීම සුඛ නම. චිත්තය විචාරය හා සමග යෙදී පවත්නාක්මෙන් යම් සිතෙක ප්‍රීතිය ඇත්තීවිනම් සුඛයද එම සිතෙහි පවත්නේය එතකුදුවුවත් සුඛසහගත කාමාවචර කුශල පඤ්චකනයෙහි චතුර්ථ ධ්‍යානය යන දෙසිතෙහි ප්‍රීතියෙන් තොරව සුඛය තනිව පවත්නා හෙයින් යම් තැනෙක සුඛය ඇත්තේ විනම් එහි නියමවශයෙන්ම ප්‍රීතිය නොයෙදෙන්නියි; මේ ධර්ම දෙදෙ

තාගේ වෙහස වන්නාහි ප්‍රීතිය සංස්කාරස්කන්ධයටද සුඛය වේදනාස්කන්ධයටද ඇතුළත් ධර්ම දෙදෙනෙක් වීම මාත්‍රයක්මය තවද රුක් සෙවන හා පැන් ඇති කාන්තාරයෙහි දීර්ඝ මාර්ගයෙහි පිපාසයෙන් මිරිකුණු පුරුෂයෙකුට වන රෙබා හා පැන් දැකීමෙන් හෝ ඇසීමෙන් හෝ උපදනා චිත්ත ස්වභාව මෙන් ප්‍රීතියද එම පුරුෂයාගේ රුක් සෙවනට පැමිණීමෙන් හෝ පැන් පීමෙන් හෝ උපදනා චිත්ත ස්වභාව මෙන් සුඛයද දතයුතු කැමති අරමුණක් ලබන කල්හිද වනරෙබා පැන් පොකුණු දුටුකල්හිද සුවය ඇත්තේ නමුත් ඊටවඩා ප්‍රීතිය බලවත්වන හෙයින්ද කැමති අරමුණු රස විඳගන්නා කල්හිද ඡායාව හා ජලය වැලඳගන්නා කල්හිද ප්‍රීතිය ඇත්තී නමුදු ඊටවඩා සුවය බලවත්වන හෙයින්ද මේ උපමාව කියනලදැයි දතයුතු මෙසේ කියනලද අර්ථයෙන් යුක්තවූ මේ ප්‍රීතියද මේ සුවයද මේ ධ්‍යානයට ඇති බැවින් හෝ මේ ධ්‍යානයෙහි ඇති බැවින් හෝ ප්‍රීතිසුඛ ධ්‍යානයයි කියනලද්දේයි. තවද ධර්මයද විනයද දෙක ධර්මවිනයයි කියන්නාක්මෙන් ප්‍රීතියද සුඛයද යන දෙක ප්‍රීතිසුඛයයි කියා හෝ දතයුත්තේයි. කායවිවේක චිත්ත විවේක දෙකින් හටගන්නාවූ ප්‍රීතිසුවය මේ ධ්‍යානයට හෝ මේ ධ්‍යානයෙහි ඇත්තේනුයි කියා හෝ මෙසේද ප්‍රීතිසුඛය විවේකයෙන් හටගත්තේයයි දතයුතු. යම්සේ ධ්‍යානය විවේකයෙන් හටගන්නේද එපරිද්දෙන්ම මේ ධ්‍යානයෙහි ප්‍රීතිසුඛය විවේකයෙන් හටගන්නේවේයි ඒ ප්‍රීතිසුඛයද මේ ධ්‍යානයට ඇති හෙයින් අල්පතා සමාස බැවින් විවේකයෙන් උපන් ප්‍රීති සුවයයි එක් පෙදින්ම කියන්නට සුදුසු වන්නේයි. ධ්‍යාන විභඞ්ගයෙහි වන්නාහි මේ සුඛය මේ ප්‍රීතිය හා සහිතව තිබේය යනාදින් මේ කාරණයම වදාරණලද්දේද එහිදු අර්ථ මෙසේමදතයුතුයි.—

( පා. • )

පඨමං ඣානන්ති ඉදං පරතො ආවි භවිස්සති උපසම්පජ්ජාති උපගන්ත්වා පාපුණිත්වාති වුත්තං හොති විභඞ්ගෙ පන උපසම්පජ්ජාති පඨමස්ස ඣානස්ස ලාභො පත්ති සම්පත්ති ඵස්සනා සච්ඡිකිරියා උපසම්පදාති වුත්තං තස්සාපි එවමෙව අත්ථො දට්ඨබ්බො—විහරතීති තදනුරූපෙන ඉරියාපථ විහාරෙන ඉති වුත්තප්පකාර ඣානසමඞ්ගී හුත්වා අත්තභාවස්ස ඉරියං වුත්තිං පාලනං යාපනං චාරං විහාරං අභිනිප්ඵාදෙති වුත්තං හෙතං විභඞ්ගෙ විහරතීති ඉරියති වත්තති පාලෙති යපෙති යාපෙති චරති විහරති තෙන වුච්චති විහරතීති—යම්පන වුත්තං පඤ්චඞ්ග විප්පහීනං පඤ්චඞ්ග සමන්නාගතන්ති තත්ථ කාමච්ඡන්දො ව්‍යාපාදො ථීනමිද්ධං උද්ධච්ච කුක්කුච්චං විචිකිච්ඡාති ඉමෙසං පඤ්චන්නං නීවරණානං පහාණවසෙන පඤ්චඞ්ගවිප්පහීනතා වෙදිතබ්බා—නහි එතෙසු අප්පහීනෙසු ඣානං උප්පජ්ජති තෙනාස්සෙතානි පහාණඞ්ගානීති වුච්චන්ති කිඤ්චාපිහි ඣානක්ඛණෙ අඤ්ඤෙපි අකුසලා ධම්මා පහීයන්ති තථාපි එතානෙව විසෙසෙන ඣානන්තරායකරානි කාමච්ඡන්දෙන හි නානාවිසයප්පලොභිතං චිත්තං න එකත්තාරම්මණෙ සමාධියති කාමච්ඡන්දාභිභූතංවා නං නකාමධාතුප්පහාණාය පටිපදං පටිපජ්ජති ව්‍යාපාදෙන වාරම්මණෙ පටිහඤ්ඤමානං න නිරන්තරං පවත්තති ථීනමිද්ධාභිභූතං අකම්මඤ්ඤං හොති

උද්ධච්චකුක්කුච්චපරෙතං අවූපසන්ත
මෙව හුත්වා පරිබ්භමති විචිකිච්ඡාය
උපහතං ඣානාධිගමසාධිකම්පටිපද
නාරොහති ඉති විසෙසෙන ඣා
නන්තරායකරත්තා එතානෙව පහා
ණඞ්ගානීති වුත්තානි යස්මාපන විත
ක්කො ආරම්මණෙ චිත්තං අභිනිරො
පෙති විචාරො අනුබන්ධති තෙහි අවි
ක්ඛෙපාය සම්පාදිතපයොගස්සචෙත
සො පයොගසම්පත්ති සම්භවා පීති
පීණනං සුඛඤ්ච උපබ්‍රූහණං කරොති
අථනං සෙසසම්පයුත්තධම්මං එතෙහි
අභිනිරොපණානුබන්ධනපීණන උප
බ්‍රූහණෙහි අනුග්ගහිතා එකග්ගතා
එකත්තාරම්මණෙසමං සම්මා, ආධියති
තස්මා විතක්කො විචාරො පීතිසුඛං
චිත්තෙකග්ගතාති ඉමෙසං පඤ්චන්නං
උප්පත්තිවසෙන පඤ්චඞ්ගසමන්නා ගත
තා වෙදිතබ්බා උප්පන්නෙසු හි එතෙසු
පඤ්චසු ඣානං උප්පන්නං නාමහොති
තෙනස්ස එතානි පඤ්චසමන්නාගතඞ්ගා
නීති වුච්චන්ති තස්මා න එතෙහි සම
න්නාගතං අඤ්ඤදෙව ඣානං නාම
අභිනිග්ගහෙතබ්බං යථාපන අඞ්ගමත්ත
වසෙනෙව චතුරඞ්ගිනී සෙනා පඤ්චඞ්ගි
කඤ්චතූරියං අට්ඨඞ්ගිකොච මග්ගොති
වුච්චති එවම්දම්පි අඞ්ගමත්තවසෙ
නෙව පඤ්චඞ්ගිකන්තිවා පඤ්චඞ්ගසම
න්නාගතන්තිවා වුච්චතීති වෙදිතබ්බං
එතානිච පඤ්චඞ්ගානි කිඤ්චාපි උප
චාරක්ඛණෙපි අත්ථි අථඛො උපචාරෙ
පකතිචිත්තතො බලවතරානි ඉධපන
උපචාරතොපි බලවතරානි රූපාවචර
ලක්ඛණප්පත්තානි එත්ථහි විතක්කො
සුවිසුද්ධෙන ආකාරෙන ආරම්මණෙ චි
ත්තං අභිනිරොපයමානො උප්පජ්ජ
ති විචාරො අතිවිය ආරම්මණං අනුම
ජ්ජමානො පීතිසුඛං සබ්බාවන්තම්පි
කායං ඵරමානං තෙනෙවාහ නාස්ස
කිඤ්චිසබ්බාවතො කායස්ස විවෙකජෙ
න පීතිසුඛෙන අප්ඵුටං හොතීති.

( ස * )

පඨමජ්ඣානන්ති, පඨමජ්ඣානං
යන මේපදය; පරතො ආවි භවිස්සති
මතුයෙහි පහළවේ (උපසම්පජ්ජතියි
සේසි) උපගන්ත්වා, තමාසතන්හි උත්
පාදන විසින් එළඹ ; පාපුණිත්වාතිවු
ත්තංහොති, පැමිණයයි කී නියායි;වා,
නොහොත්(උපසම්පාදයිත්වා-යි සේසි)
නිප්ඵාදෙත්වාති වුත්තංහොති, නිපද
වායයි කී නියායි ; විභඞ්ගෙපන, විභ
ඞ්ගයෙහිවනාහි(උපසම්පජ්ජතියිසේසි)
පඨමජ්ඣානස්ස, ප්‍රථමධ්‍යානයාගේ,
ලාභො, ලබනබවය; පටිලාභො, මනා
කොට පිළිලබනබවය; සම්පත්ති, මනා
කොට ලැබෙනබවය, දස්සනා, ඥාන
යෙන් දක්නාය කරණබවය; සච්ඡිකිරි
යා, සාක්ෂාත් කරණබවය; උපසම්පදා;
උපදවනබව යයි; වුත්තා, කියනලදී,
තස්සාපි, ඒ විභඞ්ගයාගේ, එවමෙව,මෙ
පරිද්දෙන්ම ; අත්ථොදට්ඨබ්බො, අර්ථ
දතයුතු; විහරතීති, විහරතියයෙනනයි;
තදනුරූපෙන, ඒ ධ්‍යානයට අනුරූ
පවූ ; ඉරියාපථ විහාරෙන, ඊර්‍යාපථ
විහාරයෙන් ; ඉති, මෙසේ ; උත්තප්ප
කාරජ්ඣාන සමංගී හුත්වා,උක්තාකාරවූ
ධ්‍යානයෙන් සමන්විතව; අත්තභාව
ස්ස, ආත්මභාවයාගේ ; ඉරියා, ක්‍රියා
ය ; වුත්ති, ප්‍රවෘත්තිය, පාලනං;ඉරියව්
පීඩායෙන් රැක්මය ; යපනං, ඒ ඒ
ඊරියව්වූ විසින්වැපීම ; යාපනං;යැපීම;
චාරං, හැසිරීම ; අභිනිප්ඵාදෙන්ති, නි
පදවත්;වුත්තංහෙතංවිභඞ්ගෙ, විභඞ්ග
යෙහි මේ කීයේ මැනු (විහරතියිසේසි)
ඉරියති, ක්‍රියාවකෙරේ ; වත්තති, පව
ත්නේයිපාලෙති (එක් ඊර්‍යාපථපීඩාව
ක් අනික් ඉරියව්වෙන්) රකී; යපෙති,
යැපේ ; යාපෙති, යපා, චරති, හැසි
රේ; විහරති, මෙසේ ; තෙන, එහෙ

සින්; විහරති නි වුච්චති "විහරති" යි කියනලදී (පඤ්චඞ්ගවිප්පහීණං, පඤ්චඞ්ග සමන්නාගතන්ති යම්පනවුත්තංතත්‍ර,යි යොදනු) කාමච්ඡන්දො, කාමච්ඡන්දය; ව්‍යාපාදො, ව්‍යාපාදය; ථිනමිද්ධං, ස්ත්‍යානමිද්ධය; උද්ධච්චකුක්කුච්චං, ඖද්ධත්‍යකෞකෘත්‍යය; විචිකිච්ඡාති; විචිකිත්සාය යන; ඉමෙසං පඤ්චන්නං නීවරණානං, මේ පඤ්චනීවරණයන්ගේ; පහාණවසෙන, ප්‍රහාණවශයෙන්; පඤ්චඞ්ග විප්පහීණතා, පඤ්චාඞ්ගවිප්‍රහීණ බව; වෙදිතබ්බා, දතයුතු (පඤ්චඅඞ්ගයන් විෂ්කම්භන භාවයෙන පහීණානි එතස්සාති පඤ්චඞ්ගවිප්පහීණං පඤ්ච අඞ්ගානි විප්පහීණානිවා පඤ්චාඞ්ගවිප්පහීණං යනුවේ) එතෙසු අප්පහීණෙසු, ඒ කාමච්ඡන්දාදීන් අප්‍රහීණකල්හි; ඣානං නහි උප්පජ්ජති, ධ්‍යානය නොමඋපදී, තෙන, එහෙයින්; අස්ස, මේ ධ්‍යානයාගේ ; එතානි, මේ කාමච්ඡන්දාදිහු; පහාණඞ්ගානීති, ප්‍රහාණාඞ්ගයහයි; වුච්චන්ති, කියනු ලැබෙත්; කිඤ්චාපි, කිසිසේත් ; ඣානක්ඛණෙ, ධ්‍යානක්ෂණයෙහි (ධ්‍යානලාභීහට ධ්‍යානසම්ප්‍රයුක්ත භාවනාකාලයෙහි ධ්‍යානප්‍රතිපක්ෂභාවනා ලෝභචිත්තාදීන්ගේ ප්‍රවෘත්තිසද්භාවයෙන් "ඣානක්ඛණෙහි" කීහු) අඤ්ඤෙපි අකුසලාධම්මා (ලෝභචිත්තොත්පාදාදී) සෙසු අකුශලධර්මයෝද; පහීයන්ති, පැහෙත් (නොපවත්ති යන අර්ථයි) තථාපි, එසේවුවත් ; එතානෙව; මේ කාමච්ඡන්දාදීහුම; විසෙසතො ඣානන්තරාය කරා, විසෙසින් ධ්‍යානයට අන්තරාය කරන්නෝයි; කාමච්ඡන්දෙනහි, කාමච්ඡන්දයෙන්, නානාලම්බණ විසයපලොභිතං චිත්තං, නානාලම්බණහෙයින් පොළොඹනලද සිත; එකත්තාරම්මණෙ (පඨවිකසිණාදිවිසින්) එක එක ස්වභාවාලම්බණයෙහි(නොයෙක් එකග්ගතා සංඛ්‍යාත එකත්වය එළවන අරමුණෙහි; නසමාධියති, සමාහිත නොවේ; කාමච්ඡන්දාභිභූතං වා, කාමච්ඡන්දයෙන් හෝ මඩනාලද; තං, ඒ චිත්තය; කාමධාතුප්පහාණාය (නානාවිෂය සම්මූර්ඡිත වූ) කාමධාතුවගේ ප්‍රහාණය (සමතික්‍රමණය) පිණිස; පටිපදං, ධ්‍යානයට; නපටිපජ්ජති, නොපැමිණේ; ව්‍යාපාදෙනච, ව්‍යාපාදයෙනුදු; ආරම්මණෙ පටිහඤ්ඤමානං, අරමුණෙහි ගැටෙන්නේ; නනිරන්තරං පවත්තති, නිරන්තරයෙන් නොපවතීද (විශෙෂයෙන් අන්තරිතනොව සමාහිතභාව පවති යන අර්ථයි) ථිනමිද්ධාභිභූතං, ස්ත්‍යානමිද්ධයෙන් මඩනාලද්දේද; අකම්මඤ්ඤං හොති, භාවනාකර්මයට සුදුසු නොවේ (යොග්‍යනොවේ යන අර්ථයි) උද්ධච්චකුක්කුච්චපරෙතං, ඖද්ධත්‍ය කෞකෘත්‍යදෙකින් යුක්තවූයේ (මඩනාලද්දේ) අවූපසන්තමෙව හුත්වා, නොසන්හිඳීම; පරිබ්භමති, බමී (නොසන්හුන් නහුව සමාධානයක් නැතිහෙයින් පරිග්‍රමණයකෙරේ යන අර්ථයි) විචිකිච්ඡාය උපහතං(සාතිසය විචාරය නැති බැවින් භගවත් සම්බුද්ධවේදහෝ නොවේදහෝ පඨවි පඨවි යනාදි මනසිකාරයෙන් ධ්‍යානයවේදහෝ නොවේදහෝයි යනාදීනයින් ප්‍රවෘත්තවූ)විචිකිත්සායෙන් පහරනලද්දේද; ඣානාධිගමසාධිකං පටිපදං, ධ්‍යානයාගේ ලැබීමය සාධන්නාවූ පිළිවෙතට; නාරොහති (අප්‍රතිපත්තිනිමිත්තහෙයින්) නොනැඟේ; ඉති, මෙසේ; විසෙසෙන, විශෙෂයෙන්; ඣානන්තරායකරත්තා, (සමාධි ආදීන්ට ඍජුප්‍රතිපක්ෂ බැවින්) ධ්‍යානයට අන්තරායකරණ හෙයින්; එතානෙව, මේ කාමච්ඡන්දාදීහුම; පහාණඞ්ගානීති, ප්‍රහාණාඞ්ගයහයි (කියනලදහු)යසමාපන, යම්හෙයකින්

චරතීති; විතක්කො, විතක්කය කෙරෙමි; ආරම්මණෙ චිත්තං අභිනිරොපෙති, අරමුණෙහි සිත්හු නගාද; විචාරො, විචාරය කෙරෙමි; අනුබන්ධති, අරමුණෙහි සිත්හු බඳිද තෙහි (ධ්‍යානාඞ්ගවශයෙන් ප්‍රත්‍යයවූ) ඒවිතක්කවිචාර දෙකින්; අවික්ඛෙපාය සම්පාදිතපයොගස්ස, වික්ෂෙප නොවනුපිණිස නිපයහලද ප්‍රයොග ඇත්තාහුගේ; චෙතසො, සිත්හුගේ (පීණනං උපබ්‍රෑහණව කාරෙත්-හි යොදනු) පයොග සම්පත්තියම්භවා පීති (යථොක්ත භාවනාවගේ) ප්‍රයොගසම්පත්තියෙන් උපන් ප්‍රීති තොමෝ; පීණනං (භාවනාවශයෙන්) තපීණයද; සුඛඤ්ච, සුඛයද; උපබ්‍රෑහණං, සුඛපරිවෘද්ධියද; කරොති, කෙරේ; අථ, ඉක්බිත්තෙන්, සසෙසසම්පයුත්ත ධම්මං, සෙසු (ස්පර්ශාදී) සම්ප්‍රයුක්තධර්මයන් සහිතවූ; තං, ඒ චිත්තය (සමංසම්මා ආධීයතිහි සම්බන්ධකරණු) අභිනිරොපණානුබන්ධන පීණන උපබ්‍රෑහණෙහි, අභිනිරොපනය අනුබන්ධනය ප්‍රීණනය උපබ්‍රෑහණය යන මොවුන්කරණ, එතෙහි, ඒවිතක්ක විචාරය ප්‍රීතිය සුඛය යන මොවුන් විසින්; අනුග්ගහිතා, එකග්ගතා, අනුග්‍රහකරණලද එකාග්‍රතා තොමෝ; එකත්තාරම්මණෙ, යථොක්තාලක්ෂණ එකත්වාලම්බණයෙහි; සමං (ඉන්ද්‍රිය සමතාවශයෙන්) සමකොට, සම්මා (ප්‍රතිපක්ෂ භාවයන්ගේ දුරිභාවයැති ලීනෞද්ධත නොවන බැවින්) මනාකොට, ආධීයති, පිහිටුවා (එකාග්‍රතා තොමෝ සමාධානකෘත්‍යයෙන් චිත්තයද සම්ප්‍රයුක්තධර්මයන්ද නම්හව අනුත්තරත්නිධ්‍යානලක්ෂණයෙහි සාතිසයවම සමාහිතකෙරේ) යස්මා, එහෙයින්; විතක්කො, විතර්කය; විචාරො, විචාරය; පීති, ප්‍රීතිය, සුඛං සුඛය; චිත්තෙකග්ගතා, චිත්තෙකාග්‍රතා යයි; ඉමෙසං පඤ්චන්නං, මේ පස්දෙනාගේ, උප්පත්තිවසෙන (යථාප්‍රත්‍යයෙන්) උත්පත්තිවශයෙන්; පඤ්චඞ්ග සමන්නාගතතා වෙදිතබ්බා, පස්ගින් සමන්විත බව දතයුත්තීයි; උප්පන්නෙසුහිඑතෙසු පඤ්චසු, විතක්කාදි ධ්‍යානාඞ්ගයන් පස්දෙනා උපන්කල්හි; ඣානං උප්පන්නං නාමහොති (ධ්‍යාන ව්‍යවහාරය මොවුන්කෙරෙහිම බැවින්) ධ්‍යානය උත්පන්න නම් වේ; තෙන, එහෙයින්; අස්ස, මේධ්‍යානයාගේ; එතානිපඤ්ච, මේ විතක්කාදි පස්දෙනා; සමන්නාගතඞ්ගානීති, යෙදෙන අඞ්ගයයහයි, වුච්චන්ති, කියනුලැබෙත්; තස්මා, එහෙයින්; එතෙහි සමන්නාගතං, විතක්කාදී පසගින් සමන්විතවූ; අඤ්ඤදෙවඣානං නාම අත්ථිති (ඒ පඤ්චාඞ්ගයන් මිස අනික් ධ්‍යානයෙක් නම් ඇතැයි; නගහෙතබ්බං, නොගතයුතු; යථාපන, යම්සේ; අඞ්ගමත්තවසෙනෙව, අඞ්ගමාත්‍රවශයෙන්ම; චතුරඞ්ගිනීසෙනා, සතර අඞ්ගින් යුත් සෙනාය; පඤ්චඞ්ගිකඤ්චතුරියං, පඤ්චාඞ්ගයක් ඇති තූර්යය; අට්ඨඞ්ගිකො ච මග්ගොති, අෂ්ටාඞ්ගයක් ඇති මාර්ගයයි; වුච්චති, කියනුලැබේද; එවං, එපරිද්දෙන්ම; ඉදම්පි, මේ ධ්‍යානයද; අඞ්ගමත්තවසෙනෙව, අඞ්ගමාත්‍රවසින්ම; පඤ්චඞ්ගිකං ඉතිවා, පඤ්චාඞ්ගයක් ඇත්තේයයිද; පඤ්චඞ්ගසමන්නාගතන්තිවා, පඤ්චාඞ්ගයෙන් යුක්තයයිද; වෙදිතබ්බං, දතයුතු; එතානි පචඅඞ්ගානි, මේ පස් අඟහු; කිඤ්චාපි, ඉදිසි සේත්; උපචාරක්ඛණෙපි අත්ථි, උපචාරධ්‍යානයෙහිද ඇත; අථඛො, එතකුදුවුවත්; උපචාරෙ, උපචාරක්ෂණයෙහි; පකති චිත්තතො බලවතරානි, කාමාවචර චිත්තයට වඩා අතිසයින්ම බලවත්වූ (කාමාවචර චිත්තයෙහි විතක්කාදීන්ටද වඩා මෙසෙයින්ම බලවත්හු යන අර්ථයි)

ඉධපන, මෙහි වනාහි; උපචාරතොපි බලවතරානි, උපචාරයටද වඩා අතිශයින්ම බලවත්වූ; රූපාවචර ලක්ඛණූපපතානි, රූපාවචරලක්ෂණයට පැමිණියාවූ; එතෙ, මේ පඤ්චාඞ්ගයන් කෙරෙහි; විතක්කො, විතර්කයතෙම; සුවිසදෙන ආකාරෙන, (කෙලශයන් කෙරෙන් මුක්තබැවින්) මනාවම ප්‍රසන්නවූ ආකාරයෙන්; ආරම්මණෙ, අරමුණෙහි; චිත්තං, සිත; අභිනිරොපයමානො, නගමින්; උප්පජ්ජති, උපදී; විචාරො, විචාරය; අභිවිය ආරම්මණං අනුමජ්ජමානො, අතිශයින්ම අරමුණ පිරිමදිමින් උපදී; පීතිසුඛං, ප්‍රීති සුඛදෙක; සබ්බාවන්තම්පිකායං, සියලු අවයව වත්වූ ශරීරය (සකලශරීරය යන අර්ථයි) ඵරමානං, පැතිරෙමින් උපදී; තෙනෙවාහ, එහෙයින්ම කී; අස්ස සබ්බාවතොකායස්ස, මේ සියලු අවයවවත්වූ කායයාගේ; කිඤ්චි, කිසිවෙක්; විවෙකජේන පීතිසුඛෙන, විවෙකජවූ ප්‍රීතිසුඛයෙන්; අප්ඵුතං නහොති, නොපහරණලද නොවෙයි.—

( හා § )

ප්‍රථමධ්‍යානය යන පෙදෙහි විස්තර මතු ප්‍රකාශවන්නේයි.

උපදවාය යන මෙහි තමාගේ චිත්තසන්තානයෙහි ඉපදවීම් වශයෙන් එලඹවා හෙවත් පමුණුවා හෝ නිපදවාහෝයයි අර්ථ දතයුත්තේය ධ්‍යානවිභඞ්ගයෙහි වනාහි උපදවාය යන පදයාගේ අර්ථය බෙදන්නාහු ප්‍රථම ධ්‍යානය ලබනබව හෝ මනාකොට ලබනබව හෝ ප්‍රථමධ්‍යානයට පැමිණීම හෝ මනාකොට පැමිණීම හෝ නුවණින් ස්පර්ශීකරණබව හෝ ඇසට හමුකරණ බව හෝ උපදවනබවහෝ යී කියනලද්දේය ඒ විභඞ්ගයාගේ අර්ථද මෙසේම දතයුතුයි වාසය කරන්නේය යනු ඒ ධ්‍යානයට සුදුසු ඉරියව්වෙන්ද මෙසේ කියනලද ප්‍රකාර ධ්‍යානයෙන්ද යුක්තව ආත්මභාවය ක්‍රියාකිරීමය පැවැත්වීමය ඉරියව් විඩාවෙන් රැකීමය කැමති කැමති ඉරියව්වශයෙන් පැවැත්මය යැපීමය හැසිරීමය යන මොවුන් නිපදවමින් වාසය කරන්නේයයි දතයුතුයි.කීයේ මැහෝ - ධ්‍යානවිභඞ්ගයෙහි, වාසයකරන්නේය යනු ඒ ධ්‍යානලාභී යොගාවචරතෙමේ යම්හෙයකින් ක්‍රියාකෙරේද පවත්නේද එක්ඉරියව් විඩාවක් අනික් ඉරියව්වකින් රක්නේද කැමති කැමති ඉරියව්වශයෙන් පවත්නේද ඒ ඒ ඉරියව්වෙන් යැපේද ඒ ඒ ඉරියව් වෙන්හැසිරේද එහෙයින් වාසයකරන්නේයයි කියනලද්දේයි.

ඊට අනතුරුව පස්අඞ්ගකින් වෙන්වූ පස් අඞ්ගකින් යුක්තවූ ධ්‍යානය යන යමක් කියනලද්ද එහි විස්තර මෙතැන්පටන් ප්‍රකාශවන්නේයි කාමච්ඡන්දනීවරණය ව්‍යාපාදනීවරණය ථිනමිද්ධනීවරණය උද්ධච්ච කුක්කුච්ච නීවරණය විචිකිච්ඡානීවරණය යන මේ පඤ්චනීවරණ ධර්මයන් දුරුකිරීම් වශයෙන් පස් අඞ්ගින් වෙන්වූබව දතයුතුයි ඒ එසේමැයි යම්සේ මේ කාමච්ඡන්දාදි පඤ්ච නීවරණයන් ඔබාගැණීම හෝ මුඃහඟිරීම් වශයෙන් ප්‍රහීණ නොකළකල්හි ධ්‍යානමුලුල්ලම නො උපදනේද එහෙයින් මේ කාමච්ඡන්දාදී පඤ්චනීවරණ ධර්මයෝමේධ්‍යානයාගේ ප්‍රහාණාඞ්ගයෝයයි කියනලද්දාහ කිසිසේත් ධ්‍යානක්ෂණයෙහි ලොභාදිසෙසු අකුශලචිත්තොත්පාදදී පාපධර්මයෝද නොපවත්නාහුමය එතකුදුවූවත් මේ කාමච්ඡන්දාදිපඤ්චනීවරණයෝම විශෙෂයෙන් ධ්‍යානයට අන්තරායකරවූ ධර්මයෝයි ඒ එසේමැයි කාමච්ඡන්දසංඛ්‍යාතවූ කාමතෘෂ්ණාව හෙතු

කොටගෙණ නොයෙක් අරමුණෙහි පොලොඹවනලද සිත පෘථිවී කසිණාදි එකෙකි ස්වභාවාලම්බනයෙහි හෝ එකගබව එලවන වෙන අරමුණකහෝ නොපිහිටන්නේවෙයි ඒ කාමච්ඡන්දයෙන් මඩනාලදසිත රූපශබ්දාදි නොයෙක් අරමුණෙන් මුළාවූ කාමලොකය ඉක්මීමපිණිස පවත්නාවූ ධ්‍යාන ප්‍රතිපත්තියට හෝ නොපැමිණෙන්නේයි ව්‍යාපාදසංඛ්‍යාතවූ ක්‍රොධයෙන් මඩනාලද සිත අරමුණෙහි ගැටෙමින් වික්ෂේපයෙන් අතුරක් නැතුව එකග නොවී පවත්නේය ථීනමිද්ධ සංඛ්‍යාතවූ චිත්තචෛතසිකයන්ගේ අකර්මන්‍යතාවෙන් මඩනාලද සිත භාවනාකර්මයට සුදුසු නොවන්නේය ඖද්ධත්‍ය කෞකෘත්‍ය දෙකින් මඩනාලද සිත එකඟ නොවී භාන්පස පරිභ්‍රමණය කරන්නේය විචිකිත්සාවෙන් මඩනාලද සිත තථාගතයන්වහන්සේ සම්‍යක් සම්බුද්ධවේදෝහෝ නොවේදෝහෝ පෘථිවී කසිණාදිය මෙනෙහිකිරීමෙන් ධ්‍යානය උපදීදෝහෝ නූපදීදෝහෝයි යනාදීන් පැවති සැකයෙන් මඩනාලද බැවින් ධ්‍යානාධිගමය සිද්ධකරන්නාවූ ප්‍රතිපත්තියට නොනැගෙන්නේයි මෙසේ විශේෂයෙන්ම සමාධි ආදීන්ට ඉදුරු විරුද්ධබැවින්ද ධ්‍යානයට අන්තරාය කර හෙයින්ද මේ කාමච්ඡන්දාදීහුම ප්‍රහාණාඞ්ගයෝයයි කියනලද්දාහ යම් හෙයකින් විතර්කය අරමුණෙහි සිත නගාද විචාරය අරමුණෙහි සිත බදීද ඒ ධ්‍යානයට පැමිණීමට කාරණාවූ විතර්ක විචාරදෙකින් විසෘතනොවනපිණිස නිපදවනා ප්‍රයොග ඇත්තාහුගේ සිත පිළිබඳවූ යථොක්ත භාවනානුයොග නැමති ප්‍රයොගයෙන් උපන් ප්‍රීතිය හා සුවය භාවනා වශයෙන් සිත පිණවීම හා වැඩීම කරන්නේයි ඉක්බිත්තෙන් සෙසු ස්පර්ශාදි සම්ප්‍රයුක්ත ධර්මසහිතවූ ඒ චිත්තය අරමුණට නැගීමය අරමුණෙහි හැසිරීමය පිණවීමය වැඩීමය යන මොවුන් කරණ විතර්කය විචාරය ප්‍රීතිය සුවය යන මොවුන් විසින් අනුග්‍රහකරණලද එකාග්‍රතාව එකම අරමුණෙක ඉඳුරන්ගේ සමබව පිළියෙල කොට මනාව පිහිටුවන්නේයි. එහෙයින් විතර්කය විචාරය ප්‍රීතිය සුඛය චිත්තෛකාග්‍රතාවය යනමේ අඞ්ගයන්පස් දෙනාගේ උත්පත්තිවශයෙන් ධ්‍යානය පසඟින් යුක්තවනබව දතයුත්තේයි. එහෙයින් මේ පඤ්චධර්මය උපන්කල්හිම ධ්‍යානය උපන්නේනම් වන්නේයි. එබැවින් මේ විතර්කාදි අඞ්ගයන් පස් දෙන ධ්‍යානය හා එක්ව යෙදෙන අඞ්ගයෝයයි කියනලද්දාහ එහෙයින් මේ විතර්කාදි පඤ්චාඞ්ගයම විනා මේ අඞ්ග පඤ්චයෙන් යුක්තවූ අනික් ධ්‍යානනාමලද ධර්මයක් ඇතැයි අර්ථ නොගතයුත්තේයි. යම්සේ ඇත් අස් රථ පාබල යන චතුරඞ්ගමාත්‍රයම සිවුරඟ සේනාය ආතතවිතතාදි පඤ්චාඞ්ගමාත්‍රයම පඤ්චාඞ්ගිකතූර්‍ය්‍යය සම්‍යක්සඞ්කල්පාදිමාර්ගාඞ්ග අෂ්ටමාත්‍රයම ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගයයි ව්‍යවහාර කරණු ලැබේද එපරිද්දෙන්ම මේ ධ්‍යානයද අඞ්ගමාත්‍ර වශයෙන්ම පඤ්චාඞ්ගයක් ඇතැයි කියා හෝ පඤ්චාඞ්ගයෙන් යුක්තයයි කියා හෝ දතයුත්තේයි. මේ ධ්‍යානාඞ්ගපඤ්චකය කිසිසේත් උපචාරධ්‍යානයෙහිද ඇත්තේය එතකුදුවුවත් උපචාරධ්‍යානයෙහි කාමාවචරචිත්තයට වඩා අතිශයින් බලවත්වූ විතර්කාදි අඞ්ගයෝ ඇත්තාහ, මේ ධ්‍යානචිත්තයෙහි වනාහි උපචාරයටද වඩා අතිශයින් බලවත්වූ රූපාවචර ලක්ෂණයට පැමිණියාවූ විතර්කාදි අඞ්ගයෝ ඇත්තාහ මෙ පඤ්චාඞ්ගය අතුරෙන් විතර්කය සො

ලෙසුන්නෙරෙන් මිදුනුබැවින්ප්‍රකටවූ ආකාරයෙන් අරමුණෙහි සිත නැවත මින්ද විචාරය අභිශයින් අරමුණ පිරිමදිමින්ද ප්‍රීතිසුඛදෙදෙන සියලුශරීරය පතුරුවමින්ද උපදනාහුය එහෙයින් අටුවායෙහි මේ සියලුශරීරයෙහි සමාධියෙන් හටගත් ප්‍රීතිසුවයෙන් නොපහරණලද කිසි අවයවයෙක් නැතැයි කියනලද්දේයි ……

( පා ‡ )

විතක්කඞ්ගතාපි හෙට්ඨිමම්හි සමුග්ගපටලෙ උපරිමං සමුග්ගපටලං විය ආරම්මණෙ සුඵුසිතා හුත්වා උප්පජ්ජති අයමෙතෙසං ඉතරෙහි විසෙසො. තත්‍ථ විතක්කඞ්ගතා කිඤ්චාපි සබ්බත්ථකාංසම්පචාරනාති ඉමස්මිං පාඨෙ නති දිට්ඨා තථාපි විභඞ්ගෙ ඣානන්ති විතක්කො විචාරො පීතිසුඛං චිත්තෙකග්ගතාති එවං වුත්තත්තා අඞ්ගමෙව හොතීති අධිප්පායෙන භගවතා උද්දෙසතො නෙව එතා විභඞ්ගපකාසිතා හොති …… තිවිධකල්‍යාණං දසලක්ඛණසම්පන්නන්ති එත්ථපන ආදිමජ්ඣපරියොසානවසෙන තිවිධකල්‍යාණතා තෙසංයෙව ආදිමජ්ඣපරියොසානලක්ඛණවසෙන දසලක්ඛණසම්පන්නතා වෙදිතබ්බා …… තත්‍රායං පාළි …… පඨමස්ස ඣානස්ස පටිපදාවිසුද්ධි ආදි උපෙක්ඛානුබ්‍රූහනා මජ්ඣෙ සම්පහංසනා පරියොසානං පඨමස්ස ඣානස්ස පටිපදාවිසුද්ධි ආදි ආදිස්ස කති ලක්ඛණානි ආදිස්ස තීණි ලක්ඛණානි යො තස්ස පරිපන්ථො තතො චිත්තං විසුජ්ඣති විසුද්ධත්තා චිත්තං මජ්ඣිමං සමථනිමිත්තං පටිපජ්ජති පටිපන්නත්තා තත්‍ථ චිත්තං පක්ඛන්දති යඤ්ච පරිපන්ථතො චිත්තං විසුජ්ඣති යඤ්ච විසුද්ධත්තා චිත්තං මජ්ඣිමං සමථනිමිත්තං පටිපජ්ජති යඤ්ච පටිපන්නත්තා තත්‍ථ චිත්තං පක්ඛන්දති පඨමස්ස ඣානස්ස පටිපදාවිසුද්ධි ආදි ආදිස්ස : ඉමානි තීණි ලක්ඛණානි තෙන වුච්චති පඨමං ඣානං ආදිකල්‍යාණඤ්චෙව හොති ලක්ඛණසම්පන්නඤ්ච පඨමස්ස ඣානස්ස උපෙක්ඛානුබ්‍රූහනා මජ්ඣෙ මජ්ඣස්ස කති ලක්ඛණානි මජ්ඣස්ස තීණි ලක්ඛණානි විසුද්ධං චිත්තං අජ්ඣුපෙක්ඛති සමථපටිපන්නං අජ්ඣුපෙක්ඛති එකත්තුපට්ඨානං අජ්ඣුපෙක්ඛති යඤ්ච විසුද්ධං චිත්තං අජ්ඣුපෙක්ඛති යඤ්ච සමථපටිපන්නං අජ්ඣුපෙක්ඛති යඤ්ච එකත්තුපට්ඨානං අජ්ඣුපෙක්ඛති පඨමස්ස ඣානස්ස උපෙක්ඛානුබ්‍රූහනා මජ්ඣෙ මජ්ඣස්ස ඉමානි තීණි ලක්ඛණානි තෙන වුච්චති පඨමං ඣානං මජ්ඣෙකල්‍යාණඤ්චෙව හොති ලක්ඛණසම්පන්නඤ්ච පඨමස්ස ඣානස්ස සම්පහංසනා පරියොසානං පරියොසානස්ස කති ලක්ඛණානි පරියොසානස්ස චත්තාරි ලක්ඛණානි තත්‍ථජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන සම්පහංසනා ඉන්ද්‍රියානං එකරසට්ඨෙන සම්පහංසනා තදුපගවිරියවාහනට්ඨෙන සම්පහංසනා ආසෙවනට්ඨෙන සම්පහංසනා පඨමස්ස ඣානස්ස සම්පහංසනා පරියොසානං පරියොසානස්ස ඉමානි චත්තාරි ලක්ඛණානි තෙනවුච්චති පඨමං ඣානං පරියොසානකල්‍යාණඤ්චෙව හොති ලක්ඛණසම්පන්නඤ්චාති ……

( ස ‡ )

විතක්කඞ්ගතාපි, විතර්කයාගේ අග්‍රතාවද; හෙට්ඨිමම්හි සමුග්ගපටලෙ, යට සුමුංපියනෙහි; උපරිමං සමුග්ගපටලං විය, මතු සුමුංපියනමෙන්; ආරම්මණෙ සුඵුසිතා හුත්වා, අරමුණෙහි මනාව ස්පර්ශකොට; උප්පජ්ජති,

උපදී; අයං, මේ; එවෙහසං, මේ ධර්මය
න්ගේ; ඉතරෙති, සෙසු ධර්මයන් කෙ
රෙන්; විසෙසතො, වෙනසකි; තථා,එහි;
විශෙෂතාකාශගතාපී (අර්පණාවශයෙන්
පවත්නාවූ) විශේෂතාකාශ්‍රතායොගෙන්;
කිංචාපි, කිසිසේත්; සවිතක්කං සවිචා
රන්ති ඉමස්මිං පාඨෙ, සවිතක්කං සවි
චාරං යන මේ පාඨයෙහි; නනිද්දිට්ඨා;
සවරූපයෙන් නොදක්වනලද; තථාපි,
එහෙත්තුදුවූපත්; විභංගෙ, විභංගයෙහි;
ඣානංගානි, ඣානංගානි; විතක්කො විචා
රො පීතිසුඛං චිත්තෙකග්ගතාති, විත
ක්ක විචාරය ප්‍රීතිය සුඛය චිත්තෙකාග්‍රතා
ය යනයි; එවං වුත්තත්තා, මෙසේකියන
ලද හෙයින්; අඞ්ගමෙව, ධ්‍යානා
ඞ්ගම වේ; යෙනාධිප්පායෙන, යම්
අභිප්‍රායෙකින්; භගවතා උද්දෙසො කා
තො,භගවත්හු විසින් උද්දෙශය කරණ
ලද්දේද; සොයෙව, එම අභිප්‍රාය; අනෙ
න, ඒභගවත්හු විසින්; විභඞ්ගෙපකා
සිතොති, විභඞ්ගයෙහි ප්‍රකාශකරණ
ලදී (සවිතක්කං සවිචාරං යනාදි උදෙ
සෙහි අභිප්‍රායම "විතක්කො විචාරො"
යනාදීයෙන් ප්‍රකාශකරණලද එසේ
හෙයින් උදෙසෙහි නැතැයි නොසැල
කියයුතුය - විතක්ක විචාර ඇත්තේය
ප්‍රීති සුව ඇත්තේය යනු යෙහිම අභි
ප්‍රාය විසින්ම සමාධිය ම කීයෙහියි සැල
කියයුතුය යනු සත්නයි--"කිංචාපි ස
රූපතො නනිද්දිට්ඨා සාමඤ්ඤතොප
න ඣානනාමෙන ගහිතාඑව" යනු
පීකාතායි) තිවිධකල්‍යාණං දසලක්ඛ
ණසම්පන්නන්තිඑත්ථ "තිවිධකල්‍යාණං
දසලක්ඛණසම්පන්නං,,යන මෙහි;ආදි
මජ්ඣපරියොසානවසෙන (ධ්‍යානයා
ගේ) ආදිමධ්‍ය පර්‍ය්‍යවසානවශයෙන්;
තිවිධකල්‍යාණතා, ත්‍රිවිධකල්‍යාණ යන්
ඇතිබවද; තෙසංයෙව ආදිමජ්ඣපරි
යොසානානං ලක්ඛණවසෙන, එම
ආදි මධ්‍ය පර්‍ය්‍යවසානයන්ගේම ලක්ෂ
ණවශයෙන්;දසලක්ඛණසම්පන්නතා,
දශලක්ෂණයෙන් යුක්තබවද; වෙදි
තබ්බා, දතයුතු; තත්‍ර ඒ කල්‍යාණ
ලක්ෂණ විභාවනායෙහි; අයංපාලි, මේ
පෙලයි; පඨමස්සඣානස්ස, ප්‍රථම ධ්‍යා
නයාගේ; පටිපදාවිසුද්ධිආදි, ප්‍රතිපත්ති
විශුද්ධියආදියයි (ගොත්‍රභූඅවසන්කොට
ඇති භාවනාවිධිය ප්‍රතිපත්තිනම්වෙයි
ඒ ප්‍රතිපත්තියගේ පරිපන්ථයන් කෙ
රෙන් විශුද්ධිය පටිපදා විසුද්ධිය—හෝ
ගොත්‍රමේ යයිහෙයකින් ධ්‍යානයාගේ
උත්පාදක්ෂණයෙහි ලැබේද එහෙයින්
"පටිපදාවිසුද්ධිආදිසි කීහු)පඨමස්සඣා
නස්ස, ප්‍රථමධ්‍යානයාගේ;පටිපදාවිසුද්ධි
ආදි, ප්‍රතිපත්ති විශුද්ධිය ආදියයි; ආදි
ස්ස, ආදිහුගේ; කතිලක්ඛණානි, ලක්ෂ
ණයෝ කීදෙනෙක්ද; ආදිස්ස, ආදිහු
ගේ; තීණි ලක්ඛණානි, ලක්ෂණයෝ
තුන්දෙනෙකි; යොතස්ස පරිපන්ථො,
ඒ ධ්‍යානයට යමෙක් පරිපන්ථද, ත
තො, ඒ පරිපන්ථයාකෙරෙන්; චිත්තං
විසුජ්ඣති, චිත්තය විශුද්ධවේ; විසුද්ධත්
තා, විශුද්ධහෙයින්; චිත්තං, සිත; මජ්ඣි
මං සමථනිමිත්තං පටිපජ්ජති; මධ්‍යම
සමථනිමිත්තයට පැමිණේ; පටිපන්න
ත්තා (එම සමථනිමිත්තයට) පිළිපන්
හෙයින්; තත්ථ, ඒ මධ්‍යසමථනිමිත්ත
යෙහි; චිත්තං පක්ඛන්දති, සිත වදී;
පරිපන්ථතො චිත්තං විසුජ්ඣති, පරි
පන්ථබාධියන්කෙරෙන් චිත්තය විශුද්ධ
වෙයි යන; යම්, යමෙක් ඇද්ද (සෙසු
පෙදෙහිද මෙසේ යොද අර්ථකියනු)
ඉමානිතීණි ලක්ඛණානි(පරිපන්ථයන්
කෙරෙන්චිත්තයාගේශුද්ධභාවාකාරය,
මධ්‍යමසමථනිමිත්තයට පිළිපදනාආ
කාරය එහි පක්ඛන්දනාකාරය යන)මේ
තුන්දෙන ධ්‍යානයාගේ ආදියෙහි උත්
පාදක්ෂණයෙහි)අර්පණා ප්‍රාප්තිලක්ෂණ
යෝයි (මේ ආකාරත්‍රය අර්පණාවට
පැමිණීමක් නැතිහෙයින් අර්පණාවක්
නැතහොත් ඒ ලක්ෂණයන් නොවන
හෙයිනි) පඨමජ්ඣානං, ප්‍රථමධ්‍යානය;

ආදිකල්‍යාණ වූයේ නොවේ (විශුද්ධ ප්‍රතිපත්ති ඇති බැවින්) ආදිකල්‍යාණ නාමුදු වෙයි; ලක්ඛණසම්පන්නඤ්ච (යථොක්ත ලක්ෂණයෙන් සමන්විතයෙහින්) ලක්ෂණ සම්පන්න නාමුදු වෙයි (තෙන වුච්චති යොදනු. මෙම නයින් මධ්‍යම පර්‍ය්‍යවසාන ලක්ෂණයන්ගේද යොජනා දතයුතු ...පෙ...) විසුද්ධං චිත්තං අජ්ඣුපෙක්ඛති, ප්‍රතිපදාබලයෙන් පිරිසිදුවූ සිත්හු (නැවත පිරිසිදුනොකට හැකි බැවින් විශෝධනයෙහි ව්‍යාපාර නොකරන්නේ) උපෙක්ෂා කෙරේ; සමථපටිපන්නං අජ්ඣුපෙක්ඛති (සමථභාවයට පැමිණි හෙයින් නැවත සමාධානයෙහි ව්‍යාපාර නොකරන්නේ) සමථ ප්‍රතිපන්නයා උපෙක්ෂා කෙරේ; එකත්තුපට්ඨානං අජ්ඣුපෙක්ඛති (සමථප්‍රතිපන්න බැවින්ම ක්ලේශ සංසර්ගය හැර එකත්වයෙන් වැටහුනු සමාධිහුගේ) නැවත එකත්තුපට්ඨානයෙහි ව්‍යාපාර නොකරන්නේ උපෙක්ෂා කෙරේ ...පෙ... තත්ථ ජාතානං ධම්මානං, එහි උපන් සමාධිප්‍රඥාසංඛ්‍යාත යුගනද්ධ ධර්මයන්ගේ; අනතිවත්තනට්ඨෙන, නොඉක්මෙන බැවින්; ඉන්ද්‍රියානං එකරසට්ඨෙන, ශ්‍රද්ධාදි ඉන්ද්‍රියයන්ගේ (නානා ක්ලේශයන් කෙරෙන් මුක්තවනහෙයින් විමුක්තිරසයෙන්) එකරසබැවින්, තදුපගවීරියවාහනට්ඨෙන, ඒ අනතිවර්තන ඒකරස භාවයට අනුරූපවූ වීර්‍ය්‍යය පවත්වනහෙයින්; ආසෙවනට්ඨෙන, ආසෙවනයෙන් ...පෙ...

( හා ‡ )

චිත්තෛකාග්‍රතාව සරඹුවෙක උඩු පියන යටිපියනෙහි මහාසේ ශීඝ්‍ර කොට වැදගන්නාක්මෙන් අරමුණ මොනවට ස්පර්ශකොටගෙණ උපදනේය. මේ වනාහි අන්‍යධර්මයන් කෙරෙන් මොවුන්ගේ වෙනස වන්නේයි. තවද අර්පණාසමාධිවශයෙන් පවත්නා චිත්තෛකාග්‍රතාව කිසියේන් සවිතර්ක සවිචාරධ්‍යානයයි යනාදීන්වදාළ පෙළෙහි ස්වරූපවශයෙන් නොවදාරණලද්දේය එතකුදුවූවත් විභඞ්ග ප්‍රකරණයෙහි ධ්‍යානය නම් විතර්කය විචාරය ප්‍රීතිය සුඛය චිත්තෛකාග්‍රතාවයයි මෙසේ අඞ්ග විභාගකොට වදාරණලද හෙයින් අඞ්ගයම ධ්‍යානවන්නේයි. භාග්‍යවත්හුවිසින් යම් අභිප්‍රායකින් සවිතර්ක සවිචාරධ්‍යානයයි උද්දේශන ලද්දේ වීනම් එම අභිප්‍රායම ධ්‍යානවිභඞ්ගයෙහි විස්තරකිරීම්වශයෙන් ප්‍රකාශකරණලද්දේයයි දතයුත්තේයි.

ත්‍රිවිධ කල්‍යාණයෙන් හා දශලක්ෂණයෙන්ද යුක්තවූ ධ්‍යානය යන මෙහි ආදිය මධ්‍යය කෙළවරය යන තුන්තැන යනපත්බව හා ඒ තුන් ස්ථානයෙහි ලක්ෂණවශයෙන් දශලක්ෂණයෙන් යුක්තබවද දතයුත්තේය ඒ ත්‍රිවිධ කල්‍යාණ දශලක්ෂණයන් ප්‍රකාශකිරීමෙහි මේ පෙළවන්නේය මේ කෙසේදයත්? ධ්‍යානසිත පූර්වව උපදනා ගොත්‍රභූචිත්තය අවසන්කොට ඇති පූර්වභාගිකවූ භාවනාව කාමාදි සතුරන්ගෙන් සිත පිරිසිදුකරණ හෙයින් ප්‍රතිපදවිශුද්ධිනම් ඒ ප්‍රතිපදාවිශුද්ධිය ප්‍රථමධ්‍යාන චිත්තයාගේ උත්පාදක්ෂණයෙහි ලැබෙන බැවින් ඒ උත්පාදක්ෂණය ආදිය වන්නේය නැවත කෙලෙසුන්ගෙන් පිරිසිදු කටයුත්තක් නැති බැවින් ධ්‍යානාඞ්ගයන්ට ඇතුළත්වූ උපෙක්ෂාව ධ්‍යානය නිපදවීමට උපකාරවන බැවින් අනුබ්‍රෑංහණනම ඒ අනුබ්‍රෑංහණසංඛ්‍යාතවූ වැඩීම ධ්‍යාන චිත්තයාගේ ස්ථිතික්ෂණයෙහි ලැබෙනහෙයින් මධ්‍යයනම් වන්නේය ඒ ධ්‍යානචිත්තයෙහි යෙදුනු ඒතකාදි ධර්මයන් නොඉක්මවීම් ආදිය සිද්ධන

රන්නාවූ ස්වර්ණය පිරිසිදුකිරීම ධ්‍යාන චිත්තයාගේ භඞ්ගක්‍ෂණයෙහිම ප්‍රකට වන හෙයින් ඒ පිරිසිදු බව කෙළවර නම් වන්නේයි. ඒ ප්‍රථම ධ්‍යානයාගේ ප්‍රතිපද විසුද්ධිසඞ්ඛ්‍යාතවූ ආදියෙහි උත්පාදක්‍ෂණයාගේ ලක්‍ෂණයෝ කෙතෙක් දෙනෙක්ද යත්? ඒ ආදිහුගේ ලක්‍ෂණයෝ තුන්දෙනෙක් වන්නාහුය ඔහු කවරහුදයත්? ඒ ධ්‍යානයට යම් ධර්ම කෙනෙක් සතුරුවිනම් ඒ සතුරු ධර්මයන්ගෙන් සිත පිරිසිදු කොට මධ්‍යමසමථ නිමිත්තට පිළිපන් හෙයින් ඒ මධ්‍යම සමථ නිමිත්තයෙහි සිත ඇතුළත්වන්නේය ඒ ධ්‍යානයට සතුරු ධර්මයන්ගෙන් සිත පිරිසිදුවීමය සිත පිරිසිදුවූ බැවින් මධ්‍යම සමථ නිමිත්තට පිළිපැදීමය එසේ පිළිපන් බැවින් එහි සිත බැඳීමය යන මේ ත්‍රිවිධාකාරය ප්‍රථම ධ්‍යානයාගේ ආදියෙහි උත්පාදක්‍ෂණයාගේ අපිණාවට පැමිණි ලක්‍ෂණ වන්නාහුය එහෙයින් ප්‍රථමධ්‍යානය ආදියෙහි පිරිසිදු ප්‍රතිපත්ති ඇතිබැවින් ආදිකල්‍යාණ නම්වූ වෙයි යථෝක්ත ත්‍රිවිධ ලක්‍ෂණයෙන් යුක්ත බැවින් ලක්‍ෂණ සම්පන්නනම්වූ වෙයි කියනලද්දේයි. ප්‍රථමධ්‍යානයාගේ උපෙක්‍ෂාවෙන් වැඩීම යයි කියනලද මධ්‍යයෙහි ස්ථිතික්‍ෂණ සඞ්ඛ්‍යාත මධ්‍යයාගේ ලක්‍ෂණයෝ කෙතෙක් දෙනෙක්ද යත්? ඒ මධ්‍යයාගේ ලක්‍ෂණයෝ තුන්දෙනෙක් වන්නාහ ඔහු කවරහුද යත්? ප්‍රතිපත්තිබලයෙන්ම පිරිසිදුවූ සිත නැවත පිරිසිදු කටයුත්තක් නැති බැවින් මැදහත්ව බලන්නේය කෙලෙස් සංසිඳුවීමට පැමිණියේත් නැවත සංසිඳුවීමක් නැතිබැවින් ඒ සංසිඳීමට පැමිණි සිත මැදහත්ව බලන්නේය. කෙලෙස් සංසිඳීමට පැමිණීමෙන් කෙලශ සංසර්ගයහැර එකත්වූ බැවින් වැටහුනු සමාධිය නැවත එකඟ බවට පැමිණවීමෙහි උත්සාහ නැති බැවින් මැදහත්ව බලන්නේය මෙසේ ප්‍රතිපත්ති බලයෙන් පිරිසිදුවූ සිත මැදහත්ව බැලීමය කෙලෙස් සංසිඳීමට පැමිණි සිත මැදහත්ව බැලීමය එකත්බවයෙන් වැටහුනු සිත මැදහත්ව බැලීමය යන මේ ත්‍රිවිධාකාරය ප්‍රථමධ්‍යානයාගේ උපෙක්‍ෂාවෙන් වැඩීම යැයි කියනලද මධ්‍යයෙහි ස්ථිතික්‍ෂණසඞ්ඛ්‍යාත මධ්‍යයාගේ ලක්‍ෂණවන්නාහුය එහෙයින් ප්‍රථමධ්‍යානය මධ්‍යයෙහි උපෙක්‍ෂාවෙන් වැඩීම් ඇතිබැවින් මධ්‍යකල්‍යාණ නම්වූ වෙයි යථෝක්ත ත්‍රිවිධ ලක්‍ෂණයෙන් යුක්ත බැවින් ලක්‍ෂණසම්පන්න නම්වූ වෙයි කියනලද්දේයි ප්‍රථමධ්‍යානයාගේ ඒ ඒ ධර්ම නොඉක්මවීම් ආදිය සාධන්නාවූ ප්‍රඥාවගේ සන්තෝෂ නිෂ්පත්තිවශයෙන් ලැබියයුතුවූ අවසානයෙහි භඞ්ගක්‍ෂණසඞ්ඛ්‍යාත අවසානයාගේ ලක්‍ෂණයෝ කෙතෙක් දෙනෙක්දයත්? ඒ පර්‍ය්‍යවසානයාගේ ලක්‍ෂණයෝ සතරදෙනෙක් වන්නාහුය ඔහු කවරහුදයත්? ඒ ධ්‍යානය හා එක්ව උපන් සමාධි ප්‍රඥාසඞ්ඛ්‍යාත යුගනද්ධ ධර්මයන් නොඉක්මෙන බැවින් සතුටුවීමය ශ්‍රද්ධාදී ඉන්ද්‍රියයන් නානාකෙලෙසුන්ගෙන් මිදුනුබැවින් විමුක්තිරසයෙන් එකරසහෙයින් සතුටුවීමය ඒ නොඉක්මෙන බවට හා එකරසබවටද සුදුසුවූ වීර්‍ය්‍ය පවත්වන හෙයින් සතුටුවීමය නැවත නැවත සෙවනය කරණහෙයින් සතුටුවීමය යන මේ සතරාකාරය ප්‍රථමධ්‍යානයාගේ අවසානයෙහි හෙවත් භඞ්ගක්‍ෂණ සඞ්ඛ්‍යාතවූ කෙළවර ලක්‍ෂණ වන්නාහ එහෙයින් ප්‍රථම ධ්‍යානය පර්‍ය්‍යවසාන කල්‍යාණ නම්වූ වෙයි යථෝක්ත සතරලක්‍ෂණයෙන් යුක්ත බැවින් ලක්‍ෂණ සම්පන්න නම්වූ වෙයි කියනලද්දේයි.

( පා ‡ )

තත්‍ර පටිපදා විසුද්ධි නාම සසම්භාරිකො උපචාරො උපෙක්ඛානුබ්‍රූහණා නාම අප්පනා සම්පහංසනා නාම පච්චවෙක්ඛණාති එවමෙකෙ වණ්ණයන්ති යස්මා පන එකත්තගතං චිත්තං පටිපදා විසුද්ධිපක්ඛන්දඤ්චෙව හොති උපෙක්ඛානුබ්‍රූහිතඤ්ච ඤාණෙන ච සම්පහංසිතන්ති පාළියං වුත්තං තස්මා අන්තො අප්පනායමෙව ආගමනවසෙන පටිපදා විසුද්ධි තත්‍රමජ්ඣත්තුපෙක්ඛාය කිච්චවසෙන උපෙක්ඛානුබ්‍රූහණා ධම්මානං අනතිවත්තනාදිභාව සාධනෙන පරියොදාපකස්ස ඤාණස්ස කිච්චනිප්ඵත්තිවසෙන සම්පහංසනා ච වෙදිතබ්බා— කථං යස්මිංහි වාරෙ අප්පනා උප්පජ්ජති තස්මිං යො නීවරණසඞ්ඛාතො කිලෙසගණො තස්ස ඣානස්ස පරිපන්ථො තතො චිත්තං විසුජ්ඣති විසුද්ධත්තා ආවරණවිරහිතං හුත්වා මජ්ඣිමං සමථනිමිත්තං පටිපජ්ජති මජ්ඣිමං සමථනිමිත්තං නාම සමප්පවත්තො අප්පනාසමාධියෙව තදනන්තරම්පන පුරිමචිත්තං එකසන්තතිපරිණාමනයෙන තථත්තං උපගච්ඡමානං මජ්ඣිමං සමථනිමිත්තං පටිපජ්ජති නාම එවං පටිපන්නත්තා තථත්තුපගමනෙන තත්ථ පක්ඛන්දති නාම එවන්තාව පුරිමචිත්තෙ විජ්ජමානාකාර නිප්ඵාදිකා පඨමස්ස ඣානස්ස උප්පාදක්ඛණෙයෙව ආගමනවසෙන පටිපදාවිසුද්ධි වෙදිතබ්බා— එවං විසුද්ධස්ස පන තස්ස පුන විසොධෙතබ්බාභාවතො විසොධනෙ ව්‍යාපාරං අකරොන්තො විසුද්ධං චිත්තං අජ්ඣුපෙක්ඛති නාම සමථභාවූපගමනෙන සමථපටිපන්නස්ස පුන සමාධානෙ ව්‍යාපාරං අකරොන්තො සමථපටිපන්නං චිත්තං අජ්ඣුපෙක්ඛති නාම සමථපටිපන්නභාවතො චස්ස කිලෙසසංසග්ගං පහාය එකත්තෙන උපට්ඨිතස්ස පුන එකත්තුපට්ඨානෙ ව්‍යාපාරං අකරොන්තො එකත්තුපට්ඨානං අජ්ඣුපෙක්ඛති නාම එවං තත්‍රමජ්ඣත්තුපෙක්ඛාය කිච්චවසෙන උපෙක්ඛානුබ්‍රූහණා වෙදිතබ්බා—

( ස ‡ )

තත්‍ර, ඒ පාලියෙහි; පටිපදාවිසුද්ධි නාම, පටිපදා විසුද්ධි නම්; සසම්භාරිකො, නානාවර්ජන පරිකර්ම සහිතවූ; උපචාරො, එකාවර්ජ්ජනොපචාරය (සම්භාරීයතීති සම්භාරො— නානාවජ්ජන පරිකම්මං සහසම්භාරෙනාති සසම්භාරො සො එව සසම්භාරිකොයි ගත් තේ- ප්‍රථමාදී ධ්‍යානය පූර්වභාග භාවනායෙන්ම සාධිතබැවින් එකාවර්ජ්ජනොප චාරයෙහි සිද්ධවූ උපෙක්ෂාතොමෝ ධ්‍යානක්ෂණයෙහි පරිබ්‍රෑහිත නම් වේනුයි උපෙක්ඛානුබ්‍රූහණාව අප්පනායි කීහු-ප්‍රතිලබ්ධ ධ්‍යානය නිසා වන යම් ප්‍රහෘෂ්ටාකාරයෙක් (සිත්හුගේ පරිතොෂයෙක්) ඇද්ද ප්‍රත්‍යවේක්ෂා වශයෙන් පවත්නා ඒ තොෂය සඳහා "සම්පහංසනා නාම පච්චවෙක්ඛණා"යි කීහු) එවං, මෙසේ; එකෙ, අභයගිරි නිවාසීහු; වණ්ණයන්ති, වර්ණනා කෙරෙත්) එසේහල්කී අධ්‍යාන ධර්මයෙන් ධ්‍යාන ගුණ කියනලද නම් වනබැවින් ඔවුන් කියනු නොමැනවි-මෙම කියන- "තත්‍රාති සති අජ්ඣත්තධම්මෙති ඣානස්ස ගුණසංකිත්තනං නාම න හොති න හි තුම්බන්තරං තුම්බන්තර පරියාපන්නං හොති" යි පෙලහා ද විරුද්ධවෙති දක්වනු පිණිස "යස්මා පන" යනාදී කීහු) යස්මා පන, යම්හෙයකින් වනාහි; එකත්තගතං චිත්තං (ඉන්ද්‍රියයන්ගේ එකරසභාවයෙන්ද එකාග්‍රතාවගේ සිඛාප්‍රාප්තීන්ද තදනුගුණවූ එක

තවාලම්බණයෙහි පැවති බැවින් එක
තමයට පැමිණි සම්ප්‍රයුක්තධර්මයන් ස
හිතවූ) අර්පණාප්‍රාප්ත චිත්තය; පටිපද
විසුද්ධි පක්ඛන්දනමෙව හොති (ප්‍රතිපත්
තිවිශුද්ධිය තමා විසින් නිපදනා බැවින්)
පෙරම එයට වන්නාමුදු වෙයි; උපෙ
ක්ඛානුබ්‍රෑහිතං, උපෙක්ෂාව විසින් වඩ
නාලදනමුදු වෙයි, ඤාණෙන සම්ප
හංසිතන්ති, නුවණින්ද විශෝධිතන
මුදු වෙයි; පාළියංවුත්තං, පෙළෙහිය හ
ලද; තස්මා, එහෙයින්; අනෙනා අප්ප
නායමෙව, ඇතුළු අර්පණාවේහිම; ආ
ගමනවසෙන, පරිකර්මාගමන විසින්;
පටිපදාවිසුද්ධි, ප්‍රතිපත්තිවිශුද්ධිය; තත්‍ර
මජ්ඣත්තුපෙක්ඛාය කිච්චවසෙන, ත
ත්‍රමධ්‍යස්ථොපෙක්ෂාවගේ කෘත්‍ය වශ
යෙන්; උපෙක්ඛානුබ්‍රෑහණා, උපෙ
ක්ෂානුබ්‍රෑහණාවද, ධම්මානං අනතිව
ත්තනාදි භාවසාධනෙන, ධර්මයන්ගේ
අනතිවර්තනාදි භාව සාධනයෙන්
(ආදි ශබ්දයෙන් ඉන්ද්‍රියෙක රසභාවද
තදුපගවිරියවාහනා ආසෙවනා යන මො
වුන් ගන්නු) පරියොදපකස්ස ඤා
ණස්ස කිච්චනිප්ඵත්තිවසෙන, පිරිසිදු
කරණ (ප්‍රභාස්වරකරණ යන අර්ථයි–
ඥානයාගේ කෘත්‍යනිෂ්පත්ති විසින් අ
නතිවර්තනාදි භාවසාධනයම ඥාන
යාගේ කෘත්‍ය නිෂ්පත්තිනම් වෙයි දන්
නේ)සම්පහංසනා වෙදිතබ්බා, සම්ප
හංසනා නම් වෙයි දතයුතු; කථං, කෙ
සේදයත්? යස්මිං හි වාරෙ (සහරපස්සි
තක් ඇති) යම් අර්පණාවාරයෙක්හි; අ
ප්පනා උප්පජ්ජති, අර්පණා උපදීද; තස්මිං,
ඒ වාරයෙහි; යො නීවරණ සඞ්ඛාතො
කිලෙසගණො, නීවරණසංඛ්‍යාතවූ ය
ම් කෙලෙශගණයක්, තස්සඞ්ඛාතස්ස ප
රිපන්ථො, ඒ ධ්‍යානයට පරිපන්ථද;
තතො චිත්තං විසුජ්ඣති, ඒ පරිපන්ථයා
කෙරෙන් චිත්තය විශුද්ධවේ; විසුද්ධ
ත්තා (අර්පණා විසුද්ධත්) විශුද්ධහෙයි
න්; ආවරණ විරහිත හුත්වා (යම් ආවර
ණයකින් ආවරිත චිත්තය පූර්වයෙහිම
ධ්‍යම ශමථනිමිත්තයට පැමිණෙනුව
ම නොපොහොසත්වීද) එයින් වෙන්
ව)ඔවුන් විෂ්කම්භනයකොටය යන අ
ර්ථයි) මජ්ඣිමං සමථනිමිත්තං
පටිපජ්ජති, මධ්‍යම ශමථනිමිත්තයට
පැමිණේ (සම ප්‍රවෘත්ති අර්පණා සමා
ධිය ම ලීනෞද්ධත්‍ය සඞ්ඛ්‍යාත අ
න්තවයට අනුප ගමනයෙන් මධ්‍ය
ම නමුදු සවිශෙෂ යෙන් ප්‍රත්‍යනීක
ධර්මය ව්‍යුපශමයකරණ හෙයින් ශ
මථ නමුදු යොගීහුගේ සුඛවිශෙෂයට
කාරණ හෙයින් නිමිත්ත නමුදු වේ—
එත්තම "මජ්ඣිම සමථනිමිත්තං නා
ම සමප්පවත්තො අප්පනා සමාධියෙ
ව" කීහු) තදනන්තරම්පන පුරිමචි
ත්තං, ඒ අර්පණාචිත්තයට අනන්තර
ප්‍රත්‍ය වූ පූර්ව චිත්තය ( ගොත්‍රභූ චි
ත්තය යන අර්ථයි (එකසන්තතිපරිණා
මගෙන (කිරිම දීහි නොවතුදු එක
ත්වනයින් කිරීම දීහි වෙයි යනුමෙන්
ගොත්‍රභූ චිත්තයම අර්පණාමනාවතු
දු)එක සන්තති පරිණාමනයින්; තථ
ත්තං උපගච්ඡමානං, අර්පණාසමාධි
බවට එළඹෙන්නේම, මජ්ඣිමංසමථ
නිමිත්තං පටිපජ්ජති නාම, මධ්‍යම ශ
මථනිමිත්තයට පිළිපන්නා නම්වේ;
එවං තාව පටිපන්නත්තා, මෙසේ පිළි
පන් හෙයින්; තථත්තුප ගමනෙන, එ
කොණෙණයි අර්පණාසමාධින් සමාහිත
භාවයට එළඹෙමින්; තත්‍රපක්ඛන්දති
නාම (සෙස්සන් සෙසින් වදනාබව
ක්හැතද එකත්වනයින් අර්පණාසමා
ධි බවට එළඹෙන්නේම) අර්පණාස
මාධියට වදනා නම්වේ; එවං, මෙසේ;
පුරිමචිත්තෙ (අර්පණා සිතට) පූර්වවූ
(ගොත්‍රභූ) චිත්තයෙහි; විජ්ජමානා
කාර නිප්ඵාදිකා, ඒ සිතෙහි විද්‍යමා
නවූ පරිපන්ථ විශුද්ධිය මධ්‍යම ශමථ
ප්‍රතිපත්තිය පක්ඛන්දනය යන ආකා
රයෙන් නිපදනාවූ (පටිපදා විසුද්ධි

යොදනු) පඨමස්ස ඣානස්ස උප්පාද ක්ඛණෙ යෙව, ප්‍රථමධ්‍යානයාගේ උත්පාදක්ෂණයෙහිම, ආගමන වශෙන, ආගමනවිසින්; පටිපදා විසුද්ධි වෙදිතබ්බා, ප්‍රතිපත්ති විශුද්ධි දතයුතු (ඒ ආකාරයෝ ප්‍රත්‍යය විශෙෂයෙන් ධ්‍යානක්ෂණයෙහි නිපන්නාහු පටිපදා විශුද්ධියයිලද සංඥ ඇත්තාවූ ධ්‍යානයට ඒ විශෙෂයම නිපදවන්න වූන්මෙන් කියනලදහු) එවං විසුද්ධස්ස පන තස්ස, මෙසේ විශුද්ධවූ වනාහි සිත්හුගේ, පුන විසොධෙතබ්බං භාවතො, නැවත පිරිසිදුකටයුතු බවක් නැතිබැවින්; විසොධෙතබ්‍යාපාරං අකරොන්තො, සිත්හු පිරිසිදු කිරීමෙහි ව්‍යාපාර නොකරන්නේ; විසුද්ධං චිත්තං අජ්ඣුපෙක්ඛති නාම (තත්‍රමධ්‍යස්ථොපෙක්ෂාවගේ කෘත්‍ය වශයෙන් පුද්ගලතෙමේ) විශුද්ධ චිත්තයෙහි මැදහත්වේ; සමථභාවූපගමෙනන, සමථභාවයට පැමිණිමෙන්; සමාධානෙන ව්‍යාපාරං අකරොන්තො, නැවත සමාධානයෙහි ව්‍යාපාරනොකරන්නේ; සමථපටිපන්නං චිත්තං අජ්ඣුපෙක්ඛති නාම, සමථබවට පැමිණි සිත්හු කෙරෙහි මැදහත් නම් වේ; සමථපටිපන්න භාවතො එව, ශමථ ප්‍රතිපන්නබැවින්ම; කිලෙස සංසග්ගං පහාය ඒකත්තන උපට්ඨිතස්ස (කෙලෙස් නම් කෙලශ සංසර්ගී දුරුකොටරම්හෝ අපිළිපන්නාහට දූන් ශමථප්‍රතිපත්තින් ඒ කෙලශයන් පැහැණු හෙයින්) කෙලශ සංසර්ගය නැතිබැවින් එකත්වයෙන් හුදකලාව පිහිටි, අස්ස, ඒ ධ්‍යාන චිත්තය; පුන එකත්තුපට්ඨානෙව්‍යාපාරං අකරොන්තො, නැවත එකත්වයෙන් තිබීමෙහි ප්‍රයොග නොකරන්නේ; එකත්තුපට්ඨානං අජ්ඣුපෙක්ඛති නාම, එකත්වයෙන් තිබීමෙහි මැදහත් නම්වේ; එවං, මෙසේ; තත්‍ර මජ්ඣත්තුපෙක්ඛාය කිච්චවසෙන, තත්‍ර මධ්‍යස්ථොපෙක්ෂාවගේ කෘත්‍ය වශයෙන්; උපෙක්ඛානුබ්‍රෑහණා වෙදිතබ්බා, උපෙක්ෂාවගේ වැඩීම දතයුතු(පරිපන්ථවිශුද්ධියම ජ්ඣිම සමථ පටිපත්තිය පක්ඛන්දනය යනමෙහි අනුබ්‍රෑහිත ධ්‍යානචිත්තයෙහි අවකාශලද තත්‍ර මජ්ඣත්තුපෙක්ඛා නොමෙයි සම්ප්‍රයුක්ත ධර්මයන් සමකොට පවත්වන්නී ඔවුන් වඩන්නියක මෙන්වේනුයි "තත්‍ර මජ්ඣත්තුපෙක්ඛාය කිච්චවසෙන උපෙක්ඛානුබ්‍රෑහණා වෙදිතබ්බා" යි කීහු)

( හා ‡ )

ඒ පාලියෙහි අර්ථය අභයගිරිවාසීන් විසින් මෙසේ වර්ණනාකරණ ලද්දේය කෙසේදයත්? ප්‍රතිපදා විශුද්ධි නම් ධ්‍යානයට පූර්වභාගයෙහි උපදනා නොයෙක් චිත්තවීථි පිළිබඳ මනොද්වාරාවර්ජන පරිකර්ම චිත්තයන් හා පසුව උපදනා අර්පණාවීථි පිළිබඳ එකෙකී මනොද්වාරාවර්ජන සහිත උපචාරචිත්තය වෙයි. යථොක්ත එකාවර්ජන උපචාරචිත්තයෙහි ශුද්ධවූ උපෙක්ෂා චෛතසිකය ඒව සතරවනුවූ ධ්‍යානක්ෂණයෙහි අර්පණාව වඩන බැවින් උපෙක්ෂාව අනුබ්‍රෑහණා නම් වෙයි ලබනලද ඒ ධ්‍යානචිත්තය සම්බන්ධවූ යම් ආවුපහවූ ආකාරයෙක් ඇත්තේ වීනම් ඒ ආකාරය ධ්‍යානාඞ්ග ප්‍රත්‍යවෙක්ෂාවශයෙන් පවත්නා බැවින් ඒ ප්‍රත්‍යවෙක්ෂාව සම්පහංසනා නම්වෙයි මෙසේ වර්ණනාකරන්නාහුය එනසුදුවූවන් ඔවුන්ගේ ඒ අර්ථවර්ණනාව පෙල හා නොගැළපෙන්නේය ඒ එසේයැයි ඒ අභයගිරිවාසීන්ගේ අර්ථ වර්ණනා ක්‍රමයට ධ්‍යානතොවූ උපචාරාදි කාමාවචර ධර්මයෙන් මහද්ගතවූ ධ්‍යානයාගේ ගුණ ප්‍රකාශකෙළේ නම් වන්නේය කාමභූමියට ඇතුළත්වූ උප

වාරාදි විතානයෝ රූපභූමියට ඇතුළත්නොවෙත්’‘යි යම්හෙයකින් ඉඳුරියයන්ගේ සමානකෘත්‍ය ඇති බැවින්ද ඒකාග්‍රතාවගේ මුදුන්පැමිණීමෙන්ද එකග බවට පැමිණ කසිණාරම්මණයෙහි පැවැතිබැවින් ඒකත්වයට පැමිණියාවූ අර්පණා චිත්තොත්පාදයම ප්‍රතිපදා විශුද්ධිය උපයන බැවින් අර්පණාවම ප්‍රතිපදා විශුද්ධියට ඇතුළත් නමුදු වෙයි එම අර්පණාචිත්ත සම්ප්‍රයුක්තවූ උපෙක්ෂාව විසින් අර්පණාව වඩනාලද බැවින් එම චිත්තයම උපෙක්ෂානුබ්‍රෑහිතනාමුදු වෙයි එම සිත හා සම්ප්‍රයුක්තවූ ප්‍රඥා චෛතසිකයා විසින් පිරිසිදුකරණලද බැවින් එම අර්පණා චිත්තයම සම්පහංසිතනාමුදු වෙයි යනමේ අර්ථය පෙළෙහි වදාරණලද්දේය එහෙයින් අර්පණා සිතතුළම පරිකර්මාගමන වශයෙන් ප්‍රතිපදා විශුද්ධියද තත්සම්ප්‍රයුක්ත තත්‍රමජ්ඣත්තතා සංඛ්‍යාත උපෙක්ෂාවගේ කෘත්‍ය වශයෙන් උපෙක්ෂානුබ්‍රෑහණයද ධ්‍යානචිත්තය බඳුඑවන්නාවූ තත්සම්ප්‍රයුක්ත ප්‍රඥාචෛතසිකයාගේ ඒ ඒ ධර්මස්වභාව නොඉක්මවීම් ආදි කෘත්‍ය නිෂ්පත්ති වශයෙන් සම්පහංසනාව දැයි මෙසේ මේ ත්‍රිවිධකෘත්‍යය එකම අර්පණාචිත්තයෙහිම සම්භවවන්නේයයි දතයුතුයි. කෙසේදයත්? නියතප්‍රාදුර්භාවට සතරචිත්තක්ෂණයක්හා මන්දප්‍රාදුර්භාවට පසක්ද ඇතිනාවූ යම් අර්පණා චිත්තවීථි වාරයෙක්හි සතරවනුව හෝ පස්වනුව හෝ අර්පණාචිත්තය උපදනේවේද ඒ අර්පණා චිත්තයෙහි පැවැති පංචනීවරණ සංඛ්‍යාතවූ ඒ ධ්‍යානයට සතුරු ධර්මයන් කෙමෙරත් සිත පිරිසිදුවන්නේය ඒ අර්පණාවිශුද්ධියෙන් පිරිසිදුවූ හෙයින් නීවරණසංඛ්‍යාත ශත්‍රුකුලකින් මුවහකරණඉද චිත්තය මධ්‍යම සමථනිමිත්තට පැමිණෙන්නට නොහැකිවීනම් ඒ නීවරණයන් ඔබානැඟීම් වශයෙන් දුරුකොට මධ්‍යමශමථනිමිත්තට පැමිණෙන්නේය එනි මධ්‍යම සමථනිමිත්ත නම් කවරයත්? සිත සැඟවීමය උඩගුවීමය යන දෙකෙළවරට නොපැමිණීමෙන් සමව පවත්නා අර්පණාසමාධි චිත්තය මධ්‍යම නමුදු වෙයි ධ්‍යානයට සතුරුවූ නීවරණ ධර්මයන් සංසිඳුවන හෙයින් එම ධ්‍යානයම සමථ නමුදු වෙයි යෝගාවචරයාගේ සමාධි සුවයට කාරණාවන හෙයින් එම ධ්‍යානයම නිමිත්ත නමුදු වෙයි මෙසේ සමවපවත්නා අර්පණා චිත්තයම ඒ ඒ කෘත්‍ය වශයෙන් මධ්‍යම ශමථනිමිත්ත නම් වන බව දතයුතුයි. ඒ අර්පණාචිත්තයට අනන්තර ප්‍රත්‍යය වශයෙන් මුලින් උපදනා ගෝත්‍රභූ චිත්තය කිරිය දීය යන වෙනස ඇත්තෙහිදු එකම පරම්පරාව බැවින් දීකිරියයන ලෝක ව්‍යවහාරයමෙන් එකම චිත්තවීථියට පිරිණැමූහෙයින් ගෝත්‍රභූ අර්පණා චිත්තයන්ගේ කාමාවචරය මහද්ගතය හෙතුය ඵලය යන විශේෂ ස්වභාව ඇත්තෙහිදු එකම චිත්තවීථියෙහි ඇතුළත්වූ බැවින් අර්පණාසමාධි වශයෙන් කෙලෙස් සංසිඳුවීමට පැමිණි ගෝත්‍රභූ චිත්තයද මධ්‍යම ශමථනිමිත්තට පිළිපන්නේ නම් වන්නේයි මෙසේ පිළිපන්බැවින් යම් චිත්තක්ෂණයෙක්හි මධ්‍යම ශමථනිමිත්තට පිළිපන්නේ නම් ඒක්ෂණයෙහිම අර්පණාසමාධි වශයෙන් කෙලෙසුන් සංසිඳුවන හෙයින් අර්පණාසමාධියෙහිම ඇතුළත්වූයේනම් වන්නේයි මෙසේ අර්පණාචිත්තයට පෙරටුව උපදනා ගෝත්‍රභූචිත්තයෙහි ඇතිනාවූ නීවරණ නැමති සතුරන් පිරිසිදුවීමය මධ්‍යම ශමථනිමිත්තට පැමිණීමය

අර්පණාවට ඇතුලත්වීමය යන ආකාරයෙන් පහළවූ ප්‍රතිපදා විශුද්ධිය ප්‍රථමධ්‍යානයාගේ උත්පාද ක්‍ෂණයෙහිම ගොත්‍රභූ චිත්තයෙන් සංක්‍රමණ වශයෙන් ලැබෙන්නේයයි දතයුතුයි එහෙයින් ගොත්‍රභූ චිත්තයෙහි ඇත්තාවූ එව ආකාරයෝ ගොත්‍රභූ චිත්තයෙන් ලබනලද අනන්තර ප්‍රත්‍යය බලයෙන් පසුව උපදනා අර්පණා චිත්තක්‍ෂණයෙහි ප්‍රතිපදා විශුද්ධියයි යන නම් ඇතිව අර්පණාවටද ඒ විශෙෂය උපදවත් නවූත් මෙන් වන බැවින් අර්පණාධ්‍යාන ක්‍ෂණයෙහිම ප්‍රතිපදා විශුද්ධිය ඇත්තේයයි දතයුතුයි-මෙසේ පිරිසිදුවූ සිත නැවත පිරිසිදු කටයුත්තක් නැතිබැවින් අර්පණා සම්ප්‍රයුක්ත තත්‍ර මධ්‍යස්ථොපෙක්‍ෂාව සිත පිරිසිදු කිරීමෙහි උත්සාහ නොකරන්නාහු ඒ පිරිසිදු සිතෙහි මැදහත්වූයේ නම් වන්නේය කෙලෙස් සංසිඳීමට පැමිණි හෙයින් ශමථයට පිළිපන්නහුගේ නැවත සංසිඳුවිය යුත්තක් නැතිබැවින් ශමථයට වැයම නොකරන්නාහු ශමථයට පැමිණි සිතෙහි මැදහත්වූයේ නම් වන්නේය ඒ ශමථයට පිළිපන්බැවින් කොස් නම් කෙලශ සංසර්ග දුරුකෙරේම්දෝහෝයි සලකා ධ්‍යාන ප්‍රතිපත්තියට පිළිපන්නාහාව දුන් ඒ ශමථ ප්‍රතිපත්තියෙන් කෙලෙසුන් පැහුණු බැවින් කෙලශ සංසර්ගයෙන් දුරුව හුදකළාව එකඟතාවෙහිපිහිටි ඒ ධ්‍යාන චිත්තය නැවත එකඟකිරීමෙහි වෑයම් නොකරන්නාහු එකඟබව එළඹීමෙහි මැදහත්වූයේ නම් වන්නේය මෙසේ තත්‍ර මධ්‍යස්ථොපෙක්‍ෂාවගේ කෘත්‍යවශයෙන් උපෙක්‍ෂාවගේ වැඩීම දතයුතුයි ------

( ෂා ¶ )

යෙපනෙතෙ එවං උපෙක්ඛානුබ්‍රෑහිතෙ තත්‍රජාතා සමාධි පඤ්ඤාසඞ්ඛාතා යුගනද්ධධම්මා අඤ්ඤමඤ්ඤං අනතිවත්තමානා හුත්වා පවත්තා යානිච සද්ධාදීනි ඉන්ද්‍රියානි නානාකිලෙසෙහි විමුත්තත්තා විමුත්තිරසෙන එකරසානි හුත්වා පවත්තානි යඤ්චෙස තදුපගං අනතිවත්තන එකරසභාවානං අනුච්ඡවිකං වීරියං වාහයති යාචස්ස තස්මිං ඛණෙ පවත්තා ආසෙවනා සබ්බෙපි තෙ ආකාරා යස්මා ඤාණෙන සංකිලෙසවොදානෙසු තං තං ආදීනවඤ්ච ආනිසංසඤ්ච දිස්වා තථා තථා සම්පහංසිතත්තා විසොධිතත්තා පරියොදපිතත්තා නිප්ඵන්නා තස්මා ධම්මානං අනතිවත්තනාදි භාවසාධනෙන පරියොදපකස්ස ඤාණස්ස කිච්චනිප්ඵත්තිවසෙන සම්පහංසනා වෙදිතබ්බාති වුත්තං තත්‍ර යස්මා උපෙක්ඛාවසෙන ඤාණං පාකටං හොති යථාහ ---- තථාපග්ගහිතං චිත්තං සාධුකං අජ්ඣුපෙක්ඛති උපෙක්ඛාවසෙන පඤ්ඤාවසෙන පඤ්ඤින්ද්‍රියං අධිමත්තං හොති උපෙක්ඛාවසෙන නානත්තකිලෙසෙහි චිත්තං විමුච්චති විමොක්ඛවසෙන පඤ්ඤාවසෙන පඤ්ඤින්ද්‍රියං අධිමත්තං හොති විමුත්තත්තා තෙ ධම්මා එකරසා හොන්ති එකරසට්ඨෙන භාවනාති ---- තස්මා ඤාණකිච්චභූතා සම්පහංසනා පරියොසානන්ති වුත්තා ----

( ෂ ¶ )

එවං, මෙසේ; උපෙක්ඛානුබ්‍රෑහිතෙ, උපෙක්‍ෂාවෙන් වඩනාලද; තත්‍ර, ඒසමාධිචිත්තයෙහි, ජාතා, උපන්නාවූ; සමාධිපඤ්ඤාසඞ්ඛාතා, සමාධිය ප්‍රඥායයි කියනලද; යෙ පනෙතෙ යුගනද්ධධම්මා (යම් යුගයෙහි බඳයන් මෙන්) සමවපවත්නා ධර්මකෙනෙක්ද යන අර්ථයි; අඤ්ඤමඤ්ඤං අනතිවත්තමානාහුත්වා පවත්තා, සමවපවත්නෙන්

ම ඔවුහු නොවූත් නොයිස්ම පැවැත්තාහුද; යානිව සද්ධාදීනි ඉන්ද්‍රියානි, යම් ශ්‍රද්ධාදී ඉන්ද්‍රියයෝ තොහත්; නානාකිලෙසෙහි විමුත්තත්තා, නොයෙක් කෙලෙසුන්කෙරෙන් මුක්තබව හෙයින්; විමුත්තිරසෙන එකරසානිභූතා පවත්තානි, විමුක්තිකෘත්‍යයෙන් එක කෘත්‍යව පැවැත්තාහුද (සත්නයෙහි "කිලෙසි මුහුහැරිනෙනි ඒකිසහැරි ඇතියහ"යි කීහු) එය, මේයොගිහි තෙම ("තදුපගං"යි දෙසී) තෙසං අනතිවත්තනඑකරසභාවානං, ඒ ඔව්හු නොවූත් නොඉක්මීමය එකකෘත්‍ය බවය යන මොවුන්ට; අනුච්ඡවිකං විරියං වාහයති, සුදුසුවූ වීර්‍ය්‍ය පවත්වාද; තස්ස, ඒ ධ්‍යාන චිත්තයාගේ; තස්මිං ඛණෙ පවත්තා යාව ආසෙවනා, භඞ්ග ක්ෂණයෙහි ප්‍රවෘත්ත යම් ආසෙවනාවක් ඇද්ද (උත්පාදක්ෂණය ව්‍යතිතකල්හි ස්ථිතික්ෂණයෙහි පවත් ආසෙවනා තොමෝ පවත්නා නම් වේ) සබ්බෙපි තෙ ආකාරා, අනන්‍යානභිවර්තනාදි වශයෙන් පවත්නා ඒ සියල එ ආකාරයෝ (ආසෙවනාවද ආසෙවනානාව ධර්මයන් පවත්නා ආකාරයෙක්මැයි) යං, යම් හෙයකින්; සංකිලෙසවොදානධම්මෙසු, සංක්ලෙශකර ව්‍යවදානකර ධර්මයන් කෙරෙහි (සමාධි ප්‍රඥාවන්ගේ සම්බව නොකිරීම හානභාවනා සංක්ලෙශය නොකිරීම ව්‍යවදානනම්—සෙසෙසෙ නිදුමෙම් නයකි) තංතං ආදීනවඤ්ච, ඒ ඒ දොෂද; ආනිසංසඤ්ච, ගුණද; ඤාණෙන දිස්වා, පළමු කොට පාරිහාරික ප්‍රඥාවෙන් දැක; තථා සම්පහංසිතත්තා) යම්සේ අනන්‍යතා නාභිවත්තනාදීහු වෙද්ද) එසේ එසේ සම්පහංසිත බැවින්; විසොධිතත්තා, එම නුවණින් විශොධිත බැවින්; පරියොදපිතත්තා, නිර්මල කළ බැවින්; නිප්ඵන්නා, නිස්පන්නාහුද; තස්මා, එහෙයින්; ධම්මා

නං—පෙ—(තබ්බාහිවූත්තං—යතු උඤ්ඤාණ වණ්ණනාවෙහි ආදියෙහි කීවාම නිගම්නකොළෝ—ඒ ධ්‍යානක්ෂණයෙහිම ඇති උපෙක්ඛානු බ්‍රෑහණාව අවසානැයි නොකියා සම්පහංසනාව අවසානැයි කීමට කරුණු කිමයත්? "තත්‍ර යස්මා උපෙක්ඛාවසෙන ඤාණං පාකටං හොති තස්මා ඤාණකිච්චභූතා සම්පහංසනා පරියොසානන්ති" කරුණුදක්වූහු) තත්, ඒ උපෙක්ඛානුබ්‍රෑහණ සම්පහංසනායත් හෙරෙහි; යස්මා, යම්හෙයකින්; උපෙක්ඛාවසෙන, තත්‍ර මජ්ඣත්ත උපෙක්ඛාව විසින්; ඤාණං පාකටං හොති, ඥානය ප්‍රකට වේද (තත්‍රමජ්ඣත්ත උපෙක්ෂාව විසින්ද ධර්මයන් සමව පවත්නාකල්හි සම්ප්‍රයුක්ත ඥානයප්‍රත්‍යයහත්ම ස්ඵුටවීපවති යන අදහසයි) යථාහ, කීයේමැයි; තථා පග්ගහිතං චිත්තං (යම්සේ භාවනා චිත්තය නොගිලෙන පක්ෂයෙහි නොහේද එසේ) වීර්‍ය්‍ය සම්බොධ්‍යඞ්ගස්ථානීය ධර්මයන්ගේ බහුලීකරණයෙන් හුවාලද සිත්හු; සාධුකං අජ්ඣුපෙක්ඛති) සමාධිවීර්‍ය්‍ය දෙදෙනාගේ සම්බව කිරීමෙන් හුවාණලද බැවින්) මනාකොටම මැදහත්වේ; උපෙක්ඛාවසෙන, උපෙක්ෂා සම්ප්‍රයුක්ත තත්‍රමජ්ඣත්තුපෙක්ඛා බැවිනි; පඤ්ඤාවසෙන, පූර්වයෙහි ප්‍රවෘත්තපාරිහාරික ප්‍රඥාවශයෙන්; පඤ්ඤින්ද්‍රියං අධිමත්තං හොති, අර්පණා ප්‍රඥාසංඛ්‍යාත ප්‍රඥෙන්ද්‍රිය තෙමේ අධික ප්‍රමාණවේ (කෘත්‍යාධිකවේ යන අදහසි) උපෙක්ඛාවසෙන, තත්‍රමජ්ඣත්ත උපෙක්ඛාව විසින්; නානත්තකිලෙසෙහි, නානා ස්වභාව නීවරණ ප්‍රමුඛ ක්ලෙශයන් කෙරෙන්; චිත්තං විමුච්චති, අර්පණා සිත මිදේ; විමුච්චනවසෙන, හේද විමුච්චනවශයෙහි (ප්‍රඥාව අධිමාත්‍රබැවින්ම උපෙක්ෂා වශයෙන් අජ්ඣුපෙක්ෂණයකරන්නාහුගේ සිත කෙලෙසුන්

කෙරෙන් මිදෙයිසේයි) පක්ඛන්දවසෙන එව, පුබ්බෙවුත්ත පාරිහාරික ප්‍රඥාවශයෙන්ම; පඤ්ඤින්ද්‍රියං අධිමත්තං හොති, ප්‍රඥෙන්ද්‍රිය අධික ප්‍රමාණවේ; විමුත්තත්තා, නානා ස්වභාව ක්ලේශයන් කෙරෙන් විමුක්ත හෙයින්ම; තෙ ධම්මා, ශ්‍රද්ධාදි ඒ ධර්මයෝ (විශේෂයෙන් ශ්‍රද්ධා ප්‍රඥා වීර්‍ය්‍ය සමාධිහු) එකරසා හොන්ති, එක කෘත්‍යවෙත්; එකරසට්ඨෙන භාවනාති, එකරස හෙයින් භාවනායි; තස්මා, එහෙයින්; ඤාණකිච්චභූතා සම්පහංසනා, ඤාණයාගේ කෘත්‍යවූ සම්පහංසනා තොමෝ; පරියොසානන්ති වුත්තං, පයර්‍යවසාන යයි කියනලදු (මෙසේ ත්‍රිවිධ ප්‍රතිපත්ති විශුද්ධියෙන්ලද විශේෂ ඇති ත්‍රිවිධවූ උපෙක්ෂානු බෘංහණයෙන් සාතිශය ප්‍රඥෙන්ද්‍රියයාගේ අධිමාත්‍රබැවින් චතුර්විධවූ සම්පහංසනා සිද්ධවේනුයි ආගමනොපෙක්ෂා ඥානකෘත්‍ය වශයෙන් දශප්‍රකාරාකාරයෝ ධ්‍යානයෙහිම වෙතියි දතයුතුහුයි)......

( භා ¶ )

මෙසේ උපෙක්ෂාවෙන් වඩනලද ඒ අර්පණා චිත්තයෙහි උපදනාවූ සමාධි ප්‍රඥායයි කියනලද විෂයෙහි බඳනාලද ගොන්ගෙයක් මෙන් යුග්ම බද්ධ සමව පවත්නා යම් ධර්ම දෙදෙනෙක් සමව පවත්නා බැවින් ඔවුනොවුන් නොයික්ම පැවැත්තාහුද ශ්‍රද්ධාදි යම් ඉන්ද්‍රියකෙණෙක් රාගාදි ක්ලේශයන්ගෙන් මිදුනු බැවින් විමුක්ති කෘත්‍යයෙන් සමාන කෘත්‍ය ඇතිව පැවැත්තාහුද මේ ධ්‍යාන භාවනා වඩන යොගාවචර මහණ ඔවුනොවුන් නොඉක්මීමය සමාන කෘත්‍ය ඇතිබවය යන මොවුන්ට සුදුසුවූ යම් වීර්‍ය්‍යයක් පවත්වාද ඒ ධ්‍යාන චිත්තයාගේ උත්පාදක්ෂණය ඉක්මගොස් ස්ථිතික්ෂණය පවත් භඞ්ගක්ෂණයදක්වා පවත්නා යම් ආසෙවනාවක් ඇත්තේවේද යම්හෙයකින් ඒ සියලු ආකාරයෝ සමාධිප්‍රඥාවන්ගේ සමබව නොකිරීමයයි කියනලද භාවනාව කිලුටුකරන්නාවූ ධර්මයෙහිද සමාධිප්‍රඥාවන් සමබව කිරීමයයි කියනලද භාවනාව පිරිසිදුකරන්නාවූ ධර්මයෙහිද පාරිහාරික නුවණින් ඒ ඒ අයුරු හා අනුසස් දැන ඔවුනොවුන් නොඉක්මීම් ආදියවනපරිද්දෙන් සකසුවූකලබැවින්ද එම නුවණින්ම පිරිසිදුකල බැවින්ද නිර්මලකල බැවින්ද ඒ ආකාරයෝ නිපදවන ලදහුද එහෙයින් ප්‍රභාගෙවරවූ ප්‍රඥාවගේ ඒ ඒ ධර්ම නොඉක්මවීම් ආදි කෘත්‍ය නිෂ්පත්තිවශයෙන් සම්පහංසනාව දතයුත්තීයයි කියනලද්දේය ඒ උපෙක්ෂානු බෘංහණ සම්පහංසනාන් අතුරෙන් තත්‍ර මධ්‍යස්ථොපෙක්ෂා වශයෙන් ධර්මයන් සමව පවත්නාකල්හි තත්සම්ප්‍රයුක්ත ඥානය ප්‍රකටව පවත්නා බැවින් තත්‍ර මධ්‍යස්ථොපෙක්ෂාවෙන් ඥානය ප්‍රකාශ වන්නේමැයි කීයේමැනෝ අටුවායෙහි. යම්සේ භාවනා චිත්තය කුශිතපක්ෂයෙහි නොවැටේද එපරිද්දෙන් වීර්‍ය්‍ය සම්බොධ්‍යඞ්ගයට ඇතුලත්වූ ධර්මයන් වැඩීමෙන් වීර්‍ය්‍යවත්කරණලද චිත්තය සමාධිවීර්‍ය්‍ය දෙදෙන සමකිරීමෙන්ම වීර්‍ය්‍යවත්කරණ බැවින් උපෙක්ෂාවශයෙන් මනාකොට මැදහත්වන්නේය පූර්වභාගයෙහි පැවති පාරිහාරික ප්‍රඥාවශයෙන් අර්පණාප්‍රඥාසඞ්ඛ්‍යාත ප්‍රඥෙන්ද්‍රිය අධිකවන්නේය ප්‍රඥාව අධිකබැවින් තත්‍ර මධ්‍යස්ථොපෙක්ෂා වශයෙන් නොයෙක් ස්වභාව ඇත්තාවූ නීවරණාදි ක්ලේශයන්ගෙන් අර්පණා සිත මිදෙන්නේය පූර්වභාගයෙහි පැවති පාරිහාරිකප්‍රඥා වශයෙන් ප්‍රඥෙන්ද්‍රිය අධිකවන්නේය නොයෙක් ස්වභාව ඇති ක්ලේශයන් කෙරෙන් මිදුනුහෙ

සින් විශෙෂයෙන් ශ්‍රද්ධා ප්‍රඥා සමාධීනු සමාන කෘත්‍ය ඇත්තාහු වෙති. මෙ සේ මේ ඉන්ද්‍රියයන් සමානකෘත්‍ය ඇතිහෙයින් නිපදවන්නාවූ භාවනාව ලක්ෂණයාගේ උත්සාහයම වන්නේයි මෙසේ ත්‍රිවිධ ප්‍රතිපත්ති විශුද්ධියෙන් ලබනලද විශෙෂඇති ත්‍රිවිධ උපෙක්ෂාවූ බෘංහණයෙන් ප්‍රඥෙන්ද්‍රිය අධිකවූ බැවින් චතුර්විධවූ සම්පහංසනාව සිද්ධවන්නේනුයි උපෙක්ෂාලක්ෂණයන් ගේ කෘත්‍ය වශයෙන් දශවැදෑරුම් ආකාරයෙන් යම්හෙයකින් ඒ ධ්‍යාන යෙහිම වන්නාහුද එහෙයින් ලක්ෂණ යාගේ කෘත්‍යයවූ සම්පහංසනාව අව සානයෙහි වන්නේයයි කියනලද්දු, හුය ....

( පා ※ )

ඉදානි පඨමජ්ඣානං අධිගතං හොති පථවිකසිණන්ති එත්ථ ගණනානුපුබ්බතා පඨමං පඨමං උප්පන්නන්තිපි පඨමං ආරම්මණූපනිජ්ඣානතො පච්චනීකජ්ඣාපනතො වා ඣානං පථවීමණ්ඩලම්පන සකලට්ඨෙන පථවිකසිණන්ති වුච්චති තන්නිස්සාය පටිලද්ධ නිමිත්තම්පි පථවිකසිණං නිමිත්තෙ පටිලද්ධඣානම්පි තත්‍ර ඉමස්මිං අත්ථෙ ඣානං පථවිකසිණන්ති වෙදිතබ්බං තං සන්ධාය වුත්තං පඨමජ්ඣානං අධිගතං හොති පථවිකසිණන්ති එවං අධිගතෙ පන එතස්මිං තෙන යොගිනා වාලවෙධිනා විය සූදෙන විය ච ආකාරා පරිග්ගහෙතබ්බා, යථාහි සුකුසලො ධනුග්ගහො වාලවෙධාය කම්මං කුරුමානො යස්මිං වාරෙ වාලං විජ්ඣති තස්මිංවාරෙ අක්කන්තපදානඤ්ච ධනුදණ්ඩස්ස ච ජියාය ච සරස්ස ච ආකාරං පරිග්ගණ්හෙය්‍ය එවංඨිතෙන එවං ධනුදණ්ඩං එවං ජියං එවං සරං ගහෙත්වා වාලො විද්ධොති සො තතො පට්ඨාය තථෙව තෙ ආකාරෙ සම්පාදෙන්තො අවිරාධෙත්වා වාලං විජ්ඣෙය්‍ය එවමෙව යොගිනාපි ඉමං නාම මෙ භොජනං භුඤ්ජිත්වා එවරූපං පුග්ගලං සෙවමානෙන එවරූපෙ සෙනාසනෙ ඉමිනා නාම ඉරියාපථෙන ඉමස්මිං කාලෙ ඉදං අධිගතන්ති එතෙ භොජනසප්පායාදයො ආකාරා පරිග්ගහෙතබ්බා. එවං හි සො නට්ඨෙ වා තස්මිං තෙ ආකාරෙ සම්පාදෙත්වා පුන උප්පාදෙතුං අප්පගුණං වා පගුණං කරොන්තො පුනප්පුනං අප්පෙතුං සක්ඛිස්සති ....

( ස ※ )

ඉදානි...පෙ...එත්ථ, මෙහි; ගණනානුපුබ්බතා, ගණනානුපුබ්බතායයි සේයි (ගණන් පිළිවෙළින් යන අර්ථයි) පඨමං, ප්‍රථමනම් වේ (මෙසින් දෙශනා ක්‍රම දක්වූහ) පඨමං උප්පන්නන්තිපි පඨමං, පළමුකොට අධිගතනු සිහෝ ප්‍රථමනම් (මෙයින් ප්‍රතිපත්ති ක්‍රම දක්වූහ) ආරම්මණූපනිජ්ඣානතො, පඨවිකසිණු අරමුණු බලන හෙයින්ද; පච්චනීකජ්ඣාපනතො වා, ප්‍රත්‍යනීකනීවරණ ධර්මයන් දවනහෙයින්ද; ඣානං, ධ්‍යානනම්වේ; පඨවිමණ්ඩලං පන, පෘථිවිමණ්ඩලය වනාහි; සකලට්ඨෙන (එක දෙශයක් අරමුණු නොකොට සියල්ලම අරමුණුකරණබැවින්) සකලාර්ථයෙන්; පථවිකසිණන්ති වුච්චති, පඨවි කසිණුයයි කියනු ලැබේ; තං නිස්සාය, ඒ පඨවි කසිණ නිසා; පටිලද්ධ නිමිත්තම්පි, ප්‍රතිලබ්ධ නිමිත්තයද; පථවිකසිණං ("මඤ්චා ක්‍රොශන්ති" යනුමෙන්) පථවිකසිණ නම්වේ; නිමිත්තෙ පටිලද්ධඣානම්පි, නිමිත්තයෙහි පිළිලද ධ්‍යානයද (තත් සහචරිතයෙන් "කුන්තා ප්‍රචරන්ති" යනුමෙසින්) පඨවිකසිණුනම් වේ; තත්‍ර, එහි; ඉමස්මිං අත්ථෙ, මේ අර්ථ යෙහි; ඣානං පථවිකසිණන්ති වෙදි

තබ්බං, ධ්‍යානය පෘථිවිකසිණයයි දත යුතු; තං සන්ධාය, ඒ ධ්‍යානය සඳහා; වුත්තං, කියනලදී; පඨවි...පෙ...කසිණංති; එවං අධිගතෙ, මෙසේ පැමිණෙනලද; එතස්මිං, මේ ධ්‍යාන්හි; තෙන යොගිනා, ඒ යෝගීන් විසින්* වාලවෙධිනා විය (අනෙකධාභින්න වූ) වාලය විදිනහුමෙන්ද; සූදෙන විය, භක්තකාරයාමෙන්ද; ආකාරා, ආකාරයෝ; පරිග්ගහෙතබ්බා, සැලකියයුත්තාහුයි; යථාති, යම්සේ; සුකුසලො ධනුග්ගහො, දක්ෂවූ දුනුවාතෙම; වාලවෙධාය කම්මං කුරුමානො, වාලවෙධයපිණිස අභියොගකරන්නේ; යස්මිං වාරෙ වාලං විජ්ඣති, යම් වාරයක වාලය විදීද; තස්මිං වාරෙ, ඒ වාරයෙහි; අක්කන්තපදානංච, ඔසවාගත් පාදයන්ගේද; ධනුදණ්ඩස්ස ච, ධනුර්දණ්ඩයාගේද; ජියාය ච, ජ්‍යාවගේද; සරස්ස ච, ශරයාගේද; ආකාරං පරිග්ගණ්හාති, ආකාරය සලකන්නේද; එවං ධනුදණ්ඩං, මෙසේ දුනු දඬුගෙණ; එවං ජියං, මෙසේ දුනුදියගෙණ; එවංසරං ගහෙත්වා, මෙසේ ශරය ගෙණ; එවං ඨිතෙන, මෙසේ සිටියාවූ; මෙ, මාවිසින්; වාලො විද්ධොති, වාලය විදිනාලදැයි ("ආකාරං පරිග්ගණ්හාති" යනු හා සම්බන්ධකරණු) සො, ඒතෙම; තතොපට්ඨාය, එතැන්පටන්; තථෙව, එසේම; තෙ ආකාරෙ සම්පාදෙන්තො, ඒ ආකාරයන් සපයන්නේ; අවිරාධෙත්වා වාලං විජ්ඣෙය්‍ය, නොවරදවා වාලය විදින්නේද; එවමෙව, එපරිද්දෙන්ම; යොගිනාපි, යෝගීන් විසිනුදු; ඉමං නාම භොජනං භුඤ්ජිත්වා, මෙනම් භොජනයක් වළඳා; එවරූපං පුග්ගලං සෙවමානෙන, මෙබඳුවූ පුහුලකු සෙවුනාවූ; මෙ, මාවිසින්; එවරූපෙ සෙනාසනෙ, මෙබඳුවූ සෙනසුනෙහි; ඉමිනා නාම ඉරියාපථෙන, මෙබඳුවූ ඉරියැවුවෙන්; ඉමස්මිං කාලෙ, මෙවෙනි කල; ඉදං අධිගතන්ති, මේ ධ්‍යාන් අධිගතයයි; එතෙ භොජනසප්පායාදයො, මේ බොජුන් සැප ආදී ආකාරයෝ; පරිග්ගහෙතබ්බා, සැපවියයුත්තාහුයි; එවං, එසේකල්හි; සො, ඒ යෝගීතෙම; එතස්මිං, ඒ තරුණ ධ්‍යානය; නට්ඨෙවා, නටකල්හි හෝ; තෙ ආකාරෙ සම්පාදෙත්වා, ඒ ආකාරයන් සපයා; පුන උප්පාදෙතුං, නැවත උපදවන්නටද; අප්පගුණංවා, නොපුහුණු ධ්‍යානහෝ; පගුණිකරොන්තො, පුහුණුකරන්නේ; පුනප්පුනං අප්පෙතුං, නැවත නැවත අපුන් පමුණුවන්නට; සක්ඛිස්සති, පොහොසත්වී...

( හා * )

මෙතැන්පටන් දුන් පෘථිවිකසිණය අරමුණුකොට ඇති ප්‍රථමධ්‍යානයට පැමිණියේ වෙයි යන මෙහි අභිවණ්ණනාව වන්නේය ධ්‍යාන දේශනාවෙහි ගණන් වශයෙන් පළමුකොට දේශනාකළබැවින් හෝ ප්‍රතිපත්ති ක්‍රමයෙන් පළමුකොට පැමිණියයුතු ධ්‍යානයබැවින් හෝ ප්‍රථමනම්වෙයි ඇසින් රූපය බලන්නාක්මෙන් පෘථිවිකසිණාරමුණ බලන අර්ථයෙන්හෝ ප්‍රතිපක්ෂ නීවරණ ධර්මයන් මුවහකොට ඔබාගැණීම්වශයෙන් දුරුකරණ අර්ථයෙන් හෝ ධ්‍යානනම්වෙයි යට කියනලද ක්‍රමයෙන් විධිවූ පරිද්දෙන් කරණලද කිසුණු මඬුලෙලෙහි හෝ සීසානාලද කලවිටි ආදී ප්‍රකෘති භූමියෙහි හෝ සිතින් වෙන්කොට ගන්නාලද එකම පෘථිවි ප්‍රදේශයක් අරමුණුකොට ඒ අනුසාරයෙන් සියලු පෘථිවිතලය අරමුණුකරණ හෙයින් සකලාර්ථයෙන් ඒ පෘථිවිමණ්ඩලයම පෘථිවිකසිණයයි කියනලද්දේය. යම්සේ ලොකයෙහි මඤ්චයෝ ඝොෂාකෙරෙත්යයි

* මේ සන්නයෙහි බෙහෙවින් ඉවර්ණාන්ත ශබ්දවලින් පරවූ "හු" විභක්ති ප්‍රත්‍යය "හි" යයි දක්නාලැබේ සිංහල ව්‍යාකරණ පොත්හි මේ ක්‍රමය නැතත් පූර්ව ඉකාරයාගේ අපෙක්ෂාවෙන් ප්‍රත්‍යයාන්ත උකාරයට ඉකාරයැවීම උචිතවෙයි.

කී පමණින් මැසිපිටහොත් පුරුෂයෝ කොෂාකොරන්යයි අවබොධවෙද්ද එමෙන්ම ඒ පෘථිවිකසිණ මණ්ඩලය බලා භාවනා වඩා උපදවානන් ප්‍රතිභාග නිමිත්තද ආශ්‍රයවශයෙන් පෘථිවිකසිණයයි කියනලද්දේයි. තවද යම්සේ කුන්තායුධ හැසිරෙන්යයි කී පමණින් කුන්තායුධගත් පුරුෂයෝ හැසිරෙන්යයි අවබොධවෙද්ද එමෙන්ම ඒ ප්‍රතිභාග නිමිත්තයෙහි ලද ධ්‍යානයද එක්ව හැසිරීම් වශයෙන් පෘථිවිකසිණයයි කියනලද්දේයයි දතයුතුයි. ඒ අර්ථය සඳහා පෘථිවිකසිණය අරමුණුකොට ඇති ප්‍රථමධ්‍යානයට පැමිණියේයයි කියනලද්දේයි. මෙසේ පැමිණෙනලද ප්‍රථමධ්‍යානයෙහි ඒ යෝගාවචරයා විසින් නොයෙක් වර පළනලද අස්ලොම් කොන්දක් ඉලක්ක යොදා ඒ දෙබෑකොට පළායනසේ විදිනා වාලවෙධි ධනුර්ධරයෙකුමෙන්ද සූපශාස්ත්‍රයෙහි දක්ෂ අරක්කැමියෙකුමෙන්ද ආකාර සැලකිය යුත්තානුය. ඒ එසේමැයි. යම්සේ දක්ෂවූ දුනුවායෙක් අස්ලොම් විදිනාපිණිස පුරුදුකරන්නේ යම් කාලෙක යම් ආකාරයකින් අස්ලොම විද්දේද එකල්හි මෙසේ දුනන අතටගෙණ මෙසේ දුනුදිය නගා මෙසේ ඊය හිඳුවා මේ ඉරියව්වෙන් සිටියාවූ මාවිසින් අස්ලොම විදිනාලද්දේයයි විදීමට පාදයන් ඔසවාගත් ආකාරයද දුන්නගත් ආකාරයද දුනුදියනැගූ ආකාරයද ඊතල හිඳවූ ආකාරයද යනමොවුන් සලකන්නේවේද එසේ සලකන්නාවූ දුනුවායා එතැන්පටන් අස්ලොම් විදුනු කැමැති කල ඒ ආකාරයන් සපයන්නේ නොවරදවා විද අස්ලොම දෙබෑකොට පළන්නේවෙයි. එපරිද්දෙන්ම යොගාවචර මහණ විසිනුදු මාවිසින් මෙනම් බොජුනක් වළඳ මෙබඳු පුද්ගලයෙකු ආශ්‍රයකොට මෙබඳු සෙනස්නෙහි මෙබඳු ඉරියව්වකින් හිඳ මෙබඳු කාලයෙක මේ ධ්‍යානයට පැමිණෙනලද්දේයයි සලකා සැපවූ බොජුන් ආදී මේ ආකාරයෝ සැපනියයුත්තානුය එසේතල ඒ යෝගාවචර මහණ ඒ උපදවාගත් තරුණ සමාධිය පිරිහුණේවී නම් ඒ ආකාරයන් සපයා නැවත සමාධිය උපදවන්නටද නොපුහුණු ධ්‍යානයන් පුහුණුකරන්නේ නැවත නැවත අර්පණාවට පැමිණෙන්නටද පොහොසත්වන්නේයි.

( පා † )

යථාච කුසලො සූදො භත්තාරං පරිවිසන්තො යං යං රුචියා ඌපගතභාවං සල්ලක්ඛෙත්වා තතො පට්ඨාය තාදිසමෙව උපනාමෙන්තො ලාභස්ස භාගී හොති එවමයම්පි අධිගතකාලෙ භොජනාදයො ආකාරෙ ගහෙත්වා තෙ සම්පාදෙන්තො පුනප්පුනං අප්පනාය ලාභී හොති තස්මානෙන වාලවෙධිනා විය සූදෙනවියච ආකාරා පරිග්ගහෙතබ්බා වුත්තම්පිචෙතං භගවතා ....සෙය්‍යථාපි භික්ඛවෙ පණ්ඩිතො ව්‍යත්තො කුසලො සූදො රාජනංවා රාජමහාමත්තංවා නානච්චයෙහි නානග්ග රසෙහි සූපෙහි පච්චුපට්ඨිතො අස්ස අම්බිලග්ගෙහිපි තිත්තකග්ගෙහිපි කටුකග්ගෙහිපි මධුරග්ගෙහිපි ඛාරිකෙහිපි අඛාරිකෙහිපි ලොණිකෙහිපි අලොණිකෙහිපි සඛොසො භික්ඛවෙ පණ්ඩිතො ව්‍යත්තො කුසලො සූදො සකස්ස භත්තු නිමිත්තං උග්ගණ්හාති ඉදංවා මෙ අජ්ජ භත්තු සූපෙය්‍යං රුච්චති ඉමස්සවා අභිහරති ඉමස්සවා බහුං ගණ්හාති ඉමස්සවා වණ්ණං භාසති අම්බිලග්ගංවා මෙ අජ්ජ භත්තු සූපෙය්‍යං රුච්චති

අම්බිලග්ගස්සවා අභිහරති අම්බිලග්ග ස්සවා බහුං ගණ්හාති අම්බිලග්ගස්සවා වණ්ණං භාසති ---පෙ--- අලොණි කස්සවා වණ්ණං භාසතීති ස ඛො සො භික්ඛවෙ පණ්ඩිතො වියත්තො කුසලො සූදො ලාභීචෙව හොති අච්ඡාදනස්ස ලාභී වෙතනස්ස ලාභී අභිහාරානං තං කිස්ස හෙතු තථාහි සො භික්ඛවෙ පණ්ඩිතො වියත්තො කුසලො සූදො සකස්ස භත්තු නිමිත්තං උග්ගණ්හාති එවමෙවඛො භික්ඛවෙ ඉධෙකච්චො පණ්ඩිතො වියත්තො කුසලො භික්ඛු කායෙ කායානුපස්සී විහරති ---පෙ --- වෙදනාසු චිත්තෙ ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං තස්ස ධම්මෙසු ධම්මානුපස්සිනො විහරතො චිත්තං සමාධියති උපක්කිලෙසා පහීයන්ති සො තං නිමිත්තං උග්ගණ්හාති සඛො සො භික්ඛවෙ පණ්ඩිතො වියත්තො කුසලො භික්ඛු ලාභීචෙව හොති දිට්ඨධම්ම සුඛ විහාරානං ලාභී සතිසම්පජඤ්ඤස්ස තං කිස්ස හෙතු තථාහි සො භික්ඛවෙ පණ්ඩිතො වියත්තො කුසලො භික්ඛු සකස්ස චිත්තස්ස නිමිත්තං උග්ගණ්හාතීති ---

( ස † )

යථාව, යම්සේ; කුසලො සූදො, දක්‍ෂවූ සූදතෙම; භත්තාරං පරිවිසන්තො, ස්වාමීහු වළඳවන්නේ; යං යං රුචියා භුඤ්ජති, යමක් යමක් රුචිව වළඳද; තං තං සල්ලක්ඛෙත්වා, ඒ ඒ සලකා; තතොපට්ඨාය, එතැන් පටන්; තාදිසංයෙව, එබඳුවූවම; තස්ස උපනාමෙන්තො, උහුට එළවන්නේ; ලාභස්ස භාගී හොති, ලාභයට හිමිවේද; එවං, එපරිද්දෙන්ම; අයම්පි, මේද; අධිකාරක්ඛණෙ, අධිකාර කාලයෙහි; භොජනාදයො ආකාරෙ ගහෙත්වා, භොජනාදී ආකාරයන් සලකා; තෙ සම්පාදෙන්තො, ඔවුන් සපයනුයේ; පුනප්පුනං අප්පනාය ලාභී හොති, නැවත නැවත අර්පණාව ලැබෙන්නේවේ; තස්මා, එහෙයින්; අනෙන, මේ යොගීහු විසින්; වාළවෙධිනා විය, වාලය විදුනාහු මෙන්ද; සූදෙන විය, සූදයා මෙන්ද; ආකාරා පරිග්ගහෙතබ්බා, ආකාරයෝ සැලකියයුත්තාහුයි; වුත්තම්පිචෙ තං භගවතා, භගවත්හු විසින් මේ කියනලදමැයි; සෙය්‍යථාපි, යම්සේ; භික්ඛවෙ, මහණෙනි; පණ්ඩිතො (සූපශාස්ත්‍ර පරිචයෙන්) පණ්ඩිතවූ; වියත්තො (එහි විශදඥාන ඇතිබැවින්) ව්‍යක්තවූ; කුසලො (ස්ථානෙපාකශාස්ත්‍ර කෞශල්‍ය යොගයෙන්) කුශලවූ, සූදො, අරක්කැමිතෙම; රාජානංවා, රජදරුවන්ටහෝ; රාජමහාමත්තානංවා, රාජමහාමාත්‍යයන්ට හෝ "නානග්ගරසෙහි සූපෙහි" යි පොත්හි ලියති "නානච්චයෙහි" යනු පාඨයි-එහෙයින්ම සන්නයෙහි-නානච්චයෙහි, නොයෙක් වඩ ඇතියෙන් මැනො--එක් අයිය ඇතියෙන් යෙහි වෙයි කීහු-ටීකාවෙහිදු 'නානච්චයෙහිති නානා සභාවෙහි-නානා රසෙහීති අත්ථො" යි කීහු. නොයෙක් රසඇති සූපයෙන් යන අර්ථයි) පම්වූ පටසීතො අස්ස, එළඹ සිටියේවේද; අම්බිලග්ගෙහිපි (ඇඹුල්කොටසිනිදු) උතුම් ඇඹුල් රසයෙන්හෝ; තිත්තකග්ගෙහිපි, සුදුකොටසිනිදු; කටුකග්ගෙහිපි, කුළුකොටසිනිදු; මධුරග්ගෙහිපි, මීයුරු කොටසිනිදු; ඛාරිකෙහිපි, (කරබටු කිලිල් ආදි) ක්‍ෂාර ද්‍රව්‍ය මිසු රසෙහිද්ද; අඛාරිකෙහිපි, ක්‍ෂාර ද්‍රව්‍ය නොමිසු රසෙහිද්ද; ලොණිකෙහිපි, ලුණුමිසුරසෙහිද්ද; අලො

ණීතෙනිට, ලුණු නොමුසු රෙසෙනුදු (“පච්චුපට්ඨිතො අයං”යි යොදනු “සභොජනො” යනුයෙහි “සො ඓව ඒසො” යන අර්ථයි—පෙ—) සභාසහාතු, යම්බියවූ භත්තෘනුගේ; නිමිත්තං ගණ්හාති, රුස්ව වළඳනා ආකාරය සලකා; මෙ භත්තු, මාගේ ස්වාමිනාට; අජ්ජ, අද; ඉදං සූපෙය්‍යං රුච්චති, මේ මාළුව රුච්කරයි; ඉමස්ස වා අභිහරති, මේ මාළුවට අත එළවයි (මහානුභාව වළඳයි “ඉමං වා අභිහරති” යන අර්ථයි) ඉමස්ස වා බහුං ගණ්හාති, මෙයින් බොහෝකොට ගනියි; ඉමස්ස වා වණ්ණං භාසති, මේ මාලුයේ හෝ ගුණ කියයි (“ඉමෙ හ භාතු අජ්ජ අම්බිලග්ගං වා සූපෙය්‍යං රුච්චති”යි යොදනු—පෙ—) ලාභී චෙව හොති අච්ඡාදනස්ස, හඳනා පිළි හෝ ලැබෙයි; ලාභී වේතනස්ස, හ මාගේ වැඩිවිහෝ ලැබේ; ලාභී අභිහාරානං, අභිහාරයන්හෝ ලැබෙයි; තං කිස්ස හෙතු, එයට හෙතු කිම; තථාහි, එසේ වැනු—පෙ—එවමෙව, එසේම; ඉධෙකච්චො, මහණෙනි; ඉධ, මේ ශාසනයෙහි; පණ්ඩිතො, නුවණැති; වියත්තො, ව්‍යක්තවූ; කුසලො, දක්ෂවූ; භික්ඛු, මහණතෙමේ; කායෙ (කුත්සිතවූ කෙශලොමාදිවූ සමූහ සඞ්ඛ්‍යාත) රූපකායෙහි; කායානුපස්සී, කෙශාදී ධර්ම සමූහය බලනුයේ; විහරති, වෙසේ; වෙදනාසු, වෙදනාවන් කෙරෙහි; චිත්තෙ, චිත්තයෙහි; ධම්මෙසු (ස්පර්ශාදී සෙසු) ධර්මයන් කෙරෙහි; ධම්මානුපස්සී, ධර්මයන් බලනුයේ; විහරති, වෙසේ; ආතාපී, කෙලෙසුන් තවනවීර්යයෙන් යුක්තවූයේ; සම්පජානො, ධර්ම පරිග්‍රාහකවූ ඥානයෙන් යුක්තවූයේ; සතිමා, ධර්ම පරිග්‍රාහිකවූ ස්මෘතියෙන් යුක්තවූයේ; ලොකෙ, ධර්මසඞ්ඛ්‍යාත ලොකයෙහි; අභිජ්ඣා දොමනස්සං විනෙය්‍ය, අභිධ්‍යා දෞර්මනස්යයන් දුරුකොට (“විහරති”යි යොදනු) ධම්මෙසු ධම්මානුපස්සිනො, ධර්මයන් කෙරෙහි ධර්මානුදර්ශීව; විහරතො අස්ස, වසන්නාවූ ඔහුගේ; චිත්තං, සිත; සමාධියති, සමාහිතවේ; උපක්කිලෙසා පහීයන්ති, උපක්ලේශයෝ පැහෙත්; සො, හෙතෙමේ; තං නිමිත්තං උග්ගණ්හාති, මාගේ සිත මෙසේ සමාහිතවීයයි සමාහිතාකාරය සලකා—පෙ—ලාභී චෙව දිට්ඨධම්ම සුඛවිහාරානං, දෘෂ්ටධර්ම සුඛවිහාරයනුදු ලබන්නේය; ලාභී සතිසම්පජඤ්ඤස්ස, සිහි නුවණද ලබන්නේයි. —පෙ—

( භා † )

යම්සේ දක්ෂවූ අරක්කැමියෙක් ස්වාමියා වළඳවන්නේ යම්යම් මාළුවක් කැමැත්තෙන් වළඳනම් ඒඒ මාළුව සලකා එතැන්පටන් එළවූ සූපයන් ම ඒ ස්වාමියාහට එළවන්නාහු ස්වාමීහුගෙන් මහත් ලාභ ලැබීමට සුදුසු වන්නේද එපරිද්දෙන්ම මේ යොගාවචර මහණද ධ්‍යානයට පැමිණි කල්හි සැපවූ භොජනාදී ආකාරයන් සලකා ඒ ආකාරයන් සපයන්නාහු නැවත නැවත අර්පණා සමාධිය ලබන්නේයි එහෙයින් මේ යොගාවචර මහණ විසින් වාළුවෙඩී ධනුර්ධරයකුගේත් දක්ෂ අරක්කැමියකුගේත් සැපවූ ආකාරයෝ සැලකියයුත්තාහ. භාග්‍යවත්හු විසිනුදු මේ වදාරණලදුයේමැයි. මහණෙනි යම්සේ සූපශාස්ත්‍රාභ්‍යාසකිරීමෙන් පණ්ඩිතවූ සූපශාස්ත්‍රයෙහිපිරිසිද්දනුවණ ඇතිබැවින් ව්‍යක්තවූ ස්ථානයට සුදුසු නුවණ ඇතිබැවින් දක්ෂවූ අරක්කැමියා රජුන්ට හෝ රාජමහා මාත්‍යයන්ට හෝ නොයෙක් ප්‍රභාව ඇති අග්‍ර රසයෙන් යුත් ව්‍යඤ්ජනයන්ද ඇඹුල් පමණ අතුරෙන්

උතුම් ඇඹුල් රසයෙන්ද තිත්තාවගී අතුරෙන් උතුම් තිත්ත රසයෙන්ද කුළුවගී අතුරෙන් උතුම් කුළු රසයෙන්ද මිහිරුවගී අතුරෙන් උතුම් මිහිරු රසයෙන්ද කරබටු කිලිල් ආදී ක්ෂාර ද්‍රව්‍යමුසු රසයෙන්ද ක්ෂාරයෙහා වූ මිශ්‍ර රසයෙන්ද ලුණුමිශ්‍ර රසයෙන්ද ලුණු නොමුසු රසයෙන්ද යුක්ත භොජනය එළවන්නේය මහණෙනි පණ්ඩිතවූ ව්‍යක්තවූ ස්ථාන කුශලවූ ඒ අරක්කැමියා ස්වකීය ස්වාමිහු වලඳනා ආකාරය සලකන්නේය මාගේ ස්වාමීහට අද මේ මාළුව රිසිවන්නේය මේ මාළුවට අත එළවන්නේය මේ මාළුව වලඳන්නේය මෙයින් බොහෝකොට ගන්නේය මේ මාළුවේ ගුණ වර්ණනාකරන්නේය මාගේ ස්වාමිහු අද ඇඹුල් රසාදීයෙන් උතුම්වූ අසවල් රසයට රිසිවෙයි අසවල් රසයට අත එළවන්නේය අසවල් රසය වලඳන්නේය අසවල් රසය බොහෝකොට ගන්නේය අසවල් රසයෙහි ගුණ වර්ණනාකරන්නේයයි සලකා ස්වකීය ස්වාමියාහට රිසිරිසිවූ මාළු ආදිය එළවන්නේය මහණෙනි ඒ අරක්කැමියා ස්වාමිහුගෙන් හඳනා පිළී ලබන්නේහෝවෙයි තමාගේ වැටුප් වියදම් ලබන්නේහෝ වෙයි පුදපඬුරු ලබන්නේහෝ වෙයි ඊට කාරණා කවරයත්? ඒ එසේමැයි. මහණෙනි ඒ නුවනැති ව්‍යක්තවූ දක්ෂ අරක්කැමියා ස්වකීය ස්වාමිහු වලඳනා ආකාරය සලකා ස්වාමීහුගේ චිත්තාරාධනා කිරීමෙහි පොහොසත්වන්නේයි එපරිද්දෙන්ම මහණෙනි මේ ශාසනයෙහි නුවනැති ව්‍යක්තවූ දක්ෂ යෝගාවචර මහණද පිළිකුල්වූ කෙස් ලොම් ආදී දෙතිස් කුණප සමූහයයි කියනලද රූපකායෙහි කෙශාදි ධර්ම සමූහය තත්වාකාරයෙන් බලමින් වෙසේද එසේම සෝමිනස් ආදී ප්‍රභෙද වශයෙන් පවත්නා වෙදනාවන් කෙරෙහිද රාග ද්වෙෂ මොහාදියෙන් ශුන්‍යවූ චිත්තයෙහිද ස්පර්ශ සංඥා චේතනාදී අවශෙෂ ධර්මයන්කෙරෙහිද ද්‍රැපකාරය ගිමෙන් තත්වාකාරයෙන් බලමින් වෙසේද එසේම කෙලෙසුන් තවන ඒ වීර්යයෙන්හා ධර්ම ස්වභාව දැනගතහැකි නුවණින්ද එබඳුවූ සමාධියෙන්ද යුක්තව යථොක්ත ධර්ම සමූහ සඞ්ඛ්‍යාත ලොකය පිළිබඳව පවත්නාවූ ලොභ දෞර්මනස්‍යයන් දුරුකොට වාසයකරන්නේවේද ඒ කායවෙදනා චිත්ත ධර්ම සඞ්ඛ්‍යාත සතරතන්හි නැවත නැවත නුවණින් බලමින් වසන්නාවූ ඒ යොගාවචරයාගේ සිත එකග්‍රවන්නේය දෘෂ්ටිමානාදී උපක්ලෙශයෝ ප්‍රහීණවන්නාහුය ඒ යොගාවචර මහණද මාගේ සිත මේ මේ ධර්මයන් මෙනෙහිකිරීමෙන් හෝ මෙසේ වාසයකිරීමෙන්ද එකගවියයි සලකා ඒ කෙලෙස් සන්සිඳිනා ආකාරය උගන්නේවේද මහණෙනි ඒ නුවණැති ව්‍යක්තවූ දක්ෂ මහණ ඉහාත්මයෙහි කෙලෙසුන් ඔබානැවීමෙන් ලබනලද ධ්‍යාන සුඛ විහරණයද ලබන්නේය සමෘති සම්ප්‍රජන්‍ය සඞ්ඛ්‍යාත සිහි නුවණද ලබන්නේය ඊට හෙතු කවරයත්? ඒ එසේමැයි. මහණෙනි ඒ නුවණැති ව්‍යක්තවූ දක්ෂ මහණ තමාගේ චිත්තය පවත්නා ආකාරය සලකා කෙලෙස් සන්සිඳුවීමට පොහොසත්වන්නේයි......

( පා ‡ )

නිමිත්තගහණත්තවස්ස පුන තෙ ආකාරෙ සම්පාදයතො අප්පනාවහා මෙව ඉජ්ඣති තම්විරද්ධානං විරද්ධානම්පනසමාධිපරිපන්ථානං ධම්මානං සුවිසොධිතත්තා හොති යොහි භික්ඛු කාමාදීනවපච්චවෙක්ඛණාදීහි කාමච්ඡන්දං න සුට්ඨුවික්ඛම්භෙත්වා කාය

පස්සද්ධිවසෙන කායදුට්ඨුල්ලං තස්සුප්පටිප්පස්සද්ධං කත්වා-ආරම්භධාතු මනසිකාරාදිවසෙන ථිනමිද්ධං තස්සුප්පටිවිනොදෙත්වා සමථනිමිත්තමනසිකාරාදිවසෙන උද්ධච්චකුක්කුච්චං තස්සුසමූහතං කත්වා අඤ්ඤෙපි සමාධිපරිපන්ථෙ ධම්මෙ තස්සුවිසොධෙත්වා ඣානං සමාපජ්ජති සො අසොධිතං ආසයං පවිට්ඨභමරො විය අසුද්ධං උය්‍යානං පවිට්ඨරාජා විය ච ඛිප්පමෙව නික්ඛමති යො පන සමාධිපරිපන්ථෙ ධම්මෙ සුට්ඨුවිසොධෙත්වා ඣානං සමාපජ්ජති සො සුවිසොධිතං ආසයං පවිට්ඨභමරො විය සුපරිසුද්ධං උය්‍යානං පවිට්ඨරාජා විය ච සකලම්පි දිවසභාගං අන්තොසමාපත්තියං යෙවහොති තෙනාහු පොරාණා—

කාමෙසු ඡන්දං පටිඝං විනොදයෙ
උද්ධච්චමිද්ධං විචිකිච්ඡ පඤ්චමං
විවෙකපාමොජ්ජකරෙන චෙතසා
රාජාව සුද්ධන්තගතො තහිංරමෙති—

( ස ‡ )

සකස්ස චිත්තස්ස, සමාධියවූ චිත්ත යාගේ; නිමිත්තගහණෙන ච, ආකාර පරිග්‍රහයෙනුදු; පුන තෙ ආකාරෙ සම්පාදයතො, නැවත ඒ ආකාරයන් සම්පාදනයකරණ; අස්ස, මේ යොගී හට; අප්පනාමත්තමෙව ඉජ්ඣති, අර්පණාමාත්‍රම සිද්ධවෙයි; නචිරට්ඨානං (ධ්‍යාන්හුගේ) චිරස්ථිතිය සිද්ධ නොවේ; චිරට්ඨානම්පන, චිරස්ථිතිය වනාහි; සමාධිපරිපන්ථානං ධම්මානං, සමාධියට පරිපන්ථවූ නීවරණදමුන්; සුවිසොධිතත්තා හොති, මනාකොට ශුද්ධකළබව හෙයින්වේ; යො හි භික්ඛු, යම් මහණෙක් ("ඣානං සමාපජ්ජති" යනු හා යොදනු) කාමාදීනව පච්චවෙක්ඛණාදීහි, කාමයෙහි ආදීනව පස්මිකිරීම් ආදියෙන් (ආදි ග්‍රහණීන් අශුභ මනසකාර ගන්නා ලැබේ) කාමච්ඡන්දං න සුට්ඨුවික්ඛම්භෙත්වා, කාමච්ඡන්දය මනාකොට විෂ්කම්භනය නොකොට; කායපස්සද්ධිවසෙන, කායපස්සද්ධි විසින්; කාය දුට්ඨුල්ලං, කාය පීඩාව (කාය දරථය) න සුප්පටිප්පස්සද්ධං කත්වා, මනාකොටම නොසන්හිඳුවා (මෙයින් කායවිපාත යන්ගේ සංරද්ධභාවයට නිමිත්තවූ ව්‍යාපාදනීවරණහු අශොධිතබවකීහු) ආරම්භධාතු මනසිකාරාදිවසෙන, ආරම්භධාතු මෙනෙහිකිරීම් ආදී විසින් (ආදිග්‍රහණීන් වීය්‍ය සම්බොධ්‍යඞ්ගයට නිමිත්තවූ ආලොක සංඥ ආදීන්ගේ සඞ්ග්‍රහය දතයුතු) ථිනමිද්ධං න සුට්ඨු පටිවිනොදෙත්වා, ථිනමිද්ධය මනාකොට බහා නොතබා; සමථනිමිත්ත මන සිකාරාදිවසෙන, සමථනිමිත්ත මෙනෙහිකිරීම් ආදීවිසින් (ආදි ග්‍රහණීන් සමාධි සම්බොධ්‍යඞ්ග ස්ථානීය දමුන්ගේ සඞ්ග්‍රහය දතයුතු) උද්ධච්චකුක්කුච්චං, උද්දහස් කුකුස්දෙක; න සුසමූහතං කත්වා, මනාකොට නොනසා; අඤ්ඤෙපි සමාධිපරිපන්ථෙ ධම්මෙ, සෙසු විචිකිත්සාස්ථානීය මදනිමමද නාදිවූ සමාධි පරිපන්ථ ධර්මයන්; න සුට්ඨු විසොධෙත්වා, මනාකොට පරිශුද්ධ නොකොට; ඣානං සමාපජ්ජති, ධ්‍යානයට සමවදීද; සො, හෙතෙම; අසොධිතං ආසයං පවිට්ඨභමරොවිය, අශොධිතවූ ආසයටවන් බමරකුමෙන්; අසුද්ධ උය්‍යානං පවිට්ඨරාජා විය ච, අශුද්ධ උයනටවන් රජහුමෙන්ද; ඛිප්පමෙව නික්ඛමති, වහාම නික්මේ (ධ්‍යානින් නැඟේ) යො පන, යමෙක් වනාහි; සමාධිපරිපන්ථෙ ධම්මෙ, සමාධියට පරිපන්ථවූ නීවරණ ධර්මයන්; සුට්ඨු විසොධෙත්වා, මනාකොට පිරිසුදුකොට; ඣානං සමාපජ්ජති, ධ්‍යානයට සමවදීද; සො, හෙතෙම; සුවිසොධිතං ආසයං පවිට්ඨ භමරොවිය,

මනාකොට ම පිරිසුදුකළ ආසයටවන් බමරකුමෙන්ද; සු පරිසුද්ධං උය්‍යානං පවිට්ඨරජා විය, ඉතා පිරිසුදු උයනට වන් රජකුමෙන්ද; සකලම්පි දිවස භාගං, සියලු දිවසභාගය; අනෙනා සමාපත්තියං යෙව හොයි, ඇතුළු සමවන්හිම වෙයි; තෙනාහු පොරාණා, එහෙයින් කිහු පුරාතනයෝ—

කාමෙසු ඡන්දං, කාමඡන්දයද; පටිඝං, ව්‍යාපාදයද; විනොදයෙ, දුරු කරන්නේයි ("උද්ධච්චමිද්ධං" යනු යෙහි තදෙකසත්ථබැවින් උද්ධච්චගහණින් කුක්කුච්චයද මිද්ධගහණින් ථීනයද ගන්නා ලැබෙයි දන්නේ) උද්ධච්ච කුක්කුච්ච දෙකද; ථීනමිද්ධ දෙකද ("විචිකිච්ඡා පඤ්චමං"යි කීතැනි) පස්වෙනුව විචිකිත්සාවද; විනොදයෙ, දුරුකරන්නේය; විවෙකපාමුජ්ජකාරෙන, විවෙකජවූ ප්‍රීතිය උපදවන; චෙතසා, සිතින්; තහිං, ඒ අර්පණා ඣානන්හි; සුද්ධන්තගතො රජාව, පිරිසුදුවූ කොණ පසඝීනාත ඇති උයනට වන් රජකුමෙන්; රමෙ, ඇලෙන්නේයි—

( භා ‡ )

මෙසේ යටකීය විහාරය පවත්නා ආකාරය ඉගෙණිමෙනුදු නැවත ඒ ආකාරයෙන් සපයන මේ යොගාවචරයාහට අර්පණාමාත්‍රයක්ම සිද්ධවන්නේය එතකුදුවුවන් ඒ අර්පණාව චිරස්ථායි නොවන්නේය ඒ අර්පණාව චිරස්ථායි කොට පිහිටුවාගැනීම සමාධියට සතුරුවූ නීවරණ ධර්මයන්ගෙන් මනාකොට සිත පිරිසිදුකළබැවින්ම වන්නේයි. ඒ එසේමැයි. යම් හිසි යොගාවචරයෙක් මේ පඤ්චකාමයෝනම් අල්පාස්වාද ඇත්තාහ බොහෝ දුක් ඇත්තාහයි යනාදීන් කාමයෙහි අශුභ පස්විකිමහා දශ අශුභයන් මෙනෙහිකිරීමද නම්සැපයෙන් නික්මයාමයයි කියනලද නෛෂ්ක්‍රම්‍යයෙහි අනුසස් පස්සීමද කොට කාමතෘෂ්ණාව මනාකොට බැහැරනොකෙළෙහෝ වැද නාදි සන්තාපය සන්තාන නාමකායය නොපුරුකොට කම්පාකරණ ආදියෙන් කායදුට්ඨුල්ලයයි කියනලද ව්‍යාපාදනීවරණය කායපස්සද්ධි චෛතසික ධර්මයාගේ වශයෙන් මනාකොට නොසංසිඳුවාහෝ ආරම්භධාතු ආලොකසංඥාවන් මෙනෙහිකිරීමෙන් ථීනමිද්ධ නීවරණය මනාකොට දුරුනොකොටහෝ සමථනිමිත්තාදීන් මෙනෙහිකිරීමෙන් උද්ධච්චකුක්කුච්ච නීවරණය මනාකොට නොනසාහෝ අනිකුදු සමාධියට සතුරුවූ විචිකිත්සා මද නිම්මදනාදී කෙලෙසුන් මොනවට පිරිසිදු නොකරහෝ ධ්‍යානයට සමවදීද ඒ ධ්‍යාන ලාභියා නොපිරිසිදු බිලයකට වන් බමරෙකුමෙන්ද නොපිරිසිදු උයනකට වන් රජෙකු මෙන්ද වහාම ධ්‍යානයෙන් නැඟිසිටින්නේය යම්හිසි යොගාවචරයෙක් සමාධියට සතුරුවූ යථොක්ත නීවරණාදි ධර්මයන් මොනවට පිරිසිදුකොට ධ්‍යානයට සමවදීද ඒ ධ්‍යානලාභීහු පිරිසිදුකරනලද බිලයකට වන් බමරෙකුමෙන්ද පිරිසිදු උයනකට වන් රජෙකු මෙන්ද දවස මුළුල්ලෙම සමාපත්තිය ඇතුලෙහිම ඉක්මවන්නේයි. එහෙයින් කීහ පුරාතනයෝ-කාමච්ඡන්ද සඞ්ඛ්‍යාතවූ කාමතෘෂ්ණාය ව්‍යාපාදය උද්ධච්චකුක්කුච්චය ථීනමිද්ධය විචිකිච්ඡාය යන පඤ්චනීවරණ ධර්මයන් දුරුකොට වස්තුකාම කෙලසකාමයන්ගෙන් වෙන්වීමෙන් වන ප්‍රීතිය උපදවන සිතින් ඒ අර්පණා ධ්‍යානයෙහි පිරිසිදුවූ කොණ් ඇති උයනකට වන් රජෙකුමෙන් සිත් අලවා දවස මුළුලෙම වාසයකරන්නේයි—

( පා ¶ )

තස්මා චිරට්ඨිතිකාමෙන පාරිපන්ථික ධම්මෙ සොධෙත්වා ඣානං සමාපජ්ජිතබ්බං චිත්තභාවනා වෙපුල්ලත්ථඤ්ච යථාලද්ධං පටිභාග නිමිත්තං වඩ්ඪෙතබ්බං තස්ස ද්වෙ වඩ්ඪනා භූමියො උපචාරං වා අප්පණං වා, උපචාරං පත්වාපි හි තං වඩ්ඪෙතුං වට්ටති අප්පණං පත්වාපි එකස්මිං පන ඨානෙ අවස්සං වඩ්ඪෙතබ්බං … තෙන වුත්තං යථාලද්ධං පටිභාග නිමිත්තං වඩ්ඪෙතබ්බන්ති … තත්‍රායං වඩ්ඪනානයො තෙන යොගිනා තං නිමිත්තං පත්තවඩ්ඪන පූවවඩ්ඪන භත්තවඩ්ඪන ලතාවඩ්ඪන දුස්සවඩ්ඪනයොගෙන අවඩ්ඪෙත්වා යථා නාම කස්සකො කසිතබ්බට්ඨානං නඞ්ගලෙන පරිච්ඡින්දිත්වා පරිච්ඡෙදබ්භන්තරෙ කසති යථා වා පන භික්ඛූ සීමං බන්ධන්තා පඨමං නිමිත්තානි සල්ලක්ඛෙත්වා පච්ඡා බන්ධන්ති එවමෙව තස්ස යථාලද්ධස්ස නිමිත්තස්ස අනුක්කමෙන එකඞ්ගුල ද්වඞ්ගුල තිවඞ්ගුල චතුරඞ්ගුල මත්තං මනසා පරිච්ඡින්දිත්වා පරිච්ඡින්දිත්වා යථාපරිච්ඡින්නං පරිච්ඡෙදං වඩ්ඪෙතබ්බං අපරිච්ඡින්දිත්වා පන න වඩ්ඪෙතබ්බං තතො විදත්ථි රතන පමුඛ පරිවෙණ විහාර සීමානං ගාම නිගම ජනපද රජ්ජ සමුද්දසීමානඤ්ච පරිච්ඡෙදවසෙන වඩ්ඪයන්තෙන චක්කවාළ පරිච්ඡෙදෙන වා තතො වාපි උත්තරිං පරිච්ඡින්දිත්වා වඩ්ඪෙතබ්බං යථා හි හංසපොතකා පක්ඛානං උට්ඨිතකාලතො පට්ඨාය පරිත්තං පරිත්තං පදෙසං උප්පතන්තා පරිචයං කත්වා අනුක්කමෙන චන්දිමසුරිය සන්තිකං ගච්ඡන්ති එවමෙව භික්ඛු වුත්තනයෙන නිමිත්තං පරිච්ඡින්දිත්වා වඩ්ඪෙන්තො යාව චක්කවාළ පරිච්ඡෙද තතො වා උත්තරිං වඩ්ඪෙති අථස්ස තං නිමිත්තං වඩ්ඪිත වඩ්ඪිතට්ඨානෙ පථවියා උක්කූලවික්කූල නදී විදුග්ග පබ්බත විසමෙසු සඞ්කුසතසමබ්භාහතං වසභචම්මං විය හොති තස්මිං පන නිමිත්තෙ පත්තපඨමජ්ඣානෙන ආදිකම්මිකෙන සමාපජ්ජනබහුලෙන භවිතබ්බං න පච්චවෙක්ඛණ බහුලෙන පච්චවෙක්ඛණ බහුලස්ස හි ඣානඞ්ගානි ථූලානි දුබ්බලානි හුත්වා උපට්ඨහන්ති අථස්ස තානි එවං උපට්ඨිතත්තා උපරි උස්සුක්කනාය පච්චයතං ආපජ්ජන්ති සො අප්පගුණෙ ඣානෙ උස්සුක්කමානො පඨමජ්ඣානා ච පරිහායති න ච සක්කොති දුතියං පාපුණිතුං තෙනාහ භගවා …

( ස ¶ )

තස්මා, එහෙයින්; චිරට්ඨිතිකාමෙන, චිරස්ථිති කැමැත්තහු විසින්; පාරිපන්ථික ධම්මෙ සොධෙත්වා, පරිපන්ථදමුන් සෝද; ඣානං සමාපජ්ජිතබ්බං, ධ්‍යාන් සමවැද්දයුතු; චිත්තභාවනා වෙපුල්ලත්ථඤ්ච, සමාධි භාවනාවගේ විපුලබව පිණිසද (අභිඥාදීන් විසින් මහත් බව පිණිසද යන අර්ථයි) යථාලද්ධං පටිභාග නිමිත්තං (ඛුද්දමහත් විසින් හෝ උපචාර භූමි අර්පණාභූමි විසින් හෝ) ලද යම් පිළිබා නිමිත්තක්; වඩ්ඪෙතබ්බං, වැඩියයුතු; තස්ස, ඒ පිළිබා නිමිත්හුගේ; වඩ්ඪනා භූමියො, වඩනා භූමිහු; ද්වෙ, දෙදෙනෙකී; උපචාරං වා, උපචාරහෝය; අප්පණා වා, අර්පණාව හෝයි (මෙසේ භූමි දෙදෙනෙකි) උපචාරං පත්වාපිහි, උපචාරයට පැමිණද; තං, එය; වඩ්ඪෙතුං වට්ටති, වඩන්නට වේ; අප්පණං පත්වාපි අර්පණාවට පැමිණද වේ; එකස්මිං පන ඨානෙ, එක් තැනෙක වනාහි; අවස්සං වඩ්ඪෙතබ්බං, අවශ්‍යයෙන් වැඩියයුතු … පෙ … ["තත්‍රායං වඩ්ඪනානයො" යනුයෙහි "තත්‍ර"

යනු "තස්ස"යි නත්තේ] ඒ පිළිබා නිමිත්තුගේ මේ වඩන ක්‍රමයයි; තෙන යොගිනා, ඒ යොගීහි විසින්; තං නිමිත්තං, ඒ නිමිත්ත; පත්තවඩ්ඪන යොගෙන (පා උකහන කුඹල්හු පළමු නොපිරිසිඳ) මතුමත්තට පා වඩන යුක්තියෙන් (සෙසු පදෙහි වෙනවෙන යොගශබ්දය යෙදියයුතුයි) පූවවඩ්ඪන (මැද සිට සිසාරා) පූවඩන සෙයින්; භත්තවඩ්ඪන (බත් මත්තෙහි බත්ලා) බත් වඩනුවහු සෙයින්; ලතාවඩ්ඪන (කෙලවරකින් දික්ව) ලිය වැඩෙන සෙයින්; දුස්සවඩ්ඪන යොගෙන (උපන් පිළි ගෙත්කොට එහුබුනඩහයා) දික්වඩන්නාක් සෙයින්; අවඩ්ඪෙත්වා, නොවඩා; යථානාම, යම්සේ; කස්සකො, සහන ගොවි තෙමේ; කසිතබ්බට්ඨානං, සී සෑයුතු තැන; නඞ්ගලෙන පරිච්ඡින්දිත්වා, නගුලෙන් පිරිසිඳ (අතුරු අවුලුවා) පරිච්ඡෙදබ්භන්තරෙ කසති, පරිච්ඡෙදය ඇතුළත සෙහෙයේද; යථාච, යම්සේ; සීමං බන්ධන්තා භික්ඛූ, සීම් බඳනා මහණහු; පඨමං, පළමුකොට; නිමිත්තානි සල්ලක්ඛෙත්වා, නිමිත් සලකා; පච්ඡා බන්ධන්ති, පසුව බඳිද්ද; එවං, එසේම; එතම්පි යථාලද්ධ නිමිත්තස්ස, මේද යත ලද නිමිත්තුගේ; අනුක්කමෙන, පිළිවෙළින්; එකඞ්ගුලං, එකඟුලක්; ද්වඞ්ගුලං, දෙඅඟුලක්; තිවඞ්ගුලං, තුණඟුලක්; චතුරඞ්ගුල මත්තං, සතරඟුලක් පමණ; මනසා, සිතින්; පරිච්ඡින්දිත්වා පරිච්ඡින්දිත්වා, පිරිසිඳ පිරිසිඳ; යථාපරිච්ඡෙදං, පරිච්ඡෙද පමණින්; වඩ්ඪෙතබ්බං, වැඩියයුතු; අපරිච්ඡින්දිත්වා පන න වඩ්ඪෙතබ්බං (නොපිරිසිඳ වඩවනු හව නොවඩනා බැවින්) නොපිරිසිඳ නොවැඩියයුතු; තතො, ඉක්බිත්තෙන්; විදත්ථි, වියතෙක; රතන, රියනෙක; පමුඛ, නිසවත්ත; පරිවෙණ, පිරිවෙණ; විහාරසීමානං, විහාරසීමා යන මොවුත්තෙද; ගාම, ගම්ය; නිගම, නියම්ගම්ය; ජනපද, දනව්වය; රජ්ජ, රජය; සමුද්දසීමානංවා, සමුද්‍ර සීමාය යන මොවුත්තෙද; පරිච්ඡෙදවසෙන, පරිච්ඡෙද වශයෙන්; වඩ්ඪෙන්තෙන, වඩන්නහු විසින්; චක්කවාළ පරිච්ඡෙදෙනවා, සක්වළ පරිච්ඡෙදයෙන් හෝ; තතොවාපි උත්තරිං, එයින් මත්තෙහිද; පරිච්ඡින්දිත්වා, පිරිසිඳ; වඩ්ඪෙතබ්බං, වැඩියයුතු; යථාහි, යම්සේ; හංසපොතකා, ජවන හංසපොතකයෝ; පක්ඛානං උට්ඨිතකාලතො පට්ඨාය, පියාපත් නැඟි තැන් පටන්ගෙණ; පරිත්තං පරිත්තං පදෙසං උප්පතන්තා, මඳ මඳ පෙදෙසක් නැඟෙන්නාහු; පරිචයං කත්වා, පරිචයකොට; අනුක්කමෙන, ක්‍රමයෙන්; චන්දිමසුරිය සන්තිකං ගච්ඡන්ති, හිරසඳ සමීපයට යෙත්; එවමෙව, එපරිද්දෙන්ම; භික්ඛු, මහණ තෙමේ; වුත්තනයෙන කීතියෙන්; නිමිත්තං, නිමිත්ත; පරිච්ඡින්දිත්වා, වඩ්ඪෙන්තො, පිරිසිඳ වඩන්නේ; යාව චක්කවාළ පරිච්ඡෙදා, සක්වළ පරිච්ඡෙදය දක්වා; තතො වා උත්තරිං, එයින් වැඩියක්ද; වඩ්ඪෙති, වඩන්නේය; අථ, ඉක්බිත්තෙන්; අස්ස, ඒ යොගී හට; තං නිමිත්තං, ඒ නිමිත්; වඩ්ඪිත වඩ්ඪිතට්ඨානෙ, වැඩූවැඩූතැන; පථවියං, පොළව; උක්කූලවිකූලනදීවිදුග්ගගිරිතවිසමෙසු, ගොඩය වළය නදීවිෂමෙය පමිත විෂමය යනමෙහි; සඞ්කුසතසමබ්භාහතං, සඞ්කුසතයෙන් ගසා පගරණලද; වසභචම්මං විය, වෘෂභ චර්මයක්මෙන්; හොති, වන්නේය; තස්මිං පන නිමිත්තෙ, ඒ නිමිත්හි වනාහි; පත්තපඨමජ්ඣානෙන, පැමිණි ප්‍රථම ධ්‍යාන ඇති; ආදිකම්මිකෙන, ආදි කර්මිකයා විසින්; සමාපජ්ජන බහුලෙන භවිතබ්බං, සමවැදුම් බහුලවිය

සුතුය; හා පච්චවෙක්ඛණ බහුලෙන, පස්විකුම් බහුලනොවියයුතු; පච්චවෙක්ඛණ බහුලස්ස හි, පස්විකුම් බහුලයා හට; ඣානඞ්ගානි, ධ්‍යානාඞ්ගයෝ; ථූලානි හුත්වා (ප්‍රත්‍යවෙක්‍ෂා බලයෙන් විභූතවන බැවින්) ඖදාරිකව; දුබ්බලානි (ප්‍රගුණ බලව භාවයට නොපැමිණි හෙයින්) දුර්වලව; උපට්ඨහන්ති, වැටහෙත්; අථ, ඉක්බිත්තෙන්; අස්ස, ඒ යොගීහට; තානි, ඒ ධ්‍යානාඞ්ගයෝ; එවං උපට්ඨිතත්තා, මෙසේ ඖදාරිකව දුර්වලව වැටහුනු බැවින්; උපරි උස්සුක්කනාය (මතුයෙහි දුටු බැවින්) මතුයෙහි බවුනාව නැගෙන්නට [දෙවන ධ්‍යාන උපදවනුවට) පච්චයතාං ආපජ්ජන්ති, ප්‍රත්‍යය බවට පැමිණෙති; සො, ඒ යොගී තෙමේ; අප්පගුණෙණ ඣානෙන, ලද ධ්‍යාන් නොපුහුණු කල්හි; උස්සුක්කමානො, උත්සාහ කරණුයේ; පඨමජ්ඣානාව පරිහායති, ප්‍රථමධ්‍යානින්ද පිරිහෙයි; න ච සක්කොති දුතියං පාපුණිතුං, විතීය ධ්‍යානයට පැමිණෙන්නට ද නොපොහොසත්වේ; භගවා, භාග්‍යවත් තෙමේ; තෙනාහ, එහෙයින් කීහ—

( ගා ¶ )

එහෙයින් ධ්‍යානය බොහෝකල් පවත්වනු කැමති යොගාවචර මහණ විසින් පඤ්චනීවරණාදි ධ්‍යානයට සතුරු ධර්මයන් පිරිසිදුකොට ධ්‍යානයට සම්වැද්ද යුත්තේයි එපරිද්දෙන් නම් සම්භාර භාවනාව අභිඥා වශයෙන් මහත් බව ප්‍රණීත කුදුහෙන් වශයෙන් හෝ උපචාරභූමි අර්පණාභූමි වශයෙන් හෝ ලද්දාවූ යම ප්‍රතිභාග නිමිත්තක් ඇත්තේවී නම් හේ වැඩියයුත්තේයි ඒ ප්‍රතිභාග නිමිත්ත වඩනා භූමියද උපචාරභූමිය අර්පණාභූමියයි දෙවැදෑරුම් වන්නේයි. ඒ එසේමැයි උපචාරයට පැමිණ හෝ අර්පණාවට පැමිණ හෝ ඒ ප්‍රතිභාග නිමිත්ත වැඩියයුත්තේය එහෙදුවූවත් භාවනාගේ විතානුකූලවූ පරිද්දෙන් උපචාරයෙහි හෝ අර්පණාවෙහි හෝ එක්තැනෙක අවශ්‍යයෙන් නිරතුරු වැඩියයුත්තේයි. එහෙයින්ම අවුමායෙහි ප්‍රතිභාග නිමිත්ත ලබනලද නියායෙන් වැඩියයුතු යයි කියනලද්දේයි ඒ ප්‍රතිභාග නිමිත්ත වඩන ක්‍රමය මෙතැන් පටන් ප්‍රකාශ වන්නේයි. කෙසේද යත්? ඒ ධ්‍යානලාභී යොගාවචරයා විසින් යම්සේ දැවි බඳුන තනනානාවූ කුසල්නු පලමුව භාජනයාගේ යටභාගය කුඹල්සංකෙන් වෙන්නොකොට මතුමත්තට භාජනය වඩාද ප්‍රසිද්ධවන්නානු ෂැදසිව සිසාරා පූපසාද බත් දසිනානා නු බත් මනොනානි බත්ලා බත් වඩාද ලිපවැල වැඩෙන්නාහු වැල කොළවර පවන් ලියාලා වැඩෙද විසානුය වඩන් නාහු අවින් එහුඩු විසානුය තෙන්තො ට ඇඳීමෙන් දිත්කොට වඩාද එපරිද් දෙන් නොවඩා යම්සේ සිසානා ශො විහු සිසැයුතු තැන් පළමුකොට නාගු ලෙන් ශී අතුරු අවුලුවා ඒ ශි අතුරු අතර සාන්තවේද යම්සේ සීමාබන්ධන යකරණ නිසසුහු පළමුකොට අටදිය නිමිති සලකුණුකොට ඒ නිමිති අතර තුරම සීමාබන්ධනය කෙරෙද්ද එපරිද් දෙන්ම ලබනලද නිමිත්ත පිළිවෙළින් එක්අඟුලක් දෙඅඟුලක් තුණඟුලක් සතරඟුලක් පමණ හෝ දුන් වැඩුවහෝ මෙතෙක් පැත් සඳ ... ඒ වඩනා ප්‍රදෙශය පලමුකොට සිටත් වෙන්කො ටගෙණ ඒ වෙන්කල පමණින්ම වැ ඩියයුත්තේය එසේ වෙන්නොකොට වඩින්නා හට නිමිත්ත නොවඩනා වැ විත් වෙත් ශනාකොට නොවැඩිය යු ත්තේමැයි ඉක්බිත්තෙන් වියසනා රියනොක ගෙණිද්ලය පිරිවෙණය වියා ර සිහාන යනා නොපුදද හට කියමහ

දහාවී රාජ්‍ය සමුද්‍ර සීමා යන මොවුන්ද සිහින් වෙන්කිරීම් වශයෙන් වඩන්නහු විසින් මුලු සක්වළ හෝ එයින් මන්තෙකි හෝ පිරිසිඳසිඳ වැඩියයුතු වන්නේයි යම්සේ ජවන හංසපොතකයෝ පියාපත් නැඟී දවස් පටන් මද මද තැන් පියාහඹා පුරුදුකොට ක්‍රමයෙන් හිරුසඳු ලඟට පවා යෙද්ද එපරිද්දෙන්ම යොගාවචර මහණ කී නියායෙන් වෙන්වෙන්කොට නිමිත්ත වඩනනාහු සක්වල කෙළවර දක්වා හෝ ඉන් වැඩියක් හෝ වඩන්නේයි. ඉක්බිත්තෙන් ඒ යොගාවචරයා හට ඒ නිමිත්ත වැඩූ වැඩූ තන්හි පෘථිවියෙහි ගොඩය වල්ය ගඞ්ගාය පර්වතය යන සියළු සම විෂමස්ථාන හාත්පසින් හයා ඇද හුල් සියයක් ගසනලද වෘෂභචර්මයක්මෙන් සමව වැටහෙන්නේය ඒ වැඩූ නිමිත්ත අරමුණුකොට ගෙණ ප්‍රථමධ්‍යානයට පැමිණි ආදිකර්මිකයා විසින් ධ්‍යානාඞ්ග ප්‍රත්‍යවෙක්ෂාව බහුල නොකොට ධ්‍යානයට සමවැදීමම බහුලකොට විසියයුත්තේයි ඒ එසේමැයි ධ්‍යානාඞ්ග ප්‍රත්‍යවෙක්ෂාව බහුලකොට වසන මහණහට ඒ ධ්‍යානසම්ප්‍රයුක්තවූ විතර්ක විචාරාදි ධ්‍යානාඞ්ගයෝ ප්‍රත්‍යවෙක්ෂා බලයෙන් ප්‍රකටවන බැවින් ඖදාරිකව දුර්වලව වැටහෙන්නාහුය ඉක්බිත්තෙන් ඒ යොගාවචරයා හට ඒ ධ්‍යානාඞ්ගයෝ මෙසේ ඖදාරිකහ දුර්වලහයි වැටහුනු බැවින් හා දෙස් දුටු බැවින්ද මත්තෙහි ද්විතීයධ්‍යානය ඉපදවීමට කාරණා බවට පැමිණෙන්නේය ඒ යොගාවචරයා විසින් ලබනලද ධ්‍යානය නොපුහුණුවම මතු ධ්‍යානයෙහි උත්සාහ කරන්නේවීනම් හෙතෙම ඒ ප්‍රථම ධ්‍යානයෙනුදු පිරිහෙන්නේය මත්තෙහි ද්විතීයධ්‍යානයට පැමිණෙනනවද නොහැක්කේමය එහෙයින් ( දලහ බිදුනු

( පා )

සෙය්‍යථාපි භික්ඛවෙ ගාවීපබ්බතෙය්‍යා බාලා අව්‍යත්තා අඛෙත්තඤ්ඤූ අකුසලා විසමෙ පබ්බතෙ චරිතුං තස්සා එවමස්ස යන්නූනාහං අගත පුබ්බඤ්චෙව දිසං ගච්ඡෙය්‍යං අඛාදිත පුබ්බානි චෙව තිණානි ඛාදෙය්‍යං අපීත පුබ්බානිච පානීයානිපි පිවෙය්‍යන්ති සා පුරිමං පාදං න සුප්පතිට්ඨිතං පතිට්ඨාපෙත්වා පච්ඡිමං පාදං උද්ධරෙය්‍ය සා න චෙව අගතපුබ්බං දිසං ගච්ඡෙය්‍ය න ච අඛාදිත පුබ්බානි තිණානි ඛාදෙය්‍ය න ච අපීත පුබ්බානි පානීයානි පිවෙය්‍ය යස්මිඤ්චස්සා පදෙසෙ ඨිතාය එවමස්ස යන්නූනාහං අගතපුබ්බඤ්චෙව ...පෙ... පිවෙය්‍යන්ති තඤ්ච පදෙසං න සොත්ථිනා පච්චාගච්ඡෙය්‍ය තං කිස්ස හෙතු තථාහි සා භික්ඛවෙ ගාවීපබ්බතෙය්‍යා බාලා අව්‍යත්තා අඛෙත්තඤ්ඤූ අකුසලා විසමෙ පබ්බතෙ චරිතුං එවමෙවඛො භික්ඛවෙ ඉධෙකච්චො භික්ඛු බාලො අව්‍යත්තො අඛෙත්තඤ්ඤූ අකුසලො විවිච්චෙව කාමෙහි ...පෙ... පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරිතුං සො තං නිමිත්තං නාසෙවති න භාවෙති න බහුලීකරොති න ස්වාධිට්ඨිතං අධිට්ඨාති තස්ස එවං හොති යන්නූනාහං විතක්ක විචාරානං වූපසමා ...පෙ... දුතියජ්ඣානං උපසම්පජ්ජ විහරෙය්‍යන්ති සො න සක්කොති විතක්කවිචාරානං වූපසමා දුතියජ්ඣානං උපසම්පජ්ජ විහරිතුං තස්ස එවං හොති යන්නූනාහං විවිච්චෙව කාමෙහි ...පෙ... පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරිතුං අයං වුච්චති භික්ඛවෙ භික්ඛු උභතොභට්ඨො උභතො පරිහීනො සෙය්‍යථාපි සා ගාවී පබ්බතෙය්‍යා බාලා අව්‍යත්තා අඛෙ

ත්තඤ්ඤු අකුසලා විසමෙ පබ්බතෙ චරිතුනානි—

( ස * )

භික්ඛවෙ, මහණෙනි; සෙය්‍යථාපි, යම්සේ; පබ්බතෙය්‍යා, පියැවි පර්වතයෙහි බොහෝසේ හැසිරෙන; බාලා, බාලවූ; අව්‍යත්තා, ව්‍යක්තනොවූ; අඛෙත්තඤ්ඤු, ගොචරභූමි නොහඳුනන; විසමෙ පබ්බතෙ චරිතුං, විෂම පර්වතයෙහි හැසිරෙන්නට; අකුසලා, අදක්‍ෂවූ; ගාවී (යම්) දෙනක් ඇද්ද; තස්සා, ඒ දෙනට; එවමස්ස, මෙබඳුවූ සිතෙක් වන්නේයි; අහං, මම; අගතපුබ්බඤ්චෙව දිසං ගච්ඡෙය්‍යං, නොගියවිරූ දිගකට ගියෙම් නම්; අඛාදිතපුබ්බානි චෙව තිණානි ඛාදෙය්‍යං, නොකෑවිරූ තණ කෑම්නම්; අපීතපුබ්බානිච පානීයානි පිවෙය්‍යං, නොපූවිරූ පැන් බුන්නම්; යන්නූන ඉති, යෙහෙකැයි; සා, ඒ දෙන් තොමෝ; පුරිමං පදං, පෙරපය; න සුප්පතිට්ඨිතං පතිට්ඨපෙත්වා, සුප්‍රතිෂ්ඨිතකොට නොපිහිටුවා; පච්ඡිමං පාදං උද්ධරෙය්‍ය, පශ්චිම පාදය නගන්නීනම්, සා, ගෝ තොමෝ—පෙ—යස්මිඤ්චව පදෙසෙ ඨිතාය, යම් ප්‍රදෙශයක සිටියාවූ; අස්සා, ඒ දෙනට; එවමස්ස, මෙසේවූ සිතෙක් වේනම්—පෙ—තඤ්ච පදෙසං, ඒ ප්‍රදෙශයටද; සොත්ථිනා න පච්චාගච්ඡෙය්‍ය, සුවසෙන් නැවත නොඑන්නේයි —පෙ— එකමෙවං භික්ඛු, එක්ම මහණෙක්; බාලො (සමාධිපරිපන්ථයන්ගේ විශොධනය නොදන්නෙන්) බාලවූයේ; අව්‍යත්තො (ධ්‍යානයාගේ ප්‍රගුණභාවාපාදනයෙහි ව්‍යක්ත බවක් නැති හෙයින්) අව්‍යක්තවූයේ; අඛෙත්තඤ්ඤු (මතුයෙහි ධ්‍යානයට පිහිටවන බව නොදන්නෙන්) ක්‍ෂෙත්‍රඥ නොවූයේ; අකුසලො (සමාපත්ති කෞශල්‍ය නැති බැවින්) අකුසලවූයේ; සො, ඔහුතෙමේ; තං නිමිත්තං, ඒ සමාධි නිමිත්තය; නාසෙවති, සේවනය නොකරේ; න භාවෙති, නොවඩා; න බහුලීකරොති, බහුල නොකෙරේ; න ස්වාධිට්ඨිතං අධිට්ඨාති, මනාව සිටියාකොට නොසිටුවාද; තස්ස, ඔහට; එවං හොති, මෙසේවූ සිතෙක්වේ—පෙ—

( භා * )

මහණෙනි යම්සේ ස්වභාව පර්වතයෙහි බොහෝසේ හැසිරෙන අඥාන අව්‍යක්තවූ ගොදුරු බිම් නොහඳුනන්නාවූ විෂම පර්වතයෙහි හැසිරීමෙහි අදක්‍ෂවූ යම් ගවදෙනකුට මම නොගිය විරූ දිගකට ගියේම්නම් මැනව නොකෑවිරූ තණ කෑයේම්නම් මැනව. නොපූ විරූ පැන් පූයේම්නම් මැනවයි මෙබඳු සිතක් පහළවන්නේය ඉක්බිති ඒ ගවදෙන පළමු වනපය මනාකොට නොපිහිටුවා දෙවන පය උගුළුවාහම් ඒ අඥාන ගවදෙන නොගිය විරූ දිගටද නොයාහැකි වන්නේය නොකෑ විරූ තණ කන්නටද නොලබන්නේය යම් ස්වභාව පර්වත ප්‍රදෙශයෙක සිටියාවූ ඒ ගව දෙනට නොගිය විරූ ප්‍රදෙශයකට ගියේම්නම් මැනව නොකෑවිරූ තණ කෑයේම් නම් මැනව නොපූවිරූ පැන් පූයේම් නම් මැනවැයි යන සිත පහළවීනම් ඒ ප්‍රදෙශයටද සුවසේ නොඑනහැකි වන්නේය ඊට හෙතු කවරේදයත්? මහණෙනි ස්වභාව පර්වතවාසීවූ අඥාන අව්‍යක්තවූ ගොදුරුබිම් නොහඳුනන ඒ ගවදෙන විෂම පර්වතයෙහි හැසිරෙන්නට අදක්‍ෂ වන්නීය ඒ හෙතුවෙන් ඈ අනයව්‍යසනයට පැමිණෙන්නීය එපරිද්දෙන්ම මහණෙනි මේ සස්නෙහි සමාධියට සතුරු ධර්මයන් පිරිසිඳගිරීම නොදත් බැවින් අඥානවූ ධ්‍යාන පුහු

ණුකිරීමෙහි ව්‍යක්ත නුවූ බැවින් අව්‍යක්තවූ ඉක්මෙනනි ධ්‍යානයට පිහිටවන බව නොදත් බැවින් ක්ෂෙත්‍ර නොදත්තාවූ සර්වප්‍රකාරයෙන්ම යටකීනියෙන් කාමාදීන් වෙන්ව ධ්‍යානසමාපත්තියට සමවැදීමෙහි අදක්ෂවූ ඇතම් මහණෙක් ධ්‍යාන උපදවා, ඒ සමාධි නිමිත්ත සෙවනය නොකෙරෙයි ඒ සමාධි නිමිත්ත නොවඩයි. ඒ සමාධි නිමිත්ත බොහෝ නොකෙරෙයි මොනවට පිහිටා සිටින පරිද්දෙන් නොපිහිටුවයි ඉක්බිත්තෙන් ඒ අදක්ෂවූ යොගාවචර මහණ හට ඉදින් විතර්කවිචාරයන් ව්‍යුපශමනය කිරීම් ආදියෙන් ද්විතීය ධ්‍යානයට එළඹ විසුයේම් නම් මැනවැයි යන සිත පහළවන්නේය එතකුදු වුවත් ඒ මහණ විතර්ක විචාරයන් ව්‍යුපශමනය කිරීමෙන් ද්විතීයධ්‍යානයට එළඹ විසීමටද නොපොහොසත් වන්නේය ඉක්බිත්තෙන් ඒ මහණ හට ඉදින් ඒ පළමු සමවත් ප්‍රථම ධ්‍යානයටම සමවැද විසුයේම් නම් මැනවයි සිත පහළවන්නේය. එතකුදු වුවත් ඒ අඥාන යොගාවචරයා ප්‍රථම ධ්‍යානයට ද නැවත සමවදින්නට නොපොහොසත් වන්නේමය මහණෙනි යම්සේ ප්‍රකෘති පර්වතවාසීවූ අඥාන අව්‍යක්ත අක්ෂෙත්‍රඥවූ ගවදෙන විෂම පර්වතයෙහි හැසිරෙන්නට අදක්ෂ වන්නීද එපරිද්දෙන්ම මේ අඥාන යොගාවචර මහණ මුලින් උපදවාගත්තාලද ප්‍රථම ධ්‍යානය දෙවනු උපදවනු කැමතිවූ ද්විතීයධ්‍යානය යන දෙකින්ම පිරිහුනාවූ යොගාවචරයයි කියනලද්දේයි–

( පා † )

තස්මා තෙන තස්මිං යෙව තාව පඨමජ්ඣානෙ පඤ්චහාකාරෙහි චිණ්ණවසිනා භවිතබ්බං තත්‍රිමා පඤ්චවසියො ආවජ්ජනාවසී සමාපජ්ජනාවසී අධිට්ඨානාවසී වුට්ඨානාවසී පච්චවෙක්ඛණාවසී පඨමජ්ඣානං යත්ථිච්ඡකං යදිච්ඡකං යාවදිච්ඡකං ආවජ්ජති ආවජ්ජනාය දන්ධායිතත්තං නත්ථීති ආවජ්ජනාවසී පඨමජ්ඣානං යත්ථිච්ඡකං –පෙ– සමාපජ්ජති සමාපජ්ජනාය දන්ධායිතත්තං නත්ථීති සමාපජ්ජනාවසී එවං සෙසාපි විත්ථාරෙතබ්බා– අයං පනෙත්ථ අත්ථප්පකාසනා පඨමජ්ඣානතො වුට්ඨාය පඨමං විතක්කං ආවජ්ජයතො භවඞ්ගං උපච්ඡින්දිත්වා උප්පන්නාවජ්ජනානන්තරං විතක්කාරම්මණානෙව චත්තාරි පඤ්ච වා ජවනානි ජවන්ති තතො ද්වෙ භවඞ්ගානි තතො පුන විචාරාරම්මණං ආවජ්ජනං වුත්තනයෙනෙව ජවනානීති එවං පඤ්චසු ඣානඞ්ගෙසු යදා නිරන්තරං චිත්තං පෙසෙතුං සක්කොති අථස්ස ආවජ්ජනාවසී සිද්ධා හොති අයං පන මත්ථකප්පත්තාවසී භගවතො යමකපාටිහාරියෙ ලබ්භති අඤ්ඤෙසං වා එවරූපෙ කාලෙ ඉතො පරං සීඝතරා ආවජ්ජනාවසී නාම නත්ථි– ආයස්මතො පන මහාමොග්ගල්ලානස්ස නන්දොපනන්දනාගරාජදමනෙ විය සීඝං සමාපජ්ජන සමත්ථතා සමාපජ්ජනවසී නාම– අච්ඡරාමත්තංවා දසච්ඡරාමත්තංවා ඛණං ඨපෙතුං සමත්ථතා අධිට්ඨානවසී නාම– තථෙව ලහුං වුට්ඨාතුං සමත්ථතා වුට්ඨානවසී නාම තදුභයදස්සනත්ථං බුද්ධරක්ඛිතත්ථෙරස්ස වත්ථුං කථෙතුං වට්ටති සො හි ආයස්මා උපසම්පදාය අට්ඨවස්සිකො හුත්වා ථෙරම්බත්ථලෙ මහාරොහණගුත්තත්ථෙරස්ස ගිලානුපට්ඨානං ආගතානං තිංසමත්තානං ඉද්ධිමන්තසහස්සානං මජ්ඣෙ නිසින්නො ථෙරස්ස යාගුං පටිග්ගාහයමානං උපට්ඨාකනාගරාජානං ගහෙස්සාමීති ආකාසතො පක්ඛන්දන්තං

සුපණ්ණරාජානං දිස්වා තාවදෙව පබ්බතං නිම්මිණිත්වා නාගරාජානං බාහාය ගහෙත්වා තත්ථ පාවිසි සුපණ්ණරාජා පබ්බතෙ පහාරං දත්වා පලායි මහාථෙරො ආහ සචෙ ආවුසො රක්ඛිතො නාභවිස්ස සබ්බෙව ගාරය්හා අස්සාමාති පච්චවෙක්ඛණාවසී පන ආවජ්ජනාවසී යාමෙව වුත්තා පච්චවෙක්ඛණ ජවනා තෙපි තත්ථ ආවජ්ජනානන්තරානීති ----

(ස †)

තස්මා, එහෙයින්; අනෙන, මේ යොගීහු විසින්; තස්මිං යෙවතාව පඨමජ්ඣානෙ, පලමුකොට ඒ ප්‍රථම ධ්‍යානයෙහි; පඤ්චහාකාරෙහි, පස්පරිද්දෙකින්; චිණ්ණවසිනා, පුරුදුකරණලද වසී ඇත්තහු විසින්; භවිතබ්බං, වියයුතු; තත්‍ර, එහි; ඉමා. මේහු; පඤ්චවසීයො, පස්වසීහුයි (පස් පොහොසත් බැවුහ පස්ඉසුරු බැවුහ යන අර්ථයි. "වසියොති ඉස්සරියප්පවත්තියො" යනු ටීකායි) ආවජ්ජනාවසී, ආවජ්ජනයෙහි වසිය; සමාපජ්ජනාවසී, සමවැදුමෙහි වසිය; අධිට්ඨානවසී, අධිෂ්ඨානයෙහි (සිටීමෙහි) වසිය; වුට්ඨානවසී, නැගීමෙහි වසිය; පච්චවෙක්ඛණාවසීති, පස්විසීමෙහි වසියයි (පස්විසීහයි යොදනු) පඨමජ්ඣානං, ප්‍රථම ධ්‍යානය; යදිච්ඡකං, යම් යම් ප්‍රදෙශයක ආවජ්ජනාකරණු කැමතිද; (ඒ ඒ ප්‍රදෙශයෙහි "ආවජ්ජති"යි යොදනු) යදිච්ඡකං, යම් යම් කාලයක යම් යම් ධ්‍යානාඞ්ගයක හෝ ආවජ්ජනාකරණු කැමතිද ඒ ඒ කල ඒ ඒ ධ්‍යානාඞ්ගයෙහි ආවජ්ජනා කෙරේ; යාවදිච්ඡකං, යම් තාක්කල් ආවජ්ජනාකරණු කැමතිද ඒතාක් කල්; ආවජ්ජති, ආවජ්ජනා කෙරේ ("යාවදිච්ඡකං" යනු බොහෝ ජවනවාරයන්ගේ නිරන්තරයෙන් ප්‍රවෘත්තිය සඳහා කියනලද එකම ජවනවාරයක් සඳහා නොවෙති දතයුතු) ආවජ්ජනාය දන්ධායිතත්තං නත්ථි, ආවජ්ජනාකිරීමෙහි ලස්බවෙක් නැත් නම්; ආවජ්ජනාවසී, ආවජ්ජනාවසිය සිද්ධනම්වේ...පෙ...සමාපජ්ජති, සමවදී; සමාපජ්ජනාය දන්ධායිතත්තං නත්ථි, සමවැදීමෙහි ලස්බවෙක් නැත් නම්; සමාපජ්ජනාවසී, සමාපජ්ජනවසිය සිද්ධනම්වේ (යන අර්ථයි) එවමපි, මෙසේද; සෙසාපි, සෙසු ("වුට්ඨාන අධිට්ඨාන පච්චවෙක්ඛණා) වසීහුද; විත්ථාරිතබ්බං, විස්තර කටයුතුනාහුයි; අයමෙත්ථ, මෙහි මේ; අත්ථපකාසනා, අර්ථයන් පහළකිරීමයි; තත්ථ, ඒ පස්විසීන් කෙරෙහි; පඨමජ්ඣානතො වුට්ඨාය, ප්‍රථම ධ්‍යානින් නැඟී; පඨමං, පළමුකොට; විතක්කං ආවජ්ජයතො, විතර්කය ආවජ්ජනාකරන්නහුට; භවඞ්ගං උපච්ඡින්දිත්වා, භවඞ්ග සිඳගෙණ; උප්පන්නාවජ්ජනානන්තරං, උපන් ආවජ්ජන් අනතුරෙහි; විතක්කාරම්මණානෙව, විතර්කයම අරමුණුකොට ඇති; චත්තාරි පඤ්ච වා ජවනානි ජවන්ති, (තික්ඛින්ද්‍රිය නාතිතික්ඛින්ද්‍රියයන්ට යථා ක්‍රමයෙන්) සතරපස් ජවන්හු දිවෙති, තතො, ඒ දෙවන සිතට ඉක්බිතිව; විචාරාරම්මණං, විචාරය අරමුණුකොට ඇති; ආවජ්ජනං, ආවජ්ජනයද; වුත්තනයෙනෙව ජවනානීති, කීනියෙන් ජවනයෝ දිවන්නාහුයි; එවං, මෙසේ; පඤ්චසු ඣානඞ්ගෙසු, පස් ධ්‍යානාඞ්ගයන් කෙරෙහි; යදා, යම් කාලෙක; නිරන්තරං, අතුරු නැතිකොට; චිත්තං පෙසෙතුං සක්කොති, සිත මෙහෙයන්නට පොහොසත්ද; අථ, එසමයෙහි; අස්ස, මේ යොගී හට; ආවජ්ජනාවසී සිද්ධා හොති, ආවජ්ජනාවසී තොමෝ සිද්ධ නම්වේ (මෙහි ආව

ජ්ජනාවසිය අභිමතවූවද ආවජ්ජනය උපන්සඳ වියයුතු ජවන්හු විපාතාහි නීහාරය ආවජ්ජනයෙහි තත්පර බැවින් අසම්පූර්ණවෙත්නුයි. "චත්තාරි පඤ්ච වා ජවනානි"යි දතයුතු. විචාරය ආවජ්ජනා කොරෙම් ප්‍රීතිය ආවජ්ජනා කෙරෙම් යන මෙන මෙන ආභොගයෙහි එකොඩි. අඞ්ගයෙහි භවාඞ්ගයෙන් නැඟී නැඟී ආවජ්ජනය උපදනේ පඤ්චඞ්ගානාඞ්ගය ආවජ්ජනා කෙරෙමි යන පළමු උප ආභොග බලයෙන්ම උපදිනියි දතයුතු) අයමපන මත්කපපනාවසී භවාඞ්ග සිත් දෙකකින් අතුරු ඇති සතර ජවන් සිතක් ඇති මේ මිඝනකප්‍රාප්තවසී නොමේ; භගවතො, භාග්‍යවත් භව; යමකපාටිහාරියෙ ලබහති, යමාමාපෙළහර ලැබේ; අඤ්ඤොඤ්ඤසංවා, සෙසු දහමෙසතෙව් ආදීන්ට හෝ; එවරූපෙකාලෙ, ආවජ්ජනාවසිය සැහැල්ලුකොට තිපානා කල්හි ලැබේ. (හෝද සවල්ප කාලිකය යමාමා පෙළහරමෙන් බොහෝ වෙලක් පවත්නී නොවේ එහෙයින්ම කීහ "සාවකෙහි අසාධාරණං"යි) ඉතො පරං, මෙයින් මතුයෙහි; සීඝතර ආවජ්ජනාවසී නාම නත්ථි, අතිශීඝ්‍ර ආවජ්ජනා වසියෙක්නම් නැති (බුදුනටද එක භවාඞ්ගයක් නොඋපදනා බැවිනි) ආයස්මතො පන මහාමොග්ගල්ලානස්ස, ආයුෂ්මත් මහමුගලනුන්ගේ; නන්දොපනන්ද නාගරාජදමනෙවිය, නන්දෝපනන්ද නාගරාජයා දමනයෙහි මෙන්; සීඝං සමාපජ්ජන සමත්ථතා, වහාම සමවදනට සමර්ථ බව; සමාපජ්ජනාවසී නාම, සමාපජ්ජනාවසී නම් (මිහි සමවදනා කැමති අනතුරෙහි භවාඞ්ග ඉද සිතුන් උපන් කල්හි භවාඞ්ගය සිඳ උපන් ආවජ්ජනා අනතුරෙහි සමවැද්දෙහෙන බව හා සම්වදනට සමර්ථ බව නම්වෙයි. මේ මුදුන්පත් සමාපජ්ජනවසී බුදුන්ට ධම්දෙශනා සමයෙහිම ලැබෙයි දත්නේ) අවජ්ජරාමත්තං වා, අසුරුගසන පමණවූ හෝ; දසවජ්ජරාවත්තංවා, දශඅසුරක් ගසන පමණ හෝ; ඛණං, සාණයක්; ඨපෙතුං සමත්ථතා, සිටුවන්නට සමර්ථ බව; අධිට්ඨානවසී නාම, අධිට්ඨානවසී නම්; තථෙව ලහුංවුට්ඨාතුං සමත්ථතා, එසේම අසුරක් දශඅසුරක් පමණ කල් ධ්‍යාන්හි සිට ලඝුව නැගෙන්නට සමර්ථ බව; වුට්ඨානවසී නාම, වුට්ඨානවසී නම්; තදුභයං දස්සනත්ථං, වුට්ඨාන අධිට්ඨාන වශ දෙක දක්වනු පිණිස; බුද්ධරක්ඛිතත්ථෙරස්ස වත්ථුං බුද්ධරක්ඛිත නම් තෙරුන්ගේ වත; කථෙතුං වට්ටති, කියන්නට වටී; සොහි ආයස්මා, ඒ ආයුෂ්මත් තෙමේ; උපසම්පදාය අට්ඨවස්සිකො හුත්වා, උපසම්පන්නයින් අටවස් ඇතිව; ථෙරම්බත්ථලෙ, තෙර අඹතෙලෙහි; මහාරොහණගුත්තත්ථෙරස්ස, මහාරොහණගුත්ත නම් තෙරුන්ට; ගිලානුපට්ඨානං ආගතානං, ගිලන් උපස්ථානයට ආගතවූ; තිංසමත්තානං ඉද්ධිමන්තසහස්සානං මජ්ඣෙ, තිස්දහසක් සෘද්ධිමතුන් මැද; නිසින්නො, උන්නේ; ථෙරස්ස, තෙරුන්ට; යාගුං පටිග්ගාහයමානං, යගු පිළිගන්වන; උපට්ඨාක නාගරාජානං, උපස්ථානකාරණ නාරජහු; ගහෙස්සාමීති, ගන්මියි; ආකාසතො පක්ඛන්දන්තං, අහසින් බස්නාවූ; සුපණ්ණරාජානං දිස්වා, ගුරුළුරජහු දැක; තාවදෙව, එකෙණෙහිම; පබ්බතං නිම්මිනිත්වා (මැද) පර්වතයක් මවා; නාගරාජානං බාහාය ගහෙත්වා, නාරජහු අත්හි ගෙණ; තත්ථ පාවිසි, ඒ පැව පර්වතයට වනි; සුපණ්ණරාජා, ගුරුළුරජ තෙමේ; පබ්බතෙ පහාරං දත්වා, පර්වතයෙහි පහරදී; පලායි, පලාගියේ; මහා ථෙරො ආහ, මහතෙර

හු මෙසේ කීවු; ආවුසො, ඇවැත්නි; සචෙ රක්ඛිතං නාගච්ඡිස්ස, ඉදින් රක්ඛිතයා (මිනී) නොඑන්නේ නම්; සබ්බෙව ගාරය්හා අස්සාමාති, මෙතෙක් සෘද්ධිමත්හු (එකලුපට්ඨායකයා ගුරුළුකෙරෙන් රැකගත නුහුණුහයි) ගර්හාවට පැමිණියම්හයි; පච්චවෙක්ඛණං වසිප්පත්තා, ප්‍රත්‍යවේක්ෂාවසී වන්නාහි; ආවජ්ජනවසියා එව වුත්තා, ආවර්ජනාවශියෙහිම කියනලදු; පච්චවෙක්ඛණජවනා එතෙව, ප්‍රත්‍යවේක්ෂාජවනයෝම; තත්ථ, ඒ ආවර්ජනවශියෙහි; ආවජ්ජනානන්තරානීති, ආවර්ජනා අනන්තරුවමින්නාහුයි (මෙහි ආවර්ජනවසියෙන්ම ප්‍රත්‍යවේක්ෂාවශිය සිද්ධවත් අධිෂ්ඨානවශියෙන්ම ව්‍යුත්ථානවශිය සිද්ධවත් ආවජ්ජනාවශියහා ප්‍රත්‍යවේක්ෂාවශියෙහිද අධිෂ්ඨානවශියහා ව්‍යුත්ථානවශියෙහිද වෙසෙස් කිමෙක්දයත්? ජවනුන්ට ධ්‍යානාඞ්ගයන් ස්ඵුටව නොවැටහෙතුදු ධ්‍යානාඞ්ගයෙහි නිරන්තරකොට ආවර්ජනය පැවැත්වියහෙන බව ආවජ්ජනාවසි නම් වෙයි ධ්‍යානාඞ්ගයන් සවභාවයිසින් ස්ඵුටව පස්විකණ්ඩකොට ජවන් පැවැත්වියහෙනබව ප්‍රත්‍යවේක්ෂාවශිතාම්වේ සත්ජවනුන් දිවතුදු නිරන්තරකොට ආවර්ජනය පැවැත්වියහෙනබැවි ආවර්ජනාවසිනම් වෙයි වශිතා බලයෙන් සත් ජවනුන් නොවැදි සතරහෝ පස්හෝ ජවන් කෙණෙකුන් ප්‍රත්‍යවේක්ෂා කටහෙනබව ප්‍රත්‍යවේක්ෂාවශිතානම් නොහොත් ඥානවිප්‍රයුක්ත චිත්තයෙන් ප්‍රත්‍යවේක්ෂා නොකොට නොහොතුදු ප්‍රත්‍යක්ෂකරමින් ආවජ්ජනවීථියට ඉක්බිති භවාඞ්ගයෙහි නොලස්ව වහා ධ්‍යානාඞ්ගයන් ආවජ්ජනාකටහෙනබව ආවජ්ජනාවශිතානාම්වෙයි වශිතා බලයෙන් ඥානවිප්‍රයුක්ත සිත්හුදු පස්විකියහෙනබව ප්‍රත්‍යවේක්ෂා වශිතානාම්වේ නමා කැමැතිතෙක්කල් සමාපත්තිය පැවතියහෙනබව අධිෂ්ඨානවශි නම් පරිච්ඡින්නකාලයනොඉක්මවා ධ්‍යාන පැවැත්වියහෙන බව අධිෂ්ඨානවසි නම් වෙයි නමා පිරිසුන්කල් නොඉක්ම පිරිසුන්කල්හිම නැගෙණබව ව්‍යුත්ථානවසිනාමි. පිළිසන්තෙහි වනාහි යම් යම් ආසිණ්ණාලම්බණයෙක ධ්‍යානසමවද්දනා නැවැත්තාහු නොලස්ව ඒ ඒ කීසුණ වහා ආවර්ජනය ඉපැදවියහෙනබවද ධ්‍යානයෙන් නැගී ධ්‍යානාඞ්ගයන් ප්‍රත්‍යවේක්ෂාකරන්නාහු භවාඞ්ගයෙහි නොලස්ව භවාඞ්ගයෙන් නැගී එහසිංදි ධ්‍යානාඞ්ගයෙහි වහා ආවර්ජනා පැවැත්වියහෙනබව ආවර්ජනාවසි නම් කිසුණෙහි එහා ආවර්ජන ඉපදවුවද උපචාරයෙහි වහා ධ්‍යානයට සමවැද්දහෙන බව සමාපජ්ජනවශී නම් අසුරුපහරණ ප්‍රමාණ මදකනෙත්හිදු ධ්‍යානයෙහි සිටිනු කැමැත්තාහු නොඋනුනොව එතෙක්කල්ම සිටියහෙන බව අධිෂ්ඨානවසිනම් පරිච්ඡින්නකාලය නොඉක්මවා නමා සම්වන් සමාපත්තියෙන් ගරව නැඟෙණබව ව්‍යුත්ථානවසි නම් ධ්‍යානාඞ්ගයන් ප්‍රත්‍යවේක්ෂාකරන්නාහුයටකීසෙසින්ම ඉපදවූ ආවර්ජනාව ඉක්බිති සැහැල්ලුනොව වහා ප්‍රත්‍යවේක්ෂාජවන් පැවැත්වියහෙන බව ප්‍රත්‍යවේක්ෂාවශිතාම්වෙසි කිනු).

( භා † )

එහෙයින් මේ යොගාවචරයා විසින් පළමුකොට එම ප්‍රථමධ්‍යානයෙහි පස්පරිද්දෙකින් පුරුදුකරණලද වසිනායෙහි කියනලද නැමතිසේ ධ්‍යානය පැවැත්විය හැකිබැවි ඇතිවියයුත්තේය. ඒ පඨවිකසිණාකාරයත්? ධ්‍යානලාභි යෝගාවචරයා හට නමාවිසින් ලබනලද ප්‍රථමධ්‍යානය ආවර්ජනාකාරණ නැමතික්ෂණයෙහි ආවර්ජනා

කළහැකි පරිද්දෙන් පුරුදුකිරීමය ඒ ධ්‍යානයට සමවදිනු කැමති ක්‍ෂණයෙහි සමවැද්දහැකි පරිද්දෙන් පුරුදුකිරීම එම ධ්‍යානය සිටුවනු කැමති ක්‍ෂණයෙහි සිටුවියහැකි පරිද්දෙන් පුරුදුකිරීමය එම ධ්‍යානයට සමවැද හිද නැඟිසිටිනු කැමති ක්‍ෂණයෙහි නැඟිසිටියහැකි පරිද්දෙන් පුරුදුකිරීමය ඒ ධ්‍යානය ප්‍රත්‍යවෙක්‍ෂාකටැටි කෙණෙහි ප්‍රත්‍යවෙක්‍ෂා කළ හැකි පරිද්දෙන් පුරුදුකිරීමය යන මේ පස්ආකාරයෙන් ධ්‍යානය පුරුදුකිරීම පඤ්චවසිතා නම් වන්නීයි.

ඒ පඤ්චවසිතාවන්ගේ විභාගය කෙසේ දයත්? ප්‍රථමධ්‍යානලාභී යෝගාවචරයා යම් යම් ප්‍රදේශයෙක හිඳ ධ්‍යානය ආවර්ජනා කරනු කැමතිවීනම් ඒ ඒ ප්‍රදේශයෙහි හිඳ ආවර්ජනාකිරීම පුරුදුකරන්නේ වේද යම් යම් කාලෙක ඒ ධ්‍යානයාගේ යම් යම් අඞ්ගයක් ආවර්ජනාකරණු කැමතිවී නම් ඒ ඒ කල ඒ ඒ ධ්‍යානාඞ්ගය ආවර්ජනාකිරීම පුරුදුකරන්නේ වේද යම්පමණකල් ඒ ධ්‍යානය ආවර්ජනා කරණු කැමැත්තේවීනම් එපමණකල් ආවර්ජනාකිරීම පුරුදුකරන්නේ වේද මෙසේ පුරුදුකරන්නාවූ යෝගාවචරයාහට කැමතිතැනෙක කැමති ධ්‍යානාඞ්ගයක් කැමතිපමණකල් ආවර්ජනාකිරීමෙහි ප්‍රමාදබවෙක්නොවේනම් ඔහට ආවර්ජනාවශිත්වයයි කියනලද කැමතිසේ ධ්‍යානය පැවැත්වියහැකිබව සිඬවූයේනම්වන්නේයි. මෙසේම කැමතිතැනෙක කැමතිධ්‍යානාඞ්ගයකට කැමතිපමණකල් සමවැදීමෙහි ප්‍රමාදබවෙක්නැත්තේවීනම් සමාපජ්ජනවශිතාවයයි කියනලද කැමතිසේ ධ්‍යානය පැවැත්වියහැකි බවද කැමතිතැනෙක කැමති ධ්‍යානාඞ්ගයෙකින් කැමතිපමණකාලෙකින් නැඟිසිටීමෙහි ප්‍රමාදබවෙක් නැත්තේවීනම් වුට්ඨානවසිතාවයයි කියනලද කැමතිසේ ධ්‍යානයපැවැත්වියහැකිබවද කැමතිතැනෙක කැමති ධ්‍යානාඞ්ගයක් කැමතිපමණකල් සිටුවීමෙහි ප්‍රමාදබවෙක් නැත්තේවීනම් අධිට්ඨානවසිතාවයයි කියනලද කැමතිසේ ධ්‍යානය පැවැත්වියහැකිබවද කැමති තැනෙක කැමති ධ්‍යානාඞ්ගයෙක් කැමතිපමණකල් ප්‍රත්‍යවෙක්‍ෂාකිරීමෙහි ප්‍රමාදබවෙක් නැත්තේවීනම් පච්චවෙක්ඛණවසිතාවයයි කියනලද කැමතිසේ ධ්‍යානය පැවැත්වියහැකිබවද සිඬවූවාහුයයි දතයුතු.

මෙයින් මතු මේ පඤ්චවසිතාවන්ගේ අර්ථ පහළකිරීම වන්නේයි. කෙසේදයත්? ධ්‍යානලාභී යෝගාවචරයා ප්‍රථමධ්‍යානයෙන් නැඟී පළමුකොට ඒධ්‍යානවිතාන සම්ප්‍රයුක්තවූ විතර්කය ආවර්ජනාකරණු කැමැත්තේවීනම් භවාඞ්ගශ්‍රොතස සිඳගෙණ උපන් මනොවාරාවර්ජන සිතට අනතුරුව ඒ තර්කයම අරමුණුකොට තියුණුවූ ශ්‍රඬාදී ඉන්ද්‍රියයන් ඇත්තාහට ජවන් සතරක්හෝ මඳවූ ශ්‍රඬාදි ඉන්ද්‍රියයන් ඇත්තාහට ජවන් පසක්ද දිවන්නාහ ඊට අනතුරුව භවාඞ්ගක්‍ෂණ දෙකක්පමණක් හෙළා එසින්මත්තෙහි විචාරය අරමුණුකොට එකම මනොවාරාවර්ජනසිතක් හා විතර්කයට කී නියායෙන් ජවන් සතරක් හෝ පසක්හෝ දිවන්නාහ මෙසේ අවශෙෂ ප්‍රීති සුඛ එකාග්‍රතා යන ධ්‍යානාඞ්ගයන් අරමුණුකොටගෙණද එක එකක් පාසා වීථිඅතරතුර භවාඞ්ගක්‍ෂණ දෙකබැගින්ද එකම මනොවාරාවර්ජනය බැගින්ද ජවන් සතර පස බැගින්ද ඉපදවීම පුරුදුකොට මෙසේ යම් කාලෙක අතුරුනැතිකොට ඒ ඒ ධ්‍යානාඞ්ගයන් අරමුණුකොට කැමති පරිද්දෙන් සිත මෙහෙයන්නට පොහොසත් වන්නේද එසේකල මේ

යෝගාවචරමහණහට ආවර්ජනාවශිත්වය සිද්ධවූයේනම් වන්නේයි

මෙසේ භවාඞ්ගසිත්දෙකකින් මත්තෙහි සතරජවන්සිතක් ඇති විතත වීචි ඉපදවීම්සඞ්ඛ්‍යාත මස්තකප්‍රාප්ත වශිත්වය භාග්‍යවතුන්වහන්සේට යමක ප්‍රාතිහාර්‍ය්‍යයෙහි ලැබෙන්නේය අවශේෂ ධර්මසේනාපති ශාරිපුත්‍රස්ථවිරාදීන්ටද සමචිත්තපටිපදා සූත්‍රදේශනාදියසඳහා ආවර්ජනාවශිත්වය සෑහෙල්ලුකොට උපදවනකල්හි ලැබෙන්නේය එතකුදුවුවත් බුද්ධවරයන්ට මෙන් ශ්‍රාවකයන්ට ඒ ආවර්ජනාවශිත්වය බොහෝ වේලා නොසිටිනේ මැයි සර්වඥවරයන්ට පවා එකභවාඞ්ගයක් අතර හැර ජවන්සිත් ඉපදීමක්හැකිබැවින් මීටවඩා ශීඝ්‍රතරවූ ආවර්ජනාවශිත්වයෙක් නැත්තේයී ආයුෂ්මත්වූ මහාමෞද්ගල්‍යායන ස්ථවිරයන්වහන්සේ නන්දෝපනන්ද නම් නාගරජයා දමනය ලීමෙහි වහ වහා තේජෝකසිණාදියට සමවත් නාක්මෙන් යම් කසිණයකට සමවදිනුකැමති සිතක් උපන්කල ඒ සිතට අනතුරුව භවාඞ්ගචිත්තක්ෂණදෙකක් ඉපිද ඊටඅනතුරුව උපදනා මනොද්වාරාවර්ජනසිතට අනතුරුව සමාපත්තිචිත්තයන් ඉපදවියහැකිබව සමාපජ්ජනවසිතානම සමාපත්තිනම් එමධ්‍යානචිත්තය නැවත නැවත ඉපදවීමවන්නේයී මෙහිදම ස්තකප්‍රාප්තවූ අනන්‍යසාධාරණ සමාපජ්ජනවශිත්වය සර්වඥයන්වහන්සේට ධර්මදේශනා සමයෙහි ලැබෙන්නේය මේසමාපජ්ජන වශිත්වය දක්වන පිණිස ශාරිපුත්‍රස්ථවිරයන්ගේ වතද කියයුත්තේයී එක්සමයෙක මහතෙරුන්වහන්සේ කොබෝකඳුරෙහි වැඩවසනසේක් එදවස්ම හිසකේ බහා රාත්‍රිභාගයෙහි සඳපානේ වැඩසිටියාහ එකල අගසින් යන්නාවූ නන්ද නම් මිථ්‍යාදෘෂ්ටි යක්ෂයෙක් මහතෙරුන්ගේ දිලියෙන හිස දැකමහත්වූ පර්වතකූටයක්පවා පලන්නට සමත්වූ මහත් පහරක් මහතෙරුන්ගේ හිස්මුදුනෙහි පහළේය මහතෙරුන්වහන්සේ සමාපජ්ජන වශිත්වයෙන් යුක්තහෙයින් යක්ෂයාගේ පහර හිසටඑන්නට මත්තෙන් ධ්‍යානයට සමවැද අභිඥාබලයෙන් පර්වතයක් මවා පෑයේය ඒ යක්ෂයාගේ පහර පර්වතයෙහි වැදගත්තේය.

ඒ සමවත් ධ්‍යානය එක් අසුරුසනක් හෝ දශ අසුරුසනක් හෝ කැමතිපමණ කල් සිටුවන්නට සමර්ථබව අධිෂ්ඨානවශී නම එපරිද්දෙන්ම එක් අසුරුසනක් හෝ දශ අසුරුසනක්හෝ යම්ධ්‍යානයෙක සිට වහා ඒ ධ්‍යානයෙන් නැගිසිටිනු හැකිබව ව්‍යුත්ථානවශිනම් වන්නේයි. ඒ අධිෂ්ඨාන ව්‍යුත්ථානවශිතාවන් දෙදෙන දක්වනපිණිස බුද්ධරක්ෂිතනම් තෙරුන්ගේ වස්තුව කියයුත්තේයි යේ කෙසේදයත්? මෙම ලක්දිව අනුරාධපුරාසන්නයෙහි මහමෙවුනා උයන මිහිඳුමාහිමියන් වැඩහුන් බැවින් තෙරඅඹතෙලයයි ව්‍යවහාරවූ ආමූස්ථලයෙහි ගිලන්ව වැඩහුන් මහාරෝහණගුප්තනම් මහතෙරුන්ට උපස්ථාන පිණිස පැමිණි තිස්දහසක් පමණ සාධුමතුන් මැද උපසම්පදාවෙන් අටවස් පිරුණාවූ ආයුෂ්මත්බුද්ධරක්ෂිත ස්ථවිරයන්වහන්සේද වැඩහුන්සේක එකල ගිලන්මහතෙරුන්වහන්සේට උපස්ථානපිණිස අවුත් සෑදපිළිගන්වමින්නුත් දිව්‍යනාගරාජයා අල්වාගණිමි සිතා වේගයෙන් අහසින්බැසඑන්නාවූ ගුරුළුරාජයා දැක එකෙණෙහි බුද්ධරක්ෂිත ස්ථවිරයන්වහන්සේ ධ්‍යානයට සමවැද අභිඥාබලයෙන් පර්වතයක්මවා නාගරජ අතගෙණ ඒ පර්වතකුක්ෂියට ඇතුල්

කොලෙල්ය නාරප් අල්වාගණිම්හි ම
හත්වේගයෙන් බැස ආ ගුරුළුරජයා
ද පළිගණයෙහි පියාපැහැර රැවටී ප
ලාගියේය මහතෙරුන්වහන්සේ ආ
වැත්නි ඉදින් බුද්ධරක්ඛිතයා අද නො
හි නොසිටියානම් මෙතෙක් සංඝයා
තුන් මධ්‍යයෙහි එක උපස්ථායකයා
ගුරුළාගෙන් රැකගත නුහුනුවෝ
යයි අපසියලුදෙනම ගර්හාවට පැමි
ණියම්හයි කීසේක.

ප්‍රත්‍යවෙක්ෂා වශීත්වය ආවර්ජනාව
ශිත්වයෙන්ම කියනලද්දේයි ඒ එසේ
මැයි ප්‍රත්‍යවෙක්ෂාජවන්හුම ඒ ආවර්ජ
නා වශිත්වයෙහි මනොද්වාරාවර්ජන
සිතට අනතුරුව ඒ ඒ ධ්‍යානාඞ්ගය
ආවර්ජනාකිරීම්වශයෙන් දිවන්නාහු
ය එපරිද්දෙන්ම අධිෂ්ඨානවශිත්ව
යෙන් ව්‍යුත්ථානවශිත්වය සිද්ධවන්නේ
යි එසේවීනම් ආවර්ජන ප්‍රත්‍යවෙක්ෂා
දෙදෙනාගේ හා අධිෂ්ඨාන ව්‍යුත්ථා
න දෙදෙනාගේද වෙනස කවරේද
යත්? ඒ ජවනයන්ට ධ්‍යානාඞ්ගයන්
ප්‍රකටව නොවැටහෙන්නාහුද එක
එක ධ්‍යානාඞ්ගය ආවර්ජනා කිරීම්
වශයෙන් අතරතුරක් නැතුව ආව
ර්ජනා ජවන් ඉපදවීමෙහි පොහො
සත්බව ආවර්ජනාවශී නම් එම ධ්‍යා
නාඞ්ගයන් ස්වභාව වශයෙන් ප්‍රකට
ව වැටහීම්වශයෙන් ප්‍රත්‍යවෙක්ෂාජ
වන් පැවැත්වීමහැකිබව ප්‍රත්‍යවෙ
ක්ෂාවශීනම වේද එක එක චිත්තවීථි
යෙක සත් ජවන්තොකෙණක් නියමව
ශයෙන් ඉපදීමස්වභාවධර්මයක්වුනමුත්
ආවර්ජනාවශයෙන් අතුරක් නැතිව
ජවන් ඉපදවීමෙහි පොහොසත්බව
හෝ ආවර්ජනාවශීනම වශගබල
යෙන් සත්ජවනය ඉපදීමට අවකා
ශනොදී සතරපස්ජවන්තොකෙණක්
ප්‍රත්‍යවෙක්ෂාවශයෙන් ඉපදවීමහෝ
ප්‍රත්‍යවෙක්ෂාවශීනම තමාකැමතිතා
ක්කල් සමාපත්තිජවන් ඉපදවීමහැකි
බව අධිෂ්ඨානවශී නම මෙතෙක්
කල් සමාපත්තියෙන් නොනැගිටිම්
යි ඉටාගත්කාලය නොඉක්ම ඉන්
පෙරදතුරෙහින් ධ්‍යානාලය අත්හැර ස
මවතින් නැගිසිටිනුහැකිබව ව්‍යුත්ථා
නවශී නම එපරිද්දෙන්ම තමා විසි
න් ඉටාගත්කාලද කාලය නොඅඩු
කොට ධ්‍යානය පැවැත්විය හැකිබව
හෝ අධිෂ්ඨානවශීනම තමා විසින්
ඉටාගත්කාලද කල්හිම ධ්‍යානයෙන්
නැගිසිටිනු හැකිබව හෝ ව්‍යුත්ථාන
වශීනම් වන්නේයි.

(පා ‡).

ඉමාසු පන පඤ්චසු වසීසු චිණ්ණවසි
නා පගුණපඨමජ්ඣානතො වුට්ඨාය
අයං සමාපත්ති ආසන්නනීවරණප
ච්චත්ථිකා විතක්කවිචාරානං ඔළාරික
ත්තා අඞ්ගදුබ්බලාතිච තත්ථ දොසං
දිස්වා දුතියජ්ඣානං සන්තතො මන
සි කරිත්වා පඨමජ්ඣානෙ නිකන්තිං
පරියාදාය දුතියාධිගමාය යොගො
කාතබ්බො අථස්ස යදා පඨමජ්ඣානා
වුට්ඨාය සතස්ස සම්පජානස්ස ඣාන
ඞ්ගානි පච්චවෙක්ඛතො විතක්කවි
චාරා ඔළාරිකතො උපට්ඨහන්ති පීති
සුඛඤ්චෙව චිත්තෙකග්ගතා ච සන්ත
තො උපට්ඨහන්ති තදාස්ස ඔළාරිකඞ්ග
පහානාය සන්තඞ්ගපටිලාභාය ච
තමෙව නිමිත්තං පඨවී පඨවීති පු
නප්පුනං මනසිකරොතො ඉදානි දුති
යජ්ඣානං උප්පජ්ජිස්සතීති භවඞ්ගං
උපච්ඡින්දිත්වා තමෙව පඨවීකසිණං ආ
රම්මණං කත්වා මනොද්වාරාවජ්ජනං
උප්පජ්ජති තතො තස්මිං යෙව ආර
ම්මණෙ චත්තාරි පඤ්ච වා ජවනානි
ජවන්ති යෙසං අවසානෙ එකං රූපා
වචරං දුතියජ්ඣානිකං සෙසානි වු
ත්තප්පකාරානෙව කාමාවචරානීති
එත්තාවතා චෙස —— විතක්කවිචාරා
නං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං

චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියජ්ඣානං උපසම්පජ්ජ විහරති එවමනෙන ද්වඞ්ගවිප්පහීණං තිවඞ්ගසමන්නාගතං තිවිධකල්‍යාණං දසලක්ඛණසම්පන්නං දුතියජ්ඣානං අධිගතං හොති පඨවිකසිණං —

( ස‡ )

ඉමාසු පන පඤ්චසු වසීසු, මේ පඤ්චවසිතාවන් කෙරෙහි; චිණ්ණවසිනො, පුරුදුකරණලද වශීඇත්තහුවිසින්; පගුණපඨමජ්ඣානතො වුට්ඨාය, පුහුණු ප්‍රථමධ්‍යානයින් නැඟී; අයං සමාපත්ති, මේ සමවත්තෙනාමෙයි; ආසන්ននීවරණපච්චත්ථිකා, තුදුරුවූ නීවරණනැමති පසමිතුරන්ඇත්තිය; විතක්කවිචාරානං ඔළාරිකත්තා, විතර්කවිචාරදෙදෙනා ඖදාරිකබැවින්; අඞ්ගදුබ්බලාතිච, දුර්වලවූ අඞ්ගඇත්තීය සිදු; තත්, ඒ ප්‍රථමධ්‍යානයෙහි; දෙසං දිස්වා, අයුණු දැක; දුතියජ්ඣානං සන්තතො මනසිකරිත්වා (විතර්කවිචාරයන් නැතිබැවින්) විතීයධ්‍යානත් ශාන්තයෙහියි මෙනෙහිකොට; පඨමජ්ඣානෙ නිකන්තිං පරියාදාය, ප්‍රථමධ්‍යානනිකාන්තිය ගෙවා (විෂ්කම්භන යකොට) දුතියාධිගමාය, දෙවනුධ්‍යානයාගේ අධිගමයපිණිස; යොගො කාතබ්බො, භාවනායොගකටයුතු; අථ, ඉක්බිත්තෙන්; යදා, යම්වේලෙක; පඨමජ්ඣානා වුට්ඨාය, ප්‍රථමධ්‍යානයෙන් නැඟී; සතස්ස, සිහිඇතිව; සම්පජානස්ස, නුවණැතිව; ඣානඞ්ගානි පච්චවෙක්ඛතො, ධ්‍යානාඞ්ගයන් පස් විකන්නාවූ; අස්ස, ඒ යොගීහට; විතක්කවිචාරා ඔළාරිකතො උපට්ඨහන්ති, විතර්කවිචාරයෝ ඖදාරිකවිසින් වැටහෙද්ද; පීති, ප්‍රීතියද; සුඛංචෙව, සුඛයද; චිත්තෙකග්ගතා ච, චිත්තෙහි කාග්‍රතාවද; සන්තතො උපට්ඨහන්ති, ශාන්තයෙහියින් වැටහෙද්ද; තදා, එවේලෙහි; ඔළාරිකඞ්ගප්පහාණාය, ඖදාරිකඅඞ්ගයන්ගේ ප්‍රහාණයපිණිසද; සන්තඞ්ගපටිලාභාය ච, ශාන්තාඞ්ගයන්ගේ ප්‍රතිලාභයපිණිසද; තදෙව නිමිත්තං, එම ප්‍රතිභාගනිමිත්ත; පුන, නැවත; පඨවිපඨවීති, පඨවිපඨවි කියා; පුනප්පුනං මනසිකරොතො, නැවත නැවත මෙනෙහිකරන්නාහට; ඉදානි දුතියජ්ඣානං සම්පජ්ජිස්සතීති, දැන් දෙවෙනිධ්‍යාන් උපදින්නේයයි; භවඞ්ගං උපච්ඡින්දිත්වා, භවාඞ්ගපසිඳ; තදෙව පඨවිකසිණං, එම පඨවිකසිණ; ආරම්මණං කත්වා, අරමුණුකොට, මනොද්වාරාවජ්ජනං උප්පජ්ජති, මනොද්වාරාවර්ජන සිත උපදී; තතො, ඒ ආවර්ජනයට ඉක්බිතිව; තස්මිං යෙවාරම්මණෙ, එම අරමුණෙහි; චත්තාරි පඤ්චවා ජවනානි, සතරපස් ජවන්හු; ජවන්ති, දිවෙත්; යෙසං අවසානෙ, යම් සතරහෝ පස්හෝ ජවන්කෙණෙකුන්ගේ කෙළවර (අවසන්හි) එකං, එක්සිතෙක්; රූපාවචරං දුතියජ්ඣානිකං, රූපාවචර විතීයධ්‍යාන ඇතිවේද; සෙසානි, සෙස්ස; වුත්තප්පකාරානෙව, කියනලද පරිකර්මාදිප්‍රකාර ඇතිවුම; කාමාවචරානි, කාමාවචරවෙද්ද (ඒ සතරපස් ජවන්හු දිවතියි යොදනු) එත්තාවතා, මෙපමණකින්; ද්වඞ්ගවිප්පහීණං, දෙඅඞ්ගින් පිරිහුණු; තිවඞ්ගසමන්නාගතං, තුන්අඟින් සමන්විතවූ; අවිතක්කං, විතර්කරහිතවූ; අවිචාරං, විචාරරහිතවූ; සමාධිජං, සමාධින් උපන්; පීතිසුඛං, ප්‍රීතිසුඛදෙකින් යුක්තවූ; එසො, මේතෙම; විතක්කවිචාරානං වූපසමා, විතර්කවිචාරයන්ගේ ව්‍යුපසමහෙතුවෙන්; අජ්ඣත්තං, ආධ්‍යාත්මයෙහි උපන්; සම්පසාදනං, සම්ප්‍රසාදනයෙන් යුක්තවූ; චෙතසො එකොදිභාවං, සිත්හු

ගේ එකොදිසඞ්ඛ්‍යාතසමාධිය වඩන්නාවූ; අවිතක්කං, විතර්කරහිතවූ; අවිචාරං, විචාරරහිතවූ; සමාධිජං, සමාධින් උපන්; පීතිසුඛං, ප්‍රීතිසුඛදෙකින් යුක්තවූ; දුතියජ්ඣානං උපසම්පජ්ජ විහරති, ද්විතීයධ්‍යානය උපදවා වෙසේ.... පෙ....

( භා ‡ )

මෙසේ මේ පඤ්චවශිතාවන් මනාකොට පුරුදු කරණලද යෝගාවචරයා විසින් පුහුණුකරණලද ප්‍රථමධ්‍යානයෙන් නැගී මේ ප්‍රථමධ්‍යාන සමාපත්තියට පඤ්චනීවරණ නැමති පසමිතුරෝ ලඟ ඇත්තාහ මේධ්‍යානයෙහි ඇතතාවූ විතර්කවිචාර නමැති ධ්‍යානාඞ්ග දෙදෙන මහත්වූ ගස්ක එලපනයක්සේ නිස්සාර බැවින් අඞ්ග දුර්වලහයි ආදීනවදැක ඉක්බිති ද්විතීයධ්‍යානය විතර්කවිචාර නැතිබැවින්හා ප්‍රථමධ්‍යානයෙහි ඇත්තාවූ ප්‍රීතිසුඛාදීන්ට වඩා අතිශයින් ශාන්තප්‍රණීත ප්‍රීතිසුඛාදීන් ඇතිබැවින්ද ප්‍රණීතවූ ද්විතීයධ්‍යානයට පැමිණියෙම්වීනම් යෙහෙකැයි සිතා ප්‍රථමධ්‍යානයෙහි කැමැත්තගෙවා ද්විතීයධ්‍යානය උපදවනුපිණිස භාවනාවැඩිය යුත්තේයි ඉක්බිතෙතන් යම්කලෙක ප්‍රථමධ්‍යානයෙන් නැගී සිහිනුවණඇතිව ධ්‍යානාඞ්ගයන් පස්විකන්නාවූ ඒ යෝගාවචරයාහට විතර්කවිචාරයෝ ඖදාරිකවශයෙන් වැටහෙද්ද ප්‍රීතිසුඛ ඒකාග්‍රතාවෝ ශාන්තවශයෙන් වැටහෙද්ද එවේලෙහි ඒ ඖදාරිකාඞ්ගයන් දුරුකිරීමපිණිසද ශාන්තඅඞ්ගයන්ගෙන් යුක්තවූ ප්‍රණීත ධ්‍යානය ලබනපිණිසද ඒ ප්‍රථමධ්‍යානය ඉපදවූ පෘථිවිකසිණ නිමිත්තම පඨවිපඨවියයි භාවනාවඩනකල ද්විතීයධ්‍යානය උපදනේයයි කියයුතුකල්හි භවාඞ්ග ශ්‍රොතස සිඳ මනොද්වාරාවර්ජනසිත උපදනේය ඉක්බිත්තෙන් එම අරමුණෙහි සතරපස් ජවන් කොණෙකුන්ගේ කෙළවර එක් සිතෙක් රූපාවචර ද්විතීයධ්‍යානය වේද සෙසු චිත්තක්ෂණයෝ යටකී නියායෙන් පරිකර්මාදි ප්‍රකාර ඇත්තාවූ කාමාවචර ජවන්හුම් වෙද්ද එබඳුවූ සතරපස්ජවන්කොණෙක් දිවනාහුය.

මේපමණකින් මේ යෝගාවචරමහණ දෙයඟකින් පිරිහුණාවූ තුන්අඟකින් යුක්තවූ විතර්කවිචාරයන් පසිඳීමෙන් හා මනාකොට කෙලෙසුන් ඔබාගැන්මෙන් අධ්‍යාත්මය පහදවනනාවූ සිත එකඟකරනනාවූ විතර්කවිචාරරහිත සමාධියෙන් උපන් ප්‍රීතිසුව ඇතතාවූ ද්විතීයධ්‍යානය උපදවා වාසයකරන්නේනම් වන්නේයි මෙසේ මේ යෝගාවචර මහණවිසින් දෙයඟකින් වෙන්වූ අඞ්ගත්‍රයෙන් යුක්තවූ යටකියනලද ත්‍රිවිධකල්‍යාණදශලක්ෂණයෙන් යුක්තවූ පෘථිවි කසිණයෙන් ලබනලද ද්විතීයධ්‍යානය ලබනලද්දේ නම් වන්නේයි....

( පා ¶ )

තත්ථවිතක්ක විචාරානං වූපසමාතිවිතක්කස්ස ච විචාරස්ස ච ඉමෙසං ද්වින්නංවූපසමාසමතික්කමා දුතියජ්ඣානක්ඛණෙ අපාතුභාවාති වුත්තං හොති තත්ථ කිඤ්චාපි දුතියජ්ඣානෙ සබ්බෙපි පඨමජ්ඣානධම්මා නසන්ති අඤ්ඤෙ ච හි පඨමජ්ඣානෙ ඵස්සාදයො අඤ්ඤෙ ඉධ ඔළාරිකස්ස පන ඔළාරිකස්සඅඞ්ගස්ස සමතික්කමා පඨමජ්ඣානතො පරෙසං දුතියජ්ඣානාදීනං අධිගමො හොතීති දීපනත්ථං විතක්කවිචාරානං වූපසමාති එවං වුත්තන්ති වෙදිතබ්බං.... අජ්ඣත්තන්ති ඉධ නියකජ්ඣත්තං අධි

ප්පත්තං විභඞ්ගෙ පන අජ්ඣත්තං පච්චත්තන්ති එත්තකමෙව වුත්තං. යස්මා ච නියකජ්ඣත්තං අධිප්පෙතං තස්මා අත්තනි ජාතං අත්තනො සන්තානෙ නිබ්බත්තන්ති අයමෙත්ථ අත්ථො ~ සම්පසාදනන්ති සම්පසාදනං වුච්චති සද්ධා සම්පසාදනයොගතො ඣානම්පි සම්පසාදනං නීලවණ්ණයොගතො නීලං වත්ථං විය යස්මා වා තං ඣානං සම්පසාදනසමන්නාගතත්තා විතක්කවිචාරක්ඛොභවූපසමනෙන ච චෙතසො සම්පසාදයති තස්මාපි සම්පසාදනන්ති වුත්තං ඉමස්මිඤ්ච අත්ථවිකප්පෙ සම්පසාදනං චෙතසොති එවං පදසම්බන්ධො වෙදිතබ්බො පුරිමස්මිං පන අත්ථවිකප්පෙ චෙතසොති එතං එකොදිභාවෙන සද්ධිං යොජෙතබ්බං ~

(ශ ¶)

විතක්කස්සච, විතර්කයාගේ ද; විචාරස්ස ච, විචාරයාගේ ද (යන) ද්වින්නං, මේ දෙදෙනාගේ; වූපසමා, සන්සිඳීමෙන් (සෝභාවණීයෙහි පසඳුව ම්සි) සමතික්කමා, ප්‍රහාණවශයෙන් ඉක්මීමෙන්; දුතියජ්ඣානක්ඛණෙ, විතීයධ්‍යානක්ෂණයෙහි, අපාතුභාවා ති වුත්තං හොති, අනුත්පාදයෙන් යයි කීනියායි (මෙහි යම් විතර්කවිචාර කෙණෙකුන්විසින් ප්‍රථමධ්‍යානයාගේ ඖදාරිකබවවේද ඒ විතර්කවිචාරයන්ගේ සමතික්‍රමණය විතීය ධ්‍යානයාගේ සමධිගමයෙන්වෙයි යන මේ අර්ථය "විතක්කවිචාරානං වූපසමා" යනුයෙන් දක්වන ලදී. එහෙයින්ම කීහ—"කිංපන පඨමජ්ඣානිකානං විතක්ක විචාරානං වූපසමො ඉධාධිප්පෙතො උදාහු දුතියජ්ඣානිකානං" යන මෙබඳු චොද්‍යසට අනවකාශවෙයි දතයුතු) තත්ථ, එහි; කිඤ්චාපි, කිසිසේත්; දුතියජ්ඣානෙ, විතීයධ්‍යානයෙහි; සබ්බෙපි පඨමජ්ඣානධම්මා න සන්ති, සියලු ප්‍රථමධ්‍යාන ධර්මයෝ නැත; අඤ්ඤෙයෙව හි පඨමජ්ඣානෙ ඵස්සාදයො, ප්‍රථමධ්‍යානයෙහි ස්පර්ශාදිධර්මයෝ අන්හුමය; අඤ්ඤෙ ඉධ, මේ විතීයධ්‍යානයෙහි අන්හුමැයි; ඔළාරිකස්ස පන ඔළාරිකස්ස අඞ්ගස්ස සමතික්කමා, ඖදාරික ඖදාරිකාඞ්ගයාගේ වනාහි සමතික්‍රමණයෙන්; පඨමජ්ඣානතො පරෙසං, ප්‍රථමධ්‍යානයාකෙරෙන් පරවූ; දුතියජ්ඣානාදීනං, විතීය ධ්‍යානාදීන්ගේ; අධිගමො හොතීති, අධිගමයවේයි; දීපනත්ථං, හඟවනපිණිස; විතක්කවිචාරානං වූපසමාති එතං වුත්තන්ති වෙදිතබ්බං, 'විතක්කවිචාරානං වූපසමා" යන මේ වචනය කියනලදැයි දතයුතු (කුමක්කීනියාද යත්? සියලු ප්‍රථමධ්‍යාන ධර්මයන්ම විතීය ධ්‍යානයෙහි නැතිබැවින් විතර්කාදීන්ගේ මෙන් තත්සහගතයන් ගේත් වූපසමාදිය කියයුත්තෙහි ඖදාරිකඖදාරික අඞ්ගයන්ගේ සමතික්‍රමණයෙන් විතීයාදීන්ගේ අධිගමයවේයි දක්වනුපිණිස "විතක්කවිචාරානං වූපසමා" යි කීහයි දතයුතු— මතු "පීතියාච විරාගා" යනාදියෙහිදු මෙම නය දතයුතු) අජ්ඣත්තන්ති ඉධ "අජ්ඣත්තං" යනු මෙහි; නියකජ්ඣත්තං අධිප්පෙතං, තමාසන්තානයෙහි උපන්නේයයි අභිප්‍රේතයි (අජ්ඣත්තජ්ඣත්තාදිය අභිමතනොවෙයි යන අදහසයි) විභඞ්ගෙ පන, විභඞ්ගයෙහි වනාහි; අජ්ඣත්තං පච්චත්තන්ති එත්තකමෙව වුත්තං "අජ්ඣත්තං පච්චත්තං" යි මෙපමණක්ම කියනලදී (යම්හෙයකින් "අජ්ඣත්තං" යි කියා "පච්චත්තං" යි පර්‍යායවචනය කීවද එහෙයින්ම අජ්ඣත්ත යයි නියකජ්ඣත්තයම අභිමතය අජ්ඣත්තජ්ඣත්තාදී අභිමත නොවේ හැඟෙයි සේයි) යස්මා ච නියකජ්ඣත්තං අධිප්පෙතං, යම් හෙය

කින් නියකාධ්‍යාත්මයම අභිමතද; තස්මා, එහෙයින්; අත්තනි, තමා කෙරෙහි; ජාතං, උපන්නේ; අත්තසන්තානෙ නිබ්බත්තන්ති, ආත්මසන්තානයෙහි නිපදවුයේය යනු; අයමෙත්ථ අත්ථො, මේ මේ පෙදෙහි අර්ථයි; සම්පසාදනන්ති, සම්ප්‍රසාදන යයි; සද්ධා සම්පසාදනං වුච්චති, ශ්‍රද්ධා සම්ප්‍රසාදනය කියනු ලැබේ; සම්පසාදනයොගතො, සම්ප්‍රසාදන යොගයෙන්; ඣානම්පි සම්පසාදනං, ධ්‍යානයද සම්ප්‍රසාදනනම්; නීලවණ්ණයොගතො නීලං වත්ථං විය, නීලවර්ණයොගයෙන් වස්ත්‍රය නීලනම් වන්නාසේති (වස්ත්‍රය නොනිල්හොතුදු තද්යොගයෙන් නීලය යන නම ලබනසෙයිනැයි සේති) යස්මා වා, යම් හෙයකින් හෝ; තං ඣානං, ඒ ධ්‍යානය; සම්පසාදන සමන්නාගතත්තා, සම්ප්‍රසාදනයෙන් යුක්ත හෙයින්; විතක්ක විචාරක්ඛොභ වූපසමනෙන ච, විතර්කවිචාර දෙදෙනාගේ ක්ෂොභය සංහුන් හෙයිනුදු; චෙතො සම්පසාදයති, සිත්හු පහදවාද; තස්මාපි, එහෙයිනුදු; සම්පසාදනන්ති වුත්තං, සම්ප්‍රසාදනයයි කියනලදී; ඉමස්මිඤ්ච අත්ථවිකප්පෙ "චෙතො සම්පසාදයතී" යන මේ අර්ථවිකල්පයෙහි; සම්පසාදනං චෙතසොති "සම්පසාදනං චෙතසො"යි කියා; එවං පදසම්බන්ධො වෙදිතබ්බො, මෙසේ පදසම්බන්ධය දතයුතු (මේ පක්ෂයෙහි "චෙතසො" යනු උපයොගාර්ථයෙහි ෂෂ්ඨියි) පුරිමස්මිං පන අත්ථවිකප්පෙ "සම්පසාදනයොගතො" යන ප්‍රථම අර්ථවිකල්පයෙහි වනාහි; චෙතසොති එතං, චෙතසො යන මේ; එකොදිභාවෙන සද්ධිං යොජේතබ්බං, එකොදිභාවශබ්දයහා යෙදියයුතු—

( හා ¶ )

ඒ ධ්‍යානය දක්වනලද විභඞ්ග දේශනාපාළියෙහි විතර්ක විචාරයන්ගේ සංහිඳීමෙනැයි කීබැවින් විතර්කය විචාරය යන මේ දෙදෙන සංහිඳුවු බැවින් ඉක්මවූ බැවින් හෙවත් ද්විතීය ධ්‍යානය ලබනකල්හි විතර්ක විචාරයන් පහළනොවීමෙනැයි යනඅර්ථය වදාරණලද්දේවෙයි එහි කිසිසේත් ද්විතීයධ්‍යානයෙහි සියලුප්‍රථමධ්‍යානිකධර්මනැත්තාහ ඒ එසේහැති ප්‍රථමධ්‍යානයෙහි යෙදුනාවු ස්පර්ශාදි ධර්මයෝ අන්‍යයෝමය මේ ද්විතීයධ්‍යානයෙහි යෙදුනාවූ ස්පර්ශාදිධර්මයෝ අන්‍යයෝ මැයි එසේකුදුවූවත් ඖදාරිකඖදාරිකඅඞ්ග ඉක්මීමෙන් ප්‍රථමධ්‍යානයාංකරෙන් අන්‍යවූ ද්විතීයධ්‍යානාදියට පැමිණෙන්නේයයි යන අර්ථය හඟවනපිණිස විතර්ක විචාරයන් සංහිඳීමෙන් ද්විතීයධ්‍යානය උපදවන්නේයයි කියනලද්දේයයි දතයුතු අධ්‍යාත්මය යනමෙහි සෙසු තන්හි මෙන් අජ්ඣත්තජ්ඣත්තාදි භූතප්‍රභේදයෙන් නියකජ්ඣත්තසඞ්ඛ්‍යාත වූ තමාසතන්හි උපන් ධර්මමාත්‍රයම කැමතිවියයුත්තේය ඊට කාරණා කවරේදයත්? ධ්‍යානවිභඞ්ගයෙහි අධ්‍යාත්මය කියා ඊට පර්‍යායවශයෙන් ආත්මභාවයනිසා පවත්නා ධර්මහයි යන මෙපමණක්ම වදාළබැවින් මේ ස්ථානයෙහි තමාසන්හි පවත්නා ධර්මමාත්‍රයක්මුත් අජ්ඣත්තජ්ඣත්තාදිසෙසු ත්‍රිවිධඅධ්‍යාත්මධර්ම අභිප්‍රෙතනොවන්නේයයි දතයුතු. යම්හෙයකින් නියකාධ්‍යාත්මයම අභිප්‍රෙතවේද එහෙයින් ඇතුළත හටගන්නාවූ හෙවත් තමාගේ ආත්මසන්තානයෙහි උපන්නාවූ ධර්මමාත්‍රයනැයි මේ පෙදෙහි අර්ථ මෙසේ ගතයුත්තේයි. සම්ප්‍රසාදනය යන මෙහි ශ්‍රද්ධාව සම්ප්‍රසාදනයයි කියනලද්දේය නීලවර්ණය රැඳීමෙන් වස්ත්‍රය නීලයයි නම්ලබන්

නාක්මෙන් මෙම ධ්‍යානයද සම්ප්‍ර
සාදනනම්වූ ශ්‍රද්ධාවහා එක්වයෙදුනු
බැවින් සම්ප්‍රසාදනයයි කියනලද්දේ
යි. නවද යම්සේ උදකප්‍රසාදකමාණි
ක්‍යය තමාහා එක්වයෙදුනාවූ ජලය
පහදවන්නාක්මෙන් තමාහා එක්ව
යෙදුනාවූ ධම්මයන් පහදවනඅසී
යෙන් සම්ප්‍රසාදනනම්වූ ශ්‍රද්ධාව හා
ධ්‍යානචිත්තය එක්වයෙදුනබැවින් ඒ
තර්කවිචාර දෙදෙනාගේ කැලඹීම
සංසිඳුවීමෙන් ඒ ධ්‍යානසිත පහදවාද
එහෙයිනුදු ධ්‍යානය සම්ප්‍රසාදනයයි
කියනලද්දේයි. චෙතොසම්පසාදන
ය යන මේ අර්ථපක්‍ෂයෙහි සිත සම්බ
න්ධවූ පැහැදීමයයි මෙසේ පදසම්බ
න්ධය දතයුතු. සම්පසාදනයොගය
යන පූර්ව අර්ථ පක්‍ෂයෙහි සිත සම්බ
න්ධවූ එකඟබව යයි සම්බන්ධ කට
යුත්තේයි.

( ශා * )

තත්‍රායං අත්ථයොජනා—එකො උ
දෙතීති එකොදි විතක්කවිචාරෙහි අ
නජ්ඣාරූළ්හත්තා අග්ගො සෙට්ඨො
හුත්වා උදෙතීති අත්ථො සෙට්ඨොපි
හි ලොකෙ එකොති වුච්චති විතක්ක
විචාරවිරහිතො වා එකො අසහා
යො හුත්වා ඉතිපි වට්ටති—අථ වා
සම්පයුත්තධම්මෙ උදායතීති උදි උ
ට්ඨපෙතීති අත්ථො සෙට්ඨට්ඨෙන එ
කොච සො උදිචාති එකොදි සමාධි
ස්සෙතං අධිවචනං ඉති ඉමං එකො
දිං භාවෙති වඩ්ඪෙතීති ඉදං දුතිය
ජ්ඣානං එකොදිභාවං සොපනායං
එකොදි යස්මා චෙතසො න සත්ත
ස්ස න ජීවස්ස තස්මා එතං චෙතසො
එකොදිභාවන්ති වුත්තං නනුචායං
සද්ධා පඨමජ්ඣානෙපි අත්ථි අයඤ්ච
එකොදිනාමකො සමාධි අථ කස්මා
ඉදමෙව සම්පසාදනං චෙතසො එ
කොදිභාවඤ්චාති වුත්තන්ති වුච්චතෙ අදුං
හි පඨමජ්ඣානං විතක්කවිචාරක්ඛො
භෙන වීචිතරඞ්ගසමාකුලමිවජලං න
සුප්පසන්නං හොති තස්මා සත්‍යාපි ස
ද්ධාය සම්පසාදනන්ති න වුත්තං නසු
ප්පසන්නත්තායෙව චෙත්ථ සමාධිපි
න සුට්ඨුපාකටො තස්මා එකොදිභා
වන්තිපි න වුත්තං ඉමස්මිං පන ඣා
නෙ විතක්ක විචාරපළිබොධාභාවෙ
න ලද්ධොකාසාබලවතීසද්ධාබලවසද්ධා
සහායපටිලාභෙනෙවච සමාධිපි පා
කටො තස්මා ඉදමෙව එවං වුත්තන්
ති වෙදිතබ්බං විභඞ්ගෙ පන සම්ප
සාදනන්ති යා සද්ධා සද්දහනා ඔකප්ප
නා අභිප්පසාදො චෙතසො එකොදි
භාවන්ති යා චිත්තස්ස ඨිති—පෙ—
සම්මා සමාධීති එත්තකමෙව වුත්තං
එවං වුත්තෙන පන තෙනසද්ධිං අයං
අත්ථවණ්ණනා යථා න විරුජ්ඣති අ
ඤ්ඤදත්ථු සංසන්දති චෙව සමෙතිච
එවං වෙදිතබ්බා—

( ස * )

තත්‍රායං අත්ථයොජනා, එහි මේ
අර්ථ යොජනායි; එකො, උත්තම
ව; උදෙතීති, නැඟේනුයි; එකොදි,
එකොදිනම් වේ; විතක්කවිචාරෙහි අ
නජ්ඣාරූළ්හත්තා, විතර්කවිචාරයන්
විසින් අධ්‍යාරූඪ නොවන බැවින්; අ
ග්ගො, අග්‍රව; සෙට්ඨො හුත්වා, ශ්‍රෙ
ෂ්ඨව; උදෙතීති අත්ථො, නැඟේය ය
න අර්ථයි; ලොකෙ, ලෙව්හි ("යාව
පරෙඑකභතෙ කරෙමි" යි යනාදි
යෙහිමෙන්) සෙට්ඨොපි හි, උත්තම
ද; එකොති වුච්චති, එකයයි කිය
නුලැබෙයි; විතක්කවිචාරවිරහිතො
වා, විතර්කවිචාර දෙදෙනාගේ විර
හයෙන්හෝ; එකො, හුදකලාව, අ
සහායො හුත්වා, අසහායවයයි; ඉති
පි වට්ටති, මෙසේද වටී; අථවා, නො
හොත්; සම්පයුත්තධම්මෙ, සපයුද් ස

සම්ප්‍රයුක්ත ධම්මයන්; උදයනිති, නඟා
තූසි; උදි, උදිනම්වේ ("උට්ඨපෙති"ය
හු එව අත්‍ථයි-අර්පේක්‍ෂාලක්‍ෂණයෙහි
ශ්‍රෙෂ්ඨයකාරණබැවින් සමාධියසම්ප්‍ර
යුක්ත ධම්මයන්ට විශෙෂයෙන් උප
කාර කරණුයි "සම්පයුත්ත ධම්මෙ උ
දයති"යනාදිතිනු) සෙට්ඨවෙට්ඨන,ශ්‍රෙ
ෂ්ඨාර්ථයෙන්; එකො ච සො, එකනම්
ඒවය; උදිචාති, උදි නම් වූයේ ඒමනු
යි; එකොදි, එකොදිනම් වේ; එතං,එ
කොදියනමේ; සමාධිස්ස අධිවචනං,
සමාධියට නාමෙකි; ඉති, මෙසේ; ඉ
මං එකොදිං, මේ එකොදිසඞ්ඛාත
සමාධිය (භාවෙතීයි-සේයි) වඩේනි
ති, වඩාතුයි; ඉමං දුතියං ඣානං,
මේ විනියධ්‍යානය; එකොදිභාවං, එ
කොදිභාවනම්වේ; සො පනායං එ
කොදි, ඒ එකොදිතෙමේ; යස්මා,
යම්හෙයකින්; චෙතසො, සිත්හුගේ
ද; න සත්තස්ස,සතක්නුගේ නොවේ
ද; න ජීවස්ස, ජීවයක්නුගේ නො
වේද; තස්මා, එහෙයින්; එතං, මේ
ධ්‍යානය; චෙතසො එකොදිභාවනන්ති
වුත්තං, සිත්හුගේ උතුම්ව එකලාව
ගෝ උපදනා සමාධිහු වඩනුයේන
ම් වෙයි කියනලදී(නොහොත් උතු
ම්ව සම්ප්‍රයුක්තයන් වඩන සමාධිහු
වඩනුයේනම් වෙයි කියනලද අර්ථ
යි-"නනුච"යන නිපාත සමුදායචො
දනාවකාශ යෙහි වැටේ)අයං සද්ධා, මේ
ශ්‍රද්ධා තොමෝ; පඨමජ්ඣානෙපි අ
ත්‍ථි, ප්‍රථමධ්‍යානයෙහිදු ඇත; අයඤ්ච
එකොදිනාම කො සමාධි,මේ එකො
දිනම් සමාධියද ඇත; අථ, එසේ
කල; ඉදමෙව, මේ ධ්‍යානයම; සම්ප
සාදනං, සම්ප්‍රසාදන නමුදු වෙයි;
චෙතසො එකොදිභාවඤාති, සිත්හු
ගේ එකොදිභාවනමුදුවෙයි; වුත්තං,
කියනලදි; වුච්චතෙ(පරිහාර)කියනු
ලැබේ; අදුං හි පඨමජ්ඣානං, ඒ ප්‍රථ
මධ්‍යානය; විතක්කවිචාරක්ඛොභෙ
න, විතර්ක විචාරයන්ගේ ක්‍ෂොභ
යෙන්(නීවරණප්‍රහාණයෙත් කෙල
ශකාලුෂ්‍යයාගේ ව්‍යුපශමයවුවද ආ
ඝානන පරියාහනන වශයෙන් අනු
මජ්ජන අනුයොජන වශයෙන් පව
ත්නාවූ විතර්ක විචාර දෙදෙනා ස
ම්ප්‍රයුක්තයන්ට කිසිඤොභයක් කර
ත්නාවූත්මෙන් පවත්නාහෙයිනයන
අර්ථයි ) වීචිතරඞ්ගසමාකුලම්ව ජලං,
කුඩා මහත්රලින් ආකුලවූ ජලයක්
මෙන්; න සුප්පසන්නං හොති, සුප්‍ර
සන්නනොවේද; තස්මා, එහෙයින්,
සතියාපි සද්ධාය, ශ්‍රද්ධාව ඇතද; සම්ප
සාදනන්ති න වුත්තං, සම්ප්‍රසාදනය
යි නොකියනලදී; න සුප්පසන්න
ත්තා යෙවච, සුප්‍රසන්නනොවනබ
වහෙයින්ම; එත්‍ථ, මේ ප්‍රථමධ්‍යාන
යෙහි; සමාධිපි, සමාධියද; න සුට්ඨු
පාකටො(ඉඳුරිසමත්වයඇතද විතර්ක
විචාරක්‍ෂොභයෙන් සම්ප්‍රසාදනයා
ගේ නැතිබවහෙයින්ද කැලතී දියෙ
හි මත්ස්‍යයකුමෙන් සමාධියද)වනා
ව ප්‍රකටනොවේ; තස්මා, එහෙයින්;
එකොදිභාවන්තිපි න වුත්තං, එකො
දිභාවයයිද නොකියනලදී; ඉමස්මිං
පන ඣානෙ, මේ විනියධ්‍යානයෙහි
වනාහි; විතක්කවිචාරපළිබොධා භා
වෙන, විතර්කවිචාරක්‍ෂොභසඞ්ඛ්‍යා
ත පළිබොධයාගේ අභාවයෙන්; ල
ද්ධොකාසා බලවතී සද්ධා, ලබනලද
අවකාශඇති බලවත් ශ්‍රද්ධාද; බලව
සද්ධා සහාය පටිලාභෙ නෙව, බල
වත් ශ්‍රද්ධාසහාය ප්‍රතිලාභයෙන්ද; ස
මාධිපි පාකටො, සමාධිය ද ප්‍රකට
වේ; තස්මා, එහෙයින්; ඉදමෙව,
මේ විනියධ්‍යානයම; එවං වුත්තන්ති,
"සම්පසාදනං චෙතසො එකොදිභා
වං"යි මෙසේ කියනලදුයි; වෙදිත
බ්බං, දතයුතු; විභඞ්ගෙ පන, විභඞ්ග
ප්‍රකරණයෙහි වනාහි; සම්පසාදන
න්ති, සම්ප්‍රසාදන නම්; යා සද්ධා, යම්

ශ්‍රද්ධාවක් ඇද්ද; සද්දහණා, යම් හැදහී
මෙක් ඇද්ද; ඔකප්පනා, යම් වැදහැද
හීමෙක් ඇද්ද; අභිප්පසාදෙ, යම් අධි
ක ප්‍රසාදයක් අද්දැයි ද; චෙතසො එ
කොදිභාවනති, චෙතසො එකොදි
භාවනම්; යා චිත්තස්ස ඨිති, යම් චි
ත්තයාගේ සිටිමෙක් ඇද්ද; සණ්ඨිති, ය
ම් මනාකොට සිටිමෙක් ඇද්ද; සම්මා
සමාධිනි, යම් සම්‍යක්සමාධියෙක් ඇ
ද්දැයිද; එත්තකමෙව වුත්තං(පදැයි
නොකියා ධම්මමාත්‍රයම දැක්වියටිව)
මෙපමණෙක්ම කියන ලදී; එවං
වුත්තෙ න පන, ශ්‍රද්ධා සමාධි දෙදෙ
නාගේ ප්‍රවෘත්තිආකාර විශෙෂවිභාව
නා වශයෙන් ප්‍රවෘත්තවූ වනාහි; තෙ
න සඬ්ං(සද්දහනා ඔකප්පනා යනා
දි)ඒ විභඞ්ගපාඨය හා සමග; අයං
අත්ථවණ්ණනා ("සම්පසාදනයොග
තො සම්පසාදනතො වා සම්පසාද
නං එකොදිංභාවෙතීති එකොදිභා
වනති ඣානං වුත්තං"යි මෙසේ ප්‍ර
වෘත්තවූමේ)අර්ථවර්ණනාතොමෝ;
යථා න විරුජ්ඣති, යම්සේ විරොධ
නොවේද; අසුකුදතුවූ, එකාන්ත
යෙන්; සංසන්දති චෙව, හැණේද;
සමෙති ච, සමවේද; එවං වෙදිත
බ්බා, එසේ දතයුතුයි(පෙළහා අ
විරුඩකොට දතමනා වීනම් මෙසේ
දතයුතුය යන අර්ථයි)

( භා * )

ඒ පූර්ව අර්ථපක්ෂයෙහි මේ මතු ද
ක්වන්නේ අර්ථයොජනා වන්නේයි.
මේ ධ්‍යානසම්ප්‍රයුක්ත සමාධිය තෙ
මේමශ්‍රෙෂ්ඨව අසහායව අර්පණාවට
නැඟෙනඅර්ථයෙන්හෙවත් ප්‍රථමධ්‍යා
නයෙහිමෙන් විතර්කවිචාරයන්ගේ
වශයෙන් අර්පණාවට නොනඟිණ
බැවින් අගුව ශ්‍රෙෂ්ඨව නැඟෙණඅර්ථ
යෙන් එකොදිනම්වන්නේය ලොක
යෙහිද ශ්‍රෙෂ්ඨයා එකයයි කියනලද්
දේයි. නවද විතර්කවිචාරදෙදෙනා
ගෙන් වෙන්වීමෙන් හුදකලාව මේ
සමාධිය පවත්නාහෙයින්ද එකොදි
යයි කියන්නාට වටනේය නවද නමා
හා සම්ප්‍රයුක්ත සෙසු ස්පර්ශාදි චෛ
තසිකධර්මයන් පහළකරණ අර්ථයෙ
න්හෝ නඟාසිටුවන අර්ථයෙන්හෝ
සමාධිය එකොදිනම් වන්නේයි එ
හෙයින් ශ්‍රෙෂ්ඨාර්ථයෙන්හා සෙසු ධ
ර්මයන් අර්පණාවට නගනඅර්ථයෙ
න්ද එකොදියයි ව්‍යවහාරවූ මේ ශ
බ්දය සමාධියට නම්වන්නේයයි මෙ
සේ විතීය ධ්‍යානලාභී පුද්ගලයා ඒ
කොදිභාවයයි කියනලද සමාධිය ව
ඩනබැවින් මේ විතීයධ්‍යානය එකො
දිභාවනම් වන්නේයි. යම්හෙයකින්
ඒ මේ එකොදිභාවය චිත්තයසම්බ
න්ධ ධර්මයක් වේද සත්වයාගේ වත්
ජීවිතයාගේවත් නොවේද එහෙයින්
මේ ධ්‍යානය චිත්තය සම්බන්ධව උප
දනා උතුම්වූහුදකලාවූ සමාධිය හෙ
වත් එකාග්‍රබවයයි කියනලද්දේයි එ
තකුදුවූවත් ප්‍රථමධ්‍යානයෙහිදු මේ ශ්‍ර
ද්ධාවහා සමාධියද ඇත්තේය එසේක
ල කුමක්නිසා මේ විතීයධ්‍යානසම්ප්‍ර
යුක්ත ශ්‍රද්ධාවම සම්ප්‍රසාදනනම් වේද
විතීයධ්‍යානචිත්තයාගේ සංහුත්බවම
එකොදිභාවනම් වේද යත්? ඒ එසේ
මැයි. ඒ ප්‍රථමධ්‍යානය පඤ්චනිවරණධ
ර්මයන්ගේ ප්‍රහාණයෙන් කෙලෙස්
කිළුට සංසිඳුවූයේද විතර්කවිචාරය
න්ගේ කැලඹීමෙන් අරමුණෙහි හැ
පීමෙන්ද හාත්පස හැපීමෙන්ද ප
වත්නාබැවින් විතර්කවිචාරදෙදෙ
නාවිසින් සම්ප්‍රයුක්තධර්මයන් මඳ
වශයෙන් කලඹනු ලබන්නාක් මෙ
න් පවත්නාහෙයින් කුඩාමහත් රළ
පහරින් අවුල්වූ ජලයමෙන් ධ්‍යානචි
ත්තය අතිශයින් ප්‍රසන්න නොවන්
නේයි. එහෙයින් ප්‍රථමධ්‍යාන චිත්ත
යෙහි ශ්‍රද්ධා චෛතසිකය ඇතද
නොපහන් බැවින් ඊට සම්ප්‍ර
සාදනයයි නොකියනලද්දේය මේ
ප්‍රථමධ්‍යාන චිත්තයෙහි ඇත්තාවූ ස

මායි චෛතසිකයද ඉඳුරන්ගේ සමත්වය ඇතද විතර්ක විචාරයන්ගේ කැලඹීමෙන් ප්‍රසන්නබවක් නැතිහෙයින් කැලැත්දියෙහි මත්ස්‍යයෙකුමෙන් මනාසේ ප්‍රකට නොවන බැවින් එකොදිභාවය සිද්ධ නොකියනලද්දේය මේ විභංගයෙහි වනාහි විතර්කවිචාරයන්ගේ හිරිහැර නැතිබැවින් ලබනලද අවකාශ ඇති බලවත් ශ්‍රද්ධාවද ඒ ශ්‍රද්ධාවෙන් ලබනලද උපකාරඇති හෙවත් පහදවනලද සමාධියද ප්‍රකටවන්නේය එහෙයින් මේ විභංගයෙහි ඇත්තාවූ ශ්‍රද්ධා එකාග්‍රතාවෝම සම්ප්‍රසාදනයයිදු චිත්තයාගේ එකඟබවය සිදු කියනලද්දේයයි දතයුතු. විභංගයෙහි වනාහි සම්ප්‍රසාදනනම් යම් ශ්‍රද්ධාවෙක් ඇද්ද යම් හැදහීමෙක් අද්ද යම් ඇතුලත්ව හැදහීමෙක් ඇද්ද යම් අධික ප්‍රසාදයෙක් ඇද්ද ගේ ශ්‍රද්ධානම එකඟබවනම් චිත්තයාගේ යම් සිටීමෙක් ඇද්ද යම් මනාපිහිටීමෙක් ඇද්ද ගේ එකාග්‍රතානම්වෙයි යන මෙපමණක්ම කියනලද්දේ වේද මෙසේ කියනලද ඒ විභංගපාලිය හා මෙහි දක්වූ අටුවාකථාව යම්පරිද්දෙකින් විරුද්ධනොවී එකතින් ගැළපී සමවේද එපරිද්දෙන් අර්ථ දතයුත්තේයි.

( ෂා † )

අවිතක්කං අවිචාරන්ති භාවනාය පහීණත්තා එතස්මිං එතස්ස වා විතක්කො නත්ථීති අවිතක්කං ඉමිනා ව නයෙන අවිචාරං විභංගෙපිවුත්තං ඉති අයඤ්චවිතක්කො අයඤ්ච විචාරො සන්තා හොන්ති සමිතා වූපසන්තා අත්ථගතා අබ්භත්ථගතා අප්පිතා ව්‍යප්පිතා සොසිතා විසොසිතා ව්‍යන්තීකතා තෙන වුච්චති අවිතක්කං අවිචාරන්ති එත්ථාහ නනුච විතක්කවිචාරානං වූපසමාති ඉමිනාපි අයමත්ථො සිද්ධො අථ කස්මා පුන වුත්තං අවිතක්කං අවිචාරන්ති වුච්චතෙ — එවමෙතං සිද්ධොවායමත්ථො න පනෙතං තදත්ථදීපකං නනු අවොචුම්හ ඔළාරිකස්ස පන ඔළාරිකස්ස අඞ්ගස්ස සමතික්කමා පඨමජ්ඣානතො පරෙසං දුතියජ්ඣානාදීනං සමධිගමො හොතීති දස්සනත්ථං විතක්කවිචාරානං වූපසමා එවං වුත්තන්ති අපිච විතක්කවිචාරානං වූපසමා ඉදං සම්පසාදනං නකිලෙසකාලුස්සියස්ස විතක්කවිචාරානඤ්ච වූපසමා එකොදිභාවං න උපචාරජ්ඣානමිව නීවරණප්පහානා පඨමජ්ඣානමිවච අඞ්ගපාතුභාවාති එවං සම්පසාදන එකොදිභාවානං හෙතුපරිදීපකමිදං වචනං තථා විතක්කවිචාරානං වූපසමා ඉදං අවිතක්කං අවිචාරං නතතියචතුත්ථජ්ඣානානි විය චක්ඛුවිඤ්ඤාණාදීනි වියච අභාවාති එවං අවිතක්ක අවිචාරභාවස්ස හෙතුපරිදීපකඤ්ච නවිතක්ක විචාරාභාවමත්ත පරිදීපකං විතක්කවිචාරාභාවමත්ත පරිදීපකමෙව පන අවිතක්කං අවිචාරන්ති ඉදං වචනං තස්මා පුබ්බං වත්වාපි වත්තබ්බමෙවාති —

( ෂ † )

භාවනාය පහීණත්තා, භාවනායෙන් ප්‍රහීණබැවින්; එතස්මිං, මේ ධ්‍යානයෙහි; එතස්සවා, මේධ්‍යානයටහෝ; විතක්කො නත්ථි, විතර්කයෙක් නැත්තුයි; අවිතක්කං, අවිතර්ක නම්; ඉමිනාව නයෙන අවිචාරං, මෙම නයින් අවිචාරනම්; විභංගෙ‘පි වුත්තං, විභංගයෙහිදු කියනලදී; ඉති, මෙසේ; අයඤ්ච විතක්කො, මේ විතර්කයද; අයඤ්චවිචාරො, මේ විචාරයදයන දෙදෙන; සන්තා හොන්ති, ශාන්තවේද(“සමං නිරොධංගතා”යන අර්ථයි)

සමිතා, භාවනාබෙලෙන් සමථයට
පමුණුවන ලදහුද; වූපසන්තා, එහෙ
යින්ම මනාකොට ශාන්තවෙද්ද; අ
ත්ථඞ්ගතා, විනාශයට ගියෝද("අබ්භ
ත්ථඞ්ගතා" යනු උපසර්ගයෙන් පදව
ඩ්ඪනමාත්‍රයි)අප්පිතා, විනාශයට යව
නලදහුද; ව්‍යප්පිතා, විශෙෂයෙන්
විනාශයට යවනලදහුද; සොසිතා,
වියලනලද හුද("පවත්තිසඞ්ඛාතස්ස
සන්දනස්ස අභාවෙන සොසං සුක්ඛ
භාවං ඉතාති සොසිතා"යි ගත්තේ)
ව්‍යන්තීකතා, විගතාන්ත කරණලදහු
ද; තෙන වුච්චති අවිතක්කං අවිචා
රන්ති, එහෙයින් අවිතර්කය අවිචා
රයයි කියනුලැබේ; එත්, මෙතන;
ආහ(චොදක)කී; නනුව, කියග; විත
ක්කවිචාරානං වූපසමාති ඉමිනා
ව "විතක්කවිචාරානං වූපසමා"යන
මෙයිනුදු; අයමත්ථො සිද්ධො, විත
ක්කවිචාරාභාව සඞ්ඛාත අර්ථය සිද්ධ
ය; අථ, එසේකල; කස්මා, කුමක්හෙ
යින්; පුන, නැවත; අවිතක්කං අවි
චාරන්ති වුත්තං "අවිතක්කං අවිචා
රං"යි කියනලද්ද යත්? වුච්චතෙ,
කියනු ලැබේ (චොදකයාවිසින් කි
යනලද අර්ථය ගිවිස පරිහාරකිය
න්නේ "එවමෙතං සිද්ධො වාය ම
ත්ථො"යි කියා "න පනෙතං"යනා
දිකී)එවමෙතං, ඒ එසේය; සිද්ධොවා
යමත්ථො, විතක්කවිචාරාභාව සඞ්ඛාත
ත අර්ථය සිද්ධමය; එතං පන "විත
ක්කවිචාරානං වූපසමා"යන මේ ව
චනය වනාහී; න තදත්ථදීපකං, වි
තර්කවිචාරාභාවමාත්‍ර සඞ්ඛ්‍යාත අර්ථ
ය හඟවන්නේ නොවේ(විනියධ්‍ය
නාදීන්ගේ අධිගමයට උපායදීපකවූ
අජ්ඣත්ත සම්පසාදන භාවයට හා
චෙතසො එකොදිභාවයට හෙතුදී
පකවූ අවිතර්ක අවිචාරභාවයෙහිදු
හෙතුදීපකවූ විතර්කවිචාර වූපසම
වචනයෙන් විතර්කවිචාරයන්ගේ අ
භාවය දීපිතනොවේ යන අර්ථයි-වි
තක්කවිචාරානං වූපසමා යන වචන
ය තදත්ථදීපක නොවනබව යට කී
කාරණයෙන් දක්වන පිණිස "නනු
අවොචුම්හ"යනාදිකීහු-යට කීමු චො
දක යන අර්ථයි-පෙ-)අපිච, අනික් අ
ර්ථයකුදු ඇති; විතක්කවිචාරානං වූප
සමා, විතර්කවිචාරයන්ගේ ව්‍යුපශම
හෙතුවෙන්; ඉදං, මේ විනියධ්‍යානය;
සම්පසාදනං, සම්ප්‍රසාදනනම්; න කි
ලෙසකාලුස්සියස්ස, ක්ලෙශකාලුෂ්‍ය
යාගේ ව්‍යුපශමයෙන් නොවේ; විත
ක්කවිචාරාන ඤ්ච වූපසමා එකොදිභා
වං, විතර්කවිචාරයන්ගේම වූපසම
යෙන් එකොදිභාවයද වේයි; උපචා
රජ්ඣානම්ව, උපචාරධ්‍යානයාමෙන්;
නනීවරණප්පහාණා, නීවරණ යන්
ගේ ප්‍රහාණයෙන් නොද වේයි; පඨ
මජ්ඣානම්වච අඞ්ගපාතුභාවාති, ප්‍ර
ථමධ්‍යානය මෙන් අඞ්ග ප්‍රාදුර්භාව
යෙන් නොදවේයි; එවං, මෙසේ; ස
ම්පසාදනඑකොදිභාවානං, සම්පසා
දනය එකොදිභාවය යන මොවුන්ට;
ඉදංවචනං,මේ "විතක්කවිචාරානං වූ
පසමා"යන වචනය; හෙතුදීපකං,
හෙතුහඟවන්නේයි; තථා, එසේම;
විතක්කවිචාරානං වූපසමා, විතර්ක
විචාරයන්ගේ සංසිඳීමෙන්; ඉදං,මේ
ධ්‍යානය; අවිතක්කං, අවිතර්කනම්
වේයි; අවිචාරං, අවිචාරනම්වේයි; දු
තියතතියචතුත්ථජ්ඣානානිවිය,ද්විතිය
තෘතිය චතුර්ථධ්‍යානයන් මෙන්ද; ච
ක්ඛුවිඤ්ඤාණාදීනිවියච,චක්ෂුර්විඥානා
දීන්මෙන්ද; න අභාවාති,නැතිහෙයි
න් නොවේ; එවං, එසේම; අවිතක්කඅ
විචාරභාවස්ස, අවිතර්ක අවිචාරභා
වයට; හෙතුපරිදීපක ඤ්ච, හෙතුවද
හඟවා; න විතක්කවිචාරාභාවමත්ත
පරිදීපකං, විතර්කවිචාරයන්ගේ අ
භාවමාත්‍රය හඟවන්නේ නොවේ; වි
තක්කවිචාරාභාවමත්තපරිදීපක වෙ

ව පන, විතක්කවිචාරයන්ගේ අභාව
මාත්‍රයම භගවත්නේ වනාහි; අවිත
ක්කං අවිචා රන්ති ඉදං වචනං, "අවි
තක්කං අවිචාරං"යන මේ වචනය
යි; තස්මා, එහෙයින්; පුරිමං වත්වාපි,
"විතක්කවිචාරානං"යන මේ පූර්වව
චනය කියාද,වතතබ්බමෙවාති "අවි
තක්කං අවිචාරං"යන මේ වචනය
කියයුතුමැයි.

( භා † )

අවිතක්ක අවිචාර ධ්‍යානයයි යන
මෙහි අර්ථ කෙසේදයත්? මේ ධ්‍යාන
යෙහි ඇත්තාවූ විතර්ක විචාර දෙ
දෙන භාවනාබලයෙන් දුරුකළහෙ
යින් අවිතර්කද වෙයි අවිචාරද වෙ
යි දතයුත්තේය. විභඞ්ගප්‍රකරණයෙ
හිදු මේ කියනලදමැයි මෙසේ මේ
විතීයධ්‍යානයෙහි යෙදුනාවූ විතර්ක
විචාර දෙදෙන සංසුන්නාහුවේද්ද
භාවනාබලයෙන් සංහිඳුවීමට පමුණු
වනලද්දාහුද මනාකොටම සංහිඳුවන
ලද්දාහුද අස්තයට පමුණුවන ලද්දා
හුද විශේෂයෙන්ම අස්තයට පමුණු
වනලද්දාහුද විනාශයට පමුණුවනල
ද්දාහුද විශේෂයෙන්ම විනාශයට ප
මුණුවන ලද්දාහුද වියලනලද්දාහුද
විශේෂයෙන්ම වියලනලද්දාහුද කෙ
ළවරපමණත් නොතබා විනාශකර
ණලද්දාහුද එහෙයින් මේ ධ්‍යානය අ
විතර්ක අවිචාරයයි කියනලද්දේයි.
මෙතන්හි වනාහිවිතර්ක විචාරයන්
ගේ සංහිඳුවීමෙනැයි යන හෙතුවාචී
වාචකවූ පූර්ව වචනයෙන් මේ අර්ථ
ය සිඬ නොවේද යත්? එසේවී
නම් කුමක්හෙයින් නැවතත් අවිත
ර්ක අවිචාරසමාධියයි කියනලදද ය
ත්? ඒ එසේමැයි. පූර්වෝක්ත විතර්ක
විචාරයන්ගේ ව්‍යුපශමයෙනැයි යන
වචනයෙනුදු විතර්ක විචාරයන්
ගේ අභාවය සිඬවන්නේමය එතකු
දුවුවත් මේ වචනය විතර්කවිචාරය
න්ගේ අභාවය ප්‍රකාශකිරීම පිණිස
කියනලද්දේ නොවෙයි ගේ වනාහි
විතීයධ්‍යානාදියට පැමිණීමට උපාය
භූතවන්නාවූ අධ්‍යාත්මය පහදවනබ
වටහා චිත්තයාගේ එකාග්‍රබවටද හෙ
තුප්‍රකාශ කරන්නාවූ හෙතුවාචීමාත්‍ර
යෙක එපමණකින් විතර්ක විචාරය
න්ගේ අභාවය ප්‍රකාශකරණලද්දේ
නොවේමැයි තවද ඖදාරික ඖදාරික
අඞ්ගයන් ඉක්මවීමෙන් ප්‍රථමධ්‍යාන
යෙන් අන්‍යවූ විතීය ධ්‍යානාදියට පැ
මිණෙන්නේ යයි යට කියනලද්දාහු
නොවේද? එහෙයින් විතර්ක විචාර
යන්ගේ ව්‍යුපශමයෙනැයි කීපමණ
කින් විතර්කවිචාරයන්ගේ අභාවය
ප්‍රකාශකරණලද්දේ නොවෙයි දත
යුත්තේයි. තවද විතර්ක විචාරයන්
සංහිඳුවීම හෙතුකොටගෙණ මේ වි
තීයධ්‍යානය සම්ප්‍රසාදනයයි නාම් ලබ
න්නේය. පඤ්චනීවරණ සංඛ්‍යාත කෙ
ලෙස් කිලුට සංහිඳුවීමෙන් නො
වන්නේය එසේම විතර්කවිචාරයන්
සංහිඳුවීමෙන් එකොදිභාවය ලබ
න්නේය උපචාරධ්‍යානග මෙන් නීවර
ණගත් දුරුකිරීමෙන් ද නොවෙයි
ප්‍රථමධ්‍යානයමෙන් අඞ්ගයන්ගේ ප
හළවීමෙන්ද නොවෙයි මෙසේ සම්
ප්‍රසාදනයට හා එකොදිභාවයට මේ
විතර්කවිචාරයන්ගේ ව්‍යුපශමයෙනැ
යි යන වචනය හෙතුව ප්‍රකාශකරන්
නේය තවද මේ ධ්‍යානය විතර්කවි
චාරයන්ගේ සංහිඳුවීම්මාත්‍රයකින් අවි
තර්කඅවිචාර නම් වනබවමුත් තෘති
යචතුර්ථධ්‍යානයෙහි මෙන්ද චක්ෂුරාදි
දෙපස්විඥානයෙහි මෙන්ද හාත්පසි
න්ම විතර්කවිචාරයන් නැතිබැවින්
නොවෙයි දතයුතු. මෙසේ මේ විත
ර්ක විචාරයන්ගේ ව්‍යුපශමයෙනැයි
යන හෙතුවාචීවචනයෙන් හුදෙක් අ
විතර්කඅවිචාරභාවයට ඇති හෙතුව

ප්‍රකාශකරණ පමණක් මුත් විතක්කවිචාරයන්ගේ අවිද්‍යමානභාවය ප්‍රකාශකරන්නේ නොවෙයි. අවිතක්කය අවිචාරයයි යන මේ දෙවෙනිවචනය හුදෙක් විතක්ක විචාරයන්ගේ අවිද්‍යමානභාවයම ප්‍රකාශකරන්නේමැයි එහෙයින් විතක්ක විචාරයන්ගේ ව්‍යපශමයෙනැයි යන පූර්වවාක්‍යය කියා අවිතක්කය අවිචාරය යන දෙවෙනිවාක්‍යයද කියනුත්තේමැයි.

( ෂා ‡ )

සමාධිජන්ති පඨමජ්ඣානසමාධිතො සම්පයුත්තසමාධිතො වා ජාතන්ති අත්ථො තත්ථ කිඤ්චාපි පඨමම්පි සම්පයුත්තසමාධිතො ජාතං අථඛො අයමෙව සමාධි සමාධීති වත්තබ්බතං අරහති — විතක්කවිචාරක්ඛොභවිරහෙන අතිවිය අචලත්තා සුප්පසන්නත්තා ච තස්මා ඉමස්ස වණ්ණභණනත්ථං ඉදමෙව සමාධිජන්ති වුත්තං — පීතිසුඛන්ති ඉදං වුත්තනයමෙව දුතියන්ති ගණනානුපුබ්බතා දුතියං දුතියං උප්පන්නන්ති පි දුතියං ඉදං දුතියං සමාපජ්ජතීති දුතියං යම්පන වුත්තං වඩ්ගවිප්පහීණං තිවඩ්ගසමන්නාගතන්ති තත්ථ විතක්කවිචාරානං පහාණවසෙන වඩ්ගවිප්පහීණතා වෙදිතබ්බා යථා ච පඨමජ්ඣානස්ස උපචාරක්ඛණෙ නීවරණානි පහීයන්ති න තථා ඉමස්ස විතක්කවිචාරා අප්පණාක්ඛණෙ යෙව පනෙතං විනා තෙහි උප්පජ්ජති තෙනස්ස තෙ පහාණඩ්ගන්ති වුච්චන්ති — පීතිසුඛං චිත්තෙකග්ගතාති ඉමෙසං පන තිණ්ණං උප්පත්තිවසෙන තිවඩ්ගසමන්නාගතතා වෙදිතබ්බා — තස්මා යං හි විභඩ්ගෙ ඣානන්ති දෙසෙතුං පරියායෙන වුත්තං ඨපෙත්වා පන සම්පසාදනං නිප්පරියායෙන උපනිජ්ඣානලක්ඛණප්පත්තානං අඩ්ගානං වසෙන තිවඩ්ගිකමෙවෙතං හොති යථාහ කතමං තස්මිං සමයෙ තිවඩ්ගිකං ඣානං හොති පීතිසුඛං චිත්තෙකග්ගතානි සෙසං පඨමජ්ඣානෙ වුත්තනයමෙව —

( ෂ ‡ )

සමාධිජන්ති, සමාධිජං යන්නෙනි, පඨමජ්ඣානසමාධිතො (ප්‍රථමධ්‍යානය ද්විතීයධ්‍යානයට උපනිශ්‍රය ප්‍රත්‍යය වනබැවින්) ප්‍රථමධ්‍යානසමාධීනු කෙරෙත්හෝ; සම්පයුත්තසමාධිතො වා, සම්ප්‍රයුක්ත සමාධීනුකෙරෙන්හෝ; ජාතන්ති අත්ථො, උපන්නේය යන අර්ථයි; තත්ථ, එහි; කිඤ්චාපි, කිසිසේත්; පඨමම්පි, ප්‍රථමධ්‍යානයද; සම්පයුත්ත සමාධිතො ජාතං, සම්ප්‍රයුක්තසමාධින් උපන්නේය; අථඛො, එතකුදුවුවත්; අයමෙවසමාධි, මෙම සමාධිය; සමාධීති වත්තබ්බතං අරහති, සමාධියයි කියන්නට සුදුසුයි; විතක්කවිචාරක්ඛොභවිරහෙන, විතක්කවිචාරයන්ගේ ක්ෂොභ විරහයෙන්; අතිවියඅචලත්තා, අතිශයින් අචලහෙයින්; සුප්පසන්නත්තා, සුප්‍රසන්නහෙයින්; තස්මා, එහෙයින්; ඉමස්ස වණ්ණභණනත්ථං, මේ ද්විතීයධ්‍යානයාගේ ගුණ කියනුපිණිස; ඉදමෙව, මේම; සමාධිජන්ති වුත්තං, සමාධිජයයි කියනලදී; පීතිසුඛන්ති ඉදං "පීතිසුඛං" යන මේ පදය; වුත්තනයමෙව, කියනලද නය ඇත්තේමැයි, දුතියන්ති, දුතියංයි; ගණනානුපුබ්බතාදුතියං, ගණන පටිපාටිහෙයින් ද්විතීය නම්වේ; දුතියං උප්පන්නන්ති, දෙවෙනිව උපන්නුයි; දුතියං, යි කියන්නවද වටිමැයි; ඉදං, මේ ධ්‍යානයට; දුතියං සමාපජ්ජතීති පි, දෙවනුව සමවදිනුයි කියාද; දුතියං, ද්විතීයනම්වේ; වඩ්ගවිප්පහීණං, දෙඅඩ්ගකින් විප්‍රයුක්තවූ; තිවඩ්ගසමන්නාගතන්ති, තුන්අඩ්ගකින් යුක්තයයි; යම්පන වුත්තං, යමක් කියනලදද? තත්ථ, එහි; විතක්කවිචාරානං පහාණවසෙනෙව, විතක්කවිචාරයන්ගේම ප්‍රහාණ වශයෙන්,

වඞ්ගවිප්පහීණතා, දෙඅඟකින් විප්‍ර
යුක්තබව; වෙදිතබ්බා, දතයුතු; ය
ථාච, යම්සේ; පඨමජ්ඣානස්ස උප
චාරක්ඛණෙ,ප්‍රථමධ්‍යානත්හුගේ උපචා
රක්‍ෂණයෙහි; නීවරණානි පහීයන්ති,
නීවරණයෝ ප්‍රහීණවෙද්ද; න තථා
ඉමස්ස විතක්කවිචාරා, මේ ද්විතීය
ධ්‍යානයාගේ උපචාර ක්‍ෂණයෙහි
විතක්කවිචාරයෝ එසේ ප්‍රහීණනො
වෙත් (කරුණුකිමයත්? විතක්කවිචා
රයන් අසඞ්කලිපටසවභාවබැවින් උ
පචාරභාවනාව ඔවුන්ගේ ප්‍රහාණය
ට නොපොහොසත්බැවිනි-ඉදින් උ
පචාරභාවනාවෙන් ඒ විතක්ක විචා
රයෙහි තණ්හා පැහේනමුදු ගේ වි
ශෙෂ නොවෙයි-සවිශෙෂව ඉහි තෘ
ෂණාප්‍රහාණිය අර්පණවෙහිම වෙ
යි-එයින් කීහ "අප්පණක්ඛණෙ"ය
නාදී) අප්පණක්ඛණෙ යෙව පන, අ
ර්පණක්‍ෂණයෙහිම වනාහි; තං,
ගේ ද්විතීයධ්‍යානය; තෙහි විනා උ
ප්පජ්ජති, ඒ විතක්කවිචාරයන් විනා
උපදී; තෙන, ඒ ධ්‍යාන ක්‍ෂණයෙහි
නොවන බැවින්; අස්ස, ඒ දෙවන
ධ්‍යානත්හුගේ; තෙපහාණඞ්ගානි වුච්ච
න්ති, විතක්කවිචාරදෙදෙන ප්‍රහාණ
ඞ්ගහයි කියනුලැබෙත්; පීතිසුඛචි
ත්තෙකග්ගතා ච, ප්‍රීතිය සුඛය චිත්
තෛකාග්‍රතාය යන; ඉමෙසං පන ති
ණ්ණං උප්පත්තිවසෙන, මේ තුන්
දෙනාගේ උපැත්විසින්; තිවඞ්ගසම
න්නාගතතා වෙදිතබ්බා, තුන්අඟින්
සැදියයුතුබව දතයුතු; තස්මා, එහෙ
යින්(මේ ධ්‍යානය ත්‍ර්‍යඞ්ගිකද එහෙයි
න් "යං විභඞ්ග වුත්තං"යී සම්බ
න්ධකරණු) ඣානන්ති, ඣාන නම්;
සම්පසාදො, සම්ප්‍රසාදය; පීති, ප්‍රීතිය;
සුඛ,!,සුඛය; චිත්තස්සෙකග්ගතාති, චි
ත්තෛකාග්‍රතායයි; වුත්තං, යමෙක්
කියනලද්ද; තං, ගේ විභඞ්ගවචන
ය; සපරික්ඛාරං ඣානං දසෙසතුං,
පරිවාරධ්‍යානය දක්වනුපිණිස;පරියා
යෙන වුත්තං, පර්‍යායයෙන් කියනල
දී (රථයට පාණ්ඩුකම්බලයමෙන් ස
ම්ප්‍රසාදනය ධ්‍යානයට පරිවාරවෙයි
ධ්‍යානාඞ්ග නොවෙයි කීවෙත්)ඨපෙ
ත්වා පන සම්පසාදනං, සම්පසාදන
ය තබා; නිප්පරියායෙන, නිෂ්පර්‍යා
යෙන්; උපනිජ්ඣානලක්ඛණප්පත්තා
නං, උපනිධ්‍යානලක්‍ෂණයට පැමිණි
යාවූ; අඞ්ගානං වසෙන, අඞ්ගයන්
ගේවශයෙන්; එතං, මේධ්‍යානය; ති
වඞ්ගිකමෙව හොති, ත්‍ර්‍යඞ්ගිකමවේ;
යථාහ, වදාළේමය; කතමං තස්මිං
සමයෙ තිවඞ්ගිකං ඣානං හොති, එ
සමයෙහි කවර තුන්අඟක්ඇති ධ්‍යා
නයවේද; පීති, ප්‍රීතිය; සුඛ, සුඛය, චි
ත්තස්සෙකග්ගතාති, චිත්තයාගේ ඒ
කාග්‍රතාය යන මේ තුන්අඟඇති ධ්‍යා
නය වේ; සෙසං, සෙස්ස; පඨමජ්ඣා
නෙ වුත්තනයමෙව, ප්‍රථමධ්‍යානන්හි
කියනලදමැයි.

( ගා ‡ )

සමාධියෙන් උපන් ප්‍රීතිසැපය යන
මෙහි ප්‍රථමධ්‍යානය ද්විතීයධ්‍යානයට උ
පනිශ්‍රය ප්‍රත්‍යයවන බැවින් ප්‍රථමධ්‍යා
නසම්ප්‍රයුක්ත සමාධියෙන්හෝ තමා
හා සම්ප්‍රයුක්ත ද්විතීයධ්‍යානසමාධියෙ
න්හෝ මේ ප්‍රීතිසැපය උපන්නේය
යන අර්ථවන්නේයි. එහි කිසිසේත්
ප්‍රථමධ්‍යානයද තමාහා සම්ප්‍රයුක්ත ස
මාධියෙන් උපන්නේය එනකුදුවූවත්
විතක්කවිචාරයන්ගේ කැලඹීමෙන්
වෙන්ව අතිශයින් නිශ්චලවූ බැවින්
ද විශෙෂයෙන් පහන්වූබැවින්ද මේ
ද්විතීයධ්‍යානසම්ප්‍රයුක්ත සමාධියම ස
මාධියයි කියයුතුවන්නේයි එහෙයි
න් මේ ද්විතීයධ්‍යානයාගේ ගුණවර්ණ
නාකරණුපිණිස මෙහි ඇත්තාවූ ප්‍රී
තිසැපයම සමාධියෙන් හටගත්තේ
යයි කියනලද්දේයි. ප්‍රීතිසැපය යන

පදයාගේ අර්ථ වර්ණනාව යට කියන ලද ක්‍රමයෙන්ම දතයුත්තේයි. ද්විතීය ධ්‍යානය යනු දෙවෙනි ගණන් පිළිවෙළ හෙයින් ද්විතීය නම්වේයි. එසේම යොගාවචරයා විසින් ප්‍රථම ධ්‍යානයට පළමුකොට සමවැද මේ ධ්‍යානයට දෙවනුව සමවදනා බැවින්ද ද්විතීය ධ්‍යානයයි කියනලද්දේයි. ඒ ද්විතීය ධ්‍යානය විතර්ක විචාරයන් දුරුකිරීම වශයෙන් දෙඅඟකින් වෙන්වූ බව දතයුතුයි. යම්සේ ප්‍රථම ධ්‍යානයාගේ උපචාරක්ෂණයෙහි නීවරණයෝ ප්‍රහීණවෙද්ද මේ ද්විතීයධ්‍යානයාගේ උපචාරක්ෂණයෙහි විතර්ක විචාරයෝ ඒ නීවරණයන්ගේ පහවීමක්මෙන් ප්‍රහීණවන්නාහු නොවෙත්මැයි ඊට කාරණා කවරේදයත්? මේ විතර්ක විචාරයෝ කෙලෙස් සවභාව ඇත්තාහු නොවන බැවින් උපචාර භාවනාව ඔවුන් හැසිරවීමට නොපොහොසත් බැවිනැයි දතයුතු.

ඉදින් උපචාර භාවනාවෙන් ඒ විතර්ක විචාරයන් සම්බන්ධව පවත්නා තෘෂ්ණාව ප්‍රහීණ වන්නාහු නමුදු විශෙෂ වශයෙන් ප්‍රහීණ නොවෙයි එහි තෘෂ්ණාප්‍රහාණය අර්පණාක්ෂණයෙහිම විශෙෂවශයෙන් වන හෙයින් අර්පණාක්ෂණයෙහිම ඒ ද්විතීය ධ්‍යානය විතර්ක විචාරයන්ගෙන් වෙන්ව උපදනේය. මෙසේ ඒ විතර්ක විචාර සංඛ්‍යාත ධ්‍යානාඞ්ගයෝ දෙදෙන අර්පණා ක්ෂණයෙහි නොඋපදනා බැවින් ද්විතීය ධ්‍යානයාගේ ප්‍රහාණාඞ්ගයෝයයි කියනලද්දාහුය. මේ ධ්‍යානය ප්‍රීතිය සුඛය චිත්තෛකාග්‍රතාය යන තුන් අඞ්ගයන්ගේ උත්පත්ති වශයෙන් තුන් අඟින් යුක්ත බව දතයුතු. මෙසේ මේ ධ්‍යානය තුන්අඟින් යුක්ත බැවින් විභඞ්ග ප්‍රකරණයෙහි ධ්‍යාන නම් සම්ප්‍රසාදනය ප්‍රීතිය සුඛය චිත්තෛකාග්‍රතායයි යම් වචනයක් කියනලද්ද ඒ වචනය රථය සරසන පිරිකර වශයෙන් පාණ්ඩුකම්බලය කීවාක්මෙන් මේ ධ්‍යානයෙහි ඇත්තාවූ සෙසු ශ්‍රද්ධා ප්‍රඥාදිය ධ්‍යානය සරසන පිරිකර ඇති හෙයින් සම්ප්‍රසාදන වශයෙන් මුත් ධ්‍යානාඞ්ග වශයෙන් නොකියන ලද්දමය එහෙයින් මේ ධ්‍යාන චිත්තයෙහි ඇත්තාවූ සම්ප්‍රසාදන නම්වූ ධර්මයන් තබා විශෙෂයෙන් නීවරණ ධර්මයන්ට විරුද්ධ වශයෙන් දක්මයයි කියනලද උපනිධ්‍යාන ලක්ෂණයට පැමිණියාවූ අඞ්ගයන්ගේ වශයෙන් මේ ධ්‍යානය තුන් අඟක් ඇති ධ්‍යාන නම් වන්නේයි. වදාළේමැයි විභඞ්ග ප්‍රකරණයෙහි එසමයෙහි කවර තුන්අඟක් ඇති ධ්‍යානය උපදනේදයත්? ප්‍රීති සුඛ චිත්තෛකාග්‍රතා යන තුන්අඟකින් යුත් ධ්‍යානය උපදනේයි මෙහි සෙසු විස්තර ප්‍රථම ධ්‍යානයෙහි ආ නියායෙන් දතයුත්තේයි.

---

(පසුගිය 563 වෙනි පිටේ ආ මේ ලඟට සම්බන්ධවන පාලියෙහි 36 වෙනි පේළේ "යංහි විභඞ්ගෙ ඣානානි දෙසෙසුං" යන තැන "යංහි විභඞ්ගෙ ඣානානි සම්පසාදෙ පීතිසුඛං චිත්තස්සෙකග්ගතාති වුත්තං තං සපරික්ඛාරං ඣානං දෙසෙසුං"යි බලින පාඨානය සම්පූර්ණකොට දතයුතු)

---

( පා ¶ )

එවං අධිගතෙ පනෙත්ථ තස්මිම්පි වුත්තනයෙනෙව පඤ්චහාකාරෙහි චිණ්ණවසිනා හුත්වා පගුණ දුතියජ්ඣානතො වුට්ඨාය අයං සමාපත්ති ආසන්නවිතක්කවිචාරපච්චත්ථිකා "යදෙව තත්ථ පීතිගතං චෙතසො උබ්බිලාවිතත්තං එතෙනෙතං ඔළාරිකං අක්ඛායතී"ති වුත්තාය පීතියා ඔළාරිකත්තා අඞ්ග දුබ්බලාති ච තත්ථ දොසං දිස්වා තතියජ්ඣානං සන්තතො මනසිකරිත්වා දුතියජ්ඣානෙ නිකන්තිං පරියාදාය තතියාධිගමා

ය යොගො කාතබ්බො අථස්ස යද දුතියතො වුට්ඨාය සතස්ස සම්පජානස්ස ඣානඞ්ගානි පච්චවෙක්ඛතො පීති ඔළාරිකතො උපට්ඨාති සුඛඤ්චෙව එකග්ගතාච සන්තතො උපට්ඨාති තදස්ස ඔළාරිකඞ්ගපහාණාය සන්තඞ්ග පටිලාභායච තදෙව නිමිත්තං පඨවී පඨවීති පුනප්පුනං මනසිකරොතො ඉදානි තතියජ්ඣානං උප්පජ්ජිස්සතීති භවඞ්ගං උපච්ඡින්දිත්වා තදෙව පඨවිකසිණං ආරම්මණං කත්වා මනොද්වාරාවජ්ජනං උප්පජ්ජති තතො තස්මිංයෙව ආරම්මණෙ චත්තාරි පඤ්චවා ජවනානි ජවන්ති යෙසං අවසානෙ එකං රූපාවචරං තතියජ්ඣානිකං සෙසානි වුත්තනයෙනෙව කාමාවචරානීති එත්තාවතාච පනෙස පීතියාච විරාගා උපෙක්ඛකොච විහරති සතොච සම්පජානො සුඛඤ්ච කායෙන පටිසංවෙදෙති යන්තං අරියා ආචික්ඛන්ති උපෙක්ඛකො සතිමා සුඛවිහාරීති තතියජ්ඣානං උපසම්පජ්ජ විහරති එවමනෙන එකඞ්ග විප්පහීණං ද්වඞ්ගසමන්නාගතං තිවිධ කල්‍යාණං දසලක්ඛණ සම්පන්නං තතියජ්ඣානං අධිගතං හොති පඨවිකසිණං ......

( ස ¶ )

එවං, මෙසේ; අධිගතෙ පන තස්මිං, පැමිණෙනලද ඒ ද්විතීය ධ්‍යානයෙහිදු; වුත්තනයෙනෙව, කීනයින්ම; පඤ්චහාකාරෙහි චිණ්ණවසිතා හුත්වා, පස් ප්‍රකාරයෙන්ම පුරුදුකරණලද වසිතා ඇත්තහු විසින්; පගුණ දුතියජ්ඣානතො වුට්ඨාය, ප්‍රගුණවූ ද්විතීය ධ්‍යානයෙන් නැඟී; අයං සමාපත්ති, මේ සමවත් තොමෝ; ආසන්න විතක්ක විචාර පච්චත්ථිකා, ආසන්නවූ විතර්ක විචාර යන සතුරන් ඇත්තේයයිදු; පීති සා ඔළාරිකත්තා, ප්‍රීතිය ඖදාරික බැවින්; අඞ්ග දුබ්බලාහිච, දුර්වල අඞ්ග ඇත්තේයයිදු; තාප දොසං දිස්වා, ඒ දෙවන ධ්‍යානයෙහි අයුණු දැක; තතියජ්ඣානං, තුන්වන ධ්‍යානය; සන්තතො මනසිකරිත්වා [ප්‍රීති නැති බැවින්) ශාන්තයයි මෙනෙහිකොට; දුතියජ්ඣානෙ නිකන්තිං පරියාදාය, ඒ දෙවන ධ්‍යානයෙහි නිකාන්තිය මෙරවා; තතියාධිගමාය, තුන්වන ධ්‍යානයාගේ අධිගමයට; යොගො කාතබ්බො, භාවනා යොග කටයුතු; අථ, ඉක්බිතෙන්; යදා, යම්කලෙක්හි; දුතියතො වුට්ඨාය, දෙවන ධ්‍යානයෙන් නැඟී....පෙ....එත්තාවතාච පන, මෙපමණෙකින් වනාහි; පීතියාච විරාගා, ප්‍රීතියගේද විරාගයෙන්; උපෙක්ඛකොච විහරති, උපෙක්ෂකවද වෙසේ; සතොච, සිහි ඇත්තේද; සම්පජානො, නුවණැත්තේද; සුඛඤ්ච, සුවද; කායෙන, කයින්; පටිසංවෙදෙති, විඳී; යං, යම් ධ්‍යානයක් හෙතුකොටගෙණ; තං, ඒ තෘතීය ධ්‍යාන සමන්විත පුද්ගලයා; උපෙක්ඛකො, උපෙක්ෂකය; සතිමා, සිහිය ඇත්තේය; සුඛවිහාරීති, සුඛවිහාර ඇත්තේයයි; අරියා ආචික්ඛන්ති, ආර්‍ය්‍යයෝ කියද්ද; තං තතියජ්ඣානං උපසම්පජ්ජ විහරති, ඒ තෘතීයධ්‍යානය උපදවා වෙසේ......පෙ......

( හා ¶ )

මෙසේ ලබනලද ද්විතීය ධ්‍යානයෙහිද යටකී පරිදි පස්ආකාරයකින් පුරුදුකරණලද වශිත්වය ඇත්තාහු විසින් ප්‍රගුණවූ ඒ ද්විතීයධ්‍යානයෙන් නැගී මේ සමාපත්තියට විතර්ක විචාර නාමැති සතුරෝ ලඟ ඇත්තාහ ප්‍රීති නම් වූ යම් ධ්‍යානාඞ්ගයෙක් මෙහි ඇත්තේවේද ඒ ප්‍රීතිය තමා අයත් වස්තුවෙහි අත්‍යොහාරණාලද ප්‍රෙමය මෙන් ආදීනව නොදක්නාවූ තෘෂ්ණාව

විෂයකොට ඇත්තේවේයි ඔළාරිකයේ හැගෙන්නාවූ ඒ ප්‍රීතියෙන් යුක්ත හෙයින් මේ ද්විතීය ධ්‍යානය අඞ්ග දුර්වලයයි මෙසේ ද්විතීය ධ්‍යානයෙහි අප්‍රසාද දැක තෘතීය ධ්‍යානය ප්‍රීති විරහිත බැවින් ශාන්තයයි මෙනෙහිකොට ද්විතීය ධ්‍යානයෙහි කැමැත්ත ගෙවා තෘතීය ධ්‍යානයට පැමිණීමට භාවනා කටයුත්තේයි ඉක්බිතිතෙන් ද්විතීය ධ්‍යානයෙන් නැගී සිහිනුවණ ඇතිව ධ්‍යානාඞ්ගයන් ප්‍රත්‍යවේක්ෂාකරන්නාවූ මේ යෝගාවචරයා හට ප්‍රීතිය ඔළාරිකසේ වැටහේද සුඛ ඒකාග්‍රතා යන ධ්‍යානාඞ්ග දෙදෙන ශාන්ත හෙයින් වැටහේද එකල්හි ඖදාරිකාඞ්ගයන් දුරුකිරීම පිණිසද සංසුන් අඞ්ගයන් ලැබීම පිණිසද එම පෘථිවීකසිණ නිමිත්තම පඨවි පඨවීයයි නැවත නැවත මෙනෙහිකරන්නාවූ මේ යෝගාවචරයා හට දැන් තෘතීය ධ්‍යානය උපදීය යුතුයයි කියනුතකල්හි භවාඞ්ගශ්‍රෝතස සිඳගෙණ එම පෘථිවි කසිණයම අරමුණුකොට මනොද්වාරාවර්ජන සිත උපදනේය ඉක්බිතිතෙන් එම අරමුණෙහි යම් ජවන වීථියක අවශානයෙහි එකම තෘතීයධ්‍යානික රූපාවචර සිතක් හා සෙසු චිත්තයෝ යටකියනලද ක්‍රමයෙන් කාමාවචරවෙද්ද එබඳු චිත්ත වීථියක් උපදනේය ඒ මේ යෝගාවචර මහණ මෙපමණකින් ප්‍රීතියෙහි නොඇල්මෙන් උපෙක්ෂකව සිහිනුවණින් යෙදී වාසයකරන්නේයි මානසික සුවය ත්‍රිවිධ නාමස්කන්ධ සංඛ්‍යාත කයින් විඳින්නේය ඒ තෘතීය ධ්‍යානලාභි පුද්ගලයා යම් තෘතීයධ්‍යානයක් හෙතුකොටගෙණ උපෙක්ෂාය සිහිනුවණ ඇත්තේය සුඛවිහාර ඇත්තේයයි ආර්යයෝ ප්‍රශංසා කෙරෙද්ද එබදු ප්‍රශංසා ලබන්නට සුදුසුවූ තෘතීය ධ්‍යානය උපදවා වාසයකරන්නේනම් වේද්දනේයි. මෙසේ මේ යෝගාවචර මහණ එක් අඞ්ගයකින් වියුක්තවූ දෙඅඞ්ගයකින් යුක්තවූ ත්‍රිවිධ කල්‍යාණයෙන් හා දශලක්ෂණයෙන් සම්පූර්ණවූ තෘතීය ධ්‍යානයට පැමිණී කසිණය අරමුණුකොට පැමිණෙනලද්දේනම් වන්නේයි ——

( පා )

තත්ථ පීතියා ච විරාගා ති විරාගො නාම වුත්තප්පකාරාය පීතියා ජිගුච්ඡනං වා සමතික්කමො වා උභින්නං පන අන්තරා ච සද්දො සම්පිණ්ඩනත්ථො සො වූපසමං වා සම්පිණ්ඩෙති විතක්ක විචාරවූපසමං වා තත්ථ යදා වූපසමමෙව සම්පිණ්ඩෙති තදා පීතියා විරාගා ච කිඤ්චි භියෙයා වූපසමා චාති එවං යොජනා වෙදිතබ්බා —— ඉමිස්සාච යොජනාය විරාගො සමතික්කමනත්ථො හොති තස්මා පීතියාච සමතික්කමා විතක්ක විචාරානඤ්ච වූපසමාති අයමත්ථො දට්ඨබ්බො —— කාමඤ්චෙතෙ විතක්ක විචාරා දුතියජ්ඣානෙයෙව වූපසන්තා ඉමස්ස පන ඣානස්ස මග්ගපරිදීපනත්ථං වණ්ණභණනත්ථඤ්චෙතං වුත්තං විතක්ක විචාරානඤ්ච වූපසමාති හි වුත්තෙ ඉදං පඤ්ඤායති නූන විතක්ක විචාරානං වූපසමො මග්ගො ඉමස්ස ඣානස්සාති යථාච තතියෙ අරියමග්ගෙ අප්පහීනානම්පි සක්කාය දිට්ඨාදීනං පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පහානාති එවං පහානං වුච්චමානං වණ්ණභණනං හොති තදධිගමාය උස්සුක්කානං උස්සාහජනකං එවමෙව අවූපසන්තානම්පි විතක්කවිචාරානං වූපසමො වුච්චමානො වණ්ණභණනං හොති තෙනායමත්ථො වුත්තො පීතියාච සමතික්කමා විතක්කවිචාරානඤ්ච වූපසමාති ——

( ශ * )

තත්‍ර (පාලියෙහි) ඒ විරාගා යන්නෙහි; විරාගො, විරාග නම්; වුත්තප්පකාරාය පීතියා "යදෙව තත්‍ර පීති ආභොගො" යි වුත්තප්‍රකාර ඇති ප්‍රීතියෙහි; ජිගුච්ඡනං වා, නිර්වේද මුඛයෙන් ගිලනය (නිදනය හෝ) සමතික්කමො වා, තත් ප්‍රතිබද්ධ රාගප්‍රහාණයෙන් ඉක්මීම හෝයි; උභින්නං පන අන්තරා, පීතියා විරාගා යන දෙපදයන්ගේ අතුරෙහි; චසද්දො, ච ශබ්දය; සම්පිණ්ඩනත්ථො, සමුච්චයාර්ථයි; සො, ඒ ච ශබ්දය තෙමේ; වූපසමං වා සම්පිණ්ඩෙති, ව්‍යුපසමය හෝ පිඩුකෙරෙයි; විතක්කවිචාර වූපසමං වා, විතර්ක විචාරයන්ගේ ව්‍යුපශමය හෝ පිඩු කෙරේ; තත්‍ර, ඒ දෙක්හි; යදා වූපසමමෙව සම්පිණ්ඩෙති, යම් කාලෙක ව්‍යුපශමයම පිඩුකෙරේද; තදා, එකල්හි; පීතියා ච විරාගා ච, ප්‍රීතියෙහි විරාගයෙන්ද; කිඤ්චි භීය්‍යො, නැවත කිමෙක්ද; වූපසමා ච ඉති, ව්‍යුපසමයෙන්දැයි; එවං යොජනා වෙදිතබ්බා, මෙසේ යොජනා දතයුතු; ඉමිස්සා යොජනාය, මේ යොජනාවෙහි; විරාගො ජිගුච්ඡනත්ථො හොති, විරාග ශබ්දය ජුගුප්සාර්ථවේ; තස්මා, එහෙයින්; පීතියා, ප්‍රීතියෙහි; ජිගුච්ඡනා ච, ජුගුප්සාවෙන්ද; සමතික්කමා ච ඉති, ඉක්මීමෙන්දැයි; අයමත්ථො දට්ඨබ්බො, මේ අර්ථය දතයුතු; යදා පන, යම් කලෙක වනාහි; විතක්කවිචාර වූපසමං සම්පිණ්ඩෙති, විතක්කවිචාරයන්ගේද සංසිඳීම පිඩුකෙරේද; තදා, එකල්හි; පීතියා ච විරාගා, ප්‍රීතියෙහි විරාගයෙන්ද; විතක්කවිචාරානඤ්ච වූපසමා ඉති, විතක්කවිචාරයන්ගේ සංසිඳීමෙන්දැයි; එවං, මෙසේ; යොජනා වෙදිතබ්බා, යොජනා දතයුතු; ඉමිස්සා යොජනාය, මේ යොජනාවෙහි; විරාගො, විරාග ශබ්දය; සමතික්කමත්ථො හොති, සමතික්‍රමනාර්ථවේ; තස්මා, එහෙයින්; පීතියා ච සමතික්කමා, ප්‍රීතියගේ ඉක්මීමෙන්ද; විතක්කවිචාරානඤ්ච වූපසමා ඉති, විතක්කවිචාරයන් සංසිඳීමෙන්දැයි; අයමත්ථො දට්ඨබ්බො, මේ අර්ථය දතයුතු; කාමඤ්ච, එකාන්තයෙන්ම; එතෙ විතක්කවිචාරා, මේ විතක්කවිචාර දෙදෙනා; දුතියජ්ඣානෙ යෙව වූපසන්තා, ද්විතීයධ්‍යාන ක්ෂණයෙහිම සන්හුන්හ; ඉමස්ස පන ඣානස්ස, මේ ධ්‍යානයට වනාහි; මග්ග පරිදීපනත්ථං, උපාය දක්වන පිණිසද (ද්විතීය ධ්‍යානය නොලදහොත් තෘතීය ධ්‍යානය නොලදහැකි බැවින් විතර්කවිචාරයන්ගේ සමතික්‍රමනය තෘතීය ධ්‍යානලාභයට මාර්ගවී) වණ්ණභණනත්ථඤ්ච, ගුණ කියන පිණිසද; එතං වුත්තං, මේ 'විතක්කවිචාරවූපසමා' යනවචනය කියනලදී; විතක්කවිචාරානං වූපසමා ති වුච්චමානෙ, විතක්කවිචාරයන්ගේ ව්‍යුපශමයෙනැයි කී කල්හි; ඉදං පඤ්ඤායති, මේ පැණේ; නූන, එකාන්තයෙන්; විතක්කවිචාරානං වූපසමො, විතක්කවිචාරයන්ගේ ව්‍යුපසමය; ඉමස්ස ඣානස්ස මග්ගො ති, මේ ධ්‍යානයට මාර්ගයයි ("ඉදං පඤ්ඤායති" යොදනු) යථා ච, යම්සේ; තතියෙ අරියමග්ගෙ අප්පහීනානම්පි, තෘතීය ආර්යමාර්ගක්ෂණයෙහි අප්‍රහීණවූ; සක්කායදිට්ඨාදීනං, සත්කාය දෘෂ්ටිය විචිකිත්සාය ශීලව්‍රත පරාමර්ශය කාමරාගය ව්‍යාපාදය යන; පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං, පඤ්චවාරම්භාගිය සංයොජනයන්ගේ; පහාණං ති, ප්‍රහාණයෙනැයි; එවං පහාණං වුච්චමානං, මෙසේ ප්‍රහාණය කියනුලබන්නේ; වණ්ණභණනං හොති (මෙහි නොපැහෙතුදු ප්‍රසං

ගා මාත්‍රයක් ගෙණ කියන බැවින්) ව ණ්හණන නාම්වේද; තදධිගමාය උස්සුක්කානං, තෘතීය මාර්ගාධිගමය පිණිස උත්සාහකරන්නවුන්ට; උස්සාහජනනං, උත්සාහජනකවේද; එවමෙවං, එපරිද්දෙන්ම; ඉධ, මේ තෘතීය ධ්‍යානයෙහි; අවූපසන්තානම්පි, නොසන්හුන්නාවූද; විතක්කවිචාරානං, විතර්ක විචාරයන්ගේ; වූපසමො වුච්චමානො, සංසිඳීම කියනු ලබන්නේ; වණ්ණභණනං හොති, ගුණකීර්ත නාම්වේ; තෙන, එහෙයින්; අයමෙත්ථ වුත්තො, මේ අර්ථය කියනලදී; පීතියාච සමතික්කමා, ප්‍රීතියගේ සමතික්‍රමනයෙන්ද; විතක්කවිචාරානඤ්ච වූපසමා, විතර්ක විචාරයන්ගේ සංසිඳීමෙන්ද යන ("අයමෙත්ථ වුත්තො"යි යොදනු) ——

( හා. * )

ඒ දෙශනා පාලියෙහි ප්‍රීතියෙහි නොඇලීමය යන මෙහි නොඇලීමනම් යට දක්වනලද ආකාර ඇති ප්‍රීතියෙහි කලකිරීම් වශයෙන් පිළිකුල් කිරීම හෝ ඒ පිළිබඳ ඇල්ම දුරැකිරීම හෝ දතයුතු. තවද මේ "පීතියා විරාගා" යන ශබ්දයන් දෙදෙනාඅතුරෙහි ඇත්තාවූ ච නිපාත ශබ්දය පිඩුකිරීම අර්ථකොට ඇත්තේයි. කුමක් පිඩු කරන්නේදයත්? සංසිඳීම හෝ පිඩුකරන්නේය. විතර්ක විචාරයන්ගේ ව්‍යුපශමය හෝ පිඩුකරන්නේයි ඒ දෙයාකාර සම්පිණ්ඩනාර්ථයන්අතුරෙන් යම්කලෙක ප්‍රීතියගේ සංසිඳීම පිඩු කෙරේ නම් එකල්හි ප්‍රීතියෙහි විරාගයෙන් හෙවත් ප්‍රීතිය සංසිඳුවීමෙන්දැයි මෙසේ යෙදියයුත්තේය මේ යෙදීමෙහි විරාග ශබ්දය පිළිකුල්කිරීම අර්ථකොට ඇත්තේයි. එහෙයින් ප්‍රීතියෙහි පිළිකුල්කිරීමෙන්ද ප්‍රීතිය ඉක්මීමෙන්දැයි මෙසේ මේ අර්ථය දෙයාකාරයෙන් දතයුතු. යම්කලෙක විතර්ක විචාරයන්ගේ සංසිඳීම පිඩුකෙරේද එකල්හි ප්‍රීතියෙහි නොඇලීමෙන්ද විතර්ක විචාරයන්ගේ සංසිඳීමෙන්දැයි මෙසේ යෙදියයුතු. මේ දෙවෙනි යෙදීමෙහි විරාග ශබ්දය ඉක්මීම අර්ථකොට ඇත්තේයි. එහෙයින් ප්‍රීතිය ඉක්මීමෙන්ද විතර්ක විචාරයන් සංසිඳීමෙන්දැයි මෙසේ අර්ථ දතයුතු මේ විතර්ක විචාරයෝ එකාන්තයෙන් ද්විතීය ධ්‍යානක්ෂණයෙහිම සංසිඳුනාහුය. එතකුදුවුවත් මේ තෘතීය ධ්‍යානයට උපාය දක්වන පිණිස හෙවත් ද්විතීය ධ්‍යානය නොලද්දේ විනම් තෘතීය ධ්‍යානයද නොලැබියහැකි බැවින්ද විතර්ක විචාරයන් ඉක්මීම තෘතීය ධ්‍යානය ලැබීමට මාර්ගවන බැවින්ද ද්විතීය ධ්‍යානයාගේ ගුණවර්ණනාකිරීම පිණිසද මේ විතර්ක විචාරයන්ගේ සංසිඳීම දක්වනලද්දේයි ඒ එසේමැයි විතර්ක විචාරයන්ගේ සංසිඳීමෙහැයි කීකල්හි එකාන්තයෙන් විතර්ක විචාරයන්ගේ ව්‍යුපශමය මේ තෘතීය ධ්‍යානයට මාර්ගයයි යන අර්ථය පහළවන්නේය යම්සේ අනාගාමි මාර්ග විභානක්ෂණයෙහි නිසිදේත් ප්‍රහීණ නොවන්නාවූ ප්‍රථම මාර්ගවිෂය වූ සත්කාය දෘෂ්ටිය විචිකිත්සාය සීලව්‍රත පරාමර්ශය කාමරාගය ව්‍යාපාදය යන පඤ්චොරම්භාගිය සංයෝජනයන්ගේ ප්‍රහාණය වන්නේයයි මෙසේ කියනලද ප්‍රහාණය අනාගාමි මාර්ගක්ෂණයෙහි නොවතුදු ගුණ ප්‍රකාශකිරීම පිණිසවේද ඒ අනාගාමි මාර්ගයට පැමිණීමට උත්සාහකරනනවුන්ට උත්සාහ දනවාද එපරිද්දෙන්ම මේ තෘතීය ධ්‍යානයෙහි නොසංසිඳෙන ධර්මයන්ගේ සංසිඳීම ගුණ ප්‍රකාශකිරීම පිණිස ප්‍රීතිය ඉක්මවීමෙන්ද විතර්ක වි

වාරයන් ව්‍යුපශමය කිරීමෙන් දූනිය හැලද්දේයයි මෙසේ අර්ථ දතයුතු.—

( පා † )

උපෙක්ඛකො ච විහරතීති එත්ථ උපපත්තිතො ඉක්ඛතීති උපෙක්ඛා සමං පස්සති අපක්ඛපතිතා හුත්වා පස්සතීති අත්ථො තාය විසදාය විපුලාය ථාමගතාය සමන්නාගතත්තා තතියජ්ඣාන සමඞ්ගී උපෙක්ඛකොති වුච්චති උපෙක්ඛා පන දසවිධා හොති.—

ඡළඞ්ගුපෙක්ඛා—බ්‍රහ්මවිහාරුපෙක්ඛා—බොජ්ඣඞ්ගුපෙක්ඛා—විරියුපෙක්ඛා—සඞ්ඛාරුපෙක්ඛා—වෙදනුපෙක්ඛා—විපස්සනුපෙක්ඛා—තත්‍රමජ්ඣත්තුපෙක්ඛා—ඣානුපෙක්ඛා—පාරිසුද්ධුපෙක්ඛාති—තත්ථ යා ඉධ ඛීණාසවො භික්ඛු චක්ඛුනා රූපං දිස්වා නෙව සුමනො හොති න දුම්මනො උපෙක්ඛකො විහරති සතො සම්පජානොති එවමාගතා ඛීණාසවස්ස ඡසුද්වාරෙසු ඉට්ඨානිට්ඨ ඡළාරම්මණාපාථෙ පරිසුද්ධපකති භාවා විජහනාකාරභූතා උපෙක්ඛා අයං ඡළඞ්ගුපෙක්ඛා නාම—යා පන උපෙක්ඛාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරතීති එවමාගතා සත්තෙසු මජ්ඣත්තාකාරභූතා උපෙක්ඛා අයං බ්‍රහ්මවිහාරුපෙක්ඛා නාම—

( ස † )

උපෙක්ඛකො ච විහරති, උපෙක්ඛකො ව විහරති යන්නෙහි; උපපත්තිතො (සමවාහිත බැවින්) සුදුසු පරිද්දෙන්; ඉක්ඛතීති, බලානුයි; උපෙක්ඛා, උපෙක්ෂා නම්; සමං, සමකොට; පස්සති, බලා (ධ්‍යානුපෙක්ෂාවද සමවාහිත අන්තානීතකොට පවත්නෙන් "සමංපස්සති"යි යොදනු) අපක්ඛපතිතා හුත්වා, පක්ෂපාත නොව; පස්සතී ති අත්ථො, බලයි යන අර්ථයි; විසදාය (සංක්ලේශ විගමයෙන්) පරිව්‍යක්තවූ; විපුලාය (සාතිශය මහද්ගතභාවප්‍රාප්තීන්) මහත්වූ; ථාමගතාය (ප්‍රීතිවිගමයෙන්) ස්ථිර භාවයට පැමිණියාවූ ("තාය සමන්නාගතත්තා"යි යොදනු) උපෙක්ෂාවෙන් සමන්නාගත හෙයින්; තතියජ්ඣාන සමඞ්ගී, තෘතීය ධ්‍යානයෙන් සමන්විත තෙමේ; උපෙක්ඛකොති වුච්චති, උපෙක්ෂකයයි කියනු ලැබේ; උපෙක්ඛා පන, උපෙක්ෂා වනාහි; දසවිධා හොති, දශප්‍රකාරවේ; ඡළඞ්ගුපෙක්ඛා, ෂඩඞ්ගොපෙක්ෂාය; බ්‍රහ්මවිහාරුපෙක්ඛා, බ්‍රහ්මවිහාරොපෙක්ෂාය; බොජ්ඣඞ්ගුපෙක්ඛා, බොධ්‍යඞ්ගොපෙක්ෂාය; විරියුපෙක්ඛා, වීර්‍ය්‍යොපෙක්ෂාය; සඞ්ඛාරුපෙක්ඛා, සංස්කාරොපෙක්ෂාය; වෙදනුපෙක්ඛා, වෙදනොපෙක්ෂාය; විපස්සනුපෙක්ඛා, විදර්ශනොපෙක්ෂාය; තත්‍රමජ්ඣත්තුපෙක්ඛා, තත්‍රමධ්‍යස්ථොපෙක්ෂාය; ඣානුපෙක්ඛා, ධ්‍යානොපෙක්ෂාය; පාරිසුද්ධි උපෙක්ඛාති, පාරිශුද්ධි උපෙක්ෂාය යි (උපෙක්ෂා වෙදනාව නැතිනම් "උපෙක්ඛකො" යනු කුමට කීහයත්? උපෙක්ෂා වෙදනාව උපෙක්ෂානම් නොවේගී උපෙක්ෂා නම් දශවිධ වෙයි දක්වන පිණිස "උපෙක්ඛා පන දසවිධා"යි කියා දශවිධ උපෙක්ෂාවන් උද්දෙසකොට දූන් ඔවුන් ස්වරූපයෙන් දක්වන පිණිස "තත්ථ" යනාදී කීහු) තත්ථ, ඒ දශවිධ උපෙක්ෂාවන් කෙරෙහි ("යා උපෙක්ඛා"යි යොදනු) ඉධ, මේ ශාසනයෙහි; ඛීණාසවො භික්ඛු, ක්ෂීණාශ්‍රව මහණ තෙමේ; චක්ඛුනා රූපං දිස්වා, චක්ෂුසින් රූපය දැක; නෙව සුමනො හොති (රාග වශයෙන්) නොද සොම්නස්වෙයි; න දුම්මනො (ප්‍රතිඝ වශයෙන්) නොද දොම්නස්වේ; උපෙක්ඛකො විහරති, උපෙක්ෂකව වෙසේ; ස

තො, සිහිඇත්තේ; සම්පජානොති, නුවණ ඇත්තේයයි; එවමාගතා, මෙසේ ආ; ඛීණාසවස්ස, ක්ෂීණාශ්‍රවයාගේ; ඡසු ද්වාරෙසු, ෂඩ්ද්වාරයෙහි; ඉට්ඨානිට්ඨ ඡළාරම්මණාපාථෙ, ඉෂ්ටානිෂ්ට ෂඩාලම්බනයන් හමුවූ කල්හි; පරිසුද්ධපකතිභාවා (නිකෙලශී බවයයි කියන ලබන) පරිශුද්ධ ප්‍රකෘති ඇති බව; අවිජහනාකාරභූතා, නොහරණ ආකාරයෙන්වූ; යා පන උපෙක්ඛා, යම් උපෙක්ෂාවක් ඇද්ද; අයං, මේ තොමෝ; ඡළඞ්ගුපෙක්ඛා නාම, ෂඩඞ්ගොපෙක්ෂා නම්වේ; උපෙක්ඛා සහගතෙන චෙතසා, උපෙක්ෂාසහගත චිත්තයෙන්; එකං දිසං ඵරිත්වා විහරතීති, එක්දිශක් පතුරුවා වෙසෙයි; එවමාගතා, මෙසේ ආ; සත්තෙසු මජ්ඣත්තා කාරභූතා, සත්වයන් කෙරෙහි මධ්‍යස්ථාකාරයෙන්වූ (සත්වයන් කෙරෙහි සාමීචකතා දර්ශනයට හෙතුවූ දර්ශනාකාරයෙන්වූ යන අර්ථයි) අයං බ්‍රහ්මවිහාරුපෙක්ඛා නාම, මේ බ්‍රහ්මවිහාරොපෙක්ෂා නමු —

(සා †)

උපෙක්ෂකව වාසයකරන්නේය යන මෙහි සම්ව ඉසිලීමට සුදුසු පරිද්දෙන් බලන අර්ථයෙන් හෙවත් ධ්‍යාන උපෙක්ෂාව කෙළවර දක්වා සම්කොට පැමිණ වීමෙන් අපක්ෂපාතව බලන අර්ථයෙන් උපෙක්ෂා නම් වන්නීය ඒ කෙලශ ගම්භාර කාළහෙයින් ප්‍රකටවූද අග්‍රශශීන් මහත් බවට පැමිණි හෙයින් විපුලවූද ප්‍රීතිය දුරුකළ බැවින් සපිර භාවයට පැමිණියාවූද උපෙක්ෂා වෙන් යුක්තහෙයින් තෘතීය ධ්‍යානය ට සමවන් යොගාවචරයා උපෙක්ෂක යයි කියනලද්දේයි.

ඒ උපෙක්ෂාව වනාහි දශවැදෑරුම් වන්නීය. ඒ කවරහුද යත්? ෂඩඞ්ගොපෙක්ෂාය බ්‍රහ්මවිහාරොපෙක්ෂාය බොධ්‍යඞ්ගොපෙක්ෂාය වීය්‍ර්‍යොපෙක්ෂාය සංස්කාරොපෙක්ෂාය වෙදනොපෙක්ෂාය විදර්ශනොපෙක්ෂාය තත්‍රමධ්‍යස්ථොපෙක්ෂාය ධ්‍යානොපෙක්ෂාය පාරිශුද්ධි උපෙක්ෂායයි දශවැදෑරුම් වන්නීය ඒ දශවිධ උපෙක්ෂාවන් අතුරෙන් මේ ස්ථානයෙහි ක්ෂීණාශ්‍රව රහත්මහණතෙමේ ඇසින් රූපාරමුණක් දක ඇලුම් වශයෙන් සොම්නස් හෝ නොවේද වෙෂ වශයෙන් දොම්නස් හෝ නොවේද මධ්‍යස්ථව සිහිනුවණින් යෙදී වෙසේදැයි මෙසේ දක්වනලද්දාවූ ක්ෂීණාශ්‍රව මහණහුගේ චක්ෂුරාදි සදොරට රූපාදී ඉෂ්ටානිෂ්ට අරමුණු හමුවූ කල්හි නිකෙලශී පිරිසිදු ස්වභාව අත්නොහරණ ආකාරයෙන් පවත්නා යම් උපෙක්ෂාවක් වීද ඒ ෂඩඞ්ගොපෙක්ෂා නම් වන්නීය උපෙක්ෂාසහගත චිත්තයෙන් එක් දිශාභාගයක් පතුරුවා වාසය කරන්නේයයි මෙසේ දක්වනලද සකල සත්වයන් කෙරෙහි මැදහත් ආකාරයෙන් පවත්නා යම් උපෙක්ෂාවක් වීද ඒ බ්‍රහ්මවිහාරොපෙක්ෂා නම් වන්නීය —

(සා ‡)

යා උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගං භාවෙති විවෙකනිස්සිතන්ති එවමාගතා සහජාත ධම්මානං මජ්ඣත්තාකාරභූතා උපෙක්ඛා අයං බොජ්ඣඞ්ගුපෙක්ඛා නාම — යා පන කාලෙන කාලං උපෙක්ඛා නිමිත්තං මනසිකරොතීති එවමාගතා අනච්චාරද්ධනාති සිථිලා විරියසඞ්ඛාතා උපෙක්ඛා අයං විරියුපෙක්ඛා නාම — යා කතිසඞ්ඛාරුපෙක්ඛා සමාධිවසෙන උප්පජ්ජන්ති කති සංඛාරුපෙක්ඛා විපස්සනාවසෙන උප්පජ්ජන්ති අට්ඨ සංඛාරුපෙක්ඛා සමාධිවසෙන උප්පජ්ජන්ති දස සංඛාරුපෙක්ඛා විපස්සනාවසෙන උප්පජ්ජන්තීති

එවමාගතා නීවරණාදි පටිසංඛා සන්තිට්ඨනා ගහණෙ මජ්ඣත්තභූතා උපෙක්ඛා අයං සංඛාරුපෙක්ඛා නාම. යා පන යස්මිං සමයෙ කාමාවචරං කුසලං චිත්තං උප්පන්නං හොති උපෙක්ඛාසහගතන්ති එවමාගතා අදුක්ඛමසුඛ සඤ්ඤිතා උපෙක්ඛා අයං වෙදනුපෙක්ඛා නාම. යා යදත්ථි යං භූතං තං පජහති උපෙක්ඛං පටිලභතීති එවමාගතා විචිනනෙ මජ්ඣත්තභූතා උපෙක්ඛා අයං විපස්සනුපෙක්ඛා නාම. යා පන ඡන්දාදීසු යෙවාපනකෙසු ආගතා සහජාතානං සමවාහිතභූතා උපෙක්ඛා අයං තත්‍රමජ්ඣත්තුපෙක්ඛා නාම. යා උපෙක්ඛකො ච විහරතීති එවමාගතා අග්ගසුඛෙපි තස්මිං අපක්ඛපාතජනනී උපෙක්ඛා අයං ඣානුපෙක්ඛා නාම. යා පන උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථජ්ඣානන්ති එවමාගතා සබ්බපච්චනීකපරිසුද්ධා පච්චනීකවූපසමනෙපි අබ්‍යාපාරභූතා උපෙක්ඛා අයං පාරිසුද්ධි උපෙක්ඛා නාම.

---

( ස ‡ )

උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං, උපෙක්ෂා සම්බොධ්‍යඞ්ගය; භාවෙති, වඩා; විවෙකනිස්සිතන්ති, විවෙක නිශ්‍රිතවූයයි; එවමාගතා, මෙසේ ආ; සහජාත ධම්මානං මජ්ඣත්තාකාරභූතා උපෙක්ඛා, සහජාත ධර්මයන් කෙරෙහි මධ්‍යස්ථාකාරයෙන් පවත්නාවූ උපෙක්ෂාවක් ඇද්ද (භාවනාව වීපි ප්‍රතිපන්න කල්හි අලීනානුද්ධත අනිරුස්වාද භාවයෙන් ප්‍රග්‍රහනිග්‍රහ සම්ප්‍රහර්ෂණයෙහි ව්‍යාපාරයක් නැති හෙයින් සම්ප්‍රයුක්ත ධර්මයන් කෙරෙහි මධ්‍යස්ථාකාරයෙන් පවත්නාවූ යන අදහසි. "සහජාත ධම්මානං" යනු නිර්ධාරණයෙහි ෂෂ්ඨියි) අයං බොජ්ඣඞ්ගුපෙක්ඛා, මේ බොධ්‍යඞ්ගොපෙක්ෂා නම් වේ; කාලෙන කාලං, කලින්කල; උපෙක්ඛා නිමිත්තං මනසිකරොති, වීර්‍ය නිමිත්තය මෙනෙහි කෙරේනුයි (සමවාහිතව පවත්නාසඳ මැදහත්වන බැවින් වීර්‍යයම උපෙක්ෂා නමිවේ "සමවාහිතකාලෙ උපෙක්ඛ්‍යත ඉතබ්බුපෙක්ඛාතබ්බත්‍යෙතෙ වීර්‍ය" යනු සත්නකි "ලීනුද්ධච්ච පක්ඛපාත රහිතං මජ්ඣත්තං විරියං උපෙක්ඛා" යනු ටීකාකී. මධ්‍යස්ථාකාරයෙන් පවත්නා වීර්‍යයම ආකාරයගෙන පැවැත්විය යුතුවූ එබඳු වීර්‍යයට නිමිත්ත වන බැවින් උපෙක්ෂා නිමිත්ත නමිවේ "භාවනාය සමප්පවත්තිකාලෙ උපෙක්ඛියතීති උපෙක්ඛා විරියමෙව උපෙක්ඛා විරියුපෙක්ඛා"යි ගන්ථෙත්) අනච්චාරද්ධා, අත්‍යාරබ්ධ නොවූ; නාතිසිථිලා, අතිසිථිල නොවූ; විරියසඞ්ඛාතා උපෙක්ඛා, වීර්‍ය සංඛ්‍යාත උපෙක්ෂා නොමේ; අයං විරියුපෙක්ඛා නාම, මේ වීර්‍යොපෙක්ෂා නමු; කති සඞ්ඛාරුපෙක්ඛා, සංස්කාරොපෙක්ෂා කීදෙනෙක්; සමාධිවසෙන උප්පජ්ජන්ති, සමාධි වශයෙන් උපදිද්ද; කති සඞ්ඛාරුපෙක්ඛා, සංස්කාරොපෙක්ෂා කීදෙනෙක්; විපස්සනාවසෙන උප්පජ්ජන්ති, විදර්ශනා වශයෙන් උපදනාහුද; අට්ඨසඞ්ඛාරුපෙක්ඛා සමාධිවසෙන උප්පජ්ජන්ති, සංස්කාරොපෙක්ෂාවෝ අටදෙනෙක් සමාධි විසින් උපදිත් (ඔවුන් අවදෙනා මේ පාලි විසින් දතයුතු "පඨමජ්ඣාන පටිලාභත්ථාය නීවරණෙ පටිසඞ්ඛා සන්තිට්ඨනා පඤ්ඤා සඞ්ඛාරුපෙක්ඛාසු ඤාණං දුතියජ්ඣාන පටිලාභත්ථාය විතක්ක විචාරෙ තතියජ්ඣාන පටිලාභත්ථාය පීතිං චතුත්ථජ්ඣාන පටිලාභත්ථාය සුඛදුක්ඛෙ ආකාසානඤ්චායතන සඤ්ඤ සමාපත්ති පටිලාභත්ථාය රූපසඤ්ඤ පටිඝසඤ්ඤ නානත්තසඤ්ඤ විසඤ්ඤ

ඤ්චායතන සමාපත්ති පටිලාභත්ථාය ආකාසානඤ්චායතනසඤ්ඤං ආකිඤ්චඤ්ඤායතන සමාපත්ති පටිලාභත්ථාය විඤ්ඤාණඤ්චායතන සඤ්ඤං නෙවසඤ්ඤා නාසඤ්ඤායතන සමාපත්තිපටිලාභත්ථාය ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤං පටිසඞ්ඛා සන්තිට්ඨනා පඤ්ඤා සඞ්ඛාරුපෙක්ඛාසු ඤාණං ඉමා අට්ඨ සඞ්ඛාරුපෙක්ඛා සමථවසෙන උප්පජ්ජන්ති දස සඞ්ඛාරුපෙක්ඛා විපස්සනාවසෙන උප්පජ්ජන්ති”යි කී දශවැදෑරුද පෙලින්ම දතයුතුහුයි “සොතාපත්තිමග්ග පටිලාභත්ථාය උප්පාදං පවත්තං නිමිත්තං ආයූහනං පටිසන්ධිං ගතිං නිබ්බත්තිං උපපත්තිං ජාතිං ජරං ව්‍යාධිං මරණං සොකපරිදෙවං උපායාසං ... පෙ ... සොතාපත්තිඵල සමාපත්තත්ථාය උප්පාදං පවත්තං ... පෙ ... අරහත්තමග්ග පටිලාභත්ථාය උප්පාදං ... පෙ ... උපායාසං ... පෙ ... අරහත්තඵල සමාපත්තත්ථාය සුඤ්ඤතා විහාර සමාපත්තත්ථාය අනිමිත්ත විහාරසමාපත්තත්ථාය උප්පාදං පවත්තං නිමිත්තං ආයූහනං පටිසන්ධිං ගතිං නිබ්බත්තිං උපපත්තිං ජාතිං ජරං ව්‍යාධිංමරණංසොකපරිදෙවං උපායාසං පටිසඞ්ඛා සන්තිට්ඨනා පඤ්ඤා සඞ්ඛාරුපෙක්ඛාසු ඤාණං ඉමා දස විපස්සනාවසෙන උප්පජ්ජන්ති” යි එවමාගතා, මෙසේ ආ; නීවරණාදි (ප්‍රථමධ්‍යානාදීන් විෂ්කම්භිතවූ) නීවරණ විතර්ක විචාරාදීන්; පටිසඞ්ඛා සන්තිට්ඨනා (සවගාව මෙහිසින්) පරීක්‍ෂාකොට සන්සුන් ඊසින් සිටුනාවූ; ගහණෙ මජ්ඣත්තභූතා (දෘෂ්ටාදිනාව ඇතිමෙනසින්) ඒ නීවරණාදීන්ගේ ග්‍රහණයෙහි (උත්පාදනයෙහි) මධ්‍යස්ථවූ අධ්‍යුපෙක්‍ෂණය කරණ; යා උපෙක්ඛා, යම් විදර්ශනා ප්‍රඥාවෙක් ඇද්ද; අයං, මේ තොමෙ; සඞ්ඛාරුපෙක්ඛා නාම, සංස්කාරෝපෙක්ෂා නමි; [illegible]

යෙන්හි; කාමාවචරං කුසලං චිත්තං උප්පන්නං හොති, කාමාවචරවූ කුසලචිත්තය උත්පන්නවේද; උපෙක්ඛා සහගතං හොති, උපෙක්ෂා සහගතවූ යේ; එවමාගතා, මෙසේ ආ; අදුක්ඛම සුඛ සඞ්ඛ්‍යාතා, අදුඃඛමසුඛසංඛ්‍යාතවූ; යා උපෙක්ඛා, යම් උපෙක්ෂාවක් ඇද්ද; අයං වෙදනුපෙක්ඛා නාම, මේ වෙදනාපෙක්ෂා නමි; යදත්ථි, යමෙක් ඇද්ද (අනිත්‍යාදි ලක්‍ෂණත්‍රය එව ලැබේද) යං භූතං, යමෙක් ප්‍රත්‍යය නිර්ජනිතබැවින් විද්‍යමානවූ යම් ස්කන්ධපඤ්චකයෙක් ඇද්ද; තං පජහති (අනිත්‍යානුදර්ශනාදීන්) නිත්‍ය සංඥාදීන් ප්‍රහාණය කරද්ද (මනාකොටම දෘෂ්ටාදීනව ඇතිමෙනසින් තත්ප්‍රතිබද්ධ ඡන්දරාග ප්‍රහාණයෙන් දුරුකෙරෙයි යන අර්ථයි යම්සේ ආයත්තෙහි ආදනාය මනාවේද එසේ පිළිපැදීමෙන් දුරුකෙරේ) උපෙක්ඛං පටිලභතීති (එවම්භූතවූ යෝගී තෙමේ) එහි උපෙක්ෂාව පිළිලැබෙයි; එවමාගතා, මෙසේ ආ; විචිනනෙ මජ්ඣත්තභූතා (අනිත්‍යාදිවශයෙන්) සම්මර්ශනයෙහි මධ්‍යස්ථවූ; යා උපෙක්ඛා, යම් උපෙක්ෂාවක් ඇද්ද; අයං විපස්සනුපෙක්ඛා නාම, මේ තොමේ විදර්ශනොපෙක්ෂා නමි; යා, පන, යමෙක් වනාහි; ඡන්දාදිසු යෙවාපනකෙසු ආගතා, ඡන්දාදිවූ යෙවාපනක ධර්මයන් අතුරෙහි ආවාවූ; සහජාතානං, එක්ව උපන් ධර්මයන්; සමවාහිතභූතා, සමව ඉසිලීමට කාරණවූ; උපෙක්ඛා, උපෙක්ෂාවක් වේද; අයං තත්‍රමජ්ඣත්තුපෙක්ඛා, මේ තත්‍රමධ්‍යස්ථොපෙක්ෂා නමි; යා, යමක්; උපෙක්ඛකො ච විහරතීති එවමාගතා, උපෙක්ෂකව වෙසෙයි මෙසේ ආද; අග්ගසුඛෙපි තස්මිං, ඒ උතුම්වූ ධ්‍යාන සුඛයෙහිද; අපක්ඛපාත ජනනී, පක්ෂපාත නොකරන්නාවූ;

යා උපෙක්ඛා, යම් උපෙක්ෂාවක් ඇද්ද; අයං ඣානුපෙක්ඛා නාම, මේ ධ්‍යානොපෙක්ෂා නමි; උපෙක්ඛාසති පාරිසුද්ධිං, උපෙක්ෂාස්මෘති පාරිශුද්ධි ඇති; චතුත්ථජ්ඣානං නාම, චතුර්ථධ්‍යානයයි; එවමාගතා, මෙසේ ආ; සබ්බපච්චනීකපරිසුද්ධා නීවරණ විතර්කවිචාරාදී සියලු ප්‍රතිපක්ෂයන් කෙරෙන් විමුක්තාහෙයින්) සම්ප්‍රත්‍යනීකයන් කෙරෙන් පරිශුද්ධවූ; පච්චනීකවූපසමනෙපි අව්‍යාපාරභූතා (ප්‍රත්‍යනීකයන් සන්හුන් සෙයින්) ඒ ප්‍රත්‍යනීක ව්‍යුපශමයෙහිද අව්‍යාපාරභාවයෙන් ප්‍රවෘත්තවූ (අව්‍යාපාරබවට පැමිණිහෝ) යා උපෙක්ඛා, යම් උපෙක්ෂාවක් ඇද්ද; අයං පාරිසුද්ධුපෙක්ඛා නාම, මේ පාරිශුද්ධ්‍යුපෙක්ෂා නම්වේ,

(ගා ‡)

කෙලෙසුන් කෙරෙන් සිත වෙන් කිරීමයයි කියනලද විවෙකය නිසා පවත්නා උපෙක්ෂා සම්බොධ්‍යඞ්ගය වඩන්නේයයි මෙසේ දක්වනලද සහජාත ධර්මයන් කෙරෙහි මැදහත් ආකාරයෙන් පවත්නා යම් උපෙක්ෂාවක් හෙවත් මාර්ගචිත්තයෙහි සම්ප්‍රයුක්තවූ ශ්‍රද්ධා ප්‍රඥාදී සෙසු ධර්මයන්ගේ අලීන අනුද්ධත අනිරාගම්‍යභාවය හෙතුකොට ගණ ප්‍රග්‍රහනිග්‍රහ සම්ප්‍රහීණයෙන් උත්සාහයක් නැතුව පවත්නාවූ යම් මැදහත් ආකාරයක් වේද ඒ බොධ්‍යඞ්ගොපෙක්ෂා නම්වන්නීය.

උපෙක්ෂා නම්වූ මධ්‍යස්ථාකාරයෙන් පවත්නා වීර්‍ය්‍යනිමිත්තය කලින් කල මෙනෙහි කරන්නේයයි මෙසේ දක්වනලද අතිශයින් උත්සාහවත් නොකරනලද්දවූද ඉතා ලිහිල් නොකරනලද්දවූද වීර්‍ය්‍යසඞ්ඛ්‍යාතවූ යම් උපෙක්ෂාවක් ඇත්තේවේද මේ වීර්‍ය්‍යොපෙක්ෂා නම් වන්නීය. සමාධිවශයෙන් කොතෙක් සංස්කාරොපෙක්ෂාවෝ උපදනාහුද? විදර්ශනාවශයෙන් කොතෙක් සංස්කාරොපෙක්ෂාවෝ උපදනාහුදැයි? යන ප්‍රශ්නයෙහි ප්‍රථමධ්‍යාන ප්‍රතිලාභය පිණිස පඤ්චනීවරණයන්ද විත ර්කධ්‍යාන ප්‍රතිලාභය පිණිස විතර්කවිචාරයන්ද තෘතීයධ්‍යාන ප්‍රතිලාභය පිණිස ප්‍රීතියද චතුර්ථධ්‍යාන ප්‍රතිලාභය පිණිස සුඛදුක්දෙකද ආකාශානන්ත්‍යායතන සමාපත්ති ප්‍රතිලාභය පිණිස රූපප්‍රතිඝනානාත්ව යන ත්‍රිවිධසංඥාවන්ද විඥානානන්ත්‍යායතන සමාපත්ති ප්‍රතිලාභය පිණිස ආකාශානන්ත්‍යායතන සංඥාවද ආකිඤ්චන්‍යායතන සමාපත්ති ප්‍රතිලාභය පිණිස විඥානානන්ත්‍යායතන සංඥාවද නෛවසංඥානාසංඥායතන සමාපත්ති ප්‍රතිලාභය පිණිස ආකිඤ්චන්‍යායතන සංඥාවද යන මේ ප්‍රථම ධ්‍යානාදි අෂ්ටසමාපත්තීන් විසින් ඔබා නන්නාලද නීවරණ විතර්කවිචාරාදී ධර්මයන් ඒ ඒ ධර්මයන්ගේ ස්වභාව වශයෙන් පරීක්ෂාකොට මේ ධර්ම මෙබඳු ස්වභාව ඇත්තාහයි සනිටුහන් කිරීම් වශයෙන් පවත්නා අට වැදෑරුම් ප්‍රඥාව අෂ්ටවිධ සංස්කාරොපෙක්ෂා ඥාන නම. සෝවාන් සකෘදාගාමි අනාගාමි අර්හත් යන සතරමග සතරඵලය හා ශූන්‍යතා විහාර සමාපත්තිය අනිමිත්ත විහාර සමාපත්තිය යනමේ දශවිධ අධිගමසමාපත්තීන් ලැබීම පිණිස උපදනාවූ දශවිධ විදර්ශනාවෙහි පූර්වකර්මප්‍රත්‍යයෙන් මේ භවයෙහි පඤ්චස්කන්ධයන්ගේ උත්පත්තියද උපන් පඤ්චස්කන්ධයන්ගේ පැවැත්මද කාරණා වශයෙන් වටනහා සියලු ත්‍රෛභූමික සංස්කාරධර්මයද මතු භවයෙහි උත්පත්තිය පිණිස රැස්කරන්නාවූ කර්මයද මතු භවයෙහි උත්පත්තියද ප්‍රතිසන්ධිවශයෙන් උපදනා ගතියද ස්කන්ධයන් පහළවීමද පහළවූ සත්ත්වයාගේ විපාකප්‍රවෘත්තියද ජාතියද

ජරාවද ව්‍යාධියද මරණයද ශෝකයද පරිදේවයද උපායාසයද යන මේ භෝක් ධර්මයන් ඒ ඒ ධර්මයන්ගේ ස්වභාව වශයෙන් පරීක්‍ෂාකොට දැන මේ ධර්මම්බදු ස්වභාව ඇත්තාහයි සනිටුහන්කිරීම් වශයෙන් පවත්නා දශවැදෑරුම් ප්‍රඥව දශවිධ සංස්කාරෝපේක්‍ෂාඥාන නම්වෙයි මෙසේ දක්වනලද්දවූ ප්‍රථමධ්‍යානාදියෙන් ඔබාගත්තාලද නීවරණාදී ධර්මයන් ස්වභාව වශයෙන් පරීක්‍ෂාකොට දැන සනිටුහන්කිරීම් වශයෙන් පවත්නාවූද දක්නාලද ආදීනව ඇති හෙයින් ඒ නීවරණාදීන් ඉපදීමෙහි මැදහත් ආකාරයෙන් බලන්නාවූද යම් විදර්ශනා ප්‍රඥවක් ඇත්තේවේද මේ සංස්කාරෝපේක්‍ෂානම් වන්නීය යම්කලෙක උපේක්‍ෂාසහගත වූ කාමාවචර කුශල විඥානය උපන්නේවේදැයි මෙසේ ආවාවූ අදුක්ඛමසුඛ වේදනා නම්වූ යම් උපේක්‍ෂාවක්වේද මේ වේදනොපේක්‍ෂා නම් වන්නීය යම් ස්කන්ධ පංචකයෙක් ප්‍රත්‍යයෙන් හටගත් බැවින් භූතනම්වේද යම් ස්කන්ධ පංචකයෙක්හි අනිත්‍ය දුඃඛ අනාත්ම යන ලක්‍ෂණත්‍රය ලැබේද ඒ ස්කන්ධ පංචකයෙහි අනිච්චානුපස්සනාදි භාවනා ක්‍රමයෙන් නිත්‍යසංඥදිය දුරුකරන්නාහු මනාකොට දක්නාලද ආදීනව ඇති හෙයින් ඒ පිළිබඳ ඇල්ම මතු ප්‍රතිසන්ධිය නොනගන්නා පරිදෙදුන් ප්‍රතිපත්තිය කරණකොටගෙණ දුරුකරන්නේවේද මෙසේවූ භාගාවචර මහණ එති උපේක්‍ෂාව ලබන්නේයයි මෙසේ දක්වනලද අනිත්‍යාදි වශයෙන් සම්මශීනයකිරීමෙහි මැදහත් ආකාරයෙන් පවත්නා යම් උපේක්‍ෂාවක්වේද මේ විදර්ශනොපේක්‍ෂානම් වන්නීය ඡන්දාදිචෛතසිකාදි යෙවාපනක ධර්මයන් අතුරෙහි දක්වනලද්දවූ තමා හා සම්ප්‍රයුක්ත ධර්මයන් සකොට අරමුණෙහි පිහිටුවන්නාවූ යම් උපේක්‍ෂාවක්වේද මේ තත්‍රමධ්‍යස්ථෝපේක්‍ෂා නම් වන්නීයි උපේක්‍ෂාව වාසයකරන්නේය යනාදීන් ප්‍රකාශකරණලද්දවූ අග්‍රවූ ධ්‍යාන සැපයෙහි පක්ෂපාතවූද ඒ සැපය අපක්‍ෂපාතව උපදවන්නාවූද යම් උපේක්‍ෂාවක් වේද මේ ධ්‍යානොපේක්‍ෂා නම් වන්නීය උපේක්‍ෂා සම්ප්‍රයුක්ත ස්මෘතියෙන් පිරිසිදුවූ චතුර්ථධ්‍යානයයි මෙසේ දක්වනලද්දවූ විතර්කවිචාරාදි සියළු ප්‍රතිවිරුද්ධ ධර්යන්ගෙන් මිදුන හෙයින් ප්‍රතිවිරුද්ධ ධර්මයන් සංසිඳුවීමෙහි නැවත උත්සාහ කටයුත්තක් නැත්තාවූ යම් උපේක්‍ෂාවක් වේද මේ පාරිශුද්ධ්‍යුපේක්‍ෂානාම් වන්නීය.

[567 වෙනි පිටේ 16 වෙනි පෙළේ "විරාගො සංඛිත්තො වණ්ණෙන්තො හොති" යන තැන "විරාගො ජිගුච්ඡනකො හොති නාම, පීතියා ජිගුච්ඡනා සමතික්කමො වාහි අයමෙත්ථ දට්ඨබ්බො..... යද පන විතක්ක විචාර වූපසමං සම්පිණ්ඩිත නද පීතියාව විරාගා විතක්කවිචාරානඤ්ච වූපසමානි එවං යොජනා වෙදිතබ්බා, ඉමිස්සාව යොජනාය විරාගො සමතික්කමවණ්ණෙත්‍ය හොති"යි බලිතයුතු ... යයි පූරණීකොට ගතයුතුයි මොනෝපෙත්වල මේ පාඨය අභාවයට ගොස් තිබී පුරාණ ලියවිල්ලකින් දක්නාලදි සන්නභාවි දෙක්හි සම්පූර්ණව ඇත]

( ශා ¶ )

තත්ථ ඡළඞ්ගුපෙක්ඛාච බ්‍රහ්මවිහාරුපෙක්ඛාච බොජ්ඣඞ්ගුපෙක්ඛාච තත්‍රමජ්ඣත්තුපෙක්ඛාච ඣානුපෙක්ඛාච පාරිසුද්ධුපෙක්ඛාච අත්ථතො එකා තත්‍රමජ්ඣත්තුපෙක්ඛාව හොති යෙන

තෙන අවත්ථාභෙදෙන පනස්සා අයං
භෙදො ඒකස්සාපි සතො සත්තස්ස කු
මාරයුවථෙර සෙනාපති රාජාදිවසෙ
න භෙදො විය තස්මා තාසු යත්ථ ඡළඞ්ගු
පෙක්ඛා න තත්ථ බොජ්ඣඞ්ගුපෙක්ඛාද
යො යත්ථ වා පන බොජ්ඣඞ්ගුපෙක්ඛා
න තත්ථ ඡළඞ්ගුපෙක්ඛාදයො හොන්
තීති වෙදිතබ්බා යථා චෙතාසං අත්ථ
තො ඒකීභාවො එවං සඞ්ඛාරුපෙක්ඛා
විපස්සනුපෙක්ඛානම්පි පඤ්ඤා එව හිසා
කිච්චවසෙන ද්විධා භින්නා යථා හි පුරි
සස්ස සායං ගෙහං පවිට්ඨසප්පං අජප
ද දණ්ඩං ගහෙත්වා පරියෙසමානස්ස
තං ථුසකොට්ඨකෙ නිපන්නං දිස්වා ස
ප්පො නු ඛො නොති අවලොකෙන්ත
ස්ස සොවත්ථිකත්තයං දිස්වා නිබ්බෙම
තිකස්ස සප්පො න සප්පොති විචි
නෙ මජ්ඣත්තතා හොති එවමෙවං යා
ආරද්ධ විපස්සකස්ස විපස්සනාඤාණෙ
න ලක්ඛණත්තයෙ දිට්ඨෙ සඞ්ඛාරානං
අනිච්චභාවාදි විචිනනෙ මජ්ඣත්තතා
උප්පජ්ජති අයං විපස්සනුපෙක්ඛා ය
ථා පන තස්ස පුරිසස්ස අජපදෙන ද
ණ්ඩකෙන ගාළ්හං සප්පං ගහෙත්වා කින්
තාහං ඉමං සප්පං අවිහෙඨෙන්තො
අත්තානඤ්ච ඉමිනා අඩංසාපෙන්තො
මුඤ්චෙය්‍යන්ති මුඤ්චනාකාරමෙව පරි
යෙසතො ගහණෙ මජ්ඣත්තතා හො
ති එවමෙවං යා ලක්ඛණත්තයස්ස දි
ට්ඨත්තා ආදිත්තෙ විය තයො භවෙ ප
ස්සතො සඞ්ඛාරග්ගහණෙ මජ්ඣත්තතා
අයං සඞ්ඛාරුපෙක්ඛා ඉති විපස්සනු
පෙක්ඛාය සිද්ධාය සඞ්ඛාරුපෙක්ඛාපි සි
ද්ධාව හොති ඉමිනා පනෙසා විචිනන
ගහණෙසු මජ්ඣත්ත සඞ්ඛාතෙන කි
ච්චෙන ද්විධා භින්නාති — විරියුපෙ
ක්ඛා පන වෙදනුපෙක්ඛාච අඤ්ඤම
ඤ්ඤඤ්ච අවසෙසාහිච අත්ථතො භින්
නා එවාති — ඉති ඉමාසු උපෙක්ඛාසු
ඣානුපෙක්ඛා ඉධ අධිප්පෙතා සා ම
ජ්ඣත්තලක්ඛණා අනාභොගරසා
අව්‍යාපාර පච්චුපට්ඨානා පීති විරාගප
දට්ඨානාති — එත්ථාහ නනු චායං අත්
ථතො තත්‍රමජ්ඣත්තුපෙක්ඛාව හොති
සාච පඨම දුතියජ්ඣානෙසුපි අත්ථි ත
ස්මා තත්‍රාපි උපෙක්ඛකොච විහරතීති
එවමයං වත්තබ්බං සියා සා කස්මා න
වුත්තාති — අපරිව්‍යත්ත කිච්චතො අප
රිව්‍යත්තංහි තස්සා තත්ථ කිච්චං විත
ක්කාදීහි අභිභූතත්තා ඉධ පනායං වි
තක්කවිචාරපීතීහි අනභිභූතත්තා උ
ක්ඛිත්තසිරා විය හුත්වා පරිව්‍යත්ත කිච්
චා ජාතා තස්මා වුත්තාති — නිට්ඨි
තා උපෙක්ඛකොච විහරතීති එතස්ස
සබ්බසො අත්ථවණ්ණනා —

(ෂ ¶ )

තත්ථ, මේ දශවිධ උපෙක්ෂාවන්
කෙරෙහි; ඡළඞ්ගුපෙක්ඛාච, ෂඩඞ්ගො
පෙක්ෂාවද; බ්‍රහ්මවිහාරුපෙක්ඛාච, බ්‍ර
හ්මවිහාරොපෙක්ෂාවද; බොජ්ඣඞ්ගුපෙ
ක්ඛාච, බොධ්‍යඞ්ගොපෙක්ෂාවද; තත්‍ර
මජ්ඣත්තුපෙක්ඛාච, තත්‍ර මධ්‍යස්ථො
පෙක්ෂාවද; ඣානුපෙක්ඛාච, ධ්‍යානො
පෙක්ෂාවද; පාරිසුද්ධි උපෙක්ඛාච, පාරි
ශුද්ධ්‍යුපෙක්ෂාවද; අත්ථතො, අර්ථයෙහි
න්; එකා තත්‍රමජ්ඣත්තුපෙක්ඛාව හො
ති, එකම තත්‍රමධ්‍යස්ථොපෙක්ෂාම වේ;
තෙන තෙන අවත්ථාභෙදෙන පන, ඒ
ඒ අවස්ථාභෙදයෙන් වනාහි; අස්සා,
මේ තත්‍රමජ්ඣත්තුපෙක්ඛාවගේ; අයං
භෙදො, මේ භෙදයයි; ඒකස්සාපි ස
තො සත්තස්ස, එකම සත්වයකුගේ;
කුමාරයුවථෙර සෙනාපතිරාජාදිව
සෙන, කුමරුය ළදරුය මහළුය සෙ
නාපතිය රජය යනාදීන්ගේ වශයෙ
න්; භෙදොවිය, භෙදය මෙනි; තස්මා,
එහෙයින් (යම්හෙයකින් ස්වභාවයෙ

න් භේදයෙක් නැතද යම් යම් ප්‍රත්‍ය
ය විශෙෂයකින් මේ උපෙක්‍ෂාවන්ගේ
මේ අවස්ථාභෙදය වේනම් ඒ ප්‍රත්‍යය
න්ගේ එක්ව පැවැත්මක් නැති බැවි
න් ඒ උපෙක්‍ෂාවන්ගේද භෙදයවේයි.
එක්වද නොපවති එහෙයින් යන අ
ර්‍ථයි) තාසු, ඒ උපෙක්‍ෂාවන් කෙරෙ
හි; යථා ඡළඞ්ගුපෙක්ඛා, යම් තැනෙ
ක ෂඩඞ්ගොපෙක්‍ෂාවද; තථා, එතැන්
හි; න බොජ්ඣඞ්ගුපෙක්ඛාදයො, බො
ධ්‍යඞ්ගොපෙක්‍ෂාදීහු නොවෙත්; යථා
වා පන බොජ්ඣඞ්ගුපෙක්ඛා, යම්තැ
නෙක වනාහි බොධ්‍යඞ්ගොපෙක්‍ෂාවද;
තථා, එහි; ඡළඞ්ගුපෙක්ඛාදයො න
සන්තීති වෙදිතබ්බා, ෂඩඞ්ගොපෙ
ක්‍ෂාදීහු නොවෙතියි දතයුත්තාහුයි;
යථාච, යම්සේ; එතාසං, මොවුන්ගේ;
අත්‍ථතො එකීභාවො, අර්‍ථ හෙයින් එ
කී භාවයද; සඞ්ඛාරුපෙක්ඛාවිපස්සනු
පෙක්ඛානමපි, සංස්කාරොපෙක්‍ෂා විද
ර්‍ශනොපෙක්‍ෂාවන්ගේද; එවං, මෙසේ
ම අර්‍ථ හෙයින් එකී භාවයවේ; පඤ්
ඤා එවහි සා, ප්‍රඥාවූම හෝ වනාහි; කි
ච්චවසෙන ද්විධා භින්නා, කෘත්‍ය වශ
යෙන් දෙපරිද්දෙකින් බිඳුනාලදු; ය
ථා හි, යම්සේ; ගෙහං පවිට්ඨසප්පං,
ගෙට වන් සප්හු; අජපදදණ්ඩං ගහෙ
ත්වා, අජපදයකට බඳුවූ සටහන් ඇති
දණ්ඩෙන පරියෙසමානස්ස, සොය
න්නාවූ; තං, ඒ සප්හු; ථුසකොට්ඨ
කෙ නිපන්නං, තෝ කොටුවෙහි හො
ත්තාහු; දිස්වා, දැක; සප්පොනුඛො,
සර්පයෙක්දෝ හෝ; නොති, නොවේ
දෝහෝයි; අවලොකෙන්තස්ස, බලන්
නාවූ; සොවත්‍ථිකත්තයං දිස්වා, සෝවැ
හි තුණ දැක; නිබ්බෙමතිකස්ස, විමති
නැතිවූ; පුරිසස්ස (යි යොදනු) පුරුෂ
යාගේ; සප්පො න සප්පොති විචින
නෙ, සර්ප දෝහෝයි නොවේදෝහෝයි
විචාරණයෙහි; මජ්ඣත්තතා හොති, මැ
දහත් බවවේද; එවමෙවං, එපරිද්දෙ
න්ම; ආරද්ධ විපස්සකස්ස, ආරබ්ධක
රණලද විදර්‍ශකයාගේ; විපස්සනාඤා
ණෙන ලක්ඛණත්තයෙ දිට්ඨෙ, විදර්
ශනා ඥානයෙන් අනිත්‍යාදී ලක්‍ෂණත්‍ර
ය දෘෂ්ට කල්හි; සංඛාරානං අනිච්චාදි
භාව විචිනනෙ, සංස්කාරයන්ගේ අ
නිත්‍යාදී විචාරණයෙහි; යා මජ්ඣත්තතා
උප්පජ්ජති, යම් මැදහත් බවක් උපදී
ද; අයං, මේ තොමේ; විපස්සනුපෙ
ක්ඛා, විදර්‍ශනොපෙක්‍ෂා නම්වේ; යථා
පන, යම්සේ වනාහි; තස්ස පුරිසස්ස,
ඒ පුරුෂයාගේ; අජපදෙන දණ්ඩෙන,
අජපද සටහන් ඇති දණ්ඩෙන්; ගාළ්
හං, දැඩිකොට; සප්පං ගහෙත්වා, සර්පයා
ගෙණ; කිනාහං, කිසේනම්; අහං, මම;
ඉමං සප්පං, මේ සප්හු; අවිහෙඨෙන්
තො, නොපෙළන්නෙම්; අත්තානඤ්
ච, තමාද; ඉමිනා අඩංසාපෙන්තො,
මේ සප්හු ලවා නොදෂ්වන්නෙම්; මු
ඤ්චෙය්‍යන්ති, මිදෙව්වෙද්දෝහෝයි; මුඤ්ච
නාකාරමෙව පරියෙසතො, මුදනා ආ
කාරයම සොයනුව හට; ගහණෙ ම
ජ්ඣත්තතා හොති, උහුගේ ගැන්මෙහි
මැදහත් බව වේද; එවමෙවං, එපරිද්
දෙන්ම; ලක්ඛණත්තයස්ස දිට්ඨත්තා,
ලක්‍ෂණත්‍රය දුටු හෙයින්; ආදිත්තමිව
ය තයො භවෙ පස්සතො, තුන්භවය
ගිනිගත් ගෙයක්මෙන් බලනුව හට;
සඞ්ඛාරගහණෙ, සංස්කාරයන්ගේ ග්‍ර
හණයෙහි; යා මජ්ඣත්තතා, යම් මැද
හත් බවක් වේද; අයං, මේ තො
මේ; සංඛාරුපෙක්ඛා, සංස්කාරොපෙ
ක්‍ෂා නමි; ඉති, මෙසේ; විපස්සනුපෙ
ක්ඛාය සිද්ධාය, විදර්‍ශනොපෙක්‍ෂාව සිද්ධ
කල්හි; සංඛාරුපෙක්ඛාපි සිද්ධාව හො
ති, සංස්කාරොපෙක්‍ෂාද සිද්ධමවේ
(සෝවැති තුණ දුටුවනුට සර්පලක්‍ෂණ

විචාරයෙහි මෙන් තුන්ලකුණු දුටුව
හුට සංස්කාරයන්ගේ අනිත්‍යාදී ලක්‍ෂ
ණ දුෂ්ට හෙයින් සංඛාර ලක්‍ෂණ වි
චාරයෙහි උපෙක්‍ෂාමවෙයි සංස්කාරය
න්ගේ ලක්‍ෂණ විචිනනයෙහි මැදහත්
වූ විදර්ශනොපෙක්‍ෂාව සිඬ කල්හි දෘ
ෂ්ටාදීනවවූ ඒ සංස්කාරයන් ග්‍රහණ
යෙහි අධ්‍යාශය සම්සංස්කාර නිමිත
හෙයින් උපෙක්‍ෂාවද සිඬවෙයි දතයු
තු) එසා, මේ ප්‍රඥ තොමෝ; විචිනනු
ගහණෙසු, විචිනන ග්‍රහණ දෙක්හි; ම
ජ්ඣත්තසංඛාතෙන, මැදහත් බවයයි
කියනලද; ඉමිනා කිච්චෙන, මේ කෘ
ත්‍යයෙන්; විධා භිනනාහි, දෙපරිද්දෙ
කින් භින්නහයි; විරියුපෙක්ඛාපන, වී
ර්‍ය්‍යොපෙක්‍ෂාවද; වෙදනුපෙක්ඛාච, වෙ
දනොපෙක්‍ෂාවද; අඤ්ඤමඤ්ඤඤ්ච,
ඔවුනොවුන්වද; අවසෙසානිච, සෙසු
උපෙක්‍ෂාවන් හාද; අත්ථතො භිනනා
එවාති, අර්ථ හෙයින් භින්නාමැයි;
ඉති, මෙසේ; ඉම දසු උපෙක්ඛාසු, මේ
උපෙක්‍ෂාවන් කෙරෙහි; ඣානුපෙ
ක්ඛා, ධ්‍යානොපෙක්‍ෂා තොමෝ; ඉධ,
මෙතැන; අධිප්පෙතා, අධිප්‍රෙතයි; සා,
හේ තොමෝ; මජ්ඣත්තතා ලක්ඛණා,
මැදහත් බව ලකුණුකොට ඇත්තීයි;
අනාභොගරසා (ප්‍රණීතවූ ඒ සුවයෙ
හි මනසිකාරයට ප්‍රතිපක්‍ෂ කෘත්‍ය ඇ
ත්තීයි; අව්‍යාපාරපච්චුපට්ඨානා, ප්‍රණී
තවූ ඒ සුවෙහි ව්‍යාපාරයක් නැතිබ
ව වැටහීම්කොට ඇත්තීයි; පීතිවිරාග
පදට්ඨානා, ප්‍රීතියෙහි විරාගය ආසන්
න කාරණකොට ඇත්තීයි; එත්ථ,
මෙහි; ආහ (චොදක) කී; නනුච, කිය
න; අයං, මේ ධ්‍යානොපෙක්‍ෂා තොමෝ;
අත්ථතො, අර්ථ හෙයින්; තත්‍රමජ්ඣත්
තුපෙක්ඛාව හොති, තත්‍රමජ්ඣත්තුපෙ
ක්ඛාම වෙයි; සාච, හේද; පඨමදුතිය
ජ්ඣානෙසුපි අත්ථි, ප්‍රථම විතීය ධ්‍යාන
යන්හිදු ඇති; තස්මා, එහෙයින්; තත්‍රා
පි, ඒ පළමුවන දෙවන ධ්‍යානයෙහි
දු; උපෙක්ඛකොච විහරතීති, උපෙ
ක්ඛකොච විහරතියි; එවං, මෙසේ; අ
යං, මේ ධ්‍යානොපෙක්‍ෂා තොමෝ; ව
ත්තබ්බා, කියයුතු වන්නීය; සා, හේ
තොමෝ; කස්මා නවුත්තාති, කුමක්
හෙයින් නොකියනලද්දයත්? අපරි
ව්‍යත්තකිච්චතො, පරිව්‍යක්ත නොවූ
කෘත්‍ය හෙයිනි; තැයසා, ඒ තත්‍රමධ්‍ය
ස්ථතාවගේ; තත්‍ර, ඒ පළමුවන දෙවන
ධ්‍යානයෙහි; කිච්චං, කෘත්‍යය; අපරිව්‍ය
ත්තංහි, අපරිව්‍යක්තමැයි (කුමක්හෙ
යිනයත්) විතක්කවිචාරාදීහි අභිභූත
ත්තා, විතර්කවිචාර ප්‍රීතීන් විසින් ම
ඩනාලද හෙයිනි; ඉධපන, මේ තුන්
වන ධ්‍යානයෙහි වනාහි; අයං, මේ ත
ත්‍රමජ්ඣත්තතා තොමෝ; විතක්කවි
චාරපීතීහි අනභිභූතත්තා, විතර්ක
විචාරාදීන් විසින් අනභිභූත හෙයින්;
උක්ඛිත්තසිරාවිය, නගනලද හිස් ඇ
ත්තියක මෙන්; පරිව්‍යත්තකිච්චා ජා
තා, පරිව්‍යක්තවූ කෘත්‍ය ඇතිවූ; තස්
මා, එහෙයින්; වුත්තා, කියනලදී
...පෙ...

( හා ¶ )

මෙදශවිධ උපෙක්‍ෂාවන් අතුරෙන් ෂඩ
ඞ්ගොපෙක්‍ෂාය බ්‍රහ්මවිහාරොපෙක්‍ෂා
ය බොධ්‍යඞ්ගොපෙක්‍ෂාය තත්‍රමධ්‍ය
ස්ථොපෙක්‍ෂාය ධ්‍යානොපෙක්‍ෂාය පා
රිශුඬ්‍යුපෙක්‍ෂාය යනමේ සදෙන ඒ
ඒ විෂයෙහි ඒඒ කෘත්‍ය ස ධනහෙයි
න් ඒ ඒ නමින් ව්‍යවහාරකරතුදු අ
ර්ථ හෙයින් එකම තත්‍රමධ්‍යස්ථොපෙ
ක්‍ෂාම වන්නීය. යම්සේ එකම පුද්
ගලයෙකුගේ ඒ ඒ අවස්ථාභෙදය හේ
තුකොටගෙණ කුමරුය ළදරුය මහ
ළුය සෙනාපතිය රජය යනාදී ප්‍රභෙ
ද ව්‍යවහාර වන්නේද එපරිද්දෙන්ම
මේ එකම තත්‍රමධ්‍යස්ථොපෙක්‍ෂාව ඒ

ඒ අවස්ථාභෙදය හේතුකොටගෙණ ෂඩඞ්ගොපෙක්ෂා යනාදි නොයෙක් නාමයෙන් ව්‍යවහාරවන්නේයයි දතයුතු යම්හෙයකින් මේ උපෙක්ෂාව ස්වභාව වශයෙන් ප්‍රභෙද නැත්තාහු යම් යම් කාරණයක් හේතුකොටගෙණ ඒ ඒ අවස්ථා භෙදයට පැමිණේද ඒ කාරණයන්ද එකාකාරයෙන් නොපැවත වෙනස්වන හෙයින් ඒ උපෙක්ෂාවන්ගේද භෙදයවන්නේයි එහෙයින් ඒ අනෙකප්‍රකාර උපෙක්ෂාවන් අතුරෙහි යම් සිතෙක ෂඩඞ්ගොපෙක්ෂාව ඇත්තේවීනම් ඒ සිතෙහි බොධ්‍යඞ්ගොපෙක්ෂාදීහු නොවෙත්මැයි යම් සිතෙක බොධ්‍යඞ්ගොපෙක්ෂාව ඇත්තේ වීනම් ඒ සිතෙහි ෂඩඞ්ගොපෙක්ෂාදීහු නොවෙත්මැයි දතයුත්තාහුයි යම්සේ මේ ෂට්ප්‍රකාර උපෙක්ෂාවෝම අර්ථ වශයෙන් එකව තත්‍රමධ්‍යස්ථතාව වීද එපරිද්දෙන්ම සංස්කාරොපෙක්ෂා විදර්ශනොපෙක්ෂා දෙදෙනාද අර්ථ වශයෙන් එකක්ම වන්නීය හෝ වනාහි එකම ප්‍රඥාව කෘත්‍ය වශයෙන් සංස්කාරොපෙක්ෂා විදර්ශනොපෙක්ෂායයි දෙපරිද්දෙකින් බිඳෙනලද්දීය යම්සේ සවස්භාගයෙහි ගෙටවන් සර්පයෙකු එළු කුරයකට බඳු අක් ඇති දණ්ඩක් ගෙණ සොයා ඇවිදිනාහු බෝල්කොටුවෙහි හොත් ඒ සර්පයා දැක සර්පයෙක්දෝ හෝ නොවේදෝහෝයි බලන්නාහු සෙණයෙහි සෝවැති තුණ දැක සර්පයෙක්මැයි සැකදුරුවූ පුරුෂයා හැවත සර්පයෙක්දෝ හෝ නොවේදෝහෝයි පරික්ෂාකිරීමෙහි මධ්‍යස්ථවේද එපරිද්දෙන්ම අනිත්‍යාදි ලක්ෂණත්‍රය දක්නා පිණිස විදර්ශනාභාවනාව පවත්නන් යොගාවචර මහණහට පහලවන්නාවූ විදර්ශනා ඥානයෙන් අනිත්‍ය දුඃඛ අනාත්ම යන ත්‍රිලක්ෂණය දුටුකල නැවත ඒ සංස්කාරයන්ගේ අනිත්‍යාදි ස්වභාව සෙවීමෙහි මධ්‍යස්ථතාව උපදීද මෙසේ විදර්ශනා ප්‍රඥාව මධ්‍යස්ථ වශයෙන් ඉපදීම විදර්ශනොපෙක්ෂා නම් වන්නීය යම්සේ ගෙටවන් සර්පයෙකු එළු කුරයකට බඳු අක්ඇති දඬුකෙලවරින් ඇත ඇත සොයන්නාහු සර්පයා දැක එළු කුරයකට බඳු දඬු කෙලවරින් තරකොට ඔබාගෙණ මම මේ සර්පයාත් නොපෙළා සර්පයා ලවා දෂ්ටකරවාත් නොගෙණ කෙසේ මිදෙන්නෙම්දෝහෝයි මිදෙන ආකාරයම සොයන්නාවූ ඒ පුරුෂයා හට සර්පයා අල්වාගැණීමෙහි මධ්‍යස්ථ බවෙව්ද එපරිද්දෙන්ම තිලකුණු දුටුහෙයින් භවත්‍රය ගිනිගත් ගෙයක්මෙන් දක්නාවූ යොගාවචරයාහට සංස්කාරයන් අනිත්‍යාදි වශයෙන් ගැන්මෙහි යම් මධ්‍යස්ථබවෙක් වේද මෙසේ උපදනා විදර්ශනා ප්‍රඥාව සංස්කාරොපෙක්ෂා නම් වන්නීය මෙසේ විදර්ශනොපෙක්ෂාව සිද්ධ කල්හි සංස්කාරොපෙක්ෂාවද සිද්ධවෙයි මෙසේ මේ විදර්ශනා ප්‍රඥාව සංස්කාරයන්ගේ අනිත්‍යතාදිය සෙවීමෙහිද සංස්කාරයන් අනිත්‍යාදි වශයෙන් ගැන්මෙහිදූයි යන දෙතන්හි මධ්‍යස්ථාකාරයෙන් පැවැත්මයයි කියනලද මේ දෙයාකාර කෘත්‍ය වශයෙන් දෙයාකාරයකින් බිඳෙනාලදූයි දතයුතු.

මෙසේ සර්පයාගේ සෝවැති තුණ දුටුකල සර්ප ලක්ෂණ සෙවීමෙහි මධ්‍යස්ථවන්නාක්මෙන් අනිත්‍ය දුඃඛ අනාත්ම යන තිලකුණු දුටුකල සංස්කාර ධර්මයන්ගේ නැවත අනිත්‍යාදි ලක්ෂණ සෙවීමෙහි මධ්‍යස්ථවේද එපරිද්දෙන් සංස්කාර ලක්ෂණ සෙවීමෙහි මැදහත්වූ විදර්ශනොපෙක්ෂාව සිද්ධවූ කල්හි දත්තාලද දෙෂඇති සංස්කාරයන්ගේ ගැන්මෙහි උපෙක්ෂාවද සිද්ධවන්නේමැයි. මේසේ මේ

ප්‍රහෘව අනිත්‍යාදිවශයෙන් සෙවීමය අනිත්‍යාදිවශයෙන් ගැන්මය යන මෙද තන්හි මැදහත්බවයයි කියනලද මේ කෘත්‍යවශයෙන් දෙයාකාරයකින් බෙදනලද්දීය. වීර්‍ය්‍යොපෙක්ෂා වේදනොපෙක්ෂා යන මෙදෙදන ඔවුනොවුන්වද සෙසු උපෙක්ෂාවන් හාද අර්ථවශයෙන් භින්නවූවාහු මැයි මෙසේ ප්‍රභෙදවූ මේ උපෙක්ෂාවන් අතුරෙන් ධ්‍යානොපෙක්ෂාව මෙහි කැමතිවනලද්දීය ඒ ධ්‍යානොපෙක්ෂාව මධ්‍යස්ථබව ලක්ෂණකොට ඇත්තීය ප්‍රතිඝකරණලද එසුවයව වීරුඩබව කෘත්‍යකොට ඇත්තීය ප්‍රතිඝකරණලද එමසුවයෙහි උත්සාහයක් නැතිබව වැටහීම්කොට ඇත්තීය ප්‍රීතියෙහි නොඇල්ම ආසන්නකාරණකොට ඇත්තීය මෙතන්හි චොදනාකාරයකුත්තක් ඇත්තේය මේ කුමක්දයත්? මේ ධ්‍යානොපෙක්ෂාව අර්ථවශයෙන් තත්‍ර මධ්‍යස්ථොපෙක්ෂාම වන්නීයයි යට කියනලද්දේය ඒ තත්‍ර මධ්‍යස්ථොපෙක්ෂාව ප්‍රථමධ්‍යාන ද්විතීයධ්‍යානයෙහිදු ඇත්තේමය එහෙයින් ඒ ප්‍රථමද්විතීයධ්‍යානයෙහින් උපෙක්ෂකව වසන්නේයයි මේ ධ්‍යානොපෙක්ෂාව කියයුතුවන්නීය එහෙයුදුවුවත් එහි කුමක් සඳහා ඒ ධ්‍යානොපෙක්ෂාව නොකියනලද්දිදයත්? ඒ එසේමැයි ප්‍රථම ද්විතීයධ්‍යානයෙහිදු මේ ධ්‍යානොපෙක්ෂාව ඇත්තීමය එතෙකුදුවුවත් විතර්කවිචාර ප්‍රීති යන ත්‍රිවිධ ධ්‍යානාඞ්ගයන් විසින් මඩනාලද බැවින් තත්‍රමධ්‍යස්ථතාව පළමුවන දෙවන ධ්‍යානයෙහි අප්‍රකට කෘත්‍යඇත්තීය එසේ අප්‍රකට කෘත්‍යඇතිහෙයින් එහි ගුණදශයෙන් නොවදුරණ ලද්දේයි මේ තෘතීයධ්‍යානයෙහි තත්‍රමධ්‍යස්ථතාව විතර්කවිචාර ප්‍රීතීන් විසින් නොමඩනාලද හෙයින් ඔසවන ලද හිස්ඇත්තියක් මෙන් අභිශයින් ප්‍රකටවූ කෘත්‍යඇතිවන්නීය එහෙයින් තෘතීය ධ්‍යානයෙහිම කියනලද්දීය මෙපමණකින් උපෙක්ෂකව වසන්නේය යන මේ පදයාගේ අර්ථ වර්ණනාව සර්වප්‍රකාරයෙන් කියා නිමවනලද්දීය.~

( පා * )

ඉදානි සතො ච සම්පජානො ති එත්ථ සරතීති සතො සම්පජානාතීති සම්පජානො පුග්ගලෙන සති ච සම්පජඤ්ඤඤ්ච වුත්තං තත්ථ සරණලක්ඛණා සති අසම්මුස්සනරසා ආරක්ඛපච්චුපට්ඨානා අසම්මොහලක්ඛණං සම්පජඤ්ඤං තීරණරසං පවිචයපච්චුපට්ඨානං~ තත්ථ කිඤ්චාපි ඉදං සතිසම්පජඤ්ඤං පුරිමජ්ඣානෙසුපි අත්ථි මුට්ඨස්සතිස්සහි අසම්පජානස්ස උපචාරමත්තම්පි න සම්පජ්ජති පගෙව අප්පනා ඔළාරිකත්තා පන තෙසං ඣානානං භූමියං විය පුරිසස්ස සුඛා ගති හොති අබ්‍යත්තං තත්ථ සතිසම්පජඤ්ඤකිච්චං ඔළාරිකඞ්ගප්පහානෙන පන සුඛුමත්තා ඉමස්ස ඣානස්ස පුරිසස්ස ඛුරධාරායං විය සති සම්පජඤ්ඤකිච්චපරිග්ගහිතා එව චිත්තස්ස ගති ඉච්ඡිතබ්බාති ඉධෙව වුත්තං කිඤ්ච භිය්‍යො යථා ධෙනුපකො වච්ඡො ධෙනුතො අපනීතො අරක්ඛියමානො පුනදෙව ධෙනුං උපගච්ඡති එවමිදං තතියජ්ඣානසුඛං පීතිතො අපනීතං තං සතිසම්පජඤ්ඤාරක්ඛෙන අරක්ඛියමානං පුනදෙව පීතිං උපගච්ඡෙය්‍ය පීතිසම්පයුත්තමෙව සියා සුඛෙවාපි සත්තා සාරජ්ජන්ති ඉදඤ්ච අතිමධුරං සුඛං තතො පරං සුඛාභාවා සතිසම්පජඤ්ඤානුභාවෙන පනෙත්ථ සුඛෙ අසාරජ්ජනා හොති නො අඤ්ඤථාති ඉමම්පි අත්ථවිසෙසං දස්සෙතුං ඉදමෙව වුත්තන්ති වෙදිතබ්බං~

ඉදානි සුඛඤ්ච කායෙන පටිසංවෙදෙතීති එත්‍ථ කිඤ්චාපි තතියජ්ඣානසමඞ්ගිනො සුඛපටිසංවෙදනාභොගො නත්‍ථි එවං සන්තෙපි යස්මා තස්ස නාමකායෙන සම්පයුත්තං සුඛං යං වා තං නාමකායසම්පයුත්තං සුඛං තංසමුට්ඨානෙනස්ස යස්මා අතිපණීතෙන රූපෙන රූපකායො ඵුටො, යස්ස ඵුට්ඨත්තා ඣානා වුට්ඨිතොපි සුඛං පටිසංවෙදෙය්‍ය තස්මා එතමත්‍ථං දස්සෙන්තො සුඛඤ්ච කායෙන පටිසංවෙදෙතීති ආහ.

( ඝ )

“සතොච සම්පජානො” යනුයෙහි; සරතීති, සිහි කෙරේනුයි; සතො, සත නම් වේ; සම්පජානාතීති, මනාකොට දනීනුයි; සම්පජානො, සම්පජාන නම් වේ; පුග්ගලෙන, පුද්ගල වශයෙනි (පුද්ගලාධිෂ්ඨාන දෙශනාවෙන යන අදහසි) සතිච, සමෘතිද; සම්පජඤ්ඤඤ්ච, නුවණද, වුත්තං, කියනලදී; තත්‍ථ, ඒ දෙක්හි; සරණලක්ඛණා, සිහිකිරීම ලකුණුකොට ඇත්තී; සති, සිහිනම්වේ; අසම්මුස්සනරසා, සිහි මුළානොවීම කෘත්‍යකොට ඇත්තීයි; ආරක්ඛපච්චුපට්ඨානා, කෙලෙසුන්කෙරෙන් ආරක්ෂාව වැටහීම්කොට ඇත්තීයි; අසම්මොහලක්ඛණං සම්පජඤ්ඤං, නොමුළාබව ලක්ෂණකොට ඇත්තේ සම්පජඤ්ඤනම්; තීරණරසං, කෘත්‍යයෙහි පාරයාම කෘත්‍යකොට ඇත්තේයි; පවිචයපච්චුපට්ඨානං, විමසාව වැටහීම්කොට ඇත්තේයි; තත්‍ථ, එහි; ඉදං සතිසම්පජඤ්ඤං, මේ සිහිනුවණ දෙක; පුරිමජ්ඣානෙසුපි, යට ධ්‍යානයෙහිදු; කිඤ්චාපි අත්‍ථි, කිසියේන් ඇත (මුට්ඨස්සතිස්ස යනාදීන් එම සාධන්) මුට්ඨස්සතිස්ස, සිහිනැති; අසම්පජානස්ස, නුවණ නැත්තහුට; උපචාරමත්තම්පි න සම්පජ්ජති, උපචාරපමණකුදු සිද්ධනොවෙයි; පගෙවඅප්පනා, අර්පණාකැල කියයි; ඔළාරිකත්තාපන තෙසං ඣානානං, ඒ ධ්‍යානයන් ඖදාරික බැවින් (උපචාරධ්‍යානාදීන් නිසා ප්‍රථම ද්විතීයධ්‍යානයෝද සූක්ෂ්මයෝමය මේ ධ්‍යානය වනාහි මතුයෙහි ධ්‍යානය නිසා ඖදාරිකයයි කියනලදු ඖදාරිකබවද විතර්කාදී ස්ථූලාඞ්ගවිසිනැයි දතයුතු — සත්තයෙහි බොහෝ චෛතසිකයන් ඇතිහෙයින් ඖදාරිකයයි කීහු) භූමියං විය පුරිසස්ස, භූමියෙහි පුරුෂයාගේ (ගමන) මෙන්; චිත්තස්ස ගති සුඛා හොති, ඒ ධ්‍යානයෙහි චිත්තගතිය සුව වේ; අපරිබ්‍යත්තං තත්‍ථ සතිසම්පජඤ්ඤකිච්චං (දුෂ්ප්‍රකාරයෙන් කරණ ලැබෙයි කියයුත්තක් නැතිබැවින්) ඒ ධ්‍යානයන්හි සමාහිසම්ප්‍රජන්‍යකෘත්‍යය අප්‍රකටයි; ඔළාරිකඞ්ගප්පහාණෙන පන සුඛුමත්තා ඉමස්ස ඣානස්ස, මේ ධ්‍යානය ඖදාරිකාඞ්ගප්‍රහාණයෙන් සූක්ෂ්මහෙයින් “ඔළාරිකඞ්ගප්පහාණෙන සුඛුමත්තා” යන මේ අර්ථය කිසිසේත් පළමුවන දෙවනධ්‍යානාදියෙහිදු සම්භවවෙයි එතකුදුවුවත් බොහෝසේ අවිප්‍රයොගභාවයෙන් පවත්නා ප්‍රීති සුඛයන් කෙරෙහි ප්‍රීති සඞ්ඛ්‍යාත ඖදාරිකාඞ්ගයාගේ ප්‍රහාණයෙන් සූක්ෂ්මබව මෙහි සාතිශය සමාහිප්‍රඥාවන්ගේ ව්‍යාපාරනුයී “පුරිසස්ස” යනාදිය කියනලදී) පුරිසස්ස ඛුරධාරායං විය, පුරුෂයාගේ ක්ෂුරධාරායෙහි (ගමන) මෙන්; සතිසම්පජඤ්ඤපරිග්ගහිතාව, සමෘති සම්ප්‍රජන්‍යයෙන් පරිග්‍රහ කරණලදම; චිත්තස්ස ගති ඉච්ඡිතබ්බාති, චිත්තගති පැසැස්සයුතු හුයි; ඉච්චෙව වුත්තං, (සිහිනුවණදෙක) මෙසේම කියනලදී; කිඤ්චභීයො, නැවත කිමෙක්ද යත්? යථා, යම්සේ; ධෙනුපගො වච්ඡො,

පොවන වසු; ධෙනුතො අපනීතො,
දෙනකෙරෙන් පහකරණලද්දේ; අ
රක්ඛියමානො, නොරක්නා ලබන්
නේ; පුනදෙව ධෙනුං උපගච්ඡති,
නැවත දෙනකරම යේද; එවං, එප
රිද්දෙන්ම; ඉදං තයි..ජ්ඣාන සුඛං,
මේ තෘතීයධ්‍යාන සුවය; පීතිතො අ
පනීතං, ප්‍රීතියෙන් වෙන්කරණලද්
දේ; සතිසම්පජඤ්ඤාරක්ඛෙන අර
ක්ඛියමානං, සිහිනුවණ නැමති ආ
රක්‍ෂාවෙන් නොරකිණු ලබන්නේ;
පුනදෙව පීතිං උපගච්ඡෙය්‍ය, නැව
ත ප්‍රීතියට පැමිණෙන්නේයි ( ද්විතීය
ධ්‍යානයට පැමිණෙන්නේයයි සේයි)
පීතිසම්පයුත්තමෙවසියා, ප්‍රීතිසම්ප්‍රයු
ක්තම වේ; සුඛෙවා පි, සුවයෙහිද,
සාතාසාරජ්ජති, සතම්වයේ ඇලෙ
ඩ!; ඉදඤ්ච, මේ (සප්‍රීතිකධ්‍යානයෙහි)
සුවයද; අ ති ම ධු රං සු ඛං ( උග්‍රප්‍රීති
යගේ අභාවයෙන් ) අතිමධුර සුවයි,
තතො පරං සුඛාභාවා, එයින් මතු
සුවයෙක් නැතිබැවින්; සති සම්පජ
ඤ්ඤානුභාවෙන පන, සිහිනුවණ දෙ
දෙනාගේ ආනුභාවයෙන් වනාහි; එ
ත්ථ, මේ තුන්වනධ්‍යානයෙහි; සුඛෙ අ
සාරජ්ජනා හොති, සුවෙහි නොඇලී
මවේ; නාඤ්ඤථා, අනික්පරිද්දෙකි
න් නොවේ; ඉමම්පි අත්ථ විසෙසං ද
ස්සෙතුං, මේ අර්ථවිශෙෂය දක්වනුපි
ණිස; ඉදං, මේ සිහිනුවණ දෙන; ඉ
ධෙව වුත්තනානිවෙදිතබ්බං, මෙහිම
කියනලද්දැයි දතයුතු; ඉදානි, දැන්; සුඛ
ඤ්ච කායෙන පටිසංවෙදෙතීති එත්ථ,
සුඛඤ්ච කායෙන පටිසංවෙදෙති ය
න්නෙහි; කිඤ්චාපි, කිසිසේත්; තති
යජ්ඣාන සමඞ්ගිනො, තෘතීය ධ්‍යාන
සමන්විතය හට; සුඛ පටිසංවෙදනා
භොගො නත්ථි, සුවවිඳිම්යි යන ආ
භොගයෙක් නැත; එවං සන්තෙපි;
එසේවුවද්; යස්මා, යම්හෙයකින්;
තස්ස, ඒ ධ්‍යානසමන්විතයාගේ; නා
මකායෙන සම්පයුත්තං සුඛං, නාම
කායහා සම්ප්‍රයුක්තවූ යම් සුවයෙක්
ඇද්ද (තං සො පටිසංවෙදෙය්‍ය යි
යොදනු) යං වා තං නාමකායසම්පයු
ත්තං සුඛං, නොහොත් යම් නාමකා
යසම්ප්‍රයුක්තවූ සුවයෙක් ඇද්ද; තං
සමුට්ඨානෙන, එයින් උපන්නාවූ (තං
සමුට්ඨානෙන තතො සමුට්ඨිතෙන
යනු ටීකායි) අස්ස, ඒ ධ්‍යානලාභිනු
ගේ; යස්මා, යම්හෙයකින්; අතිපණී
තෙන රූපෙන, අතිප්‍රණීතවූ රූප
යෙන්; රූපකායො ඵුට්ඨො, රූපකාය
ස්පර්ශකරණලදද; යස්ස ඵුට්ඨත්තා, ය
ම් රූපයෙකින් ස්පර්ශ ලදහෙයින්; ඣා
නාවුට්ඨිතොපි, ධ්‍යානයෙන් නැංගේ
ද; සුඛං පටිසංවෙදෙය්‍ය, කායික සුව
ය අනුභවකෙරේ; තස්මා, එහෙයින්;
එතමත්ථංදස්සෙන්තො, කායිකචෛ
තසික සුඛ පටිසංවෙදනායයි කියන
ලද අර්ථ දක්වන්නේ (සුඛඤ්ච කායෙ
න පටිසංවෙදෙති-යි කීනියායි. නාමකා
යයෙන් චෛතසිකසුඛයද කායිකසුඛ
යහතුවූ රූපය ඉපදවීමෙන් කායික
සුඛයද ධ්‍යානසමන්විතය අනුභවකෙ
රෙයි කීයනුලැබේයි මේ මෙහි සං
ක්‍ෂෙපාර්ථයි)

( හා * )

මෙතැන්පටන් "සතොසම්පජානො"
යන පදයන්ගේ අර්ථවර්ණනාව ව
න්නේයි. මෙහි පුද්ගලාධිෂ්ඨාන දෙ
ශනා වශයෙන් නොවත් සිහිනුවණ
යන ස්වභාවධර්මයන්ට පුද්ගලයෙකු
ආධාරවශයෙන් ගෙණ දෙශනාකළ
හෙයින් සිහිකරණ අර්ථයෙන් සත
නම මනාකොට දැනගන්නා අර්ථයෙ
න් සම්පජාන නමැයි කියාද අර්ථවන්
නේයි මේ දෙපෙදින් පුද්ගලයෙකු
ආධාරකොට ඇති සිහිනුවණ යන
සංස්කාරධර්මවූ දක්වන ලද්දේයි
ඒ දෙදෙනා අතුරෙන් සිහිය ඒ ඒ අර

මුළු සිත්හි කිරීම ලක්ෂණකොට ඇත්තීය මුලානොවීම කෘත්‍යකොට ඇත්තීය කෙලෙසුන් වැද්ද නොදී ආරක්ෂාකිරීම වැටහීම්කොට ඇත්තීය නුවණද නොමුලාබව ලක්ෂණකොට ඇත්තේය හටයුත්තෙහි එතරම යාම හෙවත් මුදුන්පැමිණීම කෘත්‍යකොට ඇත්තේය හාත්පසින් සෙවීම වැටහීම්කොට ඇත්තේයි එහි කිසිසේත් මේ සිහිනුවණ දෙක යට ප්‍රථමද්විතීයධ්‍යානයෙහිදු ඇත්තේමය ඒ එසේමැයි සිහිමුලාවූ නුවණ නැත්තෙකුහට උපචාරමාත්‍රයකුදු සිද්ධ නොවන්නේමය අර්පණාධ්‍යානය කියනුම කවරේද? ඒ ප්‍රථම ද්විතීයධ්‍යානයෝ විතර්කවිචාර යන ඖලාරිකාඞ්ගයන්ගෙන් යුක්තබැවින් ඖලාරික වූහෙයින් භූමියෙහි පුරුෂයාගේ ගමනමෙන් ඒ ඖලාරික ධ්‍යානයෙහි චිත්තගතිය සුවවන්නේයි එසේහෙයින් ඒ ප්‍රථමද්විතීයධ්‍යානයෙහි සිහිනුවණ පිළිබඳ කෘත්‍ය අප්‍රකට වන්නේමැයි මේ තෘතීයධ්‍යානය ඒඖලාරිකාඞ්ගයන් දුරුකිරීමෙන් සියුම්වූහෙයින් පුරුෂයාගේ කරකැති මුවහතෙහි ගමනක්මෙන් මේ තෘතීයධ්‍යානයට සිහිනුවණදෙකින් ආරක්ෂාකරණලද්දවූම චිත්තගතිය කැමතිවිය යුතුහෙයින් මේ තෘතීයධ්‍යානයෙහිම සිහිනුවණදෙක අඞ්ගවශයෙන් කියනලද්දේයි. තවද යම්සේ ගවදෙන විසින් කිරිපොවනලද වසුපැටවෙක් ගවදෙනගෙන් වෙන්කරණලදුව අන්තෙනකට ගෙණගොස් ආරක්ෂා නොකරන්නාහුනම් නැවතත් ගවදෙන කරාම දිවෙද එපරිද්දෙන්ම මේතෘතීයධ්‍යාන සුවය ප්‍රීතියෙන් වෙන්කරණලද්දේද නාමුදු සිහිනුවණ නැමැති ආරක්ෂාවෙන් නොරකින ලද්දේනම් නැවත ප්‍රීතියටහෙවත් ප්‍රීතිසම්ප්‍රයුක්ත ද්විතීයධ්‍යානයටම පැමිණෙන්නේය. ප්‍රීති නැමැති ධ්‍යානාඞ්ගයෙන් සම්ප්‍රයුක්තම වන්නේයි තවද සත්ත්වයෝ සුවයෙහි ඇලෙන්නාහුය මේ තෘතීයධ්‍යානයෙහි ඇත්තාවූ සුවයද උග්‍රප්‍රීතියෙන් තොරවූ බැවින් ඉතා මිහිරිවන්නේය මේ ධ්‍යානයෙහි ඇත්තාවූ සුවයට වඩා ප්‍රණීත සුවයෙක් අන්කිසි තැනෙක නැතිබැවින් සිහිනුවණ දෙදෙනාගේ ආනුභාවයෙන් මේ සුවයෙහි නොඇලීම වන්නේය අන් පරිද්දෙකින් නොවන්නේයි. මෙසේ මේ අර්ථවිශේෂය දක්වනු පිණිසද මේ සිහිනුවණ දෙක මේ තෘතිය ධ්‍යානයෙහිම කියන ලද්දේයයි දතයුතු මෙසේ ස්මෘති සම්ප්‍රජන්‍යයෙන් යෙදී වාසයකරන්නේය යන පදයන්ගේ අර්ථදක්වා දැන් කයින් සුවවිඳිනේය යන මේ පදයන්ගේ අර්ථවර්ණනාව වන්නේයි. එහි කිසිසේත් තෘතීයධ්‍යානලාභීහට සුවවිඳිම් යන මනස්කාරයෙක් නම් නැත්තේය එතකුදුවුවත් යම්සේ ඒ ධ්‍යානලාභීහුගේ ධ්‍යානචිත්තය පිළිබඳව පවත්නා සංස්කාරස්කන්ධ සංඛ්‍යාතවූ නොහොත් නාමකාය සම්ප්‍රයුක්තවූ යම් සුවයෙක් ඇද්ද ඒ ධ්‍යානසුවයෙන් හටගන්නාවූ අතිප්‍රණීත චිත්තජ රූපයන් ඒ ධ්‍යානලාභීහුගේ සෙසු කර්මචිත්ත ඍතු ආහාරසංඛ්‍යාත චතුජරූපකාය යම්සේ ස්පර්ශකරණලද්දේද එසේ ස්පර්ශලදහෙයින් ධ්‍යානයෙන් නැගිකලද කායිකසුවය අනුභවකරන්නේයි එහෙයින් ඒ තෘතීයධ්‍යානලාභීහු කායික චෛතසික සංඛ්‍යාත ද්විප්‍රකාර සුවයම අනුභවකරන්නාහුයි දක්වන්නාහු කයින් සුවවිඳිනේය යනු කීහයි දතයුතු.

( පා † )

ඉදානි යන්තං අරියා ආචික්ඛන්ති උපෙක්ඛකො සතිමා සුඛවිහාරීති එවං යං ඣානහෙතු යං ඣානකාරණා තං තතියජ්ඣානසමඞ්ගිපුග්ගලං බුද්ධාදයො අරියා ආචික්ඛන්ති දෙසෙන්ති පඤ්ඤපෙන්ති පට්ඨපෙන්ති විවරන්ති විභජන්ති උත්තානීකරොන්ති පකාසෙන්ති පසංසන්තීති අධිප්පායො කින්ති උපෙක්ඛකො සතිමා සුඛවිහාරීති තං තතියජ්ඣානං උපසම්පජ්ජ විහරතීති එවමෙත්ථ යොජනා වෙදිතබ්බා ~~~ කස්මා පන තං තෙ එවං පසංසන්තීති පසංසාරහතො අයං හි යස්මා අතිමධුරසුඛෙ සුඛපාරමිප්පත්තෙපි තතියජ්ඣානෙ උපෙක්ඛකො න තත්ථ සුඛාභිසඞ්ගෙන ආකඩ්ඪීයති යථා ච පීති න උප්පජ්ජති එවං උපට්ඨිතසතිතාය සතිමා යස්මා ච අරියකන්තං අරියජනසෙවිතමෙව ච අසංකිලිට්ඨසුඛං නාමකායෙන පටිසංවෙදෙති තස්මා පසංසාරහො ඉති පසංසාරහතො නං අරියා තෙ එවං පසංසාහෙතුභූතෙ ගුණෙ පකාසෙන්තා උපෙක්ඛකො සතිමා සුඛවිහාරීති එවං පසංසන්තීති වෙදිතබ්බං ~~~ තතියන්ති ගණනානුපුබ්බතා තතියං ඉදං තතියං සමාපජ්ජතීති තතියං ~~~

---

( ස † )

"ඉදානි යන්තං අරියා ආචික්ඛන්ති උපෙක්ඛකො සතිමා සුඛවිහාරීති" යනාමෙහි (යං යනු හෙත්වර්ථයෙහි නිපාතය "යස්මා" යන අර්ථයි එහෙයින්ම "යං ඣානහෙතු" කීහු යම් ධ්‍යානයක් හෙතුකොටගෙණ යන අර්ථයි "යං ඣානකාරණා" යනු හෙත්වර්ථයෙහි පඤ්චමියි - යම් ධ්‍යානකාරණයකින් ය - යන අර්ථයි - තංයිමෙන් යි) තතියජ්ඣානසමඞ්ගිපුග්ගලං, තෘතීයධ්‍යානසමන්විත පුද්ගලයා; බුද්ධාදයො අරියා, බුද්ධාදී ආර්‍ය්‍යයෝ; ආචික්ඛන්ති, කියද්ද; දෙසෙන්ති, දෙසද්ද; පඤ්ඤපෙන්ති, පණවද්ද; පට්ඨපෙන්ති, පිහිටුවද්ද; විවරන්ති, විවරණය කෙරෙද්ද; විභජන්ති, විභාගකෙරෙද්ද; උත්තානීකරොන්ති, උත්තානකෙරෙද්ද; පකාසෙන්ති, ප්‍රකාශකෙරෙද්ද; පසංසන්තීති අධිප්පායො, ප්‍රශංසාකෙරෙතියි යන අභිප්‍රායයි (ආචික්ඛන්ති යනාදි පදයෝ ප්‍රශංසාර්ථයහ යන අභිප්‍රායෙන් "පසංසන්තීති අධිප්පායො"යි කීහු) කින්ති, කෙසේ ප්‍රශංසාකෙරෙද්ද යත්? ("උපෙක්ඛකො සතිමා සුඛවිහාරීති"යි කීනියායි) තං තතියජ්ඣානං උපසම්පජ්ජ විහරතීති, ඒ තෘතීයධ්‍යානය උපදවා වෙසේ; එවං, මෙසේ; එත්ථ, මෙහි; යොජනා වෙදිතබ්බා, යොජනා දතයුතු; කස්මා පන, කුමක්හෙයින්? තං, ඒ තෘතීයධ්‍යාන් ලද පුගුලා; තෙ, ඒ ආර්‍ය්‍යයෝ; එවං පසංසන්ති, මෙසේ ප්‍රශංසාකෙරෙද්දයත්? පසංසාරහතො, ප්‍රශංසාවට අභිහෙයිනි; අයං හි, මේ තෘතීයධ්‍යානලාභිතෙමේ; යස්මා, යම්හෙයකින්; අතිමධුරසුඛෙ, අතිමධුරවූ සුඛඇති; සුඛපාරමිප්පත්තෙපි, සුඛයෙහි කෙළවරට පැමිණියාවූද; තතියජ්ඣානෙ, තුන්වනධ්‍යානයෙහි, උපෙක්ඛකො, උපෙක්ෂකය; තත්ථ, ඒ ධ්‍යානයෙහි; සුඛාභිසඞ්ගෙන, සුවයෙහි අභිලාශයෙන්; න ආකඩ්ඪීයති, හයනු නොලැබේ; යථා ච, යම්සේ; පීති න උප්පජ්ජති, ප්‍රීතිය නොවුපදීද; එවං, එසේ; උපට්ඨිතසතිතාය, එළඹසිටි සිහි ඇතිබැවින්; සතිමා, සිහිඇති; යස්මා, යම්හෙයකින්ද; අරියකන්තං, ආර්‍ය්‍යයන්ට කාන්තවූ; අරියජනසෙවිතමෙව, ආර්‍ය්‍යජනයන් විසින් සෙවුනාවූද; අසංකිලිට්ඨං සුඛං, අසංක්ලි

ෂමවූ සුඛය; නාමකායෙන පටිසංවෙදෙති, නාමකායයෙන් අනුභව කෙරේද; තස්මා, එහෙයින්; පසංසාරහං, ප්‍රශංසාවට අභීසී; ඉති, මෙසේ; පසංසාරහතො, ප්‍රශංසාවට අභිහෙයින්; අරියා, ආර්‍ය්‍යයෝ; එත එවපසංසාහෙතු භූතෙ ගුණෙ, එවැනි ප්‍රශංසාවට හේතුවූ ගුණයන්; පකාසෙන්තා, ප්‍රකාශකරන්නාහු (උපෙක්ඛකො සතිමා සුඛවිහාරීති) එවං පසංසන්තීති වෙදිතබ්බා, මෙසේ ප්‍රශංසාකෙරෙතියි දතයුතු - පෙ -

(ගා †)

දූෂ්වනාහි ආර්‍ය්‍යයෝ යම් ඒධ්‍යානලාභී පුද්ගලයක්හු අරභයා උපෙක්ෂා ඇත්තේය සිහි ඇත්තේය සුඛවිහරණ ඇත්තේයයි ප්‍රශංසාකරන්නාහු දැයි යන මේ පදයන්ගේ අර්ථවර්ණනාව වන්නේයි මෙහි යම්ගුණයක් කාරණකොටගෙණ ඒ තෘතීයධ්‍යානලාභීහු බුද්ධාදි ආර්‍ය්‍යයෝ උපෙක්ෂා ඇත්තේය සමාහිඇත්තේය සුඛවිහරණ ඇත්තේයයි ප්‍රශංසාකරන්නාහුද එබඳු බුද්ධාදි ආර්‍ය්‍යයන්විසින් ප්‍රශංසනීය ගුණඇත්තාවූ තෘතීයධ්‍යානය උපදවා වාසයකරන්නේයයිමෙසේ මෙහි අර්ථයොජනාව දතයුතු කුමක්හෙයින් වනාහි බුද්ධාදි ආර්‍ය්‍යයෝ තෘතීයධ්‍යානලාභීහට මෙසේ ප්‍රශංසාකරන්නාහුද යත්? ප්‍රශංසාවට සුදුසුහෙයින් ප්‍රශංසාකරන්නාහුයයි දතයුතු. ඒ එසේමැයි. මේ තෘතීයධ්‍යානලාභී යොගාවචරයා ඉතාමිහිරි සුවයෙහි කෙළවරට පැමිණියාහුදු ආන්වත ධ්‍යානයෙහි උපෙක්ෂා නාම වන්නේය සුවයෙහි ඇල්මෙන් ඒ ධ්‍යානයට සමනොවද්නේමය යම්පරිද්දෙකින් ප්‍රීතිය නොඋපදනේද එපරිද්දෙන් සිහිඑළවා සිටිබැවින් සමාහිද ඇත්තේයි යම්සේ ආර්‍ය්‍යයන් සිත් අලවන්නාවූ ආර්‍ය්‍යයන් විසින් සෙවු නාලද්දවූ නොකිලිටු සුවය නාමකායයි සඞ්ඛ්‍යාත සංස්කාරස්කන්ධයෙන් අනුභවකරන්නේවේද එහෙයින් ප්‍රශංසාවට සුදුසුවන්නේයි මෙසේ ප්‍රශංසාවට සුදුසුහෙයින් බුද්ධාදි ආර්‍ය්‍යයෝ ඒ ප්‍රශංසාවට කාරණවූ ගුණයන් ප්‍රකාශකරන්නාහු උපෙක්ෂා ඇත්තේය සමාහිඇත්තේය සුඛවිහරණ ඇත්තේයයි මෙසේ ප්‍රශංසාකරන්නාහුයයි දතයුතු -

තෘතීය යනු ගණන්පිළිවෙළින් තුන්වනුවූහෙයින්ද තුන්වෙනුව මේ ධ්‍යානය සමවදනා හෙයින්ද තෘතීය නම් වන්නේයි -

(පා ‡)

යං පන වුත්තං එකඞ්ගවිප්පහීණං දුවඞ්ගසමන්නාගතන්ති එත්ථ පීතියා පහානවසෙන එකඞ්ගවිප්පහීණතා වෙදිතබ්බා - සා පනෙසා දුතියජ්ඣානස්ස විතක්කවිචාරා විය අප්පනාක්ඛණෙ යෙව පහීයති තෙනස්ස සා පහානඞ්ගන්ති වුච්චති සුඛං චිත්තෙකග්ගතාති ඉමෙසං පන ද්වින්නං උප්පත්තිවසෙන දුවඞ්ගසමන්නාගතතා වෙදිතබ්බා තස්මා යං විභඞ්ගෙ ඣානන්ති උපෙක්ඛා සති සම්පජඤ්ඤං සුඛං චිත්තස්සෙකග්ගතාති වුත්තං තං සපරික්ඛාරං ඣානං දස්සෙතුං පරියායෙන වුත්තං ඨපෙත්වා පන උපෙක්ඛාසතිසම්පජඤ්ඤානි නිප්පරියායෙන උපනිජ්ඣානලක්ඛණප්පත්තානං අඞ්ගානං වසෙන දුවඞ්ගිකමෙවෙතං හොති යථාහ - කතමං තස්මිං සමයෙ දුවඞ්ගිකං ඣානං හොති සුඛං චිත්තස්සෙකග්ගතාති සෙසං පඨමජ්ඣානෙ වුත්තනයමෙව -

( ස ‡ )

එත්ථ පන, මෙති ච හොති; පීතියා පහාණවසෙන, ප්‍රීතියගේ ප්‍රහාණවශයෙන්; එකඞ්ගවිප්පහීණතා වෙදිතබ්බා, එක් අඟෙකින් විප්‍රයුක්තතබව දතයුත්තීයි; සා පනෙසා, ඒ මේ ප්‍රීතිතොමෝ; දුතියජ්ඣානස්ස විතක්කවිචාරා විය, විතීයධ්‍යානයාගේ විතර්කවිචාර ප්‍රහාණය මෙන්; අප්පනාක්ඛණෙ යෙව පහීයති, අර්පණාක්‍ෂණයෙහිම ප්‍රහාණය කරණුලැබේ; තෙන, එහෙයින්; අස්ස, මේ ධ්‍යානහුගේ; සා, ඒ ප්‍රීති තොමෝ; පහාණඞ්ගන්ති වුච්චති, ප්‍රහාණාඞ්ගයයි කියනලද; සුඛං, සුවය; චිත්තෙකග්ගතාති, චිත්තෙකාග්‍රතාය යන; ඉමෙසං පන ද්විනනං උප්පත්තිවසෙන, මේ දෙදෙනාගේ උත්පත්තිවිසින්; දුවඞ්ගසමන්නාගතතා වෙදිතබ්බා, දෙඅඟින් සම්ප්‍රයුක්තබව දතයුතු..පෙ..

---

( භා ‡ )

එක් අඟකින් වියුක්තවූ දෙයඟකින් යුක්තවූයයි යම් වචනයක් කියනලද්දේද ඒ මේ වචනයෙහි විස්තර මෙතැන්පටන් ප්‍රකාශ වන්නේයි. මෙහි ප්‍රීතිය දුරුකිරීම්වශයෙන් එක් අඟකින් වියුක්තබව දතයුත්තේය ඒ මේ ප්‍රීතිය විතීයධ්‍යානයෙහි විතර්කවිචාරයන්ගේ දුරුකිරීම මෙන් මේ තෘතීයධ්‍යානයාගේ අර්පණාක්‍ෂණයෙහිම දුරුකරණුලබන්නේයි එහෙයින් ඒ ප්‍රීතිය මේ තෘතීයධ්‍යානයාගේ ප්‍රහාණාඞ්ගයයි කියන ලද්දේයි. එපරිද්දෙන්ම සුඛය චිත්තෙකාග්‍රතාය යන අඞ්ගවයගේ උත්පත්තිවශයෙන් දෙයඟකින් යුක්තබව දතයුත්තේයි ධ්‍යානවිභඞ්ගයෙහි වනාහි ධ්‍යානාඞ්ගයන් දක්වන්නාහු උපෙක්‍ෂාය ස්මෘතිය සම්ප්‍රජන්‍යය සුඛය චිත්තෙකාග්‍රතායයි යම්ක් වදුරණලද්ද ඒ සපරිවාරධ්‍යානය දක්වනපිණිස පර්‍යායවශයෙන් වදුරණලද්දේයි ධ්‍යානයට පිරිවර වශයෙන් දක්වනලද උපෙක්‍ෂා ස්මෘති සම්ප්‍රජන්‍ය යන ධර්මයන් හැර නිෂ්පර්‍යායවශයෙන් නීවරණයන්ට විරුද්ධව දක්මයයි කියනලද උපනිධ්‍යානලක්‍ෂණ ප්‍රාප්තවූ අඞ්ගයන්ගේවශයෙන් මේ තෘතීයධ්‍යානය දෙඅඟකින් යුක්තවන්නේ මය. වදළේමැයි. විභඞ්ගප්‍රකරණයෙහි එසමයෙහි කවර දෙයඟකින් යුක්තවූ ධ්‍යානය උපදනේදයත්? සුඛය චිත්තෙකාග්‍රතාය යන දෙයඟකින් යුක්තවූ තෘතීයධ්‍යානය උපදනේයි. සෙස්ස ප්‍රථමධ්‍යානයෙහි කියනලද නයින්ම දතයුතු..

---

( පා ¶ )

එවං අධිගතෙ පන තස්මිම්පි වුත්තනයෙනෙව පඤ්චහාකාරෙහි චිණ්ණවසිනා හුත්වා පගුණතතියජ්ඣානතො වුට්ඨාය අයං සමාපත්ති ආසන්නපීතිපච්චත්ථිකා යදෙව තත්ථ සුඛම්ති චෙතසො ආභොගො එතෙනෙතං ඔළාරිකමක්ඛායතීති එවං වුත්තස්ස සුඛස්ස ඔළාරිකත්තා අඞ්ගදුබ්බලාති ච තත්ථ දොසං දිස්වා චතුත්ථජ්ඣානං සන්තතො මනසිකරිත්වා තතියජ්ඣානෙ නිකන්තිං පරියාදාය චතුත්ථාධිගමාය යොගො කාතබ්බො. අථස්ස යදා තතියජ්ඣානතො වුට්ඨාය සතස්ස සම්පජානස්ස ඣානඞ්ගානි පච්චවෙක්ඛතො චෙතසිකසොමනස්සසඞ්ඛාතං සුඛං ඔළාරිකතො උපට්ඨාති උපෙක්ඛාවෙදනාචෙව චිත්තෙකග්ගතා ච සන්තතො උපට්ඨාති තදස්ස ඔළාරිකඞ්ගප්පහාණාය සන්තඅඞ්ගපටිලාභාය ච තදෙව නිමිත්තං පථවීපථවීති පුනප්පුනං මනසිකරොතො

ඉදානි චතුත්ථජ්ඣානං උප්පජ්ජිස්සතීති භවඞ්ගං උපච්ඡින්දිත්වා තදෙව පථවිකසිණං ආරම්මණං කත්වා මනොද්වාරාවජ්ජනං උප්පජ්ජති තතො තස්මිංයෙවාරම්මණෙ චත්තාරි පඤ්ච වා ජවනානි උප්පජ්ජන්ති යෙසං අවසානෙ එකං රූපාවචරං චතුත්ථජ්ඣානිකං සෙසානි වුත්තප්පකාරානෙව කාමාවචරානි අයං පන විසෙසො යස්මා සුඛාවෙදනා අදුක්ඛමසුඛාය වෙදනාය ආසෙවනපච්චයෙන පච්චයො න හොති චතුත්ථජ්ඣානෙ ච අදුක්ඛමසුඛාය වෙදනාය උප්පජ්ජිතබ්බං තස්මා තානි උපෙක්ඛාවෙදනාසම්පයුත්තානි හොන්ති උපෙක්ඛාසම්පයුත්තත්තායෙව චෙත්ථ පීති පරිහායතීති එත්තාවතා චෙස —— සුඛස්ස ච පහාණා දුක්ඛස්ස ච පහාණා පුබ්බෙව සොමනස්ස දොමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛං අසුඛං උපෙක්ඛාසති පාරිසුද්ධිං චතුත්ථජ්ඣානං උපසම්පජ්ජ විහරති එවමනෙන එකඞ්ගවිප්පහීණං දුවඞ්ගසමන්නාගතං තිවිධකල්‍යාණං දසලක්ඛණසම්පන්නං චතුත්ථජ්ඣානං අධිගතං හොති පඨවිකසිණං ——

( ස ¶ )

අයං සමාපත්ති, මේ චතුර්ථධ්‍යාන සමාපත්ති තොමේ; ආසන්නපීති පච්චත්ථිකා, ආසන්නවූ ප්‍රීතිනැමැති ප්‍රත්‍යර්ථීන් ඇත්තීයයි දතයුතු; සුඛස්ස ච ඔළාරිකත්තා, සුඛය ඖදාරිකබැවින්; අඞ්ගදුබ්බලාතිච, දුර්වලාඞ්ගයකිද —පෙ— චෙතසික සොමනස්සසඞ්ඛාතං, චෛතසික සෞමනස්‍යයයි කීයනලද; සුඛං, සුවය; උපෙක්ඛා වෙදනා චෙව, උපෙක්ෂාවෙදනාද —පෙ— අයම්පන, මේ වනාහි; විසෙසො, විශෙෂයි; යස්මා, යම්හෙයකින්; සුඛාවෙදනා, සුඛවෙදනා තොමෝ; අදුක්ඛමසුඛාය වෙදනාය, උපෙක්ෂා වෙදනාවට; ආසෙවනපච්චයෙන පච්චයො න හොති (අනිෂ්ටතැන්හි පදනාතරයෙන් ගත්තහුගේ ආසෙවන ප්‍රත්‍යය වනබව නැතිබැවින්) ආසෙවන ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය නොවේ; චතුත්ථජ්ඣානෙච අදුක්ඛමසුඛායවෙදනාය උප්පජ්ජිතබ්බං, චතුර්ථධ්‍යානහිදු උපෙක්ෂා වෙදනාවිසින් ඉපදවියයුතුය; තස්මා, එහෙයින්; තානි, ඒ සතරපස්ජවන්හු; උපෙක්ඛා වෙදනා සම්පයුත්තානි හොන්ති, උපෙක්ෂාවෙදනා සම්ප්‍රයුක්තවෙත්; උපෙක්ඛාසම්පයුත්තත්තා චෙව, උපෙක්ෂා සම්ප්‍රයුක්තබැවින්ම; එත්ථ, මෙහි; පීති පරිහායති, ප්‍රීතිය පිරිහේ —පෙ— සුඛස්ස ච පහාණා, කායික සුඛයාගේ ප්‍රහාණයෙන්; දුක්ඛස්ස ච පහාණා, කායිකදුඃඛයාගේද ප්‍රහාණයෙන්; පුබ්බෙව, පූර්වයෙහිම; සොමනස්ස දොමනස්සානං අත්ථඞ්ගමා, සෞමනස්‍ය දෞර්මනස්‍යයන්ගේ අස්තඞ්ගමයෙන්; අදුක්ඛං, දුක් නොවූ; අසුඛං, සුඛනොවූ; උපෙක්ඛාසති පාරිසුද්ධිං, උපෙක්ෂා ස්මෘතියෙන් පිරිසිදුවූ —පෙ—

( හා * )

මෙසේ පැමිණෙනලද චතුර්ථධ්‍යාන ඇති යොගාවචර මහණවිසින් ඒ චතුර්ථධ්‍යානයෙහිදු එට කියනලද නයින්ම පස්ආකාරයකින් පුරුදුකරණලද වශිතා ඇතිව පුහුණුවූ තෘතීය ධ්‍යානයෙන් නැගී මේ සමාපත්තියට ප්‍රීතිනැමති සතුරෙක් ළඟ ඇත්තාහ යම්සේ ඒ තෘතීය ධ්‍යානයෙහි සැපය යත යම් චෛතසිකිරීමෙක් වේද ඒමේ සැපය ඖදාරිකසේ හැඟෙන්නේයැයි මෙසේ කියනලද සුවයේ ඖදාරිකබැවින් අඞ්ග දුර්වලයයි ඒ තෘතීයධ්‍යානයෙහි දෙස් දැක චතුර්ධ්‍යානය සංසුන්සේ මෙනෙහිකොට

තෘතීයධ්‍යානයෙහි කැමැත්ත ගෙවා චතුර්ථධ්‍යානාධිගමය පිණිස භාවනා කටයුත්තේයි. ඉක්බිත්තෙන් තෘතීයධ්‍යානයෙන් නැගී සිහිනුවණැතිව ධ්‍යානාඞ්ගයන් පස්විකන්නාවූ මේ යොගාවචර මහණහට යම් කලෙක චෛතසිකසෞමනස්‍යයයි කියනලද සුවය ඖලාරිකසේ වැටහේද උපෙක්ෂාවේදනා, චිත්තෛකාග්‍රතා යන දෙදෙන සංහුන්සේ වැටහේද එකල්හි ඖලාරිකාඞ්ගය දුරුකිරීම පිණිසද සංහුන් අඞ්ගයන් ලැබීම පිණිසද එම නිමිත්තය පඨවිපඨවියයි නැවත නැවත මෙනෙහිකරන්නාවූ ඒ යොගාවචර මහණහට දැන් චතුර්ථධ්‍යානය ඉපදියයුතුයයි කියයුතුකල්හි භවාඞ්ගශ්‍රොතස සිඳ එම පෘථිවිකසිණය අරමුණුකොට මනොද්වාරාවර්ජනසිත උපදනේය ඉක්බිත්තෙන් එම අරමුණෙහි යම් ජවන් වීථියක්හුගේ අවසානයෙහි එකම රූපාවචරචතුර්ථධ්‍යාන සිතක්හා සෙසු චිත්තයෝ කියනලද ප්‍රකාරවූ කාමාවචරචිත්තයෝම වෙද්ද එබඳු සතරපස්ජවන් කෙණෙක් උපදනාහුය මේ මතු දක්වන්නේ මෙහි වෙනස වන්නේයි යම්හෙයකින් සුඛවේදනාව උපෙක්ෂාවේදනාවට ආසෙවනප්‍රත්‍යයවශයෙන් උපකාර නොවේද චතුර්ථධ්‍යානයෙහිදු උපෙක්ෂාවේදනාවශයෙන් වේදනාභේදය වියයුත්තේය එහෙයින් ඒ අර්පණාචිත්තයට පෙරවූව උපදනා සතරපස් ජවනයෝ උපෙක්ෂා වේදනාවෙන් යුක්තවූවාහු වෙත්මැයි මෙහි උපෙක්ෂා සම්ප්‍රයුක්තබැවින්ම ප්‍රීතිය පිරිහෙන්නේ යයි මෙපමණකින් මේ යොගාවචරමහණ කායිකසුඛය හා කායිකදුක්ඛය දුරුකිරීමෙන්ද පළමුකොටම සෞමනස්‍ය දෞර්මනස්‍ය දෙදෙන දුරුකළහෙයින්ද දුකුත්නොවූ සැපත් නොවූ උපෙක්ෂා සම්ප්‍රයුක්ත සමාධියෙන් පිරිසිදුවූ චතුර්ථධ්‍යානය උපදවා වාසයකරන්නේයි මෙසේ මේ යොගාවචර මහණවිසින් එක් අඞ්ගයකින් වියුක්තවූ දෙඅඞ්ගයකින් යුක්තවූ ත්‍රිවිධකල්‍යාණයෙන්හා දශලක්ෂණයෙන් යුක්තවූ පෘථිවිකසිණ චතුර්ථධ්‍යානයලබනලද්දේනම් වන්නේයි.

( පා * )

තත්ථ සුඛස්ස ච පහාණා දුක්ඛස්ස ච පහාණාති කායික සුඛස්සච කායික දුක්ඛස්සච පහාණා පුබ්බෙවාති තඤ්ච ඛො පුබ්බෙව න චතුත්ථජ්ඣානක්ඛණෙ සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමාති චෙතසික සුඛස්ස චෙතසිකදුක්ඛස්ස චාති ඉමෙසං ද්වින්නං පුබ්බෙව අත්ථඞ්ගමා පහාණා ඉච්චෙවවුත්තං හොති කදාපන නෙසං පහාණං හොති චතුන්නං ඣානානං උපචාරක්ඛණෙ සොමනස්සංහි චතුත්ථජ්ඣානස්ස උපචාරක්ඛණෙයෙව පහීයති දුක්ඛදොමනස්ස සුඛානි පඨම දුතියතතියානං උපචාරක්ඛණෙසු එවමෙතෙසං පහාණක්කමෙන අවුත්තානං ඉන්ද්‍රියවිභඞ්ගෙපන ඉන්ද්‍රියානං උද්දෙසක්කමෙනෙව ඉධාපි වුත්තානං සුඛදුක්ඛසොමනස්සදොමනස්සානං පහාණං වෙදිතබ්බං යදි පනෙතානි තස්ස තස්ස ඣානස්ස උපචාරක්ඛණෙයෙව පහීයන්ති අථ කස්මා කත්ථචුප්පන්නං දුක්ඛින්ද්‍රියං අපරිසෙසං නිරුජ්ඣති ඉධ භික්ඛවෙ භික්ඛු විවිච්චෙව කාමෙහි ~ පෙ ~ පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති එත්ථචුප්පන්නං දුක්ඛින්ද්‍රියං අපරිසෙසං නිරුජ්ඣති කත්ථචුප්පන්නං දොමනස්සින්ද්‍රියං ~ සුඛින්ද්‍රියං ~ සොමනස්සින්ද්‍රියං ~ අපරි

දොමනස්සං නිරුජ්ඣති ඉධ භික්ඛවෙ භික්ඛු සුඛස්ස ච පහානා ...පෙ... චතුත්ථජ්ඣානං උපසම්පජ්ජ විහරති එත්ථුප්පන්නං සොමනස්සින්ද්‍රියං අපරිසෙසං නිරුජ්ඣතීති එවං ඣානෙසුයෙව නිරොධො වුච්චති අතිසයනිරොධත්තා. අතිසයනිරොධො හි නෙසං පඨමජ්ඣානාදිසු න නිරොධොයෙව පන උපචාරක්ඛණෙ නාතිසයනිරොධො. තථා හි නානාවජ්ජනෙ පඨමජ්ඣානූපචාරෙ නිරුද්ධස්සාපි දුක්ඛින්ද්‍රියස්ස ඩංසමකසාදිසම්ඵස්සෙන වා විසමාසනුපතාපෙන වා සියා උප්පත්ති නත්වෙව අන්තොඅප්පනායං. උපචාරෙ වා නිරුද්ධම්පෙතං න සුට්ඨු නිරුද්ධං හොති පටිපක්ඛෙන අවිහතත්තා. අන්තොඅප්පනායං පන පීතිඵරණෙන සබ්බො කායො සුඛොක්කන්තො හොති සුඛොක්කන්තකායස්ස ච සුට්ඨු නිරුද්ධං හොති දුක්ඛින්ද්‍රියං පටිපක්ඛෙන විහතත්තා. නානාවජ්ජනෙයෙව ච දුතියජ්ඣානූපචාරෙ පහීනස්ස දොමනස්සින්ද්‍රියස්ස යස්මා එතං විතක්කවිචාරපච්චයෙපි කායකිලමථෙ චිත්තුපඝාතෙ ච සති උප්පජ්ජති විතක්කවිචාරාභාවෙ ච නෙව උප්පජ්ජති යත්ථ පන උප්පජ්ජති තත්ථ විතක්කවිචාරභාවෙ අප්පහීනා එව ච දුතියජ්ඣානූපචාරෙ විතක්කවිචාරාති තත්ථස්ස සියා උප්පත්ති නත්වෙව දුතියජ්ඣානෙ පහීනපච්චයත්තා. තථා තතියජ්ඣානූපචාරෙ පහීනස්සාපි සුඛින්ද්‍රියස්ස පීතිසමුට්ඨානපණීතරූපඵුට්ඨකායස්ස සියා උප්පත්ති නත්වෙව තතියජ්ඣානෙ. තතියජ්ඣානෙ හි සුඛස්ස පච්චයභූතා පීති සබ්බසො නිරුද්ධාති ...

( ස° )

නැසූව බො, ඒ ප්‍රහාණයද; පූර්වබ ව, පෙරමැයි; හ චතුත්ථජ්ඣානක්ඛණෙ, චතුර්ථධ්‍යානක්ෂණයෙහි හොවේ "සොමනස්ස දොමනස්සානං අත්ථඞ්ගමා" යන්නෙහි; චෙතසිකසුඛස්ස, චෛතසික සුඛයාගේද; චෙතසිකදුක්ඛස්සචාති, චෛතසික දුඃඛයාගේද යි; ඉමෙසම්පි ද්වින්නං, මේ දෙදෙනාගේද; පුබ්බෙව අත්ථඞ්ගමා, පූර්වයෙහි ම අස්තඞ්ගමනයෙන්; පහානා ඉච්චෙව වුත්තං හොති, ප්‍රහාණයෙන් මැයි කී නියායි; කදා පන, කවර කලෙක; නෙසං පහානං හොති, ඔවුන්ගේ ප්‍රහාණය වේද; චතුන්නං ඣානානං උපචාරක්ඛණෙ, සතරධ්‍යානයන්ගේ උපචාරක්ෂණයෙහි; සොමනස්සං හි, සෞමනස්‍යය; චතුත්ථජ්ඣානස්ස, චතුර්ථධ්‍යානයාගේ; උපචාරක්ඛණෙයෙව පහීයති; උපචාරක්ෂණයෙහිම පහණු ලැබේ; දුක්ඛදොමනස්සසුඛානි, දුඃඛය දෞර්මනස්‍යය සුඛය යන මොහු; පඨමදුතියතතියානං, ප්‍රථම ද්විතීය තෘතීය ධ්‍යානයන්ගේ; උපචාරක්ඛණෙ, උපචාරක්ෂණයෙහි ප්‍රහීණවෙත් ("එවං වෙදිතබ්බං" යි—සම්බන්ධ කරණු) පහානක්කමෙන අවුත්තානං, ප්‍රහාණක්‍රමයෙන් නොකියනලද (ප්‍රහාණක්‍රම නම් ප්‍රහාතව්‍ය ධර්මයන්ගේ උත්පත්තිපටිපාටියයි. ඒ පිළිවෙළින් කියනලබන කල්හි "දුක්ඛං දොමනස්සං සුඛං සොමනස්සං" යි කියයුතුය. ක්‍රමභඞ්ගහෙයින් මෙහි අනර්ථාවචනය දූසි යන චොද්‍යයට "ඉන්ද්‍රියවිභඞ්ග" යනාදි කීහු) ඉන්ද්‍රියවිභඞ්ගෙ පන, ඉන්ද්‍රියවිභඞ්ගයෙහි වනාහි; ඉන්ද්‍රියානං උද්දෙසක්කමෙනෙව, ඉන්ද්‍රියයන්ගේ උද්දෙශක්‍රමයෙන්ම; ඉධාපි වුත්තානං, මෙහිදු කියනලද; සුඛදුක්ඛ

සොම්නස්ස දෞර්මනස්සානං, සුඛය දුක්ඛය සොම්නස්සය දෞර්මනස්සය යනමොවුන්ගේ; එව මේතෙසං පහාණං වේදිතබ්බං, මෙසේ මොවුන්ගේ ප්‍රහාණය දතයුතු; යදි පන, ඉදින් වනාහි, එතානි, මොහු; තස්ස ඣානස්ස උපචාරක්ඛණේ යෙව පහීයන්ති, ඒ ධ්‍යානයන්ගේ උපචාරක්ෂණයෙහි ම පහණු ලැබෙත්; ("අථ කස්මා ඣානෙසුයෙව නිරොධො වුත්තො"යි සම්බන්ධකරණු) අථ, එසේකල්හි; කස්මා, කුමක්හෙයින්; උප්පන්නං දුක්ඛින්ද්‍රියං; (සවකීය ප්‍රත්‍යයෙන්) උපන් දුඃඛිද්‍රියය; කත්ථච අපරිසෙසං නිරුජ්ඣති, කොහි නිරවශෙෂයෙන්නිරුද්ධවේද...පෙ... උප්පන්නං දුක්ඛින්ද්‍රියං, සවකීයප්‍රත්‍යයෙන් උපන් දුක්ඛින්ද්‍රිය; එත්ථ, මෙහි; නිරවසෙසං නිරුජ්ඣති, නිරවශෙෂයෙන් නිරුද්ධවේ (තත්ථ යනුයෙහිද එත්ථ යනුයෙහිද හෙතුයෙහි සප්තමීවිභක්තිහුයි ධ්‍යානානුභාවය නිමිත්ත කොටගෙණ උපදනාවූ දුඃඛෙන්ද්‍රිය ධ්‍යානයෙහි අපරිශෙෂයෙන් නිරුද්ධ වේයි කියනලදී...පෙ... එවං, මෙසේ; ඣානෙ යෙව නිරොධො වුත්තො, ධ්‍යානයෙහිම නිරොධය කියනලදී; අතිසය නිරොධත්තා, අතිශය නිරොධහෙයිනි; අතිසයනිරොධො හි එතෙසං, ඒ සුඛාදීන්ගේ අතිශය නිරොධය; පඨමජ්ඣානාදිසු, ප්‍රථමධ්‍යානාදියෙහි යි (අතිශය නිරොධ නම ස්වප්‍රතිපක්ෂයාවිසින් විශුපශමයයි) න නිරොධො යෙව, නිරොධයම නොවේ; නිරොධො යෙව පන උපචාරක්ඛණෙ; උපචාරක්ෂණයෙහි වනාහි නිරොධයම වේයි; නාතිසය නිරොධො, අතිශය නිරොධය නොවේ; තථා හි, ඒ එසේමැයි; නානාවජ්ජනෙ පඨමජ්ඣානූපචාරෙ (යම් ආවජ්ජනාවකින් අර්පණාව වේද එයි ත්) භින්නාවජ්ජනවූ ප්‍රථමධ්‍යානොපචාරයෙහි; නිරුද්ධස්සාපි දුක්ඛින්ද්‍රියස්ස; නිරුද්ධවූ දුඃඛෙන්ද්‍රියයාගේ; ඩංසමකසාදිසම්ඵස්සෙන වා, මැසිමදුරුආදීන්ගේ ස්පර්ශයෙන්හෝ; විසමාසනුපතාපෙන වා, විෂමනිෂද්‍යායෙන් උත්පන්න කලම්පුව විෂමාසනුපතාප නම් (එයින යන අදහසි) සියාඋප්පත්ති, උත්පත්තිය වේයි; නත්වෙව අන්තො අප්පනායං, ඇතුළු අර්පණා වෙහි උත්පත්තිනොවේමැයි; උපචාරෙ වා නිරුද්ධම්පෙතං, උපචාරයෙහි හෝ නිරුද්ධවූ දුක්ඛෙන්ද්‍රියය; න සුට්ඨුනිරුද්ධං හොති, මනා නිරුද්ධනම් නොවේ (කුමක් හෙයින යත් ?) පටිපක්ඛෙන අවිහතත්තා, ප්‍රතිපක්ෂයාවිසින් අවිහතබැවිනි; අන්තො අප්පනායං පන, ඇතුළු අර්පණාවෙහි වනාහි; පීතිඵරණෙන සබ්බොකායො සුඛොක්කන්තො හොති, ප්‍රීතිය පැතිරීමෙන් සියලු කය සුවෙන් වදනාලදු වේ (ප්‍රීතිස්ඵරණරසබැවින්හෝ තත්සමුත්ථානරූපයන්ගේහෝ කායයෙහි පැතිරීමෙන් හෝ "පීතිඵරණෙන සබ්බොකායො සුඛොක්කන්තො හොති"යි කීවු) සුඛොක්කන්තකායස්ස, සුවෙන් වදනාලද කය ඇත්තහුවද; සුට්ඨුනිරුද්ධං හොති දුක්ඛින්ද්‍රියං, දුඃඛෙන්ද්‍රියය මනාවම නිරුද්ධවේ; පටිපක්ඛෙන විහතත්තා, ප්‍රතිපක්ෂයාවිසින් නසනලදබව හෙයිනි; නානාවජ්ජනෙයෙව (වුක්තලක්ෂණවූ) නානාවජ්ජනවූම; දුතියජ්ඣානූපචාරෙ, ද්විතීය ධ්‍යානොපචාරයෙහි ("විතක්කවිචාරපච්චයෙපි" යන තැන පි ශබ්දය අස්ථානප්‍රයුක්ත බැවින් "පහීණස්සාපි දොමනස්සින්ද්‍රියස්ස"යි යොදනු) එතං, ඒ දෞර්මනස්සෙන්ද්‍රියය; විතක්කවිචාරපච්චයෙ කායකිලමථෙ, විතර්කවිචාර ප්‍රත්‍යයවූ කායක්ලමථවුවද; චිත්තුපඝාතෙ ච සති, චිත්ත

පීඩාවද ඇතිකල්හි; උප්පජ්ජති, උපදී; විතක්කවිචාරාභාවෙ ච, විතර්කවිචාරයන්ගේ අභාවයෙහිද; නෙව උප්පජ්ජති, නොම උපදී; යත්ථ පන උප්පජ්ජති, යම්තැනෙක වනාහි උපදීද; තත්ථ විතක්කවිචාරභාවෙ, එහි විතර්කවිචාරයන්ගේ අභාවයෙහි; දුතියජ්ඣානූපචාරෙ, ද්විතීයධ්‍යානූපචාරයෙහි; විතක්කවිචාරා, විතර්කවිචාරදෙදෙනා, අප්පහීණා එව, අප්‍රහීණම වෙත්නුයි; තත්ථ, ඒ ද්විතීය ධ්‍යානයාගේ උපචාරයෙහි; අස්ස, ඒ දෞර්මනස්සින්ද්‍රියයාගේ; උප්පත්ති සියා, උත්පත්තිය වන්නේය ("තත්ථස්ස උප්පත්ති සියා" යනුද "අස්ස" යනුද යට "දුතියජ්ඣානූපචාරෙ පහීණස්ස දොමනස්සින්ද්‍රියස්ස" යනු හා එක්කොට යොදනු "තත්ථස්ස සියා උප්පත්ති" යනුදු පරිකල්ප වචනයි — උපචාරක්ෂණයෙහි දෞර්මනස්හුගේ අප්‍රහීණභාවය දක්වනපිණිස කීබැවිනි එහෙයින් "නාෙත්ව අනෙනා අප්පනා යං" යි කීහු—ඉදින් එවේලෙහි දෞර්මනස උපදනේවිනම් ප්‍රථමධ්‍යානයෙහුදු පිරිහෙන්නේයි සමහරු අෂ්ටසමාපත්තිලාභී කාලදේවලයන්ට දෞර්මනස උපන්හෙයින් ධ්‍යානලාභීන්ට දෞර්මනස නොඋපදනේ නොවෙයි මැයි—ගෙනනාමැ හැකි අතීවරණසම භාව දෞර්මනසක් නැතිබැවිනි—ඉදින් වේ නම් රූපාරූපාවචර සත්වයන්ටද උපදනේයි කාලදෙවලයන්ට උපන් හෙයින යනුදු අකාරණයි උපදනා දෞර්මනසහා සමග ධ්‍යානයෙන් පිරිහෙනහෙයින් ලබ්ධප්‍රත්‍යයෙන් පිරිහුණුධ්‍යානයෙබඳුපුරුෂයෝ නිද්දකින්ම නැවත ප්‍රකෘතිවත් කොරගනිති දතයුතු)තථා, එසේම; තතියජ්ඣානූපචාරෙ, තෘතීයධ්‍යානූපචාරයෙහි; පහීණස්සාපි සුඛින්ද්‍රියස්ස, ප්‍රහීණවූ සුඛෙන්ද්‍රියයාගේ; පීතිසමුට්ඨානපණීතරූපඵුට්ඨකායස්ස, ප්‍රීතින් උපන්ප්‍රණීත රූපයෙන් පැතිරෙණලද කය ඇත්තහුට; සියා උප්පත්ති, උත්පත්තිය වන්නේය; නත්වෙව තතියජ්ඣානෙ, තෘතීයධ්‍යානයෙහි නොවේමැයි; තතියජ්ඣානෙ, තෘතීයධ්‍යානයෙහි; සුඛස්ස පච්චයභූතා පීති, සුඛයට ප්‍රත්‍යයවූ ප්‍රීතිතොමෝ; සබ්බසො නිරුද්ධා හොති, සර්වාකාරයෙන්ම නිරුද්ධවී—

( හා * )

ඒ දෙශනාපාලියෙහි සුඛයාගේ ප්‍රහාණියෙන් ද දුක්ඛයාගේ ප්‍රහාණියෙන්ද යනු කායික සුවදුක් දෙදෙනාගේ දුරුකිරීමෙනැයි අර්ථ ගතයුත්තේයි පුබ්බෙව යනු චතුර්ථධ්‍යානක්ෂණයෙන් පූර්වයෙහිම ඒ සුවදුක් දෙදෙනා දුරුකිරීම වෙයි යන අර්ථ වන්නේයි සොම්නස් දොම්නස් දෙදෙනා අස්තංගතකිරීමෙන් යනු චෛතසික සුවදුක් දෙදෙනා පළමුකොටම දුරුකිරීමෙන්ය යි කීනියායි ඔවුන්ගේ ප්‍රහාණිය කවරකලෙක වන්නාහුදයත් ? චතුෂ්ක ධ්‍යානයන්ගේ උපචාරක්ෂණයෙහිම ප්‍රහීණවන්නාහුය ඒ කෙසේද යත්? සොම්නස් දොම්නස් දෙදෙන චතුර්ථධ්‍යානයාගේ උපචාරක්ෂණයෙහිද දුක් දොම්නස් සුඛ යනමොවුහු පළමුවන දෙවන තුන්වන ධ්‍යානයන්ගේ උපචාරක්ෂණයෙහිද ප්‍රහීණවන්නාහුයයි දතයුතු මෙසේ ප්‍රහාණකධම්මයන්ගේ උත්පත්තිපිළිවෙළින් නොවන් දුක්ඛ දොමනස්ස සුඛ සොමනස්සයන පිළිවෙළින් නොහියා ඉන්ද්‍රියවිභඞ්ගයෙහි වදාළ ඉන්ද්‍රියයන්ගේ උද්දෙශක්‍රමයෙන්ම මෙහිද කියනලද්දවූ සුඛ දුක්ඛ සොමනස්ස දොමනස්ස යන මොවුන්ගේ ප්‍රහාණිය මෙසේ දතයුතු ඉදින් මේ දෙදෙනා සොඳිනු ඒ ඒ ධ්‍යානයන්ගේ උපචාර

ක්ෂණයෙහිම ප්‍රහීණකාරණු ලබන්නාහුනම් කුමක්හෙයින් ඉන්ද්‍රියවිභඞ්ගයෙහි ස්වකීය ප්‍රත්‍යයෙන් උපන් දුක්ඛින්ද්‍රිය කවරතැනෙක්හි ඉතුරු නොකොට නිරුද්ධවන්නේදැයි ප්‍රශ්න කොට මහණෙනි මේ සස්නෙහි යම් යෝගාවචරමහණෙක් වස්තුකාම ක්ලේශකාමයෙන් හා රාගාදි අකුශලධර්මයෙන් වෙන්ව විතර්කවිචාර සහිතවූ ප්‍රථමධ්‍යානය උපදවා වෙසේනම් මේ ප්‍රථමධ්‍යානයම හෙතුකොටගෙණ ස්වකීයප්‍රත්‍යයෙන් උපන්නාවූ දුක්ඛින්ද්‍රිය ඉතුරුනොකොට නිරුද්ධවන්නේයයිද එසේම ස්වකීයප්‍රත්‍යයෙන් උපන් දෞර්මනස්සින්ද්‍රිය සුඛින්ද්‍රිය සෞමනස්සින්ද්‍රිය යන ත්‍රිවිධ ඉන්ද්‍රියයෝ කවර කවර ධර්මයෙක්හි ඉතුරුනොකොට නිරුද්ධවන්නාහු දැයි ප්‍රශ්නකොට මහණෙනි මේ සස්නෙහි යම් යෝගාවචර මහණෙක් යට කියනලද නියායෙන් විතීයධ්‍යාන තෘතීයධ්‍යාන චතුර්ථධ්‍යානයන් උපදවා වෙසේ නම් ඒ ඒ ධ්‍යානයන් හේතුකොටගෙණම ඒ ඒ ධ්‍යානක්ෂණයෙහි ඒ ත්‍රිවිධඉන්ද්‍රියයෝ ඉතුරු නොකොට නිරුද්ධවන්නාහුයයි මෙසේ ධ්‍යානක්ෂණයෙහිම දෞර්මනස්‍යාදීහු අතිශයින් නිරුද්ධවනබැවින් ධ්‍යානයෙහිම නිරොධය වදාරණලද්දේයි. ඒ එසේමැයි. ඒ දෞර්මනස්‍යාදීහු විරුද්ධධර්මයන් ව්‍යුපශමකිරීම්වශයෙන් අතිශයින් නිරුද්ධවීම ප්‍රථමධ්‍යානාදියෙහිම වන්නේයි. උපචාරක්ෂණයෙහි වනාහි සාමාන්‍යයෙන් නිරොධවතුදු විනාකොට සර්වප්‍රකාරයෙන්ම නිරෝධය නොවෙයි ඒ එසේමැයි යම්ධ්‍යානයක් පළමුකොට උපදවන කල ඒ ධ්‍යානවිථිය අර්පණායයි කියති ඒ අර්පණාසිතට පෙරටුව උපදනා උපචාරවිථිය එකාවර්ජනොපචාරනාම වන්නේය ඒ උපදවනලද ධ්‍යානය සමාපත්තිවිථිවශයෙන් නැවත නැවත උපදවන්නාහට ඒධ්‍යානවිථියන්ට පෙරටු පෙරටුව උපදනා උපචාරවිථියෝ නොයෙක්වර පවත්නාබැවින් අනෙකාවර්ජනොපචාරනාම්වේන්මැයි මෙසේ ප්‍රථමධ්‍යානලාභි පුද්ගලයෙක්හට නැවත නැවත උපදනාවූ භින්නාවර්ජන ප්‍රථමධ්‍යානොපචාරයෙහි හෙවත් ප්‍රථමධ්‍යානයට පෙරටුව උපදනා උපචාරවිථික්ෂණයෙහි පළමුවෙන් අර්පණාක්ෂණයෙහි නිරුද්ධකරණලද්දවූද දුඃඛින්ද්‍රිය මැසිමදුරු ආදීන්ගේ වෙරපැහැර ගැන්මෙන් හා නපුරුනොවනි දිමෙන් හටගත් ශරීරපීඩාවෙන්ද නැවත ඉපදියහැකි වන්නේය එතකුදුවුවත් පළමු උපන් අර්පණාසිත තුළ ඒ දුඃඛින්ද්‍රිය නොවේමැයි උපචාරක්ෂණයෙහි නිරුද්ධවූ මේ දුඃඛින්ද්‍රිය ප්‍රතිපක්ෂ ධර්මයා කෙරෙන් පහ නොවූබැවින් මනාකොට සර්වප්‍රකාරයෙන් නිරුද්ධවූයේනම් නොවේමැයි අර්පණාසිත තුළ වනාහි ප්‍රීතිචෛතසිකය සම්ප්‍රයුක්තව ඇතිබැවින් ප්‍රීතිය පැහිරීම කෘත්‍යකොට ඇතිබැවින් හෝ ප්‍රීතියෙන් හටගත් රූපයන් පැහිරයනබැවින් හෝ සියලු ශරීරයම සුඛවෙදනාව වදනාලද්දේ වෙයි. ඒ සුඛ වෙදනාව වදනාලද ශරීර ඇත්තාහට ප්‍රතිපක්ෂධර්මයෙන් පහවූ බැවින් දුඃඛින්ද්‍රිය මනාකොටම නිරුද්ධවන්නේයි. පළමු අර්පණාක්ෂණයෙහි නසනලද්දවූද දෞර්මනස්සින්ද්‍රිය යට කියනලද ලක්ෂණ ඇත්තාවූ නානාවර්ජන විතීයධ්‍යානොපචාරයෙහි විතර්කවිචාරයන් ප්‍රත්‍යයකොටඇති කායපීඩාවක්හෝ චිත්තපීඩාවක්හෝ ඇතිකල නැවත උපදන්නේයි විතර්කවිචාරයන් නැතිකල්හි ඒ දෞර්මනස්සින්ද්‍රිය නොඋපදන්නේමැයි යම්තැනෙක දෞර්මනස්ස

ඤ්ය උපදීනම් එහි විතර්කවිචාරයන්ගේ හටගැන්මද ඇත්තේමැයි ද්විතීයධ්‍යානොපචාරයෙහි විතර්කවිචාර දෙදෙන අප්‍රහීණ වෙත්මැයි අර්පණාක්‍ෂණයෙහි ප්‍රහීණකරණලද ඒ දෞර්මනස්සෙන්ද්‍රිය නානාවර්ජන ද්විතීයධ්‍යානොපචාරයෙහි නැවත උපදනේයි එතකුදුවුවත් ද්විතීයධ්‍යානයෙහි දුරුකරණලද ප්‍රත්‍යය ඇතිබැවින් අර්පණානම්වූ පළමුවන ධ්‍යානක්‍ෂණය තුළ දෞර්මනස්සෙන්ද්‍රිය නූපදනේමැයි මෙසේ වනාහි ද්විතීයධ්‍යානලාභීහට දෞර්මනස්සෙන්ද්‍රිය උපදනේයයි කී වචනයෙන් ධ්‍යානලාභීන්ටත් දෞර්මනස් පැවැත්මක් ඇතැයි කියනලද්දේනම් වෙයි එසේකල අනීවරණස්වභාව ඇති ලෝභය ධ්‍යානලාභීන්ට පවත්නාක්මෙන් අනීවරණස්වභාව ඇති ද්වේෂයකුත් ඇතිබව ප්‍රකාශකෙළේනම් වන්නේයි එතකුදුවුවත් අනීවරණස්වභාව ඇති ද්වේෂයකුත් නැත්තේය ද්වේෂයෙන් වෙන්ව පවත්නා දෞර්මනස්සයකුත් නැත්තේයි යම් හෙයකින් ප්‍රස්ථානමහා ප්‍රකරණයෙහි ධ්‍යානලාභීහට දෞර්මනස් පැවැත්මක් දක්වනලද්දේද එහි පිරිහුණු ධ්‍යානය අරමුණු කොට ධ්‍යාන ලද විරූ පුද්ගලයාහට උපදනා දෞර්මනස දක්වනලදබැවින් ප්‍රස්ථානප්‍රකරණ පාළිය හා සමග විරොධයකුත් නොසිතිය යුත්තේයි තවද අෂ්ටසමාපත්තිලාභීවූ කාලදේවලනම් තවුසාහට දෞර්මනස් උපන්බැවින් ධ්‍යානලාභීන්ට සර්වප්‍රකාරයෙන්ම දෞර්මනස නූපදනේයයිද නොකිය හැක්කේය අනීවරණවූ ද්වේෂයක් හෝ ද්වේෂයෙන් වෙන්වූ දෞර්මනසක් හෝ නැතිබැවින් දෞර්මනස ධ්‍යානලාභීන්ට ඇතැයි කියන්නාද නොවටනේමැයි ඉදින් ධ්‍යානලාභීන්ට ඇත්නම් රූපාරූපාවචර සත්ත්වයන්ටද ඇතිවිය යුතුයි අරූපාවචර සත්ත්වයන්ට වනාහි අනීවරණ ස්වභාවවූ කාමච්ඡන්ද නීවරණය නිසා උපදනාවූ ථීනමිද්ධ උද්ධච්ච අවිද්‍යා නීවරණයන්දක්වන ප්‍රස්ථානපාළියෙහි ව්‍යාපාද කුක්කුච්ච නීවරණයන් නොදක්වූබැවින් ද්වේෂයාගේ අනීවරණබවට පරිහාරයක්ද නැත්තේයි. නීවරණස්වභාව නැත්තාවූ ඒ කාමච්ඡන්දදීන් නීවරණ සදෘශබැවින් නීවරණනාමයෙන් කියනලදබැවින් කාලදේවල තවුසාහට උපන් බැවිනැයි යන යම් වචනයක් කියනලදද හේද කාරණා නොවන්නේයි. කුමක් හෙයිනයත් ? උපදවනලද දෞර්මනස හෙතුනොවගෙණ ධ්‍යානයෙන් පිරිහුණේවීනම් ස්වල්පකාරණයෙකින් පිරිහුණාවූ ධ්‍යානය එබඳු උත්තමයෝ මදකින් නැවත උපදවන්නාහුයයි දතයුතු. එහෙයින් ප්‍රහීණකරණලද දෞර්මනස්සෙන්ද්‍රිය නැවත උපදනේය යන වචනය උපචාරක්‍ෂණයෙහි දෞර්මනස්සෙන්ද්‍රිය අප්‍රහීණබව දක්වනපිණිස කියනලද පරිකල්ප වචනයෙකැයි දතයුතු එපරිද්දෙන්ම තෘතීයධ්‍යානොපචාරයෙහි ප්‍රීතියෙන් හටගත් ප්‍රණීතරූපයෙන් පැතිරෙණලද කය ඇත්තාහට ප්‍රහීණකරණලද සුඛෙන්ද්‍රිය උපදනේය එතකුදුවුවත් තෘතීයධ්‍යානයෙහි නූපදනේයි ඒ එසේමැයි. තෘතීයධ්‍යානයෙහි සුඛවේදනාවට ප්‍රත්‍යයවූ ප්‍රීතිය සර්වප්‍රකාරයෙන්ම නිරුද්ධකරණලදැයි—

( පා † )

තත්ථ චතුත්ථජ්ඣානූපචාරෙ පහීණස්සාපි සොමනස්සින්ද්‍රියස්ස ආසන්නත්තා අප්පනාප්පත්තාය උපෙක්ඛාය අභාවෙන සම්මා අනතික්කන්තත්තා ච සියා උප්පත්ති

නාඤ්ඤෙව චතුත්ථජ්ඣානෙන තස්මා එව ච එත්ථුප්පන්නම්පි දුක්ඛින්ද්‍රියං අපරිසෙසං නිරුජ්ඣතීති තත්ථ අපරිසෙසග්ගහණං කතන්ති ... එත්ථාහ ... අථෙවං තස්ස තස්ස ඣානස්සුපචාරෙ පහීණාපි එතා වෙදනා ඉධ කස්මා සමාහටාති සුඛග්ගහණත්ථං යාහි අදුක්ඛමසුඛන්ති එත්ථ අදුක්ඛමසුඛා වෙදනා වුත්තා, සා සුඛුමා දුවිඤ්ඤෙය්‍යා න සක්කා සුඛෙන ගහෙතුං තස්මා යථා නාම දුට්ඨස්ස යථා තථා වා උපසඞ්කමිත්වා ගහෙතුං අසක්කුණෙය්‍යස්ස ගොණස්ස ගහණත්ථං ගොපො එකස්මිං වජෙ සබ්බා ගාවො සමාහරති අථෙකෙකං නීහරන්තො පටිපාටියා ආගතං අයං සො, ගණ්හථ නන්ති තම්පි ගාහයති එවමෙව භගවා සුඛගහණත්ථං සබ්බා එතා සමාහරි එවං හි සමාහටා එතා දස්සෙත්වා යං නෙව සුඛං නදුක්ඛං න සොමනස්සං න දොමනස්සං අයං අදුක්ඛමසුඛා වෙදනාති සක්කා හොති එසා ගාහයිතුං අපිච අදුක්ඛමසුඛාය චෙතොවිමුත්තියා පච්චය දස්සනත්ථඤ්චාපි එතා වුත්තාති වෙදිතබ්බා දුක්ඛප්පහාණාදයො හිස්සා පච්චයා යථාහ ... චත්තාරො බො ආවුසො පච්චයා අදුක්ඛමසුඛාය චෙතොවිමුත්තියා සමාපත්තියා ඉධ ආවුසො භික්ඛු සුඛස්ස ච පහාණා ... පෙ ... චතුත්ථජ්ඣානං උපසම්පජ්ජ විහරති ඉමෙ බො ආවුසො චත්තාරො පච්චයා අදුක්ඛමසුඛාය චෙතොවිමුත්තියා සමාපත්තියාති ... යථා වා අඤ්ඤත්ථ පහීණාපි සක්කායදිට්ඨිආදයො තතියමග්ගස්ස වණ්ණභණනත්ථං තත්ථ පහීණාති වුත්තා එවං වණ්ණභණනත්ථම්පෙතස්ස ඣානස්ස එතා ඉධ වුත්තාති වෙදිතබ්බා පච්චයඝාතෙන වා එත්ථ රාගදොසානං අතිදූරභාවං දස්සෙතුම්පෙතා වුත්තාති වෙදිතබ්බා එතාසු හි සුඛං සොමනස්සස්ස පච්චයො, සොමනස්සං රාගස්ස දුක්ඛං දොමනස්සස්ස පච්චයො, දොමනස්සං දොසස්ස සුඛාදිඝාතෙනාව සප්පච්චයා රාගදොසා හතාති අතිදූරෙ හොන්තීති ...

---

( ස † )

තථා, එසේම; චතුත්ථජ්ඣානූපචාරෙ, චතුර්ථධ්‍යානයාගේ උපචාරයෙහි; පහීණස්සාපි සොමනස්සින්ද්‍රියස්ස, ප්‍රහීණවූ සොම්නසින්ද්‍රියයාගේ; ආසන්නත්තා, ආසන්නබව හෙයින් (ප්‍රහීණවූ සොම්නසින්ද්‍රියය ප්‍රීතියගේ නුදුරුය ආසන්නභාවිනා යන අර්ථයි ) අප්පනාප්පත්තාය උපෙක්ඛාය අභාවෙන, අර්පණාප්‍රාප්තවූ උපෙක්ෂාවගේ අභාවයෙන්; සම්මා අනතික්කන්තත්තා ච, මනාකොට නොඉක්මුනු හෙයින් ද; සියා උප්පත්ති, උත්පත්තියවෙයි, නාඤ්ඤෙව චතුත්ථජ්ඣානෙන, චතුර්ථධ්‍යානයෙහි නැත්මැයි (යම්සේ මාර්ගවීථියෙන් පූර්වයෙහි සදශ විපස්සනා ජවනවාරයෝ දෙතුන්දෙනෙක් වේද්ද එසේම මෙහිද අර්පණාවාරයෙන් පූර්වයෙහි දෙතුන් ජවනෙකෙණක් උපෙක්ෂාසහගතව ව පවතිති යත් ) තස්මා යෙව ච, එහෙයින්ම ... පෙ ... අපරිසෙස ගහණං කතං, අපරිශෙෂ ග්‍රහණය කරණලදී, එත්ථාහ, මෙහි (චොදක)කියා; අථෙවං, ඉදින් එසේවීනම්; තස්ස තස්ස ඣානස්සූපචාරෙ, ඒ ඒ ධ්‍යානයන්ගේ උපචාරයෙහි; පහීණාපි එතා වෙදනා, පහීණවූ මේ වෙදනාවෝ, ඉධ, මේ ධ්‍යානයෙහි; කස්මා සමාහටාති, කුමක්හෙයින් එක්කොට කීයනලදහුද; සුඛග්ගහණත්ථං, සුවෙන් ගන්නාපිණිසයි; අදුක්ඛමසුඛන්ති එත්ථ, අදුක්ඛමසුඛං යන මෙහි; යා හි අදුක්ඛමසුඛා වෙදනා වුත්තා, යම් අදුක්ඛමසුඛවෙදනාවක් කියනලදද;

යා, හෝ නොමේ; සුඛුමා, සියුම්; දුවිඤෙඤයා, දතනොහැකි; න සක්කා සුඛෙන ගහෙතුං, සුවෙන් ගන්නට නොපිළිවනු; තස්මා, එහෙයින්; යථා නාම; යම්සේ; දුට්ඨස්ස, නොදමූ; ජථාවාතථා වා උපසඞ්කමිත්වා, යම්ගම් පරිද්ඡෙදකින් එළඹ; ගහෙතුං අසක්කුණෙය්‍යස්ස, ගන්නට නොපිළිවන්වූ; ගොණස්ස, ගොනාහු; ගහණත්ථං, ගන්නාපිණිස; ගොපො, ගොපලු; එකස්මිං වජෙ, එක ගොවුදෙහි; සබ්බා ගාවො සමාහරිත්, සියලු ගෙරින් රැස්කොටද; අථ, ඉක්බිත්තෙන්; එකෙකං නීහරන්තො, එකී එකී ගෙද නපිටතට හරනේ; පටිපාටියා ආගතං, පිළිවෙළින් ආවනු; අයං සො, මේ ගේය; ගණ්හථ නංති; මොහු හන්ව වයි; තම්පි, ඔහුද; ගාහයති, ගන්වාද; එවමෙව, එපරිද්දෙන්ම; භගවා, භාගවත්තෙමේ; සුඛගහණත්ථං, සුවෙන් ගන්නාපිණිස; එතා සබ්බා, මේ සියලු වෙදනාවන්; සමාහරිත්, රැස්කොළේ (එකතැනකීය යන අර්ථයි) එවං හි සමාහටා එතා දස්සෙතුං, මෙසේ එක්කොට කී වෙදනාවන් දක්වා; යං, යමෙක්; නෙව සුඛං, නොසුව වේද; න දුක්ඛං, දුක් නොවේද; න සොමනස්සං, සොම්නස් නොවේද; න දොමනස්සං, දොම්නස් නොවේද: අයං; මේ තොමෝ; අදුක්ඛමසුඛා වෙදනානි, උපෙක්ඛාවෙදනායයි; සක්කාහොති යා ගාහයිතුං, හෝ ගන්වන්නට පිළිවන් වේ; අපිච, අන්කොටුද ඇත; අදුක්ඛමසුඛාය වෙදනා විමුත්තියා, උපෙක්ඛා වෙ නොවිමුත්තියද; පච්චය දස්සනත්ථඤ්චාපි, ප්‍රත්‍යය දක්වනපිණිසද; එතා, මේ සියලු වෙදනාවෝ; වුත්තා, කියනලදහයි; වෙදිතබ්බා, දතයුත්තාහුයි; දුක්ඛප්පහාණාදයො, දුක්ඛප්‍රහාණාදීහු; තස්සා, ඒ උපෙක්ඛාවෙදනාවට; පච්චයා, ප්‍රත්‍යයෝයි; යථාහ, වදාළේමැයි; ආවුසො, ඇවැත්නි; අදුක්ඛමසුඛාය වෙදනා විමුත්තියා, චතුත්ථජ්ඣානසඞ්ඛාත උපෙක්ඛා වෙදනාවිමුක්තියගේ; සමාපත්තියා, සමාපත්තියට; චත්තාරො පච්චයා, ප්‍රත්‍යයෝ සතරදෙනෙකි; ඉධ, මේ ශාසනයෙහි...පෙ...යථා වා, යම්සේ හෝ; අඤ්ඤත්ථපහීනොපි සක්කායදිට්ඨි ආදයො, සෙසු මග ප්‍රහීණවූ සත්කායදෘෂ්ටයාදීහු; තතියමග්ගස්ස වණ්ණභණනත්ථං, තෘතීයමාර්ගයාගේ වර්ණනාභණනයපිණිස; තත්ථ පහීණාති වුත්තා, තෘතීයමාර්ගයෙහි ප්‍රහීණයයි කියනලදහුද; එවං, එපරිද්දෙන්ම; එතස්සඣානස්ස වණ්ණභණනත්ථං, මේ ධ්‍යානයට වර්ණනාභණනය පිණිස; තත්ථ පහිණාති වුත්තා, තෘතීයමාර්ගයෙහි ප්‍රහීණහයි කියනලද හයි දතයුත්තාහුයි; පච්චය ඝාතෙන වා, ප්‍රත්‍යය ඝාතයෙන්හෝ; එත්ථ, මේ චතුර්ථධ්‍යානයෙහි; රාගදොසානං, රාගද්වෙෂයන්; අතිදූරභාවං දස්සෙතුම්පි, ඉතා දුරැබව දක්වන්නටද; එතා, මේ වෙදනාවෝ; "වුත්තා, කියන" ලදහයි; වෙදිතබ්බා, දතයුත්තාහුයි; එතාසුහි, මොවුන්කෙරෙහි වනාහි; සුඛං, සුඛය; සොමනස්සස්ස පච්චයො, සෞම්නස්‍යයට ප්‍රත්‍යය වේ; සොමනස්සං, සොම්නස; රාගස්ස "සුඛාය වෙදනාය ආවුසො විසාඛ රාගානුසයො" යි කීබැවින් රාගයට ප්‍රත්‍යය වේ; දුක්ඛං, දුක්ඛය; දොමනස්සස්ස පච්චයො, දෞර්මනස්‍යයට ප්‍රත්‍යය වේ; දොමනස්සං, දොම්නස; දොසස්ස "දුක්ඛාය වෙදනාය ආවුසො විසාඛ පටිඝානුසයො" යි කීබැවින් ද්වේෂයට ප්‍රත්‍යය වේ; සුඛාදිඝාතෙන ච, සුඛාදීන්ගේ ඝාතයෙන් (ප්‍රහාණයෙන්ද) අස්ස, මේ චතුර්ථධ්‍යානයට; සප්පච්චයා රාග

දෙසා සනානි, ප්‍රත්‍යයසහිතවූ රාග ද්වෙෂයෝ හතයෝනුයි; අභිදූරෙ සොනානි (සුඛාදීහු) ඉතා දූරුවෙත්.

( හා † )

එසේම පළමු ප්‍රහීණකරණලද සෞමනස්‍යෙන්ද්‍රිය ප්‍රීතිය සෙයින් නොදුරුව ආසන්නවූ බැවින්ද අප්‍රණාප්‍රාප්තවූ උපෙක්ෂාවක් නැතිහෙයින්ද සෞමනස්‍යෙන්ද්‍රිය මනාකොට නොමුක්තවූ බැවින්ද තා තා වර්ජන චතුර්ථධ්‍යානුපචාරයෙහි සෞමනස්‍යෙන්ද්‍රිය උපදනේයි එතකුදු වුවත් චතුර්ථධ්‍යානයෙහි නොඋපදනේ මැයි එහෙයින්ම මෙහි උපන් දුඃඛෙන්ද්‍රිය ඉතුරු නොකොට නිරුද්ධවන්නේයයි යනාදින් ඒ ඒ තන්හි භගවත්හුවිසින් අපරිශෙෂග්‍රහණයකොට වදාරණ ලදැයි දතයුතුයි. මෙතන්හි යම් චොදකයෙක් ඉදින් එසේවීනම් ඒ ඒ ධ්‍යානයන්ගේ උපචාරයෙහි ප්‍රහීණවූ මේ වෙදනාවෝ මේ ධ්‍යානයෙහි කුමක්හෙයින් එක්කොට වදාරණලද්දේදැයි විචාලේනම් සුවසේ දැනගන්නාපිණිසයයි පිළිතුරු දියයුත්තේයි. "අදුක්ඛමසුඛං" යන මෙහි දුකුත්නොවූ සැපත්නොවූ යම් වෙදනාවක් කියනලද්දේද ඒ වෙදනාව සුවදුක් වෙදනාවන් මෙන් ඔළාරික නොවනබැවින්ද අප්‍රකටබැවින්ද ඉතා සියුම්වන්නීය ප්‍රකාශකටයුතු ස්වභාවක් නැතිබැවින් දුකසේ දැනගතයුතුනිය සුවසේ දැනනොගත හැක්කිය එහෙයින් යම්සේ නොසුලුතනමේ යම් තම් පරිද්දෙකින් ලඟට පැමිණ එසේ මෙසේ අල්වාගතනොහැකි කුළුගොණෙකු අල්වාගණු පිණිස එකකාලෙක සියලු ගෙරිත් රැස්කෙරේද ඉක්බින්නතත් ගාළෙන් පිටතට නික්මෙන්නාවූ එක එක ගවයා අන්තරිමින් පිළිවෙළින් ආවනු මේ ඒ කුළුගොණුය මොහු අල්වවයි අල්වාගණීද එපරිද්දෙන්ම භාග්‍යවතුන් වහන්සේ සුවසේ දැනගන්නාපිණිස මේ සියලුවෙදනාවන් එකතැන රැස්කොට දැක්වූසේක මෙසේ එක්කොට වදාළ වෙදනාවන් අතුරෙන් යම් වෙදනාවක් සැපත් නොවන්නේද දුකුත් නොවන්නේද සොම්නසුත් නොවන්නේද දොම්නසුත් නොවන්නේද ඒ වෙදනාව උපෙක්ෂා වෙදනායයි දැනගතහැකි වන්නේයි. උපෙක්ෂාසහගතවූ චෙතොවිමුක්තියට හේතුවන් ධ්‍යානයට සම්වැදීමට හෙතු දක්වන පිණිසද මේ සියලු වෙදනාවෝ වදාරණලදැයි දතයුතු. දුක් වෙදනාදීන්ගේ ප්‍රහාණය ඒ උපෙක්ෂා වෙදනාවට කාරණා වන්නාහ වදාළේමැයි. ඇවැත්නි චතුර්ථධ්‍යාන සඞ්ඛ්‍යාතවූ චෙතොවිමුක්ති සමාපත්තියට ප්‍රත්‍යයෝ සතරදෙනෙක් වන්නාහුය නෙ කවරහුද යත්? ඇවැත්නි මේ සස්නෙහි ශාසනාවචර මහණ සුඛවෙදනාව ප්‍රහීණකිරීමෙන්ද දුක්ඛවෙදනාව ප්‍රහීණකිරීමෙන්ද සොම්නස් වෙදනා දොම්නස් වෙදනා නැසීමෙන්ද යන මේ සතරප්‍රත්‍යයන් කරණකොටගෙණ චෙතොවිමුක්තිසඞ්ඛ්‍යාතවූ චතුර්ථධ්‍යානය උපදවා වාසයකරන්නේයි ඇවැත්නි චතුර්ථධ්‍යානසඞ්ඛ්‍යාතවූ චෙතොවිමුක්තියට මේ ප්‍රත්‍යයෝ සතරදෙන හෙතුවන්නාහුමැයි තවද යම්සේ සෝවාන් සකෘදාගාමි යන අනික් මාර්ගයන්යෙහි ප්‍රහීණවනනාවූ සත්කායදෘෂ්ටි ආදී පාපධර්මයෝ අනාගාමි මාර්ගයාගේ ගුණ කථනයපිණිස අනාගාමි මාර්ගක්ෂණයෙහි ප්‍රහීණවන්නාහුයයි වදාරණ ලදද එපරිද්දෙන්ම මේ චතුර්ථධ්‍යානයාගේ ගුණ කථනයපිණිස මෙහි උපෙක්ෂාව කියන ලදහයි දතයුතු. තවද රාගද්වෙෂ දෙදෙනාහට ප්‍රත්‍යයවන සොම්නස් සුඛ

දුක්ඛයන්ගේ නැසීමෙන් මේ චතුර්ථ ධ්‍යානයට රාගද්වේෂයෝ ඉතා දුරු බව දක්වන්නටද මේ වේදනාවෝ මේ චතුර්ථ ධ්‍යානයෙහිම කියනලදැයි දත යුතු. ඒ එසේමැයි මේ වේදනාවන් අතුරෙන් සුඛ වේදනාව සෞමනස් වේදනාවට ප්‍රත්‍යය වන්නේය ඒ සෞමනස් වේදනාව විශාඛ සූත්‍රයෙහි වදාළ පරිද්දෙන් රාගයට ප්‍රත්‍යය වන්නේයි දුක් වේදනාව දෞර්මනස් වේදනාවට ප්‍රත්‍යය වන්නේය දෞර්මනස් වේදනාව ඒ විශාඛ සූත්‍රයෙහි වදාළ නියායෙන්ම ද්වේෂයට ප්‍රත්‍යය වන්නේයි මෙසේ සුඛ වේදනාදීහු නැසීමෙන් ප්‍රත්‍යය සහිතවූ රාග ද්වේෂයන් නැසූ හෙයින් මේ චතුර්ථධ්‍යානයට සුඛවේදනාදීහු ඉතා දුරුවෙන්මැයි ....

( පා ‡ )

අදුක්ඛමසුඛන්ති දුක්ඛාභාවෙන අදුක්ඛං සුඛාභාවෙන අසුඛං. එතෙනෙත්ථ දුක්ඛසුඛපටිපක්ඛභූතං තතියවෙදනං දීපෙති න දුක්ඛසුඛාභාවමත්තං තතියවෙදනා නාම අදුක්ඛමසුඛා උපෙක්ඛාතිපි වුච්චති සා ඉට්ඨානිට්ඨවිපරීතානුභවනලක්ඛණා මජ්ඣත්තරසා අවිභූතපච්චුපට්ඨානා සුඛනිරොධපදට්ඨානාති වෙදිතබ්බා. උපෙක්ඛාසතිපාරිසුද්ධින්ති උපෙක්ඛාය ජනිතසතියා පාරිසුද්ධිං ඉමස්මිං හි ඣානෙ සුපරිසුද්ධා සති යා ච තස්සා සතියා පාරිසුද්ධි සා උපෙක්ඛාය කතා න අඤ්ඤෙන තස්මා එතං උපෙක්ඛාසතිපාරිසුද්ධින්ති වුච්චති ....විභඞ්ගෙපි වුත්තං අයං සති ඉමාය උපෙක්ඛාය විවටා හොති පරිසුද්ධා පරියොදාතා තෙන වුච්චති උපෙක්ඛාසතිපාරිසුද්ධීති යාය ච උපෙක්ඛාය එත්ථ සතියා පාරිසුද්ධි හොති සා අත්ථතො තත්‍රමජ්ඣත්තතාති වෙදිතබ්බා න කෙවලඤ්චෙත්ථ තාය සතියෙව පරිසුද්ධා අපිච ඛො සබ්බෙපි සම්පයුත්තධම්මා සතිසීසෙන පන දෙසනා වුත්තා තත්ථ කිඤ්චාපි අයං උපෙක්ඛා හෙට්ඨාපි තීසු ඣානෙසු විජ්ජති යථා පන දිවා සූරියප්පභාභිභවා සොම්මභාවෙන ච අත්තනො උපකාරකෙන වා සභාගාය රත්තියා අලාභා දිවා විජ්ජමානාපි චන්දලෙඛා අපරිසුද්ධා හොති අපරියොදාතා එවමයම්පි තත්‍රමජ්ඣත්තුපෙක්ඛා චන්දලෙඛා විතක්කාදි පච්චනීකධම්මතෙජාභිභවා සභාගාය ච උපෙක්ඛාවෙදනාරත්තියා අප්පටිලාභා විජ්ජමානාපි පඨමාදිඣානභෙදෙ අපරිසුද්ධා හොති තස්සා ච අපරිසුද්ධාය දිවා අපරිසුද්ධචන්දලෙඛාය පභා විය සහජාතාපි සතිආදයො අපරිසුද්ධාව හොන්ති තස්මා තෙසු එකම්පි උපෙක්ඛාසතිපාරිසුද්ධින්ති න වුත්තං. ඉධ පන විතක්කාදිපච්චනීකධම්මතෙජාභිභවාභාවා සභාගාය ච උපෙක්ඛාවෙදනාරත්තියා පටිලාභා අයං තත්‍රමජ්ඣත්තුපෙක්ඛාචන්දලෙඛා අතිවිය පරිසුද්ධා තස්සා පරිසුද්ධත්තා පරිසුද්ධචන්දලෙඛාය පභා විය සහජාතාපි සතිආදයො පරිසුද්ධා හොන්ති පරියොදාතා තස්මා ඉදමෙව උපෙක්ඛාසතිපාරිසුද්ධින්ති වුත්තන්ති වෙදිතබ්බං චතුත්ථන්ති ගණනානුපුබ්බතා චතුත්ථං ඉදං චතුත්ථං සමාපජ්ජතීති චතුත්ථං. යං පන වුත්තං එකඞ්ගවිප්පහීනං දුවඞ්ගසමන්නාගතන්ති තත්ථ සොමනස්සස්ස පහානවසෙන එකඞ්ගවිප්පහීනතා වෙදිතබ්බා තඤ්ච පන සොමනස්සං එකවීථියං පුබ්බජවනෙසුයෙව පහීයති තෙනස්ස තං පහානඞ්ගන්ති වුච්චති උපෙක්ඛාවෙදනා චිත්තෙකග්ගතාති ඉමෙසං පන ද්වින්නං උප්පත්තිවසෙන දුවඞ්ගසමන්නාගතතා වෙදිතබ්බා සෙසං පඨමජ්ඣානෙ වුත්තනයමෙව .... එස තාව චතුක්කජ්ඣානෙ නයො ....

( ෂ ‡ )

අදුක්ඛම සුඛනති, අදුක්ඛම සුඛං යන්නෙහි; දුක්ඛා භාවෙන, දුක් නොවන බැවින්; අදුක්ඛං, දුක් නොවේ; සුඛා භාවෙන, සුව නොවන හෙයින්; අසුඛං, සුව නොවේ; එතෙන, මෙයින්; එයින්, මෙතෙන; දුක්ඛසුඛ පටිපක්ඛ භූතං, සුඛ දුක්ඛ වයට ප්‍රතිපක්ෂවූ; තතියං වෙදනං දීපෙති, තුන්වන වෙදනාව දක්වා; න දුක්ඛ සුඛාභාව මත්තං, දුක්ඛසුඛයන්ගේ අභාව මාත්‍රය නොවේ; තතිය වෙදනා නාම, තෘතීය වෙදනානම්; අදුක්ඛමසුඛා, අදුක්ඛම සුඛ වෙදනායි; උපෙක්ඛාති පි වුච්චති, උපෙක්ෂායයිදු කියනු ලැබේ; සා, හෝ තොමෝ; ඉට්ඨානිට්ඨ විපරීතානුභවනලක්ඛණා, ඉෂ්ටානිෂ්ට දෙකට විපරීතවූ මධ්‍යස්තාලම්බණය අනුභවකිරීම ලක්ෂණකොට ඇත්තීයි; මජ්ඣත්තරසා, මැදහත් බව කෘත්‍ය කොට ඇත්තීයි; අවිභූත පච්චුපට්ඨානා (ගල්පිට මුවන් ගිය මං සේ සුවදුක් දෙකින් අනුමාන කටයුතු බැවින්) නොපහළ බව වැටහීම්කොට ඇත්තීයි; සුඛනිරොධපදට්ඨානාති වෙදිතබ්බා, චතුර්ථධ්‍යානොපචාරය සුඛනිරොධ නම. ඒ ආසන්න කාරණකොට ඇත්තේය යන අර්ථයි "උපෙක්ඛා සතිපාරිසුද්ධි" යන්නෙහි; උපෙක්ඛායජනිතසති පාරිසුද්ධිං, උපෙක්ෂාවෙන් ජනිතවූ ස්මෘති පාරිශුද්ධි ඇති; ඉමස්මිං හි ඣානෙ, මේ ධ්‍යානයෙහි; සුපරිසුද්ධා සති, ස්මෘති තොමෝ ඉතා පිරිසිදුයි; යාච තස්සා සතියා පාරිසුද්ධි, ඒ ස්මෘතියගේ යම් පාරිශුද්ධියෙක් ඇද්ද; සා, හෝ තොමෝ; උපෙක්ඛාය කතා, උපෙක්ෂාවෙන් කරණලදු (පාරිශුද්ධ්‍යුපෙක්ෂාව පවත්නා කල්හි චතුර්ථ ධ්‍යානයෙහි ස්මෘති තොමෝ සුවිශදවේනුයි "සා උපෙක්ඛාය කතා"යි කීහු] න අඤ්ඤෙන, අනිකෙක් විසින් කරණලද නොවේ; තස්මා, එහෙයින්; එතං, මේ ධ්‍යානය; උපෙක්ඛා සතිපාරිසුද්ධින්ති, උපෙක්ෂා ස්මෘති පාරිශුද්ධියයි කියනලදී; විභඞ්ගෙපි වුත්තං, විභඞ්ගයෙහිදු කියනලදී; අයං සති, මේ ස්මෘති තොමෝ; ඉමාය උපෙක්ඛාය, මේ උපෙක්ෂාවෙන්; විවටා හොති, විවෘත වේ; පරිසුද්ධා, පිරිසිදුවේ; පරියොදාතා, නිර්මලවේ; තෙන, එහෙයින්; වුච්චති, කියනු ලැබේ ("උපෙක්ඛා සති පාරිසුද්ධි"යි) යායච උපෙක්ඛාය, යම් උපෙක්ෂාවෙකින්; එත්ථ, මේ ධ්‍යානයෙහි; සතිපාරිසුද්ධිහොති, ස්මෘතියගේ පිරිසිදු බව වේද; සා, හෝ තොමෝ; අත්ථතො, අර්ථ හෙයින්; තත්‍රමජ්ඣත්තතා වෙදිතබ්බා, තත්‍රමධ්‍යස්ථතා යයි දතයුතුවේ; කෙවලං, හුදෙක්; එත්ථ, මේ ධ්‍යානයෙහි; තාය, ඒ තත්‍රමධ්‍යස්ථොපෙක්ෂාව විසින්; සති යෙව, සිහියම; න පරිසුද්ධා, පරිශුද්ධ නොවේ; අපිච ඛො, වැලි කිමෙක්ද; සබ්බෙපි සම්පයුත්තා ධම්මා, සියලු සම්ප්‍රයුක්ත ධර්මයෝම (පිරිසිදුවෙත්) සතිසීසෙන පන දෙසනා වුත්තා, ස්මෘති මුඛයෙන් දෙසනාකරණලදු; තත්ථ කිඤ්චාපි, එහි කිසිසේත්; අයං උපෙක්ඛා හෙට්ඨාපි තීසු ඣානෙසු විජ්ජති, යට තුන් ධ්‍යානයෙහිම ඇත; යථා පන, යම්සේ; දිවා සුරියප්පභාභිභවා, දිවාභාගයෙහි සූර්‍ය්‍යප්‍රභාවයෙන් මඩනාලද හෙයින්ද ("සුරියප්පභාය අභිභූයමානත්තා" යනු ටීකායි) සොම්මභාවෙනවා, සෞම්‍ය බැවින් හෝ; අත්තනො උපකාරකත්තෙනවා, තම හට උපකාර භාවයෙන් හෝ (අතීක්ෂණ බැවින් චන්ද්‍රරශ්මියෙන් රාත්‍රිද සෞම්‍ය ස්වභාව

ඇත්තීය රාත්‍රියෙහිම චන්ද්‍රරේඛාව උජ්ජ්වලවන බැවින් චන්ද්‍රරේඛා තොමෝ රාත්‍රිය විසින් සංග්‍රාහ්‍යයයි දක්වනු පිණිස "සොමනස්සභාවෙනවා අත්තනො උපකාරකත්තෙනවා"යි කීහු) සභාගාය රත්තියා අලාභා, සභාගවූ රාත්‍රියගේ අලාභයෙන්; දිවා විජ්ජමානාපි චන්ද්‍රලේඛා, දහවල් විද්‍යමානදවූ චන්ද්‍රරේඛා තොමෝ; අපරිසුද්ධා හොති, නොපිරිසිදුවේ; අපරියොදාතා, අනිර්මලවේ; එවං, එපරිද්දෙන්ම; අයම්පි හෙට්ඨිම ත්‍රයජ්ඣානුපෙක්ඛා චන්ද්‍රලේඛා, මේ තුන්වැනි ධ්‍යානොපෙක්ෂා නැමැති චන්ද්‍රලේඛා තොමෝ; විතක්කාදි පච්චනීක ධම්මතෙජාභිභවා, විතර්කාදි ප්‍රත්‍යනීක ධර්මයන්ගේ තෙජසින් මඩනාලද හෙයින්ද; සභාගාය උපෙක්ඛාවෙදනා රත්තියා අප්පටිලාභා, සභාගවූ උපෙක්ෂා වෙදනා නැමැති රාත්‍රියගේ අප්‍රතිලාභයෙන්ද; විජ්ජමානාපි පඨමාදිජ්ඣානභෙදෙසු විද්‍යමානවීද; අපරිසුද්ධා හොති, පිරිසිදු නොවේ; අපරියොදාතා, නිර්මල නොවේ; තස්සාච අපරිසුද්ධාය දිවා, ඒ දහවල් අපරිශුද්ධ කල්හි; අපරිසුද්ධාය චන්ද්‍රලේඛාය පභාවිය, දහවල් අපරිසුද්ධවූ චන්ද්‍රලේඛාවගේ ප්‍රභාවමෙන්; සහජාතාපි සති ආදයො, සහජාතවූ සිහි ආදීහු; අපරිසුද්ධාව හොන්ති, නො පිරිසිදුම වෙත්; තස්මා, එහෙයින්; තෙසු, ඒ ප්‍රථම ධ්‍යානාදීන් කෙරෙහි; එකම්පි, එක් ධ්‍යානයෙකුදු; උපෙක්ඛා සතිපාරිසුද්ධින්ති නවුත්තං, උපෙක්ඛා සතිපාරිසුද්ධියයි නොකියනලදී; ඉධ පන, මේ සතරවන ධ්‍යානයෙහි වනාහි; විතක්කාදි පච්චනීකතෙජාභිභවා භාවා, විතර්කාදි ප්‍රත්‍යනීකයන්ගේ තෙජසින් මැඩීමක් නැති බැවින්ද; සභාගාය උපෙක්ඛා වෙදනා රත්තියා පටිලාභා, සභාගවූ උපෙක්ෂා වෙදනා රාත්‍රියගේ ප්‍රතිලාභයෙන්ද; අයං තත්‍රමජ්ඣත්තුපෙක්ඛා චන්ද්‍රලේඛා, මේ තත්‍රමධ්‍යස්ථතුපෙක්ෂා නැමැති චන්ද්‍රලේඛා තොමෝ; අතිවිය පරිසුද්ධා, ඉතා පිරිසිදුය; තස්සා පරිසුද්ධත්තා, ඕහු පිරිසිදු හෙයින්; පරිසුද්ධ චන්ද්‍රලේඛප්පභා විය, පිරිසිදු චන්ද්‍රලේඛාවගේ ප්‍රභාවමෙන්; සහජාතාපි සති ආදයො, සහජාතවූ සිහි ආදීහු; පරිසුද්ධා හොන්ති, පිරිසිදු වෙත්; පරියොදාතා, නිර්මලවෙත්; තස්මා, එහෙයින්; ඉදමෙව, මේ චතුර්ථ ධ්‍යානයම; උපෙක්ඛා සතිපාරිසුද්ධින්ති වුත්තන්ති වෙදිතබ්බං, උපෙක්ඛා සතිපාරිසුද්ධියයි කියනලදැයි දතයුතු ....පෙ.... සොමනස්ස පහාණවසෙන, සොම්නස් ප්‍රහාණය විසින්; එකඞ්ගවිප්පහීණතා, එක් අංගයකින් විප්‍රයුක්තබව; වෙදිතබ්බා, දතයුතුයි ....පෙ.... යස්මා පන සොමනස්සං, ඒ සෞමනස්සය; එකවීථියං, එකම වීථියෙහි; පුරිමජවනෙසු යෙව පහීයති, පළමු ජවනයන් කෙරෙහිම පැහේ; තෙන, එහෙයින්; තං, ඒ ධ්‍යානය; අස්ස, ඒ චතුර්ථධ්‍යානයාගේ; පහාණඞ්ගන්ති වුච්චති, ප්‍රහාණාඞ්ගයයි කියනලදී ....පෙ.... තාව, පළමුවනයි; එස, මේ කීයේ; චතුක්කජ්ඣානනයෙන, චතුෂ්ක ධ්‍යානයෙහි නයයි ....

( ගා ‡ )

"අදුක්ඛමසුඛං"යන මෙහි දුක්නොවන බැවින් අදුක්ඛද සුව නොවන බැවින් අසුඛදවූ වෙදනාව දක්වන්නේයි. මේ වචනයෙන් චතුර්ථධ්‍යානයෙහි සුව දුක් දෙකට විරුද්ධවූ තුන්වන වෙදනාවක් ඇති බව දක්වන්නේයි. එනකුදුවුවත් සුඛදුක්ඛයන්ගේ අභාවමාත්‍රය නොවන්නේයි ඒ තුන්වන වෙදනාව අදුක්ඛමසුඛ වෙදනායයිද උපෙක්ෂා වෙදනායයිද කියනලද්දේයි. ඒ උපෙක්ෂා වෙදනාව ඉෂ්ටානිෂ්ට දෙ

තාව විපරීතවූ මධ්‍යස්ථ අරමුණු රස විඳිනැත්ම ලක්ෂණකොට ඇත්තීය මධ්‍යස්ථාකාරයෙන් පැවැත්ම කෘත්‍යකොට ඇත්තීය මුවන් ගිය මාර්ගය සොයන්නාහු ගල්තලාව ලඟට ගිය පියවර සටහන් ඇත්නම් ගල්තලාවට නැගී ගියහයි සලකන්නාක්මෙන් සුඛදුඃඛවේදනාවන්ට මධ්‍යස්ථවූ වේදනාව බැවින් සුවදුක් දෙදෙන අප්‍රකටව වශයෙන් පැවැත්ම වැටහිම්කොට ඇත්තීය සුඛ නිරොධ සඞ්ඛ්‍යාතවූ චතුර්ථධ්‍යානූපචාරය හෙවත් අර්පණාවට පළමු උපදනා උපචාර විථානය ආසන්න කාරණකොට ඇත්තීයයි දතයුතු.

උපෙක්ෂාවෙන් හටගත් සමාධි පාරිශුද්ධි ඇත්තේය යන මෙහි පිරිසිදු උපෙක්ෂාවෙන් හටගත් සමාධි සඞ්ඛ්‍යාත සිහියෙන් පිරිසිදුවූහ යන අර්ථයි. ඒ එසේමැයි මේ චතුර්ථධ්‍යානයෙහි විද්‍යමානවූ සමාධිය ඉතා පිරිසිදු වන්නිය ඒ සමාධියගේ යම් පිරිසිදුබවෙක් ඇත්තේවිනම් ඒ පිරිසිදු බව සියලු සතුරු ධර්මයන්ගෙන් පිරිසිදුවූ උපෙක්ෂාව විසින්ම කරණලද්දේය අනිකෙක් විසින් නොකරණලද්දේයි එහෙයින් මේ චතුර්ථධ්‍යානය උපෙක්ෂාවෙන් හටගත් සමාධියෙන් පිරිසිදුවූහයි කියනලද්දේයි විභඞ්ග ප්‍රකරණයෙහිදු මේ සමාධිය මේ උපෙක්ෂාව කාරණකොටගෙණ විවෘතවන්නීය පිරිසිදුවන්නීය නිර්මලවන්නීය එහෙයින් චතුර්ථධ්‍යානය උපෙක්ෂාවෙන් හටගත් සමාධියෙන් පිරිසිදුවූහයි වදාරණලද්දේයි යම් උපෙක්ෂාවක් හෙතුකොටගෙණ මේ චතුර්ථධ්‍යානයෙහි සමාධිය පිරිසිදුවේද ඒ උපෙක්ෂාව අර්ථවශයෙන් තත්‍රමධ්‍යස්ථතා නම්වෙයි දතයුතු. මේ ධ්‍යානයෙහි යෙදුනාවූ ඒ තත්‍රමධ්‍යස්ථතාවෙන් හුදු සමාධියම පිරිසිදුවන්නී නොවෙයි වැලිත් සියළු සම්ප්‍රයුක්ත ධර්මයෝම පිරිසිදුවන්නාහුමැයි මෙහි වනාහි භාග්‍යවතුන් විසින් සමාධිය ප්‍රධාන බැවින් සමාධි ශීර්ෂයෙන් දෙසවන් සිහිය මුල්කොට වදාරණලද්දේයි එහි කිසිසේත් තත්‍රමධ්‍යස්ථොපෙක්ෂාව ප්‍රථම ද්විතීය තෘතීය යන ධ්‍යානත්‍රයෙහිම ඇත්තීය එසේවූවත් යම්සේ දවල්හි ඇත්තාවූ චන්ද්‍රරේඛාව කිරණයින් මඩනාලද බැවින්ද සෞම්‍ය බැවින් හා තම හට උපකාර බැවින් සභාගවූ රාත්‍රිය නොලැබීමෙන්ද අපිරිසිදු වන්නීද අප්‍රකටව වන්නිද එපරිද්දෙන්ම මේ තත්‍රමධ්‍යස්ථොපෙක්ෂා නැමති චන්ද්‍රරේඛාව විතර්කාදි විරුද්ධ ධර්මයන්ගේ තෙජසින් මඩනාලද හෙයින්ද තම හට සභාගවූ උපෙක්ෂාවේදනා නැමති රාත්‍රිය නොලැබීමෙන්ද ඒ තත්‍රමධ්‍යස්ථොපෙක්ෂාව ප්‍රථම ද්විතීය තෘතීය ධ්‍යානයෙහි ඇතත් අපිරිසිදු වන්නීය මෙසේ නොපිරිසිදු දවල්හි නොපිරිසිදු චන්ද්‍රරේඛාවගේ ආලෝකය නොපිරිසිදු වන්නාක්මෙන් ප්‍රථම ධ්‍යානාදිය හා සම්ප්‍රයුක්තවූ සමාධි ආදිය ඇතත් නොපිරිසිදු වන්නාහුමය එහෙයින් ඒ ධ්‍යානත්‍රය අතුරෙන් එකකුදු පිරිසිදු උපෙක්ෂාවෙන් ජනිත සමාධියෙන් පිරිසිදුවූහයි නොවදාරණලද්දේයි මේ චතුර්ථධ්‍යානයෙහි වනාහි විතර්කාදි පසමිතුරු ධර්මයන්ගේ තෙජසින් මැඩපැවැත්වීමක් නැති හෙයින්ද උපෙක්ෂා වේදනා නැමති රාත්‍රිය ලැබීමෙන්ද මේ තත්‍රමධ්‍යස්ථොපෙක්ෂා නැමති චන්ද්‍රරේඛාව අතිශයින් පිරිසිදු වන්නීය ඒ උපෙක්ෂාව පිරිසිදුවූ හෙයින් පිරිසිදු චන්ද්‍රරේඛාවකින් නික්මෙන ආලෝකය පිරිසිදුව නික්මෙන්නාක්මෙන් පිරිසිදු උපෙක්ෂාව හා එක්ව උපන් සමාධි ආදී ධර්මයෝද පිරිසිදුවෙත්මැයි නිර්මලවෙත්මැයි එහෙයින්

මේ චතුර්ථධ්‍යානයම උපෙක්ඛාසති පාරිසුද්ධි නමැයි වදාරණලද්දේයයි දතයුතු චතුර්ථධ්‍යානය සනු ගණන් පිළිවෙළින් සතරවනුවූ හෙයින්ද මේ ධ්‍යානයට සතරවනුව සමවදනා බැවින්ද චතුර්ථධ්‍යානනාම් වන්නේයි තවද එක් අඞ්ගයකින් විප්‍රයුක්තවූ දෙයඞ්ගයකින් යුක්තවූ ධ්‍යානයයි යම් වචනයක් කියනලදද එහි සෞමනස්‍ය ප්‍රහීණවීම් වශයෙන් එක් අඞ්ගයකින් විප්‍රයුක්තබව දතයුත්තේය ඒ සෞමනස්‍යද එකම අර්පණා වීථියෙහි අර්පණා සිතට පෙරටුව උපදනා ජවන්හිම ප්‍රහීණවන්නේය එහෙයින් ඒ සෞමනස්‍ය චතුර්ථධ්‍යානයාගේ ප්‍රහාණාඞ්ගයයි කියනලද්දේයි. උපෙක්ෂාවෙදනා චිත්තෛකාග්‍රතා යන මේ දෙයඞ්ග ඉපදීම් වශයෙන් දෙයඞ්ගයකින් යුක්තබව දතයුත්තේය සෙසු විස්තරය ප්‍රථමධ්‍යානයෙහි දක්වනලද ක්‍රමයෙන් මෙහි යොදා දතයුතු.

පළමුකොට මේ දක්වනලද්දේ චතුෂ්ක ධ්‍යානයෙහි ක්‍රමය වන්නේයි —

---

( පා ¶ )

පඤ්චකජ්ඣානං පන නිබ්බත්තෙන්තෙන පගුණපඨමජ්ඣානතො වුට්ඨාය අයං සමාපත්ති ආසන්න නීවරණ පච්චත්ථිකා විතක්කස්ස ඔළාරිකත්තා අඞ්ගදුබ්බලාතිච තත්ථ දොසං දිස්වා දුතියජ්ඣානං සන්තතො මනසිකරිත්වා පඨමජ්ඣානෙ නිකන්තිං පරියාදාය දුතියාධිගමාය යොගො කාතබ්බො අථස්ස යදා පඨමජ්ඣානතො වුට්ඨාය සතස්ස සම්පජානස්ස ඣානඞ්ගානි පච්චවෙක්ඛතො විතක්කමත්තං ඔළාරිකතො උපට්ඨාති විචාරාදයො සන්තතො තදස්ස ඔළාරිකඞ්ගප්පහානාය සන්තඞ්ග පටිලාභාය ච තදෙව නිමිත්තං පථවීපථවීති පුනප්පුනං මනසිකරොතො වුත්තනයෙනෙව දුතියජ්ඣානං උප්පජ්ජති තස්ස විතක්කමත්තමෙව පහානඞ්ගං විචාරාදීනි චත්තාරි සම්පයොගඞ්ගානි සෙසං වුත්තප්පකාරමෙව — එවං අධිගතෙ පන තස්මිම්පි වුත්තනයෙනෙව පඤ්චහාකාරෙහි චිණ්ණවසීභූතෙන පගුණදුතියජ්ඣානතො වුට්ඨාය අයං සමාපත්ති ආසන්නවිතක්කපච්චත්ථිකා විචාරස්ස ඔළාරිකත්තා අඞ්ගදුබ්බලාතිච තත්ථ දොසං දිස්වා තතියජ්ඣානං සන්තතො මනසිකරිත්වා දුතියජ්ඣානෙ නිකන්තිං පරියාදාය තතියාධිගමාය යොගො කාතබ්බො අථස්ස යදා දුතියජ්ඣානතො වුට්ඨාය සතස්ස සම්පජානස්ස ඣානඞ්ගානි පච්චවෙක්ඛතො විචාරමත්තං ඔළාරිකතො උපට්ඨාති පීති ආදීනි සන්තතො තදස්ස ඔළාරිකඞ්ගප්පහානාය සන්තඅඞ්ගපටිලාභාය ච තදෙව නිමිත්තං පථවීපථවීති පුනප්පුනං මනසිකරොතො වුත්තනයෙනෙව තතියජ්ඣානං උප්පජ්ජති තස්ස විචාරමත්තමෙව පහානඞ්ගං චතුක්කනයස්ස දුතියජ්ඣානෙ විය පීතිආදීනි තීණි සම්පයොගඞ්ගානි සෙසං වුත්තප්පකාරමෙව — ඉති යං චතුක්කනයෙ දුතියං තං ද්විධා භින්දිත්වා පඤ්චකනයෙ දුතියඤ්චෙව තතියඤ්ච හොන්ති යානිච තත්ථ තතියචතුත්ථානි තානිච චතුත්ථපඤ්චමානි හොන්ති පඨමං පඨමමෙවාති —

ඉති සාධුජනපාමොජ්ජත්ථාය කතෙ විසුද්ධිමග්ගෙ සමාධිභාවනාධිකාරෙ

## පථවීකසිණනිද්දෙසො නාම

## චතුත්ථො පරිච්ඡෙදො

---

( ශ ¶ )

පඤ්චකජ්ඣානං පන නිබ්බත්තෙන්තෙන, පස්වෙනි ධ්‍යාන් වනාහි උපදවින්නහු විසින් ~ පෙ ~ විතක්කමත්තං, විතර්කය පමණක්; ඔළාරිකතො උපට්ඨාති, ඖදාරික හෙයින් වැටහේ; විචාරාදයො පන, විචාරාදීහු වනාහි; සන්තතො උපට්ඨහන්ති, ශාන්ත හෙයින් වැටහෙත් ~ පෙ ~ තස්ස, ඔහුගේ; විතක්කමත්තමෙව පහාණඞ්ගං, විතර්ක මාත්‍රයක්ම ප්‍රහාණාඞ්ගය; විචාරාදීනි චත්තාරි, විචාරාදී සතරදෙන; සමන්නාගතඞ්ගානි, සම්ප්‍රයුක්ත අඞ්ගනුයි; සෙසං, සෙස්ස; වුත්තප්පකාරමෙව, කීයහලද ප්‍රකාර ඇත්තේමැයි ~ පෙ ~ තස්ස, ඒ තෘතීය ධ්‍යාන්හුගේ; විචාරමත්තමෙව පහාණඞ්ගං, විචාරය පමණක්ම ප්‍රහාණාඞ්ගය; චතුක්කනයස්ස, චතුෂ්කනයෙහි; දුතියජ්ඣානෙ විය, ද්විතීය ධ්‍යාන්හිමෙන්; පීතිආදීනි තීණි, ප්‍රීත්‍යාදී තුන්දෙන; සමන්නාගතඞ්ගානි, සම්ප්‍රයුක්ත අඞ්ගනුයි; ඉති, මෙසේ; යං චතුක්කනයෙ දුතියං, චතුෂ්කනයෙහි යම් ද්විතීයධ්‍යානයෙක්ද; තං, එය; විධාභිඤ්ඤිත්වා, අවිතර්ක විචාර මාත්‍රය අවිතර්ක අවිචාරයයි දෙකක්කොට බිඳ; පඤ්චකනයෙ දුතියඤ්චෙව තතියඤ්ච හොති, පඤ්චකනයෙහි දෙවන්නද තුන්වන්නද වෙයි; යානිච තත්ථ තතිය චතුත්ථානි, චතුෂ්කනයෙහිදු යම් තුන්වන සතරවන ධ්‍යාන කෙනෙක්ද; තානි, ඔහු; ඉධ, මේ පඤ්චකනයෙහි; චතුත්ථපඤ්චමානි හොන්ති, සතරවනු පස්වනු වෙත්; පඨමං, චතුෂ්කනයෙහි ප්‍රථමධ්‍යානය; පඨමමෙව, පඤ්චකනයෙහිදු ප්‍රථමධ්‍යානම වේ ~

# චතුත්ථො පරිච්ඡෙදො.

---

( ශා ¶ )

පස්වෙනි ධ්‍යානය උපදවන්නහු විසින් යට කියනලද නයින් පඤ්ච වශිතායෙන් පුහුණුකරණලද ප්‍රථම ධ්‍යානයෙන් නැගී මේ සමාපත්තියට ලංවූ නීවරණ නමැති පසමිතුරෝ ඇත්තාහ විතර්කය ඔළාරික බැවින් අඞ්ග දුර්වලයයි ඒ ප්‍රථමධ්‍යානයෙහි දෙස් දක ද්විතීය ධ්‍යානය සංසුන්සේ මෙනෙහිකොට ප්‍රථමධ්‍යානයෙහි කෑමැත්ත ගෙවා ද්විතීයධ්‍යානයට පැමිණීමට උත්සාහ වැඩියයුතුය ඉක්බිත්තෙන් යම්සේ ප්‍රථමධ්‍යානයෙන් නැගී සිහිනුවණින් යෙදී ධ්‍යානාඞ්ගයන් පස්විකන්නාවූ ඒ යොගාවචරයාහට විතර්කය පමණක් මහත්සේ වැටහේද විචාරාදීහු සංසුන්නාක්මෙන් වැටහෙද්ද එකල්හි ඒ ඔළාරිකාඞ්ගය දුරුකිරීම පිණිසද සංසුන් අඞ්ගයන් ලැබීම පිණිසද එම නිමිත්තය පඨවි පඨවියයි නැවත නැවත මෙනෙහිකොරන්නාවූ ඔහට යටකියනලද නයින්ම ද්විතීයධ්‍යානය උපදනේයි ඒ ධ්‍යානයාගේ විතර්කය පමණක් ප්‍රහාණාඞ්ගවෙයි විචාරාදි සතර සම්ප්‍රයුක්තාඞ්ගයෝ වෙත් සෙසු විභාග යට කියනලද ප්‍රකාරම වන්නේයි මෙසේ පැමිණෙනලද ධ්‍යාන ඇත්තාවූ යොගාවචරයා විසින් ඒ ධ්‍යානයෙහිද යට කියනලද ක්‍රමයෙන් පස් ආකාරයකින් පුරුදුකරණලද වශිතාය ඇතිව පුහුණුවූ ද්විතීය ධ්‍යානයෙන් නැගී මේ සමාපත්තියට නුදුරුව විතර්කනැමති පසමිතුරෙක් ඇත්තේය විචාරය ඔළාරිකබැවින් අඞ්ග දුර්වලයයි. එහි දෙස් දක තෘතීය ධ්‍යානය සංසුන්සේ මෙනෙහිකොට ද්විතීයධ්‍යානයෙහි කෑමැත්ත ගෙවා තෘතීය ධ්‍යානය ලැබීමට භාවනාකටයුතුයි ඉක්බිත්තෙන් යම්කලෙක ද්විතීයධ්‍යා

නයෙන් හැඟී සිහිනුවණින් යුක්තව ධ්‍යානාඞ්ගයන් පස්විකන්නාවූ ඒ යොගාවචරයා හට විචාරය පමණක් ඖදාරිකයේ වැටහේද ප්‍රීතිආදි සෙසු තුන් අඞ්ගයෝ සංසුන්නාක්මෙන් වැටහේද එකල්හි ඒ ඖළාරිකාඞ්ගය දුරුකිරීමට හා සංසුන් අඞ්ගයන් ලැබීමටද එමනිමිත්තම පෑවිපෑවී යළි නැවත නැවත මෙනෙහිකරන්නාවූ ඒ යොගාවචරයා හට කියනලද නයින්ම තෘතීයධ්‍යානය උපදනේය චතුෂ්කනයෙහි විතීය ධ්‍යානය මෙන් ඒ ධ්‍යානයාගේ ප්‍රහාණාඞ්ගය විචාරය පමණක් වෙයි ප්‍රීති ආදි තුන්දෙන සම්ප්‍රයුක්ත අඞ්ගයෝ නම්වෙත් සෙසු විභාග යට කියනලද නයින්ම දතයුතු. මෙසේ චතුෂ්කනයෙහි යම් විතීයධ්‍යානයෙක් වේද ඒ විතීයධ්‍යානය අවිතර්ක විචාරමාත්‍රය අවිතර්ක අවිචාරයයි දෙකක් කොට බෙදා පඤ්චකනයෙහි විතීය ධ්‍යානයද වෙයි තෘතීය ධ්‍යානයද වෙයි චතුෂ්කනයෙහිද යම් තෘතීය චතුර්ථධ්‍යාන කෙනෙක් වන්නාහුද ඒ ධ්‍යානයෝ දෙදෙන මේ පඤ්චකනයෙහි සතරවනු පස්වනු වන්නාහුයි. මෙසේ චතුෂ්කනයෙහි ප්‍රථම ධ්‍යානය පඤ්චකනයෙහිද ප්‍රථම ධ්‍යානම වන්නේයි.

මෙසේ චතුෂ්කනයෙහි දෙවෙනි ධ්‍යානය විතීයධ්‍යාන තෘතීයධ්‍යානය යි යන දෙකකට බෙදා පඤ්චකධ්‍යානවිභාගය අභිධර්ම පිටකයෙහිම වන්නේය සූත්‍ර පිටකයෙහි වනාහි සවරූප වශයෙන් පඤ්චකධ්‍යාන ක්‍රමය නොවදාරණලද්දේයි මේ විශුද්ධිමාර්ගයෙහි චතුෂ්කපඤ්චක වශයෙන් නයවය කුමක් නිසා බෙදනලද්දාහුදයත්? අභිධර්මයෙහි නයවය වශයෙන්ම ධ්‍යානය දෙශනාකරණලද බැවිනැයි දතයුතු කුමක්හෙයින් අභිධර්මයෙහි නයවය වශයෙන් දෙශනාකරණලද්දයත්? පුද්ගලාධ්‍යාශය වශයෙනැ දෙශනා විලාස වශයෙන්දැයි යන දෙයාකාරයෙන් දෙශනාකරණලද්දේයි ඒ එසේමැයි. අභිධර්මදෙශනා ශ්‍රවණයට රැස්වහුන් දෙව්පිරිසඅතුරෙන්යම්යම් දෙවතා කෙනෙකුට යම් යම් පරිද්දෙකින් දෙශනාකළ කල්හි ප්‍රථමධ්‍යානයෙහි විතර්කයම ඖළාරිකසේ වැටහේද සෙසු අඞ්ගයෝ සංසුන්නාක්මෙන් වැටහේද ඒ ඒ දෙවියන්ගේ අධ්‍යාශය වශයෙන් චතුරඞ්ගිකවූ අවිතර්ක විචාරමාත්‍ර ධ්‍යානය දෙශනාකරණලද්දේයි එපරිද්දෙන් යම් යම් දෙවතා කෙනෙකුට විචාරය හෝ ප්‍රීතිය හෝ සුඛය හෝ ඖළාරික ඖළාරිකසේ වැටහේද සෙසු අඞ්ගයෝ සන්සුන්නාක්මෙන් වැටහේද ඒ ඒ දෙවියන්ගේ අධ්‍යාශය වශයෙන් තෘතීයාදි ධ්‍යානයෝ දෙශනාකරණලද්දාහුය. මේ පුද්ගලාධ්‍යාශය දෙශනානාම් වන්නීය යම්හෙයකින් භාග්‍යවතුන්වහන්සේ විසින් යම් ධර්මධාතුවක් මනාකොට ප්‍රතිවෙධකරණලද බැවින් දෙශනා විලාසයට පැමිණීසේක්ද එහෙයින් ප්‍රඥා මහත්තවය කාරණකොටගෙණ දෙශනාවෙහි අභිදක්ෂවූ සර්වඥයන්වහන්සේ ධර්මදෙශනා සමයෙහි යම් අඞ්ගයක් ලැබුයේවීනම් ඒ අඞ්ගයාගේ වශයෙන් කැමති පරිද්දෙන් දෙශනාව නියමිත කරන්නාහු චතුෂ්කනය වශයෙන්ද පඤ්චකනය වශයෙන්ද දහම් දෙසන්නේයි එහි පඤ්චාඞ්ගයක් ඇති ධ්‍යානය පළමුකොටද චතුරඞ්ගයක් ඇති ධ්‍යානය දෙවනුවද තුන්අඞ්ගයක් ඇති ධ්‍යානය තුන්වෙනුවද දෙඅඞ්ගයක් ඇති ධ්‍යානය සතරවෙනුවද නැවතත් දෙඅඞ්ගයක් ඇති ධ්‍යානය පස්වනුවද දෙශනාකරන්නේයි මේ දෙශනා විලාසනාම් වන්නේයි තවද සූත්‍රාන්තයෙහි එසමයෙහි රූප ලොකොත්පත්තිය පිණිස අවිතර්කවිචාර මාත්‍රවූ සමා

බිණිනිත් හටගත් ප්‍රීති සැප ඇති ද්විතීය
ධ්‍යානය උපදවා වාසය කරන්නේය
යනාදීයෙහි මෙන් කිසිහැයෙතක පඤ්
චකනයෙහි ද්විතීයධ්‍යානය චතුෂ්කන
යෙහි ද්විතීයධ්‍යාන පක්‍ෂයෙහි බහා
දෙශනාකරන්නේයි කුමක්හෙයිනය
න්? අසංඥතලයෙහි ප්‍රතිසන්ධි දානය
කරණ බැවිනුද ද්විතීයධ්‍යානයට සමාන
විපාක ඇති බැවින්ද ප්‍රථමධ්‍යාන ස
මාධියෙන් හටගත් බැවින්දුයි යනාදී
හෙතු සඳහා යයි දතයුතු. ඒ එසේමැ
යි ප්‍රථමධ්‍යානයම විසතුකාම කෙලශ
කාමයෙන් හා අකුශලයෙන්ද වෙන්ව
හලද්දේය ඒ ප්‍රථමධ්‍යානය නොවීමෙ
න් මේ ද්විතීයධ්‍යානයෙහි කාමයෙන්
හා අකුශලයෙන්ද වෙන්වම්යයි නො
කියහැකි වන්නේය විවේකජයයි කි
යන්නටද නොපිළිවන්වන්නේයි එ
හෙයින් විතර්ක ව්‍යුපශමයෙන් හා වි
චාරව්‍යුපශමයෙන්ද අවිතර්ක අවිචාර
වූ බැවින් සුත්‍රාන්තයෙහි ද්විතීය තෘතී
ය ධ්‍යානයෝ ද්විතීයධ්‍යානයම හජනය
කරන්නාහුවැයි මෙසේ කොට සුත්‍රා
න්තයෙහි පඤ්චකනයද ලබන්නේය
යන බව සිද්ධවන්නේයි මෙහි චනාහි
සුත්‍රාන්තයෙහි චතුෂ්ක ධ්‍යානයම බෙ
දනලද්දේය පඤ්චකධ්‍යානය නොලැ
බෙන්නේයයි කීයේ නොවේදයත්?
එනකුදුවුවත් සවිතර්ක සවිචාර සමාධි
ය අවිතර්ක විචාර මාත්‍රසමාධිය අවිත
ර්ක අවිචාර සමාධියයි යන ත්‍රිවිධ සමා
ධිය දක්වීමෙන් පඤ්චකනයද ලැබි
යයුතු හෙයින් චතුෂ්කනය ඇසුරු
කොට පඤ්චකනයක් බෙදනලද මෙහ
යින් සුත්‍රාන්තයෙහින් පඤ්චකනය උ
ගුළුවා කියයුත්තේයි ඒ එසේමැයි සූ
ත්‍රාන්තයෙහි විතර්කවිචාරයන්ගේ ව්‍යු
පශමයෙහැයි කී සමාධියෙහි විත
ර්කයාගේ ව්‍යුපශමය විචාරයාගේ ව්‍යුප
ශමය විතර්කවිචාරයන්ගේ ව්‍යුපශමය
යි සරූපෙන ගෙෂසමාස වාක්‍යාර්ථවශ
යෙන් කිවහැකි වන්නේය එසේම අ
විතර්කය අවිචාරය යන මෙහිද ත්‍රිවිධා
කාරය දතයුතු. ප්‍රථමධ්‍යානයෙහි එක්
ව හැසිරෙන්නාවූ විතර්ක විචාරයන් අ
තුරෙන් එකක් ඉක්මවා අනිකද එහි
ඇති බව දෙස් වශයෙන් දක දෙදෙ
නම එකවට ඉක්මවන්නා හට පඤ්ච
කනයෙහි තෘතීයධ්‍යානය කියනලද්
දේයි තුන්වෙනුව පැමිණියයුතු බැවි
න්ද ප්‍රථමධ්‍යානයට අනතුරු බැවින්
ද මොහුගේ ද්විතීයධ්‍යාන බව ලැබෙන්
නේයි. කවර හෙතුවකින් භාග්‍යවත්
හු සුත්‍රාන්තයෙහි පඤ්චකනය සවරූප
වශයෙන් නොවදුරා දෙශනානය ව
ශයෙන් වදාළේදයත්? විනෙයධ්‍යාශය
වශයෙන් මෙසේ වදාළේකැයි දත
යුතු.

මෙතෙකින් මේ සාධුජන ප්‍රමොදය
පිණිස කරණලද විශුද්ධිමාර්ගයෙහි සමා
ධිභාවනාධිකාරයෙහි —

## පෘථිවිකසිණ නිර්දෙශ
නාම්වූ සතරවෙනි පරිච්ඡෙදය
කියා නිමවනලද්දේයි

---

( පා * )

ඉදනි පඨවිකසිණානන්තරං ආ
පොකසිණෙ විත්ථාරකථා හොති ය
ථෙවහි පඨවිකසිණං එවං ආපොකසි
ණමපි භාවෙතු කාමෙන සුඛ නිසි
න්නෙන ආපස්මිං නිමිත්තං ගණ්හිත
බ්බං කතෙවා අකතෙවාති සබ්බං වි
ත්ථාරෙතබ්බං යථාච ඉධ එවං සබ්බ
ත්ථ ඉතොපරංහි එත්තකම්පි අවත්වා
විසෙසමත්තමෙව වක්ඛාම ඉධාපි පු
බ්බෙ කතාධිකාරස්ස පුඤ්ඤවතො
අකතෙ ආපස්මිං පොක්ඛරණියාවා

තළාකං වා ලොණියං වා සමුද්දං වා නිමිත්තං උප්පජ්ජති. චූළසිවත්ථෙරස්ස කිර තස්ස කිරායසමනො ලාභසක්කාරම්පහාය විවිත්තං වසිස්සාමීති මහාතිත්ථෙ නාවං අභිරුහිත්වා ජම්බුදීපං ගච්ඡතො අන්තරා මහාසමුද්දං ඔලොකයතො තප්පටිභාගං කසිණනිමිත්තං උදපාදි අකතාධිකාරෙන චතූසු කසිණදොසෙසු පරිහරන්තෙන නීලපීතලොහිතොදාතවණ්ණානං අඤ්ඤතර වණ්ණං ආපං අගහෙත්වා යං පන භූමිං අසම්පත්තමෙව ආකාසෙ සුද්ධවත්ථෙන ගහිතං උදකං අඤ්ඤං වා තථාරූපං විප්පසන්නමනාවිලං තෙන පත්තං වා කුණ්ඩිකං වා සමතිත්තිකං පූරෙත්වා විහාරපච්චන්තෙ වුත්තප්පකාරෙ පටිච්ඡන්නෙ ඔකාසෙ ඨපෙත්වා සුඛනිසින්නෙන න වණ්ණො පච්චවෙක්ඛිතබ්බො න ලක්ඛණං මනසිකාතබ්බං නිස්සයසවණ්ණමෙව කත්වා උස්සදවසෙන පණ්ණත්තිධම්මෙ චිත්තං ඨපෙත්වා අම්බු උදකං වාරි සලිලන්ති ආදීසු ආපොනාමෙසු පාකටනාමවසෙනෙව ආපො ආපොති භාවෙතබ්බං තස්සෙවං භාවයතො අනුක්කමෙන වුත්තනයෙනෙව නිමිත්තද්වයං උප්පජ්ජති ඉධ පන උග්ගහනිමිත්තං චලමානං විය උපට්ඨාති සචෙ ඵෙණපුබ්බුළකමිස්සං උදකං හොති තාදිසමෙව උපට්ඨාති කසිණදොසො පඤ්ඤායති පටිභාගනිමිත්තං පන නිප්පරිප්ඵන්දං ආකාසෙ ඨපිතමණිතාලවණ්ටං විය මණිමයාදාසමණ්ඩලං විය ච හුත්වා උපට්ඨාති සො තස්ස සහ උපට්ඨානෙනෙව උපචාරජ්ඣානං චතුක්කපඤ්චකජ්ඣානානි ච වුත්තනයෙනෙව පාපුණාතීති.

## ආපොකසිණං.

( ස * )

ඉදුනි, දැන්; පඨවිකසිණානන්තරෙ, පඨවිකසිණයට අනතුරුව; ආපොකසිණෙ, ආපොකසිණයෙහි; විත්ථාරකථා හොති, විස්තරකථාව වෙයි (යථා විස්තරිතයාගේ අභිදෙශයද විස්තාරස්ථානයෙහිම සිටිනාබැවින් "විත්ථාර කථා හොති"යි කීහු) යථෙව හි පඨවිකසිණං, යම්සේ පඨවි කසිණධ්‍යානය (කම්ටහනහෝ බවනලදද) එවං, එපරිද්දෙන්ම; ආපොකසිණම්පි භාවෙතුකාමෙන, ආපොකසිණ ධ්‍යානද (කම්ටහණහෝ) බවනු කැමැත්තාවූ; සුඛනිසින්නෙන, සුවෙන් හුන්නාවූ විසින්; කතෙ වා අකතෙ වා, කළහෝ නොකළහෝ; ආපස්මිං, ආපයෙහි; නිමිත්තං ගණ්හිතබ්බන්ති, නිමිත්ත ගතයුතුය යනාදී; සබ්බං විත්ථාරෙතබ්බං, සියල්ල විස්තර කටයුතු; ඉධ, මේ ආපොකසිණෙහි; යථා ච, යම්සේද; සබ්බත්ථ (වායොකසිණ ආදී) හැමතැනම; එවං, මෙසේමැයි; ඉතො පරං, මෙයින් මතු; එත්තකම්පි අවත්වා, මෙපමණකුදු නොකියා ("කතෙ වා අකතෙ වාති සබ්බං විත්ථාරෙතබ්බං" යන මෙපමණක්ම නොකියාය යන අර්ථයි) විසෙසමත්තමෙව, විශෙෂ පමණක්ම; වක්ඛාම, කියමු; ඉධාපි, මෙහිදු; පුබ්බෙ කතාධිකාරස්ස, පූර්වයෙහි ආපොකසිණ භාවනා කළවිරූ; පුඤ්ඤවතො, පිණැත්තාහුට; [illegible] ආප [illegible], පොකරණිලද ආපයෙහි; පොක්ඛරණියා වා, පොකුණෙහි විය; තළාකෙ වා, වැවෙහි [illegible]; ලොණියං වා, කලපුවෙහි; සමුද්දෙ වා, [illegible]; [illegible] උප්පජ්ජති, [illegible] උපදී; චූළසිව [illegible]

සත්කාර හැර; විවිත්තාවාසං වසිස්සා
මීති, විවේකයෙහි වාසයකෙරෙම්යි;
මහානිසංසං නාවං අභිරූහිත්වා, මාවූට
යෙහි නැවුනැගී; ජම්බුදීපං ගච්ඡතො,
දඹදිවට යන්නාහු; අන්තරා, අතුරෙ
හි; මහාසමුද්දං ඔලොකයතො, මහා
සාගරය බලන්නවුන්ට; තප්පටිභාගං
කසිණනිමිත්තං උදපාදි, ඒ සදෘශවූ
කසිණ නිමිති උපනි; අකතාධිකාරෙ
න, පෙර නොකරණලද අභියෝග
ඇත්තහු විසින්; චත්තාරො කසිණ
දොසෙ පරිහරන්තෙන, සතර කිසුණු
දොස් දුරුකරන්නහු විසින්; නීල පීත
ලොහිතොදාත වණ්ණානං, නීලය
පීතය ලොහිතය අවදාතය යන වර්ණ
ඇති ආපයන් අතුරෙන්; අඤ්ඤතර
වණ්ණං ආපං අගහෙත්වා, එක්තර
වර්ණයක් ඇති ආපය නොගෙණ;
භූමිං අසම්පත්තමෙව, භූමියට නොපැ
මිණියාමවූ; ආකාසෙ සුද්ධවත්ථෙන ග
හිතං, අහස්හි ශුද්ධවස්ත්‍රයෙන් ගන්නා
ලද; යං පන උදකං, යම් ජලයෙක්
ඇද්ද; අඤ්ඤං වා තථා රූපං, අනික්
එබඳුවූ; විප්පසන්නමනාවිලං, ප්‍රසන්
න නොකැලඹුනු ජලයෙක් ඇද්ද:
තෙන, ඒ ජලයෙන්; පත්තං වා, පා
ත්‍රයක්හෝ; කුණ්ඩිකං වා, සැළියක්
හෝ; සමතිත්තිකං පූරෙත්වා, සමනො
ව පුරා; විහාරපච්චන්තෙ, විහාර ප්‍ර
ත්‍යන්තයෙහි; වුත්තප්පකාරෙ පටිච්ඡ
න්නෙ ඔකාසෙ, කීයනලද ප්‍රකාර ඇ
ති මුවහවූ අවකාසයෙහි; ඨපෙත්වා,
තබා; සුඛ නිසින්නෙන, සුවෙන් හුන්
නහු විසින්; න වණ්ණො පච්චවෙක්ඛි
තබ්බො, වර්ණය නොසිතියයුතුය;
න ලක්ඛණං මනසිකාතබ්බං (දියෙහි
දුව) ලකුණු මෙනෙහි නොකටයුතුය;
නිස්සයසවණ්ණමෙව කත්වා, වර්ණය න
මහට ආශ්‍රයවූ ආපයහා සමානගතික
කොටම (එක්වනුකොට වර්ණයහා
එක්කොටය යන අදහසි) උස්සදවසෙ
න පණ්ණත්ති ධම්මෙ චිත්තං ඨපෙ
ත්වා (අපොධාතුවගේ උත්සන්නභාව
යෙන් ශක්තිහෙයින් අධිකවූවින්
සසම්භාර ආපයෙහි ආපය යන ලෝ
කලොකව්‍යවහාරයෙක්ද) ඒ උපාදාන
පණ්ණත්ති සිත පිහිටුවා; අම්බු උදකං
වාරි සලිලනාහි, අම්බුය උදකය වාරිය
සලිලය යනාදී; ආපොනාමෙන්නෙව, ආ
පොනාමයත්තෙකරෙනි; පාකට භාව
වසෙනෙව, ප්‍රකට භාවවශයෙන්ම;
ආපො ආපොති භාවෙතබ්බං, ආපො
ආපොයි බැවියයුතුයි; එවං භාවය
තො, මෙසේ බවන්නාවූ; තස්ස, ඊහ
ට; අනුක්කමෙන, අනුක්‍රමයෙන්: වු
ත්තනයෙනෙව, පැවැති කිසුණෙහි කී
නයින්ම; නිමිත්තද්වයං උප්පජ්ජති,
උද්ග්‍රහ ප්‍රතිභාග නිමිත්දෙක උපදී;
ඉදං පන උග්ගහනිමිත්තං, මේ උද්ග්‍ර
හ නිමිත්ත වනාහි; චලමානං විය උ
පට්ඨාති, සැලෙන්නාසේ වැටහේ; ස
චෙ ඵෙණබුබ්බුලකසම්මිස්සං උදකං
හොති, ඉදින් පෙණ බුබුළුමුසු දියෙක්
වීනම්; තාදිසමෙව උපට්ඨාති, එබඳුම
වැටහේ; කසිණදොසො පඤ්ඤායති,
(ජලතැහිම පෙණමුසුබවු ආදී) කිසු
ණු දෙස් පෙණේ; පටිභාගනිමිත්ත
මපන, ප්‍රතිභාග නිමිත්තය වනාහි; නි
ප්පරිප්ඵන්දං, පරිස්පන්ද රහිතව; අච
ලං, නිශ්චලවූ; ආකාසෙ ඨපිත මණි
තාලවණ්ටං විය, අහසතුබූ මිණිතල්
වැටක්මෙන්වද; මණිආදාසමණ්ඩ
ලං විය ච හුත්වා, මිණිමය කැටපත්
තලයක්මෙන්ද; උපට්ඨාති, වැට
හේ; සො, ඒ යොගාවචරතෙමේ; ත
ස්ස, ඒ ප්‍රතිභාග නිමිත්හු; සහ උප
ට්ඨානෙනෙව, වැටහීමහා එක්වම;
උපචාරජ්ඣානං, උපචාරධ්‍යානයද;
වුත්තනයෙනෙවම, යටකී නයින්ම;

චතුක්ක පඤ්චකජ්ඣානානි ච පාපුණාති, චතුෂ්ක පඤ්චකධ්‍යානයන්ද පැමිණේ.

# ආපොකසිණ.

( හා * )

එමෙසේ පෘථිවිකසිණ කථාව දක්වා ඊට අනතුරුව දැන් ආපොකසිණයෙහි විස්තර කථාව වන්නේය මෙහි වනාහි පෘථිවිකසිණ කථාවෙහිමෙන් අනිවිස්තාර කථාමාගීය ස්වරූප වශයෙන් නොකියනුදු පෘථිවිකසිණ කථාවෙහි ව්‍යාකරණලදතැන් මේ ආපොකසිණයෙහිද සුදුසුතැනට ගෙණ යෙදියයුතුයයි දක්වම විස්තරකථානයෙහි සිටිනාබැවින් විස්තරකථාවයයි කීහයි දතයුතු යම්සේ පෘථිවිකසිණධ්‍යානයහෝ පෘථිවිකසිණ කම්ස්ථානය භාවනාකරණලද්දේද එපරිද්දෙන්ම ආපොකසිණධ්‍යානයහෝ ආපොකසිණ කම්ස්ථානය භාවනාකරණු කැමති සුවසේ හුන් මහණ විසින් කිසු කලහෝ නොකලහෝ ආපස්සඞ්ඛ්‍යාත ජලයෙහි නිමිත්තග්‍රහණය කටයුතුය යනාදීන් යට පෘථිවිකසිණ නිර්දේශයෙන් ආනසින් සියලු විස්තර කටයුතු. මේ ආපොකසිණයෙහි විස්තර කටයුතුතැන් යට නිර්දේශයෙන්ගෙන යම් පරිද්දෙකින් විස්තරකරණුලැබේද එපරිද්දෙන් මතුමතොනහි වායොකසිණාදියෙහිද විස්තර කටයුත්තේයි මින්මතු මෙපමණකුදු නොකියා විශෙෂමාත්‍රයක්ම ප්‍රකාශකරන්නෙමු මේ ආපොකසිණයෙහිද පූර්වජාතියෙහි ආපොකසිණ භාවනාකළවිරූ පිණැත්තාහුට පොකුණකහෝ විලකහෝ සලපුවකහෝ මුහුදෙහිහෝ කියන්නාවූ කිසි ආපසඞ්ඛ්‍යාත ප්‍රකෘති ජලයෙහි චූලසීවස්ථවිරයන්ටමෙන් නිමිත්ත උපදනේය ආයුෂ්මත්වූ ඒ චූලසීවස්ථවිරයන් වහන්සේ ලාභසත්කාර හැරපියා විවේකව වෙසෙම් සිතා මාතොටින් නැව්නැගී දඹදිව් යනනාහු අතරතුර මහාසමුද්‍රය බලනනාවූ උන්වහන්සේට ඒ පෙණෙනනාවූ සාගර ප්‍රදෙශය පමණවූ කසිණනිමිත්තය උපන්නේය පූර්වජාතියෙහි ආපොකසිණ භාවනාකළ විරූ පිණැත්තවුන්ට කිසුණු නොකළ ප්‍රකෘති ජලයෙහි පූර්වජාති අභ්‍යාසවශයෙන් කසිණ නිමිත්ත උපදනා බව මෙයින් දතයුතු. පූර්වජාතියෙහි ආපොකසිණ භාවනා නොවැඩූවිරූ නැනැත්තහු විසින් සතරකසිණ දෙෂයන් දුරුකිරීමෙන් නීල පීත ලොහිත අවදාත යන සතර වර්ණඇති ජලයන් අතුරෙන් යම්කිසි ජලයක් නොගෙණ බිමට වැටෙන්නට මත්තෙන් අහස්හිදීම භාජනයකින් පිළිගෙණ නීලාදිවර්ණ මිශ්‍රනොවන පරිද්දෙන් පිරිසිදු වස්ත්‍රයකින් පෙරාගන්නාලද යම් ජලයෙක් හෝ අතිශුද්ධ එබඳුවූ නොකැලඹුනු ප්‍රසන්න අහස්දියෙක් හෝ ඇත්තේවේද එබඳු පිරිසිදු ජලයෙන් පාත්‍රයක්හෝ සැළියක්හෝ මුවවිට සමකොට පුරාගෙන යට කියනලද තැයින් විහාර කෙළවර මුවහම් තෙනක තබා කියනලද ලක්ෂණයෙන් යුත් සුවපහස් ආස්නක හිඳිනිද කසිණමඩන්නාහු ඒ ජලවර්ණය නොසිතියයුත්තේය වැගිරෙන ලක්ෂණය මෙනෙහි නොකටයුත්තේය හුදෙක් ඒ ජලයාගේ වර්ණය ජලයහා එක්කොට ආපොධාතුවගේ උත්සන්නභාවයෙන් හෝ ශක්තිවශයෙන්හෝ අධිකභාවයෙන් හෝ සලකා අම්බනිර්භොග රූපසඞ්ඛ්‍යාත ආපොධාතුවෙහි ආපය යන යම් ලොකව්‍යවහාරයක්වේද ඒ ලොක ප්‍රඥප්තියෙහි සිත පිහිටුවා අම්බුය උදකය වාරිය සලිලය යනාදි

ජලවාචක පයෝයනාමයන් අතුරෙන් ප්‍රකට නම් වශයෙන් ආපො ආපොයි භාවනා කටයුතු. මෙසේ භාවනා වඩනනාවූ ඒ යොගාවචරයාහට පෘථිවිකසිණයෙහි කී පරිද්දෙන් පිළිවෙළින් උද්ග්‍රහ නිමිත්තය ප්‍රතිභාග නිමිත්තය යන දෙදෙන උපදනාහුය ඉදින් ජලය රැළ සහිතවීනම් මේ උද්ග්‍රහ නිමිත්තය සැලෙන්නාක්මෙන් වැටහෙන්නේය ඉදින් පෙණබුබුළු මිශ්‍ර දියෙහි නිමිත්ත ගත්තේවීනම් උද්ග්‍රහ නිමිත්තද එබඳුවම වැටහෙන්නේය මේ ආදි වශයෙන් ආපොනිමිත්තයෙහි රැළනැගීමය පෙණබුබුළු මිශ්‍රවීමය යන මොවුන් එයින් හටගත් උද්ග්‍රහනිමිත්තයෙහි කසිණදෙස් මෙන් පෙණෙන්නේයි. එතකුදුවුවත් ඒ උද්ග්‍රහ නිමිත්තයෙන් හටගන්නා ප්‍රතිභාග නිමිත්තය නිශ්චලව අහස්කුස තුබූ මිණි තල්වැටක්මෙන්වද මිණි කැටපතක්මෙන්වද නිර්මලව වැටහෙන්නේයි. ඒ යොගාවචර මහණද ඒ ප්‍රතිභාග නිමිත්ත වැටහීම හා සමගම උපචාර ධ්‍යානයටද පෘථිවිකසිණයෙහි කී නයින් චතුෂ්ක පඤ්චකධ්‍යානයන්ටද පැමිණෙන්නේයයි දතයුතු.

## ආපොකසිණයයි.

—— ००० ——

( පා † )

තෙජොකසිණං භාවෙතුකාමෙනාපි තෙජස්මිං නිමිත්තං ගණ්හිතබ්බං. තත්‍ථ කතාධිකාරස්ස පුඤ්ඤවතො අකතෙ නිමිත්තං ගණ්හන්තස්ස දීපසිඛාය වා උද්ධනෙ වා පත්තපචනට්ඨානෙ වා දවඩාහෙ වා යත්‍ථ කත්‍ථචි අග්ගිජාලං ඔලොකෙන්තස්ස නිමිත්තං උප්පජ්ජති චිත්තගුත්තත්‍ථෙරස්සවිය. තස්සායස්මතො ධම්මස්සවණදිවසෙ උපොසථාගාරං පවිට්ඨස්ස දීපසිඛං ඔලොකෙන්තස්සෙව නිමිත්තං උප්පජ්ජි. ඉතරෙන පන කාතබ්බං. තත්‍රිදං කරණවිධානං. සිනිද්ධානි සාරදාරූනි ඵාලෙත්වා සුක්ඛාපෙත්වා ඝටිකං කත්වා පතිරූපං රුක්ඛමූලං වා මණ්ඩපං වා ගන්ත්වා පත්තපචනාකාරෙන රාසිං කත්වා ආලිම්පෙත්වා කටසාරකෙ වා චම්මෙ වා පටෙ වා විදත්‍ථිචතුරඞ්ගුලප්පමාණං ඡිද්දං කාතබ්බං තං පුරතො ඨපෙත්වා වුත්තනයෙන නිසීදිත්වා හෙට්ඨා තිණකට්ඨං වා උපරි ධූමසිඛං වා අමනසිකරිත්වා වෙමජ්ඣෙ ඝනජාලාය නිමිත්තං ගණ්හිතබ්බං. නීලන්ති වා පීතන්ති වාති ආදිවසෙන වණ්ණො න පච්චවෙක්ඛිතබ්බො උණ්හත්තවසෙන ලක්ඛණං න මනසිකාතබ්බං. නිස්සයසවණ්ණං කත්වා උස්සදවසෙන පණ්ණත්තිධම්මෙ චිත්තං ඨපෙත්වා පාවකො කණ්හවත්තනී ජාතවෙදො හුතාසනොති ආදීසු අග්ගිනාමෙසු පාකටනාමවසෙනෙව තෙජො තෙජොති භාවෙතබ්බං. තස්සෙවං භාවයතො අනුක්කමෙන වුත්තනයෙනෙව නිමිත්තද්වයං උප්පජ්ජති තත්‍ථ උග්ගහනිමිත්තං ජාලං ඡිජ්ජිත්වා ඡිජ්ජිත්වා පතනසදිසං හුත්වා උපට්ඨාති. අකතාධිකාරස්ස පන කසිණදොසො පඤ්ඤායති අලාතඛණ්ඩං වා අඞ්ගාරපිණ්ඩො වා ඡාරිකා වා ධූමො වා. උපට්ඨාති පටිභාගනිමිත්තං නිච්චලං ආකාසෙ ඨපිතරත්තකම්බලඛණ්ඩං විය සුවණ්ණතාලවණ්ටං විය කඤ්චනත්‍ථම්භො විය ච උපට්ඨාති. සො තස්ස සහ උපට්ඨානෙනෙව උපචාරජ්ඣානං වුත්තනයෙන චතුක්කපඤ්චකජ්ඣානානි පාපුණාතීති.

## තෙජොකසිණං.

—— ००० ——

( ස † )

තෙජොකසිණං භාවෙතු කාමෙනාපි, තෙජොකසුණ බවනු කැමැත්තහු විසිනුදු; තෙජස්මිං නිමිත්තං ගහෙතබ්බං, තෙජසෙහි නිමිත්ත ගතයුතු; තත්‍ර, එහි; කතාධිකාරස්ස, කෘතාධිකාරවූ; පුඤ්ඤවතො, පිණැතියහට; අකතෙ නිමිත්තං ගණ්හන්තස්ස, නොකරණලද තෙජසෙහි නිමිත්ත ගන්නහුට; දීපසිඛාය වා, දීපසිඛායෙහි වත්; උද්ධනෙ වා, උදුනෙහිවත්; පත්තපචනට්ඨානෙ වා, පාත්‍ර පිසනතැන වත්; දවඩාහෙ වා, ලැව්වූ ගින්නෙහි වත්; යත්ථ කත්ථචි දෙව, යම්කිසි තෙනක; අග්ගිජාලං ඔලොකෙන්තස්ස, ගිනිදැල බලනුවහට; නිමිත්තං උප්පජ්ජති, නිමිත් උපදී; චිත්තගුත්තත්ථෙරස්ස විය, චිත්තගුත්ත නම් තෙරුන්ට මෙනි; තස්සහායස්මතො, ඒ ආවත්හට; ධම්මසවණ දිවසෙ, බණ අසන දවස්; උපොසථාගාරං පවිට්ඨස්ස, පොහෝගෙට වන්නවුන්ට; දීපසිඛං ඔලොකෙන්තස්සෙව, පහන්සිල බන්නහට; නිමිත්තං උප්පජ්ජි, නිමිත් උපනි; ඉතරෙන පන, අකතාධිකාරයාවිසින් වනාහි; කාතබ්බං, කිසුණ කටයුතු; තත්‍ර, එහි, ඉදං, මේ; කරණ විධානං, කරණ ක්‍රමයි; සිනිද්ධානි සාරදාරූනි ඵාලෙත්වා, සිනිදුවූ හරඇති දර පලා; සුක්ඛාපෙත්වා, වියලා (සිනිදු වූ හර ඇති දර ගැත්ම කලක් ජලාව සිටිනා සඳහායි දන්නේ) ඝටිකං ඝටිකං කත්වා, කඩකඩකොට කපා; පතිරූපං, සුදුසු; රුක්ඛමූලං වා, රුක්මුල කටහෝ; මණ්ඩපං වා, මණ්ඩපයකටහෝ; ගන්ත්වා, ගොස්; පත්තපචනාකාරෙන, පාත්‍ර පිසනාකාරයෙන්; රාසිං කත්වා, රැස්කොට; ආලිම්පෙත්වා, දල්වා; කටසාරකෙ වා, හුණපැදුරෙකහෝ; චම්මෙ වා, සමකහෝ; පටෙ වා, පටෙකහෝ; විදත්ථිචතුරඞ්ගුලප්පමාණං, එක්වියත් සතරඟුලක් පමණකොට; ඡිද්දං කාතබ්බං, සිදුරු කටයුතු; තං, එහි; පුරතො ඨපෙත්වා, අභිමුඛයේ තබා; වුත්තනයෙන නිසීදිත්වා, යට කී නයින් හිඳ; හෙට්ඨා තිණකට්ඨං වා, යට තණ දරවත්; උපරිධූමසිඛං වා, මතුයෙහි දුම්සිලවත්; අමනසිකරිත්වා, මෙනෙහි නොකොට; වෙමජ්ඣෙ, මැද; ඝනජාලාය (විරල නොව) ඝණව පවත්නා අග්නිජ්වාලායෙහි; නිමිත්තං ගණ්හිතබ්බං, නිමිත් ගතයුතු; නීලන්ති වා පීතන්ති වාති ආදිවසෙන, නීලය පීතය යනාදී වශයෙන්; වණ්ණො න පච්චවෙක්ඛිතබ්බො, වර්ණය නොසිතියයුතු; උණ්හත්තවසෙන, හුණුබව විසින්; ලක්ඛණං න මනසිකාතබ්බං, ලකුණු මෙනෙහි නොකටයුතු; නිස්සය සවණ්ණමෙව කත්වා, වර්ණයද නිශ්‍රය ගතික කොට (නිශ්‍රයහා එක්කොට) උස්සදවසෙන පණ්ණත්ති ධම්මෙ චිත්තං ඨපෙත්වා (තෙජොධාතු අධිකබැවින් සම්භාර අග්නියෙහි තෙජසය යන යම් ලොකව්‍යවහාරයෙක්ද) ඒ උපාදානපණ්ණත්හි සිත් පිහිටුවා; පාවකො, පාවකය; කණ්හවත්තනි, කණ්හවත්තනිය; ජාතවෙදො, ජාතවෙදය; හුතාසනොති, හුතාසනය; ඉති ආදිසු අග්ගිනාමෙසු, මේ ආදී වූ අග්නිනාමයන් අතුරෙන්; පාකටනාමවසෙනෙව, ප්‍රකට නාම වශයෙන්ම; තෙජො තෙජොති භාවෙතබ්බං, තේජෝ තේජෝයි බැවියයුතු; එවං භාවයතො, මෙසේ භාවනාවඩන්නාවූ; තස්ස, ඒ යොගාවචරයාහට; අනුක්කමෙන, පිළිවෙළින්; වුත්තනයෙනෙව, කියනලද නය ඇත්තාවූම; නිමිත්තද්වයං උප්පජ්ජති, උද්ග්‍රහ ප්‍රතිභාග යන නිමිත්තද්වය

උපදී; තාව, ඒ නිමිති අතුරෙහි; උග්ගහනිමිත්තං, උද්ග්‍රහ නිමිත්තය; චලං, සිතිදූල, ඡිජ්ජිත්වා ඡිජ්ජිත්වා පතනසදිසං හුත්වා, සිඳ සිඳ හෙනු ලබන්නාක්මෙන්ව; උපට්ඨාති, වැටහේ; අකතෙ (කියනලද ක්‍රමයෙන් කිසුණු මඩුලු සංස්කාර) නොකරණලද කෙවලතෙජසෙහි; ගණ්හන්තස්ස, නිමිති ගන්නහුට වනාහි; කසිණදොසො පඤ්ඤායති, කිසුණුදෙස් පැණේ; අලාතඛණ්ඩං වා, පෙනෙහෙලිකඩක් හෝ; අඞ්ගාරපිණ්ඩො වා, අඟුරු පිඩක්හෝ; ඡාරිකා වා, හලුහෝ; ධූමො වා, දුම හෝ; උපට්ඨාති, වැටහේ; පටිභාග නිමිත්තං, ප්‍රතිභාග නිමිත්තය; ආකාසෙ ඨපිත, අහස්හි තුබූ; රත්තකම්බල ඛණ්ඩ, විය, රත් කම්බිලිකඩක් මෙන්වද; සුවණ්ණතාලවණ්ටං විය, රන් තල්වැටක් මෙන්වද; කඤ්චනත්ථම්භො විය ච, කසුන් ටැඹක් මෙන්වද; නිච්චලං උපට්ඨාති, නිශ්චලව වැටහේ; සො, ඒ යොගාවචරතම; තස්ස සහ උපට්ඨානෙනෙව, ඒ පිළිබිඹුනිමිත්හුගේ වැටහීමත් සමගම; උපචාරජ්ඣානං, උපචාරධ්‍යානයද; වුත්තනයෙන, යට කියනලද නියෙන්; චතුක්කපඤ්චකජ්ඣානානි, චතුෂ්ක පඤ්චකධ්‍යානයන්ද; පාපුණාති, පැමිණෙන්නේයි.

## තෙජොකිසුණ.

—— ००० ——

( භා. † )

තෙජොකසිණය වඩනු කැමති යොගාවචර මහණ විසිනුදු තෙජොසඞ්ඛ්‍යාතවූ ගින්නෙහි නිමිත්තග්‍රහණය කටයුත්තෝය ඒ තෙජොකසිණයෙහිද පෙර කරණලදවිරූ තෙජො කසිණ භාවනාමය පිණැති යොගාවචර මහණහට කිසුණු නොකල ප්‍රකෘති ගිනෙහෙහි නිමිත්ත උපදනේය කෙසේ දයත්? පහන් දැල්ලෙහි හෝ උදුනෙහි හෝ පාත්‍රපිසන තැන හෝ ලැව්ගින්නෙහි හෝ යම්කිසිතැනෙක ගිනිදූල බලන්නාවූ යොගාවචරයාහට චිත්තගුත්තස්ථවිරයන්ටමෙන් නිමිත්ත උපදනේයි ඒ එසේවැනි ආයුෂ්මත්වූ චිත්තගුත්තස්ථවිරයන්ටමෙන් සේ බණ අසන දවස පොහොයගෙට ඇතුල්ව පහන්දැල්ල බලනහුට තෙජොකසිණ නිමිත්ත උපන්නේයි අපර පින්නොකළවිරූ යොගාවචරයා විසින් කසිණමණ්ඩලය කටයුත්තේයි එහි මේ මතු ප්‍රකාශවන්නේ කසිණ කරණ ආකාරවන්නේයි. තෙජොකසිණ වඩන්නාවූ යොගාවචර මහණ විසින් පලමුකොට වන්නීවාලාව හෝ වෙලා සිටිමට සුදුසු තෙල්ගතියෙන් මිශ්‍රවූ හරඇති දර කඩකඩ කොට කපා සුදුසු වෘක්ෂමූලයකටහෝ මණ්ඩපයකටහෝ ගෙණගොස් පාත්‍රපිසන ආකාරයෙන් දර ගොඩකොට ගිනි දල්වා හුණපැල්ලෙකහෝ සම්කඩකහෝ වස්ත්‍රයෙකහෝ එක් වියත් සතරඟුලක් පමණ මහත්වූ වටවූ සිදුරක් කටයුත්තේයි ඉක්බිත්තෙන් ඒ සිදුරුකරණලද හුණපැලි ආදිය අභිමුඛයෙහි එල්වා පාපිටි කසිණයෙහි කී නයින් වැඩහිඳ යටභාගයෙහි තණකොල දර ආදියවත් මතුභාගයෙහි දුම්සිලවත් මෙනෙහි නොකොට මැදභාගයෙහි ඝනීනොව ඝනව පවත්නා ගිනිදූලෙහි නිමිත්තග්‍රහණය කටයුත්තේයි නීලය පීතය යනාදී වශයෙන් ගින්නෙහි වර්ණය නොසැලකියයුතුය උෂ්ණවශයෙන් හෝ ලක්ෂණ මෙනෙහිනොකටයුතුය හුදෙක් ගින්නෙහි වර්ණය භාගයේ ආශ්‍රයස්ථානවූ ගින්නටම එක්කොට තෙජොධාතුවගේ අධික වශයෙන් ස

ලකා අවිනිබ්භොග රූපසඞ්ඛ්‍යාත ගින්නෙහි ව්‍යවහාරවූ තෙජස යන ලොකප්‍රඥප්තියෙහි සිත පිහිටුවා පාවකය කණ්හවත්තනිය ජාතවෙදය හුතාසනය යනාදී වශ්නිනාමයන් අතුරෙන් ප්‍රකට නම්වශයෙන් තෙජො තෙජොයි භාවනා කටයුතු. මෙසේ භාවනා වඩන්නාවූ ඒ යොගාවචරයාහට යට කී යනලද නයින් පිළිවෙළින් උද්ග්‍රහ ප්‍රතිභාග යන නිමිත්තයන් දෙදෙන උපදනාහුය ඔවුන් අතුරෙන් උද්ග්‍රහ නිමිත්තය ගිනිදැල් සිඳිසිඳී හෙන්නාක්මෙන් වැටහෙයි කිසුණු නොකරණලද ගින්නෙහි නිමිත්තග්‍රහණය කරනනාහට කසිණදොෂයෝ පෙණෙනනාහුය පෙනහෙල්ලක්හෝ අඟුරු කැටයක්හෝ අළුහෝ දුම්හෝ වැටහෙන්නේයි එනකුදුවුවත් එයින් හටගන්නාලද ප්‍රතිභාග නිමිත්තය නිශ්චලව අහස්තුබූ රත්කම්බිලිකඩක් මෙන්වද රන් තල්වැටක් මෙන්වද රන්වැඹක් මෙන්වද වැටහෙන්නේයි ඉක්බින්තෙත් ඒ යොගාවචර මහණ ඒ ප්‍රතිභාග නිමිත්තය පහළවූ මහා සමග උපචාරධ්‍යානයටද පෘථිවිකසිණයෙහි කී පරිච්ඡේදයෙන් චතුෂ්ක පඤ්චකධ්‍යානයන්ටද පැමිණෙන්නේයි......

## තෙජොකසිණයයි.

—— ooo ——

( පා ‡ )

වායොකසිණං භාවෙතුකාමෙනාපි වායස්මිං නිමිත්තං ගණ්හිතබ්බං තඤ්චඛො දිට්ඨවසෙන වා ඵුට්ඨවසෙන වා වුත්තං හෙතං අට්ඨකථාසු වායො කසිණං උග්ගණ්හන්තො වායස්මිං නිමිත්තං ගණ්හාති උච්ඡග්ගං වා එරිතං සමෙරිතං උපලක්ඛෙති වෙළග්ගං වා......පෙ......රුක්ඛග්ගං වා කෙසග්ගං වා එරිතං සමෙරිතං උපලක්ඛෙති කායස්මිං වා ඵුට්ඨං උපලක්ඛෙතීති තස්මා සමසීසට්ඨිතං ඝනපත්තං උච්ඡුං වා වෙළුං වා රුක්ඛං වා චතුරඞ්ගුලප්පමාණ ඝනකෙසස්ස පුරිසස්ස සීසං වා වාතෙන පහරියමානං දිස්වා අයං වාතො එතස්මිං ඨානෙ පහරතීති සතිං ඨපෙත්වා යං වා පන යස් වාතපානන්තරිකාය වා භිත්තිච්ඡිද්දෙන වා පවිසිත්වා වාතො කායප්පසාදං පහරති තත්ථ සතිං ඨපෙත්වා වාතමාළුත අනිලාදීසු වාතනාමෙසු පාකටනාමවසෙනෙව වාතො වාතොති භාවෙතබ්බං......ඉධ උග්ගහනිමිත්තං උද්ධනතො ඔතාරිතමත්තස්ස පායාසස්ස උසුමවට්ටිසදිසං චලං හුත්වා උපට්ඨාති පටිභාගනිමිත්තං සන්නිසින්නං හොති නිච්චලං සෙසං වුත්තනයෙනෙව වෙදිතබ්බන්ති......

## වායොකසිණං.

—— ooo ——

( ස ‡ )

වායොකසිණං, වායො කසිණය; භාවෙතුකාමෙනාපි, බවනු කැමති මහණ විසිනුදු; වායස්මිං, වායොධාතුවෙහි; නිමිත්තං ගණ්හිතබ්බං] * නිමිත් ගතයුතු; තඤ්චඛො, ඒ ග්‍රහණයද; දිට්ඨවසෙන වා, සැලෙනතැන් බැලීමෙන්හෝ; ඵුට්ඨවසෙන වා, වෙර පැහැරමෙන්හෝ ගතයුතු [අට්ඨකථාසු, අටුවාසෙහි; වුත්තංහෙතං, මේ කියනලදමැයි; වායොකසිණං උග්ගණ්හන්තො, වායොකසුණ උගන්නා මහණ; වායස්මිං, වායුවෙහි; නිමිත්තං ගණ්හාති, නිමිත් ගනී; එරිතං (වාතයෙන්) සැලෙනලද; සමෙරිතං, හාත්පසින් සැලෙනලද; උච්ඡග්ගං වා, උගස් අගක්හෝ; උපලක්ඛෙති. නිමිත්තකොට බලයි; වෙළුග්ගං වා, හු

* [ ] මේ ලකුණුදෙයාට මැදිවූ සන්නය බසිතව නිරි අපවිසින් සපාදනලදී.

ණස් අගන්තෙ'; රුක්ඛග්ගං වා, වෘක්ෂාග්‍රයක්හෝ; එරිතං, පවණින් සැලෙනලද; සමෙරිතං, හාත්පසින් සැලෙනලද; කෙසග්ගං වා, කෙශාග්‍රයක්හෝ; උපලක්ඛෙති, නිමිත්තකොට බලයි; කායස්මිං, ශරීරයෙහි; ඵුට්ඨං වා, වැදගත්තාලද වාතයහෝ; උපලක්ඛෙති, නිමිත්තකොට බලත්තේයි] † තස්මා, එහෙයින්; සමසීසං, මුදුනෙහි පත්‍රවයින් සමවූ හිස් ඇතිව සිටි; ඝනපත්තං, ඝනපත් ඇති; උච්ඡුං වා, උක්හෝ; වෙළුං වා, හුණහෝ; රුක්ඛං වා, රුකක්හෝ; චතුරඞ්ගුලප්පමාණං, සතරඟුලක් පමණවූ; ඝනකෙසස්ස පුරිසස්ස, ඝනවූ කෙස් ඇති පුරුෂයක්හුගේ; සීසං වා, හිසහෝ; වාතෙන පහරියමානං දිස්වා, වාතයෙන් පහරණලබන්නා දුක; අයං වාතො, මේ වාතය; එතස්මිං ඨානෙ පහරන්ති, මෙතන පහරණේයයි; සතිං ඨපෙත්වා, සිහිපිටුවා ("වාතො වාතොති භාවෙතබ්බං"යි සම්බන්ධකරණු) වාතපානන්තරිකාය වා, කවුළු දෙරින්හෝ; භිත්තිච්ඡිද්දෙන වා, බිතක් සිදුරෙන්හෝ; පවිසිත්වා, වැද; වාතො, වාතයතෙමේ; අස්ස, මොහුගේ; යංවා කායප්පදෙසං පහරති, යම් ශරීර ප්‍රදෙශයෙක්හි පහරද; තත්ථ සතිං ඨපෙත්වා, ඒ කාය ප්‍රදෙශයෙහි (සඞ්ඝට්ටනවශයෙන් පවත්නා වාත පිණ්ඩයෙහි ඝට්ටනාකාර ග්‍රහණබුද්ධියෙන්) සමානිය පිහිටුවා, වාතමාළුත අනිලාදිසු වාතනාමෙසු, වාත මාළුත අනිලය යනාදී වාත නාමයන් කෙරෙහි; පාකටනාමවසෙනෙව, පහල නම් විසින්ම; වාතො වාතොති, වාතය වාතයයි; භාවෙතබ්බං (දුටුතැන් පහලතැන් නොහැරම අනන්දමින් සිත් පිහිටුවා) වැඩිය යුතු; ඉධ, මෙහි; උග්ගහනිමිත්තං, උග්ගානිමිත්; උද්ධනතො ඔතාරිතමත්තස්ස පායාසස්ස, උළුනෙන් බහාබු මාත්‍ර කිරිබත; උසුමවට්ටිසදිසං, හුනුසුම් වැටියක් බදුව; චලං හුත්වා, උට්ඨාති, චලව වැඩෙයි; පටිභාගනිමිත්තං, ප්‍රතිභාග නිමිත්; සන්නිසින්නං හොති එම ආකාරයෙන් සන්හුන් වේ; නිච්චලං, නිශ්චලවේ (නිච්චලං යනමෙයින් උද්ග්‍රහනිමිත්තින් ප්‍රතිභාග නිමිත්හුගේ වෙනස්තම නිශ්චලබව්හා ප්‍රතිභාගනිමිත්හු දුම්වැටි වනබව් දක්වෙත්) සෙසං, සෙස්ස; වුත්තනයෙනෙව වෙදිතබ්බං, කී නයින්ම දත යුතු.

## වායොකසිණං.

——ooo——

( භා ‡ )

වායොකසිණ කම්මස්ථානය වඩනු කැමති යොගාවචර මහණ විසින් වායුවෙහි නිමිත්තග්‍රහණය කටයුත්තේය ඒ ග්‍රහණයද පවණින් සැලෙනතැන් බැලීමෙන් හෝ ශරීරයෙහි පවන් වැදගැන්මෙන් හෝ ගතයුතුය එහෙයින් මේ කියනලදී අටුවායෙහි. වායො කසිණ කමටහන උගන්නහු වායුවෙහි නිමිත්තගන්නේය. පවණින් සැලෙනලද හාත්පසින් සැලෙනලද උක්ගස් අගක් හෝ නිමිත්තකොට බලන්නේය එපරිද්දෙන්ම පවණින් සැලෙනලද හාත්පසින් සැලෙනලද හුණගස් අගක්හෝ වෘක්ෂාග්‍රයක්හෝ කෙශාග්‍රයක්හෝ නිමිත්තකොට බලන්නේය ශරීරයෙහි වැදගත්තාලද වාතයහෝ නිමිත්තකොට බලන්නේයි. එහෙයින් මුදුනෙහි සමකස්ව හෙවත් සමලස්ව පිහිටි ඝනපත්‍රඇති උක්ගස්මුදුනක්හෝ හුණගස් අගක්හෝ වෘක්ෂමුදුනක්හෝසතරඟුල්

† [ ] මේ ලකුණු දෙකට මැදිවූ සන්නයද බඩිතුව හිඟි යොදනලදී.

පමණ දික්වූ ගහකිසකෝ ඇති පුරුෂයෙකුගේ හිසක් හෝ පව්ණින් පහරණු ලබනහනු දුක මේ වාතය මේතන් හි පහරණේයයි සිහි තබාගෙන "වාතො වාතො"යි භාවනා කටයුතු තවද කවුළුදොරින් හෝ බිතක් සිදුරකින් හෝ පවන් ඇතුල්ව ඔහුගේ යම්ශරීර ප්‍රදේශයක පහරිද ඒ ශරීර ප්‍රදේශයෙහි ගැටීම්වශයෙන් පවත්නා වාත පිණ්ඩයෙහි සිහිය පිහිටුවා වාතය මාළුතය අනිලය යනාදී වායුනාමයන් අතුරෙන් ප්‍රකටනම් වශයෙන් "වාතො වාතො"යි භාවනාකටයුත්තේයි මෙසේ භාවනා වඩන්නාවූ යොගාවචරයාහට යටකීනයින් උද්ග්‍රහ ප්‍රතිභාගනිමිත්තයෝ උපදනාහුය මේ වායොකසිණයෙහි උපදනා උද්ග්‍රහනිමිත්ත උදුනෙන් බාතබනලද පමණවූ කිරිබතෙක උණුසුම්වැටියක්මෙන් චඤ්චලව වැටහෙන්නේය එයින් උපදනා ප්‍රතිභාගනිමිත්තය එබඳු ආකාර ඇතිවම සන්සිඳි නිශ්චලව වැටහෙත්තේයි මෙසේ චඤ්චල දුම්වැටියක්සේ උපදනා උද්ග්‍රහනිමිත්තයෙන් නිශ්චල දුම්වැටියක්සේ ප්‍රතිභාගනිමිත්ත ඉපදීම හා සමඟ පෘථිවීකසිණයෙහි කී පරිද්දෙන් උපචාරධ්‍යානයන්ට හා චතුස්කපඤ්චකධ්‍යානයන්ටද පැමිණෙත්තේයි—

## වායොකසිණයයි.

—o—

( පා ¶ )

තදනන්තරම්පන නීලකසිණං උග්ගණ්හන්තො නීලකස්මිං නිමිත්තං ගණ්හාති පුප්ඵස්මිං වා වත්ථස්මිං වා වණ්ණධාතුයාවාති වචනතො කතාධිකාරස්ස තාව තථාරූපං මාලාගච්ඡං වා පූජට්ඨානෙසු පුප්ඵසන්ථරං වා නීලවත්ථමණීනංවා අඤ්ඤතරං දිස්වා නිමිත්තං උප්පජ්ජති ඉතරෙන නීලුප්පල ගිරිකණ්ණිකාදීනි පුප්ඵානි ගහෙත්වා යථාකෙසරං වා වණ්ටං වා න පඤ්ඤායති එවං චඞ්ගොටකං වා කරණ්ඩපටලං වා පත්තෙහි සමතිත්තිකං පූරෙත්වා සන්ථරිතබ්බං නීලවණ්ණෙන වා වත්ථෙන භණ්ඩිකං බන්ධිත්වා පූරෙතබ්බං මුඛවට්ටියංවාස්ස භෙරිතලම්ව බන්ධිතබ්බං කංසනීල පලාසනීල අඤ්ජන නීලානං අඤ්ඤතරෙන ධාතුනා පඨවිකසිණෙ වුත්තනයෙන සංහාරිමං වා භිත්තියංයෙව වා කසිණමණ්ඩලං කත්වා විසභාගවණ්ණෙන පරිච්ඡින්දිතබ්බං තතො පඨවිකසිණෙ වුත්තනයෙන "නීලං නීලන්ති" මනසිකාරො පවත්තෙතබ්බො ඉධාපි උග්ගහනිමිත්තෙ කසිණදොසො පඤ්ඤායති කෙසරවණ්ටපත්තන්තරිකාදීනි උපට්ඨහන්ති පටිභාගනිමිත්තං කසිණමණ්ඩලතො මුඤ්චිත්වා ආකාසෙ මණිතාලවණ්ට සදිසං උපට්ඨාති සෙසං වුත්තනයෙනෙව වෙදිතබ්බන්ති—;

## නීල කසිණං

—o—

( ස ¶ )

තදනන්තරම්පන, වායොකසිණයට අනන්තරවූ; නීලකසිණං උග්ගණ්හන්තො, නිල්කිසුණ උගන්නේ; නීලකස්මිං නිමිත්තං ගණ්හාති, නීලවණ්හි නිමිත් ගණී; පුප්ඵස්මිං වා මල්හි හෝ; වත්ථස්මිං වා, වස්ත්‍රයෙහි හෝ; වණ්ණධාතුයා වාති (අඳුන් රාමය ආදි) වණ්ණධාතුයෙහි හෝ යයි; වචනතො (නිමිත් ගන්නියි) වදාළබැවින්; කතාධිකාරස්ස තාව, කෘතාධිකාරයාහට; තථාරූපං මාලාගච්ඡං වා, එබඳු (අවිරල පිපුණු නිල් මලින් ගැවසීගත්) මල්ගසකහෝ; පූජට්ඨා

තොසු පුප්ඵසන්ථරං වා, පූජාකරණ තැන්හි මල්ඇතිරියක් හෝ; නීලවණ්ණ මණිගං වා අඤ්ඤතරං, නිල්වන් මිණිආදින් කොරෙන් එක්තරා එකක් හෝ; දිස්වා, දැක; නිමිත්තං උප්පජ්ජති, නිමිත් උපදී; ඉතරෙන, අකෘතාධිකාරයා විසින්; නීලුප්පලගිරිකණ්ණිකාදීනි, නිලුපුල් නිල් කටරොළුආදිවූ; පුප්ඵානි ගහෙත්වා, මල්ගෙණ; යථා, යම්සේ; කෙසරං වා, කෙසරු හෝ; වණ්ටං වා, තුවටුහෝ, න පඤ්ඤායති, නොපැණේද; එවං, එසේ; චඞ්ගොටකං වා, චඞ්ගොටකයක් හෝ; කරණ්ඩපටලං වා, කරඬුපියනක් හෝ (දෙපියන සමවූයේ කරඬුනම ගවපියන ගැඹුරුව මතුපියන ඇත්තේ චඞ්ගොටකය යෙන්) පත්තෙහි (කෙසරුතුවටු නැති) මල්පෙත්තෙන්ම; සමතිත්තිකං පූරෙත්වා, සමකොට පුරා; සන්ථරිතබ්බං, ඇතිරියයුතු; නීලවණ්ණෙන වා වත්ථෙන, නීලවණ් ඇති වස්ත්‍රයකින්; භණ්ඩිකං බන්ධිත්වා, භණ්ඩිකයක් මෙන් බැඳ (පිළිවෙන් වටා බඳනාලද්දේ භණ්ඩිකනම) පූරෙතබ්බං (චඞ්ගොටකයක්වන් කරඬු පියනක්වන්) පිරියයුතු; අස්ස වා, චඞ්ගොටකයාගේ හෝ කරණ්ඩපටලයාගේ හෝ; මුඛවට්ටියං, මුව්විට; භෙරිතලං විය බන්ධිතබ්බං, බෙරඇසක්මෙන් බැන්දයුතු; කංසනීලං, ලොහොමල නිල්ය, පලාසනීල, කොළ නිල්ය; අඤ්ජනනීලාදීනං, අඤ්ජනනිල්ය යන මොවුන්ගේ; අඤ්ඤතරෙන ධාතුනා, එක්තරාධාතුවෙකින්; පථවිකසිණෙ වුත්තනයෙන, පෘථිවිකසුණෙහි කී නයින්; සංහාරිමං වා, ගෙනයාහැකිකොට හෝ; භිත්තියං යෙව වා, භිත්තියෙහිම හෝ; කසිණමණ්ඩලං කත්වා, කිසුණුමණ්ඩලය කොට; විසභාගවණ්ණෙන පරිච්ඡින්දිතබ්බං, අනිස්වර්ණයෙකින් පිරිසින්දයුතු; තතො, ඉක්බිත්තෙන්; පඨවිකසිණෙ වුත්තනයෙන, පඨවිකසුණෙහි කී නියායෙන්; නීලං නීලන්ති, නීලං නීලං යි; මනසිකාරො පවත්තෙතබ්බො, මනස්කාර පැවත්වියයුතු; ඉධාපි, මෙහිද; උග්ගහනිමිත්තෙ කසිණදොසො පඤ්ඤායති, උග්ගහනිමිත්තයෙහි කිසුණු දොස් පැණේ; කෙසරවණ්ටක පත්තන්තරිකාදීනි, කෙසරු තුවටු පෙතිඅතුරු ආදිහු; උපට්ඨහන්ති, වැටහෙත්; පටිභාගනිමිත්තං, ප්‍රතිභාගනිමිත්; කසිණමණ්ඩලතො මුඤ්චිත්වා, කිසුණුමඬුල්කෙන්මිදී; ආකාසෙ, අහස; මණිතාලවණ්ටසදිසං, ඉන්ද්‍රනීල මිණිතල් වැටක් වැනිව; උපට්ඨාති, වැටහේ.

## නිල්කිසුණ.

(හා ¶)

මෙසේ මේ වායෝකසිණයට අනතුරුව නීලකසිණය පුරුදුකරන්නාවූ යොගාවචර මහණ තෙමේ නීලවර්ණයෙහි නිමිත්තග්‍රහණය කරන්නේනම් නිල්පුෂ්පයෙක හෝ නිල්වස්ත්‍රයෙක හෝ නීලාඤ්ජන මයුරතුත්තආදි නීලවර්ණ ධාතුවෙක හෝ නිමිත්තග්‍රහණය කරන්නේයයි අටුවායෙහි කීබැවින් පළමුකොට පූර්වජාතියෙහි නීලකසිණ භාවනාකළ විරූ යොගාවචරයාහට එබඳුවූ ගහව පිපීගිය නිල්මලින් ගැවසීගත් තික ආදි ගසක් හෝ මල්පුදන තැනක අතුරණලද නිල්මල් ඇතිරියක් හෝ නීලවස්ත්‍ර ඉන්ද්‍රනීල මාණික්‍යාදීන් අතුරෙන් එකක් හෝ දුටු නිමිත්ත උපදනේය පෙර නොකළ විරූ නීලකසිණ භාවනා ඇති යෝගාවචරයා විසින් නිලුපුල්මල් නිල් කටරොළුමල් ආදිවූ නීලවර්ණ පුෂ්පයන් ගෙන ඒ පුෂ්පයන්ගේ රෙණු හෝ

හවුහෝ නොපෙණෙනසේ කරඬු පියනක් හෝ සුඹුගුපියනක් හෝ රෙන් වූතැනි මල්පෙත්තෙන් මුවවිටි සමකොට පුරා ඇතිරියයුතුය නීලවර්ණ වස්ත්‍රයකින් වටාබැඳ හෝ මල් පිරවියයුත්තේය ඒ සුඹුගු පියන හෝ කරඬුපියන හෝ මුවවිට බෙරඇසක් මෙන් සමකොට බැන්ද යුත්තේය ලොහොබඳුන්හි උපදනා නිල්මලය අවරියආදී නිල්පත්‍රවලින් ගන්නායුසය නීලාඤ්ජනය යන මොවුන් අතුරෙන් එක්තරා නීලවර්ණ වස්තුවෙකින් පෘථිවිකසිණ කරණ විධියෙහි කීපරිද්දෙන් සම්බන්ධකහෝ වස්ත්‍රාදියෙකහෝ ආලේපකොට කෑ.ගි ගෙන කටගෙනනාහැකිසේකොට හෝ ගෙන නොයා හැකිබිත්තියක ආලේපකොට හෝ කසිණමණ්ඩලයකොට බිත්තියෙහි වටම සෙසුතැන් අනිත්වර්ණයකින් වෙන්කටයුත්තේයි ඉක්බිත්තෙන් පෘථිවි කසිණයෙහි කී නියායෙන් නිලය නිලයයි මනසකාර පැවැත්වියයුත්තේයි මේ නීලකසිණයෙන් උපදනා උද්ග්‍රහනිමිත්තයෙහිද කිසුණුදෙස් පෙණෙන්නේය මල්කොතරැමෙන් හෝ මල්හවුමෙන් හෝ පෙහිඅතරමෙන් හෝ වැටහෙයි එතකුදුවුවත් ප්‍රතිභාගනිමිත්තය කිසුණු මඬුල්ලෙන් මිදී අහස්කුසතුබු ඉඳුනිල් මිණි තල්වැටක් මෙන් වැටහෙන්නේය ඒ උපන් ප්‍රතිභාගනිමිත්තය හා සමග යොගාවචර මහණ උපචාරධ්‍යාන චතුෂ්ක පඤ්චකධ්‍යානයන්ට ක්‍රමයෙන් පැමිණෙන්නේයි.—

නීලකසිණයයි.

—o—

( පා * )

පීතකසිණෙපි එසෙව නයො වුත්තං හෙතං පීතකසිණං උග්ගණ්හන්තො පීතකස්මිං නිමිත්තං ගණ්හාති පුප්ඵස්මිං වා වත්ථස්මිං වා වණ්ණධාතුයා වාති තස්මා ඉධාපි කතාධිකාරස්ස පුඤ්ඤවතො තථාරූපං මාලාගච්ඡං වා පුප්ඵසන්ථරං වා පීතවත්ථධාතූනං වා අඤ්ඤතරං දිස්වාව නිමිත්තං උප්පජ්ජති චිත්තගුත්තත්ථෙරස්ස විය තස්ස කිරායස්මතො චිත්තලපබ්බතෙ පත්තඞ්ගපුප්ඵෙහි කතං ආසනපූජං පස්සතො සහදස්සනෙනෙව ආසනප්පමාණං නිමිත්තං උදපාදි ඉතරෙන කණිකාරපුප්ඵාදිනා පීතවත්ථෙන වා ධාතුනා වා නීලකසිණෙ වුත්තනයෙනෙව කසිණං කත්වා පීතකං පීතකන්ති මනසිකාරො පවත්තෙතබ්බො සෙසං තාදිසමෙවාති.—

පීතකසිණං.

—oo—

( ස * )

පීතකසිණයෙහිද මෙම නයයි; වූතතාං හෙතං, මේ කීයේ මැතු—පෙ—තස්ස කිර, ආයුෂ්මතා, ඒ ආවත්හු; චිත්තලපබ්බතෙ, සිතුල්පවුවෙහි; පත්තඞ්ගපුප්ඵෙහි කතං, පතැඟිමලින් කරණලද; ආසනපූජං පස්සතො, අසුන් පුද බලනුව හට; සහදස්සනෙන එව, දුටුමතා සමගම; ආසනප්පමාණං නිමිත්තං, අසුන්පමණ නිමිත්; උදපාදි, උපනි; ඉතරෙන, අනෘතාධිකාරයා විසින්; කණිකාරපුප්ඵාදිනි වා, කිණිහිරිමල්ආදියෙන් හෝ; පීතවත්ථෙන වා, රත්වන් වතෙකින් හෝ; ධාතුනා වා, රත්සිරියෙල් ආදී ධාතුවෙකින් හෝ—පෙ—

පීත කිසුණී.

—o—

( භා * )

පීතකසිණ භාවනා වඩනු කැම
ති යොගාවචර මහණ විසින් නීලක
සිණයෙහි කී පරිදෙදන් සියලු විධිහො
වරදවා කටයුත්තේය මේ කියනලද්
දේමැයි අවුවාදෙහි පීතකසිණය පුරු
දුකරණ යොගාවචර මහණතෙමේ ර
න්වන් පුෂ්පයෙකි හෝ රන්වන් වස්ත්‍ර
යෙකි හෝ රන්සිරියෙල් මනොශිලාදි
රන්වන්ධාතුවෙක හෝ නිමිත්ත ග්‍රහ
ණය කරන්නේයි එහෙයින් මේ පීත
කසිණයෙහිද පූර්වජාතියෙහි පීතකසි
ණ භාවනාකළවිරූ පිණැතිතාහුට
එබඳුවූ කිණිහිරිආදී මල්පිපිනයක්
හෝ මල්පුදනතැනක අතුරණලද
මල් ඇතිරියක් හෝ රන්වන් වස්ත්‍ර
සිරියෙල් මනොශිල ආදී ධාතුවර්ණ
යක් හෝ දුටුකම චිත්තගුත්තස්ථවිරය
න්වමෙන් නිමිත්ත උපදනේයි ඒ ආ
යුෂ්මත් චිත්තගුත්තස්ථවිරයන් වහන්
සේට සිතුල්පව් විහාරයෙහි පතැගී
මලින් අතුට පුදනලද මල්අස්නක්
දුටුමෙන් ඒ දුටුව හා සමග ඒ මල්
අස්න පමණට කසිණනිමිත්ත උපන්
නේය පූර්වජාතියෙහි පීතකසිණ භාව
නාව පුරුදු නොකළවිරූ යොගාවචර
යා විසින් කිණිහිරි ආදී රන්වන් මලි
න්හෝ රන්වන්වස්ත්‍රයෙන් හෝ රන්
සිරියෙල් මනොශිලාදී රන්වන්ධාතුව
කින්හෝ නීලකසිණයෙහි කී නියායෙ
න් කසිණමණ්ඩලය කොට "පීතකං පී
තකංයි" මනස්කාර පැවැත්විය යුත්
තේහි සෙසු උද්ග්‍රහ ප්‍රතිභාගනිමිත්තා
දිය වැටහීම හා ධ්‍යානයන්ගේ ඉපදී
මද නීල කසිණයෙහි ආ නියායෙන්
දතයුතුයි ——

## පීතකසිණයයි.

—•—

පා † )

ලොහිතකසිණෙපි එසෙවනයො
වුත්තං හෙතං ලොහිතකසිණං උග්ග
ණ්හන්තො ලොහිතකස්මිං නිමිත්තං
ගණ්හාති පුප්ඵස්මිං වා වත්ථස්මිං වා
වණ්ණධාතුයා වාති තස්මා ඉධාපි ක
තාධිකාරස්ස පුඤ්ඤවතො තථා රූපං
බන්ධුජීවකාදි මාලාවච්ඡං වා පුප්ඵ
සන්ථරං වා ලොහිතකවත්ථමණිධාතූ
නං වා අඤ්ඤතරං දිස්වාව නිමිත්තං
උප්පජ්ජති ඉතරෙන ජයසුමන බන්ධු
ජීවකරත්තකරණ්ඩකාදී පුප්ඵෙහි වා,
රත්තවත්ථෙන වා ධාතුනාවා නීලකසි
ණෙ වුත්තනයෙනෙව කසිණං කත්වා
"ලොහිතකං ලොහිතකන්ති" මනසි
කාරො පවත්තෙතබ්බො, සෙසං තාදිස
මෙවාති——

## ලොහිතකසිණං.

——oo——

( ස † )

ලොහිතකසිණෙපි, ලොහිතකසි
ණයෙහිද ....පෙ.... බන්ධුජීවක බඳුවද;
ජයසුමන, වදමල්; රත්තකරණ්ඩකා
දිකි පුෂ්පයෙකි වා, රන්කරඹුආදි මලින්
හෝ; රත්තවත්ථෙන වා, රත් වස්ත්‍ර
යෙන් හෝ; ධාතුනා වා (සුවහුරු
දුහිගුල් ආදී) ධාතුවෙන් හෝ ....පෙ....

## ලොහිතකිසුණි.

——oo——

( භා † )

ලොහිතකසිණයෙහිද මෙම ක්‍රම
ය වන්නේයි—මේ කියනලද්දේමැයි
අවුවාදෙහි ලොහිත කසිණය උගන්
නා මහණ තෙමේ ලොහිතක සඞ්ඛ්‍යා
තරක්ත වර්ණයෙහි නිමිත්ත ග්‍රහ
ණය කරන්නේයි රක්තවර්ණ
පුෂ්පයෙක හෝ රක්තවස්ත්‍රයෙක
හෝ රක්තවර්ණ ධාතුයෙක හෝ
නිමිත්තග්‍රහණය කරන්නේයි එහෙ
යින් මේ ලොහිත කසිණයෙහිද
පූර්වජාතියෙහි ලොහිතකසිණ භාව
නාව පුරුදුකළ විරූපිණැති යොගා

වචරයාහට එසේ රක්ත වර්ණ බඳු වද ආදි මල්පිපිනක් හෝ රතුමල් ඇතිරියක් හෝ රක්ත වස්ත්‍ර ලෝහිත ධාතුවර්ණයක සුවංගුරු, දැහිගුල් ආදි රක්තවර්ණ වස්තූන් අතුරෙන් එක්තරා එකක් හෝ දකීමෙන්ම නිමිත්ත උපදනේයි පෙරකරණලද ලෝහිතකසිණභාවනාවය පින් නැත්තහු විසින් බඳුවද රත්කරඹු ආදි රක්තපුෂ්පයෙන් හෝ රක්තවස්ත්‍රයෙන් හෝ සුවංගුරු දැහිගුල්ආදි රක්තවර්ණධාතුවෙන් හෝ නීලකසිණයෙහි කියනලද නයින්ම කසිණමණ්ඩලයක් කොට ලෝහිතකය ලෝහිතකයයි මනසිකාර පැවැත්විය යුත්තේයි ඉක්බිත්තෙන් යටකීනයින් උද්ග්‍රහප්‍රතිභාග නිමිත්තයන්ද උපචාරධ්‍යාන චතුෂ්ක පඤ්චක ධ්‍යානයන්ද ක්‍රමයෙන් ලබන්නේයයි දතයුතු.

## ලෝහිතකසිණයයි.

—— ○○ ——

( පා ‡ )

ඔදාතකසිණෙපි ඔදාතකසිණං උග්ගණ්හන්තො ඔදාතස්මිං නිමිත්තං ගණ්හාති පුප්ඵස්මිං වා වත්ථස්මිං වා වණ්ණධාතුයං වාති වචනතො කතාධිකාරස්ස තාව පුඤ්ඤවතො තථා රූපං මාලාගච්ඡං වා වස්සිකසුමනාදි පුප්ඵසන්ථරං වා කුමුදපදුමරාසිං වා ඔදාතවත්ථධාතූනං වා අඤ්ඤතරං දිස්වා ව නිමිත්තං උප්පජ්ජති තිපුමණ්ඩලරජතමණ්ඩලචන්දමණ්ඩලෙසුපි උප්පජ්ජතියෙව ඉතරෙන වුත්තප්පකාරෙහි ඔදාතපුප්ඵෙහි වා ඔදාතවත්ථෙන වා ධාතුනා වා නීලකසිණෙ වුත්තනයෙනෙව කසිණං කත්වා "ඔදාතං ඔදාතන්ති" මනසිකාරෙ පවත්තෙතබ්බො සෙසං තාදිසමෙවාති.

## ඔදාතකසිණං.

—— ○○ ——

( ස ‡ )

ඔදාතකසිණෙපි, අවදාතකසිණයෙහිද.—පෙ.—වස්සිකසුමනාදි, ඉද්ද දසමන් ආදීවූ; පුප්ඵසන්ථරං වා, මල් ඇතිරියක් හෝ; කුමුදපදුමරාසිං වා, හෙළැඹුල හෙළපියුම රැසක් හෝ; ඔදාතවත්ථ, සුදුපිළි; ධාතූනං (මකුල් ආදී) ධාතූන්ගේ; අඤ්ඤතරං දිස්වා, එක්තරාඑකක් දැක; තිපුමඩල, හෙල තුඹමඩුලු; රජතමණ්ඩල, රිදීමඩුලු; චන්දමණ්ඩලෙසුපි, සඳමඩුලු යන මේහිදු, උප්පජ්ජතියෙව, උපදිමැයි; ඉතරෙන; අකෘතාධිකාරයා විසින්; වුත්තප්පකාරෙහි, කියනලද ප්‍රකාර ඇති.—පෙ.—

## ඔදාතකසිණ.

—— ○○ ——

( හා ‡ )

අවදාතකසිණයෙහිදු අවදාතකසිණය උගන්නා මහණ තෙමේ සුදුපැහැයෙහි නිමිත්ත ගන්නේය ශ්වේතපුෂ්පයක හෝ ශ්වේත වස්ත්‍රයක හෝ ශ්වේත වර්ණ ධාතුවක හෝ නිමිත්ත ගන්නේයයි අටුවායෙහි කී බැවින් පූර්වජාතියෙහි අවදාතකසිණ භාවනාව පුරුදු කළ විරූ පිණැති යෝගාවචරයාහට පළමුකොට එබඳුවූ වතසුදු ආදි සුදු මල්පිපි ගියගසක් හෝ දෙඹුදු දසමන් ආදී මල් ඇතිරියක් හෝ හෙලැඹුල් හෙල පියුම් රැසක් හෝ සුදුපිළි මකුල්ආදී ධාතූන්ගෙන් එක්තරා ශ්වේතවර්ණ ද්‍රව්‍යයක් හෝ දකීමෙන්ම නිමිත්ත උපදනේය එපරිද්දෙන්ම සුදු ඊයම් මඬුලුය රිදී මඬුලුය සඳමඬලය යනාමෙකී තන්හිදු නිමිත්ත උපදනේය පෙර කළ විරූ පින් නැත්තහු විසින් යටකියන ලද ප්‍රකාර ඇත්තාවූ වත සුදු දෙඹුදු දසමන් ඈතොද හෙලැඹුල් හෙලපියුම් ආදී සුදුමලින් හෝ සුදුපිළියෙන් හෝ හුණුමකුල් ආදී ශ්වේතවර්ණ

ධාතුවකින් හෝ නීලකසිණයෙහි කීය ලද නයින් මකසිණමණ්ඩලයකොට සිඳලූ විධි සපයා ඔදාතය "ඔදාතය" යි මනසකාර පැවැත්විය යුත්තේයි ඉක්බිති යටකියපාලද ක්‍රමයෙන් උද්ග්‍රහ ප්‍රතිභාග නිමිත්තයන්ද උපචාරධ්‍යාන චතුෂ්ක පඤ්චකධ්‍යානයන්ද ලබන්නේයි ——

## අවදාතකසිණයයි.

—— ०० ——

( පා ‡ )

ආලෝකකසිණෙ පන ආලෝකකසිණං උග්ගණ්හන්තො ආලොකස්මිං නිමිත්තං ගණ්හාති භිත්තිච්ඡිද්දෙ වා තාලච්ඡිද්දෙ වා වාතපානන්තරිකාය වා තස්මා කතාධිකාරස්ස තාව පුඤ්ඤවතො යං භිත්තිච්ඡිද්දාදීනං අඤ්ඤතරෙන සුරියාලොකො චන්දාලොකො වා පවිසිත්වා භිත්තියං වා භූමියං වා මණ්ඩලං සමුට්ඨාපෙති ඝන පණ්ණරුක්ඛසාඛන්තරෙන වා ඝන සාඛාමණ්ඩපන්තරෙන වා නික්ඛමිත්වා භූමියමෙව මණ්ඩලං සමුට්ඨාපෙති තං දිස්වා නිමිත්තං උප්පජ්ජති ඉතරෙනාපි තදෙව වුත්තප්පකාරං ඔභාසමණ්ඩලං "ඔභාසො ඔභාසොති" වා "ආලොකො ආලොකොති" වා භාවෙතබ්බං තථා අසක්කොන්තෙන ඝටෙ දීපං ජාලෙත්වා ඝටමුඛං පිදහිත්වා ඝටෙ ඡිද්දං කත්වා භිත්තිමුඛං ඨපෙතබ්බං තෙන ඡිද්දෙන දීපාලොකො නික්ඛමිත්වා භිත්තියං මණ්ඩලං කරොතිතං "ආලොකො ආලොකොති" භාවෙතබ්බං ඉදං ඉතරෙහි චිරට්ඨිතිකං හොති ඉධ උග්ගහනිමිත්තං භිත්තියං වා භූමියං වා උට්ඨිත මණ්ඩලසදිසමෙව හොති පටිභාගනිමිත්තං ඝන විප්පසන්න ආලොකපුඤ්ජසදිසං සෙසං තාදිසමෙවාති ——

## ආලෝකකසිණං.

—— ०० ——

( ස ¶ )

ආලෝකකසිණෙ පන, ආලෝකකසිණයෙහි වනාහි — පෙ — භිත්තිච්ඡිද්දෙ වා, බිත්තක්සිදුරෙහි හෝ; තාලච්ඡිද්දෙ වා, කෙසිවිද හෝ; වාතපානන්තරිකායවාති වචනතො, කවුළුවෙදුර හෝයි වදළබැවින්; කතාධිකාරස්ස, කෘතාධිකාර ඇති; පුඤ්ඤවතො, පිණැත්තහුට; සුරියාලොකො වා, සූර්‍ය්‍යාලෝකය හෝ; චන්දාලොකො වා, චන්ද්‍රාලෝකය හෝ; භිත්තිච්ඡිද්දාදීනං අඤ්ඤතරෙන, බිත්තක් සිදුරු ආදීන් කෙරෙන් එක්තරා එකෙකින්; පවිසිත්වා, වැද; භිත්තියං වා, බිත්තකවත්; භූමියං වා, බිමවත්; යං මණ්ඩලං සමුට්ඨාපෙති, යම් මඬුල්ලක් කෙරේද; ඝන පණ්ණරුක්ඛසාඛන්තරෙන වා, ඝනවූ පත්ඇති වෘක්ෂශාඛා යාවෙති සාඛා අතුරෙන් හෝ; ඝන සාඛාමණ්ඩපන්තරෙන වා, ගණකොට සාඛාවෙන් සෙවූ හොලමඩුයෙහි සිදුරෙන් හෝ; නික්ඛමිත්වා, නික්ම; භූමියමෙව, භූමියෙහිම; මණ්ඩලං සමුට්ඨාපෙති, මඬුලු කෙරේද; තං දිස්වා, ඒ දුක; නිමිත්තං උප්පජ්ජති, නිමිත් උපදී; ඉතරෙනාපි, අකෘතාධිකාරයා විසිනුදු; තදෙව වුත්තප්පකාරං ඔභාසමණ්ඩලං, එම වූකතප්‍රකාරවූ අවභාෂ මඬුල්ල; ඔභාසො ඔභාසොති වා, ඔභාසො ඔභාසොයි කියා හෝ; ආලොකො ආලොකොති වා, ආලොකො ආලොකොයි–කියා හෝ; භාවෙතබ්බං, බැවියයුතු; තථා අසක්කොන්තෙන (ඒ මඬුලු නොබෝකල් සිටී නාබැවින්) එසේ නිමිත්ත උපදවනු වහට නොපොහොසත් විසින්; ඝටෙ දීපං ජාලෙත්වා, කළයෙහි පහණක්දල් වා; ඝටමුඛං පිදහිත්වා, කළමුඛය වසා; ඝටෙ ඡිද්දං කත්වා, කළයෙහි සිදුරු කොට, භිත්තිමුඛං ඨපෙතබ්බං, භිත්ති

යට අභිමුඛකොට තිබියයුතු; තෙන ඡිද්දෙන, ඒ සිදුරෙන්; දීපාලොකො නික්ඛමිත්වා, පහන්ආලොකය නික්ම; භිත්තියා මණ්ඩලං කරොති, බිතක මඩුලු කෙරේද; තං, ඒ; ආලොකො ආලොකොති භාවෙතබ්බං, ආලොකය ආලොකයයි බැවියයුතු; ඉදං, මේ; ඉතරෙහි, සෙස්සන්ට වඩා; චිරට්ඨිතිකං හොති, කලක් සිටුනේ වේ; ඉධ, මෙහි; උග්ගහ නිමිත්තං, උද්ග්‍රහනිමිත්තය; භිත්තියං වා භූමියංවා උට්ඨිත මණ්ඩල සදිස මෙව හොති, බිත්තෙහි බිමෙහි නැගී මඩුලුවැනිවේ; පටිභාග නිමිත්තං, ප්‍රතිභාග නිමිත්තය; ඝන, ගනවූ; විප්පසන්න (ගනබැවින්) ප්‍රසන්නවූ; ආලොකපුඤ්ජසදිසං, ආලොකපුඤ්ජයක් වැනිවේ; සෙසං, සෙස්ස; නාදිසමෙව, යටකීබඳුමැයි.

## ආලොකකසිණ.

—⚬⚬—

( භා ¶ )

ආලොක කසිණයෙහි වනාහි ආලොක කසිණය උගන්නා මහණ තෙමේ ආලොකයයි නිමිත්ත ගන්නේය බිත්තක් සිදුරෙක හෝ කෙසිවිදෙක හෝ කවුළුදොරක හෝ නිමිත්ත ගන්නේ යයි වදළ හෙයින් පළමුකොට පූර්වාභ්‍යාසති ආලොකකසිණ භාවනාකළ විරූ පිණැති යොගාවචරයාහට බිත්තක් සිදුරකින් හෝ කෙසිවිදකින් හෝ කවුළුදොරකින් හෝ ඉරුරැස්වන් සඳරැස්වන් ඇතුළට වැද තිබෙන හෝ බිම හෝ යම් වටවූ ආලොක මඬුල්ලක් කෙරේද ගන පත් ඇති රුක් සෙවනෙහි ශාඛා අතරතුරෙන් හෝ ගනකොට ශාඛායෙන් සෙවිලිකළ කොලොඩුයෙහි සිදුරකින් හෝ ඉරුරැස් සඳරැස් ආදිය නික්ම භූමියෙහිමඩුලුකෙරේද ඒ ආලොකමණ්ඩලය දුක නිමිත්ත උපදනේයි පෙරපුරුකළවිරූ භාවනාමිය පින්නැති යොගාවචරයා ඒසිදුරු කියනලද ප්‍රකාර ඇත්තාවූ ආලොකමණ්ඩලය ‘ඔභාසො ඔභාසො’ කියා හෝ “ආලොකො ආලොකො” කියා හෝ භාවනා කටයුතුයි ඒ සිදුරු ආදියෙන් වැටෙන ආලොකමණ්ඩලය බොහෝකල් නොසිටිනා බැවින් එහි නිමිත්ත උපදවන්නට නොපිළිවන් යොගාවචරයා විසින් කළයෙක පහණක්දල්වා කළ මුවවසා කළයෙහි සිදුරක්කොට ඒ සිදුරෙන් භිත්තියෙහි ආලොකය වැදගන්නාපරිදි කළසිදුර භිත්තියට අභිමුඛකොට තැබියයුත්තේය ඒ කළසිදුරෙන් පහන් ආලොකය නික්ම බිත්තියෙහි යම්ආලොකමණ්ඩලයක්කෙරේද ඒ ආලොකමණ්ඩලය‘ආලොකො ආලොකොයි”භාවනා කටයුත්තේයි මේ කළයෙහි පහණදල්වා කරණ කසිණමණ්ඩලය සෙසුබිතක් සිදුරු ආදියෙන් වැටෙන ආලොකමණ්ඩලයට වඩා කල්නොසෙලී සිටිනේවෙයි මෙහි උපදනා උද්ග්‍රහනිමිත්තය බිත්තියෙහි හෝ බිම හෝ නැගී ආලොකමණ්ඩලය වැනිවම වැටහෙන්නේයි එයින් උපදනා ප්‍රතිභාග නිමිත්තය ගනබැවින් ප්‍රසන්නවූ ආලොකකදම්බයක්මෙන් වැටහෙන්නේයි ඉක්බිත්තෙන් උපචාරධ්‍යාන චතුෂ්ක පඤ්චක ධ්‍යානයන් පෙරකී නයින්ම ලබන්නේයි.

## ආලොකකසිණයයි.

—⚬⚬—

( පා * )

පරිච්ඡින්නාකාසකසිණෙපි ආකාසකසිණං උග්ගණ්හන්තො ආකාස සම්මිං නිමිත්තං ගණ්හාති භිත්තිච්ඡිද්දෙවා තාලච්ඡිද්දෙ වා වාතපානන්තරිකායවාති ඒවංහෙතා කතාධි

කාරස්ස තාව පුඤ්ඤවතො භිත්තිවිවරාදීසු අඤ්ඤතරං දිස්වා ව නිමිත්තං උප්පජ්ජති ඉතරෙන සුච්ඡන්න මණ්ඩපෙ වා චම්මකටසාරකාදීනං වා අඤ්ඤතරස්මිං විදත්ථිචතුරඞ්ගුලප්පමාණං ඡිද්දං කත්වා. තදෙව වා භිත්තිච්ඡිද්දාදිභෙදං ඡිද්දං ආකාසො ආකාසොති භාවෙතබ්බං ඉධ උග්ගහනිමිත්තං සද්ධිං භිත්තිපරියන්තාදීහි ඡිද්දසදිසමෙව හොති වඩ්ඪියමානම්පි න වඩ්ඪති පටිභාගනිමිත්තං ආකාසමණ්ඩලමෙව හුත්වා උපට්ඨාති වඩ්ඪියමානඤ්ච වඩ්ඪති සෙසං පථවීකසිණෙ වුත්තනයෙනෙව වෙදිතබ්බන්ති.

## පරිච්ඡින්නාකාස කසිණං

( ස * )

පරිච්ඡින්නාකාස කසිණෙපි, පරිච්ඡින්නාකාස කිසුණෙහිදු ... පෙ ... සුච්ඡන්නමණ්ඩපෙ වා, ගහකොට සෙවූ මඩුයෙහි හෝ; චම්මකටසාරකාදීනං අඤ්ඤතරස්මිං, සම් හුණ පැදුරු ආදීන් කොරෙන් හෝ එක්තරා එකෙක්හි; විදත්ථි චතුරඞ්ගුලප්පමාණං ඡිද්දං කත්වා, එක්වියත් සතරඟුල් පමණ සිදුරක් කොට; තදෙව වා භිත්තිච්ඡිද්දාදි භෙදං ඡිද්දං, එම බිතක් සිදුරු ආදි සිදුරක් හෝ; ආකාසො ආකාසොති භාවෙතබ්බං, ආකාසය ආකාසයයි බැවියයුතු; ඉධ, මෙහි; උග්ගහනිමිත්තං, උද්ග්‍රහනිමිත්තය; සද්ධිං භිත්ති පරියන්තාදීහි, භිත්තිපරියන්තාදීන් හා සමග (ආදිග්‍රහණයෙන් භිත්තිපරිච්ඡේදයෙහි කඩතැන් පැළුනුතැන් ගැණේ) ඡිද්දසදිසමෙව හොති, සිදුරුම වැනිවේ; වඩ්ඪියමානම්පි න වඩ්ඪති, වඩනාලබන්නේද නොවඩී (මෙයින් උද්ග්‍රහනිමිත්තයම නොවඩනාසේ කීවෙත් භාවනාව දුර්වල බැවින් සියලුව උද්ග්‍රහනිමිත්තය වඩනුලබන්නේද නොවඩතේ වැයි) පටිභාගනිමිත්තං, ප්‍රතිභාගනිමිත්; ආකාසමණ්ඩලමෙව හුත්වා, අහස්මඬුලුවම; උපට්ඨාති, වැටහේ; වඩ්ඪියමානඤ්ච, වඩනුලබන්නේද; වඩ්ඪති, වඩී; සෙසං, සෙස්ස; පථවීකසිණෙ වුත්තනයෙනෙව, පඨවිකසිණෙහි කී නයින්ම; වෙදිතබ්බන්ති, දතයුත්තේයි.

## පරිච්ඡින්නාකාස කිසුණී.

( භා * )

ආකාසකසිණයෙහිද ආකාසකසිණ යැයි ගත්හා යොගාවචර මහණතෙම වෙත්කරණලද ආකාසයෙහි නිමිත්ත ග්‍රහණය කරන්නේය බිතක් සිදුරෙක හෝ කෙසිවිදෙක හෝ කවුළුදොරක හෝ පිරිසිදීහාලද ආකාසයෙහි නිමිත්ත ගන්නේයයි වදලබැවින් පළමුකොට පූර්වජාතියෙහි කරණලද ආකාසකසිණ භාවනාමය පිණැති යොගාවචරයාහට බිතක්සිදුරු ආදීන් අතුරෙන් එක්තරා සිදුරක් දකම නිමිත්ත උපදනේය පෙර කරණලද භාවනාමය පින් නැති යොගාවචරයා විසින් ගහකොට සෙවිලි කරණලද මණ්ඩපය සෙවෙනියෙක හෝ ගෙරිස මකහෝ හුණපැලැලෙක හෝ එක්වියත් සතරගුල්පමණ වටසිදුරක්කොට එමසිදුර හෝ බිතක් සිදුරු ආදි යම් සිදුරක් හෝ බලාහිද ආකාසය ආකාසයයිභාවනා කටයුතුයි, මෙසේ භාවනා වඩන්නාවූ යොගාවචරයා හට මේහිඋපදනා උද්ග්‍රහනිමිත්තය ඒ බිතක්සිදුරු ආදියෙහි කඩතැන් පැළුනුතැන් හා සමග සිදුරට සමානවම වැටහෙන්නේයි.

වේ උද්ග්‍රහ නිමිත්ත වඩනු ලබන්නේ ද භාවනාව දුර්වල බැවින් නොවැඩී නේමැයි එතකුදුවුවත් එයින් උපද නා ප්‍රතිභාග නිමිත්ත ආකාස මණ්ඩ ලයක් වැනිවම වැටහෙන්නේයි වඩ නු ලබන්නේද නැමිහිනාත් මහත්ව වැඩෙන්නේයි. ඉක්බිත්තෙන් උපචා රධ්‍යාන චතුෂ්ක පඤ්චකධ්‍යානයන් පෘථිවිකසිණයෙහි ආනයින්ම ලබත් තේයයි දතයුත්තේයි.

## ආකාස කසිණයයි.

---

( පා † )

ඉති කසිණානි දසබලො
දස යානි අවොච සබ්බධම්මදස්සී
රූපාවචරම්හි චතුක්ක
පඤ්චකජ්ඣාන හෙතූනි ....
එවං තානි ච තෙසඤ්ච
භාවනානය මිමං විදිත්වා න
තෙසෙවව අයං ඤෙය්‍යො
පකිණ්ණක කථාපි විඤ්ඤෙය්‍යා ....

ඉමෙසු හි පඨවිකසිණවසෙන එකොපි හුත්වා බහුධා හොතීති ආදිභාවො ආකාසෙ වා උදකෙ වා පඨවිං නිම්මිනිත්වා පදසා ගමනං ඨාන නිසජ්ජාදි කප්පනං වා පරිත්ත අප්පමාණ නයෙන අභිභායතන පටිලාභොති එවමාදීනි ඉජ්ඣන්ති .... ආපොකසිණවසෙන පඨවියං උම්මුජ්ජනං නිමුජ්ජනං උදක වුට්ඨි සමුප්පාදනං නදීසමුද්දාදි නිම්මානං පඨවි පබ්බත පාසාදාදීනං කම්පනන්ති එවමාදීනි ඉජ්ඣන්ති .... තෙජො කසිණවසෙන ධූපායනා පජ්ජලනා අඞ්ගාරවුට්ඨි සමුප්පාදනං තෙජසා තෙජො පරියාදානං යදෙව ඉච්ඡති තස්ස දහනසමත්ථතා දිබ්බෙන චක්ඛුනා රූපදස්සනත්ථාය ආලොකකරණං පරිනිබ්බාන සමයෙ තෙජොධාතුයා සරීර ඣාපනන්ති එවමාදීනි ඉජ්ඣන්ති වායො කසිණවසෙන වායුගති ගමනං වාතවුට්ඨි සමුප්පාදනන්ති එවමාදීනි ඉජ්ඣන්ති .... නීලකසිණවසෙන නීලරූප නිම්මාණං අන්ධකාරකරණං සුවණ්ණදුබ්බණ්ණනයෙන අභිභායතන පටිලාභො සුභවිමොක්ඛාධිගමොති එවමාදීනි ඉජ්ඣන්ති .... පීතකසිණවසෙන පීතරූප නිම්මාණං සුවණ්ණන්ති අධිමුච්චනා වුත්තනයෙනෙව අභිභායතන පටිලාභො සුභවිමොක්ඛාධිගමො චාති එවමාදීනි ඉජ්ඣන්ති .... ලොහිතකසිණවසෙන ලොහිතක රූපනිම්මාණං වුත්තනයෙනෙව අභිභායතන පටිලාභො සුභවිමොක්ඛාධිගමොති එවමාදීනි ඉජ්ඣන්ති .... ඔදාතකසිණවසෙන ඔදාතරූප නිම්මාණං ථිනමිද්ධස්ස දූරභාවකරණං අන්ධකාරවිධමනං දිබ්බෙන චක්ඛුනා රූපදස්සනත්ථාය ආලොකකරණන්ති එවමාදීනි ඉජ්ඣන්ති ....

ආලොකකසිණවසෙන සප්පභා රූපනිම්මාණං ථිනමිද්ධස්ස දූරභාව කරණං අන්ධකාරවිධමනං දිබ්බෙන චක්ඛුනා රූපදස්සනත්ථං ආලොකකරණන්ති එවමාදීනි ඉජ්ඣන්ති .... ආකාසකසිණවසෙන පටිච්ඡන්නානං විවටකරණං අන්තො පඨවි පබ්බතාදිසු පි ආකාසං නිම්මිනිත්වා ඉරියාපථ කප්පනං තිරොකුඩ්ඩාදිසු අසජ්ජමානගමනන්ති එවමාදීනි ඉජ්ඣන්ති ....

---

( ස † )

ඉති, මෙසේ, සබ්බධම්මදස්සී දසහ, සිය එ දහම් දක්නාවූ; දසබලො, දසබල තෙම; රූපාවචරම්හි, රූපාවචරයෙහි; චතුක්ක පඤ්චකජ්ඣාන හෙතූනි, චතුෂ්ක පඤ්චකධ්‍යාන හේතුවූ (මෙයින් ලොවූ අරා චතුෂ්ක පඤ්චකධ්‍යානයන් ගණ්වා වෙත්) යානි දසකසිණානි අවොච, යම් දසකසිණයක් කො

ගොත් කීද; තානිව, ඒ කිසුණන්ද;
පෙසසඳුව ඉමං භාවනාභාගං, චතුෂ්ක
පඤ්චකධ්‍යානයාගේ හෝ මේ භාවනා
ක්‍රමයද; එවං විදිත්වාන, මෙසේ දැන;
තෙසේව, ඒ දසකිසුණන් කෙරෙහි
ම; භියෙයා, හැවත; අයං පකිණ්ණක
කථාපි, මේ ප්‍රකීර්ණක කථාද; වි
ඤ්ඤෙය්‍යා, දතයුත්තීයි.

ඉමෙසුහි, මේ කිසුණන් කෙරෙහි;
පඨවිකසිණවශෙන, පඨවිකිසුණු විසි
න්; එකොපි හුත්වා බහුධා හොතීති
ආදිභාවො, එකෙකුව බොහෝ ප්‍රකාර
වෙයි යනාදි බවය; ආකාසෙවා උද
කෙවා පඨවිං නිම්මිණිත්වා, අහස හෝ
දියෙහි හෝ පොළෝ නිමවා; පදසා
ගමනං, ඒ පොළෝපිට පයින් යාමය;
ඨානනිසජ්ජාදි කප්පනංවා, ඒ පොළ
ව සිටුනා හිඳුනා ඉරියවු කිරීමය; පරි
ත්ත අප්පමාණනයෙන, පරිත්තය අප්‍ර
මාණය යන නයින්; අභිභායතන ප
ටිලාභොති (නිමිත්තොත්පත්තිය හා
සම්ගම වන) අභිභායතනයන්ගේ පි
ළි ලැබීමය යන; එවමාදයො ඉජ්ඣ
න්ති, මේ ආදීහු සිඩවේත් (ප්‍රතිභාග
නිමිත්තොත්පත්තීන් මතු දෙවන තු
න්වන ජවන වීථියෙහි හෝ සතරව
න පස්වන වීථියෙහි හෝ උපදවනල
ද ධ්‍යානයට අභිභායතන සංඥයයි ද
තයුතු) ආපොකසිණවශෙන, ආපො
කසිණ වශයෙන්; පඨවියං, පොළව;
උම්මුජ්ජනං, නැගීමය; නිමුජ්ජනං, කි
මිදීමය; උදකාවුට්ඨි සමුප්පාදනං, ජල
වෘෂ්ටි ඉපදවීමය; නදී සමුද්‍රාදී නිම්මා
ණං, නදිය සමුද්‍රය යනාදීන්ගේ නිර්මා
ණය; පඨවි පබ්බත පාසාදාදීනං කම්ප
නානි, පෘථිවිය පර්වතය ප්‍රාසාදය යනා
දීන්ගේ චලනයද; එවමාදිනී, මේ ආ
දීහු; ඉජ්ඣන්ති, සිඩවේත් (ආදිග්‍රහණි
න් ශරීරයෙන් උදකධාරානිර්මාණාදී
හු ගැණේ) තෙජොකසිණ වශෙන,
තෙජොකිසුණු විසින්; ධූපායනා, දුම
න බවය; පජ්ජලනා, දිලීමය; අඞ්ගා
රවුට්ඨි සමුප්පාදනං, අඞ්ගාරවෘෂ්ටි ඉපද
වීමය; තෙජසා තෙජො පරියාදනං,
තමාගේ තෙජසින් අනිකාගේ තෙජ
ස සංයකරණ බවය; යදෙව ඉච්ඡති
(කපු පුළුන් සාරදරු ආදීන් එක්කො
ට රැස්ව තිබුකල) යමක් යමක් දවනු
කැමතිද; තස්ස දහනසමත්ථතා, ඒ ඒ
වස්තුහුම දවන්ට සමර්ථ බවය; දිබ්බ
න චක්ඛුනා, දිව්‍යඇසින්; රූපදස්සන
ත්ථාය, රූප දක්නා පිණිස; ආලොක
කරණං, ආලොක කිරීමය; පරිනිබ්බා
න සමයෙ, පිරිනිවන සමයෙහි; තෙ
ජො ධාතුයා සරීරඣාපනානි, තෙ
ජොධාතු විසින් සිරුරු දැවීමයයි යන;
එවමාදිනී, මේ ආදීහු; ඉජ්ඣන්ති, සිඩ
වේත් (ආදිග්‍රහණින් අන්ධකාර විධම
නාදිය සංග්‍රහ වේ) වායොකසිණ ව
සෙන, වායුකිසුණු විසින්; වායුගතිග
මනං, වායු වැනි සීඝ්‍ර ගමනය; වාතවු
ට්ඨි සමුප්පාදනානි, වාතවෘෂ්ටි ඉපැද
වීමය (ආලවකසුත්තන්හි ලෙස් නිර්මිත
වාතමණ්ඩලිකාවේම වාතවුට්ඨි නම්
වේත්) එවමාදීනි, මේ ආදීහු; ඉජ්ඣන්
ති, සිඩවෙත් (ආදි ග්‍රහණින් කැමති
වස්තුවක් දෙශාන්තර ආදී ගෙනයාම් ගැ
ණේ) නීලකසිණවසෙන, නිල් කිසු
ණු විසින්; නීලරූප නිම්මාණං, නිල්
රූ මැවීමය; අන්ධකාරකරණං, අඳුරු
කිරීමය; සුවණ්ණදුබ්බණ්ණනයෙන,
සුවර්ණ දුර්වර්ණ නයින්; අභිභායතන
පටිලාභො, අභිභායතන ධ්‍යාන් පිළි
ලැබීමය; සුභවිමොක්ඛාධිගමො, ශුභ
විමොක්ෂයාගේ අධිගමය යන; එවමා
දීනි, මේ ආදීහු; ඉජ්ඣන්ති, සිඩවේත්;
පීතකසිණ වසෙන, පීතකිසුණු විසි
න්; පීතරූප නිම්මාණං, රන්වන්රූ
නිර්මාණය; සුවණ්ණන්ති අධිමුච්චනා,
සුවර්ණවේවයි ඉටීමය; වුත්තනයෙන
ච, කී සුවර්ණ දුර්වර්ණ නයින්ම;

අභිභායතන පටිලාභො, අභිභායතන ධ්‍යාන් පිළිලැබීමය; සුභවිමොක්ඛාධිගමොවාති, ශුභ විමොක්‍ෂයාගේ අධිගමයද යන; එවමාදීනි ඉජ්ඣන්ති, මේ ආදීහු සිඬවෙත්; ලොහිතකසිණ වසෙන, ලොහිත කිසුණු විසින්; ලොහිතරූප නිම්මාණං, ලොහිත රූපයන්ගේ නිර්මාණය; වුත්තනයෙනෙව, කී නයින්ම; අභිභායතන පටිලාභො, අභිභායතන ධ්‍යාන් පිළි ලැබීමය; සුභවිමොක්ඛාධිගමොති, ශුභ විමොක්‍ෂයාගේ අධිගමය යන; එවමාදීනි ඉජ්ඣන්ති, මේ ආදිහු සිඬවෙත්; ඔදාතකසිණ වසෙන, ඔදාත කිසුණු විසින්; ඔදාතරූප නිම්මාණං, අවදාත රූපනිර්මාණය; ථිනමිද්ධස්ස දූරභාවකරණං, ථිනමිද්ධ දෙදෙනාගේ දුරු බව කිරීමය; අන්ධකාරවිධමනං, අඳුරු නැසීමය; දිබ්බෙන චක්ඛුනා රූපදස්සනත්ථාය, දිවඇසින් රූ දක්නා පිණිස; ආලොකකරණන්ති, ආලොකකිරීමය යන; එවමාදීනි ඉජ්ඣන්ති, මේ ආදීහු සිඬවෙත්; ආලොකකසිණ වසෙන, ආලොක කිසුණු විසින්; සප්පභා රූපනිම්මාණං, ප්‍රභා සහිත රූපනිර්මාණය; ථිනමිද්ධස්ස ...පෙ... ආකාස කසිණ වසෙන, ආකාශ කිසුණු විසින්; පටිච්ඡන්නානං විවටකරණං, මුවහව සිටි වස්තූන්ගේ පහළකිරීමය; අන්තො පථවිපබ්බතාදිසුපි, පෘථිවි පර්වතාදීන්ගේ අතුළත්හිදු; ආකාසං නිම්මිණිත්වා, අහස් නිමවා; ඉරියාපථ කප්පනං, ඉරියවු කිරීමය; තිරොකුඩ්ඩාදිසු, තිරොකුඩ්ඩාදීයෙහි; අසජ්ජමානගමනන්ති, නොපැකිළ යාමය යන; එවමාදීනි, මේ ආදීහු; ඉජ්ඣන්ති, සිඬවෙත් ....

( ගා† )

මෙසේ දශබලධාරිවූ සර්ව ධර්මයන් දක්නා ප්‍රඥා භාග්‍යවතුන්වහන්සේ රූපාවචර ක්‍රමයෙහි චතුෂ්ක පඤ්චකධ්‍යානයන් ඉපදවීමට කාරණවූ යම් දශකසිණ නැමිස්ථාන මෙහෙණෙක් වදාළසේක්ද ඒ දශකසිණයන්ද චතුෂ්ක පඤ්චකධ්‍යානයන්ගේ භාවනාක්‍රමයද කියනලද ක්‍රමයෙන් දැන ඒ දශකසිණයෙහිම නැවතත් මේ මතු කියන ප්‍රකීර්ණක කථාව දතයුතු වේ කෙසේදයත්?

මේ දශකසිණයන් අතුරෙන් පෘථිවිකසිණ වශයෙන් හෙවත් පෘථිවි කසිණයට සම්වැද එකෙක්ව බොහෝ ප්‍රකාරවෙයි යනාදි සෘඬි දක්වීමය අහසෙහි හෝ දියෙහි හෝ පොළව මවා ඒ පොළවෙහි පයින් යාමය ඒ පොළවෙහි සිටීමය හිඳීමය යනාදි ඉරියව් පැවැත්වීමය සවල්පමාත්‍ර වශයෙන් හෝ අප්‍රමාණ වශයෙන් හෝ උපදවාලද ප්‍රතිභාග නිමිත්තයෙන් මතු දෙවන තුන්වන ජවන චිත්තයෙහි හෝ සතරවන පස්වන ජවන චිත්තයෙහි හෝ අභිඥා ආයතන සංඛ්‍යාත ධ්‍යාන ලැබීමය යන මේ ආදිහු සිඬවෙත්මැයි.

ආපොකසිණයට සම්වැදීම් වශයෙන් පොළව පළා පැනනැගීමය පොළව කිමිදීමය ජලවෘෂ්ටි ඉපදවීමය ගඞ්ගා සමුද්‍රාදිය මැවීමය පොළෝ කම්පාකරවීමය පර්වත කම්පාකරවීමය ප්‍රාසාදාදීහු කම්පාකරවීමය යමක ප්‍රාතිහාර්‍ය්‍යයෙහි මෙන් ශරීරයෙන් ජලධාරා ඉපදවීමය යන මේ ආදි ප්‍රාතිහාර්‍ය්‍ය සිඬවෙත්මැයි. තෙජොකසිණයට සම්වැදීම් වශයෙන් දුම් නගින බවය දිලියෙන බවය අඟුරු වෘෂ්ටි ඉපදවීමය තමාගේ තෙජසින් අන්‍යයන්ගේ තෙජස මැඩපවත්වන බවය කපු පුළුන් හර ඇති දර දිය යන මොවුන් එකට රැස් කොට තුබූ තැනින් ඉදින් කපු පුළුන් දවනු කැමතිවීනම් දර නොදවා කපු පුළුන්ම දැවීමට හෝ ඉදින් දර දවනු කැමති වීනම් කපුපුළුන් නොදවා දර

පමණෙක් දුවීමට හෝ මේ ආදි වශයෙන් නමා කැමති දිසාවට දවන්නාව සමර්ථ බවය දිවඇසින් රූප දක්නා පිණිස ආලෝක පැතිරවීමය පිරිනිවන් පෑ කල්හි තෙජොධාතු වශයෙන් ශරීර දැවීමය අඳුරු නැසීමය යන මේ ආදිවූ ප්‍රාතිහාර්‍ය්‍ය සිද්ධවෙත්මැයි වායොකසිණයට සමවැදීම් වශයෙන් වාතවේගය වැනි සීඝ්‍ර ගමන් යාමය ආලොක සූත්‍රයෙහි කී වාතවම්භා වැනි වම්භා ඉපදවීමය කැමති දෙයක් අත් හැතකට යැවීමය යන මේ ආදි ප්‍රාතිහාර්‍ය්‍ය සිද්ධවෙත්මැයි නීලකසිණයට සමවැදීම් වශයෙන් නිල්පැහැ රූප මැවීමය. අන්ධකාරකිරීමය යහපත් වර්ණ නපුරු වර්ණ වශයෙන් උපදවනලද ප්‍රතිභාග නිමිත්තාගෙන් මතු දෙවන තුන්වන සතරවන පස්වන ජවන වීථියෙහි ධ්‍යාන ලැබීමය ශුභවිමොක්ෂයට පැමිණීමය යනාමේ ආදි ප්‍රාතිහාර්‍ය්‍ය සිද්ධවෙත්මැයි පීතකසිණයට සමවැදීම් වශයෙන් පීතවර්ණ රූප මැවීමය රත්රන් වේවයි ඉටීමය යහපත් වර්ණ නපුරු වර්ණ වශයෙන් උපදවනලද ප්‍රතිභාග නිමිත්තාගෙන් මතු දෙවන තුන්වන සතරවන පස්වන ජවන වීථියෙහි ධ්‍යාන ලැබීමය ශුභවිමොක්ෂයට පැමිණීමය යනාමේ ආදි ප්‍රාතිහාර්‍ය්‍ය සිද්ධවෙත්මැයි ලොහිතකසිණයට සමවැදීම් වශයෙන් රක්තවර්ණ රූප මැවීමය ගියනලද ගමනෙහිම යහපත් නපුරු වර්ණ වශයෙන් උපදවනලද ප්‍රතිභාග නිමිත්තාගෙන් මතු දෙවන තුන්වන සතරවන පස්වන ජවන වීථියෙහි ධ්‍යාන ලැබීමය ශුභවිමොක්ෂය ලැබීමය යනාමේ ආදි ප්‍රාතිහාර්‍ය්‍ය සිද්ධවෙත්මැයි අවදාත කසිණයට සමවැදීම් වශයෙන් සුදුවන් රූප මැවීමය පිනම්ධ දෙදෙන දුරුකිරීමය අන්ධකාර නැසීමය දිවැසින් රූප දක්නා පිණිස ආලොක පැතිරවීමය යනාමේ ආදි ප්‍රාතිහාර්‍ය්‍ය සිද්ධවෙත්මැයි ආලොකකසිණයට සමවැදීම් වශයෙන් ආලොකයෙන් බබලනසුළු රූප මැවීමය පිනම්ධ දෙදෙන දුරුකිරීමය අන්ධකාර නැසීමය දිවැසින් රූප දක්නා පිණිස ආලොක පැතිරවීමය යනාමෙ ආදි ප්‍රාතිහාර්‍ය්‍ය සිද්ධවෙත්මැයි. ආකාශකසිණයට සමවැදීම් වශයෙන් පිළිසන්ව තුබූ වස්තූන් පහළකොට දක්වීමය පෘථිවි පර්වතාදීන්ගේ ඇතුළත්හි අහස මවා සක්මන්කිරීම් ආදි ඉරියව්වූ පැවැත්වීමය ඇතුල් බිත්ති ආදියෙහි නොපැකිළ ගෙවන් නොනැවතී යාමය යනාදි ප්‍රාතිහාර්‍ය්‍ය සිද්ධවෙත්මැයි.—

( පා ‡ )

සබ්බාතෙව උද්ධං අධො තිරියං අවයං අප්පමාණන්ති ඉමං පභෙදං ලභන්ති වුත්තානං ගෙහනං පඨවීකසිණමෙකො සඤ්ජානාති උද්ධං අධො තිරියං අවයං අප්පමාණන්ති ආදි තත්ථ උද්ධන්ති උපරිගගනතලාභිමුඛං අධොති හෙට්ඨා භූමිතලාභිමුඛං තිරියන්ති ඛෙත්තමණ්ඩලමිව සමන්තා පරිච්ඡින්දිත්වා එකෙචාහි උද්ධමෙව කසිණං වඩ්ඪෙති එකච්චො අධො එකච්චො සමන්තතො තෙන තෙනවා කාරණෙන එවං පසාරෙති ආලොකමිව දිබ්බචක්ඛුනා රූපදස්සනකාමො තෙනවුත්තං උද්ධං අධො තිරියන්ති අවයන්ති ඉදම්පන එකස්ස අඤ්ඤභාවානුපගමනත්ථං වුත්තං යථාහි උදකං පවිට්ඨස්ස සබ්බදිසාසු උදකමෙව හොති න අඤ්ඤං එවමෙව පඨවීකසිණං පඨවීකසිණමෙව හොති නත්ථි තස්ස අඤ්ඤො කසිණසම්භෙදොති එසනයො සබ්බත්ථ අප්පමාණන්ති ඉදං තස්ස ඵරණං අප්පමාණ

වසෙන වුත්තං තංහි චෙතසා ඵරන්තො සකලමෙව ඵරති න අයමස්ස ආදි ඉදං මජ්ඣන්ති පමාණං ගණ්හාතීති—

( සං‡ )

සබ්බානෙව, සියළු කසිණයෝම; උද්ධං, උඩය; අධො, යටය; තිරියං, සරසය; අද්වයං, දෙකක් නොවෙයි; අප්පමාණන්ති, අප්‍රමාණයයි; ඉමං පභෙදං ලභන්ති, මේ ප්‍රභෙදය ලැබෙත්; වුත්තං හෙතං, කියනලදමැයි; එකො, එකෙක්; පඨවිකසිණං සඤ්ජානාති, පෘථිවිකසුණු (භාවනා සංඥාවෙන්) දනී—පෙ—(ආදි ශබ්දයෙන් "ආපොකසිණං" යනාදී පෙල සංග්‍රහ කෙරෙත්) තත්ථ, ඒ පාලියෙහි; උපරිගගනතලාභිමුඛං, මතුයෙහි ගගනතලයට අභිමුඛකොට; හෙට්ඨා භූමිතලාභිමුඛං, යට භූමිතලයට අභිමුඛකොට; ඛෙත්තමණ්ඩලමිව, ක්ෂෙත්‍ර මණ්ඩලයක්මෙන්; සමන්තා පරිච්ඡින්දිත්වා, හාත්පසින් පිරිසිඳ; එකච්චො හි, එකෙක්; උද්ධමෙව, ඌර්ධ්වාභිමුඛකොටම; කසිණං වඩ්ඪෙති, කසුණු වඩා; එකච්චො, එකෙක්; අධො, යට භූමිතලයට අභිමුඛකොට වඩා; එකච්චො, එකෙක්; සමන්තතො, හාත්පසින් වඩා ("උපරිගගනතලාභිමුඛං පඨවිකසිණමෙකො සඤ්ජානාති" යි පාලි පදයන් ගෙණ අවුත් එම පෙදෙහිම සම්බන්ධ කටයුතු. පූර්වයෙහි කසුණු වඩනකල ප්‍රයෝජනයක් අපෙක්ෂා නොකොට වඩන්නවුන්ගේ වශයෙන් කී හෙයින් දැන් "තෙන තෙන වා කාරණෙන එවං පසාරෙති"යි කීහු ඒ ඒ කාරණයෙන් හෝ "උද්ධං අධො" යනාදි ක්‍රමයෙන් කසුණු පතුරුවයි යන අදහසි) දිබ්බචක්ඛුනා රූපදස්සනකාමො, දිව්‍යචක්ෂුසින් රූප දක්නා කැමැත්තහු; ආලොකමිව, ආලෝකයමෙනි (ඉදින් උඩ රූ දක්නා කැමැත්තේ වීනම් ඌර්ධ්වමුඛකොට ආලෝකය වඩයි යට රූ දක්නා කැමැත්තේ වීනම් යට ආලෝකය වඩයි හාත්පස රූ දක්නා කැමති වීනම් හාත්පස වඩයි මෙසේය) අද්වයන්ති ඉදං පන, අද්වයං යනමේ වනාහි; එකස්ස, එක් කසුණෙක්හුගේ; අඤ්ඤභාවානුපගමනත්ථං, අන්‍යභාවයට නොඑළඹීම පිණිස; වුත්තං, කියනලදී; යථා හි, යම්සේ; උදකං පවිට්ඨස්ස, දියට වන්නහුට; සබ්බදිසාසු, සියළු දික්හිම; උදකමෙව හොති, උදකයම වේද; න අඤ්ඤං, අනිකෙක් නොවේද; එවමෙව, එපරිද්දෙන්ම; පඨවිකසිණං, පෘථිවි කසුණ; පඨවිකසිණමෙව හොති, පෘථිවි කසුණම වේ; තස්ස, ඒ පෘථිවිකසුණයාගේ; අඤ්ඤකසිණසම්භෙදො නත්ථි, ආපොකසිණාදීන් හා සඞ්කර නොවේ මුසු බව නොවේ යන අදහසි) සබ්බත්ථ, සියළු ආපොකසිණාදීන් කෙරෙහි; එසනයො, මෙම නයයි; අප්පමාණන්ති ඉදං, අප්‍රමාණය යනමේ; තස්ස, ඒ කසිණයාගේ; ඵරණ අප්පමාණවසෙන වුත්තං [එක දෙසයක නොසිට අනවශෙෂකොට ස්ඵරණ ප්‍රමාණයක් නොගන්නා හෙයින්) ඵරණය අප්‍රමාණ නම්වෙයි (තද්වශයෙන් කියනලද යන අදහසි) තං, ඒ කසුණ; චෙතසා ඵරන්තො, භාවනා චිත්තයෙන් ආලම්බණකරන්නේ (භාවනා චිත්තය තෙමේ පරිත්තාවූ හෝ විපුලවූ හෝ කසුණ එකක්ෂණයෙහි සියල්ලම මෙනෙහිකෙරෙයි එකදෙසයක් අරමුණු නොකෙරේ එහෙයින්ම "චෙතසා ඵරන්තො සකලමෙව ඵරති"යි කීහු) අයං, මේ තෙම; අස්ස, මේ කසිණයාගේ; ආදි, ආදියය; ඉදං මජ්ඣන්ති, මේ මැදයයි; පමාණං න ගණ්හාති, පමණක් නොගණී—

( භා ‡ )

මේ සියලු දශකසිණයෝම උඩය යටය සරසය අවයය අප්‍රමාණය යන ප්‍රභේදය ලබන්නාහුය එහෙයින් වදාරණලදුයේමැයි. ඇතම් කෙණෙක් උඩ අහස්තලයට අභිමුඛව පෘථිවිකසිණය භාවනා සංඥාවෙන් හඳුනන්නේය ඇතම් කෙණෙක් යට පෘථිවිතලයට අභිමුඛව පෘථිවිකසිණය භාවනා සංඥාවෙන් හඳුනන්නේය ඇතම් කෙණෙක් සරසින් අටදිගට අභිමුඛව පෘථිවිකසිණය භාවනා සංඥාවෙන් හඳුනන්නේය ඇතම් කෙණෙක් දෙකක් නොවන්නාවූ එහෙන් අනික් කසිණයකින් වැහිරගැන්මක් නැත්තාවූ පෘථිවිකසිණය භාවනා සංඥාවෙන් හඳුනන්නේය ඇතම් කෙණෙක් සියලු තන්හි පැතිරීම වශයෙන් අප්‍රමාණවූ පෘථිවිකසිණය භාවනා සංඥාවෙන් හඳුනන්නේය යනාදී නයින් සෙසු ආපොකසිණාදි නවකසිණයෙහින් වෙන්වෙන් වශයෙන් මේ පඤ්චප්‍රකාර භේදය දතයුතු. ඒ දෙශනා පාලියෙහි උඩය යනු මතු අහස්තලයට අභිමුඛව ධ්‍යානය වැඩීමයි යටය යනු පාත භූමිතලයට අභිමුඛව ධ්‍යානය වැඩීමයි සරසය යනු කෙතක ලියද්දක් පිරිසිඳින්නාක්මෙන් හාත්පසින් වෙන්කොට ධ්‍යානය වැඩීමයි ඒ එසේමැයි මේ ලොකයෙහි ඇතම් කෙණෙක් උඩට අභිමුඛවම කසිණ වඩන්නේය ඇතම් කෙණෙක් යට භූමිතලයට අභිමුඛවම කසිණ වඩන්නේය ඇතම් කෙණෙක් හාත්පසින් අට දිගට අභිමුඛවම කසිණ වඩන්නේයි කවර කාරණයක් හෙතුකොටගෙණ මෙසේ කසිණ වඩන්නේදයත්? යම්සේ දිව්‍යබ්‍රහ්ම ලොකාදියෙහිවූ රූප දිවැසින් දක්නා කැමති පුද්ගල තෙම උඩට අභිමුඛව ආලොක කසිණය පතුරුවන්නේවේද යට අටමහා නරකය ආදී ස්ථානයෙහිවූ රූපදක්නා කැමති පුද්ගල තෙම යට භූමිතලයෙහි පතුරුවන්නේවේද හාත්පස අන්‍ය චක්‍රවාලාදියෙහි රූප දිවැසින් දක්නා කැමති පුද්ගල තෙම හාත්පස පතුරුවන්නේවේද එපරිද්දෙන්ම යොගාවචර තෙම ඒ ඒ අධීක කාරණකොටගෙණ ඒ ඒ ආකාරයෙන් කසිණය පතුරුවන්නේයි එහෙයින් උඩය යටය සරසය යන තන්හි කසිණ පතුරුවන්නේයයි වදාළහ. අවයය යනමේ ප්‍රභේදය වනාහි පෘථිවිකසිණාදීන් අතුරෙන් යම්කිසි කසිණයෙක් අන්‍යවූ කසිණභාවයකට නොපැමිණෙන බව දක්වන පිණිස කියනලද්දේයි. යම්සේ දියතුලට වන්නා හට සියලු දිශාවන්හි ජලයම වේද අනිකක් නොවේද එපරිද්දෙන් පෘථිවිකසිණය පෘථිවිකසිණම වන්නේය ඒ පෘථිවිකසිණය ආපොකසිණාදීන් හා මිශ්‍ර නොවන්නේයි සියලු සෙසු කසිණයෙහිත් මේ ක්‍රමය දතයුතු. අප්‍රමාණය යන භේදය ඒ කසිණය එක් ප්‍රදෙශයෙක නොසිට අප්‍රමාණ තන්හි පැතිරෙණ බව දක්වන පිණිස කියනලද්දේයි. එහෙයින්ම අනවශෙෂාර්ථය සඳහා කසිණ නාමය ව්‍යවහාරකරණ ලද්දේයි ඒ කසිණය වනාහි භාවනා චිත්තයෙන් අරමුණුකරන්නාහු කුඩාවූ හෝ මහත්වූ හෝ එකක්ෂණයෙහි සියල්ලම මෙනෙහිකරන්නේයි කසිණයාගේ මේ ආදිය ය මේ මැදයයි ප්‍රමාණයක් නොගන්නේයයි දතයුතු.

( භා ¶ )

යෙච තෙසත්තා කම්මාවරණෙනවා සමන්නාගතා කිලෙසාවරණෙනවා සමන්නාගතා විපාකාවරණෙනවා සමන්නාගතා අසද්ධා අච්ඡන්දිකා දුප්පඤ්ඤා අභබ්බා නියාමං ඔක්කමිතුං කුසලෙසු ධම්මෙසු සම්මත්තං විතානා තෙසං එකස්සපි එකකසිණෙපි

භාවනා න ඉජ්ඣති තත්ථ කම්මාවරණෙන සමන්නාගතාති ආනන්තරිය කම්මසමඞ්ගිනො කිලෙසාවරණෙන සමන්නාගතාති නියතමිච්ඡාදිට්ඨිකා චෙව උභතොබ්‍යඤ්ජනක පණ්ඩකාච විපාකාවරණෙන සමන්නාගතාති අහෙතුක ද්විහෙතුක පටිසන්ධිකා අස්සද්ධාති බුද්ධාදිසු සද්ධාවිරහිතා අච්ඡන්දිකාති අපච්චනීකපටිපදායං ඡන්දවිරහිතා දුප්පඤ්ඤාති ලොකියලොකුත්තර සම්මාදිට්ඨියා විරහිතා අභබ්බා නියාමං ඔක්කමිතුං කුසලෙසු ධම්මෙසු සම්මත්තන්ති කුසලෙසු ධම්මෙසු නියාම සම්මත්තං සඞ්ඛාත සම්මත්තඤ්ච අරියමග්ගං ඔක්කමිතුං අභබ්බාති අත්ථො. නකෙවලඤ්ච කසිණෙසුයෙව අඤ්ඤෙසුපි කම්මට්ඨානෙසු එතෙසං එකස්සාපි භාවනා න ඉජ්ඣති තස්මා විගතවිපාකාවරණෙනාපි කුලපුත්තෙන කම්මාවරණඤ්ච කිලෙසාවරණඤ්ච ආරකා පරිවජ්ජෙත්වා, සද්ධම්මස්සවණසප්පුරිසූපනිස්සයාදීහි සද්ධඤ්ච ඡන්දඤ්ච පඤ්ඤඤ්ච වඩ්ඪෙත්වා, කම්මට්ඨානානුයොගෙ කරණීයොති.

ඉති සාධුජනපාමොජ්ජත්ථාය කතෙ
විසුද්ධිමග්ගෙ සමාධිභාවනාධිකාරෙ
සෙසකසිණනිද්දෙසො නාම

# පඤ්චමො පරිච්ඡෙදො.

( ස 1 )

යෙ වතෙ සත්තා, යම් ඒ සත්ව කෙනෙක් (මින් මතු "වූහු" යනු සායොදනු) කම්මාවරණෙන වා සමන්නාගතා, කර්මාවරණයෙන් හෝ සමන්විතයෝද; කිලෙසාවරණෙන වා සමන්නාගතා (නියත මිච්ඡාදිට්ඨිකාදි) ක්ලේශාවරණයෙන් හෝ සමන්විතයෝද; විපාකාවරණෙන වා සමන්නාගතා (අහෙතුක ද්විහෙතුක විපාකාදි) විපාකාවරණයෙන් හෝ සමන්විතයෝද; අස්සද්ධා (බුද්ධාදීන් කෙරෙහි) සැදැහැ නැත්තෝද; අච්ඡන්දිකා (අප්‍රත්‍යනීක ප්‍රතිපත්තියෙහි) ඡන්ද නැත්තාහුද; දුප්පඤ්ඤා, ලොව්ලොවුතුරු සම්‍යක්දෘෂ්ටි නැත්තාහුද; කුසලෙසු ධම්මෙසු, කුශලධර්මයෙහි; සම්මත්තං, සම්‍යක්ත්වයයි කියනලද; නියාමං, ආර්යමාර්ගයට; ඔක්කමිතුං, පැමිණෙන්නට; අභබ්බාති, නුසුදුස්සෝයයි; වුත්තා, කියනලද්දාහුද; එතෙසං, ඔවුන් කෙරෙන්; එකස්සාපි, එකෙක් හටද; එකකසිණස්සාපි, එක කසුණෙක්හිද; භාවනා න ඉජ්ඣති, භාවනාව සිද්ධ නොවේ; තත්ථ, එහි; කම්මාවරණෙන සමන්නාගතාති, කර්මාවරණයෙන් සමන්වාගතයෝ නම්; ආනන්තරිය කම්මසමඞ්ගිනො, පඤ්චානන්තරිය කර්මයන් කෙරෙහි යම් කිසිවෙකින් සමන්විතවූවෝයි; කිලෙසාවරණෙන සමන්නාගතාති, ක්ලේශාවරණයෙන් සමන්විතයෝ නම්; නියත මිච්ඡාදිට්ඨිකා චෙව, අහේතුක අක්‍රිය නාස්තිකදෘෂ්ටීන් කෙරෙහි එක්තරා දෘෂ්ටියකින් යුක්තවූවෝද; උභතොබ්‍යඤ්ජනක පණ්ඩකා ච, උභය ව්‍යඤ්ජනකයන් හා පණ්ඩකයෝයි; විපාකාවරණෙන සමන්නාගතාති, විපාකාවරණයෙන් සමන්විතයෝ නම්; අහෙතුක ද්විහෙතුක පටිසන්ධිකා, අහේතුක ද්විහේතුක පිළිසඳ ඇත්තාහුයි; අස්සද්ධාති, සැදැහැ නැත්තෝහු නම්; බුද්ධාදිසු සද්ධාවිරහිතා, බුද්ධාදී තුනුරුවන් කෙරෙහි සැදැහැ නැත්තාහුයි; අච්ඡන්දිකාති, අච්ඡන්දිකයෝ නම්; අපච්චනීක පටිපදායං, මාර්ගානුලොම ප්‍රතිපත්තියෙහි; ඡන්දවිරහිතා, කත්තුකම්‍යතා ඡන්ද නැත්තාහුයි (උත්තරකුරුකයෝද මාර ආදීන්මෙන් අච්ඡන්දිකයන් කෙරෙහි ගිණියත්) දුප්පඤ්ඤාති, නුවණ නැත්තාහු නම්; ලොකිය ලොකුත්තර සම්මාදිට්ඨියා වි

රහිතා, ලෞකී ලොවුතුරු සම්මාදිට්ඨි නැත්තාහුයි (“දුප්පඤ්ඤාති භවඞ්ගපඤ්ඤාය පරිහීණා” යනුදු “භවඞ්ගපඤ්ඤාය පරිහීණාතානි යස්ස භවඞ්ගං ලොකුත්තරස්ස පාදකං නහොති සොපි දුප්පඤ්ඤො යෙව” යනුදු විභඞ්ග අටුවායි. යම් භවාඞ්ග සන්තානයෙක ලොවුතුරු දහම් උපදීද ඒ භවාඞ්ග සිත් ඒ ලොවුතුරු දහමුන්ට පාදක නම් වෙයි දත්තේ) අභබ්බා ——පෙ—— සම්මත්තං යනුයෙහි; කුසලෙසු ධම්මෙසු නියාම සම්මත්තං, කුශල ධර්මයන් කෙරෙහි නියාමයයි සම්මතවූ; සම්මත්ත සම්මතසද්ව, සම්‍යක්ත්වයයි සම්මතවූ; අරියමග්ගං ඔක්කමිතුං අභබ්බාති අපේඨා, අරිමගට බැස්නට අභව්‍යයහයන අර්ථයි; කෙවලං, හුදෙක්; කසිණෙපෙව, කසිණයෙහිම නොවෙයි; අඤ්ඤසුපි කම්මට්ඨානෙසු, සෙසු කමටහන්හිදු; එකන්තං, මොවුන් කෙරෙන්; එකස්සාපි භාවනා න ඉජ්ඣති, එකක්හට්ද භාවනා සිඬ නොවෙයි; තස්මා, එහෙයින්; විගත විපාකාවරණෙනාපි, (පූර්ව කර්ම වශයෙන්) පහකරණලද විපාකාවරණ ඇත්තාවූ; කුලපුත්තෙන, කුලපුත්‍රහුවිසින්; කම්මාවරණඤ්ච; කර්මාවරණයද; කිලෙසාවරණඤ්ච, කිලෙසාවරණයද; ආරකාපරිවජ්ජනීයා, දුරින්ම දුරුකොට; සද්ධම්මසවණ සප්පුරිසූපනිස්සයාදීහි, සද්ධර්ම ශ්‍රවණය සත්පුරුෂොපනිශ්‍රය යනාදීන්; සද්ධඤ්ච, සැදැහැද; ඡන්දඤ්ච, ඡන්දයද; පඤ්ඤඤ්ච, නුවණද; වඩ්ඪෙත්වා, වඩා; කම්මට්ඨානානුයොගෙ කරණීයො, කාමටහන්හි නැවත නැවත යෙදීමෙහි අභියොග කටයුතු——

ශෙෂකසිණ නිර්දේශ නම්වූ මේ

## පස්වන පරිච්ඡේදයයි.

---

( හා ¶ )

තවද පඤ්චානන්තරියකර්ම නැමහි අකුල හෙළා තිබන් මග අවුරණලද්දවූ හෝ ත්‍රිවිධ නියත මිථ්‍යාදෘෂ්ටි නැමති අකුල හෙළා තිබන් මග අවුරණලද්දවූ හෝ අහෙතුක විහෙතුක ප්‍රතිසන්ධි නැමති අකුල හෙළා තිබන් මග අවුරණලද්දවූ හෝ බුඬාදි රත්නත්‍රයෙහි හැදහිලි නැත්තාවූ හෝ නිර්වාණාධිගමයට කාරණවූ ප්‍රතිපත්ති පූරණයෙහි නොකැමැතිවූ හෝ දුෂ්ප්‍රාඥවූ හෝ කුශල ධර්මයෙහි නියාමයයි සම්මතවූද යහපත් බවයයි සම්මතවූද ආර්යමාර්ගයට පැමිණීමට නුසුදුසුස්සයයි වදාරණලද්දවූ හෝ යම් සත්ව කෙනෙක් වන්නාහුද එබඳු සත්වයන් අතුරෙන් එකෙකුටත් එකම කසිණයෙකවත් භාවනාව හෙවත් චතුෂ්කපඤ්චක ධ්‍යානාධිගමය සිඬනොවන්නේයි.

ඔවුන් අතුරෙන් කර්ම නැමති අකුල හෙළා තිබන්මග අවුරණලද්දේ නම් මාතෘඝාතකාදි පඤ්චානන්තරිය කර්මයන් අතුරෙන් යම් කිසි කර්මයකින් යුක්තවූවෙක්යි කෙලෙස් නැමති අකුල හෙළා තිබන්මග අවුරණලද්දේ නම් සුවිසිප්‍රත්‍යය ප්‍රතීත්‍ය සමුත්පාදදී හෙතුන්ගෙන් තොරව සත්වයාගේ පැවැත්ම වෙයි යනාදින් ගන්නා අහෙතුක දෘෂ්ටිය ක්‍රියාකර්මයන්ගේ විපාක නැතැයි යනාදින් ගන්නා අකිරිය දෘෂ්ටිය මෙලෝ පරලෝ නැතැයි යනාදීන් ගන්නා නාස්තික දෘෂ්ටිය යන මේ ත්‍රිවිධ නියත මිථ්‍යාදෘෂ්ටි අතුරෙන් යම් කිසි දෘෂ්ටියකින් යුක්තවූවෙක්ද නියුණු කාමරාගයෙන් යුක්තවූ උභතොබ්‍යඤ්ජනක පණ්ඩකයෝද යන මොහුයි විපාක නැමති අකුල හෙළා තිබන් මග අවුරණලද්දේ නම් කුශලාකුශල විපාක අහෙ

තුක සන්තීරණ චිත්තයෝ දෙදෙ නාය විපාහතුක මහාවිපාක චිත්තයෝ සතරදෙනාය යන මෙයින් එක්තරා සිතකින් පිළිසිඳගත් සත්වයෝය උ ගතනාබ්‍යඤ්ජනක පණ්ඩකයෝය යන මොහුයි. මෙහි චනායි උභතෝබ්‍යඤ්ජ නක පණ්ඩක යන දෙදෙනා අහෙතුක සිතින් ප්‍රතිසන්ධි ගත්තාවූවන් විපා කාවරණ සත්වයෝ නම් වූවෝ වෙති. ඔවු හු කාමභවාලනයෙන් ප්‍රතිසන්ධිවින් කෙලශාවරණ සත්වයෝ නම් වූවෝද වෙති. අශුබාවරණයෝ නම් බුද්ධ දහම් සඞ්ඝයා යන රත්නත්‍රයෙහි භක්ති නැත්තාවූ සත්වයෝයි. අච්ඡන්ද කයෝ නම් මාර්ගානුලෝමික ප්‍රති පත්තියෙහිද සත්‍යානුලෝමික ප්‍රති ඥානයෙහිද කාමච්ඡන්දය ජනිත නිසනලද නිවන් පසක් කරන්නට කැමැත්ත නැත්තාවූ සත්වයෝයි උතුරු කුරුදිවයින් වාසි සත්වයෝද එසේ ම්ලේච්ඡරාජ්‍යයන්හිද ත්‍රිහේතුක සිතින් ගත් ප්‍රතිසන්ධි ඇත්තෝ නිවන් ප සක්කරන්නට කැමැත්ත නැත්තෝ වූවන් බැවින් ඔවුද අච්ඡන්දිකයන් කොරෙහි ඇතු ලත් වෙත්මැයි. දුෂ්ප්‍රාඥයෝ නම් ලොව් ලොවුතුරු සම්‍යග්දෘෂ්ටි නැත් තාවූ හෙවත් භවාඞ්ගයාත්‍රාප්‍රඥා නැති යන්ගේ නිෂ්ප්‍රයෝජනය පාදක වන් නාවූ භවාඞ්ග ප්‍රඥ සත්ව යන ධිජ්ජාද ප්‍රඥ නැත්තාවූ සත්වයෝයි. කුසල ධර්මයෙහි නියාමියව පැමිණෙන්නට අභව්‍යයෝ නම් අනවද්‍ය සුඛවිපාකය ලක්ෂණකොට ඇති කුසල ධර්මයන්ගේ නොලුවරව තියන මාර්ගයෙන් පැමි ණීමට සමර්ථකාරණලද්දාවූද මහා නිවන්ට ගියනාලද්දාවූද යෝග්‍යවූ නො දැනැවී අනගාමී රහත් යන සතර මග සතර ඵලයට පැමිණීමට නුසු දුස්සෝ වූ සත්වයෝ අතුරෙන් එකෙකු හෝ වැලි දහ කසිණයෙහි උපනාව අවිශෙෂ සමතිස් භාවනාත් ගිය පාවිනාව ස්ධිතොවන්නේයි නො වත් සමසත්ලීස් කම්ටහන් භාවනා වෙන් මාර්ගඵලාධිගමයෙහි විශුද්ධ පදඋාන ඩ්‍යානාධිගමයෙහි හෝ නො වන්නේයි එහෙයින් පහකරණලද විපාකාවරණ ඇති ත්‍රිහේතුක ප්‍රති සන්ධි ඇත්තාවූ කාමාවචර කුලපුත්‍ර යා විසින් කර්මාවරණයද කෙලශාවර ණයද දුරින් දුරුකොට බණ ඇසීමය සත්පුරුෂ සේවනය යොනිසෝ මන සිකාරය යනාදී කුසල ධර්මයෙන් පුරනය කරමින් ශ්‍රද්ධාවද ප්‍රඥාවද පුරන්නා කැමැත්ත යොගාවචර භාව ණය යන ත්‍රිවිධ ධර්මයන් වඩා කම්ටහ න ගාවපාගුරුසාගරයෙහි නැවිය නැ වත උත්සාහ කටයුත්තේයි.

සජ්ජනයින් ගේ සාධුජන ප්‍රමෝදය පිණිස කරණලද විසුද්ධිමාර්ගයෙහි සමාධිභාවනාධිකාරයෙහි

සෙසකසිණ නිද්දේශ නම් වූ

## පස්වෙනි නිර්දේශය.

නිමා නිමවින ලදී.

# විශුද්ධිමාර්ග ශුද්ධිපත්‍රය.

| පි. | තී. | පෙ. | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|---|---|
| 1 | 2 | 6 | ප්‍රයොජනං... ... | ප්‍රයොජනම් |
| " | " | 18 | කාපීතාශොතෘ ... | ව්‍යාත්‍රශ්‍රොතෘ |
| 2 | 1 | 11 | කම්මනො ... ... | කම්මණො |
| 2 | 2 | 25 | පෙරලා ... ... | පෙරළා |
| " | " | 2 | තාවත්වකෙත්‍ර ණ ගෘහාතෙ | තාවත්කෙන නගෘහ්‍යතෙ |
| 6 | 1 | 6 | විචාලසේක ... | විචාලේය |
| " | " | 30 | අවේශ ... ... | අවේෂ |
| 9 | 1 | 21 | උප්‍රාශයක්... ... | උප්‍රාසයක් |
| " | " | 22 | වෛශාරුද්‍යයේන් ... | වෛශාරද්‍යයෙන් |
| " | " | 35-45 | භාගෘවත්වාදී ... | භාග්‍යවත්වාදී |
| " | 2 | 5 | නිවෘතතිය ... ... | නිවෘත්තිය |
| " | " | 37 | සත්ත්ව ... ... | සත්ව |
| 10 | 1 | 14 | පූජ්‍යතර ... .. | පූජ්‍යතර |
| " | " | 19 | ගුණාභිභවණගට ... | ගුණාභිභවනයට |
| 17 | 2 | 26 | හුණු ... ... | හුනු |
| " | 2 | 6 | ඉම්නාව ආතාපෙත.. | ඉම්නාව ආතාපෙතාති |
| 18 | 7 | 1 | පන්නේනම් ... | කපන්නේනම් |
| 19 | 2 | 9 | ප්‍රවෘතිය ... ... | ප්‍රවෘත්ත |
| 20 | 1 | 14 | ශ්‍රොත්‍රආපතනාදී ... | ශ්‍රොත ආපතනාදී |
| " | 2 | 6 | සජ්ජමෙව ... ... | සාවජ්ජමෙව |
| 26 | 1 | 11-12 | පංඤ්ඤපස්ථාන ... | පය්‍යුපස්ථාන |
| 17 | 1 | 22 | තථා අනාගාමි ... | අනාගාමිද; තථා සකෘදාගාමී, සකෘදාගාමිද; |
| 28 | 2 | 5-6 | විපච්තශ්‍රෙයයන්ට... | විපච්තඥයන්ට |
| 31 | 2 | 34 | චක්ෂුශ්‍රොත්‍ර ... ... | චක්ෂුශ්ශ්‍රොත්‍ර |
| 32 | 1 | 30 | යාව ... ... | යාව |
| 33 | 1 | 8 | විරය ... ... | විරිය |
| 41 | 2 | 26 | අප්‍ර විසාර... ... | අවිප්පටිසාර |
| 41 | 1 | 37 | මූලභූතස්ස... ... | මූලභූතස්ස |
| " | " | 32 | ලොවිතුරු... ... | ලොව්තුරු |
| 45 | 1 | 6 | පචවිධවේ... ... | පචවිධවේ; චුතානුපපිචෙතං පටිසම්භිදාය, ප්‍රතිසම්භිදායෙහිද මෙම කියනලදී) |
| 47 | 1 | 40 | යනලදහුද... ... | කියනලදහුද |
| 49 | 2 | 27 | චෛතශික... ... | චෛතසික |
| 51 | 1 | 33 | ලභා ... ... | ලාභා |
| 55 | 2 | 13 | ආතමාධිපතෙය්‍ය ... | ආත්මාධිපතෙය |
| " | " | 30 | ධර්මාධිපතෙය්‍ය ... | ධර්මාධිපතෙය |
| 56 | 1 | 8 | පරාමාශවයෙන් ... | පරාමාශවශයෙන් |
| 56 | 2 | 11 | ප්‍රසංශා ... ... | ප්‍රශංසා |
| 58 | 1 | 2 | නොවඅදනහු ... | නොඅවදනහු |
| 60 | 1 | 5 | විරති ... | සමෘති |
| " | " | 10 | හිණ ... ... | හින |
| 61 | 1 | 23 | බහුල ... ... | බහුල |

| | | | | | |
|---|---|---|---|---|---|
| 61-62 | " | " | සුඛසන්තනං | ... | සුඛසන්තානං |
| 63 | 1 | 13 | භික්ෂුනින් | ... | භික්ෂුණීන් |
| 63 | 1 | 2 | නාසජ්ජිසු | ... | නාසජ්ජිංසු |
| " | " | 14 | භික්ෂුණීන් | ... | භික්ෂූන් |
| " | " | 19 | භික්ෂූන් | ... | භික්ෂුණීන් |
| " | 2 | 2 | හිංශාව | ... | හිංසාව |
| " | " | 5 | පාෂාඩ | ... | පාෂාණ්ඩ |
| " | " | 8 | පලි | ... | පළි |
| 64 | 2 | 30 | ප්‍රවෘතීන | ... | ප්‍රවෘත්ත |
| 65 | " | 21 | දූලි | ... | දූළි |
| " | " | 28 | චක්ෂුවාර | ... | චක්ෂුර්වාර |
| 66 | 2 | 34 | බැහ් | ... | බැවින් |
| 67 | 1 | 4 | ඇත්තේයි | ... | ඇත්තේ |
| 68 | 1 | 34 | චන්ගෝත්තය | ... | චන්තෝය |
| " | 2 | 6 | පාලිසභ | ... | පැලිසෙහි |
| 69 | 2 | 21 | (ආචාර | ... | (අනාචාර |
| 76 | 2 | 30 | සකානාතය | ... | සන්තානය |
| 78 | 1 | 38 | ප්‍රශාදයෙන් | ... | ප්‍රසාදයෙන් |
| 79 | 1 | 35 | නොඇසු විරූ | ... | නොඇසූ විරූ |
| 82 | 1 | 4 | චක්ෂුප්‍රසාදය | ... | චක්ෂුඃප්‍රසාදය |
| " | " | 10 | පසඝන් | ... | පශ්‍යන් |
| " | " | 18 | චක්ෂුතිනොචිඥානොත්පාදනඑව | - | චක්ෂුඃතිනොඋපනාපාදනඑව |
| " | " | 19 | තැමා තදනුත්පන්නා- | | තැමෙන් තදනුත්පන්නා |
| " | " | 20-21 | විවක්ෂිතා නතාඃ යදුකානම් | — | විවක්ෂිතා නතායදුකානම් |
| 83 | 1 | 17 | පහි | ... | එහි |
| 84 | 1 | 11 | ඉෂ්ඨාකාරය | ... | ඉෂ්ටාකාරය |
| 85 | 1 | 23 | ද්‍රවිද්‍රවයි | ... | ද්‍රවිද්‍රයි |
| " | 2 | 6 | ස්ථාවශයෙන් | ... | ස්ථාමව වශයෙන් |
| 88 | 1 | 8 | සම්ප්‍රයෝජන | ... | සම්ප්‍රයෝජණ |
| 92 | 1 | 7 | සඵාණවූ | ... | සඵානවූ |
| " | " | 33 | සඛන් | ... | සඛයන් |
| 93 | 2 | 7 | තුන | ... | තුණ |
| 99 | 2 | 10 | නිදෙ | ... | නිදෙප |
| 100 | 1 | 6 | මැනිකාය | ... | මැණිකාය |
| 101 | 2 | 26 | සඞ්ඛ්‍යානං | ... | සඞ්ඛ්‍යානා |
| 102 | 9 | 39 | පරදනාහෙසින් | ... | පැරදීමචනාහෙසින් |
| " | 2 | 1 | චත්‍යේය | ... | චත්නිය |
| " | " | 12 | අවශ්‍යපනා | ... | යා අවශ්‍යපනා |
| 105 | 1 | 12 | පරුළුම්බ | ... | පරිළුම්බ |
| " | " | 34 | වජ්‍ය | ... | ඉවජ්‍ය |
| 106 | 2 | 5 | උපනොනාතා | ... | උපනොනානාතං |
| 108 | 2 | 31 | සඞය | ... | සඞාර |
| " | " | 34 | දක්ඛිනෙයනානං | ... | දක්ඛිණෙයනානං |
| " | " | 35 | දක්ෂිනාහි | ... | දක්ෂිණාහි |
| 109 | 1 | 16 | ප්‍රතිශෙධන | ... | ප්‍රතිෂෙධන |
| 111 | 1 | 29 | චතුරශ්‍ර | ... | චතුරස්‍ර |

| | | | | | |
|---|---|---|---|---|---|
| 113 | 1 | 24 | සම්පෙප | ... | සම්ප |
| 116 | 1 | 5 | උච්ඡ | ... | උච්ඡ |
| " | 1 | 18 | නිබ්බයෙ | ... | නිබ්බෙබ |
| 117 | 1 | 17 | උපාසාහනා | ... | උපාසහනා |
| " | 2 | 17 | පාරිවට්ටං | ... | පාරිහට්ටං |
| " | 2 | 31 | බීරගො | ... | යදි බීරගො |
| " | 2 | 32 | තෙසං | ... | තෙසං දූරකානං |
| 119 | 2 | 16 | ලෙඩ්ඩුකො | ... | ලෙඩ්ඩුකෙන |
| " | 2 | 35 | භුජිතු | ... | භුජිවු |
| 120 | 1 | 12 | මච්ඡපාලෙ | ... | මච්ඡවාලෙ |
| 121 | 1 | 29 | වම්භනා– | ... | වම්භනා |
| 122 | 1 | 11 | අපභාශ | ... | අපහාස |
| " | 2 | 30 | භිකබු | ... | භිකබූ |
| 127 | 7 | 33 | අකුදනී | ... | අකුදශී |
| " | 2 | 10 | බගිඩා | ... | බඃඩා |
| " | " | 38 | උපෂණ | ... | උෂණ |
| 128 | 2 | 35 | ප්‍රතිශෙවන | ... | ප්‍රතිසෙවන |
| 129 | 1 | 45 | ගිණි | ... | ගිනි |
| 130 | 1 | 37 | චතුමහාභූතිකාසස | ... | චාතුමහාභූතිකායස |
| " | " | 26 | පහානාවං | ... | පහානාවං වූපනාං |
| " | 2 | 3 | සරසම්භො | ... | සරසාම්භො |
| " | " | 10 | ජීතින්ද්‍රිය | ... | ජීවිතින්ද්‍රිය |
| 131 | 1 | 25 | ප්‍රතපංඩග | ... | ප්‍රත්‍යඞ්ග |
| " | 2 | 25 | හා විභූෂණය | ... | හා විභූෂණය |
| 132 | 1 | 25 | චාතුම්හභූත | ... | චතුමහාභූත |
| 134 | " | 33 | හෙවන | ... | හෙවත් |
| 136 | 1 | 30 | ලැබෙයයි | ... | ලැබියයි |
| " | 2 | 20 | මෙතණ | ... | මෙතන |
| 138 | 1 | 32 | බෙහෝ | ... | බොහෝ |
| 139 | 2 | 15 | ප්‍රාසාද | ... | ප්‍රසාද |
| 140 | 1 | 10 | කියනුලැබේ | ... | කියනුලැබී |
| " | " | 27 | උදුව | ... | උපදුව |
| " | " | 54 | සිහව්‍යඤ්ජනාදයො | ... | සිහව්‍යඤ්ජනාදීනො |
| " | " | 36 | රූගඬදසාදයො | ... | රූගඬදසාදීනො |
| 141 | 2 | 18 | පචනති | ... | පචනානි |
| 142 | 1 | 10 | ගිසත්හුගේ | ... | හිමත්හුගේ |
| 146 | 2 | 36 | ශිසාපදයෝ | ... | ශිසාපදයන් |
| 147 | 2 | 2 | ශුඩිං | ... | ශුඩා |
| 148 | 2 | 32 | සපමී | ... | සපයී |
| 150 | 1 | 17 | උකතාටැ | ... | අජ් උකතාටැ |
| 152 | 1 | 33 | මා | ... | මම |
| 156 | 2 | 21 | දත්තාලදුම්හයි | ... | දනුම්හයි |
| 159 | 1 | 22 | වචනං | ... | වචනං |
| 163 | 1 | 4 | අපරිභොගො | ... | අපාරිභොගගො |
| " | " | 10 | පතිටඨානං | ... | පතිටඨානා |
| 164 | 2 | 19 | භගතො | ... | භගතො |
| 181 | 1 | 6 | යශ | ... | යශස් |
| 182 | 2 | 14 | සන්ගීණ | ... | සන්ගීත |

| | | | | | |
|---|---|---|---|---|---|
| 183 | 1 | 4 | ආහ | ... | ආහ භගවා |
| " | 2 | 4 | භික්ඛු | ... | දහර භික්ඛු |
| " | 2 | 5 | භික්ෂුතෙම | ... | ලදරු භික්ෂුතෙම |
| " | 2 | 35 | නිබ්බත්තෙතාකොනා... | | නිබ්බත්තොතාවා |
| " | 2 | 34 | නිපදවන්නාහු | ... | නිපදවා |
| 185 | 2 | 23 | මහණ | ... | මහණනුව |
| 204 | 2 | 3 | ඊශ්‍යා | ... | ඊෂ්‍යා |
| " | " | 37 | උපැන්මෙන් | ... | ඉපැන්මෙන් |
| 208 | 1 | 2 | තන්වා | ... | තංවා |
| 216 | 2 | 14 | නිශදනාදිය | ... | නිෂද්‍යාදිය |
| 217 | 2 | 36 | විශුඩ | ... | විසුඩ |
| 218 | 2 | 12 | පරමලවනී | ... | පරලෙවනී |
| 220 | 2 | 26 | විකාලිතමල | ... | විකාලිතමලං |
| 222 | 1 | 14 | අබ්භොකාශිකාඞ්ග. | | අබ්භොකාසිකාඞ්ග |
| 223 | 1 | 38 | " පංසු | ... | " පංසුසු |
| " | 2 | 32 | නාමෙති | ... | නාමෙති; වෙදිතබ්බං, දනයුතු |
| 224 | 1 | 30 | සාමාජික | ... | සාමාකිකා |
| " | 1 | 20 | පඩපාතො | ... | පිඩපාතො |
| 227 | 1 | 22 | අබ්භවකාශ | ... | අභ්‍යවකාශ |
| 229 | 1 | 10 | විධවංශන | ... | විධ්වංසන |
| " | 1 | 27 | වීශෙති; | ... | {වීශෙති; වෙතිය පතිතිතෙ,<br>සැතිරිපවිශෙති; |
| 238 | 2 | 39 | පවුල්සිබුරු | ... | පසුල්සිබුරු |
| " | 2 | 1 | නිස්සාසානුරූප | ... | නිස්සයානුරූප |
| " | " | 3 | ආචාර්යයන්ගෙන්... | | ආචාර්යයන් විසින් |
| 240 | 1 | 32 | පරහරිතුං | ... | පරිහරිතුං |
| 241 | 1 | 5 | රඤ; ඉතරං, | | {රඤ; තං නිවාසෙසචා, එය-<br>-තැද; ඉතරං, |
| " | 2 | 7 | අනතරෙ, අනුෂරෙති; | | අනතර ගාථා, අනුරතුරෙති |
| 241 | 2 | 14 | ගහපච්ඡමව | ... | ගිහපච්ඡමව |
| 250 | 2 | 3 | රවිජය | ... | රවිජාය |
| 256 | 1 | 79 | සැතීර | ... | ශතීර |
| 262 | 2 | 3 | උපවාසපෙතබ්බං | ... | උවාසපෙතබ්බං |
| " | 2 | 15 | ථාමමජ්ඣිමපස | ... | ථාමමජ්ඣිමපුරිසස්ස |
| 263 | 1 | 1 | අවහාසාථාසු | ... | විනයවාසකථාසු |
| " | 2 | 9 | අසම්පනාතිසංමසා | | {අසම්පතාතිසංමසා-<br>රඤ්ඤශොකාකිකාබ්බු |
| 264 | 1 | 1 | ආරනාකාඩිග | ... | ආරණ්‍යකාඞ්ග |
| " | 2 | 25 | සබ්බං, සිසලල; | ... | සබ්බංමතං, මේ සිසලල; |
| 264 | 2 | 40 | {සාතුසුපාතී, සබද්ය<br>අසනුලැබෙනම්; | | {සාතුසකානාසදෙසුපාතී,<br>මනිසුන්ගේ ශබ්දය අසනු-<br>-ලැබෙනම්; |
| 264 | 2 | 28 | මිනිසුන් | ... | මිනිසුන් |
| 265 | 1 | 39 | සීලනා | ... | සීලෙනි |
| 266 | 1 | 19 | සුණනාතා | ... | සුණනාතං |
| 271 | " | 4 | සමාදිම | ... | සමාදිගාම |
| 277 | 2 | 5 | වසිතබ්බං | ... | න වසිතබ්බං |
| " | " | 28 | ගානාව | ... | ගාවිතාව |

| | | | | |
|---|---|---|---|---|
| 289 | 2 | 6-7 | ධුතභංගාම<br>ධුතාඞගමෙව | ධුතාඞගභාවී-ධුතාඞග-<br>යෙක්ම |
| 295 | 2 | 15 | අමොහ අලොභ ... | අලොභ අමොහ |
| 296 | 1 | 31 | ඉම්නා ... | ඉමානි |
| " | 2 | 10 | යුත්තානි ... | යුත්තානි පඤ්චපණ්ඩපාත-<br>පටිසංයුත්තානි |
| 302 | 1 | 32 | චතුසපාරිශුඩි ... | චතුෂපාරිශුඩි |
| 303 | 2 | 19 | චතුසක ... | චතුෂ්ක |
| 304 | 2 | 10 | අවිසාරසක්‍ෂණ ... | අවිසාරලක්‍ෂණ |
| 307 | 2 | 9 | චිතොනකගගතා ... | කුසලචිතෙතකාගගතා |
| 309 | 2 | 11 | චිතෙතගුතා ... | චිතෙතකාගුතා |
| 312 | 2 | 14 | වෙසි; ... | වෙසි; බිපපාවඅභිසඥද,<br>අභිඥදස්සිප්‍ර වෙසි; |
| 314 | 2 | 17 | වොමිසසතා ... | වොමිසසතාය |
| 317 | 2 | 19 | පීතිංක ... | පීයිකං |
| 320 | 2 | :8 | ජේ‍ය්‍ෂට ... | ජේ‍ය්‍ෂඨ |
| 328 | 2 | 40 | තෙ ... | තාවත් |
| 342 | 2 | 24 | තෝම ... | තාම |
| 350 | 1 | 6 | විශෙෂනයි ... | විශෙෂණයි |
| 352 | 1 | 13 | සමතතාගතො ... | සමතතාගතං |
| " | " | 24 | කලණමිත්වූ; ... | කලණමිත්තුයි |
| 357 | 2 | 30 | ගෙණ; | ගෙන; කමමටඨානං මෙහනෙත කාරෙථ ඉ<br>චෙවවං හාවනතබබං,වහන්ස මටකමටහන්දු<br>නමැනවැයි නොකියයුතුයි;ද්‍රතියදිවසතො<br>පන පටඨාය, දෙවෙනි දවසපටන් වනාහි; |
| 366 | 2 | 11 | ශෙලසමාදි ... | ශෛලජ්මාදි |
| 368 | 1 | 21 | නිස්ශෙෂ ... | නිශ්ශෙෂ |
| 369 | 2 | 30 | අලොභාදෙෂා මොහා.. | අලොභ දෙෂ මොහා |
| " | " | 40 | දෙස ... | දෙසා |
| 370 | 2 | 15 | න සඞකා ... | සඞෙකා |
| " | " | 16—17 | තොශපාහො .. | පොහො |
| 373 | 2 | 6 | අමොහයෝ දුබ්ල... | මෝහයෝ බලවත් |
| " | | 11 | මොහයෝ ... | අමොහයෝ |
| " | | 12 | අමොහයෝ ... | මොහයෝ |
| 375 | 2 | 11 | ප්‍රශාදවහ ... | ප්‍රසාදවහ |
| " | " | 25 | ප්‍රත්‍යාඞග ... | ප්‍රත්‍යඞග |
| 376 | 1 | 17 | ඉරියවු ... | ඉරියව |
| 380 | 1 | 25 | විෂ්මය ... | විස්මය |
| 381 | 2 | 25 | එවමාදයො, ... | එවමාදයො ධම්මා, |
| 384 | 2 | 9 | පුච්ඡිතා ... | පුච්ඡිතා වා |
| 385 | 2 | 19 | හිකනි ... | හිතනි |
| 387 | 2 | 15 | ක්‍ෂුද්‍ර ධාන්‍යයන්ගේ— | ක්‍ෂුද්‍ර ධාන්‍ය හා |
| 388 | 2 | 13 | උජවල ... | උජ්වල |
| 391 | 2 | 13 | අඝීයි) ... | අඝීයි) වටටනි, වචී; |
| " | 1 | 34 | විපුලං, ... | විපුලං මහාකසිණං, |
| 392 | 2 | 7 | දශදිශාවනඇති ... | දශදිශාවන් ඇති |
| " | 2 | 28 | ඇත්තාහට ... | ඇත්තාහට |
| 396 | 2 | 16 | සමතිකානමෙහි ... | සමතිකානමතොති |

| | | | | | |
|---|---|---|---|---|---|
| 398 | 1 | 10 | බ්‍රහ්මවිහාරෙ | — | බ්‍රහ්මවිහාරෙ |
| " | 1 | 14 | තීසු | — | තවසු |
| 405 | 2 | 11 | අවභාසමඬල | — | අවභාසමණ්ඩල |
| 408 | 1 | 1 | පා * | — | භා * |
| " | 1 | 32 | රුපාවචර | — | රූපාවචර |
| 410 | 1 | 35 | මම්මට්ඨානාන | — | කම්මට්ඨානානි |
| 411 | 1 | 25 | සෙයත්ථාපි | — | යථාගි |
| 412 | 1 | 7 | ඒහෙසිත් | — | එහෙසිත් |
| " | 1 | 9 | චවන | — | චවන |
| 416 | 1 | 20 | අරහන්ත | — | ඛීණාසව |
| 417 | 2 | 16 | චෙතොනාරෙ | — | චගානාරෙ |
| 418 | 1 | 13 | නෛයානීතික | — | නෛයයිාණික |
| 420 | 2 | 41 | නැතිබැබැවින් | — | නැතිබැවින් |
| 422 | 2 | 32 | ජිඤ්ඣාවා | — | ඣිඤ්ඣාවා |
| 424 | 2 | 40 | ජරාවාසා | — | ජරාවාසං |
| 425 | 2 | 28 | අනුරූපො නාම,<br>සුදුසුවෙහෙරනම්; | — | අනනුරූපො නාම, නුසු<br>දුසු වෙහෙරනම්; |
| 428 | 1 | 31 | දුරුනානිසසයෙ | — | දුරුසනානිසසයෙ |
| 429 | 1 | 1 | නාගබබං | — | ගනාගබබං |
| " | 2 | 24 | වත්ථුං | — | වත්ථු |
| 433 | 1 | 11 | ගෙරින බැඳ | — | ගෙරින් බැඳ |
| 446 | 2 | 9 | පතිරූපෙ විහාරෙ, | — | පතිරූපෙ සෙනාසනෙ, |
| 440 | 1 | 34 | කසිනට්ඨානෙ, | — | කසිනට්ඨානං, |
| " | 2 | 1 | විදත්ථි චතුරඞ්ගුල<br>විත්ථාරං | — | විදත්ථි චතුරඞ්ගුලප්ප-<br>මාණං |
| 455 | 1 | 11 | යොඑවර | — | යොගාවචර |
| 457 | 2 | 35 | පගගණ්හාති | — | චිත්තං පගගණ්හාති |
| 468 | 1 | 38 | අජ්ඣත්තික-<br>බාහිරානං, | — | අජ්ඣත්තික බාහිරානං-<br>වත්ථූනං, |
| 460 | 1 | 6 | කාළේතබබං | — | දස්සෙතබබං |
| 468 | 1 | 84 | සවජ්ජානවජ්ජා | — | සාවජ්ජානවජ්ජා |
| 472 | 1 | 21 | දසසාචිතා | — | දස්සිතා |
| 479 | 2 | 28 | සවෙජෙති | — | සංවෙජෙති |
| 480 | 2 | 15 | මැදහත්ව | — | මැදහත්ව |
| 482 | 2 | 23 | එරිද්දෙන් | — | එපරිද්දෙන් |
| 484 | 1 | 1 | පැමිණ; | — | පැමිණ; යාවනිවජ්ජනං<br>රෙණුං ආදය, කැමති ප<br>මණ රෙන්ගෙණ; |
| 491 | 2 | 15 | සත්වන වනුව හෝ | — | සත්වනුව හෝ |
| 501 | 2 | 31 | අයුෂ්මත් | — | ආයුෂ්මත් |
| 502 | 2 | 20 | සංයොජනනං | — | සංයොජනානං |
| 511 | 2 | 11 | පිණ්වන | — | පිණවන |
| " | 1 | 38 | ආභ, | — | වතා |
| 513 | 1 | 39 | නාවසස | — | තවසස |
| 515 | 1 | 14 | පිනිසැව | — | පිනිව |
| 517 | 2 | 3 | පඨමජ්ඣානනාගී | — | පඨමංඣානනාගී ඉදං |
| " | 2 | 22 | අභිදනසුතු: | — | අභිදනසුතු: විහරන්ති |
| " | 2 | 12 | ඉරියා | — | ඉරියං |

| | | | | | |
|---|---|---|---|---|---|
| 517 | 2 | 29 | චුතයි | — | චුතායිං |
| " | " | 32 | හැසිරීම | — | හැසිරීම, විහාරං, චිහිම; |
| " | " | " | අභිනිප්ඵාදෙනති | — | අභිනිප්ඵාදෙති |
| " | 1 | 36 | විසුඬෙන | — | සුවිසදෙන |
| 520 | 2 | 13 | ඡඩාවත් | — | විඩ වත් |
| " | 2 | 41 | හෙතුකොගෙණ | — | හෙතුකොටගෙන |
| 525 | 2 | 31 | සුදුසුමු | — | සුදුසුමූ |
| 530 | 2 | 20 | විමොක්ඛවසෙන | — | විමුච්චනවසෙන |
| " | " | 29 | වූහානං | — | වු ානා |
| 531 | 2 | 26 | යං | — | යසමා |
| " | " | 27 | සඞ්කිලෙසවොදනෙසු | — | සඞ්කිලෙසවොදානධම්මෙසු |
| 534 | 1 | 8 | පුදෙන | — | සූදෙන |
| " | 2 | 4 | භොජනසප්පායාදයො | | භොජනසප්පායාදයො- ආහාරා |
| 535 | 2 | 13 | පරිවිසහොතා | — | පරිවිසහොතා තයස |
| 540 | 1 | 3 | විය | — | වියව |
| 542 | 1 | 27 | එතමපි | — | එතයස |
| " | " | 30 | වඩ්ගුං | — | වඩ්ගුලං |
| " | 2 | 20 | යෙත් | — | යෙද්ද |
| " | " | 30 | පඨවියං | — | පඨවි |
| 545 | 1 | 20 | පදං | — | පාදං |
| 547 | 1 | 23 | අධිට්ඨාණවසී | — | අධිට්ඨානවසී |
| " | 2 | 11 | එවමපි, මෙයේද; | — | එවං, මෙසේ; |
| " | " | 27 | දිවෙති; — | | දීවෙති; තතො, ඉක්ඛිත්තොන්; එව- ගවඩගාති. දෙබවිගසිත්හු වෙත්; |
| 550 | 2 | 12 | පයවැත්විසහැකි | — | පැවැත්වියහැකි |
| 553 | 2 | 8 | මනසිකාරෙරුතො | — | මනසිකරෙරුතො |
| 554 | 2 | 16 | ප්‍රතිසු | — | ප්‍රිති සුව |
| 551 | 1 | 24 | ලෙකො | — | ලොකො |
| 558 | 2 | 15 | ඉමං | — | ඉදං |
| " | 2 | 32 | තොව | — | තොවව |
| 563 | 1 | 36 | — 565 2 22 | [illegible] | මේ ලකුණ බලනු |
| 567 | 2 | 16 | — 575 2 18 | " | මේ ලකුණ බලනු |
| 571 | 1 | 7 | වත්යනී | — | වත්නීය |
| 578 | 2 | 5 | වතනබ්බා | — | වතනබ්බාසියං |
| 579 | 1 | 22 | එකතම | — | එකක්ම |
| 580 | 2 | 5 | වණ්ණනාව | — | වණ්ණනාව |
| 585 | 1 | 24 | සමනොදවමනෝමය | — | සමනොදවත්නෝමය |
| 595 | 5 | 37 | වුහානා | — | වුහානානි |
| 604 | 2 | 2 | සමාස වනායාණි | — | සමාස වානායාණි |

"බොධ්‍යාඞ්ග" යන සියලුතැන් "බොධ්‍යඞ්ග" විශයුතු.

සබ්බදානං ධම්ම දානං ජිනාති,
සබ්බරසං ධම්ම රසං ජිනාති;
සබ්බරතිං ධම්ම රතිං ජිනාති
තණ්හක්ඛයො සබ්බදුක්ඛං ජිනාති

(ධම්මපදය තණ්හා වග්ගො)

ධම්මාරාමො ධම්මරතො - ධම්මං අනුවිචින්තයං;
ධම්මං අනුස්සරං භික්ඛු - සද්ධම්මා න පරිහායති.

(ධම්මපදය භික්ඛු වග්ගො)

ධම්මො පනෙසො සුගතප්පසත්ථො,
තරණීව සංසාර මහණ්ණවස්ස;
බ්‍රහ්මාසුරාදීහි නමස්සනීයෙපා,
රසො රසානං පරමො තිලොකෙ.

මහාගදො මච්චුජරා පහානො,
සබ්බීතිනාසාය විසෙසමන්තො;
සබ්බත්ථ දානෙන ච කප්පරුක්ඛො,
චින්තාමණී භද්දඝටොව ධම්මො.

ධම්මං විනා නත්ථි පිතාව මාතා,
තමෙව තාණං සරණං පතිට්ඨා;
තස්මා හි භො කිච්චමඤ්ඤප්පහාය,
සුණාථ ධාරෙථ චරාථ ධම්මෙ.

(රසවාහිනී)

චිරං තිට්ඨතු ලොකස්මිං - සම්මා සම්බුද්ධ සාසානං!

ධර්ම දානය පිණිසයි.........

